ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත ධම්මපදය



පිළිගැන්වීම

සිරිලක් දෙරණ වසා පැතිර විහිද ගිය
බිහිසුණු කෲරත්වයක තිමිර පටලය
මුලිනුපුටා දමා මේ පූජනීය දේශවාසීන්ට
නිදහසේ සිසිලස ආස්වාදය කරන්නට
මං පෙත් හෙළි කළ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ජනාධිපති
අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට,
මුළු මානව වංශයම
විමුක්තියේ ආලෝකයෙන් බබුළුවන
අමා මෑණියන් වහන්සේගේ
ධම්මපද ග්‍රන්ථරත්නය
සම්මාන පුරස්සරව පිරිනමන්නෙමි.

පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්ථවිරයන් වහන්සේ
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව.
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය.
27. 11. 2013

අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති

අනුග්‍රාහකත්වය

"සබ්බදානං ධම්මදානං ජිනාති"

(ධර්ම දානය, සෙසු දාන සියල්ලටම වඩා අගනේය.)

"ධර්ම භාණ්ඩාගාරය - සිතුවම් සහිත ධම්මපදය"

නමැති මේ ග්‍රන්ථය ප්‍රකාශ කිරීම සඳහා පූර්ණ අනුග්‍රහය සපයන ලද්දේ
සිංගප්පූරුවේ, න් වූ හින් මහතා (Mr. Ng Wu Hin) **සහ ඒ පවුලේ සියලු දෙනාත් විසිනි.**

මේ අනර්ඝ ග්‍රන්ථය ප්‍රකාශ කිරීමට අනුග්‍රහය සම්පාදනයෙන්,
අත්පත් කොට ගන්නා ලද පින් බෙලෙන්,
න් වූ හින් මහතාට සහ එම පවුලේ සියලු දෙනාට ම
ශ්‍රේෂ්ඨ ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය ලැබී, එහි බලයෙන්
නිදුක්, නීරෝගී සුවයත්, සර්ව සෞභාග්‍යයත්,
සියලු ශුභ සිද්ධියත් ලැබේවායි යි
මාගේ ප්‍රාර්ථනය යි.

පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්ථවිරයන් වහන්සේ
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව.
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය.
27. 11. 2013

ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත ධම්මපදය

කතෘ

ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ

ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව

විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය

නො: 1, ජලන් මස් පුටේ, සිංගප්පූරුව 128607

ටෙලි: 65 67783330 65 94656570

94 770589498 / 94 755218421

වේරගොඩ ජයන්ති විහාරය, වේරගොඩ, මීටියාගොඩ

විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

කර්තෘ
ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

චිත්‍ර ශිල්පි
පී. වික්‍රමනායක

සැකසුම
පියරත්න හේවාබට්ටගේ

පරිගණක රූපාවලි සහ පූර්ව ප්‍රකාශන මෙහෙය
පූජ්‍ය වේරගොඩ සුනන්දා භික්ඛුණී
බී. දයා සමරසිංහ
බී. රෝහණ ජයතිස්ස

පරිගණක සහාය
ශ්‍යාමනී ප්‍රියලක්ෂණා ලේකම්වසම්
ඩබ්ලිව්. මාලා කාන්ති
ප්‍රියංකා බෝධිපක්ෂ

සහාය
බී. පුෂ්පානී ධම්ලතා
බී. ජේ. ධම්ලතා
ඊ. එම්. ලයනල් මොහොට්ටි
ඊ. එම්. යුගාන් සසංක
ශ්‍රියාලතා කග්ගොඩ ආරච්චි

පරිගණක ප්‍රකාශන
සමනල ප්‍රින්ටර්ස්, බටපොල
ටෙලි: +94 777557127

පිටකවරයේ පින්තූරය
බර්ටි ගුණසේකර

මුද්‍රණය
2013 නොවැම්බර් මස 27 දින, සිංගප්පූරුව

පිටකවරයේ චිත්‍රය

පිටකවරයේ බුදු පිළිමය වේරගොඩ ජයන්ති විහාරයේ බුදුමැඳුරෙනි.
වර්ෂ 1953 ජුනි 3 වෙනිදා අඹන ලද මෙම බුදු පිළිමය දැනට ශ්‍රී ලංකාවේ තිබෙන
දර්ශණීයතම බුදු පිළිමය වශයෙන් සැලකේ. මෙම බුදු පිළිමය ඉදිකිරීමේ පුරෝගාමී වූ අපවත් වී වදාළ
ගෞරවාර්හ පණ්ඩිත යටලමත්තේ වජිරඥාණ නායක මාහිමිපාණන් වහන්සේට නිවන්සුව අත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.

මේ ග්‍රන්ථයෙහි ආගත කරුණු පිළිබඳ පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේටයි.
බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පහළ වූ සනාතනික සත්‍යයෝ පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද
තාවකාලික වූත්, අසත්‍ය වූත්, අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති.

පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
ටෙලි: 65 67783330 65 94656570
+94 770589498 +94 755218421
විද්‍යුත් ලිපිනය: weragodas1941@gmail.com | vensarada@ymail.com

ISBN: 981-00-4938-2

ධර්ම භාණ්ඩාගාරය

සිතුවම් සහිත ධම්මපදය

කතෘ

ශාස්ත්‍රවේදී පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ

ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව

සංස්කාරකවරු

කලාකීර්ති එඩ්වින් ආරියදාස
මහාචාර්ය කපිල අභයවංශ
මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර

චිත්‍ර ශිල්පි

පී. වික්‍රමනායක

සංස්කරණ උපදේශක මණ්ඩලය

ශාස්ත්‍රවේදී පූජ්‍ය ගලබොඩ ඥානිස්සර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
පණ්ඩිත පූජ්‍ය මීටියාගොඩ සද්ධානන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
පූජ්‍ය වේරගොඩ ගුණානන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
ශාස්ත්‍රවේදී පූජ්‍ය කන්දරපංගුවේ ධම්මසිරි මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
ශාස්ත්‍රවේදී පූජ්‍ය තිනියාවල පාලිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ
ගෞරව ශාස්ත්‍රවේදී පණ්ඩිත පූජ්‍ය දූල්දෙණියේ ඥානරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ (අධ්‍යාපන ඩිප්ලෝමා)
ශාස්ත්‍රවේදී පූජ්‍ය හීන්බුන්නේ කොණ්ඩඤ්ඤ ස්වාමීන්ද්‍රයන් වහන්සේ
ආචාර්ය කිරින්දේ අස්සජි ස්වාමීන්ද්‍රයන් වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය දාපනේ සුමනවංස ස්වාමීන්ද්‍රයන් වහන්සේ
ශාස්ත්‍රවේදී පූජ්‍ය අත්තරගොඩ පියනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ
පූජ්‍ය උල්ලල විජිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ
පූජ්‍ය සියඹලාණ්ඩුවේ කොණ්ඩඤ්ඤ ස්වාමීන්ද්‍රයන් වහන්සේ
තිස්ස ජයවර්ධන මහතා කොළඹ විශ්ව විද්‍යාලය සිංහල අංශාධිපති
නීතිඥ ආනන්ද එන්. තිලකරත්න මහතා

උපදේශක මණ්ඩලය

පූජ්‍ය සෙක් තුවාන් කර්න් භික්ෂුණීන් වහන්සේ (Ven. Sek Tuan Kern)
පූජ්‍ය සෙක් තුවාන් චියෑ භික්ෂුණීන් වහන්සේ (Ven. Sek Tuan Chhair)
පූජ්‍ය සෙක් චුවාන් ජියෑ භික්ෂුණීන් වහන්සේ (Ven. Sek Chuan Jie)
කෝ බෙන් තී මහතා (Mr. Koh Beng Tee)
ලී කිම් මොයි ඈන් මිය (Mdm. Lee Kim Moi Ann)
තේ ෂූ චින් ජෙසිකා මිය (Mdm. Tay Shu Chin Jessica)
දයා සතරසිංහ මයා (Mr. Daya Satharasinghe)
වොන් සෝ නගේ ෂර්ලි මිය (Mdm. Wong Sow Ngan Shirley)
න් වූ හින් මයා (Mr. Ng Wu Hin)
සීතෝ සොක් ලෙන් මිය (Mdm. Sito Sook Leng)
දොන් විජේදාස් විජේන්ද්‍ර මයා (Mr. Don Wijedas Wijendra)
තාන් ගිම් හොන් මිය (Mdm. Tan Gim Hong)
තේ යොන් ලී මිය (Ms. Tay Yong Lee)
ගන් කිම් සොනග් ඇල්බට් මයා (Mr. Gan Kim Song Albert)
යෝ චෙන් පෝ ඩග්ලස් මයා (Mr. Yeo Cheng Poh Douglas)
වන් ලයි වන් මිය (Mdm. Wan Lai Wan)
ඔ සොක් හුවා මිය (Mdm. Oh Siok Hua)
අන් ලියන් ස්වී සිතා මිය (Mdm. Ang Lian Swee Sita)

ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයක් අත්පත් කරගත් විශිෂ්ට පුද්ගලයා

පාලි බෞද්ධ සාහිත්‍යය ඉංග්‍රිසියට නැගීමේ
පුරෝගාමී වූ විද්වතුන්ගෙන් එක් අයෙක් සුප්‍රසිද්ධ
ක්‍රිස්තියානි පූජකවරයකු ගේ පුතෙක් විය.
ඔහු ඒ පරිවර්තන ව්‍යාපාරය
ආරම්භ කළේ ක්‍රිස්තියානිය බුදුසමයට වඩා උසස් යැයි
ස්ථුට කිරීම පිණිසයි. ඒ ප්‍රයත්නය අසාර්ථක විය.
එසේ වුවද ඔහු බලාපොරොත්තු වූවාටත්
වඩා ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයක් අත්පත් කොට ගත්තේ ය.
ඔහු බුද්ධභක්තිකයෙක් වූයේ ය.
මේ ව්‍යාපාරය ආරම්භ කරන්නටත් එමගින් බටහිර
දේශයන්හි දස දහස් ජනකායකට උතුම් බුද්ධ ධර්මය
අවබෝධ කරන්නටත් මං සැලසූ මේ භාග්‍ය සම්පන්න
සිද්ධිය අප විසින් කිසි කලකත් අමතක
නොකළ යුතුයි. මේ ශ්‍රේෂ්ඨ විද්වතාණන් ගේ නම
ආචාර්ය රීස් ඩේවිඩ්ස් ය.

පූජ්‍ය ඒ. මහින්ද හිමියන් ගේ "මෝක්ෂ සුවයට සැළැස්ම" නම් ග්‍රන්ථයෙනි.

පටුන

ගාථා අංකය	යමක වග්ග — පළමුවන පරිච්ඡේදය — ගාථා සංඛ්‍යාව 20	පිටු අංකය
1	අකුසල දහමන්ට සිත මුල් ය. කිලිටි වූ සිතින් අකුසල් කළ තැනැත්තා පසුපස්සේ දුක ලුහුබඳී	2
2	කුසල් දහමන්ට සිත මුල් ය. පහන් වූ සිතින් පින් කළ තැනැත්තා පසුපස්සේ සැප ලුහුබඳී	4
3	බැණීම්, පහරදීම්, දිනීම්, පැහැරගැනීම් යන වරද (සිත්හි) බැඳීමෙන් වෛරය නො සන්සිඳේ	6
4	බැණීම්, පහරදීම්, දිනීම්, පැහැරගැනීම් පිළිබඳ කෝපය (සිත්හි) නොබැඳි කලැ සන්සිඳේ	8
5	වෛරට වෛර නො කිරීමෙන් වෛර සන්සිඳේ. මෙය හැමදා පවත්නා දහමෙකි	10
6	මැරෙන බව නො දන්නෝ කලහ කරති. මැරෙන බව දන්නවුන්ගේ කලහ සන්සිඳේ	12
7	ඉන්ද්‍රිය සංවරයක් නැතිව වෙසෙන්නා මරු වසඟයට යන්නේ දුබල ගසක් වාතයෙන් ඇද වැටෙන්නාක් මෙනි	14
8	ඉන්ද්‍රිය සංවරයක් ඇති තැනැත්තා මරු වසඟට නො යන්නේ වාතයෙන් පර්වතයක් නොසැලෙන්නාක් මෙනි	16
9	කෙලෙස් කසට දුරු නො කළ ඉඳුරන් දැමීම් සහ සැබෑ වචන නැත්තා සිවුරු දැරීමට නු සුදුසු ය.	18
10	කෙලෙස් කසට පහ කළ, මනා සිල් ඇති, ඉඳුරන් දැමූ තැනැත්තා කසාවත දැරීමට සුදුසු ය.	20
11	නිසරුදෙය සරුය, සරුදෙය නිසරුය යන වැරදි අදහස් ගොදුරු කොටැ'ත්තාහු සරුවූ නිවන්සුව නොලබත්	22
12	සරුදෙය සරු ලෙසත්, නිසරුදෙය නිසරු ලෙසත් නිවැරදිව දක්නාහු සාරවූ නිවන් සුව ලබත්	24
13	භාවනාවෙහි නො වැඩුණු නුපුරුදු සිත තුළ රාගය විනිවිද යයි	26
14	මොනවට පුරුදු කළ භාවනාවෙහි වැඩුණු සිතතුළ රාගය විනිවිද නොයේ	28
15	පව් කළ තැනැත්තා මෙ ලොවැ හා පරලොවැ සෝකවෙයි. තමන් කළ පව් කම් දැක දුක්වෙයි	30
16	කුසල් කළ තැනැත්තා මෙලොවැ හා පරලොවැ බොහෝ සේ සතුටු වෙයි	32
17	පව් කළ තැනැත්තා මෙලොවක් තැවී පරලොවක් දුක් විඳ බොහෝ සේ තැවෙයි	34
18	පින්කළ තැනැත්තා මෙලොවත් සතුටු වැ, පරලොවැ සුගතියට පැමිණ, බොහෝ සේ සතුටු වෙයි	36
19	තෙවළා දහම් දැන උගෙණ, කියමින් ඒ නොපිළිපැදීම ශ්‍රමණ ගුණයේ පල හිමි නො වීමට හේතු වෙයි	38
20	මඳ වශයෙන් වූවත් තෙවළාදහම් දැන උගෙන පිළිපැදීම ශ්‍රමණ ගුණයේ පලය හිමිවීමට හේතු වෙයි	40

ගාථා අංකය	අප්පමාද වග්ග — දෙවන පරිච්ඡේදය — ගාථා සංඛ්‍යාව 12	පිටු අංකය
21	නො පමා බව නිවණට මඟය. පමා බව මරණයට මඟය. නො පමාවූවෝ නොමියෙති පමාවූවෝ මළවුන් වැනි වෙති	44
22	නුවණැතියෝ නොපමාවෙහි ගුණ දැන, එහි යෙදී, සතොස් වැ ආර්යයන්ගේ ගොදුරෙහි ඇලෙති	46
23	භාවනා කරන, නිතොරැ දැඩි වෙරැති නුවණැතියෝ නිවන් පසක් කරති	48
24	නගා සිටි වෙර සහ මනා ගුණැති දහැමින් දිවි පවත්වන නොපමා තැනැත්තාගේ යසස මොනවට වැඩේ	50
25	නුවණැත්තා කෙළෙස් මහ වතුරෙන් නසා ලිය නො හැකි රහත් පල නමැති පිහිට හිමි කරන්නේ ය	52
26	බාල වූ අනුවණ ජනයන් ප්‍රමාදයෙහි යෙදී වෙසෙන අතර, නුවණැත්තා නොපමා ගුණය මාහැඟි දනයක් සේ රකී	54
27	කම් සුවයෙහි යෙදීම් හැර නොපමාව ධ්‍යාන භාවනා කරන තැනැත්තා විපුලවූ අමා සුව ලබයි	56
28	සෝකය දුරු කළ තැනැත්තා පව්වක සිටියකු බිම සිටිනවුන් දක්නා සේ, සෝකයෙන් පෙළෙන සත්කැල දකියි	58
29	නො පමාව නිදිවරා බවුන් වඩන උතුම් නුවණැත්තා වහා නිවන් පසක් කරන්නේ ය	60
30	අප්‍රමාද ගුණය රැකීම හේතුකොටගෙන මඝ නම් තරුණයා සක්දෙව් රජය ලැබීය	62
31	පමා බැව්හි බිය දැක මහණ දම් වඩන තැනැත්තා කුදු මහත් සසර බැඳුම් වූ (රැහැන්) දවයි	64
32	නො පමාවෙහි ඇලී මහණදම් වඩන තැනැත්තා පිරිහිමට නො පැමිණේ. නිවන් පුර ළඟ ම වේ	66

චිත්ත වග්ග

තෙවන පරිච්ඡේදය

ගාථා සංඛ්‍යාව 11

ගාථා අංකය		පිටු අංකය
33	සැලෙන සුලුවූ, රැක ගැන්මට අමාරු වූ සිත නැණවතා (දොස් නමැති) ඇද හැර මොනවට සදන්නේ ය	70
34	ගොඩබිම බාහලූ මසෙකු සේ මේ සිත ඇදෙන සැලෙන බැවින් වෑයමෙන් රැක කෙලෙස්වට දුරැලියැ යුතු	72
35	කැමැති අරමුණක වැටෙන සුලු වූ සිත දමනය කිරීම යහපති. දමනය කළ (හික්ම වූ) සිත සැප එළවන්නේ වෙයි	74
36	නුවණැත්තා නො දැක්ක හැකි වූ ඉතා සියුම් වූ සිත රැක ගනී. ඒ සැප ලැබීමට හේතු වේ	76
37	බොහෝ දුර දිවෙන, ගමන් ඇති, තනිව හැසිරෙන සිත රැකගන්නාහු මර බැඳුමෙන් මිදෙත්	78
38	නො තිර, සදහම් නො දත්, ඉපිලෙන (පැන පැන යන) සිතැ'ති සැදැහැත්තාට නුවණ නො වැඩේ	80
39	රාගයෙන් නො තෙත් වූ කෝපයෙන් දැඩි නො වූ සිත් ඇති, පින් පව් දුරැලූ රහතුනට කෙළෙස් බිය නැත	82
40	සිරුර කළයක් මෙන්ද, සිත නුවරක් මෙන් ද ගෙණ නුවණ අවියෙන් කෙළෙස් මරු පරදවන්න	84
41	මේ සිරුර සිත නැති කල වැඩකට නැත. දර කඩක් සේ පොළෝ මත හෝනේ ය	86
42	සොර සතුරන් කරන විපතකට වඩා වරදෙහි යෙදූ සිත බලවත් නපුරක් කරන්නේ ය	88
43	මනාකොට පිහිටි සිත මව්පියන් විසින් වුවද නො කළ හැකි ඉතා උතුම් බවෙක් කරන්නේ ය	90

පුප්ඵ වග්ග

හතරවන පරිච්ඡේදය

ගාථා සංඛ්‍යාව 16

ගාථා අංකය		පිටු අංකය
44	කවරෙක් ලොව අවබෝධ කරන්නේ ද? කවරෙක් දහම් පදය අවබෝධ කරන්නේ ද?	94
45	හික්මෙන තැනැත්තා ලොව පිළිවිද දැනගනී. දහම්පදය ද මොනවට පිරික්සා පිළිවිද දැන ගනී	96
46	කය පෙණ පිඩක් මිරිඟුවක් සේ දැන සලකන තැනැත්තා මර බැඳුම් සිඳ බිඳ දමා නිවන් පසක් කරන්නේ ය	98
47	පස්කම්හි ගිජු ව ඇලුණු සිත් ඇත්තා සපල නො වූ අදහස් ඇති ව මැ මිය යයි	100
48	පස්කම් සැපයෙහි ඇලුම් ඇත්තා (මැරෙණ තුරුත්) කාමයන්හි සෑහීමකට නොපැමිණේ	102
49	බමරා මලේ පැහැය හා සුවඳ නොපෙළමින් පැණිගෙන යන්නාක් මෙන් මහණහු ගම හැසිරෙති	104
50	අනුන්ගේ රළුපරළු බස් හා කළ නොකළ දේ ගැන මෙනෙහි නො කොට, සිය කටයුතු සලකා බැලිය යුතු	106
51	දහම් දැන ඉගෙන ඒ අනුව නො පිළිපදින තැනැත්තාට ඒ දහමෙන් වැඩක් නැත්තේ ය.	108
52	දහම දැන ඉගෙන ඒ අනුව හැසිරෙන තැනැත්තාට ඒ දහම මොනවට හිත සැප එළවයි	110
53	මල් රැසකින් බොහෝ මල් දම් ගොතන්නේ යම් සේ ද එසේ මැ උපන් මිනිසා විසින් බොහෝ කුසල් කළ යුතු	112
54	මල් සුවඳ උඩු සුළඟට නො හමන්නේ ය. සත් ගුණවතුන් ගේ සිල් සුවඳ උඩු සුළඟට ද හමන්නේ ය	114
55	සඳුන් උපුල් ආදී සුවඳ දෑ අතුරෙන් හට ගැනෙන සුවඳට වඩා සිල් සුවඳ ම ඉතා අගනේ ය	116
56	තුවරලා සඳුන් ආදී සුවඳ ඉතා සුලුය. සිල්වතුන්ගේ සිල් සුවඳ දෙවියන් අතර පවා පැතිරේ	118
57	මනාකොට සිවුසස් දැන කෙළෙස්වලින් මිදුණු රහතුන් පිරිනිවීම් වශයෙන් වැඩි මග මරු නො දනී	120
58	මහ මගැ අසළ දැමූ කුණු කසල ගොඩක වුව ද හටගැනෙන පියුමෙහි සුවඳ හා පැහැය සිත් කලුය	122
59	පුහුදුන් අතරැ උපන් සම්මා සම්බුදු සවු රහත් තෙම නුවණින් අඳ පුහුදුන් ඉක්මවා බබළයි	124

බාල වග්ග

පස්වන පරිච්ඡේදය

ගාථා සංඛ්‍යාව 16

ගාථා අංකය		පිටු අංකය
60	නිදිවරන්නහුට රැය ද, ගමන් විඩා ඇත්තහුට යොදුන ද, අනුවණයනට සසර ද ඉතා දික් ය	128
61	නුවණැති උතුමකු ඇසුරු කිරීමට නැති නම් හුදකලාව විසීම වඩා සුදුසු ය	130
62	මට දරුවන් හා ධනය ඇත්තේ ය යි අනුවණයා දුකට පත් වුවත් තමා ද තමාට නැත්තේ ය	132
63	තමා ගේ අනුවණකම දන්නා තැනැත්තා නුවණැතියෙක් හෝ නුවණැතියෙකු සමාන හෝ වන්නේ ය	134
64	අනුවණයා දිවි ඇති තෙක් පණ්ඩිතයෙකු ඇසුරු කළත් දහමක් (මනාව) දැන නො ගනී	136
65	නුවණැත්තා මොහොතකුදු පණ්ඩිතයෙකු සෙවුණේ වේද දහම වහා දැනගන්නේ ය	138
66	අනුවණයෝ පව්කම් කරමින් තමාට සතුරෙකු වැනි වූ අත් බැවින් යුතු වැ හැසිරෙත්	140
67	කඳුළු පිරුණු මුහුණු ඇතිව දුක් විඳී. පසුතැවිලි වීමට සිදුවන පව්කම් නො කිරීම යහපති	142
68	සොම්නස වැඩෙන දෙයක් කිරීම සැපයට හේතුවන බැවින් එය ඉතා යහපත් වන්නේ ය	144
69	අකුසලය යම්තාක් කල් විපාක නොදේද ඒතාක් කල් බාලයා එය මිහිරි කොට සිතන්නේ ය	146
70	(මසකට වරක් අහර ගෙන) මිසදිටුගෙන සිටින්නා ධර්මය දත් රහතුන්ගෙන් සොළොසින් එකක් වත් නො වටී	148
71	දෙවූ කෙණෙහි කිරි නොම්දෙන්නා සේ පව ද කළ කෙණෙහි විපාක නොදෙන්නේ ය	150
72	අනුවණයාගේ දැන උගත්කම හා ඉසුරුමත් බව ඔහුට ම අවැඩ පිණිස වන්නේ ය	152
73	අනුවණ මහණතෙම තමන් තුළ නැති ගුණ අඟවා බුහුමන් හා උසස් බැව් පතන්නේ ය	154
74	නුවණ නැති පැවිද්දා ගේ කුදු මහත් කටයුතු ගැන නිසරු අදහස් ද ආසාව හා මානය ද වැඩේ	156
75	පැවිද්දා ලාභ උපදවන පිළිවෙත ද නිවන් ලබන පිළිවෙත ද වෙනස් බව දැන කෙලෙස් මලින් වෙන් විය යුතු ය	158

ගාථා අංකය	පණ්ඩිත වග්ග	හයවන පරිච්ඡේදය ගාථා සංඛ්‍යාව 14	පිටු අංකය

76 වරද දැක නිගාකොට ඔවා දෙන නැණවතා නිදන් පෙන්වන්නෙකු වැනිය 162
77 ඔවාදෙන අනුසසුන් කෙරෙන පවින් වළකන තැනැත්තා සුදනන්ට ප්‍රිය ය. දුදනන්ට අප්‍රියය........ 164
78 පව්ටු මිතුරන් හා සැහැසි පුරිස් නො සෙවිය යුතුය. කළණ මිතුරන් හා උතුම් පුරිස් සෙවිය යුතුය 166
79 දහම් රස බොන තැනැත්තා සුවසේ වෙසේ. ඒ නුවණැත්තා අරියයන් විසින් දන්නා ලද දහම්හි මොනවට ඇලේ........ 168
80 දිය ගෙනයන්නෝ දිය ද, හී වඩුවෝ හී ද, ලී වඩුවෝ ලී ද සකස් කරති. එසේ පණ්ඩිතයෝ සිත දමනය කරත්........ 170
81 ගල් පව්ව යම් සේ සුළඟින් නො සැලේ ද, එසේ මැ නුවණැත්තෝ නිගා, පැසසුම්හි නො සැලෙති 172
82 යම් සේ ගැඹුරු වූ සයුර වෙසෙසින් පහන් වේ ද, එසේ මැ පඬුවෝ දහම් අසා මොනවට පහන් වෙත්........ 174
83 උතුම් පරිස්හු කිසි දැයෙකැ නො ඇලී සුවදුක් දෙක්හි උස් පහත් ගති නො දක්වති 176
84 යස ඉසුරු නොදැහැමින් නොකැමැතිවන තැනැත්තා සිල්වතෙක් නැණවතෙක් දැහැමියෙක් වේ........ 178
85 මිනිසුන් අතුරෙහි පරතෙර (නිවන්) යන්නෝ ටික දෙනෙක් වෙති. සෙසු සත්කැල මෙතර (සසර) මැදිවෙති 180
86 මනාකොට දෙසූ දහම් පිළිවෙත පිරුමෙන් ඉතා දුක සේ එතෙර විය යුතු සසර පරතෙරට පැමිණිය හැක........ 182
87 නුවණැත්තා ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණ අකුසල් දුරුකොට කුසල් වඩන්නේ ය........ 184
88 නුවණැත්තා කම්කටොළු හැර නිවණෙහි ඇලී සිය සිත මොනවට පිරිසිදු කෙරේ........ 186
89 සම්බෝධියට පත් වන දහම්හි මනාකොට පුරුදු කළ සිතැති රහත්හු ලොවැ පිරිනිවි උතුමෝ ය 188

ගාථා අංකය	අරහන්ත වග්ග	හත්වන පරිච්ඡේදය ගාථා සංඛ්‍යාව 10	පිටු අංකය

90 නිම් සසරැ ගමන් ඇති සියලු කෙලෙස් ගැට සිඳ ලූ රහතුනට සිත් තැවිල්ලෙක් නැත්තේ ය 192
91 විල හැරපියා හංසයන් යන්නා සේ - රහත්හු, වසන හැමතැනක්ම ඇලීම් රහිතව හැරයත්........ 194
92 නිවණ ගොදුරු කොටැති රහතුන් ගේ ගතිය නොදතහැක. අහසැ සකුණයන් ගිය මඟ නො දත හැක්කාක් මෙනි........ 196
93 රහතුන් ගේ ඉපැද්ම නො දත හැක. අහසැ සකුණයන් ගිය මඟ පිය නො දත හැක්කාක් මෙනි........ 198
94 දැමුණු ඉඳුරන් ඇති පුහුන් මන් ඇති කෙලෙස් රහිත රහතුන්ගේ දැක්ම දෙව්යෝ පතති 200
95 රහත්හු අවමන් බුහුමන් මැදහත් ව ඉවසති. නින්දා පැසසුම්හි කම්පා නො වෙති 202
96 මනාව දැන නිවී සැනහුණු රහත්හු සිත, සන්සුන් ය. වචනය හා කටයුතු ද සන්සුන් ය 204
97 ඇදහිලි නැති නිවණ දන්න සඳැසිඳලු ඉපැද්ම නැසූ වමාරා දැමූ ආසා ඇත්තා උතුම් පුරිස් ය 206
98 රහතුන් වහන්සේලා ගමෙහි, වනයෙහි නිම්නයෙහි හෝ ගොඩ වෙසෙතත් ඒ බිම් පෙදෙස ඉතා සිත්කලු ය 208
99 පුහුදුන් අය නො ඇලෙන සිත්කලු වනයෙහි රහත්හු ඇලෙති. ඒ තුමෝ කම් සැප සෙවුම්හි ආසා නැත්තෝය........ 210

ගාථා අංකය	සහස්ස වග්ග	අටවන පරිච්ඡේදය ගාථා සංඛ්‍යාව 16	පිටු අංකය

100 අවැඩ සිදුවන වචන දහසකට වඩා සංසිඳීමට හේතු වූ එක වචනයකදු ඉතා උතුම්ය........ 214
101 අවැඩ සහිත පදයෙන් යුතු වූ ගාථා දහසකට වඩා සැනසීමට හේතු වූ එක් ගාථා පදයකුදු උතුම් ය........ 216
102 අවැඩට මඟ සැලසෙන කරුණු සහිත වූ ගාථා සියයකට වඩා ඇසුවන් සන්සිඳුවන එක දහම් පදය ඉතා උතුම් ය........ 218
103 දස ලක්‍ෂයක් සෙනග පරදවා යුදයෙහි දිනුමට වඩා යමෙක් එක ම තමා දිනන්නේ නම් උතුම් ය........ 220
104 තම අතබැව් දිනීම ඉතා උතුම් දිනීමය........ 222
105 තම සිත් දිනාගත් අය කිසිවෙකුටත් නොපරදිති 224
106 අවුරුදු සියයක් මුළුල්ලෙහි පුහුදුනට දෙන දනට වඩා අරිය පුගුලෙකුට මොහොතක් පිදීම උතුම් ය 226
107 අවුරුදු සියයක් මුළුල්ලෙහි පුහුදුනට දෙන දනට වඩා අරිය පුගුලෙකුට කරන පිදීම උතුම් ය 228
108 ලොවැ කුඩා දන් හා මහදන් අවුරුද්දක් මුළුල්ලෙහි පිදුවත් අරිය පුගුලනට කළ වැඳුම ම ඉතා උතුම් ය 230
109 සිල්වතුනට වඳින වැඩිහිටියනට පුදන තැනැත්තා ගේ ආයු පැහැ සැප බල යන සිවු ගුණ වැඩෙයි........ 232
110 දුසිල් වැ සියක් වසක් ජීවත් වීමට වඩා සිල්වත් වැ එක දවසක් වූවත් ජීවත්වීම උතුම් ය 234
111 නුවණ නැති යමෙක් සියක් වසක් ජීවත්වීමට වඩා නැණවත්හු ගේ දවසකුදු ජීවත්වීම උතුම් ය........ 236
112 පිරිහුණු වැරැති යමෙක් සියක් වසක් ජීවත් වීමට වඩා දැඩි වැරැතියෙකු දවසකුදු ජීවත්වීම උතුම් ය 238
113 උදය-වය (හට ගැනීම හා නැසීම) දක්නා තැනැත්තා එක දවසකුදු ජීවත්වීම උතුම් ය........ 240
114 නිවණ නො දක්නහු සියක් වසක් ජීවත්වීමට වඩා නිවණ දක්නහු එක දවසකදු ජීවත්වීම උතුම්ය 242
115 උතුම් දහම් නො දක්නහු සියක් වසක් ජීවත්වීමට වඩා උතුම් දහම් දක්නහු එක දවසකුදු ජීවත්වීම උතුම් ය 244

ගාථා අංකය	පාප වග්ග — නවවන පරිච්ඡේදය — ගාථා සංඛ්‍යාව 13	පිටු අංකය
116	කුසල් කිරීමෙහි යුහුසුලු වන්න. සිත පවින් වළකා ගන්න. පිනට අලස වන්නාහු ගේ සිත පවෙහි ඇලේ	248
117	පව් නැවත නැවතත් නො කරන්න, එයට කැමැත්ත ද නො කරන්න. පව් රැස්වීම දුකට කරුණු ය	250
118	පිනක් කළේ නම් එය නැවත නැවතත් කරන්න. කුසල් රැස්වීම සැපයට කරුණුය	252
119	පව් කළ තැනැත්තා පව් පල දෙනතාක් එහි යහපත දකී. පව් පල දෙන කලැ එහි විපාක දුක් දකී	254
120	පින් කළ තැනැත්තා ද පින්පල දෙනතුරු එය අපහසු සේ දකී. පින්පල දෙන කලැ එහි යහපත දකී	256
121	අකුසලය සුලු යැයි අවමන් නො කරන්න. මඳ මඳ වුව ද පව් රැස් කරන අනුවණයා පවින් පිරේ	258
122	කුසලය සුලු යැයි අවමන් නො කරන්න. මඳ මඳ වුව ද කුසල් රැස් කරන නැණවතා පිනෙන් පිරේ	260
123	විස දුරු කොට දිවි රැකගනු කැමැතියහු සේ පව දුරින්ම දුරැලිය යුතුය	262
124	වණයක් අතේ නැති කල්හි අතින් විස ගතහැකිවාක් මෙන්ම පව් නැති කල්හි දුක් ද නැත	264
125	නිදොස් පුගුලෙකුට අවැඩක් කෙරේ නම් උඩු සුළගට දැමූ දූවිලි සේ පෙරළා පැමිණේ	266
126	ඇතැම් කෙනෙක් මෙ ලොවැ උපදිත්. පව් කළහු නිරයැ උපදිත්. පින් කළහු දෙව්ලොවැ යෙති. රහත්හු පිරිනිවෙති	268
127	පව්කමින් මිදිය හැකි තැනක් අහසෙහිවත් ද මුහුද මැදවත් පර්වත විවරයකවත් නැත	270
128	නොමැරී සිටිනට අහස ද මුහුද මැද ද කඳු කුහරය ද සුදුසු තැනෙක් නො මැත	272

ගාථා අංකය	දණ්ඩ වග්ග — දහවන පරිච්ඡේදය — ගාථා සංඛ්‍යාව 17	පිටු අංකය
129	තමා උපමාකොට සිතා අන් සතුනට තැළීම් - පෙළීම් නැසීම් නො කොට වැළකිය යුතු	276
130	සියලු සතුනට සිය දිවි ප්‍රිය ය. තමා උපමා කොට අනුන් පෙළීම් - නැසීම් නො කොට වැළකිය යුතු	278
131	සැප බලාපොරොත්තුවන යමෙක් සැප කැමැති සතුන් පෙළා නම් ඔහු සැප නො ලබන්නෙකි	280
132	සැප පතන යමෙක් සැප කැමැති සතුන් පෙළීම් - නැසීම් නො කෙරේ නම් ඔහු සැප ලබන්නෙකි	282
133	කිසිවෙකුට පරොස් බස් නො කියන්න. එසේ කීවොත් ඔබට ද ඇණුම් - බැණුම් වලට මුහුණ පෑමට සිදුවේ	284
134	නිසල තැනැත්තා නිවණට පැමිණියකු වැනි ය. ඔහු එකටෙක කීමෙක් කෙරීමෙක් නැත.	286
135	ගොපලු ගවයන් කෙවිටෙන් ගොදුරට ගෙනයන සේ ජරා මරණ දෙ දෙන සතුන් ගේ ආයු ගෙවාලත්	288
136	අකුසල් කරන අනුවනයා තමා කළ පව් විපාක විඳැ ගින්නෙන් දැවුනකු මෙන් තැවේ	290
137	නිදොස් උතුමන්ට අවැඩ කරන තැනැත්තා දසදුක් කරුණු අතුරෙන් එකකට වහා ම පැමිණේ	292
138	නිදොස් උතුමන්ට අවැඩ කරන තැනැත්තා මේ ලොවැ මේ දස වැදෑරුම් විපත් කරුණින් එකකට පැමිණේ	294
139	නිදොස් උතුමන්ට අවැඩ කරන තැනැත්තා මේ ලොවැ මේ දස වැදෑරුම් විපත් කරුණින් එකකට පැමිණේ	296
140	නිදොස් උතුමන්ට අවැඩ කරන තැනැත්තා මේ ලොවැ මේ දස වැදෑරුම් විපත් කරුණින් එකකට පැමිණේ	298
141	සැක දුරු නොකළ තැනැත්තා විලි නො වසා හැසිරීම් ඈ කිසි ලෙසකින් පිරිසිදු නො වේ	300
142	ඇඳුම් පැළඳුම් වලින් සැරසුණාත් සන්සුන් ගති හා මෙත් සිතැතිවැ වෙසේ නම් හේ උතුම් පුගුලෙකි	302
143	විලියෙන් අකුසල් දුරු කරන තැනැත්තෙක් ලොවැ ඇති නම් ඒ සුලබ නො වන්නේ ය	304
144	කෙළෙස් තවන වැරැ හා සසරට කලකිරුම් ඇතිවැ පිළිවෙත් පිරුමෙන් සසර දුක් දුරැලිය යුතු	306
145	මොනවට කීකරු අය තමන් ගේ සිත (කෙලෙස් වසඟයෙන් මුදා) හික්මවා ගනිත්	308

ගාථා අංකය	ජරා වග්ග — එකොළොස්වන පරිච්ඡේදය — ගාථා සංඛ්‍යාව 11	පිටු අංකය
146	ගිනි (එකොළොසකින්) ඇවිල ගෙන නිතොරැ දැවෙද්දී කුමන සිනාවෙක් ද? කුමන සතුටෙක් ද?	312
147	බොහෝ දෙන සුවය යි සලකා විසිතුරු කොට සරසන සිරුර ගති සලකා බලන්න	314
148	සියලු සතුන් ගේ ජීවිතය මරණය කෙළවර කොට ඇත්තේ ය.	316
149	ලබු කබල් වැනි කොබෝවන් පැහැ (-අලුපාට) ඇති මිනී ඇට සැකිලි දැක කවර ඇල්මෙක් ද?	318
150	මේ සිරුර මස් ලේ ගල්වා ඇටවලින් සැදුණු නුවරක් (-කොටුගෙයක්) වැනි ය	320
151	ඉතා විසිතුරු වැ සැදුන රජුන් ගේ මගුල් රථය ද සිරුර දිර ද යි එහෙත් (නව ලොවුතුරු) දහම නො දිර යි	322
152	ඇසූ පිරූ තැන් නැත්තා ගොනකු මෙන් මසින් තරවැ වැඩුණත් නුවණින් නම් නො වැඩේ	324
153	නැවත නැවත ඉපැදීම දුක් හෙයින් අත්බැව් නමැති ගෙය සදන වඩුවා සොයමින් සසරැ ඇවිදි අයුරු	326
154	නැවත අත්බැව් නමැති ගෙය නො කරන සේ සියලු උපකරණ (කෙළෙස්) බිඳ දමා නිවන් පසක් කිරීම	328
155	යොවුන් වියැ කළයුතු දෑ නිසි සේ නො කළහු මහලු වයසට පැමිණ පසු තැවෙත්	330
156	තරුණ කල පින් නොකළ අය කළ දෑ සිහිකොට මහලු කල සුසුම්ලමින් සොවින් හොවිත්	332

ගාථා අංකය

අත්ත වග්ග

දොළොස්වන පරිච්ඡේදය

ගාථා සංඛ්‍යාව 10

පිටු අංකය

157 සිය අත් බැව තමාට රිසි නම් ඒ අත්බැව තුන් වයස්හි ම බැරි නම් එක වයසකදී වත් සුරැකි කළයුතු 336

158 පළමු වැ තමා සුදුසු ගුණ දහම්හි පිහිටා අනුන් සදන්න වඩන්න අනුසස්නා කළයුතු.. 338

159 තමා මනා ව දමනය වී අනුන් දමනය කළයුතු. තමා (-සිත) දමනය කිරීම ඉතා අමාරු ය 340

160 මනා සේ තමා දමනය කළ තැනැත්තා දුක සේ ලැබිය යුතු පිහිට (-ලොව්තුරා සැප) ලබ යි 342

161 තමා ම කළ තමා කෙරෙන් උපන් තමාගෙන් ම හට ගත්තා වූ පව ඒ අනුවණයා දරුණු සේ මඩී.. 344

162 සතුරෙක් (තමා ගේ) සතුරාට විපත් කරනු කැමති වේ ද, දුසිල් තැනැත්තා ද තමාට එසේ ම විපත් කරන්නේ ය............ 346

163 තමාට අවැඩ පිණිස පවත්නා දේ කරන්නට ඉතා පහසු ය. හිත පිණිස පවත්නා දේ කරන්නට ඉතා අපහසු ය 348

164 යම් අනුවණයෙක් ලාමක අදහසින් අරියයන්ගේ අනුසස්න වළකා ද එය ඔහු ගේ නැස්ම පිණිස නිපදනේ ය................. 350

165 තම තමා ගේ පිරිසිදු බව හා අපිරිසිදු බව තම තමා පිළිබඳව ය. අනිකෙක් අනිකෙකු පිරිසිදු නො කෙරේ.................... 352

166 පරවැඩ නිසා අත්වැඩ නො පිරිහෙළිය යුතු අත්වැඩ මේ මේ ය යි මනාව දැන එහි නියැලිය යුතු 354

ගාථා අංකය

ලොක වග්ග

නවවන පරිච්ඡේදය

ගාථා සංඛ්‍යාව 12

පිටු අංකය

167 ලාමක දහම් (පස්කම්) ද, පමා බව ද, මිසදිටු බව ද නො සෙවිය යුතු. සසර නො වැඩිය යුතු 358

168 වැරදි රහිත වැ නො පමා ව, දහම්හි මනා කොට හැසිර මෙ ලොවැ හා පරලොවැ සුව සේ වෙසෙන්න 360

169 දහම් හි හැසිර දුසිරිතින් වැළක මෙ ලෝ පර ලෝ දෙ ලොවැ මැ සුව සේ වෙසෙන්න 362

170 ලොව (- අත්බව) දිය බුබුලක් සේ මිරිඟුවක් සේ දක්නා තැනැත්තා මරණින් මිදෙන්නේ ය 364

171 අත්බැව්හි අනුවණයෝ ගැලෙත්, අත්බැව්හි තතු දන්න නැණවතුනට (එහි) ඇල්මෙක් නැත.. 366

172 පමා බව දුරලා නො පමා වන තැනැත්තා වළාකුලින් මිදුණු පුරසඳ මෙන් ලොව බබුලුව යි.. 368

173 පවුකම් කුසල බලයෙන් වසාලන තැනැත්තා පුන් සඳ සේ මෙ ලොව බබුළුව යි 370

174 නුවණ නැති පුහුදුන් පුගුලා අඳ ය. ඔවුනතුරෙහි ටික දෙනෙක් නිසි දේ දැක සුගතියට පැමිණෙත්........................ 372

175 නුවනැත්තාහු සෙන් සහිත මරුදිනා මෙ ලොවින් නික්ම යෙත්. (නිවනට පැමිණෙත්) 374

176 එක ම දහම (-සස්බස් බිනීම) ඉක්ම වූ බොරු කියන තැනැත්තා විසින් නො කටහැකි පවක් නැත............................ 376

177 අනුවණයෝ දන්දීමට නො පසසත්, නුවණැත්තා අනුන් දුන් දනෙහි පවා පින් අනුමෝදන් වැ සැප ලබයි........................ 378

178 සක්විති රජයට වඩා දෙව්ලෝ යාමට වඩා සියල් ලොවැ අධිපතිකමට වඩා සෝවාන් ඵලය ලැබීම උතුම් ය 380

ගාථා අංකය

බුද්ධ වග්ග

දහහතරවන පරිච්ඡේදය

ගාථා සංඛ්‍යාව 18

පිටු අංකය

179 සියල්ල දත් පිරිපුන් නුවණැති බුදුරදුන් කිසිවකුට වසඟ කරගත නො හැක.. 384

180 බුදුරදහු කවර කරුණකින් වත් කිසිවකුට වසග කරගත නො හැක.. 386

181 දැහැනෙහි ඇලුණු කෙළෙස් සන්සිඳුවන නිවනෙහි ඇලුණු සම්බුදුරදුනට දෙව් මිනිස්සු කැමති වෙති 388

182 මිනිසත් බව ලැබුම හා දිවි රැක්ම දුකරු ය. සදහම් ඇසුම හා බුදු උපත ලැබුම ද දුලබ ය.. 390

183 බුදුවරුන් ගේ අවවාදය සියලු පව් නොකිරීමට හා සියලු කුසල් කිරීමටත් සිය සිත පිරිසිදුකර ගැනීමටත් ය 392

184 උතුම් තපස් ගුණය ඉවසීම ය. අනුන් නසන - පෙළන තැනැත්තා පැවිද්දෙක්, මහණෙක් නො වේ........................ 394

185 බුදුවරුන් ගේ අනුසස්න වශයෙන් දැක්වෙන උතුම් කරුණු සයක්.. 396

186 නැණවතා කාමයන්හි සැප නැති බව හා බොහෝ දුක් ඇති බව දැනගනී.. 398

187 නුවණැත්තා දෙව් ලොවැ කම්සම්පත්හි පවා නො ඇලේ. සම්මා සම්බුදු සවුතෙම නිවනෙහි ඇලේ........................ 400

188 බියෙන් තැති ගැනුණු මිනිස්සු පර්වතයන් හා වනයන් ද අරම් - රුක් - දෙවොල් ද පිහිට කොට යෙති........................ 402

189 මේ සරණය සෙත පිණිස නො පවත්නේ ය. මේ සරණ ගොස් සියල් දුකින් මිදීමට නො හැකිය 404

190 තෙරුවන් සරණ ගිය තැනැත්තා සිව් අරියසස් දහම් මනා කොට විදසුන් නුවණින් දක්නේ ය 406

191 සිවු අරිය සස් දහම් හා අරිය අටහි මඟ නුවණැසින් දැක පිළිපැදිය යුතු 408

192 තුනුරුවන් සරණයාම සෙත සලසන සුලුය. ඒ සරණය සියල් දුකින් මිදීමට හේතු ය.. 410

193 උතුම් පුරිස් වූ බුදුරදුන් ගේ උපත දුලබ ය. බුදුවන මහසත්හු ගේ උපත හැම තැන සිදු නො වේ 412

194 බුදු උපත සදහම් දෙසුම, සහ සමගිය, සමගිවූවනට තපස, සැපයට හේතු ය.. 414

195 පූජාවට සුදුසු වූ බුදු - පසේබුදු බුදුසවු යන උතුමෝ.. 416

196 නිවීගිය සිතැති කිසි ලෙසකිනුත් බියක් නැති බුදු - පසේ බුදු - බුදුසව් යන උතුමන් පිදීමේ අනුසස් අපමණ ය 418

ගාථා අංකය

සුඛ වග්ග

පහළොස්වන පරිච්ඡේදය

ගාථා සංඛ්‍යාව 12

පිටු අංකය

197 වෛර කිරීම් ඇති වැ වෙසෙන මිනිසුන් අතුරෙහි අපි වෛර නැතිවැ ඉතා සුව සේ වෙසෙමු.. 422
198 කෙලෙස්වලින් ආතුර වූ (-ගිලන් වූ) මිනිසුන් අතුරෙහි අපි කෙළෙස් ලෙඩ නැති වැ සුවසේ වෙසෙමු 424
199 කම්සැප සෙවුමෙහි වෑයමැති මිනිසුන් අතරැ අපි කම්සැප සෙවුමක් නො මැතිවැ ඉතා සුව සේ වෙසෙමු..................... 426
200 පීඩා (කෙලෙසුන්ගෙන් හිරිහැර - කරදර) නැති බුදුරදහු සුවසේ වෙසෙති. ප්‍රීතිය ම විඳිති....................................... 428
201 සන්සිඳුනු තැනැත්තා දිනුම් පැරදුම් හැරදමා ඉතා සුව සේ වෙසේ 430
202 රාගය දරුණු ගින්නකි. කෝපය මහා අපරාධයකි. පස්කඳ මහ දුකකි. නිවණ ඉතා උතුම් සැපයකි.......................... 432
203 සාගින්න ලොකු ම ලෙඩකි. පස්කඳ ලොකුම දුකකි. නිවණ උතුම් ම සැපයකි.. 434
204 නිරෝගිකම උතුම් ලාභයකි. සතුට උතුම් ධනයකි. හිතවතා උතුම් නෑයෙකි. නිවණ උතුම් සැපයකි.......................... 436
205 උසස් විවේක රසය ද නිවන් රසය ද දහමින් නිපන් සොම්නස් රසය ද වළඳන තැනැත්තා පීඩා නැත්තෙකි................. 438
206 අරියයන් දැක්ම හා එක්ව විසුම ද අනුවණයන් නො දැක්ම හා එක් වැ නො විසුම ද සැප එළවීමට හේතු ය............... 440
207 අනුවණයන් හා එක් වැ විසුම දුකට කරුණු ය. නුවණැතියන් හා එක් වැ විසිම සැපයට කරුණු ය.......................... 442
208 මනා නුවණැති සපුරිස් උතුමන් සඳු අහස සේවනය කරන්නාක් මෙන් සේවනය කරන්න.. 444

ගාථා අංකය

පිය වග්ග

දහසයවන පරිච්ඡේදය

ගාථා සංඛ්‍යාව 12

පිටු අංකය

209 තමා නො යෙදි යුතු තැන යොදන, යෙදිය යුතු තැන නො යොදන, තැනැත්තා කම් සුවයෙහි ම ඇලේ 448
210 ප්‍රියයන් සමගත් අප්‍රියයන් සමගත් එක් නො වන්න. ප්‍රියයන් නො දැක්ම හා අප්‍රියයන් දැක්ම දුකකි 450
211 කිසිවකු හෝ කිසි දැයක් ප්‍රිය නො කරන්න. ප්‍රිය - අප්‍රිය දෙක නැතියනට කෙලෙස් ගැට නැත.................................. 452
212 ප්‍රියයන් නිසා සොව හා බිය උපදී. ප්‍රියයන්ගෙන් වෙන්වූ තැනැත්තාට සොවක් නැත බියෙක් ද නැත 454
213 ප්‍රේමය නිසා සොව හා බිය උපදී. ප්‍රේමයෙන් මිදුණු තැනැත්තාට සොවක් නැත. බියෙක් ද නැත 456
214 ඇල්ම නිසා සොව හා බිය උපදී. ඇල්මෙන් මිදුණු තැනැත්තාට සොවක් නැත. බියෙක් ද නැත.................................. 458
215 කාමය නිසා සොව හා බිය උපදී. කාමයෙන් මිදුණු තැනැත්තාට සොවක් නැත. බියෙක් නැත.................................... 460
216 ආසාව නිසා සොව උපදී. බිය උපදී. ආසාවෙන් මිදුණු තැනැත්තාට සොවක් නැත. බියෙක් නැත 462
217 පිරිපුන් සිල් හා නුවණැති සිවු සස් දහම්දත් පුඟුල්හට ජනයා ප්‍රිය කෙරේ... 464
218 කාමයන් හි නොබැඳුණු පුඟුල් උද්ධං සෝතයකි. (ජල පහරේ ඉහළ යන්නෙකි) 466
219 සුවසේ දුර සිට පැමිණියකු නෑ මිත්හු සතුටින් පිළිගනිද්දැ, එසේ ම කළ පින් පරලොවැ දී දිවසැප දී පිළිගනිත්............. 468
220 සුවසේ දුර සිට පැමිණියකු නෑ මිත්හු සතුටින් පිළිගනිද්දැ, එසේ ම කළ පින්පල පරලොවැ දී දිවසැප දී පිළිගනිත්........ 470

ගාථා අංකය

ක්‍රෝධ වග්ග

දහහත්වන පරිච්ඡේදය

ගාථා සංඛ්‍යාව 14

පිටු අංකය

221 ක්‍රෝධය දුරු කළ මානය පහකළ සංයෝජන ඉක්ම කෙළෙස් කරදර නැත්තා මතැ දුක් නො වැටේ.................................. 474
222 උපන් කෝපය සන්සිඳුවා ගනී නම් උතුම් රියැදුරා ඒ තැනැත්තා ය.. 476
223 අසත් ගති - පැවතුම් ඇති පුඟුලන් සිව් දෙනෙකු සත්ගති ඇතිව දිනිය යුතු 478
224 සත්‍ය කථා කිරීම ද, නො කිපීම ද, මඳ දෙයකුදු දීම ද, දෙව්ලෝ සැප ලැබුමට කරුණු ය 480
225 අනුන්ට හිංසා නො කරන මනා සංවරයෙහි පිහිටි මුනිවරු මරණ රහිත වූ ඒ උතුම් නිවණට පැමිණෙත්....................... 482
226 නිදි වැරීම් ඇති, රෑ දාවල්හි හික්මෙන, නිවණෙහි ඇලුණවුන් ගේ කෙලෙස් නැස්මට පැමිණෙති 484
227 නින්දාව හා පැසසීම පෙරැසිට පැවතෙන්නකි. අද පටන් ගත් එකක් නොවේ. ලොවැ නින්දා නො ලබන්නෙක් නැත 486
228 නින්දාවට ම ලක් වුවෙක් හෝ පැසසුමට ම ලක් වූවෙක් පෙර ත් මතු ත් අද ත් නොමැ ත 488
229 නුවණැත්තාහු සිදුරු රහිත දිවි පැවැත්ම ඇති පැණවත් - සිල්වත් තැනැත්තාට සෑම කල්හි ම පසසත්......................... 490
230 දඹ රන් පිඩක් සේ මොනවට පිවිතුරු තැනැත්තා දෙව් - බඹ - මිනිස් යන මොවුන් ගේ පැසසුමට සුදුසු වේ 492
231 කය කිපීම රැක ගන්න. කය සංවර කරගන්න. කයින් කෙරෙන දුසිරිත් දුරලන්න. කයින් සුසිරිත් පුරන්න 494
232 වචනය කිපීම රැක ගන්න. වචනය සංවර කරගන්න. වචනයෙන් සිදුවන දුසිරිත් දුරලන්න වචනයෙන් සුසිරිත පුරන්න.... 496
233 සිත කිපීම රැක ගන්න. සිත සංවර කරගන්න. සිතින් සිදුවන දුසරිත් දුරලන්න. සිතින් සුසිරිත පුරන්න 498
234 නුවණැතියන්ගේ කය සංවුත ය. වචනය සංවුත ය. සිත සංවුත ය. ඔවුහු මනා සංවරයෙන් යුතුවෙත්............................ 500

ගාථා අංකය	මල වග්ග	දහඅටවන පරිච්ඡේදය ගාථා සංඛ්‍යාව 21	පිටු අංකය

235 මහලු වූ විට ඉදුණු කොළයක් බඳු ය. මරණයට ආසන්න ය. මරණය දොරටුව වෙතැ ම සිටගත ... 504
236 තමාට පිහිටක් සලසා ගන්න. නුවණැත්තෙක් වන්න. කෙලෙස් නසා උතුම් අරිය බිමට පැමිණෙන්න ... 506
237 ඉක්මුණු කල් වයස් ඇත්තා මරු වෙත පැමිණ සිටින්නෙකි. අතර විසීමකුදු නැත්තෙකි ... 508
238 පිහිටක් සලසා ගැනිම සඳහා වෑයම් කරන්න. ජාති - ජරා දුකට නො පැමිණෙන්න ... 510
239 රන්කරු රත්රන්වල මල ටිකින් ටික හරින්නාක් මෙන් නැණවතා තමාගේ කෙලෙස් මල දුරු කෙරේ ... 512
240 යකඩින් උපන් මලකඩ ඒ යකඩය ම නසයි. අනුවණයා කළ පවුකම් ඔහු ම අපායට පමුණුවත් ... 514
241 නො හැදෑරීම ද, වෙර නැතිකම ද, කුසීතකම ද, පමා බව ද, කිලුටට කරුණකි ... 516
242 දුසිරිත හා මසුරු බව කිලුටට කරුණු ය. අකුසල් දහම්හු මෙ ලො වැ හා පරලො වැ කිලුටට කරුණු ය ... 518
243 ලොකු ම මල (=කිලුට) අනුවණකම ය. මේ මල දුරුකොට (කෙලෙසුන්ගෙන් මිදී) නිමල වන්න ... 520
244 හිරි - ඔතප් නැති ගසා කෑමෙහි සූර වූ කිළිටි දිවි පැවතුම් ඇතියහුට ජීවත්වීම ඉතා පහසු ය ... 522
245 විලි - බිය ඇති පිරිසිදු වැ කටයුතු කරන නිවැරදි දිවි පැවතුම් ඇත්තහුට ජීවත්වීම ඉතා අපහසු ය ... 524
246 පස් පව් කරන තැනැත්තා තමාගේ (දියුණුවේ) මුල සාරා සිඳ දමන්නෙකි ... 526
247 පස් පව් කරන තැනැත්තා තමාගේ (දියුණුවේ) මුල සාරා සිඳ දමන්නෙකි ... 528
248 පවු කරන තැනැත්තාට සංයමයක් නැත. ලෝබ - කෝප දෙක (දෙ ලොවැ) දුකට හේතු ය ... 530
249 සැදැහැ - පැහැදීම් පමණට දීමට නො සතුටු තැනැත්තා කිසිවිට දාවල් සමාධියට නො පැමිණේ ... 532
250 කෙලෙස් මුලින් ම උපුටා සිඳ දමන ලද තැනැත්තා රෑ දවල් දෙකෙහිම සමාධියට පැමිණේ ... 534
251 රාගය වැනි ගින්නක් වත්, දෝසය වැනි ග්‍රහණයක් වත් මෝහය වැනි දැලක් වත්, තණ්හාව වැනි ගඟක් වත් නැත ... 536
252 අනුන් ගේ ඉතා සුළු වරද පහසුවෙන් දක්නේ ය. තමා ගේ මහත් වු වරද වසා සඟවන්නේ ය ... 538
253 අනුන් ගේ වරද සොයන කියන තැනැත්තා කෙලෙසුනගෙන් වැඩෙන්නේ ය. රහත් ඵලයෙන් දුරුවන්නේ ය ... 540
254 අහසැ පියවරක් නැත. පිටත් සසුන්හි මහණෙක් නැත. සත්කැල පමා හේතුවල ඇලුණි ... 542
255 අහසැ පියවරක් නැත. පිටත් සසුන්හි මහණෙක් නැත. හැමකල් හි පවත්නා වූ පස් කඳෙක් නැත ... 544

ගාථා අංකය	ධම්මට්ඨ වග්ග	දහනව වන පරිච්ඡේදය ගාථා සංඛ්‍යාව 17	පිටු අංකය

256 නීති දහමෙහි පිහිටා නඩු විසඳන විනිසකරු නුවණින් විසඳන්නෙකි ... 548
257 නීති දහමෙහි පිහිටා නඩු විසඳන විනිසකරු නුවණින් නඩු විසඳන්නෙකි ... 550
258 අනුන්ට උවදුරු නැති, වයිර නැති, බිය නැති තැනැත්තා නුවණැතියෙකි ... 552
259 යමෙක් බොහෝ සේ ඉගෙණීම් දෙසීම් කළ පමණින් දහම්දර නො වේ ... 554
260 හිස පැසුණු පමණින් තෙර ගණෙහි නො ගැනේ. ඒ වයස් මේරූ (=නාකි වූ) හිස් මහල්ලෙකි ... 556
261 වමාරා දැමූ මල (= කෙලෙස් කිලුටු) ඇති නැණවත් පැවිද්ද තෙර ගණයෙහි ගැනේ ... 558
262 මිහිරි වචන කී පමණකින් හෝ මනා රූ සටහන් ඇති පමණකින් මිනිසා යහපත් නො වේ ... 560
263 වමාරා දැමූ (නසන ලද) දොස් ඇති නුවණැති ඒ තැනැත්තා ම යහපත් ගති ඇත්තෙකි ... 562
264 බොරු කියන ආසාවෙන් හා ලෝබයෙන් යුත් තැනැත්තා මහණ දහමට නො සුදුස්සෙකි ... 564
265 කුදු-මහත් අකුසලයන් සන්සිඳ වූ තැනැත්තා ම මහණ දහමට ඉතා සුදුසු ය ... 566
266 විසම වූ දහම් සමාදන් වැ වෙසෙන තැනැත්තා පිඬු සිගු පමණින් භික්ෂු නමක් නො වේ ... 568
267 පින් - පවු බැහැර කළ බඹසරින් යුත් ලොවැ නුවණින් පිරික්සන තැනැත්තා භික්ෂුය ... 570
268 නිහඬ වැ හුන් පමණින් ඔහු මුනි නම් නො වේ. පවු දුරුකළ තැනැත්තා ම මුනි ය ... 572
269 නිහඬ වැ හුන් පමණින් මුනි නම් නො වේ. පවු දුරුකළ තැනැත්තා ම මුනි ය ... 574
270 සතුන් පෙළන - නසන තැනැත්තා අරිය නම් නො වේ. සියලු සතුනට හිංසා නො කැරැ වැළකීම අරිය ගතිය ය ... 576
271 කෙලෙස් කෙළවර නො කොට (රහත්පල නො පැමිණ) සසරින් එතරවීම නො හැකි බව සලකන්න ... 578
272 කෙලෙස් කෙළවර නො කොට (රහත්පල නො පැමිණ) සසරින් එතරවීම නො හැකි බව සලකන්න ... 580

ගාථා අංකය	මග්ග වග්ග	විසිවන පරිච්ඡේදය ගාථා සංඛ්‍යාව 17	පිටු අංකය

273 අරිය අටැඟි මඟ සිවුසස් දහම් ද නිවණ හා බුදුරදු ද ඉතා උතුම් ය ... 584
274 නිවන දැකීමට අන් මඟෙක් නැත. මේ අරි අටැඟි මඟ මැ පිළිපදින්න ... 586
275 මේ අරි අටැඟි මඟ පිළිපදින්න, මා විසින් කෙලෙස් නමැති උල් උදුරන මේ මඟ දැන කියන ලදී ... 588

276 කෙලෙස් තැවීමට දැවීමට වෙර වඩන්න දැහැන භාවනා වඩා මර බැම්මෙන් මිදෙන්න 590
277 පස්කඳ අනිස් බැව් නුවණින් දැක සලකන්න ඒ පිරිසිදු වීමට (නිවන් ලැබුමට) මග ය 592
278 පස්කඳ දුක් බැව් නුවණින් දැක සලකන්න එය පිරිසිදු වීමට (නිවන් ලැබුමට) මග ය 594
279 පස්කඳ අනත් බැව් නුවණින් දැක සලකන්න. එය පිරිසිදු වීමට (නිවන් ලැබීමට) මග ය 596
280 විරිය නැති වැරැදි කල්පනා ඇති කුසීතයා නුවණින් දැක්කයුතු අරිය මග නො දක්නේ ය 598
281 කය - වචනය - සිත යන තිදොර රැකගත් තැනැත්තා අරි අටගි මගට පැමිණෙන්නේ ය 600
282 භාවනාවෙහි යෙදීමෙන් නුවණ වැඩේ. භාවනාවෙහි නො යෙදෙන්නහු ගේ නුවණ වැනසේ 602
283 කෙලෙස් නමැති වනයේ ලොකු කුඩා කෙලෙස් ගස් සිඳ දමා (=නසා) කෙලෙස් වන රහිත වන්න 604
284 යම්තාක් කල් කෙලෙස් නමැති වනය නො සිඳේ ද, ඒ තාක් කල් කෙලෙස් පිළිබඳ සිත දියුණු වන්නේ ය 606
285 සිය අත්බැව් පිළිබඳ වූ සෙනෙහස සිඳ ලන්න. අරි අටගි මග ම සිය සිත්හි උපදවා ගන්න 608
286 අනුවණයා වැසි - හිමත් - ගිමත් යන තුන් කලැ මෙහි ම වෙසෙමි යි සිතතත් දිවි අනතුරු නො දන්නේ ය 610
287 දරුවන් හා ගෙරිසරකුන් ගැන වෙසෙසින් ඇලුණු මිනිසා සපල නො වූ අදහස් ඇතිව මැ මිය යන්නේ ය 612
288 මැරෙන විටැ මවු-පිය-දූ-පුත්-නෑ-මිත් යන මොවුනතර පිහිටවන කිසිවෙක් නැත 614
289 මරණය ගැන සලකන නැණවතා සිල් රැක නිවන් මග වහා ම පිරිසිදු කරන්නේ ය 616

ගාථා අංකය	පකිණ්ණක වග්ග	විසිඑක්වන පරිච්ඡේදය ගාථා සංඛ්‍යාව 16	පිටු අංකය

290 මහත් සුවය මොනවට දක්නා නැණවතා ඒ සැපය ලබනට තමා අයත් මඳ සැපය හැර දමන්නේ ය 620
291 අනුන්ට දුක් දී තමහට සැප කැමැති තැනැත්තා වෛරයෙන් නො මිදෙන්නේ ය 622
292 කටයුතු දේ හැර දමා නො කටයුතු දේ කරන දැඩිමන් ඇති පමා වූ තැනැත්තනට කෙලෙස් වැඩේ 624
293 කායගතාසති භාවනාව වඩන මනා සිහිනුවණ ඇත්තහුගේ කෙලෙස් නැසීමට පැමිණෙත් 626
294 මව හා පියා ද කැත් රජුන් දෙදෙනා ද අනුචරයා සහිත වූ රට ද නසා බමුණුතෙම නිවනට යන්නේ ය 628
295 මව හා පියා ද බමුණු රජුන් දෙදෙනා ද පස් නීවරණයන් ද නසා බමුණුතෙම නිවන් පුරයට යන්නේ ය 630
296 රෑ දාවල් දෙක්හි බුදු ගුණ සිහිකරන බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත් 632
297 රෑ දාවල් දෙක්හි දහම් ගුණ සිහිකරන බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත් 634
298 රෑ දාවල් දෙක්හි සඟ ගුණ සිහිකරන බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත් 636
299 කය අරමුණු කොට උපදනා සිහි ඇති බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත් 638
300 රෑ දවල් දෙක්හි කරුණා ගුණයෙහි ඇලුණු බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත් 640
301 රෑ දවල් දෙක්හි මෙත් ගුණයෙහි ඇලුණු බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත් 642
302 සසර නමැති දික් මගට නො පැමිණිය යුතු. දුකින් ලුහුබඳනා ලද්දෙක් නො විය යුතුය 644
303 සැදැහැ හා සිල් ඇති යසස් හා සම්පත් ඇති තැනැත්තා සැමතැනදී ම පුදනු ලැබේ 646
304 සත්ගුණැතියේ දුර සිටියත් බුදු නුවණට පෙනෙත්. අසත් පුරිස්හු ළඟම සිටියත් නො. පෙනෙත් 648
305 භාවනාවෙන් තමා දමනය කරන තැනැත්තා තනිව හිඳීම, සයනය කිරීම, නො මැලිව, හැසිරීම කෙරේ 650

ගාථා අංකය	නිරය වග්ග	විසිදෙවන පරිච්ඡේදය ගාථා සංඛ්‍යාව 14	පිටු අංකය

306 බොරු කියන තැනැත්තා ද, පවුකොට නො කෙළෙමි යි කියන තැනැත්තා ද අපාය දුකට පැමිණේ 654
307 කසාවත ගෙල ලා ගත් සංයමයක් නැති අය සිය පවුකම් බෙලෙන් නරකයෙහි උපදිත් 656
308 දුසිල් තැනැත්තා රට වැසියා පුදන අහර වැළඳීමට වඩා ගිනිසිලක් වැනි වූ ලෝ ගුලියක් ගිලීම මැනවි 658
309 අන් සතු ගැහැණුන් සේවනය කරන පුරිස්තෙම මෙලොව හා පරලොව දුක් කරුණු සතරකට පැමිණේ 660
310 අකුසල් රැස්වීමට ද දඬුවම් විඳුමට ද අපායෙහි උපතට ද හේතු වූ පරඹුවන් සෙවුම නො කටයුතු ය 662
311 වත්පිරිම් - සිල්රැකීම් නො කොට වරදවාගත් මහණකම (ඒ තැනැත්තා) අපායට අදනේ ය 664
312 ලිහිල් වැ කරන ලද කුසලය ද කිලුටු වත ද අපිරිසිදු වැ පැවැත්වෙන මහණදම ද උතුම් නොවේ 666
313 කුසලය නො පසුබට වැ දැඩි වෙරැති වැ කටයුතු ලිහිල් වූ පැවිද්ද සිය සතන් කිලිටි කෙරේ 668
314 දුසිරි (= අකුසල්) නො කිරීම හා සුසිරි (= කුසල්) කිරීම ඉතා උතුම් ය 670
315 මනා රැකවල් ඇති නුවරක් මෙන් සිත රැකගන්න බුදු උපත ලැබූ කාලයෙන් හිසි පල ලබන්න 672
316 ලජ්ජා නො විය යුතු තැන ලජ්ජාවන, ලජ්ජා විය යුතු තැන ලජ්ජා නො වන, මිසදුටු ගත් අය අපායට යෙත් 674
317 බිය නො විය යුතු තැන බියවන, බිය වියයුතු තැන බිය නො වන, මිසදුටු ගත් අය අපායට යෙත් 676
318 නිවර ද දෑ වරද සේ ද වරද දෑ නිවර ද සේ ද සලකන මිස්දිටු ගත් අය අපායට යෙත් 678
319 වරද දෑ වරද සේ ද නිවරද දෑ නිවරද සේ ද දැන සම්දිටු ගත් අය සුගතියට යෙත් 680

ගාථා අංකය	නාග වග්ග	විසිතුන්වන පරිච්ඡේදය ගාථා සංඛ්‍යාව 14	පිටු අංකය

320 යුද බිමෙහි ඊ පහර ඉවසන ඇතෙකු මෙන් මම පුහුදුන් වූ ලෝ වැස්සා ගේ පරොස් බස් ඉවසන්නෙමි 684
321 දුසිල් පුහුදුන්ගේ පරොස් බස් ඉවසන හික්මුණු මිනිසා ම ඉතා උතුම් ය 686
322 ඇත් - අස් ඈ සතුන් ගේ දමනයට වඩා තමා දමනය කළ තැනැත්තා ම ඉතා උතුම් ය........................ 688
323 සිත දමනය කළ තැනැත්තා ඇත් - අස් යානාවලින් නො යා හැකි දෙසට යන්නේ ය........................ 690
324 ධන පාලක නම් ඇත් රජ මවට උවටැන් කිරීම සඳහා ඇතුන් වසන වනයට ම යාමට සිතී ය 692
325 බොහෝ කොට කා පෙරළි පෙරළී නිදන අනුවණයා නැවත නැවත මවු කුසට ම පැමිණේ........................ 694
326 පෙරැ කලැ කැමැති සේ සුව සේ සැරිසැරූ සිත නුවණින් මට්ටුකර හික්මවා ගතයුතු........................ 696
327 නො පමා වන්න. සිය සිත මොනවට රකින්න. විසම වූ කෙලෙස් මඩින් තමන් ගොඩ නගන්න........................ 698
328 නුවණැති කළණ මිතුරෙකු ලදොත් සියලු උවදුරු මැඩ සිහි නුවණින් යෙදී හැසිරෙන්නේ ය 700
329 නුවණැති විසුමට සුදුසු කළණ මිතුරෙකු නො ලදොත් හුදකලාව (=තනිව) ම විසිය යුතු........................ 702
330 හුදකලා වැ (=තනි වැ) විසීම ඉතා උතුම් ය. අනුවණයා කෙරෙහි සහාය බවෙක් නැත්තේ ය 704
331 යහළුවෝ ද තමා සතු දෙයින් සතුටු වීම ද මරණය ළඟ කලැ කරන ලද පිණ ද දුක් නැසීම ද සැප ය 706
332 මව හා පියා කෙරෙහි මනාව පැවැත්ම ද පැවිද්දන් හා රහතුන් කෙරෙහි ද මනාව පිළිපැදීම සැප එළවන්නේ ය......... 708
333 සිල් රැකීම හා සැදැහැයෙහි පිහිටීම සැප එළවන්නේ ය. නුවණ ලැබීම හා පවු නො කිරීම සැප එළවන්නේ ය............ 710

ගාථා අංකය	තණ්හා වග්ග	විසිහතරවන පරිච්ඡේදය ගාථා සංඛ්‍යාව 26	පිටු අංකය

334 පමාවී වෙසෙන මිනිසා ගේ තණ්හාව වැඩේ. තණ්හාවට වසඟ වූ ඒ තැනැත්තා බවයෙන් බවයට යේ 714
335 ලාමක වූ ද අරමුණු විෂයයෙහි වෙසෙසින් ඇලෙන්නා වූ ද තණ්හාවට වසඟ වූ තැනැත්තාට සෝ දුක් තර වැ වැඩෙත් . 716
336 ලාමක වූ ද දුක සේ ඉක්මවිය යුතු වූ ද තණ්හාව මැඩලූ තැනැත්තා කෙරෙන් සෝ දුක් පහව යෙත්........................ 718
337 රහත් මඟ නැණින් තණ්හාවේ මුල උදුරා දමන්න මාරයගේ මැඩීමට නැවත නැවත අසු නොවන්න........................ 720
338 තණ්හාව හේතුකොට උපදනා කෙලෙස් නො නැසූ කලැ මේ දුක් රැස නැවත නැවත හට ගැනෙන්නේ ය........................ 722
339 යමෙකුට මන වඩන අරමුණු විසයෙහි තණ්හාව බලවත් වේ ද ඒ කාම සිතිවිලි ඒ පුගුලා අපායට පමුණුවයි................ 724
340 තණ්හා නමැති ලතාව සදොරින් මතුවී සය අරමුණෙහි පවතී ඒ ලතාව පිරික්සා බලා නුවණින් මුල සිඳින්න................ 726
341 තණ්හාවට වසඟ වැ සොම්නසින් පිණා සැප සොයන සත්හු ජාති - ජරා දුකට පැමිණෙත්........................ 728
342 දුකට නැවත නැවත නො පැමිණීම සඳහා නිවන් පතා තණ්හාව දුරු කළ යුතු 730
343 දුකට නැවත නැවත නො පැමිණීම සඳහා නිවන් පතා තණ්හාව දුරු කළ යුතු........................ 732
344 ගිහිගෙයැ ආසා හැර තපසෙහි ඇලී වැස නැවත කම්සැප සොයා ගිහිගෙය කරා ම දුවමින් බැඳුනු තැනැත්තා බලන්න 734
345 යකඩ-දැව-තණ-රැහැන් බැඳුම දැඩි නො වේ. දැඩි බැඳුම ධනය හා අඹුදරුවන් කෙරෙහි ඇති ආසාව ම ය 736
346 නුවණැත්තෝ ඉතා දැඩි බැඳුම් සිඳ දමා කම්සුවයෙහි බලාපොරොත්තු හැරදමා පැවිදි වෙත් 738
347 රාගයෙන් රත්වූ අය තණ්හා නමැති සැඩදිය පහරට අසුවෙත්. නැණවත්හු කම් සැපයෙහි නොඇලී සියලු දුක් දුරු කෙරෙත් 740
348 තුන් කල්හි ම පස්කඳ පිළිබඳ ඇල්ම දුරලන්න. බවයාගේ පරතෙරට යන්න. ජාති ජරා දුකට නො පැමිණෙන්න............ 742
349 කාම සිතිවිලිවලට වසඟ වූ තැනැත්තාට තණ්හාව වැඩේ. ඒ පුගුලා තණ්හා නමැති බැඳුම දැඩි කරන්නේ ය 744
350 කාම සිතුවිලි සන්සිඳවීමෙහි ඇලුණු තැනැත්තා අසුභ භාවනා වඩන්නෙකි. මරු ගේ බැම් සිඳින්නෙකි........................ 746
351 කටයුතු නිම වූ තණ්හාව දුරු කළ තැනැත්තා බව උපත සින්දේ ය. මේ ඔහු ගේ අන්තිම ශරීරය යි........................ 748
352 තණ්හාව පහකළ සිවු පිළිසිඹියාවන්හි නිපුණවූ අන්තිම සිරුරැති තැනැත්තා ම මහ නුවණැත්තා ය 750
353 සියල්ල මැඩලූ සියල්ල දත් සියලු දැයෙහි නො ඇලුණු සියල්ල දුරැලූ මම කවරෙකු ඇදුරු ය යි කියම් ද?..................... 752
354 ධර්මදානය ද, ධර්මරසය ද, ධර්මරතිය ද, උතුම් ය. සියලු දුක් නැති කරන හෙයින් රහත් පලය ද උතුම් ය................ 754
355 අනුවණයා වස්තු තණ්හාව හේතුකොට අනුන් නසන්නාක් මෙන් තමා නසන්නේ ය........................ 756
356 මේ සත් කැල රාග හා දෝස සහිත ය. රාග හා දෝස පහකළ රහතුනට දුන් දේ ම මහත් පලය 758
357 මේ සත් කැල රාග හා දෝස සහිත ය. රාග හා දෝස පහකළ රහතුනට දුන් දේ ම මහත් පලය 760
358 මේ සත් කැල මෝහ හා තණ්හා දොස් සහිත ය. මෝහය හා තණ්හාව පහකළ රහතුනට දුන් දේ ම මහත් පලය....... 762
359 මේ සත් කැල මෝහ හා තණ්හා දොස් සහිත ය. මෝහය හා තණ්හාව පහකළ රහතුනට දුන් දේ ම මහත් පලය....... 764

ගාථා අංකය

හිකුබු වග්ග

විසිපස්වන පරිච්ඡේදය

ගාථා සංඛ්‍යාව 23

පිටු අංකය

360 සියලු තැන්හි ම සංවරය ඉතා යහපත් ය. සංවරයෙන් යුත් තැනැත්තා සියලු දුකින් මිදෙන්නේ ය.......... 768

361 සියලු තැන්හි ම සංවරය ඉතා යහපත් ය. සංවරයෙන් යුත් තැනැත්තා සියලු දුකින් මිදෙන්නේ ය 770

362 සංයමයෙන් යුත කමටහන් භාවනා ඇති එකග වූ සිතැති මඟ-පලයන්ගෙන් සතුටු වූ පුගුලා හිකුබු ය.......... 772

363 කටේ සංවරය ඇති නිවුණ සිතැති දහම් අරුත් දත් තැනැත්තහු ගේ වචනය මිහිරි ය 774

364 දහමෙහි ඇලුණු දහම නැවත නැවත සිහිකරන තැනැත්තා සදහමින් නො පිරිහේ.......... 776

365 සිය ලාබය පහත් කොට නො සැලකිය යුතු. අනුනට ලැබෙන ලාබය පතන්නා සමාදියට නො පැමිණේ.......... 778

366 තමා ලද සුලු ලාභය පහත් කොට නො සිතිය යුතු. පිරිසිදු දිවි පැවතුම් ඇති මහණහට දෙවියෝ පසසත්.......... 780

367 නාම-රූප වශයෙන් ගැනෙන පස්කඳෙහි ''මම ය මාගේ ය'', යන හැඟීමක් නැත්තා හිකුෂුව ය 782

368 මෙත් විහරණ ඇති බුදු සසුන්හි පැහැදීම් ඇති පැවිද්දා උතුම් වූ නිවන් සැපතට පැමිණේ.......... 784

369 මේ අත් බැව් නමැති නැවේ පිරී තිබෙන කෙලෙස් සිතිවිලි නමැති ජලය ඉසදමා නිවන් පුරයට වහා යන්න. 786

370 දස සංයෝජන සිඳ පසක් වැඩූ පස් සංගයන් ඉක්ම වූ පැවිද්දා සතර මහ ඕඝයෙන් එතෙරවූවෙකි 788

371 දැහැන වඩන්න. සිත කම්සැපයෙහි නො යොදන්න. පමාවී නිරයෙහි ඉපිද ලෝහගුලි නො ගිලින්න.......... 790

372 අනුවණයාට දැහැනයෙක් නැත. දැහැන නො වඩන්නාට නුවණ නැත. දැහැණත් නුවණත් ඇත්තා නිවණ ළඟ ම ය...... 792

373 නිවුණු සිත් ඇති රූ-අරූ දහම් මනාකොට වෙසෙසා බලන මහණාට මිනිසුන් පිළිබඳ නො වූ ප්‍රීතියක් ඇති වේ.......... 794

374 යමෙක් පස්කඳ දහම්හුගේ හටගැනීම හා නැසීම මෙනෙහි කෙරේ ද ඒ නුවණැතියන්ට අමාවකි.......... 796

375 පස්කඳ දහම්හුගේ හට ගැනීම්-නැසීම් මෙනෙහි කරන්න. සිවු පිරිසිදු සිල්හි පිහිටන්න. කලණ මිතුරන් ඇසුරු කරන්න.. 798

376 පිළිසඳර පැවැත්මෙන් හා යහපත් හැසිරීමෙන් යුතු සතොස බහුලකොට ඇත්තා දුක් කෙළවර කරන්නෙකි 800

377 දෑසමන් වැල, මැලවී ගිය මල්, නටුවෙන් මුදාලන්නාක් මෙන් රා-දොස් දෙක සිතින් මුදාලන්න.......... 802

378 හික්ම වූ කය-වචන-සිත යන තුන් දොර ඇති වමාරා දැමූ කම්සුව ඇති පැවිද්දා ඉතා ම සන්සුන් ය.......... 804

379 තමා විසින් තමාට චෝදනා කරගත යුතු විමසිය යුතු ඒ තැනැත්තා සුව සේ වසන්නේ ය.......... 806

380 තමා ම තමාට පිහිට ය. තමා ම තමාට පිළි සරණ ය. එහෙයින් තමා මොනවට රැකගන්න 808

381 සතුට බහුල කොට ඇති බුදුරදුන් ගේ අනුසස්නෙහි පහන් වූ මහණතෙම නිවන් සුව ලබන්නේ ය.......... 810

382 බුදු සසුන්හි යෙදී වෙසෙන ළදරු පැවිද්දා ද මෙ ලොව මොනවට බබළවන්නේ ය. 812

ගාථා අංකය

බ්‍රාහ්මණ වග්ග

විසිහයවන පරිච්ඡේදය

ගාථා සංඛ්‍යාව 41

පිටු අංකය

383 වෙරවඩා තණ්හාව සිඳින්න. කාමය දුරු කරන්න. නිවණ අවබෝධ කරන්න.......... 816

384 සමත්-විදසුන් දහම්හි පරතෙර පැමිණ සිවුසස් දහම් දන්නහු ගේ සංයෝගයෝ වැනසෙති.......... 818

385 යමෙකුට තමා පිළිබඳ වූ ද අනුන් පිළිබඳ වූ ද ආයතනයන්හි ආසා නැද්ද? ඒ තැනැත්තා නියම බමුණා ය.......... 820

386 දැහැන කරන කෙලෙස් රජස් නැති කරන ලද කිස ඇති රහත් ඵලපත් පුගුලා බ්‍රාහ්මණයා ය.......... 822

387 හිරු දාවල් සඳු රෑ රජ සැරසුණු කල බබලයි. රහත් පුගුල් සමවත් සමවැදි කල ද බුදුරද රෑ-දවල් දෙක්හි ද, බබලයි.. 824

388 බ්‍රාහ්මණ, සමණ, පබ්බජිත, යන නම් වලින් හැඳින්විමට සුදුසු අය 826

389 රහතුනට පහර නො දියයුතු රහතුනට පහර දෙන්නාට නින්දා කටයුතු.......... 828

390 රහත්හුගේ උතුම් ගුණය එකටෙක නොකිරීම ය. කෝප සිතින් වැළැක්මෙන් සසර දුක සන්සිඳේ 830

391 යමෙක් කය-වචන-සිත යන තිදොරින් සිදුවන අකුසල් හලේ ද, ඔහු බ්‍රාහ්මණායා ය 832

392 දහම් දෙසීමෙන් හා හැදෑරවීමෙන් අවබෝධ කැරැ වූ ඇදුරුතුමාට සකසා නමැදිය යුතු 834

393 සිවුසස් දහම් හා නව ලොවුතුරා දහම් පසක් කළ තැනැත්තා ම බ්‍රාහ්මණයා ය.......... 836

394 සිරුර රා-දොස් මලින් (=කිලුටින්) පිරී තිබීයදී පිට පැත්ත ම සැරසීම ඉතා නිසරු ය 838

395 පසුල් සිවුරු දරන වනයෙහි හුදකලාව දැහැන කරන තැනැත්තා බ්‍රාහ්මණයා ය.......... 840

396 බමුණු යොන්හි ඉපැද්මෙන් වත් බැමිණි මවු කුසැ හටගැන්මෙන් වත් බ්‍රාහ්මණ නම් නො වේ 842

397 යමෙක් සියල් සංයොජුන් සිඳ තැතැ නො ගැනේ ද කෙලෙසුන් කෙරෙන් වෙන් වූ ඒ තැනැත්තා බ්‍රාහ්මණයා ය.......... 844

398 අවිද්‍යා නමැති අගුල උපුටා සිවුසස් දහම් දත් තැනැත්තා බ්‍රාහ්මණයා ය 846

399 අකෝබස් හා වදබැඳුම් ඉවසන ඒ ඉවසීම බල ඇණිය කොට ඇත්තා බ්‍රාහ්මණයා ය 848

400 නො කිපෙන සුලු වූ දුහඟවත් ඇති සීලයෙන් යුතු වූ අන්තිම සිරුර ඇති පුගුලා බ්‍රාහ්මණයා ය.......... 850

401 නෙළුම්පතැ ජලය මෙන් ද, ඉඳිකටු අගැ අබ ඇටක් මෙන් ද, කාමයන්හි ඇලීම් නැත්තා බ්‍රාහ්මණයා ය.......... 852

402 යමෙක් තමා ගේ දුක පිළිබඳ නැස්ම දනී ද, බහා තැබූ බර ඇති ඒ තැනැත්තා බ්‍රාහ්මණයා ය.......... 854

403 පස්කඳ පිළිබඳ ගැඹුරු පැණැති විදසුන් නුවණැති මඟ දන්නා පුගුලා බ්‍රාහ්මණයා ය.......... 856

404 ගිහි පැවිදි දෙ පස හා එක්වීම් නැති තණ්හා නමැති ගෙයි හැසිරීම් නැති තැනැත්තා බ්‍රාහ්මණයා ය 858

405 තැතිගැනුම් සහිත වූ ද රහිත වූ ද සතුන් නො නසන නො නසවන තැනැත්තා බ්‍රාහ්මණයා ය.................................... 860
406 සතුරු වූවන් අතරැ සතුරු නො වූ ද සතුන් නො නසන නො නසවන තැනැත්තා බ්‍රාහ්මණයා ය.................................. 862
407 රාගය හා ද්වේෂය ද, මානය හා ගුණමකු බව ද, නැසූ තැනැත්තා බ්‍රාහ්මණයා ය.. 864
408 අනුන් කෝප නො කරන රළු නො වූ යහපත් වචන කියන තැනැත්තා බ්‍රාහ්මණයා ය 866
409 දික් වූ කෙටි වූ කුඩා වූ මහත් වූ යහපත් වූ නපුරු වූ හා අන්සතු දෑ නො ගන්නා තැනැත්තා බ්‍රාහ්මණයා ය 868
410 දෙව් ලොව සැප හා මිනිස් ලොව සප කෙරෙහි ආසා නැත්තා බ්‍රාහ්මණයා ය.. 870
411 ආසා නැති නුවණින් දැන සැක දුරැලූ අමාමහ නිවනට සැපත් තැනැත්තා බ්‍රාහ්මණයා ය 872
412 කුසල් අකුසල් දෙක දුරුකළ කෙලෙස්කිලුටු නැති පිරිසිදු පුද්ගලයා බ්‍රාහ්මණයා ය 874
413 පුරසඳ සේ නිමල් වූ පහන් වූ නොකැළඹුණා වූ ආසාව ගෙවාලූ තැනැත්තා බ්‍රාහ්මණයා ය.. 876
414 කිසිවක් දැඩි සේ නො ගෙන කෙලෙස් පිරිනිවීමෙන් නිවුණු තැනැත්තා බ්‍රාහ්මණයා ය.. 878
415 ගිහි ගෙය හැර මහණ වැ කාමයන් හා භවයන් නැසූ තැනැත්තා බ්‍රාහ්මණයා ය... 880
416 ගිහි ගෙය හැර පැවිදි වැ තණ්හාව හා භවයන් නැසූ තැනැත්තා බ්‍රාහ්මණයා ය 882
417 මනු ලොව හා දෙව්ලොව සැප හැර සිව් යෝගයෙන් වෙන් වූ තැනැත්තා බ්‍රාහ්මණයා ය 884
418 පස්කම් ගුණ විෂයයෙහි ඇල්ම හා මහණ දම්හි දලකිරුම් තැනැත්තා බ්‍රාහ්මණයා ය 886
419 බවයෙහි නො ඇලී යහපත් සේ නිවණට ගිය සිවුසස් දහම් තැනැත්තා බ්‍රාහ්මණයා ය 888
420 දෙව්-මිනිස්සු යමෙකු ගේ ඉපැද්ම නො දනිද්ද කෙලෙස් නැසූ ඒ තැනැත්තා බ්‍රාහ්මණයා ය.. 890
421 පෙර-මතු-වත්මන් බවයන්හි පස්කඳ කෙරෙහි කරදර නැත්තා බ්‍රාහ්මණයා ය... 892
422 බියනැති සතුරන් දිනූ ආසා නැති කෙලෙස් මල (-කිලුටු) සෝදාහළ තැනැත්තා බ්‍රාහ්මණයා ය.................................. 894
423 ඉපැද්ම නැසුවා වූ ද දත යුතු දේ මනා නුවණින් දැන නිම වූ ද, බඹසර වැය නිමනු ද, තැනැත්තා බ්‍රාහ්මණයා ය......... 896

සූචිය

ගාථා ආරම්භක පද අනුපිළිවෙල

දිලෙන හිරු

අර්බුද, අරගල, වෛරකම් හා දරුණුකම් ගහණ
මේ ලෝකයෙහි බුදුහිමියන් ගේ සංදේශය ප්‍රභාශ්වර
සූර්යයෙක් සේ බැබළේ. ජලකර බෝම්බ, පරමාණු බෝම්බ
පිළිබඳ යුගයේ දී පමණ බුදුහිමියන් ගේ සංදේශය
ලොවට අවශ්‍ය වන වෙන අන් යුගයක් නොමැති තරම්ය.
බුදුහිමියන් ගේ සංදේශයෙහි ශක්තිය හා සත්‍යතාව අවුරුදු දෙදහස්
පන්සියයක් ගෙවීයෑම නිසා තව තවත් අධික වූවා පමණි.
අපි ඒ අමරණීය සංදේශය සිහිපත්කොට ගනිමු.
ඒ උගැන්වීම අනුව අපගේ අදහස් හා ක්‍රියා පටිපාටිය
හැඩගස්වා ගනිමු. එම නිසා අපට පරමාණු යුගයේ භීෂණයට
උපේක්ෂාවෙන් මුහුණ පෑ හැකිවනු ඇත.
එමෙන්ම සම්මා දිට්ඨිය හා සම්මා වායාමය
තරමකට හෝ දියුණු කරන්නටත් අපට ඒ බුද්ධ
සංදේශය ඉවහල් වනු ඇත.

ශ්‍රී නේරු ඉන්දියාවේ හිටපු අගමැති

අපගේ කෘතඥතාව

පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

සනරාමර ලෝකශිවංකර සම්මා සම්බුදු අමාමෑණියන් වහන්සේ විසින් සුදේශිත ධර්ම ස්කන්ධයෙන් ඉතා ම ප්‍රසිද්ධ ප්‍රදේශයක් නම් ධම්මපදයයි. මේ ධම්මපද ග්‍රන්ථය පෙර-අපර දෙ දිග විවිධ භාෂාවන්ට නන් අයුරින් අනුවාදිත ව ප්‍රකාශ වූ වාර සංඛ්‍යාව සිය ගණනකි. 'ධර්මභාණ්ඩාගාරය' නමින් පළවන මෙම සිංහල ධම්මපදය එසේ විවිධ යුගවල විවිධ භාෂාවන්ගෙන් ප්‍රකාශ වූ ධම්මපද ග්‍රන්ථ ප්‍රවාහයට අලුතින් ම එකතුවන මහා කෘතිය වෙයි.

ලෝකයේ සාමයික ඉතිහාසයට අයත් අසීමිත ග්‍රන්ථ සම්භාරයක් ඇත්තේ ය. ආධ්‍යාත්මික ප්‍රගතිය පතා මිනිසා විසින් නො නවත්වා කරනු ලබන මහා ප්‍රයත්නයෙහි මං සලකුණු වශයෙන් සැලකිය හැකි ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ රාශිය, මානව සංස්කෘතියේ උච්චතම ජයග්‍රහණයන්හි ලා ගැණෙයි. ඒ මහා ග්‍රන්ථ සමූහයෙහිදී 'ධම්මපදයට' හිමි වන්නේ අත්‍යුත්කෘෂ්ට ස්ථානයෙකි. ධම්මපදයෙහි ආගත ධර්ම සමුදාය අති පරිශුද්ධ ලෝකෝත්තර චිත්තන ධාරාවෙකි. මේ උගැන්වීම්වල ආලෝකය මානව සංහතියේ අදහස්-උදහස් කෙරෙහි උදාරාකාරයෙන් බලපාන්නේ ය. සත්‍ය ගවේෂණයෙහි යෙදී ආධ්‍යාත්මික විමුක්තිය සොයා යන මානව වර්ගයාට ධම්මපදය සදා දිදුලදෙන මාර්ගෝපදේශ සම්පාදක ප්‍රදීපස්ථම්භයකි.

මේ සියල්ල හේතුකොට ගෙන ධම්මපද ග්‍රන්ථය මුළුමහත් මානව වංශයටම පොදුවේ උරුම වූ මහා නිධානයක් බවට පත්ව ඇත්තේ ය. ධම්මපද ග්‍රන්ථයේ බලපෑම කාල හා දේශ පිළිබඳ සීමා ඉක්මාව යෙමින් නැගී සිටී. කෙටියෙන් කිව හොත් ධම්මපද ග්‍රන්ථය, ආගම්, ජාති, කුල ආදී භේද පිළිබඳ තැකීමකින් තොරව මානව වර්ගයාගේ සදා සම්මානයට හිමි පූජ්‍ය ග්‍රන්ථ නමැති මාහැඟි නිධාන අතළොස්ස අතුරෙහි විශිෂ්ටතම මිණෙකි. 'ධම්මපද' නම් ධර්ම ප්‍රදේශය සුත්ත පිටකයේ ඛුද්දක නිකායෙහි එන්නේ ය. එහි ආගත ගාථා පිළිබඳ අටුවා-ටීකාදී විවරණ පළවන්නේ අනුබුද්ධ බුද්ධඝෝෂ මහා අට්ඨකථාචාරීන් වහන්සේගේ ධම්මපදට්ඨ කථා නම් ග්‍රන්ථයේ යි.

ධම්මපදය විවිධ ජාත්‍යන්තර භාෂාවන්ගෙන් මෙන්ම, සිංහලයෙන්ද නොයෙක් වාරයන්හිදී විවරණය වී ඇත්තේ ය. අද පවා, ධම්මපදයෙහි නව සංස්කරණ ප්‍රකාශයට පත්වන්නේ ය. එසේ නම් මේ 'ධර්මභාණ්ඩාගාරය' නම් නව ධම්මපද විවරණය පළ කිරීමේ හේතු කවරේ දැයි කෙනෙකු විසින් විමසන්නටද ඉඩ ඇත්තේ ය. මේ නව සිංහල ධම්මපද විවරණය වන 'ධර්මභාණ්ඩාගාර' නම් කෘතිය සතු විශේෂ ලක්ෂණ සමූහය පිළිබඳව කෙරෙන විස්තරයකින් ඒ පැනයට පිළිතුරු සැපයෙන්නේ ය. මේ ධර්මභාණ්ඩාගාරය නම් ධම්මපද විවරණයේ මුඛ්‍යාධ්‍යාශය නම් බුද්ධ භාෂිතය තව තවත් පෘථුල ලෙස ලෝකයා අතට පත් කිරීමයි. ඉන් වෙසෙසින් ම කෙරෙන්නේ අද යුගයේ නව පරපුර වෙත මේ ධම්මපදයේ අන්තර්ගත බුද්ධ වචනය ගෙන යෑමයි. නවීන යුගය සතු සන්නිවේදන ක්‍රියාවලිය හේතුකොට ගෙන නව ග්‍රාහකයෝ එන්ට එන්ටම බහුලවන ආකාරයෙන් දෘශ්‍ය මාධ්‍යයන්ට පුරුදු වෙමින් සිටිති. ඒ නිසා මේ ධර්මභාණ්ඩාගාර ධම්මපද විවරණයේදී දෘශ්‍ය අංශයට මුඛ්‍යස්ථානයක් අත්වෙයි.

මේ වෛවර්ණ දෘශ්‍ය අංශය අද යුගයේ නවීනයන්ට වෙසෙසින්ම උචිත මාධ්‍යයකි. අද හැදෙන-වැඩෙන පරපුර බොහෝ සේ හැඩගැසී සිටින්නේ මුද්‍රිත මාධ්‍යයන්ගෙන් මෙන්ම විද්‍යුත් මාධ්‍යයන්ගෙනුත් ප්‍රකාශයට පත්වන වෛවර්ණ රූප පද්ධතිය භාවිතයෙන් අදහස් උදහස් ලබා ගන්නට ය. ශ්‍රී ලංකාවේ පවා නව පාඨක පරපුර විසින් ප්‍රධාන ස්ථානයෙහි ලා සලකනු ලබන්නේ වර්ණ රූප බහුල චිත්‍රකතා ප්‍රකාශනත් අසීමිත වෛවර්ණ රූප ප්‍රවාහයක් අඛණ්ඩව ඉදිරිපත් කරන රූපවාහිනියත්ය. එවැනි පරපුරක් සඳහා විශේෂයෙන්ම උචිත වන

ආකාරයෙන් මේ ධර්මභාණ්ඩාගාර නම් ධම්මපද විවරණය සැකසුණේ වෙයි. අද ලොව, විවිධ ආලෝලනවලින්, ගැටුම්වලින් සහ ඒ හේතු කොටගෙනම පැන නගින චිත්ත අවිවේකතා, අසහන හා කර්කශ භාවයන්ගෙන්ද ගහණ වූයේ වේ. එවැනි ලොවක වාසය කිරීමේ ඉරණමට ලක්ව සිටින නවපරපුරෙහි වූවන්ගේ මනසෙහි සන්සුන් බව, තැන්පත් බව සහ විමුක්තියත් පිහිටුවාලීම සඳහා අවශ්‍ය අසීමිත බලය ධම්මපදයෙහි ආගත සනාතනික ප්‍රඥාවෙහි අන්තර්ගතව ඇත්තේය. එවැනි සන්සුන් මනසක් වර්ධනය කොට ගන්නට නවීන පරපුරේ අය බලවත් කැමැත්ත දැක්වූවද, ඔවුන්ගේ හෘදස්පන්දනයට හා චින්තන ශෛලියට හැමතින්ම ගැළපෙන පරිදි බුද්ධභාෂිතය ඔවුන් අතට පිළිගන්වන්නට මෙතෙක් දරනු ලැබ තිබෙන ප්‍රයත්නය සීමා සහිතයි. එවැනි සීමා ඉවත් කොට, ධම්මපදයේ අඩංගු සනාතනික දහම නවීනයන්ට පිළිගැන්වීම ධර්මභාණ්ඩාගාරය නම් වූ මේ නව ධම්ම පද විවරණයේ ප්‍රධානාධ්‍යාශය වන්නේය.

එනිසාම මේ ධර්මභාණ්ඩාගාර නම් ධම්මපද විවරණයෙහි ප්‍රධාන අංශය වන්නේ මේ සඳහා විශේෂයෙන් නිර්මිත චිත්‍ර 423කි. ඒවා සකස් වී තිබෙන්නේ ධම්මපදයේ එක් එක් ගාථාවකට එක් එක් චිත්‍රය බැගින් සම්පාදනය වන ආකාරයෙනි. එනිසාම, මේ ධර්මභාණ්ඩාගාරය නම් ධම්මපද විවරණය මාහැඟි චිත්‍ර සන්දර්ශනයකුත් වැනි වේ. එම චිත්‍ර පද්ධතිය නිර්මාණය කරන ලද්දේ සුප්‍රසිද්ධ චිත්‍ර ශිල්පී පී. වික්‍රමනායක මහතා විසිනි. එහිලා චිත්‍ර ශිල්පී කේ. විජය කීර්ති මහතාගේ සහාය ද සැපයුණේය. එක් චිත්‍රයක් වචන දහසක් වටනේ යැයි කියන චීන කියමන මේ චිත්‍ර පද්ධතිය නිසාත් තහවුරු වේ.

චිත්‍ර පළවන්නේ පොතේ වම්පස පිටුවලයි. ඊට ඉදිරියෙන් තිබෙන දකුණු පස පිටුවල ගාථාවල නිදාන කථා, ගාථාවල විවරණාත්මක අනුවාදය, විවරණය සහ පාඨ පිළිබඳ අටුවාවක් ද අන්තර්ගත වේ. එක් එක් චිත්‍රයට විවරණ පාඨයකුත්, පාලි ගාථාවත් එහි සිංහල පද්‍යමය අනුවාදයත් පළවන්නේ ය. ග්‍රන්ථය මුළුමණින්ම නිර්මාණය වී තිබෙන්නේ ධම්මපදයෙහි ආගත චින්තන ධාරාව, නිරවුල්ව, නිර්මලව, පැහැදිලිව අවබෝධකොට ගන්නට පාඨකයාට මං පෑදෙන ආකාරයෙනි. මේ සියලු අංගෝපාංග සංකලනය නිසා මේ "සිතුවම් සහිත ධර්මභාණ්ඩාගාරය-ධම්මපද විවරණය" අසහාය ග්‍රන්ථ රත්නයක් වෙයි. එය අදට මෙන්ම අනාගතයටත් එකසේ ප්‍රතිඵලදායී සනාතනික අගයක් ඇති ධර්ම සංග්‍රහයකි. බුදුදහම පිළිබඳ පාඨයන් සතු අවබෝධය මේ ග්‍රන්ථයේ එක් එක් අංශය නිසාම, තව තවත් උද්දීපනය වන්නේ ය.

මෙවැනි මහා කෘතියක් හුදෙක්ම ඒක පුද්ගල නිර්මාණයක් විය නොහෙන බව ඉතා පැහැදිලිය. මේ ශ්‍රේෂ්ඨ ධර්මදාන ව්‍යාපාරයෙහි ලා, මට සුවිශිෂ්ට සහායක කණ්ඩායමක සහාය ලැබුණේ ය. මේ ග්‍රන්ථයේ කර්තෘ වශයෙන් මට සහයවූ ගිහි-පැවිදි සම්භාවනීය උගතුන් කණ්ඩායමට මගේ කෘතඥතාව පිරිනැමීම මගේ යුතුකම කොට සළකන්නෙමි. මෙහි ප්‍රථමයෙන් ම, මේ ග්‍රන්ථයේ ඉංග්‍රිසි අනුවාදයේදී මට උපකාරී වූ සිතෝ වුන් චී (Sito Woon Chee), මහතාත් ඔහුගේ භාර්යාව වන ආං ලියන් ස්වී (Ang Lian Swee), මහත්මියත් වෙසෙසින්ම සඳහන් කළ යුතු වේ.

ධම්මපද ග්‍රන්ථයේ සිංහල-ඉංග්‍රිසි අනුවාද කාර්යය ආරම්භ වූ අවධියේ පටන්ම මට හිතවත්ව සහාය සැපයූ මේ ග්‍රන්ථයෙහි සංස්කාරක කලාකීර්ති එඩ්වින් ආරියදාස මහතාටත්, සැළසුම් නිර්මාණය කළ සුප්‍රසිද්ධ චිත්‍ර හා මාධ්‍ය ශිල්පී පියරත්න හේවාබටගේ මහතාටත් මගේ හෘදයංගම කෘතඥතාව පිරිනැමේ.

සිය විවරණ, අර්ථ කථන හා නව චින්තනයෙන් අපට උපකාර වූ මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර මහතාත්, තායිලන්තයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන පීඨාධිපති මහාචාර්ය කපිල අභයවංශ මහතාත් මෙහිලා කෘතඥතා පූර්වකව සඳහන් කරනු කැමැත්තෙමි. ඔවුන්ගේ සහාය මම සැමවිටම අගය කරන්නෙමි. පූජ්‍ය මීටියාගොඩ සද්ධානන්ද මහා ස්ථවිරයන් වහන්සේ, පූජ්‍ය කන්දරපංගුවේ ධම්මසිරි ස්ථවිරයන් වහන්සේ, පූජ්‍ය දූල්දෙණියේ ඥානරතන ස්ථවිරයන් වහන්සේ සහ හීන්බුන්නේ කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේ, ඔවුන්ගේ දැනුමත් කාලයත් උපයෝගී කොට ගනිමින් මේ කාර්යයෙහිදී මට සහාය සැපයූහ. උන් වහන්සේලාගේ ගරු නාමයන්ද මෙහිලා කෘතඥතා පූර්වකව සඳහන් කළ යුතු වේ.

ධම්මපද ග්‍රන්ථ සම්පාදනයේ තාක්ෂණික අංශයේ දී පරිගණක සහාය සැපයූ ශිල්පීන් අතුරෙහි බී. දයා සමරසිංහ මහතාත්, බී. රෝහණ ජයතිස්ස මහතාත්, ඩබ්ලිව්. මාලා කාන්ති මහත්මියත්, ශ්‍යාමනී ප්‍රියලක්ෂණා ලේකම්වසම් මෙනෙවියත්, ප්‍රියංකා බෝධිපක්ෂ මහත්මියත්, බී. ජිනාදරී ධර්මලතා මහත්මියත්, බී. පුෂ්පානි ධර්මලතා මහත්මියත් විශේෂයෙන් සඳහන් කළ යුතු වෙති.

මෙහි ලා, සහාය සැපයූ සැදැහැවත් පිරිස කෘතඥතා පෙරටුව සඳහන් කරන ගමන් ම මේ විශාල ග්‍රන්ථය ප්‍රකාශ කිරීම උදෙසා මූල්‍යමය ආධාර පිරිනමන ලද්දේ න් වූ හින් මහතා (Ng Wu Hin), චව් මෙයි පින්ග් මෙනෙවිය (Chow Mei Pin), ඇලිස් ලී කිම් නියෝ (Alice Lee Kim Neo) මෙනෙවිය, ලී කිම් හොක් (Lee Kim Hock) මහතා ප්‍රධාන සිංගප්පූරු දායක කණ්ඩායමක් විසින් බව ප්‍රකාශ කළ යුතු වේ.

මගේ අති විශේෂ හිතවතුන් වශයෙන්, හැම විටම මගේ සියලු කාර්යයන් හිදී මට ආධාර උපකාර සම්පාදනය කරන සිංගප්පූරු ගෝල්ඩන් පැගෝඩා සිද්ධස්ථානයේ විහාරාධිපති ගරු ෂි ෆා චාව් (Ven. Shi Fa Zhao) ස්ථවිරයන් වහන්සේත්, සිංගප්පූරුවේ පූති බෞද්ධ විහාරාධිපතිනි ගරු සෙක් තුවාන් කර්න් (Ven. Sek Tuan Kern) භික්ෂුණීන් වහන්සේත්, ගරු සෙක් තුවාන් චියෑ (Ven. Sek Tuan Chhair) භික්ෂුණීන් වහන්සේත් මම මෙහි දී ගෞරවයෙන් සිහිපත් කරමි. මට උපකාරී වූ ඩෙනිස් වැන්ග් කී පොන්ග් (Dennis Wang Khee Pong) මහතාටත්, ඈන් ලී කිම් මෝයි (Ann Lee Kim Moi) මහත්මියටත්, ජෙසිකා තේ (Jessica Tay) මහත්මියටත්, ඊ ෆොක් චෝයි (Ee Fook Choy) මහතා, කෝ බෙන් ති (Koh Beng Tee) මහතා, යන හිතවත් පිරිස මම මෙහි දී කෘතඥතා පූර්වකව වෙසෙසින් සිහිපත් කරමි. මේ ග්‍රන්ථකරණයේ දී පමණක් නොව, මාගේ ධර්මදාන ව්‍යාපාරයෙහි ලා අනුබද්ධ සියලුම ව්‍යාපෘතීන් හිදී අප්‍රතිහත උත්සාහයෙන් කාර්‍ය සාධනයේ යෙදෙන ගරු වේරගොඩ සුනන්දා භික්ෂුණීන් වහන්සේ විශේෂයෙන් ම සඳහන් කළ යුතුවේ.

එසේ වුවද, මේ කාර්‍යයන්හි යම්කිසි අඩුපාඩුවක් හෝ ඌනතාවක් වන්නේ නම් ඒ සියල්ලම උදෙසා හුදෙක්ම මා වගකිවයුතු බවද ප්‍රකාශකොට සිටින්නෙමි. මේ මහා ධර්ම සංග්‍රහ කාර්‍යය ඉටුකොට ලීමෙන් මා සතු පුණ්‍ය සම්භාරය හැම දෙනෙකුන් හා සමගම බෙදා හදා ගන්නට මම කැමැත්තෙමි.

මාගේ ගුරුදේවයන් වහන්සේ වන, වේරගොඩ ජයන්ති විහාරාධිපතිව වැඩ විසූ, අපවත් වී වදාළ ගෞරවාර්හ පණ්ඩිත යටලමත්තේ සිරි වාචිස්සර ජිනරතන වජිරඥාණාභිධාන ගාලු කෝරලයේ ප්‍රධාන සංඝ නායක ධුරන්දරව වැඩ විසූ මා පැවිදි කරවා පියෙකු මෙන් සතුටින් මගේ දියුණුව සිදු කළ ඒ මහා ස්ථවිරපාදයන් වහන්සේත්, මවිසින් කරනු ලබන සියලු ම ධර්ම ශාස්ත්‍රීය මෙහෙය උදෙසා මට ඉතා යොවුන් වියේ පටන් ආභාසය සැලසූ මට උපදේශ අනුශාසනා මගින් මාර්ගෝපදේශකත්වය ලබා දුන් කීර්තිශේෂ භාවෝපගත, ගරුතර ආචාර්ය කිරින්දේ ශ්‍රී ධම්මානන්ද නායක මහා ස්ථවිරයන් වහන්සේත්, සිංගප්පූරුවේ පූති බෞද්ධ විහාරාධිපතිනිව සිට අපවත් වී වදාළ ගරු සෙක් ජොයි එක් (Ven. Sek Joey Ek) භික්ෂුණීන් වහන්සේත් ඇතුළු අපවත් වී වදාළ මගේ ගුරු-හිතාදර යතිවරුන්ට, මම සම්මාන පුරස්සරව පිං අනුමෝදන් කරන්නෙමි.

මාගේ සදාදරණීය පියාණන් වන පරලෝසැපත් ජී. ඒ. පොඩිසිංඤ්ඤෝ උපාසක මහතාත්, මෑණියන් වන ජී. පී. එමලිස් හාමි උපාසිකා මාතාවත්, බී. ධර්මදාස මහතා ඇතුළු පරලෝ සැපත් මගේ සියලු ම නෑදෑයින්ට, මම මෙයින් පිං අනුමෝදන් කරන්නෙමි. එසේ ම, මගේ ප්‍රථම ඉංගිරිසි ආචාර්යවරිය වූ නැසී ගිය කේ. එස්. විජේනායක ගුරුතුමියටත්, සිංගප්පූරු බෞද්ධ මධ්‍යස්ථානයේ හිටපු සභාපති මා හිතවත් අභාවප්‍රාප්ත වූ සිතෝ චුං චී (Sito Woon Chee) මහතාත්, මෙම ධර්ම ග්‍රන්ථයේ චිත්‍ර ශිල්පී මා හිතවත් අභාවප්‍රාප්ත වූ පී. වික්‍රමනායක මහතාත් ඇතුළු නැසීගිය දායක-කාරක-හිතාදර සැමදෙනාටත් මම, මේ පුණ්‍ය කර්මයෙන් මා අත්පත් කොට ගත් පිං අනුමෝදන් කරන්නෙමි.

මේ ග්‍රන්ථය හැම දෙනෙකුගේම ජීවිතයන්හි සහායක උදාර මාර්ගෝපදේශක බලවේගයක් වේවා !

මෙත් සිතිනි,

පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය

සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය
නො: 1, ජලන් මස් පුරේ, සිංගප්පූරුව 128607
ටෙලි: +65 67783330 : +65 94656570
ශ්‍රී ලංකා ටෙලි: +94 770589498 : +94 755218421

විද්‍යුත් ලිපිනයන්:
weragodas1941@gmail.com
vensarada@ymail.com
27. 11. 2013

පිරිනැමීම

සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ දහම් සිසිලසින්
සැනසීමේ පරම භාග්‍යය හිමිකොට ගෙන
මිහිලොව උපත ලැබූ මිනිසා, අද බොහෝ තැන්වල
ආලෝලනයට, අවි ගැටුමට, සංග්‍රාමයට හසු වී සිටියි.
මිනිසා විසින් මිනිසාට ම කෙරෙන
දැඩි දරුණුකම් සහ කෲර අමානුෂිකකම්
ලොව නු උසුලන තරම් ය. එවැනි දුක් - දොම්නස්,
ආපදා සහ විපත් ඉවත් කොට ගෙන
සදා සුහදතාවයෙන් සහ උනුනුත් කුළුණින් ගන්නා
සහජීවනයෙන් වෙසෙමින් ලොවුතුරු මඟට
අවතීර්ණවීමේ මහා වාසනාවෙන් හෙබුණු,
අද දුක්විඳි නමුත් හෙට අමතපදය දිනන්නට
සුදුසු මානව ප්‍රජාවට මේ
"ධර්මභාණ්ඩාගාරය"
නමැති ධම්මපද විවරණය
මෙත් කරුණා පෙරටුව පිරිනැමේ.



වේරගොඩ ජයන්ති විහාරාධිපති පණ්ඩිත යටලමත්තේ
සිරි වාචිස්සර පීනරතන වජිරඤාණාභිධාන ගාලු කෝරළයේ ප්‍රධාන සංඝනායක හිමිපාණෝ

යො මාං ප්‍රව්‍රාජයිත්වා ජනක ඉවමුදා මෙ'භිවෘද්ධිං ව්‍යධත්ත
ශ්‍රී වජ්‍රඥානනාමා යටලමතුරිති ග්‍රාමජාතො යතීන්ද්‍රඃ
ග්‍රන්ථං තස්මා ඉදං මෙ භවතු ච ගුරවෙ දක්ෂිණාවත් ප්‍රශස්තං
පුණ්‍යෙනෛතෙන භූයාත් පරම මමෘතදං ශ්‍රෙයසඤ්චාපිතසෛම

"මා පැවිදි කරවා පියකු මෙන් සතුටින් මගේ දියුණුව සිදු කළ
යටලමත්තේ ශ්‍රී වජිරඤාණ ගුරුදේව ස්වාමීන්ද්‍රයන් වහන්සේට මේ මහඟු ග්‍රන්ථය පූජාවක් වේවා.
මේ පිනෙන් උන්වහන්සේට අමාමහ නිවන් සැප ලැබේවා"

රචනය: පණ්ඩිත දවුල්දෙන ඥාණිස්සර මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

හැඳින්වීම

අග්ගමහා පණ්ඩිත ආචාර්‍ය්‍ය
අතිපූජ්‍ය බළංගොඩ ආනන්ද මෛත්‍රිය මහානායක
ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

සම්බුදු හිමිපාණන් විසින් අනාවරණය කරන ලද සනාතනික සත්‍යය සිවු කරුණකින් හකුළුවා දැක්වේ. දුක්ඛ, දුක්ඛ සමුදය, දුක්ඛ නිරෝධය, සහ දුක්ඛ නිරෝධගාමිණී පටිපදා වශයෙනි. මේ චතුරාර්‍ය්‍ය සත්‍ය පිළිබඳ දැක්ම බුදුහිමියන් වහන්සේ විසින් පැහැදිලි කොට වදාරන ලද්දේ ඒ කරුණු විවිධ අත්දැකීම් සහිත ජනතාවගේ මනසට සුදුසු වන ආකාරයේ නිදර්ශණ සහ සන්නිවේදන ක්‍රම මගිනි. බුදුහිමියන් වහන්සේගේ දේශනා සියල්ලම ත්‍රිපිටකයෙහි සංගෘහිත ය. ඒ ත්‍රිපිටකය නම් විනය, අභිධම්ම සහ සුත්ත පිටකයෝයි. මේ ධම්මපද ග්‍රන්ථය සුත්ත පිටකයේ ඛුද්දක නිකායට අයත් ය. ධම්මපදය සෑදී තිබෙන්නේ වග්ග විසි හයකට බෙදුනු ගාථා 423 කිනි.

ධම්මපදය හැදෑරීමෙන් බෞද්ධ ජීවන මාර්ගයේ මූල ධර්ම උගත හැකි වේ. ධම්මපදය හදාරන තැනැත්තාට මෙලොවත්, පරලොවත් සුඛිත වූත් අර්ථවත් වූත් දිවිපෙවෙතක් හිමිවන්නාක් මෙන් ම ඔහුට අවසානයෙහි දී නිර්වාණ සුවය ද ලැබෙන්නේය. ධම්මපදයේ ඉතා ම හොඳ ඉංග්‍රිසි අනුවාදයක් සකස් කළ ඇල්බට් ජේ. එඩ්මන්ඩ් මහතා මෙසේ කියන්නේ ය. 'ආසියා මහාද්වීපයෙහි අමරණීය සම්භාව්‍ය කෘතියක් නිෂ්පාදනය විණි නම් එය ධම්මපදය යි. ''බටහිර ලෝකයේ ධම්මපදය ප්‍රථමයෙන් ම ලතින් බසට අනුවාදය කරන ලද්දේ කෝපන්හේගන් හි මහාචාර්ය පවුස්බෝල් විසිනි. එහි ප්‍රථම ඉංග්‍රීරිසි අනුවාදය සකස් කරන ලද්දේ මහාචාර්‍ය්‍ය මුලර් විසිනි. මේ සියලුම අනුවාද අතුරින් මෙම ''ධර්ම භාණ්ඩාගාර'' නම් ධම්මපද අනුවාදය සුවිශේෂයි. එයට හේතු කිහිපයකි. ධම්මපදයේ ගාථා 423 ම උදෙසා චිත්‍ර 423 ක් සකස් වී ඇත්තේ මේ අනුවාදයේදී ය.

එක් එක් ගාථාව උදෙසා එයට ම විශේෂ වූ චිත්‍රයක් බැගින් සකස් වී ඇත්තේය. මේ ධම්මපද අනුවාදයේ කතෘවරයාණන් වහන්සේ වන ගරු වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ ලොව පුරා බුද්ධ භාෂිතය ප්‍රචාරය කිරීමේ යෙදී සිටින්නෙකු වශයෙන් පෘථුල කීර්තිය ඇති, දැඩි අධිෂ්ඨාන ශක්තියකින් හා අප්‍රතිහත ධෛර්යයෙන් ද හෙබියේ වෙති. ගරු වේරගොඩ සාරද ස්ථවිරයන් වහන්සේ විසින් දැනටමත් බෞද්ධ විෂයයන් අළලා කෙරුණු ග්‍රන්ථ 69 ක් ප්‍රකාශ කරනු ලැබ පවතී. උන්වහන්සේ විසින් මෑතක දී කරන ලද 'බුදු සිරිත සිතුවමින්' නම් ග්‍රන්ථය ජගත් ව්‍යාප්ත සම්මානයට ලක් වූ කෘතියකි. වර්තමාන ග්‍රන්ථය සුවිශේෂ ප්‍රකාශනයකි.

'ධර්ම භාණ්ඩාගාර' නම් වූ ධම්මපද ග්‍රන්ථයේ නිර්මාණය අතිශය සිත්ගන්නා සුලු ය. පාලි ගාථාවන්හි අන්වය ද ඉන් පසුව එක් එක් පාලි පදයෙහි අරුත ද ප්‍රකාශ වේ. එක් එක් ගාථාවේ නිධාන කථාව ඉදිරිපත් කෙරේ. පොත භාවිත කරන අයගේ පහසුව උදෙසා අටුවාවක් ද සම්පාදිත ය. බුද්ධ ධර්මයත් ආශ්‍රිත විෂයනුත් උදෙසා ඉටුකෙරුණු උදාර මෙහෙයක් වශයෙන් මේ ග්‍රන්ථය හඳුන්වා දෙන්නට ලැබීම මට ඉමහත් සතුටකි. වර්තමාන ලෝකයා මෙන්ම මෙයට මත්තේ පහළ වන ලෝකයාත් මෙහි මහත් ඵල භුක්ති විඳිති. මානව සංස්කෘතියට ඉටු කෙරුණු මේ විපුල සේවය උදෙසා ගරු වේරගොඩ සාරද ස්ථවිරයන් වහන්සේ හැමෝගේම සම්මානයට පාත්‍ර විය යුතු වෙති.

B. Anandamaitreya

අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

මුල් ඉංග්‍රීසි ග්‍රන්ථයේ හැඳින්වීමේ පරිවර්තනයකි.



පෙරවදන

මැලේසියාවේ ප්‍රධාන සංඝනායක
අතිපූජ්‍ය ආචාර්ය කිරින්දේ ශ්‍රී ධම්මානන්ද
මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

ධර්ම භාණ්ඩාගාර නම් වූ මෙම ධම්මපද අනුවාදයෙහි කතෘවරයාණන් වහන්සේ වන සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානාධිපති ගරු වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ විසින් ඉටු කරන ලද මේ අතිඋත්තම කාර්යයෙහි ශ්‍රේෂ්ඨත්වය ඇති සැටියේ අවබෝධ කොට ගන්නට මම විශේෂයෙන් ම සමත් වෙමි. මැදහත් ව විමසා බලන කල්හි මෙම ධම්මපද අනුවාදය මෙතෙක් කරන ලද සෙසු ධම්මපද අනුවාද සියල්ලම පාහේ පසු බා සිටී. මෙසේ පැවසීමට වැදගත් හේතු කීපයක් ඇත්තේ ය. ධම්මපද ග්‍රන්ථයෙහි ආගත ගාථා 423 ම ඒ එක් එක් ගාථාව උදෙසා විශේෂයෙන් සිතුවම් කරන ලද චිත්‍ර සමූහයකින් සරසන එකම ධම්මපදය මේ 'ධර්ම භාණ්ඩාගාරය' නම් කෘතියයි. මේ චිත්‍ර පද්ධතිය අද ලොව තරුණ පරපුරට විශේෂයෙන්ම ආකර්ශණීය වේ. මක් නිසාදයත් ඒ අය දෘශ්‍ය සන්නිවේදනයට තියුණු ලෙස යොමු වී සිටින හෙයිනි. මේ නයින් සළකා බලන කල්හි මේ ධම්මපද අනුවාදය අද යුගයේ වෙසෙන වලමත් වූ පරම්පරාවනට අතිශය අර්ථවත් ආකාරයෙන් මාර්ගෝපදේශ සපයන කෘතියකි. ඒ නිසාම මේ කෘතිය ඒ නව පරපුර උසස් ආධ්‍යාත්මික ජයග්‍රහණය කරා ගෙන යන්නේ වේ.

මානව සංහතියේ සම්භාව්‍ය සාමයික කෘතියක් වන ධම්මපදය ගැඹුරට හදාරනු පිණිස මේ සංස්කරණය අතිශයින් ම ප්‍රයෝජනයත් වේ. මෙය නවීනයන්ගේ මෙන්ම ප්‍රවීනයන්ගේත් ඉමහත් චිත්ත ප්‍රමෝදය පිණිස වෙති.

සාමාජික සහ සංස්කෘතික ලෝකයට පිරිනැමෙන මේ විශිෂ්ට තිළිණය පිටුපසින් සිටින ශ්‍රේෂ්ඨ පුද්ගලයා වන ගරු වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ අපූරු කෞශල්‍යයෙන් හෙබි කෙනෙකි. ඒ හිමියන් විසින් සිය ජීවිතයේ දී ඉටු කෙරෙන මහා ම මෙහෙය නම් බුද්ධ වචනය ලොව පුරා පතුරුවාලීමයි. බෞද්ධ පත-පොත ප්‍රකාශ කිරීමෙන් එතුමන් වහන්සේ විසින් ලබන ලද ජයග්‍රහණ තව තවත් දිදුලින් දිදුලට පත්වන්නේ මේ 'ධර්ම භාණ්ඩාගාර' ය නම් කෘතියෙනි. මට සිතෙන ආකාරයට එතුමන් විසින් මෙතෙක් කරන ලද උසස්ම කෘතිය මෙය වේ.

එතුමන්ගේ ගෞරවයට හේතුවන ප්‍රකාශව 69 ක් එතුමන් විසින් මෙතෙක් පළ කොට ඇත්තේ ය.මේ ව්‍යාපාරය කර ගෙන යනු ලබන්නේ බුදුහිමියන් පැවසූ පරිදි බහුජන හිත පිණිස හා බහුජන සුව පිණිස යි.

මගේ ප්‍රාර්ථනාව නම් මේ මහා ග්‍රන්ථයෙහි කතෘවරයාණන් වහන්සේ වන ගරු වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේට බුද්ධ වචනය ලොව පුරා පතුරුවා ලීමේ සිය සද්කාර්‍ය්‍ය නො අඩුව කරගෙන යා හැකි වනු පිණිස දීර්ඝායුෂ සම්පත්තිය සහ සුව සම්පත්තියක් පිළිබඳ ආශිර්වාදය එතුමන් වහන්සේට අත්පත්වේවා යන්නයි. 'ධර්ම භාණ්ඩාගාර' නම් වූ මෙම ධම්මපද අනුවාදය වර්තමාන පරපුරට මෙන් ම මතු පරපුරටත් නිසි මග පෙන්වන ප්‍රදීපස්ථම්භයක් වේවා.

අතිපූජ්‍ය ආචාර්‍ය්‍ය කිරින්දේ ධම්මානන්ද මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

මුල් ඉංග්‍රීසි ග්‍රන්ථයේ පෙරවදනේ පරිවර්තනයකි.

කාලාම සූත්‍රය

ඇසූ පමණින් යම් කිසිවක් විශ්වාස නො කරන්න.
පරපුරෙන් පරපුරට පැවතෙන හෙයින් සම්ප්‍රදායය
මෙය යැයි සිතා යම් කිසිවක් විශ්වාස නො කරන්න.
බොහෝ දෙනා විසින් පවසන නිසා හෝ ආරංචියෙන් දත් නිසා
හෝ යම් කිසිවක් විශ්වාස නො කරන්න. ඔබ අදහන ආගමට අයත්
ග්‍රන්ථයන්හි ලියා තිබෙන නිසාම පමණක් හෝ යමක්
විශ්වාස නො කරන්න. ඔබගේ ආචාර්යවරුන් හෝ
වැඩිහිටියන්ගේ හෝ වචනය නිසා පමණක් විශ්වාස නො කරන්න.
එහෙත් නිරීක්ෂණයෙන් හා විශ්ලේෂණයෙන් පසුව
යම් කිසිවක් තර්කයට, න්‍යායට ගැළපෙන්නේ යැයි අවබෝධ වූ විට,
එමෙන්ම එය, සෑම දෙනාගේම යහපතට සහ සුවසෙතට
තුඩු දෙන්නේ යැයි ඔබට අවබෝධ වූ විට පමණක්
යම් කිසිවක් පිළිගෙන එයට අනුව හැසිරෙන්න.

- බුදුරජාණන් වහන්සේ -
අඞ්ගුත්තර නිකාය

සභාපතිතුමාගේ පණිවුඩය

කෝ බෙන් තී
සභාපති
සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානය

සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානාධිපති සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක ගෞරවාහී වේරගොඩ සාරද නායක හිමිපාණන්ගේ කර්තෘත්වයෙන් පළවන "The Treasury of Truth – Illustrated Dhammapada" නමැති මාහැඟි ග්‍රන්ථයේ සිංහල අනුවාදය එළි දැක්වෙන මේ මොහොතෙහි ඒ සඳහා සුභාශිංසනයනක් නිකුත් කිරීමට ලැබීම ඉමහත් භාග්‍යයක් කොට සළකමි.

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය දීප්තිමත්ව බබළන්නේ එය විවෘත වූ තරමට මිස සඟවා තැබීමෙන් නොවේ. මෙම බුද්ධ භාෂිතය සනාථ කරමින් පූජ්‍ය වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට ගෙන විවිධ බෞද්ධ ග්‍රන්ථ සම්පාදනයෙන් බුදුදහමේ කාලදෙශ භේදයෙන් තොර වූ සනාතනික සංදේශය සමස්ත ලෝක ජනතාවගේ යහපත සඳහා ලෝකව්‍යාප්ත කරලීමට දරන ප්‍රයත්නය සුධී ජනතාවගේ ගෞරවාදරයට නිතැතින්ම භාජනය වෙතැයි කිවයුතු නොවේ. ලෝකයා වෙත නැණ පහන දල්වන්නා ශ්‍රේෂ්ඨ මානව හිතවාදියෙකි. ප්‍රඥාලෝකය දල්වමින් අවිද්‍යා අන්ධකාරය පලවා හැරීම ශාන්තිනායකයාණන් වහන්සේගේ ධර්මදූත සේවයෙහි අරමුණ විය. එය අඛණ්ඩව ඉදිරියට ගෙනයාමේ වගකීම විශේෂයෙන් පැවරී ඇත්තේ උන්වහන්සේගේ ශ්‍රාවක මහා සංඝරත්නයටය. ස්වකීය තාරුණ්‍යයෙහි සිටම මෙම වගකීම මනාව වටහා ගත් පූජ්‍ය වේරගොඩ සාරද හිමිපාණන් වහන්සේ සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය ආරම්භ කොට එය කේන්ද්‍ර කොට ගනිමින් මේ වන විට බෞද්ධ ග්‍රන්ථ අසූවකට අධික සංඛ්‍යාවක කර්තෘත්වය දරමින් ග්‍රන්ථ 370 ක් පමණ මුද්‍රණයෙන් පළ කිරීමෙහි නියාමකත්වය දැරූ යතිවරයාණ කෙනෙකි. උන්වහන්සේ අතින්ම සම්පාදනය වූ ඉංග්‍රීසි භාෂාවෙන් රචිත සිතුවම් සහිත ධම්මපදයේ සිංහල අනුවාදය වසර දෙදහස් තුන්සියයකට අධික කාලයක් පුරා දිවෙන ශ්‍රී ලංකා බෞද්ධ ග්‍රන්ථ වංශයට අලුතින්ම එක්වන අතිවිශේෂ ග්‍රන්ථ රත්නයකි.

ධම්මපදය කාලාවකාශ භේදයෙන් තොරව සාර්වත්‍රග අගයකින් යුත් ධර්ම භාණ්ඩාගාරයකි. එහි සඳහන් මාහැඟි සදුපදේශයන්ගෙන් ජීවිතයක සාර්ථකත්වය සඳහා ලබා ගතහැකි අනුග්‍රහය අමිලය. එබැවින් ම ධම්මපදය විවිධ සංස්කරණයන්ගෙන් යුක්තව ලෝකයේ වැඩිම භාෂා ගණනකින් පළ වී ඇති බෞද්ධ ග්‍රන්ථය ලෙස හැඳින්විය හැකිය. එහෙත් චිත්‍ර මාධ්‍යය ද එක් කරගනිමින් ධම්මපද කථා පහසුවෙන් වටහා ගැනීමට අවස්ථාව උදා කර දීමට සිතුවම් සහිත ධම්මපද විවරණයක් ප්‍රථම වරට නිර්මාණය කිරීමේ නිර්මාතෘවරයා වීමේ භාග්‍යය හිමි කර ගන්නේ පූජ්‍යපාද වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේ වීම උන්වහන්සේගේ ශාස්ත්‍රීය ප්‍රකාශන කාර්යයන්ට නිබඳ සහයෝගය දක්වන සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානයේ සභාපතිවරයා වශයෙන් අපගේ අමන්දානන්දයට හේතුවකි. සිංහල බෞද්ධ පාඨක ජනතාවට මෙම ශ්‍රේෂ්ඨතම ග්‍රන්ථ රත්නය දායාද කර දෙන මේ අති උදාරතර මංගල අවස්ථාවෙහි ඒ සඳහා සහයෝගය දැක්වූ හැම දෙනාටම ගෞරවාදරයෙන් කෘතඥ වන අතර ගෞරවාර්හ වේරගොඩ සාරද නාහිමිපාණන් වහන්සේට මෙම මහඟු ධර්ම ප්‍රචාරක කටයුතු නිරුපද්‍රිතව ඉදිරියට ද කරගෙන යාම සඳහා අවශ්‍ය කායික මානසික සුවය හා ආයුරාරෝග්‍යාදී සම්පත් මෙන්ම රත්නත්‍රයේ ආශීර්වාදය ද ලැබේවායි සුභාශිංසනය කරමි.

මෙත් සිතිනි

කො බෙන් තී
සභාපති,
සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය

Koh Beng Tee
President
The Singapore Buddhist Meditation Centre

කාලාම සුත්ත

අලං හි වො කාලාමා කඞ්ඛිතුං අලං
විචිකිච්ඡිතුං කංඛණීයෙ ච පන වො
ඨානෙ විචිකිච්ඡා උප්පන්නා, එථ තුම්හෙ
කාලාමා මා අනුස්සවෙන, මා පරම්පරාය,
මා ඉතිකිරාය මා පිටක සම්පදානෙන,
මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාර
පරිවිතක්කෙන, මා දිට්ඨි නිජක්ඛානක්ඛන්තියා,
මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති. යදා
තුම්හෙ කාලාමා, අත්තනාව ජානෙය්‍යාථ, "ඉමෙ ධම්මා
අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා ඉමෙ ධම්මා
විඤ්ඤුගරහිතා ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා
අහිතාය දුක්ඛාය සංවත්තන්තීති."
අථ තුම්හෙ කාලාමා පජහෙය්‍යාථ

- බුදුරජාණන් වහන්සේ -
අඞ්ගුත්තර නිකාය

යමක වගග



අකුසල දහමන්ට සිත මුල් ය. කිලිටි වූ සිතින් අකුසල් කළ තැනැත්තා පසුපස්සේ දුක ලුහුබඳී.

1. මනො පුබ්බඞ්ගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා තතෝ නං දුක්ඛමන්වෙති චක්කං'ව වහතො පදං (1:1)	සිත පෙරටු කොට - සිත ම මුල් කොට සිතෙන් උපදිති - දහම හැම විට කතාවට හෝ ක්‍රියාවට යම් නපුරු සිතුවිලි පෙරටු වේ නම් ලෙසට රිය සක ගොනු අනුව එන ලැබෙයි දුක් වේදනා සතහට

හලොත් යෙහෙකි පවුකම් නොතබා ම සිත

1 (1) චක්ඛුපාල හිමියන්ගේ කථාව (1 ගාථාව)

මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ විසූ සමයෙහි **චක්ඛුපාල** නම් දෙනෙත් අඳ තෙර නමක් ඇරබ වදාරන ලද්දකි.

චක්ඛුපාල හිමියෝ බුදුරජාණන් වහන්සේ වැඳ පුදා ගනු වස් වරක් ජේතවනාරාමයට පැමිණියහ. එදින රැයෙහි සක්මන් භාවනාවෙහි යෙදුණු උන්වහන්සේට පෑගී කෘමි සත්තු රැසක් මළහ. දෙනෙත් නො පෙනෙන හෙයින් මෙය නොදැනුවත් කමින් සිදුවූවකි. උදෑසන පිබිදුණු හිමිවරු කීපනමක් මියගිය කෘමීන් දැක ඒ ගැන බුදුරජාණන් වහන්සේට පැමිණිලි කළහ. "චක්ඛුපාල හිමියන් ඒ සතුන් මරණවා ඔබ දැක්කාද?" යි උන්වහන්සේ ප්‍රශ්න කළහ. "නැත ස්වාමීනි." භික්ෂූහු පිළිතුරු දුන්හ. "ඔබ නොදැක්කා මෙන් ම චක්ඛුපාල හිමියන් දැක්කේත් නැහැ. උන්වහන්සේ රහත් නමක් නිසා ප්‍රාණඝාත චේතනාවක් ඇතිවන්නේත් නැහැ. සිතා මතා කළ වරදක් නො වන නිසා උන්වහන්සේ නිර්දෝෂයි" භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළහ.

චක්ඛුපාල හිමියන් රහත්බව ලබන්නට තරම් පින් ඇතිව ඉපදීත් අන්ධ වන්නට හේතුව කුමක්දැයි දැන ගන්නට භික්ෂූන් වහන්සේලා කැමැත්ත පළ කළ හෙයින් භාග්‍යවතුන් වහන්සේ එම කර්මය හෙළිකරමින් පහත දැක්වෙන කතා පුවත වදාළහ.

පෙර ජන්මයක චක්ඛුපාල හිමියෝ වෛද්‍යවරයකුව උපන්හ. ඇස් රෝගයකින් පෙළුණු එක් කාන්තාවක් ඔහු වෙත පැමිණ "මගේ ඇස් දෙක සනීප කළොත් මම දූ දරුවන් එක්ක ඔබතුමා ගේ දාසියක් වෙනවා" යි කියා සිටියාය. වෛද්‍යවරයා ද ඊට එකඟව අනර්ඝ ඖෂධ භාවිතා කොට ඇය සුවපත් කළේය. එහෙත් දෙනෙත් සුව වූ පසු තම ප්‍රතිඥාව ඉටු කරන්නට මැලි ව ඕ "තවමත් දෙනෙත් හරියට පේන්නේ නැහැ" යි කියමින් මඟ හරින්නට වෑයම් කළාය. ඇය කරන්නේ බොරුවක් බව දත් වෛද්‍යවරයා පලි ගන්නට සිතා "තව එක බෙහෙතක් කර බලමු" යි විස බෙහෙතක් යොදා ඇය සදහට ම අන්ධ කළේ ය. ආත්ම ගණනාවක් අන්ධව උපන් හෙතෙම රහත් බව ලබන අවසන් ජන්මයෙහි ද කම් විපාක වශයෙන් අන්ධව උපන්නේය.

විවරණාත්මක අනුවාදය (1 ගාථාව)

ධම්මා මනොපුබ්බඞ්ගමා මනොසෙට්ඨා මනොමයා චෙ
පදුට්ඨෙන මනසා භාසති වා කරොති වා තතො දුක්ඛං
නං අන්වෙති වහතො පදං චක්කං ඉව.

ධම්මා: කුසල සහ අකුසල ක්‍රියා; **මනොපුබ්බඞ්ගමා**: සිත පෙරටු කර පවතිති; **මනොසෙට්ඨා**: සිත ප්‍රධාන කොට පවතිති; **මනොමයා**: මනසින් හට ගනිති; **චෙ**: ඉදින්; **පදුට්ඨෙන මනසා**: ද්වේෂ සහගත සිතින් **භාසති වා**: කතා කරයි නම් හෝ **කරොති වා**: ක්‍රියා කරයි නම් හෝ; **තතො**: ඒ හේතුවෙන්; **දුක්ඛං**: දුක; **නං**: ඔහු; **අන්වෙති**: පසුපස එයි; **වහතො පදං**: ගොනා ගේ පියවර; **චක්කං ඉව**: කරත්ත රෝදය (අනුව යන්නාක්) මෙනි.

අප කරන හැම යහපත් හෝ අයහපත් ක්‍රියාවක් පසුපස ම ඇත්තේ චේතනාවකි. හැම වචනයක් ම කතා කරන්නේත් හැම ක්‍රියාවක් ම කරන්නේත් සිතා මතාය. එහෙයින් නරක සිතුවිල්ලක් පෙරදැරි කරගෙන ක්‍රියා කිරීමෙන් නරක දෙයක් වූ අකුශල කර්මයක් (අකුසලා ධම්මා) ජනිත වෙයි. එහෙයින් ඒවා 'මනෝමය' (සිතින් නිර්මිත) ලෙස හැඳින්වෙයි. එවැනි අකුසල කර්ම කරන්නවුන් පසු පස දුක් විපාක හඹා එන්නේ ගවයා පිය තබන තබන වරට ඉදිරියට ඇදී එන කරත්ත රෝදයක් මෙනි.

විවරණය

ධම්මපදයෙහි මුල් ගාථා දෙක බෞද්ධ දර්ශනයෙහි කේන්ද්‍රීය සංකල්ප පැහැදිලි කිරීමෙහි ලා වැදගත් වෙයි. වෙනත් ආගම් වල මෙන් මිනිසා මැවුම්කරුවකු විසින් නිර්මාණය කරන ලදුව දේව කැමැත්තට අනුව ජීවත්වන පුද්ගලයකු ලෙස නො හඳුන්වන බුදු දහම ඒ පිළිබඳව කරන යථාර්ථවාදී හා තර්කානුකූල විවරණ මේ ගාථා අනුසාරයෙන් හඳුනා ගත හැකි ය..

මිනිසා පිළිබඳ බෞද්ධ විග්‍රහය මනෝවිද්‍යාත්මක හා ආචාරවිද්‍යාත්මක වූවකි. මිනිසා කුඩා ලෝකයක් (ක්ෂුද්‍ර විශ්වයක්) වශයෙන් හඳුන්වන බුදුරජාණන් වහන්සේ ලෝක සම්භවය හා ලෝක විනාශය මිනිස් සිරුර තුළම දක්වති. බටහිර චින්තකයන් මෙන් කය හා සිත එකිනෙකට මුළුමනින් පටහැනි නිරපේක්ෂ පදාර්ථ දෙකක් ලෙස නො දක්වා පරස්පරාපේක්ෂ ලෙස විග්‍රහ කරන බුදුසමය ඉන්ද්‍රියය හයෙන් (චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මනෝ) අප ලබන අත්දැකීම් විවරණය කිරීම සමස්ත ලෝකයම විවරණය කිරීමක් බවට පත් වෙයි.

මෙම ගාථාවන් ගෙන් දක්වන්නේ සත්ත්වයා ගේ පැවැත්මෙහි ගුණාත්මක අංශය නිර්ණය කරන කුසලා-අකුසල කර්ම සිත පෙරදැරි කරගෙන ඇතිවන ආකාරයයි. 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමි' යි වදාරා ඇති පරිදි අප ක්‍රියා කරන්නේ සිතා මතා හෙයින් කතා කිරීම (භාසති) හා ක්‍රියා කිරීම (කරෝති) නරක සිතින් (පදුට්ඨෙන) හෝ හොඳ සිතින් (පසන්නේන) හෝ කරනු ලැබේ. එබඳු කුසල හා අකුසල ධර්ම (ධම්මා) සිත පෙරදැරි කර ගත්, සිත ම නායක කරගත් (සෙට්ඨා) සිතින් ම නිර්මාණය වූ (මනෝමය) දේ බව මේ ගාථා වලින් කියැවේ. අපි අපේ ක්‍රියා කලාපයෙන් ජනිත වූයෙමු. අපේ නරක ක්‍රියා හෙවත් අකුසල කර්ම ගොනු පසුපස පියවරෙන් පියවර ඉදිරියට ඇදෙන ගැලෙහි සක සේ අප පසුපස එයි.

මේ ගාථාවෙහි අර්ථය වරදවා ගනිමින් මනෝ පුබ්බඞගමා ධම්මා යන්නෙන් භෞතික ලෝකය සිතින් මවන ලද්දකි යන වැරදි අර්ථ කථනයක් ඉදිරිපත් කරන සමහරු බුදු දහම 'විඥප්ත්‍යාණවාදයකි' යි ගැරහුම් කරති. එහෙත් බුදුදහම විඥප්ත්‍යාණවාදයක් හෝ භෞතිකවාදයක් නොව ඇත්ත ඇති හැටියෙන් දක්වමින් විශ්වයෙහි ක්‍රියාත්මක වන නියාම ධර්ම පැහැදිලි කිරීමක් බව තේරුම් ගත යුතුය. මේ ගාථා යුග්මයෙන් විවරණය කරන්නේ කම්ම නියාමයයි. භෞතික ලෝකයේ ඇති වීම ගැන අදහසක් මෙහි ගම්‍යමාන නොවන බව අවධාරණය කළ යුතුය. මනෝ විද්‍යාත්මක හා ආචාර ධර්මීය ප්‍රකාශයක්, භෞතික හෝ ජීව විද්‍යාත්මක ප්‍රකාශයක් සේ වරදවා නො ගත යුතුය.



කුසල් දහමන්ට සිත මුල් ය. පහන් වූ සිතින් පින් කළ තැනැත්තා පසුපස්සේ සැප ලුහුබඳී.

2. මනොපුබ්බඞ්ගමා ධම්මා
මනොසෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන
භාසති වා කරොති වා
තතො නං සුඛමන්වෙති
ඡායා'ව අනපායිනී. (1:2)

සිත පෙරටු කොට - සිත ම මුල්කොට
සිතෙන් උපදිති දහම් හැම විට
කතාවට හෝ ක්‍රියාවට යම්
පහන් සිතුවිලි පෙරටු වේ නම්
සෙවනැල්ල සේ අත නොහැර එන
ලැබෙයි සුව සෙත එයින් සතහට.

කළ පින් එනවා පසුපස - හෙවනැල්ලක් සේ

1 (2) මට්ටකුණ්ඩලී ගේ කතාව (2 ගාථාව)

මට්ටකුණ්ඩලී නම් බමුණු දරුවෙකුට අත් වූ ඉරණාම අරබයා භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි දී මේ ගාථාව වදාළ සේක.

මට්ටකුණ්ඩලී ගේ පියා මසුරෙක් විය. කිසිවකුට කිසිවක් නො දෙන හෙතෙම නො කා නො බී ඉතිරි කළේය. එහෙයින් අසල්වැසියෝ ඔහුට අදින්න පුබ්බක යැයි නමක් දුන්හ. තම එකම පුතාට පංචායුධයක් වැනි ස්වර්ණාභරණයක් කරට දැමිය යුතු අවස්ථාවේ ද රන්කරුවනට මුදල් ගෙවන්නට අදි මදි කළ හේ තමා ම රන් කැබැල්ලක් තලා මට්ටම් කර එය කරෙහි පැළඳුවේ ය. එම ආභරණයෙහි විසිතුරු කැටයම් කිසිවක් නැති නිසා එය'මට්ට කුණ්ඩලයක්' ලෙස හැඳින් වූ අසල්වැසියෝ දරුවට 'මට්ටකුණ්ඩලී' යි විහිළු නමක් ද පටබැන්දහ. මට්ටකුණ්ඩලී වරක් බලවත් ලෙස අසනීප විය. එහෙත් වෛද්‍යවරුන්ට මුදල් ගෙවන්නට සිදුවෙතැයි බියෙන් ඔහු පිළියම් සඳහා ගෙන යාමක් නො කෙරිණි. දරුවා මරණාසන්න වූ විට පමණක් කලබල වූ බමුණා, "මෙබඳු ලෙඩකට දෙන ඖෂධ මොනවාදැ"යි විමසා ඒවා සම්පාදනය කර දුන්නේය. එහෙත් එයින් ප්‍රයෝජනයක් නො විණි. හදිසියේ දරුවා මිය ගිය හොත් අවමඟුලට එන ජනයා නිවස තුළ රැස් කර ඇති ධන සම්පත් දකිතියි සිතූ අදින්න පුබ්බක ගෙපිළෙහි ඇඳක් තබා පුතු එහි තැබී ය.

අළුයම මහා කරුණා සමාපත්තියෙන් ලොව බලන බුදු සමිඳුන් ගේ දිව නෙතට මට්ටකුණ්ඩලී ලක් විණි. එදින අදින්න පුබ්බක ගේ නිවස අසලින් පිඬු සිඟා වඩිනා අතර එහි මඳක් නැවතී මට්ටකුණ්ඩලී ගේ දෙනෙත් තමන් වහන්සේ වෙත ඇද ගනු වස් රැස් දහරක් ඔහු වෙත නිකුත් කළ හ. ඒ වෙත හැරී බැලූ හෙතෙම බුදුරදුන් දැක සිත පහන් කර ගෙන දෑත ඔසවා වඳින්නට අසමත් හෙයින් සිතින් බුදුන් වැඳ ගත්තේ ය. එදිනම රෑ පහන් සිතින් මිය පරලොව ගිය මට්ටකුණ්ඩලී දෙව් ලොව උපන්නේ ය. එක ම පුත්‍රයා මිය ගිය ශෝකය අදින්න පුබ්බකට දරා ගත නො හැකි තරම් විය. පුතා මිහිදන් කළ පසුත් සුසාන භූමියේ ම රැඳී වැලපෙමින් සිටි අදින්න පුබ්බක මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයාට ද පෙනිණි. පියාගේ බොළඳ කම් දුරු කරන්නට සිතූ දිව්‍ය පුත්‍ර තෙම කුඩා දරුවකුගේ වෙස් ගෙන හඬමින් සුසාන භූමියට පැමිණියේ ය. පුතා ගේ මරණයෙන් බලගතු කම්පාවට පත්ව සිටි බමුණා ගේ සිත හඬන දරුවා දැකීමෙන් දයාවෙන් තෙත් විය. "ඇයි පුතා අඬන්නේ, ඕන දෙයක් මට කියන්න. ඕන ම දෙයක් මම අරන් දෙන්නම්." යි හේ ඔහු සනසන්නට වෑයම් කළේ ය. "මට ඕන ඉරයි හඳයි! මට ඒවා අරන් දෙන්න. මගේ සෙල්ලම් කරත්තෙට රෝද වලට හයි කරන්න." "පුතා බැරි දේට අඬලා වැඩක් නෑ. රෝද ඕන නම් මම රත්තරනෙන් හදලා දෙන්නම්. කොච්චර ඇඬුවත් ඉරයි හඳයි ගන්න බැහැ නේ. ඉර හඳ ඉල්ලලා අඬන එක මහ මෝඩ වැඩක්". "ඉරයි හඳයි මට පේන්න තියෙනවා. මම පේන දේට අඬනවා. ඔබ අඬන්නේ නො පෙනෙන පුතා ගැන. ඒ ඇඬිල්ල මෝඩ නැත් ද? පුතාට ලෙඩ වුණු වෙලාවේ යමක් නො කර දැන් අඬන එක මෝඩයි." "ඔය කවුද මට කතා කරන්නේ?" මට්ටකුණ්ඩලී තමා කවුදැයි හඳුන්වා දී දෙව්ලොව උපදින්නට තමා කළ එක ම පින්කම බුදුරදුන් දැක සිත පහදවා ගැනීම බවත් විස්තර කර පින් දහම් කර ගෙන යහපත් ජීවිතයක් ගෙවන සේ අවවාද කළේ ය. අදින්න පුබ්බක බුදු පාමොක් මහ සඟනට දන් පිරිනමා වැඳ එකත් පස්ව සිටි විට භාග්‍යවතුන් වහන්සේ පිරිස හමුවට මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයා ගෙන්වා තම පුණ්‍ය මහිමය පවසන්නට මං පෑදූ බව කියැවෙයි. මේ ගාථාව ඒ මොහොතේ භාග්‍යවතුන් වහන්සේ පිරිසට දේශනා කළ ධර්මයයි.

විවරණාත්මක අනුවාදය (2 ගාථාව)

ධම්මා මනො පුබ්බඞ්ගමා මනො සෙට්ඨා මනොමයා චෙ
පසන්නෙන මනසා භාසති වා කරොති වා තතො සුඛං
නං අන්වෙති අනපායිනී ඡායා ඉව

ධම්මා: කුශලා'කුශල ධර්මයෝ; **මනොපුබ්බඞ්ගමා**: මනස පෙරදැරි කර ගෙන පවතිති; **මනො සෙට්ඨා**: මනස ශ්‍රේෂ්ඨ කොට පවතිති; **මනොමයා**: මනසින් නිර්මාණය වෙති; **චෙ**: ඉදින්; **පසන්නෙන මනසා**: පහන් සිතින්; **භාසති**: කතා කරයි නම්; **වා**: හෝ; **කරොති වා**: ක්‍රියා කරයි නම් හෝ; **තතො**: ඒ හේතුවෙන්; **සුඛං**: සැපත; **නං**: ඔහු; **අන්වෙති**: පසු පස එයි; **අනපායිනී**: අත නොහැර එන; **ඡායා ඉව**: සෙවනැල්ල මෙනි.

සියළු කුසල හා අකුසල ධර්ම ඉදිරියෙන් ඇත්තේ සිතය. ඒවාට සිත ප්‍රධානය. සිතෙන් ම නිර්මිතය. ප්‍රසන්න සිතුවිලි මුල් කර ගෙන කතා කිරීම හා ක්‍රියා කිරීම නිසා ඇතිවන කුසල ධර්ම හේතුවෙන් හෙවනැල්ල අප අත නො හැර එන්නා සේ විපාක ලැබෙයි.

විවරණය

මිනිසා සැප සම්පත් ලබන්නේ ඔහුගේ සිතුවිලි අනුව බව මේ ගාථාවෙන් පැහැදිලි කරනු ලැබේ. ප්‍රසන්න සිතුවිලි නිසා ප්‍රසන්න කතා බහ ඇතිවේ. එයින් සිදුවන සම්භාෂණය තමන්ගේ මෙන් ම අනුන්ගේ ද ප්‍රමෝදයට හේතු වෙයි. එමෙන් ම පහන් සිතුවිලි මුල් කරගෙන කරන ක්‍රියා ද ප්‍රසන්න ය. ඒවා නිසා ජනිත වන්නේ කුසල කර්ම ය. මනුෂ්‍ය චර්යාව මගින් නිරූපණය වන්නේ මනසෙහි පහන් බව හෝ නො පහන් බව ය. එහෙයින් යහපත් චර්යාවන් ඇති කර ගෙන සැපවත් ජීවිතයක් ගත කිරීම සඳහා සිත පහන් කර ගැනීම කෙතරම් වැදගත් ද යනු මෙයින් පැහැදිලි වෙයි.

අපගේ භාග්‍ය හෝ අභාග්‍ය නිර්මාණය කර ගන්නේ අප විසින් ම ය. එය බාහිර බලවේගයක බලපෑමෙන් නොව අප ගේ ම චර්යාවෙහි ප්‍රතිඵල වශයෙන් වන බව දැන ගැනීම මිනිසා ගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව අවබෝධ කර ගැනීමයි. එබඳු ස්වාධීනත්වයක් උගන්වන එක ම ආගම බුදු සමය බව නැවත නැවතත් කීම වරදක් නොවේ. අනුභූතියෙන් බාහිර වූ, විද්‍යාවෙන් හෝ තර්කයෙන් තහවුරු කළ නොහැකි ඊශ්වරයකු උපකල්පනය කරගෙන සිය ස්වාධීනත්වය පාවා දෙන්නට නො පෙළඹී මනුෂ්‍යත්වයේ ශ්‍රේෂ්ඨත්වය තේරුම් ගැනීම අර්ථවත් ය. සචේතනික කර්මය එම ස්වාධීනත්වය ප්‍රයෝජනයට ගන්නා ප්‍රායෝගික ක්‍රියා පිළිවෙල ය. මේ ගාථා යුග්මයෙන් එම දර්ශනය පැහැදිලි ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

බැණීම්, පහරදීම්, දිනීම්, පැහැරගැනීම් යන වරද (සිත්හි) බැඳීමෙන් වෛරය නො සන්සිඳේ.

3. අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මෙ
යෙ තං උපනය්හන්ති
වෙරං තෙසං න සම්මති (1:3)

"මට බැන්නා - මට ගැහුවා
වද දුන්නා - පාඩු කළා
සිතමින් සිටියොත් මෙලෙසින්
වෛරය දුරු නොවෙයි සිතින."

දුරු නො කළ වෛරය කරයි සම්පත් හානිය.

1 (3) තිස්ස තෙරුන් ගේ වස්තුව. (3 හා 4 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි **තිස්ස තෙරුන්** ඇරබ මේ ගාථා දෙක වදාරන ලදි.

බුදුරජාණන් වහන්සේ ගේ නැන්දා කෙනෙකු ගේ පුතකු වූ තිස්ස හිමියන් පැවිදි වූයේ වැඩි වයසට පත් වීමෙන් පසුය. පැවිදි බිමේ දී ජ්‍යෙෂ්ඨත්වය මනින්නේ වයසින් වැඩිමහල් කම අනුව නොව පැවිදි උපසම්පදාවෙන් වැඩිමහල් කම අනුව හෙයින් උන්වහන්සේ කණිටු භික්ෂුවක ලෙස සැලකිණි. එහෙත් තමන් බුදුරදුන්ගේ ලඟම ඥාතිවරයකු හෙයින් මානයක් සිත ඇති ව සිටි තිස්ස හිමියෝ ජ්‍යෙෂ්ඨ හිමිනමක මෙන් සුවපහසු අසුනක වැඩ හිඳිමින් තමන්ට වඩා ජ්‍යෙෂ්ඨයන්ගෙන් පවා ගෞරව ලැබූහ. ජ්‍යෙෂ්ඨ හිමිවරුන්ට ගරු සරු නො දක්වා මානාධිකව හැසිරෙන විලාසය ගැන කවුරුන් හෝ දොස් දැක්වුව හොත් හඬාගෙන ගොස් බුදුරජාණන් වහන්සේට පැමිණිලි කිරීම තිස්ස හිමියන්ගේ සිරිතයි.

එක් දිනක් මෙසේ හඬා ගෙන ගොස් බුදුරදුන් හමුවට තිස්ස හිමියන් ගිය විටෙක "මුන් වහන්සේ තනිව ම ගොස් මොන බොරු කේලමක් කියත්දැයි කවුරු දනිත් ද? අපත් යා යුතුයැ"යි කියමින් තවත් හිමිවරු ඒ හා ම ගියහ. "තිස්ස, ඇයි මේ කඳුළු සලාගෙන මා හමුවට ආවේ?" යි විමසූ විට "ස්වාමීනි,මේ භික්ෂූන් මට ගරහනවා" යි පැමිණිලි කළහ. "ඉතින් ඔබ කොහේද සිටියේ? යි භාග්‍යවතුන් වහන්සේ විමසූහ.

"මම ආවාස ගෙයි ශාලාව මැද වාඩි වී සිටියා." "මුන් වහන්සේලා එනවා ඔබ දැක්කා ද?" "එහෙමයි මම දැක්කා." "ඔබ නැගිටලා ගරු බුහුමන් දැක්වූවා ද?" "නැහැ ස්වාමීනි" "උන්වහන්සේලා ගේ පාත්‍රා-සිවුරු ගත්තා ද?" "නැහැ ස්වාමීනි" "ඔබ එහෙම නො කළ එක වැරදි යි. වැරැද්ද ඔබ අතේ. උන්වහන්සේලා ගෙන් සමාව ගන්න." "බෑ ස්වාමීනි. මම සමාව ඉල්ලන්නේ නෑ."

එවිට අනිකුත් හිමිවරු "ස්වාමීනි, තිස්ස මහ අකීකරු, නො නැමෙන කෙනෙක්" යි පැවසූ හ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "තිස්ස අකීකරු, නො නැමෙන ගති ඇතිව ඉන්නේ දැන් පමණක් නො වෙයි. පෙර සසරේදීත් එහෙමමයි" යි පැවසූහ.

"ස්වාමීනි, මොහුගේ වර්තමාන අකීකරු ගතිය අපටත් පෙනෙනවා. පෙර භවයක ඔහු එසේ පැවති ආකාරය භාග්‍යවතුන් වහන්සේ ම අපට පැහැදිලි කර දෙනු මැනවි" යි එම භික්ෂූන් වහන්සේලා ඉල්ලා සිටිය හ. එවිට භාග්‍යවතුන් වහන්සේ පහත දැක්වෙන කතා පුවත දේශනා කළ හ.

හිමාල අඩවියේ මාස අටක් පුරා තවුස් දම් පිරූ දේවල නම් තාපසයෙක් වැසි සාර මස ලුණු ඇඹුල් සහිත ආහාර අනුභව කරමින් වාසය කරන්නට සිතා බරණැස් නුවරට පැමිණියේ ය. නගරයට පිවිස "මේ නගරයට එන තාපසයන් නවාතැන් ගන්නේ කොහේ ද?" යි මහ මග ගමන් කළ ළමයින් දෙදෙනකුගෙන් විමසී ය. "කුඹල් හලේ"යි ඔවුහු පිළිතුරු දුන් හ. ඒ අනුව කුඹල් හල සොයා ගිය තවුස් තෙම "භාර්ගව, ඔබට කරදරයක් නො වෙයි නම්, මම කැමතියි අද රෑ මෙහේ නවාතැන් ගන්න" යි පැවසීය. "ස්වාමීනි, ශාලාවේ මම රෑට වැඩක් කරන්නේ නෑ. ශාලාව ඉඩ තියෙනවා. ඔබ වහන්සේ කැමති පරිදි මෙහි වැඩ හිඳින්න." යි පැවසූ කුඹල්කරු තවුස් තුමා ශාලාවට කැඳවා ගත්තේ ය.

දේවල තවුස් තුමා එහි පිවිස වැඩි වේලාවක් ගතවන්නට පෙර හිමවත සිට ආ තවත් නාරද නම් තවුස් තුමෙක් එහි පැමිණ රැය නවතින්නට අවසර ඉල්ලා සිටියේ ය.

"මුලින් ආ තාපසතුමා කැමති වෙයි ද නැත්ද මම දන්නේ නැහැ. කොයිකටත් මගේ ගැලවිල්ලට අහලා ම ඉන්න එක හොඳයි." යි සිතූ කුඹල් හල හිමියා "ස්වාමීනි, දැන් ටිකකට කලින් තවුස් කෙනෙක් ඇවිත් නවාතැන් ගත්තා. එතුමා කැමති ද අහලා, කැමති නම් ඔබ වහන්සේත් නවත්වා ගන්නම්" යි පැවසීය.

දේවල තවුසා වෙත ගිය නාරද තවුස් තෙම "ආචාර්ය තුමනි, ඔබ ගේ විරුද්ධත්වයක් නැත්නම්, මමත් අද මෙහි නවාතැන් ගන්නම්" යි විමසා සිටියේ ය. "ශාලාව බොහොම ඉඩ තියෙනවා. එන්න. ඇවිත් නවාතැන් ගන්න." යි දේවල තවුසා කියා සිටියේ ය. ඇරයුම සතුටින් පිළිගත් නාරද තවුසා එහි පිවිස සතුටු සාමීචි කතා බහ නිම කොට ගිමන් නිවන්නට හාන්සි විය.

විවරණාත්මක අනුවාදය (3 ගාථාව)

මං අක්කොච්ඡි මං අවධි මං අජිනි මෙ අහාසි යෙ තං උපනය්හන්ති තෙසං වෙරං න සම්මති

මං: මට; **අක්කොච්ඡි**: බැණ වැදුණේ ය; **මං**: මට; **අවධි**: වධ හිංසා කළේ ය; **මං**: මා; **අජිනි**: පැරදවී ය; **මෙ**: මට; **අහාසි**: පාඩු කළේ ය; (මා සතු දේ පැහැර ගත්තේ ය.) **යෙ**: යමෙක්; **තං**: එබඳු දේ; **උපනය්හන්ති**: යළි යළිත් මතක් කරමින් සිටින්නේ නම්; **තෙසං**: ඒ අය ගේ; **වෙරං**: වෛරය; **න සම්මති**: නිමාවකට නො යයි.

යම් කිසිවෙක් "මට අසවලා බැණ වැදුණේ ය. පහර දුන්නේ ය. වධ හිරිහැර කළේ ය. මා පරාජය කළේ ය. මා සතු දේ පැහැර ගෙන මට අලාභ කළේ ය." යි නිතර නිතර ම මතක් කරමින් වෛරය දිගට පවත්වන්නේ නම් ඔවුන් ගේ වෛරය සංසිඳෙන්නේ නැත.



බැණීම්, පහරදීම්, දිනීම්, පැහැරගැනීම් පිළිබඳ කෝපය (සිත්හි) නොබැඳි කල සන්සිඳේ.

4. අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මෙ
යෙ තං න උපනය්හන්ති
වෙරං තෙසූපසම්මති (1:4)

මට බැන්නා - මට ගැහුවා
වද දුන්නා - පාඩු කළා"
නො සිතන්නේ නම් මෙලෙසින්
වෛරය දුරු වෙයි විගසින්.

දුර ලමු වෛරය.

1 (3) (4) තිස්ස තෙරුන් ගේ වස්තුව. (3-4 ගාථා) (පෙර පිටුවට සම්බන්ධයි.)

නින්දට යා යුතු වේලාව එළැඹියෙන් නාරද තවුසා දේවල තවුසා නිදන තැන, නිදන දිශාව හා දොර තිබෙන තැන ද හොඳින් මතක තබාගෙන නින්දට ගියේ ය. එහෙත් දේවල තවුසා එතැන වෙනස් කොට කෙලින් ම දොර ඇති දිශාවෙහි හරහට නිදා ගත්තේ ය.

ඒ බව නො දත් නාරද තවුසා මහ රැයෙහි නැගිට බැහැරට යනු කැමතිව දොර දෙසට ගමන් කළේ ය. අවාසනාවට මෙන් ඔහුට දේවල තවුසා ගේ ජටාමඩුල්ලෙහි වූ කෙස් පෑගිණි. "කවු ද මගේ කොණ්ඩය පෑගුවේ" දේවල තවුසා කෑ ගැසී ය. "ආචාර්යන් වහන්ස, ඒ මම." යි නාරද තවුසා පැවසී ය. "හොර තාපසයා, කැලේ ඉඳලා ඇවිත් මගේ ජටා මඩුල්ලත් පෑගුවා" යි දේවල තවුසාට බැණ වැදුණේ ය.

"ආචාර්යන් වහන්ස, මම දැන ගෙන හිටියේ නෑ ඔබ මෙතන නිදි කියලා. වැරදීමක්. සමාවන්න" යි පැවසූ නාරද තවුස් තෙම මිදුලට බැස්සේ ය. "නාරද ආපසු එන කොට මාව පාගන්න තියන්න හොඳ නෑ" යි සිතූ දේවල තවුසා හිස තිබූ අතට පා දමා නිදා ගත්තේ ය. "ආ පැත්තෙන් ම ගියොත් ආයෙත් දේවල ගේ ජටාව පෑගෙන්න පුළුවනි" යි සිතූ නාරද තවුස් තෙම මෙවර අනිත් පැත්තෙන් යන්නට ගොස් දේවල තවුසා ගේ ගෙල මත පා තැබී ය. "ඒ කවුද?" දේවල විමසී ය. " ඒ මම ආචාර්යෙනි" යි නාරද පිළිතුරු දුන්නේ ය. "හොර තාපසයා. මුලින් මගේ ජටා මඩුල්ල පෑගුවා. දැන් බෙල්ල ම පෑගුවා. මම තමාට සාප කරනවා." හෙතෙම මහ හඬින් පැවසී ය. "ආචාර්ය තුමනි , කෝප නො ගන්න.

මුල් වතාවේ ජටාමඩුල්ල පෑගුණු නිසා මේ සැරේ ඒවගේ දෙයක් නොවෙන්න පය පැත්තෙන් ආවා. මම දැනගෙන හිටියේ නෑ ඔබ දිශාව මාරු කල බව. මට සමාවෙන්න." යි නාරද තවුසා කීවත් "මම නුඹට සාප කරනවා" යි දේවල තවුසා හඬ ගා කී ය. "එපා එපා. ඒක කරන්න එපා"යි නාරද නැවතත් අයැද සිටියේ ය. "නෑ. සාප කරනවාමයි." පැවසූ දේවල තවුසා, "හෙට හිරු නැගෙන විට ඔබේ හිස හත්කඩකට පැලේවා"යි සාප කළේ ය.

මේ සාපය නිවැරදි කරුවකුට කළ එකක් බැවින් කළවුන් වෙත ම ආපසු කැරකෙන එකක් බව නාරද තවුසා නුවණින් දැක ගත්තේ ය. එහෙයින් තම ධ්‍යාන බලයෙන් හිරු නො නැගෙන පරිදි අධිෂ්ඨානයක් කළේ ය. එදින හිරු උදා නො වන්නේ කවර හෙයින්දැයි සොයා බැලූ රජ තෙම කරුණු දැන නාරද තවුසා ගෙන් සමාව ගන්නැයි දේවල තවුසාට බල කර සිටි නමුත් හෙතෙම එයට අකැමැත්ත පළ කළේ ය. ඔහු ඇමතූ නාරද තවුසා මෙසේ පැවසී ය. "ආචාර්යතුමනි, මම මගේ සෘද්ධි බලයෙන් හිරු නැඟෙන්නට සලස්වන්නෙමි.

ඔබේ හිස මත මැටි බෝලයක් තබා ගෙන දියේ ගිලී වෙන තැනකින් මතුවනු මැනවි."හිරු උදාවන විට ම දියෙහි සිටි දේවල ගේ හිස මත වූමැටි ගුලිය සත් කඩකට පිපිරී ගියේ ය. දියේ ගිලී ගොස් වෙන තැනකින් මතු වූ දේවල අසලකවත් නො රැඳී පලා ගියේ ය.

"මහණෙනි, එකල රජව සිටියෝ ආනන්ද ස්ථවිරයෝ ය. එදා හිතුවක්කාර වූ දේවල තවුසා නම් අදත් අකීකරු මේ තිස්ස භික්ෂුව ය. නාරද තවුසා නම් මම ම වූයෙමි." යි භාග්‍යවතුන් වහන්සේ කතාව නිමවූ හ.

විවරණාත්මක අනුවාදය (4 ගාථාව)

මං අක්කොච්ඡි, මං අවධි, මං අජිනි, මෙ අහාසි, යෙ තං න උපනය්හන්ති තෙසං වෙරං සම්මති.

මං: මට; **අක්කොච්ඡි**: නින්දා පරිභව කළේ ය; **මං**: මට; **අවධි**: වධ හිංසා කළේ ය; **මං**: මා; **අජිනි**: පැරදවී ය; **මං**: මට; **අහාසි**: පාඩු කළේ ය; (මා සතු දේ පැහැර ගත්තේ ය.) **යෙ**: යමෙක්; **තං**: මෙබඳු දේ; **න උපනය්හන්ති**: නිතර නිතර මතක් කරමින් නො සිටියි නම්; **තෙසං**: ඔවුන් ගේ; **වෙරං**: වෛරය; **සම්මති**: සංසිඳෙයි.

මට අසවලා නින්දා පරිභව කළේ ය. මට වධ හිරිහැර කළේ ය. මා පැරදවී ය. මට පාඩු කළේ ය. යම් කිසි කෙනෙක් නිතර නිතර මතක් කරමින් නො සිටින්නේ නම් ඔහු ගේ සිතේ ඇති වෛරය ඉක්මනින් සංසිඳී යයි.

විවරණය

මේ ගාථා දෙකින් ආවේග සංසුන් කර ගැනීම සඳහා වැදගත් මනෝවිද්‍යාත්මක සංකල්පයක් පැහැදිලි කර ඇත. චිත්තවේග හට ගන්නේ කිසියම් සිතිවිල්ලක් නිසා ය. සිතිවිල්ලක් පදනම් කර ගෙන අප මවා ගන්නා මනෝරූපන චිත්ත වේගයක් ජනිත කරලයි. මනෝ චිත්‍රය නො තකා හැරීමට හැකි නම්, චිත්ත වේගය පාලනය කර ගත හැකි වෙයි.

වෛරය අහිතකර ආවේගයකි. අපට විවිධ පුද්ගලයන් විසින් කරනු ලබන හිරිහැර අවමාන, අලාභ ආදිය නිතර සිහියට නගා ගනිමින් වෛරය පෝෂණය කිරීමෙන් අනර්ථයක් මිස යහපතක් සිදු නො වේ. වෛර කිරීම හා පලිගැනීම වෙනුවට ඉවසීම, සමාව දීම හා මෛත්‍රිය ප්‍රගුණ කරන්නේ නම්, එය මානසික සුවයට මෙන් ම කායික සුවයට ද අදාළ වෙයි.

ඉවසීම, සමාව දීම හා මෛත්‍රිය දුර්වලයන් ගේ ලක්ෂණ යැයි සිතීම අමනකමකි. ඒවා ප්‍රබල පෞරුෂයක ලක්ෂණ බව අවධාරණයෙන් ම කියමු. අපේ අරමුණ නීරෝගී ප්‍රසන්න මනසක් ඇතිව සිටීම නම්, දූෂිත සිත ඊට ඉඩ නො තබයි. ආවේග පාලනය කර ගන්නට හැකි වීම දක්ෂ කමකි. ආවේග වලට යටත්ව ක්‍රියා කර මහත් විනාශයක් වූවාට පසු කණගාටු වීමට වඩා ඒවා පාලනය කරගෙන අපේ ජීවිතය වාසනාවන්ත කර ගැනීමට සමත්වීම ඥානවන්ත කමකි.

බෝසත් අවදියේ (නිදසුන්: ක්ෂාන්තිවාදී ජාතකය) මෙන් ම බුද්ධත්වය ලද පසුව ද වෛර උපදවා නො ගෙන ඉවසීම හා මෛත්‍රිය ප්‍රගුණ කරන අයුරු භාග්‍යවතුන් වහන්සේ චරිතාදර්ශයෙන් ම නිරූපණය කළහ.



වෛරට වෛර නො කිරීමෙන් වෛර සන්සිඳේ. මෙය හැමදා පවත්නා දහමකි.

5. න හි වෙරෙන වෙරානි
සම්මන්තීධ කුදාචනං
අවෙරෙන ච සම්මන්ති
එස ධම්මො සනන්තනො (1:5)

වෛරයෙන් වෛරය
නිම නොවෙයි කිසි කාලෙක
නිම වෙයි වෛර නො කළොත්
එයයි හැමකල ලොව ස්වභාවය.

පරදතොත් වෛරය - වෛර නො කිරීමෙන් ම පමණය.

1 (4) කාලි යක්ෂණිය ගේ කථාව (5 ගාථාව)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන අතර භාග්‍යවතුන් වහන්සේ **දරු පල ඇති කතක්** හා **දරු පල නැති කතක්** ඇරබ මේ ගාථාව වදාළ හ.

එක් ගෘහපතියෙක් තම බිරිඳට දරුවන් නැතිකම පිළිබඳව තැවෙන විට ඔහු ගේ බිරිඳ මෙසේ සිතුවා ය. "මේ විදියට දරුවකු නැතිව කලක් ගත වුණොත් නැන්දම්මත් ස්වාමිපුරුෂයත් දෙන්නම එකතු වෙලා මට වෙනස් කම් කරයි. තවත් ගැහැණු කෙනෙක් මේ මනුස්සයට ගෙනාවොත්, එයා ගෙන් ළමයි ලැබෙනවා නම්, මටත් සහනයක්. එතකොට ප්‍රශ්නයක් නැති වෙයි." මෙසේ සිතූ ඕ තම පුරුෂයාට තවත් කාන්තාවක් ආවාහ කර ගන්නට සැලසුවා ය. එහෙත් දෙවන බිරිඳ ගැබ් ගන්නා විට ඇයගේ සිතෙහි ඊර්ෂ්‍යාවක් ජනිත වී ඔසුවක් රහසේ පොවා ගැබ් නැසුවා ය. එය තේරුම් ගත් දෙවන බිරිඳ ඊළඟ වර ගැබ් ගත් විට එය රහසක්ව තබා ගත්තා ය. එහෙත් ඇය දෙස බැලීමෙන් ඇය ගැබ්ගෙන ඇති බව දැන ගත් පළමු බිරිඳ නැවත ද ආහාර සමග මිශ්‍ර කොට බෙහෙත යොදා ගැබ් නැසුවා ය. අන්තිමේ දරු ප්‍රසූතියක දී ම මිය ගිය දෙවන බිරිඳ දැඩි ක්‍රෝධයෙන් පුපුරමින් මෙසේ ප්‍රාර්ථනා කළා ය. "මම උප උපන් ජාති නුඹෙනුත් නුඹේ දරුවන්ගෙනුත් පළි ගන්නෙමි." දිග වෛරයක ආරම්භය මෙසේ සටහන් විය.

ඊළඟ ජන්ම වලදී මේ දෙදෙනා බැළලියක් හා කිකිළියක්, මුවදෙනක් හා කොටියෙක් ආදී වශයෙන් ඉපිදෙමින් වෛරයෙන් වෛරය පෝෂණය කරමින් සසර සැරිසරා අවසන බුදුන් දවස සැවැත්නුවර ධනවත් සිටුවරයකු ගේ දියණියක හා යක්ෂණියක වශයෙන් උපන් හ. දිනක් මේ යකින්න සිටු දියණියගේ බිළිදා බිලි ගන්නට ආවාය. බුදුරදුන් දෙව්රම් වෙහෙර වැඩ වෙසෙන බව දැනසිටි සිටු දියණිය දරුවාත් රැගෙන එහි දිව ගොස් බිළිදා බුදු පාමුල තැබුවේ බුදුරදුන් ගේ රැකවරණය ඔහුට ලැබේවායි සිතමිනි. විහාර භූමියට ඇතුල් වනු නො හැකිව යක්ෂණිය ඒ වටා රැඳෙමින් සිටිනු දුටු තථාගතයන් වහන්සේ ඇය ද ඇතුළට කැඳවූවා ය. ඔවුන්ගේ අතීත පුවත් සිහිපත් කර දුන් උන්වහන්සේ වෛරය නිසා දෙදෙනාට ම වී ඇති අනර්ථය පැහැදිලි කර දී වෛරය නැති කර ගත හැක්කේ මෛත්‍රිය, අවබෝධය සහ කාරුණිකත්වය මගින් පමණක් බව පැහැදිලි කළ හ. කරුණු තේරුම් ගත් ඔවුහු බුදු සමිඳුන් ගේ අවවාදය පිළිගෙන එකිනෙකා සමග සාමය ඇති කර ගත්හ.

අනතුරුව දරුවා යක්ෂණිය ගේ අතට දෙන ලෙස භාග්‍යවතුන් වහන්සේ සිටු දියණියට පැවසූහ. මුලදී දරුවා ගේ ආරක්ෂාව ගැන සිතා ඇය අදි මදි කළ ද බුද්ධ ගෞරවය නිසා ඕ දරුවා යකින්න ගේ අතට දුන්නා ය. දරුවා වඩා ගත් යක්ෂණිය ඔහු ආදරයෙන් සිඹ සුරතල් කර ආපසු දුන්නා ය. මෙහි ප්‍රතිඵලය වූයේ ආත්ම ගණනාවක් ලියලමින් ආ දරුණු වෛරය සහමුලින් ම දිය වී යාමයි.

විවරණාත්මක අනුවාදය (5 ගාථාව)

ඉධ වෙරෙන වෙරානි කුදාචනං න හි සම්මන්ති අවෙරෙන ච සම්මන්ති එස සනන්තනො ධම්මො.

ඉධ: මේ ලෝකයෙහි; **වෙරෙන**: වෛරයෙන්; **වෙරානි**: වෛරයෝ (සතුරු කම්); **කුදාචනං**: කිසි කලෙක; **න හි සම්මන්ති**: නො සංසිඳෙති; **අවෙරෙන ච**: අවෛරයෙන් ම; **සම්මන්ති**: සංසිඳෙති; **එස**: මෙය; **සනන්තනො**: සදාකාලික; **ධම්මො**: ස්වභාවයකි.

වෛර කිරීමෙන් කිසි කලෙක වෛරය සංසිඳෙන්නේ නැත. එය සංසිඳෙන්නේ වෛර නො කිරීම මගින් ම ය. මෙය ලොව පවත්නා සදාකාලික ධර්මතාවකි.

විවරණය

වෛරය වෛරයෙන් ජය ගන්නට සිතීම යුද්ධ කර යුද්ධය නිම කරන්නට වෑයම් කිරීම වැනි ක්‍රියාවකි. වෛරය පෙරළා වෛර කිරීමෙන් වර්ධනය වනු මිස අඩු වන්නේ නැත. යමකු අපට වෛර කරන විට අප ඊට අකැමැති වන්නේ වෛරය නරක දෙයක් යැයි අප පිළිගන්නා හෙයිනි. එසේ නම්, ඒ නරක දෙය ම කිරීමෙන් අප කරන්නේ ඔහු ගේ දෘෂ්ටිය පිළිගෙන ඔහු ගේ කඳවුරට එකතු වී නරක පුද්ගලයන් ම වීම නො වේ ද? අප කළ යුත්තේ අප නිවරද යැයි සිතන ස්ථාවරයේ ම සිට වෛර කිරීමෙන් වැළකීම ය.

මැරෙන බව නො දන්නෝ කලහ කරති. මැරෙන බව දන්නවුන්ගේ කලහ සන්සිඳේ.

6. පරෙ ච න විජානන්ති
මයමෙත්ථ යමාමසෙ
යෙ ච තත්ථ විජානන්ති
තතො සම්මන්ති මෙධගා (1:6)

බැහැරියෝ නො දනිති
යම් දිනෙක අප මැරෙතැයි
දනිත් නම් ඒ බව
කිසිවෙක් කලහ නො කරත්.

මරණසතියෙන් සාමය ඇති වෙයි.

1 (5) කොසඹෑ නුවර හිමිවරුන් ගේ කතාව (6 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසමින් **කොසඹෑ නුවර භික්ෂූන් වහන්සේලා** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

කොසඹෑ (කෞශාම්බි, කොසම්බි) නුවර වාසය කළ භික්ෂූන් වහන්සේලා අතර විනය ප්‍රශ්නයක් නිසා හටගත් විවාදයක් දුර දිග ගොස් ධර්මවාදී හා විනයවාදී යැයි කණ්ඩායම් දෙකකට බෙදී යන්නට හේතු විය. මේ භේදය දුරු කර සඟ පිරිස සමගි කරවන්නට බුදුරජාණන් වහන්සේ පවා සමත් නො වූ හ. දායක දායිකාවෝ ද දෙපක්ෂයකට බෙදුණ හ. අන්තිමේ භාග්‍යවතුන් වහන්සේ පාරිලෙය්‍යක වනයට වැඩම කොට වස් කාලය එහි ම ගත කරන්නට තීරණය කළ හ.

පාරිලෙය්‍යක වනයෙහි රක්ඛිත නම් උයනට තනිව ම වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ එහි වස් සමාදන් වූ හ. වනයෙහි විසූ පාරිලෙය්‍ය නමින් ම හැඳින්වුණු හස්තියෙක් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කළ හ.

බුදුරදුන් වනගත වූයේ සඟ පිරිස සමගි කරවන්නට ගත් ප්‍රයත්නය අසාර්ථක වීමෙනැයි දැනගත් දායක දායිකාවෝ අසමගිව සිටින භික්ෂූන්ට සිවුපසය සැපයීම නතර කළ හ. තම විවාදය කෙතරම් හානිකර වී ඇත්දැයි ඔවුන්ට වැටහුණේ එවිට ය. වාද විවාද අතහැර ඔවුන් සමගි වුව ද භාග්‍යවතුන් වහන්සේ සමා කරවා ගෙන නැවත නගරයට වැඩම කරවන තුරු දායකයෝ කලහකාරී භික්ෂූන් වෙත නැවත සමීප නො වූ හ. එහෙත් එය වස් කාලය වූ හෙයින් භාග්‍යවතුන් වහන්සේ යළි වැඩම කරවීම ද අපහසු විය. වස් තෙමස භික්ෂූන් ගත කළේ මහත් අපහසුවෙනි.

වස් කාලය අවසන ආනන්ද මහා ස්ථවිරයන් වහන්සේ පෙරටු කර ගත් භික්ෂූන් වහන්සේලා වනයට ගොස් අනාථපිණ්ඩික සිටුතුමා ඇතුළු දායක පිරිස බුදුරජාණන් වහන්සේගේ සම්ප්‍රාප්තිය ගෞරවාදරයෙන් අපේක්ෂා කරන බව දන්වමින් යළි නගරයට වැඩම කරන්නට ඇරයුම් කළ හ. භාග්‍යවතුන් වහන්සේ ද සුදුසු කල් දැන ජේතවනාරාමයට ආපසු වැඩම කළ හ. එහි දී කලහකාරී භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රසිද්ධියේ සමාව අයැද සිටිය හ.

ඔවුන් ගේ අකීකරු හිතුවක්කාර ගති පිළිබඳව නිග්‍රහ කළ භාග්‍යවතුන් වහන්සේ තමන් සදාකල් ජීවත් නොවන්නවුන් බව තේරුම් ගන්නා ලෙසත් එසේ තේරුම් ගන්නේ නම් සියලු කලහ එවිට නතර වන බවත් වදාළ හ.

විවරණාත්මක අනුවාදය (6 ගාථාව)

එත්ථ පරෙ මයං යමාමසෙ න ච විජානන්ති තත්ථ යෙ ච විජානන්ති තතො මෙධගා සම්මන්ති

එත්ථ: මේ කරුණෙහි ලා; **පරෙ**: බාහිරයෝ (දහම් මඟින් බැහැර වූවෝ); **මයං**: අපි; **යමාමසෙ**: මැරෙන්නෙමු(යි); **න ච විජානන්ති**: (නො දනිති); **තත්ථ**: එහි දී; **යෙ ච**: යම් කිසිවෙක්; **විජානන්ති**:(එය) දනිත් ද; **තතො**: ඒ හේතුවෙන්; **මෙධගා**: කලි කලහ; **සම්මන්ති**: නිමාවට යයි.

භාග්‍යවතුන් වහන්සේ උගන්වන ධර්ම මාර්ගයට පරිබාහිර පුද්ගලයෝ තමන් මැරෙන බව නො දැන කලි කලහ කරති. යමෙක් තමන් මැරෙන බව දනිත් ද, ඔවුහු කලහ නිම කර සංසුන් වෙති.

විවරණය

මරණය සහ ජීවිතයේ අනිත්‍යතාව තේරුම් ගැනීම යථාර්ථාවබෝධය සඳහා අත්‍යවශ්‍ය ය. මිනිසුන් මෙය තේරුම් නො ගැනීම බොහෝ ගැටළුවලට හේතු වී පවතියි.

බොහෝ ගිහි - පැවිද්දෝ තමන් අමරණීයැයි සිතමින් මෙන් ක්‍රියා කරති. චිත්ත වේගයන්ට වසඟව බුද්ධියට නිවාඩු දී ක්‍රියා කරන එවැන්නෝ ප්‍රමාදීව, සීලා දී ගුණධර්ම වර්ධනය ගැන නො සිතමින් ලෞකික සැප සම්පත් ගැනම සිතති. ඔවුන් ගේ ලෝභය මෙන් ම ද්වේෂය ද වැඩෙයි. අද කළ යුතු දේ හෙටට කල් දැමීම ද මෙම මිථ්‍යා දෘෂ්ටියෙහි ප්‍රතිඵලයක් වෙයි. තම මුලාවෙහි තරම අවබෝධ වන්නේ අනපේක්ෂිත ලෙස මරණය තමා අබිමුවට පැමිණි විට ය.

මරණය යන වචනය අසන්නට හෝ එම විෂය ගැන කතා බහ කරන්නට පවා රුචි නොවන පුද්ගලයෝ වෙති. දීර්ඝායුෂ, නීරෝගිකම හා යෞවනය නිසා මත්ව ප්‍රමාදී ව පස්කම් රසයෙහි ගිජුව වසන්නෝ එම වචනය පවා අසුබ සේ සිතති. අනිත්‍ය දේ නිත්‍ය ලෙස ද දුක් සහගත දේ සුවදායක සේ ද අනාත්ම දේ ආත්ම ලෙස ද අසුභ දේ සුභ ලෙස ද ගැනීම විපර්‍යාස (විපල්ලාස) චින්තනයේ ලක්ෂණ බව බුදුසමයෙහි ඉගැන්වෙයි.

මරණය ගැන අවබෝධය හා නිරතුරු ඒ පිළිබඳ මෙනෙහි කිරීම හේතුවෙන් යථාවබෝධය ලැබීම අපගේ ප්‍රායෝගික ජීවිතය කෙරේ මහත් බලපෑමක් ඇති කරයි. ගත කරන කෙටි ජීවිතය කලකෝලාහල හා මත භේද වලින් පුරවා ගැනීමෙන් වන්නේ අලාභයක් පමණි. ඒ වෙනුවට සියළුදෙනා සාමයෙන් සතුටෙන් වාසය කිරීමෙන් ලබන ආධ්‍යාත්මික ආශීර්වාද මෙලොවට පමණක් නොව පරලොවට ද ආශීර්වාදයක් වනු ඇත. කෝලාහල කර ගන්නවුන් 'මගේ අය නොව පිට අය' වශයෙන් හඳුන්වන්නට බුදුරදුන් සිතුවේ මෙම යථාර්ථය තහවුරු කොට දක්වනු පිණිස ය.

ඉන්ද්‍රිය සංවරයක් නැතිව වෙසෙන්නා මරු වසඟයට යන්නේ දුබල ගසක් වාතයෙන් ඇද වැටෙන්නාක් මෙනි.

7. සුභානුපස්සිං විහරන්තං
ඉන්ද්‍රියෙසු අසංවුතං
භොජනම්හි අමත්තඤ්ඤුං
කුසීතං හීනවීරියං
තං වෙ පසහති මාරො
වාතො රුක්ඛං'ව දුබ්බලං (1:7)

ජීවිතයේ සුභ පක්‍ෂය
බලමින් නො-දමා ඉඳුරන්
පමණ නො දැන භෝජනයෙහි
කුසීත වී බෙල හීනව
විසුවොත් වනසයි මරුවා
සැඩ පවනින් මහ තුරු මෙන්

අලසකම විනාශයේ මුලයි.

1 (6) මහාකාල තෙරුන් ගේ වස්තුව (7 හා 8 ගාථා)

සෙව්තව්‍යා නුවර අසල වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා යුග්මය **මහා කාල සහ චුල කාල** යන සහෝදරයන් දෙදෙනා අරබයා දේශනා කළහ.

සේතව්‍යා නුවර චූල කාල,මජ්ඣිම කාල හාමහා කාල නමැති සහෝදරයෝ තුන් දෙනෙක් විසූ හ. වැඩිමලා හා බාලයා වූ මහා කාල හා චූල කාල ගැල් රැගෙන ඈත දුර ප්‍රදේශ වලට ගොස් කරත්ත පන්සියයක් පුරාම විවිධ වෙළඳ භාණ්ඩ රැගෙන එති. මජ්ඣිම කාල මේවා නිවසේ තබා ගෙන වෙළඳාම් කරයි.

මෙසේ ගිය එක් වතාවක ගැල් පුරා විවිධ වාණිජ භාණ්ඩ පුරවා ගෙන සැවත් නුවර බලා එන අතර සැවත් නුවරත් ජේතවනාරාමයත් අතර කරත්ත මුදා විවේක ගත් හ. එදින සන්ධ්‍යා භාගයෙහි සැවැත් නුවර වැසියන් මල් දම් හා සුවඳ ද්‍රව්‍ය අතැතිව දහම් ඇසීම පිණිස යනු දුටු මහා කාල 'ඔබ මේ කොහි ද යන්නේ?' යි ඔවුන් ගෙන් විමසා බණ අසන්නට යන බව දැන "මමත් යන්නෙමි" යි ඉටා ගත්තේ ය. තම මලණුවන් ඇමතු හේ "මල්ලි කරත්ත ටික බලා ගන්න. මම බණ අහන්නට යනවා." යි පවසා විහාරස්ථානයට ගොස් බුදුන් වැඳ ධර්ම ශ්‍රවණය පිණිස හිඳ ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ එදින දුක්ඛ සත්‍යය විවරණය කරමින් කාමාස්වාදයෙහි ආදීනව පැහැදිලි කරමින් කළ ධර්ම දේශනාව ඇසූ මහා කාල සසර කලකිරී පැවිදි විය.

මහා කාල පැවිදි වූ පුවත ඇසූ චූල කාල ද පැවිදි විය. එහෙත් ඔහු පැවිදි වූයේ කෙසේ හෝ සිය සොහොයුරා ද සමග ආපසු ගිහිගෙට එන අරමුණිනි.

සුළු කලකින් ම මූලික ශික්ෂණය නිමවූ මහා කාල තෙරහු සිය ආචාර්‍යයන් බැහැදැක "හිමියනි, මේ සසුනෙහි ධුර කීයක් ඇත්දැයි විමසූහ. විදර්ශනා ධුරය හා ග්‍රන්ථ ධුරය ගැන ඇදුරු හිමියන් කළ විවරණය ඇසූ මහා කාල හිමියෝ "මම ස්වාමීනි, වැඩිවිය පත්ව පැවිදි වූ හෙයින් ග්‍රන්ථ ධුරයෙහි දියුණුවක් ලබන්නට අසමත් මි. එහෙයින් මම විදර්ශනා ධුරය පුරමි." යි පවසා භාවනා කර්මස්ථාන ලබා ගෙන සුසාන භූමියට ගොස් භාවනා වැඩූ හ.

දිනපතා රැයෙහි ප්‍රථම යාමයෙහි සියල්ලන් නින්දට යත්දී සුසාන භූමියට ගොස් භාවනා ආරම්භ කරන උන්වහන්සේ අළුයම කිසිවකු පිබිදෙන්නට පෙර ආරාමයට වැඩම කරති.

මෙසමයෙහි එක් තරුණ කාන්තාවක් හදිසියේ ගිලන්ව මිය ගියා ය. මිය ගිය ද ඇයගේ රූසිරිය එසේ ම පියකරුව දිස්විණි. හවස් වරුවේ ඇයගේ ඥාතිහු සිරුර දැවීමට අවශ්‍ය දර,තෙල් ආදී අවශ්‍යදේ ද රැගෙන ගොස් සිරුර ද සමග දවනු වස් සුසාන භූමි පාලිකාවට භාර දුන් හ. සිරුර දවන්නට සැරසුණු පාලිකාව ඇයගේ ඇඳුම් පැළඳුම් ඉවත් කරන විට සිරුරේ ප්‍රියංකරත්වය දැක මෙය භාවනා කරන හිමියන්ට සුදුසු අරමුණක් වෙතියි සිතා උන්වහන්සේ වෙත ගොස් "ස්වාමීනි, භාවනාවට සුදුසු අරමුණක් දක්වන්නෙමි" යි උන්වහන්සේ කැඳවා එය දැක්වී ය. උන්වහන්සේ ද ගොස් හිස සිට පාදාන්තය දක්වා සිරුරේ රූ සිරි මැනවින් නරඹා "මේ රන්වන් සිරුර ආදාහන කරන විට සිරුරට ගිනිදැල් වැටෙන විට ම මට කථා කරන්නැයි පැවසූ හ.

දරසෑය සකස් කර සිරුර ඒ මත තබා තෙල් වත් කොට ගිනි තැබූ පාලිකාව සිරුරට ගිනිදැල් වැදෙත් ම භාවනායෝගී මහා කාල හිමියන් එහි කැඳවූ හ. සිරුර ගිනිදැල් වලින් වැසෙත් ම රන්වන් හම හම ගැසූ එළදෙනකු ගේ මෙන් වී අත පය ඇඹරී කැරකී යන හැටි උන්වහන්සේ බලා සිටිය හ. මස් පිළිස්සෙමින් ඇට කටු පෑදෙන හැටි නැරඹූ හ. "බලන අයට බණ අමතක වන සුරූපී සිරුරක්ව පැවති මෙය දැන් දැවී වැනසී යයි." යි සිතූ තෙරණුවෝ ඒ අරමුණ ම භාවනාවට නගා රහත්ඵලය අධිගමනය කළහ.

මේ දිනවල භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පිරිවරා සේතව්‍යා නුවරට වැඩම කළ හ. චූල කාල ගේ පුරාණ භාර්‍යාවෝ දැන් අපි අපේ ස්වාමිපුරුෂයා නැවත ලබා ගනිමු යි සිතා බුදු පාමොක් මහ සඟනට දානයට ආරාධනා කළ හ. දානයට පෙර සංවිධාන කටයුතු සඳහා උපදෙස් දීමට එක් හිමිනමක් නිවසට යාමේ සිරිතක් තිබිණි. ඒ සඳහා චූල කාල හිමියෝ පිටත් ව ගියහ. උන්වහන්සේ නිවසට පැමිණි විට පැරණි භාර්‍යාවෝ බලහත්කාරයෙන් සිවුරු ගලවා ගිහිවත් අන්දවා ගෙදර රඳවා ගත්හ.

විවරණාත්මක අනුවාදය (7 ගාථාව)

**සුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු අසංවුතං
භොජනම්හි ච අමත්තඤ්ඤුං කුසීතං හීනවීරියං තං වෙ
පසහති මාරො වාතො දුබ්බලං රුක්ඛං ඉව**

සුභානුපස්සිං: කාම වස්තූන්ගේ ශුභ පක්ෂය ගැන පමණක් සිතමින්; **විහරන්තං**: වාසය කරන; **ඉන්ද්‍රියෙසු** ඉන්ද්‍රියයන් **අසංවුතං**: සංවරයක් නැති; **භොජනම්හි**: ආහාරයෙහි; **අමත්තඤ්ඤුං**: පමණ නොදන්නා; **කුසීතං**: කම්මැලි; **හීනවීරියං**: වීර්‍යය නොවඩන; **තං**: එම පුද්ගලයා; **පසහති**:අබිබවා සිටියි ; **මාරො**: මාරයා; **වාතො**: වාතය; **දුබ්බලං**: දුර්වල; **රුක්ඛං ඉව**: වෘක්ෂයක් (කඩා හෙළන්නාක්) මෙන්.

කම් සැපෙහි ආස්වාද ජනක ස්වභාවය ගැන පමණක් සිතමින් ඉන්ද්‍රිය සංවරයෙන් තොරව ආහාරයෙහි පමණ නො දැන කම්මැලි ව වීර්‍යය නො වඩමින් වසන තැනැත්තා මරුට පරදින්නේ කුණාටු සුළඟින් කඩා වැටෙන ගසක් මෙනි.



ඉන්ද්‍රිය සංවරයක් ඇති තැනැත්තා මරු වසඟට නො යන්නේ වාතයෙන් පර්වතයක් නො සැලෙන්නාක් මෙනි.

8. අසුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු සුසංවුතං භොජනම්හි ච මත්තඤ්ඤුං සද්ධං ආරද්ධ වීරියං තං වෙ නප්පසහති මාරො වාතො සෙලං'ව පබ්බතං (1:8)	වසමින් අසුබ බැවුමෙන් දමනය කළොත් ඉඳුරන් පමණ දැන බොජුනෙහි සැදැහැතිව විරිය වඩමින් වසතොත් නො විදියි මරු පහර නො සැලෙන ගලක් මෙන් සැඬ කුණාටුවකින්.

ආධ්‍යාත්මික ශක්තිය අපරාජිතය

1 (6) මහාකාල තෙරුන්ගේ වස්තුව (7 හා 8 ගාථා) ඉතිරිකොටස

චූල කාල පැවිදි වූයේ පැවිද්දට ඇල්මක් තිබුණු නිසා නොව මහා කාල හිමි උපැවිදිකරවා ගැනීමේ අදහසින් හෙයින් හෙතෙම සිය කැමැත්තෙන්ම ඒ තත්ත්වය භාර ගත්තේ ය.

චූල කාල රඳවා ගැනීමට ඔහුගේ බිරින්දන් සමත්වූ බව දුටු මහා කාල ගේ භාර්‍යාවෝ අට දෙනා ද 'අපිත් එසේ කරමු'යි භාග්‍යවතුන් වහන්සේ ප්‍රමුඛ සංඝයාට දන් පිණිස ඇරයුම් කළ හ. ඒදින දන් වළඳා අවසන "මහාකාල ඔබ මේ අයට අනුමෝදනා බණ කියන්නැ"යි උන්වහන්සේ නවතා ශ්‍රාවක පිරිස සමග විහාරස්ථානයට වැඩම කළ හ.

භාග්‍යවතුන් වහන්සේ ගම් දොරට වැඩම කරන අතර තුර භික්ෂූහු බුදුරදුන් මහාකාල තෙරුන් නවතා පැමිණීම ගැන අමනාපයෙන් කතා කළ හ. "එදා දානයේ උපදෙස් කටයුතු වලට චූල කාල තෙරුන් යාමෙන් සිදු වුණේ පරණ බිරින්දන් එක්ව උන්වහන්සේගේ සිවුරු ගලවා ගිහිගෙට ගැනීමයි. අද යන්තම් වෙන හිමි නමක් ගිය නිසා ඒ වගේ විපත්තියක් වුණේ නැහැ. දැන් මේ බුදුහාමුදුරුවෝ උන්වහන්සේව බණ කියන්න නවත්තලා ආවා. මොනවා වෙයි ද දන්නේනෑ. බුදුහාමුදුරුවෝ හිතාමතා කළා ද මේ වැඩේ?" වැනි අදහස් හුවමාරු විණි.

මේ අතරතුර මහාකාල තෙරුන් ගේ භාර්‍යාවෝ එතුමන් ගේ සිවුරු බලෙන් ගලවන්නට තැත් දැරූහ. සිය සෘද්ධි බලයෙන් ඔවුන් ගෙන් මිදුණු මහාකාල හිමියෝ බුදුරජාණන් වහන්සේ හමුවෙහි පෙනී සිටිය හ. එවිට මෙහි දැක්වෙන ගාථා දෙක වදාළ භාග්‍යවතුන් වහන්සේ මහාකාල හිමියන් චූල කාල ගේ මට්ටමෙන් මැනීම ගැන භික්ෂූන් වහන්සේට දොස් පැවරූ හ.

විවරණාත්මක අනුවාදය (8 ගාථාව)

අසුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු සුසංවුතං
භොජනම්හි ච මත්තඤ්ඤුං සද්ධං ආරද්ධවීරියං මාරො
තං වෙ නප්පසහති වාතො සෙලං පබ්බතං ඉව

අසුභානුපස්සිං: කාමයෙහි අසුභ පක්ෂය දකිමින්; **විහරන්තං**: වාසය කරන, **ඉන්ද්‍රියෙසු**: ඉන්ද්‍රියන්, **සුසංවුතං**: මනාව සංවර කර ගත්; **භොජනම්හි ච**: ආහාරයෙහි ද; **මත්තඤ්ඤුං**: පමණ දත්; **සද්ධං**: ශ්‍රද්ධා සම්පන්න; **ආරද්ධ වීරියං**: ඇරඹූ වීර්‍යය ඇති; **මාරො**: මාර තෙම; **තං**: එම පුද්ගලයා; **වෙ**: ඒකාන්තයෙන් ම; **නප්පසහති**: අබිබවා නොසිටියි; **වාතො**: වාතය; **සෙලං පබ්බතං**: ගල් පර්වතයක්; **ඉව**: මෙනි. (නොපෙරළෙන මෙනි)

කම් සුවයෙහි අසුභ පක්ෂය තේරුම් ගෙන ඉඳුරන් හික්මවා ගෙන, ආහාරයෙහි පමණ දැන, ශ්‍රද්ධා සම්පන්නව වීර්‍යය වඩමින් වසන්නා පරාජය කිරීමට මරුවාට හැකි නොවෙයි. වාත වේගයෙන් ගල් පර්වතයක් නො සැලෙන්නාක් මෙනි.

විවරණය

සුභවාදී දෘෂ්ටියෙන් ලොව බලන්නෝ "ජීවිතය රෝස මල් යහනකි" යි සිතා මුළා වෙති. රෝස මලේ වුව ද 'නටුවෙ කටු' අමතක කළ යුතු නැත. කාමයෙහි ආස්වාදය පමණක් දකින්නෝ ආදීනව නො දැක ඒ කෙරේ තෘෂ්ණාව වර්ධනය කර ගනිති. මම ය, මාගේ යැයි ගනිති. එසේ මමායනයෙන් ග්‍රහණය කළ දේ වැනසී යන විට මගේ දේ වැනසෙති යි සංවේගයට පත් වෙති. එහෙත් කාම වස්තූන්ගේ ආදීනවය ද මෙනෙහි කරන්නෝ එහි අසුභ පැත්ත ද දක්නා හෙයින් ඒවායේ නො ඇලෙති. එහෙයින් ඒවායේ විනාශය ඔවුන් ගේ සිත් තුළ දුකක් ජනිත නො කරයි.

අසුභානුපස්සී යන්නෙන් වේදනාත්මක බව පමණක් මෙනෙහි කර වෛරය හෝ පිළිකුල උපදවා ගත යුතු යැයි වරදවා නො ගත යුතු ය.

එසේ කළ හොත් එය '**පටිඝසඤ්ඤා**' වැඩීමක් වෙයි. එය දුරු කළ යුත්තක් මිස වැඩිය යුත්තක් නොවේ. මෙයින් අදහස් කළේ බොහෝ දෙනා විසින් නො තකා හරිනු ලබන කාමයන් හි ආදීනව ගැන මෙනෙහි කරවීමය. කාමයෙහි ආදීනව නො දන්නා හේතුවෙන් බොහෝ දෙනා ඒකාංගි ක දෘෂ්ටි ඇති කර ගෙන දුකෙහිම නිමග්න වෙති. නියම සුභවාදය නම් සුභ මෙන් ම අසුභය ද දකිමින් ඒක පාක්ෂික නො වී ජීවිතයේ ගැටළු දෙස ගැඹුරින් බලන්නට පුරුදුවීමයි.

මේ ගාථා යුග්මයෙන් ඉදිරිපත් කරන්නේ ආධ්‍යාත්මික සාර්ථකත්වයෙන් ප්‍රීතිමත් වන බෞද්ධ සදාචාර මාර්ගයයි. යථාර්ථය දැකීම ප්‍රථම පියවරයි. ඉන්ද්‍රිය සංවරයෙන් ප්‍රිය දේ කෙරෙහි ඇල්ම හා අප්‍රිය දේ කෙරේ ද්වේෂය ඇති කර ගැනීම පාලනය කෙරෙයි. අධික ආහාර සේවනය හා කුසීත බව ජීවිතයකට ලෞකික වශයෙන් පවා අභාග්‍යය උදා කරන සිරිත් ය. ඒවා දුරු කර ධෛර්‍යය වීර්‍යය වර්ධනය කර ගන්නේ නම් පර්වතයක් සුළඟින් නොසැලී පවතින්නාක් මෙන් ජීවිතයට ජයග්‍රාහීව මුහුණ දිය හැකි වෙයි.





කෙලෙස් කසට දුරු නො කළ ඉඳුරන් නොදැමූ, සැබෑ වචන නොමැත්තා සිවුරු දැරීමට නු සුදුසු ය.

9. අනික්කසාවො කාසාවං
යො වත්ථං පරිදහෙස්සති
අපෙතො දමසච්චෙන
න සො කාසාවමරහති (1:9)

දුරු කර නැති කෙනෙක් කසල
පොරවන මුත් කසාවතක්
සත්‍යය, දමනය නැති ඔහු
නො ගැලපේ ය, කසාවතට

කසාවතට නො ගැලපෙන්නෝ

1 (7) දෙව්දත් තෙරුන් ගේ කතාව (9 හා 10 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් **දෙව්දත් තෙරුන්** ඇරබ මේ ගාථා යුග්මය දේශනා කළ හ.

වරක් අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙ නම පන්සියයක් බැගින් පිරිවර භික්ෂූන් වහන්සේලා ද කැටිව බුදුරජාණන් වහන්සේ ගෙන් අවසර ගෙන ජේතවන විහාරයේ සිට රජගහ නුවර බලා පිටත් වූ හ. උන් වහන්සේලා ගේ සම්ප්‍රාප්තියෙන් ප්‍රීතියට පත් රජගහ නුවර පුරවැසියෝ ආගන්තුකව පැමිණෙන උතුමන්ට දන් දීමේ පෙර සිරිත පරිදි තනි තනිව හෝ දෙතුන් දෙනා හෝ කිහිප දෙනා එක්ව දානමානාදියෙන් උපස්ථාන කළ හ.

එක් දිනක් දන් වළඳා අවසන භුක්තානුමෝදනාව කරන සැරියුත් මහ රහතන් වහන්සේ "පින්වතුනි, යම්කිසි පුද්ගලයෙක් තමන් දන් දෙයි. එහෙත් අන් අය දීමෙහි ලා උනන්දු නො කරයි. හෙතෙම දන් දුන් පිනින් බොහෝ සැප සම්පත් ලබයි. එතකුදු වුවත් පරිවාර සම්පත්තිය නො ලබයි. තවත් කිසියම් පුද්ගලයෙක් තම ඥාති-මිත්‍ර අසල්වාසී ජනයා දන් දීමෙහි ලා පොළඹවයි. එහෙත් තෙමේ දන් නො දෙයි. හෙතෙම මතු භවයෙහි පරිවාර සම්පත්තිය ලබයි. වෙනත් පුද්ගලයෙක් තමාත් නො දෙයි. අන්‍යයන් ද දීමට යොමු නො කරයි. හෙතෙම පින් මඳ හෙයින් මතු භවයන්හිදී කුස පුරා අහරක් නො ලබයි. දුගී දුප්පත් අසරණ වෙයි. එමෙන් ම පිරිවර සම්පත්තියක් ද නො ලබා තනිවෙයි. තවත් තැනැත්තෙක් තෙමේත් දන් දෙයි. අන්‍යයන් ද දීමට පොළඹවයි. හෙතෙම මතු සසර සිය ගණන් ආත්ම භාවයන්හි යස ඉසුරෙන් ද ආඪ්‍යව පිරිවර සම්පත්තිය ද ලබා සතුටු වෙයි." යනුවෙන් ධර්මය දේශනා කළ සේක. දේශනාව අවසානයේ එක් උපාසකයෙක් "ස්වාමීනි, හෙට මගේ දානය පිළිගත මැනවි" යි ආරාධනා කළේ ය. තවත් සැදැහැතියෙක් ඉදිරිපත් ව ලක්ෂයක් වටිනා රෙද්දක් පරිත්‍යාග කරමින් "හෙට දානයට මොන යම් දෙයක් වුවමනා වුනොත් මෙය විකුණා මුදල් ගෙන එය පිරිමහන්න. එසේ අවශ්‍ය නුවුවහොත් වස්ත්‍රය කවර හෝ හිමි නමකට පූජා කරන්න" යි පැවසී ය. කෙසේ වුවද දානය සඳහා කිසි ම අඩුපාඩුවක් නො වූයෙන්, වස්ත්‍රය කාට පූජා කළ යුතුදැයි ප්‍රශ්නයක් ඇති විය.

"සැරියුත්-මුගලන් දෙනම සිටියා වුව ද උන් වහන්සේලා මෙහි පැමිණෙන්නේ කලාතුරකිනි. දේවදත්ත ස්ථවිරයෝ රජගහ නුවර නිත්‍යවාසීහු ය. වස්ත්‍රය උන් වහන්සේට පිළිගන්වමු"යි එය දෙව්දත් තෙරුන්ට පූජා කළහ. ඇත්තම කිවහොත් දායකයන් අතර මේ ගැන දිග කතාවක් ඇති විය. සැරියුත් හිමියන්ට පිරිනමන්නට බොහෝ අය කැමති වුව ද කලාතුරකින් වඩිනා සැරියුත් හිමියන් මෙන් නොව අපේ දනට, බණට, උත්සව දවසට මෙන් ම උත්සව නැති දවසට ද අප සමගම සිටින්නේ දේවදත්ත ස්ථවිරයෝ ය. උන් වහන්සේ හරියට පිංතාලියක් මෙන් ප්‍රයෝජනවත්ය" කියන්නන් බහුල වූයෙන් ඡන්දය විමසා බලන විට දේවදත්ත ස්ථවිරයන්ට පක්ෂ පිරිස හතර දෙනෙකුන් ගෙන් වැඩි වූ හෙයින් මෙය මෙසේ සිදු විය. දේවදත්ත හිමියෝ එම රෙද්ද කප්පවා, මස්සවා, පඬු පොවා සිවුරක් හා අඳනයක් සකස් කරවා ගෙන ගමන් බිමන් යන විට මහත් අභිමානයෙන් හැඳ පොරවා ගිය හ. ඒ දුටු සමහර භික්ෂූහු "මේ සිවුර දේවදත්ත හිමියන්ට තරම් නොවේ. මෙය ගැලපෙන්නේ සාරිපුත්ත හිමියන්ට ය. මේ තෙරුන් තමන්ට ගැලපෙන්නේ නැති සිවුරක් හැඳ ගෙන ඔබ මොබ ගමන් කිරීම නොහොබී"යි කතිකා කළහ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, දේවදත්ත තමන්ට නො ගැලපෙන වස්ත්‍රයක් පරිහරණය කළේ දැන් පමණක් නොව අතීතයේ ද එසේ කළහ" යි වදාළහ. අනතුරුව උන් වහන්සේ අතීත කතාව මෙසේ විස්තර කළහ.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි බරණැස එක්තරා පුද්ගලයෙක් ඇතුන් මැරීමෙන් ජීවිකාව කළේ ය. එක්තරා වනාන්තරයක ඇත්තු දහස් ගණනක් සුවසේ වාසය කළහ. දිනක් වනයේ සංචාරය කරද්දී ඔවුහු පසේ බුදු නමක් දුට හ. උන් වහන්සේ දැක සිත් පහන් වූ ඔවුහු උන් වහන්සේට නමස්කාර කළ හ. එදා පටන් එතැනින් යන එන හැම විට ම පසේ බුදුරජාණන් වහන්සේට නමස්කාර කර යාමට ඔවුහු පුරුදුවූ හ.

විවරණාත්මක අනුවාදය (9 ගාථාව)

අනික්කසාවො දමසච්චෙන අපෙතො යො කාසාවං
වත්ථං පරිදහෙස්සති සො කාසාවං න අරහති

අනික්කසාවො: කෙලෙස් කහට දුරු නො කළ; **දමසච්චෙන**: ඉන්ද්‍රිය දමනයෙන් හා සත්‍යවාදිත්වයෙන්; **අපෙතො**: තොරවූ; **යො**: යම් පුද්ගලයෙක්; **කාසාවං වත්ථං**: කහවත්; **පරිදහෙස්සති**: හඳින්නේ නම්; **සො**: හෙතෙම; **කාසාවං**: කහවතට; **න අරහති**: නුසුදුසු වෙයි.

කහ සිවුරක් හැඳ සිටිය ද, කෙලෙස් කසළ දුරු නො කළ ඉන්ද්‍රිය දමනයෙන් හා සත්‍යවාදිත්වයෙන් තොර තැනැත්තා කහවත් දරන්නට සුදුසු අයෙක් නොවේ.





කෙලෙස් කසට පහ කළ, මනා සිල් ඇති, ඉඳුරන් දැමූ තැනැත්තා කසාවත දැරීමට සුදුසු ය.

10. යො ච වන්ත කසාවස්ස
සීලෙසු සුසමාහිතො
උපෙතො දමසච්චෙන
ස වෙ කාසාවමරහති (1:10)

කෙළෙස් කහට දුරු කෙරුවෝ
මැනවින් සිල් ගුණ පිරුවෝ
සත්‍යය දමනය වැඩුවෝ
කසාවතට නිසි වූවෝ

සිල් ගුණයෙන් සරු වූවෝ කසාවතට නිසි වූවෝ
1 (7) දෙව්දත් තෙරුන් ගේ කතාව (9-10 ගාථා) (ඉතිරි කොටස)

දිනක් මේ අසිරිමත් චාරිත්‍රය හස්ති ඝාතකයා ගේ නෙත ගැටිණි. "මා දැන්ම ම කහ සිවුරක් හොයා ගත යුතු"යි සිතූ හෙතෙම එක්තරා පසේ බුදු නමක් දිය නෑමට විලට බස්නා තුරු රැක හිඳ උන් වහන්සේගේ සිවුර සොරකම් කර ගත්තේ ය. එය පොරවා ගෙන ඇතුන් ගමන් කරන මඟ එක් තැනක පළක් බැඳ හිඳ ගත් හේ හිස පටන් සිවුර පොරවා තෝමරය ද සඟවා ගෙන රැක සිටියේ ය. එසේ සිට අන්තිමට ම එන ඇතා තෝමරයෙන් ඇන මරා ගන්නා හේ දළ හා වෙනත් ප්‍රයෝජනයට ගත හැකි අංග උපුටා ගෙන ඉතිරිය වළලා දමා ගියේ ය. මේ සිරිත කලක් කර ගෙන යන අතර අප මහ බෝසත්හු මේ ඇත් රැළෙහි නායකත්වයට පත්වූ හ. ඉන්පසුව ද ඇත් මරුවා තම සුපුරුදු උපක්‍රමය අනුගමනය කරයි. තම රැළෙහි ඇතුන් ක්‍රමයෙන් අඩුවෙනු තේරුම් ගත් බෝසත් තෙම "අපේ රැළ කුඩා වන්නේ මේ ඇතුන් කොහි යන නිසාදැ"යි විමසූහ. තමන් නොදන්නා බවඅ නිකුත් හස්තිහු කියා සිටිය හ.

"මොවුන් කොහි ගියත් මට කියා මිස නො යති. එහෙයින් කිසියම් අනතුරක් ම විය යුතු ය" යි සිතූ බෝසත්හු "හිස පටන් කසාවත් පොරවා ගෙන සිටින තැනැත්තා සැක කටයුතු ය. ඔහු ගැන විමසිලිමත් වුව මනායැ"යි සිතා ගත්තේ ය.

ඇත් මුලෙ හි නායක වූ අප බෝසත්හු මෙසේ සිත උපන් සැකය මුල් කර ගෙන "විමසා බලමි" යි සිතා සියළු ඇතුන් පෙරටුව යවා සෙමින් සෙමින් අන්තිමයා ව පැමිණියේ ය. ඇත්තු ද සිවුරු පෙරැවූ ඇත් මරුවාට වඳිමින් එකිනෙකා පෙළට ගමන් කළහ. ඇත් මරුවා ද බෝසතුන් අන්තිමට එනු දැක සිවුර මෑත් කර තෝමරය අතට ගත්තේ ය. බෝසත්හු ද "මේ මාගේ පිරිවර වනසන මරුවා බව නියත යැ"යි සිතමින් ප්‍රහාරයකට මුහුණ දෙන්නට සැරසුණ හ.

ඇත් මරුවා තෝමරය දමා ගසත් ම ඉවතට පැන දිවි ගලවා ගත් බෝසත්හු ඔහු අල්ලා ගන්නට ඉදිරියට දිව ආහ. එහෙත් ඇත් මරුවා දිව ගොස් ගසකට මුවා විය. "මම මේ ගසත් මිනිසාත් එකට හිර කර ගනිමි"යි බෝසත්හු දෙදෙනාම හොඬවැලෙන් අල්ලා සිර කර ගන්නට සිතූ හ. එවිට දිවි ගලවා ගැනීම පිණිස ඇත්මරුවා සිවුර ගලවා ඉදිරියට පෑවේ ය. "දැන් මේ සිවුර ඇද දමා මොහු අල්ලා මරා දැමුව හොත් බුදු-පසේබුදු - මහරහතුන් පොරෝන චීවරයට නිග්‍රහ කළා නම් වන්නේ ය. එසේ කරන්නට අකැමැත්තෙමි"යි සිතූ බෝසත්හු ඉවසා දරා ගනිමින් ඔහුගෙන් මෙසේ විමසූ හ.

"මගේ වගීයා නැසුවේ තොප නොවේ ද?"
"එසේමැයි උතුමාණනි"

"එවැනි කුරුරු කමක් කළේ කවර හෙයින් ද? නුඹ පොරවා ගෙන සිටින්නේ කෙළෙස් නැසූ උතුමන් පොරවන චීවරයකි. එය නුඹට කිසිසේත් නො ගැළපෙයි. මෙවැනි පහත් ක්‍රියාවක් කිරීමෙන් තොප කර ඇත්තේ බලවත් අකුශල කම් යකි." එසේ පැවසූ බෝසත්හු "නුඹ කළේ ඉතාමත් අශික්ෂිත අසෝබන ක්‍රියාවකැ"යි නිග්‍රහ කළහ.

විවරණාත්මක අනුවාදය (10 ගාථාව)

යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො දමසච්චෙන
ස උපෙතො ස වෙ කාසාවං අරහති

යො ච: යම් කිසි පුද්ගලයෙක්; **වන්ත කසාවස්ස**: කෙළෙස් කසලින් දුරු වූයේ; **සීලෙසු**: සීලයන්හි; **සුසමාහිතො**: මනාව හික්මුණෝ; **දමසච්චෙන**: දමනයෙන් හා සත්‍යයෙන්; **උපෙතො**: සමන්විත වූයේ ද; **ස**: හේ; **කාසාවං**: කහවත් (දරන්නට); **අරහති**: සුදුසු වේ.

යම් කිසි පුද්ගලයෙක් කෙලෙස් කහට දුරු කර මනාව ශීලය ආරක්‍ෂා කර ගෙන ඉන්ද්‍රියයන් දමනය කර ගනිමින් සත්‍යවාදීව වාසය කරන්නේ නම් හේ සිවුරු දරන්නට සුදුසු වෙයි.

විවරණය

කාෂාය වස්ත්‍රය: කාෂාය වස්ත්‍රය හෙවත් සිවුර චරිත ශුද්ධියේ සංකේතයක් වැනි ය. බුදු-පසේබුදු-මහ රහතන් වහන්සේලා ගේ 'ඇඳුම' වන මෙය හැඳගත් මාත්‍රයෙන් ම බොහෝ දෙනා ගේ වන්දනාමානාදිය ලැබෙයි. එහෙයින් මෙය දරන්නට පෙර තමා ඊට නිස්සකු බවට පත් විය යුතුව පවතියි.

සිවුරක් දැරූ වහා ම තමා ගෘහස්ථයන් ගෙන් වෙනස් බවට පත්ව ඇත යන හැඟීම (වේවණ්ණියම්හි අජ්ඣූපගතො ති) පැවිද්දෙකුට ඇති විය යුතු ය. ඒ හැඟුම හා ගෘහස්ථයන් පසග පිහිටුවා වැඩීම ද හේතුවෙන් නව ජීවිතයක්, නව පිළිවෙතක් තමා සඳහා වෙන්ව ඇති බව තේරුම් ගෙන ආදර්ශවත් චර්‍යාවකට යොමු වෙයි. භාග්‍යවතුන් වහන්සේ දේවදත්ත චීවරධාරීත්වයට නුසුදුස්සෙකැයි වදාළේ මේ අනුව ය.

නිසරුදෙය සරුය, සරුදෙය නිසරුය යන වැරදි අදහස් ගොදුරු කොට ඇත්තාහු සරුවූ නිවන්සුව නොලබත්.

11. අසාරෙ සාරමතිනො
සාරෙ චා සාරදස්සිනො
තෙ සාරං නාධිගච්ඡන්ති
මිච්ඡා සඞ්කප්පගොචරා (1:11)

නිසරු දේ සරු සේ
සරු දේ සාර නැති සේ
වරදවා ගත හොත්
නො ලැබෙයි සාර කිසිවක්.

මිසදිටු ගත හොත් - යහ මං ඇව්රෙත්.

1 (8) සැරියුත් මුගලන් දෙනම ගේ කතාව (11-12 ගාථා)

රජගහ නුවර වේළුවන විහාරයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ සැරියුත් මුගලන් දෙනම ගේ ගුරුවරයා ව සිටි **සංජය** ඇරබ මේ ගාථා යුග්මය වදාළ හ.

රජගහ නුවරට නුදුරෙහි උපතිස්ස ගම සහ කෝලිත ගම නම් වූ බමුණු ගම් දෙකක් තිබිණ. උපතිස්ස ගමෙහි විසූ රූපසාරී නම් බ්‍රාහ්මණ කාන්තාව ගැබ් ගත් දිනයේ ම කෝලිත ගමෙහි විසූ මොග්ගලී නම් බ්‍රාහ්මණ කාන්තාව ද ගැබ් ගත්තා ය. මේ පවුල් දෙක පරම්පරා හතක පටන් ම දැඩි මිත්‍රත්වයෙන් වෙලී සමීපව සිටි බව කියනු ලැබේ. මේ පවුල් දෙක ම එක ම දිනෙක ගැබ් පෙළහර නම් වූ ගැබිණි මවුවරුන් ගේ ආරක්‍ෂාව සඳහා වන විශේෂ ආගමික කාර්‍ය්‍යය ද කළ හ. දස මස් ඇවෑමෙන් දෙදෙනාම පිරිමි දරුවෝ දෙදෙනෙකු ප්‍රසූත කළ හ.

සාරී බැමිණියගේ දරුවා ගමෙහි ගම්පති පවුලෙහි උපන් හෙයින් ගමේ නමින් ම 'උපතිස්ස' ලෙස නම් කරන ලදි. ඒ අනුව ම මොග්ගලී ගේ දරුවාට ද 'කෝලිත' යන නම ඔවුන් ගේ පවුල ද ගම්පති පවුල වූ හෙයින් යොදන්නට පියවර ගැනිණි. දරුවෝ දෙදෙන ම වැඩි වයසට පත්වන අතර උසස් අධ්‍යාපනයකට හිමිකම් ලබා විවිධ ශිල්ප ශාස්ත්‍රයන් හි නිපුණ වූ හ. නිතර නිතර හමු වන ඔවුනට 500 බැගින් පිරිවර තරුණයෝ ද වූ හ.

හැම වසරක ම රජගහ නුවර පැවැත්වෙන 'ගිරග්ග සමජ්ජ' නම් උත්සවයක් විය. එය පැවැත්වුණේ කඳු ශිඛරයක ය. නැටුම් ගැයුම් වැයුම් ප්‍රාසාංගික අංගයන් ගෙන් සපිරුණු සැණකෙලිය නරඹන්නට මේ ප්‍රභූ යෞවනයන් දෙපළට විශේෂ අසුන් දෙකක් පණවා තිබිණි. එක ලඟ වූ අසුන් දෙකෙහි හිඳ සංදර්ශනය නැරඹූ ඔවුහු දින ගණනක් එහි වූ ප්‍රහසන නරඹමින් සිනාසුණ හ. ශෝකාන්ත නරඹා ශෝක වූ හ. පරිත්‍යාග කරන්නට අවස්ථා උදා වූ විට නිර්ලෝභීව පරිත්‍යාග කළ හ.

දින ගණනක් මෙසේ විනෝද වූ පසු එක් දිනක් ඔවුහු ඒ ගැන ගැඹුරට සිතන්නට වන් හ. මේ නැටුම් ගැයුම් වැයුම් සියල්ල මවා ගත් විනෝදයන් නො වේ ද? මොවුන් කරන්නේ අප යථාර්ථයෙන් මුවා කර ව්‍යාජ චමත්කාරයක් මවා දීමක් නො වේ ද? මේ සියලු නැටුම් ගැයුම් වැයුම් පවත්නේ සුළු කලකි. මේ සියළු නළු නිළියන්ගේ රූ සොබා වසර කිහිපයකින් වැනසී මහලුව ජරපත්ව අප්‍රසන්න වනු ඇත.

එදා උපතිස්ස සිනා විය යුතු තැන සිනාසුනේ නැත. හැඬිය යුතු තැන ඔහු ගේ දෙනෙතෙහි කඳුලක් නො නැගිණ. හේ කෝලිත දෙස බැලී ය.

ඔහු ද එසේම ය. කෝලිත උපතිස්ස ඇමතී ය. "අද ඔබ අමුතුයි. ඊයේ පෙරේදා වගේ විනෝදාස්වාදයක් ලබන බවක් පෙනෙන්ට නැහැ. ඇයි අමුත්ත?" උපතිස්ස ගේ පිළිතුර වූයේ "මම මේ කල්පනා කළේ මේ දර්ශන මොන තරම් බොරුවක් ද කියලයි. මේවායින් ලබන්නෙ බොරු තාවකාලික සතුටක්,නේ ද? මේවායේ කිසිම අර්ථයක් නැහැ. ප්‍රයෝජනයක් නැහැ. මොනවද අපි මේ බලා ඉන්න විකාර. මම කල්පනා කළේ ඇයි අපි මේ තාවකාලික දේ පස්සේ දුවන එක නවත්වලා සදහට පවතින විමුක්තියක් ගැන හිතන්නේ නැත්තේ කියලයි. යාළුවා, ඔයාටත් මොකක් හරි ප්‍රශ්නයක් තිබෙන බව පේනවා. ඔබ වැඩි සතුටක් නැතිව කල්පනා බරව හිටියේ ඇයි?" යන්නයි.

"මමත් ඔය ගැනමයි හිත හිතා හිටියේ. මටත් හිතුණා මේ මායාවෙන් මිදිලා සරු සාර දෙයක් හොයන්න ඕන කියලා." යි කෝලිත ද පිළිතුරු දුන්නේ ය.

"ඉතින් අපි දෙන්නම එකතු වෙලා විසඳුමක් හොයමු. අද ඉඳලා ලෝකයේ සැබෑ තතු ගැනත් සැබෑ ප්‍රශ්න වලට නියම විසඳුමක් ගැනත් අපි දෙන්නා ම හොයමු"යි ඔවුහු කතිකා කර ගත් හ. "මුලින් ම මොකද කරන්නේ?" එවකට රජගහ නුවර විසූ සංජය නම් පරිබ්‍රාජකයා ලග පැවිදි වන්නට ඔවුහු තීරණය කර ගත් හ. පිරිවර ජනයා අඩක් සතුන් බැඳි වාහන සමඟ නිවෙස් බලා යැවූ ඔවුහු පන්සියයක් සමඟ සංජය වෙත ගොස් පැවිදි වූ හ. ඔවුන් දෙදෙනා 500 ක් සගයන් ද සමඟ පැවිදි වීමෙන් සංජය ගේ කීර්තිය ද පැතිර ගියේ ය.

දෙදෙනා ම එක්ව ඉතා උනන්දුවෙන් සංජය ගේ දර්ශනය මැනවින් ඉගෙන ගත් හ. ඉතා ටික දිනකින් ම සංජය ගේ ඉගැන්වීම් නිම වූ වගක් ඔවුන්ට හැඟිණි. එහෙයින් ඔවුහු "ගුරුතුමනි, ඔබතුමන් ගේ සියලුම ඉගැන්වීම් මෙ පමණ ද? තවත් අපට නො ඉගැන්වූ දෙයක් තිබෙනවා දැ"යි ඔවුහු විමසූ හ.

"එපමණයි. ඔබ දැන් සේරම ඉගෙන ගෙන ඉවරයි" හේ පිළිවදන් දුන්නේ ය.

විවරණාත්මක අනුවාදය (11 ගාථාව)

අසාරෙ සාරමතිනො සාරෙ ච අසාරදස්සිනො
මිච්ඡාසඞ්කප්පගොචරා තෙ සාරං න අධිගච්ඡන්ති

අසාරෙ: හරවත් නොවන දේ; **සාරමතිනො**: හරවත් යැයි සිතන; **සාරෙ ච**: හරවත් දේ විෂයෙහි; **අසාරදස්සිනො**: නිසරු දේ යැයි සිතන; **මිච්ඡාසඞ්කප්පගොචරා**: මිථ්‍යා සංකල්පනාවන්ට ගොදුරුවූ; **තෙ**: ඔවුහු; **සාරං**: අනර්ඝ දේ; **න අධිගච්ඡන්ති**: සාධනය කර නො ගනිති.

නිසරු දේ සරු යැයි සිතමින් සාරවත් දේ නිසරු දේ යැයි පටලවා ගෙන මිථ්‍යා සංකල්පනා වලට ගොදුරු වන පුද්ගලයෝ කිසි කලෙක ජීවිතයේ උසස් අධිගම සාධනය කර නො ගනිති.



සරුදෙය සරු ලෙසත්, නිසරුදෙය නිසරු ලෙසත් නිවැරදිව දක්නාහු සාරවූ නිවන් සුව ලබත්.

12. සාරඤ්ච සාරතො ඤත්වා
අසාරඤ්ච අසාරතො
තෙ සාරං අධිගච්ඡන්ති
සම්මා සඞ්කප්ප ගොචරා

සරුදේ සරු ලෙස පිළිගෙන
නිසරු-නිසරු ලෙස දැන ගෙන
නිවැරදි සිතුවිලි වඩමින
ලබති'සාර'නුවණැති දන.

සරු දේ හඳුනත් නුවනින් පිබිදෙත්.

1 (8) සැරියුත් මුගලන් දෙනම ගේ කතාව (11-12 ගාථා) (ඉතිරි කොටස)

එහෙත් **උපතිස්ස** ගේ හා කෝලිත ගේ මූලික ගැටලු තවමත් එසේ මය. ඒවාට පිළිතුරු සොයා ගත යුතුය. "තව දුරටත් සංජය ගෙන් උගන්නට දෙයක් නැති හෙයින් අපි දඹදිව පුරා ඇවිද කෙසේ හෝ මේවාට පිළිතුරු දිය හැකි ගුරුවරයෙක් සොයා ගනිමු. මුලින් ම සත්‍යය සොයා ගන්නා තැනැත්තා අනිකාට එය පවසන අදහසින් වෙන් ව සැරිසරමු" යි ඔවුහු ගිවිස ගත් හ. ඔවුහු වෙන් වෙන් ව විවිධ ගුරුවරුන් හමු ව සාකච්ඡා කරමින් ප්‍රශ්න නගමින් අමරණීයත්වය සොයන්නට පටන් ගත් හ.

උපතිස්ස හා කෝලිත නඟන ප්‍රශ්න වලට සතුටුදායක පිළිතුරු දෙන අයෙක් නො වූ හ. ඔවුන් විමසන හැම ප්‍රශ්නයකට ම ඒ දෙදෙනා පිළිතුරු දුන් හ. එක් දිනක් උපතිස්ස ගේ ජීවිතයේ සුන්දර තම සිද්ධිය සිදු විය. ඔහුට අස්සජි හිමියන් දැකීමේ භාග්‍යය උදා විය. මෙතෙක් සෙවූ අමාව ඔහු ලද්දේ එදා ය.

අස්සජි හිමියන් ගේ ප්‍රසන්න, ශාන්ත හා ප්‍රබුද්ධ විලාසය දුටු පමණින් ම උපතිස්ස නව ජීවයක් ලද්දේ ය. "එක විදියකින් කී විට මම සියක් විදියකින් හෝ දහසක් විදියකින් තේරුම් ගන්නම්" උපතිස්ස පැවසී ය. අස්සජි හිමියෝ එවිට "යම් කිසි දෙයක් හේතු-ප්‍රත්‍ය නිසා හට ගනී නම්, ඒ හේතු-ප්‍රත්‍ය භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළහ. ඒවා නිරුද්ධ කිරීම පිළිබඳව ද උන් වහන්සේ හෙළි කළහ" යන අරුත් ඇති

"යේ ධම්මා හේතුප්පභවා-තේසං හේතුං තථාගතො ආහ තේසං ච යෝ නිරෝධො-එවං වාදි මහාසමණො"

යන ගාථාව වදාළ හ. මුල් පද දෙක ඇසෙන විට ම බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද ධර්මය දේශනා කරන බව වැටහුණු උපතිස්ස සෝවාන් ඵලය ලැබී ය. වහා ම සිය මිතුරු කෝලිත සොයා ගිය හෙතෙම සුබ පුවත පවසමින් එම ගාථාව ඔහුට කීවේ ය. ගාථාව පවසා අවසන්වත් ම කෝලිත ද සෝවාන් විය.

තමන් ලද සම්පත ගුරුවරයා සමග ද බෙදා හදා ගත යුතු යැයි සිතූ ඔවුහු බුදුන් හමුවට යන්නට සංජයට ද ආරාධනා කළ හ. "මම දිගට ම ගුරුවරයෙක් වශයෙන් ප්‍රකට ව සිටියෙමි. දැන් මේ හිටි හැටියේ ශ්‍රාවකයකු වීමට මට පිළිවන්දැ"යි පැවසූ සංජය "ඔබ කැමති නම් යන්න"යි කියා සිටියේ ය. "ගුරුතුමනි, එසේ නො කරන්න. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ වහාම දහස් ගණන් ජනයා උන්වහන්සේ වටා රොක් වෙති. අපිත් ඒ ගොඩට එක් වෙමු." යි බුද්ධිමත් ශිෂ්‍යයන් දෙදෙනා නැවත අයැද සිටි විට සංජය ඔවුන් ගෙන් මෙසේ ප්‍රශ්න කළේ ය.

"ඇවැත්නි, ලෝකයේ වැඩිපුර සිටින්නේ ඥානවන්තයෝ ද මෝඩයෝ ද?"

"ස්වාමීනි, මෝඩයෝ වැඩිපුර වෙසෙති. ඥානවන්තයෝ ඉතා ස්වල්ප වෙති." "එසේ නම්, දරුවනි, ඥානවන්තයෝ ගෝතම බුදුන් වෙත යෙත්වා! මෝඩයෝ මා වෙත එති."

එසේ කී පසු තවත් ඒ ගැන කතා කිරීම නිෂ්ඵල බව තේරුම් ගත් කෝලිත සහ උපතිස්ස භාග්‍යවතුන් වහන්සේ හමුවට යාම පිණිස පිටත් වූ හ. සංජයගේ ශ්‍රාවක පිරිසෙන් 250 දෙනෙක් ද ඒ දෙදෙනාට එක්වූ හ.

කෝලිත හා උපතිස්ස භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් පැවිදි වූ හ. සංජය පැමිණෙන්නට කැමති නො වූ බව දැනුම් දුන් විට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා යුග්මය වදාළ හ.

විවරණාත්මක අනුවාදය (12 ගාථාව)

සාරං සාරතො ච අසාරං අසාරතො ච ඤත්වා
සම්මාසඞ්කප්ප ගොචරා තෙ සාරං අධිගච්ඡන්ති

සාරං: අර්ථවත් දේ; **සාරතො ච**: අර්ථවත් වශයෙන් ද; **අසාරං**: අර්ථ ශූන්‍ය දේ; **අසාරතො ච**: අර්ථ ශූන්‍ය සේ ද; **ඤත්වා**: දැන; **සම්මා සඞ්කප්ප ගොචරා**: සම්‍යක් සංකල්පයනට ගෝචර වන; **තෙ**: (නුවණැත්තෝ) ඔවුහු; **සාරං**: හරවත් දේ; **අධිගච්ඡන්ති**: සාධනය කර ගනිති.

හරවත් දේ හරවත් දේ ලෙස පිළිගෙන නිසරු දේ නිසරු දේ බව දැන නිවැරදි සිතුවිලි වලින් සමන්විත වන පුද්ගලයෝ ජීවිතයේ අනගිතම දේ සාධනය කර ගනිති.

විවරණය

මෙම ගාථා යුග්මය සාර ධර්‍ම පිළිබඳ විචක්ෂණයෙහි වැදගත්කම අවධාරණය කරයි. සාරධර්‍ම පටලවා ගැනීම ලෝකෝත්තර සාධන සියල්ල වරදවා ගැනීමට හේතු වෙයි. අපගේ ක්‍රියා කලාපයන්හි නිරවද්‍යතාව රඳා පවතින්නේ අපගේ සාරධර්ම විචක්ෂණය මත ය. හොඳ හා නරක, දුක හා සැප ආදිය පිළිබඳ විනිශ්චයට අපගේ සාරධර්ම විචක්ෂණය බලපායි.

බොහෝ අය දුසිරිතට යොමු වන්නේ සාරධර්ම පද්ධතිය වරදවා ගැනීම හේතුවෙනි. ඔවුහු කිසි කලෙක උතුම් අධිගම නො ලබති.



භාවනාවෙහි නො වැඩුණු නුපුරුදු සිත තුළ රාගය විනිවිද යයි.

13. යථා'ගාරං දුච්ඡන්නං
වුට්ඨී සමතිවිජ්ඣති
එවං අභාවිතං චිත්තං
රාගො සමතිවිජ්ඣති (1:13)

තෙමෙයි ගෙය වැස්සට
සෙවිලි නො කළොත් මැනවින්
සිත රාගයෙන් කෙළෙසෙයි
නො වැඩුව භාවනාවෙන්

පුහුණු නො කළ සිත - රාගයෙන් වෙයි තෙත්

1 (9) නන්ද හිමියන්ගේ කථා වස්තුව (13 සහ 14 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ සැවත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සිය ඥාති සොහොයුරු **නන්ද තෙරණුවන්** ඇරබ මේ ගාථා යුග්මය වදාළ සේක.

කපිලවස්තු නුවරට ගොස් සිය පියාණන් දැක ගන්නට දැන් බුදුරදුනට සුදුසු කල් යැයි සිතූ කාළුදායි තෙරණුවෝ ගමන් මඟෙහි විසිතුරු කවි වලින් පවසමින් බුදු සමිඳුන් සපිරිවරින් කපිල වස්තු නුවරට වැඩම වූ හ. නුවර පිඬුසිඟා වඩිමින් සිටියදී සිය පියාණන්ට '**උත්තිට්ඨේ නප්පමජ්ජෙය්‍ය**' යන ගාථාවෙන් ධර්ම දේශනා කර සෝවාන් ඵලයෙහි පිහිටවූ භාග්‍යවතුන් වහන්සේ '**ධම්මං චරේ සුචරිතං**' ආදී ගාථාවෙන් ධර්ම දේශනා කර මහා ප්‍රජාපතී ගෝතමිය සෝවාන් ඵලයෙහි ද පියාණන් සකදාගාමී ඵලයෙහි ද පිහිටවූ හ.

පසු දින නන්ද කුමරුන් ගේ මංගල්‍යය තුනක් ම එකට යෙදී තිබිණ. අභිෂේකය, නව නිවසට පිවිසීම හා විවාහය ඒ තුනයි. එදින භාග්‍යවතුන් වහන්සේට දානය පිරිනමන ලද අතර මාළිගය විවෘත කිරීමේදී අභිනව මාළිගාවට පිවිසුනු උන් වහන්සේ නන්ද කුමරුට ආශීර්වාද කරමින් පාත්‍රය ඔහු අතට දුන් හ. ආපසු ගමනේදී පාත්‍රය ඔහු අතින් ආපසු නො ගෙනම පිටත් වූ හ.

"සමිඳුනි, ඔබේ පාත්‍රය ගන්නැ"යි කීම නිග්‍රහයක් සේ සිතූ නන්ද පියගැට පෙළ බසින්නට පෙර එය ගනිතැයි සිතා පසුපසින් ගියේ ය. එහෙත් එය නොවූ හෙයින් පිය ගැටපෙළ පාමුලදී ගනිතැයි සිතීය. එයත් ඉටු නො විනි. රජ වාසල මිදුලේ දී එසේ කරතැයි සිතුව ද එසේත් නොවීය. පාත්‍රය බුදුරදුන් අතට දී ඉක්මනින් සිය මනාලිය වෙත යන්නට අවශ්‍යතාව තිබුණ ද එය කියා ගන්නට අසමත්ව මෙතැන දී ගනු ඇත, මෙතැන දී ගනු ඇත යි සිතමින් දිගටම ගියේ ය.

මේ අතරතුර බුදුරදුන් නන්ද කුමරුන් විහාරස්ථානයට කැඳවා ගෙන යන බවත් එය ජනපද කල්‍යාණියට හොඳකට හිටින්නට බැරි වෙන බවත් ඇයට සැළ විය. එහෙයින් ඕ බාගෙට පීරූ කෙස් වැටිය ද ඇතිව දෑසේ කඳුළු පුරවා ගෙන දිව ගොස් "නන්ද කුමරුනි, වහා ආපසු එන්න" යි කීවා ය. ඒ වදනින් නන්ද ගේ හද කිති කැවී ගිය ද ඒ වගක් නොදන්නා මෙන් බුදුරජාණන් වහන්සේ ඔහු ජේතවනාරාමයට ම කැඳවා ගෙන ගිය හ. ජේතවනාරාමයට ගිය පසු පාත්‍රය අතට ගත් භාග්‍යවතුන් වහන්සේ "නන්ද, ඔබ මහණ වන්නට කැමතිද"යි ඇසූ හ. තමන් ඊට අකැමති වුව ද බුද්ධ ගෞරවය නිසා එසේ කියා ගන්නට අසමත් වූ නන්ද කුමරු "කැමතියි" යනුවෙන් පිළිවදන් දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු එවෙලේ ම පැවිදි කරවූ හ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ සමග ජේතවනාරාමයට ගිය නන්ද තෙරණුවෝ ටික දිනකින් ම පැවිද්දෙහි උකටලී ව සිය සබ්‍රහ්මචාරීන්ට මෙය දැන්වූ හ. "ඇවැත්නි, මම අසන්තෝෂයෙන් සිටිමි. මා පැවිදි ව සිටින නමුත් දිගින් දිගටම පැවිදි දම් පුරන්නට අසමර්ථයෙමි. එහෙයින් පැවිද්ද හැර දමා ගිහි ගෙට ආපසු යාමට කැමැත්තෙමි." ඒ ඇසූ සබ්‍රහ්මචාරී භික්ෂූහු "ඇවැත් නන්ද හිමියනි, ඔබ පැවිද්දෙහි උකටලී වන්නට හේතු කවරේ ද?" යිවිචාළ හ. "මා පැවිද්දට එන දා මගේ බිරිඳ ජනපද කල්‍යාණිය අඩක් පීරූ කෙස් ඇතිව කඳුළු වැකුණු මුහුණින් යුතුව "හිමියනි, වහා ආපසු එනු මැනැවැ"යි කීවා ය. ඒ වදන් තවමත් මා සවණෙහි රැව් පිළිරැව් දෙයි. එහෙයින් මම පැවිදි ජීවිතය කෙරේ උකටලීව සිටිමි. තවදුරටත් පැවිදිව සිටින්නට නොහැක."

නන්ද හිමියන් ගේ මේ වචන භාග්‍යවතුන් වහන්සේට දැනුම් දෙන ලදි. උන් වහන්සේ නන්ද හිමි කැඳවා ඒ සැබෑදැයි විමසා තහවුරු කර, අනතුරුව නන්ද හිමි සිය සෘද්ධි බලයෙන් තව්තිසා දෙව්ලොවට කැඳවා ගෙන ගිය හ. එසේ යන අතරමඟදී දැවී ගිය හේනක දැවුණු ගසක් මත හින්නෙන් දෙකන්, නාසා හා වලිගය ද පිළිස්සී විකෘත වූ වැඳිරියක දක්නට සැලැස්සූ හ.

විවරණාත්මක අනුවාදය (13 ගාථාව)

දුච්ඡන්නං අගාරං වුට්ඨී යථා සමතිවිජ්ඣති එවං අභාවිතං චිත්තං රාගො සමති විජ්ඣති

දුච්ඡන්නං: මනා ව සෙවිලි නො කළ; **අගාරං**: ගෙයකට; **වුට්ඨී**: වැස්ස; **යථා**: යම් සේ; **සමති විජ්ඣති**: කාන්දු වන්නේ (තෙමෙන්නේ) ද; **එවං**: ඒ ලෙසින් ම; **අභාවිතං**: භාවනා නො කළ; **චිත්තං**: සිත; **රාගො**: රාගය; **සමති විජ්ඣති**: විනිවිද යයි.

වහල මනාව සෙවිලි නො කළ ගෙයක් වැස්සට තෙමෙයි. එසේ ම භාවනාවෙන් හික්මවා නො ගත් සිත රාගයෙන් ආතුර වෙයි.



මොනවට පුරුදු කළ භාවනාවෙහි වැඩුණු සිතතුළ රාගය විනිවිද නොයේ.

14. යථා'ගාරං සුච්ඡන්නං
වුට්ඨී න සමතිවිජ්ඣති
එවං සුභාවිතං චිත්තං
රාගො න සමතිවිජ්ඣති(1:14)

නො තෙමෙයි නිවස වැස්සට
සෙවිලි කළහොත් මැනවින්
රාගයෙන් සිත නො සැලෙයි
වැඩුවොත් භාවනාවෙන්

සිත හුරු පුහුණු කර - තබනු රාගය දුරු කර

1 (9) නන්ද හිමියන් ගේ කථා වස්තුව (13-14 ගාථා) ඉතිරි කොටස

තව්තිසා දෙව්ලොවට ගිය පසු සක් දෙවිඳුන් ගේ සේවාවට පැමිණි රෝස පැහැති දෙපා ඇති දිව්‍ය අප්සරාවන් පන්සියයක් පෙන් වූ භාග්‍යවතුන් වහන්සේ "නන්ද, ඔබේ අදහසේ හැටියට වඩාත් සුරූපී යැයි ඔබට සිතෙන්නේ ජනපද කල්‍යාණිය ද නැත්නම්, මේ අප්සරාවෝ දැ"යි විමසූ හ. "ස්වාමීනි, මේ අප්සරාවන් සමග සසඳන විට ජනපද කල්‍යාණිය දෙකන්, නාසා හා වලිගය දැවී ගිය වැඳිරිය වැනි යැයි හැඟේ" යි නන්ද හිමියෝ පිළිතුරු දුන් හ.

"නන්ද, දුක් නොවන්න. ඔබ කැමති නම්, මම මේ අප්සරාවන් ගෙන් කෙනෙක් ඔබට ලබා දෙන්නම්." යි භාග්‍යවතුන් වහන්සේ පැවසූ හ. ප්‍රීතියට පත් නන්ද හිමියෝ "ඉතින් භාග්‍යවතුන් වහන්සේ මට ඒ ගැන සහතික වෙනවා නම් මම ඉතා කැමැත්තෙන් පැවිදි දම් පුරන්නෙමි"යි පැවසූ හ.

එදා පටන් නන්ද හිමියෝ ඉතා කැමැත්තෙන්, මහත් අභිරුචියෙන් වීර්‍ය්‍ය වඩමින්, භාවනානුයෝගී බවින් පැවිදි දම් පිරූ හ. අනෙකුත් භික්ෂූන් වහන්සේ නන්ද තෙර දෙවඟනුන් පතා මහණදම් පුරතියි විහිළු තහළු කළ ද නන්ද හිමියෝ දිගට ම වීර්‍ය්‍ය වැඩූ හ. මේ විධිමත් පැවිදි දම් පිරීමේ ප්‍රතිඵලය වූයේ නන්ද හිමියන් නොබෝ කලකින් ම රහත් ඵලය ලැබීමයි.රහත්ඵලය ලත් දින රැයෙහි බුදු සමිඳුන් දක්නට ගිය නන්ද රහතන් වහන්සේ "ස්වාමීනි, මට රෝස පැහැති පා ඇති අප්සරාවන් ලබා දෙන්නට වූ පොරොන්දුවෙන් ඔබ වහන්සේ මුදවන්නට ආමි"යි පැවසූ හ. "නන්ද මම ඔබේ සිත විනිවිද දැක එය පසක් කළෙමි" යි වදාළ හ. නන්ද ඔබ ඒ දිනවල කීවේ "මම අසන්තෝෂයෙන් සිටිමි, මම ගිහිගෙට ආපසු යමි" කියා ය. දැන් ඔබ එසේ නො කියන්නේ ඇයි දැයි විමසූ භික්ෂූහු උන් වහන්සේ රහත් වූ බව ගැන සාකච්ඡා කළ හ. බුදුරජාණන් වහන්සේ උන් වහන්සේලා ගේ කතා බහ දැන ගෙන ඒ නිමිත්තෙන් මේ ගාථා දෙක දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (14 ගාථාව)

සුච්ඡන්නං අගාරං වුට්ඨී යථා න සමති විජ්ඣති එවං සුභාවිතං චිත්තං රාගො න සමති විජ්ඣති

සුච්ඡන්නං: මනාව සෙවිලි කළ; **අගාරං**: ගෙයකට; **වුට්ඨී**: වැස්ස; **යථා**: යම් සේ; **න සමති විජ්ඣති**: කාන්දු නො වන්නේ ද; **එවං**: ඒ ලෙසින් ම; **සුභාවිතං**: භාවනාවෙන් සංවර්ධිත; **චිත්තං**: සිත; **රාගො**: රාගය; **න සමති විජ්ඣති**: විනිවිද නො යයි.

ගෙයක් මැනවින් සෙවිලි කර ඇත්නම් එය වැස්සට නො තෙමෙයි. එමෙන්ම සිත මනාව භාවනාවෙන් වර්ධනය කළ විට රාගය එයට නො පිවිසෙයි.

විවරණය

මේ ගාථා යුග්මය චිත්ත සංවර්ධනය හා සම්බන්ධය. බුදු දහමෙහි 'චිත්ත' හෙවත් මනස පැරණි බටහිර මනෝ විද්‍යාඥයන් මෙන් කය සමග නිරපේක්ෂ පදාර්ථයක් ලෙස දක්වා නො මැත.

'භාවනා' නම් බුදු සමයෙහි එන මානසික ශික්ෂණය හෙවත් මානසික හැදියාවයි. රාගයෙන් පරිජිත වන්නේ එසේ ශික්ෂණය නො කළ අදාන්ත සිතය.



පව් කළ තැනැත්තා මෙ ලොව හා පරලොව සෝකවෙයි. තමන් කළ පව් කම් දැක දුක්වෙයි.

15. ඉධ සොචති පෙච්ච සොචති
පාපකාරි උභයත්ථ සොචති
සො සොචති සො විහඤ්ඤති
දිස්වා කම්මකිලිට්ඨම'ත්තනො (1:15)

තැවෙයි එලොවත්-තැවෙයි මෙලොවත්
පවුකාරයා තැවෙයි දෙලොව ම
දුක් වේ ය වැලපේ ය පවුකරු
මෙනෙහි කර කළ පාප කර්‍මය

අම්හිරිය පවු පල

1 (10) චුන්ද සූකරිකයා ගේ කථාව (15 ගාථාව)

බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් **චුන්ද සූකරිකයා** අරමුණු කොට මේ ගාථාද්වය වදාළ හ.

භාග්‍යතුන් වහන්සේ වැඩ විසූ ආරාමයට යාබදව වාසය කළ ද චුන්ද කිසි දිනෙක විහාරස්ථානයට නො පැමිනියේ ය. භාග්‍යවතුන් වහන්සේට ගරු සත්කාර නො කළේ ය. එක් බත් හැන්දක් වත් පිණ්ඩපාතයකට නො බෙදී ය. සැකෙවින් කිවහොත් පිනක් යැයි කිවහැකි කිසි ම දෙයක් නො කළේ ය.

මුළු ජීවිත කාලය ම චුන්ද කළේ ඌරන් මැරීම ය. පණපිටින් සිටිය දී ම ඌරන්ට පොලුවලින් තළයි. ඒ මස් ඉදිමීම සඳහා ය. ඉන්පසු කට ඇර නටන උණු වතුර වත් කරයි. ඒ කුස පිරිසිදු කිරීමට ය. අනතුරුව ගිනි හුලකින් ඇඟෙහි රෝම සියල්ල පුළුස්සයි. මේ සියල්ල කරන විට ඌරා අමුතුවෙන් මරන්නට දෙයක් නැත. මර හඬ දෙමින් වේදනාවෙන් දුක් විඳින සතා ඉබේ ම මැරෙයි.

දිගින් දිගට ම මෙම කුරිරු ප්‍රාණවධය කළ චුන්ද මරණාසන්න සමයෙහි වියරු වැටුණෝ ය. ඌරකු මෙන් ගොරවමින් හතර ගාතෙන් දුවමින් මළ පහ කර අනුභව කරමින් දැඟලූ ඔහු හික්මවන්නට කිසිවෙක් සමත් නො වූ හ. ගෙයින් පිට යන්නට බැරි වන සේ දොරගුළු දැමීම හැර වෙන කිසිවක් කළ නො හැකි විය. තම කර්මානුරූපව දැඩි දුක් විඳි හෙතෙම සත් දිනක් "අවීචි මහ නරකාදි දුක" මෙලොව ම විඳින්නාක් සේ දුක් විඳ මිය ගියේ ය. සත් දිනම දොර වසා තිබුණ ද චුන්ද ඌරකු සේ මරහඬ දුන් හෙයින් බොහෝ අය සිතුවේ ඔහු දින හතක් ම දිවා රෑ ඌරන් මැරූ බව ය.

භාග්‍යවතුන් වහන්සේ හමුවට ගිය භික්ෂූන් වහන්සේ කීප නමක් "ස්වාමීනි, චුන්ද ගෙයි දොර වසා ගෙන දිගින් දිගට ම ඌරන් මරයි. නියතයෙන් ම ඔහු ලොකු සාදයකට සූදානම් වෙනවා විය හැක. මේ තරම් කුරිරු මස් වැද්දෙක් නම් මීට පෙර ඉන්නට නැතිව ඇත"යි පැවසූ හ. "මහණෙනි, මේ සත් දින පුරා ඔහු ඌරන් මරනවා නො වෙයි. ඔහු ගේ අකුසල විපාකය විඳිනවා. පණ පිටින් ම නිරා දුක් විඳිනවා. ඌරකු සේ මරහඬ තළමින් ගේ පුරා එහි මෙහි දුවන නිසා ගෙයි දොර වහන්නට සිදු වුණා. අද ඔහු මිය ගොස් නරකයෙහි උපන්නා"යි බුදුරජාණන් වහන්සේ පැහැදිලි කළ හ. "ස්වාමීනි, ඔහු මෙලොවත් දුක් විඳ පරලොවත් දුකට ම පත් වුණා"යි භික්ෂූන් වහන්සේලා පැවසූ විට තථාගතයන් වහන්සේ මේ ගාථාව වදාළ හ.

විවරණාත්මක අනුවාදය (15 ගාථාව)

පාපකාරී ඉධ සොචති පෙච්ච සොචති උභයත්ථ සොචති
සො අත්තනො කිලිට්ඨං කම්මං දිස්වා සොචති සො
විහඤ්ඤති

පාපකාරී: පවු කාරයා; **ඉධ**: මෙලොව දී; **සොචති**: ශෝක කරයි; **පෙච්ච**: පරලොව ද; **සොචති**: ශෝක කරයි; **උභයත්ථ**: දෙලොවදී ම; **සොචති**: ශෝක කරයි; **සො**: හෙතෙම; **අත්තනො**: තමා ගේ; **කිලිට්ඨං කම්මං**: පාප කර්මය; **දිස්වා**: දැක; **සොචති**: ශෝක කරයි; **සො**: හෙතෙම; **විහඤ්ඤති**: ඛේදයට පත් වෙයි.

පවු කරන තැනැත්තා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවදී ම ශෝක කරයි. තමා කළ පාප කර්මයන් දැක ශෝක කරයි, පසුතැවෙයි.

විවරණය

අකුසල් කරන පුද්ගලයෝ එම කර්ම කරන අවස්ථාවේ දී එයින් තමන්ට විඳින්නට වෙන විපාක පිළිබඳව නො සිතති. එහෙත් මෙලොව දී ම විපාක විඳින විට ශෝක කරන්නට සිදු වේ. මෙලොව දී මෙන් ම පරලොව දී ද අකුසලයෙහි විපාක විඳින්නට සිදු වේ.

මෙයින් අදහස් වන්නේ සියළුම කර්ම අනිවාර්යයෙන් ම විපාක විඳිය යුතු බව නො වේ. ආගමික විවරණය අර්ථවත් වන්නට නම් කර්මය පරාජය කරන ක්‍රමයක් තිබිය යුතු ය. එහෙයින් බෞද්ධ ශික්ෂණය තුළ කම්මනිරෝධගාමිනී ප්‍රතිපදාවක් ද ඇතුළත් වෙයි. කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හුදෙක් 'එකට-එක' මෙන් සරල වූවක් නොව කර්මයන්හි ගුණාත්මක විචිත්‍රත්වය, පුද්ගල විවිධත්වය හේතු-ප්‍රත්‍ය ධර්මයෙහි ස්වභාවය ආදී හැම දේ සැලකිල්ලට ගෙන තේරුම් ගත යුතු සංකීර්ණ විෂයකි.

බුදුසමය ජීවිතය පුළුල් දෘෂ්ටියකින් විවරණය කරන දහමකි. එය එක් භවයකින් සියල්ල නිම වෙතියි නො පිළිගනියි. සත්ත්වයා දීර්ඝ වූ සංසාරයේ සිය කර්මානුරූපව උසස්-පහත් වෙමින් සැප හා දුක විඳිමින් සැරිසරති. එතකුදු වුවත් ඒ සියල්ල සිදුවන්නේ නිත්‍ය වූ අවිනශ්වර වූ ආත්මයකින් තොරව ය. එහෙයින් අනන්‍යතාවකින් තොර අවිච්ඡේදතාවක් තහවුරු කරමින් 'න ච සො න ච අඤ්ඤො' යන ප්‍රකාශය අර්ථකථාචාර්යවරු දක්වති.





කුසල් කළ තැනැත්තා මෙලොව හා පරලොව බොහෝ සේ සතුටු වෙයි.

16. ඉධ මොදති පෙච්ච මොදති
කත පුඤ්ඤො උභයත්ථ මොදති
සො මොදති සෝ පමොදති
දිස්වා කම්ම විසුද්ධි මත්තනො (1.16)

මෙලොවත් තුටුවෙති එලොවත් තුටුවෙති
පින් කළ උදවිය දෙලොව ම තුටුවෙති
වැඩියෙන් තුටුවෙති සතුටින් ඉපිලෙති
කළ පිරිසිදු පින් දැක දැක සැනසෙති

කළ හොඳ දේ සැප ගෙන දේ

1 (11) ධම්මික උපාසකයා ගේ කතා පුවත (16 වන ගාථාව)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව **ධම්මික උපාසක** තැන නිමිති කොට දේශනා කළ සේක.

සැවැත් නුවර ධම්මික නැමැති ගෘහස්ථ ශ්‍රාවකයෙක් වාසය කළේ ය. නමට ම ගැලපෙන ධාර්මික ජීවිතයක් ගත කළ හෙතෙම දන් දීමෙහි මහත් රුචියක් දැක්වී ය. බුද්ධ ප්‍රමුඛ සංඝයා වහන්සේට නිතර නිතර දන් දුන් අතර විශේෂ දිනවල මහ දන් පැවැත්වී ය. බුදුරජාණන් වහන්සේ ගේ මහා දායකයන් පන්සියයෙන් එක් අයෙක් වූ හෙතෙම පුතුන් හත් දෙනෙකු ගේ සහ දූවරුන් හත් දෙනෙකු ගේ පියෙක් වූයේ ය. දරුවෝ ද පියා මෙන් ම දහම් මඟ ගමන් කළ සැදැහැතියෝ වූ හ.

වරක් හොඳටම ගිලන් වූ ධම්මික මහ සඟ රුවන වැඩමවා පිරිත් සජ්ඣායනා කරවන සේ ඉල්ලා සිටියේ ය. භික්ෂූන් වහන්සේ වැඩම කොට, ඇඳෙහි වැතිර සිටි ඔහු අබිමුව වැඩ හිඳුවා, මහා සතිපට්ඨාන සූත්‍රය සජ්ඣායනා කරන අතරතුර දෙව් ලෝ හයෙන් සැරසූ දිව්‍ය වාහන හයක් ඔහු තම තම දෙව් ලෝ වලට කැඳවා ගෙන යනු පිණිස පැමිණිය හ. ඔවුන් දුටු ධම්මික පිරිත් නිම වන තුරු මඳක් නවතින්නැයි සංඥා කළේ ය. එහෙත් ඒ සංඥාව පිරිත නවත්වන්නැයි කළ සංඥාවක් සේ තේරුම් ගත් භික්ෂූන් වහන්සේ පිරිත නවතා පිටත් ව ගිය හ.

අනතුරුව තමන් කැඳවා ගෙන යාමට සදෙව් ලොවින් රිය හයක් පැමිණ ඇති බව ධම්මික උපාසක තෙම තම දරුවන්ට පැවසී ය. තුසිත දෙව්ලොවින් පැමිණි රථය තෝරා ගත් හෙතෙම මල් දමක් එය තිබෙන තැන අහසට දමන්නැයි දරුවන්ට උපදෙස් දුන්නේ ය. ඒ අනුව දරුවෝ මල් දමක් ගුවනට විසි කළ හ. එය ගුවනෙහි වූ දිව්‍ය රථයෙහි රැඳිණි. මල් දම ගුවනෙහි රැඳී තිබෙනු එහි රැස්ව සිටි හැම දෙනාටම පෙනිණි. එහෙත් රථය නො පෙනිණි. "ඔබට මල් දම පෙනෙනවා නො වේ ද"යි විමසූ ධම්මික තම දරුවන් අමතා එය රැඳී ඇත්තේ තුසිත දෙව් ලොවින් පැමිණි රථයේ බවත් තමන් තුසිත දිව්‍ය ලෝකයේ උපදනා බවත් පවසා, ඔබ මා සමඟ උපදින්නට කැමති නම් මා කළාක් මෙන් පින් දහම් කරන්නැ"යි අවවාද කළේ ය. අනතුරුව දෙනෙත් පියා ගත් හෙතෙම මිය ගොස් තුසිත දෙව් ලොව උපන්නේ ය.

භික්ෂූන් වහන්සේ නැවත විහාරස්ථානයට පැමිණි විට "මහණෙනි, ධම්මික පිරිත් සජ්ඣායනයට සවන් දුන්නා දැ"යි භාග්‍යවතුන් වහන්සේ විමසූ හ. "එසේ ය. ස්වාමීනි, එහෙත් සජ්ඣායනය මැද දී හෙතෙම 'නවතින්න, නවතින්න' යි කියා සංඥා කර අප නවතා ලීය.

එවිට දූ දරුවන් වැලපෙන්නට වූ හෙයින් අපි සජ්ඣායනය නවතා ආපසු ආවෙමු"යි ඔවුහු පිළිවදන් දුන් හ. "මහණෙනි, ධම්මික කතා කළේ ඔබ සමග නොවේ. දෙව් ලොව හයේ දෙව්වරු දිව්‍ය රථ හයක් සරසා ගෙන ඔහු කැඳවා ගෙන යාම සඳහා පැමිණ සිටිය හ. ඔහු නවතින්නට යැයි කීවේ ඔවුන්ට ය. ධර්ම ශ්‍රවණය නිමවන තුරු සිටින්නැයි ඔවුන්ට කළ සංඥාව ය." "සැබෑ ද ස්වාමීනි?" "එසේ ය මහණෙනි, ඒ සැබෑ ය." "දැන් ඔහු උපන්නේ කොහිද, ස්වාමීනි?" "මහණෙනි, ධම්මික තුසිත දිව්‍ය ලෝකයෙහි උපන්නේ ය."

"ස්වාමීනි, ධම්මික මේ ඊයේ පෙරේදා වන තුරුම මහත් ප්‍රීතියෙන් මෙහි සිටියේ ය. දැන් හෙතෙම මිය ගොස් දෙව්ලොව මහත් සතුටින් සිටින බව ඔබ වහන්සේ ගෙන් දැන ගතිමු." භික්ෂූන් වහන්සේලා එසේ පැවසූ විට "එසේ ය මහණෙනි. අප්‍රමාදී, කුසල් කරන පුද්ගලයෝ මෙලොවත් ප්‍රීතියෙන් සිටිති. පරලොවත් ප්‍රීතියෙන් සිටිති." යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව ද දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (16 ගාථාව)

කත පුඤ්ඤො ඉධ මොදති, පෙච්ච මොදති, උභයත්ථ මොදති, සො අත්තනෝ කම්ම විසුද්ධිං දිස්වා මොදති සො පමොදති

කත පුඤ්ඤො: පින් කළ තැනැත්තා; **ඉධ**: මෙලොවත්; **මොදති**: සතුටු වෙයි; **පෙච්ච**: පරලොව ද; **මොදති**: සතුටු වෙයි; **උභයත්ථ මොදති**: දෙලොව ම සතුටු වෙයි; **සො**: හෙතෙම; **අත්තනො**: තමා ගේ; **කම්ම විසුද්ධිං**: ක්‍රියාවෙහි පිරිසිදුකම; **දිස්වා**: දැක; **මොදති**: සතුටු වෙයි; **සො**: හෙතෙම; **පමොදති**: අතිශයින් සතුටු වෙයි.

පින් කළ තැනැත්තා මෙලොවත් සතුටු වෙයි. පරලොවත් සතුටු වෙයි. දෙලොවම සතුටු වෙයි. තමා ගේ ක්‍රියාවෙහි පවිත්‍රත්වය (කර්ම විශුද්ධිය) ගැන සිතා සතුටු වෙයි. අතිශයින් ම සතුටට පත් වෙයි.

විවරණය

කත පුඤ්ඤො: නම් පින් කර ගත් තැනැත්තා ය. ජීවිත කාලය පුරා යහපත් ක්‍රියාවන් හේතු කොට ගෙන කුසල් රැස් වේ. යමකු පරලොව යනවිට ගෙන යන එකම දේ කුසල් හා අකුසල් හෙයින් කුසල් කර ගෙන ඇතහොත් ඒ ගැන සිතා ප්‍රීති විය හැකිය. තම මතු ජන්මය අනිවාර්යයෙන්ම ප්‍රසන්න වන බව ඔහුට සිතා ගත හැකි වේ. යහපත් චුති චිත්තයකින් මිය ගිය විට ඊළඟ ජන්මය නියත වශයෙන් ම යහපත් වෙයි.

පව් කළ තැනැත්තා මෙලොවත් තැවී පරලොවත් දුක් විඳ බොහෝ සේ තැවෙයි.

17. ඉධ තප්පති පෙච්ච තප්පති
පාපකාරී උභයත්ථ තප්පති
පාපං මෙ කතං'ති තප්පති
භිය්‍යො තප්පති දුග්ගතිං ගතො (1.17)

මෙලොවත් -පරලොවත් තැවෙයි
පවුකරු දෙලොව දී ම තැවෙයි
පවු කළෙමැයි සිතා තැවෙයි
අපාගතව තවත් තැවෙයි

කළෝතින් පාපය - සිදුවෙයි පසුව තාපය

1 (12) දෙව්දත් තෙරුන්ගේ කතා පුවතක් (17 වන ගාථාව)

බුදුරජාණන් වහන්සේ සැවත් නුවර ජේතවන විහාරයෙහි වැඩ වසන සේක් **දේවදත්ත ස්ථවිරයන්** වහන්සේ අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

බුදුරජාණන් වහන්සේ සමග ම කොසඹෑ නුවර එකට වාසය කල සමයෙහි උන් වහන්සේට සැදැහැවතුන් ගේ වැඩි ගෞරවාදර හා පුද සත්කාර ලැබෙන ආකාරය දුටු දෙව්දත් තෙරණුවන් ගේ සිත් තුල ඊෂ්‍ර්‍යාවක් හට ගත්තේ ය. තමන් සංඝ නායකත්වය ලද හොත් මේ ගරු සැලකිලි තමන් වෙත හරවා ගත හැකි බව සිතූ තෙරණුවෝ දිනක් බුදුරදුන් වේළුවනාරාමයෙහි දම් දෙසමින් සිටිය දී උන් වහන්සේ කරා එළඹ "ඔබ වහන්සේ දැන් මහලුයි. ඒ නිසා සංඝයා ගේ පාලනය මට පවරා නිවාඩු ගන්න"යි ආරාධනය කළ හ. එහෙත් දේවදත්ත ස්ථවිරයන් ගේ සැබෑ තතු දන්නා හෙයින් එයට එකඟ නො වූ බුදුරජාණන් වහන්සේ "දෙව්දත් ඔබ එවැනි පදවියකට කිසි සේත් ම සුදුසු නැතැ"යි පවසමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ.

එදා පටන් දෙව්දත් බුදුරදුන් කෙරෙහි වෛර බැඳ ගත්තේ ය. තුන් වතාවක් ම උන් වහන්සේ ඝාතනයට අසාර්ථක උත්සාහයන් දැරී ය. වරක් දුනුවායන් යෙදැවී ය. අනතුරුව ගිජුකුළු පව්ව මත සිට ගල් පෙරැළී ය. තුන්වන වතාවේ නාලාගිරි ඇතා මෙහෙයැවී ය. එහෙත් මේ තුන්වර ම ඔහු ගේ අදහස ඉටු නො වීය. දුනුවායෝ බුදුන් නසනු වෙනුවට ශ්‍රාවකත්වයට පත් වූ හ. පෙරැළූ ගල වළකනු පිණිස ගලක් ඉදිරිපත් විය. එයින් ගැළවුණු කුඩා පතුරක් බුදුරදුන් ගේ පයෙහි කුඩා තුවාලයක් කළ ද බරපතල හානියක් නො වී ය. නාලාගිරි ඇතා ද බුදුරදුන්ට දමනය විය. මේ සියල්ලෙනුදු දුර්මුඛ නො වූ දේවදත්ත සංඝ භේදයක් කරන්නට ඉටා ගත්තේ ය. අලුත පැවිදි වූ භික්ෂු පිරිසක් රවටා බුදුරදුන් ගෙන් වෙන් කර ගෙන ගයා ශීර්ෂයට ගිය හෙතෙම ප්‍රතිපක්ෂයක් ගොඩ නඟා ගත්තේ ය. එහෙත් එහි ගිය සැරියුත් මුගලන් දෙනම විසින් එයින් වැඩි පිරිස ආපසු කැඳවා ගෙන එන ලදි.

අන්තිමේ දෙව්දත් බලවත් ලෙස රෝගාතුර විය. නවමසක් ම රෝගයෙන් දුක් විඳ දුර්වල වූ හෙතෙම භාග්‍යවතුන් වහන්සේ දකින්නට කැමැත්ත පළ කළේ ය. එහෙත් ඔහු ගේ ශ්‍රාවකයෝ මෙසේ කී හ. " ඔබ හොඳ සුවයෙන් පසු වෙත් දී බුදුරදුන්ට එරෙහිව ක්‍රියා කළෙහි ය. දැන් අපි ඔබ උන්වහන්සේ වෙත රැගෙන නො යමු." එහෙත් බුදුරදුන් දකින්නට රිසි වූ දෙව්දත් "මා විනාස නො කරන්න. මා බුදුන්ට වෛර කළ බව සැබවි. එහෙත් උන් වහන්සේ ගේ සිත් තුළ මා කෙරේ කෙස් ගසක තරම් වත් වෛර මාත්‍රයක් නො මැත." යි ප්‍රකාශ කළේ ය. එය සැබවි. බුදුරදුන් ගේ සිත් තුළ කිසි ද සතුරකුට වෛර මාත්‍රයක් නො වී ය. ඔවුහු දෙව්දත් රැගෙන භාග්‍යවතුන් වහන්සේ දකින්නට පැමිණිය හ. එහෙත් අවාසනාවට දෙව්දත් තමන් රැගෙන ආ දෝලාවෙන් බසින්නට බිමට පා තබත් ම පොළොවෙහි ගිලී ගියේ ය. ඔහු කෙළින්ම අවීචි මහා නරකාදියෙහි උපන් බව කියැවෙයි.

විවරණාත්මක අනුවාදය (17 ගාථාව)

පාපකාරී ඉධ තප්පති පෙච්ච තප්පති උභයත්ථ තප්පති මෙ පාපං කතං ඉති තප්පති දුග්ගතිං ගතො භියෝ‍යා තප්පති

පාපකාරී: පවු කරන තැනැත්තා; **ඉධ**: මෙලොව දී; **තප්පති**: තැවෙයි; **පෙච්ච**: පරලොවත්; **තප්පති**: තැවෙයි; **උභයත්ථ**: දෙලොව ම; **තප්පති**: තැවෙයි; **මෙ**: මා විසින්; **පාපං**: පාප කර්මයක්; **කතං ඉති**: කරන ලදැයි; **තප්පති**: තැවෙයි; **දුග්ගතිං**: නිරයට; **ගතො**: ගියේ; **භියෝ‍යා**: වැඩියෙන්; **තප්පති**: තැවෙයි.

පවු කරන තැනැත්තා මෙලොවත් තැවෙයි. පරලොවත් තැවෙයි. මම පාපයක් කළෙමියි සිතමින් තැවෙයි. අපායට ගිය පසු වඩාත් තැවෙයි.

විවරණය

මෙහි දී තැවීම යන්නෙන් වැරදි වැඩ කරන පුද්ගලයන් තුළ ඇතිවන පසු තැවීම අදහස් වෙයි. තප්පති යන පාලි වචනයෙහි දැවෙයි, පිළිස්සෙයි යන අරුත තිබේ. වරදක් කරන අවස්ථායෙහි හරි වැරදි ගැන කල්පනා නො කළ ද පසුව තම ක්‍රියාවෙහි බරපතල කම වැටහෙන විට, තමාට තමා ම චෝදනා කරන විට, ඇතිවන හැඟීම තමාට ම දැවිල්ලක් වැනි ය. දෙව්දත් තම පවුකම් මෙනෙහි කොට දැවුණෝ ඒ අනුව ය. සමහර කර්මවල විපාක දිට්ඨධම්ම වශයෙන් පැමිණීම ද මීට ම ඇතුළත් ය.

පරලොව තැවෙන්නේ කර්ම විපාක විඳින විට ය. අන්ත දුක්ඛිත ස්ථාන වූ දුගති වල උපන් විට අනේක විධ වේදනා කම් කටොළු වලට පාත්‍ර වන්නට සිදු වෙයි. එහෙයින් තම පවු නිසා මෙසේ දුක් විඳිතැයි තැවෙන්නට පවුකරුට සිදු වෙයි.

දෙව්දත් ගේ මතු අනාගතය ගැන බොහෝ අය ප්‍රශ්න නඟති. ථෙරවාද අටුවාවල සඳහන් වන්නේ ඔහු අනාගතයෙහි යම් දිනක අට්ඨිස්සර නමින් පසේ බුදු කෙනෙකුන් වී නිවන් දක්නා බව ය. ගිහි ව සිටියා නම් දෙව්දත් වැනසෙන බව දුටු හෙයින් භාග්‍යවතුන් වහන්සේ ඔහු පැවිදි කළ බවත්, කෙතරම් පවු කළත් පැවිදි ව විසූ හෙයින් අනාගත අපේක්ෂාවක් තැබිය හැකි තත්ත්වයක් ඇති වූ බවත් කියා ඇත. මහායානික ග්‍රන්ථ වල සඳහන් වන්නේ ඔහු බුදුරජාණන් වහන්සේ ගේ ඉවසීමේ හා සමාව දීමේ ගුණය ලෝකයාට ප්‍රකට කිරීමට උපකාරයක් වූ බව ය. අනාගතයේ යම් දිනෙක දෙව්දත් දේවරාජ නමින් බුදු වන බව ද එහි දැක්වෙයි.

පින්කළ තැනැත්තා මෙලොවත් සතුටු ව, පරලොව සුගතියට පැමිණ, බොහෝ සේ සතුටු වෙයි.

18. ඉධ නන්දති පෙච්ච නන්දති
කතපුඤ්ඤො උභයත්ථ නන්දති
පුඤ්ඤං මෙ කතං ති නන්දති
භිය්‍යො නන්දති සුග්ගතිං ගතො (1.18)

මෙලොවත් තුටුවෙයි-එලොවත් තුටු වෙයි
දෙලොව ම තුටු වෙයි-කළ පින් ඇති අය
සිහි කොට තුටු වෙයි-පිනක් කළෙමි යයි
වැඩියත් තුටු වෙයි-ඉපිදී දෙව් ලොව

කළ කළ පින - පිනවයි මන

1 (13) සුමනා දේවිය ගේ කතාව (18 වන ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් අනේපිඬු සිටාණන් ගේ බාල ම දියණිය වූ **සුමනා දේවිය** ඇරබ මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවර අනාථපිණ්ඩික සිටුවරයාණන් ගේ නිවසෙහි දිනපතා පන්සියයක් නමකට දන් පිරිනැමෙයි. විසාඛා උපාසිකාව ගේ නිවසෙහි ද පන්සියයක් නමකට දන් පිරිනැමෙයි. අනේපිඬු සිටුතුමා විසින් මේ දෛනික මහා දානමය පුණ්‍ය කර්මයෙහි කාර්ය සංවිධානය සිය වැඩිමහල් දියණිය වූ මහා සුභද්‍රාවනට පවරා තිබිණ. ඇය විවාහ වී ස්වාමියා ගේ නිවසෙහි වාසයට ගිය පසු ඒ කටයුතු චූල සුභද්‍රාවනට පවරණ ලදි. ඕ ද පසු කලෙක විවාහ ව ස්වාමියා ගේ නිවසෙහි වාසයට ගියා ය. ඒ දෙදෙනා ම විවාහ වන විට සෝවාන් ව සිටිය හ.

වැඩිමහල් දියණියන් විවාහ වී ගිය පසු මේ කාර්යභාරය බාල ම දියණිය වූ සුමනා දේවියට පැවරිණි. ඕ ද බණ අසා සෝවාන් වූවා ය. විවාහය ප්‍රිය නො වූ ඕ අවිවාහකව ම සංඝෝපස්ථාන කටයුතු කරමින් පියාණන් ගේ නිවසෙහි ම වාසය කළා ය. පින්කම් සංවිධානයෙහි ම නිරතව විසූ හෙයින් ඕ ඉතා සතුටින් සියල්ලන් හා ප්‍රිය වාදී ව ප්‍රීතියෙන් හා සැහැල්ලු සිතින් කල්ගත කළා ය.

මේ අතරතුර සුමනා දේවී හදිස්සියේ ම බරපතල ලෙස ගිලන් වූවා ය. ඇය සුව වන බවක් නො පෙනිණ. එක් දිනක් හදිසියේ ම ඕ පියාණන් තමන් වෙත කැඳවූවා ය. අනාථ පිණ්ඩික සිටුතුමා ද දියණිය බරපතල සේ රෝගාතුර හෙයින් වහා ඇය වෙත දිව අවුත් "ඇයි දියණියෙනි, මා හදිසියේ ම කැඳවූයේ?" යි ප්‍රශ්න කළේ ය. "මලණුවෙනි, ඔබ කුමක් ද විමසුයේ?" යි සුමනා දේවී ප්‍රශ්න කළා ය. තමන්ට තම දියණිය 'මලණුවෙනි' යි ඇමතීම ගැන විමතියට පත් සිටු තෙම "දියණියෙනි, ඔබේ කතාව අමුතු ය. ඔබ ගේ සිහිය අවුල් වූ බවක් පෙනේ." යි පැවසී ය. "නැත බාල සොහොයුරාණනි, මම සිහි ඇතිව කතා කරමියි සුමනා දේවී පිළිතුරු දුන්නා ය. " දියණියෙනි, ඔබට බයක් දැනෙනවා ද?" යි සිටුතුමා යළි විමසූ විට "නැත මලණුවනි, මට බයක් නො දැනේ" යි පවසා සඳහටම දෙනෙත් පියා ගත්තා ය.

සෝවාන් ඵලයට පත් ව සිටියා වුව ද සිටුතුමා ට ඉන් ඇති වූ ශෝකය විඳ දරා ගත නො හැකි තරම් විය. අවමංගල චාරිත්‍ර නිම වූ වහා ම හැඬූ කඳුලෙන් බුදුරදුන් දකින්නට ගිය හෙතෙම "ස්වාමීනි, මගේ දියණිය සුමනා දේවී මියගියා"යි වැලපෙන්නට පටන් ගත්තේ ය. ඔහු අස්වසමින් භාග්‍යවතුන් වහන්සේ "සිටුතුමනි, මරණය සියල්ලන්ට ම උරුම බව ඔබ නො දන්නේදැ"යි විමසූ හ. එහෙත් මට විඳ දරා ගත නො හැක්කේ මෙ තරම් නුවණැතිව සංවරව සිටි මගේ දියණිය අවසන් මොහොතේ උමතුවෙන් දොඩවා මිය යාම ය" යි හෙතෙම සැල කර සිටියේ ය. "මොනවා ද, ඔබේ බාල දියණිය දෙඩවූයේ?" යි භාග්‍යවතුන් වහන්සේ විමසූ හ. "ස්වාමීනි, මා ඇයට දියණියනි යි ඇමතූ විට ඕ මට 'බාල මලණුවෙනි' යි කතා කළා." යි පැවසූ සිටුතෙම තමන් හා දියණිය අතර වූ සංවාදය මුළුමනින් ම බුදුරදුන්ට සැලකර සිටියේ ය. "සිටුවරය, ඔබේ දියණිය මිය ගියේ සිහි විකල්ව නො වේ. ඇය සිහි විකල්ලෙන් දෙඩවූයේ නැත." "එසේ නම් ඇය මට මලණුවෙනි යි ඇමතුවේ කවර හෙයින් ද ස්වාමීනි?" "ඇත්තට ම සිටුතුමනි, ඔබ ඇය ගේ මලණු කෙනෙකි. ඔබ ලබා ඇත්තේ සෝවාන් ඵලය පමණි. සුමනා දේවී සකෘදාගාමීව සිටියා ය." "එය ද ස්වාමීනි හේතුව?" "එසේ ය සිටුවරය, ඇය ඔබට බාල සොහොයුරායැයි ඇමතුවේ ඒ නිසා ය."

අනතුරුව තම දියණිය ගේ නව ජන්මය ගැන දැන ගන්නට සිටුතුමාට අවශ්‍ය විය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස මගේ දියණිය මරණින් පසු උපන්නේ කොහි ද?" "ඔබේ දියණිය දැන් තුසිත දෙව්ලොව ඉපිද සිටින්නී ය." "ස්වාමීනි මගේ දුව මනුලොව සිටිය දී කාගේත් සිත් ගනිමින් ප්‍රසන්න පැවතුම් ඇතිව මහත් ප්‍රීතියෙන් සිටියා ය. දැන් ඕ මිය ගිය පසු පරලොව ද මහත් සොම්නසින් සිටින බව දැන ගතිමි." යි සිටුතුමා උදම් වූ විට බුදුරජාණන් වහන්සේ "සිටුතුමනි, එය සැබෑවක් ම යැ" යි වදාරා මේ ගාථාව ද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (18 ගාථාව)

> **කතපුඤ්ඤො ඉධ නන්දති පෙච්ච නන්දති උභයත්ථ නන්දති මේ පුඤ්ඤං කතං ඉති නන්දති සුග්ගතිං ගතො භිය්‍යො නන්දති**

> **කතපුඤ්ඤො**: පින් දහම් කළ තැනැත්තා; **ඉධ**: මෙලොවදී; **නන්දති**: සතුටු වෙයි; **පෙච්ච**: පරලොව දී; **නන්දති**: සතුටු වෙයි; **උභයත්ථ**: දෙලොව ම; **නන්දති**: සතුටු වෙයි; **මෙ**: මවිසින්; **පුඤ්ඤං කතං**: පිනක් කරන ලදැයි; **ඉති**: මෙසේ; **නන්දති**: සතුටු වෙයි; **සුග්ගතිං**: දෙව්ලොව; **ගතො**:ගියේ; **භිය්‍යො**: වැඩියත්; **නන්දති**: සතුටු වෙයි.

පුණ්‍ය කර්ම කර ඇති තැනැත්තා ඒ හේතුවෙන් මේ ජන්මයේ දී මෙන් ම මතු ජන්මයේදී ද ප්‍රීතියට පත් වෙයි. හෙතෙම දෙලොව ම සතුටු වෙයි. කළ පින්කම ගැන සිතමින් 'මම පින්කමක් කළෙමි' යි සිතමින් ප්‍රීති වෙයි. සුගතියෙහි උපන් විට වඩාත් ම සන්තෝෂයට පත් වෙයි.

විවරණය

තුසිත දෙව් ලොව නම් සතුට අධිපති ලක්ෂණය කරගත් දෙව් ලොව යි. සාමාන්‍යයෙන් පශ්චිම භවික බෝසත්වරුන් උපදින්නේ ද තුසිත දෙව්ලොව ය. කුශල කර්ම කරන අය මනුලොව දී සතුටින් සිටින බව සැබෑ වුව ද වඩාත් ම සතුටු වන්නේ දෙව් සැප විඳින විට බව මෙහි 'භිය්‍යො නන්දති' යන්නෙන් කියැවිණි.



තෙවළා දහම් දැන උගෙණ, කියමින් ඒ නොපිළිපැදීම ශ්‍රමණ ගුණයේ පල හිමි නො වීමට හේතු වෙයි.

19. බහුම්පි චෙ සහිතං භාසමානො
න තක්කරො හොති නරො පමත්තො
ගොපො'ව ගාවො ගණයං පරෙසං
න භාගවා සාමඤ්ඤස්ස හොති (1:19)

දෙසුවත් බණ වැඩි වැඩියෙන්
නො පිළිපදිති-ප්‍රමාදයෙන්
බලනා අන්සතු ගවයන්
නො ලබති ඵල ලෙස ගොපළුන්

දහමෙහි ප්‍රතිඵල ලබන්න - මැනවින් එය පිළිපදින්න

1 (14) මිතුරු දෙනමක ගේ පුවතක් (19-20 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ සැවත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසමින් මිතුරු දමින් වෙළී සිටි භික්ෂු දෙනමක් ඇරබ මේ ගාථා දෙක දේශනා කළ සේක.

සැවැත් නුවර ප්‍රභූ පවුල් දෙකක තරුණයෝ දෙදෙනෙක් දැඩි මිත්‍රත්වයෙන් වෙළී සිටිය හ. වරක් ඒ දෙදෙන විහාරස්ථානයට ගොස් බුදුරජාණන් වහන්සේ ගේ ධර්ම දේශනාවක් අසා දහමෙහි පැහැදී කම්සුව අත්හැර පැවිදි බිමට පත් වූ හ. වසර පහක් පමණ ආචාර්ය උපාධ්‍යායයන් යටතේ මූලික ශික්ෂණය ලැබ ග්‍රන්ථධුරය හා විදර්ශනා ධුරය පිළිබඳව අසන්නට ලැබී බුදුරජාණන් වහන්සේ වෙතින් ඒ පිළිබඳ සියලු විස්තර අසා දැනගත් හ.

ඒ දෙනමගෙන් වැඩිමහලු හිමි නම "මම වැඩි මහලුව පැවිදි වූ හෙයින් ග්‍රන්ථ ධුරයෙහි කටයුතු කරගන්නට අසමත් මි. එහෙත් මට විදර්ශනා ධුරයෙහි කටයුතු කර ගත හැකි ය."යි පවසා රහත් ඵලය ලබන තුරු අදාළ වන කර්මස්ථාන ලබා ගත්තේ ය. අනෙක් නම "මම ග්‍රන්ථ ධුරය පුරන්නට සමර්ථයෙමි"යි නගරයෙහි ම නැවතී ධර්ම විනය හදාරන්නට අධිෂ්ඨාන කර ගත්තේ ය. කර්මස්ථාන ලබා ගත් හිමි නම වනගත ව බවුන් වඩා රහත් ඵලය ලබා ගත් අතර ග්‍රන්ථ ධුරය තෝරා ගත් හිමි නම මනාව ධර්ම විනය ප්‍රගුණ කර ගෙන තැනින් තැන සංචාරය කරමින් ඉගැන්වීමේ කටයුතු කළේ ය. උන් වහන්සේ ගෙන් ධර්ම විනය හදාළ භික්ෂු පිරිස පන්සියයක් පමණ වූ අතර උන් වහන්සේ භික්ෂූන් අටළොස්සකගේ උපාධ්‍යායවරයා ද වූහ.

මේ අතර තුර භාග්‍යවතුන් වහන්සේ ගෙන් කමටහන් ලබා ගත් පන්සිය නමක් භික්ෂූහු විදර්ශනා ධුරය වඩන හිමි නම විසූ ආරණ්‍යයට ගොස් උන් වහන්සේ ගේ අවවාද ද ලබමින් භාවනා කර රහත් ඵලය ලැබූ හ. අනතුරුව උන් වහන්සේට වැඳ නමස්කාර කළ ඒ පන්සිය නම තමන් භාග්‍යවතුන් වහන්සේ දක්නට යා යුතු බව පවසා සිටිය හ. "යහපති. එසේ නම් යන්න. ගොස් භාග්‍යවතුන් වහන්සේට හා අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාට මා වෙනුවෙන් සිහිකර නමස්කාර කරන්න. එසේ ම මගේ සහෝදර නමට ද "අපේ ගුරු හිමියන් ඔබ සිහිපත් කළා"යි ද පවසන්න" යි පවසා සමු දුන් හ.

ඒ හිමිවරු එසේ ම බුදුරදුන් හා මහා ශ්‍රාවකයන් වහන්සේ වැඳ තම ආචාර්යයන් වහන්සේ ගේ මිතුරු හිමි නම ද බැහැ දැක "අප ගේ ආචාර්යයන් වහන්සේ ඔබ වහන්සේ සිහිපත් කළා"යි පැවසූ හ. "ඒ කවුද?"යි උන් වහන්සේ ප්‍රශ්න කළහ. "ඒ ඔබ වහන්සේ ගේ එකට පැවිදි වූ මිත්‍ර ස්වාමීන් වහන්සේයි."

"එයා ගෙන් ඔබ මොනවා ද ඉගෙන ගත්තේ? එයා ඉගෙන ගත්ත ධර්ම විනයක් නැහැ නේ. පාංසුකූල සිවුරක් අරගෙන කැලෑ වැදුණා මිසක් මොනව ද ඉගෙන ගත්තේ ?" තම මිත්‍ර හිමි නම කවදා හෝ වනයේ සිට නගරයට පැමිණි දිනක මේ තරම් සිසුන් පිරිසක් පිරිවරා ගෙන ඉගැන්වූයේ කුමක්දැයි අසන්නට තීරණය කර ගත්තේ ය. උන් වහන්සේ ගෙන් ධර්ම ප්‍රශ්න විමසන්නෙමියි සිතා ගත්තේ ය.

ටික කලකට පසු භාග්‍යවතුන් වහන්සේ දකින්නට පැමිණි වැඩිහිටි රහතන් වහන්සේ, බුදුරජාණන් වහන්සේට සහ මහා ශ්‍රාවකයන් වහන්සේලාට හර සර දක්වා අනතුරුව සිය මිත්‍ර ග්‍රන්ථ ධූරී හිමි නම දකින්නට ද ගියේ ය. උන් වහන්සේ ද වනවාසී රහතන් වහන්සේට ගෞරවාචාර දක්වමින් පා සිවුරු පිළිගෙන "අද මම මුන් වහන්සේ ගෙන් හොඳ ප්‍රශ්න ටිකක් විමසමි" යි සිතමින් සංග්‍රහ කළේ ය.

භාග්‍යවතුන් වහන්සේ මේ භික්ෂුව මපුතණුවන් ගෙන් ප්‍රශ්න අසා හිරිහැර කර අකුසල් කර ගත හොත් එය ඔහුට ම අලාභ පිණිස පවතී යැයි සිතා ඔවුන් දෙනම වැඩ සිටි තැනට වැඩම කළ සේක. එසේ වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේ ග්‍රන්ථධුරය පිරූ භික්ෂූන් වහන්සේ ගෙන් ප්‍රථම ධ්‍යානය පිළිබඳ ව ප්‍රශ්නයක් විමසූ හ. එම භික්ෂුව ඊට නිවැරදි පිළිතුර දුන්නේ ය. අනතුරුව ද්විතීය ධ්‍යානය ගැන විමසූ හ. ඊට ද නිවැරදි පිළිතුර ලැබිණ.

අෂ්ට සමාපත්තීන් හා රූප ලෝක හා බ්‍රහ්ම ලෝක ගැන ද විමසූ සියළු ප්‍රශ්න වලට සාර්ථක ලෙස නිවැරදි පිළිතුරු දීමට භික්ෂු නම සමත් විය. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ සෝතාපත්ති ඵලය පිළිබඳව ප්‍රශ්නයක් නැගූ හ. ග්‍රන්ථ ධුරය පුරන හිමි නම ඊට පිළිතුරු දීමෙහි අසමත් විය.

විවරණාත්මක අනුවාදය (19 ගාථාව)

පමත්තො නරො සහිතං බහුං භාසමානො අපි චෙ
තක්කරො න හොති පරෙසං ගාවො ගණයං ගොපො
ඉව සාමඤ්ඤස්ස භාගවා න හොති

පමත්තො: ප්‍රමාද **නරො**: පුද්ගලයා **සහිතං**: ධර්මය **බහුං**: වැඩියෙන් **භාසමානො**: දේශනා කරන්නේ **අපි**: වුව ද **චෙ**: නමුත් **තක්කරො**: එය පිළිපදින්නෙක් **න හොති**: නො වන්නේ **පරෙසං**: අනුන් ගේ **ගාවො**: ගවයන් **ගණයං**: බලා ගන්නා **ගොපො**: ගව පාලකයෙක් **ඉව**: මෙන් **සාමඤ්ඤස්ස**: පැවිදි ජීවිතයේ ඵලයට **භාගවා**: හිමිකරුවෙක් **න හොති**: නො වන්නේ ය.

බුදු බණ වැඩි වැඩියෙන් දේශනා කරන නමුත් එය ක්‍රියාත්මක නො කරන ප්‍රමාදී පුද්ගලයෝ අනුන් ගේ ගවයන් බලා ගන්නා ගව පාලකයෙක් මෙන් ශ්‍රමණ ජීවිතයේ ඵලය ලබා නො ගනියි.

මඳ වශයෙන් වුවත් තෙවළාදහම් දැන උගෙන පිළිපැදීම ශ්‍රමණ ගුණයේ පලය හිමිවීමට හේතු වෙයි.

20. අප්පම් පි චෙ සහිතං භාසමානො
ධම්මස්ස හොති අනුධම්මචාරි
රාගඤ්ච දොසඤ්ච පහාය මොහං
සම්මප්පජානො සුවිමුත්තචිත්තො
අනුපාදියානො ඉධ වා හුරං වා
ස භාගවා සාමඤ්ඤස්ස හොති (1:20)

ඉතා ටිකක් බණ දෙසුවත්
දහම අනුව පිළිපැද්දොත්
රාග-දෝස-මෝහ දුරැර
මිදුණු සිතින් හොඳ නුවනින්
නොබැඳී එලොවත් මෙලොවත්
පැවිදි දිවිය පලය ලබත්

වඩා බවුන් - ලබමු නිවන්

1 (14) මිතුරු දෙනමක ගේ වතක් (19-20 ගාථා) ඉතිරි කොටස

එම ප්‍රශ්නය විදර්ශනා ධුරය පිරූ රහතන් වහන්සේට යොමු කරනු ලැබිණ. උන් වහන්සේ ඊට නිවැරදිව පිළිතුරු දුන්හ. සාධු සාධු යි එය අනුමත කළ භාග්‍යවතුන් වහන්සේ අවශේෂ මාර්ග-ඵල පිළිබඳ ව ද උන් වහන්සේ ගෙන් ම විමසූ හ. ඒ හැමකෙකට නිවැරදි පිළිතුරු ලැබුණු අතර ඒ තුන් වාරයේ ම ද භාග්‍යවතුන් වහන්සේ සාධුකාර දුන් හ. ඒ ඇසූ දිව්‍ය බ්‍රහ්මාදීහු ද සාධුකාර දුන් හ.

බුදුරදුන් දුන් සාධුකාරයෙන් ග්‍රන්ථ ධුරය පුරන හිමියන් ගේ සිසු හිමිවරු සහ ගිහි දායකයෝ නො පහන් වූ හ. "ඇයි බුදුරදුන් මෙසේ කරන්නේ? මහළු භික්ෂුව පිළිතුරු දුන් හතර වතාවේ ම උන් වහන්සේ සාධුකාර දුන්නත්, දහම දිවග ලෙලැවූ අපේ ධර්මධර විනය ධර පණ්ඩිත හාමුදුරුවන් පිළිතුරු දුන් විට එසේ කළේ නැහැ. එය අසාධාරණයි" ඔවුහු එකිකෙනා කොඳුරන්නට වූ හ.

"මහණෙනි, ඔබ මොනවා ද කියන්නේ" යි බුදුහු ප්‍රශ්න කළ හ. ඔවුහු තම විමතිය උන් වහන්සේට කියා පෑ හ. "මහණෙනි, ඔබේ ජනප්‍රිය භික්ෂුව මගේ සසුනේ කුලියට හරක් බලනවා වැනියි. එහෙත් මපුතු මහ රහත් නම පස් ගෝ රසය ම තමන් සතු කර ගත් ගව හිමියෙකු වගෙයි" යනුවෙන් ඇති තතු පැහැදිලි කර වදාළ හ.

විවරණාත්මක අනුවාදය (20 ගාථාව)

සහිතං අප්පං අපි භාසමානො චෙ ධම්මස්ස
අනුධම්මචාරී හොති රාගං ච දොසං ච මොහං ච පහාය
සො සම්මප්පජානො සුවිමුත්තචිත්තො ඉධ වා හුරං වා
අනුපාදියානො සාමඤ්ඤස්ස භාගවා හොති

සහිතං: බුද්ධ වචනය; **අප්පං**: ස්වල්පයක් ද; **අපි**: වුවත්; **භාසමානො**: දේශනා කරමින්; **චෙ**: ඉදින්; **ධම්මස්ස**: ධර්මයෙහි; **අනුධම්මචාරී හොති**: ධර්මානුකූලව ජීවත් වෙයි (නම්); **රාගං ච**: රාගය ද; **දොසං ච**: ද්වේෂය ද; **මොහං ච**: මෝහය ද; **පහාය**: දුරුකර; **සො**: හෙතෙම; **සම්මප්පජානො**: නිවැරදි ප්‍රඥාව ඇති ව; **සුවිමුත්තචිත්තො**: දුබල හැඟීම් වලින් මනාව මිදී; **ඉධ වා**: මෙලොවට වත්; **හුරං වා**: පරලොවට වත්; **අනුපාදියානො**: බැඳීමක් නැතිව; **සාමඤ්ඤස්ස**: ශ්‍රමණ ජීවිතයේ ඵලයට; **භාගවා**: හිමිකරුවෙක්; **හොති**: වෙයි.

බුද්ධ වචනය දේශනා කරන්නෝ ස්වල්ප වශයෙන් වුව ද ධර්මයට අනුව තම ජීවිතය ගත කරන රාගය, ද්වේෂය හා මෝහය දුරුකර කෙලෙසුන් ගෙන් සිත මුදා ගෙන මෙලොවට හෝ පරලොවට නො බැඳී වසන්නේ නම් හෙතෙම පැවිදි ජීවිතයේ ප්‍රයෝජනය විඳ ගනියි.

විවරණය

සහිතං: යන්නෙන් අදහස් වන්නේ ආගමික සාහිත්‍යයයි. මෙහි දී විශේෂයෙන් ම බෞද්ධ සාහිත්‍යය හෙවත් බුද්ධ වචනය සූත්‍ර හා විනය වශයෙන් ද්විවිධ ය. වර්තමානයෙහි එය ත්‍රිපිටකය ලෙස සංවිධානය කර රැක ගනු ලැබේ.

භාසමානො: යන්නෙන් ධර්මය දේශනා කිරීම අදහස් වෙයි. ඇතමුන් ධර්ම දේශනයට හපන් වුව ද නිතර නිතර විචිත්‍ර ලෙස ධර්ම විවරණ ඉදිරිපත් කළ ද එමගින් ජීවිතය ආලෝකවත් කර නො ගනිති. ධර්මය පිළිපැදීමෙන් තොරව ධර්ම දේශනා කරන භික්ෂුව, භික්ෂු ජීවිතයෙහි නියම ආස්වාදය නො ලබන බව මෙහි කියැවෙයි. අනුන් ගේ ගවයන් කුලියට බලන්නහුට පස්ගෝරසය භුක්ති විඳින්නට නො ලැබේ. ඔහු ලබන්නේ සුළු වැටුපක් පමණි.

සුවිමුත්ත චිත්තො: යන්නෙන් තෘෂ්ණා-උපාදානයන් ගෙන් හා අපිරිසිදු හැඟීම් වලින් මිදුණු සිත අදහස් වෙයි. විමුක්තිය ලබා ගත හැක්කේ එබඳු හැඟීම් දුරු කිරීමෙනි. එසේ අරහත් ඵලය ලබා ගත් උතුමෝ මෙලොවට හෝ පරලොවට හෝ නො බැඳෙති. 'අනුපාදියානො' යි සඳහන් කළේ එහෙයිනි.

බුද්ධ සංදේශය

බුදු හිමියෝ අන්‍ය ආගමික ක්‍රමවලටත් විවිධ සාමාජික
මතවාද වලටත් වඩා ශ්‍රේෂ්ඨය. බුදු හිමියන් වහන්සේගේ සනාතනික
සංදේශය කාලාන්තරයක් මුළුල්ලේ මානව වංශය ප්‍රමෝදයට පත් කළේය.
බුදු හිමියන් වහන්සේගේ සාම පණිවුඩය දුකින් පෙළෙන,
දෝමනස්සයට නැඹුරු වූ මානව වංශයට අද යුගයේදී
පමණ අවශ්‍ය වූ වෙන අන් සමයක්
අතීත ඉතිහාසයේ නොතිබුණේ විය හැකිය.

ශ්‍රී නේරු ඉන්දියාවේ හිටපු අගමැති.

අප්පමාද වග්ග



නො පමා බව නිවණට මඟය. පමා බව මරණයට මඟය. නො පමාවූවෝ නොමියෙති පමාවූවෝ මළවුන් වැනි වෙති.

21. අප්පමාදො අමතපදං
පමාදො මච්චුනො පදං
අප්පමත්තා න මීයන්ති
යෙ පමත්තා යථා මතා. (2:1)

නිවනට මඟ නො පමාවයි
පමාව මරණයට මඟයි
නො පමා වූවෝ නො මියෙති
පමා වුවොත් මළවුන් වෙති.

ලබා ගැනුම නිවන් සුවේ - ලෙහෙසි පහසු දෙයක් නො වේ.

2 (1) සාමාවතිය ගේ කතා පුවත (21, 22, 23 ගාථා)

කොසඹෑ නුවර ඝෝසිතාරාමයෙහි වැඩ වසන සේක් භාග්‍යවතුන් වහන්සේ එනුවර රජ කළ **උදේනී** රජතුමා ගේ අග මෙහෙසියක වූ සාමාවතිය පිළිබඳ ව මේ ගාථාත්‍රය දේශනා කර වදාළ හ.

භද්‍රාවතී නම් නගරයක භද්‍රාවතිය නම් සිටුවරයෙක් විසී ය. හෙතෙම ඝෝෂක සිටාණන් ගේ මිත්‍රයෙක් වූයේ ය. එහෙත් ඔවුන් එකිනෙකා දැන නො තිබිණි. භද්‍රාවතී නගරයේ සිට එන වෙළඳුන් අතින් භද්‍රාවතිය සිටාණන් ගේ ධන සම්පත් ගැන ඇසූ ඝෝෂක සිටාණෝ ඔහු සමග මිත්‍රත්වයක් ඇති කර ගන්නට සිතා තෑගි බෝග යැවී ය. එමගින් හෙතෙම අදෘෂ්ට මිත්‍රත්වයක් ඇති කර ගත්තේ ය.

කලකට පසු භද්‍රාවතිය සිටාණන් ගේ නිවසෙහි එක් භයානක රෝගයක් ඇති විය. මෙම රෝගයෙන් මුලින් ම මිය යන්නෝ මැස්සෝ ය. ඉන් පසු ක්‍රමයෙන් කෘමි සත්තු, මීයෝ, කුකුළෝ, ගවයෝ වැනි සත්තු මිය යති. අවසන නිවසේ හැම දෙන ද මිය යති. බිත්තියක් කඩා ගෙන පලා යන්නෝ පමණක් ජීවත් වෙති. භද්‍රාවතිය සිටුතුමා, දේවිය හා දියණිය මෙසේ දිවි ගළවා ගනු පිණිස බිත්තියක් බිඳ ඉන් නික්ම ඝෝෂක සිටාණන් ගේ පිළිසරණ ලබනු පිණිස එහි යාමට පිටත් වූ හ.

ගමන නිම කරන්නට පෙර ම ඔවුන් මග දී කෑමට බීමට ගෙනා සියල්ල නිම වී අව්වෙන් හා සුළඟින් පීඩිතව කුසගින්නෙන් වෙළී දුකට පත් වූ හ. අපහසුවෙන් කොසඹෑ නුවරට පැමිනි ඔවුහු එක් පොකුණකින් දිය නා සැරසී රැය ගත කිරීම පිණිස නුවර දොරටුව අසල ලැගුම් හලකට ගිය හ.

පසුදින දුබලව වැහැරී චාම් ඇඳුමින් සැරසී සිටි සිටුතුමා තමන් පත්ව සිටි තත්වය ගැන මෙනෙහි කොට දේවිය අමතා, "දේවිය, මෙලෙස අප මිතුරු බැහැ දකින්නට යා හැකි ද? අපි මෙසේ දුබලව වැහැරී සිටිනවා දුටුව හොත් වැඳූ මවට වුව ප්‍රිය මනාප නැත. අපේ මිත්‍රයා ගේ දන්සැලක් ඇත. එහි දුගී දුප්පත් අසරණයන්ට දිනපතා ආහාර පාන දෙනු ලැබේ.

දුව එහි යවා කෑම ගෙන්වා ගෙන අනුභව කර නීරෝගී වී යමු" යි යෝජනා කළේ ය. දේවිය ද එය අනුමත කළෙන් ඔවුහු ලැගුම් හලේ ම නැවතී දියණිය දන් සැලට යැවූ හ. දහවල් වන විට ඔවුහු බඳුනක් දී දියණිය දන් සැලට යැවූ හ. සැප සම්පත් මැද අභිමානවත් ලෙස හැදුණු වැඩුණු නමුත් නිහතමානීව දුගී දුප්පත් යාචකයන් ගැවසෙන දන්සැලට ගිය ඕ බඳුන දිගු කළා ය.

"කොටස් කීයක් නුඹට අවශ්‍ය ද"යි දන්සල භාරකරු ප්‍රශ්න කළ විට 'තුනක්' යි පැවසූ ඇයට කොටස් තුනක් ලැබිණ. ඒවා නවාතැනට ගෙන'වුත් අනුභවයට සැරසුණු විට සිටු දේවිය සිටු වරයා අමතා "අපේ දිවි රැකෙන්නේ ඔබෙන් ය. ඔබ රැකුණොත් මිස අප රැකී කවර පලක් ද? එහෙයින් මේ බත් සියල්ලම ඔබ ම අනුභව කර පණ රැක ගන්නැ"යි සියල්ලම ඔහුට ම අනුභව කර වූවාය. එහෙත් කුසගින්නේ සිට එක්වර මහත් ප්‍රමාණයක් අනුභව කළෙන් දිරවාගත නො හැකිව හෙතෙම රාත්‍රියෙහි කළුරිය කළේ ය. සංවේගයට පත්ව ඔහු ගේ අවසන් කටයුතු කළ ඔවුහු පසු දින ද අහර පිණිස දියණිය යැවූ හ. එදින කොටස් කීයක් අවශ්‍ය දැයි ඇසූ විට ඕ දෙකක් ඉල්ලා ගත්තා ය. එදින මව ඇමතූ දියණිය, "මෑණියෙනි, පියාණනුත් මිය ගිය හෙයින් ඔබ රැකුණොත් මම රැකෙමි. එහෙයින් මේ කොටස් දෙක ම අනුභව කර ඔබ රැකෙන්නැ"යි කීවා ය. ඕ තොමෝ ද කොටස් දෙකම අනුභව කර දිරවා ගත නො හී රාත්‍රියෙහි මිය ගියා ය.

පසු දින දන්සලේ දී දියණිය එක් කෑම කොටසක් පමණක් ඉල්ලූ විට දන්සල පාලකයා "අද ද තී තමන් ගේ බඩේ තරම දැන ගත්තේ?" යි බැණ වැදුණා ය. මහත් ලජ්ජාවට පත් සිටු දියණිය "මා මුල් දිනයේ කොටස් තුනක් ගෙන ගියේ කෑමට අප තිදෙනෙක් සිටි නිසා ය. ඊයේ අපි දෙදෙනෙක් බවට පත් වුමු. අද ඉතිරිව සිටින්නේ මා පමණය" යි පැවසුවා ය. ඒ කවර හෙයින් දැයි විමසා දන්සල් පාලකයා සියලු තාව අසා දැන ගත්තේ ය. ඔහු ගේ දෑසට කඳුළු නැගිණි. "දුක් නො වන්න දියණිය, අද පටන් ඔබ මගේ දියණිය වන්න" යි සිය නිවසට ඇය කැඳවා ගත් හෙතෙම මහත් සෙනෙහසින් ඇය වැඩුවා ය.

විවරණාත්මක අනුවාදය (21 ගාථාව)

අප්පමාදො අමතපදං පමාදො මච්චුනො පදං
අප්පමත්තා න මීයන්ති යෙ පමත්තා යථා මතා.

අප්පමාදො: ප්‍රමාද නො වීම; **අමතපදං**: නිවන් ලැබීමේ මගයි; **පමාදො**: ප්‍රමාදය; **මච්චුනො පදං**: මරණයට මගයි; **අප්පමත්තා**: අප්‍රමාදවූවෝ; **න මීයන්ති**: නො මැරෙති; **යෙ පමත්තා**: යමෙක් ප්‍රමාද වූ හුද; **යථා මතා**: මළ ගියවුන් වැනිය.

ප්‍රමාද නො වී නිරතුරු අවදිකමින් සිටීම නිවන් ලැබීමේ මග වෙයි. ප්‍රමාද වීම මරණයට හෙවත් සසරට හේතු යි. අප්‍රමාද වූවෝ නො මියෙත්. ප්‍රමාද වූ අය ජීවත් වූවත් මළවුන් මෙනි.

නුවණැතියෝ නොපමාවෙහි ගුණ දැන, එහි යෙදී, සතොස් ව ආර්යයන්ගේ ගොදුරෙහි ඇලෙති.

22. එතං විසෙසතො ඤත්වා
අප්පමාදම්හි පණ්ඩිතා
අප්පමාදෙ පමොදන්ති
අරියානං ගොචරෙ රතා (2:2)

අප්‍රමාදයෙ අගය වෙසෙසින
දැන හැඳින ලොව නුවණ ඇති දන
ප්‍රමෝදය ලැබ අප්‍රමාදෙන්
ඇලෙති පියයෙහි නිවෙන රහතුන්

ලබා ගැන්ම නිවන් සුවේ - ලෙහෙසි පහසු දෙයක් නොවේ

2 (1) සාමාවතිය ගේ කථාව (21, 22, 23 ගාථා) (ඉතිරි කොටස)

දිනක් දන්සලේ ආහාර ගෙන යන්නට පැමිණෙන දුගියන් ගේ කෑ කෝ ගසන හඬ ඇසූ සාමාවතී "පියාණෙනි, මේ මිනිසුන් කල කෝලාහළ කර ගැනීම නවතා ලන්නේ නැත්තේ මන්දැ" යි විමසුවා ය. "දියණියෙනි, එය නවත්තන්නට අපහසු ය. ඒ ඔවුන් ගේ ස්වභාවයය"යි හේ පැවසී ය. "එය පිළිවන් පියාණනි." "කෙසේ ද දියණියනි එය කරන්නේ?" "දන් සල වටා වැටක් ඉදි කරන්න. එක් අයකුට පමණක් එක්වර එන්නටත්, එක් පසෙකින් ඇතුළු වී අනෙක් පැත්තෙන් පිට වන්නටත් හැකි වන පරිදි එය සකස් කරන්න." "ඉතා මැනවි දියණියනි." යි පවසා දන්සල පාලක තෙම එසේ කළේය. එතැන් පටන් දන්සලෙහි කලබල හා ඝෝෂා නැතිව සියල්ල සාමකාමී වූයේ ය.

ඝෝෂක සිටාණෝ දන්සලෙහි ශබ්ද වලට හොඳට හුරු පුරුදුව සිටි හෙයින් නිශ්ශබ්දතාව ගැන විස්මයට පත් විය. එහෙයින් හේ මිත්‍ර නම් වූ දන්සැල් පාලක තැන කැඳවා "දැන් අසරණයන්ට දන් දීම නවත්වලාදැ" යි විමසී ය. "නැත. තවමත් දිනපතා දානය දෙනු ලැබේ." "එසේ නම් දින කීපයක සිට කිසි ශබ්දයක් නැත්තේ කවර හෙයින් ද?" "ඔවුන්ට පිළිවෙළට පැමින කරදරයක් නැතිව ආහාර ගන්නට පිළිවෙළක් යෙදුවෙමි" "ඔබ ඇයි කලින් එසේ නො කළේ?" "කලින් මම ඒ ගැන දැන ගෙන නො සිටියෙමි" "කලින් නො දැන සිටි දෙයක් දැන් දැන ගත්තේ කෙසේ ද?" "මගේ දියණිය මට කියා දුන්නා ය" "මා නොදත් දියණියක් ඔබට කොහින් ද?" මේ අවස්ථාවේ දී සාමාවතී සිටු දියණිය තම දියණිය බවට පත් වූ සියලු කතා පුවත කියන්නට මිත්‍රට සිදු විය.

ඒ ඇසූ සිටුතුමා බලවත් කම්පාවට පත්ව "ඇයි ඔබ මේ බව මට කලින් නො කීවේ? මේ සාමාවතී මගේ මිතුරා ගේ දියණියයි" මෙසේ කියා හෙතෙම සාමාවතී ගෙන්වී ය. "ඔබ අසුවල් සිටුතුමා ගේ දියණිය යැයි කියන්නේ සැබෑදැ"යි විමසූ ඔහුට "එසේය" යන පිළිතුර ලැබිණි.

"එසේ නම් දුක් නො වන්න. ඔබේ පියා මගේ මිත්‍රයා ය. දැන් ඔබ මගේ ම දියණියයි" යි පවසා හිස සිඹ ඇය පිළිගත් හෙතෙම පන්සියයක් පිරිවර ළඳුන් ද දී ඇය තමන් ගේ දියණිය ලෙස එතැන් පටන් හදා ගත්තේ ය.

දිනක් නගරයේ උත්සවයක් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම උත්සවයට සාමාන්‍යයෙන් නිවසින් පිට නො යන ප්‍රභූ පවුල් වල දියණියන් තම තමන් ගේ පරිවාර ළඳුන් සමග ගඟට ගොස් ස්නානය කිරීම ද ඇතුළත් ය. ඒ අනුව එදින සාමාවතී ද පිරිවර ළඳුන් 500 ද සමග රජ වාසල ඉදිරියෙන් යෙදී ඇති මාවතින් ගඟට ගියා ය.

සී මැදුරු කවුලුවෙන් මඟ දෙස බලා සිටි උදේනි රජ තෙම එම ළඳුන් 500 දැක "මේ කෙළි දෙලෙන් යන ළඳුන් කා ගේ ද?" යි විමසා සිටියේ ය. "භද්දවතිය සිටාණන් ගේ සාමාවතී නම් දියණිය ගේ පිරිවර ළඳුන්ය" යි රජතුමාට පිළිතුරු දෙන ලදී. ඒ ඇසූ රජ තෙම සිටුතුමාට දන්වා සාමාවතිය අග මෙහෙසුන් තනතුරේ තබා ගත්තේ ය. ඇය ගේ පිරිවර කතුන් 500 ද රජවාසලට ගෙන්වා ගන්නා ලදී.

මේ අතරතුර තවත් කාන්තාවක් ද රජතුමා ගේ අග මෙහෙසුන් තනතුරට පත් වූවා ය. ඇය ගේ නම මාගන්දි ය. ඇය ගේ දෙමාපියන් ඇය බුදුරදුන්ට පාවා දෙන්නට වෑයම් කළ අවස්ථාවෙහි බුදුරදුන් කී වදනක් පිළිබඳව අමනාපය ඇය සිත් තුළ මුල් බැස තිබිණ. සාමාවතී බුදුරදුන් ගේ භක්තිමත් ශ්‍රාවිකාවක් වූවා ය. එහෙයින් බුදුරදුන් ගෙන් පලිගන්නට සිතමින් සිටි මාගන්දියා ගේ වෛරය සාමාවතිය හා පිරිසට ද යොමු විය.

විවරණාත්මක අනුවාදය (22 ගාථාව)

එතං විසෙසතො ඤත්වා අප්පමාදං හි පණ්ඩිතා
අප්පමාදෙ පමොදන්ති අරියානං ගොචරෙ රතා

එතං: මෙය; **විසෙසතො**: විශේෂ වශයෙන්; **ඤත්වා**: දැන; **අප්පමාදං හි**: අප්‍රමාද වීමෙහි නිරතව; **පණ්ඩිතා**: නුවණැත්තෝ; **අප්පමාදෙ**: අප්‍රමාදයෙහි; **පමොදන්ති**: ප්‍රමුදිත වෙති; **අරියානං**: රහතන් වහන්සේලා ගේ; **ගොචරෙ**: ගැලපෙන හැසිරීම් හි; **රතා**: ඇලෙති.

අප්‍රමාදයෙහි අගය විශේෂ වශයෙන් ප්‍රත්‍යක්ෂ කර ගෙන එහි නිරත වන නුවණැත්තෝ අප්‍රමාදයෙහි ප්‍රමුදිත වෙති. රහතන් වහන්සේලාට ගැලපෙන චර්‍යා රටාවක් අනුව හැසිරෙති.

භාවනා කරන, නිතර දැඩි වෙරුති නුවණැතියෝ නිවන් පසක් කරති.

23. තෙ ඣායිනො සාතතිකා
නිච්චං දළ්හපරක්කමා
ඵුසන්ති ධීරා නිබ්බාණං
යොගක්ඛේමං අනුත්තරං (2:3)

දිගින් දිගට බවුන් වඩන
නිතර දැඩිව විරිය දරන
නුවණැති දන ලබති නිවන
උතුම් ම තැන - බිය නැති වන

ලබා ගැන්ම නිවන් සුවේ - සිතන තරම් පහසු නො වේ

2 (1) සාමාවතිය ගේ කතාව (21, 22, 23 ගාථා) (ඉතිරි කොටස)

වරක් ඔවුන් බුදුන් දකින්නට බිත්තියේ කුඩා කවුළු ඇති කරගෙන සිටිනු දුටු මාගන්දියා රජතුමාට බොරු කේලාම් කියා වැරදි අවබෝධයක් දෙන්නට වෑයම් කළා ය. එහෙත් එය නිරර්ථක වූයෙන් තවත් වෛර බැඳගත් ඕ සාමාවතී රජතුමා මරන්නට කුමන්ත්‍රණය කරතැයි ද කේලාම් කීවා ය. වරක් උණ බම්බුවක් තුළ සර්පයකු බහා හිල් වසා මල් වල සඟවා රජතුමා සමීපයෙහි තැබුවා ය. නාගයා පෙණය විදහමින් එළියට ආ විට රජතුමා බලවත් ලෙස කෝප වී සාමාවතී ඇතුලු පිරිස පෙළට හිඳුවා විස පෙවූ ඊතල වලින් විදින්නට අණ කළේ ය.

එහෙත් සාමාවතී ඇතුළු පිරිස මෙත් වැඩූ හෙයින් ඊතල වලින් ඔවුන්ට හානියක් නො වීය. සාමාවතී ගේ අහිංසකත්වය තේරුම් ගත් රජ ඇයට බුදුරදුන් මාලිගයට කැඳවා බණ අසන්නටත් දන් දෙන්නටත් අවසර දුන්නේ ය. තම සියළු සැලසුම් නිෂ්ඵල වූ තැන නොවරදින අවසන් උපායක් සිතූ මාගන්දියා තම මාමා කෙනකුට පණිවුඩ යවා සාමාවතී ඇතුළු පිරිස විසූ මාලිගය ඔවුන් එහි සිටියදී ගිනි ලවා මරා දමන්නට කටයුතු යෙදුවා ය. ඒ බියකරු අනතුර සිදුවත්දී ද දහම් දැනුමින් පොහොසත්ව සිටි සාමාවතී ඇතුළු පිරිස භාවනාවෙහි යෙදෙමින් පිළිස්සී මිය ගිය හ.

මෙය මාගන්දියා ගේ කුමණ්ත්‍රණයක් බව රජතුමා සැක කළේ ය. එහෙත් තමා එසේ සැක කරන බව හේ රහසක් වශයෙන් තබා ගත්තේ ය. ඒ වෙනුවට තමන් ඇය කෙරේ බෙහෙවින් ප්‍රසන්නව සිටින බවක් පෙන්වමින් කල් ගත කළ රජතෙම වරක් තමා ඇයටත් ඇයගේ ඥාතිවරුන්ටත් සංග්‍රහයක් කරන්නට යන බව පවසා ඇය ගේ පවුලේ බොහෝ ඥාතීන් ගෙන්වා ගත්තේ ය. හිටි හැටියේ මුළු පිරිස ම අත් අඩංගුවට ගත් රජතුමා මාගන්දියා හා ඔවුන් හැමදෙන රජ ගෙදර මිදුලේ ම මරා දමන්නට සැලැස්වී ය.

මේ සිද්ධි දෙක බුදු පියාණන් වහන්සේට සැල වූ විට උන්වහන්සේ මේ ගාථාවන් තුන වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (23 ගාථාව)

තෙ ධීරා ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා
යොගක්ඛේමං අනුත්තරං නිබ්බාණං ඵුසන්ති.

තෙ ධීරා: ඒ නුවණැත්තෝ; **ඣායිනො**: ධ්‍යාන භාවනා වඩන්නෝ; **සාතතිකා**: නො නවත්වා වෙර දරන්නෝ; **නිච්චං**: නිතරම; **දළ්හපරක්කමා**: දැඩි පරාක්‍රමයෙන් යුක්තව; **යොගක්ඛේමං**: බැඳුම් වලින් නිදහස් වූ; **අනුත්තරං**: අනුත්තර වූ; **නිබ්බාණං**: නිර්වාණය; **ඵුසන්ති**: ස්පර්ශ කෙරෙති.

අප්‍රමාදයෙහි අගය දත් නුවණැත්තෝ ධ්‍යාන භාවනා වඩමින් නිරතුරුව ම වෙර වඩමින් නිතරම දැඩි උත්සාහ දරමින් බැඳුම් වලින් නිදහස් වූ අනුත්තර වූ නිර්වාණය ස්පර්ශ කරති.

විවරණය

අප්පමාද: යන වචනය බුද්ධ දේශනාවේ නිරතුරුව හමුවන්නකි. අවසාන බුද්ධ වචනයෙහි පවා එය හමුවෙයි. අප්පමාද යන්නෙහි හොඳ සිහි නුවණින් ක්‍රියා කිරීම 'යන අර්ථය ගැබ් වෙයි. නිරතුරුව ම අවදි කමින් යුතුව නො මඟ නො යා සියළු කාර්‍යයන් නුවණින් යුතුව කරන මානසික තත්ත්වය මින් අදහස් වෙයි. මෙය හොඳින්ම අරෝපණ කළ හැක්කේ රහතන් වහන්සේ නමක වෙත ය. සාමාන්‍ය පෘථග්ජනයන් අතර විවිධ මත්වීම්-ප්‍රමාද වීම් ඇත.

අමත: බෞද්ධ චර්‍යාවෙහි අවසාන නිෂ්ටාව වූ නිර්වාණය මෙයින් අදහස් වෙයි. නිර්වාණය මරණයෙන් තොර බව අමත යන්නෙන් හැඟවෙයි. එය ශූන්‍යත්වයක් නො වේ. නිර්වාණය ලෝකෝත්තර තත්ත්වයක් හෙයින් ලෞකික පද ව්‍යවහාර වලින් එය විස්තර කළ නො හැක. එහෙත් එය නිත්‍ය, ශාන්ත සුඛයක් බව ප්‍රකාශ කළ හැක.

න මීයන්ති: හෙවත් නො මැරෙති යන්නෙන් අදහස් වන්නේ අමරණීය වන බවක් නො වේ. කිසිම සත්වයකුට මරණයෙන් ගැළවී වාසය කළ නො හැක. ප්‍රමාදී නො වූ නිර්වාණාධිගමය කළ අය මරණින් මතු යළි උපතක් නො ලබන හෙයින් සංසාර ලක්‍ෂණයක් වූ මරණයට පත් නොවන බව මෙයින් හඟවනු ලැබේ. ප්‍රමාදී වූ වෝ දිගටම සසරේ උපදිති. එහෙයින් මැරෙති.

නිබ්බාණ: යන වචනයෙන් තෘෂ්ණාවෙන් මිදීම අදහස් කරනු ලැබේ. (නි+වාණ යනු එහි ප්‍රභවයයි.) මෙම ලෝකෝත්තර අධිගමය මේ භවයේදී ම ලද හැකි ය. එහි දි ක්ලේශයන් විනාශ වන බව කියැවෙන පමණින් සර්වශූන්‍ය භාවයක් ලෙස වරදවා නො ගත යුතු ය. ක්ලෙශ සමූලච්ඡේදනයෙන් ලැබෙන විශුද්ධිය හා ශාන්ත සුවපත් ස්වභාවය එහි ලක්‍ෂණයයි.



නගා සිටි වෙර හා මනා ගුණැති දහැමින් දිවි පවත්වන නොපමා තැනැත්තාගේ යසස මොනවට වැඩේ.

24. උට්ඨානවතො සතිමතො
සුචිකම්මස්ස නිසම්මකාරිනො
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො
අප්පමත්තස්ස යසො'භිවඩ්ඪති (2:4)

උට්ඨානය, සතිය සහිත
සිහි නුවණැති, කුසල් නිරත
සංවර, දැමි නො පමා දන
කිතු ගොස පැතිරෙයි දින දින

පමා නොවන දන - පැතිරේ කිතු ගොස

2 (2) කුම්භඝෝෂක ගේ කථාව (24 ගාථාව)

වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි **කුම්භඝෝෂක** නම් සිටුවරයකු ඇරබ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

එක් සමයෙක රජගහ නුවර වසංගතයක් පැතුරුණේ ය. නගරයේ සිටුතුමා ගේ නිවසෙහි සේවකයෝ මේ රෝග යෙන් මළ හ. සිටුතුමා හා බිරිඳ ද රෝගයෙන් පෙළුණ හ. එවිට ඔවුහු තම තුරුණු පුතා අමතා තමන් අතහැර ගොස් කලක් ගිය පසු පමණක් පැමිණෙන්නට උපදෙස් දුන් හ. තමන් ධනය නිදන් කර ඇති ස්ථාන ද මේ මේ යයි පෙන්වා දුන් හ.

පුත්‍රයා ද නගරය හැර ගොස් වන ගතව වසර දොළහක් ම ගත කළේ ය. ආපසු නගරයට එන විට ඔහු තරුණ වියට පත්ව සිටි හෙයින් කිසිවකුට හඳුනා ගත නො හැකි විය. සම්පත් වළලා ඇති තැන් බලන්නට ගොස් ඒවා නිරුපද්‍රැතව පවත්නා බව ද දැන ගත් හෙතෙම මේවා ගොඩ ගෙන භාවිත කරන්නට පටන් ගත හොත් නුවර වැස්සන් කිසියම් දුගියකු හිටි හැටියේ සම්පතක් සොයා ගෙන සැප විඳින්නට පටන් ගත්තේ යැයි සැක කොට රජතුමාට පැමිණිලි කළහොත් තම වස්තුව රජතුමා විසින් රාජ සන්තක කරන්නට ඉඩ ඇතැයි බියට පත්ව එය භාවිතයට නො ගත්තේ ය. එහෙයින් තවම ඒ සඳහා නිසි කල උදානුනේ යයි සිතූ හේ ජීවත් වීමට රැකියාවක් සෙවී ය. ඔහුට පැවරුණු රැකියාව අළුයම පිබිදී නගරයෙහි ජනයා අවදි කරවා, දන් ආහාර පිළියෙල කිරීමට, කරත්ත ගෙන ඒමට හා ගොනුන් බැඳීමට කාලය බව කියමින් ඝෝෂා කිරීමයි.

එක් උදෑසනක බිම්බිසාර රජතුමාට ඔහු ගේ කෑ ගැසීම ඇසිණි. කටහඬින් පුද්ගලයන් විනිශ්චය කිරීමේ සමර්ථයකු වූ රජතෙම "මේ නම් මහා ධනවතකු ගේ කටහඬයැ"යි පැවසී ය. ඒ ඇසූ එක් සේවිකාවක් ඒ ගැන සොයා බලා "ඒ ඉතා දුප්පත් අසරණයෙක් පමණි, දේවයන් වහන්ස" යි වාර්තා කළේ ය. එහෙත් රජතුමා තව දින දෙකක් ම කියා සිටියේ ඒ නම් දුප්පත් අසරණයෙක් නොව මහා ධනවතකු බවයි. නැවත ද පරීක්ෂාවක් කළ මුත් වාර්තා වූයේ ඔහු සුළු වැටුපකට සේවය කරන දුප්පතකු බව පමණ ය. එයින් විස්මයට පත් සේවිකාව මේ ගැන පෞද්ගලිකව ම සොයා බලන්නට රජතුමාගෙන් අවසර ගෙන සාමාන්‍ය දුප්පත් කතක් සේ වෙස් වලාගෙන තම දියණිය ද කැටිව කම්කරුවන් අතරට ගියා ය. තමන් සංචාරයක ආ බව පවසමින් ඔවුහු කුම්භඝෝෂක ගේ ගෙයි ලැගුම් ගත් හ. එක් රැයකට නවාතැන් ඉල්ලා ගත් නමුත් දින කීපයක් එහි නවාතැන් ගැනීමට අවසර ලබා ගත් හ. මේ අතරතුර නගරයේ එක්තරා උත්සවයකට හැම නිවසකින් ම එක්තරා මුදලක් අනිවාර්යයෙන් ම දියයුතු බවට රජ තෙම නීතියක් පැනවිය. එහෙත් කුම්භඝෝෂක ලඟ එතරම් මුදලක් නො වීය. එහෙයින් අකැමැත්තෙන් වුව ද නිධානයෙන් රන් කාසියක් දෙකක් ගන්නට කුම්භඝෝෂකට සිදු විණි. ඒවා බාර දෙන්නට බාර ගත් සේවිකාව ඒවා රජතුමා වෙත යවා, උත්සවයට තමා අත වූ මුදල් දුන්නේ ය. ඉන් පසු ඕ රජතුමාට පණිවුඩයක් යවා කුම්භඝෝෂක රජවාසලට ගෙන්වන සේ ඉල්ලීමක් කොට ඔහු එහි යන්නට පෙර තමාත් දියණියත් එහි ගොස් සිටියා ය. රජ වාසලදී රජතුමා කුම්භඝෝෂකට කතා කොට කිසිම දඬුවමක් නො දෙන බවට පොරොන්දු වී ඇත්ත හෙළි කරන සේ ඉල්ලා සිටියේ ය. ඒ කහවුණු තමන් ගේ බව පිළිගත් හේ තමා මියගිය නගර සිටුතුමා ගේ පුත්‍රයා බවත් වසර දොළහකට පෙර තමාට වන ගත වන්නට වූ බවත් හෙළි කළේ ය. එමෙන් ම තම නිධාන ඇති තැන් ද නො වළහා පැවසීය. අන්තිමේ ඒ ධනය රජ වාසලට ගෙන්වා පරීක්ෂා කර බැලූ රජතුමා ඔහුට සිටු පදවියක් පිරිනමා රජ දියණියක් ද විවාහ කරවා දුන්නේ ය. අනතුරුව ඔහු වේළුවනාරාමයට කැඳවාගෙන ගිය රජතෙම භාග්‍යවතුන් වහන්සේට සියළු පුවත් දන්වා සිටියේ ය.

විවරණාත්මක අනුවාදය (24 ගාථාව)

උට්ඨානවතො සතිමතො සුචිකම්මස්ස නිසම්මකාරිනො සඤ්ඤතස්ස ච ධම්මජීවිනො අප්පමත්තස්ස යසො අභිවඩ්ඪති.

උට්ඨානවතො: උට්ඨාන වීර්‍ය්‍යය ඇති; **සතිමතො**: සිහි නුවණින් ක්‍රියා කරන; **සුචිකම්මස්ස**: නිරවද්‍ය ක්‍රියා කලාපයක් ඇති; **නිසම්මකාරිනො**: විමසා බලා ක්‍රියා කරන; **සඤ්ඤතස්ස**: සංවර වූ; **ච**: සහ; **ධම්මජීවිනො**: ධර්මානුකූලව ජීවත් වෙන; **අප්පමත්තස්ස**: අප්‍රමාදී වූ පුද්ගලයා ගේ; **යසො**: කීර්තිය; **අභිවඩ්ඪති**: වර්ධනය වෙයි.

යම් කිසි පුද්ගලයෙක් වීර්‍ය්‍යය වඩමින්, සිහි නුවණින් යුතුව නිවැරදි ක්‍රියා ම කරමින්, සිහි නුවණින් යුතුව, වැඩ කරමින්, සංවරව ධර්මානුකූල ජීවිතයක් ගත කරයි නම්, ඒ අප්‍රමාදී පුද්ගලයා ගේ කීර්තිය දිනෙන් දින වර්ධනය වෙයි.

විවරණය

උට්ඨානවතො: යන්නෙන් අදහස් වන්නේ මැලිකම් දුරැර පුබුදුවාගත් වීර්‍ය්‍යයෙන් යුතුව ක්‍රියා කිරීමයි. ආර්‍ය්‍ය මාර්ගයෙහි ගමන් කිරීමෙහි දී කුසීත බව බලවත් බාධකයක් වෙයි. එහෙයින් උට්ඨාන වීර්‍ය්‍යය අත්‍යවශ්‍ය ය.





නුවණැත්තා කෙළෙස් මහ වතුරෙන් නසා ලිය නො හැකි රහත් පල නමැති පිහිට හිමි කරන්නේ ය.

25. උට්ඨානෙන'ප්පමාදෙන
සඤ්ඤමෙන දමෙන ච
දීපං කයිරාථ මේධා වී
යං ඔඝො නාභිකීරතී (2:5)

උත්සාහෙන් නො පමා වෙන්
සංයමයෙන් හා දමනෙන්
තමනට පහනක් කර ගෙන
සැඩ පහරින් ගැළවෙනු මැන.

තනනු මැන දිවයින - සැඩ දිය පහර වලකන

2 (3) චුල්ලපන්ථක ගේ කතාව (25 වන ගාථාව)

වේළුවන විහාරයෙහි වැඩ වසන සමයෙහි රජගහ නුවර සිටාණන් ගේ මුණුබුරකු වූ **චුල්ලපන්ථක තෙරුන්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

රජගහ නුවර සිටාණන්ට මහාපන්ථක හා චුල්ලපන්ථක යැයි මුණුබුරෝ දෙදෙනෙක් වූ හ. ධර්ම ශ්‍රවණය පිණිස විහාරස්ථානයට යන විට තම මුණුබුරන් ද කැටුව යන්නට සිටුතුමා පුරුදුව සිටියේ ය.

මෙසේ දහම් අසන්නට පුරුදුව සිටි මහාපන්ථක පැවිදිව රහත් වූයේ ය. ටික කලකින්ම චුල්ලපන්ථක ද පැවිදි වූයේ ය. එහෙත් ඉගෙනුමෙහි දක්‍ෂයකු නො වූ හෙතෙම සිවු මසක් ම උත්සාහ කිරීමෙන් ද එක් ගාථාවක් පාඩම් කර ගන්නට අසමත් වූයේ ය. මේ අතරතුර දිනක් ජීවක වෛද්‍යවරයා බුදු පාමොක් මහ සඟනට දානයකට ඇරයුම් කිරීම පිණිස පැමිණියේ ය. එ සමයෙහි ඇරයුම් බාර ගැනීම කළේ මහාපන්ථක හිමියන් විසිනි. උන්වහන්සේ එදින ඇරයුම බාර ගනිද්දී චුල්ලපන්ථක හිමියන් අතහැර පිළිගත් හ. ඒ ඇසූ චුල්ලපන්ථක හිමියෝ මහත් කණස්සල්ලට පත්ව සසුනෙන් ඉවත් වන්නට තීරණය කළේ ය. ඒ ගැන දැනගත් භාග්‍යවතුන් වහන්සේ චුල්ලපන්ථක හිමියන් තමන් වෙත කැඳවාගෙන ගන්ධකුටි දොරටුවෙහි රඳවා සුදු ලේන්සුවක් අතට දී හිරු නැගෙන දිසාවට මුහුණ ලා 'රජෝ හරණං' (දුවිලි පිස දමමි) යි කියමින් එය පිස දමන සේ උපදෙස් දුන් හ. උන්වහන්සේ එසේ කරන අතරතුර බුදුරජාණන් වහන්සේ සඟගණ පිරිවරා ජීවක ගේ නිවසට වැඩම කළ හ.

මේ අතර තුර ලේන්සුව පිස දමමින් සිටි චුල්ලපන්ථක හිමියන්ට තම පිස දැමීම නිසා රෙදි කඩ කිළිටි වන ආකාරය දැක ගන්නට ලැබිණ. ලොව සියල්ලෙහි යථාර්ථය දැන ගන්නට මෙය මඟක් කර ගත් චුල්ලපන්ථක හිමියෝ අසුභය, අනිත්‍යය ගැන මනාව පසක් කර ගත්හ. ජීවක ගේ නිවසේ සිටිමින් ම චුල්ලපන්ථක හිමියන් ගේ සිත විනිවිද දත් බුදුරජාණන් වහන්සේ ආලෝකයක් යවා මෙසේ ඇසෙන්නට සැලැස්වූ හ. "චුල්ලපන්ථක ලේන්සුව පමණක් නො වෙයි, ඔබ තුළත් කිළිටි තිබෙන බව සිතන්න. කිළිටි හෙවත් කෙළෙස් දුරු කිරීමෙන් පමණයි කෙනකු රහත් බව ලබන්නේ."

බුදුරජාණන් වහන්සේ ගේ සන්දේශය මැනවින් ග්‍රහණය කරගත් චුල්ලපන්ථක හිමියෝ රහත් ඵලය ලබා ගත් හ.

ජීවක වෙදැදුරාණන් ගේ නිවසෙහි දානමය පුණ්‍ය කර්මය ආරම්භ කිරීම පිණිස ආහාර පිළිගන්වන්නට සැරසෙත් ම භාග්‍යවතුන් වහන්සේ ආරාමයෙහි තව භික්ෂූන් වහන්සේලා සිටිත්දැයි විමසූ හ. කිසිවකු නැතැයි පිළිතුරු ලැබුණ ද එය නො පිළිගත් භාග්‍යවතුන් වහන්සේ තව එක් නමක් සිටින බව පවසමින් එක් තැනැත්තෙකු අමතා "ඔබ ගොස් චුල්ලපන්ථක හිමියන් කැඳවාගෙන එන්න" යි උපදෙස් දුන්හ. පණිවුඩකරු ආපසු පැමිණියේ විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේ දහස් නමක් වැඩ හිඳින බව කියමිනි. ඒ හැම දෙන චුල්ලපන්ථක හිමියන් විසින් මවන ලද්දේ ය. "චුල්ලපන්ථක හිමි පමණක් කැඳවා ගෙන එන්න" යි දෙවන වර යවන ලදුව ඔහු ආපසු ආයේ, "හැම දෙන ම මම චුල්ලපන්ථකයැයි පැවසූහ" යි කියමිනි. "මුලින්ම මම චුල්ලපන්ථක යැයි කියන භික්ෂුනම ගේ අතින් අල්ලා ගන්න" යි ඔහුට භාග්‍යවතුන් වහන්සේ උපදෙස් දුන් හ. ඔහු එසේ කළ විට අනිත් පිරිස අතුරුදහන් වූ හ. චුල්ලපන්ථක හිමියෝ ඔහු සමග ජීවක මැදුරට පැමිණිය හ. දානය වළඳා නිම වූ පසු බුදුරජාණන් වහන්සේ භුක්තානුමෝදන බණ දෙසුම උන්වහන්සේට පැවරූ හ. සිංහනාදයක් පවත්වන්නා සේ මධුර ස්වරයෙන් හා නිරාකූලව චුල්ලපන්ථක හිමියෝ රම්‍ය වූ ධර්ම දේශනයක් කළ හ.

විවරණාත්මක අනුවාදය (25 ගාථාව)

උට්ඨානෙන අප්පමාදෙන සඤ්ඤමෙන දමෙන ච මෙධාවී
දීපං කයිරාථ යං ඔඝො න අභිකීරති.

උට්ඨානෙන: උත්සාහයෙන්; **අප්පමාදෙන**: අප්‍රමාදයෙන්; **සඤ්ඤමෙන**: සංයමයෙන්; **දමෙන**: දමනයෙන්; **ච**: ද; **මෙධාවී**: නුවණැත්තා; **දීපං**: දිවයිනක්; **කයිරාථ**: නිර්මාණය කර ගන්නේ ය; **යං**: යම් (දිවයිනක්); **ඔඝො**: සැඩ පහරින්; **න අභිකීරති**: යට නො වන්නේ ද (එවැනි දිවයිනක් තනා ගනියි).

නුවණැති තැනැත්තා උත්සාහයෙන්, අප්‍රමාදයෙන්, සංයමයෙන් හා ඉන්ද්‍රිය දමනයෙන් සැඩ පහරට හසු නොවන දිවයිනක් තනා ගනියි.

විවරණය

මෙධාවී: යන්නෙන් ප්‍රඥාවන්තයා අදහස් වෙයි. සංස්කාර ධර්මයන් ගේ අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම ලක්‍ෂණ දක්නා විදර්ශනා ඥානය 'මේධා' නම් වන බව අටුවාවෙහි දැක්වෙයි.

දීපං: යන්න පහන යන අර්ථය ද ඇති පදයක් වුව ද මෙහි දී මෙන්ම අත්ත දීපා විහරථ යන මහා පරිනිබ්බාණ සුත්ත පාඨයෙහි ද යෙදී ඇත්තේ දිවයින යන අර්ථයෙන් ය. කාම, දිට්ඨි, භව හා අවිජ්ජා යන මහ ගංවතුරු වලින් හානියක් නො වන පරිද්දෙන් මේ දිවයින නිර්මාණය කර ගත යුතුය.



බාල වූ අනුවණ ජනයන් ප්‍රමාදයෙහි යෙදී වෙසෙන අතර, නුවණැත්තා නොපමා ගුණය මාහැගි දනයක් සේ රකී.

26. පමාදමනුයුඤ්ජන්ති
බාලා දුම්මෙධිනො ජනා
අප්පමාදඤ්ච මෙධාවී
ධනං සෙට්ඨං'ව රක්ඛති (2:6)

නුවණ මඳ අමන දන
පමා වෙති තතු නො දැන
නොපමාව නැණැති දන
රකිති ලෙස මහඟු දන

සම්පතක් වේ අප්‍රමාදය

2 (4) බාල නක්ඛත්ත උත්සවයේ විත්තිය (26 සහ 27 ගාථා)

ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි නුවණ මඳ පොදු ජනතාව අතර ජනප්‍රිය වූ එක් නැකැත් කෙළියක් ඇරඹ භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ.

එසමයෙහි එක් දිනක් මේ නැකැත් උත්සවය සැවැත් නුවර වැසියන් විසින් සංවිධානය කරන ලදී. මේ උත්සවයෙහි විශේෂාංගයක් වූයේ මිනිසුන් තම සිරුරු අළු හා ගොම වලින් තවරා ගෙන විවිධ අසභ්‍ය වචන අඩංගු විහිළු තහළු කරමින් ගෙයක් පාසා යාම ය. මොවුන් පැමිණි විට නිවැසියන් ඔවුනට මුදල් දිය යුතු ය. විහිළු තහළු අසභ්‍ය හෙයින් පැමිණෙන විට ම මුදලක් දී හරවා යැවීම විනීතයන් ගේ සිරිතයි. උත්සවය දින හතක් පැවැත්වෙයි.

මෙය එක් විදියක 'අවිනීත සමයක්' හෙයින් වැඩිහිටියන්, පැවිද්දන්, මිතුරන්, නෑදෑයන් ආදී විශේෂයක් නො තකා අසභ්‍ය විහිළු කිරීම සිරිත ය. එකල සැවැත් නුවර බෞද්ධයෝ පන් කෝටියක් පමණ විසූහයි කියති. ඔවුහු මේ උත්සව සමයෙහි විනෝදවන අඥාන ජනයා ගෙන් භාග්‍යවතුන් වහන්සේට හෝ භික්ෂු සංඝයාට අවමන් වනු නො රිසිව මෙසේ ආරාධනා කළහ.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේත් සියළු ම භික්ෂු සංඝයා වහන්සේත් ආරාමයෙන් පිටතට වැඩම නො කර ආරාමය තුළ ම වැඩ හිඳින සේක්වා. මේ දින හත අපි දාන මානාදිය සකසා විහාරයට ම එවමු. අපිත් පිටත සැරි සැරීමෙන් තොරව අපේ නිවෙස් තුළ ම කල් ගත කරමු" මෙසේ ඇරයුම් කළ ඔවුහු ඒ සතිය මහත් අපහසුවෙන් ගෙවා ගත් හ.

අටවන දින සියලු සැණකෙළි නිම වූ පසු සැදැහැවත්හු එක්ව බුදුපාමොක් මහ සඟගණ නුවරට වඩමවා, මහ දන් පවත්වා විවිධ පූජෝපහාර පැවැත්වූ හ. අනතුරුව එකත් පසෙක හිඳ "ස්වාමීනි, මේ සත් දවස ඉතා අපහසුවෙන් ගෙවා ගත්තෙමු. ඒ අසභ්‍ය කථා බහ කන් වලට යහුල් වලින් අනින්නා වැනි විය. ඔබ වහන්සේලාට ආරාමයටම වී සිටින්නැයි අප ඇරයුම් කළේ ඒ නිසා ය"යි පැවසූ හ. ඒ අසා සිටි භාග්‍යවතුන් වහන්සේ "අඥානයන් මෙසේ තම කාලය වැරදි ලෙස භාවිත කරමින් හැසුරුණත් නුවණැත්තෝ අප්‍රමාදීව ක්‍රියා කොට සසර දුක් කෙළවර කර ගනිති" යි වදාරා මේ ගාථාව ද දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (26 ගාථාව)

බාලා දුම්මෙධිනො ජනා පමාදං අනුයුඤ්ජන්ති මෙධාවී ච අප්පමාදං සෙට්ඨං ධනං ඉව රක්ඛති.

බාලා: සාරධර්ම නොදත්; **දුම්මෙධිනො**: නුවණ මඳ; **ජනා**: මිනිස්සු; **පමාදං**: ප්‍රමාදී හැසිරීම් වල; **අනුයුඤ්ජන්ති**: යෙදෙති; **මෙධාවී ච**: නුවණැත්තා නම්; **අප්පමාදං**: අප්‍රමාදය; **සෙට්ඨං**: ශ්‍රේෂ්ඨ; **ධනං ඉව**: ධනයක් මෙන්; **රක්ඛති**: රැක ගනියි.

නුවණ නැති, සාරධර්ම නො හඳුනන පුද්ගලයෝ අර්ථ ශූන්‍ය විනාශකාරී හැසිරීම් වල යෙදෙති. එහෙත් නුවණැත්තෝ අප්‍රමාදය උතුම් ධනයක් මෙන් සුරකිති. (නාස්තිකාරී ක්‍රියාවල නො යෙදෙති)

විවරණය

බාලා: නමින් ජන කොටසක් නිතර ම පාහේ බෞද්ධ දේශනාවල වගී කරනු ලැබේ. මේ නම්, අනුවණ, නූගත්, නො පැසුණු පුද්ගලයෝ ය. මෙයින් ඔවුන් ගේ ශිල්ප කලා නෛපුණ්‍යයෙහි අඩු පාඩුකම් ගැන කියැවෙතැයි නො සිතිය යුතු ය. යථාර්ථාවබෝධය අතින් හෙවත් විදග්ධභාවය ඔවුන් දුර්වල බව මෙයින් හැඟවෙයි. ලෝකස්වභාවය ගැන අවබෝධය අඩු මෙවැන්නෝ බොළඳ, නොමේරූ හැසිරීම් වල යෙදෙති. ඔවුහු පස්කම් සැපයෙහි ම ගැලෙමින් කාමසුඛල්ලිකානුයෝගය ම ප්‍රිය කරමින් ජීවත් වෙති. ගුණ දම් වැඩීමක් හෝ ගැඹුරු දාර්ශනික යථාර්ථයක් තේරුම් ගැනීමේ වෑයමක් නො දරති. ඔවුහු තමන්ට මෙලොවට හා පරලොවට හිතකර දේ කවරේදැයි තේරුම් ගන්නට අසමත් වෙති.

පමාදං අනුයුඤ්ජන්ති: යන්නෙහි 'පමාද' හෙවත් ප්‍රමාදය නම් මත් වීමයි. ගැඹුරට සිතන්නට ශක්තිය නැත්තෝ චිත්තවේග මගින් මුළාකරන ලදුව මත් වෙති. සිය ආවේග පාලනය කර ගන්නට අසමත් වෙති. 'මේ නො වැඩුණු ආවේග තත්ත්වය' එක්තරා විදියක නියුරෝසියාවකැයි කීමේ වරදක් නැත.

සෙට්ඨං ධනං ඉව: යන්න අගනා ධනයක් මෙන් තම සිහි නුවණ, විචක්ෂණ චින්තනය රැක ගත යුතු යැයි අවධාරණය කරනු වස් දක්වන ලදි. පැරණි පොත් වල ඉතාම අගනා ධන සප්තකය ලෙස රන්, රිදී, මුතු, මැණික්, වෙරළු, විදුරු, පබලු යන හත දැක්වෙයි. බුරුමයේ ඡට්ඨ සංගායනාවෙන් අනුමත ත්‍රිපිටකයෙහි මෙම පාඨය ධනං සෙට්ඨංව සේ දැක්වෙයි. ඇතැම් පැරණි සංස්කරණවල එසේ ම ආයේ ය. එවිට අර්ථය-"සිටුවරයකු ධනය රකින්නාක් මෙන්" ලෙස ගත යුතු ය.



කම් සුවයෙහි යෙදීම් හැර නොපමාව ධ්‍යාන භාවනා කරන තැනැත්තා විපුලවූ අමා සුව ලබයි.

27. මා පමාදමනුයුඤ්ජෙථ
මා කාමරතිසන්ථවං
අප්පමත්තො හි ඣායන්තො
පප්පොති විපුලං සුඛං (2:7)

නො ඇලී පමාවෙහි
නො ගැලී කාම සුවයෙහි
නො පමාව බවුන් වඩමින්
පැමිණෙති උතුම් සුවයට

වැඩුවොත් බවුන් - ලද හැක උතුම් නිවන්

2 (4) බාල නක්ඛත්ත උත්සවයේ පුවත (26 සහ 27 ගාථා) (ඉතිරි කොටස)

විවරණාත්මක අනුවාදය (27 ගාථාව)

පමාදං මා අනුයුඤ්ජෙථ කාමරතිසන්ථවං මා (අනුයුඤ්ජෙථ) අප්පමත්තො ඣායන්තො හි විපුලං සුඛං පප්පොති.

පමාදං: ප්‍රමාදයෙහි; **මා අනුයුඤ්ජෙථ**: නො යෙදෙන්න; **කාමරතිසන්ථවං**: කාමාස්වාදයෙහි; **මා (අනුයුඤ්ජෙථ)**: නො යෙදෙන්න; **අප්පමත්තො**: අප්‍රමාදීව; **ඣායන්තො**: ධ්‍යාන වඩන්නා; **හි**: ඒකාන්තයෙන් ම; **විපුලං සුඛං**: ශ්‍රේෂ්ඨ වූ සැපතට; **පප්පොති**: පැමිණෙයි.

පමා නොවන්න. කාමාස්වාදයෙහි නො ගැලී අප්‍රමාදව භාවනා කරන පුද්ගලයා ඉමහත් සුව ලබා ගනියි.

විවරණය

කාමරති සන්ථවය: නම් කම් සුව විඳීමෙහි යෙදීම ය. කාමාස්වාදයෙහි ගැලී සිටින විට මනස කැළඹෙයි. සහනයක් නො ලබයි. සත්‍ය ගවේෂණයෙහි ලා උද්‍යෝගයක් ඇති නො වේ. කම් සැපට ගිජුවන පුද්ගලයා බන්ධනයට හසුවෙයි. කාමය පිපාසයක් වැනිය. කාමයෙන් පිපාසිතව කාමයෙන් දැවෙන පුද්ගලයෝ දිගින් දිගට ම සසර දුක් විඳිති. බෞද්ධ විග්‍රහයට අනුව කුඩා පෞද්ගලික ගැටුම් වල පටන් ලෝක යුද්ධ දක්වා සියළු කලි කලහ පසු පස ඇත්තේ තෘෂ්ණාව ය. රට්ඨපාල සූත්‍රයෙහි දැක්වෙන්නේ මෙසේ ලෝකයා නිතරම අඩු පාඩු කම් ගැන ම සිතමින් අතෘප්තියෙන් පීඩා විඳිමින් තෘෂ්ණාවට දාසව සිටින බව ය.

කාමය වස්තු කාම හා ක්ලෙශ කාම වශයෙන් දෙවැදෑරුම් ය. අපේ සිත් ඇදගන්නා රම්‍ය වස්තු වස්තු කාම වශයෙන් හැඳින් වේ. ඒවායෙහි රම්‍ය භාවය පඤ්චේන්ද්‍රිය මගින් අපි ආස්වාදනය කරමු. මෙම කාම වස්තූන් විෂයෙහි ඇතිවන දැඩි ඇල්ම, කැමැත්ත, ග්‍රහණය ක්ලෙශ කාම නම් වෙයි. ක්ලේශ කාමය විසින් වස්තු කාමය ප්‍රාර්ථනය කරනු ලැබේ.

මෙබඳු කාම වස්තූන් කෙරේ ඇති ආශාව කාමරතියයි. කාම රතිය හා සමග ම බැඳී පැවැත්ම සඳහා වන ආශාව ද වෙයි. කාමච්ඡන්ද නමින් හැඳින්වෙන්නේ ද රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන දේ කෙරේ ඇති ආශාවයි. සාමාන්‍ය පෘථග්ජනයෝ මේවාට ආශක්ත වෙති. කාමාශාව අඩු කිරීම පිණිස උපස්ථම්භක වන කරුණු හයකි.

1. කාම වස්තූන් ගේ අසුභ ස්වභාවය මෙනෙහි කිරීම.
2. පිළිකුල් භාවනාව නිතර නිතර වැඩීම.
3. ඉන්ද්‍රිය දමනය.
4. භෝජනයෙහි පමණ දැනීම.
5. කල්‍යාණ මිත්‍ර සේවනය.
6. ප්‍රයෝජනවත් කතා බහ.

ෂඩින්ද්‍රිය හා සම්බන්ධ වූ කාමාශාව හෙවත් තෘෂ්ණාව ෂඩ්විධ තෘෂ්ණාව ලෙස හැඳින් වේ. මේ හය බාහිර හා ආධ්‍යාත්මික වශයෙන් ගත් විට දොළොස් වැදෑරුම් වේ. එම දොළස අතීත, වර්තමාන හා අනාගත යන කාල තුනට යෙදූ විට 36 ක් වෙයි. මේවා කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙන් ත්‍රිවිධ වූ විට 108 ක් බවට පත් වේ.

භව චක්‍රයෙහි ඉතා වැදගත් සන්ධිස්ථාන වන්නේ අවිද්‍යා හා තෘෂ්ණාවයි. අවිද්‍යාව අතීත හේතුවක් සේ ද තෘෂ්ණාව වර්තමාන හේතුවක් සේ ද දක්වා ඇත. සත්ත්වයා පුනර්භව වශයෙන් දිගින් දිගට සසරේ දුක් විඳින්නේ මේ හේතුවෙනි. එහෙයින් මෙම අවිද්‍යාව හා තෘෂ්ණාව මූලෝත්පාටනය කිරීම මගින් සංසාර දුක්ඛයෙන් මිදී විමුක්තිය සාධනය කරගත හැකි ය.

මාපමාදමනුයුඤ්ජෙථ: යන අවවාදය සත්‍යාවබෝධය අපේක්ෂා කරන්නවුන් සඳහා කෙරෙන අවවාදයකි. විමුක්තිය ප්‍රාර්ථනා කරන්නේ නම් මොහොතකටවත් උට්ඨාන වීර්‍ය්‍යය ලිහිල් නො කළ යුතු ය. එමෙන් ම පෘථග්ජන ස්වභාවය වර්ධනය කරන සුළුපැවතුම් වර්ජනය කළ යුතු ය. බැඳීම් විමුක්තියට ඇති මහා බාධාවකි.



සෝකය දුරු කළ තැනැත්තා පව්වක සිටියකු බිම සිටිනවුන් දක්නා සේ, සෝකයෙන් පෙළෙන සත්කැල දකියි.

28. පමාදං අප්පමාදෙන
යදා නුදති පණ්ඩිතො
පඤ්ඤාපාසාදමාරුය්හ
අසොකො සොකිනිං පජං
පබ්බතට්ඨො’ව භුම්මට්ඨෙ
ධීරො බාලෙ අවෙක්ඛති (2:8)

අප්‍රමාදය වහල් කර ගෙන
ප්‍රමාදය පරදවන පඬි දන
නුවණ ප්‍රාසාදයට නඟිමින
දුරුර සෝකය සෝක වන දන
කඳු මුදුන සිට පහල නරඹන
විලස නරඹයි දනන් අනුවණ

දුරැර තම සෝකය - බලයි සෝකී ලෝකය

2 (5) මහා කස්සප හිමියන් ගේ වස්තුව (28 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි **මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ** නිමිති කොට මේ ගාථාව වදාළ සේක.

එක් දිනක් පිප්පලි ගුහාවෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ අළුයම පිබිද අද ම විසින් කාහට අනුග්‍රහ දැක්විය යුතු දැයි මහා කරුණා සමාපත්තියෙන් ලොව බලා වදාළ සේක. දුප්පත්, පොහොසත් භේදයක් නැතිව ගොඩ බිම-ජලාශය යැයි වෙනසක් නැතිව සමස්ත ලෝ තලයම පීරා බලන භාග්‍යවතුන් වහන්සේ ගේ කරුණා ජාලයට මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ලක් වූහ.

මහ කසුප් තෙරණුවෝ ඒ මොහොතේ සත්ත්වයන් ගේ චුති-උත්පත්ති විමසමින් උන් හ. ලෝකයේ විවිධ සත්ත්වයන් උපදිනු, මියයනු, නැවත උපදිනු උන්වහන්සේ ගේ දිවැසට ලක් විය. මෙසේ දිවැසින් විවිධ සත්ත්වයන් ඉපැදෙන-මැරෙන විලාසය නිරීක්‍ෂණය කරමින් උන් මහා කාශ්‍යප මහා ස්ථවිරයන් වහන්සේ දුටු භාග්‍යවතුන් වහන්සේ එම ක්‍රියාව මහා ශ්‍රාවක නමකට අනුරූප නොවන බව පසක් කළ හ. අචින්ත්‍ය වූ සත්ත්ව විෂය ගෝචර වන්නේ බුදු කෙනෙකුන්ට ම පමනි. එහෙයින් මහ කසුප් තෙරුන් එම කාර්‍යයෙන් වළකා ලනු රිසි වූ භාග්‍යවතුන් වහන්සේ මහා කාශ්‍යප හිමියන් අමතා "කාශ්‍යපයෙනි, සත්ත්වයන් ගේ චුති-උත්පත්ති පිළිබඳ පූර්ණ වශයෙන් පසිඳ දැනීම ඔබට කළ නො හැක්කේ ය. ජීවත්වන සත්ත්වයෝ මිය ගොස් මාතෘ කුසයක ප්‍රතිසන්ධි ගනිති. ඒ පිළිබඳව මව හෝ පියා පවා නො දනියි. සමහරු මවුපියන් නො දැනම මිය යති. එබඳු සත්ත්වයන් ගේ ගණනක් මිම්මක් නම් නැත්තේ ය. එය ඔබ ගේ විෂය පථය ඉක්මවා සිටියි. ඔබ ගේ විෂය පථය සීමිත ය. සත්ත්වයන් ගේ චුති-උත්පත්ති නිරීක්‍ෂණය බුදුවරයකු විසින්ම කළ හැකි වන්නේ ය. ඔබ වැන්නකු විසින් කළ නො හැක්කේ ය"යි පැහැදිලි කළ සේක.

අනතුරුව මේ කාරණය සම්බන්ධයෙන් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (28 ගාථාව)

පණ්ඩිතො යදා අප්පමාදෙන පමාදං නුදති ධීරො
පඤ්ඤාපාසාදං ආරුය්හ අසොකො සොකිනිං පජං
පබ්බතට්ඨො භූම්මට්ඨෙ ඉව බාලෙ අවෙක්ඛති.

පණ්ඩිතො: ඥානවන්තයා; **යදා** යම් කලෙක; **අප්පමාදෙන**: අප්‍රමාදයෙන්; **පමාදං**: ප්‍රමාදය; **නුදති**: දුරු කරයි ද; **ධීරො**: නැණවතා; **පඤ්ඤාපාසාදං**: ප්‍රඥා ප්‍රාසාදයට; **ආරුය්හ**: නැගී; **අසොකො**: ශෝක දුරු කළේ; **සොකිනිං**: ශෝක කරන; **පජං**: ප්‍රජාව දෙස; **පබ්බතට්ඨො**: පර්වතයක මුදුනට නැග ගත් අයෙක්; **ඉව**: මෙන්, **භූම්මට්ඨෙ**: පහළ සිටින්නවුන්; **බාලෙ**: බාලයන් දෙස; **අවෙක්ඛති**: බලයි;

අප්‍රමාදයෙන් ප්‍රමාදය දුරු කළ නුවණැත්තා ප්‍රඥාව නම් ප්‍රාසාදයට නැඟී, පර්වතයක් මුදුනට නැග ගත්තෙක් පර්වත පාමුල සිටින ජනයා දෙස බලන්නාක් මෙන්, තමා ශෝක දුරු කර, ශෝක කරන ප්‍රජාව දෙස බලයි.

විවරණය

සොකිනිං පජං: යන්නෙන් මෙහි දී සමස්ත සත්ත්ව ලෝකය ම ගැනේ. අවිද්‍යාව හා තෘෂ්ණාව මූලෝත්පාඨනය නො කළ හේතුවෙන් සසර ඉපදී මැරෙමින් දුක් විඳින සමස්ත ප්‍රජාව සෝකිනිං පජං ලෙස හැඳින්වේ. සත්ත්වයාට සංසාරයේ දී සැප සම්පත් විඳ ගැනීමේ අවස්ථාව ලැබෙන නමුත් සැප සම්පත් තාවකාලික හෙයින් ද සැප සම්පතින් ලබන ආස්වාදය කෙටි කාලීන හෙයින් ද ඒවා ද ශෝකයට ම හේතු වෙයි. ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස ආදිය නිසා සත්ත්වයෝ නිරන්තරයෙන් ම ශෝක කරති.

අසොකො නමින් මෙම ශෝකී ප්‍රජාව විඳගන්නා විවිධ දුක්ඛ දෝමනස්සයන් ගෙන් තොර වූ ප්‍රාඥයා අදහස් වෙයි. අභිඥා ලාභී මහ රහතන් වහන්සේලාට ශෝකයෙන් තොරව සත්ත්වයන් දෙස බැලීමේ ශක්තිය ලැබේ.

පණ්ඩිතයා හෙවත් විචක්‍ෂණ නුවණින් සමන්විත පුද්ගලයා කිසි ම ලෞකික සම්පත්තියකින් මත් නො වී කුසල් දම් වඩා සසර බැම් සිඳ විමුක්ති ප්‍රතිලාභී වූ විට සියළු දුකින් මිදී සතුටට පත් වෙයි. එසේ වූ විට ඔහු පර්වතයක හෝ ප්‍රාසාදයක මුදුණේ සිටින්නකු මෙනි. ඔහු ලබා ඇති ප්‍රඥාව නො ලත් සාමාන්‍ය පෘථග්ජනයෝ පර්වත පාදයක සිටින්නෝ වැන්නෝ ය. විමුක්තිය ලැබ ගත් තැනැත්තා මහත් අනුකම්පාවෙන් ඔවුන් දෙස බලයි.

සත්ත්වයන් විඳින දුක් පිළිබඳ පූර්ණ විග්‍රහයක් වූ දුක්ඛ සත්‍යයෙහි කාටත් පොදුවේ වැටහෙන කායික මානසික දුක් මෙන් ම සියුම් ලෝක ස්වභාවය ගැන ද අන්තර්ගතය. පොදුවේ කවුරුත් දන්නා පැහැදිලි දුක්, දුක්ඛ, දුක්ඛෙ නමින් හැඳින්වේ. බොහෝ පෘථග්ජනයන් දුක යැයි හඳුන්වන්නේ එපමණකි. එහෙත් දුක්ඛ සත්‍යය නම් එයින් එහාටත් විහිදුණකි. සියළු සැප වේදනාවන් දුක් බවට පරිවර්තනය වෙතැයි තේරුම් ගැනීම පහසු නැත. එහෙයින් එය තේරුම් ගැනීම විපරිණාම දුක්ඛ වශයෙන් හැඳින්වෙයි. ඊටත් වඩා ගැඹුරු හා අවබෝධය දුෂ්කර තත්ත්වය සංඛාර දුක්ඛ නමින් හැඳින්වෙයි. සමස්ත සංස්කාර ධර්‍ම සමූහය ම පටිච්ච සමුප්පන්න වූ, ස්ව-භාවයකින් තොර වූ (ස්වාධීන පැවැත්මක් නැත්තා වූ) දේ බව වටහා ගැනීම දුක්ඛ සත්‍යාවබෝධයට තුඩු දෙයි. මෙම උසස් මට්ටම 'සංඛාර දුක්ඛ' අවබෝධය ලෙස දැක්වේ.

නො පමාව නිදිවරා බවුන් වඩන උතුම් නුවණැත්තා වහා නිවන් පසක් කරන්නේ ය.

29. අප්පමත්තො පමත්තෙසු
සුත්තෙසු බහු ජාගරො
අබලස්සං'ව සීඝස්සො
හිත්වා යාති සුමෙධසො (2:9)

පමාවූවන් අතර - නො පමාව වසමින්
නිදා සිටිනවුන් මැද - අවදියෙන් පසුවෙමින්
අබල අසු පරදමින් - පෙරට යන වේගවත්
අසෙකු මෙන් පෙරට යයි - නුවණ ඇති දන මහත්

නො පමා දන - යති පෙරමුණ

2 (6) යහළු දෙනමක ගේ පුවතක් (29 ගාථාව)

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසමින් මිතුරු **දෙනමක්** නිමිති කරගෙන මේ ගාථාව වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ ගෙන් භාවනා කර්මස්ථාන ලබා ගත් මේ දෙනම භාවනා පිණිස ආරණ්‍යයට ගිය හ. ඒ දෙනමගෙන් එක් නමක් දවල් දවසෙහි දර එක් රැස්කර රාත්‍රියෙහි ප්‍රථම යාමයෙහි දී ගිනි ගොඩක් ගසයි. ඒ වටා වාඩි වී සාමණේරවරුන් සමග ඕපාදූප-ප්‍රලාප කතා බහෙහි මැදියම් රැය වන තුරු කල් යවයි. අනිත් හිමි නම මුල් යාමය භාවනාවෙන් ගත කරයි. තම මිතුරු හිමි නම ප්‍රමාදයෙන් කල් යවනු දුටු භාවනා කරන හිමි නම "අප වනගත වූයේ බුදුරදුන් වෙතින් කර්මස්ථාන ලබා ගෙන හෙයින් කථා බහින් කල් යැවීම අනුචිත ය. එහෙයින් පමා නො වී භාවනාවෙහි නිරත වන්නැ"යි අවවාද කළ හ. එහෙත් ඒ නොතකා ප්‍රමාදී භික්ෂුව තම චාරිත්‍රය එසේම කරගෙන ගියේ ය. අප්‍රමාදී භික්ෂුව ද අවවාද පිළි නො ගන්නා මොහුට අවවාද කර කුමට වෙහෙසෙම් දැයි සිතා තමන් ගේ සුපුරුදු භාවනාවෙහි යෙදෙයි.

රාත්‍රී ප්‍රථම යාමය භාවනාවෙන් කල් ගෙවන අප්‍රමාදී හිමි නම මැදියම් යාමයෙහි නින්දට යයි. ඒ දැක ප්‍රමාදී භික්ෂුව "වනගත වූයේ නිදන්නට නො වේ. ඔබ කමටහන් ලැබ අවුත් ප්‍රමාදීව වාසය කරනවා නො වේදැ"යි. භාවනා යෝගී භික්ෂුවට චෝදනා කරමින් සිය කුටියට වැදී දොර වසා ගෙන නිදයි. අප්‍රමාදී භික්ෂුව රාත්‍රී මධ්‍යම යාමය පමණක් නිදා අලුයම් යාමයෙහි නැඟී භාවනා කරයි. මේ අප්‍රමාදී චර්යාව හේතුවෙන් උන්වහන්සේ ඉතා සුළු කලකින් ම රහත් ඵලය ලබා ගත් හ. ප්‍රමාදී හිමි නම මුළු වස් කාලය ම ගිනි තපිමින් ඕපාදූප දොඩවමින් ගත කළේ ය. වස් කාලය නිම කළ දෙනම භාග්‍යවතුන් වහන්සේ බැහැ දැකීම පිණිස දෙව්රමට පැමිණිය හ.

"මහණෙනි, ඔබ දෙදෙනා ම තම ආරණ්‍ය වාසය අප්‍රමාද විහරණයෙන් සාර්ථක කර ගෙන හොඳ ප්‍රතිඵල ලබා පැමිණියේ යැයි සිතමි"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ. එවිට ප්‍රමාදී භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ අමතමින් "ස්වාමීනි, මේ භික්ෂුව අප්‍රමාද විහරණයෙන් වස් කාලය ගත කරන්නේ කෙසේ ද? ආරණ්‍යයට ගිය දා පටන් ම හේ නිදා ගැනීම හැර වෙන යමක් නො කළේ ය"යි පැවසී ය. "ඔබ කල් ගත කළේ කෙසේ ද?"

"ස්වාමීනි, මම දවල් දවසේ දර කඩා එක් රැස් කළෙමි. ප්‍රථම යාමය ගිනි දල්වා මා උණුසුම් කර ගතිමි. ප්‍රථම යාමයෙහි නො නිදාම අවදියෙන් සිටියෙමි."

"මහණ, ඔබේ කාලය ඔබ ප්‍රමාද විහරණයෙන් ගත කර ඇත. ඔබ කාලය නාස්ති කර පමාව සිට 'මම අප්‍රමාදීව කාලය ගත කළෙමි' යි කියයි. ඔබ ප්‍රමාදය අප්‍රමාදය ලෙසත්, අප්‍රමාදය ප්‍රමාදය ලෙසත් පටලවා ගෙන ඇත. ඔබ සමඟ සසඳන විට මපුතු දුබල අසකු පරදවා පෙරට යන ප්‍රබල අශ්වයකු මෙන් ඉදිරියට ගොස් ඇත." යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ හ.

විවරණාත්මක අනුවාදය (29 ගාථාව)

පමත්තෙසු අප්පමත්තො සුත්තෙසු බහුජාගරො
සුමෙධසො සීඝස්සො අබලස්සං ඉව හිත්වා යාති.

පමත්තෙසු: ප්‍රමාදවන්නවුන් අතර; **අප්පමත්තො**: අප්‍රමාදී වන; **සුත්තෙසු**: නිදන්නවුන් අතර; **බහු ජාගරො**: වැඩිපුර අවදියෙන් සිටින; **සුමෙධසො**: ප්‍රඥාවන්තයා; **සීඝස්සො**: ජවාධික අශ්වයෙක්; **අබලස්සං ඉව**: දුබල අශ්වයකු මෙන්; **හිත්වා**: පසු කරමින්; **යාති**: ඉදිරියට යයි.

අන් අය ප්‍රමාද බහුලව නිතර නිදමින් කල් ගත කරන විට අප්‍රමාදීව, වැඩිපුර අවදියෙන් සිටින අතිශය ඥානවන්ත පුද්ගලයා දුර්වල අශ්වයකු පරදවා ඉදිරියට යන දක්ෂ අශ්වයකු මෙන් ඉදිරියට යයි.

විවරණය

මේ ගාථාවෙන් ප්‍රමාද නො වී නින්ද අඩුකර අවංකව භාවනා වඩන භික්ෂුව ප්‍රමාදී, නිද්‍රාපරවශ භික්ෂුව අබිබවා පෙරට යන අයුරු දැක්විණ. ඒ සඳහා යොදා ගත් උපමාව සිත් ගන්නා සුළු ය. දුබල අශ්වයකුට කිසි කලෙක ප්‍රබල අශ්වයකු පරදවා ධාවන තරඟයෙන් ජය ගත නො හැක. එසේ ම වීර්යාධික අප්‍රමාදී පුද්ගලයා පරදවන්නට ප්‍රමාදී පුද්ගලයා සමත් නො වෙයි.



අප්‍රමාද ගුණය රැකීම හේතුකොටගෙන මඝ නම් තරුණයා සක්දෙව් රජය ලැබීය.

30. අප්පමාදෙන මඝවා	අප්‍රමාදයෙන් මඝ තෙම
දෙවානං සෙට්ඨතං ගතො	ලැබුවා සක් දෙව් පදවිය
අප්පමාදං පසංසන්ති	අප්‍රමාදය ම පසසත්
පමාදො ගරහිතො සදා (2:10)	පමාව හැමදා ගරහත්

වැඩුවෙන් අප්‍රමාදය - හිමි විය ශක්‍ර පදවිය

2 (7) මඝ මානවක වෘත්තාන්තය (30 ගාථාව)

බුදු පියාණන් වහන්සේ විශාලා මහ නුවර කූටාගාර ශාලාවෙහි වැඩ වාසය කරන සේක් දෙවියන් ගේ අධිපති වූ **ශක්‍ර දේවේන්ද්‍රයා** අරමුණු කර ගෙන මේ ගාථාව දේශනා කළ සේක.

භාග්‍යවතුන් වහන්සේ සක්ක පඤ්හ සූත්‍රය දේශනා කළ බව ආරංචි වූ මහාලි නම් ලිච්ඡවි කුමාරයෙක් මෙසේ සිතී ය. "ශක්‍රයා ගේ ආශ්චර්යය භාග්‍යවතුන් වහන්සේ විසින් විස්තර කර ඇත. එහෙත් ඇත්තෙන් ම භාග්‍යවතුන් වහන්සේ ශක්‍රයා දැක තිබේ ද? උන්වහන්සේ ශක්‍රයා සමග කතා බහ කර තිබේ ද? නැතහොත් උන්වහන්සේ තමන් නුදුටු ශක්‍රයෙක් ගැන වර්ණනා කරනවා ද? මම උන්වහන්සේ හමු වී මෙහි ඇත්ත නැත්ත පැහැදිලි කර ගනිමි".

මෙසේ සිතා භාග්‍යවතුන් වහන්සේ හමුවට ගිය හෙතෙම උන්වහන්සේට වැඳ එකත්පස්ව සිට උන්වහන්සේ සමග පිළිසඳර කතා නිමවා "භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ ශක්‍ර දේවේන්ද්‍රයා දැක තිබේ ද?"යි විමසූ හ.

"එසේ ය මහාලි, මම ශක්‍ර දේවේන්ද්‍රයා දැක ඇත්තෙමි." "භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ දකින්නට ඇත්තේ ශක්‍ර දේවේන්ද්‍රයා වැනි වෙන කෙනෙකි. ශක්‍ර දේවේන්ද්‍රයා දැක ගැනීම ඉතා ම දුෂ්කර කරුණකි." "නෑ මහාලි, මම ශක්‍රයා හොඳින් දනිමි. ඔහු ශක්‍ර පදවිය ලද්දේ කවර ගුණ පිරීමෙන් ද යන්නත් මම දනිමි"යි පැවසූ භාග්‍යවතුන් වහන්සේ ශක්‍රයා ගේ උත්පත්ති කථාව මහාලිට පැහැදිලි කර දුන් හ.

"මහාලි, එක් පූර්වාත්මභාවයෙක ශක්‍ර දේවේන්ද්‍ර තෙම මනු ලොව ඉපිද සිටියේ ය. එකල ඔහු ගේ නම මඝ නම් විය. ඒ නිසා ඔහුට අද 'මඝවා' යයි ද කියති. හෙතෙම නුවරක් නුවරක් පාසා දන්සැල් සකස් කරවා දන් දුන්නේය. එහෙයින් ඔහුට 'පුරින්දද'යි කියති. ඔහු දන් දුන්නේ මනා පිළිවෙළට ය. එහෙයින් ඔහුට 'සක්ක' යැයි කියති. මිනිස් බව ලැබ සිටිත් දී හේ ආවාසයක් තනා පූජා කළේ ය. එහෙයින් ඔහුට 'වාසව' යැයි කියති.

ඔහුට දැන් එක මොහොතක් තුළ දහසක් කරුණු වටහා ගැනීමේ ශක්තිය ඇත. එහෙයින් ඔහුට 'සහස්සක්ඛ' යැයි කියති. ඔහුට සුජාතා නම් අසුර කන්‍යාවක් ආවාහ කර ගත හැකි වූ හෙයින් 'සුජම්පති' යැයි කියති. ඔහු තව්තිසාවෙහි දෙවියන්ට අධිපති හෙයින් 'දේවින්ද' යැයි කියති. ඔහුට 'ශක්‍ර දේවේන්ද්‍ර' භාවය ලබා ගැනීමට හැකි වූයේ මනුෂ්‍යාත්ම භාවයෙහි දී සප්තව්‍රත පද පූරණය කළ හෙයිනි. ඒ සප්ත ව්‍රත පද නම්,

1. දිවි තිබෙන තුරු ම මවු පියන් රැක බලා ගැනීම
2. කුල දෙටුවන් පිදීම.
3. මොළොක් බස් කතා කිරීම.
4. කේලාම් නො කීම.
5. මසුරු කම හැර දන් දීම
6. සත්‍යවාදිත්වය
7. කෝප නො ගැනීම යන ප්‍රතිපත්ති හතයි.

මේ ප්‍රතිපත්ති සප්තකය නො කඩවා ආරක්ෂා කළ හෙයින් හෙතෙම ශක්‍ර සම්පත්තිය ලැබී ය.

මෙසේ වදාළ භාග්‍යවතුන් වහන්සේ මඝ මානවකව උපන් සමයෙහි තරුණයන් තිස් දෙදෙනකු සමග එක්ව ගමක් සංවර්ධනය කිරීමට ක්‍රියා කළ අයුරුත් ඊට එරෙහි වූ ගම් මුලාදෑනියා රජතුමාට දන්වා ඔවුන් අත් අඩංගුවට ගත් අයුරුත් වදාල සේක. රජතුමා පසුව නියම තතු දැන ගෙන ඔවුන් නිදහස් කර උදවු උපකාර කළේ ය. මනු ලොව බොහෝ පින්කම් කර යහපත් ජීවිතයක් ගත කළ හේතුවෙන් ඔවුනට තමන් ගේම දේව ලෝකයක් 'තව්තිසා' නමින් නිර්මාණය විය. එහි අධිපති වූ මඝ ශක්‍ර දේවේන්ද්‍ර නමින් ප්‍රකට විය. මේ පුවත් මහාලිට පැවසූ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව ද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (30 ගාථාව)

මඝවා අප්පමාදෙන දෙවානං සෙට්ඨතං ගතො
අප්පමාදං පසංසන්ති. පමාදො සදා ගරහිතො

මඝවා: මඝ මානවක තෙම; **අප්පමාදෙන**: අප්‍රමාදයෙන්; **දෙවානං**: දෙවියන් ගේ; **සෙට්ඨතං**: නායකත්වයට; **ගතො**: පත් විය; **අප්පමාදං**: අප්‍රමාදය; **පසංසන්ති**: (නුවණැත්තෝ) පසසති; **පමාදො**: ප්‍රමාදය; **සදා**: හැමවිට ම; **ගරහිතො**: පහත් කොට සලකනු ලැබේ.

මඝ නම් තරුණයා දෙවියන් ගේ නායකත්වයට පත් වූයේ අප්‍රමාදය හේතුවෙනි. අප්‍රමාදය හැමදා නුවණැත්තන් ගේ ප්‍රශංසාවට ලක් වුවකි. ප්‍රමාදය කවදත් ගර්හාවට ලක් වුවකි.

විවරණය

පමාදො ගරහිතො සදා: ප්‍රමාදය හැමවිට ම පහත් කොට සලකනු ලබන්නේ ප්‍රමාද වූවනට උසස් ආධ්‍යාත්මික සාධන ලබා ගැනීමට කිසි කලෙක හැකි නොවන හෙයිනි. එය සියළු ලෞකික ගැටලු වලට ද මුල් වෙයි.

මඝවා: මඝ ගේ කතාව ජාතකට්ඨ කථාවෙහි මඝ මානවක ජාතකය වශයෙන් සවිස්තරව දැක්වේ.

දේව: නම් සියුම් ශරීර ඇති ආලෝකමත් උසස් ජීව විශේෂයකි. ඔවුහු දිව්‍ය ලෝකවල වාසය කරමින් කර්මානුරූපව උසස් සැප සම්පත් ලබති. ඒ හැර වෘක්ෂ දේවතා, වාස්තු දේවතා දී භූමාටු දේවතාවෝ ද වෙති. දෙවියන්ට පුණ්‍යානුමෝදනා කිරීම බෞද්ධයන් ගේ යහපත් චාරිත්‍රයකි. පින් ලබා සතුටට පත් වන දෙවියන් ගේ ආශීර්වාදය ලෞකික අර්ථසිද්ධියට ඉවහල් වෙයි.

පමා බැව්හි බිය දැක මහණ දම් වඩන තැනැත්තා කුදු මහත් සසර බැඳුම් වූ (රැහැන්) දවයි.

31. අප්පමාදරතො භික්ඛු
පමාදෙ භය දස්සි වා
සඤ්ඤොජනං අණුං ථූලං
ඩහං අග්ගී ව ගච්ඡති (2:11)

අප්‍රමාදයෙහි රුචි වන
ප්‍රමාදයේ නපුර දකින
හිමි නම සව් කෙළෙස් තවන
ගිනි දළුවකි බැඳුම් දවන

දවයි සංයෝජන - අප්‍රමාදය පැතිරෙන

2 (8) එක්තරා භික්‍ෂුවක ගේ වස්තුව (31 ගාථාව)

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් **එක්තරා භික්‍ෂුනමක්** මුල් කර මෙම ගාථාව වදාළ සේක.

මේ භික්‍ෂු නම රහත් වීම දක්වා අවශ්‍ය සියලු භාවනා කර්‍මස්ථාන සහ භාවනා උපදේශ තම ආචාර්යයන් වහන්සේ ගෙන් ලබා ගෙන ආරණ්‍ය වාසයට ගියේ ය. එහෙත් කවර තරම් උත්සාහ කළ ද උන්වහන්සේට අධිගමයක් ලබන්නට හැකි නො වී ය. අන්තිමේ උන්වහන්සේ මෙසේ සිතූ හ. "මම බුදු රදුන් හමු වී මගේ චරිතයට වඩාත් ගැළපෙන කමටහනක් ලබා ගනිමි."

මෙසේ සිතූ උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ බැහැ දැක කමටහන් ලබා ගැනීම පිණිස ගමනට පිටත් වූ හ. අතර මගදී උන්වහන්සේට මහා ලැව් ගින්නක් දක්නට ලැබිණ. ලැව් ගින්න වහ වහා පැතිරෙමින් පැවතිණ. එහෙයින් උන්වහන්සේ ලඟ ම වූ පර්‍වතයකට නැග ගත්හ. කඳු මත සිට ගින්න පැතිර යනු බලා සිටි උන්වහන්සේ මෙසේ සිතූ හ. "මේ ගින්න බුර බුරා නැගී වැඩෙන්නා සේ, සියලු බාධක දවා හරිමින් පැතිර යන්නා සේ මම ද සියලු බාධක දවා හැර ආර්‍ය්‍ය මාර්‍ගය පරිපූරණය කරමි."

මේ භික්‍ෂූන් වහන්සේ එදින භාග්‍යවතුන් වහන්සේ ගේ කරුණා ජාලයට හසු වී තිබිණ. සුවඳ ගඳ කිළියේ වැඩ වසමින් ම උන්වහන්සේ එම භික්‍ෂුව අමතා මෙසේ වදාළ හ. "භික්‍ෂුව, එය ඉතාමත් උචිත ය. කුඩු මහත් සියළු බාධක දවා ගෙන ලැව් ගින්න පෙරට යයි. ප්‍රඥාව නමැති ගින්න ද සියළු කුඩු මහත් තෘෂ්ණා බාධක දවා ගෙන පෙරට යා යුතු ය." තමන් වහන්සේ වෙතින් භාග්‍යවතුන් වහන්සේ එම භික්‍ෂුව වෙත යැවූ ආලෝක ධාරාව, භාග්‍යවතුන් වහන්සේ තමන් අභිමුඛයෙහි සිට ගාථාව දේශනා කරන්නා සේ උන් වහන්සේට දිස් විය.

භාග්‍යවතුන් වහන්සේ වදාළ ගාථාවට සවන් දුන් භික්‍ෂුව එතැන හිඳිමින් ම වහා සිය සිත කෙලෙසුන් ගෙන් මුදවා ගෙන සියළු කෙළෙසුන් දවා අභිඥා ලාභීව රහත් ඵලය ලැබූ හ. අනතුරුව අහසට නැගුණු උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ නිර්මිත ශරීරයට වන්දනා කොට ප්‍රශංසා කර නික්ම ගිය හ.

විවරණාත්මක අනුවාදය (31 ගාථාව)

අප්පමාදරතො පමාදෙ භයදස්සි වා භික්ඛු අණුං ථූලං
සඤ්ඤොජනං අග්ගී ඉව ඩහං ගච්ඡති.

අප්පමාදරතො: අප්‍රමාදයෙහි ඇලුණු; **පමාදෙ**: ප්‍රමාදයෙහි; **භය දස්සි වා**: බිය දක්නා; **භික්ඛු**: භික්‍ෂුව; **අණුං ථූලං**: සියුම් හා මහත්; **සඤ්ඤොජනං**: බන්ධන; **අග්ගී ඉව**: ගින්නක් මෙන්; **ඩහං**: දවමින්; **ගච්ඡති**: ඉදිරියට (නිවනට) යයි.

සත්‍ය ගවේෂණයෙහි ලා අප්‍රමාදී වූ ප්‍රමාදයෙහි බිය දක්නා භික්‍ෂුව කුඩු මහත් සංයෝජන ගින්නක් මෙන් දවමින් පෙරට යයි.

විවරණය

සංයෝජන: නම් සත්ත්වයා සසරට බැඳ තබන බන්ධන ය. එබඳු බන්ධන 10 ක් තිබේ. එනම්,

1. සක්කාය දිට්ඨිය
2. විචිකිච්ඡාව
3. සීලබ්බත පරාමාස
4. කාම රාග
5. ව්‍යාපාද
6. රූප රාග.
7. අරූප රාග
8. මාන
9. උද්ධච්ච
10. අවිජ්ජා

යන දහයයි. මෙයින් මුල් සංයෝජන පහ පහළට බැඳ තබන බන්ධන වශයෙන් ද දෙවන සංයෝජන පහ ඉහළට බැඳ තබන බන්ධන වශයෙන් ද හඳුන්වනු ලැබේ. පහලට බැඳීම නම් කාම ලෝක වලට බැඳීමයි. ඉහලට බැඳීම නම් රූප හා අරූප ලෝකවලට බැඳීමයි.

මේවායින් i සිට iii දක්වා සංයෝජන වලින් මිදුනු තැනැත්තා සෝවාන් වූ තැනැත්තකු ලෙස හැඳින්වෙයි. මීට අතිරේකව iv හා v ද තරමකට මර්දනය කර ගත් තැනැත්තා සකෘදාගාමී වූවෙකි. i සිට v දක්වා සියළු සංයෝජන බිඳ හළ විට අනාගාමී වූ බව කියනු ලැබේ. සංයෝජන දහයෙන් ම මිදුණ තැනැත්තා අර්හත් ඵලය ලබා ගත් උතුමෙකි.

පමාදෙ භය දස්සිවා: යන්නෙහි අරුත යම් යම් මානසික සාධක හේතුවෙන් මත් ව වීර්‍ය නො කර ක්ලෙශ වසඟව ජීවත් වීමේ භයංකරත්වය ප්‍රත්‍යක්‍ෂ කර ගන්නා බවයි. සති සම්පජඤ්ඤයෙන් තොරව විසීමෙන් වන්නේ සසර දුක් දික්වීම ය.

අප්පමාදරතො: යන්නේ සත්‍ය ගවේෂකයා මානසික ප්‍රබෝධයෙන් යුතුව ආගමික චර්‍ය්‍යාවෙහි උත්සුක වන ආකාරය හැඟවෙයි. නිර්‍වාණප්‍රතිලාභය විෂයෙහි උද්‍යෝගය මඳ වුවහොත් වන හානිය දන්නා හෙයින් හෝ අප්‍රතිහත ධෛර්‍ය්‍යයෙන් භාවනාවෙහි නිරත වෙයි.

භික්ඛු: නම් බුදුරජාණන් වහන්සේ වෙත පැවිද්ද ලත් තැනැත්තාය. බෞද්ධ භික්‍ෂුව පූජකයෙක් නොව පැවිද්දෙක් පමනි. දෙවියන් හා මිනිසුන් අතර මැදි පුරුෂයකු ලෙස ක්‍රියා කරන තැනැත්තකු නොවන හෙයින් පූජකයකු සේ කිව නො හේ. භික්‍ෂුත්වය නම් සිය කැමැත්තෙන් ආගමික ජීවිතයක් භාර ගැනීමකි. එය අකැමැති වූ විට අත් හළ හැකි ය.



නො පමාවෙහි ඇලී මහණදම් වඩන තැනැත්තා පිරීහිමට නො පැමිණේ. නිවන් පුර ළඟ ම වේ.

32. අප්පමාදරතො භික්ඛු
පමාදෙ භයදස්සි වා
අභබ්බො පරිහාණාය
නිබ්බාණස්සෙ'ව සන්තිකෙ (2:12)

ඇලුණු නො පමාවෙහි
බිය දක්නා පමාවෙහි
නො පිරිහෙයි භික්ෂුව
ළංව සිටිනා නිවනට

ඇතොත් නුවණ - ළඟය නිවන

2 (9) නිගාමවාසී තිස්ස හිමියන් ගේ කථාව (32 ගාථාව)

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් නිගාමවාසී **තිස්ස තෙරුන් වහන්සේ** ඇරබ මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවරින් නුදුරෙහි එක්තරා නියම් ගමෙක ප්‍රභූ පවුලක තරුණයෙක් බුදු සස්නෙහි පැහැද පැවිදි වූයේ ය. නියම් ගමකින් පැවිදි වූ හෙයින් උන්වහන්සේට නිගාම තිස්ස යන නම ව්‍යවහාර විය. ඉතා සැදැහැයෙන් පැවිදි දම් පිරූ උන්වහන්සේ ගේ අල්පේච්ඡ, සන්තුෂ්ට ගුණය හා විනය ගරුක ශික්ෂාකාමී චර්යාව පිළිබඳව ඉතා ඉක්මණින් ම පැතිර ගියේ ය. උන්වහන්සේ තම ඤාතීන් විසූ ගමෙහි නිතර පිඬුසිඟා ගිය හ. නුදුරෙහි ම වූ සැවැත් නුවර අනේපිඬු සිටාණන් වැනි සැදැහැති දානපතියන් විසුව ද, මහා සංඝරත්නයට නිතර ගරු සත්කාර කළ සිවුපසය පිළිගැන්වූ පසේනදී කොසොල් රජතුමා සිටිය ද උන්වහන්සේ කිසි කලෙක එහි නො ගිය හ.

දිනක් භාග්‍යවතුන් වහන්සේ හමු වූ භික්ෂූන් වහන්සේ පිරිසක් උන්වහන්සේට මෙසේ සැළ කර සිටිය හ. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ නිගාමතිස්ස භික්ෂුව තම ඤාතිවරුන් මධ්‍යයේම වාසය කරන්නේ ය. මෙතරම් සැදැහැති දානපති අනේපිඬු මහ සිටාණන් සිටිය ද, අසදෘශ දන් දෙන පසේනදී කෝසල රජතුමාණන් විසුව ද ඒ කිසිවකු ගේ පුණ්‍ය කර්මයකට නො පැමිණෙයි." භාග්‍යවතුන් වහන්සේ ඒ අසා නිගාමතිස්ස හිමියන් සැවැත් නුවරට කැඳවූ හ. "භික්ෂුව, ඔබ ඤාතීන් අතරම රැඳී ඔවුන් වෙතම පිඬු සිඟා යමින් ඔවුන්ට ම සීමිතව කුල සංසට්ඨව සිටින බව සැබෑදැ" යි විමසා සිටිය හ. "භාග්‍යවතුන් වහන්ස, මම කුලයන් හා බැඳී නො වෙසෙමි. මා පිළිගන්නේ මට යැපෙන්නට අවශ්‍ය තරමේ භෝජනයක් පමණි. මට ලැබෙන අහර සුළු හෝ වේවා මඳ හෝ වේවා ප්‍රනීත වේවා ප්‍රනීත නො වේවා මම ඉන් කම්පා නො වී ලද දෙයින් සතුටු වෙමි. වැඩිපුර හෝ වැඩි මිහිරට හෝ මම නො වෙහෙසමි. එසේ අල්පෙච්ඡව ජීවත් වනු මිස ඤාතීන් කෙරේ ඇලී ජීවත් නො වෙමි." යි නිගාමතිස්ස හිමියෝ ප්‍රකාශ කර සිටිය හ.

භාග්‍යවතුන් වහන්සේ "සාධු, සාධු, භික්ෂුව ඉතාමත් සුන්දරය" යි පවසා භික්ෂූන් වහන්සේ අමතා මෙසේ ප්‍රකාශ කළ හ. "මහණෙනි, මා වැනි ගුරුවරයෙක් ලත් ඔබ අල්පෙච්ඡ වීම පුදුමයක් නොවේ. මගේ පරපුරේ මගේ පුරුද්දේ ආකාරය මෙය ය." එසේ වදාළ භාග්‍යවතුන් වහන්සේ නිගාමතිස්ස හිමියන් ගේ අල්පෙච්ඡතාව කීර්තනය කරමින් මේ කතා පුවත ද වදාළ හ.

එක් කලෙක හිමවත පෙදෙස ගංගා නම් ගඟ ඉවුරේ දිඹුල් වනයක ගිරව් දහසක් පමණ විසූ හ. කලක දී මේ දිඹුල් ගස වියළී මැරී යන්නට වූයෙන් බොහෝ ගිරවු එය හැර ගිය හ. එහෙත් එක් ගිරවෙක් තමා විසූ ගසෙහි ඵල නැති කල ද කොළ, පොතු ආදිය කමින් ගඟේ දිය බොමින් විසීය. ඔහු ගේ අල්පේච්ඡතාව හේතුවෙන් ශක්‍රයා ගේ මන්දිරය පවා කම්පා විය. හෙතෙම ගිරවා වඩාත් විමසනු පිණිස ගස වියලී කුඩු හැලෙන තත්ත්වයට පත් කළ ද හේ එතැනින් නො ගියේ ය. එයින් ප්‍රසන්න වූ ශක්‍ර දේවේන්ද්‍ර තෙම ඔහු විසූ වනය නැවත සරු සාර ඵල බර උයනක් බවට පත් කළේ ය. එකල "ගිරා රජවත් අල්පේච්ඡභාවය ප්‍රගුණ කළ මගේ පරපුරේ එක් පුරුකක් වූ මේ නිගාමතිස්ස මෙසේ අල්පේච්ඡවීම පුදුමයක් නො වේයැ"යි වදාළ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව වදාළ හ.

විවරණාත්මක අනුවාදය (32 ගාථාව)

අප්පමාදරතො පමාදෙ භයදස්සි වා භික්ඛු අභබ්බො
පරිහාණාය නිබ්බාණස්ස සන්තිකෙ එව

අප්පමාදරතො: අප්‍රමාදයෙහි ඇලුණු; **පමාදෙ**: ප්‍රමාදයෙහි; **භයදස්සි වා**: භය දක්නා; **භික්ඛු**: භික්ෂුව; **නිබ්බාණස්ස**: නිර්වාණයෙහි; **සන්තිකෙ**: සමීපයෙහි සිටියේ; **පරිහාණාය**: පරිහාණියට; **අභබ්බො එව**: සුදුසු නොවන්නේ ම ය.

අප්‍රමාදයෙහි ඇළුණු, ප්‍රමාදයෙහි භයංකරත්වය හඳුනන භික්ෂුව නිවණට සමීපව වසන හෙයින් පිරිහෙන්නට සුදුසු නො වේ.

විවරණය

නිබ්බාණස්ස සන්තිකෙ: යන්නෙන් අප්‍රමාදී භික්ෂුව නිවණට ඉතා සමීපව වසන බව අදහස් කරනු ලැබේ. නිර්වාණය අජාත, අභූත, අකත, අසංඛත වශයෙන් හඳුන්වන බුදුරජාණන් වහන්සේ එය ඇති දෙයක් බව වදාළ හ. එවැන්නක් නො තිබිණි නම්, ජාත, භූත, කෘත, සංස්කෘත, දෙයින් ගැලවීමක් නො වන්නට තිබිණැයි ද වදාළ හ. ආපො, තෙජෝ, වායො, පඨවි යන සතර මහා භූතයෝ තැනක් නො ලබති. දිග-පලල, හොඳ-නරක, නාම-රූප ආදී සියල්ල වියැකී යයි. එලොවක්-මෙලොවක්, ඊමක්-යාමක්, උපතක්-චිපතක් හෝ කාම වස්තුවක් විද්‍යාමාන නො වේ. "නිවන මෙසේ ඍණ වාචී පද වලින් විස්තර කර ඇති හෙයින් එය උච්ඡේදයක් සේ වරදවා වටහා ගන්නෝ බහුල වෙති. එහෙත් නිර්වාණය උච්ඡේදයක් නො වේ.

අභබ්බො පරිහාණාය: පරිහානියට අයෝග්‍යයැයි සඳහන් කළේ එබඳු අයෙක් පිරිහෙන්නේ නැතැයි පැවසීම සඳහා ය. භාවනාවෙන් පිරිහීම හෝ මාර්ග ඵලවලින් පිරිහීම යන එක් විදියකින්වත් පිරිහීම යුතු නැත. ඒ වෙනුවට වර්ධනයක් ම භාවනාවෙහි හා මාර්ග ඵලයන්හි අභිවෘද්ධියක් ම අපේක්ෂා කළ හැකිය.



නුවණ අසි පතකි - අවිද්‍යාව සතුරෙකි

බෞද්ධ ඉතිහාසයෙහි එකම පිටුවක්වත් චෝදනාකාර
ගින්නෙන් දැවුනේ වත් වෛතුල්‍යවාදී දුමෙන්
අඳුරු වූයේවත් නැත. මිථ්‍යාදෘෂ්ඨික නගර ගිනිබත්
කරනු ලැබුවේ නැත. ආගමික වෛරයට ගොදුරු වූ නිර්දෝෂී
තැනැත්තන්ගේ ලෙයින් රත් පැහැ ගැන්වුනේත් නැත.
ප්‍රඥාව පිලිබඳ අසිපත විසින් පිළිගනු ලබන එකම සතුරා
නම් මෝහයයි. මෙය ඉතිහාසය සපයන සාක්ෂියයි.
එය කිසිසේත් ප්‍රතික්ෂේප කළ නොහැක.

මහාචාර්ය පී. වී. බාපත්.
"2500 වසරක බෞද්ධ ඉතිහාසය"
(2500 Year of Buddhism)

මානසික ප්‍රාගුණ්‍යය

චිත්ත බලය ගැන දැන් බොහෝ දේ අසන්නට ලැබේ.
එහෙත් අංග සම්පූර්ණ වූ ද ඵලදායි මානසික පුහුණු වැඩ පිළිවෙළක්
ලොව හමුවේ මෙතෙක් තබා ඇත්තේ බුදු සමය විසින් ය.

ඩඩ්ලි රයිට්

3 වන පරිච්ඡේද

චිත්ත වග්ග



සැලෙන සුලුවූ, රැක ගැන්මට අමාරු වූ සිත නැණවතා (දොස් නමැති) ඇද හැර මොනවට සදන්නේ ය.

33. ඵන්දනං චපලං චිත්තං
දුරක්ඛං දුන්නිවාරයං
උජුං කරොති මෙධාවී
උසුකාරො'ව තෙජනං (3:1)

රැක ගැනීම අමාරුයි
සැලෙන චපල සිත අපේ
නුවණැත්තා ඇද අරියි
හී -කරු හීයක් වගේ

දන නුවණැති - සිත හික්මවති

3 (1) මෙඝිය තෙරුන් ගේ කථා වස්තුව (33 සහ 34 ගාථා)

චාලිකා කන්දෙහි වැඩ වසන අතර භාග්‍යවතුන් වහන්සේ **මෙඝිය තෙරුන්** ඇරබ මේ ගාථාව දේශනා කළ සේක.

මෙඝිය හිමියෝ ගංතෙරක් අයිනේ මනරම් අඹ උයනක් දැක බවුන් වැඩීම පිණිස එහි යන්නට බුදුරජාණන් වහන්සේ ගෙන් අවසර ඉල්ලා සිටිය හ. තම තනියට වෙනත් නමක් සොයා ගන්නා තුරු තමන් හැර නො යන සේ බුදු රදුන් ඉල්ලා සිටිය ද තමන් යා යුතු යැයි තෙවරක් ම බල කොට කියා සිටි මෙඝිය තෙරුන්ට බුදු පියාණෝ තෙවන වර අවසර දුන් හ.

එහෙත් අඹ උයනට ගොස් අඹ රුකක් යට භාවනාවට වැඩ හුන් උන්වහන්සේට තමන් පෙර ජන්ම රැසක ම රජකුව ඉපිද නළගනන් පිරිවරා එහි විනෝද වූ ආකාරය සිහි වීමෙන් කාම රාගය ද, අපරාධ කරුවකු තමන් වෙත ගෙන ආ බව සිහි වීමෙන් ව්‍යාපාදය ද ඔහුට දඬුවම් නියම කිරීම් වශයෙන් විහිංසාව ද වශයෙන් විතර්ක ඇති විය. මෙයින් විපිලිසරට පත් උන්වහන්සේ වහා ම බුදුරදුන් දක්නට ගොස් මේ තතු හෙළි කර සිටිය හ.

"මෙඝිය ඔබ කළේ වරදකි. මා දැන් තනිවමයි ඉන්නේ. යන්න එපා. වෙනත් තෙරුන් වහන්සේ නමක් එනතුරු ඉන්න. එසේ මා තනිව දමා නොයන්නැයි කියද්දීත් ඔබ ගියෙහි ය. එපා කියද්දී සිතට යටත්ව ගොස් දැන් ත්‍රිවිධ විතර්කයන්ට ම ගෝචර විය.

සිතට වහල් වීම නුසුදුසු ය. සිත තමන් වසඟයට ගත යුතුය" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ 'ඵන්දනං චපලං චිත්තං' යනාදී ගාථාව දේශනා කළ සේක. භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දේශනාවසානයෙහි මෙඝිය භික්ෂුව සෝවාන් ඵලයෙහි පිහිටියහ. අන්‍ය බොහෝ දෙනාට ද ධර්මාභිසමය විය.

විවරණාත්මක අනුවාදය (33 ගාථාව)

ඵන්දනං චපලං දුරක්ඛං දුන්නිවාරයං චිත්තං මෙධාවී
උසුකාරො තෙජනං, ඉව උජුං කරොති

ඵන්දනං: ස්ඵන්දනය වන; **චපලං**: චපල වූ; **දුරක්ඛං**: රැක ගැනීම අපහසු වූ; **දුන්නිවාරයං**: සංවර කර ගැනීම දුෂ්කර වූ; **චිත්තං**: සිත; **මෙධාවී**: නුවණැත්තා; **උසුකාරො**: ඊතල හදන්නා; **තෙජනං**: ඊ දණ්ඩ (ඍජු කරන්නාක්); **ඉව**: මෙන්; **උජුං කරොති**: ඍජු කරයි.

සිත නිතර සැලෙයි. වෙනස් වෙයි. රැක ගැනීම හා සංවර කර ගැනීම අපහසු ය. එහෙත් නුවණැත්තෝ ඊතල හදන කම්මල් කරුවකු ඊ දණ්ඩ ඇද හැර ඍජු කරන්නාක් මෙන් සිත ඍජු කරති.

විවරණය

චිත්ත: පංචස්කන්ධ අතුරෙන් විඤ්ඤාණ ස්කන්ධය චිත්ත වශයෙන් ගැනේ. වේදනා, සඤ්ඤා හා සංඛාර යන චෛතසික ධර්මයෝ චිත්තය මුල් කොට පවතිති. රූපස්කන්ධය වුව ද ක්‍රියාත්මක වන්නේ චිත්තය ඇති කල්හි ම හෙයින් චිත්තය ප්‍රධාන වේ. චින්තනයට උපකාරක වන්නේ සිත හෙයින් එයට චිත්ත යැයි නම් කෙරේ. සිත නිරතුරුවම වෙනස් වෙමින්, පවතින්නකි. එහෙත් අනතුරුව ඇතිවන සිත් මුල් සිතෙහි ලක්ෂණ-ගුණාංග ග්‍රහණය කරන හෙයින් එක් දිගටම පවතින සේ පෙනේ. සිත වෙනස් වන හෙයින් ම එය සක්‍රිය ය.

බටහිර දර්ශනයෙහි ඉගැන්වෙන ආත්ම සංකල්පය කෘත්‍යය විසින් චිත්තයට සම වුවද 'ආත්ම' යන්නෙන් පෙරදිග දාර්ශනිකයන් අවධාරණය කළ නිත්‍ය හා අවිනශ්වර සංකල්පය බුදු සමය විසින් ප්‍රතික්ෂේප කරන ලද්දකි. සිතෙහි අඛණ්ඩතාව පවත්වා ගෙන යන භවංග නම් චිත්තයක් පිළිබඳව අභිධර්මයෙහි සඳහන් වේ. යමකු ගේ උපතේ සිට පවත්නා ස්වභාවික චිත්තය එය වුවද 'ආත්ම' ලෙස එය හැඳින්විය නො හැක්කේ එය ද අනිත්‍ය හෙයිනි. එය නූතන මනෝ විද්‍යාවේ උප විඤ්ඤාණයට ද සම කළ නො හැක්කේ උප විඤ්ඤාණය හෙවත් යටිසිත උඩුසිත හා සමගාමී චිත්තයක් ලෙස විස්තර කරනු ලබන හෙයිනි. භවංග නමින් අභිධර්මාචාර්යවරුන් උද්දේශ කරන්නේ එබඳු සමගාමී චිත්තයක් නො වේ.





ගොඩබිම බාහලූ මසෙකු සේ මේ සිත ඇදෙන සැලෙන බැවින් වෑයමෙන් රැක කෙලෙස්වට දුරැලියැ යුතුය.

34. වාරිජෝ’ව ථලෙ ඛිත්තො
ඔකමොකත උබ්භතො
පරිඵන්දති’දං චිත්තං
මාරධෙය්‍යං පහාතවෙ (3:2)

දියෙහි හැම කල් වසනා
ගොඩ බිම ලු මසෙකු සේ
සැලෙනා චපල වූ මේ සිත
මිදිය යුතු වේ මරහු බැලුමෙන්

නලියයි සිත මාළුවකු සේ

3 (2) මෙඝිය හිමියන් ගේ වස්තුව (33 සහ 34 ගාථා) (ඉතිරි කොටස)

විවරණාත්මක අනුවාදය (34 වන ගාථාව)

ඔකමොකත උබ්භතො ථලෙ ඛිත්තො වාරිජො ඉව ඉදං චිත්තං පරිඵන්දති මාරධෙය්‍යං පහාතවෙ.

ඔකමොකත: ජලාශයෙන්; **උබ්භතො**: ගොඩට ගෙන; **ථලෙ**: ගොඩ බිම; **ඛිත්තො**: තබන ලද; **වාරිජො**: මත්ස්‍යයකු; **ඉව**: මෙන්; **ඉදං**: මේ; **චිත්තං**: සිත; **පරිඵන්දති**: ස්ඵන්දනය වෙයි. (ගැහෙයි); **මාරධෙය්‍යං**: මාර බන්ධන; **පහාතවෙ**: ප්‍රහාණය කළ යුතු ය.

ජලයෙන් ගොඩට ගෙන ගොඩ බිම තැබූ මත්ස්‍යයකු ගැහෙන්නාක් මෙන් අප ගේ සිත ද සලිත වෙයි. මාරයා ගේ බන්ධන සිඳහල යුතු ය.

විවරණය

මෙහි දියෙන් ගොඩට දැමූ මත්ස්‍යයකු උපමාවට ගෙන ඇත්තේ සිතෙහි ඇති ඉක්මණින් සැලෙන ස්වභාවය ප්‍රබල ලෙස අවබෝධ කරවනු පිණිස ය. මෙඝිය හිමියන් භාවනාවට ගොස් ආරම්භ කළ මොහොතේ පටන් උන් වහන්සේ ගේ චිත්තය කාම විතර්කයෙන් ව්‍යාපාද විතර්කයට ද ව්‍යාපාද විතර්කයෙන් විහිංසා විතර්කයට ද වහ වහා මාරු වූයේ ඒ නියාමය අනුවය.

අභිධර්ම පිටකය සිතෙහි නිරන්තරයෙන් සිදුවන ක්‍රියා කාරිත්වය ඉතා සූක්ෂ්ම ලෙස සාකච්ඡා වෙයි. බාහිර උත්තේජකයක් මගින් සම්බාධිත වන තුරු භවංග අවස්ථාවෙහි පවත්නා සිත, උත්තේජක මගින් චලනයට පත් වෙයි. ඇසට රූපයක් ආපථ ගමනය වූ විට භවංගය චලනය වී උපච්ඡේද වෙයි. ඉන් පසු පංචද්වාරාවර්ජනය සිදු වෙයි. චක්ඛු විඤ්ඤාණය ඇති වන්නේ ඉන් පසුව ය. මින් පසු එම රූපය පිළිබඳව සිත විසින් ගනු ලබන අනුක්‍රමික සංජානන ක්‍රියාවලිය අභිධර්ම ග්‍රන්ථවල සියුම්ව විවරණය කර ඇති අතර ජවන් සිත් වලදී කර්මය සිදුවන ආකාරය ද පැහැදිලි කර ඇත.

අප විසින් කරනු ලබන සියළුම ක්‍රියා වලට වග කිව යුත්තෝ අපි ම වෙමු. විවිධ බාහිර බලපෑම් අප ගේ සිතට ලැබෙන බව සැබෑ වුව ද සිතා මතා නිදහසේ තීරණ ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමේ හැකියාව හෙවත් ස්වච්ඡන්දතාව අප සැම දෙනා වෙතම පවතින බව පිළිගත යුතුය. මෙම නිදහස ප්‍රයෝජනයට ගෙන නිරතුරුව වෙනස්වන සිත පාපයට අවනත වන්නට නො දී රැක ගැනීම අප ගේ යහපතට හේතු වෙයි.

බෞද්ධ භාවනා ක්‍රමය තුළ අන්තර්ගත චිත්තානුපස්සනාව සිත පිළිබඳ මෙම ශික්ෂණය සඳහා ඇති සාර්ථක උපක්‍රමයයි. නවීන මනෝ විද්‍යාවට පවා සිතෙහි සූක්ෂ්ම හා සංකීර්ණ ස්වරූපය ග්‍රහණය කර ගැනීමට හැකි වී නැත. විවිධ චර්‍යාවන් අධ්‍යයනය කිරීම මගින් ලබා ගන්නා අනුමාන ඥාණයක් මිස ප්‍රත්‍යක්ෂ දැනීමක් ලබා ගන්නට ඔවුන් සමත් වී නැති බව කිව යුතු ය. බෞද්ධ දර්ශනය අන්තරවලෝකන ක්‍රමය මගින් තම සිත තමන් විසින් ම අධ්‍යයනය කර ගැනීමේ ශික්ෂා මාර්ගයක් වශයෙන් භාවනා ක්‍රම නිර්දේශ කරයි.

සිත පිළිබඳ භාවනාව පහසු කරනු වස් චිත්තානුපස්සනා භාවනා නිර්දේශයේ දී සිතෙහි ස්වරූප 16 ක් පිළිබඳව නිරීක්ෂණය කිරීමට උපදෙස් දෙනු ලැබේ. එනම්,

1. සරාග,
2. වීතරාග,
3. සදෝස,
4. වීතදෝස,
5. සමෝහ,
6. වීතමෝහ,
7. සංඛිත්ත,
8. වික්ඛිත්ත,
9. මහග්ගත,
10. අමහග්ගත,
11. ස උත්තර,
12. අනුත්තර,
13. සමාහිත,
14. අසමාහිත,
15. විමුත්ත,
16. අවිමුත්ත. වශයෙනි.



කැමැති අරමුණක වැටෙන සුලු වූ සිත දමනය කිරීම යහපති. දමනය කළ (හික්මවූ) සිත සැප එළවන්නේ වෙයි.

35. දුන්නිග්ගහස්ස ලහුනො
යත්ථ කාමනිපාතිනො
චිත්තස්ස දමථො සාධු
චිත්තං දන්තං සුඛාවහං (3:3)

අපහසුය දමනය
ඉක්මන් ය එහි චලනය
රිසි රිසි තැන නතර කරන
දෙයක් වෙයි මේ චිත්තය
කළෝතින් දමනය
අත්වේය ඉන් සුව සෙත

සංවර සිත - ගෙන දෙයි සෙත

3 (2) එක් හිමිනමක ගේ වත (35 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසමින් **එක්තරා භික්ෂු නමක්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

වරක් භික්ෂූන් වහන්සේලා හැට නමක් බුදුරදුන් වෙතින් කර්මස්ථාන ලබා ගෙන කඳු පාමුලෙක පිහිටි මාතික නම් ගමට ගිය හ. එහි දී ගම්පතියා ගේ බිරිඳ වූ මාතිකමාතා නම් තැනැත්තිය උන්වහන්සේලාට දන් පිළිගැන්වූවා ය. ඒ ගමේ ම වස් කාලය ගත කරන්නැයි ඇරයුම් කළ ඕ, ඒ සඳහා ආරාමයක් ද ඉදි කරවූවා ය.

මේ අතර එක් දිනක් "මටත් භාවනා උගන්වන්න" යි ඕ තොමෝ භික්ෂූන් වහන්සේලාගෙන් ඉල්ලා සිටියා ය. උන් වහන්සේලා ද ශරීරයේ අසුභය දකිමින් දෙතිස් කුණපය පිළිබඳව භාවනා කරන ආකාරය ඇයට ප්‍රගුණ කරවූ හ. ඕ තොමෝ ද අප්‍රමාදීව බවුන් වඩා ඉක්මණින් ම මාර්ග-ඵල තුනක් ම ලබා ගත්තා ය. ඒ හා ම ඇයට ලෞකික ඍද්ධි ද විදසුන් නුවණ ද ලැබිණ.

මාර්ගඵල ලබා සිය දිවැසින් භික්ෂූන් වහන්සේලා ගේ අධිගම ගැන සම්මර්ශනය කළ ඕ තොමෝ උන්වහන්සේලා තවමත් මාර්ග ඵල ලබා නැති බව දැක ඒ සඳහා ඇති අඩුපාඩු කවරේදැයි විමසා බලා ඒ පහසුකම් සැලසුවා ය. භික්ෂූන් වහන්සේලා ගේ රුචි අරුචි වලට ගැළපෙන පරිදි සිවුපසය සකසා දී සියළු උපස්ථාන කිරීම මගින් උන්වහන්සේලාට ද වහා අධිගම ලබා ගන්නට ඉඩ සැලසීම ඇය ගේ අරමුණ විය. එහි ප්‍රතිඵලය වූයේ නො බෝ කලකින්ම සියලු හිමිවරුන් අර්හත් ඵලයෙහි පිහිටීමයි. වස් කාලය අවසානයේ භික්ෂූන් වහන්සේ හැම දෙන ජේතවනාරාමයට ගොස් භාග්‍යවතුන් වහන්සේ බැහැදුට හ. තමන් ට ගැළපෙන ප්‍රත්‍ය පහසුව මාතිකමාතාව විසින් සැලසූ අයුරු ද හොඳ සුවයෙන් පහසුවෙන් වස් කාලය ගත කර පැමිණි බව ද සැල කර සිටිය හ. මාතිකමාතාව තම සිතැගි මනාව දැන තමන් ප්‍රිය කළ ආකාරයට ම දාන මානාදිය සූදානම් කළ බව ද පැවසූ හ.

මේ සියල්ලට සවන් දුන් එක්තරා භික්ෂු නමක් "මාත් මාතිකමාතාවන් ගේ පන්සලට යා යුතුය" යි ඉටා ගත්තේ ය. ඒ අනුව භාග්‍යවතුන් වහන්සේ ගෙන් භාවනා කර්ම ස්ථාන ලබා ගත් උන්වහන්සේ එහි ගිය හ. සිතූ පරිදිම මාතිකමාතාවෝ උන්වහන්සේ ගේ සිතැගි දැන සියල්ල සකසා පිළිගැන්වූ හ. ඇය පැමිණෙතහොත් මැනවැයි හිමි නම සිතන විට ඕ ආවාය. යම් ආහාරයක් ගැන සිතූ විට එය ද සැපයුවා ය. මෙයින් විස්මයට පත් හිමි නම "ඔබට අනුන්ගේ සිත් දැන ගන්නට ශක්තිය තිබේදැ" යි විමසුවා ය. එයට ඍජුව පිළිතුරු නුදුන් උපාසිකාව "සිත් දැනගත හැකි උදවිය ඒ ඒ සිතැගි අනුව වැඩ කරති" යි පමණක් පැවසුවා ය. කෙසේ වුව ද, "මේ උපාසිකාව පරසිත් දන්නී ය. මා පෘථග්ජන හෙයින් මගේ සිතෙහි අපිරිසිදු සිතුවිලි ඇති වුවහොත් ඒවා ද මෙතුමිය දැන ගන්නීය" යි බියට පත් භික්ෂුව වහාම බුදුරජාණන් වහන්සේ වැඩ සිටි දෙව්රම් වෙහෙරට ආපසු ආවේ ය. තමන්ට මාතිකාරාමයේ වසන්නට බැරි බවත්, උපාසිකාව පරසිත් දන්නා හෙයින් තම සිතෙහි අකුසල සිතුවිල්ලක් උපනහොත් ඇය දැන ගනිතැයි බියක් ඇති වූ හෙයින් ආපසු ආ බවත් උන්වහන්සේ බුදු සමිඳුන්ට සැළ කර සිටිය හ. "භික්ෂුව ඔබ කළ යුත්තේ ඔබේ සිත රැක ගැනීම පමණක් නො වේ ද?"යි උපදෙස් දුන් බුදු පියාණෝ "යන්න, ආපසු මාතිකගාමයට ම යන්න. වෙන කිසිවක් ගැන නොසිතා හුදෙක් භාවනාව ගැන ම සිතන්න" යි අවවාද කළ හ. උපාසිකාව ද ආපසු පැමිණි භික්ෂුවට පෙර හිමිවරුන් ට මෙන්ම බැතිසිතින් සියළු පහසුකම් සලසා දුන්නා ය. පසුතැවිල්ලකින් තොරව සුවසේ විදසුන් වැඩූ භික්ෂුනම නො බෝ දිනකින් ම රහත් ඵලය ලැබී ය.

විවරණාත්මක අනුවාදය (35 වන ගාථාව)

දුන්නිග්ගහස්ස ලහුනො යත්ථ කාමනිපාතිනො චිත්තස්ස
දමථො සාධු දන්තං චිත්තං සුඛා වහං

දුන්නිග්ගහස්ස: පාලනය කිරීම ඉතා අපහසු; **ලහුනො**: ඉක්මන් පැවතුම් ඇති; **යත්ථ කාමනිපාතිනො**: කැමති ඕනෑම තැනක රැඳෙන; **චිත්තස්ස**: සිත; **දමථො**: දමනය කර ගැනීම; **සාධු**: යහපත් ය; **දන්තං**: දමනය කරන ලද; **චිත්තං**: සිත; **සුඛා වහං**: සැප ගෙන දෙයි.

සිත අතිශයින් ම සංකීර්ණ හෙයින් දමනය අසීරුය. එය ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් කැමති කැමති අරමුණුවල රැඳෙයි එය දමනය කර ගත හොත් සුවදායක ය.

විවරණය

දුන්නිග්ගහස්ස: යත්ථ කාමනිපාතිනො: දමනයට අපහසුකම හා තමා ප්‍රිය කරන ඕනෑම අරමුණක් ගැනීම සිතෙහි ප්‍රධාන ලක්ෂණ දෙකක් ලෙස මෙහි දැක්වෙයි. සිත තරම් වේගයෙන් ක්‍රියා කරන වෙනත් දෙයක් නැති තරම්. එහෙයින් එය ග්‍රහණය කර ගැනීම අපහසු ය. සිත යම් අරමුණක් කරා යාම නවතා ගැනීම උසස්ම ආධ්‍යාත්මික ශික්ෂණයකින් යුක්ත උත්තමයකුට මිස අපහසු ය. විශේෂයෙන් ම සාමාන්‍ය පෘථග්ජනයෝ චිත්ත වේගයන්ට අවනත වෙති. චිත්ත වේග සමග අනනය නො වී, ඊට නතු නො වී, ඒවා හඳුනාගන්නට සමත් වීම අවශ්‍ය ය. ඒවා ඇතිවන අයුරු හා නැතිවන අයුරු නිරීක්ෂණය භාවනාවක් වෙයි.



නුවණැත්තා නො දැක්ක හැකි වූ ඉතා සියුම් වූ සිත රැක ගනී. ඒ සැප ලැබීමට හේතු වේ.

36. සුදුද්දසං සුනිපුණං
යත්ථ කාමනිපාතිනං
චිත්තං රක්ඛෙථ මෙධාවී
චිත්තං ගුත්තං සුඛාවහං (3:4)

දැක්ම අමාරුයි තියුණුයි
සිත රිසි තැන්වල නවතියි
නුවණැත්තා එය සුරකියි
රැක ගත් සිත සුව ගෙන එයි.

රැක ගත් සිත සුව ගෙන දෙයි

3 (3) උකටලී වූ භික්ෂුනමක ගේ කතාව (36 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සිටුවරයකු ගේ පුත්‍ර **තරුණ භික්ෂුනමක්** පැවිදි ජීවිතයෙහි කළකිරීම නිමිති කරගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ හ.

බුදුරදුන් සැවැත් නුවර වසන සමයෙහි එක් සිටුවරයකු ගේ තරුණ පුත්‍රයෙක් තම නිවසට පිඬු සිඟා පැමිණි හිමි නමක් අමතා මෙසේ කීවේ ය. "සමිඳුනි, මම දුකින් මිදෙන්නට කැමැත්තෙමි. මට ඒ සඳහා මාර්ගය පැහැදිලි කළ මැනවි." ඒ ඇසූ හිමිනම ඔහුට "ඔබට යහපතක් ම වේවා සිටු පුත්‍රය. දුකින් මිදෙන්නට අවශ්‍ය නම්, දන් දෙන්න. පිණ්ඩපාතය, අඩ මසකට වරක් දෙන දානය, වස් දානය ආදී දන් දෙන්න. වැසි කාලයට පන්සල් කරවා දෙන්න. සිවු පසය පිරිනමන්න. ඔබේ දේපළ තුනට බෙදා එක් කොටසකින් ව්‍යාපාර කරන්න. තව කොටසකින් අඹුදරු පෝෂණය කරන්න. ඉතිරි කොටස පින්කම් සඳහා යොදවන්න."

"යහපති, හිමියනි" යි පැවසූ සිටු පුත්‍රයා උන්වහන්සේ දුන් උපදෙස් අනුව ම ක්‍රියා කළේ ය. ඒ සියල්ල පිළිපැද නිම කළ හෙතෙම "ස්වාමීනි, තවත් මා කළ යුතු යමක් තිබේ දැ" යි ප්‍රශ්න කළේ ය. "එසේ නම් තරුණය, තිසරණ-පන්සිල් සමාදන්ව රකින්න" යි අවවාද කරන ලදී. ටික කලක් එසේ කළ සිටු පුත්‍රයා "මෙයටත් වැඩි යමක් කරන්නට ඇත්දැ"යි විමසා සිටියේ ය. "එසේ ය" යි පැවසූ හිමිනම "දස සිල් සමාදන් වන්න" යි අවවාද කළේ ය. එය ද පිළිගත් සිටු පුත්‍රයා දසසිල් ආරක්ෂා කිරීමට පටන් ගත්තේ ය. ඔහු මෙසේ එකින් එක, පියවරින් පියවර පුණ්‍ය කටයුතුවල නිරත වීම හේතුවෙන් ඔහුට 'අනුපුබ්බ' යන නම ද යෙදිණි. ඊළඟ වතාවේ "සමිඳුනි, මා කුමක් කරන්නදැ" යි විමසූ විට ලැබුනු පිළිතුර වූයේ "දැන් ඔබ පැවිදිවන්න" යන්න ය.

භික්ෂූන් වහන්සේ ගේ අවවාදය පරිදි ගිහි සුව හැර දමා හෙතෙම පැවිදි බිමට එළැඹුණේ ය. පැවිදි වූ පසු උන්වහන්සේට අභිධර්මය පිළිබඳ විශේෂඥ වූ ආචාර්යයන් වහන්සේ නමක් ද විනය පිළිබඳ විශේෂඥවූ උපාධ්‍යාය නමක් ද ලැබිණි. උපසම්පදාව ලත් පසු ආචාර්යයන් වහන්සේ බැහැ දකින්නට යන හැම අවස්ථාවේ ම ඔහුට අභිධර්මයට අනුකූල ධර්ම විවරණ අසන්නට ලැබේ. "අභිධර්මයට අනුව මේ මේ විදියට හැසිරීම උචිතය. මේ මේ විදියට ජීවත් වීම අනුචිතය. මෙසේ කරන්න. මෙසේ නො කරන්න." ආදී උපදේශ රාශියක් ලැබේ. තම උපාධ්‍යයයන් වහන්සේ හමුවට යන හැම විට ම අසන්නට ලැබෙන්නේ "විනයට අනුව මේ මේ දේ අකැපය. මේ මේ දේ කැපය. ඔබ මේ මේ දේ කළ යුතුය. මේ මේ දේ නො කළ යුතුය වැනි උපදෙස් ය." කාලයා ගේ ඇවෑමෙන් හිමිනමට මෙසේ සිතිණ. "මේ මොන කරදරයක් ද? මා පැවිදි වූයේ දුකින් මිදීම පිණිස ය. එහෙත් දැන් මට අතක් පයක් හොළවන්නටවත් නිදහසක් නැත. ගිහි ගෙදර වාසය කරමින් වුවත් දුකින් මිදීමට අමාරුවක් නැත. මා ආපසු ගිහි ගෙදරට යා යුතු ය." භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුව අමතා "මහණ, ඔබ උකටලී වූවා නොවේ දැ" යි විමසූ හ. "එසේ ය, ස්වාමීනි, මම දුකින් මිදීම පිණිස පැවිදි වීමි. එහෙත් මෙහි අතක් පයක් සොලවන්නටවත් නිදහසක් නැත. මට ගිහි ගෙයි සිටත් දුකින් මිදී ගත හැකි වෙයි" යනු භික්ෂු නමගේ පිළිතුර විය.

"මහණ, ඔබට එකක් රකින්නට හැකි වෙයි නම් සෙසු කිසිවක් රකින්නට උවමනා නො වේ" යි බුදුහු වදාළ හ. "ඒ කුමක් ද, සමිඳුනි?" "ඔබට සිත රැක ගත හැකි ද?" "මට හැකි වෙයි ස්වාමීනි," එසේ නම් ඔබේ සිත රැක ගන්න" යි භාග්‍යවතුන් වහන්සේ අවවාද කළ හ.

විවරණාත්මක අනුවාදය (36 වන ගාථාව)

සුදුද්දසං සුනිපුණං යත්ථ කාමනිපාතිනං චිත්තං මෙධාවි
රක්ඛෙථ ගුත්තං චිත්තං සුඛාවහං

සුදුද්දසං: දැක ගැනීම අතිශයින් ම දුෂ්කර වූ; **සුනිපුණං**: අතිශයින් ම සූක්ෂ්ම වූ; **යත්ථ කාමනිපාතිනං**: රිසි රිසි හැම තැන රැඳෙන්නා වූ; **චිත්තං**: සිත; **මෙධාවි**: නුවණැත්තා; **රක්ඛෙථ**: රැක ගත යුත්තේ ය; **ගුත්තං**: ආරක්ෂා කරගත්; **චිත්තං**: සිත; **සුඛාවහං**: සැප ගෙන එන්නේ ය.

සිත දැක ගැනීම අතිශයින් ම දුෂ්කරය. එහි ක්‍රියා කාරිත්වය ඉතා සියුම් ය. එය කැමති කැමති අරමුණු වල රැඳෙයි. එබඳු වූ සිත ඥාණවන්තයන් විසින් රැක ගත යුතු ය. රැක ගත් සිත සැප ගෙන එයි.

විවරණය

සුදුද්දසං සුනිපුණං: දුර්දශ බව හා සූක්ෂ්මත්වය සිතෙහි ලක්ෂණ දෙකකි. සිත අති විශ්මය ජනක කාර්‍ය්‍යයන් රාශියක් කරන නමුත් එය දැක ගත නො හැකි. එහෙත් එම සිත නරක අරමුණු කරා යා නොදී රැකගත හැකි නම්, එය මහත් ලාභයකි.





බොහෝ දුර දිවෙන, ගමන් ඇති, තනිව හැසිරෙන සිත රැකගන්නාහු මර බැඳුමෙන් මිදෙත්.

37. දූරඞ්ගමං ඒකචරං අසරීරං ගුහාසයං යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති මොක්ඛන්ති මාරබන්ධනා (3:5)	දුර ගමන් යන, තනිව හැසිරෙන නැතිව සිරුරක්, ගුහා නිවසන කළෝතින් සිත යමෙක් සංවර බිඳ හරියි හේ මාර උවදුර

කළ සිත සංවර - නැත මර උවදුර

3 (4) සංඝරක්ඛිත හිමියන් ගේ කථා වස්තුව (37 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වෙසෙමින් සංඝරක්ඛිත හිමියන් ගේ බෑණා වූ **භාගිනෙය්‍ය සංඝරක්ඛිත හිමි** අරබයා මේ ගාථාව දේශනා කළ හ.

සැවැත් නුවර සංඝරක්ඛිත නමින් එක් ජ්‍යෙෂ්ඨ හිමි නමක් විසූ හ. උන්වහන්සේ ගේ සහෝදරියට උපන් පුතාට සංඝරක්ඛිත හිමියන් ගේ නම ම ගෞරවය පිණිස තබන ලදි. එහෙයින් හේ භාගිනෙය්‍ය සංඝරක්ඛිත නමින් ප්‍රකට විය. වැඩිවියට පත් වූ පසු ඔහු ද පැවිදි කරවන ලදි. සිය ගමෙහි ම ආරාමයේ වැඩ විසූ 'තරුණ සංඝරක්ඛිත හිමියනට වරක් සිවුරු දෙකක් පිරිකර වශයෙන් ලැබිණි.

ඉන් එකක් තම මාමාට පූජා කරනු රිසි වූ හෙතෙම වස් කාලය අවසානයේ උන්වහන්සේ සොයා ගොස් එය පිළිගැන්වී ය. එහෙත්, තමන්ට ඇති පමණ සිවුරු තිබේ යයි පැවසූ සංඝරක්ඛිත හිමියෝ එය නො පිළිගත් හ. නැවත නැවත පෙරැත්ත කළ ද පිළිගනු නො ලැබිණ. මෙයින් බලවත් කළකිරීමට පත් භාගිනෙය්‍ය සංඝරක්ඛිත හිමියෝ තමන් පිදූ පිරිකරක් පිළිගන්නට තරම් වත් කාරුණිකත්වයක් නො ලැබ පැවිද්දේ විසීමෙන් කවර ප්‍රයෝජනයක් දැයි සිතමින් සිවුරු හැර දමා ආපසු ගිහි ජීවිතයට යන්නට රිසි වූ හ.

එම සිතුවිල්ල හා ම සිතුවිලි වැලක් උන්වහන්සේ ගේ සිතට ගලා ආවේ ය. "සිවුරු හැර ගොස් මේ සිවුර විකුණා ඒ මුදලින් එළු දෙනක මිලට ගනිමි. ඇය පැටවුන් බිහි කරනු ඇත. ක්‍රමයෙන් යමක් කමක් එකතු වූ පසු මම විවාහයක් කර ගනිමි. මගේ බිරිඳ පුතකු ලබා දුන් විට බිරිඳත් පුතාත් කරත්තයක නංවාගෙන මාමා වූ සංඝරක්ඛිත හිමියන් බලන්නට යමි. මගදී මම දරුවා වඩා ගන්නට රිසි වෙමි. මගේ බිරිඳ "ඔබ කරත්තය දක්කන්න. දරුවා මම බලා ගන්නෙමි" යි කියනවා ඇත. මම දරුවා ඇය ගෙන් උදුරා ගනිමි. එහෙත් දරුවා මා අතින් වැටුණ හොත්! කරත්ත රෝදය දරුවා ගේ ඇඟ මතින් යනු ඇත. මට දැන් කේන්තියක් එයි. එවිට මම බිරිඳට කෙවිට පහරක් දෙමි."

මේ සිතුවිලි ගලා එනවිට භාගිනෙය්‍ය සංඝරක්ඛිත හිමියන් සිටියේ මාමා වූ හිමියන්ට පවන් සලමිනි. මුළුමනින් ම සිතුවිලි දහරෙහි වෙලී සිටි හේ බිරිඳට කෙවිටි පහර දෙමි යයි සිතා පවන් සලන අවානෙන් මාමාට පහරක් ගැසී ය. පරසිත් දැනීමෙහි දක්ෂව සිටි සංඝරක්ඛිත තෙරණුවෝ " බිරිඳට කෙවිටි පහර දෙන්නට බැරි වුණු නිසා මහලු හිමි නමකට පහර දුන්නා නො වේ ද?" යි ප්‍රශ්න කළ හ. එයින් විස්මයට මෙන් ම බියට ද පත් තරුණ භික්ෂුව පැන දිවුවේ ය. එහෙත් ආරාමයෙහි විසූ තරුණ සාමණේර හිමිවරු ඔහු අල්ලා ගත් හ. අවසානයේ දී තරුණ සංඝරක්ඛිත හිමි බුදුරදුන් හමුවට පමුණුවන ලදි.

මේ සිද්ධිය බුදුරජාණන් වහන්සේට දැනුම් දුන් පසු උන්වහන්සේ "සිත, ඈත දුර පවත්නා දෙයක් වුව සිතීමේ ශක්තිය ඇත්තක් බවත්, එම සිත කෙළෙස් බැම්මෙන් මුදා ගැනීම පිණිස දැඩි ප්‍රයත්නයක් දැරිය යුතු බවත් පැහැදිලි කළ හ. මෙහි එන ගාථාව දේශනා කරනු අසා සිටි තරුණ හිමි නම සෝවාන් ඵලයෙහි පිහිටියේ ය.

විවරණාත්මක අනුවාදය (37 වන ගාථාව)

දූරඞ්ගමං එකචරං අසරීරං ගුහාසයං චිත්තං යෙ
සඤ්ඤමෙස්සන්ති (තෙ) මාරබන්ධනා මොක්ඛන්ති.

දූරඞ්ගමං: දුර ගමන් යන; **එකචරං**: තනිව හැසිරෙන; **අසරීරං**: ශරීරයක් නැති; **ගුහාසයං**: නිලීනව සිටින; **චිත්තං**: සිත; **යෙ**: යමෙක්; **සඤ්ඤමෙස්සන්ති**: සංවර කර ගනිත් ද; (**තෙ**: ඔවුහු); **මාරබන්ධනා**: මාරයා ගේ බැම්මෙන්; **මොක්ඛන්ති**: මිදෙති.

දුර ගමන් යන, තනිව හැසිරෙන, ශරීරයක් නැති ගුප්ත වූ මේ සිත සංවර කර ගන්නට යමකුට හැකි නම් මරුවා ගේ බැම්ම වූ සංසාරයෙන් මිදෙන්නට ඔවුනට හැකි වෙයි.

විවරණය

දූරඞ්ගමං එකචරං අසරීරං ගුහාසයං: මිනිස් මනසෙහි තවත් අපූර්ව ලක්‍ෂණ කිහිපයක් මේ ගාථාවෙන් අපට හඳුන්වා දෙනු ලැබේ. ලොව කවර තැනකට වුව ද ක්‍ෂණයකින් යාමේ හැකියාව සිතට ඇත. එයට ශරීරයක් නැත. ඒකචාරී බව යන්නෙන් අදහස් කරන්නේ එක් ක්ෂණයකදී සිතනු ලබන්නේ එක් අරමුණක් ගැන පමණක් බව ය. අසරීරං යන්නෙන් එයට අවකාශය තුළ භෞතික ශරීරයකට මෙන් ඉඩ කඩක් අනවශ්‍ය බව හැඟවේ. චිත්තය ක්‍රියාකාරිත්වයක් මිස ද්‍රව්‍යයක් නොවන හෙයිනි. ගුහාසයං හෙවත් නිලීනව සැඟවී සිටීම යන්නෙන් එය ස්පර්ශ කිරීමට හෝ පංච ඉන්ද්‍රියානුසාරීව පැහැසීමට සොයාගත නො හැකි බව හැඟවේ.



නො තිර, සදහම් නො දත්, ඉපිලෙන (පැන පැන යන) සිතැති සැදැහැත්තාට නුවණ නො වැඩේ.

38. අනවට්ඨිතචිත්තස්ස
සද්ධම්මං අවිජානතො
පරිප්ලවපසාදස්ස
පඤ්ඤා න පරිපූරති (3:6)

නැත හොත් සිත වී තහවුරු
දහමත් කර නැත්නම් හුරු
සැලෙන සැදැහැ ඇති ඒ අය
ප්‍රඥාවෙන් නොමවෙති සරු

සිත නිති සැලෙතොත් - නුවණත් නො වැඩෙත්

3 (5) චිත්තහත්ථ හිමියන් ගේ කථා වස්තුව (38 සහ 39 ගාථා)

ජේතවනාරාමයෙහි වැඩ වාසය කළ භාග්‍යවතුන් වහන්සේ **චිත්තහත්ථ** නම් හිමිනමක් ඇරබ මේ ගාථා යුග්මය දේශනා කළ සේක.

සැවැත් නුවර වැදගත් පවුලක උපන් ගව පාලක තරුණයෙක් නැතිවුණු ගවයකු සොයා වනයට පිවිසියේ ය. ඔහු එහි මෙහි ඇවිද දුකසේ ගවයා සොයා ගන්නා විට මධ්‍යාහ්නය විය. ගමන් වෙහෙස හා හිරු රස්නය නිසා පීඩිතව සිටි ඔහුට දැඩි කුස ගින්නක් දැනිණ. පිපාසය ද බලගතු ය. කෙසේ අහරක් සොයා ගනිම්දැයි සිතූ ඔහුට වනගත ආරාමයේ බවුන් වඩන තෙරවරුන් සිහිපත් විය. උන්වහන්සේලා ගෙන් කෑමට යමක් ලබා ගත හැකි වෙතියි සිතූ හෙතෙම එහි ගියේ ය. ඒ වන විට භික්ෂූන් වහන්සේලා දන් වළඳා නිම ව තිබිණ. තවත් ආහාර ඉතිරිව ඉවත ලන්නට සැරසෙන මොහොතේ ඔහු එහි ආ හෙයින් ඔහු ගේ දුක්ඛිත ස්වරූපය දුටු භික්ෂූහු අනුකම්පාවෙන් ඔහු ඇමතූ හ. "ඔබට කුසගිනි පාටයි. මේ ආහාර කැමති පරිදි භුක්ති විඳින්න"යි ඔවුහු පැවසූ හ. (භාග්‍යවතුන් වහන්සේ ධරමාණ සමයෙහි සැදැහැවතුන් නිර්ලෝභීව දාන මානාදිය සැපයූ හෙයින් අවශ්‍යතාවටත් වඩා ලැබීම සිරිතක් විය.) ඇති පමණ රසවත් අහරින් සැනසුණු තරුණ තෙම දෑත් සෝදා පැන් බී සුවපත්ව "සමිඳුනි, අද මහා දානමය පුණ්‍යකර්මයකට වැඩම කළා ද?" යි ඇසී ය. "නැත. උපාසකය, දිනපතා අපට දායකයෝ දානය රැගෙන එති" යි හිමිවරු පිළිතුරු දුන් හ.

තරුණයා හිමිවරුන්ගෙන් එය විශේෂ දිනයක පිදෙන සාංඝික දානමය පුණ්‍ය කර්මයක අවශේෂය දැයි විමසා සිටියේ එදින ආහාරය එතරම් ම ප්‍රණීත වූ හෙයිනි. දිනපතා ලැබෙන සාමාන්‍ය දානය එසේ ම ප්‍රණීත බව දැනගත් විට ඔහුට මෙසේ සිතිණ. "අපි දිනපතා කෙසේ හෝ වෙහෙස මහන්සි වී උපයමු. එහෙත් මෙතරම් රස බොජුන් වළඳමින් සුවසේ වසන්නට අපට හැකියාවක් නැත. කුමට දුක් විඳිමින් මහන්සි වෙමු ද? පැවිදි වුව හොත් දවස ගාණේ රස අහර වළඳමින් පහසුවෙන් විසිය හැක. මම ද පැවිදි වෙමි" එසේ සිතූ හේ භික්ෂූන් වහන්සේලා අමතා "ස්වාමීන් වහන්ස, මම පැවිදිවනු කැමැත්තෙමි" යි පැවසීය. "යහපති, උපාසකය, අපි ඔබ පැවිදි කරමු" යි පැවසූ හිමිවරු ඔහු පැවිදි කළ හ.

පැවිදි වූ හෙතෙම ආරාමයෙහි වතාවත් ආදිය කරමින් ටික දිනක් පැවිදි දම් පිරී ය. වැඩි වෙහෙසක් නැතිව සුවසේ ප්‍රණීත භෝජන වළඳමින් විසූ හෙයින් ඒ ටික කාලය තුළ හේ පියකරුව, කාය ශක්තිය වැඩී සුවපත් බවට පත් විය. තම ශරීරයේ ප්‍රසන්න ප්‍රමුදිත බව දැක "පැවිදි ජීවිතයෙන් ඇති ඵල කිම? මම නැවත ගිහි ගෙට යමි" යි සිවුරු හැර දමා සිය නිවසට ම ගියේ ය. එහෙත් නැවත සුපුරුදු පරිදි සිරුර වෙහෙසා වැඩ කරන විට නොබෝ දිනකින් ම ඔහු ගේ සිරුර කෘශව ගියේ ය. පෙර වූ පහන් බව හීන විය. "මෙසේ දුක් විඳ වෙහෙසෙන්නේ කුමට ද? මම යළිත් පැවිදි වන්නෙමි" යි සිතූ හේ නැවත භික්ෂූන් වෙත ගොස් පැවිදි විය. නැවත ද ටික දිනකින් සිරුර ප්‍රසන්නව මහත්ව ප්‍රමුදිත වූ විට "කුමට මේ පැවිදි ජීවිතයේ හිරිහැර විඳිම් ද?"යි සිතා යළිත් ගිහිගෙට ආවේ ය. ගිහිගෙයි මහන්සි වී වැඩ කරන ඔහුට සිරුර යළිත් වැහැරී වෙහෙස දැනෙන විට යළිත් පැවිදි ජීවිතයේ මිහිර මතක් විය. යළිත් හේ ආරාමය කරා ගොස් පැවිදි විය. මෙසේ වරින් වර ආශ්‍රමයෙන් ගිහිගෙයටත්, ගිහි ගෙයින් ආශ්‍රමයටත් මාරුවන ඔහු ගේ චර්යාව දුටු අනෙකුත් හිමිවරු "මෙතෙම සිත විසින් මෙහෙයනු ලබයි" යි පවසමින් 'චිත්තහත්ථ' නම් කළ හ.

නිතර නිතර නිවසටත් ආරාමයටත් මාරුවෙමින් වසන අතරතුර චිත්තහත්ථ ගේ බිරිඳ ගැබ් ගත්තා ය. ඔහු නිවසට ආපසු එන එක් දිනක බිරිඳ මෝරා ගිය ගැබ් ඇතිව ඇඳෙහි නිදා සිටියා ය. ඇය ගේ ඇඳිඳවත් ලිහිල්ව තිබිණ. මුව අයා ගෙන නිදා සිටි ඇය ගේ මුවින් කෙළ වැගිරෙමින් පැවතිණ. ගැබ් ගැනීම නිසා ඉදිමී තිබුණ අත පය ඔහු තුළ රාගය වෙනුවට ජුගුප්සාවක් ජනිත කළේ ය.

"පැවිදිවන හැම වතාවක ම මැය ගේ රූ සපුව ගැන සිතා මම ගිහි ගෙට ඇදුණෙමි. ඒ සුන්දරත්වයට කුමක් වී ද? මෙලොව සියළු විසිතුරු තාවකාලික ය. සියල්ල අනිත්‍යය. පැවිදි ජීවිතයේ සමෘද්ධියක් ලබන්නට මා අසමත් වූයේ මේ සත්‍යය පසක් නො කළ නිසා නො වේ ද?" යි සිතූ හෙතෙම කහ සිවුර යළිත් බඳවටා ඔතා ගෙන ඉක්මන් ගමනින් ආරාමයට යනු පිණිස නික්මුණේ ය.

සිවුරත් ඉණේ ඔතාගෙන පන්සල දෙසට දුවන බෑණා දැක විස්මයට පත් ඔහු ගේ බිරිඳගේ මව මේ හදිසි කලකිරීමට හේතුව දැනගනු වස් නිවස තුළට පිවිස තම දියණිය ගේ නින්ද දැක කරුණු තේරුම් ගත්තා ය. දියණිය පිබිදවූ ඕ "ඔබ නිදාගත් පිළිකුල් සහගත ස්වභාවය දැක චිත්තහත්ථ ආපසු ගියා. ගිය විදියෙන් නම් මට හිතෙන්නේ ආපසු එන එකක් නෑ කියලයි" පැවසුවා ය. "අම්මා කලබල වෙන්න එපා. එයා ගෙ හැටි මම දන්නවා. තව ටික දවසකින් ආපසු එයි." පැවසූ දියණිය නැවත නින්දට වැටුණා ය.

විවරණාත්මක අනුවාදය (38 වන ගාථාව)

අනවට්ඨිත චිත්තස්ස සද්ධම්මං අවිජානතො
පරිප්ලවපසාදස්ස පඤ්ඤා න පරිපූරති.

අනවට්ඨිත චිත්තස්ස: ස්ථාවර නො වූ සසල සිතැති; **සද්ධම්මං**: සද්ධර්මය; **අවිජානතො**: නො දන්නා; **පරිප්ලවපසාදස්ස**: චංචල වන පැහැදීම ඇති තැනැත්තා ගේ; **පඤ්ඤා**: නුවණ; **න පරිපූරති**: වර්ධනය නො වේ.

යම් කිසි පුද්ගලයකු ගේ සිත නිතර චංචල වේ නම්, ධර්මාවබෝධය මඳ හෙයින් ප්‍රසාදය නිතර අඩු වැඩි වේ නම්, එවැන්නහු ගේ ප්‍රඥාව වර්ධනය නො වේ.



රාගයෙන් නො තෙත් වූ කෝපයෙන් දැඩි නොවූ සිත් ඇති, පින් පව් දුරැලූ රහතුනට කෙළෙස් බිය නැත.

39. අනවස්සුත චිත්තස්ස
අනන්වාහත චේතසො
පුඤ්ඤපාපපහීණස්ස
නත්ථි ජාගරතො භයං (3:7)

කෙළෙසුන් ගෙන් සිත නො තෙමුණු
වෛර කිරීමෙන් නො තැළුණු
පින් - පවු දෙකමත් දුරු කළ
අය බය නැති වෙති පිබිදුණු

සිත පිබිදුණු අය - දුරු කර ලති බය.

3 (5) චිත්තහත්ථ හිමියන් ගේ කථා වස්තුව (38 සහ 39 ගාථා) (ඉතිරි කොටස)

චිත්තහත්ථ ගේ සිතෙහි ඇති වූ පුජුප්සාව ඉතා දැඩි විය. මග දිගේ ම ඔහු සිතමින් ගියේ "ලොව සියල්ල තාවකාලිකය, අනිත්‍ය ය. ඒ හැමකෙක් ම දුක ය." යනුවෙනි. එය ඔහුට භාවනාවක් විය. මඟදී ම හෙතෙම සෝවාන් ඵලය ලද්දේ ය. ආරාමයට ගිය හේ "මා නැවත පැවිදි කළ මැනවි'' යි ඉල්ලා සිටිය ද භික්ෂූහු ඊට කැමති නො වූ හ. "මේ අන්තිම වාරයයි. මෙවර ආපසු නො යමි. අන්තිම වතාවට මා පැවිදි කරන්න" යි නැවත නැවත ආයාචනා කළ විට, ඔහු ආරාමයේ කුදු මහත් කටයුතු සැලකිල්ලෙන් කරන බව මෙනෙහි කළ හිමිවරු චිත්තහත්ථ යළිත් පැවිදි කළ හ.

දින කීපයක් ගත වත්ම චිත්තහත්ථ බවුන් වඩා සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය පෑමේ ශක්තිය ද ඇති මහ රහත්නමක් බවට පත් වූයේ ය. චිත්තහත්ථ හිමියන් උපැවිදි වීමක් ගැන නොසිතා දිගට ම පැවිද්දේ රැඳී සිටිනු දුටු විහාරවාසී හිමිවරු විස්මයට පත්ව "චිත්තහත්ථ, කවුදාද ඔබ ගෙදර යන්නේ? ඔබට ම හිතෙන්න ඕන නේද? මෙවර නම් හුඟක් දිග කාලයක් මෙහෙම හිටියා නේ ද?" යි ප්‍රශ්න කළ හ. "හිමිවරුනි, ලෞකික ආශාවලින් වෙලී සිටි දවස්වල මම එහෙම ගියා. දැන් මම ඒ ආශා දුරු කරලා දැන් ඉතින් ගෙදර යන අදහසක් නැහැ" යි චිත්තහත්ථ හිමියෝ පිළිතුරු දුන් හ.

චිත්තහත්ථ හිමියන් බුදුරදුන් වෙත කැඳවා ගෙන ගිය භික්ෂූන් වහන්සේ උන්වහන්සේ අමතා මෙසේ කී හ. "බුදුරජාණන් වහන්ස, අපි මේ චිත්තහත්ථට මෙසේ කීමු. උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ. තමන් කෙලෙසුන්ගෙන් මිදුණු බවක් උන්වහන්සේ හැඟවුවත් එය ඇත්ත විය නොහැක" එහෙත් භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ම පුතණුවන් ගේ සිත සසලව පැවති බව සැබෑ ය. සද්ධර්මය අවබෝධ නොවූ තාක් හෙතෙම ගියේ ය. ආවේ ය. එහෙත් දැන් හෙතෙම පුණ්‍ය පාප දෙකින්ම විමුක්ත වූයේ ය." යි වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (39 වන ගාථාව)

අනවස්සුතචිත්තස්ස අනන්වාහතචේතසො පුඤ්ඤපාප පහීණස්ස ජාගරතො භයං නත්ථි.

අනවස්සුතචිත්තස්ස: සිත රාගයෙන් තෙත් නො වූ; **අනන්වාහතචේතසො**: ද්වේෂයෙන් නො කෙලෙසුණු සිත් ඇති; **පුඤ්ඤපාප පහීණස්ස**: පින් පව් දෙක ම දුරු කළ තැනැත්තා හට; **ජාගරතො**: අවදියෙන් සිටීම හේතුවෙන්; **භයං නත්ථි**: බියක් නො මැත.

සිත රාගයෙන් තෙත් කර නොගත් ද්වේෂයෙන් පළුදු කර නොගත් පුණ්‍ය-පාප දෙකම දුරු කළ, නිතර අවදියෙන් සිටින පුද්ගලයාට බියක් නැත.

විවරණය

අනවට්ඨිතචිත්ත: යන්නෙන් සාමාන්‍ය පුද්ගලයන් ගේ තැන්පත් නො වූ සිත අදහස් වෙයි. ඔවුන් ගේ සිත ඒකාග්‍ර නැත. සමාධිගත නැත. එබඳු චංචල සිතක් ඇත්තහුට ආර්‍ය්‍ය මාර්ගයේ ඉදිරි ගමන නියත නැත.

සද්ධම්මං අවිජානතො: යන්නෙන් තථාගතයන් වහන්සේ ගේ උතුම් ධර්‍මය නොදන්නා පුද්ගලයා

පරිප්ලවපසාදස්ස: නම් ශ්‍රද්ධාව නිතර නිතර අඩු වැඩි වන බවයි. වරින් වර පැහැදීම වෙනස් කර ගන්නා විට ශීඝ්‍ර හා සමබර ප්‍රගතියක් ලබා ගැනීම දුෂ්කර වෙයි.

අනවස්සුතචිත්ත: නම් රාගයෙන් සිත තෙත් නො වූ බවයි. එය උතුම් ගුණයකි. සිත තුළට ගංවතුරක් ගලා එන පරිද්දෙන් රාගය ගලා ඒමට ඉඩ ඇත. එසේ සිදු වන්නේ රූප ශබ්ද ගාන්ධාදිය විෂයෙහි දක්වන ප්‍රතිචාර හේතුවෙනි.

අනන්වාහතචේතසො: රාග ද්වේෂාදියෙන් නො මැඩුණු සිත අනන්වාහත සිතයි. මෙබඳු ක්ලේශයන් ගෙන් සිත දූෂිත නො වූ විට එය යහපත සඳහා යෙදැවිය හැකි ය.

නත්ථි ජාගරතො භයං: නිරතුරුව පූර්ණ අවදිකම යන්නෙන් මෙහි අදහස් වන්නේ සිතට බලපෑම් කළ හැකි ක්ලේශ පිළිබඳ අවදිකමින් සිටීමයි. නිදි නොලබා සිටීමත් 'ජාගරතො' යන්නෙන් අදහස් නො කැරෙන බව මතක තබා ගත යුතු ය. සද්ධා, විරිය, සති, සමාධි හා ප්‍රඥා යන ගුණාංග පඤ්චකය නිරතුරුව පවත්නා හෙයින් අවදිකමින් සිටීම යැයි පැවසෙයි.

පුඤ්ඤපාප පහීණස්ස - පුණ්‍ය හා පාප යන සංකල්ප ඉක්මවා සිටීම යන්නෙන් තම හොඳ ක්‍රියා වුවත් භවය තුළදී විපාක ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් ක්‍රියා නො කිරීම අදහස් වෙයි. මෙය ඉතා උත්කෘෂ්ට වූ ආචාර ධර්මීය උපේක්ෂාවකි. ආත්ම විරහිත උපේක්ෂාවකි. දන්දීම කෙරෙහි හෝ දන් පිළිගන්නා පිළිබඳව හෝ දීමනාව පිළිබඳව හෝ කිසිම හැඟීමක් තබා නො ගත යුතු ය. රහතන් වහන්සේ පුනර්ජන්මය ඇති කරවන සකල විධ පුණ්‍ය-පාප ක්‍රියාවලින් ම විනිර්මුක්ත ය.

රහත් වහන්සේලා ගේ ක්‍රියා පුණ්‍ය හෝ පාප ගණයට නො වැටේ. උන්වහන්සේ අකර්මණ්‍ය බවක් මින් අදහස් වන්නේ නැත. උන්වහන්සේ සක්‍රිය ය. එහෙත් ඒ සියලු ක්‍රියා ආත්මාර්ථකාමයෙන් තොරව හුදු අන්‍යයන්ගේ යහපත ම අරමුණු කර ගෙන කරනු ලබන දේය. සාමාන්‍යයෙන් ඒවා හොඳ වැඩ වුව ද තමන්ට ප්‍රතිඵල දීම පිළිබඳ අර්ථයෙන් ගත් විට ඵලදායී ශක්තියෙන් තොරය. රහතන් වහන්සේට අතීත කර්ම විපාක දෙන බව සැබෑ වුව ද වර්තමාන කර්ම රැස්වීමක් නො මැත. රහතන් වහන්සේ ගේ චර්‍යාව හුදෙක් 'ක්‍රියා' ලෙස හැඳින්වේ. සියළු ධර්මයන් ගේ යථාර්ථය අවබෝධ කරගත් උන්වහන්සේ විසින් හේතු-ඵල චක්‍රය බිඳ දමා ඇත.





සිරුර කළයක් මෙන්ද, සිත නුවරක් මෙන් ද ගෙණ නුවණ අවියෙන් කෙළෙස් මරු පරදවන්න.

40. කුම්භූපමං කායමිමං විදිත්වා
නගරූපමං චිත්තමිදං ඨපෙත්වා
යොධෙථ මාරං පඤ්ඤායුධෙන
ජිතඤ්ච රක්ඛෙ - අනිවෙසනො සියා (3:8)

මේ කය මැටි කළයක් සේ දැනගෙන
මෙ සිතට නුවරක් උපමා කරගෙන
ප්‍රඥා යුධයෙන් මරුවා ජයගෙන
දිනු දේ රැක ගත යුතු නො ඇලී ගෙන

මරු පරදන අවි

3 (6) පන්සියයක් හිමිවරුන් ගේ පුවත (40 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි **භික්ෂූන් වහන්සේ පන්සියයක්** අරබයා තථාගතයන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවර භික්ෂූන් වහන්සේලා පන්සිය නමක් භාග්‍යවතුන් වහන්සේ වෙතින් කර්මස්ථාන ලබා ගෙන එහි සිට යොදුන් සියයක් පමණ දුරින් පිහිටි ස්ථානයකට පිටත්ව ගිය හ. එහි වූ භාවනානුයෝගීනට ගැළපෙන වන ලැහැබක නවාතැන් ගත් හ. එම වනයෙහි තුරු ලතාවන් හි රුක් දේවතාවෝ භික්ෂූන් වහන්සේලා එහි වසත් නම් තම අඹු දරුවන් සමග එහි විසීම අයෝග්‍යයැයි සිතමින් තුරුමතින් බිමට බට හ. ඔවුන් සිතුවේ භික්ෂූන් එදා රාත්‍රිය පමණක් එහි වසනු ඇත යනුවෙනි. එහෙත් දෙ සතියක් යන තුරුත් භික්ෂූන් එහි ම විසූ හෙයින් උන්වහන්සේලා මුළු වස් කාලයම එහි ගත කරන්නට ඉඩ ඇතැයි ඔවුහු තේරුම් ගත් හ. එසේ වුවහොත් ඔවුන්ට හා අඹු දරුවනට දිගු කලක් බිම වසන්නට සිදුවනු ඇත. එහෙයින් භික්ෂූන් බිය කොට පළවා හරින්නට තීරණය කර හොල්මන් හා විවිධ භයානක ශබ්ද ආදිය කරන්නට පටන් ගත් හ.

හිස් නැති ශරීර, ශරීර නැති හිස් ආදිය දැක්වූ හ. මෙයින් වියවුලට පත් භික්ෂූහු ඒ ස්ථානය අතහැර බුදුරදුන් හමුවට ආපසු ගියහ. උන් වහන්සේලා ගේ විස්තරය අසා සිටි භාග්‍යවතුන් වහන්සේ මේ සියල්ල සිදු වූයේ කිසි ආරක්ෂාවක් නැතිව ගිය හෙයින් බව ද, දැන් නිසි ආරක්ෂාවක් ඇතිව යා යුතු බව ද පැවසූ හ. එසේ වදාරා කරණීය මෙත්ත සූත්‍රය උගන්වා වදාළ හ. වනයට පිවිසෙන මොහොතේ සිට ආරාමය දක්වා ම මේ පිරිත සජ්ඣානය කරන්නැයි ඔවුන්ට උපදෙස් ලැබිණ. භික්ෂූහු ද තමන් ලද උපදෙස් පරිදි සූත්‍රය සජ්ඣායනා කළ හ.

භික්ෂූන් වහන්සේලා මෙත්ත සූත්‍ර සජ්ඣායනය මගින් දේවතාවනට මෙත් වඩන විට දේවතාවෝ ද එයින් සොම්නසට පත්ව හිරිහැර කරනු වෙනුවට ගරුසරු ඇතිව භික්ෂු පිරිස ආදරයෙන් පිළිගත් හ. ඉන් පසු අප්‍රසන්න ශබ්ද හෝ හොල්මන් දක්නට නො ලැබිණ. මෙසේ යහපත් පරිසරයක් ඇති වූ පසු භික්ෂූහු කායගතා සති භාවනාව වඩා ශරීරයේ අනිත්‍යත්වය මනාව තේරුම් ගත් හ. භාග්‍යවතුන් වහන්සේ ද දෙව්රම් වෙහෙර වැඩ වසමින් ම භික්ෂූන් වහන්සේලා ගේ ප්‍රගතිය විමසා බලා තමන් වහන්සේ ඔවුන් අබියස පෙනී සිටින්නාක් මෙන් ඍද්ධියක් කර වදාරා 'මහණෙනි, ඔබ තේරුම් ගත් පරිද්දෙන් ම ශරීරය මැටි කළයක් මෙන් අනිත්‍ය ය. විනාශ වන සුලුය'' යි. අනුශාසනා කළ හ.

විවරණාත්මක අනුවාදය (40 වන ගාථාව)

ඉමං කායං කුම්භූපමං විදිත්වා ඉදං චිත්තං නගරූපමං ඨපෙත්වා පඤ්ඤායුධෙන මාරං යොධෙථ ජිතං ච රක්ඛෙ අනිවෙසනො සියා.

ඉමං කායං: මේ කය; **කුම්භූපමං විදිත්වා**: කළයකට උපමා කොට තේරුම් ගෙන; **ඉදං චිත්තං**: මේ සිත; **නගරූපමං**: නගරයකට උපමා කොට; **ඨපෙත්වා**: සිත තබා ගෙන; **පඤ්ඤායුධෙන**: ප්‍රඥාව නැමති ආයුධයෙන්; **මාරං**: මාරයාට; **යොධෙථ**: පහර දෙන්න; **ජිතං**: ජයග්‍රහණය කොට; **රක්ඛෙ**: රැක ගන්න; **අනිවෙසනො**: බන්ධනය වන තැනක් නැතිව; **සියා**: වසන්න.

මේ ශරීරය කළයක් සේ සිතන්න. සිත නගරයකට උපමා කරගන්න. ප්‍රඥාව ආයුධය වශයෙන් ගෙන මරු පරදවන්න. දිනා ගත් දේ රැක ගන්න. කිසිවකට ඇලුම් බැඳුම් නො කරන්න.

විවරණය

කුම්භූපමං: මනුෂ්‍ය ශරීරය කළයක් මෙන් බිඳෙන සුළු, නැසෙන සුළු බව සිතන්නට භික්ෂූන් වහන්සේලාට අවවාද කර ඇත.

චිත්තං නගරූපමං: සිත බල කොටු ප්‍රාකාර ආදියෙන් යුක්ත නගරයක් ලෙස දක්වා ඇත. බල කොටුවක විශේෂ ලක්ෂණය ඒ තුළ අගනා වස්තූන් පැවතීම ය. මුරකාවල් දුර්වල වුවහොත් බාහිර පුද්ගලයන්ට පැමිණ ඒ වස්තු පැහැර ගත හැක. සිත ද එසේ ආරක්ෂා කරනු නො ලැබුවහොත් බාහිර බලවේග නිසා කිලිටි වීමට ඉඩ ඇත.

යොධේථ මාරං පඤ්ඤායුධෙන: ප්‍රඥාව නම් ආයුධයෙන් මරුවා සමග සටන් කරන්න. රැකගත් නගරය වූ සිතට මාර සේනා පහර දෙන විට භාවිත කිරීමට ඇති එකම ආයුධය ප්‍රඥාවයි. එනම් සියළු ධර්මයන් ගේ යථා ස්වභාවය තේරුම් ගැනීමයි.

මේ සිරුර සිත නැති කල වැඩකට නැත. දර කඩක් සේ පොළෝ මත හෝනේ ය.

41. අචිරං වත'යං කායො
පඨවිං අධිසෙස්සති
ඡුද්ධො අපෙතවිඤ්ඤාණො
නිරත්ථං ව කලිඞ්ගරං (3:9)

ඇද වැටෙවි මිහිකත මත
වැඩි කල් නො ගොසින් මේ ගත
අතැර දැමූ, පහ වූ සිත
දිරූ ලී කඳක් මෙන් වත.

සිත නැති ගත - වැඩකට නැත

3 (7) පූතිගත්තතිස්ස හිමියන් ගේ කතාව (41 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **තිස්ස නම් තෙර** කෙනකුන් නිමිති කොට ගෙන මේ ගාථාව වදාළ සේක.

බුදු පියාණන් වහන්සේ වෙතින් භාවනා කර්මස්ථාන ලබා ගෙන ශ්‍රද්ධාවෙන් හා උද්‍යෝගයෙන් භාවනා කරමින් සිටි තිස්ස තෙරණුවෝ හිටි හැටියේ රෝගී වූ හ. මුලින් සිරුර පුරා කුඩා බිබිලි මතු වී පසුව ඒවා ක්‍රමයෙන් විශාල වී පුපුරා ගියේ ය. සිරුර පුරා තුවාල ඇති විය. ඒවායින් ගලන සැරව හේතුවෙන් සිවුරු පෙඟී යන්නට පටන් ගත්තේ ය. සිරුර දුගඳ හමන්නට පටන් ගත්තේ ය. ශරීරයෙන් කුණු ගඳ හමන හෙයින් උන්වහන්සේට 'පූතිගත්ත තිස්ස' යන නම පටා යෙදිණ. (පූති = කුණු වූ, ගත්ත = ඇඟ)

දිනකට දෙ වරක් මහා කරුණාවෙන් ලොව විමසා බලන භාග්‍යවතුන් වහන්සේ ගේ කරුණා දිවැසට පූතිගත්ත තිස්ස තෙරණුවෝ හසු වූ හ. පූතිගත්ත තිස්ස තෙරණුවන් රහත් වීමට තරම් නුවණ මෝරා සිටි බව දුටු භාග්‍යවතුන් වහන්සේ "මේ තෙරණුවෝ සිය සබ්‍රහ්මචාරීන් විසින් අතහැර දමන ලද හ. මා හැර දැන් මොහුට පිහිටක් නැත" යි සිතූ හ. එසේ සිතා සුවඳ ගඳ කිළියෙන් නික්ම ගිනිහල් ගෙයට ගොස් ලොකු බඳුනක් සෝදා පිරිසිදු කර ජලය උණු කළ සේක. ජලය රත් වූ පසු උන් වහන්සේ තිස්ස හිමියන් වැතිර සිටි ඇඳ වෙතට ගියේ එම හිමියන් නාවනු පිණිස බැහැරට ගනු පිණිස ය. ඒ දුටු භික්ෂූහු වහා අවුත් "ස්වාමීනි, බුදුරජාණන් වහන්ස, අපි ඒ නම බැහැරට ගෙනෙමු" යි පවසා ඇඳ පිටින් ම ඔසවා උණුදිය නාන කාමරයට ගෙන ආහ. රෝගියා ගේ සිවුර ගළවා උණු දියෙන් සෝදන්නට සැලැස්වූ බුදුරජාණන් වහන්සේ ඒවා වේලෙන්නට දම්මවා, රෝගියා වෙත එළඹ උණුදියෙන් නැවූ හ.

රෝගී හිමියන් කරුණාවෙන් මනාව නාවා පිරිසිදු කර නිම වන විට සිවුර වේලී තිබිණ, එය හඳවා අඳනය ද උණු වතුරෙන් සේදූ බුදුරජාණන් වහන්සේ එය ද අව්වේ දැමූ හ.අඳනය වියලෙන විට සිරුර ද වියලී තිබුණොත් එය හඳවා මනාව පිරිසිදුව පහන් සිත් ඇතිව සිටි තිස්ස තෙරුන් ගේ හිස සමීපයෙහි වැඩ හිඳිමින් භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුන් ඇමතූ හ. "භික්ෂුව, ඔබේ ශරීරයෙන් සිත වෙන් වූ දින ගත මුළුමනින්ම නිෂ්ඵල දෙයක් වන්නේ ය. දර කොටයක් මෙන් මිහි මත වැටෙන්නේ ය" යි ධර්ම දේශනා කළ හ. දේශනාව අවසන තිස්ස තෙරණුවෝ රහත් ඵලයෙහි පිහිටිය හ. රහත් ඵලය ලත් නොබෝ වේලාවකින් ම උන්වහන්සේ පිරිනිවන් පෑ හ.

විවරණාත්මක අනුවාදය (41 වන ගාථාව)

අයං කායො වත අචිරං අපෙතවිඤ්ඤාණො ඡුද්ධො
නිරත්ථං කලිඞ්ගරං ඉව පඨවිං අධිසෙස්සති.

අයං කායො: මේ ශරීරය; **වත**: ඒකාන්තයෙන්; **අචිරං**: වැඩි කල් යන්නට පෙර ම; **අපේත විඤ්ඤාණො**: පහ වූ සිත් ඇතිව; **ඡුද්ධො**: ඉවත ලන ලදුව; **නිරත්ථං**: වැඩකට නැති; **කලිඞ්ගරං**: දිරාගිය ලී කොටයක්; **ඉව**: මෙන්; **පඨවිං**: පොළොවෙහි; **අධිසෙස්සති**: පතිත වෙයි.

මේ සිරුර නොබෝ කලකින්ම සිත නිරුද්ධව ගිය පසු වැඩකට නැති දිරා ගිය ලී කොටයක් මෙන් ඉවත දමන ලදුව මිහි මත පතිත වනු ඇත.

විවරණය

අචිරං වත: වැඩිකල් යන්නට පෙර ස්ථිර වශයෙන් ම යන අර්ථයි. මේ ගාථාවෙන් මනුෂ්‍ය ශරීරයට අත්වන ඉරණම මනාව දක්වනු ලැබේ. නියත වශයෙන් ම එය ඉක්මණින් විනාශ වී යනු ඇත.

ඡුද්ධො: ඉවත ලන ලදුව. අපට කවර තරම් නෑදෑ හිතමිතුරන්, ආදරණීයයන් සිටිය ද මිය ගිය පසු කිසිවෙක් මළ සිරුර රැක නො ගනිති. එය වහාම ඉවත ලනු ලැබේ.

නිරත්ථං කලිඞ්ගරං: ඉවත ලන ලද සිරුර දිරා ගිය ලී කොටයක් වැනි ය. එයින් කිසි ම ප්‍රයෝජනයක් ගත නො හැක. ප්‍රාණය නිරුද්ධ වූ පසු ශරීරය නිෂ්ඵල ය. දිරා ගිය ලීය දරට ගත හැකි වුවත් ශරීරය දරටවත් ගත නො හැකි හෙයින් ශරීරය දිරූ ලී කොටයක් තරම් වත් ප්‍රයෝජනවත් නො වේ.

සොර සතුරන් කරන විපතකට වඩා වරදෙහි යෙදු සිත බලවත් නපුරක් කරන්නේ ය.

42. දිසො දිසං යං තං කයිරා
වෙරී වා පන වෙරිනං
මිච්ඡාපණිහිතං චිත්තං
පාපියො නං තතො කරෙ (3:10)

හොරෙක් හොරෙකුටත් සතුරෙක් සතුරකුටත්
හමු වූ විට දි පමුණති අති කුරිරු විපත්
මිසදිටු වැරදි පිළිවෙත යෙදැවුවොත් සිතත්
ලැබදෙනු නියත වෙයි ඊටත් වඩා විපත්.

සිත නොමගක යෙදැවුවොත් - ඉන් සිදුවේ දරුණු විපත්

3 (8) නන්ද ගෝපාලයන් ගේ වස්තුව (42 ගාථාව)

කෝසල රාජධානියේ එක් ගමකට වැඩම කළ අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව **නන්ද ගෝපාල** නිමිති කර ගෙන දේශනා කළ හ.

නන්ද අනාථපිණ්ඩික සිටාණන් ගේ ගවයන් බලා ගත් ගෝපාලයා ය. රැකියාවෙන් ගෝපාලයකු වුව ද ඔහුට තමන් ගේ ම ධනයක් ද තිබිණ. ඉඳ හිට අනේපිඬු සිටාණන් ගේ මැදුරට යන නන්ද එහිදී භාග්‍යවතුන් වහන්සේ ගෙන් දහම් ඇසීමට ද අවස්ථාව ලද්දේ ය. තම නිවසට වැඩම කරන සේ නන්ද භාග්‍යවතුන් වහන්සේට ආරාධනය කළේ ය. සුදුසු අවස්ථාවේදී පැමිණෙන්නෙමැයි භාග්‍යවතුන් වහන්සේ එහි වැඩම කිරීම කල් දැමූ හ.

ටික කලකට පසු නන්ද ගේ නිවසට වැඩම කිරීමට දැන් සුදුසු කල්යයි සිතූ භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් පිරිවරා ඔහු ගේ නිවසට විශේෂයෙන් ම වැඩම කළ හ. භාග්‍යවතුන් වහන්සේ මහත් හරසරින් පිළිගත් නන්ද සත් දිනක් ම උන් වහන්සේට පස්ගෝ රසයෙන් සංග්‍රහ කළේ ය. සත්වන දින භාග්‍යවතුන් වහන්සේ කළ දම් දෙසුමට සවන් දීමෙන් නන්ද සෝවාන් වූයේ ය. එදින භාග්‍යවතුන් වහන්සේ ආපසු ගමන් ගන්නා විට නන්ද ද උන්වහන්සේ ගේ පාත්‍රය රැගෙන සෑහෙන දුරක් පසු ගමන් කළේ ය.

භාග්‍යවතුන් වහන්සේට වැඳ අවසර ගෙන ඔහු ආපසු සිය නිවස බලා එන ගමනේ දී වැද්දකු වරදවා විදි ඊතලයක් ඔහුට වැදිණි. හේ එතැනම මිය ගියේ ය. පසුව භික්ෂූන් වහන්සේලා විසින් ඒ බව භාග්‍යවතුන් වහන්සේට දැනුම් දෙන ලදී. "භාග්‍යවතුන් වහන්ස, නන්ද ඔබ වහන්සේට ඉතා ප්‍රණීත අන්දමින් දාන මානාදි පුද සත්කාර කළේ ය. එහෙත් ඔහුට මේ අනතුර වූයේ ඔබ වහන්සේ ආපසු ඇරලීම පිණිස පසු ගමන් කළ හෙයින් ය. ඔබ වහන්සේ එහි ගිය ගමන නො වූවා නම් ඔහුට මේ විපත නො වන්නට තිබිණ" යි ද උන්වහන්සේලා පැවසූ හ. "මහණෙනි, මා එහි නො ගියා වුව ද ඔහුට මේ විපත සිදුවන්නට තිබිණ. ඔහු ගේ පූර්ව කර්මයක විපාකය මෙය නිසා ඔහුට මරු ගෙන් ගැළවීමක් නම් නො තිබිණි" යි බුදුරජාණන් වහන්සේ පැහැදිලි කළ හ.

විවරණාත්මක අනුවාදය (42 වන ගාථාව)

දිසො දිසං වා වෙරී පන වෙරිනං යං තං කයිරා තතො
පාපියො මිච්ඡා පණිහිතං චිත්තං නං කරෙ

දිසො: හොරෙක්; **දිසං**: (තවත්) හොරෙකුට; **වා**: හෝ; **වෙරී**: සතුරෙක්; **පන**: වනාහි; **වෙරිනං**: (තවත්) සතුරෙකුට; **යං තං කයිරා**: යම් කිසිවක් කරයි ද; **තතො පාපියො**: ඊට වැඩි දරුණු විපතක්; **මිච්ඡා පණිහිතං**: නොමඟ යවන ලද; **චිත්තං**: සිත; **නං**: ඔහුට; **කරෙ**: කරන්නේ ය.

පල් හොරෙක් තවත් පල් හොරෙකුට හෝ සතුරෙක් තවත් සතුරෙකුට යම් නපුරු කමක් කරයි ද ඊටත් වැඩි නපුරක් වැරදි මාර්ගයෙහි යොමු කළ සිත අපට කරයි.

විවරණය

දිසො දිසං: පල් හොරෙක් නම් දරුණු සිතැත්තෙකි. ඔහු තුළ සත් ගුණ තිබීම අපේක්ෂා කළ නො හැක. එබඳු දරුණු, තෘෂ්ණා හරිත, හොඳ නරක නො දන්නා හොරෙක් තමා බඳුම තවත් හොරෙකු දුටු විට ඔහු මරා දමන්නට පෙළඹෙනු ඇත. එකිනෙකා කෙරේ ආඝාත බැඳගත් සතුරන් දෙදෙනකු හමු වූ විට අපේක්ෂා කළ හැක්කේ ද එබඳුම තත්ත්වයකි. මේ ගාථාවෙන් දක්වනු ලබන්නේ නො මඟ ගිය සිත අපට ඊටත් වඩා දරුණු විපත් පමුණුවන බව ය.

මිච්ඡා පණිහිතං: වැරදි ලෙස මෙහෙයන ලද, නො මඟ යෙදැවූ අපේ සිත් යහමඟ යැවීමට මෙන් ම නො මඟ යැවීමට ද අපට පිළිවන. සුමඟ යෙදැවූ සිතින් යහපත් ප්‍රතිඵල ලැබේ. සුමඟ යෙදැවූ සිත අපට අපේක්ෂා කළ හැකි හොඳම මිතුරා වෙයි. එහෙත් පාපයෙහි යෙදැවූ සිත අපට දරුණු විපත් ලබා දෙන සතුරකු බවට පත් වෙයි.

මිච්ඡා පණිහිතං චිත්තං: සිත මිථ්‍යා මාර්ගයෙහි පිහිටැවීම යන්නෙන් මූලික වශයෙන් අදහස් වන්නේ දශ වස්තුක මිථ්‍යා දෘෂ්ටියෙහි පිහිටීමයි. එසේ පිහිටි සිත දශවිධ අකුශල කර්ම කරන්නට අප පෙළෙඹවයි. ඉන් අපගේ මෙලොව මෙන් ම පරලොව ද අඳුරු වෙයි.

මනාකොට පිහිටි සිත මව්පියන් විසින් වුවද නො කළ හැකි ඉතා උතුම් බවෙක් කරන්නේ ය.

43. න තං මාතා පිතා කයිරා
අඤ්ඤෙ වාපි ච ඤාතකා
සම්මාපණිහිතං චිත්තං
සෙය්‍යසො නං තතො කරෙ (3:11)

මවක් පියෙක් හෝ නෑයෙක්
නො කරන තරමේ මෙහෙයක්
ලැබදෙයි යමකුට වැඩියක්
නිවැරදි මග පිහිටි සිතක්.

සිතින් උතුම් - වෙතොත් උතුම්

3 (9) සෝරෙය්‍ය ගේ කථා වස්තුව (43 ගාථාව)

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් සෝරෙය්‍ය නගරයේ ධනවතකු ගේ පුත්‍රයා වූ **සෝරෙය්‍ය** නැමැත්තා ඇරබ මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් සෝරෙය්‍ය තම මිතුරකු හා සේවකයන් ද සමග වාහනයක නැගී ස්නානය පිණිස යමින් සිටියේ ය. මේ අවස්ථාවෙහි මහා කච්චායන හිමියෝ සෝරෙය්‍ය නුවර පිඬු සිඟා යනු පිණිස සිවුරු පොරවමින් සිටිය හ. උන්වහන්සේ ගේ රන්වන් ප්‍රියංකර තරුණ ශරීරය සෝරෙය්‍ය ගේ දෙනෙතට මැනවින් ලක් විය. "මේ හිමියන් ගේ රූපය අති සුන්දරයි! මේ හිමියන් මගේ බිරිඳ වුණා නම්! මේ මනරම් ඡවි කල්‍යාණය එහෙම නම් මගේ බිරිඳට තිබෙනවා නො වේ ද" යි සිතූ සෝරෙය්‍ය තුළ කාම රාගය ඇති විය. මේ අවාසනාවන්ත සිතුවිල්ලත් සමගම හෙතෙම ලිංග විපර්‍යාසයකට භාජන විය. මහත් ලජ්ජාවට පත් හෙතෙම වාහනයෙන් බැස තක්ෂිලාව දෙසට පැන දිවුවේ ය. ඔහු ගේ මිතුරන් බොහෝ වෙහෙස වී සෙව්ව ද සෝරෙය්‍ය කොහි ගියා දැයි සොයා ගන්නට අසමත් වූ හ. කාන්තාවක් බවට පත්ව සිටි සෝරෙය්‍ය තක්ෂිලාව දෙසට යන වාහනයක ගැල්කරුට ගාස්තු වශයෙන් තම මුදුව දී තක්ෂිලාවට ගියේ ය. තක්ෂිලාවට ලඟා වූ පසු ගැල්කරුවෝ ඇය තම හිතවත් තරුණ ධනවතකුට හඳුන්වා දුන් හ. ඇය ගේ රූප ශෝභාවෙන් වශී ප්‍රාප්ත හෙතෙම ඇය විවාහ කර ගත්තේ ය. මේ විවාහයේ ප්‍රතිඵල වශයෙන් පුත්තු දෙදෙනෙක් උපන් හ. සෝරෙය්‍ය ගේ කලින් විවාහයෙන් ලද පුත්තු දෙදෙනෙක් ද වූ හ.

දිනක් සෝරෙය්‍ය නගරයේ කෙළෙඹියකු ගේ පුත්‍රයෙක් ගැල් පන්සියයක බඩු පුරවා ගෙන වෙළඳාම් පිණිස තක්ෂිලාවට පැමිණියේ ය. ඔහු තම පැරණි මිතුරකු බව හඳුනාගත් සෝරෙය්‍ය කාන්තාව පණිවුඩයක් යවා ඔහුට නිවසට පැමිණෙන ලෙස ඇරයුම් කළා ය. තමාට ඇරයුම් කළ කාන්තාව කවුරුන්දැයි නො දත් කෙළෙඹියා විශ්මයට පත් විය. "මම නම් ඔබව හඳුනන්නේ නැහැ. ඔබ මාව හඳුනනවා ද?" යි හෙතෙම සෝරෙය්‍ය කාන්තාව ගෙන් ප්‍රශ්න කළේ ය. "ඔව්. මම ඔබ හඳුනමි" යි පැවසූ කාන්තාව තම පවුලේ සුව දුක් හා තොරතුරු විමසී ය. එවිට කෙළෙඹියා සෝරෙය්‍ය සිටාණන් ගේ පුත්‍රයා ස්නානයට යන අතර මග අරුම පුදුම ආකාරයෙන් අතුරුදහන් වූ පුවත විස්තර කළේ ය. අනතුරුව කාන්තා තොමෝ තමා කවුරුන්දැයි හඳුන්වා දී පාපී සිතුවිල්ලක් නිසා තමන්ට අත් වූ ඉරණම ගැන මුළු ප්‍රවෘත්තියම ඔහුට කියා පෑවා ය. "ඔබට තියෙන්නේ මහා කච්චායන හිමියන් සමා කරවා ගන්නයි" සෝරෙය්‍ය නුවරින් පැමිණි මිතුරා උපදෙස් දුන්නේ ය. ඒ යෝජනාව පිළිගැනිණි. මිතුරා ගේ ද සහාය ඇතිව මහා කච්චායන හිමියන් නිවසට වැඩමවා දන් පිළිගන්වන ලදී. අනතුරුව මිතුරා කච්චායන හිමියනට සෝරෙය්‍ය කාන්තාව හඳුන්වා දී සියලු පුවත් හෙළි කළේ ය. අනතුරුව කච්චායන හිමියන් පාමුල වැඳ වැටුණු කාන්තාව ඉතා යටහත්ව මහා කච්චායන හිමියන් වෙතින් තම වරදට සමාව අයැද සිටියේ ය. "නැගී සිටින්න, මම ඔබට සමාව දෙමි" යි තෙරුන් වහන්සේ වදාළ හ. විශ්මයකි! සෝරෙය්‍ය නැගී සිටියේ පිරිමියෙකු වශයෙනි. එක ම ආත්ම භාවයක දී වරක් පිරිමියකු සේත් තවත් වරක් ගැහැණියක සේත් දරුවන් ද ලබමින් තමන්ට ගත කරන්නට සිදු වූ ජීවිත රටාවන් ගැන මෙනෙහි කරත් දී සෝරෙය්‍යට ලජ්ජාවක් මෙන් ම ජුගුප්සාවක් ද දැනිණ. දිගින් දිගට ඒ ගැන සිතත් ම ඔහු ගේ කළ කිරීම දැඩි විය. ගිහි ගෙය අතහැර පැවිදි වන්නට ඔහු ගේ සිත නැමිණ. පැවිදි වූ පසු බොහෝ අය උන් වහන්සේ ගෙන් "ඔබේ දරුවන් ගෙන් ඔබ වඩාත් ආදරේ කාට ද? පියකු ලෙස ලද දරුවන්ට ද, මවක ලෙස දරුවන්ට ද?" යි බොහෝ අය ප්‍රශ්න කළ හ. "මගේ කුසින් ම උපන් දරුවන්ට වැඩියෙන් ආදරය ඇත්තෙමි" යි උන්වහන්සේ පිළිතුරු දෙති. නමුත් ප්‍රශ්නවල ඉවරයක් නැත. පිළිතුරු දී නිමාවක් නැත. අන්තිමේ මෙසේ විමසනු ලැබීම තිත්ත වූ උන් වහන්සේ පිරිස් වලින් ඈත්ව හුදෙකලාව බවුන් වඩා සිවු පිළිසිඹියාපත් මහ රහත් නමක් බවට පත් වූ හ. නැවතත් පැරණි ප්‍රශ්නය ම අසනු ලබන විට දැන් උන්වහන්සේ අලුත් පිළිතුරක් දෙති. "කිසිවෙකුට එබඳු විශේෂ ආදරයක් නැත" යනු ඒ නව පිළිතුරයි. උන්වහන්සේ එසේ කියනවා ඇත්තේ බොරුවට විය යුතුයැයි සිතූ අන්‍ය භික්ෂූහු බුදුරජාණන් වහන්සේට තම අදහස පැවසූ හ. "මගේ පුත් සෝරෙය්‍ය බොරු නො කියයි. ඔහු කියන්නේ සැබෑමය" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ ඒ අරබයා මේ ගාථාව ද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (43 වන ගාථාව)

මාතා පිතා වා අඤ්ඤෙද ඤාතකා අපි තං න කයිරා
සම්මා පණිහිතං චිත්තං නං තතො සෙය්‍යසො කරෙ

මාතා: මව; **පිතා**: පියා; **වා**: හෝ; **අඤ්ඤෙද**: අන්‍ය වූ; **ඤාතකා අපි**: නෑදෑයෝ වුව ද; **තං**: ඔහුට; **න කයිරා**: (යම් උදව්වක්) කරන්නට අසමත් වෙත් ද; **සම්මා පණිහිතං**: මනාව පිහිට වූ; **චිත්තං**: සිත; **නං**: ඔහුට; **තතො සෙය්‍යසො**: ඊටත් වඩා උසස් දෙයක්; **කරෙ**: කරයි.

යම් තැනැත්තකු ගේ මව, පියා හෝ වෙනත් ඤාතිවරයකු විසින් ඔහුට යම් උදව්වක් කර ගන්නට අසමත් ද, ඊටත් වඩා ලොකු උපකාරයක් මනාව පිහිටුවා ගත් සිත කරයි.

විවරණය

සම්මා පණිහිතං චිත්තං: යන්නෙන් දශවස්තුක මිථ්‍යා දෘෂ්ටියෙන් තොරව කුසලය, කුසල මූලය, අකුසලය, අකුසල මූලය මනාව දැක නිවැරදි ශ්‍රද්ධාවෙන් යුක්තව සමථ විදර්ශනා භාවනාවන් හි යෙදීම අදහස් වෙයි.

දෙමාපියන් හා නෑදෑයිනට අපට අගනා වස්තු ආදියෙන් උදවු කළ හැකි වුව ද උසස් අධ්‍යාත්මික සාධක ලබා දීම කළ නො හැක. ඒවා ලබා ගත හැක්කේ සිත නිවැරදි මග ශික්ෂණය කිරීමෙන් පමණි.

බුදුරදුන් ගේ නිෂේධාත්මක පිළිතුරු

නිදසුනක් වශයෙන් අප ඉලෙක්ට්‍රෝනයේ ස්ථානය
ඒකාකාරව පවතී දැයි විමසුවහොත් පිළිතුර විය යුත්තේ
'නැත' යන්නයි. ඉලෙක්ට්‍රෝනයේ ස්ථානය කාලය සමග වෙනස් වේදැයි
විමසුවහොත් පිළිතුර විය යුත්තේ 'නැත' යන්නයි.
එය චලනය වේදැයි විමසමු නම්, එයට පිළිතුර 'නැත' යන්න ය.
මනුෂ්‍යයා ගේ මරණින් පසු පෞද්ගලිකත්වය පිළිබඳ විමසූ විට බුදුරදුන්
පිළිතුරු දී ඇත්තේ ද මෙ පරිදිම ය. ඒවා දහහත්වන දහඅටවන ශත
වර්ෂවල විද්‍යාත්මක සම්ප්‍රදායට හුරු පුරුදු පිළිතුරු නො වේ.

ජේ. රොබට් ඕපන්හයිමර්

4 වන පරිච්ඡේදය

පුප්ඵ වග්ග

කවරෙක් ලොව අවබෝධ කරන්නේ ද? කවරෙක් දහම් පදය අවබෝධ කරන්නේ ද?

44. කො ඉමං පඨවිං විජෙස්සති
යමලොකඤ්ච ඉමං සදෙවකං
කො ධම්මපදං සුදෙසිතං
කුසලො පුප්ඵමි'ව පචෙස්සති (4:1)

යම ලොවත් දෙව් ලොවත් ඇතුළුව
කවුද මිහි කත හොඳින් දන්නේ
තෝරමින් මල් ගොතන මල් දම්
ලෙස කවුද දම් සිතට ගන්නේ.

දැන මුනි දෙසූ දම් - ලෙස මල් දම්

4 (1) පන්සියයක් භික්ෂූන් ගේ කථා වස්තුව (44 සහ 45 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් භික්ෂූන් වහන්සේ පන්සියයක් අරබයා මේ ගාථා දෙක දේශනා කර වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ සමග එක් ව සංචාරයෙහි යෙදුණු භික්ෂූන් වහන්සේ පන්සියයක් නැවත ජේතවනාරාම විහාරයට සම්ප්‍රාප්ත වූ හ. එදින සන්ධ්‍යාවේ උන් වහන්සේලා එක්ව තම සංචාරය ගැන සාකච්ඡා කළ හ. සාකච්ඡාවට විෂය වූයේ ගමන් මඟ විසිතුරු, භූමියේ තත්ත්වය ආදියයි. කඳු, තැනිතලා, මාර්ගයෙහි උස් මිටි බව, පස රතු ද කළු ද යන්න, ආදී බාහිර කරුණු ය. මෙබඳු කරුණු සාකච්ඡා වන බව දැනගත් බුදු පියාණෝ උන්වහන්සේලා හමුවට පැමිණ "මහණෙනි, ඔබ ඔය කතා කළ සියල්ල ඔබෙන් පරිබාහිර කරුණු ය. ඔබගේ ම ශරීරයේ යථා තත්ත්වය ගැන ගැඹුරෙන් පිරික්සා බලා භාවනාවට සැරසෙනවා නම් වඩාත් ප්‍රයෝජනවත් නො වේ ද? " යි උන්වහන්සේ විමසූ හ.

විවරණාත්මක අනුවාදය (44 ගාථාව)

කො ඉමං පඨවිං ඉමං සදෙවකං යමලොකඤ්ච
විජෙස්සති කො කුසලො පුප්ඵං ඉව සුදෙසිතං ධම්මපදං පචෙස්සති

කො: කවරෙක්; **ඉමං පඨවිං**: මේ පෘථිවිය ද; **ඉමං**: මේ; **සදෙවකං**: දෙව් ලොව සහිත; **යමලොකඤ්ච** : යම ලෝකය ද; **විජෙස්සති** : දැන ගනී ද?; **කො**: කවරෙක්; **කුසලො**: දක්ෂ (මාලා කාරයෙකු); **පුප්ඵං**: මල්; **ඉව**: මෙන්; **සුදෙසිතං**: මනාව දෙසා ඇති; **ධම්මපදං**: දහම් පද; **පචෙස්සති**: රැස් කර ගනියි ද?

දෙව්ලොව, යමලොව හා මනුලොව තේරුම් ගන්නට කවුරු සමත් වෙත් ද?. දක්ෂ මල් දම් ගොතන්නෙක් ගැළපෙන පරිදි මල් තෝරා ගන්නා සේ මනාව දේශනා කර ඇති ධම්ම පද කවරෙක් තෝරා ගනිත් ද?

විවරණය

සේඛො: සේඛ හෙවත් ශෛක්ෂ්‍ය නමින් හඳුන්වන්නේ උසස්තම ගණයේ ශික්ෂණ ලාභීහු ය. ත්‍රිවිධ ශික්ෂාව අනුගමනය කරන මේ අය සප්ත විධ ය. ලෝකෝත්තර මාර්ග ඵල අෂ්ටකයෙන් රහත් ඵලය හැර අවශේෂ හත මේ හත වශයෙන් දැක්වෙයි. රහත් ඵලය ලැබූ උතුමන් තව දුරටත් ශික්ෂණය වන්නට දෙයක් නැති හෙයින් අසේඛ හෙවත් අශෛක්ෂ්‍ය වශයෙන් හඳුන්වනු ලැබේ. සාමාන්‍ය පෘථග්ජනයෝ සෙඛ ගණයට හෝ අසේඛ ගණයට නො ගැනෙති.

ලෝක: ලෝක යන්නෙන් මෙහිදී බෞද්ධයන් ගේ සමස්ත විශ්වය ම පැහැදිලි කර දක්වයි. එනම්, කාම ලෝකය, රූප ලෝකය හා අරූප ලෝකයයි. කාම ලෝකය නම් පසිඳුරන් මගින් වින්දන ලබන ලෝක පද්ධතියයි. රූප ලෝකයට අයත් වන්නේ මුල් ධ්‍යාන හතරට අයත් රූප බ්‍රහ්ම ලෝක යි. අරූප ලෝක නම්, අරූප ධ්‍යාන හතරට අයත් වන අරූප බ්‍රහ්ම ලෝක පද්ධතියයි.

විජෙස්සති: දැන ගනියි. '**අත්තනො ඤාණෙන විජානිස්සති**'යි අටුවාවේ දැක්වෙන පරිදි තමා ගේ නුවණින් ම දැන ගනියි.

දේව: යන වචනයෙහි භාෂාමය අර්ථය බබළන, දිලිසෙන යන්නයි. තම තමන් කළ කුශල කර්මයන් හි අනුසස් භුක්ති විඳිමින් ප්‍රීතියෙන් දවසරින සත්ත්ව කොට්ඨාසයකි. ඔවුන් ගේ පැවැත්ම ද කුශල බලය පවත්නා කල් පමණි.

දේව ලෝකය ද අයත් වන්නේ කාම ලෝක වලට ය. අපාය, තිරශ්චීන භවය, ප්‍රේත භවය, යක්ෂ-අසුර ගණය මෙන් ම මනු ලොව ද මේ ගණයට ම වැටෙති. කාම ස්වර්ග වූ දිව්‍ය ලෝක සංඛ්‍යාව හයකි. දෙවිවරු මනුෂ්‍ය දෘෂ්ටියට හසු නො වෙති. කුසල් ඇති තාක් සැප විඳින ඔවුහු ජරාවට පත් නො වෙති. ඔවුන් ගේ මරණය ද මෘත ශරීරාදියෙන් තොරව චුත වීමක් සේ හැඳින්වෙයි. කෙසේ වූවද කුශල බලය නිම වූ පසු නැවත සංසාර දුක්ඛයනට පාත්‍ර වන්නට සිදුවන හෙයින් දෙව්ලොව ඉපදීම සසර දුකින් මිදීමක් සේ හඳුන්වනු නො ලැබේ.

රූප ලෝක හෙවත් පහළ බ්‍රහ්ම ලෝක වලදී දෘෂ්‍ය ඉන්ද්‍රිය හා ශ්‍රවණ ඉන්ද්‍රිය අනිකුත් ඉන්ද්‍රිය ද සමග පවත්නා නමුත් ධ්‍යානයන්හි දී තාවකාලිකව යටපත් කරනු ලැබේ. අරූප බ්‍රහ්ම ලෝකවල දී රූපයක් විද්‍යාමාන නො වේ. ඒවායේ ඇත්තේ ස්කන්ධ චතුෂ්කයක් පමණි.

මෙම ත්‍රිවිධ සත්වාවාසයන් සඳහා පාලි සූත්‍ර ග්‍රන්ථවල යොදා ඇත්තේ 'භව' යන පදය මිස 'ලෝක' යන පදය නො වේ. එතකුදු වුවත්, කාම, රූප, අරූප යන ත්‍රිවිධ ප්‍රවෘත්තීන් පිළිබඳ සංකල්පය බෞද්ධ ත්‍රිපිටකයෙහි සූත්‍ර යුගයට ම අයත් වූවකැයි සිතුම අසාධාරණ නො වේ.



හික්මෙන තැනැත්තා ලොව පිළිවිද දැනගනී. දහම්පදය ද මොනවට පිරික්සා පිළිවිද දැන ගනී.

45. සෙබො පඨවිං විජෙස්සති
යමලොකඤ්ච ඉමං සදෙවකං
සෙබො ධම්මපදං සුදෙසිතං
කුසලො පුප්ඵමි’ව පචෙස්සති (4:2)

යම ලොවත් දෙව් ලොවත් ඇතුළුව
සේඛ මනු ලොව හොඳින් දන්නේ
තෝරමින් මල් ගොතන මල් දම්
ලෙසයි ඔහු දම් සිතට ගන්නේ

සේඛ මුනි දැන ගනියි මුනි දම්

4 (1) පන්සියයක් භික්ෂූන් ගේ කථා වස්තුව (44 සහ 45 ගාථා) (ඉතිරි කොටස)

විවරණාත්මක අනුවාදය (45 ගාථාව)

සෙඛො පඨවිං ඉමං සදෙවකං යමලොකඤ්ච විජෙස්සති
සෙඛො කුසලො පුප්ඵං ඉව සුදෙසිතං ධම්මපදං
පචෙස්සති.

සෙඛො: ශෛක්‍ෂ්‍ය තෙම; **පඨවිං**: පෘථිවිය ද; **ඉමං**: මේ; **සදෙවකං**: දිව්‍ය ලෝකය ද සහිතව; **යමලොකඤ්ච**: යම ලෝකය ද; **විජෙස්සති**: දැන ගනියි; **සෙඛො**: ශෛක්ෂ්‍ය තෙම; **කුසලො**: දක්‍ෂ (මල් කරුවකු); **පුප්ඵං ඉව**: මල් මෙන්; **සුදෙසිතං**: මනාව දේශනා කර ඇති; **ධම්මපදං**: දහම් පද; **පචෙස්සති**: රැස්කර ගනියි.

ශෛක්‍ෂ්‍ය (හෙවත් සෝතාපන්න, සකෘදාගාමී හා අනාගාමී) පුද්ගලයෝ දෙව්ලොව, යමලොව හා මනුලොව අවබෝධ කරති. දක්‍ෂ මල්කරුවකු මල් තෝරා ගෙන මල් දම් ගොතන්නාක් මෙන් ශෛක්‍ෂ්‍යයෝ දහම් පද එක් රැස් කර ගනිති.

විවරණය

යම ලෝක: යම රජු ගේ ලෝකය. යම ලෝකය ප්‍රාග් බෞද්ධ යුගයේ සිට පැවත එන විශ්වාසයකි. මරණින් මතු සියළු දෙනා ම යම රජු නම් ධර්ම විනිශ්චය කරුවකු අබිමුවට ගොස් සිය කුශලා'කුශල කර්මානුරූපව ඉදිරි භවය විනිශ්චය කරගනු ඇත යන අදහස බුද්ධකාලය වන විට ප්‍රචලිතව තිබිණ. පැරණි විශ්වාස වලට නව අර්ථ ගැන්වීමේ බෞද්ධ සම්ප්‍රදාය හා පොදු ජනතාවට සාරධර්ම සන්නිවේදනය කිරීමේ පහසුව තකා මෙම වාග් ව්‍යවහාර වෙනස් නො කර බුදු සමයානුගත කර ගන්නට ඇතැයි සිතේ. පිරිසිදු බෞද්ධ දර්ශනය අනුව අප ගේ කුශල හා අකුශල කර්ම අනුව අප සුගතියට හෝ දුගතියට නියම වන්නේ දිව්‍ය රාජයකු ගේ විනිශ්චය අනුව නොව ස්වයංක්‍රීය නියාමයක් වූ කම්ම නියාමය අනුවය.

එය ක්‍රියාත්මක කිරීමට මහා බලධාරී සියල්ල දක්නා දිව්‍ය රාජයකු අවශ්‍ය වන්නේ ඊශ්වර නිර්මාණවාදය පිළිගන්නා ආගමකට මිස බුදු දහම වැනි ප්‍රබුද්ධ ආගමකට නො වේ. එසේකුදු වුවත් දුගතීන් සඳහා යමලෝකය යන වචනය භාවිත කිරීම නිතර සිදුවෙයි. එය වරදවා තේරුම් නො ගෙන අකුශල විපාක ලබා දෙන ස්වයං සිද්ධ නියාමයට භාරතීය සංස්කෘතියට අනුරූපව දෙන ලද සංඥානාමයක් සේ ගැනීම උචිතය. ධම්ම පදයේ ම 'යමාමසේ' යන්න 'මැරෙමු' යන අරුත දෙන ක්‍රියා පදයක් සේ යෙදී ඇත. යම සංකල්පය මෙන් ම සංකීර්ණ වූ හා සංස්කෘතික සංකේත උකහා ගන්නා වූ තවත් සංකල්පයක් සේ මාර සංකල්පය දැක්විය හැක. එය මරණය පෞරුෂත්වාරෝපණයෙන් දැක්වීමට නිරතුරුව භාවිත වේ.

මාර: යන්නෙන් හඳුන්වන්නේ ද එක්තරා දිව්‍ය පුත්‍රයකු සේ සම්මත ප්‍රාග් බෞද්ධ යුගයේ සිට උරුම කර ගත්තා වූ විශ්වාසයකි. 'මාරෝ පාපිමා' සහ 'නමුචි' යන සංඥාවලින් ද ඔහු හැඟවේ. 'පාපිමා' යන්නෙන් පව්කාරයා යන්න ද 'නමුචි' යන්නෙන් විමුක්තිය නො දෙන්නා, නො මුදන්නා යන අරුත ද හැඟ වේ.

පාලි පොත්වල මාර යන්න හුදෙක් 'මරණය' යන අරුතෙන් මෙන් ම කෙලෙස් වලට අපර නාමයක් වශයෙන් ද දැක්වේ. එමෙන් ම එම නමින් හැඳින්වෙන පාපය නියෝජනය කරන අමනුෂ්‍ය ලක්‍ෂණ ඇති ජීවියකු (සත්ත්වයකු) වශයෙන් ද දැක්වේ. (පාලියෙහි එන මාර සංකල්පය ගැන කළ විධිමත් විමර්ශනයක් ලෙස මහාචාර්ය ට්‍රෙවෝ ලිං ගේ The Buddhist Mythology of Evil නම් කෘතිය සඳහන් කළ හැකිය.)

මාරයා පිළිබඳව බෞද්ධ ග්‍රන්ථවල සඳහන් පාලි අටුවාවල පංචමාර සංකල්ප වශයෙන් සංග්‍රහණය කර ඇත. එම පස් මරුන්

1. දේවපුත්ත මාර
2. කිලෙස මාර
3. ඛන්ධ මාර
4. අභිසංඛාර මාර හා
5. මච්චු මාර යනුවෙන් නම් කෙරේ.

ජීවිතයක් ඇති, පෞරුෂයක් ඇති 'පුද්ගලයකු' ලෙස හැඟෙන්නේ දේවපුත්තමාර පමණි. අන් සියල්ල ක්ලේශාදි දේ තත්වාරෝපණය කිරීම ය. මච්චුමාර නම් කේවල මරණයයි. හෙවත් එක් ජීවිත පරිච්ඡේදයක අවසානයයි. (අභිධර්මානුකූලව නම් ක්‍ෂණයක් පාසා සිදුවන ස්කන්ධ පරිවර්තනයෝ ද ක්‍ෂණික මරණය ලෙස හැඳින්වෙති.

එහෙත් එය ආනුභවිකව දැක්විය නො හැකි තරම් සූක්ෂ්ම හෙයින් තාර්කිකව ලැබෙනු මිස යථාර්ථවත්ත්‍ය ප්‍රත්‍යක්‍ෂ නොවන්නකි). සියල්ලන්ට ම ප්‍රත්‍යක්‍ෂ මරණය නම් එක් ජීවිත කාල පරිච්ඡේදයක අවසානයේ දී සිදුවන නාම-රූප සන්තතියෙහි විද්‍යාමාන භේදයයි. එහෙත් එය පූර්ණ විනාශයක් නො වේ. ස්කන්ධ-ධාතු-ආයතනයන් ගේ ප්‍රවාහය තවදුරටත් ප්‍රවර්තනය වන ශක්තිය මරණයෙන් නිම වන්නේ නැත. විදුලි බල්බයක් බිඳී ගිය පමණින් විද්‍යුත් ශක්තිය විනාශයට නො යන්නා සේ භෞතික ශරීරයේ බිඳ වැටීම තුළින් කර්ම ශක්තියෙහි විනාශයක් සිදු නො වේ. එහෙත් පුනර්භවයක් සිදු වන්නේ කිසියම් සාධක සංක්‍රමණයක් නිසා නොව හේතු-ප්‍රත්‍යය බලපෑමෙන් සිදුවන පටිච්ච සමුප්පාද ක්‍රියාවලියක් නිසා බව සටහන් කර ගැනීම වටියි.

කුසලො: මෙහි 'කුසලො' යන්න යොදා ඇත්තේ "දක්‍ෂයා, කෞෂල්‍යයන්ගෙන් සමන්විත පුද්ගලයා යන අරුතිනි. කුසල කර්මයක් එ නමින් හඳුන්වන්නේ ද දක්‍ෂලෙස ක්‍රියා කරන විට අපට උපදින දේ නිසා ය. (කොසල්ල සම්භූතට්ඨෙන) මෙහි අදහස් වන්නේ උචිතානුචිත විචක්‍ෂණ ඇතිව ක්‍රියා කරන පුද්ගලයා යන අර්ථයයි. ධම්මපදට්ඨ කථාව වෙහි කුසල නමින් හැඳින්වෙන්නේ සත්තිස් බෝධිපාක්‍ෂික ධර්ම වර්ධනය කරන පුද්ගලයා බව දක්වයි. ඒවා නම්, සතර සතිපට්ඨාන, සතර සම්‍යග් ප්‍රධාන, සතර ඉද්ධිපාද, පංච ඉන්ද්‍රිය, පංච බල, සත්ත බෝජ්ඣංග, ආර්ය අෂ්ටාංගික මාර්ගය යන මේවා ය.



කය පෙණ පිඩක් මිරිඟුවක් සේ දැන සලකන තැනැත්තා මර බැඳුම් සිඳ බිඳ දමා නිවන් පසක් කරන්නේ ය.

46. ඵෙණූපමං කායමි'මං විදිත්වා
මරීචිධම්මං අභිසම්බුධානො
ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි
අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ (4:3)

මේ කය පෙණ පිඬුවක් සේ දැන ගෙන
මිරිඟුවක් ය නිසි සේ තේරුම් ගෙන
මරුගේ කම් හී සැර වළකා ගෙන
ගියොත් යෙහෙකි මරුහට නො පෙනෙන තැන

කවුද සමත් වනු - මරුවා පරදනු

4 (2) කය මිරිඟුවක් සේ දුටු හිමි නම (46 ගාථාව)

තථාගතයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන සේක් **එක්තරා භික්ෂුනමක්** අරබයා මේ ගාථාව දේශනා කර වදාළ සේක.

එක් භික්ෂුනමක් භාග්‍යවතුන් වහන්සේ වෙතින් භාවනා කර්මස්ථාන ලබා ගෙන බවුන් වඩනු පිණිස වනගත වූයේ ය. එහෙත් දිගින් දිගට ම උත්සාහ කළත් කිසි අධිගමනයක් ලබා ගන්නට අසමත් වූ තැන හේ මෙසේ සිතී ය. "මට වඩාත් ගැලපෙන වෙනත් භාවනා කර්මස්ථානයක් දෙන්නැයි මා භාග්‍යවතුන් වහන්සේ ගෙන් අයැද සිටිය යුතු ය." එසේ සිතමින් උන්වහන්සේ බුදුරදුන් බැහැ දකිනු වස් ආපසු ගමන් ඇරඹී ය.

අතර මගදී උන්වහන්සේට මිරිඟුවක් දක්නට ලැබිණ. "උෂ්ණ කාලයේ දී මේ මිරිඟුව ඈත දුර සිට බලන්නහුට යථාර්ථවත් දෙයක් සේ පෙනෙයි. එහෙත් ඊට ලංවත්ම නැතිව යයි. උත්පත්තිය හා මරණය හේතුවෙන් අනාත්ම වූ මෙම සසර පැවැත්ම ද එබඳුම ස්වභාව ඇත්තේ ය" යි උන්වහන්සේ සිතූ හ. මිරිඟුව කෙරේ මෙසේ සිත යොමු කළ උන්වහන්සේ ඒ ගැන භාවනා කළ හ. දිගින් දිගටම ගමන් කිරීම නිසා දැඩි වෙහෙසට පත්ව සිටි භික්ෂුනම ගමන් වෙහෙස නිවා, ගත සනහා ගනු පිණිස අචිරවතී නදියට බැස ස්නානය කළ හ. අනතුරුව නදී ඉවුරේ තුරු සෙවනක වැඩ හිඳ විවේක ගත් හ. ඒ අසල ම දිය ඇල්ලක් ද විය. දිය ඇල්ල දෙස බලා සිටිනා උන් වහන්සේට සුදු පෙණ පිඬු නැඟී නැඟී ගල්වල හැපෙමින් බිඳී යන අයුරු දක්නට ලැබිණ. "මේ සුදු පෙණ පිඬු නැඟී බිඳී යන පරිද්දෙන් ම සියල්ල ඇති වෙයි, නැති වෙයි" යනුවෙන් උන්වහන්සේ කල්පනා කළ හ. එය ක්‍රමයෙන් උන්වහන්සේ ගේ භාවනාව බවට පත් විය.

සුවඳ ගඳ කිළියෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුනම අර්ථ සම්පන්න භාවනාවකට වැටී සිටින ආකාරය දුටු සේක. "භික්ෂුව, එය සැබෑම ය. පැවැත්ම නම් හුදෙක් මිරිඟුවක් වැනි ය. පෙණ පිඬුවක් වැනි ය. ඇති වන පරිද්දෙන් ම නැතිව යයි." එසේ පැවසූ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා ධර්මය ද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (46 ගාථාව)

ඉමං කායං ඵේණුපමං විදිත්වා මරීචි ධම්මං
අභිසම්බුධානො මාරස්ස පපුප්ඵකානි ඡෙත්වාන
මච්චුරාජස්ස අදස්සනං ගච්ඡෙ

ඉමං කායං: මේ ශරීරය; **ඵේණුපමං**: පෙණ පිඬුවක් හා උපමා කොට; **විදිත්වා**: දැන ගෙන; **මරීචි ධම්මං**: මිරිඟුවක ස්වභාවය ඇති බව; **අභිසම්බුධානො**: තේරුම් ගෙන; **මාරස්ස**: මාරයා ගේ; **පපුප්ඵකානි**: මල් හී දඬු; **ඡෙත්වාන**: කඩා බිඳ දමා; **මච්චුරාජස්ස**: මාර දිව්‍ය රාජ්‍යාට; **අදස්සනං**: නො පෙනෙන තැනකට; **ගච්ඡෙ**: යන්න.

අප ගේ මේ ශරීරය පෙණ පිඬුවක් හා මිරිඟුවක් වැනි බව නුවණින් මනාව වටහා ගෙන මාරයා එවන මල් හී දඬු (මල්සර) කඩා බිඳ දමා මරුට නො පෙනෙන තැන (අමෘත වූ නිර්වාණය) සොයා යන්න.

විවරණය

ඵේණුපමං: මේ සිරුර පෙණ පිඬුවකට සමාන කරනු ලබන්නේ එය ඉක්මණින් විනාශ වී යන හෙයිනි. පෙණ පිඬු ද වහා ඇතිව නැතිවන හෙයින් අස්ථිර බව හා නිසරු බව පැහැදිලි කිරීමේ දී එය ප්‍රබල උපමාවක් වෙයි.

මරීචි ධම්මං අභිසම්බුධානො: මිරිඟුව පෙණ පිඬුවට ද වඩා නිසරු ය. එය හුදෙක් දෘෂ්ටිමය මායාවක් පමණි. යථාර්ථයක් හෙවත් ඇත්තට ම පවත්නා දෙයක් මෙන් දුරට දිස් වුව ද එයට ලං වත් ම හුදෙක් ඇසේ රැවටිල්ලක් බව හෙළි වේ.

කාය: සමූහය යන අරුත ද ඇති 'කාය' යන්නෙන් ශරීරය ගැණෙයි. ඇතැම් විට භෞතික කය මෙන් ම ආධ්‍යාත්මික කාය ගැන ද සඳහන් වේ. එසේ වූ විට ආධ්‍යාත්මික කාය සේ ගත හැක්කේ රූපස්කන්ධය හැර ඉතිරි ස්කන්ධ චතුෂ්කය යි. (නාමස්කන්ධය යි) නැත හොත් වේදනා, සඤ්ඤා හා ඇතැම් සංඛාර ගත හැකි ය. එමෙන් ම පසිඳුරන් අතර පස් වැන්න ද කාය වශයෙන් ගැණෙයි.

මරීචිධම්මං: යන්නෙ හි එන ධම්මං යන්නෙන් ස්වභාවය අදහස් වෙයි. 'ධම්ම' යනු බෞද්ධ ශබ්දාවලියෙහි අතිශය විචිත්‍ර හා සංකීර්ණ අර්ථ දනවන වචනයකි. බොහෝ විට එහි අරුත සන්දර්භය තුළින් විග්‍රහ කර ගත යුතු ය. දරන්නා, සංයුතිය, ප්‍රතිමානය, නීතිය, දේශනාව, යුක්තිය, සාධාරණත්වය, ගුණය, ද්‍රව්‍යය, විෂය හා මනස යන මේ විවිධ අර්ථ සඳහා විවිධ සන්දර්භයන් හි මෙය යොදා තිබේ. ගුණ, දේසනා, පරියත්ති හා නිස්සත්ති යන අරුත් හතර ගැන ධම්පියා අටුවාව සඳහන් කරයි. සමහර අර්ථකථිකයෝ දේසනා වෙනුවට 'හේතු' යන්න දක්වති. ධර්මය පිළිබඳ විශ්ලේෂණාත්මක ඥානය අවසාන අර්ථයෙන් බලන විට හේතු-ඵල ධර්මය පිළිබඳ ඥානය හෙයින් මෙසේ දක්වනවා විය හැකිය. ධම්ම යන්නට චතුසච්ච යන්න ද ගැළපෙන බව කෙනෙකුට කිව හැක.

'ධම්ම' යන්න මනසට අරමුණු වන ඕනෑ ම දෙයක් සඳහා ද යෙදිය හැකිය. මනෝ ඉන්ද්‍රියට විෂය වන දේ 'ධම්ම' වශයෙන් හඳුන්වන්නේ එහෙයිනි.



පස්කම්හි ගිජු ව ඇලුණු සිත් ඇත්තා සපල නො වූ අදහස් ඇති ව මැ මිය යයි.

47. පුප්ඵානි හෙ'ව පචිනන්තං
බ්‍යාසත්තමනසං නරං
සුත්තං ගාමං මහොඝො'ව
මච්චු ආදාය ගච්ඡති (4:4)

සොම්නස් මල් නෙළ නෙළා
මුසපත් වන්නන් බලා
ගෙන යයි මරු ගඟ මෙන් එන
නිදිවන් ගමකට ගලා.

කම් සුව මත් දන - යෙත් ගඟ ගහ ගෙන

4 (3) විඩූඩභ ගේ කථා ප්‍රවෘත්තිය (47 ගාථාව)

තථාගතයන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩ වසමින් ප්‍රසේනජිත් කෝසල රජතුමා ගේ පුත් **විඩූඩභ කුමරුන්** සම්බන්ධයෙන් මේ ගාථාව දේශනා කළ සේක.

ශාක්‍ය වංශයෙන් විවාහයක් කර ගන්නට රිසි වූ ප්‍රසේනජිත් (පසේනදි) කෝසල රජ තෙම ශාක්‍ය කුමරියක තමන්ට විවාහ කර දෙන සේ ඉල්ලමින් කපිලවස්තු නුවරට දූත පිරිසක් යැවී ය. ශාක්‍යයන් මානාධික වුව ද කෝසල රජතුමා අමනාප කර ගන්නට ද අකැමැති හෙයින්, ඒ ඉල්ලීම ඉටු කරමු යි ගිවිස උභතෝ සුජාත ශාක්‍ය කුමාරිකාවක් වෙනුවට මහානාම ශාක්‍යයාට දාව සේවිකාවක ගේ කුසින් උපන් කුමරියක ඔහුට විවාහ කර දුන් හ. කොසොල් රජුගේ එක් අග බිසවක් බවට පත් වූ ඕ තොමෝ කල් ඇවෑමෙන් පුත් කුමරකු ජනිත කළා ය. ඔහුට විඩූඩභ යැයි නම් කරන ලදී.

විඩූඩභ කුමරුන්ට වයස අවුරුදු දහ සය පිරුණු තැන මහානාම රජු ඇතුළු සිය ඥාතීන් දැක බලා ගනු පිණිස ඔහු පිටත් කර යවන ලදී. ශාක්‍යයෝ ඔහුට ආගන්තුක සත්කාරයෙන් සංග්‍රහ කළ හ. එහෙත් වයස අවුරුදු දහසයට අඩු ශාක්‍ය කුමාරවරුන් හැම දෙන විඩූඩභ කුමරුන්ට වැඳ ආචාර කිරීමෙන් වළකනු පිණිස වෙනත් පළාතකට යවා තිබිණ.

කපිලවස්තුවේ දින කිහිපයක් ගත කළ විඩූඩභ ආපසු පිටත්ව ගියේ ය. ඔහු පිටත්ව සුළු වේලාවකින් එක් සේවිකාවක ලවා විඩූඩභ කුමරුන් හිඳ ගත් පුටුව කිරෙන් සේදීම ඇරඹිණ. "මේ දැස්සක ගේ කොල්ලා හිඳ ගත් පුටුව" යි කියමින් ඇය පුටුව සෝදන අතරේ ම තමන්ට අමතකව ගිය යමක් රැගෙන යනු පිණිස විඩූඩභ ගේ සේවකයෙක් එහි පැමිණියේ ය. විඩූඩභ ගේ මව වූ වාසභඛත්තියා උපන්නේ මහානාම රජුට දාව දාසියක ගේ කුසින් බව ඔහුට හෙළි කළා ය.

මේ පුවත විඩූඩභ කුමරුනට නො වළහා හෙළි කරනු ලැබිණ. මේ අපහාසයෙන් බලවත් සේ කෝපයට පත් විඩූඩභ "මම යම් දිනක ශාක්‍යවංශය මිහිමතින් තුරන් කරමි" යි ප්‍රකාශ කළේ ය. ඒ වදන් එසේ ම සත්‍ය කරනු වස් හේ රාජ්‍යපදප්‍රාප්ත වූ වහා ම යුද හමුදාවක් ද රැගෙන කපිලවස්තුවට ගොස් මහානාම ශාක්‍යයන් ගේ පවුලේ කීපදෙනකු හැර අන් සියළු දෙනාම ඝාතනය කළේ ය. ජයග්‍රහණයෙන් පසු ආපසු කෝසලය බලා එන අතරමග අචිරවතී ගං ඉවුරේ ඔවුහු නවාතැන් ගත් හ.

ඒ රැයෙහි ගඟ ඉහළ ප්‍රදේශයේ මහ වැසි වට හෙයින් ගඟ පිරී යෝධ ගංවතුරක් පහළට ගලා ආවේ ය. ගමන් හා සටන් වෙහෙස නිවා ගනිමින් තද බල නින්දේ පසු වූ විඩූඩභ ගේ සමස්ත හමුදාවම සැඩ පහරට හසු වී මරණයට පත් වූ හ. මේ ව්‍යසන දෙකම සැළ වූ විට භික්ෂූන් වහන්සේ ලා ඇමතූ භාග්‍යවතුන් වහන්සේ තම ඥාතීන්ට මේ ඉරණම අත් වූයේ ඔවුන් පෙර ජන්මයක ගඟක දියට වස දමා එහි විසූ සියලු මත්ස්‍යයන් විනාශ කිරීමෙහි දුර්විපාකය වශයෙන් බව දැක් වූ හ. අනතුරුව විඩූඩභ කරගත් ව්‍යසනය ගැන සඳහන් කරමින් උන්වහන්සේ පූර්වෝක්ත ගාථාව දැක්වූ හ.

විවරණාත්මක අනුවාදය (47 ගාථාව)

ඉහ පුප්ඵානි පචිනන්තං ඉව බ්‍යාසත්ත මනසං නරං
මහොඝො සුත්තං ගාමං ඉව මච්චු ආදාය ගච්ඡති

ඉහ: මේ (ලෝකයෙහි); **පුප්ඵානි**: මල්; **පචිනන්තං ඉව**: නෙළන්නාක් මෙන්; **බ්‍යාසත්ත මනසං**: කාමසුඛාස්වාදයෙහි ම ඇළුණු මනසක් ඇති; **නරං**: පුද්ගලයා; **මහොඝො**: මහ ගංවතුරක්; **සුත්තං ගාමං**: නිදිගත් ගමක්; **ඉව**: (වනසන්නාක්) මෙන්; **මච්චු**: මාරයා; **ආදාය ගච්ඡති**: රැගෙන යයි.

මල් වත්තක මල් නෙලන්නාක් මෙන් මහත් අභිරුචියෙන් පංච කාම රසාස්වාදයෙහි නිරතව වසන මිනිස්සු, සියල්ලන් නිදද්දී ගමකට එන ගංවතුරක් හැම දෙන ගොදුරු කර ගන්නා පරිද්දෙන් මරුවා විසින් ගොදුරු කරගනු ලැබෙති.

විවරණය

පුප්ඵානිහෙව පචිනන්තං: මල් වත්තක මල් නෙලන්නට යන්නෙක් එහි ඇති පියකරු වර්ණයෙන් හා සුගන්ධයෙන් යුක්ත පුෂ්ප සම්භාරය දැක වශී වෙයි. මල් නෙලන්නට පටන් ගත් පසු ඔහුට වෙන කිසිවක් ගැන අදහස් හිසට නො එයි. ඔහු ගේ මූලික හා එකම අරමුණ හැකි තරම් සුන්දර කුසුම් නෙළීම ය. පංච කාම රසාස්වාදයෙහි ගිජු වන පුද්ගලයා ද එසේ ය. හෙතෙම ජීවිතයේ වෙනත් උදාර අරමුණු සියල්ල අමතක කර හුදෙක් කාමරතිය ම අගය කරයි.

සුත්තං ගාමං: පස් කම් සැපතෙහිම ගිලී ජීවිතයේ ගැඹුරු හා උසස් පරමාර්ථ අමතක කර ලන්නෝ නින්දට වැටුණවුන් හා සමාන ය.

මහොඝො ඉව මච්චු ආදාය ගච්ඡති: මහ ගංවතුරක් නිදිගත් ගම ගොදුරු කර ගන්නා මෙන් මරුවා පමා වූවන් ගෙන යයි.

පස්කම් සැපයෙහි ඇලුම් ඇත්තා (මැරෙණ තුරුත්) කාමයන්හි සෑහීමකට නොපැමිණේ.

48. පුප්ඵානි හෙ'ව පචිනන්තං
බ්‍යාසත්තමනසං නරං
අතිත්තං යෙව කාමෙසු
අන්තකො කුරුතෙ වසං (4:5)

සොම්නස් මල් නෙළ නෙළා
මුසපත් වන්නන් බලා
ගනියි මරු තමන් වසඟෙට
සිටියත් සිත තුටු නොලා

කම් සුවයෙන් - මුලා නොවත්

4 (4) පතිපූජිකා කුමරිය ගේ කථාව (48 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **පතිපූජිකා කුමරිය** ඇරබ මේ ගාථාව දේශනා කර වදාළ සේක.

සැවැත් නුවර උපන් පතිපූජිකා කුමරිය වයස දහසයේ දී විවාහ කර දෙනු ලැබ පුතුන් සිව් දෙනකු ලද්දා ය. සිල්වත් ගුණවත් දානපතිනියක වූ ඕ තොමෝ සඟරුවනට සිවුපසය පිළිගැන්වීමෙහි ලා විශේෂයෙන් ම උනන්දු වූවා ය. නිතර නිතර විහාරස්ථානයට යන ඕ පැන් බඳුන් පිරිසිදු කර පැන් පුරවා වෙනත් වතාවත් ආදිය ද කරයි. පූර්ව ජන්මයන් සිහිපත් කිරීමේ නුවණ ඇති ව සිටි ඇයට තමන් පෙර ජන්මයේ තාවතිංස දිව්‍ය ලෝකයෙහි මාලාභාරී නම් දිව්‍ය පුත්‍රයා ගේ භාර්යාවක් ව සිටි බව සිහිපත් විය. තමා එයින් චුත වූයේ සියලු දෙන උද්‍යානයෙහි මල් නෙළන්නට ගොස් සිටි අවස්ථාවක බව ද මතක් විණි. එහෙයින් පින් කමක් කරන හැම මොහොතක ම තමන් ඒ පුණ්‍යානුභාවයෙන් නැවත තව්තිසාවේ මාලාභාරී දිව්‍ය පුත්‍රයා ගේ භාර්යාවක ව උපදිත්වා යි ප්‍රාර්ථනා කළා ය.

දිනක් පති පූජිකාව හදිසියේ ම ගිලන්ව එදින ම මිය පරලොව ගියා ය. ඇය දිගින් දිගට ම දැඩිසේ ප්‍රාර්ථනය කළ පරිදි මිය ගිය වහා ම ඕ තාවතිංසයේ මාලාභාරී දේවතාවා ගේ බිරිඳක ලෙස ම උපත ලද්දා ය. මෙලොව සියක් වසරක් දෙව්ලොව එක දවසක් හෙයින් පතිපූජිකාව එහි උපදින විටත් අන්‍ය දේවතාවෝ හා අප්සරාවෝ මල් උයනෙහි විනෝද වෙමින් සිටිය හ. එහෙයින් ඇය එහි නැවත පහළ වූ විට සුළු වේලාවක් ඇය දක්නට නො සිටියේ කවර හෙයින් දැයි මාලාභාරී විමසීය. ඕ තමන් එතැනින් චුත ව මනුලොව උපන් බවත් එහිදී විවාහව දරුවන් සිවුදෙනකු ලත් බවත් හදිසියේ අසනීපව මිය ගොස් මෙහි යළිත් උපන් බවත් හෙළි කළා ය.

පතිපූජිකාව ගේ මරණය ඇසූ භික්ෂූන් වහන්සේ සංවේග යට පත් වූ හ. භාග්‍යවතුන් වහන්සේ බැහැදැක ඒ පිළිබඳව කතා කළ හ. උදේ දන් පිළිගැන්වූ ඇය හවස මිය ගිය අයුරු ගැන සඳහන් කළ හ. ජීවිතයේ කෙටි කම ගැන විස්තර කළ භාග්‍යවතුන් වහන්සේ මිනිසුන් කම් සැප විඳ තෘප්තියක් ලබන්නට පෙර ම ඔවුන්ට මරු වසඟයට යන්නට සිදුවන බව පැහැදිලි කර දුන් හ.

විවරණාත්මක අනුවාදය (48 ගාථාව)

ඉධ පුප්ඵානි පචිනන්තං ඉච බ්‍යාසත්ත මනසං නරං
කාමෙසු අතිත්තං එව අන්තකො වසං කුරුතෙ.

ඉධ: මේ (ලෝකයෙහි); **පුප්ඵානි**: මල්; **පචිනන්තං ඉව**: නෙළන්නාක් මෙන්; **බ්‍යාසත්ත මනසං**: කාම සුඛාස්වාදයෙහි ම ආශක්ත මනස් ඇති; **නරං**: පුද්ගලයන්; **කාමෙසු**: කාමයන් විෂයෙහි; **අතිත්තං එව**: තෘප්තිය නො ලබා සිටියදී ම; **අන්තකො**: මරුවා; **වසං කුරුතෙ**: තම වසඟයට ගනියි.

මේ ලෝකයෙහි මල් නෙළන්නාක් මෙන් කම් රස විඳීමෙහි ම ඇලී වසන මිනිසුන් කාමයෙන් තෘප්තියක් නො ලබා සිටියදී ම මාරයා තමන් වෙත ඇද ගනියි.

විවරණය

අන්තකො: යන්නෙහි භාෂාමය අර්ථය "ඉවරයක් කරන්නා" යන්නයි. මෙය මරණය හෙවත් මාරයාට තවත් වචනයකි. මෙම ගාථාවෙහි දී මේ අන්තකයා මිනිසුන් කාමවස්තූන් රස විඳ දැන් ප්‍රමාණවත් යැයි සිතන තුරු බලා නො සිටින බව කියැවෙයි.

කාම: කාම යන වචනය කාමාශාව (විෂයී බද්ධ) මෙන් ම කාම වස්තු (විෂය බද්ධ) යන දෙකම හඟවනු පිණිස සන්දර්භය අනුව යෙදෙයි.

කාමාශාව පංච කාම වස්තූන් විෂයෙහි ම යොමු වෙයි. පංච නීවරණයන් අතර කාමරාගය, දස සංයෝජන අතර කාමච්ඡන්දය, ත්‍රිවිධ තණ්හාවන් අතර කාම තණ්හාව ත්‍රිවිධ චේතනා අතර කාම චේතනා වශයෙන් දැක්වෙන්නේ මේ විෂයී බද්ධ කාමාශාවයි.

කාම වස්තු පංචකය නම්, ඇසට ගෝචර වන රූප, කණට ගෝචර වන ශබ්ද, නාසයට ගෝචර වන ගන්ධ, දිවට ගෝචර වන රස සහ කයට ගෝචර වන ස්පර්ශ වෙති. මේවා ඉෂ්ට, කාන්ත, මනාප, රජනීය වැනි වචන වලින් හැඳින් වේ.

කාමච්ඡන්දය දුරු කර ලන්නේ අනාගාමී ඵලය මගිනි. කාමය ගැන විස්තර කරන පාලි පොත්වල දැක්වෙන පරිදි, හානිකරත්වය ඇත්තේ චක්ෂුරාදී ඉන්ද්‍රිය වලටත් රූපාදී කාම වස්තුවලත් නොව පුද්ගලයා ගේ කාමාශාව තුළ ය.

බමරා මලේ පැහැය හා සුවඳ නොපෙළමින් පැණිගෙන ගන්නාක් මෙන් මහණාහු ගම හැසිරෙති.

49. යථාපි භමරෝ පුප්ඵං
වණ්ණගන්ධං අහෙඨයං
පලෙති රසමාදාය
එවං ගාමෙ මුනී චරෙ (4:6)

බමරකු කුසුමක් වෙත ගොස්
නො නසා පාටත් සුවඳත්
පැණි ගෙන යන විලාසයෙන්
සමිඳු ගමේ හැසිරෙනවා

බඹරකු සේ නිසි - හිමි නම සරයි ගම තුළ

4 (5) කෝසිය සිටාණන් ගේ කතාව (49 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **කෝසිය සිටාණන්** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

රජගහ නුවර සමීපයෙහි සක්කර නම් ගමෙහි තමන් සතු කිසිම දෙයක් කිසි ම කෙනෙකුට නො දෙන මච්ඡරිය කෝසිය නම් සිටුවරයෙක් විසී ය. එක් දිනක් සිටුවරයා හා දේවිය කැවුම් කනු රිසිව එය යම් කිසිවකු දුටුව හොත් ඔවුන්ටත් දෙන්නට සිදු වෙතැයි ලොබ සිතා උඩු මහලට නැගී තමන්ට පමණක් ඇතිවන තරමට කැවුම් තනන්නට පටන් ගත් හ.

එදින උදේ භාග්‍යවතුන් වහන්සේ මහා කරුණා සමාපත්තියෙන් ලොව බලා වදාරන සේක්, සිටුතුමා හා දේවිය දෙදෙනාට ම සෝවන් ඵලය ලැබීමට භාග්‍යය තිබුණු බව දුටු සේක. ඒ අනුව මුගලන් මහ රහතන් වහන්සේ අමතා, සිටු නිවසට ගොස් මධ්‍යාහ්න සමය වන විට දෙදෙනාම ජේතවනාරාමයට කැඳවා ගෙන එන ලෙස උපදෙස් දුන් හ. මුගලන් මහරහතන් වහන්සේ ද සෘද්ධි බලයෙන් ක්‍ෂණයකින් එහි වැඩම කර කවුළුවක් අසල වැඩ හුන් සේක.

සිටුවරයා මුගලන් හිමි දැක උන්වහන්සේට ඉවත්ව යන සේ නියෝග කළේ ය. උන්වහන්සේ කිසිවක් නො කියා එහිම වැඩ සිටිය හ. අවසානයේ කර ගත හැකි කිසිවක් නැති තැන මුගලන් හිමියන්ට දීම සඳහා ඉතා කුඩා කැවුමක් තනන්නැයි හෙතෙම බිරිඳට පැවසී ය. ඒ අනුව ඕ හැන්දකට පිටි මුසුවෙන් ඉතා ස්වල්පයක් ගෙන තාච්චියට දැම්මා ය. එයින් සෑදුණු කැවුමෙන් මුළු තාච්චිය ම පිරිණි. බිරිඳ වැරදීමකින් පිටි මුසු ව වැඩිපුර දමා ඇතැයි සිතූ සිටාණෝ තමා ම ඇඟිලි දෙකකට අසුවන තරමේ ස්වල්පයක් තාච්චියට දැම්මේ ය. එය ද අති විශාල කැවුමක් බවට පත් විය. ඔවුන් නැවත නැවත වෑයම් කළ ද කුඩා කැවුමක් තනාගන්නට බැරි විය. කුඩා කැවුම් තනන්නට මහන්සි වෙනවා වෙනුවට කලින් තනා ඇති සාමාන්‍ය ප්‍රමාණයේ කැවුම් වලින් එකක් දෙන්නට ඔවුහු තීරණය කළ හ.

කැවුම් තනා රැස්කර තිබුණු පෙට්ටියෙන් එක කැවුමක් ගන්නට බිරිඳ තැත් කළ ද අරුම පුදුම අයුරින් එහි සියලු ම කැවුම් එකට බැඳී තිබිණ. එකක් වෙන් කර ගන්නට හැකියාවක් නො තිබිණ. මේ වන විට කැවුම් කන ආශාව සිටුතුමා ගෙන් තුරන් වී ගියේ ය. සියලු ම කැවුම් මුගලන් හිමියන්ට පූජා කරන්නැයි හේ පැවසී ය. මුගලන් හිමියෝ සිටුතුමා හා දේවියට ධර්ම දේශනාවක් කළ හ. එමෙන් ම බුදු පියාණන් ඔවුන් එනතුරු බලා සිටින බව ද පැවසූ හ. බුදුරදුන් වැඩ සිටි සැවැත් නුවර ජේතවනාරාමයට රජගහ නුවර සිට දුර යොදුන් 45 කි. මුගලන් හිමියෝ සිටුවරයා හා දේවිය සිය සෘද්ධි බලයෙන් බුදුන් හමුවට පැමිණවූ හ. ඔවුන් එහි ගියේ කැවුම් පෙට්ටිය ද රැගෙන ය. එය බුදුරජාණන් වහන්සේට හා භික්ෂූන් වහන්සේලා පන්සියයක් නමට පූජා කරන ලදී. අවසානයේ බුදුරදුන් දෙසූ දහම් දෙසුම අසා කෝසිය සිටුතුමා හා දේවිය සෝවාන් වූ හ.

මේ පුවත පසුදින සන්ධ්‍යාවෙහි භික්ෂූන් වහන්සේ අතර සාකච්ඡාවට ලක් විය. ඔවුන් මුගලන් මහරහතන් වහන්සේ ගේ දක්ෂකම් හා ගුණ මහිමය ගැන කතා කරමින් සිටිය දී එහි වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ඔබ ද ගමේ වාසය කළ යුත්තේ මොග්ගල්ලාන පරිද්දෙන්මය. ප්‍රත්‍ය ලබා ගත යුත්තේ ඔවුන් ගේ ශ්‍රද්ධා භක්තියට හානියක් නො වන පරිද්දෙනි" යි වදාළ හ.

විවරණාත්මක අනුවාදය (49 ගාථාව)

යථා අපි භමරො පුප්ඵං වණ්ණගන්ධං අහෙඨයං රසං
ආදාය පලෙති එවං මුනී ගාමෙ චරෙ

යථා අපි: යම් සේ; **භමරො**: බමරෙක්; **පුප්ඵං**: මල; **වණ්ණගන්ධං**: පාට හා සුවඳ; **අහෙඨයං**: නොනසා; **රසං**: පැණි; **ආදාය**: රැගෙන; **පලෙති**: ගමන් කරයි ද; **එවං**: මෙසේ ම; **මුනී**: භික්ෂුව; **ගාමෙ**: ගමක; **චරෙ**: හැසිරෙයි.

බඹරා පාටට හා සුවඳට හානියක් නො කර මලෙහි පැණි ගෙන පරාගනය මගින් ඵල දරන තත්ත්වය ද ඇති කරයි. භික්ෂුව ද ගමක හැසිරිය යුත්තේ ඒ අයුරිනි.

විවරණය

ගාමෙ මුනී චරෙ: භික්ෂූන් වහන්සේ නමක් ගමකින් ප්‍රත්‍ය ලබා ගන්නේ ඉතාමත් සෞම්‍ය විලාසයෙනි. පිඬු සිඟා යන භික්ෂුවක් ගෙපිළිවෙලින් නිහඬව ගමන් කරමින් හැන්දක් පමණ වූ ස්වල්පයක් ලබා ගනියි. අනෙකුත් ප්‍රත්‍යය විෂයෙහි වුව ද ඉල්ලීමකින් හෝ බලපෑමකින් තොරව ලබා ගැනීම සිරිතය. කවර අයුරකින් වත් ගම 'සූරාකෑමක්' සිදු නො වේ. බමරකු මලකින් රොන් ගන්නේ ද ඒ අයුරින්මය. මලෙහි වර්ණය හෝ සුගන්ධයට හානියක් නො කෙරෙයි. බමරා රොන් ගත් විට මල පරාගනය වී ඵලෝත්පාදනය සිදු වෙයි. එමෙන් ම භික්ෂූන් වහන්සේ ශික්ෂාව පිළිගත් විට දායකයාට කුශල කර්ම රැස් වෙයි. එමගින් මෙලොව මෙන්ම පරලොව ද අභිවෘද්ධිය සැලසෙයි. භික්ෂුවක් අභිනිෂ්ක්‍රමණය මගින් සමාජයෙන් බැහැර වූවා සේ පෙනුණ ද එතුමන් ගේ ක්‍රියාකාරිත්වය හුදෙක් තමා ගේ විමුක්තිය අරබයා නොව අන්‍යයන්ගේ ද විමුක්තිය අරබයා වූවකි.



අනුන්ගේ රළුපරළු බස් හා කළ නොකළ දේ ගැන මෙනෙහි නො කොට, සිය කටයුතු සලකා බැලිය යුතු.

50. න පරෙසං විලොමානි
න පරෙසං කතාකතං
අත්තනො'ව අවෙක්ඛෙය්‍ය
කතානි අකතානි ච (4:7)

අනුන් ගේ දොස් පරොස් බස් හෝ
කළ නො කළ දේ ගැනත් නො සොයා
තමන් ගේ අඩුපාඩු කම් හා
කළ නො කළ දේ බලනු විමසා

අනුන් ගැන නොව - තමන් විමසනු

4 (6) පාවෙය්‍ය ආජීවකයා ගේ වත (50 ගාථාව)

සැවැත් නුවර ආජීවකයකු පුත් තනතුරේ තබා වැඩූ එක් **පොහොසත් කාන්තාවක්** ඇරබ දෙව්රම වැඩ විසූ බුදු රජාණන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

නිතර නිතර බුදුරදුන් දක්නට යන සැදැහවතුන්, බුදුරජාණන් වහන්සේ ගේ ගුණ මහිමය හා ධර්ම දේශනා කෞශල්‍යය ගැන කරන වැණුම් අසා මේ කාන්තාවට බුදුරදුන් දැක දහම් අසන්නට ආශාවක් ඇති කර ගත්තී ය. එහෙත් ආජීවකයා ඊට කිසි විටෙක ඉඩ නො දෙයි. අන්තිමේ, "එසේ නම් මම බුදුරදුන් මගේ නිවසට වැඩම කරවා ගෙන දහම් අසන්නෙමි"යි සිතා සිය පුත්‍රයාට බුදුරදුන් හමුවී තම නිවසේ දවල් දානය සඳහා වැඩම කරවන සේ ආරාධනය කරන්නැයි නියම කළේ ය.

පුත්‍රයා ද ආරාධනය සඳහා ජේතවනාරාමයට යන අතර මග ආජීවකයා ගේ ආරාමයට ද ගොඩ විය. ඔහු බුදුරදුන්ට දවල් දානය සඳහා පැමිණෙන්නැයි ඇරයුම් කිරීමට යන බව දැනගත් හේ එය වළකන්නට බොහෝ උත්සාහ කළේ ය. එහෙත් මව ගේ අණට අකීකරු වන්නට අකැමැති දරුවා ඊට එකඟ නො වූයෙන්, "එසේ නම්, දානයට ආරාධනා කරන්න. එහෙත් නිවසට එන මාර්ග විස්තර නො කියා වහා ආපහු එන්න. එවිට බුදුරදුන්ට පැමිණෙන්නට බැරි වනු ඇත. පිසනු ලබන රසවත් ආහාර අප දෙදෙනාට අනුභව කළ හැකිය" යි උපදෙස් දුන්නේ ය. දරුවා ද ඒ කී ලෙසින් ම කළේ ය.

පසු දින බුදුරදුන්ට මඟ වරදිතියි සිතා ගත් ආජීවකයා උදෙන්ම එම නිවසට ගියේ ය. උපාසිකාව ද ඔහු පසුපස කාමරයෙක හිඳුවා බුදුරදුන් පිළිගැනීමට නිවස සරසා භෝජන පිළියෙළ කොට බලා සිටියා ය. බුදුරදුනට කිසිවකු මඟ කිවයුතු නැති හෙයින් උන්වහන්සේ නියම වේලාවට එහි වැඩම කළ හ. කාන්තාව ද ඉතා ප්‍රණීත භෝජනයෙන් බුදු පියාණන් වහන්සේට දානමානාදියෙන් උවටැන් කළා ය.

දන් වළඳා අවසානයේ, බුදුරජාණන් වහන්සේ අනුමෙවෙනි බණ දෙසූ හ. උපාසිකාව ද ඉතා සැදැහැයෙන් බණ අසන්නී වරින් වර සාදුකාර දුන්නා ය. ඒ අසා සිටි ආජීවක තෙම ඊර්ෂ්‍යාවෙන් දැවී කාමරයෙන් එළියට අවුත් "තී දැන් ඉතින් මගේ දායිකාවක් නො වේ. තී මොහු ගේ බණට සාදුකාර දුන්නී ය. ඒ නො තරම් ක්‍රියාවකි" ආදී වශයෙන් ඵරුස වචනයෙන් බැණ වැදී යන්නට ගියේ ය.

එතැන් පටන් උපාසිකාව ගේ සිතට බණ නො වැටහෙයි. බුදුරදුනට එම මානසික විපර්යාසය වැටහින. "උපාසිකාව මගේ බණ දැන් ඔබේ සිතට නො වැටහෙයි." බුදු රදුන් පැවසූ විට "ස්වාමීනී, ඒ ආජීවකයා ගේ කතාවෙන් මා සිත වියවුල් විය. ඒ බැණුම් වලින් මම කම්පා වීමි''යි පැවසුවා ය. ඇයට අවවාද කළ භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන් ගේ අවලාද කතා, කළ නො කළ දේ ගැන නො සිතා තමන් කළ නො කළ දේ ගැන බලා ගැනීම වඩා හොඳ බව පවසා මේ ගාථාව ද වදාළ හ.

විවරණාත්මක අනුවාදය (50 ගාථාව)

පරෙසං විලොමානි න පරෙසං කතාකතං න අත්තනො
එව කතානි අකතානි ච අවෙක්ඛෙය්‍ය

පරෙසං: අනුන් ගේ; **විලොමානි**: අඩු පාඩු සෙවීම්; **න**: නො සිතන්න; **පරෙසං**: අනුන් ගේ කතා: **කතං**: කළ නො කළ දේ; **න**: නො සිතන්න; **අත්තනො එව**: තමන් ගේ ම; **කතානි**: කළ දේ; **අකතානි**: නො කළ දේ; **අවෙක්ඛෙය්‍ය**: පරීක්ෂා කර බලන්න.

අන්‍යයන් අපට දක්වන විරුද්ධ, විවේචන ගැන හෝ අනුන් කරන නො කරන දේ ගැන නොව තමන් කරන හා නො කරන දේ ගැන විමසා බැලීම යහපත් ය.

විවරණය

පරෙසං කතා කතානි: අනුන් කළ කී දේ හා නො කළ දේ ගැන සෙවීම සමාජයේ බොහෝ දෙනා අතර පවත්නා ස්වභාවයකි. මේ ගාථාව එම දුර්වලතාව පිළිබඳව සඳහන් කරයි. මෙය හුදෙක් ගිහියනට පමණක් උරුම ගතියක් නො ව පැවිද්දනට ද උරුම ස්වභාවයකි. එහෙත් මෙය අධ්‍යාත්මික දියුණුවට බාධාවකි. එමෙන් ම ඉතාමත් ම අවශ්‍ය කාර්‍යයක් වූ අන්තරවලෝකනය වළකා ලයි.



දහම් දැන ඉගෙන ඒ අනුව නො පිළිපදින තැනැත්තාට ඒ දහමෙන් වැඩක් නැත්තේ ය.

51. යථාපි රුචිරං පුප්ඵං
වණ්ණවන්තං අගන්ධකං
එවං සුභාසිතා වාචා
අඵලා හොති අකුබ්බතො (4:8)

හොඳ ලස්සණ මලක් වුවත්
පල නැති සේ සුවඳ නැතොත්
නොපිළිපදින බණ පදයක්
පල නැති වෙයි මිහිරි නමුත්

පිළිපැද්දෝතින් පමණක් - බණෙන් අපට වේය වැඩක්

4 (7) ඡත්තපානි ගේ කතාව (51 හා 52 ගාථා)

ඡත්තපානි නම් උපාසක තැන හා පසේනදී කොසොල් රජතුමා ගේ දේවීන් දෙ දෙන ඇරබ භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙරදී මේ ගාථා දෙක වදාළ සේක.

සැවැත් නුවර විසූ ඡත්තපානි, ධර්ම විනය පිළිබඳ මනා දැනුමක් ඇතිව සිටි සකදාගාමී ඵලය පත් ගෘහස්ථ බුද්ධ ශ්‍රාවකයෙක් වූයේ ය. එක් හිමිදිරි පෝදා උදයක ඡත්තපානි භාග්‍යවතුන් වහන්සේ බැහැ දකින්නට ආයේ ය. සාමාන්‍යයෙන් පෝ දින පෙහෙවස් රැකීම ගිහි බෞද්ධයන් ගේ සිරිත වුවද සකදාගාමී වූවන් හැම දා පෙහෙවස් රකින හෙයින් ඊදින වුව ද විශේෂයක් නො වී ය.

සිල්වත් උපාසකයකු වූ ඡත්තපානි එදා භාග්‍යවතුන් වහන්සේ දක්නට ගොස් වැඳ, නමස්කාර කොට ධර්ම ශ්‍රවණය කරමින් හුන්නේ ය. මේ අතර තුර පසේනදී කොසොල් රජතුමා ද භාග්‍යවතුන් වහන්සේ දැක හර-සර දක්වනු වස් එහි පැමිණියේ ය. රජතුමා එනු දුටු ඡත්තපානි "දැන් මහ රජතුමා මෙහි එන විට මා නැගිට ගරු කළ යුතු ද? රජතුමාට අප ගරු කළ යුතු වුවත් දැන් මා සිටින්නේ තුන් ලෝකාග්‍ර බුදුරජාණන් වහන්සේ සමීපයෙහි ය. එසේ හෙයින් මා රජතුමාට හරසර දක්වන්නට ගිය හොත් බුදුරජාණන් වහන්සේට නිග්‍රහයක් කළා වෙයි. රජතුමා සමග සිටින විට මා ප්‍රාන්ත රජ කෙනකුට ගරු නො කළ යුතු පරිද්දෙන් ම බුදුරජාණන් වහන්සේ හමුවෙහි රජතුමාට ගරු නො කළ යුත්තේ ය. එහෙයින් රජතුමා මා කෙරේ කෝප ගන්නේ වුව ද මම හුනස්නෙන් නො නැගී සිටිමි"යි සිතා ගත්තේ ය. ඒ අනුව රජතුමා පැමිණි විට ඡත්තපානි නැගී සිට ගරු කිරීමක් නො කළේ ය. (මෙහි දැක්වෙන ආදර්ශය නුවණින් වටහා ගැන් ම ප්‍රයෝජනවත් ය. අපට වඩා ශ්‍රේෂ්ඨයන් සමග යමකු සිටින විට ඔහු ගෙන් හරසර නො ලැබුණා යයි අප කෝප නොගත යුතුය. නුවණැත්තෝ එසේ සිත් නො සතුටු කර නො ගනිති.)

කෙසේ වුව ද ඡත්තපානි නැගිට තමාට ආචාර සමාචාර නො දැක්වීම ගැන කොසොල් රජු කෝපයට පත් විය. එතකුදු වුවත් නිහඬ ව භාග්‍යවතුන් වහන්සේට වැඳ නමස්කාර කර එකත්පස්ව හුන්නේ ය. රජතුමා කිපී සිටින බව දත් භාග්‍යවතුන් වහන්සේ "මහරජ, මේ ඡත්තපානි උපාසක තැන නැණවතෙකි. ධර්මය පිළිබඳ විශාරදයෙකි. ලාභයෙහි මෙන් ම අලාභයෙහි ද කම්පා නො වන්නෙකි." ආදී වශයෙන් ඔහු පිළිබඳ ගුණ වර්ණනාවක් කළ සේක. ඒ අසා සිටි රජතුමා ගේ හද තරමක් මෘදු විය. එක් දිනක් උදෑසන, මහරජ තෙම සිය මාලිගයෙහි සී මැදුරු කවුළුවෙන් මහ මග දෙස බලා සිටින විට ඡත්තපානි උපාසක තැන පාවහන් පැළඳ කුඩය ද දරා ගෙන රජ වීදිය දිගේ ගමන් කරනු එතුමා ගේ නෙත ගැටිණ. ඔහු වහා ම රජ මැදුරට කැඳවන්නැයි රජ තෙම නියෝගයක් දුන්නේ ය. පණිවුඩය ලත් වහාම කුඩය හකුළා පාවහන් මුදා තබා ගරු සරු ඇතිව මාලිගයට පිවිසුණු ඡත්තපානි රජතුමාට හරසර දක්වා එකත් පසෙක විනීත ව සිටියේ ය. "උපාසකය, පාවහන් මුදා තබා ඡත්‍රය ද පසෙක තබා එන්නට හේතුව?" යි රජතෙමේ ප්‍රශ්න කළේ ය. "මහ රජතුමනි, ඔබ වහන්සේ මා කැඳවන බව ඇසූ සැණෙකින් ඔබ වහන්සේට හරසර පිණිස ඒවා මුදා තැබුවෙමි." "එසේ නම්, මා මහරජ බව අද ඔබ දැන ගත්තා!"

"දේවයන් වහන්ස මා ඒ බව හැමදාමත් දැන සිටියා" "එහෙම නම්, එදා බුදුරදුන් හමුවේ දී ඔබ මා දැක දැකත් කිසි ගරු සරුවක් නැතිව හිඳගෙන ම සිටියේ?" "දේවයන් වහන්ස, ඒ ඔබ වහන්සේ කෙරේ නිග්‍රහ කරනු පිණිස නො වේ. මා එදා සිටියේ තුන් ලොවට ම අග්‍ර වූ භාග්‍යවතුන් වහන්සේ හමුවේ. උන් වහන්සේ හමුවේ ඔබ තුමාට හරසර පිණිස නැගී සිටියා නම් එයින් භාග්‍යවතුන් වහන්සේට අවමානයක් වන්නට තිබුණා. ඒ නිසා මා නො නැගිට සිටියා මිස මහරජ තුමාට අවමානයක් කරන්නට සිතුවා නො වෙයි."

ඒ ඇසූ මහ රජතෙම "හොඳයි ගිය දේ ගියාවේ. මට ආරංචියි ඔබ මෙලොව-පරලොව දෙකටම හිතකර ධර්ම කාරණා පිළිබඳව විශාරදයෙක් බව. ඒවගේ ම ධර්ම විනය පිළිබඳ හොඳ දැනුමක් ඔබට තියෙන නිසා මගේ අන්තඃපුරයට නිතර ඇවිත් ඒ කාන්තාවන්ට ධර්ම දේශනා කරන්න මම ඔබට ඇරයුම් කරනවා"යි පැවසී ය. ඡත්තපානි ඒ අදහසට කැමැත්තක් නො දැක්වී ය. "දේවයන් වහන්ස, මම ඒකට නම් කැමැත්තක් නෑ"යි ඔහු පැවසූ විට ඊට හේතු දක්වන ලෙස රජතුමා ඉල්ලා සිටියේ ය. "දේවයන් වහන්ස, රජ ගෙදර බොහොම නීති රීති, දඬුවම් තියෙන තැනක්. චාරිත්‍ර වාරිත්‍ර බොහොමයි. එය ටිකක් අනතුරුදායක වැඩක්"යි හේ පැවසී ය. "එදා සිදු වූ දේ ගැන මගේ හිතේ යම් අමනාපයක් තිබෙනවා යැයි ඔබ වෙත බයක් තියා ගන්න එපා. මම එය අමතක කළා" යි රජතුමා පැවසූව ද "දේවයන් වහන්ස, පැවිදි උතුමන් කළ යුතු දේවල් ගිහි අප කරන්නට යාම හරි නැහැ. ඒ නිසා එයට භික්ෂු නමක් ම යොදවා ගන්න" යි ඡත්තපානි බොහෝ නිහතමානී ලෙස කියා සිටියේ ය.

විවරණාත්මක අනුවාදය (51 ගාථාව)

යථා අපි රුචිරං වණ්ණවන්තං අගන්ධකං පුප්ඵං යථා,
එවං සුභාසිතා වාචා අපි අකුබ්බතො අඵලා හොති.

යථා අපි: යම් සේ; **රුචිරං**: ප්‍රියංකර; **වණ්ණවන්තං**: වර්ණවත්; **අගන්ධකං**: සුවඳ නැති; **පුප්ඵං**: මලක්; **යථා**: යම් සේ (නිෂ්ප්‍රයෝජන) ද; **එවං**: එසේම; **සුභාසිතා වාචා**: සුභාෂිත වචනය (ධර්මය); **අපි**: ද, **අකුබ්බතො**: පිළිපැදීමක් නො කරන්නාට; **අඵලා හොති**: නිෂ්ප්‍රයෝජන වෙයි.

ඉතා ප්‍රියංකර වර්ණවත් පුෂ්පයක් වුව ද සුවඳින් තොර නම් නිෂ්ඵල සේම මනාව දේශිත ධර්මයක් වුව ද ක්‍රියාත්මක නො කරන්නේ නම් ප්‍රයෝජන නො ලැබේ.

දහම දැන ඉගෙන ඒ අනුව හැසිරෙන තැනැත්තාට ඒ දහම මොනවට හිත සැප එළවයි.

52. යථාපි රුචිරං පුප්ඵං
වණ්ණවන්තං සගන්ධකං
එවං සුභාසිතා වාචා
සඵලා හොති සකුබ්බතො (4:9)

හොඳ ලස්සණ පාට මලක්
ඇති විට ඉම්හිරි සුවඳක්
ඒ වාගෙයි බණ පදයක්
පිළිපදිතොත් වේය සරණක්.

පිළි පැද්දෝතින් පමණක් - බණෙන් අපට වේය වැඩක්

4 (7) ඡත්තපානි ගේ කතාව (51 සහ 52 ගාථා) ඉතිරි කොටස.

රජතුමා එයට එකඟ ව ඡත්තපානිට සමුදුන්නේ ය. පසේනදී කොසොල් රජතෙම තම අන්තඃපුරයෙහි ධර්ම දේශනා කරන්නැයි භාග්‍යවතුන් වහන්සේට ආරාධනය කර යැව්වේ "ස්වාමීනි, මගේ අග බිසෝවරුන් වූ මල්ලිකා හා වාසභඛත්තියා "අපිත් ධර්මධර වන්නට ආශා ඇත්තෝමු" යි කියති. එහෙයින් නිරතුරුව ම පන්සියයක් භික්ෂූන් වහන්සේ ද කැටුව රජ මාලිගයට වැඩම කර මෙහි ධර්ම දේශනා කළ මැනව'' යි කියමිනි. එහෙත් "මහරජ, එකම තැනකට නිතර නිතර පැමිණීම මට පහසු කාර්‍යයක් නො වේ. එහෙයින් මම ඒ කාර්‍යය ආනන්ද ස්ථවිරයන්ට පවරමි" යි භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු එවූ හ.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද නිතර නිතර රජ මාලිගයට වැඩම කර බිසෝවරුනට ධර්මානුශාසනා කරති. රජතුමාගේ දේවීන් අතුරින් මල්ලිකා දේවිය මනාව ධර්මශ්‍රවණය කර නැවත නැවත සිහිපත් කරමින් ධාරණය කර ගන්නා අතර ප්‍රගුණ කිරීම ද කරයි. එහෙත් වාසභඛත්තියා එතරම් උනන්දුවෙන් ධර්මය ඉගෙනීමක් හෝ පිළිපැදීමක් නො කරයි. දැනුම මෙන් ම භාවිතය අතින් ද ඕ බොහෝ පසුබට වූ වා ය. දිනක් භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් අමතා "ආනන්ද, ඔබ ගේ රජවාසල ශ්‍රාවිකාවන් ධර්මය හොඳට ඉගෙන ගන්නවා ද?" යි විමසූ හ. "එසේ ය ස්වාමීනි" යි ආනන්ද හිමියෝ පිළිතුරු දුන් හ.

"කවුද වඩා හොඳින් ඉගෙන ගන්නේ?" "මල්ලිකා දේවිය හොඳට ඉගෙන ගන්නවා. ඇය උනන්දුවෙන් සවන් දෙනවා, හොඳට තේරුම් ගන්නවා. නැවත ආවර්ජනය කරනවා. ඒත් ඔබ වහන්සේ ගේ ඥාති වරිය, වාසභඛත්තියා එතරම් උනන්දුවෙන් සවන් දෙන්නේ නැහැ. හරියට තේරුම් ගන්නේත් නැහැ. නිතර සිහිපත් කරන්නේත් නැහැ" යි ආනන්ද හිමියෝ පිළිතුරු දුන් හ. "ආනන්ද, මා දේශනා කරන ධර්මය සැදැහයෙන් සවන් නො දෙන, ඉගෙන නො ගන්න, නැවත නැවත මතක් නො කරන, දේශනාත් නො කරන තැනැත්තාට සුවඳ නැති ලස්සන මලක් මෙන් නිෂ්ප්‍රයෝජන වෙයි. එයට ශ්‍රද්ධාවෙන් සවන් දී හොඳින් ඉගෙන, නැවත නැවත මෙනෙහි කොට තව අයටත් පැහැදිලි කර දෙන අයට එයින් බොහෝ ප්‍රයෝජන අත් වෙනවා" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා දෙක ද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (52 ගාථාව)

යථා අපි රුචිරං වණ්ණවන්තං සගන්ධකං පුප්ඵං යථා ඒවං සුභාසිතා වාචා අපි සකුබ්බතො සඵලා හොති.

යථා අපි: යම් සේ; **රුචිරං**: සිත්කළු; **වණ්ණවන්තං**: පැහැපත්; **සගන්ධකං**: සුවඳැති; **පුප්ඵං**: කුසුමක්; **යථා**: යම් සේ ද; **ඒවං**: එසේ ම; **සුභාසිතා වාචා අපි**: සුභාෂිත ධර්මය ද; **සකුබ්බතො**: ක්‍රියාත්මක කරන්නාට; **සඵලා හොති**: සප්‍රයෝජන වන්නේ ය.

සිත් පිනවන වර්ණවත් පුෂ්පය සුගන්ධයෙන් ද යුක්ත නම් එය ප්‍රයෝජනවත් ය. එපරිද්දෙන් ම මනාව දේශිත මධුර ධර්මය ක්‍රියාත්මක කරන්නේ නම් එයින් ප්‍රයෝජන සැලසෙයි.

විවරණය

අගන්ධකං: යි හැඳින්වූයේ පුෂ්පයක් සුගන්ධයෙන් තොර වූ බව හඟවනු පිණිසය. මලක අප වඩාත් ම ප්‍රිය කරන අංගය සුවඳයි. සුවඳ නැත හොත් එය අගය නො කරමු. එමෙන් ම ධර්මය ද කවර තරම් මධුර ආකාරයෙන් දේශනා කරනු ලැබුවද ක්‍රියාවට නො නඟන්නේ නම්, එහි පැවැත්මෙන් ප්‍රයෝජනයක් නැත. සද්ධර්මය සුගන්ධිත වන්නේ ක්‍රියාවට නංවන විට ය.

සගන්ධකං: පුෂ්පය සුවඳ සහිත වූ විට මල් මාලා තැනීමට, බුදුන් පිදීමට, සුවඳ ද්‍රව්‍ය නිෂ්පාදනයට වැනි දහසකුත් එකක් දේට එය යොදා ගනු ලැබේ. ධර්මය ද එසේ ම ය.

අකුබ්බතො හා සකුබ්බතො: යන වචන වලින් ධර්මයෙහි ප්‍රායෝගික අගය දක්වනු ලැබේ. බුදු දහම හුදු විශ්වාස මාත්‍රයක් නො වේ. විශ්වාසය පදනම් කරගත් ආගම් වල බාහිර දේවත්වයක ආධාරය පතා යාඥා කිරීම ප්‍රමාණවත් ය. ප්‍රායෝගිකව තමන් ම ප්‍රගුණ කළ යුතු ශික්ෂාවක් අනවශ්‍ය ය. එහෙත් බුදු දහම විශ්වාසය වෙනුවට භාවිතය අවධාරණය කරයි. තම තම ඥාන ප්‍රමාණය හා ශක්ති ප්‍රමාණය අනුව තම තමා විසින් ප්‍රගුණ කළ විට බෞද්ධ ශික්ෂාව ප්‍රතිඵල දානය විසින් සුගන්ධිත වෙයි. බුදු දහම පිළිපදින්නා වර්ණවත් සුගන්ධිත පුෂ්පයක් බවට පත් වෙයි.

මල් රැසකින් බොහෝ මල් දම් ගොතන්නේ යම් සේ ද එසේ ම උපන් මිනිසා විසින් බොහෝ කුසල් කළ යුතු.

53. යථාපි පුප්ඵරාසිම්හා
කයිරා මාලාගුණෙ බහූ
එවං ජාතෙන මච්චේන
කත්තබ්බං කුසලං බහුං (4:10)

මල් රැසකින් මනා
මාලා සදන අයුරින්
උපන් අප සැම දෙන
බොහෝ පින් කළ යුතුමය

මනු ලෝකේ උපන්නොතින් - කළ යුතුවෙයි කුසල් නිතින්

4 (8) විශාඛාවන් ගේ කථා ප්‍රවෘත්තිය (53 ගාථාව)

පූර්වාරාමය තනවා පූජා කළ **විශාඛා මහෝපාසිකාව** නිමිති කර ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව එම විහාරස්ථානයේ ම වැඩ වෙසෙමින් වදාළ සේක.

භද්දිය නුවර ධනංජය සිටාණන් ගේත් සුමනා දේවිය ගේත් දියණිය වූ විශාඛා බිම්බිසාර රජතුමා ගේ පාලනයේ පැවති මගධ රාජ්‍යයේ විසූ පංච මහා සිටුවරුන් ගෙන් එක් අයකු වූ මෙණ්ඩක ගේ මිණිපිරිය වූවා ය.

විශාඛා සත් හැවිරිදිව, සිටිය දී බුදුරජාණන් වහන්සේ භද්දිය නගරයට සම්ප්‍රාප්ත වූ හ. ඒ අවස්ථාවේ දී මෙණ්ඩක සිටාණෝ විශාඛාව හා ඇය ගේ පිරිවර කුමරියන් පන්සියයක් දෙනා ද කැටුව බුදුන් දකින්නට ගිය හ. බුදුරදුන් කළ දහම් දෙසුම අසා මෙණ්ඩක සිටාණෝ ද, විශාඛාවෝ ද පිරිවර කුමරියෝ ද යන මේ හැම දෙනා සෝවාන් ඵලයෙහි පිහිටිය හ.

වැඩි වයසට පත් විශාඛා සැවැත් නුවර මිගාර සිටුවරයා ගේ පුත්‍රයා වූ පූර්ණවර්ධනට විවාහ කර දෙන ලද්දී ය. දිනක් මිගාර සිටුතුමා ආහාර ගනිමින් සිටිනා අතර භික්ෂු නමක් පිඬු සිඟා පැමිණියේ ය. ඔහු එය ගණනකට නො ගෙන ආහාර ගනු දුටු විශාඛා හිමි නම වෙත ගොස් "හිමියනි, මගේ මාමා පුරාණයක් අනුභව කරයි" යි පැවසුවා ය. එයින් කෝපයට පත් මිගාර විශාඛාවනට නිවසින් බැහැර යන සේ නියෝග කළ ද "මම නොයමි. මා යා යුතු ද නැත්දැයි තීරණය කළ යුත්තේ මා විවාහ වූ දිනයේ මෙ බඳු අවස්ථාවලට මැදිහත් වන සේ පත් කළ නැණවත් වෘද්ධ සිටුවරුන් අට දෙනා විසිනි" යි. පැවසූ ඕ ඔවුන් කැඳවූවා ය.

ඔවුන් හමුවේ මිගාර තම පැමිණිල්ල කළේ ය. විශාඛා තමන් පුරාණයක් යැයි කීවේ 'අසුචි' යන අරුතින් නොව පෙර කළ පිනින් ලත් දෙයක් යන අරුතින් බවත් මිථ්‍යාදෘෂ්ටික මිගාර පවුලේ අය වර්තමානයේ පිනක් නො කරන හෙයින් එය අර්ථ සම්පන්න බවත් පැහැදිලි කළ විට ඇය නිවරද බව විද්වත් වැඩිහිටියෝ තීරණය කළ හ. අනතුරුව විශාඛා "මම තෙරුවන් කෙරේ පැහැදුණු බොදු කතක්මි. පිනක් දහමක් නො කෙරෙන මේ මිසදිටු කුලයෙහි මට විසිය නො හැකිය." යි පවසා "මම යමි" යි යන්නට සැරසුණා ය. එහෙත් ඇයට තමන් රිසි පරිදි බුදු පාමොක් මහ සඟනට දන් පිළිගැන්වීමට අවසර ලැබුණු හෙයින් ඕ නො ගියා ය.

පසුදින ම විශාඛා බුදු පාමොක් මහ සඟනට දන් පිරිනැමුවා ය. දන් පිළිගන්වන්නට එන්නැයි මිගාරට ද ඇරයුම් කළද හේ නො පැමිණියේ ය. දන් පිළිගැන්වීමෙන් පසු බුදුරදුන් අනුමෙවෙනි බණ දෙසන්නට සැරසෙන විට ඕ යළිත් තම මාමණ්ඩියට පණිවුඩයක් යැව්වා ය. දෙවන වර ඇරයුම් කළ විට ප්‍රතික්ෂේප කිරීම නුසුදුසු යැයි සිතූ මිගාර එන්නට සැරසෙන විට එහි පැමිණ සිටි නිඝණ්ඨ නාථපුත්ත ගේ බැතිමත්හු ඔහු වැළකූ හ. එහෙත් බුදුරදුනට මුහුණ නො දී තිරයකින් පසුපස සිට දම් අසමියි පැවසූ හේ තිරය පසුපස සිට ඇසූ බණින් බුදුරදුන් කෙරේ පැහැදී සෝවාන් ඵලය ද ලබා තමන්ට දහම් ඇස පාදාගන්නට උදව් කළ ලේලිය මව් තනතුරේ තබා ගෞරව කළා ය. එහෙයින් විශාඛාවට 'මිගාර මාතා' යන නම ද භාවිතයට ආවේ ය.

විශාඛාවෝ පිරිමි දරුවන් දහ දෙනකුට ද ගැහැණු දරුවන් දහ දෙනෙකුට ද මව වූවා ය. ඒ හැමටම ද පිරිමි දරුවන් 10 බැගින් හා ගැහැණු දරුවන් 10 බැගින් ලැබිණ.

විශාඛාවනට සිය පියා විසින් විවාහ මංගල්‍යය දා තෑගි කරන ලද මාණික්‍ය රාශියකින් සමලංකෘත මහා ආභරණයක් විය. දිනක් මෙම මහලිය පළඳනාව පැළඳ දෙව්රම් වෙහෙරට ගිය ඇයට එහිදී එය අමතක විණි. ආභරණය බර වැඩි හෙයින් එය බලා ගන්නැයි සේවිකාවකට බාර දී තිබුණි. ඇය එය පසෙක තබා ගෙන සිටිය ද ආපසු එන විට අමතක විය. ආනන්ද හිමියන් විසින් එය විහාරස්ථානය තුළ පරෙස්සමින් තබා තිබුණා ද දැන් එය තමන්ට හිමි නැතැයි තීරණය කළ විශාඛා එය විකුණා ලැබෙන මුදලින් ආරාමයක් කරවන්නට තීරණය කළා ය. කිසිවකුට ආභරණයක් එතරම් මිළකට ගත නො හැකි වූයෙන් තමා ම එය කෝටි නමයකට මිල දී ගෙන ඒ මුදලින් නගරයෙහි නැගෙනහිර පැත්තෙහි පූර්වාරාමය නමින් පන්සලක් ඉදි කළා ය.

විවරණාත්මක අනුවාදය (53 ගාථාව)

යථා අපි පුප්ඵරාසිම්හා බහු මාලාගුණෙ කයිරා එවං
ජාතෙන මච්චෙන බහුං කුසලං කත්තබ්බං

යථා අපි: යම් සේ; **පුප්ඵරාසිම්හා**: මල් රැසකින්; **බහු**: බොහෝ; **මාලාගුණෙ**: මල් දම්; **කයිරා**: කරන්නේ ද; **එවං**: ඒ අයුරින් ම; **ජාතෙන**: උපන්; **මච්චේන**: සත්ත්වයන්; **බහුං**: බොහෝ; **කුසලං**: කුසල්; **කත්තබ්බං**: කළ යුතුය.

මල් දම් නෙලන්නෙක් මල් රාශියක් එකතු කර ගෙන බොහෝ මල් මාලා ගොතන්නාක් මෙන් උපන් සත්ත්වයන් විසින් ද බොහෝ පින්කම් කරගත යුතු ය.

විවරණය

කුසල් කරමින් සාධු චර්යාවෙන් කල් ගත කරන්නා ගේ ජීවිතය මල් දම් ගොතන්නකුට සමාන කර ඇත. අපේ ජීවිත කාර්‍ය සියල්ල මල් ගොඩක් වැන්න. මේ මල් මල්දම් බවට ගොතා ගැනීමට හැම දෙනාම සමත් වුව මනාය. අප ලබා ඇති තාවකාලික ජීවිතය තුළ හැකි තරම් කුසල් දහම් කර ගත යුතු ය.



මල් සුවඳ උඩු සුළඟට නො හමන්නේ ය. සත් ගුණවතුන් ගේ සිල් සුවඳ ම ඉහළට හමනේ ය.

54. න පුප්ඵගන්ධො පටිවාතමෙති
න චන්දනං තගරමල්ලිකා වා
සතඤ්ච ගන්ධො පටිවාතමෙති
සබ්බා දිසා සප්පුරිසො පවාති (4:11)

මල් වල සුවඳ උඩු සුළඟට නොයන්නේ
දැසමන් සඳුන් සුවඳත් නෑ හමන්නේ
සත් ගුණ සුවඳ උඩු සුළඟෙත් විහිදෙන්නේ
යහපත් අය ගෙ ගුණ දස අත දැනෙන්නේ

විහිදෙන හැම තැන - සුවඳයි යහ ගුණ

4 (9) ආනන්ද හිමියන් නැගූ ප්‍රශ්නය (54 සහ 55 ගාථා)

ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සමයෙහි **ආනන්ද හිමියන්** විසින් විමසන ලද ප්‍රශ්නයක් හේතුවෙන් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා දේශනා කළ හ.

දිනක් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විවේකීව සිටින අතර මෙසේ සිතූහ. "ලොව අග්‍රගණ්‍ය සුවඳ වර්ග තුනක් ගැන බුදුරජාණන් වහන්සේ වදාරති. එනම්,

1. හර සුවඳ (සඳුන් වැනි)
2. මුල් සුවඳ (සැවැන්දරා වැනි)
3. මල් සුවඳ (සමන් වැනි) යන තුනයි.

මේ සුවඳ වර්ග තුන ම යටි සුළඟට මිස උඩු සුළඟට නොයයි. උඩු සුළඟට යන සුවඳක් තිබේ ද? නැතහොත් හැම අතට ම යන සුළඟක් තිබේ ද? මෙය සොයා ගැනීමට මා තනිවම සිතීමෙන් ඇතිවන ප්‍රතිඵලයක් නැත. භාග්‍යවතුන් වහන්සේ ගෙන් ම අසා දැන ගනිමි."

මෙසේ සිතූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ එක් සන්ධ්‍යාවක භාවනාවෙන් නැඟිට බුදුරදුන් හමුවට ගොස් උන්වහන්සේ ගෙන් මෙසේ විමසූ හ. "ස්වාමීනි, මේ ලෝකයෙහි අග්‍රගණ්‍ය සුගන්ධයන් වූ හර සුවඳ, මුල් සුවඳ හා මල් සුවඳ යන මේ හැම විහිදෙන්නේ යටි සුළඟේ ය. ඒ එකක් වත් උඩු සුළඟට නො යයි. ස්වාමීනි, උඩු සුළඟට හෝ උඩු හා යටි හැම සුළඟට ම විහිදෙන සුවඳක් නැත් ද?"

"ආනන්ද, උඩු සුළඟට මෙන් ම යටි සුළඟටත් විහිදෙන සුගන්ධයක් තිබේ." යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ. "ඒ කුමන සුගන්ධයක් ද ස්වාමීනි"යි ආනන්ද හිමියෝ විමසූ හ. "ආනන්ද, කිසියම් ගමක හෝ නගරයක පුරුෂයෙක් හෝ ස්ත්‍රියක් හෝ බුද්ධ, ධම්ම, සඞ්ඝ යන තෙරුවන් සරණ ගියේ ද, ප්‍රාණවධයෙන්, සොරකම් කිරීමෙන්, කාමයෙහි වරදවා හැසිරීමෙන්, බොරු කීමෙන්, සුරා පානයෙන් වැළකුණේ ද, යහගුණ වඩමින්, මසුරු මල හැර පරිත්‍යාගශීලීව, දීමට හුරු වූ අත් ඇතිව, ඉල්ලීම් වලට සවන් දෙන සුළුව, බෙදා හදා ගෙන භුක්ති විඳීමට හුරුව වසයි ද එවැන්නා ගේ උතුම් ගුණ දස දෙසම වසන පැවිද්දෝ ද වර්ණනා කරත්. දෙවියෝ ද වර්ණනා කරත්. අසවල් ගමේ අසවල් ස්ත්‍රිය, අසවල් පුරුෂයා මෙබඳු ගුණ ඇත්තේ යයි කතා බහ කරත්. එබන්දා ගේ ගුණය උඩු සුළඟටත් යටි සුළඟටත් දස අතටමත් විහිදුණේ යැයි කිව හැක"යි භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළ සේක. අනතුරුව මේ ගාථා දෙක ද වදාළ හ.

විවරණාත්මක අනුවාදය (54 ගාථාව)

පුප්ඵගන්ධො පටිවාතං න එති චන්දනං ච තගරමල්ලිකා
වා න සතං ගන්ධො පටිවාතං ච එති සප්පුරිසො
සබ්බාදිසා පවාති

පුප්ඵගන්ධො: මල් සුවඳ; **පටිවාතං**: උඩු සුළඟට; **න එති**: නො එයි; **චන්දනං ච**: සඳුන් (සුවඳ) ද; **තගර**: තුවරලා ද; **මල්ලිකා වා**: සමන් පිච්ච (සුවඳ) ද; **න**: නො එති; **සතං**: සත් පුරුෂයන් ගේ; **ගන්ධො**: සුවඳ; **පටිවාතං ච**: උඩු සුළඟට ද; **එති**: එයි; **සප්පුරිසො**: යහපත් තැනැත්තා; **සබ්බා දිසා**: හැම දිශාවට ම; **පවාති**: (සුවඳ) හමයි.

මල් සුවඳ, සඳුන් සුවඳ, තුවරලා සුවඳ, සමන් පිච්ච සුවඳ ආදිය උඩු සුළඟේ නො විහිදෙයි - සත් පුරුෂයන් ගේ ගුණ සුවඳ පමණක් උඩු සුළඟේ විහිදෙයි. යහපත් පුද්ගලයන් ගේ ගුණ සුවඳ හැම'තම විහිදේ.

විවරණය

මේ ගාථා දෙක දේශනා කළේ ආනන්ද ස්ථවිරයන් වහන්සේ අරබයා ය. බෞද්ධ ඉතිහාසයෙහි ආනන්ද හිමියන්ට හිමි වන්නේ ඉතා වැදගත් ස්ථානයකි. භාග්‍යවතුන් වහන්සේ විසින් කරන ලද ධර්ම දේශනා වැඩි හරියක් ම වාර්තා කර ගන්නා ලද්දේ අනඳ හිමියන් විසිනි. උන් වහන්සේ ඒවා ප්‍රථම ධර්ම සංගීතියේ දී ඉදිරිපත් කළ හ. පාලි සූත්‍රවල මුලින් ම හමුවන '**ඒවං මේ සුතං**' යන වචන ආනන්ද මහා ස්ථවිරයන් වහන්සේ ගේ වචන ය.

භාග්‍යවතුන් වහන්සේ ගේ පෞද්ගලික උපස්ථායක ධුරය දරන ලද්දේ අනඳ හිමියන් විසිනි. නිරතුරුව ම උන්වහන්සේ සමග ගැවසෙමින් ධර්මය අසන්නටත්, ධාරණය කර ගන්නටත් භාග්‍යය ලත් හෙයින් අනඳ හිමියන්ට ධර්මභාණ්ඩාගාරික යන ව්‍යවහාරය ද විය.

මුල් දොළොස් වස තුළ භාග්‍යවතුන් වහන්සේට නිත්‍ය උපස්ථායකයෙක් නො වී ය. වරින් වර විවිධ භික්ෂූන් වහන්සේ කීප නමක් තාවකාලිකව උන්වහන්සේ ගේ උපස්ථාන කටයුතු කළ හ. නාගසමාල, නාගිත, උපවාන, සුනක්ඛත්ත, චුන්ද, සාගල, රාධ සහ මෙඝිය යන හිමිවරු ඒ අතර වූ හ.

එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ නාගසමාල තෙරුණුවන් සමග දිග ගමනක් ගිය හ. එක්තරා හන්දියක දී නාගසමාල හිමියෝ එක් මඟක් ගනිමු යි යෝජනා කළ හ. අනෙක් මඟ ගනිමුයි භාග්‍යවතුන් වහන්සේ යෝජනා කළ හ. භාග්‍යවතුන් වහන්සේ ගේ යෝජනාව පිළි නො ගත් හිමි නම බුදුරදුන් ගේ පාත්‍රය හා සිවුරු බිම තබා යන්නට සැරසෙත් ම භාග්‍යවතුන් වහන්සේ එය සිය'තට ගත් හ. බුදුරදුන් තනිව එක් මඟක යත් දී එයට එරෙහිව වෙනත් මඟක් ගත් හිමිනම මුහුණ පෑවේ මහා අතවරයකට ය. මඟදී මං පහරන හොරු උන්වහන්සේ ගේ පා සිවුරු පැහැර ගෙන හිසට පොළු පහරක් ද එල්ල කළ හ. ලේ පෙරෙන හිසින් යුතුව නැවත බුදුරදුන් සොයා ආ භික්ෂුවට භාග්‍යවතුන් වහන්සේ අවවාද කොට සැනසූ හ.

ඊළඟ පිටුව හා බැඳේ

සඳුන් උපුල් ආදී සුවඳ දෑ අතුරෙන් හට ගැනෙන සුවඳට වඩා සිල් සුවඳ ම ඉතා අගනේ ය.

55. චන්දනං තගරං වා'පි
උප්පලං අථ වස්සිකී
එතෙසං ගන්ධජාතානං
සීල ගන්ධො අනුත්තරො (4:12)

සඳුන් තුවරලා සුවඳයි
උපුල් සහ සමන් සුවඳයි
මේ කොයි සුවඳත් පරදියි
වඩා උතුම් සිල් සුවඳයි.

විහිදෙන හැම තැන - සුවඳයි යහ ගුණ

4 (9) ආනන්ද හිමියන් නැගූ ප්‍රශ්නය (54 සහ 55 ගාථා) (ඉතිරි කොටස)

විවරණය

පෙර පිටුව හා බැඳේ

තවත් වතාවක භාග්‍යවතුන් වහන්සේ මෙඝිය හිමියන් සමග ජන්තු නම් ගමට වැඩම කරද්දී මෙඝිය හිමියෝ ගමන වෙනස් කොට අඹ වනයකට පිවිස භාවනා කරන්නට තීරණය කර ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ ගේ පා සිවුරු උන්වහන්සේ අතට ම බාරදී භාග්‍යවතුන් වහන්සේ 'එපා' කියද්දී ම මෙඝිය හිමියෝ භාවනාව පිණිස අඹ වනයට ගිය හ. පසුව බුදුරදුන් දක්නට ආ මෙඝිය හිමියෝ තමන් ගේ භාවනාව අසාර්ථක වූ බව සැලකර සිටිය හ. සැවැත් නුවරට වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ භික්ෂුන් අමතා මේ අමිහිරි අත්දැකීම් විස්තර කළ හ. දැන් තමන් වයසින් තරමක් වැඩි හෙයින් නිත්‍ය උපස්ථායකයකු ඇත්නම් යහපත් බව ද භික්ෂූන් වහන්සේලා ට දැනුම් දුන් හ.

සැරියුත් මහ රහතන් වහන්සේ වහා නැඟී සිට තමන් තථාගතයන් වහන්සේ ගේ නිත්‍ය උපස්ථායකත්වය දරන්නට කැමති බව ප්‍රකාශ කර සිටිය ද අග්‍ර ශ්‍රාවක වශයෙන් උන් වහන්සේට වෙනත් කාර්‍ය්‍ය භාරයන් ඇති හෙයින් බුදුහු එය අනුමත නො කළ හ. මෙසේ බොහෝ ජ්‍යෙෂ්ඨ ශ්‍රාවකයන් එම නිලය අයැද සිටිය ද භාග්‍යවතුන් වහන්සේ ඊට කැමති නො වූ හ. ආනන්ද ස්ථවිරයන් වහන්සේ නිහඬව සිටිනු දුටු භික්ෂූහු ඔබ වහන්සේ නිහඬව සිටින්නේ මන්ද? භාග්‍යවතුන් වහන්සේ ඔබ ඉල්ලා සිටියහොත් කැමති වන්නට ඉඩ තිබේ යැයි කී හ. එහෙත් අනඳ හිමියන් කියා සිටියේ "මම භාග්‍යවතුන් වහන්සේ විසින් ම මා තෝරා පත් කර ගනු ලබන්නට කැමැත්තෙමි" යනුවෙනි. ඒ ඇසූ බුදු පියාණෝ "කවුරුන් නො කීවත් ආනන්ද මා ගේ උපස්ථායකයාණන් වශයෙන් කටයුතු කරනවා ඇත" යි වදාළ හ.

ආනන්ද හිමියන් අග්‍ර උපස්ථායක ධුරය භාර ගත්තේ කොන්දේසි අටක් ඇතිව ය.

1. බුදුරදුන්ට ලැබෙන අගනා සිවුරු අනඳ හිමියන්ට නො දිය යුතු ය.

2. බුදුරදුන්ට ලැබෙන ප්‍රණීත ආහාර ආනන්ද හිමියන්ට නො දිය යුතු ය.

3. භාග්‍යවතුන් වහන්සේ ගේ ගන්ධකුටියෙහි ආනන්ද හිමියන්ට නවාතැන් නො දිය යුතු ය.

4. භාග්‍යවතුන් වහන්සේට දානමානාදියට ලැබෙන ආරාධනාවන්ට යන්නැයි අනඳ හිමියන්ට නිල නොකළ මනාය.

5. අනඳ හිමියන් බාරගන්නා ආරාධනයන්ට බුදුරජාණන් වහන්සේ වැඩම කළ යුතු ය.

6. දුර සිට පැමිණෙන ආගන්තුකයන් බුදුන් දැකීම සඳහා කැඳවා ගෙන ඒමට අනඳ හිමියන්ට ඉඩ දිය යුතු ය.

7. තමන්ට සැකයක් ඇති වූ ඕනෑම වේලාවක බුදුරදුන් බැහැදකින්නට අනඳ හිමියන්ට අවස්ථාව තිබිය යුතු ය.

8. අනඳ හිමියන් නැති තැන කරන ධර්ම දේශනා අනඳ හිමියන්ට ද දේශනා කළ යුතු ය.

බුදුරදුන් මේ ඉල්ලීම් වලට කැමති වූ පසු ආනන්ද හිමියෝ උපස්ථායක ධුරය භාර ගත් හ. එතැන් පටන් භාග්‍යවතුන් වහන්සේට උවටැන් කළ ආනන්ද හිමියෝ උණු පැන්-සිහිල් පැන් ලබාදීමෙන්, ත්‍රිවිධ දැහැටි දඬු පිරිනැමීමෙන්, සිරුර පිරිමැදීමෙන් හා මුළු රෑ තිස්සේ ම ආරක්ෂාව සැලසීමෙන් තම යුතුකම් ඉටු කළ හ. රෑ මුළුල්ලෙහි ගිනි හුළක් හා සැරයටියක් ද සූදානම් කර ගෙන තමන් කැඳවන ඕනෑම විටක ගන්ධකුටියට පැමිණීමට සූදානමින් සිටින අනඳ හිමියෝ රැයකට නව වරක් ගන්ධ කුටිය වටා පරීක්ෂාවෙන් ඇවිද්ද හ. ගන්ධකුටිය අතුපතු ගා පිරිසිදු කළේ ද උන්වහන්සේ ම ය. සම්බුද්ධ පරිනිර්වාණය තෙක් ම අනඳ හිමියෝ මේ වතාවත් නො පිරිහෙලා ඉටු කළ හ.

එතකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේ ගේ ජීවිත කාලය තුළ රහත් වන්නට උන් වහන්සේ අසමත් වූ හ. බුද්ධ පරිනිර්වාණයෙන් සති කිහිපයකට පසු ප්‍රථම සංගායනා වේ මුල් ම දින උන්වහන්සේ රහත් බව ලද හ.

විවරණාත්මක අනුවාදය (55 ගාථාව)

චන්දනං තගරං වා උප්පලං අපි අථ වස්සිකී එතෙසං
ගන්ධජාතානං සීලගන්ධො අනුත්තරො

චන්දනං: සඳුන්; **තගරං**: තුවරලා; **වා**: හෝ; **උප්පලං**: උපුල්; **අපි**: වුවද; **අථ**: එමෙන් ම; **වස්සිකී**: පිච්ච මල් ද; **එතෙසං**: යන මේ; **ගන්ධජාතානං**: සුවඳ ජාතීන්ට වඩා; **සීලගන්ධො**: සිල් සුවඳ; **අනුත්තරො**: උදාරය.

සඳුන්, සැවැන්දරා, උපුල් සමන් පිච්ච වැනි කවර සුවඳක් වුව ද පරදවන උත්තම වූ සුවඳ සිල් සුවඳයි.



තුවරලා සඳුන් ආදී සුවඳ ඉතා සුලුය. සිල්වතුන්ගේ සිල් සුවඳ දෙව්ලොව දක්වාම පැතිරේ.

56. අප්පමත්තො අයං ගන්ධො
යායං තගර චන්දනී
යො ච සීලවතං ගන්ධො
වාති දෙවෙසු උත්තමො (4:13)

සඳුන් තුවරලා සුවඳයි
එහෙත් ඉතා සුළු පමණයි
දෙව් ලෝකයටත් දැනෙන්නේ
සිල් වතුන් ගෙ සිල් සුවඳයි.

පැතිරෙයි සිල් සුවඳ දෙව්ලොව දක්වා ම.

4 (10) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ (56 ගාථාව)

රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් භාග්‍යවතුන් වහන්සේ **මහා කාශ්‍යප මහ තෙරුන්** ඇරබ මේ ගාථාව දේශනා කර වදාළ හ.

දිනක් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ සත් දිනක් සමවත් සුවයෙන් වැඩ ඉන් නැඟී රජගහ නුවර ගෙපිළිවෙළින් පිඬුසිඟා යන්නට සැරසුණු සේක. එකෙණෙහි සක් දෙව්ඳුන් ගේ අප්සරාවෝ පන් සියයක් දෙනා පිඬු පන්සියයක් පිළියෙළ කරගෙන මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට පිරිනමන්නට සූදානම් කළ හ. ඒ ද රැගෙන මඟ රැක සිටි ඔවුහු තෙරුන් අමතා "ස්වාමීනි, අපට අනුකම්පා කර අපගේ දාන වස්තුව පිළිගත මැනව" යි ආරාධනය කළ හ. එහෙත් මහා කාශ්‍යප ස්වාමීන් වහන්සේ "ඉවත්ට යන්න. මම දුගී දුප්පතුන්ට අනුග්‍රහ කරන්නෙමි" යි පැවසූ හ. එයින් මුකුලිත වූ ඔවුහු දුක්මුසුව ගොස් සක් දෙව්රදුන්ට එපවත් කියා පෑහ.

"ඔබ පිළිවෙළ වරදවා ගෙන ඇත. දන් දෙන හැටි මගෙන් ඉගෙන ගන්න" යි පැවසූ හෙතෙම ඉතා වයස්ගත දුගී අසරණයකු ගේ වෙස් ගෙන සුජාතා නම් දිව්‍ය අප්සරාවක් ද මහළු අසරණ ස්ත්‍රියක් සේ වෙස් ගන්නවා ගෙන අවුත් රෙදි වියන්නන් ගේ වීදියෙහි පැලක් මවා ගෙන එහි සිටියේ ය. මහා කාශ්‍යප හිමියෝ ද මම දුප්පතුන්ට අනුග්‍රහ කරන්නෙමැයි එම වීදියෙහි පිඬු සිඟා හැසිරෙන්නට ගිය හ. ශක්‍රයා මවා ගත් පැල හා එහි දුගී වෙස් ගෙන සිටි සක් දෙව්ඳු දුටු තෙරණුවෝ මේ අසරණයන් ගෙන් දන් පිළිගෙන ඔවුනට අනුග්‍රහ කරමි යි සිතා එහි පිඬු සිඟා ගිය හ. සක් දෙව්ඳු ද තෙරුන් ගේ පාත්‍රය ගෙන "ස්වාමීනි, ආහාර කර්කශ ද මධුරද ආදී වශයෙන් නො සිතා අපට අනුග්‍රහ පිණිස පිළිගෙන වළඳන්නේ නම් යෙහෙකි" යි පවසමින් දන් පිළිගැන්වී ය.

හෝජනයෙහි සුවඳින් ම එය සාමාන්‍ය ආහාරයක් නොව දිව්‍යභෝජනයකැයි දැනගත් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ දිවැසින් බලා මේ නම් ශක්‍රයා යි දැන හැඳින "ඔබ විසින් කරන ලද්දේ බලවත් පාපයකි. දුප්පතෙකුට මහත් ඵල වන්නට තිබුණු දානයක් ඔබ විසින් පැහැර ගෙන ඇත්තේ ය." යි නිග්‍රහ කළ හ. "ස්වාමීනි, මා පමණ දුප්පතෙක් තවත් සිටී දැ" යි හේ බැගෑපත්ව පැවසී ය. "දෙව්ලොවට අධිපතිව සුර සැප විඳින තොප දුප්පත් වූයේ කෙසේ ද?" යි මහ තෙරුන් ප්‍රශ්න කළ විට ශක්‍ර දේවේන්ද්‍ර තෙම මෙසේ පැවසී ය.

"ස්වාමීනි, ඒ මෙසේ ය. භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වීමට පෙර මම කුසල් කොට මෙහි උපන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ පසු පින් කොට මට වඩා පුණ්‍යර්ධි ඇතිව දිව්‍ය පුත්‍රයෝ තුන් දෙනෙක් මෙහි පහළ වූ හ. ඔවුන් ගේ දීප්තිය මට වඩා වැඩි ය. අපි විනෝදගමනක් යමු යි ඔවුන් තම විමාන වලින් මගට බට විට ඔවුන් ගේ තේජසින් මගේ තේජස යට යන හෙයින් මම නිවෙසට වදිමි. මා ගේ තේජසින් ඔවුන් ගේ තේජස යටපත් වන්නේ නැත. එහෙයින් දැන් මා තරම් අසරණ වූ දුප්පතෙක් තවත් නැත" ඒ ඇසූ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ "කෙසේ වුවත් නැවත මෙවැනි ක්‍රියා කොට මා රවටා දන් දෙන්නට නො පෙළඹෙන්නැ"යි අවවාද කළ හ. "ස්වාමීනි, මා දැන් දුන් දනින් පිනක් සිදු නොවීදැ"යි හෙතෙම විමසී ය. "පින් සිදුවිය"යි තෙරුන් වදාළ කල් හි "කුසල් දහම් කිරීමට මම බැඳී සිටිමි, ස්වාමීනි," යි පැවසූ සක්දෙව් තෙම තෙරුන්ට වැඳ නමස්කාර කර පිටත් විය.

ශක්‍ර දේවේන්ද්‍රයා සතුටෙන් උදන් අනමින් ගිය අයුරු දුටු භාග්‍යවතුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට ඒ බව හෙළි කොට මේ ගාථාව ද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (56 ගාථාව)

යො අයං තගරචන්දනී අයං ගන්ධො අප්පමත්තො
සීලවතං යො ච ගන්ධො උත්තමො දෙවෙසු වාති.

යො අයං: යම් මේ; **තගර**: සැවැන්දරා; **චන්දනී**: සඳුන් (සුවඳක් වේද); **අයං ගන්ධො**: එම සුවඳ; **අප්පමත්තො**: ඉතා ස්වල්ප ය; **සීලවතං ච**: සිල්වතුන්ගේ;
යො ගන්ධො: යම් සුවඳක් වේ නම්; **උත්තමො**: (එය) උතුම් ය; **දෙවෙසු**: දෙවියන් අතරට; **වාති**: හමයි.

තුවරලා, සඳුන් ආදියෙහි සුවඳ සිල්වතුන් ගේ සිල් සුවඳ හා සමාන කරන විට ඉතා ස්වල්ප ය. (ඒවා හමන්නේ සුළු දුරක් පමණක් හෙයිනි.) සිල්වතුන් ගේ සීල සුගන්ධය දිව්‍ය ලෝකයට පවා හමයි. (දෙව්වරුන් අතරහිත් පැතිරෙයි)

විවරණය

ගන්ධ: හෙවත් සුවඳ වර්ග අතර මිනිසුන් විසින් අග්‍රගණ්‍ය කොට සලකන ලද්දේ සඳුන්, තුවරලා (සැවැන්දරා) හා සමන් පිච්ච සුවඳ ය. මේ සුවඳ ඉතා සුළු පරිමිත අවකාශයක පමණක් පැතිරෙයි. එහෙත් සිල් සුවඳ දෙව් ලොව දක්වා පැතිරෙයි.

මනාකොට සිවුසස් දැන කෙලෙස්වලින් මිදුණු රහතුන් පිරිනිවීම් වශයෙන් වැඩි මග මරු නො දනී.

57. තෙසං සම්පන්නසීලානං	සපිරි සිල් ගුණයෙන්
අප්පමාදවිහාරිනං	යුතුව නො පමා විසුමෙන්
සම්මදඤ්ඤා විමුත්තානං	විමුත් යහ නුවණින්
මාරො මග්ගං න වින්දති (4:14)	මිදී යන්නෝ මරු ගෙ දෑසින්

රහතුන් ගිය ලෙසේ - මරුවා සොයයි කෙලෙසේ

4 (11) ගෝධික හිමියන් ගේ පුවත (57 ගාථාව)

ගෝධික හිමියන් ගේ පුවත අරමුණු කර ගනිමින් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළේ වේළුවනාරාමයේ වැඩ විසූ සමයේ ය.

ඉසිගිලි කන්ද අසල කළුගල් තලාවෙක ගෝධික තෙරණුවෝ අප්‍රමාද විහාරීව වියයී වඩමින් භාවනානුයෝගීව වැඩ විසූ හ. භාවනාවෙහි ප්‍රතිඵල වශයෙන් උන්වහන්සේට තාවකාලික ව කෙළෙස් යටපත් කිරීමෙන් ලැබෙන තාවකාලික (සාමයික) චේතෝ විමුත්තිය ලැබී තිබිණ. මේ අතරතුර උන්වහන්සේට වැළඳුණු රෝග යක් නිසා කීප වාරයක් ම ලබාගත් ධ්‍යානයෙන් පිරිහීමට භාජන වූ හ. හය වරක් ම මෙසේ වූයෙන්, සත් වන වර ධ්‍යානය උපදවා ගත් විට "සය වරක් ම මගේ ධ්‍යානය නැතිව ගියේ ය.

ධ්‍යානයෙන් පිරිහී මිය ගියහොත් කවර විදියේ මතු උපතක් ලැබේදැයි කිව නො හේ. එහෙයින් ධ්‍යානය තිබියදී ම මිය යන්නෙමි යි සිතා දැලි පිහියෙන් ගෙල කපා ගෙන මිය යමි යි ඇඳෙහි වැතුරුණ හ.

ගෝධික හිමියෝ ගෙළ සිඳගෙන මිය යන්නට සැරසෙනු දුටු මාරයා "සිය දිවි නසා ගන්නට යන්නේ ජීවිතාශාව නැති හෙයිනි. මරණයට පෙර සියළු ආශා සිඳ රහත් වන්නටත් ඇත. එය වළක්වන්නට මා යමක් කීව ද මේ හිමිනම එය නො පිළිගනු ඇත. එහෙයින් බුදුන් ලවා ම කියවා රහත් වීම වළකා ලමි" යි සිතා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ ඒ බව කියා සිටිය හ.

ගෝධික තෙරණුවෝ දැළිපිහිය ගෙන සිය ගෙල සිඳ ගන්නට සැරසෙනු භාග්‍යවතුන් වහන්සේ විසින් ද දක්නා ලදී. ගෝධික තෙරණුවෝ ගෙල කැපෙන අතර ම රහත් ඵලය ලද හ. මාරයා ඇමතූ බුදුරජාණන් වහන්සේ "මාරය, ස්ථිර වූ නුවණැත්තෝ මෙසේ ද කරති. ම පුතු ගෝධික ජීවිතාශාවෙන් තොර වී ය. හෙතෙම සියලු ආශා සිඳ දමා රහත් ඵලය ලැබ පිරිනිවුණ හ"යි වදාළ හ. මාර තෙම දසත පීරමින් ගෝධික තෙරුන් ගේ ප්‍රතිසන්ධි විඥානය සොයා වෙහෙසුණෝ ය.

බුදුහු භික්ෂූන් අමතා "මහණෙනි, මාරයා දුම් කඳක් හෝ අඳුරු කුටියක් සේ ලොව සිසාරා ගෝධික තෙරුන් ගිය තැන සෙව්ව ද ඒ සෙවිල්ල නිෂ්ඵල ය. ගෝධික තෙරුන් පිරිනිවුණෙන් කිසි තැනෙක නො පිහිටි විඤ්ඤාණය ඇතිව ය" යි පැහැදිලි කළ හ. මරුවා නැවත ද වීණාවක් ද අතැතිව ගොපලු දරුවකු වෙසින් බුදුරදුන් කරා එළඹ "ගෝධික තෙරුන් මිය ගොස් උපන්නේ කොහිදැයි මම සොයමි. ඔහු උපන්නේ කොහි ද?" යි විමසූ හ. "ඔබට තබා ඔබ වැනි ලක්ෂයක් එක් වී සෙව්ව ද ගෝධික උපන් තැනක් සොයා ගන්නට හැකි නො වෙයි" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (57 ගාථාව)

සම්පන්නසීලානං අප්පමාදවිහාරිනං සම්මදඤ්ඤා
විමුත්තානං තෙසං මග්ගං මාරො න වින්දති.

සම්පන්නසීලානං: සීලයෙන් සමන්විත වූ;
අප්පමාදවිහාරිනං: අප්‍රමාදීව වාසය කරන්නා වූ;
සම්මදඤ්ඤා විමුත්තානං: නිවැරදි නුවණ ලබා විමුක්තිය සාධනය කර ගත්තා වූ; **තෙසං**: උතුමන් ගේ; **මග්ගං**: ගිය මඟ; **මාරො**: මාරයා; **න වින්දති**: සොයා නො ගනියි.

පිරිසිදු ලෙස සිල් රැක, අප්‍රමාදීව භාවනා වඩා යථාභූත ඥාන දර්ශනය ලැබ විමුක්තිය සාධනය කර ගත් උතුමන් මිය ගිය පසු උපදින ස්ථානය සොයා ගැනීමට මාරයා සමත් නො වෙයි.

විවරණය

සම්මදඤ්ඤා විමුත්තානං: පරිපූර්ණඥානය ලැබ, ලබා ගන්නා විමුක්තිය මෙයින් අදහස් වේ. සම්මා යන්නෙන් මනාව යන අර්ථය ද අඤ්ඤා යන්නෙන් ඥානය ද ගැණෙයි. චතුරාර්‍ය්‍ය සත්‍යය මනාව අවබෝධ කර ගැනීම මෙයින් අදහස් වේ. අර්ථකථාවන්හි විමුත්තිය,

1. තදංග විමුත්ති 2. වික්ඛ මභාන විමුත්ති. 3. සමුච්ඡේද විමුත්ති. 4. පටිප්පසද්ධි විමුත්ති. හා 5. නිස්සරණ විමුත්ති වශයෙන් පස් වැදෑරුම්ව දක්වා ඇත.

අඤ්ඤා: නම් දැනුමයි. අඤ්ඤාය යන්න පූර්ව ක්‍රියා පදයකි. එහි 'ය' ලොප් වී 'අඤ්ඤා' ලෙස යෙදේ. 'දැන ගෙන' යන අර්ථය එහි වෙයි. ස්කන්ධ, ආයතන, ධාතු, දුක්ඛ, සමුදය, නිරොධ, මග්ග, අනිච්චතා යන මේ කරුණු යථාභූත වශයෙන් දැන, තීරණය කොට, තුලනය කොට විභජනය කොට ලබා ගන්නා දැනුම ඇති ව යන අර්ථයෙන් 'අඤ්ඤාය' යන්න යොදන ලදී.

මාර: බුදු සමයෙහි 1.මච්චු මාර, 2. ඛන්ධ මාර, 3. කිලෙස මාර, 4. සංඛාර මාර, 5. දේවපුත්ත මාර වශයෙන් පස් මරුන් ගැන සඳහන් වේ. මේ කථාවේ දැක්වෙන්නේ දේවපුත්තමාර ගැන ය.



මහ මගැ අසළ දැමූ කුණු කසළ ගොඩක වුව ද හටගැනෙන පියුමෙහි සුවඳ හා පැහැය සිත් කලුය.

58. යථා සඞ්කාරධානසමිං
උජ්ඣිතසමිං මහාපථෙ
පදුමං තත්‍ථ ජායෙථ
සුචිගන්‍ධං මනොරමං (4:15)

යම් සේ කුණු වලක
මහ මාවතක් අසලක
පිජේනම් පියුමක්
මනරම් සුවඳ විහිදන

සිත්කළුය පියුමන් - කුණු මඩ වළක පිපුණාත්

4 (12) ගරහදින්න ගේ කතා පුවත (58 සහ 59 ගාථා)

මේ ගාථා දෙක භාග්‍යවතුන් වහන්සේ විසින් දෙව්රම වෙසෙන සමයෙහි **ගරහදින්න** නමැත්තකු ඇරබ දේශනා කරන ලදි.

සැවැත් නුවර සිරිගුත්ත සහ ගරහදින්න නම් මිතුරෝ දෙදෙනෙක් විසූ හ. සිරිගුත්ත බෞද්ධෝපාසකයෙකු වූ අතර ගරහදින්න නිගණ්ඨ ශ්‍රාවකයෙක් වූයේ ය. "ඔබේ මිත්‍ර සිරිගුත්තට බුදුරදුන් වෙත යාමේ නිෂ්ඵල භාවය පැහැදිලි කර ඔහු අප වෙත කැඳවා ගෙන නො එන්නේ කවර හෙයින්දැයි නිගණ්ඨයෝ නිතර නිතර ගරහදින්නට බල කරති. එහෙයින් ගරහදින්න ද නිතර නිතර තම මිතුරාට "ගෞතම බුදුන් වෙත යාමෙන් ඔබට අත්වන ප්‍රයෝජනය කුමක් ද? එහි යාම නවතා අප ගේ නිගණ්ඨ භික්ෂූන් වහන්සේ වෙත යන්න. උන් වහන්සේලාට දාන මානාදියෙන් උපස්ථාන කරන්න" යි පෙරැත්ත කරන්නට විය.

ටික දිනක් මේ පෙරැත්තයන් මැදහත් සිතින් ඉවසූ සිරිගුත්ත එක් දිනක් මිතුරා ගෙන් මෙසේ ඇසී ය. "ඔබේ නිගණ්ඨ පැවිද්දන් හමු වී බණ අසන්නට හා දන් පුදන්නට ඔබ මට බල කරන්නේ ඇයි? උන් වහන්සේලා කවර දෙයක් දන්නා නිසා ද? කවර ශක්තීන් තිබෙන නිසා ද?" එයට පිළිතුරු දෙන ගරහදින්න "මිත්‍රය, ඔවුන් නො දන්නා දෙයක් නැත. අතීත, වර්තමාන, අනාගත යන තුන් කාලය ම දනිති. සෑම දෙනා ගේම සිතිවිලි, වචන හා ක්‍රියා ද දනිති. වෙන දේත්, වන්නට ඇති දේත් දනිති." යි පැවසී ය. "ඇයි ඔබ මට ඒ බව කලින්ම නො කීවේ? එබඳු බල ඇති නුවණැති උතුමන් ඇසුරු කරන්න ම අවශ්‍යයි. දැන්ම යන්න. ගොස් මා වෙනුවෙන් උන්වහන්සේලාට ආරාධනය කරන්න" යි සිරිගුත්ත පැවසී ය.

ගරහදින්න ද වහාම ගොස් නිගණ්ඨ භික්ෂූන්ට සිරිගුත්ත ගේ ආරාධනය කළේ ය. "සිරිගුත්ත එයා ම ඔබට කීවා ද මේ ආරාධනය කරන්න කියලා?"යි ඔවුහු විමසූ හ. "එසේ ය. ඔහුමයි ආරාධනය කළේ"යි ගරහදින්න පිළිතුරු දුන් විට සතුටින් ඉපිල ගිය නිගණ්ඨයෝ "සිරිගුත්ත අපේ පැත්තට ආවොත් අපට මොනවායින් ද අඩු" යි පැවසූ හ.

සිරිගුත්ත ගේ නිවස විශාල වූවකි. ලොකු ගෙවල් අතරේ වූ දිග ඉඩ ප්‍රමාණයේ ලොකු අගලක් කපා එහි අසූචි හා මඩ පුරවා, දෙකෙළවර කණු සිටුවා රැහැන් බැඳ, වළ නො පෙනෙන සේ අසුන් තබා ඒ මත ඇතිරිලි දමා සැකසී ය. ඒ මත වාඩි වූ වහාම පුටුව කැරකී හිස පහළට සිටින සේ පුටු වල පසුපස පා රැහැන්වල බැඳ තැබී ය.

ලොකු ගැල් ගෙන්වා ඒවා කඩමාලු වැනි දෙයින් පුරවා කෙසෙල් කොළ අතුරා ඒ මත යම් යම් කෑම වර්ග තබා හැලි කෑම වර්ග වලින් පිරී තිබෙන බව පෙනෙන පරිදි සැරසී ය. බැලු බැල්මට දානය පිණිස බත්, කැඳ, ගිතෙල්, හකුරු, කැවුම්, අතිරස, අග්ගලා, කොකිස්, ආස්මී, දොදොල්, කිරි පැණි ආදිය පිරී තිබුණා මෙන් විය.

උදෙන් ම දානය සඳහා කර තිබුණු සංවිධාන කටයුතු බලන්නට පැමිණි ගරහදින්න ඒ සියල්ල දැක අතිශය සතුටට පත් විය. ආහාර පාන පිරි ඇතැයි පෙන් වූ බඳුන් හිස් බව හේ නො දත්තේ ය.

ගරහදින්න පිටත්ව ගිය පසු නිගණ්ඨ ශ්‍රාවකයෝ 500 ක් දෙනා පැමිණිය හ. සිරිගුත්ත නිවසින් බැහැරට අවුත් වැඳ නමස්කාර කර මෙසේ අධිෂ්ඨාන කළේ ය. "ඔබ වහන්සේලා අතීත, වර්තමාන සහ අනාගත කාලයන් දැක ගන්නට සමත් නම්, මේ වෙන්නට යන දේ තේරුම් ගෙන මගේ නිවසට නො පැමිණ සිටින්න. ඔබ මෙහි පැමිණියා වුව ද මෙහි ඔබට දෙන්නට කිසිම අහරක් නැත. සියලු බඳුන් හිස් ය. අගල පිරී ඇත්තේ අසූචි හා මඩ වලිනි."

එසේ සිතා අනතුරුව තම සේවකයන්ට මෙසේ උපදෙස් දුන්නේ ය. "සියලු දෙනා ම වාඩිවන්නට සැරසෙන විට එක්වරම ඇතිරිල්ල ඉවත් කරන්න. නැත්නම් අපරාදේ එය කිළිටි වනු ඇත." සේවකයන් තම තම ස්ථාන ගත් පසු "ඔබ වහන්සේලා වාඩි වන විට සියලු දෙනා ම එකවර වාඩි ගන්න. මෙහි සිරිත එයයි" යි ඔවුහු නිගණ්ඨ හිමිවරුන්ට ඇරයුම් කළ හ. ඒ පරිදිම ඔවුන් අසුන් ගන්නා විට ඇතිරිල්ල ඉවත් කරන ලද අතර සියලු දෙනම එක් වර පෙරැළී ගොස් අසූචි වළේ ඇද වැටුණ හ.

විවරණාත්මක අනුවාදය (58 ගාථාව)

යථා මහාපථේ උජ්ඣිතස්මිං සඞ්කාරධානස්මිං තත්‍ථ සුචිගන්ධං මනොරමං පදුමං ජායෙථ

යථා; යම් සේ; **මහා පථේ උජ්ඣිතස්මිං**; මහ මග අසල එක් වූ; **සඞ්කාරධානස්මිං**; කුණු මඩ වළෙක; **තත්‍ථ**; එහි; **සුචිගන්ධං**; මනා සුවඳැති; **මනොරමං**; මනෝරම්‍ය; **පදුමං**; පියුමක්; **ජායෙථ**: හට ගන්නේ නම්,

මහා මාර්ගය අසල කුණු රොඩු එක්වන කසල කාණුවක වුවද මනරම් සුවඳ හමන පියුමක් හටගන්නේ වේ ද,





පුහුදුන් අතරැ උපන් සම්මා සම්බුදු සවු රහත් තෙම නුවණින් අඳ පුහුදුන් ඉක්මවා බබළයි.

59. ඒවං සඞ්කාරභූතෙසු
අන්ධභූතෙ පුථුජ්ජනෙ
අතිරොචති පඤ්ඤාය
සම්මාසම්බුද්ධසාවකො (4:16)

මෙසේ කුණු රොඩු බඳු
පුහු දුන් අඳ දනන් මැද
නුවණින් වැඩී බබළති
බුදුරදුන් ගේ සවුවෝ

බබලයි මහ රහත් - කවර තැන වැඩ සිටියත්

4 (12) ගරහදින්න ගේ කතා පුවත (58 සහ 59 ගාථා)

තම නිගණ්ඨ පැවිද්දනට සිරිගුත්ත කළ නිග්‍රහයට පලි ගන්නට ඉටා ගත් ගරහදින්න බුදුරජාණන් වහන්සේට දානයකට ආරාධනය කළේ ය. බුදුරජාණන් වහන්සේ ද රහතන් වහන්සේ පන් සියයක් සමග වැඩම කළ හ. ගරහදින්න නිවසින් පිටතට අවුත් වැඳ නමස්කාර කර එකත් පසෙක සිට දෑත් හිස් මුදුනේ තබා මෙසේ අධිෂ්ඨාන කළේ ය. "හිමියනි, අතීතය, වර්තමානය, හා අනාගතය යන ත්‍රෛකාලය ම දන්නේ නම්, දහස් ආකාරයකට සත්වයන් ගේ සිත් දැන ගත හැකි නම්, ගෙතුළට නො පැමිණෙන්නේ යහපති" එසේ සිතා "ස්වාමීනි, වඩිනු මැනවි. එක නමක් ගොස් හිඳගත් පසු අනිත් නම හිඳ ගැනීම මැනවි" යි ඇරයුම් කළේ ය. ඒ අනුව භාග්‍යවතුන් වහන්සේ මුලින් ම පිවිසුණා හ.

ගරහදින්න ආසන පණවා තිබුණේ ගිනි අඟුරු වලක් තනවා, ඒ මත කළාල අතුරා බුදුරදුන් හා ශ්‍රාවක පිරිස එහි වැටෙන පරිද්දෙනි. එහෙත් භාග්‍යවතුන් වහන්සේ කිහිරි අඟුරු වළට පා තබන විට ම කළාලය අතුරුදහන් වී පියුම් පැන නැංගේය. භාග්‍යවතුන් වහන්සේ පියුම් පිට වැඩ අසුනෙහි වැඩ සිටිය හ. සියලු ම භික්ෂූහු ද එසේ ම වැඩ හුන් හ.

ගරහදින්න ගේ සිරුරින් දහදිය නැඟිණි. ඒ ඔහු කිසිම අහරක් පිළියෙල නො කොට හුදෙක් සිරිගුත්ත කළාක් මෙන් ම හිස් බඳුන් කෑම වගී වලින් සරසා තිබුනු හෙයිනි. හේ දිව ගොස් සිරිගුත්ත ගේ ඇගේ එල්ලී මට පිහිට වන්නැයි ආයාචනා කළේ ය. "දැන් ඉතින් කුමක් කරමු ද?" යි පැවසූ හේ කෙසේ වුවත් ඒ බඳුන් හැර බලන්නැයි කීය. ගරහදින්න ඒ බඳුන් හැර බැලූ විට ඒවා අපේක්ෂිත ආහාර වලින් පිරී තිබිණ. මහත් සතුටට පත් ගරහදින්න බුද්ධප්‍රමුඛ මහා සංඝයා වළඳවා පාත්‍රය ගෙන පසෙක අසුන් ගත් විට තථාගතයන් වහන්සේ මේ ගාථා දේකින් ධර්මදේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (59 ගාථාව)

එවං සඞ්කාරභූතෙසු අන්ධභූතෙ පුථුජ්ජනෙ සම්මා සම්බුද්ධසාවකො පඤ්ඤාය අතිරොචති.

එවං; එලෙසින් ම; **සඞ්කාර භූතෙසු**; කුණු ගොඩවල් බවට පත් වූ; **අන්ධභූතෙ**; යථා තත්ත්වය නො දක්නා; **පුථුජ්ජනෙ**; පෘථග්ජනයන් අතර; **සම්මා සම්බුද්ධ සාවකො**; සම්මා සම්බුද්ධ ශ්‍රාවකයා; **පඤ්ඤාය**; ප්‍රඥාවෙන්, **අතිරොචති**; ඉහළින්ම බබලන්නේ ය.

එලෙසින් ම කසළ ගොඩක් බඳු අන්ධපෘථග්ජනයන් අතුරෙහි උපන් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවක වූ රහතුන් වහන්සේ පුහුදුන් ලෝකයා ඉක්ම ප්‍රඥාවෙන් බබලන්නේ ය.

විවරණය

පදුමං තත්ථ ජායෙථ: අපිරිසිදු තැනක වුවද පිවිතුරු යමක් හට ගැනීම ධර්ම ග්‍රන්ථ වල නිරතුරුව දැක්වෙන අදහසකි. බුදුවරු පෘථග්ජන ලෝකයෙහි ඉපිද, මඩින් හට ගෙන මඩෙහි නො ගැටෙන පියුමක් පරිද්දෙන් පිරිසිදු ව බබලති.

අතිරොචති පඤ්ඤාය: ප්‍රඥාව හේතුවෙන් වඩාත් බබලයි. බෞද්ධ ඉගැන්වීමේ හැටියට ලෝකයේ ඉතාම පහල ජනයා අතර වුව ද මෙම බැබළීමේ ශක්තිය නිලීන ව පවතියි.

උන්වහන්සේ ගේ තර්කන ශක්තිය
අප විශ්මයට පත් කරයි.

බුදුරජාණන් වහන්සේ ගේ දේශන කියවන විට
අපි උන්වහන්සේ ගේ තාර්කිකත්වයෙන් විස්මයට පත් වෙමු.
උන්වහන්සේ වදාළ සදාචාර මාර්ගයෙහි ප්‍රථමාංකය
තාර්කික ලක්ෂණයක් වූ සම්මා දිට්ඨියයි.
තමන් හා තම ඉරණම පිළිබඳව මානව වර්ගයා ගේ
දෘෂ්ටිය වටා බැඳුණු සියළු මකුළු දැල්
ඉවත් කර දීමට බුදුහිමියෝ ප්‍රයත්න දැරූ හ.

ආචාර්ය සර්වපල්ලි රාධා ක්‍රිෂ්ණාන්
'Gantama The Buddha'

5 වන පරිච්ඡේදය

බාල වග්ග



නිදිවරන්නහුට රැය ද, ගමන් විඩා ඇත්තහුට යොදුන ද, අනුවණයනට සසර ද ඉතා දික් ය.

60. දීඝා ජාගරතො රත්ති
දීඝං සන්තස්ස යොජනං
දීඝො බාලානං සංසාරො
සද්ධම්මං අවිජානතං (5:1)

දිග ය රැයක් නිදි මරතොත්
යොදුන දිගය වෙහෙස ඇතොත්
සසර දිගය අමන දනට
සද්ධර්මය නොම දනිතොත්.

දික් වෙයි සසර - නො දතොත් හසර

5 (1) එක්තරා පුද්ගලයෙකු ගේ කථා වස්තුව (60 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන අතර භාග්‍යවතුන් වහන්සේ එක්තරා පුද්ගලයෙක් හා **පසේනදි කෝසල** රජතුමන් නිමිති කර ගෙන මේ ගාථාව වදාළ සේක.

වරක් පසේනදි කොසොල් රජතුමා නගරයෙහි වීදි සංචාරයේ යන අතර නිවසක කවුළුවෙන් වීදිය දෙස බැලූ රූමත් ළඳක් දැක ඇය කෙරේ රාග සිතක් ඇති කර ගත්තේ ය. එහෙයින් ඇය හා ඇසුරට මගක් පාදා ගන්නට සිතූ රජතෙම තොරතුරු සොයා බැලී ය. ඇය විවාපත් තැනැත්තියක බව සොයා ගත් රජ ඇය ගේ සැමියාට රජවාසල රැකියාවක් දුන්නේ ය.

ටික දිනකින් ම රජතෙම ඇය ගේ සැමියාට ඉටු කිරීමට ඉතා අපහසු කාර්‍යයක් පැවරී ය. සැවැත් නුවර සිට යොදුනක් (සැතපුම් දොළහක්) පමණ දුර තැනකට ගොස් අරුණුවන් මැටි හා කුමුදු මල් රැගෙන රජතුමා ස්නානය කරන සන්ධ්‍යා සමයට පෙර සැවැත් නුවරට ආපසු එන්නට ඔහුට නියම විය. රජු ගේ අරමුණ වූයේ මේ දුෂ්කර කාර්‍යය ඉටු කරන්නට ඔහු අසමත් වූ විට හිස ගසා දමා මරා ඔහු ගේ බිරිඳ හිමිකර ගන්නට ය. වහ වහා බිරිඳ ලවා බත් මුලක් ද සකසා ගත් හේ ගමනට පිටත් විය. මග දී තවත් මගියකු සමග බත් මුල බෙදා ගෙන අනුභව කළ හෙතෙම බත් ටිකක් ඉතිරි කර ගෙන දියට දමා හඬනගා මෙසේ කී ය. "මේ ගඟ වසන ආරක්‍ෂක දේවතාවනි, නාගයනි, පසේනදි කොසොල් රජ තෙම අරුණුවන් මැටි සහ කුමුදු මල් ගෙන එන සේ මට නියෝග කළේ ය. අද මම මගේ බත් මුල තවත් මගියකු සමග බෙදා ගත්තෙමි. නදියෙහි මසුන්ට ද ආහාර දුන්නෙමි. මා අද කර ගත් පින් ඔබට අනුමෝදන් කරන්නෙමි. අනුකම්පා කර මට අද අරුණුවන් මැටි හා කුමුදු මල් ලබා දෙනු මැනවි." ඒ ඇසූ නාගයන් ගේ රජතෙම මහළු මිනිසකු ගේ වෙස් ගෙන ඔහු හමුවට අවුත් අරුණුවන් මැටි සහ කුමුදු මල් ලබා දුන්නේ ය.

සැන්දෑවන විට, තරුණ කත ගේ සැමියා කෙසේ හෝ කුමුදු හා මැටි ලබා ගෙන පැමිණිය හොත් තම අරමුණ ඉටු කර ගන්නට තවත් කල් යන හෙයින් ඔහු එන්නට පෙර ම නුවර දොරටු කල් ඇතිව වසන්නට අණ දුන්නේ ය. මල් හා මැටි ගෙන එන්නට ගිය තැනැත්තා ද නියමිත වේලාවට අවුත් දොරටු වසා තිබෙනු දැක "රජතුමා නියතයෙන් ම බොරු වරදක් ගෙන මා මරන්නට තැතක් දරයි" යි සිතා "දැන් ඉතින් කුමක් කරම් ද? නුවර වැසියන්ට මේ බව හඬගා කියමි" යි හඬ නගා මෙසේ කී ය. "නුවර වැසියනි, රජතුමා මට අරුණුවන් මැටි හා කුමුදු මල් ගෙන එන්නට අණ කළේ ය. මා නියම වේලාවට ඒ ගෙනා මුත් රජතුමා දොරටු වසා ඇති හෙයින් දී ගන්නට නො හැකි ය. මෙය නිවරද මා මරා දමන්නට රජතුමා යෙදූ උපායකි. සියල්ලෝ ම ඒ දැනගනිත් වා!" යි පවසා නිවසට නො ගොස් ජේතවනාරාමයට ගොස් එහි පසෙකට වී නිදා ගත්තේ ය.

මේ අතර තම උපාය සාර්ථක වී යැයි සතුටු වූ රජතුමා හෙට උදයෙන් ම සැමියා මරා රූමත් බිරිඳ ගෙන'වුත් සුව පහස විඳ ගනිමියි සිතමින් රාගයෙන් දැවී දැවී ඇඳෙහි පෙරැළෙමින් නිදි නැතිව රැය ගත කළේ ය. ඒ අතරතුර ලෝකුඹු නිරයෙහි පැසෙමින් කලාතුරකින් උඩට මතුවන නිරිසතුන් සිවුදෙනකුන් ගේ හඬ අසා බියට පත් හේ පසුදින මල්ලිකා දේවිය ද සමග බුදුරදුන් හමු වීම පිණිස දෙව්රම් වෙහෙරට ගියේ ය. ඒ හඬ පිළිබඳව පැහැදිලි කළ භාග්‍යවතුන් වහන්සේ ඒ පරදාර සේවනය වැනි විවිධ කාමදුෂ්චරිතයන්හි යෙදී අපාගත වූ සිවු දෙනකු වසර තිස්දහසකට වරක් උඩ මතු වී ගාථා හතරක් කියන්නට මුල් අකුරු පමණක් කී හඬ බව හෙළි කළ හ. පරදාර සේවනයෙහි ආදීනව තේරුම් ගත් රජ තෙම තමා කරන්නට ගිය කාර්‍යයෙහි බරපතල කම තේරුම් ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ ඇමතූ රජතෙම "සමිඳුනි, රැයක දිග මා තේරුම් ගත්තේ ඊයේ" යයි පැවසී ය. මේ සංවාදයට සවන් දෙමින් පසෙක සිටි තැනැත්තා "මට මේ ඉදිරිපත් වන්නට නිසි අවස්ථාව" යැයි සිතා පෙරට අවුත් "ස්වාමීනි, යොදුනක දුර මා තේරුම් ගත්තේ ද ඊයේ ය"යි තමන් ගේ කතාව ද සැල කර සිටියේ ය. ඒ සියල්ල සැලකිල්ලට ගනිමින් භාග්‍යවතුන් වහන්සේ පූර්වෝක්ත ගාථාව දේශනා කර වදාළ හ.

විවරණාත්මක අනුවාදය (60 ගාථාව)

ජාගරතො රත්ති දීඝා සන්තස්ස යොජනං දීඝං
සද්ධම්මං අවිජානතං බාලානං සංසාරො දීඝො

ජාගරතො: නිදි මරන්නාට; **රත්ති**: රාත්‍රිය; **දීඝා**: දිග ය; **සන්තස්ස**: ගමන් වෙහෙස ඇත්තාට; **යොජනං**: යොදුන; **දීඝං**: දිග ය; **සද්ධම්මං**: සද්ධර්මය; **අවිජානතං**: නො දන්නා; **බාලානං**: අනුවණයන්ට; **සංසාරො**: සංසාරය; **දීඝො**: දීර්ඝය

නිදි නො ලබන විට රැය ඉතා දිග බව දැනෙයි. ගමන් වෙහෙස දැඩි තැනැත්තාට යොදුන ඉතා දිග සේ දැනෙයි. ධර්මය නො දත් අනුවණ පුද්ගලයන්ට සංසාරය ඉතා දීර්ඝ ය.

විවරණය

සංසාරය නමින් හඳුන්වන්නේ භවයෙන් භවයට අඛණ්ඩව සිදුවන උපත්-චිපත් ක්‍රියාවලියයි. නැවත නැවත උපදින්නේ නැවත නැවත මැරෙනු පිණිස ය. එහෙයින් පුනර්භවය ආස්වාදනීය දෙයක් නොව නිම කළ යුත්තකි. "සදාකාල ජීවනය" නම් මායාවකි. ජීවිතය නම් උපතේ සිට මරණය දක්වා සිදුවන දිරායාම් ක්‍රියාවලියක් සේ දත යුත්තේ ය. එහෙයින් 'නො මැරී සිටීම' පිළිබඳ අරමුණ සාක්‍ෂාත් කරන්නේ ජීවිතය දීඝ කිරීමෙන් නොව පුනර්භවය නවතා ලීමෙනි. මෙය උච්ඡේදයක් හෝ විනාශයක් ලෙස හැඳින්විය නො හැක්කේ උච්ඡේදවීම සඳහා ස්ථිර වාස්තවික යමක් නොමැති හෙයිනි. උච්ඡේදයක් නම් 'සත්' වස්තුවක පූර්ණ විනාශයයි. බුදු සමය එබඳු ස්වාධීන, හේතු-ඵල සම්බන්ධයෙන් බැහැරව පවතින සත් පදාර්ථ නො පිළිගන්නා හෙයින් නිර්වාණය උච්ඡේදයක් ලෙස හඳුන්වනු නො ලැබේ.

නුවණැති උතුමකු ඇසුරු කිරීමට නැති නම් හුදකලාව විසීම වඩා සුදුසු ය.

61. චරං චෙ නාධිගච්ඡෙය්‍ය
සෙය්‍යං සදිසමත්තනො
එක චරියං දළ්හං කයිරා
නත්‍ථි බාලෙ සහායතා (5:2)

ඇසුරට නිසි සම මිතුරෙක්
හෝ ගැලපෙන උසස් කෙනෙක්
නො ලදොත් තනිවම වසන්න
නො කර ඇසුර අනුවණයෙක්

ඇසුරු නො කරන් - අමන මිනිසුන්

5 (2) මහා කාශ්‍යප හිමියන් ගේ ශිෂ්‍ය භික්ෂුවක් (61 ගාථාව)

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ගේ ශිෂ්‍ය භික්ෂු නමක් අරබයා භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථාව වදාරන ලද්දේ ජේතවනාරාමයේ වැඩ වාසය කළ සමයේ ය.

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පිප්ඵලි ගුහාවෙහි වැඩ වාසය කරන සමයෙහි උන් වහන්සේට ශිෂ්‍ය භික්ෂු දෙනමක් සිටිය හ. එක් නමක් තම යුතුකම් මැනවින් ඉටු කරයි. එහෙත් අනික් භික්ෂු නම තමා කිසිවක් නො කළ ද අනිත් නම කරන දෙයෙහි ගෞරවය තමන්ට ලබා ගන්නට ක්‍රියා කරයි. යහපත් ශිෂ්‍යයා මුව සෝදන දිය, දැහැටි දඬු ආදිය සූදානම් කළ විට හේ "සමිඳුනි මුව සෝදන කළමනා සූදානම්" යි දැනුම් දී ගෞරවය ලබා ගනියි. පැන් උණු කළ විට "සමිඳුනි නා ගන්න. පැන් ලැහැස්තියි" කියා දැනුම් දෙයි. වෙහෙස මහන්සිය විනීත ශිෂ්‍ය භික්ෂුවටත්, ගෞරවය අවිනීත භික්ෂුවටත් ලැබෙයි.

මෙහි කෙළවරක් නැති තැන දිනක් සුවිනීත ශිෂ්‍යයා මෙසේ සිතී ය. "දවස ගාණේම සිදුවන මේ වංචාව හෙළි කළ යුතුයි." එසේ සිතා දිනක් පැන් උණු කොට එය සඟවා තබා හිස් බඳුනකට සුළු පැන් ප්‍රමාණයක් ලිප තැබීය. බඳුනෙන් නගින දුම දුටු අවිනීත ශිෂ්‍යයා එහි උණු පැන් පිරී ඇතැයි සිතා "සමිඳුනි, නාන දිය සූදානම් යැයි දැනුම් දුන්නේ ය.

එහෙත් මහා කාශ්‍යප හිමියෝ නාන්නට සැරසී බැලූ විට දිය නො තිබුණෙන් "කෝ ආයුෂ්මතුනි වතුර?"යි විමසන ලදී. කලබල වූ ඔහු කලයක් රැගෙන වතුර ගෙනෙන්නට ලිඳට යන අතර සුවිනීත නම සැඟවූ වතුර ගෙන'වුත් දුන්නේ ය. යථා තත්ත්වය කුමක්දැයි තේරුම් ගත් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙබඳු වංචනික ක්‍රියා නො කරන්නැයි අවිනීත භික්ෂුවට අවවාද කළ හ. එහෙත් අවවාදක්ෂම නො වූ අවිනීත භික්ෂුව තෙරුන් වහන්සේ සමග වෛර බැඳ ගත් හ.

පසු දින විනීත ශිෂ්‍ය නම මහ තෙරුන් වහන්සේ සමඟ පිඬු සිඟා ගිය අතර අවිනීත හිමි නම දායක ගෙදරකට ගොස් මහ තෙරුන් ගිලන් බව දන්වා ප්‍රණීත භෝජන පිළියෙල කරවා ගෙන අතර මගදී සියල්ල අනුභව කළේය. එදින පිඬු සිඟා ගිය ගමනේ දී දායකයෝ මහා කාශ්‍යප මහරහතන් වහන්සේට සිවුරු සඳහා නව පිළියක් පිළිගැන්වූහ. එය විනීත භික්ෂු නමට දෙන ලදුව හේ ඉන් සිවුරක් කර පඬු පොවා භාවිතයට ගත්තේ ය.

දායකයන් "ඔබ වහන්සේට අප එවූ විශේෂ ආහාරයෙන් රෝගය පහසු වීදැයි විමසූ විට අවිනීත නම කළ දුෂ්කෘතය හෙළි වූයෙන් කසුප් හිමියෝ ඒ ගැන ඔහුට දොස් පැවරූ හ. ඉන් කිපුණු හෙතෙම "මේ මහලු මහණ තෙම දිය ටිකක්, ආහාර ස්වල්පයක් වෙනුවෙන් මට බැණ වදියි. නව සිවුරක් ලද විට අනෙක් ශිෂ්‍යයාට දෙයි. මම කළ යුත්ත දනිමි''යි හිමියන් පිටත යනතුරු හිඳ සියලු භාණ්ඩ විනාශ කර පන්සල් ගේ ගිනි තබා පලා ගියේ ය. මරණින් පසු ඒ අකුශල කර්මය නිසා හේ අවීචි මහා නරකාදියෙහි උපන්නේ ය.

විවරණාත්මක අනුවාදය (61 ගාථාව)

චෙ අත්තනො සෙය්‍යං සදිසං චරං න අධිගච්ඡෙය්‍ය
එකචරියං දළ්හං කයිරා බාලෙ සහායතා නත්ථි

චෙ: ඉදින්; **අත්තනො**: තමාට; **සෙය්‍යං**: උසස් හෝ; **සදිසං**: සමාන; **චරං**: මිතුරෙක් (එකට හැසිරෙන කෙනෙක්); **න අධිගච්ඡෙය්‍ය**: නො ලැබෙන්නේ නම්; **එකචරියං**: තනිව වාසය; **දළ්හං කයිරා**: දැඩි කරන්න; **බාලෙ**: අනුවණයන් සමඟ; **සහායතා**: මිත්‍රතාවක්; **නත්ථි**: නැත.

තමාට සමාන හෝ තමාට වඩා උසස් මිතුරෙකු සොයා ගන්නට බැරිනම්, තනිව වාසය කිරීම යහපත් ය. බාල ජනයා සමඟ ආශ්‍රය කිරීම කිසිසේත් නො කළ යුත්තේ ය.

විවරණය

සහායතා: මිත්‍රත්වය, එකට වැඩ කිරීම, මෙම ගාථාවේ අභිප්‍රාය වන්නේ නොමේරූ අඥානයන් සමග ආශ්‍රය නො කළ යුතු බව දක්වා කල්‍යාණ මිත්‍ර සේවනයෙහි අනුසස් දැක්වීම ය. පහත් පුද්ගලයන් ඇසුරු කිරීමෙන් තමා දෙලොවින්ම පිරිහෙන අතර කීර්තිය ද කෙලෙසෙයි.

කෙසේ වුවද බාලයකු වුවත් ගුණ යහපත්කම් උගන්වා නැඟා නුවණින් දියුණු කරවීමේ කාරුණික අපේක්ෂාවෙන් ආශ්‍රය කිරීම වරදකැයි මෙයින් නො කියැවෙන බව සටහන් කළ යුතු ය.

මට දරුවන් හා ධනය ඇත්තේ ය යි අනුවණයා දුකට පත් වුවත් තමා ද තමාට නැත්තේ ය.

62. පුත්තාම'ත්ථි ධනංම'ත්ථි
ඉති බාලො විහඤ්ඤති
අත්තා හි අත්තනො නත්ථි
කුතෝ පුත්තා කුතෝ ධනං (5:3)

මට පුතුන් ඇත, මට ධනය ඇත
සිතා අනුවණ දනෝ වෙහෙසෙත
කවර පුත්තු ද? කවර ධනය ද?
තමන් පිහිටට තමන්වත් නැත.

අවිද්‍යාවේ 'ඵලය දුක වේ'

5 (3) ආනන්ද සිටුවරයා ගේ පුවත (62 ගාථාව)

ආනන්ද නම් වූ මසුරු සිටුවරයෙකු නිමිති කොට මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් ජේතවනාරාමයෙහි දී දේශනා කරන ලදී.

සැවැත් නුවර ආනන්ද නම් ඉතා ධනවත් සිටුවරයෙක් විසී ය. ඔහුට අසූ කෙළක් ධනය තිබුණ ද කිසිවෙකුට කිසිවක් දෙන්නට හේ මැලි විය. තම පුත් මූලසිරි අමතා ඔහු නිතරම කීවේ "මේ මහා විශාල ධනයකැයි නො සිතන්න. ඔබට ඇති කිසිවක් වෙන කිසිවෙකුට නො දිය යුතු ය. ඔබ කළ යුත්තේ ධනය තව තව වැඩි කිරීමයි. නැතහොත් ඉතා ඉක්මණින් ම මේ ධනය නිම වනු ඇත. නිවසේ බිම රන් පිරැවූ මැටි බඳුන් පහක් නිදන් කර ගෙන සිටි ඔහු මිය ගියේ ඒවා තිබුණු බවක් වත් කිසිවෙකුට නො පවසමිනි.

මිය ගිය ආනන්ද සිටු වරයා සැවැත් නුවරට ආසන්නයේ එක් සිඟන පිරිසක උපන්නේ ය. ඔහු උපදින්නට පෙර මවු කුස විසූ සමයෙහි සිඟන්නනට ලැබෙන ආදායම අඩු වූයේ ය. කවුරුන් හෝ අවාසනාවන්තයකු තමන් අතර ඇතැයි සිතූ ඔවුහු, කණ්ඩායම කොටස් වලට බෙදෙමින් අවාසනාවන්තයා අයත් කණ්ඩායම තනි කරන ක්‍රමයට ඔහු ගැබ්ගත් පවුල තනි කර ගත් හ. ඔවුන් ගමෙන් පළවා හරින ලදී. ඔහු උපන්නේ කැත විකෘත දරුවකු ලෙසිනි. ඔහු ගේ කිසිම ඉන්ද්‍රියයක් පිහිටිය යුතු තැන නියම විදියට නො පිහිටියේ ය. බැලූ බැල්මට පාංශු පිශාචයකු බඳු වූ හේ ඉතා අවාසනාවන්ත විය. මව ඔහු සමඟ සිඟා ගියදාට කිසිවක් නො ලැබේ. තනිව ගිය විට යමක් ලැබෙයි.

එහෙත් මව දැඩි දුක් විඳ ඔහු තරමක් වැඩෙන තුරු පෝෂණය කර, තනිව යමක් කරගන්නට තරමට ඔහු වැඩුණු පසු ඔහු අතට කොළපතක් දුන් මව "පුත, අප මේ ව්‍යසනයට වැටුණේ නුඹ නිසා ය. දැන් ඉතින් මම ඇති තරම් දුක් විඳ හෙම්බත්ව සිටිමි. මේ කොළපතත් රැගෙන සිඟා කා ජීවත් වන්න" යි පැවසුවා ය. සැවැත් නුවර සිඟා යන අතරතුර ඔහුට හිටි හැටියේ තම පෙර ජන්මය හා ඒ ජන්මයේ නිවස සිහිපත් විය. එහෙයින් හේ එය සොයා ගියේ ය. ඔහු ගේ පෙර ජන්මයේ පුත් මූලසිරි ගේ දරුවෝ ඔහු දැක බියෙන් හඬන්නට පටන් ගත් හ. එහෙයින් ඔහුගේ සේවකයෝ ඔහු තළා පෙළා ගෙයින් බැහැරට එළවූ හ.

මේ සිද්ධිය පිඩු සිඟා වඩිනා ගමන් දුටු භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් ලවා මූලසිරි කැඳවූ හ. මේ හිඟන කොළුවා ඔබේ පෙර ජන්මයේ පියා යැයි බුදුරදුන් මූලසිරිට හෙළි කළ ද හේ එය පිළි නො ගත්තේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ හිඟන දරුවා අමතා රන් කළ පහ වළලා ඇති තැන දක්වන්නැයි ඉල්ලා සිටියේ ය. ඒ අනුව කොලුවා රන් කළ පහ පෙන්වූ පසු මූලසිරි ඒ තම පියා බව පිළි ගත්තේ. මෙයින් මහත් කම්පනයට පත් මූලසිරි බුද්ධ ශ්‍රාවකයෙක් බවට පත් විය.

විවරණාත්මක අනුවාදය (62 ගාථාව)

මෙ පුත්තා අත්ථි, මෙ ධනං අත්ථි ඉති බාලො විහඤ්ඤති. අත්තා හි අත්තනො නත්ථි පුත්තා කුතො ධනං කුතො?

මෙ: මට; **පුත්තා**: පුත්තු; **අත්ථි**: සිටිති; **මෙ**: මට; **ධනං**: ධනය; **අත්ථි**: ඇත; **ඉති**: යනුවෙන්; **බාලො**: අඥානයා; **විහඤ්ඤති**: වෙහෙසයි; **අත්තා හි**: තමා ද; **අත්තනො**: තමාට; **නත්ථි**: නැත; **පුත්තා කුතො**: පුත්තු කොහෙන්ද; **ධනං කුතො**: ධනය කොහෙන් ද?

මට දරුවෝ සිටිති, මට ධනය තිබේ, ආදි වශයෙන් සිතමින් අඥාන පුද්ගලයා වෙහෙසෙයි. එහෙත් අඩු ගණනේ තමාට තමාවත් නැත. පුත්තු හා ධනය කෙසේ ද?

විවරණය

තමාට පුත්තු, ධනය වෙතියි වෙහෙසීම පෘථග්ජන ගතියකි. එහෙත් යථාර්ථ වශයෙන් ගත් විට තමාට තමාවත් නො මැත.

පුත්තු වර්ග තුනක් වෙති. අතිජාත, අනුජාත හා අවජාත වශයෙනි. අතිජාත නම්, මවුපියන්ටත් වඩා ගුණ නැණ ඇති උතුම් දරුවෝය. අනුජාත නම් අඩුගණනේ මවුපියන් තරම් වත් ගුණ නුවණ ඇති දරුවෝය. සමහරු මේ දෙකින්ම දෙමාපියන්ට වඩා අඩු වෙති. එහෙයින් 'අඩු' යන අරුතින් ඔවුහු 'අවජාත' වෙති.

අත්තාහි අත්තනො නත්ථි: මෙහි 'අත්තා' නම් සම්මුති සත්‍යාගත 'අත්තා' ය. පරමාර්ථ වශයෙන් කථා කරන විට 'අත්තා' යි නො යෙදේ.

තමා ගේ අනුවණකම දන්නා තැනැත්තා නුවණැතියෙක් හෝ නුවණැතියෙකු සමාන හෝ වන්නේ ය.

63. යො බාලො මඤ්ඤති බාල්‍යං
පණ්ඩිතො වාපි තෙන සො
බාලො ච පණ්ඩිතමානී
ස වෙ බාලො'ති වුච්චති (5:4)

තමන් බාල බව දනිතොත්
පඬිවරයෙකි එ පමණිනුත්
බාලව පඬි බව සිතතොත්
පරම බාලයෙක් ය කියත්

දැන සත'රුත් - වන්න වියත්

5 (4) ගැට කපන්නෝ දෙදෙනෙක් (63 ගාථාව)

ගැට කපන්නන් දෙදෙනකු මුල් කරගෙන භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර දී මේ ගාථාව දේශනා කර වදාළ සේක.

සැවැත් නුවර ගැට කැපීම රැකියාව කර ගත් මිතුරෝ දෙදෙනෙක් වූ හ. දිනක් ඔවුහු ගැට කැපීම සඳහා නිතර බණ අසන්නට සෙනඟ ගැවසෙන හෙයින් ජේතවනාරාමය සුදුසු තැනක් යයි සිතා එහි ගිය හ. එක් තැනැත්තෙක් සෙනඟ අතරේ ගැවසෙමින් මුදල් ගැටයක් කපා ගන්නට මාන බැලූ අතර අනෙකා ඉබේ ම මෙන් බුදුරදුන් ගේ දේශනයට සවන් යොමන්නට පටන් ගත්තේ ය.

බණ අසන්නට පටන් ගත් තැනැත්තා උනන්දුවෙන් බණ අසා සෝවාන් ඵලය ද ලබා ගත්තේ ය. අනෙකා එක් සැදැහැවතකු ගේ මුදල් පසුම්බිය කපා ගෙන මසුරන් පහක් ලබා ගත්තේ ය.

මුදල් ලබා ගත් තැනැත්තා ගේ ගෙදර එදින භෝජන පිළියෙළ වූ අතර සෝවාන් වූ තැනැත්තා ගේ නිවසේ කෑමට යමක් නො වීය. මේ බව දැනගත් ගැට කැපූ තැනැත්තා හා ඔහු ගේ බිරිඳ "පණ්ඩිතකම් කරන්නට ගොස් අද නුඹලාට බඩගින්නේ ඉන්නට සිදුවුණා නො වේද?" යි ඔවුන් වෙහෙසූ හ. එහෙත් සෝවාන් වූ තැනැත්තා ගේ පවුලේ අය "මේ අඥාන තැනැත්තා තම අඥාන භාවය නිසාම ඒ බව නො දැන තමන් පණ්ඩිතයකු කොට සිතයි" යි සිතා භාග්‍යවතුන් වහන්සේ බැහැ දක්නට ගොස් සම්පූර්ණ සිද්ධිය කියා පෑහ. භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළේ ඒ නිමිත්තෙනි.

විවරණාත්මක අනුවාදය (63 ගාථාව)

යො බාලො බාල්‍යං මඤ්ඤති තෙන අපි වා සො පණ්ඩිතො පණ්ඩිතමානි බාලො ච සො වෙ බාලො ඉති වුච්චති.

යො: යම්කිසි; **බාලො**: බාලයෙක්; **බාල්‍යං**: (තම) බාල කම; **මඤ්ඤති**: දනියි ද; **තෙන අපි වා**: එපමණකින් වුව ද; **සො**: හෙතෙම; **පණ්ඩිතො**: පණ්ඩිතයෙක් වෙයි; **පණ්ඩිතමානි**: පණ්ඩිතයෙක් යැයි සිතට ගත්; **බාලො ච**: මෝඩයෙක් වේ නම්; **සො**: හෙතෙම; **වෙ**: ඒකාන්තයෙන් ම; **බාලො ඉති**: මෝඩයෙක් යැයි; **වුච්චති**: කියනු ලැබේ.

යම්කිසි අඥාන පුද්ගලයෙක් අඩු ගණනේ තමන් අඥාන බව තේරුම් ගනියි ද එපමණකිනුත් හේ පණ්ඩිතයෙක් වෙයි. එහෙත් තමන් අඥාන බව නො දන්නා, ඒ බව නො පිළිගන්නා තැනැත්තා ඒකාන්තයෙන් ම මෝඩයෙකැයි කියනු ලැබේ.

විවරණය

බාලො: යන්නෙන් බෞද්ධ ධර්ම සාහිත්‍යයෙහි හඳුන්වන්නේ නුවණින් බාල තැනැත්තා ය. විශේෂයෙන් ම අඥානකම හේතුවෙන් ත්‍රිවිධ දුශ්චරිතයෙහි යෙදෙන්නා බාලයෙකි. මෙය මෝහයෙහි හෙවත් අවිද්‍යාවෙහි ප්‍රතිඵලයකි. බාලයා තමා මෝහයෙන් වැසුණු නුවණ ඇති හෙයින් යථාර්ථය නො දකියි. සියල්ල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව නො දැන මමය, මාගේ යැයි දෘෂ්ටි ගනියි. චතුරාර්‍ය සත්‍යය අවබෝධය කර නො ගනියි.

මෝහය හෙවත් බාලකම දුරුවන්නේ අවිද්‍යාව හෙවත් චතුරාර්‍ය සත්‍යය නො දැනීම දුරු කිරීමෙනි. පටිච්ච සමුප්පාදයෙහි මූලාංගය ලෙස දක්වා ඇත්තේ අවිජ්ජාව ය. එසේ දක්වන්නේ අවිද්‍යාව ලෝකයෙහි ආදි හේතුව නිසාවත්, අවිද්‍යාවට පෙර කිසිවක් ලොව නො තිබිණි යන අරුතින් වත් නො වේ. අවිද්‍යාව ද ප්‍රතීතය සමුත්පන්න ය. "ආසව සමුදය නිසා අවිජ්ජා සමුදය වේ" යි දක්වන්නේ එහෙයිනි.

අවිද්‍යාව සූක්ෂ්ම වශයෙන් හෝ අර්හත් ඵලය ලබන තෙක් පවතියි. එහෙයින් එය දස සංයෝජන අතර දසවැන්න වශයෙන් දැක්වෙයි. අකුශල මූලත්‍රයෙන් වුව ද රාගය හා ද්වේෂය සියුම් ලෙස අවිද්‍යාව පදනම් කර ගෙන පවත්නා හෙයින් වඩාත්ම ප්‍රබල අකුශල මූල සේ මෝහය හඳුනාගත යුතු ය. මනුෂ්‍ය චර්යාව පසුපස පවත්නා අභිප්‍රේරණ වශයෙන් දැක්විය හැකි ආසවයන් අතර අවිද්‍යාව ද එකකි. අප සංසාරයෙහි බැඳ දමනු ලබන්නේ අවිජ්ජා නීවරණ හේතුවෙනැයි භාග්‍යවතුන් වහන්සේ වදාරා ඇත. එය බිඳ දැමූ විට සංසාර චක්‍රය හෙවත් හේතුඵල චක්‍රය බිඳ දමා බුදුවරයෙක් හෝ රහතන් වහන්සේ නමක් විය හැක.

අවිද්‍යාව දුරු කර ගන්නට නම් තමන් වෙත අවිද්‍යාව ඇති බව පිළිගත යුතු ය. අවිද්‍යාවෙන් පිරීතිරී සිටිද්දීම තමන් ප්‍රඥාවෙන් පිරීතිරී සිටිතැයි වරදවා ගතහොත් ප්‍රගතියක් නම් අපේක්ෂා කළ නො හේ. බාල බව දැනුම් මතින් ම වුව ද පණ්ඩිත නාමයට යෝග්‍ය වෙතියි මේ ගාථාවෙහි දැක් වූයේ එහෙයිනි.

අනුවණයා දිවි ඇති තෙක් පණ්ඩිතයෙකු ඇසුරු කළත් දහමක් (මනාව) දැන නො ගනී.

64. යාවජීවම්පි චෙ බාලො
පණ්ඩිතං පයිරුපාසති
න සො ධම්මං විජානාති
දබ්බී සූපරසං යථා (5:5)

දිවි ඇති තෙක් වුවත් අමන
දනෝ කළත් පඬි සේවන
නො විඳිති දහමේ රස ගුණ
හැන්දක් මෙන් රස නො දන්න.

මහ උගතුන් ඇසුරු කළත් - අනුවණයෝ එල නොලබත්

5 (5) උදයි හිමියන් ගේ ප්‍රවෘත්තිය (64 ගාථාව)

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් **උදයි** නම් එක්තරා පුහු මානයෙන් පිරි භික්ෂුනමක් මුල් කර මේ ගාථාව දේශනා කළ සේක.

උදයි හිමි ධර්මය පිළිබඳ ගැඹුරු අවබෝධයක් නො ලත් සාමාන්‍ය භික්ෂු නමක් විය. දිනක් ධර්ම ශාලාවෙන් මහ තෙරවරුන් නික්ම ගිය පසු එහි ගිය උදයි තෙරණුවෝ ධර්මාසනයෙහි වාඩි වී සිටිය හ. ඒ අවස්ථාවෙහි පිට පළාතක සිට පැමිණි ආගන්තුක භික්ෂු පිරිසක් උදයි හිමි ධර්මාසනයෙහි වැඩ සිටිනු දැක උගත් ධර්මධර හිමි නමක් වන්නට ඇතැයි එහි ගොස් ස්කන්ධ පිළිබඳව ප්‍රශ්නයක් ඇසූ හ. තමන් ගැඹුරු දහම් නො දත් හෙයින් උදයි තෙරණුවෝ ඊට පිළිතුරු දීගන්නට සමත් නො වූ හ. එවිට ආගන්තුකව පැමිණි සිටි හිමිවරු "බුදුරදුන් වැඩ වෙසෙන ආරාමයේ ම වාසය කරමිනුත් ස්කන්ධ, ධාතු, ආයතන වැනි මූලික කරුණු ගැනවත් මේ භික්ෂුවට බින්දු මාත්‍ර අවබෝධයක් නැත. කවුද මේ අඥාන හිස් භික්ෂුව?"යි අවමන් කළ හ. එසේ නින්දා කොට එයින් නො නැවතී භාග්‍යවතුන් වහන්සේට ද ඒ බව දැන් වූ හ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ හ.

විවරණාත්මක අනුවාදය (64 ගාථාව)

බාලො චෙ යාවජීවං අපි පණ්ඩිතං පයිරුපාසති සො
යථා දබ්බි සූපරසං ධම්මං න විජානාති

බාලො: අඥාන පුද්ගලයා; **චෙ**: ඉදින්; **යාවජීවං අපි**: දිවි ඇතිතාක් වුව ද; **පණ්ඩිතං**: පණ්ඩිතයකු; **පයිරුපාසති**: ඇසුරු කරන්නේ ද; **සො**: හෙතෙම; **යථා**: යම්සේ; **දබ්බි**: හැන්ද; **සූපරසං**: ව්‍යාංජනයේ රස (නොදන්නා) මෙන්; **ධම්මං**: ධර්මය; **න විජානති**: දැන නො ගනියි.

අඥාන පුද්ගලයා ජීවිතාන්තය දක්වා ම පණ්ඩිතයකු ආශ්‍රය කළත්, හැන්දකට කිසි කලෙක සූපයක රසය නො දැනෙන්නාක් මෙන් හේ ධර්මය ඉගෙන නො ගනියි.

විවරණය

දබ්බි සූපරසං යථා: යන සරල උපමාව බුදුරදුන් විසින් මෙහිදී ඉදිරිපත් කර ඇත්තේ ප්‍රබල ලෙස අරුත සිතට විදින ආකාරයෙනි. රසවත් භෝජන පිළියෙළ කිරීමේ දී හැන්ද නිරන්තරයෙන් ම උපකාර කරගනු ලැබේ. එහෙත් හැන්දෙන් සූපයන් කවර තරමට හැදිගෑම් කළ ද කිසි කලෙක සූපයේ රස හැන්දට නො දැනේ. ජීවිත කාලයක් පුරා අඥානයන් පණ්ඩිතයකු සේවනය කළ ද ඔහුට එයින් නිසි ඵල ලැබීම අපහසු විය හැකි බව මෙයින් කියැවෙයි. මෙය ඉතා ප්‍රබල හා සිත් කාවදින කියුමකි.

ධම්ම: ධම්ම යන වචනයට අරුත් රැසක් තිබේ. පොදුවේ කාගේත් සිතට නැගෙන ජනප්‍රිය අරුත නම් 'බුද්ධ දේශනාව' යන්නයි. භාග්‍යවතුන් වහන්සේ ලෝකයාට දේශනා කළේ තමන් වහන්සේ ප්‍රත්‍යක්ෂ කළ සත්‍යය යි. බුදුරදුන් පසක් කළ මේ සත්‍යය ගැන ලෝකයා දැන ගන්නේ බෞද්ධ සාහිත්‍යය තුළිනි. බුද්ධත්වයෙන් අනතුරුව විමුක්ති සුවයෙන් විවේකීව වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේට මෙබඳු අදහසක් පහළ විය. "මා විසින් අවබෝධ කරගත් මේ ධර්මය ගැඹුරුය. අවබෝධ කිරීම දුෂ්කර ය. ශාන්තය, ප්‍රණීතය, නිපුණය, අතර්කාවචරය, පණ්ඩිවරුන් විසින් ම දැනගත හැකි ය. මේ සත්ත්වයෝ වූ කලී කාම වස්තූන්ටම ඇළුණා හ. කාමයෙන් ම මත් වූ හ. ආලයරත, ආලය සම්මුදිත ප්‍රජාවට මේ ධර්මය මනාව අවබෝධ කර ගැනීම අපහසු ය. සියලු සංස්කාරයන් ගේ නිරෝධය වූ, සියලු උපධීන් සංසිඳීම වූ, තෘෂ්ණා නිරෝධය වූ, නිර්වාණය අවබෝධය අපහසු ය. මෙය දේශනා කරන්නට යාම මට වෙහෙසක් පමණි." එසේ සිතූ භාග්‍යවතුන් වහන්සේට මෙයද සිතට නැගිණි.

"මා විසින් දුකසේ අවබෝධ කර ගත් නමුත් දැන් ධර්මය දේශනා කිරීම නිෂ්ඵල ය. මේ ප්‍රතිසෝතගාමී සියුම්, ගැඹුරු, අතිශය දුර්දශ ධර්මය රාගයෙන් හා ද්වේෂයෙන් පිරුණාවුනට අවබෝධ කර ගැන්ම පහසු නො වේ. මෝහාන්ධකාරයේ ගිලුණු රාගයෙන් රත් වූ ජනයා ධර්මය නො දකිති." මෙසේ සිතත් ම ධර්ම දේශනා කෙරෙහි උන්වහන්සේ ගේ සිත උදාසීන විය. බුදුරදුන් ගේ සිතිවිලි වටහා ගත් සහම්පති බ්‍රහ්මයා දහම් අසන්නට නො ලැබීමෙන් ලොව වැනසෙතැයි බියෙන් උන්වහන්සේ හමුවට පැමිණ මෙසේ ආරාධනය කළේ ය. "ස්වාමීනි, බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරන සේක්වා. ඇසෙහි දූවිලි අඩු මිනිස්සු වෙසෙති. ධර්මය අසන්නට නො ලැබීමෙන් ඔවුනට මහත් අලාභයක් වෙයි. ධර්මය අවබෝධ කර ගන්නට සමත් අය වෙති." වැඩි දුරටත් හේ මෙසේ ද පැවසී ය. "කලින් මගධයෙහි පිරිසිදු නො වූ පුද්ගලයන් විසින් පළ කළ අපිරිසිදු දහම් පහළ විය. අමෘතයෙහි දොරටුව විවෘත කළ මැනවි. නික්ලේශී ඔබ වහන්සේ විසින් අවබෝධ කළ ධර්මය ඔවුන්ට අසන්නට සැලැස්සුව මැනවි. පර්වතයක මුදුනේ සිට පහල සිටින්නවුන් දෙස බලන්නකු මෙන් ශෝක රහිත ඔබ වහන්සේ ද ධර්ම ප්‍රාසාදය මත නැගී ජාති ජරා මරණයෙන් පීඩිත ශෝකී ප්‍රජාව දෙස බලනු මැනවි. වීරයාණන් වහන්ස, නැගී සිටිනු මැනවි. සටන දිනූ සාර්ථවාහකය, ණය නැති උතුමාණන් වහන්ස, ලොවෙහි හැසිරෙනු මැනවි. භාග්‍යවතුන් වහන්ස, ධර්මය දේශනා කරන සේක්වා, ධර්මය අවබෝධ කර ගන්නට සමත් අය සිටිති"

බ්‍රහ්මයා එසේ පැවසූ විට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ. "බ්‍රහ්මය, මට මේ සිතුවිල්ල උපන්නේ ය. ම විසින් දුක සේ අවබෝධ කර ගත් මේ ධර්මය රාගයෙන් හා ද්වේෂයෙන් පිරුණාවුනට අවබෝධ කර ගැනීම පහසු නැත. මෝහාන්ධකාරයෙහි ගිලුණු රාගයෙන් රත් වූ ජනයා මේ ප්‍රතිසෝතගාමී, ගැඹුරු, දුර්දශ සියුම් ධර්මය නො දකිති. මා මෙසේ සිතත් ම ධර්මය නො දෙසීම කෙරේ මා සිත නැමුණේ ය." සහම්පතී බ්‍රහ්ම තෙම දෙවන වරට ද ධර්මය දේශනා කරන්නැයි බුදුරදුන්ට ආයාචනය කර සිටියේ ය. බුදුහු නැවත ද ඒ පිළිතුර ම දුන් හ. බ්‍රහ්මයා තුන්වන වරට ද ආයාචනය කළ විට තථාගතයන් වහන්සේ ලෝකානුකම්පාවෙන් සිය බුදු නුවණ මෙහෙයවා ලොව බැලූ සේක. එසේ ලොව බලත් ම ඇසෙහි දූවිලි අඩු හා වැඩි, නුවණ සියුම් හා නුවණ මඳ සුසිරිත් ඇති හා දුසිරිත් ඇති, ශික්ෂණයට පහසු හා ශික්ෂණයට අපහසු අය මෙන් ම පරලොවට හා වරදට බය සුළු පිරිසකුත් දුටු සේක. නිල්, රතු, සුදු පියුම් පිපෙන පොකුණක දියෙහි ජනිතව දියෙහි වැඩී දිය යට ම පවතින පියුම්, දියෙහි ජනිතව දියෙහි වැඩී දිය මට්ටමට ආ පියුම් හා දියෙහි ජනිතව දියෙහි වැඩී දියෙන් ඉහළට නැගී දියෙහි නො ගැටී පවතින පියුම් වශයෙන් විවිධ පියුම් පවතියි. එමෙන් ම සිය බුදු ඇසින් ලොව බලන සර්වඥයන් වහන්සේට ඇසෙහි දූවිලි අඩු හා වැඩි තියුණු බුද්ධියෙන් යුතු හා බුද්ධි මට්ටමෙන් හීන, යහපත් චරිත ඇති හා පහත් චරිත ඇති, ශික්ෂණයට පහසු හා ශික්ෂණයට අපහසු අය ද එමෙන් ම පරලෝකයට හා වැරදි කිරීමට යන දෙකට බය ඇති සුළු පිරිසක් ද සිටින බව පෙනී ගියේ ය. ඉක්බිති උන්වහන්සේ සහම්පති බ්‍රහ්මයා අමතා මෙසේ වදාළ හ.

"ඔවුනට අමෘතයෙහි දොර විවර කරන ලදී. කන් ඇත්තෝ ශ්‍රද්ධාව පෙරදැරි කරත්වා! බ්‍රහ්මය, වෙහෙස නිෂ්ඵල වෙති යි. මම දෙව් මිනිසුනට මෙම සද්ධර්මය දේශනා නො කර සිටියෙමි." ධර්මයෙහි උදාව සිදු වූයේ මෙසේ ය.



නුවණැත්තා මොහොතකුදු පණ්ඩිතයෙකු සෙවුණේ වේද දහම වහා දැනගන්නේ ය.

65. මුහුත්තමපි චෙ විඤ්ඤූ
පණ්ඩිතං පයිරුපාසති
ඛිප්පං ධම්මං විජානාති
ජිව්හා සූපරසං යථා (5:6)

මොහොතක් හෝ නුවණැත්තෙක්
කළ හොත් පඬිවර ඇසුරක්
සැණකින් දැන ගනියි දහම
සූප රසය ලෙස දිව'ගින්

උගනිමු සදහම් - ඇසුරෙන් වියතුන්

5 (6) පාඨෙය්‍යක තිස් නම ගේ කතාව (65 වන ගාථාව)

පාඨෙය්‍යක භික්ෂූන් තිස් නම ඇරබ මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ ජේතවනාරාමයේ වැඩ විසූ සමයේ ය.

පාඨෙය්‍යක ප්‍රදේශයේ තරුණයෝ තිස් දෙනෙක් වරක් විනෝද චාරිකාවක් සඳහා වනාන්තරයකට ගිය හ. එයින් විසිනම දෙනෙක් තම භාර්යාවන් ද සමග පැමිණ සිටියහ. අවිවාහක තැනැත්තා වෙසඟනක් කැඳවා ගෙන පැමිණ තිබිණ. ඔවුන් කා බී විනෝදයෙන් හැසිරෙත් දී කාගේත් අවධානය ඉවත යොමු වූ මොහොතක් බලා වෙසඟන ඔවුන් ගේ වටිනා ආභරණ ආදිය සොරා ගෙන පලා ගියා ය.

වනය පීරමින් වෙසඟන සොයා යන ඔවුනට තුරු මුලක බවුන් වඩමින් සිටි බුදුරදුන් දක්නට ලැබිණ. උන්වහන්සේ වෙත පැමිණි ඔවුහු "සමිඳුනි, මේ දෙසට කාන්තාවක් යනු දුටු සේක් ද?" යි ප්‍රශ්න කළ හ. "කාන්තාවක් සොයා යනවාට වඩා තමන් සොයා ගත්තොත් නරක ද?" යි බුදුහු ප්‍රශ්න කළ හ. තමන් සොයා ගැනීම වඩා වැදගත් බව ඔවුන් පිළිගත් හෙයින් තථාගතයන් වහන්සේ ඔවුනට ධර්ම දේශනා කළ හ. දහමෙහි පහන් වූ ඔවුහු ඒහි භික්ඛු භාවයෙන් පැවිදි වූ හ.

පසු දිනෙක බුදුන් දක්නට ආ තිස් නම අනමතග්ග සූත්‍ර දේශනාව අසා රහත්ඵලය ලද හ. මේ භික්ෂු තිස් නම ඉතා ඉක්මනින් උසස් අධිගම ලත් අයුරු විස්මය ජනකයැයි භික්ෂූන් වහන්සේලා අතර කතා බහ ඇති විය. ඒ සැලවූ විට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මේ ඔවුන් ඉක්මන් ප්‍රතිඵල ලද ප්‍රථම වතාව නො වෙයි. ඉකුත් ජන්මයකත් ඔවුහු සුරා පානය කර කා බී විනෝද වෙමින් සිටියදී කුණ්ඩිල විසින් දෙසූ අවවාද අසා දුසිරිත් හැර යහගුණ වැඩූහ"යි කුණ්ඩිල ජාතකය දේශනා කර වදාළ හ. අනතුරුව උන්වහන්සේ මේ ගාථාව ද දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (65 ගාථාව)

චෙ විඤ්ඤූ මුහුත්තං අපි පණ්ඩිතං පයිරුපාසති ඛිප්පං ධම්මං විජානාති යථා ජිව්හා සූපරසං

චෙ: ඉදින්; **විඤ්ඤූ**: නුවණැත්තා; **මුහුත්තං අපි**: මොහොතක් වුව; **පණ්ඩිතං පයිරුපාසති**: පණ්ඩිතයකු සේවනය කරයි නම්; **ඛිප්පං**: ඉක්මණින් ම; **ධම්මං**: ධර්මය; **විජානාති**: අවබෝධ කර ගනියි; **යථා**: යම් සේ; **ජිව්හා**: දිව; **සූපරසං**: සූපයන්හි රසය (දැනගනී ද එපරිද්දෙන්ම ය).

නුවණැත්තාට එක් මොහොතක් පණ්ඩිතයකු ආශ්‍රය කරන්නට ලැබුණහොත්, ඉතා ඉක්මණින් ම හේ ධර්මය අවබෝධ කර ගනියි. දිව ඉතා ඉක්මණින් සූපයන් හි රසය තේරුම් ගන්නාක් මෙනි.

විවරණය

ජිව්හා සූපරසං යථා: පෙර ගාථාවෙහි දැක්වූ ආහාර රස දැන ගැනීමේ උපමාවෙහි තේමාව ම මේ ගාථාවට ද අදාළව ඇත. හැන්ද දිනපතාම සූප පිසීමේ දී හා බෙදීමේදී භාවිත කළ ද එය සූප රසය ආස්වාදනය කිරීමෙහි ලා සමත් නො වෙයි. එහෙත් දිව සංවේදී බවින් තියුණු හෙයින් සූපයක් යන්තම් දිව ගැටුණු වහාම එය එහි රසය දැන ගනියි. නැණවතා ද දිවක් වැනිය. මොහොතින් ධර්මය තේරුම් ගනියි. එහෙත් ඇතැම් අනුවණයෝ හැඳි වැනි වෙති. දිවි හිමියෙන් නැණවතුන් ඇසුරු කළ ද ඔවුහු ධර්මය තේරුම් නො ගනිති.

විඤ්ඤූ: යම් යම් දේ විශේෂයෙන් තේරුම් ගැනීමේ ස්වභාවය ඇති තැනැත්තා විඤ්ඤූ නම් වෙයි. ''**විසේසං ජානාති සීලෙනාති විඤ්ඤූ**'' යනුවෙන් අටුවාචාර්‍යවරු මෙය දක්වති. බුද්ධියෙන් උසස් (උසස් බුද්ධි ඵලයක් ඇති) තැනැත්තා ලෙස වර්තමාන අර්ථයෙන් දැක්විය හැක. මෙම සියුම් අවබෝධන ශක්තිය නැති, වහා කරුණු වටහා ගන්නට අසමත් අය බුද්ධි හීනයෝ ය.

බුද්ධිමත් පුරුෂ තෙම මොහොතක් නමුත් ප්‍රඥාව ඇති තැනැත්තෙකු සේවනය කළ හොත් උගත යුත්ත ඉගෙන, ඇසිය යුත්ත අසා, වහා ම ධර්මය ඉගෙන ගනියි. ඉන්පසු කමටහන් වඩා වෑයම් කර උසස් ආධ්‍යාත්මික සුවය ලබයි. එම අවබෝධන කෞශල්‍යයෙහි තීක්ෂ්ණත්වය 'ජිව්හා සූපරසං යථා' යන උපමාවෙන් ප්‍රබල ලෙස සටහන් වෙයි.

අනුවණයෝ පව්කම් කරමින් තමාට සතුරෙකු වැනි වූ අත් බැවින් යුතු වැ හැසිරෙත්.

66. චරන්ති බාලා දුම්මෙධා
අමිත්තෙනෙ’ව අත්තනා
කරොන්තා පාපකං කම්මං
යං හෝති කටුකප්ඵලං (5:7)

සරති අනුවණ දනෝ හැම තැන
තමන්ට ම සතුරුකම් කරමින
කරති පවුකම් නොයෙක් අයුරින
කටුක ප්‍රතිඵල ලැබෙයි නිසැකින

සතුරුය තමන්ට ම පවුකම් කරන්නා

5 (7) සුප්‍රබුද්ධ කුෂ්ඨ රෝගියා ගේ කථාව (66 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් **සුප්‍රබුද්ධ** නම් කුෂ්ට රෝගියා අරබයා මේ ගාථාව දේශනා කර වදාළ හ.

එකල රජගහනුවර සුප්‍රබුද්ධ නම් කුෂ්ඨ රෝගියෙක් වාසය කළේ ය. දිනක් හේ භාග්‍යවතුන් වහන්සේ ගෙන් දහම් අසනු කැමතිව වේළුවනාරාමයට ගියේ ය. එහෙත් තමා කුෂ්ට රෝගියකු හෙයින් අන් අයට කරදරයක් වෙතියි සිතූ හෙතෙම පිරිස් මැදට නොගොස් කෙළවරකට වී ධර්ම ශ්‍රවණය කළේ ය. මහත් ශ්‍රද්ධාවෙන් බණ ඇසූ හේ ධර්මානුශාසනාව අවසානයෙහි සෝවාන් ඵලය ලැබීය. එයින් මහත් සොම්නසට පත් ඔහුට තමා ලද අධිගමය භාග්‍යවතුන් වහන්සේට සැල කරන්නට බලවත් ආශාවක් ඇති විය. එහෙත් කුෂ්ට රෝගයෙන් පෙළෙන හෙයින් පිරිස මැදට යන්නට මැලි වූ හේ සියලු දෙනා පිටත්ව යන තුරු පසෙකට වී සිටියේ ය.

සියලු දෙනා බැහැරව ඉඩකඩ සැලසුණු පසු හෙතෙම ආරාමය තුළට යන්නට සූදානම් විය. ඒ මොහොතේ ඔහු පරීක්ෂා කරන්නට සිතූ ශක්‍ර දේවේන්ද්‍ර තෙම අහසෙහි සිට සුප්‍රබුද්ධ අමතා මෙසේ පැවසී ය. "සුප්‍රබුද්ධ, මේ අහන්න. ඔබ දුප්පත් ය. අසරණ ය. මම ඔබට මහත් සම්පත් දෙමි. මට ඔබ එක් කාරියක් කරන්න. 'බුදුහු බුදුහු නො වෙති. ධර්මය ධර්මය නො වේ. සංඝයා සංඝයා නො වේ' යි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්න. මට බුදුන්, ධර්මය, සංඝයා තිත්තයි කියා ඔබ ප්‍රසිද්ධියේ කිවහොත් මම අසීමිත සම්පත් ලබා දෙමි" ඒ ඇසූ සුප්‍රබුද්ධ "මට මේ යෝජනා කරන ඔබ කවුද?" යි විමසී ය.

ශක්‍රයා ද "මම ශක්‍ර දේවේන්ද්‍ර වෙමි" යි පැවසී ය. සුප්‍රබුද්ධ ඒ අසා "ඔබ නම් ලජ්ජා නැති කෙනෙකි. මට කතා කරන්නට ඔබ සුදුස්සෙක් නො වේ. මා දිළින්දෙක් අසරණයෙක් කොට ඔබ කතා කරයි. මම දිළිඳු අසරණයෙක් නො වෙමි. මම සෝතාපන්න උපාසකයෙක් වෙමි. මා සතුව සප්තාර්‍ය ධනය තිබේ. එබඳු ධනයක් ඇත්තෙකුට බුද්ධාදී උත්තමයෝ දරිද්‍ර යැයි නො කියති.

මට මෙවැනි පහත් යෝජනා නො කරව" යි ශක්‍රයාට නිග්‍රහ කළේ ය. ඒ අසා සිටි ශක්‍රයා භාග්‍යවතුන් වහන්සේ හමු වීමට ගොස් පූර්ණ සංවාදය ම උන්වහන්සේට සැලකර සිටියේ ය. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "එක් ශක්‍රයකුට තබා ශක්‍රයන් දහසකටවත් සුප්‍රබුද්ධ ලවා එවැන්නක් කියවා ගත නො හැක. මොනම සම්පතක් ලදුවත් බුදුහු බුදුහු නො වෙති, ධර්මය ධර්මය නො වේ, සංඝයා සංඝයා නො වේ, මට බුදුන්, ධර්මය හා සංඝයා තිත්තය යි ඔහු ගේ මුවින් නො කියැවෙනු ඇත." යි
වදාළ හ.

සුප්‍රබුද්ධ භාග්‍යවතුන් වහන්සේ දකින්නට ගොස් වැඳ නමස්කාර කොට සියල්ල දන්වා සිටියේ ය. එසේ දන්වා ඔහු පිටත්ව ගොස් වැඩිදුර යන්නට නො ලැබිණ. තරුණ ගවදෙනක විසින් ඇනිනු ලැබ හේ මිය ගියේ ය. එය පැරණි කර්මයක් විපාක දීමක් වූයේ ය.

විවරණාත්මක අනුවාදය (66 ගාථාව)

බාලා දුම්මේධා යං කටුකප්ඵලං හොති (තං) පාපකං
කම්මං කරොන්තා අත්තනා අමිත්තෙන ඉව චරන්ති

බාලා: නො මේරූ නුවණැති; **දුම්මේධා**: අඥාන ජනයෝ; **යං කටුකප්ඵලං හොති**: යමක් කටුක විපාකදායක නම් එබඳු; **පාපකං කම්මං**: පාප ක්‍රියා; **කරොන්තා**: කරමින්; **අත්තනා**: තමා ගේ; **අමිත්තෙන ඉව**: සතුරකු මෙන්; **චරන්ති**: හැසිරෙ ති.

නුවණ මඳ බාලයෝ කටුක විපාකදායක පාප කර්ම කරමින් තමා තමාගේම සතුරන් බවට පත්ව ජීවත් වෙති.

විවරණය

බාලා දුම්මේධා: නුවණ මඳ බාල ජනයා. බාල හා දුම්මේධ යන වචන දෙකේ ම අරුත සමාන ය. මේධා යන්න කඳු මුදුනකට වන් හෙණ පහරක් මෙන් ලෝභ ද්වේෂා දී වූ සියලු කෙලෙස් වනසන බව හඟවයි. එම මේධා හෙවත් විචක්ෂණ ඥානය නැති අය දුම්මේධා ලෙස හැඳින්වේ.



කඳුලු පිරුණු මුහුණු ඇතිව දුක් විඳී. පසුතැවිලි වීමට සිදුවන පව්කම් නො කිරීම යහපති.

67. න තං කම්මං කතං සාධු
යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛො රොදං
විපාකං පටිසෙවති (5:8)

කර තැවෙන්නට වන යමක්
එය නො කළ යුතු පව් කමක්
කඳුළු වැකි මුහුණින් විපාකය
විඳින්නට සිදුවන දෙයක්

දුක් දෙයි නම් - හළ යුතු කම්

5 (8) ගොවියකු ගැන පුවතක්. (67 වන ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ එක්තරා **ගොවියකුට** සිදු වූ විපතක් ඇරබ මේ ගාථාව දේශනා කළ සේක.

සැවැත් නුවර සමීපයෙහි ගොවියෙක් කුඹුරක් සාමින් සිටියේ ය. කලින් දින රැයෙහි ධනවතකු ගේ ගෙයක් බිඳි සොරුන් ඒ කුඹුර අසලින් යමින් සිටිය දී මුදල් පොදියක් එක් සොරකු විසින් අන් අයට හොරෙන් සඟවා ගෙන යද්දී ඇඳුම් අතුරින් ලිස්සා ගොස් බිම වැටී තිබිණි.

පසුදින හිමිදිරියේ ම ගොවියා පැමිණ වැඩ පටන් ගත් අතර භාග්‍යවතුන් වහන්සේ ද ඒ අසලින් ගමන් කරමින් සිටිය හ. උන්වහන්සේ ගේ නෙතට බිම වැටී තිබුණු මුදල් පොදිය ලක්විණි. අනඳ හිමියෝ ද භාග්‍යවතුන් වහන්සේ සමඟ සිටිය හ. භාග්‍යවතුන් වහන්සේ කුඹුර අසලින් වැඩම කරනු දුටු ගොවියා වහාම අවුත් බුදුරජාණන් වහන්සේට වැඳ නමස්කාර කළේ ය.

ඔහු මේ මුදල් පොදිය නිසා අමාරුවේ වැටෙන්නට යන බවත් තමන් වහන්සේට ඔහුට පිහිට වීමේ හැකියාව ඇති බවත් උදෑසනම මහා කරුණාවෙන් දුටු උන්වහන්සේ මෙහි වැඩම කළේ ද ඔහුට පිහිට වීම සඳහා ය. එහෙයින් ගොවියාට යමක් නො කියා ඔහුට ඇසෙන පරිදි උන්වහන්සේ ආනන්ද හිමියන් අමතා "විසකුරු සර්පයා දැක්කා ද, ආනන්ද?" යි පැවසූ හ. අනඳ හිමියෝ ද මුදල් පසුම්බිය දෙස බලා "එහෙමයි ස්වාමීනි. බොහොම භයානක සර්පයෙක්" යි පැවසූ හ.

බුදු සමිඳුන් හා අනඳ හිමියන් නික්ම ගිය පසු මම ඒ විසකුරු සර්පයා මරමි යි සිතා ගත් ගොවියා එතැනට ගියේ ය. සර්පයකු වෙනුවට ඔහු දුටුවේ මුදල් පොදියකි. කුමක් කළ යුතු දැයි සිතා ගන්නට අසමත් වූ හෙතෙම එය පස් යට සඟවා ගොස් වැඩ පටන් ගත්තේ ය.

මේ අතර ගම් වැස්සෝ ගෙය බිඳි සොරුන් සොයා ඒ මේ අත යන්නෝ කුඹුර අසලට පැමිණ අලුත් පසින් වසා තිබුණු මුදල් පොදිය සොයා ගත් හ. එතැන් සිට කුඹුරට යොමුව තිබූ පා සටහන් අනුව ගොවියා රැයෙහි සොරකම් කොට දහවල් කුඹුරේ වැඩ කරතියි සිතා ඔහු අල්ලා තළා පෙළා රාජ පුරුෂයන්ට භාර කළ හ. ඔහු මහ රජතුමා වෙත පමුණුවන ලදින් මරණ දඬුවම නියම කරන ලදී.

රාජ පුරුෂයෝ ඔහු වධකස්ථානය කරා කස පහර දෙමින් ඇද ගෙන ගිය හ. හේ දිගටම "ආනන්ද, විසකුරු සර්පයා දැක්කා ද? එහෙමයි ස්වාමීනි, බොහෝම භයානක සර්පයෙක්" යන්න කියමින් ගියේ ය. දිගින් දිගට ම මොහු මේ කියවන්නේ බුදු රදුන් හා අනඳ හිමියන් අතර වූ සංවාදයක් බව තේරුම් ගත් රාජ පුරුෂයෝ "ඔබ මේ කියවන දෙයෙහි අර්ථය කුමක් ද?"යි විමසූ හ. "මා මහරජු හමුවට පැමිණ වුවහොත් කියන්නෙමි" යි ගොවියා පැවසූයෙන් රාජ පුරුෂයෝ නැවත ඔහු මහරජු හමුවට පැමිණ වූ හ. එහිදී හෙතෙම "දේවයන් වහන්ස, මම සොරෙක් නො වෙමි. එදා උදේ මා ඔය මුදල් පොදිය දුටු වේලේ භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් සමඟ එතැන සිටිය හ. උන්වහන්සේලා දෙනම අතර වූ සංවාදය නිසා ම මම එය දුටුවෙමි. ඒ සංවාදය මට හොඳින් මතක සිටියේ ය. මම එය නැවත නැවත කියමින් මරණයට පිය නැඟීමි" යි සැල කර සිටියේ ය.

"එසේ නම් නුඹ බුදුරදුන් සාක්ෂ්‍යය වශයෙන් දක්වතියි සිතමි" යි පැවසූ රජ තෙම ඔහුත් සමඟ ම භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණියේය. "මහරජ, මොහු කියන බස සැබෑ ය. මම මොහුට වන විපත දැක එහි වැඩම කළෙමි." යි කරුනු පැහැදිලි කර දුන් බුදු පියාණෝ "යමෙකු කළ යුත්තේ පසුව තැවෙන්නට සිදුවන දේ නො වේ. කඳුළු සලමින් විපාක විඳින්නට වන ක්‍රියා නො කිරීම යහපත්ය'' යි වදාරමින් මේ ගාථාව දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (67 ගාථාව)

යං කත්වා අනුතප්පති, යස්ස විපාකං අස්සුමුඛො රොදං
පටිසෙවති තං කම්මං න කතං සාධු

යං: යම් කිසි ක්‍රියාවක්; **කත්වා**: කොට; **අනුතප්පති**: පසු තැවෙන්නට සිදුවේ ද; **යස්ස**: යම් කිසි කර්මයක; **විපාකං**: විපාකය; **අස්සුමුඛො**: කඳුලු වැකි මුහුණින් යුතුව; **රොදං**: හඬමින්; **පටිසෙවති**: විඳින්නට වේද; **තං කම්මං**: ඒ ක්‍රියාව; **න කතං**: නො කළ හොත්; **සාධු**: මැනවි.

යමක් කළ පසු පසුතැවෙන්නට සිදු වේ නම්, එහි විපාකය විඳින්නට වන්නේ කඳුලු පෙරමින් හඬා වැලපෙමින් නම්, එබඳු දේ නො කර සිටීම යහපත් ය.

විවරණය

අස්සුමුඛො රෝදං: ඇසෙහි කඳුලු පුරවා ගෙන විපාක විඳින්නට වන්නේ නරක ක්‍රියාවල ය. එය කල් ඇතිව ම තේරුම් ගෙන එබඳු ක්‍රියා නො කර සිටින්නේ නම් යෙහෙකි.

අනුතප්පති: තැවෙයි, පසුතැවෙයි. ඇතැම් ක්‍රියා කළ විට මුලින් සිත් තැවුලක් ඇති නො වුව ද පසුව තමන් කළ දෙයෙහි බරපතල කම තේරුම් ගෙන තැවෙන්නට සිදු වෙයි.





සොම්නස වැඩෙන දෙයක් කිරීම සැපයට හේතුවන බැවින් එය ඉතා යහපත් වන්නේ ය.

68. තඤ්ච කම්මං කතං සාධු
යං කත්වා නානුතප්පති
යස්ස පතීතො සුමනො
විපාකං පටිසෙවති (5:9)

කළ පසුව නො තැවෙන යමක්
වෙතොත් එය කළ යුතු දෙයක්
ප්‍රීතියෙන් සතුටින් විපාකය
විඳින්නට හැකි පින්කමක්

කළොත් හොඳ දේවල් - වේය දෙලොවම යහපත්

5 (9) සුමන මාලාකාරයා ගේ කථාව (68 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරමයෙහි වැඩ විසූ සමයෙහි **සුමන** නම් වූ මල්කරුවකු ඇරබ මේ ගාථාව දේශනා කළ සේක.

සුමන විසින් දිනපතා උදෑසනින් බිම්බිසාර රජතුමාට සමන් පිච්ච මල් සැපයිය යුතුව තිබිණි. දිනක් උදෑසන මල් ද රැගෙන රජවාසලට යන අතරතුර ඔහුට භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක සංඝයා පිරිවරා බුදුරැසින් බබළමින් මහ මඟ වඩනා අසිරිය දක්නට ලැබිණ. බුදුරදුන් ගේ රූසිරි හා බුද්ධානුභාව දුටු මල්කරුට පුදන්නට වෙනත් දෙයක් නො තිබුණෙන් රජුට ගෙන යන මල් පුදන්නට සිතක් පහළ විය. රජුට මල් නැති වුවහොත් තමන්ට දරුණු දඬුවම් ලැබෙන බව දැන දැනත් පහළ වූ සැදැහැ සිත නිසා මා රටින් පළවා හැරියත්, මරා දැමුවත් මේ පූජාව කරමියි සිතා බුදුරදුන් මත මල් වැස්සක් මෙන් මල් ඉස්සේ ය.

ඔහු ඉසින ඉසින මලින් බුදුරදුන් මත මල් වියනක් සේ ද උන් වහන්සේ ගේ හාත් පසින් තිරයේ ද ප්‍රාතිහාර්යමය විලාසයෙන් මල් රැඳුණෝ ය. භාග්‍යවතුන් වහන්සේ වීදියෙහි පෙරට යත් ම මල් වියන හා මල් තිර උන්වහන්සේ සමඟම පෙරට යයි. සවනක් බුදු රැසින් වඩාත් ප්‍රභාමත් වූ මේ පුෂ්ප මණ්ඩපය දැක අත්‍යන්ත ප්‍රමෝදයට පත් වූ මල්කරු උන්වහන්සේ සමඟ සෑහෙන දුරක් ගමන් කොට සොම්නසින් ම නිවෙස බලා ගොස් බිරින්දෑට ද ඒ පුවත් සැළ කළේ ය.

ඔහු ගේ බිරිඳ දැන උගත් හෝ සැදැහැවත් කෙනෙක් නො වූවා ය. ඇය සිතුවේ ඔහු අනුවණ ක්‍රියාවක් කර ඇති බව ය. රාජ උදහස ඔහු වෙත යොමු වෙතියි සිතූ ඕ, එයින් තමන්ට ද මහත් ව්‍යසනයක් වෙතියි සිතා බියපත්ව රජතුමා හමුවට ගොස් සැමියා කළ අනුවණකමට තමා ගේ සහයෝගයක් නැති බව පවසා තමා ඔහුගෙන් වෙන්ව යන බව දැනුම් දුන්නා ය.

සෝවාන්ව සිටි සැදැහැවතකු වූ බිම්බිසාර රජතුමා එපවත් අසා තොරතුරු විමසා බලා මහත් සොම්නසට පත්ව වහාම බුදුරදුන් මාලිගයට වැඩම කරවා මහ දන් පැවැත්වී ය. ප්‍රාතිහාර්යය ගැන සැලව දහස් ගණන් ජනයා රැස්ව සිටි අතර ඔවුහු ජේතවනාරාමය දක්වා බුදුරදුනට පසු ගමන් ද කළ හ. අනතුරුව මල්කරු ගෙන්වූ රජතෙම "බුදුරදුනට මල් පූජා කරද්දී ඔබට සිතුණෝ කුමක් ද?"යි ප්‍රශ්න කළේ ය. "දේවයන් වහන්ස, මම මගේ ජීවිතය බුදුරදුනට පුද කළෙමි.

ඔබ වහන්සේ මා රටින් නෙරපන්නට හෝ වධ දී මරන්නට පිළිවන. එසේ කළේ වුව ද කම් නැතැයි සිතුවෙමි"යි මල්කරු පැවසී ය. ඒ ඇසූ බිම්බිසාර රජ තෙම "ඔබ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙකි. ඔබේ ක්‍රියාව මහා පරිත්‍යාගයකි" යි සුමන ගේ ක්‍රියාව අගය කරමින් ඔහුට ඇතුන් අටදෙනෙක්, අසුන් අටදෙනෙක්, සේවකයන් අටදෙනෙක්, සේවිකාවන් අටදෙනෙක්, අනර්ඝ මාණික්‍ය අටක්, මුදලින් කහවණු අට දහසක්, රාජකීය අන්තඃපුරයෙන් සර්වාභරණ විභූෂිත රාජ කන්‍යාවන් අට දෙනෙක් සහ සශ්‍රීක ගම්වර අටක් ද පරිත්‍යාග කළේ ය. මේ අටේ තෑගි අටක් දෙන ලද්දේ මල්කරු මල් අට මිටක් පිදූ හෙයිනි.

සන්ධ්‍යා භාගයෙහි, අනඳ මහ තෙරුහු "මුළු දවස පුරාම රජගහ නුවර සැණකෙළි සිරි ගත්තේ ය. මේ මහෝත්සවයට නිමිති වූ සුමන මල්කරුවාට අත්වන ආනිශංසය කවර විදියේ එකක්දැ"යි බුදුරජාණන් වහන්සේ ගෙන් විමසූ හ. "ආනන්ද, සුමන තම ජීවිතය මා හමුවේ පූජා කළේ ය. තම කුශල කර්මයෙහි විපාක ඔහු සොම්නසින් විඳිනු ඇත. දෙව් මිනිස් දෙගතියෙහි සැප සම්පත් විඳ කෙළවර හෙතෙම සුමන නමින් ම පසේ බුදුවරයෙක් ව අමා මහ නිවන් සුව ලබන්නේ යැ"යි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (68 ගාථාව)

යං කත්වා න අනුතප්පති යස්ස විපාකං පතිතො
සුමනො පටිසේවති තංකද්ච කම්මං කතං සාධු.

යං: යම්කිසි ක්‍රියාවක්; **කත්වා**: කොට; **න අනුතප්පති**: පසු තැවීමක් නොවන්නේ ද; **යස්ස**: යම් කර්මයක; **විපාකං**: විපාකය; **පතිතො**: ප්‍රීතිමත්ව; **සුමනො**: සොම්නසින්; **පටිසේවති**: ලබන්නේ ද; **තංකද්ච කම්මං**: එවන් වූ ක්‍රියාව; **කතං**: කිරීම; **සාධු**: මැනවි.

යම්කිසි ක්‍රියාවක් කළ පසු පසුතැවෙන්නේ නැතිව ප්‍රීතියෙන් සොම්නසින් විපාකය විඳගන්නට ලැබෙන්නේ නම්, එබඳු කර්ම කිරීම යහපත් ය.

විවරණය

පතීතො සුමනො: යන්නෙන් ප්‍රීතිය හැඟවෙයි. සිත ප්‍රීතියෙන් පිරුණු පුද්ගලයාට 'පතීතො' යි කිව හැක. 'සුමනො' නම් සොම්නස් සිත ඇති වීමයි. මේ පද දෙකින් හඟවෙන්නේ පුණ්‍ය කර්ම කරන පුද්ගලයාට එහි අනුසස් භුක්ති විඳින විට උත්කර්ෂවත් ප්‍රීති වේගයත්, සෝමනස්සයක් ඇති වන බව ය. සියළු දෙනා විසින් කළ යුත්තේ එබඳු ක්‍රියා ය.



අකුසලය යම්තාක් කල් විපාක නොදේද ඒතාක් කල් බාලයා එය මිහිරි කොට සිතන්නේ ය.

69. මධූ'ව මඤ්ඤති බාලො
යාව පාපං න පච්චති
යදා ච පච්චතී පාපං
අථ බාලො දුක්ඛං නිගච්ඡති (5:10)

පවු මෝරා යන තුරු මත්
මිහිරිය මී පැණිසේ සිතත්
මේරූ දා අඳ බල සත්
විඳිති නිරා දුක් බලවත්

කළෝතින් පාපය - අමිහිරි වෙයි විපාකය

5 (10) උප්පලවණ්ණා භික්ෂුණිය ගේ කථා වස්තුව (69 ගාථාව)

උප්පලවණ්ණා භික්ෂුණිය නිමිති කොට වදාළ මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් ජේතවනාරාමයෙහි දී දේශනා කරන ලද්දේ ය.

සැවැත් නුවර එක් ධනවත් සිටුවරයකුට ප්‍රියංකර දියණියක් වූවා ය. ඇය නිල් මානෙල් මලක් මෙන් සුන්දර වූ හෙයින් 'උප්පලවණ්ණා' යි නම් කරන ලදී. ඇය ගේ රූප සෞන්දර්‍ය්‍ය පිළිබඳ රට පුරා පැතිර ගියෙන් රජ කුමාරවරු, සිටු කුමාරවරු හා විවිධ ධනවත් ප්‍රභූ තරුණයෝ ඇය අත පතා ආහ. මෙය සිටුතුමාට මහත් ගැටළුවක් වූයෙන් දිනක් හෙතෙම සිය දියණිය සමග ඒ පිළිබඳව සාකච්ඡා කළේ ය.

"දියණියෙනි, මේ තරම් විශාල පිරිසක් ඔබේ අත පතද්දී, එක් අයකු තෝරා ගැනීම අපට මහත් ගැටලුවකි. මේ ගැටලුවෙන් කෙසේ මිදෙමු දැ"යි හේ ඇය ගෙන් පිළිතුරක් අපේක්ෂා කරමින් විමසී ය. සාකච්ඡාව අවසන පින් මෝරා ගිය කුමරියක් වූ උප්පලවණ්ණා හා ඇය ගේ පියා එකඟත්වයට ආ හ. ඔවුන් දෙදෙනාගේම තීරණය වූයේ උප්පලවණ්ණා පැවිදි ජීවිතයට ඇතුළත් විය යුතු බවයි.

පැවිදි වූ අළුතම උපෝසථාගාරයෙහි වතාවතට ගිය උප්පලවණ්ණා, එය ඇමද පහන් දල්වා පහන් දැල්ල දෙස බලා සිටියා ය. එය දෙස එක දිගට බලා සිටින ඇය කසිණ භාවනාවට යොමු වී තෙජෝකසිණ භාවනාවෙන්ම සිවු පිළිසිඹියා පත් රහත් මෙහෙණියක වූවා ය.

දනවූ සැරිසරමින් සත්හට සෙත් වඩමින් කල් යැවූ උප්පලවණ්ණා භික්ෂුණිය වරක් අඹවනයෙහි කුටියක් තනවා ගෙන විවේක සුවයෙන් විසුවා ය. ගිහි කල ඇය ගේ රූපශෝභාවෙන් මත්ව කාමාශක්තව සිටි ඇය ගේ මාමා කෙනෙකු ගේ පුත්‍රයා වූ නන්ද නම් තරුණයෙක් එතුමිය පිඩු සිඟා ගිය අතර කුටියට වැදී, ඇඳ යට සැඟවී සිට ඇය පැමිණ ඇඳෙහි වැතිර ගත් වහා ම එළියට අවුත් බලහත්කාරකම් කළේ ය. ඔහු ඇඳෙන් බිමට බැස යන්නට සැරසෙත් ම මිහිකත පලාගෙන ඔහු අවීචි මහා නරකාදියට ගිය බව වාර්තා වෙයි.

භික්ෂුණිය තමන්ට වූ ව්‍යසනය අන්‍ය භික්ෂුණියන්ට පැවසුවා ය. භික්ෂුණියන්ගෙන් එපවත් ඇසූ භික්ෂුහු ඒ බව භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන් හ. ඒ නිමිති කර ගෙන භික්ෂූන් ඇමතූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා, ස්ත්‍රී වේවා පුරුෂ වේවා, කවර හෝ අයකු පාප කර්මයක් කරන විට එය මී පැණි මෙන් මධුරව ඔහුට වැටහෙනු ඇත. එහෙත්, විපාක විඳින විට ඔවුන් දැඩි දුක් විඳිනු ඇත" යි ප්‍රකාශ කළ හ.

උප්පලවණ්ණා භික්ෂුණිය නන්ද ගේ බලහත්කාරකම හේතු කොට ගෙන කාමාස්වාදයක් ලැබීදැයි විමතියක් ඇති වූයෙන් එය විසඳනු පිණිස භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, රහත්හු කම් සැප නො ඉවසති. කාම සේවනය නො කරති. පියුම් පතෙක වැටුණු දිය බිඳ එහි නො ඇලෙන පරිද්දෙන් ඉදිකටු තුඩක අබ ඇටයක් නො රැඳෙන පරිද්දෙන් රහතන් වහන්සේ ගේ සිතෙහි ද කාමය නො රැඳෙයි."යි වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (69 ගාථාව)

පාපං යාව න පච්චති බාලො මධූ ඉව මඤ්ඤති යදා ච
පාපං පච්චති අථ බාලො දුක්ඛං නිගච්ඡති

පාපං: පව් කම; **යාව**: යම්තාක්; **න පච්චති**: නො පැසේද (ඒ තාක්); **බාලො**: අඥාන තෙමේ; **මධූ ඉව**: මී මෙන් (මිහිරි කොට); **මඤ්ඤති**: හඟියි; **යදා ච**: යම් කලෙක වනාහි; **පාපං**: පව් කම; **පච්චති**: පැසේද; **අථ**: එකල්හි **බාලො**: අඥාන තෙමේ; **දුක්ඛං**: දුකට; **නිගච්ඡති**: පැමිණෙයි.

අඥාන තෙමේ තමා කළ පාපය විපාක දෙන තුරු එය මිහිරි රසක් මෙන් සිතයි. එසේ වුව ද තමා කළ පාපකර්මය විපාක දෙන විට හෙතෙම දුකට පත් වන්නේ ය.

විවරණය

පාපං: පාපය, අකුසල චර්‍ය්‍යාව, පාප ශබ්දය ද බෞද්ධ සාහිත්‍යයෙහි යෙදෙයි.

සියලු සචේතනික අකුසල ක්‍රියා හේතුවෙන් පාපය ජනිත වෙයි. පාප ක්‍රියාවන්ට පසුබිම් වන්නේ රාගය, ද්වේෂය හා මෝහයයි. මෝහය හේතුවෙන් තම ක්‍රියාවෙහි පවත්නා නින්දිත දුරාචාරී ස්වභාවය තේරුම් නො ගන්නා දුර්ජනයෝ තාවකාලික ආස්වාද මාත්‍රයම මී පැණිසේ මධුරව ගනිති.





(මසකට වරක් අහර ගෙන) මිසදිටුගෙන සිටින්නා ධර්මය දත් රහතුන්ගෙන් සොළොසින් එකක් වත් නො වටී.

70. මාසේ මාසේ කුසග්ගෙන
බාලො භුඤ්ජේථ භොජනං
න සො සඞ්ඛතධම්මානං
කලං අග්ඝති සොළසිං (5:11)

මාසයකට වරක් බැගින්
එක් කුස තණ පතක් අගින්
බුදිමින් සුළු පමණ බොජුන්
විසුවත් නැණ මඳ දුදනන්
සදහම් දත් රහතුන් ගෙන්
නැත එක් අගයක් සොළසින්

රහත් බවයි ඉතා අගේ

5 (11) ජම්බුක හිමියන් ගේ විත්තිය (70 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වාසය කරන සේක් **ජම්බුක නම් භික්‍ෂුනම** ගේ පෙර පැවැත්ම ඇරබ මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවර ධනවත් ප්‍රභූවරයකු ගේ පවුලෙහි උපන් ජම්බුක කුඩා වියේ පටන් ම අරුම පුදුම ගතිගුණ විද්‍යමාන කළේ ය. ඇඳක නිදනු රිසි නො වූ හේ බිම නිදාගන්නට ප්‍රිය විය. බත් වෙනුවට තමන් ගේ ම අසූචි අනුභවයට රුචි කළේ ය. වැඩි වයසට පත් වූව ද මේ අප්‍රසන්න පුරුදු අත්හැර ගන්නට ඔහු අසමත් වූයෙන් දෙමාපියන්ට එය මහත් ගැටලුවක් විය. ඔහු නිවසේ තබා ගන්නට බැරි තරම් මේ චයෆීයාව ජුගුප්සා ජනක වූයෙන් ආජීවකයනට බාරදීමට ඔවුහු තීරණය කළ හ.

ආජීවක ආරාමයේදී ද ඔවුනට ලැබෙන ප්‍රණීත ආහාර ප්‍රතික්‍ෂේප කර අසූචි අනුභව කර අසු වූ හෙයින් එතැනින් පළවා හරිනු ලැබූ ජම්බුක තනිව ම ගල්තලාවක වාසයට ගියේ ය. එහි ගල් තලාවකට හේත්තු වී තනි පයින් සිට ගෙන මුව විවර කර ගෙන සිටි හේ "මම සුළං ආහාර කර ගෙන සිටිමි"යි. දිවා කල පවසා රාත්‍රියෙහි අසූචි අනුභව කර කාටත් හොරෙන් බිම වැතිර නිදයි. නිදි නො ලබන නිරුවත් නිරාහාරී තවුසකු ලෙස ප්‍රසිද්ධ වූයෙන් ඔහුට වඳින පුදන දනෝ බොහෝ වූ හ. ප්‍රණීත ආහාර ගෙන ආවිට කුසතණ පතක අග අහරෙහි ගාවා දිව ගාන හේ එය තමන්ට මසකට ඇති බව පවසයි. මෙසේ පණස් පස් වසරක් හෙතෙම ජනතාව මුළා කර කීර්ති ප්‍රශංසා ආදිය ලබමින් කල් යැවීය. දනෝ ඔහුට 'ජම්බුක ආජීවක' වශයෙන් නම් කළ හ.

එක් දිනක් මහා කරුණාවෙන් ලොව බලන බුදුරදුන්ට ජම්බුක ආජීවකයන් රහත්වන්නට තරම් පින් මෝරා ඇති බව පෙනී ගියේ ය. ඒ අනුව එදින සන්ධ්‍යා භාගයෙහි ඔහු ගේ වාසස්ථානයට වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ ඔහු වසන ගල් පොත්තට ලඟම ගල්පොත්තක රාත්‍රි කාලය ගත කළ සේක. රැයෙහි ප්‍රථම යාමයේ දී චාතුම්මහාරාජික දේව රාජයෝ (හතරවරම් දෙවිවරු) භාග්‍යවතුන් වහන්සේ ගේ සත්කාර පිණිස ආහ. මධ්‍යම යාමයෙහි ශක්‍රදේවේන්ද්‍ර තෙම බුද්ධෝපස්ථානයට ආයේ ය. අලුයම් වේලෙහි පැමිණියේ මහා බ්‍රහ්මයා ය. ඒ අය පැමිණි හැම වතාවේ ම මහ වන රොද ඒකාලෝක වූයෙන් ජම්බුක ආජීවක තෙම විස්මයෙන් බලා ගියේ ය. උදෑසනින් ම බුදුරදුන් හමුවට ගොස් ඒ පැමිණියේ කවුරුන්දැයි අසා දැනගත්තේ ය.

"ඔබ වහන්සේ එසේ නම් ඉතා උත්තම කෙනකු විය යුතුයි. නැත්තම් සතර වරම් දෙවිවරු, ශක්‍රයා, මහා බ්‍රහ්මයා ඔබ වහන්සේ ගේ සේවයට පැමිණෙන්නේ නැහැ. මම මේ පණස්පස් වසරක් නිරුවත්ව, තනි පයින්, සුළං බුදිමින් තවුස් දම් රැකලත් ඔය එක් කෙනෙක්වත් තව ම මගේ සේවයට ආවේ නැහැ" යි ජම්බුක ප්‍රකාශ කළේ ය.

"ජම්බුක, මෝඩ ස්ත්‍රීන්, මෝඩ මිනිසුන් රවටනවා මෙන් මා රවටන්න බැහැ. ඔබ පණස් පස් වසරක් කළේ මොනවාදැයි මම දන්නවා. අසූචි කමින්, බිම නිදන ඔබ කරන දේ මම හොඳින් දන්නවා. ඔබ කළේ ජනතාව රැවටීමක් විතරයි" යි භාග්‍යවතුන් වහන්සේ ඔහු විපිළිසරට පත් කරමින් වදාළ හ ." ඔබට ඔය අප්‍රසන්න ජීවිතය ගත කරන්නට සිදු වුණේ පූර්වාත්මභාවයක කළ අකුසල කර්මයක විපාකය වශයෙන්"යි පැහැදිලි කළ භාග්‍යවතුන් වහන්සේ ඔහු පෙර ජන්මයක භික්‍ෂුවක් ව සිටියදි මහරහත් නමකට තම දායකයකු කළ සංග්‍රහ ඉවසිය නොහැකිව කළ නින්දා අපහාස නිසා මෙසේ ජීවත් වන්නට සිදු වූ බව පෙන්වා දුන් හ. ඒ අසා ලජ්ජාවට පත් වූ ජම්බුකට වස්ත්‍රයක් දුන් බුදුහු බණ කියා ඔහු රහත් බවට පත් කර පැවිදි කර ගත් හ.

උදෑසන පැමිනි ජම්බුක ගේ දායකයෝ බුදුරදුන් ජම්බුක ගේ ශ්‍රාවකත්වයට පත්ව ඇත් ද නැතහොත් ජම්බුක බුද්ධ ශ්‍රාවකත්වයට පත්ව ඇත්දැයි විමතියක් උපන්නෙන් බුදුරදුන් ගේ උපදෙසින් ප්‍රාතිහාර්යය පෑ ජම්බුක තමන් බුද්ධ ශ්‍රාවක බව ප්‍රසිද්ධියේ කියා පෑවේ ය. ජම්බුක මසකට වරක් කුසතණ අගින් බොජුන් ගන්නා බවක් පෙන්වමින් ගත කළ පණස්පස් වසරක කුහක ජීවිතය මේ රහත් වූ මොහොතින් සොළසින් අඩක් තරම් වත් නො වටිනා බව පැවසූ තථාගතයන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (70 ගාථාව)

බාලො මාසෙ මාසෙ කුසග්ගෙන භොජනං භුඤ්ජෙථ
සො සඞ්ඛතධම්මානං සොළසිං කලං න අග්ඝති

බාලො: අඥානයා; **මාසෙ මාසෙ**: මසකට එක් වරක් බැගින්; **කුසග්ගෙන**: කුස තණ පතක අගින්; **භොජනං**: ආහාර; **භුඤ්ජෙථ**: අනුභව කරයි; **සො**: හෙතෙම; **සඞ්ඛතධම්මානං**: මහ රහතන් වහන්සේ ගේ; **සොළසිං කලං**: දහයෙන් පංගුවක්වත්; **න අග්ඝති**: අගේ නො වෙයි.

නුවණ නැති බාලයකු මසකට වරක් කුස තණ පතක අගින් ආහාර බිඳක් කමින් වාසය කළා වූව ද ඔහු රහතන් වහන්සේ නමක ගෙන් දහසයෙන් කොටසක් තරම් වත් නො වටියි.

විවරණය

කුසග්ගෙන භොජනං: ඉතා සුළු ආහාර ප්‍රමාණයකින් තමාට යැපෙන්නට හැකි යයි දායකයාට හඟවනු පිණිස කළ එක් උපක්‍රමයකි. මේ කතාවෙහි දී දායකයන් රස බොජුන් දුන්විට ජම්බුක කළේ එයයි. එය දැඩි අත්තකිලමථානුයෝගයක් සේ බැලූ බැල්මට දිස් විය.

සඞ්ඛත ධම්ම: යන්නෙන් සෝවන් ඵලයේ පටන් ඉහලට ඇති අධිගම ගත හැක.



දෙවු කෙණෙහි කිරි නොමිදෙන්නා සේ පව ද කළ කෙණෙහි විපාක නොදෙන්නේ ය.

71. න හි පාපං කතං කම්මං
සජ්ජු ඛීරං'ව මුච්චති
ඩහන්තං බාලමන්වෙති
භස්මච්ඡන්නො'ව පාවකො (5:12)

පල නොදේවි කළ විගසින්
කල් යයි මිදෙනා කිරිමෙන්
හඹයි බාලයන් දවමින්
අළුයට ගිනි පුපුරු ලෙසින්

කළ පව් නො නැසේ - අළුයට ගිනි සේ.

5 (12) අහිප්‍රේතයා ගේ කතාව (71 ගාථාව)

අහිප්‍රේතයකු ගේ වෘත්තාන්තය නිමිති කර ගෙන භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසමින් මේ ගාථාව දේශනා කළ සේක.

වරක් මුගලන් මහ රහතන් වහන්සේ ලක්ඛණ හිමියන් ද කැටුව ගිජු කුළු පවුවෙන් බැස ජටිලයන් දහසක් දෙනා මැදින් රජගහ නුවර පිඬු සිඟා වඩිනු පිණිස නික්මුණා හ. ඒ එන අතරමග අහිප්‍රේතයකු (සර්ප ප්‍රේතයකු) දුටු මුගලන් මා හිමියන්ට සිනා පහළ විය. සිනා පහළ කිරීමට හේතුව කුමක් දැයි ලක්ඛණ හිමියන් ප්‍රශ්න කළ විට "ආයුෂ්මත්නි, දැන් නොව, එය භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී විමසන්න." යි මුගලන් හිමියෝ පැවසූ හ. පිඬු සිඟා ගොස් දන් වළඳා බුදුරදුන් හමුවට ගිය විට ලක්ඛණ ස්ථවිරයෝ "සමිඳුනි, ගිජු කුළු පව්වෙන් බසිද්දී ඔබ වහන්සේ සිනා පහළ කළේ කවර හෙයින්දැයි මා ඇසූ විට එය බුදුරදුන් හමුවේ විමසන්නැයි ඔබ වහන්සේ පැවසූ හ. දැන් ඒ කවර හෙයින්දැයි හෙළි කළ මැනවි" යි ආරාධනය කළ හ.

"ආයුෂ්මතුනි, මම අහිප්‍රේතයකු දැක සිනාසුනිමි. ඔහු ගේ ස්වරූපය මම ඔබට විස්තර කරන්නෙමි. ඔහු ගේ හිස මනුෂ්‍යයකු ගේ මෙනි. එහෙත් කඳ සර්පයකු ගේ මෙන් ය. ඔහුට අහිප්‍රේතයා යයි කියන්නේ ඒ හේතුවෙනි. ඔහු ගේ දිග යොදුන් 25 කි. ඔහු ගේ හිසෙන් පටන් ගන්නා ගිනි දලු වලිගය දක්වා විහිද යයි. වලිගයෙන් පටන් ගන්නා ගිනි දලු හිස දක්වා පැතිර යයි. හිසෙන් හට ගන්න ගිනි දෙපස දිගේ පැතිර යයි. දෙපසින් හට ගන්නා ගිනි සිරුර මුළුමනින් පැතිරෙයි යොදුන් 25 ක් දිග ප්‍රේතයන් ඇත්තේ දෙදෙනෙක් පමණක් යැයි කියති.

එනම්, මේ අහිප්‍රේතයා සහ තවත් එක් කාක ප්‍රේතයෙකි. ඉතිරි ප්‍රේතයෝ යොදුන් තුන් කාලක් පමණ දිග ය. මේ අහිප්‍රේතයා හා කාක ප්‍රේතයා පමණක් යොදුන් 25 ක් දිගට සිටිති. මම කාකප්‍රේතයා ද දැක ඇත්තෙමි. කාක ප්‍රේතයා දුටු දිනයේ මම ඔහු පෙර කළ කර්මය කුමක් දැයි ඇසීමි. පෙර ජන්මයෙක භික්ෂුන් වහන්සේලාට පිළිගැන්වීමට ගෙන ගිය බත් පාත්‍රයකින් කටවල් තුනක් අනුභව කළ පාපයෙන් එසේ කාක ප්‍රේතව දුක් විඳින බව හේ පැවසී ය.

අහිප්‍රේතයා ප්‍රේතාත්මභාවය ලද්දේ ද බලගතු අකුසලයක විපාක වශයෙනි. හෙතෙම ඉකුත් භවයක බරණැස් නුවර කුඹුරක් කරවූයේ ය. කුඹුරෙන් එහා එක් තැනෙක පසේ බුදු නමක් වාසය කළේ ය. උන් වහන්සේ වැඳගන්නට යන සැදැහැවත්තු කුඹුර පාගා ගෙන යති.

මෙයින් ගොවියාට හිරිහැර විය. කුඹුර පාගා ගෙන නො යන්නැයි කීවත් මිනිසුන් ඊට සවන් නුදුන් හෙයින් මේ සියලු කරදර පසේ බුදුන් ගේ පන්සල නිසා නො වේදැයි සිතූ හෙතෙම උන්වහන්සේ පිඬු සිඟා ගිය අතර පන්සල ගිනි තැබීය. පසේ බුදුරජාණන් වහන්සේ ද පන්සල ගින්නෙන් වැනසී තිබෙනු දැක වෙනත් පළාතකට වැඩි සේක.

මිනිසුන් අවුත් පසේ බුදුන් ගැන විපරම් කරන විට "මම පන්සල ගිනි තැබීමි" යි හේ පැවසී ය. කුපිත වූ මිනිස්සු ඔහු ට පහරදී මරා දැමූ හ. අවීචි මහා නරකාදියෙහි පැසී ඉක්බිති හේ දැන් මෙසේ අහි ප්‍රේතයකුව දුක් විඳියි."

ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මේ මොග්ගල්ලාන ස්ථවිරයන් පැවසූ දේ සැබෑය. මම ද මේ අහිප්‍රේතයා දැක ඇත්තෙමි. එහෙත් මා ඒ ගැන සඳහන් නො කළේ නිකරුණේ සැකකරන්නවුන් තමන්ට ම අලාභ කර ගනිතැයි සිතීමෙනි'' යි වදාරා පුර්වෝක්ත ගාථාව ද දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (71 ගාථාව)

කතං පාපං කම්මං ඛීරං ඉව සජ්ජු න හි මුච්චති.
භස්මච්ඡන්නො පාවකො ඉව තං බාලං ඩහං අන්වෙති.

කතං: කරන ලද; **පාපං කම්මං**: පාප කර්මය; **ඛීරං ඉව**: කිරීමෙන් ම; **සජ්ජු**: වහා; **න හි මුච්චති**: නො මිදෙන්නේම ය; **භස්මච්ඡන්නො**: අළුවලින් වැසුණු; **පාවකො ඉව**: ගිනි අඟුරු මෙන්; **තං**: එය; **බාලං**: අඥානයා; **ඩහං**: දවමින්; **අන්වෙති**: පසු පස එයි.

පාප කර්මයක් කළ පමණින් එය වහාම විපාක දෙන්නේ නැත. කිරි, වහා නො මිදී කාලයක් ගෙන මිදෙන්නාක් මෙනි. අළු යට තිබුණත් ගිනි අඟුරු යමක් පුළුස්සා දමන්නට සමත් වන්නාක් මෙන් පාප කර්මය ද පසු පසින් අවුත් අඥාන පුද්ගලයා දවාලයි.

විවරණය

සජ්ජු ඛීරං ව මුච්චති: යන්නෙන් විස්තර කරන්නේ කිරි මිදෙන්නට කල් ගත වන බවයි. එසේම කර්මය විපාක දෙන්නට පෙරද එක්තරා මුහුකුරා යාමක් සිදුවේ. එහෙත් පව් කරන අනුවණ දනෝ වහාම විපාක නො ලැබෙන විට විපාක නො ලැබෙතැයි සිතා උදම් වෙති. එය මුළාවකි.



අනුවණයාගේ දැන උගත්කම හා ඉසුරුමත් බව ඔහුට ම අවැඩ පිණිස වන්නේ ය.

72. යාවදෙව අනත්ථාය
ඤත්තං බාලස්ස ජායති
හන්ති බාලස්ස සුක්කංසං
මුද්ධමස්ස විපාතයං (5:13)

උගත් සිප්සත මෝඩ මිනිසකු
විපත් පිණිසම සිටි ඔහු හට
ඉදිමිලා හිස පිපිර යන්නේ
හොඳක් ඇත්නම් එයත් වනසා

මෝඩයන් ගෙ පිපිරෙයි හිස් - උගත් කමින් ඉදිමී ගොස්

5 (13) සට්ඨිකූට ප්‍රේතයා ගේ වෘත්තාන්තය (72 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ විසූ සේක් **සට්ඨිකූට** නම් ප්‍රේතයා නිමිති කර ගෙන මේ ගාථාව වදාළ සේක.

ගල් කැට ඉලක්කයට විදීමේ සමත් පිළෙක් (කොරෙක්) බරණැස් නුවර වාසය කළේ ය. නුග ගසක් යට වාසය කළ ඔහුට නුග ගසේ කොළ වලට ගල් කැට විද හිල් කර අව්වේ සෙවනැල්ලෙන් ඇත්රූප අස් රූප ආදිය වැටෙන ආකාරයට කිරීමේ හැකියාවක් තිබිණ. එබඳු දේ කර දක්වන ඔහුට ළමයි කෑම බීම ගෙනවුත් දෙති.

දිනක් බරණැස රජතුමා ඒ අසලින් යන විට ළමයි බියපත් ව කොරා ගසෙහි අතු අතර සඟවා පැන දිවූ හ. එහෙත් කොළවල හිල් අතුරින් බිමට වැටෙන ඇත් රූප ආදිය දැක, මේ කාගේ වැඩක් දැයි විමසා පිළා සොයා ගත් රජතුමා ඔහු රජවාසලට කැඳවා ගෙන ගියේ ය. පුරෝහිත බමුණා ගේ වාචාල කට පාලනය කරනු පිණිස පිළා ලවා එළු බෙටි නැලියක් ඔහු ගේ කටට විද්දවීම ද කරවා ගත් රජ තෙම මහත් සතුටට පත් ව පිළාට සිවු දෙසින් ගම්වර හතරක් හා අගනා තෑගි බෝග පිරිනැමීය.

මේ දක්ෂතාවෙන් කොරකු ලද තිළිණ දැක විශ්මයට පත් එක් පුද්ගලයෙක් මා මේ ශිල්පය උගත යුතු යැයි සිතා ඔහු වෙත ගොස් උපස්ථාන කොට සිත් ගෙන ශිල්පයෙහි නිපුණ වූයේ ය.

තම නව ශිල්ප දක්ෂතාවෙන් ඔද වැඩුණු හේ කුසල් අකුසල් දන්නා නුවණින් තොර වූ හෙයින් නගරයෙහි පිඬු සිඟා වඩිනා පසේ බුදු කෙනකුන් දැක මේ පසේ බුදුනට කාත් කවුරුත් නැති හෙයින් මා එතුමා මරා දැම්මත් මට නීතියෙන් දඬුවමක් ලැබෙන්නේ නැතැයි සිතා උන්වහන්සේ ගේ දකුණු කණට ඉලක්ක කර ගලක් විද්දේ ය. එය කණ විදගෙන ගොස් වම් කණෙන් නිකුත් විය. හේ පලා ගියේ ය. බලවත් වේදනාවට පත් පසේ බුදුරජාණන් වහන්සේ පිඬු සිඟා වඩින්නට අසමත් ව වහා පන්සලට හැරී ගොස් පිරිනිවන් පෑ හ.

පසේ බුදුන්ට මේ විපත කළ තැනැත්තා සොයා ගත් මිනිස්සු ඔහු තළා පෙළා මරා දැමූ හ. මිය ගොස් අවීචි මහා නරකයෙහි බොහෝ කල් දුක් විඳි හෙතෙම ඉන් මිදී අනතුරුව ගිජුකුළු පව්වෙහි සට්ඨිකූට ප්‍රේතව උපන්නේ ය. ලක්ඛණ තෙරුන් සමඟ ගිජුකුළු පව්වෙහි ගමන් කරන විටකදී ඒ ප්‍රේතයා දුටු මහ මුගලන් තෙරුන්, ප්‍රේතයා පිළිබඳව කළ විස්තරය අසා සිටි, භාග්‍යවතුන් වහන්සේ ඒ නිමිතිකොට මේ ගාථාව වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (72 ගාථාව)

බාලස්ස ඤත්තං යාව එව අනත්ථාය ජායති. බාලස්ස මුද්ධං විපාතයං අස්ස සුක්කංසං හන්ති.

බාලස්ස: මෝඩයා ගේ; **ඤත්තං**: උගත් කම; **යාව එව**: හුදෙක්; **අනත්ථාය**: අනර්ථය පිණිස ම; **ජායති**: පවතියි; **බාලස්ස**: මෝඩයා ගේ; **මුද්ධං**: හිස; **විපාතයං**: බිඳ හෙළමින්; **අස්ස**: ඔහු ගේ; **සුක්කංසං**: අංශුමාත්‍ර වූ හොඳක්; **හන්ති**: වනසයි.

මෝඩයා යමක් උගත්තේ වුව ද එය ඔහුට අනර්ථය පිණිස ම පවතියි. ඔහු ගේ හිස සිඳ හෙළමින් බින්දු මාත්‍ර වූ හොඳක් ඔහු වෙත ඇත් නම් එය ද වනසා දමයි.

විවරණය

ඤත්තං - උගත් දේ - දත් දේ යනු මෙහි අරුතයි. මෝඩයාට තම උගත්කමින් නිසි, නිවැරදි ඵල නෙළා ගන්නට අවශ්‍ය උචිතානුචිත විචක්ෂණය නැති හෙයින් එය වරදවා භාවිත කොට විපතට වැටෙ යි. ඔහු ලඟ යම් බින්දු මාත්‍ර හෝ යහපතක්, ගුණයක් වේ නම් එය පවා විනාශ වෙයි.



අනුවණ මහණතෙම තමන් තුළ නැති ගුණ අඟවා බුහුමන් හා උසස් බැව් පතන්නේ ය.

73. අසතං භාවනමිච්ඡෙය්‍ය
පුරෙක්ඛාරඤ්ච භික්ඛුසු
ආවාසේසු ච ඉස්සරියං
පූජා පරකුලෙසු ච (5:14)

නැති ගුණ අගයනු රිසි වෙති
ස නායක කම් ද පතති
පන්සල් වල අදිපති කම්
පරකුල පූජා ද සොයති

ගුණ නුවණින් හිස් - රිසි වෙති කිතු ගොස්

5 (14) චිත්ත ගෘහපතියා ගේ ප්‍රවෘත්තිය (73 හා 74 ගාථා)

සුධම්ම ස්ථවිරයන් හා **චිත්ත ගෘහපතියා** නිමිති කොට භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථා දෙක දේශනා කරන ලද්දේ ජේතවනාරාමයේ වැඩ විසූ සමයේ ය.

මච්ඡිකාසණ්ඩ නම් නුවර විසූ චිත්ත නම් ගෘහපතිතෙම පිඬු සිඟා වඩිනා මහානාම මහ රහතන් වහන්සේ දැක උන්වහන්සේ ගේ ප්‍රසන්න ඉරියව් විෂයෙහි පැහැද, නිවසට වැඩම කරවා දන් පිළිගන්වා බණ අසා පැහැදී සෝවන් ඵලය ද ලබා ගත්තේ ය. අනතුරුව තමන් සතු උද්‍යානය අත පැන් වත් කොට සංඝයාට පූජා කළ හෙතෙම එහි විශාල ආරාමයක් ඉදි කරවා පූජා කළේ ය. එතැන් පටන් එය සතර දෙසින් වඩිනා මහ සඟරුවනට විවෘත ස්ථානයක් විය. සුධම්ම නම් තෙර නමක් එහි නේවාසිකව වාසය කරන්නට පටන් ගත්තේ ය.

චිත්ත ගෘහපතියා ගේ සැදැහැ ගුණය කටින් කට පැතිර ගියේ ය. ඒ ඇසූ සැරියුත්-මුගලන් දෑග සව්වෝ ද ඔහුට අනුග්‍රහ කරනු කැමතිව මච්ඡිකාසණ්ඩයට වැඩම කළ හ. අගසවු දෙනම පැමිණෙන පුවත ඇසූ චිත්ත අඩ යොදුනක් පෙර ගමන් කොට උන්වහන්සේලා පිළිගෙන ආරාමයට වැඩම කරවා ගෙන'වුත් ආගන්තුක සත්කාර කොට "ස්වාමීනි, බණ ටිකක් වදාළ මැනව" යි ආරාධනා කළේ ය. ගමන් වෙහෙස තිබුණ ද සැරියුත් මහ තෙරණුවෝ කෙටියෙන් ධර්මානුශාසනයක් කළ හ.

ඒ අසා සිටි චිත්ත සකෘදාගාමී ඵලයට පත් වූයේ ය. අනතුරුව දෑගසව්වන්ටත් උන්වහන්සේලා සමඟ සපැමිණි දහසක් තෙරවරුන්ටත් පසු දින දවල් දානය පිණිස නිවෙසට වැඩම කරන්නැයි ආරාධනය කළ හේ ආරාමික සුධම්ම හිමියන්ට ද ඒ හා වැඩම කරන සේ ඇරයුම් කළේ ය. "මට ආරාධනා කළේ කාටත් පසුවය" යි කිපුණු සුධම්ම හිමියෝ එය පිළි නොගත් හ. දෙතුන් වරක් ම ඇරයුම් කළ ද පිළි නො ගත්තෙන් චිත්ත ද "ඔබ වහන්සේ ගේ කැමැත්තක්" යි පවසා නික්ම ගියේ ය.

පසු දින මොහු මේ අගසවු දෙනම ඇතුළු පිරිසට සංග්‍රහ කරන්නට සූදනම් කර ඇත්තේ කවර දාන වස්තු දැයි දැන ගැනීමේ කුතුහලයෙන් සුධම්ම ස්ථවිරයෝ උදෙන්ම පා සිවුරු ගෙන එහි ගිය හ. "වැඩ හිඳිනු මැනවි, ස්වාමීනි." යි චිත්ත ඇරයුම් කළ ද "මම පිඬු සිඟා යන්නෙමි. වැඩ නොහිඳිමි"යි කී උන්වහන්සේ දාන වස්තු විමසා බලා අඩුපාඩුවක් දක්වනු කැමැත්තෙන් "ඔබ බොහොම ජයට කෑම හදලා තිබෙන නමුත් එක අඩුවක් තිබෙනවා" යි කී හ. "ඒ කුමක් ද ස්වාමීනි?" යි විමසූ විට ''තලගුලි නැහැ" යි කී හ. "ඔබ වහන්සේ හරියට කපුටෙක් වගෙයි" චිත්ත අවමන් පෙරදැරිව පැවසී ය. එයින් කෝපයට පත් සුධම්ම හිමියෝ "ගෘහපතිය, ඔබේ ආවාසය ඔබ ම තියා ගන්න. මට එය රැකිය නො හැක. මම යන්නෙමි"යි යන්නට සැරසුණ හ. "නොයනු මැනවි, හිමියනි" යි දායකයා තුන් වරක් ම ඉල්ලා සිටිය ද උන්වහන්සේ බුදුරදුන් හමුවට ගොස් සියල්ල දන්වා සිටියේ ය. "සැදැහැති දායකයාට නිග්‍රහ කිරීමෙන් ඔබ කර ඇත්තේ බලගතු වරදකි"යි පැවසූ භාග්‍යවතුන් වහන්සේ සුධම්ම හිමියන්ට උන්වහන්සේ ගේ වරද පහදා වහා ම ගොස් ගෘහපතියා සමා කර්වා ගන්නැයි උපදෙස් දුන් හ. සුධම්ම හිමියෝ ද ගොස් චිත්ත ගෘහපතියාට "උපාසකය, එය මගේ වරදය. මට සමාවන්න" යි කීව ද "මම සමාව නො දෙමි"යි චිත්ත පැවසී ය. එයින් සිත්තැවුලට හා අමනාපයට පත් සුධම්ම හිමි නැවත බුදුරජාණන් වහන්සේ හමුවට ගියේ ය.

විවරණාත්මක අනුවාදය (73 ගාථාව)

> **අසතං භාවනං, භික්ඛුසු පුරෙක්ඛාරඤ්ච, ආවාසේසු**
> **ඉස්සරියං ච, පරකුලෙසු පූජා ච ඉච්ඡෙය්‍ය**

> **අසතං භාවනං**: තමන් වෙත නැති ගුණ ඇතැයි පිළිගනු ලැබීම; **භික්ඛුසු**: භික්ෂූන් අතර; **පුරෙක්ඛාරඤ්ච**: පුරෝගාමිත්වය ද; **ආවාසේසු**: විහාරස්ථානවල; **ඉස්සරියං ච**: ආධිපත්‍යය ද; **පරකුලෙසු**: වෙනත් දායක පවුල් වලින්; **පූජා ච**: පුද සත්කාර ද; **ඉච්ඡෙය්‍ය**: කැමති වන්නේ නම් (එය ද)

තමන් වෙත නැති ගුණ ඇතැයි අන්‍යයන් පිළිගනු දැක්මට ඇති කැමැත්ත, භික්ෂූන් අතර නායකත්වය ලබන්නට ඇති රුචිය, විහාරස්ථානවල අධිපති පදවි ලබන්නට ආශා වීම, දායක පවුල් වලින් පුද පිරිකර ලබන්නට ඇති රුචිය,



නුවණ නැති පැවිද්දා ගේ කුදු මහත් කටයුතු ගැන නිසරු අදහස් ද ආසාව හා මානය ද වැඩේ.

74 මමේ'ව කත මඤ්ඤන්තු ගිහී පබ්බජිතා උභො මමේ'ව අතිවසා අස්සු කිච්චාකිච්චෙසු කිස්මිචි ඉති බාලස්ස සඞ්කප්පො ඉච්ඡා මානො ච වඩ්ඪති (5:15)	ගිහි පැවිදි කවුරුත් මා ගැනම නිති සිතමින් ලොකු පොඩි කොයි වැඩත් මගේ වැඩ යයි කියමින් මා වට සිටිත්වා - මට ම මුල් තැන පුදමින් සිතුවහොත් මෙලෙසින් ලොබ මන් වැඩෙයි නිතියෙන්.

ගුණ නුවණින් අඩු වුණාම - පිම්බෙනවා තමන් ගැනම.

5 (14) චිත්ත ගෘහපතියා ගේ ප්‍රවෘත්තිය (73 සහ 74 ගාථා) (ඉතිරි කොටස)

නැවත ගිය ද චිත්ත සමාව නො දෙන බව දනිතත්, මානය දුරු කිරීම පිණිස තිස් යොදුනක් ගොස් ආපසු ගෙන්විය යුතුයයි සිතූ භාග්‍යවතුන් වහන්සේ නැවත ද උන්වහන්සේ ගෘහපතියා වෙත යැවූ හ. එවර ද ගෘහපතියා සමාව නුදුන් හෙයින් මානය මුළුමනින්ම සිඳීගිය තෙරණුවෝ නැවත බුදුසමිඳුන් හමුවට අවුත් ඒ බව සැළ කර සිටිය හ.

"සුධම්ම, මේ මගේ පන්සල, මේ මගේ දායකයෝ, මේවා මගේ ම වැඩ ආදි ලෙසින් සිතීම මානය වැඩෙන, කුසල් පිරිහෙන මෝඩ වැඩකි. එසේ සිතීම භික්ෂූන් විසින් නො කළ යුතුය"යි අවවාද කර "මේ සහායක භික්ෂුවද සමඟ ගොස් ගෘහපතියා සමා කර ගන්න" යි දෙවැන්නකු ද දී යැවූ හ.

බුදුරදුන් වැඳ අවසර ගෙන බොහෝ නිහතමානී ව චිත්ත ගෘහපතියා වෙත ගිය සුධම්ම තෙරණුවෝ නැවත ද සමාව අයැද සිටිය හ. එවර "හිමියනි මම ඔබට කමා කරමි. මා අතින් ද යම් වරදක් වී නම් ඊට ඔබ වහන්සේ කමා කරන්න" යි පැවසූ චිත්ත උන්වහන්සේට සමාව දුන් හ. සුධම්ම තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේ දුන් උපදෙස් මනාව පිළිපැද ඉතා ඉක්මණින්ම සිවු පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේ නමක් බවට පත් වූ හ. මේ සිද්ධියෙන් පසු චිත්ත ගෘහපතියා මෙසේ සිතී ය. "මා සෝවන් ඵලය ලද්දෙත්, සකෘදාගාමී ඵලය ලද්දෙත් භාග්‍යවතුන් වහන්සේ සියැසින් නොදැකම ය. අනාගාමී ඵලය ලද්දෙත් බුදුන් නො දැකමය. දැන් ඉතින් මා බුදුරදුන් සියැසින් දැකගත යුතුම ය.

එසේ සිතා ගැල් පන්සියයක තල, උඳු, මුං, සහල්, උක්සකුරු, රෙදි පිළි ආදිය පුරවා විශාල පිරිසක් ද කැටුව බුදුන් දක්නට යාම සඳහා පිටත් වූ හ. අතර මග දෙව් මිනිසුන් ගෙන් බොහෝ ආදර සංග්‍රහ විඳිමින් ගොස් මාසයක් ම බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට දාන මානාදියෙන් උපස්ථාන කොට ආපසු පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේ ආනන්ද මහ තෙරුන් අමතා චිත්ත ගෘහපතිය පූර්වාත්මභාවයෙක කරන ලද දානමය පුණ්‍යකර්මයක අනුභාවයෙන් මේ යස ඉසුරු ලද බව ද දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (74 ගාථාව)

ගිහී පබ්බජිතා උභො මම එව කතං අභිඤ්ඤන්තු,
කිස්මිචි කිච්චාකිච්චෙසු මම එව අතිවසා අස්සු ඉති
බාලස්ස සඞ්කප්පො ඉච්ඡා මානො ච වඩ්ඪති.

ගිහී: ගිහි; **පබ්බජිතා**: පැවිදි; **උභො**: දෙපක්ෂයම; **මම එව**: මා විසින් ම; **කතං**: කළ දේ යැයි; **අභිඤ්ඤන්තු**: පිළි ගනිත්වා; **කිස්මිචි**: කවර වුව ද; **කිච්චාකිච්චෙසු**: කළ යුතු කුඩු මහත් දෙයහි; **මම එව**: මා ම; **අතිවසා අස්සු**: මුල් කර ගනිත්වා; **ඉති**: යන මෙය; **බාලස්ස**: නුවණ නැත්තාගේ; **සඞ්කප්පො**: අදහස ය; (එයින්), **ඉච්ඡා**: ආශාව ද; **මානො ච**: මානය ද; **වඩ්ඪති**: වැඩෙයි.

ගිහි පැවිදි කවුරුත් හැම දේම මා විසින් කළ දේ යැයි පිළිගනිත්වා. ලොකු කුඩා ඕනෑ ම වැඩක දී මා ම මුල් කර ගනිත්වා යි සිතීම යන මේ දුබල කම් ඇතිවීම නුවණ නැත්තා ගේ ක්‍රමයයි. එයින් තෘෂ්ණාව හා මානය වර්ධනය වෙයි.

(කලින් ගාථාවේ දැක් වූ දුර්වලකම් මාලාව ද මීට ම එක් කර මෝඩයා ගේ ලක්ෂණ බව තේරුම් ගත යුතුය)

විවරණය

මේ ගාථා දෙකින් ම දක්වන ලද්දේ ආරාමික ජීවිතයක් තුළ විද්‍යාමාන විය හැකි දුර්වලතා ය. ආධ්‍යාත්මික වශයෙන් එතරම් සමෘද්ධියක් නො ලද භික්ෂූන් දායකයන් ගෙන් ලැබෙන වන්දනා මාන, පුද පිරිකර ආදියෙන් මත් වී ඒවාටම ලොල් වී පුහු මානයක් වර්ධනය කරගත හැකි ය. තමන් අධිගම අතින් ඉතා බිළිඳු වූවද පිරිස් මැද හරසර ලබන විට තමන් පිළිබඳ නිසරු මානයක් වගා කරන්නා ඔවුහු හරසර අඩු වූ විට අසහනයට පත් වෙති. වෙනත් දායක පවුල් වලින් හරසර පතන්නට සිතති. මෙසේ වූ විට තෘෂ්ණාව හා මානය වර්ධනය වීමෙන් විමුක්ති මාර්ගය ඇහිරෙයි.

පැවිද්දා ලාභ උපදවන පිළිවෙත ද නිවන් ලබන පිළිවෙත ද වෙනස් බව දැන කෙලෙස් මලින් වෙන් විය යුතු ය.

75. අඤ්ඤා හි ලාභූපනිසා
අඤ්ඤා නිබ්බාණගාමිනී
එවමෙතං අභිඤ්ඤාය
භික්ඛු බුද්ධස්ස සාවකො
සක්කාරං නාභිනන්දෙය්‍ය
විවේකමනුබ්‍රෑහයෙ. (5:16)

ලාබ ලබන මඟ අනිකකි
නිවන් ලබන මඟ තවෙකකි
හොඳ නුවණින් දත් භික්ෂුව
බුදුරදුන් ගෙ ශ්‍රාවකයෙකි
ලාබ ලෝබ වෙත නො ඇලී
විවේක සුව විඳ ගන්නෙකි.

හැර ඉසුරු මඟ - යමු නිවන් මඟ

5 (15) වනවාසී තිස්ස සාමණේරයන්ගේ වත (75 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ වනවාසී **තිස්ස සාමණේරයන්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

තිස්ස සැවැත් නුවර සිටු කෙනෙකුන් ගේ පුත්‍රයෙක් වූයේ ය. ඔහු ගේ පියා අග්‍රශ්‍රාවක සාරිපුත්ත මහ රහතන් වහන්සේට නිතර නිතර දන් පිරිනැමූ හෙයින් තිස්සට කුඩා වියේදී ම සැරියුත් මහ රහතන් වහන්සේ නිතර දකින්නට වාසනාව උදා වී තිබිණ. යන්තම් වයස හත වන විට පැවිදි වන්නට කැමැත්ත දැක්වූ හේ සැරියුත් මහ තෙරණුවන් වෙත පැවිදි වූයේ ය. පැවිදිව දෙව්රම් වෙහෙර වැඩ විසූ තිස්ස සාමණේරයන් දක්නට නිතර නිතර උන්වහන්සේ ගේ මිතුරෝ තෑගි බෝග ද රැගෙන පැමිණෙන්නට වූ හ.

මෙය තමන්ට මහත් හිරිහැරයක් සේ සැලකූ සාමණේර නම භාග්‍යවතුන් වහන්සේ ගෙන් කර්මස්ථාන ලබා ගෙන වනගත වූයේ ය. ගම්වැසියකු යමක් පිදූවිට **"සුඛිතා හෝථ, දුක්ඛා මුඤ්චථ"** (සුවපත් වේවා, දුකින් මිදේවා) හැර වෙන කිසිවක් නො වදරති. එසේ කෙටියෙන් පවසා ආරණ්‍යය තුළට පිවිසෙන උන්වහන්සේ අප්‍රතිහත ධෛර්‍ය්‍ය යෙන් බවුන් වඩති. මෙසේ වෑයම් කොට මාස තුනක් ගතවන විට උන්වහන්සේ රහත් ඵලය ලබා ගත් හ.

වස් කාලය අවසන් වූ පසු භාග්‍යවතුන් වහන්සේ වෙතින් අවසර ලබා ගත් සැරියුත් මහ රහතන් වහන්සේ මුගලන් මහරහතන් වහන්සේ ද කැටුව තිස්ස සාමණේරයන් වසන ආරණ්‍ය සේනාසනය බලා පිටත් වූ හ. අගසවු දෙනම පැමිණි බව ඇසූ ගම්වැසියෝ උන් වහන්සේලාට හරසර දැක්වීම පිණිස රැස් වූහ. තමන්ට අනුකම්පාවෙන් දම් දෙසුමක් කරන්නැයි ඔවුහු සැරියුත් හිමියන්ගෙන් ඉල්ලා සිටිය හ. එහෙත් තමන් වෙනුවට තිස්ස සාමණේරයන් බණ කියනු ඇතැයි උන්වහන්සේ ගැමියාට පැවසූ හ. ඒ ඇසූ ගම්වැසියෝ "ඒ පොඩි හාමුදුරුවෝ සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා කියන්නට හැර වෙන යමක් කියන්නට නො දනිති. එහෙයින් වෙනත් නමකට කියන්නැ"යි ඉල්ලා සිටිය හ.

එහෙත් තිස්ස සාමනේරයන් ම බණ කියනු ඇතැයි පැවසූ සැරියුත් හිමියෝ "තිස්ස, මේ අයට අනුශාසනා කරන්න. සුවපත්වන හැටි හා දුකින් මිදෙන හැටි ඔවුනට පහදා දෙන්න" යි තිස්ස සාමණේරයනට පැවසූ හ. තම ගුරු දේවයන් වහන්සේ ගේ බසට අවනතව ධර්මාසනාරූඪවූ තිස්ස සාමණේර හිමියෝ ස්කන්ධා යතන ධාතූන් ගේ යථා තත්ත්වය පහදා සත්තිස් බෝධිපාක්ෂික ධර්ම විවරණය කර රහත් වී නිවන් ලබන පිළිවෙළ දේශනා කළ හ. තිස්ස සාමණේරයන් වහන්සේ ගේ දීර්ඝ හා සාරගර්භ ධර්මදේශනය නිම වන විට අලුයම ද වී තිබිණ. ඒ වන විට සියලුම ගම්වැසියෝ ඉමහත් ප්‍රසාදයට පත්ව සිටිය හ. මේ තරම් හොඳින් ධර්මය දැන සිටි තිස්ස සාමණේරයන් මෙතුවක් කල් ඉතා අඩුවෙන් කතා කිරීම ගැන ඔවුහු විස්මයට පත්ව සිටිය හ. කෙසේ වුව ද මේ සා උතුම් හිමිනමක් තමන් ගේ උවටැන් ලබමින් තමන් හා විසීම ගැන ඔවුහු ආනන්දයට පත් වූ හ. දායකයන් ගේ ප්‍රසාදය පිණිස භාග්‍යවතුන් වහන්සේ ද එහි වැඩම කළ අතර, තිස්ස සාමණේරයන් ගේ ගුණය පතළ කරනු පිණිස පූර්වෝක්ත ගාථාව ද දම්සභා මණ්ඩපයෙහි වැඩහුන් භික්ෂූන් වහන්සේලාට දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (75 ගාථාව)

ලාභූපනිසා අඤ්ඤා නිබ්බාණගාමිනී අඤ්ඤා හි
බුද්ධස්ස සාවකො භික්ඛු එවං එතං අභිඤ්ඤාය
සක්කාරං න අභිනන්දෙය්‍ය විවේකං අනුබ්‍රෑහයෙ

ලාභූපනිසා: ලාභ උපදවන මාර්ගය; **අඤ්ඤා**: වෙනකකි; **නිබ්බාණ ගාමිනී**: නිවන් ලබන මඟ; **අඤ්ඤා හි**: තවෙකක් ම ය; **බුද්ධස්ස සාවකො**: බුද්ධ ශ්‍රාවක; **භික්ඛු**: භික්ෂුව; **එවං**: මෙසේ; **එතං**: මෙය; **අභිඤ්ඤාය**: මැනවින් දැන; **සක්කාරං**: ලාභ සත්කාර; **න අභිනන්දෙය්‍ය**: අභිනන්දනය නො කරන්නේ ය; **විවේකං අනුබ්‍රෑහයෙ**: විවේකය වඩන්නේය.

භෞතික ලාභ ප්‍රයෝජන ලබන මාර්ගය එකකි. නිර්වාණය ලබා ගැනීම සඳහා ඇති මාර්ගය තවත් එකකි. මෙය මනාව හොඳින් දැන තේරුම් ගන්නා බුද්ධ ශ්‍රාවක තෙම ලාභ සත්කාර කෙරේ නො ඇලෙන්නේ ය.

විවරණය

විවේක: විවේකය ත්‍රිවිධ ය. කාය විවේකය, චිත්ත විවේකය හා උපධි විවේකය වශයෙනි. කාය විවේකය නම් පිරිස් වෙත නො ඇලී තනිව විවේකීව වාසය කිරීමයි. ගණසංගණිකාවෙහි නො ඇලී කාය විවේකය වඩන්නැයි වදාරා ඇත්තේ එබැවිනි. ප්‍රථමධ්‍යානයේ සිට රහත් මග දක්වා සියල්ල චිත්ත විවේක නම්. උපධි විවේක නම් නිර්වාණයයි.

ශ්‍රේෂ්ඨත්වයට මාර්ගය ප්‍රඥාවයි.

කාම සුඛාල්ලිකානු යෝගයෙන් තොරව ජීවිතය ගත කළ හැකි ද?
අමරණීයත්වය ගැන විශ්වාස නොකර සදාචාර සම්පන්න විය හැකි ද?
දෙවියන් වහන්සේ කෙනකු වන්දනා නො කර මිනිසාට
ධාර්මිෂ්ඨත්වය කරා ලංවිය හැකි ද?

"හැකිය" යි භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු දෙනු ඇත. මේ සියල්ල සාධනය කර ගත හැක්කේ ප්‍රඥාවෙනි. ශ්‍රේෂ්ඨත්වයට ඇති ඒකායන මාර්ගය නම් ප්‍රඥාවයි. ව්‍යවහාරික ලෝකයේ සියළු කුණාටු උපේක්ෂාවෙන් විඳ දරා ගන්නට ශක්තිය ලබා දෙන්නෙත් සාමය හා සැනසිල්ල ගෙන දෙන්නෙත් ප්‍රඥාව විසිනි.

මහාචාර්ය කාල් පියර්සන්

පණ්ඩිත වග්ග

වරද දැක නිගාකොට ඔවා දෙන නැණවතා නිදන් පෙන්වන්නෙකු වැනිය.

76. නිධීනං'ව පවත්තාරං
යං පස්සෙ වජ්ජදස්සිනං
නිග්ගය්හ වාදිං මෙධාවිං
තාදිසං පණ්ඩිතං භජෙ
තාදිසං භජමානස්ස
සෙය්‍යො හොති න පාපියො (6:1)

පෙන්වා දී වැරදි - නිදන් දක්වා ලන මෙන්
ඔවදන් දෙන නිතින් - නිසි තැන්වල ගරහමින්
කළෝතින් භජනය - එසේ කරනා වියතුන්
දියුනුවක් මිස නැත - විපතක් එබඳු ඇසුරින්

වියතුන් වදන් - සිරසින් දරන්

6 (1) රාධ තෙරනුවන් ගේ ප්‍රවෘත්තිය (76 ගාථාව)

කලක් දුගී බමුණකු ලෙස දිවි ගෙවූ **රාධ තෙරනුවන්** නිමිති කරගෙන භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි මේ ගාථාව දේශනා කරන ලදී.

දුගී අසරණ බ්‍රාහ්මණයකු වූ රාධ, භික්ෂූන් වහන්සේලා ගේ සුළු සුළු සත්කාර කරමින් ආරාමයෙහි කල් ගෙවූහ. භික්ෂූන් වහන්සේ ද ඔහුට කෑම බීම, ඇඳුම් පැළඳුම්, බේත් හේත් සපයා දෙමින් කළගුණ දැක්වූහ. රාධ භික්ෂූන් වහන්සේට පැවිදි වීමේ ආශාවක් ජනිත වුවද කිසිම හිමි නමක් ඔහු පැවිදි නොකළහ. හේ ඒ පිළිබඳව සිත්තැවුලෙන් පසු විය.

මේ අතරතුර දිනක් කුළුණෙන් ලොව බලන භාග්‍යවතුන් වහන්සේ ගේ නුවණ දැලට ඔහු අසු විය. ඔහුට රහත් වීමට පින් මෝරා තිබූ බව දුටු භාග්‍යවතුන් වහන්සේ ඔහු හමුවට ගොස් සුවදුක් විචාළ හ. තමන් සුවසේ ජීවත් වන නමුත් පැවිදි වීමේ ආශාව මුදුන් පත් නොවූ බව හේ බුදු සමිඳුන්ට දන්වා සිටියේ ය.

භික්ෂූන් තමන් වෙත කැඳවූ භාග්‍යවතුන් වහන්සේ "මේ රාධ තමන්ට කළ උදව්වක් ගැන කාටවත් මතක නැත්ද?"යි විමසූ හ. බොහෝ දෙන නිහඬව සිටියදී සැරියුත් මහ රහතන් වහන්සේ "ස්වාමීනි මා පිඬුසිඟා යන අවස්ථාවක දී මොහු, තමන්ට දෙනු පිණිස ගෙනා බත් හැන්දක් මට යොමු කළ අයුරු මතකයි" යි පැවසූ හ.''එසේ නම් සාරිපුත්ත, කළ ගුණ සලකා මොහු පැවිදි කරන්න'' යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ. ඒ අනුව රාධ සැරියුත් හිමිපාණන් ගේ ශිෂ්‍යයකු සේ පැවිදි වූහ.

ඉතා කරුණාවෙන් රාධ රැක ගත් සැරියුත් හිමියෝ ඔහුට භාවනා උපදෙස දුන් හ. අතිශයින් කීකරු සුවිනීත භික්ෂුවක් වූ රාධ ඒ උපදෙස් පිළිපැද ඉතා ඉක්මණින් ම රහත් වූ හ. උන්වහන්සේ ගේ කීකරු විනීත ස්වභාවයත් සැරියුත් මා හිමිපාණන් ගේ කාරුණික ඉවසිලිමත් ගතිගුණත් ගැන භික්ෂූන් වහන්සේලා අතර නිතර කතා බහ ඇති විය.

වරක් ඒ පිළිබඳ භාග්‍යවතුන් වහන්සේ සමග භික්ෂූන් සාකච්ඡා කළ විටෙක උන්වහන්සේ ''මහණෙනි රාධ ආදර්ශයට ගෙන සෑම භික්ෂු නමක් ම විනීත භික්ෂූන් විය යුතුයැයි වදාළහ.

සාරිපුත්ත ද පෙර ජන්මයක කෙතරම් කළගුණ සැළකීම ප්‍රගුණ කළා ද යත් හුදෙකලා හස්ති රාජයෙක්ව ඉපිද තම පයෙහි තුවාලයක් සුව කළ වඩු කාර්මිකයනට කෘතඥතාව දක්වනු වස් තම පුත් ඇත් පැටවා පරිත්‍යාග කළේය" යි වදාළ හ. රාධ තෙරුන් ගේ අවවාද පිළිගැනීමේ ගුණය අගය කරමින් මේ ගාථාව ද දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (76 ගාථාව)

වජ්ජදස්සිනං නිග්ගය්හවාදිං යං මෙධාවිං නිධීනං
පවත්තාරං ඉව පස්සේ, තා දිසං පණ්ඩිතං භජේ ,
තාදිසං භජමානස්ස සෙය්‍යො හොති පාපියො න.

වජ්ජදස්සිනං: වරද පෙන්වා දෙන; **නිග්ගය්හවාදිං**: නිග්‍රහ කළ යුතු තැන එසේ කරන; **යං**: කිසියම්; **මෙධාවිං**: නුවණැත්තකු; **නිධීනං**: නිධානයක්; **පවත්තාරං**: පෙන්වා දෙන්නකු; **ඉව**: මෙන්; **පස්සේ**: දකින්නේ නම්; **තාදිසං**: එබඳු ; **පණ්ඩිතං**: පඬිවරයකු; **භජේ**: ඇසුරු කරන්න; **තාදිසං**: එබන්දකු; **භජමානස්ස**: ඇසුරු කරන්නහුට; **සෙය්‍ය හොති**: යහපතක්ම වන්නේ ය; **පාපියො**: වරදක්; **න**: නොවන්නේය.

යමෙක් තමන් ගේ වරද පෙන්වා දෙමින් නිග්‍රහ කළ යුතු තැන නිග්‍රහ කරත් නම් එබඳු නුවණැත්තා නිධානයක් පෙන්වා දෙන කෙනකු මෙන් සිතා ගෙන ආශ්‍රය කළ යුතුය. එවැන්නන් ආශ්‍රය කරන විට අපට යහපතක් ම මිස විපත්තියක් නො වන්නේ ය.

විවරණය

වජ්ජදස්සිනං නිග්ගය්හ වාදිං: අපගේ වරද දැක එය පෙන්වා දී නිසි නිග්‍රහය කරන්නවුන් මින් අදහස් වෙයි. මේ ගතිගුණ දෙක පවතින්නේ සාධනීය ලෙස විවේචනය කරන්නන් තුළ ය. සමහරුන් වැරදි සොයන්නේ පුද්ගලයන් වනසාලන අටියෙනි. එහෙත් මෙහි දැක්වූයේ නිර්මාණශීලී විවේචනය හෙවත් අඩුපාඩු හදාගෙන නිවරද වන්නට ආධාරී වන කාරුණික විවේචනය ගැන ය. එබඳු කෙනකු වරදක් පෙන්වා දෙන විට එය නිධානයක් පෙන්වා දීම සේ ගත යුතුය. තම වරද දුරුකර ගෙන වඩාත් පරිපූර්ණ, නිවැරදි හොඳ ගුණ ඇති කාගේත් ප්‍රශංසාවට ලක්වන තැනැත්තකු වීම සඳහා කෙරෙන උපකාරයක් වශයෙන් එබඳු විවේචන සලකන විට මේ කියුමෙහි අගය වැටහෙනු ඇත.



ඔවාදෙන, අනුශාසනා කරන, පවින් වළක්වන තැනැත්තා සුදනනට ප්‍රිය ය. දුදනට අප්‍රියය.

77. ඔවදෙය්‍යානුසාසෙය්‍ය
අසබ්භා ච නිවාරයෙ
සතං හි සො පියො හොති
අසතං හොති අප්පියො (6.2)

ඔවදන් අනුසාසනා
කර නරකින් වලකනා
අයට ප්‍රියයි සත්දනා
දුදනන් ප්‍රිය නොම වෙනා

සුදනන් හට දුන් ඔවදන් - අමවන් වේ සවණට වන්

6 (2) අස්සජි හා පුනබ්බසුක දෙනම ගේ කථාව (77 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **අස්සජි** හා **පුනබ්බසුක** හිමිවරුන් අරබයා මේ ගාථාව වදාළ සේක.

අස්සජි හා පුනබ්බසුක යන නම් ඇති භික්ෂූ දෙනම යහපත් පවුල් වලින් අවුත් අග්‍රශ්‍රාවක හිමිවරුන් දෙදෙන වෙත පැවිදි වූහ. එහෙත් ඔවුහු විනය ගරුක නොවී ලජ්ජා භය නැතිව කෙළිලොල් ජීවිත ගත කළහ. ඔවුන් කීටාගිරියේ වාසය කළේ තවත් පන්සියයක් පමණ පිරිවර භික්ෂූන් ද කැටිව ය.

ඔවුහු භාවනා කරනු වෙනුවට මල් වවා මල් දම් ගොතා ළඳුන්ට දීම, සුරා පානය, නැටුම් ගැයුම් කිරීම වැනි විනය විරෝධී ක්‍රියා රැසක්ම කරමින් එම විහාරස්ථානයට කිසිම ගුණවත් සිල්වත් හිමි නමකට යන්නට බැරි තත්ත්වයක් උදා කළ හ.

මේ දුසිරිත් ඇසූ භාග්‍යවතුන් වහන්සේ සැරියුත් මුගලන් මහ රහත් දෙනම කැඳවා "ඔබ දෙපල කීටාගිරියට ගොස් මේ කුලදූෂණාදිය කරන මහණුන්ට අවවාද කරන්න. යමෙක් අවවාද ප්‍රතික්ෂේප කරත් නම් ඔවුන් නෙරපා හරින්න. පිළිගන්න අයට නැවත නැවත අවවාද කර නගා සිටුවන්න." යි උපදෙස් දුන් හ.

අග්‍රශ්‍රාවක දෙනම ද බුද්ධාවවාදය පරිදි කීටාගිරියට ගොස් එම භික්ෂූන් කැඳවා උපදෙස් දුන් හ. ඇතැම් භික්ෂූහු ඒ අවවාද පිළිගෙන සදාචාර සම්පන්න වූහ. සමහරු නැවත ගිහිගෙට ම ගිය හ. තවත් සමහරුන් බලහත්කාරයෙන් යවන්නට සිදු විය.

මේ ඇරබ භාග්‍යවතුන් වහන්සේ අවවාද ප්‍රිය නොවන්නේ අඥානයන්ට පමණකැයි වදාරා මේ ගාථාව ද දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (77 ගාථාව)

ඔවදෙය්‍ය අනුසාසෙය්‍ය,අසබ්භා ච නිවාරයෙ, සො සතං හි පියො හොති, අසතං අප්පියො හොති

ඔවදෙය්‍ය: අවවාද කරන්නේ නම්; **අනුසාසෙය්‍ය**: අනුශාසනා කරන්නේ නම්; **අසබ්භා ච නිවාරයෙ**: සමාජ විරෝධී කටයුතු වලින් වලකන්නේ නම්; **සො**: එබඳු තැනැත්තා; **සතං හි**: සත්පුරුෂයනට; **පියො හොති**: ප්‍රිය වන්නේ ය; **අසතං**: අසත් පුරුෂයනට; **අප්පියො හොති**: අප්‍රිය වන්නේ ය.

අවවාද කරන, අනුශාසනා කරන, අසභ්‍ය පැවතුම් වලින් වළකන තැනැත්තා සත්පුරුෂයාට ප්‍රියවෙයි. අසත් පුරුෂයන්ට ඔහු ප්‍රිය නොවන්නේ ය.

විවරණය

ඔවදෙය්‍ය-අනුසාසෙය්‍ය: අවවාද කිරීම හා අනුශාසනා කිරීම යන මේ වචන දෙකහි අර්ථ විභේදයත් ඇතැම් අටුවාවල එයි. යමක් කළ පුද්ගලයකු වෙත ගොස් ඔහු ඇසුරු කොට කළ යුතු-නොකළ යුතු දේ කියා දීම අවවාද වෙයි. යමක් කර නැතත්, මෙසේ කළ හොත් මෙසේ වෙයි, මෙය නොකළොත් මෙසේ වෙයි ආදී වශයෙන් අනාගත චර්යාව පිළිබඳ කෙරෙන උපදෙස් දීම අනුශාසනා නම්. අවවාදය අවවාද ලබන පුද්ගලයා කායික වශයෙන් අභිමුඛව සිටින විට කරන්නකි. අනුශාසනාව අනභිමුඛයේ වුවද දූතයකු මගින්, ලිපියක් මගින් වැනි කිසියම් සන්නිවේදන මාධ්‍යයකින් කළ හැකි ය. තවත් අර්ථයක් නම්, වරක් පමණක් කරන්නේ අවවාදයයි. දිගින් දිගට ම කරන්නේ අනුශාසනයයි යන්න ය.

අසබ්භාව නිවාරයෙ: සමාජයට, සභාවට අයෝග්‍ය වූ දෙයින් වළකා ලීම. ප්‍රාණඝාතය, සොරකම් කිරීම වැනි පංච දුෂ්චරිතය සමාජ විරෝධී චර්යා වෙයි. මේවායින් වළකින පුද්ගලයා සමාජයේ අනිකුත් පුරවැසියනට බිය සැක නැතිව ජීවත් වීමට යෝග්‍ය පරිසරය සකසා දෙයි. සියළු සදාචාර චර්යාවන් ගේ පසුබිමෙහි ඇත්තේ මෛත්‍රී හා කරුණා සහගත හැඟීම්ය. මෙම චේතනාවන් ගෙන් තොරව කෙරෙන හැසිරීම් සමාජ විරෝධී බව කිව හැක. මෛත්‍රී හා කරුණා ඇත්තකුට පංච දුෂ්චරිතයෙහි යෙදිය නො හැක. රාග, ද්වේෂ හා මෝහ වැනි පාපී චේතනා ඇත්තනට සමාජ ද්‍රෝහී හැසිරීම් වල යෙදිය හැකයි.

යමකු ගේ චරිතය ගොඩ නැගෙන්නේ තමන් ගේ ම චර්යාව නිසා ය. කෙනෙකුට තවත් කෙනෙකුන් ගේ චරිතය යහපත් කළ නොහැක. හුදෙක් අවවාද අනුශාසනා මගින් උදවු කළ හැකි වුව ද තම සුසිරිත තමා විසින් ම වර්ධනය කළ යුත්තේ ය.

"පාපය අතහැර දැමිය හැකයි. එසේ නොහැකි නම් පව් නො කරන්නැයි මම උපදෙස් නො දෙමි. කුසලය වර්ධනය කළ හැකිය. එසේ නොහැකි නම් කුසලය වර්ධනය කරන්නැයි මම උපදෙස් නො දෙමි." යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ. යමකුට සැබවින් ම හැකි වන්නේ මෙබඳු අවවාද කිරීම පමණි.



පව්ටු මිතුරන් හා සැහැසි පුරිස් නො සෙවිය යුතුය. කළණ මිතුරන් හා උතුම් පුරිස් සෙවිය යුතුය

78. න භජෙ පාපකෙ මිත්තෙ
න භජෙ පුරිසාධමෙ
භජෙථ මිත්තෙ කල්‍යාණෙ
භජෙථ පුරිසුත්තමෙ (6:3)

පව්ටු මිතුරන් ඇසුරු නොකරනු
පහත් මිනිසුන් දුරින් දුරලනු
කළණ මිතුරන් උතුම් මිනිසුන්
පමණක්ය ඔබ ඇසුරු කලයුතු

කරනු ඇසුරු - කලණ මිතුරු

6 (3) ඡන්න හිමියන් ගේ වස්තුව (78 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරන සේක් **ඡන්න හිමියන්** අරබයා මේ ගාථාව වදාළ සේක.

මහාභිනිෂ්ක්‍රමණය කරන අවස්ථාවේදී සිදුහත් කුමරුන් මාලිගයෙන් පිටත්ව අසුපිටින් ගිය ගමනේදී සිදුහත් කුමරුන් හා එක්ව ගියේ ඡන්න අමාත්‍යයා ය. පසුව සිදුහත් කුමරුන් බුදු බව ලත් බව ඇසූ ඡන්න බුදුරදුන් සොයා අවුත් පැවිද්ද ලද්දේ ය.

පැවිද්ද ලත් පසු බුදු රදුන් ගේ අභිනිෂ්ක්‍රමණයට උදවු කිරීමේ භාග්‍යය හිමි වීම හේතුවෙන් ඡන්න හිමියෝ මානයෙන් පිම්බී සිටිය හ. "අභිනිෂ්ක්‍රමණ කරන වෙලාවේ මමයි තනියට හිටියේ. මම ඇරෙන්න කවුරුවත් හිටියේ නෑ එදා. ඒ වුණාට දැන්නම් සැරියුත් හාමුදුරුවොයි මුගලන් හාමුදුරුවොයි දෙන්නා 'අපි තමයි අග්‍ර ශ්‍රාවක' කියා ගෙන හැම තැනම යනවා" යි ඡන්න හිමියෝ නිතරම දොස් පරොස් කී හ.

භාග්‍යවතුන් වහන්සේ ඡන්න හිමි කැඳවා අවවාද කළ හ. ඒ අවස්ථාවේ නිහඬව අවවාද අසා සිටි නමුත් අග සවුවන් විවේචනය කිරීම අත නොහරින ලදී. ඒ නිසා ඡන්න හිමි නැවත ගෙන්වා අවවාද කරන්නට භාග්‍යවතුන් වහන්සේට සිදු විය. තුන් වරක් ම අවවාද කළ ද වෙනසක් නොවූ හෙයින් භාග්‍යවතුන් වහන්සේ අවසන් වරට ද මෙසේ වදාළ හ. "ඡන්න, මේ උත්තමයන් වහන්සේලා දෙනම ඔබට හිතවත්ය. ඒ අය ඇසුරු කරන්න. උන්වහන්සේලාත් සමග සමගියෙන් සතුටින් වසන්න."

දිගින් දිගට ම මෙසේ බුදුරදුන් විසින් උපදෙස් දෙන ලද නමුත් ඡන්න හිමියෝ අත්තනෝමතිකව ක්‍රියා කරමින් අනිකුත් හිමිවරුන්ට නිගරු කරමින් හැසුරුණ හ. තමන් ජීවතුන් අතර වසන තාක් ඡන්න වෙනස් නොවන බව පැවසූ භාග්‍යවතුන් වහන්සේ, තමන් වහන්සේ ගේ පරිනිර්වාණයෙන් පසු උන්වහන්සේ වෙනස් වෙතැයි පැවසූ හ. පරිනිර්වාණ අවස්ථාවේදී අනඳ හිමියන් ඇමතූ බුදුරජාණන් වහන්සේ ඡන්න හිමියනට බ්‍රහ්මදණ්ඩය පණවන සේ උපදෙස් දුන් හ. බ්‍රහ්මදණ්ඩය නම්, වරදකරු සහමුලින් ම නො තකා හැරීමයි. බුද්ධ පරිනිර්වාණයෙන් පසු තමන්ට බ්‍රහ්මදණ්ඩය පණවා ඇති බව ඇසූ ඡන්න හිමියෝ බලවත් සංවේගයට පත්ව තුන් වරක් ම සිහි නැතිව වැටුණ හ. තම වරද පිළිගෙන භාවනා කර රහත් ඵලය ලබා ගත් උන්වහන්සේ සංඝයා කමා කරවා ගෙන දඬුවම ඉවත් කර ගත් හ.

විවරණාත්මක අනුවාදය (78 ගාථාව)

පාපකෙ මිත්තෙ න භජෙ පුරිසාධමෙ න භජෙ කල්‍යාණෙ මිත්තෙ භජේථ පුරිසුත්තමෙ භජේථ.

පාපකේ මිත්තෙ: නරක මිතුරන්; **න භජෙ**: ඇසුරු නො කරන්න; **පුරිසාධමෙ**: අධම පුරුෂයන්; **න භජෙ**: ආශ්‍රය නො කරන්න; **කල්‍යාණ මිත්තෙ**: යහපත් මිත්‍රයන්; **භජේථ**: ආශ්‍රය කරන්න; **පුරිසුත්තමෙ**: උතුම් පුරුෂයන්; **භජේථ**: ආශ්‍රය කරන්න.

පාප මිත්‍රයන් ඇසුරු නො කරන්න. පහත් මිනිසුන් ඇසුරෙන් වලකින්න. කළණ මිතුරන් ම ඇසුරු කරන්න. උතුම් අය ම ආශ්‍රය කරන්න.

විවරණය

මිත්ත: බෞද්ධ සාහිත්‍යයෙහි මිත්‍රත්වය පිළිබඳව ගැඹුරු හා සිත්ගන්නා සුලු විවරණ දක්වා තිබේ. සමස්ත බෞද්ධ චරණය ම කල්‍යාණ මිත්‍රත්වය මත රඳා ඇතැ යි ද එක් තැනක සඳහන්ව ඇත.

අට්ඨකථාවන් හි මිත්‍රයන් වර්ග හතක් දක්වා තිබේ. එනම්:-

1. **පාණ සඛා**: අවන්හලේ දී සුරා පානය සඳහා මිතුරුවන්නෝ,
2. **සම්මිය සම්මියො**: හමු වූ විට පමණක් මිත්‍රත්වය දක්වන්නෝ,
3. **අත්‍ථෙසු ජාතෙසු**: යම්කිසි කාරියක් කර ගැනීම සඳහා මිතුරු දම් දක්වන්නෝ,
4. **උපකාරක**: අවශ්‍ය අවස්ථාවට ඉදිරිපත්ව උදවු කරන මිත්‍රයෝ,
5. **සමාන සුඛ දුක්ඛ**: සැපේදී මෙන් ම දුකේදී ද එකට සිටින මිත්‍රයෝ,
6. **අත්ථක්ඛායි**: වරදින් වළකා යහ මඟ යොදවමින් දියුණුවට අතදෙන මිත්‍රයෝ,
7. **අනුකම්පක**: අපට විපතක් වන විට දුක් වන අපේ සැපයේ දී සතුටු වන සුහද මිතුරෝ. මොවුහු යම් යම් අය අපේ අගුණ පවසන විට එය වලකා ගුණ කියන විට ප්‍රශංසා කරති.

හොඳ මිතුරන් හඳුන්වන්නේ කල්‍යාණ මිත්‍ර නමිනි. නරක මිතුරෝ පාපමිත්ත වශයෙන් හැඳින්වෙති.

සිඟාලෝවාද සූත්‍රයෙහි මිත්‍රයන් වගී 8 ක් දැක්වෙයි. එයින් හතර වගී යක් හොඳ මිතුරෝ ය. හතර වර්ගයක් නරක මිතුරෝ ය.

හොඳ මිතුරෝ නම්;

(1) **උපකාරක මිත්ත**: අවශ්‍ය අවස්ථාවේදී ඉදිරිපත්ව උපකාර කරන්නා
(2) **සමාන සුඛ දුක්ඛ මිත්ත**: දුකේ දී හා සැපේදී එකසේ සිටින මිත්‍රයා.
(3) **අත්ථක්ඛායී මිත්ත**: හිත වැඩ සලසන, විපතේ දී සුරකින මිත්‍රයා.
(4) **අනුකම්පක මිතත**: දියුණුවේදී සතුටු වන, පසසන, සුහද, මිතුරු, යන සිවු දෙනා ය.

නරක පාප මිත්‍රයෝ නම්;

(1) **අඤ්ඤදත්‍ථුහර**: යමක් ලබා ගැනීම සඳහා ම මිතුරු වන තැනැත්තා.
(2) **වචීපරම**: වචනයෙන් පමණක් උදවු කරන තැනැත්තා.
(3) **අනුප්පියභාණී**: හොඳ දේ මෙන්ම නරක දේත් අනුමත කරන තැනැත්තා.
(4) **අපාය සහාය**: මත්පැන් වැනි දුසිරිත් කෙරේ යොමු කරන මිත්‍රයා යන සිවු දෙනා ය.



දහම් රස බොන තැනැත්තා සුවසේ වෙසේ. ඒ නුවණැත්තා අරියයන් විසින් දන්නා ලද දහම්හි මොනවට ඇලේ.

79. ධම්මපීති සුඛං සෙති
විප්පසන්නෙන චෙතසා
අරියප්පවෙදිතෙ ධම්මෙ
සදා රමති පණ්ඩිතො (6:4)

දම් රස විඳ වෙසෙති
සුවසේ සිත් පහන් කර
උතුමන් දෙසූ දහමෙහි
සැමදා ඇලෙති පඬිවරු

වෙසෙමු සුවයෙන් - දහම ඇසුරෙන්

6 (4) මහා කප්පින හිමියන් ගේ කතා පුවත (79 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **මහා කප්පින මහ රහතන් වහන්සේ** ඇරබ මේ ගාථාව වදාළ සේක.

මහා කප්පින කුක්කුටවතියෙහි රජතුමා ය. එතුමා ගේ දේවිය වූයේ අනෝජා ය. රට පාලනයෙහි ලා උපකාර පිණිස එතුමාට ඇමතිවරු දහසක් වූ හ. දිනක් ඇමතිවරුන් පිරිවරා උයනට ගිය රජතුමාට සැවැත් නුවර සිට පැමිණි වෙළඳුන් පිරිසක් හමු විය. ඔවුන් වෙතින් ත්‍රිවිධ රත්නය ගැන දැනගත් රජතෙම ඇමතිවරුන් ද කැටුව වහා ම සැවැත්නුවර බලා පිටත් විය.

ඒදින මහා කරුණාවෙන් ලොව බලා වදාරන භාග්‍යවතුන් වහන්සේට මහා කප්පින රජතුමා සහ පිරිස දිස් විණි. ඔවුනට රහත් වීමට හැකියාව ඇති බව ද උන්වහන්සේට වැටහිණි. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් හමු වීම පිණිස සැවැත් නුවරින් යොදුන් එකසිය විස්සක් දුර තැනකට වැඩම කළ හ. එහි චන්ද්‍රභාග නදී ඉවුරේ නුග තුරු සෙවනක උන්වහන්සේ වැඩ හුන් හ. භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන් තැනට මහා කප්පින රජ සහ ඇමතිවරු සම්ප්‍රාප්ත වූහ. සවනක් බුදුරැසින් බබලමින් වැඩසිටි බුදුරදුන් දුටු ඔවූහු උන්වහන්සේ වෙත එළැඹුණ හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට ධර්මය දේශනා කළ හ. ඒ අසා ඔවූහු හැමදෙන සෝවන් ඵලයට පත්ව පැවිද්ද අයැද සිටිය හ. බුදුරජාණන් වහන්සේ ඔවුන් හැම දෙන ඒහිභික්ඛුපබ්බජ්ජාවෙන් පැවිදි කළහ.

රජතුමා සැවැත් නුවරට ගිය පුවත ඇසූ අනෝජා දේවිය ඇමතිවරුන් ගේ බිරින්දන් දහස ද ගෙන්වා ගෙන රජතුමා ගිය මඟින් ම සැවැත් නුවර බලා පිටත් වූවා ය. ඔවූහු ද බුදුරදුන් වැඩ සිටි තැනට පැමිණ සවණක් බුදු රැස් විහිදුවමින් වැඩ සිටි බුදුන් දැක පැහැදී නමස්කාර කළ හ. එම අවස්ථාවේදී භාග්‍යවතුන් වහන්සේ දේවිය හා පිරිසට රජතුමා හා පිරිස නොපෙනෙන පරිදි අධිෂ්ඨාන කළ හ.

රජතුමා හා පිරිස කොහිදැයි විමසූ දේවියට තව නොබෝ වේලාවකින් ඔවුන් ඔබට දැකගත හැකි යැයි වදාළ භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට ධර්ම දේශනා කළ හ. දේවිය හා පිරිස දහම් අසා සෝවාන් වූ අතර එම දෙසුමට සවන් දී සිටි රජතුමා ඇතුළු පිරිස රහත් ඵලය ලැබූහ. අනතුරුව ඒ වන විට පැවිද්ද ලබා සිටි රජතුමා සහ ඇමති පිරිස දේවීනට දක්නට ලැබිණි. එම භික්ෂු පිරිස තම සැමියන් බව හඳුනාගත් ඔවූහු තමන් ද පැවිදි කරන සේ බුදුරදුන්ගෙන් ඉල්ලා සිටිය හ. බුදුරදුන් ගේ උපදෙස් පරිදි සැවැත් නුවරට ගිය ඔවූහු පැවිද්ද ලබා නොබෝ දිනකින් ම රහත් ඵලය ලැබූ හ. භාග්‍යවතුන් වහන්සේ ද දහසක් භික්ෂූන් පිරිවරා දෙව්රම් වෙහෙරට වැඩම කළ හ.

දෙව්රම් වෙහෙර වැඩ වසන මහා කප්පින හිමියන් දිවා රෑ විවේකයෙන් පසුවන අවස්ථාවන් හි "මොන තරම් සුවදායක ද?" (අහෝ සුඛං) යි නිතර පවසනු අසන්නට ලැබිණ. ඒ ඇසූ භික්ෂූහු ඒ බව භාග්‍යවතුන් වහන්සේට සැළ කළ හ. "ම පුත් කප්පින ධර්මාස්වාදය විඳ ගනිමින් සිත පහන් වූ හෙයින් සුවපත්ව එම සුවය ගැන උද්න් අනයි" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ හ.

විවරණාත්මක අනුවාදය (79 ගාථාව)

ධම්ම පීති විප්පසන්නෙන චෙතසා සුඛං සෙති පණ්ඩිතො අරියප්පවෙදිතෙ ධම්මෙ සදා රමති.

ධම්ම පීති: දහම් රස විඳින තැනැත්තා; **විප්පසන්නෙන චෙතසා**: පහන් සිතින්; **සුඛං සෙති**: සුවපත්ව වසයි; **පණ්ඩිතො**: නුවණැත්තා; **අරියප්පවෙදිතෙ**: ආර්යයන් වහන්සේලා විසින් වදාරන ලද; **ධම්මෙ**: ධර්මයෙහි; **සදා**: හැමකල; **රමති**: ඇලෙයි.

ධර්මයෙහි රස විඳින තැනැත්තා ප්‍රසන්න සිතින් සුවසේ වාසය කරයි. නුවණැත්තා බුද්ධාදී ආර්යයන් වහන්සේලා විසින් වදාරන ලද ධර්මයෙහි හැම කල සිත් අලවයි.

විවරණය

ධම්ම පීති සුඛං සෙති: යන්නෙන් ධර්මය ඉගෙන පිළිපදිමින් එමගින් ආස්වාදයක් ලබා ගන්නා තැනැත්තා සුවසේ වසන බව ය. මෙහි පීති යන්නෙන් 'පානය කරන' යන අදහස ලැබේ. ධර්මය පානය කිරීම යන්නෙන් එය ජීවිතයට එක්කර ගැනීම අදහස වෙයි.

අරිය: නම් කෙලෙසුන් දුරු කර උසස් බවට පත් උත්තමයෝ ය. ජාති වාචක 'ආර්ය' යන්න මෙයින් නො ගැණෙයි. බුදු සමයෙහි දී ආර්ය වන්නේ උදාර වූ චරිත ශක්තියත්, ගුණ වගාවත් ඇති බුදුන්, රහතුන් වැනි උත්තමයෝ ය.

දිය ගෙනයන්නෝ දිය ද, හී වඩුවෝ හී ද, ලී වඩුවෝ ලී ද සකස් කරති. එසේ පණ්ඩිතයෝ සිත දමනය කරත්.

80\. උදකං හි නයන්ති නෙත්තිකා
උසුකාරා නමයන්ති තේජනං
දරුං නමයන්ති තච්ඡකා
අත්තානං දමයන්ති පණ්ඩිතා (6:5)

දිය හරවද්දී ගොවියන්
හී නවද්දී කම්කරුවන්
ඇද හරිද්දී වඩුවන් ලී
නැණැති දනෝ නමති තමන්

තමන් සිත දමනය කරති පඬිවරු

6 (5) පණ්ඩිත සාමණේරයන් ගේ වස්තුව (80 ගාථාව)

පණ්ඩිත සාමණේරයන් අරබයා භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි ය.

සැවැත් නුවර ධනවතකු ගේ පුත්‍රයා වූ පණ්ඩිත වයස අවුරුදු හතේදී පැවිදි බිමට පත් විය. දිනක් සැරියුත් හිමියන් ද සමග පිඬුසිඟා යන අතරතුර ගොවියන් තම කෙත් වලට ජලය හරවන ආකාරය උන්වහන්සේ ගේ නෙත ගැටිණි. "සිත් පිත් නැති ජලය අප කැමති ඕනෑම තැනකට හරවා ගෙන යත හැකි ද?" යි පණ්ඩිත සාමණේරයෝ සැරියුත් මහ තෙරුන්ගෙන් විමසූ හ. "ඔව්. අප කැමති ඕනෑම තැනකට ජලය ගෙන යත හැකියි" සැරියුත් මහ තෙරණුවෝ පිළිතුරු දුන් හ. තවත් මඳ දුරක් ගිය පසු පණ්ඩිත සාමණේරයන් ගේ නෙත ගැටුණේ හී වඩුවන් උණ ලී ඇද ඇර මුවහත් කර ඊතල හදන ආකාරයයි. තවත් ටිකක් දුර ගිය විට වඩු කාර්මිකයන් ලී දඬු තමා කැමති පරිදි කපමින් ඇද හරිමින් හැඩ වැඩ යොදමින් කරත්ත රෝද වැනි දේ නිර්මාණය කරන අයුරු දක්නට ලැබිණ.

මේ සියල්ල දුටු සාමණේර නම මෙසේ සිතීය. "ජලය අප කැමති කැමති තැනකට ගෙන යා හැකි නම්, ඇද ඇති උණ ලී ඇද ඇර උල් කර ඊතල තනා ගත හැකි නම්, සිත් පිත් නැති ලී දඬු කපා කැමති හැඩයේ උපකරණ තනා ගත හැකි නම්, සිත් ඇති මට මා රිසි පරිදි සිත දමනය කර කෙලෙසුන් ගෙන් මුදා සංවර කර ගන්නට බැරි ඇයි?" එසේ සිතා ගුරු හිමිපාණන් ගෙන් අවසර ගෙන පිඬුසිඟා යාම නවතා හැරී අවුත් තම ඕවරකයට පිවිසුණු පණ්ඩිත සාමණේරයෝ උත්සාහයෙන් හා උද්යෝගයෙන් භාවනා කරන්නට පටන් ගත්හ. ඒ දුටු දෙව්වරුන් පවා ප්‍රසාදයට පත්ව ආරාමය හා පරිසරය නිහඬව තබා උදව් කළ බව කියවෙයි. දවල් දන් වේලාව එළඹෙන විට සාමණේරයන් වහන්සේ අනාගාමී ඵලය ලබා තිබිණි.

මේ වන විට සැරියුත් මහ රහතන් වහන්සේ සාමණේරනමත් සමග පිණ්ඩපාතය රැගෙන ආපසු වැඩම කරමින් සිටියහ. සාමණේරනම අනාගාමී ඵලය ලබා ඇති බවත් දිගටම භාවනාවෙහි නිරත වුවහොත් නොබෝ වේලාවකින් රහත් ඵලය ලබන බවත් දිවැසින් දුටු භාග්‍යවතුන් වහන්සේ සැරියුත් හිමියන්, සාමණේර හිමියන් විසූ ඕවරකයට පිවිසීම වලකා ලන්නට ඉටා ගත් හ. උන් වහන්සේ සැරියුත් හිමියන් වඩිනා මඟට ගොස් ප්‍රශ්න කීපයක් අසා සාකච්ඡාවේ නිරත වූහ. එම සාකච්ඡාව සිදුවන අතරතුර පණ්ඩිත සාමණේරයෝ රහත් ඵලය ලද හ. මේ වන විට උන්වහන්සේ පැවිදිවී ගෙවී තිබුණේ දින හතක් පමණි. අටවන දින වන විට උන්වහන්සේ රහත් නමක් බවට පත් වූහ.

මේ කරුණ සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේලා ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "යමකු අවංකව උනන්දුවෙන් භාවනා කරන විට ශක්‍රාදී දෙව්වරු පවා ආරක්ෂාව සලසති. පණ්ඩිත සාමණේරයන් ගේ භාවනාවට බාධාවක් නොවනු පිණිස මම ද සැරියුත් තෙරණුවන් නවතා සිටියෙමි. පරිසරයෙන් ලත් පාඩම් අනුව සාමණේරයෝ දැන් මහ රහතන් වහන්සේ නමක් බවට පත්ව සිටිති" යි වදාළ හ.

විවරණාත්මක අනුවාදය (80 ගාථාව)

නෙත්තිකා හි උදකං නයන්ති උසුකාරා තේජනං නමයන්ති තච්ඡකා දාරුං නමයන්ති පණ්ඩිතා අත්තානං දමයන්ති.

නෙත්තිකා: දියාළුවෝ (දිය ගෙන යන්නෝ); **හි**: ඒකාන්තයෙන්; **උදකං**: ජලය; **නයන්ති**: ගෙනයති; **උසුකාරා**: හී වඩුවෝ; **තේජනං**: ඊතල; **නමයන්ති**: හැඩ ගන්වති; **තච්ඡකා**: වඩුකාර්මිකයෝ; **දාරුං**: ලී; **නමයන්ති**: හැඩ ගන්වති; **පණ්ඩිතා**: නුවණැත්තෝ; **අත්තානං**: තමා; **දමයන්ති**: දමනය කරති.

දියාළුවෝ හෙවත් ජලය හරවා ගන්නා ගොවියෝ තමා රිසි පරිදි ජලය හරවා ගෙන යති. ඊතල හදන්නෝ ඊතලය තමන් කැමති පරිදි ඇද හැර සකස් කර ගනිති. වඩු කාර්මිකයෝ ලී දඬු කපා නවා හැඩ කර භාණ්ඩ නිර්මාණය කරති. නුවණැත්තෝ තමා දමනය කරති.

විවරණය

නෙත්තිකා: උසුකාරා: තච්ඡකා: නමින් දක්වා ඇත්තේ ක්ෂේත්‍ර තුනක දක්ෂයෝ ය. තම තමාට අදාළ කාර්යයන්හි ඔවුහු විශේෂඥයෝ ය. මේ තෙවර්ගයේ ම ශිල්පීහු සිත් පිත් නැති දේ තමා රිසි පරිදි නමා හැඩ කොට භාවිත කරති. ජලය, උණ ලී හා දැව දඬු ඔවුන් රිසි පරිදි භාවිත කරති. නුවණැත්තෝ මෙ පරිදිම තමා රිසි පරිදි තම සිත දමනය කරති. සිත දමනය කිරීම පෙර දැක්වූ ක්‍රියා තුනට ම වඩා අපහසු ය.

ගල් පව්ව යම් සේ සුළඟින් නො සැලේ ද, එසේ ම නුවණැත්තෝ නිගා, පැසසුම්හි නො සැලෙති.

81. සෙලො යථා ඒකඝනො
වාතෙන න සමීරති
එවං නින්දා පසංසාසු
න සමිඤ්ජන්ති පණ්ඩිතා (6:6)

මහ ගල් පර්වතයක් මෙන්
නො සැලෙන සැඩ වා පහරින්
නො සැලෙත් පඬිවරු ලැබුමෙන්
කිත් පැසසුම් හෝ අවමන්

නුවණැත්තෝ නො සැලෙන්නෝ

6 (6) ලකුණ්ටක භද්දිය තෙරුන්ගේ වස්තුව (81 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි බුදුරජාණන් වහන්සේ **භද්දිය තෙරුන්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

ජේතවනාරාමයෙහි වාසය කළ භද්දිය තෙරුන් වහන්සේ මිටි වූ හෙයින් අවශේෂ භික්ෂූහු උන්වහන්සේට ලකුණ්ටක භද්දිය යැයි නම් කළ හ. උන්වහන්සේ ඉතා නිහතමානී සුහද පැවතුම් ඇති කෙනෙක් වූ හ. සියල්ලෝ ම උන්වහන්සේ සමග විහිළු කළහ. සතුටු සාමීචි කතා කළ හ. සමහරු හිස නිකට අත ගෑහ. නාසයෙන් ඇල්ලූ හ. සමහරු "කොහොම ද මාමේ, පන්සලේ ජීවිතේ කොහොම ද? එපාවෙන්නේ නැත් ද?" යි විමසති. එහෙත් භද්දිය හිමියෝ කිසි විටෙක අමනාප නො වෙති. අවමන් වදනක් නො තෙපලති. යටි සිතින් වත් කෝප නොවෙති.

ලකුණ්ටක භද්දිය තෙරුන් ගේ මේ ඉවසිලිමත් ස්වභාවය ගැන භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන්හ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "රහත් නමක් කිසි විටෙක කෝප නො ගනියි, නපුරු වචනයක් නො කියයි. නපුරක් නො සිතයි. උන්වහන්සේ සුළඟින් නො සැලෙන පර්වතයක් හෝ ගල් කුළක් බඳු ය. රහතන් වහන්සේ නින්දාවෙන් හෝ ප්‍රශංසාවෙන් කම්පා නොවෙති" යි වදාළ හ.

විවරණාත්මක අනුවාදය (81 ගාථාව)

යථා එකඝනො සෙලො වාතෙන න සමීරති. එවං
පණ්ඩිතා නින්දා පසංසාසු න සමිඤ්ජන්ති.

යථා: යම්සේ; **එකඝනො**: ඝණ; **සෙලො**: ගල් පර්වතයක්; **වාතෙන**: සැඩ සුළඟින්; **න සමීරති**: නො සැලේ ද; **එවං**: ඒ ආකාරයෙන් ම; **පණ්ඩිතා**: නුවණැත්තෝ; **නින්දා පසංසාසු**: නින්දාවෙන් හෝ ප්‍රශංසාවෙන්; **න සමිඤ්ජන්ති**: නො සැලෙති.

සැඩ සුළඟින් නො සැලෙන මහ ගල් පවුවක් මෙන් නුවණැත්තා ද නින්දාවෙන් හෝ ප්‍රශංසාවෙන් කම්පනයට පත් නො වෙයි.

විවරණය

නින්දා පසංසාසු: සාමාන්‍ය මිනිස්සු ජීවිතයේ ලබන මිහිරි හා අමිහිරි අත් දැකීම් නිසා මානසික සමතුලිතතාව නැති කර ගනිති. යමක් වැරදුණු විට ඔවූහු ඉච්ඡා භංගයට හා අසහනයට පත් වෙති. සාර්ථක වූ විට ප්‍රීතියෙන් ඉපිලෙති. එහෙත් නුවණැත්තෝ සියල්ල එකසේ පිළිග නිති. සාමාන්‍යයෙන් ලෝවැසියනට මුහුණ පාන්නට වන අත් දැකීම් අෂ්ට ලෝක ධර්ම වශයෙන් හැඳින්වේ.

ලාභො අලාභො, අයසො යසො ච,
නින්දා පසංසා ච, සුඛං ච දුක්ඛං
එතෙ අනිච්චා මනුජෙසු ධම්මා
අසස්සතී විපරිණාම ධම්මා

යනුවෙන් දක්වා ඇති පරිදි, ලාභ, අලාභ, අයස, යස, නින්දා, ප්‍රශංසා, සැප හා දුක යන මේවා අපට විඳගන්නට සිදු වෙයි.

සාමාන්‍ය පෘථග්ජනයෝ මේවා හමුවේ සැලෙති. එහෙත් නුවණැත්තන් මේවා නිසා කම්පනයට පත් නො වන්නේ ලෝක ධර්මයන්හි වෙනස් වන අනිත්‍ය ස්වභාවය ඔවුන් දන්නා හෙයිනි. ඔවුන් සැඩ සුළඟට නො සැලෙන ගල් පර්වතයකට උපමා කර ඇත්තේ එහෙයිනි.

නැණවතුන් අෂ්ටලෝක ධර්මයට මුහුණ දෙන ආකාරය විස්තර කරන තවත් ගාථාවක් මෙසේ ය.

එතෙච ඤත්වා සතිමා සුමෙධො
අවෙක්ඛතී විපරිණාම ධම්මා
ඉට්ඨස්ස ධම්මා න මථෙන්ති චිත්තං
අනිට්ඨතො න පටිඝාතමෙති.

"නුවණැත්තා මේ දේ සිහි නුවණින් විමසා බලයි. ඒවා වෙනස් වන සුළු බව නිරීක්ෂණය කර තේරුම් ගනියි. ප්‍රිය මනාප දේ සිදු වූ පමණින් සිත කුල්මත් කර නො ගනියි. අකැමැති දේ සිදු වූ විට කෝපයට හෝ පසුතැවිල්ලට පත් නො වෙයි." මෙසේ අනිත්‍ය ස්වභාවය තේරුම් ගැනීම ඔහු ගේ උපේක්ෂා පරවශ ආකල්පයට පදනම් වෙයි.

ලකුණ්ටක භද්දිය: ලකුණ්ටක භද්දිය තෙරුණුවන් ගැන තවත් තොරතුරු අපට ලැබේ. උන් වහන්සේ සිරුරින් මිටි වුව ද මිහිරි කටහඬකට හිමිකම් කී හ. මිහිරි කටහඬ ඇත්තන් අතර උන්වහන්සේ අග්‍ර වූ හ. සියළු දාන අතර ධර්ම දානය උසස් ය. උන් වහන්සේ ගේ ධර්මදේශනා හිමාල වනයෙහි වසන කුරවීක පක්ෂීන් ගේ නාදය මෙන් මධුර වූ බව කියති. උන්වහන්සේ මිටිව උපන්නේ පුරාකෘත අකුසලයක් නිසා බව කියැවේ.

සිරුරින් එතරම් ප්‍රියංකර නො වුව ද ප්‍රියංකර කටහඬ හේතුවෙන් උන්වහන්සේ ජනප්‍රිය වූ හ. එමෙන් ම උදාර චරිත ශක්තිය හා උසස් ගති ගුණ නිසා ද තථාගතයන් වහන්සේ ගේ පැසසුමට ලක් වූ හ.

ගීතයක් බඳු වීය කට හඬ
බඳින දහමට අසන්නන් හද
බලන්නට ප්‍රිය නැතත් සිරුරින්
පිනා යයි සිත සැදැහැ ඇත්තන්.



යම් සේ ගැඹුරු වූ සයුර වෙසෙසින් පහන් වේ ද, එසේ මැ පඬුවෝ දහම් අසා මොනවට පහන් වෙත්

82. යථා'පි රහදො ගම්භීරො
විප්පසන්නො අනාවිලො
ඒවං ධම්මානි සුත්වාන
විප්පසීදන්ති පණ්ඩිතා. (6:7)

විලක් සේ සුපසන්
පැහැදිලි ගැඹුරු දිය ඇති
ඇසීමෙන් සදහම්
පහදිති දන නුවණ ඇති.

ඇතොත් නුවණ - වෙසෙත් තුටින

6 (7) කානමාතාවන් ගේ කතාව (82 ගාථාව)

දෙව්රම් වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **කානමාතාව** ඇරබ මේ ගාථාව වදාළ සේක.

කානමාතාව බුදුරදුන් කෙරේ පහන් බැතිමත් උපාසිකාවක් වූවා ය. ඇය ගේ දියණිය කාන වෙනත් ගමක තැනැත්තකු සමග විවාහ ව සිටියා ය. කානා සිය මව ගේ නිවසට පැමිණ සිටි දිනක සැමියා ඇයට ආපසු එන සේ පණිවුඩයක් එවී ය. සැමියාට ගෙන යනු පිණිස රස කැවිලි ටිකක් සකස් කර දෙනු පිණිස තව එක් දිනක් පමා වන සේ ඇයට පැවසූ මව, රස කැවිලි පිළියෙළ කළා ය. එහෙත් පසු දින උදේ පිඩු සිඟා වැඩි හිමිවරුන් සිවු නමකට ඕ ඒ රස කැවිලි වලින් ටිකක් පිරිනැමුවා ය.

ඒ පිළිගත් හිමිවරු කානාවගේ නිවසේ රස කැවිලි ඇති බව තවත් හිමිවරුනට පැවසූයෙන් ඔවුහු ද එහි පිඩුසිඟා වැඩිය හ. කානමාතාව ද තමා බැතිමත් හෙයින් ඒ හැමට ම රස කැවිලි පිළිගැන්වූවා ය. අන්තිමේ දී කානා ට ගෙනයන්නට කිසිවක් ඉතිරි නො වූයෙන් එදා ගමන යා නො හැකි විය. ඊළඟ දිනයේ සිදු වූයේ ද එය ම ය. තුන්වන දිනයේ සැමියා අන්තිම නිවේදනයත් එවා තිබිණි. කාන නො පැමිණිය හොත් වෙනත් බිරිඳක් ගෙන එන බව ඔහු දන්වා තිබිණ. එහෙත් එදින ද භික්ෂූන් පිඩුසිඟා වැඩි හෙයින් රස කැවිලි සියල්ල නිම විය. කානට සැමියා වෙත යාමට නො හැකි විය.

අන්තිමේ කාන ගේ සැමියා වෙනත් ස්ත්‍රියක බිරිඳ කර ගත්තේ ය. මෙයින් කලකිරීමට පත් කාන භික්ෂූන් කෙරේ අප්‍රසාදයක් ඇති කර ගත්තී ය. ඇය භික්ෂූන්ට බැණ වදින්නට පටන් ගත්තෙන් ඔවූහු කානමාතාව ගේ නිවසට පිඩුසිඟා ඒම නැවැත්වූ හ. බුදුරජාණන් වහන්සේට ද මේ පුවත සැල වූයෙන් උන් වහන්සේ කානමාතාව ගේ නිවසට වැඩම කළ හ. ඕ භාග්‍යවතුන් වහන්සේට සහල් කැඳ පිළිගැන්වූවා ය.

වළඳා අවසන භාග්‍යවතුන් වහන්සේ කාන අමතා "මගේ ශ්‍රාවක භික්ෂූන් පිළිගත්තේ ඒ අයට පූජා කළ දේ ද? නැතහොත් නුදුන් දේත් ගත්තා ද?" යි ප්‍රශ්න කළ හ. "උන්වහන්සේලා පිළිගත්තේ දුන් දේ පමණි"යි පැවසූ ඕ "වරද උන්වහන්සේලා ගේ නොවේ. මමයි වරද කළේ" යි පැවසුවා ය. මෙසේ සිය වරද පිළිගත් ඕ බුදුන් වැඳ සමා කරවා ගත්තා ය. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ධර්මානුශාසනාවක් කළෙන්, ඒ අසා සිටි කාන සෝවාන් ඵලය ලැබුවා ය.

ආරාමයට ආපසු පැමිණෙන අතරතුර බුදුරදුන්ට පසේනදි කොසොල් රජතුමා හමු විය. කාන භික්ෂූන් වහන්සේලාට බැණ වදින ආකාරය ගැන අසා තිබුණු රජතුමා බුදුරදුන් ඇයට දම් දෙසූ බව අසා විස්මයට පත් විය. ඇයට සත්‍යය අවබෝධ කරවන්නට බුදුරදුන් සමත් වී දැයි විමසූ රජුට බුදුරදුන් වදාළේ "එසේ ය. මම ඇයට ධර්මය පැහැදිලි කළෙමි. ඇය ගේ මතු භවය සාර්ථක කළෙමි " යනුවෙනි. "මම ඇය ගේ මේ භවය සාර්ථක කරමි." යි පැවසූ රජතෙම දෝලාවක් සමග රාජපුරුෂයන් යවා ඇය ගෙන්වා ගත්තේ ය. ඇය පැමිණි පසු ඇමතියන් ඇමතූ හේ "මගේ දියණිය කානාට සැප සම්පත් දෙන්නට හැකි අයෙකුට එසේ කරන්නට අවසර දෙමි" යි පැවසී ය. එක් අමාත්‍යවරයෙක් "මම ඇය මගේ දියණිය සේ හදා ගනිමි" යි පවසා තමා සතු සියලු දේපළ ඇයට පවරා "දියණියනි, ඔබට කැමති පරිදි දන් පින් කරගන්න" යි කීයේ ය. කානාව ද දිනපතා නුවර දොරටු හතරෙහි දන් පිරිනමන්නට පටන් ගත්තා ය. භික්ෂූන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ " මහණෙනි, කැළඹී දූෂිතව පැවති කානා ගේ සිත මගේ වදනින් පහන් වූයේ ය'' යි වදාළ හ.

විවරණාත්මක අනුවාදය (82 ගාථාව)

යථා ගම්භීරො රහදො විප්පසන්නො අනාවිලො එවං පණ්ඩිතා අපි ධම්මානි සුත්වාන විප්පසීදන්ති.

යථා: යම් සේ, **ගම්භීරො**: ගැඹුරු, **රහදො**: විලක්, **විප්පසන්නො**: බෙහෙවින් ප්‍රසන්නව, **අනාවිලො**: කැළඹීමෙන් තොරව (පවතී ද), **එවං**: එසේ, **පණ්ඩිතා අපි**: නුවණැත්තෝ ද, **ධම්මානි**: දහම්, **සුත්වාන**: අසා, **විප්පසීදන්ති**: ප්‍රසන්න වෙති.

ගැඹුරු දිය විලක් පහන්ව, නො කැලඹී පවත්නා පරිද්දෙන් ධර්මය ඇසීම හේතුවෙන් නුවණැත්තන් ගේ සිත ද කැලඹීමෙන් තොරව ප්‍රසන්න බවට පත් වෙයි.

විවරණය

ගැඹුරු දිය විලක ජලය ප්‍රසන්නව, මඩ නොවී පවතින ආකාරය ධර්මය අසා සංසුන් කරගත් සිතට උපමා කර ඇත. ධර්මය නො පිවිසුණු සාමාන්‍යය සිත නිතර ම කැළඹී, ආකූලව, වියවුල්ව පවතී. සිතට සහනය ගෙන එන්නේ ධර්මය යි.



උතුම් පුරිස්හු කිසි දෙයෙක නො ඇලී සුවදුක් දෙක්හි උස් පහත් ගති නො දක්වති

83. සබ්බත්ථ වෙ සප්පුරිසා චජන්ති
න කාමකාමා ලපයන්ති සන්තො
සුඛෙන ඵුට්ඨා අථ වා දුඛෙන
න උච්චාවචං පණ්ඩිතා දස්සයන්ති (6:8)

නුවණැත්තෝ දුරු කරලති සැප සම්පත්
කම්සැප පතමින් නො දොඩති වදනක්
වාරෙන් වාරෙට දුක සැප ලැබුණත්
නැත පිම්බීමක් - මුකුලිත වීමක්

නුවණ වඩත් - සංසුන් වෙත්

6 (8) පන්සියයක් හිමිවරුන් ගේ කතාවක් (83 ගාථාව)

පන්සියයක් භික්ෂූන් වහන්සේ අරබයා වදාළ මේ ගාථාව දෙව්රම වැඩ වසත් දී භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දකි.

වේරඤ්ජා නම් බ්‍රාහ්මණයා ගේ ආරාධනය පරිදි භාග්‍යවතුන් වහන්සේ වරක් භික්ෂූන් වහන්සේලා ද සමග වේරඤ්ජා නම් ගමෙහි වස් විසූ හ. තමන් බුදුරදුන්ට උපස්ථාන කරමැයි පොරොන්දු වී වස් වසන්නට ආරාධනය කළ බව බ්‍රාහ්මණයාට අමතක විය. එ සමයෙහි වේරඤ්ජා ප්‍රදේශයේ ආහාර හිඟයක් වූ හෙයින් පිඬු සිඟා යාමෙන් පවා එතරම් ප්‍රයෝජනයක් නො වී ය.

මේ අමාරු තත්වය යටතේ වුවද භික්ෂූහු දුර්මුඛ නො වූ හ. අශ්වයන් වෙළඳාමේ ගිය වෙළඳුන් විසින් පුදන ලද කඩල ස්වල්පයකින් යැපෙන්නට උන්වහන්සේලා සමත් වූ හ. වස් කාලය අවසාන වේරඤ්ජා බමුණාටද දැනුම් දී බුද්ධ ප්‍රමුඛ භික්ෂූ පිරිස යළි ජේතවනාරාමයට ම සම්ප්‍රාප්ත වූහ.

ජේතවනාරාමයේදී දායකයෝ භික්ෂූන් වහන්සේලාට ප්‍රණීත දාන වස්තුවෙන් උපස්ථාන කළ හ. එදින දන් පිරිනැමීමෙන් පසු ඉතිරි වූ ආහාර, විහාරස්ථානයේ සුළු වැඩ කරමින් වසන අයට දෙන ලදී. ඔවුහු ඒ අනුභවයෙන් පසු ප්‍රීතියට පත්ව ගී ගයමින් නටමින් කලබල කළ හ. මාස තුනක් ම නීරස යව අනුභව කිරීමෙන් පසුව වුව ද භික්ෂූහු අමුත්තක් නැතිව උපේක්ෂාවෙන් සිටිය හ. මේ සම්බන්ධයෙන් සවස දම්සභා මණ්ඩපයේ දී භාග්‍යවතුන් වහන්සේට දැනුම් දෙන ලදී. උන්වහන්සේ ඒ නිමිත්තෙන් අඥානයෝ ලාභයේ දී ප්‍රමුදිතව අලාභයේ දී මුකුලිත වීම ස්වභාව කොට ඇත්තෝ වෙති. නුවණැත්තෝ එබඳු උච්චාවචතා නැතිව සියල්ල මධ්‍යස්ථව ඉවසති යි පැහැදිලි කොට මේ ගාථාව වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (83 ගාථාව)

සප්පුරිසා වෙ සබ්බත්ථ චජන්ති සන්තො කාමකාමා
න ලපයන්ති සුඛෙන අථවා දුඛෙන පුට්ඨා පණ්ඩිතා
උච්චාවචං න දස්සයන්ති.

සප්පුරිසා: සත්පුරුෂයෝ; **වෙ**: ඒකාන්තයෙන්; **සබ්බත්ථ**: සෑම අංශයෙන් ම; **චජන්ති** : අභිනිෂ්ක්‍රමණය කරති, **සන්තො**: (ශාන්ත) යහපත් අය; **කාමකාමා**: කාම වස්තු අපේක්ෂාවෙන්; **න ලපයන්ති**: කථා නො කරති; **සුඛෙන**: සැපයෙන්; **අථ වා**: නැතහොත්; **දුඛෙන**: දුකෙන්; **පුට්ඨා**: පැහැදුණු; **පණ්ඩිතං**: නුවණැත්තෝ; **උච්චාවචං**: ඉහල පහල යාමක්; **න දස්සයන්ති**: නො දක්වති.

සත්පුරුෂයෝ සියල්ල අතහැර නෛෂ්ක්‍රම්‍යය ප්‍රගුණ කරති. ලාභ ලෝභ පතා කතා නො කරති. සැප ලද විට ප්‍රීතියෙන් මත් ව යාමක් හෝ දුක් ලද විට දුකින් හැකිලීමක් නො දක්වති.

විවරණය

සුඛෙන දුඛෙන: නුවණැති උසස් පුද්ගලයෝ සැප හා දුක නිසා මානසිකත්වයේ වෙනසක් - උච්චාවචතාවක් නො දක්වති. සාමාන්‍යයෙන් මනුෂ්‍යයන්ට ලැබෙන අත්දැකීම් අතර සැප හා දුක ඉතා ප්‍රබල වෙයි. සැපය නම් බොහෝ විට ආශාවක් මස්තකප්‍රාප්ත වීමකි. එසේ වූ විට සිත ප්‍රීතියෙන් ඉල්පෙයි. එහෙත් ඒ ඉක්මණින්ම තවත් ආශාවක් ජනිත වෙයි. එහෙයින් අපි නිතර ම නොතිත් ආශාවන්ගෙන් යුතුව ජීවත් වෙමු. කෙසේ වුව ද සාමාන්‍ය මිනිසාට තම ආශාවක් ඉටු වීම තරම් ප්‍රීතියෙන් තවත් නැත. ඉඳුරන් පිනා ගිය විට ඔවූහු ප්‍රීතියෙන් ඉල්පෙති. එහෙත් මේ ප්‍රීතිය හුදු මායාවක් පමණි. ධනය, බලය, කීර්තිය හෝ විජයග්‍රහණය මගින් ලැබෙන ප්‍රීතිය දිගුකල් පවතින සරු දෙයක් නොවේ. නියම ප්‍රීතිය නම් ආධ්‍යාත්මික ප්‍රීතිය යි.



යස ඉසුරු නොදැහැමින් නොකැමැතිවන තැනැත්තා සිල්වතෙක් නැණවතෙක් දැහැමියෙක් වේ.

84. න අත්තහෙතු න පරස්ස හෙතු න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධි මත්තනො ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා (6:9)	තමන් නිසාවත් අනුන් නිසාවත් පුතුන්, ධනය හෝ රටක් නො පතතොත් අධර්මයෙන් පොහොසත් වනු නොසිතන සිල්වත්, නුවණැති දැහැමි කෙනෙක් වේ

නුවණැති දන - ඇති යහ ගුණ

6 (9) ධම්මික ස්ථවිරයන් ගේ වස්තුව (84 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන කල භාග්‍යවතුන් වහන්සේ විසින් **ධම්මික** ස්ථවිරයන් වහන්සේ අරබයා මේ ගාථාව වදාරන ලදී.

ධම්මික සිය බිරිඳත් සමග සැවැත් නුවර වාසය කළේ ය. බිරිඳ ගැබ් ගෙන සිටි සමයක දිනක් හේ තමන් පැවිදිවනු කැමති බව ඇයට පැවසී ය. දරුවා උපදින තුරු ඒ තීරණය පමා කරන්නැයි ඕ ධම්මිකගෙන් ඉල්ලා සිටියා ය. දරුවා උපන් පසු ඔහු පැවිදි වන්නට සැරසුණු විට දරුවාට ඇවිදින්නට හැකි වනතුරු සිටින්නැයි ඇය පැවසූ හෙයින් හේ මෙසේ කල්පනා කළේ ය. "පැවිදි වීම සඳහා බිරිඳගෙන් අවසර ලැබෙන තුරු බලා සිටීමේ පලක් නැත. මගේ විමුක්තිය මම සලසා ගනිමි." මෙසේ සිතා හෙතෙම විහාරස්ථානයට ගොස් පැවිදි විය. භාග්‍යවතුන් වහන්සේ ගෙන් කර්මස්ථානයක් ද ලබාගත් ධම්මික හිමියෝ උද්යෝගයෙන් භාවනා වඩා ඉක්මණින් ම රහතන් වහන්සේ නමක් බවට පත් වූහ.

අවුරුදු ගණනකට පසු තම බිරිඳට හා දරුවාට ධර්මදේශනා කරනු පිණිස හේ සිය නිවස බලා ගියේ ය. උන්වහන්සේ ගේ පුත්‍රයා ද සසුන් ගතව රහත් වූයේ ය. "මගේ සැමියාත් දරුවාත් දෙදෙනාම සසුන් ගත වූ හෙයින් මා පමණක් ගිහිගෙයි විසීමෙන් ඇති අරුත කුමක් ද?" යි සිතූ බිරිඳ ද භික්ෂුණියක් ව රහත් බව ලද්දා ය.

දම් සභා මණ්ඩපයෙහි රැස් වූ භික්ෂූන් වහන්සේ ධම්මික හිමියන් පැවිදිව රහත් වූ අයුරුත් බිරිඳ හා දරුවාත් සසුන් ගත ව නිවන් සුව සාධනය කර ගත් අයුරුත් බුදුරදුන් හා සමග සාකච්ඡා කළ හ. ඒ අවස්ථාවෙහි දී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, නුවණැත්තෝ ධනය හා සමෘද්ධිය පිණිස තමන් සඳහා හෝ අනුන් සඳහා වත් පව්කම් නො කරති. ඔවූහු ධර්මානුකූලව ජීවත් වී සංසාරයෙන් විමුක්තිය ලබා ගැනීම සඳහා ම ක්‍රියා කරති" යි වදාළ හ.

විවරණාත්මක අනුවාදය (84 ගාථාව)

අත්ත හෙතු (න) පරස්ස හෙතු (න) පුත්තං (න) ධනං (න) රට්ඨං න ඉච්ඡෙ අධම්මේන සමිද්ධිං, න ඉච්ඡෙය්‍ය සො සීලවා පඤ්ඤවා ධම්මිකො සියා

අත්ත හෙතු: තමා ගේ යහපත පිණිසවත්; **පරස්ස හෙතු**: අනුන්ගේ ප්‍රයෝජනය පිණිසවත්; **පුත්තං**: පුත්‍රයකු; **ධනං**: ධනය; **රට්ඨං**: රටක්; **න ඉච්ඡෙ**: ප්‍රාර්ථනා නො කරන්නේ ය; **අධම්මේන**: අධර්මයෙන්; **සමිද්ධිං**: සමෘද්ධිය; න **ඉච්ඡෙය්‍ය**: අපේක්ෂා නො කරන්නේ නම්; **සෝ**: හෙතෙම; **සීලවා**: සිල්වතෙක්; **පඤ්ඤවා**: නුවණැත්තෙක්; **ධම්මිකො**: ධාර්මිකයෙක්; **සියා**: වන්නේ ය.

තමා ගේ ප්‍රයෝජන පිණිසවත් අනුන්ගේ ප්‍රයෝජනය පිණිසවත් දරුවන්, ධනය හෝ රාජ්‍යයක් ප්‍රාර්ථනා නො කරන්නේ ය. තමා ගේ සමෘද්ධිය අධර්මයෙන් අපේක්ෂා නො කරන්නේ ය. එසේ වූ විට හේ සිල්වතෙක්, නුවණැත්තෙක් හා ධාර්මිකයෙක් වෙයි.

විවරණය

"සිදුහත් කුමරුන් තම බිරිඳ, පුතා, දෙමාපියන් හා රාජධානිය හැර පැවිදි වූයේ කවර හෙයින් දැයි" විමසන අයට පිළිතුර මේ ගාථාවෙහි ඇතුළත් ය. එය තමා ගේ කිසියම් ආත්මාර්ථකාමී බලාපොරොත්තුවක් නිසා කළ දෙයක් නො වන බව මෙයින් තේරුම් ගත හැකි ය.

ඒ ලෝක තත්ත්වය මනාව තේරුම් ගෙන අනිච්ච-දුක්ඛ-අනත්ත ලක්ෂණ මැනවින් දැන ගෙන කළ ක්‍රියාවකි.

මෙහි වැදගත් ම පණිවුඩය - "අධර්මයෙන් තමන් ගේ සමෘද්ධිය නො පතන්න"- වත්මන් දූෂිත අර්ථක්‍රමය නිවරද්‍ය කර ගැනීම පිණිස අත්‍යන්තයෙන් ම අදාළ වන්නකි. අධර්මයෙන් ලබන සමෘද්ධිය නිරර්ථකය. එමගින් මෙලොව හා පරලොව දෙක්හි ම සිදු වන්නේ අනර්ථයකි.

මිනිසුන් අතුරෙහි පරතෙර (නිවන්) යන්නෝ ටික දෙනෙක් වෙති. සෙසු සත්කැල මෙතර (සසර) මැදිවෙති.

85. අප්පකා තෙ මනුස්සෙසු
යෙ ජනා පාරගාමිනො
අථායං ඉතරා පජා
තීරමෙවානුධාවති (6:10)

මිනිසුන්ගෙන් සුළු පිරිසක්
පරතෙර වෙත යති පීනා
ඉතිරි පිරිස නැවත වරක්
මෙතර වෙත ම ඒති ආපසු.

සුළු පිරිසක් - සසරින් එතරට යත්

6 (10) ධම්මය අසන පිරිසක් ගැන පුවතක්. (85 සහ 86 ගාථා)

ධර්මශ්‍රවණය සඳහා පැමිණි සැවැත් නුවර **වැසියන් පිරිසක්** විෂයෙහි මෙම ගාථාවන් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි ය.

එසමයෙහි සැවැත්නුවර විසූ සැදැහැවත්හු පිරිසක් සම්මාදම් කර භික්ෂූන් වහන්සේලාට යම් යම් පිරිකර පූජා කළ හ. මෙම විශේෂ පිරිකර පූජාවෙන් පසු ධර්මශ්‍රවණාභිලාෂී වූ ඔවුහු රාත්‍රිය පුරා ධර්මදේශනා කරනු පිණිස භික්ෂූන් වහන්සේලා කිහිපනමකට ආරාධනා කළ හ. රැය පුරා ම දහම් අසන්නට අසමත් වූ සමහරු අතර මැද දී නැගිට සිය නිවෙස් බලා ගිය හ. සමහරු රැය පුරා ම ධර්මය ශ්‍රවණය කරන්නට සිතා නැවතුණ ද නිදි කිරමින් සිටිය හ. බණ අසමින් ම සමහරුන්ට නින්ද ගියේ ය. මුළු රාත්‍රිය ම අවධානයෙන් බණ ඇසූ පිරිස ඉතා සුළු විය.

පසු දා උදේ භික්ෂූහු එදින රැයෙහි ජනයා ධර්මය ශ්‍රවණය කළ ආකාරය භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන් හ. ඒ ඇසූ උන්වහන්සේ ඒ පිළිබඳව කරුණු පැහැදිලි කරමින් ගාථා දෙකක් දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (85 ගාථාව)

මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො තෙ අප්පකා අථ අයං ඉතරා පජා තීරං එව අනුධාවති.

මනුස්සෙසු: මිනිසුන් අතර; **යෙ ජනා**: යම් පිරිසක්; **පාරගාමිනො**: පරතෙරට යන්නෝ ද; **තෙ**: ඔවුහු; **අප්පකා**: ඉතා සුළු පිරිසකි; **අථ**: ඉක්බිති; **අයං**: මේ; **ඉතරා පජා**: අවශේෂ පිරිස; **තීරං එව**: මෙතෙරට ම; **අනුධාවති**: ආපසු එන්නෝ ය.

මිනිසුන් අතර සසරින් එතෙරට යන්නෝ ඉතා ස්වල්ප දෙනෙකි. ඉතිරි ප්‍රජාව නැවත සසර නම් වූ මෙතෙරට නැවත ආපසු එන්නෝ ය.

විවරණය

ධම්මෙ ධම්මානුවත්තිනො: යන්නෙන් මෙහි දී අදහස් කරන ලද්දේ බුදුරදුන් වදාළ ශ්‍රී සද්ධර්මයයි. බුදුරදුන් විසින් මුලින් ම දම් දෙසන ලද්දේ පස්වග මහණුන්ට ය. උන්වහන්සේ ගේ ප්‍රථම ධර්ම දේශනය ධම්මචක්කප්පවත්තන සූත්‍රය යි. ධර්මය චක්‍රයක් හෙවත් රෝදයක් බඳු බව ද එය ප්‍රථම වරට ඉදිරියට යන පරිදි ක්‍රියාත්මක කළ බව ද ඉන් හැඟවෙයි. මුල් ම බුද්ධ ශ්‍රාවක පිරිස බවට පත් වූයේ මේ සූත්‍රය ශ්‍රවණය කළ පස්වග මහණ පිරිස ය. මේ නිසා බරණැස ඉසිපතනය ධර්ම රත්නය හා සංඝ රත්නය පහළ වූ නිජබිම වශයෙන් හැඳින්විය හැකි ය. මුල් ම භික්ෂු පිරිස ඇමතූ භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ.

"මහණෙනි, මම සියලු දිව්‍යමය හා මානුෂික බන්ධනයන්ගෙන් මිදුණෙමි.

ඔබද සියලු දිව්‍යමය හා මානුෂික බන්ධනයන් ගෙන් මිදුණාහු ය.

එහෙයින් බොහෝ දෙනා ගේ හිතසුව පිණිස ජනානුකම්පාව පෙරදැරි කරගෙන දෙව් මිනිසුන්ට ශුභ සිද්ධිය සලසනු වස් සංචාරයෙහි යෙදෙන්න. දෙදෙනකු එක මඟ නො යන්න. මුල-මැද හා අග යහපත් වූ අර්ථ සම්පන්න වූ පරිපූර්ණ වූ ධර්මය දේශනා කරන්න. පිරිසිදු ජීවිතයක් ගත කරන ආකාරය උගන්වන්න. ඇසෙහි කුණු රොඩු නැති බොහෝ දෙනා ධර්මය දකිනු ඇත. දහම නො ලදහොත් ඔවුන් විනාශ වී යන්නට ඉඩ තිබේ. දහම තේරුම් ගත හැකි ජනයා ලොව වෙසෙති. මම ද දහම් දෙසනු පිණිස උරුවෙල් දනව්වේ සේනානි ගමට යන්නෙමි." පන්සාලිස් වසක් පුරා කරන ලද ධර්මදූත කාර්යභාරය ඇරඹුණේ එලෙස ය. තම ශ්‍රාවක පිරිස ද කැටුව දඹදිව මහා මාර්ග හා අනුමාර්ග යන් හි උන්වහන්සේ සංචාරය කළ හ.

දහම් දෙසීමේදී භාග්‍යවතුන් වහන්සේ ජාති-කුල-ගෝත්‍රා දී කිසි ම වෙනසක් නො කළ හ. දුප්පත්-පොහොසත්, කුලීන-කුලහීන, උගත්-නූගත්, පින් ඇති-පින් නැති සෑම සියළු දෙනා ම උන්වහන්සේ හමුවට ආහ. ශ්‍රමණ- බ්‍රාහ්මණ වේවා, රාජකීය හෝ දුගී දුප්පත් වේවා සුදනෙකු හෝ දුදනෙකු වේවා කාට වුව ද නිසි මඟ පෙන්වන්නට අවස්ථාව ලබා ගැන්මට භාග්‍යවතුන් වහන්සේ උත්සුක වූ හ. කිසිවකුට නිවන් මඟ අසුරා නො තිබිණ.ධර්මය විශ්වසාධාරණ වූයේ ය.

දඹදිව බමුණන් මහ ඉහළින් පිළිගත් කුල පාරිශුද්ධිය ගැන භාග්‍යවතුන් වහන්සේ මඳ වූ හෝ තැකීමක් නො කළ හ. කුල භේදය නින්දිත සංස්ථාවක් සේ උන්වහන්සේ හෙළා දුට හ. ඕනෑම කුලයක හෝ පන්තියක අයකු ඔවුන් පැවිද්දෙහි ප්‍රතිඵල ලබාගනිතැයි බුදුරදුනට පෙනී ගිය විට සංඝ සමාජයට ඇතුළත් කර ගන්නා ලදී. මින් පෙර කුල හා පන්ති භේද මගින් භේද භින්නව පැවති සමාජය ඒකාග්‍ර කරන්නට ප්‍රයත්නයක් දැරූ එක ම තත්කාලීන භාරතීය ශාස්ත්‍රවරයා භාග්‍යවතුන් වහන්සේ ය.

බුදුරජාණන් වහන්සේ භාරතීය කාන්තාව ගේ තත්ත්වය ද යහපත් බවට පත් කළ හ. බ්‍රාහ්මණ චින්තනයේ බලපෑම හේතුවෙන් බුද්ධ කාලීන කාන්තාවට වැඩි ගෞරවයක් හිමි ව නො තිබිණ. ඉඳහිට දාර්ශනික චින්තනයෙන් අග තැන්පත් කාන්තාවක ගැන අසන්නට ලැබුණ ද පොදුවේ ඔවුනට හිමි වූයේ පහත් තත්ත්වයකි. ස්වකීය විවෘත හා දයාන්විත ආකල්පය හේතුවෙන් කාන්තාවනට විනීත අයුරින් සැලකූ බුදුහු ඔවුනට ද විමුක්ති මාර්ගය පාදා දුන් හ. ඉතිහාසයේ ප්‍රථම වරට භික්ෂුණී ශාසනයක් ද උන්වහන්සේ විසින් අරඹන ලදී. විවිධ පංතිවල ස්ත්‍රීහු එහි පැවිද්ද ලද හ. ඔවුන් විමුක්ති ලාභය පිණිස පධන් වීර්යය වැඩූ අයුරු හා විමුක්තිය ලබා උදාන ගීතිකා ගැයූ අයුරු ථෙරිගාථාවේ සඳහන් ය.



මනාකොට දෙසූ දහම් පිළිවෙත පිරුමෙන් ඉතා දුක සේ එතෙර විය යුතු සසර පරතෙරට පැමිණිය හැක.

86. යෙ ච ඛො සම්මදක්ඛාතෙ
ධම්මෙ ධම්මානුවත්තිනො
තෙ ජනා පාරමෙස්සන්ති
මච්චුධෙය්‍යං සුදුත්තරං. (6:11)

දෙසා ඇති මැනවින්
සදහම් අනුව විසුමෙන්
මාර බල බිඳිමින්
එතර විය හැක සසර කතරින්.

ධර්මය සිත තුළ නම් - සසරින් එතරට යයි

6 (10) ධර්මය අසන පිරිසක් ගැන පුවතක්. (85 සහ 86 ගාථා)

විවරණය

පෙර පිටුව හා සම්බන්ධයි

ගමින් ගමට, නගරයෙන් නගරයට වැඩම කරමින් බොහෝ දෙනාට ධර්මාස්වාදය සහ නිවන් සුව ලබා දෙමින් සැරිසරන භාග්‍යවතුන් වහන්සේට අවිද්‍යාවෙනි ගිලුණු පොදු ජනයා පශුඝාතනය කරමින්, දෙවියන් යදිමින් මුලාව වසන ආකාරය පෙනී ගියේ ය. ඔවුන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ

ජීවිතයක් නැති කිරීම - ඉතා පහසු වැඩක් වුණත්
දෙන්නට කිසිවකුට පණක් - මොන ජගතෙක් වේද සමත්
ඉපිද මෙලොව ජීවත් වෙන - ඉතා කුඩා සතෙක් වුණත්
පණට ආදරෙයි තමන් ගෙ - බයයි මරණයට කවදත්

යි දේශනා කළ හ.

වාද විවාද, කලකෝලහල, අරගල බුදුරජාණන් වහන්සේට ප්‍රිය නො වීය. භික්ෂූන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ වරක් මෙසේ වදාළ හ. "මහණෙනි, මම ලෝකයා සමග වාද නො කරමි. ලෝකයා මා සමග වාද කරයි. ධර්මවාදියකු කිසි විටෙක කිසිවකු සමග වාද කළ යුතු නැත."

භාග්‍යවතුන් වහන්සේ වැදගත් කොට සැලකූයේ ධර්මය යි. එහෙයින් සියළු ම බෞද්ධයන් ධර්මානුවර්තී විය යුතු ය. බුදු සමයෙහි ඉගැන්වෙන නිෂ්ටාව සාධනය කර ගන්නට නම් ධර්මය ප්‍රායෝගිකව අනුගමනය කළ යුතු ය.

විමුක්ති සුවය සාක්ෂාත් කිරීම පිණිස කෙටි මං නො මැත. ක්‍රමානුකූලව මානසික සංවර්ධනය සාධනය කිරීම ඒ සඳහා ඇති ඒකායන මාර්ගය බව සූත්‍ර රාශියක ම අවධාරණය කර තිබේ. එය අනුක්‍රමික ශික්ෂාවකි. කය, වචනය හා සිත ක්‍රමානුකූලව ප්‍රගුණ කිරීමෙන් නියම ප්‍රඥාව වර්ධනය කර ගෙන සම්බෝධිය ලබා නිර්වාණය සාක්ෂාත් කර ගත හැකි ය. එය ජාති, කුල, ගෝත්‍ර, පංති, වර්ණ ආදී සකලවිධ භේදයන් ම ඉක්මවා සිටින සර්ව සාධාරණ ප්‍රතිපදාවකි.

බෞද්ධ පුරුෂාර්ථ නියත වශයෙන් දක්වන අවස්ථාවක භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ.

"බුදු බව ලත් භාග්‍යවතුන් වහන්සේ බුදු බව පිණිස ධර්මය දේශනා කරති. දමනය වූ භාග්‍යවතුන් වහන්සේ දමනය පිණිස ධර්මය දේශනා කරති. ශාන්ත වූ භාග්‍යවතුන් වහන්සේ ශාන්තිය පිණිස ධර්මය දේශනා කරති. තරණය කළ භාග්‍යවතුන් වහන්සේ තරණය පිණිස ධර්මය දේශනා කරති. පිරිනිවන් පෑ භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණය පිණිස ධර්මය දේශනා කරති."

භාග්‍යවතුන් වහන්සේ විසින් සාධනය කර ගත් පුරුෂාර්ථයන් ධර්මානුවර්තී ශ්‍රාවකයාට ද විවෘතව පවත්නා බව මින් සනාථ වෙයි. ධර්මය මනාව දේශනා කර තිබේ. එහෙත් ඒ අනුව පිළිපැදීම හුදෙක් ශ්‍රාවකයනට භාර කාර්යයකි. අසීමිත උද්යෝගයෙන්, අප්‍රතිහත ධෛර්යයෙන් හා කැපවීමෙන් අප ධර්ම මාර්ගයෙහි ගමන් කළ යුතුය. බුදුන් රහතුන් ගමන් කළ ඒ මග කවර බාධා එළැඹුණ ද අප ඒ ජය ගත යුතුය. ධර්මය හුදෙක් වෛද්‍යවරයකු විසින් නිර්දිෂ්ට ඖෂධයක් බඳුය. රෝගියා තම එකම අරමුණ ආරෝග්‍යය බව තේරුම් ගෙන ඖෂධ භාවිතයෙන් හා වෛද්‍යොපදේශ පිළිපැදීමෙන් සුවය ලබා ගත යුතුය.

සසර තරණය ගැන කරුණු දක්වන අවස්ථාවකදී භාග්‍යවතුන් වහන්සේ එය පහුරක් උපකාරයෙන් ගඟකින් එතර වීමක් හා සමකොට දැක්වූ හ. "මහණෙනි, මම ධර්මය පහුරක් මෙන් උගන්වමි. එය තරණය පිණිස උපකාර කර ගැනීමට මිස කර තබා ගැනීමට නොවේ."

දැන් භාග්‍යවතුන් වහන්සේ අප අතර වැඩ වාසය නො කරන බව සැබෑය. එහෙත් උන්වහන්සේ විසින් උතුම් වූ ශ්‍රී සද්ධර්මය අපට දායාද කොට ඇත. එම ධර්මය උන්වහන්සේ විසින් ගොතා නිර්මාණය කළ දෙයක් නොව සොයාගත් දෙයකි. එය කවදාත් ලොව පවත්නා විශ්ව නියාමයයි. එය සදා හැමතැන පවතියි. බෞද්ධ-අබෞද්ධ, පෙර දිග-අපර දිග කාටත් එය විවෘතය. බුදුවරු එය සොයා ගෙන දේශනා කරති. එයට අමුතු ලේබලයක් අනවශ්‍යය. එය සොයා ගන්නා ඕනෑම කෙනෙකුට තවත් අයකුට දේශනා කළ හැකිය. නමුත් අවබෝධ කිරීම පෞද්ගලික ය. ධර්මය නුවණැත්තන් විසින් තම නුවණින් ම ප්‍රත්‍යක්ෂ කර ගත යුත්තකි.

මච්චුධෙය්‍ය: මාරයා ගේ බලය ක්‍රියාත්මක වන ක්ෂෙත්‍රය මෙහි මච්චුධෙය්‍ය යන්නෙන් අදහස් වෙයි. මාරයා ක්‍රියාත්මක වීම මරණය සේ ගතහොත්, මච්චුධෙය්‍ය යන්නෙන් සංසාරය ගත හැකිය. සසරින් එතෙර වීම මාරයා ගේ රාජධානියෙන් ඉවත් වීමකි. නිර්වාණාධිගමය කර පිරිනිවි උතුමනට නැවත කිසි කලෙක මරණ දුක විඳින්නට සිදු නොවේ. එමෙන් ම කෙලෙසුන් නිසා පීඩාවක් ද සිදු නො වෙයි.

විවරණාත්මක අනුවාදය (86 ගාථාව)

යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො තෙ ජනා සුදුත්තරං මච්චුධෙය්‍යං පාරමෙස්සන්ති

යෙ ච ඛො: යම් කිසිවෙක්; **සම්මදක්ඛාතෙ**: මැනවින් දෙසා ඇති; **ධම්මෙ**: ධර්මයෙහි; **ධම්මානුවත්තිනො**: ධර්මානුකූලව පිළිපදිමින් ජීවත් වෙත් ද; **තෙ ජනා**: ඒ ජනයා; **සුදුත්තරං**: තරණය කිරීම අති දුෂ්කර වූ; **මච්චුධෙය්‍යං**: මරුවා ගේ විජිතය (ඉක්මවා); **පාරං** නිවනට; **එස්සන්ති** පැමිණෙන්නාහු ය.

භාග්‍යවතුන් වහන්සේ විසින් මනාව දේශනා කර ඇති ධර්මය නිසි පරිදි ක්‍රියාත්මක කරමින් පිළිපදින අය තරණයට අති දුෂ්කර වූ මාරයා රජ කරන ප්‍රදේශය වූ සසරින් එතර වෙති.



නුවණැත්තා ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණ අකුසල් දුරුකොට කුසල් වඩන්නේ ය.

87. කණ්හං ධම්මං විප්පහාය
සුක්කං භාවෙථ පණ්ඩිතො
ඔකා අනොකං ආගම්ම
විවෙකෙ යත්ථ දූරමං (6:12)

අඳුරු පව් වැඩ දුරැර
සුසුදු පින් දහම් කර
ගිහි ගෙදර විත් අතැර
පැවිදි බිම සිත නො හැර

හික්මීමෙන් ලැබෙයි නිවන්

6 (12) පන්සියයක් ආගන්තුක හිමිවරුන් පිළිබඳ කතා පුවත (87,88 සහ 89 ගාථා)

දෙව්රම් වෙහෙර වැඩහුන් සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **ආගන්තුක භික්ෂූන් වහන්සේලා පන්සියයක්** අරබ මේ ගාථා තුන දේශනා කළ හ.

කෝසල රාජධානියේ වස් විසීම සඳහා ගොස් සිටි මේ භික්ෂු පිරිස වස් වැස නිමවා භාග්‍යවතුන් වහන්සේ වැඳ නමස්කාර කිරීම පිණිස පැමිණිය හ. එසේ පැමිණ බුදුරදුන් වැඳ එකත් පසෙක අසුන් ගත් හ. උන්වහන්සේලා වැසි සමය ගත කළ ආකාරය පිළිබඳව විස්තර අසා සිටි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා වලින් ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (87 ගාථාව)

පණ්ඩිතො යත්ථ විවෙකෙ දූරමං ඔකා අනොකං ආගම්ම කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ.

පණ්ඩිතො: නුවණැත්තා; **යත්ථ විවෙකෙ**: කිසියම් විමුක්තියක; **දූරමං**: ඇලුම් කිරීම අපහසු වූ ; **ඔකා**: ගිහි ගෙයින්; **අනොකං**: අනගාරික ජීවිතයට; **ආගම්ම**: පැමිණ; **කණ්හං ධම්මං**: අකුසල ක්‍රියාවන්; **විප්පහාය**: අතහැර; **සුක්කං**: කුසලක්‍රියා; **භාවෙථ**: වඩන්නේය.

නුවණැත්තා විවේකයෙහි ඇලීම දුෂ්කර තැනක් වූ ගිහි ගෙයින් නික්ම පැවිදි බිමට එළඹ අකුසල් වලින් වැලකී කුසල් දහම්හි නිරත විය යුතුය.

විවරණය

කණ්හං ධම්මං: අකුශල ධර්මය - මෙයින් අදහස් වන්නේ සදාචාරමය වශයෙන් දුර්වර්ණ වූ හෙවත් පාප ධර්මයි. විමුක්තියට අහිතකර ඊට අනුග්‍රහ වශයෙන් නො පවත්නා කරුණු අකුසල ධර්මය වෙති.

ඔකා ආනෝකං: ඔක නමින් හඳුන්වන්නේ ගිහි ගෙයයි. ගිහි ජීවිතයේ සුව පහසුකම් නිසා එය ඔක නමින් හැඳින් වේ. ගිහි ගෙයින් නික්ම චාම් අපිස් ජීවිතයට හුරුවීම 'අනෝක' ලෙස හඳුන්වා ඇත.

පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො: යන්නෙන් නුවණැත්තන් තම සිත් කෙලෙසුන් ගෙන් මුදා ගන්නා බව කියැවෙයි. මනස පිරිසිදු කිරීම පිළිබඳ දීර්ඝ ක්‍රියාවලිය කෙටියෙන් පැවසීමකි මේ. සිත කෙලෙසන කෙලෙසුන් අතර ප්‍රධාන තැනක් ගන්නේ පංච නීවරණ ධර්මයෝ ය.

පංච නීවරණ: නම් සිත ආධ්‍යාත්මික වර්ධනය වෙතින් වළකා සිටින බාධාකාරී සාධක පහකි. නිර්වාණ ප්‍රතිලාභය වෙතින් පුද්ගලයා වළකා සිටින මෙම බාධාකාරී ධර්ම පහ නම්,

1. කාමච්ඡන්ද,
2. ව්‍යාපාද,
3. ථීන මිද්ධ,
4. උද්ධච්ච කුක්කුච්ච
5. විචිකිච්ඡා ය.

1. කාමච්ඡන්ද

රූප, ශබ්ද, ගන්ධ, රස හා ස්පර්ශ යන පංච විධ කාම වස්තූන් කෙරේ ඇතිවන ඇල්ම කාමච්ඡන්දය යි. අප සසරට බැඳ තබන බන්ධන අතුරෙන් මෙය එකකි. සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයෝ මේවාට ඇළුම් කරති. ඊට හේතුව ඔවුන් තුළ ඉන්ද්‍රිය සංවරය නොමැති වීමයි. ධ්‍යානංග පංචකයෙන් එකක් වන ඒකාග්‍රතාව මගින් මෙම නීවරණය මැඩ පවත්වනු ලැබේ. සකදාගාමී වන විට මෙය දුබල කරන අතර අනාගාමී වීමෙන් සහමුලින්ම වනසනු ලැබේ. රූප රාග, අරූප රාග වැනි සූක්ෂම ඇලුම් දුරුවන්නේ රහත් ඵලය ලැබීමේදී ය. කාමච්ඡන්දය දුරු කිරීමෙහිලා පහත දැක්වෙන තත්ත්වයන් හය මහෝපකාරී වෙයි.

1. කාමය තුනී කිරීමට අදාළ වන අරමුණක් භාවනාව සඳහා යොදා ගැනීම.
2. කාමය තුනී කිරීමට අදාළ වන අරමුණක් යොදා ගෙන ධ්‍යානයක් උපදවා ගැනීම.
3. ඉඳුරන් දමනය කර ගැනීම.
4. ආහාරයෙහි පමණ දැනීම.
5. බඹසර හැසිරෙන උතුමන් ආශ්‍රය කිරීම.
6. තම ක්‍රියාවලියට අදාළ දැහැමි කතාවන්හි නිරත වීම.

2. ව්‍යාපාද

ප්‍රිය කරන අරමුණක් හමු වූ විට එහි මනාප වන පරිද්දෙන් ම, අප්‍රිය අරමුණක් හමු වූ විට අමනාප වීම සිරිතයි. මේ දෙක මුළු ලොවම දවන මහා ගිනි දෙකක් සේ හැඳින්වේ. අවිද්‍යාව සමග එක්වන කාමච්ඡන්දය හා ව්‍යාපාදය ලොව සියළු දුක් පසුපස පවත්නා මහා නිදාන දෙක සේ කීම නිවරද ය. ධ්‍යානාංගයක් වූ ප්‍රීතිය ව්‍යාපාද මැඩ ලයි. සකදාගාමී ඵලය ලැබීමෙන් දුබල වන ව්‍යාපාදය දුරු වන්නේ අනාගාමී ඵලය සාක්ෂාත් කළ විටය.

ව්‍යාපාදය දුරු කිරීමෙහි ලා උපස්ථම්භක වන සාධක හය මේ ය.

1. මෙත් සිතින් අරමුණ දෙස බැලීම.
2. මෙත්තා භාවනාව නිරතුරුව ප්‍රගුණ කිරීම.
3. තමන් ගේ ම කර්මය ගැන ආවර්ජනය කිරීම.
4. ඥාන සම්ප්‍රයුක්තව කල්පනා කිරීම.
5. කල්‍යාණ මිත්‍ර සේවනය.
6. අර්ථ සම්පන්න සංවාදයන්හි යෙදීම.

3. ථීන මිද්ධ

ථීන නම් අලස කමයි. මිද්ධ නම් නිදිබර ඔතෑනි ගතියයි. මෙය කායික අපහසුකමක් නොව මානසික ස්වභාවයකි. මෙය ගසක එල්ලී සිටින වවුලෙකු හෝ කෝටුවකට ඇලුණු පැණි ටිකක් ලෙස හෝ ගාන්නට අපහසු තරම් උකු වෙඩරු පිඬක් සේ උපමා කර දක්වති. මේ ගතිය ඇති විට වැඩක් කරන්නට උද්යෝගයක් නො නැඟෙයි. මේ ගති වීර්යාරම්භයෙන් මැඩ ගත හැකි අතර මුලුමනින් ම දුරු වන්නේ රහත් බව ලත් විට ය.

ථීන මිද්ධ දුරුවීම කෙරේ බලපාන සාධක ද හයක් වෙයි. එනම්

1. පමණ දැන ආහාර ගැනීම.
2. කායික ඉරියව් වෙනස් කිරීම.
3. ආලෝක කසිණය වැඩීම.
4. එළිමහනේ සිටීම.
5. කල්‍යාණ මිත්‍ර සේවනය.
6. අර්ථ සම්පන්න සංවාදයන්හි යෙදීම.

ඊලග පිටුව හා සම්බන්ධයි



නුවණැත්තා කම්කටොලු හැර නිවණෙහි ඇලී සිය සිත මොනවට පිරිසිදු කෙරේ.

88. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය
හිත්වා කාමෙ අකිඤ්චනො
පරියොදපෙය්‍ය අත්තානං
චිත්තක්ලෙසෙහි පණ්ඩිතො (6:13)

නිදහස් වී දුරු වී හැම කාමෙන්
විසුවොත් යහපති විවේක සුවයෙන්
තමා ම මැනවින් දමනය වීමෙන්
නැණැති මුදයි සිත හැම කෙලෙසුන්ගෙන්

පිරිසිදු කරගන්න ඔබගේ සිත

6 (12) පන්සියයක් ආගන්තුක භික්ෂූන් පිළිබඳ කතා පුවත (87,88 සහ 89 ගාථා)

විවරණාත්මක අනුවාදය (88 ගාථාව)

පණ්ඩිතො කාමෙ හිත්වා අකිඤ්චනො තත්‍ර අභිරතිං ඉච්ඡෙය්‍ය චිත්තක්ලෙසෙහි අත්තානං පරියොදපෙය්‍ය.

පණ්ඩිතො: නුවණැත්තා; **කාමෙ**: ඉඳුරන් පිණාවීම; **හිත්වා**: අතහැර; **අකිඤ්චනො**: කිසිවකුට ඇළුම් නො කරමින; **තත්‍ර**: එම විවේකයෙහි; **අභිරතිං**: ඇලීම; **ඉච්ඡෙය්‍ය**: ප්‍රිය කරන්නේය; **චිත්තක්ලෙසෙහි**: මානසික කිලිටි වලින්; **අත්තානං**: තමා; **පරියොදපෙය්‍ය**: පිරිසිදු කර ගන්නේය.

නුවණැත්තා කම්සුව හැර දමා සියළු වස්තු සම්පත් කෙරේ ආශාව දුරු කර පැවිදි ජීවිතයෙහි ලැබෙන විවේක සුවය ප්‍රිය කරයි. සිත කෙළෙසුන්ගෙන් මුදවා ගනියි.

විවරණය

පෙර පිටුව හා සම්බන්ධයි

5. විචිකිච්ඡා

සැකය හෙවත් අතීරණය මෙයින් හැඟෙයි. නුවණ මඳ වූ විට ඇතිවන මේ තත්වය පැටළුණු ව්‍යාකූල චින්තනය ලෙස ද හැඳින්වෙයි. මෙය බුද්ධාදී අවතැන්හි සැකය වශයෙන් නිර්වචනය නො කළ යුත්තේ අබොද්ධයන් පවා විචිකිච්ඡා දුරු කර ධ්‍යාන ලබන හෙයිනි.

විචිකිච්ඡා නම් වූ සංයෝජනය එසේ හැඳින්විය හැකිය. එහෙත් නීවරණයක් වූ විචිකිච්ඡාව හුදෙක් ඕනෑම වැදගත් ප්‍රස්තුතයන් විෂයෙහි ඇති විය හැකි ව්‍යාකූල චින්තනය යි. අටුවාවෙහි එන මේ නිර්වචනය අනුව විචිකිච්ඡාව අතීරණය ලෙස හැඳින්විය හැකිය. විචිකිච්ඡාව ධ්‍යානාංගයක් වූ විචාරය මගින් මැඩලිය හැකිය. එය සෝවාන් ඵලය මගින් මුලෝත්පාටනය වෙයි. විචිකිච්ඡාව දුරලීමේ විෂයෙහි හිතකර බලපෑමක් විය හැකි කරුණු හයක් දක්වා ඇත. එනම්,

1. ධර්ම විනය පිළිබඳ ඥානය.
2. ප්‍රශ්න කිරීම හා සාකච්ඡාව.
3. ශික්ෂාවෙහි යථා තත්ත්වය පිළිබඳ අවබෝධය.
4. දැඩි ශ්‍රද්ධාව.
5. කල්‍යාණ මිත්‍ර සේවනය.
6. අර්ථවත් කතා බහ යන කරුණු හයයි.

උපමා දක්වන විට, කාමච්ඡන්දය විවිධ වර්ණ මිශ්‍ර ජලයට ද, ව්‍යාපාදය උණු වතුරට ද, ථීන මිද්ධය පෙඳ හා පාසි වලින් වැසුනු ජලයට ද , උද්ධච්ච කුක්කුච්චය වාත වේගයෙන් කැළඹුණු ජලයට ද, විචිකිච්ඡාව කැළඹුණු මඩ වතුරට ද සමාන කර දක්වා තිබේ. මෙබඳු ජලයේ යමෙකුට තම පිළිබිඹුව දැක ගත නො හැකි පරිද්දෙන් ම පංච නීවරණයෙන් යුක්ත සිතක් ඇති විට තමා ගේ යහපත, අනුන්ගේ යහපත හෝ තමාගේත් අනුන්ගේත් යන දෙපිලේ ම යහපත යන කිසිවක් මෙනෙහි කර ගැනීම අපහසු වෙයි. මේ පංච නීවරණ විවිධ ක්‍රම වලින් යටපත් කර ගන්නේ තාවකාලිකව ය. ඒවායේ පූර්ණ ප්‍රහාණය සිදුවන ආකාරය මෙහි දැක්වේ.සෝවාන් වීමේ දී - විචිකිච්ඡා, අනාගාමී වීමේ දී - කාමච්ඡන්ද, ව්‍යාපාද, උද්ධච්ච කුක්කුච්ච සහ රහත් වීමේ දී - ථීන මිද්ධ

සප්ත බොධ්‍යඞග (සම්බොජ්ඣංග): නම් ලෝකෝත්තර සිත්වල නිර්වාණාලම්බනයෙහි එල්බ ඒකක්ෂණික ව හා ලොකික සිත්වල නානාලම්බනයෙහි එල්බ නානාක්ෂණිකව උපදනා සමෘති, ප්‍රඥා, වීර්යය,ප්‍රීති, ප්‍රශ්‍රබ්ධි, ඒකාග්‍රතා, උපේක්ෂා යන චෛතසික සතය. බුදුබව ලැබීම සඳහා උපකාරි වන මේ ගුණාංග සම්බොජ්ඣංග වශයෙන් හැඳින් වේ. මේ අංග විෂයෙහි සත්‍ය ගවේෂකයා දක්වන්නේ කවර විදියේ ආකල්පයක් ද? සත්‍ය ගවේෂකයා "මා තුළ සම්බුද්ධත්වය ලැබීමේ ගුණාංගයක් වූ සතිය ඇත" යි දනියි.

එය නැති විට නැති බව දනියි. එය ඇති කර ගන්නේ කෙසේ දැයි තේරුම් ගන්නා හෙතෙම එය වර්ධනය කර ගනියි. එය ඇති වූ විට දැන් මා තුළ මෙම සම්බෝධි අංගය වර්ධනය වී ඇතැයි දැන ගනී. මෙය සතිපට්ඨාන සූත්‍රයේ දී සත්‍ය ගවේෂකයා ධම්මානුපස්සනාව වඩන ආකාරය යි. සත්‍ය ගවේෂකයකු සම්බොජ්ඣංග විෂයෙහි දක්වන්නේ මෙම ගතික හා ප්‍රායෝගික ආකල්පය යි. සම්බොජ්ඣංග හත නම්,

1. සති සම්බොජ්ඣංගය
2. ධම්ම විචය සම්බොජ්ඣංගය
3. විරිය සම්බොජ්ඣංගය
4. පීති සම්බොජ්ඣංගය
5. පස්සද්ධි සම්බොජ්ඣංගය
6. සමාධි සම්බොජ්ඣංගය
7. උපෙක්ඛා සම්බොජ්ඣංගය

සප්ත බොධ්‍යඞග එනමින් හඳුන්වනු ලබන්නේ බුද්ධත්වය කරා යමකු යොමු කරන ගුණාංග සප්තකයක් හෙයිනි. (බෝධි-අංග) මේවා වර්ධනය වන්නේ **කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා**, සහ **ධම්මානුපස්සනා** යන සතර සතිපට්ඨානය ප්‍රගුණ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මේ සම්බන්ධයෙන් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාල හ.

(1) "මහණෙනි, භික්ෂුනමක් වීර්යයෙන් යුතුව පිරිසිදු සිහියෙන් යුතුව, සම්පජඤ්ඤයෙන් අභිද්‍යාව හා දොම්නස දුරු කොට වේදනා, සිත හා ධර්මයන් විෂයෙහි සිහිය පිහිටුවා ගෙන වාසය කරයි නම්, ඔහු ගේ සිහිය මනාව පිහිටා සිටියි. ඔහු ගේ සිහිය මනාව පිහිටා සිටි විට සති සම්බොජ්ඣංගය වර්ධනය වී පූර්ණත්වයට පත් වෙයි.

(2) සතියෙන් යුතුව වාසය කරන අතර එම භික්ෂුව නුවණින් යුතුව ධර්මය ගැන සිතමින් විමසමින් වාසය කරන්නේ නම් එවිට ඔහු ගේ ධම්ම විචය සම්බොජ්ඣංගය පූර්ණත්වයට පත්වෙයි.

(3) නුවණින් විමසා බලමින් තහවුරු වූ පඨන් වීර්යයෙන් යුතුව එම භික්ෂුව වාසය කරන විට ඔහු ගේ විරිය සම්බොජ්ඣංගය පූර්ණත්වයට පත්වෙයි.

(4) වීර්යය පූර්ණත්වයට පත් වී වාසය කරන භික්ෂුව තුළ අනිඳිය වූ ප්‍රණීතකර වූ සමාධිජ ප්‍රීතිය වර්ධනය වීමෙන් පීති සම්බොජ්ඣංගය පරිපූර්ණ වෙයි.

(5) සිත සමාධිගතව, සිත හා ගත සංවරව වාසය කරන එම භික්ෂුවට පස්සද්ධි සම්බොජ්ඣංගය වර්ධනය වෙයි.

(6) කාය පස්සද්ධිය ඇති වී ප්‍රීතිය වර්ධනය වී චිත්තේකාග්‍රතාව වර්ධනය වූ විට සමාධි සම්බොජ්ඣංගය වර්ධනය වෙයි.

(7) තම සිත දෙස පූර්ණ උපේක්ෂාවෙන් නිරීක්ෂණය කරන විට යෝගාවචර භික්ෂු තෙම උපේක්ඛා සම්බොජ්ඣංගය පරිපූර්ණය කර ගනියි."

තත්‍රාභිරති මිච්ඡෙය්‍ය: විමුක්තිය විෂයෙහි ඇල්ම ඇති කර ගැනීම.

අකිඤ්චන: සියලු උපභෝග- පරිභෝග වස්තු අතහැර තෘෂ්ණා විරහිත ජීවිතයක් ගත කිරීම.

චිත්තක්ලෙසෙහි: සිත කිලිටි කරන කෙලෙස්.

සම්බෝධියට පත් වන දහම්හි මනාකොට පුරුදු කළ සිතැති රහත්හු ලොව පිරිනිවි උතුමෝ ය.

89. යෙසං සම්බෝධිඅඞ්ගෙසු
සම්මා චිත්තං සුභාවිතං
ආදානපටිනිස්සග්ගෙ
අනුපාදාය යෙ රතා
ඛීණාසවා ජුතී මන්තො
තෙ ලොකෙ පරිනිබ්බුතා (6:14)

සම්බුදු අංග වඩමින්
සිය සිත පුහුණු කළ අය
හැම බැඳුම් සිඳ හැර
නො රඳා ඇළුම් දුරු කර
බබලති රහත් වී
වෙති පිරිනිවන් පෑවෝ

රහත් පල ලැබගෙන - යති ලොව ඉක්මවා ගෙන

6 (12) පන්සියයක් ආගන්තුක හිමිවරුන් පිළිබඳ කතා පුවත (87,88 සහ 89 ගාථා)

විවරණාත්මක අනුවාදය (89 ගාථාව)

යෙසං චිත්තං සම්බෝධි අඞ්ගෙසු සම්මා සුභාවිතං යෙ අනුපාදාය ආදාන පටිනිස්සග්ගෙ රතා ජුතිමන්තො තෙ ඛීණාසවා ලොකෙ පරිනිබ්බුතා.

යෙසං: යම්කිසි (නිර්මල) තැනැත්තකු ගේ; **චිත්තං**: සිත; **සම්බෝධි අඞ්ගෙසු**: සම්බොජ්ඣංගයන් විෂයෙහි; **සම්මා සුභාවිතං**: මැනවින් වඩන ලද ද; **යෙ**: යම් කිසි කෙනෙක්; **අනුපාදාය**: කිසිවක් උපාදාන වශයෙන් ග්‍රහණය නො කර; **ආදාන පටිනිස්සග්ගෙ**: ග්‍රහණයන් අතහැර දැමීමෙහි; **රතා**: ඇලුම් කරත් ද; **ජුතිමන්තො**: බැබළෙමින් සිටින;**තෙ ඛීණාසවා**: ඒ රහතන් වහන්සේලා; **ලොකෙ**: ලෝකයෙහි; **පරිනිබ්බුතා**:- පිරිනිවන් පෑ උත්තමයෝ ය.

බෝධ්‍යංග නිසි ලෙස වර්ධනය කර ගත්, කිසිම වස්තුවක් මගේ යැයි ග්‍රහණය නො කරන, උපාදාන නො ගන්නා යමෙක් වෙත් නම්, එම දීප්තිමත් රහතන් වහන්සේලා නිවන් සුව පසක් කර ගත්තෝ ය.

විවරණය

ආදාන පටිනිස්සග්ගේ: අල්වා ගැනීම (ග්‍රහණය) කෙරෙහි ඇති ප්‍රවණතා නැති කර දැමීම. අල්ලා ගැනීමේ ස්වභාවය දුරු කිරීම.

ලෝකේ පරිනිබ්බුතා: මේ භවයේදීම (මේ ලෝකයේදී ම) නිවන් සුවය සාක්ෂාත් කරගෙන ඇත්තේ ය. පරිනිබ්බුත යන වචනයෙන් මරණය අදහස් නොවන බව තේරුම් ගැනීම මැනවි. මෙහිදී සෝපාධිසේස පරිනිර්වාණය අදහස් කර ඇත.

පරිනිබ්බුත යන්නෙන් සාමාන්‍යයෙන් භාග්‍යවතුන් වහන්සේ ගේ පිරිනිවන් පෑම අදහස් වෙතත් රහතන් වහන්සේ නමක් සම්බන්ධයෙන් වුවද එය යෙදිය හැකිය. බුදුරජාණන් වහන්සේ ගේ පරිනිර්වාණය පිළිබඳව මහා පරිනිර්වාණ සූත්‍රයෙහි පැහැදිලිව විස්තර කර ඇත. මුලින් ම ප්‍රථම ධ්‍යානයට සමවැදුණු භාග්‍යවතුන් වහන්සේ අනතුරුව ඉන් නැගී ද්විතීය ධ්‍යානයට සම වැදුණාහ. මේ ක්‍රමයෙන් තෘතීය, චතුර්ථ ධ්‍යානයන්ට ද ඉන් පසු ආකාසානඤ්චායතන ධ්‍යානය, විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය, ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය, හා නේ'ව සඤ්ඤා නාසඤ්ඤායතනයට ද සමවන්හ. ඉන් නැගී සඤ්ඤාවේදයිත නිරෝධයට සමවන්හ. ඉන් පසු නැවත අවරෝහණ ක්‍රමයෙන් මුල් ධ්‍යානය දක්වා සමවැද නැවත චතුර්ථ ධ්‍යානය දක්වා ආරෝහණ ක්‍රමයට සම වැදුණාහ.

එයින් නැගී සිටි භාග්‍යවතුන් වහන්සේ අනුපදිසේස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ හ.

බෞද්ධයා කිසිවෙකුගේ වහලෙක් නොවේ.

බෞද්ධයෙක් පොතකට වහල් නොවේ. ඔහු සෙසු අයෙකුටද වහල් නොවේ. බෞද්ධයකු වීමෙන් ඔහු සිතීමේ නිදහස කැප කරන්නේ නැත. ඔහුට සිය නිදහස් චින්තනය භාවිතා කළ හැක. බුද්ධත්වය ලැබීම සඳහා වුවත් ඔහුට සිය ප්‍රඥාව දියුණුකොට ගත හැකිය. මක්නිසාදයත් හැමෝම බුදු කෙනෙකු වීමේ වාසනාව සහිත හෙයිනි.

නාරද මහා ස්ථවිරයන් වහන්සේ 'බුදු සමය යනු කුමක්ද?' නම් පොතෙන්.

අරහන්ත වග්ග



නිමි සසර ගමන් ඇති සියලු කෙලෙස් ගැට සිඳ ලූ රහතුනට සිත් තැවිල්ලෙක් නැත්තේ ය.

90. ගතද්ධිනො විසොකස්ස
විප්පමුත්තස්ස සබ්බධි
සබ්බගන්ථප්පහීනස්ස
පරිළාහෝ න විජ්ජති (7:1)

ගමන නිම කළ, දුරැර සෝකය
සියල්ලෙන් ලැබගත් විමුක්තිය
පුපුරුවා හළ සියලු බන්ධන
උතුමනට නැත කිසි දැවීමක්

නිවී යයි කෙලෙස් ගිම්

7 (1) ජීවක නැගූ ප්‍රශ්න (90 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ **ජීවක** නම් අඹවනයේ වැඩ විසූ සමයෙහි ජීවක විසින් විමසන ලද ප්‍රශ්නයක් විෂයෙහි මේ ගාථාව දේශනා කළ සේක.

එසමයෙහි අජාසත් රජ සමග එක් වූ දේවදත්ත ස්ථවිරයෝ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෛර බැඳ ගලක් පෙරළා උන් වහන්සේ මරා දමමි යි සිතා ගිජුකුළු පව්වට නැග ගත්තේ ය. ඔහු කඳු මත සිට බුදුන් වෙතට කළු ගලක් වෙර යොදා පෙරලූ නමුත් බුදුරදුන් ගේ පින් මහිමයෙන් මතු වූ ගලක් එම ගල නවතාලීය. එහෙත් ගලෙන් බිඳුණු පතුරක් භාග්‍යවතුන් වහන්සේ ගේ පයෙහි වැදී ලේ ගලන්නට පටන් ගත්තේ ය. බුදුරජාණන් වහන්සේට දැඩි වේදනාවක් දැනුණෙන් භික්ෂූහු උන් වහන්සේ මද්දකුච්ඡියට ගෙන ගිය හ.

අම්බ වනයෙහි සිටි ජීවක වෛද්‍යවරයා වෙතින් පිළියම් ලබනු රිසි වූ උන් වහන්සේ "මා ජීවක වෙත ගෙන යන්නැ"යි භික්ෂූන් වහන්සේලාට කියා සිටිය හ. වහා ක්‍රියාත්මක වූ ජීවක බුදුරදුන් ගේ පාදයෙහි ඖෂධයක් ගල්වා "සමිඳුනි, නගරයේ එක් රෝගියකු බලන්නට ඇත. ඔහුට පිළියම් කොට වහා ආපසු එමි. මා එන තුරු මේ බෙහෙත තිබෙන්නට හරින්න"යි කියා හේ තම රෝගියාට පිළියම් කරන්නට ගියේ ය.

ඔහු රෝගියාට පිළියම් කර ආපසු එන විට ගේට්ටුව වසා තිබුණු හෙයින් පැමිණීමට අපහසු විය. ඔහුට මෙසේ සිතිණි."බෙහෙත ලිහා දැමීමට දැන් වේලාවයි. එසේ නො කළ හොත් බුදුරදුන්ට බොහෝ වේදනා ඇති වනු ඇත. මට තිබුණේ බෙහෙත ලිහන්නට වෙන කෙනෙකු යොදවා යාමට යි. මා කර ඇත්තේ බරපතල පාප කර්මයකි." මෙසේ සිතමින් හේ පසු තැවුණේ ය.

ජීවක එසේ පසුතැවෙන අතරතුර භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් අමතා "ආනන්ද, ජීවකට ගේට්ටුව වසා ඇති බැවින් මෙහි පැමිණීම දුෂ්කර විය. දැන් බෙහෙත ගළවා දමන්නට යෝග්‍ය වේලාවයි." ඒ ඇසූ ආනන්ද හිමියෝ වෙළුම් පටි ගලවා බෙහෙත ඉවත් කළ හ. තුවාලය සුව වී තිබිණ.

උදෑසනින් ම ජීවක බුදුරදුන් දකින්නට පැමිණ,"සමිඳුනි, ඔබ වහන්සේට බරපතල වේදනාවක් දැනුණා ද?"යි ප්‍රශ්න කළ හ. "ජීවක, බුද්ධත්වය ලත් දින වජ්‍රාසනය මත දී තථාගතයන් වහන්සේ ගේ සියලු වේදනා අවසන්ව ගියේ ය" යි උන් වහන්සේ පැවසූහ.

විවරණාත්මක අනුවාදය (90 ගාථාව)

ගතද්ධිනො විසොකස්ස සබ්බධි විප්පමුත්තස්ස සබ්බ
ගන්ථප්පහීණස්ස පරිළාහෝ න විජ්ජති.

ගතද්ධිනො: ගමන නිම කළ; **විසොකස්ස**: ශෝකය දුරු කළ; **සබ්බධි**: හැම දේ කෙරෙන් ම; **විප්පමුත්තස්ස**: විමුක්ත වූ; **සබ්බ ගන්ථප්පහීණස්ස**: සියළු බන්ධනයන්ගෙන් මිදුණු; **පරිළාහො**: වේදනාවක්; **න විජ්ජති**: විද්‍යාමාන නොවේ.

සසර ගමන නිමැවූ, සියලු ශෝක දුරු කළ හැම අතින්ම විමුක්ත, සියළු බන්ධන සිඳලූ බුදුන් වහන්සේ, රහතන් වහන්සේ වැනි උතුමනට පරිළාහයන් හෙවත් වේදනාවක් නො මැත.

විවරණය

ගතද්ධිනො: යන්නෙන් අදහස් වන්නේ සසර ගමන නිමවා වදාළ බුද්ධාදී උතුමෝය. සියලු මිනිසුන් ගමන් ගන්නා සංසාර මාර්ගය හැරෙන විට තවත් මිනිසුන් විසින් ගමන් ගන්නා මාර්ග තිබේ. එනම්,

1. සොර සතුරන් ගැවෙසෙන මාර්ගය
2. වන සතුන් ගැවසෙන මාර්ගය
3. ජලය නැති මාර්ගය
4. අමනුෂ්‍යගෘහිත මාර්ගය හා
5. ආහාර විරහිත මාර්ගය යි.

මෙහි දී එම දුගී මාර්ග නොව සංසාර මාර්ගය අදහස් වෙයි.

සබ්බ ගන්ථප්පහීන: මින් සියලු බන්ධනයන්ගෙන් මිදුණු යන්න කියැවෙයි. බන්ධන වර්ග හතරක් වෙයි.

1. අභිධ්‍යා: අධික තෘෂ්ණාවයි. අන්‍යයන් ගේ සම්මාන ලබා ගැනීම සඳහා ඇතිවන දැඩි තෘෂ්ණාව යි.

2. ව්‍යාපාද: අන්‍යයන් විෂයෙහි අමනාප ව ක්‍රෝධය හෙවත් වෛරය ඇති කර ගැනීම යි.

3. සීලබ්බත පරාමාස: විධිමත් ශික්ෂණයෙන් බැහැරව විවිධ මිථ්‍යා ව්‍රත චාරිත්‍ර ආදියට යොමු වීමයි.

4. ඉදං සච්චාභිනිවෙසො: මා පිළිගන්නා දෙය පමණක් ම සත්‍යය යි, අන් සියල්ල මුසාවාද වෙති, යි පිළිගැනීම. යන මේ හතර එබඳු බන්ධන වෙති. මේ හතර මිනිසා සසරට බැඳ තබයි.

ජීවක: බුදුරජාණන් වහන්සේ ගේ වෛද්‍යවරයා ය. උපන් හැටියේ ම මව විසින් කූඩයක දමා කුණු ගොඩක දමා තිබිණි. බිම්බිසාර රජුගේ පුත්‍රයකු වූ අභයරාජ කුමාරයා ඔහු දැක දරු සෙනෙහසින් හදා ගත්තේ ය. කුණු ගොඩෙන් ගනිද්දී පණ තිබුණු හෙයින් (ජීවති) ඒ බව කියැවෙන ජීවක නම ඔහුට යෙදිණි. කුමරකු විසින් හදා වඩා ගත් හෙයින් කෝමාරභච්ච යන්න ද නමට ඈඳිණි. වෛද්‍ය ශාස්ත්‍රය හදාරා දක්ෂ වෛද්‍යවරයකු වූ හෙතෙම ශල්‍ය කර්මයන්හි ද දක්ෂ විය. දරුණු ශීර්ෂාබාධයකින් පෙළුණු සිටුවරයකුට සැත්කම් දෙකක් කළ බව පත පොතේ සඳහන් වේ. දිනකට තුන් වරක් බුදුරදුන් හමු වීමට ගිය සැදැහැවතකු වූ හේ ගල් පතුර වැදී තුවාල වූ බුදුරදුන් ගේ පාදයට ද පිළියම් කළේ ය.

විල හැරපියා හංසයන් යන්නා සේ - රහත්හු, වසන හැමතැනක්ම ඇලීම් රහිතව හැරයත්.

91. උයයුඤ්ජන්ති සතීමන්තො
න නිකෙතෙ රමන්ති තෙ
හංසා'ව පල්ලලං හිත්වා
ඔකමොකං ජහන්ති තෙ (7:2)

සිහි ඇත්තෝ බවුන් වඩන
නවාතැනක සිත නො රඳන
හංසයන් සේ විල හැර යන
හැරලති යන යන නිවහන

උතුමෝ අරහත් - කිසිතැනක නො ඇලෙත්

7 (2) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ (91 ගාථාව)

මහා කාශ්‍යප මහ තෙරුන් වහන්සේ ඇරබ බුදුරදුන් මේ ගාථාව වදාරන ලද්දේ වේළුවනාරාමයෙහි වැඩ සිටි සමයේ ය.

රජගහ නුවර වස් වැස නිමැ වූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "දෙසතියකින් පසු මම පිණ්ඩපාත චාරිකාවෙහි නිරත වන්නෙමි" යි වදාළ හ. ඒ ඇසූ බොහෝ භික්ෂූන් වහන්සේලා පාත්‍ර සූදානම් කර ගත්හ. සිවුරු සෝදා පඬු පොවා සකස් කරන්නට පටන් ගත්හ. ඒ අවස්ථාවෙහි මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ද තම සිවුරු සෝදා පිරිසිදු කර ගත්හ.

මහා කාශ්‍යප තෙරුන් සිවුරු සෝදා වේලා සකස් කරනු දුටු ඇතැම් භික්ෂූහු "මහා කාශ්‍යප හිමියන් මේ සිවුරු සූදානම් කරන්නේ කුමට ද? රජගහ නුවර දහ අට කෝටියක් ජනයා වෙසෙති. මේ අයගෙන් වැඩි හරිය එක්කෝ කාශ්‍යප හිමියන් ගේ දායකයෝ ය. නැත්නම් නෑදෑයෝ ය. ඔවුන් අතහැර උන්වහන්සේ කොහි වැඩම කරන්නට ද? ඒ අය උන්වහන්සේට නො අඩුව සිවුපසය පිරිනමන්නෝ ය. ඒ අය හැර දමා උන්වහන්සේ කොහි වඩින්නට ද? ගියත් උන්වහන්සේ මාපමාද ගුහාවෙන් එහාට නො යනවා ඇත." යි කතිකා කළ හ. (මාපමාද ගුහාව නම්, භාග්‍යවතුන් වහන්සේ තමන් සමග යන්නට එන භික්ෂූන්ගෙන් සමහරුන් ආපසු එවන්නට සිතා නැවතී "මහණෙනි, ඔබ මෙතැනදී ආපසු හැරී ආරාමයට යන්න. ප්‍රමාද නො වී ක්‍රියා කරන්න. (මා පමජ්ජිත්ථ)" යි අවවාද කරන තැනය.) භාග්‍යවතුන් වහන්සේ ද ගමනට පිටත් වී, "මේ රජගහනුවර ඇතුළත හා පිටත දහ අට කෝටියක් ජනයා වෙසෙති.

මේ අය ගේ විවිධ ආගමික අවශ්‍යතා තිබේ. එහෙයින් ආරාමය හිස් වන්නට ඉඩ හැරීම නුසුදුසු ය. මෙහි කවුරුන් හෝ සිටිය යුතු ය. මේ වැඩිදෙනා එක්කෝ මහා කාශ්‍යප ගේ දායකයෝ ය. නැත්නම් ඥාතිවරුය. එහෙයින් මා උන්වහන්සේ හා පිරිස මෙහි නවතා යන්නේ නම් මැනවි" යි සිතා, මහා කාශ්‍යප හිමියන් අමතා මෙසේ වදාළ හ. "මහා කාශ්‍යප, ආරාමය හිස්ව තැබීම නුසුදුසු ය. මහ ජනතාවට උත්සව අවස්ථාවල හෝ විපත්ති අවස්ථාවල සංඝයා අවශ්‍ය වෙයි. එහෙයින් ඔබ ඔබ ගේ පිරිසත් සමග නවතින්න." ඒ ඇසූ මහා කාශ්‍යප හිමියෝ ද "මැනවි, ස්වාමීනි" යි ආපසු හැරී ගියහ.

ඇතැම් භික්ෂූහු ඒ දැක "අප කීවා බොරු ද? මහා කාශ්‍යප හිමියන් සිවුරු සෝදා සකසත් දී මාපමාද ගුහාවෙන් එහාට නො යන බව අපි නො කීවෙමු ද? අප කී දේ එලෙස ම ඉටු වූවා නොවේ ද?'' යි කියන්නට වූහ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ නැවතී "මහණෙනි, ඔබ මේ දැන් කතා කළේ කුමක්ද?" යි විමසුයෙන් භික්ෂූහු සියල්ල නොවළහා කියා පෑහ. "මහණෙනි, මහා කාශ්‍යපයන් නැවතුණේ ඔබ කියන පරිදි ඥාතීන් හෝ දායකයන් ප්‍රත්‍ය පිරිනමන නිසා නොව, මාගේ වචනය නිසා ය. මට ඇති අවනත බව නිසා ය. මහා කාශ්‍යපයෝ කුල ගෙවලට හෝ ගිහියන්ගෙන් ලැබෙන ප්‍රත්‍යයට ඇලුම් කරන්නෝ නො වෙති. ඇත්තම කිවහොත් පෙර අත් බවෙක මහා කාශ්‍යප ස්ථවිරයෝ මම චන්ද්‍රයා මෙන් නො ඇලී වසන්නට සමත් වෙම්වා යි ප්‍රාර්ථනා කළේ ය. මහා කාශ්‍යප දායකයන් වෙත හෝ විහාරය වෙත හෝ බැඳුණෝ නො වෙයි. මහා කාශ්‍යප ගේ පටන් සියලුම ශ්‍රාවකයන්ට මා අවවාද කර ඇත්තේ චන්ද්‍රයා උපමා කොට හැසිරෙන ලෙස නොවේ ද? සියළු භික්ෂූන් හංසයන් විලකට නො ඇලී විලෙන් විලට පියාඹන්නා සේ එක් ස්ථානයකට නො ඇලී සෙනසුනෙන් සෙනසුනට ඇල්මක් නොකර සැරිසරන්නට සමත් වුව මනාය"යි අවවාද කළ හ.

විවරණාත්මක අනුවාදය (91 ගාථාව)

සතීමන්තො උයුඤ්ජන්ති තෙ නිකෙතෙ න රමන්ති තෙ
පල්ලලං හිත්වා හංසා ඉව ඔකමොකං ජහන්ති.

සතීමන්තො: සිහිය වඩන උතුමෝ; **උයුඤ්ජන්ති**: නිරතුරුව බවුන් වඩති; **තෙ**: ඔවුහු; **නිකෙතෙ**: ඇලුම් බැඳුම් විෂයෙහි; **න රමන්ති**: උනන්දු නො වෙති; **තෙ**: ඔවුහු; **පල්ලලං හිත්වා**: විල හැර යන; **හංසා ඉව**: හංසයන් මෙන්; **ඔකමොකං**: නවාතැන් පොළවල්; **ජහන්ති**: හැරයති.

සිහි නුවණින් දවසරින නිරතුරු බවුන් වඩන උතුමෝ කිසි ම බන්ධනයක් ඇති කර නොගනිති. හංසයන් විලක් හැර විලකට යන පරිද්දෙන් ඔවුහු ආරාම කෙරේ නො ඇලී හැර යති.

විවරණය

සතීමන්තො: සතිය නම් අවධානය යි. නිරන්තර අවදිකම යි. සතිය පංච ඉන්ද්‍රිය හා පංච බල අතර එකකි. බෝධි අංගයන් ගෙන් ද එකකි. ආර්යය අෂ්ටාංගික මාර්ගයෙහි සත් වන පියවරයි. කුසල කර්ම හා කර්මජ මහග්ගත චිත්තයන්ගේ ද යෙදෙන අනිවාර්ය ය චෛතසිකයකි.

අරහන්ත: හෙවත් රහතන් වහන්සේලා කිසිවකට හෝ කිසිවෙකුට ඇලුම් නොකරන්නෝ ය. මම ය, මාගේ ය වැනි සංකල්පයන්ගෙන් ද තොරය හ.

නිවණ ගොදුරු කොටැති රහතුන් ගේ ගතිය නොදතහැක. අහසේ සකුණයන් ගිය මඟ නො දත හැක්කාක් මෙනි.

92. යෙසං සන්නිචයො නත්ථි	නැත ඔවුන් රැස් කරන්නේ
යෙ පරිඤ්ඤාතභොජනා	පමණ දැනගෙන බුදින්නේ
සුඤ්ඤතො අනිමිත්තො ච	නිවුණු සලකුණු දකින්නේ
විමොක්ඛො යස්ස ගොචරො	නිවන් අරමුණු කරන්නේ
ආකාසෙ’ව සකුන්තානං	නුබ සියොත් පිය ලෙසින්නේ
ගති තෙසං දුරන්නයා.(7:3)	නොමැත සලකුණු තියන්නේ

ගුණවත් රහතුන් - නො ලබන අවමන්

7 (3) බෙල්ලට්ඨිසීස තෙරුන් වහන්සේ (92 ගාථාව)

වේරම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **බෙල්ලට්ඨිසීස** තෙරුන්වහන්සේ ඇරබ මේ ගාථාව දේශනා කළ හ.

දිනක් බෙල්ලට්ඨිසීස තෙරහු පිඬු සිඟා ගොස් අතර මඟ එක් පහසු තැනක වැඩ හිඳ වළඳා නිම කොට පාත්‍රය පිරිසිදු කර නැවත පිඬු සිඟා ගිය හ.එසේ එක් කර ගත් බත ද රැගෙන වෙහෙරට පැමිණි උන් වහන්සේ ඒවා අව්වේ ලා වේළා ගත් හ. ඊළඟ දිනයේ පිඬු සිඟා යාමේ අවශ්‍යතාව වලකා ගන්නට උන්වහන්සේ එසේ කළ හ. අනතුරුව උන්වහන්සේ දින දෙක තුනක් ම එක දිගට ධ්‍යාන සුවයෙන් භාවනානුයෝගී ව කල් ගත කළහ. ධ්‍යානයෙන් නැඟී සිට වියළා තබා ගත් ආහාර දියෙන් පොඟාවා වළඳා කුසගිනි නිවා ගත්හ.

මේ ක්‍රියාව භික්ෂු ජීවිතයට නො ගැලපෙතැයි තීරණය කළ අන්‍ය භික්ෂූහු ඒ බව භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන්හ. ආහාර තැන්පත් කර තබා ගෙන භුක්ති විඳීම භික්ෂුත්වයට අගෝචර හෙයින් භාග්‍යවතුන් වහන්සේ එය නො මනාය යැයි ශික්ෂාවක් පැණවූ හ.

එතකුදු වුවත් බෙල්ලට්ඨිසීස හිමියන් ආහාර තැන්පත් කරගෙන සිටියේ ශික්ෂාවක් පණවන්නට කලින් හෙයින් උන්වහන්සේ නිවරදකරු වූ අතර එසේ කළේ ආහාර තෘෂ්ණාව නිසා නො ව හුදෙක් භාවනානුයෝගී වීමේ චේතනාවෙන් ම හෙයින් එය අහිංසක ක්‍රියාවක් බව ද පිළිගන්නා ලදී.

විවරණාත්මක අනුවාදය (92 ගාථාව)

යෙසං සන්නිචයො නත්ථි, යෙ පරිඤ්ඤාතභොජනා, යස්ස සුඤ්ඤතො අනිමිත්තො විමොක්ඛො ච ගොචරො, තෙසං ගති ආකාසෙ සකුන්තානං ඉව දුරන්නයා.

යෙසංඃ යම් කිසි (රහත්) උතුමන් වෙත; **සන්නිචයො**ඃ රැස්කිරීම; **නත්ථි**ඃ නැත් ද; **යෙ**ඃ යම් (උතුමන්) පිරිසක්; **පරිඤ්ඤාත භොජනා**ඃ පමණ දැන වළඳත් ද; **යස්ස**ඃ යමෙකුට; **සුඤ්ඤතො**ඃ ශුන්‍ය වූ; **අනිමිත්තො**ඃ නිමිත්තක් විරහිත වූ; **විමොක්ඛො**ඃ විමෝක්ෂය; **ච**ඃ ද; **ගොචරො**ඃ අරමුණු වේ ද; **තෙසං**ඃ ඔවුන් ගේ; **ගති**ඃ ගිය මග; **ආකාසෙ**ඃ අහසෙහි; **සකුන්තානං ඉව**ඃ කුරුල්ලන් ගේ මෙන්; **දුරන්නයා**ඃ දැක ගත නො හැකි ය.

වස්තු රැස් නො කරන, පමණ දැන අනුභව කරන, ශුන්‍ය වූ අනිමිත්ත වූ විමෝක්ෂය (නිවන) ගෝචර කර ගන්නා උතුමන් ගිය මග අහසෙහි කුරුල්ලන් පියාසර කළ මඟ මෙන් ම දැක ගත නො හැකි ය.

විවරණය

සන්නිචයෝ නත්ථිඃ යන්නෙන් රැස් කිරීමක් නැති බව දැක්වේ. එක් අතකින් උන්වහන්සේ ලා ලෞකික භෞතික වස්තු රැස් නො කරති. එමෙන් ම අනිත් අතට සසර සඳහා අලුතෙන් පින් රැස් කිරීමක් ද නො කරති. නව කර්ම වලින් උන් වහන්සේලාට ප්‍රයෝජනයක් නො මැත. එහෙයින් මේ අර්ථ දෙකින් ම රහතන් වහන්සේලා සන්නිචයෙන් තොර බව කිව යුතු ය.

මේ ගාථාවෙන් කරුණු දක්වන ලද්දේ රහතන් වහන්සේලා පිළිබඳව ය. ආර්යය මාර්ගය පරිපූර්ණය කොට විමුක්තිය ලද උතුමෝ රහතන් වහන්සේ වෙති. භාග්‍යවතුන් වහන්සේ ද "අහං හි අරහා ලෝකේ"යි වරක් තමන් වහන්සේ රහතන් වහන්සේ නමක් ලෙස හඳුන්වා ගත් හ. රහතන් වහන්සේලා සියලු ඇළුම්-බැඳුම් දුර හැරි උතුමෝ වෙති. ශුන්‍යත, අනිමිත්ත හා අප්‍රණිහිත විමෝක්ෂයන් දකිතැයි අදහස් කරන්නේ එහෙයිනි.

බුදුරජාණන් වහන්සේ "අරහං සම්මා සම්බුද්ධෝ" වශයෙන් රහතන් වහන්සේ නමක ලෙස හැඳින්වුව ද සාමාන්‍ය රහතන් වහන්සේ නමකට වඩා වෙනසක් ද තිබේ. "මහණෙනි, බුදුන් වහන්සේ ද රහත් ය. සම්මා සම්බුද්ධ ය. උන්වහන්සේ පෙර හෙළි නො වූ මාර්ගයක් හෙළි කරති. උන්වහන්සේ මාර්ගය දත්හ. මාර්ගය තේරුම් ගත්හ. මාර්ගයෙහි විශාරද ය. ශ්‍රාවකයෝ උන්වහන්සේ ගිය මග යන්නා හ." අරහත් සම්මා සම්බුද්ධ හා අරහන්ත දෙදෙනා ගේ වෙනස එය ය. අරහත් යන වචනයෙහි අර්ථය "පූජා සත්කාරයන්ට යෝග්‍යය, ගෞරව නමස්කාරයට සුදුසු ය." යන්නයි. ප්‍රථම වරට බුදුරදුනට 'අරහං' යන නම යෙදුවේ බුදුරජාණන් වහන්සේ ම ය. ඒ උපක ආජීවකයා හමු වූ අවස්ථාවේ ය. දෙවන වරට 'අරහං' යන වචනය බුදුරදුන් තමන්ට ම යොදා ගත්තේ පස්වග මහණුනට තමා හඳුන්වා දුන් අවස්ථාවේදී ය. රහත් යන වචනය සියළු කෙළෙසුන් මිඳූ උතුමන්ට ම යෙදේ. ඒ අරුතින් ගතහොත් අපේ යුගයේ ප්‍රථම රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේම ය.



රහතුන් ගේ ඉපැද්ම නො දත හැක. අහසැ සකුණයන් ගිය මග පිය නො දත හැක්කාක් මෙනි

93. යස්සා'සවා පරික්ඛීණා
ආහාරෙ ච අනිස්සිතො
සුඤ්ඤතො අනිමිත්තො ච
විමොක්ඛො යස්ස ගොචරො
ආකාසෙ'ව සකුන්තානං
පදං තස්ස දුරන්නයං (7:4)

සියලු කෙලෙසුන් නසන්නේ
අහර වෙත නැත ඇලෙන්නේ
නිවුණු සලකුණු දකින්නේ
නිවන් අරමුණු කරන්නේ
නුබ සියොත් පිය ලෙසින්නේ
නො මැත සලකුණු තියන්නේ

ගිය මග රහතුන් - සොයමු ද කෙලෙසින්

7 (4) අනුරුද්ධ තෙරණුවන්ගේ කතා පුවත (93 ගාථාව)

අනුරුද්ධ තෙරුණුවන් ඇරබ මේ ගාථාව දේශනා කරන ලද්දේ භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ විසූ අවදියේ ය.

අනුරුද්ධ තෙරණුවන්ගේ සිවුර පරණ වී දිරා ගොස් තුබූ හෙයින් අළුත් සිවුරක් තනා ගනු පිණිස උන් වහන්සේ තැන් තැන් වල වීසි කළ රෙදි කැබලි රැස් කරමින් සිටිය හ. තෙරණුවන් මෙසේ කැලි කසළ පීරමින් රෙදි කැබලි සොයනු උන් වහන්සේ ගේ පූර්ව ජන්මයක භාර්‍යාවක්ව සිට, දැන් තව්තිසා දෙව්ලොව ජාලිනී නමින් ඉපද සිටි දිව්‍ය අප්සරාවට පෙනිණි. උන් වහන්සේට උදව් කරන්නට සිතූ ඕ තොමෝ රියන් 13 ක් දිග රියන් 4ක් පළල දිව්‍ය වස්ත්‍රයක් ගෙන මා මේ අයුරින් දැක්වුව හොත් එය තෙරුන් වහන්සේ විසින් නො පිළිගන්නට ඉඩ ඇතැයි සිතා, තෙරුන් පීරමින් සිටි කුණු ගොඩ ඉදිරියේ තවත් කුණු ගොඩක වාටියක් පමණක් පෙනෙන පරිදි සැඟවූවා ය.

අනුරුද්ධ හිමියෝ රෙදි කඩ ලැබ එයින් සිවුරක් කර ගනු පිණිස විහාරයට ගෙන ගිය හ. උන් වහන්සේ ගේ සිවුරු මැසීමට උදවු කරනු පිණිස බුදුරජාණන් වහන්සේ අසූ මහා ශ්‍රාවකයන් වහන්සේ ද කැටුව එහි වැඩම කළ හ. සිවුර මැසීම පිණිස පහලින් මහා කාශ්‍යප හිමියෝ හිඳ ගත් හ. ඉහළ කොනෙහි ආනන්ද හිමියෝ හිඳ ගත්හ. මැද සාරිපුත්ත හිමියෝ හිඳගත් හ. භික්ෂූන් වහන්සේලා පිරිසක් නූල් කැට දුන් හ. භාග්‍යවතුන් වහන්සේ ඉදිකටුව ඇමිණීම කළ හ. අවශ්‍ය දේ ලඟට සපයා දීම සඳහා මුගලන් හිමියෝ එහා මෙහා සක්මන් කළ හ.

දෙව් දුව ගම් වැසියන් වෙත ගොස් "අද අනුරුද්ධ තෙරුන් වහන්සේට සිවුරක් කරවන දිනයයි. භාග්‍යවතුන් වහන්සේත් අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාත් තවත් බොහෝ භික්ෂූන් වහන්සේලාත් සාමුහිකව ක්‍රියා කරති. ආරාමයෙහි සඟරුවන බොහෝ ය. කැඳ බත් ගෙන ගොස් පූජා කර පින් ලබා ගන්න" යි දැනුම් දුන්නා ය.

දන් වළඳන මොහොත වන විට මුගලන් හිමියෝ විශාල ජම්බු ගෙන ආහ. සංඝයාට එය වළඳා නිම කළ නො හැකි විය. ශක්‍රයා උන් වහන්සේලා සිවුරු කර වූ තැන වටා රැකවල් ලෑවේ ය. මිහි කත ලතුයෙන් නැහැවූවා සේ දිස් විණි. ආහාර පානයෙන් ස්ථානය පිරී තිබිණි. සංඝයා වහන්සේලා වැළඳූ පසුත් විශාල ආහාර ප්‍රමාණයක් ඉතිරි විය. "මේ තරම් විශාල ආහාර ප්‍රමාණයක් මේ සුළු පිරිසකට සූදානම් කළෝ කවුරු දැ"යි සමහර භික්ෂූහු ප්‍රශ්න කළ හ. සමහරු ඒ ගැන බුදුරජාණන් වහන්සේට පැමිණිලි කළහ. "මහණෙනි, මේ මහ දන් අනුරුද්ධ තෙරුන් විසින් සංවිධානය කරන ලදැයි ඔබ සිතනවා ද?" උන් වහන්සේ එසේ ප්‍රශ්න කළ විට භික්ෂූහු "එහෙම යි, ස්වාමීනී" යි පැවසූ හ. "නැත මහණෙනි, ම පුත් අනුරුද්ධ එසේ නො කරයි. ආශා දුරු කළ උතුමෝ ආහාර වැනි දේ ගැන එසේ උනන්දු නො වෙති. මේවා දෙව්දුවක විසින් පහන් සිතින් කළ දේ ය" යි භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළ හ.

විවරණාත්මක අනුවාදය (93 ගාථාව)

යස්ස ආසවා පරික්ඛීණා ආහාරෙ ච අනිස්සිතො යස්ස
සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො ගොචරො තස්ස
පදං ආකාසෙ සකුන්තානං ඉව දුරන්නයං

යස්ස: යමකු ගේ; **ආසවා**: ක්ලේශ; **පරික්ඛීණා**: දුරු කරන ලද ද; **ආහාරෙච**: ආහාර විෂයෙහි ද; **අනිස්සිතො**: ඇල්මක් නැති ද; **යස්ස**: යමෙකුට; **සුඤ්ඤතො**: ශූන්‍ය වූ; **අනිමිත්තො**: නිමිති විරහිත ව; **විමොක්ඛො**: විමෝක්ෂය; **ගොචරො**: ගෝචර වේද; **තස්ස පදං**: ඔහු ගිය මග; **ආකාසෙ**: අහසෙහි; **සකුන්තානං ඉව**: පක්ෂීන් ගේ මෙන්; **දුරන්නයං**: දැක ගැනීම දුෂ්කර ය.

සියලු කෙලෙසුන් දුරු කළ ආහාර විෂයෙහි අභිරතියක් නැති, ශූන්‍ය හා අනිමිත්ත විමෝක්ෂය ගෝචර කර ගත් උතුමන් ගේ ගමන් මග දැක ගැනීම අහසෙහි පක්ෂීන් ගේ පිය සටහන් නැතිවාක් මෙන් දුෂ්කර ය.

විවරණය

ආසව: යන්නෙන් අදහස් වන්නේ කෙලෙස් ය. පාලි පොත් වල ආසව වර්ග හතරක් ගැන සඳහන් වෙයි.

1. කාමාසව (ඉඳුරන් පිණවීමට ඇති ප්‍රවණතාව)
2. භවාසව (පැවැත්ම සඳහා ඇති ප්‍රවණතාව)
3. දිට්ඨාසව (විවිධ දෘෂ්ටීන් ඇති කිරීමේ ප්‍රවණතාව)
4. අවිජ්ජාසව (යථාර්ථය නො දැනීම පිළිබඳ ප්‍රවණතාව)

ඇතැම් සූත්‍රයක දිට්ඨි ඉවත් කර ඉතිරි තුන දක්වා තිබේ. මේවා ඕඝ වශයෙන් ද හඳුන්වා තිබේ.

සෝවාන් වන විට දිට්ඨාසය ප්‍රහීණ වෙයි. අනාගාමී වීමෙන් කාමාසව ද රහත් වීමෙන් භවාසව හා අවිජ්ජාසව ද වනසනු ලැබේ. රහත්වීම 'ආසවක්ඛය' වශයෙන් හඳුන්වන්නේ එහෙයිනි. ආසව ප්‍රහාණය විදර්ශනාවෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, විරතියෙන් හා විචක්ෂණවත් ප්‍රත්‍ය පරිභෝගයෙන් සිදුවන බව බුදුහු පෙන්වා දුන්හ.

ඛීණාසව: යනු රහතන් වහන්සේට නමකි. එය යොදන්නේ ආසව දුරු කළ හෙයිනි. ආසව යන්න තණ්හා යන්නට පර්‍යාය ව යෙදිය හැකිය. තණ්හාවද කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙන් ත්‍රිවිධව දක්වනු ලැබේ.



දැමුණු ඉඳුරන් ඇති පුහු මාන නැති කෙලෙස් රහිත රහතුන්ගේ දැක්ම දෙවියෝ පතති.

94. යස්සි'න්ද්‍රියානි සමථං ගතානි
අස්සා යථා සාරථිනා සුදන්තා
පහීණමානස්ස අනාසවස්ස
දෙවා'පි තස්ස පිහයන්ති තාදිනො (7:5)

ඇත්ද යමකුට දැමුණු ඉඳුරන්
වගේ හොඳ හීලෑ අශ්වයන්
මාන දුරු කළ, කෙළෙස් කළ සුන්
ඔහුට දෙවියොත් කරති බුහුමන්

දෙවියොත් පුදත් - සම්බුදුන් රහත්

7 (5) මහා කච්චායන මහ රහතන් වහන්සේ (94 ගාථාව)

පූර්වාරාමයෙහි වැඩ සිටි සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **මහා කච්චායන මහ රහතන් වහන්සේ** නිමිති කොට මේ ගාථාව වදාළ සේක.

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වැසි සාරමස අවසන පැවැත්වුණු මහා පුණ්‍යකර්මයක් වෙනුවෙන් ශ්‍රාවක සංඝයා පිරිවරා මිගාරමාතා ප්‍රාසාදයෙහි බිම් මහලෙහි වැඩ හුන් සේක. එකල මහා කච්චායන හිමියන් වැඩ සිටියේ අවන්ති දේශයේ ය. සාමාන්‍යයෙන් ඈත දුරු රට වැඩ විසුවත් ධර්ම දේශනය ආරම්භ වන විට පැමිණ සිටීම මේ මහා තෙරුන් ගේ පිළිවෙළයි. එහෙයින් අවසන් මොහොතේ හෝ උන්වහන්සේ පැමිණෙන බව දන්නා සංඝයා වහන්සේ උන්වහන්සේට අසුනක් වෙන් කර තබා ගෙන සිටිති.

ශක්‍ර දේවේන්ද්‍රයා එදින පින්කමට සහභාගි වීම පිණිස පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ පුදා ගෙන මහ සඟරුවනට ද ගරු සත්කාර දක්වා එකත් පස්ව මහා කච්චායන තෙරුන් නො දැක " අපේ මහා කච්චායන හිමියන් වැඩම කර නැත්තේ ඇයි? උන් වහන්සේ වැඩම කළා නම් කවර තරම් යහපත් ද" යි සිතී ය. ඔහු එසේ සිතන විට ම මහා කච්චායන හිමියෝ එහි වැඩම කළහ. ඒ දුටු ශක්‍ර දේවේන්ද්‍රතෙම පස්වනක් ප්‍රීතියෙන් පිනා ගොස් මහ තෙරුන් වහන්සේ ගේ වළලුකරින් අල්වා ගෙන "ඔබ වහන්සේ වැඩම කළ එක හොඳයි. මම සිතමින් සිටියේ ඔබ වහන්සේ ගැන යි. ඔබ වහන්සේ හිටියා නම් හොඳයි කියා සිතූ වහා ම ඔබ වහන්සේ පහල වුණා."යි දෙපා අතගාමින් සුවඳ මල් දමක් පුදා හරසර දැක්වීය. අනතුරුව යළි එකත් පසෙක හිඳ ගත්තේ ය.

මේ දුටු ඇතැම් භික්ෂුනමක් අසන්තෝෂයට පත්වූ හ. "ශක්‍ර දේවේන්ද්‍රයා වඳින්නෝ පුදන්නෝ පක්ෂග්‍රාහී ක්‍රමයට ය. වෙන කිසි ම භික්ෂු නමකට නො දැක්වූ ගරුසරු මහා කච්චායන හිමියන්ට දැක්වීය. අපේ මහා කච්චායන හිමියන් වැඩම කළ එක හොඳයයි කියමින් හේ දෙපා අතගාමින් වැන්දේය" යි දෝෂාරෝපණය කළ හ.

භාග්‍යවතුන් වහන්සේ ඒ අසා "මහණෙනි, මපුත් කච්චායන වැනි භික්ෂූන්ට දෙවියොත් විශේෂ ගරුසරු දක්වති"යි පූර්වෝක්ත ගාථාව දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (94 ගාථාව)

යස්ස ඉන්ද්‍රියානි සාරථීනා සුදන්තා අස්සා යථා සමථං ගතානි පහීණමානස්ස අනාසවස්ස තාදිනො තස්ස දෙවා අපි පිහයන්ති.

යස්ස: යමකුගේ; **ඉන්ද්‍රියානි**: ඉඳුරන්; **සාරථීනා**: රථාචාර්යයා විසින්; **සුදන්තා**: මැනවින් දමනය කරන ලද; **අස්සා**: අශ්වයන්; **යථා**: යම්සේ ද; **සමථං ගතානි**: සමථයට ගියේ ද; **පහීණමානස්ස**: මානය දුරුකළ; **අනාසවස්ස**: කෙළෙස් නැති; **තාදිනො**: චිත්තෛකග්‍රතාව ලත්; **තස්ස**: ඒ රහතන් වහන්සේට; **දෙවා අපි**: දෙවියෝ ද; **පිහයන්ති**: ප්‍රිය වෙති.

රථාචාර්යයන් විසින් මනාව හික්මවා ගත් අශ්වයන් මෙන් තම ඉන්ද්‍රියයන් හික්මවා ගත්, මානය දුරු කළ, කෙළෙස් වැනසූ එබඳු රහතන් වහන්සේලාට දෙවියන් ද ප්‍රීති වෙති.

විවරණය

ඉන්ද්‍රියානි: ඉඳුරන්. මෙයින් අදහස් වන්නේ අපට බාහිර ලෝකයෙන් අරමුණු ගෙන එන

1. ඇස: චක්ඛු
2. කණ: සෝත
3. නාසය: ඝාන
4. දිව: ජිව්හා
5. කය: කාය
6. මනස: මනො යන ඉන්ද්‍රිය හය ය.

තාදිනො: තහවුරු වූ, අභ්‍යන්තර හා බාහිර පෙලැඹීම් මගින් කම්පනය නො වන බව. භාග්‍යවතුන් වහන්සේ ගැන පවසන විට තාදිත්වය මෙසේ විවරණය කරති.

1. **භගවා කාමොඝං තිණ්ණො**; භාග්‍යවතුන් වහන්සේ කාමය නම් සැඩ පහරෙන් එතර වූහ.

2. **භගවා භවොඝං තිණ්ණො**; භාග්‍යවතුන් වහන්සේ භවය නම් සැඩ පහරෙන් එතර වූහ.

3. **භගවා අවිජ්ජෞඝං තිණ්ණො**; භාග්‍යවතුන් වහන්සේ අවිද්‍යා ඕඝය ද තරණය කළ හ.

මේ හේතු හා තවත් හේතු නිසා උන්වහන්සේ තාදී යයි කියති. පුද්ගලයකු තාදී වන්නේ චිත්තවීර්යය වශයෙන් ස්ථාවර වූ විටය. උචිතානුචිත විචක්ෂණය ඇති ව කලබල නොවී ක්‍රියා කරන විට තාදී ගුණය වැඩෙයි.



රහත්හු අවමන් බුහුමන් මැදහත් ව වසති. නින්දා පැසසුම්හි කම්පා නො වෙති.

95. පඨවීසමො නෝ විරුජ්ඣති
ඉන්දඛීලූ'පමො තාදී සුබ්බතො
රහදො'ව අපෙතකද්දමො
සංසාරා න භවන්ති තාදිනො (7:6)

මහ පොළොව මෙන් සාමකාමී
ඉන්ද්‍රඛීලය සේ අචල වී
විලක් සේ පිරිසිදුව නො මඩව
එතර වෙති සසරින් රහත් වී

ලොව පූජිත - රහත් චරිත

7 (6) සැරියුත් මහ රහතන් වහන්සේ ගේ චරිතය (95 ගාථාව)

අග්‍රශ්‍රාවක සාරිපුත්ත මහ රහතන් වහන්සේ සහ තරුණ හිමිනමක් නිමිති කොට දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයේ දී භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථාව දේශනා කරන ලදී.

එක් වස්සාන සමයක් අවසානයේ පිණ්ඩපාත චාරිකාවෙක යෙදෙනු කැමති වූ සැරියුත් මහ රහතන් වහන්සේ, බුදුරදුන් බැහැ දැක වැඳ නමස්කාර කොට අවසර ගෙන සිය අන්තේවාසික භික්ෂූන් ද කැටිව සංචාරය පිණිස නික්මුණු සේක. තෙරුන් වහන්සේ ගෙන් සමුගැනීමට භික්ෂූහු පැමිණ සිටියහ. නම් ගොත් දත් හිමිවරුන් සමග උන් වහන්සේ නමින් අමතා කතා කළ හ. ඒ අතර විසූ එක් නමක් තමාට ද පෞද්ගලික නාමයෙන් අමතා ආශිර්වාද කරනු ඇතැයි බලා සිටිය ද මහ පිරිස මැද සැරියුත් මහ රහතන් වහන්සේට එම භික්ෂුව නෙත ගැටුණේ නැත.

එමෙන් ම ඒ භික්ෂූන් වහන්සේ ගේ නම් ගොත් සැරියුත් හිමියන් දැන සිටියේත් නැත. එහෙයින් තමා නමින් අමතනු නො ලැබීමෙන් දොම්නසට පත් හෙතෙම "වෙනත් අයට නමින් කතා කළත් මට එසේ කතා කළේ නැත" යි තෙරුන් කෙරේ ආඝාත බැඳ ගත්තේ ය. එසේ සිතමින් සිටින අතර සැරියුත් හිමියන් උන් වහන්සේ අසලින් යද්දී නො දැනුවත්ව උන්වහන්සේ ගේ චීවරය මේ හිමියන් ගේ ඇඟෙහි ගැටිණි. එය හිතාමතා කළ දෙයකැයි පිළිගත් එම භික්ෂු නම මහත් කෝපයට පත්ව සැරියුත් හිමියන් දොරටුවෙන් පිටත් වෙනවාත් සමගම භාග්‍යවතුන් වහන්සේ හමු වී "ඔබ වහන්සේ ගේ අග්‍රශ්‍රාවක පදවිය ලබාගෙන සැරියුත් හිමියන් බොහොම ආඩම්බර වෙලා. මට ගැහුවා පාරක්, තව පොඩ්ඩෙන් මගෙ කණත් පැලෙනවා. මගෙන් සමාව ඉල්ලුවේවත්, කණගාටුයි කිව්වේවත් නැතුව පිණ්ඩපාත චාරිකාවකට පිටත් වුණා'' යි පැමිණිලි කළේ ය. වහා ම සැරියුත් හිමි ආපසු කැඳවන සේ භාග්‍යවතුන් වහන්සේ නියම කළ හ.

සැරියුත් මහ රහතන් වහන්සේ තම අන්තේවාසික භික්ෂූන් වහන්සේලා ද කැටුව ආපසු පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ නමස්කාර කළ හ. මේ භික්ෂු නමට පහර දුන්නේ කවර හෙයින් දැයි භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්න කළ විට "මම උන්වහන්සේට පහර නො දුන්නෙමි" යි පවසා ඔහු බොරු කාරයකු කරනු වෙනුවට තම පැවතුම් ගැන අහිංසක විස්තරයක් කළහ. සැරියුත් හිමියන් තමන් වහන්සේ ගේ පැවතුම් ගැන කියත් කියත් ම බොරු පැමිනිල්ල කළ හිමි නම ගේ සිත කම්පා විය.

හේ බුදුපාමුල වැටී තමා බොරු පැමිණිල්ලක් කළ බවත් සැරියුත් හිමි තමාට පහර නුදුන් බවත් කියා සිටියේ ය. සැරියුත් හිමියන් ඇමතූ බුදුරජාණන් වහන්සේ "සාරිපුත්ත, මේ මුළා වූ භික්ෂු නමට සමාව දෙන්න" යි වදාළ හ. එවිට එම භික්ෂු නම ඉදිරියේ දෑත් එක් කොට දණ ගසා ගත් සැරියුත් හිමියෝ "මම මේ භික්ෂූන් වහන්සේට සමාව දෙමි. මේ භික්ෂූන් වහන්සේත් මගෙන් උන්වහන්සේට යම් වරදක් සිදු වී ඇත්නම්, ඊට ද සමාව දෙන සේක්වා"යි පැවසූ හ. ඒ දුටු භික්ෂූහු "බලන්න, සැරියුත් හිමියන් තුළ ඒ භික්ෂුව කෙරෙහි අංශු මාත්‍ර වූ හෝ අමනාපයක් නැති හැටි. මේ භික්ෂුව බොරු නඩුවක් කියා තමන්ට කරන්නට ගිය අවමානය මුළුමනින් ම අමතක කළ ආකාරය පුදුමයි. ඒ විතරක් ද, සැරියුත් හාමුදුරුවෝ උන්වහන්සේ ඉදිරියේ දණත් ගහගෙන ගෞරවත් කරනවා"යි පැවසූ හ. ඔවුන් ගේ කතා බහ අසා දැනගත් භාග්‍යවතුන් වහන්සේ "සාරිපුත්ත වැනි මනා ගති පැවතුම් ඇති අයට කෝප විය නො හැකිය. සාරිපුත්ත ස්ථවිරයන්ගේ සිත මහ පොළොව මෙන් ය. පැහැදිලි පිරිසිදු දිය ඇති විලක් වැනි ය." යි වදාළ හ.

විවරණාත්මක අනුවාදය (95 ගාථාව)

සුබ්බතො පඨවීසමො නො විරුජ්ඣති ඉන්දඛීලූපමො තාදී රහදො ඉව අපෙතකද්දමො තාදිනො සංසාරා න භවන්ති.

සුබ්බතො: මනා පැවතුම් ඇති රහතන් වහන්සේ; **පඨවීසමො**: මහා පෘථිවිය මෙන්; **නො විරුජ්ඣති**: ගැටුම් ඇති කර නො ගනියි; **ඉන්දඛීලූපමො**: ඉන්ද්‍රඛීලයක් (නො සැලෙන කණුවක්) බඳුව; **තාදී**: ස්ථාවර වූ; **රහදො ඉව**: විලක් මෙන්; **අපෙතකද්දමො**: මඩ නැති; **තාදිනො**: රහතන් වහන්සේට; **සංසාරා**: සසර සැරි සැරීම්; **න භවන්ති**: නැත.

මනා පැවතුම් ඇති රහතන් වහන්සේ මිහිකත මෙන් කිසි විටෙක නො කිපෙති. ඉන්ද්‍රඛීලයක් මෙන් නො සැලී සිටිති. මඩ නැති විලක් මෙන් ප්‍රසන්න පැවතුම් ඇති උන් වහන්සේලාට සසර සැරි සැරීමක් නැත.

විවරණය

ඉන්ද්‍රඛීලය: නම් ශක්‍රයා විසින් සිට වූ බල කණුවක් මෙන් තහවුරු දෙයකි. ඉන්ද්‍රඛීල නම් අචල මහා කණු බව අටුවාව කියයි. මේවා නගර වල ඇතුළත හෝ පිටත ඉදි කරති. සාමාන්‍යයෙන් මේවා ගඩොල් හෝ ලී වලින් අෂ්ටාශ්‍රාකාර ලෙස තනති. නො සැලෙන යමක් ගැන උපමාවට මෙය ගනු ලබන්නේ එහි ස්ථාවර බව නිසා ය.

තාදිනො: ප්‍රිය දේ කෙරේ බැඳීමක් හෝ අප්‍රිය දේ කෙරේ ද්වේෂයක් නැති ව තහවුරු ව මධ්‍යස්ථව සිටිය හැකි නම් එය තාදී ගුණය යි. ලෝ දහමින් කම්පා නො වෙන මහ රහතන් වහන්සේලාට 'තාදී' යි කියති.



මනාව දැන නිවී සැනහුණු රහත්හු සිත, සන්සුන් ය. වචනය හා කටයුතු ද සන්සුන් ය.

96. සන්තං තස්ස මනං හොති සන්තා වාචා ච කම්ම ච සම්මදඤ්ඤා විමුත්තස්ස උපසන්තස්ස තාදිනො (7:7)	ඔහු ගේ සිත සංවරය කය-වචන සංවරය ඇත්ත දැන නිවුණු ඔහු මුළුමනින් සංවර ය

අරහත් තෙරණුවෝ - වෙති සංවර මැනවින්

7 (7) කොසඹෑ නුවර සාමණේර නමගේ කතාව (96 ගාථාව)

ජේතවනාරාම විහාරයෙහි වැඩ වාසය කළ තථාගතයන් වහන්සේ කොසඹෑ නුවර **තිස්ස තෙරුන් වහන්සේ** ගේ ශිෂ්‍ය සාමණේර නමක් මුල් කොට මේ ගාථාව දේශනා කළ සේක.

කොසඹෑ නුවර ධනවත් පවුලක තරුණයෙක් සසර කළකිරී බුදු සසුනෙහි පැවිදි විය. උපසම්පදාව ලත් පසු උන්වහන්සේ ප්‍රකට වූයේ කෝසම්බිවාසී තිස්ස නමිනි. උන්වහන්සේ කොසඹෑ නුවර වස් එළඹි විට උන්වහන්සේ ගේ දායකයා තුන් සිවුරු, ගිතෙල්, උක් හකුරු වැනි පූජා වස්තු ද රැගෙන අවුත් උන් වහන්සේ ගේ දෙපා මුල තබා වැඳ "ස්වාමීනි, ඔබ වහන්සේට උපස්ථානයට සාමණේර නමක් නැති හෙයින් මාගේ පුත්‍රයා ඔබ වහන්සේ ලඟ පැවිදි කරනු කැමැත්තෙමි" යි පැවසීය. තිස්ස හිමියෝ ද මහත් සතුටින් එය අනුමත කළ හ. තම සත් හැවිරිදි පුත්‍රයා කැඳවා ගෙන ආ උපාසක තැන "ස්වාමීනී, මොහු පැවිදි කර ගත මැනවැ යි" කියා සිටියේ ය.

දරුවා ගේ හිස කෙස් තෙමා, තච පඤ්චක කර්මස්ථාන ඉගැන්වූ තිස්ස හිමියෝ ඔහු ගේ හිස මුඩු කරන්නට පටන් ගත්හ. හිස කෙස් කපන්නට පටන් ගත් වහා ම කමටහන් වැඩූ දරුවා රහත් බවට පත් විය. දරුවා පැවිදි කළ තිස්ස තෙරණුවෝ ටික දිනක් එහි ම වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ බැහැ දකින්නට යන්නට තීරණය කර, සාමණේර නම ලවා අවශ්‍ය මාර්ගෝපකරණ ගෙන්වා ගෙන ගමනට පිටත් වූහ. අතරමග දී ආරාමයකට පිවිසුණු දෙනම එහි නවාතැන් ගත් හ. සාමණේර නම කාමරයක් ලදින් එහි ගුරු හිමියනට අවශ්‍ය සියල්ල සකස් කළ හ. ගුරු හිමියන්ට නවාතැන් සකසත් දී රෑ බෝ වූයෙන් තමාට රැය ගත කරන්නට තැනක් පිළියෙල කර ගැනීම අපහසු විය. එහෙයින් හෙතෙම ගුරු හිමියන් ගේ ඇඳ අසල බද්ධ පයඞ්කයෙන් වාඩි වී රැය පහන් කළේ ය.

පසුදා හිමිදිරියේ පිබිදුණු ගුරු හිමියෝ සාමණේර නම කාමරයෙන් පිටත යවනු කැමතිව ඇඳ පසෙක තිබුණු විජිනි පත ගෙන මිට පැත්ත සාමණේරයන් සිටි පැත්තට ගටා "සාමණේරයෙනි පිටතට යන්නැයි" කීහ. එහෙත් සාමණේර නම වාඩි වී සිටි හෙයින් විජිනි පත් මිට වැදී එක් ඇසක් තුවාල වී අන්ධ විය. ඒ වේදනාව ගැන කිසිත් නො කී සාමණේරයෝ කාමරයෙන් පිටතට ගිය හ. අනතුරුව කළ යුතු හැම වැඩ ම එක් අතකින් ඇස වසා ගෙන කළහ. ඉදල හා කොස්ස තනි අතින් ගෙන අතුගෑම් කළ හ. ගුරු හිමියන්ට මුව සෝදන දිය හා දැහැටි දඬු ද සකසා තබා දැහැටි දඬු පිළිගන්වන විට තනි අතින් පිළිග න්වන්නට සිදු වූ හෙයින් තමාට වූ හදිය ගැන එළි කළ හ.

ඒ ඇසූ තිස්ස තෙරහු බලවත් කම්පාවට පත් වූහ. තමන් නො දැනුවත් ව කළ වරදක් වුවද සාමණේර නම සමා කරවා ගන්නට උන් වහන්සේ පෙළැඹුණාහ. "සමිඳුනි, එය ඔබ වහන්සේ ගේ වරදක් වත් මගේ වරදක් වත් නො වේ" යි පවසමින් ගුරු හිමි සැනසූ හ. එහෙත් දැඩි සංවේගයෙන් පිරි සිතින් යුතුව තිස්ස තෙරණුවෝ සාමණේරයන් ද කැටු ව බුදුරදුන් හමුවට ගියහ.

"භික්ෂුව සියල්ල යහපත් ව සිදු වේද?" යි බුදුන් ප්‍රශ්න කළ විට

"මා පිළිබඳව නම් සියල්ල යහපත් යැයි කිව හැකිය. එහෙත් මේ අසරණ සාමණේර නම ආශ්චර්යය ජනක ය. මා අතින් මෙබඳු වරදක් සිදුවී ම විසින් සමාව යදිද්දීත් මෙසේ කියයි."යි සියලු විස්තරය සැල කර සිටියේ ය.

ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "තිස්ස, සියලු ආසවයන් දුරු කළ උතුමෝ තරහක් හෝ වෛරයක් කිසිසේත් සිත තබා නො ගනිති" යි වදාරා මේ ගාථාව දේශනා කළහ.

විවරණාත්මක අනුවාදය (96 ගාථාව)

සම්මා අඤ්ඤාය විමුත්තස්ස උපසන්තස්ස තාදිනො
මනං සන්තං හොති තස්ස වාචා ච කම්මං ච සන්තා.

සම්මා: මැනවින්; **අඤ්ඤාය**: දැන; **විමුත්තස්ස**: විමුක්තිය ලද; **උපසන්තස්ස**: උපශාන්ත වූ; **තාදිනො**: රහතන් වහන්සේ ගේ; **මනං**: සිත; **සන්තං හොති**: ශාන්ත ය; **තස්ස**: උන්වහන්සේ ගේ; **වාචා ච**: වචන ද; **කම්මං**: ක්‍රියා ද; **සන්තා**: ශාන්ත ය.

චතුරාර්‍ය්‍ය සත්‍යය මනාව අවබෝධ කර ගෙන විමුක්ති සුවය ලැබ නිවී සැනසුණු රහතන් වහන්සේ ගේ සිත ශාන්තය. වචනය ද ශාන්ත ය. ක්‍රියා ද ශාන්ත ය.

විවරණය

සන්ත: යන්නෙන් මෙහි අදහස් වන්නේ කැලැඹීමෙන් හා අසහනයෙන් තොර සැනසුණු ස්වභාවයයි. රහතන් වහන්සේ ලෝක ස්වභාවය මනාව දන්නා හෙයින් තමන්ට සිදුවන කවර විපතක දී වුව ද කලබලයට පත් නො වෙති. සිත, කය, වචනය යන ත්‍රිවිධ ද්වාරයෙන් ම මෙම පිරුණු, මේරූ, නො සැලෙන ස්වභාවය විද්‍යමාන වෙයි.



ඇදහිලි නැති නිවණ දන්න සදැසිඳලු ඉපැද්ම නැසූ වමාරා දැමූ ආසා ඇත්තා උතුම් පුරිස් ය.

97. අස්සද්ධො අකතඤ්ඤූ ච
සන්ධිච්ඡෙදො ච යො නරො
හතාවකාසො වන්තාසො
ස වෙ උත්තමපොරිසො (7:8)

හැර දමා සැදැහැ සිත් ලබා ගෙන නිවන් සෙත්
බඳින සසරට සියළු සිඳ දැමූ බන්ධනත්
නසා කෙළෙසුන් නවතමින් නැවත ඉපදුමත්
සිටිත් නම් යම් කෙනෙක් උතුමෙක්ය ඔහු රහත්

කෙළෙස් මල නැසුවහොත් ඔහු ලොවට උතුම් වෙත්

7 (8) සැරියුත් මහ තෙරුන්ගේ වත (97 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **සැරියුත් මහ රහතන් වහන්සේ** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් වනවාසී හිමිවරු තිස් නමක් භාග්‍යවතුන් වහන්සේ දක්නට පැමිණ වැඳ නමස්කාර කොට එකත්පස් ව උන්හ. මේ පිරිසට රහත් ඵලය ලැබීමේ වාසනාව පවත්නා බව දිවැසින් දුටු බුදු රජාණන් වහන්සේ සැරියුත් හිමියන් අමතා මෙසේ වදාළ සේක. "සාරිපුත්ත, ශ්‍රද්ධාවේ ස්වරූපය නම්, එය ඇති කර ගෙන වැඩි වර්ධනය කරගත් විට නිර්වාණාධිගමයට හේතුවන බවත්, නිර්වාණාධිග මයෙන් එය නිම වන බවත් ඔබ විශ්වාස කරනවා ද?"

මේ ක්‍රමයට ගුණාංග පංචකයක් සම්බන්ධයෙන් ම බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න කළ හ. එයට සැරියුත් හිමියන් ගේ පිළිතුර වූයේ "ස්වාමීනි, ශ්‍රද්ධාව ඇති කරගෙන වැඩි වර්ධනය කිරීමෙන් නිර්වාණාධිගමය සිදුවන බවත්, නිර්වාණාධිගමයෙන් එය කෙළවර වන බවත් මා විශ්වාසයෙන් පිළිගත්තක් නො ව ප්‍රත්‍යක්ෂ කර ගත්තකි. එහෙත් ස්වාමීනි, මේ කරුණ ප්‍රත්‍යක්ෂ කර නො ගත්, විමුක්තිය නුවණින් පසිඳ නොදත් කෙනෙකුට නම්, එම කරුණ ශ්‍රද්ධාවෙන් ම පිළිගත යුත්තක් වෙයි" යන්නයි.

මේ ඇසූ ඇතැම් භික්ෂූහු "සාරිපුත්ත ස්ථවිරයන් තවමත් සාවද්‍ය දෘෂ්ටීන් දුරලා නැති බව පෙනේ. අද පවා උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ වචන විෂයෙහි ශ්‍රද්ධාවෙන් තොර ව කතා කළ හ." යි කතිකා කළ හ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ඔබ මෙසේ ප්‍රකාශ කරන්නේ කවර හෙයින් ද? මා සාරිපුත්ත ස්ථවිරයන් වෙතින් පංච විධ ගුණාංගයන් වර්ධනය නො කර අධ්‍යාත්මික ශාන්තිය හා විමුක්තිය ලද හැකි දැයි ප්‍රශ්න කළ විට, ඒවා ප්‍රගුණ නො කොට අධ්‍යාත්මික ශාන්තිය හා විමුක්තිය ලද නො හැකි බව සාරිපුත්ත ස්ථවිරයෝ ප්‍රකාශ කළ හ.

අනතුරුව දානාදී කුශල කර්මයන් ගේ විපාකය ගැන හා බුද්ධාදී උතුමන් ගේ ශ්‍රේෂ්ඨත්වය ගැන ඔබ වෙත ශ්‍රද්ධාවක් නැත්දැයි ප්‍රශ්න කළෙමි. මේවා සැබෑ වශයෙන් ම සාරිපුත්ත ස්ථවිරයන් ශ්‍රද්ධාවෙන් පිළිගත් දේ නො ව තමන් විසින් ම ප්‍රත්‍යක්ෂ ඥානයෙන් යථාර්ථ දර්ශනයෙන් ප්‍රත්‍යක්ෂ කර ගත් දේ ය. උන් වහන්සේ තමා ම මාර්ග ඵලාධිගමය කොට යථාභූත ඥාන දර්ශනය ලබා විමුක්ති සුඛ වින්දනය කරමින් වාසය කරන හෙයින් ශ්‍රද්ධාව පිළිබඳ ප්‍රශ්නයක් හට නො ගනියි. එහෙයින් සැරියුත් තෙරණුවන්ට නිග්‍රහ කිරීම යුක්ති සහගත නො වෙයි" යි කරුණු පැහැදිලි කර මේ ගාථාව දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (97 ගාථාව)

යො නරො අස්සද්ධො අකතඤ්ඤූ ච සන්ධිච්ඡෙදො
හතාවකාසො වන්තාසො ච සො වේ උත්තම පෝරිසො.

යො නරො: යම් කිසි පුද්ගලයෙක්; **අස්සද්ධො:** ශ්‍රද්ධාව අනවශ්‍ය තත්ත්වයට පත් ව සිටී ද; **අකතඤ්ඤූ ච:** අකතව හෙවත් විමුක්තිය ප්‍රත්‍යක්ෂ කළේ ද; **සන්ධිච්ඡෙදො:** සියළු සන්ධි බිඳ හළේ ද; **හතාවකාසො:** නැවත ඉපදීමට ඇති අවස්ථා අත් හළේ ද; **වන්තාසො:** සියලු ආශාවන් ප්‍රහීණ කළේ ද; **සො:** හෙතෙම; **වෙ:** ඒකාන්තයෙන්; **උත්තම පොරිසො:** උත්තම පුරුෂයෙක් වෙයි.

යම් කිසි තැනැත්තෙක් ශ්‍රද්ධාවෙන් ධර්මය පිළිගන්නා තත්ත්වයෙන් ඔබ්බට ගොස් එය ප්‍රත්‍යක්ෂ ඥානයෙන් දැන ගත්තේ නම්, නිර්වාණය අවබෝධ කර ගෙන ඇත්නම්, නැවත ඉපදීමට ඇති අවස්ථාව අත්හැර දැමී නම්, සියලු කෙළෙසුන් දුරු කර හළේ නම්, හෙතෙම උත්තමයෙකි.

විවරණය

මේ ගාථාව 'දහම් ගැට' නමින් ජනවහරේ හැඳින්වෙන ප්‍රහේලිකාත්මක ශෛලියෙන් කරන ලද දේශනයකි. ඇසූ පමණින්, වචනාර්ථය තුළින් එන අරුත නො ව විග්‍රහ කර දත යුතු අරුතක් එහි වෙයි. මෙහි එන වචන සාමාන්‍ය වහරේදී දෙන අර්ථය ගාථාවෙහි දී නො ගත යුතුය. අසන්නා විස්මයට පමුණුවා අනතුරු ව ගැඹුරු අරුත් වෙත මෙහෙයවන මෙ වැනි ' දහම් ගැට' පෞරාණික අධ්‍යාපනික උපාය මාර්ගයක් වෙයි.

අස්සද්ධෝ: යන්න සාමාන්‍ය වචනාර්ථයට අනුව ශ්‍රද්ධාව නැත්තා, මිථ්‍යා දෘෂ්ටිකයා යන තේරුම දෙයි. එහෙත් මෙහි යොදා ඇත්තේ ප්‍රත්‍යක්ෂ අවබෝධය ඇති හෙයින් ශ්‍රද්ධාවෙන් ප්‍රයෝජනයක් නැති හෙයින් එය හැර දැමූ තැනැත්තා සඳහා ය. ශ්‍රද්ධාව හෙවත් විශ්වාසය අවශ්‍ය වන්නේ ප්‍රත්‍යක්ෂ අවබෝධය නැත්නම් පමණි.

අකතඤ්ඤූ: යන්නේ සාමාන්‍ය අර්ථය කෘතඥතාව නැති, කළගුණ නො තකන තැනැත්තා යන්න යි. මෙහි දී යොදා ඇත්තේ (අ-කත-අඤ්ඤ) කිසිවකු විසින් නිර්මාණය කළ දෙයක් නො වන නිර්වාණය (අකත) පසක් කර ගැනීම අදහස් වෙයි.



රහතුන් වහන්සේලා ගමෙහි, වනයෙහි නිම්නයෙහි හෝ ගොඩ වෙසෙතත් ඒ බිම් පෙදෙස ඉතා සිත්කලු ය.

98. ගාමෙ වා යදි වා'රඤ්ඤෙ
නින්නෙ වා යදි වා ථලෙ
යත්ථ අරහන්තො විහරන්ති
තං භූමිං රාමණෙය්‍යකං (7:9)

ගමක් හෝ වනයක්
නිම්නයක් හෝ කන්දක්
රහතුන් වාසයක්
නම් සිත් අදන පියසක්

වාසය නිකෙලෙස් උතුමන් - පිනවයි හැම සිත් නිතියෙන්

7 (9) රේවත හිමියන් ගේ කතාව (98 ගාථාව)

ඛදිරවනිය රේවත හිමියන් ඇරබ වදාළ මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයේ ය.

රේවත හිමියෝ සාරිපුත්ත හිමියන් ගේ බාල සොහොයුරා වූ හ. සැරියුත් හිමියන් ගේ සොහොයුරු සොහොයුරියන් අතර අවසන් වරට ගිහිගෙයින් නික්මුණෝ රේවත ය. ඔහු පමණක් ගිහි දිවියේ ඉතිරි ව සිටි සමයෙහි දෙමාපියෝ ඔහුට විවාහයක් කර දෙන්නට බොහෝ වෑයම් කළ හ. කෙසේ හෝ ඔහුට ගැලපෙන යුවතියක් සොයාගත් ඔවුහු විවාහ මංගල්‍ය උත්සවය ද සැලසුම් කළ හ.

විවාහ මංගල දිනයේ දී එහි පැමිණ සිටි, එකසිය විසි හැවිරිදි කාන්තාවක් දුටු හෙතෙම සියලු කාන්තාවන් ඒ තත්ත්වයට පත්වන බව මෙනෙහි කර කම් සුවයෙහි කළකිරුණේය. එහෙයින් විවාහය පසෙක තබා පලා ගිය හෙතෙම අසල වූ විහාරස්ථානයකට ගොස් පැවිද්ද ඉල්ලා සිටියේ ය. විහාරස්ථානයෙහි විසූ හිමිවරුන් තිස් නමට තම සොහොයුරු හමු වූ විටක ඔහු පැවිදි කරන සේ සැරියුත් හිමියන් විසින් කල් තබා උපදෙස් දී තිබුණ හෙයින් රේවත වහා ම පැවිදි කරන ලදී.

පැවිද්ද ලත් රේවත සාමණේරයෝ විහාරවාසී භික්ෂූන් වහන්සේ වෙතින් කර්මස්ථාන ලබා ගෙන යොදුන් තිහක් ඈත පිහිටි කිහිරි වනයට ගොස් භාවනා වඩන්නට පටන් ගත් හ. වස් කාලය අවසන් වත් ම රේවත හිමියෝ රහතන් වහන්සේ නමක් බවට පත් වූහ.

තම සොහොයුරාණන් දක්නට ඛදිරවනයට යාම සඳහා සාරිපුත්ත හිමියෝ තථාගතයන් වහන්සේ වෙතින් අවසර ඉල්ලා සිටිය හ. තමන් වහන්සේ ද එහි යාමට කැමති බව පළ කළ බුදුහු සැරියුත් හිමියන් හා සිවලී හිමියන් ඇතුළු බොහෝ භික්ෂූන් වහන්සේ ද සමග එහි වැඩම කළ හ.

ගමන දීර්ඝ එකක් විය. මාර්ගය දුෂ්කර වූ අතර අතර මග එතරම් ජනාකීර්ණ ද නො වීය. එහෙත් සංඝයා වහන්සේලා පිරිවරා වඩින බුදුරදුන් ගේ සුව පහසුව ගැන සිතූ දෙවිවරු යොදුනක් පාසා ආරාම මවා ආහාරපානාදිය ද සැලසූ හ. දිනකට යොදුන බැගින් මාර්ගය ද පිරිසිදු කර සම කර තැබූ හ. බුදුරදුන් සහපිරිවරින් පැමිණෙන බව දත් රේවත සාමණේර හිමියෝ ද උන්වහන්සේ පිළිගැනීම සඳහා සූදානම් වූහ. තම සෘද්ධි බලයෙන් බුදුරදුන් සඳහා විශේෂ ගඳකිළියක් ද අනිකුත් හිමිවරුන් සඳහා ආවාසඝර පන්සියයක් ද මවා සියලු සුව පහසුකම් පිළියෙල කොට තැබූ හ.

රේවත හිමියන් ගේ ආරාමයෙහි විවේක සුවයෙන් වැඩ සිටි බුද්ධප්‍රමුඛ සංඝරත්නය ආපසු ජේතවනාරාමයට සම්ප්‍රාප්ත වූයේ ද පෙර මෙන් ම දිනකට යොදුන බැගින් පා ගමනින් මය. මසක් අවසන සැවැත් නුවර නැගෙනහිර පිහිටි පූර්වාරාමයට වැඩම කළ උන් වහන්සේලා අනතුරුව විශාඛා උපාසිකාව ගේ නිවසෙහි දන් පිළිගත් හ. දන් වළඳා අවසන විශාඛාව රේවත හිමියන් විසූ ඛදිර (කිහිරි) වනය රම්‍ය දැයි විමසූ විට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළ හ.

විවරණාත්මක අනුවාදය (98 ගාථාව)

ගාමෙ වා යදි අරඤ්ඤෙ වා, නින්නෙ වා යදි ථලෙ වා
යත්ථ අරහන්තො විහරන්ති, තං භූමිං රාමණෙය්‍යකං

ගාමෙ වා: ගමක හෝ; **යදි**: නැතහොත්; **අරඤ්ඤෙ වා**: ආරණ්‍යයක හෝ; **නින්නෙ වා**: පහත් බිමක හෝ; **යදි**: නැතහොත්; **ථලෙ වා**: කඳු මුදුනක හෝ; **යත්ථ**: යම් තැනෙක; **අරහන්තො**: රහතන් වහන්සේලා; **විහරන්ති**: වාසය කරත් ද; **තං භූමිං**: ඒ බිම; **රාමණෙය්‍යකං**: සිත් ගන්නා සුලු ය.

ගමක හෝ ආරණ්‍යයක වේවා තැනිතලාවක හෝ කඳු මුදුනක වේවා, ඕනෑම තැනක මහ රහතන් වහන්සේ වෙසෙත් නම්, ඒ තැන රමණීය ය.

විවරණය

අරහත්: රහතන් වහන්සේ නම් ආර්‍ය්‍ය පුද්ගලයන් අතරින් රහත් මාර්ග ඵල ලත් උත්තමයෝ ය. සෝවාන්, සකදාගාමී, අනාගාමී හා මහ රහත් යන මාර්ගස්ථ හා ඵලස්ථ පුද්ගලයන් වශයෙන් ආර්‍ය්‍ය පුද්ගලයෝ අට දෙනෙක් වෙති. මාර්ගයෙහි රැඳී සිටීමක් නැති ව ඇසිල්ලකින් ම ඵලයට පත් වන හෙයින් මේ පුද්ගලයන් යුගල වශයෙන් ගෙන 'චත්තාරි පුරිස යුගානි' වශයෙන් ද සැලකීම සිරිතය. අභිධර්මයට අනුව මාර්ගය වූ කලී සතර ඵලයන්ට පත් වීමට පෙර ඇති චිත්තක්ෂණය පමණකි. නිවන් අරමුණු කර ගෙන අනිච්ච, දුක්ඛ හා අනත්ත පිළිබඳව ලබන විදර්ශනා ඥානයෙහි ඵලයක් වශයෙන් කෙනකු තුළ ක්ෂණික ව හට ගන්නා ආධ්‍යාත්මික පරිවර්තනයක් මෙසේ නම් කර ඇත. ඊලඟ ක්ෂණයෙහි වහා ම ඵල සිත හටගන්නා බව දැක්වෙයි. ඇතැම් පොත් වල අෂ්ඨායී පුද්ගලයනට අතිරේක ව 'ගෝත්‍රභූ' නම් වන වන ආර්‍ය්‍ය පුද්ගලයකු පිළිබඳව ද දැක්වෙයි.

පුහුදුන් අය නො ඇලෙන සිත්කලු වනයෙහි රහත්හු ඇලෙති. එ තුමෝ කම් සැප සෙවුම්හි ආසා නැත්තෝය.

99. රමණීයානි අරඤ්ඤානි
යත්ථ න රමතී ජනො
වීතරාගා රමෙස්සන්ති
න තේ කාමගවේසිනො (7:10)

රමණීය වන ගහණ
නොපිනවන දනන් මන
විරාගී සිත් අදියි
කම් සුවෙන් වැළකුණොන්

විරාගී සිත - අදියි වන පෙත

7 (10) එක් යුවතියක ගේ වත (99 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේ එක්තරා **නොසරුප් පැවතුම්** ඇති ස්ත්‍රියක් මුල් කරගෙන මේ ගාථාව දේශනා කළ සේක.

එක්තරා පිණ්ඩපාතික තෙර නමක් භාග්‍යවතුන් වහන්සේ වෙතින් කමටහන් ගෙන බවුන් වඩනු පිණිස පාළුවට ගිය උද්‍යානයකට වැඩම කළ හ. එසමයෙහි එක් තුරුණු වෙසඟනක් එම වනයෙහි දී හමුවෙමුයි කිසියම් පුද්ගලයකු හා ගිවිසගෙන ඔහු එන වේලාවට එහි ගොස් බලා සිටියා ය. එහෙත් කිසියම් හේතුවක් නිසා ගිවිසගත් වේලාවට ඔහු නො පැමිණි හෙයින් දොම්නසට පත් ඕ උයනෙහි ඒ මේ අත ඇවිදිමින් සිටියා ය.

තුරු සෙවනක බවුන් වඩනු පිණිස පළඟක් බැඳ වැඩ සිටි තරුණ හිමි නම දුටු ඕ තොමෝ "මේත් පිරිමියෙක් නොවේ ද? මොහු ගේ සිත අවදි කොට පොළඹවා ගනිමි"යි සිතා හිමි නමට පෙනෙන පරිදි හිස කෙස් කඩා කඩා නැවත බැන්දාය. ඇය මෙසේ කරන විට හිමි නම ගේ නෙත් ඒ දෙස බැඳිණි. ඇය ගේ සිරුරත් සිනහවත් දැක තමන් ගත පිබිදෙන බව උන්වහන්සේට දැනිණි. "මේ වෙන්නේ කුමක් දැ"යි උන්වහන්සේ විමතියට පත් වූහ.

මේ අතරතුර භාග්‍යවතුන් වහන්සේ "කමටහන් ගෙන බවුන් වඩමැයි පිටත් ව ගිය භික්ෂුනමට කුමක් වීද?" යි සිතමින් බුදු ඇසින් බලා වදාරන සේක් එම යුවතිය ගේ හාව භාව ලීලාවන් දැක හිමිනම ගේ සිත විපිළිසර වනු දැක ගත්හ. තමන් වහන්සේ ඒ භික්ෂුවට පෙනෙන පරිදි අධිෂ්ඨානයක් කළ බුදුරජාණන් වහන්සේ සිත පාලනය කර ගත හැකි පරිදි ධර්මෝපදේශ ලබා දුන් හ. අනතුරුව භික්ෂූන් අමතා මේ ගාථාව ද වදාළ හ.

විවරණාත්මක අනුවාදය (99 ගාථාව)

යත්ථ ජනො න රමතී රමණීයානි අරඤ්ඤානි වීතරාගා රමෙස්සන්ති තෙ කාමගවෙසිනො න

යත්ථ: යම් තැනක, **ජනො**: පොදු ජනයා, **න රමති**: නො ඇලෙත් ද, **රමණීයානි**: රමණීය වූ, **අරඤ්ඤති**: (එබඳු) වනාන්තර, **වීතරාගා**: වීතරාගීහු, **රමෙස්සන්ති**: ඇසුරු කරති, **තෙ**: ඔවුහු, **කාමගවේසිනො**: කම් සුව සොයන්නෝ, **න**: නො වෙති.

පොදු ජනයා වනාන්තර වල වාසයට ප්‍රිය නො වෙති. එහෙත් එබඳු රමණීය ආරණ්‍යවලට වීතරාගී උතුමෝ ප්‍රිය වෙති. උන් වහන්සේලා කාමාස්වාදය සොයන්නෝ නො වන හෙයිනි.

විවරණය

වනගහනයට ප්‍රිය වන රහතන් වහන්සේලා සියලු කෙලෙසුන් මුදා හළ හෙයින් කම්සුව නො පතති. කළ යුතු සියල්ල නිම කර සියලු බර පසෙක තබා සැහැල්ලු සිතින් වසන රහතන් වහන්සේලා අලුතින් කර්ම රැස් කිරීමක් නො කරති. නැවත උපතක් ද නො ලබති.

රහතන් වහන්සේලා තම ශික්ෂණය මුළුමනින් ම නිමවා ප්‍රතිඵල ද සාක්ෂාත් කරගෙන වෙසෙන හෙයින් තවදුරටත් ශික්ෂණය අනවශ්‍යයි යන අරුතින් ' අසෙඛ' වශයෙන් හඳුන්වනු ලැබේ. සෝතාපත්ති ඵලයේ සිට රහත් බව දක්වා සිටින අධිගම ලාභීන් තව දුරටත් ශික්ෂා මාර්ග යෙහි ශේෂයන් ඇති හෙයින් ' සෙඛ' සේ හැඳින්වෙයි. පිරිනිවන් පාන්නට පෙර ම නිර්වාණික පූර්වාස්වාදයක් ලබන්නට රහතන් වහන්සේලාට ඉඩ තිබේ. නිරෝධ සමාපත්ති සුවය සේ හැඳින්වෙන්නේ එයයි.

හිංසා

ඉතිහාසයේ එන සියළු ශ්‍රේෂ්ඨ ආගම් අතුරින් මා ඉතාම කැමැත්තේ
බුදු සමයටයි. මා වෙසෙසින්ම කැමැත්තේ බුදු සමයෙහි
ආදී ස්වරූපයටයි. මක් නිසාදයත් හිංසාකාරී බව පිළිබඳ
අංශු මාත්‍රයක් හෝ නොමැත්තේ එහි හෙයිනි.

බර්ට්‍රන් රසල්

බුදුදහම ඇගැයුමක්

බුදුදහමෙහි ඇති ආධ්‍යාත්මික හුදකලා බව නිසා බුදුසමය
මූලික වශයෙන් අපගේ සිත් ඇදගන්නේ නමුත් යමෙකුට
බුදුදහසේ නියම හරය වටහා ගැනීමට හැකිවන්නේ එදිනෙදා
ජීවිතයේ දී ඒ මගින් ඇතිකරණු ලබන ඉමහත් ප්‍රයෝජන නිසාය.

මහාචාර්ය එඩ්වඩ් කොන්සේ (බටහිර බෞද්ධ විද්වතෙක්)

මානව ආගම

ඉර හඳ පවතින තෙක් බුදු සමය පවතී. මිහි තලයෙහි මානව සංහතිය
පවත්නා තෙක් බුදු සමය පවතී. මක්නිසාදයත් එය මිනිසා ගේ,
මුලු මහත් මානව සංහතියේ ආගම හෙයිනි.

ශ්‍රී ලංකාවේ හිටපු අගමැති එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක.

8 වන පරිච්ඡේදය

සහස්ස වග්ග

අවැඩ සිදුවන වචන දහසකට වඩා සංසිඳීමට හේතු වූ එක වචනයකදු ඉතා උතුම්ය.

100. සහස්සමපි චෙ වාචා
අනත්ථපදසංහිතා
එකං අත්ථපදං සෙය්‍යො
යං සුත්වා උපසම්මති (8:1)

වැඩකට නැති වචන
එක් දහකටත් වැඩියෙන්
අසා සිත සැනසෙන
එක වචනයක් මහඟුයි.

අගෙයි එක් වදනත් - සිතට සැනසුම ගෙනෙතොත්

8 (1) තම්බදාඨිකගේ පුවත (100 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ සොරුන් ඝාතනය කරන වධකයා වූ **තම්බදාඨික** නිමිති කොට මේ ගාථාව වදාළ සේක.

තම්බදාඨික නමැත්තා රජු යටතේ පණස් පස් වසරක් වධකයා ලෙස සේවය කළේ ය. මහළු වියට පත් වූ පසු සොරකු ගේ හිස එක් කඩු පහරින් සිඳ දමන්නට බැරි තත්වයට හේ පත් විය. එහෙයින් ඔහුට විශ්‍රාම ගන්නට සිදු විය.

විශ්‍රාම ගන්නා දිනයේ තමන්ට අනුභව කිරීම පිණිස මිහිරි කිරි කැඳක් උවමනා බව හේ කියා සිටියේ ය. ඒ අනුව ඔහුට රසවත් කිරි කැඳක් පිළියෙල කරන ලදී. තම පැරණි ඇඳුම් ද රැගෙන පිච්ච මල් හා සුවඳ විලවුන් ද රැගත් හෙතෙම ගඟට ගොස් නා පිරිසිදු වී ඇඳුම් ඇඳගෙන මල් මාලයක් පැළඳ ගත්තේ ය. අත පය තෙල් ගා සාත්තු කර ගත්තේ ය. නිවසට ගොස් සුව පහසු පරිදි හිඳගෙන කිරිකැඳ පානයට සැරසුණා පමණි. සැරියුත් මහරහතන් වහන්සේ වධකයා ගේ නිවසෙහි දොරකඩ පෙනී සිටි සේක. සැරියුත් මහ රහතන් වහන්සේ දුටු තම්බදාඨික උන්වහන්සේ නිවස තුළට වඩමවා අසුනක වඩා හිඳුවා පාත්‍රයට කිරිකැඳ පිළිගැන්වී ය. ඒ මත ගිතෙල් ස්වල්පයක් ද වත් කළේ ය. උන්වහන්සේ එය වළඳන තුරු ළඟින් සිටගෙන පවන් සලන්නට පටන් ගත්තේ ය. වළඳා නිම වූ පසු සැරියුත් මහ රහතන් වහන්සේ ඔහුට ධර්ම දේශනා කරන්නට පටන් ගත් හ. එහෙත් ඒ සඳහා සිත එකඟ කර ගන්නට තම්බදාඨික සමත් නො වීය. රජතුමා ලඟ වධකයා වශයෙන් සේවය කරද්දී දිනපතා කළ මනුෂ්‍ය ඝාතන ඔහු ගේ සිහියට නැඟිණි.

ඔහු පත්ව ඇති අපහසුව තේරුම් ගත් සැරියුත් හිමියෝ දේශනය නවතා ඔහුගෙන් ප්‍රශ්නයක් ඇසූ හ. "ඔබ වධකයා වශයෙන් ඝාතනය කළේ ඔබේ උවමනාවට ද නැතහොත් රජ අණට කීකරු වීමක් වශයෙන් ද?" ඊට පිළිතුරු දෙමින් තම්බදාඨික "මට ඔවුන් මරන්නට සිතුවිල්ලක් නොවීය. හුදෙක් රජතුමා අණ කළ හෙයින් ම එසේ කළෙමි" යි පැවසී ය. "එසේ නම්, ඔබ ඊට වරදකරු ද, නිවරදකරු ද?" "මම වැරදි කරුවෙක් නො වෙමි" යි පැවසූ තම්බදාඨිකට සංසුන්ව බණ ඇසී ය.

උනන්දුවෙන් බණ ඇසූ හෙයින් හෙතෙම සෝවාන් මඟට ඉතා ආසන්නයෙහි වූ අනුලෝම ඤාණය ලැබීය. ධර්ම දේශනයෙන් පසු ටික දුරක් සැරියුත් හිමියන්ට පසු ගමන් කළ තම්බදාඨික මඟදී ආපසු හැරී නිවස බලා පිටත් විය. එහෙත් නිවසට ලඟා වන්නට පෙර එළදෙනකු විසින් ඇන ඔහු මරා දමනු ලැබිණ.

සන්ධ්‍යාවෙහි භාග්‍යවතුන් වහන්සේ දම් සබා මණ්ඩපයට වැඩම කළ විට භික්ෂූහු තම්බදාඨික ගේ මරණය ගැන භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන් හ. ඔහු මරණින් මතු උපන්නේ කොහිදැයි භික්ෂූහු බුදුරජාණන් වහන්සේ ගෙන් විමසූ හ. තම්බදාඨික ජීවිත කාලයක් පව්කම් කරමින් ජීවත් වුව ද අවසන් මොහොතේ සාරිපුත්ත මහ තෙරුන් වෙතින් බණ අසා අනුලෝම ඤාණය ලත් හෙයින් මිය ගිය පසු තුසිත දෙව්ලොව උපන් බව උන්වහන්සේ ප්‍රකාශ කළ හ. මෙබඳු පව්කාර පුද්ගලයෙක් එක ම ධර්ම දේශනාවක් පමණක් අසා මේ සා විශාල යහපතක් සිදු කර ගන්නේ කෙසේ දැයි භික්ෂූහු විමතිය පළ කළ හ. භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළේ ඒ නිමිත්තෙනි.

විස්තරාත්මක අනුවාදය (100 ගාථාව)

අනත්ථපද සංහිතා වාචා චෙ සහස්සං අපි යං සුත්වා
උපසම්මති එකං අත්ථ පදං සෙය්‍යො.

අනත්ථ පද සංහිතා: වැඩකට නැති පද වලින් යුත්; **වාචා**: දේශන; **චෙ**: ඉදින්; **සහස්සං අපි**: දහසක් තිබුණේ වුව ද; **යං සුත්වා**: යමක් ශ්‍රවණය කොට; **උපසම්මති**: සිත ශාන්තියට පත් වේද; **එකං අත්ථ පදං**: එබඳු එකම අර්ථවත් පදය; **සෙය්‍යො**: ඊට වඩා උතුම් වෙයි.

වැඩකට නැති නිසරු කියුම් ඇතුළත් දෙසුම් දහසකට වඩා මානසික ශාන්තිය උදාකරන එකම දේශනයක් වුව ද ශ්‍රේෂ්ඨ වෙයි.

විවරණය

අනර්ථ පද සංහිතා: කතා බහ නම් උසස් මානසික සාධන සඳහා අදාල නොවන නිසරු ප්‍රලාප කතා ය. අටුවා වල එබඳු නිසරු කතා ලෙස අහස, පොළොව, ඉර, හඳ, තරු, උද්‍යාන, ජලාශ, මධුපානෝත්සව, ප්‍රිය සම්භාෂණ ආදිය ගැන කෙරෙන දෙඩැව්ලි නම් කර ඇත. පෙළ පොත් වල සඳහන් රාජ කථා, චෝර කථා, මහා මච්ච කථා, සේනා කථා, භය කථා, යුද්ධ කථා ආදිය ද මෙබඳු නිසරු කතා වෙති.

අවැඩ සහිත පදයෙන් යුතු වූ ගාථා දහසකට වඩා සැනසීමට හේතු වූ එක් ගාථා පදයකුදු උතුම් ය.

101. සහස්සමපි චෙ ගාථා
අනත්ථපද සංහිතා
ඒකං ගාථා පදං සෙය්‍යො
යං සුත්වා උප සම්මති (8:2)

එක්දාහකටත් ඉහලින්
හරයක් නැති ගාථාවන්
තිබුණත් සිත කරන පහන්
එකක් අගේ ඇත වැඩියෙන්

හර ඇති ගාථා එකක් - පරදයි හර නැති දහක්

8 (2) බාහිය දාරුචීරිය වෘත්තාන්තය (101 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **බාහිය දාරුචීරිය** තෙරුන් වහන්සේ අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

වෙළඳ පිරිසක් නැව් නැගී වෙළඳාම් පිණිස සමුදුරු තරණයට නික්මුණා හ. මහ මුහුද මැද්දී නැව බිඳී වැනසී එක් අයෙක් හැර අන් සියල්ලෝම මිය ගිය හ. හේ නැවේ ලෑල්ලක් මතට වී පාවී ගොස් සුප්පාරක නම් තොටට ගොඩ බැස්සේ ය. ගොඩ බිමට පා වන විට සියළු ඇඳුම් අහිමිව නිරුවත්ව සිටි හෙයින් හෙතෙම ගස්වල පොතු ගලවා වියා විලි වසා ගන්නට ඇඳුමක් තනා ගත්තේ ය. ආහාර ලබා ගැනීමට සුදුසු බඳුනක් ද සොයා ගත් හේ මිනිසුනට පෙනෙන තැනක හිඳ ගෙන සිටියේ ය. ඒ දුටු සමහරු තවුසෙකැයි සිතා වැඳ පුදා කැඳ බතින් සංග්‍රහ කළ හ. සමහරුන් ඔහුට ඇඳුම් දෙන්නට වෑයම් කළ ද හේ ඒවා ප්‍රතික්ෂේප කළේ සාමාන්‍ය ඇඳුම් ඇඳ ගතහොත් තමන් ට ලැබෙන පුද සැලකිලි අඩු වෙතැයි බියෙනි. සමහරුන් ඔහු රහතන් වහන්සේ නමක් ලෙස හඳුන්වනු ඇසුණෙන්, ඇත්තට ම තමා රහත් ව ඇතැයි ඔහුට ද සිතිණි. ඔහු අමුතු ආගමික පිළිවෙතක් දරන හෙයින් හා ගස් පොතු වලින් තැනූ වස්ත්‍රයක් දරන හෙයින් ඔහුට බාහිය දාරුචීරිය යන නම ව්‍යවහාර වන්නට පටන් ගත්තේ ය.

දිනක් රැයෙහි මහා බ්‍රහ්මයා තමන් හමුවට පැමිණ "බාහිය, ඔබ රහත් වී නැත. රහත් නමක් වෙත තිබිය යුතු ගුණාංග කිසිවක් ඔබ වෙත නැත" යි කියනු ඔහුට ඇසිණි. "එසේ ය. මා රහත් වී නැතැයි මම දනිමි. එහෙත්, මේ ලොව කවර තැනක හෝ රහත් වූ අයෙක් සිටිත් ද?" යි හේ ප්‍රශ්න කළේ ය. එවිට මහා බ්‍රහ්මයා සැවැත් නුවර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ සියළු තොරතුරු ඔහුට පැවසී ය.

භාග්‍යවතුන් වහන්සේ සොයා ගිය බාහිය දාරුචීරිය තෙමේ උන්වහන්සේ භික්ෂූන් පිරිවරා පිඬු සිඟා යනු දැක පසු පසින් ගියේ ය. තමන්ට ධර්ම දේශනාවක් කරන්නැයි ඔහු ඉල්ලා සිටි විට "බාහිය, මේ අප පිඬු සිඟා වඩන වේලාවයි. මේ බණක් කීමට සුදුසු වේලාව නො වේ" යි බුදු රජාණන් වහන්සේ පිළිතුරු දුන් හ. "ස්වාමීනි, ඔබ වහන්සේ ගේ ජීවිතයට හෝ මගේ ජීවිතයට කවර මොහොතේ අනතුරක් වේ දැයි අපි නො දනිමු. එහෙයින් පමා නො කර මට දැන්ම ම දහමක් දෙසනු මැනවි'' යි දාරුචීරිය ඉල්ලා සිටියේ ය. යොදුන් එකසිය විස්සක් එක් රැයකින් ගෙවා පැමිණ දැඩි වෙහෙසට පත්ව සිටි බාහිය දාරුචීරිය බුදුරදුන් දුටු ප්‍රීතියෙන් ඔද වැඩී සිටි හෙයින් ඔහු මඳක් සංසුන්වන තුරු පමා කරන්නට බුදුරජාණන් වහන්සේට අවශ්‍ය විය. එහෙත් බාහිය දිගින් දිගටම ආයාචනා කරන්නට වූයෙන් භාග්‍යවතුන් වහන්සේ මග නැවතී "බාහිය, රූපයක් ඔබේ නෙත ගැටෙන විට රූපයක් දිස්වන බව පමණක් සිතන්න. ශබ්දයක් කණ වැකෙන විට ශබ්දයක් ඇසෙන බව පමණක් සිතන්න. සුවඳක් දැනෙන විට සුවඳක් දැනෙන බව පමණක් සිතන්න. රසයක් දිවට දැනෙන විට රසයක් දිවට දැනෙන බව පමණක් සිතන්න. ස්පර්ශයක් ගතට දැනෙන විට ස්පර්ශයක් බව පමණක් සිතන්න. සිතට සිතිවිල්ලක් එන විට සිතිවිල්ලක් නැගෙන බව තේරුම් ගන්න." යි වදාළ හ. මේ දෙසුම අසා සිටි බාහිය රහත් ඵලය ලද්දේ ය.

රහත් බව ලද බාහියට පැවිදි වන්නට රුචියක් ඇති විය. එහෙත් සිවුරු පිරිකර නො වූයෙන් ඒවා සපයා ගැනීමට හේ පිටත්ව ගියේ ය. එහෙත් මගදී එළදෙනක විසින් අනිනු ලැබ හේ මිය ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ සහ භික්ෂූන් වහන්සේලා දන් වළඳා ආපසු වඩින විට බාහිය කුණු ගොඩක් අසල මැරී වැටී සිටිනු උන්වහන්සේලා ගේ නෙත ගැටිණි. බුදුරජාණන් වහන්සේ ගේ උපදෙස් පරිදි භික්ෂූහු මළ සිරුර ආදාහන කර භස්මාවශේෂ නිදන් කර සෑයක් ද තැනවූ හ. දෙව්රම් වෙහෙර දම්සබා මණ්ඩපයේ දී බාහිය මිය ගියේ රහතන් වහන්සේ නමක් වශයෙන් බව ප්‍රකාශ කළ බුදුරජාණන් වහන්සේ ඉක්මණින් ධර්මාවබෝධය කළවුන් අතුරින් බාහිය දාරුචීරිය අගතැන්හි තැබූ හ. බාහිය රහත් වූයේ කවදා කොහේ දී දැයි විමසූ භික්ෂූන් වහන්සේලාට "මා ඔහුට මගදී දෙසූ වචන කිහිපය අසා හෙතෙම මහ මග මැද ම රහත් වීය" යි වදාළ උන් වහන්සේ අර්ථසම්පන්න එක් වචනයක් වුවත් අර්ථ විරහිත වචන දහසකට වඩා අගනා බව මේ ගාථාවෙන් දේශනා කර වදාළ හ.

විස්තරාත්මක අනුවාදය (101 ගාථාව)

අනත්ථ පද සංහිතා ගාථා චේ සහස්සං අපි යං සුත්වා
උපසම්මති එකං ගාථා පදං සෙය්‍යො.

අනත්ථපද සංහිතා: නිරර්ථක ප්‍රකාශයන්ගෙන් පිරුණු; **ගාථා**: ගාථාවන්; **සහස්සං අපි**: දහසක් වුව; **චෙ**: (තිබුණ) ද; **යං සුත්වා**: යමක් අසා; **උපසම්මති**: නිවී සැනසේ ද (එබඳු); **එකං ගාථාපදං**: එකම ගාථාපදය; **සෙය්‍යො**: වඩා උතුම් ය.

නිෂ්ප්‍රයෝජන කියමන් සහිත ගාථා දහසකට වුව ද වඩා, ඇසීමෙන් සිත නිවී සැනසී යන එක ගාථා පදයක් වුවත් වටියි.

විවරණය

ගාථා නමින් හඳුන්වන්නේ පාලි භාෂාවෙන් කරන ලද පද්‍ය ස්වරූපී ප්‍රබන්ධ ය. සිංහලයෙන් මේවා ගී හෝ කවි වශයෙන් හැඳින්විය හැක. කිසියම් ඡන්දසකට අනුව මාත්‍රා පිහිටුවා ගාථා වාදනය කරන අතර ඇතැම් විට තාල වෙනස් වන පරිදි නිදහසේ ප්‍රබන්ධ කර ඇති අවස්ථා ද වෙයි. එසේ කරන්නේ අර්ථයට මුල් තැන දීම හේතුවෙනි. නවංග සාසනයෙන් එක් අංගයක් ලෙස ගාථා දක්වා ඇත. ධම්මපදය ද ගාථාමය ධර්ම ග්‍රන්ථයකි. සාමාන්‍යයෙන් ගාථාවකට පද හතරක් ඇතත්;, ඉඳහිට පද හයක් ඇති අවස්ථා ද දක්නට ලැබේ.

අවැඩට මග සැලසෙන කරුණු සහිත වු ගාථා සියයකට වඩා ඇසුවන් සන්සිඳුවන එක දහම් පදය ඉතා උතුම් ය.

102. යො වෙ ගාථා සතං භාසෙ
අනත්ථපදසංහිතා
එකං ධම්මපදං සෙය්‍යො
යං සුත්වා උපසම්මති. (8:3)

සීයක් ගැයුවත් හර නැති
ගාථා කිසි වැඩකට නැති
එක ගාථාවක් හර ඇති
උතුම්ය ඉන් සිත් සැනහෙති.

පද දහම් - වේ උතුම්

8 (3) කුණ්ඩලකේසි තෙරණිය ගේ වත (102, 103 ගාථා)

දෙව්රම් වෙහෙර වැඩ විසූ තථාගතයන් වහන්සේ මේ ගාථා යුග්මය දේශනා කර වදාළේ **කුණ්ඩලකේසී භික්ෂුණිය** අරබයා ය.

රජගහ නුවර එක් සිටුවරයකුට සොළොස් හැවිරිදි දියණියක් වූවා ය. අතිශයින් රූප සම්පන්න වූ දකින්නන් ගේ මන බඳින සුළු වූවා ය. දෙමාපියෝ ඇය සත් මහල් පායක ඉහල ම මහලේ රඳවා දාසියක් ද සමග සියළු සැප සම්පත් දී පෝෂණය කළ හ. එසමයෙහි එක් සොරෙක් සොරකමේ ගොස් රාජපුරුෂයන් විසින් අල්ලා ගනු ලැබ මරණීය දණ්ඩනයට නියම කරන ලද්දේ ය. ඔහු ගේ අත් පිටුපසට තබා බැඳ හතරමං හන්දි වලදී කස පහර දෙමින් මරා දැමීම පිණිස ගෙන යමින් තිබිණ. මහ මග කලබල හඬ ඇසූ සිටු දියණිය මතු මහලේ සිට ඒ කුමක්දැයි බැලුවා ය. චෞරයා ගේ ආරෝහ පරිණාහ සම්පන්න සිත් අලවන පෙනුම දැක ඇය සිත තුළ ඇල්මක් ඇති විය. කෙතරම් දැඩි ලෙස ඇය ගේ සිත බැඳුනා ද යත් ඕ තොමෝ කෑම බීම ප්‍රතික්ෂේප කරමින් ඇඳෙහි වැතුරුණා ය. "මා දියණියනි, ඇයි මේ?" යි මව විචාළ විට "මරා දමනු පිණිස ගෙන යනු ලබන තරුණයා ලදොත් පමණක් ජීවත් වෙමි. නැතහොත් මේ ජීවිතයෙන් ප්‍රයෝජනයක් නැත. නොකා නොබී මිය යන්නෙමි" යි කීවා ය. කිසි අයුරකින් දියණිය සනසන්නට අසමත් වූ මව මෙ පවත් සිටුවරයාට දැන්වී ය.

වෙන කළ යුත්තක් නැති තැන හෙතෙම කහවණු දහසක් රාජපුරුෂයනට අල්ලස් දී සොරා බේරා ගත්තේ ය. ඔහු වෙනුවට වෙනත් අයකු මරා දමන ලදී. සිටුවරයා සොරාට තම දියණිය විවාහ කර දුන්නේ ය. සිටු දියණිය ද ඔහු ගේ ආදරය දිනා ගනු පිණිස දිනපතා පියකරුව සැරසී, විසිතුරු ඇඳුම් ඇඳ, අගනා ආභරණ පැළඳ ඔහුට සෙනෙහස දක්වන්නී ය. ආහාර පාන ආදිය ද ප්‍රණීත ලෙස සකසා සියතින් ම පිළිගන්වන්නී ය. එහෙත් සොර තරුණයා නිතර ම කල්පනා කළේ සිටු දියණිය මරා දමා ඇය ගේ අගනා ආභරණ ද රැගෙන පලා යන ක්‍රමයකි. "මැය මරා ආභරණ රැගෙන පලා ගොස් හොඳ රා පොලකින් සුරා පානය කර විනෝද වෙමි" යි සිතූ හේ උපක්‍රමයක් සිතා ගෙන ආහාර පානාදිය නො ගෙන ඇඳට වී සිටියේ ය.

"හිමියනි ඔබ අසනීපයෙන් ද?" යි ඕ විමසුවා ය. "නැත සොඳුර". "එසේ නම් මගේ දෙමාපියන් ගෙන් වරදක් වූවා ද?" "නැත. ඔවුන්ගෙන් වරදක් නොවී ය." "එසේ නම්, ප්‍රශ්නය කුමක් ද ස්වාමීනි?" "සොඳුර, මා එදා අත් බැඳ මරන්නට ගෙන යද්දී මා දිවි ගැලවුවහොත් ඉටු කරන්නෙමැයි චෝරපබ්බතයෙහි දේවතාවාණනට බාරයක් වුණෙමි. මා දිවි ගැලවුණෝත් ඔබ වැනි බිරිඳක් ලැබුණේත් දේව කරුණාවෙන් මය. ඉතින් මා ඒ බාරය ඉටු කළ යුතු ය. ඒ ගැන සිතා තැවෙමි". "හිමියනි, එය තැවෙන්නට කරුණක් නො වේ. උවමනා කවර පූජා වස්තුදැයි මට කියන්න. අපි ඒ බාරය ඔප්පු කරමු" යි ඕ කීවා ය.කිරිබත්, මීපැණි, ලද පස් මල් වැනි දේ සූදානම් කරන්නැයි ස්වාමියා කී හෙයින් සිටු දියණිය ඒ සියල්ල ඉටු කළා ය. ඔවුන් බාරය ඉටුකරන්නට යන දිනයෙහි "සොඳුර, ඔබේ නෑදෑ කිසිවකු නාවාට කම් නැත. ඔබත් මමත් තනිව ගොස් මේ බාරය ඔප්පු කරමු. ඔබ ගේ අගනා ම ආභරණ පැළඳ ගනිමු." යි හෙතෙම ජැවසී ය. සිටු දියණිය ද ඒ අනුව ම සැරසුණා ය. ඔවුහු ඉතා සතුටින් විනෝදයෙන් චෝරපබ්බතය නැග ගත් හ. එහෙත් කඳු මුදුනෙහි දී සොරා අමුතු මිනිසෙක් බවට පත් විය. "මට මේ පූජාවස්තු වලින් පලක් නැත. මා වූ බාරයකුත් නැත." යි හේ පැවසී ය.

"එසේ නම් මා මෙහි කැඳවාගෙන ආයේ කුමට ද ස්වාමීනී?" යි ඕ විමසුවා ය. "තී මරා දමා ආබරණ සියල්ල ද රැගෙන පලා යන්නට ය" භීතියට පත් සිටු දියණිය "හිමියනි, මගේ අබරණ සියල්ලත්, මාත් මේ හැමෙකක්මත් ඔබගේ මය. එසේ තිබිය දී ඔබ මේ කුමක් කියන්නේ දැයි" විමසුවා ය. යළි යළිත් ඔහුට කරුණු කියමින් තේරුම් කරන්නට උත්සහ කළ ද ඔහු දිගට ම කියා සිටියේ ඇය මරා දැමිය යුතු බව ය. "මා මරා දැමීමෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? මේ ආභරණ සියල්ල රැගෙන මා මුදා හරින්න" යි ඕ ආයාචනා කළා ය. අන්තිමේ දී ඔහු වෙත තිබුණු ඇල්ම දුරු කළ කුණ්ඩලකේසී මෙසේ සිතුවා ය. "මේ මොන දුෂ්ට වැඩක් ද? කොහොම වුණත්, නුවණක් කියා දෙයක් අපට ලැබී තිබෙන්නේ උයාගෙන කන්නට ම නොවේ. පනින්නට පෙර සිතා බැලිය යුතුය.

විස්තරාත්මක අනුවාදය (102 ගාථාව)

යො අනත්ථපද සංහිතා ගාථා සතං භාසෙ ච යං සුත්වා උපසම්මති එකං ධම්මපදං සෙය්‍යො.

යො: යම්කිසි කෙනෙක්; **අනත්ථපද සංහිතා**: නිරර්ථක ප්‍රකාශ ඇතුළත්; **ගාථා**: ගාථා; **සතං**: සියයක්; **භාසේ ච**: කියුව ද; **යං**: යමක්; **සුත්වා**: අසා; **උපසම්මති**: සැනසිල්ල ලැබේ ද; **එකං ධම්මපදං**: එවන් එක් ධම්මපදයක්; **සෙය්‍යො**: ඊට වැඩියෙන් උතුම් ය.

යම්කිසි කෙනෙක් නිෂ්ඵල කරුණු ඇතුළත් ගාථා දහසක් පාඩම් කරගෙන ගායනා කළ ද, ඊට වඩා අසන්නා ගේ සිත සනසන එක ධර්ම පදයක් වුව ද ශ්‍රේෂ්ඨ ය.



දස ලක්‍ෂයක් සෙනග පරදවා යුද්ධයෙහි දිනුමට වඩා යමෙක් එක ම තමා දිනන්නේ නම් උතුම් ය.

103. යො සහස්සං සහස්සෙන
සඞ්ගාමේ මානුසේ ජිනේ
එකඤ්ච ජෙය්‍ය අත්තානං
ස වෙ සඞ්ගාමජුත්තමො (8:4)

දහසක් වර දහසක් දෙන
දිනුවත් මිනිසුන් සටනින
උසස් නොවෙයි තමන් දිනන
තරම්, එයයි උතුම් සටන

උතුම් දිනුම තමන් දිනුම

8 (3) කුණ්ඩලකේසී තෙරණිය ගේ වත (102 හා 103 ගාථා)

මේ දුෂ්ට මිනිහාගෙන් ගැලවෙන ක්‍රමයක් යොදා ගත යුතු ය." "ස්වාමි පුරුෂයාණෙනි, ඔබව වධ බෙර වයමින් පිටිතල හයා බැඳ මරන්නට ගෙන යන මොහොතේ දී මම මගේ දෙමාපියන්ට කියා කහවණු දහසක් දී ඔබ බේරා ගතිමි. ඒ ඔබට ඇති වූ ආදරය නිසා ය. මම ඔබට ඒ උපකාරය කළෙමි. අද මේ ජීවිතයේ අවසන් මොහොතේ ඔබ මට ද උපකාරයක් කළ මැනවි. මට ඔබතුමා ප්‍රදක්ෂිණා කර වැඳ මියයන්නට ඉඩ දෙනු මැනැවි" යි ඕ ඉල්ලා සිටියා ය.

"කදිමයි, සොඳුර, ඊට ඉඩ දෙමි" යි සොරා ඊට ඉඩ දුන්නේ ය. ඒ වන විට ඔවුන් සිටියේ පර්වතයෙහි මුදුනේ ම ප්‍රාන්තයේ ය. "හිමියනි මේ මගේ අන්තිම මොහොතය. අදින් පසු ඔබේ ප්‍රිය දර්ශනය මට නො ලැබේ. මට ඔබ ආදරයෙන් සිප වැළඳ ගැන්මට ඉඩ දෙන්න" යි කියමින් ඕ ඔහු ඉදිරියෙන් සිප ගෙන පසු පසින් ද සිප ගනිමින් හිටි හැටියේ ම ඔහු පර්වතයෙන් පහලට තල්ලු කර දැම්මා ය. කන්දෙන් පහළට පෙරළී ගිය සොරා කඩ කඩ වී ගොස් මිය ගියේ ය. අනතුරුව ඕ තොමෝ පරිබ්‍රාජකාරාමයකට ගොස් පැවිදි වූවා ය.

පරිබ්‍රාජිකාවක වශයෙන් දහම් හදාරා ගැටළු දහසක් විසඳන්නට සමාර්ථ්‍යය ලත් තැන ඔවුහු ඇයට මෙසේ කී හ. "දැන් ඔබ ධර්මධර ය. දඹදිව පුරා සංචාරය කරමින් ඔබ සමග තර්ක කරන්නට සමත් අයෙක් සිටීදැයි සොයන්න." එසේ පවසා ජම්බු අත්තක් ඇය අතට දී " සොහොයුරිය, යන්න. යම් ගිහියෙක් ඔබ තර්කයෙන් පැරදවුව හොත්, ඔහු ගේ වහලිය වන්න. යම් භික්ෂුවක් හෝ භික්ෂුණියක් එසේ කළ හොත් ශ්‍රාවිකාවක් වන්න" යි ද කීහ.

තර්ක ශක්තියෙන් හා වාග් චාතුර්යයෙන් පොහොසත් වූ ඇය ගේ කීර්තිය දඹදිව පුරා පැතිර ගියේ ය. ඇය යනු දකින විට මිනිස්සු "ඔය යන්නේ ජම්බු පරිබ්‍රාජිකාව" යි කියන කරමට ඕ ප්‍රකට වූවා ය.

නගරයකට හෝ ගමකට පිණ්ඩපාතයෙහි හැසිරෙනු පිණිස ඇතුල් වෙත්දී නුවර දොරටුව අසල වැලි ගොඩක් ගසා ජම්බු අත්ත සිටුවන ඕ "මා වාදයෙන් පරදන්නට හැකි යයි සිතන කෙනෙක් මෙය පෙරලත්වා. මම ඔහු සමග වාද කරමි" යි පවසා පිඩු සිගා යයි. අත්ත ඉවත් කරනු තබා කිසිවෙක් ඒ අසලටවත් නො යති. එක් අත්තක් වියළී ගිය විට ඕ එය ඉවත දමා අළුත් අත්තක් සොයා ගනියි.

මේ ක්‍රමයෙන් ගමක් ගමක් පාසා නගරක් නගරයක් පාසා සැරිසරන ජම්බු පරිබ්‍රාජිකා හෙවත් කුණ්ඩලකේසාවෝ සැවැත් නුවරට පිවිසුණ හ. ඇය සුපුරුදු පරිදි ජම්බු අත්ත සිටුවා පිඩු සිගා ගිය අතර එහි වැඩම කළ සැරියුත් තෙරණුවෝ අසල සෙල්ලම් කළ ළමයින් ලවා අත්ත ගලවා දැම්මවූ හ. ඕ පැමිණ "හිමියනි, මේ අත්ත ඉවත් කළේ ඔබ වහන්සේ ද?" යි විමසූ හ. "එසේ ය නැගණිය" "එසේ නම් ඔබ වහන්සේ මගේ ප්‍රශ්න වලට පිළිතුරු දීමට සූදානම් ද?" "එසේ ය නැගණිය, මම සූදානම්." තමා උගත් ධර්ම ප්‍රශ්න දහසම ඕ සැරියුත් හිමියන්ගෙන් විමසූවා ය. ඒ සියල්ලට ම උන් වහන්සේ සාර්ථක පිළිතුරු දුන් හ. අනතුරුව සාරිපුත්ත හිමියෝ "නැගණිය මම ඔබට සාර්ථකව පිළිතුරු දුන්නෙමි. මගේ එකම එක ප්‍රශ්නයට ඔබ පිළිතුරු දෙන්න" යි පැවසූහ. "අසන්න ස්වාමීනි, මම විසඳමි" ඇය එසේ පවසා එකග වූයෙන් සැරියුත් හිමියෝ "එක නම් කුමක් ද" යි විමසූ හ.

පිළිතුරු නො දත් ඕ "ඒ කුමක් ද ස්වාමීනී" යි තෙරුන් වහන්සේගෙන් විමසූ හ. "නැගණිය, මෙය බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රශ්නයකි" යි සැරියුත් හිමියෝ වදාළ හ. "මට පිළිතුරක් කියා දුන මැනවි ස්වාමීනී" යි ඕ අයැද සිටියා ය. "ඔබ පැවිදි වන්නට කැමති නම් කියා දෙමි" "හොඳමයි ස්වාමීනී මම පැවිදි වන්නෙමි'' යි ඇය එකග වූයෙන් සැරියුත් හිමියෝ ඇය මෙහෙණවරට යවා පැවිදි කරවූ හ. භික්ෂුණී ශාසනයට ඇතුළුව ධර්මය ඉගෙන දින කිහිපයකින් ම රහත් වූ ඕ තොමෝ උපසම්පදාව ද ලබා කුණ්ඩලකේසා භික්ෂුණිය වශයෙන් ප්‍රකට වූවාය. ඍද්ධිප්‍රාතිහාර්යයී දැක්විය හැකි භික්ෂුණීන් අතර අග්‍රස්ථානය ද ලද්දා ය.

විස්තරාත්මක අනුවාදය (103 ගාථාව)

යො සඞ්ගාමෙ සහස්සෙන සහස්සං මානුසෙ ජිනෙ ච
එකං අත්තානං ජෙය්‍ය සො වෙ සඞ්ගාමජුත්තමො

යො: යම්කිසි කෙනෙක්; **සඞ්ගාමෙ**: යුද්ධය මගින්; **සහස්සෙන**: දහස් වරක්; **සහස්සං**: දහසක්; **මානුසෙ**: මිනිසුන්; **ජිනෙ ච**: පරදවයි නම්; **ඒකං අත්තානං**: එක් අයෙක් තමන්; **ජෙය්‍ය**: ජය ගන්නේ නම්; **සො**: හෙතෙම; **වෙ**: ඒකාන්තයෙන් ම; **සඞ්ගාමජුත්තමො**: යුද්ධ දිනන උත්තමයා වේ.

යුද්ධ කිරීම මගින් දහස් වරක් දහසක් දෙනා පරාජය කර ජයග්‍රහණය කළ ද යමෙක් තමන් දිනීම තරම් එය ශ්‍රේෂ්ඨ නොවේ. උසස් ම ජයග්‍රාහකයා තමන් ජයගන්නා තැනැත්තා ය.

විවරණය

මේ ගාථාවෙන් අගය කරනු ලබන්නේ තමා ජය ගැනීම ය. තමා ජය ගන්නා තැනැත්තා ජය ගන්නේ එකම එක පුද්ගලයෙකි. යුද්ධ කරන තැනැත්තා දහසක් දෙනා පරදවා ජය ගනියි. නමුත් ඔහු ගේ ජයග්‍රහණය තනි තැනැත්තකු ජය ගන්නා ගේ ජයග්‍රහණය තරම් වටින්නේ නැත. තමා ජය ගැනීම අතිශය දුෂ්කර වූත් ආධ්‍යාත්මික වූත් නිරවද්‍ය වූත් ජයග්‍රහණයක් හෙයිනි.



තම අතබැව් දිනීම ඉතා උතුම් දිනීමය

104. අත්තා හවෙ ජිතං සෙය්‍යො
යා චා යං ඉතරා පජා
අත්තදන්තස්ස පොසස්ස
නිච්චං සඤ්ඤත චාරිනො (8:5)

තමා දිනුමයි උතුම් වන්නේ
අනුන් පරදා දිනුම වෙනුවට
තමා දමනය කරන අය ගේ
නිතර සංවර විලස හැසිරෙන

වෙනත් ජයක් නැත සමවෙන - ජයට තමන් දිනා ලබන

8 (4) අනත්ථපුච්ඡක බමුණා ගේ කථාව (104, 105 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් **අනත්ථපුච්ඡක බමුණා** අරබයා මේ ගාථාව වදාළ සේක.

වරක් භාග්‍යවතුන් වහන්සේ හමුවීමට පැමිණි අනත්ථපුච්ඡක නම් බමුණා මෙසේ පැවසී ය. " ස්වාමීනි, මට හැඟෙන්නේ ඔබ වහන්සේ දන්නේ අර්ථ සම්පන්න (ප්‍රයෝජනවත්) දේවල් ගැන පමණක් බවයි. ඔබ වහන්සේ අනර්ථ සම්පන්න (විනාශකාරී) දේවල් ගැන දන්නේ නැතැයි මට හැඟෙයි.'' ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ අර්ථ සංහිත දේ පමණක් නොව අනර්ථ සංහිත දේත් දන්නා බව ප්‍රකාශ කර ධන හානිය සිදුවන නරක පුරුදු හයක් නම් කර දැක්වූහ.

1. හිරු නැගෙන තුරු නිදා ගැනීම.
2. අලසකම.
3. කුරිරුකම.
4. මදයට හා ප්‍රමාදයට හේතුවන බීමත් කම.
5. නොකල්හි වීථි සංචාරය.
6. කාම මිථ්‍යාචාරය යන හයයි.

මේ අසාසිටි බමුණා සාධුකාර දී "යහපති ස්වාමීනි, ඉතා මැනවි. ඔබ වහන්සේ අර්ථ සංහිත දේ පමණක් නොව අනර්ථකාරී දේත් දන්නා සේක"යි ප්‍රකාශ කළේ ය."එසේ ය බ්‍රාහ්මණය, අනර්ථකාරී දේ මොනවාදැයි මා තරම් දන්නා වෙනත් අයෙක් නැත" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ.

අනතුරුව මේ බ්‍රාහ්මණයා මෙවන් ප්‍රශ්නයක් නැගුවේ කවර හෙයින්දැයි විමසනු රිසි වූ භාග්‍යවතුන් වහන්සේ "බ්‍රාහ්මණය, ඔබ ජීවත් වන්නේ කවර වෘත්තියකින්දැයි" විචාළ හ. "සූදුවෙනි" යි හෙතෙම පිළිවදන් දුන්නේ ය.

"කවුද දිනන්නේ, ඔබ ද වෙන අය දැයි" බුදුරජාණන් වහන්සේ විමසූ හ. "සමහර විට මා දිනනවා. සමහර විට අනුන් දිනනවා" "බ්‍රාහ්මණය අනුන් පරදවා ජයග්‍රහණය කිරීම එතරම් වැදගත් දිනුමක් නොවේ. තමා ගේ දුබලතා තේරුම් ගෙන දිනන තැනැත්තා නියම ජයග්‍රාහකයා ය." යි භාග්‍යවතුන් වහන්සේ පැවසූ හ.

විස්තරාත්මක අනුවාදය (104 ගාථාව)

අත්තා ජිතං හවෙ සෙය්‍යො යා ච අයං ඉතරා පජා
අත්තදන්තස්ස නිච්චං සඤ්ඤතචාරිනො පොසස්ස

අත්තා: තමන්; **ජිතා**: දිනාගැනීම; **හවෙ**: ඒකාන්තයෙන්; **සෙය්‍යො**: ශ්‍රේෂ්ඨ ය; **යා ච**: යම් මේ; **ඉතරා පජා**: අවශේෂ ජනයා (දිනා ගැනීම ශ්‍රේෂ්ඨ නොවේ.); **අත්තදන්තස්ස**: තමා දමනය කරගත් සහ; **නිච්චං**: නිතර; **සඤ්ඤතචාරිනො**: සංවර හැසිරීම් ඇති; **පොසස්ස**: පුද්ගලයා ගේ දිනීම

තමන් දිනා ගැනීම ඒකාන්තයෙන් ම ශ්‍රේෂ්ඨ ය. අන් අය පරදවා ජය ගැනීම එතරම් වැදගත් නැත. තමා ජයගත් සංයත හැසිරීම් ඇති.

විවරණය

ගන්ධබ්බ: ගාන්ධර්ව නමින් හඳුන්වන්නේ ගී ගයමින් නටමින් විනෝදකාමී ජීවිතයක් ගත කරන දේව ගණයකි. අටුවාවල එන විස්තර අනුව ගාන්ධර්වයන් වසන්නේ චාතුම්මහා රාජික දේව ලෝකයේ ය.

අත්තදණ්ඩස්ස පොසස්ස: මෙවැනි සන්දර්භයන්හි 'අත්ත' යන වචනය යෙදෙන්නේ බ්‍රාහ්මණික චින්තනයේ මෙන් 'ආත්ම' නමින් පවත්නා නිත්‍ය, අවිපරිණාමී පදාර්ථයක් හඟවන්නට නොව සම්මුති අරුතකින් 'තමා' යන්න හැඟවීමට ය. ස්ථාවර ආත්මයක් නැති බව බුදු දහමේ කේන්ද්‍රිය ඉගැන්වීමකි. භාරතීය ඇතැම් ආගම් වල මෙන් ජගදාත්මයක් හා පුද්ගලාත්මයක් වශයෙන් දීර්ඝ සම්බන්ධයක් ඇති අධිභෞතික සංකල්පයක් පිළි ගැනීමට බුදු සමයෙන් ඉඩක් සැලසී නැත. නිත්‍ය වූ ආත්මයක් ගතික ලක්ෂණයෙන් තොර හෙයින් සංවර්ධනයක් හෝ පරිහානියක් ඇති වීමට හෝ ඇති කිරීමට ඉඩක් නැත. එසේ වුවහොත් ශික්ෂාව නිරර්ථක දෙයක් වෙයි.

බටහිර දර්ශනයෙහි පෙර පිළිගත් කාය - චිත්ත භේදය හෙවත් භෞතිකය හා ආත්මය වශයෙන් පැවති ද්විභේදතාව ද දැන් නො පිළිගැනෙයි. එහෙයින් විද්‍යානුකූලව ආත්මයක පැවැත්ම සනාථ කරන තර්කයක් ඉදිරිපත් කිරීම දුෂ්කර ය.

තම සිත් දිනාගත් අය කිසිවෙකුටත් නොපරදිති.

105. නෙව දෙවො න ගන්ධබ්බො
න මාරො සහ බ්‍රහ්මුනා
ජිතං අපජිතං කයිරා
තථා රූපස්ස ජන්තුනො (8:6)

ගන්ධබ්බයෙක් කිසිම දෙවියෙක්
මාරයෙක් හෝ කිසි බ්‍රහ්මයෙක්
නො පෙරලයි ඒ ජය පරාජය
ලබා ගත් ඒ වගේ උතුමෙක්

කළහොත් දමනය තමන් - නො හෙති වෙනසකට අනුන්

8 (4) අනත්ථපුච්ඡක බමුණා ගේ කථාව (104, 105 ගාථා)

විස්තරාත්මක අනුවාදය (105 ගාථාව)

තථාරූපස්ස ජන්තුනෝ ජිතං දෙවො න එව අපජිතං කයිරා ගන්ධබ්බො න බ්‍රහ්මුණා සහ මාරො න.

තථාරූපස්ස: එබඳු වූ; **ජන්තුනෝ**: පුද්ගලයා ගේ; **ජිතං**: ජයග්‍රහණය; **දෙවො**: දෙවිවරු; **න අපජිතං කයිරා**: පරාජයක් බවට පත් නො කරති; **ගන්ධබ්බො න**: ගාන්ධර්වයෙක් ද නො කරයි; **බ්‍රාහ්මුණා සහ**: බ්‍රාහ්මයන් සහ; **මාරො න**: මරුවා ද නොකරයි.

එවන් (තමා දමනය කළ සංයත) පුද්ගලයා ගේ ජයග්‍රහණය පරාජයක් බවට පත් කරන්නට දෙවියකුට ගාන්ධර්වයකුට, බ්‍රහ්මයාට හෝ මාරයාට නො හැකි ය.

විවරණය

ඇතැම් දේවධර්මවල ඉගැන්වෙන පරිදි මිනිසාට ඇත්තේ මැවුම්කාර දෙවියන් වහන්සේ විසින් දෙන ලද ආත්මයකි. මෙම ආත්මය මරණින් පසු සදාකාලික ස්වර්ගයට හෝ සදාකාලික අපායට නියම කරනු පිණිස නැවත දෙවියන් හමුවට කැඳවනු ලැබේ. වර්තමාන ශරීරයන් ම සුසානයෙන් නැඟිටුවා එම ආත්මය ද සහිතව දේවාධිකරණය හමුවට කැඳවන බව ඔවුහු විශ්වාස කරති. මිනිසා නිර්මාණය කරන අවස්ථාවේ දී ඔහු නිමැවුයේ මැටියෙන් බවත් අනතුරුව එම දේවසම රූපී ශරීරයට දෙවියන් වහන්සේ විසින් ජීවය දුන් බවත් ඔවුහු කියති. "Riddle of univese" නම් ග්‍රන්ථය ලියූ විද්වතා මෙසේ කියයි. "පෞරුෂේය දෙවිකෙනකුන් මනුෂ්‍යයාට අමරණීය ආත්මය හුස්ම තුළින් ප්‍රදානය කළ බව (මේ දුන් ආත්මය දෙවියන් ගේ ආත්මයෙන් ම අංශුවකැයි ද සිතති.) පිළිබඳ මෙම දේවධර්ම වාදීන් ගේ තර්කය සම්පූර්ණයෙන්ම ප්‍රවාද කතාවකි. ලෝකයේ සදාචාරය පිළිබඳ නියාමයක් ක්‍රියාත්මක වන බව පෙනේ යැයි ද ඒ අනුව මානව ආත්මය සනාතනව පවතින්නක් විය යුතු යැයි ද ඔවුන් නඟන විශ්ව විභාග විද්‍යාමය තර්කය පදනම් විරහිත ආදානග්‍රාහී විශ්වාසයක් පමණි. එමෙන් ම මිනිසා ගේ අසම්පූර්ණ, දෝෂ සහිත පෘථිවි බද්ධ ආත්මය පරිපූර්ණ කිරීම පිළිබඳ උත්තම පරමාර්ථය සාර්ථක කර ගැනීම පිණිස මනුෂ්‍යාත්මය සුසාන භූමියෙන් එහාටත් ව්‍යාප්ත විය යුතු යැයි පැවසීම ද (සාධනවාදී තර්කය) ව්‍යාප්ත වූ මානව රූපාන්තරණවාදී ප්‍රකාශයකි. අඩුපාඩු සහිත වූ අසන්තෘප්තිදායක වූ පෘථිවි බද්ධ පැවැත්ම සදාකාල පැවැත්මේ අවශේෂ භාගයට සම්බන් ධ පරිපූරක යුක්තිය විසින් පූරණය කළ යුතු යැයි නඟන සදාචාර තර්කය ද දැහැමි ප්‍රාර්ථනාවකට වැඩි දෙයක් නොවේ. අමරණීයත්වය හා ඊශ්වර නිර්මාණය පිළිබඳ විශ්වාසය සමස්ත මානව සංහතිය විසින් ම අවිවාදයෙන් සර්වත්‍රගතව පිළිගනු ලබන විශ්වාසයකි යි පවසන මානව වංශ විද්‍යාත්මකැයි හඳුන්වනු ලබන තර්කය ද කරුණු විකෘත කිරීමකි. ආත්මය සරල, අරූපී, විනාශ කළ නොහැකි පදාර්ථයක් හෙයින් මරණින් පසු උච්ඡේදයට යතැයි සිතිය නොහැකි බව පදනම් කරගෙන නඟන සත්භාව තර්කය ද පාරමනෝ පදාර්ථ පිළිබඳව වැරදි මතයක් ඉදිරිපත් කිරීමකි. එය ආධ්‍යාත්මවාදී භ්‍රමයකි. මේවා සහ මෙබඳු වෙනත් තර්ක සියල්ල ම ඉකුත් දශක දෙක තුන තුළ විද්‍යාත්මක විචාරය විසින් මුළු මනින්ම බිඳහෙළා අවසානය."

මේ භවයෙන් ඊළඟ භවයට සංක්‍රමණය වන ආත්මයක් හෝ ජීවයක් නැත්නම් පුනර්භවයක් ලබන්නේ කුමක් ද? මේ ප්‍රශ්නය අසන්නේ පුනර්භවය වීමට යමක් තිබිය යුතු යැයි කල් තබා ම තීරණය කර ගැනීමෙනි. සියවස් කිහිපයකට පෙර එක් චින්තකයෙක් "මම සිතමි. ඒ නිසා මම සිටිමි "යි පැවසී ය. මෙසේ කියනවිට සිතන්නට 'මම' කෙනකු සිටින බව මුලින් ම සනාථ කළ යුතුව තිබේ. නැගෙනහිරින් නැඟෙන හිරු බටහිරින් බැස යතැයි අපි කියමු. එහෙත් හිරු නඟින්නේවත් බසින්නේවත් නැති බව අපි හොඳ හැටි දනිමු. එමෙන් ම එක් අයෙකුට දෙවරක් එකම දේකට තට්ටු කළ නො හැක. එම දෙය පෙනුමට එක සේ දිස් වුව ද ඊළඟ මොහොත වන විට වෙනසකට පත්වන හෙයිනි. ලොව සියල්ල වහ වහා වෙනස් වෙයි. කිසිවක් එකම ස්වරූපයෙන් දෙමොහොතක් පවතින්නේ නැත."ඊයේ සිටි මම අද සිටින මට සමාන පුද්ගලයෙකි යි සිතුමට යම් හේතුවක් තිබිය යුතු ය. වඩාත් පැහැදිලි නිදසුනක් ගනිතොත් මා මිනිසකු දිස්වන මොහොතේ ම ඔහු ගේ කට හඬ ද ඇසේ නම් මා දකින, අසන දෙයෙහි යම් අරුතක් තිබේ" යයි පවසන දාර්ශනිකයා සමග බෞද්ධයනට එකඟ විය හැකි ය. බ්‍රහ්ම ආත්ම දමනට කළ පුද්ගයා ගේ ජයග්‍රහණය වෙනස් කිරීමට බ්‍රහ්මයෙක්වත් සමත් නො වන බව මේ ගාථාවෙහි දැක්වෙයි. මෙහි බ්‍රහ්මයා නම් මැවුම් කරුවකු සේ බ්‍රහ්මණ ආගමෙහි පිළිගැනෙන බ්‍රහ්ම නොව බ්‍රහ්මකායික දෙවියෝ වෙති.

බ්‍රහ්මකායික දෙවියෝ නම්, ප්‍රථම ධ්‍යානය ලබන්නවුන් මිය ගොස් උපදින රූප ලෝක අතුරින් ප්‍රථම ලෝක තුනෙහි වාසය කරන දෙවිවරු වෙති. මේ දිව්‍ය ලෝක වල උත්තරීතර පාලකයා මහා බ්‍රහ්මයා ය. ඔහු "මම බ්‍රහ්මයා වෙමි, මහා බ්‍රහ්මයා වෙමි, සියල්ල අභිභවා සිටිමි. කිසිවකුට මා අභිභවනය කළ නො හැක. සර්වඥ වෙමි. පාලකයා වෙමි. නායකයා වෙමි ලොව මැවූ නිර්මාතෘ වෙමි. සියළු අයුරින් ම පරිපූර්ණ වෙමි. ලොව රකිමි. පරිපාලනය කරමි. ලොව උපන් හා උපදින සියල්ලන් ගේ පියා වෙමි" යන ව්‍යාජ දෘෂ්ටිය (ඔහුට මුල අමතක වීම නිසා) ප්‍රකාශ කළ බව දීඝනිකායෙහි එක් සූත්‍රයක අවශ්‍ය ස්වරයෙන් දක්වා ඇත. බ්‍රහ්ම ලෝකය නම් පුළුල් අරුතින් ගන්නා විට සියළු රූප හා අරූප ලෝක වලට නමකි. පටු අරුතින් ගත් විට ප්‍රථම රූප ලෝකත්‍රය මින් ගැනෙයි. බ්‍රහ්මයෝ ද දේව කොට්ඨාශයක් ම වෙති. දේව (බබලන්නෝ, ලතින් බසින් deus) දිව්‍ය ලෝකවල වාසය කරන සැප සම්පතින් පොහොසත් සත්ත්වයෝ දෙවි වරුය. ඔවුහු මනුෂ්‍යයන් ගේ පියවි නෙතට දෘශ්‍යමාන නො වෙති. මිනිසුන් මෙන් ම දෙවියෝ ද ජාති- ජරා- මරණ සංසාරයෙහි ම සංචරණය කරන සත්වයෝ ය. එහෙයින් යථාර්ථ වශයෙන් දුකින් නො මිදුණෝ ය. පින් ඇතිතෙක් දෙව්ලොව සැප විඳින සත්ත්වයෝ නැවත සැප අඩු ලෝකවල උත්පත්තිය ලබති. දෙවිවරු වර්ග කිහිපයකට අයත් වෙති.

(1) **කාමාවචර** හෙවත් කාම ලෝක වල වාසය කරන දෙවි වරු වර්ග පහකට අයත් වෙති. එනම්, **චාතුම්මහාරාජික**, **තාවතිංස**, **යාම**, **තුසිත**, **නිම්මාණරති** හා **පරනිම්මිත වසවත්ති** ය.

(2) **රූපාවචර** හෙවත් රූප ලෝකවල වසන දෙවිවරු දොළොස් වර්ගයකි. ඔවුහු මෙසේ ගණ හතරකින් දැක්වෙති.

1. **බ්‍රහ්ම පාරිසජ්ජ**, **බ්‍රහ්ම පුරෝහිත**, **මහා බ්‍රහ්ම**, ප්‍රථම ධ්‍යානය අල්ප වශයෙන්, මධ්‍ය වශයෙන් හෝ පූර්ණ වශයෙන් වැඩූ තැනැත්තෝ මේ බ්‍රහ්ම ලෝක වල උපදිති.

2. **පරිත්තාභ**, **අප්පමණාභ**, **ආභස්සර** ද්විතීය ධ්‍යානය වර්ධනය කළෝ මේවායේ උත්පත්තිය ලබති.

3. **පරිත්ත සුභ**, **අප්පමාණ සුභ**, **සුභ කිණ්ණ** (**සුභ කිණ්හ**) තෘතීය ධ්‍යානය ලද්දෝ මෙම බ්‍රහ්ම ලෝක වල උපදිති.

4. **වෙහප්ඵල**, **අසඤ්ඤ සත්ත**, සුද්ධාවාස ප්‍රථම දෙකෙහි චතුර්ථ ධ්‍යානය ලද්දෝ උපදිති. තුන්වැන්නෙහි උත්පත්තිය ලබන්නේ අනාගාමී ඵලය ලත් අය පමණි.

(3) **අරූපාවචර** හෙවත් අරූප ලෝකවල උපදින දෙවියෝ නම්, ආකාසානඤ්චායතනූපග දෙවිවරු, විඤ්ඤාණඤ්චාය තනූපග දෙවිවරු, ආකිඤ්චඤ්ඤායතනූපග දෙවිවරු, නේවසඤ්ඤනා සඤ්ඤායතනූපග දෙවිවරු ය. ඒ නම් වලින් හැඳින්වෙන සතර අරූප ධ්‍යාන ලද්දෝ පිළිවෙලින් මේ අරූප ලෝකවල පුනර්ජන්මය ලබති.

අවුරුදු සියයක් මුළුල්ලෙහි පුහුදුනට දෙන දනට වඩා අරිය පුගුලෙකුට මොහොතක් පිදීම උතුම් ය.

106. මාසෙ මාසෙ සහස්සේන
යො යජේථ සතං සමං
එකඤ්ච භාවිතත්තානං
මුහුත්තං අපි පූජයෙ
සායෙව පූජනා සෙය්‍යො
යං චෙ වස්සසතං හුතං (8:7)

මාස්පතා සියක් වසක්
වැය කර කහවණු දහසක්
යාග කළත් දහස් වරක්
නැත ඉන් සිදුවන්නෙ පලක්
සොයා උතුම් රහත් නමක්
කළොත් එකම පූජාවක්
අගේය ඒ එක් මොහොතක්
හෝම පිදූ සිය වසරක්

හොඳම පිදුම

8 (5) සැරියුත් හිමියන් ගේ මාමා (106 ගාථාව)

රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්ත මහ රහතන් වහන්සේ ගේ මාමා වූ **බ්‍රාහ්මණයකු** අරබයා මේ ගාථාව දේශනා කොට වදාළ සේක.

සැරියුත් හිමියෝ දිනක් තම මාමා හමුවන්නට ගොස් මෙසේ විමසූ හ.

"බ්‍රාහ්මණය, ඔබ ඉඳ හිට වත් පුණ්‍ය කර්මයක් කරන්නේ නැත්ද?"

"මම කරනවා ස්වාමීනී "

"මොනවා ද ඔබ කරන පින්කම්?"

"මාස් පතා මම දහස බැගින් වියදම් කර දන් දෙනවා"
"කාටද දෙන්නේ?"

"නග්න පරිබ්‍රාජකයන්ට යි ස්වාමීනී"

"ඉතින් ඒ දීමෙන් ඔබ බලාපොරොත්තු වන්නේ මොන විදියේ ආනිසංසයක් ද?"

"බ්‍රහ්ම ලෝකයේ උපදින්නයි ප්‍රාර්ථනාව"

"ඉතින් බ්‍රහ්ම ලෝකයේ උපදින්න මාර්ගය ඕක ද?"
"එහෙමයි"

"කවුද එහෙම කියන්නේ?"

"ස්වාමීනී, මගේ ගුරුවරු එහෙම කියනවා"

"බ්‍රාහ්මණය, ඔබවත් ඔබේ ගුරුවරුවත් බ්‍රහ්ම ලෝකයේ උපදින විදිය දන්නේ නැහැ. ඒ විදිය දන්නේ බුදු රජාණන් වහන්සේ පමණයි. එන්න මාත් එක්ක. මම බුදු රජාණන් වහන්සේට ආරාධනා කරන්නම් ඔබට බ්‍රහ්ම ලෝකයේ උපදින මාර්ගය දේශනා කරන්න කියලා." මෙසේ පැවසූ සාරිපුත්ත හිමියෝ තම මාමා තථාගතයන් වහන්සේ හමුවට කැඳවා ගෙන ගියහ.

"ස්වාමීනී, මේ බ්‍රාහ්මණයා බ්‍රහ්ම ලෝකයේ උපදින්නට හිතාගෙන මාස්පතා දහසක් වියදම් කර නග්න පරිබ්‍රාජකයනට දන් දෙනවා. " යාග හෝම කරනවා. මොහුට අනුකම්පා කර බඹ ලොව උපදින ක්‍රමය පැහැදිලි කර දෙනු මැනවි " යි ආරාධනය කළ හ.

"බ්‍රාහ්මණය, ඔබ මෙවැනි දන්දීම් අවුරුදු සීයක් කළත් ඊට වඩා ඉඳුරන් දමනය කළ කෙළෙසුන් දුරු කළ උතුමකුට එක මොහොතක් ගරු සත්කාර කළොත් වටිනවා " යි පැවසූ භාග්‍යවතුන් වහන්සේ ඔහුට ධර්ම දේශනා කළ හ.

විස්තරාත්මක අනුවාදය (107 ගාථාව)

යො මාසෙ මාසෙ සහස්සේන සතං සමං යජේථ
භාවිතත්තානං එකං ච මුහුත්තං අපි පූජයෙ චෙ
වස්සසතං යං හුතං සා පූජනා යෙව සෙය්‍යො.

යො: යම්කිසි පුද්ගලයෙක්; **මාසෙ මාසෙ**: මාසයක් මාසයක් පාසා; **සහස්සේන**: දහසක් වියදම් කර; **සතං සමං**: අවුරුදු සියයක්; **යජේථ**: යාග කරනු ඇත; **භාවිතත්තානං**: තමා දමනය කරගත් උතුමකුට (රහතන් වහන්සේ නමකට); **එකං ච මුහුත්තං අපි**: එක් මොහොතක් වුව ද; **පූජයෙ**: පූජා සත්කාර කරන්නේ නම්; **වස්ස සතං**: අවුරුදු සියයක්; **හුතං**: කළ යාගයන්ට වඩා; **සා පූජනා යෙව**: එම පිදුම ම; **සෙය්‍යො**: ශ්‍රේෂ්ඨ ය.

යම් අයකු මාසයකට වරක් දහස බැගින් වියදම් කර වර්ෂ සියයක් යාග කළ හැකි ය. එසේ අවුරුදු සියයක් කරන යාගයට වඩා ඉඳුරන් දමනය කර ගත් උත්තමයකුට එක් මොහොතක් ගරු සත්කාර කරන්නේ නම් එය ශ්‍රේෂ්ඨ ය.

විවරණය

යජේථ: **හුතං**: මේ වචන දෙකින් ප්‍රාග් බෞද්ධ යුගයේ 'වෛදික යුගයේ පටන්) භාරතයේ ක්‍රියාත්මක වූ යාග- හෝම සංස්කෘතිය අදහස් වෙයි. දෙවියන් අරමුණු කර ගෙන යාග ද්‍රව්‍ය සූදානම් කර මන්ත්‍ර හා ස්තෝත්‍ර ගායනා කර ඒවා ගින්නට දැමීම ඒවායේ මූලික ලක්ෂණය වූයේ ය.

අවුරුදු සියයක් මුළුල්ලෙහි පුහුදුනට දෙන දනට වඩා අරිය පුග්ගලෙකුට මොහොතක් පිදීම උතුම් ය.

107. යො ච වස්සසතං ජන්තු
අග්ගිං පරිචරෙ වනෙ
එකඤ්ච භාවිතත්තානං
මුහුත්තමපි පූජයේ
සායෙව පූජනා සෙය්‍යො
යඤ්චෙ වස්සසතං හුතං (8:8)

ගිනි පුද ගාණේ දවසක්
කළමුත් අවුරුදු සියයක්
පුද කළ හොත් එක මොහොතක්
හමුව උතුම් රහත් නමක්
එබඳු එකම පූජාවක්
ගිනි පුදයට වැඩි අගයක්

රහතුන් වැන්දොත් මොහොතක් - අත් වෙයි ඉන් වැඩි කුසලක්

8 (6) සැරියුත් හිමියන් ගේ බෑණා (107 ගාථාව)

වේළුවනාරාමයෙහි වැඩ වාසය කළ භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්ත මහ රහතන් වහන්සේ ගේ **බෑණා නුවන්** අරබයා මේ ගාථා ධර්මය දේශනා කොට වදාළ සේක.

තම බෑණා වූ බ්‍රාහ්මණයකු වෙතට වැඩම කළ සැරියුත් මහ තෙරණුවෝ ඔහු ගෙන් මෙසේ ප්‍රශ්න කළ හ.

"බ්‍රාහ්මණය, ඉඳ හිට හෝ ඔබ යම් කුසල කර්මයක් කරන්නේ නැත්ද?"

"කරනවා ස්වාමීනි"

"මොන විදියේ පින්කමක් ද ඔබ කරන්නේ?"

"මසකට වරක් මම සතකු මරා යාග කරනවා"

"මොන බලාපොරොත්තුවක් ඇතිව ද ඔබ එසේ කරන්නේ?"

"ඒ තමයි බ්‍රහ්ම ලෝකයේ උපදින්නට ඇති මාර්ගය ස්වාමීනී"

"කවුද එහෙම කියන්නේ?"

"මගේ ගුරුවරු"

"ඔබවත් ඔබේ ගුරුවරුන් බ්‍රහ්ම ලෝකයේ උපදින්නට ඇති මග දන්නේ නැහැ. එය බුදු රජාණන් වහන්සේ දන්නවා. එන්න, මාත් එක්ක. එය බුදු රජාණන් වහන්සේ ඔබට පැහැදිලි කරයි."

ඒ අනුව බ්‍රාහ්මණතෙම සැරියුත් හිමියන් සමග බුදුරජාණන් වහන්සේ බැහැදකින්නට ගිය හ.

"ස්වාමීනී, මේ මගේ බෑණාට බ්‍රහ්ම ලෝකයේ ඉපදීමට අදාළ පිළිවෙත පැහැදිලි කර දෙනු මැනවි" යි සැරියුත් හිමියෝ ඇරයුම් කළ හ.

ඔහු අමතා ධර්මදේශනා කළ භාග්‍යවතුන් වහන්සේ වසර සියයක් ගිනි පුද කළ ද එක් මොහොතක් කෙළෙසුන් දුරු කළ උතුමකු පිදීම තරම් නො අගින බව හෙළි කරමින් මේ ගාථාව දේශනා කර වදාළ සේක.

විස්තරාත්මක අනුවාදය (107 ගාථාව)

යො ජන්තු වනෙ වෙ වස්ස සතං අග්ගිං පරිචරෙ
භාවිතත්තානං එකං මුහුත්තං අපි පූජයෙ වස්ස සතං
යං හුතං සා පූජනා එව සෙය්‍යො.

යො ජන්තු: යම් කිසි පුද්ගලයෙක්; **වනෙ**: වනගතව; **වෙ**: ඉදින්; **වස්ස සතං**: වසර සියයක්; **අග්ගිං පරිචරෙ**: ගිනි පුජා කරන්නේ ද; **භාවිතත්තානං**: රහතන් වහන්සේලාට; **එකං මුහුත්තං අපි**: එක මොහොතක් පමණක් වත්; **පූජයෙ**: පුජා කළේ නම්; **වස්සසතං**: අවුරුදු සියයක්; **යං හුතං**: යම් යාග හෝ ගිනි පුජා කළේ ද (ඊට වඩා); **සා පූජනා එව**: එම පුජාව ම; **සෙය්‍යො**: ශ්‍රේෂ්ඨ ය.

යම්කිසි පුද්ගලයෙක් වනගතව අවුරුදු සියයක් ගිනි දෙවියන් පිදූ නමුත්, කෙළෙසුන්ගෙන් මිදුණු මහ රහතන් වහන්සේ නමකට එක් මොහොතක් පූජා කිරීම එම සියවසේ ම කළ පූජා වලට වඩා අගියි.

විවරණය

අග්ගිං පරිචරෙ වනෙ: ගිනි පුද අතුරින් මෙහි වනගතව ගිනි පිදීම ගැන සඳහන් වෙයි. වන ගතව ගිනි පුදන්නේ බ්‍රාහ්මණයන් ගේ ජීවිත අවස්ථා හෙවත් ආශ්‍රම වලින් තුන්වන ආශ්‍රමය වූ වානප්‍රස්ථ තත්වයට පත් වූ අයයි. ගිහි ජීවිතයේ සුව අත හැර මහළු වයසේ දී වන ගතවන බ්‍රාහ්මණයෝ ගිනි පුදමින් ජීවත් වෙති. බ්‍රාහ්මණික විශ්වාසය අනුව ගින්න දෙවි කෙනෙකි. එමෙන් ම අන්‍ය දෙවියන් වෙත පූජාවස්තු රැගෙන යන පුරෝහිතයා වශයෙන් සලකනු ලබන්නේ ද ගින්නයි. ගින්නට ගිතෙල් ආදී පූජා වස්තු පිරිනමන විට ගිනි දැල්ල උඩට නැගෙන ආකාරය බමුණන් දකින්නේ ගිනි දෙවියන් පූජාව දෑතින් ම පිළිගන්නා විලාසයක් සේ ය.

ගිනි පිදීම හුදෙක් සම්පත් විනාශයක් පමණි. බුදු සමය එය නිසරු ක්‍රියාවක් ලෙස හඳුන්වයි. විමුක්තිය සඳහා අවශ්‍යවන්නේ කෙළෙසුන් දවා හැරීම මිස ගිතෙල්, මීපැණි, උක් හකුරු වැනි ප්‍රණීත භෝජන හෝ අහිංසක සතුන් ගේ සිරුරු දැවීම නොවේ. බ්‍රහ්ම ලෝකයෙහි උපදින්නට මෙවන් ක්‍රියා කිසිසේත් ප්‍රයෝජනවත් නොවන බව භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දුන්හ.

ලොව කුඩාදන් හා මහදන් පිදීමට වඩා ආර්ය පුද්ගලයකුට කළ වැඳීමම ඉතා උතුම්ය.

108. යං කිඤ්චි යිට්ඨං ච හුතං ච ලොකෙ
සංවච්ඡරං යජෙථ පුඤ්ඤපෙක්ඛො
සබ්බම්පි තං න චතුභාග' මෙති
අභිවාදනා උජ්ජුගතෙසු සෙය්‍යො (8:9)

සුලු දන් මහ දන් නිතර පුදන්නේ
අවුරුද්දක් වුව නොකඩ කරන්නේ
අරි උතුමකුට වැඳි පමණින්නේ
අත් වූ පිනමය වඩා වටින්නේ

ආර්ය පුද්ගලයකුට වැඳීම පවා උතුම්ය

8 (7) සැරියුත් මහතෙරුන් වහන්සේගේ යහළු බමුණු (ගාථා අංකය 108)

රජගහ නුවර වේළුවන වෙහෙර වැඩ සිටි සැරියුත් මහතෙරහු සිය (උපතිස්ස නම් මහබමුණු) ගමට වැඩි සේක. ඒ දවස එහි බමුණන්ගේ පුද සිරිත් පැවැත්වෙන දිනයකි. බඹලෝ සැප පතා නිවටුන්ට මහදන් දෙමින් උන්හ. ගවයන් ආදී සතුන් මරා කරන පිදීම්ද ගිනිදෙවි පිදීම්ද සිදුකළහ. ගිනි දෙවි පුදන **එක් බමුණෙක්** සැරියුත් මහ තෙරුන්ට හිත මිතුරුව සිටියේය.

ඒ ගිහිගෙය කුමරවියේ සිට ඇති වූ මිතුරු දහමෙකි. ඔහු තෙරුන්ගේ ගුණද උසස් කමද දනී. එහෙයින් සියනිවසට වැඩි තෙරුනට බොහෝ බුහුමන් කොට පිළිගෙන වඩා හිඳුවා පිළිසඳර පැවැත්වීමෙහි යෙදුන බමුණාගේ සතුට කෙමෙන් වැඩී ගියේය.

සැරියුත් තෙරණුවෝ යහළු බමුණා අමතා "බමුණ, පින් කරවුදැ"යි ඇසීය.

යහළු බමුණ. "එසේය, පින් කරමි ස්වාමීනි"යි පිළිතුරු දුන්නේය.

සැරියුත් තෙරුන් වහන්සේ "ඒ කුමන පිනක්දැ"යි යළිත් ඇසූහ.

යහළු බමුණා "බඹලෝ සැප පතා බොහෝ වියදම් කොට යාග (පුද) පවත්වමි"යි කීය.

සැරියුත් තෙරණුවෝ "බඹලෝ සැප ලබනු තබා බඹලෝ යන මං වත් නොදන්නෙ"හි යයි පවසා දහම් දෙසූ සේක.

සැරියුත් මහතෙරුන්ගේ දෙසුමට පැහැදුණු ඒ බමුණා කැඳවාගෙන වෙහෙරට වඩමවා බුදුරදුන් හමුවේ බමුණාගේ අදහස පැවසීය.

ඒ නිමිතිකොට "ලොව පින් කැමැති යමෙක් කුඩා දනක් හෝ මහ දනක් හෝ අවුරුදු සියයක් මුළුල්ලෙහි පිදූයේ නමුදු ඒ සියල්ල සෝවාන් ආදී මග-පලවලට පැමිණි අරිය පුද්ගලයෙකුට කළ වැඳීමෙන් උපදනා කුසල් සිතින් සතරෙන් පංගුවක් පමණ වත් නොවටනා බවද, අරිය පුගුලෙකුට කළ වැඳීම ම ඉතා උතුම් බව"ද වදාරා ඒ බමුණා සෝවාන් පලයෙහි පිහිට වූ සේක.

විස්තරාත්මක අනුවාදය (108 ගාථාව)

ලොක පුඤ්ඤපෙකඛො යං කිඤ්චි යිට්ඨං වා හුතං වා සංවච්ඡරං යජේථ, තං සබ්බං අපි චතුභාගමෙති (චතුභාගං + එති) චතුභාගං න එති, උජ්ජුගතෙසු අභිවාදනා සෙය්‍යො

ලොකෙ: මේ සත්ත්ව ලෝකයෙහි; **පුඤ්ඤපෙක්ඛො**: පින් කරනු කැමති තැනැත්තේ; **යංකිඤ්චි යිට්ඨං වා හුතං වා**: මංගලාදී අවස්ථාවන්හි දෙන යම් දාන වස්තුවක් හෝ කම්පල අදහා දෙන මහ දනක් හෝ; **සංවච්ඡරං යජේථ**: අවුරුද්දක් මුළුල්ලෙහි (මුළු සක්වළ මහා ජනයා හට නිරන්තරයෙන්) දුන්නේ වී නමුදු; **තං සබ්බං අපි**: ඒ සියලු දානයම; **න චතුභාගමේති**: (**චතුභාගං න එති**) සෝවාන් ආදී ආර්‍ය පුද්ගලයකු උදෙසා දුන් දීමනාවෙහි සතරෙන් කොටසකුදු නො අගනේය; **උජ්ජුගතේසු**: කායවඞ්කාදිය රහිත හෙයින් ඍජු බවට පැමිණි සෝවාන් ආදි ආර්‍ය පුද්ගලයන් උදෙසා කරන ලද; **අභිවාදනා සෙය්‍යො**: වන්දනාවම උතුම් වේ.

ලොව පින් කැමැතියෙක් සියක් වසක් දෙන දන ආර්ය පුද්ගලයෙකුට වැඳීමෙන් ලැබෙන පිනෙන් සතරෙන් එකක් පමණවත් නොඅගී.

විවරණය

පුඤ්ඤපෙක්ඛො: පින් රැස් කිරීමෙහි ආසා ඇත්තාය. පරලොව සැප කැමැති ව මෙලොවෙහි කුසල් රැස්කරනු කැමැති පුද්ගලයාය.

යිට්ඨං: කුඩා දන්ය. මඟුල් අවමඟුල් ඈ කිසි දැයක් නිමිතිකොට දියුණුව සඳහා සුලු වශයෙන් පැවැත් වෙන දන්ය.

හුතං: මහදන්ය. වෙසෙසින් කම්පල අදහා බොහෝ වියදම් කොට උසස් ලෙස පැවැත්වෙන විසාල දන් දීම්ය.

සංවජ්ජරං යජේථ: අවුරුද්දක් මුළුදා (නොකඩවා) පිදීමය. මුළු සක්වලම පුරවා අවුරුද්ද මුළුදා පුහුදුන් පුද්ගලයන්ට කරන පිදීමය.

චතුභාගං න ඒති: සතරෙන් කොටසක් පමණට වත් නොපැමිණි මය. කෙලෙසුන්ගෙන් මිදුණු අරිය පුද්ගලයෙකුට වැඳීමෙන් ලැබෙන කුසලය සතරට බෙදා ඉන් කොටසක් පමණ වත් නො අගනා බව දැක්වීමය.

උජ්ජුගතේසු: උජු (ඇදනැති) බවට පැමිණිය වුන් කෙරෙහිය. නිකෙලෙස් වූ එතුමන්ගේ කය හෝ පැවසෙන බස හෝ සිතෙන දැය හෝ ඇද නැත්තේය.





සිල්වතුන්ට හා වැඩිහිටියනට පුදන තැනැත්තාගේ ආයුෂ පැහැය සැප හා බලය යන සිවු ගුණ වැඩේ.

109. අභිවාදන සීලිස්ස
නිච්චං වද්ධාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති
ආයු වණ්ණො සුඛං බලං (8:10)

සිල්වතුන් හා වැඩිහිටි යන්නේ
ගුණය උතුම් වැඳුමෙන් පින් වන්නේ
ආයු පැහැය බලද ලැබෙ න්නේ
ඒකයි වැඩිහිටියන්ට වඳින්නේ

ආයු පැහැ සැප බල වැඩෙන පින්කම්

8 (8) ආයුවඩ්ඪන කුමරු (ගාථා අංකය 109)

දඹදිව දීඝලම්බික නුවර වැසි **බමුණෙක්** තපස් රැකීමට වනවැද අටසාළිස් වසක් තපස් වත රැඳීසිට පසුව කුලය නැසුනොත් පරපුරට වන හානිය සලකා තපස හැර ගොස් බිරිඳක් සරණ කර ගත්තේය.

දරුවෙක් ලැබුණු පසු ඒ බමුණු-බැමිණි දෙදෙනා කුඩා පුතුද සමග දීඝලම්බික නුවර ඇසුරු කොට වන කුටියෙක්හි වැඩ වෙසෙන බුදුරදුන් වෙත එළඹ වැඳ සිටියහ. බුදුරදහු "(දීඝායුක හොථ) බොහෝ ආයු විඳුවවු"යි වදාළ සේක. ඔවුන් එයට කරුණු විමසූ කළ "මේ ළදරුවාට උවදුරක් ඇත. ආයු සත් දවසෙකැ"යි වදාළ පසු දෙමාපියෝ තැතිගෙන කඳුලෙන් පිරුණු නෙත් ඇත්තෝ වූහ.

ඔවුහු "බුදුරදුන් වහන්ස ඒ උවදුර වැළකුමට උවදෙසක් වේ නම් වදාළ මැනැවැ" යි අයදියහ. "එසේ නම් සිය ගෙදොර මණ්ඩපයක් තනා එහි අසුන් පනවා සඟුන් වහන්දෑ අට නමක් හෝ සොළොස් නමක් වඩා හිඳුවා සතියක් මුළුල්ලෙහි නොකඩවා පිරිත් දෙසුම් පවත්වා ඒ උවදුරු දුරු කැර ගන්න"යි වදාළ සේක. බමුණා විගස ගෙදොර පිරිසිදු කරවා මණ්ඩප තනා සියලු කටයුතු නිමවා සඟුන් වැඩමවා පුතු ද පසෙක බිම හොවා සතියක් මුළු දා නොකඩවා පිරිත් දෙසුම් කැරැවීය. සත්වන දවස බුදුරජාණන් වහන්සේද වැඩම කළසේක. එහෙයින් දෙවියන්ගේ පැමිණීමද ඇතිවිය. බෙහෙවින් සෙත සැලසුණේය. ඒ කුමරු උතුරු දිගට අධිපති වෙසවුණු රජුගේ නියමය පරිදි අවරුද්ධ නම් යකුට බිලිව සිටියේය.

පිරිත් දෙසුමේ අනුහසින් සෙත සැලසී ඔහුට ආයු වැඩුණේය. තුනුරුවන් ගේ පිහිට ලැබිණි. දෙවියන් ගේ රැකවල් ඇතිවිය. එහෙයින් වෙසවුණු රජුගේ නියමය වැරැදුණේය. අවරුද්ධ යකුගේ බිලි වැළකුණේය. අනතුරුව ඒ ළදරුවන් ලවා බුදුරදුන් වැන්ද වූහ. බුදුරදුහු 'දීඝායුකො හොථ' (බොහෝ ආයු විඳුව) යි වදාළ සේක. එක්සිය විසි අවුරුද්දක් ආයු වැඩුණේය. ඒ කුමරු ආයුවඩ්ඪන නමින් පසිඳුවිය. ඒ නිමිති කොට 'නිතර සිල්වතුන්ට වඳින වැඩිහිටියනට පුදන තැනැත්තාගේ ආයු හා සිරුරු පැහැය ද සැපය ද කාය බල හා නැණ බලද වැඩෙන බැව්' වදාළ සේක.

විස්තරාත්මක අනුවාදය (109 ගාථාව)

අභිවාදන සීලිස්ස නිච්චං වද්ධාපචායිනො ආයු වණ්ණො
සුඛං බලං චත්තරෝ ධම්මා වඩ්ඪන්ති.

අභිවාදනසීලිස්ස: (සිල්වතුන්හට) වඳින්නා වූ; **නිච්චං වද්ධාපචායිනෝ**: නිතර ගුණයෙන් වැඩි සිටියවුන් පුදන්නහු ගේ; **ආයු**: ජීවිතේන්ද්‍රියයාගේ පැවැත්ම; **වණ්ණෝ**: ඡවිගත වර්ණය; **සුඛං**: සිත කය දෙක්හි සුවය; **බලං**: කාය ශක්තිය හා ඥාන ශක්තිය (යන); **චත්තරෝ ධම්මා වඩ්ඪන්ති**: (මේ) සතර ගුණයෝ වැඩෙන්නාහුය.

නිතොර සිල්වතුන් වඳිනා සුලුවූ ද ගුණයෙන් වැඩිහිටියන් පුදන සුලු වූද පුද්ගලයාගේ ආයුෂය, වර්ණය, සැපය, බලය යන කරුණු සතරක් වැඩේ.

විවරණය

ආයු: ආයුගුණය අතුරු අනතුරුවලින් වැළකී ආයුවඩ්ඪන කුමරුට මෙන් අවුරුදු සිය ගණන් ආයු විඳීමට ලැබීමය.

වණ්ණෝ: පැහැ ගුණය මනා සුව පහස් එළවමින් සොම්නසින් යුතුව නිදුකින් කය-සිත දෙක වැඩීමය.

බලං: බල ගුණය. කය පෙළීම් සිත පෙළීම් රහත්ව කය බල ඤාණ බල දෙකින් මොනවට වැඩීමය. පැවිදි වූ තැන් පටන් ළදරු හෙරණුවෝ වුවද ගිහියනට සිල්වත්හුය. ගුණවත්හුය. මවුපියන් විසින් පවා වැඳීමට පිදීමට සුදුස්සෝය. පැවිද්දනට (වයස් පිළිවෙළින්) පැවිදි වූ තැන් සිට හෝ උපසපුව වැඳීම් වැඩිහිටියනට පිදීම් කරන්නාහු අතුරු අනතුරුවලින් වැළකී බොහෝ ආයු විඳ ඉතිරි ගුණ නැණ ද දියුණුව යසසින් සැපතින් වැඩෙති.

දුශ්ශිලයෙක් ව සියක් වසක් ජිවත් වීමට වඩා සිල්වත් ව එක දවසක් ජීවත්වීම උතුම්ය.

110. යො වෙ වස්සසතං ජීවෙ
දුස්සීලො අසමාහිතො
එකා'හං ජීවිතං සෙය්‍යො
සීලවන්තස්ස ඣායිනො (8:11)

දුසිල්ව අසමාහිත සිත් වන්නේ
සියක් වසර ගෙව්වත් නොව ටින්නේ
නැණවත් වී හිඳ දැහැන් වඩන්නේ
දවසක් මුත් එය තමයි වටින්නේ

දුසිල්වත්ව සිටීමට වඩා සිල්වත්ව ජීවත්වීම උතුම්ය.

8 (9) සංකිච්ච රහත් හෙරණපාණන් වහන්සේ (ගාථා අංකය 110)

සැවැත් නුවර උසස් කුල තිහකින් **කුමරහු තිස් දෙනෙක්** පැවිදිවූහ. පිළිවෙත් පිරීමෙහි නියැලුණු ඒ තිස් නමට විදසුන් වැඩීමට සිත් පහළ විය.

ඔවුන් බුදුරදුන් වෙතින් කමටහන් (භාවනාවට අරමුණු පිළිවෙත්) උගෙන වනයට යාමට පිළිවෙළ වූහ. බුදුරදහු ඒ තිස් නම වැඩමවන පෙදෙස උවදුරක තතු දැන ඒ වළකනු සඳහා සංකිච්ච රහත් හෙරණුන් සමඟ යාමට සැලසූහ. ඒ එක් තිස් නම සාරසිය අසූගව්වක් මග ගෙවා පසල් (පිටිසර) ගමකට වැඩියහ. ඒ ගම්වැස්සෝ ඔවුනට උවටැන් කොට විසීමට සෙනසුන් සලසා පිදූහ. විදසුන් වඩා වෙසෙන උන්වහන්සේලාට රසවත් අහර සුලභව ලැබිණි.

එක් සිඟන මිනිසෙක් එහි පැමිණ කුස පුරා අහාර ගනිමින් 'අනේ' රෑ දාවල් වැඩ කරන අයට මෙබඳු රසවත් අහරෙක් නැත. මේ හාමුදුරුවරුන් සැමදාම මෙසේ වළඳති"යි සිතුයේය. ඔහු එහි කලක් නැවතී වැඩුණු සිරුරැතිව මහ වනයට වැද යන කල පන්සියයක් පමණ සොරන්ට අසුවිය. සොරු ඔහු මරා වන දෙවියනට බිලි පිදුමට සැරසුණාහ. එකල ඒ මිනිසා "පින්වත්නි, මා සිඟන්නෙකි, මා බිලි පූජාවට නුසුදුසුය. වන දෙවියන් සතුටු කළ නොහැකිය. අසුවල් තැන සඟහු වෙසෙති. ඔවුන් බිලි පූජාවට ඉතා උතුම්ය"යි කීයේය. සොරදෙටුහු එබඳු කෙනෙක් වෙත් නම් බිලි පිදුමට අගනේය"යි සිතා සිඟන්නාගෙන් මං අසා ගොස් එක නමක් ගෙනයාමට තැත් කළහ.

සංකිච්ච හෙරණුවෝ ඒ බිලි පූජාවට දිවි දීමට වැඩියහ. සොර දෙටු බිලියට හෙරණුන්ගේ දිවි නැසීමට සූදානම් විය. එවේලෙහි උන්වහන්සේ සමවතට සමවැදුණාය. සොර දෙටු කඩුව හයා (ඇද) ගෙලට ගැසීය. කඩුව මිට දක්වා හැකුළුණේය. සොරු පන් සියයම පුදුමයට පැමිණ "අහෝ සිත් පිත් නැති මේ කඩුව පවා මුන් වහන්සේගේ ගුණ දනිති"යි පැහැද ඒ හෙරණුන් වෙතම පැවිදි වූහ. පසුව බුදුරදුන් වෙත පැමිණි කල්හි ඒ නිමිති කොට "දුසිල් වූ එකඟ වූ සිත් නැති යමෙක් සියක් වසක් ජිවත් වීමට වඩා දැහැනයෙහි ඇලුණු සිල්වත් තැනැත්තා ගේ එක දවසකුදු ජීවත් වීම උතුම්"යයි වදාරා ඒ සියලු දෙන රහත් පලයෙහි පිහිටවූ සේක.

විස්තරාත්මක අනුවාදය (110 ගාථාව)

දුස්සීලො අසමාහිතො යො වෙ වස්සසතං ජීවෙ,
(තතො) සීලවන්තස්ස ඣායිනො එකාහං ජීවිතං සෙය්‍යො.

දුස්සීලො: සීල සමාදානයක් නැති හෙයින් දුස්සීලවූ; **අසමාහිතො**: චිත්ත සමාධියෙන් සමාහිත නොවූ; **යො**: යම් පුද්ගලයෙක්; **වේ වස්සසතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජීවත්වන්නේ නමුදු; (ඒ ජීවිත්වීමට වඩා) **සීලවන්තස්ස**: සිවු පිරිසිදු සීලයෙන් සිල්වත් වූ; **ඣායිනො**: සමථවිදර්ශනා භාවනාවන්හි නියුක්ත භික්ෂුවගේ; **එකාහං ජීවිතං සෙය්‍යො**: එක දවසකුදු ජීවත් වීම උතුම් වේ.

විසිරුණු සිත් ඇති දුසිල්වතෙකු අවුරුදු සියයක් ජීවත්වනවාට වඩා දැහැන් වඩන සිල්වතෙකුගේ එක් දිනක් ජීවත්වීම ශ්‍රේෂ්ඨවෙයි.

විවරණය

දුස්සීලො: දුසිල්වත් තැනැත්තාය. ගිහියන් විසින් රැක්ක යුතු පන්සිල් - අටසිල් නොවඩන ගිහියෝ ගිහි දුසිල්හුය. පැවිද්දන් වූ හෙරණ උපසපන් දෙපස අතර යම් කෙනෙක් පැවිදි වත නොවඩා 'අරහත් දදයට' (සිවුරට) මුවාවී දුසිල් දේ කෙරෙත් නම් ඔවුහු පැවිදි දුසිල්හුය.

අසමාහිතො: නොඑකඟ (සමාධියෙන් නොවැඩුණු) සිත් ඇත්තාය. භාවනා වශයෙන් නොවැඩුණු සිත ඉතා නොසන්සුන්ය. දමනය නොකළ කුළු හරකෙකු සේ අකීකරුය. තැන්පත් වීමෙක් නැත.

සීලවන්තස්ස: සිල්වත්හටය. පන්සිල් අටසිල් ආදී සිල් පිරිසිදුව රකින ගිහියෝ ගිහිවතින් සිල්වත්හුය. හෙරණ සිල් සිවු පිරිසිදු සිල් පිරිසිදුව රකින පැවිද්දෝ පැවිදිවතින් සිල්වත්හුය.

ඣායිනො: භාවනා කරන තැනැත්තාගේය.

නුවණ නැත්තාගේ සියක් වසක් ජීවත්වීමට වඩා නුවණ ඇත්තාගේ දවසකුදු ජීවත්වීම උතුම්ය.

111. යො වෙ වස්සසතං ජීවෙ
දුප්පඤ්ඤො අසමාහිතො
එකා'හං ජීවිතං සෙය්‍යො
පඤ්ඤාවන්තස්ස ඣායිනො (8:12)

නුනුවණ අසමාහිත සිත් වන්නේ
වසර සියක් ගෙවුවත් නොව ටින්නේ
ඇරඹූ වෙරැ'තිව දහම් වඩන්නේ
නම්, එක දවසක් වුනත් වටින්නේ

නුවණ ඇතිව එක දවසක් ජීවත්වීම වුවද උතුම්ය.

8 (10) ඛාණුකොණ්ඩඤ්ඤ තෙරුන්වහන්සේ (ගාථා අංකය 111)

සැවැත් නුවර දෙවුරම් වෙහෙර වෙසෙන බොහෝ වහන්දෑ විදසුන් වැඩීමෙහි නියැලීම සඳහා නිතොර වන පෙදෙස් කරා වැඩමවති. පිලිවෙත් පිරීමෙහි රැඳී වෙසෙන කොණ්ඩඤ්ඤ තෙරහුද "මාගේ සබ්රම් සරුන්ද තමන් හා සමාන සිල් පිරුම් ඇති අය වහන්දෑ රහත්ව මහණ දම් සරුකර ගෙන බුදුරදුන් වෙත පැමිණ තමන් ලත් උසස් පල පවසා උදන් අනති. (සතුට පල කෙරෙති.) මාත් එබඳු පල ලබන්ට නුසුදුසු ද"යි සිතා වනයට වැඩ විදසුනෙහි යෙදී වෑයම් කළහ. රෑ දාවල් දෙක්හි කළ වෑයමේ පල ලැබ බුදුරදුන් දැක්මට දෙවුරම් වෙහෙරට පැමිණීම සඳහා පිටත් වූහ.

අතර මඟ රෑ නවාතැනට සුදුසු මනා වැලිතලාවක් හා ගල්තලාවක් ද පැන් පොකුණක් ද දැක ගල්තලාවට පැමිණ පැන් පෙරා වළදා විඩා සන්සිඳුවා ධ්‍යානයට සමවැද වැඩ හුන්සේක. එදා රෑ සොරු පන්සිය දෙනෙක් ගමක් පැහැර බඩු පොදි බැඳගෙන ඒ ගල්තලාවට පැමිණියහ. ඒ ඔවුන්ගේ පුරුදු තැනකි. එහි පසෙක සමවතට සමවැද හුන් තෙරුන් දැක ඒ කණුව කැයි සිතා මුලින් ආ සොරු ගෙනා පොදිය උන් වහන්සේගේ හිසමත තැබූයේය. අන් අයද තම තමන් ගෙනා පොදිත් එසේම (තෙරුන් වසා) මුල් පොදිය වටා තබා ඒ ඒ තැන වැතිර නිදාගත්හ. එළිවන්නට පෙර අවදිවී පොදිගන්නා සොරහු තෙරුන් දැක බියට පැන දුවන්නට වූහ.

තෙරහු 'පින්වත්නි, බිය නොවන්න. අපි බුදුරදුනගේ සවු වෙමු"යි පැවසූකල සොරහු පෙරළා පැමිණ වැඳ හෙව කණුවකැ"යි සිතා නොදැනීමෙන් සිදුවූ වරදට සමා අයැද සිටියහ. එතැන් සිට උන් වහන්සේ ඛාණුකොණ්ඩඤ්ඤ නම් වූහ. සොරහු බොහෝ සෙයින් පැහැද බණ අසා ඒ තෙරුන් වෙතම පැවිදි වූවාහුය. පසුව ඒ අතවැස්සන්ද සමඟ දෙවුරම් වෙහෙරට පැමිණ බුදුරදුන් වැඳ එකත් පස්ව සිටියහ. බුදුරදුහු පිළිසඳර පවත්වා අනතුරුව, "නුවණ නැති එකඟ වූ සිත් නැති යමෙක් සියක් වසක් ජීවත් වීමට වඩා නුවණැති දැහැන් වැඩීමෙහි ඇලුණු තැනැත්තාගේ එක දවසක්වුවත් ජීවත් වීම උතුම්ය"යි වදාරා ඒ පන්සියයම රහත් පලයෙහි පිහිට වූ සේක.

විස්තරාත්මක අනුවාදය (111 ගාථාව)

දුප්පඤ්ඤො අසමාහිතො යො චෙ වස්සසතං ජීවෙ,
(තතො) පඤ්ඤවන්තස්ස ඣායිනො එකාහං ජීවිතං සෙය්‍යො

දුප්පඤ්ඤො: ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවන්ගෙන් යුක්ත නොවූ හෙවත් ප්‍රඥා නැත්තා වූ; **අසමාහිතො**: චිත්ත සමාධියෙන් සමාහිත නොවූ; **යො**: යම් පුද්ගලයෙක්; **චෙ වස්සතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජීවත්වන්නේ නමුදු (ඒ ජීවත්වීමට වඩා); **පඤ්ඤවන්තස්ස**: සමථ විදර්ශනා හා මාර්ගඵල යන ලෞකික ලොකෝත්තර ප්‍රඥාවන්ගෙන් යුක්ත වූ; **ඣායිනො**: සමථ විදර්ශනා භාවනාවන්හි නියුක්ත භික්ෂුවගේ; **එකාහං ජීවිතං**: එක් දවසකුදු ජීවත් වීම වුවද; **සෙය්‍යො**: උතුම් වේ.

නුවණ නැති අයෙක් අවුරුදු සියයක් ජීවත්වෙනවාට වඩා භාවනාවෙන් සිත් එකඟකිරීමේ යෙදුනු නුවණ ඇති අයෙකුගේ එක් දිනක් ජීවත්වීම වුවද ශ්‍රේෂ්ඨය.

විවරණය

දුප්පඤ්ඤො: නුවණ නැත්තාය. දත යුතු දහම් නොදැනුමෙන් හා පිරිය යුතු වත් පිළිවෙත් නොවැඩුමෙන් පසුබට වූ අනුවණ පුඟුල්ය.

පඤ්ඤවන්තස්ස: නැණවත් තැනැත්තා ගේය. දහම් හැදෑරී මෙන් හා පිළිපැදීමෙන් මොනවට වැඩුණු නැණින් යුත් තැනැත්තා ගේය.

'**පඤ්ඤවන්ත**' යනුවෙන් දැක්වෙන්නේ සිවුසස් දහම් පිළිබඳ හෝ අරිඅටහිමඟ දහම් පිළිබඳ හෝ වෙසෙස් දැනුම් ඇත්තාය.

පැණ නම් - සමත් - විදසුන් ප්‍රඥා වශයෙන් දැක්වෙන ලෞකික නුවණ හා මගඵල ප්‍රඥා වශයෙන් දැකවෙන ලොවුතුරා නුවණය.

ඣායිනො: ධ්‍යාන (සමාධි) යෙහි ඇලුණු තැනැත්තාගේය.

හීන වීයඞ් ඇත්තා සියක් වසක් ජීවත් වීමට වඩා දැඩි වීර්යය ඇතියෙකුගේ ජීවත්වීම උතුම්ය.

112. යො වෙ වස්සසතං ජීවෙ
කුසීතො හීනවීරියො
එකා'හං ජීවිතං සෙය්‍යො
විරිය'මාරභතො දළ්හං (8:13)

අලසව වෙර නැතිවම නම් ඉන්නේ
වසර සියක් වුව එය නොව ටින්නේ
ඇරඹු වෙරැතිව දහම් වඩන්නේ
දවසක් මුත් එය උතුමැයි දන්නේ

වීර්යවන්තව ගෙවන ජීවිතය ඉතා උතුම්ය.

8 (11) සප්පදාස තෙරුන් වහන්සේ (ගාථා අංකය 112)

සැවැත් නුවර සැදැහැවත් පවුලක **කුල දරුවෙක්** පැවිදිව වත් පිළිවෙත්හි නියැලී මහණදම් පුරා පසුව උකටලී වී (කලකිරී) ගිහිවීමට සිතුයේය. පැවිදිව සිට ගිහිවීම ශක්‍රව සිට හෝ බ්‍රහ්මව සිට ඉන් වෙන්වීමක් වැනිය. එහෙයින් මහණකමේම සිට මියයාම යහපතැ"යි සිතා එයට උපා සොයමින් සිටියේය. එක් දවසෙක කලකිරීමට පත් මහණාහු ගිනිහල් ගෙය සිටි නාගයෙකු කලයකට ගෙන දුරලෑමට යන බැව් දැක තමන් දුරැලන බව කියා තමා කලය ගෙන කිසිවෙකු නැති තැනකට ගොස් නයා ලවා කවාගෙන මැරෙන්නට වෑයම් කෙළේය. ඈත මෑත ඇවිදුවා අත්පා කටටදීත් නොකෑයේය. ඒ තෙර තෙමේ එතැන් සිට සප්පදාස නම් විය.

දිනක් කරණැවෑමියෙක් (දැළි රැවුළු කපන්නෙක්) වෙහෙරට අවුත් කර සඟලෙන් (දැළිපිහියා දෙකෙන්) එකක් බිම තබා අනිකෙන් හිසකේ කැපුයේය. උකටලී තෙර බිම තිබූ කරය අරගෙන "මින් බොටුව (බෙල්ල) කපා ගෙන මියෙමි"යි එක් රුකක හිස තබා ගෙන කරය බොටුවේ තබා, තමන් මේ දක්වා සුරැකි සිල් පිරික්සා බැලුයේය. මනාව රැකි සිල්හි පිරිසිදු බැව් දැක හටගත් සොම්නසින් මුළු සිරුරම පිනාගියේ එය. මැඩ පවත්වමින් විදසුනට සිත නන්වා ඔහු රහත් පලයට පැමිණියේය.ඒ තෙරුන් බොටුව කපාගන්ට ගොස් රහත් වූ බැවු සැලවිය. එහෙයින් වහන්දෑ බුදුරජාණන් වෙතින් ඒ තෙරුන් උකටලීවීමටත් නයා නොකෑමටත් කරුණු විමසූහ. බුදුරජාණන්වහන්සේ 'කසුප් බුදුරදුන්ගේ සස්නෙහි ඒ තෙරුන් මහණව සිට කලකිරුණු පැවිදි නමකගේ සිවුරු පිරිකර ගැනීමට ආසාකොට ඒ නමගේ කලකිරීමට අනුබල දීම නිසා මේ අත් බැව්හි තමන් ගේ උකටලී වීමට එය හේතු වූ බවද ඒ නයා මෙයට තුන්වන අත් බැව්හි ඒ තෙරුන්ගේ මෙහෙකරු ළමයෙක්ව සිටි බැවින් හිමියාට ඇති වූ බියෙන් නොකෑ බව ද වදාළසේක. අනතුරුව වහන්දෑ බොටුවේ කරය තබා කපාගන්නට තැත් කරනතුරු රහත්වීම ගැන විමසූහ. බුදුරදුහු වඩන ලද වෙර ඇතියනට ඔසවාලූ පය බිම තබන්ට පෙර රහත් බැව් වේයයි පවසා 'මැලි වූ වෙර නැති යමෙකු සියක් වසක් ජීවත්වීමට වඩා දැඩිසේ වෙර වඩන තැනැත්තා එක දවසකුදු ජීවත් වීම උතුමැයි වදාළ සේක.

විස්තරාත්මක අනුවාදය (112 ගාථාව)

කුසීතො හීනවීරියො යො වෙ වස්සසතං ජීවෙ, (තතො) දළ්හං (විරියමාරභතො - විරියං + ආරභතො) විරියං ආරභතො එකා හං ජිවිතං සෙය්‍යො.

කුසීතො: වත්පිළිවෙත් ආදියෙහි මැළි වූ හෙවත් කුසීත වු; **හීනවීරියො**: කායික චෛතසික වීර්‍ය්‍ය තැනැත්තා වූ; **යො**: යම් පුද්ගලයෙක්; **වෙ වස්සතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජීවත්වූයේ නමුදු (ඒ ජීවත්වීමට වඩා); **දළ්හං**: දැඩි කොට; **විරියමාරභතො**:(විරියං + ආරභතෝ) කායික චෛතසික වීර්‍ය්‍ය වඩන භික්ෂුවගේ; **එකාහං ජිවිතං**: එක් දවසකුදු ජීවත් වීම; **සෙය්‍යො**: උතුම් වේ.

කුසීත වූ හීන වීර්‍ය්‍ය ඇති අයෙක් සියවසක් ජීවත්ව විසීමට වඩා දැඩිසේ වෙර වඩනහුගේ එක් දිනක් ජීවත්වීම වුවද ශ්‍රෙෂ්ඨ වේ.

විවරණය

කුසීතො: අලසය. වත් පිළිවෙත්හි හැදෑරීම් පිරවීම්හි (පාඩම් කිරීමෙහි හා පාඩම් කීමෙහි) මැලි තැනැත්තාය. උදය-දාවල-සවස-පින්න-අව්ව-වැස්ස වශයෙන් සලකා කටයුත්ත පමා කොට කල්දමා පවු සිතිවිලිවලට යටහත්ව විසීම කුසීතයා ගේ ගතිය වේ.

කුසීතයා: නිතොර 'කාම විතක්ක - ව්‍යාපාද විතක්ක - විහිංසා විතක්ක නම් මන වඩන රූ - සද ඈ පස්කම් ගුණ විෂයෙහි ඇස් කන් - නාස් ඈ ඉදුරන පිණාවීම සඳහා සිත යොමු කිරීමයි.

ව්‍යාපාද විතක්ක නම්: අන්සතුහු නැසෙත්වා, වැනසෙත්වා යන අනුන් පිළිබඳ නපුරු සිතිවිලි ගැන සිත යොමු කිරීමයි.

විහිංසා විතක්ක නම්: අනුන්ට හිංසා පීඩා ඇතිවෙන යම් යම් දේ කිරීමට හා කරවීමට සිත යොමු කිරීමයි.

දළ්හං වීරියං: දැඩි වීර්යය. එළඹ සිටි කටයුත්ත මුදුන් පැමිණ වීම සඳහා ඇරඹූ සිත්සතන්හි බල පවත්නා වැර වෑයමය. අකුසල් මැඩීම හා කුසල් වැඩීම සඳහා ද කෙලෙස් කැවීම් - දැවීම් සඳහා ද ඇරඹූ විරියය.



හටගැනීම හා නැසීම දක්නා තැනැත්තාගේ එක දවසකුදු ජීවත්වීම උතුම්ය.

113. යො ච වස්සසතං ජීවෙ
අපස්සං උදයව්‍යයං
එකාහං ජීවිතං සෙය්‍යො
පස්සතො උදයව්‍යයං (8:14)

ඇතිවනු නැතිවනු නොදැක සිටින්නේ
වසර සියයක් විසුවත් නො වටින්නේ
ඇතිවනු නැතිවනු පිරිසිඳ දන්නේ
දවසක් විසුවත් එය සෙට වන්නේ

උදය ව්‍යය දුටුවහුගේ ජීවිතය උතුම්ය

18 (12) පටාචාරා මෙහෙණිය (ගාථා අංකය 113)

සැවැත් නුවර සතළිස් කෙළක් පමණ ධනයෙන් හා ඉසුරෙන් වැඩුණු සිටු කුලයක් විය. **සිටු දියණි** තුරුණු විය පත්ව කම් සැපයෙහි ගිජුව මෙහෙකරු තරුණයෙකු සමග පෙම් බැඳ ඈත පෙදෙසකට ගොස් මෙහෙ කොට දුක්සේ රැකේ.

ඒ අතර සිටු දුව කුස ගැබක් හට ගැනුණේය. එහෙයින්, "මා දෙමාපියන් ළඟට යායුතුයැ"යි සිතා. ඒ බව සැමියාට සැලකළ කල "මා කල වරදට මා නසා පළිගනිති"යි සිතා ගමන පමා කළේය. ගමන පමාවීම නිසා අතර මගදී පුතෙකු ලැබුනු හෙයින් දෙදෙනාම පුතු ද රැගෙන විසූ තැනටම පැමිණියහ.

දෙවන වරද දරු ගැබක් හට ගැනුණේය. පෙරසේම මවුපියන් වෙත යාමට සිතා පුතුන් රැගෙන මඟට වන. තද වැසි සුළං විදුලි ගැසීම් ඇති දවසෙක දෙවන ළමයා ද ලැබුණේය. බිරිඳට හා දරුවනට සාත්තු කරන අතර සැමියා නයෙකු විසින් දෂ්ට කරන ලදුව මිය ගියේය. සැවැත් නුවරට යාම සඳහා කුඩා දරුවන් සමග අචිරවතී ගඟබඩට පැමිණ වැඩිමහල් දරු මෙගොඩ සිටුවා කුඩා දරු එගොඩ ගෙන ගොස් හොවා ගඟ මැද පෙරළා යන්නී අහස හඬක් ඇසී බැලුවාය. අහස යන උකුස්සෙක් ඈතදීම ඒ දරුවා දැක ඩැහැගෙන යාමට අහසින් බස්නේය. මව වේගයෙන් අත්ලෙන් අත්ල ගසා හඬ නගා දියෙහි පැන යන අතර උකුසු ළදරු ඩැහැගෙන ගියේය. මෙගොඩ සිටි පුතු "මා මව මට හඬ ගසනේය"යි සිතා දියට බැස ගිලී මළේය.

සිටු දු හැඬීම් වැළපීම් සහිතව සැවත් නුවර බලා මවු පියන් වෙත යන්නී හමුවන මිනිසුන් ගෙන් ඔවුන්ගේ පවත් කෙසේදැ"යි ඇසුවාය. ඔවුහු තද වැස්ස හා සුළං වේගයත් හේතු කොට සිටු මාලිගාව ඇද වැටී සිටුත් දේවිත් පුතුත් එයට යටව මළහ. දැන් ඔවුහු එකම දරසෑයක දවති"යි කීහ. දෙදරුවන්ගේද, සැමියාගේද, එකම දර සෑයක දැවෙන මවුපියන්ගේද සොහොයුරාගේද මරණ නිසා සිටුදුව සිහි මුළා වී උමතු විලස් පහළ විය. මවුපියන් හා සොහොයුරු දවන සෑයේම තමනුත් දැවෙන්ට සිතා පනින්ට යන කල නොහඳුනන තැනැත්තියෙකැයි ගල්මුල්වලින් ගසා එළවන්නට වූහ.

සිටු දු ඔවුන්ගේ පහරින් මිදෙනු සඳහා උමතු වෙසින් ඉවත් වූ පිළි ඇතිව වහා යන්නී දෙවුරම් වෙහෙරට වන් කල උවැසියෝ පිළි හැඳ වූහ. බුදුරදුන් ඈට පිහිටවිය. දහම් දෙසා සෝ ගිනි නිවා සෝවාන් පල පිහිටුවිය. ඈ මරණ බියෙන් තැති ගෙන සසරට කලකිරී මෙහෙණින් වෙසෙන අරමක මහණවූවාය.

ඇය හඳිනට පිළි නැතිව සිට පිළි ලද හෙයින් පටාචාරා නමින් හැඳුනුණි. විදසුනෙහි ඇලුණු ඒ මෙහෙණ දුටු බුදුරදුහු රැස් විහිදුවා ඉදිරියේ වැඩ සිටි සේ අමතා "උදය - ව්‍යය (හටගැනීම් - නැසීම්) නොදක්නා වූ යමෙක් අවුරුදු සියයක් ජීවත්වීමට වඩා හට ගැනීම් නැසීම් නුවණින් දක්නහුගේ එක දවසක ජීවිත්වීම උතුම්ය"යි වදාරා ඒ මෙහෙණ රහත් පලයෙහි පිහිට වූ සේක.

විස්තරාත්මක අනුවාදය (113 ගාථාව)

උදයව්‍යයං අපස්ස යො චෙ වස්සතං ජීවෙ (තතො)
උදයව්‍යයං පස්සතො එකාහං ජිවිතං සෙය්‍යො

උදයව්‍යයං අපස්සං: පංචස්කන්ධයෙහි උදයව්‍යය හෙවත් ඇතිවීම හා නැතිවීම නොදක්නා වූ;
යො: යම් පුද්ගලයෙක්; **චෙ වස්සසතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජීවත්වන්නේ නමුදු (ඒ ජීවත් වීමට වඩා); **උදයව්‍යයං පස්සතො**: පංචස්කන්ධයෙහි උදයව්‍යය දක්නා වූ භික්ෂුවගේ; **එකාහං ජීවිතං**: එක් දවසකුදු ජීවත් වීම; **සෙය්‍යො**: උතුම් වේ.

ලෝකය හැම දෙයක්ම ඇතිව නැතිව නැති වන බව නොසිතා සියවසක් විසීමට වඩා එය ගැන සිතමින් එක් දිනක් විසීම ශ්‍රේෂ්ඨ වෙයි.

විවරණය

උදයව්‍යය: (රූ ඈ පස් කඳයන්ගේ) හැටගැනීම හා නැසීමය.

උදය නම්: ඉපදීම - පහළ වීම - හටගැනීම යන තේරුම් ඇති වචනයකි.

ව්‍යය නම්: නැසීම් - නැතිවීම් යන තේරුම් ඇති වචනයකි.

පස්සතො: (පස්කඳ පිළිබඳ උදය - වය) දක්නහුගේය.

උදයව්‍යය: දැක්ම රූ ඈ පස්කඳයන් ගේ වසයෙන් පස් විසි අයුරකි.

නිවන නොදක්නහු සියක් වසක් ජීවත්වීමට වඩා නිවන දක්නහු එක දවසකුදු ජීවත්වීම උතුම්ය.

114\. යො වෙ වස්සසතං ජීවෙ
අපස්සං අමතං පදං
එකාහං ජීවිතං සෙය්‍යො
පස්සතො අමතං පදං (8:15)

නිවන් අමාපද නොදැන වසන්නේ
වසර සියක් විසුවත් නො වටින්නේ
නිවන් අමාපද දැක නිවසන්නේ
එක දවසක් වුව උතුමැයි වන්නේ

අමාපදය දක්නහුගේ ජීවිතය උතුම්ය

8 (13) කිසාගෝතමී මෙහෙණිය (ගාථා අංකය 114)

සැවැත් නුවර ඉසුරුමත් සිටු කුලයෙක **ගෝතමී** නම් කුමරියක් වූහ. ඒ සිටු කුමරිය මනා රූ ඇත්තීය, සන්සුන් පැවැතුම් ඇත්තීය. සැම දෙන සතොස් බවට පමුණුවන තෙපුල් හා දීමට සතුටු අත් ඇත්තීය. හීන් සිරුරු ඇතිව වැඩෙන ඒ කුමරී කිසාගෝතමී නමින් හැඳුනුණි. දෙමාපියෝ සිය කුලයට සරිලන සිටු කුමරෙකුට ඈ සරණ පාවා දුන්හ.

කුස දරු ගැබක් හටගෙන දසමස් ඇවෑමෙන් පුතෙකු ලැබ සෙනේහයෙන් රැකේ. පුතු දණ ගා යනෙන කල ඉක්මවා පිය ඔසවා ඇවිදින තරම් වියේ දී මළේය. පුතුගේ නැසීම නිසා මුළු සිරුරම සෝ ගිනියෙන් දැවෙන ඈ සැනසීමට කිසිවෙකුටත් නොහැකි විය.

කිසාගෝතමී සොවින් පෙළෙමින් වැළපෙමින් පුතුගේ මළ සිරුර කර හොවාගෙන "මා පුතුට බෙහෙත් කියන්න"යි ඇවිදී. නුවණැති සපුරිස් කෙනෙකුට කිසාගෝතමීයට සොවින් ඇතිවුණු උමතු ගතිය දැනුණේය. ඔහු "ඇයි ගෝතමියනි දුක්වන්නේ? ඔබ පුතුට බෙහෙත් කරවා ගතමනා නම් දෙවුරම් වෙහෙරට නිසැකව යන්න. බුදුරදුහු බෙහෙත් දනිත්"යයි කීහ. කිසාගෝතමී වෙහෙරට ගොස් "බුදුරදුන් වහන්ස, මා පුතුට බෙහෙත් දැනිත්දැ"යි ඇසී. බුදුරදුහු ඇගේ සෝගිනි නිවීමට පිළිවෙළක් යොදනු සඳහා "බෙහෙත් දනුම්හ"යි වදාළ සේක. උවමනා බෙහෙත් ඇසූ කල "නොමළ ගෙයකින් අබමිටක් පමණ ගෙනෙව"යි වදාළහ. ඈ "ඒ ඉතා සුලු දෙයකැ"යි සැලකී.

කිසාගෝතමී මළසිරුර කර හොවාගෙන ගෙන් ගෙට ඇවිද නොමළ ගෙයකින් බෙහෙතට අබමිටක් සොයාගත නොහැකිවීය. "ජීවත්ව සිටිනවුන්ට වඩා මළහු බොහෝ වෙති. පමණෙක් නොදත් හැකි"යි සිතා මළ සිරුර ඉවතලා කලකිරී වෙහෙරට ගොස් බණ අසා සෝවාන්ව මෙහෙණින් වෙසෙන අරමක මහණ වූහ. දවසක කිසා ගෝතමී විදසුනට සිත නංවා සිටින අතර බුදුරදුහු රැස් විහිදුවා ඉදිරියේ වැඩ සිටි සේ අමතා "නිවන නොදක්නා වූ යමෙක් සියක් වසක් ජීවත් වීමට වඩා අමාපදය දක්නා වූ තැනැත්තාගේ එක් දවසකුදු ජීවත්වීම උතුම්ය"යි වදාරා ඒ මෙහෙණ රහත් පලයෙහි පිහිටවූ සේක.

විස්තරාත්මක අනුවාදය (114 ගාථාව)

අමතං පදං අපස්සං යො වෙ වස්සසතං ජීවෙ, (තතො)
අමතං පදං පස්සතො එකාහං ජීවිතං සෙය්‍යො.

අමතපදං: මරණ රහිත වූ පදය හෙවත් අමෘත මහා නිර්‍වාණය; **අපස්සං**: නොදක්නා වූ; **යො**: යම් පුද්ගලයෙක්; **වෙ වස්සසතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජීවත්වන්නේ නමුදු (ඒ ජීවත්වීමට වඩා); **අමතං පදං පස්සතො**: අමෘත මහා නිර්වාණය දක්නා වූ පුද්ගලයාගේ; **එකාහං ජීවිතං**: එක දවසකුදු ජීවත් වීම; **සෙය්‍යො**: උතුම් වේ.

නිවන නොදක්නා අයගේ සියවස් දිවියට වඩා එය දක්නහුගේ එක් දිනක් ජීවත්වීම ශ්‍රෙෂ්ඨ වේ.

විවරණය

අමතං පදං: අමාපදය, මඟ-පල නැණින් පසක් කළ යුතු වු නිවනය. ජරා-මරණ රහිත වූ 'අමා' සුවය. අමා නම් නොයෙක් කප් කෙළ ගණන් පුරණ ලද පෙරුම් ඇති බුදු-පසේබුදු-මහසවු යන උතුමන් සෙවුණු සිත් ගැන්වූ එකම පිහිට වූ උතුම් සෙතය. ඒ සිහි නුවණින් යෙදී මනාව රැකි සිල් ඇති නොපසුබට දැඩි වැරැති විදසුන් මගින් වැඩුණු සිතැති පුඟුලන් විසින් සිවු මඟ-පලයනට පැමිණ පසක් කොට දැක්ක යුතු. එසේම ලැබිය යුතු නිවනය.

අමත පදං පස්සතො: අමා පදය දක්නා තැනැත්තාගේය. අමා පදය දැකීම නම්, නිවණ මඟ-පල නැණයනට අරමුණු කොට පසක් කර ගැනීමයි. එබඳු තැනැත්තා එක දවසක් වුවත් ජීවත්වීමට උතුම්ය. අමා පදය නොදක්නහුගේ හෝ දක්නට වැර වෑයම් නොකරන්නහුගේ සියක් වසක් නමුදු ජීවත්වීම නිසරුය. උතුම් නොවන්නේය.

දහම් නොදක්නහු සියක් වසක් ජීවත් වීමට වඩා දහස් දක්නහු එක දවසකුදු ජීවත්වීම උතුම්ය.

115. යො චෙ වස්සසතං ජීවෙ
අපස්සං ධම්මමුත්තමං
එකාහං ජීවිතං සෙය්‍යො
පස්සතො ධම්මමුත්තමං (8:16)

උතුම් දහම් පද නැතිනම් දන්නේ
සියක් වසක් සිටියත් නොවටින්නේ
උතුම් දහම් පිරිසිඳ දැන ගන්නේ
එක දවසක දිවි වුවද වටින්නේ

උතුම් දහම් දක්නහුගේ ජීවිතය උතුම්ය

8 (14) බහුපුත්තික මෙහෙණිය (ගාථා අංකය 115)

සැවැත් නුවර නොමඳ ඉසුරෙන් වැඩුණු පවුලක්විය. එහි දෙමාල්ලෝ පන්සිල් රැක දස අකුසලින් වැලකී වෙසෙති. ඔවුනට පුත් කුමරුන් සත් දෙනෙකුත් දු කුමරියන් සත් දෙනෙකැයි තුදුස් (දස සතර) දූ පුත් කෙනෙක් වූහ. නිසි වයස්හි සිය කුලයට සැසැඳෙන (ගැළපෙන) අයුරු පුතණුවන්ට යෙහෙළියන් සත් දෙනෙක් ද දුවනියන්ට බෑණනුවන් සත් දෙනෙක් ද මඟුල් උළෙලින් සරණ කැර දුන්හ. ඔවුහු මුල් ගෙය මවු පියනට තබා ගෙවල් තනාගෙන වෙන් ව වෙසෙති. මව බොහෝ දරු පිරිසක් ඇති කළ හෙයින් **බහුපුත්තික** යයි පසිඳුවිය. පියා මළ කල ධනයට හිමි වූයේ මවය. ඒ සියලු දෙනම මවට සලකති. උවටැනෙහි අඩුවක් නොපෙන්වති.

ඒ දරුවෝ "මෑණියෙනි, ධනය බෙදා දුන මැනව. අපි නුඹ මෙසේ රකුම්හ"යි මව රැවටීමට ඇවිටිලි බස් කියති. මවගේ කිසි රැවටීමෙක් නැත. දරුවනට කුලුණු සිතැත්තීය. මව "මේ ධනය අයිති මා දරුවනට මැයි සිතා දරුවන් නිසා මම රැකෙමි"යි සලකා තුදුස් දූ පුතුනට තමන් සතු කිසිවක් ඉතිරි කර නොගෙන සම සම සේ ධනය සතුටින් බෙදා දුණි. මෑණියෝ කිහිප දවසකට පසු වැඩිමහල් පුතුගේ ගෙදරට ගියහ. එදා දෙටු යෙහෙළි පිළිගැනුමක්වත් සාද (සත්කාර) කිරීමක් වත් පිළිසඳරක් (සුවදුක් විචාරීමක්) වත් නොකොට ගෙට ගොඩ වූ සැටියේ ම වේගයෙන් "ඔබ වැඩිමල් පුතු යයි යමක් වඩා දීලාද මෙහෙට ආවේ"යි කිසි සැලකිල්ලක් නොකළාය.

සෙසු යෙහෙළිහුත් එසේම කිවාහ. දූවරුන් සත් දෙන ගෙන්ද එයට වඩා සාදයක් (සත්කාරයක්) නොලැබිණ. මව කලකිරී "මා වදා හදා ධනය බෙදා දුන් දරුවෝ ද මා හෙළ දකිති. තවත් බලාපොරොත්තු නොවිය යුතු"යයි සිතා මෙහෙණවර (මෙහෙණින් වෙසෙන අරම) මහණව බහුපුත්තික නමින් පසිඳුවිය. ඒ මෙහෙණ දැඩි වැරතිව තුන්යම් රෑ මුළුල්ලෙහි විදසුනට සිත නංවා සිටි බැව් බුදුරදුහු දැක රැස් විහිදුවා ඉදිරියෙහි වැඩ සිටි සේ අමතා "උතුම් දහම් (නව ලොවුතුරු දහම්) නොදක්නා වූ යමෙක් අවුරුදු සියයක් ජීවත් වීමට වඩා උතුම් දහම් දක්නා තැනැත්තාගේ එක දවසකුදු ජීවත්වීම උතුම්ය"යි වදාරා ඒ මෙහෙණ රහත් පලයෙහි පිහිටු වූ සේක.

විස්තරාත්මක අනුවාදය (115 ගාථාව)

(ධම්මමුත්තමං - ධම්මං + උත්තමං) උත්තමං
ධම්මං අපස්සං යො චෙ වස්සසතං ජීවෙ (තතො)
(ධම්මමුත්තමං - ධමමං + උත්තමං) උත්තමං ධම්මං
පස්සතො එකාහං ජිවිතං සෙය්‍යො.

උත්තමං ධම්මං: උත්තම වූ නවලෝකෝත්තර ධර්මය; **අපස්සං**: නුවණැසින් නොදක්නා වූ; **යො**: යම් පුද්ගලයෙක්; **වේ වස්සසතං ජීවේ**: ඉදින් අවුරුදු සියයක් ජීවත්වන්නේ නමුදු (ඒ ජිවත්වීමට වඩා); **උත්තමං ධම්මං පස්සතෝ**: උත්තම වූ නවලෝකෝත්තර සද්ධර්මය නුවණින් දක්නහුගේ; **එකහං ජීවිතං**: එක දවසකුදු ජීවත් වීම; **සෙය්‍යො**: උතුම් වේ.

උතුම් දහම් නොදත්තහුගේ සියවස් විසීමට වඩා එය දක්නහුගේ එක් දින දිවිය උතුම් වෙයි.

විවරණය

ලෝකුත්තරධම්ම: (ලෝක+උත්තර+ධමම) ලෝක නම් - පුහුදුන් ලොවය. උත්තර නම් එතෙරය. ධම්ම නම් මග - පල දහම්ය. පුහුදුන් ලොවින් (කෙලෙස් සහිත පස් කඳින්) මග - පල දහම් පසක් කොට එතෙර වූ හෙයින් ඒ නවය නව ලොවුතුරු දහම් නම්.

සෝවාන්: මේ තැනැත්තා පවා මොක් මග හෙළි කොට පුහුදුන් ලොවින් එතෙරට ගමන් ගත් හෙයින් ද නැවත පුහුදුනට ඇතුළත් නොවන හෙයින් ද ලොවුතුරු බැව්හි පිහිටියේ වේ. හේ කෙමෙන් සෙසු මග පල ලැබ සව් කෙලෙස් මුලිනුපුටා නැසීමෙන් නව ලොව්තුරු දහම් හිමි කර ගනී. සියලු දුකින් මිදී සෙත් පුරා සැනසේ.

බලයෙන් හරවා ගැනීමක් නොමැත

බුදු දහමට අනුගාමිකයන් හරවා ගැනීමේ දී කිසි විටෙක බලහත්කාරයෙන් කිසිවකුට අදහස් හෝ විශ්වාස පවරන්නට උත්සාහ ගෙන නැත. කවර විදියක වත් බලපෑමක් කර නැති අතර චාටු කතා, රැවටීම් බොරු පොරොන්දු භාවිත කර තම මතයට කිසිවකු අවනත කරගෙන නැත. බෞද්ධ ධර්මදූතයන් කිසිවිටක අනුගාමිකයන් වැඩි කර ගැනීමේ තරඟයක යෙදුනේ නැත.

මහාචාර්ය ජී. පී. මලලසේකර

9 වන පරිච්ඡේදය

පාප වගග

කුසල් කිරීමෙහි යුහුසුලු වන්න. සිත පවින් වළකා ගන්න. පිනට අලස වන්නාහු ගේ සිත පවෙහි ඇලේ.

116. අභිත්ථරෙථ කල්‍යාණෙ
පාපා චිත්තං නිවාරයෙ
දන්ධං හි කරොතො පුඤ්ඤං
පාපස්මිං රමතී මනෝ (9:1)

කරනු ඇසුරු කලණ මිතුරු
පව් කර දුරු සිත නිර තුරු
වුණොත් නුහුරු පිනට මහරු
පවට ඇදෙන්නයි සිත හුරු

පිනෙහි ඇලී - නොවන් මැලී

9 (1) චුල්ල ඒකසාටකගේ වත (116 ගාථාව)

චුල්ල ඒකසාටක නමින් පතළ බමුණු යුවලක් අරබයා භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි මේ ගාථාව දේශනා කළ සේක.

සැවැත් නුවර විසූ එක් බමුණු යුවලකට ගමනක් බිමනක් යන විට හැඳ ගනු පිණිස වූයේ එක ම උතුරු සළුවකි. එහෙයින් යුවලටම එකවර එකට ගමනක් යා ගත නොහැකි විය. එහෙයින් බණ අසන්නට යන විට බිරිඳ දිවා කාලයෙහි ගොස් ආ විට රාත්‍රි කාලයෙහි ස්වාමියා යයි. ඔවුනට 'ඒකසාටක' නම යෙදුනේ එහෙයිනි.

එක් දිනක් රැයෙහි ඒකසාටක බමුණා බණ අසන්නට ගියේය. එදින මුල් යාමයෙහි දහම් අසන විට බමුණා ගේ සිත පරිත්‍යාගශීලය කෙරේ බෙහෙවින් නැමිණි. යමක් පරිත්‍යාග කිරීමේ බලගතු ආශාව සිත උපන්න ද පුදන්නට වස්තුවක් නොවීම ගැටළුවක් විය. දෙන්නට ඇති එකම වස්තුව වූ උත්තරසාටකය පිදුවහොත් බමුණාට කෙසේ වෙතත් බැමිණියට මගට බසින්නට ක්‍රමයක් නැති වෙයි. එහෙයින් හෙතෙම සිත පාලනය කර ගෙන දහම් ඇසීය. රාත්‍රි දෙවන යාමයෙහි දී ද ඔහුට බලගතු දාන චේතනාවක් ඇති වුව ද උත්තර සාටකය පිදීමේ චේතනාව පාලනය කර ගන්නට සිදුවිය.

රැයෙහි තුන්වන යාමයෙහි දි ධර්ම ශ්‍රවණය කරන අතර ඔහුට මෙසේ සිතිණි. "මගේ මසුරු සිත පරදවා ගන්නට මා අසමත් වුවහොත් සසර දුක් නිවාගන්නට බැරිවෙයි. මා මේ වතාවේදී තෘෂ්ණාව පාලනය කර මේ උතුරු සළුව බුදුරදුන්ට පිදිය යුතුය." එසේ සිතා හේ උත්තර සාටකය බුදු පාමුල තැබීය. එසේ කොට තමන් තම ලෝභය පරදවා ජයගත් ප්‍රීතිය හේතුවෙන් "මම ජයගතිමි"යි තුන්වරක් ප්‍රකාශ කළේය. පිරිසේ අසුන් ගෙන බණ අසමින් සිටි පසේනදි කොසොල් රජ ඒ අසා කලබල වූයේ ඔහු කිසියම් කුමන්ත්‍රණයක් කළා දැයි සිතා ඔහු ගෙන් ප්‍රශ්න කරන්න රාජපුරුෂයනට උපදෙස් දුන්නේය. ඇති තතු දැනගත් රජතුමා බමුණා කර ඇත්තේ කිසිවකු විසින් කළ නොහැකි තරම් දුෂ්කර කාර්යයක් හෙයින් ඔහුට ත්‍යාගයක් දිය යුතු බව තීරණය කළේය.

බමුණාට වස්ත්‍ර දෙකක් ත්‍යාග වශයෙන් දෙන්නට රජතුමා තීරණය කළේය. ඒ වස්ත්‍ර දෙකද හෙතෙම බුදුරජාණන් වහන්සේට පූජා කළේ ය. එවිට රජතුමා ඔහුට වස්ත්‍ර හතරක් පිරිනැමීය. එය ද හේ බුදුන්ටම පූජා කළේ ය. මෙසේ වැඩි කරමින් ගොස් වස්ත්‍ර 32 ක් වූ තැන බමුණා එක් වස්ත්‍රයක් තමාටත් එකක් බිරිඳටත් තබා ගෙන ඉතිරි වස්ත්‍ර තිහ බුදුරජාණන් වහන්සේට පූජා කළේ ය. බමුණා දුන් දානය අතිශය දුෂ්කර එකක් බව දත් රජතුමා ඔහුට සෑහෙන සංග්‍රහයක් කළ යුතු යැයි සිතා එකක් දහස බැගින් වටිනා විල්ලුද රෙදි දෙකක් මාලිගයෙන් ගෙන්වා බ්‍රාහ්මණයාට තෑගි කළේ ය. බමුණා ඉන් එකකින් වියනක් කරවා ජේතවනාරාමයෙහි බුදුරදුන් වැඩ විසූ ගඳ කිළියෙහි උන්වහන්සේ ගේ ඇඳ මත්තෙහි සවි කරවී ය. අනෙක් වස්ත්‍රයෙන් වියනක් කරවා සිය නිවසෙහි දිනපතා භික්ෂු නමක් දන් වළඳවන අසුනට ඉහලින් සවි කළේය. පසු දිනෙක රජතුමා,බුදුන් වඳින්නට දෙව්රමට ගිය විට බුදුරදුන් ගේ ගඳ කිළියෙහි සකසා තිබුණු වියන දැක ඒ තමා ඒකසාටකට පිරිනැමූ විල්ලුද වස්ත්‍රය බව හඳුනා ගත්තේය. මෙවර වඩාත් පැහැදුණු රජතුමා සබ්බචතුක්ක ත්‍යාගය නමින් එක් වර්ගයෙන් හතර බැගින් තෑගි හත් වර්ගයක් යැවීය. ඇතුන් හතර දෙනෙක්, අසුන් හතර දෙනෙක්, සේවිකාවන් හතර දෙනෙක්, සේවකයන් හතර දෙනෙක්, පණිවුඩ කරුවන් හතර දෙනෙක්, ගම්වර හතරක් හා මුදලින් හාර දහසක් යවන්නට යෙදිණ.

මේ ත්‍යාගය පිළිබඳ පුවත ඇසූ භික්ෂූහු "ඒක සාටක බමුණා ගේ කුසල කර්මය ඇස්පනාපිට ම මහානිසංස දී ඇති ආකාරය ආශ්චර්යජනකය" යි කතිකා කළ හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ. "මහණෙනි, බ්‍රාහ්මණයා ප්‍රථම යාමයේදී ම ඒ වස්ත්‍රය පිදුවා නම්, එක් වර්ගයෙන් 16 බැගින් ලැබෙන්නට තිබිණ. ද්විතීය යාමයේ දී පිදුවා නම් 8 බැගින් ලැබෙන්නට තිබිණ. කෙසේ වුවද අවසන් යාමයෙහි පිදූ හෙයින් සබ්බ චතුක්ක (4 බැගින්) වශයෙන් ලැබිණ. එහෙයින් යම් හොඳක් කරන්නට සිතට අදහසක් එයි නම්, එය වහාම ක්‍රියාත්මක කළ යුතු ය. පමා කළහොත් ආනිශංස ද පමා වන අතර සිතෙහි පහළ වූ අදහස පවට නැමීම නිසා එය කර ගැනීම අපහසු වීමට ද පිළිවන.

විවරණාත්මක අනුවාදය (116 ගාථාව)

කල්‍යාණෙ අභිත්ථරෙථ ,පාපා චිත්තං නිවාරයෙ පුඤ්ඤං
දන්ධං හි කරෝතෝ මනෝ පාපස්මිං රමති.

කල්‍යාණෙ: හොඳ වැඩ (සුචරිත ධර්මයෙහි) කිරීමෙහි; **අභිත්ථරෙථ**: යුහුසුලු වන්නේ ය; **පාපා**: පව්කමින්; **චිත්තං**: සිත; **නිවාරයෙ**: වළකාගන්න; **පුඤ්ඤං**: පින් කිරීමෙහි; **දන්ධං කරොතො**: ප්‍රමාද වන්නහුගේ; **මනො**: සිත; **පාපස්මිං**: පාපයෙහි; **රමති** :ඇලෙයි.

පින් කිරීමෙහිදී උනන්දුවෙන් වහා වහා එය කළ යුතු ය. සිත පාපයෙන් වළකා ගත යුතුය. පින් කිරීමෙහි ලා පමා වුවහොත් සිත පාපයට ඇදෙන්නට ඉඩ තිබේ.

විවරණය

අභිත්ථරෙථ කල්‍යාණෙ: යහපත් දේ කෙරේ සිත යොමු වීම නිතර සිදුවන්නක් නො වේ. සිතෙහි ස්වභාවය ආකර්ශණීය වූ පංචකාමය හා පාප ක්‍රියා වෙත යොමු වීමයි. එහෙයින් පුණ්‍ය චේතනාවක් ඇති වූ වහාම පමා නො කර මැලි නොවී වහා එයකර නො ගතහොත් සිත යළිත් පහත් දෙයට ම යොමු වන්නට ඉඩ තිබේ. හොඳ දේ කිරීම උඩුගම් බලා පිහිනීමක් වැනිය.



පව් නැවත නැවතත් නො කරන්න, එයට කැමැත්ත ද නො කරන්න. පව් රැස්වීම දුකට කරුණු ය.

117. පාපං චෙ පුරිසො කයිරා
න තං කයිරා පුනප්පුනං
න තම්හි ඡන්දං කයිරාථ
දුක්ඛො පාපස්ස උච්චයො (9:2)

කළත් වරදක් කෙනකු වරකට
නොකළ යුතු එය තවත් වරකට
ඇළුම් නොකරනු යළි කරන්නට
වැඩී පව් වෙයි දුක් විඳින්නට

වරකදි කළ පවු - යළි යළි නොකරවු

9 (2) සෙය්‍යසක තෙරුන් ගේ වත. (117 ගථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ තථාගතයන් වහන්සේ **සෙය්‍යසක තෙරුන්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

සෙය්‍යසක තෙරණුවෝ කාළුදායි තෙරුන්ගේ හිතමිත්‍ර වූ හ. පැවිදි ජීවිතයේ ඇති විවිධ බඹසරට අදාල නීති රීති ගැන එතරම් සතුටක් උන්වහන්සේ තුළ නො විය. අන්තිමේ උන්වහන්සේ ස්වයං ආස්වාදයට පුරුදු වූහ. උන්වහන්සේ දිගටම එසේ කරන බව බුදුරජාණන් වහන්සේටද දැනගන්නට ලැබිණ.

"සෙය්‍යසක, ඔබ මෙවැනි ක්‍රියාවක යෙදෙන බව සැබෑවක් ද?" බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න කළහ.

"එහෙමයි ස්වාමීනි."

"මෝඩ භික්ෂුව, තමන්ගේ තත්වයට නො ගැලපෙන මෙවැනි අමන ක්‍රියාවක් කරන්නට ඔබ පෙළැඹුණේ කෙසේ ද?" යි පැවසූ භාග්‍යවතුන් වහන්සේ එම ක්‍රියාවෙහි පහත් බව දක්වමින් ධර්ම දේශනා කොට ශික්ෂා ගෞරවයෙන් ක්‍රියා කරන්නැයි අවවාද කළහ. මෙවැනි අනුවණකම් වලින් සිදුවන්නේ පව් වැඩි වී දුගතියෙහි දුක් විඳින්නට බව පැහැදිලි කළ බුදුරජාණන් වහන්සේ වැරදීමකින් වරක් පව්කමක් කළ ද එය දිගින් දිගට නො කළ යුතු බව දැක්වූ හ.

විවරණාත්මක අනුවාදය (117 ගාථාව)

චෙ පුරිසො පාපං කයිරා තං පුනප්පුනං න කයිරා.
තම්හි ඡන්දං න කයිරාථ පාපස්ස උච්චයො දුක්ඛො

චෙ: ඉදින්; **පුරිසො**: යම් පුද්ගලයෙක්; **පාපං**: පව්කමක්; **කයිරා**: කළේ වුවද; **තං**: එය; **පුනප්පුනං**: නැවත නැවත; **න කයිරා**: නොකළ යුතුය: **තම්හි**: එහි: **ඡන්දං**: ඇල්මක් (රුචියක්): **න කයිරාථ**: නොකරන්න: **පාපස්ස**: පව්වල **උච්චයො**: එකතු වීම: **දුක්ඛො**: දුකකි.

යමෙකු පාප කර්මයක් කළ ද එය නැවත නැවතත් නො කළ යුතුය. ඒ පාප ක්‍රියාව පිළිබඳ රුචියක් ඇති කර නො ගත යුතුය. පව් රැස්වීම දුකට හේතුවක් හෙයිනි.

විවරණය

කාළුදායි තෙරණුවෝ: සෙය්‍යසක හිමියන් සුමග යැවීමේ වගකීම උන්වහන්සේගේ හිතමිත්‍ර කාළුදායි හිමියනට පැවරිණි. කාළුදායි තෙරුන් නම් බුදුරදුන් ලොව පහළ වූ දිනම පහළ වූ සත් රුවනින් එකකි.

(1. **ශ්‍රී මහා බෝධීන් වහන්සේ**, 2. **යශෝධරා දේවිය**, 3. **සතර මහා නිධාන**, 4. **අරෝහනීය නම් රාජකීය හස්තියා**, 5. **කන්ථක අශ්වයා**, 6. **ඡන්න ඇමති** 7. **කාළුදායි** යන හත එදා පහළ විය.

බෝසතුන් බුදු වූ පසු කපිලවස්තුවට වඩමවා ගනු වස් සුදොවුන් රජතුමා යැවූ සියලුම දූතයන් තම ගිවිසුම් අමතක කර රහත්ව පැවිදි වූ නමුත්, කාළුදායි තෙරුණුවෝ හිසි කලට භාග්‍යවතුන් වහන්සේ ගමට කැඳවා ගෙන ආහ.

පාප: ලෝභ, දෝස, මෝහ චේතනා මුල් වීමෙන් කය, වචනය හා සිත යන තුන් දොරින් සිදු වන සචේතනික ක්‍රියාවෝ අකුශල ක්‍රියාවෙති. අකුශල ක්‍රියාවන් ගෙන් ලැබෙන ලෞකික දුක්ඛදායක ප්‍රතිඵල ගැන සලකා ඒවා පාප වශයෙන් නම් කෙරේ. සංසාරයෙහි අපාගත කරන ජීවිතයෙහි ගුණාත්මක භාවය විෂයෙහි පාප කර්ම නිෂේධනාත්මක ලෙස බලපායි. තිරශ්චීන යෝනියෙහි හා අපායෙහි ඉපිද පාපයෙහි විපාක විඳින්නට සිදු වෙයි.

අකුසල සාධාරන චෛතසික: පාප ක්‍රියාවන්ට මුල් වන අකුසල සාධාරණ චෛතසික හතරක් ගැන අභිධර්මයෙහි දැක්වේ.

එනම්,
1. **අහිරික** - සදාචාරමය ලජ්ජාවෙන් තොර බව
2. **අනොත්තප්ප** - සදාචාරමය බිය (පවට බය) නැතිකම
3. **අසහනය** (උද්ධච්ච)
4. **මෝහ** - මුලාව යන මේ හතරයි.

මූල: පාප කර්මයට මුල්වන අකුශල මූල හෙවත් අකුශල හේතු තුනක් වෙයි. මේවා චේතනාවක කුසල හෝ අකුසල ස්වරූපය විනිශ්චය කරයි.

අකුශල හේතු තුන නම්, ලෝභය, දෝසය හා මෝහයයි.

ඊට ප්‍රතිපක්ෂ අලෝභ, අදෝස හා අමෝහ යන තුන කුශල මූල වෙති.

කෙනකු තුළ ලෝභය උපදින්නේ ප්‍රියජනක රූප විෂයෙහි අඟදාන ආකාරයෙන් දිගින් දිගට සිතීම හේතුවෙනි. අප්‍රිය ජනක රූප විෂයෙහි එසේ අඟදාන ලෙස සිතීමෙන් ද්වේෂය ඇතිවෙයි. මේ දෙක තුළට සියුම් හා රළු සියලුම අනුනය-ප්‍රතිඝ මනෝ වෘත්තීන් අන්තර්ගත වේ. මෙම අකුශල චේතනාවන් මුල් කරගෙන කරනු ලබන පාප ක්‍රියා අතර ප්‍රාණඝාතය, සොරකම, කාම මිථ්‍යාචාරය, මුසාවාදය, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම, අභිද්‍යාව, ව්‍යාපාදය, හා මිථ්‍යාදෘෂ්ටිය ඇතුළත් ය. මේවා සිදුවන්නේ ලෝභ, දෝස හෝ මෝහ පාදක වීමෙනි.

මෙම දුෂ්ට චේතනාවන්ගෙන් පිරි සත්වයෝ තමන් ගේ විනාශය පිණිස, අනුන්ගේ විනාශය පිණිස හෝ අනුන් හා තමන් යන උභය පක්ෂයේම විනාශය පිණිස ක්‍රියා කරති. කාය, චිත්ත, වාක් යන ත්‍රිවිධ ද්වාරයෙන් මෙසේ පාප ක්‍රියාවන් හි නිරත වන්නෝ ආත්මාර්ථයෙහි හා පරාර්ථයෙහි යථාරූපය නො දනිති. අවිද්‍යාවෙන් අන්ධව මෝහයෙන් මුළාව ක්‍රියා කරන ඔවුහු ආධ්‍යාත්මික ශාන්තිය විඳ නො ගනිති.

භාග්‍යවතුන් වහන්සේ "නො දැන ගිනි අඟුරු මැඩගත් කෙනෙක් එහි ම පය ඔබා නොසිට වහා පාදය ඉන් ඉවතට ගන්නා සේ, සිහිනුවණින් තොරවීමක් නිසා හෝ පාපිෂ්ඨයන් හා එක්ව විසීමක් නිසා යම්කිසි පාපකර්මයක් කළේ නමුදු එකෙණෙහිම නුවණින් මෙනෙහි කොට "මෙබඳු ලාමක ක්‍රියා කිරීම ඔබේ ජාති, ගෝත්‍ර, වයස් ආදියට නුසුදුසුය" යි සලකා වහාම ඉන් වැළකිය යුතුය"යි වදාළ සේක.



පිනක් කළේ නම් එය නැවත නැවතත් කරන්න. කුසල් රැස්වීම සැපයට කරුණුය.

118. පුඤ්ඤං වෙ පුරිසො කයිරා
කයිරාථෙතං පුනප්පුනං
තම්හි ඡන්දං කයිරාථ
සුඛො පුඤ්ඤස්ස උච්චයෝ (9:3)

පින්කම් නම් කළ යුතු වෙයි
නැවත නැවත කළ යුතු මයි
පිනට ඇළුම් කළ යුතු වෙයි
පින් වැඩි නම් සැප වැඩි වෙයි

ලැබෙයි සැප වැඩියෙන් - කළොත් පින්කම් වැඩියෙන්

9 (3) ලාජා දෙවඟනගේ කථා ප්‍රවෘත්තිය (118 ගාථාව)

දෙව්රම් වෙහෙරෙහි වැඩ විසූ තථාගතයන් වහන්සේ **ලාජා නම් දෙවඟනක්** අරබයා මේ ගාථාව වදාළ සේක.

මහා කස්සප තෙරුන් වහන්සේ පිප්පලී වනයෙහි වැඩ වාසය කරන සේක් සත් දිනක් නො කඩවා සමවත් සුවයෙන් ගත කළ සේක. සමාධියෙන් නැඟී සිටි උන්වහන්සේ තමන් වහන්සේට පිඬු සිඟා වඩින්නට තැනක් විමසන සේක් එක් කුඹුරක් රක්නා ගෙවිලියක් දිවැසින් දැක ඕතොමෝ සැදැහැතියක් ද, නො එසේ නම් සැදැහැ නැත්තියක් ද යි විමසූ සේක් සැදැහැතියක් බව දැන ඕ තොමෝ තමන්ට අනුග්‍රහ කරන්නට සමර්ථවේදැයි විමසූහ. "ඕ තොමෝ නුවණැත්තී ය. කළ පින් ඇත්තී ය. ඕ තොමෝ මට අනුග්‍රහ කොට එහි පුණ්‍යර්ධිය හේතුකොට ගෙන උසස් ප්‍රතිඵලයක් ලබන්නීය"යි දැනගත් උන්වහන්සේ පා සිවුරු ගෙන ඇය රක්නා කෙත අසලට වැඩම කළ හ. ස්ථවිරයන් වහන්සේ කුඹුර අසලට වැඩ සිටිනු දුටු සැදැහැවත් ගෙවිලිය පස්වණක් ප්‍රීතියෙන් පිනා ගියාය. ඕ තොමෝ වහාම දිව ගොස් උණු බත් ගෙනවුත් ස්වාමීන් වහන්සේට පිළිගැන්වී ය. එසේ පිළිගන්වා "ස්වාමීනි, ඔබ වහන්සේ දැකගත් සත්‍යයට මම ද හිමිකරුවෙක් වෙම්වා."යි ප්‍රාර්ථනය කළා ය. "ඔබගේ ප්‍රාර්ථනය සමෘද්ධ වේවා"යි පින් දුන් තෙරුන් වහන්සේ ඇය නමස්කාර කර සමුගත් පසු ආපසු පිටත් වූ සේක.

ඒ සැදැහැති ගෙවිලිය ද තෙරුන් වහන්සේට පිළිගැන්වූ දානය පිළිබඳවම මහත් සන්තෝෂයෙන් ආවර්ජනා කරන්නී ද නිවෙස බලා යන්නට පිටත් වූවා ය. මඟ දෙපස වූයේ කුඹුරුය. කුඹුරක් අසල වූ එක් තුඹසක විෂඝෝර සර්පයෙක් වාසය කළේ ය. තෙරුන් වහන්සේ දුටු සර්ප තෙම සිවුරෙන් පා වැසී තිබුණෙන් දෂ්ට කරන්නට අසමත් වූයේ ය. එහෙත් කාන්තාව එතැන පසු කර යත් ම ඇය ගේ පය දෂ්ට කළේ ය. දරුණු විෂ සිරුරෙහි පැතිර ගියෙන් සිහිසුන්ව ඇද වැටුණු කාන්තාව එකෙණෙහිම මිය ගියා ය. සැදැහැ සිතින් දුන් දානය පිළිබඳව සිතමින් සිට මිය ගිය හෙයින් වහාම දිව්‍යාත්මභාවයක් ලද්දා ය. තමන් මේ දිව්‍යානුභාව ලද්දේ කවර හෙයින්දැයි බැලූ ඕ "තෙරුන් වහන්සේ නිසාය"යි දැන ගෙන උන්වහන්සේ ගේ ආරාමය පවිත්‍ර කිරීම් ආදිය කළා ය. විහාරස්ථානය මනාව පිරිසිදු කර තිබෙනු දුටු උන්වහන්සේ කිසියම් අළුත් සාමණේර නමක් හෝ පරිවාසික භික්ෂුවක් මෙය කරන්නට ඇතැයි සිතූහ. දෙවන දිනයේ ද දෙව්දුව එසේ කළ අතර තෙරුන් වහන්සේ ද එම තීරණයටම එළඹුණා හ. එහෙත් තුන්වන දින අතුගාන හඬ ඇසී කවුරුන් විසින් මෙය කරනු ලැබේදැයි දැක ගනු රිසි වූ තෙරුණුවෝ යතුරු සිදුරෙන් බැලූ හ. ශරීරයෙන් රශ්මි විහිදෙන රූප ශෝභා සම්පන්න අප්සරාව දුටු මහා කස්සප තෙරණුවෝ "කවුද ඔය අතුගාන්නේ?" යි විමසූහ. "ස්වාමීනි, ඒ මම ඔබ වහන්සේ ගේ ශ්‍රාවිකාව ලාජා" "ඒ නමින් මට ශ්‍රාවිකාවක් නැහැ" "ස්වාමීනි, මා ගෙවිලියක් ව කුඹුර රක්නා විට ඔබ වහන්සේ පිඬු සිඟා වැඩියා. එදාම සර්පයකු දෂ්ට කොට මියගිය මම ඔබ වහන්සේ ට දන් දුන් පිනින් දිව්‍යාත්මභාවයක් ලබා ගත්තා. ඉතින් මා මේ දිව්‍ය ශ්‍රී සම්පත් ලබා ගත්තේ ඔබ වහන්සේ ගේ කරුණාව නිසා. ඒ හේතුවෙන් මම ඔබ වහන්සේ ගේ කුදු-මහත් කටයුතු කරන්නට කැමැත්තෙමි. ඒ උවටැන් මගින් මට දෙව් මිනිස් දෙගතියෙහි සැපට වඩා උතුම් නිවන් සුව සලසා ගත හැකි වෙතියි සිතමි." දෙව්දුව කීවාය.

"ඊයේ මේ මිදුල අතුගා පිරිසිදු කළෙත්, පැන් පෙරා සකසා තැබුවෙත් ඔබම ද?" "එසේය ස්වාමීන් වහන්ස."

"වහාම මෙතනින් පිටවන්න දෙව්දුව. ඔබ විසින් කළ සේවා තිබේවා. නැවත මෙහි නො පැමිණෙන්නේ නම් යෙහෙකි."

"සමිඳුනි, එසේ නො කළ මැනවි. මට මෙහි කුදු-මහත් කටයුතු කර ගෙන සිට මගේ විමුක්තිය සලසා ගන්නට උපකාර වුව මැනවි."

"දෙව්දුව, කරුණාකර මෙතනින් යන්න. 'අනාගතයේ දී ධර්ම කථිකයන් බණ කියන්නට පටන් ගත් විට මහා කස්සප ස්ථවිරයන්ට කුදු-මහත් කටයුතු කර දෙන දෙව්දුවක් සිටියාය'යි කියන්න ඉඩ නො තබන්න."

ඒ ඇසූ දෙව්දුව හඬා වැලපී, ශෝකයෙන් පීඩිත හද ඇතිව, කඳුලින් පිරුණු දෙනෙතින් යුතුව ඉවත්ව ගියා ය. මේ නිමිති කරගෙන භාග්‍යවතුන් වහන්සේ මෙලොවදී මෙන්ම පරලොවදී ද සැප ලැබෙන්නේ පින් කිරීමෙන් පමණක් බව පැහැදිලි කර දී මෙම ගාථාව ද දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (118 ගාථාව)

පුරිසො චෙ පුඤ්ඤං කයිරා. තං පුනප්පුනං කයිරාථ.
තම්හි ඡන්දං කයිරාථ පුඤ්ඤස්ස උච්චයෝ සුඛො.

පුරිසො: පුරුෂ තෙමේ; **චෙ**: ඉදින්; **පුඤ්ඤං**: පින්කමක්; **කයිරා**: කරන්නේ නම්; **තං**: එය; **පුනප්පුනං**: නැවත නැවත; **කයිරාථ**: කළ යුතුය; **තම්හි**: එහිම; **ඡන්දං**: ඇල්ම; **කයිරාථ**: කළයුත්තේය; **පුඤ්ඤස්ස උච්චයෝ**: පින් රැස්වීම; **සුඛො**: සුවදායකය.

පින් කරන තැනැත්තා නැවත නැවත පින් කිරීම සුදුසුය. පින් කිරීමට ම කැමති වීම යෝග්‍යය. පින් වැඩි වැඩියෙන් එකතු වීම සැප ලැබෙන්නට හේතු වෙයි.

විවරණය

පුඤ්ඤ: පින්. සාමාන්‍ය ව්‍යවහාරයෙහි දී කුසල් හා පින් අතර වෙනසක් නො දක්වතත් එහි සියුම් වෙනසක් තිබේ. එකම ක්‍රියාව නිර්වාණය පිළිබඳ අපේක්ෂාව මුල් කර ගෙන විග්‍රහ කරන විට කුසලයක් ලෙසද දිව්‍ය-මනුෂ්‍ය සම්පත් ලැබීම පිළිබඳ දෘෂ්ටියෙන් විග්‍රහ කරන විට පින් වශයෙන් ද හඳුන්වනු ලැබේ. සෑම කුසල කර්මයකින් ම අනිවාර්යයෙන් පින්සිදු වේ.



පව් කළ තැනැත්තා පව් පල දෙනතාක් එහි යහපත දකී. පව් පල දෙන කල එහි විපාක දුක් දකී.

119. පාපො'පි පස්සති භද්‍රං
යාව පාපං න පච්චති
යදා ච පච්චති පාපං
අථ පාපො පාපානි පස්සති (9:4)

මෝරන තුරු කළ පාපය
කරන අයට පව් මිහිරිය
මේරූ දවසට පාපය
ගෙන එයි ඔහු වෙත සාපය

මෝරන තුරු - පව සුමියුරු

9 (4) අනේපිඬු සිටු වත (119 සහ 120 ගාථා)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වාසය කළ කීර්තිමත් දානපති **අනාථපිණ්ඩික සිටුවරයා** ඇරබ මේ ගාථා දෙක දේශනා කළ සේක.

භාග්‍යවතුන් වහන්සේට දෙව්රම් වෙහෙර තනා දීමට පමණක් කෝටි පණස් හතරක් වියදම් කළ අනේපිඬු සිටාණෝ සිරිතක් වශයෙන් දිනපතා තුන් වරක් බුද්ධෝපස්ථානයට පැමිණියහ. විහාරස්ථානයට යන හැම විටම කුඩා සාමණේරවරු පැමිණ "අපට මොනවාද ගෙනාවේ? යි මගේ අත බලා විමසති"යි සිතමින් යමක් රැගෙන යයි. කිසිවිටෙක හේ හිස් අතින් නො යයි.

සාමාන්‍යයෙන් උදේ යන විට හේ කැඳ ගෙන යයි. උදේ හීල් දානයෙන් පසු යන්නේ නම්, එළඟි තෙල්, වෙඬරු වැනි යමක් හෝ ගිලානපච්චය ගණයට වැටෙන දෙයක් ගෙන යයි. සවස් වරුවෙහි යන විට සුවඳ විලවුන්, මල් දම් වැනි දෙයක් හෝ සිවුරු පිරිකර ගෙන යයි. සිටුතුමාට අතමිට සරු හෙයින් බොහෝ අය ඔහුගෙන් ණය ගනුදෙනු කරති. මෙසේ වෙළඳුන්ට දුන් ණය වලින් කෝටි දහ අටක් ආපසු ගෙවනු නො ලැබිණ. මේ අතර ඔහුගේ පවුලේ නිධන් කර තිබුණ ධනයක් වූ කෝටි දහ අටක් ගංවතුරට අසුව ගසා ගෙන ගියේ ය. මේ හේතුවෙන් සිටුතුමාට ආර්ථික දුෂ්කරතා ඇති විය. එහෙත් ඒ නො හඟවා සුපුරුදු පරිදි සංඝයා වහන්සේලාට දන් දීමේ කටයුතු කර ගෙන ගියේ ය. කෙසේ වුව ද පෙර මෙන් ප්‍රණීත ආහාර-පානාදිය සපයන්නට අපහසු වූ හෙයින් දාන වස්තු සාමාන්‍ය තත්වයෙන් සකසන ලදි.

දිනක් භාග්‍යවතුන් වහන්සේ සිටුතුමාගෙන් "ඔබ නිවසේ බුදු පාමොක් මහ සඟ රුවනට නො කඩවා දන් පිළියෙල වෙනවා නො වේද?" යි විමසූ විට "ස්වාමීනි, එසේ ය. එහෙත් ආහාර ප්‍රණීත නැත. නීරස අහර සහ ඇඹුල් කැඳ බොහෝ විට පිරිනමන්නට සිදුවෙයි." ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "සිටුවරය, මා බුදු පාමොක් මහ සඟනට පිරිනමන්නේ නීරස අහර යැයි දුක් නො වන්න. චේතනාව පිරිසිදු නම් බුද්ධාදී උතුමනට දෙන ආහාර නීරස වන්නේ නැත." යි වදාළ හ. අනේපිඬු සිටාණන්ගේ මැදුරෙ හි ප්‍රවේශයෙහි එක් දෙව්දුවක් වාසය කළා ය. බුදුරදුන් හා අනඳ හිමියන් පිවිසෙන විට උන්වහන්සේලාගේ ගුණ මහිමය නිසා ඇයට බිමට බැස ගරු කරන්නට වෙයි. නිතර නිතර එසේ කිරීමෙන් පීඩාවට පත්ව උන් ඕ දැන් සිටුතුමා ආර්ථික අහේනියට මුහුණ පා සිටින හෙයින් ඔහුට කරුණු කියා උන්වහන්සේලා ගේ ගමන නවතන්නෙමි යි සිතා රාත්‍රියෙහි සිටුතුමා ගේ නිදන කාමරයෙහි අහසෙහි පෙනී සිටියා ය. "මේ කවුදැයි" සිටුතුමා ප්‍රශ්න කළ විට "සිටුතුමනි, මම ඔබගේ වාසල වාසය කරන දේවතාවා වෙමි. මම ඔබට අවවාදයක් කරනු සඳහා පැමිණියෙමි" යි පැවසුවා ය. "හොඳයි ඔබට කියන්නට ඇති දේ කියන්න" යි සිටු තෙම පැවසීය.

"සිටුතුමනි, දුර දිග නොබලා ගෞතමයන් ගේ ශාසනය වෙනුවෙන් වියදම් කිරීම නිසා ඔබ දැන් දුප්පත්ව සිටියි. එහෙත් තවමත් ඔබ කරන්නේ ඉවරයක් නැතිව දන් දීම ය. මෙසේ කරගෙන ගියහොත් තව ටික දිනකින් කෑමට ඇඳීමටවත් දෙයක් නැති තත්ත්වයට ඔබ වැටෙනු ඇත. ඔබට ඔය ගෞතමයන් ගෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? දානපතිකම් මඳකට නවතා තමන්ගේ ව්‍යාපාර ගැන සිත යොදවන්න." දෙව්දුව කීවා ය.

"ඔය ඔබ මට දෙන්නට ආ අවවාදය ද?"

"එසේ ය සිටුතුමනි. ඔබේම යහපතට එය ඔබට පැවසුවෙමි."

"එසේ නම් මේ පලාතේවත් නො සිට දුරින් දුරටම යන්න. ඔබ වැනි අය ලක්ෂයක් අවුත් කීවත් මගේ ගමන් මග වෙනස් නො වනු ඇත. ඔබ මට කීවේ ඔබට අයිති නැති දෙයකි. මගේ නිවසේ විසීමෙන් පලක් නැත. වහාම බැහැර වෙනු."

සිටුතුමා එසේ පැවසූ පසු තවදුරටත් ඒ මැදුරෙහි වසන්නට අසමත් වූ දෙව්දුව තම දරුවන් ද රැගෙන පිට වූවා ය.

(මතු සම්බන්ධයි)

විවරණාත්මක අනුවාදය (119 ගාථාව)

යාව පාපං න පච්චති පාපො අපි භද්‍රං පස්සති. යදා ච පාපං පච්චති අථ පාපො පාපානි පස්සති.

යාව: යම්තාක්; **පාපං**: පව්කම; **න පච්චති**: මෝරා නොගියේ ද (එතෙක්); **පාපො අපි**: පව් කරන්නා ද; **භද්‍රං**: (එය) යහපත් සේ; **පස්සති**: දකියි; **යදා ච**: යම් දිනක; **පාපං**: පාප කර්මය; **පච්චති**: විපාක දේද; **අථ**: එකල්හි; **පාපො**: පව්කරන්නා; **පාපානි**: දුර්විපාක; **පස්සති**: දකියි.

පව්කම් කරන පුද්ගලයා පාපය මෝරා යනතුරු එහි ආස්වාදනීය පැත්ත දකියි. පාපය මෝරා ගිය දිනට හේ එහි විපාකය විඳියි.





පින් කළ තැනැත්තා ද පින්පල දෙනතුරු එය අපහසු සේ දකී. පින්පල දෙන කල එහි යහපත දකී.

120. භද්‍රෝ'පි පස්සති පාපං
යාව භද්‍රං න පච්චති
යදා ච පච්චති භද්‍රං
අථ භද්‍රෝ භද්‍රානි පස්සති (9.5)

මෝරන තුරු කළ පින්කම්
නො දනිති එහි වටිනාකම්
මේරූ දින පින් කළ දන
විඳිති මිහිරි ඵල පින්කම්

මෝරා ගොස් ඵල දෙන තුරු - පිනත් පෙනේ පවක් අයුරු

9 (4) අනේ පිඬු සිටු වත (119 - 120 ගාථා) (ඉතිරි කොටස)

නවතින්නට මැදුරක් සොයමින් සැවැත් නුවර පුරා සැරිසැරුව ද ඇයට තැනක් නො ලැබිණි. "දැන් කරන්නට දෙයක් නැත. මම සිටුතුමා සමා කරවා ගෙන නැවත එතුමා ගේ නිවසේම වාසයට අවකාශ ලබා ගත යුතු ය"යි සිතූ ඕ තොමෝ නගරාරක්ෂක දේවතාවාණන් වෙත ගොස් "කරුණාකර මා සිටුතුමාණන් වෙත කැඳවා ගෙන යන්න. මට එතුමා ගෙන් සමාව ලබා ගන්න අවශ්‍යය"යි කීවා ය.

"ඔබ කර ඇත්තේ අයිති නැති වැඩකි. වරද ඉතා බරපතල හෙයින් සිටුතුමා වෙත ඔබ කැඳවා ගෙන යන්නට මම අකමැත්තෙමි"යි හේ ප්‍රතික්ෂේප කළේ ය. අනතුරුව ඕ හතරවරම් දෙවියන් වෙත ගියා ය. එහෙත් ඔවුහු ද ඇයට උදව් කිරීම ප්‍රතික්ෂේප කළ හ. අනතුරුව ශක්‍ර දේවේන්ද්‍රයා හමුවට ගිය ඕ සිදු වූ සියල්ල හෙළි කොට ඉතා යටහත්ව මෙසේ කීවා ය. "මට වාසයට කිසිම තැනක් නැත. මට කෙසේ හෝ මා විසූ තැනම ලබා දුන මැනවි." ඒ අසා සිටි ශක්‍ර දේවේන්ද්‍රයෝ සිටුතුමාට මේ ගැන කියන්නට මම ද අසමත් වෙමි. එහෙත් ඔහු සමා කරවා ගන්නට හොඳ උපක්‍රමයක් මම කියා දෙමි"යි පැවසු හෙයින් "මැනවි ස්වාමීනි, කියා දෙනු මැනවි" යි ඕ කීවා ය.

"යන්න, සිටුතුමා ගේ සේවකයකු ගේ වෙස් ගන්න. සිටුතුමා අතින් ලියූ ණය කරුවන් ගේ ලැයිස්තුවක් ලබා ගන්න. ඔබ ගේ දිව්‍යමය තේජස, බල මහිමය යොදවා ණය ගත්තවුන් ගෙන් ලැබෙන්නට ඇති දහ අට කෝටිය එකතු කර සිටුතුමා ගේ භාණ්ඩාගාරය පුරවන්න. ගංවතුරට අසු වී මහ මුහුදට ගිය සිටු තුමා ගේ දහ අට කෝටියක් රන් කහවණු ද ගෙන'වුත් එහි පුරවන්න. තවත් රට පුරා තැන් තැන් වල අස්වාමික ධනය නිදන්ව තිබේ. ඒවායිනුත් දහ අට කෝටියක් ගෙනවුත් ගබඩාවෙහි තබන්න. මේ සියල්ල කළ විට එතුමා ගේ භාණ්ඩාගාරය පිරෙනු ඇත. මෙසේ කළ විට ඔබේ වරදට දඩුවම ලැබුණා හා සමාන වෙයි. අනතුරුව ගොස් සිටුතුමා සමා කරවා ගන්න." ශක්‍ර දේවේන්ද්‍රයා මේ ක්‍රමය කියා දුන් විට එයට එකඟ වූ දෙව් දුව ඒ සියල්ල කර, නිමවූ පසු සිටුතුමා ගේ ඇතුළු ගැබෙහි ශරීරාලෝකය විහිදුවමින් අවකාශයෙහි පෙනී සිටියා ය.

"ඔබ කවුද?" සිටුතුමා ප්‍රශ්න කළේ ය. "ඒ මම, ඔබතුමා ගේ නිවසේ සිටි අන්ධ බාල දෙව්දුව. මම මගේ වරද පිළිගෙන ශක්‍ර දේවේන්ද්‍රයා දුන් උපදෙස් පරිදි, ඔබතුමා ගේ භාණ්ඩාගාරය කෝටි පනස් හතරක් රන් කහවණු වලින් පිරවූයෙමි. මගේ වරදට මම පිළියම් කළෙමි. මට වාසය පිණිස වෙනත් ස්ථානයක් නො මැත. එහෙයින් මම දුකට පත්ව වෙසෙමි" යි ඕ කීවා ය.

අනේපිඬු සිටුතුමා ද "මේ දෙව්දුව ඇය කළ වරදට පිළියම් කළ බව කියයි. ඇය ගේ වරද පිළිගනියි. මම ඇය බුදුරදුන් හමුවට පමුණුවන්නෙමි" යි සිතා ඇය තථාගතයන් වහන්සේ හමුවට කැඳවා ගෙන ගොස් "ඔබ කළ සියළු දේ කියන්න" යි පැවසී ය.

බුදු පාමුල වැඳ වැටුණු දෙව්දුව "ස්වාමීනි, මාගේ නො දැනුවත්කම නිසා, ඔබවහන්සේගේ කීර්තිමත්භාවය නො දැන පාපී වචන පැවසුවෙමි. මාගේ එම දුර්වචන වලට සමාවන සේක්වා!" යි පැවසුවා ය. මෙසේ ඒ දෙව් දූ තොමෝ බුදුරදුන් හා සිටුතුමා සමා කරවා ගත්තී ය.

පින් හා පව් මුහුකුරා යන අයුරු ගැන දෙව් දුව හා සිටුතුමා අමතා ධර්ම දේශනා කළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා දෙක වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (120 ගාථාව)

යාව භද්‍රං න පච්චති භද්‍රෝ අපි පාපං පස්සති. යදා ච භද්‍රං පච්චති අථ භද්‍රො භද්‍රානි පස්සති.

යාව: යම්තාක්; **භද්‍රං**: කුශල කර්මය; **න පච්චති**: විපාක නො දේද (එතෙක් කල්); **භද්‍රෝ අපි**: කුශල් කළ තැනැත්තේ ද; **පාපං**: (එය) නපුරු සේ; **පස්සති**: දකියි; **යදා ච**: යම් දිනක; **භද්‍රං**: කුශල කර්මය; **පච්චති**: විපාක දේද; **අථ**: එකල්හි; **භද්‍රො**: කුශල් කරන්නා; **භද්‍රානි**: ඉෂ්ටවිපාකයන්; **පස්සති**: දකියි.

යම්තාක් කල් කුශල කර්මය විපාක නො දේ ද එතෙක් කල් කුශල් කර්ම කරන පුද්ගලයා එය නපුරු සේ දකියි. කුශල කර්මය මෝරා ගිය දිනට ඔහු එහි ඉෂ්ට විපාකයන් දකියි.

විවරණය

අනාථපිණ්ඩික සිටුතුමා: (අනේපිඬු සිටුතුමා) භාග්‍යවතුන් වහන්සේට සිටි ප්‍රධාන දායකයා ය. ඔහු ගේ නියම නම 'සුදත්ත' ය. එහෙත් භාග්‍යවතුන් වහන්සේගේ දායකයකු බවට පත්ව දානපතියකු වූ පසු 'අනාථයන්ට උපකාර කරන තැනැත්තා' යන අරුතින් 'අනාථපිණ්ඩික' නම යෙදිණි. ඔහු උපන්නේ සැවැත් නුවර ය. බුදුරජාණන් වහන්සේට ආරාමයක් පූජා කරනු පිණිස ඉඩමක් සෙවූ හෙතෙම ජේත කුමාරයා ගේ උද්‍යානය රන්කාසි අතුරා මිළයට ගෙන, ජේතවනාරාමය ඉදි කර බුදුරජාණන් වහන්සේට පූජා කළේ ය.

අථ පාපො පාපානි පස්සති: පව් කරන පුද්ගලයෝ තමන් ගේ පැරණි පින්ඵල භුක්ති විඳිමින් සුවසේ වෙසෙනු අපි දකිමු. වර්තමාන පාප එක් රැස් වෙද්දී පැරණි කුසල් විපාක දෙයි. මේ දක්නා සාමාන්‍ය ජනයා එහි අසාධාරණයක් දකිති. ඇතැම් විට පාපයට විපාක නැතැයි වැරදි දෘෂ්ටි පවා ඇති කර ගනිති. එහෙත් එය මුලාවක් පමණි. අනිවාර්ය ස්වභාව න්‍යායක් වූ කම්ම නියාමය අනුව පාපයෙහි විපාක යම් දිනක ලැබෙනු ඇත. එසේ වූ කල පාපියා පාප විපාක දැන ගනියි.

අථ භද්‍රෝ භද්‍රානි පස්සති: කුසල් කරමින් ජීවත් වන යහපත් පුද්ගලයෙක් වුව ද අතීත පාප විපාක විඳිමින් සිටින විට කුසල විපාකය ගැන සමහරුන් විමතියට පත් විය හැක. එහෙත් එක් රැස් වන පුණ්‍ය විපාකය ඔහුට ඊට උචිත අවස්ථාවක ලැබෙනු ඇත.



අකුසලය සුලු යැයි අවමන් නො කරන්න. මඳ මඳ වුව ද පව් රැස් කරන අනුවණයා පවින් පිරේ.

121. මාප්පමඤ්ඤේථ පාපස්ස
න මං තං ආගමිස්සති
උදබින්දු නිපාතෙන
උදකුම්භො'පි පූරති
පූරති බාලො පාපස්ස
ථොක ථොකම්පි ආචිනං (9:6)

පව සුළු කොට නොතකන්නේ
පල නොදෙතියි සිතමින්නේ
දිය බිඳ බිඳ රැස්වන්නේ
දිය කලයක් පිරැවෙන්නේ
අමන බාල ජනයන්නේ
ටික ටික පව් ගොඩ වන්නේ

පව් සුළු කොට නොතකන්නේ

9 (5) නොසැලකිලිමත් භික්ෂුවක් (121 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ ආරාමයට අයත් ගෘහ භාණ්ඩ නාස්ති කළ **භික්ෂුනමක්** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

එම භික්ෂූන් වහන්සේ පන්සලේ කව්ච්චි, පුටු, බංකු, ඇඳන් ආදී කවර භාණ්ඩයක් වුව ද, පාවිච්චි කර මිදුලේ එළිමහනේ දමයි. ඒවා වැස්සට තෙමී හානියට පත් වේ. සමහර ඒවා වේයන් විසින් හානි කරනු ලැබේ. මෙසේ භාණ්ඩ විනාශයට යන ආකාරය දැක භික්ෂූහු මේ වගකීමෙන් තොර නාස්තිකාර ස්වරූපය ගැන දොස් පැවරූ විට "මම මේවා නාස්ති කරන්නේ නෑ. බලන්න, ඒ තරම් ලොකු නාස්තියක් වෙලා නැහැනේ?" යි කියයි. එහෙත් දිගටම නාස්තිකාරකම් කරයි.

මේ නාස්තිකාර භික්ෂුව ගැන බුදුරජාණන් වහන්සේට ද සැල විය. "මහණ ඔබ මෙසේ කිරීම වැරදි ය. පාපක්‍රියා ගැන සැහැල්ලුවෙන් නො සිතන්න. යමක් සුළු සේ පෙනුන ද ක්‍රමයෙන් එය විශාල විය හැකිය" යි අවවාද කොට මේ ගාථාව වදාළ හ.

විවරණාත්මක අනුවාදය (121 ගාථාව)

තං මං න ආගමිස්සති පාපස්ස මාප්පමඤ්ඤෙථ (පාපං අප්පං මාවමඤ්ඤෙථ) උදබින්දුනිපාතෙන අපි උදකුම්භො පූරති. ථොකථොකං අපි ආචිනං බාලො පාපස්ස පූරති

තං: ඒ සුළු අකුශලය; **මං**: මා කරා; **න ආගමිස්සති**: (විපාක වශයෙන්) නො එන්නේ යයි; **පාපස්ස**: පාපයට; **මාප්පඤ්ඤෙථ**: අවමන් නො කරන්නේය; නොහොත්; **පාපං**: පාපය; **අප්පං**: ස්වල්පයයි; **මා වමඤ්ඤෙථ**: නො සිතන්නේය; **උදබින්දුනිපාතෙන අපි**: (එක් එක්) දිය බිඳ එකතුවීමෙන්; **උදකුම්භො**: දිය බඳුන; **පූරති**: (යම් සේ) පිරේ ද; (එමෙන්) **ථොක ථොකං අපි**: ටිකින් ටික වුව ද; **ආචිනං**: (පව්) රැස් කරණ; **බාලො**: අඥාන තෙමේ; **පාපස්ස**: පාප කර්මයෙන්; **පූරති**: පිරෙයි.

අකුශලය ඉතා සුළු යැයි සිතමින්, එය මට විපත් පිණිස නො පවතී යැයි අවමන් නො කරන්න. දිය බින්දුව, බින්දුව බැගින් එකතු වීමෙන් හිස් කලය පවා පිරෙයි. එසේම ටිකින් ටික පව් එකතු වීමෙන් පව්කාරයා ද පවෙන්ම පිරෙයි.

විවරණය

භික්ෂු නමක ගේ එක් යුතුකමක් නම් විහාරස්ථානයක ඇති කුඩු මහත් පරිෂ්කාර, උපභෝග පරිභෝග භාණ්ඩ ආරක්ෂා කිරීමයි. ඒවා සඟ සතු කොට පිදූ දේපල හෙයින් ඒවා ආරක්ෂා කළ යුතු ය.

සංඝ සන්තක දේපල ආරක්ෂා කිරීම පිණිස එවිට සංවිධාන හා උපදේශ බුද්ධ කාලයේ සිට ම යෙදී තිබිණි. සංඝයා වහන්සේලා ට පිරිනමනු ලබන පූජා වස්තු ගරු භාණ්ඩ හා ලඝු භාණ්ඩ වශයෙන් දෙ වැදෑරුම් ය. ඒවායින් ගරු භාණ්ඩ ආරාමයට අයත්ය. ඒවා බෙදනු නො ලැබේ. බෙදනු ලබන භාණ්ඩ සඳහා භික්ෂූන් වහන්සේලා අතුරින් ම නිල දරන පිරිසක් පත්ව සිටි බව දැක්වයි. මුව පිස දමන තුවා භාරගෙන බෙදන්නට සිටි හිමි නම මුඛ පුඤ්ඡක චොළ භාජක නම් විය. සිවුරු බෙදන භික්ෂුව චීවර භාජක නම් විය. මේ ක්‍රමයට විශාල පිරිසක් ඉතා සැලකිල්ලෙන් සංඝික දේපල පරිහරණය කළ හ.

ආරාමය වුව ද අතුගා, මකුළු දැල් කඩා, බිම රතු පැහැ ගල්වා ප්‍රියංකර පෙනුමෙන් තබා ගත යුතු විය. මිදුල් අතු පතු ගා තබා ගත යුතුය.

සඟ සතු දේපල අනිසි ලෙස පරිහරණය කරන භික්ෂූන්ට පාචිත්තිය අපත්තියක් සිදුවයි. එම නීතිය පාචිත්තිය පාලියෙ හි දක්වා ඇත.

සංඝයා වහන්සේලා විසින් තමන්ට පිරි නැමෙන දේපල පරිහරනය කරන ආකාරය ක්‍රමානුකූලව වර්ධනය වී විශේෂ පාලන සංවිධානයක් ඇති විය. ලංකාවේ ජේතවන විහාරය පාලනයට එබඳු විශේෂ කමිටුවක් පිහිටුවා ගෙන තිබිණ. දිනපතා අය වැය වාර්තා තැනීම, සති පතා, මාස් පතා වාර්තා තැනීම ගැන හා වාර්ෂික අය වැය සමාලෝචනය ගැන දීර්ඝ විස්තර එහි දැක්වයි. ආරාම දේපල පාලනය ගැන මුල් විනය පිටකයෙහි නො වූ විස්තර පසුව සකස් වූ පාලි මුත්තක විනයෙහි දැක්වේ.

භික්ෂුනමකට පෞද්ගලික වස්තුව වශයෙන් ඇත්තේ අට පිරිකර පමණි. තනි පට සිවුර, දෙපට සිවුර, අඳනය, පටිය, ඉඳිකටුව හා නූල්, පාත්‍රය, පෙරහන් කඩය සහ දැලි පිහිය එම අට පිරිකර ය. මෙම පෞද්ගලික පිරිකර වුව ද භික්ෂු නමකගේ මරණයෙන් පසු සංඝික වවයි.

භික්ෂූන් වහන්සේලා සැදැහැයෙන් පිදූ දේ නාස්ති නො කර උපරිම වශයෙන් ප්‍රයෝජන ගන්නා ආකාරය සිවුරු විශාල ප්‍රමාණයක් ලැබුණු අවස්ථාවක එවායෙන් කරන්නේ කුමක්දැයි විමසනු ලැබූ විට දුන් පිළිතුරු වලින් පෙනේ. අළුත් සිවුරු ලැබුණු විට පරණ සිවුරු අත පිස දැමීමට, පාපිසි හැදීමට වැනි දේට යොදනු ලැබේ. එයින් පසු වෙනත් ප්‍රයෝජනයක් ගත නොහැකි තත්වයට ආ විට හීනියට කපා මැටි සමඟ අනා බිත්ති සැදීමට ගනිති. ඒවා කවර හේතුවක් නිසාවත් නාස්ති කරනු නො ලැබේ.



කුසලය සුලු යැයි අවමන් නො කරන්න. මඳ මඳ වුව ද කුසල් රැස් කරන නැණවතා පිනෙන් පිරේ.

122. මාප්පමඤ්ඤෙථ පුඤ්ඤස්ස	පින සුළු කොට නො තකන්නේ
න මං තං ආගමිස්සති	ඵල නොදෙති යි සිතමින්නේ
උදබින්දුනිපාතෙන	දිය බිඳ බිඳ රැස්වන්නේ
උදකුම්භොපි පූරති	හිස් කලයක් පිරැවෙන්නේ
පූරති ධීරෝ පුඤ්ඤස්ස	දැන නුවණැති ජනයන්නේ
ථොකථොකම්පි ආචිනං (9:7)	ටික ටික පින් වැඩිවන්නේ

පින් රැස් වේවි - ටික ටික එක් වී

9 (7) බිලාලපාදක සිටුවරයාගේ කතා වස්තුව (122 ගාථාව)

බිලාලපාදක නම් සිටුවරයකු මුල් කර ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි ය.

සැවැත් නුවර එක් තැනැත්තෙක් බුදුරදුන් වෙතින් ධර්ම ශ්‍රවණය කර පැහැදී උන්වහන්සේ වදාළ ධර්මයට අනුව ජීවත් වන්නට තීරණය කළේ ය. බුදුරදුන් එදා දේශනා කළේ දන් දීම ගැන ය. තමා පමණක් දන් දීම වෙනුවට අනුන් ද එක් කර ගෙන දන් දීමෙන් යස ඉසුරු පමණක් නොව පරිවාර සම්පත්තිය ද ලැබෙන බව උන්වහන්සේ ඉගැන්වූ හ. එහෙයින් තමා ද එසේ කළ යුතු යැයි සිතූ හෙතෙම පසු දින දානය සඳහා බුද්ධ ප්‍රමුඛ සංඝයාට ආරාධනය කළේ ය. අනතුරුව හේ ගෙයින් ගෙට යමින් හෙට දින පිරිනැමෙන දානයට තමා සමඟ එක් වන සේ ජනතාවට ඇරයුම් කරමින් ඔවුන් දාන වස්තු සම්පාදනයට හවුල් කර ගත්තේ ය. ඔහු ගේ මේ ක්‍රියාව බලා සිටි බිලාලපාදක නම් සිටුවරයෙක් එය විවේචනය කළේය.

"මේ මිනිසා තමන්ට කරගන්නට බැරි තරම් විශාල සඟ පිරිසකට දනට ඇරයුම් කළේ ඇයි? තමන්ට කරන්න බැරි දේ බාර ගෙන අනුන්ට කරදර කරනවා" යි පවසමින් සිතා ඉතා සුළුවෙන් පමණක් උදව් කරන්නට තීරණය කළේ ය.

හේ බඳුනකට හාල් ස්වල්පයක්, වෙඬරු ස්වල්පයක් හා හකුරු ටිකක් දුන්නේ ය. දාන වස්තු රැස් කරන්නෝ එය අනිකුත් ආහාර සමඟ මිශ්‍ර නො කර වෙනම තබා ගත්තෝය. මෙසේ කරන්නේ සිටුවරයෙක් දුන් ආහාර ස්වල්පයක තරම යැයි අනුන්ට පෙන්වා තමන්ට නිග්‍රහ කරන්නට විය හැකි යැයි සිතූ බිලාලපාදක තමන් දුන් දාන වස්තුවට කරන්නට යන්නේ කුමක්දැයි බලා ගන්නැයි සේවකයෙක් යැවීය.

දානය සංවිධානය කළ පුද්ගල තෙම සිටුවරයාට කුසල් වැඩිවීම සඳහා යැයි ඔහු දුන් ආහාරය ඉතා ස්වල්පය බැගින් ගෙන පාත්‍ර රාශියකට බෙදුවේ ය. සේවකයා මේ පුවත බිලාලපාදකට දැනුම් දුන් නමුත් දායකයා එසේ කළේ කවර හේතුවෙන් දැයි හරි හැටි තේරුම් ගන්නට අසමත් වූ හෙතෙම එය තමන් ලජ්ජාවට පත් කිරීම සඳහා ම කළ ක්‍රියාවක් සේ වරදවා වටහා ගත්තේ ය. එහෙයින් දායකයා සමඟ වෛර බැඳගත් හෙතෙම පසුදින දානය දෙන ස්ථානයට ගියේ උල් පිහියක් ද රැගෙන ය.

"සමහර විට ඔහු මා දුන්නේ ඉතා ස්වල්පයක් බව සබා මැද කියා මා ලජ්ජාවට පමුණුවන්නට ඉඩ තිබේ. එසේ කළහොත් ඔහු එතැනම මරා දමමි" යි ඔහු සිතා ගෙන තිබිණි.

එහෙත් දායක තැන බුදුරදුන් අමතා මෙසේ පැවසීය. "ස්වාමීනි, මෙය සම්මාදම් කර දෙන දානයකි. කවුරුන් වැඩියෙන් දුන්නා ද?, කවුරුන් අඩුවෙන් දුන්නා ද? යන්න ප්‍රශ්නයක් නො වේ. අප කවුරුත් සම්මාදම් වූයේ ශ්‍රද්ධාවෙනි. එහෙයින් සෑම දෙනාටම එකම තරමින් 'පින් සිදු වේවා!" මේ ඇසූ බිලාලපාදකට තමන් දායක තැන වරදවා වටහා ගත් බ්ව අවබෝධ විය. "මා මොහුට කළේ බලවත් වරදකි. මා සිතූ පාපී සිතුවිලි මෙතුමාට කියා සමා කර නො ගත්තොත් මට සිදු වන්නේ සතර අපායෙන් එකක දුක් විඳීමටය." එසේ සිතූ හෙතෙම ඔහු වෙත ගොස් "මා මිතුර, මම ඔබට ලොකු වරදක් කළෙමි. මම ඔබ වරදවා තේරුම් ගත්තෙමි. කරුණාකර මට සමා වනු මැනවි" යි ප්‍රකාශ කළේය.

මේ සමාව යැදීම බුදුරදුන්ගේ සවනට ද ඇසිණි. ඔහු කැඳවා සියළු පුවත් අසා දැනගත් භාග්‍යවතුන් වහන්සේ "උපාසකය, පිනක් සුළුයයි කිසිවිට නො සිතන්න. කෙතරම් සුළු වුව ද පින නම් වැදගත් ය. සුළු සුළු පින් එක් වීමෙන් දිනෙක එය මහා පුණ්‍යස්කන්ධයක් බවට පත්වන්නේ ය" යි පැහැදිලි කර මේ ගාථාව වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (122 ගාථාව)

තං මං න ආගමිස්සති පුඤ්ඤස්ස මා අවමඤ්ඤෙථ (පුඤ්ඤස්ස අප්පං මා මඤ්ඤෙථ) උදබින්දු නිපාතෙන අපි උදකුම්භොපි පූරති ථොකථොකං අපි ආචිනං ධීරො පුඤ්ඤස්ස පූරති

තං: ඒ සුළු කුශලයම; **මං**: මා වෙතට; **න ආගමිස්සති**: (විපාක වශයෙන්) නො එන්නේ යයි; **පුඤ්ඤස්ස**: පින්කමට; **මා අවමඤ්ඤෙථ**: අවමන් නො කරන්නේ ය නොහොත්; **පුඤ්ඤස්ස**: කුශල කර්මය; **අප්පං**: ස්වල්පයයි; **මා මඤ්ඤෙථ**: නො සිතන්නේ ය; **උදබින්දුනිපාතෙන අපි**: (එක් එක්) දිය බිඳ වැටීමෙනුත්; **උදකුම්භොපි**: දිය බඳුන; **පූරති**: පිරෙයි; (මෙසේ) පිරේ ද (එමෙන්); **ථොකථොකං අපි**: ටික ටික වුවද; **ආචිනං**: (කුශල්) රැස් කරණ; **ධීරො**: නුවණැත්තා; **පුඤ්ඤස්ස**: කුශල කර්මයෙන්; **පූරති**: පිරෙයි.

මේ සුළු පින මට විපාක දෙන්නට සමත් නො වෙතියි සිතා පිනට අවමන් නො කරන්න. දිය බිඳ බැගින් වැටීමෙන් පිරෙන දිය බඳුනක් මෙන් නුවණැත්තා පින් ටික ටික කිරීමෙන් පිනෙන් සමෘද්ධ වෙයි.

විවරණය

මාප්පමඤ්ඤෙථ: මා අවමඤ්ඤෙථ: මේ ගාථාවෙහි අරමුණ පින සුළු යයි ඒ ගැන හරි ඇගයුමක් නො කරන සිරිත වෙනුවට කුඩා වුව ද පින අගය කරන්නට දනන් පෙළැඹවීමයි. කුඩා පිනක් වුව ද යහපත් අනුසස් ලබා දෙයි. ස්වල්ප වශයෙන් හෝ සිරිතක් ලෙස නිතර නිතර පින් කරන විට ඒවා එක් රැස්වීමෙන් අපට මහා පුණ්‍යස්කන්ධයක හිමිකරුවන් විය හැක. එහෙයින් සුළු පිනක් හෝ කර ගන්නට ඉඩක් ලත් විට එය පැහැර නො හළ යුතුය.

විස දුරු කොට දිවි රැකගනු කැමැතියහු සේ පව දුරින්ම දුරැලිය යුතුය.

123. වාණිජෝ'ව භයං මග්ගං
අප්පසත්ථෝ මහද්ධනෝ
විසං ජීවිතු කාමෝ'ව
පාපානි පරිවජ්ජයෙ (9:8)

වැඩි පිරිසක් නැති - ලොකු ධනයක් ඇති
වෙළඳකු අනතුරු මඟ දුරලන සේ
සහමුලින් ම පාපය දුරලන්නේ
පණට ආදරෙන් විස දුරලන සේ

පවු දුර ලන් - විස විලසින්

9 (7) මහ ධන සිටාණන් ගේ කතාව (123 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි **මහාධන සිටුවරයා** ඇරබ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

මහාධන සැවැත් නුවර සිටුවරයෙකි. එක් වරක් හොරු පන්සියයක් ඔහු මංකොල්ලකෑමට සැලසුම් කළ හ. එහෙත් ඔවුන්ට ඊට අවස්ථාව නො ලැබිණි. එහෙත් ඔවුහු සිටාණන් ගේ ගමන් බිමන් ගැන විමසිල්ලෙන් සිටිය හ. සිටාණන් ලඟදීම වෙළඳ භාණ්ඩ පිරැවූ ගැල් පන්සියයක් ද රැගෙන බැහැර යන්නට සූදානම් වන බව ඔවුන්ට සැළවිණ.

තමන් හා එක්ව යන්නට කැමති භික්ෂූන් වහන්සේලා වෙත් නම් ගමනේ දී සියළු උවටැන් කරමියි පැවසූ සිටුතෙම භික්ෂූන් වහන්සේට තමන් හා යන්නට ඇරයුම් කළේ ය. ඒ ඇසූ පන්සියයක් භික්ෂූන් වහන්සේ ඔහු සමග යන්නට එකඟ වූහ. සිටුතුමා පිටත් වන බව දැනගත් සොරු කල් ඇතිව ම ගොස් අතරමග රැක සිටිය හ.

සිටුවරයා ද සොරුන් රැඳී සිටි වනාන්තර මාර්ගයට පිවිසෙන්නට පෙර වනදොර ටික දිනක් නැවතුණ හ. සොරු ද වන මගට තවලම පිවිසුණු පසු කොල්ලකෑමට සූදානම්ව බලා සිටිය හ. සොරුන් තමන් එනතුරු බලා සිටින බව සිටුතුමාට සැලවූයෙන් ගමන නවතා ආපසු යන්නට හේ තීරණය කළේ ය. සිටුතුමා ආපසු හැරුණු බව සැළ වූ සොරු කෙටි මගකින් අවුත් නිවසට යන අතරමග රැඳී සිටිය හ. සොරුන් ගේ ක්‍රියා පටිපාටිය ගැන ගම්වැසියෝ සිටුතුමාට පණිවුඩ එවූ හ. ඒ අනුව සිටුතුමා ටික දිනක් ගමෙහි ම රැඳී සිටින්නට තීරණය කර, ඒ බව භික්ෂූන් වහන්සේලාට ද දැනුම් දුන්නේ ය. ඒ ඇසූ භික්ෂූහු තනිවම සැවැත් නුවරට ආපසු ආහ.

දෙව්රම් වෙහෙරට ආපසු ආ භික්ෂූහු බුදුරදුන් හමුව තමන් ගමන අතහැර ආ බව ප්‍රකාශ කර සිටිය හ. බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මහා ධන ඇති මහාධන සිටුවරයා සොර සතුරන් ගැවසුණු මග මඟ හරියි. ජීවිතාශාව ඇත්තා වස විසෙන් දුරුව සිටිය යුතුය. එමෙන්ම මහණෙනි, නුවණැති භික්ෂුව ගමන් මග උවදුරු සේ භවත්‍රය දකිමින් පාපයෙන් වළකින්නට තීරණය කළ යුතු ය"යි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (123 ගාථාව)

භයං මග්ගං අප්පසත්ථො මහද්ධනො වාණිජෝ ඉව
විසං ජීවිතුකාමො ඉව පාපානි පරිවජ්ජයේ

භයං මග්ගං: අනතුරු සහගත මාර්ගය (හැර යන); **අප්පසත්ථො**: (කැටුව යන) වෙළඳ මුලක් නැති; **මහද්ධනො**: බොහෝ ධනය ඇති; **වාණිජො ඉව**: වෙළෙන්දකු මෙන් ද; **විසං**: විසක් (දුරු කරන); **ජීවිතුකාමෝ ඉව**: ජීවිතාශාව ඇති තැනැත්තකු මෙන් ද; **පාපානි**: පව්කම්; **පරිවජ්ජයෙ**: දුරු කරන්නේ ය.

සුළු පිරිසක් සමග සංචාරයෙහි යෙදෙන මහා ධනයක් ඇති වෙළෙන්දා අනතුරු සහිත මාර්ගයෙන් බැහැර වෙයි. ජීවිතාශාව ඇති පුද්ගලයා වස විස වලින් දුරු වෙයි. එසේ ම අප පාපයෙන් වැළකිය යුතු ය.

විවරණය

අප්පසත්ථ: සුළු පරිමාණ තවලමක් මෙයින් අදහස් වෙයි. සත්ථ නම් ගැල්කරු කණ්ඩායමකි. වෙළඳ භාණ්ඩ වෙනත් නගර වලට ගැල් මගින් ගෙන යාම පැරණි භාරතයේ වූ වෙළඳ රටාවයි. වනගත දුර්ග මාර්ග වලින් යා යුතු නිසා ආරක්ෂාව පිණිස කණ්ඩායම් වශයෙන් යා යුතු ය. සොරු වනයෙහි රැක සිට වෙළඳුන් වෙත කඩා පැන මංකොල්ල කති. විශාල ගැල්සාත්තු වශයෙන් යා යුත්තේ මේ උවදුරු වැළකීමට ය.

අටුවාවල **සත්ථ** (වෙළෙන්දෙ) දෙවර්ගයක් විස්තර වෙති.

එනම්,

1. **ජංඝ සත්ථ** - තනිවම පා ගමනින් බඩු සුළු ප්‍රමාණයක් රැගෙන ගොස් විකුණන වෙළෙන්දෝ

2. **සකත සත්ථ** - ගැල්වල බඩු පටවා ගෙන ගොස් විකුණන වෙළෙන්දෝ.

මෙසේ ගැල්වල ද බඩු පටවා ගෙන වෙළඳාමේ යාම බුද්ධ කාලීන භාරතීය සමාජයේ ප්‍රචලිතව තිබිණ.

පාපානි: ලෝභ, දෝෂ, මෝහ චේතනා මුල් කරගෙන කරන කායික, වාචසික හා මානසික වශයෙන් ත්‍රිවිධ වන සංචේතනික ක්‍රියාවෝ පාප වෙති.

පුද්ගලයා පහත් බවට හෝ සතර අපායාදී දුගතියට පමුණුවන ප්‍රාණඝාතාදී දුශ්චරිත කර්ම පාප නම්.

වණයක් අතේ නැති කල්හි අතින් විස ගතහැකිවාක් මෙන්ම පව් නැති කල්හි දුක් ද නැත.

124. පාණිම්හි චෙ වණො නා'ස්ස
හරෙය්‍ය පාණිනා විසං
නාබ්බණං විසමන්වේති
නත්ථි පාපං අකුබ්බතො (9:9)

තුවාලයක් අත නැති විට
නො බියව විස ගන්න අතට
වැරදි නො කරනා කෙනෙකුට
පවක් සිදු නො වේ එලෙසට

දූෂිත නම් සිත - පව් සිදු වනු ඇත.

9 (8) කුක්කුටමිත්ත ගේ කතාව (124 ගාථාව)

වේළුවනාරාමයෙහි වැඩ වාසය කළ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ **කුක්කුටමිත්ත** හා ඔහුගේ මිත්‍රයා අරමුණු කර ගෙන මේ ගාථාව දේශනා කළ සේක.

රජගහ නුවර එක් සිටුවරයකුට බාල වියේදීම සෝවාන් වූ දියණියක් සිටියේ ය. දිනක් කුක්කුටමිත්ත නම් දඩයක්කාරයෙක් කරත්තයක් පුරා මුව මස් පටවා ගෙන වෙළඳාමේ ආයේ ය. ඔහුගේ කායික පෙනුම දුටු සිටු දියණිය ඔහු කෙරේ පෙම් බැඳ ඔහු සමග ගියා ය. ඔවුන් දෙදෙනා ගේ විවාහ ජීවිතයේ ප්‍රතිඵල වශයෙන් පුත්තු හත් දෙනෙක් උපන්හ. නිසි වයසට පැමිණි පුත්තු විවාපත් වූහ.

දිනක් ලොව බලා වදාරන භාග්‍යවතුන් වහන්සේට කුක්කුටමිත්තටත් ඔහු ගේ දරුවන් හත් දෙනාටත්, ලේලියන් හත් දෙනාටත් සෝවාන් වීමට වාසනාව ඇති බව දිස් විය. එහෙයින් ඔවුන් කෙරේ අනුකම්පාවෙන් කැලෑවෙහි කුක්කුටමිත්ත සතුන්ට උගුල් අටවන තැනට ගිය භාග්‍යවතුන් වහන්සේ උගුල අසල පිය සටහනක් තබා තුරු සෙවනක වැඩ හුන් හ.

සතෙකු උගුලට අසුවී ඇත්දැයි බැලීමට ආ දඩයක්කරුට කිසිම සතෙක් අසුවී නැති බව දැකීමෙන් සිත පෑරිණි. උගුල අසල දුටු පා සටහන දුටු හෙතෙම කවුරුන් හෝ උගුලට අසුවූ සතා මුදා හරින්නට ඇතැයි සැකයක් ඇති විය. වටපිට බැලූ ඔහුට තුරු සෙවණේ වැඩ සිටි බුදුරදුන් දක්නට ලැබිණ.

"මොහු තමයි, එකත් එකට ම සතා මුදා හළේ!" යි සිතූ හේ දුන්නට ඊ තලයක් යොදා බුදුන් නසන්නට ඊයක් විදීමට සැරසුණේ ය. එහෙත් බුදුරදුන් ගේ සෘද්ධි බලය හේතුවෙන් හෙතෙම එසේම පාෂාණීභූත වූවාක් මෙන් දුනු දිය නඟා ගත් වහාම සෙළවීගත නො හැකිව සිටියේ ය. තම පියා නිවසට ඒම පමා වත් ම අනතුරක් වූවා දෝයි සිතූ දරුවෝ පියා බුදුරදුන්ට විදින්නට සැරසී සිටින අයුරු දැක, තම පියාගේ සතුරු බුදුරදුන් යැයි සිතා තමනුත් බුදුන් විදින්නට දුනු ඊතල නඟා ගත් හ. ඔවුහු ද දුනු ඊතල නඟා ගත් වන ම ගල් පිළිම සේ එසේම සිටිය හ.

මෙසේ සෑහෙන වේලාවක් ගිය පසු තම සැමියා හා දරුවන් හත්දෙනා සොයා දඩයක්කාරයා ගේ බිරිඳ සිය ලේලියන් හත් දෙනා ද කැටුව ආවාය. ඔවුන් සිටි විලාසයත් භාග්‍යවතුන් වහන්සේත් දුටු ඕ "මගේ පියා මරන්න එපා"යි කියා ගෙන ඉදිරියට ආවාය. ඒ ඇසූ කුක්කුටමිත්ත "එසේ නම් මේ මගේ මාමණ්ඩිය විය යුතු යැ"යි සිතා සිත මොළොක් කර ගත්තේ ය. දරුවෝ ද "මේ අපේ සීයා විය යුතු යැ"යි සිතා ද්වේෂය ලිහිල් කළ හ. "ඔය දුනු ඊතල අහක දමන්න"යි ඕ නැවතත් කීවා ය. මේ මොහොතේ කුක්කුටමිත්ත හා දරු පිරිස ගේ සිත් මෘදුවී ඇති බව දුටු භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට අත පය ලිහිල් කර ගන්නට ඉඩ සැලසෙන පරිදි අධිෂ්ඨාන කළ හ. ඒ අනුව ඔවුනට දුනු ඊතල බිම දමන්නට හැකියාව ලැබිණි.

ඔවුහු බුදුන් වැඳ එකත්පස වූහ. ඔවුන් ඇමතූ බුදුරජාණන් වහන්සේ ඔවුනට ධර්මදේශනයක් කළ හ. දහම් ඇසූ කුක්කුටමිත්ත, පුතුන් හත්දෙනා සහ ලේලිලා හත්දෙනා ද සෝවාන් ඵලයෙහි පිහිටිය හ.

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙරට යළි වැඩම කළ පසු ආනන්ද ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වහන්සේලා අතර මේ සිද්ධිය ගැන සාකච්ඡා ඇති විය. භාග්‍යවතුන් වහන්සේ ඇමතූ භික්ෂූහු "ස්වාමීනි, කුක්කුටමිත්ත ගේ බිරිඳ සෝවාන් උපාසිකාවක් වූ නමුත් ඕ තොමෝ සිය සැමියාට දුනු ඊතල ගෙනැවිත් දුන්නා ය. දැල් ගෙනැවිත් දුන්නා ය. ඇය ඔහුගේ දඩයමෙහි කොටස්කරුවකු වූවා නොවේද? සෝවාන් වූ ඇය තමන් නො මරනවා පමණක් නොව මරණයට අනුබලත් නො දිය යුතු නො වේ ද?" යි ප්‍රශ්න කළ හ.

භාග්‍යවතුන් වහන්සේ ඊට පිළිතුරු දෙමින් "මහණෙනි, සෝවාන් වූවෝ නො මරති. නො මරවති. අනුබල ද නො දෙති. මෙහි දී සිදුවූයේ ඇය තම සැමියා ගේ අණට කීකරු වීමක් පමණකි. අතක තුවාලයක් නැති විට විස බීජ අත ගැටුණත් තමාට අනතුරක් සිදු නො වන පරිද්දෙන් ඇයට අකුසලයක් සිදු නො වීය" යි පවසා මේ ගාථාව දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (124 ගාථාව)

චෙ පාණිම්හි වණො න අස්ස, පාණිනා විසං හරෙය්‍ය,
විසං අබ්බණං න අන්වෙති අකුබ්බතො පාපං නත්ථි

චෙ: ඉදින්; **පාණිම්හි**: අත්ලෙහි; **වණො**: වණයක් (තුවාලයක්); **න අස්ස**: නැත්නම්; **පාණිනා**: අත්ලෙන්; **විසං**: විස; **හරෙය්‍ය**: හැරගන්නේය; **විසං**: විස; **අබ්බණං**: වණයක් නැති අතට; **න අන්වෙති**: ප්‍රවිෂ්ට නො වෙයි (එසේම); **අකුබ්බතො**: පව් නො කරන්නාට; **පාපං නත්ථි**: පව් සිදු නො වෙයි.

අතෙහි තුවාලයක් නැත්නම් විස ගැන බිය විය යුතු නැත. විස සිරුරු ගත වන්නේ තුවාලයක් ඇති විට හෙයින් තුවාල නැති අතට පිවිසෙන්නේ නැත. එසේ ම වැරදි වැඩ නො කරන අයට පව් සිදු වන්නේ නැත.

විවරණය

විසං: විස මෙයින් අදහස වන්නේ තුවාල මගින් ශරීරය තුලට පිවිසෙන විෂ වගී යි.

අත්ලෙහි තුවාලයක් නැත්තහු අතින් ගත් විෂ සිරුරෙහි නො පැතිරෙන්නා සේ පව්කම් කරන්නෙකුට දුනු හී ආදිය සූදානම් කර දුන්නත් තමන් කායා දී තුන් දොරින් පව් නොකරන්නාට අකුශල චේතනා රහිත හෙයින් සිද්ධ වන අකුශල කර්මයක් නැත.

නිදොස් පුගුලෙකුට අවැඩක් කෙරේ නම් උඩු සුළඟට දැමූ දූවිලිසේ පෙරළා පැමිණේ.

125. යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනංගනස්ස
තමෙ'ව බාලං පච්චේති පාපං
සුඛුමො රජො පටිවාතං'ව ඛිත්තො (9:10)

කෙළෙස් නැති - බැඳුම් නැති
නොමැති කිසි ලෙස දුෂ්ට
කලෝතින් දුෂ්ට කම් - එවැනි හොඳ කෙනකු හට
උඩු සුළඟෙ පිඹ හරින දූවිල්ල එන ලෙසට
පාප කර්මය ඇදෙයි - කළ අමන දන වෙතට

අනුන්ට කළ දේ - තමන්ට පල දේ

9 (9) කෝක නම් වූ දඩ වැද්දා පිළිබඳ කථාව (125 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වාසය කළ භාග්‍යවතුන් වහන්සේ **කෝක** නම් වැද්දා අරමුණු කරගෙන මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් උදෙන්ම තම දඩයම් උපකරණ ද රැගෙන දඩයම් පිණිස නික්මෙන කෝක නම් වැද්දාට පිණ්ඩපාතය පිණිස නගරයට පිවිසෙන භික්ෂු නමක් මුහුණට හමු විය. එය නරක නිමිත්තක් යැයි ඔහුට හැඟිණි. "මේ කාලකන්නි භික්ෂුනම මුහුණට හමු වුනු හෙයින් අද මට කිසිම දඩයමක් ලැබෙන එකක් නැත" යි හේ තමාටම කියා ගත්තේය. ඔහු සිතූ පරිදිම එදා ඔහුට 'මුසල' දවසක් විය. එකම එක සතෙකුවත් මරා ගන්නට ලැබුණේ නැත. හිස් අතින් දොම්නසින් හේ ගෙදර ආවේ ය.

ඔහු එසේ එන අතර අවාසනාවට මෙන් ඒ භික්ෂුනම ම ඔහුට හමු විය. "අද දවස අවාසනාවන්ත වුණේ මොහු මුණ ගැසුණු නිසා ය. දැනුත් මොහු මට ඇසට පේන්නට එයි" සිතා කෝපයෙන් පිපිරුණු හෙතෙම තම දඩ බල්ලන් තෙරුන් වහන්සේ වෙත උසි ගැන්වීය. බල්ලන් තමා හපන්නට එන නිසා බියට පත් භික්ෂුනම ගහකට නැග ගත්තේ ය. බල්ලෝ ගස වටා කැරකෙමින් උඩ බලමින් බුරන්නට වන් හ. ගස මුලට ගිය වැද්දා ගසේ සිටි භික්ෂුනමගේ පයට ඊතල වලින් අනින්නට පටන් ගත්තේ ය. වේදනාවෙන් දඟලන භික්ෂුනමගේ චීවරය ලිහිල් වී වැද්දා ගේ ඇඟ මත වැටිණි.

කහවත වැද්දා මත වැටුණු විට හේ එයින් වැසී ගියේ ය. බල්ලන් සිතුවේ හිමිනම බිම වැටුණු බවකි. බල්ලෝ සිවුරෙන් වැසුණු වැද්දා මැරෙන තුරු හපා කෑහ. ඒ වේදනාවෙන් වැද්දා මිය ගියේ ය.

සියල්ල සංසුන් වූ පසු ගසෙන් බැස ගත් භික්ෂුනමට වැද්දා ගේ මරණය මහත් පසුතැවිල්ලට හේතු විය. තමා ඊට වගකිවයුතුදැයි ඔහුට සැක සිතිණි. තම සැකය දුරු කරගනු රිසි වූ උන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ හමුවට ගොස් සියළු පුවත් සැළකර ප්‍රශ්න කර සිටියෙන් භාග්‍යවතුන් වහන්සේ "භික්ෂුව, සැකයක් සිත තබා ගන්නට උවමනා නැත. වැද්දාගේ මරණයට ඔබ කිසිසේත් වග කිව යුතු නැත. ඔබ ගේ ශීලයට හානියක් නැත. තමාට වරදක් නො කළ දුෂ්ටකමක් නො කළ අයකුට දුෂ්ටකම් කිරීමෙන් වැද්දා කර ඇත්තේ වරදකි. ඔහුට එබඳු බේදවාචකයකට මුහුණ පාන්නට සිදු වූයේ ඒ නිසා ය" යි පැහැදිලි කර, මේ ගාථාව දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (125 ගාථාව)

යො අප්පදුට්ඨස්ස සුද්ධස්ස අනංගනස්ස නරස්ස
පොසස්ස දුස්සති පාපං පටිවාතං ඛිත්තො සුඛුමො
රජෝ ඉව තං එව බාලං පච්චේති

යො: යමෙක්; **අප්පදුට්ඨස්ස**: දුෂ්ටකම් නැති; **සුද්ධස්ස**: පිරිසිදු වූ; **අනංගනස්ස**: කෙලෙසුන් ගෙන් මිදුණු; **නරස්ස පොසස්ස**: නර පුරුෂයකුට; **දුස්සති**: දුෂ්ටකම් කරයි ද; **පාපං**: (ඔහු විසින් කළ ඒ) පාප කර්මය; **පටිවාතං**: උඩු සුළඟට; **ඛිත්තො**: දමන ලද; **සුඛුමො**: සියුම්; **රජො ඉව**: දූවිලි මෙන්; **තං එව බාලං**: ඒ බාලයා වෙතම; **පච්චේති**: (විපාක වශයෙන්) ආපසු එයි.

වරදක් නො කළ පිරිසිදු සිත් ඇති නික්ලේශී (කෙලෙස් නැති) උතුමකුට යමෙක් දුෂ්ටකම් කරයි නම්, උඩු සුළඟට පිඹ හල දූවිල්ලක් ආපසු තමන් වෙතම එන්නාක් මෙන් එම ක්‍රියාවෙන් ජනිත පාපය එම ක්‍රියාව කළ අඥානයා වෙත ම ආපසු එයි.

විවරණය

අනංගනස්ස: මෙහි අනංගන යන්නෙන් කෙලෙසුන්ගෙන් තොර වීම අදහස් වෙයි. අනංග නම් රාග, දෝෂ, මෝහ වැනි ක්ලේශයෝ ය. අංගන යන වචනයෙහි පිටිටනිය, කහට යන වචනාර්ථ ඇත.

ඇතමෙක් මෙලොව උපදිත්. පව් කළහු නිරයේ උපදිත්. පින් කළහු දෙව්ලොව යති. රහත්හු පිරිනිවෙති.

126. ගබ්භං එකෙ උප්පජ්ජන්ති
නිරයං පාපකම්මිනො
සග්ගං සුගතිනො යන්ති
පරිනිබ්බන්ති අනාසවා (9:11)

සමහරු මව් කුස ට
පව් කළෝ යෙති නිරය ට
පිනෙන් සුර පුරයට
පිරිනිවී යෙති කෙළෙස් දුරු කොට

සමහරු සසරට - සමහරු නිවනට

9 (10) තිස්ස තෙරණුවන් ගේ කථා වස්තුව (126 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **තිස්ස තෙරණුවන්** අරබයා මේ ගාථාව දේශනා කළ හ.

සැවැත් නුවර මැණික් කපා ඔප දමන පුද්ගලයෙක් වාසය කළේ ය . තිස්ස නම් වූ තෙර නමක් ඔහු හා මිතුරුව සිටියේ ය. නිතර මැණික් ඔප දමන්නා ගේ නිවසට ගිය හෙයින් උන්වහන්සේට 'මණිකාර කුළුපග තිස්ස' යැයි ද ව්‍යවහාර විණි. දිනක් තෙරුන් වහන්සේ ද නිවසෙහි වැඩ සිටි මොහොතක මණිකාර තෙම මස් කපමින් සිටියේ ය. එවේලෙහි රාජ දූතයෙක් රජතුමාට ඔප දමා ගැනීමට අවශ්‍ය වූ මැණිකක් රැගෙන ආයේ ය. මණිකාර තෙම ලේ මස් තැවරුණු අතින්ම මැණික ගෙන පසෙක තබා කිසියම් කාරියකට ගෙට ගියේ ය. නිවසෙහි සුරතලයට ඇති කරන කුකුළෙක් මේ අවස්ථාවෙහි ගෙට අවුත් ලේ සුවඳ නිසා මැණික ගිල දැම්මේ ය. තිස්ස හිමියෝ එය දැක්ක හ.

මණිකාරයා නැවත අවුත් බලන විට මැණික පෙනෙන්නට නො තිබුණු හෙයින් තෙරුන් වහන්සේ ගෙන් විමසී ය. එහෙත් තෙරුන් වහන්සේ තමන් එය නොගත් බව මිස ගත් කෙනකුන් ගැන නො කියති. එහෙයින් එහි සිටි එකම තැනැත්තා වූ උන්වහන්සේ සැක කළ මණිකාරයා වධ දී හෝ මැණික ආපසු ගන්නට තීරණය කළේ ය. මැණික නැති වුවහොත් රාජ උදහසට ලක්වන්නට වන හෙයින් තෙරුන් වහන්සේට එසේ වධ දී හෝ මැණික ගත යුතු ය. එහෙත් බිරිඳ ඔහුට කීවේ එසේ නොකරන ලෙස ය. "මේ හාමුදුරුවෝ විසි අවුරුද්දක් අපිට බණ කිව්වා. අපේ ගුරුවරයෙක් වගේ. ඉෂ්ට දේවතාවෙක් වගේ හිටපු මේ හාමුදුරුවෝ ගැන එහෙම හිතන්න එපා. හාමුදුරුවන්ට වධ දෙනවාට වඩා රාජ උදහසට ලක් වෙලා දඬුවම් විඳින එක හොඳයි" එහෙත් ඒ කිසිවකට සවන් නොදුන් මණිකාර තෙම උන්වහන්සේ කඹවලින් වෙලා නාසයෙන් කටින් ලේ එනතුරු වධ දුන්නේ ය. තෙරුන් වහන්සේ ගෙන් වහනය වූ රුධිරය පානය කිරීම පිණිස කුකුළා නැවත ආයේ ය. දරුණු කේන්තියෙන් සිටි මණිකාර තෙම කුකුළාට පා පහරක් දුන්නේය. ඌ එතනම මිය ගියේ ය.

එවිට තෙරුන් වහන්සේ මණිකාරයා අමතා "කුකුළාට පණ තිබේ ද? මිය ගොස් ද?" කියා බලන සේ ඉල්ලීමක් කළේ ය. "කුකුළා මැරිලා. තමනුත් මැරෙන්නේ එහෙම තමයි" මණිකාරයා ගෝරනාඩු කළේ ය. "එහෙම නම් උපාසකතුමනි, කුකුළාගේ බඩ පලා මැණික ගන්න. කුකුළා මැණික ගිලිනවා මම දැක්කා. ඌට පණ තිබුණා නම් මම මැරුණත් ඒක කියන්නේ නෑ"යි තෙරුන් වහන්සේ පැවසූ හ. කුකුළා ගේ බඩ පලා මැණික ගත් මණිකාරයා බියෙන් හා ලජ්ජාවෙන් වෙව්ලන්නට පටන් ගත්තේ ය.
"මට සමාවන්න සමිඳුනි" හේ දෙපාමුල වැඳ වැටුණේ ය. "උපාසකය, වරද මගේ ය. ඔබේ නොවේ. මෙය අපගේ පෙර කර්මයක දෝෂය නිසා වූවා විය හැක. පරණ ණය ගනුදෙනුවක් නිම වූවා යයි සිතා ගනිමු. මගේ සිතෙහි ඔබ කෙරේ ද්වේෂයක් නැත. ඇත්තටම මෙය සිදු වූයේ ගිහි ගෙවල් වලට යාමේ නරක පුරුද්ද නිසා ය. මින් මතු මම එළිපත්තෙන් මෙහාට නො එමි." යි උන්වහන්සේ පැවසූ හ. උන් වහන්සේ ලද වධ වේදනා නිසා වැඩි දවසක් ජීවත් නො වූහ. කලකට පසු මේ කතාවේ එන පුද්ගලයන්ට මරණින් මතු සිදු වූයේ කුමක් දැයි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගෙන් විමසූ හ. "කුකුළා මණිකාරයා ගේ දරුවෙක් වී උපන්නේ ය. මණිකාරයා අපාගත විය. මණිකාරයා ගේ බිරිඳ දෙව්ලොව උපන්නා ය. තෙරුන් වහන්සේ අපවත් වීමට පෙර රහත් වූයෙන් පිරිනිවන් පෑහ"යි භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කර දුන් හ.

විවරණාත්මක අනුවාදය (126 ගාථාව)

එකෙ ගබ්භං උප්පජ්ජන්ති. පාපකම්මිනො නිරයං.
සුගතිනො සග්ගං යන්ති අනාසවා පරිනිබ්බන්ති.

එකෙ: සමහර සත්වයෝ; **ගබ්භං**: මවුකුස; **උප්පජ්ජන්ති**: උපදිති; **පාපකම්මිනො**: (කළ) පව්කම් ඇත්තෝ; **නිරයං**: නරකයෙහි (උපදිති); **සුගතිනො**: යහපත්ව හැසුරුණු අය; **සග්ගං**: දිව්‍ය ලෝකයට ද; **යන්ති**: යන්නාහ; **අනාසවා**: (කාමාදී) ආශ්‍රව නැති රහත්හු; **පරිනිබ්බන්ති**: පිරිනිවන් පාති.

මරණින් මතු කර්මානුරූපව සමහරු ගැබක පිළිසිඳෙති. පව් කළ අය අපාගත වෙති. පින් කළ අය දෙව්ලොව උපදිති. කෙළෙස් දුරු කළ උතුමෝ පිරිනිවන් පාති.

විවරණය

සග්ග: දෙව්ලොව. අටුවාවල ස්වර්ගය විස්තර කරන්නේ "රූපාදීහි පඤ්ච කාම ගුණෙහි සුත්ඨු අග්ගොති සග්ගො" යනුවෙන් "රූපා දී වූ පංචකාම ගුණයන් ගෙන් මනාව පරිපූර්ණව ඇති ස්ථානය" වශයෙනි. දිව්‍ය ලෝකවල උපදින සත්වයන් මවුකුස කල් යැවීමක් නැතිව පහල වන බවද මිය යන විට මළ සිරුරක් අවශ්‍ය නො වන බව ද කියනු ලැබේ.

ගබ්භං එකෙ උප්පජ්ජන්ති: බුදු දහමේ සත්ත්වයන් ගේ උත්පත්ති ක්‍රම හතරක් ඉගැන්වෙයි. බිජු වටින් උපදන ක්‍රමය අණ්ඩජ නම් වෙයි. ගර්භයකින් උපදින ක්‍රමය ජලාබුජ නමින් හැඳින්වේ. ජලය ඇසුරෙහි උපදින ක්‍රමය සංසේදජ ය. මාධ්‍යයකින් තොරව උපදින ක්‍රමය හෙවත් 'පහළ වීම' ඕපපාතික ක්‍රමයයි.

නිරයං පාප කම්මිනො: පව් කළ අය නිරයේ උපදිති. නිරය යන වචනය සෑදී ඇත්තේ නි+අය - සැපත නැති තැන (නිරය) යන ක්‍රමයට ය. නිරය සිවු වැදෑරුමිය.

1. අපාය
2. තිරිසන් භවය (තිරච්ඡාන යෝනි)
3. ප්‍රේතාත්මය (පේත යෝනි)
4. අසුරාත්මය (අසුර යෝනි) වශයෙනි.

මේ එකක්වත් ස්ථිර සදාකාලික වාසස්ථාන නො වේ. තම අකුසල් ගෙවෙන තුරු ඒවායේ වෙසෙන සත්ත්වයෝ ඉන් අනතුරුව මනු ලොව හෝ පූර්ව ජන්මයක කරන ලද කුශලයකට ගැලපෙන තැනක උපදිති.

පරිනිබ්බන්ති අනාසවා: කෙළෙසුන් දුරු කළ උතුමන්ට උපතක් නැත.

පව්කමින් මිදිය හැකි තැනක් අහසෙහිවත් ද මුහුද මැදවත් පර්වත විවරයකවත් නැත.

127. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සෝ ජගතිප්පදෙසො
යත්ථට්ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා (9:12)

අහස් කුස හෝ මුහුද මැද හෝ
ගල් ගුහාවක හැංගිලා හෝ
කිසි තැනක මේ ලෝකයේ නැහැ
පාප කර්මෙන් බේරුමක් නම්

බේරුමක් නැත පාප කර්මෙන්

9 (11) කණ්ඩායම් තුනක විත්තිය (127 ගාථාව)

භික්ෂූන් වහන්සේලා පිරිසක් භාග්‍යවතුන් වහන්සේ දැක ගැනීමට පැමිණෙන අතරමග එක්තරා ගමක නවාතැන් ගත් හ. ඇතැම්හු භික්ෂූන් වහන්සේලා සඳහා දානය පිසමින් සිටිය හ. මේ අතර එක් නිවසක් ගිනිගත්තේ ය. එම ගින්නෙන් ගිනි ගත් පිදුරු ටිකක් අහසට නැගිණි. ඒ මොහොතේ එතනින් කපුටෙක් පියාසර කළේ ය. ගිනිගත් පිදුරු රැල් ඒ කපුටා ගේ ගෙල වටා පටලැවිනි. කපුටා ගින්නෙන් පිළිස්සී ගම මැද ඇද වැටිණි. මැරී වැටුණු කපුටා දුටු භික්ෂූන් වහන්සේලා මේ අද්භූත මරණයේ පසුපස ඇති හේතුව භාග්‍යවතුන් වහන්සේ මිස වෙන කිසිවකුට විවරණය කළ නො හැකි නිසා, දානය වැළඳීමෙන් පසු යළිත් බුදුරදුන් දක්නට යන ගමන ඇරඹූ හ. මේ අතර තවත් භික්ෂු පිරිසක් භාග්‍යවතුන් වහන්සේ බැහැ දකිනු පිණිස මුහුදු මගින් එමින් සිටිය හ. මුහුද මැදදී ඔවුන් ගේ යාත්‍රාව හිටි හැටියේ එකතැන නතර විය. කවර විදියකින් වත් නැවතුණු තැනින් සොලවා ගත නොහැකි වූ විට "මේ නැවේ කවුරුන් හෝ පව්කාරයකු සිටින හෙයින් එය ගමන් කරවිය නො හැක. ඔහු සොයා ගත හොත් ඔහු මුහුදට දමා අනිත් අය ගේ ජීවිත බේරා ගත හැකිය" යි කතිකා කරගත් ඔවුහු පව්කාරයා සෙවීම පිණිස සලාක දමන්නට එකග වූහ. තුන් වතාවක්ම සලාකය නැවියා ගේ බිරිඳටම වැටිණි. කවුරුත් බලවත් විස්මයට පත් වූහ. එහෙත් නැවියා තම බිරිඳ අමතා කඳුළු පිරුණු නෙතින් මෙසේ කී ය. "සොඳුර, ඔබ ගේ අවාසනාව නිසා මේ සියළුදෙනාම මිය යන්නට හැරීම සුදුසු නො වේ." එසේ පැවසූ හෙතෙම ඇය ගේ ගෙලෙහි වැලි කලයක් එල්ලා දියෙහි ගිල්වන ලෙස අන්‍යයනට උපදෙස් දුන්නේ ය. පුදුමයකට මෙන් ඇය මුහුදෙහි ගිල්වූ පසු නැව පිටත් විය. නැව ගොඩ බිමට ලඟා වූ පසු භික්ෂූහු "මේ සිද්ධිය පසුපස වූ යථාර්ථය භාග්‍යවතුන් වහන්සේ වෙතින් ම දැනගනිමු" යි කතිකා කර ගත් හ. තවත් භික්ෂූන් වහන්සේ හත්නමක් භාග්‍යවතුන් වහන්සේ දක්නට එන අතරමග නවාතැන් ගන්නට ආරාමයක් ගැන විමසූ විට උපාසකවරු ගල් ගුහාවක් පෙන්වා එහි නවාතැන් ගන්නැයි ඇරයුම් කළ හ. ඔවුහු එහි රාත්‍රිය ගත කළ හ. මැදියම් රැයෙහි මහ කළු ගලක් අවුත් ගුහා දොර වැසිණි. උදෑසන අසල විහාරස්ථානයක භික්ෂූහු පැමිණ ගුහාවෙහි භික්ෂූන් හත්නමක් හිරව සිටි බව දැන, අසල ගම් හතක සෙනග කැඳවා ගෙන ගල ඉවත් කරන්නට වෑයම් කළ හ. එහෙත් සත් දිනක් ගත වන තුරු ම ගල සොලවා ගන්නට ඔවුහු අසමත් වූහ. ගුහාව තුළ හිර වූ භික්ෂූන්ට ඒ සත් දින ම ආහාර තබා දිය බිඳකුදු නො ලැබිණ. සත්වන දින ගල ඉබේම ඉවත් වූයෙන් භික්ෂූහු යන්තම් දිවි ගලවා ගත් හ. "අපට මෙබඳු අතවරයක් වන්නට ඇත්තේ අප පෙර කළ කර්මයක විපාක වශයෙන්ම විය යුතු ය. එය බුදුරජාණන් වහන්සේ ගෙන්ම විමසා දැන ගනිමු" යි කතිකා කර ගත් ඔවුහු බුදුරදුන් හමුවට පිටත් වූහ. මේ කණ්ඩායම් තුනම බුදුරදුන් හමු වී තම අත්දැකීම් පවසා ඊට හේතු කවරේදැයි විමසූ හ. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, එක් සමයෙක එක්තරා ගොවියෙක් තම අකීකරු හීලෑ නැති ගොනා කෙරේ බලවත්ව කිපී උගේ ගෙල වටා පිදුරු ඔතා ගිනි තැබීය. ඌ දැවී මිය ගියේ ය. එම අකුශල කර්මයෙන් දිගු කලක් අපාදුක් විඳි හෙතෙම ආත්මභාව හතක්ම ගින්නෙන් දැවී මිය ගියේ ය. මේ කපුටා වශයෙන් මිය ගියේ ද ඒ ගොවියා ය"යි පළමු කණ්ඩායමට පැහැදිලි කළ සේක. දෙවන කණ්ඩායමට මෙසේ වදාළ හ. "මහණෙනි, එක් කාන්තාවකට ඉතා හිතවත් බල්ලෙක් සිටියේ ය. බල්ලා තම ස්වාමිදුවට බලවත් සෙනෙහසින් යන යන තැන පස්සෙන්ම ගියේ ය. මේ හේතුවෙන් ඇතැම් ගැමි තරුණයෝ ඇයට විහිළු තහළු කළ හ. එයින් බලවත් ලෙස කුපිත වූ ඕ බල්ලා මරා දමන්නට සිතා ගත්තා ය. දිනක් ඕ වැලි කලයක් බල්ලාගේ ගෙලෙහි බැඳ දියේ ගිල්වා මරා දැම්මා ය. එම අකුසල කර්මයෙන් දිගු කලක් අපාගතව දුක් විඳි මේ ස්ත්‍රිය මේ භවයෙහි නැවියා ගේ බිරිඳව ඉපිද මෙසේ වැලි කලයක් ගෙල බැඳ මුහුදට දමනු ලැබුවා ය." තුන්වන කණ්ඩායම ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ඉකුත් ජන්මයක ඔබ ගවයන් බලන තරුණයන් හත් දෙනකුව ඉපිද සිටි අවදියෙහි තලගොයකු තුඹසකට රිංගනු දැක එහි කට වසා දමා විනෝද වූහ. එය විවෘත කරන්නට අමතකව ගිය ඔවුහු දින හතකට පසු එය දැක තමන් කළ ක්‍රියාව මතක් වී තුඹස් කට විවෘත කළහ. ආහාර-පාන නැතිව දුක සේ සිටි තලගොයා එළියට අවුත් දිවි රැක ගත්තේ ය. ඔබට සත් දිනක් ආහාර-පාන නැතිව ගල් ගුහාවේ හිර වී සිටින්නට සිදු වූයේ ඒ අකුශල කර්මය හේතුවෙනි" යි ඔවුන් ගේ අකුශල කර්මය ද විවරණය කළ හ. අවසානයේ දී උන්වහන්සේ මේ සිද්ධි සියල්ල අරබයා මේ ගාථාව දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (127 ගාථාව)

යත්ථ ඨිතො පාපකම්මා මුඤ්චෙය්‍ය සො
ජගතිප්පදෙසො න විජ්ජති අන්තලික්ඛෙ න
සමුද්දමජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස න.

යත්ථ: යම් තැනක; **ඨිතො**: සිටි සත්ව තෙමේ; **පාපකම්මා**: (තමා කළ) පාප කර්මයෙන්; **මුඤ්චෙය්‍ය**: මිදෙන්නේ නම්; **සො ජගතිප්පදෙසො**: එබඳු වූ බිම් පෙදෙසක්; **න විජ්ජති**: නැත; **අන්තලික්ඛෙ**: අහසෙහි ද; **න**: (එබඳු වූ තැනක්) නැත; **සමුද්දමජ්ඣෙ**: මුහුද මැද ද; **න**: (එබඳු වූ තැනක්) නැත; **පබ්බතානං**: පර්වතයන්ගේ; **විවරං**: කුහරයට; **පවිස්ස**: පිවිසීමෙනුත්; **න**: (පව්කමින් මිදෙන්නට සුදුසු තැනක්) නැත,

මේ මිහිකත මත, පාප කර්මයෙන් මිදිය හැකි තැනක් කිසි තැනක නැත. අහසෙහි සිටියත්, මුහුද මැද සිටියත් පර්වත විවරයක් තුළට පිවිසියත් පවින් නො මිදෙන්නේ ය.

විවරණය

න විජ්ජති සෝ ජගතිප්පදෙසො: තමා කළ පාප කර්මයාගේ විපාක දුක් අනුභව නො කොට ඉන් මිදෙනු පිණිස වාසයට සුදුසු වූ බිම් පෙදෙසක් කෙසගක් පමණවත් නැත. අහස, මුහුද හෝ පර්වත ගුහාවක් වැනි කවර තැනක සිටියත් පාප කර්මය විපාක දෙන්නට සූදානම් වන විට එයින් ගැලවී ගත නො හැක.



නොමැරී සිටින්නට අහස ද මුහුද මැද ද කඳු කුහරය ද සුදුසු තැනෙක් නො මැත.

128. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතං නප්පසහෙථ මච්චු (9:13)

අහස් කුස හෝ මුහුද මැද හෝ
ගල් ගුහාවක හැංගිලා හෝ
කිසි තැනෙක මේ ලෝකයේ නැහැ
මාරයාගෙන් බේරුමක් නම්

ගැලවීමක් නැත මරුගෙන්

9 (12) සුප්පබුද්ධ රජු ගේ කතා පුවත (128 ගාථාව)

සුප්පබුද්ධ රජු අරබයා භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළේ නිග්‍රෝධාරාමයෙහි වැඩ වසමිනි.

සුප්පබුද්ධ (සුප්‍රබුද්ධ) රජතුමා දෙව්දත් හිමියන්ගේ සහ යශෝධරා කුමරියගේ පියා වූයේ ය. කරුණු දෙකක් හේතුවෙන් සුප්පබුද්ධ රජ තෙම භාග්‍යවතුන් වහන්සේ සමඟ අමනාපයෙන් පසු විය. මූලික හේතුව වූයේ තම දියණිය වූ යශෝධරා කුමරිය විවාහ කර ගෙන ඇය අත්හැර දමා ගොස් පැවිදි වීමයි. දෙවන හේතුව නම්, තම පුත්‍රයා වූ දේවදත්ත හිමියන් බුදුරදුන් ගේ පරම හතුරා බවට පත් වීමයි.

දිනක් භාග්‍යවතුන් වහන්සේ සහ මහා සංඝයා වහන්සේ පිඬු පිණිස වඩිනා බව සැළ වූ සුප්පබුද්ධ බීමත්ව උන්වහන්සේට ගමන් කරන්නට බැරිවන පරිදි මඟ අහුරා සිටියේ ය. "ශ්‍රමණ ගෞතම මට වඩා බාලය. එහෙයින් මම ඔහුට ඉඩ දී මාර්ගයෙන් ඉවත් නො වෙමි"යි පැවසූ හේ දිගට ම මඟ වළකා සිටියේ ය. මාර්ගය විවෘත නොවන බව දත් බුදුපාමොක් මහ සඟන ආපසු ගිය හ. විහාරස්ථානයට ගිය පසු බුදුරදුන් තමන් ගැන විවේචනය කරනු ඇතැයි සැක කළ සුප්පබුද්ධ "බුදුරදුන් පවසන දේ අසා සිට තමන්ට වාර්තා කරන්නයැ"යි චර පුරුෂයන් යැවී ය.

භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් අමතා මෙසේ වදාළ හ. "ආනන්ද, මගේ මඟ අහුරා සිටි සුප්පබුද්ධ ඒ කරගත් අකුශලය නිසා අදින් සත්වන දින ඔහුගේ මාලිග යේ සඳළු තලයට පිවිසෙන පිය ගැට පෙළ අසල දී පොළව පලා ගෙන නරකාදියට ගෙන යනු ලබන්නේ ය." චර පුරුෂයෝ ඒ ප්‍රකාශය රජුට සැල කර සිටිය හ. "මම පියගැට පෙළ අසලටවත් නො ගොස් බුදුරදුන් ගේ අනාවැකිය බොරු කරමි"යි පැවසූ සුප්පබුද්ධ තම සේවකයන් ලවා පිය ගැට පෙළ ඉවත් කරවීය. තමා එතැනට යන්නට සැරසුණහොත් එය කෙසේ හෝ වළක්වන්නට උපදෙස් දී රාජ පුරුෂයන් පිරිසක් ද එහි රඳවා ගත්තේ ය.

මේ තොරතුරු භාග්‍යවතුන් වහන්සේට ද සැලවිය. ඒ ඇසූ උන්වහන්සේ "මහණෙනි, සුප්පබුද්ධ කුළුණක් මත මහලක් තනා ගෙන සිටියත්, අහසෙහි සිටියත්, මහා මුහුදෙහි සිටියත්, ගුහාවක සිටියත් මගේ වචනය බොරු කළ නො හැක. මා පැවසූ තැනදීම පොළව පලාගෙන අපාගත වනු ඇත."යි පැවසූ හ.

හත්වන දින කෑම වේලාව ආසන්නයෙහි රාජකීය අශ්වයා කිසියම් හේතුවකින් බලවත් සේ කලබලව කුපිතව මාලිගය දෙවනත් කරන්නට පටන් ගත්තේ ය. හේෂාරව නඟමින් සියල්ලන්ටම පා පහර දෙමින් කලබල කරනු සැල වූ රජ තෙම තමන්ට මිස වෙන කිසිවකුට අශ්වයා හික්මවන්නට බැරි බව දන්නා හෙයින් එසේ කළ යුතු යැයි සිතා ගත්තේ ය. සියලු උපදෙස් අමතකව ගිය රජතෙම දොර දෙසට ගියේ ය. තද කොට වසා යතුරු ලා තිබුණු දොර ඉබේම ඇරිණි. ගලවා දමන ලද පිය ගැට පෙල ද එහිම වූයේ ය. ඔහු නවතාලන්නට ඔහු ගේ සේවකයන්ට අමතක විය. පිය ගැට පෙල බැස පොළවට පාදය තබත්ම මිහි මඬල විවරව රජතුමා අවීචි මහා නරකාදියටම ඇද ගෙන යන ලදි.

මොන තරම් වෑයම් කළ ද ඔහුට මරණයෙන් ගැලවී ගන්නට බැරි විය. කර්මානුරූපව සිදු විය යුත්ත සිදු විය. මේ නිමිති කර ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (128 ගාථාව)

යත්ථ ඨිතං මච්චු නප්පසහෙථ සො ජගතිප්පදෙසො න විජ්ජති අත්තලික්ඛෙ න සමුද්ද මජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස න

යත්ථ: යම් තැනක; **ඨිතං**: සිටි (සත්වයා); **මච්චු**: මරුවා; **නප්ප සහෙථ**: නො මැඩලන්නේ ද; **සෝ ජගතිප්පදේසෝ**: එබඳු බිම් පෙදෙසක්; **න විජ්ජති**: නැත්තේය; **අන්තලික්ඛෙ**: අහසෙහි ද; **න**: (එබඳු වූ තැනක්) නැත; **සමුද්දමජ්ඣෙ**: මුහුද මැද ද; **න**: (එබඳු වූ තැනක්) නැත; **පබ්බතානං**: පර්වතයන්ගේ; **විවරං**: කුහරයට (ගුහාවකට); **පවිස්ස**: පිවිසීමෙනුත්; **න**: (මරණින් මිදෙන්නට සුදුසු තැනක්) නැත,

යම් තැනක සැඟවී සිට මරුගෙන් ගැලවෙන හැකි යයි කිවහැකි තැනක් මේ මිහිමත නැත. එමෙන් ම අහසේ ද නැත. මුහුද මැද ද නැත. පර්වත ගුහාවක් තුළ ද නැත.

විවරණය

නප්පසහෙථ මච්චු: මේ ගාථාවෙන් මරුගෙන් ගැලවෙන තැනක් ලොව කිසි තැනක නැති බව අවධාරණය කරයි. උපත හා සමඟම මරණය ද නිශ්චිත වන හෙයින් ලොව උපදින සියළු සත්ත්වයන් මරණයට පත් වන බව සනාතන සත්‍යයකි.

මිනිසාට තනිවම සිට ගත හැකි ය.

බුදු සමය මිනිසාට තනිව ම කෙළින් සිට ගන්නා හැටි උගන්වයි. ආත්ම විශ්වාසය හා ධෛර්ය ලබා දෙයි.

නාරද හිමි
" Buddhism in a Nutshell "

සොබාදහමින් මිනිසා නො පරදි යි.

සොබාදහමේ අන්ධ බලවේගයනට වඩා මිනිසා ශක්තිමත් ය. මිනිසා ඒවාට යටත් වුව ද, එයින් පීඩිත වුව ද, ඒවා තේරුම් ගැනීම මගින් හේ ප්‍රභූත්වයට පත් වෙයි. බුදු සමය මේ සත්‍යය තවත් ඉදිරියට ගෙන යයි. අවබෝධය මගින් මිනිසාට තම පරිසරය පාලනය කර ගත හැකි බව එය පෙන්වා දෙයි. එහි පීඩනයෙන් මිදී සොබාදම් නීතිය තමා උසස් කර ගැනීමට භාවිතා කිරීමට ඔහුට පිළිවන් වෙයි.

පස්කාල්

10 වන පරිච්ඡේදය

දණ්ඩ වග්ග



තමා උපමාකොට සිතා අන් සතුනට තැළීම් - පෙළීම් නැසීම් නො කොට වැළකිය යුතු

129. සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාතයේ (10:1)

ලොව සියළු සත්වයෝ - තැති ගනිති දඬුවමින්
කොයි කවුරු වුණත් ලොව - බිය ගනිති මරණයෙන්
අනුන් තේරුම් අරන් - තමා උපමා කරන්
වළකින්න මැරීමෙන් - මැරීමට පෙළඹුමෙන්

තමන් ලෙසින් - සිතන් අනුන්

10 (1) භික්ෂූන් වහන්සේලා හය නමක ගේ කතාවක් (129 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **භික්ෂු හය නමක්** අරබයා මේ ගාථාව දේශනා කළ හ.

එ සමයෙහි භික්ෂූහු හය නමක් නවාතැන් ගැනීම පිණිස ජේතවනාරාමයෙහි ගොඩනැගිල්ලක් පිරිසිදු කරමින් සිටිය හ. එහෙත් එය කරගෙන යද්දී එහි පැමිණි තවත් භික්ෂු පිරිසක් "අපි ඔබට වඩා වැඩිමහල් භික්ෂූන් වෙමු. ඒ නිසා ඔබ අපට ගරු සරු කළ යුතු ය. මේ ගොඩනැගිල්ලේ අපි නවාතැන් ගන්නෙමු. අප මෙහි නැවතීම නවත්වන්නට කිසිවකුට නො හැක" යි කියමින් බාධා කළ හ.

එහෙත් මේ ආගන්තුක පිරිස ගේ බාධා කිරීම පිළිගන්නට සූදානම් නොවූ මුල් පිරිස, ඒ ඉල්ලීමට ඉඩ දෙන්නට කැමති නො වූහ. එවිට පසුව ආ ජ්‍යෙෂ්ඨ භික්ෂූහු ඒ පිරිසට පහර දෙන්නට පටන් ගත් හ. වේදනාව උසුලා සිටින්නට අසමත් වූ භික්ෂූහු කෑගසන්නට පටන් ගත් හ.

මේ කෝලාහලය බුදුරදුන්ට ද සැලවිය. දෙපක්ෂයම ගෙන්වූ භාග්‍යවතුන් වහන්සේ කිසිම භික්ෂුවක් තවත් භික්ෂුවකට පහර නො දිය යුතු යයි විනය නීතියක් පැණවූ හ. මේ ගාථාව දේශනා කරන ලද්දේ එම සිද්ධිය නිමිත්තෙනි.

විවරණාත්මක අනුවාදය (129 ගාථාව)

සබ්බේ දණ්ඩස්ස තසන්ති සබ්බේ මච්චුනො භායන්ති
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ

සබ්බේ: සියලු (සත්වයෝ); **දණ්ඩස්ස**: දඬුවමින්; **තසන්ති**: තැති ගනිති; **සබ්බේ**: සියලු සත්වයෝ; **මච්චුනො**: මරණයට; **භායන්ති**: බිය වෙති; **අත්තානං**: තමා; **උපමං කත්වා**: උපමාවට ගෙන; **න හනෙය්‍ය**: (කිසි සතෙකු) නො මරන්න; **න ඝාතයෙ**: (අනුන් ලවා ද) නො මරවන්න.

ලොව සියල්ලෝම දඬුවමට බිය වෙති. මරණයට බියවෙති. "මා මෙන් හැම සත්හු දණ්ඩනයට බියපත් වෙති. මරණයට බියපත් වෙති."යි තමා උපමා කොට අත් පා ආදියෙන් කිසි සතෙකුට හිංසා නො කට යුතුය. අන් කිසිවෙකු ලවා ද එසේ නො කර විය යුතුය.

විවරණය

මච්චුනො භායන්ති: මරණය ලොව කිසිවකුට ප්‍රිය දෙයක් නොවේ. සියල්ලෝ ම මරණය අප්‍රිය කරති. ඊට බිය වෙති. එහෙත් එය සියල්ලන්ටම සාධාරණ සංසිද්ධියකි. මරණය සිදුවන ක්‍රම හතරක් ගැන ධර්ම ග්‍රන්ථවල සඳහන් වෙයි.

1. ජනක කර්මයෙහි අවසානය නිසා සිදුවන මරණය (කම්මක්ඛය මරණ)

කිසියම් පුද්ගලයකු තම ජීවිත කාලය පුරා ප්‍රගුණ කළ සිතුවිලි රටාව මරණ මොහොතෙහි ඇතිවන චුති චිත්තයට බලපායි. එය ඊළඟ ජන්මය සඳහා විශාල බලපෑමක් ඇති කරයි. එවැනි තත්ත්වයක දී බලපාන චේතනාව ජනක කම්ම නම් වෙයි. මෙම ජනක කර්මයෙහි ශක්තිය පිරිහී ගිය විට ආයු කාලය ඉතිරිව තිබුණ ද මරණය සිදු වෙයි. මෙය බහුල වශයෙන් සිදුවන්නේ අපායෙහි උපන් සත්ත්වයන්ට වුව ද එය අන්‍ය ලෝකවල වුව ද සිදුවිය හැකිය.

2. ආයුෂ නිම වීමෙන් සිදුවන මරණය (ආයුක්ඛය මරණ)

පරමායුෂ විවිධ උත්පත්ති ස්ථානයන් හි විවිධ වේ. වයස් ගතවී ස්වාභාවිකව සිදුවන මරණය මෙසේ ආයු කාලය ඉකුත් වී සිදුවන මරණ සේ හැඳින්වේ. ඒ සත්ත්ව නිකායට හිමි විවිධ ආයු ප්‍රමාණ තිබේ. කර්ම ඉතිරිව තිබුණ ද, උපරිම ආයු සීමාව ඉක්මවිය නො හැක. ජනක කර්මය ඉතාමත් ප්‍රබල අවස්ථාවකදී ඊළඟ උපත ද එම කාලයේම සිදුවීමට ඉඩ ඇත.

3. කර්මය හා ආයු සීමාව යන දෙකම එකවර ගෙවී ගිය විට සිදුවන මරණය (උභයක්ඛය මරණ)

4. උපච්ඡේදක මරණ

ජනක කර්මයට වඩා ප්‍රබල වූ වෙනත් කර්මයක් හිටි හැටියේ ඉදිරිපත්ව ජීවිතය අකාලයේ නිම වීමට ද ඉඩ ඇත. අකාලයේ මිය යන පුද්ගලයෝ මෙන්ම ළමා කාලයේ මිය යන්නෝ ද මේ හේතුව නිසා මිය යති. ඉලක්කයක් කරා යන ඊතලයක් ඊට වඩා ප්‍රබල වේගයකින් බිම දැමීමට මෙය සම කළ හැක. මෙබඳු බලගතු කර්ම උපච්ඡේදක කර්ම ලෙස හඳුන්වනු ලැබේ. දේවදත්ත තෙරුන්ගේ හදිසි මරණය මේ ජන්මයේම කරන ලද බලගතු කර්මය උපච්ඡේදක වශයෙන් ක්‍රියා කිරීමෙන් සිදුවිය.

මේ වගී හතරින් මුල් තුන එකට ගත් විට කාල මරණ වශයෙන් ද, හතරවැන්න අකාල මරණ වශයෙන් ද හඳුන්වති.

පොල්තෙල් පහනක් නිවී යාමට තිරය නිම වීම, තෙල් නිම වීම, තිරය හා තෙල් යන දෙකම නිම වීම හෝ තද සුළඟක් හැමීම වැනි බාහිර හේතුවක් බලපෑම යන හතර විදියෙන් එකක් හේතු විය හැක. ඒ ආකාරයෙන්ම මරණය ද පූර්වෝක්ත සිවු අයුරින් එක විදියකින් සිදු විය හැක.

මරණය අනිවාර්යයෙන් ම කාටත් සිදුවන දෙයක් නමුත් ඒ බව පිළිගන්නෝ ඉතා ස්වල්ප වෙති. ඔවුහු දිගින් දිගට ම ජීවත් වන්නට රුචි වෙති. පැවැත්ම කෙරේ විශේෂ ඇල්මක් ඇත්තන් වුව ද මරණයට බිය නො විය යුත්තේ ඉදිරියට තවත් ජීවිත රැසක්ම පවත්නා හෙයිනි. අනිත් අතට මරණය සෑම දෙනාටම එක සේ වේදනාදායකයයි සිතුමද අනවශ්‍ය ය.





සියලු සතුනට සිය දිවි ප්‍රිය ය. තමා උපමා කොට අනුන් පෙළීම් - නැසීම් නො කොට වැළකිය යුතු

130. සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාතයෙ (10:2)

ලොව සියළු සත්ත්වයෝ - තැති ගනිති දඬුවමින්
කොයි කාට වුණත් ලොව - ජීවිතය ප්‍රිය හෙයින්
අනුන් තේරුම් අරන් - තමා උපමා කරන්
වළකින්න මැරීමෙන් - මැරීමට පෙළඹුමෙන්

ලොව හැමට ජීවිතය - එක සේම ප්‍රියවේය.

10 (2) භික්ෂූන් භය නමක් කළ කලබලයක් (130 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **භික්ෂූන් වහන්සේලා භය** නමක් කළ කලබලයක් ඇරබ මෙය වදළ හ.

පෙරදැක්වූ ගාථාවට අදාළ භික්ෂු භයනම තමන් බලහත්කාරයෙන් උදුරා ගන්නට තැත් කළ ලැගුම් ගෙය පිළිබඳ අරගලය නිම නො කළහ. ඔවුහු නැවතත් ගොස් පෙර සේම එහි නැවතී සිටි භික්ෂූන් පලවා හරින්නට වෑයම් කළ හ.

භාග්‍යවතුන් වහන්සේ විසින් කිසිම භික්ෂුවක් වෙනත් භික්ෂුවකට පහර නො දිය යුතුයයි නීතියක් පැණවූ හෙයින් මෙවර ඔවුහු නේවාසික භික්ෂූනට පහර නො දුන්හ. එහෙත් අරගලය මැද එක් අවස්ථාවක එක් භික්ෂුවක් තවත් භික්ෂුවකට භයංකර විලාසයෙන් තර්ජනය කළෙන් තමා මරා දමති යි බියවූ හෙතෙම මහ හඬින් කෑ ගැසීය. ඒ පිළිබඳ භාග්‍යවතුන් වහන්සේට පැමිණිලි කරන ලදුයෙන් උන්වහන්සේ තවත් නීතියක් පණවමින් කිසිම භික්ෂුවක් තවත් භික්ෂුවකට තර්ජනය නො කළ යුතු යැයි නීතියක් පැණවූ හ. අනතුරුව මේ ගාථා ධර්මය ද දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (130 ගාථාව)

සබ්බේ දණ්ඩස්ස තසන්ති සබ්බේසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ

සබ්බේ: සියළු දෙනා; **දණ්ඩස්ස**: දඬුවමින්; **තසන්ති**: ත්‍රස්ත වෙති; **සබ්බේසං**: හැම දෙනාටම; **ජීවිතං**: ජීවිතය; **පියං**: ප්‍රිය ය; **අත්තානං**: තමා; **උපමං කත්වා**: උපමා කර ගෙන; **න හනෙය්‍ය**: නො මරන්න; **න ඝාතයෙ**: නො මරවන්න.

ලොව සියල්ලෝම දඬුවමට බියවෙති. ජීවිතයට ප්‍රිය වෙති. එහෙයින් තමා උපමා කොට කල්පනා කරමින් කිසිවකු නො මරන්න. නො මරවන්න.

විවරණය

න හනෙය්‍ය න ඝාතයෙ: නො මරන්න; නො මරවන්න. මෙහි විවරණය වන්නේ බෞද්ධ සදාචාර ධර්මයෙහි ඉතා වැදගත් වන උපමාවකි. තමන් ජීවියකු වශයෙන් මරණයට හා දඬුමට ඇති බියත් තමන් තුළ පවත්නා ජීවිතාශාවත් මිම්මක් වශයෙන් ගනිමින් අනිකුත් ජීවීන් ද ඒ හා සමාන ම ජීවිතාශාවකින් හා මරණ භයකින් සමන්විත බව තේරුම්ගෙන ඒ අනුව කිසිම සත්ත්වයකුට මරණ භය ඇති නො කර හිරිහැර නො කර කාරුණිකව පිළිපැදීම මෙහි හරය යි. තමා අකැමැති කිසිවක් අනුන්ට ද නො කරන්නැයි බුදු දහම උගන්වයි.

මෙහි "හැම සත්හු දණ්ඩනයෙන් තැති ගණිති, මරණයෙන් බියපත් වෙති"යි වදාළේ නමුදු මෙහි අර්ථය සාවශේෂ බැවින් කේශරසිංහයන් ද ආජානේය හස්ති-අශ්ව-වෘෂභයන් හා ක්ෂීණාශ්‍රවයන් ද හැර අවශේෂ සත්ත්වයෝ පමණක් බියපත් වෙතියි දත යුතුයි. මොවුන් අතුරෙන් ක්ෂීණාශ්‍රව තෙම සක්කායදෘෂ්ටිය ප්‍රහීණ වූ හෙයින් නාම-රූප ධර්මයන්ගේ බිඳීමක් විනා මියෙන සත්ත්වයෙකු නො දක්නේ බියපත් නොවෙයි. කේසරසිංහාදීහු සක්කායදෘෂ්ටිය බලවත් හෙයින් තමන්ට ප්‍රතිපක්ෂසත්ත්වයෙකු නො දක්නාහු මරණයට බිය නොවේ.

මෙත්තා: තමා උපමා කර අන් අයගේ දුක-සැප ගැන සිත ඇති කර ගන්නා ආකල්පය මෛත්‍රිය සඳහා පාදක වෙයි. කිසිවෙකුට වධ වේදනා හිරිහැර නො කරනු. ඔවුන් සුබී සුවපත් වේවා යි සිතුම මෛත්‍රිය හෙවත් මිත්‍රත්වයේ ආකල්පය වැඩීමයි.

කරණීයමෙත්ත සූත්‍රයෙහි දැක්වෙන පරිදි අප ලොවට මෙත් වැඩිය යුත්තේ එකම දරුවකු ඇති මවක් එම දරුවාට දක්වන මෙත් සිත උපමාවට ගනිමිනි. මෙත් සිත වැඩීමේදී රාගය, කාමය වැනි සිතුවිලි බැහැර කර හුදෙක් මිත්‍රත්වයම වර්ධනය කළ යුතුය. වෛරය, ඊර්ෂ්‍යාව, තරඟකාරීත්වය වැනි සිතුවිලි දුරුකර මේ ආකල්පය වර්ධනය කිරීමෙන් සිත් පහන් වෙයි.

භාග්‍යවතුන් වහන්සේ තමන්ට වෛර කළ සතුරන්ට හිරිහැර කර මරා දමන්නට තැත් කළ අයට පවා මෙත් වැඩූ හ. තම පුත් රාහුලටත් දෙව්දත් තෙරුනටත් එකම සෙනෙහසින් මෙත් වැඩූ හ .

මෙත්තාව සතර බ්‍රහ්ම විහරණයන් ගෙන් එකකි. මෙත් සිත ප්‍රගුණ කරන අය කරුණාව, මුදිතාව හා උපේක්ෂාව ද වඩති. මේ සතර බ්‍රහ්ම විහරණ වැඩූ අය මරණින් මතු බඹලොව උපදින බව ද කියැවේ.

මෛත්‍රියෙහි ආනිශංස

මෙත් වඩන්නා සුවසේ නින්දට යයි. ඔහු නින්දට සැරසෙන්නේ වෛරයෙනි තොර සැහැල්ලු හදින් හෙයින් පහසුවෙන් ඉක්මනින් නින්දට වැටෙයි. හදෙහි මෙත් ගුණ පිරි අය දෙනෙත් පියා ගත් වහාම සුව නින්දක් ලබති.

සැප බලාපොරොත්තුවන යමෙක් සැප කැමැති සතුන් පෙළා නම් ඔහු සැප නො ලබන්නෙකි.

131. සුඛ කාමානි භූතානි
යො දණ්ඩේන විහිංසති
අත්තනො සුඛ මෙසානො
පෙච්ච සෝ න ලභතෙ සුඛං (10:3)

සැපට කැමති සත්වයන්ට
කර හිරිහැර දුක් දැනෙන්ට
තමන්ට සැප රිසි වුනාට
නො ලැබෙයි මතු සැප විඳින්ට

පැතුවත් නො ලබත් - මතු සැප සම්පත්

10 (3) ළමා පිරිසක ගේ පුවතක් (131 සහ 132 ගාථා)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ එක් **යොවුන් පිරිසක්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

දිනක් භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස හැසිරෙන වස් සැවැත් නුවරට පිවිසුණ හ. එක් වීදියක වඩිනා උන්වහන්සේට ළමුන් පිරිසක් කෑ කෝ ගසමින් කිසියම් දෙයක් වෙත ගල් ගසනු පෙනිණි. ඒ කුමක් දැයි කිට්ටු වී බැලූ උන්වහන්සේට ළමුන් ගල් ගසන්නේ ගැරඬියකුට බව පෙනිණි.

උන්වහන්සේ ඔවුන් ගෙන් ප්‍රශ්නයක් නැගූ හ.

"ළමයි මොකද ඔය කරන්නේ?"

"අපි මේ සර්පයකුට ගල් ගහනවා"

"ඇයි ඒ?"

" සර්පයා විසයි. අපිට දෂ්ට කරයි"

"ඉතින්, සර්පයා දෂ්ට කරනවට ඔය ළමයි බය ද?"

"ඔව්. අපි බයයි. අපි අපේ පණට ආදරෙයි. අපි සර්පයා ගෙන් බේරෙන්න තමයි මේ ගහන්නේ. ගහලා මරනවා."

"ඔය ළමයි, ඔය ළමයින්ගේ පණට ආදරෙයි. ඒ වගේ මේ සර්පයාත් උගේ පණට ආදරේ ඇති නේ ද?"

ළමෝ කතා නො කරති.

"ඔය ගොල්ලන්ට කවුරු හරි වට කර ගෙන ගහනවට ඔය ගොල්ල කැමති නැහැ නේ ද?"
"නැහැ."

"ඒ වගේ තමයි මේ සතාට ඔය ළමයි වට කර ගෙන ගහනවට එයා කැමති නෑ. දැක්ක නේද දුවල බේරෙන්න හදන හැටි. ඉතින් අපි අපේ සැප බලාගෙන අනුන්ට දුක් හිරිහැර දෙනවා නේ ද? ළමයිනේ, අපි එහෙම කළොත් අපිට සැපක් නම් ලැබෙන්නේ නෑ. ඇයි? අපි පව් කරන නිසා. පව් කරන අයට සංසාරේ දුකම තමයි ලැබෙන්නේ"

භාග්‍යවතුන් වහන්සේ ගේ උපදෙස් ඇසූ ළමෝ කැට කැබලිති පසෙකලා උන්වහන්සේට වැඳ තමන් නැවත සතුන්ට හිරිහැර නොකරන බව කියා සිටිය හ.

විවරණාත්මක අනුවාදය (131 ගාථාව)

අත්තනො සුඛමෙසානො යො සුඛකාමානි භූතානි
දණ්ඩේන විහිංසති සො පෙච්ච සුඛං න ලභතෙ

අත්තනො: තමහට; **සුඛමෙසානො**: සුව කැමැති වූ; **යො**: යමෙක්; **සුඛකාමානි**: (එසේම) සුව කැමති වූ; **භූතානි**: සත්ත්වයන්; **දණ්ඩේන**: තැළීම් පෙළීම් ආදියෙන්; **විහිංසති**: හිරිහැර කරයි ද; **සො**: හෙතෙම; **පෙච්ච**: මතු (ආත්මයේ දී); **සුඛං**: සැප; **න ලභති**: නො ලබයි.

තමහට සුව කැමැති වූ යමෙක් (එසේම) සුව කැමති වූ සත්ත්වයන් තළා පෙළා හිරිහැර කරයිද, ඔහුට පරලොව දිව්‍ය මනුෂ්‍ය සැප හෝ නිවන් සැප නො ලබන්නේය.



සැප පතන යමෙක් සැප කැමැති සතුන් පෙළීම් - නැසීම් නො කෙරේ නම් ඔහු සැප ලබන්නෙකි.

132. සුඛකාමානි භූතානි
යො දණ්ඩේන න හිංසති
අත්තනො සුඛ මෙසානො
පෙච්ච සො ලහතෙ සුඛං

සැපට කැමති සත්ත්වයන්ට
තැළුම් පෙළුම් නො දෙන්නන්ට
සැප සම්පත් රිසි තමන්ට
මතු ජන්මෙක හැකි ලබන්ට

අනුන්ට දුක් නො දෙන්නන්ට - හැකි මතුවට සැප ලබන්ට

10 (3) ළමා පිරිසක් ගේ පුවතක් (131 සහ 132 ගාථා) (ඉතිරි කොටස)

විවරණාත්මක අනුවාදය (132 ගාථාව)

අත්තනො සුඛමෙසානො යො සුඛකාමානි භූතානි
දණ්ඩේන න හිංසති සො පෙච්ච සුඛං ලභතෙ

අත්තනො: තමහට; **සුඛමෙසානො**: සැප කැමති වූ; **යො**: යමෙක්; **සුඛ කාමානි භූතානි**: (එසේම) සැප කැමති වූ සත්වයන්ට; **දණ්ඩේන**: තැළිම් පෙළීම් ආදියෙන්; **න හිංසති**: හිරිහැර නො කරයි ද; **සො**: හෙතෙම; **පෙච්ච**: මතු භවයෙහි; **සුඛං**: සැප; **ලභතෙ**: ලබයි.

තමහට සුව කැමති යමෙක් එසේම සුව කැමති සත්වයන් තැළීම් පෙළීම් ආදියෙන් නො පෙළන්නේ නම් හෙතෙම පරලොව දිව්‍ය මනුෂ්‍ය හා නිවන් සැප ලබන්නේය.

විවරණය

අනාථ පිණ්ඩික සිටුතුමා: මේ ගාථා වැඩි හරියක් දේශනා කර ඇත්තේ සැවැත් නුවර ජේතවනාරාමයේ දී ය. බුදුරදුන් වස් විස්සක් පමණ විසූ මේ ආරාමය ඉදි කර පූජා කරන ලද්දේ අනාථ පිණ්ඩික සිටුතුමා විසිනි.

අනේ පිඬු සිටුතුමාණන් ගේ නියම නම සුදත්ත ය. ඔහු ගේ අසමාන දනපතිත්වය හේතුවෙන් අනාථ පිණ්ඩික යන නම යෙදිණ. මේ නමෙන්ම පැහැදිලි වන්නේ බුද්ධ ශාසනයට කරන ලද පූජාවන්ට මෙන්ම අසරණයන්ට පරිත්‍යාග කිරීම මගින් ඔහු කීර්තියට පත්ව සිටි බවකි.

සුදත්ත උපන්නේ සැවැත් (සාවත්ථි) නුවර ය. ඔහු ගේ මස්සිනා විසූයේ රජගහ නුවර ය. වරක් ඔහු මස්සිනා ගේ නිවසට ගිය ගමනේ දී වෙනදා මෙන් තමා පිළිගන්නට පෙරට නො ආ මස්සිනා කිසියම් සාදයකට සැරසෙන බවක් දුටු හේ ඒ ගැන විමසී ය. පසු දින බුද්ධ ප්‍රමුඛ සංඝයාට දන් පිරිනමන බව ඔහුට පවසන ලදි. 'බුද්ධ' යන වචනය ඇසූ පමණින්ම ඔහුට කිසියම් අමුත්තක් දැනිණි. තමා දිගු කලක් සොයමින් සිටි යමක් ලැබුණු බවක් දැනුණු ඔහුට වහාම බුදුන් දකින්නට රිසි විය.

'බුද්ධ' යන වචනය ඇසූ මොහොතේ සිට පස්වණක් ප්‍රීතියෙන් පිනා ගොස් සිටි සුදත්තට පසුදින උදාවන තුරු සිටින්නට ඉවසිල්ලක් නො විය. එහෙයින් රෑ අඩ නින්දේ සිට ඉතා අළුයම පිබිදුණු හෙතෙම කාටත් නො දන්වා බුදුරදුන් වැඩ සිටි සීතවනය බලා අඳුරේම පිටත් විය. රැය අඳුරු වුව ද බුදුරදුන් දක්නට ඔහු තුළ වූ ප්‍රසාදාත්මක උද්‍යෝගය හා භක්තිය නිසා මග පෙනෙන තරමේ ආලෝකයක් ඔහු ගේ ශරීරයෙන් විහිදුණු බව කියනු ලැබේ. එහෙත් අතර මගදී සුසාන භූමියක් පසු කර යද්දී ඔහුට බියක් දැනිණි. ආපසු හැරෙන්නට පවා සිතුන ද සීවක නම් යක්ෂයා එතුමා දිරි ගැන්වී ය.

"ඇතුන් සීයක් - අසුන් සීයක්
සියක් වාහන - සියක් යුවතින්
රුවන් කණකර - පැළඳ ගත් නිසි
මුදු මාල මොන - තරම් තිබුණත්
පියවරක ඔබ - පෙරට තබනා
එක් සොළොස් අඩ - තරම් නො වටී
සිටු තුමාණනි - යන්න පෙරටම
එපා කිසි ලෙස පසු බසින්නට"

ඔහු ගේ බිය දුරු වී බුදුරජාණන් වහන්සේ කෙරේ භක්තියෙන් සිත පිරී ගියේ ය. දිරි උපදවා ගත් හේ පෙරටම ගමන් කළේ ය. මෙ බඳු පසුබෑම් දෙ තුන් වරක් ම සිදු වුව ද අන්තිමේ හේ සීත වනයටම ගියේ ය.

ඔහු ගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටි භාග්‍යවතුන් වහන්සේ ඔහු "සුදත්ත" යැයි නමින් අමතා පිළිගත් හ. එසේ අමතනු ලැබීමෙන් පහන් වූ, හෙතෙම "බුදුරදුන් සුවසේ සැතපිණිදැ"යි විමසී ය. එයට පිළිතුරු වශයෙන් භාග්‍යවතුන් වහන්සේ

"කෙළෙස් ගිනි නිවාලූ - කම් සුවය හැර දැමූ
රහත් පල ලත් අයට - නිදා ගත හැක සුවෙන්
සියළු බර බහා ලූ - නිවී සැනසුණු සිතැති
නැවුම් දිවියක් ලැබූ - පහන් සිත් ඇති ඔවුහු
දුක් වේදනා මුදා - සුවෙන් සැතපෙති සදා"

යි පිළිතුරු දුන් හ. දහම් අසා සෝවාන් වූ හෙතෙම භාග්‍යවතුන් වහන්සේට සැවැත් නුවර වස් වසන්නට ඇරයුම් කළ හ. බුදු රදුන් ඒ ඇරයුම පිළිගත්තෙන් හෙතෙම ජේත කුමරුන් ගේ උයන රන් කාසි අතුරා මිලයට ගෙන ජේතවනාරමය තනවා පූජා කළේ ය. බුදුරදුන් වස් දහ නමයක්ම ගත කළේ ජේතවනාරාමයේ ය.

අනාථ පිණ්ඩික සිටාණන් ගේ ලේලිය වූ සුජාතා තරමක් සැර පරුෂ, කලබලකාරී තැනැත්තියක වූවා ය. වරක් සිටුතුමාගේ නිවසට වැඩම කළ බුදුරදුන්ට ඇය ගේ කට හඬ අසන්නට ලැබිනි. "ඒ මගේ ලේලිය යි. ඕ සැර පරුෂයි. ඇය සැදැහැ ඇත්තියක නො වේ" යි සිටුතුමා පැවසී ය.

ඇය කැඳවූ බුදුහු භාර්යාවරුන් සත් දෙනකු සිටින බව විස්තර කළ හ. එනම්,

1. වධක භාර්යාව
2. චෝර භාර්යාව (හෙරක් වැනි බිරිඳ)
3. අය්‍ය භාර්යාව (ස්වාමිදුවක් බඳු බිරිඳ)
4. මාතු භාර්යාව (මවක් වැනි බිරිඳ)
5. භගිනි භාර්යාව (නැගනියක වන් බිරිඳ)
6. සඛී භාර්යාව (මිතුරියක වැනි බිරිය)
7. දාසි භාර්යාව (දැස්සක වැනි බිරිඳ)

මෙයින් ඔබ කවරෙක්දැයි ඇසූ විට 'මම දාසි භාර්යාවක් වෙමි' යි ඕ නිහතමානීව කීවා ය. දිනපතා දෙව්රමට ගොස් බුදුරදුන් දකින්නට පුරුදුව සිටි අනාථ පිණ්ඩික සිටුතුමා උන්වහන්සේ ආරාමයේ නැති විට උන්වහන්සේ වෙනුවට වඳින්නට පුදන්නට යෝග්‍ය සංකේතයක් සේ ආනන්ද හිමියන් ලවා බෝධියක් රෝපණය කරවා ගත්තේ ය.

සුඛ: බුදු සමය මෙලොව සැප හා පරලොව සැප පිළිබඳව උගන්වන දහමකි. දිට්ඨධම්ම සුඛ හා සම්පරායික සුඛ වශයෙන් හඳුන්වන්නේ දෙලොව සැපත යි. දිට්ඨධම්ම හෙවත් මෙලොව සැපත ගිහි සුඛ හා පබ්බජිත සුඛ වශයෙන් ද්විවිධ ය. ගිහියා ගේ සැප ලෞකිකත්වයට බර වෙතත් පබ්බජිත සුඛය නෛෂ්ක්‍රම්‍යයට බර ය.

ගිහියා ගේ සැපත ගැන විස්තර කරන භාග්‍යවතුන් වහන්සේ

1. **අත්ථි සුඛ** (දැහැමින් දෑත දෙපය වෙහෙසා උපයා ගත් ධනයක් තමන්ට ඇති බව සිතන විට ඇති වන සැපය)

2. **භොග සුඛ** (උපයා ගත් ධනයෙන් තමා, තම දෙමාපියන්, අඹු දරුවන්, මිත්‍රාමාත්‍යයන් සතුටු කර, පිණවා පංච විධ බලිද ඉටු කළ විට ඇතිවන සතුට)

3. **අණන සුඛ** (තමා කිසිවකුට ණය නැති බව සිතන විට ඇති වන සතුට)

4. **අනවජ්ජ සුඛ** (නිරවද්‍ය ජීවිතයක් ගත කරන බව සිතන විට ඇතිවන සතුට)

යනුවෙන් එය සිව් වැදෑරුම් වන අයුරු පැහැදිලි කළ හ.



කිසිවෙකුට පරොස් බස් නො කියන්න. එසේ කීවොත් ඔබට ද ඇණුම් - බැණුම් වලට මුහුණ පෑමට සිදුවේ.

133. මා'වොච ඵරුසං කඤ්චි
වුත්තා පටිවදෙය්‍යු'තං
දුක්ඛා හි සාරම්භ කථා
පටිදණ්ඩා ඵුසෙය්‍යු තං (10:5)

නො කියනු මැන පරුස වචන - ඔබ ඒවා කීවොත්
සිත් රිදෙනා වචන ඔබට - කියත හැකිය අනුනුත්
එකට එක කියා ගැනීම දුකක් වේය ඔබටත්
එකිනෙකාට බැන වැදීම විඳින්න වෙයි කාටත්

කළොත් එකට එක - අත් වෙනවා දුක

10 (4) කුණ්ඩධාන තෙරුන්ගේ කථාව (133 සහ 134 ගාථා)

කුණ්ඩධාන තෙරුන් වහන්සේ ඇරබ බුදුරජාණන් වහන්සේ මේ ගාථා දෙක දේශනා කළේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරමිනි.

කුණ්ඩධාන තෙරුන් පැවිදි වූ දා පටන් උන්වහන්සේ ගමන් කරන හැම තැනම රූමත් කාන්තාවක් ද උන්වහන්සේ කැටුව ඇවිදිනා බවක් පෙනෙයි. එහෙත් තෙරුන් වහන්සේට ඇය පෙනෙන්නේ නැත. තෙරුන් ගම පුරා පිඬු සිඟා වැඩි විට දායකයෝ තෙරුන්ගේ පාත්‍රයට එක් හැන්දක් බෙදා "ඔබ වහන්සේටය" කියා, තවත් හැන්දක් "මේ ඔබ වහන්සේ සමග යන මිතුරියට"යැයි බෙදති.

මෙම අරුමය සිදු වූයේ උන්වහන්සේ අතින් කාශ්‍යප බුදුන් සමයෙහි සිදු වූ පාප කර්මයක විපාකයක් වශයෙන් යැයි වාර්තා වෙයි.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගේ ශාසනයෙහි භික්ෂු දෙනමක් එක මවගේ දරුවන් මෙන් මහත් සෙනෙහසින් විසූ හ. කොහි යතත් දෙනම එකටම යති. දිනක් මේ දෙනම උපෝසථ කර්මය පිණිස යමු යි එකට පිටත් වූ හ. එකල්හි එක් දෙවි දුවක් මේ දෙනම දැක "මුන් වහන්සේලා ගේ මිතුරු කම උවමනාවට වැඩිය. මේ දෙදෙනා භේද කළ යුතුය" යි සිතා උපක්‍රමයක් කල්පනා කරමින් සිටියා ය.

අතර මඟ දි එක් නමකට ශරීරකෘත්‍යය කිරීමේ අවශ්‍යතාවක් ඇතිවිය. මා ශරීරකෘත්‍යය කර එනතුරු ඔබ ඔතැනම සිටිනු මැනවැයි උන්වහන්සේ වනරොද තුළට පිවිසුණා හ. මේ අවස්ථාවෙහි තම අරමුණ ඉටු කර ගන්නට ඉඩ ලැබිණැයි සිතූ දෙවි දුව මනුෂ්‍ය ස්ත්‍රියක ගේ වේශයක් මවා ගෙන තෙරුන් වනයෙන් පිටතට එන විට ඇඳිවත සකස් කරමින් හිස කෙස් සකසමින් උන්වහන්සේ සමඟම පිටතට ආවාය. තෙරුන්ගේ මිතුරු හිමිනමට පෙනෙන්නට එසේ අවුත් ඕ වෙන්'තක නොපෙනී ගියා ය.

මිතුරු හිමිනම මේ සියල්ල බලා සිට තෙරුන් වහන්සේ ගෙන් "ඔබේ සිල් බිඳ ගත්තා නො වේ දැ" යි ප්‍රශ්න කළේය. "නැත. මා එවැන්නක් කර ගත්තේ නැත"යි තෙරනු පිළිවදන් දුන් හ. "ඇයි නැත්තේ මා දුටුවා ඔබ පසු පස රූමතියක් එන බව." "නැහැ ඇවැත්නි, මා එවැන්නියක් දැක්කේ නැහැ. එබඳු දෙයක් කළෙත් නැහැ. නිකරුණේ මා වැනසෙන කතාවක් හදන්න එපා." "මගේ ඇහින් දුටු දේ බොරු කරන්න හදන්න එපා. ඇය ආපු විදියෙන් මට හොඳටම විස්වාසයි නරක දෙයක් වෙලා තියෙන බව." මෙසේ දිගින් දිගටම කරුණු කීවත් ඇසින් දුටු දේට වඩා වෙනත් දෙයක් පිළිගන්නට හිමිනම කැමති නො වීය. "මම ඔබ සමග පෝය නො කරමි."යි හේ කියා සිටියේ ය.

උපෝසථාගාරයේ දී චෝදක හිමිනම සියළු භික්ෂූන් ඉදිරියේ "මේ භික්ෂු නම පාරාජිකා වූයේ ය. මම මේ සිද්ධිය දුටුවෙමි. ඔහු සමඟ පෝය කළ නො හැක"යි චෝදනා කළේ ය. චූදිතයා ඒ චෝදනාව ප්‍රතික්ෂේප කළ ද ඇසින් දුටු සාක්ෂිය ප්‍රබල විය. අන්තිමේ දී උපෝසථ කර්මය ඉදිරියට ගෙන යා නො හැකිව මහා අර්බුදයක් ඇති විය.

මේ සියල්ල බලා සිටි දෙවි දුව ''මා විසින් මිතුරු දමක් බිඳින්නට ගොස් කර ඇත්තේ මහා බරපතල වරදකි. දැන් මේ අර්බුදය විසඳිය යුත්තේ ද මා විසිනි"යි සිතා සංඝයා වහන්සේලා අමතා "ස්වාමීනි, මේ භික්ෂුනම වරදක් නො කළේ ය. මා මේ විහිළුව කළේ දෙනම ගේ මිතුරු දම් බිඳ දමා විනෝද වීමට ය. සමා වී පෝය කරනු මැනවි"යි කියා සිටියේ ය. දෙවි දුව අහසේ පෙනී සිට ප්‍රකාශ කළ හෙයින් හිමිවරු එය පිළිගත් හ. කෙසේවුව ද දෙනමගේ මිත්‍රත්වය පෙර මෙන් කුළුපග තත්වයට යළි පත් නො වීය.

විවරණාත්මක අනුවාදය (133 ගාථාව)

කඤ්ච් එරුසං මා අවෝ ච වුත්තා තං පටිවදෙය්‍යුං
සාරම්භ කථා හි දුක්ඛා පටිදණ්ඩා තං ඵුසෙය්‍යුං

කඤ්ච්: කිසිවකුට; **එරුසං**: රළු බසක්; **මා අවෝ ච**: නො කියන්න; **වුත්තා**: බැණුම් ලද්දෝ; **තං**: ඔබට; **පටිවදෙය්‍යුං**: පිළිවදන් කියන්නා හ; **සාරම්භ කථා හි**: හරස් කතා කිරීම හෙවත් එකටෙක කියා ගැන්ම; **දුක්ඛා**: දුකක් වෙයි; (එහෙයින්) **පටි දණ්ඩා**: ප්‍රති ප්‍රහාර; **තං**: ඔබට; **ඵුසෙය්‍යුං**: පැමිණෙයි.

කිසිවකුට බැණ නො වදින්න. බැණුම් ලද්දෝ ඔබට ද බණිනු ඇත. (එකට එක කියා ගනිමින්) බැණ ගැනීම දුකකි. එහි ප්‍රතිඵල වශයෙන් ප්‍රති ප්‍රහාරයට ලක්වන්නට සිදුවෙයි.



නිසල තැනැත්තා නිවණට පැමිණියකු වැනි ය. ඔහු එකටෙක කීමෙක් කෙරීමෙක් නැත.

134. ස වෙ නෙරෙසි අත්තානං
කංසො උපහතෝ යථා
එස පත්තෝසි නිබ්බාණං
සාරම්භො තෙ න විජ්ජති (10:6)

බිඳුණු පිත්තල බඳුන
නැවත හඬ නොම නඟන
විලස නිවනට පැමිණ
මැන කලහ දුර හරින

සැනසුම් සිත - යුතු රැක ගත

10 (4) කුණ්ඩධාන තෙරුන්ගේ කතාව (133 සහ 134 ගාථා) (ඉතිරි කොටස)

හිමිවරු ඒ ආත්ම භාවයේ ම රහත් වී ගත නුහුණු හෙයින් අපවත් ව දෙව් ලොව උපන් හ. දෙව් දුව තමන් කළ අකුශල කර්මය නිසා අවීචි මහා නරකාදියෙහි උපන්නා ය. බොහෝ කලක් අපාදුක් විඳි ඕ අප බුදුන් සමයෙහි සැවැත් නුවර කුල පුත්‍රයෙක් ව ඉපිද පැවිදිව උපසම්පදාව ද ලද්දේ ය.ඒ මේ කුණ්ඩධාන තෙරණුවෝ ය. එහෙත් උන්වහන්සේ පැවිදි වූ දා පටන් මහ මග වඩිනා විට රූමත් කාන්තාවක් පසු පසින් යන අයුරක් දිස් වෙයි. එය උන්වහන්සේ නො දකිති.

පුරාකෘත අකුශලයෙහි විපාක වශයෙන් මෙය සිදු වන බව කිසිවෙක් නො දනිති. එහෙයින් මෙය මුළු සඟ පරපුරට ම නිග්‍රහයක් සේ සිතූ භික්ෂූහු අනේ පිඬු සිටාණන් හමු වී "සිටාණෙනි,මේ අබ්‍රහ්මචාරී භික්ෂුව ඔබේවිහාරස්ථානයෙන් නෙරපා දමන්න. උන්වහන්සේ ගේ නොමනා පැවතුම් නිසා සියළු භික්ෂූන්ටම සිදු වී ඇත්තේ නින්දාවකි" යි පැවසූ හ. "හිමිවරුනි, බුදුරදුන් විහාරයේ නැති ද?" යි සිටුතෙම විමසීය. "සිටිති"යි ඔවුහු පිළිවදන් දුන් හ."එසේ නම් උන්වහන්සේම මෙය දකිත්වා"යි හේ නිහඬ විය. අනතුරුව භික්ෂූහු විශාඛා උපාසිකාව හමුවට ගොස් ඒ ඉල්ලීම කළ හ. ඕ ද එම පිළිතුර ම දුන්නා ය. දායකයන් මෙසේ උදාසීන වීම ගැන නො සතුටු වූ හිමිවරු රජතුමා හමුවන්නට ගොස් මෙ පවත් පැවසූ හ. රජතුමා ඒ හිමි නම වසන ආරාමය අසා දැක ගෙන පරීක්ෂණයක් කරනු පිණිස තෙමේ ම ගියේ ය.

රජතුමා තෙරුන් පරීක්ෂාවට එතැයි ඇසූ බොහෝ ගිහි-පැවිදි පිරිස එහි රැස් වූයෙන් ඇති වූ කලබල හඬට කුණ්ඩධාන තෙරණුවෝ ද ලැගුම් ගෙයින් පිටතට ආහ. එවිටම හිමි නම සමග කාන්තාවක් ද පිටතට එනු රජතුමාට දිස් විණි. රජතුමා වෙහෙරට පැමිණෙනු දුටු කුණ්ඩධාන තෙරණුවෝ උඩුමහලේ සිය ඕවරකයට ගොස් වැඩ හුන් හ. රජතුමා උඩු මහලට නැගි නමුත් තෙරුන් නො වැන්දේ ය. එහෙත් ස්ත්‍රී රූපය පෙනෙන්නට නුවූයෙන් උඩු මහල පුරා බලා ඇය නො දැක "හිමියනි ඔබ වහන්සේ සමග උඩු මහලට ආ ස්ත්‍රිය කොහිද"යි විචාළ හ. "මහරජ මා දුටු ස්ත්‍රියක් නැත" යි හිමිනම පිළිතුරු දුන්නේ ය. "ස්වාමීනි, මඳකට පහල මාලයට වැඩම කරන්නැ"යි රජතුමා ඉල්ලා සිටියෙන් තෙරණුවෝ එසේ කළ හ. මතු මාලයේ දී නො පෙනුනු ස්ත්‍රී රූපය පහල මාලයේ දී යළි පහළ විය. නැවත උඩු මහලට ගිය විට ස්ත්‍රී රූපය අතුරුදහන් විය. දෙ තුන් වරක් මෙය පිරික්සූ රජ තෙම "ස්වාමීනි, මෙහි තේරුම කුමක් ද? මට ඇත්ත කියනු මැනවි"යි විමසී ය. "මහරජ, මම මෙහි ඇත්ත නැත්ත නො දනිමි. මා සමග කාන්තාවක් ඇවිදින බව බොහෝ දෙනා කියති. එහෙත් මම කිසි කලෙක ඇය නො දකිමි" යි පිළිතුරු දුන්නේය.

යම්කිසි අබිරහස් ඉරණමකින් හිමිනම අසරණ බවට පත්ව සිටින බව තේරුම් ගත් රජතෙම "හිමියනි, මේ තත්වය යටතේ ඔබ වහන්සේට කිසිවකු දාන-මානාදිය නො පිරිනමනු ඇත. එහෙයින් දිනපතා රජ මැදුරට පැමිණ ආහාර වළඳා යනු මැනවි" යි ආරාධනය කර ගියේ ය. පැමිණිලිකාර හිමිවරු මෙයින් වඩාත් අමනාපයට පත්ව " දුශ්ශීලයා දැන් රජතුමා සමග මිත්‍ර වූවා"යි කීහ. ඒ ඇසූ කුණ්ඩධාන තෙරණුවෝ දැන් තමන් රාජ කුලුපග හෙයින් මානයෙන් ද යුතුව "දුස්සීල කමත් සුසීල කමත් ඔබවහන්සේලා ලගම ය" යි බැණ වැදුණෝ ය.

එයින් අමනාපයට පත් හිමිවරු බුදුරදුන් කරා එළඹ "මේ භික්ෂුව තමන් දුශ්ශීල වූවා මදිව අපට දුශ්ශීල වාදයෙන් චෝදනා කරයි" යි පැමිණිලි කළ හ. ඒ පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ විමසූ විට කුණ්ඩධාන තෙරණුවෝ "දුශ්ශීල නොවූ මට එසේ කී හෙයින් මමත් එසේ කීමි" යි පිළිතුරු දුන් හ. භාග්‍යවතුන් වහන්සේ එවිට "එසේ එකට එක කීම නො වටී. මේ හිමිවරුන් ඔබ දුශ්ශීලයැයි කීවේ කාන්තා රූපයක් ඔබ හා ඇවිදිනු ඇසට පෙනෙන හෙයිනි. එහි නිදහසට කරුණක් තිබේ. එහෙත් ඔබ ඔවුන්ට දුශ්ශීල චෝදනාව කරන්නේ එසේ නැතිව නිකරුණේ ය.
ගිය ආත්මයක කළ බලවත් අකුශල කර්මය නිසා දැන් මෙසේ නිග්‍රහ ලබන්නේහි ය. දැනුත් සිල්වතුන්ට බැණ වැදී තවත් අයසට පත් වන්නට වෑයම් නොකරන්න. කිසිවකුට එකට එක නො කියන්න. පිත්තල කළයක් කෑලිවලට කැඩූ පසු හඬ නැතුවා සේ නිහඬව ඉන්න"යි අවවාද කර මේ ගාථා වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (134 ගාථාව)

සචෙ උපහතො කංසො යථා අත්තානං නෙරෙසි එසො
නිබ්බාණං පත්තො අසි තෙ සාරම්භා න විජ්ජති

සචෙ: ඉදින්; **උපහතො**: බිඳ දැමූ; **කංසො**: ලෝහ තලියක්; **යථා**: විලසින්; **අත්තානං**: තමා; **නෙරෙසි**: නිහඬ කර ගන්නේ නම්; **එසො**: ඒ ඔබ; **නිබ්බාණං**: නිවනට; **පත්තො අසි**: පැමිණියේ වෙහි; **තෙ**: ඔබට; **සාරම්භො**: වචන හුවමාරුවක්; (එකට එක කියුම් කෙරුම්) **න විජ්ජති**: නො වන්නේ ය.

බිඳ දැමූ ලෝහ තලියක් මෙන් නිහඬව ඔබට ඉන්නට හැකි නම්, මේ පිළිවෙත පුරන්නා වූ ඔබ නිවනට පැමිණියෙක් වන්නේය. එසේ නිවන් ලබන ඔබට කිසිවකු සමග වචන හුවමාරු කර ගන්නට අවශ්‍ය නො වන්නේ ය.

විවරණය

එරුසං මා අවො ච: රළු වචන නො කියා වාග් සදාචාරය පුරන්නට පෙළඹවීමකි. බොරුව, කේලම, එරුස වචනය හා සිපාදප කතාව යන හතරෙන්ම වැළකුණු විට වාග් සුචරිතය පිරුවා වෙයි.

කංස: ලෝහයෙන් තැනූ තලියක් වැනි බඳුන් කංස නම් වෙයි. ලෝහ ගණයට රන්, රිදී, තඹ, යකඩ හා ඊයම් යන පහ ගැනේ. ලෝහයෙන් තැනූ තලියක් හඬ නගන්නේ එහි ගෝල හැඩය තිබෙන තුරු පමණි. කඩා බිඳ දැමූ විට ඝණ්ටා නාදය වැනි රාවයක් නගන්නේ නැත.



ගොපලු ගවයන් කෙවිටෙන් ගොදුරට ගෙනයන සේ ජරා මරණ දෙ දෙන සතුන් ගේ ආයු ගෙවාලත්.

135. යථා දණ්ඩේන ගොපාලො ගාවො පාචෙති ගොචරං එවං ජරා ච මච්චූ ච ආයුං පාචෙන්ති පාණිනං (10:7)	කෙවිටි පාහර දී ගව රැල ගෙන යන සේ තණ පිටියට ජරා මරණ දෙක මිනිසුන් ගෙන යනවා දිවිය අගට

ජරා මරණ එයි - දිවි කෙළවර වෙයි.

10 (5) සිල් ගත් උවැසියන් පිරිසක් (135 ගාථාව)

පූර්වාරාමයෙහි වැඩ වාසය කරන සමයෙහි අප බුදුපියාණන් වහන්සේ විසින් මේ ගාථාව පෙහෙවස් සමාදන් වූ **උපාසිකාවන්** පන්සියයක් මුල් කරගෙන වදාරන ලදී.

වරක් සැවැත් නුවර කාන්තාවෝ පන්සියයක් පූර්වාරාමයට පැමිණ අටසිල් සමාදන් වූ හ. විහාරය කරවා පූජා කළ දානපතිනිය වූ විසාකා සිටු දියණියෝ ඔවුන් බැහැ දකින්නට පැමිණ විවිධ වයස් වල අයගෙන් සිල් ගන්නට හේතුව කුමක්දැයි විමසූ හ. ඇයට විවිධ වයස් වල අය ගෙන් ලැබුණේ විවිධ පිළිතුරු ය. වයස්ගත උපාසිකාවන් පැවසුවේ තමන් ආවේ අටසිල් රැකීම මගින් මරණින් මතු දිව්‍ය ලෝකවල ඉපිද දෙව් සැප විඳින්නට බව ය. සමහර මැදිවියේ කාන්තාවෝ පැවසුවේ සැමියා ගේ සම බිරින්දෑන් සමග දිගටම නිවසෙහි සිටින්නට ඇති අකමැත්ත නිසා දිනය විහාරස්ථානයේ ගත කිරීමට පැමිණි බව ය. තරුණ කාන්තාවන් කරා ගොස් විමසූ විට පුතුන් ලැබේවා යි ප්‍රාර්ථනා කරමින් සිල් ගන්නට ආ බව කී හ. බාල ළඳුන් කියා සිටියේ තමන් නව යොවුන් වියේ දීම විවාහ වීම ප්‍රාර්ථනා කර පැමිණි බවය. මේ සියළු පිළිතුරු රැස් කර ගත් විසාකා තොමෝ බුදුරදුන්ට ඔවුන් හඳුන්වා දී මේ අය අට සිල් ගන්නට පෙළැඹුණු විවිධ හේතු සැළ කර සිටියා ය. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "විසාකාවෙනි, ගවයන් කෙවිටෙන් හසුරුවා තණ බිමට ගෙන යන්නා සේ ජරාව හා මරණය අපේ ජීවිත අවසානය කරා ගෙන යයි" යි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (135 ගාථාව)

යථා ගොපාලො දණ්ඩේන ගාවො ගොචරං පාචෙති එවං ජරා ච මච්චූ ච පාණිනං ආයුං පාචෙන්ති

යථා: යම් සේ; **ගොපාලො**: ගව පල්ලෙක්; **දණ්ඩේන**: කෙවිටෙන්; (පහර දෙමින්) **ගාවො**: ගවයන්; **ගොචරං**: තණ බිම කරා; **පාචෙති**: ගෙන යයි ද; **එවං**: එ පරිද්දෙන්; **ජරා ච**: ජරාව ද; **මච්චූ ච**: මරණය ද (යන මොහු); **පාණිනං**: සත්වයන්ගේ; **ආයුං**: ආයුෂය; **පාචෙන්ති**: (ක්‍ෂයට) පමුණුවන්නාහ.

කෙවිටි පහර දෙමින් ගවයන් තණ බිමට ගෙන යන ගෝපාලයකු මෙන් ජරාව හා මරණය සත්ත්වයන් ජීවිතාවසානය කරා ගෙන යයි.

විවරණය

ජරා ච මච්චූ ච: මෙහි ජරා මරණ දෙක ගොපල්ලා මෙන් ද, ජීවිතෙන්ද්‍රියය ගොනුන් මෙන් ද, මරණය තණබිම මෙන් ද දත යුතුයි. එහි ජාති තොමෝ වනාහි සත්වයන්ගේ ජීවිතෙන්ද්‍රියය ජරාව වෙතට මෙහෙයවයි. ජරා තොමෝ ව්‍යාධිය වෙතට ද, ව්‍යාධි තොමෝ මරණය වෙතට මෙහෙයවයි. ඒ මරණ තෙමේම කෙටේරියෙන් සින්දාක් මෙන් ඒ පුද්ගලයා ගේ ජීවිතෙන්ද්‍රියය සිඳ දමා යන්නේය.

විසාකා මහා උපාසිකාව: විසාකාව ධනංජය සිටුතුමා ගේ දියණිය වූවා ය. ඇය ගේ මව සුමනා දේවිය යි. ප්‍රකට ධනවත් සිටුවරයකු වූ මෙණ්ඩක ඇය ගේ සීයා වූයේ ය. විසාකාවට වයස හතක් වූ සමයෙහි බුදුරජාණන් වහන්සේ ඇය ගේ උපන්බිම් වූ අංග රාජ්‍යයේ භද්දිය නම් ගමට වැඩම කළ හ.,ඒ ප්‍රවෘත්තිය ඇසූ විසාකාවගේ මුත්තණුවෝ සිය මිනිබිරිය කැඳවා "විසාකාවෙනි, මෙය ඉතා ප්‍රීතිමත් දිනයකි. ඔබේ සහායිකාවන් හැමදෙනා කැඳවන්න. මනාව සැරසී වාහන වල නැගී සේවක සේවිකාවන් ද කැටුව බුදු පියාණන් පිළිගනු පිණිස පිටත් වන්න" යි උපදෙස් දුන්නේ ය. එයට එකඟ වූ ඕ වහා සියල්ල සූදානම් කර ගෙන බුදුරදුන් එන පෙර මගට ගොස් වැඳ නමස්කාර කර පිළිගත්තා ය.
මේ කුඩා දැරියන් ගේ විනීතාචාරවත් බව දුටු භාග්‍යවතුන් වහන්සේ බෙහෙවින් ප්‍රසන්නව ඔවුන්ට ධර්ම දේශනා කළ සේක. පින් මෝරා සිටි විසාකා කුමරිය ධර්ම දේශනය අවසානයෙහි සෝවාන් ඵලය ලැබුවා ය. ඇය ඒ බාල වියේ දී පවා මුහුකුරා ගිය නුවණින් යුත් වූවා මෙන්ම කාය ශක්තියෙන් ද අන් අයට වඩා මුල් පෙළේ සිටියා ය. එමෙන්ම වනිතාවන් සතු ප්‍රියංකරත්වයෙන් හා ආකර්ශනීයත්වයෙන් ද නො අඩු වූවාය. දිග වරලස, මොනර පිලක් මෙන් වූ බව ද අගින් ඉහලට නැමී සිටි බව ද කියැවෙයි. ඇය ගේ දෙතොල් දීප්තිමත් රක්ත වර්ණයෙන් බැබලුණු අතර මෘදු හා ප්‍රියජනක ද විය. මනාව පිහිටි සුදු දත් මුතු පෙළක් බඳු විය. ඇය ගේ රන්වන් සම මානෙල් පෙති මෙන් සුමුදු විය. දරුවන් රැසක ගේ මවක් වූ පසුව ද ඇය ගේ රූ සපුව මනාව සුරැකිණි.

කේශ කළ්‍යාණය, මාංස කළ්‍යාණය, අස්ථි කළ්‍යාණය, චර්ම කළ්‍යාණය හා වය කළ්‍යාණය යන පංච කළ්‍යාණයෙන්ම යුක්ත වූ ඕ ලෞකික හා ලෝකෝත්තර කරුණු විෂයෙහි ප්‍රඥාවෙන් ද අග්‍රප්‍රාප්ත වූවාය. වයස 16 දී පමණ ඕ තොමෝ පිරිවර සමඟ එක් උත්සව දිනක දිය කෙළි පිණිස ගං ඉවුරට ගියා ය. උන් හිටි හැටියේ වැස්සක් කඩා වැටිණි. විසාකාව ගේ පිරිස වහලක් ඇති තැනක් සොයා දිව ගිය හ. ඔවුන් පිවිසුණු ශාලාවෙහි තමන් ඇසුරු කරන සිටු පවුලක සිටුකුමරකු සඳහා පංච කල්‍යාණියක සොයා ආ බමුණෝ පිරිසක් වූහ. විසාකාව, තම පිරිස දිව ගෙන ආ නමුත් තමා හෙමිහිට තෙමෙමින් අවුත් එහි පිවිසුණු අයුරු දුටු බමුණෝ "අලස කෙල්ලක්" යැයි ඇයට විහිලු කළ හ.

"මට අනිත් අයට වඩා වේගයෙන් දුවගෙන එන්න තිබුණා. නමුත් ඔටුණු පළන් රජතුමා, සැරසූ මඟුල් ඇතා, භික්‍ෂුනම, අබරණ ලා සැරසුණු කාන්තාව යන සිවු දෙනා දිවීම සිත්කළු හෝ නිවැරදි නොවන බව ඕ පෙන්වා දුන්නා ය. ඇය ගේ පිළිතුරෙන් සතුටට පත් බමුණෝ මේ පංච කළ්‍යාණයෙන් පොහොසත් උගත් වියත් රූමතිය අප ගේ සිටු පුත්‍රයාටම ගැලපෙතැයි තීරණය කොට ඒ සඳහා කටයුතු කළ හ. එහි ප්‍රතිඵලය වූයේ මිගාර නම් වූ සිටුවරයා ගේ පුත්‍ර පූර්ණවර්ධන සමඟ ඇය විවාහ වීම යි. ඒ සිටු පවුල තෙරුවන් සරණ ගිය පිරිසක් නො වූහ. විවා මඟුල් දින ඇයට මහා ලතා ප්‍රසාදනය හෙවත් මහ ලිය පළඳනාව දායාද වශයෙන් පියාණන් ගෙන් ලැබිණ. පියාණන් විසින් ඇයට

1. ඇතුළත ගිනි පිටත නො දෙන්න.
2. පිටත ගිනි ඇතුළට නො ගන්න.
3. දෙන්නන්ට පමණක් දෙන්න.
4. නො දෙන්නන්ට නො දෙන්න.
5. දෙන්නන්ට හා නො දෙන්නන්ට ද දෙන්න.
6. සුවසේ හිඳින්න.
7. සුවසේ ආහාර ගන්න.
8. සුවසේ නිදන්න.
9. ගිනි පුදන්න.
10. කුල දේවතාවන් පුදන්න"යි යන උපදෙස් දහය දෙන ලදී.

විවාහයෙන් පසු වාසනාවන්ත පුතුන් දහයක් හා දූවරුන් දහයක් ලද ඕ තොමෝ කාරුණික මවක් වූවා ය. මාමාණ්ඩිය බුදු දහමට හරවා ගත් පසු ඇය ඔහුට ද මවක් වූවා යන අරුතින් "මිගාර මාතා" නමින් ද පතළ වූවා ය. පින් දහම් කරමින් ප්‍රමුදිත ජීවිතයක් ගත කළ ඇය මිය යන විට වයස අවුරුදු එකසිය විස්සක් වී තිබිණි.

අකුසල් කරන අනුවනයා තමා කළ පව් විපාක විඳැ ගින්නෙන් දැවුනකු මෙන් තැවේ.

136. අථ පාපානි කම්මානි
කරං බාලො න බුජ්ඣති
සෙහි කම්මේහි දුම්මේධො
අග්ගි දඩ්ඩො'ව තප්පති (10:8)

නො වැටහෙන මුත් බාලයන් හට
පාපයෙහි රඟ එය කරන විට
දැවෙයි ගින්නෙන් පිළිස්සෙන මෙන්
විපාකය පෙරැළී පැමිණි විට

දවයි විපාකය - කළ වුන් පාපය.

10 (6) අජ්ගර ප්‍රේත වස්තුව (136 ගාථාව)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කළ භාග්‍යවතුන් වහන්සේ අජ්ගර ප්‍රේතයකු නිමිති කර ගෙන මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් මුගලන් මහ රහතන් වහන්සේ ලක්ඛණ හිමියන් සමග ගිජුකුළු පව්වෙන් පහළට වැඩම කරන සේක් යොදුන් විසි පහක් දිග පිඹුරකු වන් ප්‍රේතයකු සිය දිවැසින් දුටු සේක. ඔහු ගේ හිසෙන් නැඟෙන ගින්න වල්ගය තෙක් දවා ලයි. වල්ගය දෙසින් නැගෙන ගින්න හිස තෙක් දවයි. දෑලයෙන් නැගෙන ගින්න සිරුර මැද තෙක් දවාලයි. මේ ප්‍රේතයා දුටු මුගලන් මහ රහතන් වහන්සේ සිනා පහළ කළ සේක."ස්වාමිනි, සිනාසෙන්නෙ කවර හෙයින්දැ" යි ලක්ඛණ තෙරුන් විමසූ විට "ආයුෂ්මත්නි, එය භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී විමසන්නැ" යි මුගලන් හිමියෝ පැවසූ හ.

ලක්ඛණ තෙරණුවෝ ඒ අනුව භාග්‍යවතුන් වහන්සේ හමුවේ දී මුගලන් හිමියන් ගෙන් ඒ ප්‍රශ්නය විමසූ හ. "ආයුෂ්මත්නි, මම එතැනදි ප්‍රේතයකු දුටුවෙමි. ඔහු ගේ ශරීරය පිඹුරකු බඳු විය. මුළු සිරුරම හැම අතින්ම දැවෙමින් තිබුණේය"යි විස්තර කර "එවන් ප්‍රේතයකු මීට කලින් මම දැක නො තිබුණෙමි. මෙවන් රුදුරු දුක් ඇති සසරින් මම මිදී ඇත්තෙමි. එහෙයින් සිනා පහළ කළෙමි"යි පැහැදිලි කළ හ. එවිට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මගේ ශ්‍රාවකයන්ට දෙනෙත් ඇතුවා පමණක් නොව ඒවායින් ප්‍රයෝජන ගන්නා ශක්තිය ද තිබේ. ඔය අජ්ගර ප්‍රේතයා මම බුදු වූ දා විදුරසුනේ සිටම දිටිමි. එහෙත් එවන් ප්‍රේතයන් සිටින්නටත් පිළිවන් දැයි සැක කර ශ්‍රාවකයන් විමතියට පත් වන හෙයින් ඒ ගැන යමක් කිසිවකුට නො වදාළෙමි"යි ප්‍රකාශ කළ හ.

දම් සබාවෙහි රැස්ව හුන් භික්ෂූන් වහන්සේලාට එම ප්‍රේතයා එසේ දුක් විඳින්නට හේතුව කුමක්දැයි දැන ගන්නට රුචියක් ඇති වූයෙන් බුදුරජාණන් වහන්සේ එය හෙළි කර වදාළ හ.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගේ සමයෙහි සුමංගල නම් එක් සිටුවරයෙක් රන් ගඩොලින් විශාල ඉඩමක් වහා මිළදී ගෙන තවත් විශාල රන් ප්‍රමාණයක් වැය කොට මහා විහාරයක් කරවා කෝටි ගණන් වැය කර බුද්ධෝපස්ථාන කළ හ. දිනක් පාන්දරින් බුදුන් දකින්නට යන අතර මග රෑ තිස්සේ හොරකමේ ගොස් දෙපාවල තැවරුණු මඩවත් සෝදා නො ගෙන කළු රෙද්දකින් හිස වසා ගෙන නුවර දොරටුව අසල නිදා සිටි සොරෙක් සිටාණන් ගේ නෙතට ලක් විය. ඒ දුටු සිටාණෝ "මේ තැනැත්තා රෑ එළිවන තුරු හොරකමේ ගොස් දෙපාවල මඩවත් සෝදා නොගෙන නිදා ඉන්න හැටි" යි පැවසී ය. ඒ වචන අඩ නින්දේ සිටි සොරා ගේ කණ වැකිණ. "හොඳයි මම ඒක බලා ගන්නම්'' යි දත් මිටි කෑ හේ සිටාණන් ගෙන් පලි ගැනීම පිණිස එතුමා ගේ කුඹුර හත්වරක් ගිනි තැබී ය. ගවයන් ගේ පාද හත් වරක් ම කපා ලීය. සිටු මැදුරට ද හත් වරක් ගිනි තැබීය.

ඔහු තුළ සිටුතුමා කෙරේ වූ වෛරය මේ කිසිවකුනුත් නිවී නොගිය හෙයින් සිටුතුමා ගේ සේවකයකු වෙතින් ''ඔය සිටු තුමා ඉතාම ප්‍රිය කරන වස්තුව කුමක් ද?'' යි විමසූ හේ ''බුදු රදුන්ට ඉදි කළ ගඳ කිළිය තරම් සිටුතුමා අගය කරන වස්තුවක් තවත් නැත''යි ඔහු කී හෙයින් ගඳ කිළිය විනාශ කර මගේ වෛරය සංසිඳවා ගනිමි යි සිතා බුදු රදුන් පිඬු පිණිස ගිය අතර තුර ගඳ කිළියේ වූ සියළු පරිභෝග භාණ්ඩ කුඩුකර දමා ඊට ගිනි තැබී ය. සිටු තුමා එහි අවුත් බලන විට මුළු ගඳ කිළිය ම දැවී අළුවී තිබිණි. වචනයක් වත් නො කී සිටු තුමා අළුතෙන් ගන්ධකුටියක් ඉදි කර පූජා කළේය. එම පූජාව දින ''මේ මිනිසාට කවර දෙයක් කළත් ඔහු කම්පාවට පත්වන්නේ නැත. ඔහු මරා ඉවරයක් කරමි'' යි සිතූ හොරා උල් පිහියක් කකුලේ බැඳ ගෙන උත්සවයට සහභාගි විය.

ගඳ කිළිය බුදුන්ට පිදූ සිටුවරයා ''මා සමඟ වෛර බැඳගත් පුද්ගලයෙක් මගේ දේපල වනසා දමා මේ ගන්ධකුටිය ද ගිනි තැබීය. ඔහු ගඳ කිළිය ගිනි තැබූ නිසා මට මේ පින කර ගන්නට පිළිවන් විය. ඔහුට මේ පින් අනුමෝදන් කරමි. ඔහු සුවපත් වේවා !'' යි පින් අනුමෝදන් කරනු ඇසූ සොරා ''මේ නම් පුදුම සාධු ගුණ ඇති උතුමෙකැ'' යි ළය හුණු වී වැඳ සමාව අයැදී ය. සිටු තුමා ද තමන් එදා කී වචනයට සමාව ඉල්ලා සිටියේ ය.

''කළ අකුසල් නිසා දිගු කලක් අපා දුක් විඳ දැන් මේ අජ්ගර ප්‍රේතව උපන්නේ ඒ තැනැත්තා ය'' යි වදාළ භාග්‍යවතුන් වහන්සේ පූර්වෝක්ත ගාථාව ද දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (136 ගාථාව)

අථ පාපානි කම්මානි කරං බාලො න බුජ්ඣති අථ
දුම්මේධො සෙහි කම්මෙහි අග්ගි දඩ්ඪො ඉව තප්පති

අථ: එපමණක් නොවෙයි (අඥානයා ක්‍රෝධ වශයෙන් පව්කම් කරනවා පමණක් නො වෙයි) **පාපානි කම්මානි**: පාප කර්ම, කරං: කරන්නා වූ, **බාලො**: අඥානයා (මෝඩයා), **න බුජ්ඣති**: (මේ පව්කමට මෙබඳු විපාකයක් ඇතැයි ද) නො දනියි. **දුම්මේධො**: (ඒ) අඥාන තැනැත්තා, **සෙහි කම්මෙහි**: තමා කළ පව්කමින්, **අග්ගි දඩ්ඪො ඉව**: ගින්නෙන් පිළිස්සෙන්නාක් මෙන්, **තප්පති**: දැවෙයි.

අඥාන පුද්ගලයා පව් කරන අතරතුර එහි බරපතලකම තේරුම් නො ගනියි. එහෙත් පසු කලක කම් විපාකයන් ගින්නකින් දැවෙන්නාක් මෙන් දුක් විඳි යි.

විවරණය

මෙහි **බාල**, **දුම්මේධ** යන වචන වලින් නුවණ මඳ තැනැත්තා අදහස් වෙයි. ඔහුට හොඳ - නරක වෙන් කර හඳුනා ගන්නා විචක්ෂණය නැත. එහෙයින් සම්මා දිට්ඨියෙන් තොර ය.

නිදොස් උතුමනට අවැඩ කරන තැනැත්තා දසදුක් කරුණු අතුරෙන් එකකට වහා ම පැමිණේ.

137. යො දණ්ඩේන අදණ්ඩේසු
අප්පදුට්ඨේසු දුස්සති
දසන්නං අඤ්ඤතරං ඨානං
ඛිප්පමෙව නිගච්ඡති (10:9)

වද නොකළ යුතු අයට - වද වේදනා කරන
දුෂ්ට කම් සිත නොමැති - උතුමන් ට දුෂ්ට වන
යමෙක් වෙත්නම් ඉපිද - දස නරකයෙන් එකක
වහා දුකටම වැටෙති - එහි විපාකය විලස

කළොත් වෛර උතුමන්හට - වෙයි විපාක විඳ ගන්නට

10 (7) මුගලන් මහ තෙර වත (ගාථා 137 සිට 140 දක්වා)

මුගලන් මහ රහතන් වහන්සේ නිමිති කොට බුදු පියාණන් වහන්සේ විසින් මේ ගාථා හතර දේශනා කර වදාරන ලද්දේ දෙව්රම් වෙහෙරදී ය.

එක් සමයෙක් හි මිසදිටුවෝ එක් රැස්ව මහා කුමන්ත්‍රණයක් කළ හ.

"සොහොයුරනි, බුදු රදුන්ටත් ශ්‍රාවකයන්ටත් බොහෝ දාන මානාදියත් පිරිකරත් ලැබෙන රහස ඔබ දනිත් ද?" එක් අයෙක් විමසූ හ.

"ලාභ ප්‍රයෝජන ලැබෙන බව නම් දනිමු. රහස නම් නො දනිමු. ඔබ දනිත් නම් අපටත් කියන්න" යි අන්‍යයෝ පැවසූ හ.

"අහන්න, මුගලන් මහ රහතන් වහන්සේ එක් වරකට දිව්‍ය ලෝකයට යති. පින් කර දේවාත්ම භාව ලබා උපන්නවුන් ගෙන් ඔබ මෙහි උපදින්නට කළ පින්කම කුමක්දැයි අසා දැන ගෙන මනු ලොව අවුත් ජනයාට ඒ ගැන කියා පින් කළ මැනවැ යි පිනට දිරි ගන්වති. තවත් වරක අහසට යති. එහිද නිරා දුක් විඳින සත්ත්වයන් ගෙන් ඔබ මේ දුක් විඳින්නට කළ පාප කර්මය කුමක් දැයි අසා දැන ගෙන එය ද මනු ලොව ජනයාට විස්තර කර දී පාපයෙන් වළකා පිනට යොදවති. මිනිස්සු ද ඒ අසා බුද්ධ ප්‍රමුඛ සංඝයාට ලාභ සත්කාර පමුණුවති. මේ මුගලන් තෙරුන් ඝාතනය කර ලන්නට අපට හැකි වුව හොත් සියළු ලාභ ප්‍රයෝජන අපටම ලබා ගත හැකි වෙයි"

ඒ ඇසූ අන්‍ය තීර්ථකයෝ "කදිම යෝජනාවකි" යි ඒකමතිකව "කොහොම හරි අපි මුගලන් හිමි මරා දමමු" යි සිතා දායක දායිකාවන් ගෙන් මුදල් සම්මාදම් කර කහවණු දහසක් එකතු කර ගත් හ. මැර පිරිසක් කැඳවා ඒ මුදල් දී "මුගලන් තෙරණුවෝ කාලසිලාවෙහි වෙසෙති. එහි ගොස් උන් වහන්සේ මරා දමන්න" යි ඉල්ලා සිටිය හ. මිනීමරු මැරයෝ ද යහපතැයි ගිවිස ගත් හ. ඔවුහු කාලසිලා ප්‍රදේශයට ගොස් මුගලන් තෙරුන්ගේ කුටිය වටලා ගත් හ.

සිය කුටිය මිනීමරුවන් විසින් වට කළ බව දැනගත් මුගලන් මහ රහතන් වහන්සේ ඍද්ධි බලයෙන් යතුරු සිදුරෙන් නික්ම දිවි ගලවා ගත් හ. තෙරුන් නුදුටු මැරයෝ ඊළඟ දිනයේ ද අවුත් කුටිය වට කළ හ. එදින ද තෙරුන් වහන්සේ කැණි මඬලින් නික්ම දිවි රැක ගත් හ. මෙසේ මාස දෙකක් තිස්සේම මැරයන් ගේ වෑයම අසාර්ථක විය. එහෙත් ඔවුහු තුන් වන මාසයේ ද තෙරුන් අල්ලා ගන්නා අධිෂ්ඨානයෙන්ම ක්‍රියා කළ හ.

තමන් වහන්සේ පූර්ව ජන්මයක කළ අකුසලයක විපාක වශයෙන් මෙසේ මිනීමරුවන් තමන් පසු පස එන බව දත් තෙරුන් වහන්සේ ගැලවීමේ උත්සාහය අත හරින්නට තීරණය කළ හ. අන්තිමේ තෙරුන් අල්ලා ගැනීමට සමත් වූ සොරු උන්වහන්සේ ගේ සිරුරෙහි ඇට කටු කුඩුවන සේ තැලූ හ. උන්වහන්සේ මිය ගිය බව සිතූ ඔවුහු සිරුර පඳුරක් යටට විසිකොට යන්නට ගිය හ.

පිරිනිවන් පාන්නට පෙර බුදුරදුන් දැක සමුගන්නට සිතූ තෙරණුවෝ ඍද්ධි බලයෙන් සිරුර සෘජු කරගෙන බුදුරදුන් දක්නට ගොස් තමන් පිරිනිවන් පානා බව සැළ කර සිටිය හ.

"ඔබ පිරිනිවන් පානවාද මොග්ගල්ලාන?" බුදු රජාණන් වහන්සේ විමසා සිටිය හ.

"එහෙමයි ස්වාමීනි, මම පිරිනිවන් පාන්නෙමි"

"කවර තැනකට ද ඔබ පිරිනිවන් පාන්නට යන්නේ ?"
"කාලසිලාවට යි ස්වාමීනි,"

"එසේ නම්, පිරිනිවන් පාන්නට පෙර මට බණ ටිකක් කියන්න. අදින් පසු මට ඔබ වැනි ශ්‍රාවකයෙක් නැති වෙයි."
"මම එසේ කරන්නෙමි ස්වාමීනි," යි පැවසූ මොග්ගල්ලාන මහ රහතන් වහන්සේ අහසට නැගී ප්‍රාතිහාර්යය දක්වා භාග්‍යවතුන් වහන්සේට ගෞරව කොට ධර්ම දේශනයක් ද පවත්වා කාලසිලාවට ම වැඩි සේක.

විවරණාත්මක අනුවාදය (137 ගාථාව)

යො අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු දණ්ඩෙන දුස්සති දසන්නං
අඤ්ඤතරං ඨානං ඛිප්පං එව නිගච්ඡති

යො: යමෙක්; **අදණ්ඩෙසු**: අහිංසක වූ (දණ්ඩනයට නො නිසි වූ); **අප්පදුට්ඨෙසු**: (කිසිවෙකුට) ද්වේෂ නො කරන,(රහතුන් විෂයෙහි); **දණ්ඩෙන**: දඬුවමින්; **දුස්සති**: අපරාධ හා ද්‍රෝහිකම් කරයි ද (හෙතෙම); **දසන්නං**: දශවිධ දුක්ඛ වේදනාවන් ගෙන්; **අඤ්ඤතරං ඨානං**: එක්තරා වේදනාවකට; **ඛිප්පං එව**: වහාම; **නිගච්ඡති**: පැමිණෙන්නේය.

යම්කිසි තැනැත්තෙක් අනුන්ට හිරිහැර නො කරන දුෂ්ට ගති නැති අයකුට හිරිහැර කරයි නම් ඔහුට විපාක දහයකින් එක්තරා දඬුවමක් අත්වන්නේ ය.



නිදොස් උතුමනට අවැඩ කරන තැනැත්තා මේ ලොවැ මේ දස වැදැරුම් විපත් කරුණින් එකකට පැමිණේ.

138. වෙදනං ඵරුසං ජානිං
සරීරස්ස ච භෙදනං
ගරුකං වාපි ආබාධං
චිත්තක්ඛෙපං ච පාපුනෙ (10:10)

ඇඟ පතට වේදනා - ධන හානි ඇති වෙමින්
ලැබෙයි අත පය කැඩෙයි - වේදනා ලැබ දෙමින්
භයානක ලෙඩ රෝග - හැදෙයි දුක් දී නොමින්
කල්පනා අවුල් වෙයි - සිත විකල් වී ගොසින්

දුන්නොත් වද රහතුන් හට - දැඩි දුක් වෙයි උහුලන්නට

10 (7) මුගලන් මහ තෙර වත (137 සිට 140 දක්වා ගාථා)

මුගලන් මහ රහතන් වහන්සේ පිරිනිවන් පෑ වහාම "මැරයෝ මුගලන් තෙරුන් ඝාතනය කළ හ"යන පුවත රට පුරාම පැතිර ගියේ ය. මිනීමරුවන් අල්ලා ගැනීම පිණිස අජාසත් රජ තෙම චර පුරුෂයන් යෙදැවී ය. මැර පිරිස දිනක් සුරාපානය කරමින් අවන්හලෙක කල් යවන අතර එක් මැරයකු ගේ සුරා විත තවෙකකු ගේ අත වැදී ඉහිරිණි. කුපිත වූ මැරයා "තක්කඩියා! මගේ රා කට්ට ඉහිරෙව්වා" යි ඔහුට බැණ වැදිණ. ඒ අසා අනෙකාද කිපී "උඹ තමයි තක්කඩි මිනී මරුවා. උඹ තමයි මුගලන් හාමුදුරුවන්ට මුලින් ම ගැහුවේ" යි බැණ වැදුණෝ ය. චර පුරුෂයන් වහා රජතුමාට දන්වා ඔවුන් අත් අඩංගුවට ගෙන සම්පූර්ණ තොරතුරු අසා දැන ගත්තේ ය. "කවුද නුඹලාට මුගලන් හිමි මරන්න මුදල් ගෙව්වේ?" යි රජතුමා ප්‍රශ්න කළ විට තීර්ථකයන් බව ඔවුහු හෙළි කළ හ.

තීර්ථකයන් ගේ පහත් කුමන්ත්‍රණය ගැන ඇසීමෙන් බලවත් සංවේගයට හා කෝපයට පත් රජ තෙම ඔවුන් අත් අඩංගුවට ගෙන මැරයන් ද සමඟ එකට ඉණ මට්ටමට බිම වළලා පිදුරු වලින් වසා ගිනි තබා මැරවී ය. ඔවුන් මිය ගිය බව දත් විට අජාසත් රජ තෙම යකඩ නගුලෙන් සී සා සිරුරු විනසා දැම්මේ ය.

මුගලන් මහ රහතන් වහන්සේට අත් වූ ශෝක ජනක ඉරණම ගැන භික්ෂූන් වහන්සේ දම් සභාවෙහි කතිකා කළ හ. උන් වහන්සේලා ගේ අදහස වූයේ මුගලන් හිමියන් ගේ ශ්‍රේෂ්ඨත්වයේ තරමට උන් වහන්සේට ලැබුණු මරණය කිසිසේත් නො ගැලපෙන බවය. එවන් උත්තමයකු මිය යා යුත්තේ මීට වඩා උතුම් ගෞරවාන්විත විලාසයෙන් නො වේ ද? උන් වහන්සේලා ගේ සාකච්ඡාව පැවැත්වෙන අතරේ භාග්‍යවතුන් වහන්සේ එහි වැඩම කළ හ.

"මහණෙනි, මොග්ගල්ලාන මේ ආත්මයෙහි පත්වූ විශිෂ්ට තත්වයට ඒ මිය ගිය විලාසය නො ගැලපෙන බව සැබෑය. එහෙත් උන් වහන්සේ ඉකුත් භවයෙක කළ මහා අකුසලයේ තත්වයට ගැලපෙන්නේ ය"යි උන්වහන්සේ වදාළ හ. ඒ ඇසූ භික්ෂූහු "එහෙත් ස්වාමීනි, මෙසේ මිය යන්නට මුගලන් තෙරුන් ඒ අතීත භවයක කළ අකුසල කර්මයෙහි තොරතුරු අපි නො දනිමු. භාග්‍යවතුන් වහන්සේ එය අපට පැහැදිලි කර දෙන්නේ නම් යෙහෙකි." යි ආරාධනය කර සිටියහ. භාග්‍යවතුන් වහන්සේ එය හෙළි කොට වදාළ හ.

පෙර එක් යස ඉසුරෙන් ආඪ්‍ය වූ පවුලක තරුණ පුත්‍රයෙක් තම දෙමාපියන්ට සියතින් ම උපස්ථාන කරමින් ගෙදර හැම කටයුත්තක් ම තමා ම කරමින් ඉතා යහපත් ජීවිතයක් ගත කළේ ය. දිනක් ඔහු ගේ දෙමාපියෝ ඔහු අමතා "පුතුනි, මේ ගෙදර හැම වැඩම තනියම කිරීමෙන් ඔබ උවමනාවට වඩා මහන්සි වෙනවා. මේ සේරම පුතාට තනියම කරන්න බෑ. අපි පුතාට විවාහයක් කර දෙන්නම්" යි පැවසූ හ. එහෙත් ඊට අකැමැති වූ පුත්‍රයා "අම්මත්, තාත්තත් ජීවතුන් අතර ඉන්න තුරු මට මේ සේරම කරන්න පුළුවන්. ඔබ මට විවාහයක් කිරීම ගැන හිතන්නවත් උවමනා නෑ." එහෙත් ඔහු දිගින් දිගට ම එපා කීවත් බලයෙන් මෙන් දෙමාපියෝ ඔහුට තරුණ ළඳක් විවාහ කර දුන් හ. එහෙත් ඇය දෙමාපියන්ට ගරු කර ගෙන සිටියේ ඉතා ටික කලක් පමණි. ඇයට මේ මහළු යුවල ගේ දර්ශනය පවා අප්‍රිය වූයේ ය. "ඔබේ දෙමාපියන් සමඟ මේ ගෙදර එකට වසන්නට මම අකැමැත්තෙමි" යි ඕ නිතර කියන්නට වූවාය. එහෙත් සැමියා ඒ ගණනකට නො ගන්නා හෙයින් ඕ ගේ හැම තැනම සෙම් සොටු, කෙළ, හිසකේ වැනි සේ පෙනෙන්නට යම් යම් දේ විසුරුවමින් බඩු මුට්ටු එහි මෙහි විසුරුවමින් මවුපියන් ගේ වැරදි බව කියමින් ඉතා අප්‍රසන්න තත්ත්වයක් නිවසෙහි ඇති කළා ය. අන්තිමේ තරුණයා ද ඇය ගේ බස් පිළිගෙන තම දෙමාපියන් කෙරේ කළකිරුණේ ය.

"දුක් නොවන්න. මම ඉක්මණින් ම ඔවුන් ගෙන් බේරුමක් කර ගන්නම්" යි පැවසූ හේ දෙමාපියන් අමතා "අම්මේ, තාත්තේ, ඔබට හුගක් නෑදෑයින් ඉන්නවා නේ ද? හුගක් කාලෙකින් ඒ අය බලන්නට ගියේත් නැහැ නේ ද?" යි පවසා ඔවුන් නෑදෑ ගෙවල්වල ගෙන යන ව්‍යාජයෙන් කරත්තයකට නංවා ගත්තේ ය.

විවරණාත්මක අනුවාදය (138 ගාථාව)

ඵරුසං වෙදනං ජානිං සරීරස්ස භෙදනං වා අපි
ගරුකං ආබාධං වා චිත්තක්ඛෙපං වා පාපුණෙ

ඵරුසං: රළු වූ; **වෙදනං**:(ශාරීරික)වේදනාවකට; **ජානිං**: ධන හානියට; **සරීරස්ස භෙදනං වා**: ශරීරාංග කැඩී බිඳී යාමට හෝ; **අපි**: එමෙන්ම; **ගරුකං ආබාධං වා**: බරපතල ලෙඩ රෝගයකට හෝ; **චිත්තක්ඛෙපං වා**: මානසික ව්‍යාකූල භාවය හෝ; **පාපුණෙ**: පැමිණෙන්නේය.

උසුලන්නට අපහසු වේදනා, ධන හානිය, අතපය කැඩීම, බරපතල ලෙඩ රෝග හෝ මානසික ව්‍යාකූල භාවය යන විපාක ඔහුට ලැබෙන්නට පුළුවන.

නැණවතා කාමයන්හි සැප නැති බව හා බොහෝ දුක් ඇති බව දැනගනී.

139. රාජතො වා උපස්සග්ගං
අබ්භක්ඛානං ව දාරුණං
පරික්ඛයං ච ඤාතීනං
භොගානං ව පභංගුරං (10:11)

රජවරුන් උදහස්ව - නොයෙක් හිරිහැර ඒවි
චෝදනා වලට බර - මුහුණ දෙන්නට වේවි
නෑ පිරිස ටිකින් ටික - දුරින් දුරටම යාවි
වස්තු සම්පත් හැමත් - ටිකින් ටික දිය වේවි.

උතුමන්හට වද හිරිහැර - කළහොත් සිදු වේය නපුර

10 (7) මුගලන් මහ තෙර වත (ගාථා 137 සිට 140 දක්වා)

මහ වන මැද්දී හේ මා පියන් අමතා "පල් හොරු ගැවසෙන පලාතකයි දැන් අපි යන්නේ. ඒ නිසා මම කරත්තෙන් බැහැලා ටිකක් සෝදිසි කරන්නම්. මේ තෝන් ලණුව අතට ගන්න. ගොන්නු පාර දන්නවා. ඉඳ හිටලා පොඩ්ඩක් ඇඟට පයින් පොඩි තට්ටුවක් කළා ම ඇති"යි පවසා කරත්තයෙන් බැස වනයේ මඳක් ඈතට ගොස් හඬ වෙනස් කර කෑගසමින් හොරු කණ්ඩායමක් කරත්තය වෙත ළං වන විලාසයක් දැක්වී ය. මා-පිය දෙපළ ම නෙත් අඳ හෙයින් කිසිවක් නො දකිති. හොරුන් තමන් වට කළායයි සිතූ ඔවුහු "පුතේ, අපි නම් හිටියත් එකයි මළත් එකයි. අපි දැන් වයසක මිනිස්සුනේ. පුතා පණ බේරා ගෙන දුවන්න. පණ බේරා ගන්න පුතේ" යි කියන්නට වූ හ. එහෙත් හොරුන් පැමිණි බව හැඟවූ පුත්‍රයා ලොකු පොල්ලක් ගෙන තම දෙමාපියන් තළා මරා දැම්මේ ය. මළ සිරුරු වනයේ විසි කර දමා හේ ගෙදර ගියේ ය.

මහ මුගලන් තෙරුන් පූර්වාත්මභාවයෙක මෙසේ තරුණ සැමියකු ලෙස බිරිඳ ගේ වචන වලින් අන්ධව, අන්ධ දෙමාපියන් තලා මරා දැමූ අකුශලය විස්තර කළ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මෙබඳු කෲරතර පහත් ක්‍රියාවක් කිරීමෙන් රැස් වූ අකුසලය හේතුවෙන් මොග්ගල්ලාන වසර අසංඛ ප්‍රමාණයක් අපාගතව දුක් විඳ ඒත් පව් ගෙවී නිම නො වූයෙන් ආත්ම සියයක් ම මෙසේ මැරයන් විසින් ඇට කටු කුඩු කරනු ලැබ මිය පරලොව ගියේ ය. එහෙයින් මොග්ගල්ලාන මිය ගිය විලාසය ඔහු ගේ සම්භාවනීය ශාසනික තත්ත්වයට අනුරූප නො වුණ ද ඔහු ගේ කර්මයෙහි තත්ත්වයට අනුරූප වූයේයැ"යි දේශනා කළ හ.

මුගලන් හිමියන් තළා පෙළා මරා දැමීමේ කාර්‍ය්‍යය භාරගත් මැරවරයන් ගැන කරුණු දැක්වූ උන් වහන්සේ තමන්ට වරදක් නො කළ අයට හිරිහැර කරන්නහු විඳින බරපතල දඬුවම් විස්තර වන පරිදි මේ ගාථා චතුෂ්කය වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (139 ගාථාව)

රාජතො උපස්සග්ගං වා දාරුණං අබ්භක්ඛානං වා
ඤාතිනං පරික්ඛයං වා භොගානං පභංගුරං වා

රාජතො: රජුන් ගෙන් (වන); **උපස්සග්ගං වා**: උවදුරකට හෝ; **දාරුණං**: දරුණු; **අබ්භක්ඛානං වා**: චෝදනාවන්ට ලක්වීම හෝ; **ඤාතීනං**: නෑයන් ගේ; **පරික්ඛයං වා**: ක්ෂය වීමට හෝ; **භොගානං**: භෝගයන් ගේ; **පභංගුරං**: විනාශයට හෝ; (පැමිණෙන්නේ ය.)

රජවරුන් ගෙන් හිරිහැර වීම, දරුණු චෝදනා වලට ලක් වන්නට වීම, නෑදෑ පිරිස අඩු වීම හෝ භෝග සම්පත් විනාශ වීම සිදුවිය හැක.

විවරණය

මුගලන් මහ රහතන් වහන්සේ: මේ ගාථා හතරම දේශනා කර ඇත්තේ මුගලන් මහ රහතන් වහන්සේ ගේ පරිනිර්වාණය සිදු වූ ආකාරය මුල් කර ගනිමිනි. මුගලන් මහ රහතන් වහන්සේ සම්ප්‍රදායෙහි හඳුන්වනු ලබන් නේ වමත් සව්වන් වහන්සේ වශයෙනි. (දකුණත් සව් වූයේ සාරිපුත්ත මහ රහතන් වහන්සේ ය.) සාරිපුත්ත - මොග්ගල්ලාන දෙනම පෙර ජන්ම රාශියක පටන් එකට ම බෝධි සම්භාර පුරා ගෙන අවුත් මේ ජන්මයෙහි දී එකම දිනයෙහි උපන් බව සඳහන් වෙයි. මෙය මිත්‍රත්වයෙහි ගැඹුරු බව දැක්වීම සඳහා ලොව ඇති පැරණිතම නිදසුන් වලින් එකකි.

මුගලන් මහ තෙරුන් වහන්සේ බුද්ධ ශ්‍රාවකයන් අතර ඍද්ධිමතුන්ට අග්‍ර වූ බව ප්‍රකාශ කර තිබේ. ඍද්ධි ප්‍රාතිහාර්ය පෑම විෂයෙහි දක්ෂතා තිබුණු එක් නන්දෝපනන්ද නම් නාග රාජයෙක් බුදු රදුන්ට හා මහා ශ්‍රාවකයන් වහන්සේලාට තර්ජනය කළ අවස්ථාවෙහි ඔහු දමනය කිරීමට බොහෝ ශ්‍රාවකයන් වහන්සේ පෙරමුණ ගත් හ. එහෙත් ඒ කිසි ම හිමිනමකට ඉඩ නුදුන් භාග්‍යවතුන් වහන්සේ ඒ සඳහා මොග්ගල්ලාන හිමියනට පමණක් ඉඩ දුන් හ. අන්තිමේ නාග රාජයා දමනය වූ අතර මුගලන් හිමියන් ගේ කීර්තිය දසත පැතිර ගියේ ය. මහා ජයමංගල ගාථාවන්හි අට වැන්නෙන් කීර්තනය කරනු ලබන්නේ එම ජයයි. මුගලන් මහ රහතන් වහන්සේට තම ඍද්ධි බලයෙන් පයෙහි මහපටැඟිල්ලෙන් ශක්‍රයා ගේ විමානය කම්පනය කිරීමට හෝ අපායෙහි සංචාරයක යෙදීමට වුව ද හැකි විය.

දෙව් ලොවට හා අපායට ගමන් බිමන් කිරීමේදි තොරතුරු හුවමාරු කටයුතු ද උන්වහන්සේ අතින් සිදු වූ බව පෙනෙයි. මිහි කත මත වසන්නවුනට අපාගත වූවන් කළ පාප කර්ම ගැනත්, දෙව් ලොව වාසීන් කුසල විපාක අනුභව කරන අකාරය ගැනත් තොරතුරු ගෙන ආවේ උන්වහන්සේ ය. මේ කාර්‍ය්‍යය නිසා බුදු සසුනෙහි ගෞරවය වර්ධනය වූ නමුත් තීර්ථකයනට අලාභ සිදු විය.

මුගලන් හිමියන් ගේ ජීවිත කථාව අපට ආදර්ශ සපයන අතර ම අනතුරු ඇඟවීම් ද කරයි. ඍද්ධි ප්‍රාතිහාර්යය පෑමේ ශක්තිය අතින් අතිශය උත්කෘෂ්ට මට්ටමේ සිටි මහ රහතන් වහන්සේ නමකට වුව ද කර්මයේ අයෝමය හස්තයෙන් ගැලවී ගන්නට බැරි වූ ආකාරය එයින් මනාව නිරූපිත ය. ඈත අතීත භවයක පිතෘ ඝාතන හා මාතෘ ඝාතන යන පාප කර්මයන් උන්වහන්සේ විසින් කර තිබුණේ අතිශය ජුගුප්සා ජනක අන්දමිනි. ආත්ම විශාල සංඛ්‍යාවක් නරකාදියෙහි පැසීමෙන් පවා පාපය ගෙවී නිම වී නො තිබිණි. කෙසේ වුව ද සාමාන්‍ය ධර්මතාව වන්නේ අග්‍ර ශ්‍රාවක දෙනම භාග්‍යවතුන් වහන්සේට පෙර පිරිනිවන් පෑම බව කියති. පරිනිර්වාණ ප්‍රාප්ත අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා ගේ ගුණ කථනය භාග්‍යවතුන් වහන්සේ විසින් ම කරනු ලැබීම ධර්මතාවකි.

ඊළග පිටුව හා බැඳේ

නිදොස් උතුමනට අවැඩ කරන තැනැත්තා මේ ලොවැ මේ දස වැදැරුම් විපත් කරුණින් එකකට පැමිණේ.

140. අථව'ස්ස අගාරානි
අග්ගි ඩහති පාවකො
කායස්ස භෙදා දුප්පඤ්ඤො
නිරයං සො'පපජ්ජති (10:12)

දැවෙයි ගිනි ගෙන ඔහු ගේ - ගෙවල් දොරවල් හැමත්
නැඟී ගිනි දැල් උඩට - දැවී යයි දේපලත්
අමන දද තැනැත්තා - කය බිඳී මරණ පත්
දුක් විඳියි ඉපදිලා - නියතයෙන් අපායෙත්

කළෝතින් පාපය - අපා දුක මය උරුමය

10 (7) මුගලන් මහ තෙර වත (ගාථා 137 සිට 140 දක්වා)

විවරණය

පෙර පිටුව හා බැඳේ

මුගලන් මහ තෙරුන් වහන්සේ පැවිද්දට පෙර හඳුන්වන ලද්දේ කෝලිත නමිනි. කෝලිත ගිහි අවදියෙහි දී ඉතා කුළුපගව ඇසුරු කළේ උපතිස්ස නම් තමා බඳුම පින් මේරූ නුවණැති තරුණයෙකි. මේ දෙදෙනා සසර ඉතා දිගු කලෙක පටන් අතිශය කුළුපග මිත්‍රයෝ වූහ. ලොව අව්‍යාජ ස්නේහාර්ද්‍ර මිත්‍රත්වය පිළිබඳව මෙතරම් රම්‍ය වූ නිදර්ශනයක් තවත් සිතිය නො හැක. ඔවුහු එකට පෙරුම් දම් පුරමින් සසර සැරිසරා අප බුදුන් සමයෙහි ද එක් ම රුචි - අරුචිකම් ඇතිව ඉපිද එකට ම පැවිදිව රහත්ව පිරිනිවන් පෑහ. ලෞකික අරමුණු විෂයෙහි පමණක් නොව ආධ්‍යාත්මික අරමුණු විෂයෙහි ද සමාන මානසිකත්වයන් ඇතිව සිටි මේ දෙදෙනා එක්ව ම සත්‍ය ගවේෂණය කර එක්ව ම එය අවබෝධ කර ගත් හ.

මේ දෙදෙනා වහන්සේ මෙසේ අගසවු තනතුරු ලබන්නට ප්‍රාර්ථනා කළේ අනෝමදස්සි නම් බුදු රජාණන් වහන්සේ සමයෙහි ය. එසමයෙහි මුගලන් තෙරුන් උපන්නේ සිරිවඩ්ඪන නමිනි. සැරියුත් හිමියෝ සරද නම් වූ හ. සිරිවඩ්ඪන ගොවි මහසල් කුලයෙහි ද සරද බමුණු මහසල් කුලයෙහි ද ඉපිද සිටිය හ. එ සමයෙහි ද මේ දෙදෙනා ඉතා දැඩි මිත්‍රත්වයෙන් බැඳී සිටිය හ. දිනක් ජීවිතය හා මරණය ගැන ගැඹුරින් විමසූ සරද තරුණයා ඒ පිළිබඳව කළකිරී පැවිදි වන්නට තීරණය කළේ ය. තමන් තනිව මහණ වනවාට වඩා මිතුරා ද කැටිව පැවිදි වනු රිසි වූ හෙතෙම සිරිවඩ්ඪන සොයා ගොස් "මිත්‍රය, මම පැවිදි වනු, කැමැත්තමි. ඔබත් මා හා එක්වනු කැමති දැ" යි විමසී ය.

එහෙත් ඔහු එයට කැමති නොවූ හෙයින් හෙතෙම තනිව ම පැවිදි විය. එතුමා පැවිදි වූ පුවත අසා තවත් විශාල තරුණ පිරිසක් ගිහි සුව හැර පියා පැවිදි වූහ. කවුරුත් භාවනා වඩා පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා ගත් හ. මෙ සමයෙහි අනෝමදස්සි බුදු රජාණන් වහන්සේ උදෑසන මහා කරුණාවෙන් ලෝ බලන සේක් සරද තවුසාණන් හමුව දහම් දෙසුව හොත් ඔහු මතු අගසවු කෙනෙකුන් වන්නට පතා ගන්නා බවත් ඔහු ගේ මිතුරා ද අගසවු තනතුරු පතන්නට පෙළඹෙන බවත් සිතා ගෙන ඍද්ධි බලයෙන් එහි වැඩම කළ සේක. බුදුරදුන් අහසින් වැඩම කරනු දුටු සරද තවුසා පෙර ගමන් කොට පසඟ පිහිටුවා වැඳ පිළිගෙන අසුනක් පණවා වැඩහිඳවීය. සබ්‍රහ්මචාරීන් ගෙනා එලා'පල බුදුරදුන්ට පිළිගැන්වූ ඔහු තම ශ්‍රාවකයන් සමඟ එකත් පසෙක හුන් අතරතුර "මගේ අගසවු දෙනම පිරිවර සංඝයා ද කැටුව මෙහි පැමිණෙත්වා" යි අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ අධිෂ්ඨාන කළ හ. උන්වහන්සේලා ද අහසින් එහි වැඩම කළ හ.

මේ සියළු පිරිසට සරද තවුසා තම පිරිවර තවුසන් ගේ උදව් ඇතිව මහා මල් පූජාවක් කළ පසු බුදුහු මල් පූජාවේ අනුහස් වදාරන්නැයි දකුණත් සවු හිමියනට ඇරයුම් කළ හ. ඒ ධර්‍ම දේශනාව අසා සිටි සරද හිමියෝ තමාත් බුදු කෙනෙකුන් ගේ දකුණත් සව් විය යුතුයයි සිතා ගත් හ. භාග්‍යවතුන් වහන්සේ ද දිවැසින් බලා වදාරා "මතු සිද්ධාර්ථ ගෞතම නම් බුදුන් දවස ඔබ දකුණත් සව් වෙතැ" යි ප්‍රකාශ කළ හ. ඒ ඇසූ සරද තවුසා සිරිවඩ්ඪන කෙළඹියානෝ සොයා ගොස් තමන් කළ පින්කම හා අගසවු පදවි පැතීම ගැන කියා සිටි හෙයින් හෙතෙම තම නිවසෙහි බුද්ධ ප්‍රමුඛ සංඝයාට දනට ඇරයුම් කළේ ය. සිරිවඩ්ඪන කෙතරම් පැහැදුණා ද යත් සතියක් ම මහ දන් පවත්වා බුදුරදුන් අමතා "ස්වාමීනි, මගේ මිත්‍ර සරද තවුසාණන් සිද්ධාර්ථ ගෞතම බුදුන් ගේ දකුණත් සවු වන දා මම වමත් සවු වන්නට ප්‍රාර්ථනා කරමි" යි පැවසී ය.

අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ ද ඔබ ගේ ප්‍රාර්ථනය එසේ ම ඉටු වෙති යි අනාවැකි පළ කළ සේක. වත්මන් භවයෙහි මුගලන් තෙරුන් වහන්සේ සාරිපුත්ත තෙරුන් සමග වමත් සවු පදවිය ලද්දේ මේ ප්‍රාර්ථනය සමෘද්ධ වීම හේතුවෙනි. දෙදෙනාම සංජය පරිබ්‍රාජකයා ලඟ ධර්‍මය හදාරා එය නිෂ්ඵල බව දැන සත්‍ය ගවේෂණයෙහි යෙදෙමින් සිටි අතර සාරිපුත්ත හිමියන් හා අස්සජි හිමියන් ගෙන් ලද දහම අනුව බුදුරදුන් වෙත අවුත් පැවිදිව ප්‍රාර්ථනා පරිදි අගසවු තනතුරු ලද හ. පස්වග මහණුන්, යස තෙරුන්, භද්‍රවර්ගිය තෙරවරුන්, තුන් බෑ කාශ්‍යපයන් සිටිය දී බුදුරදුන් සැරියුත්, මුගලන් දෙනම අගසවු තනතුරු වලට පත් කර ගැනීම ගැන ඇතැම් භික්ෂූන් නොමනාපකම් පළ කළ හෙයින් මේ අතීත කතාව පැහැදිලි කරන්නට බුදු රදුන්ට සිදුවිය.

දසන්නං අඤ්ඤතරං ඨානං: මේ ගාථා හතරින් අහිංසකයනට හිරිහැර කරන අයට සිදුවන විපාක දහයක් දක්වා ඇත. එනම්,

1. උසුලන්නට බැරි දරුණු වේදනා ඇති වීම
2. මිල මුදල් නාස්ති වී යාම
3. අතපය ඇටකටු ආදිය කැඩී බිඳී යාම
4. දරුණු රෝග ඇති වීම
5. උමතු වීම
6. රාජ උදහස
7. බොරු චෝදනා වලට ලක් වීම
8. නෑදෑයින් නැති වී යාම
9. වස්තු හානිය
10. ගෙවල් ගිනි ගැනීම යන මේවා යි .

විවරණාත්මක අනුවාදය (140 ගාථාව)

**අථ ඉව අස්ස අගාරානි පාවකො අග්ගි ඩහති සො
දුප්පඤ්ඤෙදා් කායස්ස භෙදා නිරයං උප්පජ්ජති.**

අථ ඉව: නැත හොත්; **අස්ස**: ඔහු ගේ; **අගාරානි**: ගෙවල්; **පාවකො අග්ගි**: පාවක නම් වූ ගින්න; **ඩහති**: දවයි; **සො දුප්පඤ්ඤෙදා**: ඒ අඥාන තෙම; **කායස්ස භෙදා**: කය බිඳී ගිය පසු (මරණින් පසු); **නිරයං**: අපායෙහි; **උප්පජ්ජති**: උපදියි.

නැත හොත් ඔහු ගේ ගෙවල් ගිනි ගනියි. ඒ අනුවණ තෙම (මේ දස විධ උවදුරෙන් එකක් ලබා) අනතුරුව අපායෙහි උපදියි.

සැක දුරු නොකළ තැනැත්තා විලි නො වසා හැසිරීම් ඈ කිසි ලෙසකින් පිරිසිදු නො වේ.

141. න නග්ගචරියා න ජටා න පඞ්කා
නානාසකා ථණ්ඩිලසායිකා වා
රජො ච ජල්ලං උක්කුටිකප්පධානං
සොධෙන්ති මච්චං අවිතිණ්ණකඞ්ඛං (10:13)

නිරුවත් තාපස පිළිවෙත් - ජටා මඩුළු මඩ නෑමත්
නො කා නො බී උපවාසය
ඇතිරිලි නැති බිම නිදුමත්
කුණු දූවිලි ඇඟ නා ගෙන
උක්කුටිකෙන් හිඳ ගැනුමත්
කවුරු කළත්, නැත නිවණක්
සැක සංකා දුරු නො කළොත්

නිසරු පිළිවෙත් - සැපක් නො ගෙනෙත්

10 (8) බහුභාණ්ඩික තෙරුන් ගේ වස්තුව (141 ගාථාව)

දෙව්රම් වෙහෙරෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ එක්තරා බහුභාණ්ඩික භික්ෂු නමක් අරබයා මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවර එක් ධනවත් තැනැත්තෙක් තම බිරිඳ මිය ගිය පසු පැවිදි වන්නට සිතී ය. පැවිදි වන්නට පෙර හේ තමන්ට වාසය කිරීම පිණිස ආරාමයක් ඉදිකර ගත්තේ ය. එහි කුස්සියක්, ගබඩා කාමරයක් ආදී ගෘහාංග සම්පූර්ණව තිබුණු අතර ඇඳ, පුටු, මේස ආදී ගෘහ භාණ්ඩ සියල්ල ද සම්පාදනය කරන ලදී. අවශ්‍ය තරම් සහල්, ගිතෙල්, වෙඬරු, ආදී ආහාර ද්‍රව්‍ය ද ගබඩා කර ගත් හෙතෙම පැවිදි වූ පසු ද තමන්ට රුචි වර්ග වල ආහාර පාන තම සේවකයා ලවා සූදානම් කර ගත්තේ ය. පැවිදි වූ පසු ද හේ මනා සැප සම්පතින් ආඪ්‍යව සුවසේ විසී ය. බොහෝ බඩු භාණ්ඩ ඇතිව වාසය කළ හෙයින් උන්වහන්සේ බහුභාණ්ඩික තෙරුන් වහන්සේ යි පතළ වූහ.

දිනක් භාග්‍යවතුන් වහන්සේ වෙත මේ භික්ෂුව කැඳවාගෙන ගිය භික්ෂූහු ඔහු පැවිදි වන විට ගෙන ආ බඩු භාණ්ඩ සමූහය ගැන ද ගත කරන සුඛෝපභෝගී ජීවිතය ගැන ද භාග්‍යවතුන් වහන්සේට විස්තර කළ හ. භාග්‍යවතුන් වහන්සේ බහුභාණ්ඩික තෙරුන් අමතා "මහණ, අල්පෙච්ඡතාව වර්ණනා කරමින් මා ධර්ම දේශනා කරත්දීත් ඔබ බහුභාණ්ඩික වන්නට හේතුව කුමක්ද" යි විචාළ හ. බුදුරදුන් වදාළේ ඒ සුළු එක් ම වැකිය වුවද ඉන් කෝපයට පත් භික්ෂු නම උඩු සිවුර ගළවා පසෙකට දමා අඳනය පමණක් ඉතිරි කර ගෙන "ඇත්තමයි බුදුරජාණන් වහන්ස, එසේ නම්, මම මෙහෙම ඉන්නද?" යි විචාළ හ. ඔහු ගේ ඒ විළිබිය නැති හැසිරීම දුටු භාග්‍යවතුන් වහන්සේ, "මහණ, පෙර ආත්මභාවයක ඔබ දිය රකුසකුව ඉපිද පවා දොළොස් අවුරුද්දක් හිරි ඔතප් රැකගෙන විසී ය. දැන් මේ බුදු සස්නෙහි පැවිදිව සිට ගෙන සිව් පිරිස් මැද සිවුරු ගලවා දමන්නට තරම් විළි බිය හළේ කවර හෙයින් දැයි ප්‍රශ්න කළ හ. ඒ වචන ඇසීමෙන් තම බොළඳ ක්‍රියාවෙහි තරම වටහා ගත් බහුභාණ්ඩික භික්ෂුව සිවුර ගෙන පොරවා ගරු සරු ඇතිව පසෙකට වී හිඳ ගත්තේ ය. පෙර අත්බවක ඔහු දිය රකුසුව සිට විළි බිය ගරු කළ ආකාරය දැන ගන්නට කැමති වූ භික්ෂූහු ඒ පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ ගෙන් විමසූ හ. එවිට උන්වහන්සේ දේවධර්ම ජාතකය දේශනා කර වදාළ හ. අනතුරුව උන්වහන්සේ නිරුවත ඇතුළු විවිධ බාහිර ස්වරූප කවර දිවිපෙත වුවද සිත සැක දුරු නො කළොත් නිවන් සුව නො ලබන බව පැහැදිලි කරමින් ගාථා ධර්මයක් ද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (141 ගාථාව)

නග්ගචරියා න සොධෙන්ති ජටා න සොධෙන්ති පඞ්කා
න සොධෙන්ති අනාසකා න සොධෙන්ති ථණ්ඩිලසායිකා
වා න සොධෙන්ති රජෝජල්ලං ච උක්කුටිකප්පධානං
අවිතිණ්ණකඞ්ඛං මච්චං න සොධෙන්ති

නග්ගචරියා: නිරුවත්ව සිටීම; **ජටා**: ජටා මඩුළු ඇතිකර ගැනීම; **පඞ්කා**: මඩ තවරා ගැනීම; **ආනාසකා**: කෑම බීම නො ගෙන සිටීම; **ථණ්ඩිල සායිකා**: බිම නිදීම; **රජෝජල්ලං**: ඇගෙහි කුණු දූවිලි බැඳෙන්නට ඉඩ දීම; **වා**: හෝ; **උක්කුටිකප්පධානං**: ඇණ තියා ගෙන තවුස් දම් පිරීම; **අවිතිණ්ණකඞ්ඛං**: එතෙර නො වූ හෙවත් සැක දුරු නො කළ; **මච්චං**: සත්වයා; **න සොධෙන්ති**: පිරිසිදු නො කරයි.

නිරුවත්ව සිටීම, හිස්කේ නො පීරා ජටා මඩුළු වන්නට හැරීම, ශරීරය පුරා මඩ තවරා ගැනීම, ආහාර පාන නො ගෙන උපවාස කිරීම, බිම නිදා ගැනීම, ඇගෙ හි කුණු දූවිලි බැඳෙන්නට හරිමින් නො නා සිටීම, උක්කුටුකයෙන් හිඳගෙන තවුස් දම් රැකීම යන මේ එකකින් වත් සැක දුරු නො කළ තැනැත්තාට විශුද්ධිය නො ලැබේ.

විවරණය

නග්ගචරියා: හෙවත් නිරුවතින් හැසිරීම වැනි මේ ගාථාවේ දක්වන ලද තවුස් දම් ක්‍රම බුද්ධ කාලීන භාරතය පුරා පැතිර පැවතිණ. මේ සියළු තවුස් ක්‍රම පදනම් වූයේ ශරීරයට කවර ක්‍රමයෙන් හෝ දුක් වේදනා පැමිණ වීම මගින් විමුක්තිය ලද හැකි බව මතය. (දුක්ඛෙන සුඛං අධිගන්තබ්බං) මෙය අත්තකිලමථානු යෝගයට සම්බන්ධ ය. භාග්‍යවතුන් වහන්සේ කාමසුඛල්ලිකානු යෝගය මෙන්ම මෙම අත්තකිලමථානු යෝගය ද ප්‍රතික්ෂෙප කළ හ. බුද්ධ ශ්‍රාවකයන් අනුග මනය කරන්නේ මධ්‍යම ප්‍රතිපදාව ය. එය අන්තවාදයන් ගේ මිශ්‍රණයක් නොව අන්තවාද ප්‍රතික්ෂෙප කිරීමෙන් මතුවන නිරවද්‍ය ප්‍රතිපදාව ය. එය අනුගමනය කරන බෞද්ධ භික්ෂූහු අපිරිසිදුකම, කයට වධ දීම ආදිය වෙනුවට සරල, අල්පේච්ඡ, පවිත්‍ර ජීවිත ගත කරති. බාහිර වත් පිළිවෙත් මගින් අධ්‍යාත්මික පාරිශුද්ධිය ලද නොහැකි බව බුදුසමය උගන්වයි.



ඇඳුම් පැළඳුම් වලින් සැරසුණත් සන්සුන් ගති හා මෙත් සිතැතිවැ වෙසේ නම් හේ උතුම් පුගුලෙකි.

142. අලඞ්කතො චෙ'පි සමං චරෙය්‍ය
සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු (10:14)

අලංකාරයට ඇන්දත් - සමබර දිවියක් ගෙවන්න
පැවතුම් සමිතව දමිතව
දිගට ම බඹසර රකින්න
කිසිම සතකු නො මරනු වස්
අවි ආයුධ බිම තබන්න - එසේ කළොත් මහණ
බමුණු භික්‍ෂු කෙනෙක් වෙයි සිතන්න

හැඩ වැඩ ඇඳුමෙන - නො මැකෙයි යහගුණ

10 (9) සන්තති ඇමති තුමා ගේ කතාව (142 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **සන්තති අමාත්‍යයා** නිමිති කොට මේ ගාථාව වදාළ සේක.

සන්තති ඇමති තුමාට වරක් ප්‍රත්‍යන්ත ප්‍රදේශයක කැරැල්ලක් මර්දනය කිරීමට සිදු විය. ඔහු ඒ කාර්‍යය සාර්ථකව නිමවා පැමිණි විට පසේනදි කොසොල් රජ තෙම බලවත් ප්‍රීතියට පත්ව බොහෝ තෑගි බෝග යස ඉසුරු ධන සම්පත් දී හර සර දක්වා ඔහු සත් දිනක් විනෝදාස්වාදයෙන් තබන්නැයි උපදෙස් දී නාටිකාංග නාවක් ද යැවී ය. සත්වන දින රාජ හස්තියා මත නැගුණු ඇමති තුමා ස්නානය කිරීම පිණිස ගං තෙරට යමින් සිටියේ ය. ඒ අවස්ථාවේ භාග්‍යවතුන් වහන්සේ අනඳ මහා තෙරුන් ද කැටුව මඟ වැඩම කරනු දුටු අමාත්‍යවරයා සුරා පානය කොට හුන් හෙයින් ඇතු පිටින් නො බැස ඇතු පිටම හිඳ නමස්කාර කොට හිස සළා ගියේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ සිනා පහළ කළ හ. "භාග්‍යවතුන් වහන්ස, සිනා පහළ කළේ කවර හෙයින් ද?" යි අනඳ හිමියන් විචාළ විට "ආනන්ද, ඇමතිතුමා අද ම මා දකින්නට පැමිණෙනු ඇත. මා කරන කෙටි දෙසුමක් අසා රහත් වන්නේ ය. රහත් වී වැඩි වෙලා යන්නට පෙර පිරිනිවන් පාන්නේ ය. එහෙයින් සිනා පහළ කළෙමි" යි වදාළ හ.

ඇමති තුමා ද ගං ඉවුරට ගොස් තවත් සුරා පානය කර, පැන් පහසුව මුළු දිනයම කමින්, බොමින්, නටමින්, ගී ගයමින් ගත කළේ ය. හවස් වන විට ඇමති තුමා නැවත ද සුරා පානය කර නාටිකාංගනාව සමඟ විනෝද වනු වස් උයනට ගියේ ය. නිළිය ද ඇමති තුමා විනෝදවත් කරනු පිණිස ඉතා චමත්කාර ජනක රංගනයක් ඉදිරිපත් කළා ය. එහෙත් රඟන අතරම හෘදයාබාධයක් වැළඳුනු ඕ මැරී වැටුණා ය. ඇය ගේ පණ නල සිරුරින් ඉවත්ව ගොස් බව දැනගත් මොහොතේ පටන් දැඩි සංවේගයට පත් ඇමති තුමා භාග්‍යවතුන් වහන්සේ බැහැ දැකීමට කල්පනා කොට එහි ගොස් "භාග්‍යවතුන් වහන්ස, මට පිහිට වුව මැනැවි. මට මහත් ශෝකයක් ඇති විය. ඔබ වහන්සේ ගේ පිහිට පතා ආවේ එහෙයිනි" යි. පවසා නිළිය මිය ගිය දුක්ඛජනක ආකාරය ගැන සැළ කළේ ය. "ඇමතිවරය, දුක් නොවන්න ඔබ ආවේ සහනයක් ලබත හැකි තැනකට ම ය. ඔය නිළිය ගේ මරණය ගැන සසර පුරා ඔබ හැඬූ කඳුළු සියළු මහ සමුදුර ජලයටත් වැඩි ය" යි පැහැදිළි කර "දුක ශෝකය ඇති වන්නේ රාගය නිසා ය. සිත තුළ පවත්නා රාගාදී කෙලෙස් කුණු ඉවත් කර ගන්න. අළුතින් කෙළෙස් කුණු ඇති කර නො ගන්න. සිත පිරිසිදු කර ගෙන උප ශාන්තව වසන්න"යි අනුශාසනා කළ හ.

භාග්‍යවතුන් වහන්සේ ගේ අනුශාසනය අවසන රහත් වූ සන්තති ඇමති තෙම තමන් ගේ ආයු කාලය නිම වූ බව දිවැසින් දුටුවේ ය. "ස්වාමීනි, මාගේ ආයු කාලය නිම ය. දැන් මම පිරිනිවන් පාන්නෙමි" යි ඔහු පැවසූ විට බුදුරජාණන් වහන්සේ "එසේ නම් අහසට නැගී ඔබ කළ පින් කම් කියා පිරිනිවන් පෑම යෝග්‍යයැ"යි වදාළ හ. ඇමති තුමා ද එසේ කොට තේජෝ කසිණයට සම වැදී පිරිනිවන් පෑවේ ය. සිරුරෙහි ලේ මස දැවී යත්දි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේ ලවා සුදු රෙදි කඩක් ගෙන්වා ඇමති තුමා ගේ ධාතු එහි පතිත වන්නට සැලැස්වී ය.

"ඇමතිතුමා පිරිනිවන් පෑවේ සවාභරණයෙන් ම සැරසී සිටිමිනි. එහෙයින් ඔහු ශ්‍රමණයෙක් ද, බ්‍රාහ්මණයෙක් ද?" යි රැස්ව සිටි භික්ෂූන් විමසූයෙන් "මාගේ පුත්‍රයාට ශ්‍රමණයකු කීවත්, බ්‍රාහ්මණයකු කීවත් වරදක් නැත" යි භාග්‍යවතුන් වහන්සේ පිළිවදන් දුන් හ.

විවරණාත්මක අනුවාදය (142 ගාථාව)

අලඞ්කතො අපි චෙ සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී
සබ්බේසු භූතෙසු දණ්ඩං නිධාය සමං චරෙය්‍ය සො
බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු

අලඞ්කතො අපි: ප්‍රියංකර ලෙස හැඳ පැළැඳ ගත්තේ වුව ද; **චෙ**: ඉදින්, **සන්තො**: ශාන්ත වූයේ; **දන්තො**: ඉඳුරන් දමනය කර ගත්තේ; **නියතො**: ඒකාන්ත අරමුණු ඇතිව; **බ්‍රහ්මචාරී**: බඹසර හැසිරෙමින්; **සබ්බේසු භූතෙසු**: සියළු සත්වයන් කෙරෙහි; **දණ්ඩං නිධාය**: අවි ආයුධ අත හැර දමා; **සමං චරෙය්‍ය**: සමබර ලෙස ජීවත්වන්නේ ද; **සො**: හෙතෙම; **බ්‍රාහ්මණො**: බ්‍රාහ්මණයෙක්; **සො**: හෙතෙම; **සමණො**: ශ්‍රමණයෙකි; **ස**: හෙතෙම; **භික්ඛු**: භික්ෂුවකි.

පියකරු ලෙස හැඳ පැළඳ ගත්තේ වුව ද යමෙක් ශාන්තව දාන්තව ඒකාන්ත යහපත් අරමුණු ඇතිව බ්‍රහ්මචර්යාව හැසිරෙයි නම්, කිසිම සත්ත්වයෙකුට හිරිහැර නො කරයි නම් සමබර ජීවිතයක් ගත කරයි නම් හෙතෙම ශ්‍රමණයෙකි, බ්‍රාහ්මණයෙකි, භික්ෂුවකි.

විවරණය

බ්‍රහ්මචර්‍යාව: යන්න බොහෝ විට යෙදෙන්නේ පැවිදිව ගත කරන ජීවිත රටාවට ය. පොහෝ දින සිල් සමාදන් වන ගිහි උපාසක උපාසිකාවෝ ද බ්‍රහ්මචර්‍යාව රකිති. මෙහි අරමුණ ලිංගික හැසිරීම් වලින් වෙන්ව සිටීම යි. බඹසර රැකීමෙහි අරමුණ සියළු සරාගී සිතිවිලි මුලිනුපුටා දමා විමුක්තිය ලබා ගැනීමයි.





විලියෙන් අකුසල් දුරු කරන තැනැත්තෙක් ලොවැ ඇති නම් ඒ සුලබ නො වන්නේ ය.

143. හිරී නිසෙධො පුරිසො	ලජ්ජාවෙන් පවු දුරලන
කොචි ලොකස්මිං විජ්ජති	අය ඉඳහිට ලොව හමුවෙත්
යො නින්දං අප්පබොධති	හොඳ අසු මෙන් කස වලකන
අස්සො භද්‍රො කසාමිව (10:15)	ඔහු නින්දාවක් නො ලබත්

ඇතිව ලජ්ජා බය - දුරු කර ලන්න පාපය

10 (10) පිලෝතික තිස්ස තෙරුන්ගේ වත (143 සහ 144 ගාථා)

පිලෝතික තිස්ස තෙරුන් නිමිති කොට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දෙව්රම් වෙහෙරදී දේශනා කළ සේක.

දිරාපත් වැරහැලි හැඳ සිඟමනේ ගිය තරුණයකු දුටු ආනන්ද මහ තෙරුන් ගේ සිත උණු වී ගියෙන් උන්වහන්සේ ඔහු සාමණේර පැවිද්දෙන් පැවිදි කරලූ හ. පැවිදි වන දා මුදා ලූ ගිහි වැරහැලි හා සිඟමන් යැදි කබල ද ගස් බිලයක රඳවන ලදී. පිරිසිදු සිවුරු හැඳ සුවසේ වළඳමින් සිටින තිස්ස සාමණේරයනට ටික කලකින් උදාසීන බවක් දැනෙන්නට විය. නැවත කබලත් රැගෙන සිඟමනේ යන්නට ආශාවක් ද හට ගති.

එහෙයින් කඩමලු හා කබල තිබූ තැනට ගොස් එය අතට ගෙන තමන්ට ම තමන් කරන්නට යන බොළඳ කමෙහි තරම වැටහී ගියෙන් "අඥානය, ඉතා හොඳ සිවුරු පිළි, ප්‍රනීත භෝජන ලැබෙන මේ පහන් දිවිය හැර නැවත වැරහැලි හැඳ හිඟමනේ යන්නට තරම් ඔබ අමනයෙක්දැ'' යි තමන්ට ම නිග්‍රහ කර ගත්තේ ය. ඒ වැරහැලි නැවත එහි දමා අවුත් මහණ දම් පිරීය. යළිත් ටික දිනකින් පැවිද්ද එපා වූ හෙයින් වැරහැලි අතට ගෙන පෙර මෙන්ම තමාට අවවාද කර ගත්තේ ය. මේ ක්‍රමයට තමන්ට පැවිදි ජීවිතය ගැන කළ කිරීමක් එන හැම විට ම හේ එහි ගොස් වැරහැලි අතට ගෙන තමා ම අවවාද කර ගනියි.

නිතර නිතර තිස්ස තෙරුන් එම ගස ලඟට යන්නේ කුමටදැයි සබ්‍රහ්මචාරී හිමිවරු විමසූ හ. "මගේ ගුරුවරයා ගෙන් උපදෙස් ලබන්නට යමි" යි යන්න පිළිතුර විය. මෙසේ නිතර දක්නා දිරා ගිය වැරහැලි ම භාවනා අරමුනක් කර ගත් තිස්ස සාමණේරයෝ ටික දිනකින් භාවනා වඩා රහත් වූ හ. ඉන්පසු ගස වෙත යාමක් නො වීය. "දැන් තිස්ස ගුරුන් දකින්නට යන ගමන කරන්නේ නැහැ නො වේද?" යි හිතවත් හිමිවරුන් ප්‍රශ්න කළ විට "ප්‍රයෝජනයක් තිබුණු දවස්වල ගියාට දැන් අවශ්‍යතාවක් නැහැ" යි උන්වහන්සේ පිළිතුරු දුන් හ."ඒ කතාවේ තේරුම තිස්ස දැන් රහත්වෙලා කියන එකයි. ඒක නම් වෙන්න බෑ. එයා ගෙ බොරුවක්" යි කතිකා කරගත් විහාරවාසී හිමිවරු ඒ පිළිබඳව භාග්‍යවතුන් වහන්සේට දැනුම් දෙන්නට තීරණය කළ හ. "ස්වාමීනි, තිස්ස තමන් රහත් වූ බවක් අඟවන්නට වෑයම් කරයි. ඔහු කියන්නේ බොරුවක් විය යුතුය" යි ඔවුහු බුදුන් හමුවේ කියා සිටිය හ.

"මහණෙනි, තිස්ස භික්ෂුව බොරුවක් කියනවා නො වේ. එය සැබෑවකි. ඔහු ගේ ආචාර්‍ය්‍යවරයා වූ පිලෝතිකය (වැරහැලි ඇඳුම) සමග තිබුණු සම්බන්ධය අවසන් වූයේ යථාභූතඥාන දර්ශන පහළ වීමත් සමග ය. ඔහු දැන් රහත් නමක් හෙයින් ගුරුවරයා ගේ අවවාද තව දුරටත් අනවශ්‍යය'' යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා යුග්මය දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (143 ගාථාව)

කසා භද්‍රෝ අස්සෝ ඉව යො නින්දං අප්පබොධති, හිරි නිසෙධො පුරිසො ලොකස්මිං කොචි විජ්ජති.

කසා: කස පහරින් (වැළකෙන); **භද්‍රෝ අස්සෝ ඉව**: උතුම් අසෙකු මෙන්; **යො**: යමෙක්; **නින්දං**: නින්දාව, හෙවත් අකුශල චිත්තය; **අප්පබොධති**: සිය සිතින් පහකෙරේ ද; **හිරි නිසෙධො පුරිසො**: (එබඳු සේ) ලජ්ජාවෙන් පාපය වළකා ගන්නා පුරුෂයෝ; **ලොකස්මිං**: මේ ලෝකයෙහි; **කොචි**: කිසිවෙක්; **විජ්ජති**: ඇත්තේ ය; (දුර්ලභ ය)

හොඳ අශ්වයෝ කස පහරට අකැමැත්තෙන් තම කාර්‍ය්‍යය මැනවින් කරති. එසේම ලොව නින්දා විඳින්නට අකැමැති ඇතැම් පුද්ගලයෝ පාපයට ඇති ලජ්ජාව නිසා යහ මඟෙහි ගමන් කරති.





කෙලෙස් තවන වැරැ හා සසරට කලකිරුම් ඇතිවැ පිළිවෙත් පිරුමෙන් සසර දුක් දුරැලිය යුතු.

144. අස්සො යථා භද්‍රො කසානිවිට්ඨො
ආතාපිනො සංවෙගිනො භවාථ
සද්ධාය සීලෙන ච විරියෙන ච
සමාධිනා ධම්ම විනිච්ඡයෙන ච
සම්පන්න විජ්ජාචරණා පතිස්සතා
පහස්සථ දුක්ඛමිදං අනප්පකං (10:16)

හොඳ අශ්වයකු මෙන් රඟ දත් කස පහරේ
තවමින් කෙලෙස් සංවේදී වී සසරේ
ඇති කර සැදැහැ සිත්, සිල්, වීරිය පුරලා
වඩමින් සමාදිය දැක ඇතිතතු ලෝකේ
විජ්ජාචරණ සමගින් සිහි නුවණ වඩා
වනසා ලන්න මේ දුක් කඳ සංසාරේ

උත්සාහය ඇවැසිවේ ය - වනසන්නට මේ දුක් කඳ

10 (10) පිලෝතික තිස්ස තෙරුන්ගේ වත (143 සහ 144 ගාථා)

විවරණාත්මක අනුවාදය (144 ගාථාව)

**කසා නිවිට්ඨො භද්‍රො අස්සො යථා ආතාපිනො
සංවෙගිනො භවාථ සද්ධාය ච සීලේන ච විරියේන ච
සමාධිනා ධම්ම විනිච්ඡයෙන ච සම්පන්නවිජ්ජාචරණා
පතිස්සතා අනප්පකං ඉදං දුක්ඛං පහස්සථ**

කසා: කසයෙන්; **නිවිට්ඨො**: මෙහෙයනු ලබන; **භද්‍රො අස්සො**: උසස් අශ්වයා; **යථා**: යම්සේ ද; (එසේ), **ආතාපිනො**: කෙලෙස් තවන වීර්ය ඇත්තාහු ද; **සංවෙගිනො**: සසර කලකිරුම් ඇත්තාහු ද; **භවාථ**: වන්න; **සද්ධාය ච**: ශ්‍රද්ධාවෙන් ද; **සීලේන ච**: ශීලයෙන් ද; **විරියේන ච**: වීර්යයෙන් ද; **සමාධිනා**: සමාධියෙන් ද; **ධම්ම විනිච්ඡයෙන ච**: ධර්ම විනිශ්චය නම් වූ විදසුන් නුවණින් ද (යුක්තව); **සම්පන්නවිජ්ජාචරණා**: සම්පූර්ණ වූ විද්‍යාවෙන් හා චරණයෙන් යුක්ත ව; **පතිස්සතා**: සිහියෙන් යුතුව; **අනප්පකං**: අනල්ප වූ; **ඉදං දුක්ඛං**: මේ සසර දුක; **පහස්සථ**: දුරු කරව්.

කසය මගින් හික්මෙන (කස පහර නො කනු පිණිස හොඳින් හැසිරෙන) යහපත් අශ්වයකු මෙන් කෙලෙස් තැවීම කළ යුතු ය. සංවේදී විය යුතු ය. ශ්‍රද්ධාව, ශීලය, වියර්‍යය, සමාධිය හා ධර්‍ම විනිශ්චයෙන් (යථා තත්ත්ව නිරීක්ෂණයෙන්) යුතුව විද්‍යාව හා චරණය ප්‍රගුණ කර සිහි නුවණින් යුතුව මේ අනල්ප වූ දුක් කඳ දුරු කළ යුතු ය.

විවරණය

සීල: සීල යන්නෙන් හික්මීම, ශික්ෂණය යන අරුත දෙයි. සීලය සියළු ආධ්‍යාත්මික ක්‍රියාවලින් හි ආරම්භය වෙයි. සීල - සමාධි - පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂා මාර්ගයෙහි දි සීලය පරිපූර්ණ නො කළ හොත් සමාධිය මහානිශංස නො වන බව කියැවෙයි. එහෙයින් භාවනා මාර්ගයට ප්‍රවේශ වන්නට පෙර සීලයෙන් සමන්විත විය යුතු වෙයි. සීලය ශාසනයෙහි ආදි චරණය හා ප්‍රතිෂ්ඨාව වශයෙන් හඳුන්වන්නේ ද එහෙයිනි. එහෙත් සීලය යනු මාධ්‍යයක් මිස නිෂ්ටාවක් නොවන බව තේරුම් ගත යුතුය. වෙන විදියකින් කිවහොත් සිල් පිරූ පමණින් සියල්ල සම්පූර්ණ නො වේ. සීලය පුරා සිත කය හික්මවා ගන්නේ සමථ - විදර්ශනා භාවනා සාර්ථක කරගනු පිණිස ය. විමුක්තිය සාධනය කර ගත හැක්කේ එවිට ය. සීලය මෙසේ විමුක්ති මාර්ගයේ ප්‍රථම අංගය වශයෙන් ප්‍රායෝගික වටිනාකමක් ඇත්තක් බව තේරුම් නො ගෙන තමා සීලය ආරක්ෂා කර ගත් පමණින් "මම නිර්මල සීලය ඇත්තෙමි. එහෙයින් මට වෙන කළ යුත්තක් නැත. මෙ පමණකින් ම මට විමුක්තිය ලද හැක" වැනි බොළඳ කල්පනා ඇති වුවහොත් තමන් 'සීලබ්බත පරාමාස' තත්ත්වයට ම ඇද වැටෙන්නට හැකි බව මෙනෙහි කර සීලය අත්‍යවශ්‍ය වුවත් එය පුරන්නේ ඉතිරි ශික්ෂාවන් සඳහා පදනම සැකසීමට බව තරයේ වටහා ගත යුතුය. සීල මදය මුළුමනින්ම දුර ලමින් අනතිමානීව හික්මිය යුතු ය.

01) දරුවකු විසින් දෙමාපියනට
1) පෝෂණයෙන් 2) කුදු මහත් කටයුතු කර දීමෙන් 3) කුල වංශය ස්ථාපනය කිරීමෙන් 4) දායාදයට යෝග්‍ය පරිදි හැසිරීමෙන් 5) මිය ගිය පසු පින් දීමෙන් යුතුකම් ඉටු කළ යුතු ය.

02) දෙමාපියන් දරුවනට
1) පාපයෙන් වැළකීමෙන් 2) හොඳ වැඩෙහි නිරත කර වීමෙන් 3) ශිල්ප ඉගැන්වීමෙන් 4) නිසි කල ආවාහ - විවාහ කර දීමෙන් 5) සුදුසු කල දායාද පවරා දීමෙන් සංග්‍රහ කරති.

03) ශිෂ්‍යයකු ආචාර්‍ය වරයාට
1) අසුනෙන් නැගී සිටීමෙන් 2) උවටැන් කිරීමෙන් 3) මනාව සවන් දීමෙන් 4) කුදු - මහත් කටයුතු කර දීමෙන් 5) ගරු සරු ඇතිව ඉගෙනුමෙන් මනාව පවතිති.

04) ආචාර්‍යවරු ශිෂ්‍යයන් ට
1) මනාව ශික්ෂණය කරති. 2) හොඳම දේ කියා දෙති. 3) සියළු විද්‍යා - ශාස්ත්‍ර නො මසුරුව උගන්වති 4) මිතුරන්ට හා සම්භාවනීයයනට හඳුන්වා දෙති. 5) ආරක්ෂාව සලසති.

05) ස්වාමිපුරුෂයන් බිරිඳට
1) සම්මානනයෙන්, 2) අනවමානනයෙන් 3) විශ්වාසය කඩ නො කිරීමෙන් 4) අධිකාරය පවරා දීමෙන් 5) ආභරණ ආදිය ලබා දීමෙන් සංග්‍රහ කළ යුතු ය.

6) බිරිඳ
1) කුදු මහත් කටයුතු සකසා ඉටු කිරීමෙන් 2) ආගන්තුක හා පරිජන සංග්‍රහ කිරීමෙන් 3) විශ්වාසය කඩ නො කිරීමෙන් 4) උපයන දෑ ප්‍රවේසමෙන් පරිහරණය කිරීමෙන් 5) අලස නො වී කඩිසරව ක්‍රියා කිරීමෙන් චාරිත්‍ර ඉටු කරයි.

(7)ගෘහපතියකු තම මිතුරන්ට
1)තෑගි බෝග දීමෙන් 2) මිහිරි වචන කථා කිරීමෙන් 3) අර්ථ සිද්ධියට ක්‍රියා කිරීමෙන්, 4) සමානාත්මතාවෙන් 5) සත්‍යවාදිත්වයෙන් සංග්‍රහ කරයි.

(8) මිතුරෝ ඔහුට
1) පමා වූ විටෙක ආරක්ෂාව සැපයීමෙන් 2) දේපල රැක දීමෙන් 3) බියපත් වූ විට ආරක්ෂාව සැලසීමෙන් 4) අනතුරේ දී අත නො හැරීමෙන් 5) දූ දරුවන්ට කාරුනික වීමෙන් ප්‍රති සංග්‍රහ කරති.

(9) ස්වාමියා සේවකයාට
1) ශක්තියට අනුව වැඩ පවරයි. 2) ආහාර පාන හා වැටුප් දෙයි 3) සෞඛ්‍ය පහසුකම් සපයයි. 4) විශේෂ දේ බෙදා හදා ගනියි. 5) නිසි කළ විවේක පහසුව ලබා දෙයි.

(10) **සේවකයෝ ස්වාමීන්ට**
1) ඔහුට පෙර අවදි වීමෙන් 2) ඔහුට පසුව නින්දට යාමෙන් 3) දුන් දේ පමණක් ගැනීමෙන් 4) ස්වකීය සේවය මනාව ඉටු කිරීමෙන් 5) ස්වාමියා ගේ කීර්තිය පතුරුවා හැරීමෙන් කෘතවේදී වෙති.

(11) **ගෘහපතියකු ශ්‍රමණ බ්‍රාහ්මණයනට**
1) මෛත්‍රී සහගත කාය කර්මයෙන් 2) මෛත්‍රී සහගත වාක් කර්මයෙන් 3) මෛත්‍රී සහගත මනෝ කර්මයෙන් 4) දොර විවෘත කිරීමෙන් 5) පෝෂණය සැපයීමෙන් සත්කාර කරයි.

(12) **ශ්‍රමණ බ්‍රාහ්මණයෝ**
1) පාපයෙන් වැළකීමෙන් 2) යහපතෙහි යෙදැවීමෙන් 3) කුළුණු සිත් ඇති කිරීමෙන් 4) නො දත් දේ කියා දීමෙන් හා දත් දේ වඩාත් පැහැදිලි කර දීමෙන් 5) දෙව් ලොවට මග කියා දීමෙන් සංග්‍රහ කරති.

ගෘහස්ථයා ගේ චාරිත්ත සීලය වන්නේ ප්‍රධාන වශයෙන් පංච ශීලයයි. අන්‍යයන් ගේ ජීවිත විනාශ කිරීමෙන් වළකින හේ නුදුන් දේ ගැනීමෙන් ද වළකියි. කාම මිථ්‍යාචාරයෙහි නො යෙදෙයි. සුරාපානයෙන් වළකියි. මේ විරතීන් මගින් තම චරිතය පවිත්‍ර කර ගන්නා හෙතෙම සමාජයට ද මානව අයිතිවාසිකම් නිරුපද්‍රැත ලෙස භුක්ති විඳීමේ හැකියාව සහතික කරයි. මේ මූලික පංච ශීල ශික්ෂණය අතිරේකව උපෝසථ දිනයන් හි අෂ්ඨාංග, ආජීවාෂ්ටමක හෝ දශ ශික්ෂා ආරක්ෂා කිරීමට ගෘහස්ථයනට හැකි ය.

මොනවට කීකරු අය තමන් ගේ සිත (කෙලෙස් වසඟයෙන් මුදා) හික්මවා ගනිත්.

145. උදකං හි නයන්ති නෙත්තිකා
උසුකාරා නමයන්ති තෙජනං
දාරුං නමයන්ති තච්ඡකා
අත්තානං දමයන්ති සුබ්බතා (10.17)

දියාළුවෝ දිය ගෙන යත්
හී වඩුවෝ ඊය නමත්
වඩුවෝ ලී ඇදය හරිත්
සිල්වත් අය තමන් නමත්

දමනය කර ගන්න තමන්

10 (11) සුබ සාමණේරයන් ගේ වස්තුව (145 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ සුබ නම් සාමණේරයන් වහන්සේ මුල් කර ගෙන මේගාථාව දේශනා කර වදාළ සේක.

සුබ සාමණේරයන් පැවිදි වූයේ හත් හැවිරිදි වියේ දී ය. උන්වහන්සේ ගේ ආචාර්ය වූයේ සැරියුත් මහ රහතන් වහන්සේ ය. පැවිදිව අටවන දින සැරියුත් මහ තෙරුන් සමග පිඩු සිඟා ගිය සාමණේරයන් වහන්සේ කුඹුරකට ජලය ගෙන යන ගොවියන් දුට හ. සිත් පිත් නැති දිය තමන් රිසි පරිදි රිසි තැනට ගෙන ගොස් වැඩ ගන්නා අයුරු සිතට ගත් හ. ඉන් අනතුරුව ශී වඩුවන් ඊතල සඳහා දඬු නමනු දැක එයත් පාඩමකට ගත් හ. අවසන දැක්කේ වඩු මඩුවකි. එහි වඩු කාර්මිකයෝ දැවදඬු කපමින්, මදිමින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය කරනු දක්නට ලැබිණ. තමන් කැමති පරිදි මේ පණ නැති භාණ්ඩ හික්මවා ගන්නට මිනිසුන්ට හැකි නම් අපට අපේ ම සිත් හික්මවා ගන්නට බැරි මන්ද?

එසේ සිතූ සුබ සාමණේරයෝ පිඩු සිඟා යාම නවතා ආපසු විහාරස්ථානයට යාමට ගුරු හිමියන් ගෙන් අවසර පැතූ හ. අවසරය ලැබුණෙන් රහත් වී මිස නො නවතිමියි අදිටන් කර ගත් උන්වහන්සේ භාවනාවට පටන් ගත් හ. මේ අතර ගඳකිළියෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ "සුබ සාමණේරයෝ පිඩු සිඟා යාම නවතා භාවනා කරනු පිණිස ආරාමයට ආපසු ආ හ. උන්වහන්සේ ගේ කාරිය ඉටු වීදෝ" යි දිවැසින් බලා වදාළ හ. සාමණේරයන් අනාගාමී ඵලය දක්වා පිළිවෙළින් පත්ව සිටි අයුරු දුටු භාග්‍යවතුන් වහන්සේ එදිනම රහත් ඵලය ලබා ගැනීමේ ශක්තිය ද එම සාමණේර නම සතුව පවත්නා බව ද දැක ගත් හ. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ගන්ධකුටියෙන් නික්ම විහාරස්ථානයට පිවිසෙන දොරටුව අසල රැඳී සිටිය හ.

සාරිපුත්ත මහ රහතන් වහන්සේ පිඩු සිඟා ගෙන ආපසු පැමිණිය හ. බුදු පියාණන් වහන්සේ සුබ සාමණේරයන් රහත් වන තුරු සැරියුත් මහ තෙරුන් කුටියට නො පිවිසවනු පිණිස උන්වහන්සේ ගෙන් ප්‍රශ්න හතරක් විමසූහ. ඒ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සැරියුත් හිමියන් පමා වූ අතර සාමණේර හිමියෝ රහත් වූ හ. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ "සාරිපුත්ත, සාමණේර නමට ආහාර දෙන්න" යි වදාළ හ. සැරියුත් හිමියෝ ද සාමණේර නමට පිණ්ඩපාතය පිරිනැමූ හ. සාමණේර නම වළඳා නිම වන විට ඉරු මඳක් අවරට ගොස් තිබිණි. ඒ ගැන භික්ෂූන් වහන්සේ දම් සභාවෙහි කතා කරමින් සිටියහ.

භාග්‍යවතුන් වහන්සේ එහි වැඩම කර "මහණෙනි, මෙතෙක් වේලා කවර කතාවක යෙදී සිටියහු ද?" යි විමසූ විට ඔවුහු "ස්වාමීනි, අද උදේ වරුව ටිකක් දිග වුවා වැනිය. සාමණේරයන් දන් වළඳා අවසන් වූ විට එක්වර ම හවස් වුවා වැනි විය. අපි ඒ ගැන කතා කළෙමු" යි පැවසූ හ. "මහණෙනි, උදාර අභිමතාර්ථ ඇත්තන් පධන් වීර්යයෙහි යෙදෙන විට එබඳු ප්‍රාතිහාර්ය සිදු වන්නේ ය. අද සුබ සාමණේරයෝ දියාඑවන් දිය ගෙන යන හැටි, ඊ වඩුවන් ඊ දඬු සකසන හැටි, වඩු කාර්මිකයන් ලී කපා මැද සකසන හැටි බලා සිට එයින් පාඩමක් ඉගෙන තමා ඔපවත් කර ගත් හ. උන් වහන්සේ දවල් දානය වැළඳුයේ රහතන් වහන්සේ නමක් වශයෙනි'' යි වදාළ හ.

විවරණාත්මක අනුවාදය (145 ගාථාව)

නෙත්තිකා හි උදකං නයන්ති උසුකාරා තෙජනං
නමයන්ති තච්ඡකා දාරුං නමයන්ති සුබ්බතා අත්තානං
දමයන්ති

නෙත්තිකා: කුඹුරු වලට දිය ගෙන යන්නෝ; **උදකං**: ජලය; **නයන්ති**: ගෙන යති; **උසුකාරා**: ඊතල සාදන කාර්මිකයෝ; **තෙජනං**: ඊ දඬු; **නමයන්ති**: හැඩ ගන්වති; **තච්ඡකා**: වඩු කාර්මිකයෝ; **දාරුං**: ලී; **නමයන්ති**: නවති; **සුබ්බතා**: සිල් රකින්නෝ; **අත්තානං**: තමා; **දමයන්ති**: දමනය කර ගනිති.

කුඹුරු වලට අවශ්‍ය ජලය ගොවියෝ ඇල මාර්ග වලින් කැමති පරිදි ගෙන ගොස් හසුරුවා ගනිති. ඊතල සාදන්නෝ ඊ දඬු ගින්නෙන් රත්කර දිග හැර සාදා ගනිති. වඩු කාර්මිකයෝ ලී කපා මැද තමාට රිසි පරිදි වැඩට යොදවා ගනිති. සිල් රකින්නෝ තමා දමනය කරගනී.

විවරණය

සුබ්බතං: මනා පැවතුම් ඇත්තා සුබ්බත නමින් හැඳින් වේ. යහපත් සීල ගුණය හා විනීතාචාරවත් බව මෙයින් අදහස් වෙයි. එවැන්නන් පහසුවෙන් ශික්ෂණය කළ හැකි වෙයි.

මිනිස් සිත් පුබුදන දහමක්

ආගම් වැවෙන සරු බිමක් වූ චමත්කාර ජනක
පෙර දිගින් අපට ලැබෙන බුදු සමය නිසා ඉතාමත් සත්‍ය වූ පණිවුඩයක්
අපට ලැබී තිබේ. මිනිස් බව තුළ නිලීනව පවත්නා ප්‍රියංකර
සාධුගුණයත් පවිත්‍රත්වයත් එමගින් අපට පහදා දී ඇති හෙයින්
මිනිස් හදෙහි වසන දෙවියන් ගෙන් බාහිර
වෙනත් දෙවියකු මිනිසුන් ප්‍රභාමත් කිරීම පිණිස අවශ්‍ය නැත.

චාල්ස්. ටී. ගෝරම්
(Charles T. Gorham)

11 වන පරිච්ඡේදය

ජරා වග්ග



ගිනි (එකොළොසකින්) ඇවිල ගෙන නිතොරැ දැවෙද්දී කුමන සිනාවෙක් ද? කුමන සතුටෙක් ද?

146. කොනු හාසෝ කිමානන්දෝ
නිච්චං පජ්ජලිතේ සති
අන්ධකාරෙන ඔනද්ධා
පදීපං න ගවෙස්සථ (11:1)

මොන සිනා දෝ
මොන සතුට දෝ
නිතර ගිනි ගෙන දැවෙද්දී
දිලෙන පහනක්
සොයනු නැත්දෝ
අන්ධකාරේ සිටිද්දී

එක වදනක් - දුන් එළියක්

11 (1) විසාකාවන් ගේ පිරිවර ලඳුන් (146 ගාථාව)

විසාකා උපාසිකාවගේ **පිරිවර ලඳුන්** ඇරබ මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ දෙව්රම් වෙහෙරදී ය.

විසාකාවන් දනට පිනට හිතැති කාරුණික ගුණවත් කුලකතක් සේ පතලව සිටි හෙයින් තම බිරින්දන් ද එබඳු ගුණ යහපත් අය බවට පත් වෙනවා නම් ජීවිතය කෙතරම් ප්‍රසන්න වන්නේ දැයි සැවැත් නුවර බොහෝ අය සිතූ හ. එසේ සිතූ පන්සියය දෙනෙක් වරක් තම බිරින්දන් එසේ ගුණ යහපත් කර ගනු පිණිස ඔවුහු විසාකා උවැසිය ගේ ඇසුරට පත් කළ හ. විසාකාවෝද විහාරස්ථානයට යන ගමන් බිමන් වලදී ඔවුන් කැටුව යමින් සදුපදේශ දානයෙන් ඔවුනට සංග්‍රහ කළ හ.

මේ අතර රජතුමා ගේ ද අවසර ඇතිව පැවැත්වෙන එක් සැණකෙළි සමයෙක ඔවුහු සිය ස්වාමිවරුනට තැනූ සුරාවෙන් ඉතිරිය විසාකාවන් මඟහැර උයනට සඟවා ගෙන ගොස් බී කලබල කළෙන් ස්වාමිපුරුෂයන් ගෙන් ගුටි බැට කෑ හ.

තවත් වතාවක ඔවුහු විසාකාවන් සමඟ ආරාමයට යන අතර සුරා බඳුන් ද සඟවා ගෙන ගොස් ආරාමයේදී හොර රහසේ ම බී ධර්ම ශාලාවේ වාඩි වූ හ. බුදුරදුන් ධර්ම දේශනා කරන අතරතුර ඔවුන් ගේ සුරා මත වැඩි විය. සමහරු මහ හඬින් සිනාසෙන්නටත්, සමහරුන් ගී ගයන්නටත්, සමහරුන් නටන්නටත් පටන් ගත්තෙන් ඒ කවර හෙයින් දැයි දිවැසින් බැලූ භාග්‍යවතුන් වහන්සේට කරුණු වැටහිණ. ඔවුන්ට සුරා මත මැද්දේ මාර පාක්ෂික මිථ්‍යා දෘෂ්ටික භූතාත්මයන් ද ආවිෂ්ටව තිබින. මාරයාට අවස්ථාව නො දිය යුතු යැයි සිතූ භාග්‍යවතුන් වහන්සේ සිය දෙබැමෙන් තද නීලවණී රශ්මියක් නිකුත් කර සමස්ත දම් සභාවම අඳුරේ ගිල්වූ හ. භීතියට පත් කාන්තාවන් ගේ සුරාමත නැතිවිණ. ඒ වෙනුවට ඔවුහු බියෙන් තැති ගත්හ.

අනතුරුව සුදු බුදුරැසින් දම් සභාව ඒකාලෝක කළ භාග්‍යවතුන් වහන්සේ ඔවුන් අමතා "උපාසිකාවෙනි, ඔබ මේ දම් සභාවට මෙබඳු ස්වරූපයකින් නො පැමිණිය යුතුව තිබිණි. ඔබ එසේ ප්‍රමාදීව හැසුරුණු හෙයින් මාරයාට අවස්ථාව සැලසිණ. මාරාවේශය නිසා ඔබ ක්‍රියා කළේ විලි බිය නැතිව ය. ඔබ හාත්පසින් ම එකොලොස් ගින්නකින් දැවෙත්දී තමන් තුළ ඇති කෙළෙසුන් ගෙන් මිදෙන්නට තැත් නො දරන්නේ ඇයි? ඔබ අඳුරෙහි ගිලී සිටින හෙයින් ආලෝකයක් සොයා ගන්නට නො වෙහෙසෙන්නේ ඇයි?" යනාදි වශයෙන් අනුශාසනා කළ හ. ධර්ම ශ්‍රවණය කළ උපාසිකාවෝ සියළු දෙන අවසන සෝවාන් ඵලයෙහි පිහිටිය හ.

විවරණාත්මක අනුවාදය (146 ගාථාව)

නිච්චං පජ්ජලිතේ සති කොනුහාසො කිං ආනන්දෝ
අන්ධකාරෙන ඔනද්ධා පදීපං න ගවෙස්සථ?

නිච්චං: නිතරම; **පජ්ජලිතේ සති**: (එකොළොස් ගින්නෙකින්) ගිනි ගෙන දැවෙත්දි; **කො නු හාසො**: කවර නම් හිනාවක් ද?; **කිං ආනන්දෝ?**: කුමන සතුටක් ද?; **අන්ධකාරේන**: (අවිද්‍යා)අන්ධකාරයෙන්; **ඔනද්ධා**: වැසී සිටිමිනුත්,(ඔබ); **පදීපං**: ආලෝකයක්; **න ගවෙස්සථ?**: නො සොයන්නහු ද?

නිතරම කෙළෙස් ගින්නෙන් දැවෙමින් සිටිය දී කවර හිනාවක් ද, කවර ආනන්දයක් ද?, අඳුරෙහි ගිලී සිටිමිනුත් ආලෝකය පිණිස පහනක් නො සොයවු ද?

විවරණය

පජ්ජලිතෙ සති: සත්ත්වයා නිරන්තරයෙන් ගිනි එකොළසකින් දැවෙන බව දහම් පොත්වල දැක්වෙයි. ඒ ගිනි නම්,

1) රාගය 2) ද්වේෂය 3) මෝහය 4) ව්‍යාධිය 5) ජරාව 6) මරණය 7) සෝකය 8) පරිදෙව 9) දුක්ඛ (කායික දුකය) 10) දෝමනස්ස (නො සතුට හෙවත් සිතේ දුකය) 11) උපායාස (දැඩි ආයාසය)

යන එකොළසයි. සෑම සත්ත්වයෙක්ම නිවන් දැක සසරින් එතෙර වන තුරු මේවායින් දැවෙයි.

අන්ධකාරෙන: අඳුර ලෙස මෙහි හඳුන්වන්නේ සියළු පෘථග්ජන සත්ත්වයන් ගිලී සිටිනා අවිද්‍යා අන්ධකාරයයි.

පදීපං: ප්‍රදීපය නම් ප්‍රඥා ප්‍රදීපයයි.

ගාථාවසානයෙහි විසාකාවගේ පිරිවර කාන්තාවෝ සෝවාන් වූහ. සෝවාන් වූ අය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදෙති. එනම්,

1. **සත්තක්ඛත්තු පරම**: පහත් ජන්මවල නො ඉපිද දිව්‍ය-මනුෂ්‍ය ලෝකවල සත් වරක් පමණක් උපදිති.

2. **කෝලං කොල**: දෙතුන් වරක් පමණක් ඉපිද සසර දුක් කෙළවර කරයි.

3. **ඒක බීජේ**: තව එක් වරක් පමණක් මනු ලොව උපතක් ලබයි.

සෝතාපත්ති ඵලය ලබන්නේ සක්කාය දිට්ඨි විචිකිච්ඡා සහ සීලබ්බත පරාමාස යන සංයෝජන නැති කිරීමෙනි.



බොහෝ දෙන සුවය යි සලකා විසිතුරු කොට සරසන සිරුර ගති සලකා බලන්න.

147. පස්ස චිත්තකතං බිම්බං
අරුකායං සමුස්සිතං
ආතුරං බහු සඞ්කප්පං
යස්ස නත්ථි ධුවං ඨිති (11:2)

බලන්න හැඩ වැඩ කළ කය
තුවාලයකි ඇට කටු පිරි
ලෙඩකි කවුරු ලොබ සිතුවත්
තිර පැවතුම් බිඳකුත් නැති

බලන්න ඇති තතු සිරුරේ

11 (2) සිරිමා පුරඟන පුවත (147 ගාථාව)

සැවැත්නුවර ජේතවන විහාරස්ථානයෙහි වැඩ වාසය කළ භාග්‍යවතුන් වහන්සේ සිරිමා නම් ගණිකාව ඇරබ මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවර ඉතා ප්‍රියංකර රූප ශෝභාවෙන් යුක්ත සිරිමා නම් අබිසරුලියක් විසුවා ය. ඕ දිනපතා භික්ෂූන් වහන්සේලා අටනමකට දන් පිරිනැමුවා ය. වරක් එහි දන් වැළඳූ භික්ෂූහු ඇය ගේ අසමාන රූප සෞන්දර්යය ගැනත් ඇය පිළිගැන්වූ ආහාර වල ප්‍රණීතත්වය ගැනත් ආරාමයේදී කථා කළ හ. ඒ අසා සිටි එක් තරුණ හිමි නමක ගේ සිත තුළ ඇය නොදැකම පවා ඇය පිළිබඳ සරාගී සිතක් ඇති විය. පසු දින හෙතෙම අනිත් භික්ෂූන් ද කැටුව සිරිමාවන් ගේ නිවසෙහි දානය වැළඳීම පිණිස පිටත් විය. එදා සිරිමා රෝගාතුරව සිටි දිනකි. එසේ වුව ද ඇය භික්ෂූන් වහන්සේලාට ගෞරව කරන්නට අවශ්‍යයැයි කියා සිටි හෙයින් ඇය වත්තම් කර ගෙන සඟ මැදට ගෙන එන ලදී. "ඇය අසනීපව සිටිය දී පවා අතිශයින් රූප සම්පන්නය" යි සිතූ භික්ෂුව ඇය කෙරේ තදින් ම ඇළුම් කළේ ය.

එදා රැයෙහි අසනීපය වැඩි වීමෙන් සිරිමා කළුරිය කළා ය. බිම්බිසාර රජ තෙම සිරිමා මිය ගිය බව බුදුරජාණන් වහන්සේට දැනුම් දුන්නේ ය. සිරිමා ගේ මළ සිරුර සුසාන භූමියට ගෙන ගොස් වළ නො දමා දින තුනක් එහි සුරක්ෂිතව තබන සේ භාග්‍යවතුන් වහන්සේ රජුට උපදෙස් දුන් හ. කපුටන් හා ගිජු ලිහිණියන්ගෙන් රැක ගනිමින් එය දින තුනක් එසේ තබන ලදී. සිරිමා ගේ රූබර සිරුර තව දුරටත් රූබර නො වීය. එය ඉදිමී කුණු වී පණුවෝ පවා ඇති වූහ. නව දොරින් ම ඕජාව ගලන්නට විය.

සිවුවන දින බුදුරජාණන් වහන්සේ මහ සඟන පිරිවරා සුසාන භූමියට වැඩම කළ හ. රජතුමා ද සහ පිරිවරින් පැමිණියේ ය. සිරිමා කෙරේ දැඩි ප්‍රේමයක් ඇති කර ගෙන සිටි තරුණ භික්ෂුව ඇය මියගිය බව දැන සිටියේ නැත. බුදුරදුන් සිරිමාව ගේ සිරුර බලන්නට යතියි ඇසූ උන්වහන්සේ ද ගමනට එක් විය. සුසාන භූමියෙහි දී සිරිමාවන් ගේ සිරුර වට කර සඟරුවන හා බුදුරජාණන් වහන්සේ වැඩ සිටි අතර රජතුමා සහ පිරිස ද වටව සිටියහ. බොහෝ ගිහි පැවිදි, ස්ත්‍රී පුරුෂ සෙනඟ ද එහි රැස් වූහ.

භාග්‍යවතුන් වහන්සේ රජතුමාගෙන් මෙසේ විමසූ හ. "මහරජ, මේ කාන්තාව කවුද?" රජතුමා පිළිතුරු දුන්නේ "ස්වාමීනි, මේ ජීවක වෛද්‍යවරයා ගේ සහෝදරිය වූ සිරිමා ය." "මේ සිරිමා ද, මහරජ?" "එහෙමයි ස්වාමීනි," "එසේ නම් මහරජ කහවුණු දහසක් දෙන්නකුට සිරිමා ලද හැකි යැයි අණ බෙර ලවන්න" කිසිවෙක් 'හුම්' හඬකුදු නො නැගූ හ. රජතුමා මිල සතයක් දක්වා අඩු කළේ ය. කිසිවෙක් මිලට නො ගත් හ. "බුදුරජාණන් වහන්ස මේ සිරුර කිසිවෙක් නොමිලයේවත් නො ගනිති" යි රජතුමා දැනුම් දුන්නේය.

භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා අමතමින්, "මහණෙනි, වනිතාවක ගේ අගයට වූ දේ බලන්න. මැය සමග එක් රැයක් ගත කරන්නට මිනිස්සු කහවුණු දහසක් ගෙවූ හ. අද කිසිවෙක් නොමිලයේ ද නො ගනිති. ඇය ගේ රූසපුව දිරාපත්ව ගියේ ය. මහණෙනි, සිරුරේ හැටි තේරුම් ගන්න" යි ධර්ම දේශනා කළ හ. සිරිමාවන් කෙරේ ඇළුම් කළ භික්ෂු නම ද සෝවාන් ඵලය ලද්දේ ය.

විවරණාත්මක අනුවාදය (147 ගාථාව)

යස්ස ධුවං ඨිති නත්ථි අරුකායං සමුස්සිතං ආතුරං බහු සඞ්කප්පං චිත්තකතං බිම්බං පස්ස

යස්ස: යමකට; **ධුවං ඨිති**: තිර පැවැත්මක්; **නත්ථි**: නැත්ද; **අරුකායං**: තුවාලයක් ව; **සමුස්සිතං**: ඇටකටු සමූහයක් වූ; **ආතුරං**: රෝගී වූ; **බහු සඞ්කප්පං**: බොහෝ දෙනා විසින් විවිධ ලෙස කල්පනා කරනු ලබන්නා වූ; **චිත්තකතං**: විචිත්‍ර කරන ලද; **බිම්බං**: මේ ශරීරය; **පස්ස**: බලන්න.

ස්ථාවර පැවැත්මක් නැති, මුළුමනින් ම තුවාලයක් වැනි, ඇට එක්වී රොක්වී පෙනෙන, රෝගී වූ,විවිධ ජනයා විසින් විවිධාකාරයෙන් උපකල්පනය කරනු ලබන, මේ විසිතුරු කරන ලද ශරීරයේ යථා තත්ත්වය බලන්න.

විවරණය

ශරීරයට නිත්‍ය පැවැත්මක් නැත. එය නිරතුරුවම වෙනස් වෙමින් දිරා පත් වෙමින් විනාශය කරා ගමන් කරයි. එහෙත් එය විවිධාකාරයෙන් විසිතුරු කොට විවිධ කල්පනා ජනිත කරවයි.

සියලු සතුන් ගේ ජීවිතය මරණය කෙළවර කොට ඇත්තේ ය.

148. පරිජිණ්ණමිදං රූපං
රොගනිඩ්ඩං පභඞ්ගුරං
භිජ්ජති පූතිසන්දෙහො
මරණන්තං හි ජීවිතං (11:3)

දිරා යන මේ සිරුර
ලෙඩින් වැටෙනා නිතර
බිඳෙයි සැරව ද වැගිර
දිවියේ කෙළවරයි මරණය

දිවිය නිමවෙයි මරණයෙන්

11 (3) උත්තරා මෙහෙණිය ගේ කතාව (148 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව **උත්තරා මෙහෙණිය** නිමිති කොට දේශනා කළ සේක.

එකසිය විසිවස්ව වැඩ විසූ උත්තරා මෙහෙණිය දිනක් පිඬු සිඟා ගොස් එන අතර මඟ භික්ෂු නමක් දැක තම පිණ්ඩපාත භෝජනය උන්වහන්සේට පිළිගැන්වූවා ය. එහෙයින් ඇයට එදින නිරාහාරව සිටින්නට සිදු විය. දෙවන දින ද එය ම සිදු විය. තුන්වන දින ද ඕ තොමෝ තම පිණ්ඩපාත භෝජනය භික්ෂුනමක් දැක පූජා කර තුමූ නිරාහාරවම ගත කළා ය. තුන් දිනක් ම නිරාහාරව සිටීමෙන් මෙහෙණිය ඉතා දුර්වල වූවා ය.

සිවුවන දින උත්තරා භික්ෂුණිය පිඬුසිඟා වඩිනා අතර මඟ ඇයට පටුමඟක දී භාග්‍යවතුන් වහන්සේ මුණ ගැසිණි. භාග්‍යවතුන් වහන්සේට ගෞරවයෙන් වැඳ නමස්කාර කළ ඕ තොමෝ පස්සට වූවා ය. එහෙත් අවාසනාවට තමන් ගේ ම චීවරය පෑගී පැටලී බිම ඇද වැටුණා ය. එයින් ඇය ගේ හිස තුවාල විණි. ඇය වෙත ගිය භාග්‍යවතුන් වහන්සේ "ඔබේ සිරුර බෙහෙවින් දුබලව ගියේ ය. දැන් බිඳ වැටෙන්නට ආසන්න ය. ලඟදීම එහි අවසානය සිදුවනු ඇත" යි වදාළ සේක. ඒ අසා සිටි මෙහෙණිය සෝවාන් ඵලයෙහි පිහිටියා ය.

විවරණාත්මක අනුවාදය (148 ගාථාව)

ඉදං රූපං පරිජිණ්ණං රෝගනිඩ්ඩං පභඞ්ගුරං
පූතිසන්දෙහො භිජ්ජති හි ජීවිතං මරණන්තං

ඉදං රූපං: මේ රූපය; **පරිජිණ්ණං**: අතිශයින් දිරා ගියේ; **රෝගනිඩ්ඩං**: රෝගයට කැදැල්ලක් බඳුය; **පභඞ්ගුරං**: (වහා) බිඳෙන සුලුය; **පූතිසන්දෙහො**: (නව දොරින්) කුණු සැරව ගලා යයි; **භිජ්ජති**: (මේ සිරුර) පහසුවෙන් බිඳී යයි; **හි**: යම් හෙයකින්; **ජීවිතං**: ජීවිතය; **මරණන්තං**: මරණය කෙළවර කොට ඇත්තේ වේ ද (එහෙයිනි).

වයසට යන විට ශරීරය දිරාපත් වෙයි. රෝග වලට ආකරයකි. පහසුවෙන් බිඳී යයි. කුණු වී සැරව ගලා යයි. පහසුවෙන් බිඳෙයි. ජීවිතය මරණයෙන් කෙළවර වෙයි.

විවරණය

මරණන්තං හි ජීවිතං: ජීවිතයේ අවසානය මරණයයි. මේ ගාථාවේ අරමුණ ජීවිතයේ අනිත්‍යය පැහැදිලි කිරීමයි. ත්‍රි ලක්ෂණයන් ගේ ප්‍රථම ලක්ෂණය අනිත්‍යය යි. අනිත්‍යය පැහැදිලි කිරීමේ දී ලක්ෂණ තුනක් ගැන මෙනෙහි කිරීම දැක්වෙයි. එනම්, උප්පාද (හට ගැනීම) ඨිති (පැවැත්ම) භංග (විනාශය) යන ලක්ෂණ තුනයි. පැවැත්ම වුව ද මොහොතක් එකවිට එක ලෙස පැවැත්මක් නැත.

සියලුම සංස්කෘතක ධර්මයන් ගේ ස්වභාවය නිබඳව නිරන්තරව වෙනස් වීම යි. භෞතික වේවා, මානසික වේවා, ආධ්‍යාත්මික වේවා, බාහිර වේවා සියල්ලම අනිත්‍ය ය. පංචස්කන්ධ විභාගය, ආයතන විභාගය හා ධාතු විභාගය මගින්ද මෙම අනිත්‍යතාව ප්‍රකට කරනු ලැබේ. අනිත්‍යතාවෙන් මිදුණු එකම දෙය අසංස්කෘත ධර්මය වූ නිර්වාණය පමණි.

සෝවාන් වීම විග්‍රහ කරනු සුප්‍රකට පාඨය තුළ එන "**යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං**" හටගන්නා යමක් ඇත්නම්, ඒ සියල්ල නැසෙන සුළුය." යන්නෙහි හරය වන්නේ අනිත්‍යය පිළිබඳ පරිඥානයක් ඇති කර ගැනීමයි. විමුක්ති මාර්ගයේ ප්‍රථම පියවර වන්නේ අනිත්‍යය පිළිබඳ යථාවබෝධය බව මෙයින් හැඟවෙයි. අනිත්‍යය අවබෝධ කර ගැනීමේ ආගමික වැදගත්කම මෙයින් තේරුම් ගත හැකි ය. එමෙන් ම පිරිනිවන් පාන්නට මඳකට පෙර තථාගතයන් වහන්සේ විසින් වදාළ අවසාන බුද්ධ වචනය වූයේ ද "මහණෙනි, සියළු සංස්කාර ධර්මයෝ අනිත්‍යය හ. අප්‍රමාදව සම්පාදනය කර ගනිවු" යන්නයි.

සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බව හා අනාත්ම බව ප්‍රත්‍යක්ෂ කර නො ගෙන විමුක්තිය ලබා ගත නො හැක. එහෙයින් එය භාවනා මාර්ගයෙන් ඍජුව හා සූක්ෂම ලෙස ප්‍රත්‍යක්ෂ කර ගත යුතුව තිබේ. එම අවබෝධය අස්වාදය විදර්ශනාවන් අතර ප්‍රථමය ලෙස දැක්වෙයි. ඤාණ දස්සන විසුද්ධිය හා මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය ලබා දෙන නව විධ අනුස්සතීන් අතර ප්‍රථමාංකයට ද උදයව්‍යය විෂයෙහි අවධානය යොමු කිරීම දක්වා ඇත.

පභඞ්ගුරං: ශරීරය ඉතා පහසුවෙන් බිඳී විසිර යන්නක් බව මෙයින් හැඟෙයි.

පූතිසන්දෙහො: ශරීරයේ නව දොරින්ම සැරව (අපවිත්‍ර දේ) වැගිරෙයි.

අනිත්‍යය: ගස් වල දළු, මේරූ කොළ, ඉදී කහ ගැහුණු කොළ හා බිම වැටී වියළී යන කොළ අප නෙත ගැටෙන මුත් අපි ඒ මගින් ඉගැන්වෙන පාඩම සිතට නො ගනිමු. හිසෙහි කළු කෙස් සුදු වන විට එමගින් දෙන දාර්ශනික පණිවිඩය අපි තේරුම් නො ගනිමු. මේ සියල්ලෙන් අපට දෙන පණිවුඩය කුමක් ද? අනිත්‍යයයි. ඉඳ හිට අනිත්‍යය පිළිබඳ සුළු අවදිකමක් ජනිත වීම හා එය ගැඹුරින් ප්‍රත්‍යක්ෂ කිරීම අතර බලගතු වෙනසක් පවතියි. බුද්ධිමය වශයෙන් යමක් පිළිගැනීම හා ප්‍රත්‍යක්ෂ කර ගැනීම අතර වෙනසක් පවතියි. බොහෝ විට අප එය තේරුම් ගත්තත් අපට සම්බන්ධ කර වටහා ගන්නට වෑයම් නො කරමු.



ලබු කබල් වැනි කොබෝවන් පැහැ (-අලුපාට) ඇති මිනී ඇට සැකිලි කවර ඇල්මෙක් ද?

149. යානිමානි අපත්ථානි
අලාපූනෙ'ව සාරදෙ
කාපොතකානි අට්ඨීනි
තානි දිස්වාන කා රති? (11:4)

සරත් කාලෙ එතන මෙතන
වැටී තිබෙන ලබු ඇට මෙන
අළු පැහැ ඇට කටු දැකුමෙන
කවුරුත් පෙළඹෙති ඇල්මෙන

මේ දේ දැකුමෙන් - ආසා දුරලත්

11 (4) අධිමානික හිමිවරුන් ගේ කථා පුවත (149 ගාථාව)

තමන් ගැන පමණට වඩා සිතට ගත් එක් **භික්‍ෂු පිරිසක්** අරබයා බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් මේ ගාථාව වදාළ සේක.

එක්තරා භික්‍ෂු පිරිසක් භාග්‍යවතුන් වහන්සේ වෙතින් කමටහන් ලබා ගෙන බවුන් වඩනු පිණිස වනගත වූහ. බොහෝ උනන්දුවෙන් අප්‍රමාදී ව භාවනා කළ ඒ හිමිවරු ඉක්මනින් ම ධ්‍යාන උපදවා ගත් හ. එහෙත් එම අධිගමය වරදවා තේරුම් ගත් උන්වහන්සේලා දැන් තමන් සියළු කෙළෙසුන් නසා රහත්ව ඇතැයි සිතූහ. එහෙත් ඔවුන් ලබා තිබුණේ ධ්‍යානයක් පමණි.

තමන් රහත් ඵල ලබා ඇතැයි සතුටට පත් ඒ හිමිවරු භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස, දෙව්රම් වෙහෙර බලා ආපසු ගමනට පිටත් වූහ. උන් වහන්සේලා දෙව්රම් වෙහෙරට ඇතුල් වන්නට පෙර පවුරු දොරටුව ට සම්පවත් ම සිය බුදු නෙතින් ඔවුන් දැක වදාළ භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් අමතා "ආනන්ද, ඔය භික්‍ෂූන් වහන්සේලාට දැනට මා හමුවීමෙන් ප්‍රයෝජනයක් නො වෙයි. ඒ අයට මුලින් ම සුසාන භූමියට ගොස් අනතුරුව මා හමුවට එන්නැයි උපදෙස් දෙන්න" යි වදාළ හ.

ආනන්ද හිමියෝ ඒ භික්‍ෂූන්ට බුදුරදුන් ගේ පණිවුඩය දැන්වූ හ. ඒ භික්‍ෂුහු ද මෙසේ සිතූ හ.

"භාග්‍යවතුන් වහන්සේ සියල්ල මැනවින් දන්නා සේක. නිකරුණේ මෙසේ නො කරති. කිසියම් වැදගත් හේතුවක් ඇතිව ම මෙසේ කරති." එසේ සිතූ ඔවුහු සොහොන් බිමට ගිය හ.

සුසාන භූමිය පුරා විවිධ මිනී විසිරී තිබිණ. සමහර ඒවා ඇටකටු බවට පත්ව තැන තැන විසිර තිබිණ. සමහරක් කුණු වී යමිනි. පණුවෝ නලියති. ඕජාව ගලති. ඇතැම් මිනියක් පැයකට දෙකකට පෙර ගෙනා පරිද්දෙනි. තම සිත්වල විවිධ සංකීර්ණ හැඟීම් ඇතිව නැතිව යන හැටි පසක් කළ ඔවුහු තමන් කෙළෙසුන් නසා නැති බව තේරුම් ගත් හ.

ගඳ කිළියෙහි සිට දිව නෙතින් මේ සියල්ල නිරීක්‍ෂණය කරමින් සිටි භාග්‍යවතුන් වහන්සේ රශ්මි ධාරාවක් එහි යවා උන්වහන්සේලා ඇමතූ හ. "මහණෙනි, වට පිට විහිදී ඇති අළු පැහැති ඇටකටු බලන්න. මේ තත්ත්වය දැක දැකත් ඔබට කම් සුව ගැන සිතිය හැකි ද?"

අනතුරුව උන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (149 ගාථාව)

සාරදෙ අපත්ථානි අලාපූනි ඉව කාපොතකානි යානි
ඉමානි අට්ඨීනි තානි දිස්වාන කා රති?

සාරදෙ: සරත් ඍතුවෙහි; **අපත්ථානි**: (තැන තැන) විසුරුණු; **අලාපූනි ඉව**: ලබුකබල් වැනි වූ; **කාපොතකානි**: (පරෙවියන් ගේ පාට) අළු පැහැය ඇති; **යානි ඉමානි**: යම් මේ; , **අට්ඨීනි**: මිනී ඇට (වේද); **තානි**: ඒ මිනී ඇට; **දිස්වාන**: දැකීමෙන්; **කා රති**: කවර ඇල්මක් ද?.

පරෙවියන් ගේ පාට ගත් මිනී ඇට කටු සරත් කාලයෙහි වියලී තැන තැන විසිර ගිය ලබු කබල් මෙන් දිස් වෙයි. ඒ මිනී ඇට දැක්මෙන් කවර නම් ඇල්මක් උපදී ද?

විවරණය

අට්ඨීනි: ඇට කටු මේ අමු සොහොනෙහි මිනී දිරා ගොස් තැන තැන විසිර ඇති ඇට කැබලි පිරී පැවතිණ. හිස් කබල් පෙනී යන්නේ වියලී ගිය ලබු කබල් මෙනි. ප්‍රියංකර මනුෂ්‍ය ශරීරයට අවසානයේ අත්වන ඉරණම ඒ හිස් කබල් දෙස බැලීමෙන් වටහා ගත හැක.

ජරා: මහළු විය උදාවන විට ශරීරයේ පහළ වන ජරා ලකුණු කාටත් ප්‍රකට දේ ය. මහළු විය මිනිසුනට සසර කළකිරී පැවිදි වන්නට සිත් පොළඹවන එක් පෙර නිමිත්තක් වෙයි. සිදුහත් බෝසතුන් පැවිදි වූයේ මහල්ලෙක්, ලෙඩෙක් හා මළ කඳක් දැකීමෙනි. මේ නිමිති තුන දෙවියන් විසින් උන්වහන්සේ හමුවට පැමිණ වූ බව සම්ප්‍රදායෙහි කියැවෙයි.

යම රජු මිනිසුන් ගෙන් මෙසේ විමසතැයි කතාවක් ඇත. "එම්බා නරය, අවුරුදු අසූවක්, අනූවක්, සියයක් වයස් වූ මහළු, දුබල, කුදුව ගිය, ගෙල නැමුණු, හැරමිටි වාරුවෙන් යන, පා පැකිලෙන, රෝගී, තුරුණු බව ඉකුත්ව ගිය, දත් හැළුණු, හිසකේ පැසුණු, තට්ටය පෑදුණු, හම රැලි වැටුණු වෙවුලන අත් පා ඇති අයකු දැක්කේ නැත් ද? ඔබත් යම්කිසි දවසක මහළුව දුබලව යන බවත් එය මග හරින්නට ක්‍රමයක් නැති බවත් වැටහුණේ නැත් ද? රෝගීව, ගිලන්ව, වේදනාවෙන් පීඩිතව, තම අසූචියෙහිම ගිලී වෙනත් අය විසින් ඔසවා ගෙන ගොස් ඒ ඒ තැන තබනු ලැබිය යුතු අයකු දුටුවේ නැත් ද? මටත් මේ දේ වෙයි, මෙයින් ගැලවුමක් නැති වෙයි කියා කිසි කලෙක වැටහුණේ නැත් ද? තමාත් කවදා හෝ මියයන බව තේරුම් ගත්තේ නැත් ද? මරණයෙන් ගැලවීමක් නැති බව නො වැටහුණේ ද? කිසිදාක ගැහැණියක ගේ හෝ පිරිමියකු ගේ හෝ දිනක්, දෙකක් තුන හතරක් පැරණි වී ගිය ඉදිමුණු, දුර්වර්ණ වුණු කුණු වුණු මළ සිරුරක් දැක්කේ නැත් ද?"

සියල්ල නැසෙන සුළු බව, අනිත්‍ය බව තේරුම් ගත් විට ලොව දෙස බලන දෘෂ්ටිය වෙනස් කර ගන්නට හැකි වනු ඇත. කිසිවක් අපේ නොවන බව, අපට අවශ්‍ය ලෙස පාලනය කර ගත නො හැකි බව තේරුම් ගත් විට යථාර්ථය දැකීමේ නව උද්‍යෝගයක් අප තුළ ඇති වෙයි.





මේ සිරුර මස් ලේ ගල්වා ඇටවලින් සැදුණු නුවරක් (කොටුගෙයක්) වැනි ය.

150. අට්ඨීනං නගරං කතං
මංසලොහිතලෙපනං
යත්ථ ජරා ච මච්චූ ච
මානො මක්ඛො ච ඔහිතො (11:5)

නගරය ඇට වලින් කළේ
පුරවා ඇත්තේ මස් ලේ
ජරාව මරණය සමගින්
මානය මකු බව ඇතුළේ

සිරුරු නුවරකි - ඇට සැකිල්ලකි

11 (5) රූප නන්දා භික්ෂුණිය ගේ වත (ජනපද කල්‍යාණි) (150 ගාථාව)

ජනපද කල්‍යාණිය හෙවත් රූප නන්දාව ඇරබ බුදුරදුන් මේ ගාථාව දේශනා කළේ දෙව්රම් වෙහෙර වැඩ වසමිනි.

ජනපද කල්‍යාණිය ගෝතමිය ගේ ලේලිය වූවා ය. ඇය ඉතාමත් රූමත් වූ හෙයින් රූප නන්දා නමින් ද පතළ වූවා ය. නන්ද කුමරු පැවිදි වූ දින පටන් ඕ මෙසේ සිතුවා ය. "වැඩිමල් සොහොයුරු සිදුහත් පැවිදි වී සම්මා සම්බුදු පදවි ලද්දේ ය. ඔහු ගේ පුත් රාහුල ද පැවිදි වූයේ ය. මගේ සැමියා වූ නන්ද ද පැවිදිව සිටියි. මගේ මව වූ ප්‍රජාපති ගෝතමිය ද පැවිදි වූවා ය. මම පමණක් ගිහිගෙහි තනි වූයෙමි." එසේ සිතමින් සිට ඕ තොමෝ ද පැවිදි වූවා ය.

පැවිදි වුවද තමන් ඉතා රූමත් බව ඇයට අමතක කළ නො හැකි විය. කිසි ම භික්ෂුණියක් ඇය තරම් රූමත් නො වීය. තමන් රූමත් වීම ගැන ඇය තුළ එක්තරා අභිමානයක් ද තිබිණ. බුදුරදුන් රූපයෙහි ආදීනව දේශනා කරන බව අසා සිටි ඕ "මා බණ අසන්නට ගිය හොත් මා ද මහළුව රූපශ්‍රීය නැසී ගොස් ජරපත්වන බව උන්වහන්සේ වදාරන්නට ඉඩ තිබේ. එවිට අනිකුත් භික්ෂුණීන් මා දෙස බලමින් සිනාසෙන්නටත් ඉඩ ඇත"යි සිතමින් කිසි දිනක ධර්ම ශ්‍රවණයට නො ගියා ය.

එහෙත් දිනපතා බණ අසන්නට යන අනිකුත් භික්ෂුණීහු දහම් අසා අවුත් දම් දෙසුම්වල වූ කරුණු ගැන කතා කරති. ඒ අසත් අසත් ම බණ අසන්නට ඇය තුළ ද ආශාවක් වර්ධනය විය. එහෙයින් දිනක් රූප නන්දා "මමත් බණ අසන්නට එමි" යි කියා පිරිස සමඟ යන්නට කැමති වූවා ය.

කෙසේ වුව ද තමා නෙතට ලක් වුව හොත් බුදුන් වහන්සේ තමා ම ඉලක්ක කොට රූපයෙහි ආදීනව ඇතුළත් බණක් කියන්නටත් ඉඩ ඇතැයි සිතූ රූප නන්දා අනිකුත් භික්ෂුණීන්ට මුවා වී පසු පෙළක හිඳ ගත්තා ය. එහෙත් බුදු රජාණන් වහන්සේ ඇය ගේ පැමිණීම කල් තබා ම දිවැසින් දැක තිබිණි. එහෙයින් කටුවක් ගලවන්නට කටුවක් ම යොදා ගන්නා පරිද්දෙන් රූප නන්දාට ගැලපෙන උපක්‍රමයක් යොදා ඇය ගේ රූප මදය දුරලන්නට සිතූ හ. සොළොස් හැවිරිදි රූමතියක් තම සෘද්ධි බලයෙන් මවා ඇය තමන්ට පවන් සලමින් සිටින සේ පෙනෙන්නට සැලැස් වූ උන්වහන්සේ එම දර්ශනය නන්දාට මිස අන් අයට නො පෙනෙන පරිදි අධිෂ්ඨාන කළ හ.

ඒ දුටු රූප නන්දා "මේ රන්වන් සුරූපී යුවතිය හා සසඳා බලන විට මම කුමන විධියකටවත් ඇය තරම් ප්‍රියංකර නො වන්නෙමි" යි මානය හැර ඒ රුව දෙස ම ආශාවෙන් බලා සිටියා ය. ඇය ඒ රුවෙහි බැඳුණු බව දත් තථාගතයන් වහන්සේ ඒ රුව ක්‍රමයෙන් යෞවන වියෙන් මැදි වියට ද එයින් මහළු වියට ද මාරුවන සේ සෘර්ධිමය අධිෂ්ඨානයක් කළ හ. අනුක්‍රමයෙන් මහළු වියට පත් රුව අවසන ගිලන්ව දුබලව හැරමිටි වාරුවට ද පත්ව ඉතා විරූපව අන්තිමේ මැරී වැටුණා ය. මළ සිරුර ද කුණු වී සැරව ගලමින් පිළිකුල් තත්ත්වයට පත්වනු රූප නන්දාට දක්නට ලැබිණ.

මේ සියල්ල බලා සිටි රූප නන්දා "ඒ අතිශය සුන්දර වූ රම්‍ය යෞවනිය ක්‍රමයෙන් වියපත්ව රෝගාතුරව ජරපත්ව මිය ගියා සේ යම් දිනක මට ද ඒ සියල්ලට යටත් වන්නට වෙයි. මා ඇස් ඉදිරිපිට සිදු වූ එම පරිවර්තනය ලොව කාටත් අත්වන ඉරණමයි. මම ද එයින් නො මිදුණෙමි"යි ආවර්ජනය කළා ය. ඇය සිතන සිතුවිලි වලට ගැලපෙන පරිදි බුදුරජාණන් වහන්සේ අනිත්‍යය, දුක හා අනාත්මය පිළිබඳව තම දම් දෙසුම යොමු කළ හ. දහම් අසා සිටි රූප නන්දා සෝවාන් ඵලයට පත් වූවා ය.

විවරණාත්මක අනුවාදය (150 ගාථාව)

මංසලොහිතලෙපනං නගරං අට්ඨීනං කතං යත්ථ ජරාච
මච්චූ ච මානෝ ච මක්ඛෝ ච ඔහිතෝ අට්ඨීනං

මංසලොහිතලෙපනං: මස් හා ලේ ගල්වන ලද; **නගරං**: නගරයක් (කොටු ගෙයක්); **අට්ඨීනං**: ඇට වලින්; **කතං**: කරන ලදි; කෙබඳු වූ ද යත්; **යත්ථ**: යම් තැනක; **ජරාච**: මහළු බව ද; **මච්චූ ච**: මරණය ද; **මානෝ ච**: මානය ද; **මක්ඛෝ ච**: ගුණමකු බවද; **ඔහිතො**: තැන්පත් කරන ලද ද. (එබඳු කොටු ගෙයක් ය)

මේ ශරීරය ඇට සැකිල්ලක් ලෙස තනා මස් ලේ පුරවා සකස් කරන ලද නගරයකි. එහි ජරාව, මරණය මෙන් ම මානය සහ ගුණමකු කමද නිදන් කර තිබේ.

විවරණය

මක්ඛො: නම් ගුණමකු බවය. තමාට කරන ලද උදව් උපකාර ආදිය අමතක කර අන්‍යයන් ගේ ගුණ සඟවා ඔවුන් ගේ අගුණ කතා කිරීම මෙහි ස්වභාවයයි. අනුන් ගේ කවර තරම් උසස් ගුණයක් ඇතත් එය සඟවා කතා කිරීම 'ගුණ-මකු' බවයි. බොහෝ ගිහි-පැවිද්දෝ මේ දුර්ගුණයෙන් සමන්විත වෙති. එහෙයින් මෙය පොදු මානුෂික දුර්වලතාවයක් ලෙස ද හැඳින්විය හැක.

ඉතා විසිතුරු වැ සැදුන රජුන් ගේ මගුල් රථය ද සිරුර දිර ද යි එහෙත් (නව ලොවුතුරු) දහම නො දිර යි.

151. ජීරන්ති වෙ රාජරථා සුචිත්තා
අථො සරීරම්පි ජරං උපෙති
සතඤ්ච ධම්මො න ජරං උපෙති
සන්තො හවේ සබ්භි පවෙදයන්ති (11:6)

හැඩ වැඩ කළ රාජ රථත් යම් දවසක දිරා යතී
දිරා යාම ඒ විලසට වෙයි කාගෙත් ගතේ ගතී
සදහම් උතුමන් වදහළ කිසිකල ජරපත් නො වෙතී
ශාන්ත උතුමෝ යහපත් අය වෙත සදහම් දෙසතී

කිසි කල නො දිරන - සුමිහිරි බුදු බණ

11 (6) මල්ලිකා දේවිය ගේ පුවත (151 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **මල්ලිකා දේවිය** ඇරබ පසේනදී කොසොල් රජතුමාට මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් මල්ලිකා දේවිය මුව සෝදනු පිණිස නාන කොටුවට ගොස් පිරිසිදු වන අතර තුර රජ ගෙදර සුරතලයට හැදෙන බල්ලෙක් එහි පිවිසියේ ය. දේවිය පා පිරිසිදු කරන විට එම සුනඛයා ඇය හා අස්වාභාවික හැසිරීමක යෙදෙන්නට තැත් කළේය. දේවිය ද එය එතරම් වරදක් සේ නො සිතා ඊට ඉඩදී සිටියා ය. එහෙත් රජතුමා උඩු මහලේ සිට බිම බලන විට නාන කොටුවෙහි සිදු වූ මේ සිද්ධිය දැක විස්මයට පත්ව දේවිය උඩු මහලට ආ පසු ඒ ගැන ප්‍රශ්න කළේය. දේවිය ලජ්ජාව නිසා එවැන්නක් සිදු නො වූ බව කීවද රජතුමා මා සියැසින් දුටු දේ ප්‍රතික්ෂෙප කරතියි අමනාපයට පත් විය. දේවිය ද තම බසම සැබෑ කරනු රිසිව "මේ කාමරයේ පිහිටීම කිසියම් අද්භූත පිහිටීමකි. මෙහි සිට නාන කොටුව දෙස බලන විට එබඳු අරුම පුදුම දර්ශන පෙනේ. ඔබතුමා දැන් නාන කොටුවට ගිය හොත් මටත් එබඳු දේ පෙනේ" යි පැවසුවා ය. රජතුමා ඒ අනුව නාන කොටුවට ගියේ ය. ඔහු නැවත ආ පසු "දේවයන් වහන්ස ඔබ තුමා එළු දෙනක සමග අස්වාභාවික හැසිරීමක යෙදෙනු මම මෙහි සිට දුටුවෙමි" යි කීවා ය. රජතුමා ඒ අනුව දේවිය කී දේ සැබෑයයි පිළිගෙන ඇය එබන්දක් නො කළ බව පිළිගත්තා ය.

රජතුමා සංසුන් කළ ද තමා විසින් කරන ලද්දේ බරපතල වරදක් බව සිතමින් මල්ලිකා දේවිය තැවුණාය. එම පාපය මැකී යනු වස් ඕ තොමෝ රජතුමා ගේ අසදෘශ දානමය පුණ්‍ය කර්‍මයේ දී බෙහෙවින් වෙහෙසව ක්‍රියා කළා ය. ඇය ඉන් මහා පුණ්‍යානුභාවයක් රැස් කර ගත්තාය. එතකුදු වුවත් ඇයට මරණ මොහොත් දී තම පුණ්‍ය කර්‍ම වෙනුවට සිහියට නැඟුණේ මේ කුඩා අකුශල කර්‍මයය. එහෙයින් ඕ තොමෝ මිය ගොස් නිරයෙහි උපන්නා ය.

රජතුමා මල්ලිකා දේවියට ඉතා දැඩි සෙනෙහසින් සිටි හෙයින් ඇය උපන් තැන දැන ගැනීමේ කුතුහලයක් ඔහු තුළ තිබිණ. එය බුදු රජාණන් වහන්සේ ගෙන් අසා දැන ගැනීම පිණිස හෙතෙම විහාරස්ථානයට පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතූ හ. "මල්ලිකා නිරයෙහි උපන් බව දැනගතහොත් රජතුමා බලවත් සංවේගයට පැමිණ එතරම් පින් කළ මල්ලිකාත් නිරයෙහි උපන්නේ නම් පුණ්‍ය කර්ම කිරීමෙහි කිසි ප්‍රයෝජනයක් නැතැයි සිතා මිථ්‍යාදෘෂ්ටි ගෙන බොහෝ පව් කර ගනියි. එය ඔහුට මහා අලාභයක් වනු ඇත. එහෙයින් ඒ ගැන අසන්නට ඔහුට අමතක වන්නේ නම් යහපති" බුදුරදුන්ගේ අධිෂ්ඨානය අනුවම රජතුමාට ඒ ගැන විමසීමට අමතක විය. රජතුමා දින ගණනාවක් ම ඒ ගැනම විමසන්නට පැමිණිය ද බුදුරදුන්ගේ අධිෂ්ඨානය පරිදි එය දිගට ම අමතක විය.

සත් දිනකට පසු මල්ලිකා දේවියගේ අකුශලය ඉතා සුළු හෙයින් ඕ තොමෝ නිරයෙන් මිදී තුසිත දෙව් ලොව උපන්නා ය. ඒ අනුව භාග්‍යවතුන් වහන්සේ තම අධිෂ්ඨානය ලිහිල් කළෙන් එදින රජතුමා දන් පිළිගැන්වීමෙන් අනතුරුව මල්ලිකා දේවිය ගේ පුනර්ජන්මය ගැන විමසා සිටියේ ය. "මහරජ, ඔබ ගේ දේවිය තුසිත දිව්‍ය ලෝකයෙහි ඉපිද සිටින්නීය" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ හ. "මල්ලිකාත් දෙව් ලොව නූපදින්නේ නම් කවුරු එහි උපදිත් ද? " රජතුමා සතුටෙන් ප්‍රකාශ කළේ ය. එහෙත් "මල්ලිකා ඉතා සෙනෙහැති බිරිඳක් වූවා ය. මට ඇය ගේ වියෝගය ඉවසා දරා ගත නො හැකිය" යි හෙතෙම බලවත් ශෝකය ද ප්‍රකාශ කළේ ය. එදින භාග්‍යවතුන් වහන්සේ රජතුමා ගේ දානය පිළිගත්තේ මාලිගයෙහි පා මුල රාජ රථ නවතා තබන ස්ථානයේ ය. එහි රජ පරපුරේ ආදි පුරුෂයන් ගේ රාජ රථ කෞතුක වස්තු වශයෙන් තැන්පත් කර තිබින. භාග්‍යවතුන් වහන්සේ ඒවා එකින් එක ගැන ප්‍රශ්න කරමින් "මහරජ, ඔබ ගේ මුතුන් මිත්තෝ මේ රථ රැගෙන නො ගිය හ. දැන් ඒවා දෙස බලන්න. එකින් එක ටික ටික දිරා පත් වෙනවා නො වේ ද? අතිශයින් විසිතුරුව සාදන ලද මේ අනර්ඝ රථ දිරා පත්වන පරිද්දෙන් සියළු දේ දිරාපත් වේ. අප ගේ ශරීරද දිරා පත් වේ. දිරාපත් නොවන එකම දේ නම් ධර්‍මය පමණි"යි ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (151 ගාථාව)

සුචිත්තා රාජරථා වෙ ජීරන්ති අථො සරීරං අපි ජරං උපෙති සතං ධම්මො ච ජරං න උපෙති සන්තො සබ්භි හවෙ පවෙදයන්ති

සුචිත්තා: විචිත්‍ර වූ; **රාජරථා**: රාජකීය වාහන; **වෙ**: ඒකාන්තයෙන්; **ජීරන්ති**: දිරායති; **අථො**: එසේ ම; **සරීරං අපි**: ශරීරය ද; **ජරං උපෙති**: ජරාවට යයි; **සතං ධම්මො**: සත් පුරුෂයන් ගේ ධර්මය; **ච**: වනාහි; **ජරං න උපෙති**: දිරාපත් නො වන්නේ ය; **සන්තො**: ශාන්ත වූවෝ; **සබ්භි**: සත් පුරුෂයන් සමග; **හවෙ**: ඒකාන්තයෙන්; **පවෙදයන්ති**: මෙසේ ප්‍රකාශ කෙරෙති.

ඉතා විසිතුරු ලෙස නිර්මාණය කළ රාජකීය රථ වුව ද දිරා යයි. අප විසින් මනාව රැක ගනු ලබන ශරීරය ද එසේම දිරා යයි. එහෙත් සත් පුරුෂයන් ගේ ධර්‍මය එසේ දිරා නොයයි. සත් පුරුෂයෝ සත් පුරුෂයන් සමග ධර්‍ම සංවාදයෙහි යෙදෙති.

විවරණය

කවර දේ දිරාපත්ව ගිය ද බුද්ධාදී ආයර්‍යයන් වහන්සේලා ගේ ධර්මය දිරාපත් නො වන්නේ ය. උන් වහන්සේලා උපන්නත් නැතත් ලෝක ස්වභාවය පිළිබඳ සත්‍යය ලොව කවදත් පවතියි. එය බුද්ධාදී උත්තමයෝ ප්‍රත්‍යක්ෂ කර ගෙන දේශනා කරති. ලොව ඇති තත්ත්වය එසේ ප්‍රත්‍යක්ෂ කර ගෙන දේශනා කරනු මිස අළුතෙන් ප්‍රබන්ධ කර ගොතා දේශනා කරන්නක් නොවන හෙයින් එම ධර්මය දිරාපත් වීමක්, යල් පැනීමක්, බොරු වීමක් නැත.

ඇසූ පිරූ තැන් නැත්තා ගොනකු මෙන් මසින් තරවැ වැඩුණත් නුවණින් නම් නො වැඩේ.

152. අප්පස්සුතා'යං පුරිසො
බලිවද්දෝ'ව ජීරති
මංසානි තස්ස වඩ්ඪන්ති
පඤ්ඤා තස්ස න වඩ්ඪති (11:7)

උගත් දෙයක් නැති මිනිසා
ගොනෙක් වගේ යයි වයසට
සිරුරේ මස් වැඩෙන නමුත්
නුවණ ඔහු ගෙ වැඩී නොයත්

මසින් වැඩේ - නැණ නො වැඩේ.

11 (7) ලාලුදායි තෙරුන් ගේ වස්තුව (152 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **ලාලුදායි** නම් වූ නුවණ මඳ තෙර නමක් ඇරබ මේ ගාථාව දේශනා කළ සේක.

මේ ලාලුදායි තෙරුන් වහන්සේ ස්ථානෝචිත ප්‍රඥාවෙන් තොර වූ හෙයින් තැනට ගැලපෙන ලෙස බණ කියන්නට නො දත් හ. මිනිසුන් මංගල උත්සව පවත්වන තැන බණ කියන්නට අවමංගල අවස්ථාවල කිවයුතු ගාථා තෝරා ගනියි. අවමංගල අවස්ථාවලට ගොස් මංගල උත්සව වල කිව යුතු බණක් කියයි. ඒ තැන් වලදී උන්වහන්සේ ගේ මේ අඥාන කථා නිසා ඒ හා වඩින අනිකුත් හිමිවරු මහත් අපහසුවකට පත් වෙති. මේ නිසා භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ හමුවට ගොස් "ස්වාමීනි, මේ ලාලුදායි භික්ෂුව මංගල්‍ය අවස්ථාවලට ගොස් අවමංගල්‍යයට උචිත දේශනයක් කරයි. අවමංගල්‍ය අවස්ථාවලට ගොස් මංගල්‍ය අවස්ථාවකට උචිත බණක් කියයි. තැනට ගැලපෙන දේශනයක් කරන්නට නො දනී නම් ඒ තැන්වලට නො ගොස් සිටීම වඩා උචිත නො වේ ද?" යි කියා සිටිය හ.

භාග්‍යවතුන් වහන්සේ ඒ අසා "මහණෙනි, මේ ලාලුදායි දැන් පමණක් නොව පෙර ජන්මයක පවා වැරදි තැන වැරදි දේ කතා කළේ ය"යි වදාරා පෙර ජන්මයක වූ සිද්ධියක් හෙළි කර වදාළ හ. පෙර ජන්මයෙක අග්ගිදත්ත නමින් ඉපිද සිටි මොහුට හේමදත්ත නම් පුතෙක් සිටියේ ය. පියා දුප්පත් වුව ද, තම උගත්කම අනුව හෙතෙම රාජ කුළුපඟව සිටියේ ය. වරක් අග්ගිදත්ත ගේ ගොන් බානෙන් එක් ගොනෙක් මිය ගියේය. "පුත ඔබ රාජ කුළුපග හෙයින් මට රජතුමාගෙන් ගොනෙක් ඉල්වා දෙනු මැනව" යි හේ පුතා ගෙන් ඉල්ලා සිටියේ ය. රජතුමා ගෙන් තමා ඉල්ලා සිටිය හොත් එය තමාට ලජ්ජාවක් වෙතියි සිතා පියාට කවියක් ඉතා අමාරුවෙන් උගන්වා ගෙන රජ වාසලදී කියන්නට සැලසුම් කළේය

කුඹුරු වැඩට ගන්න නිතින්
සිටියා මට බානක් ගොන්
එකෙක් මලා නිරිඳුනි ඉන්
දෙන්න එකෙක් කරුණා වෙන්

එහෙත් නූගත් ගැමියකු වූ පියාට රාජ සභාවේ දී කියන්නට ගිය කවිය වැරදුණේ ය. "දෙන්න එකෙක් කරුණාවෙන්" වෙනුවට "ගන්න එකෙක් කරුණාවෙන්" යි කියවුණේ ය. ඔහු ලවා එය දෙතුන් වතාවක් කියවූව ද හැම වතාවේ ම වැරැද්දුවේ ය.

කරුණු තේරුම්ගත් රජතුමා "හේමදත්තලාට හුඟක් හරක් ඉන්නවා වගෙයි" කියා ඔහුට ගවයෙක් ලබා දුන්නේ ය. මේ කතාව වදාළ භාග්‍යවතුන් වහන්සේ "ලාලුදායි එදත් අනුවණයෙකි. අදක්ෂයෙකි. අදත් එසේම ය" යි මේ ගාථාව ද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (152 ගාථාව)

අයං අප්පස්සුතො පුරිසො බලිවද්දෝ ඉව ජීරති තස්ස මංසානි වඩ්ඪන්ති තස්ස පඤ්ඤා න වඩ්ඪති.

අප්පස්සුතො: අල්පශ්‍රැත; **අයං පුරිසො**: මේ පුරුෂ තෙම; **බලිවද්දෝ ඉව**: ගොනකු මෙන්; **ජීරති**: වැඩෙයි; **තස්ස**: ඔහු ගේ; **මංසානි**: මස්; **වඩ්ඪන්ති**: වැඩෙයි; **තස්ස**: ඔහු ගේ; **පඤ්ඤා**: ප්‍රඥාව; **න වඩ්ඪති**: නො වැඩෙයි.

අල්පශ්‍රැත වූ මේ පුරුෂ තෙම ගොනෙකු මෙන් වැඩෙන්නේ ය. ඔහු ගේ ශරීරමාංශයෝ වැඩෙන්නා හ. ලෞකික ලෝකොත්තර ප්‍රඥාව නම් නො වැඩෙයි.

විවරණය

අප්පස්සුතො: වැඩි ඉගෙනුමක් නැති, සුත යන්නේ නියම අර්ථය 'අසා ඇති' යන්නයි. පැරණි යුගයේ අධ්‍යාපනය මුළුමනින් ම රඳා පැවැත්තේ ශ්‍රව්‍ය මාධ්‍යය මත හෙයින් උගතා බහුශ්‍රැත සේ ද නූගතා අල්පශ්‍රැත සේ ද හඳුන්වන ලදී.

පඤ්ඤා: නුවණ, ප්‍රඥාව. බුදු සමයෙහි දී පඤ්ඤා යන්න හුදෙක් විෂය කරුණු දැනුමට වඩා ගැඹුරු සංකල්පයක් ලෙස ඉදිරිපත් වෙයි. යමකු පත පොතින් හා ගුරු මුවින් කරුණු අසා ගෙන කට පාඩම් කළ පමණින් ප්‍රඥාවන්තයකු බවට පත් නො වේ. 'පරතොසොප' හෙවත් අනුන්ගෙන් ඉගැන්ම ප්‍රඥාවන්ත වීමේ එක් මාවතක් පමණි. ඒ හා සම 'යොනිසො මනසිකාර' හෙවත් තර්කානුකූල චින්තනය ද එක් විය යුතුය. මේ දෙක්හි ක්‍රියාකාරිත්වය මගින් අපට යථා භූත ඥානය ලබා ගත හැකිය.

අප ලබන ඥාණය ත්‍රිවිධ බව බෞද්ධ ඉගැන්වීම් වල දක්වා තිබේ. එනම්;

1. **සුතමය ඥාණය**: සුතමය ඥාණ නම් ඉගෙනුම මගින් ලබන දැනුමයි.

2.**චින්තාමය ඥාණය**: චින්තාමය ඥාණය නම්, ස්වාධීන චින්තා ක්‍රියාකාරිත්වය මගින් ලබන දැනුමයි.

3. **භාවනාමය ඥාණය**: භාවනාමය ඥාණය නම් භාවනා මගින් ලබන උසස් හා ගැඹුරු අත්දැකීම් පදනම් කරගෙන ලබන දර්ශනයයි.

තුන් වැන්න වූ භාවනාමය ඥාණය මුල් ඥාණ දෙකට වඩා වැදගත් බව දැක්වෙයි. එය අප තුළින් ම ගැඹුරු ස්ව - ප්‍රත්‍යක්ෂතාවක් වශයෙන් උද්ගත වන්නක් හෙයිනි. ත්‍රිවිධ ශික්ෂාවෙහි එක් ශික්ෂාවක් වන ප්‍රඥාව එහි උපරිම සාධන හා බැඳේ. පාරමිතාවක් ද වන ප්‍රඥාව බුදු සමයෙහි විමුක්තිය ලැබීම සමග සම්බන්ධ වෙයි.





ගෙවල් හදන්නා සොයමින් - සංසාරේ සැරි සරමින්

153. අනෙකජාති සංසාරං
සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවේසන්තෝ
දුක්ඛා ජාති පුනප්පුනං (11:8)

ඉපදි ඉපදි සංසාරේ
සෙවූ නමුත් නෙකවාරේ
නැත වඩුවා හමු වූයේ
දුකයි උපත සංසාරේ

ගෙවල් හදන්නා - කවුද සොයන්නා

11 (8) බුදුරදුන් ගේ ප්‍රථම උදානය (153 - 154 ගාථා)

හය අවුරුදු දුෂ්කර ක්‍රියාවෙන් පසු අත්තකිලමථානු යෝගය නිෂ්ඵල බව වටහාගත් **බෝසතාණන් වහන්සේ** මැදුම් පිළිවෙත ප්‍රගුණ කළ හ. සුජාතාවන් ගේ කිරි පිඩු දානය වළඳ සොත්ථිය බමුණා දුන් කුස තණ මිටි අට ද රැගෙන ජයසිරි මහ බෝ මැඩට වැඩම කළ උන් වහන්සේ තණ මිටි මත පළක් බැඳ වැඩ හුන් හ. එය උන්වහන්සේ ගේ කුසල මහිමයෙන් අපරාජිත වජ්‍රාසනය බවට පත් විය.

"මගේ ශරීරයෙහි සියළු ලේ මස් වියැලී ගොස් සමෙන් වැසුණු ඇටසැකිල්ලක් පමණක් ඉතිරි වුවත් බුදු වී මිස මෙතැනින් නො නැගිටිමි" යි වැඩ හුන් උන් වහන්සේ මාර යුද්ධයෙන් ජය ලබා සව් කෙළෙසුන් නසා සම්මා සම්බෝධිය ලබා ගත් සේක.

රැයෙහි ප්‍රථම යාමයේ දී පෙර විසූ කඳ පිළිවෙල දක්නා නුවණ ද මධ්‍යම යාමයේ දී දිබ්බ චක්ඛු හෙවත් දිවැස් නුවණ ද, අළුයම් වේලෙහි ආසවක්ඛය ඥාණය ද ලබා ගත් සේක.

අනතුරුව සම්මා සම්බෝධිය ලැබීමෙන් තමන් වහන්සේ තුළ ඇති වූ ප්‍රීතිය හේතුවෙන් මෙම ගාථා ද්වය උදාන වශයෙන් ප්‍රකාශ කළ සේක.

විවරණාත්මක අනුවාදය (153 ගාථාව)

පුනප්පුනං ජාති දුක්ඛා ගහකාරකං ගවේසන්තෝ
අනෙකජාතිසංසාරං අනිබ්බිසං සන්ධාවිස්සං

පුනප්පුනං: නැවත නැවත; **ජාති**: ඉපදීම; **දුක්ඛා**: (යම් හෙයකින්) දුක් ද; (එහෙයින්) **ගහකාරකං**: (ආත්ම නැමැති) ගෙය සාදන වඩුවා; **ගවේසන්තෝ**: සොයමින්,(මම); **අනෙකජාතිසංසාරං**: නොයෙක් ජාතියයි කියූ සසරෙහි; **අනිබ්බිසං**: (ගෘහකාරකයා දන්නා මාර්ගඥානය) සොයාගත නො හැකිව; **සන්ධාවිස්සං**: සැරිසරා ඇවිද්දෙමි.

ශරීරය නමැති ගෙය නිර්මාණය කරන කාර්මිකයා සොයමින්, ඔහු සොයාගත නො හැකිව මේ සසරෙහි විවිධ ජාතිවල උපදිමින් සංචාරය කළෙමි. නැවත නැවත ඉපදීම දුකකි.

විවරණය

භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බුද්ධත්වය ලත් ප්‍රථම උදෑසන කළ මෙම උදානය බුද්ධත්වය පිළිබඳ යථාතත්වය මනරම් උපමාවක් ද සහිතව කදිමට හකුළුවා දක්වයි. උන්වහන්සේ ලද ආධ්‍යාත්මික ශාන්තිය ඉන් ලද ප්‍රබෝධජනක ආස්වාදය මෙහි මනාව ධ්වනිත ය. දිගු කාලීන සංසාර සංචරණයකින් පසු මේ අන්තිම භවයේ දී උන්වහන්සේ විසින් මෙතෙක් සොයාගත නො හැකි වූ සංසාර කාරකයා සොයා ගන්නා ලදී, බැහැර සිට නොව තමා තුළම සිට එම තෘෂ්ණා නැමැති මැවුම්කරු උන්වහන්සේට හමු විය. තමන් තුළම පවත්නා පැවැත්ම කෙරේ වන ආශාව - භව තෘෂ්ණාව මෙම නිර්මාතෘ වරයාය. තමන් විසින් ම නිර්මාණය කරන ලද දේ අවසන් කළ හැක්කේ ද තමන්ට ම ය.

ගෘහ කාරකයා ගේ උපකරණ සියල්ල බිඳ දැමූ හෙයින් යළි ගෙයක් හදන්නට බැරි බව කියා ඇත්තේ නිවන් සුව ලද බව විස්තර කරනු පිණිස ය. නිවන් සුව ලබන්නට බෝසතුන් පෙළැඹුණේ නැවත නැවත සසර ඉපැදීම දුකක් හෙයිනි. බුදු සමය විෂයෙහි පුනර්භව සංකල්පය කේන්ද්‍රියයැයි පැවසිය හැක්කේ මේ නිසාය. පුනර්භවයක් නො මැති නම් සංසාරයක් ද නැත. සංසාරයක් නොමැති නම් කළකිරෙන්නට, අතහරින්නට හෝ නිවාලන්නට දෙයක් නො මැති හෙයින් නිර්වාණයක අවශ්‍යතාවක් නො මැත.

එවිට බෞද්ධ චින්තනයේ ස්ථාවරය මුළුමනින් ම බිඳ වැටෙයි. එහෙයින් පුනර්භවය බෞද්ධ චින්තනයේ අතිශයින් ම වැදගත් මූලික පිළිගැනීමක් වෙයි. එය පවත්නා බව පිළිගත් පසු ප්‍රායෝගික අභියෝගය වන්නේ එය නැති කර දැමීම ය.

නැවත අත්බැව් නමැති ගෙය නො කරන සේ සියලු උපකරණ (කෙළෙස්) බිඳ දමා නිවන් පසක් කිරීම.

154. ගහකාරක දිට්ඨො'සි
පුන ගෙහං න කාහසි
සබ්බා තේ ඵාසුකා භග්ගා
ගහකූටං විසඞ්ඛිතං
විසඞ්ඛාරගතං චිත්තං
තණ්හානං ඛයමජ්ඣගා (11:9)

වඩුවාණෙනි, ඔබ පෙනුණා
නැවත ගෙයක් නො හදන්නා
පරාල ටික බිඳ දැම්මා
කැණි මඬලත් බිම දැම්මා
සිත නිදහස් කර ගත්තා
තණ්හාවත් ඉවර කළා

ගෙවල් හදන බඩු - සේරම කුඩු කුඩු

11 (8) බුදුරදුන් ගේ ප්‍රථම උදානය (153 සහ 154 ගාථා)

විවරණාත්මක අනුවාදය (154 ගාථාව)

ගහකාරක දිට්ඨො අසි පුන ගෙහං න කාහසි තෙ
සබ්බා ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං චිත්තං
විසඞ්ඛාරගතං තණ්හානං ඛයං අජ්ඣගා

ගහකාරක: (ආත්ම නැමැති) ගෙය සාදන වඩුව; **දිට්ඨො අසි**: (මවිසින් ඔබ) දක්නා ලද්දෙහි; **පුන** : නැවත,(මට); **ගෙහං**: (ආත්ම නැමැති) ගෙයක්; **න කාහසි**: නො සාදන්නෙහි ය; **තෙ**: ඔබ ගේ; **සබ්බා**: සියලු; **ඵාසුකා**: (කෙලෙස් නමැති) පරාල; **භග්ගා**: බිඳ දමන ලදී; **ගහකූටං**: ගෘහකූටය (කැණි මඬල); **විසඞ්ඛිතං**: (පළා) විසුරුවන ලදී; **චිත්තං**: (මාගේ) සිත; **විසඞ්ඛාරගතං**: නිවණට වන; **තණ්හානං ඛයං**: තෘෂ්ණාක්ෂයට හෙවත් අර්හත්ඵලයට; **අජ්ඣගා**: පැමිණියෙමි.

ආත්ම නැමැති ගෙය සාදන වඩුව, මවිසින් ඔබ දක්නා ලදි. ඔබ නැවත මට ගෙයක් නො සාදන්නෙහි ය. මම කෙලෙස් නමැති සියලු පරාල බිඳ දැමුවෙමි. කැණි මඬල විනාශ කළෙමි. මාගේ සිත නිවණට වැටහිණි. තෘෂ්ණාක්ෂයට හෙවත් අර්හත්ඵලයට මම පැමිණියේ වෙමි.

විවරණය

තණ්හානං ඛය මජ්ඣගා: නිර්වාණය ගැන නිර්වචන දක්වන විට තෘෂ්ණාව ක්‍ෂය කිරීම නිර්වාණය බව පැවසීම සුලබ ය. සසර නැවත නැවත ඉපදීමේ හේතුව තෘෂ්ණාව හෙයින් එය ක්‍ෂය කිරීම නිර්වාණය වෙයි.

සුමේධ තාපසව උපන් සමයෙහි බෝසතුන් මෙසේ සිතූ බව ජාතකට්ඨකථාවෙහි සඳහන් කර ඇත.

"දුකක් තිබේ නම් - සැපත් තිබිය යුතු
සසරක් ඇත්නම් - මිදුමක් විය යුතු

උණුසුම ඇත්නම් - සිසිලක් විය යුතු
තුන් ගිනි ඇති ලෙස - නිවණ තිබිය යුතු

නරක තිබෙන විට - හොඳත් තිබිය යුතු
තිබුණාට සසරක් - එය නොපැතිය යුතු"

'**නිබ්බාණ**' යන පාලි වචනය (සිංහල හා සංස්කෘත භාෂා වලින් නිර්වාණ) නිර්මාණය වී ඇත්තේ 'නි' පූර්ව 'වාණ' යන්නෙනි. 'නි' යන නිෂේධනාර්ථයේ උපසර්ගයකි. 'වාණ' යන්නෙහි අරුත ගෙතීම හෙවත් තෘෂ්ණාව යන්නයි. මෙම තෘෂ්ණාව එක් ජන්මයක් හා තවත් ජන්මයක් අතර බන්ධනයක් සේ ක්‍රියා කරයි. 'වාණ' නම වූ තෘෂ්ණාවෙන් වෙන් වීම - ඉවත් වීම යන අරුතින් එයට 'නිබ්බාණ' යැයි කියනු ලැබේ.

යමකු තුළ තෘෂ්ණාව ඇති තාක් කල් ඔහු කර්ම රැස් කරයි. පුණ්‍ය හා පාප යන දෙවර්ගීය ම කර්ම ගණයට වැටෙයි. පැවැත්ම කෙරේ ආශාවක් ඇත්තෝ මතු ජන්මයන් සඳහා කර්ම එක් රැස් කරති. තෘෂ්ණාව ක්‍ෂය කළ උතුමන් කර්ම රැස් නො කරන හෙයින් නිර්වාණයට 'කම්මක්ඛය' යන වචනය ද යෙදිය හැක.

නිර්වාණය ලෝභ, දෝස හා මෝහ යන ත්‍රිවිධ ක්ලේශයන් මූලෝත්පාටනය වශයෙන් ද හඳුන්වනු ලැබේ. මේ ලෝභ, දෝස හා මෝහ ගිනි වශයෙන් හඳුන්වා ඇත. වරක් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ. "මහණෙනි, ලෝකය ගින්නෙන් දැවෙයි. කවර ගිනි වලින් ද මහණෙනි, රාග ගින්නෙන් දැවෙයි, ද්වේෂ ගින්නෙන් දැවෙයි, මෝහ ගින්නෙන් දැවෙයි. ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දොමනස්ස, උපායාස, ගිනි වලින් දැවෙයි. මේ ගිනි නිවීම 'නිබ්බාන' වශයෙන් දැක්වේ. මේ ගිනි නිවීම ම නිවනයි."

නිර්වාණය ශූන්‍ය ධර්මයක් ද නැද්ද යන්න බොහෝ උගතුන් වාද විවාද කරන ගැටළුවකි. පැරණි බෞද්ධ පොත්වල නිර්වාණය 'සුඤ්ඤතා' වශයෙන් හඳුන්වා තිබෙන බව මෙහි දී සැලකිල්ලට ගත මනාය. පොදු ජන වහරෙහි 'ශූන්‍ය' යන වචනයෙන් කිසිවක් නැත යන්න අරුත ගැනෙයි. එහෙත් දාර්ශනික ව්‍යවහාරයෙහි ශූන්‍ය යන වචනය ඊට වඩා සියුම් අරුතකින් භාවිත වෙයි. දාර්ශනික වහරෙහි දී ආකාශය ද ශූන්‍ය ලෙස හැඳින් වේ. ආකාශ නම් කිසිම වස්තුවකින් තොර 'ඉඩකඩ' ය. එය නැතැයි කීම වැරදි ය. එය ශූන්‍ය වන්නේ වෙනත් වස්තූන් ගෙන් තොර නිසාය. නිර්වාණය ද ජාති, ජරා, මරණ, සංඛ්‍යාත සකල විධ දුක්ඛයන්ගෙන් ම තොර නිසා ශූන්‍ය ය. එහෙත් "නිවණක් නැත" යන වාක්‍යය වැරදි ය. නිවණ ඇත. ශූන්‍ය යන්නෙන් නැති දෙයක් යන අරුත නො ලැබේ.

මේ ගාථා දෙක අයත් වන්නේ බෞද්ධ සාහිත්‍යාංගයක් වූ උදාන ගණයට ය. නවංග සත්ථුසාසනයෙහි උදාන ගණයට ඇතුළත් ගාථා එක් රැස් කර ඇත්තේ ඛුද්දක නිකායට අයත් උදාන නම් ග්‍රන්ථයේ ය. එහි ද ඇතුළත් මේ ගාථා යුග්මය ධම්මපදයට ඇතුළත් වූයේ පසු කලෙක ආනන්ද ස්ථවිරයන් වහන්සේ ගේ විමසුමක් පරිදි උන්වහන්සේට කළ දේශනයක් හෙයිනි.

යොවුන් වියැ කළයුතු දෑ නිසි සේ නො කළහු මහලු වයසට පැමිණ පසු තැවෙත්.

155. අචරිත්වා බ්‍රහ්ම චරියං
අලද්ධා යොබ්බනෙ ධනං
ජිණ්ණකොඤ්චා ව ඣායන්ති
ඛීණ මච්ඡේ’ව පල්ලලෙ (11:10)

බඹසර හැසිරෙන්නේවත් - සම්පත් උපයන්නේ වත්
නැතිව නිකරුණේම වගේ
යොවුන් විය ගෙවා දැම්මොත්
නියං කලට මසුන් නැතිව
වේලුණු විල් තෙරකට පත්
කොස්වා ලිහිණියන් වගේ
අසරණයන් වී වැල පෙත්.

මහලු වයස - ලබන අයස

11 (9) මහධන සිටු පුත්‍රයා ගේ කථාව (155 සහ 156 ගාථා)

ඉසිපතනයෙහි වැඩ සිටි සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා දේශනා කර වදාළේ **මහධන සිටු පුතු** නිමිති කර ගෙන ය.

මහධන උපන්නේ බරණැස් නුවර අසූ කෝටියක් ධනය තිබුණු සිටු පවුලක ය. ඔහු ගේ මව සහ පියා මෙසේ කතා කර ගත් හ. "අපිට අසූ කෙළක් ධනය තියෙනවා. ඉතින් අපේ පුතාට තවත් සල්ලි හොයන්න ඕන වෙන්නේ නෑ. තියෙන දේ කාලා ඇඳලා සතුටෙන් ඉන්න පුළුවන්." ඒ නිසා ඔවුන් ඔහුට වෘත්තියක් සඳහා අදාළ කිසිවක් නුගන්වා සංගීතය හා ගායනය පමණක් ප්‍රගුණ කරවූ හ.

මේ නගරයේ ම අසූ කෙළක් ධනය තිබුණු තවත් සිටු පවුලක් විය. ඒ පවුලට සිටියේ දියණියක් පමණි. ඒ පවුලේ දෙමාපියෝ ද තමන්ට යස ඉසුරෙන් අඩුවක් නොවූ හෙයින් දියණියට අධ්‍යාපනයක් ලබා නොදුන් හ. ඇයට ගායනය හා රංගනය ප්‍රගුණ කරවූ හ. මේ පවුල් දෙක උනුනුන් දන්නා හෙයින් දරුවන් වැඩි විය පත් පසු ඔවුහු ඔවුන් විවාහ කරවූ හ.

දෙමාපියන් මිය ගිය පසු මේ යුවලට අසූ කෝටිය බැගින් වූ ධන සම්භාර දෙකකට හිමිකම් කීමේ භාග්‍යය උදා විය. ඔහු ගේ යස ඉසුරු දුටු නගරයේ සුරා ලෝලයෝ මෙතුමා බීමට පුරුදු කර ගත හොත් අපට ජය මඟුල් යැයි කතා කර ගෙන ඔහු ඊට නමා ගන්නට කුමන්ත්‍රණය කළ හ. ඒ අනුව දිනක් ඔවුහු මස් බැද, අල තම්බා ගෙන සුරා විත ඇතිව සිටුතුමා එන මඟ රැක සිට ඔහු එන විට ම මස් හා අල කමින් රා බොමින් "දීඝායු වේවා සිටුතුමනි, ඔබ තුමාට පින් සිදු වන්නට අපිත් කාලා බීලා විනෝදෙන් ඉන්නවා" යි හඬනගා කී හ. "ඔවුන් මහත් විනෝදයෙන් බොන්නේ මොනවාද" යි සිටුතුමා තම සේවකයා ගෙන් විමසී ය. "සුරා වර්ගයකි" යි පිළිතුරු ලද හේ "එය මොන වගේ බීමක් දැ" යි විමසීය. "සිටුතුමනි, එය ඉතා කදිම බීමකි. බොනවා නම් බොන්න හොඳ රසවත් බීමකි" යි සේවක තෙම එය වර්ණනා කළේ ය. එසේ නම් මාත් එය පානය කළ යුතුයැයි කී හෙතෙම සුරා ගෙන්වා ගෙන පානය කළේ ය.

සුළුවෙන් පටන් ගත්තද හෙතෙම ක්‍රමයෙන් ඊට ඇබ්බැහි වී දිනපතා මහා පරිමාණයෙන් බීමට පුරුදු විය. ඒ දැනගත් නගරයේ සුරාධූර්තයෝ ක්‍රමයෙන් ඔහු හා මිතුරු වූ හ. සිටු වරයා ද ඔවුන් ගෙදරට ගෙන්වා ගෙන දිනපතා විශාල මුදලක් වැය කරමින් තමනුත් බී අනුන්ටත් සුරාවෙන් සංග්‍රහ කරන්නට පටන් ගත්තේය. දිනපතා ඔහුට අළුතෙන් සුරා ධූර්තයෝ එකතු වූහ.

සුරාපානයට පමණක් නොව මිළ මුදල් නාස්ති කිරීමට ද හෙතෙම පුරුදු විය. බීමත් වූ විට රන් කාසි ගොඩවල් දෙමින් සුවඳ විලවුන් ගෙනෙව, මල් ගෙනෙව, ආදී වශයෙන් මුදල් දෙයි. "මෙයා සූදුවට දක්ෂයි මෙයාට දාහක් දෙනවා. මෙයා නටන්න හපනා. මෙයාට දාහක් දෙනවා. මෙයා දක්ෂ වාදකයා. මෙයාට දෙදාහක් දෙනවා" ආදිය කියමින් මුදල් නාස්ති කිරීමට පුරුදු විය. අසූ කෙළක් ධනය ඉක්මණින් ම නාස්ති වී ගියේ ය. අනතුරුව බිරිඳ ගේ ධනය ද නාස්ති කර නිම කළේ ය. වියදමට මුදල් නැති තැන නිවසෙහි සියළු භාණ්ඩ විකුණමින් විනෝද වූ හේ අන්තිමේ සිටු මැදුර ද විකුණා දැම්මේ ය. එය මිළදී ගත්තෝ ඔහු මහ මඟට ඇද දැමූ හ. සුරා පානය සඳහාම එක් වූ හිත මිතුරෝ දැන් මොහුගෙන් පලක් නැතැයි ඔහු අමතක කර දැමූ හ.

විවරණාත්මක අනුවාදය (155 ගාථාව)

> **යොබ්බනේ බ්‍රහ්මචරියං අචරිත්වා ධනං අලද්ධා ඛීන**
> **මච්ඡේ පල්ලලෙ පිණ්ණකොඤ්චා ඉව ඣායන්ති**

> **යොබ්බනේ**: යොවුන් වියේ දී; **බ්‍රහ්මචරියං**: බඹසර; **අචරිත්වා**: නො හැසිරී; **ධනං**: ධනය; **අලද්ධා**: නො උපයා; **ඛීන මච්ඡේ**: මසුන් නැති; **පල්ලලෙ**: විලක (මඩපිට හිඳ තැවෙන); **පිණ්ණකොඤ්චා ඉව**: මහලු කොස්වා ලිහිණියන් මෙන්; **ඣායන්ති**: ශෝක කරති.

තරුණ වයසේ දී පැවිදිව බඹසරත් නො රැක, නූපන් භෝග උපදවන්නටත්, උපන් භෝග රක්නටත්, නිසි යොවුන් වියේදී ගොවිකම් වෙළඳකම් ආදිය කොට ධනයත් ලැබ නො ගෙන, ප්‍රමාදී වූ අඥානයෝ මසුන් නිම වූ දිය හිඳුනු පොකුණක බලා සිටින මහලු කොස්වා ලිහිණියකු මෙන් ශෝක කරයි.

තරුණ කල පින් නොකළ අය කළ දෑ සිහිකොට මහලු කල සුසුම්ලමින් සොවින් හොවිත.

156. අචරිත්වා බ්‍රහ්මචරියං
අලද්ධා යොබ්බනෙ ධනං
සෙන්ති චාපාතිඛීනා'ව
පුරාණානි අනුත්ථුනං (11:11)

බඹසර හැසිරෙන්නේවත් - සම්පත් උපයන්නේ වත්
නැතිව නිකරුණේම වගේ
යොවුන් විය ගෙවා දැම්මොත්
වැඩකට ගත නො හැකි පරණ
ඊතලයක් වගේ වෙමින්
වැළපෙති දුක් වෙති මහළුව
පෙර සම්පත් සිහි කරමින්

අතීත සම්පත් - සිහිකර වැලපෙත්

11 (9) මහධන සිටු පුත්‍රයා ගේ කථාව (155 සහ 156 ගාථා)

ශ්‍රීවත් වන්නට ක්‍රමයක් නැති තැන සිටුවරයා සහ බිරිඳ කබලක් ද අතට ගෙන සිඟා කන්නට පටන් ගත් හ. අනුන් ගේ අගු පිල්වල නිදා ගන්නට සිදු විය. කුණු කූඩ වලට දමන ඉඳුල් බත් පවා කන්නට පුරුදු විය. ඉඳහිට හෙතෙම ආරාමයට ද ගොස් පාත්‍රවල ඉතිරිව ඉවත දමන ඉඳුල් බත් ඉල්ලා ගෙන අනුභව කරයි. දිනක් සාමණේර හිමිවරුන් විසින් ඉවත දමනු ලබන ඉතිරි බත් ඉල්ලා එකතු කර ගත්නා ඔහු දුටු භාග්‍යවතුන් වහන්සේට සිනා පහළ විය. ඒ දුටු ආනන්ද තෙරණුවෝ "භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සිනා පහළ කළේ කවර හෙයින් දැ"යි විමසූයෙන් භාග්‍යවතුන් වහන්සේ මේ සිටුතුමා ගේ පූර්ව චර්යාව හා වර්තමාන චර්යාව ගැන ආනන්ද හිමියනට විස්තර කර වදාළ හ.

"ආනන්ද, මහධන සිටුවරයකු ගේ පුත්‍රයෙකි. ඔහු නාස්ති කළ ප්‍රමාණය එකසිය හැට කෝටියකි. දැන් තම බිරිඳ සමඟ මහ මඟ සිඟා යයි. මේ පුද්ගලයා තම තුරුණු වියේ දී නුවණින් වැඩ කොට ව්‍යාපාරික කටයුතු වල යෙදුණේ නම් ඔහුට මේ නගරයේ ප්‍රධාන සිටුවරයා වන්නට හැකියාව තිබිණ.

එසමයෙහි ඔහු පැවිදි වූයේ නම් රහත් වන්නට භාග්‍යය තිබිණි. ඔහු ගේ බිරිඳට ද අනාගාමී වන්නට හැකියාව තිබිණි. මැදි වියේ දී ඔහු ධනය නාස්ති නො කර ව්‍යාපාරික කටයුතු වල යෙදුනේ නම්, මේ නගරයේ දෙවන සිටාණන් වන්නට හැකියාව තිබුණේ ය. පැවිදි වූයේ නම් ඔහුට අනාගාමී ඵලයත් බිරිඳට සකෘදාගාමී ඵලයත් ලබන්නට හැකියාව තිබුණේය. ජීවිතයේ තුන්වන යාමයෙහි ඔහු ව්‍යාපාරික කටයුතු ගැන උනන්දු වී, නාස්තිකාර භාවයෙන් ඉවත්ව නුවණින් ක්‍රියා කළානම් නගරයේ තුන්වන සිටාණන් වන්නේ ඔහු ය. නො එසේව ඔහු පැවිදි වූවා නම්, ඔහුට සකෘදාගාමී ඵලයත් බිරිඳට සෝවාන් ඵලයත් හිමිවන්නේ ය. එහෙත් දැන් ඒ සියල්ල වරදවා ගෙන මහ මඟ හිඟා කන්නේ ය. අගාරික සම්පතින් මෙන්ම අනගාරික සම්පතින් ද පිරිහුනු ඔහු වියළී ගිය මසුන් නැති පොකුණක් අසළ සිටින කොස්වා ලිහිණියකු වැනිය. භාවිතයට ගත නොහැකිව ඉවත දැමූ ඊතලයක් වැනිය" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා යුග්මය ද වදාළහ.

විවරණාත්මක අනුවාදය (156 ගාථාව)

යොබ්බනෙ බ්‍රහ්මචරියං අචරිත්වා, ධනං අලද්ධා චාපා
අතිඛීණා ඉව පුරාණානි අනුත්ථුනං සෙන්ති

යොබ්බනෙ: යොවුන් වියෙහි දී; **බ්‍රහ්මචරියං**: බඹසර; **අචරිත්වා**: නො හැසිර; **ධනං අලද්ධා**: ධනය උපයා නො ගෙන; **චාපා**: දුන්නෙන්; **අතිඛීණා ඉව**: විදිනා ලද ඊතල මෙන්; **පුරාණානි**: පෙර කළ දේවල්; (පෙර කළ කෑම බීම නැටුම් ගැයුම් ආදියට) **අනුත්ථුනං**: මතක් කරමින්; **සෙන්ති**: වැලපෙති.

යොවුන් වියේදී පැවිදි ජීවිතයකුත් ගත නො කර, මිල මුදල් ඉපැයීමකුත් නො කරන අය දුන්නෙන් ඉවතට විසි කරන ලද ඊතල මෙන් පැරණි දේ ගැන මතක් කරමින් වැලපෙති.

විවරණය

මේ ගාථාවන් ගෙන් තම ජීවිතයේ වටිනා සමය අපතේ යවා පසුව දුකට පත්වන්නවුන් ගේ තත්ත්වය මනාව විග්‍රහ කරනු ලැබේ. මෙහි දක්වා ඇති කොස්වා ලිහිණියා ගේ උපමාව කදිමට සිත් ගනියි. ආහාර ලබා ගන්නට ඇති පොකුණේ මත්ස්‍යයන් නිම ව ගොසිනි. එහෙත් මහළු කොස්වා ලිහිණියාට වෙනත් මසුන් පිරි පොකුණකට පියඹා යන්නට ද නො හැක. පාවිච්චියට ගත නොහැකි කබල් ඊතල ද එබඳුම ය.

ලෝකයේ බොහෝ මිනිස්සු මෙසේ තම යෞවන ජීවිත අර්ථසම්පන්න යමක් නොකර නාස්ති කරන්නෝ ය. අනිවාර්යයෙන් තමා වෙත හඹා එන මහළු දිවිය ගැන මඳකුදු නො සිතා සියලු ධන සම්පත් නාස්ති කර දමන්නෝ ය.

මේ ගාථා දෙකින් බුදුරදුන් මනුෂ්‍ය වර්ගයාට දෙන පණිවුඩය නම්, නිතර ම අනාගතය ගැන සිතමින් වත්මන් මොහොතෙන් උපරිම ඵල නෙලා ගත යුතු බව ය. යෞවනය ඉතා ඉක්මනින් ගෙවී යයි. තිබ්බතීය බෞද්ධ කවීන්ද්‍ර මිලරේසා ලියූ පහත දැක්වෙන ගීතය මේ ගාථාවලට අටුවාවක් වැන්න.

"පිපි කුසුමකි යොවුන් විය ගිම්හානයක
පරවී වැටෙනු ඇත ඕනෑම මොහොතක
ලැව් ගින්නකි මහළු විය - දැවෙන හේනක
එයි ඔබ පාමුලට ගිනිදළු යම් සැණක"

භාග්‍යවතුන් වහන්සේ වරක් මෙසේ වදාළහ.

"උපත හා විපත
හිරු උදාවයි හිරු බැස්මයි වගෙයි
මේ එනවා - මේ යනවා

තුවාල වුනු පුංචි කුරුල්ලෙක්
වගෙයි නේ ද ලෙඩ දුක්!
ඔබෙත් ශක්තිය - ආරෝග්‍යය
නැතිව යා හැක - ලගම මොහොතක

සියළු වැරදිවලට මුල ආත්ම පිළිබඳ විශ්වාසයයි

ගැටළු හට ගනියි.
පුද්ගලාන්තර ගැටළුවල පටන් ජාතීන් අතර යුද්ධ දක්වා ම
සියළු ප්‍රශ්න වලට මූලික හේතුව ආත්ම වාදයයි.
කෙටියෙන් කිවහොත් මෙම මිථ්‍යා දෘෂ්ටියට ලොව
සියළු දුෂ්ටතාවන් හි වගකීම පැවරිය හැකි ය.

ආචාර්ය වල්පොල රාහුල හිමි
What the Buddha Taught

12 වන පරිච්ඡේදය

අත්ත වග්ග

සිය අත් බැව තමාට රිසි නම් ඒ අත්බැව් තුන් වයස්හි ම බැරි නම් එක වයසකදී වත් සුරැකි කළයුතු.

157. අත්තානං චෙ පියං ජඤ්ඤා
රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තිණ්ණං අඤ්ඤතරං යාමං
පටිජග්ගෙය්‍ය පණ්ඩිතො (12:1)

තමන්ව ප්‍රිය නම් තමන්ට
හිතන්න හොඳ හැටි රකින්ට
තුන් යාමෙන් එක් යමකට
වත් යම් ගුණයක් පුරන්ට

රකිත් තමන් - නිති මැනවින්

12 (1) බෝධිරාජ කුමාරයා ගේ කතාව (157 ගාථාව)

භේසකලා වනයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **බෝධිරාජ කුමාරයා** ඇරබ මේ ගාථාව දේශනා කළ සේක.

වරක් බෝධිරාජ කුමාර තෙම අතිශයින් මනෝරම්‍ය විසිතුරු ප්‍රාසාදයක් තමන් සඳහා ඉදිකරවා ගත්තේ ය. එය ගෙවදින දින භාග්‍යවතුන් වහන්සේට හා සංඝරත්නයට දන් පිණිස ආරාධනය කළේ ය. නිවස සුවඳවත් කර සරසා, භාග්‍යවතුන් වහන්සේට නිවසෙහි උඩුමහලට වැඩම කරනු පිණිස දිගු පලසක් පාවාඩ වශයෙන් එළා, අපට දාරක සම්පත්තියක් ලැබේ නම් භාග්‍යවතුන් වහන්සේ මේ පාවාඩය මත වැඩම කරත්වා යි අධිෂ්ඨානයක් කළේ ය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ එතැනට පැමිණ පාවාඩ මත නො වැඩ බලා සිට එය ඉවත් කරවා උඩු මහලට නැඟුණු සේක.

දන් පිළිගැන්වූ බෝධිරාජ කුමාර තෙම "ස්වාමීනි, මම මවුකුසයෙහි දී මා වෙනුවෙන් මව විසින් තෙරුවන් සරණ යන ලද්දෙමි. කිරි බොන අවදියේ ද සරණ ගියෙමි. වැඩිවිය පත් පසුත් සරණ ගියෙමි. එතරම් හිතවත් මගේ පා පිස්නා පියවිලි මත නො වඩින්නට හේතු කවරේදැ"යි විමසීය. කුමාරයා හා ඔහු ගේ බිරිඳ පෙර ජන්මයක මුහුදේ යද්දී නැව කැඩී එක් පාළු දිවයිනකට පාවී තනි වූ අවස්ථාවේ කෑමට දෙයක් නැති තැන කුරුළු බිත්තර කමින් සිට, එය අවසන් වූ පසු කුරුළු පැටවුන් කා නිම කර, ලොකු කුරුල්ලන් ද පුළුස්සා ගෙන කෑ අකුසලය නිසා දරුවන් ලබන්නට භාග්‍යය නැති හෙයින් බව උන්වහන්සේ පැහැදිලි කළ හ. එසේ ඔවුන් ගේ පූර්ව ජන්මයෙහි කරන ලද අකුශල කර්මය හෙළි කොට වදාළ භාග්‍යවතුන් වහන්සේ තමන්ට තම ජීවිතය ප්‍රිය මෙන්ම හැම දෙනටම එය ප්‍රිය බව වදාරා, තමා ගේ ජීවිතය තමාට ප්‍රිය නම්, එය පාපයෙහි නො යොදවා රැක ගත යුතු බව දක්වමින් අනුශාසනා කර මේ ගාථාව ද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (157 ගාථාව)

චෙ අත්තානං පියං ජඤ්ඤා නං සුරක්ඛිතං රක්ඛෙය්‍ය
පණ්ඩිතො තිණ්ණං අඤ්ඤතරං යාමං පටිජග්ගෙය්‍ය

චෙ: ඉදින්; **අත්තානං**: තමා; **පියං**: (තම හට)ප්‍රිය යයි; **ජඤ්ඤා**: දන්නේ නම්; **තං**: ඒ තමා; **සුරක්ඛිතං**: සුරක්ෂිත කොට; **රක්ඛෙය්‍ය**: රක්නේය; **පණ්ඩිතො**: නුවණැත්තා; **තිණ්ණං අඤ්ඤතරං යාමං**: ජීවිතයේ තුන් වයසින් එක්තරා වයසකවත්; **පටිජග්ගෙය්‍ය**: ගුණ දම් වඩන්නේ ය.

තමන්ට තම ආත්මය ප්‍රිය නම් එය මනාව රැක ගත යුතු ය. නුවණැත්තහු විසින් ජීවිතයේ මුල, මැද හා අග යන එක් යාමයකදීවත් අකුසල් දුරු කර යහපත් ක්‍රියා කළ යුතු ය.

විවරණය

'තමා ගේ ආත්මය තමා ම රැක ගන්න' යන අවවාදය බුදු දහමෙහි ආචාර විද්‍යාත්මක ස්ථාවරය මනාව පැහැදිලි කරන්නකි. මෙහි 'ආත්ම' යන්න බ්‍රාහ්මණික හින්දු චින්තනයේ දැක්වෙන්නක් මෙන් අධි භෞතික සංකල්පයක් නොව තමා ගේ ස්වභාවය විෂයෙහි යෙදෙන සම්මුති සංකල්පයක් බව මුලින්ම සටහන් කළ යුතුව පවතියි.

බුදු දහමේ වෙනත් ආගම් වල මෙන් බාහිර බලවේගයක් මගින් ආත්මය ගැලවීමක් ගැන ඉගැන්වීමක් නො මැත. තමා ගේ ගැලවීම තමා අතම යැයි පවසන වෙනත් ආගමක් නැති තරම් ය. ආගම හඟවන ඉංග්‍රිසි වචනය වූ Religion යන්නෙහි නිරුක්තිය සොයන්නෝ ඒකමතික නො වෙති. සිසරෝ එය re හා lego යන වචන වලින් ඇති වූ බව දක්වමින් යාඥා කිරීම, නිතර සජ්ඣායනා කිරීම යන අරුත් එයින් මතු කරයි. තව සමහරු re+ logo යන ක්‍රමයට මෙය ඇති වූ බව දක්වමින් භක්තිය, එක දිගට බැඳී සිටීම යන අරුත් ගනිති. Lex යන වචනයෙන් Religion යන්න බිඳ ගන්නා සමහරු නීති ගරුකත්වය, ප්‍රවේසමෙන් හිතා මතා ක්‍රියා කරන සුළු මනසක් ඇති කර ගැනීම වැනි අරුත් දක්වති.

මේ දැක්වූ අරුත් වලින් ගතහොත් බුදු දහම ආගමක් නො වේ. බොහෝ ආගම් වල දැක්වෙන විමුක්ති දායක ඊශ්වරයකු පිළිබඳ සංකල්පය බුදු දහමට මුළුමනින්ම බාහිර ය. භාග්‍යවතුන් වහන්සේ විමුක්ති දායකයෙක් නො වේ. උන්වහන්සේ විමුක්ති මාර්ගය පහදා දෙන ගුරුවරයෙක් පමණි. බෞද්ධයන් තම ශාස්තෲන් වහන්සේ කෙරේ පවත්වන ශ්‍රද්ධාව රෝගියකු වෛද්‍යවරයකු කෙරේ ඇති කරගන්නා විශ්වාසය වැනි ය. නැතහොත් ශිෂ්‍යයකු තම ගුරුවරයා ගැන පවත්වන හැඟීම වැනි ය. බෞද්ධයන් ගේ පව් සෝදා දැමීමක් හෝ ඔවුන් විමුක්තියට පත් කරලීමක් බුදුරදුන් ගේ කාර්යභාරයට අයත් නැත. අනිත් අතට කිසිවකු කෙළෙසීමට හෝ අපායට යැවීමට ද බුදුරදුනට හැකියාවක් නැත. බුදු සමයෙහි උගන්වන්නේ තමාට පිහිට තමා බව ය.



පළමු වැ තමා සුදුසු ගුණ දහම්හි පිහිටා අනුන් සදන්න වඩන්න අනුසස්නා කළයුතු.

158. අත්තානමෙව පඨමං
පතිරූපේ නිවෙසයේ
අථඤ්ඤමනුසාසෙය්‍ය
න කිලිස්සෙය්‍ය පණ්ඩිතෝ (12:2)

මුලින් තමා හැඩි පසුව
අනුන්ට දෙත හොත් ඔවදන්
නුවණැත්තා කිලිටි නො වෙයි
නො ලබයි කිසි ලෙස අවමන්

මුලින් තමන් හැදී හොඳට - අනුන්ට ඔවදන් පසුවට

12 (2) උපනන්ද ශාක්‍යපුත්ත තෙරණුවන් ගේ වත (158 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය වංශයෙන් පැවිදි වූ **උපනන්ද** නම් හිමිනම ඇරබ මේ ගාථාව වදාළ සේක.

උපනන්ද හිමියෝ විචිත්‍ර ධර්ම කථිකයෙක් වූ හ. උන්වහන්සේ තෘෂ්ණාවෙහි ආදීනව මනාව පැහැදිලි කරති. අල්පෙච්ඡතාවෙහි අනුහස් වදාරති. ධූතංග පිරීමෙහි අගය වියත් ලෙස හුවා දක්වති. පරිත්‍යාගශීලය අගයති. එසේ මේවා අන්‍යයනට විසිතුරු ලෙස පැහැදිලි කළත් උන්වහන්සේ ධර්මදේශනාදියෙන් තමන්ට ලැබෙන පිරිකර ආදිය විෂයෙහි තමන් දේශනා කරන ධර්මයට අනුව ක්‍රියා නො කරති. ඒවා දැඩි තෘෂ්ණාවෙන් එක් රැස් කර තබා ගනිති.

වරක් වස් සමාදන් වන දිනයට කිට්ටුව උපනන්ද හිමියෝ ගම්බද ආරාමයකට ගිය හ. උන්වහන්සේ ගේ ධර්මදේශනා චාතුර්‍යයෙන් ප්‍රසන්න වූ තරුණ හිමි නමක් එම විහාරස්ථානයෙහි වස් වසන්නට එතුමන්ට ආරාධනය කළ හ. වස් වසන භික්ෂූන් වහන්සේලාට සාමාන්‍යයෙන් දායකයන් සිවුරු කීය බැගින් දෙනවාදැයි උන්වහන්සේ විමසූ හ. "එක නමකට එක සිවුර බැගින්" යි පිළිතුරු ලැබිණ. ඒ ඇසූ උන්වහන්සේ තම පාවහන් සඟල එහි තබා වෙනත් ආරාමයකට ගිය හ. එහිදී ද වස් ආරාධනයක් ලැබුණොත් එක නමකට සිවුරු කීයක් ලැබේදැයි අසා දෙකක් ලැබෙතැයි පැවසූයෙන් තම හැරමිටිය එහි තබා වෙනත් ආරාමයකට ගියේ ය. එය එක් නමකට සිවුරු තුන බැගින් ලැබෙන තැනකි. එහි හේ තම දිය බඳුන (ඩබරාව) තැබී ය. අනතුරුව තවත් ආරාමයකට ගිය විට එහි එක නමකට සිවුරු හතර බැගින් ලැබෙන බව අසා එහි වස් විසී ය.

වස් කාලය අවසානයේ තමන්ට හිමි සිවුරු හතර ලබාගත් උපනන්ද හිමියෝ අනිත් ආරාම තුනට ගොස් තමන් ඒවායේ තම පාවහන්, සැරයටිය හා ඩබරාව තැබූ බව පවසා සිවුරු කොටස ඉල්ලා ගත්තේ ය. ඒ සිවුරු කරත්තයක පටවා ගෙන තම ආරාමය බලා එන අතරමග තරුණ හිමි දෙනමක් සිවුරු දෙකක් හා විල්ලූද පොරෝනයක් බෙදා ගන්නට බැරිව විවාද කරනු දුටුවේ ය. ඔවුහු තම අර්බුදය විසඳා දෙන ලෙස උපනන්ද හිමියන්ගෙන් ඉල්ලා සිටියහ. සිවුරු දෙක ඒ දෙනම අතර බොදා දී, බෙදුම් ගාස්තුව වශයෙන් විල්ලූද පොරෝනය තමන් හිමි කරගත්තේ ය.

තරුණ හිමි දෙනම විනිශ්චය ගැන සතුටු නො වූ නමුත් කළ හැකිදෙයක් නො වීය. එහෙයින් ඔවුහු භාග්‍යවතුන් වහන්සේ හමු වී තම පැමිණිල්ල ඉදිරිපත් කළ හ. භාග්‍යවතුන් වහන්සේ අනුන්ට අවවාද කරන්නට පෙර තමන් ශික්ෂණය වී එසේ කළ යුතු බව දේශනා කර මේ ගාථාව වදාළ හ.

විවරණාත්මක අනුවාදය (158 ගාථාව)

පඨමං අත්තානං එව පතිරූපෙ නිවෙසයෙ අථ අඤ්ඤං අනුසාසෙය්‍ය පණ්ඩිතො න කිලිස්සෙය්‍ය

පඨමං: ප්‍රථමයෙන්; **අත්තානං ඒව**: තමා ම; **පතිරූපෙ**: උතුම් ගුණ ධර්මයන් හි; **නිවෙසයේ**: පිහිටුවන්නේය; **අථ**: ඉක්බිති; **අඤ්ඤං අනුසාසෙය්‍ය**: අන්‍යයන්ට අනුශාසනා කරන්නේ ය; **පණ්ඩිතො**: (මෙසේ කරන) නුවණැත්තා; **න කිලිස්සෙය්‍ය**: නො කෙලෙසෙන්නේ ය.

අන්‍යයන්ට අවවාදානුශාසනා කරන්නහු විසින් පළමු කොට මනා ගුණයෙන් තමා ම ගුණවත් විය යුතුයි. ඉන් පසු අනුන්ට අනුශාසනා කළ යුතුයි. එසේ කරන නුවණැත්තා අනුන්ගෙන් ප්‍රශංසා ලබයි. නින්දා නොලබයි.

විවරණය

පඨමං අත්තානං එව: 'මුලින් තමා හික්මෙන්න, අනතුරුව අනුන්ට අනුශාසනා කරන්න' යන්නෙන් දේශකයා ගේ විශ්වාසනීයත්වය තහවුරු කරන්නට මගක් පහදයි. යම්කිසි පුද්ගලයකු තමා අනුන්ට දේශනා කරන ධර්මය තමන් අනුගමනය නො කරන්නේ නම් ශ්‍රාවකයෝ ඔහු විශ්වාස නො කරති. එබඳු ආදර්ශයන් නොදී අවවාදයන් පමණක් දෙන්නන්ට ජන සමාජය 'වැදිබණ දෙසන්නෝ' යි අවමන් කරති. තවත් උපමාවක් ලෙස කකුළු මව ද දක්වති. තමා හරහට ගමන් කරමින් කෙළින් ගමන් කරන්නැයි දරුවනට අවවාද කරන මවක් සේ කකුළු මව දක්වමින් තමා අනුගමනය නො කරන බණ අනුන්ට දේශනා කරන්නන්ට අවමන් කරති.

තමා මඩෙහි ගිලී සිටිමින් අනුන් මඩෙන් ගොඩ ගන්නට සිතීම මුලාවක් බව දක්වන භාග්‍යවතුන් වහන්සේ පළමුව තමා ගොඩට අවුත් ඒ අත්දැකීම් මත පිහිටා අනුන්ට උදවු කළ යුතු බව දක්වති. එසේ ම යම්කිසි භික්ෂුනමක් තමන් පිළි නො පදින ධර්මය හුදෙක් පිරිකර ආදී යමක් බලාපොරොත්තුවෙන් අන්‍යයනට දේශනා කරමින් ඇවිදින්නේ නම් නිග්‍රහයට ලක් වෙයි.

පතිරූපෙ නිවෙසයෙ: සුදුසු ගුණයෙහි පිහිටුවීමය. පස් පව්න් හා දස අකුසලින් වැළකීම, ලාභයට ගිජු නොවීම, අගතියට නො බැඳීම, සන්සුන් පැවතුම්, යහපත් වචන භාවිතය, යන ගුණයන් පිහිටුවීමයි.

තමා මනා ව දමනය වී අනුන් දමනය කළයුතු. තමා (-සිත) දමනය කිරීම ඉතා අමාරු ය.

159. අත්තානං චෙ තථා කයිරා
යථඤ්ඤමනුසාසති
සුදන්තො වත දම්මෙථ
අත්තාහි කිර දුද්දමො (12:3)

අනුන්ට යම් ලෙස උපදෙස් දෙන්නේ
නම් ඒ ලෙස තමනුදු හැසිරෙන්නේ
තමන් හැදී අන් අයද හදන්නේ
තමන් හැදීමය අපහසු වන්නේ

අනුශාසනයට පෙර ආදර්ශය

12 (3) පධානිකතිස්ස තෙරුන්ගේ වත (ගාථා 159)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසමින් මේ ගාථා ධර්මය **පධානික තිස්ස තෙරුන්** අරබයා දෙසූ සේක.

පධානික තිස්ස තෙරුන් වහන්සේ බුදුරදුන් හමුවී භාවනාවට සුදුසු කමටහන් ගෙන මහත් භික්ෂු පිරිසක් ද සමග භාවනා කටයුතු සඳහා ආරණ්‍ය ගත වූහ. එහිදී මෙම තෙරුන් වහන්සේ අනෙක් භික්ෂූන්ට භාවනා කටයුතු විෂයෙහි සිහියෙන් යුක්තව අප්‍රමාදීව කටයුතු කරන්නැයි අවවාද දුන්හ. එහෙත් තෙමේ පසකට වී කිසිත් භාවනාවක් නොකොට නිදා ගත්හ. අනෙක් තරුණ භික්ෂූහු ලැබුණු අනුශාසනා අනුව භාවනාවෙහි සිත යොමා රාත්‍රියෙහි ප්‍රථම යාමය ගත වූ විට යහන් ගත වීමට සැරසුනහ. එවිට පධානිකතිස්ස භික්ෂුව අවදිව අනෙක් භික්ෂූන්ට යළිත් භාවනා ප්‍රගුණ කිරීම සඳහා පිටත්ව යාමට අවවාද කළහ. රාත්‍රියෙහි දෙවැනි තෙවැනි යාමයන්හි එම භික්ෂූන් නිදා ගැනීම සඳහා පැමිණි විට ද පධානික තිස්ස තෙරුන් වහන්සේ එම භික්ෂූන්ට එලෙසින් ම පැවසූහ.

පධානික තිස්ස තෙරුන් නිතරම මෙසේ ක්‍රියා කරන විට සෙසු තරුණ භික්ෂූන් වහන්සේලා ගේ මනසට අස්වැසිල්ලක් නොවීය. මේ නිසාම ඔවුනට මනස එකඟ කොට භාවනා කටයුතුවල යෙදීමට නොහැකි විය. දිනක් ඔවුන්ට තම ඇදුරුවරයා, ඔහු අනුන්ට කියන ලෙසම අනලස්ව භාවනාවෙහි යෙදේදැයි විමසා බැලීමට අදහස් විය. එසේ විමසීමේ දී ඔවුන්ට දක්නට ලැබුනේ තම ආචාර්ය පධානික තිස්ස තෙරුන් තමන්ට අවවාද කළ ද, ඔහු එම අවවාදයෙහි පිහිටා ක්‍රියා නොකරන බවත්, භාවනාවෙහි නොයෙදී බොහෝ විට නින්දෙහි යෙදෙමින් කුසීතව සිටින බවත් ය. පධානික තිස්ස තෙරුන්ගේ අවවාද අනුශාසනා මත බොහෝ කලක් නිදිවර්ජිතව සිටි එම තරුණ භික්ෂූන් බොහෝ දෙනෙක් රෝගාතුර වූහ. එහෙයින් ම භාවනාවෙන් කිසිදු ප්‍රයෝජනයක් ගැනීමට ද නො හැකි විය.

වස්සාන කාලය අවසන් වෙත් ම භික්ෂූහු නැවත බුදුන් හමුවට පැමිණියහ. පිළිසඳර කථාවලින් පසු බුදුන් වහන්සේ, "මහණෙනි, කෙසේ ද භාවනා කටයුතු අප්‍රමාදීව කළාහුදැ"යි විමසූ සේක. එවිට භික්ෂූහු සියලු කතා පුවත සැළ කළාහුය.

එවිට බුදුරජාණන් වහන්සේ "මහණෙනි, යමෙක් අනුනට අනුශාසනය කරන්නේ නම් ඒ අනුශාසනය පරිද්දෙන් ක්‍රියා කළ යුතුය. තමා පළමුව සුදුසු ස්ථානයෙහි පිහිටා අනුනට ඔවා දිය යුතු"යි ප්‍රකාශ කළ සේක.

විවරණාත්මක අනුවාදය (159 ගාථාව)

(යථඤ්ඤදමනුසාසති) යථා අඤ්ඤං අනුසාසති වෙ අත්තානං තථා කයිරා වත සුදන්තො දම්මෙථ අත්තා හි කිර දුද්දමො

යථා: යම් සේ; **අඤ්ඤං**: අන්‍යයාට; **අනුසාසති**: අනුශාසනා කෙරේ ද; **වෙ**: ඉදින්; **අත්තානං**: තමා; **තථා**: එසේ; **කයිරා**: (පිළිවෙත් සරු) කරන්නේ නම්; **වත**: ඒකාන්තයෙන්; **සුදන්තො**: මනාව දැමුනු තැනැත්තේ; (අනුන්) **දම්මෙථ**: දමනය කරන්නේ ය; **අත්තා හි කිර**: තමා වනාහි; **දුද්දමො**: දමනය කිරීම දුෂ්කර යි; (එහෙයින් එය මනා සේ දැමිය යුතුයි.)

අනුන්ට අවවාද අනුශාසනා දෙන පරිද්දෙන් ම තමා ද එම අවවාදයෙහි පිහිටා ක්‍රියා කළ යුතුය. මනාව දැමුනු තැනැත්තේම අනුන් දමනය කරන්නේ ය. තමා දමනය කිරීම ඇත්තෙන් ම බෙහෙවින් දුෂ්කරය.

විවරණය

අත්තානං තථා කයිරා: අනුන්ට මේ මේ ලෙස හැසිරිය යුතුයයි අවවාද අනුශාසනා කිරීම. තමන් අවවාද අනුශාසනයන් හි නොපිහිටා අනුන්ට අවවාද කරන්නන්ට බුදුන් වහන්සේ දෙන උපදේශය නම් "තමා පළමුව ආදර්ශයෙහි පිහිටන්න. ඉන් පසුව එසේ ක්‍රියා කිරීමට අනුන්ට අවවාද උපදෙස් දෙන්න."

බුදුරජාණන් වහන්සේ යථොක්ත ආකල්පය අවධාරණය කිරීමට ලෝකයේ සිටි උසස්ම යෝග්‍යතම පුද්ගලයායි. බුදුරජාණන් වහන්සේ නිබඳවම සෑම උතුම් ගුණ ධර්මයකම ශ්‍රේෂ්ඨතම ආදර්ශය වූහ. බුදුන් වහන්සේ බුද්ධත්වයට පත් වීමේ සිට පරිනිර්වාණය තෙක් වූ අවුරුදු සතළිස් පහ පුරා කාලය ගත කළේ අනුන්ගේ ම යහපත සඳහාය. තමන් වහන්සේ සියලු ගුණ ධර්මයන්ගේ මුහුකුරා යාමක් වූ බැවින් අනුන්ට අනුශාසනා කිරීමෙහි යෝග්‍යත්වයට පත්ව සිටියහ. බුදුරජාණන් වහන්සේ ඇතැම් විට තනිවම ද ඇතැම් විට ශ්‍රාවක පිරිස් සමග ද තැනින් තැනට යමින් ලොකු, කුඩා, උසස්, පහත්, ධනවත්, දුප්පත්, නුවණැති, නුවණමඳ වශයෙන් කිසිදු භේදයක් නොතකා සමස්ත මානව වර්ගයාටම තම ධර්මානුශාසනයන්ගෙන් උදාර මෙහෙයක් සිදු කළ සේක.

සුදුසු දෙය තමාම කළ යුතු බව බුදුරජාණන් වහන්සේ අවධාරනය කළ සේක. උන් වහන්සේ කිසි විටෙක තම දේශනයන්ට පමණක් සීමා නොවූ හ. උන් වහන්සේ ප්‍රායෝගිකත්වයට ආදර්ශයක් වූහ. තමන් වහන්සේ පත් වූ බුද්ධත්වය ඒ සඳහා අදාළ ක්‍රියා මාර්ගය සපුරන්නේ නම් ඕනෑම කෙනෙකුට විවෘත බව වදාළ එකම ශාස්තෘවරයා බුදුන් වහන්සේය. උන් වහන්සේ හැම විටකම ශ්‍රාවකයන් උනන්දු කළේ පත් විය හැකි උසස්ම ආධ්‍යාත්මික තත්වයට පත්ව ජීවිතයක උත්තමාර්ථය අත්පත් කර ගන්නා ලෙසය. මහා කරුණාවෙන් හා මහා ප්‍රඥාවෙන් පරිපූර්ණ වූ උන් වහන්සේ සමස්ත මානව වර්ගයා සංසාර දුක්ඛයෙන් ඉවත් කොට අමා මහ නිවන් සුවයට පැමිණිවීමට ස්වකීය කාලය හා ශ්‍රමය වචනයේ පරිපූර්ණ අර්ථයෙන්ම කැපව ක්‍රියා කළ සේක.



මනා සේ තමා දමනය කළ තැනැත්තා දුක සේ ලැබිය යුතු පිහිට (ලොව්තුරා සැප) ලබයි

160. අත්තාහි අත්තනො නාථො
කොහි නාථො පරො සියා
අත්තනාව සුදන්තේන
නාථං ලභති දුල්ලභං (12:4)

තමන්ට තමාමයි පිහිටට සිටින්නේ
වෙන කවුරුද තමන් පිහිටට සිටින්නේ
තමන් මනා ලෙස දමනය කරන්නේ
එවිටයි උතුම් වූ පිහිටක් ලැබෙන්නේ

තමන් හිසට තම අතමය

12 (4) කුමාර කස්සප මාතාවගේ ප්‍රවෘත්තිය (160 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **කුමාරකස්සප** තෙරුන් ගේ මෑණියන් අරබයා මේ ගාථාව දේශනා කර වදාළ සේක.

වරක් එක් විවාහක යොවුන් කතක් පැවිදි වන්නට සැමියා ගෙන් අවසර ඉල්ලා සිටියා ය. අවසර ලත් ඕ දේවදත්ත පාක්ෂික භික්ෂුණීන් ගේ ආරාමයට ගොස් පැවිද්ද ලබා ගත්තා ය.

මේ තරුණිය පැවිදි වන්නට පෙර ගැබ් ගෙන සිටියා ය. ඇය පැවිදි වූයේ එය නො දැනය. එහෙත් මාස කීපයක් යන විට ගැබ මෝරමින් පිටතට පෙනෙන්නට පටන් ගති. භික්ෂුණීහු ඒ බව දෙව්දත් තෙරුනට දැනුම් දුන් හ. ඇය වහාම සිවුරු ගලවා ගිහි ගෙදරට නෙරපා හරින සේ අණ කළේ ය. එහෙත් ඊට අකැමැති වූ ඕ "මට දෙව්දත් ලඟ පැවිදි වන්නට උවමනාවක් නො විය. මා පැවිදි වූයේ බුදුරදුන් වෙනුවෙනි. ඔබ මා දේවදත්තගේ ශ්‍රාවිකාවක් කර ඇත්තේ වැරදීමකිනි. මම සිවුරු හැර නො යමි. මා භාග්‍යවතුන් වහන්සේ වෙත ගෙන යන්න" යි ඕ පැවසුවා ය. මෙසේ පැවසූ ඕ ජේතවනාරාමයට ගොස් භාග්‍යවතුන් වහන්සේ හමු විය.

ඇය ගැබ් ගත්තේ පැවිදිවන්නට පෙර බව බුදු ඇසින් දත් බුදුරජාණන් වහන්සේ ඇය ගේ අහිංසකත්වය තමන් විසින් පෙන්වා දෙනු වෙනුවට විධිමත් කමිටුවක් ලවා එය කරවන්නට සිතූ හ. බුදුන් වහන්සේ පසේනදි කොසොල් රජ, අනේපිඬු සිටුතුමා, විසාකා උපාසිකාව, ඇතුළු පිරිසක් කැඳවූ හ. උපාලි මහ රහතන් වහන්සේට මෙම කාර්‍යය මෙහෙයවීම පැවරූ හ.

කමිටුවේ මෙහෙයුම පරිදි විසාකාව ඇය තිරයකින් ආවරණය වූ තැනකට ගෙන ගොස් පරීක්ෂා කළා ය. මැනවින් කරුණු විග්‍රහ කළ ඕ තොමෝ භික්ෂුණිය ගැබ් ගත්තේ පැවිදි වන්නට පෙර බව උපාලි තෙරුනට වාර්තා කළ හ. උන්වහන්සේ පැමිණ සිටි පිරිසට ඒ බව දැනුම් දී, ඒ අනුව ඇය ගේ ශීලයට හානියක් වී නැති බව ප්‍රකාශයට පත් කළ හ.

නිසි කලට තෙරණිය පුත් කුමරකු බිහි කළා ය. දරුවා හදා වඩා ගැනීම බාර ගත් පසේනදි රජතෙම ඔහුට කුමාරකස්සප යන නම යෙදී ය. හත් වස් වූ පසු තම මව භික්ෂුණියක බව ඇසූ දරුවා තමන් ද පැවිදි වීමට කැමති බව කියා සිටියේ ය. පැවිදි වී කලකට පසු බුදුරදුන්ගෙන් කම්ස්ථාන ලබා වනගත වූ කුමාරකස්සප තෙරණුවෝ භාවනා කොට රහත් බව ලැබූ හ. රහත් වූ පසුව ද තවත් දොළොස් වසරක් වනගතව විසූ හ. උන්වහන්සේ ගේ මව ඒ දොළොස් වසර පුරාම පුතණුවන් දැක ගැනීමේ ආශාවෙන් විසූ හ.

දොළොස් වසරකට පසු නගරයට පැමිණි කුමාරකස්සප තෙරුන් දුටු මව "පුතනුවනි, කුමාරකස්සප මා පුත් තෙරණුවනි" යි හඬ ගසමින් කඳුළු පිරි නෙතින් උන්වහන්සේ වෙත දිව ආහ. තෙරණුවෝ ද ඇය දැක "මා දැන් කාරුණික ලෙස කතා කළහොත් තෙරණියගේ අනාගතයට එය යහපතක් නො වේ. ඇය තුළ දාරකස්නේහය රජ කරන්නට ගියහොත් මාර්ග ඵලාධිගමයට එය බාධාවෙයි. එහෙයින් නෙතමනයක් නො දක්වමි"යි සිතා තදින් කතා කළ හ.

"තෙරණිය බුදු සස්නෙහි පැවිදිව සිටත් දරු සෙනෙහයවත් දුර ලන්නට අසමත් ද?" යි විමසූ හ. "මගේ පුතා මට නපුරුකම් නො කරනු ඇත" යි සිතූ භික්ෂුණිය "පුතණුවනි, ඔබ කුමක් ද කීවේ?" යි යළි ප්‍රශ්න කළා ය. තෙරහු ද පෙර සේම තදින් කතා කළ හ. ඒ ඇසූ තෙරණිය "මොහු වෙනුවෙන් මම දොළොස් අවුරුද්දක් කඳුළු බිවෙමි. නමුත් හේ මට නපුරු බසින් කතා කරයි. දරුවන් කෙරේ ඇළුම් කිරීමෙන් ඇති ඵලය කුමක් ද?" යි සිතා දරුවා කෙරේ වූ ඇල්ම හැර බවුන් වඩා එදිනම රහත් වූ වාය.

එපවත් ඇසූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, කවර අධිගමයක් ලබන්නට වුවද තමාට තමා පමණක් ම සරණ බව තෙරුම් ගත මනාය" යි මේ දේශනාව කර වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (160 ගාථාව)

අත්තනො අත්තා හි නාථො පරො කො හි නාථො සියා
සුදන්තෙන අත්තනා එව දුල්ලභං නාථං ලභති

අත්තනො: තමා හට; **අත්තා හි**: තමා ම; **නාථො**: පිහිට; (වෙයි) **පරො**: අන්‍ය වූ; **කො හි**: කවරෙක් නම්; **නාථො**: (තම හට) පිහිටක්; **සියා**: වන්නේ ද?; **සුදන්තෙන**: මනාව දැමුනා වූ; **අත්තනා එව**: තමා විසින් ම; **දුල්ලභං**: ලැබීමට දුෂ්කර; **නාථං ලභති**: (අර්හත්ඵල නමැති) පිහිට ලබයි.

තමාට පිහිට තමාමය. තමාට වෙන කවරෙක් පිහිට වේ ද? තමා මනාව හික්මවා ගත් විට දුර්ලභ වූ අර්හත්ඵල නමැති පිහිට ලැබිය හැක.

විවරණය

කුමාරකස්සප තෙරණුවෝ දුර්ලභගනයේ උතුමෙක් වූ හ. බුදු සස්නේ විචිත්‍ර ධර්ම කථිකයන් අතර අග්‍රස්ථානය ලද්දේ උන්වහන්සේ ය.

වයස අවුරුදු හතේ දී කුමාරකස්සප පැවිදි වූයේ රජතුමාගේ අනුමැතිය ලබා ගනිමිනි. උන්වහන්සේ පැවිදිව ගියේ අන්ධ වනයටය. එහිදී තුඹසක් උපමා කර දෙසූ සූත්‍රයට සවන් දීමෙන් නිවන් සුව ලත් හ.

පදුමුත්තර බුදුරදුන් ගේ කාලයෙහි කළ ප්‍රාර්ථනාවක් සමෘද්ධ වීමෙන් උන්වහන්සේ විචිත්‍ර කථිකයන් අතර අගතැන් පත් වූ හ.

තමා ම කළ තමා කෙරෙන් උපන් තමාගෙන් ම හට ගත්තා වූ පව ඒ අනුවණයා දරුණු සේ මඩී.

161. අත්තනා'ව කතං පාපං
අත්තජං අත්තසම්භවං
අභිමන්ථති දුම්මෙධං
වජිරං'වස්මමයං මණිං (12:5)

තමන් කළ පාපෙන්
තමන් තුළින් ම බිහි වූ
කැපෙති අනුවණ දන
දියමන්තියෙන් මිණි මෙන්.

විහින් නැසෙන - පවු කළ දන

12 (5) මහාකාල උපාසක වත (161 ගාථාව)

මහාකාල නම් ගිහි උපාසකයකු ඇරබ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළ සේක.

මහාකාල උපාසක තැන එක් පොහෝ දිනක දෙව්රම් වෙහෙර බලා ගියේ ය. ඒදින අටසිල් සමාදන්ව සිටි හෙතෙම පසු දින අළුයම් වනතුරුම ධර්ම ශ්‍රවණය කළේ ය.

එදා රෑ හොරු නගරයේ එක් ගෙයක් බිඳ බඩු රැගෙන පලා යන්නට සැරසෙන විට ගෙහිමියෝ අවදිව ඔවුන් පසුපස එළවා ගෙන ආහ. ඒ මේ අත දිවූ සොරුන් ගෙන් සමහරු විහාර බිම හරහා ද දුවන්නෝ මහා කාල මුහුණ සෝදමින් සිටි තැනින් ද දිවූ හ. එක් හොරෙක් තම බඩු මහා කාල සිටි තැන දමා පලා ගියේ ය. ගෙහිමියෝ මහාකාල සිටි තැන තිබූ සොරබඩු දැක ඔහු හොරකු සේ සිතා ඔහුට පහර දුන් හ. ඔවුන් ගෙන් පහර කෑ උපාසක තැන එතැනම මිය ගියේ ය.

උදෑසන පොකුණ වෙත ගිය සාමණේර හිමිවරු ඔහු ගේ මළසිරුර දැක බුදුරජාණන් වහන්සේට දැනුම් දුන් හ. "උපාසක මහතා මිය ගියේ ඔහුට කිසිසේත් නො ගැලපෙන විලාසයෙනි" යි ඔවුහු දුක් වූ හ.

භාග්‍යවතුන් වහන්සේ එවිට, "මේ ජීවිතයේ දී මහාකාල උපාසක තැන කළ පුණ්‍ය කටයුතු අනුව බලන විට නම් මේ මරණය ඔහුට සරිලන මරණයක් නො වේ. එහෙත් ඔහු ගේ පෙර කල කර්ම දෙස බලන විට නම් එසේ නො සිතෙයි. පෙර ආත්මයක මොහු එක්තරා අහිංසක පුද්ගලයෙකු ගේ බිරිඳ කෙරේ කාම රාගය ඉපදී, ඔහු මරා දමනු පිණිස තමා සතු වටිනා මැණිකක් ඔහු ගේ වාහනයට දමා සොරකු බවට නම් කර තලා මරා දැම්ම වූ පාපය නිසා මේ විපාකය ඔහුට විඳින්නට වූ බැව්" වදාළ සේක. "තමා ම කළ පවින් පව්කාරයෝ අපා දුක් විඳිති. දියමන්තිය තමාත් මැණිකක් නමුත් අනිත් මැණික් කපන්නාක් මෙනි" යි වදාළ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව ද දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (161 ගාථාව)

අත්තනා එව කතං අත්තජං අත්තසම්භවං පාපං
අස්මමයං මණිං වජිරං ඉව දුම්මෙධං අභිමන්ථති

අත්තනා එව: තමා විසින් ම; **කතං**: කරන ලද; **අත්තජං**: තමා තුළින් ම උපන්; **අත්තසම්භවං**: තමා කෙරෙන් ම හටගත්තා වූ; **පාපං**: පාපය; **අස්මමයං**: පාෂාණමය වූ; **මණිං**: මැණික;(කා දමන) **වජිරං ඉව**: දියමන්තිය මෙන්; **දුම්මෙධං**: අඥානයා; **අභිමන්ථති**: අතිශයින් පෙළයි.

තමා විසින්ම කළ, තමාගෙන්ම ජනිත, තමා ගෙන්ම හට ගත්, පාපය තමාව ම පීඩාවට පත් කරයි. ගලෙන්ම උපන් දියමන්තිය ගලම නසන්නාක් මෙනි.

විවරණය

දියමන්තියක් ඉතාමත් ම ශක්තිමත් ගල් විශේෂයක් ලෙස හැඳින්වෙයි. එයින් සියළුම මැණික් ගල් කැපිය හැකි ය. දියමන්තියට පාලියෙන් යෙදෙන 'වජිර' යන වචනයෙහි නිරුක්ති දක්වන අටුවාචාරීහු ''**වජතේව න පටිහඤ්ඤතේ යස්ස ගමනං කේනචීති වජිරං**'' යි කැපී ගෙන යන විට නවත්වන්නට බැරි ලෙස කපන්නේ වජිර නම්'' යි ඒ බව දැක්වූ හ. දියමන්ති ගැන කියවෙන ශ්ලෝකයක් මෙසේ ය.

පෘථිව්‍යං යානි රත්තානි
යෙ චාන්‍යෙ ලෝහ ධාතව
සර්වානි විලිඛේද් වජ්‍රං
තච්ච තෙර් න විලිඛ්‍යතෙ

මහ පොළොවේ කොයි මැණිකත්
වෙන කොයි විදියේ ලෝහත්
සේරම වජ්‍රයෙන් කපත්
එකකින් වත් එය නොකපත්

දියමන්තිය ඉතා මිල අධික ගල් විශේෂයක් වුව ද එය පැළඳීම ආයුරාරෝග්‍ය භාග්‍යාදිය ලබා දෙන බව පැරණියෝ විශ්වාස කළ හ. වර්තමානයේ එය ධනවතුන් ගේ ආභරණයක් මෙන් ම ආයෝජනයක් ලෙස ද සැලකේ. මේ ගාථාවේ දී උපමාවට ගත්තේ එහි ඇති තීක්ෂණ කැපෙන සුළු ගුණයයි.

සතුරෙක් (තමා ගේ) සතුරාට විපත් කරනු කැමති වේ ද, දුසිල් තැනැත්තා ද තමාට එසේ ම විපත් කරන්නේ ය.

162. යස්ස අච්චන්ත දුස්සීල්‍යං
මාලුවා සාලමි'වොතතං
කරොති සො තථත්තානං
යථා නං ඉච්ඡතී දිසො (12:6)

හැසුරුණොත් දුසිල් ලෙස - පහත් දුසිරිත යෙදී
සල් ගහක් වනසන්න - වැලක් එතුණා වගේ
ඔහු ගෙ හතුරන් ඔහුට - කරන්නට කැමති වන
මහ විපත් තමාටම - උදාකර ගනී ඔහු

පවෙන් වැනසෙයි - පවු කරන්නා.

12 (6) දේවදත්ත තෙරුන් ගේ පුවත (162 ගාථාව)

දෙව්දත් තෙරුන් ඇරබ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයේ ය.

දිනක් දම් සභාවෙහි රැස් වූ භික්ෂූන් වහන්සේ දෙව්දත් තෙරුන් ගැන කතා බහ කරමින් විසූ හ. එහි වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, කවර කතාවක් සාකච්ඡා කළහු ද?" යි ප්‍රශ්න කළෙන් තමන් දෙව්දත් තෙරුන් ගැන කතා කරමින් සිටි බව ඔවුහු පිළිවදන් සේ පැවසූ හ. "ස්වාමීනි, දේවදත්ත සීලයක් ගුණයක් නැති පාපතරයෙකි. ඔහු අතිශයන් ම දුෂ්ට ය. නුසුදුසු ක්‍රම වලින් අජාසත් පහදවා ගෙන කීර්තිය හා ලාභ ලබන්නට හෙතෙම වෑයම් කළේ ය. ඔහු ගේ බසින් නො මඟ ගිය අජාසත් තම පියා ඝාතනය කළේ ය. ඔබ වහන්සේ ඝාතනයට දෙව්දත් තෙවරක් වෑයම් කළේ ය. ඔහු නම් නියම පාපිෂ්ඨයෙකි" යි ඔවුහු පැවසූ හ.

උන්වහන්සේලාට සවන් දී සිටි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, දේවදත්ත මා ඝාතනයට සැරසුණේ දැන් පමණක් නො වෙයි. පෙරත් වෑයම් කළේ ය" යි පවසා පැරණි වෘත්තාන්තය වශයෙන් මුව වැද්දාගේ කතාව වදාළ සේක.

එක් සමයක බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රජ කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ මුවකු වී උපන් සේක. ඒ ආත්මයෙහි දෙව්දත් උපන්නේ මුව වැද්දකු වශයෙනි. දිනක් දඩයමේ ගිය මුව වැද්දා මුවකු ගේ පිය සටහන් දැක ගහකට නැඟ උණ පතුරු වලින් මැස්සක් තනා ගෙන රැක සිටියේ ය. දුනු ඊතල සූදානම් කර ගෙන ඔහු සැරසී සිටියේ මුවා දඩයම් කර ගැනීමටයි. මුවා ඉතා ප්‍රවේසමෙන් වටපිට බලමින් ආවේ ය. මුවා පරිස්සමෙන් හෙමින් එනු දුටු මුව වැද්දා ඔහු ලඟට කැඳවා ගැනීමට පෙළඹුමක් වශයෙන් පලතුරු ටිකක් මුවා වෙත විසි කළේ ය.

එයින් වඩාත් සැක ඇති කරගත් මුවා විමසිලිමත් වී ගසේ රැක සිටි මුව වැද්දා දුටුවේ ය. වැද්දා නුදුටු බවක් හඟවා ආපසු හැරුණු මුවා මෙසේ පැවසී ය. "ගස, මේ වනතුරු ඔබේ පලතුරු වැටුණේ සිරස් අතට ය. අද අමුතු විදියකට හරස් අතට වැටෙයි. සොබා දම් නීතිය ඔබ කඩ කර ඇත. ඔබ ස්වභාව ධර්මයට එරෙහිව යන නිසා මම ඔබ අතහැර වෙන ගසක් සොයා යමි." ඒ ඇසූ මුව වැද්දා දුනු ඊතල බිම හෙලා "ඔව් අදට ගැලවුණා. මම හිතූ හැටි වැරදුණා. ඊත් හැමදාම ගැලවෙන්න හිතන්න එපා" යි පැවසී ය. එදා මුවකුව සිටි බෝසත්හු මෙසේ පිළිතුරු දුන් හ.

"වැද්දාණනි, ඇත්තටම ඔබට අද වැරදුණා. හැබැයි ඔබේ කර්මයට නම් කවදාවත් වරදින්නේ නෑ. නොවරදවාම ඔබ පස්සේ කර්මය එනවා ඇති."

"මහණෙනි, දේවදත්ත මෙසේ එදත් මා ඝාතනය කරන්න වෑයම් කළේ" යි වදාළ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, 'මාලුවා' නම් වැල් වර්ගීය සල් ගසේ එතී එය මරා දමයි. පාපයත් ඒ වගෙයි. මිනිසා වටා එතෙන පාපය හා දුරාචාරය ඔහු අපාදුකට හෙළයි."යයි වදාරා මේ ගාථාව ද දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (162 ගාථාව)

යස්ස අච්චන්ත දුස්සීල්‍යං සාලං මාලුවා ඉව ඔතතං
දිසො නං යථා ඉච්ඡති සො අත්තානං තථා කරොති

යස්ස: යමෙකුගේ; **අච්චන්ත දුස්සීල්‍යං**: ඒකාන්ත දුශ්ශීලභාවය; **සාලං**: සල් ගසක්; (වැළඳගෙණ සිටි) **මාලුවා ඉව**: මාලුවා (නම් වූ) වැලක් මෙන්; **ඔතතං**: (ඔහු) වැළඳගෙණ සිටියේ; **දිසො**: සතුරෙක්; **නං**: ඒ (තමා ගේ) සතුරාට; **යථා**: යම් සේ; **ඉච්ඡති**: (අනර්ථ කරනු) කැමති වේ ද; **සො**: ඒ දුශ්ශීල තෙමේ; **අත්තානං**: තමහට; **තථා**: එසේ; **කරොති**: (අනර්ථ) කරයි.

යමෙක් පරම දුස්සීලතාවයෙන් වෙළී ජීවත් වෙයි නම් සල් ගසක එතුණු මාලුවා වැලක් මෙන් හෙතෙම එයින් ම විනාශයට පැමිණෙයි. ඔහු ගේ හතුරන් ඔහුට යම් අනර්ථයක් වේවා යි බලාපොරොත්තු වෙයි නම් ඒ අනර්ථය හෙතෙම තමාට කර ගනියි.

විවරණය

අච්චන්තදුස්සීල්‍යං: ඉතා දුසිල් බවය. සුසරිත පිරුමෙන් ගිහි පිළිවෙත නිදොස්ව නොරැක අකුසල් කරන ගිහියා තුළ පවත්නා තද දුසිල්කමය. මහණ පිළිවෙත සුරැකි කොට නොවඩනා පැවිද්දා තුළ පවත්නා තද දුසිල්කමය. මෙය යෙදුනේ දෙව්දත් තෙරුන් ගේ චර්‍යාව අරබයා හෙයින් වඩාත් ගැලපෙන්නේ භික්ෂු ජීවිතයේ දුශ්ශීලතාව අරබයා ය. භික්ෂු නමක ගේ බරපතල ම සීල භේද වශයෙන් හඳුන්වන්නේ පාරාජික හතර හා සංඝාදිසේස දහ තුනය.

සාලං මාලුවා ඉව: සල් ගසක එතුණු මාලුවා වැලක් මෙන්ය. මාලුවා වැලේ පත් ගොටු සේ උඩුකුරුව සිටී. වැසිවැස ඒ පත් ගොටු වල වතුර පිරුණු කල ඒ වැල වැළඳ ගෙන සිටි සල් රුක බිඳ සුණුවිසුණු කරන්නේය.



තමාට අවැඩ පිණිස පවත්නා දේ කරන්නට ඉතා පහසු ය. හිත පිණිස පවත්නා දේ කරන්නට ඉතා අපහසු ය.

163. සුකරානි අසාධූනි
අත්තනො අහිතානි ච
යං වෙ හිතඤ්ච සාධුඤ්ච
තං වෙ පරමදුක්කරං (12:7)

පව් වැඩ නරක වැඩ - කරන එක නම් පහසුයි
පහසුයි අහිත වැඩ - තමන්ට විපත් ගෙන එන
තමන්ට යහපතක් - සිදුවන සත් ක්‍රියාවන්
කරන එක හොඳට ම - අමාරුයි අපහසු වෙයි.

තමන්ට හිත වැඩ - නොවේ පහසු වැඩ

12 (7) සංඝභේදයට උත්සාහ කිරීම පිළිබඳ කතා වස්තුව (163 ගාථාව)

සංඝයා භේද කිරීමේ ආනන්තරිය මහා පාප කර්මය කරගත් **දේවදත්ත ස්ථවිරයන්** අරබයා මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් වේළුවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි දේශනා කරන ලදී.

වරක් බුදුරදුන් වේළුවනාරාමයෙහි දහම් දෙසමින් වැඩහුන් කල දෙව්දත් තෙරණුවෝ උන්වහන්සේ වෙත පැමිණ යෝජනාවක් ඉදිරිපත් කළ හ."සමිඳුනි, දැන් ඔබ මහළුයි. එහෙයින් ඔබ වහන්සේ විවේක ගන්න. සංඝයා පාලනය කිරීම මට බාර දෙන්න" භාග්‍යවතුන් වහන්සේ "ඔබ වැනි අයෙක් මෙයට නුසුදුසුයි. ඔබට එය කළ නො හැකියැ"යි පවසා එය ප්‍රතික්ෂෙප කළ හ.

එදා පටන් බුදුන් කෙරේ වෛර බැඳගත් දෙව්දත් බුදුන් මැරීමට තුන් වරක් ම වෑයම් කළේ ය. සියළු උපක්‍රම නිරර්ථක වූ තැන හේ අළුත් උපක්‍රමයක් අත්හදා බලන්නට සිතා බුදුරදුන් හමුව සංඝයාට යාවජීව වශයෙන්

1. වනගතව විසිය යුතු ය.
2. පිණ්ඩපාත භෝජනයෙන් පමණක් ජීවත් විය යුතු ය.
3. පාංසුකූල චීවරය පමණක් පරිහරණය කළ යුතු ය.
4. රුක් මුල් වලම වාසය කළ යුතු ය.
5. මස් මාංශ අනුභවයෙන් වැළකිය යුතු ය.

යන ශික්ෂා පණවන සේ ඉල්ලා සිටියේ ය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කර සිටියේ ඒවා හුදෙක් ස්වේච්ඡාවෙන් අනුගමනය කළ හැකි දේ මිස දිවිහිමියෙන් අනිවාර්යයෙන් පිළිපැදිය යුතු දේ ලෙස පැනවීම අපහසු බව ය.

මෙය දෙව්දත්ට කදිම අවස්ථාවක් විය. "මේ නීති දැනට පවත්නා විනය නීති වලට වඩා හොඳය. එහෙත් මෙබඳු අගනා දේ සංඝයාට අනිවාර්ය කරන්නට බුදුහු අකැමැති වෙති" යි හේ පතුරුවා හැරියේ ය. ඇතැම් අනුවණ භික්ෂූහු ස්වල්ප දෙනෙක් දෙව්දත් නිවැරදි යැයි සිතූ හ. එහෙයින් ඔහුට යම් පිරිස් බලයක් ගොඩ නැඟෙමින් තිබිණ. මේ අතර දිනක් දෙව්දත් කැඳවූ භාග්‍යවතුන් වහන්සේ "ඔබ සංඝයා අතර භේදයක් ඇති කිරීමට සැලසුම් කරන බව සැබෑ ද?"යි විමසූ හ.

"සැබෑය" යි ඔහු කී විට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ. "දේවදත්ත, එය බලගතු අපරාධයකි. ඔබ එයින් ම විනාශයට පත් වනු ඇත." එහෙත් ඒ අවවාදය ගණනකට නො ගත් දෙව්දත් තෙරණුවෝ ආනන්ද හිමියන් රජගහ නුවර පිඬු සිඟා වඩිනා අතර හමු වී "ආනන්ද, මම අද සිට වෙනම උපෝසථය කරමි. බුදුරදුන්ට පක්ෂපාත භික්ෂූන් සමඟ නොව මට පක්ෂපාත පිරිස සමඟ වෙනම පොහොය කරමි. සෙසු විනය කම් ද කරමි' යි පැවසී ය. ආනන්ද මහ තෙරණුවෝ ද ඒ බව බුදුරදුන්ට දැනුම් දුන් හ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "දෙව්දත් කරන්නට යන්නේ බලගතු අපරාධයකි. එහි විපාකය වන්නේ ඔහු අවීචිමහා නරකාදියෙහි ඉපදීමයි. පව්කම් කිරීම පහසු ය. අපහසු වන්නේ හොඳ වැඩ කිරීම ය. තමන්ට යහපතක් වන හොඳ වැඩ ඉතා දුෂ්කර ය," යනුවෙන් වදාළ හ.

කෙසේ වුවද පන්සියයක් පමණ භික්ෂූන් තම පක්ෂයට හරවා ගෙන ගයා ශීර්ෂයට ගිය දේවදත්ත ස්ථවිරයෝ එහි තම නව සසුන ඇරඹූ හ. එහෙත් සැරියුත්-මුගලන් අගසවු තෙරවරු එහි ගොස් ධර්මදේශනා කර සඟ පිරිස යළි බුදුරදුන් වෙත ම කැඳවා ගෙන ආ හ.

විවරණාත්මක අනුවාදය (163 ගාථාව)

අසාධූනි අත්තනො අහිතානි ච සුකරානි යං හිතඤ්ච
සාධුඤ්ච තං වෙ පරමදුක්කරං

අසාධූනි ච: අයහපත් වූ ද; **අත්තනො**: තමා හට; **අහිතානි**: අහිත පිණිස පවතින්නා වූ ද දේ; **සුකරානි**: (කිරීම) පහසු ය; **යං**: යමක්; **හිතඤ්ච**: හිතකර ද; **සාධුඤ්ච**: නිරවද්‍ය ද; **තං**: ඒවා (කිරීම); **වෙ**: ඒකාන්තයෙන් ම; **පරමදුක්කරං**: අතිශයින් දුෂ්කරය.

අයහපත් වූත් තමන්ට විපත් පිණිස පවතින්නා වූත් දේ කිරීම පහසු ය. යමක් හිතකර නම්, නිවැරදි නම් ඒ දේ කිරීම අතිශයින් දුෂ්කර ය.

විවරණය

දේවදත්ත: පරම මානව දයාවෙන්, ආත්මාර්ථාභිලාෂයෙන් තොරව ජන හිත වැඩ වඩන්නට ධර්මදූත සේවය ඇරඹුව ද භාග්‍යවතුන් වහන්සේට එහිලා අනන්ත සම්බාධ එළැඹුණේ ය. උන්වහන්සේට දරුණු නින්දා-ප්‍රලාප, බොරු චෝදනා, නිග්‍රහ ලැබුණේ ය. බොහෝ විට මේ නින්දා කළෝ තරඟකාරි, ශාස්තෘවරු ය. එහෙත් ඒ කිසිවෙක් දෙව්දත් තරම්, ලොකු හානියක් නො කළ හ. ඒ ශාස්තෘවරුන් ගේ මූලික දාර්ශනික සංකල්ප, ආගමික චාරිත්‍ර වාරිත්‍ර, යාග හෝම විධි, පෞද්ගලික පැවතුම් ආදී බොහෝ දේ බුදුරදුන් අතින් විවේචනයට ලක් වුව ද ඔවුහු චරිත ඝාතනයට වෑයම් කලත් බුදුරදුන් මරා දැමීමට උත්සාහ නො කළ හ. එහෙත් දෙව්දත්, තුන් වරක් ම උන්වහන්සේ මරන්නට වෑයම් කළේ ය. ඇඟෙහි ලේ ද සෙලැව්වී ය. නෑ කමින් මස්සිනා වුව ද හේ සසර පටන් බැඳගත් වෛරයක් නිසා මෙ බඳු දුෂ්ට ක්‍රියා කළේ ය. දෙව්දත් මේ දෑ කළේ බුදුරදුන් ගේ ඉවසීමේ ගුණය ලොව පතළ කිරීමට යැයි පවසන මහායානිකයෝ ඔහු අනාගතයේ 'දේවරාජ' නමින් බුදුවෙතැයි ද කියති.



යම් අනුවණයෙක් ලාමක අදහසින් අරියයන්ගේ අනුසස්න වළකා ද එය ඔහු ගේ නැස්ම පිණිස නිපදනේ ය.

164. යො සාසනං අරහතං
අරියානං ධම්ම ජීවිනං
පටික්කොසති දුම්මෙධො
දිට්ඨිං නිස්සාය පාපිකං
ඵලානි කට්ඨකස්සෙව
අත්තඝඤ්ඤාය ඵල්ලති (12:8)

දැහැමින් දිවි ගෙවන - උතුම් මහ රහතුන් ගේ
සසුනට අමනයෙක් - මිසදිටුගත් හේතුවෙන්
කළෝතින් බාධා - එයම ආපසු කැරකී
විපත් දෙයි ඔහුටම - උණ ගහක් පල ගත් මෙන්

වැනසෙති නපුරෝ විහින්

12 (8) කාල තෙරුන් ගේ වත (164 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි මේ ගාථාව උන්වහන්සේ විසින් වදාරන ලද්දේ **කාල** නම් තෙරුන්ගේ පැවතුම් මුල් කර ගෙන ය.

සැවැත් නුවර එක් උපාසිකාවක් කාල නම් තෙර කෙනෙකුන්ට පැහැදී දිනපතා සිය නිවසට වැඩම කරවා දන් දෙන්නී ය. එහෙත් ඇය කිසි කලෙක බුදුරදුන්ගෙන් බණක් අසා නො තිබිණි. අසල්වැසි ජනයා නිතර බුදුන් දක්නට ගොස් දන් දී බණ අසා අවුත් බුදුරදුන් ගැන හා ධර්මය ගැන කරන කතා ඇසූ ඇයට ද බුදුන් දැක ගැනීමේ බලවත් ආශාවක් ඇති විය. ඒ පිළිබඳව කාල තෙරුනට දැනුම් දුන් විට "මැය බුදුන් හමුවට ගොස් බණ ඇසුවහොත් මා කෙරේ ඇති ප්‍රසාදය අඩු විය හැක. එවිට අලාභය වන්නේ මට ය"යි සිතා එය වැළකූ හ. තුන් වතාවක් ම ඇයගේ ගමන තෙරුන් ගේ කතා නිසා වැළකින. අන්තිමේ ඕ තනිවම තීරණයක් ගෙන හිමිනමට දානය පිස තබා සංග්‍රහ කටයුතු දියණියට පවරා තමා දෙව්රමට ගියා ය.

වෙනදා මෙන් කාල තෙරුන් නිවසට පැමිණි විට උපාසිකාව වෙනුවට ඇයගේ දියණිය උවටැන් කරන්නට සැරසුණෙන් උපාසිකාව කොහිදැයි විමසුවේය. උපාසිකාව බුදුරදුන් දක්නට ගිය බව අසා දැන ගත් තෙරණුවෝ "බුදුරදුන් ගැඹුරු බණ වදාරා උපාසිකාව දැනුවත් කළහොත් එයින් මට හානි වෙති"යි සිතා දන් වැළඳීම පසෙක ලා වහා දෙව්රමට දිව ගොස් "සමිඳුනි, මගේ උපාසිකාවට නුවණ මඳය. ගැඹුරින් බණ නොකියා දානානිශංස ටිකක් පමණක් කියනු මැනැවි" යි පැවසී ය. එහෙත් බුදුහු "අනුවණ මහණ, ඔබ ගේ අඥානකම හා මිසදිටු හේතුවෙන් මගේ දහමට නිග්‍රහ නොකරව. ඔබ ඔබේ ම විනාශය ළඟා කර ගන්නෙහි ය." නිග්‍රහ කොට කළ දහම් දෙසුමෙන් උපාසිකාව සෝවාන් වූවා ය.

විවරණාත්මක අනුවාදය (164 ගාථාව)

යො දුම්මෙධො පාපිකං දිට්ඨිං නිස්සාය, අරහතං ධම්ම ජීවිනං අරියානං සාසනං පටික්කොසති කට්ඨකස්ස ඵලානි ඉව අත්තඝඤ්ඤාය ඵල්ලති

යො: යම්; **දුම්මෙධො**: අනුවණයෙක්; **පාපිකං**: පාපී (ලාමක); **දිට්ඨිං**: දෘෂ්ටිය; **නිස්සාය**: හේතුවෙන්; **අරහතං**: රහත් වූ; **ධම්ම ජීවිනං**: දැහැමින් ජීවත් වන; **අරියානං**: ආර්යයන්ගේ; **සාසනං**: අනුශාසනාව; **පටික්කොසති**: වළකයි නම් (එය ඔහුගේ); **කට්ඨකස්ස**: උණ ගසේ; **ඵලානි ඉව**: ගෙඩි මෙන්; **අත්තඝඤ්ඤාය**: තමා ගේම විනාශය පිණිස; **ඵල්ලති**: පල ගන්නේය. හැදෙන්නේය.

යම් අනුවණ තැනැත්තෙක් තමා ගේ වැරදි අදහස් නිසා ධර්මානුකූලව ජීවත් වන ආර්‍ය්‍ය වූ රහත් උතුමන් ගේ ධර්මයට බාධා කරන්නේ නම්, උණ ගහේ හට ගත් ගෙඩි උණගහේ විනාශයට ම හේතුවන්නා සේ ඔහු ගේ එම ක්‍රියාවෙන් ඔහුම විනාශයට පත් වෙයි.

විවරණය

දිට්ඨි: හෙවත් දෘෂ්ටි නම්, පිරිසිදු අවබෝධය හෝ අත් දැකීමකින් තොරව යම් යම් දේ පිළිබඳව ඇති කරගන්නා කාල්පනික අදහස් ය. අනුන් ගැන අසා දැන ගැනීමෙන් හෝ තාර්කිකව සිතා බැලීමෙන් මෙබඳු කාල්පනික දෘෂ්ටි හෙවත් දැඩිව එල්බ ගන්නා චින්තන ඇති විය හැක. ඇතැම් දෘෂ්ටි හිතකර හෙයින් ඒවා සම්මා දිට්ඨි වශයෙන් ද හානි කර දෘෂ්ටි මිච්ඡා දිට්ඨි වශයෙන් ද හඳුන්වනු ලැබේ. 'දිට්ඨි' යන්න වැඩි වශයෙන් යෙදෙන්නේ මිච්ඡා දිට්ඨි සම්බන්ධයෙනි. සම්මා දිට්ඨි වුව ද ප්‍රායෝගික අර්ථසාධනය පිණිස උපයෝගි කර ගත්ත ද විමුක්තිය ලැබීමේ දී හැර දමනු ලැබේ. යථා තත්ව දර්ශනය හඳුන්වනු ලබන්නේ දිට්ඨි වශයෙන් නොව දර්ශන වශයෙනි. **'දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා - දස්සනේන සම්පන්නො'** යි දක්වන්නේ එහෙයිනි.

මිථ්‍යා දෘෂ්ටි, පාපී හා දුෂ්ට අපේක්ෂාවනට හා චයඝ්‍රාවනට පාදකව සිටින හෙයින් සහමුලින්ම ප්‍රතික්ෂේප කළ යුතු බව දැක්වෙයි. ''මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය තරම් නූපන් අකුශල ධර්මයන් ගේ උත්පාදයටත්, උපන් අකුශල ධර්මයන්ගේ වෘද්ධියටත් හේතුවන වෙන දෙයක් නැත. මිථ්‍යා දෘෂ්ටිය තරම් නූපන් කුසල ධර්මයන් ගේ උත්පත්තියට බාධා කරන, උපන් කුශලයා ගේ විනාශයට හේතු වෙන වෙනත් දෙයක් නැත. මරණ මොහොතෙහි දී සත්වයන් ඒ අපායට, නිරයට, දුගතියට ඇදගෙන යන තවත් අන් ධර්මයක් මිථ්‍යා දෘෂ්ටිය තරම් ලොව කොහිවත් නැත. මිථ්‍යා දෘෂ්ටියෙන් පිරුණු පුද්ගලයා කවර දෙයක් කළත්, කවර දෙයක් උරුම කර ගත්තත්, කවර ආශා, ප්‍රාර්ථනා තිබුණත් ඒ සියල්ල ඔහු අප්‍රිය, අමනාප, අප්‍රසන්න දුක්ඛස්කන්ධයක් කරා යොමු කරයි.



තම තමා ගේ පිරිසිදු බව හා අපිරිසිදු බව තම තමා පිළිබඳව ය. අනිකෙක් අනිකෙකු පිරිසිදු නො කෙරේ.

165. අත්තනා'ව කතං පාපං
අත්තනා සඞ්කිලිස්සති
අත්තනා අකතං පාපං
අත්තනා'ව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං
නාඤ්ඤො අඤ්ඤං විසොධයෙ (12:9)

තමන් කෙලෙසෙන්නේ - තමන් කළ පාපෙන්ම ය
නො කළහොත් පාපය - තමා පිරිසිදු වේම ය
පිරිසිදු - අපිරිසිදු - වීම කළ දේ අනුව ය
කෙනෙකු තව කෙනකුන් - පිරිසිදු කළ නොහේම ය.

පිරිසිදු බව හා අපිරිසිදු බව - දෙකම තමන් අතමය

12 (9) චූලකාල උපාසකයා ගේ කතාව (165 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසමින් **චූලකාල** නම් ගෘහස්ථ ශ්‍රාවකයකු මුල් කරගෙන මේ ගාථා ධර්මය දේශනා කර වදාළ සේක.

චූලකාල උපාසක තැන එක් පුන් පොහෝදාක අටසිල් සමාදන්ව රැය විහාරස්ථානයේ ම ගත කළේ ය. අළුයම නැගිට මුහුණ සෝදාගනු පිණිස ලිඳ ලඟට ගිය ඔහුට බලවත් අතවරයකට ලක් වන්නට සිදු විය. ඔහු මුහුණ සෝදන අතරෙහි අළුයම ගෙයකින් බඩු පැහැර ගනිමින් සිටි සොර මුලක් ගෙහිමියන් විසින් ලුහුබඳිනු ලැබිණ. එක් සොරෙක් දෙව්රම් වෙහෙර මැදින් පලා යන්නේ තම අතේ තිබුනු බඩු පොදියක් චූලකාල ඉදිරියට දමා පැන දිව්වේ පසු පස එන්නන්ගේ අවධානය වෙන'තක යවා ගැලවී ගනු පිණිස ය. සොර දිව ආ දිශාවටම දිව ආ මිනිස්සු මුහුණ සෝදන චූලකාල ලඟ නැවතී ඔහු ලඟ තිබූ බඩු ද දැක "මේ හොරා රෑ තිස්සේ ගෙවල් බිඳ දැන් රැය පන්සලේ භාවනා කළ බවක් හඟවන්නට තැත් දරයි. එයින් අප රැවටිය නො හැක. මේ තිබෙන්නේ හොර බඩුය"යි ඔහු අල්ලා ගෙන පහර දෙන්නට පටන් ගත් හ. "මම සොරකම් නො කළෙමි" යි ඔහු කෑ ගසද්දී උදෙන් ම දිය ගෙන යනු පිණිස ආ කාන්තාවෝ "මේ චූලකාල උපාසක මහතා නො වේද? මෙතුමන් සොරකම් කරන කෙනෙක් ද? මේ නම් බරපතල වැරදීමකි. ඔහුට පහර නො දෙන්නැ"යි නන් විධියෙන් පවසා ඔහු බේරා ගත් හ.

අනතුරුව භාග්‍යවතුන් වහන්සේ හමුවට ගිය චූලකාල " ස්වාමිනි, දිය ගෙන යන්නට ආ කතුන් නිසා යන්තම් පණ ගලවා ගතිමි" යි පැවසී ය. සම්පූර්ණ සිද්ධිය අසා දැනගත් භාග්‍යවතුන් වහන්සේ "උපාසකය, දිය ගෙනයන්නට ආ කතුන්ගේ වචනය පමණක් නොව ඔබ ගේ ගැලවීම සඳහා මෙතුවක් දුසිරිතයෙහි නො යෙදී ගත කළ දැහැමි ජීවිතය ද හේතු විය"යි පවසා "ඔබ මෙතෙක් කිසිදා සොරකම් කළේ නැත. කිසිදා පව්කම් ද නො කළ හෙයින් ඔබ රැකිනි. පව්කම් නො කරන අය නිරයෙහි දුක් නො විඳිති. දෙව් ලොව සැප විඳිති" යි දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (165 ගාථාව)

අත්තනා එව පාපං කතං අත්තනා එව සඞ්කිලිස්සති
අත්තනා පාපං අකතං අත්තනා එව විසුජ්ඣති සුද්ධි
අසුද්ධි පච්චත්තං අඤ්ඤෙදා අඤ්ඤදං න විසෝධයෙ

අත්තනා එව: තමා විසින් ම; **පාපං**: පව්; **කතං**: කළේ නම්; **අත්තනා එව**: තමාම; **සඞ්කිලිස්සති**: ඉන් කෙලෙසෙන්නේ ය; **අත්තනා**: තමා විසින්; **පාපං**: පව්; **අකතං**: නො කරණ ලද නම්; **අත්තනා එව**: තමා විසින් ම; **විසුජ්ඣති**: විශුද්ධියට පත් වෙයි; **සුද්ධි අසුද්ධි**: පිරිසිදු බව හා අපිරිසිදු බව; **පච්චත්තං**: තමන් විසින් කර ගන්නා දෙයකි; **අඤ්ඤෙදා**: අනෙකෙක්; **අඤ්ඤදං**: අනෙකෙකු; **න විසෝධයෙ**: පිරිසිදු නො කරන්නේ ය.

තමා කළ පාපයෙන් තමා ම කෙළෙසෙයි. තමා පව් නොකර සිටීමෙන් තමා පිරිසිදු වෙයි. පිරිසිදු බව හා අපිරිසිදු බව පෞද්ගලිකව තමා කරගන්නා දෙයකි. එක් අයකු විසින් තවත් අයකු පිරිසිදු කිරීමක් කළ නො හැක.

විවරණය

අඤ්ඤෙදා අඤ්ඤදං න විසෝධයෙ: බෞද්ධයෝ තම විශුද්ධිය හෙවත් විමුක්තිය කිසිවකු වෙතින් අපේක්ෂා නො කරති. භාග්‍යවතුන් වහන්සේ විසින් උගන්වා ඇත්තේ තම තමා ගේ වයර්ාව අනුව තමන් පිරිසිදු වන බව ය.

විසුද්ධි: යන්නෙන් සාමාන්‍යයෙන් විමුක්තිය හෙවත් නිර්වාණය අදහස් වෙයි. එහෙයින් බෞද්ධ ආගමික ප්‍රතිපදාව විසුද්ධි මග්ග වශයෙන් හැඳින් වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් රථ විනීත සූත්‍රයේ දී සප්ත විසුද්ධියක් ගැන සඳහන් කර ඇත. උපතිස්ස හිමියන් විසින් ලියන ලදුව දැනට චීන බසින් පමණක් අවශිෂ්ටව පවත්නා විමුක්ති මග්ග නම් ග්‍රන්ථය හා බුද්ධඝෝෂ හිමියන් විසින් ලියන ලදුව ථෙරවාදී ලෝකයා විසින් ආදරයෙන් පරිශීලනය කරනු ලබන විසුද්ධි මග්ගයේ ද තේමාව වී ඇත්තේ සත්ත විසුද්ධියයි. රථ විනීත සූත්‍රයෙහි දක්වා ඇත්තේ යමෙකු රථයෙන් රථයට මාරු වෙමින් දිග ගමනක් යන පරිද්දෙන් සීල විසුද්ධිය ලත් තැනැත්තා අනතුරුව චිත්ත විසුද්ධියට මාරුවෙමින් ක්‍රමානුකූලව සත්ත විසුද්ධියම ලබන බවයි. සප්ත විශුද්ධිය නම්,

1. සීල විසුද්ධි
2. චිත්ත විසුද්ධි
3. දිට්ඨි විසුද්ධි
4. කංඛා විතරණ විසුද්ධි
5. මග්ගා'මග්ග ඤාණ දස්සන විසුද්ධි
6. පටිපදාඤාණ දස්සන විසුද්ධි
7. ඤාණ දස්සන විසුද්ධි යන හතය.

මේ සත්ත විසුද්ධීන් අතුරින් සත් වැන්න වූ ඤාණ දස්සන විසුද්ධිය චතුර්විධ ඵල චිත්තයන් ගෙන් ඕනෑම එකක් ආශ්‍රිත ය. සෑම ඵල චිත්තයක් ම එකම මොහොතේ කාර්ය හතරක් ඉටු කරයි. එනම්, පරිඤ්ඤා (තේරුම් ගැනීම) පහාණ (ප්‍රහාණ කිරීම) සච්ඡිකිරියා (සාක්ෂාත් කරණය) භාවනා (ආර්ය අෂ්ටාංගික මාර්ගය වර්ධනය කිරීම) යන හතරයි.



පරවැඩ නිසා අත්වැඩ නො පිරිහෙළිය යුතු අත්වැඩ මේ මේ ය යි මනාව දැන එහි නියැලිය යුතු.

166. අත්තදත්ථං පරත්ථෙන
බහුනා'පි න හාපයෙ
අත්තදත්ථං අභිඤ්ඤාය
සදත්ථ පසුතො සියා (12:10)

වැඩියෙන් කළමුත් පර වැඩ
නො හෙළන් කිසිවිට අත් වැඩ
නිසි සේ දැන ගෙන අත් වැඩ
කළ යුතු වන්නේ හිත වැඩ

අනුන්ට හිත වැඩ කරන්න - සිය වැඩ අමතක නො වෙන්න.

12 (10) අත්තදත්ථ තෙරුන් ගේ කතා වස්තුව (166 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසමින් **අත්තදත්ථ තෙරුන්** ඇරබ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා ධර්ම දේශනා කර වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ තමන් සිවු මසකින් පිරිනිවන් පානා බව දේශනා කළ විට බොහෝ පෘථග්ජන භික්ෂූහු කළ යුතු නො කළ යුතු දේ ගැන හිතා ගන්නට බැරි තත්ත්වයට පත් වූ හ. එහෙයින් ඔවුහු කළ යුතු නො කළ යුතු දේ ගැන කතා කරති. ඇතැම් විට බුදුරදුන් සමීපයේ ම හැසිරෙති.

එහෙත් අත්තදත්ථ නම් තෙරුන් "භාග්‍යවතුන් වහන්සේ අප අතර වැඩ වසන්නේ තව මාස හතරක් නම්, අපතේ යවන්නට කාලයක් නැත්තේ ය. වහ වහා උත්සාහ කොට පෘථග්ජන භාවයෙන් මිදිය යුත්තේය" සිතා භික්ෂු සංඝයා ගේ ආශ්‍රයෙන් ඈත්ව සිට භාවනා වඩන්නේ ය. පෙර මෙන් ඒ තෙරුන් තමන් ඇසුරට නො පැමිණ නිලීනව හිඳීම ගැන නො පහන් තෙරවරු භාග්‍යවතුන් වහන්සේට ඒ බව දැන්වූහ.

භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුනම ගේ අර්ථවත් හැසිරීම ගැන කාටත් පැහැදිලි කරනු පිණිස උන් වහන්සේ සඟ මැදට කැඳවා "මහණ, ඔබ මේ දිනවල පිරිසෙන් බැහැරව එකලාව කල් ගෙවන්නේ මක්නිසාදැයි පහදන්න" යි පැවසූ හ. අත්තදත්ථ තෙරණුවෝ "ස්වාමීනි, ඔබ වහන්සේ තව මාස හතරකින් පිරිනිවන් පානා බව දැනගත් දා සිට මාගේ අධිෂ්ඨානය නම්, ඔබ වහන්සේ පිරිනිවන් පාන්නට පෙර පෘථග්ජන භූමියෙන් ඉවත් වීමට ය. එහෙයින් සඟ මැදට නො ආවෙමි"යි පැවසී ය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, මා ගරුකරන මට හිතවත් ශ්‍රාවකයෙකු විසින් කළ යුත්තේ වැඳුම් පිදුම් කිරීම නො ව, මා උගන්වා ඇති ධර්මය ක්‍රියාත්මක කිරීමයි. අන්‍යයනට වැඩ කිරීම සඳහා තමන් ගේ වැඩ අතපසු නො කළ යුතුය'' යි අත්තදත්ථ තෙරුන්ගේ පිළිවෙත වර්ණනා කර මේ ගාථාව දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (166 ගාථාව)

බහුනා අපි පරත්ථෙන අත්තදත්ථං න හාපයෙ
අත්තදත්ථං අභිඤ්ඤාය සදත්ථපසුතො සියා

බහුනා අපි: බොහෝ වූ; **පරත්ථෙන**: පරාර්ථය නිසා; **අත්තදත්ථං**: ආත්මාර්ථය; **න හාපයෙ**: නො පිරිහෙලන්නේ ය; **අත්තදත්ථං**: ආත්මාර්ථය; **අභිඤ්ඤාය**: මනාව දැන; **සදත්ථපසුතො සියා**: තම අභිවෘද්ධිය සලසා ගන්න.

පරාර්ථයෙහි වැඩි වැඩියෙන් යෙදෙමැයි තමන් ගේ වැඩ අතපසු නොකළ යුතු ය. තමාට කරගත යුතු වැඩ මැනවින් දැන තමන්ට හිත වැඩ කර ගැනීම මැනවි.

විවරණය

සදත්ථ පසුතො සියා: යන අවවාදය අතිශය වැදගත් ය. පුද්ගලයකු විසින් සාධනය කර ගත යුතු උත්තරීතර අධිගමය නම් නිර්වාණය යි. එම සදර්ථය ලබා ගැනීම පසෙක ලා පුදපූජා ආදියෙහි නිරත වීම හෝ ගණසංගණිකාව හෙවත් පිරිස් මැද කතා බහෙන් කල් යැවීම ප්‍රිය නො කළ අත්තදත්ථ තෙරහු බුදුරදුන් ගේ ප්‍රශංසාවට ලක් වූ හ.

නිර්වාණය නම් කවර විදියේ සදර්ථයක් ද? මානව සන්නිවේදනයේ ප්‍රධාන තම මාධ්‍යය වූ භාෂාව, නිර්වාණය පිළිබඳ ප්‍රමාණවත් නිර්වචනයක් ඉදිරිපත් කිරීමෙහි ලා පොහොසත් නො වේ. එහෙයින් භාෂා මාධ්‍යයෙන් නිර්වාණය විවරණය කිරීමට ගත් බොහෝ ප්‍රයත්න අසාර්ථක වී ඇත. විශේෂයෙන් බොහෝ නූතන විචාරකයන් ගේ පරස්පර විරෝධී අදහස් විවරණය දෙස බලන විට ඔවුන් ගැටළුවක් නිරාකරණය කරනවා නොව එය අවුල්ජාලයක් බවට පත් කරන බව හැඟේ. භාෂාව නිර්මාණය කර ඇත්තේ ඉන්ද්‍රියානුසාරයෙන් ලබන අනුභූතීන් ප්‍රකාශ කරනු පිණිසය.

නිර්වාණය වැනි අතීන්ද්‍රිය උත්තරීතර යමක් ගැන ප්‍රකාශ කරන්නට වචන භාෂාවෙහි නො මැත. නිර්වාණය ඉන්ද්‍රියානුසාරී අනුභූතියක් නොව ලෝකෝත්තර යථාර්ථයකි. එහෙයින් එය වාග් විෂයාතික්‍රාන්ත ය. ගොඩ බිම සංචාරයක ගොස් පැමිණි ඉදිබුවා සහ දිගටම ජලයේ වසන මත්ස්‍යයා අතර සිදු වූයේ යැයි කියන සංවාදය මීට කදිම නිදසුනකි. "ඔබ කියන්නේ ඔබ පීනුවා කියන එක නේ?" මාළුවා ඇසී ය. "නැහැ. එහේ පීනන්න බෑ. එහේ ඝණයි. ඒ ඝණ පොළොව උඩ ඇවිදින්න ඕන." ඉදිබුවා එසේ කීව ද මාළුවාට ඒ කිසිවක් තේරුම් ගන්නට බැරි විය. දියර ගතිය නැත්නම්, රැලි නැගෙන්නේ නැත්නම්, කිමිදීමට හා පිහිනීමට බැරිනම්, එබඳු තැනක් තිබෙන්නට ඉඩක් නැත. මාළුවා එසේ තීරණය කළේ තමන් සතු සංකල්ප ලෝකයෙන් එහා යමක් සිතා ගන්නට අසමත් හෙයිනි. පාලි පොත්වල දක්නා ලැබෙන නිර්වචන කිහිපයක් මෙහි දක්වමු.

"නිර්වාණය නම් තෘෂ්ණාවගේ ම නිරෝධයයි, අතහැරීමයි, එයින් මිදීම යි."

"සියළු සංස්කාර ධර්මයන් ගේ සමථය, සකල ක්ලේශයන් ගේ ප්‍රහාණය, තෘෂ්ණාව ගේ නිරෝධය විරාගය, සංසිඳීම නිර්වාණ යයි.

"මහණෙනි, අසංඛතය නම් කුමක් ද? රාගය ක්ෂය කිරීම, ද්වේෂය ක්ෂය කිරීම, මෝහය ක්ෂය කිරීම අසංඛතයයි."

"රාධ, තණ්හක්ඛය නම් නිර්වාණයයි"

"මහණෙනි, සියළුම සංඛත හා අසංඛත වස්තූන් විෂයෙහි නො ඇල්ම (විරාගය) නිර්වාණයයි."

"මානය, තෘෂ්ණාව, ආලය, යන මේ සියල්ල උදුරා දමා සංසාර ප්‍රවෘත්තිය ඡේදනය කර දමා තෘෂ්ණාව ක්ෂය කිරීම, අනාලය, සමථය නිර්වාණයයි."

"පඨවි, ආපො, තෙජො, වායො යන සතර මහා භූතයන් යම් තැනෙක ප්‍රතිෂ්ඨාවක් නො ලබත් ද, දිග-පළල, සූක්ෂම හා දළ, පුණ්‍ය හා පාප, නාම හා රූප යන මේ සියල්ල සිඳීද යේද, එලොව හා මෙලොව, යාම හා ඊම, ජීවිතය හා මරණය යන සංකල්ප නැත්ද, ඉන්ද්‍රිය ගෝචර වස්තු විද්‍යමාන නො වෙත් ද එබඳු තැනකි නිර්වාණය" නිර්වාණය තෘෂ්ණාව ක්ෂය කිරීමෙහි ප්‍රතිඵලය ලෙස සිතීම වැරදිය. නිර්වාණය කිසිවක ප්‍රතිඵලයක් නො වේ. එය ප්‍රතිඵලයක් නම්, එය පටිච්ච සමුප්පන්න ය. එහෙත් නිර්වාණය පටිච්ච සමුප්පන්න වස්තුවක් නො වේ. සත්‍යය හේතුවක් වත් ඵලයක් වත් නො වේ. එය ධ්‍යාන හෝ සමාධි මෙන් යෝගාවචරයකු විසින් උපදවා ගන්නා ආධ්‍යාත්මික තත්ත්වයක් නො වේ.

බුදු සමය අසදෘශයි

බෞද්ධ හා අබෞද්ධ කම් පිළිබඳව නොතකා මෙම ලෝකයේ
හැම සාමයික ක්‍රමයක් ම විමසා බැලුවෙමි.
බුදු හිමියන් විසින් දේශනා කරන ලද ආර්ය අෂ්ඨාංගික මාර්ගයත්,
චතුරාර්‍ය්‍ය සත්‍යයත් සතු විභූතිය සහ පෘථුල බව ඉක්මවා යන
කිසිම දහමක් මට ඒ අනික් ආගම් එකක වත් දැකිය හැකි නොවේ.
බුදු හිමියන්ගේ මාර්ගයට අනුව මගේ දිවි පෙවෙත
සකස් කොට ගැනීමෙන් මම තෘප්තිමත් වන්නෙමි.

මහාචාර්‍ය්‍ය රීස් ඩේවිස්

ලෝකය හා විශ්වය
අතෘප්තිකර ලෝකය

බුදු හිමියෝ ලෝකය හා සමග කෝප නොවූහ. ලෝකය අතෘප්තිකර ස්ථානයක් වශයෙන් උන්වහන්සේ දුටු සේක. බුදුහිමියන් ලොව දුටුවේ අනිත්‍ය ස්ථානයක් වශයෙන් මිස නපුරු ස්ථානයක් වශයෙන් නොවේ. මෝහයෙන් පිරි ස්ථානයක් වශයෙන් මිස විප්ලවකාරී ස්ථානයක් වශයෙන් නොවේ. සිය වදන් නො අසන අය ගැන බුදු හිමියෝ කලබලයට පත් නොවූහ. ඒ ගැන කෝපයට ද පත් නොවූහ.

මහාචාර්‍ය්‍ය එලියට් 'බුදුසමය හා හින්දු සමය' නම් පොතින්.

ලොක වග්ග

ලාමක දහම් (පස්කම්) ද, පමා බව ද, මිසදිටු බව ද නො සෙවිය යුතු. සසර නො වැඩිය යුතුය.

167. හීනං ධම්මං න සෙවෙය්‍ය පමාදෙන න සංවසෙ මිච්ඡාදිට්ඨිං න සෙවෙය්‍ය න සියා ලොකවද්ධනො (13:1)	පහත් වැඩ නො කරනු පමාවෙන් කල් නො යවනු මිසදිටුව නො වසනු ලෞකිකත්වය නො වඩනු

වඩනු නො යෙදේ ලෞකිකත්වය
13 (1) ලාබාල හිමිනමක ගේ පුවතක් (167 ගාථාව)

සාමණේර නමක් නිමිති කර ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කර වදාළේ දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයේ ය.

වරක් එක් තෙර නමක් තම ශිෂ්‍ය සාමණේර නමක් ද කැටුව විසාකා උවැසිය ගේ නිවසෙහි දන් පිළිගනු පිණිස වැඩම කළ හ. දානය පිළිගත් උන්වහන්සේ සාමණේර නම එහි ම නවතා කිසියම් කාර්‍යයකට පිටත්ව ගිය හ. මේ අතරතුර විසාකාව ගේ මිණිබිරියක් වූ ලාබාල දැරියක් සංඝයාට පිරිනමනු පිණිස පැන් පෙරන අතරතුර තම මුහුණෙහි පිළිබිඹුව දියෙහි දුටුවා ය. එයින් ප්‍රමෝදයට පත් දැරිය පිළිබිඹුව දෙස බලාගෙන මඳ සිනා පහළ කළා ය. සාමණේරයන් වහන්සේ ද ඒ දුටහ. උන්වහන්සේත් ඇය දෙස බලා සිනාසුණා හ. එහෙත් ඒ දුටු දැරිය නො මනාපයට පත්ව "හිස මුඩු කළ සාමණේර නමක් හිනා වෙනවා" යි තරහෙන් පැවසුවා ය. සාමණේර නම ද කෝපයට පත්ව "මම විතරද හිස මුඩු කළේ! ඔබත් ඔබත් හිස මුඩු කළා. අම්මත් හිස මුඩු කළා. තාත්තාත් හිස මුඩු කලා. ඔය ගොල්ල සේරම හිස මුඩු කරපු අය තමයි" යි පැවසී ය.

දෙදෙනාම එකිනෙකාට ඇණුම් බැණුම් කියා ගැනීම නිසා මහා අරගලයක් ඇතිවිණි. ඒ කෝලහල හඬ ඇසුණු විසාකාවෝ දිව අවුත් "මේ කවර නම් අර්බුදයක්දැ" යි ඇසූ විට දැරිය හඬා ගෙන ගොස් සිදු වූ දේ විස්තර කළා ය. ඇය සැනසූ විසාකාවෝ "ස්වාමීනි, මේ පොඩි දැරිය ගේ කතාවට ඔච්චර තරහ ගන්න එපා. කොහොමත් ඉතින් හාමුදුරුවරු හිස මුඩු කරනවනෙ. ඔබ වහන්සේලා හිස මුඩු කරලා නියපොතු කොටට කපලා කෑලි එකතු කරලා මහපු සිවුරක් ඇඳලා පිණ්ඩපාතෙන් ජීවත් වෙන අයනේ. පොඩි එකී කියාපු දේ බොරු නෙමෙයි නේ. ඇයි තරහ ගන්නේ?" යි පැවසූවා හ. "බොරු නෙමෙයි තමයි. ඒ වුණාට ඒක අල්ල ගෙන ඒ දැරිවි මට බැන්නා. එහෙම බණින්න යුක්තියක් නෑ" යි සාමණේර නම කියා සිටියේ ය. මේ මොහොතේ සාමණේර නම ගේ උපාධ්‍යාය තෙරණුවෝ එහි වැඩම කළ හ. තෙරණුවන් සාමණේර නමට අවවාද කරන්නට යාමෙන් තත්ත්වය බරපතල විය. සාමණේර නම බලවත් අමනාපයෙන් සියළු දෙනාට ම එරෙහිව සිටියේ ය. මේ අරගලය මැදට වාසනාවට මෙන් භාග්‍යවතුන් වහන්සේ සම්ප්‍රාප්ත වූ හ. සාමණේර නමට සෝවාන් වීමට පින් මෝරා ඇති බව දිවැසින් දුටු භාග්‍යවතුන් වහන්සේ ඔහු අස්වසාලනු පිණිස සාමණේර නම වෙනුවෙන් කතා කළ හ. "විසාකාවෙනි, සාමණේර නම කියන දේත් අහන්න. මේ පුංචි සාමණේර නම හිස මුඩුකර ඇති බව බොරු නොවෙයි. ඒ වුනත් ඇයි ඒකට කවුරුත් නින්දා කරන්නේ? හිස මුඩු කළේ පැවිදි වෙන්න එහෙම කරන්න අවශ්‍ය නිසා නේ. කෑලි කපා මැසූ සිවුරක් නො ඇඳ, පිඩු සිඟා වළඳන්නේ නැතිව මහණ කම් කරන්නේ කොහොම ද? ඇයි ඒකට කවුරුත් බණින්නේ?" යි වදාළ හ. ඒ ඇසූ සාමණේර නම "හරියට හරි. අපේ ලොකු හාමුදුරුවන්ට වත් විසාකා උපාසිකාවටවත් හරි වැරදි තේරෙන්නේ නැහැ. බුදු හාමුදුරුවෝ විතරයි යුක්ති - අයුක්ති දන්නේ" යි සතුටට පත්ව ප්‍රකාශ කළ හ. සාමණේර නම තමන්ට නැමුණු බව දත් භාග්‍යවතුන් වහන්සේ සාමණේර නමට ලෞකික සිනාවේ ආදීනව දක්වා ධර්ම දේශනා කරමින් මේ ගාථාව ද දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (167 ගාථාව)

හීනං ධම්මං න සෙවෙය්‍ය පමාදෙන න සංවසෙ
මිච්ඡාදිට්ඨිං න සෙවෙය්‍ය ලොකවද්ධනෝ න සියා.

හීනං ධම්මං: (නරකාදී සතර අපායෙහි උපදනා බැවින්) පඤ්ච කාමගුණ ධර්මයන්; **න සෙවෙය්‍ය**: සේවනය නො කරන්නේය; **පමාදෙන**: කුශල ධර්ම විෂයෙහි පමා බැවින් හෝ මුළා වූ සිහියෙන් යුක්තව; **න සංවසෙ**: එක්ව නොවසන්නේය; **මිච්ඡාදිට්ඨිං**: මිසදිටු; **න සෙවෙය්‍ය**: සේවනය නොකරන්න; **ලොකවද්ධනො න සියා**: චුති පටිසන්ධි වශයෙන් පංචස්කන්ධ ලෝකය වැඩීම නොකළ යුතුය.

ලාමක වූ පස්කම් ගුණය ද, පමා බැවින් කල් යැවුම ද, මිසදිටු බව ද, සේවනය කිරීමෙන් සසර වඩන්නකු නොවන්න.

විවරණය

හීනං ධම්මං: ලාමක වූ දහම් ය. පස්කම් ය.
හීනං : සසර බැඳුමට හා දුකට හේතුවන හෙයින් ද තිරිසන් ආදී සතුන් විසින් පවා සෙවිය යුතු හෙයින් ද ලාමක බවය. පස්කම් ඇස, කන, නාසය, දිව, කය යන මොවුනට ගොදුරු වූ **රාග, දෝස, මෝහ** යන මොවුන් ගේ දැඩිකම් පානා **රූප, ශබ්ද, ගන්ධ**, රස හා පහස යන පහයි. මේ පහ, පහත් ගති ඇති සතුන් විසින් පවා ඇලීම්-සෙවීම් කටයුතු හෙයින් ද පහත් ගතිවල ඉපදීම් ඇති කරන හෙයින් ද නො සෙවිය යුතු හීන දහම් වශයෙන් සලකනු ලැබේ.

මිච්ඡාදිට්ඨිං: මිථ්‍යා දෘෂ්ටි නම්, දශ විධ නාස්තික සංකල්ප ය. කවර ආගමක් අදහන්නකු වුවද එබඳු අදහස් දරන්නේ නම්, හේ මිථ්‍යා දෘෂ්ටිකයෙකි. දශ විධ මිථ්‍යා දෘෂ්ටි නම්; 1. දන් දීමේ විපාකයක් නැත, 2. ආගමික වත් පිළිවෙත් වලින් පලක් නැත, 3. ආරාධනා කර සංග්‍රහ කිරීමෙන් (හෝම) හෝ ආගමික පූජා වලින් පළක් නැත, 4. කුශලා'කුශල කර්මවල ඵල විපාක නැත, 5. මව නැත, 6. පියා නැත, 7. මෙලොව නැත, 8. පරලොව නැත, 9. ඕපපාතික සත්ත්වයෝ (-දිව්‍ය, බ්‍රහ්මාදීන්) නැත. 10. යහ මගට පිළිපන්, රහත් බව ලද උතුමන් නැත යන අදහස් ය. මිසදිටුවෝ ආර්‍ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කරනු වෙනුවට, අෂ්ටාංගික මිථ්‍යා මාර්ගය අනුගමනය කරති. (මිච්ඡා දිට්ඨි, මිච්ඡා සංකප්ප ආදී වශයෙනි.)

බුද්ධ කාලීනව සුප්‍රකට මිසදිටු ශාස්තෘවරු හය දෙනෙක් සිටියහ. එනම්;

1. **පූරණ කස්සප** (අකිරිය වාදිය හෙවත් පින් පවු නැත යන අදහස දේශනා කළේ ය.), 2. **අජිත කේස කම්බලී** (උච්ඡේද වාදය හා ලෝකායන වාදය දේශනා කළේ ය.), 3. **පකුධ කච්චායන** (අකෘත්තක වාදය හෙවත් නාස්තික වාදය), 4. **මක්ඛලී ගොසාල** (සියල්ල නියත රටාවකට සිදු වී විශුද්ධි ඉබේ ලැබෙති යන නියති සංගති භාව පරිණාම වාදය) 5. **සංජය බෙල්ලට්ඨි පුත්ත** (අමාරා වික්ඛෙප වාදය හෙවත් අනිශ්චිත වාදය), 6. **නිගණ්ඨනාථ පුත්ත** (පුබ්බේකත හේතු වාදය හා චාතුයාම සංවරය) යන හය දෙන ය.

වැරදි රහිත වැ නො පමා ව, දහම්හි මනා කොට හැසිර මෙ ලොවැ හා පරලොවැ සුව සේ වෙසෙන්න.

168. උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය
ධම්මං සුචරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති
අස්මිං ලොකෙ පරම්හි ච (13:2)

නැඟී සිටින්නේ පමා නොවන්නේ
දහමෙහි සුචරිතයෙහි හැසිරෙන්නේ
ධර්මචාරිය සුවෙන් වසන්නේ
එලෝ - මෙලෝ දෙලොවම සැනසෙන්නේ

දහම් මග යතොත් - දෙලෝ සුව ලබත්

13 (2) සුදොවුන් සිරිතින් බිඳක් (168 සහ 169 ගාථා)

කපිල වස්තුවෙහි නිග්‍රෝධාරාමයෙහි විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **සිය පියාණන්ට** මේ ගාථා යුග්මය දේශනා කළ සේක.

බුද්ධත්වයෙන් පසු ප්‍රථම වරට භාග්‍යවතුන් වහන්සේ කපිල වස්තු නගරයට වැඩම කළ අවස්ථාවෙහි බුදුරදුන්ට වැඩිමහල් ශාක්‍යයෝ අපට වඩා වයසින් බාල හෙයින් වැඳීම යෝග්‍ය නො වේ යැයි උන්වහන්සේට නො වැඳ සිටිය හ. ඔවුන් ගේ මානය මඩිනු පිණිස බුදුහු යමා මහ පෙළහර පා වදාළ හ.

තම පරපුරෙහි පහළ වූ මහා ශාස්තෘවරයාණන් ගේ විශිෂ්ඨත්වය වටහාගත් සුද්ධෝන රජතුමා ප්‍රමුඛ ශාක්‍යයෝ උන්වහන්සේට නමස්කාර කළ හ.
ඒ අවස්ථාවෙහි පොකුරු වැස්සක් ද වැස්සේ ය. පොකුරු වැස්සක් නම් තෙමෙන්නට කැමති අය පමණක් තෙමෙන, අකමැති අය නොතෙමන වැස්ස ය.

භික්ෂූන් වහන්සේලා ඒ ගැන සාකච්ඡා කරන විට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මේ මෙවැන්නක් වූ ප්‍රථම වතාව නො වේ. වෙස්සන්තර රජු දවසත් මෙසේ පොකුරු වැසි වැස්සේය"යි එම පුවත ද වදාළ හ. ධර්ම දේශනාවසානයෙහි බුදුරදුන් ගේ ඥාතීන්ට පසුදින දානය ගැන සිහිපත් නො වූයෙන් කිසිවෙක් ඇරයුමක් නො කළ හ. සුද්ධෝදන රජතුමා සිතූයේ මා ගේ පුත්‍රයා අනිවාර්යයෙන් ම දිවා ආහාරය මගේ මාලිගයෙන් ම ලබනු ඇත කියා ය. එහෙයින් ඇරයුමක් නො වී ය.

පසුදින දිවා භෝජන සමය උදාවත් ම භාග්‍යවතුන් වහන්සේ "පෙර බුදුවරුන් ගේ සිරිත වූයේ තම පියාණන් ගේ මාලිගයට අනාරාධිතව වුවත් යාම ද? නැතහොත් පිඬු සිඟා දන් වැළඳීමද?" යි ආවර්ජනය කොට පෙර සිරිත පරිදි ගෙපිළිවෙළින් පිඬු සිඟා වැඩි සේක.

මේ දුටු රාජ පුරුෂයෝ ඒ බව රජතුමාට දැනුම් දුන් හ. තම පුත්‍රයා ආහාර පිණිස ගෙයක් ගානේ සිඟා යාම නිග්‍රහයක් යැයි සිතූ රජ තෙම ඇඳි වත ද එකතකින් ගෙන වහා වීදියට දිව අවුත් "මා ගේ පුත්‍රය, අපගේ ශාක්‍ය වංශයේ කිසිවෙක් සිඟා නො කෑහ. මට මෙසේ නින්දා කරන්නේ මන්ද?" යි විමසී ය.

"මහරජ, ඒ ඔබ ගේ වංශයේ චාරිත්‍රය විය හැක. එහෙත් මා ගේ වංශය වූ බුද්ධ වංශයේ කවුරුත් පිඬු සිඟා ගෙනම වළඳති" යි වදාරා මේ ගාථා දෙකද වදාළ හ.

විවරණාත්මක අනුවාදය (168 ගාථාව)

උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරේ
ධම්මචාරී අස්මිං ලොකෙ පරම්හිච සුඛං සේති.

උත්තිට්ඨෙ: පිබිදෙන්න, **නප්පමජ්ජෙය්‍ය**: ප්‍රමාද නො වන්න, **ධම්මං**: ධර්මයෙහි. **සුචරිතං**: සුසිරිතෙහි, **චරෙ**: හැසිරෙන්න, **ධම්මචාරී**: ධර්මයෙහි හැසිරෙන්නා, **අස්මිං ලොකෙ**: මේ ලෝකයෙහි ද, **පරම්හි ච**: පරලෝකයෙහි ද, **සුඛං සේති**: සුවසේ වසයි.

පිබිදෙන්න (අලස නොව නැඟී සිටින්න). පමා නොවන්න. ධර්මයෙහි හා සදාචාරයෙහි හැසිරෙන්න. ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා මෙලොව මෙන්ම පරලොව ද සුවසේ වසයි.

දහම් හි හැසිර දුසිරිතින් වැළක මෙ ලෝ පර ලෝ දෙ ලොවැ මැ සුව සේ වෙසෙන්න.

169. ධම්මං චරෙ සුචරිතං
න නං දුච්චරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති
අස්මිං ලොකෙ පරම්හි ච (13:3)

හැසිරිය යුතු වෙයි දහමෙහි මැනවින්
නොමඟට නො වැටී අන් කිසි ලෙසකින්
දහමෙ යෙදන්නා සැනසෙයි සුවයෙන්
එලෝ මෙලෝ දෙලොවම සැනසිල්ලෙන්

හැසිරෙන් දහමින් - වදහළ විලසින්
13 (2) සුදොවුන් සිරිතින් බිඳක් (168 සහ 169 ගාථා)

විවරණාත්මක අනුවාදය (169 ගාථාව)

ධම්මං සුචරිතං චරෙ නං දුච්චරිතං න චරෙ ධම්මචාරී අස්මිං ලොකෙ පරම්හි ච සුඛං සෙති.

ධම්මං: පිඩු සිඟීම නම් වූ ධර්‍මයෙහි; **සුචරිතං**: මනාව ලෙස; **චරෙ**: හැසිරෙන්න; **නං**: එහි; **දුච්චරිතං න චරෙ**: (අගෝචර ස්ථානයන්හි හැසිරීමෙන්) නොසුදුසු ලෙස නොකරන්නේය.; **ධම්මචාරී**: පිඩු සිඟන මහණ තෙමේ ධර්‍මයෙහි හැසිරෙන්නා; **අස්මිං ලොකෙ**: මෙලොව ද; **පරම්හි ච**: පරලොව ද; **සුඛං**: සුවසේ; **සෙති**: වාසය කරයි.

ධර්මයෙහි ඉතා නිරවද්‍යලෙස හැසිරෙන්න. එහි සාවද්‍යලෙස නො යෙදෙන්න. ධර්මානුකූලව හැසිරෙන තැනැත්තා මෙලොව හා පරලොව ද සුවපත්ව වාසය කරයි.

විවරණ

සුද්ධෝදන රජතුමා: බුදුරදුන් සම්මා සම්බුදු පදවි ලබා මගධ රාජධානියෙහි සදහම් පතුරුවමින් වැඩ වෙසෙන බව ඇසූ දා පටන් තම බුදු පුතුන් දැක ගැනීමේ අභිලාෂය සුද්ධෝදන රජතුමා ගේ සිත් තුළ බලවත් ව නැඟිණි. බුදුරදුන් කපිල වස්තුවට වැඩම කරවා ගෙන එන්නැයි නව වරක් ම දූතයන් යැව්ව ද ඒ හැම වෑයමක් ම නිසරු වූයේ ධර්‍මශ්‍රවණය කොට රහත් වූ දූතයන් පැවිදිව තමන්ට පැවරුණු මෙහෙවර අමතක කිරීම නිසා ය. අවසානයේ දී සිදුහත් කුමරුන් හා වැලි කෙළියේ පටන් ම මිතුරුව සිටි කාළුදායි තම මෙහෙවර ඉටු කළේ ය. කාළුදායි පැවිදිව රහත් වූ නමුත් තම යුතුකම අමතක නො කළේ ය.

මේ ගාථාවන් දේශනා කළ අවස්ථාවේ සුද්ධෝදන රජතුමා මහ වීදිය මැදම සෝවාන් ඵලයෙහි පිහිටියේ ය. අනතුරුව බුදුරජාණන් වහන්සේ ගෙන් පාත්‍රය ඉල්ලා ගත් රජතෙම උන්වහන්සේ හා ශ්‍රාවක පිරිස මාළිග යට කැඳවාගෙන ගොස් ප්‍රණීත දාන වස්තුවෙන් උවටැන් කළේ ය. දන් වළඳා අවසානයේ කළ භුක්තානුමෝදනාවෙන් රජතෙම සකෘදාගාමී ඵලයෙහි පිහිටියේ ය. ප්‍රජාපතී ගෝතමිය සෝවාන් වූවා ය. පසු වතාවක බුදුරජාණන් වහන්සේට රජතුමා ගැන තවත් පුවතක් දැනග න්නට ලැබිණ. එනම්, දුෂ්කර ක්‍රියා කරන සමයෙහි තමන් මිය ගිය බව රජතුමාට වාර්තා කරනු ලැබූ අවස්ථාවේදී එය නො ඇදහූ රජතුමා මගේ පුත්‍රයා බුදු වී මිස මිය නො යනු ඇතැයි පැවසූ බවයි.
ඒ නිමිතිකොට භාග්‍යවතුන් වහන්සේ ධම්මපාල ජාතකය දේශනා කළහ. ඒ දෙසුම අසා රජතුමා අනාගාමී වූයේ ය.

සුද්ධෝදන රජතුමා මහළු වියට පත්ව මරණාසන්නව වෙසෙතැයි සැල වූ අවස්ථාවේ ද භාග්‍යවතුන් වහන්සේ එතුමන් දකින්නට වැඩම කළ හ. ඒ අවස්ථාවෙහි කළ දෙසුමෙන් රජතෙම අර්හත් ඵලය ලබා ගත්තේ ය. දින හතක් විමුක්ති සුව විඳි රජතෙම සත්වන දින ගෘහස්ථ රහතන් වහන්සේ නමක් ලෙස පිරිනිවන් පෑවේ ය. එවකට භාග්‍යවතුන් වහන්සේ ගේ වයස හතළිහක් විය. තම පුත් සිදුහත් කුමරුන් කෙරේ සුදොවුන් රජතුමා තුළ වූයේ අප්‍රමාණ ස්නේහයකි. සියළු යස ඉසුරෙන් ඔහු සනහා තමන් වෙතම රඳවා ගන්නට වෑයම් කළේ එහෙයිනි. සිදුහත් කුමරුන් සතර පෙර නිමිති දකින්නට මත්තෙන් රජතුමා සිහින හතක් දුටු බව ඇතැම් සම්ප්‍රදායවල එයි. ඒවා මෙසේ ය.

1. ශක්‍රයා ගේ ධජය වැනි ධජයක් රැගත් මහ සෙනඟ එය කපිලවස්තුව පුරා ගෙන ගොස් නුවර නැගෙනහිර වාසලෙන් නික්මී ගිය හ.

2. මංගල හස්තීන් විසින් අදිනු ලැබූ රථයක නැඟුණු සිදුහත් කුමර තෙම නුවර දකුණු වාසලින් පිටත්ව ගියේ ය.

3. අසුන් හතර දෙනකු යෙදූ අති විභූෂිත රථයක නැඟුණු කුමර තෙම නගරයෙහි බටහිර වාසලින් නික්මිණි.

4. අති විචිත්‍ර වූ මාණික්‍යමය චක්‍රයක් ගුවනෙහි පාවී උතුරු වාසලින් පිටව ගියේ ය.

5. කුමාරයා කපිලවස්තු නගරයෙහි සිව්මංසලක හිඳ රාජ යෂ්ටියෙන් යෝධ බෙරයක් වාදනය කළේ ය.

6. කපිලවස්තු නගර මධ්‍යයේ යෝධ කුළුණක් මත නැඟුණු කුමාරයා ගුවන් කුස සිව් දෙසට සෑම වගීයේම අගනා මිණි මුතු විසුරුවා හළේ ය. නන් දෙසින් පැමිණි සත්ත්වයෝ ඒවා එක්රැස්කර ගත් හ.

7. කපිලවස්තුවෙන් බැහැර නුදුරු තැනක මිනිස්සු හය දෙනෙක් මහ හඬින් හඬා වැලපෙමින් සිය දෑතින් ගිය කෙස් උගුළුවා අහුරු පිටින් පොළොව මත දැමූ හ.

රජතුමා ගේ සුපුරුදු ස්වප්න විමර්ශක බ්‍රාහ්මණයෝ මේ සිහින තෝරන්නට අසමත් වූ හ. ආගන්තුක බමුණකු ලෙස වෙස් වලාගෙන පැමිණි දේවතාවෙක් සිහින තෝරා දෙන්නට ඉදිරිපත් විය. ඔහු සිහින තෝරා දුන්නේ මෙසේ ය.

1. ඉතා ලඟදීම කුමාරයා ගිහිගෙයින් නික්ම යනු ඇත. දෙව් බඹුන් විසින් පිරිවරනු ලැබ නුවරින් බැහැර ගොස් තවුසකු බවට පත් වන්නේ ය.

2. අබිනික්මණින් නො බෝ දිනකින්ම දශබලධාරීව සම්මා සම්බුදු පදවි ලබනු ඇත.

3. සම්බුදු පදවි ලබත් ම එතුමන් චතුර්වෛශාරදාඟදාන ලබා ගනු ඇත.

4. දෙව් මිනිසුන් ගේ යහපත පිණිස උන්වහන්සේ ධර්‍ම චක්‍රය ප්‍රවර්තනය කරති.

5. බුදු බව ලබා ධර්‍මචක්‍ර ප්‍රවර්තනය කළ විට එම රාවය අකනිටා බඹලොව දක්වා පැතිරෙනු ඇත.

6. බුද්ධත්වය ලැබීමෙන් පසු උන්වහන්සේ අට වගෙහිම සත්වයන් ගේ ම යහපත පිණිස සදහම් මිණි මුතු විසුරුවා හරිනු ඇති.

7. බුදු වී ධර්‍ම දේශනා කරන්නට පටන් ගත් විට එතෙක් නම් දරා සිටි ෂඩ් ශාස්තෘවරු පරිහානියට පත්ව ඛේදනීය තත්වයට ඇද වැටෙනු ඇත.

ලොව (-අත්බව) දිය බුබුලක් සේ මිරිඟුවක් සේ දක්නා තැනැත්තා මරණින් මිදෙන්නේ ය.

170. යථා බුබ්බුලකං පස්සේ
යථා පස්සේ මරීචිකං
ඒවං ලොකං අවෙක්ඛන්තං
මච්චුරාජා න පස්සති. (13:4)

දිය බුබුලක් සේ සිතන්න
මිරිඟුව විලසින් බලන්න
බලමින් ලොව දෙස එලෙසින්
මරුහට නොපෙනී හිඳින්න.

ජීවිතයක රඟ සොබාව - නිතර වෙනස් වන නියාව

13 (3) පන්සිය නමක් රහත් වූ වත (170 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ තමන් වෙත පැමිණි **පන්සියයක් මහණුන්** අරබයා මේ ගාථාව දේශනා කර වදාළ හ.

වරක් භික්ෂූන් වහන්සේ පන්සිය නමක් තථාගතයන් වහන්සේ වෙතින් කමටහන් ලබා ගෙන භාවනා කිරීම පිණිස වනගත වූ හ. එහෙත් අධිගමයක් ලබා ගන්නට අසමත් වූ උන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ බැහැ දකින්නට ආපසු එමින් සිටිය හ. බුදුරදුන් වෙතින් වඩා ප්‍රයෝජනවත් නව කර්මස්ථානයක් ලබා ගැනීම උන්වහන්සේලා ගේ අරමුණ විය. එන අතරමග මිරිඟුව දුටු උන්වහන්සේලා එහි මායාව ගැන සිතමින් පැමිණිය හ.

මේ භික්ෂූන් වහන්සේලා එන අතරමග මහ වැස්සක් වැස්සේ ය. ඔවුන් තෙමී ගෙන විහාර භූමියට පිවිසෙන විට වතුර පිරී ඒ මත දිය බුබුළු පිපෙමින් ගලන අයුරු දක්නට හැකි විය. දිය බුබුළු නැගෙමින් පිපිරෙන ඉක්මන බලත්ම අනිත්‍යත්වය පිළිබඳ හැඟුමක් උන්වහන්සේලාට ඇතිවිණි. "හැම දෙයක ම ස්වභාවය මෙය නො වේ ද? අපේ ශරීරයත් මෙසේ දිය බුබුලක් මෙන් බිඳී යනු ඇත." ඔවුන් එසේ සිතත් ම බුදුහු ගඳ කිළියේ සිට රශ්මි ධාරාවක් එවා තමන් වහන්සේ ඔවුන් අබියස සිටින්නාක් මෙන් දක්වා මේ ගාථාව වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (170 ගාථාව)

බුබ්බුලකං යථා පස්සේ මරීචිකං යථා පස්සේ එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති.

බුබ්බුලකං: දිය බුබුලක්; **යථා**: යම් ස්වභාවය ඇත්තේ ද; **පස්සේ**: එසේ (ලෝකය දෙස) බලන්න; **මරීචිකං**: මිරිඟුවක්; **යථා**: යම් ආකාරය ද; **පස්සේ**: එසේ (ලොව දෙස) බලන්න; **එවං**: මෙසේ; **ලොකං**: ලෝකය; **අවෙක්ඛන්තං**: (නුවණැසින්) බලන්නහු; **මච්චුරාජා**: මාරයා; **න පස්සති**: නො දකියි.

ලෝකය දිය බුබුලක් ලෙස ද මිරිඟුවක් ලෙස ද බලන්නට හැකි නම්, මරුගෙන් බේරෙන්නට හැකි වෙයි.

විවරණය

ලෝකං: ලෝකය ත්‍රිවිධ ය. කාමලෝකය, රූප ලෝකය හා අරූප ලෝකය වශයෙනි. රූප හා අරූප ලෝක වනාහි ධ්‍යාන වලට ගෝචර වන්නා වූ බ්‍රහ්ම ලෝක වෙති. කාම ලෝකයට නරකාදිය, තිරිසන් යෝනිය, අසුර නිකාය හා මනුෂ්‍ය ලෝකය ඇතුළත් ය.

බුබ්බුලකං මරීචිකං: දිය බුබුල හා මිරිඟුව ලෝක ස්වභාවයට උපමා කොට දක්වන්නේ නැසී යන ස්වභාවන් හෙවත් අනිත්‍යතාව පැහැදිලි කරන අටියෙනි. මෙම නිදර්ශනා අනිත්‍යය පිළිබඳ භාවනාමය අරමුණකට වැටෙන්නට කර්මස්ථාන වූ බව කථාවෙන් දැක්වෙයි.

වෙනත් තැනක වේදනාව දිය බුබුලකට ද සංඥාව මිරිඟුවකට ද උපමා කර ඇත. ඒවා චිත්ත සංඛාර වෙති. විතක්කය වචී සංඛාරයකි. ලෝකය මෙබඳු තාවකාලික සංස්කාර වලින් නිර්මිතය. ලොව මිරිඟුවක්, දිය බුබුලක් සේ සැලකිය යුත්තේ එබැවිනි. මෙසේ ලොව නිසරු සේ දැකීමෙන් ඇළුම් බැඳුම් සිඳී යයි.



අත්බැව්හි අනුවණයෝ ගැලෙත්, අත්බැව්හි තතු දන්න නැණවතුනට (එහි) ඇල්මෙක් නැත.

171. එථ පස්සථි'මං ලෝකං
චිත්තං රාජරථූපමං
යත්ථ බාලා විසීදන්ති
නත්ථි සඞ්ගො විජානතං (13:5)

එන්න බලන්න - ලෝකයේ රඟ
රාජ රථයක් වගෙයි විසිතුරු
මෝඩයෝ නම් ලගිති සුවසේ
නුවණ ඇති අය - නැත ඇලෙන්නේ.

ගත නො ඇලෙන - හික්මුණු දන

13 (4) අභය රාජ කුමාර වස්තුව (171 ගාථාව)

වේළුවනාරාමයෙහි වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **අභය රාජ කුමාරයා** අරමුණු කොට මේ ගාථාව වදාළ සේක.

අභය රාජ කුමාරයාට පියා වූ බිම්බිසාර රජතුමා විසින් ප්‍රාන්තයෙක ඇති වූ කැරැල්ලක් මැඩ පවත්වන්නට බාර දෙන ලදී. හේ එය ඉතා සාර්ථකව නිමකොට පැමිණියේ ය. ප්‍රීතියට පත් පිය රජ්ජුරුවෝ ඔහුට සත් දිනක් රාජ්‍ය ශ්‍රී විඳින්නට අවකාශ දී නැටුම් ගැයුම් වැයුම් දත් රූමතියක් ද සමඟ මාලිගය බාර දුන් හ.

අභය රාජ කුමාරයා ද මේ සත් දින මාලිගයෙන් බැහැර නො අවුත් මහත් ප්‍රීතියෙන් ගත කළේ ය. අටවන දින රූමතිය ද කැටුව ගඟෙහි නාන්නට ගිය හෙතෙම එහි දී ද ඇය ගේ නැටුමක් බලමින් ප්‍රීතිවෙමින් සිටියේ ය. එහෙත් අවාසනාවට සන්තති ඇමතියාට වූවාක් මෙන්ම එතුමාට ද මුහුණ පාන්නට වූයේ ඛේදජනක අත්දැකීමකටය.
නිළිය හිටි හැටියේම මැරී වැටුණාය. බලවත් සංවේගයට පත් අභයරාජ කුමාර තෙම මගේ සංවේගය නිවන්නට භාග්‍යවතුන් වහන්සේ තරම් සමර්ථ කෙනෙක් තවත් නැතැයි සිතමින් උන්වහන්සේ හමුවට ගියේ ය.

"ස්වාමීනි, මා හද ඇවුළුණු සෝ ගින්න සංසිඳවාලුව මැනවි" යි බුදුරදුන් පා මුල ඇද වැටුණු අභය රාජ කුමරුන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "කුමරුනි, මේ එකම නාටිකාංගනාව මළ ශෝකයෙන් ඔබ සසරෙහි හෙළූ කඳුලු මැන නිම කළ නො හැකි තරම්" යි වදාරා "දුක් නොවන්න. තමන් ශෝක සයුරේ ගිලෙන්නට ඉඩ හරින්නේ නුවණ නැති බාලජනයන් පමණි" යි අනුශාසනා කළ සේක. මේ ගාථාව මුල් කර ගෙන භාග්‍යවතුන් වහන්සේ කළ ධර්මදේශනයෙන් කුමාරයා සෝවාන් විය.

විවරණාත්මක අනුවාදය (171 ගාථාව)

යත්ථ බාලා විසීදන්ති, විජානතං සඞ්ගො නත්ථි, චිත්තං රාජරථූපමං ඉමං ලෝකං එථ පස්සථ

යත්ථ: යම් ආත්මභාවයක; **බාලා**: අඥාන පුද්ගලයෝ; **විසීදන්ති**:(තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) ගැලෙත් ද; **විජානතං**: යථාර්ථය දන්නවුන්ට; **සඞ්ගො**: (යම් ආත්මභාවයෙක්හි රාගාදී) ඇලීමක්; **නත්ථි**: නැත් ද; (එම), **චිත්තං රාජරථූපමං**: විසිතුරුව සැරසූ රාජකීය රථයක් බඳු වූ; **ඉමං ලෝකං**: මේ පංචස්කන්ධ ලෝකය; **එථ**: එන්න; **පස්සථ**: බලන්න.

මේ ලෝකය දෙස ඇවිත් බලන්න. මෙය රාජ රථයක් ලෙස විසිතුරුව දිස්වන හෙයින් බාල ජනයෝ එහි ඇලී ගැලී වැනසෙති. එහෙත් නැණවත්හු එහි කිසිම ඇල්මක් නො කරති.

විවරණය

විජානතං: ලෝක තත්ත්වය යථාර්ථ වශයෙන් අවබෝධ කර ගත් උතුමෝ විජානීන්,තතු දන්නවුන්, නුවණැත්තන් වශයෙන් මෙහි දැක්වෙති. බුදු දහම ලෝකත්වය පිළිබඳ යථාර්ථ විවරණයකි.

අනිත්‍යය, දුක හා අනාත්මය වශයෙන් ප්‍රකට වන ලෝක තත්ව විචාරයෙහි පාදක සිද්ධාන්තය පටිච්ච සමුප්පාදයයි. ලෝක තත්ත්වය නිරවද්‍ය පරිදි දැන ගැනීම නම් මේ පටිච්ච සමුප්පාදය යථාර්ථ වශයෙන් දැන ගැනීමයි.

"**උප්පාදවා තථාගතානං, අනුප්පාදවා තථාගතානං, ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා, ධම්ම නියාමතා යදිදං පටිච්ච සමුප්පාදො**"යි දක්වා ඇත්තේ එය බුදුවරුන් ලොව පහළ වුවත් නැතත් ලොව සදහටම පවත්නා යථා තත්ත්වය බව පැහැදිලි කරනු පිණිස ය.

එය බුදුවරු සොයා ගනිති. අනතුරුව ශ්‍රාවකයනට දේශනා කරති. තවත් සූත්‍රයක "තථාගතයන් වහන්සේලා ලොව පහළ වුවත් නැතත් ලොව සියල්ල අනිත්‍යය, දුකය, අනාත්මය. එය තථාගතයන් වහන්සේ තේරුම් ගෙන දේශනා කරති" යි දක්වා තිබේ.

මෙම ධර්මය අවබෝධ කරගන්නා බුදු, පසේ බුදු, මහ රහත් උතුමෝ මෙහි විජානතං යන්නෙන් ගැනෙති. එබඳු උත්තමයෝ ලෝකය රාජ රථයක් මෙන් විසිතුරු කොට සරසා තිබෙන නමුත් මුලා නො වෙති.

පමා බව දුරලා නො පමා වන තැනැත්තා වළාකුලින් මිදුණු පුරසඳ මෙන් ලොව බබුලුව යි.

172. යො ච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තෝ ච චන්දිමා (13:6)	කල් යැවූ මුත් පෙර පමාවෙන් සිටී නම් දැන් අප්පමාදෙන් බබලවයි නේ අපේ ලෝකය වළා ගැබකින් මිදුණු සඳ මෙන්.

දන නුවණ ඇති - ලොව බබුලුවති

13 (5) සම්මුඤ්ජනී තෙරුන් ගේ වත (172 ගාථාව)

ජේතවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **සම්මුඤ්ජනී තෙරුන් වහන්සේ** අරබයා මේ ගාථාව දේශනා කර වදාළ සේක.

සම්මුඤ්ජනී තෙරුන් වහන්සේ ගේ මුළු කාලය ම ගත වූයේ විහාරස්ථානය අතුපතු ගෑමට ය. මෙ සමයෙහි රේවත නම් තෙරුන් වහන්සේ ද එම විහාරස්ථානයේ ම කල් ගත කළ හ. එහෙත් උන් වහන්සේ සම්මුඤ්ජනී තෙරුන් මෙන් නොව භාවනාවෙන් ම කල් යවති.

රේවත තෙරුන් ධ්‍යාන සුවයෙන් කල් යවන අයුරු දක්නා සම්මුඤ්ජනී තෙරුණුවෝ එය උන්වහන්සේ ගේ අලසකම යැයි සිතූ හ. නිකරුණේ කල් යවතැයි වරදවා ගත් හ. එහෙයින් රේවත තෙරුන් කරා ගිය උන්වහන්සේ " ඔබවහන්සේ නම් අලසයෙකි. දායකයන් සැදැහැයෙන් දෙන දේ අනුභව කර එසේ අලසව සිටීම සුදුසු නැත. කාලය නාස්ති කරනවා වෙනුවට මුස්නක් ගෙන මිදුල ටිකක් අතු පතු ගානවා නම් කොච්චර හොඳ ද?" යි ප්‍රශ්න කළ හ.

රේවත හිමියන් ගේ පිළිතුර වූයේ "ආයුෂ්මතුනි, භික්‍ෂු නමක් මුළු දවස ම අතුපතු ගෑමට ම කාලය වෙන් කිරීම නුසුදුසුයි. උදෑසන අතුපතු ගා, වළඳා, භාවනා වඩා, රෑ වීමට පෙරත්, අතුපතු ගා රෑ කල යළිත් භාවනා වඩා මඟ-ඵල පසක් කිරීමට වෙර වැඩුම මැනවි"යි අවවාද කළේය. ඒ අවවාදය හොඳින් හිතට ගත් සම්මුඤ්ජනී තෙරුණුවෝ අකුරටම එය පිළිපැද නොබෝ දිනකින් ම රහත් නමක් බවට පත් වූ හ.

වෙනදා මෙන් දවල් කාලයේ කුණු රොඩු ස්වල්පයක් මිදුලේ එක් වෙත් දීත් සම්මුඤ්ජනී තෙරුන් ඉදල රැගෙන අතුගාන්නට නො පැමිණෙන බව දැන "ආයුෂ්මතුන් දවස තිස්සේ ම අතුගාන්නේ නැත්තේ ඇයි?" යනුවෙන් ප්‍රශ්න කළ හ. "නො පමාවෙන් වෙසෙමි. සුදුසු වේලෙහි හැමදීම් කරමි." උන්වහන්සේ පිළිතුරු දුන් හ.

ඒ පිළිතුර ඇසූ තෙරවරු විමතියට පත්ව භාග්‍යවතුන් වහන්සේ බැහැ දැක. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, සම්මුඤ්ජනී තෙරුණුවෝ තමා රහත් වූ බවක් අපට හඟවන්නට තැත් දරති. ඔහු කියන්නේ මුසාවක් විය යුතුය" යි දැන් වූ හ. "නැත මහණෙනි, ඔහු ඇත්තට ම රහත් ඵලය ලබා ඇත. ඔහු කියන්නේ සැබෑවකි'' යි වදාළ බුදුහු මේ ගාථාව දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (172 ගාථාව)

යො පුබ්බෙ පමජ්ජිත්වා ච සො පච්ඡා නප්පමජ්ජති සො අබ්භාමුත්තො චන්දිමා ඉව ඉමං ලොකං පභාසෙති.

යො: යමෙක්; **පුබ්බෙ**: පෙර; **පමජ්ජිත්වා ච**: පමා වූයේ නමුදු; **සො**: හෙතෙම; **පච්ඡා**: පසුව; **නප්පමජ්ජති**: පමා නොවන්නේ ද; **සො**: හෙතෙම; **අබ්භාමුත්තො**: වළා ගැබින් මිදුනා වූ; **චන්දිමා ඉව**: චන්ද්‍රයා මෙන්; **ඉමං ලොකං**: මේ ලෝකය; **පභාසෙති**: ප්‍රභාස්වර කරයි.

යම් කිසි තැනැත්තෙක් මුල් කාලයේ උත්සාහ නො කර කාලය අපතේ යැවූ නමුත් පසුව බණ භාවනා මඟට වැටී අප්‍රමාදව කටයුතු කරන්නේ නම් වළා ගැබින් වැසී තිබුණු චන්ද්‍රයා පසුව ඉන් මිදී ආලෝකය විහිදුවන්නාක් මෙන් මේ ලෝකය ප්‍රභාස්වර කරයි.

විවරණය

අබ්භාමුත්තොව චන්දිමා: වළා ගැබින් වැසුණු මුත් සඳ නැවත ඉන් මිදී ලොව ආලෝකවත් කරනු ඇත. සමහර පුද්ගලයෝ ද එසේ කලක් කුසල් දහම් වැඩීමෙන් තොරව වසන්නා හ. එහෙත් පසුව ඔවුහු දැඩි සේ වීර්‍ය්‍ය වඩා ඉක්මනින් ප්‍රතිඵල ලබා ගනිති.

මිනිස් සිත වළා ගැබින් මිදීම ක්‍රමානුකූලව සිදුවන්නකි. ධ්‍යාන මගින් තාවකාලිකව කෙළෙස් යටපත් වෙයි. සිත කෙළෙසුන්ගෙන් මිදුනු විට එය ප්‍රභාස්වර වන්නේ සියල්ල මනාව පිළිබිඹුවන කැඩපතක් මෙනි.

බෞද්ධ ශික්‍ෂා මාර්ගය ක්‍රමික වූවකි. සීලය මගින් කය සහ වචනය හික්මවනු ලැබේ. සමාධිය චිත්තේකාග්‍රතාව ඇති කරයි. එහෙත් පූර්ණ විශුද්ධිය උදාවන්නේ ප්‍රඥාව මගිනි. එමගින් දෘෂ්ටිය පිරිසිදු වෙයි. සංසුන් සිතින් හා පිවිතුරු දැක්මෙන් යුක්තව ධර්මයන් විශ්ලේෂණය කර බැලීම මගින් ආත්ම දෘෂ්ටිය ප්‍රහාණය වෙයි. ත්‍රි ලක්‍ෂණය අවබෝධ වෙයි. ජීවිතය වූ කලී අච්ඡින්න ප්‍රවාහයක් වශයෙන් දිස්වන පටිච්ච සමුප්පන්න - සිද්ධි දාමයක් බව වැටහෙයි.

පවුකම් කුසල බලයෙන් වසාලන තැනැත්තා පුන් සඳ සේ මෙ ලොව බබුළුව යි.

173. යස්ස පාපං කතං කම්මං
කුසලෙන පිථීයති
සො ඉමං ලොකං පභාසෙති
අබ්භා මුත්තොව චන්දිමා (13:7)

යම් කෙනකු කළ පාප කර්මය
කුසල කර්මෙන් වැසී යානම්
බබුලුවයි හේ අපේ ලෝකය
වළා ගැබකින් මිදුණු සඳ මෙන්.

පාපය නසී - කුසලින් වැසී

13 (6) අංගුලිමාල තෙරුන් ගේ වත (173 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි **අංගුලිමාල තෙරුන්** ඇරබ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

අංගුලිමාල පසේනදී කොසොල් මහරජ තුමාගේ පුරෝහිත බ්‍රාහ්මණයා ගේ පුත්‍රයා ය. ඔහු ගේ මුල් නම වූයේ අහිංසක ය. නිසි වයසට පැමිනි කළ ඔහු තක්ෂිලාවේ ඉගෙනුම පිණිස යවන ලදී. බුද්ධිමත් ශිෂ්‍යයකු වූ අහිංසක විනීතව කීකරුව සිප් හදාළේ ය. එහෙයින් හේ ගුරුතුමා ගේ ද එතුමා ගේ බිරිඳ ගේ ද සිත් දිනා ගත්තේ ය. එහෙත් එහි ප්‍රතිඵලය වූයේ අන්‍යයන් ගේ අසතුටට ඔහු ලක් වීම ය. එහෙයින් ඔවුහු අහිංසක ගුරුතුමා ගේ බිරිඳ සමග රහස් සබඳතාවක් පවත්වතැයි ඔවුහු බොරු කේලාම් කී හ. මුලදී ගුරුතුමා එය විශ්වාස නොකළ ද දිගින් දිගටම කේලාම් බස් කීම හේතුවෙන් අන්තිමේ එය විශ්වාස කරන්නට පටන් ගත්තේ ය. තම ශිෂ්‍යයා විනාශ කළ යුතු යැයි සිතා ගත් දිසාපාමොක් ආචාරීහු ඒ සඳහා උපක්‍රමයක් කල්පනා කරමින් සිටිය හ. ශිෂ්‍යයා මැරුවුවහොත් එය ගුරුතුමා ගේ අපකීර්තියට හේතු විය හැක. එහෙයින් ඊට වඩා සූක්ෂ්ම ක්‍රමයක් කල්පනා කළ හේ අනුන් ලවා ඔහු මරවනු පිණිස අමුතුම විදියේ ගුරු පඬුරක් ඉල්ලා සිටියේ ය. "මිනිසුන් (හෝ ගැහැණුන්) දහසක් මරා දමන්නේ නම්, සියළු ගුරු මුෂ්ටි දෙන බවට හේ පොරොන්දු විය. අගනා ධනයක් වූ ශිල්ප කෙරේ සිත යොමු කළ අහිංසක, තම ගුරුවරයා ගේ වචනය ඉටු කරන්නට තීරණය කළේ ය. එහෙයින් මිනී මරන්නට පටන් ගත් අහිංසක ගණන් මතක තබා ගනු වස් ඔවුන් ගේ මහපටඇඟිල්ලක් කපා මාලයක අමුණා ගෙල ලන්නට පටන් ගත්තේ ය. ඇඟිලි මාලයක් තනන හෙයින් අංගුලිමාල යැයි ප්‍රසිද්ධ වූ ඔහු ගේ මිනීමරු ක්‍රියා නිසා මුළු ප්‍රදේශයම බියෙන් ඇලලී ගියේ ය. ඔහු ගේ දරුණු අපරාධ ගැන ඇසූ රජතුමා අංගුලිමාල අල්ලා මරා දමන්නට අණ දුන්නේ ය. තම පුතා මරා දමන්නට රජතුමා සූදානම් වන බව ඇසූ අංගුලිමාල ගේ මව වූ මන්තානි, පුතා බේරාගනු පිණිස වනයට යාමට පිටත් විය. මේ වන විට අංගුලිමාලට අඩුව පැවතියේ එකම ඇඟිල්ලක් පමණි. ඔහු එය තම මව මරා පුරවා ගනු නියත විය. කෙසේ හෝ එදින භාග්‍යවතුන් වහන්සේ ගේ කරුණා දැලට අංගුලිමාල හසු විය. ඔහුට පිහිට වෙමැයි සිතූ භාග්‍යවතුන් වහන්සේ අංගුලිමාල සැඟවී සිටි වනාන්තරය කරා පිටත් වූ සේක. මුලින් ම නෙතට ගොදුරු වන තැනැත්තා මරන්නට ඉටා ගෙන සිටි ඔහු ගේ නෙතට හිටි හැටියේ ම සම්මා සම්බුදුරජාණන් වහන්සේ රුව ලක් විය. මේ තැනැත්තා මරා ඇඟිලි දහස පුරවා ගනිමියි සිතූ හේ කඩුවක් ද රැගෙන බුදුරදුන් පසු පස දිව ආවේ ය. එහෙත් ඔහුට තමා අල්ලා ගැනීමට බැරිවන පරිදි ඍද්ධියක් කළ භාග්‍යවතුන් වහන්සේ තම පියෙවි ගමනින් ගමන් කළ හ. අංගුලිමාල කොතෙක් දිවුවද ඔහුට බුදුරදුන් අල්ලා ගැනීමට බැරි වූයෙන් "නවතිනු මහණ, නවතිනු" යි හඬ නැඟීය. භාග්‍යවතුන් වහන්සේ "මම නැවතුණෙමි. නවතින්නට ඇත්තේ ඔබට ය" යි වදාළ හ. මේ වචන වලින් විස්මයට පත් හෙතෙම "මේ මහණ ගමන් කරමින් ම මම නැවතුණෙමි" යි පවසයි. මෙ තරම් වේගයෙන් දුවමිනුත් මම ඔහු හසු කර ගන්නට අසමත් වෙමි. ඔහු ගේ වචනයෙහි අරුත විමසා ගත යුතු ය" යි සිතා "මහණ ඔබ නැවතිලා, මම නැවතිලා නැතැයි ඔබ කියන දේ මට නො වැටහේ" යි පැවසී ය. "අංගුලිමාල, මා ප්‍රාණඝාතය නවතා ඇති හෙයින් මම නැවතුණෙමි" යි කියමි. මම කිසිවකුට වධ වේදනා නො දෙමි. හිරිහැර නො කරමි. ඒ මා තුළ සියළු සත්ත්වයන් කෙරේ කරුණාව, දයාව ඇති හෙයිනි. නැවතී නැත්තේ ඔබය. ඔබ දිගින් දිගටම මරයි." යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළ සේක. "මේ නම් මහා ප්‍රාඥයකු ගේ කියමනකි. මේ භික්ෂුව කිසි ම බියක් සැකක් නැතිව කතා කරයි. මෙබඳු නිර්භීත බවක්, විශාරදත්වයක් බුදුරජාණන් වහන්සේට මිස සාමාන්‍ය පැවිදි කෙනෙකුට තිබිය නො හැක. මේ නම් භාග්‍යවතුන් වහන්සේ ම විය යුතුය. මා කෙරේ කරුණාවෙන් උන්වහන්සේ අද මෙහි වැඩම කරන්නට ඇතැ"යි සිතූ හෙතෙම සිය කඩුව බිම දමා බුදු පාමුල වැටී සමාව අයැද සිටියේ ය.භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වූ අංගුලිමාල භාවනා කර රහත් නමක් වූයේ ය. කලක් ලෝක ශාසනාර්ථයෙහි නිරතව "යො ච පුබ්බෙ පමජ්ජිත්වා" යනාදි ගාථාවෙන් උදානයක් ද පළ කළ අංගුලිමාල තෙරණුවෝ පිරිනිවන් පෑහ. එයින් පසු භික්ෂූහු අංගුලිමාල තෙරුන් මරණින් පසු උපන්නේ කොහිදැයි බුදුරදුන්ගෙන් ප්‍රශ්න කළ විට "අංගුලිමාල පිරිනිවන් පෑවේය" යි උන්වහන්සේ වදාළ හ. එතරම් මිනීමරා පිරිනිවන් පෑවේ කෙසේ දැයි විමතියට පත් භික්ෂූන් වහන්සේලාට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (173 ගාථාව)

යස්ස කතං පාපං කම්මං කුසලේන පිථීයති සො අබ්භා මුත්තෝ චන්දිමා ඉව ඉමං ලෝකං පභාසේති.

යස්ස: යමකු; **කතං**: කළ; **පාපං කම්මං**: පාප කර්මය; **කුසලේන**: කුසලින්; **පිථීයති**: වළකින්නේ ද; **සො**: හෙතෙම; **අබ්භාමුත්තෝ**: කළු වළාවෙන් මිදුණු; **චන්දිමා ඉව**: සඳ මෙන්; **ඉමං ලෝකං**: මේ ලෝකය; **පභාසේති**: ප්‍රභාමත් කරයි.

යමකු තුළ පවුකම් කුසලින් වැළකී සිටි නම් හේ වළාගැබින් මිදුණු සඳ මෙන් ලොව ආලෝකමත් කරයි.

විවරණය

කුසලේන පිථීයති: මෙයින් බෞද්ධ කර්ම නියාමයෙහි තවත් වැදගත් අංශයක් කෙරේ අප සිත් යොමු කරයි. ජෛන ධර්මයෙහි මෙන් අප කරන කර්මයේ අනිවාර්ය විපාක අප පවත්වන බවක් බුදු සමය නො දක්වයි. අපට අපගේ කර්මය පරාජය කළ හැක. කර්මය බලපාන්නේ සංස්කෘත ධර්ම ක්ෂේත්‍රය තුළ පමණි. එයින් බැහැරව ගිය විට කර්මයෙන් මිදෙන්නට හැකි වෙයි. කුසලෙන් පිථීයති යි දැක් වූයේ ඒ බවය. සාමාන්‍ය පාප විපාක යමකුගේ බලවත් කුසල් නිසා විපාක නො දෙන අවස්ථා ඇත.

නුවණ නැති පුහුදුන් පුගුලා අඳ ය. ඔවුනතුරෙහි ටික දෙනෙක් නිසි දේ දැක සුගතියට පැමිණෙත්.

174. අන්ධභූතෝ අයං ලොකො
තනුකෙත්ථ විපස්සති
සකුන්තෝ ජාල මුත්තො'ව
අප්පො සග්ගාය ගච්ඡති (13:8)

අන්ධයෝ වෙති ලොවෙහි වැඩි දෙන
ඉතා සුළුවෙනි ඇස් පෙනෙන දන
දැලෙන් මිදෙනා කුරුල්ලන් මෙන්
පිරිස සුළු වෙති සුර ලොවට යන

නුවණින් තොරවී - වැඩි දෙන අඳ වී

13 (7) පේෂකාරයා ගේ දියණිය (174 ගාථාව)

අලවි රට අග්ගාලව නම් ආරාමයෙහි වැඩ විසූ සමයෙහි එක්තරා **පේෂකාරයකු ගේ දියණියක්** නිමිති කර ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

අලවි නුවර පැවති දානමය පුණ්‍ය මහෝත්සවයකින් අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ස්කන්ධයන් ගේ අනිත්‍යත්වය ගැන ධර්ම දේශනයක් කළ හ. එම දෙසුමෙහි මූලික හරය වූයේ "ජීවිතය අනිත්‍යය. නියත එකම දේ මරණය ය." එහෙයින් සියළු දෙනාම "ජීවිතය අනියතය. මරණය නියතය. මා ද නියතයෙන් ම මිය යා යුතු ය. ජීවිතය මරණයෙන් කෙළවර වේ" යනුවෙන් නිරතුරුව මෙනෙහි කළ යුතු ය. මෙසේ නිරතුරුව පංචස්කන්ධයෙහි යථා ස්වභාවය මෙනෙහි කළ යුතු බව වදාළ භාග්‍යවතුන් වහන්සේ "දණ්ඩක් හෝ මුගුරක් අතින් ගෙන සතුරා කවර මොහොතක තමා හමුවට ඒ දැයි සූදානමින් සිටින්නකු මෙන්, මරණයට මුහුණ දීම පිණිස නිරතුරුව සූදානමින් සිටිය යුතු ය. එසේ සූදානමින් සිටින්නා මෙලොවින් චුතව දෙව්ලොව උපදින්නේ ය" යි ද දේශනා කළ හ. ඇතැමුන් මෙබඳු දෙසුමක් එතරම් වැදගත් කොට ගෙන ක්‍රියාත්මක කරන්නට නො සිතතත් එදින ධර්මශ්‍රවණය කළ සොළොස් හැවිරිදි එක් පේෂකාර දියණියක් එය මනාව තේරුම් ගත්තා ය. නිරතුරුව මරණානුස්සතිය වඩන්නට තීරණය කළා ය. ධර්ම දේශනයෙන් පසු භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙරට වැඩම කළ සේක.

වසර තුනකට පසු දිනක් භාග්‍යවතුන් වහන්සේ අළුයම ලෝ බලන විට පේෂකාර දියණිය උන්වහන්සේ ගේ බුදු ඇසට ලක් වූවා ය. ඇයට සෝවන් වීමට භාග්‍යය ඇති බව දුටු භාග්‍යවතුන් වහන්සේ අලවි නුවරට වැඩම කළ හ. බුදුරදුන් පන්සියයක් සංඝයා වහන්සේ පිරිවරා අලවි නුවරට වැඩම කළ බව ඇසූ තරුණියට බුදුරදුන් බැහැ දැක ධර්ම දේශනාව ඇසීමේ බලවත් අභිරුචියක් උපන. එහෙත් ඇය ගේ පියා නූල් පන්දු රැසක් වහා ඔතා දෙන ලෙස ඇයට අණ කළෙන් ඇය ඒවා කඩිනමින් ඔතා නිම කළා ය. වහාම ඒවා පියාණන්ට දීම සඳහා රැගෙන යන අතර මග මිනිසුන් බුදුරදුන් ගෙන් බණ අසන්නට වට වී සිටිනු දැක ඒ අසලින් ගියා ය.

භාග්‍යවතුන් වහන්සේ ද ඇය ගේ ජීවිතයේ අවසන් දිනයෙහි පිහිට වන්නට වැඩම කළ හෙයින් ඇය දෙස හිස ඔසවා විශේෂයෙන් බැලූ සේක. ඕ අවුත් පැස බිම තබා බුදුන් වැන්දා ය. බුදුරජාණන් වහන්සේ ඇය ගෙන් ප්‍රශ්න හතරක් විචාළහ. ඒවාට ඇය දුන් පිළිතුරු අමුතු වූ හෙයින් බොහෝ දෙනා ඇය කෙරේ නො පහන් වූ හ. එහෙත් ඒ පිළිතුරු තමන් අපේක්ෂා කළ ධර්මානුකූල පිළිතුරු බව භාග්‍යවතුන් වහන්සේ ඇය ලවා පැහැදිලි කළ හ.

පළමුවන ප්‍රශ්නය වූයේ "කොහි සිට ආවේ ද?" යන්නයි. භාග්‍යවතුන් වහන්සේ අදහස් කළේ මේ ජන්මය කවර පූර්වජන්මයක සිට ආවාද යන්න හෙයින් එය මා නො දන්නා නිසා "මම නොදනිමියි" කීමි.

"යන්නේ කොහිද?"යි ඇසුවේ මරණින් මතු යන්නේ කොහි ද යි බව මට හැඟුණු හෙයින් "නො දනිමියි" කීමි.

"නොදන්නෙහි ද?" යි විමසූයේ මැරෙන බව නොදන්නෙහිද යන්න හෙයින් "මම දනිමි"යි පිළිතුරු දුනිමි.

නැවත "දන්නෙහි ද?"යි විමසූයේ මැරෙන දිනය දන්නේහි ද යන්න බව තේරුම් ගෙන මා මැරෙන දිනය නො දත් හෙයින් "නො දනිමි"යි පැවසීමි.

ඒ පිළිතුරු ඇය පැහැදිලි කළ පසු පිරිස ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "ඔබ බොහෝ දෙනකුට ඒ පිළිතුරු නො වැටහුණේ වැඩි දෙන අවිද්‍යා අන්ධකාරයෙහි සිටින හෙයිනි" යි වදාළ හ. අනතුරුව පේෂකාර දුහිතෘව එම ප්‍රශ්න හා පිළිතුරු ගැනම සිතමින් තම පියාට නූල් පන්දු බාර දීම පිණිස ඉක්මන් ගමනින් ගියා ය. ඇය යන විට අඩ නින්දේ පසු වූ පියා හිටි හැටියේ ම පිබිදී අත් දණ්ඩ ගසා ලූයෙන් එය ඇයගේ පපුවෙහි වේගයෙන් වැදී එතනම ඇය ගේ මරණය සිදු විය. මහත් සංවේගයට පත් පියා වහා දිවගොස් භාග්‍යවතුන් වහන්සේට ඒ බව සැළ කර සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු අස්වසා පැවිදි කර ගත් හ. හෙතෙම නොබෝ දිනකින් ම බවුන් වඩා රහත් වූයේ ය.

විවරණාත්මක අනුවාදය (174 ගාථාව)

**අයං ලොකො අන්ධභූතො එත්ථ තනුකො විපස්සති
ජාලමුත්තො සකුන්තො ඉව අප්පො සග්ගාය ගච්ඡති.**

අයං ලොකො: මේ ලෝවැසි තෙමේ, **අන්ධභූතො**: අන්ධ වූයේ (වෙයි), **එත්ථ**: මේ ලෝවැසියා අතුරෙහි, **තනුකො**: ඉතා සුළු පිරිසක්, **විපස්සත**: වෙසෙසින් දකිති, **ජාලමුත්තො**: දැලින් මිදී යන, **සකුන්තො ඉව**: කුරුල්ලකු මෙන්, **අප්පො**: ස්වල්ප දෙනෙක්, **සග්ගාය**: දෙව් ලොවට, **ගච්ඡත**: යති.

මෙලොව බොහෝ දෙනා අන්ධයන් වැනි ය. ඔවුහු යථාර්ථය නො දකිති. ඉතා සුළු පිරිසක් පමණක් කුරුළු වැද්දකු ගේ දැලෙන් මිදී යන කුරුල්ලකු මෙන් යහපත අයහපත දැක දෙව් ලොව උපදිති.

විවරණය

අන්ධභූතො: ලෝක වාසී සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයෝ විමුක්ති මාර්ගය නොදකිති. ඔවුහු ශාස්වත උච්ඡේද ආදී මිථ්‍යා දෘෂ්ටීන් ගෙන් අන්ධ වූවාහු යථා තත්ත්වය නො දැක, කුශලා'කුශල විචක්ෂණයෙන් තොරව අවිචාරවත්ව ක්‍රියා කරති.

සග්ග: බුදු සමයෙහි ඉගැන්වෙන ස්වර්ගය ඇතැම් ආගම්වල ඉගැන්වෙන සදාකාලික ස්වර්ගය නොව දිව්‍ය ලෝකයයි.

නුවණැත්තාහු සෙන් සහිත මරුදිනා මෙ ලොවින් නික්ම යෙත්. (නිවනට පැමිණෙත්)

175. හංසාදිච්චපථෙ යන්ති
ආකාසෙ යන්ති ඉද්ධියා
නීයන්ති ධීරා ලොකම්හා
ජෙත්වා මාරං සවාහිනිං (13:9)

හංසයන් යන මෙන් පියඹා - නුබ ගැබේ හිරු බබලනා
යති ගුවන් ගැබ රහත් හිමිවරු
තමන් ලත් ඉදු බලයෙන්
අතැර යති ලොව ලොවේ ඇති තතු
දත් උතුම් දන නුවණිනා
පරදවා සහමුලින් මරුවා
ඔහුගේ පිරිවර සමගිනා

ලොව හැර යති - දන නුවණැති

13 (8) හිමිවරුන් තිස් නමක්ගේ කතා පුවත (175 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **සඟ පිරිසක්** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් ප්‍රත්‍යන්ත දේශවාසී භික්ෂූන් වහන්සේ තිස් නමක් බුදුරදුන් හමුවට පැමිණිය හ. උන්වහන්සේලා එනු ඈත පටන්ම දුටු ආනන්ද තෙරුන් වහන්සේට මෙසේ සිතිණි. "දැන් මා බුදුරදුන්ට වත් පිළිවෙත් කළ යුතු වේලාවයි.

කෙසේ වුවත් මේ පැමිණෙන භික්ෂූන් සමග කතා බහ කරන්නට භාග්‍යවතුන් වහන්සේට ඉඩ හැර පසෙකට වී සිටිමි. ඒ කතා බහ නිම වී ඔවුන් පිටත්ව ගිය පසු වතාවත් කරන්නෙමි." එසේ සිතා උන්වහන්සේ විහාර දොරටුව අසල බලා සිටිය හ.

භාග්‍යවතුන් වහන්සේ ඒ පැමිණි තෙරවරුන් සමග සතුටු සාමීචි කතා නිමකොට උන්වහන්සේලාට ධර්ම දේශනා කළ හ. එම ධර්මය ඇසූ තිස් නම රහත් වූ හ. රහත් ඵල ලත් පසු බුදුරජාණන් වහන්සේ ගෙන් සමුගත් උන්වහන්සේලා දොරටුවෙන් පිටව නො ගොස් අහසින් ගිය හ.

බුද්ධෝපස්ථානයට අවස්ථාව පතමින් දොරටුව ලඟ රැඳී සිටි ආනන්ද හිමියෝ බොහෝ වේලා බලා සිට ඒ හිමිවරුන් පිටව නො යන හෙයින් බුදුරදුන් හමුවට ගොස් එහි දී තෙරවරුන් නො දැක ඔවුන් පිටත්ව ගියා දැයි බුදුරදුන් ගෙන් විමසූ හ.

ඔවුන් පිටත්ව ගිය බව බුදුන් වහන්සේ වදාල විට ඒ කෙසේදැයි විමසූහ. ඒ අවස්ථාවෙහි හංසයෝ රංචුවක් අහසින් ගිය හ. මේ රහත් හිමිවරුන් ඍද්ධියෙන් යාමත් හංසයන් අහසින් යාමත් අලලා භාග්‍යවතුන් වහන්සේ ගාථාවකින් අනඳ හිමියන්ට පැහැදිලි කළ සේක.

විවරණාත්මක අනුවාදය (175 ගාථාව)

හංසා ආදිච්චපථෙ යන්ති ඉද්ධියා ආකාසෙ යන්ති ධීරා
සවාහිනිං මාරං ජෙත්වා ලොකම්හා නීයන්ති

හංසා: හංසයෝ; **ආදිච්චපථෙ**: ආකාශයෙහි; **යන්ති**: පියඹා යති; **ඉද්ධියා**: ඍද්ධි බලයෙන්; **ආකාසෙ**: අහසින්; යන්ති: (ඍද්ධිය ඇත්තෝ) යති; **ධීරා**: නුවණැත්තෝ; **සවාහිනිං**: පිරිවර සේනා සහිතවූ; **මාරං**: මරු; **ජෙත්වා**: පරදවා; **ලොකම්හා**: ලෝකයෙන්; **නීයන්ති**: නික්ම (නිවනට) යන්නාහුය.

හංසයෝ අහසේ පියඹා යති. ඍද්ධි ඇත්තෝ අහසේ ඍද්ධි බලෙන් යති. නුවණැති රහතුන් වහන්සේලා පිරිවර සේනා සහිතවූ මරු පරදවා මෙලොවින් නිකුත්ව නිවනට යයි.

විවරණය

ඍද්ධි: සමාධියට පැමිණෙන්නේයයි හෙවත් සිද්ධ වෙයි ඍද්ධි නම්. ඍද්ධි විධ ඥාණය ෂඩ්විධ අභිඥාවන් ගෙන් එකකි. ඒ ඍද්ධි තොමෝ **අධිෂ්ඨාන ඍද්ධි**; **විකුර්ණ ඍද්ධි**; **මනොමය ඍද්ධි**; **ඥාණ විෂ්ඵාර ඍද්ධි**; **සමාධි විෂ්ඵාර**; **ආයර්‍ය ඍද්ධි** ; **කර්මවිපාකජ ඍද්ධි**; **පුණ්‍ය ඍද්ධි**; **විද්‍යාමය ඍද්ධි**; සහ **සම්‍යක්ප්‍රයෝග ඍද්ධි** යයි දශවිධ වන්නේ ය.

මෙම චිත්ත පාලනය ගැන සූත්‍රධර්මවල නිරතුරුව සඳහන් වේ. මෙහි විස්තරය විශුද්ධි මාර්ගය බලා දැන ගත හැක.

ඉද්ධි පාද: ඉද්ධිපාද නම් 'සමෘද්ධි සඳහා ඇති මාවත' යන අරුත් දෙයි. සතර ඍද්ධිපාදයෝ නම්:

1. ඡන්ද සමාධි
2. විරිය සමාධිය,
3. චිත්ත සමාධිය,
4. විමංසා සමාධිය

යන මොහු ඍද්ධි ලැබීමට උපාය වෙත් නුයි ඍද්ධිපාද නම් වේ.

ඍද්ධිපාද මගින් ඍද්ධි උපදවා ගත හැකි වෙයි. ඍද්ධි පාද වඩා ඒවා දිගට පවත්වාගෙන යන භික්ෂුවට දිව්‍ය චක්ෂු, දිව්‍ය ශ්‍රොත, පරචිත්ත විජානන, පුබ්බෙනිවාසානුසමෘති, චුති උත්පත්ති, හා ආශ්‍රවක්ෂය යන ඍද්ධි ලැබේ. "මහණෙනි, කවරකුට හෝ සතර ඍද්ධිපාද මඟ හැරුණේ නම්, ඔහුට දුක්ඛ නිරෝධයට ඇති මාර්ගය ද මඟ හැරුණේ වෙයි" යි සඳහන්ව ඇත.

ඉද්ධියා ආකාසෙ යන්ති: ඍද්ධි බල ඇති රහතන් වහන්සේලා අහසින් යති. රහතන් වහන්සේලා වනාහි කළ යුත්ත කළ උතුමෝ වෙති. මේ නිම කළ කාර්යය ඇත ද ශරීරය පවත්නා තුරු මේ ලොව ජීවත්වන උන්වහන්සේලා ලෝ වැඩ වඩමින් වෙසෙති. රහත් බව හෝ අනාගාමී ඵලය රූප හෝ අරූප ධ්‍යාන බල උපදවා ගත් උතුමනට සතියක් දක්වා විමුක්ති සුවයෙන් වාසය කළ හැක. පාලියෙන් එය හඳුන්වන්නේ නිරෝධ සමාපත්ති නමිනි.

සවාහිනිං මාරං ජෙත්වා: සේනා සහිත වූ මරු දිනාය.

දස මාර සේනා නම් **කාම**, **අරති**, **ඛුප්පිපාසා**, **තණ්හා**, **ථිනමිද්ධ**, **උත්තාස**, **විචිකිච්ඡා**, **මක්ඛ ථම්භ**, **මිථ්‍යාවෙන් ලත් ලාභ සත්කාරාදි අත්තුක්කංසන**, **පරවම්භන** යන මොහුය.



එක ම දහම (-සස්බස් බිණීම) ඉක්ම වූ බොරු කියන තැනැත්තා විසින් නො කටහැකි පවක් නැත.

176. එකං ධම්මං අතීතස්ස
මුසාවාදිස්ස ජන්තුනො
විතිණ්ණපරලොකස්ස
නත්ථි පාපං අකාරියං (13:10)

එකම එක සීලයක්
රකිනු බැරි බොරුකාර
පරලොවත් නසාගත්
අයට බැරි පවක් නැත.

බොරු කියන්නාට කළ හැකිය - ඕනෑම පාපයක්

13 (9) චිංචා මානවිකාව ගේ කතාව (176 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ සිටි සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **චිංචාමානවිකාව** අරබයා මේ ගාථාව දේශනා කළ සේක.

භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දේශනා ඇසූ බොහෝ දෙනා උන්වහන්සේ ගේ ශ්‍රාවකයන් බවට පත් වූ හ. වැඩිකල් නොයාම බුද්ධ ශ්‍රාවක පිරිස වැඩි වන්නට පටන් ගත්තෙන් අන්‍ය තීර්ථකයෝ අසහනයට පත් වූහ. බුද්ධ ශ්‍රාවකයන් බවට බොහෝ විට පත් වූයේ ඔවුන්ගේ ශ්‍රාවකයන් හෙයින් ඔවුන් ගේ පිරිස පිරිහිණි. එහෙයින් ඔවුහු බුදුරදුන්ගේ හොඳ නම කෙලෙසන්නට මගක් ගැන කල්පනා කළ හ. එසේ සිතා ඔවුන් ගේ ශ්‍රාවිකාවක් වූ චිංචා නම් එක් රූමත් ළඳක් කැඳවූ පරිබ්‍රාජකයෝ "ඔබ අපට හිතවත් නම්, ශ්‍රමණ ගෞතමයා අපකීර්තියට පත් කිරීමට අපට උදව් කරන්න" යි ඔවුහු ඉල්ලා සිටිය හ. චිංචා ඊට එකඟ වූවා ය.

එදා පටන් ඕ මල් සුවඳ ආදිය රැගෙන සැන්දෑ කාලයේ දෙව්රම් වෙහෙර දෙසට යන්නට පටන් ගත්තා ය. මිනිස්සු "මේ කොහිද ඔබ යන්නේ?" යි ඇසූ විට ඕ අමනාපයෙන් මෙන් "මා කොහි යන්නේදැයි දැන ගැනීමෙන් ඔබට ඇති ඵලය කුමක් ද?" වැනි පිළිතුරු දෙයි. අනතුරුව දෙව්රම් වෙහෙර අසල ම ඇති පරිබ්‍රාජකාරාමයක රාත්‍රි නවාතැන් ගන්නා ඕ හිමිදිරියේ ම දෙව්රම පැත්තේ සිට එන බව හඟවමින් නිවස බලා යයි. මගදී කොහි ගියේ දැයි විමසූ විට "රැය ශ්‍රමණ භවත් ගෞතමයන් සමග සුවඳ ගඳ කිළියේ වාසය කළෙමි" යි කියයි. තුන් හාර මසක් ගිය තැන ඕ කුස මඳින් මඳ වැඩෙන බවක් පෙනෙන සේ රෙදි තබා වෙලාගෙන යන්නීය. මාස අටක් නමයක් වූ කළ ලී කැබලි එකතු කර තනා ගත් බඩක් විදහාපාමින් ඇවිදියි. ගැබ්බර ලියක මෙන් වෙහෙස ගතියක් පාමින් අපහසුවෙන් ඇවිදියි.

මෙසේ පසුබිම සැකසූ චිංචා දිනක් බුදුරදුන් ධර්ම දේශනා කරමින් සිටින අතර දෙව්රම් වෙහෙරට ගියා ය. "අනුන්ට බණ කිය කිය හිටියාම හරියයි ද? මහ ලොකු ශ්‍රමණයා දැන් මගේ බඩට මාස නමයයි. මේවා ඔබගේ වැඩ. ඉතින් උපදින්න ඉන්නා දරුවා ගැන, මා ගැන මොනවද ලෑස්ති කරලා තියෙන වැඩ. ඔබේ ප්‍රීතිය ගැන විතරයි ඔබ හිතුවෙ" යි කියාගෙන කියාගෙන ගියා ය. භාග්‍යවතුන් වහන්සේ කරමින් සිටි දම් දෙසුම නවත්වා "නැගණිය ඔබ කියන්නේ සැබෑද බොරුද යන්න දන්නේ ඔබත් මාත් පමණක් නොවේ ද?" යි පැවසූ හ. "ඇත්ත, කොහොමද අනිත් අය දන්නේ, අපි දෙන්නා විතරක් දන්න දේවල්?" චිංචා කීවා ය.

එකෙණෙහි දෙ දෙව්ලොවට අධිපති ශක්‍රයා මෙ පවත් දැක තම පිරිවර දෙව්වරුන් හතර දෙනකු අමතා මීයන් හතරදෙනකු ගේ වෙස් ගෙන චිංචා මානවිකාව ගේ බොරුව කාටත් දැන ගන්නට සලසන්නැයි පැවසී ය. ඔවුහු මී වෙස් ගෙන චිංචාවගේ ඇඳුම් අතරින් ඇයගේ කුසට බැඳ තිබූ ලී කැබලි කපා දැමූ හ. නූල් ගොඩවල් කැපී ලී කැබලි බිම වැටෙන්නට පටන් ගත්තේ ය. පිරිස ඇයට නින්දා කරන්නට පටන් ගත් හ. කෙනෙක් ඇයට කෙළ ගැසී ය. වහා දෙව්රමින් නික්ම පරිබ්‍රාජක ආරාමයක් බලා ඕ දිව ගියා ය. එහෙත් ඇය පරිබ්‍රාජක ආරාමයට යත් ම මහ පොළව දෙබෑ වී ඕ අවීචි මහා නිරයට ගෙන යනු ලැබූවා ය.

විවරණාත්මක අනුවාදය (176 ගාථාව)

එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස විතිණ්ණපරලොකස්ස
ජන්තුනො අකාරියං පාපං නත්ථි

එකං ධම්මං: (සත්‍යවාදිත්වය නම් වූ) එකම ගුණ ධර්මයවත්; **අතීතස්ස**: ඉක්මවාලූ; **මුසාවාදිස්ස**: බොරු කියන සුලු වූ; **විතිණ්ණපරලොකස්ස**: පරලොව වරදවා ගත්; **ජන්තුනො**: පුද්ගලයාට; **අකාරියං**: කළ නො හැකි; **පාපං: පාපයක**; නත්ථි: නැත.

සත්‍යවාදිත්වය නම් වූ එකම ගුණ ධර්මයවත් නැති පරලොව වනසා ගත් බොරුකාරයාට කරන්න බැරි පාප කර්මයක් නො මැත.

විවරණය

මුසාවාදිස්ස: මුසාවාදියා නම් ඇත්ත සඟවා නැත්ත කතා කරන පුද්ගලයා ය. සත්‍යවාදිත්වය උතුම් ගුණධර්මයක් ලෙස බුදු දහමෙහි ඉගැන්වෙයි.

බෞද්ධ විමුක්ති මාර්ගයෙහි සත්‍යයට හිමිවන වැදගත් ස්ථානය එය පාරමිතාවක් කොට දැක්වීමෙන් ම පෙනී යයි. සත්‍ය පාරමිතාව පිරූ අවස්ථාවක් දක්වන විධුර ජාතකය ජීවිත පරිත්‍යාගයෙන් පවා සත්‍යවාදිත්වය රැකි අයුරු දක්වයි. විධුර පණ්ඩිතයන් යක්ෂයකුට ගොදුරුවන්නට ඔන්න මෙන්න කියා තිබියදී ඔහුට එක් සතියක් තම නගරයට ගොස් එන්නට අවසර ලැබේ. ඒ සතිය ගත කළ පසු වෙනත් අය තමන් ඒ වෙනුවෙන් බිලි වන්නට කැමැත්ත පළ කරත්දී පවා තමන් ගිවිස ගත් පොරොන්දුව ඉටු කරමියි විදුර පඬිතුමා ආපසු යයි. රකුසෝ එයින් විස්මයට පත්ව සත්‍යවාදිත්වයට ගරු කිරීමක් ලෙස එතුමාට අභය දෙති.

නත්ථි පාපං අකාරියං: බොරු කාරයාට කළ නො හැකි පවක් නැත. මේ කියුම සත්‍යවාදිත්වයට බුදුදහමෙහි හිමිවන වැදගත් තැන තවත් තහවුරු කරයි. බොරු කියන්නන්ට කිසි කලෙක දිව්‍ය හෝ මානුෂික සැප හිමි නොවන බව අටුවාව කියයි.



අනුවණයෝ දන්දීමට නො පසසත්, නුවණැත්තා අනුන් දුන් දනෙහි පවා පින් අනුමෝදන් වැ සැප ලබයි.

177. න වෙ කදරියා දෙවලොකං වජන්ති
බාලා හවෙ නප්පසංසන්ති දානං
ධීරො ච දානං අනුමොදමානො
තෙනෙව සො හොති සුඛී පරත්ථ (13:11)

මසුරෝ කිසි කලෙක දෙව් ලොව නූපදිති
අනුවණ දනෝ නම් දානය නොපසසති
නුවණැති අයම දෙන දන් දැක සතුටු වෙති
එපමණකින් වුවත් පරලොව සැප ලබති.

හොඳ ම කරත් - සැප ම ලබත්

13 (10) අසදිස මහා දානය (177 ගාථාව)

පසේනදි **කොසොල් රජතුමා** විසින් දෙන ලද අසදිස මහා දානය ඇරබ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථාව දේශනා කරන ලදි.

වරක් රජ තෙමේ බුද්ධ ප්‍රමුඛ සංඝයාට මහා දානයක් පිරිනැමී ය. එම මහා දානය දුටු පුරවැසියෝ ද අපිත් ඊට නො දෙවෙනි මහ දනක් දෙමුයි තවත් මහා දානයක් දුන් හ. රජතුමා එය පරදවන්නට තමන් ද මහ දානයක් දුන්නේ ය. මෙසේ රජතුමාත් ජනතාවත් කීපවරක් ම තරඟයට මෙන් මහ දන් පැවැත්වූ හ.

රජතුමාටම ජයග්‍රහණය ලබා දෙනු රිසි වූ මල්ලිකා දේවිය ඒ සඳහා උපායක් සිතුවා ය. ඒ සඳහා එතුමිය රජතුමා ලවා මහා මණ්ඩපයක් ඉදි කරවූවා ය. අනතුරුව පන්සියයක් ශ්වේතඡත්‍ර ද, පන්සියයක් හීලෑ හස්තීන් ද සූදානම් කරවූවා ය. පන්සියයක් හස්තිහු ශ්වේතඡත්‍ර (සුදු කුඩ) එසවීම සඳහා ය. මණ්ඩපය මැද සුවඳ පිරුවූ භාජන 10 ක් තබන ලදි. පන්සියයක් භික්ෂූන් දන් වැළඳීම පිණිස වැඩ හිඳි විට පවන් සලනු වස් රාජ කන්‍යාවන් දෙසිය පණහක් ද සූදානම් කරන ලදි. මෙසේ සැලසුම් කළ දානයෙන් පසු ජනයා තමන්ට රාජ කන්‍යාවන්, ශ්වේතඡත්‍ර, හස්තීන් සොයා ගත නො හැකි හෙයින් පරාජය පිළිගත් හ. දන් දීමෙන් අනතුරුව රජ තෙම මණ්ඩපය පුරා කෝටි දාහතරක් වටිනා පූජා වස්තු පූජා කළේ ය.

මේ අවස්ථාවට සහභාගී වූ රජතුමා ගේ ජුණ්හ නම් අමාත්‍යවරයා රජතුමා විසින් බුද්ධප්‍රමුඛ සංඝයාට දෙන ලද මෙම අසදිස දානය ගැන අතිශයින් ප්‍රසන්න වූයේ ය. රජතුමාට තම ප්‍රසාදය ද පළ කළේ ය. රජතුමා එම පුණ්‍යකර්මයෙන් ජනිත කුසලය සියල්ලන්ටම අනුමෝදන් කිරීම ගැන වඩාත් ප්‍රමෝදයට පත් විය. එසේ කිරීමෙන් රජ කෙනෙකු පමණක් කළ හැකි අසදිස පින්කමක් කොට එම පුණ්‍ය මහිමය තවත් අය සමග බෙදා ගැනීමට ඔහු කාරුණික වීම ගැන ඉතා සතුටට පත් වූ හේ රජතුමා මෙන්ම ප්‍රීතියට පත්ව සිටියේ ය.

එහෙත් කාල නම් වූ අනිත් අමාත්‍ය තෙම රජතුමා විශාල ධනයක් නාස්ති කළේ යැයි සිතී ය. "එක් දිනයක දී කෝටි දාහතරක් වැය කළ නමුත් එහි ඇති ප්‍රයෝජනය කුමක් ද? භික්ෂූන් ආහාර අනුභව කොට විහාරස්ථානයට ගොස් නිදාගනු ඇත" යි හේ සිතී ය. කාල ගේ මේ සිතුවිලි බුදුරජාණන් වහන්සේට පෙනිණි.

තමන් දිග දම් දෙසුමක් කළහොත් කාල තවදුරටත් සිත දූෂණය කර ගනු ඇත. එහි විපාකය වන්නේ ඔහු ගේ මතු ජන්මය අන්ත දුඃඛිත එකක් වීම ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ කෙටියෙන් ධර්ම දේශනාවක් කර පසුව රජතුමා අමතා මෙසේ පැවසී ය. "රජතුමනි, මේ අසදිස දානය දෙන්නට හැකි වීම ගැන ඔබ අතිශයින් ම ප්‍රීති විය යුතු ය. මෙබඳු අවස්ථාවක් උදාවන්නේ ඉතාමත් ම කලාතුරකිනි. එවැන්නක් එක් බුද්ධාන්තරයක දී එක් වරක් පමණක් උදා වෙයි. එහෙත් ඔබ ගේ කාල ඇමතිවරයා එය මහා ධන නාස්තියක් සේ සිතයි. හේ එය අගය නො කරයි. මා දිග ධර්මදේශනාවක් කළ හොත් ඔහු ගේ සිත තව තවත් දූෂිත වනු ඇත. එසේ පව් රැස් කර ගැනීමේ ප්‍රතිඵලය වන්නේ කාල ඇමති තුමා අපාගත වීමයි. එහෙයින් මගේ ධර්ම දේශනය කෙටි කළෙමි.'' එසේ රජතුමා අස්වැසූ භාග්‍යවතුන් වහන්සේ පූර්වෝක්ත ගාථාව ද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (177 ගාථාව)

කදරියා වෙ දෙවලොකං න වජන්ති. බාලා හවෙ දානං නප්පසංසන්ති ධීරො ච දානං අනුමොදමානො සො තෙන එව පරත්ථ සුඛී හොති

කදරියාඃ තද මසුරෝ; **වෙ**ඃ ඒකාන්තයෙන්ම; **දෙවලොකං**ඃ දෙව්ලොවට; **න වජන්ති**ඃ නො යති; **බාලා**ඃ අඥාන පුද්ගලයෝ; **හවේ**ඃ ඒකාන්තයෙන්ම; **දානං**ඃ දානයට; **නප්පසංසන්ති**ඃ ප්‍රශංසා නො කරති; **ධීරො ච**ඃ නැණවතා වනාහි; **දානං**ඃ දානය; **අනුමොදමානො**ඃ අනුමෝදන් වන්නේ ය; **සො**ඃ හෙතෙම; **තෙන එව**ඃ (පුණ්‍ය කර්මය අනුමෝදන් වීම) ඒ හේතුවෙන් ම; **පරත්ථ**ඃ මතු ජන්මයෙහි දී; **සුඛී**ඃ සැප ඇත්තෙක්; **හොති**ඃ වෙයි.

විවරණය

දානඃ දන්දීම, දානය දස පාරමිතා අතර පළමුවැන්නයි. එමෙන් ම ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන් අතර ප්‍රථම යයි. දන් දෙන තැනැත්තා සිය සිත ආත්මාර්ථකාමී චේතනාවලින් මුදවා පරාර්ථකාමයෙහි යොදවයි. දානපතියා පිවිතුරු සිත නිසා භාග්‍ය සම්පන්න වන අතර ප්‍රතිග්‍රාහකයා යමක් ලැබීම හේතුවෙන් භාග්‍ය සම්පන්න වෙයි. බෝසත්වරුන් දන් දෙන්නේ දානානිශංස වශයෙන් භෞතික සැප සම්පත් ලබන්නට නොව තම තෘෂ්ණාව පරාජය කිරීමට හා ලොව සුවපත් කිරීමට ය. ආයුෂ, වර්ණය, සැපය, බලය හා ප්‍රඥාව ලැබීම දානයෙහි ලෞකික ආනිශංස වශයෙන් දැක්වෙයි.



සක්විති රජයට වඩා දෙව්ලෝ යාමට වඩා සියල් ලොවැ අධිපතිකමට වඩා සෝවාන් ඵලය ලැබීම උතුම් ය.

178. පඨව්‍යා එක රජ්ජේන	මහ පොළොවේ තනි රජයයි
සග්ගස්ස ගමනේන වා	දෙව් ලොව ගොස් සැප විඳුමයි
සබ්බලොකාධිපච්චෙන	මුළු ලොව අදිපති වීමයි
සොතාපත්තිඵලං වරං (13:12)	සෝවන් ඵලයට පරදියි

ලැබීම සෝවන් ඵලය - මසු දහසට වඩා අගය

13 (11) කාල සිටු පුත්‍රයා ගේ කතාව (178 ගාථාව)

අනේපිඬු සිටාණන් ගේ පුත්‍රයා වූ **කාල** නිමිති කරගෙන භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙරදී මේ ගාථාව වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ හා ශ්‍රාවක පිරිස නිතර නිතර සිටු මැඳුරට වැඩම කළ නමුත් අනේපිඬු සිටාණන් ගේ පුත්‍රයා කිසි විටෙක ගරුසරු දැක්වීමට හෝ දහම් ඇසීමට හෝ පැමිණුනේ නැත. තම පුත්‍රයා ගේ මේ පැවැත්ම ගැන සිටුතුමා දුකින් පසුවිය. දරුවා පිනට ලැදි නොවී මිසදිටුවකු සේ ජීවත් වී මරණින් මතු අපාගත වේදෝ හෝයි හෙතෙම බිය විය. එහෙයින් ඔහු දහමට නමා ගන්නේ කෙසේ දැයි හේ නිතර සිතුවේ ය.

දිනක් තම පුත්‍රයා ඇමතූ සිටුතුමා "පුතා පෝයදාට පන්සල් ගිහින් ආවොත් කහවණු සීයක් දෙනවා" යි පැවසී ය. කහවණු වලට ලොබ කළ කාල එදා උදෙන්ම විහාරස්ථානයට ගොස් දිවා භෝජනය සඳහා ආපසු ගෙදර ආවේ ය. තම අතට කහවුණු සියය ලැබෙන තුරු හේ කෑම නො ගත්තේ ය. සිටුතුමා ද ගිවිස ගත් පරිදි ඔහුට කහවණු සියයක් දුන්නේ ය.

පසුදින සිටු කුමාරු ඇමතූ පියා "පුත්‍රය අද විහාරස්ථානයට ගොස් ගාථාවක් ඉගෙන ගෙන ආවොත් කහවණු දාහක් දෙනවා" යි පොරොන්දු විය. සිටු පුත්‍රයා ද ඉමහත් සතුටින් ගාථාවක් ඉගෙන ගනු පිණිස බුදුරජාණන් වහන්සේ හමුවට ගොස් තමන්ට ගාථාවක් උගන්වන ලෙස ඉල්ලා සිටියේ ය. බුදුහු ඔහුට කෙටි ගාථාවක් ඉගැන්වූ හ. එහෙත් එය වහා අමතක වන සේ සෘද්ධියක් ද කළ හ. ගාථාව වහා අමතක වන හෙයින් එය කීප වාරයක් තේරුම් සහිතව ඉගෙන ගන්නට ඔහුට සිදු විය.

එහි ප්‍රතිඵලය වූයේ අර්ථය අනුව සිතා කාල සෝවාන් වීමයි.භාග්‍යවතුන් වහන්සේ සිටු නිවසෙහි දවල් දානය පිණිස සපිරිවරින් වැඩම කරන විට සිටු පුත්‍රයා ද ඒ සමගම නිවසට පැමිණියේ ය. එසේ පැමිණෙන අතර තම පියා බුදුරදුන් හමුවේ දීම තමන්ට මුදල් දේදැයි බියක් ද ඔහුට ඇති විය. එසේ නො දෙත්වායි හේ දිගටම ප්‍රාර්ථනා කළේ ය.

භාග්‍යවතුන් වහන්සේට දන් පිළිගන්වා අනතුරුව අනේපිඬු සිටාණෝ පුතාට ද ආහාර දුන් හ. අනතුරුව බුදුපාමොක් සඟරුවන හමුවේ ම හේ තම පුත්‍රයාට "පුත්‍රය මෙන්න ගාථාවක් ඉගෙන ගෙන ආවාට කහවණු දහස" යි ඒ මුදල ඔහුට දුන් නමුත් සිටුපුතා මහත් ලජ්ජාවෙන් එය ප්‍රතික්ෂේප කළේ ය. විස්මයට පත් අනාථපිණ්ඩික සිටුතුමා බුදුරජාණන් වහන්සේ අමතා "ස්වාමීනි, මෙතෙම පෙරදින කහවණු සියය අතට දෙන තුරු ආහාර ගැනීම පවා ප්‍රතික්ෂේප කළේ ය. දැන් කහවණු දහසක් දුන් විට ප්‍රතික්ෂේප කරයි. ඔහු ගේ පැවතුම් ද අද බෙහෙවින් ප්‍රසාද ජනක ය." යි සැලකර සිටියේ ය. එවිට සිටුතුමා ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "සිටුතුමනි, අද ඔහු කහවණු දහසක් නොව මහා පෘථිවියේ සක්විති රජකමටත්, දෙව් සැපතටත් දෙලොව ම ආධිපත්‍යයටත් වඩා වටිනා සෝවාන් ඵලය ලබා සිටියි" යි වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (178 ගාථාව)

පඨව්‍යා එකරජ්ජේන, සග්ගස්ස ගමනේන වා
සබ්බලොකාධිපච්චෙන සොතාපත්තිඵලං වරං

පඨව්‍යා: මුළු පෘථිවියෙහි; **එකරජ්ජේන**: එකම රජ වීමටත්; **සග්ගස්ස**: (සව්සිවැදෑරුම්) දෙව්ලොවට; **ගමනේන**: යාමටත්; **සබ්බලොකාධිපච්චෙන වා**: (නාග සුපර්ණාදීන් සහිත වූ) සමස්ත ලෝකයට ම අධිපති වීමටත් (වඩා); **සොතාපත්ති ඵලං**: සෝවාන් ඵලය; **වරං**: උතුම් ය.

මුළු පොළොවෙහි සක්විති රජකමටත්, සදෙව්ලොවට ගොස් සැපවිඳීමටත් සමස්ත ලෝකයේ ම අධිපතියා වීමටත් වඩා සෝවාන් වීම උතුම් ය.

විවරණය

පඨව්‍යා එක රජ්ජේන: පෘථිවියෙහි තනි රාජ්‍යය. සාම්ප්‍රදායික විශ්වාසයනට අනුව කලින් කලට මුළු ලෝකයම පාලනය කරන රජවරු පහළ වෙති. මෙය කුසල බලයෙන් ලැබෙන්නකැයි විශ්වාස කෙරේ. එවැන්නකු ගේ පහලවීම දෙව්වරුන් විසින් කල් ඇතිව නිවේදනය කෙරේ. 'චක්‍රවර්ති' නමින් හැඳින්වෙන එබඳු රජකුට සප්තරත්නයක් ද පහළ වෙයි. ආගමික අංශයෙන් බලන විට ලොව පහළ වන ශ්‍රේෂ්ඨතම උත්තමයා බුදුරජාණන් වහන්සේ වන අතර ලෞකික වශයෙන් බලන විට ලොව පහළවන ශ්‍රේෂ්ඨතම ගෘහස්ථ නායකයා සක්විති රජතුමා ය. බුදුවරුන් දෙනමක් එක්වර ලොව පහළ නොවන්නා සේම සක්විති රජවරු දෙදෙනෙක් ද එකවර ලොව පහළ නොවන්නා හ.

සෝතාපත්ති: සෝවාන් ඵලය බෞද්ධ විමුක්ති මාර්ගයෙහි සතර ඵලයන් අතර ප්‍රථමය යි. මෙය ලත් පසු දුගතිගාමී නොවන බව කියැවේ.



බුදුරජාණන් වහන්සේ

බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රේෂ්ඨත්වය

ප්‍රඥාවෙන් හෝ වේවා, සාධු චර්යාවෙන් හෝ වේවා, ක්‍රිස්තුස් වහන්සේ ඉතිහාසයෙහි පහළ වූ සෙසු ඇතැම් අය තරම් උසස් යැයි මට නොසිතේ. මෙහි ලා බුදුරජාණන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේට වඩා ශ්‍රේෂ්ඨ යයි මම සිතමි.

බර්ට්‍රන්ඩ් රසල්
"මම ක්‍රිස්තු භක්තිකයකු නොවන්නේ ඇයි" ග්‍රන්ථයෙන්
(Why I am not a Christian)

ගුණ මූර්තිය

බුදුරජාණන් වහන්සේ උන්වහන්සේ ඉගැන්වූ සියළු ම ගුණධර්මවල මූර්තියක් වූහ. උන්වහන්සේ ගේ සාර්ථක හා සශ්‍රීක පන්සාලිස් වසක ධර්මදූත සමය තුළ උන්වහන්සේ තම වචන ක්‍රියාවට පරිවර්තනය කළ හ. කිසි විටෙක මිනිස් දුබලතා නිරූපණය නො කළ හ. කිසි ම පහත් ආශාවක් විද්‍යමාන නො කළ හ. මෙතෙක් පහළ වූ සියළු සදාචාර පද්ධතීන් අතර බුදුරදුන් ගේ සදාචාර ධර්ම පද්ධතිය තරම් උසස් වෙනෙකක් නොමැත.

මහාචාර්ය මැක්ස් මුලර්
(ජර්මන් ජාතික පඬිතුමා)

14 වන පරිච්ඡේදය

බුද්ධ වග්ග



සියල්ල දත් පිරිපුන් නුවණැති බුදුරදුන් කිසිවකුට වසඟ කරගත නො හැක.

179. යස්ස ජිතං නාවජීයති
ජිතම’ස්ස නො යාති කොචි ලොකෙ
තං බුද්ධමනන්තගොචරං
අපදං කෙන පදෙන නෙස්සථ? (14:1)

දිනූ දේ බෑ පරදවන්නට
කිසිවෙකුට බෑ හඹා යන්නට
විපුල නුවණැති බුදුන් කිසිවිට
කාට හැකි වෙද අරන් යන්නට

කාට හැකිවෙද - බුදුන් පොළඹනු?
14 (1) මාර දූවරුන්ගේ විත්තිය (179 සහ 180 ගාථා)

බුදුරදුන් මේ ගාථා දේශනා කළේ බෝ මැඩ වැඩ සිටිමිනි. උන්වහන්සේ මේ ගාථා කුරුරට **මාගන්දිය** බමුණාට ද යලි වදළහ.

කුරුරට විසූ මාගන්දිය බමුණාට මාගන්දියා නම් දියණියක් වූවා ය. ඕ අභිරමණීය රූප සෞන්දර්යයෙන් සමන්විත වූවා ය. ධන ධාන්‍යාදියෙන් හා යශෝකීර්තියෙන් සමන්විත වූ බොහෝ ක්‍ෂත්‍රිය කුමාරවරු හා බ්‍රාහ්මණ තරුණයෝ ඇය විවාහ කර ගනු කැමතිව "ඔබ ගේ දියණිය විවාහ කර දෙන්න" යි මාගන්දිය බමුණා වෙත ආයාචනා ඉදිරිපත් කළ ද "මගේ දියණියට ඔබ සරිලන්නේ නැත" යයි හේ ඒ යෝජනා ප්‍රතික්ෂේප කළේය.

දිනක් හිමිදිරියේ කුළුණින් ලොව බලන භාග්‍යවතුන් වහන්සේ මාගන්දිය බමුණාට පිහිට වීමට සිතූහ. බමුණා දිනපතා ගිනි පුද කරන තැනට පා සිවුරු රැගත් බුදුහු හිමිදිරි උදයේ ම වැඩම කළ හ. බුදුන් දුටු මාගන්දිය උන්වහන්සේ ගේ අභිරාම රූප කාය දැක ප්‍රසන්නව මේ නම් මාගේ දියණියට ගැලපෙන මහා පුරුෂයෙක් යැයි සිතා උන් වහන්සේ හමුවට පැමිණ "මොහොතකට නවතින්න. මට එකම එක දියණියක් සිටියි. ඕ තොමෝ රූප ශෝභාවෙන් කිසිවකුට නො දෙවැනි ය. ඇයට ගැලපෙන පුරුෂයකු සොයමින් මෙතෙක් වෙහෙසුණෙමි. නා නා ප්‍රකාර කුමාරවරුන් ඇයගේ අත පැතුව ද මම ඇය කිසිකෙනෙකුට සරණ පාවා නොදුන්නෙමි. මම ඇය ඔබට පාවා දෙමි. මඳක් ඉවසන්න"යි පවසා වහා නිවසට දිව ගියේ ය.

නිවසට දිව ගිය බමුණා සිය දියණිය මනාව සරසා බුදුරදුන් හමුවට කැඳවාගෙන ආවේ ය. බමුණාගේ බිරිඳ ද ඒ සමගම ආවා ය. ඒ වන විට භාග්‍යවතුන් වහන්සේ එතැන වැලි මත පා සටහනක් තබා පෙනෙන නො පෙනෙන මානයේ ගසක් මුල වැඩ සිටියහ.

"කෝ ඔය කියන තරුණයා?" යි විමසමින් විපරම් කළ බැමිණියට "මෙතැන හිටියා. දැන් පේන්න නැහැ" යි බමුණා පිළිවදන් දුන්නේ ය. බුදුරදුන් වැලි මත තැබූ පා සටහන දුටු බැමිණිය " මේ නම් කාමාස්වාදය පතන්නකු ගේ පිය සටහනක් නො වේ. මොහු අපගේ දියණිය නො පතනු ඇත" යි පැවසුවාය.

"ඔබ මේ තලියක කිඹුලන් දකිනවා! මම මගේ දියණිය ගැන යෝජනාව දැනට ම ඉදිරිපත් කරලයි තියෙන්නේ. එයා බෑ කිව්වෙ නැහැ. මම කොහොම හරි එයාව සොයා ගෙන දුව විවාහ කර දෙනවා" යි පැවසූ බමුණා වට පිට පීරමින් බුදුන් සොයන්නට පටන් ගත්තේය. "ඔබ කැමති දෙයක් කියන්න. කැමති දෙයක් කරන්න. හැබැයි, මේ පිය සටහන් අයිතිකාරයා නම් රාගය තුනී කළ කෙනෙක්. මම ඒක සහතික කරලාම කියනවා" යි කී බැමිණිය උපේක්ෂිත වූවාය. "ඔව්, මේක මට කර ගන්න අරින්න. වැඩේ අවුල් කරන්නේ නැතිව කට වහගෙන ඉන්න" යි බමුණා කියා සිටියේ ය. තුරු සෙවනක සංසුන්ව වැඩ සිටි බුදුන් නෙත ගැටුණු බමුණා "අන්න ඉන්නවා එතුමා" යි පවසමින් එතැනට ගියේය. "ස්වාමීනි, මම මගේ දුවයි බිරිඳයි කැඳවාගෙන ආවා. ඔබ වහන්සේට මගේ දියණිය ගැලපෙනවා නොවේ ද?" යි ඔහු පැවසූ විට බුදුපියාණෝ ඔහු අමතා "බ්‍රාහ්මණය, මට ඔබට කියන්න දෙයක් තියෙනවා. මට ඇහුම්කන් දෙන්න" යි පැවසූ හ. "හොඳයි මම අහගෙන ඉන්නම්"යි කී බමුණා එකත්පස් විය.

භාග්‍යවතුන් වහන්සේ මහා අභිනික්මණෙහි පටන් තමන් වහන්සේගේ අතීත කථාව ඔහුට ප්‍රකාශ කළහ. තමන් කන්ථක අසු පිට නැගී මහ රෑ අභිනික්මන් කළ අයුරු, මාරයා තමන්ට සක්විති රාජ්‍යය ගැන කී කතා. එය ප්‍රතික්ෂේප කරමින් තමා සකල සත්වයන් සසරින් එතර කරන්නට සම්මා සම්බුද්ධත්වය ලබන්නට කෙලෙසුන් දමනයට ප්‍රයත්න දරන බව පැවසූ විට මාරයා "එසේ නම් මම ඔබ පසු පස දිගට ම ලුහු බඳිමි.

සුළු හෝ ප්‍රමාදයක් අල්ලා ගනිමි" යි අභියෝග කළ අයුරු, එහෙත් සත් වසරක් ම ලුහු බැඳීමෙන්වත් මරුවාට තමන්ගේ පමාදොසක් සොයා ගන්නට බැරි වූ හැටි, මාරයා ගේ බල බිඳීමෙන් බැහැරට යමින් තමන් සම්මා සම්බුදු වූ විට බලාපොරොත්තු සුන් වූ මාරයා දුක්මුසුව සිටි අයුරු උන්වහන්සේගේ විස්තර කළ සේක.

විස්තරාත්මක අනුවාදය (179 ගාථාව)

යස්ස ජිතං ලොකෙ න අවජීයති, අස්ස ජිතං කොචි නෝ යාති අනන්තගොචරං අපදං තං බුද්ධං කෙන පදෙන නෙස්සථ.

යස්සඃ යම් බුදු කෙනෙකුන් විසින්; **ජිතංඃ** (ඒ ඒ මාර්ග යෙන්) දිනූ (කෙලෙස්); **නාවජීයතිඃ** නපුරු කොට දිනන ලද නම් නොවේ ද; **අස්සඃ** ඒ බුදුන් විසින්; **ජිතංඃ** දිනූ (කෙලෙස් රැස); **ලොකෙඃ** ලෝකයෙහි; **කොචිඃ** කිසි ක්ලේශයෙක්; **නො යාතිඃ** ලුහුබැඳ නො යා ද; **අනන්තගොචරංඃ** අප්‍රමාණ වූ ගෝචර ඇති දැන; **අපදංඃ** (රාගා දී) පදයක් (හේතුවක්) නැති; **තං බුද්ධංඃ** ඒ සම්බුදුරජාණන් වහන්සේ; **කෙන පදෙනඃ** කවර පදයකින් (කාරණයකින්); **නෙස්සථඃ** (තොපගේ පියාණන් වූ මරහු වෙතට) ගෙන යව් ද?

බුදුරදුන් ගේ ජයග්‍රහණය පරාජයක් බවට පත් කරන්නට හැකියාවක් නැත. උන් වහන්සේ විසින් පැරදවූ කිසිම ක්ලේශයක් නැවත උන්වහන්සේ හඹා එන්නට සමත් වන්නේ නැත. උන්වහන්සේ ආ මග සටහන් තබා නැත. එහෙයින් කවර මග සටහන් අනුව උන්වහන්සේ රැගෙන යා හැකි ද?

බුදුරදහු කවර කරුණකින් වත් කිසිවකුට වසඟ කරගත නො හැක.

180 යස්ස ජාලිනී විසත්තිකා
තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවෙ
තං බුද්ධං අනන්තගෝචරං
අපදං කෙන පදෙන නෙස්සථ? (14:2)

දැල්වැනි විස වැනි තණ්හා සුන් කොට
ඇත්නම් බැහැ ඔහු බැඳ ගෙන යන්නට
සියළු දක්නා බුදුන් බඳින්නට
කාහට හැකිවෙද ඇරගෙන යන්නට

කාට හැකිවේද - බුදුන් පරදනු?

14 (1) මාර දුවරුන් ගේ විත්තිය (179 සහ 180 ගාථා) (ඉතිරි කොටස)

මාරයා දුකින් සිටිනු දැකීමෙන් ඔහුගේ දියණියෝ කම්පාවට පත්ව පියාණනි, ඔබ මහත් දොම්නසින් සිටින්නේ කවර හෙයින් ද? අපට කළ හැකි යමක් ඇත්නම් අපි නො කරමු ද"යි විමසූහ.

තණ්හා, රතී, රගා යන දුවරුන් ඇමතූ මාරයා "සිද්ධාර්ථ පරදවන්නට මට බැරි විය"යි පැවසූ විට "පියාණනි, එය ලොකු දෙයක් නො වේ. අපි ඔහු වසඟ කොට ඔබ පා මුලට ගෙන එමු" යි කියා බුදුරදුන් හමුවට ගිය හ. අතිශයින් ම රූප සම්පන්න වූ ඒ මාර දියණියෝ තිදෙනා " ස්වාමීනි, ඔබ වහන්සේ ගේ අත් පා මෙහෙවරට ආවෙමු. අප පිළිගන්න" යි පැවසුව ද නෙත් අගින් බලා දක්වන සැලකිල්ලක්වත් ඔවුනට උන්වහන්සේගෙන් නො ලැබිණි. "පිරිමින් ගේ රුචි විවිධය. සමහරු මැදිවියේ ගැහැණුන්ට ද සමහරු තලතුනා වූවනට ද රිසි වෙති. නව යෞවන අයට රුචි නැත්තම් මෙතෙම එබන්දනට රුචි ඇත" යි කියා ගත් ඔවුහු මැදි විය හා තලතුනා වියේ රූ සිරි ද මවා පාමින් විවිධ රංග ලීලාවන් පාමින් බුදුන් වසඟ කර ගන්නට වෑයම් කළ හ. එහෙත් ඒ එකම රුවකිනුදු, එකම වෙසකිනුදු බුදුහු නො සැලී සිටිය හ.

මාර දූවරුන් විවිධ අභිනය දක්වමින් පොළඹවන්නට වෑයම් කරන විට "කරුණාකර ඉවත්ව යන්න. ඔබ මෙහි පාන රැඟුම් හා නැටුම් දැක්විය යුත්තේ රාගය හා අනිකුත් කෙලෙස් දුරු නොකළ පුහුදුන් මිනිසුන් ඉදිරියේ ය. මා වැන්නන් ඉදිරියේ කුමට වෙහෙසෙනවා ද? මම සියළු කෙලෙසුන් නසා දමා ඇත්තෙමි. මා වසඟ කර ගැනීමට වෙහෙසෙන්නේ කුමට ද?" යි භාග්‍යවතුන් වහන්සේ පැවසූහ. මේ සියළු අත් දැකීම් ද මාගන්දිය බමුණාට විස්තර කර අනතුරුව භාග්‍යවතුන් වහන්සේ "මාගන්දිය, කලකට පෙර ඒ වා-පිත්-සෙම් දෝෂ වලින් තොර රන් රුවැති ප්‍රියංකර රූප සෞන්දර්යයෙන් සපිරි ඒ තණ්හා, රතී, රගා මා වෙත පැමිණි අවස්ථාවේත් මට බින්දු මාත්‍ර හෝ රාගයක් ඇති නොවීය. ඔබ ගේ දියණිය ගේ දෙතිස් කුණපයෙන් පිරි සිරුර පිටින් හැඩ වැඩ දමා විසිතුරු කළ අසුචි කළයක් වැනිය. මම එය පහසන්නට රුචි වෙම් ද?" යි විමසූ හ.

විස්තරාත්මක අනුවාදය (180 ගාථාව)

යස්ස කුහිඤ්චි නෙතවේ ජාලිනී විසත්තිකා තණ්හා නත්ථි අනන්ත ගොචරං අපදං තං බුද්ධං කෙන පදෙන නෙස්සථ?

යස්ස: යම් බුදුකෙනෙකු; **කුහිඤ්චි නෙතවේ**: කොතනකට හෝ ගෙන යාමට; **ජාලිනී**: දැලක් වැනි; **විසත්තිකා**: විසක් වැනි; **තණ්හා**: තෘෂ්ණාව; **නත්ථි**: නැත්ද; **අනන්ත ගොචරං**: අසීමිත විෂය ක්ෂෙත්‍රයක් දැකිය හැකි; **අපදං**: (රාගා දී) පදයක් (හේතුවක්) නැති; **තං බුද්ධං**: ඒ සම්බුදුරජාණන් වහන්සේ; **කෙන පදෙන**: කවර පදයකින් (කාරණයකින්); **නෙස්සථ**: ගෙන යව් ද?

බුදුරදුන් ගේ තෘෂ්ණාව මුළුමනින්ම සුන්කර ඇත. උන් වහන්සේට අසීමිත දේ දැකගත හැකිය. එහෙයින් පිය සටහන් නැති ගමනක් ආ ඒ බුදුන් කවර සටහන් අනුව ආපසු ගෙන යා හැකි වේ ද?

විවරණය

හය වසරක දුෂ්කර චර්යාවකින් පසු වයස තිස් පහේ දී බෝසත්හු සම්මා සම්බුදු පදවිය ලත් හ. කිසිම බාහිර ලෝකෝත්තර බල වේගයක සහායයක් හෝ ආභාසයක් හෝ ආධාරයක් නොලබා ස්වෝත්සාහයෙන් ම සම්බෝධිය ලබා ගැනීමට උන්වහන්සේ සමර්ථ වූහ. සව් කෙලෙසුන් නිසා උතුම් වූ බුද්ධ ඥානය ලත් හෙයින් උන් වහන්සේට 'බුද්ධ' යැයි කියනු ලැබේ.

උන්වහන්සේ ජන්ම ලාභය ලද්දේ පෘථග්ජන මනුෂ්‍යයකු වශයෙනි. එහෙත් ස්වාධීන ප්‍රයත්නයක ප්‍රතිඵල වශයෙන් තම චිත්තයෙහි මහත් විපර්යාසයන් කර පෘථග්ජනත්වයෙන් මිදී සම්බෝධිය ලබා බුදුවරයෙක් වන්නට උන්වහන්සේ සමර්ථ වූහ.

තමන් වහන්සේ දෙවියකු, දේව පුත්‍රයකු, දේව නියෝජිතයෙකු හෝ දෙවියන් වෙනුවෙන් පෙනී සිටින කථිකයකු බව නොකී එක ම ශාස්තෘවරයා භාග්‍යවතුන් වහන්සේ ය. උන් වහන්සේ තමන් මනුෂ්‍යයකු බව පිළිගත්තා පමණක් නොව අන් සියලු මනුෂ්‍යයන්ට ද ලබා ගත හැකි ආධ්‍යාත්මික අධිගම විශේෂයක් තමන් ලද හෙයින් බුද්ධත්වය තම ඒකාධිකාරයක් සේ තබා නො ගත්හ. සියල්ලන්ට ම තමන් මෙන් විය හැකි බව උන්වහන්සේ පැහැදිලි කළහ. එමෙන් ම තමන් වදාළ ධර්මය ද සනාතන ලෝක ධර්මතාව මිස තම නිර්මාණයක් නොවන බව ද පළ කළහ. පවත්නා යථා තත්වය අවබෝධ කර ගත් හෙයින් උන් වහන්සේ 'බුද්ධ' නම් වූහ.

දැහැනෙහි ඇලුණු කෙළෙස් සන්සිඳුවන නිවනෙහි ඇලුණු සම්බුදුරදුනට දෙව් මිනිස්සු කැමති වෙති.

181. යෙ ඣානපසුතා ධීරා
නෙක්ඛම්මූපසමෙ රතා
දෙවා'පි තෙසං පිහයන්ති
සම්බුද්ධානං සතීමතං (14:3)

දැහැන් වඩන නැණවතුන්ට
නික්මීමෙන් විඳින සතුට
දෙවියොත් ප්‍රිය වෙති ඔවුනට
සතිමත් සම්බුදු රදුන්ට

නමදිති සුරතර - උතුමන් බුදුවර

14 (2) තුසිත දෙව් ලොවින් මිහිබට වගයි (18 ගාථාව)

තුසිත දෙව් ලොව සිට මනු ලොවට ආපසු වැඩම කළ අවස්ථාවේ දී **සාරිපුත්ත මහ රහතන්** වහන්සේ පැවසූ ප්‍රිය වචන ඇසූ භාග්‍යවතුන් වහන්සේ සංකස්ස නුවරදී මේ ගාථාව වදාළ සේක.

වරක් භාග්‍යවතුන් වහන්සේට මිසදිටුවන්ගේ අභියෝගයකට පිළිතුරු වශයෙන් සැවැත් නුවරදී යමා මහ පෙළහර පාන්නට සිදු විය. භාග්‍යවතුන් වහන්සේ ඉන් අනතුරුව මාතෘ දිව්‍ය රාජයාණන්ට අභිධර්මය දේශනා කරනු පිණිස තව්තිසා දෙව් ලොවට වැඩම කළහ. වැසි තුන් මසම එහි වැඩ වෙසෙමින් දෙව් බඹුන්ට අභිධර්මය දේශනා කළහ. උන්වහන්සේගේ දේශනාවසානයෙහි බොහෝ දිව්‍ය බ්‍රහ්මයෝ සෝවාන් ඵලය ලද හ.

භාග්‍යවතුන් වහන්සේ දක්නට නැති හෙයින් උන් වහන්සේ කොහි වැඩම කළ සේක් දැයි මිනිස්සු මුගලන් මහ තෙරුන්ගෙන් විමසූ හ. තමන් දිවැසින් එය දන්නා මුත් අන් තෙරවරුන්ට ද දිවැස් ඇති බව ජනතාව අතර පතළ කරනු පිණිස අනුරුද්ධ තෙරුන්ගෙන් විමසන්නැයි උන් වහන්සේ ඔවුන්ට උපදෙස් දුන්හ. ඔවුන් අනුරුද්ධ තෙරුන් කරා එළඹ විමසූ විට උන්වහන්සේ "උන්වහන්සේ තාවතිංස දේව ලෝකයෙහි පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි වැඩ හිඳිමින් සිය මාතෘ දිව්‍ය රාජයාණන්හට අභිධර්මය දේශනා කරන සේක." යි ඔවුනට පිළිතුරු දුන් හ.

එම වස් කාලය සාරිපුත්ත තෙරුන් ගත කළේ සැවැත් නුවරින් තිස් යොදුනක් ඔබ්බෙහි පිහිටි සංකස්ස නගරයේ ය. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ වෙතින් අභිධර්මය උගනිමින් උන්වහන්සේ එය විශාල පැවිදි පිරිසකට ඉගැන්වූ හ.

වස් කාලය නිම වූ විට මොග්ගල්ලාන මහ රහතන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ බැහැදකිනු වස් තාවතිංස දේව ලෝකයට වැඩම කළහ. බුදුරදුන් වස් නිම කොට, සැරියුත් මහ තෙරුන් වැඩ විසූ තැනට ආපසු වැඩම කරන බව උන්වහන්සේට දැන ගන්නට ලැබිණි.

දැනුම්දුන් පරිදිම භාග්‍යවතුන් වහන්සේ අස්සයුජ මාසයේ පුර පසළොස්වක් පොහෝදින සඳ බබලන රැයෙහි සවණක් ගණ බුදුරැස් විහිදවමින් සංකස්ස නගරද්වාරයට දෙව්ලොව සිට අවතීර්ණ වූහ. උන්වහන්සේගේ එක් පසෙකින් දෙව්වරු මහ පිරිසක් ද අනෙක් පසින් බ්‍රහ්මයෝ මහ පිරිසක් ද වූහ. සැරියුත් හිමි ප්‍රධාන මහ පිරිසක් භාග්‍යවතුන් වහන්සේ පිළිගත්හ. මුළු නුවරම ඒකාලෝකව තිබිණි. මේ මහත් අසිරියෙන් ප්‍රමුදිත වූ සැරියුත් තෙරණුවෝ "ස්වාමීනි මෙබඳු ආශ්චර්යක් මින් පෙර දැක විරූනම් නැත. ඇත්තට ම ඔබ වහන්සේ නම් සුර-නර පූජිතයෝමය. බ්‍රහ්මයන්ගේ පවා ගෞරවාදරයට පාත්‍රවූවෝම ය. මේ නම් මහත් ආනන්දකර, ප්‍රමෝදජනක සිද්ධියකි ස්වාමීනි" යි පැවසූ හ. බුදුහු එවිට "මපුත් සැරියුත් තෙරණුවනි, උතුම් ගුණාංග ඇති බුද්ධාදී උත්තමයෝ ඒකාන්තයෙන්ම දෙව්-බඹ-නර කාගේත් ප්‍රසාදයට, අභිවාදනයට ලක්වන්නෝමය" යි ධර්ම දේශනා කළහ.

දේශනාවසානයෙහි සාරිපුත්ත හිමියන් ගේ ශිෂ්‍ය භික්ෂු පිරිස-රහත් ඵලයෙහි පිහිටි අතර තවත් බොහෝ ගිහි -පැවිදි ශ්‍රාවකයෝ සෝවාන් ඵලයෙහි පිහිටිය හ.

විස්තරාත්මක අනුවාදය (181 ගාථාව)

යෙ ඣානපසුතා ධීරා නෙක්ඛම්මූපසමෙ රතා සතීමතං
තෙසං සම්බුද්ධානං දෙවා අපි පිහයන්ති

යෙ ධීරා: යම්කිසි නැණවත් පිරිසක්; **ඣානපසුතා**: ධ්‍යාන වඩත් ද; **නෙක්ඛම්මූපසමෙ රතා**: නෛෂ්ක්‍රම්‍යයෙහි හා කෙලෙස් දමනයෙහි ඇළුණෝ ද; **සතීමන්තං**: සතිය වැඩූ; **තේසං සම්බුද්ධානං**: ඒ සම්බුදුවරුනට; **දෙවා අපි**: දෙවියෝ ද; **පිහයන්ති**: ප්‍රිය වෙති.

නුවණැති, ධ්‍යාන වඩන, නෛෂ්ක්‍රම්‍යය මගින් කෙලෙස් දවන, සිහිය වැඩූ ඒ සම්මා සම්බුදුවරුන්ට දෙවියෝ ද ප්‍රිය වෙති.

විවරණය

දෙව්වරු නම්, දේව ලෝකවල වසන දීප්තිමත් ශරීර ඇති පුණ්‍යවන්ත සත්වයෝ ය. තමන් විසින් රැස් කරගත් කුශල කර්මවල යහපත් විපාක වශයෙන් විවිධ පංචකාම සම්පත් අනුභව කිරීමේ භාග්‍යය දෙව්වරුනට උරුමව ඇත. එහෙත් ඒ සියලු සම්පත් පුණ්‍ය කර්ම බලය ඇති තාක් පමණි. පින් නිම වූ පසු මහලු වීමකින් තොරව එහි චුත වී මනුෂ්‍ය ලෝකයෙහි උපදිති. දෙව්වරු වර්ග කිහිපයකි.

1. කාමාවචර දෙව්වරු
2. රූපාවචර දෙව්වරු හා
3. අරූපාවචර දෙව්වරු වශයෙනි.

දෙව්වරුන්ට ප්‍රයෝජන ඇත්තේ පිනෙන් හෙයින් තමන් පිනක් කරන හැම වතාවකම දෙවියන්ට පින් දීම බෞද්ධයන්ගේ සිරිත ය. ගෘහස්ථයන්ට වහා නිවන් සුව ලැබීම දුෂ්කර හෙයින් ඔවුනට දිව්‍යලෝකවල උපදින මග කියාදීම භික්ෂු සංඝයා ගේ යුතුකමක් බව (සග්ගස්ස මග්ගං ආචික්ඛන්ති) සිගාලෝවාද සූත්‍රයෙහි දක්වා තිබේ.



මිනිසත් බව ලැබුම හා දිවි රැක්ම දුෂ්කර ය. සදහම් ඇසුම හා බුදු උපත ලැබුම ද දුර්ලභ ය.

182. කිච්ඡො මනුස්සපටිලාභො කිච්ඡං මච්චාන'ජීවිතං කිච්ඡං සද්ධම්මසවණං කිච්ඡො බුද්ධානං උප්පාදො (14:4)	මිනිස් ලොව උත්පත්තිය - කලාතුරෙන් ලැබෙන දෙයකි ලැබූ දිවිය ගත කිරීම - අමාරුවෙන් කරන දෙයකි දහම් අසන වාසනාව - අපහසුවෙන් ලබන දෙයකි බුදු කෙනකුන් පහල වීම - ඉතා දුලබ උතුම් දෙයකි

මෙ සිවු දේම - දුලබ ලැබුම

14 (3) ඒරකපත්‍ර නාගරාජයාගේ කතාව (182 ගාථාව)

ඒරකපත්‍ර නම් නාගරාජයා ඇරබ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළේ බරණැස අසල වාසය කළ සමයේ ය.

ඒරකපත්‍ර නාගරාජයා පෙර ජන්මයෙහි කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගේ ශාසනයෙහි පැවිදිව සිටියේ ය. දිගු කලක් ශික්ෂාකාමී භික්ෂු නමක් වශයෙන් පැවිදි දම් පිරුව ද එක් ඉතා සුළු ශික්ෂාවක් පිළිබඳව තමන්ට ම ඇති වූ සැකයක් හේතුවෙන් හේ නාගරාජව උපන්නේය. නාග ජන්මය ලත් දා පටන් ම ඔහු බලා සිටියේ බුදු කෙනකුන් පහළ වන තුරුය. බුදු කෙනකුන් පහළව ඇත්දැයි සොයා ගැනීම පිණිස හෙතෙම කදිම උපක්‍රමයක් යෙදීය. ඔහුට ඉතා රූමත් දියණියක් සිටියා ය. තම දියණියට ගැඹුරු දාර්ශනික ප්‍රශ්න කිහිපයක් ඉගැන්වූ හේ ඒවාට පිළිතුරු දෙන්නට සමත්වන අයකුට ඇය විවාහ කර දෙන බව පළ කළේය. මසකට දෙවරක් ඕ එළිමහනේ රැඟුම් පෑවාය. ගී ගැයුවාය. එහි පැමිණෙන ප්‍රේක්ෂකයන්ට ඕ තම ප්‍රශ්න ඉදිරිපත් කරයි. ඇය විවාහ කර ගන්නට බොහෝ දෙනා කැමති වූව ද ඒ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්නට සමත් අයකු සොයා ගැන්ම දුෂ්කර විය. එක් දිනක් භාග්‍යවතුන් වහන්සේගේ කුළුණු දැලට උත්තර නම් මානවකයෙක් ගෝචර වූයේය. ඔහුට ඒරක පත්‍රගේ දියණිය ගේ ප්‍රශ්න මගින් සෝවාන් ඵලය ලැබීමේ භාග්‍යය ඇති බව ද උන්වහන්සේ දුට හ. ඔහු භාග්‍යවතුන් වහන්සේට ගෝචර වූයේ ඒරක පත්‍රගේ දියණිය හමුවට යමින් සිටින අතරය. එහෙයින් උන්වහන්සේ ඔහු මග නවතා ඔහුට ඒ ප්‍රශ්න වලට පිළිතුරු උගන්වා වදාළ හ. භාග්‍යවතුන් වහන්සේ උගන්වන පිළිතුරු අනුව සිතීමෙන් හේ සෝවාන් ඵලය ලැබීය. සෝවාන් ඵලය ලත් පසු ඒරක පත්‍රගේ දියණිය ගැන වූ ඇල්ම ඔහු වෙතින් තුරන් විය. එහෙත් අන්‍යයන් ගේ ප්‍රයෝජනය පිණිස ප්‍රශ්න වලට පිළිතුරු දීම සඳහා හේ එහි ගියේය.

ප්‍රථම ප්‍රශ්න හතර වූයේ මේවාය:-

1. කවර දෙයකට අධිපති තැනැත්තා රජෙක් නම් වේ ද?
2. රජුගේ ඓශ්වර්යය නම් කුමක් ද?
3. විරජ වන්නේ කෙසේ ද?
4. බාලයකු යයි කියනු ලබන්නේ කෙසේ වූවිට ද?

මේවාට බුදුරදුන් ඉගැන්වූ පිළිතුරු මේවාය.

1. යම් කෙනෙක් තම ඉන්ද්‍රිය හය පාලනය කරයි නම් හේ රජ කෙනෙකි.
2. රාජ ඓශ්වර්යය නම් ඉන්ද්‍රිය හයට අරමුණු වන දේ ය. එහි ඇලෙන්නෝ එම ඓශ්වර්යය විඳිති.
3. විරජ නම් රූපාදී අරමුණු හයෙහි නො ඇලෙන තැනැත්තා ය.
4. බාලයා නම් රූපාදී අරමුණු වල ඇලෙන තැනැත්තා ය.

උත්තර නම් මානවකයා මේ පිළිතුරු හතර දුන් විට නාග කන්‍යාව තවත් ප්‍රශ්න තුනක් විමසුවා ය.

1. බාලයන් ගෙනයනු ලබන්නේ කුමකින් ද?
2. නුවණැත්තා එය කවර අයුරින් වළකයි ද?
3. යෝග ක්ෂෙම හෙවත් නිරුපද්‍රත වන්නේ කවර අයුරින් ද?

මේ ප්‍රශ්න තුන ඇසූ විට උත්තර තමාට උගන්වා තිබුණු පරිදි

1. කෙළෙස් නැමැති ඕඝයෙන් (මහ ගංවතුරෙන්) බාලයෝ ගෙන යනු ලැබෙති.
2. නුවණැත්තා සම්‍යග් ප්‍රධාන වීර්යය මගින් එයින් වළකියි.
3. චතුර්විධ යෝගයෙන් වෙන්වූවන්ට උපද්‍රව නැත"යි පිළිතුරු දුන්නේය.

පිළිතුරු අසා සිටි නාගරාජයා බුදුන් ලොව පහළව ඇති බව දැන අති මහත් ප්‍රීතියට පත් වූයේය. තමා බුදුන් හමුවට ගෙන යන සේ හෙතෙම උත්තර ගෙන් ඉල්ලා සිටියේ ය. ඔහු සමග ගොස් බුදුන් දැකගත් හේ තමන් කසුප් බුදුන් දවස පැවිදිව දිගුකල් සිල් පිරූ නමුත් ඔරුවක නැගී ගිය දවසක එරුපතක් (තණකොළ වර්ගයක්) සිඳ ඉන් වන් ඇවත දෙසාගන්නට අවස්ථාව නොලැබ මිය ගොස් මේ තිරශ්චීන ජන්මය ලැබූ බව හෙතෙම බුදුරදුන් හමුවේ කියා සිටියේය. ඔහු ඇමතූ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාවෙන් මනුෂ්‍යාත්මභාවයක් ලැබීමේ දුෂ්කරත්වය වදාළ හ.

විස්තරාත්මක අනුවාදය (181 ගාථාව)

මනුස්ස පටිලාභෝ කිච්ඡෝ මච්චාන ජීවිතං කිච්ඡං සද්ධම්ම සවණං කිච්ඡං බුද්ධානං උප්පාදෝ කිච්ඡෝ

මනුස්ස පටිලාභෝ: මනුෂ්‍යාත්ම භාවයක් ලැබීම; **කිච්ඡෝ**: අමාරුවෙන් කර ගත යුත්තකි; **මච්චාන ජීවිතං**: උපන් සත්ත්වයන් ගේ ජීවිතය; **කිච්ඡං**: දුෂ්කරය; **සද්ධම්ම සවණං**: බණ ඇසීම; **කිච්ඡං**: දුකසේ ලද යුත්තකි; **බුද්ධානං උප්පාදෝ**: බුදුවරුන් පහළ වීම; **කිච්ඡෝ**: දුර්ලභය.

මනුෂ්‍යාත්ම භාවයක් ලැබීම අපහසු කාර්යයකි. සත්වයන් ගේ ජීවිතය දුෂ්කරය. ධර්මශ්‍රවණය දුර්ලභ ය. බුදුවරුන් ගේ උපත ද දුර්ලභ ය.

විවරණය

මච්චාන ජීවිතං නම් උපන් සතුන් ගේ ජීවිතයයි. සත්ත්වයන් මච්ච නමින් හඳුන්වන්නේ මරණය නියත කොට සිටිනා හෙයිනි. සියලු සත්ත්වයන් අතර මරණය හරි හැටි තේරුම් ගන්නට සමත් එක ම සත්වයා මනුෂ්‍යා වීම වැදගත් ය.

බුදුවරුන් ගේ අවවාදය සියලු පව් නොකිරීමට හා සියලු කුසල් කිරීමටත් සිය සිත පිරිසිදුකර ගැනීමටත් ය.

183. සබ්බපාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්තපරියොදපනං
එතං බුද්ධාන'සාසනං (14:5)

නොකර කිසි පාපය
වැඩි දියුණු කර කුසලය
කරනු සිත දමනය
මේය සම්බුදු රදුගෙ සස්නය

හඳුනන්න - බුදු සස්න

14 (4) අනඳ මහ තෙරුන් විමසු ප්‍රශ්නයක් (183, 184, 185 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවස්ති නගරයෙහි ජේතවනාරාම විහාරයෙහි වාසය කළ සමයෙහි **ආනන්ද මහ තෙරුන්** විමසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් මේ ගාථා තුන වදාරන ලදී.

වරක් ආනන්ද හිමියන් විවේක සුවයෙන් සිය කුටියෙහි වැඩ සිටින අතර උන් වහන්සේට මෙබඳු අදහසක් පහල විය. "භාග්‍යවතුන් වහන්සේ විසින් පෙර බුදුවරුන් හත් නමක ගේ තොරතුරු අපට දක්වන ලදී. උන්වහන්සේලා ගේ මවුපියන්, ආයු කාලය, බුද්ධත්වය ලද බෝධීන් පිළිබඳ විස්තර, උන්වහන්සේලා ගේ ශ්‍රාවකයන් පිළිබඳ විස්තර, අග්‍රශ්‍රාවකයන් වහන්සේලා ප්‍රධාන දායකයන් ආදී බොහෝ විස්තර දේශනා කරන ලදී. එහෙත් උන් වහන්සේලා ගේ ශාසනයන්හි උපෝසථ කර්මය කළ ආකාරය පිළිබඳ කිසිම තොරතුරක් අපි නොදනිමු. එය අද අපට පොහොය කරන ආකාරයෙන් ම කරන ලද්දේ ද, නැතහොත් වෙනත් විදියකට කරන ලද්දේද යන්නත් දැන ගන්නට ඇත්නම් මැනවි."

මේ කුතුහලය සංසිඳුවා ගනු පිණිස උන් වහන්සේ බුදුරදුන් හමුවට වැඩම කළහ. භාග්‍යවතුන් වහන්සේ ඒ පිළිබඳ යථා තත්වය ආනන්ද හිමිපාණන්ට මනාව පැහැදිලි කර දුන්හ. ඒ අනුව, මේ සත් බුදුවරුන් දවස උපයුක්ත ගාථාවල වෙනසක් නොවී ය. එහෙත් විපස්සි බුදුරජාණන් වහන්සේ ගේ සමයෙහි දී උපෝසථ කර්මය කරන ලද්දේ සත් වසරකට එක් වරක් බැගිනි. එක් වරක් උන් වහන්සේ අවවාද කළ විට එය සත් වසකට ප්‍රමාණවත් විය. සිඛී සහ වෙස්සභූ බුදුවරුන් උපෝසථ කර්මය කළේ වසර හයකට වරකි. කකුසඳ හා කෝණාගමන බුදුවරුන්ගේ කාලයන්හි උපෝසථ කර්මය වසරක් පාසා කරනු ලැබිණි. කස්සප බුදුහු හය මසකට වරක් උපෝස්ථය කළහ. ඒ ඒ බුදුවරුන් ගේ අනුශාසනා ඒ කාල සීමාවනට හොඳට ම ප්‍රමාණවත් වූයේ ය. කෙසේ වුවද සෑම බුදුවරයකුම දේශනා කරන ඕවාද ප්‍රාතිමෝක්ෂ ගාථා එක සමාන ය. එසේ පැහැදිලි කළ බුදුරජාණන් වහන්සේ එම ගාථා තුන දේශනා කර වදාළහ.

විස්තරාත්මක අනුවාදය (183 ගාථාව)

සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා සචිත්ත
පරියොදපනං එතං බුද්ධාන සාසනං

සබ්බපාපස්ස: සියලු පව්; **අකරණං**: නොකිරීම;
කුසලස්ස: **කුසල්**; උපසම්පදා: වැඩි කර ගැනීම;
සචිත්ත: තම සිත; **පරියොදපනං**: දමනය කර ගැනීම;
එතං: යන මෙය; **බුද්ධාන සාසනං**: බුදුවරුන්ගේ
අනුශාසනයයි.

සියලු පව් නො කිරීම, කුසල් වැඩි වැඩියෙන් කිරීම, තම සිත දමනය කර ගැනීම යන මෙය බුදුවරුන්ගේ පණිවුඩයයි.

විවරණය

සබ්බ පාපස්ස අකරණං - මේ ගාථාවෙන් බෞද්ධ ශික්‍ෂා මාර්ගය මුළුමනින්ම වාගේ හකුළුවා දැක්වෙයි. පාපය නම්, ලෝභ, ද්වේෂ, මෝහ යන මූලයන් ගෙන් හට ගන්නා ක්‍රියාවෝය. අලෝභ, අදෝස, අමෝහ යන කුසල මූලයන් ගෙන් සංජාත සියල්ල කුශල කර්ම වෙති.

පබ්බජිත ඉදිරියට ගිය. හැර ගිය යන තේරුම් දෙන පබ්බජිත යන වචනයෙන් ගෘහස්ථ ජීවිතය හැර දමා අනගාරිකත්වය වැළඳ ගත් උතුමන් අදහස වෙයි. ඉන්දු නිම්න ශිෂ්ටාචාර අවදියෙහි පවා භාරතීයයන් අතර පැවිදි ජීවිත තුබූ බව මොහෙන්ජොදාරෝ - හරප්පා නටබුන් ඇසුරින් සනාථ වෙයි. බ්‍රාහ්මණ සංස්කෘතිය පැවිදි ජීවිතය එතරම් ප්‍රිය නො කළ බව චතුරාශ්‍රම ක්‍රමය තුළ පැවිද්ද ජීවිතයේ මහලු අවදියේ දී කළ යුතු දෙයක් බවට පත් කර තිබීමෙන් සනාථ වෙයි.

සමණො "**සමිත පාපත්තා සමණා**"යි අටුවාචාරීන් දක්වන්නේ 'පාපයන් සමනය කරන්නා ශ්‍රමණ' බව ය. සියලු පව් සන්සිඳ වූ තැනැත්තාය.

ප්‍රාග් බෞද්ධ යුගයේ පටන්ම ව්‍යවහාර වන ශ්‍රමණ යන වචනයෙන් බ්‍රාහ්මණ සංස්කෘතියට පරිබාහිරව පැවිදි වූ අය අදහස් කෙරේ. 'ශ්‍රමණ' යන්න බ්‍රාහ්මණ නොවන ආගම් සමූහය හැඳින්වීමට ද උපයෝගී කර ගනු ලැබේ.

උතුම් තපස් ගුණය ඉවසීම ය. අනුන් නසන - පෙළන තැනැත්තා පැවිද්දෙක්, මහණෙක් නො වේ.

184. ඛන්තී පරමං තපො තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා
න හි පබ්බජිතො පරූපඝාතී
සමණො හොති පරං විහෙඨයන්තො (14.6)

උත්තම තපස නො සැලෙන ඉවසීමම ය
නිවණ ම උතුම් වෙයි බුදුනගෙ දෙසීම ය
වදකරු පැවිද්දකු ලෙස ගත නොහේම ය
වෙහෙසන අය අනුන් මහණුන් නොවේම ය

ඉවසුම වේ පරම තපස

14 (4) අනඳ මහ තෙරුන් විමසූ ප්‍රශ්නයක් (183, 184, 185 ගාථා) (ඉතිරි කොටස)

විස්තරාත්මක අනුවාදය (184 ගාථාව)

තිතික්ඛා ඛන්ති පරමං තපො බුද්ධා නිබ්බාණං පරමං වදන්ති පරූපඝාති පබ්බජිතො න හි හොති පරං විහේඨයන්තෝ සමණො න හි හොති

තිතික්ඛා: තහවුරු වූ; **ඛන්ති**: ඉවසීම; **පරමං තපො**: උසස්තම තපසයි; **බුද්ධා**: බුදුවරු **නිබ්බාණං**: නිවණ; **පරමං**: උත්තරීතර යැයි; **වදන්ති**: පවසති; **පරූපඝාති**: අනුන්ට හිරිහැර කරන්නා; **පබ්බජිතො**: පැවිද්දෙක්; **න හි හොති**: නොවන්නේය; **පරං**: අනුන්ට; **විහෙඨයන්තො**: වෙහෙසන පුද්ගලයෝ; **සමණො**: ශ්‍රමණයෙක්; **න හි හෝති**: නොවන්නේ ම ය.

උසස්ම තපස නම්, අඛණ්ඩව ඉවසීම ප්‍රගුණ කිරීමයි. බුදුවරු නිවණ උතුම් ම දේ බව වදාරති. අනුන්ට හිරිහැර කරන්නා පැවිද්දෙක් නො වේ. අනුන් වෙහෙසන තැනැත්තා ශ්‍රමණයෙක් නො වේ.

විවරණය

ඛන්ති පරමං තපෝ ඉවසීම පරම තපස වේ. මෙයින් අපේක්ෂිත ගුණාංගයේ ස්වරූපය නම් අනුන් විසින් තමන්ට පමුණුවන සියළු වධ හිරිහැර කිසිසේත් ම කෝප නො වී දිගට ම ඉවසීමයි. එමෙන්ම අනුන්ගේ වැරදි ඉවසීමට පුරුදු වීමද මීටම අයත්ය. බෝසතුන් මේ ක්ෂාන්තිය හෙවත් ඉවසීම කෙතෙක් දුරට පුහුණු කළාද යත් තම අත් පා කප දැමූ විට පවා කෝප නො වී සිටීමට හේ සමත් විය.

ක්ෂාන්තිවාදී ජාතකයෙහි දැක්වෙන පරිදි බීමත් රජකු බෝසතුන්ගේ අත පය කන් නාසා කපා ලේ විලක වැටී සිටියදී පවා "මා දෑත් දෙපා කන් නාසා සිඳින මේ රජතුමා සුවපත් වේවා"යි මෙත් වඩන්නට බෝසතුන්ට හැකි විය.

ඉවසීම පුහුණු කරන විට තමන්ට වධ වේදනා පමුණුවන්නා ගැන බෝසතුන් සිතන්නේ මෙසේ ය. " මේ මගේ මිත්‍රයෙකි. හිතාමතා හෝ නොසිතා මා මොහු කෝප ගන්වන්නට ඇත. නැත්නම් මෙය පරණ කර්මයක විපාකයක් වන්නට ද පිළිවන. මගේ කර්මයක විපාකය මට විඳගන්නට සිදුවූ විට මා මොහු කෙරේ කිපෙන්නේ කුමට ද?"

කකචූපම සූත්‍රයෙහි දී භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයනට අවවාද කරන්නේ "මං පහරන හොරුන් දිග කියතකින් ඔබ දෙකට ඉරද්දී පවා සිත දූෂ්‍ය කර නො ගෙන සිටින්නට බැරි නම් ඔබ මගේ ශාසනය නිසි අයුරින් පිළිගනිතියි සිතිය නො හැක. ඔබ එබඳු විටක "මගේ සිත තුල කෝපය ඇති නො වේවා. මගේ දෙතොළින් නරක වදනක් පිට නොවේවා. කාරුණික සිතින් මෙත් කරුණා වඩමින් අපි වෙසෙමු. වෛර නො කරමින් ද්වේෂ නොකරමින් අපව කියතකින් දෙකට කපන විට පවා එම මැරයනට පවා මෙත් වඩමු. මුළු ලොවටම සෙත් පතමින් වාසය කරමු. අප්‍රමාණ වූ ශුභ සාධක වූ ඒකාග්‍ර වූ මෙත් සිත් වඩා වාසය කරමු.

ඛන්ති හෙවත් ඉවසීම බෞද්ධ සාහිත්‍යයෙහි උත්කර්ෂයෙන් වර්ණනා කරනු ලබන උතුම් ගුණාංගයෙකි. සිත තුළ නොසන්සුන් බව දුරු කරගෙන මෙය ප්‍රගුණ කළ යුතුය. අසහනය හා නො ඉවසිල්ල නිසා අපට බොහෝ අගනා අවස්ථා අහිමි වී යයි. නිවී සැනසිල්ලේ වාඩි වී සිටින්නට බැරි කලබලකරුවෝ හදිසියේ දුව පැන දඟලන්නට ගොස් පහසුවෙන් ලබාගත හැකිදේද නැති කර ගනිති. ඉවසීම ප්‍රගුණ කරන තැනැත්තාට නො ඉවසිලිමත් තැනැත්තාට නො ලැබෙන බොහෝ වාසි ලැබේ. එක් වාසියක් නම් නිසල තැන්පත් මනසක් ඇති කරගත හැකි වීමයි. ඉවසීම භාවනාවට අවශ්‍ය මානසික පරිසරය සකසයි. මිනිත්තු පහකින් භාවනාවේ ප්‍රතිඵල ලබාගත නො හැක. ඔබ පානය කරන කෝපි කෝප්පය ක්ෂණික, වූ පලියට භාවනාව එසේ වන්නේ නැත.

ඉක්මන් වුවහොත් භාවනාවෙන් ආනිශංස වෙනුවට ආදීනව ලැබෙන්නට ද පිළිවන. කාලාන්තරයක් තිස්සේ අප සිත්හි එක් රැස්වී ඇති කුණු කන්දල් සියල්ල තේ හැන්දකින් ඉවත් කරන්නට කොපමණ කල් යත්දැයි ඔබ දන්නවා ද? ඉවසීම හා අධිෂ්ඨානය හා බැඳුණු අඛණ්ඩ වීර්‍ය්‍යය මේ සඳහා අවශ්‍යය. ක්ෂණික සහනය සොයන්නා සහනය වෙනුවට අසහනය ම එක් කර ගන්නවා ඇත.

ධර්මය උගන්වා ඇත්තේ ඉවසිලිවන්තයන්ට ය. බෞද්ධයකු තම වර්තමාන ජීවිතය දෙස බලන්නේ අවුරුදු අසූවක පමණ කෙටි කාලයක් වශයෙනි. එබඳු ජීවිත විශාල සංඛ්‍යාවක් අපි පෙර ගත කර ඇත්තෙමු. එහෙයින් ඔහු විමුක්තිය සඳහා හැකි තරම් දේ මේ ආත්මයේ දී කර ගන්නට සිතුව ද තම ශක්තිය පිළිබඳ අධි තක්සේරුවක් කර නොග නියි. ඉවසිල්ලෙන් හා සැනසිල්ලෙන් යුතුව විධිමත් ව විමුක්ති මාර්ගයෙහි ගමන් කරයි. කලබල නොවී පියවරෙන් පියවර වර්ධනය කරන විට විමුක්ති මාර්ගය නිරුපද්‍රිතව වැඩෙයි.

බෝධිසත්ත්වයන් ලෝක ධර්මයන් දෙස කම්පිත නොවී බෝධිසම්භාර පිරුවේ එපරිද්දෙනි. හිරු සැර වැඩිය කියා හෝ කාලගුණය ශීතල වැඩිය කියා හෝ තමා කෘමියකු විසින් දෂ්ට කළේය කියා හෝ කම්පා නොවී හේ බවුන් වැඩී ය. මිනිසුන් තමාට දෝෂාරෝපණ කළත්, අවමන් කළත්, බොරු කියා රැවටුවත් හේ කම්පා නොවීය.

සචිත්ත පරියොදපනං බුදු දහමේ ඉගැන්වෙන්නේ උසස් සාධන ලබා ගන්නට නම් මානසික පාරිශුද්ධිය අත්‍යවශ්‍ය බව ය. එහෙයින් මානසික පාරිශුද්ධිය ලබා ගැනීම සඳහා භාවනා වැඩීම බෞද්ධ ශික්ෂණයේ අංගයක් ලෙස දැඩිව අවධාරණය කර ඇත .

භාවනා ක්‍රම හැම ආගමකම පාහේ දක්නා ලැබේ. යාඥාව පවා එක් විදියක භාවනාවකි. හින්දු ආගමෙහි එන ශ්ලෝක හා මන්ත්‍ර භාවිතය ද මනස සංසුන් කර එය කර්මණ්‍ය, සංවේදී තත්ත්වයකට පත් කිරීම සඳහා වූවකි. මේ බොහෝ ක්‍රම වල අරමුණ වන්නේ කිසියම් අධි මානසික ප්‍රතිඵල සමූහයක් ලැබීමයි. අධි ධ්‍යානී තත්ත්වයක සිට ලබන යම් යම් දර්ශන මීට නිදසුනකි. යම් යම් ශබ්ද ශ්‍රවණය කිරීම ද ඇතැම් විට අරමුණු කරගනු ලැබේ.

එහෙත් බෞද්ධ භාවනාවෙහි අරමුණ මීට වඩා වෙනස් ය. මනස ඉතා අඩුවෙන් අවබෝධ කරගනු ලැබුවකි. එහි ක්‍රියාකාරිත්වය හා ශක්තිය ගැන ද ඇත්තේ සුළු දැනුමක් පමණකි. එහෙයින් බොහෝ අයට ස්වයං මෝහනය, ප්‍රවාහක තත්ත්වයන් හා නියම මානසික විශුද්ධිය අතර වෙනස තේරුම් ගැනීම අපහසුව ඇත. බෞද්ධ භාවනා මගින් අපේක්ෂා කරන ඍජු ප්‍රත්‍යක්ෂය මෝහනය හා ප්‍රවාහකත්වයෙන් වෙනස්ය. බොහෝ ආගම්වල භාවනා කරන්නන් ප්‍රතිඵල වශයෙන් ලබන්නේ සංස්කෘතික ස්ථම්භනය හේතුවෙන් ඔවුන්ගේ මනස තුළ නිදන්ගතව පවත්නා යම් යම් දේ මතු පිටට ගැනීමය. බොහෝ දර්ශන හා ශ්‍රැති එබඳුය.

මෝහනය මගින් සිදුවන්නේ පාත්‍රයා දිගින් දිගටම යෝජනාවන්ට අවනතවන සංවේදී තත්වයකට පත් වීමය. මෝහකයා එබඳු යෝජනා ඉදිරිපත් කරන්නෙකි. මෝහනය විෂය පිළිබඳ දැනුමක් ඇති ඕනෑම අයකුට මෝහනයට ගෝචර වන ඕනෑම පාත්‍රයකු හෝ ඊනියා 'ධ්‍යානියකු' ලබන සම්මෝහන මානසික මට්ටම හා මෝහකයා තම රුචිය පරිදි කවර අනුභූතීන් ඔහුට ලබා දීමට සමත් වෙයිද යන්න ගැන අවබෝධයක් ලද හැකි ය.

බුදුවරුන් ගේ අනුසස්න වශයෙන් දැක්වෙන උතුම් කරුණු සයක්.

185. අනූපවාදො අනූපඝාතො
පාතිමොක්ඛෙ ච සංවරො
මත්තඤ්ඤුතා ච භත්තස්මිං
පන්ථඤ්ච සයනාසනං
අධිචිත්තෙ ච ආයොගො
එතං බුද්ධාන’සාසනං (14.7)

නොසොයා අඩුපාඩු - හිරි හැර නොකර අනුනට
සංවර වීම මැන - අනුව පාමොක් විනයට
ගනිමින් ආහාර - ගැලපෙන සුදුසු පදමට
ඇදෙමින් විවේකය - ඇති සුව පහසු අරමට
යොදන්න නිතර සිත - අදිසිත් බවුන් වැඩුමට
මෙය වෙයි සාසනය - බුදුවරුන් දෙන සතහට

කුළුණු හදින් - දුන් ඔවදන්

14 (4) අනඳ මහ තෙරුන් විමසු ප්‍රශ්නයක් (183, 184, 185 ගාථා) (අවසන් කොටස)

විස්තරාත්මක අනුවාදය (185 ගාථාව)

අනූපවාදො අනූපඝාතො පාතිමොක්ඛෙ සංවරො ච
භත්තස්මිං මත්තඤ්ඤුතා ච පන්ථං සයනාසනං ච
අධිචිත්තේ ආයොගො ච ඒතං බුද්ධාන සාසනං

අනූපවාදො: අනුන්ගේ වැරදි සෙවීමෙන් වැළකීම; **අනූපඝාතො**: අනුන්ට හිරිහැර කිරීමෙන් වැළකීම; **පාතිමොකඛෙ සංවරො ච**: විනය නීති වල සංවරවීම ද; **භත්තස්මිං**: භෝජනයෙහි; **මත්තඤ්ඤුතා ච**: ප්‍රමාණය දැනීම ද; **පන්ථං සයනාසනං ච**: විවේක සෙනසුනහි ඇලීම ද; **අධිචිත්තේ**: අධිචිත්ත ශික්ෂාවෙහි; **ආයොගොච**: යෙදීම ද; **ඒතං**: යන මෙය; **බුද්ධාන සාසනං**: බුදුවරුන්ගේ ඉගැන්වීමයි.

අනුන්ගේ වැරදි සෙවීමෙන් හා අනුන්ට හිරිහැර කිරීමෙන් වැළකීම. ප්‍රාතිමෝක්ෂ ශීලයෙහි හික්මීම. ආහාරයෙහි පමණ දැනීම. විවේක සෙනසුන්හි ඇලීම. උසස් මානසික වර්ධනයෙහි හෙවත් උසස් භාවනාවෙහි නිරත වීම යන මේවා බුදුවරුන්ගේ ඉගැන්වීම් යි.

විවරණය

පෙර පිටුව හා බැඳේ

භාවනානුයෝගියා ලබන අත්දැකීම් ඊට වෙනස් ය. ඔහුට තමන් කැමති විවිධ අනුභූතීන් ලබා ගත හැකි වෙයි. භාවනානුයෝගියාට තම භාවනා බලයෙන් විවිධ ජීවී තත්ත්වයන්-එනම් දෙවියන්, භූත-ප්‍රේතාදීන් සමග අදහස් හුවමාරු කර ගැනීමේ ශක්තිය ද ලබා ගත හැකිය. අපට වඩාත්ම සමීප ලෝක සමග වඩාත් පහසුවෙන් අදහස් හුවමාරු කර ගත හැක. බටහිර භූත විද්‍යාවේ කටයුතු තේරුම් ගත යුත්තේ මේ අයුරිනි.

බෞද්ධ භාවනාවේ අරමුණ මේ එකක්වත් නොවන බව කිව යුතුය. භාවනාවේ අතුරුඵල වශයෙන් මේ දේ ඇති විය හැකි වූව ද ඒවා අනවශ්‍ය දේ පමණක් නොව බාධාකර දේ වශයෙන් ද හැඳින්විය හැක. එම බාධක වළකා ගත යුතුය. භාවනාව මගින් ජේසුතුමන් දැක ගත් කිතුනුවා හෝ භගවාන් ක්‍රිෂ්ණා දැක ගත් හින්දු භක්තිකයා තම ආගමික අරමුණක් සාර්ථක වූවා යයි ප්‍රීතිවනු ඇත. එහෙත් භාවනාව මගින් බුදු රදුන් දැක ගත් බෞද්ධයා තමන් කර ඇත්තේ තමන්ගේ විශ්වාසයන් මනස නැමති සිනමා තිරයට ප්‍රක්ෂෙපණය කර නැරඹීම පමණක් බව තේරුම් ගනියි. පරිනිර්වාණයෙන් පසු තමන් වහන්සේ දැක ගත නො හෙන බව භාග්‍යවතුන් වහන්සේ විසින් ම වදාරා තිබේ.

බෞද්ධ භාවනාව සහ බාහිර සමයයන් හි භාවනාවන් අතර අනිවාර්ය වෙනසක් පවත්නා බව මෙයින් පැහැදිලි වන්නට ඇත. භාවනාව අරඹන බෞද්ධයන් මේ පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍යය. සසර දුක් විඳින්නට සිදුවන පුනර්භවය ඇති කරවන මූල හේතුව තෘෂ්ණාව හා බැඳුණු අවිද්‍යාවයි. මේ හේතු දෙක විෂම චක්‍රයක් ඇති කරයි. එක් අතකින් සංකල්ප මගින් චිත්ත වේග ඇතිවේ.

අනිත් අතට චිත්ත වේග සංකල්ප ඇති කරයි. ප්‍රපඤ්ච ලෝකයට අපගේ අර්ථකථන මගින් ලැබෙන අර්ථය හැර වෙනත් අර්ථයක් නැත.අර්ථකථන පූර්ව උපනතීන් පදනම් කර ගත් විට අපි විපල්ලාස (විපයඨාස) වල ගොදුරු බවට පත් වෙමු. සඤ්ඤා විපල්ලාස, චිත්ත විපල්ලාස, දිට්ඨි විපල්ලාස (අනිත්‍යය නිත්‍ය වශයෙන් ගන්නට පොළඹවන විපල්ලාසය, දුක්ඛය සුඛය වශයෙන් ගන්නට පොළඹවන විපල්ලාසය, අනත්තය අත්ත වශයෙන් ගන්නට පොළඹවන විපල්ලාසය) යන මේවාට පත් වෙමු. ඉන්ද්‍රිය හයෙන් ගන්න සියළු අරමුණු ඒවාට අනුව අර්ථ කථනය කරමු. අප මේ ඉන්ද්‍රියානුසාරයෙන් ලබන දැනුම බාහිර ලෝකයට හරියට ම ගැලපෙන්නේ නැති බව පතළ කරුණකි. අපේම ඉන්ද්‍රියයෝ අප නොමග යවති. අප සුන්දරය, සුවදායකයයි තීරණය කර ගත් වස්තූන් පසුපස හඹා යාම හුදෙක් මිරිඟුවක් පසුපස දිවීමක් පමණි. මේ සියළු ප්‍රපඤ්චයෝ අනිත්‍යය හ. දුක්ඛ දායකවෙති. අනාත්ම ද වෙති. මිරිඟුවක්, සෙවනැල්ලක් බඳු මේ දේ පසුපස දිව යන අපි ද අනිත්‍ය වෙමු.

එහෙයින්, බෞද්ධ භාවනාවේ අරමුණ මේ සියල්ල ගැන නුවණින් වටහා ගැනීමටත් වඩා ඒ මායාවෙන් අප මුදාගෙන අවිද්‍යාව හා තෘෂ්ණාව මූලෝත්පාටනය කිරීම ය. භාවනාව මගින් ලැබෙන ප්‍රතිඵල පුද්ගලයා ගේ චර්යාව තුළ හා ඔහුගේ ජීවන දෘෂ්ටිය තුළ නිරූපණය විය යුතුය. එසේ නොවන්නේ නම්, භාවනා ක්‍රමයෙහි වරදක් තිබේ. නැතහොත් භාවනාව ප්‍රගුණ කළ ආකාරයෙහි වරදක් සිදු වී ඇත. ආලෝක හෝ දර්ශන මාත්‍ර ලැබීමෙන් හෝ අතිමාත්‍ර ප්‍රීතියක් වින්දනය කළ පමණින් භාවනාව සමෘද්ධ වී යැයි සිතා ගැනීම මුළාවකි. මේවා ඉතා සුලබ අත්දැකීම්ය.

භාවනාවේ අරමුණ හා භාවනා කරන ආකාරය බුදුරජාණන් වහන්සේ විසින් මහා සතිපට්ඨාන සූත්‍රයෙහි ඉතා පැහැදිලිව දක්වා තිබේ. කයෙහි හා සිතෙහි නිබඳව නිරතුරුව සිදුවන වෙනස් වීම් විෂයෙහි අවධානයෙන් සිටීම යථාර්ථය තේරුම් ගැනීමෙහිලා මහෝපකාරී වෙයි. ඒවා ආත්මයක සිදුවන වෙනස් කම් ලෙස නොව යථාර්ථ වශයෙන් එනම් පටිච්ච සමුප්පන්න ශරීරයක සිදුවන වෙනස්කම් හා එක පිට එක එන සංවේදන මාලාවක්, චිත්ත වේගීය තත්ත්වයන් හා සංකල්ප බාහිර උත්තේජකයනට ප්‍රතිචාර වශයෙන් ඇතිව නැතිව යාම් වශයෙන් දකින්නට අප පුරුදු විය යුතුය. ඒවා ආත්මීය ක්‍රියාවලීන් කොට නිෂ්පුද්ගල ප්‍රපඤ්ච ලෙස විෂය බද්ධව නිරීක්ෂණය කළ යුතුය.

ආත්මාර්ථකාමය හා අහංකාරය ජනිත වන්නේ සක්කාය දිට්ඨියෙන් මිස වෙන කවරකින් ද? යම් කිසි භාවනාවකින් ආත්ම දෘෂ්ඨිය, ආත්මාර්ථකාමය දුරු නොවේ නම්. එය සාර්ථක භාවනාවක් නොවේ. ගහක් අගය කරනු ලබන්නේ එහි ඵලදාවෙනි. මිනිසකු අගය කරන්නේ චයර්‍යාවෙනි. වෙන මිම්මක් නැත. බෞද්ධ මනෝ විද්‍යාවේදී මිනිසා නම් චයර්‍යාව ම හෙයින් මෙය වඩාත් සත්‍යය ය. මිනිසාගේ අනන්‍යතාව සැකසෙන්නේ භවයෙන් භවයට ගෙන යන කර්ම සංචිතය මගිනි. කය හා සිත දෙස අවදිකමින්-සති සම්පජඤ්ඤයෙන්-නිරීක්ෂණය කිරීමෙන් ආත්ම මිථ්‍යාව බිඳී යයි. බාහිර වස්තූන් වෙත ඇති ඇල්ම ද දියවී යයි. අන්තිමේ ඇළුම් කරන්නකු හෝ ඇළුම් කරන දෙයක් නැති වෙයි.

මෙය දුෂ්කර වූ හා විවේකීව අනුගමනය කළ යුතු ශික්ෂාවකි. එහෙත් වරින් වර හැකි පමණින් ප්‍රගුණ කිරීමෙහි වුව ද ආනිශංස තිබේ. විශේෂයෙන් ම ආශාවන් තුනී කිරීම, විෂය බද්ධව සිතන්නට පුරුදු වීම, ප්‍රායෝගික ජීවිතය සඳහා යම් ප්‍රමාණයකට අර්ථවත් වෙයි. එමගින් පෞද්ගලික වූ හෝ නො වූ ඕනෑම ගැටළුවක දී අපක්ෂපාතීව නිවැරදිව සිතන්නට ශක්තිය ලැබේ. චිත්තේකාග්‍රතාව තවත් ප්‍රතිලාභයකි. හික්මවීමට අපහසු මනස සුළඟ මෙන් හෝ අකීකරු අශ්වයකු මෙන් ඔබ මොබ දුවයි. එය හික්මවා ගැනීම ඕනෑම කාර්යයක් සාර්ථක කර ගැනීමේ රහස සේ දැක්විය හැක. හික්මවා ගත් සිත ලෝකයේ ප්‍රබලතම උපකරණය වෙයි.

භාවනා කිරීම මගින් ආත්ම දෘෂ්ටිය, ආත්මාර්ථකාමය දුරු කළ, මනස දියුණු කළ තැනැත්තා බිය සැක දුරු කර අෂ්ට ලෝක ධර්මයන් හි කම්පා නො වී, දුරාචාරයන්ට නො වැටී නිහතමානී සුන්දර ජීවිතයක් ගත කරන්නෙකි. ඔහු ගේ ක්‍රියා ලෝභ, දෝෂ, මෝහ වලින් තොර ශුභ සාධක සහ ඥාණ සම්ප්‍රයුක්ත වෙති.

නැණවතා කාමයන්හි සැප නැති බව හා බොහෝ දුක් ඇති බව දැනගනී.

186. න කහාපණ වස්සේන
තිත්ති කාමෙසු විජ්ජති
අප්පස්සාදා දුඛා කාමා
ඉති විඤ්ඤාය පණ්ඩිතො (14.8)

කහවණු වරුසාවක් වැස්සත්
මදිව සිතට තව තව ඉල්ලත්
සතුට ටිකයි දුක මය බලවත්
පඬිවරු මේ තතු තේරුම් ගත්

කම් සුවෙන් සිත් නොවෙයි ආසා

14 (5) සසුනෙහි කළකිරුණ යොවුන් හිමි නම (186 සහ 187 ගාථා)

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වෙසෙන සමයෙහි පැවිදි ජිවිතය හැර දමා යන්නට සිතූ **තරුණ භික්‍ෂුනමක්** අරබයා මේ ගාථා යුග්මය දේශනා කළ සේක.

එක් තරුණ භික්‍ෂු නමකට ගුරු තෙරුන් විසින් වෙනත් දුර බැහැර ආරාමයකට ගොස් ධර්‍ම ශාස්ත්‍ර හදාරන්නැයි නියම කළ හෙයින් සිය ගම් පෙදෙසින් බැහැර වසන්නට සිදු විය. එසේ දුර බැහැර ඉගෙනුම ලබමින් විසූ සමයෙහි උන්වහන්සේ ගේ පියා බරපතල සේ අසනීප විය. පුත් හිමියන් දැක ගන්නට බලවත් ආශාවක් සිත ඇති වුවද පණිවුඩයක් වත් යවා ගන්නට කෙනකු නො වූ හෙයින් එය කර ගත නො හැකි විය.

රෝගය බරපතලව මරණාසන්න වූ පියා වෙන කර ගත හැකි දෙයක් නො වූයෙන් හිමිනම ගේ බාල සොහොයුරා අමතා "අපේ හාමුදුරුවන් කවදා හෝ හමු වුවහොත්, මේ මුදල් උන් වහන්සේට කැප පිරිකරක් සඳහා යොදවන්න" යි කහවණු සියයක් වෙන් කර දුන්නේය. එසේ පැවසූ හෙතෙම කළුරිය කළේය.

පසු කලෙක තරුණ හිමි නම තම පවුලේ අය දැක ගනු පිණිස නිවසට පැමිණි විට හඬා වැලපෙමින් පියාණන් ගේ අභාවය දැනුම් දුන් බාල සොහොයුරා කහවුණු සියය ද උන්වහන්සේට දක්වා මෙයින් කුමක් කරම්දැයි විමසීය. "මට දැනට කිසිදු පිරිකරක අවශ්‍යතාවක් නැත. එය ඔබම තබා ගන්න" යි පැවසූ උන් වහන්සේ ආරාමයට ගියහ.

ආරාමයට ගිය පසු උන්වහන්සේට පියාගෙන් උරුම වූ කහවුණු සියය යළි සිහිපත් විය. "කහවුණු සියයකුත් තිබිය දී සිඟා ගත් දෙයින් ජීවත් වන්නේ කුමට ද? මට ගිහි වී එයින් ජීවත් වන්නට බැරි ද?" එසේ සිතූ උන්වහන්සේ පැවිදි ජීවිතය කෙරේ නොරිස්සුම් ගති ඇති කර ගත්හ. නිතර නිතර කහවණු සියය ගැනත් ගිහි ජීවිතය ගැනත් සිතීම නිසා සුදුමැලිව දුබලව ගිය උන්වහන්සේ ගෙන් මිතුරු හිමිවරු එසේ වන්නට හේතුව අසා දැනගත් හ. ඔවුහු ඒ බව තරුණ හිමිනම ගේ ගුරු හිමියන්ට හා බුදුරදුන්ට ද දැනුම් දුන් හ.

භාග්‍යවතුන් වහන්සේ ඒ තරුණ භික්‍ෂුව තමන් වහන්සේ වෙත කැඳවා ගත්හ. "ඔබ උකටලීව ගිලන්ව සිටින බව, නැවත ගිහිගෙට යන්නට සැරසෙන බව සැබෑ ද, මහණ?" "එහෙමයි ස්වාමීනි" "ඇයි ඔබ එසේ කරන්නට හේතුව? ඔබට ගිහි ගෙට ගොස් ජීවත් වන්නට ක්‍රමයක් තිබෙනවා ද?" "ඔව් ස්වාමීනි, තිබෙනවා" "කොපමණ ධනයක් ඔබට තිබෙනවා ද, භික්‍ෂුව?" "ස්වාමීනි, කහවණු සියයක් තියෙනවා." "හොඳයි. ඒ කහවණු ගාණට තිරිවාන ගල් කැට ටිකක් අහුලාගෙන එන්න" භාග්‍යවතුන් වහන්සේ එසේ වදළ විට ඒ භික්‍ෂුව ගල් කැට සියයක් අහුලාගෙන ආවේ ය. "දැන් අපි බලමු මේවා වියදම් කරන විදිය. පණහක් ගණන් කරලා හාල් ආදිය ගන්න අයින් කරන්න. දැන් පණහක් ඉතිරියි. ගොවිතැන් වැඩ කරන්න ගොන් බානක් ගන්න විසි හතරක් අයින් කරන්න. තව විසි හයක් ඉතිරියි නේ. දැන් ඒකෙන් බිත්තර වී ගන්න පුළුවන්. තව උදැල්ලක් ගන්න ඕන. ඒකටත් විසි හයක් ඕන. නගුලක් ගන්න ඕන. පොරවකුත් ඕන වෙයි, වෑයක්, නියනක් මේ සේරමත් ගන්න වෙනවා. ඒවාටත් විසි හය ගානෙ වගේ යයි." බුදුරදුන් මෙසේ වදාරන විට "ස්වාමීනි, තව තුන් හාරසීයක් නැතුව කොහොම ද ඔය සේරම ගන්නේ?" යි තරුණ හිමිනම විපිලිසර වන්නට වූයෙන් "භික්‍ෂුව, ඔය කහවුණු සියය ඒ තරම් ලොකු මුදලක් නොවන බව දැන් වැටහෙනවා නො වේ ද? උවමනා බඩු ටික ගන්නවත් ඔය මුදල මදි නම්, ඔබ ගේ තණ්හාව පුරවන්න කොච්චර ඕන වෙයි ද?" යි උන්වහන්සේ වදාළහ. අනතුරුව උන්වහන්සේ "භික්‍ෂුව, ඔබ සතු මුදල එතරම් ලොකු දෙයක් නො වේ. අතීතයේ මුළු දඹදිව් තලයම මදි වී දෙව් ලොවට අධිපති ශක්‍ර දිව්‍ය රාජයන් තිස් හය දෙනකු ඉකුත් වන තුරුත් කම් සැප විඳ එයිනුත් තෘෂ්ණාව තෘප්ත කරගත නුහුණු අය අතීතයේ විසූහ. කහවණු වැස්සකින් වුව ද තණ්හාව තෘප්තිමත් කර ගත නොහැකි ය" යි. ධර්මදේශනා කළහ. භික්‍ෂු නම ඒ අසා සෝවාන් වූයේ ය.

විස්තරාත්මක අනුවාදය (186 ගාථාව)

කහාපන වස්සේන කාමෙසු තිත්ති න විජ්ජති පණ්ඩිතො
කාමා අප්පස්සාදා දුඛා ඉති විඤ්ඤාය

කහාපන වස්සේන: කහවණු වැස්සකින් (වුවද); **කාමෙසු**: කාමාශාවෙහි; **තිත්ති**: තෘප්ත වීමක්; **න විජ්ජති**: සිදු නොවේ; **පණ්ඩිතො**: නුවණැත්තා; **කාමා**: කාමයෝ; **අප්පස්සාදා**: ආස්වාද රහිතය; **දුඛා**: දුක්ඛ සහගත යැයි (ද); **ඉති**: යනුවෙන්; **විඤ්ඤාය**: දැන.

කහවණු වැස්සක් වැස්සත් කාම වස්තූන් පිළිබඳ මිනිසුන් ගේ ආශාව තෘප්තිමත් නො වේ. නුවණැත්තා කාමයන් ගේ ආස්වාදය ස්වල්පයක් බව ද, ඒවා ඇත්තට ම දුකට හේතුවන බව ද දැක ගනියි.





නුවණැත්තා දෙව් ලොවැ කම්සම්පත්හි පවා නො ඇලේ. සම්මා සම්බුදු සවුතෙම නිවනෙහි ඇලේ.

187. අපි දිබ්බේසු කාමෙසු
රතිං සො නාධිගච්ඡති
තණ්හක්ඛයරතො හොති
සම්මාසම්බුද්ධසාවකො (14:9)

දිව්‍ය ලෝකයේ සැපෙහි වුණත්
ඇල්මක් මොහොතක්වත් නොකරත්
තණ්හා සුන් නිවන ම රිසිවෙත්
බුදු සවුවෝ නුවණින් අගපත්

හැරලමු කම් සුව

14 (5) සසුනෙහි කලකිරුණු යොවුන් හිමි නම (186 සහ 187 ගාථා)

විස්තරාත්මක අනුවාදය (187 ගාථාව)

සො දිබ්බේසු කාමෙසු අපි රතිං නාධිගච්ඡති
සම්මාසම්බුද්ධසාවකො තණ්හක්ඛයරතො හොති

සො: හෙතෙම; **දිබ්බේසු කාමෙසු අපි**: දිව්‍යමය කාමයන්හි පවා; **රතිං**: ආශාවක්; **නාධිගච්ඡති**: ඇති කර නොගනියි; **සම්මාසම්බුද්ධසාවකො**: බුද්ධ ශ්‍රාවකයා; **තණ්හක්ඛය**: නිර්වාණයෙහි; **රතො**: ඇළුම් කරන්නේ; **හොති**: වෙයි.

හෙතෙම (නුවණැත්තා) දිව්‍ය ලෝකවල ඇති කම් සුවය කෙරේවත් නො ඇලෙයි. බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවකයන් ඇලුම් කරන්නේ නිවන් සුවය යි.

විවරණය

සම්මා සම්බුද්ධ සාවකො: බුදුරදුනට විශාල පැවිදි ශ්‍රාවක පිරිසක් විසූ හ. බුද්ධ ශ්‍රාවක පිරිස භාග්‍යවතුන් වහන්සේ ම මහා පරිනිබ්බාන සූත්‍රයේ දී හඳුන්වාදුන් පරිදි චතුර්විධය. සිවුවණක් පිරිස නමින් හඳුන්වා ඇති පරිදි භික්ඛු, භික්ඛුණී, උපාසක හා උපාසිකා යනු එම ශ්‍රාවක පිරිසයි.

සාවක (=ශ්‍රාවක) යන වචනයේ සාමාන්‍ය අර්ථය වන්නේ අසන්නා යනුයි. එහෙත් ආගමික සමාජය තුළ ශ්‍රාවක යන්නෙන් යම්කිසි ශාස්තෘවරයකු ගේ ධර්මයට සවන්දී පැහැදී අනුගාමිකත්වයට පත්වන තැනැත්තා යන අර්ථය ගැනේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේගෙන් දහම් අසා පැහැදී අනුගාමිකත්වයට පත් ගිහි-පැවිදි පිරිස ශ්‍රාවකත්වයෙහි ලා 'බුද්ධ ශ්‍රාවක' වශයෙන් හැඳින් වේ. ප්‍රථම වරට දෙසරණ ගෙන උපාසකත්වයට පත් වූ තපස්සු හා භල්ලුක වෙළඳ දෙ බෑයෝ මුල්ම බුද්ධ ශ්‍රාවකයෝ වූ හ. පැවිද්දන් වශයෙන් ප්‍රථම ශ්‍රාවකත්වයට පත් වූයේ දම්සක් පැවැත්වූ අවස්ථාවෙහි පැහැදී ඒහි භික්ඛු පබ්බජ්ජාව ලත් පස්වග මහණහු ය. මේ පස්දෙනා ගෙන් කොණ්ඩඤ්ඤ බෝසත් කුමරාට නම් තැබීමේ මංගල්‍යයට සහභාගී වූ බමුණන් අට දෙනාගෙන් ලාබාලම තැනැත්තාය. එක ඇඟිල්ලක් ඔසවා මේ කුමරු සසර කලකිරී පැවිදිව සම්මා සම්බුදු වෙතැයි නියත අනාවැකියක් පළ කළේ ද ඔහුය. භද්දිය, වප්ප, මහානාම, අස්සජි යන නම් වූ ඉතිරි හතර දෙනා නම් තැබීමේ මංගල්‍යයට පැමිණි බමුණන් අට දෙනාගෙන් ඉතිරි සත්දෙනා අතුරින් සිව් දෙනෙකු ගේ දරුවෝ වූහ. ඔවුහු ද කොණ්ඩඤ්ඤ සමග පැවිදිව බෝසතුන් හා පැවිදි දම් කළද. බෝසතුන් දුෂ්කර ක්‍රියා අතහළ විට වෙන්ව ගිය හ.

බුදුරදුන් ගේ මුල් ශ්‍රාවක හැට නම එක් වූ අයුරු ද චමත්කාර ජනකය. පස්වග මහණුන්ට අනතුරුව පැවිදි වූ යසකුල පුතු විශාල තරුණ පිරිසක ගේ පැවිදි වීමට මූල සාධක විය. යස පැවිදි වූයේ සිදුහතුන් මෙන් ම නාටිකාවන් ගේ විප්‍රකාරයන් දැකීමෙනි. භාග්‍යවතුන් වහන්සේ ඔහුට දම් දෙසා නිවන් මග පාදා දුන් හ. ඔහුගේ මිතුරු විමල, සුබාහු, පුණ්ණජි සහ ගවම්පති යන තරුණයෝ හතර දෙනා යස පැවිදි වූ බව අසා පැමිණ දහම් අසා පැහැදී පැවිදි වූහ. ඔවුන් ගේ මිතුරු පණස් දෙනෙක් ද තම මිතුරන් පස් දෙනා පැවිදි වූ බව අසා පැමිණ බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවකත්වයට පත් වූ හ. එම මිතුරන් පණස් පස් දෙනා සමග පස්වග මහණුන් එක් වූ විට ශ්‍රාවක පිරිස හැට නමක් වූහ. ප්‍රථම ශ්‍රාවක පිරිස හැට නමක් වූ වහා ම භාග්‍යවතුන් වහන්සේ ඔවුන් කැඳවා සාමාන්‍යයෙන් භාරතීය ශ්‍රමණ ශාස්තෲන් නො කරන විදියේ අවවාදයක් කළ හ. සාමාන්‍ය ශ්‍රමණ ශාස්තෘවරුන්ගේ සිරිත වූයේ තම පිරිස නිරතුරුව ම තමන් වටා රඳවාගෙන පිරිස් නායකත්වයෙහි අභිමානය වින්දනය කිරීමයි. සාමාන්‍යයෙන් බොහෝ දෙනා 500, 300, 250 ආදි සංඛ්‍යාවක් ඇතිව සංඝී, ගණී, ගණාචරිය යන විශේෂණ පද වලට ගැලපෙන ජීවිත ගත කළහ. එහෙත් භාග්‍යවතුන් වහන්සේ කළේ ඊට හාත්පසින් ම වෙනස් ක්‍රියාවකි. උන්වහන්සේ මෙසේ වදාළ හ. "මහණෙනි, මම දිව්‍යමය හා මානුෂික සියලු බැඳුම් වලින් මිදුණෙමි. ඔබ ද සියලු දිව්‍යමය හා මානුෂික බාධක වලින් මිදුණා හ. එහෙයින් මහණෙනි, බොහෝ දෙනා ගේ හිත සුව පිණිස, යහපත පිණිස දෙව් මිනිසුනට සෙත සලසනු පිණිස චාරිකාවෙහි යෙදෙන්න. දෙදෙනකු එක මග නොයන්න. මහණෙනි, මුලත් යහපත් වූ, මැදත් යහපත් වූ අගත් යහපත් වූ ධර්මය දේශනා කරන්න. ඉතාමත් නිර්මල වූ පවිත්‍ර වූ බ්‍රහ්මචරිය ප්‍රකාශ පත් කරන්න."

මේ අනුශාසනා මගින් උන් වහන්සේ ඉතා වැදගත් නව ආදර්ශයක් දුන් හ. පැරණි ශාස්තෘවරුන් මෙන් ශ්‍රාවකයන් දිගට ම තමා යටතේ තබා නො ගෙන ඔවුන් ප්‍රතිබල සම්පන්න වූ විට, උසස් අධිගම සාධනය කර ගත් විට, ස්වාධීනව ක්‍රියා කරන්නට අනුබල දුන් හ. තමන් ලත් අධිගමය හා ශ්‍රාවකයන් ගේ අධිගමය ඉතා ම අඩු වෙනස ඇති තැනින් සසඳා ඔබත් මාත් එක ම සාධන තලයක සිටිතියි පැවසුම මගින් උන්වහන්සේ සිය ශ්‍රාවකයනට ලබා දුන්නේ මහත් ආත්ම විශ්වාසයකි. එමෙන්ම ධර්මය නම් සීමිත පිරිසක් අතර තබා ගත යුතු ගුප්ත ශාස්ත්‍රයක් නොව වැඩිම පිරිසක් වෙත පත් කළ යුතු දෙයක් බව ද තහවුරු කළහ. උපනිෂද් සෘෂිවරුන් මෙන් සීමිත පිරිසකට රහසේ ධර්මය ඉගැන්වීම වෙනුවට වැඩිම පිරිසකට එය ලබා දීම උන්වහන්සේ ගේ අභිප්‍රාය විය. එහෙයින් "දෙදෙනෙකු එක මඟ නො යන්න" යන අවවාදය දෙන ලදී.

භික්ෂුණී ශ්‍රාවක පිරිසක් ඇති වූයේ බුද්ධත්වයෙන් වසර පහක් ගිය තැනය. මුලින් ම යශෝධරා දේවිය පැවිද්ද ආයාචනා කළ නමුත් ඇයට ඒ සඳහා වරම නො දෙන ලදී. සමහර විට බුදුරදුන් එසේ කළා නම් විවිධ චෝදනා නැගෙන්නට ද ඉඩ තිබිණි. අනතුරුව ප්‍රජාපති ගෝතමිය පැවිද්ද ඉල්ලා සිටියාය. එයට ද ඉඩ නො දෙන ලදී. එහෙත් පසුව එතුමිය තම පිරිවර පන්සියයක් ලඳුන් ද කැටුව හිස මුඩුකර, කහවත් හැඳ පා ගමනින් ම පැමිණ පැවිද්ද ඉල්ලා සිටි අවස්ථාවේ දී තුන් වරක් ම ප්‍රතික්ෂෙප කර සිවුවන වර ආනන්ද මහ තෙරුන් ගේ මැදිහත් වීමෙන් පැවිද්ද ලබා දෙන ලදී. ආනන්ද හිමියන් වනිතාවන් ගේ පැවිද්ද වෙනුවෙන් බුදුරදුන් වෙත ඉදිරිපත් කළ තර්කය වනිතා විමුක්ති ඉතිහාසයෙහි රන් අකුරින් සටහන් වූවකි. "පුරුෂයකු පැවිදිව කරනු ලබන ශික්‍ෂා පරිපූර්ණය කාන්තාවක කළහොත්, පුරුෂයාට ලැබෙන අධිගමය ඇයටත් ලැබේදැ"යි ආනන්ද හිමියෝ විමසූ හ. එය ලැබෙන බව භාග්‍යවතුන් වහන්සේ පැවසූ හ. එසේ නම් ඔවුන් පැවිදි කරන්නැයි ආනන්ද හිමියෝ ඉල්ලා සිටිය හ. කාන්තාවනට භික්ෂුණී ශ්‍රාවිකාවන් බවට පත් වීමේ භාග්‍යය ලැබුණේ ඒ අයුරිනි.

තම ශ්‍රාවක පිරිස වූ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවු පිරිසම ධර්‍මය මනාව ඉගෙන එය පිළි පැද අධිගම ද ලබා තම ගුරුන්ගෙන් උගත් ධර්මය අනුන්ට ඉගැන්වීමේ සාමර්ථ්‍යය හා ප්‍රතිවාදීන් ධර්මය විකෘත කර ඉදිරිපත් කරන විට එම දුර්වාද මැනවින් නිරාකරණය කරලන්නට අවශ්‍ය චාතුර්‍යය ද ලබා ගන්නා තුරු තමන් පිරිනිවන් පාන්නේ නැති බව බුදුරදුන් මාරයාට පවසා තිබිණ. අසූවන වියේ පසු වූ භාග්‍යවතුන් වහන්සේට පිරිනිවන් පාන ලෙස මාරයා ඇරයුම් කළ අවස්ථාවේ දී, ඊට එකඟ වූයේ ඒ වන විට සිවු පිරිසම මේ ගුණාංග වලින් පිරිපුන්ව සිටි හෙයිනි.





බියෙන් තැති ගැනුණු මිනිස්සු පර්වතයන් හා වනයන් ද අරම්-රුක්-දෙවොල් ද පිහිට කොට යෙති.

188. බහුං වෙ සරණං යන්ති
පබ්බතානි වනානි ච
ආරාම රුක්ඛ චෙත්‍යානි
මනුස්සා භයතජ්ජිතා (14:10)

වැඩි දෙනා සරණ යත්
පර්වත සහ කැළෑවත්
උයන්, ගස්, සෑයත්
බොහෝ මිනිස්සු බියෙන් තැති ගත්

දන තැති ගත් - වී බියපත්, අසරණ වෙත් - සරණ සොයත්

14 (6) අග්ගිදත්ත වත (188 ගාථාවේ සිට 192 ගාථා)

අග්ගිදත්ත නම් බමුණකු අරබයා භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දෙව්රම් වෙහෙරදී දේශනා කළ සේක.

අග්ගිදත්ත මහා කෝසල රජතුමා ගේ පුරෝහිත බ්‍රාහ්මණයා වූයේ ය. මහා කෝසල රජතුමා ගේ අභාවයෙන් පසු රජ වූ පසේනදී කොසොල් රජතුමා ද පිය රජතුමා ගේ පුරෝහිතයා වූ අග්ගිදත්ත ම තමා ගේ ද පුරෝහිත තනතුරට පත් කර ගත්තේය. ඔහු තමාට වඩා වැඩිහිටි වූයෙන් රජතුමා ඔහුට බොහෝ ගෞරව කළේය. ඔහු රජ වාසල රාජකාරි සඳහා පැමිණෙන විට රජතුමා පෙර ගමන් කරයි. ඔහු මහත් ගෞරවයෙන් කැඳවා ගෙන අවුත් "බ්‍රාහ්මණයාණෙනි, මේ අසුනේ වාඩි වෙන්න"යි තමාට සමාන අසුනක ම අසුන් ගන්වා ගනියි.

මෙසේ කලක් ගත වන විට අග්ගිදත්තට මෙසේ සිතිණි. "මේ රජතුමා මට මහත්සේ හරසර දක්වයි. එහෙත් හැමදමත් රජවරුන් ගේ ප්‍රසාදය දිනාගෙන ජිවත් වීම පහසු කාර්‍යයක් නො වේ. රජ ගෙදර ජීවිතය රජු සමග සම වයසේ කෙනෙකුට නම් ගැලපෙයි. මේ රජතුමා තරුණය. මම මහළු බමුණෙක් වෙමි. ඒ නිසා මම පැවිදි වෙමි." මෙසේ සිතා රජතුමාගෙන් පැවිදි වන්නට අවසර ලබා ගත්තේය. රජතුමා ලවා නුවර පුරා අණ බෙර ගස්වා තම දේපල සියල්ල අසරණයන්ට බෙදා දුන්නේ ය. අනතුරුව ගිහි ගෙය අතහැර දමා මහ පෙරහරින් ගොස් පැවිදි විය. එහෙත් ඔහු පැවිදි වූයේ අන්‍ය තීර්ථක ආරාමයකය. අග්ගිදත්ත අනුව ගිය තවත් සෑහෙන පිරිසක් ද ඔහු සමගම පැවිදි වූ හ.

අග්ගිදත්ත තමන් හා පැවිදි වූ පිරිස ද සමග අංග, මගධ සහ කුරු ජනපද එක්වන පෙදෙසෙක්හි ආරාමයක් සකස් කරගෙන පදිංචි විය. "ඇවැත්නි, ඔබ කාට හෝ කාමය, ව්‍යාපාදය හෝ දුෂ්ට චේතනාවක් හටගතහොත් ගඟෙන් වැලි බඳුන් ගෙනවුත් මෙහි පුරවන්න" යි හේ ඔවුනට අවවාද කළේ ය. "යහපති"යි පිළිගත් ඔවුහු තමන් තුළ එවන් චේතනාවක් ඇතිවන හැම විට ම වැලි ගෙන'වුත් එහි පිරැවූහ. කාලයාගේ ඇවෑමෙන් එහි මහා වැලි ගොඩක් ඇති විය. එම වැලි ගොඩට අහිච්ඡත්‍ර නම් වූ නාග රාජ තෙම අරක් ගත්තේ ය.

අංග, මාගධ හා කුරු යන තුන් රට ම වැස්සෝ මාස්පතා මේ තාපසවරුන්ට ආහාරපානාදී අවශ්‍යතා සම්පාදනය කළ හ. අග්ගි දත්ත තාපසයා ද ඔවුනට මෙසේ අනුශාසනය කරයි. "පර්වත, වන, උද්‍යාන, රුක් යන මේවා සරණ යන්න. මේවා සරණ පතන ඔබට දුක් කම්කටොළු වලින් මිදී වාසය කරන්නට හැකි වනු නිසැකය" අග්ගි දත්ත ගේ දේශනය මෙයට සීමා විය.

මෙසමයෙහි භාග්‍යවතුන් වහන්සේ වාසය කළේ දෙව්රම් වෙහෙරෙහි ය. දිනක් උදෑසන දෙව්රම සිට කුළුණැසින් ලොව බලන බුදු සමිඳුන්ගේ කුළුණු දැලට අග්ගිදත්ත සහ පිරිස ලක්වූහ. ඔවුන් සියළු දෙනාම රහත් ඵලය ලබන්නට වාසනා මහිමය ඇත්තන් බව පෙනී ගියෙන් එදින සවස් වරුවේ මුගලන් හිමියන් ඇමතූ උන් වහන්සේ "මොග්ගල්ලාන, මේ අග්ගිදත්ත විශාල පිරිසකට උගන්වන්නේ ඔවුන් කළ යුතු දේ නොව, නොකළ යුතු දේ ය. ගොස් ඔහුට හරි මග වටහා දෙන්න" යි උපදෙස් දුන්හ. "ස්වාමීනි, ඒ තවුසෝ අනේක විධය හ. එහෙයින් ඔබ වහන්සේත් මා සමග වැඩම කරන්නේ නම් යහපත්ය" යි මුගලන් හිමියන් පැවසූ විට භාග්‍යවතුන් වහන්සේ මමත් පැමිණෙන්නෙමි. ඔබ මුලින් යන්න''යි වදාළ හ.

විස්තරාත්මක අනුවාදය (188 ගාථාව)

භයතජ්ජිතා මනුස්සා පබ්බතානි වනානි ආරාම රුක්ඛ චෙත්‍යානි ච වෙ බහුං සරණං යන්ති

භයතජ්ජිතා: බියෙන් තැති ගැනුණු; **මනුස්සා**: මිනිස්සු; **පබ්බතානි**: පර්වත; **වනානි**: වනාන්තර; **ආරාම**: උද්‍යාන; **රුක්ඛ**: වෘක්‍ෂ; **චෙත්‍යානි ච**: වඳින පුදන තැන් ද; **වෙ**: ඒකාන්තයෙන්; **බහුං**: බොහෝ සේ; **සරණං යන්ති**: සරණ යත්

බියෙන් තැති ගැනුණු මිනිස්සු බෙහෙවින් පර්වත, වනාන්තර, උද්‍යාන, ගස් හා වෙනත් වඳින පුදන චෛත්‍ය සරණ යති.



මේ සරණය සෙත පිණිස නො පවත්නේ ය. මේ සරණ ගොස් සියල් දුකින් මිදීමට නො හැකිය.

189. නේ'තං ඛො සරණං ඛෙමං
නේ'තං සරණ මුත්තමං
නේ'තං සරණ මාගම්ම
සබ්බ දුක්ඛා පමුච්චති (14:11)

නො වෙයි එය සැනසුම
නැත ඒ සරණ උත්තම
ඒ සරණට පැමුණුම
නොවේ හැම දුක් වලින් ගැලවුම

නො වේ එසරණ - වගේ තිසරණ

14 (6) අග්ගිදත්ත වත (188 ගාථාවේ සිට 192 ගාථාව දක්වා)

තාවුස් පිරිස බොහෝ වූ හෙයින් තමන් වහන්සේ යමක් වදාළ විට සියල්ලන් ම හඬ නගා කතා කරන්නට වුවහොත් කිසිවක් කරගන්නට බැරිවෙතියි සිතූ මුගලන් හිමියෝ වැස්සක් මවා ඔවුන් තම තමන් ගේ කුටිවලට යන්නට සැලසූ හ. අනතුරුව අග්ගිදත්ත විසූ අතු සෙවිලි කළ පැල්පතට ගිය උන් වහන්සේ 'අග්ගිදත්ත' යි ඇමතූ හ. තමන්ට නමින් අමතන්නට තරම් ශ්‍රේෂ්ඨයකු ලොව නැතැයි සිතා සිටි අග්ගිදත්ත මේ ඇමතුමෙන් කැළඹුණ හ. අභිමානයෙන් දැවෙමින් "ඒ කවුද?" යි හේ විමසීය. "ඒ මම" "ඔබට කියන්න තියෙන්නේ මොනවා ද?" "මට මෙහි රැය ගත කරන්න අවශ්‍යයි. මට නවතින්න තැනක් පෙන්වන්න."

"මේ පුංචි කුටියේ තව කෙනෙකුට ඉඩ නැති බව පේන්නේ නැත් ද? මෙහි ඉඩ නෑ. යන්න යන්න" "අග්ගි දත්ත, මේ අහන්න, මිනිස්සු මිනිසුන් ළඟට යනවා. හරක් හරක් ළඟට යනවා. පැවිද්දන් පැවිද්දන් ළඟට යනවා. අපට ගිහියන් ළඟට යන්න බැහැනේ. ඒ නිසා බැහැ නොකියා අද රෑට විතරක් මට මෙහි නවාතැන් දෙන්න" "ඔබත් පැවිද්දෙක් ද? පැවිද්දෙක් නම්, වල්කලා සිවුරු ආදිය කෝ? තවුස් පිරිකර කෝ?" "මට ඒවා තියෙනවා. ඒත් ඒවා උස්සාගෙන ඇවිදින එක කරදර නිසා ඒවා ඇඟ තුළ තියාගෙන ඇවිදිනවා." මුගලන් තෙරුන්ගේ වදනින් කිපුණු අග්ගිදත්ත "එහෙනම් ඒවා ඇඟේම තියාගෙන යන තැනක යන එක හොඳයි"යි පැවසී ය.

"අග්ගිදත්ත, එහෙම කියන්න එපා. තරහ නො ගෙන මට රැය ගත කරන්න තැනක් පෙන්වන්න." "නෑ. මෙහෙ එහෙම තැනක් නෑ." "අර වැලි ගොඩේ කවුරුත් නෑ නේද?" "මහා නාග රාජයෙක් ඉන්නවා." "එතන මම ඉන්නම්." "බෑ, බෑ එයා එච්චර හොඳ කෙනෙක් නෙමෙයි. මහා විපත්තියක් වෙන්න පුළුවන්." "එයා ගේ හොඳින් නරකින් වැඩක් නෑ. මට එතන ඉන්න දෙන්න" " එහෙනම් ඉතින් කැමැත්තක් කරගන්න" යි අග්ගිදත්ත නිහඬ විය.

අග්ගිදත්ත එසේ පැවසූ විට මුගලන් තෙරණුවෝ වැලි ගොඩ වෙත පිය නැගූ හ. ඒ දුටු නාග රාජයා මෙසේ සිතීය. "මේ තෙරහු මෙතැනට පැමිණෙති. මා මෙහි වෙසෙන බව ඔහු නො දන්නවා විය යුතු ය. දුමක් නිකුත් කර ඔහු වනසා දමමි." තෙරුන් වහන්සේ ද "මේ නාගයා සිතන්නේ තමන් ට පමණක් දුම් දැමිය හැකි බව ය. එහෙයින් මම ද දුමක් නිකුත් කරමි." යි සිතූහ. දෙදෙනාම මහා දුම් කඳක් නිකුත් කළෙන් අකනිටා බඹලොව දක්වාම දුම විහිදුණායි කියති. දුමෙන් තෙරණුවනට කිසි ම පීඩාවක් නො වූව ද නාගයා පීඩාවට පත් විය.

"මම මේ තෙරුන් ගින්නෙන් දවා ලමි" යි සිතූ නාගරාජ තෙම මහ ගිනි කඳක් නිකුත් කළේ ය. තෙරුන් වහන්සේ ද තෙජෝ කසිණයට වහා සමවැද සිරුරින් ගිනි ජාලාවක් නිකුත් කළ සේක. ගිනි කඳ ද විශාලව බඹ ලොව දක්වා උසට ගියේ ය. නාගයා ගේ ගින්නෙන් තෙරුන් වහන්සේට හානියක් නො වූවද නාගයාට තෙරුන් වහන්සේ ගේ ගින්න ඉවසිය නොහැකි වූයේය. තාපසාරාමයේ සියළු තාපසයෝ "මේ නාගරාජයා හිමි නමක් දවා හරියි"යි කියමින් වටා රොක්වූ හ. එහෙත් මුගලන් මහ රහතන් වහන්සේ නන්දෝපනන්ද නාගරාජයා දමනය කළ පරිද්දෙන් ම මොහු ද දමනය කර ගත් සේක. අන්තිමේදී නාග රාජයා වැලි ගොඩ වටා දරණ ගසා ගෙන යෝධ පෙණ ගොබයකින් තෙරණුවන්ට සෙවණ සපයමින් යටහත් පහත් විලාසයෙන් සිටියේ ය.

සියළු තාපසවරු "තෙරුන් ජීවතුන් අතර ද මිය ගිහින්දැයි බලමු." යි උදේ පාන්දරම වැලි ගොඩ වටා රැස් වූ හ. තෙරුන් වැලි ගොඩ මත එසේ වැඩ හිඳිනු දුටු තවුසෝ " හිමියනි, ඔබ වහන්සේට නාගරාජයා ගෙන් හුගක් හිරිහැර වුණාද?" යි විමසූහ. "නාගරාජයා මට පෙණ ගොබයෙන් රැකවරණ සපයමින් සිටින හැටි ඔබට පෙනෙන්නේ නැත් ද?" යි තෙරහු පෙරළා විමසූ හ. මේ නම් ආශ්චර්යජනක ය. තෙරුන් විසින් නාගරාජයා දමනය කර තිබේ" යි පවසමින් සියළු තවුසෝ මුගලන් මහ රහතන් වහන්සේ පිරිවරා ගත් හ.

විස්තරාත්මක අනුවාදය (189 ගාථාව)

එතං සරණං ඛො න ඛෙමං එතං සරණං න උත්තමං
එතං සරණං ආගම්ම සබ්බ දුක්ඛා න පමුච්චති

එතං සරණං: මේ සරණ; **ඛො**: සැබවින් ම; **න ඛෙමං**: සුරක්ෂිත නොවේ; **එතං සරණං**: මේ සරණ; **න උත්තමං**: උතුම් නොවේ; **එතං සරණං**: මේ සරණය; **ආගම්ම**: පැමිණ; **සබ්බ දුක්ඛා**: සියළු දුකින්; **න පමුච්චති**: මිදීමක් නොවේ.

මේ සරණ සැබැවින් ම සහනයක් (පිළිසරණක්) නො දෙයි. මේ සරණ උතුම් නො වේ. මේ සරණ යාමෙන් සියළු දුකින් මිදීමක් වන්නේ ද නැත.

විවරණය

නේ'තං ඛො සරණං ඛෙමං මේ බාහිර සරණ එකක් වත් උතුම් නැත. ලෝකයේ හැම ප්‍රාථමික ශිෂ්ටාචාරයක ම ජනයා ආගම සහ අභිචාර විධි ඇති කර ගන්නේ භය නිසා ය. මුල් ජනයා ගේ දඩයක්කාර වනචාරි ජීවිතය තුළ ඔවුනට වනසතුන්ගෙන් පැමිණි අනතුරුවල දී දිවි ගලවා ගත්තේ ගස් වලට හෝ පර්වතයකට නැගීමෙනි. එහෙයින් රැකවරණය පිළිබඳ ඔවුන්ගේ අපේක්ෂා කේන්ද්‍ර වූයේ එබඳු දේටය. මේ ස්වභාව ධර්මයේ දායාද දේවත්වයෙන් පිදීමත් සමග ඇරඹුණ විශ්වාස රටාව පැරණි ආගමේ සම්භවය විය. ආගම පහළ වූයේ බිය මුල් කරගෙන යයි ඊ.ඩබ්ලිව්. හොප්කින්ස් පවසා ඇත්තේ ඒ අනුවය. කෙසේ වුව ද මිනිසා ශිෂ්ඨ වූ පසුත් ගස් ගල් වැඳීම ඔවුන් අතුරින් තුරන් නොවිය. එහෙත් මෙබඳු බොළඳ සරණ යෑම් වලින් දුක් කෙළවර කර ගැනීමට සහායයක් නොවන බව භාග්‍යවතුන් වහන්සේ හෙළිකර වදාළහ.



තෙරුවන් සරණ ගිය තැනැත්තා සිව් අරියසස් දහම් මනා කොට විදසුන් නුවණින් දක්නේ ය.

190. යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච
සඞ්ඝඤ්ච සරණං ගතො
චත්තාරි අරියසච්චානි
සම්මප්පඤ්ඤාය පස්සති (14:12)

යමෙක් බුදු සරණාත්
දහමත් සඟුන් සරණාත්
ලැබ සතර ඇත්තත්
මහා නුවණින් පසක් කළ හොත්

තෙරුවන් සරණින් - සිවුපස දකිමින්

14 (6) අග්ගි දත්ත වත (188 ගාථාවේ සිට 192 ගාථාව දක්වා)

ඒ මොහොතෙහි භාග්‍යවතුන් වහන්සේ එහි සම්ප්‍රාප්ත වූ හ. තෙරුන් වහන්සේ නැගී බුදු රජාණන් වහන්සේට නමස්කාර කළ හ. ඒ දුටු තවුසෝ "මේ ඔබ වහන්සේටත් වඩා උතුම් කෙනෙක් දැ"යි විමසුවෙන් "මම මේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ වමත් සවු වෙමි. මේ නම් තිලෝගුරු බුදු පියාණන් වහන්සේ වෙති" යි හඳුන්වන්නට යෙදිණි. "ශ්‍රාවකයන් වහන්සේ නමකට මෙබඳු ආශ්චර්‍ය්‍ය ඍද්ධි ඇත්නම් මුන් වහන්සේට කවර තරම් ඍද්ධි ඇත් ද?"යි සිතමින් තවුසෝ බුදුරදුන් හමුවේ වැඳ වැටෙමින් හරසර දැක්වූ හ. අනතුරුව අග්ගිදත්ත ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "ඔබ ශ්‍රාවකයන්ට කරන අනුශාසනය කුමක්දැ"යි විමසූ හ. "පර්වත සරණයන්න. වනාන්තර සරණ යන්න. උද්‍යාන, මහා වෘක්‍ෂ හා චෛත්‍යස්ථාන සරණයන්න. එයින් ඔබට දුකින් බියෙන් මිදෙත හැකිය. කියා මම අනුශාසනා කරමි"යි හෙතෙම පැවසී ය. "අග්ගිදත්ත එය එසේ නො වේ. මේ සරණ කිසිවකින් දුක් කෙළවර කළ නො හේ. මේ එකක් වත් බියපත් ජනතාව දුකින් මුදන්නේ නැත. යමෙක් බුද්ධ, ධම්ම හා සංඝ යන තිසරණය ගිය හොත් ඒ සරණ උතුම් සරණයි. එයින් රැකවරණයක් ලැබේ. සියළු දුකින් මිදිය හැකි ය" යි උන් වහන්සේ වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ ගේ දම් දෙසුම් අවසන සියළු තාපසවරු රහත්ඵලය ලදහ. අනතුරුව බුදුරදුන් දෙපා නැමදි ඔවුහු තමන් පැවිදි කර ගන්නා ලෙස අයැද සිටිය හ. භාග්‍යවතුන් වහන්සේ ද සිය දකුණත දිගු කොට "එන්න මහණෙනි, සියළු දුක් කෙළවර කරන උතුම් වූ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්න"යි ඔවුනට 'ඒහිභික්ඛු පබ්බජ්ජාව' දී වදාළ සේක.මාස්පතා පුද පිරිකර රැගෙන අංග, මගධ හා කුරු යන තුන් රට ජනයා අග්ගිදත්ත හා ශ්‍රාවකයන් දක්නට එන දිනය එය විය. එම අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේ අග්ගිදත්ත ගේ පිරිස සමග සිටිනු දුටු ඔවුහු "අග්ගිදත්ත ද උතුම්, නැතහොත් බුදුන් ද උතුම්"යි විමතියට පත් වූහ. බුදුරදුන් පැමිණ සිටියේ අග්ගිදත්ත ගේ අරමට හෙයින් ඔහුම වඩා උතුම් වෙතැයි බොහෝ දෙනා සිතූහ. පර සිත් දන්නා බුදුරජාණන් වහන්සේ ඒ විමති දුරු කරලනු පිණිස "අග්ගිදත්ත, ඔබ ගේ දායකයන් ගේ සිත්වල පහලව ඇති විමති දුර ලන්න" යි වදාළ හ. "මටත් කරන්නට සිතුණේ එයමයි ස්වාමීනි" යි පැවසූ අග්ගිදත්තයන්, සත් වරක් අහසට පැන, නැවත පොළවට බැස පෑ පෙළහරින් හා භාග්‍යවතුන් වහන්සේට කළ අභිවාදනයෙන් දායකයනට සත්‍යය වැටහිණි. "ස්වාමීනි, ඔබ වහන්සේ මගේ ආචාර්යෝත්තමයන් වහන්සේ ය" අග්ගිදත්ත කාටත් ඇසෙන සේ පැවසී ය.

විස්තරාත්මක අනුවාදය (190 ගාථාව)

යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගතෝ
චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති

යො ච: යමෙක්; **බුද්ධඤ්ච**: බුදුරජාණන් වහන්සේ ද; **ධම්මඤ්ච**: ධර්මය ද; **සඞ්ඝඤ්ච**: සංඝයා ද; **සරණං ගතෝ**: සරණ ගියේ ද; **චත්තාරි අරියසච්චානි**: චතුරාර්‍ය්‍ය සත්‍යය; **සම්මප්පඤ්ඤාය පස්සති**: මනා නුවණින් දකියි ද,

යමෙක් බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය සරණ ගොස් චතුරාර්‍ය්‍ය සත්‍යයන් මනාව දකින්නේ ද,

විවරණය

යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගතො: ත්‍රිවිධ රත්නය ලෙස බෞද්ධ ලෝකය සරණ යන්නේ බුදුරජාණන් වහන්සේ, උන් වහන්සේ විසින් වදාළ ධර්මය හා අෂ්ඨාර්‍ය්‍ය පුද්ගල සංඝරත්නයයි. මෙහිලා 'සරණ' යන පදය අතිවිශේෂ ආගමික අර්ථයකින් තේරුම් ගත යුත්තකි. වෙනත් ආගම්වල මෙන් තමා ගේ ස්වාධීනත්වය, ආත්ම ගෞරවය පාවා දීමක් හෝ යටත්ව, දීනව මනුෂ්‍යත්වයට නිගාදීමක් බෞද්ධ සරණාගමනය තුළ නොමැත. එසේ වන්නට හේතුව මේ ත්‍රිවිධ රත්නයෙන් එක් රත්නයක් වත් මැවුම් කරුවකු, ගැලවුම් කරුවකු හෝ විනාශකයකු නොවන හෙයිනි. එබඳු බලතල කිසිවක් බුදු දහමින් කිසිවකුට පවරනු නොලැබේ. ලෝකය ස්වභාව ධර්ම න්‍යායයනට අනුව පටිච්ච සමුප්පන්නව පවතින්නේ නිරතුරුව වෙනස් වෙමිනි. ත්‍රිවිධ රත්නය එම ක්‍රියාකාරිත්වයට බලපෑමක් කිරීම පවරා නැත. එහෙත් තමන්ට සම්බන්ධ හේතු-ඵල ක්‍රියා දාමයට බලපෑමක් කර ගන්නට මනුෂ්‍යයාට ඇති හැකියාව අවධාරණය කර ඇත. එය කරන්නේ කෙසේද යන්න සොයා ගත් උතුමා භාග්‍යවතුන් වහන්සේ ය. එය කරන ක්‍රමය ධර්මයෙහි අන්තර්ගතය. සංඝයා එය අනුගමනය කර ප්‍රතිඵල ලද්දේය. අපට එම ක්‍රමය ක්‍රියාත්මක කර අප දුකෙහි බැඳ තබන ප්‍රත්‍ය සාමග්‍රිය බිඳ හෙළා විමුක්තිය ලද හැක. එසේ නම්, බුදුරජාණන් වහන්සේ වෙත අප එළැඹෙන්නේ ගුරුවරයෙකු වෙත එළැඹෙන ශිෂ්‍යයන් පරිද්දෙනි. උන්වහන්සේ අපගේ පිහිට හෙවත් සරණ වූයේ මාර්ගය කියා දීම මගිනි. ඒ ගමන් මග අප යන්නේ 'බුදුන් සරණ යමි' යි කියමිනි. ඒ ගමන් මග අපට පිහිට වන්නේ උපකරණාර්ථයෙනි (එනම් ධර්‍මයයි). සංඝයා සැපයූ ආදර්ශය ද අපි අනුගමනය කරමු. සරණයෑම නම් මෙබඳු දෙයක් මිස අපට විමුක්තිය ත්‍රිවිධ රත්නයෙන් ලැබෙතියි සිතා කරනු ලබන්නක් නො වේ. පිරිනිවන් පාන්නට මොහොතකට පෙර පවා බුදුරජාණන් වහන්සේ උපදෙස් දුන්නේ 'අත්ත සරණා භික්ඛවෙ හොථ අනඤ්ඤ සරණා' යනුවෙනි. "තමා සරණ කර ගන්න, අනුන් සරණ කර නො ගන්න." යනු එහි අරුතයි. එසේ නම් තෙරුවන් සරණ යන්නේ කුමකට ද? ගැලවීම පතා කරන සරණ යාමක් ලෙස නොව 'ගුරු ගෞරවය' දැක්වීමක් වශයෙන් හා අප සම්‍යග් දෘෂ්ටියෙහි පිහිටි බව තහවුරු කර ගැනීමක් වශයෙන් එසේ කරමු. එය දේවවාදී දෘෂ්ටියක කරනු ලබන සරණ යෑමකට වඩා වෙනස් ය. ත්‍රිවිධ රත්නය විෂයෙහි බෞද්ධයන් ගේ ප්‍රසාදය දක්වන වතාවතක් වූ එය දාන-ශීල භාවනා දී පුණ්‍ය කර්‍ම කිරීමෙහි ලා සමාරම්භක වන සම්‍යග් දෘෂ්ටියෙහි ලක්‍ෂණයක් පමණි.

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සඞ්ඝං සරණං ගච්ඡාමි
දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි
තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි

ඊශ්වර නිර්මාණවාදය, භෞතික වාදය, සංසාර ශුද්ධි වාදය වැනි මිථ්‍යාදෘෂ්ටි ගැනීමෙන් බෞද්ධයන් වළකා තබන්නේ නිරන්තරව කරනු ලබන තිසරණ සමාදන් වීම නිසාය.

සිවු අරිය සස් දහම් හා අරිය අටඟි මග නුවණැසින් දැක පිළිපැදිය යුතු.

191. දුක්ඛං දුක්ඛසමුප්පාදං
දුක්ඛස්ස ච අතික්කමං
අරියං ච'ට්ඨඞ්ගිකං මග්ගං
දුක්ඛූපසමගාමිනං (14:13)

දුක හේතුව දුකට
මිදුම, මග ඒ මිදුමට
උතුම් මග අරි අට
මාවතයි ඒ දුක නිවන්නට

අරි අටැඟි මග - දුක නිවන මග

14 (6) අග්ගිදත්ත වත (188 ගාථාවේ සිට 192 ගාථාව දක්වා)

විස්තරාත්මක අනුවාදය (191 ගාථාව)

දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස අතික්කමං ච
දුක්ඛූපසමගාමිනං අරියං අට්ඨඞ්ගිකං මග්ගං ච

දුක්ඛං: දුක; **දුක්ඛ සමුප්පාදං**: දුකට හේතුව;
දුක්ඛස්ස අතික්කමං ච: දුක අතික්‍රමණය කිරීම ද;
දුක්ඛූපසමගාමිනං අරියං අට්ඨඞ්ගිකං මග්ගං ච: දුක් උපසමන කිරීමට ඇති ආර්ය අෂ්ඨාංගික මාර්ගය ද;

දුක, දුක ඇති වීමේ හේතුව, දුක්ඛ නිරෝධය හා දුක්ඛ උපසමයට ඇති ආර්ය අෂ්ටාංගික මාර්ගය (යන චතුරාර්‍ය්‍ය සත්‍ය දකියි ද)

විවරණය

චත්තාරි අරිය සච්චානි: බුදුරදුන් ජයසිරි මහ බෝ මැඩදී අවබෝධ කරගත් උතුම් සත්‍ය හතර චතුරාර්‍ය්‍ය සත්‍යය ලෙස හැඳින්වේ. ආර්‍ය්‍ය හෙවත් උත්කෘෂ්ට භාවයට යමකු පත්වන්නේ මෙම සත්‍යයන් අවබෝධ කර ගැනීම නිසා හෙයින් ඒවා සාමාන්‍ය සත්‍යවලට වඩා වෙනස් ය. ඒවායින් කියැවෙන්නේ ලෝකයේ යථා තත්වය හා ඒ තුළ අප ක්‍රියා කළ යුතු ආකාරයයි. මෙය අවබෝධ කර ගැනීම තුළින් විමුක්තිය සාධනය වන හෙයින් 'ආර්‍ය්‍ය' යන විශේෂණය ඊට අන්වර්ථය.

චතුරාර්‍ය්‍ය සත්‍යය බුද්ධ දේශනාවෙහි අතිශයින් ම වැදගත් වූ මූලික ඉගැන්වීමයි. එය බුදුරජාණන් වහන්සේ ගේ නිෂ්පාදනයක් නොව ලොව හැමදා පවතින්නකි. බුදුවරුන් පහළ වූවත් නැතත් ලෝකස්වභාවය එසේ ම පවතියි. බුදුවරු එය අවබෝධ කර ගෙන ලොවට දේශනා කරති. එහෙයින් එය සදාතනිකය, අකාලිකය. එහෙත් යමකු ආර්‍ය්‍යයකු වන්නේ එය බාහිර උගැන්මක් ලෙස කට පාඩම් කර ගැනීමෙන් නොව ස්වයං ප්‍රත්‍යක්ෂයක් ලෙස ගැඹුරින් ප්‍රත්‍යක්ෂ කර ගැනීමෙනි. බුදුරජාණන් වහන්සේට මේවා කිසිවකුගෙන් අසා දැනගන්නට වත් නො ලැබිණි. උන් වහන්සේ චතුරාර්‍ය්‍ය සත්‍යය ස්වයං ප්‍රතිභානයෙන් සාක්ෂාත් කළ බව **"පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි"** ආදි වශයෙන් කළ සිංහ නාදයෙන් තහවුරු වෙයි. අපට එය පත පොතින් කියවා ගන්නටත් ධර්ම කථිකයන් ගෙන් අසන්නටත් ලැබේ. එහෙත් භාවනාමය ප්‍රත්‍යක්ෂයක් ලෙස අපම එය දැන ගන්නා තුරු අපි ආර්‍ය්‍යයන් බවට පත් නො වෙමු.

ප්‍රථම ආර්‍ය්‍ය සත්‍යයෙන් උගන්වනු ලබන්නේ '**දුක්ඛ**' පිළිබඳව ය. '**දුක**' යන සිංහල වචනයෙන් දුක්ඛාර්‍ය්‍ය සත්‍යයෙහි ඉගැන්වෙන දුක අදහස් නො වෙයි. '**දුක**' යනුවෙන් සාමාන්‍ය ව්‍යවහාරයෙහි දැක්වෙන්නේ හුදෙක් අප්‍රසන්න වේදනා පමණි. එහෙත් දුක්ඛ සත්‍යයට ත්‍රිවිධ දුක්ඛයන් අන්තර්ගත වෙයි. එනම්,

1. **දුක්ඛ දුක්ඛ**,
2. **විපරිණාම දුක්ඛ**
3. **සංඛාර දුක්ඛ**

යන ත්‍රිවිධ ස්වරූපයයි. පොදු ජන වහරේ කියැවෙන දුක මෙයින් පළමුවැන්න පමණි. එහෙයින් එය වැටහුණු පමණින් දුක්ඛ සත්‍යය අවබෝධ වන්නේ නැත. විපරිණාම දුක්ඛ නම්, සියළු සුවදායක දේත්, පවතින දේත්, නිබඳව වෙනසකට භාජනය වීමයි. සංඛාර දුක්ඛ නම් සමස්ත සංස්කාර ධර්මයන්හි ම පවත්නා නිසරු බවයි. එය අවබෝධ වන්නේ උසස් මානසික ප්‍රාගුණ්‍යයක් (තත්වයක්) ඇති උතුමන්ට පමණි. සමස්ත පැවැත්ම ම කිසිම නියත, ස්ථාවර පදනමකින් හෝ ආත්මයකින් තොරව සිද්ධි දාමයක් හෝ ක්‍රියා දාමයක් වශයෙන් පමණක් පවත්නා බව තේරුම් ගැනීම මෙයින් අදහස් වේ. සාමාන්‍ය පෘථග්ජනයෝ නිතරම නිත්‍යත්වයක්ම අපේක්ෂා කරති. අනිත්‍ය වූ ලෝකය තුළ නිත්‍යත්වයක් අපේක්ෂා කිරීම මගින් ජනිත වන්නේ ඉච්ඡාභංගය පමණි.

චතුරාර්‍ය්‍ය සත්‍යයෙහි දෙවන සත්‍යය වන්නේ දුක්ඛ සමුදය සත්‍යයයි. දුක්ඛය ඇති වන්නේ කවර,හේතුවෙන්දැයි එම සත්‍යයෙන් පැහැදිලි කරනු ලැබේ. දුක්ඛ සමුදය නම් තෘෂ්ණාව බව භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කර ගත්හ. තෘෂ්ණාව ත්‍රිවිධාකාර වෙයි.

1. කාම තණ්හා - කාම වස්තූන් විෂයෙහි ඇතිවන ආශාව
2. භව තණ්හා - පැවැත්ම කෙරෙහි පවත්නා ආශාව
3. විභව තණ්හා - නො පැවැත්ම සඳහා පවත්නා ආශාව

මෙයින් භව තණ්හාව ශාස්වත දෘෂ්ටිය (සියල්ල සදහට පවතියි යන කල්පනාව) ගත් විට ඇතිවන්නක් බව ද, විභව තණ්හාව උච්ඡේද දෘෂ්ටිය (සියල්ල මරණයෙන් අවසන් වෙයි යන කල්පනාව) ගත් විට ඇති වන්නක් බව ද, අටුවාවල දක්වා ඇත. තවත් ක්‍රමයකට භව තණ්හාව නම් රූප ලෝකවලට ඇති ආශාව සේ ද, විභව තණ්හාව අරූප ලෝක වලට ඇති ආශාව සේ ද දක්වා තිබේ. රූප රාගය හා අරූප රාගය දස සංයෝජන අතුරින් දෙකක් බව මෙහිදී සටහන් කළ හැක.

තෘෂ්ණාව ඉතා බලගතු මානසික බලවේගයකි. ජීවිතයේ බොහෝ ප්‍රශ්නවලට මුල් වන්නේ මෙයයි. පුනර්භවය ඇති කරන්නේ මේ තණ්හාවෙන් වන අතර (යා'යං තණ්හා පොනොභවිකා), එය විවිධ ආත්ම භාවයනට පුද්ගලයා බැඳ තබයි (තත්‍රතත්‍රාභි නන්දිනි).

තණ්හාවෙහි දළ ගොරෝසු ගතිය සකදාගාමී වනවිට තරමක් දුරට අඩු වී යයි. එය මුළුමනින් දුරුවන්නේ අනාගාමී වන විට ය. තෘෂ්ණාවෙහි අතිශය සූක්ෂ්ම ස්වරූප පවා දුරීභූත වන්නේ රහත් බව ලැබීමෙනි.

තුන්වන ආර්‍ය්‍ය සත්‍යය දුක්ඛ නිරොධ සත්‍යයයි. එනම් සියළු දුක් කෙළවර කර ලබන නිර්වාණයයි. නිර්වාණය සාක්ෂාත් කරනු ලබන්නේ සියළු ලෞකික සැප සම්පත් අත් හැරීම මගිනි. අප තුළ පවත්නා සියළු කෙලෙස් හා අකුශල මූලයන් උපුටා දමා ලබා ගන්නා පවිත්‍ර මානසිකත්වය හා නුවණ මගින් නිර්වාණය සාක්ෂාත් කරගනු ලැබේ. නිර්වාණය සාක්ෂාත් කර ගත යුත්තකි. එය අපගේ සීමිත සංකල්ප හා වචන මගින් විවරණය කිරීම දුෂ්කර ය.

චතුරාර්‍ය්‍ය සත්‍යයෙහි සතරවන සත්‍යය වන්නේ මාර්ග සත්‍යයයි. (දුක්ඛ නිරෝධගාමිනීපටිපදා) එනම්, කාමසුඛල්ලිකානු යෝගය සහ අත්තකිලමථානුයෝගය යන අන්ත දෙකම දුරලන මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයයි. නිර්වාණය ලැබීම සඳහා ඇති එකම හා නො වරදින මාර්ගය මෙය බව භාග්‍යවතුන් වහන්සේ වදාරති.



තුනුරුවන් සරණයාම සෙත සලසන සුලුය. ඒ සරණය සියල් දුකින් මිදීමට හේතු ය.

192 එතං ඛො සරණං ඛෙමං
එතං සරණමුත්තමං
එතං සරණමාගම්ම
සබ්බ දුක්ඛා පමුච්චති (14:14)

ලැබෙයි ඉන් සැනසුම
එය වෙයි සරණ උත්තම
ඒ සරණට පැමුණුම
මගය සසරින් ලබන ගැලවුම

14 (6) අග්ගිදත්ත වත (188 ගාථාවේ සිට 192 ගාථාව දක්වා)

විස්තරාත්මක අනුවාදය (192 ගාථාව)

එතං සරණං ඛො ඛෙමං එතං සරණං උත්තමං එතං සරණං ආගම්ම සබ්බදුක්ඛා පමුච්චති

එතං සරණං: මේ සරණ; **ඛො**: ඒකාන්තයෙන්; **ඛෙමං**: සුරක්‍ෂිතය; **එතං සරණං**: මේ සරණ; **උත්තමං**: උතුම්ය; **එතං සරණං**: මේ සරණට; **ආගම්ම**: පැමිණ; **සබ්බ දුක්ඛා**: සියළු දුකින්; **පමුච්චති**: මිදෙන්නේය.

මේ සරණ ඒකාන්තයෙන් සුරක්‍ෂිත ය. මේ සරණ උත්තමය. මේ සරණට පැමිණ සියළු දුකින් මිදෙන්නේය.

විවරණය

අරියඤ්චට්ඨංගිකං මග්ගං: උතුම් වූ අංග අටකින් සමන්විත මාර්ගය. මෙය මුල පටන්ම නිර්වාණාභිලාශී තැනැත්තකු විසින් අනුගමනය කළ යුතු ශික්‍ෂාව විවරණය කිරීමකි. එම ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයට අයත් අංග අට නම් මේවාය.

1. සම්මා දිට්ඨි - නිවැරදි දැකීම
2. සම්මා සංකප්ප - නිවැරදි කල්පනා (සිතුවිලි)
3. සම්මා වාචා - නිවැරදි වචන
4. සම්මා කම්මන්ත - නිවැරදි ක්‍රියා
5. සම්මා ආජීව - නිවැරදි දිවි පෙවෙත (රැකියාව)
6. සම්මා වායාම - නිවැරදි ප්‍රයත්නය
7. සම්මා සති - නිවැරදි සිහිය
8. සම්මා සමාධි - නිවැරදි සමාධිය

1. **සම්මා දිට්ඨි**: මිසදිටු වශයෙන් හඳුන්වන නාස්තික දෘෂ්ටිවලින් වෙන්ව කර්මය, කර්ම ඵලය අදහමින් චතුරාර්‍ය්‍ය සත්‍යය පිළිබඳ විශ්වාසයක් ඇති කර ගැනීම සම්මා දිට්ඨි වෙයි.

2. **සම්මා සංකප්ප**: දෘෂ්ටිය නිරවද්‍ය වූ විට කල්පනා නිරවද්‍ය වෙයි. නෙක්ඛම්ම, අව්‍යාපාද හා අවිහිංසා සංකල්ප මේ ගණයට අයත් වෙයි. ධාර්මික කල්පනා පහල වන්නේ ධාර්මික දෘෂ්ටියක් ඇති විටය.

පුද්ගලයකු දූෂණය වීමට හෝ පවිත්‍ර වීමට වඩාත්ම බලපාන්නේ ඔහුගේ සිතුවිලි ය. එමගින් ඔහු ගේ චරිතය හැඩ ගැසෙයි. පහත් සිතුවිලි ඇත්තා ගේ කතාබහ මෙන් ම ක්‍රියා ද පහත් වෙයි. දුසිරිතට ම නැඹුරු වෙයි. එහෙත් උසස් සිතුවිලි ඇත්තා කතා කරන්නේත් ක්‍රියා කරන්නේත් උසස් අයුරිනි. ඔහු ප්‍රකට කරන්නේ සුසිරිත ය. සම්මා සංකප්ප මගින් නරක චේතනා ඉවත් කරන අතර හොඳ චේතනා වර්ධනය ද සිදුවේ.

සම්මා සංකප්පයට ඇතුළත් නෙක්ඛම්ම සංකප්ප ගණය වැටෙන්නේ ලෞකික කාම සම්පත් අතහැර දැමීමයි. එමගින් ආත්මාර්ථකාමය දුරුවෙයි. තෘෂ්ණාව දිය වී යයි. අව්‍යාපාද සංකල්පයෙන් අදහස් කරන්නේ මෙත් සිත, සුහද ආකල්ප, පරාර්ථකාමිත්වය වර්ධනය කිරීමයි. කිසිම සත්වයෙකුට වධ වේදනා නොපැනවීම මෙහි අභිප්‍රාය යයි. අවිහිංසා සංකල්පය නම් කරුණාව දයාව ප්‍රගුණ කිරීමයි.

සාමාන්‍ය පෘථග්ජනයන් අතර මෙබඳු පාපී සිතුවිලි සිත් තුළ යටපත්ව පවතියි. මේවා දුරුකර සෞම්‍ය සිතුවිලි වර්ධනය කර ගැනීම ඉතා අර්ථ සම්පන්න වෙයි. සම්මා සංකල්ප ඇති කර ගැනීම පමණක් නොව නිතර ප්‍රගුණ කිරීම මගින් රැක ගැනීම ද අවශ්‍යය ය. එමගින් මානසික සමතුලිත තාව, සන්සුන් බව වගා කර ගත හැක. අනිකුත් මාර්ගයන්හි වර්ධනයට ද එය බලපායි.

3. **සම්මා වාචා**: සම්මා සංකප්ප, ආර්‍ය්‍ය මාර්ගයේ තුන්වන පියවර වූ සම්මා වාචා වලට හේතු වෙයි. බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම හා හිස් වචන කීමෙන් වැළකීම එයින් අදහස් වෙයි.

4. **සම්මා කම්මන්ත**: සම්මා වාචා වලින් අනතුරුව දැක්වෙන්නේ ප්‍රාණ ඝාතය, සොරකම හා කාමයෙහි වරදවා හැසිරීම දුරලන සම්මා කම්මන්තයි.

5. **සම්මා ආජීව**: මෙසේ සිත, කය සහ වචනය මූලාරම්භයේ දීම පිවිතුරු කර ගන්නා ආර්‍ය්‍ය මාර්ගගාමියා පංච විධ මිථ්‍යා ආජීවයන් වූ වෙළදාම් පහකින් ඈත් වෙයි. එනම්; අවි ආයුධ වෙළදාම, මිනිසුන් වෙළදාම, මස් වෙළදාම, මත්පැන් වෙළදාම, වස විස වෙළදාම යන මේවාය.

6. **සම්මා වායාම**: සම්මා වායාමය චතුර්විධය. ඒ මෙසේ ය.

1. උපන් අකුසල් ප්‍රහාණය කිරීම සඳහා වීර්යය කිරීම
2. නූපන් අකුසල් නූපදවීම සඳහා වීර්යය කිරීම
3. නූපන් කුසල් ඉපැදවීම සඳහා වීර්යය කිරීම
4. උපන් කුසල් වර්ධනය කිරීම සඳහා වීර්යය කිරීම

7. **සම්මා සතිය**: සම්මා සතිය නම් කය පිළිබඳව (කායානුපස්සනා), වේදනාවන් පිළිබඳව (වේදනානුපස්සනා), සිත පිළිබඳව (චිත්තානුපස්සනා) හා මානසික අරමුණු (ධම්මානුපස්සනා) පිළිබඳව නිරන්තර අවදිකමින්, සිහියෙන් සිටීමයි.

8. **සම්මා සමාධි**: සම්මා වායාම හා සම්මා සති මගින් සම්මා සමාධිය වෙත යොමු විය හැකිය. සිතෙහි ඒකාග්‍රතාව සමාධියයි. සමාධිගත සිත ඇත්ත ඇති සැටියෙන් දැන ගැනීමට ප්‍රබල උපකාරකයක් ලෙස ක්‍රියා කරයි.

උතුම් පුරිසු වූ බුදුරදුන් ගේ උපත දුලබ ය. බුදුවන මහසත්හු ගේ උපත හැම තැන සිදු නො වේ.

193. දුල්ලභො පුරිසාජඤ්ඤො
න සො සබ්බත්ථ ජායති
යත්ථ සො ජායතී ධීරො
තං කුලං සුඛමෙධති (14:15)

මහා පුරුෂයන් දුලබයි
හැමදා හැම තැන නොලැබෙයි
ඉපදුනහොත් යම් පවුලක
එය නියතින් සැපවත් වෙයි

කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ

14 (7) ආනන්ද හිමියන් නැගූ පැනයක් (193 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළේ **ආනන්ද හිමියන්** නැගූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.

දිනක් විවේක සුවයෙන් වෙසෙන ආනන්ද හිමියන්ට මෙබඳු අදහසක් පහළ විය. "අපේ බුදුරජාණන් වහන්සේ අපට මෙසේ වදාරා ඇති සේක. ආජානීය හස්තීහු ඡද්දන්ත කුල වල උපදිති. ආජානීය අශ්වයෝ වලාහක හෙවත් සෛන්ධව කුලයෙහි උපදිති. ආජානීය වෘෂභයෝ දක්ෂිණ දිග්භාගයේ පමණක් උපදිති. එහෙත් උන්වහන්සේ ආජානේය මනුෂ්‍යයන් උපදින තැන් වදාරා නැත."

එය උන්වහන්සේ ගෙන් අසා විසඳා ගත යුතුයයි සිතූ ආනන්ද මහ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් "ස්වාමීනි ඔබ වහන්සේ ආජානේය සත්වයන් ගැන වදාළ නමුත් ආජානේය මනුෂ්‍යයන් ගැන වදාරා නැත. ආජානේය මනුෂ්‍යයන් ගැන ද දේශනා කළ මැනවි" යි ඇරයුම් කළේය. එයට පිළිතුරු වශයෙන් "ආනන්ද ආජානේය මනුෂ්‍යයෝ දුර්ලභය. ඔවුහු හැමතැනම නූපදිති. ඔවුන් යම් පවුලක උපදින්නේ නම්, එය සැපවත් වෙයි" යනුවෙන් පූර්වොක්ත ගාථාවෙන් ධර්ම දේශනා කළ හ.

විස්තරාත්මක අනුවාදය (193 ගාථාව)

පුරිසාජඤ්ඤො දුල්ලභො සො සබ්බත්ථ න ජායති සො ධීරො යත්ථ ජායති තං කුලං සුඛං එධති

පුරිසාජඤ්ඤො: උත්තරීතර පුරුෂයා; **දුල්ලභො**: දුර්ලභය; **සො**: හෙතෙම; **සබ්බත්ථ**: හැමතැනම; **න ජායති**: නූපදී; **සො ධීරො**: ඒ ප්‍රාඥයා; **යත්ථ**: යම් තැනක; **ජායති**: උපදියි ද; **තං කුලං**: එම කුලයට; **සුඛං**: සැපත; **එධති**: ලඟා වෙයි.

ඒ පුරුෂොත්තමයා (සම්මා සම්බුදුරජාණන් වහන්සේ) ඉතා දුර්ලභ ය. හැම තැනම පහළ නො වෙයි. යම් පවුලක උන් වහන්සේ පහළ වන්නේ නම් ඒ පවුල සැපවත් වෙයි.

විවරණය

සබ්බත්ථ න ජායති: හැම තැනම නූපදියි. මේ දක්වන්නේ බුදුරජාණන් වහන්සේ ගැනය. පශ්චිම භවික බෝසතුන් වශයෙන් බුදුවරුන් උපදින්නේ දේවාරාධනය අනුව ය. ඒ ඇරයුම ලත් විට බෝසත්හු පස් මහ බැලුම් (පංච මහා විලෝකන) බලති. කාලය, දීපය, දේශය, කුලය, මව ගේ ආයුෂ යන කරුණු එසේ නිරීක්ෂණය කරනු ලැබේ. මුලින් ම බලන්නේ කාලයයි. මිනිසුන් ගේ ආයුෂ වර්ෂ ලක්ෂයකට වඩා වැඩි කාලවල බුද්ධොත්පාදය උචිත නො වේ. ඒ කාලවල මිනිසුනට උපත, ජරාව හා මරණය යන දේ ගැන කම්පනයක් ඇති කර ගැන්ම අපහසුය. අනිත්‍යය වැටහෙන්නේ නැති තරම් ආයු කාලය දිඝ් හෙයිනි. එමෙන්ම දුක ගැන අවදිකමක් ද ඇති නො වේ. අනිත්‍යය හා දුක ගැන සංවේදී නොවන විට අනාත්මාවබෝධය ද සිදු නො වේ. ත්‍රිලක්ෂණය ගැන හැඟීමක් ඇති කර නො ගන්නවුනට බුදු සමය දේශනා කළ නො හැක. බුදුවරුන් තිලකුණු ගැන දෙසන විට ඔවුන් "මේ කවර කතාවක් දැ"යි කියමින් එය නොතකා හරිනු ඇත. එවිට එය සිත් නොවදියි. සිතට නො ගන්නා හෙයින් පිළි පැදීමක් ද නැත. එකල මිනිස්සු කෙලෙසුන් ගෙන් ම මැඩී රාග දෙසාදියෙන් පිරී කම් සැප විඳිමින් ප්‍රමාදව වසති. දෙසන බණ දියෙහි ඇඳි ඉරක් මෙන් වහාම මැකී යයි. එහෙයින් එය නියම කාලය නො වේ. මිනිසුන් ගේ ආයුෂ වසර සියයේ සිට ලක්ෂය දක්වා අතරතුර කාලයක් වූ විට බුද්ධෝත්පත්තිය යහපත් ය.

දීපය ගැන බලන්නේ කෙසේ ද? කොදෙව් පිරිවැරූ මහා ද්වීප හතර ගැන නිරීක්ෂණය කොට ජම්බුද්වීපයෙහි හැර අන්‍ය වූ ද්වීපයෙක බුදුවරු නූපදිති යි ප්‍රත්‍යක්ෂ කර ගැනීම මගිනි. අනතුරුව මෙසේ සිතති. "ජම්බුද්වීපය නම් විශාල භූමි ප්‍රදේශකි. යොදුන් දස දහසක් පමණ විශාල ය. එහි කවර රටක බුදුවරු උපදිත් ද?" එසේ විමසා බලන විට බුදුවරු මධ්‍ය ප්‍රදේශයේ ම උපදිතියි තීරණය කරති. වත්මන් බුදුරදුන් කපිලවස්තුව තෝරා ගත්තේ ඒ අයුරින් විමසුමෙනි.

අනතුරුව විමසන්නේ පවුල ගැනය. බුදුවරු කිසි කලෙක වෛශ්‍ය හෝ ශුද්‍ර පවුලක නූපදිති. ඔවුන් උපදින්නේ ක්ෂත්‍රිය හෝ බ්‍රාහ්මණ කුලයක ය. එය තෝරා ගන්නේ එම යුගයේ වඩාත් ප්‍රමුඛව සිටින්නේ කවර කුලයදැයි විමසා බැලීමෙනි. වත්මන් බෝසතුන් උපන් සමයේ දඹදිව ප්‍රබලව සිටියේ ක්ෂත්‍රිය කුලය හෙයින් එහි උපදින්නට තීරණය කර ගත්හ. සුද්ධෝදන රජතුමා පියා වශයෙන් තෝරාගෙන එම රජ පවුලේ උපදින්නට තීරණය කළේ එබැවිනි.

අනතුරුව බෝසතුන් විමසන්නේ මව ගැනය. බෝධිසත්ත්ව මාතාව දුසිරිතෙන් තොර කල්ප ලක්ෂයක් පෙරුම් පිරූ තැනැත්තියක් වුව මනාය. නිති පන්සිල් රකින පින්වතියක් විය යුතුය. මහාමායා දේවිය ගැන විමසූ විට පෙනී ගියේ ඇයට ආයුෂ ඇත්තේ මාස දහයකුත් දින හතක් පමණක් බවයි.

මේ පංච මහා විලෝකනයන් ගෙන් අනතුරුව බෝසත්වරු දේවාරාධනය පිළිගෙන මනු ලොව උපදින්නට තීරණය කළ බව දන්වති. මෙබඳු ශ්‍රේෂ්ඨ සිද්ධියක් සිදුවන්නේ ඉතා කලාතුරකිනි. බුද්ධෝත්පාදය දුර්ලභයයි පවසන්නේ එහෙයිනි.

බුදු උපත, සදහම් දෙසුම, සහ සමගිය, සමගිවූවනට තපස, සැපයට හේතු ය.

194. සුඛො බුද්ධානං උප්පාදො
සුඛා සද්ධම්මදෙසනා
සුඛා සඞ්ඝස්ස සාමග්ගි
සමග්ගානං තපො සුඛො (14:16)

බුදුවරුන් ගේ උපත සැපතකි
උතුම් සදහම් දෙසුම සැපතකි
සංඝ සමගිය තවත් සැපතකි
සමගි පිරිසේ තපස සැපතකි

සැප ගෙන එන - සතර කරුණු

14 (8) භික්ෂු පිරිසක ගේ කතාවක් (194 ගාථාව)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි **භික්ෂු පිරිසක්** අතර ඇති වූ සාකච්ඡාවක් මුල් කර ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

භික්ෂූන් වහන්සේලා එදින කථා කරමින් සිටියේ මේ මනුෂ්‍ය ලෝකයෙහි සැප නමින් හඳුන්වන්නේ මොනවා ද යන්නයි. රාජකීය පවුල් වලින් පැවිදිව සිටි භික්ෂූහු යස ඉසුරු සැප බව කියා සිටිය හ. පංච කාම සම්පත් අනුභව කරමින් සිට පැමිණ පැවිදිව සිටි පිරිසක් ඉහලම සැපය නම් ඉඳුරන් පිනවමින් කම් සුව විඳිමින් වාසය කිරීම බව කියා සිටියහ. ආහාරයෙහි ගිජුව සිටි සමහරු රස මසවුළු සහිතව ප්‍රණීත භෝජන අනුභව කිරීම සැප බව කීහ.

මේ සාකච්ඡාව මෙසේ පවතින අතර බුදුරජාණන් වහන්සේ එහි අවුත් "මහණෙනි, ඔබ සාකච්ඡා කරන්නේ කවරක්දැ" යි විමසූ හ. "ස්වාමීනි, අපි සැප යනු මොනවාදැයි කතා කරමින් සිටියෙමු" යි පැවසූ ඔවුහු ඉදිරිපත් වූ මත කිහිපය ද වාර්තා කළ හ. "මහණෙනි, ඔබ සඳහන් කළ සැප සියල්ල සසරටම බැඳුණු හෙයින් හුදෙක් සාංසාරික සැප ම වෙති. ඒවායින් ඔබට සසර දුකින් මිදෙන්නට කිසිම රුකුලක් නො ලැබෙයි. මේ මනුෂ්‍ය ලෝකයේ සැප නම්, බුද්ධෝත්පාදය, සද්ධර්මය පහළවීම, සංඝයා ගේ සමගිය හා සමගි සංඝයා ගේ තපසය"යි මේ ගාථාවෙන් ධර්ම දේශනා කර වදාළහ.

විස්තරාත්මක අනුවාදය (194 ගාථාව)

බුද්ධානං උප්පාදො සුඛො සද්ධම්මදෙසනා සුඛා
සඞ්ඝස්ස සාමග්ගී සුඛා සමග්ගානං තපො සුඛො

බුද්ධානං: බුදුවරුන්ගේ; **උප්පාදො**: උපත; **සුඛො**: සුවයකි; **සද්ධම්මදේසනා**: සද්ධර්මය පහළවීම; **සුඛො**: සුවයකි; **සඞ්ඝස්ස**: සංඝයාගේ; **සාමග්ගී**: සමගිය; **සුඛො**: සුවයකි; **සමග්ගානං**: සමගි වූවන්ගේ; **තපො**: ඉන්ද්‍රිය දමනය; **සුඛො**: සුවයකි.

බුදුවරුන්ගේ උපත සුවයකි. ධර්මය දේශනා කරනු ලැබීම සුවයකි. සංඝයා ගේ සමගිය සුවයකි. සමගි වූවන් ගේ ඉන්ද්‍රිය දමනය සුවයකි.

විවරණය

බුද්ධානං උප්පාදො සුඛො: බුදුවරුන් ගේ උපත සුවයකි. බුදුවරයකු ලොව පහළ වන්නේ සියළු සත්වයන්ගේ හිත සුව පිණිස ය. සසර දුකින් පෙළෙන සියළු දෙනාට එයින් මිදෙන මාර්ගය දේශනා කරනු පිණිස ය. බුදුවරයෙකු පහළ වන්නට පෙර ලෝකයේ එබඳු කෙනෙකුන් පහළ වෙතැයි 'බුද්ධ කෝලාහල' නමින් හඳුන්වන මහත් උද්‍යෝගයක් විද්‍යමාන වන්නේ එහෙයිනි. ඇතැම් යක්ෂයන් පවා බුදු කෙනකුගෙන් විමසා ගන්නට යයි ප්‍රශ්නාවලීන් තබා ගත් බව බෞද්ධ පොත්වල දැක්වේ. ඒරකපත්‍ර නම් නාගරාජයා පවා බුදුවරයකු පහළ වී දැයි දැන ගැනීම පිණිස තම දියණියට ප්‍රශ්න හතරක් උගන්වා දෙ-පෝදාට ගං ඉවුරේ රඟමින් ගයන්නට හුරු කළ බව කියැවේ. බුදුරදුන් පහළ වූ භාරතයේ මේ කුතුහලය මැද තමන් බුදු යැයි කියා ගනිමින් ඇතැම් ව්‍යාජ බුදුවරුන් ජනතාව රවටන්නට වෑයම් කළ බව පවා වාර්තා වී ඇත. බුදු උපත සැපතක් වන්නේ එය හුදෙක් බුදුවන බෝසතුන්ට පමණක් යහපත ගෙන එන්නක් නොවන නිසා ය. බොහෝ සාහිත්‍ය කෘති වල ඇතැම් ධර්ම දේශනා ගැන සඳහන් කරත් දී "සුවාසූ දහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමය විය" යි දක්වා ඇත්තේ මේ හේතුවෙනි. බුදුවරුන් හඳුන්වන්නේ **"සත්ථා දේව මනුස්සානං"** වශයෙනි. එහි තේරුම බුද්ධ දේශනාවෙන් මනුෂ්‍යයන් පමණක් නොව දෙවියන් ද ප්‍රයෝජන ලබා ගන්නා බවයි. බුද්ධත්වය ලද පසු සියළු සත්වයන් ගේ හිත සුව පිණිස ක්‍රියා කිරීමෙහි ලා බුදුවරු වෙහෙසක් නො දකිති.

"සබ්බදා සබ්බ සත්තානං
හිතාය ච සුඛාය ච
උයුත්තො අකිලාසු ච
අහෝ අච්ඡරියෝ ජිනො"

(හැම දා හැම සතුන්
හිත සුවට ම වෙහෙසුණාත්
විඩා නොතැකූ බුදුරජ
අහෝ කෙතරම් පුදුම ද?)

ගෞතම බුද්ධ චරිතය කියවන ඕනෑම අයකු බුදුරදුන් ලෝ වැඩ වැඩූ අනුපම විලාසය ගැන විස්මයට පත් වනු නියතය. කුලභේදයේ පීඩාවෙන් මැඩී සිටි චණ්ඩාල ආදී පහත් යැයි සම්මත ප්‍රජාවට මානුෂික අයිතිවාසිකම් ලබා දීමට උන්වහන්සේ කුලභේදයට එරෙහිව ක්‍රියා කළ හ. තමන් පිහිට වූ ආගමික සමාජය තුළ කාටත් සමසේ සැළකූ උන්වහන්සේ සියළු කුලවල ජනයා පැවිදි කොට සිවු ගඟ දිය මහ මුහුදේ දී මිශ්‍ර වන්නාසේ එකට එක් කළහ.

ආර්ථික පීඩනයෙන් හා සමාජ පීඩනයෙන් මැඩී සිටි බොහෝ දෙනා උන්වහන්සේ ගේ සසුනෙහි පිහිට ලැබූ හ. සුනීත වැනි කසලසෝධකයන්, සෝපාක වැනි නොතකා හරිනු ලැබූ අනාථ දරුවන්, රජ්ජුමාලා වැනි වහල් දැරියන් සුවපත් වූයේ සසර දුක් නිවා ගනිමිනි. මිසදිටු අඳුරේ ගැලී හුන් බොහෝ දෙනා බුදුරදුන් ගෙන් දහම් අසා මිසදිටු බිඳ ධර්මාලෝකය ලබා ගත්හ. ඔවුන්ට භාග්‍යවතුන් වහන්සේ විසින් සම්මාදිට්ඨිය ලබා නුදුන්නේ නම්, ඔවුන් දුශ්ශීලව මිථ්‍යා දෘෂ්ටිය නිසා අන්ත අගතිගාමී වන්නට තිබිණි.

වර්තමානය දක්වාම භාග්‍යවතුන් වහන්සේ වදාළ ධර්මය නිසා නුවණැස පාදාගනිමින් සතර අපායෙහි නො වැටී ස්වර්ග මෝක්ෂ සම්පත් සලසා ගන්නෝ අසංඛ්‍ය වෙති. එහෙයින් බුද්ධෝත්පාදය නම් ලෝකයට මහත් ශාන්තියකි.

සඞ්ඝස්ස සාමග්ගී: සංඝයා නම් ලෝකයේ පැරණිතම ප්‍රජාතාන්ත්‍රික සංස්ථාපිත බ්‍රහ්මචාරීන්ගේ සමාජයයි. සංඝ සමාජය සඳහා විනය නීති පද්ධතියක්, පාලන ව්‍යුහයක් හා චරිත විසෝධන ක්‍රියාවලියක් ද මනාව සංවිධානය කර ඇත. සංඝයා සමගිව සිටින විට සමාජයට සිදුවන සේවය වඩාත් නිර්මල ය.

පූජාවට සුදුසු වූ - පසේබුදු බුදුසවු යන උතුමෝ.

195. පූජාරහෙ පූජයතො
බුද්ධෙ යදි ව සාවකෙ
පපඤ්ච සමතික්කන්තෙ
තිණ්ණ සොකපරිද්දවෙ (14:17)

පහන් කර තමන් සිත් - කෙළෙස් මල ඉවත් කර
හැඬුම් වැලපුම් දුරැර - සුවපත්ව වෙසෙන නිති
පිදිය යුතු උතුමන්ට - බුදුන්, සවුවන් වගේ
කරන පුද සත්කාර - නිතර ගරුසරු ඇතිව

පුදනු යහපති පිදිය යුත්තන්

14 (9) කසුප් බුදුන් ගේ රන් සෑයේ විත්තිය (195 සහ 196 ගාථා)

බුදුරදුන් සැවැත් නුවර සිට බරණැස් නුවර වැඩම කරන අතරමග දී, හමු වූ බමුණකු දෙවොලකට කළ පුද සත්කාර දැක වදාළ ගාථා යුග්මයකි.

භාග්‍යවතුන් වහන්සේ මහත් සඟ පිරිවර ද කැටිව සැවැත් නුවරින් පිටත්ව බරණැස් නුවරට ගමන් කරමින් සිටිය හ. අතරමග දී උන්වහන්සේ තෝදෙය්‍ය නම් ගමෙහි එක් දෙවොලක් අසලට පැමිණිය හ. එහි වැඩ හිඳි භාග්‍යවතුන් වහන්සේ ලඟ කුඹුරක සීසාමින් සිටි බමුණෙකු දැක ඔහු මා වෙත කැඳවාගෙන එන්නැයි ආනන්ද හිමියනට උපදෙස් දුන් හ.

ආනන්ද තෙරණුවෝද බමුණා කැඳවා ගෙන ආහ. බමුණා එහි පැමිණ දේවාලයට ගොස් නමස්කාර කර අවුත් බුදුන් හමුවෙහි පෙනී සිටියේ ය. "බමුණ, මෙතෙක් අප මෙහි වැඩ හිඳිද්දීත් ඔබ වැන්දේ දේවාලයට පමණි. එසේ දේවාලයට වඳින්නට කිසියම් විශේෂ හේතුවක් ඇත් ද?"යි ඔහු ගෙන් තථාගතයන් වහන්සේ විමසූ හ.

"මේ අපේ පරම්පරාවේ අය දිගින් දිගටම වැඳ පුදගෙන ආ පරම්පරාගත දේවාලය යි" හේ පිළිතුරු දුන්නේ ය. "ඉතාම යහපත්, ඉතාම යහපත්" ඔහු පැසසූ භාග්‍යවතුන් වහන්සේ "බ්‍රාහ්මණය, ඔබ නමදින්නේ නැමදිය යුතුම තැනක්" යි ප්‍රශංසා කළ හ.

ඒ ඇසූ භික්ෂූහු "ස්වාමීනි, ඔබ වහන්සේත් මේ බමුණා ගේ දේවාලය වර්ණනා කරනවා. මෙහි ඇති විශේෂ වැදගත්කම කුමක් ද?" යි ප්‍රශ්න කළ හ. "මහණෙනි, මෙය ඉතාම වැදගත් තැනක්. මම එහි ඉතිහාසය ඔබට හෙළි කරන්නම් යි වදාරා ඝටිකාර සූත්‍රය (මෙය මජ්ඣිම නිකායේ දක්වා ඇත.) දේශනා කොට, මෙතැන කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගේ ශරීර ධාතු නිදන් කළ රන් සෑය ඇති තැනයි"යි හෙළිකොට එතෙක් පොළොව යට සැඟවී පැවති රන් සෑය තම සෘද්ධි බලයෙන් මතුකර පෙන්වා දුන් හ. අනතුරුව බමුණා අමතා ධර්ම දේශනා කළ භාග්‍යවතුන් වහන්සේ, තම ශ්‍රාවක පිරිස දෙසට ශ්‍රී හස්තය දිගු කොට බමුණාට දක්වමින් "බ්‍රාහ්මණය, පිදිය යුත්තන්ට පිදීම උතුම් ය. මෙවැනි උතුමන්ට පුද පූජා කිරීම ඉතා උතුම්ය" යි වදාරා මේ ගාථා දෙක වදාළ හ.

විස්තරාත්මක අනුවාදය (195 ගාථාව)

පපඤ්චසමතික්කන්තෙ තිණ්ණ සොකපරිද්දවෙ
පූජාරහෙ බුද්ධෙ යදි වා සාවකෙ පූජයතො

පපඤ්ච සමතික්කන්තෙ: බාහිර ලෝකය නිසා සිත් තුළ ඇති වන කෙළෙස් ඉක්මවා ගිය, **තිණ්ණ සෝක පරිද්දවෙ**: ශෝක පරිදේව ඉක්මවා ගිය, **පූජාරහෙ**: පූජාවන්ට යෝග්‍ය, **බුද්ධෙ**: බුදුරදුන් වෙත (ගෙන්), **යදි වා**: එසේ නැතහොත්, **සාවකෙ**: ශ්‍රාවකයන් වෙත, **පූජයතො**: පුජා කරන්නේ නම්,

සිත් තුළ ඇති වන කෙළෙස් ඉක්මවා ගිය, ශෝක පරිදේව ඉක්මවා ගිය, පූජාවන්ට යෝග්‍ය වූ බුදුරජාණන් වහන්සේ වෙත හෝ ශ්‍රාවකයන් වහන්සේ වෙත පූජාවන් කරන්නේ නම්,

විවරණය

පූජාරහේ පූජයතො බුද්ධෙ යදිව සාවකෙ: බුදුරජාණන් වහන්සේ සහ ශ්‍රාවකයෝ පූජාවන්ට යෝග්‍ය වෙති. කෙනකු අන්‍යයන් ගේ පුද පූජාවනට යෝග්‍ය වන්නේ ගුණවත් කම හේතුවෙනි. ගුණයහපත්කම නැමැති මිම්මෙන් බුදුරජාණන් වහන්සේට සමාන කළ හැක්කේ තවත් බුදු කෙනෙකුන් ම පමණි. බුදු ගුණ තවත් බුදු කෙනෙකුන් විසින් කල්පයක් තිස්සේ කීවත් කල්පය නිම වනු මිස බුදු ගුණ නිම නොවන බව පවසන්නේ එහෙයිනි. බෞද්ධයන් විසින් නමස්කාර පාඨයට ඇතුළත් කර ඇති ගුණ නවය ගැන කල්පනා කර බැලීමෙන් වුවද බුදුරදුන් ගේ පූජාරහත්වය තේරුම් ගත හැකි ය. බුදුරදුන් ලද තරම් පූජා ලද වෙනත් උතුමකු ලොව ඇතැයි සිතිය නොහේ. පැරණි කවියකු තම බුදුගුණ කාව්‍යය

"පරසතු මලින් පුද
ලද මුනි සඳුට දිය නඳ
වනපස මලින් පුද
කළැයි පවසනු කවර වරද ද?"

යි සටහන් කළේ එ හෙයිනි. අෂ්ටායෑ පුද්ගල සංඝ රත්නය ද **ආහුණෙය්‍ය, පාහුණෙය්‍ය, දක්ඛිණෙය්‍ය** හා **අඤ්ජලිකරණෙය්‍ය** වශයෙන් දක්වා ඇත්තේ පූජාරහ ගුණය දක්වනු පිණිස ය. සංඝයාට පිදූ දේ මහා ආනිශංස බව බුදුරදුන් විසිනිදු ප්‍රජාපති ගෝතමිය තමන්ට පිදුමට ගෙන ආ චීවරය "**සංඝෙ ගොතමේ දේහි**" "සංඝයාට පිදීම පිණිස යොමු කරන්න"යි කීමෙන් පැහැදිලි වේ.



නිවීගිය සිතැති කිසි ලෙසකිනුත් බියක් නැති බුදු - පසේ බුදු - බුදුසවු යන උතුමන් පිදීමේ අනුසස් අපමණ ය.

196. තෙ තාදිසෙ පූජයතො
නිබ්බුතෙ අකුතොභයෙ
න සක්කා පුඤ්ඤං සඞ්ඛාතුං
ඉමෙ'ත්තංඉ'ති කේන චි (14:18)

පැමිණි නිවනට උතුම් - කිසි තැනෙක නැති බියක්
එබඳු උතුමන්ට නිසි - නිතර පුදසත්කාර
කරන යම් කෙනකුහට - ලැබෙන පින්වල තරම
මෙතෙක් යයි කියන්නට - කෙනෙක් නැත වන සමත්

වැඳුම් පිදුම් සැදෑ සිතින් - කළොත් ලැබේ අපමණ පින්

14 (9) කසුප් බුදුන් ගේ රන් සෑයේ විත්තිය (195 සහ 196 ගාථා)

විස්තරාත්මක අනුවාදය (196 ගාථාව)

නිබ්බුතෙ අකුතොභයෙ තාදිසෙ තෙ පූජයතො පුඤ්ඤං
ඉමං එත්තං ඉති සඞ්ඛාතුං කෙනචි අපි න සක්කා

නිබ්බුතෙ: නිවී ගිය; **අකුතොභයෙ**: කිසිම බියක් නැති; **තාදිසෙ**: එබඳු උතුමන් වෙත; **තෙ පූජයතො**: පූජාකරන්නහු ගේ; **පුඤ්ඤං**: පින; **ඉමං එත්තං ඉති**: මෙය මෙ පමණයයි; **සඞ්ඛාතුං**: ප්‍රමාණ කිරීමට; **කෙනචි අපි**: කිසිවකු විසිනුදු; **න සක්කා**: කළ නොහැකිය.

නිවන් ලද, බියෙන් තොර එබඳු උතුමන්ට වැඳුම් පිදුම් කිරීමෙන් ලබන පින මෙතෙකැයි කියා ප්‍රමාණ කිරීම කිසිවකු විසින් වත් කළ නො හැක.

විවරණය

පූජාරහේ පූජයතො: ත්‍රිවිධ රත්නයට පුද පූජා පැවැත්වීම බෞද්ධ සංස්කෘතියේ විශේෂාංගයක් වශයෙන් දියුණුවට පත් වූයේ මෙම '**පූජාරහේ පූජයතො**' සංකල්පය නිසාය. බුද්ධ කාලයේ භාග්‍යවතුන් වහන්සේට ගෞරව පිණිස බොහෝ දෙනා උන්වහන්සේ බැහැ දකින්නට යන විට කිසියම් පූජා භාණ්ඩයක් ගෙන යන්නට ඇත. විහාරස්ථානයට ගෙන ගිය විවිධ පාරිභෝගික භාණ්ඩ භාරගෙන අවශ්‍ය පරිදි භික්ෂූන් වහන්සේලා ගේ පොදු පරිහරණයට යෙදීම සඳහා භික්ෂූන් වහන්සේලා අතුරින්ම පත් කරන ලද නිලධර පෙළැන්තියක් ද සිටි බව විනය පොත් කියවන විට පෙනේ. උදේ වරුවේ යන අය ආහාරයට ගත හැකි දේ ගෙන යන්නට ද ඇත. සිවුරු පිරිකර, තුවා, ලේන්සු වැනි විවිධ භාණ්ඩ රාශියක නම් විනය පොත්වල එයි.

බුදුරජාණන් වහන්සේ විහාරස්ථානයෙහි නො සිටින අවස්ථාවල වැඳුම් පිදුම් කිරීම පිණිස කිසියම් සංකේතයක් ඇත්නම් මැනවැයි කරන ලද යෝජනාවක් අනුව ආනන්ද හිමියන් විසින් ආනන්ද බෝධිය රෝපණය කරන ලදී. එයට භාග්‍යවතුන් වහන්සේ ගේ ද, අනුමැතිය ලැබුණු බව කියැවේ. රුක් පිදීම බුදු සමයෙන් අනුමත නො වූව ද බෝධිය වැඳීමට අවසර දෙන ලද්දේ එමගින් බුද්ධත්වය සංකේතවත් වෙතියි සිතූ හෙයිනි. බුද්ධත්වය ලද පසු ගත කළ සත් සති අතුරෙන් දෙසතියක් ම බෝධිය ඇසුරෙහි ගෙවා ඇත. මුල් සතිය බෝධි මූලයේ ම වැඩ හිඳින ලද අතර, දෙවන සතිය අනිමිස ලෝචන පූජාව කරන ලදී. බුදුරදුන් එසේ කළේ තමන් වහන්සේට බුද්ධත්වය ලැබීමේ දී සෙවණ සැපයූ වෘක්ෂයට කෘතඥතාව දැක්වීමක් වශයෙනි. ඒ මගින් ලෝකයාට දෙන ලද කළගුණ සැලකීම පිළිබඳ ආදර්ශය ද වැදගත්ය. කෙසේ වුවද බුද්ධත්වය ලැබීමෙහි දී සමීපව පැවති වස්තුවක් වශයෙන් බෝධිය පාරිභෝගික වස්තුවක් බවට පත් විය. එහෙයින් බුදුරදුන් පිදීමෙහිලා වර්තමානයේ වුවද සැදැහැවත්හු බෝධිපූජාවට ප්‍රමුඛත්වයක් දෙති. එය ප්‍රාථමික වෘක්ෂ වන්දනාවට වඩා අරමුණ විසින් වෙනස් බව අප තේරුම් ගත යුතුය.

පූජාර්හ වස්තුවක් වශයෙන් බුද්ධ ප්‍රතිමා භාවිතයට ආවේ බුද්ධ පරිනිර්වාණයෙන් වසර පන්සියයක් පමණ ගෙවී ගිය පසුව ය. එතෙක් උද්දේසික වස්තු සේ සලකන ලද විවිධ සංකේත තිබිණ. පැරණි භාරතීය ගල් කැටයම් වලින් නිරූපිත පරිදි බුදුරුව වෙනුවට ආසනය පමණක් සකසා පිදීමක් තිබිණ. ඇතැම් විට ආසනය හා බෝධිය එකට තබා බෝධිමණ්ඩපය නිරූපණය කර වැඳීමද තිබිණ. ලංකාවේ ද පැරණි වන්දනා ස්ථානවල ආසන තබා ගෙන ඒ වටා ගෘහයක් ද ඉදිකර වඳින ලද බවට සාධක තිබේ. පුළුකුණාව, කුඩා කටුවන්නාව වැනි තැන්වල ආසනඝර තිබිණ. ආසනය හැරෙන විට ධර්ම චක්‍රය, ත්‍රිරත්න සංකේතය, සිරිපතුල් ගල් ආදියට ද වන්දනා කරන ලදී.

බුද්ධ පරිනිර්වාණයෙන් පසු බුද්ධ වන්දනාව සඳහා සර්වඥධාතූන් යොදා ගැනීම ඇරඹිණ. ධාතු වන්දනාව පිළිබඳ ඉඟි භාග්‍යවතුන් වහන්සේ විසින්ම ඉදිරිපත් කරන ලදී. තමන් වහන්සේට පෙර සිරිනිවන් පෑ භික්ෂු-භික්ෂුණී මෙන්ම උපාසක සංඝයා ගේ ද ධාතු නිදන් කරවා භාග්‍යවතුන් වහන්සේ විසින් ම චෛත්‍ය කරවන ලදී. එමෙන් ම මේ කථා පුවතේ ද දැක්වෙන පරිදි පෙර බුදුවරුන් ගේ ධාතූන් නිදන් කර තැනවූ ස්තූප ගැන ද බුදුරදුන් විසින් කරුණු දක්වා තිබේ. එමෙන්ම මහා පරිනිර්වාණ සූත්‍රයේදී තථාගත ශරීරයට පූජා කරන්නේ කෙසේදැයි විමසූ විට ආදාහන කරන ආකාරය විස්තර කර අවශේෂ වන සර්වඥධාතූ සතරමං සන්ධියක චෛත්‍යයක් කරවා නිදන් කරන්නැයි ද උපදෙස් දී ඇත. යම්කිසි ශ්‍රද්ධාමාත්‍රයක් ප්‍රේමමාත්‍රයක් ඇති අයකු එහි මලක් පිදුවහොත් එය ඔහු ගේ දිව්‍ය ලෝක උත්පත්තිය පිණිස හේතුවන බව ද දක්වන ලදී.

වත්මන් හි ත්‍රිවිධ බෝධිය හැරෙන විට අටවිසි බුද්ධ පූජා, ඥාණ පූජා, පාරමිතා පූජා, බුදුගුණ පූජා ආදී වශයෙන් වර්ධනය වූ පූජා විධි රාශියක් පවතියි. එමෙන් ම බෞද්ධ සංස්කෘතිය පැතුරුණු විවිධ රට රාජ්‍යවල ඒ ඒ රටවල සංස්කෘතියට අනුරූප පරිද්දෙන් සකස් කර වර්ධනය කර ගත් නානා විධ පූජා විධි ඇත. ඒවායේ නෘත්‍ය, ගීත, වාද්‍යාදිය ද බහුල වශයෙන් යොදාගන්නා බව පෙනේ. මේ ජනතාවන් විසින් කරනු ලබන්නේ තම තමන් සතු ස්වාභාවික සම්පත් හා කලා කෞශල්‍යය උපයෝගී කරගෙන තම ආගමික භක්තිය ප්‍රකට කිරීම ය.

බුදු සමයෙහි පුද පූජා වලට හිමිවන්නේ එතරම් උසස් තැනක් නොවන බව ද මෙහිලා සඳහන් කළ යුතුය. ඒවා පුණ්‍යකර්ම හා මානව ගුණධර්ම වශයෙන් අගය කරනු ලැබෙතත් එමගින් විමුක්ති සාධනය සිදු කරගත හැකි බවක් උගන්වන්නේ නැත. එහෙයින් ආමිස පූජා හා ප්‍රතිපත්ති පූජා වශයෙන් පූජා වර්ග දෙකකට බෙදා ප්‍රතිපත්ති පූජාව වඩාත් අගය කර තිබේ. ප්‍රතිපත්ති පූජාව නිර්වාණගාමී ප්‍රතිපදාවට අදාල වෙයි. ආමිස පූජාව අදාළ වන්නේ ඍජුව නොව වක්‍රව ය. එහෙත් ආමිස පූජාවන් හි යෙදීම ප්‍රතිපත්තියෙහි වර්ධනයට බෙහෙවින් උපකාරී වෙයි.

ප්‍රීතිමත්ව ඇදහිය හැකි ආගමක්

බුදු දහම දුක්ඛිත, ශෝකාර්ද්‍ර, දුක්මුසු අඳුරු අප්‍රසන්න වැලපෙන මානසිකත්වයට සහමුලින් ම පට හැනිය. එබඳු ආකල්ප සත්‍යවබෝධයට බාධාවක් වශයෙන් සැලකේ. අනින් අතට ප්‍රීතිය නිර්වාණාධිසමයට අනිවාර්යයයෙන්ම වර්ධනය කර ගත යුතු වූ සත්ත බොජ්ඣංගයන් අතුරින් එකක් බව සිහියට ගැනීම ද වැදගත් ය.

ආචාර්ය වල්පොල රාහුල
What the Buddha Taught

අනිත් ආගම් වලට අභියෝගයක්

වෙනත් ආගම් වලට තවමත් ප්‍රබල අභියෝගයක් ව ඇත්තේ උපන්‍යස්ත ප්‍රාථමික ආගමක් නොව නිසි පරිදි ලේඛනගත කරන ලදුව අපට ලැබී ඇති බුදු සමයයි.

Bishop Gore
Buddha and the Christ

15 වන පරිච්ඡේදය

සුඛ වගග



වෛර කිරීම් ඇති වැ වෙසෙන මිනිසුන් අතුරෙහි අපි වෛර නැතිවැ ඉතා සුව සේ වෙසෙමු.

197. සුසුඛං වත ජීවාම
වෙරිනෙසු අවෙරිනො
වෙරිනෙසු මනුස්සෙසු
විහරාම අවෙරිනො (15.1)

සුවසේ මයි අප ඉන්නේ
වෛර කළත් වෛර නො කර
වෛර කරන මිනිසුන් මැද
වෛර නැතුව අප ඉන්නේ

වෛර නො බඳිමු - සුවපත් වෙමු.

15 (1) බුදු රදුන් ඥාතීනට සාමය උදා කළ වග. (197 සිට 199 දක්වා ගාථා)

රෝහිණී නදියේ ජලය බෙදා ගන්නට යුද වදින්නට සැරසුණු ඥාතීන් සමගි කරවීමෙන් අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයේ දී මේ ගාථාවන් වදාළ සේක.

ශාක්‍යයෝ හා කෝලියයෝ කෘෂිකාර්මික කටයුතු සඳහා රෝහිණී නදියේ ජලය භාවිත කරති. ගඟ මැද වේල්ලක් බැඳ දෙ පැත්තට ජලය ගෙන යමින් දෙපක්‍ෂයම ගොවිතැන් කරති. එක් පොසොන් සමයක ජලය හිඟ විය. බෙදාගත් විට දෙපක්‍ෂයටම ප්‍රමාණවත් නො වෙයි. එහෙයින් එක් පක්‍ෂයක ගොවියෝ අනිත් පක්‍ෂය අමතා "මේ ජලය දෙකට බෙදා ගෙන දෙපක්‍ෂයේ කුඹුරු වලට ගෙන ආවොත් දෙපක්‍ෂයේ ම කුඹුරු නො හැදෙයි. අප පමණක් භාවිත කළහොත් අපේ කුඹුරු මනාව කරගත හැකි ය. එහෙයින් මේ ජලය අපට දෙව්." යි කී හ. අනිත් පක්‍ෂයේ අය ද "මේ ජලය අප දෙපක්‍ෂයට ම බෙදා ගන්නට මඳ බව හැබෑ ය. එහෙත් ඔබ මේ ජලය මුළුමනින් ම ගෙන වගා කළහොත් මුළු අස්වැන්න ම ඔබටය. අපට වන්නේ හිස් මළුත් රැගෙන වී ඉල්ලා ඔබේ ගෙවල් වලට එන්නට ය. ජලය තනිවම භාවිතයට ඉඩ දෙතොත් අපේ කුඹුරුත් හොඳින් වැඩ කරගත හැකි ය. එහෙයින් මුළු ජලය ම අපට දෙවු" යි කී හ. දෙ පක්‍ෂයම බුරුලක් නො දැක්වුවා පමණක් නොව අවලාද කතා කියා ගන්නට ද වූ හ.

විවාදය බරපතල වී එක් තැනැත්තෙක් තවත් තැනැත්තෙකුට පහර දුන්නේ ය. අනිකා ද පහරට පහර දුන්නෙන් මහා කෝලාහලයක් ඇති විය. මෙය ශාක්‍ය හා කෝලිය ප්‍රභූවරුනට ද දැනුම් දුන්නෙන් ඔවුහු ද විවාදයට පැටළුණි. අන්තිමේ රජ දරුවෝ ද එකිනෙකට එරෙහි වූහ. දෙපක්‍ෂයම හමුදා සූදානම් කර ගෙන යුද වදිනු පිණිස ගඟ දෙපස රොක් වූ හ.

සාමාන්‍ය වැසියෝ තම තමන් ගේ අතීත කතා ඇද ගනිමින් බැණ ගත් හ. ශාක්‍ය වංශයේ ආරම්භයේ සිදු වූ සහෝදරයන් සමග සහෝදරියන් විවාහ වූ වග කෝලියයෝ එළි දැක්වූ හ. "කපිලවස්තුව අතහැර අඹු දරුවන් රැගෙන නුඹලාට හිමි තැන සොයා යවු. බල්ලන් නරින් මෙන් හැසුරුණු අශීලාචාර මිනිසුන් ගෙන් පහර කන්නට අපි සූදානම් නො වෙමු." යි ඔවුහු හඬ නැගූහ. ශාක්‍යයෝ ද "කුෂ්ට රෝගීන් වූ තොපත් තොපගේ අඹුදරුවුන් රැගෙන තොප අයිති කැලෑවට ම යව්! කුෂ්ට හැදී කැලේ කොළ කමින් ගස් ගල්වල ලැග සිටි තිරිසනුන් වැනි තොපෙන් අපි පහර කමු ද?" යි පිළිතුරු දුන් හ. මෙසේ වාද විවාද කරමින් සටනට සැරසී සිටි ඔවුන් ගේ රජවරු ද "සහෝදරියන් අඹුකමට ගත්තවුන් ගේ ශක්තිය අපි දක්වමු" කැලේ ගස් බෙනවල උපන් එවුන්ගේ ශක්තිය අපි දක්වමු" යි කියා ගනිමින් සටනට සැරසී සිටිය හ.

උදෑසන මහා කරුණාවෙන් ලෝ බලන භාග්‍යවතුන් වහන්සේ මේ සටන් සූදානම දැක "මා එහි ගොස් පිහිට නොවුනොත් මේ අඥානයෝ යුද්ධයෙන් විනාශ වෙති. මගේ පරම යුතුකම මේ මොහොතේ මොවුන් සමගි කරවීම" යි සිතා තනිවම අහසින් වැඩම කර තමන් වහන්සේ ගේ ඥාතීන් සටන් කරන්නට සැරසී දෙපසට වී සිටි රෝහිණී නදිය මත ගුවන් තලයේ පෙනී සිටිය හ. උන් වහන්සේ දුටු සියළු රජ දරුවෝ ද වැසියෝ ද තම තමන් අත්වල වූ අවි ආයුධ බිම දමා නමස්කාර කළ හ. "කුමක්ද මේ ඔබේ අර්බුදය? කුමක් ගැන ද?" යි බුදු රදුන් විමසූ විට "අපි හරියට ම නො දනිමු. සෙන්පතියන් එය කියනු ඇත" යි සෙන්පතියන්ට ප්‍රශ්නය යොමු කළ හ. "අපිත් හරියට ම නො දනිමු. ප්‍රදේශාධිපතීන් දන්නවා ඇත." යි ඔවුහු ප්‍රදේශාධිපතීන්ට යොමු කළ හ. ඔවුහු ද "අපිත් හරියට ම නො දනිමු. ගොවි කම්කරුවන් ගේ ප්‍රශ්නයකි" යි එය පොදු මිනිසුන්ට යොමු කළ හ. "ස්වාමීනි, මෙය වතුර පිළිබඳ ප්‍රශ්නයක්" යි ගොවි කම්කරුවෝ පිළිතුරු දුන් හ.

අනතුරුව භාග්‍යවතුන් වහන්සේ රජවරුන්ගෙන් මෙසේ විමසූ හ. "ජලයේ වටිනාකම කොපමණ ද?" "ඉතා සුළුයි ස්වාමීනි" "ඔබගේ ජීවිත කෙතරම් වටිනවා ද?" "කිව නො හැකි තරම් වටිනවා ස්වාමීනි" "ඉතින් මේ එතරම් නොවටින ජලය වෙනුවෙන් ඔබ ගේ ජීවිත සියල්ල විනාශ කර ගැනීම ගැලපෙන වැඩක් ද?" රජවරු නිහඬව බලා සිටිය හ. අනතුරුව බුදුරජාණන් වහන්සේ ඔවුන් ඇමතූහ. "රජ දරුවනි, මා අද මෙතනට නො ආවා නම්, ඔබ මේ ගඟ එකම ලේ ගඟක් කරනු ඇත. ඔබ කරන්නට ගියේ මහත් අනුවණ ක්‍රියාවකි. ඔබ වසන්නේ වෛරය සමග ය. මම වෛරයෙන් මිදුනෙමි. ඔබ වසන්නේ රෝගයන් ගෙන් ආතුරව ය. මම අනාතුරව වෙසෙමි. ඔබ කාම වස්තු සෙවිල්ලේ ම නිරතව වසති. මම කාම වස්තු ගවේෂණයෙන් තොර ව වසමි. එහෙයින් මම සුවසේ වසමි. සුවසේ වසන්නට නම්, වෛරයෙන්, කෙලෙස් ලෙඩින්, කාම වස්තූන් හඹා යාමෙන් වැළකී සිටිය යුතු ය'' යි අනුශාසනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (197 ගාථාව)

වෙරිනෙසු (මනුස්සෙසු) අවෙරිනො වත සුසුඛං ජීවාම
මනුස්සෙසු වෙරිනෙසු අවෙරිනො විහරාම

වෙරිනෙසු: (මනුස්සෙසු) වෛර ඇති මිනිසුන් අතුරෙහි; **අවෙරිනො**: වෛර නැති (අපි); **වත**: ඒකාන්තයෙන්; **සුසුඛං**: ඉතා සුවසේ; **ජීවාම**: ජීවත් වෙමු; **මනුස්සෙසු**: මිනිසුන්; **වෙරිනෙසු**: වෛර ඇතිව වසන කල්හි; **අවෙරිනො**: වෛර නො කර (ඒ අපි); **විහරාම**: වසමු.

ප්‍රාණඝාතාදී පංච දුශ්චරිත යැයි කියන වෛර බහ හෙවත් පාපක්‍රියා කරන්නවුන් මැද වෛර නැත්තා වූ අපි ඒකාන්තයෙන්ම ඉතා සුවසේ ජීවත් වෙමු. පංච දුශ්චරිත කරන වෛරී මිනිසුන් මැද වෛර නැතිව වසමු.

කෙලෙස්වලින් ආතුර වූ (-ගිලන් වූ) මිනිසුන් අතුරෙහි අපි කෙළෙස් ලෙඩ නැති වැ සුවසේ වෙසෙමු.

198 සුසුඛං වත ජීවාම
ආතුරෙසු අනාතුරා
ආතුරෙසු මනුස්සෙසු
විහරාම අනාතුරා (15.2)

සුවසේමයි අප ඉන්නේ
ආතුර මැද අනාතුරව
ආතුර මිනිසුන් මැද්දේ
අනාතුරව අප ඉන්නේ

මැද දනන් ආතුර - ඉන්නෙමු වී අනාතුර

15 (1) බුදු රදුන් ඥාතීනට සාමය උදා කළ වග. (197 සිට 199 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (198 ගාථාව)

ආතුරේසු අනාතුරා වත සුසුඛං ජීවාම ආතුරේසු
මනුස්සෙසු අනාතුරා විහරාම

ආතුරේසු: (කෙලෙස් ලෙඩින්); ආතුර වුවන් මැද; **අනාතුරා**: ආතුර නො වූ (අපි); **වත**: ඒකාන්තයෙන්; **සුසුඛං**: ඉතා සුවසේ; **ජීවාම**: ජීවත් වෙමු; **ආතුරේසු**: ආතුර වූ; **මනුස්සෙසු**: මිනිසුන් මැද; **අනාතුරා**: ආතුර නො වී; **විහරාම**: වෙසෙමු

කෙලෙසුන් ගෙන් රෝගීව වසන්නවුන් මැද අපි ක්ලේශාතුර නොවී ඉතා සතුටින් වාසය කරමු. කෙලෙස් ලෙඩින් පෙළෙන මිනිසුන් මැද අපි ලෙඩ නො වී වසමු.

විවරණය

භාග්‍යවතුන් වහන්සේ පිය පක්ෂයෙන් ශාක්‍ය වංශයට අයත් ය. උන්වහන්සේ ගේ පියා වූ සුද්ධෝදන එවකට ශාක්‍යයන් අතර රජ ව සිටියේ ය. ශාක්‍ය වංශය ක්ෂත්‍රියයන් අතර තම කුල වංශ පාරිශුද්ධිය පිළිබඳව අතිශයින්ම සැලකිලිමත්ව අමිශ්‍රව සිටින්නට උත්සාහ කළ හෙයින් කුල අභිමානය පිළිබඳව ප්‍රසිද්ධියක් ඉසිළූ හ. භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයෙන් පසු ප්‍රථම වරට මහා වීදියෙහි පිඬු සිඟා වඩන විට සුද්ධෝදන රජතුමා මගේ වංශයට නින්දා නො කරන්නැයි පැවසුයේ ද එහෙයිනි. ශාක්‍ය වංශිකයෝ තම තරාතිරමට නො ගැලපෙන පහත් වැඩ නො කරති. ඔවුහු රණ ශූරයෝ වූහ. බුද්ධිමත් වූ හ. එබඳු පරපුරකින් පැවත ආ භාග්‍යවතුන් වහන්සේ ගෙපිළිවෙළින් පිඬු සිඟා යන්නට තරම් නිහතමානී වීම උසස් ආධ්‍යාත්මිකත්වය නිදර්ශනයකි. එම නිහතමානී බව තමන් වෙත පැවිදිවන ශාක්‍ය කුමාරවරුන් ගෙන් ද උන්වහන්සේ අපේක්ෂා කළහ.

ආනන්ද, භගු, කිම්බිල, ආදී කුමාරවරුන් පැවිද්දට පැමිණි විට ඔවුන් සමග පැමිණි උසස් යැයි සම්මත නොවූ කරණවෑම් පවුලක උපන් උපාලි කලින් පැවිදි කළේ ඒ අරමුණෙනි.

ශාක්‍ය වංශය ආරම්භ වීමේ ඉති වෘත්තය පුරාණ සම්භව්‍ය වංශයක් වූ ඔක්කාක පරපුර හා සම්බන්ධ කර ඇත. රජු ගේ එක් රූමත් යොවුන් බිසොවක් රජු හා ප්‍රියමනාපව කල් යවන මොහොතක අග බිසොවගේ දරුවන් සිටිය දී තම දරුවාට රජකම ලබා දෙන සේ ඉල්ලා සිටිය හ. ඇය තම දරුවා උපන් මොහොතේ රජතුමා දුන් වරයක් ලබා නො ගෙන රැක ගෙන තිබිණ. මෙ වර මේ ඉල්ලීම කළේ ඒ වරය ලබා ගන්නා නියාවෙනි. වරයක් දුන් විට එය ප්‍රතික්ෂේප කළ නො හැකිය. ඉල්ලන ඕනෑම දෙයක් දිය යුතුය. එහෙයින් ඒ ඉල්ලීම ඉටු කළ යුතුව තිබින. එහෙයින් රජ තෙම තම වැඩිමහල් පුතුන් හා දූවරුන් කැඳවා ආරක්ෂාව පිණිස වනගත වන්නට උපදෙස් දුන්නේ ය.

එසේ වනගත වූ ඔවුහු වනරොදෙහි ජනපදයක් ඉදි කර ගෙන විසූ හ. විවාපත් වන වයසට පත්ව තම කුල වංශාදියට ගැලපෙන බිරින්දන් ලබා ගත නො හැකිව තමන් ගේ ම සොහොයුරියන් විවාහ කර ගෙන දරුවන් ලැබූහ. පසු කලෙක රජතුමා මහළුව මියයන්නට ආසන්න බව අසා ඔවුහු තම දරුවන් ද කැටුව පිය රජතුමා දැක ගනු පිණිස ගිය හ.

ඔවුන් දරුවන් සමග පැමිණ සිටිනු දුටු පිය රජ තෙම කවුරුන් විවාහ කර ගත්තේ දැයි අසා, කුල පරපුරට ගැලපෙන ලඳුන් නො වූයෙන් තම නැඟණියන් ම විවාහ කර ගෙන දරුවන් ලත් බව ඔවුහු පැවසූහ. ඒ ඇසූ මහළු රජ තෙම "සක්‍යා වත භෝ රාජ කුමාරා" (ඔබ දක්ෂයෝය, කුමාරවරුනි) යි කියූ හෙයින් 'ශාක්‍ය' යන නම ඔවුනට යෙදිණි. මෙම චාරිත්‍රය ශාක්‍යවරුන් තුළ දිගටම පවතින්නට ඇත. බුදුරදුන් උපන් පවුලේ ද ප්‍රජාපති ගෝතමියගේ පුත් නන්ද කුමරා විවාහප්‍රාප්ත වූයේ ජනපදකල්‍යාණියැයි විරුදාවලි ලබා සිටි නන්දා නම් වූ තම සොහොයුරිය සමග යි. කෝලිය වංශිකයන් ඔවුනට මේ දිය ඩබර අවස්ථාවෙහි නින්දා කළේ මේ අවිනීත සිරිත මතුකර ගනිමිනි.

ශාක්‍ය වංශය විවාහ සබඳතා නිතරම පාහේ ඇති කර ගත්තේ අසල්වැසි වංශය වූ කෝලිය වංශය සමග ය. බුදුරදුන් ගේ පියා වූ සුද්ධෝදන රජතුමා විවාහ කර ගෙන සිටියේ කෝලිය වංශික මහාමායා දේවිය හා මහා ප්‍රජාපතී දේවියයි. සිදුහත් කුමරුන්ට විවාහ කරදුන් යසෝධරා හෙවත් භද්දකච්චානා කුමරිය ද කෝලිය වංශික වූවාය. ඇයගේ පියා කෝලිය වංශික වූ අතර මව ශාක්‍ය කුමරියකි. ඕ සුද්ධෝදන රජතුමා ගේ නැඟණිය වූ පමිතා ය. යසෝධරා කුමරිය සිදුහත් කුමරුන් උපන් දිනයේ ම උපන් බව ද කියනු ලැබේ. දේවදත්ත නමින් ප්‍රකටව සසුනේ පැවිදි ව සිටිමින් පවා බුදුරදුනට සතුරුකම් කළ තැනැත්තා යසෝධරා කුමරියගේ සොහොයුරෙකි. මහා ප්‍රජාපතී ගෝතමියගෙන් ඇරඹුණ භික්ෂුණී ශාසනයෙහි පැවිදි වූ යශෝධරා ද රහත්ව පිරිනිවන් පෑවා ය.

කෝලිය වංශය උත්පත්ති කථාව ද ප්‍රවාද ස්වරූපයක් ගනියි. ඔවුන් ගේ ආදි පුරුෂයා ද ඉක්ෂ්වාකු රජෙක් වූයේ ය. ඔහු ගේ දේවියට සුව කළ නො හැකි කුෂ්ට රෝගයක් හට ගත්තේ ය. එහෙයින් ඇය ද රැගෙන වනගත වූ හේ විවිධ වෘක්ෂ ලතාවන්හි කොළ පොතු ආදියෙන් ඇය නාවා සුවපත් කර ගත්තේ ය. තවත් මතයක් පරිදි ඇය ගේ රුවක් කරවා කොලොම් ගසක බිලයක තබා පුළුස්සා දැමූ විට ඒ අනුහසින් කුෂ්ට රෝගය සුව වූ බව කියැ වේ. කෙසේ හෝ කුෂ්ට රෝගය සුව වූ වත් නැවත නගරයට එන්නට මැලිව එහි ම නුවරක් කර එහි විසූ බව කියති. කුෂ්ට රෝගීන් ගෙන් පැවතෙතියි යන මේ නිග්‍රහය ඔවුනට කරන ලද්දේ එහෙයිනි. කුෂ්ට රෝගී දේවිය ශාක්‍ය කුමරියක් වූ බව ද කියති. කෙසේ වුව ද මේ වංශ දෙක ඉතා සමීපව සම්බන්ධව අවාහ විවාහයෙන් බැඳී විසූ බව පෙනේ.

කම්සැප සෙවුමෙහි වෑයමැති මිනිසුන් අතරැ අපි කම්සැප සෙවුමක් නො මැතිවැ ඉතා සුව සේ වෙසෙමු.

199. සුසුඛං වත ජීවාම
උස්සුකෙසු අනුස්සුකා
උස්සුකෙසු මනුස්සෙසු
විහරාම අනුස්සුකා (15.3)

සුවසේමයි අප ඉන්නේ
උත්සුක නොව අනුත්සුකව
උත්සුක වන මිනිසුන් මැද
අනුත්සුකව අප ඉන්නේ

වෙහෙසෙන්නන් මැද සොයමින් කම්සුව - වෙසෙමු හඹා නොයමින් කම් සුව

15 (1) බුදු රදුන් ඥාතීනට සාමය උදා කළ වගයි. (197 සිට 199 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (199 ගාථාව)

උස්සුකෙසු අනුස්සුකා වත සුසුඛං ජීවාම උස්සුකෙසු මනුස්සෙසු අනුස්සුකා විහරාම

උස්සුකෙසු: කාම වස්තූන් සොය යමින් උත්සුක වන්නන් අතර; **අනුස්සුකා**: අනුත්සුකව; **වත**: ඒකාන්තයෙන්; **සුසුඛං**: ඉතා සුවසේ; **ජීවාම**: ජීවත් වෙමු; **උස්සුකෙසු**: උත්සුක වූ; **මනුස්සෙසු**: මිනිසුන් අතර; **අනුස්සුකා**: අනුත්සුකව; **විහරාම**: වසමු.

කාම සම්පත් හඹා යමින් වෙහෙසෙන්නන් මැද එසේ නො කර අපි ඒකාන්තයෙන් ම සුවසේ වසමු. එසේ උත්සුක වන මිනිසුන් මැද අපි අනුත්සුකව වසමු.

විවරණය

මෙසේ ඉතා සමීප ඥාතිත්වයෙන් බැඳී සිටි මේ රාජ වංශ දෙක අතර මෙබඳු අර්බුදයක් ඇති විට අතිශය ඛේදජනක සිද්ධියක් වූයේ ය. සාමාන්‍යයෙන් සාමයෙන් සිටින දෙපිරිසක් අතර අර්බුදයක් ඇති වූ විට එය වඩාත් ආවේග බහුල තත්ත්වයකට පත් වෙයි. ඥාතීන් ගේ අභිවෘද්ධිය පිළිබඳව උනන්දුවෙන් සිටීම ශිෂ්ට සමාජයක ඕනෑම පුරවැසියකු ගේ උදාරත්වය පෙන්වන්නකි. ඥාතිත්වය සුන්දර සමාජ සබඳතාවක් බවත් එහි ලා අන්‍යෝන්‍ය යුතුකම් පද්ධතියක් ඇති අතර ඒවා මනාව ඉටුකිරීම ජන සමාජයේ අභිවෘද්ධියට හිතකර බවත් පිළිගැනීමෙහි ලා බුදුසමය නො පැකිලෙයි.

යමෙක් තම ඥාතීන් පහත් කොට සිතන්නේ නම් එය නින්දනීය ගතියක් බව බුදුරජාණන් වහන්සේ විසින් දක්වා තිබේ. ඥාතීන් දිළිඳුව සිටිත් නම් තම ධන ශක්තියෙන් ඔවුන්ට යම් සංග්‍රහයක් කිරීම බුද්ධ ප්‍රශස්ත ය. වසල හා පරාභව සූත්‍ර දෙකම ඥාතීන් නො තකා හැරීම, ඔවුන් පහත් කොට සිතීම දුර්ගුණ බව දක්වයි. මංගල සූත්‍රයේ නෑදෑයන්ට සැලකීම මංගල කාරණයක් බව දක්වයි. (ඥාතකානඤ්ච සංගහො) සම්බුද්ධත්වයෙන් පසුව පවා කපිලවස්තුවෙන් එන සුළඟ පවා සුවදායක යයි බුදුරජාණන් වහන්සේ වදාළේ මේ ප්‍රියංකර මානුෂික සබඳතාව කෙරේ කාගේත් අවධානය යොමු කරනු පිණිස ය.

මෙහි තේරුම ඥාතීන් වෙනුවෙන් ක්‍රියා කර අගතියට යාම නො වේ. ඡන්දාගතියට වැටෙන එබඳු ක්‍රියා හෙළා දකිනු ලැබේ. බුදුරජාණන් වහන්සේ විසින් කිසිදා ශාසනික පදවියක් ඥාතිත්වය තකා නො දෙන ලදි. නියම සුදුසුකම් නැති කිසිවකුට ඥාතිත්වය නිසා ශාසනික පදවියක් දීමට භාග්‍යවතුන් වහන්සේ කැමති නො වූ හ. දේවදත්ත තම මස්සිනා වුවද ඔහු ඉල්ලූ සංඝ නායකත්වය ලබා දීමට උන්වහන්සේ ක්‍රියා නො කළහ. යශෝදරා දේවියට හෝ ප්‍රජාපතී ගෝතමියට භික්ෂුණී ශාසනය ආරම්භ කරමින් පැවිදි වීම සඳහා වරම් දීමට බුදුරදුන් පැකිලෙන්නට ඇත්තේ ද ඥාති සංග්‍රහ චෝදනාවට හසු වනු අකැමැත්තෙන් විය හැක. ප්‍රජාපතී ගෝතමියට පැවිද්ද ලැබුණේ ද තුන් වරක් ම ප්‍රතික්ෂේප කරනු ලැබ අවසන අනඳ මහ තෙරුන් ප්‍රබල තර්කයක් ඉදිරිපත් කළ පසුවය.

භාග්‍යවතුන් වහන්සේ ඥාති වර්ගයාට අනවශ්‍ය සැලකිලි දැක් වූ බවට චෝදනා කරන්නට කිසිවකුට හැකියාවක් නැත. එමෙන්ම ඥාතීන් නොතකා හැරියායයි චෝදනා කිරීම ද අසාධාරණ ය. තමන් වහන්සේ ඉදිරිපත් විය යුතු කිසිම අවස්ථාවක් පැහැර නො හැරීම උන් වහන්සේ ගේ සිරිත වූ හෙයින් අවශ්‍ය අවස්ථාවට අවශ්‍ය පරිදි ඉදිරිපත් වූහ. රෝහිණී නදියේ දිය ඩබරය එබඳු අවස්ථාවකි. තථාගතයන් වහන්සේ ඉදිරිපත් නො වී නම් විඩූඩභ විසින් ඝාතනය කරන්නට පෙර ශාක්‍ය වංශය කෝලිය වංශය ද සමග ම නාම ශේෂ වන්නට තිබිණ.

යුද්ධය නිම කිරීම පිණිස බුදුරදුන් විසින් ඥාතීන් වෙත ඉදිරිපත් කරන ලද තර්කය ද චිත්තා - කර්ශනීය ය. "ජලයද, මිනිස් ජීවිත ද වඩා වටින්නේ?" යි උන්වහන්සේ ප්‍රශ්න කළ හ. පිළිතුර ඉතා වැදගත් වෙයි. ජලය අවශ්‍ය වන්නේ ද මිනිස් ජීවිත රැක ගනු සඳහා ය. එහෙයින් ජලය වෙනුවෙන් මිනිස් ජීවිත විනාශ වන්නට යතොත් එය සපත්තුව සඳහා කකුල සැකසීම වැනි අමන කමකි. ජලය ජීවිත සඳහා මිස ජීවිත ජලය සඳහා නො වේ. එහෙයින් ජලය සඳහා ජීවිත විනාශ වන යුද්ධය නවතා දමා සාමයෙන් ජලය බෙදා ගැනීම වඩා අර්ථවත් බව බුදුරජාණන් වහන්සේ ඥාතීනට ස්ඵුට කළ හ.

යුද්ධය බුදු සමයෙන් අනුමත වන්නක් නො වේ. යුද්ධයෙහි ආදීනව දක්වන දේශනා පාලි ත්‍රිපිටකයෙහි සුලබය. යුද්ධය නවතා සාමය ඇති කර ගන්නට භාග්‍යවතුන් වහන්සේ අනුශාසනා කරන්නේ එහි පවත්නා භීෂණ ස්වරූපය හා ප්‍රතිඵල මැනවින් දන්නා හෙයිනි. තමන් සසර කලකිරී පැවිදි වූයේ කවර හෙයින්දැයි දක්වමින් බුදුරදුන් වදාළ ගාථා කිහිපයක් සුත්ත නිපාතයෙහි දැක්වෙයි. එහි දී උන්වහන්සේ ප්‍රධාන වශයෙන් එකල ජන සමාජයෙහි පැතිර තිබූ අසමගිය හා අසහනය ගැන කරුණු දක්වති. මිනිසුන් එකිනෙක සමග කුලල් කමින් අවි ආයුධ දරමින් එකිනෙකා මරා ගන්නා ස්වරූපය දැක මම කළකිරුණෙමි යි උන්වහන්සේ වදාරති. යුද්ධය නම් සමාජගත දුකෙහි එක් ප්‍රමුඛ අංගයකි.

යුද්ධයෙහි ප්‍රතිඵල වන්නේ ජයග්‍රාහකයා විසින් සතුරකු ඇති කර ගැනීම හා පරාජිතයා දුකින් ඇද වැටීම බව බුදුහු වදාරති. කිසිවකු දිනා නැත. දෙපක්ෂයට ම බලගතු අවාසි සිදු වෙයි. ජය අනුන්ට ම දී යුද බිමෙන් මග හැර ගිය සිංහයකු ගැන කතාවක් ජාතක පොතෙහි දැක්වේ. යුද්ධයට ඇති පිළිතුර එම කතාවෙන් දක්වනු ලැබේ. යුද්ධය වෙනුවට සාමය හා සහජීවනය අනුදැන වදාරන්නේ එහෙයිනි. භික්ෂූන් වහන්සේලාට යුද්ධය ගැන ඕපදූප කතා කිරීමට තහනම් ය. එය දෙතිස් කථාවන්ගෙන් එකකි.

හොඳම යුද්ධය කෙලෙස් යුද්ධය බව බුදු දහම උගන්වයි. යුද්ධයක් මගින් සතුරන් දහස් ගණනක් මරා දැමුවද තම සිත තුළ පවත්නා කෙලෙසුන් පරදවා ජයග්‍රහණය කිරීම නමැති ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයෙන් සොළොස්වන කලාව තරම් වත් වටින්නේ නැති බව කියැවේ. එහෙයින් කෙලස් සමග කෙරෙන සටන අප්‍රතිහත ධෛර්‍යයෙන් කළ යුත්තකි.

පීඩා (කෙලෙසුන්ගෙන් හිරිහැර-කරදර) නැති බුදුරදහු සුවසේ වෙසෙති. ප්‍රීතිය ම විඳිති.

200. සුසුඛං වත ජීවාම
යෙසං නො නත්ථි කිඤ්චනං
පීතිභක්ඛා භවිස්සාම
දෙවා ආභස්සරා යථා (15.4)

ජීවත් වෙමු අපි සුවසේ
තණ්හා දුරු කොට රිසිසේ
වළඳමු සොම්නසෙහි රසේ
ආභරස්සර දෙවියන් සේ

නිකෙලෙස් මනසින් - නිවසති සතුටින්

15 (2) මාරයා පිළිබඳ කථා පුවත (200 ගාථාව)

මරුවා ඇරබ බුදුරදුන් මේ ගාථාව දේශනා කර වදාළේ පංචසාලා නම් බමුනු ගම්මානයේ දී ය.

වරක් භාග්‍යවතුන් වහන්සේ පංචශාල නම් ගමෙහි බොහෝ යොවුන් ලියන් සෝවාන් ඵලය ලැබීමේ වාසනාව ඇතිව සිටින බව දිවසින් දුට හ. එහෙයින් උන් වහන්සේ ඒ ගම අසලට වැඩම කළ හ.

එදා පංචශාල ගම උත්සව සිරි ගත් දිනකි. යෞවනියෝ පන්සිය දෙනා ගඟට බැස ජලස්නානය කොට මනහර ඇඳුමින් සැරසුණාහ. ඒ අතර භාග්‍යවතුන් වහන්සේ ගම පුරා පිඬු සිඟා වැඩි සේක.

බුදුරදුනට හිරිහැරයක් කරනු රිසි වූ මාරයා එදා මුළු ගමේ සියළුම ගම් වැසියන්ට ආවේශ වෙමින් බුදුරදුනට එක බත් හැන්දක් තරම් වත් නො ලැබෙන පරිදි කටයුතු කළේ ය. භාග්‍යවතුන් වහන්සේ ද දන් නො ලබා ආපසු නවාතැන කරා වැඩම කළ හ.

භාග්‍යවතුන් වහන්සේ සුන්බත්ව ආපසු වැඩම කරනු දැක්මෙන් සතුටට පත් මාරයා උන් වහන්සේ හමුවට පැමිණියේ ය. "බුදුරජාණන් වහන්ස, අද කොහොමද දහවල් දානය ලැබුණා ද?" යි හේ ප්‍රශ්න කළේය. "මාරය, අද ඔබ මුළු ගමටම ආවේශ වුණා! ඒ නිසා කවුරුවත් මට දන් පිළිගන්වන්න පෙළඹුණේ නෑ. එක නේද ඇත්ත?" "ස්වාමීනි, ඔව්. දැන් එහෙනම් ආයෙත් පිණ්ඩපාතයේ යන්න. මේ සැරේ හැමෝම දන් පිළිගන්වයි."

එසේ කීව ද මාරයා ගේ අභිප්‍රාය වූයේ බුදුරදුන් නැවත වරක් ගම වටා යවා පෙරසේම සුන් බත් කරවා වඩාත් අවඥාවට ලක් කිරීම ය. එහෙත් බුදුවරුන් වරක් පිඬු නොලදින් නැවත ඒ ගෙවල් වලටම එදාම දෙවන වරටත් පිඬු සිඟා යන සිරිතක් නැති බව මාරයා දැන සිටියේ නැත. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඒ ඇරයුම කරුණාවෙන් ප්‍රතික්ෂේප කළ හ.

දිය නා ප්‍රියංකර වස්ත්‍ර හැඳ අබරණ පැළඳ හැඩ වැඩ වූ රූමතියෝ 500 දෙනා ආපසු එමින් බුදුරජාණන් වහන්සේ දැක උන් වහන්සේ වැඳ ගැනීම පිණිස නැවතුන හ. ඒ මොහොතේ මාරයා නැවතත් මුව විවර කළේ ය.

"බුදුරජාණන් වහන්ස, අද දහවල් දානය ලැබුණේ නැහැනේ. දැන් හොඳටම බඩගිනි දැනෙනවාත් ඇති නේද?'' යි හේ අවඥා සහගතව විමසී ය. "දුෂ්ට මාරය, අප වැන්නන්ට එක ආහාර වේලක් වැරදුණත් අපි කම්පා නො වෙමු. අපි ආභස්සර දිව්‍ය ලෝකයේ දෙවිවරු මෙන් ප්‍රීතිය අනුභව කොට ජීවත් වෙමු." යි පවසා ගාථාවකින් ධර්ම දේශනා කළහ. බුදුරදුන් ගේ අරමුණ වූයේ මාරයා නොව එහි පැමිණ සිටි යෞවනියන් 500 දෙනාට ධර්මාවබෝධ කරවීමයි. ඔවුහු බණ අසා සෝවාන් ඵලය ලද හ.

විවරණාත්මක අනුවාදය (200 ගාථාව)

යෙසං නො කිඤ්චනං නත්ථි, වත සුසුඛං ජීවාම
ආභස්සරා දෙවා යථා පීතිභක්ඛා භවිස්සාම.

යෙසං නො: යම්බඳු වූ අපහට; **කිඤ්චනං නත්ථි**: කෙලෙසුන් නැත් ද; (ඒ අපි) **වත**: ඒකාන්තයෙන්; **සුසුඛං**: ඉතා සුවසේ; **ජීවාම**: ජීවත් වෙමු; **ආභස්සරා දෙවා**: ආභස්සර දිව්‍ය ලෝකයෙහි දෙවිවරු; **යථා**: යම්සේ ද; (එසේ ම) **පීතිභක්ඛා**: ප්‍රීතිය අහර කොට ඇත්තෝ; **භවිස්සාම**: වන්නෙමු.

කෙලෙසුන් දුරු කළ අපි ඉතා සුවසේ වෙසෙමු. ආභස්සර දෙවියන් මෙන් ප්‍රීතිය ම ආහාරය කොට වසමු.

විවරණය

සුඛ: මේ ගාථාවන්හි සුඛ වශයෙන් දක්වන ලද්දේ ආධ්‍යාත්මික ප්‍රීතියයි. භෞතික සම්පත් හෝ කාම සුඛාස්වාදය හේතුවෙන් අප ලබන සුවය තාවකාලික ය. නැසෙන සුළුය. ලාමකය. එහෙයින් ධර්මයට අනුව ආධ්‍යාත්මික වර්ධනයෙන් ලබන සුවය සියළු සුවයන්ට වඩා ප්‍රනීත වූ අලාමක වූ සුවයක් සේ සැලකෙයි. එසේ සලකනු ලබන්නේ එම සුවය මගින් මිනිසුන් නො මඟ යවනු වෙනුවට නිරාමිස වූ සුවයක් කරා - එනම් විමුක්ති ප්‍රතිලාභය කරා යොමු කරන හෙයිනි.

බෞද්ධ භාවනා මාර්ගයෙහි හමුවන ධ්‍යානයන්හි ද සුඛය අංගයක් සේ දක්වනු ලැබේ. ඒ වනාහි පවිත්‍ර වූ නිරාමිස සුඛයයි. පීති සුඛ, ඒකග්‍රතා සහිත ආදි වචන වලින් ධ්‍යාන විස්තර කරන්නේ එහෙයිනි.

ආභස්සරා දෙවා: ආභස්සර දේව ලෝකය නමින් හඳුන්වන ලද්දේ රූපී බ්‍රහ්මලෝකයකි. එහි දෙවිවරු නිරාමිස වූ ප්‍රීතිය ආහාර කොට වසති.

සන්සිඳුනු තැනැත්තා දිනුම් පැරදුම් හැරදමා ඉතා සුව සේ වෙසේ.

201. ජයං වෙරං පසවති
දුක්ඛං සෙති පරාජිතො
උපසන්තො සුඛං සෙති
හිත්වා ජය පරාජයං (15:5)

වෛරයයි බිහිවන්නෙ දිනුමෙන්
දුකින් වැතිරෙයි ලද පරාදෙන්
සුවෙන් සැනසෙති සාමකාමීන්
ජය පරාජය දෙකම දුරලන්

හැරපියා පරාජය - උදාකර ගමු සාමය

15 (3) කොසොල් රජතුමාගේ පරාජය ගැන කථා පුවත (201 ගාථාව)

කොසොල් රජතුමා තම බෑණා වූ **අජාසත් රජතුමා** සමග සටන් කර පරාජයට පත් වූ අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථාව දේශනා කරන ලදි.

අජාසත්ත රජු සහ කොසොල් රජතුමා අතර සටන් තුනක් සිදු විය. අජාසත් කොසොල් රජතුමා ගේ නැගණිය වූ වේදේහි දේවිය ගේ හා බිම්බිසාර රජතුමා ගේ පුත්‍රයා ය. එක් ගමක් පිළිබඳ අර්බුදයක් නිසා මේ සටන් ඇති විය. වේදේහි දේවිය බිම්බිසාර රජතුමාට සරණ පාවා දුන් අවස්ථාවේ දායාද වශයෙන් මේ ගම මගධයට පවරා තිබිණ. එහෙත් අජාසත් තම පියා මරා රජකම ලබා ගත් නිහීන විලාසය කෙරේ කළකිරුණු කෝසල රජතුමා ඒ ගම ආපසු ගත්තේය. අජාසත් යුද වැදුණෝ එම ක්‍රියාවට එරෙහි ව ය.

සටන් තුනෙන් ම ජයගත්තේ අජාසත් හෙයින් කොසොල් රජ තෙම මහත් සේ කලකිරුණේ ය. "මම මොහු ගේ මාමා වෙමි. ඔහුට වඩා වැඩිමහල් ජ්‍යෙෂ්ඨ පුද්ගලයකු වූ මට මොහු අතින් මෙසේ පරාජය වී ජීවත් වීමෙන් ඇති ඵලය කුමක් ද?" එසේ සිතූ රජ තෙම ආහාර පානාදිය වර්ජනය කොට ඇඳෙන් නො නැගිට සිටියේ ය. රජතුමා එසේ මුකුලිතව වැතිර සිටින බව රට පුරා ලැව් ගින්නක් මෙන් පැතිරිණි. ඒ බව භික්ෂූන් වහන්සේලා විසින් තථාගතයන් වහන්සේට ද දැනුම් දෙන ලදි. ඒ මොහොතේ භික්ෂූන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (201 ගාථාව)

ජයං වෙරං පසවති පරාජිතො දුක්ඛං සෙති
උපසන්තො ජය පරාජයං හිත්වා සුඛං සෙති

ජයං: අනුන් දිනන්නේ; **වෙරං පසවති**: වෛරය උපදවයි; **පරාජිතො**: අනුන් විසින් පරදවන ලද්දේ; **දුක්ඛං සෙති**: දුකින් කල් යවයි; **උපසන්තො**: සන්සිඳුනු තැනැත්තා; **ජය පරාජයං**: ජය හා පරාජය දෙකම; **හිත්වා**: හැරදමා; **සුඛං සෙති**: සුවසේ සැතපෙයි.

ජයග්‍රාහකයා පරදින්නා තුළ වෛරය ඇති කරයි. පැරදුනු තැනැත්තා දුකසේ වෙසෙයි. සන්සුන් තැනැත්තා ජය පරාජය දෙකම අත්හැර සුව සේ වෙසෙයි.

විවරණය

කොසොල් රජතුමා: අජාසත් රජතුමා ගේ මාමා වූ කොසොල් රජතුමා සැවැත් නුවර අගනුවර කර ගෙන කෝසල රාජ්‍යය පාලනය කළේ ය. භාග්‍යවතුන් වහන්සේ ගේ සමකාලීනයකු වූ හෙතෙම තම ශිල්ප ශාස්ත්‍ර නෛපුණ්‍යය නිසා පිය මහ රජතුමා ගේ විශේෂ ප්‍රසාදයට බාල වියේ පටන් ම පාත්‍රව සිටියේ ය. ඔහු බුදු සමයෙහි පැහැදුණේ බුදුරදුන් ධම්දූත කායනීය පටන් ගත් මුල් අවදියේ ම බව පෙනේ. සංයුක්ත නිකායේ එක් සූත්‍රයක එතුමා භාග්‍යවතුන් වහන්සේ වයසිනුත් තරුණ පැවිද්දෙනුත් නවක අයකු සේ හැඳින්වූ බව සඳහන් වීමෙන් ඒ බව තහවුරු වෙයි. එවිට භාග්‍යවතුන් වහන්සේ "මහරජ, ලාබාල කම හේතුවෙන් නො තකා නො හළ යුතු දේවල් හතරක් තිබේ. එනම්

1. ඔටුණු පලන් රජතුමා
2. සර්පයා
3. ගින්න
4. භික්ෂුව

එසේ වදාළ භාග්‍යවතුන් වහන්සේ ඒ විෂයෙහි කළ ධර්ම දේශනයෙන් ප්‍රසාදයට පත් රජතුමා ඒ අවස්ථාවේ ම තෙරුවන් සරණ ගිය බව සඳහන් වේ. එදා පටන් මිය යන තෙක් ම හෙතෙම සැදැහැවත් බෞද්ධෝපාසකයෙක් ව සිටියේ ය. කොසොල් රජතුමා ගේ දේවියක් වූ මල්ලිකා ද බුදු දහම මනාව ප්‍රගුණ කළ සැදැහැති ගුණවත් කාන්තාවක් වූවා ය. රජතුමා ගේ ආගමික ජීවිතය පිළිබඳ වැඩි ගෞරවය හිමි විය යුත්තේ එතුමියට ය.

වරක් රජතුමා අමුතුම විදියේ සිහින දහසයක් දැක ඒ පිළිබඳව තම රාජ සභාවේ නිරන්තර සේවයට පැමිණෙන බ්‍රාහ්මණයන්ගෙන් විමසීය. හරි තේරුමක් සිතා ගත නො හැකි වූ ඔවුහු ඒවා රජුටත් රාජ්‍යයටත් මහත් විපත් ගෙන එන භයංකාර සිහින බව පවසා ව්‍යසනයෙන් ගැලවෙන්නට නම් මහා යාගයක් කළ යුතු බව කී හ. ඒ උපදෙස් පරිදි රජතුමා දහස් ගණන් සතුන් එක් රැස් කර ඔවුන් මරවා යාග කරන්නට සූදානම් වූයේය. එහෙත් මේ කුරිරු සත්ව ඝාතනය වලකන්නට සිතූ මල්ලිකා දේවිය ඒ ගැන භාග්‍යවතුන් වහන්සේ ගෙන් ද විමසන සේ උපදෙස් දුන්නාය. එම සිහින රජතුමාට හෝ රාජ්‍යයට විපත්තිකර දේ නොවන බව හෙළි කළ භාග්‍යවතුන් වහන්සේ ඒවායේ සංකේතාත්මක අර්ථ ඔහුට පැහැදිලි කළ සේක.

දහම් ඇසීමේ අවස්ථාව ලැබීම අතින් කෝසල රජතුමා බිම්බිසාර රජතුමාට වඩා භාග්‍ය සම්පන්න වූ බව පෙනේ. එතුමන්ට දේශනා කළ සූත්‍ර වලින්ම සමන්විත වූ වෙනම කොටසක් (සංයුක්තයක්) සූත්‍ර පිටකයෙහි සංයුක්ත නිකායේ අන්තර්ගත වෙයි.

වරක් කොසොල් රජතුමා බුදුරදුන් හමුවේ සුහද කතාබහේ නිරතව සිටින අතර හිසකේ දිගු කර නිය පොතු නො කැපූ කිහිල්ලේ ලෝම වවා ගත් අපිරිසිදු තවුසෝ පිරිසක් ඒ අසලින් ගියහ. ඒ දුටු රජතුමා හුනස්නෙන් නැගී ආචාර කොට "හිමිවරුනි, මම කොසොල් රජ" යි පැවසී ය. අනතුරුව බුදුන් හමුවට පැමිණි හෙතෙම "ස්වාමීනි ඒ එක්කෝ රහතන් වහන්සේලා ය. නැත්නම් රහත් බව ලබන්නට වෑයම් කරන්නෝ ය. ඔබ වහන්සේ හිතන්නේ කෙසේ ද?" යි විමසී ය. "මහරජ, ශීලය දත හැක්කේ ලඟ ඇසුරෙනි. ඒ ද සුළු කලක් නොව දිගු කලක් ඇසුරු කිරීමෙනි. නුවණැත්තෙකු විසින් මිස නුවණ මඳ කෙනෙකුට එය දත නො හැක. යමෙකු ගේ පිරිසිදු බව දත හැක්කේ ක්‍රියාවෙනි. නුවණ දැන ගත හැක්කේ සාකච්ඡාවෙනි. ඒ වුවද කෙටි කලකින් නොව දිගු කලකිනි." යි උන් වහන්සේ පැහැදිලි කළ හ.

භාග්‍යවතුන් වහන්සේ ගේ සමකාලීනයකු වූ කොසොල් රජ තෙම උන්වහන්සේට මහත් සෙනෙහසක් දැක්වීය. ධම්මචේතිය සූත්‍රයෙහි ඒ පිළිබඳ කදිම සටහනක් එයි. දිනක් බුදුරදුන් දක්නට ආ එතුමා බුදුරදුන් ගේ සිරිපා අතගාමින් සිඹිමින් ඉතා ගරු සරු විලාසයක් දක්වමින් "ස්වාමීනි, ඔබ වහන්සේටත් වයස අසූවයි. මටත් දැන් වයස අසූවයි. ඔබ වහන්සේත් කොසොල් රටේ. මමත් කොසොල් රටේ" ආදී වශයෙන් මිහිරි වචන පවසමින් කතා කළ අයුරු එම සූත්‍රයේ දැක්වේ.

බුද්ධ කාලයේ දී මහා ජනයා අතුරෙන් බලතරඟයෙන් ජය ගෙන ප්‍රබලතම රාජ්‍ය බවට පත් ව තිබුණේ කෝසල රාජ්‍යය හා මගධ රාජ්‍යයි. බුද්ධ පරිනිර්වාණයෙන් පසු මගධය විසින් කෝසලය අල්ලා ගන්නා ලදින් යළිත් ප්‍රබල අධිරාජ්‍යයක් භාරතයේ ඇති වූයේ ය. ක්‍රි.පූ. 800 දී පමණ බිඳ වැටුනු පෞරව අධිරාජ්‍යයෙන් පසු මෙසේ මගධය විසින් යළි අධිරාජ්‍යයක් ගොඩ නැගීම වැදගත් ඓතිහාසික සිද්ධියකි.

රාගය දරුණු ගින්නකි. කෝපය මහා අපරාධයකි. පස්කඳ මහ දුකකි. නිවණ ඉතා උතුම් සැපයකි.

202. නත්ථි රාගසමො අග්ගි	නැත රාගය සම ගින්නක්
නත්ථි රාගසමො කලි	නැත රාගය සම කිලුටක්
නත්ථි ඛන්ධාසමා දුක්ඛා	පස් කඳ සම දුක් ගොන්නක්
නත්ථි සන්ති පරං සුඛං (15:7)	නිවන තරම් වන සුවයක්

නිවන පරම - වෙයි සැනසුම

15 (4) යොවුන් මනාලයකුගේ කතා පුවතක් (202 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව **එක් යොවුන් මනාලයකු** අරබයා ගිහි ගෙදරක දී දේශනා කළ සේක.

එක් තරුණයෙකු ගේ දෙමාපියෝ තම පුතුට රූමත් ලඳක් ආවාහ කර දී ඒ නිමිත්තෙන් බුදු රජාණන් වහන්සේට හා සඟරුවනට දනක් දෙන්නට සූදානම් කළ හ. දානය දෙන දවසෙහි එම කාන්තාව ඉතා දක්‍ෂ ලෙස ඔබ මොබ යමින් සියළු කටයුතු මනාව ඉටු කළා ය. එසේ කඩිසරව ක්‍රියා කරන තම නව යොවුන් බිරිඳ දෙසම බලා සිටි මනාල තරුණයා ඇයගේ ක්‍රියා විලාසය බලමින් ප්‍රීති වද්දී ඔහු ගේ සිතෙහි රාගය ඇවිස්සිණි. එහෙයින් බුදු පාමොක් සඟ ගණ දෙස නො බලා ඇය දෙසම බලා සිටියා මිස දන් පිළිගැන්වීම් ආදී කිසිවක් නො කළේය.

බුදුරදුන් අනුමෝදනා බණ දේශනා කරන්න සූදානම් වන විට දැඩි ලෙස කාමාතුරව සිටි ඔහු සිය බිරිඳගේ අත අල්ලා ගන්නට සැරසෙත්ම පරසිත් දන්නා නුවණැති තථාගතයන් වහන්සේ ඇය ඔහුට නො පෙනී යන පරිදි අධිෂ්ඨානයක් කළ හ.

ඉන් පසු පියවි සිහිය ඇති කර ගත් හේ ධර්ම ශ්‍රවණයට සිත් යොමු කළේ ය. භාග්‍යවතුන් වහන්සේ එම අවස්ථාවෙහි නව යුවලට වැඩ පිණිස "රාගය සමාන ගින්නක් නැත. ද්වේෂ සමාන පාපයක් නැත" යි දැක්වෙන ගාථාවෙන් ධර්ම දේශනා කළ සේක. ධර්ම දේශනාව අවසානයේ නව යුවල සෝතාපත්ති ඵලය ලැබූ හ.

විවරණාත්මක අනුවාදය (202 ගාථාව)

රාගසමො අග්ගි නත්ථි, දොසසමො කලි නත්ථි ,
ඛන්ධාසමා දුක්ඛා නත්ථි , සන්ති පරං සුඛං නත්ථි

රාගසමො: රාගය හා සමාන වූ; **අග්ගි**: ගින්නක්; නත්ථි: නැත; **දොසසමො**: ද්වේශය හා සමාන වූ; **කලි**: පාපයක්, **නත්ථි**: නැත; **ඛන්ධාසමා**: පංචස්කන්ධය හා සමාන වූ; **දුක්ඛා**: දුකක්; **නත්ථි**: නැත; **සන්ති පරං**: නිවනට වැඩි; සුඛං: සුවයක්; **නත්ථි**: නැත.

රූපාදියෙහි ඇලීම බඳු ගින්නක් තවත් නැත. ද්වේෂය කෝපය හා සමාන වූ අපරාධයක් නැත. (අධර්මයක් නැත) පංචස්කන්ධය සමාන දුකක් නැත. නිවණ හා සම සැපයක් නැත.

විවරණය

ඛන්ධ: නම් පංචස්කන්ධයයි. මේ පහ සත්ත්වයා පිළිබඳ මූලික සංඝටක වශයෙන් භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළ හ.

ධර්මය හදාරා පුරුදු නො වූ පෘථග්ජන මිනිසුන් තම ආත්මය (නො නැසී පවත්නා පදාර්ථය) ලෙස ගන්නේ මෙම පංචස්කන්ධයෙන් එකක් හෝ සියල්ලම ය. පංචස්කන්ධය කෙරේ බැඳුම් ඇති කර ගෙන එය මම ය මාගේ යයි ගත් විට පංච උපාදානස්කන්ධය වශයෙන් හඳුන්වනු ලැබේ. පඤ්චස්කන්ධය නම්;

1. **රූපස්කන්ධය** - භෞතික වූ රූපී වූ කොටස
2. **වෙදනාස්කන්ධය** - වින්දන
3. **සඤ්ඤා** - සංජානනයෙන් කැටි කර ගන්නා හැඳුනුම්, හැඟීම්
4. **සංඛාර** - මනසින් සැකසෙන සිතිවිලි
5. **විඤ්ඤාණ** - දැනීම්

මේ පහ කෙටියෙන් රූපස්කන්ධය හා නාමස්කන්ධය ලෙස දෙවදෑරුම් ව ගැනීම ද වෙයි. රූපස්කන්ධය හැරෙන විට අනිත් හතරම නාම ලෙස ගැනේ. (ධම්මසංගිණියෙහි සියළු ධර්ම තුනකට බෙදනු ලැබේ.)

අප පුද්ගලයා යයි හඳුන්වනු ලබන්නේ හුදෙක් නාම-රූප සමවායම ය. එය සන්තතියක් වශයෙන් ඇති වෙමින් නැති වෙමින් පවතියි. මරණින් මතු ද එහි පැවැත්ම අචින්ත්‍ය තරම් කාලයක් පවතියි. එහෙත් මේ පංචස්කන්ධය වෙන් වෙන්ව ගත් විට හෝ එකට ගත් විට නිත්‍ය වූ යථාර්ථවත් ආත්මයක ලක්‍ෂණ විද්‍යමාන නො කරයි. පංචස්කන්ධයට අතිරේක යමක් පවතිතියි නිර්දේශ කිරීම ද කළ නො හේ. එහෙයින් ආත්මයක පැවැත්මක් ගැන කථා කිරීම නිෂ්ඵල ය.

යථාහි අංග සම්භාරා
හොති සද්දො රථො ඉති
එවං ඛන්ධෙසු සන්තෙසු
හොති සත්තො ති සම්මුති

"කොටස් එකතු වීමෙන් වාහනයක් නිර්මාණය වන්නාක් මෙන් ස්කන්ධය එකතු වූ විට සත්ත්වයා යන සම්මුතිය (ව්‍යවහාරය) ඇති වෙයි."

කෙසේ වුව ද මෙම පංචස්කන්ධය හුදෙක් බුදුරදුන් විසින් කරන ලද හුදු නිෂ්කර්ෂණයක් (වියුක්ත ව දැක්වීමක්) බව කිව යුතුව තිබේ. සමස්ත ස්කන්ධයන් යථාර්ථ වශයෙන් පවතිතියි කිව නො හේ. එක මොහොතක එක එක චිත්තක්‍ෂණයක පහල වන්නේ එක් උපදානස්කන්ධයක නියෝජනයක් පමණි. එක් චිත්තයක් තුළ එක් වර්ගයක වේදනාවක් පමණක් (එනම් සුඛයක් හෝ දුක්ඛයක්) පමණක් ඇති වේ. එමෙන්ම සංඥා දෙකක් එකවර පහළ නොවේ. විඤ්ඤාණයෙහි තත්වය ද මෙසේ මය. එක වරකට ඇති වන්නේ, එක් විඤ්ඤාණයක් පමණි. (නිදා: දැකීම, ඇසීම හෝ ධම්මාරම්මණ) කෙසේ වුව ද සිත් පණාහ තුළ දී සෑම චිත්තයක ම කුඩා හෝ ලොකු සංඛ්‍යාවක් යෙදෙන්නට ඉඩ ඇත.

පංචස්කන්ධය හුදෙක් වගී කිරීමේ පහසුව සඳහා වූවක් පමණක් බව තේරුම් නො ගත් බුදු සමය ගැන ලියූ සමහර ලේඛකයෝ ඒවා රාශි වශයෙන්, ගොඩවල් වශයෙන් දැක්වූහ. එහෙත් පෙර දැක්වූ පරිදි රාශි කිසි කලෙක එකට නො පවතිති. එක් නාම-රූප මොහොතක විද්‍යාමාන මෙම කේවල සංස්කාරයන් ක්‍ෂණික පැවැත්මක් පමණක් ඇති හෙයින් ඒවායේ සංගතීන් ද ක්‍ෂණිකය. වේදනා, සඤ්ඤා හා සංඛාර යනු හුදෙක් එකම විඤ්ඤාණ ඒකකයක විවිධ අංශ හා කෘත්‍ය පමණි. විඤ්ඤාණයට ඒවා ඇපල් ගෙඩියකට රතු බව මෘදු බව හා රසවත් බව මෙන් වෙයි. වෙන වෙන ම පවතින දේවල් නො වෙයි.



සාගින්න ලොකු ම ලෙඩකි. පස්කඳ ලොකුම දුකකි. නිවණ උතුම් ම සැපයකි.

203. ජිඝච්ඡා පරමා රොගා	කුසගින්න වෙයි පරම රෝගය
සඞ්ඛාරා පරමා දුඛා	සංස්කාරය පරම දුක වෙයි
එතං ඤත්වා යථාභූතං	මේ කරුණ නිසි ලෙසම දැන ගෙන
නිබ්බාණං පරමං සුඛං (15.7)	නිවන උසස් ම පරම සැපත යි.

අවම දුකයි - පරම සැපයි

15 (5) දුගී උපාසකයකු ගේ පුවතක් (203 ගාථාව)

අළව් නුවර වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ එක් **දුගී උපාසකයකු** ගේ පුවතක් හේතුවෙන් මේ ගාථාව දේශනා කළ සේක.

දිනක් උදෑසන කුළුණු සිතින් ලොව බලා වදාරන බුදුරජාණන් වහන්සේට සෝවාන් වීමෙහි වාසනා ඇති එක් දුප්පත් තැනැත්තෙක් අලව් නුවර වෙසෙන බව පෙනී ගියේ ය. එහෙයින් ඔහුට අනුග්‍රහ කරන්නෙමැයි සිතූ උන් වහන්සේ සැවැත් නුවරින් තිස් යොදුනක් දුර බැහැර පිහිටි අලව් නුවරට වැඩම කළ සේක.

බුදුපියාණන් තම නුවරට වැඩම කළ බව ඇසූ මිනිස්සු දාන වස්තු පිළියෙල කර ගෙන අවුත් උන් වහන්සේට පිළිග ැන්වූ හ. බුදුරදුන් ගේ කරුණා දැලට හසු වූ පුද්ගලයාට ද උන්වහන්සේ එනුවරට වැඩ වදාළ පුවත අසන්නට ලැබී බුදුරදුන් දක්නට අවුත් ධර්ම ශ්‍රවණය කිරීමේ රුචිය ඇති විය. එහෙත් අවාසනාවට මෙන් එදා උදේ ඔහු ගේ ගවයකු වල්මත් වී තිබින. එහෙයින් ගවයා සොයා යාම හා බණ ඇසීමට යාම අතර හේ අතරමං විය. ගවයා සොයා ගෙන'වුත් ගාල් කර බණ අසන්නට යමි යි සිතූ හේ වහ වහා වෙහෙසී ගවයා සොයා ගෙන'වුත් ගාල් කළේ ය. ඒ වන විට බොහෝ දවල් වී තිබුණ ද කෑම කන්නටවත් පමා නොවූ ඔහු වහා ම විහාරස්ථානයට ගියේ ය.

මේ වන විට දානමය කටයුතු සියල්ල නිම වී බණ අසන්නට පිරිස වාඩි වී සිටිය ද තමන් මෙහි පැමිණියේ ගවයන් සොයා ගිය උපාසකයාට පිහිට වීමට හෙයින් ඔහු එනතුරු බුදුරජාණන් වහන්සේ බණ නො වදාරා නිහඬව සිටිය හ. ජනයා ද දහම් ඇසීමේ අපේක්ෂාවෙන් නිහඬව සිටිය හ. මේ අතර ගමන් වෙහෙස හා කුසගින්න තිබුණ ද දුගී තැනැත්තා ද බණ අසන්නට සැරසුණේ ය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ "ආහාර තිබේදැ"යි විමසා මොහුට සංග්‍රහ කරන්නැයි ඉල්ලා සිටිය හ. ඔහු එසේ අහරින් සංග්‍රහ විඳ නැවත ආපසු භාග්‍යවතුන් වහන්සේ ධර්ම දේශනා කළ හ. උපාසක තැන ද සෝවාන් ඵලය ලද්දේ ය.

භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයට ආපසු වැඩම කළ පසු භික්ෂූහු බුදුරදුන් දුගී උපාසකයාට භෝජන සංග්‍රහයක් කළ අයුරු ගැන විමතියෙන් කතා කරමින් සිටිය හ. එතැනට වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මා යොදුන් තිහක් ගෙවා එහි ගියේම ඒ තැනැත්තාට පිහිට වන අටියෙනි. ඔහු කුසගින්නෙන් හා වෙහෙස මහන්සියෙන් සිටියදී ධර්ම දේශනා කළෙම් නම් ඔහුට ධර්මාභිසමය නොවනු ඇත. එහෙයින් මුලින් ඔහු ගේ කුසගිනි නිවා අනතුරුව ධර්මයෙන් සංග්‍රහ කළෙමි" යි වදාරා මේ ගාථාව ද දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (203 ගාථාව)

රොගා ජිඝච්ඡාපරමා දුඛා සඞ්ඛාරාපරමා එතං
යථාභූතං ඤත්වා නිබ්බාණං පරමං සුඛං

රොගා: රෝග අතුරින්; **ජිඝච්ඡාපරමා**: (නිරන්තරයෙන් පිළියම් කළ යුතු බැවින්) **කුසගින්න ප්‍රධානය**; **දුඛා**: දුක් අතුරින්; **සඞ්ඛාරාපරමා**: සංස්කාර ප්‍රධාන කොට ඇත්තාහ; **එතං**: මෙය; **යථාභූතං**: තත් වූ පරිද්දෙන්; **ඤත්වා**: දැන; **නිබ්බාණං**: නිර්වාණය (සියලු දුක් නිවන බැවින්); **පරමං**: උසස්තම; **සුඛං**: සැපයයි.

රෝගයන් අතරින් කුසගින්න ප්‍රධාන රෝගයයි. දුක් අතරින් පංචස්කන්ධය පිළිබඳ දුක ප්‍රධාන දුකයි. මෙය මනාව තේරුම් ගෙන නිවන පසක් කරගනු. එය සැප අතරෙන් උතුම් ම සැපතයි.

විවරණය

සඞ්ඛාරා පරමා දුඛා:මෙහි එන සඞ්ඛාර යන වචනය පාලි ත්‍රිපිටක සාහිත්‍යයෙහි විවිධ අර්ථ දනවන පදයකි. එය මනාව තේරුම් ගත යුතුව ඇත. එහෙයින් පදය යෙදෙන සන්දර්භයට අනුව අර්ථ කථනය කළ යුතුව තිබේ. මෙය ඇතැම් විට සංස්කරණය වශයෙන් කාරකාර්ථයේ ද සංස්කෘතය වශයෙන් කෘතාර්ථයේ ද යෙදෙයි.

1.) පටිච්ච සමුප්පාදයට අයත් ද්වාදසාංගයෙහි දී දෙවැන්න ලෙස සඞ්ඛාර යන්න හමුවෙයි. එහි ඇත්තේ කාරකාර්ථයයි. සංචේතනිකව කයින් සිතින් හා වදනින් කුශලා'කුශල ක්‍රියාවන් හි නිරත වීම ඉන් අභිප්‍රේතයි. ඇතැම් අවස්ථාවල සංඛාර යන්න **පුඤ්ඤාභිසංඛාර**, **අපුඤ්ඤාභිසංඛාර** හා **ආනෙඤ්ජාභිසංඛාර** (චලනය කළ නොහැකි සංඛාර) වශයෙන් යෙදී ඇත. මෙම වචන තුන සියළු ප්‍රවෘත්ති ස්ථානයන්හි කර්‍මය හා බැඳුනු ක්‍රියාවලිය මුළුමනින් ආවරණය කරයි. කාම හා රූප ලෝකවල පුඤ්ඤාභිසංඛාර සිදු කරන අතර අපුඤ්ඤාභිසංඛාර සිදු වන්නේ කාම ලෝකයේ පමනි. ආනෙඤ්ජාභිසංඛාර සිදු වන්නේ අරූපි ලෝක වල පමනි.

2.) **කාය සඞ්ඛාර**, **වචී සඞ්ඛාර** හා **මනෝ සඞ්ඛාර** යන පද තුන මීට වෙනස් අරුතක ද යෙදෙන බව තේරුම් ගත යුතු ය. එනම්,

(අ) ආශ්වාස ප්‍රශ්වාස කිරීම නම් වූ කායික ක්‍රියාව **(ආ)** සංකල්ප සාධනය හා විචාරාත්මක චින්තනය සම්බන්ධව වාචසික ක්‍රියාව **(ඇ)** වින්දනය හා සංජානනය පිළිබඳ මානසික ක්‍රියාව යනුවෙනි.

3) සතර වන ස්කන්ධය වූ කර්මජ හෝ එසේ නො වන සියළු මානසික සංස්කරණ ඇතුලත් සංස්කාරස්කන්ධය සඳහා ද සඞ්ඛාර යෙදේ.

4.) හට ගන්නා ඕනෑම දෙයක් සඳහා ද මෙය යෙදේ. ලොව පවත්නා පටිච්ච සමුප්පන්න සියළුම වස්තු, පුද්ගල, සිද්ධි හැමෙකක්ම සංස්කෘත ධර්ම වෙති. 'සබ්බේ සඞ්ඛාරා අනිච්චා' ආදි වශයෙන් කියන විට මේ අර්ථය ගත යුතු ය. එහි දී මතක තබා ගත යුත්තේ අනිච්ච වන්නේ සියළු ධර්ම නොව සියළු සංස්කාර ධර්ම බවයි. ධර්ම යනු විශාල කුලකය වන අතර, සංස්කාර ධර්ම අනුකුලකයයි. ධම්ම තුළ සංස්කෘත ධර්‍ම මෙන් ම අසංස්කෘත ධර්ම ද ඇතුළත් ය.

සංස්කාර යන්නෙන් සචේතනික ප්‍රයත්නය යන අරුත ද ලැබේ. ඉද්ධිපාද ලැබීම ගැන කථා කරන විට ඒ අරුත ගත යුතුය. එමෙන් ම සසඞ්ඛාරා හා අසඞ්ඛාර පරිනිබ්බායි (අනාගාමී) යන සන්දර්භයේ ද අභිධර්මයෙහි එන අසඞ්ඛාරික හා සසඞ්ඛාරික සිත් "උත්සාහ රහිතව" "පෙළඹුම් රහිතව" හා "උත්සාහ සහිතව පෙළඹුම් සහිතව" යන සන්දර්භයේ ද මේ අර්ථය ගත යුතු ය. පටිච්චසමුප්පාදයේ දී සඞ්ඛාර යනු උපචිඤ්ඤාණගත වූවක් හෝ හුදු ප්‍රවණතාවක් නොවේ. පූර්ණ සසංඥී සක්‍රිය කර්මික සංචේතනිකත්වයකි. සංස්කාරස්කන්ධයේ ඉතා සුළු ප්‍රමාණයක් පමණක් අවිඥානගත ව දක්නට ලැබුණ ද ඒවා ඊට ම සීමිත නොවන අතර හුදු ප්‍රවණතා ද නො වෙති.

නිරෝගිකම උතුම් ලාභයකි. සතුට උතුම් ධනයකි. හිතවතා උතුම් නෑයෙකි. නිවණ උතුම් සැපයකි.

204. ආරොග්‍යපරමා ලාභා	පරම ලාභය නීරෝගි කම
සන්තුට්ඨී පරමං ධනං	සතුට කාටත් පරම ධනයයි
විස්සාස පරමා ඤාති	විශ්වාසයයි පරම නෑයා
නිබ්බාණං පරමං සුඛං (15.8)	නිවණ ලෝකේ පරම සැපතයි

උතුම් වූ කරුණු සතර

15 (6) පසේනදි කොසොල් රජතුමා පිළිබඳ කතා පුවතක් (204 ගාථාව)

දෙව්රම වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ පසේනදි **කොසොල් මහ රජතුමා** අරමුණු කොට මේ ගාථාව දේශනා කළ සේක.

එක් කලෙක කොසොල් රජතුමා ලොකු බේසමක් තරම් තලියක පිරැවූ බත් කා ඊට සරිලන ව්‍යඤ්ජන අනුභවයට පුරුදුව සිටියේ ය. දිනක් උදේ ආහාරය සඳහා එතරම් විශාල කෑම වේලක් අනුභව කළ රජතුමා භාග්‍යවතුන් වහන්සේ දක්නට ගියේ ය. කුස හොඳට ම පිරී තිබුණෙන් ඔහුට සුවසේ වාඩි වී හිඳින්නට පවා අපහසු විය. ඒ අත මේ අත හැරෙමින් අමාරුවෙන් සිටින රජතුමාට නිදි මත ද දැනෙයි. මේ දුටු භාග්‍යවතුන් වහන්සේ "මහරජ, ඇති තරම් නිදාගන්නට ලැබුනේ නැත් ද?" යි විමසූහ. "නැත, ස්වාමීනි. කෑම වේලකට පසු නිතරම වාගේ මට මේ අමාරුව දැනෙනවා" "මහරජ, ඔය ගතියට හේතුව උවමනාවට වඩා ආහාර ගැනීමයි." යි පැවසූ භාග්‍යවතුන් වහන්සේ රජතුමා සමග පැමිණ සිටි සුදර්ශන නම් බෑණනුවන්ට ගාථාවක් ඉගැන්වූ හ.

"සිහිය නුවණ ඇතිව ඉන්න
නියම පමණ අනුව කන්න
පහසු වේවි දිරව ගන්න
නිරෝගීව දිවි ගෙවන්න"

සුදර්ශන ද එය ඉගෙන රජතුමා ආහාර ගන්නා විට කියන්නට පුරුදු විය. එවිට රජතුමා අන්තිම බත් කට නො කා සිටියි. ඒ ප්‍රමාණයට පසුදින හාල් අඩු කරන ලදි. මෙසේ ක්‍රමයෙන් ආහාර ප්‍රමාණය අඩු කරන ලදින් රජතුමා ගේ බඩ ද අඩු වී ශරීරය සැහැල්ලු වී සුවපත් ස්වභාවයක් ඇති විය.

නිරෝගීව ප්‍රීතිමත්ව සිටි රජතුමා දිනක් භාග්‍යවතුන් වහන්සේ හමුවට ගොස් "ස්වාමීනි, මම දැන් ආහාර අඩුකොට නිරෝගීව සතුටින් සිටිමි. එය මට ලොකු ලාභයකි. මා සමග අමනාපයෙන් සිටි අජාසත් රජතුමාට මගේ දියණිය වජිරා විවාහ කර දී මිතුරු කර ගතිමි. එයත් ලාභයකි. රජ පරපුරෙන් මට ලැබුණු අෂ්ටවංක මාණික්‍යය නැතිව තිබී ලඟදී ආපසු ලැබිණි. එයත් ලාභයකි. ඔබ වහන්සේට ඤාති වූ වාසභ ඛත්තියා විවාහ කරගෙන ඤාතීත්වයක් ඔබ වහන්සේ හා ඇති කර ගැනීම තවත් ලාභයකි. දැන් ඒ නිසා මම බොහෝ සතුටින් වෙසෙමි." යි පැවසීය. ඒ අසා සිටි භාග්‍යවතුන් වහන්සේ රජතුමාට මේ ගාථාවෙන් ධර්‍ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (204 ගාථාව)

ලාභා ආරොග්‍යපරමා. ධනං සන්තුට්ඨීපරමං ඤාති
විස්සාසපරමං නිබ්බාණ සුඛං පරමං

ලාභා: (සියලු) ලාභයෝ; **ආරොග්‍යපරමා**: නීරෝගීබව ප්‍රධාන කොට ඇත්තාහ; **ධනං**: ධනය; **සන්තුට්ඨීපරමං**: සතුට ප්‍රධාන කොට ඇත; **ඤාති**: නෑයෝ; **විස්සාසපරමං**: විශ්වාසය ප්‍රධාන කොට ඇත; **සුඛං නිබ්බාණ පරමං**: සැපත උතුම් නිවණ ප්‍රධාන් කොට ඇත.

නිරෝගීභාවය සියලු ලාභයන්ට වඩා උතුම් ලාභයයි. සන්තුෂ්ටිය සියලු ධනයන්ට වඩා උත්තම ධනයයි. විශ්වාසවත් වූයේ සියලු නෑයන්ට වඩා උතුම් නෑයායි. නිවන් සුවය වැනි සුවයක් නැති හෙයින් එය උතුම් සුවයයි.

විවරණය

විස්සාස පරමං ඤාති: යන්නෙන් නෑකම පිළිබඳ අර්ථකථනයක් ඉදිරිපත් වෙයි. සාමාන්‍ය ලෝකයා ඥාතීත්වය මත විශ්වාසය තබති. එහෙත් බෞද්ධ මතය වන්නේ විශ්වාසය තැබිය නො හැකි නම් ඒ නෑකම උසස් නොවන බවයි. වෙනත් විදියකට පවසතහොත් ඤාතිත්වයක් නැතත් විශ්වාසය ඇත්නම් සාමාන්‍ය ඤාතිත්වයටත් වඩා උසස් ඤාතිත්වයක් එයින් ඇති වන බවයි. යමකු විශ්වාස කළ හැකි නම්, සමීපතම, ස්නේහය හා සබඳතාව ඒ මතම පදනම් වෙයි. පුරාණ ශ්ලෝකයක මෙසේ දැක්වෙයි.

ලෝභ ප්‍රමාද විශ්වාසතා - පුරුෂො න ශසතෙ තිහි
තස්මා ලෝභෝ න කර්තව්‍යං - ප්‍රමාදෝ න විශ්වසේත්

"මිනිසා පිරිහෙන්නේ ලෝභය, ප්‍රමාදය හා නුසුදුසු අය විශ්වාස කිරීම නිසාය. එහෙයින් ලෝභ නො වන්න. ප්‍රමාද නො වන්න. නුසුදුස්සන් විශ්වාස නො කරන්න."



උසස් විවේක රසය ද නිවන් රසය ද දහමින් නිපන් සොම්නස් රසය ද වළඳන තැනැත්තා පීඩා නැත්තෙකි.

205. පවිවෙකරසං පිත්වා
රසං උපසමස්ස ච
නිද්දරො හොති නිප්පාපො
ධම්මපීතිරසං පිබං (15.9)

විවේක රස පානය කර
ශාන්තියේ රසයත් විඳ
සෝක තැවුල්-පව් දුරුකර
ධර්ම ප්‍රීතියේ රස විඳ

නිදහස් වී කෙලෙසුන් ගෙන් - තුටු වෙත් ලද මිහිරි සුවෙන්

15 (7) තිස්ස තෙරණුවන් ගේ කථා පුවත (205 ගාථාව)

මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ **තිස්ස තෙරුන්** අරබයා ය.

භාග්‍යවතුන් වහන්සේ තමන් පිරිනිවන් පානා බව මාස හතරකට පෙර ම භික්ෂු සංඝයාට දන්වා සිටි සේක. ඒ ඇසූ මහ රහතන් වහන්සේලා පටිච්ච සමුප්පාදයට අනුව කරුණු සැලකිල්ලට ගනිමින් ලෝ තතු සැලකිල්ලට ගත්හ. එහෙත් පෘථග්ජන හිමිවරු බලවත් කම්පාවට පත් ව හඬන්නට වැලපෙන්නට පටන් ගත් හ. කළ යුතු නො කළ යුතු දේ ගැන සිතා ගන්නට අසමත්ව තැන තැන කතිකා කරමින් විසූ හ.

එහෙත් තිස්ස නම් එක් තෙර නමක් මෙසේ සිතීය. "භාග්‍යවතුන් වහන්සේ තව සිව් මසකින් පිරිනිවන් පාති. මම තවමත් පෘථග්ජනව සිටිමි. මාස හතරක් ම ඇති හෙයින් උත්සාහ කළහොත් බුදුරදුන් ජීවමාන සමයෙහි ම රහත් බව ලබන්නට හැකි වීමට ඉඩ තිබේ. මම අනිවාර්යයෙන් ම එසේ කරන්නෙමි." එසේ සිතා භික්ෂු සංඝයා සමග කතා බහ අතහැර නො කඩවා ම විවේකීව භාවනා කරන්නට පටන් ගත්තේය. අනිත් භික්ෂුහු මේ හැසිරීමේ අමුත්ත දැක හේතුව විමසුව ද තමන් නිහතමානී හෙයින් ඒ ගැන කිසිවක් නො කී හ. වඩාත් විමතියට පත් උන් වහන්සේලා බුදුරදුන් හමුවට ගොස් "ස්වාමීනි, අප ඔබ වහන්සේ ගේ පරිනිර්වාණය ගැන මුසුප්පුව සිටියත් තිස්ස තෙරුනට කිසි වගක් නැති සේය. ඔබ වහන්සේ බලන්නට වත් එන්නේ නැත. අප හා ඇසුරක් ද නැත "යි පැමිණිලි කළ හ. භාග්‍යවතුන් වහන්සේ ද තිස්ස හිමියන් ගෙන්වා "මේ කියන දේ සැබෑ ද තිස්ස"යි විමසූ හ. "ස්වාමීනි, ඔබ වහන්සේ තව සිවු මසකින් පිරිනිවන් පාන හෙයින් ඊට කලින් මමත් කෙලෙසුන් ගෙන් මිදී ඔබ වහන්සේත් දැන ගෙන සිටියදීම ශාසනයෙන් නිසි ප්‍රතිඵල ලබන්නට සිතුයෙමි." යි පිළිතුරු ලැබිණි. "මහණෙනි, මට ගරු කර සෙනෙහස ඇති හැම දෙනම කළ යුත්තේ තිස්ස භික්ෂුව කරන දේ මය. මලින් ගඳින් පූජා කරනවාට වඩා මෙසේ කරන පූජාව ම උතුම් ය" යි තිස්ස තෙරුන් පසසා මේ ගාථාව ද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (205 ගාථාව)

පවිවේකරසං උපසමස්සරසං ච පීත්වා ධම්මපීතිරසං
පිබං නිද්දරො නිප්පාපො හොති

පවිවේකරසං: කාය චිත්ත විවේකයෙන් උපන් විවේක සුවය යයි කියන රසය ද; **උපසමස්සරසං ච**: කෙලෙස් සන්සිඳීමෙන් ලබන නිර්වාණ රසය ද; **පීත්වා**: පානය කොට; **ධම්මපීතිරසං පිබං**: නව ලොවුතුරු දහම් රසය බොන්නා වූ (රහත් තෙමේ); **නිද්දරො**: ශෝක නොකර **නිප්පාපො**: පාපයන් ගෙන් තොරව; **හොති**: වෙසෙයි.

විවේකයෙහි හා සංසුන් බවෙහි ආස්වාදය විඳගෙන ධර්ම ප්‍රීතියෙහි රසය විඳ ගන්නා තැනැත්තා ශෝකයෙන් හා පාපයෙන් තොරව වාසය කරයි.

විවරණය

මේ ගාථාව දේශනා කරන ලද්දේ බුද්ධ පරිනිර්වාණයට මාස කීපයකට පෙර සිදු වූ සිද්ධියක් මුල් කර ගෙන ය. බුදුරජාණන් වහන්සේ ගේ අවසන් මාස කිහිපය චමත්කාරජනක සිද්ධීන් ගෙන් පිරුණාහ. මහා පරිනිර්වාණ සූත්‍රය ඒ පිළිබඳ විස්තරයක් අප හමුවේ තබයි.

බුදුරජාණන් වහන්සේ ගේ ශරීරයට කවර අන්දමේ උපහාරයක් කළ යුතුදැයි අනඳ හිමියන් විමසූ විට උන් වහන්සේ වදාරා ඇත්තේ තථාගතයන් වහන්සේ ගේ ශරීර පූජාව සඳහා සංඝයා නො වෙහෙසිය යුතු බව ය. "ඔබගේ අභිවෘද්ධිය පිණිස (රහත් බව ලැබීම පිණිස) වෙහෙසෙන්න. අප්‍රමාද වන්න. සිහියෙන් යුක්තව, හොඳ වැඩ කරන්න. මා කෙරේ ප්‍රසන්න වූ ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති පිරිස වෙති. ඔවුන් මාගේ ශරීර පූජා කරනු ඇත"යි උන් වහන්සේ අවවාද කළ හ. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පාන්නට තෝරා ගත්තේ කුසිනාරාවේ මල්ලයන් ගේ උපවර්තන නම් සල් වනයයි. රාජගහ, ශ්‍රාවස්ති වැනි මහා නගරවල සැරිසැරූ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පාන්නට කුසිනාරාව වැනි කුඩා නගරයක් තෝරා ගත්තේ මන්දැයි විමසනු ලැබූ විට බුදු රජාණන් වහන්සේ කුසිනාරාව එකල කුඩා නගරයක් මෙන් පෙනී ගිය ද එය විශාල නගරයක් ව පැවති කාලය පිළිබඳ ඉතිහාසයක් දැක් වූහ.

බුදුරදුන් උපවර්තන සල් උයනට වැඩම කරන විට මල්ල රජ දරුවෝ සපිරිවරින් එහි පැමිණ සිටිය හ. ඔවුන්ගේ හරසර ලත් බුදුහු ආනන්ද හිමියන් අමතා, "ආනන්ද, දැන් ඉතින් ශාස්තෘවරයෙකු නැතිව සසුන අනාථ වී යැයි නො සිතන්න. මා විසින් දේශනා කළ ධර්මයත් දේශනා කළ විනයත් ඔබට ශාස්තෘ වනු ඇත. මගේ ඇවෑමෙන් පසු සංඝයා කැමති නම් කුඩා ඉතා කුඩා ශික්ෂා පද වෙනස් කර ගැනීමට ඉඩ ඇත." යි වදාළ හ. ශික්ෂා පද වෙනස් කර ගත යුතුයැයි නො වදරා ශික්ෂා පද වෙනස් කර ගන්නට ඉඩ ඇතැයි වදාළේ මහා කාශ්‍යප හිමියන් සංගීති අවස්ථාවේ දී ශික්ෂා පද සංශෝධන සංඝයා ලවා තහනම් කරවා ගන්නට සමත් වන බව දිවැසින් දුටු නිසායයි අටුවාචාර්ය වරු කියති. (එසේ නම් මේ අවසරය කාරුණිකව යථා තත්වය විමසා දුන් අවසරයක් නොව හුදු මවා පෑමක්, ව්‍යාජයක් බවට පත්වෙයි. එහෙයින් එය අටුවාචාර්ය මතයක් සේ පමණක් සිතීම වටියි.)

බුදුරදුන් මේ කුඩා හා ඉතා කුඩා ශික්ෂා කවරේදැයි පැහැදිලිව නිශ්චිතව දක්වා නො තිබි හෙයින් ඒ කවරේදැයි සිතා ගන්නට සංගීති කාරක හිමිවරු අසමත් වූ හ. ඒවා පැහැදිලිව විමසා නො ගැනීම වෙනුවෙන් අනඳ හිමියනට ආපත්තියක් පවා දේශනා කරන්නට වීමෙන් පෙනී යන්නේ එම අවසරය ප්‍රයෝජනයට නො ගත්තේ අටුවාචාර්යයන් දක්වන හේතුව නිසා නො වන බව ය.

"මහණෙනි, මා පිරිනිවන් පාන්නට පෙර ඔබට බුදුන්, ධර්මය, සංඝයා, මාර්ගය, ශික්ෂාව ගැන යම් විමතියක් වේ නම් ඒ ගැන මගෙන් විමසා දැන ගන්න"යි භාග්‍යවතුන් වහන්සේ සංඝයා ගෙන් ඉල්ලා සිටිය ද කිසිවෙක් යමක් නො විමසූ හ. තමන් විමසන්නට මැලි නම්, වෙනත් කෙනෙකු ලවා එසේ කරවන්නැ යි කිව ද එසේ ද නො කරන ලදී. සංඝයා අතර කිසිවකු සැකයකින් විමතියකින් තොරව සිටීම ගැන සතුටට පත් ආනන්ද හිමියෝ "ස්වාමිනී, මේ පිළිබඳ සැකයක් විමතියක් ඇති එක ද භික්ෂුවක් නැත. එය ආශ්චර්යයයි ස්වාමීනි" යි පැවසූ හ.

"ආනන්ද ඔබ පවසන්නේ සැබෑවකි. මේ පිරිසෙහි බුදුන්, ධර්මය, සංඝයා, මාර්ගය හෝ ශික්ෂාව පිළිබඳ සැකයක්, විමතියක් ඇති එකද භික්ෂුවක් නැති බව තථාගතයන්ට ද පෙනෙයි. මේ පන්සියයක් භික්ෂූන් අතර අන්තිමයා ද පරිහානියට නො වැටෙන, නිත්‍ය වශයෙන් ම විමුක්තිය ලබන බවට නිසැක සෝතාපන්නයෙකි" වදාළ බුදුහු අන්තිම බුද්ධ වචනය මෙසේ වදාළ හ. "මහණෙනි, සවන් දෙන්න. මම ඔබට අවවාද කරමි. සියළු සංස්කාර ධර්මයෝ නැසෙන සුලුය. අප්‍රමාදයෙන් ක්‍රියා කරන්න." මෙසේ පවසා සියළු ධ්‍යානයන්ට අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සමවන් උන්වහන්සේ අනුපදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවි සේක.



අරියයන් දැක්ම හා එක්ව විසුම ද අනුවණයන් නො දැක්ම හා එක් වැ නො විසුම ද සැප එළවීමට හේතු ය.

206. සාධු දස්සනමරියානං
සන්නිවාසො සදා සුඛො
අදස්සනේන බාලානං
නිච්ච'මෙව සුඛී සියා (15.10)

දැකුම යහපති නිමල උතුමන්
සදා සතුට ම ලැබෙයි ඇසුරින්
නො දැකුමයි හොඳ බාල ජනයන්
විසිය හැකි වෙයි නිතර සුවයෙන්

දැක උතුමන් - වෙමු සුපහන්

15 (8) සක් දෙවිඳු පිළිබඳ කථා පුවත (ගාථා අංක 206 සිට 208 දක්වා)

දෙව් ලොව අධිපති **ශක්‍ර දේවේන්ද්‍ර** මුල් කරගෙන මේ ගාථා දෙක භාග්‍යවතුන් වහන්සේ විසින් වේළුවනාරාමයෙහි වැඩ වසමින් දේශනා කරන ලදි.

භාග්‍යවතුන් වහන්සේ ආයු සංස්කරණය හැර තමන් වහන්සේ විසින් යටපත් කරගෙන සිටි අතීසාරයට නැවත මතු වන්නට ඉඩ හළ මොහොතේ අසනීපය දැඩි ව නැගුණේ ය. ඒ දත් ශක්‍ර දේවේන්ද්‍ර තෙම "බුදුරදුන් ගිලන් අවස්ථාවේ උන්වහන්සේ වෙත ගොස් උපස්ථාන කිරීම මගේ යුතුකමක්" යි සිතා එහි එළැඹුණේ ය. එසේ එළැඹුණේ තම දිව්‍ය ශරීරය වෙනුවට මිනිස් වෙසක් මවා ගනිමිනි. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සැතපී විවේක ගන්නා විට පා මිරිකීමට පටන් ගත්තේය. "ඔබ කවුද?"යි බුදුන් විසූ විට "ස්වාමීනි මම ශක්‍රයා" යි පිළිතුරු දුන්නේ ය. "ශක්‍රය, දෙවියෝ මනුෂ්‍යයන් ගේ ශරීර ගන්ධය අතිශයින් අප්‍රියය. එහෙයින් ඔබට මෙය කළ නො හැක. ඒ සඳහා භික්ෂූහු සිටිති. ඔබ ඉවත්ව යන්න" යි බුදුන් ඔවදන් දුන් හ. "ස්වාමීනි, යොදුන් 84000 ක් දුර සිට ද මට ඔබ වහන්සේ ගේ සිල් සුවඳ දැනෙයි. ඔබ වහන්සේ ගිලන්ව සිටින මේ මොහොතේ මට ඔබ වහන්සේට උපස්ථාන කරන්න ඉඩ දෙන්න. වෙන කිසිවකුට ඉඩ නොදී මට ම ඒ උපස්ථානය කරන්නට ඉඩ දෙන්න" යි තරයේ ඉල්ලා සිටියේ ය. මෙසේ අවසර ගත් හේ අනඳ හිමියනටවත් ඉඩ නො දී සියළු කටයුතු තමා ම කළේ ය. බුදුරදුන් ගේ ශරීර බහිස්‍රාවයන් අඩංගු බඳුන් මුහුණ හැකිලීමක් පවා නො කර හිස මත ම තබා ගෙන ගොස් පිරිසිදු කළේ ය. ඔහු ආපසු ගියේ භාග්‍යවතුන් වහන්සේ ගේ රෝගය සංසිඳුනු පසුව ය.

ශක්‍රයා මේ කළ බුද්ධෝපස්ථානය ගැන මහා සංඝයා වහන්සේ අතර සාකච්ඡා ඇති විය. තම දිව්‍යමය ආශ්චර්‍ය්‍යයන් පසෙක තබා නර වෙස් ගෙන පරම නිහතමානයෙන් බුදුරදුන් ගේ බහිස්‍රාවයන් සුගන්ධ ද්‍රව්‍යයක් මෙන් හිස තබාගෙන ගොස් පිරිසිදු කළ අයුරු උන්වහන්සේ ලා පුදුමයට පත් කර තිබින. මේ කතා බහ ඇසූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, සැබෑය. ශක්‍ර දිව්‍ය රාජ්‍යා එසේ මා ගේ උපස්ථානයට පැමිණීම සැබෑ වුව ද මම ද ඔහුට අනුග්‍රහ කර ඇත්තෙමි. වරක් තම ආයු කාලය නිම වී යන බව දැනී පංච ශිඛ ද සමග මා සිටි ඉන්ද්‍රසාල ගුහාවට පැමිණි අවස්ථාවේ මම "වාසව, ඔබ කැමති ඕනෑම ප්‍රශ්නයක් අසන්නැ" යි ඔහු පිළිගෙන ධර්ම දේශනා කළෙමි. බණ අසා සිය පිරිසත් සමග සෝවාන් වූ හෙතෙම වසර තුන්කෝටි හැට ලක්ෂයකට ආයුෂ ලද්දේ ය. එහෙයින් ඔහු තම කෘතඥතාව හේතුවෙන් මා ගිලන් වූ විට උපස්ථානයට ආයේ ය." යි කරුණු පැහැදිලි කළ හ. අනතුරුව මේ ගාථාවෙන් ධර්ම දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (206 ගාථාව)

අරියානං දස්සනං සාධු සන්නිවාසො සදා සුඛො
බාලානං අදස්සනේන නිච්චං එව සුඛී සියා.

අරියානං: ආර්‍ය්‍ය වූ උතුමන් ගේ; **දස්සනං**: දර්ශනය; **සාධු**: යහපත් ය; **සන්නිවාසො**: (එතුමන් ගේ) ආශ්‍රය; **සදා**: හැමකල්හි; **සුඛො**: සුවදායක ය; **බාලානං**: බාලයන් ගේ; **අදස්සනේන**: නො දැක්ම හේතුවෙන්; **නිච්චං එව**: නිරන්තරයෙන් ම; **සුඛී සියා**: සැපක් ම ලැබෙන්නේ ය

බුදු, පසේ බුදු, බුදුසව් යන උතුමන් ගේ දැක්ම යහපත් ය. එතුමන් ගේ ආශ්‍රය හැමකල්හි ම සැප ගෙන එයි. අඥානයන් නො දැක්ම ම නිතර සැප ලබා දීමට හේතු වන්නේ ය.

විවරණය

බුදුරදුන්ගේ අසනීපය: මේ ගාථා තුන දේශනා කර ඇත්තේ බුදුරදුන් ගේ අවසන් සමයෙහි උන් වහන්සේ අසනීප අවස්ථාවෙහි ය. උන් වහන්සේ ගේ අසනීපය හා අනතුරුව පරිනිර්වාණය සිදු වූ ආකාරය ගැන බෞද්ධ සාහිත්‍යයෙහි බොහෝ දීර්ඝ විස්තර දක්වා තිබේ.

භාග්‍යවතුන් වහන්සේ අසාමාන්‍ය පුද්ගලයකු වුව ද සාමාන්‍ය මනුෂ්‍යයකුට මෙන් උන් වහන්සේට ද අසනීප වැළඳුනි. උන් වහන්සේ ගේ ශරීරය ද අනිච්ච, දුකඛ හා අනත්ත යන ලක්ෂණ තුනට යටත් ය. තමන් වහන්සේ වයස අසූවේ දී පිරිනිවන් පානා බවට උන්වහන්සේ දැන සිටිය හ. බුදුරජාණන් වහන්සේ කුසිනාරාවේ උපවත්තන නම් සල් වනයේ දී පිරිනිවන් පෑ සේක.

බුදුරජාණන් වහන්සේ ගේ පරිනිර්වාණය හා සම්බන්ධ සිද්ධි කිහිපයක් මෙහි දක්වමු.

කුසිනාරාවට වැඩම කරන අතර මඟ කුකුත්ථ නදිය දැක එහි පැන් පානය කර ස්නානය කළ භාග්‍යවතුන් වහන්සේ නදිය තරණය කොට අඹ වනයට පිවිසුණ හ. එහිදී ආනන්ද හිමියන් ඇමතූ භාග්‍යවතුන් වහනසේ "චුන්ද ගේ දානය වැළඳීමෙන් අනතුරුව මා ගිලන් වූවායයි ඔහු දුක් විය යුතු නැත. එය ප්‍රථම දානය තරම් ම අනුසස් සහිතය" යි වදාළ හ.

අනතුරුව උන් වහන්සේ හිරණ්‍යවතී නදිය අසබඩ කුසිනාරාවෙහි මල්ලයන්ගේ සල් වනයට පිවිස ආනන්ද හිමියන් ඇමතූහ. "ආනන්ද, මට වෙහෙසයි. විවේක ගනු කැමැත්තෙමි. සල් ගස් දෙකක් අතර උතුරට හිස ලා සයනයක් පණවන්න." එහි පැණවූ සයනයෙහි උන්වහන්සේ චිත්ත සමාධියෙන් යුතුව දකුණැලයෙන් සීහ සෙය්‍යාවෙන් සැතපුනු සේක.

එකල මල් පිපෙන සමයක් නුවූව ද සල් තුරු දෙක ම මලින් පිරී ගියේ ය. ගසෙන් පතිත වූ කුසුමින් බුදු සිරුර වැසී ගියේය. අහසින් මදාරා මල් වැසි වැස්සේ ය. දෙව්ලොව සඳුන් සුණු ද වැස්සේ ය. පරිසරය දිව්‍යමය සංගීතයෙන් පිරිණි.

භාග්‍යවතුන් වහන්සේ අනඳ හිමියන් අමතා මෙසේ වදාළ හ. "ආනන්ද, මේ මදාරා මල්, සඳුන් සුණු හා සංගීතය මට උපහාර පිණිස ය. එහෙත්, මේ එතරම් උතුම් උපහාරයක් නො වේ. කිසියම් භික්ෂුවක්, භික්ෂුණියක්, උපාසකයෙක් හෝ උපාසිකාවක් මගේ ධර්මය ඉගෙන එය මනාව ප්‍රගුණ කරන්නේ ද එය ම මට කරන නිසි උපහාරය වන්නේ ය. මට කළ හැකි උපරිම උපහාරය ද එය ම වන්නේ ය. එහෙයින් ආනන්ද ඔබ විසින් උත්සාහ කළ යුත්තේ මගේ ධර්මය මනාව ඉගෙන එය පිළිපැදීමම ය.

අනුවණයන් හා එක් වැ විසුම දුකට කරුණු ය. නුවණැතියන් හා එක් වැ විසිම සැපයට කරුණු ය.

207. බාලසඞ්ගතචාරී හි
දීඝමද්ධාන සොචති
දුක්ඛො බාලෙහි සංවාසො
අමිත්තෙනෙ'ව සබ්බදා
ධීරො ච සුඛසඞ්වාසො
ඤාතීනං ව සමාගමො (15.11)

වැටුණහොත් බාලයන් ඇසුරට
දිගු කලක් දුක්වන්න සිදු වෙයි
දුකකි උන් හා සමග වාසය
වගෙයි සතුරකු සමග විසුමක්
නැණැතියන් හා විසුම සතුටකි
වාසයක් මෙන් සමග නෑයන්

ගුණැති උතුමන් ඇසුර මිහිරිය

15 (8) සක් දෙව්ඳු පිළිබඳ කථා පුවත (ගාථා අංක 206 සිට 208 දක්වා)

විවරණාත්මක අනුවාදය (207 ගාථාව)

බාලසඞ්ගතචාරී හි දීඝං අද්ධානං සොචති බාලෙහි සංවාසො අමිත්තෙන ඉව සබ්බදා දුක්ඛො ධීරො ච ඤාතීනං සමාගමො ඉව සුඛ සංවාසො

බාලසඞ්ගතචාරී: අඥාන පුද්ගලයන් සමග ආශ්‍රය කරන තැනැත්තා; **හි**: ඒකාන්තයෙන්; **දීඝං අද්ධානං**: දීර්ඝ කාලයක්; **සොචති**: ශෝක කරයි; **බාලෙහි සංවාසො**: බාලයන් සමග ඇසුර; **අමිත්තෙන ඉව**: සතුරකු සමග ආශ්‍රය මෙන්; **සබ්බදා**: හැම කල; **දුක්ඛො**: දුකකි; **ධීරො ච**: නුවණැත්තා නම්; **ඤාතීනං**: නෑයන් ගේ; **සමාගමො ඉව**: ඇසුර මෙන්; **සුඛ සංවාසො**: ප්‍රිය ජනක ඇසුර ඇත්තේ ය.

නිතර අනුවණයන් ගේ ඇසුරට යන්නා දිගු කල් ශෝක කරයි. බාලයන් ගේ ඇසුර සතුරකු ඇසුරු කිරීම මෙන් සැමදා දුක් ගෙන දෙයි. නුවණැත්තා නම් නෑයන් ගේ ආශ්‍රය මෙන් ප්‍රිය ජනක ආශ්‍රයක් ඇත්තෙකි.

විවරණය

උපවාන හිමියෝ බුදුරදුන්ට පවන් සලමින් ලඟ ම සිටිය හ. උන් වහන්සේට එතැනින් ඉවත් වන්නැයි බුදුහු වදාළ හ. භාග්‍යවතුන් වහන්සේට ඉතා හිතවත් වූ උපවාන හිමියනට එසේ ඉවත් වන්නැයි බුදුන් පැවසීම ගැන විමතියට පත් ආනන්ද හිමියෝ එසේ පවසන්නට හේතුව කුමක් දැයි බුදුරදුන්ගෙන් විමසූ හ. ඒ වන විට උපවත්තන සල් උයන අවට යොදුන් දොළහක් දක්වා අල්පෙනෙත්තක් තබන තරම් ඉඩක් නො තබා දෙවියන්ගෙන් පිරී පැවති බවත්, උපවාන තෙරුන් බුදුරදුන් අබිමුව සිට පවන් සැලීමේ දී උන් වහන්සේ ආවරණය වන හෙයින් අන්තිම වරට බුදුන් දැක ගැනීමට පැමිණි දෙවියන් උරණව සිටි හෙයින් තමා උන්වහන්සේ එතනින් ඉවත් කළ බවත් බුදුරජාණන් වහන්සේ පැහැදිලි කළ හ. යලිත් ආනන්ද තෙරුන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ "ආනන්ද, සැදැහැවතුන් විසින් දැකිය යුතු, ප්‍රසාද සංවේග උපදවා ගත යුතු ස්ථාන හතරක් වෙයි. එනම් බුදුරදුන් උපන් ස්ථානය, බුද්ධත්වයට පැමිණි ස්ථානය, ධර්මචක්‍රප්‍රවර්තනය කළ ස්ථානය හා පිරිනිවන් පෑ ස්ථානයයි. මෙම ස්ථාන වන්දනාවේ යන අතර යමෙක් මිය පරලොව යේ නම්, හේ අනිවාර්‍යයෙන් ම ප්‍රගතිගාමී වන්නේ ය" යි වදාළ හ.

බුදුරදුන් ගේ ශරීරයට අවසන් ගෞරව දක්වන ආකාරය පිළිබඳව ආනන්ද හිමියන් විමසූ විට උන් වහන්සේ වදාලේ සක්විති රජ කෙනෙකුගේ ආදාහනය කරන ආකාරයෙන් එය සිදු කරන ලෙස ය. එසේ කොට අවශේෂ වන ධාතු නිදන් කර සතරමං හන්දියක චෛත්‍යයක් ඉදි කරන්නැයි උපදෙස් දුන් හ. ස්තූප ඉදිකර ගෞරව කළ යුතුයැයි බුදුරදුන් නිර්දේශ කළ සිවු දෙනෙක් වෙයි. එනම්, බුදු, පසේ බුදු, මහරහතන්, සක්විති රජ යන සිවු දෙනා ය.

භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාවෙහි දී පිරිනිවන් පානා බව මල්ල රජ දරුවනට දැනුම් දෙන ලදි. මහත් සංවේගයට පත් ඔවුහු වහාම බුදුරදුන් දක්නට ආහ. රාත්‍රියේ ප්‍රථම යාමයේ දී ඔවුනට තථාගතයන් වහන්සේ හමුවීමට ඉඩ දෙන ලදි.

ඒ මොහොතේ සුභද්‍ර නම් පරිබ්‍රාජකයෙක් බුදුරදුන් හමුවනු පිණිස පැමිණියේ ය. ඔහු ආවේ ප්‍රශ්න කිහිපයක් විසඳා ගැනීම පිණිසය. එහෙත් මේ අවස්ථාවේ බුදුරදුන් දක්නට ඉඩදිය නො හැකි බව අනඳ හිමියෝ පැවසූ හ. එහෙත් ඒ දෙබස බුදුරදුන්ගේ සවණට වැටිණි. උන්වහන්සේ අනඳ හිමියන් අමතා සුභද්‍රට තමන් හමුවන්නට ඉඩ දෙන්නැයි පැවසූහ. සුභද්‍රට අවශ්‍ය වූයේ ෂඩ් ශාස්තෲන් නිසි මග ගිය අයදැයි දැන ගැනීමට ය. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ යන අය පමණක් නිසි මග යන බව වදාළ බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කළ හ. පැහැදුනු සුභද්‍ර බුදුරදුන්ගේ අවසන් ශ්‍රාවකයා වශයෙන් පැවිදිව රහත් විය.

වැඩිමහල් භික්ෂූන් බාල භික්ෂූන්ට නමින් හෝ 'ඇවත්නි' යි ඇමතිය යුතු බවත්, බාල භික්ෂූන් එසේ නොකර 'ස්වාමීනි' යි වැඩිමහල් භික්ෂූන්ට ඇමතිය යුතු බවත් මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ වදාළහ.

"බුදුන්, දහම්, සඟුන්, මඟ ගැන යම් සැකයක් ඔබට ඇත්නම්, දැන් එය නිරවුල් කර ගන්න, මහණෙනි" යි මේ අවස්ථාවේ දී බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයාට පැවසූහ. බුදුරදුන් තෙවරක් ම එසේ පැවසුව ද සංඝයා නිහඬව ම සිටිය හ. ඒ අවස්ථාවේ ආනන්ද හිමියෝ "මෙහි වැඩ සිටින එක ම භික්ෂු නමකට වත් තෙරුවන් ගේ ශික්ෂාව පිළිබඳ සැකයක් නැත"යි බුදුරජාණන් වහන්සේට දන්වා සිටිය හ. භාග්‍යවතුන් වහන්සේ ද "මෙහි සිටින පන්සියයක් භික්ෂූන් ගෙන් අන්තිමයා ද අඩුම වශයෙන් සෝවාන් ඵලය ලද්දෙක් බව වදාළ හ.

මනා නුවණැති සපුරිස් සඳු අහස සේවනය කරන්නාක් මෙන් සේවනය කරන්න.

තස්මා හි,
208. ධීරඤ්ච පඤ්ඤඤ්ච බහුස්සුතඤ්ච
ධොරය්හසීලං වතවන්තමාරියං
තං තාදිසං සප්පුරිසං සුමෙධං
භජෙථ නක්ඛත්ත පථං'ව චන්දිමා (15.12)

නැණවත් බුද්ධිමත් ඇසූ පිරූ තැන් ද ඇතී
බණ පිළි පදින වත් පිළිවෙත් රකින නිතී
උතුම් සත් පුරුෂ දැනුමැති අයම වෙතී
සඳට ගුවන මෙන් ඇසුරට සුදුසු වෙතී

ගුණ ඇති නුවණැති - ඇසුරට නිසි වෙති

15 (8) සක් දෙවිඳු පිළිබඳ කථා පුවත (ගාථා අංක 206 සිට 208 දක්වා)

විවරණාත්මක අනුවාදය (208 ගාථාව)

තස්මාහි ධීරඤ්ච පඤ්ඤඤ්ච බහුස්සුතං ච ධොරය්හ සීලං වතවන්තං අරියං සුමෙධං තාදිසං තං සප්පුරිසං චන්දිමා නක්ඛත්ත පථං ඉව භජේථ

තස්මාහි; එහෙයින්, **ධීරඤ්ච**; නැණවත් වූ ද, **පඤ්ඤඤ්ච**; ප්‍රඥාව ඇත්තා වූ ද, **බහුස්සුතං ච**; බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තා වූ ද, **ධොරය්හ සීලං**; මනාව පිළිපදින්නා වූ ද, **වතවන්තං**; වත් පිළිවෙත් පුරන්නා වූ ද, **අරියං**; උතුම් වූ, **සුමෙධං**; විචක්ෂණය ඇති, **තාදිසං**; එබඳු වූ, **තං සප්පුරිසං**; සත්පුරුෂයා, **චන්දිමා**; චන්ද්‍රයා, **නක්ඛත්ත පථං ඉව**; තරුමඟ හෙවත් අහස මෙන්, **භජේථ**; ඇසුරු කරන්න.

එහෙයින්, නුවණැති, ප්‍රඥාවන්ත, බහුශ්‍රැත, මනාව පිළිපදින, වත් පිළිවෙත් පුරන උතුම් වූ විචක්ෂණ නුවණ ඇති එබඳු වූ සත් පුරුෂයකු චන්ද්‍රයා අහස ඇසුරු කරන්නාක් මෙන් ඇසුරු කරන්න.

විවරණය

අනතුරුව භාග්‍යවතුන් වහන්සේ අන්තිම බුද්ධ වචනය වදාළ හ. "මහණෙනි, සියළු සංස්කාර ධර්මයෝ අනිත්‍යය හ. අප්‍රමාදයෙන් සම්පාදනය කරව්."

එසේ වදාළ භාග්‍යවතුන් වහන්සේ ධ්‍යාන නමයට ම අනු පූර්ව වශයෙන් සමවැදුනහ. ආපසු ප්‍රථම ධ්‍යානයට පැමිණ චතුර්ථ ධ්‍යානය දක්වා සමවැදී එයින් පසු පිරිනිවන් පෑහ. ඒ මොහොතේ භයංකර භූමිකම්පාවක් වූ අතර ගුවන් ගැබ දෙදරුම් කමින් මේඝ ගර්ජනා ද ඇති විය.

බුදුරදුන් පිරිනිවන් පෑ විගස අනුරුද්ධ හිමියෝ මෙසේ පැවසූහ. "නිකෙලෙස් වූ සම්මා සම්බුදුන් ගේ ආශ්වාස ප්‍රශ්වාස නැවතුණේ ය. කිසිවක නො රැඳි ශක්තියම අරමුණු කර ගෙන භාග්‍යවතුන් වහන්සේ පිරිනිවිය හ. විවෘත මනසින් උන්වහන්සේ වේදනාව ඉවසා ගත් හ. උන්වහන්සේ ගේ පරිනිර්වාණය පහන් සිළුවක් නිවී ගියා මෙන් විය." ආනන්ද තෙරුන් මෙසේ පැවසූහ. "මිහි මඬල කම්පා විය. ලොමු දැහැ ගන්වන සිදුවීම් සිදු විය." සහම්පති මහා බ්‍රහ්මයා මෙසේ කීය. "ලොව විසූ විශිෂ්ටතම පුද්ගලයා වූ සර්වඥතාව ඇතිව සිටි මේ විශිෂ්ටතම ශාස්තෲන් වහන්සේ පිරිනිවන් පෑම නිසා සියළු සත්වයෝ බලාපොරොත්තු සුන් කර ගත් හ." ශක්‍රයා ප්‍රකාශ කළේ "සියළු සංස්කාර ධර්මයෝ ඒකාන්තයෙන්ම අනිත්‍යය හ. හට ගැනීම හා වැනසීම හැම දෙයකම ධර්මතාව ය. හටගත් සියල්ල වැනසේ. ඒවායේ නිරෝධය සුවදායක ය." යනුවෙනි.

අනතුරුව පෘථග්ජන ශ්‍රාවකයන් හඬා වැලපෙන්නට වූයෙන් අනුරුද්ධ හිමියන්ට ඔවුන් අස්වසන්නට සිදු විය.

සත් දිනක් තිස්සේ බුදුරදුන්ගේ සිරුරට උපහාර පූජා දක්වන ලදි. සත්වන දින මල්ල රජ දරුවෝ අට දෙනෙක් දිය නා පිරිසිදුව බුදු සිරුර දකුණු වාසලින් ආදාහන භූමිය කරා ගෙන යනු වස් ඔසවන්නට සැරසුණ හ. එහෙත් සිරුර සොලවන්නට ඔවුහු අසමත් වූ හ. අනුරුද්ධ හිමියෝ එවිට "දෙවි වරුන් කැමති වන්නේ බුදු සිරුරට තමන් කැමති පරිදි අවසන් ගෞරවය දැක්වීමට ය. ඔවුන් කැමති එය උතුරු දොරටුවෙන් ගෙන ගොස් නගර මධ්‍යයෙන් ගමන් කොට නැගෙනහිර දොරටුවෙන් පිටවී මල්ලයන් ගේ මකුට බන්ධන චේතිය නම් ස්ථානයේ දී ආදාහන කරනු දැක්මට ය." යි හෙළි කළ හ. දෙවියන්ගේ කැමැත්තට ඉඩ දෙන්නට කවුරුත් කැමති වූ හ. මල් වැසි සුවඳ විලවුන්, සංගීත පූජා මැද බුදු සිරුර මකුට බන්ධන චේතිය වෙත ගෙන යන ලදි. අනඳ හිමියන් ගේ උපදෙස් පරිදි මල්ල රජ දරුවෝ බුදු සිරුරට සක්විති රජකුගේ සිරුරට දක්වන උපහාර දැක්වූ හ. අවසන මල්ල රජවරු සිවු දෙනෙක් අලුත් වස්ත්‍රයෙන් සැරසී චිතකය දැල්වීමට උත්සාහ කළ හ. එහෙත් ගිනි දැල්වුණේ නැත. මහා කස්සප හිමියන් පැමිණෙන තුරු ගිනි නො දැල්වෙන බව අනුරුද්ධ හිමියෝ දැනුම් දුන් හ.

එසමයෙහි මහා කස්සප හිමියෝ පාවා නුවර සිට කුසිනාරාව දක්වා වැඩම කරමින් සිටිය හ. උන්වහන්සේ අතර මග රුක් මුලක වැඩ හිඳිනා අතර මදාරා මලක් රැගෙන යන ආජීවකයකු කුසිනාරාවේ සිට එනු දැක ඔහු සමග කතා බහට වැටී "ඔබ අප ගේ ශාස්තෲන් වහන්සේ ගැන දන්නවාද?" යි ඇසූ හ. "එසේය. මම ගෞතමයන් වහන්සේ ගැන දනිමි. අදට දින හතකට පෙර උන් වහන්සේ පිරිනිවන් පෑහ. මා මේ මදාරා මල අහුලා ගත්තේ ආදාහන භූමියෙනි" යි හේ පිළිවදන් දුන්නේ ය. මේ පුවත අසා පෘථග්ජන භික්ෂූන් හඬා වැලපෙනු දුටු එක් මහළුව පැවිදි වූ සුභද්‍ර නම් භික්ෂු නමක් "හැඬුමෙන් පලක් නැත ඇවැත්නි, දැන් ඉතින් මෙසේ කරව්. මෙය නොකරව් යයි අපට වද දෙන්නට කෙනෙක් නැත" යි පැවසීය. කස්සප හිමියෝ භික්ෂූන් අස්වසා කුසිනාරාව බලා පිටත් වූහ. මකුට බන්ධන චෙතිය වෙත ගොස් මහා කස්සප හිමියෝ දොහොත් මුදුන් තබා තෙවරක් චිතකය පැදකුනු කර බුදු සිරුරේ පාද නිරාවරණය කර නමස්කාර කළ හ. උන්වහන්සේ සමග පැමිණි පන්සියයක් හිමිවරුද එසේ කළ හ. වහා ම චිතකයට ඉබේම ගිනි දැල්විණි.

මගධයේ අජාසත් රජ, විශාලාවේ ලිච්ඡවීහු, කපිලවස්තුවේ ශාක්‍යයෝ, අල්ලකප්පයේ බුලියෝ, රාමග්‍රාමයේ කෝලියයෝ, පාවා හි මල්ලයෝ මෙන් ම වේඨදීප නම් බමුණා ද තම තමන්ට සර්වඥ ධාතු අවශ්‍ය බව කී හ. කුසිනාරාවේ මල්ලයන් කියා සිටියේ බුදුරදුන් පිරිනිවන් පෑවේ තම රාජධානියේ හෙයින් කිසිවකුට සර්වඥ ධාතු දීමක් අනවශ්‍ය බව ය. මේ අවස්ථාවේ ද්‍රෝණ නම් බ්‍රාහ්මණයෙක් ඉදිරිපත්ව "ශාන්තිවාදී වූ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ ශරීර ධාතු බෙදා ගන්නට කෝලාහලයක් අනවශ්‍ය ය." යි පවසා ධාතූන් සම කොටස් අටකට බෙදා දී කලබලය සමථයකට පත් කළේ ය. බෙදීම සඳහා භාවිත කළ හිස් බඳුන ගෙන ගිය හෙතෙම චෛත්‍යයක් ඉදි කළේය. ධාතු කොටස් රැගෙන ගිය රජ දරුවෝ තම තමා ගේ ප්‍රදේශ වල චෛත්‍ය ඉදි කළ හ.

සප්පුරිස: සත් ගුණ වඩන පුද්ගලයෝ සත් පුරුෂයෝ ය. මේ ගාථා වලින් එබඳු අයගේ ගුණ වර්ණනා කෙරේ. සදාචාරය ප්‍රගුණ කිරීම නිවසක් සොරුන් ගෙන් රැකීමට මුරකාවල් යෙදීම වැන්න. සමාජ, ආර්ථික, දේශපාලන හා ආගමික පරමාදර්ශ සියල්ල ආචාර ධර්ම මත රඳා පවතියි. ජීවිතයේ ජීව රුධිරය සෙනෙහසය. සදාචාරය එහි පිට කොන්දය. ගුණ දම් වලින් තොර ජීවිතය නිසරු ය. සෙනෙහසින් තොර ජීවිතය ජීවයෙන් තොරය. මිනිසා උපතින්ම සර්ව සම්පූර්ණ කෙනෙක් නොවේ. ඔහු හොඳ වීමට විශේෂ ප්‍රාගුණයක් අවශ්‍ය ය. සදාචාරය සියළු දෙනාට ම අත්‍යවශ්‍ය ය. එය ආභරණයක් හෝ වස්ත්‍රයක් නො වේ. වස්ත්‍රය යල් පනියි. එහෙත් සදාචාරය යල් පනින්නේ නැත.

ආගම් උමතුවක් නැත

ආගම් උමතුවෙන් තොර එකම ආගම වශයෙන්
සැලකිය හැක්කේ බුදුසමය පමණි. බුදුසමයේ හරය නම් ආත්ම
විජයයෙන් ආධ්‍යාත්මික විප්ලවයක යෙදෙන පුද්ගලයන් බිහිකිරීමයි.
ඒ නිසා සිය ආගමට මිනිසුන් හරවා ගැනීම පිණිස බුදුසමය
මිල මුදල් හෝ පොළඹවාලීම් හෝ බලය හෝ භාවිත
කරන්නේ නොවේ. බුදුහිමියෝ විමුක්ති මාර්ගය පෙන්වූ සේක.
ඒ මඟ ගමන් ගැනීමට තීරණය කිරීම එක් එක්
පුද්ගලයාට අයත් කාර්‍යයකි.

මහාචාර්‍ය ලක්ෂ්මී නරසු 'බුදුසමයේ හරය' නම් ග්‍රන්ථයෙන්.

පිය වග්ග



තමා නො දිය යුතු තැන යොදන, යෙදිය යුතු තැන නො යොදන, තැනැත්තා කම් සුවයෙහි ම ඇලේ.

209. අයොගෙ යුඤ්ජමත්තානං
යොගස්මිඤ්ච අයොජයං
අත්ථං හිත්වා පියග්ගාහී
පිහෙත'ත්තානුයොගිනං (16.1)

යෙදෙමින් නො යෙදිය යුතු තැන
නො යෙදී යෙදුමට නිසි තැන
පල දේ හැර ප්‍රිය දේ ගැන
යෝගීනට ඉසි වඩ මින

හොඳ දේ හැර - ප්‍රිය දේ ගෙන

16 (1) තවුසෝ තුන්දෙනා පිළිබඳ කථාව (ගාථා අංක 209 සිට 211 දක්වා)

දෙව්රම් වෙහෙර වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **මව, පියා හා පුතා** යන තිදෙනාම එකට පැවිදි වී එකට උපැවිදි වූ පුවතක් ඇරබ මේ ගාථා වදාළ සේක.

එක් මා-පිය දෙපලක් තම එකම පුතුට ඉතා සෙනෙහසින් කල් යැවූ හ. දිනක් නිවසෙහි මහා සඟනට දන් පිරිනැමූ අවස්ථාවේ උන්වහන්සේලා කෙරේ පහන් වූ පුතා පැවිදි වන්නට රිසි විය. එහෙත් තමන්ට සිටින්නේ එකම දරුවකු පමණක් හෙයින් ඔහු පැවිදි වනු දක්නට රිසි නො වූ දෙමාපියෝ ඊට ඉඳුරා ම විරුද්ධ වූ හ. එහෙත් තරුණ පුත්‍රයා ගේ රුචිය බලවත් වූ හෙයින් කවදා හෝ දෙමාපියන්ට හොරෙන් ගොස් පැවිදි වෙමියි හේ සිතා ගත්තේ ය.

එතැන් පටන් මව හා පියා පුතාට නිවසින් බැහැර යන්නට නො දී රැක ගත් හ. පියා ගමනක් යන හැම විටම පුතා රැක බලා ගන්නැයි මවට කියා යයි. "හොඳයි මම එයා බලා ගන්නම්" යැයි පවසන මව ඔහුට ගෙදරින් පැන යන්නට නොදී රැකවල් ලා සිටියි. වැඩක් කරන විට දී දොරටුව අහුරා වාඩි වී එසේ කරන්නේ පුතාට පිට වී යාමට බැරිවන පරිදි ය. එහෙත් මහණ වීමේ ආශාව බරපතල හෙයින් හේ දිනක් දොරටුව හරස් කර සිටි මවට තමා වැසිකිළියට යන බව පවසා ඇය රවටා නිවසෙන් පිට වී විහාරස්ථානයට ගොස් පැවිදි විය.

පියා ගෙදර අවුත් දරුවා නො දැක පුතා කොහිදැයි විමසා බලා ඔහු බොරුවකින් මව රවටා ගිය බව දැන ශෝකයට පත්ව ඔහු යන්නට ඇත්තේ විහාරස්ථානයට යැයි සිතා එහි ගියේ ය. එහි දී පුත්‍රයා පැවිදිව සිටිනු දැක හඬා ශෝකවී දැන් ඉතින් මටත් ගිහි ජීවිතයෙන් වැඩක් නැතැයි පැවිදි විය. පියා ආපසු නො එන තැන ඔහු සොයා ගිය මව ද දෙදෙනාම පැවිදි වී නම් මා පමණක් ගිහි ගෙයි වාසය කිරීමෙන් පලක් නැත. මමත් පැවිදි වෙමි යි තමා ද පැවිදි විය. මෙසේ තිදෙනාම පැවිදි වුව ද ඔවුනට තම පවුලේ සෙනෙහස දමනය කර ගන්නට හැකි නො වීය. ඔවූහු නිතර නිතර හමු වූහ. සෙනෙහසින් කතා බහ කරමින් කල් ගෙවූහ. බණ භාවනාවට සිත් යොමු නො කළ හ. මේ අය නිතර නිතර හමුවෙමින් කතා බහේ නිරත වීම අනිකුත් හිමිවරුන්ට ද වධයක් වූයෙන් ඒ බව බුදුරජාණන් වහන්සේට දැනුම් දෙනු ලැබිනි. ඔවුන් ගෙන්වා මේ හැබෑදැයි විමසා තොරතුරු දැනගත් බුදුන් වහන්සේ "ඇයි ඔබ එසේ කරන්නේ? භික්ෂු භික්ෂුණීන් ජීවත් විය යුතු පිළිවෙත මෙය නො වෙයි." යි අවවාද කළ හ. "ස්වාමීනි, පැවිදි වුවද අපට අප කෙරෙහි ඇති සෙනෙහසින් මිදෙන්නට පිළිවන් කමක් නැත." යි ඔවුහු කී හ."එහෙත් දැන් ඔබ පැවිදිව සිටින හෙයින් තවදුරටත් එසේ සිටීම යෝග්‍ය නො වේ. ප්‍රිය, අප්‍රිය වශයෙන් ලෝකය දෙකට බෙදා ගෙන සිටින විට උපේක්ෂාව ප්‍රගුණ කළ නොහේ. පැවිදි නමක් මුළු ලෝකයටම සම ව හැසිරිය යුතුය" යි බුදුරදුන් පැහැදිලි කළ ද එය ඔවුහු පිළි නොගත් හ. අවසන පැවිදි දම් පුරාගත නො හැකි ව ඔවුහු තිදෙනම නැවත ගිහි ගෙටම ගිය හ.

විවරණාත්මක අනුවාදය (209 ගාථාව)

අත්තානං අයොගෙ යුඤ්ජං යොගස්මිං අයොජයං ච
අත්ථං හිත්වා පියග්ගාහී අත්තානුයොගිනං පිහෙති

අත්තානං: තමා; **අයොගෙ**: නො යෙදිය යුතු තැන (අයොනිසො මනසිකාරයෙහි); **යුඤ්ජං**: යෙදෙන්නා වූ ද; **යොගස්මිං**: යෙදිය යුතු තැන; **අයොජයං ච**: නො යෙදෙන්නා වූ ද (පුද්ගල තෙමේ); **අත්ථං හිත්වා**: හිතකර දේ අත්හැර; **පියග්ගාහී**: ප්‍රිය දේ පමණක් ගන්නා සුලු වූයේ; **අත්තානුයොගිනං**: අත්වැඩෙහි යෙදුනහු; **පිහෙති**: රුචි කරයි.

තමා නො යෙදිය තැන යොදවමින් යෙදිය යුතු තැන නො යොදමින් ප්‍රයෝජනවත් දේ අතහැර ප්‍රිය දේ පමණක් ගන්නා සමහරු තමා නිසි මග තබා ගත්තවුනට ප්‍රිය වෙති.



ප්‍රියයන් සමගත් අප්‍රියයන් සමගත් එක් නො වන්න. ප්‍රියයන් නො දැක්ම හා අප්‍රියයන් දැක්ම දුකකි.

210. මා පියෙහි සමාගඤ්ජි
අප්පියෙහි කුදාචනං
පියානං අදස්සනං දුක්ඛං
අප්පියානඤ්ච දස්සනං (16.2)

නො ගැවසෙන්න ප්‍රියයන් හෝ
අප්‍රියයන් සමගින් වත්
ප්‍රියයන් නො දැකීම දුකකි
අප්‍රියයන් දැක්ම දුකකි

ප්‍රියයන් නො දැක්ම වගේ ම අප්‍රියයන් දැක්ම දුකකි

16 (1) තවුසෝ තුන්දෙනා පිළිබඳ කථාව (ගාථා අංක 209 සිට 211 දක්වා)

විවරණාත්මක අනුවාදය (209 ගාථාව)

**පියෙහි මා සමාගඤ්ජි අප්පියෙහි කුදාචනං පියානං
අදස්සනං දුක්ඛං අප්පියානඤ්ච දස්සනං**

පියෙහි: ප්‍රිය වූවන් සමග ද; **අප්පියෙහි**: අප්‍රියයන් සමග ද; **කුදාචනං**: කිසි කලෙකත්; **මා සමාගඤ්ජි**: එක් නො වන්න; (කුමක් හෙයින් ද යත්) **පියානං**: ප්‍රියයන්ගේ; **අදස්සනං**: නො දැක්ම; **අප්පියානං**: අප්‍රියයන් ගේ; **දස්සනඤ්ච**: දැක්ම ද; **දුක්ඛං**: දුක් (වේ ද එහෙයිනි.)

ප්‍රියයන් සමග වත් අප්‍රියයන් සමග වත් කිසි කලෙක එක් නො විය යුතුයි. ප්‍රිය වූවන් වෙන් ව යාමෙන් ද අප්‍රිය වූවන් සමීපයට එළඹීමෙන් ද හිතට දුක් බැවිනි.

විවරණය

දුක්ඛ: මෙහි පියානං අදස්සනං දුක්ඛං යන්නෙන් දුකෙහි එක් අංශයක් ගැන - එනම් ප්‍රියයන් ගෙන් වෙන්වීම පිළිබඳ දුක ගැන - දැක්වෙයි. බුදු දහමෙහි ඉගැන්වෙන දුක්ඛ සත්‍යය එය ද ඇතුළත් කර ගත් පුළුල් විග්‍රහයක් ඉදිරිපත් කර අප හා ලෝකය පිළිබඳව පූර්ණ යථා තත්ව විවරණයක් අප හමුවේ විදහා දක්වන බව කිව යුතුය.

දුක වින්දනයක් වශයෙන් ගත් විට 'ඉසිලීමට අපහසු' යන අරුත දෙයි. දුක්ඛ යන වචනයෙහි ධර්මානුකූල නිරුක්තිය දක්වන විට 'දු' යන්නෙන් පිළිකුල් බව ද 'ඛ' යන්නෙන් 'හිස් බව' හා 'නිසරු බව' ද ගැනෙතියි දැක්වේ. ලෝකය පිහිටා ඇත්තේ දුක මත ය. එහෙයින් ලෝකය ද පිළිකුල් ය. නිසරුය.

පොදු මිනිසා නිතරම දකින්නේ මතුපිට තත්ත්වය පමණි. එහෙත් ආර්‍ය්‍යයන් වහන්සේලා ගැඹුර ද දකිති. පොදු මිනිසා සුවයයි ගන්නා දේ ආර්‍ය්‍යයෝ දුක සේ දකිති. උන්වහන්සේලා මේ ලෝකයෙහි කිසිදු සැපයක් හෝ හරයක් නො දකිති. සියළු සැප හා ප්‍රීති ප්‍රමෝදයෝ හුදු මායාවෝ ම වෙති. නුදෙක් ආශාවන් පිණවීම මාත්‍රයන් ම වූ ඒවායේ දිගට පවත්නා සාරවත් බවක් නොමැත. එක් ආශාවක් සමෘද්ධ වූ වහාම තවත් ආශාවක් ජනිත වෙයි. සමෘද්ධ වූ ආශාවේ තව දුරටත් වටිනා කමක් නැත. ලබා ගත් දේ පිළිබඳ අගය පිරිහී යයි. සියළුම පදාර්ථයෝ ජාති, ජරා, ව්‍යාධි ලක්‍ෂණයනට ගොදුරු වූවෝ ය. අවසානය මරණය හෝ නැතිව යාම අනිවාර්‍ය්‍ය ය. එහෙයින් මේ සියල්ල දුක් ම ය.

කිසියම් ආශාවක් සමෘද්ධ නො වීම ද දුකකි. අප අකමැති කිසිවක් එක් වන්නට අපි ආශා නො වෙමු. එමෙන් ම අප ආශා කරන කිසිවකින් වෙන් වන්නට ද කැමති නො වෙමු. එහෙත් අප රුචි කරන දේම සිදු වන්නේ නැත. සමහර විටෙක අප අකැමැතිම අපට අප්‍රියම දේ බාර ගන්නට අපට සිදු වේ. මෙය කෙතරම් අප්‍රිය අමනාප වෙනවාද යත් ඇතැම් අඥානයෝ සියදිවි නසා ගන්නට පවා පෙළඹෙති.

නියම ප්‍රීතිය නම් අධ්‍යාත්මික වූවකි. එය ධනය, බලය, ගරු නම්බු, විජයග්‍රහණ හෝ සිතන පතන සෑම භෞතික සම්පත්තියක්ම අත්පත් කර ගැනීම නො වේ. ඒවා බලහත්කාරයෙන් අසාධාරණයෙන් ලබා ගත් විට හා වැරදි ලෙස භාවිත කළ විට හෝ ඒවාට අනවශ්‍ය ලෙස ඇළුම් කළ විට ඒවාම හිමිකරු ගේ දුකට පසුතැවිල්ලට හේතු භූත වෙයි.

සාමාන්‍යයෙන් පොදු ජනයා දන්නා ඉහලම හා එකම ප්‍රීතිය ඉන්ද්‍රියයන් පිණවීම යි. බලාපොරොත්තු තබා ගැනීම, බලාපොරොත්තුව ඉටු කර ගැනීම හා ලත් තාවකාලික සොම්නස යළි යළිත් ආවර්ජනය කිරීම මගින් යම් තාවකාලික සතුටක් ලැබෙන බව සැබෑ ය. එහෙත් ඒවා මායාමය ය. තාවකාලික ය. බුද්ධ වචනයට අනුව නියම සතුට නම් විරාගතාව ය. භෞතික ආස්වාදයෙන් ඔබ්බට යාම ය. ප්‍රථම සත්‍ය වූ දුක්ඛ සත්‍ය ප්‍රවේසමෙන් හා සැලකිල්ලෙන් විශ්ලේෂණාත්මකව අවබෝධ කර ගත යුත්තකි. යථාර්ථය දැන ගත හැකි වන්නේ මෙම දුක්ඛ සත්‍යය පිළිබඳව ලබන පරිඥානය මගිනි.

දුකඛ සත්‍යය විවරණය කරමින් භාග්‍යවතුන් වහන්සේ 'ජාතිය දුකකි' යි වදාරා ඇත. ජාතිය නම් ඉපදීමයි. මෙහි දී ප්‍රතිසන්ධියේ සිට ජන්ම ලාභය තෙක් ක්‍රියාවලිය එක්ව ගැනීම වේ. තෘෂ්ණා බන්ධනය මගින් දිරාපත්වන භෞතික ශරීරයකට බැඳිනු ලැබීම දුකකි. කර්මය විසින් මෙහෙයවනු ලැබ තෘෂ්ණාව විසින් උත්පත්තිය විෂයෙහි පොළඹවනු ලැබීම හේතුවෙන් අපට දුක් අනුභව කරන්නට සිදුවෙයි. උත්පත්ති ක්‍රියාවලිය තුළ කවර හෝ යමක් වැරදී ගියහොත්, නූතන මනෝ විද්‍යාඥයන් විසින් හෙළි කර ඇති පරිදි දරුවා ගේ සිතෙහි දිගුකල් පවතින කැළලක් ඇති විය හැක. උත්පත්තිය වේදනාකර බිය ජනක අත් දැකීමක් බව ශත සහස්‍රවාරයක් ඉපිද අත්දැකීමෙන් ම බුදුරජුන් වදාළ ද එහි වේදනාකර අප්‍රසන්න තත්ත්වය නිසා ම බොහෝ දෙන එය අමතක කර ලන්නට කැමති වෙති.

ජාතිය දුක යැයි තවත් අරුතකින් ද දැක්විය හැකි ය. බුද්ධ දේශනාව අනුව ජාතිය හා මරණය (උප්පාද - වය) ක්‍ෂණිකව සිදුවන්නා වූ පැවැත්මෙහි ම අංශ දෙකකි. ශරීරයෙහි ගෙවී ගිය සෛල වෙනුවට නිරතුරුව ම නව සෛල හට ගනියි. එමෙන්ම මනසෙහි නව අරමුණු ගැටෙයි. පරික්‍ෂාවට භාජන කරනු ලැබෙයි. හැර දැමෙයි. මෙම නිරන්තර ක්‍රියාවලිය දිවා රෑ දෙකෙහි ම සිදු වෙයි. මෙය සියුම්ව තේරුම් ගත හොත් ඉවරයක් නැති, බේරුමක් නැති, ඇතිවීමක් නැති 'අනුභවික ව්‍යාධියක්' වශයෙන් හඳුන්වන්නට සිදු වෙයි. එක් අනුපැති මොහොතක තුළ සිද්ධියක් ඇරඹෙයි. පවතියි. නැසෙයි. එහෙත් ජාතිය හා මරණ මේ අරුතින් තේරුම් ගත හැක්කේ භාවනා මග ප්‍රතිභානයකින් පමණි.

ජරාව හෙවත් වියපත් වීම ද දුකකි. මෙය ජාති දුකට වඩා ප්‍රකටව පෙනෙන්නකි. දත් හැලෙයි. ප්‍රියංකරව බබලමින් පැවති හිසකේ තුනී වෙයි. සුදු වෙයි. කලින් රස විඳි ප්‍රණීත ආහාර දිරවීම කුස ප්‍රතික්ෂේප කරයි. හන්දි රුදා දෙයි. කීරි ගැසෙයි. මාංශ පේශි දුබල වෙයි. මීටත් වඩා සිත කලකිරෙන්නේ ඇස් පෙනීම හා කන් ඇසීම දුබල වන විට ය. පිටු ගණන් ලියන්නට තරම් දුකකි මෙය. ඊටත් වඩා කම්පා කරවන සුළු දෙය නම් යමක් නුවණින් තේරුම් ගන්නට ඇති හැකියාව දුර්වල වීමයි. යම් යම් දේ පුරුද්දට යයි. කලින් තීරණ ගැනීම සිදු වෙයි. ඉදිරිය බැලීම වෙනුවට අතීතය ගැන ආවර්ජනය කරමින් විශ්ලේෂණය කිරීම පුරුද්දක් වෙයි. එමෙන්ම කෙනකු 'දෙවන බිළිඳු විය' වශයෙන් හැඳින්විය හැකි මනස බොළඳ වීම හෙවත් වඩා නිවැරදිව කිවහොත් සිත දුර්වල වීම ද දැක්විය හැක. හැමෝටම මේ සියල්ලම සිදු නොවුණ ද වයසට යන විට මේ අම්හිරි දේවලින් කීපයක් හෝ විඳගන්නට සිදු වීම වැළකිය නො හේ.

කිසිවකු හෝ කිසි දැයක් ප්‍රිය නො කරන්න. ප්‍රිය - අප්‍රිය දෙක නැතියනට කෙලෙස් ගැට නැත.

211. තස්මා පියං න කයිරාථ
පියාපායො හි පාපකො
ගන්ථා තෙසං න විජ්ජන්ති
යෙසං නත්ථි පියාප්පියං (16:3)

ප්‍රිය නොකරන් කිසි කෙනෙකුට
දුක් ඇතිවෙයි වෙන් වන විට
ප්‍රිය-අප්‍රිය දුරු කළ හට
නොම වෙයි බැම්මක් කිසි විට

මිදී බැඳුමින් - නසමු කෙළෙසුන්

16 (1) තවුසෝ තුන්දෙනා පිළිබඳ කථාව (ගාථා අංක 209 සිට 211 දක්වා)

විවරණාත්මක අනුවාදය (211 ගාථාව)

තස්මා පියං න කයිරාථ හි පියාපායො පාපකො යෙසං
පියප්පියං නත්ථි තෙසං ගන්ථා න විජ්ජන්ති

තස්මා: එහෙයින්; **පියං න කයිරාථ**: (කිසිවක්) ප්‍රිය නො කරන්නේය; **හි**: ඒ එසේමය; **පියාපායො**: ප්‍රියයන්ගෙන් වෙන්වීම; **පාපකො**: ලාමකයි; **යෙසං**: යම් කෙනෙකුට; **පියප්පියං**: ප්‍රිය හෝ අප්‍රිය වූවක්; **නත්ථි**: නැත්ද; **තෙසං**: ඔවුනට; **ගන්ථා**: (කාය) ග්‍රන්ථයෝ (ගැට); **න විජ්ජන්ති**: විද්‍යාමාන නො වේ.

එහෙයින් ප්‍රියවිප්‍රයොගය හා අප්‍රියසම්ප්‍රයොගය දුක් හෙයින් කිසි කෙනෙකු වත් කිසි දැයක් ප්‍රිය නො කට යුතුයි. ප්‍රිය විප්‍රයොගය නම් ඉතා ලාමකයි. නො ඉවසිය හැකි වේ. මැදහත් ව විසීමෙන් ප්‍රියයන් හා සතුරන් ඇති කර නො ගන්නා යම් කෙනෙකුට ප්‍රියවිප්‍රයොග හා අප්‍රියසම්ප්‍රයොග යන දුක් ඇති නොවේ. ඔවුනට අභිධ්‍යා ව්‍යාපාද ආදී කායග්‍රන්ථ නැත.

විවරණය

ව්‍යාධිය හෙවත් ලෙඩ වීම තවත් දුකකි. රෝගී වීම සියල්ලන්ටම සිදු වෙතැයි කීම අපහසු වුවත් පොදු ලක්‍ෂණයක් යැයි කීමට තරම් බහුල තත්ත්වයකි. මේ සිරුර කෙතරම් සංකීර්ණ දැයි සිතා බලන්න. අසූ වසක් නොව මිනිත්තු පහක් තරම් කාලයක් වත් යම්කිසි කුඩා සෛලයකවත් මඳ වරදක් සිදු නොවී නිර්මල නිරවද්‍ය ක්‍රියාකාරිත්වයෙන් යුතුව එය පවතියි නම් එය ප්‍රාතිහාර්යයකි. එක කුඩා ග්‍රන්ථියක් හෝ සෛලයක් වැරදියට ක්‍රියා කළහොත්, පයක් වරදවා ගතහොත් මොන තරම් ඛේදවාචකයක් සිදු විය හැකි ද? මේ ගැන සිතන්නට බොහෝ අය අකමැති වෙති. එහෙත් එයට මුහුණ පාන විට දැඩි ලෙස දුක් විඳිති. රෝගී වීම කවර තරම් පොදු දෙයක් දැයි තේරුම් ගැනීමට රෝහල් දෙස බැලිය යුතු ය. දොස්තරවරුන් හා සාත්තු සේවිකාවන් සමග කතා කළ යුතු ය. නැත්නම් වෛද්‍ය විද්‍යාව පිළිබඳ පොතක් කියවා බැලිය යුතුයි. ඉගෙන ගන්නට ඇති රෝග සංඛ්‍යාව දහස් ගණනකි. බොහෝ රෝග වලට තවම විද්‍යාවෙන් ප්‍රතිකර්මයක් සොයා ගෙන නැත. අවිද්‍යාව නම් වූ ප්‍රබල මූලය හා බැඳී තෘෂ්ණාව හා ද්වේෂය සමග විවිධාකාරයෙන් සම්මිශ්‍රව ඇතිවන මානසික ව්‍යාධි සමූහය ද මෙහි ලා අන්තර්ගත බව සැලකුව මනා ය.

ස්වකීය ප්‍රථම ධර්ම දේශනාවේ දී දුක්ඛ සත්‍ය නම් වූ කේන්ද්‍රීය සංකල්පය ඉදිරිපත් කරමින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ හ. "දුක්ඛ ආර්ය සත්‍යය නම් කුමක් ද? ජාතිය දුකය. ජරාව දුකය, ව්‍යාධිය දුකය, මරණය දුකය, අප්‍රියයන් හා එක් වීම දුක ය, ප්‍රියයන්ගෙන් වෙන් වීම දුක ය, අපේක්ෂිත දේ නො ලැබීම දුක ය. කෙටියෙන් කිවහොත් සමස්ත පංච උපාදානස්කන්ධය ම දුක ය."

මෙම ගාථාවලින් ඉදිරිපත් කරන ලද්දේ මෙහි දැක්වෙන දුක් සමූහයෙන් එකක් වූ ප්‍රිය දේ ඇසුරෙන් මතු වන දුක ගැන පමණි. යම්කිසි කෙනකුට හෝ දෙයකට ප්‍රිය වීම දුක් ඇතිවීමට හේතු වෙයි. ප්‍රිය දෙයින් වෙන් වීම දුකක් වන හෙයිනි. එක් දෙයකට හෝ කීපයකට ප්‍රිය වීම තව දේ අප්‍රිය කිරීමට හේතු වෙයි.

යම් යම් දේවලට අප්‍රිය කිරීම ද දුකකි. ඒවා සමග දකින්නට, එක්වන්නට, එකට පවතින්නට හෝ ක්‍රියා කරන්නට අපට සිදුවන හෙයිනි. එවිට අප තුළ ඇති වන්නේ අප්‍රසාදයකි. වෛරයකි. පිළිකුලකි. එහෙයින් ප්‍රිය වීම මෙන් ම අප්‍රිය වීම ද දුකකි. බුදුරදුන් වදාලේ ප්‍රිය රූපී රූප (මෙය රූප පමණක් නොව ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ හා ධර්ම හෙවත් මානසික අරමුණු යන හැමදේටම ගලපා විවරණය කර ඇත.) කෙරේ රාගයෙන් බැඳීම හා අප්‍රිය රූපී රූප කෙරේ ව්‍යාපාදය ඇති කර ගැනීම පෘථග්ජන ස්වභාවය බව ය. එහෙයින් ආර්යයෝ ප්‍රිය කිරීම මෙන්ම අප්‍රිය කිරීම ද දුරලති. ප්‍රිය හා අප්‍රිය දෙකම වර්ජනය කර මධ්‍යස්ථතාව හෙවත් උපේක්‍ෂාව වර්ධනය කර ගනිති. එවිට ලෝකය විෂයෙහි ද්වි විධ පිළිවෙතක් අනුගමනය කිරීම (ද්වන්ද්ව වරණය) නවතියි. එය උසස් මානසික ස්වභාවයේ ලක්‍ෂණයයි. බුදු, පසේ බුදු, මහ රහත් උතුමෝ ලෝකය විෂයෙහි එසේ පවතිති. එහෙයින් උන්වහන්සේලාට ශෝක කිරීමක් හෝ ලොව හා ගැටුමක් නැත.

ඉන්ද්‍රිය භාවනාව නමින් උගන්වනු ලබන විශේෂ භාවනා ක්‍රමය මගින් මෙබඳු ප්‍රිය-අප්‍රිය තත්වයෙන් මිදීමේ ප්‍රාගුණ්‍යය ලබා ගත හැක. ඉන්ද්‍රියයනට ගෝචර වන අරමුණු හුදෙක් අරමුණු ලෙස පමණක් ගෙන නිමිති - අනු නිමිති නො ගැනීම මගින් මේ මානසිකත්වය ඇති කර ගැනීමට උත්සාහ කිරීම ඒ භාවනාවෙහි හරය යි.

ප්‍රියයන් නිසා සොව හා බිය උපදී. ප්‍රියයන්ගෙන් වෙන්වූ තැනැත්තාට සොවක් නැත බියෙක් ද නැත.

212. පියතො ජායති සොකො
පියතො ජායති භයං
පියතො විප්පමුත්තස්ස
නත්ථි සොකො කුතො භයං (16:4)

ප්‍රිය කිරීමෙන් වේය සෝකය
ප්‍රිය කිරීමෙන් වේය භීතිය
වැළකුණෝතින් ප්‍රිය කිරීමෙන්
නොවේ සෝකය, කවර ප්‍රීතිය?

කළොතින් ප්‍රිය - වේය ශෝකය

16 (2) එක් ධනවත් ගෘහපතියකු ගේ කතාව (212 ගාථාව)

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන කළ, පුත්‍රයාගේ මරණයෙන් දැඩි සේ ශෝකාකුලව විසූ **ධනවත් ගෘහපතියකු** අරබයා මේ ගාථාව වදාළ සේක.

තම පුත්‍රයා ගේ වියෝගය නිසා බලවත් කම්පනයට පත් මේ ගෘහපතියා දිනපතාම පුතු මිහිදන් කළ තැනට ගොස් හඬා වැලපෙයි. තම ශෝකය දුරු කරන්නට අසමත් වූ හේ දිනපතාම මෙසේ කරයි. ඔහු පෙළෙන මේ මානසික පීඩාව අළුයම කුළුණින් ලොව බලන භාග්‍යවතුන් වහන්සේට පෙනිණි. ඔහු කෙරේ අනුග්‍රහ දක්වන්නට සිතූ උන්වහන්සේ ඔහු හමුවන්නට තීරණය කළ හ.

එදා දහවල් පිඬු සිඟා වළඳා නිම කළ බුදුරජාණන් වහන්සේ එක් හිමිනමක් ද කැටුව මේ ගෘහපතියාණන් ගේ නිවසට වැඩම කළ සේක. බුදුරදුන් තම නිවෙස වෙත වැඩම කරනු දුටු හේ "මගේ දුක නිවන්නට මට ම කරුණාවෙන් භාග්‍යවතුන් වහන්සේ වැඩම කරනවා විය යුතුය"යි මහත් සතුටට පත්ව අසුන් පණවා ආදරයෙන් සත්කාර කළේ ය.

පැනවූ අසුනෙහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේට වැඳ නමස්කාර කර එකත් පස්ව සිටි ගෘහපතියා අමතා "ගෘහපතිය, ඔබ දොම්නසින් පසුවන බවක් පෙනෙනවා" යි වදාළ හ. "එහෙමයි ස්වාමීනි, මගේ පුත්‍රයා මිය ගිය ශෝකය දුරු කර ගත නො හැකිව මම දොම්නසින් සිටිමි" යි හේ පිළිවදන් දුන්නේ ය.

ගෘහපතියා ගේ ශෝකය තුනී කිරීම පිණිස භාග්‍යවතුන් වහන්සේ ඔහුට මෙසේ අනුශාසනා කළ හ. "ශෝක නොකරන්න, උපාසකය. මරණය ඔබ ගේ පුත්‍රයාට පමණක් විශේෂ වූවක් නො වේ. එය ලෝකයේ එක් තැනක එක් පුද්ගලයකුට පමණක් සිදු වන්නක් නොව සියළුම සත්ත්වයනට සාධාරණ තත්වයකි. මහා සම්මත වැනි රජ දරුවෝත්, මහා ඥාණවන්ත බ්‍රාහ්මණයෝත් හා පණ්ඩිතයෝත් මිය ගිය හ. නිවන් දක්නා තුරු ම සියළුම උපන් සත්ත්වයෝ මිය යති. ලොව හැම දේම අනිත්‍ය හෙයින් මරණයක් සිදු වූ කල එම ස්වභාවය ගැන සිතා ශෝකය දුරු කර ගන්නවා මිස දිගින් දිගටම ශෝක කිරීම ඥානවන්තකමක් නො වේ. ඔබ දැන් මෙසේ සියළු රාජකාරී පිරිහෙළා ගෙන නොකා නොබී වැලපුණත් පෙර විසූ නුවණැත්තෝ යථා තත්වය ආවර්ජනා කර ශෝක දුරු කරගෙන කටයුතු කළහ"යි අනුශාසනා කළ සේක.

"පෙර විසූ ඥානවන්තයන් ශෝක දුරු කරගත්තේ කෙසේද? ස්වාමීනි"යි ගෘහපතියා නැවත ප්‍රශ්න කළේය. "ගෘහපතිය, ඔවුහු මරණය උරගයෙක් හැව හැර යාමක් කොට සිතූහ. ශරීරය හැර දමා ගිය උරගයකු මෙන් කෙනකු කළුරිය කළ විට අප ඒ ගැන ශෝක කරන්නේ කුමට ද? මරණානුස්සති භාවනාව වැඩූ ඔවුහු ශෝක දුරු කර ගත්හ. ඔබත් එසේ ශෝකය දුරු කරගෙන සාමාන්‍ය කටයුතු කරන්න. ශෝකය උපදින්නේ ප්‍රියතාව නිසා ය. භය උපදින්නේත් ඒ නිසාය. එහෙයින් ස්නේහ දුරලන්නට හැකිනම් ශෝකය හා භය නැතිව ජීවත් විය හැකිය" යි අනුශාසනා කළ හ. මේ ගාථාව වදාළේ එම අවස්ථාවේ ය.

විවරණාත්මක අනුවාදය (212 ගාථාව)

පියතො සොකො ජායති පියතො භයං ජායති පියතො
විප්පමුත්තස්ස සොකො නත්ථි භයං කුතො?

පියතොः ප්‍රිය වූවන් නිසා; **සොකොः** ශෝකය; **ජායතිः** හට ගනී; **පියතොः** ප්‍රිය වූවන් නිසා; **භයං ජායතිः** භය උපදනේය; **පියතොः විප්පමුත්තස්සः** ප්‍රිය වූවන්ගෙන් මිදුණු සිත් ඇත්තාට; **සොකො නත්ථිः** ශෝකයක් නැත; **භයංः** බියක්; **කුතො**? කොයින්ද?

ප්‍රිය වූ සත්ත්ව සංස්කාරයන් නිසා ශෝකය ද භය ද ඇතිවෙයි. ප්‍රිය වූවන් කෙරෙන් මිදුණු සිත් ඇත්තාට ශෝකයක් නැත. බියක් කොයින් ද? නැත.

විවරණය

මේ ගාථාවෙහි දැක්වෙන පරිදි කෑම් බීම් හා දිනපතා සාමාන්‍ය කටයුතු පවා කර ගත නො හී ශෝකාතුරව විසූ ගෘහපතියා වෙත භාග්‍යවතුන් වහන්සේ එළඹුනේ උදෑසන එදා තමන් වහන්සේ විසින් උදව් කළ හැකි කෙනකු ලොව සිටිත් දැයි මහා කරුණාවෙන් ලොව බලන විට ඔහු දුටු හෙයිනි. දිනපතා එසේ ලොව බැලීම බුදුරජාණන් වහන්සේ ගේ සිරිත ය.

ලොව විසූ ආගම් කතුවරුන් අතුරින් ලෝක සත්වයා වෙත වඩාත් ම වෙහෙසී සේවය කළ ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේ යැයි කිවහොත් එය අතිශයෝක්තියක් නො වනු ඇත. උන්වහන්සේ තම දින චර්‍යාව විධිමත්ව ක්‍රමානුකූලව පරාර්ථ චර්‍යාවටම ගැලපෙන පරිදි හැඩ ගසාගෙන තිබිණි. තමන් ලබා ගත් බුද්ධත්වය තුළින් ලෝ සතුනට සෙත සලසනු වස් එම දින චර්‍යාව සකසා ගෙන තිබිණි.

භාග්‍යවතුන් වහන්සේ ගේ දවස කොටස් පහකට වෙන් කර තිබිණි.

1. පෙරබත් කිස, **2.** පසු බත් කිස **3.** පෙරයම් කිස **4.** මැදියම් කිස හා **5.** අළුයම් කිස වශයෙනි.

උදෑසනින්ම පිබිදෙන උන්වහන්සේ පෙරබත් කිස අරඹන්නේ අනුග්‍රහ කළ හැකියවුන් සොයා ගනු පිණිස දිවැසින් ලොව බැලීමෙනි. යමකුට අනුග්‍රහ කළ හැකි නම් එතනට ඇරයුමක් නැතිවම වැඩම කිරීම උන්වහන්සේ ගේ සිරිත ය. පාගමනින් හෝ ඍද්ධි මගින් හෝ ගැලපෙන පරිදි වැඩම කරති. නපුරන් දුදනන් වෙත උන්වහන්සේ වැඩම කළ අතර ගුණවත් යහපත් අය උන්වහන්සේ සොයා ආහ. මෙසේ ලෝ සෙත් වඩනා අතර ඇරයුමක් තිබුණහොත් සැදැහැතියකු ගේ නිවසට දිවා කල දන් පිණිස වැඩම කරති. නැතහොත් තනිව හෝ සඟගණ කැටුව පිඬු සිඟා වඩිති. අසූවන වියේ දී පවා උන්වහන්සේ මෙසේ පාත්‍රය ද රැගෙන ගෙපිළිවෙළින් ගොස් පිඬු පිණිස නිහඬව ගෙදොර අබියස වැඩ හුන් හ.

දිවාකල දන් වැළඳීමෙන් පසු හවස වරුවේ උන් වහන්සේ ශ්‍රාවකයන්ට ධර්මානුශාසනය කරති. ඇතැම් විටෙක යම් යම් ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ගේ ආරාම වලට වැඩම කර ප්‍රිය සංවාද පවත්වා ධර්ම දේශනා ද පවත්වති. භාග්‍යවතුන් වහන්සේ ගේ දිවා දවස ගත වූයේ එපරිද්දෙනි.

ප්‍රේමය නිසා සොව හා බිය උපදී. ප්‍රේමයෙන් මිදුණු තැනැත්තාට සොවක් නැත. බියෙක් ද නැත.

213. පෙමතො ජායති සොකො
පෙමතො ජායති භයං
පෙමතො විප්පමුත්තස්ස
නත්ථි සොකො කුතො භයං (16:5)

ප්‍රේමයෙන් ඇති වේ ය සෝකය
ප්‍රේමයෙන් ඇති වේ ය භීතිය
යමකු විසුවොත් නොකර ප්‍රේමය
නොවේ සෝකය කවර භීතිය?

කළෝතින් කෙනෙකුන්ට ප්‍රේමය - ලැබෙයි ශෝකය සමග භීතිය

16 (3) විශාඛාවන් ශෝකාතුර වූ පුවත (213 ගාථාව)

පූර්වාරාම විහාරය කරවා පූජා කළ මහෝපාසිකාව වූ **විශාඛාව** ශෝකාකූල වූ එක් අවස්ථාවක භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරමින් මේ ගාථාව දේශනා කළ හ.

විශාඛාවන් ගේ පුත්‍රයා ගේ දියණිය දන්තා නම් වූවා ය. ඉතා සුන්දර ගුණ ඇති විනීත ළඳක් වූ ඕ විශාඛාවන් විසින් දිනපතා නිවසේ පැවැත්වෙන සාංඝික දානමය පුණ්‍ය කර්‍මයන් අධීක්‍ෂණය පිණිස පත් කරන ලද්දී ය. විශාඛාව මෙන්ම ශ්‍රද්ධා සම්පන්න වූ දන්තා බොහෝ සැලකිල්ලෙන් ඒ කටයුතු නො පිරිහෙළා ඉටු කළා ය. එහෙයින් විශාඛාවෝ ඇයට දැඩි සේ ඇළුම් කළ හ. අවාසනාවට මෙන් හිටි හැටියේ දන්තා මිය ගියා ය. මිනිබිරිය ගේ ආදාහන කටයුතු නිම කළ විශාඛා තමන් ඇයට බෙහෙවින් ආදරය කළ හෙයින් ඉවසා ගත නො ගෙන ශෝකයෙන් පීඩා වින්දාය. ඇය කඳුළු වැකි මුහුණින් යුතුව බුදුන් වහන්සේ දක්නට පැමිණි විට විශාඛාවන් ගේ ශෝකාකූල භාවය දුටු භාග්‍යවතුන් වහන්සේ එසේ ශෝකාතුර වන්නට හේතුව විමසූ හ. "ස්වාමීනි, මා ඉතා ආදරය කළ මට ඉතා අවනතව සිටි මිනිබිරිය දන්තා මිය ගියා ය. ඇය ගේ මරණය මට දරා ගත නො හැකිය" යි ඕ තොමෝ හෙළි කළා ය. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "විශාඛාවෙනි, මේ සැවැත්නුවර ජනගහණය කොපමණදැ" යි විචාළ හ. "ස්වාමීනි, ඔබ වහන්සේම එය හත් කෝටියක් යයි පවසනු මතකයි" "දිනකට කීදෙනෙක් මිය යනවා ද?" "ස්වාමීනි, ගණන් හරියටම නො දනිතත් ජනගහණය විශාල නිසා සෑහෙන විශාල ගණනක් මැරෙනවා ඇති." "මේ හැම දෙනා ම ඔබට දන්තා වගේ මිණිබිරියන් වුණොත්?" "මම හරි කැමතියි ස්වාමීනි," "එහෙම වුණොත්, මේ නගරයේ මරණවලට අඬනවා මිස වෙන වැඩක් ඔබට හිටින්නේ නැත." බුදුරදුන් වදාළ දේ ගැන විශාඛා මොහොතක් සිතුවා ය. දැනට නගරයේ මිය යන දහසක් දෙනා ගැන ඇය ගේ සිතෙහි ශෝකයක් නූපදියි. එහෙත් මිනිබිරියන් බවට ඔවුන් පත් වුවහොත් පමණක් දිගට ම ශෝක කරන්නට වෙයි. ඒ ඇයි ද? මිණිබිරියන්ට තමන් ප්‍රේම කරන හෙයිනි. ස්නේහය ඇති හෙයිනි. එසේ නම් ශෝකය ඇති වන්නේ ප්‍රේම කිරීම නිසා නො වේ ද? ප්‍රේම නො කරන්නේ නම් ශෝකයක් ඇති නො වේ. මේ සත්‍යය ඇය ගේ තියුණු නුවණට හසු කරගන්නට ගත වූයේ සුළු මොහොතකි. "ස්වාමීනි, මට වැටහෙනවා. මම තේරුම් ගත්තා" විශාඛාවෝ කඳුළු පිසිමින් කියා සිටිය හ. භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළේ ඒ මොහොතේ ය.

විවරණාත්මක අනුවාදය (213 ගාථාව)

පෙමතො සොකො ජායතී. පෙමතො භයං ජායතී.
පෙමතො විප්පමුත්තස්ස සොකො නත්ථි. භයං කුතො

පෙමතො: ප්‍රේමය හේතුවෙන්; **සොකො**: ශෝකය; **ජායති**: හටගනියි; **පෙමතො**: ප්‍රේමය හේතුවෙන්; **භයං**: බිය; **ජායති**: හටගනියි; **පෙමතො**: ප්‍රේමයෙන්; **විප්පමුත්තස්ස**: තොර වූ අයට; **සොකො නත්ථි**: සෝකයක් නැත; **භයං කුතො**: බියක් කොයින් ද?.

ප්‍රේමයෙන් ශෝකය හටගනී. ප්‍රේමයෙන් බිය ද හටගනී. ප්‍රේමය දුරු කළ අයට ශෝකයක් හෝ බයක් හට නො ගනියි.

විවරණය

විශාඛා බුදුසස්නෙහි අග්‍රගණ්‍ය දායිකාවක් වූවා ය. ඇය ගේ ජීවිතය බෞද්ධ සාරධර්මයන් ගේ සජීව ප්‍රකාශනයක් බඳුය. ගුණධර්මයන් ගේ මූර්තියක් වන් ඇය ගේ ජීවිතය බුදුසස්නේ ඉතිහාසය සමග සමීපයෙන් බැඳී පවතියි. ඇය කෙතරම් කාරුණික කාන්තාවක් දැයි පැහැදිලි කරන එක් නිදසුනක් වශයෙන් මහ රැයක වෙළඹකට දැක්වූ දයාව දැක්විය හැක. මැදියම් රැයක ඇය ගේ එක් වෙළඹක් ප්‍රසව වේදනාවෙන් පසුවන බව ඇසූ ඕ සිය සේවිකාවන් කීප දෙනකු ද කැටිව හුළු එලි රැගෙන ඉස්තාලයට ගොස් ඉතා සැලකිල්ලෙන් හා පරිස්සමෙන් අවශ්‍ය සාත්තු කළා ය. පසු කලෙක ඇය ගේ මාමණ්ඩිය ඇයට නැඟූ චෝදනාවන් අතර එය ද එකක් විය. "මැය එදා රෑ නිවෙසින් බැහැරව යම් රහස් වැඩක් කළා" යි ඔහු චෝදනා කළ විට ඕ තමන් කළ මෙහෙවර විස්තර කළා ය. විහාරස්ථානයට යන විට ළපටි සාමණේර හිමිවරුන්ට රස කැවිලි, චතු මධුර වැනි යමක් ගෙන යන්නට හුරුව සිටි ඕ මවු සෙනෙහස ලබන බාල වියේ වූ ඔවුන්ට මවක් මෙන් වූවා ය.

විවාහ යෝජනාවක ප්‍රතිඵලයක් සේ ධනවත් වුවත් මිථ්‍යාදෘෂ්ටික සිටු කුලයකට විවාහ කර දෙනු ලැබූ ඇයට එම මිසදිටු පවුල බුදු සමයට හරවා ගන්නට හැකි වූ අයුරු ද චමත්කාර ජනක කතා පුවතකි. විශාඛාව ගේ මාමණ්ඩිය නිගණ්ඨනාථ පුත්ත මහාවීර තුමා ගේ උපාසකයකු වූ හෙයින් එහි දන් දෙන ලද්දේ ජෛන භික්‍ෂූන්ට ය. ඔවුන් වැඩම කළේ නිරුවතින් හෙයින් එම අවස්ථාවන්ට සහභාගි වීම විශාඛා ප්‍රතික්ෂේප කළා ය. බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවිකාවක පුත්‍රයාට විවාහ කරදීම ගැන නිඝණ්ඨයන් ගෙන් අවලාද ලත් මිගාර සිටුතුමා (විශාඛාවගේ මාමණ්ඩිය) ඇය කෙරේ අමනාපයෙන් සිටියේ ය. මේ අතර දිනක් බෞද්ධ භික්‍ෂුනමක් ඒ නිවසට පිඬු සිඟා වැඩිය හ. අබෞද්ධ නිවහනක විසූ හෙයින් සිය කැමැත්තෙන් ආහාරයක් පුදන්නට විශාඛාවෝ සමත් නුවූ හ. ඒ වන විට මිගාර සිටුවරයා සිටියේ ද හිමිනමට පෙනෙන තැනක වාඩි වී කිරිකැඳක් රස විඳිමිනි. සිටුතුමාට පවන් සලමින් සිටි විශාඛා ඔහු හිමිනමට යමක් නො දෙන බව වැටහුණු පසු "හිමියනි, වෙන තැනකට වැඩම කරනු මැනවි. අපේ මාමණ්ඩි පුරාණයක් වළඳන වෙලාව"යි විනීතව පැවසුවා ය. පුරාණය යන වචනය සාමාන්‍යයෙන් අසුචි සඳහා ද යෙදෙයි. එහෙයින් තමා අසුචි අනුභව කරනවා යැයි කීවා යයි සිතූ මිගාර ඇයට වහාම තම නිවසින් පිට වන්නැයි නියෝග කළේ ය. "මා මේ කුලයට විවාහ කර දෙන දවසේ මේ වගේ යම් ගැටළුවක් ආවිට එය ඉදිරිපත් කර විසඳා ගන්නට සිටුවරුන් අට දෙනෙකු පත් කළා. ඒ අය ලවා මෙය විසඳවා ගෙන මිසක් යා යුතු නෑ. මා මෙහාට ගෙනාවේ දාසියක් ගේනවා වගේ නෙමෙයි නේ!" යි පැවසූ විසාකා බැහැර නො ගියා ය. එය පිළිගත් මිගාර ඒ විනිශ්චය මණ්ඩලය කැඳවා පැමිණිලි කළෙන් ඇය ගේ පිළිතුරු විමසන ලදි. "මා කියා සිටියේ මාමණ්ඩිය තමන් කළ පෙර පිනෙන් ලද දෙයක් භුක්ති විඳින බවයි. දැනට ඔහු මිසදිටුව වසන නිසා අළුත් පිනක් නැහැ. පරණ කළ පින් වළඳන නිසා පුරාණයක් වළඳනවායි කීවා" යි ඕ පිළිතුරු දුන්නා ය. අනතුරුව විශාඛාවගේ පියා මඟුල් දින දුන් ගුප්ත උපදේශාවලිය ගැන ද, මහ රෑ විශාඛා නිවෙසින් බැහැර ගිය ගමන ගැන ද චෝදනා එල්ල කළ ද ඒවාට නිසි පිළිතුරු දෙන ලදින් ඕ නිදොස් වූවා ය. පසුව තමන්ට බුදු පාමොක් මහ සඟනට දන් දීම සඳහා අවසරය පවා ලබාගත් ඕ ඒ සිටු කුලය මිසදිටුවෙන් මුදගන්නට සමත් වූවා ය.

ඇල්ම නිසා සොව හා බිය උපදී. ඇල්මෙන් මිදුණු තැනැත්තාට සොවක් නැත. බියෙක් ද නැත.

214. රතියා ජායති සොකො රතියා ජායති භයං රතියා විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං (16:6)	රතියෙන් ඇතිවෙයි සෝකය රතියෙන් ඇතිවෙයි භීතිය විසුවෝතින් නැතිව රතිය නැත සෝකය කෝ භීතිය?

රුති නොවන් රතියට

16 (4) ලිච්ඡවි කුමාරයන් ගේ වස්තුව (214 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩ වසන සමයෙහි **ලිච්ඡවි කුමාරවරුන්** අතර ඇති වූ කලබැගෑනියක් මුල් කරගෙන මේ ගාථාව දේශනා කළ හ.

එක් සැණකෙළි දිනයක ලිච්ඡවි කුමාරවරු පිරිසක් රන්වන් ඇඳුම් ඇඳ රන්පැහැ පලඳනාවන් ගෙන් සැරසී මහත් සොම්නසින් උයනට පිවිසෙනු පිණිස ගමන් ගත් හ. භාග්‍යවතුන් වහන්සේ ද භික්ෂු සංඝයා පිරිවරා මහ මඟ වැඩම කරන සේක් මේ කුමාරවරුන් දුටු හ. ඔවුන් ගේ රන්වන් සිරුරු බබලන ඇඳුම් පැළඳුමෙන් තවත් ප්‍රියංකරව දිස්වනු නරඹන්නැයි භික්ෂු සංඝයාට පෙන්වූ බුදුහු ''මහණෙනි, ඔබ ගෙන් සමහරු තව්තිසා දෙව් ලොව දෙවියන් දැක නැතුව ඇති. එසේ නම් මේ ලිච්ඡවීන් බලා ගන්න. ඒ අයත් හරියට මේ වාගේ'' යැයි වදාළ හ. භික්ෂූහුද ඒ සිතට ගත් හ.

කුමාරවරු විනෝදාස්වාදය පිණිස උයනට යන අතර එක් රූමත් කාන්තාවක් ද කැඳවා ගත් හ. ලෝකධර්මානුකූල පොදු දුබලතාවක් වූ ඊර්ෂ්‍යාව හේතුවෙන් ඒ කාන්තාව නිසා කුමාරවරුන් අතර කලහයක් ඇති විය. එය දුරදිග ගියෙන් ඔවුනොවුන් කපා කොටා ගෙන ලේ වගුරා ගත් හ.

බුදු පාමොක් මහ සඟන නගරයේ පිඬු සිඟා වළඳා ආපසු එන අතරමඟ නැවත වරක් කුමාර වරුන් හමුවිණි. ඔවුහු අනුන් ගේ කරපිටින් ලේ වැගිරුණු තුවාල ඇතිව ඔසවාගෙන යනු ලැබූ හ. "ස්වාමීනි, උදේ තාවතිංසයේ දිව්‍ය පුත්‍රයන් මෙන් ගිය ලිච්ඡවි කුමාරවරු දැන් තුවාල වී ලේ වගුරා ගෙන අනුන් ගේ කර පිටින් යති" යි පැවසූ හ. ඔවුන් ඒ තත්වයට වැටුණේ කාන්තාවක් සමග විනෝදවන්නට ගොස් ඇති වූ කලහයෙන් බව ද දැනගන්නට ලැබිණි. "මහණෙනි, කාමාස්වාද රතියෙහි ස්වභාවය ඔය වැනි මය. රතිය නිසා ශෝකය හා භය ඇති වෙයි"යයි පැහැදිලි කළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (214 ගාථාව)

රතියා සොකො ජායති. රතියා භයං ජායති රතියා
විප්පමුත්තස්ස සොකො නත්ථි භයං කුතො

රතියා: රතිය (කාමය) හේතුවෙන්; **සොකො**: ශෝකය; ජායති: **හටගනියි**; **රතියා**: රතියෙන්; **භයං**: භය; **ජායති**: හට ගනියි; **රතියා විප්පමුත්තස්ස**: රතියෙන් මිදුණාහුට; **සොකො**: සෝකයක්; **නත්ථි**: නැත; **භයං**: භයක්; **කුතො**: කොයින් ද?

රතිය හේතුවෙන් ශෝකය හටගනියි. භය ද හට ගනියි. කාම රතියෙන් මිදුණු තැනැත්තාට ශෝකයක් නැත. භයක් කෙසේ ඇතිවන්නේ ද?

විවරණය

ලිච්ඡවි රජදරුවෝ: බුද්ධ කාලීනව දඹදිව විසූ අතිශය රූප සම්පන්න පිරිසකි. විශාලාව ඔවුන් ගේ අගනුවර විය. විශාල හා සෞභාග්‍ය සම්පන්න රාජ්‍යයක් වූ එය පාලනය වූයේ ගණතන්ත්‍ර රාජ්‍ය පාලන ධර්මය අනුවය. භාග්‍යවතුන් වහන්සේ විසින් උගන්වන ලද සප්ත අපරිහානි ධර්ම අනුගමන හේතුවෙන් ඔවුහු ආදර්ශමත් රාජ්‍යයක්ව සිටිය හ.

විශාලාවේ එක් අඹ උයනක් තිබිණි. එහි හිමිකාරිය අම්බපාලී නම් රූමත් නගර ශෝභිනියක් වූවා ය. වරක් භාග්‍යවතුන් වහන්සේ විශාලාවට වැඩම කර ඇය ගේ අඹ වනයෙහි වැඩ විසූ සමයෙහි ලිච්ඡවිහු තම තමාගේ ජවි වර්ණවලට ගැලපෙන අනර්ඝ ඇඳුම් පැළඳුම් වලින් සැරසී අශ්ව රථ වල නැගී අඹ වනයට යනු පිණිස නික්මුණා හ.

ඔවුනට මඟදී තමා ඉදිරියට එන අම්බපාලී හමු විය. ලිච්ඡවි කුමාරවරුන් ගේ රථ වලට ඉඩ දී අයින්ව සිටිනු වෙනුවට ඕ කෙළින් ම ඔවුන් ගේ රථ හමුවට අවුත් රෝදයට රෝදය, කඩ ඇණයට කඩ ඇණය සිටින පරිදි ගමන් කළා ය. "අම්බපාලි, ඇයි ඔබ අපේ රථයේ රෝදයට රෝදය, කඩ ඇණයට කඩ ඇණය හිටින පරිදි මෙසේ ධාවනය කරන්නේ?" යි ඔවුහු විමසූ හ. "ඒ මම හෙට දවල් දානයට බුදුරජාණන් වහන්සේටත් සංඝරත්නයටත් ආරාධනය කළ නිසයි." යනු ඇයගේ පිළිතුරු විය. "අපි කැමතියි ඒ දානය දෙන්න. අම්බපාලී, අපි ඔබට කහවුණු ලක්‍ෂයක් දෙනවා ඒ අවස්ථාව අපට දෙන්න" ඔවුහු ඉල්ලා සිටිය හ. "කුමාරවරුනි, සියළු විජිතත් සමඟ මුළු විශාලා රාජධානියම මට දුන්නත් ඒ අවස්ථාව නම් දෙන්නේ නෑ." ඒ ඇසූ ලිච්ඡවිහු "මේ අම්බපාලිට අපි පැරදුණා! අම්බපාලිට අපි පැරදුණා!"යි අසුරු ගැසූ හ.

කෙසේ වුවද ඔවුහු බුදුන් දකිනු වස් අඹ උයනට ගිය හ. ඔවුන් දුරතියාම දුටු භාග්‍යවතුන් වහන්සේ ද දෙවියන් දැක නැති හිමිවරුන් අමතා "තව්තිසා දෙව් ලොව දෙවියන් දැක නැත්නම්, ඔය එන කුමාරවරුන් බලාගන්න"යි වදාළහ. භාග්‍යවතුන් වහන්සේ වැඳ පුදාගත් කුමාරවරු පසුදින දානයට ඇරයුම් කළ හ. තමන් අම්බපාලි ගේ ඇරයුම භාරගත් බව වදාළ භාග්‍යවතුන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළ හ. කුමාරවරු නැවත ද අසුරු ගසා "අපි පැරදුණෙමු, අම්බපාලිය අප පරදවා ඇත" යි පැවසූ හ.

කාමය නිසා සොව හා බිය උපදී. කාමයෙන් මිදුණු තැනැත්තාට සොවක් නැත. බියෙක් නැත.

215. කාමතො ජායති සොකො
කාමතො ජායති භයං
කාමතො විප්පමුත්තස්ස
නත්ථි සොකො කුතො භයං (16:7)

කාමයෙන් ඇති වේය සෝකය
කාමයෙන් ඇති වේය භීතිය
කළොත් වාසය නැතිව කාමය
නොවේ සෝකය කවර භීතිය

ඇති තැන කාමය - වෙයි බිය සෝකය

16 (5) අනිත්ථිගන්ධ කුමාරයා ගේ කථාව (215 ගාථාව)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ විසූ බුදුරජාණන් වහන්සේ **අනිත්ථිගන්ධ කුමාරයා** මුල් කරගෙන මේ ගාථාව දේශනා කර වදාළ සේක.

අනිත්ථිගන්ධ කුමාරයා සැවැත් නුවර ධනවත් පවුලක දරුවකු වශයෙන් මනු ලොව උපන්නේ දිගු කලක් බඹ ලොව විසීමෙන් අනතුරුව ය. උපන්දා පටන් ම ඔහුට කාන්තාවෝ අප්‍රිය වූ හ. කිසිම කාන්තාවක් තමා අසලටවත් එනු දකින්නට රිසි නොවූ හේ කිසි කතක් වෙත ද නො ගියා ය. ඔහු තරුණ වයසට පත් වූ පසු දෙමාපියෝ ඔහු අමතා "පුත, ඔබට විවාහයක් කර දෙන්නෙමු"යි පැවසූ හ. "මට ස්ත්‍රියකගෙන් පලක් නැත. මම ඔවුනට රුචි නොවෙමි" යි පැවසූ හේ එය ප්‍රතික්ෂේප කළේ ය.

නැවත ද කලකට පසු දෙමාපියෝ ඔහුට එම යෝජනාව ම කළ හ. හේ ද නැවත නැවත ප්‍රතික්ෂේප කළේ ය. අන්තිමේ දෙමාපියන් ගේ පෙරැත්ත ඉවසනු නො හැකි වූ හෙතෙම රන්කරුවකු ගෙන්වා ප්‍රියංකර ස්ත්‍රී රූපයක් තනවා රන් ආලේප කර "මෙවන් ලඳක් ලදොත් ඇය ආවාහ කර ගන්නට කැමැත්තෙමි" යි පැවසී ය. ඉතා සතුටට පත් දෙමාපියෝ "අපේ පුතා පව්කාරයෙක් නො වේ. මහ පින්වතෙකි. මෙබඳු රූමතියක් නැති විය නො හැක" යි බමුණන් කිහිප දෙනෙකු ගෙන්වා මෙවන් යෞවනියක් සොයා ගෙනවුත් අපගේ පුත්‍රයාට පාවා දෙන්නැයි ඉල්ලා සිටිය හ. ඔවුහු ද එයත් රැගෙන දේශයෙන් දේශයට යන්නෝ මදුරට දේශයෙහි සාගල නුවරට ගිය හ.

බ්‍රාහ්මණයෝ නාන තොටට යන පාරෙහි රන් රුව තබා පසෙකට වී බලා සිටිය හ. එවිට එහි ආ එක් සේවිකාවක් "මෙතන මේ මොනවා කරනවා ද?" යි රන් රුවෙන් විමසුවා ය. ඒ දුටු බමුණෝ "ඔබේ දුව මේ වගේ ද?" යි විමසූ හ. "මගේ ස්වාමි දූ මීට වඩා බොහොම ලස්සණයි. මම එක පාරටම රැවටුණා විතරයි" යි ඕ පිළිතුරු දුන්නා ය. "එහෙනම් අපි ඔබේ ඒ ස්වාමි දූ බලන්න කැමතියි" යි පැවසූ බමුණෝ ඇය සමග නිවසට ගොස් ඇය දෙස බැලූ හ."රන් රුව මොන ලස්සනක් ද? මේ දියණිය අතිශයින් ම රූමත් නො වේ ද?" යි ප්‍රසන්න වූ බ්‍රාහ්මණයෝ වහාම ඒ බව අනිත්ථිගන්ධ කුමාරයාගේ දෙමාපියන්ට දැනුම් දුන් හ. අමන්දානන්දයට පත් ඔවුහු "ඇය වහා ම කැඳවා ගෙන එන්න" යි පැවසූ හ. එසේ කියා තෑගි බෝග රාශියක් හා සැරසූ රථයක් ද සමග බ්‍රාහ්මණයන් එහි යැවූ හ. මේ පුවත ඇසූ අනිත්ථිගන්ධ කුමාරයා ද බලවත් ප්‍රීතියට පත් විය. රන් රුවට ද වඩා ශෝභමාන රූපශ්‍රීයක් ඇති යුවතියක් ලොව ඇතැයි හේ කිසිසේත් අපේක්ෂා නො කළේ ය. "හැකි ඉක්මනින් ඇය කැඳවාගෙන එන්නේ නම් යහපති" යි හේ පැවසී ය.

එහෙත් සිදු වූයේ අනපේක්ෂිත විපතකි. සියුමැලි රූමතිය රථයෙන් ගමන් කරත් දී එය එහා මෙහා පැද්දීම හේතුවෙන් ඇති වූ පීඩාව නිසා රථයේ ම මිය ගියා ය. කුමරිය මඟදීම මිය ගිය බව ඇසූ අනිත්ථිගන්ධ කුමාරයා "මේ තරම් රම්‍ය වූ රූමතිය ඇසින් දැක ගන්නටත් ලැබුණේ නැත" යි බලවත් ශෝකයෙන් ආතුරව තම ඕවරකයට ම වී හොත්තේ ය.

කුමාරයාට සෝවාන් වීමට පින් ඇති බව දත් භාග්‍යවතුන් වහන්සේ පිඬු සිඟා වඩිනා අතර එම නිවසට ද ගොස් අනිත්ථිගන්ධ කුමාරයා කොහිදැයි විමසූ හ. ඔහු ශෝකාතුරව හිඳින බව ඇසූ උන්වහන්සේ ඔහු කැඳවන්නැයි උපදෙස් දුන් හ. කුමරුන්ගෙන් තොරතුරු විමසූ විට "ස්වාමීනි, මේ තරම් රූප සම්පන්න ඒ ලඳ බොළඳ කුමරිය වාහනයේ ම මිය යාම මට ඉවසා ගත නො හැක. දුක සේ සොයගත්ත ද මට ඇය ඇසින් දැක ගන්නටවත් නො ලැබිණි. දැන් මා මොන තරම් සංවේග යෙන් කම්පාව ඉන්නවාද කිවහොත් ආහාර රුචිය පවා නැත හිමියනි" යි හේ පිළිවදන් දුන්නේ ය. "කුමරුනි, ඔබ මේ තරම් ශෝකයට පත් වීමේ හේතුව දන්නවා ද?" යි බුදුහු විමසූ හ. "නැත ස්වාමීනි, නොදනිමි" "කුමාරය, කාමය නිසා ය. ඔබ දැඩි ලෙස කාමයෙන් බැඳී සිටි නිසා ඔබට ශෝකය ඇති විය. සත්ත්වයාට කාමය නිසා ශෝකය හා භය ඇති වෙයි" යි වදාළ තථාගතයන් වහන්සේ මේ ගාථාව ද දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (215 ගාථාව)

කාමතො සොකො ජායති. කාමතො භයං ජායති.
කාමතො විප්පමුත්තස්ස සොකො නත්ථි. භයං කුතො

කාමතො: කාමය හේතුවෙන්; **සොකො**: සෝකය; **ජායති**: හට ගනියි; **කාමතො**: කාමය හේතුවෙන්; **භයං**: භය; **ජායති**: ඇති වෙයි; **කාමතො**: කාමයෙන්; **විප්පමුත්තස්ස**: මිදුණාහුට; **සොකො නත්ථි**: සෝකයක් නැත; **භයං කුතො**: භය කොයින් ද ?

කාමය හේතුවෙන් සෝකය ඇතිවෙයි. භය ද ඇති වෙයි. කාමයෙන් මිදුණු සිත් ඇති තැනැත්තාට ශෝකයක් නැත. භයක් කොහින් ද?

විවරණය

මේ කතාව කුස රජු ගේ කතාවට යම් යම් සමාන කම් දක්නා ලැබේ. කුස රජු මෙන් විරූපී තැනැත්තකු නොවන අනිත්ථිගන්ධ කුස රජු මෙන්ම රන් රුවක් තනා ඒ සම රුව ඇති කතක් තමාට ආවාහ කර දෙන්නැයි කියයි. කුස රජුට ලඳ ලැබුණාද මෙතෙම ඇය නො ලබා ම දුක් වෙයි.

මුලදී කාන්තාවන් අප්‍රිය කළ ද රූප ශෝභාව හේතුවෙන් ඔහු ගේ සිත කාමයෙන් මුසපත් වූ අයුරු මනුෂ්‍ය සන්තානයේ තවත් සංකීර්ණ පැතිකඩක් විවර කිරීමක් වැන්න.

ආසාව නිසා සොව උපදී. බිය උපදී. ආසාවෙන් මිදුණු තැනැත්තාට සොවක් නැත. බියෙක් නැත.

216. තණ්හාය ජායති සොකො
තණ්හාය ජායති භයං
තණ්හාය විප්පමුත්තස්ස
නත්ථි සොකෝ කුතෝ භයං (16:8)

තණ්හාවෙන් සෝකය ඇති වන්නේ
තණ්හාවෙන් භීතිය ඇති වන්නේ
තණ්හාවෙන් මැනවින් මිදුමෙන්නේ
සෝකය සහ භීතිය නැති වන්නේ

දුක හා භීතිය - තණ්හා ජනිතය

16 (6) බමුණකු ගේ වතක් (216 ගාථාව)

ඒක්තරා **කෘෂිකාර්මික බ්‍රාහ්මණයකුට** භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළේ සැවැත් නුවර ජේතවනාරාම විහාරයෙහි වැඩ සිටි අවදියේ ය.

බෞද්ධාගමිකයකු නො වූ මේ බ්‍රාහ්මණයා දිනක් ගං ඉවුරෙහි පිහිටි තම කුඹුර සකස් කිරීම පිණිස ගියේ ය. ඔහුට සම්‍යක් දෘෂ්ටියකු වීමට කාලය පැමිණ ඇති බව සිතූ භාග්‍යවතුන් වහන්සේ ඔහු වැඩ කරන ස්ථානයට වැඩම කළ සේක. බමුණා බුදුරදුන් දුටු නමුත් වැඳුම් පිදුම් කිරීමක් නැතිව නිහඬව සිටියේ ය. බුදුහු මුලින් ම ඔහු ඇමතූ හ. "බ්‍රාහ්මණය, ඔබ මොනවද කරන්නේ ?" "මම මේ මගේ කුඹුර එළි කරනවා. පසුගිය කාලේ මේක වල් බිහි වෙලා." ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ තම කටයුතු සඳහා පිටත්ව ගිය හ.

පසුදා බමුණා සී සාන්නට ගියේ ය. එදින ද එතැනට වැඩම කළ බුදුහු "බමුණ අද මොකද කරන්නේ?" යි විමසූ හ. "ස්වාමීනි, අද කුඹුර සීසානවා" පැල සිටුවනදා ද බුදුරජාණන් වහන්සේ එහි වැඩම කළ හ. "අද මම පැල සිටුවනවා" බමුණා උන් වහන්සේට පැවසී ය. වල් පැල නෙලන දා බුදුන් එහි පැමිණි විට "ස්වාමීනි, මම වල් නෙලනවා" යි හේ පිළිතුරු දුන්නේ ය. බමුණා කුඹුර රකින අතරතුර ද විටින් විට භාග්‍යවතුන් වහන්සේ එහි ගොස් බමුණා කරන කටයුතු විමසී ය.

බුදුරදුන් එහි එසේ පැමිණි එක් දිනක බමුණා උන් වහන්සේට මෙසේ පැවසී ය. "ස්වාමීනි, මා කුඹුරු එළි කරන්නට පටන් ගත්දා සිටම ඔබ වහන්සේ නිතර මෙහි අවුත් මගේ වැඩ ගැන කතා කළා. ඒ නිසා මගේ කුඹුර හොඳට පැහුණොත් මම අස්වැන්න දෙකට බෙදනවා. මම ඔබ වහන්සේට නොදී තනියම භුක්ති විඳින්නේ නැහැ. අද ඉඳලා ඔබ වහන්සේත් මගේ කුඹුරේ කොටස් කාරයෙක්.

කාලයා ගේ ඇවෑමෙන් කුඹුර සරු සාරට වැඩුණේය. "මගේ වගාව හොඳට හරි ගිහිං හෙට කැපුම්කාරයන් ගෙන්නලා ගොයම් කප්පවනවා" බමුණා සිතා ගත්තේ ය. හෙතෙම ඒ සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කළේ ය. එහෙත් අනපේක්ෂිත පරිදි එදින රෑ මහ වැසි වැස්සේ ය. වැහි කුණාටුවට කුඹුරේ වගාව වැනසී ගියේ ය. ගොයම් ගස් සියල්ල ඉගිලී වතුරේ පාවී ගියේ ය. බමුණා මහත් සංවේගයෙන් පීඩිතව නිවසට වී ඇඳෙහි වැතිර සුසුම් ලන්නට විය.

සිදු වූ විපත දත් භාග්‍යවතුන් වහන්සේ ඔහු ගේ නිවසට වැඩම කළ හ. ඒ බව ඔහුට දැනුම් දුන් විට "ඒ මගේ මිත්‍රයා ය. අසුන් පනවා සත්කාර කරන්නැ"යි උපදෙස් දී ගෙතුළ ම සිටියේ ය. අසුන් ගත් භාග්‍යවතුන් වහන්සේ "බ්‍රාහ්මණයා කොහි ද?" යි විචාළ හ. ඔහු දුකසේ වසන බව ඇසූ උන්වහන්සේ ඔහු කැඳවන්නැයි වදාළ හ. බමුණා බුදුන් හමුවට පැමිණ. "ස්වාමීනි, ඔබ වහන්සේ මා කුඹුර එළි පහල කරන විටත්, සීසාන විටත්, වපුරන විටත්, වල් නෙලන විටත් වැඩි සේක. මා කුඹුර රැක බලා ගන්නා සමයේ දී නිතර නිතර එහි පැමිණි සේක. මම ඔබ වහන්සේ සමග මිතුරු වීමි. අපේ මිත්‍ර ධර්මය නිසා අස්වැන්නෙන් අඩක් ඔබ වහන්සේට දෙන බවට පොරොන්දු වීමි. කුඹුරු පාළු වුවාටත් වඩා මට හිතට අමාරු ඔබ වහන්සේට වූ පොරොන්දුව ඉටු කරන්නට බැරි වීම ය." යි පැවසී ය. "හිත මොන තරම් වේදනාවෙන් පිරී ඇත් ද කිවහොත් මට ආහාර පාන පවා අරුචියි ස්වාමීනි," පැවසී ය. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "බ්‍රාහ්මණය ඔබට ඔය තරම් ශෝකයක් ඇති වූයේ කවර හෙයින් ද?" යි විමසූ හ. "ඔබ වහන්සේ දන්නවා නම් වදාරන්න"යි හේ පැවසීය. "මම දන්නවා හිමියනි, ශෝකය හා උවදුරු සියල්ල සිදුවන්නේ තණ්හාව නිසා ය" යි උන්වහන්සේ වදාළ හ.

විවරණාත්මක අනුවාදය (216 ගාථාව)

තණ්හාය සොකො ජායතී. තණ්හාය භයං ජායතී.
තණ්හාය විප්පමුත්තස්ස සොකො නත්ථි, භයං කුතො?

තණ්හාය: තෘෂ්ණාව හේතුවෙන්; **සොකො ජායති**: සෝකය උපදියි; **තණ්හාය**: තණ්හාව හේතුවෙන්; **භයං ජායති**: බිය උපදියි; **තණ්හාය විප්පමුත්තස්ස**: තණ්හාවෙන් මිදුණු තැනැත්තා හට; **සොකො නත්ථි**: සෝකය නැත; **භයං කුතො?**: බියක් කොයින් ද?

තෘෂ්ණාව නිසා ශෝකය ඇතිවෙයි. තෘෂ්ණව නිසා භය (උවදුරු) ඇති වෙයි. තෘෂ්ණාවෙන් මිදුණු තැනැත්තා හට ශෝකයක් නැත. භයක් කොහෙන් ද?

විවරණය

තණ්හා: තෘෂ්ණාව දුක් ඇතිවන මූලික හේතුවයි. පුනර්භවය ඇති වන්නේ තෘෂ්ණාව හේතුවෙනි. "මහණෙනි, දුක්ඛ සමුදාය නම් කුමක් ද? පුනර්භවය ඇති කරන ප්‍රීතිය හා රාගය සමග බැඳුණු ඒ ඒ තැන ඇලෙන සුළු තෘෂ්ණාවයි. "එය කාමවස්තූන් විෂයෙහි තෘෂ්ණාව (කාම තණ්හා), පැවැත්ම සඳහා ඇති ආශාව (භව තණ්හාව), විනාශය සඳහා ඇති ආශාව (විභව තණ්හා) වශයෙන් ත්‍රිවිධ ය. තෘෂ්ණාව පටිච්ච සමුප්පාදයෙහි අටවන පුරුක ය.

ඉන්ද්‍රිය හයට සමගාමීව තෘෂ්ණාව ද ෂඩ් විධ වෙයි. රූප තණ්හාව, ශබ්ද තණ්හාව, ගන්ධ තණ්හාව, රස තණ්හාව, ස්පර්ශ තණ්හාව, ධම්ම තණ්හාව වශයෙනි. තෘෂ්ණා විචරිත (තෘෂ්ණාව සම්බන්ධ, ප්‍රණාලි) දහ අටක් වෙයි. එය අධ්‍යාත්මික හා බාහිර වන විට 36ක් වෙයි. අතීත වර්තමාන හා අනාගත වශයෙන් ත්‍රිවිධය යන විට එය 108 ක් වෙයි. ඒ අයුරින් තෘෂ්ණා ප්‍රභේද 108ක් සේ දක්වති.

පටිච්ච සමුප්පාදයේ දැක්වෙන පරිදි තෘෂ්ණාවට ප්‍රත්‍යය වන්නේ වේදනා ය. භව තණ්හාව ගැන දේශනා කරන විට "මහණෙනි, භව තණ්හාවට මීට පෙර මෙය නොවීය. මෙදා සිට ඇති විය යයි කීමට ආදි මූලයක් ඇතැයි දැක්විය නො හැක. එහෙත් භව තණ්හාවට ප්‍රත්‍යය දැක්විය හැක. භව තණ්හාවට ද ප්‍රත්‍යයක් ඇති බව - දැක්විය හැක. එහි ප්‍රත්‍යය නම් අවිද්‍යාව යි." අවිද්‍යාව හා භව තෘෂ්ණාව සංසාරයෙහි හේතුව වශයෙන් දැක්විය හැක.

පිරිපුන් සිල් හා නුවණැති සිවු සස් දහම්දත් පුඟුල්හට ජනයා ප්‍රිය කෙරේ.

217. සීලදස්සනසම්පන්නං
ධම්මට්ඨං සච්චවෙදිනං
අත්තනො කම්මකුබ්බානං
තං ජනො කුරුතෙ පියං (16:9)

සීලයෙන් යහ දැක්මකින් යුත්
දහම පිහිටා කියන ඇත්තත්
තමන් කාරිය නිසිව කරගත්
ප්‍රියයි ඒ වැනි අයට කවුරුත්

ප්‍රියයි මේ වැනි අයට කවුරුත්

16 (7) යෞවනයන් පන්සියයක ගේ පුවත (217 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වාසය කළ සමයෙහි **යෞවනයන් පන්සියයක්** මුල් කර ගෙන මේ ගාථාව වදාළ හ.

එක් සැණකෙළි දිනක භාග්‍යවතුන් වහන්සේ අසූ මහා ශ්‍රාවකයන් හා පන්සියයක් පිරිවර භික්ෂූන් වහන්සේ ද කැටුව රජගහ නුවරට පිවිසුණු සේක. ඒ අවස්ථාවේ පන්සියයක් තරුණයෝ පෙට්ටි පුරවා කැවුම් ද රැගෙන උයනට යනු උන්වහන්සේට පෙනිණි. ඒ තරුණයෝ ද බුදුරදුන් හා ශ්‍රාවක පිරිස දැක උන්වහන්සේලාට වැඳ නමස්කාර කොට කැවුම් ද රැගෙන පිටත්ව ගිය හ. බුදු පාමොක් මහ සඟනට කැවුම් පිරිනමන්නට සිතක් ඔවුනට පහළ නො විය.

සඟ පිරිස වෙත හැරුණු භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි කැවුම් වළඳන්නට කැමති නැද්ද?" යි විමසූ හ. "කොහෙන් ද ස්වාමීනි, කැවුම්?" යි භික්ෂූහු පිළිවදන් දුන්න. "ඇයි මහණෙනි, ඒ තරුණයන් ගෙන ගිය පෙට්ටිවල පුරවා තිබුණේ කැවුම්" "ඉතින් ස්වාමීනි, ඒ අය අපට පිළිගැන්වූයේ නැහැ නේ?" "ඒක ඇත්තයි මහණෙනි. ඔවුන් ඔබට වත් මටවත් පිළිගැන්වූයේ නැහැ. ඒත් ඒ කැවුම් වල නියම උරුමක්කාරයා පස්සෙන් එනවා. එයාට ලැබුණාම ඔබ කාටත් ලැබෙයි" භාග්‍යවතුන් වහන්සේ එසේ වදාළේ උන්වහන්සේ කිසිවකුට ඊර්ෂ්‍යා නො කරන හෙයින් කරුණාවෙන් ම ය. එසේ වදාළ භාග්‍යවතුන් වහන්සේ සඟ පිරිස සමග එක් මහ තුරු සෙවනක වැඩ හුන් හ.

අනතුරුව මහා කාශ්‍යප තෙරණුවෝද ඒ මඟ වැඩම කළ හ. උන්වහන්සේ වැඩම කරනු යෞවනයන් ගේ නෙත ගැටිණි. දුටු මතින් ම ඔවුන් ගේ සිතෙහි කසුප් තෙරණුවන් කෙරේ මහත් ප්‍රසාදයක් ඇති විය. කැවුම් පෙට්ටි බිම තබා මහ රහතන් වහන්සේට වැඳ නමස්කාර කළ ඔවුහු කැවුම් පෙට්ටි පිටින් ම උන්වහන්සේට පිළි ගැන්වූ හ.

මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ද ඔවුනට බුදුරදුන් හා ශ්‍රාවක පිරිස දක්වා "අර තුරු සෙවනෙහි භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක සංඝයා පිරිවරා වැඩ වෙසෙති. උන් වහන්සේලාට මේ කැවුම් පිළිගන්වන්න" යි ඉල්ලා සිටිය හ. තරුණයෝ ද මහත් සතුටින් එසේ කොට වළඳා නිම වූ පසු අත් සෝදා ගන්නට පැන් ද ගෙනවුත් දුන් හ. බුදුරදුන් හා සඟරුවන වැළඳූ දෙස බලා සිටි ඔවුන් ලද්දේ මහත් ආස්වාදයකි.

එතකුදු වුවත් මුලදී බුදුරදුන් හා සඟරුවන දැක දැකත් එක කැවුමකුදු පිළි නො ගැන්වූ තරුණයන් මහා කාශ්‍යප හිමියන් දුටු වහාම කැවුම් සියල්ල පිළිගැන්වීම ගැන සංඝයා අතර විමතියක් ඇති විය. "ඇයි ඔවුන් දන් දෙද්දී මුහුණ බලා දුන්නේ? ඇයි ඔවුන් බුදු පාමොක් මහ සඟන පසු කර මහ කසුප් හිමියන් වෙත ගියේ?" ඔවුහු එසේ කතා කරද්දී භාග්‍යවතුන් වහන්සේ මෙසේ පැහැදිලි කළ හ. "මහණෙනි, මහා කාශ්‍යප තෙරණුවෝ මනුෂ්‍යයන්ට පමණක් නොව දෙවියන්ට පවා ප්‍රිය ය. එබඳු උතුමන්ට සිවුපසයෙන් සංග්‍රහ කරන්නට කවුරුත් කැමති වෙති" යි කසුප් මහරහතන් වහන්සේ ගේ විශේෂත්වය පැහැදිලි කළහ.

විවරණාත්මක අනුවාදය (217 ගාථාව)

සීලදස්සනසම්පන්නං ධම්මට්ඨං සච්චවෙදිනං අත්තනො කම්මකුබ්බාණං තං ජනො පියං කුරුතෙ.

සීලදස්සනසම්පන්නං: සීලයෙන් හා ප්‍රඥාවෙන් යුක්ත වූ; **ධම්මට්ඨං**: ධර්මයේ පිහිටියා වූ ද; **සච්චවෙදිනං**: සත්‍යවාදී වූ; **අත්තනො**: තමා ගේ; **කම්මකුබ්බාණං**: කටයුතු කරන්නා වූ ද; **තං**: ඒ පුද්ගලයාට; **ජනො**: ජනතාව; **පියං කුරුතෙ**: ප්‍රිය කරති.

සීලයෙන් හා දර්ශන ඥානයෙන් සමන්විත වූ ධර්මයෙහි මනාව පිහිටියා වූ සත්‍යවාදී වූ තමන් ගේ සියළු කටයුතු නිමකර සිටියා වූ පුද්ගලයාට ජනතාව ප්‍රිය වෙති.

විවරණය

සත්‍යය: සත්‍යයට බුදු සමයෙහි විශේෂ ස්ථානයක් හිමිවේ. බුදු සමය තහවුරුව සිටින්නේ මානව සංහතිය පිළිබඳ සනාතන සත්‍යය වූ චතුරාර්ය සත්‍යය මත ය. සත්‍යවාදීත්වය පාරමිතාවන් අතර හත්වැන්නයි. සත්‍යය පාරමිතාවක් වශයෙන් දක්වන විට සත්‍යය යන්නෙන් අදහස් කරන්නේ පොරොන්දු ඉටු කිරීමයි. බෝසත්වරු කිසි කලෙක ප්‍රතිඥා නො බිඳයි. ඔවුහු කියන දේ කරති, කරන දේ කියති. (යථාවාදී තථා කාරී යථා කාරී තථාවාදී) භාරිති ජාතකය අනුව බෝධි සත්ත්වයන් වහන්සේ කලාතුරකින් අනිකුත් ශික්ෂා හතර බිඳිතත් මුසාවාදයෙන් වැළකීමේ ශික්ෂාපදය නො බිඳිති.

විනීතත්වයේ නාමයෙන් වත් බෝසත්හු සත්‍යය නො සඟවති. සත්‍යය ඔහු ගේ ගුරුවරයා ය. එහෙයින් යමක් පොරොන්දු වුවහොත් නො පිරිහෙලා ඉටු කරති. පොරොන්දුවක් වන්නට පෙර කීපවරක් කල්පනා කරති. එහෙත් එය වූ පසු ජීවිතය රැක ගැනීම සඳහා වත් කඩ නො කරති.

හිරි ජාතකයේ දී බෝධිසත්වයන් වහන්සේ "සෑම පොරොන්දුවක් ම නිසි පරිදි අකුරට ම ඉටු කරන්න. ඉටු කරන්නට බැරිදේ පොරෙන්දු වන්නට බැරි බව කියන්න."

මහා සුතසෝම ජාතකයේ දී පොරොන්දුවක් ඉටු කිරීම පිණිස බෝධිසත්වයෝ ජීවිත පරිත්‍යාගයට සැරසෙති. උදතරුව තම සමබර ගමන් මග නො වරදවා දිගටම එකසේ පවත්වා ගන්නා අයුරින් බෝධිසත්ත්වයෝ ද තම සත්‍යවාදිත්වයේ මාවතින් බැහැරව නො යති.

බෝධිසත්වයෝ තමන් සත්‍යාවාදී හෙයින් දෙබිඩි ජීවිත ගත නොකරති. කියන දේම කරති. කරන දේම කියති. ප්‍රසිද්ධ ජීවිතය මෙන් ම පෞද්ගලික ජීවිතය ද එකසේ ම නිරවද්‍යව, සංස්ථිතිකව පවත්වති. සත්‍යයක් වුවද අන්‍යයන් ගේ හිත සුව පිණිස නො පවතී නම් නො කියා නිහඬව සිටිති. සත්‍යය අනුන් ගේ යහපත පිණිස පවතී නම්, තමාට කවර තරම් අනර්ථයක් ඉන් සිදු වුවද කියති.



කාමයන් හි නොබැඳුණු පුගුල් උද්ධං සෝතයකි. (ජල පහරේ ඉහළ යන්නෙකි).

218. ඡන්දජාතො අනක්ඛාතෙ
මනසා ච ඵුටො සියා
කාමෙසු ච අප්පටිබද්ධචිත්තො
උද්ධංසොතො'ති වුච්චති (16:10)

නිවණට සිත බැඳී
සිතින් එය සනසා ගෙන
කාමසෙහි නො බැඳී
කෙනෙකි උඩුගං දෙසට පිහිනන

උස් පැතුමක් - ඇති උතුමෙක්

16 (8) අනාගාමී හිමි නමක ගේ කතාව (218 ගාථාව)

අනාගාමී තෙර කෙනෙකුන් අරබයා දේශනා කළ මේ ගාථාව බුදුරදුන් ජේතවනාරාමයේ සිටිය දී වදාරන ලද්දකි.

මේ තෙර නම අනාගාමී ඵලය ලබා රහත් ඵලය ලබා ගන්නට බවුන් වඩමින් සිටි සේක. දිනක් උන්වහන්සේ ගේ ශිෂ්‍යයෝ "ස්වාමීනි, කිසියම් උතුම් අධිගමයක් ලත් සේක් දැ" යි විමසූ හ. එසේ විචාළ විට "අනාගාමී ඵලය නම් ගිහියෝත් ලබති. එයත් කියන්නට දෙයක් ද? රහත් ඵලය ලත් විට එය කියමි"යි සිතා පිළිතුරක් නො දුන් හ. ශිෂ්‍යයන් සිතා ගත්තේ කියන්නට තරම් අධිගමයක් නො ලත් හෙයින් නිහඬව සිටි බවය.

කෙසේ වුවද උන් වහන්සේට ජීවිත කාලය තුළ රහත් වී ගත් නො හැකි විය උන්වහන්සේ අපවත් වූ විට ශිෂ්‍ය හිමිවරු අප ගේ ආචාර්‍යයන් වහන්සේ කිසිම මාර්ග ඵලයක් නො ලබා අපවත් වූවයි. බොහෝ සංවේගයට පත් වූ හ. ඔවුහු භාග්‍යවතුන් වහන්සේ හමුවට ගොස් තම ආචාර්‍යයන් වහන්සේ ගේ පුනර්භවය ගැන විමසූ හ. "ස්වාමීනි, අපගේ ආචාර්‍යයන් වහන්සේ මාර්ග ඵලයක් නො ලබා ම මිය යාම අපට මහත් සංවේගයකි. උන් වහන්සේ යම්කිසි යහපත් උපතක් ලැබුවා දැයි දැනග නු කැමැත්තෙමු" යි විචාළ හ. "ඔබ ගේ ආචාර්‍යයන් වහන්සේ අනාගාමීව සිටිය හ. දැන් සුද්ධාවාස බ්‍රහ්ම ලෝකයක උපන්හ. ඉතා දිගු කලක් එහි සුව සම්පත් විඳ පිරිනිවන් පාති" යි උන්වහන්සේ වදාළ හ. "ස්වාමීනි, අප අධිගමයක් ගැන විචාළ කළ නිහඬව සිටිය හ"යි පැවසූ විට "මහණෙනි ආචාර්‍යයන් වහන්සේ සිතූ සේ අනාග ාමීත්වය නම් ගිහියෝත් ලබති. රහත්ව ම කියමියි සිතා ය. කෙසේ වුවත් දැන් හේ කාම ලෝකයෙන් මිදී උද්ධංසෝත වූහ" යි දහම් දෙසූ හ.

විවරණාත්මක අනුවාදය (218 ගාථාව)

අනක්ඛාතෙ ඡන්දජාතො මනසා ඵුටො ච සියා කාමෙසු
අප්පටිබද්ධචිත්තො ච උද්ධංසොතො ඉති වුච්චති.

අනක්ඛාතෙ: නිර්වාණයෙහි; **ඡන්දජාතො**: කැමැත්ත ඇති කරගත්තේ; **මනසා ඵුටො ච**: මනසින් ස්පර්ශ කළේ ද; **සියා**: වූයේ නම්; **කාමෙසු**: ක්ලෙශ කාමයන් හි; **අප්පටිබද්ධචිත්තෝ ච**: නො බැඳුණු සිත් ඇත්තේ ද වූයේ නම්; **උද්ධංසොතො ඉති**: (ඔහු) උඩුගං බලා පිහිනන්නකු සේ; **වුච්චති**: හඳුන්වනු ලැබේ.

කරවන්නෙක් හෝ වර්ණ සණ්ඨාන වශයෙන් හෝ නොකිය හැකි බැවින් '**අනක්ඛාත**' නම් වූ නිර්වාණය කෙරෙහි අපේක්ෂාවක් ඇති කර ගෙන සිතිනුත් නිවන සනසා සිටින කාමයන් හි නො බැඳුණු පුද්ගලයා උඩුගං බලා පිහිනන්නකු (ප්‍රතිසන්ධි වශයෙන් සුද්ධාවාසයන්හි පිළිවෙළින් උපදනා බැවින්) වශයෙන් හඳුන්වනු ලැබේ.

විවරණය

අනාගාමී: නැවත මනු ලොවට උත්පත්ති වශයෙන් නො පැමිණෙන මාර්ග ඵල ලාභියා අනාගාමී වශයෙන් හැඳින්වේ. එය තුන්වන මාර්‍ග ඵලයයි. අනාගාමී වූවෝ වර්ග පහක් වෙති.

"ඕරම්භාගීය සංයෝජන පටකය බිඳ හළ හෙතෙම සුද්ධාවාස ලෝකවල උපදින්නේ නැවත මනුලොවට නො පැමිණ එහිම පිරිනිවන් පාන්නේ ය."

1. ඔහු එහි උපන් වහාම හෝ එහි ආයු කාලයෙන් අඩක් ගෙවෙන්නට පෙරම උද්ධම්භාගිය සංයෝජන පහ බිඳ හැර රහත් වී පිරිනිවන් පායි. ඔහු අන්තරා පරිනිබ්බායි නමින් හැඳින්වේ.

2. නැතහොත් ජීවිතයෙහි ඉතිරි අඩ තුළ හෝ චුත වන මොහොතේ උද්ධම්භාගීය සංයෝගය බිඳ හැර රහත් වෙයි. (උපහච්ච පරිනිබ්බායි)

3. නැතහොත් වීර්‍ය වඩා සංයොජන සුන් කර පිරිනිවන් පායි (සඞ්ඛාර පරිනිබ්බායි)

4. නැතහොත් වීර්‍ය වැඩීමක් නො කරම සංයෝජන ප්‍රහාණය කරයි. (අසඞ්ඛාර පරිනිබ්බායි)

5. නැතහොත් අවිහ දෙව්වරුන් වෙතින් චුතවී ආතප්ප දෙව්වරුන් අතර පහළ වී එතැනින් සුදස්ස දෙව්වරුන් අතර ඉපදේ. එතැනින් පසු සුදස්සී දෙව්වරුන් අතර ඉපදී ඉන්පසු අකනිට්ඨ බඹලොව ඉපිද එහිදී උද්ධම්භාගීය සංයෝජන දුර හරියි. එබන්දෝ උද්ධංසෝත අකනිට්ඨ ගාමී වශයෙන් හැඳින්වෙති.

සුවසේ දුර සිට පැමිණියකු නෑ මිත්හු සතුටින් පිළිගනිද්ද, එසේ ම කළ පින්පල පරලොවැ දී දිවසැප දී පිළිගනිත්.

219. චිරප්පවාසිං පුරිසං
දූරතෝ සොත්ථි මාගතං
ඤාතිමිත්තා සුහජ්ජා ච
අභිනන්දන්ති සාගතං (16:11)

බැහැර ගොසින් කලකට පසු
දුරසිට සුවසේ ආවිට
නෑදෑ හිත මිතුරන් හැම
පිළිගන්නේ හරි සතුටින්

පින්කම් වල හොඳ ප්‍රතිඵල
16 (9) නන්දිය ගේ කතාව (219 හා 220 ගාථා)

ඉසිපතනාරාමයෙහි වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **නන්දිය** නම් පුණ්‍යවන්තයකු මුල් කරගෙන මේ ගාථා දෙක වදාළ හ.

බරණැස එක් සැදැහැති පවුලක පිනට ලැදි නන්දිය නම් තරුණයෙක් විසී ය. ඔහු විවාහයක් කර ගන්නා වයසට ආ විට ඔහු ගේ දෙමාපියෝ නිවස අසලම නිවසක විසූ ඔහු ගේ මාමා ගේ දියණිය ඔහුට ආවාහ කර දෙන්නට සිතූ හ. එහෙත් රේවතී නම් ඒ දියණිය බින්දුමාත්‍ර හෝ ශ්‍රද්ධාවක් නැති තැනැත්තියකි. එහෙයින් නන්දිය තුළ ඇය ගැන ඇල්මක් ඇති නො විය. නන්දිය ගේ මවට මේ විවාහය කෙසේ හෝ කර දෙන්නට ම අවශ්‍ය විය. එහෙයින් ඕ රේවතී වෙත ගොස් "ඔබ කිසි ආගමික ශ්‍රද්ධාවක් නැති හෙයින් මගේ පුතා විවාහයට කැමැත්තක් නො දක්වයි. මේ විවාහය කෙසේ හෝ කරන්නට ම අවශ්‍ය හෙයින් ඔබ ශ්‍රද්ධාව නැතත් ඇතුවා සේ පෙනෙන්නට යම් යම් දේ කරන්න. දන් දෙන තැන හොඳට අතු පතුගා පිරිසිදු කර අසුන් පැනවීම්, ඇතිරිලි එලීම් ආදිය කරන්න. සංඝයා වැඩම කළ විට පාත්‍රය ගෙන වඩා හිඳවා පැන් පෙරා පිළිගන්වන්න.

වළඳා අවසන් වූ විට පාත්‍රය සෝදා පිරිසිදු කර දෙන්න. එවිට මගේ පුතා ඔබට කැමති වනු ඇත" යි කීවා ය. රේවතිය ද විවාහය ඉටු කර ගන්න අදහසින් එසේ කළා ය. අනතුරුව නන්දිය ගේ මව "දැන් රේවතී ඉස්සර වගේ නො වෙයි. සැදැහැවත්. විනීතයි. දැන් කැමති වෙන්න" යි කියා සිටියා ය. "මගේ මවට, පියාට සහ සංඝරත්නයට ගරු සරු ඇතිව පිළිපදිමින් උවටැන් කරන්නට හැකිනම්, මම ඔබ විවාහ කර ගනිමි. එසේ කරන තුරු ඔබට මා සමග විසිය හැක. ඒ අයට වෙනස් කමක් කළ දාට වහාම ඔබ මගේ නිවසින් බැහැර කරමි. ඊට කැමති නම්, විවාහ කර ගනිමි" යි හේ රේවතීයට පැවසූවා ය. ඕ තොමෝ ද එයට එකඟ වූවා ය. එතැන් පටන් තමන් සැදැහැ නැතත් සැදැහැතියක් සේ හැසිරෙමින් ඕ සියළු උපස්ථාන කළා ය. එසේ වසන ඕ තොමෝ දරු දෙදෙනකුත් ද ලැබුවා ය. නන්දිය ගේ දෙමාපියන් මිය ගිය පසු ඒ දේපල ද ඔවුන්ටම හිමි විය. සංඝයාට දන් පිරිනැමීම පමණක් නොව දුගී මගී යාචකාදීනට ද ආහාර පාන බෙදා දීමට ශාලාවක් ද සැකසූ හ. මෙසේ ඔවුහු ඉතා ආදර්ශවත් ජීවිතයක් ගත කරමින් කල් යැවූ හ. මේ අතරවාරයේ දිනක් නන්දිය බුදුරදුන් ආරාම ඉදිකරවීමේ කුසල් ගැන ධර්ම දේශනයක් කරනු අසා සිට තමා එම කුසලය ද ලබා ගත යුතු යැයි සිතා ඉසිපතනාරාමයෙහි හතරැස් ගොඩ නැගිල්ලක් තනවා පූජා කළේ ය. පූජා කරන දින බුදු පාමොක් මහ සඟනට දන් පිළිගන්වා සංඝාවාස ගොඩනැගිල්ල අත පැන් වත්කර බුදුරදුන්ට පූජා කළේ ය. පැන් බුදුරදුන් ගේ අතින් මිහි මතට වැටෙත්ම තව්තිසා දෙව්ලොව නන්දිය අරබයා සතර පැත්තෙන්ම දොළොස් යොදුන් වූ මහා දිව්‍ය විමානයක් පැන නැංගේ ය. එහි සියළු රන් රිදී මුතු මැණික් බඳු සම්පත් මෙන් ම දිව්‍යාංගනාවෝ ද පහළ වූ හ. එක් දිනක් මුගලන් මහ රහතන් වහන්සේ දෙව්ලොව සංචාරයක් සඳහා වැඩම කළ අවස්ථාවේ මේ මහා දිව්‍ය විමානය දැක එහි නැවති මේ දිව්‍යාංගනාවන් පිරි මහා මන්දිරය කාගේ කුසල මහිමයක් නිසා පහළ වූයේදැයි ප්‍රශ්න කළ හ.
"ස්වාමීනි, මේ මහා විමානය නන්දිය නම් කුල පුත්‍රයාණන් ගේ පුණ්‍ය මහිමය නිසා ඔහු වෙනුවෙන් නිර්මිත වූයේ ය. ඔහු ඉසිපතනාරාමයේ නව සංඝාවාසයක් කරවා පිදූ පිනින් හටගත් විමානයයි මේ" යි දිව්‍ය පුත්‍රයෝ පිළිතුරු දුන් හ. එම විමානයේ විසූ දිව්‍ය අප්සරාවෝද "ස්වාමීනි, අපි මේ නන්දිය කුල පුත්‍රයා මෙහි පහලවන තුරු නො ඉවසිල්ලෙන් සිටිමු. අප මේ දිව්‍ය විමානයෙහි පහල වුවද නන්දිය දිව්‍ය පුත්‍රයා තවම මෙහි පහල නො වූයෙන් අපි බලවත් කනස්සල්ලෙන් පසුවෙමු. ඔබ වහන්සේ මනු ලොව වැඩම කළ විට මැටි බඳුනක් බිඳ රන් බඳුනක් ලබා ගන්නා සේ මනුෂ්‍ය සම්පත් ඉවත ලා දිව්‍ය සම්පත් භුක්ති විඳීමට වහාම මෙහි පැමිණෙන්නැයි ඔහුට උපදෙස් දෙනු මැනවි" යි ඉල්ලා සිටිය හ.

දෙව්ලොවින් නැවත මනු ලොව වැඩම කළ මුගලන් මහ රහතන් වහන්සේ බුදු පියාණන් හමුවට පැමිණ "ස්වාමීනි, මිනිසුන් මනු ලොව සිටිය දී ම ඔවුන් ගේ කුශලානිශංසයන් දිව්‍ය ලෝකයෙහි ප්‍රකට වීම කෙසේ වන්නේ ද ?" යි විචාළෙන් බුදුහු "මොග්ගල්ලාන, නන්දිය ගේ පුණ්‍ය කර්ම පිළිබඳ යශෝඝෝෂය දිව්‍ය ලෝකයෙහි ප්‍රචලිතව ඇති අන්දම ඔබ සියැසින්ම දැක ගත්තා නො වේ ද? යි පිළිතුරු දුන් හ. "එහෙනම් ඒක ඇත්තක් නේ ද ස්වාමීනි" "ඔව් මොග්ගල්ලාන, යම්කිසි පවුලක පුතෙක්, සහෝදරයෙක් ඈත දුරු රටක සිට බොහෝ කලකට පසු සිය නිවෙසට සුවසේ පැමිණෙන විට නෑදෑ හිතමිතුරන් වටවී ඔහු ආදරයෙන් වැළඳ ගෙන පිළිගන්නා සේ මනුලොව හොඳින් පින්කම් කරගෙන වාසය කරන තැනැත්තෙක් දෙව්ලොව යන විට ඔහු කළ පින් ඔහු ආදරයෙන් බාර ගැනීමට සූදානම්ව සිටී" යි භාග්‍යවතුන් වහන්සේ තවදුරටත් විස්තර කර මේ ගාථා දෙක ද වදාළ හ.

විවරණාත්මක අනුවාදය (219 ගාථාව)

චිරප්පවාසිං පුරිසං දූරතො සොත්ථිං ආගතං
ඤාතිමිත්තා සුහජ්ජා ච ආගතං අභිනන්දන්ති.

චිරප්පවාසිං: බොහෝ කලක් ඈත දුරුරට විසූ; **පුරිසං**: පුරුෂයෙකු; **දූරතො**: දුර බැහැර සිට; **සොත්ථිං**: සුවසේ; **ආගතං**: ආපසු පැමිණි විට; **ඤාතිමිත්තා**: නෑයන් හා මිතුරන්; **සුහජ්ජා ච**: හිතවත් යාලුවෝ ද; **ආගතං**: (ඔහුගේ) සුවසේ පැමිණීම ගැන; **අභිනන්දන්ති**: (යම්සේ) සතුටු වේ ද.

නිවසින් බැහැරව බොහෝ කලක් දුර පලාතක සිටි තැනැත්තකු සුවසේ නිවසට ආපසු පැමිණි විට නෑදෑ හිත මිත්‍රාදීන් එක් වී ආදරයෙන් පිළි ගනිති.

සුවසේ දුර සිට පැමිණියකු නෑ මිත්හු සතුටින් පිළිගනිද්ද, එසේ ම කළ සින්පල පරලොවැ දී දිවසැප දී පිළිගනිත්.

220. තථෙව කත පුඤ්ඤ'ම්පි
අස්මා ලොකා පරං ගතං
පුඤ්ඤානි පටිගණ්හන්ති
පියං ඤාතිං ව ආගතං (16:12)

එලෙසට පින් කරගත් අය
මෙලොවින් පරලොව ගියාම
පින් ඇවිදින් පිළිගනීවි
ප්‍රිය නෑයකු ආ විලසින්

කළ හොඳ දේ - හොඳ පල දේ.

16 (9) නන්දිය ගේ කතාව (219 හා 220 ගාථා)

විවරණාත්මක අනුවාදය (219 ගාථාව)

තථා එව කත පුඤ්ඤං අපි අස්මා ලොකා පරං ගතං පුඤ්ඤානි ආගතං පියං ඤාතිං ඉව පටිගණ්හන්ති.

තථා එවා: ඒ ලෙසින් ම; **කත පුඤ්ඤං අපි**: කළ පින් ඇති තැනැත්තා ද; **අස්මා ලොකා**: මෙ ලොවින්; **පරං**: පරලොවට; **ගතං**: ගිය කල්හි; **පුඤ්ඤානි**: පුණ්‍යයෝ; **ආගතං**: (දුර සිට) ආ නෑයෙකු (පිළි ගන්නා); **පියං ඤාතිං ඉව**: (සෙසු) ප්‍රිය නෑයන් මෙන්; **පටිගණ්හන්ති**: පිළිගනිති.

එසේ ම පින් කළ තැනැත්තා පරලොව ගිය කළ පුණ්‍යයෝ කලෙකින් පැමිණි නෑයෙකු මෙන් ඔහු පිළිගනී.

විවරණය

පුඤ්ඤානි පටිගණ්හන්ති: පරලොව ගිය පුණ්‍යවන්තයා පින් විසින් පිළිගනු ලැබේ. 'පින්' යනු කර්ම වශයෙන් කුශල පක්ෂයට ගැනෙන ක්‍රියාවනට පොදු ජනතාව අතර ජනප්‍රිය පදයකි. මෙහි විරුද්ධ වචනය 'පාප' ය. (අපුඤ්ඤ සිත යෙදිය හැක. පුණ්‍යානිශංස පිළිබඳව බුද්දක පාඨයෙහි එන නිධි කාණ්ඩ සූත්‍රයෙහි විස්තර ඇතුළත් ය. අෂ්ටාචාර්‍ය පුද්ගල මහා සංඝ රත්නය අනුත්තර වූ පුණ්‍ය ක්ෂෙත්‍රයක් ලෙස දැක්වේ. (අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස)

පුණ්‍යක්‍රියා දහයක් ගැන සම්ප්‍රදායෙහි ඉගැන්වේ. එනම්,

1. දන් දීම
2. සිල් රැකීම
3. භාවනා කිරීම
4. ගරු කිරීම
5. වතාවත් කිරීම
6. පින් දීම
7. පින් අනුමෝදන් වීම
8. බණ ඇසීම
9. බණ කීම
10. දෘෂ්ටිය ඍජු කිරීම.

යන මේ දහයයි. ඇතැම් අවස්ථාවල 7 හා 10 දෙකට උප කොටස ඇඳීමෙන් දොළහක් කර ඇත. අනුන් ගේ පින් වර්ණනා කිරීම පින් අනුමෝදනාවට එක් කර ඇත. දෘෂ්ටිය ඍජු කිරීම වෙනුවට තිසරණ යාම හා අනුස්සතිය එක් කර ඇත.

දන්දීම ධන ධාන්‍ය සම්පත් ලැබීමට ඉවහල් වෙයි. සීලයෙන් වාසනාවන්ත පවුල් වල උපත හා සැප ලබා දෙයි. භාවනාව මගින් රූප හා අරූප ලෝකවල උපත ලැබෙන අතර පරමාර්ථ ඥානය හා විමුක්තිය ලබා ගත හැක. පින් අනුමෝදන් කිරීම අනාගත ජන්මයන්හි දී වාසනාව ලබා දෙයි. පින් අනුමෝදන් වීම මගින් උපනුපන් තැන සතුට ලබා ගත හැකි ය. බණ ඇසීම හා දෙසීම ප්‍රඥාවේ වර්ධනයට හේතු වෙයි. ගරුසරු දැක්වීම උසස් දෙමාපියන් ලැබීමට හේතුවේ. උපස්ථානය පිරිවර වැඩි වෙන පින් කමකි. අන්‍යයන් ගේ පුණ්‍ය කර්ම වර්ණනා කරන්නා ගේ කීර්තිය දසත පැතිරෙයි. තෙරුවන් සරණ යෑමෙන් කෙලෙසුන් නැසීම පහසු වෙයි. සති සම්පජඤ්ඤාය සියළු ආකාරයේ ම සැප සම්පත් වලට හේතුවෙයි.

රූප ලෝකවල විපාක දෙන කුසල කර්මය වූ භාවනාව මගින්, ධ්‍යාන උපදවා ගත හැක.

1. විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා සහිත ප්‍රථම ධ්‍යානය.
2. විචාර, පීති, සුඛ ඒකග්ගතා සහිත ද්වතීය ධ්‍යානය.
3. පීති සුඛ ඒකග්ගතා සහිත තෘතීය ධ්‍යානය.
4. සුඛ ඒකග්ගතා සහිත චතුර්ථ ධ්‍යානය.
5. උපෙක්ඛා ඒකග්ගතා සහිත පංචම ධ්‍යානය.

යන ධ්‍යාන කුසල් සිත් වශයෙන් හඳුන්වන අතර එමගින් රූපී බ්‍රහ්ම ලෝකවල උත්පත්තිය ලැබේ.

අරූපී ලෝකවල උපත ලැබෙන ධ්‍යාන නම්,

1. ආකාසානඤ්චායතනය (අනන්ත ආකාසය පිළිබඳ වූ ධ්‍යාන සිත)
2. විඤ්ඤාණඤ්චායතනය (අනන්ත වූ විඥානය පිළිබඳ ධ්‍යාන සිත)
3. ආකිඤ්චඤ්ඤායතනය (කිසිවක් නැත යන සිතිවිල්ල මත වූ ධ්‍යානය)
4. නෙ'වසඤ්ඤා නා සඤ්ඤායතනය (සංජානනය ඇත්තෙත් නැති නැත්තෙත් නැති තත්ත්වය) යන මේ හතර ය.

පුණ්‍යකර්මවල අනුහස් අනුක්‍රමිකතාවක් පිළිබඳව බුදුරජාණන් වහන්සේ විසින් අනේපිඩු සිටාණන්ට දේශනා කර ඇත. බුදුපාමොක් මහ සඟනට දන් දීම මහත් ඵල මහානිශංස ඇති කුසලයක් බව වදාළ උන්වහන්සේ සංඝයා ගේ වාසය පිණිස ආවාසයක් කරවීම ඊටත් වැඩි අනුසස් ඇති පින්කමක් බව දැක් වූහ. තෙරුවන් සරණයාම ඊටත් වඩා ප්‍රබල පින් කමකි. පංචශීලය ආරක්ෂා කිරීම ඊටත් වඩා ආනිශංසදායක ය. මොහොතක් හෝ මෙත් වැඩීම ඒ හැම පරදවන පින් කමකි.

සියළු කුසල් පරදවන මහා කුසල කර්මය නම් විදර්ශනා භාවනාව ය. මේ දේශනය දෙස බලන විට කුශල වර්ධන ශික්ෂාව තුළ දන්දීම ප්‍රථම පියවර බව වැටෙහෙනු ඇත. ආමිස දානමය කුසල කර්මවලට වඩා මෙත් වැඩීම හා විදර්ශනාව කුසලමය වශයෙන් වඩා අගය කර තිබේ.

අකාරුණික වචනයක් නැහැ.

බුදුහිමියන් කෝපයෙන් බැන වැදුණු කිසිම අවස්ථාවක් නොමැත. කිසිවිටෙකවත් බුදුහිමියන්ගේ මුවින් අකාරුණික වචනයක් නොගිලිහුණේය.

ආචාර්ය එස්. රාධක්‍රිෂ්ණන්

බුද්ධිය සහ කරුණාව ක්‍රියාවට නැගීම

පවිත්‍රතාවය පිළිබඳ පත්මය මත පළක් බැඳ වැඩ සිටින සදාකාලික තුරුණුබව සහිත, කාරුණික, මන වඩන රුවැති, බුදුහිමියන් සිය දකුණත ඔසවාගෙන අවවාද පූර්වකව මෙසේ දෙසන්නා වැනිය. "දුකින් හා බියෙන් මිදෙන්නට කැමති නම් බුද්ධියත්, මෛත්‍රියත් වඩන්න."

ඇනටෝල් ෆ්‍රාන්ස්

අන්‍ය ආගමිකයන් නොපෙළීම

බුදුසමය පිළිබඳ ශතවර්ෂ ගණනක දිගු ඉතිහාසය මුළුල්ලේ බෞද්ධ භක්තිකයන් විසින් සෙසු ආගමක් අදහන අයට තාඩන පීඩන පමුණුවාලු අවස්ථාවක් ගැන කිසිදු වාර්තාවක් ඇති බවක් මම නොදනිමි.

මහාචාර්ය රීස් ඩේවිඩ්ස්.

ක්‍රෝධ වග්ග

ක්‍රෝධය දුරු කළ මානය පහකළ සංයෝජන ඉක්ම කෙළෙස් කරදර නැත්තා මතු දුක් නො වැටේ.

221. කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං
සඤ්ඤොජනං සබ්බ මතික්කමෙය්‍ය
තං නාමරූපස්මිං අසජ්ජමානං
අකිඤ්චනං නානුපතන්ති දුක්ඛා (17:1)

ක්‍රෝධය හැර මානය දුරු කරලා
සංයෝජන හැම විනාස කරලා
හැරියොත් සිත කය ආශා බැඳලා
ඔහු වෙත දුක එන්නේ නැත පෙරලා

සෝකය දුක නොලබා මග
17 (1) රෝහිණී කුමරිය ගේ පුවත (221 ගාථාව)

අනුරුද්ධ මහරහතන් වහන්සේ ගේ සොහොයුරිය වූ **රෝහිණී කුමරිය** ඇරබ බුදුරදුන් මේ ගාථාව වදාළේ නිග්‍රෝධාරාමයේ දීය.

වරක් අනුරුද්ධ හිමියන් කපිලවස්තුවට වැඩම කළ අවස්ථාවෙහි උන්වහන්සේ බැහැදැකීමට රෝහිණී නම් වූ නැඟණිය නො පැමිණියේ කවර හෙයින්දැයි විචාල උන්වහන්සේට ඇය බලගතු කුෂ්ට රෝගයකින් පෙලෙන හෙයින් නො පැමිණි බව දැන ගන්නට ලැබිණි. ඇය කැඳවාගෙන එන්නැයි උන් වහන්සේ උපදෙස් දුන් විට ඕ මුළු සිරුරම සේද රෙද්දකින් වසා ගෙන පැමිණියාය. මේ රෝගය සුව වන්නට නම් පුණ්‍ය ක්‍රියාවක් කරන්නැයි අනුරුද්ධ හිමියෝ නැඟණියට උපදෙස් දුන් හ. සංඝයා සඳහා දන් වැළඳීමට ආසන ශාලාවක් (දාන ශාලාවක්) තැනවීම උචිත බව උන්වහන්සේ වැඩි දුරටත් පැවසූහ. ඒ සඳහා මුදල් තම අබරණ විකිණීමෙන් ලබා ගන්නැයි ද උන්වහන්සේ උපදෙස් දුන් හ.

රෝහිණී ද ඒ අනුව සිය ආභරණ විකුණා ඒ මුදලින් දෙමහල් දාන ශාලාවක් ඉදි කරවූවා ය. බිම ගොම මැටි ගෑම වැනි දේ තමාම කළා ය. මේ කටයුතු කරන විට ඇය ගේ කුෂ්ට රෝගය ක්‍රමයෙන් සුවපත් විය. එහෙත් සම තවමත් ප්‍රකෘති තත්වයට පත් නොවී ය.

ශාලාව සඟසතු කර පූජා කරන දින බුදු පාමොක් මහ සඟනට දන් පිරිනමන ලදී. දන් වළඳා අවසන භාග්‍යවතුන් වහන්සේ රෝහිණී එතනට පැමිණ නො තිබුණෙන් ඇය කැඳවාගෙන එන සේ උපදෙස් දුන් හ. ඡවි වර්ණය ප්‍රසන්න නොවූ හෙයින් ඕ ලජ්ජාවෙන් සළු වලින් ගත වසා ගෙන පැමිණියා ය. "රෝහිණී, ඔබට ඔය අසනීපය හැදෙන්නට හේතුව දන්නවා ද?" බුදුහු විමසූ හ. ඇය තමන් එය නොදත් බව පැවසූයෙන් භාග්‍යවතුන් වහන්සේ එය ඇයට හෙළි කර දුන් හ.

බුදුරදුන් හෙළි කළ පරිදි රෝහිණී ඉකුත් ජන්මයක බරණැස් රජුගේ අග මෙහෙසියව සිටියා ය. රජතුමා එක් පුරඟනක කෙරේ වැඩිපුර බැඳී සිටින බව දුටු ඕ කුපිතව ඇය ගේ ඇඳ ඇතිරිලි වල කහඹිලියා ගෙඩි කඩා ඒවායේ කුඩු දමා ඇය කසන විට ඇඟට ද ඒ කුඩු දමා හිරිහැර කරවූවා ය.

පුරඟන ඇඟ කසා ඉදිමී මහත් දුකට පත්වූවා ය. මේ ආත්මයේ මෙබඳු දරුණු කුෂ්ට රෝගයකින් දුක් විඳින්නට රෝහිණිට සිදු වූයේ මේ පාපකර්මයෙහි විපාක වශයෙනි. ඒ පුවත පැහැදිලි කළ භාග්‍යවතුන් වහන්සේ ක්‍රෝධයෙහි දුර්විපාක පැහැදිලි කරමින් කළ දෙසුම අසා සිටි රෝහිණී සෝවාන් වූවා ය. ඒ සමගම ඇය ගේ චර්මාබාධය මුළුමණින්ම සුව වී ප්‍රියකරු පෙනුම ද නැවත ලැබිණි.

විවරණාත්මක අනුවාදය (221 ගාථාව)

කොධං ජහෙ මානං විප්පජහෙය්‍ය. සබ්බං
සඤ්ඤොජනං අතික්කමෙය්‍ය නාමරූපස්මිං
අසජ්ජමානං අකිඤ්චනං තං දුක්ඛා න අනුපතන්ති

කොධං: ක්‍රෝධය; **ජහෙ**: දුරු කරන්නේය; **මානං**: මානය; **විප්පජහෙය්‍ය**: මුළුමනින්ම දුරලන්න; **සබ්බං**: සියළු; **සඤ්ඤොජනං**: සංයෝජන (දශ විධ); **අතික්කමෙය්‍ය**: ඉක්මවන්නේය; **නාම රූපස්මිං**: නාමයෙහි හා රූපයෙහි; **අසජ්ජමානං**: නො ඇලෙන; **අකිඤ්චනං**: රාගාදී කිඤ්චන කිසිවක් නැත්තා වූ; **තං**: ඒ පුද්ගලයා කෙරෙහි; **දුක්ඛා**: කායික චෛතසික දුක්; **න අනුපතන්ති**: යළි නො පැමිණෙති.

ක්‍රෝධය හා මානය මුළුමනින් දුරු කරන්න. සියළු සංයෝජන අතික්‍රමණය කර සිටින්න. නාම-රූපය (සිත හා කය) කෙරෙහි නො ඇලෙන ඔහු නැවත දුකට පැමිණෙන්නේ නැත.

විවරණය

මිනිසා තුළ ඇතිවන අතිශය දුර්විපාකදායි චිත්ත වේගය ලෙස ක්‍රෝධය හැඳින්විය හැක. ක්‍රෝධයට ක්‍රෝධයෙන් ප්‍රතික්‍රියා දැක්වීමෙන් එය දස ගුණයකින් වැඩි විය හැක. එහෙත් සංසුන්ව මුහුණදුන හොත් විලිබිය මුල් වී ඉක්මනින් සංසිඳී යනු ඇත. කෝපයට පත් මිනිසා තුළින් මිනිස් බව අතුරුදන් වෙයි. විනාශකාරී තිරිසන් ගති මතු වෙයි.

ආසාධාරණයක් විෂයෙහි ඇති කර ගන්නා කෝපය වුවද ප්‍රශ්නයට විසඳුමක් ගෙන එන්නේ නැත. තමා ම තමාගේ ක්‍රෝධය විශ්ලේෂණය කර සංසිඳවා ගත යුතුය. මෙය දුෂ්කර කාර්‍යයක් වුවද බැරි දෙයක් නො වේ. ක්‍රෝධය සංසිඳවා ගත් විට එයින් වන්නට තිබුණු අනර්ථයන් වළක්වා ගැනීම ගැන අපට සතුටු විය හැක.



උපන් කෝපය සන්සිඳුවා ගනී නම් උතුම් රියැදුරා ඒ තැනැත්තා ය.

222. යො වෙ උප්පතිතං කොධං
රථං භන්තං'ව ධාරයෙ
තම'හං සාරථිං බ්‍රෑමි
රස්මිග්ගාහො ඉතරො ජනො (17:2)

උපන් ක්‍රෝධය දුරු කරයි නම්
හසුරුවන සේ නොමග ගිය රිය
කියමි ඔහු වෙයි නියම රියැදුරු
ලනුව අල්ලනු පමණි අන් අය

කෝපය පාලනය කරන් - පදවන වාහනය ලෙසින්

17 (2) එක් සඟ නමක්ගේ වතක් (222 ගාථාව)

අලව් නුවර අග්ගාලව චේතිය නම් ස්ථානයෙහි බුදුරදුන් වැඩ සිටි සමයෙහි **එක් භික්ෂුනමක** පිළිබඳ සිද්ධියක් අරමුණු කර භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ගාථාව දේශනා කරන ලදී.

බුදුරදුන් ආරාම සේනාසන වශයෙන් ගොඩනැගිලි ඉදිකර පූජා කිරීම අනුදත් පසු බොහෝ ශක්ති ඇත්තෝ භික්ෂූන් වහන්සේලාට වාසය සඳහා සුදුසු ගොඩනැගිලි ඉදිකර දෙන්නට පටන් ගත්හ. එක් අප්‍රකට භික්ෂුනමක් තමන්ට ආරාම ඉදිකර දෙන හිතවත් දායක කෙනකු නො වූ හෙයින් තමා ම ඉදිකර ගන්නට සිතා ගසක් කපන්නට පටන් ගත්තේ ය. එක් දෙව්දුවක් ඒ ගස තම විමානය වශයෙන් භාවිත කළාය. ඇයට බිළිඳු පුතෙක් ද සිටියේ ය. භික්ෂුනම ගස කැපුවහොත් තමාට විමානයක් නැතිවන හෙයින් ඕ පුත්‍රයා ද රැගෙන ගොස් ගස නොකපා වෙනත් ගසක් තෝරා ගන්නා ලෙස ආයාචනා කළා ය.

එහෙත් භික්ෂුනම ඊට සවන් නොදී දිගටම ගස කැපීය. "මට වෙන ගහක් හොයා ගන්න බෑ. මම මේකම කපනවා" හේ කියා සිටියේ ය. "මටත් මගේ පුතාටත් වෙන තැනක් නෑ" යි පැවසූ දෙව්දුව පුතා දෙස බැලීමෙන් හිමිනම ගේ සිත උණුවෙතැයි සිතා පුතු ඔසවා හිමිනම කපමින් සිටි අත්ත මත තැබීය. එහෙත් පොරෝ පහර පාලනය කර ගැන්මට භික්ෂු නම අසමත් වූයෙන් එය බිළින්දාගේ අතෙහි වැදී තුවාල විය.

දෙව්දුව ගේ කෝපය ඉහවහ ගියේය. හිමිනම මැරී වැටෙන්නට පහරක් දෙන්නට සැරසුණාත්, එක්වරම "මේ භික්ෂුව ශීලවන්තයෙකි. මා ඔහු මැරුවොත් මට අපාදුක් විඳින්නට වෙයි. එය මට ම කරගන්නා අනර්ථයකි. එමෙන්ම තවත් භික්ෂූහු මේ වනයේ ගස් කපති. ඒ ගස්වල වසන දේවතාවන් ද මා අනුගමනය කළ හොත් විශාල භික්ෂු පිරිසකට අනර්ථයක් වෙයි." සිතා ක්‍රෝධය පාලනය කරගෙන බුදුරජාණන් වහන්සේ සොයා ගියාය.

කඳුළු සලමින් බුදුරදුන් සොයා ගිය ඕ තොමෝ බුදුන් වැඳ එකත් පසෙකට වූවා ය. "දෙව්දුව දුක්වන්නට හේතුව කුමක් ද?" යි බුදුහු විමසූ හ. "ස්වාමීනි, ඔබ වහන්සේ ගේ එක් ශ්‍රාවක නමක් මගේ විමානය වැනසුවේය එය බේරා ගන්නට මා පුත්‍රයා ඉදිරිපත් කළ ද පලක් නොවී ය. හේ මගේ පුත්‍රයා ගේ අත ද කපාලී ය. ස්වාමීනි, භික්ෂුව එතැනම මරා දමන්නට තරම් මට කෝපය ඇති විය.

එහෙත්, මම දුර දිග සිතා කෝපය පාලනය කර ගෙන ඔබ වහන්සේ හමුවට ආමි" යි කියා සිටියා ය. "ඉතා යහපති දෙව්දුව. ඉතා යහපති. අධි වේගයෙන් පාරෙන් ඉවතට යන රථයක් නවතා ගන්නා දක්ෂ රථාචාර්යවරයකු පරිද්දෙන් ඔබ ද තමා ක්‍රෝධය පාලනය කරගෙන තිබේ" යි පැවසූ බුදුරජාණන් වහන්සේ ඇයට ධර්මදේශනා කළ සේක. දේශනාවසානයේ ඕ සෝවාන් වූවා ය.

එහෙත් තවමත් දෙව්දුව ගේ හැඬුම් නතර නොවීය.

"තවමත් කඳුළු සලන්නේ කිම ද දෙව්දුව ?" යි බුදුරදුන් විමසූ විට "මට දැන් වාසයට තැනක් නැහැ ස්වාමීනි, මාත් දරුවත් කොහි යන්නද?" යි ඕ වැලපුණා ය.

බුදුහු "දුක් නොවන්න දෙව්දුව. මම ඔබට නවාතැනක් දෙමි" යි පවසා දෙව්රම් වෙහෙර අසල කිසි දේවතාවකු නොවිසූ රුකක් ඇයට වෙන්කර දුන්හ. මේ ගස ඇයට බුදුරදුන් විසින් වෙන් කර දුන් හෙයින් ආනුභාවයෙන් වැඩි දෙවි කෙනකුට වුවද එම අයිතියට අභියෝග කළ නොහැකි විය.

"මෙතැන් පටන් කිසිම ගසක් කිසිම භික්ෂුවක විසින් නො කැපිය යුතුය" යි භාග්‍යවතුන් වහන්සේ නීතියක් ද පැණවූ හ.

විවරණාත්මක අනුවාදය (222 ගාථාව)

යො වෙ උප්පතිතං කොධං භන්තං රථං ඉව ධාරයෙ
තං අහං සාරථිං බ්‍රෑමි ඉතරො ජනො රස්මිග්ගහො

යො: යම්කිසි පුද්ගලයෙක්; **වෙ**: ඒකාන්තයෙන්; **උප්පතිතං කොධං**: උපන් ක්‍රෝධය; **භන්තං රථං ඉව**: පාලනයෙන් මිදුණු රථයක් මෙන්; **ධාරයෙ**: හසුරුවා ගන්නේ නම්; **අහං**: මම; **තං**: ඒ තැනැත්තා; **සාරථිං බ්‍රෑමි**: රථාචාර්යයෙක් යැයි කියමි; **ඉතරො ජනො**: අනිත් තැනැත්තෝ; **රස්මිග්ගහො**: තෝන් ලනුව අල්ලන්නෝ (පමණක් වෙති).

පාලනයෙන් මිදී ගිය රථයක් මනාව හසුරුවා ගන්නාක් මෙන් උපන් ක්‍රෝධය පාලනය කර ගන්නා තැනැත්තාට මම නියම රියැදුරා යයි කියමි. අන්‍යයෝ හුදෙක් තෝන් ලණුව අල්ලන්නෝ පමණක් වෙති.

විවරණය

ක්‍රෝධයට බිලිවන්නෝ බොහෝ වෙති. මිනිසුන් කෝප ගන්නේ විවිධ හේතු නිසාය. බොහෝ විට මිනිසුනට ගැරහුම් ඇනුම් බැනුම් වැනි නොමනා ක්‍රියාවන්ට ගොදුරු වන්නට සිදුවේ. ඒවායින් සිත් දූෂණය වෙයි. තවත් සමහරු කුඩා වියේ පටන්ම විකෘතියට පත් මනසින් යුක්ත වෙති. එබඳු අතීත අමිහිරි අත්දැකීම් අප කාටත් තිබිය හැක. කෙසේ වුව ද කවර අමිහිරි අත් දැකීමකට වුවත් ඉවසිල්ලෙන් මුහුණ දීමට පුරුදු නොවුන හොත් ආයුෂ මාර්ගයෙහි සාර්ථකත්වයක් ලද නො හැක. එහෙයින් පුළුල්ව සිතා කෝපයට හෝ වෛරයට සිතෙහි ඉඩ නොලැබෙන පරිදි ක්‍රියා කළ මනාය.

කෝප වූ මිනිසා දිවා කල ඇස් නො පෙනෙන ඇතැම් සතුන් මෙන් පැහැදිලි යථාර්ථයට පවා අන්ධ වෙයි. කෝපයට පත් පුද්ගලයා තමා ම වනසා ගනියි. තමා සමගම පොර බදියි. තමාගේම පරම හතුරා බවට පත් වෙයි. සීල, සමාධි, ප්‍රඥා වර්ධනය කරන්නා තුළ ක්‍රෝධයට ඉඩ ලැබෙන්නේ නැත.



අසත් ගති - පැවතුම් ඇති පුඟුලන් සිව් දෙනෙකු සත්ගති ඇතිව දිනිය යුතු.

223. අක්කොධෙන ජිනෙ කොධං
අසාධුං සාධුනා ජිනෙ
ජිනෙ කදරියං දානෙන
සච්චෙන අලිකවාදිනං (17:3)

ක්‍රෝධය පරදන්න ක්‍රෝධය නො කිරීමෙන්
නරක පරදන්න නරකින් වැළකීමෙන්
ලෝබය පරදන්න නො මසුරු දන් දීමෙන්
බොරුව පරදන්න ඇත්තම පැවසීමෙන්

ජය හතරක් ලබන ලෙසත්

17 (3) උත්තරා උපාසිකාවගේ විස්තරය (223 ගාථාව)

වේළුවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **උත්තරා උපාසිකාවන්** අරබයා මේ ගාථාව වදාළ සේක.

උත්තරා නම් පුණ්ණ සිටාණන් ගේ දියණිය එම සිටුවරයා සිටු පදවිය හා ධනසම්පත් ලබන්නට පෙර සුමන නම් ධනවත් සිටුවරයා ගේ කුලී ගොවියෙක්ව සිටියේ ය. කුඹුරු වැඩ කරන අතරතුර සමාධි සුවයෙන් නැගී සිටි සැරියුත් හිමියන්ට දැහැටි, පැන් ආදිය සපයා බිරිඳ සමඟ එක්ව දන් පිළිගන්වා එම පින් බලයෙන් තමා වැඩ කරන කුඹුරේ රත්රන් පහල වීමෙන් ධනපති වූයේ ය. එතරම් විශාල ධනස්කන්ධයකට හිමිකම් කියන්නකු වෙනත් එරට නොවූ හෙයින් ඔහුට සිටු පදවියක් ද රජතුමා විසින් දෙන ලදී. ඔහු කලින් සේවය කළ සුමන සිටාණන්ගේ පුත්‍රයාට උත්තරා දියණිය පාවා දෙන ලදි.

සෝවාන්ව සිටි උත්තරාවනට සුමන සිටාණන්ගේ නිවසේ දී දනක් පිනක් කරගන්නට ඉඩක් නො ලැබුණේ එම පවුල මිථ්‍යාදෘෂ්ටිකයන් වූ හෙයිනි. එහෙයින් ඕ තමා මෙවන් තැනකට පැමිණීමෙන් වූ අලාභය ගැන සිය පියාට ලියා දැන්වූවා ය. පියා තම දියණියට දන් පින් කර ගැනීමට අවස්ථාවක් සලසා දෙනු වස් උපායක් කල්පනා කොට දියණියට ලියුමකින් උපදෙස් දුන්නා ය. හේ උත්තරාවට කහවුණු පහළොස් දහසක් යැව්වාය. එම කහවුණු 15,000 සිරිමා නම් නගර ශෝභනියට දෙන්න. දිනකට ඇය කහවුණු දහසක් අය කරන්නිය. ඇයට දින 15 කට ඔබේ සැමියාට භාර දෙන්න. ඒ දින 15 තුළ ඔබ බුදු පාමොක් මහ සඟනට දන් පිරිනමා පින් පුරා ගන්නයි උපදෙස් දුන්නේ ය.

සිරිමා ද සිටු මාලිගයට පැමිණ සිටු පුත්‍රයා සමග අති මහත් ප්‍රීතියෙන් කල් යැව්වා ය. ඇයට තමන් සිටුවරයාගේම බිරිඳ යැයි සිතිණ. උත්තරා තමන් මෙහි එවූ බව අමතක විය. පහළොස් වන දින සිටු පුත්‍රයා ඉහල මාලයේ කවුළුවෙන් බලන විට දැලි වැකුණු ඇඳුම් පැළඳුම් හැඳ වෙහෙස මහන්සිය වන උත්තරා දක්නට ලැබිණ. "විනෝදය නාඳුනන මේ මෝඩ ස්ත්‍රිය නිකරුණේ කරදර වන හැටි" යි ඔහුට හිනා ගියේ ය.

සිරිමා ද ඒ දැක උත්තරාවන් සමඟ සිනාසුනා යයි සිතා සිත ඊෂ්‍යාවෙන් පිරී ක්‍රෝධයෙන් දැවීගොස් වහා ඔවුන් කෑම පිසින ශාලාවට ගොස් උණුතෙල් හැන්දක් ගෙන උත්තරාවගේ හිසට වත් කරන්නට ආවා ය. ඇය එනු දුටු උත්තරා "මා මේ පුණ්‍යස්කන්ධය රැස්කර ගන්නේ මේ තැනැත්තිය නිසා නොවේ ද? එහෙයින් ඇයට මා අතිශයින්ම ණය ගැතිය. ඇය මට සහෝදරියක් හා සමානය" යි මෙත් සිතුවිලි පහළ කළා ය. තම හිස මත වත් කරන්නට උණු තෙල් ගෙන එන බව තේරුම් ගත් වහා "මා තුළ මේ තැනැත්තියට වෛරයක් නැත. ඒ සැබෑ නම් මේ උණුතෙල් මට සිසිල් පැන් වේවා" යි සත්‍යක්‍රියා කළා ය. උණු තෙල් ඇය හිස මත වැටී සිසිල් පැන් විය. ඇයට බින්දු මාත්‍ර හෝ හානියක් නොවීය. එහෙත් එවන් ප්‍රාතිහාර්‍ය බලය තේරුම් නොගත් සිරිමා තවත් හැන්දක් ගෙන එන්නට ගියද සේවිකාවෝ ඇය වළක්‍ා පහර දෙන්නට තැත් ,කළාය. උත්තරා ඇය බේරා ගෙන මා පින් කර ගත්තේ මෙතුමිය නිසා ය. ඇයට හිරිහැර නොකරන්නැයි කීවාය. එයින් තමා කළ වරද තේරුම් ගත් සිරිමා සමාව අයැද සිටිය ද බුදුරදුන් සමා කරවා ගන්නැයි උත්තරා ඇයට උපදෙස් දුන්නාය.

පසු දින සිරිමා ද දානවස්තුවක් පිළියෙළ කළා ය. උත්තරාම ගේ නිවසේ දන් පිරිනැමූ අනතුරුව සිදුවූ සියල්ල බුදුරදුන් හමුවේ සැල කරන ලදී. අනතුරුව උත්තරා බුදුරදුන් අමතා "සමිඳුනි, මා මේ දින 15 ක් පුරා දන් දී බණ අසා බුද්ධෝපස්ථාන, සංඝොපස්ථාන කර පින් කර ගත්තේ මේ සොහොයුරිය නිසාය. ඇයට මා තුළ බින්දු මාත්‍ර හෝ වෛරයක් නැත. ඉදිරියටත් මෙ පරිද්දෙන් ම මෙත් කරමි" යි කීවා ය. "ඉතා යහපති උත්තරා, ඉතා යහපති. තමන්ට හිරිහැර කළ අයටත් ඔබ මෙත් කළා ය. වෛරය දිනා ගත යුත්තේ මෛත්‍රියෙනි" යි අනුශාසනා කර මේ ගාථාවද වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (223 ගාථාව)

කොධං අක්කොධෙන ජිනෙ, අසාධුං සාධුනා ජිනෙ,
කදරියං දානෙන අලිකවාදිනං සච්චෙන ජිනෙ

කොධං: ක්‍රෝධය; **අක්කොධෙන**: ක්‍රෝධ නොකිරීමෙන්; **ජිනෙ**: ජයගන්න; **අසාධුං**: නරක; **සාධුනා**: හොඳ දෙයින්; **ජිනෙ**: දිනන්න; **කදරියං**: මසුරුකම; **දානෙන**: දානයෙන් (ද); **අලිකවාදිනං**: බොරුකාරයා; **සච්චෙන**: සත්‍යයෙන; **ජිනෙ**: දිනන්න.

මෛත්‍රියෙන් ක්‍රෝධ කරන්නා දිනිය යුතුය. යහපත් පුද්ගලයා විසින් අයහපත් පුද්ගලයා දිනිය යුතුය. දීමෙන් මසුරු කම දිනිය යුතුය. සත්‍යයෙන් බොරු කියන්නා දිනිය යුතුය.

විවරණය

නිරෝධ සමාපත්තිය: නම් නිරුද්ධ වීම පිළිබඳ ධ්‍යානයයි. මෙය සියළු ධ්‍යාන අතර අග්‍ර වන්නේ ය. නිර්වාණයට අතිශයින්ම සමාන සමාධියයි. තාවකාලිකව සියළු සංඥා හා වින්දන (සඤ්ඤා වේදයිත) නිරුද්ධ කිරීම මෙයින් සිදු වෙයි.



සත්‍ය කථා කිරීම ද, නො කිපීම ද, මඳ දෙයකුදු දීම ද, දෙව්ලෝ සැප ලැබුමට කරුණු ය.

224. සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය
දජ්ජාප්පස්මිං'පි යාචිතො
එතෙහි තීහි ඨානෙහි
ගච්ඡෙ දේවාන සන්තිකෙ (17:4)

ඇත්ත කියන්නේ - කෝප නොවන්නේ
ටික මුත් ඉල්ලූ කෙනකුට දෙන්නේ
මේ තුන් ගුණ හරි හැටි සපුරන්නේ
ඉන් දෙවියන් මැදියම උපදින්නේ

දෙව්ලොව දිනූ මැන - පුරා මෙ තුන් ගුණ

17 (4) මුගලන් තෙරුන් පින ගැන නැගූ ප්‍රශ්න. (224 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ විසූ අමා මෑණී වූ බුදුරජාණන් වහන්සේ විසින් මහ මුගලන් තෙරුන් නඟනා ලද පැනයක් අරබයා මේ ගාථාව වදාළ හ.

වරක් දෙව් ලොව වැඩම කළ මහා මුගලන් තෙරුන් වහන්සේ දෙව්වරුන් වින්දනය කරන මහත් වූ දිව්‍ය ආශ්චර්‍ය්‍යය දැක ඔවුන් කළ කුසලානිශංසයන් දැන ගන්නට රුචි වූ හ.

එහෙයින් උන්වහන්සේ කීපදෙනකු ගෙන් ප්‍රශ්න කළ හ.

"දන් දෙන්නට තරම් දේපලක් නොවූ හෙයින් දානමානාදී පින්කම්, චෛත්‍ය පූජා, ධර්‍ම ශ්‍රවණ ආදී කිසිවක් කර ගන්නට බැරි විය. මා දෙව්ලොව උපන්නේ සත්‍යවාදීව සිටීමේ ආනුභාවයෙනි" යි එක් දෙව් දුවක් කීවාය.

තවත් දෙව් දුවක් කීවේ "මම ඉතා දුප්පත් හෙයින් ගෙදරක බැල මෙහෙ කළෙමි. එහි ස්වාමි දුව නිතරම මට ඇණුම් බැනුම් අවමන් කළ ද ඒ හැම මෙත් සිතින් ඉවසුවෙමි. මගේ පින එයයි." යි පැවසුවා ය. තවත් පිරිසක් "මම උක්දණ්ඩක් දන් දිනිමි." "මම පළතුරක් පූජා කළෙමි." "මම පලා මිටියක් පිදුවෙමි." "මම කොහොඹ අත්තක් පූජා කළෙමි" ආදී වශයෙන් දානමය පින්කම් කියා පෑහ.

භාග්‍යවතුන් වහන්සේ වෙසෙන තැනට පෙරළා පැමිණි මුගලන් තෙරණුවෝ "ස්වාමීනි, වැඩි පින් කමක් නැතත් සත්‍යවාදීව විසූ පමණින්, ක්‍රෝධ නොකිරීම් පමණින්, පිපිඤ්ඤා ගෙඩියක්, උක්දණ්ඩක් පිදූ පමණින් දෙව් සැප ලද හැකි ද?" යි විමසූ හ. "මොග්ගල්ලාන, මා අතින් නො විචාළත් දෙව්ලොව දෙවියන් වෙතින් විචාරා ඔබම දැන ගත්තා නොවේ ද?" යි බුදුහු විමසූ හ. "ස්වාමීනි, මා පමණක් දැන ගෙන පලක් නැති හෙයින් සියල්ලන්ට ම දැන ගනු පිණිස ඔබ වහන්සේ ලවා ව්‍යාකරණය කරගනු පිණිස විමසීමි"යි කීහ. භාග්‍යවතුන් වහන්සේ එවිට මේ ගාථාව වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (224 ගාථාව)

සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය යාචිතො අප්පස්මිං අපි
දජ්ජා එතේහි තීහි ඨානෙහි දේවානං සන්තිකේ ගච්ඡෙ

සච්චං: සත්‍යය; **භණෙ**: කියන්නේය; **න කුජ්ඣෙය්‍ය**: නො කිපෙන්නේය; **යාචිතො**: ඉල්ලූ විට; **අප්පස්මිං**: ස්වල්පයක්; **අපි**: වුව ද; **දජ්ජා**: දෙන්න; **එතෙහි තීහි ඨානෙහි**: මේ තුන් කරුණෙන්; **දේවානං**: දෙවියන් ගේ; **සන්තිකෙ**: සමීපයට; **ගච්ඡෙ**: යන්නේය.

ඇත්ත කියන්න. කෝප නොවන්න. යමක් ඉල්ලූ විට සුළු වශයෙන් වත් දෙන්න. මේ පුණ්‍ය කර්‍ම තුනෙන් දෙව්ලොව උත්පත්තිය ලද හැක.

විවරණය

න කුජ්ඣෙය්‍ය: යන අනුශාසනයෙන් කෝප නො වන්නැයි සිහිපත් කෙරෙයි. ක්‍රෝධය සිතෙහි ඇතිවන නපුරු ගතියකි. ක්‍රෝධය විවිධ අවස්ථාවන්හි, ප්‍රමාණ අනුව උස් පහත්ව මතු වෙයි. මිනිසා තමාටම පාලනය කර ගන්නට බැරි තත්ත්වයට පත් කරන ක්‍රෝධය ඉතා සුළු මානසික කැළඹිල්ලක් ලෙස ආරම්භ වී අවි ආයුධ ගෙන මහා විනාශයක් කරන තත්ත්වයට උග්‍රව නැගෙයි. ඇතැම් විට මෙබඳු වෛරයෙහි අවසානය තමා ගේ හෝ අනුන්ගේ ජීවිත හානිය විය හැක.

තරහ හෙවත් ක්‍රෝධය අප සිත් තුළ ඇතිවන විවිධ ප්‍රාමණයන් ගැන අටුවාවල රමණීය විස්තර දක්නා ලැබේ.

කොධනො දුබ්බණ්ණො හොති - අථො දුක්ඛම්පි සෙති සො
අථො අත්ථං ගහේත්වාන - අනත්ථං අධිගච්ඡති

ක්‍රෝධය සිතට නැඟුණු විට හමේ පාට වෙනස් වෙයි. (දුර්වර්ණ වෙයි) දුකින් පිරි සිතින් වැතිරී සිටියි. යහපත්, ප්‍රයෝජනවත් දේ ප්‍රාර්ථනා කරන නමුත් අයහපත් ප්‍රතිඵල ම ලබයි.

තතො කායෙන වාචාය - වධං කත්වාන කොධනො
කොධාභිභූතො පුරිසො - ධනජානිං නිගච්ඡති

ක්‍රෝධයෙන් උමතුවූ තැනැත්තා කයින්, වචනයෙන් මෙන්ම සිතින් ද අනුන්ට වධ වේදනා පමුණුවයි. හෙතෙම ධන හානියට ද පත් වෙයි.

දුම්මඞ්කුයංස දස්සෙතා - ධූමග්ගිව්ව පාවකො
යතො පතායති කොධො - යේන කුජ්ඣන්ති මානවා

දුම් දමන මහා ලැව් ගින්නක් මෙන් කුපිතයා ගේ මුහුණේ පෙනුම දරුණු අප්‍රසන්න තත්ත්වයකට පත් වෙයි. කවර හේතුවක් නිසා හෝ කෝප වූ තැනැත්තා කියන දේ අර්ථ ශූන්‍ය වෙයි. හෙතෙම අසරණ තත්ත්වයට වැටෙයි.



අනුන්ට හිංසා නො කරන මනා සංවරයෙහි පිහිටි මුනිවරු මරණ රහිත වූ ඒ උතුම් නිවණට පැමිණෙත්.

225. අහිංසකා යෙ මුනයො
නිච්චං කායෙන සංවුතා
තෙ යන්ති අච්චුතං ඨානං
යත්ථ ගන්ත්වා න සොචරෙ (17:5)

අහිංසක මුනි වර
කයින් වී නිති සංවර
යති තැනට නැති මර
වෙසෙති එහි ගොස් සෝක නොම කර

උතුම් අහිංසක මුනිවර - යති තැනකට අජරාමර

17 (5) බුදු පියාණන්ට දෙමාපිය වූ යුවලක් (225 ගාථා)

සාකේත නුවර ආසන්නයේ අඤ්ජන වනයේ වැඩ විසූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ තමන්ට මාපිය කම් කියමින් හිතවත් වූ **බමුණු යුවලක්** ඇරබ මේ ගාථාව වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ සාකේත නුවර පිඬු සිඟා හැසිරෙත් දී එක් මහළු බමුණෙක් දිව අවුත් පා මුල වැටී "පුත්‍රය, මෙ පමණ කලක් මහළු අප බලන්නට නො පැමිණියේ ඇයි? මහළු දෙමාපියන් දැකීම දරුවන් ගේ යුතුකම නො වේ ද? යමු, යමු, මෑණියන් දැක ගන්නට යමු" යි පවසා තම බිරිඳ දක්වන්නට බුදුරදුන් ද කැඳවා ගෙන ගියේ ය. බුදුහු ද යමක් නොකියා බ්‍රාහ්මණයා සමඟ ඒ නිවසට වැඩම කළ හ. බැමිණිය ද වහාම "පුතණුවනි, බොහෝ කලකින් දුටුවෙමි" යි මහත් ස්නේහයෙන් බුදුන් වැළඳ තම දරුවන් කැඳවා "මේ හැමගේ ම ලොකු අයියා ය. ලොකු අයියාට වඳින්න" යි කීවා ය. ඔවුහු ද ආදරයෙන් බුදුන් වැන්දා හ. එතැන් පටන් ඔවුහු බුදුරදුන්ට තමන්ගේ ම දරුවකුට සේ උවටැන් කළ හ. නිතර නිතර දන් පිදූහ. බුදුහු ද කිසි වෙනසක් නො දක්වා ඔවුන්ගේම දරුවකු ගේ ඒ සියල්ල ඉවසූ හ. අතරතුරේ ඔවුහු අනාගාමී ඵලය ද ලත් හ. බමුණු දම්පතීන් ගේ හා බුදුරදුන් ගේ මේ පැවැත්ම භික්ෂූන් වහන්සේලා ගේ විමතියට හේතු වූයෙන් ඔවුහු ඒ පිළිබඳව තථාගතයන් වහන්සේ ගෙන් විමසූ හ.

"මහණෙනි, මේ බමුණු යුවල සසර බොහෝ දහස් වරක් මට දෙමාපිය වූහ. ඇතැම් අවස්ථාවල සුළු පිය - සුළු මව් වූහ" යි බුදුරදුන් පැහැදිලි කළෙන් විමතිය දුරුවිණි. තවත් තෙමසක් මහළු යුවල බුදුරදුන්ට උවටැන් කළ හ. දහම් ඇසූ හ. අවසන ඔවුන් මිය ගියේ රහත් ඵලය ද ලබමිනි.

බමුණු යුවල බුදුරදුනට දරු සෙනෙහසින් උවටැන් කළ බව දත් සැදැහැතියෝ ඔවුන් ගෞරවණිය ලෙස ආදාහනය කළහ. සියල්ල නිම වූ පසු භාග්‍යවතුන් වහන්සේ ගෙන් "ස්වාමීනි, ඔබ වහන්සේ ගේ දෙමාපිය යුවල කොහි උපන්නා ද?" යි විමසූ හ. "මහණෙනි, රහත් වූවනට යළි ඉපදුමක් නොමැත. ඒ අහිංසක යුවල පිරිනිවන් පෑ හ" යි වදාළ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාවෙන් ධම් දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (225 ගාථාව)

යෙ මුනයො අහිංසකා නිච්චං කායෙන සංවුතා තෙ
යන්ථ ගන්ත්වා න සොචරෙ අච්චුතං ඨානං යන්ති

යෙ මුනයො: යම් මුනිවරු; **අහිංසකා:** (අනුන්ට) හිරිහැර නො කරත් ද; **නිච්චං:** නිතර; **කායෙන: කයින්**; සංවුතා: සංවර වූවාහුද; **තෙ:** ඒ මුනිවරු; **යත්ථ:** යම් තැනකට; ගන්ත්වා: **ගොස්**; **න සොචරෙ:** ශෝක නොකරත් ද; **අච්චුතං:** මරණයක් නැති (නිර්වාණ යයි කියන ලද); **ඨානං:** (එම) ස්ථානයට; **න යන්ති:** යති.

අහිංසක මුනිවරු නිතර කයින් සංවරව වසත් නම් ඔවුහු ශෝක නැති, මරණය නැති තැන වූ නිර්වාණයට යති.

විවරණය

අච්චුතං ඨානං: යන්නෙන් මරණයත්, චුතියත් නැති නිර්වාණය අදහස් වෙයි. සියල්ල විනාශයට යන නමුත් නිර්වාණය එම තත්වය අභික්‍රමණය කර සිටීමකි. සසර සමඟ සංසන්දනය කරමින් නිර්වාණය නිත්‍ය (ධ්‍රැව), සුභ සහ සුඛ වශයෙන් හඳුන්වන්නේ එහෙයිනි.

ලොව සියල්ල සංඛත හා අසංඛත වශයෙන් බෙදිය හැකිය. පටිච්ච සමුප්පන්න සියල්ල සංඛත ය. සංඛත දේවල ලක්‍ෂණ තුනක් වෙයි. එනම්, උප්පාද (හට ගැනීම) වය (විනාශ වීම) ඨිතස්ස අඤ්ඤතත්ථ (පවතින අතරතුරේ දිගට ම වෙනස් වීම) යන තුනයි. හේතු-ප්‍රත්‍ය සමවාය නිසා හටගන්නා සියළුම දේ මෙලෙස නිබඳව නිරන්තරව වෙනස් වෙයි. අංශුමාත්‍ර හෙවත් අතිශය සියුම් අණුමාත්‍ර පදර්ථයේ සිට අති මහත් වස්තුව තෙක් සකල විධ භෞතික හා අභෞතික සියල්ලම මෙම අනිත්‍යතාවට යටත් ය. චිත්තය වූ කලී භෞතිකයට ද වඩා ශීඝ්‍රයෙන් වෙනස් වන්නේ ය. මෙසේ සංස්කෘත ධර්ම නිරන්තර උත්පාද-වය ස්වභාවයට යටත් වුවද අලෞකික වූ අසංස්කෘත වූ නිර්වාණය අජාත, අජර, අමර වෙයි. නිර්වාණය හේතුවක් හෝ ඵලයක් නො වේ. එහෙයින් එය සුවිශේෂ කේවල පදාර්ථයකි. හේතුවකින් හටගත්තේ නම්, එය ද ජරා මරණ ස්වභාවය නො ඉක්මවයි. එහෙයින් නිර්වාණය අප්‍රණීත්‍ය සමුත්පන්න ය. අජරය අමරය.

මනුෂ්‍ය ජීවිතය දුකින් පිරී පවතින්නකි. දුක කවර තරම් බරපතල ද යත් සමහරු සිය දිවි නසා ගන්නට පවා පෙළඹෙති. එහෙත් ඉඳහිට ලැබෙන සුඛාස්වාදය හේතුවෙන් මිනිස්සු දුක පිළිබඳ යථාවබෝධයෙන් තොරව සසර සුවයක් කොට සිතති. එසේ සසර සුවපත් සේ වැරදි දෘෂ්ටියක් ගත් විට අනිවාර්යයෙන් තමා වෙත එන දුක් සහගත අත්දැකීම් විඳ දරා ගත නොහැකි වෙයි. එවිට බලාපොරොත්තු සුන් වී දිවිනසා ගැනීම වැනි අඥාන තීරණ වලට එළැඹෙති. එහෙත් එය ගැටළුවට විසඳුමක් නො වේ. දිවි නසා ගැනීමෙන් සසර කෙළවර වන්නේවත්, කෙටි වන්නේවත්, සුඛදායක වන්නේවත් නැත. ඒ වෙනුවට නැවත නැවත උපදිමින් මැරෙමින් තව තවත් දුක ලබන්නට මඟ පෑදෙයි. එහෙයින් දුක පිළිබඳ අවබෝධය විපතට නොව සැපතට හරවා ගැනීම පිණිස දුකෙහි නිදානය ගවේෂණය කොට එය මුලෝත්පාටනය කළ යුතු ය. බුද්ධාදී උතුමන් විසින් කරන ලද්දේ එයයි. දුක පිළිබඳ අමිහිරි අත්දැකීම නිර්මාණශීලීව අර්ථසම්පන්නව යොදා ගන්නා උතුමෝ විමුක්ති සුවය ලබා ගනිති. අච්චුතං ඨානං යි හැඳින්වෙන නිර්වාණය සාධනය කර ගනිති.



නිදි වැරීම් ඇති, රෑ දාවල්හි හික්මෙන, නිවණෙහි ඇලුණවුන් ගේ කෙලෙස් නැස්මට පැමිණෙති.

226. සදා ජාගරමානානං
අහොරත්තානුසික්ඛිනං
නිබ්බාණං අධිමුත්තානං
අත්ථං ගච්ඡන්ති ආසවා (17:6)

නිති පිබිදී සිටිමින්නේ
දිවා රැයේ හික්මෙන්නේ
නිවනට සිත නමමින්නේ
කෙලෙසුන් සුන් වී යන්නේ

නිදි නොලබා - නිවන් පතා

17 (6) පුණ්ණාවන් ගේ විත්තිය (226 ගාථාව)

රජගහ නුවර විසූ මෙහෙකාර දැරියක වූ **පුණ්ණාවන්** ඇරබ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව වදාළේ ගිජුකුළු පව්වෙහි වැඩ විසූ සමයේ ය.

දිනක් ඇය මෙහෙ කළ නිවසේ ස්වාමිවරු ඇයට සහල් විශාල ප්‍රමාණයක් කොටන්නට දුන් හ. රෑ වනතුරු කෙටුවත් ඉවරයක් කර ගන්නට බැරි වූයෙන් පහනක් දල්වා ගෙන රෑත් කෙටුවාය. දැඩි ලෙස වෙහෙස වූ ඕ දහදිය නිවාගනු පිණිස රෑ මැදියම ගෙයින් පිටත්ව අවුත් එළිමහනේ සිසිල් සුළඟ විඳිමින් සිටියා ය. රාත්‍රියේ ඇයට දක්නට ලැබුණේ අපූරු දර්ශනයකි. බුදුරදුන්ගෙන් බණ අසා සැතපෙන්නට කුටි වලට යන තෙරවරුන්ට ඒ තැන් පෙන්වන්නට බාරව සිටි දබ්බමල්ල තෙරුන් විසින් තමන්ට ඒ හැම නමම ඒ ඒ කුටිවලට කැඳවාගෙන යාම වෙහෙස දායක හෙයින් ඍද්ධි බලයෙන් තෙරවරුන් පිරිසක් මවා තිබිණි.

ඒ තෙරවරු තම ඇඟිලි දල්වා ගෙන ඒ එළියෙන් බණ ඇසූ හිමිවරුන් නවාතැන් කරා කැඳවාගෙන ගිය හ. මේ දර්ශනය දුටු පුණ්ණා විශ්මයට පත්ව "මම නම් දුගී දුප්පත්ව ඉපිද අනුන්ට බැල මෙහෙ කරන හෙයින් මෙසේ නිදි මරන්නෙමි. මේ හිමිවරුනට එබඳු ගැටළුවක් නැත. උන්වහන්සේ ලා රාත්‍රියෙහි මේ නිදි නොලබා කරදර වන්නේ ඇයි?" යි සිතුවාය. "කාට හරි හිමිනමකට රාත්‍රියේ අසනීපයක් හැදිලා ඇති. එක්කෝ සර්පයෙක් දෂ්ට කරලා ඇති" ඇයගේ නිගමනය වූයේ එයයි.

පසු දින උදේ දැඩි කුසගින්න නිසා සහල් නිවුඩු කුඩු ඇල් දියෙන් අනා රොටියක් තනා ගත් ඕ ස්වාමිදූවරුන් දුටුවොත් අවමන් ලබන්නට වෙතියි සිතා එය ඇඳුම් අතර සඟවා ගෙන "පැන් ගෙනෙන්ට යන අතර මග කමි" යි කලය ද රැගෙන පැන් තොටට නික්මුණා ය.

උදෙන්ම භාග්‍යවතුන් වහන්සේ ද පිඬු සිගා ඒ මග වැඩම කළ සේක. ඒ දුටු පුණ්ණා "වෙනදාට මට බුදුන් දැක්නට ලැබෙන්නේ පුදන්නට දෙයක් නැති විට ය. පුදන්නට දෙයක් ඇතිව සිටි කිසිදාක බුදුරදුන් හමු නො වීය. අද නම් කුඩු රොටියක් තිබේ. බුදුන් ද හමුවිය. අද පූජාවක් කරගත හැකිය" යි සිතා කළය පසෙක තබා බුදුන් වැඳ "ස්වාමීනි, මේ රොටිය රසක් නැතත් මට අනුකම්පාවෙන් පිළිගත මැනවි" යි කියා පිළිගැන්වූ විට උන්වහන්සේ එය පිළිගත් හ.

තමන් පිදූ රොටිය පිළිගත් නමුත් "දිව්බොදුන්, රජ බොදුන් වළඳා පුරුදු බුදුරදුන් එය නො වළඳනු ඇත. රජ-මැති සිටු කෙනකුන් දෙන දෙයක් වළඳා රොටිය බල්ලෙකුට දෙන්නට ඉඩ ඇත" යි සිතූ ඕ මඳ වෙලාවක් බලා සිටියා ය. සිතිවිල්ල දැනගත් භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් ලවා සඟල සිවුර නමා බිම එලා අසුනක් පණවාගෙන වැඩ වී එම දානය වැළඳූ සේක.

දානය පිළිගන්වා පුණ්ණා ප්‍රාර්ථනා කළේ භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය අවබෝධ කර ගෙන තෘෂ්ණාවට ඇති දාස බවින් මිදෙන්නට ය. ඒ පැතුම සාර්ථක වෙත්වා යි බුදුහු ද සෙත් පැතූ හ.

උදෑසන ලද කුඩු රොටිය වැළඳූ භාග්‍යවතුන් වහන්සේ පුණ්ණා අමතා "ඔබ මගේ ශ්‍රාවකයනට දොස් නැගුවේ මන්ද?"යි විමසූ හ. "මම එසේ නො කළෙමි" යි ඕ පිළිවදන් දුන්නා ය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඇය පෙරදින රෑ යෙහි සිතූ සිතිවිලි මතක් කර දුන්නා ය. "පුණ්ණාවෙනි, ඔබ නිදි මැරුවේ ඔබට ඇති වූ කායික අපහසුව-වෙහෙස මහන්සිය නැතිකර ගැනීමට සුළං මිහිර විඳ ගනිමිනි. මාගේ ශ්‍රාවකයන් නිදි මැරුවේ අප්‍රමාදීව සතිමත්ව වසමිනි "යි. මේ ගාථාවෙන් ධර්ම දේශනා කළ හ. ධර්ම දේශනාවසානයේ පුණ්ණා සෝවාන් වූවා ය.

විවරණාත්මක අනුවාදය (226 ගාථාව)

සදා ජාගරමානානං අහොරත්තං අනුසික්ඛිනං නිබ්බාණං
අධිමුත්තානං ආසවා අත්ථං ගච්ඡන්ති

සදා: හැම කල්හිම; **ජාගරමානානං**: (කෙලෙස් නින්දෙන්) නො නිදන්නා වූ; **අහොරත්තං**: දිවා රාත්‍රියෙහි; **අනුසික්ඛිනං**: (ත්‍රිශික්ෂාවන්හි) හික්මෙන්නා වූ; **නිබ්බාණං අධිමුත්තානං**: නිවණෙහි ඇලුනා වූ යෝගාවචරයන් ගේ; **ආසවා**: කාමාදී චතුර්විධ ආශ්‍රවයෝ; **අත්ථං ගච්ඡන්ති**: නිමාවට යති. (අස්තයට)

හැම කල්හිම කෙලෙස් නින්දෙන් නො නිදන්නා වූ දිවා රාත්‍රියෙහි ත්‍රිශික්ෂාවන්හි හික්මෙන්නා වූ නිවණෙහි ඇලුනා වූ යෝගාවචරයන් ගේ කාමාදී චතුර්විධ ආශ්‍රවයෝ නැසී යයි.

විවරණය

ආසවා: කෙලෙස්ය. බුදුහු ආසව, ආසව සමුදය හා ආසව නිරෝධය ද දත්හ. කාමාසව, භවාසව හා අවිජ්ජාසව වශයෙන් ආසව ත්‍රිවිධ ය. මේ සියල්ලෙන්ම භාග්‍යවතුන් වහන්සේ විමුක්ත වූහ. උන්වහන්සේ ගේ ප්‍රබුද්ධ ශ්‍රාවකයෝ ද මෙම ආසව නිරෝධය පිණිස දිවා රෑ බඹසර පිරූ හ.

නින්දාව හා පැසසීම පෙරැසිට පැවතෙන්නකි. අද පටන් ගත් එකක් නොවේ. ලොවැ නින්දා නො ලබන්නෙක් නැත.

227. පොරාණමෙතං අතුල නෙතං අජ්ජතනාමිව නින්දන්ති තුණ්හිමාසීනං නින්දන්ති බහුභාණිනං මිතභාණිම්පි නින්දන්ති නත්ථි ලොකෙ අනින්දිතො (17:7)	පෙර සිට එන දෙයකි අතුල අද ඊයේ දෙයක් නොවෙයි නිහඬව සිටියත් ගරහයි ගොඩක් කතා කළත් බණියි ගණනට දෙඩුවත් ගරහයි කොයි කාටත් බැණුම් ලැබෙයි.

කවුද ලොව ගැරහුම් නො ලද්දේ

17 (7) අතුල උපාසකයන් ගේ කතා පුවත (227 සිට 230 ගාථා)

බුදුහු දෙව්රම් වෙහෙරෙහි වැඩ විසූ අවදියෙහි එහි පැමිණි **අතුල** නම් උපාසකයා හා ඔහු ගේ පිරිවර අරබයා බුදුරජාණන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

සැවැත් නුවර විසූ අතුල උපාසක තැනට පන්සියයක් මිතුරු උපාසකවරු සිටිය හ. දිනක් හෙතෙම ඒ හැම සමඟ ධර්ම ශ්‍රවණය සඳහා විහාරස්ථානයට පැමිණියේ ය. එසේ පැමිණ රේවත හිමියන් දැක උන්වහන්සේ ගෙන් බණ අසමු යි වැඳ නමස්කාර කොට එකත්පස්ව හුන් හ.

රේවත හිමි වනාහී විවේක සුවයම කැමති භික්ෂු නමකි. එහෙයින් උන්වහන්සේ කිසිවක් නො වදාරා නිහඬව හුන් හ. එයින් සිත කළකිරුණු අතුල "උන් වහන්සේ වදාරණ බණක් නැත. සැරියුත් තෙරුන් කරා යමු" යි පිරිස ද කැඳවා ගෙන සැරියුත් මහ තෙරුන් කරා ගියේ ය. උන්වහන්සේ ගේ "උපාසකවරුනි, කුමක් නිසා පැමිණියාහු දැ" යි විමසා "බණ අසන්නට ආවෙමු" යි කී විට "එසේ නම් හිඳගන්න" යි පවසා දීර්ඝ අභිධර්ම දේශනයක් කළ හ. එවිට ඔවුහු මෙසේ සිතූ හ."අභිධර්මය ඉතා සියුම් ගැඹුරු දේශනයකි. තෙරුණුවන් වහන්සේ එය ඉතා දීර්ඝව දේශනා කළ සේක.

එහෙත් ඒ ගැඹුරු දහම් අපට වැටහෙන්නේ නැත. උන් වහන්සේ අපට නොවැටහෙන ගැඹුරු අභිධර්ම දේශනා කළ සේක" යි සිත් බිඳගෙන නික්ම ආනන්ද හිමියන් වෙත ගියේ ය. "කිම ද උපාසකය" යි විචාළ උන්වහන්සේට අතුල මෙසේ කීය. "ස්වාමීනි, අපි බණ අසන්නට සිතා රේවත තෙරුන් වහන්සේ හමුවට ගියෙමු. උන්වහන්සේ තමන් දන්නා බණක් නැතිවාක් මෙන් නිශ්ශබ්දව හුන් හ. එහෙයින් අපි සාරිපුත්ත මහ රහතන් වහන්සේ වෙත ගියෙමු. උන්වහන්සේ ඉතා දිගට අභිධර්ම දේශනාවක් කළ හ. සියුම් ගැඹුරු ධර්මයක් වූ එය ඔහු නුවණැත්තන්ට ගෝචර නමුත් මේ සාමාන්‍ය නුවණැති අපට ගෝචර නො වීය. ඒ නිසා ඔබ වහන්සේ සොයා ආවෙමු. "එසේ නම් උපාසකවරුනි, සවන් යොමු කරන්න" යි පැවසූ ආනන්ද හිමියෝ වැඩිත් නොකර අඩුත් නොකර ධර්ම දේශනා කළ හ. ඉතා සරලව දේශනා කළ හෙයින් ඔවුනට එය මනාව අවබෝධ විය. එහෙත් එය කෙටි වැඩියැයි සිතූ ඔවුහු ඒ ගැන සිත් අමනාප කර ගත් හ.

අනතුරුව භාග්‍යවතුන් වහන්සේ සොයා ගිය ඔවුහු වැඳ එකත් පස්ව හිඳගත්හ. "උපාසක වරුනි, කුමක් නිසා ද මෙහි පැමිණියේ?" යි උන්වහන්සේ විචාළ හ.

"බණ අසන්නට ආවෙමු" යි ඔවුහු පිළිවදන් දුන් හ. "උපාසකවරුනි, ඔබ බණ ඇසුවා නො වේ ද?" "සම්දුනි, අපි මුලින්ම රේවත හිමියන් වෙත ගියෙමු. උන්වහන්සේ කිසිවක් නො වදාළහ. ඒ ගැන සිත් අමනාපයෙන් අපි සැරියුත් මහ තෙරුන් කරා ගියෙමු. මේ නුවණ මඳ අපට උන්වහන්සේ ඉතා සියුම් වූ ගැඹුරු අභිධර්මයෙන් ධර්ම දේශනා කළ හ. අභිධර්මය ගැඹුරු වුවත් සියුම් වුවත් අපට ඒ නොවැටහෙන හෙයින් සරල ලිහිල් බණක් අසාගනු පිණිස ආනන්ද හිමියන් සොයා ගියෙමු. උන්වහන්සේ උගුර රිදෙන්නාක් සේ මඳකින් නතර වූහ. ඒ නිසා දැන් අපි ඔබ වහන්සේ සොයා ආවෙමු."

ඒ අසා සිටි භාග්‍යවතුන් වහන්සේ "අතුල, මේ අද ඊයේ වැඩක් නොව බොහෝ ඈත කල සිටම පැවත එන ගතියකි. මිනිස්සු නිශ්ශබ්දව සිටින්නාට ද නින්දා කරති. බොහෝ කතා කරන්නාට ද නිගා කරති. පමණට කතා කරන්නාට ද නිගා කරති. ලෝකයේ නින්දා නොලැබුවෙක් නැත. දිගටම ප්‍රශංසා පමණක් ලැබූ කෙනෙක් හෝ නින්දා පමණක් දිගටම ලැබූ කෙනෙක් ලොව සිටියේත් නැත. දැනටත් නැත. මතු ඇතිවන්නේත් නැත. රජවරුන්ට පවා සමහරු පසසති, සමහරු ගරහති. මහ පොළොවට ඉරහඳට පමණක් නොව සිව් පිරිස (භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා) මැද ධර්ම දේශනා කරන සම්මා සම්බුදුවරුනට පවා සමහරු පසසති, සමහරු ගරහති. නුවණ මඳ අඳ බාල දනන් කරන හරසරින් හා ගැරහුමෙන් ඇති විශේෂයක් නැත. එහෙත් නුවණැත්තෝ මනාව විමසා බලා ම පසසති"යි වදාරා මේ ගාථා චතුෂ්කය ද දේශනා කළ හ.

විවරණාත්මක අනුවාදය (227 ගාථාව)

අතුල එතං පොරාණං එතං න අජ්ජතනා ඉව
තුණ්හිමාසීනං අපි නින්දන්ති බහුභාණිනං අපි නින්දන්ති
මිතභාණිනං අපි නින්දන්ති ලොකෙ අනින්දිතො නත්ථි

අතුල: අතුලය; **එතං**: මෙය (නින්දා ප්‍රශංසා යන); **පොරාණං**: පුරාතන ධර්මයකි; **එතං න අජ්ජතනා ඉව**: මෙය අද වූ දෙයක් පමණක් නොවෙයි; **තුණ්හිමාසීනං අපි**: නිහඬව සිටින්නන්ට ද; **නින්දන්ති**: නින්දා කරති; **බහුභාණිනං අපි**: වැඩිපුර කතා කරන්නන්ට ද; **නින්දන්ති**: නින්දා කරති; **මිතභාණිනං අපි**: මධ්‍යස්ථව කතා කරන්නන්ට ද; **නින්දන්ති**: ගරහති; **ලොකෙ**: මේ සත්ත්ව ලෝකයෙහි; **අනින්දිතො**: නින්දා නොලබන්නෙක්; **නත්ථි**: නැත.

අතුල, මෙය පෙර සිට පැවැතෙන්නකි. නිහඬව සිටින්නාටත් නින්දා කරති. වැඩිපුර කතා කරන්නාට ද නිග්‍රහ කරති. ප්‍රමාණයට කතා කළත් නිගා කරති. ලොව නිග්‍රහ නොලත් කෙනෙක් නැත.



නින්දාවට ම ලක් වුවෙක් හෝ පැසසුමට ම ලක් වූවෙක් පෙර ත් මතු ත් අද ත් නොමැ ත.

228. න චාහු න ච භවිස්සති
න චෙතරහි විජ්ජති
එකන්තං නින්දිතො පොසො
එකන්තං වා පසංසිතො (17:8)

පෙරවත් නැත - මතුවත් නැත
දැන් මේ මොහොතේවත් නැත
කෙනෙක් දිගට වූ නින්දිත
නැත්නම් දිගටම පූජිත

නැත නිති ගරුසරු ලද්දෝ - හෝ නිති අවමන් ලද්දෝ

17 (7) අතුල උපාසකයන් ගේ කතා පුවත (227 සිට 230 ගාථා)

විවරණාත්මක අනුවාදය (228 ගාථාව)

එකන්තං නින්දිතො වා එකන්තං පසංසිතො පොසො න ච අහු න ච භවිස්සති එතරහි ච න විජ්ජති.

එකන්තං: ඒකාන්තයෙන්ම; **නින්දිතො**: නින්දා ලැබූ; **වා**: හෝ; **එකන්තං පසංසිතො**: ඒකාන්ත වශයෙන් ප්‍රශංසා ලැබූ; **පොසො**: තැනැත්තෙක්; **න ච ආහු**: පෙර නොසිටියේ ය; **න ච භවිස්සන්ති**: මතු ද ඇති නොවන්නේ ය; **එතරහි ච**: දැනුත්; **න විජ්ජති**: නැත.

ඒකාන්තයෙන්ම නින්දා පමණක් ලැබූ හෝ ඒකාන්තයෙන්ම ප්‍රශංසා පමණක් ලැබූ තැනැත්තෙක් පෙර ද නො වීය. මතු ද නොවන්නේ ය. දැනුදු නැත.

විවරණය

සම්මා සම්බුදු රජාණන් වහන්සේ: සම්මා සම්බුද්ධත්වයට පත්, ලොව සුපතළ සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේ බෞද්ධාගමේ නිර්මාතෘන් වහන්සේය. සිදුහත් කුමරු නමින් ක්‍රිස්තු වර්ෂයට පෙර 623 නේදී උපත ලද අමා මෑණී බුදුරජාණන් වහන්සේ, බුද්ධත්වලාභය ලබා ක්‍රිස්තු පූර්ව 543 නේදී පරිනිර්වාණයට පත්වන විට, උන්වහන්සේ අසූවන වියෙහි සිටි සේක.

බුදු හිමියන් ගේ පරිනිර්වාණයෙන් වසර දෙදහස් පන්සිය පණස් පස් වසක් ගෙවී ගොස් ඇත්තේය. බුදු හිමිපාණන් වහන්සේ නිසැකයෙන්ම මානව සංහතියේ මෙතෙක් පහළ වූ ශ්‍රේෂ්ඨතම පුද්ගලයාණන් වහන්සේයි. අසහාය ලොවුතුරා නැණ බෙලෙන් බුදු හිමියෝ මානවයා ගේ ඉරණම විනිවිද දුටු සේක. ඒ ලෝකෝත්තර අවබෝධය, චතුරාර්‍ය සත්‍යයට නගාලූ බුදුරජාණන් වහන්සේ, ඒ දහම, හැම තැනකට ම, හැම කාලයකට ම සුදුසු අකාලික දහමක් වශයෙන් පිහිටුවාලූ සේක. ආර්ය අෂ්ඨාංගික මාර්ගය හෙළි-පෙහෙළි කළ බුදු හිමියෝ, මානව සංහතිය සසර දුකින් ගලවා සදාකාලික් මෝක්‍ෂ මාර්ගයට ඇරලූ සේක. විමුක්තිවාදී චින්තනය, හුවාලමින්, නිදහස්ව සිතීමේ අයිතිය සනාතනික මානව අයිතිවාසිකමක් බවට පත්කළ බුදුහිමියන් වහන්සේ, මෝක්‍ෂය, සියළුම ස්ත්‍රී-පුරුෂයන්ට උරුම වරප්‍රසාදයක් බවට පත් කළ සේක. ජාති-ආගම් වර්‍ගාදී පටු වාද-භේද ඉක්මවා යන මානව අයිතිවාසිකමක් වශයෙන් මෝක්‍ෂ ලාභය සංහතියට පිරිනැමූ මහා පුරුෂයාණෝ, සම්මා සම්බුදු හිමිපාණෝය.

රාජකීයයෙකු වශයෙන් උපත ලැබ හිමි කරගත් අසීමිත සුඛෝපභෝගී සම්පත් හා අනූන වරප්‍රසාද සියල්ල අත්හැර දමා, සිද්ධාර්ථ ගෞතම කුමරු අභිනිෂ්ක්‍රමණයෙහි යෙදුනහ. එසේ ලෞකික සැප සම්පත් හැරදමා ගොස් සත්‍ය ගවේෂීව, සිද්ධාර්ථ තවුසාණෝ අතිශය කර්කශ අත්තකිලමථානු යෝගයෙන්, සය අවුරුද්දක් මුලුල්ලේ දුෂ්කර ක්‍රියාවෙහි යෙදී වාසය කළහ. ඒ කයට වධදීමේ අන්තය, නිරර්ථක බව අවබෝධ කර ගෙන, දුෂ්කර ක්‍රියා අතහැර දමා, මධ්‍යම ප්‍රතිපදානුකූලව වෙසෙමින්, ශ්‍රී මහා බෝධි සෙවනේ දී සියලු මරසෙන් පරාජය කිරීමෙන් සම්මා සම්බුද්ධත්වය සාක්‍ෂාත් කර ගත් සේක.

බුදුරජාණන් වහන්සේ හතලිස් පස් වසක් මුලුල්ලේ සිය ලොවුතුරු අවබෝධය, ලොවට දේශනා කරමින් වැඩ වාසය කළහ. අසහාය සාමයික සන්නිවේදකයාණෝ කෙනෙකු වූ බුදු හිමියෝ, දිළින්දන් ගේ පටන් කුමාරවරුන් දක්වාත්, ඝාතකයන් ගේ පටන් රජ දරුවන් දක්වාත් විහිද-පැතිර ගිය අසහාය මානව සමූහයකට, ජීවිතයෙහි යථා තත්ත්වය සාක්‍ෂාත් කර ගන්නට පිහිට වූ සේක.

කාලයාගේ වරණඩ ඔස්සේ රැව්-පිළිරැව් නගමින් විහිද එන සම්මා සම්බුද්ධ භාෂිතය, විසින්, සාමාන්‍ය ජනී ජනයා, ආධ්‍යාත්මික වීරයන් බවට පත් කෙරෙයි. මෙය සෑම කාලයකටම, සෑම තැනකටම සාධාරණ ක්‍රියා මාලාවකි.

නුවණැත්තාහු සිදුරු රහිත දිවි පැවැත්ම ඇති පැණවත් - සිල්වත් තැනැත්තාට සෑම කල්හි ම පසසති.

229. යඤ්චෙ විඤ්ඤූ පසංසන්ති
අනුවිච්ච සුවෙ සුවෙ
අච්ඡිද්දවුත්තිං මෙධාවිං
පඤ්ඤාසීලසමාහිතං (17:9)

නුවණැත්තන් යමෙකුට පසසත් නම්
දවසක් ගාණේ සොයා බලා
පිරිසිදු පැවතුම් ඇති ඒ දොස් නැති
සිල්වත්, දැනුමෙන් පොහොසත් වූ

කළයුතු වෙයි තුති පැසසුම් - සොයා බලා අයට උතුම්

17 (7) අතුල උපාසකයන් ගේ කතා පුවත (227 සිට 230 ගාථා)

විවරණාත්මක අනුවාදය (229 ගාථාව)

**වෙ විඤ්ඤූ අච්ඡිද්දවුත්තිං මෙධාවිං
පඤ්ඤසීලසමාහිතං යං සුවෙ සුවෙ අනුවිච්ච
පසංසන්ති**

වෙ: ඉදින්; **විඤ්ඤූ**: නුවණැත්තෝ; **අච්ඡිද්දවුත්තිං**: සිදුරු රහිත යහ පැවතුම් ඇති; **මෙධාවිං**: විදසුන් නුවණ ඇත්තා වූ; **පඤ්ඤාසීලසමාහිතං**: ප්‍රඥාවෙන් හා සීලයෙන් යුක්ත වූ; **යං**: යමෙකුට; **සුවෙ සුවෙ**: දවසින් දවස; **අනුවිච්ච**: විමසමින්; **පසංසන්ති**: ප්‍රශංසා කෙරෙත් ද;

එතකුදු වුවත් නුවණැත්තෝ සිදුරු රහිත යහ පැවතුම් විදසුන් නුවණැති ප්‍රඥාවෙන් හා ශීලයෙන් පිරිපුන් තැනැත්තකු දවසින් දවස විමසමින් ප්‍රශංසා කෙරෙත් ද

විවරණය

බුදුරදුන්ගේ ලෝකාර්ථචර්යාව: තුති පැසසුම් හෝ ගැරහුම් කිසිවකින් නොසැලී සිටිමින් අප බුදුරදුන් ලෝ වැඩූ අයුරු බුදු සිරිත හදාරන්නෝ අගයති. පන්සාලිස් වසක් තිස්සේ භාග්‍යවතුන් වහන්සේ බාල මහළු, දුප්පත් පොහොසත්, කුලීන කුලහීන, උගත් නූගත්, භේදයක් නොතකා දහස් ගණන් දෙව් මිනිසුනට හිත සුව පිණිස වෙහෙසුණේ ඉතා සුළු විවේකයක් පමණක් ලබමිනි.

මුල් විසිවස තුළ උන්වහන්සේ වස් විසූ ස්ථාන මේවාය.

1. වස- බරණැස ඉසිපතනය
2. වස - රජගහ නුවර වේළුවනාරාමය
3. වස- රජගහ නුවර වේළුවනාරාමය
4. වස- රජගහ නුවර වේළුවනාරාමය
5. වස- විසාලාවේ මහා වනයේ මහා ශාලාව
6. වස- මංකුල පර්වතය
7. වස- තව්තිසා දෙව්ලොව
8. වස- සුංසුමාරගිරි අසල හෙසකලා වනය
9. වස- කොසඹෑ නුවර
10. වස- පාරිලෙය්‍යක වනය
11. වස- ඒකනාලා බමුණුගම
12. වස- වේරඤ්ජාය
13. වස- චාලිය පබ්බතය
14. වස- සැවැත් නුවර ජේතවනාරාමය
15. වස- කපිලවස්තුව
16. වස- අලව් නුවර
17. වස - රජගහ නුවර
18. වස - චාලිය පබ්බත
19. වස - චාලිය පබ්බත
20. වස- රජගහ නුවර

21 වන වස පටන් පරිනිර්වාණ වසර දක්වා ම උන්වහන්සේ වැඩ විසුවේ සැවැත් නුවර ජේතවනාරාමයේ හා පූර්වාරාමයේ ය. ඒ අනේපිඬු සිටාණන් ගේ හා විසාකා උපාසිකාවන් ගේ සැදැහැ ගුණය හේතුවෙනි. අවසන් වසර විසාලාවේ ගත කරන ලදී

රජගහ නුවර වසන සමයෙහි උන්වහන්සේ උදේ වරුවේ භික්ෂූන් පිරිවරා සැවැත් නුවරට දකුණු වාසලින් පිවිස පිඬු සිඟා ගොස් නැගෙනහිර වාසලින් නික්මෙති. අනතුරුව පූර්වාරාමයට ගොස් දවස ගත කරති. රැය ද පූර්වාරමයෙහි ගත කළහොත් පසුදා උදේ නැගෙනහිර දොරටුවෙන් නුවරට පිවිස පිඬු සිඟා ගොස් දකුණු දොරටුවෙන් නික්ම ජේතවනාරාමයට වැඩම කරති.

භාග්‍යවතුන් වහන්සේ කිසි දිනක කාලය අපතේ නොයැවූ හ. දවස යාම පහකට බෙදා එයින් විධිමත්ව පල නෙලාගත් හ. පෙරබත් කිස, පසුබත් කිස, පෙරයම් කිස, මැදියම් කිස, හා අළුයම් කිස වශයෙන් එම දින චර්යාව සැකසී තිබිණ.



දඹ රන් පිඩක් සේ මොනවට පිවිතුරු තැනැත්තා දෙවි - බඹ - මිනිස් යන මොවුන් ගේ පැසසුමට සුදුසු වේ.

230. නෙක්ඛං ජම්බොනදස්සෙව
කො තං නින්දිතුමරහති
දෙවා'පි තං පසංසන්ති
බ්‍රහ්මුණා'පි පසංසිතො (17:10)

පිරිසිදු රන් කහවණුවක් වැනි වූ
ඒ උතුමා හට නිගා කරන්නට
කවුද සමත්? දෙවියොත් ඔහු පසසත්
ලැබෙයි ඔහුට බඹුගෙනුත් ප්‍රශංසා

ගුණවත් උතුමකු ගෙ අගේ - පිරිසිදු රත්තරන් වගේ

17 (7) අතුල උපාසකයන් ගේ කතා පුවත (227 සිට 230 ගාථා)

විවරණාත්මක අනුවාදය (230 ගාථාව)

ජම්බොනදස්ස නෙක්ඛං ඉව තං නින්දිතුං කො අරහති
තං දෙවා අපි පසංසන්ති බ්‍රහ්මුණා අපි පසංසිතො

ජම්බොනදස්ස: දඹ රනින් කළ; **නෙක්ඛං ඉව**: පළඳනාවක් මෙන් වූ; **තං**: ඔහුට; **නින්දිතුං**: නින්දා කරන්නට; **කො**: කවරෙක්; **අරහති**: සුදුසු වේ ද?; **තං**: ඔහුට; **දෙවා අපි**: දෙවියෝ ද; **පසංසන්ති**: ප්‍රශංසා කරති; **බ්‍රහ්මුණා අපි**: බ්‍රහ්මයා විසින් ද; **පසංසිතො**: පසසන ලද්දේ වෙයි.

දඹරන් පිඩක් බඳු චරිත ඇති එතුමාට නින්දා කරන්නට කිසිවෙක් සමර්ථ නොවේ. දෙවියෝ ද එතුමාට පසසති. බ්‍රහ්මයා ගෙන් ද ප්‍රශංසා ලැබෙන්නේ ය.

විවරණය

බුදුරදුන් පිඩුසිඟා වඩිනා බව දත් නුවර වැසියෝ ඒ වේලාවට පිරිසිදු ඇඳුමින් සැරසී එළිමහනට අවුත් උන්වහන්සේ වැඳ හරසර දක්වති. උන්වහන්සේ දන් වළඳා නිමවන තුරු ඔවුන් බලා සිටින්නේ බණපදයක් බුදු මුවින් අසාගන්නට ය. ඔවුනට ගැලපෙන දහමක් උන්වහන්සේ දේශනා කරති. ජනතාව ගේ සිත් සතන් විනිවිද දක්නා හැකියාවක් බුදුරජාණන් වහන්සේට පැවති හෙයින් දහම් දෙසුම අවසන බොහෝ දෙනාට ධර්මශ්‍රද්ධානය ඇති වෙයි. සමහරු මාර්ගඵල ලබති. සමහරු පැවිදි වන්නට කැමැත්ත පළ කරති.

හවස් වරුවේ දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලා සමග කතා බහ කරමින් ඔවුන්ට උපදෙස් දීම සඳහා දම්සභා මණ්ඩපයට වැඩම කරති. බොහෝ විට භික්ෂූන් යම් මාතෘකාවක් ගැන කතා කරමින් සිටියේ නම්, එය මුල් කරගෙන දහම් දෙසති. එසේ නොවූ විටෙක උන්වහන්සේ ම මාතෘකාවක් උපදවා ගෙන ඇතැම් විට භික්ෂු සංඝයාගෙන් ප්‍රශ්න කරමින් ධර්මානුශාසනා කරති. ඇතැම් භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙතින් භාවනා කර්මස්ථාන ලබා ගනිති. ඔවුන්ගේ චරිතානුරූපව, ශක්තියට ගැලපෙන කර්මස්ථාන ලබාදීම උන්වහන්සේ ගේ සිරිත ය.

අනතුරුව උන්වහන්සේ ගඳකිළියට වැඩම කරති. මඳක් විවේක ගත් පසු උන්වහන්සේ නැවත තමන් වහන්සේ වෙතින් ධර්මාස්වාදය විඳගන්නට රිසි සැදැහැතියන් වෙනුවෙන් කැප වෙති. බුදුන් හමුවට සන්ධ්‍යාසමයෙහි එළැඹෙන්නේ භාවනා කර්මස්ථාන පතන භික්ෂූන් වහන්සේ හෝ ධර්මශ්‍රවණාලාභී භික්ෂූහු ය. රාත්‍රියේ ප්‍රථම යාමය ගතවන්නේ මෙබඳු ධර්ම කථා වලිනි.

රැයෙහි මධ්‍යම යාමය දෙවියන් සඳහා වෙන් වූවකි. දෙවිවරු ඔවුන්ගේ ප්‍රශ්න ද රැගෙන බුදුන් හමුවට එති. භාග්‍යවතුන් වහන්සේ ඒවාට විසඳුම් දෙති. මෙබඳු ප්‍රශ්න හා පිළිතුරු ගාථා ස්වරූපයෙන් ත්‍රිපිටකයෙහි සුරැකී තිබේ. සුප්‍රකට මංගල සූත්‍රය දේවතාවකු විමසූ ප්‍රශ්නයට දුන් පිළිතුරකි. පරාභව සූත්‍රය තවත් එබඳු සූත්‍රයකි. සංයුක්ත නිකායෙහි එන දේවතා සංයුක්ත නම් කොටස මුළුමනින් ම දේවතාවන් හා වූ සංවාදයන්ගෙන් ම සකස් වූවකි. බුදුරජාණන් වහන්සේට '**සත්ථා දේවමනුස්සානං**' යයි පවසන්නේ උන්වහන්සේ මෙසේ දේවතාවනට ධර්ම දේශනා කරමින් ඔවුන්ට ද ගුරුවරයකු වූ නිසා ය.

අළුයම යාමය තුනකට බෙදා ඇත. මුල් කොටස භාග්‍යවතුන් වහන්සේ සක්මනින් ගත කරති. කායික මානසික සුවය සඳහා සක්මන අතිශයින් ප්‍රයෝජනවත් ය. බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ද සක්මන් භාවනාව බුදුරදුන් විසින් නිර්දේශිතය. බොහෝ විහාරස්ථානයන්හි සක්මන් මළුවක් ඉදි කරන්නේ මෙම බුද්ධ ප්‍රශස්ත සක්මන සඳහා ය. අළුයම් යාමයේ දෙවන කොටස භාග්‍යවතුන් වහන්සේ විවේක ගනිති. සිහි නුවණින් යුතුව සිංහ සෙය්‍යාවෙන් උන්වහන්සේ දකුණාලයෙන් සැතපෙති. තෙවන කොටස උන්වහන්සේ කුළුණින් ලොව බලති. අළුයම පිබිද මෙසේ ලොව බලන්නේ එදින තමන් වහන්සේ විසින් අනුග්‍රහ කළ යුතු සරණාර්ථීන් විනිශ්චය කරගනු පිණිස ය. පෙර බුදුවරුන්ගේ කාලයන් හි පෙරුම් දම් පිරූ සමහරු මේ බුදු සස්නේ නිවන් දකිති. එසේ පින් මේරූ නුවණ මේරූ අය වෙත මෙන්ම විවිධ හේතු නිසා දුකට පත් අසරණයන් කරා ද යන භාග්‍යවතුන් වහන්සේ ඔවුනට දෙලොවින්ම පිහිට වෙති.



කය කිපීම රැක ගන්න. කය සංවර කරගන්න. කයින් කෙරෙන දුසිරිත් දුරලන්න. කයින් සුසුරිත් පුරන්න.

231. කායප්පකොපං රක්ඛෙය්‍ය
කායෙන සංවුතො සියා
කාය දුච්චරිතං හිත්වා
කායෙන සුචරිතං චරෙ (17:11)

කය සංවර කර රකින්න
ඇවිස්සෙන්න ඉඩ නොදෙන්න
දුශ්චරිතය අත් හරින්න
සුචරිතයට කය යොදන්න.

කර සංවර - නිති තුන් දොර

17 (8) භික්ෂූන් හය නමක් පිළිබඳ කතා පුවත (231 සිට 234 දක්වා ගාථා)

වේළුවනාරාමයෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ ඡබ්බග්ගිය (හයදෙනා ගේ කණ්ඩායම) භික්ෂූන් වහන්සේලා ගේ නො පණත් පැවැත්මක් ඇරබ මේ ගාථා චතුෂ්කය වදාළ සේක.

එක් දිනක් මේ භික්ෂූහු හයදෙනා ලී සෙරෙප්පු පය ලා දෑතට ලී කැබලි රැගෙන සෙරෙප්පු හඬට අතේ වූ ලී කැබලි ගැටෙන හඬ එකතු කරමින් ගල්තලාවක් මත එහාට මෙහාට ඇවිද්දහ. ඔවුන් නැගූ 'ටකස් ටකස් හඬ ඇසුණු බුදුරජාණන් වහන්සේ "ආනන්ද, මේ මහා ශබ්දය කුමක්ද?" යි විචාළ හ. ආනන්ද හිමියෝ "ස්වාමීනි, මේ ඡබ්බග්ගිය භික්ෂූන් ලී සෙරෙප්පු පය ලා ලී කෑලි දෑතින් ගෙන ගටමින් ගල් තලාව මත ඇවිදින ශබ්දය"යි පිළිතුරු දුන් හ. ඒ ඇසූ භාග්‍යවතුන් වහන්සේ "භික්ෂූන් නම් සිතින්, කයින් හා වචනයෙන් සංවර විය යුත්තා හ. මෙබඳු අවිනීත හැසිරීම් නොකළ යුත්තාහ"යි වදාරා මේ ගාථා හතරින් අනුශාසනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (231 ගාථාව)

> **කායප්පකොපං රක්ඛෙය්‍ය කායෙන සංවුතො සියා කාය දුච්චරිතං හිත්වා කායෙන සුචරිතං චරෙ**
>
> **කායප්පකොපං**: කායික අසංවරකම; **රක්ඛෙය්‍ය**: පාලනය කර ගන්න; **කායෙන**: කයින්; **සංවුතො සියා**: සංවර වන්න; **කාය දුච්චරිතං**: කාය දුශ්චරිතය; **හිත්වා**: අතහැර; **කායෙන**: කයින්; **සුචරිතං**: සුචරිතෙහි; **චරෙ**: හැසිරෙන්න.

කයින් අසංවර නොවන්න. සංවර වන්න. කයින් දුසිරිතෙහි නො හැසිරී සුසිරිතෙහි යෙදෙන්න.

විවරණය

බුදුරදුන් කාය-මනො-වාක් ත්‍රිවිධ ද්වාරය සංවර කර ගැනීම පිළිබඳ මේ දෙසුම කළේ සුප්‍රකට ඡබ්බග්ගිය භික්ෂූන්ට ය. නමින් පණ්ඩුක, ලෝහිතක, මෙත්තිය, භුම්මජක, අස්සජී, පුනබ්බසුක නම් වූ ඔවුහු නිතරම විනය නීතිවල අඩුපාඩුකම් සොයා ඒවාට අනුව නොපණක් කම් කිරීමට තැත් දැරූ අය වූහ. බොහෝ විනය ශික්ෂාවලට අනුප්‍රඥප්ති එකතු කර ඇත්තේ ඔවුන්ගේ එබඳු ක්‍රියා නිසා ය. නිතරම එකට හැසුරුණු ඔවුහු නොහික්මුණු හැසිරීම් නිසාම ප්‍රකට වූ හ.

කය, වචනය සහ සිත ශික්ෂණය කිරීම තුළ සමස්ත බෞද්ධ ශික්ෂාවම සංග්‍රහණය වෙයි. මට මේ දෙසිය ගණනක් සිල්පද රකින්නට අමාරුයැයි මැසිවිලි කී එක් භික්ෂු නමකට එසේ නම් ඔබේ තුන්දොර රැකගන්න යයි බුදුරදුන් අවවාද කළේ එහෙයිනි.

කායප්පකොපං: කය කිපීමය. යම් යම් කරුණු හේතු කොට ඇතිවන නොසන්සුන්කමය. එයින් දරුණු විපතට මග සැලසේ.

රක්ඛෙය්‍ය: රැක ගැනීමය. යම් කිසි දෙයක පල ලැබිය හැක්කේ ඒ දේ රැකුණු කල්හි පමණකි. කය රැකුණොත් කයින් ද නියම පල ලබන්නට නෙළාගන්නට හැකිවේ.

කායෙන සංවුතො: කයින් සංවරයෙහි පිහිටීමය. කය කරණ කොට කෙරෙන අකුසලයනට ඉඩ නොදී වළකා, නවතා හික්මවා කය සන්සුන් කරගැනීමය.

කාය දුච්චරිතං හිත්වා: කයින් කෙරෙන දුසිරිත් (අකුසල්) දුරු කිරීමය. කයින් සිදුවන දුශ්චරිත තුන;

1. ප්‍රාණඝාතය (සතුන් මැරීම)
2. අදින්නාදානය (නුදුන් දේ ගැනීම)
3. කාම මිථ්‍යාචාරය (පරදාර-පරපුරුෂ සේවනය)

කායෙන සුචරිතං චරෙ: කයින් සුසිරිත හැසිරීමය. කයින් කෙරෙන තෙවැදෑරුම් දුසිරිතින් වැළකෙන විට කයින් සුසිරිත පිරෙන්නේය.

වචනය කිපීම රැක ගන්න. වචනය සංවර කරගන්න. වචනයෙන් සිදුවන දුසිරිත් දුරලන්න වචනයෙන් සුසිරිත පුරන්න.

232. වචීපකොපං රක්ඛෙය්‍ය
වාචාය සංවුතො සියා
වචී දුච්චරිතං හිත්වා
වාචාය සුචරිතං චරෙ (17:12)

ඇවිස්සෙන්න ඉඩ නො දෙන්න
වචනය සංවර කරන්න
වචී දුසිරිතෙන් වැළකී
වදනින් සුසිරිතව ඉන්න

වදනින් සංවර - සීලය හුරු කර

17 (8) භික්ෂූන් හය නමක් පිළිබඳ කතා පුවත (231 සිට 234 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (232 ගාථාව)

වචීපකොපං රක්ඛෙය්‍ය වාචාය සංවුතො සියා වචී දුච්චරිතං හිත්වා වාචාය සුචරිතං චරෙ

වචීපකොපං: වාචික අසංවරය; **රක්ඛෙය්‍ය**: පාලනය කර ගන්න; **වාචාය**: වදනින්; **සංවුතො සියා**: සංවර වන්න; **වචී දුච්චරිතං**: වාග් දුශ්චරිතය; **හිත්වා**: දුරු කර; **වාචාය**: වදනින්; **සුචරිතං චරෙ**: සුසිරිත හැසිරෙන්න.

වාචසික අසංවරකමින් වළකින්න. වදනින් සංවර වන්න. වාග් දුශ්චරිතය හැර දමා වචනයෙන් සුසිරිත හැසිරෙන්න.

විවරණය

වචී දුච්චරිත: වචනයෙන් සිදුවන දුශ්චරිත හතරකි. එනම්;

1. මුසාවාදය (බොරු කීම)
2. පිසුණාවාචා (කේලාම් කීම)
3. ඵරුසාවාචා (අසභ්‍ය වචන කීම)
4. සම්ඵප්පලාප (හිස් වචන කතා කිරීම)

වාචාය සුචරිතං චරේ: වචනයෙන් සුසරිතෙහි හැසිරීමය. වචනයෙන් සිදුවන සිව් වැදෑරුම් දුසිරිතින් වැළකෙන විට වචනයෙන් සුසිරිත පිරෙන්නේය.

වාග් ද්වාර සංවරය උදෙසා පනවා වදාළ ශික්ෂාපදයන් නො ඉක්මවා රැකීම වාග් සුචරිත නම් වේ.

සුභාසිතා ච යා වාචා එතං මංගල මුත්තමං යනුවෙන් දක්වන ලද සුභාෂිත වචනය හෙවත් යහපත් වචනය නම් අංග පසකින් යුක්ත වූවකි. දෙවියන් සහිත ලෝකයෙහි සකල සත්ත්වයන් විසින්ම තම තමාගේ මෙලොව පරලොව යහපත පිණිස කරන්නා වූ සැලකිය යුතු කටයුතු බොහෝ සෙයින් ඔවුනොවුන් කථාකර ගැනීමෙන් කරන්නාහු වෙති. බුදුවරයන් වහන්සේලා සත්ත්වයන්ට ස්වර්ග මෝක්ෂ සම්පත් දෙවා වදාරන්නේ ද සුභාෂිත වචනයාගේ මාර්ගයෙන්මය. වචනය මෙසේ ඉතාමත් සැලකිය යුතු වූද, නිතරම පාවිච්චි කරන්නාවූද දෙයක් බැවින් ඒ පිළිබඳ විශේෂයෙන්ම දැනගත යුතුවේ.

අංගුත්තර පඤ්චක නිපාතයෙහි වදාරන ලද සුභාසිත සූත්‍රයේ.

1 සුදුසු කාලයෙහි කීමය
2 සත්‍යයක් වීමය
3 මොළොක් වීමය
4 ප්‍රයෝජනවත් වීමය
5 මෛත්‍රී සහගත සිතින් කීමය

යන අංග පසින් යුක්ත කොට කියන්නා වූ යම් වචනයක් වේ නම් එය රාගාදී දෝෂයන් ගෙන් මිදුනා වූ යහපත් වචනයක් වේය යනු එහි සංක්ෂේප අදහසයි.

අන් කොතෙක් ගුණ ඇතත් සත්‍යයෙහි නොපිහිටි තැනැත්තා ගුණවතකු වශයෙන් ගණන් ගනු නොලැබේ. යමෙක් සත්‍යයෙහි පිහිටියේ නම්, පොරොන්දු කඩ නොකෙරේ නම්, ඒ තැනැත්තා කෙරෙහි ඒ සත්‍යයෙහි පිහිටීම නිසාම තවත් බොහෝ ගුණ ඇතිවේ.

ඒ බැවින් සත්‍යය ගුණයන්ට බිමක් ද වෙයි. උසස් ගුණයක් ද වෙයි. මෙය මහ බෝසතුන් විසින් ඉතා උසස් කොට රැකි ගුණයෙකි.

මහ බෝසතාණන් වහන්සේ අතින් සමහර අවස්ථා වලදී ප්‍රාණඝාතයත්, අදත්තාදානයත්, මිථ්‍යාචාරයත්, සුරාපානයත් සිදුවී ඇති නමුත් අනුන්ගේ අර්ථය නැසෙන පරිදි බොරු කීමක් කවදාවත් සිදුවී නැති බව

"බෝධි සත්තස්ස හි ඒකච්චේසු ඨානේසු පාණාති පාතම්පි අදින්නාදානම්පි මිච්ඡාචාරොපි සුරාපානම්පි හොති යෙව. අත්ථ භඤ්ජකං විසංවාදං පන පුරක්ඛත්වා මුසාවාදො නාම නාහොසි" යනුවෙන් හාරිත ජාතක අටුවාවෙහි දක්වා තිබේ.



සිත කිපීම රැක ගන්න. සිත සංවර කරගන්න. සිතින් සිදුවන දුසරිත් දුරලන්න. සිතින් සුසිරිත පුරන්න.

233. මනොපකොපං රක්ඛෙය්‍ය
මනසා සංවුතො සියා
මනොදුච්චරිතං හිත්වා
මනසා සුචරිතං චරෙ (17:13)

ඇවිස්සෙන්න ඉඩ නො දෙන්න
සිත සංවර කර රකින්න
දුශ්චරිතය අත් හරින්න
සිත සුචරිතයෙහි යොදන්න

සංවරවී සිතින් රකින්න සිත දුසිරිතෙන්

17 (8) භික්‍ෂූන් හය නමක් පිළිබඳ කතා පුවත (231 සිට 234 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (233 ගාථාව)

මනොපකොපං රක්ඛෙය්‍ය මනසා සංවුතො සියා මනො දුච්චරිතං හිත්වා මනසා සුචරිතං චරෙ

මනොපකොපං: මානසික අසංවරකම; **රක්ඛෙය්‍ය**: පාලනය කරගන්න; **මනසා**: මනසින්; **සංවුතො සියා**: සංවර වන්න; **මනො දුච්චරිතං**: මානසික දුසිරිත්; **හිත්වා**: හැර දමා; **මනසා**: මනසින්; **සුචරිතං**: සුසිරිත; **චරෙ**: හැසිරෙන්න.

මනස ඇවිස්සෙන්නට ඉඩ නොදෙන්න. මනසින් සංවර වන්න. මානසික දුසිරිතෙන් වැළකී මනෝ සුසිරිතෙහි යෙදෙන්න.

විවරණය

මනෝ දුච්චරිතං හිත්‍වා: සිතින් සිදුවන අකුසල් දුරු කිරීම.

ධර්මය සත්ත්වයන්ගේ සිත්වල හටගන්නා වූ පව් නමැති රෝග යන් නැසීමෙහි සමර්ථ වූ දිව්‍ය ඖෂධයක් බව මොනවට පැහැදිළිය. මතු නූපදනා පරිද්දෙන් මාර්ග ඥානය කරණකොටගෙන ක්ලේශයන් ප්‍රහාණය නොකළාවූ මේ සත්ත්වයන්ගේ සිත් සතන් තුළ දක්නට අසන්නට ලැබෙන්නාවූ ද, දැනගන්නට ලැබෙන්නාවූද, රූප ශබ්දාදිය හේතුකොට නොයෙක් අවස්ථාවල කාම විතර්කය ව්‍යාපාද විතර්කය, විහිංසා විතර්කය, යන ත්‍රිවිධ විතර්කයෝ පහළ වෙති.

ත්‍රිවිධ වූ පාප විතර්ක: ලෝකයෙහි රූප සම්පන්න ස්ත්‍රියක කෙරෙහි හෝ පුරුෂයෙකු කෙරෙහි හෝ රන්, රිදී, මුතු , මැණික්, මුදල්, ඇඳුම්, පැළඳුම්, ආහාරපාන, ගේ දොර, වතුපිටි, යාන වාහන, ආදී යම්කිසි වස්තුවක් කෙරෙහි හෝ හටගත් ආශාව මුල්කොට පහළවන්නාවූ, මේ ස්ත්‍රිය, මේ පුරුෂයා, මේ වස්තුව කෙසේ ලබම්ද? මෙසේ කොට ලබාගනිමියි යනාදීන් කාමයන් සඳහා උපදනා කල්පනා කාම විතර්ක වේ.

අප්‍රිය වූ, අමනාප වූ යම් පුද්ගලයකු හෝ හිංසා කිරීම පිණිස දුක් ඇති කිරීම පිණිස පහළවන්නා වූ කල්පනා විහිංසා විතර්ක නම් වෙති.

ගිහියකු හට හෝ වේවා පැවිද්දෙකු හට හෝ වේවා යම් කිසිවකුට මේ අකුශල විතර්කයන් අතුරෙන් යම් කිසි විතර්කයක් පහළ වී නම් එය ඒ තැනැත්තාට ඒකාන්තයෙන් අහිත පිණිස අනර්ථය පිණිස පවත්නේය.

වස්තුවක් හෝ විනාශ කිරීම පිණිස එකී වස්තුව බැලීමෙහි පටන් විනාශය සිදු කරන තෙක් මෙසේ ද කරමියි පවත්නා වූ නපුරු කල්පනා ව්‍යාපාද විතර්ක නම් වෙති.

මනෝ දුච්චරිත නම්, සිතින් සිදුවන

1. දැඩි ලෝභය 2. දැඩි කෝපය 3. මිසදුටු බවය යන තුනය.

දසවත්ථුක මිච්ඡාදිට්ඨිය

1. නත්ථි දින්නං
2. නත්ථි යිට්ඨං
3. නත්ථි හුතං
4. නත්ථි සුකත දුක්කතානං ඵලං විපාකො
5. නත්ථි අයං ලොකො
6. නත්ථි පරෝ ලොකො
7. නත්ථි මාතා
8. නත්ථි පිතා
9. නත්ථි සත්තා ඕපපාතිකා
10. නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදෙන්ති.

මේ දසවස්තුක මිථ්‍යා දෘෂ්ටිය බුද්ධ කාලයේ විසූ අජිත කේසකම්බලී නම් ශාස්තෘවරයා පැවසූ දෘෂ්ටිය ය. ඒ බව දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් වේ.

මනසා සුචරිතං චරෙ: සිතින් සුසිරිතෙහි හැසිරීමය. සිතින් සිදුවන තෙවැදෑරුම් දුසිරිතින් වැළකෙන විට සිතින් සුසරිත පිරෙන්නේය.

නුවණැතියන්ගේ කය සංවුත ය. වචනය සංවුත ය. සිත සංවුත ය. ඔවුහු මනා සංවරයෙන් යුතුවෙත්.

234. කායෙන සංවුතා ධීරා
අථො වාචාය සංවුතා
මනසා සංවුතා ධීරා
තෙ වෙ සුපරිසංවුතා (17:14)

නුවණැත්තන් කය සංවර වන්නේ
වදනින් එලෙසම සංවර වන්නේ
සිතිනුත් සංවර බව ඇති වන්නේ
ඉඳුරා ඔහු ඉන් සංවර වන්නේ

සිත කය, වචනය සංවර කරගැනීම යහපති

17 (8) භික්ෂූන් හය නමක් පිළිබඳ කතා පුවත (231 සිට 234 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (234 ගාථාව)

ධීරා කායෙන සංවුතා අථො වාචාය සංවුතා මනසා සංවුතා තෙ ධීරා වෙ සුපරිසංවුතා

ධීරා: (යම්) නුවණැති කෙනෙක්; **කායෙන**: කයින්; **සංවුතා**: සංවර වූවෝ ද; **අථො**: ඉක්බිති; **වාචාය සංවුතා**: වචනයෙන් සංවර වූවාහු ද; **මනසා සංවුතා**: මනසින් සංවර වූවාහු ද; **තෙ ධීරා**: ඒ නුවණැත්තෝ; **වෙ**: ඒකාන්තයෙන්; **සුපරිසංවුතා**: මනාව සංවර වූවාහු ය.

නුවණැත්තෝ කයින් සංවර වූවාහු ය. වචනයෙන් ද සංවර වූවාහු ය. එමෙන්ම මනසින් ද සංවර වූවාහු ය. ඒ නුවණැත්තෝ මෙසේ ඒකාන්තයෙන්ම අතිශයින් සංවර වූවාහු ය.

විවරණය

ධීරා: පණ්ඩිතයෝය. කරුණු නොකරුණු පිරික්සන නුවණැත්තෝය.

කායෙන සංවුතා: කයින් සංවරවීමය. කය කරණකොට සිදුවන තෙවැදෑරුම් අකුශලයනට අවකාශය නොදී කය හික්මවා ගැනීමය.

වාචාය සංවුතා: වචනයෙන් සංවරවීමය. වචනය කරණකොට සිදුවන තෙ වැදෑරුම් අකුසලයනට අවකාශ නොදී සිත හික්මවා ගැනීමය.

මනසා සංවුතා: සිතින් සංවරවීමය. සිත කරණකොට සිදුවන තෙ වැදෑරුම් අකුසලයනට අවකාශ නොදී සිත හික්මවා ගැනීමය.

සුපරිසංවුතා: ඉතා පිරිසිදු හික්මීම් ඇත්තේ මය. කෙනෙකුගේ කය, වචන, සිත යන තිදොර සංවර නම් ඔවුහු ඉතා පිරිසිදු වෙති. ඒ දුසිරිත් නමැති කිළුටු තිදොරින් සෝදා හැරීමෙන් ඇතිවන පිරිසිදුකමය.

නුවණැත්තන් විසින් සංවර කළ යුතු ස්ථාන තුනක් ම ඇත. ඒ නම් සිත, කය, වචනය, යන තෙතැනයි.

අභිධ්‍යා ව්‍යාපද, මිථ්‍යාදිට්ඨි යන තුන සංවර කර ගැනීම සිත සංවර කිරීමයි. මෙසේ සිත කය වචනය යන තුන් ස්ථානයෙන් අකුසල් දහයක්ම මග හැරීමෙන් පුද්ගලයා මනා සංවරයෙන් යුතු අයෙකු බවට පත්වේ.

තුන්දොර සංවරය යනුවෙන් අදහස් කරන්නේ ද විනයෙහි හික්මීමයි. විනය වනාහි පැවිද්දන් පිළිබඳ විනය, ගිහියන් පිළිබඳ විනය යැයි දෙවැදෑරුම්ය. එයින් පැවිද්දන් ගේ විනය නම් බුදුරජාණන් වහන්සේ විසින් පනවා වදාරන ලද සප්තාපත්ති ස්කන්ධයට නොපැමිණ ආරක්ෂාවීමයි. ගිහියන් ගේ විනය නම් කය වචනය සිත යන තුනෙන් සිදුවන දස අකුශල කර්ම පථයෙන් වැළකීමය. මේ ද්විප්‍රකාර වූ ම විනය ඒ ඒ පුද්ගලයන් කිළිටි නොවීමෙන් සැප එළවන බැවින් උත්තම වූ මංගල නම් වේ. තමාගේ කායා දී ද්වාරත්‍රය ආරක්ෂා නොකොට වරදට අසුවීම ගිහි පැවිදි දෙපක්ෂයටම තම තමා විසින් ලැබිය යුතු වූ ස්වර්ග මෝක්ෂ සම්පත් අන්තරායක වේ.

අන්තරායික ධර්මයෝ වනාහි

1. කර්මය
2. ක්ලේශය
3. විපාකය
4. උපවාදය
5. ආඥා ව්‍යතික්‍රමණය යයි පස් දෙනෙකි.

මේ අන්තරායික ධර්මයන් හැර කය වචනය සිත හික්මවා ගන්නා තැනැත්තාට උතුම් නිර්වාණ සම්පත්තිය ලබා ගත හැකිය.

ත්‍රිවිධ දුශ්චරිතයෙන් වැළකීම ත්‍රිවිධ සුචරිතය වශයෙන් හඳුන්වනු ලැබේ. ත්‍රිවිධ දුශ්චරිතයෙන් වැළකී සුචරිතයෙහි හැසිරෙන විට සීලය මෙන්ම සමාධිය හා ප්‍රඥාව ද වැඩිය හැකි වෙයි. කය හා වචනය දුශ්චරිතයෙන් වළකා සුචරිතයෙහි යොදවන විට සීලය වැඩේ. මානසික දුශ්චරිතයෙන් වළකින්නේ භාවනාව මගිනි. සමථ හා විදර්ශනා භාවනා මගින් අභිද්‍යාව, ව්‍යාපාදය හා මිථ්‍යා දිට්ඨිය දුරු වී සම්මා දිට්ඨිය වැඩේ.

ශීලය ප්‍රමුඛ වශයෙන් ගෘහස්ථ ශීලය හා ප්‍රව්‍රජිත ශීලය වශයෙන් දෙකට බෙදේ. ගෘහස්ථයාගේ නිත්‍ය ශීලය පංච ශීලයයි. එමගින් ඔහුගේ කායික හා මානසික සදාචාරය සුරැකෙයි. උපෝසථ දිනයන් හි ගෘහස්ථනයට තම අභිමතය පරිදි අෂ්ටාංගික ශීලය, දස ශීලය හෝ ආජීවාෂ්ටමක ශීලය ආරක්ෂා කළ හැකිය. භාවනාව ඔහුට අභිමත පරිදි ප්‍රගුණ කළ හැකි ය.

ගෘහස්ථව සිට වුවද යමකුට විමුක්තිය ලැබීමට බාධා නැත. මහරහතන් බව දක්වාම ගෘහ ජීවිතයේ සිට මැදුම් පිළිවෙත ප්‍රගුණ කළ ආර්‍ය ශ්‍රාවකයන් ගැන බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ.

සුද්ධෝදන රජතුමා, සන්තති ඇමතිතුමා වැන්නෝ ගිහිවම රහත් වූ හ. ඝටීකාර ආනාගාමී විය. මහානාම ශාක්‍යතෙම සකෘදාගාමී විය. අනේපිඬු සිටු වැනි විශාල පිරිසක් සෝවාන් වූ හ. එතකුදු වුවත් පැවිද්ද තරම් එය විවේකී ස්ථානයක් නො වේ. එහෙයින් සීල, සමාධි, ප්‍රඥා වශයෙන් ත්‍රිවිධ වන උසස් ශික්ෂාවන් වඩාත් හිතකර පරිසරයක් තුළ පුරනු කැමැත්තෝ පැවිද්දට ප්‍රිය වෙති.

කය හා වචනය සීලයෙන් හික්මවා ගත් පසු සිත හික්මවා ගත යුතුය. සිත හික්මවීම හුදෙක් ශික්ෂා පද මගින් කළ නො හැක. ඒ සඳහා භාවනා කළ යුතුව තිබේ.

බෞද්ධ භාවනාව ප්‍රධාන වශයෙන් සමථ සහ විදර්ශනා වශයෙන් කොටස් දෙකකි. සමථ භාවනාව සඳහා කර්මස්ථාන හතළිහක් වෙයි. විදර්ශනා භාවනා වඩන්නේ අනිත්‍යය, දුක්ඛය හා අනාත්මය පිළිබඳව ය. සතිපට්ඨාන නමින් හැඳින්වෙන බෞද්ධ භාවනා ක්‍රමය මේ දෙකම සංකලනය වූ ඒකායන විශුද්ධි මාර්ගය හඳුන්වා ඇත.

ජීවන සැලැස්ම

බුදුසමය යනු දිවිපෙවෙතින් උසස්ම ප්‍රතිඵල ලද හැකි ආකාරයෙන් ජීවත්වීම පිළිබඳ සැලැස්මකි. එය බුද්ධිය හා ප්‍රඥාව පිළිබඳ ආගමකි. එය අවබෝධයට හා දැනුමට මුල්තැන දෙන ප්‍රඥාව පිළිබඳ ආගමකි. බුදුහිමියන් ධර්මය දේශනා කළේ පුද්ගලයන් සිය ආගමට හරවාගනු පිණිස නොව ධර්මයට සවන් දෙන්නන්ට යථාතත්ත්වය අවබෝධ කරවීමටයි.

බටහිර ලේඛකයෙක්.

මල වග්ග

මහලු වූ විට පඬුවන් කොළයක් බඳු ය. මරණයට ආසන්න ය. මරණය දොරටුව වෙතැ ම සිටගනී.

235. පණ්ඩුපලා’සොව දානි’සි
යමපුරිසා’පි ච තං උපට්ඨිතා
උය්‍යොගමුඛෙ ච තිට්ඨසි
පාථෙය්‍යම්පි’ච තෙ න විජ්ජති (18:1)

පරඬැල් පතකට දෙවැනි නොවන්නේ
යම දූතයිනුදු ළංවම ඉන්නේ
මරුමුව වෙතටයි ඔබ දැන් යන්නේ
මග වියදමවත් ඇයි නොසොයන්නේ

නිබඳව මරුමුව - සිටිනා මිනිසා

18 (1) සතුන් මරන්නකු ගේ පුතෙකුගේ කතා වස්තුව. (235-238 ගාථා)

දෙව්රම් වෙහෙරෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ **සතුන් මරන්නකුගේ පුතකු** අරභයා මේ ගාථා චතුෂ්කය වදාළ සේක.

සැවැත් නුවර එක්තරා සතුන් මරන්නෙක් විසීය. හෙතෙම ගවයන් මරා මස් කොට එයින් තමන් කැමති මස් කොටසක් තෝරා පිසවා ගෙන බිරිය සහ දරුවාද සමග අනුභව කරයි. ඉතිරි මස් මුදලට විකුණයි. අවුරුදු සතළිස් පහක් මුළුල්ලේ හෙතෙම ගවයන් මැරීමේ පුරුද්ද දිගටම කර ගෙන ගියේය. අසල පිහිටි දෙව්රම් වෙහෙරෙහි බුදුන් වහන්සේ වැඩ සිටිය ද මේ මුළු කාලය තුළ හෙතෙම කිසිදු විටෙක බත් සරළුවක්-කැඳ ටිකක් හෝ දානය වශයෙන් පිරිනැමීමට නොසිතුවේය. ඔහු මස් නොමැතිව බත් නොකයි. දිනක් අඳුර වැටීමට කලින් ඔහු මස් විකුණා තම කොටස පිසීමට බිරියට දී නාගෙන ඒම සඳහා පිටත්ව ගියේ ය.

ඔහු ගෙදරින් පිටව ගිය අතරතුර ඔහු ගේ මිතුරෙක් එහි පැමිණ තමාට මස් ටිකක් මිළදී ගැනීමට අවශ්‍ය බව බිරිඳට පැවසීය. මස් විකුණා අවසන් බවත් දැනට ගෙදර ඇත්තේ සැමියා ගේ ආහාරය සඳහා වෙන් කළ කොටස පමණක් බවත් බිරිඳ දන්වා සිටියා ය.

"එසේ නොකියන්න. මගේ ගෙදරට අමුත්තෙක් පැමිණ සිටී. අද නම් මට මස් ටිකක් අවශ්‍යමයි" සැමියා ගේ මිතුරා පැවසී ය. "ඔබේ මිතුරා මස් නොමැතිව බත් නොකන බව ඔබ දන්නවානේ. ඉතින් ඇයි කරදර කරන්නේ? ඒ මස් ටික නම් කොහොමටවත් දෙන්න බැහැ." මස් නොලැබෙන බව මනාව දත් ඒ මිනිසා බිරිඳ අතින් මස් කෑල්ල බලයෙන් උදුරා ගෙන යන්නට ගියේ ය.

සතුන් මරන්නා නා ගෙන ආපසු බිරිඳ තමා පිසූ එළවලු සහිත බත ඔහු ඉදිරියෙන් තැබුවා ය. මස් නොමැති බව දුටු හෙතෙම බිරිඳ ගෙන් ඒ බව ඇසීය. බිරිඳ සියලු පුවත් ඔහුට සැළ කළා ය. "මා මස් නැතිව බත් නොකන බව නොදන්නෙහි"දැයි හෙතෙම බිරියට බැණ වැදුනේ ය. "කුමක් කරන්න ද? අදට ඔය විදියට කමු" යි බිරිය ඇයද සිටියා ය. තරහින් පුපුරා හැළුණු මිනිසා ආහාරය පසෙකට දමා නැගිට ගොස් ගෙදර ඇති මස් කපන තියුණු පිහිය ද අතට ගෙන නිවස අසළ බැඳ සිටි ගොනකු ලගට ගොස් ගොනුගේ කට ඇර අත දමා දිව ඇද දිව මුලින්ම කපා ගත්තේ ය. පෙරළා නිවසට පැමිණි හෙතෙම ගොනුගේ දිව ගිනි අඟුරෙන් පුළුස්සා බත් සමග කෑමට සූදානම් වූයේ ය. පළමුව බත්මිටක් මුවට ගෙන ඊට මස් ටිකක් මුසු කළා පමණි. එකෙණෙහිම ඔහු ගේ දිව දෙකට පැළී අහර බඳුනට පතිත විය. මේ වූකලි ඔහු මොහොතකට කලින් කළ පාපය එකෙණෙහිම පල දීමකි. මුවින් ලේ දහරා වගුරවමින් අමාරුවෙන් ගෙමිදුලට ගිය හෙතෙම එහි සතරගාතයෙන් යමින් ගොනෙකු මෙන් තප්පුලමින් ඉවසා ගත නොහැකි වේදනාවෙන් පෙළෙන්නට විය.

මේ වේලාවෙහි ඔහුගේ පුතා පියාගේ මේ වේදනාකාරී තත්වය දෙස බලා ගෙන සිටියේ ය. මව පුතු වෙතට ගොස් මෙසේ කීවා ය. "දරුව, බලන්න මේ ඔබේ පියා මෙතෙක් කලක් සතුන්ට වධ දී මැරීමේ පවෙහි විපාකය අද විඳියි. දැන් ඔහු ගොනකු මෙන්ම සතර ගාතයෙන් යමින් ගොනකු මෙන් තප්පුලමින් දුක් විඳියි. මේ පාපය ඔබේ හිස මතටත් කඩා වැටීමට පිළිවන. මා ගැන නොබලන්න. මෙයින් පළා ගොස් වෙනතකට වී ඔබේ දිවි රැක ගන්න." මරණ බියෙන් තැති ගත් හෙතෙම මවගේ අවසර ඇතිව ගෙදරින් පළා ගොස් තක්සිලා නුවරට පැමිණියේ ය. සතුන් මරන්නා ගොනෙකු අයුරින්ම ක්‍රියා කරමින් දින කිහිපයක් අපමණ දුක් විඳ මිය ගොස් අවීචි මහා නිරයෙහි උපන්නේ ය.

විස්තරාත්මක අනුවාදය (235 ගාථාව)

ඉදානි පණ්ඩුපලාසො ඉව අසි යමපුරිසා අපි ච තං උපට්ඨිතා උයොාගමුඛෙ ච තිට්ඨසි තෙ පාථෙය්‍යං අපි ච න විජ්ජති.

ඉදානි: දැන්; **පණ්ඩුපලාසො ඉව**: (ඔබ) ඉදීගිය කොළයක් මෙන්; **අසි**: වූයෙහිය; **තං**: ඔබ වෙත; **යම පුරිසා අපි ච**: යම පුරුෂයෝත්; **උපට්ඨිතා**: එළඹ සිටියාහුය; **උයොාගමුඛෙ ච**: පරිහානි මුඛයෙහිත්; **තිට්ඨසි**: සිටින්නෙහි ය; **තෙ**: ඔබට; **පාථෙය්‍යං අපි ච**: මග වියදමක්වත්; **න විජ්ජති**: දක්නට නැත.

(ඔබ) දැන් පරඬලා පතක් මෙන් වෙහි. යම පුරුෂයෝ ද ඔබ වෙත පැමිණ සිටිති. මරු මුව දොරටුවෙහි සිටින්නෙහිය. ඔබ වෙත මග වියදමකුදු දක්නට නොලැබේ.

236. සො කරොහි දීපම'ත්තනො
ඛිප්පං වායාම පණ්ඩිතො භව
නිද්ධන්තමලො අනඞ්ගනො
දිබ්බං අරියභූමිං එහිසි (18:2)

තමාට පිහිටක් සිදු කර ගන්නේ
ඉක්මන් විරියෙන් නුවණ ලබන්නේ
කෙලෙසුන් දුරු කොට පිරිසිදු වන්නේ
දෙව්ලොව ආරිය බිමට වඩින්නේ

වහාම උදව් ගන්න.

18 (1) සතුන් මරන්නකු ගේ පුතෙකුගේ කතා වස්තුව. (235-238 ගාථා)

තක්සිලාවට ගිය සතුන් මරන්නාගේ පුතා එහි රන්කරුවකු ලඟ වැඩ පුහුණු වන්නට විය. දිනක් රන්කරුවා ගමනක් යාමට සූදානම් වී රන් අබරණ කිහිපයක් තැනීමට ඔහුට උපදෙස් දී ගමන පිටත් වූයේ ය. රන්කරුවාගේ උපදෙස් පරිදිම රන් අබරණ තැනීමට හෙතෙම සමත් විය. රන්කරුවා පෙරළා පැමිණ රන් අබරණ බලා බෙහෙවින් සතුටට පත් විය. "මොහු ඕනෑම තැනකට ගොස් ජීවත් වීමට හැකියාව ඇත්තෙකි." හෙතෙම තමාටම සිතා ගත්තේ ය.

අතවැසියා ගැන බෙහෙවින් පැහැදුණු රන්කරුවා ඔහු තරුණ වියට පත් වූ පසු තම දියණිය ඔහුට පාවා දුන්නේ ය. තරුණ යුවළ එහි ජීවත් වෙමින් දූ දරුවන් ද ලබා සතුටින් විසූහ. තරුණ වියට පත් වූ දරුවෝ සැවත් නුවරට ගොස් ජීවත් වීමට කැමති වූහ. ඔවුහු එහි නිවෙස් තනා ගෙන පදිංචි වී දෙව්රමට ගොස් බුදුන් හමුව බණ අසා පැහැද බෙහෙවින් බුදුන් කෙරෙහි භක්ති ඇත්තෝ වූහ. ඔවුන්ගේ පියා තක්සලාවෙහිම පදිංචිව සිටි අතර කිසිදු පින් දහමක නොහැසුරුණේය.

ඔහු මහලු වියට පත් වූ පසු දරුවෝ ඔහු සැවැත් නුවරටම කැඳවා ගෙන අවුත් ඔවුන් සමඟ ජීවත් වීමට අවස්ථාව සැලසූහ. මහලු වියෙහි සිටි පියා කිසියම් කුශල කර්මයකට සහභාගී කරවිය යුතුයයි සිතූ දරුවෝ තම නිවසෙහි දානය සඳහා බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට ආරාධනා කළහ.

බුදුන් වහන්සේ ඇතුළු සඟ රුවනට දන් පිළි ගැන්වූ ඔවුහු තම අදහස බුදුන් වහන්සේට දන්වා සිටියහ.

"ස්වාමීනි, මේ අපගේ පියා දැන් මහලුය. පියා ද පිනට සහභාගී කර ගැනීමේ අදහසින් අපි මේ දානය පිළියෙල කෙළෙමු."

බුදුරජාණන් වහන්සේ එම මහලු පුද්ගලයා අමතා අනුශාසනා කරමින් "උපාසකය, ඔබ දැන් මහලුය. දල්ලෙහි සිට කෙමෙන් මෝරා ගොස් පරඬැල් බවට පත් තණපතක් වැන්න. අප්‍රමාදව පින් දහමෙහි යෙදෙන්න. පරලොව ගමනට මග වියදම් වන්නේ තමන් කරන පින් පමණි. එබැවින් සුචරිතයෙහි යෙදීමට පමා නොවන්නැ"යි පවසා මේ ගාථා සතර වදාළ සේක.

විස්තරාත්මක අනුවාදය (236 ගාථාව)

සො අත්තනො දීපං කරොති ඛිප්පං වායම පණ්ඩිතො
භව නිද්ධන්තමලො අනඞ්ගණො දිබ්බං අරියභූමිං එහිසි

සො: ඒ ඔබ; **අත්තනො**: තමාට; **දීපං**: පහනක් (පිහිටක්); **කරොති**: කරගන්න; **ඛිප්පං**: වහා; **වායම**: වෑයම් කරන්න; **පණ්ඩිතො භව**: නුවණැති වන්න; **නිද්ධන්තමලො**: දුරු කළ කෙලෙස් මල ඇත්තෙක්ව; **අනඞ්ගණො**: කෙලෙස් කිලිටි නැත්තෙක් ව; **දිබ්බං**: දිව්‍යමය වූ; **අරියභූමිං**: ආර්යභූමියට (ශුද්ධාවාසයට); **එහිසි**: එළඹෙන්න.

ඒ ඔබ තමාට පිහිටක් කර ගන්න. වහාම උත්සාහ කරන්න. නුවණැත්තෙක් වන්න. කෙලෙස් මල දුරලා, කෙලෙස් කිලිටි නැතිව දිව්‍යමය වු ශුද්ධාවාසයට (ශුද්ධාවාස බ්‍රහ්මලෝකයට) ඇතුළු වන්න.

ඉක්මුණු කල් වයස් ඇත්තා මරු වෙත පැමිණ සිටින්නෙකි. අතර විසීමකුදු නැත්තෙකි.

237. උපනීතවයො'ච දානි'සි සම්පයාතො'සි යමස්ස සන්තිකෙ වාසොපි'ච තෙ නත්ථි අන්තරා පාථෙය්‍යම්පි'ච තෙ න විජ්ජති (18:3)	ගෙවුණු වයසෙහියි ඔබ දැන් ඉන්නේ යම දොරටුවටයි පත්ව සිටින්නේ අතරමගෙහි විසුමකුදු නොවන්නේ මග වියදමවත් ඇයි නොසොයන්නේ

යම රජු ඉදිරියෙ - නොබියව ඉන්නට

18 (1) සතුන් මරන්නකු ගේ පුතෙකුගේ කතා වස්තුව. (235-238 ගාථා)

විස්තරාත්මක අනුවාදය (237 ගාථාව)

ඉදානි උපනීතවයො ච අසි යමස්ස සන්තිකෙ සම්පයාතො අසි තෙ අන්තරා වාසො අපි ච නත්ථි, තෙ පාථෙය්‍යං අපි ච න විජ්ජති.

ඉදානි: දැන්; **උපනීතවයො ච**: ඉක්ම ගිය වයස් ඇත්තේ ද; **අසි**: වූයෙහිය; **යමස්ස**: යම රජු ගේ; **සන්තිකෙ**: සමීපයෙහි; **සම්පයාතො අසි**: පැමිණියේ වෙහි; **තෙ**: ඔබට; **අන්තරා**: අතරතුර; **වාසො අපි ච**: විසීමක් ද; **නත්ථි**: නැත; **තෙ**: ඔබට; **පාථෙය්‍යං අපි ච**: මඟ වියදම් ද; **න විජ්ජති**: නොපෙනෙයි.

දැන් ඔබ ගෙවූ වයස් ඇත්තේ වෙහි. යම රජු සමීපයට එළඹ සිටින්නෙහිය. අතරතුර ඔබට විසීමට තැනක් නැත. මඟ වියදම් ද ඔබ වෙත දක්නට නැත.

විවරණය

උපනීතවයො: ගත කළ වයස් ඇත්තෙයි. මේ ගාථාවලට තේමාව වී ඇත්තේ මරණයයි. ජීවිතයට අවසානයක් ඇති බව පුද්ගලයකු විසින් සිහිපත් කිරීමේ අවශ්‍යතාව මේ ගාථා මගින් ඉස්මතු කොට දැක්වෙයි. මෙහිදී බුදුන් වහන්සේ වයස් ගතව මරණය ආසන්නයෙහි සිටි පුද්ගලයකු අමතා මරණය පිළිබඳ හැඟීමෙන් යුතුව යළි මරණයක් ඇති නොවන අයුරින් ක්‍රියාකරන ලෙස උපදෙස් දෙන සේක. මරණය පිළිබඳව සිහි නුවණින් විසීමට පුද්ගලයකු උනන්දු කරවීමක් මෙම ගාථා මගින් සිදු වෙයි. පුද්ගලයකු මරණය පිළිබඳ සිහි නුවණින් සිටීමෙන් වැදගත් ප්‍රතිඵල දෙකක් සඳහන් කළ හැකි ය. මරණය පිළිබඳව වැදගත් ප්‍රතිඵල දෙකක් සඳහන් කළ හැකිය. මරණය පිළිබඳව සිහිමෙන් තමාට ද මරණයට මුහුණ පෑමට සිදුවන බවට හැඟීමක් ඇතිවන නිසා පුද්ගලයා පින් දහම් කටයුතුවල උනන්දු වෙයි. අනෙක් අතට මරණය සිහිපත් කිරීම සසර දුක් නැති කරලීමට උපයෝගී කර ගත හැකි වැදගත් භාවනාවක් වෙයි. බෞද්ධ භාවනා ක්‍රමයෙහි මරණානුස්සති භාවනාව යනුවෙන් ගැනෙන්නේ මරණය අරභයා සිහිනුවණින් යෙදී මානසික ඒකාග්‍රතාව රඳවා ගෙන අනිත්‍ය, දුක්ඛ, අනත්ත යන ත්‍රිලක්ෂණය දැකීමට උත්සාහ ගැනීමයි.

හිරු උදාවේ සිට නැවැත්මක් නොමැතිව අස්තයට යන්නාක් මෙන් ජීවිතය උපතේ සිට මරණයට යයි. මෙය ලොව සිටින සෑම ජීවියකු ගේම ජීවිතයට උරුම වූවකි. අජීවී වස්තු පවා හටගැනීමේ සිට විනාශයට ගමන් කරයි. අමරණීය වූ කිසිවෙක් හෝ කිසිවක් ලෝකයෙහි නොමැත. පුද්ගලයකුගේ ජීවිතය තණපතක් අග රැඳි පිනි බිඳුවක් මෙන් අනිත්‍යය. මරණය පුද්ගලයකු ගේ ජීවිතයෙහි කවර මොහොතක ඔහු වෙත ළඟා වේදැයි කිව නොහැකිය. එය ළදරු අවදියෙහි, තරුණ වියෙහි හෝ මහළු වියෙහි විය හැකිය. කවර වියක දී වුවද එය අනිවාර්‍යයෙන් සිදු වන්නකි.

මිනිස්, තිරිසන්, දෙව්, බඹ යන විශේෂයක් මරණයේ දී නොසැලකෙයි. හට ගැනෙන ඕනෑම දෙයක් විනාශය ද ස්වභාවය කොට ගෙන ඇත. "යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං" යනුවෙන් බුදුන් වහන්සේ දේශනා කර ඇත්තේ මේ නිසාය. උපත, පැවැත්ම හා විනාශය ලක්ෂණ කොට ඇති අනිත්‍යය ජීවී අජීවී කිසිදු ප්‍රභේදයක් නැතිව හැමටම පොදුය.

වන, පර්වත, ගංගා, නගර, සාගර, ඉර හඳ පමණක් නොව මේ මහා පෘථිවිය පවා දිරා යාමට සහ විනාශයට ගොදුරු වෙයි. ලොව ඇති හැම දෙයකටම දිරාපත් වීම (ජරා), රෝග (ව්‍යාධි) සහ මරණය (මරණ) යන ත්‍රිවිධ බියකට මුහුණපෑමට සිදු වෙයි. ධනය, ශක්තිය, බලය, උගත්කම ආදී මේ කිසිවකට ලොව පවත්නා මේ අනිත්‍ය ස්වභාවය නවතාලිය නොහැක. මේ නිසා ජීවිතය වූකලී තෘප්තිමත් විය හැකි හෝ සන්තුෂ්ටිදායක දෙයකැයි අප්ට නිගමනය කළ නොහැකිය.

මරණය පිළිබඳව සිහි නුවණින් නොසිතන පුද්ගලයාට ජීවිතයේ අනියත බව වටහාගත නොහැකි වෙයි. එබඳු පුද්ගලයකු ගේ සිත වෛරය පලි ගැනීම, ද්වේෂය, අධික තෘෂ්ණාව, බලකාමය, ආත්මාර්ථකාමිත්වය ආදී පාපී සිතුවිලි කෙරෙහි ඇදී යයි. මරණානුස්සති භාවනාව ප්‍රගුණ කිරීම යථොක්ත පාපී සිතුවිලි සිත තුළ පහළ නොවීමට හේතුවක් වනු පමණක් නොව මෛත්‍රිය, කරුණාව, මුදිතාව, සමානාත්මතාව, අවංක බව, අවිහිංසාව පරිත්‍යාගශීලය ආදී පුණ්‍ය සිතිවිලි සිත තුළ ජනිත වීමට හේතුවක් ද වෙයි.

අපට වැදගත් පාඩම් කියා දීම සඳහා සමාජය තුළ දේවදූතයන් තිදෙනකු සිටින බව බුදු දහමින් පෙන්වා දී ඇත. ඒ ජරා, ව්‍යාධි සහ මරණ යන දේවදූතයන් තිදෙනායි. ඔබ දිරාපත්ව අබල දුබල වී ඇති කිසිවකු දුටු විට එම තත්වය මෙනෙහි කරමින් කෙදිනක හෝ මේ තත්වයට තමන්ට ද මුහුණ පෑමට සිදුවන බව සිතන්න. ව්‍යාධියෙන් පෙළෙන රෝගියකු දුටුවිට තමාට ද මෙම ලෙඩ රෝග වැළඳිය හැකි බව සිතන්න. මරණයක් දුටු විට තමාට ද මරණය අත්වන බව සිත්න්න. මෙසේ කිරීමෙන් ඔබ අනිවාර්යයෙන්ම මහළු අයට, ලෙඩුන්ට, නැති බැරි අයට, දුබලයන්ට, කරුණාව දැක්වීමට පුරුදු වනු ඇත. එපමණක් ද නොවේ. ධනයෙන්, බලයෙන්, ශක්තියෙන්, රූපයෙන්, කුලයෙන් හෝ වෙනත් ඕනෑම දෙයකින් දැනටමත් ඔබ උඩගුවට මානයට අනුන් හෙළා දැකීමට පුරුදු වී සිටිනම් ඒ නුගුණ පුරුදු අතහැර යහපත් මිනිසකු වීමට ඔබට අවස්ථාව උදා වෙයි.

දිනපතා මරණානුස්සති භාවනාව ප්‍රගුණ කිරීමෙන් ඔබ කෙරෙහි මරණයට ඇති බිය කෙමෙන් පළා යයි. ජීවත් වන හැම කෙනෙක්ම මරණයට බියය. මේ බිය සිත තුළින් ඉවත් කර ගත හැක්කේ මරණය කාටත් පොදු උරුමයකි යන ගැඹුරු අවබෝධය ඔබ සිතට ඇතුළු වන්නේ නම් පමණි. එම අවබෝධය නිවැරදිව ලබා ගැනීමට අපට මග පාදන්නේ මරණානුස්සති භාවනාවයි. ඔබේම මරණයට ඇති බිය, කණගාටුව, කනස්සල්ල පමණක් නොව ඔබේ නෑදෑ හිතවතුන්ගේ මරණයකදී ඔබට ඇති වන තද බල ශෝකය මග හරවා ගැනීමට ද මරණානුස්සති භාවනාව බෙහෙවින් ම උපකාරී වෙයි.

පිහිටක් සලසා ගැනීම සඳහා වෑයම් කරන්න. ජාති - ජරා දුකට නො පැමිණෙන්න.

238. සො කරොහි දීපමත්තනො
ඛිප්පං වායම පණ්ඩිතො භව
නිද්ධන්තමලො අනඞ්ගනො
න පුන ජාතිජරං උපෙහිසි (18:4)

තමාට පිහිටක් සිදු කර ගන්නේ
ඉක්මන් විරියෙන් නුවණ ලබන්නේ
කෙලෙසුන් දුරු කොට පිරිසිදු වන්නේ
ජරා මරණ දුක් යළි නොලබන්නේ

දුරුකරමින් සසර ගමන - නිවන් සුවය අත් විඳින්න.

18 (1) සතුන් මරන්නකු ගේ පුතෙකුගේ කතා වස්තුව. (235-238 ගාථා)

විස්තරාත්මක අනුවාදය (238 ගාථාව)

**සො අත්තනො දීපං කරොහි ඛිප්පං වායාම පණ්ඩිතො
භව නිද්ධන්තමලො අනඞ්ගණො න පුන ජාතිජරං
උපෙහිසි**

සො: ඒ ඔබ; **අත්තනො**: තමාට; **දීපං**: පහණක් (පිහිටක්); **කරොහි**: කරගන්න; **ඛිප්පං**: වහාම; **වායාම**: වෑයම් කරන්න; **පණ්ඩිතො**: නුවණැත්තෙක්; **භව**: වන්න; **නිද්ධන්තමලො**: දුරු කළ කෙලෙස් මල ඇත්තෙක්ව; **අනඞ්ගණො**: කෙලෙස් කිලිටි නැත්තෙක් ව; **පුන**: නැවත; **ජාතිජරං**: උත්පත්තියට හා ජරාවට; **න උපෙහිසි**: නො එළඹෙන්නේ ය.

ඒ ඔබ තමාට පිහිටක් කර ගන්න. වහාම උත්සාහ කරන්න. නුවණැත්තෙක් වන්න. කෙලෙස් මල දුරලා, කෙලෙස් කිලිටි නැත්තෙක් ව නැවත උත්පත්තියට හා ජරාවට නො එළඹෙන්නේ ය.

විවරණය

මරණානුස්සති භාවනාව ප්‍රගුණ කිරීමේ දී භාවනාවක් සඳහා අදාළ වන පූර්ව කෘත්‍ය සම්පූර්ණ කර ගත යුතුය. පිරිසිදු වී මල් පහනින් බුදුන් පුදා පන්සිල් සමාදන්ව සිතේ සාමකාමී බව ඇති කර ගත යුතුය. නිසල සන්සුන් තැනක සුදුසු ඉරියව්වකින් භාවනාවෙහි යෙදිය යුතුය. පහත සඳහන් කරන කරුණු ගැන නැවත නැවත මෙනෙහි කරමින් ඔබට මෙම භාවනාවෙහි යෙදිය හැකිය.

1. මම ජරාවට, රෝගයට මරණයට ගොදුරු වෙමි. මා මෙන්ම ලොව සියලු සත්වයෝ ද ජරාවට, රෝගයට හා මරණයට ගොදුරු වෙති.

මෙසේ භාවනාවට එළැඹෙන ඔබට පහත සඳහන් කරුණු මුල සිට යළි යළිත් මෙනෙහි කරමින් භාවනාවේ දෙවැනි පියවරට පැමිණිය හැකිය.

2. මගේ ජීවිතය අනිත්‍යය, මරණය නියතය, මම මහලු වීමට හෙවත් ජරාවට ගොදුරු වෙමි. ව්‍යාධියට සහ මරණයට ගොදුරුවෙමි.

3. මගේ දෙමාපියන්ගේ ජීවිත ද අනිත්‍යය. ඔවුන්ගේ ද මරණය නිත්‍යය. ඔවුහු ද මහලු වීමට, ව්‍යාධියට හා මරණයට ගොදුරු වෙති.

4. මගේ ගුරුවරුන්ගේ ජීවිත ද අනිත්‍යය. ඔවුන්ගේ මරණය නිත්‍යය. ඔවුහු ද මහලු වීමට, ව්‍යාධියට හා මරණයට ගොදුරු වෙති.

5. මගේ සහෝදර සහෝදරියන් ගේ ද ජීවිත අනිත්‍යය, මරණය නිත්‍යය. ඔවුහු ද මහලු වීමට ව්‍යාධියට හා මරණයට පත් වෙති.

6. මගේ ඥාතීන් ගේ ජීවිත ද අනිත්‍යය. ඔවුන්ගේ මරණය නිත්‍යය. ඔවුහු ද මහලු බවට ව්‍යාධියට හා මරණයට පත් වෙති.

7. මගේ හිතවතුන් ගේ ජීවිත ද අනිත්‍යය. ඔවුන්ගේ මරණය නිත්‍යය. ඔවුහු ද මහලු බවට, ව්‍යාධියට හා මරණයට පත් වෙති.

8. මගේ අසල්වැසියන් ගේ ජීවිත ද අනිත්‍යය, ඔවුන්ගේ ද මරණය නිත්‍යය. ඔවුහු ද මහලු බවට, ව්‍යාධියට හා මරණයට පත් වෙති.

9. මගේ අහිතවත් වූවන් ගේ ජීවිත ද අනිත්‍යය, ඔවුන් ගේ මරණය නිත්‍යය. ඔවුහු ද මහලු බවට, ව්‍යාධියට හා මරණයට පත් වෙති.

10. මේ ලෝකයෙහි සියලුම සතුන්ගේ ජීවිත අනිත්‍යය. ඔවුන් ගේ මරණය නිත්‍යය. ඔවුහු ද මහලු බවට, ව්‍යාධියට හා මරණයට පත් වෙති.

ඔබ දිගු කලක් මේ භාවනාවෙහි නිරත වන්නේ නම් ඔබගේ කය, වචන, සිත යන තිදොරම පිරිසිදු වෙයි. එවිට ඔබ කිසිවිටෙක සමාජයට හානිදායක විපත්තිදායක පුද්ගලයෙක් නොවන්නෙහි ය. ඔබේ වචනය, ක්‍රියාව සහ සිතුවිලි යන හැම එකක්ම අනුන්ගේ යහපත සඳහා හේතු වෙයි. මරණානුස්සති භාවනාව පුහුණු කරන්නා නිබඳවම සතුටින් සැහැල්ලුවෙන් ජීවත් වන්නෙකි. මරණයට මුහුණ පෑමට ඔහු බිය නොවෙයි. එපමණකුදු නොව මේ භාවනා පුණ්‍යකර්මය හේතුවෙන් ඔහු ගේ පරලොව ජීවිතය ද සැපදායක වෙයි. දෙව් මිනිස් සුව ලබා ගැනීම ඔහුට අපහසු නොවේ. භාවනාව ප්‍රගුණ කිරීම මගින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම තත්වයන් යථාර්ථයෙන් වටහා ගෙන කෙලෙසුන් දුරු කොට නිවන් ලැබීමට ද අවස්ථාව එබඳු පුද්ගලයකුට උදා වෙයි.

සාමාන්‍ය මිනිසාට 'මරණය' සාකච්ඡා කිරීමට ප්‍රිය උපදවන මාතෘකාවක් නොවේ. එය දුක්මුසු වූත් බිය උපදවන්නා වූත් දෙයකි. මරණය හුදෙක් මලගෙවල් වල සාකච්ඡාවට පමණක් ලක් වූවකි. සාමාන්‍ය මිනිසා තමා කිසි දිනෙක නොමැරෙන්නකු යයි සිතමින් ඉන්ද්‍රියන් පිණවන ප්‍රිය ජනක කාම වස්තුවල ගැලී සිටීමට නිබඳවම උත්සාහ කරයි. මේ ප්‍රියජනක යයි සිතන කාම වස්තු පවා කිසියම් දිනෙක විනාශයට වන පව සිතීමට ඔහු මැලි වෙයි. ඉඳුරන් පිනවීමෙන් ම ඇලී ගැලී සිටින මිනිසාට කිසියම් දිනෙක මරණය ඔහුගේ දොරට තට්ටු කරන බව හැඟවීමට බුද්ධිමත් උපදේශනයක් නොවන්නේ නම්, ඔහු ගේ ගෙදරම නිවැසියකු-මවුපිය, සහෝදර, අඹුදරු ආදී යමෙකු මරණයට පත් වූ විට එය ඔහුට ඉවසිය නොහැකි කම්පනයක් වනු ඇත. එබඳු විටෙක ලෝකයේ යථාර්ථ පිළිබඳව ඔහු ගේ ඇස් ඇරෙනු ඇත. අප බොහෝ දෙනකුට කෙදිනක හෝ මේ මරණයේ දර්ශනය ගැඹුරු චින්තනයකට සහ විචක්ෂණ ප්‍රශ්නාවලියකට මග පාදනු ඇත. ජීවිතයේ වටිනාකම කුමක් ද? ලෝකයේ ශ්‍රේෂ්ඨ වැඩ වල නිරත වූ පුද්ගලයන් ගේ පවා ජීවිත මරණයෙන් නිමා වෙනවා නොවේ ද?. ප්‍රීතියෙන් ප්‍රමුදිත වූ ඇස්, ආදරයෙන් පිරවුණු ඇස් මරණයේ දී සදහටම වැසී යනවා නොවේ ද?. මෙබඳු ප්‍රශ්න, සිතුවිලි, මනාව නිවැරදිව මෙහෙයවනු ලැබුහොත් පරම සත්‍යය දැකීමට මිනිස් මනසේ සැඟවී ඇති ශක්ති විශේෂයන් පුබුදුවා ලිය හැකිය.

බෞද්ධ චින්තනයට අනුව මරණය මිනිස් සිතෙන් සැඟවිය යුතු දෙයක් නොව ජීවිතයේ රහස් හෙළිදරව් කිරීමට උපයෝගී වන්නකි. මරණය වටහා ගැනීමෙන් ජීවිතය වටහා ගත හැකිය. මරණය වූකලී ජීවිත ක්‍රියාකාරීත්වයේ එක් කොටසකි. මරණය හා ජීවිතය එකම ක්‍රියාකාරීත්වයක අන්ත දෙකකි. එක් අන්තයක් වටහා ගත් විට අනෙක් අන්තය ද වැටහෙයි. මරණය පිළිබඳව සිහි නුවණින් මෙනෙහි කරන්නේ නම් අපේ සිතුවිලි බෙහෙවින් මෘදු මොලොක් බවට පත් කරයි. අපේ ගල් හදවත් බෙහෙවින් සියුමැලි බවට පත් කරවයි. කරුණාවෙන් සහ මෛත්‍රියෙන් එකිනෙකා අතර සුහද බන්ධනයක් ඇති වෙයි. ජාති, කුල, ගෝත්‍ර, ආගම්, භාෂා ආදී මිනිසුන් එකිනෙකාගෙන් වෙන් කරන තබන වැට කඩොලු ඉවත් වී යයි. මරණය කාටත් පොදු වූවකි. එය හැමදෙනා කෙරෙහිම සමතාවක් ඇති කරයි.



රන්කරු රත්රන්වල මල ටිකින් ටික හරින්නාක් මෙන් නැණවතා තමාගේ කෙළෙස් මල දුරු කෙරේ.

239. අනුපුබ්බෙන මෙධාවී
ථොකථොකං ඛණෙ ඛණෙ
කම්මාරො රජතස්සෙව
නිද්ධමෙ මලමත්තනො (18:5)

රිදියෙහි ඇති මල හරිනා
රන්කරුවකු ලෙසිනා
සෙමෙන් කෙමෙන් නැණැති දනා
දුරලති කෙලෙසුන් සිතිනා

අනුපිළිවෙලින් ටික ටික - ලැබ ගන්න පිවිතුරු බව

18 (2) බමුණකු ගේ කථාවක් (239 ගාථාව)

දෙව්රම වැඩවසන භාග්‍යවතුන් වහන්සේ එක්තරා බමුණකු අරභයා මේ ගාථාව වදාළ සේක.

කිසියම් බමුණෙක් දිනක් ගමනක් සඳහා පිටත්ව යන අතරතුර භික්ෂූන් වහන්සේ සිවුරු හඳනා තැනක් දැක ඒ ගැන විමසිලිමත් වූයේය. මේ ස්ථානයෙහි තණ ආදී පැළෑටි ඝනව වැවී තිබිණ. භික්ෂූන් වහන්සේ නමක් සිවුරු හඳනා විට සිවුර කොණ තණ පැළෑටිවල තිබූ පින්නෙන් තෙත්ව ගිය බවක් බමුණාට පෙනිණ.

සිවුරු පිණි දියෙන් නොතෙමෙන සේ මේ ස්ථානයෙහි තණ පැළෑටි ඉවත් කළ යුතුයයි සිතූ බමුණා පසු දින උදැල්ලක් ගෙනවුත් එතැන සැස තණ ඉවත් කළේ ය. යළිත් දිනෙක භික්ෂූන් වහන්සේ නමක් සිවුරු හඳනා විට සිවුරු කොණ බිම ගෑවී සිවුරෙහි දූවිලි ගෑවෙනු බමුණා දුටුවේ ය. එහි දූවිලි ඉවත් කිරීමට සිතූ බමුණා එහි වැලි අතුරා ලීය.

හිරුරැස් දැඩිව උණුසුම වැඩිව ගිය දිනෙක භික්ෂූන් වහන්සේලාගේ සිරුරෙන් වැගිරෙන දහදියෙන් උන්වහන්සේලාගේ සිවුරු තෙත් වන බව දුටු බමුණා භික්ෂූන්ට සෙවන සලසාලනු සඳහා එහි මඩුවක් තැනවීය. යළිත් දිනෙක භික්ෂූන් ඒ ස්ථානයෙහි වැස්සෙන් තෙමනු දැක නොතෙමී භික්ෂූන්ට නැවතී සිටිනු සඳහා එහි පියැස්සෙන් සෙවිලි කළ ශාලාවක් තැනවීය. හෙතෙම එසේ ශාලාව තනා භික්ෂූන්ට පූජා කරනු සඳහා බුදු පාමොක් මහසඟනට දානයක් ද දීමට අදහස් කළ බමුණා ඒ සඳහා ආරාධනා කොට බුදු පාමොක් මහ සඟන ශාලාවෙන් ඇතුළත හා පිටත වඩා හිඳුවා මහත් ශ්‍රද්ධාවෙන් දානය පිළිගැන්වීය.

දන් වළඳා අවසන් වූ විට බමුණා බුදුරජාණන් වහන්සේ වෙතට ගොස් ගෞරව නමස්කාරයෙන් යුතුව සිවුරු හඳනා තැන තණ පැළෑටි ඉවත් කිරීමේ සිට සියලු පවත් සැලකර සිටියේ ය. බුදුරජාණන් වහන්සේ මේ පුවත අසා අනුමෙවෙනි බණ වදාරමින් "බමුණ, නුවණැති පුද්ගලයා අනුක්‍රමයෙන් ටිකෙන් ටික රන්කරුවකු රිදියෙන් මල ඉවත් කරන්නාක් මෙන් තම සිතින් කෙලෙස් මල ඉවත් කොට පිරිසිදු වන්නේය"යි පවසා මේ ගාථා ධර්මය වදාළ සේක.

විස්තරාත්මක අනුවාදය (239 ගාථාව)

මෙධාවී අනුපුබ්බෙන ඛණෙ ඛණෙ ථොකථොකං
කම්මාරො රජතස්ස ඉව අත්තනො මලං නිද්ධමෙ

මෙධාවී: නුවණැති තැනැත්තෙක්; **අනුපුබ්බෙන**: අනුපිළිවෙලින්; **ඛණෙ ඛණෙ**: මොහොතින් මොහොත, **ථොක ථොකං**: ටිකෙන් ටික, **කම්මාරො**: රන්කරුවකු, **රජතස්ස**: රිදියෙහි, **ඉව**: (මල ඉවත් කරන්නාක්) මෙන්, **අත්තනො**: තමන්ගේ, **මලං**: කෙලෙස් මල, **නිද්ධමෙ**: බැහැර කරයි.

නුවණැති පුද්ගලයා අනුපිළිවෙලින් මොහොතින් මොහොත ටිකින් ටික රන් කරුවක රිදියෙහි මල ඉවත් කරලන පරිද්දෙන් තම සිතෙහි ඇති කෙලෙස් කසට ඉවත් කොට පිරිසිදු කරන්නේය.

විවරණය

මලං: කිලිටි, බසට, අපවිත්‍ර දෑ යනුයි. සාමාන්‍යයෙන් බුදු දහමෙහි මල යන්නෙන් අදහස් වන්නේ සිත අපිරිසිදු කරන ක්ලේශ ධර්මයි. කිලේස, ක්ලේශ යන පදය ව්‍යවහාර වන්නේ මනස අපිරිසිදු කරලන, මනස දූෂණය කෙරෙන මනසෙහි ස්වාභාවික පිරිසිදු බව වසාලන චිත්ත චෛතසික ස්වභාවයන්ට ය. පහත සඳහන් ආකාරයෙන් ප්‍රධාන ක්ලේශ ධර්ම දක්වාලිය හැකිය.

1. ලොභ (ආශාව)
2. ද්වේෂ (තරහ)
3. මොහ (මුළාව)
4. මාන (මානය)
5. දිට්ඨි (කාල්පනික දෘෂ්ටි)
6. විචිකිච්ඡා (බුද්ධාදී අටතැන් හි සැකය)
7. ථීන (මානසික පසුබෑම)
8. උද්ධච්ච (මනසේ විසුරුණු බව)
9. අහිරික (පාපයට ලජ්ජා නැති වීම)
10. අනොත්තප්ප (පාපයට බිය නැති වීම)

යකඩින් උපන් මලකඩ ඒ යකඩය ම නසයි. අනුවණයා කළ පවුකම් ඔහු ම අපායට පමුණුවත්.

240. අයසා'ව මලං සමුට්ඨිතං
තදුට්ඨාය තමෙ'ව ඛාදති
එවං අතිධොනචාරිනං
සකකම්මානි නයන්ති දුග්ගතිං (18:6)

යකඩෙහි නැගී එන
මල සේ එයම වනසන
සිය දුසිරිත මගින
තමා වැනසෙයි පමණ ඉක්මන

නරකින් තමන්ගේම - සැලසේ ය තම විපතම

18 (3) තිස්ස තෙරුණුවෝ ගේ කථාව (240 ගාථාව)

දෙව්රම් වෙහෙර වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **තිස්ස** නම් වූ තෙරණු කෙනකුන් අරභයා මේ ගාථා ධර්මය වදාළ සේක.

සැවැත් නුවර විසූ එක්තරා තරුණ කුල පුත්‍රයෙක් පැවිද්දෙහි ඇලුම් කොට ගිහි ගෙය හැර පියා බුදු සසුනෙහි පැවිදි උපසපන් ලබා තිස්ස තෙරුන් නමින් පතළ විය. උන්වහන්සේ එක්තරා වැහි කාලයක කිසියම් දනව්වෙක වූ අරමක වස් වසා වස් අවසන් හි සිවුරක් කර ගැනීමට නිසි වූ අට රියන් පමණැති අමු රෙදිකඩකින් පිදුම් ලැබූහ. වස් පවාරණයෙන් පසු සැවැත් නුවරට ආපසු පැමිණි තෙරණුවෝ රෙදිකඩ පසුව ප්‍රයෝජනයට ගනිමැයි සිතා එය ගෙන ගොස් තම නැගණියට දී පරිස්සම් කොට තබන ලෙස පැවසූහ. නැගණිය එම දළ අමුරෙදි කඩ බලා "මෙය මගේ සොහොයුරාට සිවුරකට නොහොබියි. එය ගොරෝසු වැඩිය. එහෙයින් මෙය ලිහා නූල් රැගෙන සිනිඳු රෙදිකඩක් තනමි" යි සිතුවාය. එසේ සිතා රෙදිකඩ කැබැලිවලට කපා වංගෙඩියෙහි ලා කොටා, පොලා පුළුන් කොට එම පුළුන් වලින් සිහින් නූල් කැට නවරියක් පමණ වූ සිනිඳු රෙදිකඩක් වියුවා ය. තිස්ස තෙරණුවෝ, සිවුරු මැසීමෙහි දක්ෂ භික්ෂූන්වහන්සේ කෙනකු ලවා සිවුරක් තනා ගනු කැමතිව නූල් සහ ඉදිකටු ද සපයා ගෙන නැගණිය වෙත එළඹ රෙදිකඩ ඉල්ලා සිටිය හ. නැගණියෝ ද බෙහෙවින් සතුටුව රෙදිකඩ උන්වහන්සේ අත තැබූහ. තෙරණුවෝ රෙදිකඩ දෙස බලා එය සිහින් නිසා හෝ ලෝභය නිසා උපන් සැකයෙන් එය දිග හැර මැන බලා නවරියක් බවත් ඉතා සිහින් බවත් දැන නැගණිය රෙදිකඩ මාරු කළා වන්නට ඇතැයි සිතා "මෙය මා දුන් රෙදිකඩ නොවේ. එය අටරියනකි. මෙය නවරියනකි. එය රළුය. මෙය දුහුල්ය. මගේම රෙදිකඩ මට දෙව" යි නැගණියගෙන් ඉල්ලා සිටිය හ. "නැත ස්වාමීනි, මෙය ඔබගේම රෙදිකඩය"යි ඕ කියා සිටියා ය. නැගණිය සියලු පවත් තෙරණුවන්ට පවසා රෙදිකඩ යළි තෙරුන් අත තැබුවා ය. අන්තිමේ දී කරුණු වටහා ගත් තෙරණුවෝ එය පිළිගෙන අරමට ගොස් සිවුරු මසනා භික්ෂූන්වහන්සේට සිවුරක් මැසීම සඳහා පැවරූහ. උන්වහන්සේගේ නැගණිය අරමෙහි භික්ෂූන් වහන්සේට කැඳබත් සපයමින් සිවුරු මසා නිමවන දිනයෙහි විශේෂ දානයක් ද පිළියෙල කොට පිදුවා ය. තිස්ස තෙරණුවෝ මසා නිම වූ සිවුර අතට ගෙන බලා බෙහෙවින් සතුටුව සිවුර කෙරෙහි හටගත් ආශාවෙන් එය නො ඇඳම "පසු දින හඳිමි"යි සිතා, නවා ආරක්ෂා සහිත තැනක තැබූහ. අවාසනාවක මහිම, සිවුරට ඇති වූ ආශාවෙන්ම කල් ගෙවූ තෙරණුවෝ කිසියම් රෝගයකින් එදින රැයෙහිම කළුරිය කළ හ. සිවුරට බලවත් ඇල්මෙන් මියගිය හෙයින් තෙරණුවෝ සිවුරෙහිම ඉණිකුණෙකු වී උපන්හ. තෙරුන් මියගිය පුවත සැළ වූ නැගණිය අරමට ගොස් හඬා වැළප භික්ෂූන් වහන්සේගේ ද සහයෝගයෙන් ආදහන කටයුතු කළාය. තෙරණුවන්ගේ රෝගී අවස්ථාවෙහි උවටැනට කිසිවකු නොසිටි හෙයින් උන්වහන්සේ සතු වූ අලුත් සිවුර සංඝ සම්මතයෙන් කිසියම් භික්ෂුවකට පිරිනැමීමට කටයුතු යෙදිණි. ඉණිකුණා තම වස්තුව අන් අය සතු වෙතැයි බියෙන් සිවුරෙහි ඒ මේ අත දුවමින් හඬා වැලපෙන්නට විය. දෙව්රම ගඳ කිළියෙහි වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේට ඉණිකුණා ගේ මේ වැළපීම අසන්නට ලැබිණ. එබැවින් උන්වහන්සේ අනඳ හිමියන් අමතා, "ආනන්ද, තිස්ස තෙරුන්ගේ සිවුර සඟ සතු කිරීම සත් දිනකින් කල් දමන සේ සංඝයාට පවසන්නැ" යි පැවසූ සේක. අනඳ තෙරණුවෝ එසේ කළ හ. ඉණිකුණා සත් දිනකින් පසු මිය ගොස් තුසිත දෙව්ලොව උපන්නේ වේ. අටවැනි දිනයෙහි බුදුරජාණන් වහන්සේ තිස්ස තෙරුන්ගේ සිවුර සඟසතු කිරීමේ කටයුත්ත කරන්නැයි සංඝයාට දන්වා සිටි සේක. එසේ කළ සංඝයා අතර බුදුන් වහන්සේ තිස්සගේ සිවුරු සඟ සතු කිරීම දින සතකින් කල් දැමීම සාකච්ඡාවට බඳුන් විය. එය දැන ගත් භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, තිස්ස තම සිවුර කෙරෙහි ලොබින් මිය ගිය බැවින් එහිම ඉණිකුණකු වී උපන. සංඝයා අතර එය බෙදා ගැනීමට යන බව දැන ගත් ඉණිකුණා තම වස්තුව අන්සතු වේ යයි බියෙන් තැති ගැනී සිටියේ ය. ඔහු එසේ සිටිය දී සිවුර සඟ සතු වූයේ නම් සංඝයා කෙරෙහි කිපී වෛරයෙන් මිය ගොස් අපායෙහි ඉපදීමට ඉඩ තිබිණ. එබැවින් මම එය වළක්වාලූයෙමි. දැන් ඔහු මිය ගොස් තුසිත දෙව්ලොව ඉපදී සිටී. එබැවින් එය යළි සඟ සතු කිරීමට ඉඩ හලෙමි" යි පවසා මෙසේ ද වදාළ සේක. "සත්වයන් ගේ සිත තුළ වස්තූන් කෙරෙහි පවත්නා ලෝභය ඔවුන්ගේම විනාශයට විපතට හේතුවන්නකි.

යකඩයක හට ගන්නා මලකඩ එයින්ම මතු වී එයම විනාශ කරන්නා සේ ලෝභය ද සත්වයන් ගේ සිතෙහි හට ගැනී සත්වයන්ගේ ම අයහපතම උදා කරයි. ලෝභය නිසා පුද්ගලයෝ නිතර අපායාදී දුගතීන් හි උපදිති."

විස්තරාත්මක අනුවාදය (240 ගාථාව)

අයසා එව සමුට්ඨිතං මලං තදුට්ඨාය තං එව ඛාදති.
එවං අතිධොනචාරිනං සකකම්මානි දුග්ගතිං නයන්ති

අයසා එව: යකඩයෙන් ම; **සමුට්ඨිතං**: හටගත්; **මලං**: මල (කඩ); **තදුට්ඨාය**: එයින් මතුව; **තං එව**: එය ම; **ඛාදති**: විනාශ කරයි; **එවං**: එසේම; **අතිධොනචාරිනං**: වැරදි ලෙස සිත මෙහෙයවන අයගේ; **සකකම්මානි**: සිය කටයුතු (කර්ම); **දුග්ගතිං**:(ඒ අයව) දුගතියට; **නයන්ති**: පමුණුවති.

යකඩයෙන්ම හටගත් මල යකඩයෙන්ම ඉස්මතුව එයම කා වනසා දමයි. මෙසේම වැරදි දෙසට සිත දුවවන අයගේ කටයුතු වලින් ඔවුන්ගේම විපත උදා කෙරෙයි.

විවරණය

දුග්ගති: දු+ගති යන පද දෙක එක්ව සෑදෙන මෙයින් පහත් තත්වය, විපත, අයහපත හෝ දුක් ඇති කරලන උත්පත්ති භවය යන අර්ථය දෙයි. බෞද්ධ සාහිත්‍යයෙහි දුගති ලෙස අපාය, තිරිසන් ලෝකය, ප්‍රේත ලෝකය, අසුර නිකාය, යන සතර සැලකී ඇත. සුගති යන්නට මනුෂ්‍ය ලෝකය, සදෙව් ලොව හා බඹලොව අයත් වෙයි.



නො හැදෑරීම ද, වෙර නැතිකම ද, කුසීතකම ද, පමා බව ද, කිලුටට කරුණකි.

241. අසජ්ඣායමලා මන්තා
අනුට්ඨානමලා ඝරා
මලං වණ්ණස්ස කොසජ්ජං
පමාදො රක්ඛතො මලං (18:7)

වනපොත් නොකිරීම මතුරට ඇති නපුරයි
දිරිමත් නොම වීම ගෙයකට වන විපතයි
නොසැලකිල්ල රූසිරි සම්පත් වනසයි
රැකවලු පමාවෙන් පිරිහී යනු නියතයි.

විපතට කරුණු දැන - එයින් දුරුවනු මැන

18 (4) කාළුදායි තෙරණුවෝ (241 ගාථාව)

දෙව්රම් වෙහෙරෙහි වැඩ වසනා භාග්‍යවතුන් වහන්සේ **කාළුදායි** තෙරුන් අරභයා මෙම ගාථා ධර්මය වදාළ සේක. සැවැත් නුවර සැදැහැති උවසු උවැසියෝ උදය කාලයෙහි දෙව්රම් වෙහෙරෙහි භික්ෂූන් වහන්සේට දහවල් දානය පිළිගන්වා සවස යළි වෙහෙරට ගොස් මල් පහන් පුද කොට සැරියුත් මුගලන් ආදී මහතෙරවරුන්ගෙන් ධර්මය ඇසීම පුරුද්දක් කොට ගෙන සිටිය හ. ධර්මය අසා පහදින උවසු උවැසියෝ දහම් දෙසන සැරියුත් මුගලන් ආදී මහ තෙරවරුන්ගේ ගුණ වනති. උවසු උවැසියන්ගේ මේ ගුණ කථාව ඇසූ කාළුදායි තෙරණුවෝ ඔවුන් අමතා දිනක් මෙසේ කීහ. "ඔබ එම තෙරවරුන්ගේ ගුණ පවසන්නේ උන්වහන්සේලාගෙන් පමණක් දහම් අසන නිසාය. අපට ද දහම් දෙසීමට හැකිය. අපෙන් දහම් ඇසුවහොත් ඔබ හැම අපටද පසසනු ඇත," මෙය ඇසූ උවසු උවැසියෝ කාළුදායි තෙරුන් ලවා ද බණක් කියවා ඇසීමට සිතූහ. එසේ සිතා දිනක් උන්වහන්සේට දහම් දෙසන සේ ඇරයුම් කළහ. ඇරයුම පිළිගත් කාළුදායි තෙරණුවෝ ධර්මාසනයෙහි හිඳ සිත්කළු විජිනිපතක් ද අතට රැගෙන පවන් සලා ගනිමින් දහම් දෙසීමට සූදානම් වූහ. එහෙත් මාතෘකාවට දහම් පදයක් හිතට නඟා ගැනීමට බොහෝ වේලාවක් උත්සාහ කළද ධර්මය පිරිවහා නොතිබුණු බැවින් කිසිදු දහමක් මතකයට නොනැඟිණි. දහම් දෙසීමට නො හැකි වූ තෙරණුවෝ "මම රාත්‍රි කාලයෙහි දහමක් දෙසමි. දැනට වෙන තෙරුන් කෙනකුන් ලවා බණ කියවා ගන්නැ"යි පවසා ධර්මාසනයෙන් බැස යන්නට ගිය හ.

උපාසකවරු ද වෙනත් තෙර කෙනකුන්ගෙන් බණ අසා රාත්‍රි කාලයෙහි කාළුදායි තෙරුන්ගෙන් පෙළ දහමක් අසනු රිසි වූවෝ ඒ තෙරුන් වෙත රාත්‍රි සමයෙහි ගොස් පෙළ දහම දෙසන ලෙස ඉල්ලා සිටියහ. තෙරණුවෝ ද ධර්මාසනයට නැඟී කිසිදු දහමක් කියාගත නොහැකිව දැනට වෙනත් තෙර කෙනකුගෙන් අසා ගන්නැයි ද තමන් අලුයම් කාලයෙහි දෙසන බව ද පවසා ධර්මාසනයෙන් බැස යන්නට ගිය හ. අලුයම් කාලයෙහි ද උපාසකවරු තෙරුනට දෙසුම සඳහා ඇරයුම් කළහ. එවරද උන්වහන්සේ දහම් දෙසුමෙහිලා අසමත් වූහ. සැරියුත් මුගලන් ආදී මහ තෙරවරුන්ට මහජනයා කරන පැසසුමට ඊර්ෂ්‍යාවෙන්ම තමන් නොදන්නා බණ දන්නා බව කාළුදායි තෙරුන් හැඟවූහයි වටහා ගත් උපාසකවරුද ධර්මාසනයෙන් බැස යන තෙරුන් පසු පස්සේ លුහු බඳිමින් දොස් පරොස් කීහ. උපාසකවරුන්ගෙන් බේරී පලා යන තෙරණුවෝ අසළ තිබූ වලකට වැටුනහ. කාළුදායි තෙරුන් පිළිබඳ මේ සිද්ධිය එදින විහාරයට රැස් වූ මහජනයා අතර කථාවට මාතෘකාවක් විය. "සැරියුත් මුගලන් ආදී මහ තෙරවරුන් කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් ම කාළුදායි තෙරුණුවෝ තමාට නොහැකි බව දැන දැනත් දහම් දෙසීමට ඉදිරිපත් වීමෙන් ලජ්ජාවටත් විපතටත් පත්වූහ"යි යන පුවත විහාරය පුරා පැතිර ගියේ ය. මේ කථාව භික්ෂූන්ගෙන් අසා දැන ගත් බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි දී භික්ෂූන් අමතමින් "මහණෙනි, කාළුදායි දැන් පමණක් නොව පෙර අත්බැවකදී ද බලවතුන්ට ඊර්ෂ්‍යා කොට විපතට පත් විය. හෙතෙම ඌරකුව උපන් පෙර ජන්මයක දී තම ශක්තිය නොදැන සිංහයකුට අභියෝග කළේ ය. පසුව සිංහයා ඔහු පසු පස එලවා එන විට බියෙන් පලා යමින් ගවර වලෙක වැටුණේය"ය. ජාතක කථාවක් ද ඉදිරිපත් කොට මෙසේ ද වදාළ සේක. "මහණෙනි, කාළුදායි සුළුවෙන් හෝ උගත් දහම හෝ අභ්‍යාස නොකිරීමේ හේතුවෙන් සිතෙහි රඳවා ගැනීමට අසමත්ව ඇත. උගත් දෙය වනපොත් නොකරන්නේ නම් අභ්‍යාස නොකරන්නේ නම් එය අමතකව යයි. එබැවින් අනභ්‍යාසය උගත් ශිල්පශාස්ත්‍රයන් වනසන මල බැඳීමකි. ගෙයක වසන අය උත්සාහයෙන් හා ධෛර්යයෙන් ක්‍රියා නොකරන්නේ නම් එය ගෙහි මල බැඳීමක් වෙයි. කෙනකු ගේ රූසිරිය වැඩිකල් තබා ගත හැක්කේ එය පවත්වා ගැනීමට සත්කාර කිරීමෙනි. අලස බවින් රූපය පිළිබඳව සැලකිල්ලක් නොකරන්නේ නම් එය වර්ණ සෞන්දර්යයෙහි මල බැඳීමකි. කිසියම් තැනක ආරක්ෂකයකු පමාව හිඳින්නේ නම් එය ඔහු ගේ විනාශයට හේතුවකි. එබැවින් ප්‍රමාදය මුරකරුගේ මල බැඳීමකි" යි මෙසේ පැවසූ භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (241 ගාථාව)

මන්තා අසජ්ඣායමලා, ඝරා අනුට්ඨානමලා වණ්ණස්ස
කොසජ්ජං මලං පමාදො රක්ඛතො මලං

මන්තා: මන්ත්‍රයෝ (උගත්දැය); **අසජ්ඣායමලා**: නො හැදෑරීම මල (පිළිලයක්) කොට ඇත්තාහ;
ඝරා: ගෘහවාසීහු; **අනුට්ඨානමලා**: උත්සාහයෙන් ක්‍රියා නොකිරීම පිළිලයක් කොට ඇත්තාහ; **වණ්ණස්ස**: ශරීර පැහැයට; **කොසජ්ජං**: අලස බව; **මලං**: කිලුටකි; **පමාදො**: ප්‍රමාදය; **රක්ඛතො**: රැකවලාට; **මලං**: කිලුටකි.

උගත් ශිල්ප ශාස්ත්‍රයන්ට අනභ්‍යාසය පිළිලකි. වීර්යයෙන් උත්සාහවත් නොවීම ගෙවලට පිළිලකි. අලස බව රූ සපුවට පිළිලයකි. පමාව රැකවලාට පිළිලයකි.

විවරණය

අසජ්ඣායමලා: අසජ්ඣායනය, අනභ්‍යාසය යන අරුත්ය. මන්ත්‍රයක් සිතෙහි බොහෝ කල් මතක තබා ගත හැක්කේ එය නැවත නැවතත් සජ්ඣායනය කොට සිතෙහි ධාරණය කර ගන්නේ නම් පමණි. ඉගෙන ගන්නා හැම ශිල්ප ශාස්ත්‍රයකම තත්වය එසේ ය. වනපොත නොකරන්නේ නම්, පුනරීක්ෂණයෙහි නොයෙදෙන්නනේ නම් උගත් දෙය සිතින් ගිලිහී යයි. එබැවින් මන්ත්‍රයට අසජ්ඣායනය පිළිලක් කොට දැක්වෙයි.

පමාදො: අප්‍රමාදය හෙවත් පමා වීමයි. ප්‍රමාදය සියලු පිරිහීම් වලට මූලසාධකයක් වෙයි. සැලකිලිමත් නොවී අනවධානයෙන් ක්‍රියා කරන පුද්ගලයාගෙන් ආධ්‍යාත්මික වූත් භෞතික වූත් දියුණුව පළා යයි. එබැවින් අප්‍රමාදයෙන් අනලස්ව සාවධානාත්මකව කටයුතු කිරීම බුදු දහමෙහි දී නිතරම ප්‍රශංසාවට ලක් වෙයි. භික්ෂූන් උදෙසා බුදුරජාණන් වහන්සේ අවසාන අවවාදය වූයේ ද "**අප්පමාදෙන සම්පාදෙථ**" නොපමාව කටයුතු කරන්න" යන්නයි.



දුසිරිත හා මසුරු බව කිලුටට කරුණු ය. අකුසල් දහම්හු මෙලොව හා පරලොව කිලුටට කරුණු ය.

242. මලිත්‍ථියා දුච්චරිතං
මච්ඡෙරං දදතො මලං
මලා වෙ පාපකා ධම්මා
අස්මිං ලොකෙ පරම්හි ච (18:8)

කැලලකි පැවැත්මට දුසිරිත ගැහැනියගේ
මසුරු වෙතොත් එය කිලුටකි දෙන අයගේ
පවිටුකම ඇතොත් සිත තුළ කිසිවකු ගේ
නියතයි කිලුටු කරලනු දෙලොවම ඔහු ගේ

කෙනකුගෙ පව්ටුකම - අඳුරෙහි හෙළයි දෙලොවම

18 (5) දුසිරිතෙන් කෙලෙසුණු බිරියකගේ සැමියෙක් (242-243 ගාථා)

වේළුවන වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ කිසියම් **තරුණ කුලපුත්‍රයකු** අරභයා මෙම ගාථා දෙක දේශනා කළ සේක.

මෙම කුල පුත්‍රයා තමාට සමාන කුලගොත් ඇති තරුණියක සමඟ විවාහව සිටියෙකි. විවාපත් කාලයෙහි පටන්ම බිරිය අනාචාරයෙහි හැසිරීම පුරුද්දක් කොට ගත්තාය. බිරියක අනාචාරයෙහි හැසිරීම සැමියාට සමාජයට මුහුණ පෑමට බැරි තරමේ වූ ලජ්ජාවකි. තම බිරිය දුසිරිතෙහි හැසිරීම නිසා බෙහෙවින් ලජ්ජාවටත් කලකිරීමටත් පත් මෙම කුල පුත්‍රයා තමන් කලින් පුරුදුව සිටි බුද්ධෝපස්ථානය සඳහා විහාරයට යාම පවා අත්හළේ ය. එහෙත් මෙය කොතෙකුත් අත්හැර දමා සිටිය නොහැකි දෙයක් වූ බැවින් හෙතෙම දිනක් විහාරයට ගොස් බුදුන් වහන්සේ බැහැදැක සිටියේ ය. කලකින් නුදුටු කුලපුත්‍ර දැක "උපාසකය, බොහෝ කලකින් දක්නට නොලැබුනේ මන්ද?"යි බුදුරජාණන් වහන්සේ ඔහුගෙන් විමසූ සේක. ලජ්ජාවෙන් හැකිළුණු කුල පුත්‍රයා උන්වහන්සේට සියලු පවත් සැළ කළේය. එය ඇසූ භාග්‍යවතුන් වහන්සේ, "උපාසකය, දැන් පමණක් නොව පෙර භවයකදී ද මා බෝසතුන්ව සිටිය දී ඔබ මා වෙත පැමිණ මෙබඳුම කරුණක් මා වෙත දන්වාලීය. බොහෝ ස්ත්‍රීන් පාපයෙහි බැඳෙන සැටි මම ඒ අවස්ථාවෙහි ද ඔබට පැවසූයෙමි. බොහෝ ස්ත්‍රීන්ගේ ස්වභාවය පිළිබඳව මා එදා කී කරුණු භවයෙන් වැසී යාම හේතුවෙන් ඔබට අමතකව ඇත"යි අතීත ජාතක කථා පුවත ද හෙළි කරමින් ගාථා ද්‍රාමයකින් ධම් දේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (242 ගාථාව)

ඉත්ථියා දුච්චරිතං මලං, දදතො මච්ඡෙරං මලං, පාපකා ධම්මා අස්මිං ලොකෙ පරම්හි ච වෙ මලං

ඉත්ථියා: ස්ත්‍රියට; **දුච්චරිතං**: දුසිරිත; **මලං**: කිලුටකි; **දදතො**: (දන්) දෙන්නාට; **මච්ඡෙරං**: මසුරු බව; **මලං**: කිලුටකි; **පාපකා ධම්මා**: අකුශල ධම්යෝ; **අස්මිං ලොකෙ**: මෙලොවෙහි (ද); **පරම්හි ච**: පරලොවෙහි ද; **වෙ**: ඒකාන්තයෙන්; **මලං**: කිලුටකි.

දුසිරිතය ගැහැනියට කිලුටකි, මසුරු බව දෙන්නාට කිලුටකි, පව්ටු අකුශල ධම්යෝ මෙලොව පරලොව දෙකෙහිම කිලුටුය.

විවරණය

ඉත්ථියා දුච්චරිතං මලං: නොමනා හැසිරීම ස්ත්‍රියට කිලුටකි. සමාජයෙහි ස්ත්‍රියට හිමි තත්වය තහවුරු වන්නේ ඇය දුසිරිතෙන් මිදී සුසිරිතෙහි නිරත වන විටය. දුසිරිතෙහි යෙදෙන ස්ත්‍රිය සමාජයෙහි පිළිකුලට බඳුන් වෙයි. දියණියක්, බිරියක්, මවක් වශයෙන් සමාජයෙහි ස්ත්‍රියට ඉතා උසස් තත්වයක් හිමි වන බව ස්ත්‍රී වර්ගයාට පමණක් නොව එතෙක් ස්ත්‍රිය පහත් කරමින් ඇයගේ දුර්ගුණාම ඉස්මතු කොට දැක්වීමට පුරුදුව සිටි භාරතීය සමාජයට පැහැදිලි කළ බුදුරජාණන් වහන්සේ ස්ත්‍රිය දුර්ගුණාවලින් මුදවා සුසිරිතෙහි යොමු කරවීමට අදාළ ඉතා උසස් උපදෙස් ඉදිරිපත් කළ සේක. තත්කාලීන භාරතීය සමාජයෙහි ස්ත්‍රියට හිමි වූ පහත් තත්වය ගැන සානුකම්පිත වූ බුදුරජාණන් වහන්සේ ඔවුන්ගේ සමාජ සහ ආගමික වරප්‍රසාද සමාජයෙහි තහවුරු කරනු සඳහා අසීමිත සේවයක් සිදු කළ සේක්.

බුදුරජාණන් වහන්සේ පහළ වීමට පෙර භාරතයෙහි කාන්තාව උසස් තත්වයෙන් සමාජයෙහි සැලකූ බවට සාධක නොමැත. බ්‍රාහ්මණික ආගමික සංස්ථාව මගින් කාන්තාව ස්වභාවයෙන් ම පහත් වූ, ලාමක ගති පැවතුම් ඇති, ආගමික අභිමතාර්ථයන් ඉටුකර ගත නොහැකි දුර්වල තැනැත්තියක සේ සලකණු ලැබිණ. භාරතීය ලේඛකයකු වන හේමචන්ද්‍ර "ස්ත්‍රිය අපාය මාර්ගයේ දොරටුව දක්වන්නීය."යනුවෙන් හඳුන්වයි. බුදුන් වහන්සේ ගැහැණිය පහත් කොට නොසැලකූ අතර ගැහැණු පිරිමි භේදයක් නැතිව කාහටත් උත්තම ගුණාංග එකසේ දියුණු කර ගත හැකි බව පෙන්වා වදාළහ. ලිංගිකත්වය ආධ්‍යාත්මික හෝ බාහිර අභිවෘද්ධියේ බාධකයක් නොවන බවට උන්වහන්සේ කොතෙකුත් කරුණු දක්වා ඇත.

බොහෝ විට බෞද්ධ ආගමික කෘතීන්හි කාන්තාව හැඳින්වීම සඳහා පාලි භාෂාවෙන් යොදා ඇති වචනය වන්නේ මාතුගාම යනුයි. මාතෘ සමූහය හෝ මාතෘ සමාජය යන අර්ථය මතුගාම යන්නෙහි ඇත. කාන්තාව මාතාවක වශයෙන් බුදු සමයේ දී උසස් තත්වයක් ලබන්නීය. මව්පිය දෙදෙනාම බ්‍රහ්ම යනුවෙන් හඳුන්වමින් ස්ත්‍රී පුරුෂ භේදයක් නොතකා සමතත්වයෙන් සලකමින් හින්දූන් ගේ නිර්මාණකාරක මහා බ්‍රහ්මයාගේ තත්වයෙන් තබනු ලැබූහ. එසේ තැබීමට තරම් බුදුන්වහන්සේ නිර්භය වූහ. 'මව' දෙව්ලොව යාමට ඇති පහසුම හිණිමග ලෙසද බුදු දහමෙහි දී හඳුන්වා ඇත. කාන්තාව භාර්යාවක වශයෙන් ගැනීමේ දී ඇය ස්වාමියාගේ හොඳම යෙහෙළිය වශයෙන් ද හඳුන්වනු ලැබුවාය.

බුදුරජාණන් වහන්සේ සාධාරණ හේතු සමූහයක් මත කාන්තාවන් පැවිදි සංස්ථාවට ඇතුළත් කර ගැනීමට මුලදී අකමැත්ත පළ කොට ඇතත් පසුව අනඳ හිමියන්ගේ හා තම සුළු මව වන මහා ප්‍රජාපතී ගෝතමියගේ බලවත් මැදිහත් වීම සැලකිල්ලට ගනිමින් භික්ෂුණී සංස්ථාව පිහිටුවා වදාළහ. මානව ඉතිහාසයෙහි පළමුවරට නීති රීති මාලාවක් යටතේ කාන්තා සංවිධානයක් පිහිටුවනු ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි.

ලොකු ම මල (=කිලුට) අනුවණකම ය. මේ මල දුරුකොට (කෙළෙසුන්ගෙන් මිදී) නිමල වන්න.

243. තතො මලා මලතරං
අවිජ්ජා පරමං මලං
එතං මලං පහත්වාන
නිම්මලා හොථ භික්ඛවො (18:9)

ඒ හැම කිලිටි ඉක්මූ
දැඩි කිලුට මුළාවය
මේ කිලුට දුරලා
නිකිලිටි වන්න මහණෙනි

අවිද්‍යාව බලවත්වූ කිලුටයි

18 (5) දුසිරිතෙන් කෙලෙසුණු බිරියකගේ සැමියෙක් (242 සහ 243 ගාථා)

විස්තරාත්මක අනුවාදය (243 ගාථාව)

භික්ඛවෝ තතෝ මලා මලතරං අවිජ්ජා පරමං මලං
එතං මලං පහත්වාන නිම්මලා හොථ

භික්ඛවෝ: මහණෙනි; **තතෝ මලා**: ඒ හැම කිලුටට වඩා; **මලතරං**: දැඩි කිලුටක් (ඇත); **අවිජ්ජා**: අවිද්‍යාව (නොදැනීම); **පරමං**: දැඩිතර වූ; **මලං**: කිලුටකි; **එතං**: මේ; **මලං**: කිලුට; **පහත්වාන**: දුරු කොට; **නිම්මලා**: කිලිටි නැත්තෝ; **හොථ**: වෙමු.

මහණෙනි, ඒ කිලිටි වලින් දැඩි තර වූ කිලුටක් ඇත. අවිද්‍යාව බලවත් ම වූ කිලුටයි. ඒ අවිද්‍යා කිලුට දුරු කොට පිරිසිදු වන්න.

විවරණය

ලෝකයේ පැරණිම ප්‍රජාතාන්ත්‍රික පැවිදි සංවිධානය ලෙස ගැනෙන බෞද්ධ භික්ෂු සංස්ථාවේ අග්‍රශ්‍රාවක තනතුරෙහි සැරියුත් මුගලන් රහතන් වහන්සේලා පිහිටවනු ලැබූ පරිද්දෙන්ම භික්ෂුණී සංස්ථාවෙහි අග්‍රශ්‍රාවක තනතුරු සඳහා ඛේමා, උප්පලවණ්ණා යන තෙරණිවරුන් දෙදෙනා පිහිටුවනු ලැබූහ. මෙසේම බුදුරජාණන් වහන්සේ තවත් බොහෝ තෙරණිවරුන්ට විවිධ ශාසනික තනතුරු ප්‍රදානය කළ බව ද ප්‍රකට කරුණකි.

බුදු සසුනින් කාන්තාවන් සඳහා විවෘත වූ නිදහසින් නිසි ප්‍රයෝජන ලබනු රිසි වූ බොහෝ වනිතාවෝ භික්ෂුණී සංස්ථාවට ඇතුළත්ව පැවිදි උපසම්පදාව ලබා ආගමික නිදහස අත්පත් කරගත්හ. මේ අත්වූ නිදහසින් කාන්තාවන් කෙබඳු තරමින් සන්තුෂ්ටියට පත් වූයේ ද යන කරුණ ඔවුන්ගේ ආත්ම ප්‍රකාශන අන්තර්ගත වූ ථෙරීගාථාවෙන් ප්‍රකට වෙයි. සමාජයේ විවිධ කොටස් වලට, තරාතිරම් වලට අයත් වූ කාන්තාවෝ භික්ෂුණී සාසනයට ඇතුළත්ව සියලු කෙලෙස් සිඳ දමා රහත් බවින් නිවන් සුවය අත් කර ගත් හ.

කාන්තාවන් පිළිබඳ භාරතීය සමාජයෙහි මුල් බැසගෙන තිබූ මිථ්‍යා ආකල්ප දුරුකරලීම සඳහා බුදුන් වහන්සේ තම දේශනා උපයෝගී කොට ගත්හ. වරක් පසේනදී කොසොල් රජු බුදුන් වහන්සේ හමුවී සාකච්ඡා කරමින් සිටිය දී රජ බිසවට 'දුවණියක ලැබිණි' යන පුවත දූතයකු මගින් රජුට දැන ගන්නට ලැබිණ. මේ පුවත රජුගේ සතුට නොව කණස්සල්ල දක්වන්නක් විය. රජුගේ නොපහන් බව වටහා ගත් බුදුරජාණන් වහන්සේ රජු එතෙක් ස්ත්‍රීන් කෙරෙහි දැක්වූ වැරදි ආකල්පය ඉවත් කරලනු සඳහා දහම් දෙසූ සේක. **"ඉත්ථීපි හි එකච්චියා සෙය්‍යා පොස නරාධිප"** (ඇතැම් පිරිමින් පමණක් නොව) ඇතැම් ස්ත්‍රීහුත් ශ්‍රේෂ්ඨ වෙති. එබැවින් මහරජ දියණිය පෝෂණය කරන්න." මේ බුදුන්වහන්සේ රජුට ඉදිරිපත් කළ ඉගැන්වීමයි. "මහරජ, නුවණැති, සිල්වත්, නැදිමයිලන් දේවත්වයෙන් සලකන පතිවත රකින කාන්තාවෝ වෙති"යි උන්වහන්සේ තවදුරටත් රජුට කරුණු පැහැදිලි කළසේක. කාන්තාවකගේ නියම තත්වය ගිහි සමාජයේ ඉහළම පුද්ගලයාට-රජුට මෙතරම් පැහැදිලි හා සිත්ගන්නා සුලු ලෙස වටහා දුන් අවස්ථාවක් මින් පෙර නොවීය.

ආගමික අභිමතාර්ථ සාධනයෙහි ලා ස්ත්‍රී වර්ගයාගේ හැකියාව පිළිබඳව බුදුන්වහන්සේ නැගූ කාහල නාදය වෙනත් කිසිම ආගමික ශාස්තෘවරයකු ගෙන් ඉදිරිපත් වී නැත. ප්‍රජාපතී ගෝතමිය පිරිනිවන් පෑම සඳහා අවසර පැතූ මොහොතෙහි බුදුරජාණන් වහන්සේ කරන ප්‍රකාශය සමස්ත කාන්තා සංහතිය පිළිබඳ ලෝක ඉතිහාසයෙහි සදාතනිකව රැව් පිළි රැව් නංවන්නකි.

''ථීනං ධම්මා'භිසමයෙ - යෙ බාලා විමතිං ගතා
තෙසං දිට්ඨි පහානත්ථං - ඉද්ධිං දස්සෙහි ගොතමී''

"ගෞතමිය ස්ත්‍රීන්ගේ ධර්මාවබෝධය විෂයෙහි මෝඩයෝ සැකයට පත්ව සිටිති. ඔවුන්ගේ වැරදි මතය දුරු කරලනු සඳහා ඍද්ධි ප්‍රාතිහාර්ය දක්වන්න."

ස්ත්‍රීන් අනුවණ දුර්වල පිරිසකැයි සිතා සිටි අය මෝඩයන් වශයෙන් හැඳින්වීමක් මෙහි දී සිදු වී ඇත. මේ වූකලී ස්ත්‍රීන් කෙරෙහි එල්ල වූ ප්‍රහාරයක් ප්‍රහාරකයන් වෙතටම ආපසු හරවා යැවීමක් ලෙස සැලකිය හැකිය.

ස්ත්‍රීන් දෑගිලි නුවණ ඇත්තියන් ලෙස සලකනු ලැබූ සමාජ ආකල්පයට බුදුදහමේ ආලෝකයෙන් විමුක්තිය ලබා සිටි සෝමා තෙරණිය කදිම පිළිතුරක් දී ඇත.

"ඉත්ථි භාවෝ නො කිං කයිරා - චිත්තම්හි සුසමාහිතෙ"

"සිත මනාව සංසුන් කල්හි අපේ ස්ත්‍රී භාවය කවර වෙනසක් ඇති කෙරේ ද?"

බුදුන් දවස ඇතැම් කාන්තාවෝ බුදු සමයෙන් ලද අවසරය යටතේ ඇතැම් බොහෝ පිරිමින්ට වඩා උත්තම ගුණාංගයන්ගෙන් පරිපූර්ණ ජීවිත ගත කළහ. ශ්‍රද්ධාව, කරුණාව, පරිත්‍යාගශීලය, උගත් බව හා ප්‍රඥාව විදහාපාමින් පිරිමින් අභිබවා ඔවුන් ක්‍රියාකළ ආකාරය බෞද්ධ සාහිත්‍යයෙන් විස්තර වෙයි. බුදුන් වහන්සේ ගේ අග්‍ර දායිකාව වන විශාඛාවන්ගේ කථා පුවත්වලින් ඇය පිරිමින් පරදවා ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කළ අවස්ථා රාශියක් හෙළිදරව් කොට ඇත.

කිසියම් දුර්ගුණයක් ඇතොත් ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැතිව එය විදහා දක්වමින් එයින් ඔවුන් මුදවා සුමග යැවීම සඳහා ක්‍රියා කිරීම බුදුන්වහන්සේගේ සිරිතයි. ස්ත්‍රීන් සම්බන්ධයෙන් බුදු සමයෙන් කිසියම් විවේචනයක් එල්ල වී ඇත්නම් එහි අරමුණ වී ඇත්තේ කාන්තාවන් සුමගට යොමු කරලීමේ අභිලාෂයයි. 'ස්ත්‍රීන් උපතින්ම පාපකාරිය' යන මිථ්‍යා ආකල්පයට බුදු සමය දැඩි සේ පහර එල්ල කොට ඇත.





හිරි - ඔතප් නැති ගසා කෑමෙහි සූර වූ කිළිටි දිවි පැවතුම් ඇතියහුට ජීවත්වීම ඉතා පහසු ය.

244. සුජීවං අහිරිකෙන
කාකසූරෙන ධංසිනා
පක්ඛන්දිනා පගබ්භෙන
සඞ්කිලිට්ඨෙන ජීවිතං (18:10)

කවුඩු කපටිකම් ඇති විලිබිය නැතිව
පුරසාරම් දොඩා රැවටිලි ගති ඇතිව
බිය සැක වරා දිවයන ලොබයට ගැතිව
කිලිටි වූවහුට දිවි පහසුය නිතිව

විලි බිය නැති දිවිය - රැකුමට ඉතා පහසුය.

18 (6) චුල්ල සාරී තෙරුන්ගේ කථාව (244 සහ 245 ගාථා)

දෙව්රම වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ වෙදකමින් දිවි රකිමින් සිටි චුල්ලසාරි නම් භික්ෂුවක අරභයා මේ ගාථා ද්වය වදාළ සේක.

චුල්ලසාරි තෙරුන් වහන්සේ සැරියුත් මහරහතන් වහන්සේ සමග එක්ව වාසය කරන්නෙකි. භික්ෂූන් වහන්සේ කෙනකු සතුවිය යුතු අල්පේච්ඡතාදී ගුණයන්ගෙන් තොරවූ මෙම තෙරහු දායක ගෙවලට ගොස් අවස්ථාවක් ලද විට වෙද හෙදකම් කිරීම ද සිරිත කොට ගත්හ. එසේ වෙදකම් කිරීමෙන් අතිරේක ලාභ ප්‍රයෝජන ද එම තෙරුනට ලැබිණ, දිනක් එසේ වෙදකම් කොට ලැබුණු ප්‍රත්‍යයන් ද රැගෙන එන අතර මගදී සැරියුත් හිමියනට මේ භික්ෂුව මුණ ගැසිණ. චුල්ලසාරි භික්ෂුව තමන්ට ලැබුණ රසවත් අහරක් සැරියුත් හිමියන්ට පෙන්වා. "ස්වාමීනි, මේ වෙදකම් කොට මට ලැබුණු රසවත් අහරෙකි. නුඹ වහන්සේට මෙබඳු ආහාර ලැබෙන්නේ කලාතුරකිනි. මෙයින් කොටසක් ඔබ වහන්සේගේ පරිභෝජනයට ගන්න.

මින් මත්තෙහි ද මෙබඳු ආහාර ලැබුණු විට ඔබ වහන්සේට ද දෙමි"යි පවසා ආහාර කොටසක් සැරියුත් හිමියන්ට දීමට සූදානම් විය. සැරියුත් හිමියෝ භික්ෂුව ගේ වචන නෑසුණා සේ දුන් ආහාර කොටස ද නොපිළිගෙන විහාරයට වැඩම වූහ. වෙදකම් කිරීම වැනි ගිහි කටයුතු කොට ප්‍රත්‍යයන් ලබා ගැනීම භික්ෂු ජීවිතයට නොගැලපෙන්නක් බැවින් මෙම සිද්ධිය සැරියුත් හිමියෝ බුදුරදුනට දක්වාලූහ. මේ සිද්ධිය අරභයා බුදුරජාණන් වහන්සේ කරුණු දක්වමින් "කපටිකමින් පාපයට ලජ්ජාබිය නැති කමින් මේ භික්ෂුව භික්ෂුවකට නොගැලපෙන අයුරින් ක්‍රියා කරමින් ප්‍රත්‍යලබා ගෙන ඉතා පහසු ජීවිතයක් ගෙවයි. පාපයට ලජ්ජා භය ඇති සුපේශල භික්ෂුව ගෙපිළිවෙලින් සිඟා ගොස් තමාට ලැබෙන ආහාරයක් පිළිගෙන දුකසේ තම දිවිය ගත කරයි"යනුවෙන් පවසා ගාථා දෙකකින් ධර්ම දේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (244 ගාථාව)

අහිරිකෙන කාකසූරෙන ධංසිනා පක්ඛන්දිනා පගබ්භෙන සඞ්කිලිට්ඨෙන ජීවිතං සුජීවං

අහිරිකෙන: ලජ්ජා නැති; **කාකසූරෙන**: කපුටකුට බඳු කපටි ශූර බවක් ඇති; **ධංසිනා**: රැවටිලි බස් ඇති; **පක්ඛන්දිනා**: අවිශ්වසනීය වූ; **පගබ්භෙන**: දරදඬු ගති ඇති; **සඞ්කිලිට්ඨෙන**: කිලිටි චරිතයක් ඇති පුද්ගලයකු විසින්; **ජීවිතං**: දිවි පැවැත්ම; **සුජීවං**: සුවසේ පවත්වනු ලැබේ.

ලජ්ජා නැති කපුටකුට බඳු කපටි ශූර බවක් ඇති නැලවිලි බසින් අනුන් රවටන, වංචනික වූ දරදඬු ගති පැවතුම් ඇති කිලිටි චරිතයක් ඇති පුද්ගලයා පහසුවෙන් දිවි පවත්වා ගනියි.

විවරණය

කාකසූරෙන: කවුඩකු මෙන් කපටිකමින් ශූරවූ භික්ෂුව මෙහි දී විශේෂයෙන් අදහස් කෙරෙයි. පවට විලිබිය නැති ගිහි පැවිදි කවුරුන් වුවද තම දිවි පැවැත්මෙහි දී කපටිකම් වංචා සටකපට ප්‍රයෝග යොදා ක්‍රියා කරන බව නොරහසකි. එබඳු පැවතුම් ඇති අය බොහෝ පහසුවෙන් තම ජීවිතය ගෙවන බව ද ලෝකයෙහි අද වුව ද පැහැදිලිව පෙනෙන කරුණකි. බුදු දහමින් අනුමත කෙරෙන පුද්ගලයකු ගේ ජීවන ප්‍රතිපත්තිය බෙහෙවින් ධාර්මික වූවක් වෙයි. එය සම්මා ආජීව යටතේ විවරණය වෙයි. විශේෂයෙන් පැවිදි ජීවිතයේදී සම්මා ආජීවය භික්ෂූන්ගේ අභිමතාර්ථ සාධනයට යෝග්‍ය පරිද්දෙන් ඉදිරිපත් වී ඇත. භික්ෂුව වූකලී ගිහි කටයුතු වලින් බැහැරව ගිහි ගෙයින් නික්ම විමුක්තිගාමී මාර්ගයෙහි කැප වූවෙකි.

විමුක්තිය ලබා ගැනීම උදෙසා සාධක වන බොහෝ කරුණු අතරින් චරිත පාරිශුද්ධිය ද එකකි. ත්‍රිවිධ ශික්ෂාවෙන් එන ශීල යටතේ විවරණය වන චරිත පාරිශුද්ධියට අදාළ එක් අංශයක් වන්නේ ආජීව පාරිශුද්ධියයි. භික්ෂූන්ගේ දිවි පැවැත්ම බෙහෙවින් ආදර්ශමත් එකක් වීමට අදාළ සියලු කරුණු බුදුරජාණන් වහන්සේ විසින් විවිධ සූත්‍ර ධර්මයන්හිදී විවරණය කොට දක්වා ඇත. පියාපත් බරින් පමණක් හැසිරෙන ලිහිණියකු සේ බෙහෙවින්ම සැහැල්ලු දිවි පැවැත්මක් ඇතිව ලද දෙයින් පමණක් සතුටට පත්විය යුතු භික්ෂුවට ගිහි ජීවිත වෘත්තින්ගෙන් යැපීමට අවශ්‍යතාවක් නැත. මේ කථාවෙන් විවරණය වන චුල්ලසාරි භික්ෂුව වෙදකම් කිරීමෙන් ලැබෙන ලාභ ප්‍රයෝජන පිළිබඳ ගිජු බවකින් ක්‍රියා කළ තැනැත්තෙකි. වෙදකම යහපත් වෘත්තියක් වුවත් එය බෞද්ධ භික්ෂු ප්‍රතිපදාවෙන් ඉවත් කරනු ලැබුවකි.

තමා වෙදකම දන්නෙක් නම් එය ජීවන වෘත්තියක් වශයෙන් යොදා නොගෙන ලෙඩකු කෙරෙහි හුදු අනුකම්පාවෙන්ම කටයුතු කිරීමෙහි බලවත් වරදක් නොතිබිය හැකිය. වෙදකම උත්තම ක්‍රියාවක් වුවත් එය භික්ෂු ප්‍රතිපදාවට අයෝග්‍ය ක්‍රියාවක් වශයෙන් හඳුන්වා ඇත්තේ ප්‍රධාන කරුණු දෙකක් පාදක කොට ගෙනය. භික්ෂුව වචනාර්ථයෙන්ම විමුක්තියට කැප වී ආත්ම විමුක්තියෙහි ඇලුණු කෙනෙකි. වෙදකම් කිරීම් වැනි ගිහි කටයුතු කෙරෙහි යොමු වීමට ඔහුට අවස්ථාවක් නැත. අනෙක් අතට වෙදකම් ආදියෙහි නිරත වන්නේ නම් එය ජීවන වෘත්තියක් බවට පරිවර්තනය වීමේ සම්භාවිතාවක් ඇත. එසේ වුවහොත් ජීවන වෘත්තිය සඳහාම භික්ෂුව යොමුවනු ඇත. එය විමුක්තිගාමී ප්‍රතිපදාවට බලවත් බාධකයක් වෙයි. බුදුරජාණන් වහන්සේ තම භික්ෂු සාසනය පිහිටුවා වදාළේ එය බෙහෙවින්ම පරමාදර්ශී සහෝදරත්වයක් පිහිටුවීමේ අපේක්ෂාවෙනි.

තත්කාලීන ප්‍රව්‍රජිත සංවිධානයන්හි පැවැති පැවිදි බවට නොගැලපෙන ආකල්ප හා සිරිත් විරිත් සියල්ල ප්‍රතික්ෂේප කරමින් ඒ කිසි සංවිධානයක දක්නට නොලැබෙන උත්තම චරිතාංග භික්ෂූන් කෙරෙහි විද්‍යාමාන විය හැකි පරිද්දෙන් සැකසුනු නීති රීති පද්ධතියක් තුළ භික්ෂු ජීවිතය රඳවා ඇත. මෙම නීතිරීති යටතෙහි භික්ෂුවකගේ ආජීවය පවත්වා ගත යුතු ආකාරය පිළිබඳව ද අවධානය යොමු වී ඇත. ගිහි කාමභෝගීන් පරිද්දෙන් ක්‍රියා නොකොට අල්පේච්ඡ පැවැත්මකින් ජීවිතය පවත්වා ගැනීම භික්ෂු ආජීවයේ විශේෂ ලක්ෂණයයි.





විලි - බිය ඇති පිරිසිදු වැ කටයුතු කරන නිවැරදි දිවි පැවතුම් ඇත්තහුට ජීවත්වීම ඉතා අපහසු ය.

245. හිරීමතා ච දුජ්ජීවං
නිච්චං සුචිගවෙසිනා
අලීනෙ'නප්පගබ්භෙන
සුද්ධාජීවෙන පස්සතා (18:11)

විලියෙන් යුතුව පිරිසිදු බව සොයන නිති
හික්මීමක් ඇතිව කම්මැලි ගති ද නැති
නුවණින් දකින නිවැරදි දිවි පෙවත ඇති
අයගේ දිවිය අපහසු බව නම් නියති

නිවැරදි දිවි පෙවත ඇති - අයගේ දිවිය අපහසු බව

18 (6) චුල්ලසාරී තෙරුන්ගේ කථාව (244 සහ 245 ගාථා)

ආහාරපාන, සිවුරු, පිරිකර, බෙහෙත්, ගිලන් පස හා නිවාස ස්ථාන යන ජීවිතයට අත්‍යවශ්‍ය සිවුපසය වුවද ලබා ගත යුතු පිළිවෙල භික්ෂු විනය යටතේ ඉදිරිපත් වෙයි. ආත්ම විමුක්තිය සාදා ගැනීමට ඇති අවශ්‍යතාවට බාධක වන සියලු අවස්ථාවන් මග හරවා භික්ෂුව නිවැරදි මාර්ගයට යොමු කර වීමට විනය නිති රීති ඉදිරිපත් වී ඇත. එබැවින් ඉතා සුළු වරද වුව ද භික්ෂු ජීවිතයෙන් ඉවත් කරවීම මෙම නිති රීති වල අරමුණයි. ප්‍රත්‍යය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් වෙදකම් කිරීම, යන්ත්‍ර මන්ත්‍ර කොඩිවිණ, ශාන්ති කර්ම ආදිය කිරීම පේන කීම, යකැදුරුකම් කිරීම, ශාස්ත්‍ර කීම, ජ්‍යොතිශ්ශාසත්‍ර කටයුතු ආදී මේ ජීවන වෘත්තීන් බොහෝ කොට බුද්ධකාලීන භාරතීය සමාජයෙහි පැවතුණේ ආගමික පූජකවරුන් අතේය. මේවා බුදු දහමින් අනුමත කෙරෙන ආගමික ප්‍රතිලාභයට බාධක වන කරුණුය. භික්ෂු ජීවිතය මෙබඳු වෘත්තින් කෙරෙහි යොමු වේ නම් බුදුන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කොට ඇති පූජක සංස්ථාවක් බවට භික්ෂු සාසනය ද පත් වනු නො අනුමානය. එබඳු ජීවන වෘත්තීයන්ගෙන් යැපීමට වඩා රත්වූ යවටක් තම කුස තුළට දමා ගැනීම යෙහෙකැයි පවසා ඇත.

විස්තරාත්මක අනුවාදය (245 ගාථාව)

හිරිමතා ච නිච්චං සුචිගවෙසිනා, අලීනේන අප්පග
බ්භේන සාධු ජීවෙන පස්සතා දුජ්ජීවං

හිරිමතා ච: ලජ්ජාව ද ඇති; **නිච්චං**: නිතර; **සුචිග වෙසිනා**: පිරිසිදු බව බලාපොරොත්තු වන; **අලීනේන**: අනලස වූ; **අප්පගබ්භේන**: විනීත ගති ඇති; **සාධු ජීවෙන**: පිරිසුදු දිවි පැවැත්මකින් යුතු; **පස්සතා**: නුවණින් දකින යහපත් පුද්ගලයා විසින්; **දුජ්ජීවං**: දුකසේ ජීවිතය ගෙන යනු ලැබේ.

පවට විලි බිය ඇති, අලසකමින් තොරවූ, විනීත ගති පැවතුම් ඇතිව, පිරිසිදු දිවි පැවැත්මක් ඇති නුවණින් සත්‍යය දකින යහපත් පුද්ගලයා දුෂ්කර ජීවිතයක් ගෙවයි.

විවරණය

මෙම ගාථා ධර්ම දෙකින් ඉදිරිපත් වී ඇති කරුණු නොමඟට යොමු වී ඇති භික්ෂු ජීවිතයක් සුමඟට ගැනීමට බෙහෙවින් උපකාරි වෙයි. ප්‍රත්‍යය ලබා ගැනීමෙහි ගිජුවන භික්ෂුවක් ක්‍රියාකරන ආකාරය ප්‍රථම ගාථාවෙන් විවරණය වෙයි. වංචනික ක්‍රියාවලින් හා රැවටිලි බස් වලින් දායක-කරකාදීන් රවටා තම ප්‍රත්‍යය ලබා ගැනීම නොමඟට යොමු වූ භික්ෂූන් කෙරෙහි දක්නට ලැබෙන්නකි. එබඳු ක්‍රියාවලින් ඔවුහු විවිධ ප්‍රයෝජන ලබති. තම ජීවිතය බෙහෙවින් සුඛෝපභෝගීව ගෙවීමට හැකි වන්නේ එබඳු භික්ෂූන්ටය. නිසි ආකාරයෙන් අල්පේච්ඡතාවෙන් යුතුව, විනීත ගතිගුණ ඇති යථාලාභ සන්තෝෂයට ලද දෙයින් සතුටට පත්වන භික්ෂුව ගෙවන්නේ දුෂ්කර ජීවිතයකි. අලජ්ජී භික්ෂුවගේ ජීවිතය මෙලොව සුවපත්ව ගත වුවත් පරලොව දුකට යොමුව පැවතීම පමණක් නොව තම ආත්ම පාරිශුද්ධිය පිළිබඳව අංශයෙන් දුරුව පවතින්නක් ද වේ. එහෙත් මෙලොව දුකසේ ජීවත්වන, පවට විලිබිය ඇති අවංකව තම ජීවනය සරිකර ගන්නා භික්ෂුව විමුක්ති ප්‍රතිලාභයට යොමුව පවතින්නෙකි. එබැවින් ඔහු ගේ ජීවිතය ආධ්‍යාත්මිකත්වයෙන් සරු වුවකි. සම්මා ආජීවය භික්ෂු ජීවිතයට පමණක් නොව බෞද්ධ ගිහි ජීවිතයට ද අදාළ වන්නකි. බුදු රජාණන් වහන්සේ විසින් ඉදිරිපත් කොට ඇති ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්‍ගය භික්ෂුවට පමණක් වෙන් වූවක් නොවේ. එය ගිහියාට ද එකසේ බලපායි. වෙනසකට ඇත්තේ භික්ෂුව අන් සියලු කටයුතු අතහැර විමුක්ති මාර්‍ගයට අදාළ කටයුතු වලට පමණක් කැප වූවකු වීමය. ගිහියා බෙහෙවින් විමුක්තියට සම්බාධක වූ ගෘහකටයුතුවල යෙදෙමින්ම ආර්‍ය්‍ය මාර්‍ගයට ද යොමුව ඇත. ගිහියා භික්ෂුව මෙන් අනුන්ගෙන් යැපෙන්නෙක් නොවේ. ඔහුට ජීවන වෘත්තීන්හි යෙදීමට සිදු වෙයි. තමාට, තම අඹුදරුවන්ට, ඥාති හිත මිත්‍රාදීන්ට සැලකිලි සත්කාර කිරීමට පමණක් නොව ආගමික පූජ්‍යපක්ෂයේ අවශ්‍යතා ඉටු කරලීමට ද සමාජ සුභසාධක කටයුතුවල නිරත වීමට ද ඔහුට සිදු වෙයි. එබැවින් ගිහියා කාර්‍ය්‍ය බහුල වූවෙකි. මේ කාර්‍ය්‍ය බහුල ජීවිතයෙහි වුවද ධාර්මික බව ආරක්ෂාවිය යුතු අන්දමින් කටයුතු කිරීමේ වැදගත්කම බුදුදහමින් අවධාරණය කොට ඇත. ගිහියකු ගේ සම්මා ආජීවය සැකසිය යුතු පිළිවෙල බෞද්ධ සූත්‍රධර්ම රාශියකින් විවරණය වී ඇත.

අනුන් රවටන හා අනුන්ට පාඩු හානි සිදුවන ජීවන වෘත්තීන්හි නොයෙදී නිවැරදි ජීවන වෘත්තීන් මගින් තම ජීවනෝපාය සලසා ගැනීම බෞද්ධ ගිහියාට අනුමත වූ සම්මා ආජීවයයි. ඉහත කී පරිදි අනුන් රවටමින් පාඩු හානි සිදු කරන්නා වුත්, අනුන්ගේ අයිතීන් පැහැර ගනිමින් සමාජයට හා පුද්ගලයාට විපතක් සිදු වන්නා වුත්, වෘත්තීන් බැහැර කොට පවත්නා ඕනෑම රැකියාවකින් ධාර්මිකව තම ජීවනෝපාය සලසා ගැනීමට සම්මා ආජීවයෙන් බාධාවක් නැත.ජීවනෝපාය සඳහා තමා යෙදෙන කවර වෘත්තියකදී වුවද ක්‍රියා කළ යුතු ආකාරය ව්‍යාඝපජ්ජ සූත්‍රයෙන් පැහැදිලි කර තිබේ. උට්ඨාන වීර්යයෙන් යුතුව තම දෑතේ ශක්තිය යොදා දහදිය හෙළමින් ධාර්මිකව කටයුතු කිරීම මගින් ධාර්මිකව ලැබෙන ධනධාන්‍යාදියෙන් ජීවනෝපාය සලසා ගත යුතු බව එම සූත්‍රයෙන් පැහැදිලි කෙරෙයි. සම්මා ආජීවය මෙසේ බුදුන් වහන්සේ විසින් විවරණය කිරීමෙන් පැහැදිලි වන ඉතාම වැදගත් කාරණය වන්නේ අනුන්ට කිසිදු කරදරයක් විපතක් හා හානියක් නොවන අයුරින් තම ජීවිතය පවත්වා ගැනීමයි. අවංකව තම ශක්තිය මත රැඳීමට පුද්ගලයා මෙයින් උනන්දු කරනු ලැබේ. අනුනට බරක් නොවීම බෞද්ධ ජීවන ප්‍රතිපත්තියෙහි විශේෂ ලක්ෂණයකි. භික්ෂුවට තම සිවුපසය සලසා ගැනීමේ දී ද දායක පක්ෂයට බරක් නොවන අයුරින් එසේ කිරීමට උපදෙස් දී ඇත. බමරකු මල නොතලා රොන් ගන්නා සේ දායක කාරකාදීන්ට අපහසුවක් නොදැනෙන අයුරින් සිවුපස ලබා ගැනීමේ වැදගත් කම බුදුන්වහන්සේ විසින් පෙන්වා දී ඇත.

සම්ම ආජීවය: නිවැරදි දිවි පැවැත්ම ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්‍ගය, නමින් හැඳින්වෙන බෞද්ධ විමුක්ති මාර්‍ගයේ එක් අංගයක් වෙයි. තමන් ජීවනෝපාය සලසා ගැනීමේ දී සිතෙහි කෙලෙසුන් ඇතිවන ආකාරයේ කටයුතු වල නොයෙදී සිටීම එයින් අපේක්ෂා කෙරෙයි. විමුක්තිය යනු කෙලෙසුන්ගෙන් මිදීමයි. එබැවින් කෙලෙස් පුද්ගලයා ගේ සිතට ඇතුළත් විය හැකි මාර්‍ග සියල්ලක් ක්‍රමානුකූලව අවුරා දැමීමක් විමුක්ති මාර්‍ගයේ දී අවශ්‍ය වෙයි. බෞද්ධ විමුක්ති මාර්‍ගයේ විශේෂ ලක්ෂණයක් වන්නේ එය පුද්ගලයාගේ ආධ්‍යාත්මික පාරිශුද්ධියට හේතු වීම පමණක් නොවේ. එය සමාජයේ පොදු යහපතට ද හේතුවන්නක් වීමයි. සම්මා ආජීවය නැමති අංගය පමණක් වෙන් කොට ගත්තත් මේ ලක්ෂණය අපට දැක ගත හැකිය. සතුන් මස් පිණිස විකිණීම, අවි ආයුධ විකිණීම, මස් විකිණීම, වස විෂ විකිණීම, මත්පැන් හා මත්ද්‍රව්‍ය විකිණීම සම්මා ආජීවයේ දී ප්‍රතික්ෂේප කෙරෙයි. මේ සියලු දේ සමාජයේ තිරිසන් හෝ මිනිස් යන කාගේ වුවද ජීවිතය විනාශ කරන හෝ ජීවිතයට හානි පමුණුවන දේය. යමෙකු ඒවායින් ඉවත් වේ නම් හෙතෙම සමාජ හිතකාමියෙක් වෙයි. සමස්ත සත්ව වර්‍ගයා දෙසම අනුකම්පාවෙන් බලන කාරුණික පුද්ගලයෙක් වෙයි. මීට අතිරේකව තුලා කූට, මාන කූට, කංස කූට ආදී වානිජ ක්ෂෙත්‍රයේ සිදුවන සියලු ආකාර රැවටිලි ප්‍රයෝග සටකපට කම් වලින් ඉවත් වීමට ද සම්මා ආජීවය යටතේ උපදෙස් ලැබෙයි.

පස් පව් කරන තැනැත්තා තමාගේ (දියුණුවේ) මුල සාරා සිඳ දමන්නෙකි.

246. යො පාණමතිපාතෙති	පරපණ නසන්නේ
මුසාවාදඤ්ච භාසති	බොරු බස ද දොඩවන්නේ
ලොකෙ අදින්නං ආදියති	නොදුන් දෙය ගන්නේ
පරදාරඤ්ච ගච්ඡති (18:12)	සොයා අන් අඹු වෙතට යන්නේ

පවුකම් දුරලමු

18 (7) උවසුවෝ පන්සිය දෙනෙක් (246 සහ 248 ගාථා)

දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **උවසුවන් පන්සිය දෙනකු** අරභයා මේ ගාථා තුන වදාළසේක.

මේ උපාසකවරුන් පන්සිය දෙනාගෙන් සමහර අය පස් පවින් පරපණ නැසීමෙන් පමණක් වැළකී සිටින්නෝය. සමහරු සොරකමින් වැළකී සිටින්නෝය. සමහරු අන් අඹුවන් වෙත යාමෙන් වැළකී සිටින්නෝය. සමහරු බොරු කීමෙන් ද සමහරු රහමෙර පානයෙන් ද වැළකී සිටින්නෝය. වරක් ඔවුන් අතර සිල් රැකීම පිළිබඳව සාකච්ඡාවක් ඇති විණ. තම තමන් ආරක්‍ෂා කළ ශීලයෙහි වැදගත් බවත් දුෂ්කර බවත් ඔවුනොවුන්ගේ මතය විය.

පරපණ නැසීමෙන් වැළකී සිටි අයගේ මතය වුයේ, තමන් ආරක්‍ෂා කරන ශීලය පමණක් අන් අය ආරක්‍ෂා කළ ශීලයන්ට වඩා වැදගත් බවයි. මෙසේ හැම කෙනෙක්ම තම තමන්ගේ ශික්‍ෂාපදයන්ගේ වැදගත් කම පමණක් ඔවුහු අවධාරණය කළහ. හැම කෙනෙකුම තම තමන් ගේ මතයන් හි එළඹ සිටි බැවින් ඔවුන් අතර තීරණාත්මක නිගමනයක් ඇති නොවීය. එබැවින් මේ කරුණ බුදුන් වහන්සේට දන්වා උන්වහන්සේගේ අදහස දැන ගැනීමේ කැමැත්තෙන් දෙව්රම් වෙහෙරට ගොස් සියලු පවත් බුදුරජාණන් වහන්සේට දන්වා සිටිය හ. මේ කාරණය අසා උන්වහන්සේ "එක් ශික්‍ෂාපදයක් තවත් ශික්‍ෂා පදයකට වඩා උසස් හෝ පහත් නොවන බවත් මේ සියලු ශික්‍ෂාපද ආරක්‍ෂා කිරීම පහසු කාර්‍යයක් නොවන බවත්" වදාරමින් මේ ගාථා තුනෙන් ධර්මදේශනා කළසේක.

විස්තරාත්මක අනුවාදය (246 ගාථාව)

යො පාණං අතිපාතෙති, මුසාවාදඤ්ච භාසති ලොකෙ
අදින්නං ආදියති, පරදාරඤ්ච ගච්ඡති.

යො: යමෙක්; **පාණං**: (පර) පණ; **අතිපාතෙති**: නසන්නේ ද; **මුසාවාදං ච**: බොරුව ද; **භාසති**: කියන්නේ ද; **ලොකෙ**: ලොවෙහි; **අදින්නං**: නොදුන් දෙය; **ආදියති**: ගන්නේ ද; **පරදාරං ච**: පරඹුවන් වෙත ද; **ගච්ඡති**: යන්නේ ද;

මෙලොව යමෙක් පරපණ නසයි ද, බොරු කියයි ද, අන්සතු දෙය සොරකම් කරයි ද, පරදාර සේවනයෙහි යෙදෙයි ද,

විවරණය

මේ ගාථා තුනෙන් ගිහියන් විසින් ආරක්‍ෂා කළ යුතු පංච ශීලය විවරණය කෙරෙයි. ගිහි බෞද්ධ පිළිවෙතෙහි පදනම වන්නේ පංචශීලයයි. මෙය ගිහි බෞද්ධයන් තම මුළු මහත් ජීවිතය පුරා නිරන්තරයෙන් ආරක්‍ෂා කළ යුතු එකක් බැවින් ගිහියන්ගේ නිත්‍යශීලය වශයෙන් හඳුන්වා ඇත. පුද්ගලයකු ගේ නිවැරදි හැසිරීමට අදාළ වන මූලිකම කරුණු පහක් පංච ශීලය තුළින් ඉදිරිපත් වෙයි. මේ මගින් තමන්ගේ ආධ්‍යාත්මික පාරිශුද්ධිය පමණක් නොව භෞතික සුරක්‍ෂිතතාව ආරක්‍ෂා වන අතර සමාජයේ අන්‍යයන්ගේ අයිතීන් ද තහවුරු කෙරෙයි.

පංචශීලය පහත සඳහන් පරිදි දැක්වෙයි.

1. **පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**
පරපණ නැසීමෙන් වැළකීමේ ශික්‍ෂාපදය සමාදන් වෙමි.

2. **අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**
නුදුන් දෙය ගැනීමෙන් (සොරකමින්) වැළකීමේ ශික්‍ෂාපදය සමාදන් වෙමි.

3. **කාමෙසු මිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**.
කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන් වීමේ ශික්‍ෂාපදය සමාදන් වෙමි.

4. **මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**.
බොරුකීමෙන් වැළකීමේ ශික්‍ෂාපදය සමාදන් වෙමි.

5. **සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**.
පමාවට හේතුවන රහමෙර පානයෙන් වැළකීමේ ශික්‍ෂාපදය සමාදන් වෙමි.

බුද්ධ ධම්ම සංඝ යන තෙරුවන සරණ ගොස් බෞද්ධයකු වන ගිහි පුද්ගලයා තම හැසිරීම යහපත්ව පවත්වා ගැනීම සඳහා යථෝක්ත පංචශීලය ආරක්‍ෂා කරන බවට ප්‍රතිඥාවක් දෙයි. සෑම ශික්‍ෂාපදයක්ම 'සමාදියාමි'-'සමාදන් වෙමි' යන්නෙන් ප්‍රකාශ වනුයේ එම ප්‍රතිඥාවයි. මෙම ප්‍රතිඥාව කිසිවකුට දෙන ප්‍රතිඥාවක් නොවේ. හුදු රීතියකට හෝ නීතියකට යටත් වීම් වශයෙන් ලෝකයා හමුවේ හෝ නීතිදායකයන් හමුවේ කරන ප්‍රතිඥාවක් මෙයින් අදහස් නොවෙයි. මෙය ඇත්තටම තම හෘද සාක්‍ෂියට දෙන ප්‍රතිඥාවකි. එසේත් නැතහොත් තමා තුළම ඇති කර ගන්නා අධිෂ්ඨානයකි.

පස් පව් කරන තැනැත්තා තමාගේ (දියුණුවේ) මුල සාරා සිඳ දමන්නෙකි.

247. සුරාමේරය පානඤ්ච
යො නරො අනුයුඤ්ජති
ඉධෙවමෙසො ලොකස්මිං
මූලං ඛණති අත්තනො (18:13)

රහමෙර ද බොන්නේ
පස් පවෙහිමයි ඉන්නේ
මෙලොවෙහි තමන්නේ
විපත මිස අන් කිම ද වන්නේ

ගිහියනට නිතිසිල් - සුරැකුම වේය පන්සිල්

18 (7) උවසුවෝ පන්සිය දෙනෙක් (246 සහ 248 ගාථා)

විස්තරාත්මක අනුවාදය (247 ගාථාව)

යො නරො සුරාමෙරයපානඤ්ච අනුයුඤ්ජති, එසො ඉධ ලොකස්මිං එව අත්තනො මූලං ඛණති

යො: යම්; **නරො**: මිනිසෙක්; **සුරාමෙරයපානඤ්ච**: රහමෙර පානය කිරීමෙහි; **අනුයුඤ්ජති**: නැවත නැවත යෙදේ ද; **එසො**: හෙතෙම; **ඉධ ලොකස්මිං එව**: මෙලොවදීම; **අත්තනො**: තමන්ගේ; **මූලං**: මුල; **ඛණති**: සාරයි.

යම් මිනිසෙක් රහමෙර පානය ද කරයි ද නම් (මේ පස්පව් හේතු කොට ගෙන) හෙතෙම මෙලොව දීම තමන් ගේ විනාශය සිදු කර ගනියි.

විවරණය

පංච ශීලය ඉදිරිපත් වී ඇති ආකාරය විමසා බැලීම ද වැදගත් ය. මෙහි එක් එක් ශික්ෂාපදයක් වෙන වෙනම සමාදන් විය යුතු ආකාරයෙන් ඉදිරිපත් වී ඇත. පංචශීලය සමස්තයක් වශයෙන් එකට සමාදන් වීමක් අපේක්ෂා නොකරන බැවින් සිල්පද පහ ප්‍රකාශ කොට ඒ සියල්ල එකට සමාදන් වන බවට ප්‍රතිඥා නොකෙරෙයි. සෑම ශික්ෂාපදයක් වෙන් වෙන් ව ආරක්ෂා කරන බවට අධිෂ්ඨාන කරගත යුතු බැවින් ඒ ඒ ශික්ෂාපදය අවසානයෙහි සමාදියාමි යන්නෙන් එම අධිෂ්ඨානය ඇති කර ගැනෙයි. පුද්ගල ජීවිතයේ විවිධ ක්‍රියාකාරකම් වලදී මෙම ශික්ෂාපද කඩ වීමේ හැකියාව ඇත. එසේ යම් ශික්ෂාපදයක් කඩවුවහොත් එය නැවත ආරක්ෂා කිරීමට අධිෂ්ඨාන කර ගැනීමේ අවස්ථාව සැලසීම සඳහා ශික්ෂාපද වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් වී ඇත. ශික්ෂාපද පහ සමස්තයක් වශයෙන් සමාදන් වූ විට එක් ශික්ෂාවකුදු කඩ වුවහොත් සමස්ත ප්‍රතිඥාවම කඩ වුවා වෙයි.

පංච ශීලයෙන් ඉදිරිපත් වන ශික්ෂාපද පහේම සමාන වැදගත් කමක් ඇත. එකක් තව එකකට වඩා උසස් හෝ පහත් නොවේ. මෙම පංච ශීලයම පුද්ගලයකු ගේ හැසිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇත. පුද්ගල චර්යාව ක්ෂෙත්‍ර දෙකකට විහිදී යයි. පුද්ගලයකුට පෞද්ගලිකත්වයක් ඇති අතරම ඔහු සමාජයේ නියෝජිතයෙක් ද වෙන බැවින් ඔහු ගේ චර්යාව සමාජය කෙරෙහි ද බලපායි. මේ නිසා තමාගේ පෞද්ගලිකත්වය කෙරෙහි මෙන්ම සමාජයේ පොදු පැවැත්ම කෙරෙහි ද තම චර්යාව බලපාන ආකාරය ගැන පුද්ගලයකු අවධානවත් විය යුතුය. පංච ශීලය මෙම අංශ දෙකම සුරක්ෂිත වන ආකාරයට ඉදිරිපත් වී තිබේ.

පළමු ශික්ෂාපදය පිළිගැනීමෙන් අවධාරණය කෙරෙන්නේ සමාජයේ අනෙක් පුද්ගලයන් ගේ ජීවත් වීමේ අයිතිය පිළිගැනීමයි. උපදින හැම කෙනෙක්ම අනෙක් කෙනකුගේ හිංසාවට පීඩාවට හා ඝාතනයට ගොදුරු නොවී නිදහසේ ජීවත් වීමට අයිතිය ඇත්තෝය. එබැවින් මෙම ශික්ෂාපදයෙන් බෞද්ධයා අන් හැම දෙනකුගේම ජීවත් වීමේ අයිතිය පිළිගන්නා අතර එය කඩකිරීමෙන් තමාගේ පෞද්ගලිකත්වයට සිදුවන හානිය ද වළක්වා ගනියි. පරපණ නැසීම ද්වේෂය මුල් කොට සිදු වන්නකි. ද්වේෂය ආත්මීයත්වය දූෂණයට පත් කරවන්නක් වන අතර ආධ්‍යාත්මික පාරිශුද්ධියට පටහැනිව සිටී.

මේ නිසා සිත දූෂණය කරන ද්වේෂයෙන් වැළකෙන බෞද්ධයා, අන්‍යයන් කෙරෙහි දයාවෙන්, කරුණාවෙන් හා මෛත්‍රියෙන් යුතුව සිටී. හෙතෙම අනුන් තලා පෙලන, ඝාතනයට පමුණුවන, දඬුමුගුරු, අවි ආයුධ, සම්පූර්ණයෙන් අත්හළ පුද්ගලයකු ලෙස සමාජයේ සාමකාමී පැවැත්මට අතහිත දෙන්නෙක් වෙයි.

දෙවැනි ශික්ෂාපදය ද සමාජයේ පුද්ගලයන්ගේ අයිතිය සම්බන්ධ වූවකි. සෑම කෙනෙක්ම තම සන්තකයන්ට - ධනයට හා වස්තුවට ආශා කරති. ඒවා කෙනකු පැහැර ගන්නේ නම් එය ඔවුන්ගේ අයිතිය සොරා ගැනීමකි. එබැවින් දෙවැනි සික පදය ආරක්ෂා කිරීම සමාජයේ අනෙක් සාමාජිකයන්ගේ සන්තකයන් හෙවත් අයිතීන් ආරක්ෂා කිරීමකි. මෙසේම සොරකමෙහි පුද්ගලයකු යෙදෙන්නේ ලෝභයෙන් පෙළඹවීමෙනි. ලෝභය වූ කලි පුද්ගලයාගේ ආධ්‍යාත්මික දියුණුවට අකුල් හෙලන පාපධර්මයකි. දෙවැනි සික පදය ආධ්‍යාත්මික පක්ෂයට රුකුලක් වන්නේ එපරිද්දෙනි.

තෙවැනි සිකපදය ද පුද්ගලයන්ගේ අයිතියට සම්බන්ධ වන්නකි. කාමයෙහි වරදවා හැසිරීම යන්නෙන් මෙහිදී අදහස් වන්නේ පරපුරුෂ හෝ පරභාර්‍යා සේවනයයි. ස්වකීය පුරුෂයාගෙන් හෝ ස්වකීය භාර්‍යාවගෙන් සැනසීම කාම මිථ්‍යාචාරයට අයත් නොවෙයි. ලෝකයේ සෑම රටකම පාහේ ගිහි ජනතාව සඳහා විවාහ චාරිත්‍රය අනුමත වී ඇත. විවාහයෙන් අඹු සැමියන් වශයෙන් විසීම ලෝක සම්මතයයි. විවාහ නැමති බන්ධනයෙන් භාර්‍යාව සැමියාට ද සැමියා භාර්‍යාවට ද අයත් වේ. පරදාර හෝ පරපුරුෂ සේවනයෙහි යෙදෙන විට අනෙක් සැමියකු ගේ හෝ අනෙක් භාර්‍යාවකගේ අයිතිය පැහැර ගැනෙයි. කාම මිථ්‍යාචාරය යන්න බෞද්ධ සූත්‍රධර්ම අනුව මීටත් වඩා පුළුල් ක්ෂේත්‍රයක පැතිරෙයි. විවාහයක නොබැඳී මවුපියන් යටතේ සිටින කාන්තාවක්, සහෝදර සහෝදරියන් යටතේ සිටින සහෝදරියක්, භාරකරුවන් යටතේ සිටින කාන්තාවක්, වැනි කවරකු ගේ හෝ අයිතියට යටත්ව සිටින කාන්තාවක් සම කාමසේවනයෙහි යෙදීම ද කාම මිථ්‍යාචාරයටම අයත් වෙයි.

පුද්ගලයකු වැරදි කාමසේවනයෙහි යෙදෙන්නේ රාගයෙන් පොළඹවනු ලැබීමෙනි. මේ නිසා සමාජයේ සාමකාමී පැවැත්මට එය තර්ජනයක් වනු පමණක් නොව ස්වකීය අධ්‍යාත්මයේ අපවිත්‍රතාවට ද හේතුවක් වෙයි.

පවු කරන තැනැත්තාට සංයමයක් නැත. ලෝබ - කෝල දෙක (දෙ ලොවැ) දුකට හේතු ය.

248. එවම්භො පුරිස ජානාහි පාපධම්මා අසඤ්ඤතා මා තං ලොභො අධම්මො ච චිරං දුක්ඛාය රන්ධයුං (18:14)	මෙය මෙසේ දැන ගනු අපහසුය පව මැඩ ලනු පව හා ලොබට ඉඩ දෙනු එපා ඔබ දුක් ගොඩට පමුණානු

පන්සිල් පිළිපදින්න - දුක දුරුවෙයි එවිට

18 (7) උවසුවෝ පන්සිය දෙනෙක් (246 සහ 248 ගාථා)

විස්තරාත්මක අනුවාදය (248 ගාථාව)

හො පුරිස, එවං ජානාහි, පාපධම්මා අසඤ්ඤතා
ලොභො ච අධම්මො ච චිරං දුක්ඛාය තං මා රන්ධයුං

හො පුරිස: පින්වත් පුරුෂය; **එවං**: මෙසේ; **ජානාහි**: දැන ගන්න; **පාපධම්මා**: අකුසල ධර්මයො; **අසඤ්ඤතා**: නොහික්මුණාහුය; **ලොභො**: ලෝභය ද; **අධම්මොච**: ද්වේෂය ද; **චිරං**: බොහෝ කලක්; **දුක්ඛාය**: දුක් පිණිස; **තං**: ඔබව; **මා රන්ධයුං**: නොපෙළත්වා!

පින්වත, පාපධර්ම හික්මීමට දුෂ්කර බව දැන ගන්න. ලෝභයට හා ද්වේෂයට ඔබව බොහෝ කලක් දුකෙහි තැබීමට ඉඩ නොදෙන්න.

විවරණය

බොරුවෙන් වැළකීම සිවුවැනි සිකපදයයි. බොරුවෙහි ප්‍රතිඵලය වන්නේ අනුන් රැවටීමයි. රවටනු ලැබීමට කිසිවෙක් කැමති නොවෙති. රැවටීම නිසා හිරිහැර පාඩු විපත්ති සිදු වෙයි. එබැවින් බොරු කීම ද සමාජයේ සහජීවනයට බාධාවකි. පුද්ගලයකු බොරු කියන්නේ වංචනික අදහසිනි. එය ස්වකීය පරිහානියට හේතු වෙයි. සිවුවැනි සිකපදය රකින්නා බොරුවෙන් වළකිනු පමණක් නොව සත්‍යයම කථා කරන්නෙක් වෙයි. හෙතෙම අනුන්ට වැඩදායක වන සත්‍යයක්ම කථා කරයි. බොරු නොකියන සත්‍යයම කථා කරන පුද්ගලයාගේ වචනය අන්‍යයෝ විශ්වාස කරති. එබැවින් එවන් පුද්ගලයා අන්‍යයන්ගේ ආදර ගෞරවයට බඳුන් වෙයි. පංචශීලයේ දී බොරුවෙන් වැළකීම ගැන පමණක් සඳහන් වුවද බෞද්ධ සදාචාරයේ දී මේ සමඟ එකට යෙදෙන තවත් කරුණු තුනක් ද වෙයි. ඒවා නම් කේළාම් කීමෙන් වැළකීම, රළු පරුෂ වචන කීමෙන් වැළකීම හා හිස් අරුත් සුන් වචන කීමෙන් වැළකීමයි. මුසාවාදා වේරමණී යන ශික්ෂාපදයට මෙම කරුණු ද ඇතුළත් වෙයි.

බොරුකීම වූ කලි පුද්ගලයකු ගේ වාග් ද්වාරයෙන් සිදුවන වරදකි. වාග් ද්වාරයෙන් පිරිසිදු බව සඳහා ඉහතින් සඳහන් කළ කරුණු ද අවශ්‍ය වෙයි. එබැවින් පංචශීලය රකින්නාගෙන් ඉහත සඳහන් වචනයට සම්බන්ධ කරුණු වලින් යුක්ත වීම ද බලාපොරොත්තු වෙයි. කේළාම් කීමෙන් අන්‍යයන් අතර අසමගිය ඇති වෙයි. පුද්ගලයකු කේළාම් කියන්නේ එහි ඇති බරපතල බව තේරුම් නොගෙන වුව ද එහි ප්‍රතිඵලය වන්නේ මිතුරන් දෙදෙනකු අතර අසමඟියයි. කේළාම් කීමෙහි ලා කෙනකු පෙළඹෙන්නේ මිතුරන් කෙටවීමේ අදහසිනි. එබැවින් එය සමාජයක සුහදතාවට නොව භේදයටම හේතු වෙයි. බොරු නොකියන පුද්ගලයා කේළාම් කීමෙන් ද වැළකී, අනුන්ගේ සමඟියට ම හේතු වන වචන භාවිතා කරයි. පරුෂ වචන හෙවත් රළු පරළු අසභ්‍ය වචන කීමෙන් එය අසන්නාගේ සිතට වේදනාවක් ඇති වෙයි. කිසිවෙක් කිසිවකුගෙන් බැනුම් ඇසීමට කැමති නැත. එබැවින් බෞද්ධයා හැමවිටකම කන්කළු වචනම කථා කරයි. අනුන් ඇසීමට කැමති, අනුන්ගේ හදවතට සිසිලක් දෙන වචනම ප්‍රකාශ කරයි.

හිස් වචන හෙවත් සම්ප්‍රලාප කීමෙන් ද වැළකීම ද බොරුවෙන් වළකින තැනැත්තා ආරක්ෂා කරන තවත් අංගයකි. වැඩකට නැති හිස් අරුත් සුන් වචන කීමෙන් එය කියන්නාට හෝ අසන්නාට කිසිදු ප්‍රයෝජනයක් අත් නොවේ. එය කියන්නාගේත් අසන්නාගේත් අගනා කාලය කා දැමීමකි. එබැවින් පුද්ගලයකු නිතරම පැවසිය යුතු වන්නේ අරුත් බර වැඩකට ඇති දේය. මෙසේ මුසාවාදයෙන් වැළකීම යටතේ බෞද්ධයකු විසින් ප්‍රකාශ කළ යුතු වන්නේ සත්‍යයක්ම ඇතුළත් වූ අනුන්ගේ සමගියට හේතුවන ඇසීමට මිහිරි කන්කළු ප්‍රිය මනාප අර්ථ සම්පන්නම වචන ම වෙයි. පුද්ගලයකුගේ වචනය සම්බන්ධයෙන් බුදුන්වහන්සේ කෙතරම් සැළකිලිමත් වීද යත් උන්වහන්සේ ප්‍රකාශ කොට ඇත්තේ 'කථා කළ යුත්තේ ධාර්මික දෙයක් බවත් එසේ නැතහොත් නිහඬව සිටිය යුතු' බවත්ය. '**ධම්මී වා කථා අරියො වා තුණ්හීභාවො**' යන්නෙන් එය පැවසෙයි.

රහමෙර පානයෙන් වැළකීම පස්වෙනි සිකපදයයි. රහමෙර පානයේ වරද ශික්ෂාපදය තුළින්ම ඉදිරිපත් වී තිබේ. ශික්ෂාපදයෙහි යෙදෙන '**පමාදට්ඨානා**' යන පදයෙහි අර්ථය වන්නේ 'ප්‍රමාදයට හේතුවන' යන්නයි. පුද්ගලයකු ගේ ආධ්‍යාත්මික පමණක් නොව භෞතික ප්‍රගතියෙහි ද ප්‍රමාදය ඇති කරවන්නක් වශයෙන් රහමෙර පානය සැලකී ඇත. මත්පැන් මෙන්ම මත්ද්‍රව්‍ය ද මේ යටතට අයත් වෙයි. මත්පැන් හෝ මත්ද්‍රව්‍ය ගැනීමෙන් පුද්ගලයකු ගේ ප්‍රකෘති සිහිය විකෘති තත්වයට පත් වෙයි. ඔහුට පැහැදිලිව නිවැරදිව සිතීමට අපහසු වෙයි. හොඳ නරක තේරුම් ගැනීමට නොහැකි වෙයි. මත් වීමෙන් සිත විකල් වීම නිසා ඔහුගේ අත්‍යවශ්‍ය වැඩ සියල්ලම අතපසු වී යයි. සිඟාලෝවාද සූත්‍රයේ දී මත්පැන් පානය පුද්ගලයකු ගේ විනාශයෙහි දොරටුවක් වශයෙන් දැක්වී ඇත. එම සූත්‍රයට අනුව මද්‍යපානයේ අනිටු විපාක සයෙකි.

1. ධන විනාශයට හේතු වෙයි.
2. අඬ දබර රන්ඩු කෝලාහල ඇති වෙයි.
3. රෝගාබාධයන්ට ගොදුරු වෙයි.
4. චරිතය කෙලෙසීමට හේතු වෙයි.
5. අවිනීත බව විදහා දැක්වෙයි.
6. බුද්ධිය පිරිහී යයි.

මෙපමණක් නොව මද්‍යපානයෙහි යෙදෙන්නා සියලු ආකාර දුසිරිත් වලට පෙළඹෙන්නෙක් වෙයි. මත්පැනින් සිහිය විකල් වීම නිසා තමා කරන කියන දෙය ගැන ඔහුට කල්පනාවක් නැත. එබඳු පුද්ගලයකු නිතරම පෙළඹෙන්නේ සුචරිත ක්‍රියාවන්ට නොව දුශ්චරිත වලටය. මේ නිසා මද්‍යපානය සියලු ආකාර දුසිරිත්වලට මූල හේතුවක් ලෙස දැක්වී ඇත. තම භෞතික ජීවිතය මත්පැනින් විනාශ කර ගන්නාට ආගමික ජීවිතයක් ගැන සිතිය නොහැකිය. එබැවින් හෙතෙම ආධ්‍යාත්මික ප්‍රගතියෙහි ද ප්‍රමාදයට පත් වන්නෙකි. පුද්ගලයකු ගේ සියලු ආකාර අභිවෘද්ධිය සඳහා විවේකී මනසක් පැවතිය යුතුය. හොඳ නරක තේරුම් ගැනීමට හැකි විය යුතුය. කායකිකාර්‍ය විෂයෙහි විචක්ෂණ බුද්ධියක් පැවතිය යුතුය. නීරෝගී කාය ශක්තියක් තිබිය යුතුය. මද්‍යපානයෙන් මේ සියල්ල පුද්ගලයා කෙරෙන් තුරන් වී යයි. මේ නිසා හෙතෙම අනුන්ගේ ගැරහීමට අවමානයට හා හෙළා දැකීමට බඳුන් වෙමින් මෙලොවම කාලකණ්ණි ජීවිතයකට යොමු වන අතර පරලොව දුගතිය ද අත් කර ගනියි.

මේ අනුව පංචශීලය ආරක්ෂා කිරීමේ වැදගත් කම කෙනකුට තේරුම් ගත හැකිය. සමාජයේ හැම කෙනෙක්ම පංචශීලය ආරක්ෂා කරන්නේ නම් එබඳු සමාජයක ජීවත් වීම භාග්‍යයක් වෙයි. මිනී මැරීම් තාඩන පීඩන නැති, අනුන්ගේ ජීවිතයට හා දේපලවලට ගරු කරන, අන්‍යොන්‍ය සමගියට සහජීවනයට හා සුහදතාවට ක්‍රියා කෙරෙන බුද්ධිමත්ව හොඳ නරක තෝරා ගෙන හොඳ දෙයක්ම කරන සමාජයක් මිහිපිට පවත්වා ගැනීමට නම් පංචශීලය හොඳටම ප්‍රමාණවත් වෙයි.

සැදැහැ - පැහැදීම් පමණට දීමට නො සතුටු තැනැත්තා කිසිවිට සමාධියට නො පැමිණේ.

249. දදාති වෙ යථාසද්ධං
යථාපසාදනං ජනො
තත්ථ යො මඞ්කු භවති
පරෙසං පානභොජනෙ
න සො දිවා වා රත්තිං වා
සමාධිං අධිගච්ඡති (18:15)

කෙලෙස ද කෙනකු තව කෙනකුට දන් දෙන්නේ
සැදැහැ පැහැදීම ඇති ලෙසටයි දෙන්නේ
අන්සතු බොජුන් ගැන සිත පසුබට වන්නේ
රෑ දහවලෙහි නැත සිත එකඟව ඉන්නේ

ලැබෙන දෙයින් සිත රිදවා ගනීනම් - අසහනයකි ඇත්තේ රෑ දවාලේ

18 (8) තිස්ස තෙරණුන් ගේ කථාව (249 සහ 250 ගාථා)

ජේතවනාරාමයෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ තිස්ස නම් වූ තරුණ භික්ෂුවක් අරභයා මෙම ගාථා ද්වය වදාළ සේක.

තිස්ස නම් වූ මෙම සාමණේර භික්ෂුව පිඬු සිඟා ගොස් ලැබෙන ආහාර-පාන සම්බන්ධයෙන් නිතරම අඩුපාඩු දකින්නෙක් වූයේය. අනේපිඬු, විශාඛා වැනි සැදැහැවත් මහා උපාසක උපාසිකාවන් පිළිගන්වන ආහාර-පාන සම්බන්ධයෙන් වුව ද හෙතෙම නිතරම නෝක්කඩු කියන්නෙකි. කවරකුගෙන් ආහාර-පාන සම්බන්ධයෙන් වුවද හෙතෙම නිතරම නෝක්කඩු කියන්නෙකි. කවරකුගෙන් ආහාර-පාන ලැබුනත් හෙතෙම එයින් තෘප්තියක් ලබන්නේ නැත. අසතුටු සිතින් මුහුණ දික් කර ගෙන දෙන දෙයෙහි වරදම දකියි.

ආහාර පාන නිවී තරමක් සිසිල්ව තිබුණ හොත් "මේවාත් කෑමට දෙන දේ ද? මෙතරම් සීතල වූ කෑම වැළඳිය හැකි කාටද?" යි පවසයි. තරමක් උණුසුම් අහරක් ලැබුණොත් "මෙතරම් උණුසුම් අහරක් වළඳන්නට හැකි ද? ඇයි මේ මිනිසුන්ට කල් ඇතිව දානය සූදනම් කොට තබන්නට බැරි ද?" මේ ආදී දේ කියයි. දෙන ආහාර පානයෙහි අඩු ලුහුඬු බවක් ඇති වුවහොත්, "අනේ මේ මිනිසුන්ගේ ලෝබ කම? කෙනකුගෙ කුස පිරෙන තරම් අහරක්වත් දෙන්න බැරි හැටි?" මෙසේ අවලාද නගයි. වැඩිපුර ආහාර ලැබෙන විට "මේ මිනිසුන්ට ගෙදර තියා ගන්න බැරි නිසා වෙන්න ඇති මෙතරම් ගොඩවල් බෙදන්නෙ" සිත අසතුටින් හෙතෙම මෙසේ දොස් නගයි. මෙසේ අනුන් ගෙන් දනට ලැබෙන අහරෙහි දොස් දකිමින් අසතුටු බවක් දක්වන මේ භික්ෂුව තම නෑයන් පිළිබඳව සඳහන් කරමින්, "අපේ නෑ ගෙවල්වල අපේ නෑදෑයෝ භික්ෂූන්වහන්සේලාට කොතරම් සැලකිල්ලකින් ගෞරවයකින් දානය පිළියෙළ කර දෙනවාද? කිසි ලෝබ කමක් නැතිව සිවු දිගින් වඩින භික්ෂූන් වහන්සේලාට රසමුසු ආහාර පානයෙන් සැලකීම අපේ නෑදෑයින්ගෙ සිරිත"යි මේ ආදී දෑ කියමින් ඒ අයගේ ගුණ වර්ණනා කරයි. අනේපිඬු විශාඛා ආදීන්ගෙන් ලැබෙන දානයෙහි පවා දොස් දකිමින් බණ දොඩන මෙතෙම තම නෑදෑයන්ගෙන් ගුණයම පවසයි.

මේ තිස්ස තෙරණුන්දෑ සැවත් නුවරින් පිටත වූ කිසියම් දනව්වක වාසල්කඩ රැකවලෙහි නිරතව සිටි අයකුගේ පුතෙකි. මෙතෙම ගෙදරින් පිටත්ව, ගමින් ගමට ඇවිදින වඩුවන් පිරිසක් සමඟ මහ මඟට වැටී සැවැත් නුවරට පැමිණි විට ගිහිගෙය අත්හැර පැවිදි බවට පත් වූවෙකි. මොහු නිතරම අනුන්ට දොස් නගමින් තම නෑදෑයන්ගේ වත් පොහොසත් කම් හා ගුණ නුවණ ගැන නිතර කථා කරනු ඇසූ වෙනත් භික්ෂූහු මොහුගේ මේ කථාවෙහි සත්‍යයක් ඇත්දැයි විමසා බැලීමට අදහස් කළහ. එසේ සිතා මේ තෙරුන්ගෙන් "ඇවැත්නි, ඔබ වහන්සේගේ නෑදෑයෝ කොහි වෙසෙත්දැ" යි ඇසූහ. ඒ භික්ෂුව ද අසවල් ගමෙහියයි පැවසීය. මෙසේ මොහු ගේ ගම අසා දැනගත් භික්ෂූහු සාමණේරවරුන් කිහිප දෙනකු කැඳවා "ඇවැත්නි, තොප අසුවල් ගමට ගොස් මේ තිස්ස තෙරුන් කියන කතාවේ ඇත්තක් තිබේදැ"යි දැන ගෙන එව"යි පවසා ඔවුන් පිටත් කොට යැවූහ. උන්වහන්සේලා ද තිස්ස සඳහන් කළ ගමට ගොස් ගම් වැසියන්ගෙන් ආගන්තුක සත්කාරද විඳ , "මේ ගමෙහි පදිංචිව සිට සැවත් නුවරට ගොස් පැවිදි වූ තිස්ස නම් තෙරණුන් දෑ කෙනෙක් සිටිති. ඒ තෙරණුන්දෑගේ නෑදෑයෝ කවුරුන්දැ"යි ඇසූහ. ගම්වැසියෝ එය අසා, "ස්වාමීනි, මේ ගමෙහි සැලකිය යුතු පවුලකින් එසේ මහණ වූ කෙනෙක් නම් නැතැ"යි පවසා, වාසල රැකවලෙහි සිටි තැනැත්තාගේ පුතා වඩු පිරිසක් සමඟ ගමෙන් පලාගොස් එසේ මහණ වූ බවක් අසා ඇත්තෙමු. ඒ අයගේ සැලකිය යුතු නෑදෑ කෙනෙක් මේ ගමේ වාසය නොකරති" යි කියූහ.

සාමණේරවරුද නියම තතු දැන පෙරලා පැමිණ භික්ෂූන් වහන්සේට සියලු තොරතුරු පැවසූහ. සියලු විස්තර දැන ගත් භික්ෂූහු තිස්සට ඔහු ගුණ වර්ණනා කරන තරමේ සැලකිය යුතු නෑදෑ පිරිසක් නැතිවම බොරුවට ඔවුන්ගේ ගුණයම පවසමින් අනුන්ගේ දොස් දකින බව වටහා ගෙන මේ සිද්ධිය බුදුන් වහන්සේට සැල කළහ. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා, "මහණෙනි, මේ භික්ෂුව දැන් පමණක් නොව පෙර අත්බවක දී ද මෙසේම අනුන්ට දොස් නගමින් තම නෑදෑයන් උසස් කොට දොඩමලුව කථා කළේය. යම් කිසිවෙක් අනුන් තමන්ට දෙන දානයෙහි අඩුපාඩු දැක සිත අසතුටු කරගනිමින්, දොම්නස් වේ නම් හෙතෙම දිවා රෑ දෙක්හි ඒ ගැනම සිතමින් සිටිනු මිස තම සිත එකඟ කර ගෙන මාර්ගඵලාදියක් නොලබන්නේය" යි වදාරමින් ඉහත සඳහන් ගාථා දෙකින් ධර්ම දේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (249 ගාථාව)

ජනො වෙ යථා සද්ධං යථාපසාදනං දදාති යො පරෙසං
තත්ථ පානභොජනෙ මඞ්කු භවති සො වෙ දිවා වා
රත්තිං වා සමාධිං න අධිගච්ඡති

ජනො: ජනයා; **වෙ**: ඒකාන්තයෙන්ම; **යථා සද්ධං**: ශ්‍රද්ධාව ඇති පරිද්දෙන්; **යථා පසාදනං**: පැහැදීම ඇති පරිද්දෙන්; **දදාති**: (දන්) දෙයි; **යො**: යම් තැනැත්තෙක්; **පරෙසං**: අනුන්ගේ; **තත්ථ පානභොජනෙ**: ඒ ආහාර පානාදියෙහි; **මඞ්කු**: සිත් අසතුටු (දොම්නස්) වන්නේ; භවති: වෙයි ද; **සො**: හෙතෙම; **වෙ**: ඒකාන්තයෙන් ම; **දිවා වා**: දහවල් හි හෝ; **රත්තිං වා**: රාත්‍රියෙහි හෝ; **සමාධිං**: සිතේ එකඟතාව; **න අධිගච්ඡති**: නො පැමිණෙයි.

මිනිස්සු තමන්ගේ ශ්‍රද්ධාව සහ ප්‍රසාදය ඇති අයුරින් අනුනට දෙති. යමෙක් එසේ අනුන් දෙන දෙයෙහි සිත දුර්මුඛ කර ගන්නේ නම් හෙතෙම දිවා රෑ සිතෙහි සමාධියක් නොලබයි.



කෙලෙස් මුලින් ම උපුටා සිඳ දමන ලද තැනැත්තා රෑ දවල් දෙකේහිම සමාධියට පැමිණේ.

250. යස්ස චෙ'තං සමුච්ඡින්නං
මූලඝච්චං සමූහතං
ස වෙ දිවා වා රත්තිං වා
සමාධිං අධිගච්ඡති (18:16)

මකු බව වනසමින්
කරලමින් එය මුල්සුන්
රෑ දහවල නිතින්
සැනසුම ලබයි මනසින්

දුර්ලතොත් මකු බව - සහතිකය සැනසුම් සුව

18 (8) තිස්ස තෙරණුන් ගේ කථාව (249 සහ 250 ගාථා)

විස්තරාත්මක අනුවාදය (250 ගාථාව)

**යස්ස එතං සමුච්ඡින්නං ච මූලඝච්චං සමූහතං සවෙ
දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති.**

යස්ස: යම් තැනැත්තකුගේ; **එතං**: මේ මකු බව; **සමුච්ඡින්නං ච**: සම්පූර්ණයෙන් සිඳලන ලද්දේ ද; **මූලඝච්චං**: මුලින්ම නසන ලද්දේ ද; **සමූහතං**: උදුරා වනසන ලද්දේ ද; **සවෙ**: හෙතෙම; **දිවා වා**: දහවලෙහි හෝ; **රත්තිං වා**: රැයෙහි හෝ; **සමාධිං**: චිත්ත සමාධිය; **අධිගච්ඡති**: ලබයි.

ඉදින් යමකු ගේ සිතින් මේ මකු බව මුලසුන් වූයේ ද, සම්පූර්ණයෙන්ම සිඳලන ලද්දේ ද හෙතෙම නිසැකයෙන් ම රැයෙහි හෝ දහවලෙහි සිතෙහි සමාධිය ලබයි.

විවරණය

සමාධිං: මනසෙහි ඒකාග්‍රතාව මෙයින් අදහස් කෙරෙයි. සම්මා සමාධිය විමුක්තිගාමී ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි අවසාන පියවරයි. සම්මා සමාධිය ඇති විට යථාර්ථය අවබෝධ කර ගනිමින් සියලු කෙලෙසුන් නසා රහත් බවින් නිර්වාණය සාක්ෂාත් කර ගත හැකිය. එබැවින් සමාධියට බාධා කරවන, සිත අවුස්සා තබන, කෙලෙසුන්ගෙන් දුරුව විසීමට බුදුරජාණන් වහන්සේ නිබඳව ම ශ්‍රාවකයන්ට අනුශාසනා කරන සේක. අනුන් දෙන දෙයෙහි චිත්තාපරවශ වෙමින් මකු බවින් සිටින කෙනකුට මානසික එකඟතාවක් ලබා ගත නොහැක. එබැවින් එබඳු තැනැත්තා උසස් ආධ්‍යාත්මික ප්‍රගතියක් නොලබන්නෙකි.

සමාධිය යනු කිසියම් අරමුණක් කෙරෙහි පමණක් සිත පිහිටුවා ගැනීමෙන් මනසෙහි ඇති වන එකඟතාවයි. සමාධිය පුළුල් අරුතින් ගත් විට සෑම සිතකම එම සිත පහළ වීමේ දී ක්ෂණිකව යෙදෙන එකඟ බවයි. කුසල් අකුසල් භේදයක් නොමැතිව මෙම සමාධිය සෑම සිතකම යෙදිය හැකිය. එහෙත් කුසල්සිත් සමඟ යෙදීමේ දී මෙය සම්මා සමාධි නමින් ගැනෙයි. මෙහිදී අඩුම ගණනින් සම්මා සංකප්ප, සම්මා වායාම, සම්මා සති යන ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග මෙම සම්මා සමාධිය සමඟ එක් වෙයි.

අකුසල් සිත් සමඟ යෙදෙන සමාධිය මිථ්‍යා සමාධියකි. එය යෙදෙන්නේ කාම භවයෙහි කාම වස්තූන් පිළිබඳ වූ අකුසල සිත් සමඟය. රූප අරූප හා ලෝකෝත්තර සිත සමඟ මිථ්‍යා සමාධිය එක් නොවෙයි. සූත්‍ර ධර්මයන් හි දී සම්මා- මිථ්‍යා යනුවෙන් ප්‍රභේදයක් නැතිව සමාධි යන්න බොහෝ විට යෙදී ඇතත් එයින් අදහස් කරනුයේ සම්මා සමාධියමය.

සම්මා සමාධියේ අරමුණු වශයෙන් ගැනෙන්නේ සතර සතිපට්ඨානයි. ඒවා **කායානුපස්සනා**, **වේදනානුපස්සනා**, **චිත්තානුපස්සනා** හා **ධම්මානුපස්සනා** නමින් හැඳින්වෙයි. සමාධියේ අවශ්‍යතා ලෙස සැලකෙන්නේ සතර සම්‍යක් ප්‍රධාන වීර්යයයි. සතර සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් යුක්තව සතර සතිපට්ඨානයන් හි සිහිය රඳවා එය ප්‍රගුණ කිරීම, වර්ධනය කිරීම භාවනා නමින් හැඳින්වෙන අතර මෙම භාවනාවේ ප්‍රතිඵලය ලෙස චිත්ත ඒකාග්‍රතාව-සමාධිය අත්පත් වෙයි.

සම්‍යක් සමාධිය වර්ධනයේ අවස්ථා දෙකක් ඇත. ඒවා උපචාර සමාධි, හා අප්පණා සමාධි යනුවෙන් හැඳින්වෙයි. උපචාර සමාධිය යනු ප්‍රථමධ්‍යානයට සමීප බවින් ඇතිවන සිතෙහි එකඟතාවයි. කෙසේ වුවද මෙහිදී ධ්‍යානය අත්පත් වීමක් නොමැත. ධ්‍යානයට සිත නැංවීමේ සමාධිය අප්පණා සමාධි නම්. සතර විධ ධ්‍යානයන්හි විද්‍යමාන වන සිතෙහි එකඟතාව මෙම අප්පණා සමාධිය නමින් හඳුන්වා ඇත. පංචවිධ ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය මගින් ලඟාවිය නොහැකි මෙම ධ්‍යාන මානසික අවස්ථාය. මේවා ලබාගත හැක්කේ දැඩි වීර්යයෙන් යුක්තව මනස ඒකාග්‍රතාවෙහි පවත්වා ගැනීමෙන් පමණි. මෙම ධ්‍යානමය මානසික අවස්ථාවන් හි දී පංචවිධ ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය සම්පූර්ණයෙන් ම යටපත් කරනු ලැබේ. දෘශ්‍යමය හෝ ශ්‍රව්‍යමය සංවේදන මෙම ධ්‍යානාවස්ථාවන්හිදි ඇති නොවේ. කායික සංවේදන ද මනසට ඇතුළු වීමක් නොමැත. මේ සියලු බාහිර ඉන්ද්‍රිය සංවේදන පහළ නොවී තිබුණද මනස බෙහෙවින්ම ක්‍රියාත්මක හා ප්‍රබුද්ධ තත්වයෙහි පවතියි.

සෝවාන්, සකෘදාගාමි, අනාගාමි සහ අරහත් නමින් ගැනෙන සතර මාර්ග සතර ඵල සංඛ්‍යාත ලෝකෝත්තර උත්තම තත්වයන් ලබා ගැනීමෙහි ලා මෙම ධ්‍යාන ලාභය අත්‍යවශ්‍යම නොවේ. මේ ධ්‍යාන මගින් එක්තරා ප්‍රමාණයකට කෙලෙස් ධර්ම සන්තානයෙන් ඉවත් කරනු ලැබේ. විෂ්කම්භන ප්‍රහාණයෙන් කෙලෙස් යටපත් කර දැමීමට ඉවහල් වුවත් සම්පූර්ණයෙන්ම කෙලෙස් මුලිනුදුරා දැමීම හෙවත් සමුච්ඡේද ප්‍රහාණය සිදු වන්නේ සතර මඟ සතර ඵල පිළිවෙළිනි. එබැවින් මෙම ධ්‍යානයන්ට කෙනකු කෙලෙස් වලින් මුදා නිවණට පත් කිරීමේ ශක්තියක් නොමැත.

කෙලෙසුන් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණයට පත් කෙරෙන ලෝකෝත්තර මාර්ග ඵල අත්පත් කරගත හැක්කේ විදර්ශනා ඥානය අවබෝධ කර ගැනීමෙනි. මේ සඳහා සංස්කාර ධර්මයන්හි යථා ස්වභාවය - අනිත්‍ය, දුක්ඛ, අනාත්මය යන ස්වභාවය වටහා ගත යුතු වෙයි. සමථ භාවනා, විපස්සනා භාවනා යන භාවනා ක්‍රම දෙකෙහි විශේෂත්වය වනුයේ සමථය මගින් ක්ලෙෂ විෂ්කම්භනය කරමින් ධ්‍යාන ලබාගත හැකි වීමත් විපස්සනාව මගින් කෙලෙස් සමුච්ඡේදය කරමින් ලෝකොත්තර මාර්ගඵල සාක්ෂාත් කරගත හැකි වීමත්ය.

යථොක්ත භාවනා ක්‍රම දෙක මගින්ම මානසික ඒකාග්‍රතාවක් හෙවත් සමාධියක් අත්පත් කර දෙයි. විදර්ශනාව මගින් සිතේ එකඟතාව ඇති කොට ගෙන ධ්‍යානවලට පත් නොවී හුදෙක් මාර්ගඵල අවබෝධ කර ගන්නා යෝගාවචරයකු හැඳින්වෙන්නේ සුක්කවිපස්සක හෙවත් සුද්ධ විපස්සනා යානික යන නමිනි. හුදු විදර්ශනාව පමණක් උපයෝගී කර ගන්නා යන අරුත එයින් දෙයි. සමථය ද උපයෝගී කොට ගෙන ධ්‍යාන අත්පත් කර ගනිමින් අනතුරුව විදර්ශනා වඩා මාර්ග ඵල එකක් හෝ වැඩි ගණනක් සාක්ෂාත් කරගන්නා හැඳින්වෙනුයේ සමථයානික යන නමිනි.

සමථ භාවනාව මගින් මානසික සමාධිය අත්පත් කර ගැනීමෙහි ඉෂ්ට විපාක තුනක් විද්‍යාමාන වෙයි. වර්තමාන භවයෙහි සුඛිත මුදිත මානසික තත්වයක් ඇති වීම, පුනර්භවය වශයෙන් සුගතියක් අත්පත් වීම, හා විමුක්ති ලාභය සඳහා අවශ්‍ය ප්‍රඥාව ලගා කර ගැනීමට පහසු විය හැකි පරිද්දෙන් මානසික කෙලෙසුන් යටපත් වීම යනු ඒ ප්‍රතිඵල තුනයි. සමථය මගින් මනස නොකැළඹුණු නිශ්චල හා බෙහෙවින් පැහැදිලි දිය බඳුනක තත්වයට පත් වෙයි. වෙනත් ලෙසකින් පවසතොත් බෙහෙවින් පිරිසිදු කැඩපතක තත්වයට පත්වෙයි. එබඳු දියකින් හෝ කැඩපතකින් හෝ පුද්ගලයකුට තම මුහුණ යථා තත්වයෙන් දැක ගැනීමේ අවස්ථාව සලසා දෙයි. එපරිද්දෙන් සමථය මගින් පිරිසුදු වූ මනසින් සංස්කාර ධර්මයන් ගේ යථා තත්වය දැකීම පහසුය.

රාග ද්වේෂාදියෙන් අපිරිසිදු වී ඇති සාමාන්‍ය මනසින් වස්තු තත්වය යථාර්ථ වශයෙන් දැක ගැනීමට හැකි නොවේ. එබැවින් එබඳු කෙලෙස් යටපත් කොට දෑමෙන් සමථයෙන් පුද්ගලයකුගේ මනස වස්තූන් යථාර්ථ වශයෙන් දකින විදර්ශනයට නතු කර ගැනීම පහසු වෙයි. විදර්ශනාව විවිධ විශෙෂ ඥාන දර්ශනයන් - අභිඥාවන් ලබා දෙමින් අවසාන වශයෙන් සව් කෙලෙසුන් නසා අත්පත් කර ගන්නා ආසවක්ඛය ඥානය තුළින් නිර්වාණවබෝධය ලබා දෙයි.

රාගය වැනි ගින්නක් වත්, දෝසය වැනි ග්‍රහණයක් වත් මෝහය වැනි දැලක් වත්, තණ්හාව වැනි ගඟක් වත් නැත

251. නත්ථි රාගසමො අග්ගි
නත්ථි දොසසමො ගහො
නත්ථි මොහසමං ජාලං
නත්ථි තණ්හාසමා නදී (18:17)

රාගය ලොවේ අති දැඩිතර වූ ගින්නයි
දොසය අසම වූ බලවන්තම බැම්මයි
මෝහය දැලකි එහි වැටුනොත් අවුලක්මයි
තණ්හා සැඩපහර අන්ගඟ දිය ඉක්මයි.

තණ්හාව පරදවන - සැඩ දිය දහර නැත වෙන

18 (9) උවසුවෝ පස් දෙනෙක්ගේ කතාව (251 ගාථාව)

දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **උපාසකවරුන් පස් දෙනකු** අරභයා මෙම ගාථා ධර්මය වදාළ සේක. දිනක් දෙව්රම් වෙහෙරට පැමිණි උපාසකවරු පස් දෙනෙක් බුදුන් වැඳ එකත් පසෙක හිඳ බුදුරජාණන් වහන්සේගෙන් බණ ඇසීමේ කැමැත්ත පළ කළහ. බුදුන්වහන්සේ ධර්ම දේශනා කිරීමේ දී පැමිණි අයගේ කුලමල නොවිමසා කිසිවකුට උසස් ලෙසින් හෝ තවත් කිසිවකුට පහත් ලෙසින් සැලකීමක් නොමැතිවම කාටත් එකසේ සුදුසු පරිද්දෙන් ධර්ම දේශනා කරති. රජ මැති ඇමති, දුප්පත්, පොහොසත් ආදි භේදයක් බුදුන්වහන්සේට නැත. කාටත් සම මෙත පතුරුවන උන්වහන්සේ තම ධර්ම දේශනා මගින් ලෝකශාන්තිය උදා කරලන සේක. මේ උවසුවන් පස්දෙනා ධර්මශ්‍රවණයට කැමැත්තක් දැක්වූ බැවින් බුදුන් වහන්සේ ඔවුන් උදෙසා ධර්මදේශනා කරමින් සිටි සේක. ධර්ම දේශනාව කෙරෙන අතරතුර මේ උවසුවන් පස්දෙනාගෙන් එක් කෙනෙක් හැර අන් අය මනා අවධානයකින් ධර්මය නොඇසූහ. ඔවුන්ගෙන් කෙනෙක් බණ අසන අතරතුර නිදිබරව සිටියේ ය. ඔහු බණ ඇසුවාට වඩා කළේ නිදා ගැනීමය. තවත් කෙනෙක් බණ ගැන සැලකිල්ලක් නොදක්වමින් බිම ඉරි අඳිමින් සිටියේ ය. අනෙකා අසළ තිබූ ගසෙක අත්තක් සොලවමින් සිටියේ ය. සිවුවැන්නා අහසෙහි තරු ගණින්නට මෙන් අහස දෙස බලා ගෙන සිටියේ ය. එක් කෙනෙක් පමණක් ධර්මය ගෞරවය ඇතිව සැලකිල්ලෙන් ධර්මයට සවන් දුන්නේ ය.බුදුරජාණන් වහන්සේට සමීපයෙහි සිට පවන් සලමින් සිටි අනඳ හිමියෝ මොවුන් ධර්මයට සවන් දෙන ආකාරය මනාව බලා සිටියහ. එක්කෙනකු ගේ හැර අනෙක් සිවු දෙනාගේම විකාර වැඩ හොඳින් දුටු අනඳ හිමියෝ ඒ බව බුදුරජාණන් වහන්සේට සැලකළහ. "ස්වාමීනි, මොවුන්ගෙන් සිවු දෙනෙක්ම දහම් නො අසති. කෙනෙක් නිදා වැටෙයි. කෙනෙක් පොලොවෙහි ඉරි අඳියි. තව කෙනෙක් කොළ අතු සොලවයි. අනෙකා අහස දෙස බලා ගෙන සිටියි. මනාව බණ අසන්නේ එක් කෙනෙක් පමණි." මෙසේ පැවසූ අනඳ හිමියෝ මොවුන් මෙසේ හැසිරීමට කරුණු බුදුන්වහන්සේගෙන් විමසූහ. බුදුරජාණන් වහන්සේ ඔවුන්ගේ මේ හැසිරීම් වලට හේතුව පැහැදිලි කරමින් ඔවුන්ගේ භව පුරුදු අනුව මෙසේ හැසිරෙතියි වදාරා එක් එක් පුද්ගලයාගේ පූර්ව භව පුරුදු මෙසේ විස්තර කළ සේක. "ආනන්ද, මේ පුද්ගලයන්ට තම අතීත භවයන්හි පුරුදු වලින් තවමත් අත්මිදීමට නොහැකි වී ඇත. මොවුන්ගෙන් බණ අසමින් නිදා සිටි තැනැත්තා අතීත ජාති පන්සියයක නාගයකුව උපන්නෙකි. නාගයා දරණ වෙලා ගෙන පෙණ ගොබය දරණ වැල මත තබා නිතරම නිදා සිටින්නෙකි. ඔහු අතීත භව පන්සියයකදීම නාගයකුව හිඳ දැඩි සේ නින්දට පුරුදුව සිටි බැවින් මේ අත් බවෙහි දී ද ඒ පුරුද්ද අත්හැර ගත නොහී බණ අසමින්ම නිදා ගත්තේය. පොළොවෙහි ඉරි ඇඳි තැනැත්තා භව පන්සියයක ගැඩවිලි පණුවකුව උපන්නෙකි. පොළව හාරා පොළව ඇතුළට රිංගා ගැනීම ගැඩවිල් ගතිය බැවින් ඔහුට ද පෙර පුරුද්ද අතහැර ගත නොහී බණ අසමින්ම පොළවෙහි ඉරි අඳිමින් සිටියේය. කොළ අතු සෙලවූ තැනැත්තා ජාති පන්සියයක වඳුරකුව උපන්නෙකි. වඳුරු ගතිය ඔහුට ද අත්හැර ගත නොහැකි විය. අහස දෙස බලමින් සිටි තැනැත්තා අතීත ජාති පන්සියයක නැකැත් ඇදුරෙකුව සිටියෙකි. එබැවින් අහස දෙස බලා නැකැත් තරු ගණන් කළ පුරුද්දට ඔහුට තවමත් අහස දෙස බැලෙයි. සැලකිල්ලෙන් බණ ඇසූ තැනැත්තා පෙර ජාති පන්සියයක වේදමන්ත්‍ර හැදෑරූ උගත් බ්‍රාහ්මණයෙක් විය. එබැවින් හෙතෙම අධ්‍යයනයට සැලකිල්ල දක්වන්නකු පරිද්දෙන් මෙහිදී මනාව ධර්මය නිසා උගත්තේය."

බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ කල්හි අනඳ හිමියෝ, "ස්වාමීනි, යමෙකු ධර්මය ඇසීමෙහි අකැමැති කරවන ධර්මයට උනන්දු නොකරවන හේතු ඇත්දැ"යි බුදුන් වහන්සේගෙන් ඇසූහ. "පුද්ගලයන් අනාදිමත් කාලයක සිට භවයෙහි පුරුදු කොට ඇති, රාගය, ද්වේෂය, මෝහය හා තෘෂ්ණාව ධර්මය ඇසීමෙහි හා ධර්මය වටහා ගැනීමෙහි අකැමැත්ත ඇති කරවයි. රාග ද්වේෂ මෝහ තෘෂ්ණාදිය නිසා පුද්ගලයා නිතරම ඇදී යන්නේ ලෞකික කාම වස්තූන් කෙරෙහිය. කාම වස්තූන්හි අනිත්‍ය දුක්ඛ අනාත්ම යන යථා ස්වභාවය ප්‍රකාශ කෙරෙන මෙම ධර්මයට ඇළුම් කරන්නෝ ලෝකයෙහි විරලය. රාගය ලොව ඇති දැඩිම ගින්නයි. ද්වේෂය මුදාගත නොහැකි තරම් වූ දැඩි ග්‍රහණයයි. මෝහය අසුවූවහුට ගැලවී ගත නොහැකි තරම් අවුල් වූ දැලයි. තෘෂ්ණාව පුද්ගලයකු සංසාර සාගරයට ගසාගෙන යන සැඩ දියපහර සහිත නදියයි". මෙසේ අනඳ හිමියනට කරුණු වටහා දුන් බුදුරජාණන් වහන්සේ යථෝක්ත ගාථා ධර්මය වදාළ සේක.

විස්තරාත්මක අනුවාදය (251 ගාථාව)

රාගසමො අග්ගි නත්ථි, දොස සමො ගහො නත්ථි,
මොහසමං ජාලං නත්ථි, තණ්හාසමා නදී නත්ථි

රාගසමො: රාගයට සමාන වූ; **අග්ගි**: ගින්නක්; **නත්ථි**: නැත; **දොසසමො**: ද්වේෂයට සමාන වූ; **ගහො**: ග්‍රහණයක් (බැම්මක්); **නත්ථි**: නැත; **මොහසමං**: මෝහයට සමාන වූ; **ජාලං**: දැලක්; **නත්ථි**: නැත; **තණ්හාසමා**: තෘෂ්ණාවට සමාන වූ; **නදී**: ගංගාවක්; **නත්ථි**: නැත.

රාගයට සමාන වූ ගින්නක් නැත. ද්වේෂයට සමාන වූ ග්‍රහණයක් නැත. මෝහයට සමාන වූ දැලක් නැත. තෘෂ්ණාවට සමාන වූ සැඩ දිය පහරක් නැත.

විවරණය

රාගසමො: දොසසමො: මොහසමො: තණ්හාසමො: මේ පද මගින් ප්‍රධාන මානසික ක්ලේශ ධර්මයන් ලෝකයෙහි පුද්ගලයාට බලපෑ හැකි විපත්ති සමග සංසන්දනය කර දක්වා ඇත. ගින්න, දැඩි බැම්ම, අවුල් දැල හා රුදුරු සැඩ පහර ඇති නදිය යන මේවාට අසුවුව හොත් මිනිසාට සිදුවන්නේ විපත්තියකි. මේවා සාමාන්‍ය ස්වාභාවික විපත්තිය. මේවාට පුද්ගලයකු හසුවන්නේ කලාතුරකිනි. එහෙත් රාග, දෝෂ,මෝහ, තෘෂ්ණා යනාදී ක්ලේශ ධර්ම වලට පුද්ගලයා නිතරම නතුව පවතියි. මේ ක්ලේශ ධර්මවලින් පුද්ගලයාට මෙලොව පමණක් නොව පරලොවද විපත්වලට මුහුණ පෑමට සිදු වෙයි. මේවායින් දුරු නොවී සිටිය හොත් සසර දුකින් කිසිවිටෙක එතර වීමක් නොවේ. එබැවින් ඒවා යථෝක්ත ස්වාභාවික විපත්තිවලට වඩා දරුණු විපත්ති ලෙස දක්වා ඇත.



අනුන් ගේ ඉතා සුළු වරද පහසුවෙන් දක්නේ ය. තමා ගේ මහත් වූ වරද වසා සඟවන්නේ ය.

252. සුදස්සං වජ්ජං අඤ්ඤෙසං
අත්තනො පන දුද්දසං
පරෙසං හි සො වජ්ජානි
ඔපුණාති යථා භුසං
අත්තනො පන ඡාදෙති
කලිං'ව කිතවා සඨො (18:18)

අනුන් වරද පෙනේ හොඳට
තමන්ගේ දොස් වැසේ ඔහුට
අනුන්ගෙ දොස් නඟයි යසට
බොල් මතු වී එන විලසට
වැද්දෙකු ඇඟ වසන ලෙසට
තමන් වරද වසයි රඟට

පෙනේ හොඳට - අනුන්ගේ දොස

18 (10) මෙණ්ඩක සිටුවරයා ගේ කතාව (252 ගාථාව)

භද්දිය නුවරෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ සුප්‍රසිද්ධ **මෙණ්ඩක සිටුවරයා** සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් අරභයා මෙම ගාථා ධර්මය දේශනා කළ සේක.

බුදුරජාණන් වහන්සේ වරක් අංග සහ උත්තර ප්‍රාන්තවල සැරසරමින් ලෝ සතුන් උදෙසා දහම් දෙසමින් වැඩ සිටිය දී එම ප්‍රදේශයෙහි භද්දිය නම් නුවර විසූ මෙණ්ඩක මහ සිටාණන්, ඔහු ගේ බිරිය, පුතණුවන්, ලේලිය, මිණිබිරිය සහ ඔහු ගේ සේවිකාව යන පිරිස සෝවාන් ඵලයට පත් වීමට හේතු සම්පත් ඇති බව දිවැසින් දුටු සේක. එබැවින් ඔවුනට සෙත සලසනු පිණිස ඔවුන් වසන භද්දිය නුවරට වැඩම කළ සේක.

මෙණ්ඩක ඒ අවධියෙහි විසූ බෙහෙවින්ම ධනවත් මහ සිටුවරයෙකි. ඔහුගේ නිවස පිටුපස ගෙවත්තෙහි විශාල ප්‍රමාණයේ ඝනරන් එළු ප්‍රතිරූප සමූහයක් මතු වූ බව කියනු ලැබේ. මේ සිටාණන්ට මෙණ්ඩක (එළු) යන නම ලැබුණේද මේ හේතුව නිසා බව කියැවෙයි. මේ සිටුවරයා අතීත භවයන්හි බොහෝ පින් රැස් කළ කෙනෙකි. හෙතෙම විපස්සී බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි උන්වහන්සේට වැඩ සිටීමටත් ධර්මදේශනා කිරීමටත් විශාල ධනයක් වියදම් කොට අලංකාර ශාලාවක් තනවා එය බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට පූජා කළේය. ශාලාව පූජා කිරීම නිමිත්තෙන් සිවු මසක් පුරා බුදුපාමොක් මහ සඟනට මහ දන් පිරිනැමීය. මේ හැර වෙනත් භවයකදී බරණැස් නුවර සිටු කෙනකුව ඉපිද මහා නියං සමයක සිය නිවසෙහි තිබූ සියලු ආහාර ද්‍රව්‍ය අවසන් වෙමින් තිබිය දී ඉතා අපහසුවෙන් සොයා ගත් සහල් ටිකකින් නිවසෙහි අයට පමණක් යන්තම් සෑහෙන බතක් පිසගෙන කෑමට සූදානම් වෙත් දී එහි වැඩම කල පසේබුදු කෙනකුන්ට ඒ සියලු බත පිරිනැමීය. අමාරුවෙන් සොයාගෙන කෑමට පිසගත් අහර පසේ බුදුන්ට පිරිනැමීමෙන් ජනිත වූ පිනෙන් ඔහුගේ සියලු ධාන්‍යාගාර සහලින් පිරී ඉතිරී ගියේය.

බුදුරජාණන් වහන්සේ භද්දිය නුවරට වැඩම කොට ඇති බව දැනගත් මෙණ්ඩක සිටුවරයා, සිය පවුලේ සාමාජිකයන් ද සමඟ බුදුන් දැක දහම් ඇසීම සඳහා උන්වහන්සේ වැඩ සිටි තැනට ගියේය. අතරමඟදී ඔහුට නිගණ්ඨයෝ මුණ ගැසුණහ. සිටාණන් බුදුන් දකින්නට යන බව දැන ගත් ඔවුහු බුදුන්ගේ අගුණ පවසා ඔහු බුදුන් දැක ගැනීමට යෑමෙන් වළක්වන්නට උත්සාහ කළහ. ඔවුන්ගේ බස් නොපිළිගත් සිටුවරයා බුදුන් කරා ගොස් වැඳ එකත්පසෙක සිටියේය.

බුදුරජාණන් වහන්සේ සිටුවරයා ඇතුළු මෙම පිරිසට ධර්ම දේශනා කළ සේක. ධර්මයට සවන් දුන් මෙණ්ඩක සිටුවරයාත්, ඔහුගේ බිරිය වන චන්ද්‍රපදුමා දේවියත්, ධනඤ්ජය නම් වූ පුත්‍රයාත්, ඔහුගේ බිරිය වන සුමනා දේවියත්, සිටුවරයාගේ මිණිබිරිය වන විශාඛා කුමරියත්, සේවිකාව පුණ්ණාත් සෝවාන් ඵලයට පැමිණියහ. දහම් අවසන්හි සිටුවරයා, තමන් එන අතර මගදී මුණ ගැසුණු නිගණ්ඨයන් බුදුන් වහන්සේගේ නුගුණ පවසමින් තමන් බුදුන් දැකීමට එන ගමන වළක්වන්නට උත්සාහ දැරූ සැටි බුදුන් වහන්සේට සැළ කර සිටියේය. මෙහිදී බුදුරජාණන් වහන්සේ අනුන්ගේ වරද පහසුවෙන් දැකීමත්, තමන්ගේ වරද එසේ පහසුවෙන් නොදැකීමත් මිනිසුන්ගේ ස්වභාවය බව පවසමින් ඉහත සඳහන් ගාථාවෙන් ධර්මය දේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (252 ගාථාව)

අඤ්ඤෙසං වජ්ජං සුදස්සං අත්තනො පන දුද්දසං සො හි පරෙසං වජ්ජානි භුසං යථා ඔපුණාති සඨො කිතවා කලිං ඉවං අත්තනො පන ඡාදෙති.

අඤ්ඤෙසං: අනුන්ගේ; **වජ්ජං**: වරද; **සුදස්සං**: දැකීම පහසුය; **අත්තනො**: තමන්ගේ (වරද); **පන**: වනාහි; **දුද්දසං**: දැකීම අපහසුය; **සො**: (එසේ අනුන් වරද දක්නා) හෙතෙම; **හි**: ඒකාන්තයෙන්; **පරෙසං**: අනුන්ගේ; **වජ්ජානි**: දෝෂයන්; **භුසං**: දහයියා (වෙන් කොට ගන්නාක්); **යථා**: මෙන්; **ඔපුණාති**: තෝරා බේරා ගනියි; **සඨො**: කපටි වූ; **කිතවා**: රවටනු සුලු (කුරුළු වැද්දෙක්); **කලිං ඉව**: ඇඟ වසාගන්නාක් මෙන; **අත්තනො පන**: තමන්ගේ වරද වනාහි; **ඡාදෙති**: සඟවයි.

අනුන්ගේ වරද දැකීම පහසුය. තම වරද දැකීම අපහසුය. එසේ අනුන්ගේ වරද දකින පුද්ගලයා සහලින් දහයියා වෙන් කර ගන්නාක් මෙන් අනුන්ගේ දෝෂයන් මතුකර ගනියි. කපටි වූ කුරුළු වැද්දෙකු කොළ අතුවලින් තම සිරුර වසා ගන්නාක් මෙන් තමන්ගේ වරද වසා ගනියි.

විවරණය

කිතවා: රවටන්නා වූ අරුතයි, මෙහි කුරුළු දඩයමේ දී තමන් කුරුල්ලන්ට නොපෙනෙන පරිදි ඇඟ කොල අතුවලින් වසා ගෙන සැඟවී සිටීම කුරුළු වැද්දන් ගේ ස්වභාවයයි. මෙහි කිතවා යන පදය යෙදී ඇත්තේ එසේ කුරුල්ලන් රැවටීම සඳහා ඇඟ වසා ගන්නා කුරුළු වැද්දකු හැඟවීම සඳහාය. අනුන්ගේ වරද දකින පුද්ගලයා ද තමන්ගේ වරද වසා ගැනීමට පෙළඹෙයි.



අනුන් ගේ වරද සොයන කියන තැනැත්තා කෙලෙසුනගෙන් වැඩෙන්නේ ය. රහත් ඵලයෙන් දුරුවන්නේ ය.

253. පරවජ්ජානුපස්සිස්ස නිච්චං උජ්ඣාන සඤ්ඤිනො ආසවා තස්ස වඩ්ඪන්ති ආරා සො ආසවක්ඛයා (18:19)	අනුන් දොස් දකි නා අනුනට දොස්ම නඟ නා කෙලෙස් මල වඩ නා අයහට නිවණ දුරි නා

අනුන් දොස දැකීමෙන් - පිරිහෙයි තමන් නිතැතින්

18 (11) උජ්ඣානසඤ්ඤී තෙරණුවන්ගේ කතා පුවත (253 ගාථාව)

දෙව්රම් වෙහෙරහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **උජ්ඣානසඤ්ඤී** නමැති තෙරුන් වහන්සේ නමක් අරභයා මේ ගාථා ධර්මය වදාළ සේක.

උජ්ඣානසඤ්ඤී තෙරණුවෝ නිතරම අනෙක් භික්ෂූන් වහන්සේලා ගේ ඇද පළුදු සොයන්නෙකි. ඔවුන්ගේ වරද සොයා චෝදනා මුඛයෙන් කථා කරන්නෙකි. උජ්ඣානසඤ්ඤී තෙරුන්වහන්සේ ගේ නිබඳවම අනුන්ගේ මේ දොස් දක්නා ස්වභාවය ගැන අනෙක් භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට දැන්වූහ. බුදුරජාණන් වහන්සේ ඒ සම්බන්ධයෙන් මෙසේ වදාළ සේක. "මහණෙනි, කෙනෙක් අන් අයකු ගේ වරදක් දැක ඒ අය යහපත් මාර්ගයට ගැනීමේ අදහසින් එම වරද ගැන පෙන්වා දීම යහපත් ක්‍රියාවකි. එහෙත් අනුනට දොස් නඟන අදහසින්ම අනුන්ගේ දොස් දැකීමත් ඒ පිළිබඳව කථා කිරීමත් ද්වේෂ සහගත සිතින් චෝදනා නැඟීමත් කරන්නේ නම් එසේ කරන්නාට අනුන්ගේ දොස් සොයනු විනා තමන්ගේ උසස් පරමාර්ථයන් ඉටු කර ගැනීමට නොහැකි වෙයි. නිබඳ ද්වේෂයෙන් දූෂිත වූ සිතක් ඇති එබඳු පුද්ගලයාට මනස එකඟ කර ගැනීමෙන් භාවනා ආදියෙහි යෙදී කෙලෙස් දුරු කර ගැනීමට නොහැකි වෙයි. එබඳු පුද්ගලයාගේ සිතෙහි අනුන් නිසා ආශ්‍රවයන් වැඩෙන අතර නිවණ ඔහු කෙරෙන් ඈත් වෙයි." මෙසේ පැහැදිලි කළ භාග්‍යවතුන් වහන්සේ යථොක්ත ගාථාවෙන් ධර්මදේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (253 ගාථාව)

පරවජ්ජානුපස්සිස්ස නිච්චං උජ්ඣානසඤ්ඤිනො තස්ස ආසවා වඩ්ඪන්ති, සො ආසවක්ඛයා ආරා

පරවජ්ජානුපස්සිස්සඃ අනුන්ගේ වරද දක්නා සුලු වූ; **නිච්චං**ඃ නිතරම; **උජ්ඣානසඤ්ඤිනො**ඃ (අනුන්ට) අවඥා කොට කියන සුලු වූ; **තස්ස**ඃ ඒ පුද්ගලයාට; **ආසවා**ඃ ආශ්‍රවයෝ; **වඩ්ඪන්ති**ඃ වැඩෙත්; **සො**ඃ හෙතෙම; **ආසවක්ඛයා**ඃ ආශ්‍රවක්ෂයෙන් (රහත්ඵලයෙන්); **ආරා**ඃ දුරයි.

අනුන්ගේ වරද දක්නා සුලු වූ අනුන්ට දොස් නැඟීමේ හැඟීමෙන් යුතු පුද්ගලයාගේ ආශ්‍රවයෝ වැඩෙති. හෙතෙම නිවණින් බොහෝ ඈත සිටියි.

විවරණය

උජ්ඣානසඤ්ඤිනොඃ අනුනට දොස් පවරන අදහසින් යුක්ත තැනැත්තාගේ යනුයි. මේ කථාවෙහි සඳහන් තෙරුන්වහන්සේ ගේ නම ද උජ්ඣානසඤ්ඤී යනුවෙන් ව්‍යවහාර වී ඇත්තේ නිබඳවම උන්වහන්සේ නපුරු අදහසින් අනුන්ගේ දොස් දැකීමට පුරුදුව සිටි බැවිනි.

පරවජ්ජානුපස්සිස්සඃ අනුන්ගේ දොස් දකින සුලු තැනැත්තා ගේ යන අර්ථයයි. අනුන්ගේ දොස් දැකීම අරමුණු දෙකකින් කෙරෙයි. අනුන්ගේ වරද පෙන්වා ඔවුන් ඒ වරදින් ගලවා ගෙන නිවැරදි කරවීමේ අරමුණින් කෙනෙක් තව කෙනකුගේ දොස් දකියි. ඇතමෙක් තව කෙනකුගේ දොස් දකින්නෙත් එය අනුනට පවසන්නේත් නින්දා අපහාස කිරීමේ නපුරු අදහසිනි. මෛත්‍රී සහගත සිතින් අනුන්ගේ වරද දැක වරද කළ තැනැත්තාට එය දැනුම් දීම යහපත් ගතියකි. එය බුදුදහමින් අනුමත වී ඇත. "දුටුවරද කීමෙන් මෙත්තාවචී කර්මය පුරා" යන්නෙන් එය සඳහන් වෙයි. කෙනකු ගේ වරද දැක එය ඔහුට පැවසීම මෛත්‍රී සහගත වාග් කර්මයකි. එහෙත් හෙළා දැකීමේ අදහසින්ම වරද සෙවීමත් එය අනෙක් අය සමග කීමත් පාප කර්මයකි.

පෘථග්ජන කවුරුන් අතින් වුවද වරද සිදු වෙයි. අනුන්ගෙන් සිදුවන වරද දැකීමට වඩා වැදගත් වනුයේ තමන් ගේ වරද දැකීමයි. වරද වරද ලෙස දැක එය නිවැරදි කර ගෙන අනාගතයෙහි යළි එම වරද සිදු නොවන ලෙස ක්‍රියා කිරීම අභිවෘද්ධියට හේතු වන කරුණක් ලෙස බුදු දහමින් දැක්වෙයි. වුද්ධිහෙසා මහාරාජ, අරියස්ස විනයෙ අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති ආයතිං සංවරං ආපජ්ජති යනුවෙන් එය දැක්වෙයි.

තමන්ගේ වරද සඟවා ගෙන අනුන්ගේ වරද ඉස්මතු කරමින් අවඥා කිරීම මිනිසුන් අතර බෙහෙවින්ම දක්නට ලැබෙන දුර්ගුණයකි. එසේ අනුන්ගේ වරද ඉස්මතු කොට ගෙන ද්වේෂ සහගත සිතින් එය අනෙක් අය හමුවෙහි කියාපාන්නා ඒ නිසාම අනුන් ගේ අවඥාවට පාත්‍ර වන්නෙකි. ඔහු ද්වේෂ සිතින් එසේ කිරීම නිසා නිබඳවම පරිහානියට පත් වෙයි. තමන්ගේ යහපත සඳහා ක්‍රියාකිරීමක් ඔහු ගේ අතින් සිදු නොවෙයි. අනුන්ගේ සුළු වුවද වරදක් දැක එය අනෙක් අය සමඟ කියමින් සිනහ වෙමින් විනෝද වීමේ පුරුද්දක් ද ඇතැම් අය අතර තිබේ. මෙබඳු ගති සිරිත් යහපත් සමාජයක නොතිබිය යුතු දුර්ගුණයකි.

කෙනකු මෛත්‍රී සහගත සිතින් අන් කෙනකු ගේ වරදක් ඔහුට පෙන්වා දුන් විට එය පිළි ගැනීමට තරම් නිහතමානී නොවන්නේ නම් එය ද වරදකි. යහපත් සිතින් වරද පෙන්වා දෙන තැනැත්තා කරන්නේ උපකාරයකි. ඔහු ඒ වරද පෙන්වා දීම නිසා එය තේරුම් ගෙන යළි එබඳු වරදක් සිදු නොවීමට අවස්ථාව සලසා ගැනීමට තමාට හැකි වෙයි. භික්ෂු ශික්ෂණයේ විශේෂ ලක්ෂණයක් වන්නේ අන්‍යොන්‍ය වරද පෙන්වා දීමෙන් ආයතිසංවරයෙහි පිහිටීමය. ඒ අනුව භික්ෂූන් වහන්සේ නිරන්තරයෙන්ම නිවැරදිව සිටීමට උත්සාහයක් ගනියි.

ආසවක්ඛයාඃ ආශ්‍රව හෙවත් ක්ලෙශධර්ම ක්ෂය වීමෙන් යන අරුත්ය. ආශ්‍රවයන් ක්ෂය වීම නිර්වාණ ප්‍රතිලාභය වශයෙන් සැලකෙයි. පුද්ගලයාගේ සන්තානයෙන් ආශ්‍රවයන් මූලොත්පාටනය කරන තුරු සංසාර දුකින් නිදහස් වීමට නොලැබෙයි. ද්වේෂයෙන් යුතුව අනුන්ගේ දොස් නඟා දක්වමින් සමච්චල් කරන්නා තුළ සිතේ එකඟතාවක් නොමැති වෙයි. ඔහු නිබඳව අනුන් ගැන සිතනු විනා භාවනාදී ආධ්‍යාත්මික දියුණුවට හේතු වන කටයුතුවල නොයෙදෙයි. එමෙන්ම ඔහු ගේ සිත නිබඳවම චිත්තාපරවශව පවත්නා බැවින් ආශ්‍රවයන් දුරුකර ගැනීමට අදාළ වන පරිද්දෙන් චිත්ත ඒකාග්‍රතාවක් ඇති කර ගැනීමට අසමත් වෙයි. එබැවින් එබඳු පුද්ගලයාගෙන් නිවණ බොහෝ දුරස්ව පවතියි.

අහසැ පියවරක් නැත. පිටත් සසුන්හි මහණෙක් නැත. සත්කැල පමා හේතුවල ඇලුණි.

254. ආකාසෙ පදං නත්ථි
සමණො නත්ථි බාහිරෙ
පපඤ්චාභිරතා පජා
නිප්පපඤ්චා තථාගතා (18:20)

අහසෙ නොමැත පිය සටහන්
සසුනෙන් පිට නැත මහණුන්
දනෝ ඇලෙති මග කෙලෙසුන්
බුදුවරු දුරුවෙති එමගින්

නිවන හැර අන් කිසිවක් සදාතනික නොවේ.

18 (12) පිරිවැජි සුභද්ද ගේ කතාව (254 සහ 255 ගාථා)

කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ උපවත්තන නම් වූ සල් වෙනෙහි වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑමට මොහොතකට කලින් **සුභද්ද** නම් පිරිවැජියකු නැගූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් මේ ගාථා වදාළ සේක.

අතීත භවයක දී සුභද්ද තම බාල මලනුවන් නව වරක් අග්‍රසශ්‍ය දානය දෙනු බලාත් එක් වරකු දු එසේ අග්‍රසශ්‍ය දානය නොදුන් තැනැත්තෙකි. මලනුවන් පෙරැත්ත කරද්දීත් අගසස් දන්දීමේ කැමැත්තක් ඔහුට පහළ නොවීය. කෙසේ වුවද අවසානයේ දී සාමාන්‍ය දානයක් දී පින්ලබා ගත් කෙනෙකි. මොහුගේ මලනුවන් නව වරක් අගසස් දන් දුන් බැවින් එහි විපාකයෙන් කොණ්ඩඤ්ඤ නමින් ඉපදී බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රථම ධර්ම දේශනාව කළ අවස්ථාවේදීම ධර්මය අසා රහත් බව ලබා ගත්තේය. සුභද්ද තමාට සැක හැර දැන ගැනීමට ප්‍රශ්න කිහිපයක් තිබුණත් මුල් අවධියෙහි ඒවා ඇසීමට බුදුන් කරා නොගියේ, වයසින් අඩු තැනැත්තකු වූ බුදුරජාණන් වහන්සේට ඒවාට පිළිතුරු සැපයිය නොහැකි වේය යන හැඟීමෙනි. මේ නිසා සුභද්ද වයසින් වැඩිමහළු ශ්‍රමණ බ්‍රාහ්මණයින්ගෙන් තම ප්‍රශ්නවලට පිළිතුරු විමසීය. එහෙත් ඒ එක ප්‍රශ්නයකට හෝ ඔවුන්ගෙන් සුදුසු සතුටුදායක පිළිතුරක් ලබා ගැනීමට හෙතෙම අසමත් විය. අවසානයේ දී බුදුන්ගෙන් අසා දැන ගැනීමට ඔහුට අදහසක් ඇති විය. මේ වනවිට බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑම සඳහා කුසිනාරාවට වැඩම කොට සිටි සේක. සුභද්දට එහි පැමිණිය හැකි වූයේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට ඉතාමත් ආසන්නයේය.

බුදුරජාණන් වහන්සේ දැඩි සේ ගිලන්ව පිරිනිවන් පෑමේ අපේක්ෂාවෙන් සිටි බැවින් බුද්ධෝපස්ථායක අනඳ හිමියෝ සුභද්දට බුදුන් හමු වීමට ඉඩ නොදුන්හ. මේ බව දැනගත් බුදුරජාණන් වහන්සේ අනඳ හිමියන් අමතා "ආනන්ද, සුභද්දව නොවළක්වන්න. ඔහුට මා හමු වීමට ඉඩ හරින්න"යි පැවසූ සේක. බුදුන් සමීපයට එළැඹි සුභද්ද බුදුනට ගෞරව දක්වා තම ප්‍රශ්න ඉදිරිපත් කළේය. එම ප්‍රශ්න වලින් ඔහු විමසුවේ, "අහසෙහි පිය සටහන් තිබේ ද?, බුදුසසුනෙන් බාහිරව ශ්‍රමණයෙක් සිටිය හැකි ද?, ලොව නොනැසී සදහටම පවත්නා යම් කිසිවක් තිබේද?" යන්නයි. සුභද්ද විමසූ මෙම කරුණු ලෝකයෙහි අවිද්‍යමාන බව පැවසූ බුදුරජාණන් වහන්සේ යථොක්ත ගාථා දෙකින් ධර්ම දේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (254 ගාථාව)

ආකාසෙ පදං නත්ථි, බාහිරෙ සමණො නත්ථි, පජා පපඤ්චාභිරතා, තථාගතා නිප්පපඤ්චා

ආකාසෙ: අහසෙහි; **පදං**: පා සටහනක්; **නත්ථි**: නැත; **බාහිරෙ**: (බුද්ධ ශාසනයෙන්) පිටත; **සමණො**: ශ්‍රමණයෙක්; **නත්ථි**: නැත; **පජා**: සත්ත්ව ප්‍රජාව; **පපඤ්චාභිරතා**: තෘෂ්ණාමානාදී කෙලෙස් උපදින මාර්ගයෙහි ඇළුණේය; **තථාගතා**: බුදුවරු; **නිප්පපඤ්චා**: ප්‍රපඤ්ච (තෘෂ්ණාමානාදිය) රහිත වූවෝ ය.

අහසෙහි පිය සටහන් නොමැත. සසුනෙන් පිටත ශ්‍රමණයෙක් නොමැත. සාමාන්‍ය ජනතාව ප්‍රපඤ්චයන් හි ඇළුණෝය. බුදුවරු ප්‍රපඤ්ච රහිත වූවෝ ය.

විවරණය

සමණො නත්ථි බාහිරෙ: මෙහි සමණ යන පදය යෙදී ඇත්තේ හුදෙක් ගිහිගෙය හැරපියා ශ්‍රමණ වේශය ගත් පුද්ගලයා යන අර්ථයෙන් නොවේ. බුදුදහම පහළ වන අවධියෙහි භාරතයෙහි ශ්‍රමණ පිරිස් කොතෙකුත් සිටියහ. ආජීවක, ශ්‍රමණ, පරිබ්‍රාජක, ජටිල, නිගණ්ඨ යන නම් වලින් හැඳින්වෙමින් සිටි මේ කවුරුත් ශ්‍රමණයෝ වූහ. ගිහි ඇඳුම් හැර පියා ශ්‍රමණවේශය ගත් පමණින් ශ්‍රමණයෙක් නොවේ යන ආකල්පය බුදු දහමින් ඉදිරිපත් වෙයි. බුදුදහමෙහි ශ්‍රමණ යන්න අර්ථවත් වන්නේ කෙලෙස් ශමනය කළ හෙවත් කෙලෙස් විනාශ කළ පුද්ගලයා සම්බන්ධයෙනි. මෙසේ සම්පූර්ණයෙන් කෙලෙස් මුලිනුපුටා විනාශ කරන පුද්ගලයා දක්වා අනුක්‍රමයෙන් කෙලෙස් විනාශ කරන ශ්‍රමණයෝ සතර දෙනෙක් වෙති. සොතාපන්න, සකදාගාමි, අනාග ාමි, සහ අරහත් නමින් මේ පුද්ගලයෝ හැඳින්වෙති. පුද්ගලයකු ශ්‍රමණ බවට පත් වන්නේ සසර දුකින් එතරව නිවන අත්පත් කර ගනු සඳහාය. එබැවින් නිවන් මඟට පිවිසෙමින් නිවන සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියා මාර්ගයෙහි යෙදෙන්නාත් නිවන සාක්ෂාත් කළ පුද්ගලයාත් බුදු දහමෙහි දී ශ්‍රමණ යන්නෙන් අර්ථවත් වෙයි. පුද්ගලයකු සසරෙහි බැඳ තබන සංයෝජන දහයක් වෙයි. මෙම සංයෝජන සිතෙන් ඉවත් කරන තැනැත්තා ශ්‍රමණයෙකි.

බුදු දහමට අනුව, සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සංයෝජන තුන සහමුලින් විනාශ කරමින් සෝවාන් මාර්ග ඵලයන්ට පැමිණෙන්නා ප්‍රථම ශ්‍රමණයා ය. ඉහත කී සංයෝජන තුන සහමුලින් විනාශ කිරීමට අතිරේකව කාමරාග, පටිඝ යන සංයෝජන වල ශක්තිය මැඩලමින් සකෘදාගාමි මාර්ගඵලයන්ට පැමිණෙන්නා ද්විතීය ශ්‍රමණයා ය. එම සංයෝජන දෙකද සම්පූර්ණයෙන් දුරු කරමින් උද්ධම්භාගිය සංයෝජ පහම මුලිනුදුරමින් අනාගාමිමාර්ගඵලයන්ට පැමිණෙන්නා තෘතීය ශ්‍රමණයා ය. රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච සහ අවිජ්ජා යන අපරම්භාගිය සංයෝජන පසද ඇතුළත්ව දස සංයෝජනයන්ම සිතින් දුරු කරමින් අර්හත් මාර්ගඵලයන්ට පැමිණෙන තැනැත්තා චතුර්ථ ශ්‍රමණයා වෙයි. ඉහත සඳහන් සතර වැදෑරුම් ශ්‍රමණයන් බුදු සසුනෙන් පිටත අන්‍ය ශාසනයන්හි පහළ නොවීමට හේතුව වන්නේ එම ශාසනයන්හි මධ්‍යම ප්‍රතිපදා සංඛ්‍යාත ආර්ය අෂ්ටාංගික මාර්ගයක් ඉදිරිපත් නොවන බැවිනි.



අහසැ පියවරක් නැත. පිටත් සසුන්හි මහණෙක් නැත. හැමකල් හි පවත්නා වූ පස් කඳෙක් නැත.

255. ආකාසෙ පදං නත්ථි
සමණො නත්ථි බාහිරෙ
සඞ්ඛාරා සස්සතා නත්ථි
නත්ථි බුද්ධානමිඤ්ජිතං (18:21)

අහසේ නොමැත පිය සටහන්
සසුනෙන් පිට නැත මහණුන්
හටගත් දෙය නැසෙයි නිතින්
නැත පෙළඹුම් වෙත මුනිඳුන්

කෙලෙසුන් ගෙන්වන පෙළැඹුම් - බුදුවරු කර ඇත මුල්සුන්

18 (12) පිරිවැජි සුභද්ද ගේ කතාව (254 සහ 255 ගාථා)

විස්තරාත්මක අනුවාදය (255 ගාථාව)

ආකාසෙ පදං නත්ථි බාහිරෙ සමණො නත්ථි සස්සතා සඞ්ඛාරා නත්ථි බුද්ධානං ඉඤ්ජිතං නත්ථි

ආකාසෙ: අහසෙහි, **පදං**: පිය සටහනක්, **නත්ථි**: නැත, **බාහිරෙ**: සසුනෙන් බැහැරව, **සමණො**: ශ්‍රමණයෙක්, **නත්ථි**: නැත, **සස්සතා**: සදාතනික වූ, **සඞ්ඛාරා**: සංස්කාර ධර්මයෝ, **නත්ථි**: නැත, **බුද්ධානං**: බුදුවරයන්ට, **ඉඤ්ජිතං**: (රාගාදියෙන්) කම්පා වීමක්, (සැලීමක්) **නත්ථි**: නැත.

අහසෙහි පියසටහනක් නැත, බුදුසසුනෙන් බැහැරව ශ්‍රමණයෙක් නැත. සදාතනික වු සංස්කාර ධර්මයක් නැත. බුදුවරුන්ට පෙළඹවීම් නැත.

විවරණය

පපඤ්චාභිරතා: පපංච නමින් සැලකෙන්නේ තණ්හා, මාන, දිට්ඨි යන ක්ලේෂ ධර්මයි. මේවා මිනිස් සන්තානයෙහි පහළවීමෙන් විමුක්ති මාර්ග යෙහි නිරත වීමකින් තොරව සසරෙහි ප්‍රමාද වීමට සිදු වේ. පුද්ගලයා ඉන්ද්‍රිය මාධ්‍යයෙන් විෂය වස්තූන් පිළිබඳව දැනුම ලබා ගැනීමෙහි ලා පෙළඹෙන ආකාරය අනුව මානසික වශයෙන් තෘෂ්ණා, මාන, දෘෂ්ටි යන ප්‍රපඤ්ච සිත තුළ බිහි වෙයි. ප්‍රපඤ්ච ඇති නොවන ආකාරයෙන් විෂය වස්තූන් පිළිබඳ ඉන්ද්‍රිය සම්බන්ධතා පැවැත්වීම සඳහා ඉන්ද්‍රිය සංවරය බුදු දහමින් ඉදිරිපත් කර ඇත. ඉන්ද්‍රිය සංවරයකින් තොරව ප්‍රිය විෂය වස්තූන් හි ඇලෙමින් තෘෂ්ණාව ද, අප්‍රිය විෂය වස්තූන්හි ගැටෙමින් ද්වේෂය ද, විෂය වස්තු මුලාවෙන් ගැනීම මගින් මෝහය ද ඇති වෙයි. විෂය වස්තුව මගේ ය යන හැඟීම ඇති වු විට තෘෂ්ණාව ද, විෂය වස්තුව හා තමා තුලනය කිරීමෙන් මානය ද, මේ කරුණු නිසාම තමා සදාතනිකව පවත්නා ආත්මයකි යන දෘෂ්ටියට එළඹීමෙන් දිට්ඨිය ද, ඇති වෙයි. අට්ඨකථා විවරණයන්ට අනුව මෙම තණ්හා, මාන, දිට්ඨි යන ක්ලෙෂ ධර්ම ප්‍රපඤ්ච නමින් සලකනු ලැබේ.

සංඛාරා: හේතු ප්‍රත්‍යයෙන් හට ගන්නා හැර දෙයක්ම සංඛාර නමින් බුදුදහමෙහි දී හැඳින්වෙයි. ලොව පවත්නා කිසිවක් හේතු ප්‍රත්‍යයන්ගෙන් තොරව හට නොගන්නා බව බුදුදහමේ මතයයි. මෙසේ හේතුඵල සිද්ධාන්තයට අනුව හට ගන්නා හැම දෙයකම විශේෂ ලක්ෂණය වන්නේ විනාශයයි. "යං කිඤ්චි සමුදාය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං" යනුවෙන් එය සඳහන් වෙයි. "හට ගන්නා ස්වභාවය හා ඇති හැම දෙයක්ම විනාශය ද ස්වභාවය කොට ඇත්තේ ය"

සංස්කාරයන්හි විශේෂ ලක්ෂණ තුනක් බුදු දහමෙහි දී ත්‍රිලක්ෂණය යනුවෙන් දැක්වෙයි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු එම ත්‍රිලක්ෂණයයි. මෙම ත්‍රිලක්ෂණය ස්වභාවය කොට ඇති සංස්කාර ධර්මයන්ට සදාතනික අවිනශ්වර පැවැත්මක් නැත. මේ නිසා මෙම ගාථාවෙහි දී "සංඛාරා සස්සතා නත්ථි" යනුවෙන් සඳහන් කොට ඇත. ලෝකයෙහි වෙනස් නොවන, විනාශ නොවන සදාකල්හිම පවතින පදාර්ථ තිබේ යන ඉගැන්වීම ඇතැම් බුද්ධකාලීන ආගමික ශාස්තෲවරුන් විසින් ඉදිරිපත් කොට තිබිණ. සෑම පුද්ගලයකු සතුවම ආත්මයක් පවත්නා බවත් එම ආත්මය විනාශ නොවන සදාකාලික පදාර්ථයක් බවත් ඔවුන්ගේ අදහස විය. එහෙත් බුදු දහම මේ මතය මිථ්‍යාදෘෂ්ටියක් වශයෙන් සලකා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරයි. ආත්මවාදය බුදුසමයේ දී බෙහෙවින්ම විචාරයට භාජනය වූවකි. එය වස්තූන්හි යථාර්ථය වටහා ගැනීමෙන් කෙලෙසුන් දුරු කොට නිවණට පත් වීමෙහිලා ඇති ප්‍රධාන බාධකයක් ලෙස බුදු දහමින් දකියි. වස්තූන්හි යථාර්ථය දකින්නේ ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමෙනි. ආත්මවාදය වූකලී විදර්ශනයට සම්පූර්ණයෙන්ම ප්‍රතිපක්ෂ වු ඉගැන්වීමකි. එබැවින් බුදුරජාණන් වහන්සේ තම ධර්මය මගින් සංස්කාර ධර්මයන්හි ශාශ්වත පැවැත්මක් නැති බව නිබඳවම අවධාරණය කොට දක්වන සේක.

සුභද්ද: මෙම ගාථා ධර්මයන් දේශනා කිරීමට හේතු සාධක වූ සුභද්ද බුදුරජාණන් වහන්සේගේ ජීවමාන කාලය තුළට අයත් වන අන්තිම ශ්‍රාවකයා වශයෙන් පිළිගැනෙයි. බුදුරජාණන් වහන්සේ ඔහුට ධර්ම දේශනා කළේ පිරිනිවන් මඤ්චකයෙහි වැඩ සිටියදීමය. බුදුරජාණන් වහන්සේ ආගමික ශාස්තෲවරයකු වශයෙන් ලෝකසත්වයාගේ හිත සුව කෙතරම් උපරිම මට්ටමින් සැලකූ සේක් ද යන කාරණය සුභද්ද පිළිබඳ මේ කථා ප්‍රවෘත්තියෙන්ම ඔප්පු වෙයි. සුභද්ද පැවිද්ද සහ උපසම්පදාව ලබා උත්සාහයෙන් භාවනා කරමින් රහත් බවට පත් වු බව සඳහන් වෙයි.

ඉඤ්ජිතං: සෙලවීම, කැළඹීම, පෙළඹීම, යන අරුත් ඇති පදයකි. බුදුවරුනට කිසිදු ඉඤ්ජිතයක් නොමැත. ලාභ, අලාභ, යස, අයස, නින්දා ප්‍රශංසා, සුඛ දුක්ඛ යන අෂ්ට ලෝක ධර්මයෙන් සැලීමක් පෙළඹවීමක් බුදුවරුනට නැත. නොපෙළඹෙන සුලු තාදී ගුණය බුදුවරුනගේ විශේෂ ලක්ෂණයකි.

දෙවියකුගෙන් තොර විමුක්තිය

ලෝක ඉතිහාසයේ ප්‍රථම වරට බුදුහිමියන් විසින් දේශනාකරන
ලද්දේ තමාගේ විමුක්තිය තමාටම ලබාගත හැකි බවයි.
එමෙන්ම මෙම ජිවිත කාලය තුළදීම එම විමුක්තිය
ලබාගත හැකි බවද බුදුහිමියෝ දෙසුහ.
ඒ සඳහා දෙවියෙකුගේ හෝ දෙවියන්ගේ හෝ පිහිට
අනවශ්‍ය බවද බුදුහිමියෝ දෙසූහ. ආත්ම විශ්වාසය,
පාරිශුද්ධිය, ශීලය, ප්‍රඥාව, සාමය හා මෛත්‍රිය පිළිබඳ දහම
උන්වහන්සේ ප්‍රබල ලෙස උගැන්වූහ. බුද්ධිය, ප්‍රඥාව අත්‍යවශ්‍ය බව
උන්වහන්සේ දැඩි ලෙස කියා සිටියහ.
මක් නිසාදයත් ප්‍රඥාවෙන් තොරව මේ ජීවන කාලය තුළදී
විදර්ශනාව ලබාගත නොහෙන හෙයිනි.

මහාචාර්‍ය එලියට් 'බුදුසමය සහ හින්දුසමය' යන ග්‍රන්ථයෙනි

ධම්මට්ඨ වග්ග



නීති දහමෙහි පිහිටා නඩු විසඳන නුවණින් විසඳන්නෙකි.

256. න තෙන හොති ධම්මට්ඨො
යෙන'ත්ථං සහසා නයෙ
යො ච අත්ථං අනත්ථං ච
උභො නිච්ඡෙය්‍ය පණ්ඩිතො (19:1)

සැහැසි ලෙසින් ගෙන හැර පාමින් අරුත
කිසිවෙක් ලොවේ දහමෙහි පිහිටියේ නැත
නිසි ලෙස අනරුතින් වෙන් කොට ගෙන අරුත
පසිඳන කෙනා පඬිවරයෙක් වෙයි නියත

අගතියෙන් තොරවී - විනිස දීමයි උතුම්

19 (1) විනිසුරුවෝ පිළිබඳ කතාව (256 සහ 257 ගාථා)

ජේතවන වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ අල්ලසින් අගතියට ගොස් **අයුතු ලෙස නඩු විසඳන විනිසුරුවන් පිරිසක්** අරභයා මෙම ගාථා ද්වය වදාළ සේක.

එක් දිනක් භික්ෂූන් වහන්සේලා සැවැත් නුවර උතුරු වාසල් දොර සමීපයෙහි වූ ගමක පිඬු සිඟා හැසිර එහිදීම දන් වළඳා ආපසු එන ගමනේ දී මහ වැස්සක් කඩා හැලුනේ ය. වැස්සෙන් නොතෙමෙනු පිණිස උන්වහන්සේලා අසල තිබූ විනිශ්චය ශාලාවකට ගොඩ වැදුනාහ.

මේ එහි විනිසුරු මඬුල්ලක් නඩු විසඳමින් සිටි අවස්ථාවකි. විනිසුරුවන් විත්ති පැමිණිලි යන කවර පක්ෂයෙන් හෝ අල්ලස් ගෙන සාධාරණ ලෙස විනිශ්චය නො දෙමින් අගතිගාමීව වරද කරුවන් නිවරද කරනුත් නිවැරදි කරුවන් වරද කරුවන් කරනුත් උන්වහන්සේලාට මෙහිදී දක්නට ලැබිණ. "විනිස කරුවන් නිබඳවම සාධාරණයෙහි පිහිටා නිසිලෙස විනිශ්චය දෙතියි අපි විශ්වාස කෙළෙමු. මේ විනිසුරුවන් අසාධාරණ ලෙස මෙසේ නඩු පසිඳලීම කෙතරම් වරදක්ද?"යි උන්වහන්සේලා සිතූහ.

වැස්ස නැවතුන විට ආපසු ජේතවනාරාමයට පැමිණි භික්ෂූන් වහන්සේලා මේ සිද්ධිය බුදුරජාණන් වහන්සේට සැළ කළ හ. භික්ෂූන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ, "මහණෙනි, යමෙක් විනිශ්චය දීමේ දී අගතිගාමී වන්නේ නම් හෙතෙම ධර්මයෙහි පිහිටියෙක් නොවන්නේ ය. වරද නිවරද තෝරා බේරා ගෙන අපක්ෂපාතීව විනිශ්චය දීම නියම විනිශ්චයකරුවකු ගේ යුතුකම විය යුතුය"යි යථොක්ත ගාථා ද්වයෙන් ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (256 ගාථාව)

යෙන සහසා අත්ථං නයෙ තෙන ධම්මට්ඨො න හොති
යො අත්ථං ච අනත්ථං ච උභො නිච්ඡෙය්‍ය (සො)
පණ්ඩිතො.

යෙන: යම් හෙයකින්; **සහසා**: අනිසි ලෙස ඉක්මන් වී; **අත්ථං**: නිගමනය; **නයෙ**: ඉදිරිපත් කෙරේද?; **තෙන**: එකරුණින්; **ධම්මට්ඨො**: ධර්මයෙහි පිහිටියෙක්; **න හොති**: නොවේ; **යො**: යමෙක්; **අත්ථං ච**: අර්ථය ද; **අනත්ථං ච**: අනර්ථය ද; **උභො**: (යන) දෙකම; **නිච්ඡෙය්‍ය**: මනාව විනිශ්චය කරන්නේ ද?; **පණ්ඩිතො**: (හෙතෙම) නුවණැත්තෙකි.

ඉක්මන් වී අයුතු ලෙස නිගමන ඉදිරිපත් කළ පමණින් ධර්මයෙහි පිහිටියෙක් නො වෙයි. හරි වැරදි හොඳ නො හොඳ නිසි ලෙස තෝරා බේරා විනිශ්චය කරන්නා දැහැමි නුවණැති විනිසුරුවෙක් වෙයි.

විවරණය

ධම්මට්ඨො: ධර්මයෙහි පිහිටි, ධර්මයෙහි හැසිරෙන තැනැත්තා යන අරුත්ය. ධම්ම යන පදය බුදු සමය තුළ විවිධ අර්ථ සහිතව ඉදිරිපත් වන්නකි. ස්වභාව ධර්මය, යුක්ති ධර්මය. පර්‍යාප්ති ධර්මය යන මේ අර්ථ ඒ අතුරෙන් ප්‍රධාන වෙයි. ධර්මයෙහි පිහිටීම යන්නෙන් බුදුරජාණන් වහන්සේ විසින් ලෝක සත්වයාගේ යහපත සඳහා ඉදිරිපත් කර වදාළ ධර්ම මාර්ගයෙහි පිහිටීම යනුවෙන් අර්ථ කථනය ද කළ හැක. එම ධර්ම මාර්ගය පර්‍යාප්ති ධර්මය යනුවෙන් හැඳින්වෙයි.

බුද්ධභාෂිතය අන්තර්ගත කොට ඇති එම පර්‍යාප්ති ධර්මය සංගායනා කාරක භික්ෂූන් වහන්සේලා විසින් ත්‍රිපිටකය නමින් හැඳින්වෙන කොටස් තුනකට බෙදා දක්වා ඇත. විනය පිටක, සුත්ත පිටක හා අභිධම් පිටක යනුවෙන් එම ත්‍රිපිටකය හැඳින්වෙයි. භික්ෂූන් වහන්සේලාගේ චර්‍යාව සකස් විය යුතු ආකාරය පදනම් කොට බුදුරජාණන් වහන්සේ විසින් පණවා වදාළ විනය ශික්ෂාපද සමුදායත් ඒවා පිළිබඳ විස්තර විභාගයත් විනය උල්ලංඝනය කෙරෙන විට ඒ සඳහා භික්ෂූන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියා විධිත් එමෙන්ම භික්ෂූන් වහන්සේලා විසින් පැවැත්විය යුතු ආගමික චාරිත්‍ර වාරිත්‍ර ආදියත් පිළිබඳ සියලු විස්තර විනය පිටකයට ඇතුළත් වෙයි. විනය පිටකයේ දී මෙම සියලු විස්තර ග්‍රන්ථ පහකට අන්තර්ගත කොට තිබේ. ඒ ග්‍රන්ථ පහ මෙසේ ය.

1. පාරාජිකා පාළි
2. පාචිත්තිය පාළි
3. මහාවග්ග පාළි
4. චුල්ලවග්ග පාළි
5. පරිවාර පාළි

නීති දහමෙහි පිහිටා නඩු විසඳන විනිසකරු නුවණින් නඩු විසඳන්නෙකි.

257. අසාහසෙන ධම්මෙන
සමෙන නයතී පරෙ
ධම්මස්ස ගුත්තො මෙධාවී
ධම්මට්ඨොති පවුච්චති (19:2)

ඉවසිලි සහිතවම නිසි දහමින් යුතුව
මෙරමා මෙහෙයවන අගතියකුදු නැතුව
දහමෙහි යෙදෙන්නා නුවණැති බව සතුව
දැහැමියෙකැයි කියත හැකි සහතික ඇතුව

මැදිහත්ව සමසේ - දහමෙහි සිටිනු තිරසේ

19 (1) විනිසුරුවෝ පිළිබඳ කතාව (256 සහ 257 ගාථා)

විවරණාත්මක අනුවාදය (257 ගාථාව)

**අසාහසෙන සමෙන ධම්මෙන පරෙ නයතී ධම්මස්ස
ගුත්තො මෙධාවී ධම්මට්ඨො ඉති පවුච්චති.**

අසාහසෙන: හිතුවක්කාර නොවූ; **සමෙන**: සාධාරණ වූ; **ධම්මෙන**: යුක්ති ධර්මයෙන්; **පරෙ**: අනුන්; **නයතී**: මෙහෙයවයි ද; **ධම්මස්ස**: ධර්මයෙන්; **ගුත්තො**: යුක්තවූ; **මෙධාවී**: නුවණැති වූ හෙතෙම; **ධම්මට්ඨො ඉති**: ධර්මයෙහි පිහිටි යෙකැයි; **පවුච්චති**: කියනු ලැබේ.

හිතුවක්කාර නොවී සාධාරණ ලෙස ධර්මානුකූලව අනුනට විනිශ්චය දෙන්නා යුක්තිගරුක වූ නුවණැති ධර්මයෙහි පිහිටියෙකැයි කියනු ලැබේ.

විවරණය

බුදුරජාණන් වහන්සේ විසින් අවුරුදු හතළිස් පහක් මුළුල්ලේ තම විමුක්ති මාර්ගය පැහැදිලි කරමින් ඉදිරිපත් කරන ලද සූත්‍ර ධර්ම සියල්ල අන්තර්ගත වන්නේ සූත්‍ර පිටකයට ය. තමන් වහන්සේගේම අදහසට අනුව මේ ධර්මය මෙහි දී විවරණය කළ යුතු යයි හැඟී ගිය විට දේශනා කළ සූත්‍ර ධර්ම, අනුන්ගේ අදහස් වලට ගැලපෙන පරිද්දෙන් ඉදිරිපත් කරන ලද සූත්‍ර ධර්ම, කෙනකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් ඉදිරිපත් කරන ලද සූත්‍ර ධර්ම හා කිසියම් කාරණයක් උද්ගත වූ විට ඉදිරිපත් කරන ලද සූත්‍ර ධර්ම යන මේ සියල්ල සූත්‍ර පිටකයට ඇතුළත්ය. මෙම සූත්‍ර ධර්මවලට අයත් වන විෂය ක්ෂෙත්‍රය බෙහෙවින්ම සංකීර්ණය, මේවායින් බොහෝ විට පහත දැක්වෙන කරුණු විවරණය වී ඇත.

1. ලොකස්වභාවය හා පුද්ගලස්වභාවය
2. විමුක්ති මාර්ගය හා විමුක්තිය
3. සදාචාර සාරධර්ම
4. සමාජ සදාචාරය හා දර්ශනය
5. බෞද්ධ ආර්ථික ප්‍රතිපත්ති
6. රාජ්‍ය ධාර්මිකත්වය
7. මිථ්‍යාමත විවේචනය
8. මිථ්‍යාදර්ශන විවේචනය

මෙසේ පොදුවේ සූත්‍රධර්මයන්ට අන්තර්ගත වී ඇති කරුණු මෙසේ වර්ග කර දැක්විය හැකි වූවත් මෙම වර්ග කිරීම්වලට ඇතුළත් වී නැති තවත් බොහෝ කරුණු කොතෙකුත් ඇත. කෙසේ වුවද මෙබඳු ධර්ම කරුණු වලින් පරිපූර්ණ වූ සූත්‍ර ධර්ම ඇතුළත් වී ඇති සූත්‍ර පිටකට ග්‍රන්ථ පහකින් සමන් විතය. ඒවා මෙසේය.

1. **දීඝනිකාය** - දීර්ඝ සූත්‍ර දේශනා තිස්සතරක් මෙයට අයත් ය.

2. **මජ්ඣිම නිකාය** - මධ්‍යම ප්‍රමාණයේ සූත්‍ර දේශනා 152 ක් මීට අයත් ය.

3. **සංයුක්ත නිකාය** - විවිධ වර්ගවලට අයත් සූත්‍ර දේශනා 7762 ක් මෙයට අයත් ය.

4. **අංගුත්තර නිකාය** - අංගයෙන් අංගය වැඩිවන සේ එක් කොට සැකැසුණු සූත්‍ර දේශනා 9557 ක් මෙයට අයත්ය.

5. **ඛුද්දක නිකාය** - විවිධ දේශනා ඇතුළත් වූ ග්‍රන්ථ 15 ක් මෙයට අයත් වී ඇත.

ඛුද්දක නිකායට අයත් වී ඇති ග්‍රන්ථ පහළොව මෙසේ ය.

1. ඛුද්දක පාඨ
2. ධම්මපද
3. උදාන
4. ඉතිවුත්තක
5. සුත්තනිපාත
6. විමානවත්ථු
7. පෙතවත්ථු
8. ථෙරගාථා
9. ථෙරීගාථා
10. ජාතක
11. නිද්දෙස
12. පටිසම්භිදාමග්ග
13. අපදාන
14. බුද්ධවංස
15. චරියාපිටක

සූත්‍ර පිටකයෙන් ඉදිරිපත් වන බොහෝ ධර්ම කරුණු කිසියම් සංවිධානාත්මක ක්‍රමානුකූලතාවක් යටතේ වර්ග කිරීම්වලට හා විවරණය කිරීම්වලට බඳුන්ව අභිධර්ම පිටකයට අන්තර්ගත වී ඇත. අභිධර්ම පිටකයේ විවරණය වී ඇත්තේ බොහෝ විට චිත්ත, චෛතසික, රූප, නිබ්බාන යන මාතෘකා යටතේ සූත්‍ර පිටකයෙන්ම ඉදිරිපත් වී ඇති කරුණුය.

අභිධර්ම පිටකය ද ග්‍රන්ථ සතකින් සමන්විත වෙයි. ඒවා මෙසේය.

1. ධම්මසංගණී ප්‍රකරණය
2. විභංග ප්‍රකරණය
3. ධාතු කථා ප්‍රකරණය
4. පුග්ගල පඤ්ඤත්ති ප්‍රකරණය
5. කථාවත්ථු ප්‍රකරණය
6. යමක ප්‍රකරණය
7. පට්ඨාන ප්‍රකරණය

ඉහතින් සඳහන් කරන ලද පයර්‍යාප්ති ධර්මය දැනගෙන එහි හැසිරෙන තැනැත්තා ධර්මයෙහි පිහිටියෙකැයි කිවහැකි වුවද මෙම ගාථා ද්වයට අදාළ වන කථා තුළ දී ධම්මට්ඨ යන්නෙන් වඩාත් අර්ථවත් වන්නේ යුක්ති ධර්මයෙහි පිහිටි තැනැත්තා යනුයි. කළ යුතු නොකළ යුතු, හොඳ නරක, හරි වැරදි යන දේ තෝරා බේරා ගැනීමෙහිලා පයර්‍යාප්ති ධර්මය අපට ඉවහල් වන බව සැබවි. එහෙත් ලෝකව්‍යවහාරය ගැන මනා පළපුරුද්දක් ඇති බුද්ධිමත් පුද්ගලයකුට පයර්‍යාප්තියේ මග පෙන්වීමකින් තොරව වුවද යුක්ති ධර්මය වටහා ගත හැකිය. ලොව කාටත් සාධාරණය ඉටුවන පරිද්දෙන් ක්‍රියා කළ හැකි වන්නේ යුක්ති ධර්මයට අනුගත වීමෙනි. තමාගේම දැනුමෙන් තමාගේම අත්දැකීම් වලින් කෙනකුට යුක්ති ධර්මය වටහා ගත හැකිය. යුක්තිය වටහා ගැනීමේ දී ඊට බාධක වන කරුණු කිහිපයක්ම බුදුරජාණන් වහන්සේ විසින් කාලාම සූත්‍රයේ දී කාලාමයන්ට දේශනා කළහ. අගතියකින් තොරව මධ්‍යස්ථව තමාම හරිවැරදි තෝරා ගෙන යුක්ති ධර්මයෙහි පිහිටන ලෙස බුදුන් වහන්සේ එහිදී කාලාමයන්ට උපදෙස් දෙති.



අනුන්ට උවදුරු නැති, වයිර නැති, බිය නැති තැනැත්තා නුවණැතියෙකි.

258. න තෙන පණ්ඩිතො හොති
යාවතා බහු භාසති
ඛෙමී අවෙරී අභයො
පණ්ඩිතො'ති පවුච්චති (19:3)

දොඩමලු වූ පමණින්
වේද කෙනෙක් පණ්ඩිතයෙක්
නිවුණු, මිතුරු, බිය නැත්තෙක්
වේය සැබෑ පණ්ඩිතයෙක්

දොඩමලු වී කියන බසින් - නුවණැත්තෙක් වෙද කෙලෙසින්
19 (2) භික්ෂූන් සය දෙනකු ගෙන් සමන්විත කණ්ඩායමේ කතාව (258 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **ඡබ්බග්ගිය** භික්ෂූන් අරභයා මේ ගාථා ධර්මය වදාළ සේක.

සය දෙනකුගෙන් සමන්විත කණ්ඩායමක් නිසා ඡබ්බග්ගිය නමින් ප්‍රකට වූ මේ භික්ෂූහු බුදුන් දවස අවිනීත කම් හා දඩබ්බර හැසිරීම් හේතු කොට ගෙන බෙහෙවින් ප්‍රසිද්ධ පිරිසක් වූහ. පණ්ඩුක, ලෝහිතක, මෙත්තිය, භුම්මජක, අස්සජි, පුනබ්බසුක යන මේ තෙරුන් සය නමගේ අවිනීත හැසිරීම් නිසා ඔවුන් අරභයා ධම්පද ගාථා සමූහයක් දෙසීමටත් විනය නීති රීති සමූහයක් පැනවීමටත් බුදුන් වහන්සේට සිදු විය. මේ භික්ෂු පිරිස ගමෙහි වූ හෝ විහාරයෙහි වූ හෝ භෝජන ශාලාවල වාචාල කථා කරමින් ඒවා අපිළිවෙළට පත් කරමින් හා අපවිත්‍ර කරමින් හැසිරෙති. එක් දිනක් ගමින් දන් වළඳා විහාරයට වැඩම කළ සාමණේර හිමිවරුන්ගෙන් අනෙක් වැඩිමහලු භික්ෂූහු ගමෙහි දානශාලාවල තත්වය කෙසේදැයි විමසූහ. "ස්වාමිනි, ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලා එම දානශාලාවල කලබල කරමින් හැසිරෙති. අපිම නුවණැති වෙමු, අප කරන කියන දෙයට අන් අයට විරුද්ධ විය නොහැක, ආදී ලෙසින් වහසි බස් කියමින් අවිනීත ලෙස හැසිරෙමින් එම දාන ශාලා අපවිත්‍ර කෙරෙති. අපට ද රොස් පරොස් බැන අපේ හිස්වලට කසළ දැමුවාහුය"යි ඒ සාමණේරවරු පැවසූහ. මෙය ඇසූ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට මේ පුවත සැළ කළාහු ය. භාග්‍යවතුන් වහන්සේ මෙම කාරණය මුල් කොට ගෙන යථොක්ත ගාථා ධර්මයෙන් ධර්මදේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (258 ගාථාව)

යාවතා බහු භාසති තෙන පණ්ඩිතො න හොති ඛෙමී
අවෙරී අභයො පණ්ඩිතො ඉති පවුච්චති

යාවතා: යම් හෙයකින්; **බහු භාසති**: බොහෝ කොට කථා කරයි ද?; **තෙන**: ඒ හේතුවෙන්; **පණ්ඩිතො**: නුවණැත්තෙක්; **න හොති**: නො වේ; **ඛෙමී**: නිවුණු; **අවෙරී**: වෛරය නැති; **අභයො**: බිය නැති තැනැත්තේ; **පණ්ඩිතො ඉති**: නුවණැත්තෙකැයි; **පවුච්චති**: කියනු ලැබේ.

කෙනෙක් බොහෝ කොට කථා කළ පමණින් නුවණැත්තෙක් නොවෙයි. නිවුණු, මෙත් සිතැති, බිය රහිත පුද්ගලයාම නුවණැත්තෙක් වෙයි.

විවරණය

ඛෙමී : නිවුණු, බිය රහිත යන අරුත්ය. කෙනෙක් ක්ෂේම භාවයට පත් වන්නේ කෙලෙස් නිසා ඇති වන සංසාර භයෙන් නිදහස් වීමෙනි. බුදු දහමෙහි ඛෙම යනුවෙන් හැඳින්වෙන්නේ නිර්වාණයයි. නිර්වාණයට පත් වීම මගින් සංසාර භයින් දුරු විය හැකිය. එසේ කෙලෙස් ගිනි නිවා ක්ෂේම භාවයට පත් තැනැත්තා ඛෙමී නමින් හැඳින්වෙයි.

අවෙරී: වෛරය නැති කළ තැනැත්තායි. වෛරය නැති වන්නේ මෛත්‍රිය පුහුණු කිරීමෙනි. වෛරය පුද්ගලයකු ආධ්‍යාත්මික වශයෙන් පරිහානියට පත් කරවන ක්ලේශ ධර්මයක් වනු පමණක් නොව පුද්ගලයකු තුළ එය ඇති වීම ඔහුගේ වටපිටාවෙහි සිටින අනෙක් අයට ද විපතක් ඇති කරවන්නකි. අනුනට හිංසා පීඩාවට පෙළඹෙන්නේ වෛර කිරීම නිසාය. වෛරය දුරු කොට ඊට ප්‍රතිපක්ෂ වන මෛත්‍රිය පුරුදු පුහුණු කරන ලෙස බුදු දහමින් උපදෙස් දෙනු ලැබේ. මෙත් සිත බෙහෙවින් මෘදු මොලොක් වූවකි. එබඳු සිතක් ඇති පුද්ගලයා අනෙක් අයගේ ආදර ගෞරවයට බඳුන් වෙයි. මෛත්‍රිය වඩන පුද්ගලයා අත් කර ගන්නා අනුසස් එකොළසක් ගැන මෙත්තානිශංස සූත්‍රයෙන් විස්තර වී ඇත. ඒවා මෙසේ දැක්වෙයි.

1. සුවපහසු නින්ද
2. සුව පහසුවෙන් අවදිවීම
3. අසුභ සිහින නොදැකීම
4. මිනිසුන් විසින් ප්‍රිය කරනු ලැබීම
5. අමනුෂ්‍යයන්ගේ ප්‍රසාදයට පත් වීම
6. දෙවියන්ගේ රැකවරණය ලැබීම
7. ගිනි විෂ අවි යනාදියෙන් අනතුරු නොවීම
8. සිතෙහි සහනය ඇති වීම-ඉක්මණින් සමාධිගත වීම
9. මුහුණෙහි පැහැය ප්‍රභාමත් වීම
10. මරණයේ දී බියට පත් නොවීම
11. මෛත්‍රී භාවනාව වඩා ධ්‍යාන ලැබූ පුද්ගලයා බඹලොව ඉපදීම

මෛත්‍රී භාවනාවෙහි ආනිශංස එකළොසෙන් දහයක්ම පුද්ගලයකුට මෙලොවදීම අත්පත් වෙයි. බුදු දහමින් පුද්ගලයකු විසින් වර්ධනය කරගත යුතුයයි ඉගැන්වෙන සාරධර්මවල අගය මෛත්‍රිය තුළින් පමණක් වුවද වටහා ගත හැකිය.

අභයො: බියක් නැති තැනැත්තා යන අරුත්ය. කෙනකු තුළ බිය ඇති වන්නේ තමා වරද සහගත වූ විටය. ලොකවද්‍ය ප්‍රඥප්තිවද්‍ය යනුවෙන් වරද දෙයාකාර කොට දැක්වෙයි. මිනිස් සමාජයෙහි පොදුවේ වැරදි ලෙස සම්මත වී ඇති නරක ක්‍රියා ලොකවද්‍ය නම්. බුදුන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේ සඳහා අනුගමනය නොකළ යුතුයයි ප්‍රඥප්ති-ශික්ෂාවශයෙන් පෙන්වා දී ඇති වැරදි ප්‍රඥප්තිවද්‍ය නම්. ගිහි ජනතාව සඳහා බොහෝ කොට බලපාන්නේ ලෝකවද්‍යයි. පඤ්චශීලයෙන් වුවද දක්වා ඇත්තේ ලෝකවද්‍යයයි. වැරදි වලින් මිදුණු පුද්ගලයා තුළ බියක් නූපදියි. තමා යන කවර තැනකට වුවද නිර්භයවම යාමට එබඳු පුද්ගලයාට හැකි වෙයි. මේ ගාථාවෙන් නුවණැති පුද්ගලයකු තුළ පිහිටිය යුතුයයි දක්වා ඇති ඛෙමී, අවෙරී, අභයො යන ගුණත්‍රය පුද්ගලයකුගේ චරිතය පරිපූර්ණත්වයට පත් වීමට බෙහෙවින්ම ඉවහල් වෙයි. ආධ්‍යාත්මික සංවර්ධනය තුළින් සකසා ගන්නා ලද සුරක්ෂිතතාව, මෛත්‍රිය වර්ධනයෙන් තමා සමස්ත සත්වසංහතියේ මිත්‍රයකු වීම හා සියලු වැරදි වලින් මිදී ලෝකයා හමුවේ නිර්භයව සිටීමේ හැකියාව යන මේ තත්වයන් පුද්ගලයකු කෙරෙහි විද්‍යමාන වේ නම් ඔහු ගේ චරිතය පරිපූර්ණ වූවකි. හෙතෙම අනුන් විසින් ගරුබුහුමන් දැක්විය යුත්තකු වනු පමණක් නොව අනුන් විසින් ඇසුරු කළ යුතු ආදර්ශමත් පුද්ගලයෙක් ද වෙයි. බුදුසමයට අනුව පුද්ගලයකු නුවණැත්තකු හෝ පඬිවරයකු වන්නේ තමන් එසේ කියා ගැනීමෙන් හෝ සාමාන්‍ය ව්‍යවහාර ඥානය පැවතීමෙන් හෝ පමණක් නොවේ. ආධ්‍යාත්මික ගුණ ධර්මවලින් පරිපූර්ණ පුද්ගලයකු පමණක් බුදු සමයේ දී පණ්ඩිත යන නමින් හඳුන්වනු ලැබෙයි. නුවණැත්තා හෙවත් පණ්ඩිතයා ලොව අනුනට උපදෙස් දෙන්නකු ලෙස සම්මත වී ඇත. අනුනට මග පෙන්විය හැක්කේ තමන් යන මග ගමන් ගන්නා විට පමණි. එබැවින් පළමුව තමා සම්මතයෙහි පිහිටීම පණ්ඩිතයකු ගේ ලක්ෂණය වෙයි. මේ තත්වය බුදුන් වහන්සේ විසින්ම ධම්මපදයේ (158 ගාථාව)දී දක්වා ඇත.

අත්තානමෙව පඨමං - පතිරූපෙ නිවෙසයෙ
අථඤ්ඤමනුසාසෙය්‍ය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතො

"තමා පළමුව සුදුසු තත්වයෙහි පිහිටිය යුතුය. අනතුරුව අවවාද අනුශාසනා දිය යුතුය. එවිට පණ්ඩිතයා නො කෙලෙසෙයි."

ලෝක සත්වයාගේ යහපත සඳහා කෙනෙකුට ඉදිරිපත් විය හැක්කේ තමා තුළ සාරධර්ම සපුරා ගැනීමෙනි. මේ තත්වය සඳහා ගාථා ධර්මය මගින් අවධාරණය කොට ඇති ගුණත්‍රය පුද්ගලයකුට බෙහෙවින් උපකාරී වෙයි.



යමෙක් බොහෝ සේ ඉගෙනීම් දෙසීම් කළ පමණින් දහම්දර නො වේ.

259. න තාවතා ධම්මධරො
යාවතා බහු භාසති
යො ච අප්පම්පි සුත්වාන
ධම්මං කායෙන පස්සති
ස වෙ ධම්මධරො හොති
යො ධම්මං නප්පමජ්ජති (19:4)

බෙහෙවින් දෙසන තරමින් නොදරයි දහම
ටික වුව අසා එය දිවියෙහි දකින තම
නොපමා වේද දහමෙහි කරමින් ඇලුම
දහම දරන්නෙක් වන්නේ මැයි හෙතෙම

මනාව දන්නෝ - මඳක් කියන්නෝ

19 (3) එකුදාන රහතන් වහන්සේ (259 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ නිබඳව ම එක් උදාන ගාථාවක් පමණක් දෙසන **රහතන් වහන්සේ** නමක් අරභයා මේ ගාථා ධර්මය වදාළ සේක. සැවැත් නුවර සමීපයෙහි වූ වනයක භික්ෂූන් වහන්සේ නමක් විසූහ. උන්වහන්සේ එකම උදාන ගාථාවක් පමණක් දන්නා බැවින් එකුදාන තෙරණුවෝයයි ප්‍රසිද්ධ වූහ.

"උසස් සිතැතිව පමා නොමැතිව - මුනි මගෙහි නික්මෙන
සිත් ඇතිව සැනසෙන - මුනිනට නොවේ සෝකය"

මේ උන්වහන්සේ දත් එකම උදානයයි. හුදෙකලාව වනයෙහි බවුන් වඩමින් සිටි උන්වහන්සේ සෑම පොහෝ දවසකම ධම් දේශනා කරන නියායෙන් මේ ගාථාව දේශනා කරති. ධර්මය ඇසීමට වනයෙහි මිනිසුන් නො සිටියත් මිනිසුනට ධම් දේශනා කරන විටක මෙන් දේවතාරාධනය කොට ඉහත කී ගාථාව පමණක් හඬ නගා කියති. උන්වහන්සේ මේ ගාථාව ප්‍රකාශ කරන හැම දිනයකම වනයෙහි විසූ රුක් දෙවිවරු බෙහෙවින් පැහැදී උස්හඬින් සාධුකාර දෙති. එක් දිනෙක පන්සියය පන්සියය බැගින් වූ භික්ෂු පිරිවර ඇති ධර්මධර තෙරුන් වහන්සේලා දෙනමක් මේ එකුදාන තෙරුන්වහන්සේ වැඩ සිටි වනයට පැමිණ උන්වහන්සේ හමු වූහ. කලකින් ධර්මය මනාව දන්නා කෙනකුගෙන් දහම් ඇසීමට අවස්ථාවක් නොලද එකුදාන තෙරණුවෝ ධර්මධර භික්ෂු දෙනමගේ පැමිණීමෙන් සතුටට පත් වූහ. සතුටු සාමීචි කථාවලින් පසු, තමන් ධර්මය ඇසීමට කැමති බවත් බොහෝ කලකින් කෙනකුගෙන් දහම් ඇසීමට අවස්ථාව නොලද බවත් තමන්ට අනුග්‍රහ පිණිස දහම් දෙසන ලෙසත් එම තෙරණුවෝ ධර්මධර තෙරවරුන්ගෙන් ඉල්ලා සිටියහ. ධර්මධර තෙරවරු විශේෂයෙන් විශාල ශ්‍රාවක පිරිස්වලට ධර්මය දෙසීමෙහි පුරුද්ද ඇත්තෝය. එබැවින් උන්වහන්සේලා ඇවැත්නි, "මෙහි ධර්මය ඇසීමට පිරිසක් නැත. එබැවින් අප වැනි අය ධර්මය දෙසීමෙහි අර්ථයක් ඇත්දැ"යි එකුදාන තෙරුන් වහන්සේගෙන් ඇසූහ. "මේ වනයෙහි ධර්මය ඇසීමට මා හැර වෙනත් මිනිස්සු නැත. එහෙත් මේ වනයෙහි වෙසෙන දෙවිවරු මා දන්නා එකම ගාථාව වුවත් දෙසන විට අසා බෙහෙවින් සතුටට පත්ව සාධුකාර දෙති. එබැවින් මටත් ඒ අයටත් අනුග්‍රහ පිණිස ධර්මය දෙසනු මැනවැ"යි තෙරණුවෝ පැවසූහ. මෙය අසා දහම් දෙසීමට කැමති වූ තෙරවරු දෙනම එක් කෙනකු විසින් පෙළ ඉදිරිපත් කිරීමෙන්ද අනෙක් තෙරුන් විසින් අරුත් පැහැදිලි කිරීමෙන් ද ධර්මය දෙසූහ. එහෙත් දෙසුම අවසන්හි පුරුදු පරිද්දෙන් වන දෙවිවරුන්ගේ සාධුකාර හඬක් අසන්නට නොලැබිණ. එබැවින් ධර්මධර තෙරවරු මීට කරුණු විමසූහ. "වෙනදා නම් මගේ එකම දෙසුම අසා දෙවිවරු සාධුකාර දෙති. අද එසේ නොවන්නේ කුමක් නිසාදැයි නොදනිමි" යි තෙරණුවෝ පිළිතුරු දුන් හ.

මේ කථාවෙහි සත්‍යය විමසීමට සිතූ එම තෙරවරු "එසේ නම් ඔබ වහන්සේ ධර්මය දෙසනු මැනවැ"යි කීහ. එකුදාන තෙරණුවෝ විජිනිපත ද අතට රැගෙන දේවතාරාධනය ද කොට පුරුදු ගාථාව ම දේශනා කළ හ. පුදුමයකට මෙන් එවර දෙවිවරු එකවරම සාධුකාර දෙමින් තම සතුට පළ කළහ. ධර්මධර තෙරවරුන් සමඟ පැමිණි අනෙක් භික්ෂු පිරිස මෙය අසා "ධර්මධර තෙරවරුන් මනාව ධර්මය දෙසත්දීත් එයින් සතුටට නොපත් දෙවිවරු මෙහිමියන්ගේ එකම ගාථාව අසා සාධුකාර දුන්හ. දෙවියෝ ද පක්ෂග්‍රාහීව කටයුතු කරතැ"යි කුකුස් ඇති කර ගත්හ. උන්වහන්සේලා පෙරළා දෙව්රමට ගිය පසු සිද්ධිය භාග්‍යවතුන් වහන්සේට සැළකළහ. භාග්‍යවතුන් වහන්සේ කරුණු පැහැදිලි කරමින් "මහණෙනි, බොහෝ කොට ධර්මය උගත් තරමින් හෝ බොහෝ කොට ධර්මය දෙසූ තරමින් කෙනෙක් ධර්මධර නොවෙති. කෙනෙක් ධර්මය මඳක් වුවද ඉගෙන එය අනුව හැසිරෙමින් දහම දිවියෙහි දරන්නේ නම් එබඳු තැනැත්තා ධර්මය දරන්නෙකැයි මම කියමි"යි පවසමින් යථොක්ත ගාථා ධර්මය වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (259 ගාථාව)

**යාවතා බහු භාසති තාවතා ධම්මධරො න යො ච
අප්පං අපි සුත්වාන කායෙන ධම්මං පස්සති. යො ධම්මං
නප්පමජ්ජති සො ධම්මධරො හොති.**

යාවතා: යම්තාක්; **බහු**: බොහෝ කොට; **භාසති**: කියයි ද; **තාවතා**:එපමණකින්; **ධම්මධරො**: ධර්මය දරන්නෙක්; **න**: නොවේ; **යො ච**: යම් කෙනෙක් වනාහි; **අප්පං අපි**: මඳක් වුවත්; **සුත්වාන**: අසා; **කායෙන**: සිරුරෙන්; **ධම්මං**: ධර්මය; **පස්සති**: දකියි ද; **යො**: යමෙක්; **ධම්මං**: ධර්මයෙහි; **නප්පමජ්ජති**: නොපමා වේද; **සො**: හෙතෙම; **ධම්මධරො**: ධර්මය දරන්නෙක්; **හොති**: වෙයි.

යමෙක් බොහෝ කොට දෙසූ පමණින් ධර්මය දරන්නෙක් නොවේ. මඳක් වුවද අසා එය ජීවිතය තුළ දකින්නා ද ධර්මයෙහි නොපමාව හැසිරෙන්නා ද ධර්මධර නම් වෙති.

විවරණය

බහුභාසති: බොහෝ කොට කියයි යන අරුත්ය. කෙනකු ධර්මධරයකු වීමට අදාළ අවශ්‍යතා බුදුරජාණන් වහන්සේ මේ ගාථා ධර්මය තුළින් පැහැදිලි කර දෙන සේක. බොහෝ කොට ධර්මය වුවද කීම ධර්මධරයකු වීමේ ලක්ෂණයක් නො වේ. ධර්මය උගෙනීම එකකි. ධර්මය දෙසීම තව එකකි. බොහෝ කොට ඇසූ පිරූ තැන් ඇති පමණින් හෝ බොහෝ කොට අන් අයට ධර්මය දෙසූ පමණින් ධර්මධරයෙකු වීමට නොහැක. ධර්මධර යන්නෙහි නියම අර්ථය වන්නේ ධර්මයට අනුව හැසිරීමයි. ධර්මය ටිකක් අසා හෝ උගෙන වුවද ඊට අනුව ජීවත් වන්නාට ධර්මධරයෙක් විය හැකිය. මේ ගාථාවෙහි යෙදී ඇති ධම්මං කායෙන පස්සති යන ප්‍රකාශය ඉතා වැදගත් ය. ධර්මය තම හැසිරීම තුළින් දැකීම එහි අර්ථයයි. කෙනකුට කයින් (හැසිරීමෙන්) ධර්මය දැකිය හැක්කේ එය තම ජීවිතය හා සම්බන්ධ කොට ගෙන ඇත්නම් පමණි. බුදුරජාණන් වහන්සේ තම ධර්මය ලෝකයට දෙසන ලද්දේ එය අසා දැන ගැනීමට පමණක් නොවේ. ඊට අනුව ජීවත් වීමෙන්, ධර්මයට අනුව පිළි පැදීමෙන් ධර්මයෙන් ලබාගත හැකි උසස් ප්‍රතිඵල ලෝකයාට අත්පත් කර දීමේ අදහසිනි. එබැවින් "ධර්මය අසන්න, දරන්න, හැසිරෙන්න", යනුවෙන් පැවසෙයි. (සුණාථ, ධාරෙථ චරාථ ධම්මෙ)

හිස පැසුණු පමණින් තෙර ගණෙහි නො ගැනේ. ඒ වයස් මේරූ හිස් මහල්ලෙකි.

260. න තෙන ථෙරො හොති
යෙන'ස්ස පලිතං සිරො
පරිපක්කො වයො තස්ස
මොඝජිණ්ණො'ති වුච්චති (19:5)

හිස පැසුණු තරමින්
නොවේ මහතෙර කෙනකුන්
විය ඉක්මුණු බැවින්
හිස් මහල්ලෙක් කියත් සැබවින්

මහලු නැතද කෙසින් පැසුණු - හේ නියමින් කෙනෙකි තෙරණු

19 (4) ලකුණ්ටක භද්දිය රහතන් වහන්සේ පිළිබඳ කතාව (260 සහ 261 ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **ලකුණ්ටක භද්දිය තෙරණුවන්** අරභයා මේ ගාථා ද්වය දේශනා කළ සේක.

භද්දිය නම් වු මේ තෙරණුවන්ට ලකුණ්කට යනුවෙන් විශේෂණ පදයක් එක් වී ඇත්තේ උන්වහන්සේ සිරුරින් මිටි පුද්ගලයකු වූ බැවිනි. උන් වහන්සේ දෙස බලන කෙනකුට වැටහෙන්නේ කුඩා සාමණේර හිමි නමක් ලෙසය. දිනක් උන් වහන්සේ දෙව්රම් වෙහෙරට ගොස් බුදුන් දැක වැඳ පුදා ආපසු එන අතර මඟදී වෙනත් භික්ෂු පිරිසක් දෙව්රම් වෙහෙර දෙසට යනු දුටුහ. නමුත් ඒ භික්ෂු පිරිස ලකුණ්ටක භද්දිය තෙරුන් සමඟ සතුටු සාමීචියකුදු නැතිව යන්නට ගියහ.

භික්ෂූන් වහන්සේලා විහාරයට ගොස් බුදුන් වැඳ එකත් පසෙක සිටියහ. භික්ෂූන් වහන්සේලා රහත් වීමට තරම් උපධි සම්පත් ඇති පිරිසක් බව දුටු භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේලාගෙන් මෙසේ විමසූ සේක. "මහණෙනි, ඔබ එන අතර මගදී ඔබ පසු කර ගිය තෙර කෙනකුන් දුටුවාහු ද?" තෙර කෙනකුන් දුටු බවට මතකයක් නොතිබුණු එම භික්ෂූන් වහන්සේලා "ස්වාමීනි, තෙර කෙනකුන් නම් නොදුටුවෙමු, කුඩා සාමණේර නමක් අප පසු කොට යනු දුටුවෙමු" යි පිළිතුරු දුන්හ. "මහණෙනි, මම වයස් ගත වී මහලු වු පමණින් භික්ෂුවකට ස්ථවිර (තෙර) කෙනෙකැයි නොකියමි. නියම ස්ථවිර භික්ෂුව නම් සත්‍යය, ධර්මය, අහිංසාව, දැමුණු බව, නොකිළිටි බව ආදී උතුම් ගුණයෙන් යුක්ත පුද්ගලයා"යි ප්‍රකාශ කරමින් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා දෙකින් ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (260 ගාථාව)

යෙන අස්ස සිරො පලිතං තෙන ථෙරො න හොති. තස්ස වයො පරිපක්කො මොඝ ජිණ්ණො ඉති වුච්චති

යෙනඃ යම් හෙයකින්, **අස්ස**ඃ ඔහුගේ, **සිරො**ඃ හිස (කෙස්), **පලිතං**ඃ පැසුණේ ද, **තෙන**ඃ ඒ කරුණින්, **ථෙරො**ඃ තෙර කෙනෙක්, **න හොති**ඃ නොවේ, **තස්ස**ඃ ඔහු ගේ, **වයො**ඃ වයස, **පරිපක්කො**ඃ මුහුකුරා ගියේ ය, **මොඝ ජිණ්ණො ඉති**ඃ (ඔහුට) හිස් මහල්ලෙකැයි, **වුච්චති**ඃ කියනු ලැබේ.

හිස පැසුණු තරමින් යමෙක් තෙර කෙනෙක් නොවේ. ඔහුගේ වයස ගෙවී ඇත. එබැවින් ඔහුට දිරාපත් වු හිස් මහල්ලෙකැයි කියනු ලැබේ.

විවරණය

ථෙරොඃ භික්ෂුවක් සඳහා මේ නම භාවිත වන්නේ උපසපන් වීමේ සිට අවුරුදු දහයක් ගත වීමෙනි. ථෙර හෙවත් ස්ථවිර යන්න ශාසනික ව්‍යවහාරයෙහි භික්ෂූන් වහන්සේ කෙනකුට ලැබෙන පදවියක් ලෙස සැලකිය හැකිය. උත්තම වු උපසම්පදා ශීලයෙහි වසර දහයක් ගත කිරීම බෙහෙවින් වැදගත් සිද්ධියක් වෙයි. මෙය හුදෙක් වයස ගතවීම නිසාම උරුම වන්නක් නොවේ. චතුපාරිශුද්ධි ශීලයෙන් සමන්විත උපසම්පදා තත්වයෙහි අවංකව ශීලපාරිශුද්ධියෙන් යුතුව ජීවත්වීම කරණකොට ගෙන අයත් වන්නකි.

ථෙර යන්නෙහි අරුත් දෙකක් ඇත. වයස්ගත වූ පුද්ගලයා හැඳින්වීමට ද ථෙර යන්න භාවිත වෙයි. ස්ථිර වු තිරසාර වු පුද්ගලයා යන අර්ථයෙන් ද ථෙර නම් වෙයි. බුදු සමයෙහි ථෙර යන්න අර්ථවත් වන්නේ ස්ථිරසාර යන අර්ථයෙනි. උපසම්පත්තියෙහි ස්ථිරසාර වු ආගමික ප්‍රතිපදාවෙන් නොසැලෙන තත්වයට පත් වු යන අරුතින් භික්ෂූන් වහන්සේ 'ස්ථවිර' නම් වෙයි. උපසම්පත්තියෙහි සිට විසිවයස් ඉක්මවු භික්ෂූන් වහන්සේ මහාථෙර - මහා ස්ථවිර යන නමින් හැඳින්වීම ශාසනික ව්‍යවහාරයයි.

සච්චංඃ මෙහි දී චතුරාර්ය සත්‍යය මෙන්ම මුසාවෙන් වෙන්වු සත්‍ය වචනය ද අදහස් කෙරෙයි. චතුරාර්ය සත්‍යය පුද්ගලයකු තුළ පැවතීම යන්නෙන් අදහස් කෙරෙන්නේ එම සත්‍ය සතර පිළිබඳ මනා අවබෝධයක් පැවතීමයි. චතුරාර්ය සත්‍යය අවබෝධ නොකොට කෙනකුට විමුක්තියට පත් විය නොහැකිය.

වමාරා දැමූ මල (= කෙලෙස් කිලුටු) ඇති නැණවත් පැවිද්ද තෙර ගණයෙහි ගැනේ.

261. යම්හි සච්චඤ්ච ධම්මො ච
අහිංසා සඤ්ඤමො දමො
ස වෙ වන්තමලො ධීරො
ථෙරො ඉති පවුච්චති (19:6)

සබවස දහම හා හිංසක නැති බව ද
දමනය සංයමය කෙනකුට ඇති වේද
දිරිමත් වෙමින් කෙලෙසුන් හැමදුරලාද
හේ තෙර කෙනෙක් වේයයි කිව හැකි නේද

දිරියෙන් පිරුණෝ - තෙරවරු වන්නෝ

19 (4) ලකුණ්ටක භද්දිය රහතන් වහන්සේ පිළිබඳ කතාව (260 සහ 261 ගාථා)

විවරණාත්මක අනුවාදය (261 ගාථාව)

**යම්හි සච්චඤ්ච ධම්මො ච අහිංසා සඤ්ඤමො දමො
වන්තමලො සො ධීරො වෙ ථෙරො ඉති පවුච්චති**

යම්හි: යම් කෙනකු තුළ වනාහි; **සච්චඤ්ච**: සත්‍යය ද; **ධම්මො ච**: ධර්මය ද; **අහිංසා**: හිංසා නොකිරීම ද; **සඤ්ඤමො**: සංයමය ද; **දමො**: දමනය ද (වේද); **වන්තමලො**: කෙලෙස් කිළිටි ඉවත් කළ; **ධීරො**: ධෛර්යමත් වූ; **සො**: හෙතෙම; **වෙ**: ඒකාන්තයෙන්; **ථෙරො ඉති**: ස්ථවිර කෙනකැයි; **පවුච්චති**: කියනු ලැබේ.

යම් කෙනකු තුළ සත්‍යය, ධර්මය, අහිංසාව, සංයමය සහ ඉන්ද්‍රිය දමනය වේද, ඉවත් කළ කෙලෙස් මල ඇති ධෛර්යවන්ත වූ හෙතෙම නියම ස්ථවිර කෙනෙකැයි කියනු ලැබේ.

විවරණය

ධම්මො: නවලොකෝත්තර ශ්‍රී සද්ධර්මයයි. බුදුන් වහන්සේ විසින් ඉදිරිපත් කරන ලද පර්යාප්ති ධර්මය ප්‍රතිපත්ති ධර්මයක් ලෙස ප්‍රගුණ කිරීමෙන් අත්පත් කරගත හැකි ප්‍රතිවේද ධර්මය නවවිධ කොට දැක්වෙයි. ඒවා මෙසේ ය.

1. සොතාපත්ති මග්ග 2. සොතාපත්ති ඵල 3. සකදාගාමි මග්ග
4. සකදාගාමි ඵල 5. අනාගාමි මග්ග 6. අනාගාමි ඵල
7. අරහත්ත මග්ග 8. අරහත්ත ඵල 9. නිබ්බාන

පර්යාප්ති ධර්මය අනුගමනය කිරීමේ අභිලාෂය වන්නේ විමුක්ති හෙවත් නිර්වාණය සාක්ෂාත් කර ගැනීමයි. සංසාරය දුකක් ලෙස සැලකෙන බැවින් එයින් නිදහස් වීමෙන් ලබන විමුක්තිය පරම සැපත ලෙස හැඳින්වී ඇත. විමුක්තිය ලබා ගත හැක්කේ චතුරාර්ය සත්‍යාවබෝධයෙනි. එහි ලා ඉදිරිපත් වන මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය නමින් සැලකෙයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය උපරිම තත්වයකින් ප්‍රගුණ කරන තැනැත්තාට අත් කර ගත හැකි උත්තම ප්‍රතිඵල නවලෝකොත්තර ධර්මයෙන් දැක් වෙයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනයෙන් නිවන් දැකීමේ මුල් පියවරට එළඹෙන්නා හැඳින්වෙන්නේ සොතාපන්න නමිනි. නිවණ කරා යන ප්‍රවාහයට එළඹෙන්නා යන අරුත සොතාපත්ති යන්නෙහි ඇත. සොතාපන්න පුද්ගලයා තවදුරටත් පෘථග්ජනයෙක් නොවේ. හෙතෙම ආර්ය පුද්ගලයෙකි. සෝවාන් මාර්ගය හා ඵලය අත්පත් වන්නේ සංයෝජන ධර්ම තුනක් ප්‍රහාණය කිරීමෙනි. සංසාරයට බැඳ යන අර්ථය සංයෝජන යන වචනයෙහි ඇත. සෝවාන් පුද්ගලයා බැඳුම් තුනකින් මිදෙයි. ඒවා සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන නම් වලින් හැඳින්වී ඇත.

1.) **සක්කාය දිට්ඨි**: මෙම සංයෝජනයෙන් අර්ථවත් වන්නේ ආත්ම දෘෂ්ටියයි. සත්+කාය+දිට්ඨි යන වචන තුන එක්වීමෙන් සක්කාය දිට්ඨි යන පදය සෑදෙයි. සත් යනු ස්ථාවර පැවැත්මයි. හෙවත් ආත්මයයි. කාය යනු ශරීරය හෙවත් පඤ්චස්කන්ධයයි. දිට්ඨි යනු විශ්වාසයයි. පඤ්චස්කන්ධයෙන් ආත්ම නමින් වූ ස්ථාවර පැවැත්මක් පවතී යන විශ්වාසය සක්කාය දිට්ඨි නම් වෙයි. බුදු දහමට අනුව පුද්ගලයා විෂයෙහි ස්ථාවර පැවැත්මක් නැත. නිබඳව වෙනස් වන ස්කන්ධ පංචකයක් හිමිකර ගෙන ඇති පුද්ගලයා තුළ සදාතනිකව පවතින ආත්ම පදාර්ථයක් නැත. අවිද්‍යාව නිසා පුද්ගලයා තමා සම්බන්ධයෙන් ගොඩ නඟා ගෙන ඇති ආත්මීයත්වය පිළිබඳ වැරදි මතය එනම් සක්කාය දිට්ඨිය සෝවාන් මාර්ගඵලයන්ට පත් වීමත් සමඟ දුරු වෙයි.

2.) **විචිකිච්ඡා**: කරුණු අටක් පිළිබඳ සැකය විචිකිච්ඡා නමින් ගැනෙයි.

1. **බුදුන්වහන්සේ පිළිබඳ සැකය**. සව් කෙලෙසුන් නැසූ සම්මා සම්බුදු කෙනකු පහළ වේද? උන්වහන්සේට සර්වඥතාඥානයක් තිබේ ද වැනි කරුණු පිළිබඳව සැක කිරීමයි.
2. **ධර්මය පිළිබඳ සැකය**, නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය හා එහි සත්‍යතාව පිළිබඳ සැකයයි.
3. **සංඝයා පිළිබඳ සැකය**, අෂ්ටාර්ය පුද්ගල සංඝයා සිටී ද යන සැකයයි.
4. **ශික්ෂාවන් පිළිබඳ සැකය**, ලෝකවද්‍ය හා ප්‍රඥප්තිවද්‍ය වලින් මිදීම සඳහා පණවා ඇති ශික්ෂාපදයන් හි ශක්‍යතාව පිළිබඳ සැකයයි.
5. **අතීත පැවැත්ම පිළිබඳ සැකය**, පූර්වභවයන්ට සම්බන්ධව සත්වයකු පැවතියේ දැයි සැක කිරීමයි.
6. **අනාගත භවය පිළිබඳ සැකය**, මිය යාමෙන් පසු සත්වයාට පුනර්භවයක් පවතීද යන සැකයයි.
7. **පූර්ව සහ පුනර්යත භව** දෙකම සම්බන්ධ සැකය
8. **ප්‍රතීත්‍ය සමුත්පාදය පිළිබඳ සැකය**, වස්තූන්ගේ පැවැත්ම හේතුඵල සම්බන්ධයෙන් ප්‍රතීත්‍ය සමුත්පන්නව සිදුවේ ද යන සැකයයි.

3.) **සීලබ්බත පරාමාස**: ශීලව්‍රත දැඩි සේ ග්‍රහණය කිරීමයි. ශීලව්‍රත චාරිත්‍රාදිය නිෂ්ටාව වශයෙන් සලකා ගෙන ඒවායෙහිම එල්බ සිටීම සීලබ්බතපරාමාස නම්.

සෝවාන් පුද්ගලයකු උපරිම වශයෙන් මෙලොව උපදින්නේ සත්වරක් පමණකැයි කියනු ලැබේ. ඒ උපත් සත තුළදී ඉතිරි සංයෝජන ධර්ම සත දුරුකිරීමෙන් නිවන් අත්පත් කර ගැනීමට ඔහුට හැකි වෙයි. සෝවාන් බවට පත් පූද්ගලයා කෙරෙහි බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය සම්බන්ධයෙන් පවත්නේ අචල ප්‍රසාදයකි. ඔහු ගේ ශ්‍රද්ධාව කිසි විටෙක කඩ නොවේ. කිසිදු හේතුවක් නිසා ඔහු අතින් පන්සිල් බිඳෙන්නේ නැත. මරණින් මතු දුගතියක ඉපදීමක් ද ඔහුට නැත. සෝවාන් වීමෙන් අනතුරුව නිර්වාණ මාර්ගයෙන් අනලස්ව ක්‍රියා කිරීමෙන් දෙවැනි ආර්ය තත්වය වන සකෘදාගාමී තත්වයට පත් වෙයි. සකෘදාගාමී තත්වයට පත් වීමෙන් කාමරාග, පටිඝ යන සංයෝජන දෙකෙහි බලය දුර්වල කරනු ලබයි. මෙහිදී මෙම සංයෝජන සම්පූර්ණයෙන් විනාශ කරනු නොලැබුව ද එහි ශක්තිය තුනී කරනු ලැබේ. කාමරාග යන පංචකාම විෂය වස්තූන් කෙරෙහි ඇති වන ආශාවයි. පටිඝ යනු ද්වේෂයයි. සකෘදාගාමි පුද්ගලයාට ප්‍රතිභව වශයෙන් උපත ලැබෙන්නේ එක් වරක් පමණකි. ඒ උපතේ දී හෙතෙම ඉතිරි සංයෝජනයන් ද දුරු කොට නිවණ සාක්ෂාත් කර ගනියි. තුන් වැනි ආර්ය තත්වය අනාගාමි මාර්ගඵල වලින් නියෝජනය වෙයි. අනාගාමි පුද්ගලයා සකෘදාගාමි තත්වයේ දී දුර්වල කරනු ලැබූ සංයෝජන දෙක සම්පූර්ණයෙන්ම විනාශ කරයි. මෙම පුද්ගලයා කාමරාගය සම්පූර්ණයෙන් දුරු කොට ඇති බැවින් මරණින් මතු හෙතෙම කාමභාවයක නූපදියි. ඔහු මරණින් මතු දෙවන භවය ලබන්නේ ශුද්ධාවාස බ්‍රහ්මලෝකයකය. එහිදී හෙතෙම ඉතිරි සංයෝජන පස සම්පූර්ණයෙන් මුලිනුදුරා රහත් භාවයට පත්ව පිරිනිවන් පායි. මේ නිසා නැවත මෙලොව උපත සඳහා පැමිණීමක් නැත යන අරුතින් අනාගාමි නම් වෙයි.

සිව්වැනි වු අරහත් මාර්ගඵලය අත්පත් කර ගන්නා පුද්ගලයා රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන සංයෝජන පසම සම්පූර්ණයෙන් දුරු කරයි. දශ සංයෝජන සියල්ල සමූලඝාතනය කොට ඇති බැවින් අරහත් වූ පුද්ගලයාට යළි සසර සැරිසැරීමක් නැත.රූප රාග යනු රූප භවයන් කෙරෙහි දක්වන ආශාවයි. අරූප රාග යනු අරූපභවයන්ට දක්වන ආශාවයි. මාන යන්නෙන් අදහස් වන්නේ ආත්ම මානයයි. අභිමානය යනුවෙන් ද මෙය හැඳින්විය හැකිය. උද්ධච්ච යනු මානසික නොසන්සුන්තාවයයි. අවිජ්ජා යනු චතුරාර්ය සත්‍යය පිළිබඳව ඇති නොදැනීම හෙවත් මුලාවයි. මේ සියලු ක්ලෙශ ධර්ම රහතන් වහන්සේගේ මනසින් මුළුමනින්ම ඉවත් වී ඇති බැවින් උන්වහන්සේ කියන, කරන ක්‍රියාතුළින් කර්ම බිහි නොවෙයි. පුනර්භව ඇති කරන තෘෂ්ණාව හා ප්‍රතිසන්ධි චිත්තයට සාධක වන කර්ම ශක්තිය විනාශ කිරීම නිසා රහතන් වහන්සේට පුනර්භවයක් අත්වන්නේ නැත. උන්වහන්සේ සදහටම භවය විනාශ කළ පුද්ගලයා වෙයි.



මිහිරි වචන කී පමණකින් හෝ මනා රූ සටහන් ඇති පමණකින් මිනිසා යහපත් නො වේ.

262. න වාක්කරණ මත්තෙන
වණ්ණපොක්ඛරතාය වා
සාධුරූපො නරො හොති
ඉස්සුකී මච්ඡරී සඨො (19:7)

ඇතත් මිහිරි බව කෙනකුගෙ කතාවෙන්
පැහැපත් වෙනත් රූ සිරි ලතාවෙන්
මසුරු ඉසි කපටිකම් ඇති නිසාවෙන්
රූමත් නොවේ තොරනම් ගුණ වගාවෙන්

ඉරිසියාව ඇතොත් සිතේ - ගතේ රුවින් වැඩක් නැතේ

19 (5) බොහෝ භික්ෂූන් වහන්සේලා පිළිබඳ කතාව (262-263 ගාථා)

දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **භික්ෂූන් වහන්සේ කිහිප නමක්** අරභයා මේ ගාථා ද්වය වදාළ සේක.

ආචාර්ය උපාධ්‍යාය භික්ෂූන් වහන්සේට වත් පිළිවෙතින් උපස්ථාන කිරීම ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ යුතුකමක් ලෙස ශාසන සම්ප්‍රදායෙහිදී පිළිගැනෙයි. මෙසේ ධර්‍ම විනයධර ආචාර්‍ය උපාධ්‍යාය වරුන්ට සිවුරු පඬු පෙවීම්, නහනා මුවදෝනා ජලය තැබීම, ඇප උපස්ථාන කිරීම් වැනි වත් පිළිවෙත් සපුරන ශිෂ්‍ය පිරිස් දැක එක්තරා භික්ෂු පිරිසක් මෙසේ සිතූහ.

"අපි ද පෙළ දහම උගත් අය වෙමු. විස්තරාර්ථ අපි නොදන්නා නමුදු පෙළදහම දනිමු. සාමණේර භික්ෂූන් වහන්සේලා අප කරා අවුත් අපෙන් පෙළ දහම ඉගෙන ගන්නේ නම් ඔවුන්ගෙන් ඇප උපස්ථාන අපට ද ලබා ගත හැක. එසේ වූ විට අපව ද ප්‍රසිද්ධ වී අපට ලාභ සත්කාරාදිය ද වැඩි වනු ඇත." මෙසේ අනුන්ට ලැබෙන ලාභයෙහි ඊර්ෂ්‍යාවෙන් හා තමන්ට ද ලාභ ලැබීමේ ගිජු බවින් පෙළුණු මේ භික්ෂූහු බුදුරජාණන් වහන්සේ කරා ගොස් "ස්වාමීනි, අපිට ද පෙළ දහම මනාව කියන්න හැකි වෙමු, ග්‍රන්ථධූර වඩන භික්ෂූන් වහන්සේලාට අපගෙන් පෙළ දහම උගන්නා ලෙස නියෝග කර වදාළ මැනවැ" යි කීහ.

බුදුරජාණන් වහන්සේ භික්ෂු පිරිසේ අදහස් මනාව තේරුම් ගෙන ඔවුන් අමතා "මහණෙනි, ඊර්ෂ්‍යා, වංචා, ප්‍රයෝග කම් සිතේ ඇති විට කෙනකු ගේ දක්ෂ කතාවෙන් හෝ ශරීර වර්ණයෙන් හෝ ඔහුගේ මනා රුවැති බවක් ඇති නොවෙයි. ආචාර්‍ය උපාධ්‍යාය කම්වලට සුදුස්සෝ නම් සිතින් ගුණවත් වූ යහපත් පුද්ගලයෝ"ය වදාරමින් ඉහත සඳහන් ගාථා දෙකින් ධර්‍ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (262 ගාථාව)

වාක්කරණමත්තෙන වණ්ණපොක්ඛරතාය වා ඉස්සුකී
මච්ඡරී සඨො නරො සාධුරූපො න හොති

වාක්කරණමත්තෙන: ලක්ෂණ වචන ඇති පමණින්; **වණ්ණපොක්ඛරතාය**: ශරීර වර්ණය යහපත් බැවින්; **වා**: හෝ; **ඉස්සුකී**: ඊර්ෂ්‍යා කරන සුලු වූ; **මච්ඡරී**: මසුරුකම් ඇති; **සඨො**: කපටිගති ඇති; **නරො**: මිනිසා; **සාධුරූපො**: මනා ගති ඇත්තෙක්; (යහපත් පුද්ගලයෙක්); **න හොති**: නොවේ.

මනාව කථා කළ පමණින් වත් ශරීර ශෝභාවෙන් යුතු පමණින් වත් ඊර්ෂ්‍යා සහගත වූ, මසුරු කම් ඇති, කපටි පුද්ගලයා, මනා ගති ඇති මිනිසෙක් නම් නොවේ.

වාක්කරණ: මෙය සාමාන්‍යයෙන් කථාව්‍යවහාරය යන අර්ථයෙහි යෙදෙතත් මෙහිදී භාවිත වී ඇත්තේ මිහිරි තෙපුල් ඇති යන අදහස දීමටය. මනා මිහිරි තෙපුල් ඇති තැනැත්තකු හැඳින්වීම සඳහා කල්‍යාණවාක්කරණො යන පදය පාලි සාහිත්‍යයෙහි යෙදෙයි. වණ්ණපොක්ඛරතා : ඡවිවර්ණයේ පැහැපත් බව මෙයින් අදහස් වෙයි. කෙනකු ගේ රූප සෞන්දර්ය මැනීමේ දී වණ්ණපොක්ඛරතාව ද එක් ගුණයක් කොට සැලකෙයි. පංච කල්‍යාණයට ඡවි කල්‍යාණය ද ඇතුළත් ය. බුදුරජාණන් වහන්සේගේ රූපකාය විවරණය වන තැන්වලදී 'පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො' උතුම් වර්ණ සෞන්දර්යෙන් යුක්ත වූයේ යන විශේෂණය දක්වා ඇත.

වමාරා දැමූ (නසන ලද) දොස් ඇති නුවණැති ඒ තැනැත්තා ම යහපත් ගති ඇත්තෙකි.

263. යස්ස චෙතං සමුච්ඡින්නං
මූලඝච්චං සමූහතං
ස වන්තදොසො මෙධාවී
සාධුරූපො'ති වුච්චති. (19:8)

සියලු පව්වුකම් දුරලූ
මුලින් උදුරමින් වැනසූ
දොසින් මිඳුනු නුවණැත්තේ
වේය මනා රුව ඇත්තේ

යහගුණයෙන්මයි - හැඩ වැඩ වෙන්නේ

19 (5) බොහෝ භික්ෂූන් වහන්සේලා පිළිබඳ කතාව (262-263 ගාථා)

විවරණාත්මක අනුවාදය (263 ගාථාව)

යස්ස එතං සමුච්ඡින්නං ච මූලඝච්චං සමූහතං ස
වන්තදොසො මෙධාවී සාධුරූපො ඉති වුච්චති

යස්ස: යම් තැනැත්තකු ගේ; **එතං**: මේ පව්ටු කම්; **සමුච්ඡින්නං**: මුලින් සිඳින ලද්දේ; **ච**: (වේ) ද; **මූලඝච්චං**: මුලින් උදුරන ලද්දේ ද; **සමූහතං**: සහමුලින් වනසන ලද්දේ ද; **ස**: ඒ; **වන්තදොසො**: දුරලන ලද දොස් ඇති; **මෙධාවී**: නුවණැති පුද්ගලයා; **සාධුරූපො ඉති**: යහපත් රුවැත්තෙක් යයි; **වුච්චති**: කියනු ලැබේ.

යම් තැනැත්තෙක් මේ ඊර්ෂ්‍යාදි පව්ටු කම් මනාකොට සිඳින ලද ද මුලින් උදුරන ලද්දේ ද සහමුලින් වනසන ලද්දේ ද ඒ දුරලන ලද දොස් ඇති නුවණැති පුද්ගලයා හොඳ ගති ඇත්තෙක් වෙයි.

විවරණය

සාධුරූපො: යහපත් රූපය ඇත්තා යන අර්ථය දීමට යෙදී ඇත. බුදු දහමෙහි දී රූපය මැනෙන්නේ කෙනකුගේ බාහිර සොඳුරු බව පදනම් කොට ගෙන නොවේ. මෙම ගාථාවට අනුව මිහිරි තෙපුල් ඇති බැවින් හෝ ඡවිවර්ණය පැහැපත් වූ තරමින් යහරුව ඇත්තෙකැයි පිළි නොග ැනෙයි. ඊර්ෂ්‍යා, මසුරු හා කපටි කම් නැතිව එබඳු පව්ටුකම් සිතින් සහමුලින්ම උදුරා දැමූ කෙලෙස් කිලිටි නැති පුද්ගලයාම යහපත් පුද්ගලයකු වශයෙන් සැලකෙයි. පුද්ගලයකු බාහිර රූපයෙන් අවලස්සන වුවත් අභ්‍යන්තරයෙන් පිරිසිදු නම් ඔහුට වැඩි යහපත් පුද්ගලයෙක් වෙනත් නැත.

ඇතුළත කිලිටි තිබියදීම බාහිර රූපය ලස්සන කර ගත්ත ද ඔහු ගේ ක්‍රියාකාරකම් වලදී සමාජයට එම අවලස්සන මතු වී දැක්වෙයි. එබැවින් බුදුරජාණන් වහන්සේ නිබඳවම තම අනුශාසනවන් යොමු කොට ඇත්තේ සියලු ආකාර කෙලෙස් මුල් සිතින් මුලිනුදුරා දමා අභ්‍යන්තර පාරිශුද්ධිය ලබා ගන්නා ලෙසය. සියලු කෙලෙස් මුල් සිතින් මුලිනුදුරා දැමෙන්නේ රහත් භාවය ලබා ගැනීමෙනි. බුද්ධ ධර්මයෙහි අවසාන නිෂ්ටාව ලෙස දැක්වෙන්නේ කෙලෙස් සහමුලින් විනාශ කොට රහත් බවින් සාක්ෂාත් කර ගන්නා නිර්වාණයයි. සාධුරූපත්වයට හෙවත් යහපත් භාවයට පැමිණෙන්නේ එබඳු රහතන් වහන්සේ ය.

ඉස්සුකී: අනුනට ඊර්ෂ්‍යා කරන තැනැත්තා යන අරුත්ය. අනුන්ගේ සම්පත් නුහුලන ස්වභාවය ඊර්ෂ්‍යාව නමින් හැඳින්වෙයි. මෙය සමාජයෙහි නිතර දක්නට ලැබෙන දුර්ගුණයකි. තමාට සැප සම්පත් නැතත් අනුන්ගේ සම්පත් කෙරෙහි සතුටු සිතින් බැලීමට කෙනකුට හැකි විය යුතුය. ඊර්ෂ්‍යා කිරීමෙන් තමා ද්වේෂයෙන් දැවෙන්නකු බවට පත් වෙයි. ඒ නිසා තව තවත් තමා සැප සම්පත් වලින් පිරිහෙයි. බෞද්ධ ප්‍රතිපත්තිය වන්නේ අනුන්ගේ සැපට ඊර්ෂ්‍යා කරමින් අකුල් හෙලීම නොව අනුනට සැප සම්පත් අත් වේවායි පැතීමය. "**සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා**"- සියලු සත්වයෝ සැපවත් වෙත්වායි මෛත්‍රී සහගත සිත වර්ධනය කිරීමේ වැදගත් කම බුදුදහමින් අවධාරණය කොට දක්වා ඇත. අනුන්ගේ සැපත පතන්නා අන් හැම දෙනාට ප්‍රිය වන අතර අනුන්ගේ සැපතට ඊර්ෂ්‍යා කරන්නා හැම දෙනාගේම පිළිකුලට හා අප්‍රසාදයට භාජනය වෙයි.

මච්ඡරී: මසුරු බව හෙවත් අධික ලෝභය ඇති තැනැත්තායි. මසුරු බවෙහි විශේෂත්වය වන්නේ තමන් රැස්කරගත් සැප සම්පත් කෙරෙහි අධික ආශාවෙන් ඒවා තමන්ගේ හෝ අනුන්ගේ පරිභෝගයට නොයොදා රැක ගැනීමයි. විෂය වස්තු කෙරෙහි දක්වන ආශාවට වඩා සැප සම්පත් කෙරෙහි ආශාවෙන් ඒවා එක් රැස් කර ගැනීමත් ඒවා කිසිවකුගේ පරිභෝගයට නොයොදවා ආරක්ෂා කර ගැනීමත් මසුරු කමේ විශේෂ ලක්ෂණයයි. කෙනකු ධනය උපයන්නේ අඩුම මට්ටමින් තමන්ගේ හා තම දූ දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ය. ඒවායින් එසේ ප්‍රයෝජනයක් නොගෙන රැස්කර තබා ඒවා දෙස බල බලා සිටීමෙන් කිසිදු පලක් නැත. බුදුසමයෙහි සම්පත් පරිභෝජනය පිළිබඳව දක්වන ආකල්පය ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි භොග සුඛ යටතේ විවරණය වෙයි. ධාර්මික ලෙස උපයා ගන්නා ධනය තමාගේත් තම අඹුදරුවන්ගේත් ප්‍රයෝජනයට පමණක් ගැනීම බුදු දහමින් අනුමත නොවෙයි. ධනය ප්‍රමාණවත්ව ඇති පුද්ගලයා එම ධනයෙන් ඥාති හිත මිත්‍රාදින්ට, ශ්‍රමණ බ්‍රාහ්මණාදින්ට හා දුගී මගී යාචකාදීන්ට ද සංග්‍රහ කළ යුතුය. එසේ ඇති විට පමණක් රැස් කළ ධනයෙන් නියම ප්‍රයෝජනය ගත්තා වෙයි.

සඨො: කපටිකම් ඇති පුද්ගලයා යි. කපටි කම අනුන්ගේ අලාභය හෝ විපත සඳහා හේතු වන්නකි. සටකපට වංචා ප්‍රයෝග යෙදීමෙන් අනුන් රවටා ආත්මලාභය සලසා ගැනීම කපටියාගේ ලක්ෂණයයි. කපටිකම නිතරම අනුනට අයහපත සඳහා යොමුවන බැවින් එය දුර්ගුණයක් ලෙස බුදු දහමින් දැක්වෙයි. බෞද්ධයකුගේ ජීවන මාර්ගයට කපටි කම ප්‍රතිපක්ෂය. ධාර්මික ලෙස ජීවනෝපාය සලසා ගැනීම බෞද්ධ ජීවන ප්‍රතිපදාවේ ලක්ෂණයයි.

නිර්වාණගාමී වූ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා ආජීවය යටතේ බෞද්ධ ජීවනෝපාය ක්‍රමය විවරණය වී ඇත. කපටි කමින් අනුන් රවටා ආත්ම ලාභය සාදා ගන්නා විවිධ ක්‍රම එහිදී ප්‍රතික්ෂේප වෙයි. වානිජ කටයුතු වලදී බොහෝ කොට වංචක ක්‍රම දක්නට ලැබෙයි. භාණ්ඩ කිරීමේ දී, මැනීමේ දී අනුන් රවටා තමන්ට වාසිදායක වන ලෙස කටයුතු කිරීම පහත් ජීවන ක්‍රමයක් ලෙස බුදු දහම සලකයි. තුලාකූට, මානකූට, කංසකූට ආදි වශයෙන් වාණිජ කටයුතු වලදී සිදුවන අසාධාරණ වු වංචනික ක්‍රියාවලින් වැලකී තමාට ද පාරිභෝගිකයාට ද පාඩුවක් නොවන අයුරින් කටයුතු කිරීම ජීවන පාරිශුද්ධියට හේතු වෙයි.

වන්තදොසො: ඉවත් කළ, දුරුකළ දොස් ඇති පුද්ගලයායි. දොස යන පදයෙන් ද්වේෂය යන අරුත මෙන්ම වරද හෙවත් දෝසය යන අරුත ද දෙයි. මෙහිදී මේ අර්ථ දෙකම වුවද අයෝග්‍ය නොවේ. සියලු වැරදි, කිළිටි, පව්ටුකම් දුරු කළ පුද්ගලයා '**වන්තදොස**' යනුවෙන් හැඳින්වෙයි. උපරිම අර්ථයෙන් ගත් විට 'වන්තදොස' යන්නෙන් අදහස් වන්නේ රහතන් වහන්සේය.



බොරු කියන ආසාවෙන් හා ලෝබයෙන් යුත් තැනැත්තා මහණ දහමට නො සුදුස්සෙකි.

264. න මුණ්ඩකෙන සමණො
අබ්බතො අලිකං භණං
ඉච්ඡාලොභසමාපන්නො
සමණො කිං භවිස්සති (19:9)

මහණෙක් නොවේ ඇතිවිට මුඩු කෙරුණු හිසක්
බෙණෙමින් බොරුම නොමැතිව කිසියම්ම වතක්
ආසාවෙන් ලොබින් ඇත්නම් පිරුණු හදක්
ඔහුහට කෙලෙස දිය හැකිවෙද 'මහණ' නමක්

ඇතිවිට මුඩුවූ හිසක් - නොම වේ මහණ කෙනෙක්
19 (6) හත්ථක තෙරුණුවන් පිළිබඳ කතා පුවත (ගාථා අංක 264-265)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **හත්ථක** නම් වූ භික්ෂුවක් අරභයා මෙම ගාථාද්වය වදාළ සේක.

හත්ථක තෙරුන් වහන්සේ අන්‍ය ශ්‍රමණ බ්‍රාහ්මණයන් සමග වාද විවාදාදියෙහි තමන් සමර්ථයෙකැයි කියා ගනිමින් අනුන් රැවටීමෙහි යෙදෙන්නෙකි. තමන්ට වාද විවාදයෙහි දක්ෂකමක් නැතිව තිබිය දී ද, අනෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන් සමග වාදයට ගිවිස ගෙන තැනක් හා වේලාවක් නියම කර ගෙන නියමිත වේලාවට බොහෝ කලින් විවාද ස්ථානයට යාම මේ තෙරුන්ගේ සිරිත විය. එසේ ගොස් විවාදය නැරඹීමට පැමිණ සිටින පිරිසට මෙසේ කියති. "පෙනේ ද? විවාදයට කැමති වූ අන්‍ය තීර්ථකයන් තවමත් මෙතැනට පැමිණ නැත්තේ මා සමග වාද කිරීමට ඇති බිය නිසාය. ඔවුන් මා සමග විවාදයට ආවා නම් මගෙන් පරාද වී ලජ්ජාවට පත් වනු නියති. මෙතැනට ඔවුන් නො පැමිණීම නිසාම දැනටමත් පරාජය භාර ගෙන ඇතැ"යි මෙසේ පවසා හත්ථක තෙරුණුවෝ එතැනින් පලා යති. නියමිත වේලාවට පැමිණෙන අන්‍ය ශ්‍රමණ බ්‍රාහ්මණයෝ හත්ථක තෙරුන් පැමිණෙන තෙක් බලා සිට නො එන බැවින් ඒ තෙරුනට දොස් පවරමින් ආපසු යති.

හත්ථක තෙරුන්ගේ මේ පැවැත්ම බුදුරජාණන් වහන්සේට දැන ගන්නට ලැබිණ. උන්වහන්සේ හත්ථක තෙරුන් කැඳවා, කාරණයෙහි සත්‍යතාව විමසූ සේක. හත්ථක තෙරුණුවෝ තමා එසේ කරන බව පිළිගත්හ. එවිට බුදුරජාණන් වහන්සේ "හත්ථක, නියම ශ්‍රමණයෝ බොරුවෙන් මෙසේ අනුන් මුළා නොකරති. හිස මුඩු වූ පමණින් කිසිවෙක් ශ්‍රමණයෙක් නොවේ. පිළිපදින කිසි වත් පිළිවෙතක් නොමැතිව ආශා ලෝභ කම්වලට ගැතිව, බොරු කියමින් ඇවිදින්නා, නියම ශ්‍රමණයෙක් නොවේ" යයි පවසමින් හත්ථක තෙරුන්ට යථොක්ත ගාථා ද්වයෙන් ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (264 ගාථාව)

මුණ්ඩකෙන සමණො න අබ්බතො අලිකං භණං
ඉච්ඡාලොභසමාපන්නො කිං සමණො භවිස්සති.

අබ්බතො: වත් පිළිවෙතක් නැති; **අලිකං භණං**: බොරු කියන්නා වූ(පුද්ගලයා); **මුණ්ඩකෙන**: හිස මුඩු පමණින්; **සමණො**: ශ්‍රමණයෙක්; **න**: නොවේ; **ඉච්ඡාලොභසමාපන්නො**: ආශාවෙන් හා ලෝභයෙන් යුක්ත වූ තැනැත්තා; **කිං සමණො භවිස්සති**: කෙසේ ශ්‍රමණයෙක් වන්නේ ද?

වත් පිළිවෙත් නොරකින, බොරු කියන, පුද්ගල තෙමේ හිස මුඩු කළ පමණින් ශ්‍රමණයෙක් නොවේ. ආශාවෙන් හා ලෝභයෙන් යුක්ත වූයේ කෙසේ නම් ශ්‍රමණයෙක් වන්නේ ද?

විවරණය

සමණො: පාප සමනය කිරීමේ අරමුණින් වත් පිළිවෙත්වල යෙදෙන පැවිදි කෙනකු හැඳින්වීම සඳහා යෙදෙන නමකි. බුදුරජාණන් වහන්සේ පහළ වූ අවදියෙහි භාරතයෙහි ශ්‍රමණ පිරිස් බහුලව ජීවත් වූහ. භාරතීය අතීත ආගමික ඉතිහාසයෙහි ආගමික අංශයෙහි ක්‍රියාත්මක වූ ප්‍රධාන සම්ප්‍රදාය දෙකක් ශ්‍රමණ හා බ්‍රහ්මණ යන නම් වලින් නියෝජනය වෙයි. වෛදික ආගමික කටයුතු භාරව කටයුතු කළ පූජක කොට්ඨාශය බ්‍රහ්මණ නමින් හැඳින්විණ. ශ්‍රමණයන් හා බ්‍රහ්මණයන් අතර කැපී පෙනෙන විශේෂතා පැවතිණ. බ්‍රාහ්මණයන්ගේ ප්‍රධාන ආගමික ක්‍රියා මාර්ගය වූයේ අනුගාමිකයන්ගේ ආගමික අවශ්‍යතා සම්පූර්ණ කිරීමයි.

ශ්‍රමණ සම්ප්‍රදාය මීට වඩා මුළුමනින් වෙනස් වූ පිරිසකගෙන් යුක්ත විය. ඔවුහු ලෞකික ආශාවන් පිළිබඳ අපේක්ෂා වලින් සම්පූර්ණයෙන්ම බැහැර වූ පිරිසක් වූහ. ඔවුන්ගේ එකම අපේක්ෂාව වූයේ ලෞකිකත්වය ඉක්මවා ලබාගත හැකියයි විශ්වාස කරනු ලැබූ ලෝකෝත්තර විමුක්තියයි. ගිහි ජීවිතයක් ගෙවමින් කාම සුඛයෙහි ඇලෙමින් මෙම විමුක්තිය ලබා ගත නොහැකියි ඇදහූ භාරතයේ ජන කොටස් ගිහිගෙය හැරපියා ශ්‍රමණ බවට පත් විය. ගෘහ ජීවිතය සම්බාධ කර බැවින් කාර්ය බහුල එම ජීවිතයෙන් මිදී විවේකී ජීවිතයක් ගෙවමින් ආත්ම විමුක්තිය සාධනය කර ගැනීම ඔවුන්ගේ අපේක්ෂාව විය. මේ නිසා ඔවුහු ගෘහ ජීවිතයේ සියලු බැමි මුදාහල පිරිසක් වූහ. තම ඇඳුම්, කෑම, බීම ආදිය සපයා ගන්නේ ද ගිහියන් විසින් ඔවුනට පුදන ලද දෙයිනි. ඔවුනට ස්ථාවර නිවාසස්ථාන නොවීය. ඔවුහු සංචාරක ජීවිතයක් ගත කළහ.

ගෘහ ජීවිතය අත්හළ මෙම ශ්‍රමණ පිරිස්වලට පොදු වූ ආගමික පිළිග ැනීමක් නොවීය. ඇතැම් විට මෙම ශ්‍රමණ පිරිස් විවිධ නම් වලින් ද හඳුන්වනු ලැබූහ. ආජීවක, අචේලක, පරිබ්බාජික, නිගණ්ඨ, ජටිල, ආදී විවිධ නම් වලින් හඳුන්වනු ලැබූ විවිධ ශ්‍රමණ පිරිස් බුද්ධකාලීන භාරතයෙහි බහුලව දක්නට ලැබිණ. බොහෝ ශ්‍රාවක පිරිස් සහිතව තමන්ට විශේෂිත වූ ආගමික දර්ශනයක් ඉදිරිපත් කළ ශ්‍රමණ ශාස්තෘවරුන් සය දෙනකු පිළිබඳව බෞද්ධ සාහිත්‍යයෙන් විස්තර සැපයෙයි. තම තමන්ට විශේෂිත වූ මෙම ශ්‍රමණ ශාස්තෘවරුන් සය දෙනාගෙන් ඇතැමුන්ට භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යනුවෙන් සතර වැදෑරුම් වූ ශ්‍රාවක පිරිස් ද විය. මහාවීර වර්ධමාන, ආජීවක, මක්ඛලි ගොසාල, පූරණ කස්සප, අජිත කෙසකම්බලි, පකුධකච්චායන, සංජය බෙල්ලට්ඨිපුත්ත යන නම් වලින් හඳුන්වනු ලැබූ ශ්‍රමණ ආචාර්‍ය වරු බුද්ධකාලීන යුගයෙහි විසූහ.

බෞද්ධ භික්ෂු සංස්ථාවද ශ්‍රමණ සම්ප්‍රදායට අයත් වූවකි. බුදුරජාණන් වහන්සේ වුවද අන්‍ය ආගමිකයන් විසින් හඳුන්වනු ලැබුවේ ශ්‍රමණ ගෞතම යන නමිනි. සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ ගිහිගෙය හැරපියා ශ්‍රමණයකු වශයෙන් පැවිද්දට පත් වූ කෙනෙකි. මේ නිසා උන්වහන්සේ ගේ ශ්‍රාවක සංඝයා ද ශ්‍රමණ නමින් ම හඳුන්වනු ලබති. බෞද්ධ ශ්‍රමණ පිරිස අනෙක් ශ්‍රමණ පිරිස් වලින් වෙන් කර හැඳින්වීම සඳහා ශ්‍රමණ ශාක්‍යපුත්‍රීය (සමනා සක්‍ය පුත්තියා) යන නම භාවිත කෙරිණි.

ශ්‍රමණ සම්ප්‍රදාය සමස්තයක් වශයෙන් ගත් විට බ්‍රාහ්මණ සම්ප්‍රදායේ ආගමික ව්‍යාපාරයට විරුද්ධ වූ ප්‍රතිචාරයක් වශයෙන් බිහි වුව ද ආධ්‍යාත්මික පාරිශුද්ධිය සඳහා වූ ප්‍රතිපත්තිවලින් ඉවත් වූ ශ්‍රමණයෝ ද බහුල වූහ. ශ්‍රමණ ජීවිතයට හා අපේක්ෂාවලට නොගැලපෙන විවිධ ජීවන වෘත්තීවලින් තම ජීවනෝපාය සලසා ගනිමින් ශ්‍රමණසාරුප්‍ය නොවූ ක්‍රියාකාරකම්වල යෙදුණු ශ්‍රමණයන් පිළිබඳව බෞද්ධ සූත්‍රධර්ම ආශ්‍රයෙන් දත හැකිය. දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රය බෞද්ධ ශ්‍රමණයන් කවර ආකාරයෙකින් තම අභිමතාර්ථ සාධනයෙහි නිරතවිය යුතු ද යන්න බුදුරජාණන් වහන්සේ විසින් පැහැදිලිව දේශනා කොට ඇත.



කුදු-මහත් අකුසලයන් සන්සිඳ වූ තැනැත්තා ම මහණ දහමට ඉතා සුදුසු ය.

265. යො ච සමෙති පාපානි
අණුං ථූලානි සබ්බසො
සමිතත්තා හි පාපානං
සමණොති පවුච්චති (19:10)

වෙනසක් ලොකු කුඩායයි නොම දක්වාම
හැම පව් දුරලයි ද සිත තුළ නොරදාම
මැඩලන බැවින් පවුකම් මුලිනුදුරා ම
මහණැයි කියත හැක ඔහු හට ඉඳුරාම

කුඩා මහත් පව් සමනය කරන්නා මහණකමට සුදුසුවෙයි

19 (6) හත්ථක තෙරණුවන් පිළිබඳ කතා පුවත (ගාථා අංක 264-265)

විවරණාත්මක අනුවාදය (265 ගාථාව)

යො ච අණුං ථූලානි පාපානි සබ්බසො සමෙති පාපානං සමිතත්තා හි සමණො ඉති පවුච්චති

යො ච: යමෙක් වනාහි; **අණුං**: කුඩා වූ ද; **ථූලානි**: මහත් වූ ද; **පාපානි**: පව්කම්; **සබ්බසො**: සර්වප්‍රකාරයෙන්; **සමෙති**: මැඩ පවත්වයි ද; **පාපානං**: පව්; **සමිතත්තා හි**: මැඩ පැවැත්වූ බැවින්ම; **සමණො ඉති**: මහණැයි; **පවුච්චති**: කියනු ලැබේ.

කුදු මහත් සියලු පව් මුළුමනින්ම මැඩ පවත්වන පුද්ගලයාම ශ්‍රමණයෙක් නම් වෙයි. පව් මැඩලන බැවින්ම ශ්‍රමණයයි කියනු ලැබේ.

විවරණය

බෞද්ධ ශ්‍රමණ සංස්ථාව හෙවත් ශාක්‍යපුත්‍රීය භික්ෂු සංස්ථාව අන්‍ය ශ්‍රමණයන්ගෙන් වෙනස් වූ පරමාදර්ශී සමාජ සංස්ථාවක් වශයෙන් පවත්වා ගැනීමට බුදුරජාණන් වහන්සේ විශාල පරිශ්‍රමයක් ගත් සේක. සූත්‍ර විනය අභිධර්ම වශයෙන් ඉදිරිපත් වන ත්‍රිපිටකයේ විනය පිටකය සම්පූර්ණයෙන්ම වෙන්වී ඇත්තේ බෞද්ධ ශ්‍රමණ සංස්ථාවට අදාළ කටයුතු පිළිබඳව විවරණය කිරීමට ය. විනය පිටකයෙහි භික්ෂූන් වහන්සේගේ චර්යාවට අදාළ නීති රීති දෙසිය විස්සක් ඉදිරිපත් වෙයි. භික්ෂූන් විසින් නොකළ යුතු වැරදි විනය නීති ලෙස දක්වා ඇත. විනය නීති කඩ කිරීම ඒ ඒ නීතියට අදාළ වූ දඬුවමකට යටත් වෙයි. අදාළ දඬුවම් අනුව විනය නීති (220) වර්ගකොට දක්වා ඇත. මෙම වැරදි විනයේ දී හඳුන්වා ඇත්තේ ආපත්ති නමිනි. දඬුවම් අනුව වර්ග කරන ලද ආපත්ති ස්කන්ධක සතක් භික්ෂූන් සඳහා ඉදිරිපත් වී ඇත.

1. පාරාජිකා ආපත්ති (4)
2. සංඝාදිසේස ආපත්ති (13)
3. නිස්සග්ගිය පාචිත්තිය ආපත්ති (30)
4. අනියත ආපත්ති (2)
5. පාටිදෙසනීය ආපත්ති (4)
6. පාචිත්තිය ආපත්ති (92)
7. සෙඛියා ආපත්ති (75)

මෙසේ භික්ෂූන් විසින් උල්ලංඝනය නොකළ යුතු වැරදි දෙසිය විස්සක් වෙයි. මේ හැර අධිකරණ සතරක් ද අධිකරණයක් නිරවුල් කරගත යුතු ආකාරය පැහැදිලි කෙරෙන අධිකරණ සමථ සතක් ද ඉදිරිපත් වී ඇත.

මේ හැර විනය පිටකයෙන් ඉදිරිපත් වන කරුණු අතර ආපත්ති හෙවත් වැරදි කඩ කිරීම මත භික්ෂුවකට දිය යුතු දඬුවම් වර්ග ද දැක්වෙයි. මෙම දඬුවම් වර්ග පහත දැක්වෙන ආකාරයෙන් වේ.

1. පරිවාස
2. මානත
3. තජ්ජනීය
4. නිස්සාය
5. පබ්බාජනීය
6. පටිසාරණීය
7. උක්ඛෙපනීය
8. පකාසනීය
9. බ්‍රහ්මදණ්ඩ

භික්ෂු සංස්ථාවට අදාළ චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ විස්තර ද විනය පිටකයෙහි දක්නට ඇත. බෞද්ධ ශ්‍රමණ භූමියට ඇතුළත් වීමෙන් අනතුරුව භික්ෂුවක වශයෙන් ඉටු කළ යුතු චාරිත්‍ර වාරිත්‍ර ද පවත්වා ගැනීම භික්ෂු සංස්ථාවේ පැවැත්මට අදාළ වන්නක් වශයෙන් දැක්වෙයි. මෙම චාරිත්‍ර මෙසේ නම් කොට දැක්විය හැකිය.

1. උපසම්පදා
2. උපොසථ
3. සීමාබන්ධන
4. වස්සූපගමන
5. පවාරණ
6. කඨින

භික්ෂු සංස්ථාවට අයත් වන ආරාමික දේපළ පාලනය, භික්ෂූන් වහන්සේලා ගේ ආරාමික වත්, ආචාර්ය උපාධ්‍යාය වත් ආදී නොයෙක් විස්තර ද විනය පිටකයෙන් දක්නට හැකි බෞද්ධ ශ්‍රමණ සංස්ථාවේ ම කොටසක් ලෙස පිළි ගැනෙන භික්ෂුණී සංස්ථාවේ සුභ සිද්ධිය සඳහා බුදුරජාණන් වහන්සේ විසින් පණවා වදාළ විවිධ ශික්ෂා වර්ග ද විනය පිටකය ඇතුළත්ව ඇත.

විනය පිටකයෙන් විවරණය වන කරුණු වලට අදාළව ජීවිතය පවත්වා ගැනීම පමණකින් ශ්‍රමණයකු ගේ ජීවිත සාඵල්‍යය සම්පූර්ණ නොවෙයි. බෞද්ධ ශ්‍රමණයෙක් නම් ශ්‍රමණත්වයේ ප්‍රතිඵල හෙවත් සාමඤ්ඤඵල අත් කරගත යුත්තෙකි. නියම ශ්‍රමණයකු වන්නේ එවිටයි. මෙම ශ්‍රමණ ඵල ලබා ගැනීමේ ක්‍රියා මාර්ගය සාමඤ්ඤඵල, නත්ථිපදොසම වැනි සූත්‍ර රාශියකින් බුදුරජාණන් වහන්සේ විසින් ඉදිරිපත් කොට තිබේ.

ශ්‍රමණ ඵල ලබා ගැනීම පිළිබඳ ක්‍රියා මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගයට අනුගතව සිදු වන්නකි. සාමඤ්ඤඵල සූත්‍රයට අනුව ශ්‍රමණඵල ලබා ගැනීම සඳහා වූ ක්‍රියා මාර්ගය පහත සඳහන් කරුණු වලින් සමන්විත වෙයි.

1. ආර්ය ශීලයෙන්
2. ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන්
3. ආර්ය වූ සන්තුෂ්ටියෙන්
4. ආර්ය වූ සතිසම්පජඤ්ඤයෙන්
5. ආර්ය වූ සමාධියෙන්
6. ආර්ය වූ ප්‍රඥාවෙන්.

මේ ක්‍රියා මාර්ගයට නිසි සේ කෙනකු අනුගත වන්නේ නම් සමාධියේ ප්‍රතිඵල වශයෙන් උදාවන විවිධ ධ්‍යාන හා ප්‍රඥාවේ ප්‍රතිඵල වශයෙන් උදාවන විවිධ උත්තරීතර ඥාන හෙවත් අභිඥා ද ලබා ගත හැකි වන අතර අවසාන වශයෙන් ආසවක්ඛය ඥාණයෙන් සියලු කෙලෙසුන් ප්‍රහාණය කොට රහත් බවෙන් නිවණ සාක්ෂාත් කර ගැනීමට ද අවස්ථාව උද්ගත වෙයි.



විසම වූ දහම් සමාදන් වැ වෙසෙන තැනැත්තා පිඩු සිඟු පමණින් භික්ෂු නමක් නො වේ.

266. න තෙන භික්ඛු හොති
යාවතා භික්ඛතෙ පරෙ
විස්සං ධම්මං සමාදාය
භික්ඛු හොති න තාවතා (19:11)

යැපුනත් සිඟා කා අන් අයගෙන් සොඳට
එපමණකින් ම බික් සඟනක් නොවේ සෙට
සියලු යහගුණය ගත හොත් දිවි මගට
හෙතෙමේ භික්ෂුවකි නිසි වූ පින් කෙතට

භික්ෂුවකගේ සලකුණ - නොවේමැයි සිඟමන

19 (7) එක්තරා බමුණකුගේ කතාව (ගාථා අංක 266 සහ 267 ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **එක්තරා බමුණකු** අරභයා මේ ගාථාද්වය දේශනා කළ සේක.

සැවැත් නුවර විසූ කිසියම් මහළු වියට පත්ව ජීවත් වීමේ මාර්ගයක් නැති බැවින් භික්ෂු වේශයක් ගෙන වෙනත් භික්ෂූන් මෙන් අනුන්ගේ ගෙවලින් සිඟා ලත් භික්ෂාවෙන් ජීවත් වෙයි. භික්ෂාවෙන් හෙවත් සිඟා ලද අහරින් ජීවත් වන බැවින් ද භික්ෂු නාමය කෙනකුට ලැබෙයි.

භික්ෂාවෙන් ජීවත් වන මේ බමුණා තමා ද භික්ෂුවකැයි හඳුන්වා ගැනීමෙහි කැමැත්තෙන් සිටියේය. බුද්ධ ශාසනයෙහි පැවිදි වී භික්ෂුනාමයෙන් සිටි භික්ෂු සංඝයා මෙන්ම තමා ද භික්ෂුවකැයි සිතා ගත් බමුණාට තමා භික්ෂුවක් ලෙස බුදුරජාණන් වහන්සේගෙන් අනුමතකර ගැනිමට අදහස් කළේය.

එබැවින් හෙතෙම දිනක් බුදුරදුන් හමුවීමට දෙව්රමට ගොස් බුදුන් දැක වැඳ පුදා එකත් පසෙක සිට මෙසේ කීවේ ය. "ස්වාමීනි, ඔබ වහන්සේගේ ශ්‍රාවක භික්ෂූහු අනුන්ගෙන් ලැබෙන භික්ෂාවෙන් ජීවත් වෙති. එබැවින් ඔවූහු භික්ෂු නාමයෙන් හැඳින්වෙති. මමද අනුන්ගෙන් ලැබෙන භික්ෂාවෙන් ජීවත් වන්නෙක්මි. එබැවින් මට ද භික්ෂුවකට ලෙස ආමන්ත්‍රණය කරන මැනවි."

බුදුරජාණන් වහන්සේ බමුණාගේ කථාව අසා "බමුණ, මම කෙනෙකු සිඟා කා ජීවත් වන තරමින් භික්ෂුවකැයි නොකියමි. සිඟා කෑමට අතිරේකව ජීවිතයෙන් සම්පූර්ණ කළ යුතු තවත් බොහෝ ගුණ ධර්ම වත් පිළිවෙත් තිබේ. ඒවා සමාදන්ව සිතෙන් කෙලෙසුන් ඉවත් කිරීමේ මාර්ගයට පිළිපන් පුද්ගලයාම භික්ෂුවක් වෙතැයි දේශනා කරමින් යථොක්ත ගාථා ද්වය ප්‍රකාශ කළ සේක.

විවරණාත්මක අනුවාදය (266 ගාථාව)

යාවතා පරෙ භික්ඛතෙ තෙන භික්ඛු න හොති විස්සං
ධම්මං සමාදාය තාවතා භික්ඛු න හොති

යාවතා: යම් පමණකින්; **පරෙ**: අනුන්ගෙන්; **භික්ඛතෙ**: අහර සිඟා ද; **තෙන**: ඒ කාරණයෙන්; **භික්ඛු න හොති**: භික්ෂුවක් නම් නො වෙයි; **විස්සං ධම්මං සමාදාය**: විෂම වූ දුගඳ හමන කාය සමාචාරවාදී ධර්මයන් සමාදන් ව වසන්නේ නම්; **තාවතා**: (සිඟා කෑව ද) එපමණින්; **භික්ඛු න හොති**: භික්ෂුවක් නොවේ.

අනුන්ගෙන් ලැබෙන භික්ෂාවෙන් ජීවත් වන පමණින් භික්ෂුවක් නොවෙයි. විෂම වූ දුගඳ හමන කාය සමාචාරවාදී ධර්මයන් සමාදන් ව වසන්නේ නම් ඔහු සිඟා කෑව ද භික්ෂුවක් නොවේ.

විවරණය

භික්ඛූ: භික්ෂාටනයෙහි හෙවත් පිඩු සිඟා යාමෙහි යෙදෙන්නා යන අරුතින් භික්ෂු යන නම ශ්‍රමණ පිරිස් වලට ලැබී තිබේ. වචනාර්ථය එසේ වුවද බුදු සමයේ දී, භික්ෂු යන නම භික්ෂූන් සඳහා භාවිත වන්නේ පිඩුසිඟා යන්නා යන අර්ථයෙන් නොවේ. බ්‍රහ්මචාරී ජීවිතයක් ගෙවන්නා යන අර්ථයෙනි.

බ්‍රහ්මචරිය: බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නා යන අර්ථයයි. බ්‍රහ්මචරිය යන වචනය ආගමික ප්‍රතිපදාව යන අර්ථයෙන් එක් එක් ආගමික ශාස්තෘවරුන්ගේ ධර්ම මාර්ගය හැඳින්වීමට යෙදී ඇති පදයකි. උත්තම වූ චර්‍යා ප්‍රතිපදාව යන අර්ථයෙන් බුදු සමයෙහි මෙම වචනය ව්‍යවහාර වෙයි. මෙම පදය භාවිත වන ක්ෂෙත්‍රයන් අනුව බ්‍රහ්මචර්‍යාව විවිධ අර්ථවත්ව යෙදී ඇත.

කාමසේවනයෙහි නොයෙදී විසීම යන අර්ථයට ද බ්‍රහ්මචර්යා යන පදය යෙදෙයි. කුමාර බ්‍රහ්මචර්යාව යන්නෙන් අර්ථවත් වන්නේ එයයි.

අබ්‍රහ්මචරියා වේරමණී යන්නෙහිදී කාමසේවනයෙන් වෙන්වීම යන අර්ථය ලැබෙයි.

ශාසනික බ්‍රහ්මචර්යාව යන පදය යෙදෙන්නේ බුදුරජාණන් වහන්සේ විසින් ඉදිරිපත් කරන ලද විමුක්තිගාමී ප්‍රතිපදාව සඳහාය.

බ්‍රහ්මවිහාර යන පදය බ්‍රහ්මචර්යා යන්නෙන් වෙනස් වූ අර්ථයක් දෙයි. බ්‍රහ්මයා සතු ගුණාංග සතරක් යන අර්ථයෙන් ගෙන මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන චතුර්විධ ගුණයෙන් යුක්තව විසීම බ්‍රහ්මවිහරණ වශයෙන් සලකා ඇත. කෙසේ වුවද බ්‍රහ්ම චර්යාව හා බ්‍රහ්ම විහරණ යන පද දෙකේම යෙදෙන බ්‍රහ්ම යන පදයෙන් උත්තම, විශිෂ්ට වූ යන අර්ථය ප්‍රධාන වෙයි.

පින් - පවු බැහැර කළ බඹසරින් යුත් ලොවැ නුවණින් පිරික්සන තැනැත්තා භික්ෂුය

267. යො'ධ පුඤ්ඤඤ්ච පාපඤ්ච
බාහෙත්වා බ්‍රහ්මචරියවා
සඞ්ඛාය ලොකෙ චරති
ස වෙ භික්ඛූති වුච්චති (19:12)

පින් පවු ඉක්මවා කෙලෙසුන් සිඳ බිඳැර
මුලු දිවියම ගෙවා බඹසරෙහිම හැසිර
නුවණින් දකින්නා ලොව ඇත්තකු විතර
හඳුනති දනො භික්ෂුවකැයි සැක දුරැර

උතුම් හැසිරීමෙන් - භික්ෂුවක් වේමැයි

19 (7) එක්තරා බමුණකුගේ කතාව (ගාථා අංක 266 සහ 267 ගාථා)

විවරණාත්මක අනුවාදය (267 ගාථාව)

ඉධ යො පුඤ්ඤඤ්ච පාපඤ්ච බාහෙත්වා බ්‍රහ්මචරියවා සඞ්ඛාය ලොකෙ චරති සො වෙ භික්ඛු ඉති වුච්චති.

ඉධ: මේ සසුනෙහි, **යො**: යම් භික්ෂුවක්, **පුඤ්ඤඤ්ච**: පින ද, **පාපඤ්ච**: පව ද, **බාහෙත්වා**: ඉක්මවා, **බ්‍රහ්මචරිය වා**: බ්‍රහ්මචර්යයෙන් යුක්ත වූයේ, **සඞ්ඛාය**: නුවණින් දැන, **ලොකෙ**: ලෝකයෙහි, **චරති**: හැසිරේ ද, **සො**: හෙතෙම, **වෙ**: ඒකාන්තයෙන්, **භික්ඛු ඉති**: භික්ෂුවකැයි, **වුච්චති**: කියනු ලැබේ.

බුදු සසුනෙහි යම් කිසි භික්ෂුවක් පින් පවු දෙකද හැර පියා බ්‍රහ්මචර්යාවෙහි යෙදෙමින් ලෝකස්වභාවය නුවණින් දැන ගෙන ජීවත් වෙයි ද හෙතෙම නිසැකයෙන්ම භික්ෂුවකි.

විවරණය

පුඤ්ඤඤ්ච පාපඤ්ච බාහෙත්වා: පින් පව් දෙකම ඉක්මවා යන අරුත්ය. රහතන් වහන්සේ පින් පව් දෙකම ඉක්මවූ පුද්ගලයකු වශයෙන් බුදු දහමෙහි දී සඳහන් වෙයි. පින් හා පව් වලින් කෙරෙන්නේ සසර දික් කිරීමකි. පින් පව් යන දෙකම කර්ම සංඛ්‍යාවට ගැනෙයි. කර්ම සිදුවීමේ ශක්තිය පුද්ගලයකු කෙරෙහි පවත්නා තාක් ඔහු මෙලොවට බැඳුණු පුද්ගලයකි. එබැවින් පුද්ගල පැවැත්ම නිමා කිරීමට නම් කර්ම ඇති වීමේ ශක්තිය මනසින් මුලිනුපුටා දැමිය යුතුය. බෞද්ධ විමුක්ති මාර්ගය යොමු වී ඇත්තේ කර්ම ක්‍ෂය කිරීම සඳහා ය. විමුක්ති මාර්ගයෙහි යෙදීමෙන් ලබාගත හැකි අවසාන ප්‍රතිඵලය ලෙස බෞද්ධ සූත්‍ර ධර්මයන්හි දක්වා ඇත්තේ කම්මක්ඛය හෙවත් ආසවක්ඛය ඤාණයයි. කම්මක්ඛය ඤාණය ලබා ගත් පුද්ගලයා අරහත් නමින් හැඳින්වෙයි. එබැවින් රහතන් වහන්සේ පුඤ්ඤපාප පහීණ යන නමින් ද හැඳින්වෙයි.

පින්පව් අතුරින් පව වූ කලී කෙනකුගේ සාංසාරික පැවැත්මේ දී දුක් විපාක ගෙන දෙන්නකි. පවක් කෙරෙන්නේ මානසික අපවිත්‍රතාවකිනි. දූෂිත වූ සිතකින් කෙරෙන ක්‍රියා පාප සංඛ්‍යාවට ගැනෙයි. ඒවා දුක් විපාක ගෙන දීමේ ශක්තියකින් යුක්තය. ධම්මපදයෙහිම පව විවරණය වී ඇත්තේ මානසික දූෂිත බවකින් කෙරෙන ක්‍රියා නමිනි. 'මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා' යන්නෙන් එය දැක්වී ඇත. දූෂ්‍ය වූ සිතින් කරන පාපකර්ම ගොනු පසුපස රියසක ඇදී එන්නාක් මෙන් පුද්ගලයා හඹා එමින් දුක් විපාක ලබා දෙන බව ද එහිම සඳහන් වෙයි. '**තතො නං දුක්ඛ මන්වෙති චක්කංව වහතොපදං**' පව්කම් කරන්නාට දුක් විපාක ගෙන දීමත් හැර පාපයක් නිතරම යොමු වී ඇත්තේ අනුනට විපතක් ගෙන දීම සඳහාය. ප්‍රාණඝාත අදත්තාදාන, කාමමිථ්‍යාචාර වැනි පස්පව් පිළිබඳව විමසා බැලුවද එය වටහා ගත හැකිය. එබැවින් තමන්ටත් අනුන්ටත් විපත් ඇති කරවන සුලු පාපකර්ම නොකිරීමේ අගය බුදු දහමින් වර්ණනා කෙරෙයි. බෞද්ධ සදාචාර ධර්මවලදී පාපය සම්පූර්ණයෙන් බැහැර කරන ලෙසට උපදෙස් දෙයි. බුදුවරුන්ගේ උපදේශයෙහි ද මෙය අන්තර්ගතව ඇත. '**සබ්බ පාපස්ස අකරණං**' 'සියලු පව් දුරු කිරීම' බුද්ධානුශාසනයේ එක් කොටසකි.

බෞද්ධ විමුක්ති මාර්ගයේ ප්‍රාථමික මට්ටමේ දී පාපය ඉවත් කොට පුණ්‍යකර්ම කිරීමෙහි ලා පුද්ගලයා යොමු කරනු ලැබේ. සසර විසීමේ දී පුණ්‍යකර්මවල විපාකයෙන් සැප සම්පත් උරුම වන බව විශ්වාස කරනු ලැබේ. සුගති භවයන්හි උපතත් ඒ ඒ භවවල ජීවත් වන කාලය අතරතුර ජීවිතයට සැප සම්පත්ති ලැබීමත් පුණ්‍ය කර්මයන් ගේ විපාක වශයෙන් උරුම වේ. මේ නිසා සාංසාරික ජීවිතය සැපවත් කර ගැනීමේ අරමුණින් පුණ්‍යකර්ම කිරීමට බෞද්ධ සදාචාර ධර්ම මගින් පුද්ගලයා පෙළඹවීමට උත්සාහයක් දරා ඇත."පුද්ගලයා පින් කිරීමෙහි යෙදෙන්නේය. නැවත නැවතත් පින් කරන්නේ ය. එහිම උනන්දුව ඇති කර ගන්නාහුය. පින වැඩීම සැපතකි." මෙසේ පුද්ගලයා පුණ්‍යකර්මයන්හි උනන්දු කරවනුයේ පුද්ගල ජීවිතයට සසර වසන තුරු සැප සම්පත් අවශ්‍ය බැවිනි. මේ හැර පුණ්‍යය යනු මනස පිරිසිදුව පවත්වන ක්‍රියායි. එබඳු ක්‍රියාවලින් තමාට සැප විපාක ලැබෙනු පමණක් නොව සමාජයේ අන්‍යයන්ට ද යහපතක් වෙයි.

බෞද්ධ සමාජධර්ම හා සදාචාරධර්ම ඉදිරිපත් වී ඇත්තේ පුද්ගලයකු යහපතට නතු කිරීමට ය. අයහපතින් වැළකීම සඳහා පාපයන්ගෙන් දුරු වීමටත් යහපතෙහි හැසිරීම සඳහා පුණ්‍යකර්ම වගා කර ගැනීමටත් බුදු සමයෙන් අවවාදානුශාසනා ඉදිරිපත් වෙයි. බුද්ධානුශාසනයෙහි '**සබ්බපාපස්ස අකරණං**' (සියලු පව් නොකිරීම) යන්නට අතිරේකව '**කුසලස්ස උපසම්පදා**' යන්නද ඉදිරිපත් වී ඇත්තේ එබැවිනි.

පුද්ගලයා සාංසාරික පැවැත්මෙහිම රඳවා තබා ගැනීම බුදු දහමේ අරමුණ නොවේ. පුණ්‍ය කර්ම මගින් කෙතරම් සැප සම්පත් ලැබුණත් සාංසාරික ජීවිතයට උරුම වූ ජාති ජරා මරණාදී දුක්වලින් මිදීමට නොහැකිය. එම දුක්වලින් මිදුණු සසරෙහි ඉපදීම නැවැත්වීමට නම් සියලු කෙලෙසුන් දුරු කොට කර්ම ඉපදීමේ ශක්තිය නැති කළ යුතුය. සිද්ධාර්ථ ගෞතම බෝධිසත්වයන් සංසාර විමුක්තිය සඳහා පධන් වීර්යයෙහි යෙදී සිටියදී එහි පැමිණි මාරයා දුක් සහිත ජීවිතය අතහැර සුවබර ජීවිතයක් ගෙවමින් පින්රැස් කරන්නැයි ඉල්ලීමක් කළේය. එහිදී බෝසතුන් දුන් පිළිතුර වූයේ

''අණුමත්තෙනපි පුඤ්ඤෙන
අත්ථො මය්හං න විජ්ජති''

"ඉතා සුළු වූ ද පිනකින් මට වැඩක් නැත" යනුවෙනි. මෙයින් අදහස් කරන්නේ කෙතරම් සුවබර වුවද සාංසාරික ජීවිතයක් ගෙවීමෙහි අර්ථයක් නැත යන්න පමණක් නොව තම අභිමතාර්ථය වන සංසාර විමුක්තියට පිනෙන් ප්‍රයෝජනයක් ද නැත යන්නයි.

උපතට හේතු වන කර්ම හට ගන්නේ පුද්ගල සන්තානයෙහි තෘෂ්ණාව පවත්නා බැවිනි. පුණ්‍ය හෝ පාප කර්ම විෂයෙහි තෘෂ්ණාවෙන් කෙරෙන පෙළඹවීමක් ඇත. තෘෂ්ණාවෙන් පෙළඹී කරන කර්ම වලින් නැවත නැවත උපත ඇති කරයි. මේ නිසාම තෘෂ්ණාව නැවත නැවත උපත ඇති කරවන්නක් වශයෙන් 'පොනොභවික' යන පදයෙන් ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි දී පැහැදිලි කර ඇත. තෘෂ්ණාව ක්‍ෂය කිරීම බුදුදහමේ අරමුණයි. තෘෂ්ණාව ක්‍ෂය වූ විට විමුක්තිය සාක්‍ෂාත් වේ. එබැවින්ම නිර්වාණය තණ්හක්ඛය යන පදයෙන් ද හැඳින්වී ඇත.

තෘෂ්ණාව ක්‍ෂය කොට කර්ම ඉපදීමේ ශක්තිය විනාශ කර දමන රහතන් වහන්සේ පුණ්‍ය පාපයන් ප්‍රහීණ කළ තැනැත්තෙකි. රහත් වීමෙන් අනතුරුව රහත් පුද්ගලයකුගේ ජීවිතයෙහි දී කෙරෙන කවර ක්‍රියාවක් වුවද පුණ්‍ය වශයෙන් හෝ පාප වශයෙන් වර්ග කළ නොහැකිය. උන්වහන්සේගේ මානසිකත්වය තුළ තෘෂ්ණාවෙන් කෙරෙන පෙළඹවීමක් නොමැති බැවින් කයෙන් වචනයෙන් හෝ සිතින් කරන කිසිදු ක්‍රියාවකින් කර්ම ජනනය නොවේ. ඒවා හුදු ක්‍රියා සිත් වශයෙන් මිස කර්ම වශයෙන් නො හැඳින්වෙයි. ක්‍රියා සිත් වලින් විපාක බිහි නොවෙයි.

සඞ්ඛාය: නුවණින් සැලකීමෙන් යුක්තව යන අර්ථයයි. බුදු දහමට අනුව නුවණින් දැකීම, සැලකීම යනු ලෝකයෙහි යථාර්ථය දැන ගැනීමයි. නුවණින් ලෝකය දෙස බලන්නාට ලෝකය බෙහෙවින් සුඛ සහගත ග්‍රහණය කළ යුතු තැනක් ලෙස පෙනෙයි. එහි පවත්නා වස්තු නිත්‍ය, සුභ, සුඛ සහගත දේ ලෙස වැටහෙයි. එහෙත් බුදු සමයට අනුව ලෝකයේ යථාර්ථය බාහිර පෙනුමට වඩා බෙහෙවින් වෙනස්ය.



නිහඬ වැ හුන් පමණින් ඔහු මුනි නම් නො වේ. පව් දුරුකළ තැනැත්තා ම මුනි ය.

268. න මොනෙන මුනි හොති
මූළ්හරූපො අවිද්දසු
යො ච තුලං'ව පග්ගය්හ
වර'මාදාය පණ්ඩිතො (19:13)

සිටියත් නිහැඬියාවෙන් ගොලු අයකු මෙනී
අනුවණ මුළා වූවහු නොම වේය මුනී
මැනවින් තරාදියකින් මැන බලනු වැනී
නැණැති දනා හොඳ නොහොඳින් හොඳම ගනී

ලොවේ නියම මුනි - යහගුණයම ගනී

19 (8) අන්‍ය තීර්ථකයෝ පිළිබඳ කථාව (ගාථා අංක 268 සහ 269)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **තීර්ථක පිරිසක්** අරභයා මේ ගාථාද්වය වදාළ සේක.

තීර්ථකයෝ යම් තැනකින් ආහාරය ලබා ගනිත් ද එහි දී ඔවුහු ගෙහිමියන්ට දන්දීම පිළිබඳව ශුභාසිංශනය කරති. "යහපතක්ම වේවා! දීඝායුෂ වේවා!" මේ ආදියක් පවසා ඔවුහු පිටත්ව යති. එහෙත් බුදුන් වහන්සේ, භික්ෂූන්ට ගිහියන් දන් දී දානය වැළඳූ පසු ඔවුනට අනුමෙවෙනි බණක් පවසන ලෙස පැනවීමක් කරන තුරු භික්ෂූහු මුල් අවදියේ දී ගිහියන්ගේ දානය වළඳා මුවින් නොබැණ ම පෙරළා පිටත්ව යති. අන්‍ය තීර්ථකයෝ දානය වළඳා ගිහියන්ට සතුටු වීමට යමක් පවසා යතත් භික්ෂූන්ට එබඳු පුරුද්දක් නොතිබු බැවින් ගිහියෝ ඒ කාරණය උදෙසා බෞද්ධ භික්ෂූන්ට මැසිවිලි නැගූහ.

"අන්‍ය තීර්ථකයෝ නම් දානය පිළිගෙන ශුභාශිංසනය කරති. භික්ෂූහු කිසිවක් නොකියා නිහඬවම යති" යි ඔවූහු චෝදනා නැගූහ. බුදුරජාණන් වහන්සේට එපුවත සැලවී **"අනුජානාමි භික්ඛවෙ භත්තග්ගෙ අනුමෝදිතුං"** "මහණෙනි, දන් වළඳා අනුමෙවෙනි බණක් දෙසීමට අනුදනිමි" යි පැණවීමක් කළ සේක. එතැන් පටන් භික්ෂූහු ද ගිහියන්ගෙන් දානය ලැබ දානයේ අනුසස් පවසා ඔවුන්ගේ සිත පැහැදීම ඇති කොට ආපසු එති. මේ චාරිත්‍රය භික්ෂූන් අතින් සිදුවන විට වඩ වඩාත් පැහැදීමට පත් ගිහියෝ බෞද්ධ භික්ෂූන්ට වඩ වඩාත් දන් දීමට පෙළඹුනහ. භික්ෂූන්ට සිවුපසය ලැබීමට වඩ වඩාත් බහුල විය.භික්ෂූන්ට ප්‍රත්‍යලාභය බහුල වන විට තීර්ථකයෝ ඊර්ෂ්‍යාවට පත්වූහ. ඔවූහු භික්ෂූන්ට දොස් නඟන්නට වූහ.

"අපි නියම මුනිවරුය. අපි පමණ දැන කථා කරමු. දානය පිළි ගැනීමෙන් පසු අප කරන්නේ ගිහියන්ට යහපතක්ම වේවා වැනි යමක් පමණි. නමුත් ශ්‍රමණ භවත් ගෞතමයන් ගේ ශ්‍රාවකයෝ ගිහියන්ගේ පැහැදීම වැඩි කර ගන්නා අදහසින්ම දන් වළඳා නොයෙක් දේ පවසති. එය මුනිවරුනට සුදුසු නොවෙති. මෙසේ භික්ෂූන්ට තීර්ථකයෝ අවලාද නඟන්නට වූහ. තීර්ථකයන්ගේ අවලාදය කණ වැකුණු භික්ෂූන් වහන්සේලා මේ බව බුදුරජාණන් වහන්සේට සැළ කළ හ.

එය අසා උන්වහන්සේ "මහණෙනි, කෙනකු නිහඬව සිටි තරමින් ම ඔහු මුනිවරයකැයි මම නොකියමි. සමහරු ඔවුන්ගේ නොදැනීම නිසා කිසිවක් මුවෙන් නොබැණ සිටිති. ඇතැම් අය ආත්ම විශ්වාසයක් නොමැති බැවින් කියන දෙය වරදීදෝ බියෙන් නිහඬවම සිටිති. තවත් සමහරු තමන් වැදගත් දෙයක් පැවසූ විට අන් අය ඒ දෙය දැනගනිතියි බියෙන් අනුනට නොපවසා සිටිති. මේ හැම දෙනකුම නිහඬව සිටින නිසා ම ඔවුනට මුනිවරුන්යයි කිව නොහැක. නියම මුනිවරයා නම් කෙලෙසුන් දුරු කිරීමෙහි අවංකව නිරත වන්නාය" යි භික්ෂූන්ට දහම් දෙසමින් යථොක්ත ගාථාද්වය වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (268 ගාථාව)

මූළ්හරූපො අවිද්දසු මොනෙන මුනි න හොති යො ච
පණ්ඩිතො තුලං පග්ගය්හ ඉව වරං ආදාය

මූළ්හරූපො: මුළා වූ ස්වරූපය ඇති; **අවිද්දසු**: අනුවණ පුද්ගලයා; **මොනෙන**: නිහඬව සිටීමෙන් පමණින්; **මුනි න හොති**: මුනිවරයෙක් (නම්) නොවෙයි; **පණ්ඩිතො**: නුවණැති වූ; **යො ච**: යමෙක් වනාහි; **තුලං**: තරාදියක්; **පග්ගය්හ ඉව**: ගෙන (සිටියෙකු) මෙන්; **වරං ආදාය**: උතුම් වූ ගුණයම (ගෙන);

නිශ්ශබ්දව සිටීමෙන් පමණක් මුළාවට පත් අනුවණ පුද්ගලයා මුනිවරයෙක් නොවේ. නුවණැත්තා තරාදියකින් කිරා බලා පමණ දන්නා සේ උතුම් දෙය දනී. ඔහු නියම මුනිවරයාය.



නිහඬ වැ හුන් පමණින් මුනි නම් නො වේ. පවු දුරුකළ තැනැත්තා ම මුනි ය.

269. පාපානි පරිවජ්ජෙති
ස මුනි තෙන සො මුනි
යො මුනාති උභො ලොකෙ
මුනී තෙන පවුච්චති (19:14)

හොඳින් නොහොඳ වෙන් කොට පව් දුර ලන්නේ
එහෙයින් තමයි හේ මුනිවරයෙක් වන්නේ
ඇතුළත පිටත ලොව හරි හැටියට දන්නේ
හේ මුනි කෙනකු ලෙස නම් කළ හැකි වන්නේ

කාට වුවද නුවණින් තොර - නොවිය හැකිය නිසි මුනිවර

19 (8) අන්‍ය තීර්ථකයෝ පිළිබඳ කථාව (ගාථා අංක 268 සහ 269)

විවරණාත්මක අනුවාදය (269 ගාථාව)

පාපානි පරිවජ්ජේති, ස මුනි සො තෙන මුනි යො උභො ලොකෙ මුනාති. තෙන මුනී පවුච්චති

සො මුනි: ඒ මුනිවරයා; **පාපානි**: පාපයන්; **පරිවජ්ජේති**: දුරු කරයි; **සො**: හෙතෙම; **තෙන**: ඒ හේතුවෙන්; **මුනි**: මුනිවරයෙකි; **යො**: යමෙක්; **උභො ලොකෙ**: ආධ්‍යාත්මික බාහිර යන දෙලොවමත්; **මුනාති**: නුවණින් දැන ගනියි; **තෙන**: ඒ කාරණයෙන්; **මුනී**: මුනිවරයකැයි; **පවුච්චති**: කියනු ලැබේ.

යමෙක් පව් දුරු කරයි ද හෙතෙම ඒ කරුණින් මුනිවරයෙකි. යමෙක් ආධ්‍යාත්මික හා බාහිර යන දෙලොව නිසි සේ නුවණින් දැන ගනියි ද ඒ හේතුවෙන් ඔහුට මුනි යයි කියනු ලැබේ.

විවරණය

මුනි: බුද්ධකාලීන පැවිදි සමාජයෙහි පැවිදි කොට්ඨාශයන් පොදුවේ මුනි නමින් හැඳින්වෙයි. වෙනත් ශ්‍රමණයන් මෙන්ම මුනිවරයා ද ගෘහ ජීවිතය අතහැර ආත්ම විමුක්තිය අපේක්ෂාවෙන් කිසියම් ප්‍රතිපදාවක් අනුව ජීවත් වුවෙකි. අනෙක් ශ්‍රමණයන්ට වඩා මුනිවරයෙකු ගේ විශේෂ ලක්ෂණය වනුයේ නිශ්ශබ්දතාව අගය කිරීමයි. අනවශ්‍ය කථා වලින් තොරව ප්‍රමාණවත් කථා ඇතිව හෙවත් මිතභාෂීව මුනිවරයා ජීවත් වෙයි. මොනෙය්‍ය ව්‍රතය හෙවත් කතා නොකර සිටීම ද ඇතැම් මුනිවරුන්ගේ ලක්ෂණයක් වූ බව බෞද්ධ සාහිත්‍යයෙන් හෙළිදරවු වෙයි. කාලදේවල තවුසාගේ බෑණණුවන් වූ නාලක තවුසා ද මොනෙය්‍ය ව්‍රතය සමාදන්ව වනගත ජීවිතයක් ගෙවූ බව සඳහන්ව ඇත. බුදු සමයේ අර්ථ නිරූපණයට අනුව කෙනකු කථා නොකළ පමණින්ම මුනිවරයකු නොවෙයි. මුනිවරයකු සතු ආගම් ප්‍රතිපදාවක් පැවතිය යුතුය. මුනිවරයා ගිහියනට වඩා වේගවත් ක්‍රියා මාර්ගයක් ඔස්සේ විමුක්තිගාමී ක්‍රියා මාර්ගයෙහි නිරත වන්නෙකි. ගිහියා හා මුනිවරයා අතර වෙනස මින් පැහැදිලි වෙයි. "නිල් ගෙලැති මොනර පක්ෂියා හංසයාගේ ගමන් වේගයට කිසි විටෙක නො එළඹෙයි. එසේම ගිහියා ද වනයෙහි හුදෙකලාව ධ්‍යාන වඩන මුනි නම් භික්ෂුව අනුකරණය නොකරයි." බුදුරජාණන් වහන්සේ මුනිවරයකුගේ විශේෂ ලක්ෂණ පැහැදිලි කළ සූත්‍රයක් සුත්ත නිපාතයෙහි දක්නට ලැබේ. එම සූත්‍රය මුනි සූත්‍රය නමින් හඳුන්වා ඇත. එම සූත්‍රයට අනුව මුනිවරයා "අන් අය මෙහෙයවන්නෙක් ලෙසත් අන් අයගෙන් මෙහෙයවනු නොලබන්නෙක්" ලෙසත් දැක්වෙයි. **"නෙතාරං අඤ්ඤෙසං-අනඤ්ඤ නෙය්‍යං"** මුනි සූත්‍රය විශේෂ වැදගත් කමක් ඇති සූත්‍රයක් ලෙස සලකා අශෝක මහාධිරාජ්‍යයා විසින් තම ධර්ම පාඨ වල මුනිගාථා නමින් කොටසක් ඇතුළත් කරවා ඇත.

යො මුනාති උභොලොකෙ: දෙලොව දැන ගනියි යනු මෙහි අදහසයි. බෞද්ධ ව්‍යවහාරයේ දී දෙලොව යන්න අර්ථ දෙකක් සඳහා ඉදිරිපත් වී ඇත. මෙලොව පරලොව යනු එක් අර්ථයකි. ආධ්‍යාත්මික ලෝකය හා බාහිර ලෝකය යනු අනෙක් අර්ථයයි. මෙම ගාථා ධර්මයට අනුව වඩාත් අර්ථවත් වන්නේ ආධ්‍යාත්මික හා බාහිර ලෝකය යන දෙලොව දැනීම යන්නය. ආධ්‍යාත්මික හා බාහිර වශයෙන් සලකන විට ලෝකය යන්නට විශේෂ අර්ථයක් බුදුන් වහන්සේ විසින් ඉදිරිපත් කොට ඇත. මෙහි දී ලෝකය වශයෙන් සැලකෙන්නේ පුද්ගලයාමය. මේ බව බුදුරජාණන් වහන්සේ ගේ පහත සඳහන් දේශනයෙන් පැහැදිලි වෙයි.

"ඉමස්මිං ච පන බ්‍යාමත්තකෙ කලෙබරෙ සසඤ්ඤම්හි සමනකෙ ලොකං ච ලොක සමුදයං ච ලොක නිරොධං ච ලොකනිරොධගාමිනි පටිපදං ච පඤ්ඤපෙමි"

"සංඥා සහගත වු මනස සහිත වු මේ බඹයක් පමණ වු ශරීරය තුළම ලෝකයද ලෝකයේ හට ගැනීම ද ලෝකයේ නිරෝධය ද ලෝක නිරෝධගාමිනි පටිපදාව ද පනවමි." වෙනත් කිසිදු දර්ශනයකින් ඉදිරිපත් නොකරන අතිශයින් ශ්‍රේෂ්ඨ වු ඉගැන්වීමක් ඉහත කී පාඨයෙන් බුදුරජාණන් වහන්සේ විසින් ඉදිරිපත් කොට තිබේ. බුදු දහමෙහි ඉගැන්වෙන චතුරාර්ය සත්‍යයම පුද්ගලයාගෙන් බාහිරව නොපවත්නා බව ඒ ඉගැන්වීමයි. මේ නිසා බුදුදහමට අනුව අභ්‍යන්තර හා බාහිර යන දෙලොවම,දැකිය යුත්තේ පුද්ගලයා තුළමය. පුද්ගලයා තුළ ස්ථාවර ආත්ම පදාර්ථයක් නොමැති බව දැක්වීම සඳහා පුද්ගල සංකල්පය විවිධ විශ්ලේෂණවලට විවරණය කොට ඇති බව මුල් බුදු සමයෙහි නොයෙක් සූත්‍ර ධර්ම වලින් දක්නට ලැබේ. එහිලා දැක්වෙන මූලිකම විශ්ලේෂණය වුකලී නාම රූප වශයෙන් බෙදා දැක්වීමයි. පඤ්චස්කන්ධ විභාගයට අනුව මෙම නාම රූප විශ්ලේෂණය මෙසේ විග්‍රහ කොට දැක්විය හැකිය.

රූප: රූපස්කන්ධය, **නාම**: වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ

රූප ස්කන්ධය තවදුරටත් විවරණය කර දැක්වීම අභිධර්ම ග්‍රන්ථවලදී දැක ගත හැකිය. පඨවි, ආපෝ, තෙජෝ, වායෝ, වණ්ණ ගන්ධ, රස ඕජා යනුවෙන් රූපය ශුද්ධාෂ්ටකයක් වශයෙන් වෙන් කොට දැක්වීම අභිධර්මයේදී අපිට හමු වෙයි. බාහිර ලෝකය වශයෙන් අප හැඳිනගත යුත්තේ මෙම රූපස්කන්ධයයි. රූපය ආත්මයක් වශයෙන් හෝ රූපයෙහි ආත්මයක් ඇත යනුවෙන් වැරදි ලෙස ආත්ම දෘෂ්ටියක් තනා ගත නොහැකි බව දැකීම බාහිර ලෝකය නුවණින් දැකීමයි. අභ්‍යන්තර ලෝකය වශයෙන් ගත යුත්තේ නාමස්කන්ධයි. වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ වශයෙන් බෙදා දැක්වෙන නාමස්කන්ධය අභිධර්මයේ දී තව දුරටත් සූක්ෂම විග්‍රහ වලට භාජනව තිබේ. වේදනා, සඤ්ඤා, සංඛාර යනු චෛතසික වශයෙන් ගෙන එය චෛතසික පණස් දෙකකට කොටස් කොට දක්වා ඇත. විඤ්ඤාණ ස්කන්ධය අසූනව වැදෑරුම් විවිධතාවකට විශ්ලේෂණය කොට දක්වා ඇත. මෙසේ විවිධාකාර ලෙස නාමස්කන්ධ සියුම් කොට විග්‍රහ කර දැක්වීමෙන් බුදු සමය අදහස් කොට ඇත්තේ නාමස්කන්ධය විෂයෙහි ද ආත්ම පදාර්ථයක් පිළිබඳ විශ්වාසයක් තබා නොගත හැකි බව පැහැදිලි කොට දැක්වීමයි. මෙසේ අභ්‍යන්තර ලෝකය සම්බන්ධයෙන් ද නුවණින් සලකා බලා එහි ආත්මයක් වශයෙන් ගත හැකි සාර පදාර්ථයක් නොමැති බව දැකීම අභ්‍යන්තර ලෝකය දැකීමයි.

1. පුද්ගලයා තුළ සදාතනික ආත්මයක් ඇත.
2. පුද්ගලයා තුළ මරණයෙන් පසු පවත්නා ආත්මයක් නැත.

පුද්ගලයා පිළිබඳ වූ අන්තගාමී මෙම දෘෂ්ටිවාද දෙක බුදුන්වහන්සේ පහළ වන අවධියෙහි පැවතිණි. මේ අන්තවාද දෙක ශාස්වත දෘෂ්ටිය හා උච්ඡේද දෘෂ්ටිය ලෙස බෞද්ධ සූත්‍ර ධර්මවලදී හැඳින්වෙයි. බුදු දහමට අනුව මෙම දෘෂ්ටිවාදවල එල්බ ගැනීම නිසා පුද්ගලයාට තමා පිළිබඳ වූ යථාතත්වය නොපෙනී යයි. මෙය පුද්ගලයකුගේ විමුක්තියට සම්බන්ධකර වූවකි. විමුක්තිය අත්පත් කර ගැනීමට නම් තමාගේම යථාර්ථය කුමක්දැයි පුද්ගලයා විසින්ම අවබෝධ කර ගත යුතුය. මෙම අවබෝධය ඇති කර ගැනීමෙහිලා පුද්ගලයාට අත්වැලක් සැපයීම බුදුන් වහන්සේගේ අරමුණ විය. බුදුරජාණන් වහන්සේ මාර්ගය කියා දෙන්නෙක් පමණි. එහි යාම පුද්ගලයාගේ වගකීමකි.

"තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා"

"විමුක්ති මාර්ගයෙහි නිරත වීම ඔබේ කාර්යයි. තථාගතවරු මාර්ගය කියා දෙති."

ඉහත සඳහන් කළ පුද්ගලයා පිළිබඳ විවිධ විශ්ලේෂණ බුදුරදුන් වහන්සේ විසින් ඉදිරිපත් කොට ඇත්තේ යථොක්ත දෘෂ්ටිවාද දෙකට නො පැමිණ තමා පිළිබඳ යථාර්ථය අවබෝධ කොට ගෙන නිර්වාණය සාක්ෂාත් කර ගැනීමට උපකාර කිරීමක් වශයෙනි. මෙම ගාථා ධර්මයෙන් කියැවෙන නියම මුනිවරයා නම් හුදු මොනෙය්‍ය වත රකින්නා නොව ආධ්‍යාත්මික බාහිර ලෝකය වශයෙන් තමා පිළිබඳවම නුවණින් විමසා බලන්නාය.



සතුන් පෙළන - නසන තැනැත්තා අරිය නම් නො වේ. සිල් සතුනට හිංසා නො කැරැ වැළකීම අරිය ගතිය ය.

270. න තෙන අරියො හොති
යෙන පාණානි හිංසති
අහිංසා සබ්බපාණානං
අරියො'ති පවුච්චති (19:15)

නසන්නෙක් පරපණ
උතුමෙක් නොවේ කිසි දින
සවුසත නොම නසන
නිසාවෙන් හේ අරිය නම් වන

නැති නම් හිංසා අනුනට - අරිය ගුණය ඇත ඔහු හට

19 (9) අරිය නමැති බිලී වැද්දා (270 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **අරිය** නම් වූ මසුන් මරන්නකු අරභයා මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

මේ අරිය නමින් හැඳින්වුණු මසුන් මරන්නා ජීවත් වූයේ සැවැත් නුවර නැගෙනහිර දිසා දොරටුව ආසන්නයෙහි වූ ගමකය. සිරිත් පරිදි භාග්‍යවතුන් වහන්සේ උදෑසන මහා කරුණා සමාපත්තියෙන් ලොව බලා වදාරණ සේක් එක් දිනක් මේ මසුන් මරන්නා සෝවාන් ඵලයට පැමිණීමට තරම් හේතු වාසනා ඇත්තකු බව දක්නට ලැබිණ. එදින පෙරවරුයෙහි පිඬු සිඟා වැඩම කොට ආපසු එන ගමනේ දී භික්ෂූන් වහන්සේ ද සමඟ එම මසුන් මරන්නා මසුන් මරමින් සිටි තැනට වැඩම කළ සේක. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේ සමඟ වඩිනු දුරදීම දුටු මසුන් මරන්නා ඉක්මණින් මසුන් මරන උපකරණ පසෙකට දමා දිව අවුත් බුදුන් වැඳ පසෙකින් සිටියේය.

බුදුරජාණන් වහන්සේ සෙසු භික්ෂූන් වහන්සේලා ඉදිරියේදීම මසුන් මරන්නාගේ නම ඇසූ සේක. "ස්වාමීනි, මම අරිය නම් වෙමැ"යි හෙතෙම පිළිතුරු දුන්නේය. ඔහු ඇමතූ භාග්‍යවතුන් වහන්සේ, "අරිය නමින් හඳුන්වන්නේ අනුනට හිංසා පීඩා නොකරන, සියලු සතුන් කෙරෙහි අනුකම්පාව පතුරන උත්තම පුද්ගලයකුටය. මසුන් අල්ලමින් පරපණ නසන ඔබට අරිය නම නොගැලපෙයි. නියම ලෙසින් අරිය වීමට නම් සියලු ප්‍රාණීන් කෙරෙහි හිංසාවෙන් වැළකී මෛත්‍රී දයා කරුණාදි ගුණ ඇති කර ගත යුතුයැ"යි ධර්ම දේශනා කරමින් යථොක්ත ගාථා ධර්මය දේශනා කළ සේක. මසුන් මරන්නා ධර්මය අසා සෝවාන් ඵලයට පැමිණියේ ය.

විවරණාත්මක අනුවාදය (270 ගාථාව)

යෙන පාණානි හිංසති තෙන අරියො න හොති
සබ්බපාණානං අහිංසා අරියො ඉති පවුච්චති

යෙන: යම් කරුණකින්; **පාණානි**: ප්‍රාණීන්; **හිංසති**: නසයි ද; **තෙන**: එහෙයින්; **අරියො**: ආර්‍ය්‍ය නම්; **න හොති**: නොවෙයි; **සබ්බපාණානං**: සියලු ප්‍රාණීන්ට; **අහිංසා**: හිංසා නොකිරීම් හේතුවෙන්; **අරියො ඉති**: අරිය යයි; **පවුච්චති**: කියනු ලැබේ.

යම් කෙනෙක් සතුන් මරන්නේ නම් හෙතෙම ආර්‍ය්‍යයෙක් නොවේ. සියලු ප්‍රාණීන්ට හිංසා නොකිරීමෙන් ආර්‍ය්‍ය යයි කියනු ලැබේ.

විවරණය

අහිංසා: බෞද්ධ සදාචාර ධර්ම පද්ධතියෙහි යටින් දිවෙන නූලක් මෙන් ඒ සියල්ල එක්කොට ගන්නා මූල ධර්මයක් ලෙස අහිංසාව හැඳින්විය හැකිය. බෞද්ධ ගිහි සදාචාරයෙහි මෙන්ම පැවිදි සදාචාරයෙහි ද මුල් අංකයට එන්නේ සතුන් මැරීමෙන් හා හිංසා පීඩා කිරීමෙන් වැළකීමයි. බෞද්ධයකුගේ නිත්‍ය පංචශීලයෙහි පළමු ශික්ෂාපදය අවිහිංසාවට සම්බන්ධ වෙයි. බෞද්ධ විමුක්ති මාර්ගයෙහි යෙදෙන භික්ෂූන් වහන්සේ ද තම ශික්ෂණයෙහි පළමු අංකය ලෙස සලකන්නේ ද අවිහිංසාවයි. බෞද්ධ ධර්මයන් හි එය මෙසේ දක්වා ඇත."පරපණ නැසීමෙන් වෙන් වූයේ, අත්හළ දඬු මුගුරු ඇත්තේ සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පාවෙන් වෙසෙයි."

සතුන්ට හිංසා පීඩා කිරීම කෲර බවේ ලක්ෂණයකි. බෞද්ධ විමුක්තිගාමී මාර්ගයට එළඹිය හැක්කේ මෘදු මොළොක් හදවතක් ඇත්තෙකුට ය. ද්වේෂයෙන් දූෂිත වූ හදවතක් ඇත්තා දරුණු රළු පුද්ගලයෙක් වෙයි. හෙතෙම අති දරුණු වූ භයානක සත්වඝාතනාදියෙහි යෙදෙයි. අවිහිංසාව නිතරම මෛත්‍රිය සමඟ සම්බන්ධ වන්නකි. මෛත්‍රී භාවනාවේ දී "**ඛ්‍යාරොසනා පටිඝසඤ්ඤා නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය**" යනුවෙන් දක්වා ඇත්තේ ද්වේෂ සහගත සිතින් ඔවුනොවුන්ගේ දුක නොකැමැති වන්නේය"යි කියැවෙයි. එය අවිහිංසාවෙන් යුක්ත මෛත්‍රී සහගත පුද්ගලයකුගේ ලක්ෂණකි.

පුද්ගලයකුට සත්වඝාතනාදියෙන් තොරව අවිහිංසකව සිටීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් අත්තූ පනායික ක්‍රමය ඉදිරිපත් කොට තිබේ. තමා සම්බන්ධයෙන් සිතා අනුන් තමාට උපමා කොට ගෙන ප්‍රාණඝාතනයෙන් වැළකී සිටින ලෙස බුදුන් වහන්සේ විසින් අනුශාසනා කරන සේක.

"අත්තානං උපමං කත්වා-න හනෙය්‍ය න ඝාතයෙ"

"තමන් උපමා කොට ගෙන අනුන් නොමරන්නේ ය. නොමරවන්නේ ය."

තමා ඝාතනයට හිංසනයට අකැමැති වන්නාක් මෙන් අනුන් ද ඝාතනයට හා හිංසනයට නොකැමැති වෙති. එබැවින් තමා නොකැමති හිංසාව අනුනට ද නොකළ යුතුය. බුදු සමයෙන් ඉගැන්වෙන 'සමානත්තා' නමැති ගුණය ද මෙම අවිහිංසාවට ම සම්බන්ධය. හැම කෙනකුම තමා හා සමාන කොට සලකන්නේ නම් එවිට පුද්ගලයන් තුලින් හිංසක ගති ඉවත් වෙයි. ආර්ය පුද්ගලයකු විය හැක්කේ එබඳු අවිහිංසාවෙන් යුක්ත තැනැත්තාට ය.

කෙළෙස් කෙළවර නො කොට (රහත්පල නො පැමිණ) සසරින් එතරවීම නො හැකි බව සලකන්න.

271. න සීලබ්බතමත්තෙන
බාහුසච්චෙන වා පුන
අථ වා සමාධිලාභෙන
විවිච්ච සයනෙන වා (19:16)

බොහො දැනුම සිල්වත
ඇතිවද සිත සමාහිත
සයනයෙන් තොර වත
ගමන නම් තව නිමාවී නැත

නිකෙලෙස් වුව සිත - ඇතිවේ පැවිදි සුව සෙත

19 (10) තෙරණුවෝ බොහෝ දෙනෙකු ගේ කථාව (ගාථා අංක 271 සිට 272)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ **භික්ෂූන් වහන්සේ පිරිසක්** අරභයා මේ ගාථාද්වය දේශනා කළ සේක.

මේ භික්ෂු පිරිසෙහි ඇතැම් අය විනය ප්‍රතිපත්ති හා ධූතාංග වැනි ශීලව්‍රත සමාදන්ව ඒවා ඉතා උත්කෘෂ්ට තත්වයෙන්ම සම්පූර්ණ කරන්නෝය. ඇතැම් අය පර්‍යාප්ති ධර්‍මය පිරිවහමින් බහුශ්‍රැතව වසන්නෝය. තවත් අය බවුන් වඩා සිත එකඟ කිරීමෙන් ධ්‍යාන ලබා සිටින්නෝ ය. මේ පිරිස තම තමන් ප්‍රගුණ කරනු එම පිළිවෙත් කෙරෙහිම සිත යොදා සිටිනු විනා කෙලෙසුන් ක්ෂය කොට විමුක්ති සුවය අවශ්‍ය විටෙක ලබා ගැනීම අමාරු නැතැයි සිතමින් එය පසුවට කල්තබා වසන්නෝය. මේ භික්ෂු පිරිස එක් දිනෙක දෙව්රම් වෙහෙරට පැමිණ බුදුන් හමුව වැඳ පුදා පසෙක හිඳ ගත්හ.

බුදුරජාණන් වහන්සේ ඔවුන් සමඟ සාකච්ඡා කරමින් මේ වන විට ඔවුන් තම ශ්‍රමණ කාර්‍යභාරය කෙතෙක් දුරට නිමා කොට ඇත්දැයි ඔවුන්ගෙන් විමසු සේක. භික්ෂූහු "ස්වාමීනි, අපි මේ මේ ප්‍රමාණයන් ප්‍රගුණ කොට ඇත්තෙමු. එම නිසා කෙලෙසුන් නිසා රහත් වීමට අපට වැඩි දුෂ්කරතාවක් නොවනු ඇතැයි සිතමින් ඒ ගැන අනුත්සුකව සිටිමු"යි පැවසූහ. භික්ෂූන් ගෙන් මේ තොරතුරු දැන ගත් භාග්‍යවතුන් වහන්සේ, "මහණෙනි, ශීලව්‍රත සම්පූර්ණ කිරීමෙන් හෝ ධර්‍මය පිළිබඳ බහුශ්‍රැත භාවයෙන් හෝ ධ්‍යාන වඩා සමාධි ප්‍රතිලාභයෙන් හෝ කෙලෙසුන් දුරු කළ උතුමන් විසින් විඳිනා නෛෂක්‍රම්‍ය සුඛය පිළිබඳ ආත්ම විශ්වාසයක් කෙලෙසුන් ක්ෂය නොකරන භික්ෂුවට අත්පත් නොවේ" යි පවසමින් යථොක්ත ගාථා ධර්‍ම දෙකින් දම් දෙසූ සේක.

විවරණාත්මක අනුවාදය (271 ගාථාව)

සීලබ්බතමත්තෙන පුන බාහුසච්චේන වා අථ වා
සමාධිලාභෙන විවිච්ච සයනෙන වා

සීලබ්බතමත්තෙන: ශීලයෙන් හා ව්‍රතයෙන් යුත් පමණින් (වත්); **පුන**: නැවත; **බාහු සච්චේන වා**: බොහෝ ඇසූ පිරූ තැන් ඇති බැවින් (වත්); **අථ වා**: නොහොත්; **සමාධිලාභෙන**: රූපාරූප අෂ්ට සමාපත්ති ලාභී පමණකින් හෝ; **විවිච්චසයනෙන වා**: කාය විවේකයෙන් විසීමෙන් හෝ;

සිල් පමණින් හෝ ව්‍රත පමණින් ද, බහුශ්‍රැතියෙන් ද, නො එසේ නම් සමාධි ලැබීමෙන් ද, විවේක වාසයෙන් ද, රහත් ඵල ලැබීම අපහසුය.

විවරණය

නෙක්ඛම්ම සුඛං: නෛෂ්ක්‍රමය සුඛය ලෙස සැලකෙන්නේ කම් සැපතින් සම්පූර්ණයෙන් ඉවත් වීමෙන් හෙවත් කෙලෙසුන්ගෙන් මිදීමෙන් අත්පත් කර ගන්නා නිර්වාණ සුවයයි. විමුක්තිය අත් කර ගැනීම සඳහා අදාළ ප්‍රතිපදාවක හැසිරීම උදෙසා ගිහි ගෙය අත්හැරීමට ද නිෂ්ක්‍රමණය කිරීමයයි කියනු ලැබේ. සිද්ධාර්ථ ගෞතම බෝසතුන් වහන්සේ රජ සැපත් අත්හැර ගිහි ගෙයින් ඉවත්ව අභිනිෂ්ක්‍රමණය කළ බව කියැවෙයි. නිෂ්ක්‍රමණයෙන් අත්පත් කර ගන්නා ක්ලෙශ ක්ෂය කිරීම නිසා කෙනකුට නෙක්ඛම්ම සුවය ලබාගත හැකිය. හුදෙක් ගිහිගෙය අත් හැරීම නිසාම හෝ ගිහිගෙයින් නික්ම ශීලව්‍රත චාරිත්‍ර ආදිය පිරීම නිසාම හෝ බණ දහම් උගෙනීමෙන් ලබා ගන්නා බහුශ්‍රැත භාවය ඇති නිසා හෝ භාවනාවන් හි නිරතව ධ්‍යානඵල ලබා ගැනීම නිසාම නෛෂ්ක්‍රම්‍යගේ නිසි ප්‍රතිඵල ලැබුනේ නම් නොවෙයි.

නිකෙලෙස් සුවය උදෙසා - නිසැක විය යුතුය නොලසා

272. ඵුසාමි නෙක්ඛම්මසුඛං
අපුථුජ්ජන සෙවිතං
භික්ඛු විස්සාසමාපාදි
අප්පත්තො ආසවක්ඛයං (19:17)

විඳිනෙමි කාමයෙන් වෙන් වීමේ සුවය
එය නිසැකයෙන් නිකෙලෙස් අයටම සතුය
මෙලෙසින් සිතන්නට නොමැතිව සිත සැකය
නොහැකිය මහණහට නොනැසුව කෙලෙස් බිය

කෙලෙස් මුල් උදුරා - ලබනු නිකෙලෙස් සුවය ඉඳුරා

19 (10) තෙරුණුවෝ බොහෝ දෙනෙකු ගේ කථාව (ගාථා අංක 271 සිට 272)

විවරණාත්මක අනුවාදය (272 ගාථාව)

අපුථුජ්ජන සෙවිතං නෙක්ඛම්මසුඛං ඵුසාමි භික්ඛු
ආසවක්ඛයං අප්පත්තො විස්සාසං මා ආපාදි

අපුථුජ්ජන සෙවිතං: පෘථග්ජනයන් විසින් නොසෙවුනා ලද; **නෙක්ඛම්මසුඛං**: විරාගී සුවය හෙවත් අනාගාමි ඵල සුවය; **ඵුසාමි** (ඉති) විඳිමියයි; **භික්ඛු**: මහණ; **ආසවක්ඛයං**: කෙලෙසුන් ක්ෂය කිරීමට; **අප්පත්තො**: නොපැමිණි තැනැත්තේ; **විස්සාසං**: විශ්වාසයට; **මා ආපාදි**: නොපැමිණෙන්නේය.

රහත් බවට නොපැමිණ ආර්යයන් ලත් නෙක්ඛම්ම සැපය ලබමි, භවය කෙටි වී යැයි විශ්වාස නොකළ යුතුය.

විවරණය

අපුථුජ්ජන සෙවිතං: පෘථග්ජන නොවන පුද්ගලයන් විසින් ඇසුරු කරන ලද යන අරුත්ය. පෘථග්ජන යනුවෙන් ගැනෙන්නේ කෙලෙස් බහුල පුද්ගලයන්ය. නෙක්ඛම්ම සුඛය විඳගත හැකි වන්නේ කෙලෙසුන් දුරු කළ පුද්ගලයකුට පමණි. ලෝකෝත්තර මාර්ගඵලලාභී පුද්ගලයෝ පෘථග්ජන නාමයෙන් නොගැනෙති. 'අස්සුතවා පුථුජ්ජන-සුතවා අරිය සාවක' යනුවෙන් බුදු සමයේ දී පුද්ගලයෝ දෙවර්ගයක් ලෙස ගැනෙති.

ධර්මය පිළිබඳ මනා දැනුමක් නැති කෙලෙස් බහුල පුද්ගලයන්ට අස්සුතවා පුථුජ්ජන යන නම ලැබෙයි. ආර්ය මාර්ගයට එළඹුණු පුද්ගලයෝ සුතවා අරිය සාවක නම් වෙති. ආර්ය මාර්ගයෙහි සෝවාන් මාර්ග ඵලයන්ට පැමිණෙන පුද්ගලයා වුවද නෙක්ඛම්ම සුඛය ස්පර්ශ කරන්නෙකි. සෝවාන් මාර්ග ඵලයන්ගෙන් විමුක්තියේ ප්‍රවාහයට පුද්ගලයකු ඇතුළත් වන බැවින් ඔහුට මේ ආත්මයේම හෝ භව සතක් ඇතුළත හෝ නිසැකවම ක්ලෙශ ක්ෂය කොට නිවන් සුවය අත් කර ගත හැකිය.

ආසවක්ඛයං: ආශ්‍රවයන් ක්ෂය වීම යනුවෙන් අදහස් කරනුයේ සියලු කෙලෙසුන් දුරු කොට නිර්වාණාධිගමය ලැබීමය. නිවණ අත්පත් කර ගැනීම සඳහා විනාශ කළ යුතු ආසව සතරක් කොට දැක්වෙයි.

1. **කාමාසව**; කාම වස්තූන් පිළිබඳව දක්වන ආශාව කාමාසව නම් වේ.
2. **භවාසව**; භාවයන්හි නැවත නැවත ඉපදීමේ ආශාව භවාසව නම් වේ.
3. **දිට්ඨාසව**; මිථ්‍යාදෘෂ්ටි ගැනීම දිට්ඨාසව නම් වේ.
4. **අවිජ්ජාසව**; අවිද්‍යාව හෙවත් චතුරාර්ය සත්‍යය නො දැනීම අවිජ්ජාසව නම් වේ.

මෙම චතුර්විධ ආශ්‍රවයන් දුරු කිරීම මගින් සිතින් සියලු ආකාර කෙලෙස් විනාශ වී යයි. ආසවක්ඛයඤාණය වුකලි බෞද්ධ විමුක්ති මාර්ගයෙන් උදා කර ගත හැකි ශ්‍රේෂ්ඨතම ප්‍රතිලාභය වෙයි. පුද්ගලයා සසර තුළ රඳවා ගැනීමට ප්‍රධාන වශයෙන් හේතු වන ක්ලෙශ ධර්ම සතරක් ඉහත සඳහන් පරිදි ආසව නමින් සැලකෙයි. එයින් කාමසවය ලෝකයෙහි පවත්නා පංචකාම විෂය වස්තූන්හි පුද්ගලයා රඳවා තබයි. අපේ බාහිර ඉඳුරන් පහට පිළිවෙලින් විෂය වන කාමවස්තු පසක් බාහිර ලෝකයෙහි පවතියි.

චක්ඛු (ඇස), **සොත** (කණ), **ඝාන** (නාසය), **ජිව්හා** (දිව) හා **කාය** (ශරීරය)

මේ පුද්ගල බද්ධ ඉන්ද්‍රියන් පහයි. මේ ඉන්ද්‍රිය පහට අනුකූලව වූ කාම වස්තු පහක් බාහිර ලෝකයෙහි ඇත.

රූප (රූපය), **සද්ද** (ශබ්දය), **ගන්ධ** (ගඳ සුවඳ), **රස** (රසය), හා **පොට්ඨබ්බ** (ස්පර්ශය)

මේවා බාහිර ලෝකයෙහි පවත්නා විෂය වස්තු පහයි. මේවා ,පංච කාම වස්තු නමින් හැඳින්වෙන්නේ මේවා අරභයා අනුකූල ඉන්ද්‍රිය මගින් සිතෙහි කාමය හෙවත් ආශාව, ඇලීම, බැඳීම ඇති කර ගන්නා බැවිනි. ඇත්ත වශයෙන්ම එය මෙම වස්තුවල පවත්නා වරදක් හෝ දෝෂයක් නොවේ. මෙම වස්තූන් පිළිබඳ තත්වාවබෝධයක් නොමැති පුද්ගලයා ඒවා නිත්‍ය, සුභ, සුඛ වශයෙන් සිතා ඒවාට බැඳෙයි. එබැවින් කාමාසවය වූ කලි පුද්ගලයා තම සිත තුළින්ම ඇති කරගන්නකි. මේ නිසා බුදුන් වහන්සේ සුත්තනිපාතයේ දී මෙසේ පවසති.

න තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ - සංකප්පරාගො පුරිසස්ස කාමො

"ලොව ඇති විසිතුරු දෙය කාමයෝ නොවෙති. පුද්ගලයාගේ කාමය වනාහි මානසික වශයෙන් සංකල්ප මගින් තනා ගන්නා රාගයයි. ප්‍රිය වූ රූපයක් ඇසින් දැක මෙම ප්‍රිය රූපයෙහි ඇලෙයි. එය වර්ණනා කරයි. එහි බැසගෙන සිටියි. එවිට ඔහු ගේ මනසෙහි රාගය නොහොත් කාමය මුල් බැස ගනියි." මජ්ඣිම නිකාය මහා තණ්හාසංඛය සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ මේ තත්වය ඉතා සිත් ගන්නා සුලු අයුරින් පැහැදිලි කර දී ඇත.

භවාසව යනුවෙන් හැඳින්වෙන්නේ ද තෘෂ්ණාවේම තවත් අංශයකි. කාමාසවය, කාම තෘෂ්ණාව වශයෙන් ද හැඳින්විය හැකි අතර භවාසවය, භවතෘෂ්ණාව වශයෙන් හැඳින්විය හැකිය. පුද්ගලයා උත්පත්ති භවයන්හි ආශාවකට ඇලීමකට පත් කිරීම ද තෘෂ්ණාවේ ලක්ෂණයකි. ධම්ම චක්කප්පවත්තන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ තෘෂ්ණාව පැහැදිලි කරමින් මෙසේ වදාළ සේක.

"යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභි නන්දිනි"

"පුනර්භවය ඇති කරවන ඇලීම් ස්වභාවය ඇති ඒ ඒ තන්හි පුද්ගලයා සතුටු කරවන ඒ මේ තෘෂ්ණාවයි"

භවාසවයේ දී භව නමින් සැලකෙනුයේ උත්පත්ති භවයයි. භවය ප්‍රධාන වශයෙන් කාම භවය, රූප භවය හා අරූප භවය හා අරූප භවය යනුවෙන් කොටස් තුනකට වෙන් කොට දක්වා තිබේ. මෙයින් කවර භවයකට හෝ ඇල්ම කිරීම භවාසව නමි.

දිට්ඨි ආසවය නමින් සැලකෙන්නේ මිථ්‍යා දෘෂ්ටියයි. ප්‍රධාන වශයෙන් ආත්මයක් ඇත යනුවෙන් ගන්නා ලද වැරදි අවබෝධය පාදක කර ගෙන මෙම දෘෂ්ටිය ඇති වෙයි. සස්සත දිට්ඨි, උච්ඡේද දිට්ඨි, යනුවෙන් දෘෂ්ටිය දෙවැදෑරුම් වෙයි. පුද්ගලයා තුළ ආත්මයක් ඇත. එය වෙනසකට භාජනය නොවේ. නිත්‍යය, සුභය, සුඛය වශයෙන් ගැනීම සස්සත දිට්ඨියයි. පුද්ගලයාගේ මරණයෙන් සියල්ල අවසන් වේ. මරණයෙන් පසු කිසිදු ආකාරයක පුනර්භවයක් පුද්ගලයාට නැතැයි තරයේ මතයක එල්බ සිටීම උච්ඡේද දෘෂ්ටියයි. මෙම දෙවැදෑරුම් මිථ්‍යාදෘෂ්ටියම දිට්ඨාසව නම් වේ.

අවිජ්ජාසවය වුකලී පුද්ගලයා තුළ පවත්නා මුළාවයි. යථාර්ථය දැකීමට බාධකව පවත්නා මානසික තත්වයක් අවිද්‍යාව නමින් සැලකෙයි. අවිද්‍යාව වුකලි සෑම පෘථග්ජන පුද්ගලයකුගේම සන්තානයෙහි ඉතා දැඩි සේ මුල් බැස ගෙන ඇති තත්වයකි. මේ නිසාම මෙය සිතින් ඉවත් කර දැමීම ඉතාම අපහසු ක්‍රියාවකි. ආර්යමාර්ගඵල පිළිවෙලින් සිතින් ඉවත් කර දැමෙන දස සංයෝජන අතරට ද අවිද්‍යාව අයත් වේ. අවිද්‍යාව ඉවත් කිරීමේ දුෂ්කරතාව කෙතෙක් ද යතහොත් අර්හත් මාර්ග යෙන් හැර වෙනත් මාර්ගඵලයකදී එය දුරු කිරීමට නොහැකි වෙයි. මෙම සතර විධ ආශ්‍රවයන් මුලිනුදුරා දැමෙන්නේ ආර්ය මාර්ගඵල පිළිවෙලිනි.

යථාතත්ත්වය පදනම් කොට ගත් දහම

බුදුසමයෙහි විශේෂ ලක්ෂණයක් වෙයි.
එනම් යම්කිසි සාමයික ආචාර්යවරයකුගේ ක්‍රමවත්
දර්ශනයකින් උද්ගත වූ එකම ආගම එය වීමයි.
බුදුසමය විසින් අපට ජීවිතයත් යථාතත්ත්වයත් පිළිබඳ
ප්‍රාථමික සත්‍යය උගන්වනු ලැබේ. බුදුසමය වූ කලී, යථාතත්ත්වය
පදනම් කොටගත් ජීවන දෘෂ්ටියක් නිසා උද්ගත වූ ජීවන මාර්ගයකි.
බුදුහිමියන්ගේ දර්ශන වාදයෙහි බුද්ධියේ හා ප්‍රඥාවේ
ස්වභාවය පිළිබඳව විවරණයක් නැත්තේ නොවේ.

ආචාර්ය කේ.එන්. ජයතිලක 'බුදුසමය සහ සාමය'

20 වන පරිච්ඡේදය

මග්ග වග්ග

අරිය අටගි මග සිවුසස් දහම් ද නිවණ හා බුදුරදු ද ඉතා උතුම් ය.

273. මග්ගාන'ට්ඨඞ්ගිකො සෙට්ඨො
සච්චානං චතුරො පදා
විරාගො සෙට්ඨො ධම්මානං
ද්විපදානඤ්ච චක්ඛුමා (20:1)

මගින් උතුම් නම් අරි අටැගි මගමය
ඇත්තෙන් උතුම් නම් සිවුසස් දහමමය
හැම දහමින් උතුම් වන්නේ නිවණමය
දෙපා ඇත්තන්ගේ උතුමා බුදුන්මය

අරි අටඟි මග ශ්‍රේෂ්ඨය

20 (1) පන්සියයක් තෙරවරු පිළිබඳ පුවත (273 සිට 276 දක්වා ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩවසන භාග්‍යවතුන් වහන්සේ **පන්සියයක් තෙරවරුන්** අරභයා මෙම ගාථාද්වය වදාළ සේක.

ලෝක සත්ත්වයාගේ යහපත සඳහා ගම් නියම්ගම් නගර සැරිසරමින් ඒ ඒ පෙදෙස් වැස්සන් හමුව ඔවුනට දහම් දෙසීම බුදුරජාණන් වහන්සේගේ සිරිතකි. වරක් භික්ෂූන් වහන්සේ පිරිවරා එසේ දනවු සැරිසරා බුදුරජාණන් වහන්සේ ආපසු දෙව්රම් වෙහෙරට ම වැඩම කළ අවස්ථාවක එම දනවු සැරිසැරීමට සහභාගී වූ භික්ෂූන් වහන්සේලා පන්සිය දෙනෙක් විහාරයෙහි සන්නිපාත ශාලාවට රැස්ව තමන් බුදුන්වහන්සේ කැටුව ගිය ගමන පිළිබඳව සාකච්ඡා කරමින් සිටිය හ. උන්වහන්සේ ලා කථා කළේ බොහෝ කොටම ගමන් මාර්ගයෙහි තමන් අත්දුටු දේ පිළිබඳවය. අසුවල් මාර්ගය ගමනාගමනයට සුදුසු ය. අසුවල් මාර්ගය ගල් බොරළු රහිතව මනාව පිහිටියේ ය. අසුවල් මාර්ගයෙහි ගමනාගමනය අපහසු ය. මේ ආදී කථා උන්වහන්සේලා ගේ මාතෘකාව විය.

මෙම භික්ෂූන් වහන්සේලා මාර්ගඵල අධිගමයෙහි සුදුසු කම් ඇති පිරිසක් වූ බැවින් බුදුන් වහන්සේ එතැනට වැඩම කොට ඔවුනට සුදුසු දහමක් දෙසීමට අදහස් කළ සේක. එබැවින් භික්ෂු පිරිස රැස්ව සිටි ශාලාවට වැඩම කොට පණවා තිබූ අසුනෙහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ, "මහණෙනි, මා මෙහි එන විට කුමන කථාවකින් යුක්තව සිටියහුදැ" යි විමසූ සේක. භික්ෂූන් වහන්සේ ද තමන් කථා කරමින් සිටි කරුණු උන්වහන්සේ හමුවෙහි තැබූ හ. භික්ෂූන් ඇමතූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මෙබඳු කථා භික්ෂූන්ට නොසුදුසු ය. මාර්ගයන් පිළිබඳව කථා කරන්නේ නම් කථා කළ යුත්තේ ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිබඳවය. සියලු මාර්ග අතුරෙන් ශ්‍රේෂ්ඨ වන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.

මෙම මාර්ගය දැන එහි ගමන් කිරීමෙන් සව් කෙලෙසුන් නසා නිර්වාණ සුවයට පැමිණෙන්නේය යි වදාරමින් යථොක්ත ගාථාද්වයෙන් ධර්ම දේශනා කළ සේක. දේශනාව කෙළවර බොහෝ භික්ෂූන් වහන්සේ මාර්ග ඵලාධිගමය කළ හ.

විවරණාත්මක අනුවාදය (273 ගාථාව)

මග්ගානං අට්ඨඞ්ගිකො සෙට්ඨො සච්චානං චතුරො පදා
ධම්මානං විරාගො සෙට්ඨො ද්විපදානඤ්ච චක්ඛුමා

මග්ගානං: මාර්ගයන් අතුරෙන්; **අට්ඨඞ්ගිකො**: ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය; **සෙට්ඨො**: ශ්‍රේෂ්ඨය; **සච්චානං**: සත්‍යයන් අතුරෙන්; **චතුරො පදා**: චතුරාර්ය සත්‍යය ශ්‍රේෂ්ඨය; **ධම්මානං**: සියලු ධර්මයන් අතුරෙන්; **විරාගො**: විරාග ධර්මය (නිර්වාණය); **සෙට්ඨො**: ශ්‍රේෂ්ඨය; **ද්විපදානඤ්ච**: දෙපා ඇති සතුන් අතුරෙන්; **චක්ඛුමා**: පසැස් ඇත්තේ (බුදුරජාණන් වහන්සේ); **සෙට්ඨො**: ශ්‍රේෂ්ඨය.

මාර්ගයන්ගෙන් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයම උතුම් වේ. සත්‍යයන් අතුරෙන් චතුරාර්ය සත්‍යයම උතුම් වේ. සියලු ධර්මයන් අතුරෙන් විරාග ධර්මයම (නිවණ) උතුම් ය. දෙපා ඇත්තවුන් අතුරෙන් ප්‍රඥා ඇස ඇති බුදු රජාණන් වහන්සේම උතුම් සේක.

විවරණය

විරාගො සෙට්ඨො ධම්මානං: සංඛත වූ ද අසංඛත වූද සියලු ධර්ම අතුරෙහි නිර්වාණය නම් වූ විරාග ධර්මය ශ්‍රේෂ්ඨය.

චක්ඛුමා: පසැස් ඇත්තා වූ බුදුරජාණන් වහන්සේ (මසැස, දිවැස, පැණැස, බුදු ඇස හා සමතැස පසැස් යනුයි.

නිවන දැකීමට අන් මගෙක් නැත. මේ අරි අටඟි මග මැ පිළිපදින්න.

274. එසො'ව මග්ගො නත්ථඤ්ඤො
දස්සනස්ස විසුද්ධියා
එතම්හි තුම්හෙ පටිපජ්ජථ
මාරස්සෙතං පමොහනං (20:2)

මෙයම මගය නැත අන් මාවතක් වෙන
දසුනය නිසැක පිවිතුරු බව ලබා දෙන
මේ මග පිළිපදිනු මහණෙනි සියලු දෙන
මෙය වියවුලයි මරුවා අවුලටම ලන

එකම මගක් නැත වෙන - පිවිතුරු බව ලබා දෙන

20 (1) පන්සියයක් තෙරවරු පිළිබඳ පුවත (273 සිට 276 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (274 ගාථාව)

දස්සනස්ස විසුද්ධියා මග්ගො එසො එව අඤ්ඤො
නත්ථි තුම්හෙ එතම්හි පටිපජ්ජථ එතං මාරස්ස
පමොහනං

දස්සනස්ස: දර්ශනයාගේ (ඥානදර්ශනයේ); **විසුද්ධියා**: පිරිසුදු බව සඳහා; **මග්ගො**: මාර්ගය; **එසො එව**: මෙයමය; (ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයයි), **අඤ්ඤො**: වෙනත් මාර්ගයක්; **නත්ථි**: නැත; **තුම්හෙ**: තෙපි; **එතම්හි**: මේ මාර්ගයෙහි; **පටිපජ්ජථ**: පිළිපදිව්; **එතං**: මෙය; **මාරස්ස**: මාරයා; **පමොහනං**: මුළා කරවන්නකි.

මාර්ගඵල සංඛ්‍යාත දර්ශනය (නුවණ) පිරිසිදු කර ගැනීමට මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය හැර වෙනත් මාර්ගයක් නැත. මහණෙනි, මේ මග පිළිපදින්න. මෙය මාරයා මුළාවට පමුණුවන්නකි.

විවරණය

එසොව මග්ගො නත්ථඤ්ඤො දස්සනස්ස විසුද්ධියා: ඥානදස්සන විසුද්ධිය ලැබීම සඳහා ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය හැර වෙනත් මාර්ගයක් නැත. බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා දෙනු ලැබූ මෙම මාර්ගයෙහි පිවිස ඥානදස්සන විසුද්ධිය ලබා ගනු කැමති අය ඒ සඳහා උපයුක්ත වන භාවනාමය ක්‍රියා මාර්ගය අනුගමනය කළ යුත්තෝ ය.

ඥානදස්සන විසුද්ධිය වූ කලී පියවර සතකින් සමන්විත වූ පාරිශුද්ධි පිළිවෙතක සත්වැන්නයි. පිවිතුරු බව ක්‍රමානුකූලව ලබා දෙන මෙම පියවර සත සප්ත විසුද්ධි නමින් හඳුන්වනු ලැබෙයි. සප්ත විසුද්ධිය මෙසේ ය.

1. **සීල විසුද්ධි** (ශීලයෙන් පිවිතුරු වීම)
2. **චිත්ත විසුද්ධි** (සිතේ පිරිසිදු බව)
3. **දිට්ඨි විසුද්ධි** (දෘෂ්ටි දුරු කොට ලබන පිරිසිදු බව)
4. **කඞ්ඛාවිතරණ විසුද්ධි** (සැක දුරලීමෙන් ලැබෙන පිරිසිදු බව)
5. **මග්ගා මග්ග ඥාණදස්සන විසුද්ධි** (හරි-වැරදි මාර්ගය පිළිබඳව දැනුමේ සහ දැකුමේ පිරිසිදු බව)
6. **පටිපදා ඥාණදස්සන විසුද්ධි** (ප්‍රතිපදාව පිළිබඳව දැනුමේ සහ දැකුමේ පිරිසිදු බව)
7. **ඥාණදස්සන විසුද්ධි** (ආර්ය මාර්ගය පිළිබඳව දැනුමේ හා දැකුමේ පිරිසිදු බව)

1 **සීලවිසුද්ධි**: සදාචාරයේ පාරිශුද්ධිය: දුරාචාරයෙන් අපිරිසිදු වූ පුද්ගලයා නිබඳව ම ජීවත් වන්නේ බියකිනි. තමා කළ වැරදි නිසා අනුන්ගේ දඬුවමට, නින්දා අපහාසයට, රොස් පරොස් බිණුමට තමා ලක් වෙතැයි හෙතෙම බිය වෙයි. මේ හැර තමාගේ හෘදය සාක්ෂිය තමාටම නිතර දොස් නඟයි. තමා කළ වරද පිළිබඳව තමාටම දොස් නඟන මනසක් ඇති කෙනෙකුට චිත්ත පාරිශුද්ධිය සඳහා වූ භාවනාමය කටයුත්තක යෙදීම දුෂ්කරය. කෙතරම් උත්සාහ කළ ද තමන් කරන ලද වැරදි නිබඳව ම ඔහු ගේ සිතට වද දීමට පටන් ගනියි. එබැවින් සිත එකලස් කරගෙන භාවනාවෙහි යෙදීම දුෂ්කර වෙයි.

නිසරු පොළවක සිටවූ ගසක් මනාව පල නොදරන්නාක් මෙන් සදාචාර පාරිශුද්ධියක් නැති පුද්ගලයාට චිත්ත පාරිශුද්ධිය ඇතිකර ගැනීම අතිශයින් දුෂ්කරය මේ නිසා භාවනාව මාර්ගයෙන් උසස් ප්‍රතිඵල ලබනු රිසි වූ යෝගාචාර තෙමේ වගාව සඳහා ක්ෂෙත්‍රය සූදානම් කරන ගොවියකු පරිද්දෙන් තමා භාවනාවෙහි ලා සුදුස්සකු කර ගත්තේ ය. තමන් ගිහියෙක් නම් ගිහියකුට අදාළ සුචරිතයෙහි නිරත විය යුතුය. භික්ෂුවක් නම් චතුපාරිශුද්ධි ශීලයෙන් පිරිසිදු බවට පත් විය. ගිහියා යටත් පිරිසෙන් නිත්‍ය පංචශීලය ආරක්ෂා කරන්නෙක් විය යුත්තේ ය.

මනසින් කෙලෙස් දුරු කිරීමේ ප්‍රථම පියවර වන්නේ කය වචන යන දොරටු දෙකින් සිදුවන වැරදි වලින් තොර වීමයි. සිතට කෙලෙස් ගලා එන මාර්ග දෙකක් වශයෙන් කය හා වචනය දැක්විය හැකිය. මෙම ද්වාර දෙකින් සිදුවන වැරදි වලින් දුරු වීම පංචශීලයෙන් සිදු කෙරේ. එබැවින් ගිහි වේවා පැවිදි වේවා ආධ්‍යාත්මික පාරිශුද්ධි මාර්ගයේ ප්‍රථම පියවර ලෙස සදාචාර පාරිශුද්ධිය හැම කෙනකු තුළම පැවතීම අනිවාර්ය අවශ්‍යතාවක් වෙයි.

ඊළඟ පිටුව හා සම්බන්ධයි

මේ අරි අටඟි මඟ පිළිපදින්න, මා විසින් කෙළෙස් නමැති උල් උදුරන මේ මග දැන කියන ලදී

275. එතම්හි තුම්හෙ පටිපන්නා
දුක්ඛස්සන්තං කරිස්සථ
අක්ඛාතො වෙ මයා මග්ගො
අඤ්ඤාය සල්ලසන්ථනං (20:3)

මේ මග අනුව යන
අය වෙති දුක නිමා වන
හුල් ඉදිරීම දැන
කියා ඇත මග මවි සින

පිළිපන් අය මගෙන් - නිමාවට එති දුකෙහි

20 (1) පන්සියයක් තෙරවරු පිළිබඳ පුවත (273 සිට 276 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (275 ගාථාව)

එතම්හි පටිපන්නා තුම්හෙ දුක්ඛස්ස අන්තං කරිස්සථ
මයා වෙ සල්ලසන්ථනං අඤ්ඤාය මග්ගො අක්ඛාතො

එතම්හි: මේ මඟට; **පටිපන්නා**: පිළිපන්නා වූ; **තුම්හෙ**: නුඹලා; **දුක්ඛස්ස**: දුකෙහි; **අන්තං කරිස්සථ**: කෙළවර කරන්නහුය; **මයා**: මවිසින්; **වෙ**: ඒකාන්තයෙන් ම; **සල්ලසන්ථනං**: (කෙලෙස් නමැති) උල් උපුටාලන; **මග්ගො**: ආර්‍ය්‍ය මාර්ගය; **අඤ්ඤාය**: දැන; **අක්ඛාතො**: ප්‍රකාශ කරන ලදි.

ඔබලා මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට පැමිණ සියලු සසර දුක් කෙළවර කර ගන්න. මා විසින් රාගාදී උල් උදුරාලන උපාය දැන නිත්‍ය වශයෙන් ම ඔබට ප්‍රකාශ කරන ලදි.

විවරණය

පෙර පිටුව හා බැඳේ

2. **චිත්ත විසුද්ධි**: මානසික පවිත්‍රතාව: බුදු දහමින් අනුමත වී ඇති විමුක්තිය වූ කලී යථාර්ථාවබෝධය ඇති වීම මගින් සාක්ෂාත් වන්නකි. වස්තූන් පිළිබඳ යථාතත්වාවබෝධය ඇති වීමට නම් මනස අතිශයින්ම පිවිතුරු විය යුතුය. විලක ඇති ජලය අතිශයින්ම පිවිතුරු වූ විට විල පතුලේ ඇති කැට කැබිලිති, ගල්, මාලු ආදී දෙය මනාව දැක ගත හැකි වෙයි. බොර දියක එසේ දැකිය නොහැක. එමෙන්ම අපිරිසිදු වූ මනසින් යථාර්ථය දැකිය නොහැක. විෂය වස්තූන්ගේ යථාර්ථය අවිද්‍යාව මගින් ආවරණය කොට ඇත. චිත්ත විසුද්ධියෙන් කෙරෙන්නේ ක්‍රමානුකූලව සිතෙහි අවිද්‍යාව දුරු කරවීමේ ක්‍රියා මාර්ගයකි. සිත අපිරිසිදු කරන නීවරණ ධර්මයන් සිතින් ඉවත් කිරීමෙන් සිතේ බෙහෙවින් පිරිසිදු බවක් මෙන්ම මෘදු මොලොක් බවක් ද උදාවෙයි. තමන් කැමති අතකට සිත යොමු කරවීම සඳහා සිතේ කර්මණ්‍යතාව අවශ්‍යතාවකි. මෙම තත්ත්වය සිතෙහි ඇති කර ගැනීම සඳහා පංචනීවරණ ධර්ම සිතෙන් ඉවත් කළ යුතු වෙයි. ඒවා මෙසේ ය.

1. කාමච්ඡන්ද - කාම වස්තූන් කෙරෙහි ඇති ආශාව
2. ව්‍යාපාද - ද්වේෂය
3. ථීන මිද්ධ - කයෙහි හා සිතෙහි උදාසීනතාව
4. උද්ධච්චකුක්කුච්ච - මානසික නොසන්සුන්තාව
5. විචිකිච්ඡා - බුද්ධාදී අට වැදෑරුම් වස්තූන් පිළිබඳ සැකය.

චිත්ත විසුද්ධිය යනුවෙන් සඳහන් වන්නේ මෙම පංච විධ නීවරණ ධර්මයන් සිතෙන් ඉවත් කිරීමයි. මේවා ඉවත් කිරීමකින් තොරව මනසෙහි ඒකාග්‍රතාවක් පවත්වා ගත නොහැකිය. මානසික ඒකාග්‍රතාවට හෙවත් සමාධියට බාධා කරන අවුරාලන ධර්ම වශයෙන් නීවරණ හැඳින්වෙයි.

3. **දිට්ඨි විසුද්ධි**: සදාචාරයෙන් ශීල විසුද්ධියත් නීවරණ ප්‍රහාණයෙන් චිත්ත විසුද්ධියත් අත්පත් කර ගන්නා යෝගාවචරයා මීලඟට උත්සාහ කරනුයේ මනසේ මුල් බැසගෙන ඇති දෘෂ්ටි ඉවත් කරලීමෙන් පිවිතුරු බව ඇති කර ගනු සඳහාය. යථාර්ථය දැකීමට නම් යථාර්ථය අරභයා මනසේ තනා ගෙන ඇති විවිධාකාර දෘෂ්ටි ඉවත් කළ යුතු වෙයි. යථාර්ථය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති බැවින් පෘථග්ජන පුද්ගලයාගේ මනස තුළ ප්‍රධාන වශයෙන් ආත්ම දෘෂ්ටිය මුල් බැස ගෙන ඇත. දෘෂ්ටි වූ කලී මනසෙහි දැඩි සේ මුල් බැස ගෙන ඇති විශ්වාසයි. මේවා ඉවත් කිරීම පහසු නොවේ. අනාදිමත් සංසාරයක් සැරිසරන සත්වයා මුළු සංසාරය මුළුල්ලෙහිම ආත්මදෘෂ්ටිය හා බද්ධව සිටින්නෙකි. එබැවින් දෘෂ්ටි ඉවත ලෑම ඉතාම අපහසු දෙයකි.

ආත්මදෘෂ්ටිය යනු කුමක් ද? මෙයම සක්කාය දිට්ඨි යන නමින්ද හැඳින්වී ඇත. පුද්ගලයා තමා අරභයා කිසියම් ආත්ම හැඟීමක පිහිටා සිටී. උපතේ සිට මරණය තෙක් අඛණ්ඩව පැවතෙන ආත්මයක් තමා තුළ පවතියි. මෙම ආත්මය මරණයෙන් මතු වුව ද අඛණ්ඩවම භවගාමීව හැසිරෙයි. මෙබඳු හැඟීමක්-දෘෂ්ටියක් පුද්ගලයන් තුළ ඇත. මේ වූ කලී සදාතනික වූ ආත්මයක් ඇත යන ශාශ්වත දෘෂ්ටියයි.

උපතේ සිට මරණය තෙක් අඛණ්ඩව පවත්වනා ආත්මයක් තමා සතුව පවතියි. එය මරණයත් සමඟ සම්පූර්ණයෙන් විනාශ වී යයි. ඉන්මතු පුද්ගලයකු සත්වයකු වශයෙන් උපතක් නොලබයි. මෙබඳු වූ දෘෂ්ටියක් ද ඇතැම් පුද්ගලයන් සතුව ඇත. මෙය උච්ඡේද දෘෂ්ටියයි.

මෙම ශාශ්වත උච්ඡේද දෘෂ්ටි දෙකම ඇතිවන්නේ පුද්ගලයා තුළ පවත්නා අවිද්‍යාව නිසාය. වස්තු තත්වය හරිහැටි දකින්නා තුළ මෙබඳු තත්ත්වයක් ඇති නොවෙයි. බුදුරජාණන් වහන්සේ වස්තූන්හි යථාර්ථය මනාව දැන එය ලොව හමුවේ ප්‍රකාශයට පත් කොට ඇත. අනිත්‍ය දුක්ඛ අනාත්ම නොවන කිසිවක් ලොව නොපවතියි. මෙම ත්‍රිලක්ෂණය ප්‍රඥාවෙන් නොදකින පුද්ගලයා තුළ දුක පිළිබඳ නිර්වේදයක් ඇති නො වේ. දුක්ඛ නිර්වේදය නොමැති තැන දුක්ඛනිරෝධයක් නොමැත.

ආත්මදෘෂ්ටිය ඉවත් කර ගැනීමට අවශ්‍ය ධර්ම මාර්ගය බුදුරජාණන් වහන්සේ විසින් ඉදිරිපත් කොට ඇත. පුද්ගලයා නාමරූප, ස්කන්ධ, ධාතු ආයතන වශයෙන් විවිධ ලෙස විශ්ලේෂණයන්ට වෙන් කොට බෙදා දක්වා ඇත්තේ එම කොටස් තුළ හෝ එම කොටස්වලට බාහිරව හෝ ආත්ම නමින් ගත හැකි කිසියම් සාර පදාර්ථයක් නොමැති බව දැක්වීම සඳහාය. පුද්ගලයකු ගේ වේවා, ලොව පවත්නා අන් ඕනෑම වස්තුවක වේවා උපත, පැවැත්ම හා විනාශය සිදුවන්නේ ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මතාවට අනුකූලවය. ලෝකයේ යථාර්ථ පැවැත්ම පිළිබඳ මෙම ප්‍රතීත්‍යසමුත්පාද නියාමය බුදු සමයෙන් හැර අන් කිසිම දර්ශනයකින් විවරණය නොවෙයි. මෙය බුදුරජාණන් වහන්සේ විසින් වුවද අවබෝධ කර ගන්නා ලද්දේ ඉතාමත් දුෂ්කර සේය. මේ බව බුදුරජාණන් වහන්සේ අරිය පරියෙසන සූත්‍රයේ දී මෙසේ ප්‍රකාශ කරන සේක.

"අධිගතො ඛො මයා ධම්මො දුද්දසො දුරනුබොධො අතක්කාවචරො සන්තො පණීතො පණ්ඩිත වෙදනීයො යදිදං ඉදප්පච්චයතා පටිච්ච සමුප්පාදො"

"වස්තූන්ගේ හටගැන්ම පැවැත්ම හා නිරොධය පුද්ගලයකු මනාව දකී නම් තමා ගැන හෝ අන් කිසිවක් ගැන හෝ ආත්මදෘෂ්ටියක් ඇති කර නොගනී."

ශාශ්වත උච්ඡේද යන දෘෂ්ටි දෙකම ඔහු තුළින් ඉවත් වෙයි. එසේ දෘෂ්ටි ඉවත් වන විට වස්තූන් කෙරෙහි ආශා කිරීම්, ද්වේෂ කිරීම් ආදියෙන් ද ඉවත් වෙයි. සියලු ක්ලේෂ ධර්මයන්ට මූලික හේතුව වන්නේ වස්තූන් යථාර්ථ වශයෙන් නොගෙන දෘෂ්ටි වශයෙන් අල්වා ගැනීම නිසාය. භාවනාවේ දී මෙම දෘෂ්ටිය ඉවත් කර ගැනීමෙන් උදාවන විශුද්ධිය හෙවත් පවිත්‍ර බව දිට්ඨි විසුද්ධි නමින් ගැනෙයි.

ඊළඟ පිටුව හා සම්බන්ධයි



කෙළෙස් තැවීමට දැවීමට වෙර වඩන්න දැහැන භාවනා වඩා මර බැම්මෙන් මිදෙන්න.

276. තුම්හෙහි කිච්චං ආතප්පං
අක්ඛාතාරො තථාගතා
පටිපන්නා පමොක්ඛන්ති
ඣායිනො මාරබන්ධනා (20:4)

මෙහෙවර ඔබ අතය, ඔබ එහි යෙදෙනු නිති
බුදුවරු මග කියා දෙන ගුරුවරුම වෙති
පිළිපන්නාහු බැවුමෙහි යෙදවූ සිතැති
මරුබැම් කඩා ගෙන ඉන් ගැලවී ගනිති.

බුදු මග පිළිපන්නෝ - මරු බැම් බිඳලන්නෝ

20 (1) පන්සියයක් තෙරවරු පිළිබඳ පුවත (273 සිට 276 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (276 ගාථාව)

තුම්හෙහි ආතප්පං කිච්චං තථාගතා අක්ඛාතාරො
පටිපන්නා ඣායිනො මාරබන්ධනා පමොක්ඛන්ති

තුම්හෙහි: නුඹලා විසින් ම; **ආතප්පං**: (කෙලෙස් තැවීමේ) උත්සාහය; **කිච්චං**: කළ යුතුය; **තථාගතා**: බුදුවරු; **අක්ඛාතාරො**: (නිවන් මග) මග කියා දෙන්නෝ ය; **පටිපන්නා**: (නිවන් මඟට) පිළිපන්නා වූ; **ඣායිනො**: ධ්‍යාන වඩන්නෝ; **මාරබන්ධනා**: මාර බන්ධනයෙන්; **පමොක්ඛන්ති**: මනා සේ මිදෙන්නාහ.

නුඹලා විසින්ම කෙලෙස් තවන මේ වීර්‍ය්‍ය කළ යුතුය. බුදුවරු මග කියා දෙන්නෝ ය. මේ මග අනුගමනය කරමින් ධ්‍යාන වඩන උත්සාහවන්තයෝ මාරයාගේ බැඳීමෙන් මිදුනාහු වෙති.

විවරණය

පෙර පිටුව හා බැඳේ

4. **කඞ්ඛාවිතරණ විසුද්ධි**: සැක දුරු කර ගැනීමෙන් ඇති වන පිරිසිදු බව කඞ්ඛාවිතරණ විසුද්ධි නමින් සැලකී ඇත. විසුද්ධි මග්ගයෙහි බුද්ධඝෝෂ හිමියන්ට අනුව,"මේ නාම රූපයන්ගේ ම ප්‍රත්‍යය පිරිසිඳීමෙන් තුන් කල්හි පැවති සැක දුරු කර සිටි ඥානය කඞ්ඛාවිතාරණ විසුද්ධියයි'' නාමරූප ධර්මයන්ගේ පැවැත්ම පිළිබඳව පුද්ගල සන්තානයෙහි පවත්නා සැකය කඞ්ඛාවිතරණ විසුද්ධිය මගින් නැති වෙයි. නාමරූප ධර්ම යනු බුදුදහමින් පුද්ගලයා විශ්ලේෂණය කොට දැක්වෙන කොටස් දෙකකි. නාම යනු පුද්ගලයා ගේ විඥානය හා ඒ හා සමඟ යෙදෙන චෛතසිකයෝ යි. රූප යනු පඨවි, ආපො, තේජෝ, වායෝ යන නමින් වූ සතර මහා භූතයන්ගෙන් නිර්මිත වී ඇති භෞතික රූපස්කන්ධයයි. මේ නාම රූපයන්ගේ පැවැත්ම පිළිබඳ ප්‍රත්‍යය විග්‍රහ කොට දත්විට එම පැවැත්ම පිළිබඳ සැකය දුරු වෙයි. විවිධ සූත්‍රවල අංග දොළසකින් යුක්ත හේතුඵල සන්තතියක් වශයෙන් නාමරූපයන්ගේ පැවැත්ම විස්තර වී ඇත.

අවිද්‍යාවෙන් සංස්කාරයෝ පහළ වෙති.
සංස්කාරයන්ගෙන් විඥානය පහළ වෙයි.
විඥානයෙන් නාමරූප පහළ වෙයි.
නාම රූපයෙන් සළායතන පහළවෙයි.
සළායතනයෙන් ස්පර්ශය පහළ වෙයි.
ස්පර්ශයෙන් වේදනාව පහළ වෙයි.
වේදනාවෙන් තෘෂ්ණාව පහළ වෙයි.
තෘෂ්ණාවෙන් උපාදානය පහළ වෙයි
උපාදානයෙන් භවය පහළ වෙයි.
භවයෙන් ජාතිය පහළ වෙයි.
ජාතියෙන් ජරා මරණ සෝක පරිදේව දුක්ඛදෝමනස්සා දී සියලු දුක් හට ගනියි.

නාමරූප සන්තතිය පිළිබඳ මෙම ප්‍රත්‍යයෝත්පන්න ධර්මතාව මනාව වටහා ගන්නා විට අතීතයෙහි මම වීම් ද වර්තමානයෙහි මම වෙමි ද අනාගතයෙහි මම වන්නෙමි ද යනාදී සැක දුරුවෙයි. එමගින් කඞ්ඛාවිතරණ විසුද්ධිය ඇති වෙයි.

5. **මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධි**: නිවැරදි හා වැරදි මග දැනීමෙහි නුවණෙහි පිරිසිදු භාවයයි. මෙහි මග්ග යනුවෙන් දැක්වෙන්නේ නිවැරදි වූ භාවනා මාර්ගයයි. මේ තත්වය ලබා ගැනීම සඳහා යෝගාවචරයකු විසින් ත්‍රිලක්ෂණ භාවනාව කළ යුතුය. නාම ධර්ම හා රූප ධර්ම තනි නමකින් හඳුන්වන්නේ නම් ඒවාට සංස්කාර ධර්මයයි කිව හැකිය. හේතු ප්‍රත්‍යයන්ගේ සංස්කරණය වූ ධර්ම යන අර්ථය සංස්කාර හෙවත් සඞ්ඛාර යන්නෙහි ඇත. මේ සංස්කාරයන්ගේ අනිවාර්ය වූ ත්‍රිවිධ ලක්ෂණයක් වෙයි. ඒ අනිත්‍ය දුක්ඛ අනාත්ම යනුයි.

නිරන්තර වෙනස් වීමට භාජනය වීම අනිත්‍යතාවයි. වෙනස් වන ධර්මයන්ගේ තෘප්තිමත් විය හැකි සතුටුදායක තත්වයක් නොමැති බැවින් ඒවා දුක්ඛ යනුවෙන් ගැනෙයි. අනිත්‍ය දුක්ඛ තත්වයන් යම් තැනක ඇත්නම් එහි නොවෙනස් වන ආත්මීයත්වයක් නොමැත. එබැවින් අනාත්මය. මේ වෙනස් වන දුක් සහගත අනාත්මීය වූ සංස්කාර ධර්මයන් මේ ආකාරයෙන් පවත්නා බව අපි දනිමු. නමුත් එය හුදෙක් දැනීම් මාත්‍රයක් පමණී. ඒ පිළිබඳ අවබෝධයක් අපට නොමැත. මේ අවබෝධය ලබා ගැනීම සඳහා නිවැරදි වූ භාවනා ක්‍රමයක් අප අනුග මනය කළ යුතුය. විදර්ශනා ප්‍රඥාව දියුණු කරන විපස්සනා භාවනාව මෙහිලා උචිත භාවනා මාර්ගයයි. මේ මගින් දියුණු කෙරෙන විදර්ශනා ප්‍රඥාව මාර්ගය ලෙස විසුද්ධි මග්ගයේ දී විස්තර වී ඇත.

6. **පටිපදාඤාණදස්සන විසුද්ධි**: ආර්‍ය්‍ය මාර්ගයට පිළිපැදීමෙන් උදාවන ඥානයෙන් ඇති වන පාරිශුද්ධියයි. සංස්කාර ධර්මයන්හි හටගැනීම හා විනාශය-"උදයව්‍යය මනාව දැකීම් අර්ථයෙන් ද එයම ප්‍රත්‍යක්ෂ අර්ථයෙන් ද ඤාණදස්සන නම්. එයම ප්‍රත්‍යක්ෂ ධර්මයන්ගෙන් විසුද්ධ හෙයින් ඤාණදස්සන විසුද්ධි නම්. (එයම) මෙයින් ආර්‍ය්‍ය මාර්ගයට පිළිපදිනුය පටිපදාඤාණදස්සන විසුද්ධි නම්"(විසුද්ධි මග්ග). මෙම ප්‍රතිපදාඥානදර්ශන විශුද්ධි සංඛ්‍යාවට ගැනෙනුයේ ඥාන දර්ශන නවයක මස්තක ප්‍රාප්තියයි.

7. **ඤාණදස්සන විසුද්ධි**: ආර්‍ය්‍ය මාර්ගය පිළිබඳ මනාව දැනීම හා ප්‍රත්‍යක්ෂ කිරීම නිසා ඇති වන විශුද්ධියයි. සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන මෙම සතර මාර්ගයෙහි ඥානය මෙයින් අදහස් වෙයි.

මේ සප්ත විශුද්ධිය අතුරෙන් සීලාදී විසුද්ධි සය ලෞකික වෙයි. අවසාන වූ ඤාණදස්සන විසුද්ධිය ලෝකෝත්තර ඥානයයි. ප්‍රඥා භාවනාව වැඩීමෙන් විමුක්ති සංඛ්‍යාත නිරොධය හෙවත් නිර්වාණය අවබෝධ වනුයේ මෙම ඤාණදස්සන විසුද්ධියක් සමගය. එබැවින් ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය පිළිපැදීම ඉහත කී සප්තවිධ ඤාණදස්සන විසුද්ධිය ලබා ගැනීමෙන් නිර්වාණය සාක්ෂාත් කර ගැනීම සඳහා ඇති ඒකායන මාර්ගයයි කියනු ලැබේ.

පස්කඳ අනිස් බැව් නුවණින් දැක සලකන්න ඒ පිරිසිදු වීමට (නිවන් ලැබුමට) මඟ ය.

277. සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා (20:5)	සියලු සකර දම් අනියස ඇති මෙලොවේ යනුවෙන් නුවණැසින් යම් අයකු ද බැලුවේ මෙනයින් කළ කිරෙන්නේ නම් දුක් හමුවේ මෙමගින් තමා පිරිසිදු බව අත් කෙරුවේ

සියලු දෙය ලොවේ - වෙනසකට පත් වේ
20 (2) පන්සියයක් භික්ෂූන් වහන්සේලා පිළිබඳ කතා පුවත (277 සිට 279 දක්වා ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩවසන භාග්‍යවතුන් වහන්සේ තෙරවරුන් පන්සියයක් අරභයා මෙම ගාථා තුන ප්‍රකාශ කළ සේක.

මේ භික්ෂූන් වහන්සේලා පන්සියය බුදුරජාණන් වහන්සේ හමුවී භාවනා කරනු සඳහා කමටහන් ලබා ගෙන වනගතව භාවනා වඩමින් සිටි පිරිසකි. භාවනාවෙහි යෙදී බොහෝ කලක් උත්සාහ කළ ද සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට උන්වහන්සේලා අපොහොසත් වූහ. එබැවින් යළිත් බුදුරජාණන් වහන්සේ හමුව වෙනත් සුදුසු කමටහනක් ලබා ගෙන භාවනා කළහොත් ප්‍රතිඵල ලබාගත හැකි වෙතැයි සිතූ උන්වහන්සේලා දෙව්රමට පැමිණ බුදුන් වහන්සේ බැහැදැක සියලු තතු පැවසූ හ.

මෙම භික්ෂූන් වහන්සේලාට නිසි කර්මස්ථානය කුමක්දැයි නුවණින් විමසා බැලූ බුදුන් වහන්සේට මෙම භික්ෂූන් තමන්ට කලින් ලොව පහළ වූ කාශ්‍යප බුදුරදුන්ගේ සමයෙහි අවුරුදු විසිදහසක් අනිත්‍යතා ධර්ම භාවනාවට අරමුණු කරගත් පිරිසක් බව දක්නට ලැබිණ. එබැවින් මෙම භික්ෂූන්ට ඉතාමත්ම සුදුසු කර්මස්ථානය ත්‍රිලක්ෂණ කර්මස්ථානය බව දැන "මහණෙනි, මෙලොව ඇති හැම දෙයක්ම ප්‍රතීත්‍ය සමුත්පන්න බැවින් අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණයෙන් යුක්තය"යි වදාරමින් බුදුරජාණන් වහන්සේ යථෝක්ත ගාථා තුනෙන් ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (277 ගාථාව)

සබ්බෙ සඞ්ඛාරා අනිච්චා ඉති යදා පඤ්ඤාය පස්සති
අථ දුක්ඛෙ නිබ්බින්දති එසො විසුද්ධියා මග්ගො

සබ්බෙ: සියලු; **සඞ්ඛාරා**: භවත්‍රයෙහි උපදවන්නා වූ ස්කන්ධ සංඛ්‍යාත සංස්කාරයෝ; **අනිච්චා ඉති**: (ඒ ඒ තැන්හිම ඇතිව නැති වන බැවින්) **අනිත්‍යයයි**; යදා: යම් විටෙක; **පඤ්ඤාය**: නුවණින්; **පස්සති**: දකී ද; **අථ**: එකල්හි; **දුක්ඛෙ**: දුකෙහි; **නිබ්බින්දති**: කලකිරෙයි ද; **එසො**: මෙය (දුකෙහි කලකිරීම); **විසුද්ධියා**: නිර්මල බවට නොහොත් නිවණට; **මග්ගො**: මාර්ගයයි.

හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගෙන ඇති සියලු දේ අනිත්‍යයයි. යම් විටෙක එය නුවණින් දකියි ද, එසේ දැක දුකෙහි කලකිරෙයි ද මෙය නිවණ සඳහා ඇති මාර්ගයයි.

විවරණය

අනිච්ච: සියලු සංස්කාරධර්මයන් පිළිබඳ අනිවාර්ය වූ ලක්ෂණත්‍රයෙන් එක් ලක්ෂණයකි. වෙනස් වන ස්වභාවය අනිත්‍ය නමින් ගැනෙයි. ලොව පවත්නා වස්තූන්ගේ මෙම අනිත්‍යතාව ඊට පදනම් වූ මූලකාරණය ද සමඟ ලොවට මුල්වරට හෙළි කරන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි. අනිත්‍යතාවට පමණක් නොව දුක්ඛ, අනත්ත යන අනෙක් ලක්ෂණ වලට ද පාදක වන මූල හේතුව වූ කලී ප්‍රතීත්‍ය සමුත්පන්න බවයි. ලොව ඇති හැම දෙයක්ම හට ගන්නේ හේතු ප්‍රත්‍ය සමවායෙනි. එසේ හට ගන්නා වස්තූන්ගේ පැවැත්මේ ස්වභාවය මෙම ත්‍රිලක්ෂණයෙන් හෙළිදරව් කොට තිබේ. අනිත්‍යතා සිද්ධාන්තය මගින් හෙළි කරන්නේ ලොව ඇති සියලු ප්‍රපඤ්ච ජරාවට පත් වෙමින් මරණයෙන් අවසන් වන බවය. ප්‍රපඤ්ච හට ගන්නා හේතුව පවත්නා තාක් මරණය වූ කලි පූර්ණ අවසානයක් නොවේ. එය අනිත්‍යතාවේ එක් අවස්ථාන්තරයක් පමණි. මෙම අනිත්‍යතාව නිවණ හැර අන් හැම දෙයකම විශේෂ ලක්ෂණය වෙයි.

වස්තූන් තුළ විද්‍යාමාන වන මෙම අනිත්‍යතාව මෙනෙහි කිරීම සංසාර දුකෙන් වෙන්ව විමුක්ති සුඛය අත්කර ගැනීම සඳහා ඇති නොවරදින මඟකි. යම්කිසි දිනෙක තමා මරණයට පත් වන බවත්, මරණය අනිවාර්ය සිද්ධියක් බවත්, නිතරම සිතෙහි දරන පුද්ගලයා ස්වකීය විසුද්ධිය සඳහා භාවනා කටයුතුවල නිරත වනු පමණක් නොව තමාගෙන් අන්‍යයන් සඳහා ඉටුවිය යුතු යුතුකම් සම්පූර්ණ කිරීමට ද උත්සුක වෙයි. මරණය අතලඟ පවත්නා දෙයක් බැවින් ස්වකීය කටයුතු වල හෙතෙම අනලස්ව තත්පර වෙයි. පුද්ගලයකු ගේ උනන්දුව උසස් මට්ටමකින් පවත්වා ගැනීම සඳහා අනිත්‍යතාව පිළිබඳ නිති අවධානයෙන් සිටීම ඉතා වැදගත් වෙයි. මරණය පිළිබඳ සිහි කිරීමෙහි (මරණානුස්සතියෙහි) යෙදෙන භික්ෂුව නිබඳව ම අප්‍රමාදීව සිටිතැයි කියැවෙයි.

මරණය පිළිබඳව සිහි කිරීම පුද්ගලයකු ගේ ප්‍රගතිය වළකන්නකැයි ඇතැම් අන්තවාදීහු කියති. එහෙත් මෙය ලොව ඇති වස්තූන්හි යථාතත්වය නොදැන කියන කියමනකි. යථාර්ථය නොදන්නා මරණයට බිය වෙයි. එහෙත් යථාර්ථය හරිහැටි දකින්නා මරණය උපත මෙන්ම අනිවාර්ය සිද්ධියක් කොට දකියි. මරණය දෙස බියෙන් බලන්නාට මරණය ගැන සිහි කිරීම පවා බිය දනවන්නකි. එබැවින් නොමැරෙන්නකු සේ සිතා මරණය අමතක කොට දමා සිටියි. නමුත් මරණය යථාර්ථයෙන් දකින්නා නොබියව තම කටයුතුවල අප්‍රමාදී වෙයි. මරණය සිහි කිරීම බුද්ධිමතාගේ ජීවිතය බෙහෙවින් සුඛනම්‍ය තත්වයට පත් කරවන්නකි.

මරණය ගැන සිහි කිරීම තම කටයුතු පමා කිරීමට හේතුවක් නොවේ. උද්යෝගයෙන් වැඩ කටයුතු කිරීමට හේතුවක් වෙයි. බුදුරජාණන් වහන්සේ පුද්ගලයාට මරණය සිහිපත් කරවනුයේ ඔහු ස්වකීය කාර්යයෙහි උද්යෝගවත් කරනු සඳහාය.

අජ්ජේව කිච්චං ආතප්පං
කො ජඤ්ඤා මරණං සුවෙ

මරණය හෙට එතැයි කවුරු දනිත් ද?
එබැවින් අදම උත්සාහයෙන් කටයුතු කළ යුතුය.

අනිත්‍ය ලක්ෂණය බෙහෙවින්ම ප්‍රකට කරන අවස්ථාන්තරයක් වූ මරණය නිබඳව සිහිපත් කිරීම විමුක්තිය ලබා ගැනීමේ නොවරදන උපායයක් වශයෙන් දැක්වී ඇත.

"එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො
එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය
අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්ති
කතමො එකධම්මෙ මරණාස්සති"

"මහණෙනි, එක් ධර්මයක් වඩන ලද්දේ බොහෝ කොට වඩන ලද්දේ ඒකාන්තයෙන් ම දුකෙහි කලකිරීම සඳහා, විරාගය සඳහා, නිරොධය සඳහා, සංසිඳීම සඳහා, මනාව දැනීම සඳහා, අවබෝධය සඳහා, නිවණ සඳහා පවතියි. ඒ එක් ධර්මය කුමක් ද? ඒ මරණානුස්සතියයි."

නිර්වාණයේ අවබෝධය සඳහා අනිත්‍යතාවේ වැදගත් කම ඉහත සඳහන් පාඨයෙන් මනාව පැහැදිලි වේ.



පස්කඳ දුක් බැව් නුවණින් දැක සලකන්න එය පිරිසිදු වීමට (නිවන් ලැබුමට) මඟ ය.

278. සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති
යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ
එස මග්ගො විසුද්ධියා (20:6)

දුකය සකර දම් නියතින් ඇති මෙලොවේ
යනුවෙන් නුවණැසිසයම් අයකු ද බැළුවේ
මෙනයින් කළ කිරෙන්නේ නම් දුක් හමුවේ
මෙමගින් තමා පිවිතුරු බව අත් කෙරුවේ

හටගත් හැමදෙය - දුකෙකිය මෙලොවේ

20 (2) පන්සියයක් භික්ෂූන් වහන්සේලා පිළිබඳ කතා පුවත (277 සිට 279 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (278 ගාථාව)

සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා ඉති යදා පඤ්ඤාය පස්සති, අථ දුක්ඛෙ නිබ්බින්දති, එසො විසුද්ධියා මග්ගො

සබ්බෙ: සියලු; **සඞ්ඛාරා**: භවත්‍රයෙහි උපදවන්නා වූ ස්කන්ධ සංඛ්‍යාත සංස්කාරයෝ; **දුක්ඛා ඉති**: දුක් සහගතයයි (ඒ ඒ තැන්හිම ඇතිව නැති වන බැවින්); **යදා**: යම් විටෙක; **පඤ්ඤාය**: නුවණින්; **පස්සති**: දකී ද; **අථ**: එකල්හි; **දුක්ඛෙ**: දුකෙහි; **නිබ්බින්දති**: කළකිරෙයි ද; **එසො**: මෙය (දුකෙහි කළකිරීම); **විසුද්ධියා**: නිර්මල බවට නොහොත් නිවණට; **මග්ගො**: මාර්ගයයි.

හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගෙන ඇති සියලු දෙය දුක් සහගතයයි, යම් විටෙක නුවණින් දකියි ද, එසේ දැක දුකෙහි කළකිරෙයිද, මෙය නිවණට මඟයි.

විවරණය

දුක්ඛ: වස්තූන් පිළිබඳ ප්‍රතීත්‍ය සමුත්පන්න පැවැත්මේ දෙවැනි ලක්ෂණය වන්නේ දුක්ඛතාවයි. බුදුරජාණන් වහන්සේ විසින් අවබෝධ කරන ලද්දාවූත් ඊට කලින් ලෝකයා විසින් නොදැන සිටියාවූත් චතුරාර්ය සත්‍යය ඉදිරිපත් වී ඇත්තේ මෙම දුක පදනම් කොට ගෙනය.

1. දුක අවබෝධ කිරීම
2. දුකට හේතුව දැන ගැනීම
3. දුකෙහි හේතුව නැති කිරීම
4. දුක නැති කිරීමේ මාර්ගය පිළිපැදීම

මෙම චතුරාර්ය සත්‍යයේ පළමු වැන්න වන දුක්ඛ සත්‍යයෙන් කියවෙනුයේ සත්වයන්ගේ පැවැත්මේ ස්වභාවයයි. උපතේ සිට මරණය දක්වා ජීවිත ප්‍රවෘත්තියේ සෑම අවස්ථාන්තරයක් ම දුක හෙවත් වෙනස් වීම අනිවාර්ය ලක්ෂණය කොට ඇති බැවින් පුද්ගලයා පිළිබඳව පඤ්ච උපාදානස්කන්ධයන් ගේ පහළ වීමම දුකක් කොට දැක්වෙයි.

මෙහිදී දුක යන්නෙන් අදහස් වන්නේ හුදෙක් වේදනාත්මකය යන්න නොවේ. අස්ථිරය, අසතුටුදායකය, තෘප්තිමත්විය නොහැකිය යන අදහස පාලිභාෂාවේ දුක්ඛ යන පදයෙන් ගම්‍ය වෙයි. පුද්ගලයා පිළිබඳ පඤ්ච උපාදාන ස්කන්ධය විග්‍රහ කොට බැලීමෙන් මෙම අසතුටුදායක පැවැත්ම අවබෝධ කළ හැකිය. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර හා විඤ්ඤාණ යනු මෙම පඤ්ච උපාදානස්කන්ධයයි. මේවාට ස්කන්ධ යන නම යෙදී ඇත්තේ ඒවා තනි තනි ඒකක වශයෙන් නො පවතින බැවින් හා සමූහ, රාශි, සන්තති වශයෙන් පවත්නා බැවිනි, මේ හැම දෙයක්ම සංස්කාරය ප්‍රතීත්‍ය සමුත්පන්නය. හේතුඵල සමවායයෙන් හටගනියි. හේතුව නිසා හටගන්නා දෙයෙහි විශේෂ ලක්ෂණය වන්නේ හේතු විනාශයෙන් ඵලය ද විනාශ වීමයි.

"හෙතුං පටිච්ච සම්භූතං හෙතු භඞ්ගා නිරුජ්ඣති"
"හේතුව නිසා හටගත් දෙය හේතුව බිඳී යාමෙන් විනාශයට පත්වේ."

දෙවැනි ආර්‍ය්‍ය සත්‍ය වනුයේ දුකෙහි හේතුවයි. බුදුරජාණන් වහන්සේ විශේෂයෙන්ම සත්වයන්ගේ සාංසාරික පැවැත්මෙහි හේතු සාධක විමසා බලා අවබෝධ කළ උතුමෙකි. දුකෙහි හේතුව ලෙස උන්වහන්සේ පෙන්වා දී ඇත්තේ තෘෂ්ණාවයි. තෘෂ්ණාවෙන් පොළඹවනු ලබන සත්ත්වයා දැඩි සේ භාවගාමිත්වයට ඇලී බැඳී සිටින්නෙකි. තෘෂ්ණාව තුළින් පුද්ගලයා ඒ ඒ වස්තුවල, ඒ ඒ භාවයන්හි අභිනන්දනය කරයි. සතුටු වෙයි. එම සතුටම දුකට හේතු වන බව ඔහු නොදනියි. ප්‍රසාද ජනක විෂය වස්තූන්හි පෙළඹවීම තෘෂ්ණාවේ ලක්ෂණයකි. මේ නිසා පුද්ගලයාගේ ස්වභාවය වී ඇත්තේ මිරිඟුව පසුපස දුවන මුවකු ලෙස සතුට ප්‍රීතිය හඹා යාමයි. එහෙත් දුක්ඛසත්‍යයෙන් ප්‍රකාශ කොට ඇති පරිදි අනිත්‍යතාවෙන් යුක්ත කිසිවක පරම සුවයක් නොමැත. පවත්නා තාවකාලික සුවය වුවද 'අවසානයෙහි දුකටම නතු වී පවතියි. භවය අතහැර භව නිරෝධය අත්පත් කර ගැනීමට නම් තෘෂ්ණාව සිතින් සම්පූර්ණයෙන් ප්‍රහාණය කළ යුතුය. මේ බුදු සමයේ පුද්ගලයා පිළිබඳ දර්ශනයයි.

තෘෂ්ණාව අංශ තුනක් යටතේ විග්‍රහ කොට දැක් වී ඇත.

1. කාම තණ්හා (කාම වස්තු කෙරෙහි ඇති ආශාව)
2. භව තණ්හා (පැවැත්මට ඇති ආශාව)
3. විභව තණ්හා (නොපැවැත්මට ඇති ආශාව)

පුද්ගලබද්ධව පවත්නා පංචවිධ ඉන්ද්‍රියයන්ට අනුකූලව බාහිර ලෝකයෙහි ඇති පංචවිධ විෂය වස්තු කෙරෙහි ඇලීම කාමතෘෂ්ණාවයි. විෂය වස්තූන්ට ඇලීම බැඳීම තුළින් විවිධ මානසික ක්ලෙශ ධර්ම බිහි වෙයි. තමන් තෘෂ්ණාවෙන් බැඳී ඇති විෂය වස්තූන්ගේ වෙනස් වීම, විනාශය දක්නා විට පුද්ගලයා තුළ ඇති වන්නේ දුකක්මය. යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං - පියෙහි විප්පයොගො දුක්ඛො ආදි වශයෙන් දැක්වෙන්නේ ද විෂය වස්තූන්ට ඇලීම බැඳීම නිසා ඇති වන දුකයි.

පවත්නා භවය අත්හැර නොයාමට ඇති ආශාව භව තණ්හා යනුවෙන් හැඳින්වෙයි. තමන් කෙතරම් දුක් සහිත භවයක දුක් විඳිමින් සිටියත් එම භවය අත හැරීමට පුද්ගලයා නො කැමතිය. ඒ එම භවයට ආශාකරන බැවිනි. තත්‍රතත්‍රාභි නන්දිනී යනුවෙන් තෘෂ්ණාව විශේෂ කොට දක්වා ඇත්තේ ඒ ඒ භවයට පුද්ගලයා ආශා කිරීම තෘෂ්ණාවේ ලක්ෂණයක් වන බැවිනි. පුද්ගලයකු මිය යාමට බිය වන්නේ එම භවයෙන් දිගටම පැවතීමේ ආශාව නිසාය. මෙය ශාශ්වත දෘෂ්ටිය යනුවෙන් ද හැඳින්වී ඇත.

විභව තණ්හා යනු භවය අවසන්කර ගැනීමේ ආශාවයි. පවත්නා භවයෙන් පසු තවත් අලුත් භවයක් නොලැබේ යන දෘෂ්ටිය මත විභව තණ්හාව ඇති වෙයි. එබැවින් මෙය උච්ඡේද දෘෂ්ටියට සම්බන්ධ වන්නකි. භව තණ්හාව සහ විභව තණ්හාව අන්ත දෙකක් වන බැවින් එක්වර පුද්ගලයකු ගේ සිත තුළ මෙම තෘෂ්ණා ප්‍රභේද දෙක ඇති විය නොහැකිය. දුක් පිරී ඇති මෙලොවින් තුරන් වී නැවත උපතක් නොලබා සිටීමේ ආශාව මෙම විභව තණ්හාව ලෙස හැඳින්විය හැකිය. එහෙත් මෙහි විශේෂත්වයක් ඇත. "පවත්නා භවයෙහි ආත්මයක් ඇත. සැප හා දුක් විඳින්නේ එම ආත්මයයි. එම ආත්මය මරණයත් සමඟ සම්පූර්ණයෙන් විනාශ වන බැවින් එම උච්ඡේදයෙන් තමන්ට සතුටු විය හැකිය" යන අදහසින් භවය අවසන් කිරීමට ඇති ආශාව මෙහිදී විභව තණ්හාව ලෙස වටහා ගත යුතුය. බුදු දහම භව නිරෝධය හෙවත් විමුක්තිය පිළිබඳව කථා කරයි. එහෙත් එය උච්ඡේද දෘෂ්ටියක් නොවන්නේ යථාර්ථය සමඟ එම භව නිරෝධය බැඳී ඇති බැවිනි. බුදු දහමින් ස්ථාවර හෝ තාවකාලික ආත්මයක් පිළි නොගනියි.





පස්කඳ අනත් බැව් නුවණින් දැක සලකන්න. එය පිරිසිදු වීමට (නිවන් ලැබීමට) මඟ ය.

279. සබ්බෙ ධම්මා අනත්තාති
යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ
එස මග්ගො විසුද්ධියා (20:7)

අනාත්මය දහම් එය හැමටම පොදුවේ
යනුවෙන් නුවණැසින් යම් අයකු ද බැලුවේ
මෙනයින් කළකිරෙන්නේ නම් දුක් හමුවේ
මෙමගින් තමා පිවිතුරු බව අත් කෙරුවේ

හැම දෙයක්ම - අනාත්ම වේ

20 (2) පන්සියයක් භික්ෂූන් වහන්සේලා පිළිබඳ කතා පුවත (277 සිට 279 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (279 ගාථාව)

සබ්බෙ ධම්මා අනත්තා ඉති යදා පඤ්ඤාය පස්සති, අථ දුක්ඛෙ නිබ්බින්දති, එසො විසුද්ධියා මග්ගො

සබ්බෙ: සියලු; **ධම්මා**: සංස්කාර ධර්මයෝ; **අනත්තා ඉති**: (තමා විෂයෙහි නො පවත්නා හෙයින්) **අනාත්මයහ**; **යදා**: යම් කලෙක; **පඤ්ඤාය**: නුවණින්; **පස්සති**: දකී ද; **අථ**: එකල්හි; **දුක්ඛෙ**: දුකෙහි; **නිබ්බින්දති**: කලකිරෙයි ද; **එසො**: මෙය (දුකෙහි කළකිරීම); **විසුද්ධියා**: නිර්මල බවට නොහොත් නිවණට; **මග්ගො**: මාර්ගයයි.

යමෙක් සියලු පඤ්චස්කන්ධයෝ අනාත්මයහයි යම් විටෙක විදසුන් නුවණින් දකියි ද, එවිට දුකෙහි කළකිරෙයිද, මේ කලකිරීම කෙලෙසුන් ගේ පිරිසිදු වීමට නිවණට මාර්ගය වේ.

විවරණය

තෙවැනි ආර්‍ය්‍ය සත්‍යය වනුයේ දුක නැති කිරීම පිළිබඳ සත්‍යයයි. දුකෙහි හේතුව තෘෂ්ණාව නම් දුක නැති කිරීමට තෘෂ්ණාව නැති කළ යුතුය. නිරෝධ සත්‍යයේ දී සිදුවනුයේ තෘෂ්ණාව ක්‍ෂය කර දැමීමයි. තෘෂ්ණාව ක්‍ෂය කරනු විනා ආත්මය ක්‍ෂය කර දැමීමක් නිරෝධය සත්‍යයෙන් නොකියවෙයි. මේ නිසාම නිරෝධය හෙවත් නිර්‍වාණය බොහෝ විට හැඳින්වෙන්නේ **තණ්හක්ඛයො නිබ්බාණං** යනුවෙනි.සිවුවැනි ආර්‍ය්‍ය සත්‍යය දුක්ඛනිරොධගාමිනී පටිපදාවයි. තෘෂ්ණාව නැති කිරීම සඳහා විශේෂ වූ ක්‍රියා පිළිවෙතක් ඇත.

එය අන්තගාමිත්වයෙන් තොරව ඉදිරිපත් වී ඇති බැවින් මජ්ඣිමා පටිපදා යනුවෙන් ද හැඳින්වෙයි. අංග අටකින් සමන්විත වූ මෙම මාර්‍ගය අනුගමනය කිරීමෙන් සම්මා සමාධිය ලබා ගෙන මනස සංස්කාරයන් පිළිබඳ ත්‍රිලක්‍ෂණයට යොමු කිරීමෙන් යථාර්ථාවබෝධය ලබා ගත හැකි වෙයි. එබඳු රහතන් වහන්සේ තුළ තෘෂ්ණාව කිසි විටෙක පහළ නොවෙයි. එබැවින්ම එතුමා පුනර්භවය නැති කිරීමෙන් දුක නැති කළ පුද්ගලයා ද වෙයි.

අනත්ත: සංස්කාර ධර්‍මයන් පිළිබඳ ත්‍රිලක්‍ෂණයේ තෙවැනි ලක්‍ෂණය අනත්ත යනුවෙන් ඉදිරිපත් කෙරෙයි. සත්වයන් පිළිබඳව ස්ථාවර වෙනස් නොවන කිසියම් සාර පදාර්ථයක් ඇතැයි පිළිගැනීම පුද්ගලයන්ගේ ස්වභාවයයි. යථාර්ථය වසා පවත්නා අවිද්‍යාවෙන් පෘථග්ජන පුද්ගලයන් බැඳී පවත්නා නිසා මෙම ,ආත්මයක් නැත යන හැඟීම අවබෝධ කිරීම පෘථග්ජන පුද්ගලයාට බෙහෙවින්ම දුෂ්කරය.

සාමාන්‍ය ජනතාව තමන් දෙස බලන්නේත් අනුන් දෙස බලන්නේත් සංගාත සංඥාවෙනි. පුද්ගලයා, මිනිසා, පිරිමියා, ගැහැණිය, ගවයා, බල්ලා, ආදී වශයෙන් සංගාත ස්වරූපයෙන් හෙවත් ඒකත්වයකින් බැලීම නිසා මෙම ඒකත්වය ක්‍රියාත්මක භාවයට පමුණුවන කිසියම් නියාමක බලවේගයක් ඇතැයි සාමාන්‍ය පුද්ගලයා සිතයි. ආත්ම යනුවෙන් දාර්ශනික ක්‍ෂෙත්‍රයේ දී හැඳින්වී ඇත්තේ පුද්ගලයන් විසින් වරදවා සිතා ගෙන ඇති මෙම නියාමක බලවේගයයි. එබඳු නියාමක බලවේගයක් පුද්ගලයා සතුව හෝ විශ්වයේ හෝ නොමැත.

මෙබඳු ආත්ම සංඥාවක් ඇති කර ගැනීමේ ආදීනවය වන්නේ එවිට වස්තූන් හා පුද්ගලයන් පිළිබඳ යථාර්ථය වටහා ගැනීමට අපහසු වීමයි. සාමාන්‍ය ජනතාව පමණක් නොව ලෝකයේ විවිධ දාර්ශනිකයන් විසින් ද පිළිගෙන ඇති මෙම ආත්ම සංඥාව බුදුදහමට අනුව පුද්ගලයාගේ ආධ්‍යාත්මික පාරිශුද්ධියට බෙහෙවින් බාධාකර වන්නකි. ආත්ම හා අනාත්ම දෘෂ්ටි දෙකම අන්තගාමී දෘෂ්ටි වශයෙන් ප්‍රතික්‍ෂේප කරන බුදුන් වහන්සේ ලෝකයේ යථාර්ථය ලෙස දක්වා ඇත්තේ ප්‍රතීත්‍ය සමුත්පන්නතාවයි.

ලෝකයේ යථාර්ථය එයයි. මෙයට බාහිරව අවබෝධ කර ගත යුතු පරම සත්‍යයක් හෝ යථාර්ථයක් බුදු දහමට අනුව නොමැත. මෙම යථාර්ථය අපට පැහැදිලි කර දක්වන්නේ වස්තූන් පිළිබඳ යථොක්ත ත්‍රිලක්‍ෂණය මගිනි.

බුදු දහම විපස්සනාවට විශේෂ වැදගත් කමක් පමණක් නොව ප්‍රමුඛතාවයම දක්වා ඇත්තේ විදර්ශනයෙන් වස්තු තත්වය යථාර්ථයෙන් දැක ගැනීමට පුද්ගලයාට අවස්ථාව සැලසෙන බැවිනි. ඉහත සඳහන් ගාථා තුනෙන් එම විදර්ශනාව අවධාරණය කොට ඇත. එම විදර්ශනය විසුද්ධියට එකම මාර්ගය වශයෙන් දක්වා ඇත්තේ වස්තු තත්වය යථාර්ථයෙන් දැන ගෙන සියලු ක්ලෙශයන් මුලිනුදුරා විමුක්තිය ලබා ගැනීමට එම මාර්ගය පමණක්ම එකම උපාය වන බැවිනි.



විරිය නැති වැරැදි කල්පනා ඇති කුසීතයා නුවණින් දැක්කයුතු අරිය මඟ නො දක්නේ ය.

280. උට්ඨානකාලම්හි අනුට්ඨහානො
යුවා බලී ආලසියං උපෙතො
සංසන්න සඞ්කප්පමනො කුසීතො
පඤ්ඤාය මග්ගං අලසො න වින්දති (20:8)

නැගිටිය යුතුකල නොනැගිට ඉන්නේ
තරුණෙකි හැඩි දැඩි කම්මැලි වන්නේ
යහ සිතුවිලි හැම විට මැඩ ලන්නේ
නුවණින් මගපල නොම ලැබ ගන්නේ

අලස වුනොත් - මඟ වරදියි.

20 (3) පධානකම්මික තිස්ස තෙරණුවෝ පිළිබඳ කතාව (280 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ භාවනාවෙහි නොයෙදී අලස බවින් කාලය ගත කළ **පධානකම්මික තිස්ස** නම් භික්‍ෂු කෙනකුන් අරභයා මෙම ගාථා ධර්‍මය දේශනා කළ සේක.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන කාලයෙහි සැවැත් නුවර බොහෝ කුල දරුවෝ ගිහිගෙය හැරපියා බුදු සසුනෙහි පැවිදි වූහ. මේ අය අතුරෙන් තරුණ භික්‍ෂු පිරිසක් බුදුරදුන් ගෙන් කමටහන් උගෙන භාවනාවෙහි නිරත වනු සඳහා වනගත පෙදෙසකට ගියහ. මේ පිරිසේ සිටි තිස්ස නම් වූ එක් භික්‍ෂුවක් පමණක් එසේ නොගොස් නතර වූයේ ය. වනගත වූ භික්‍ෂූන් වහන්සේ සියලු දෙනාම ඉතා උද්යෝගයෙන් භාවනාවෙහි නිරතව නොබෝ දිනකින් මාර්ග ඵල ලබා ගත්හ. භාවනාවෙහි ප්‍රතිඵල නිසියාකාරව ලබා ගත් උන්වහන්සේලා ඒ බව බුදුරජාණන් වහන්සේට පැවසීම සඳහා ආපසු ජේතවනාරාමයට පැමිණිය හ. විහාරයට අවුත් බුදුරජාණන් වහන්සේ හමුවට යන මේ භික්‍ෂු පිරිසට භාවනාව සඳහා වනගත නොවී නතර වූ භික්‍ෂුවද එක් වුයේ ය. බුදුන් වැඳ පසෙක සිටි එම පිරිස සමඟ සතුටු සාමීචියෙහි යෙදුණු බුදුරජාණන් වහන්සේ එම භික්‍ෂූන් වහන්සේලා දැඩි ප්‍රයත්නයකින් භාවනාවෙහි නිරතව මාර්ග ඵල ලබා ගත් පුවත අසා ප්‍රසාදයට පත් වූ සේක. තිස්ස භික්‍ෂුව උත්සාහ නොගෙන අලසව ම සිටි බැවින් ඔහු කිසිදු මාර්ගඵලයක් ලබා නොගෙන සිටියේ ය. අනෙක් භික්‍ෂූන්ගේ තොරතුරු වලින් බුදුරජාණන් වහන්සේ සතුටට පත් වූ වග දැනගත් එම තිස්ස භික්‍ෂුව තමාත් උනන්දුවෙන් භාවනා කටයුතු වල යෙදී උසස් ප්‍රතිඵලයක් ලබා ගැනීමට අදිටන් කරගත්තේ ය.

එදිනම රාත්‍රියෙහි භාවනා කිරීමට ඉටාගත් තිස්ස භික්‍ෂුව සක්මන් මළුවෙහි සක්මනෙහි යෙදී සිටියදී පය ලිස්සා ගොස් බිම වැටී උකුල් ඇටය කැඩී ගොස් ඉතා වේදනාවෙන් හඬ නැගීය. අනෙක් භික්‍ෂූන් වහන්සේලා තිස්සගේ අදෝනා හඬ ඇසී එහි අවුත් තිස්සට ඇප උපස්ථාන කළ හ. මේ පුවත සැලවූ විට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ශක්තිමත් තරුණයෙකුව සිටියදී උත්සාහවත් විය යුතු අවස්ථාවෙහි උත්සාහ නොගෙන අලසව සිටීම නිසා තිස්ස භික්‍ෂුව ප්‍රඥාවෙන් ලබා ගත යුතු මාර්‍ගඵල වලට හිමිකරුවෙක් නොවීය" යි ප්‍රකාශ කරමින් යථොක්ත ගාථා ධර්‍මය දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (280 ගාථාව)

උට්ඨානකාලම්හි අනුට්ඨානො යුවා බලී ආලසියං
උපෙතො සංසන්න සඞ්කප්පමනො කුසීතො අලසො
පඤ්ඤාය මග්ගං න වින්දති.

උට්ඨානකාලම්හි: වීර්‍යය කළයුතු කාලයෙහ; **අනුට්ඨානො**: වීර්‍යය නොකරන්නේ; **යුවා**: තරුණයෙක් (වූයේ ද); **බලී**: ශක්තිමතෙක් (වූයේ ද); **ආලසියං** (හේ) අලසබවින්; **උපෙතො**: යුක්ත වූයේ (නම්); **සංසන්න සඞ්කප්පමනො**: යටපත් කරගන්නා ලද බැවින් යහපත් සිතුවිලි වලින් තොර වූ; **කුසීතො**: කම්මැලි වූ; **අලසො**: අලසයා; **පඤ්ඤාය**: නුවණින් (දැකිය යුතු); **මග්ගං**: (ආර්‍යය) මාර්ග ය; **න වින්දති**: නො ලබයි.

ශක්තිමත් තරුණයකු වුවද, උනන්දු විය යුතු කලට උනන්දු නොවී, කම්මැලි කමින්, උසස් සිතිවිලි සිතතුළ මැඩලමින් කල් ගෙවයි නම්, ඒ අලසයා නුවණින් ලබා ගත යුතු මාර්‍ගඵල අත්කර නොගනියි.

විවරණය

පඤ්ඤාය මග්ගං: ප්‍රඥාව තුළින් අවබෝධ කළ යුතු මාර්‍ගයයි. මෙහි මග්ග යන්නෙන් සෝවාන් ආදී ලෝකෝත්තර මාර්‍ග ඵල අදහස් වෙයි.

පඤ්ඤා: නුවණ, අවබෝධය, වැටහීම ආදී නම් වලින් හැඳින්වෙන ප්‍රඥාව බුදුසමයෙහි දී පළල් ක්‍ෂේත්‍රයක් අයත් කර ගන්නා ලද්දකි. ප්‍රඥාව උපරිම මට්ටමින් ගන්නා විට චතුස්සත්‍යාවබෝධය කෙරෙන ලෝකෝත්තර ප්‍රඥාව අදහස් වෙයි. ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්‍ගයේ නිෂ්ටාව වන්නේ සෝවාන් ආදී මාර්‍ගඵල පිළිවෙලින් අත්පත් කර ගන්නා ප්‍රඥාවයි. එය විමුත්තිඤාණ යන නමින් ද හැඳින්වෙයි. ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්‍ගය ද සීල, සමාධි, පඤ්ඤා යනුවෙන් ත්‍රිශික්‍ෂාවකට බෙදා දක්වා ඇත. එහි සම්මාදිට්ඨි, සම්මා සංකප්ප යන අංග දෙක ප්‍රඥා ක්‍ෂෙත්‍රයට අයත් වෙයි.

සංස්කාරයන් පිළිබඳ **අනිත්‍ය, දුක්ඛ, අනත්ත** යන ත්‍රිලක්‍ෂණය අවබෝධ කොට වස්තු තත්වය යථාර්ථයෙන් දකින යථාභූතඤාණදස්සන නැමති ප්‍රඥාව උත්තරීතර ප්‍රඥාව ලෙස ද ඇතැම් විට හැඳින්වී ඇත. විමුක්ති ඥානය අත්පත් වීමට නම් යථාභූතඤාණදස්සනය අනිවාර්‍ය අවශ්‍යතාවක් වෙයි. එබැවින් එය උත්තරීතර ඤාණය ලෙස දැක්වී ඇත.

ප්‍රඥාව හෙවත් ඤාණය කෙනකු තුළ ඇති වන ආකාරය අනුව එහි ප්‍රභේද තුනක් දක්වා ඇත. තර්කානුකූල චින්තනය මගින් ඇති වන ඤාණය (චින්තාමය ප්‍රඥා), ඉගෙනීමෙන් හා විවිධ දේ ඇසීමෙන් ඇතිවන ඤාණය (සුතමය ප්‍රඥා හා භාවනාව පුරුදු පුහුණු කිරීමෙන් ඇතිවන ඤාණය (භාවනාමය ප්‍රඥා) යනු ඒ ත්‍රිවිධ ප්‍රභේදයයි.

බුදු දහම වූ කලි ප්‍රඥාව පිළිබඳ දර්‍ශනයකි. බෞද්ධ ප්‍රතිපදාමාර්‍ගය ඒ හැම පිටින්ම යොමු වී ඇත්තේ ප්‍රඥාව දෙසටය. ප්‍රඥාවේ පරිසමාප්තිය සඳහා මූලික අවශ්‍යතා දෙකක් වන්නේ කය හා වචන සංවර කෙරෙන සදාචාරය හා සිත සමාධියට පත් කෙරෙන භාවනාවයි. එබැවින් ප්‍රඥාප්‍රතිපදාවේ මූලික අංග ලෙස අධිශීල හා අධිචිත්ත යන අංග දෙක ඉදිරිපත් වී ඇත. අධිපඤ්ඤා යනු සීලසමාධි දෙකේ ප්‍රතිඵලයයි.



කය - වචනය - සිත යන තිදොර රැකගත් තැනැත්තා අරි අටඟි මඟට පැමිණෙන්නේ ය.

281. වාචානුරක්ඛී මනසා සුසංවුතො
කායෙන ච අකුසලං න කයිරා
එතෙ තයො කම්මපථෙ විසොධයෙ
ආරාධයෙ මග්ගං ඉසිප්පවේදිතං (20:9)

සුරැකී වචනයෙන් සංවරවූ මනසින්
අකුසල් කයින් සිදුවන සැම දුරු කරමින්
මේ තුන් කම් මගම පිරිසිදු වෙහි තබමින්
මග ලැබ ගන්න මැනවින් දත් ඉසි උතුමන්

ගන්න ලොවුතුරු මග - රැකගෙන නිසිව තුන්දොර

20 (4) සූකර ප්‍රේතයා පිළිබඳ කතා පුවත (281 ගාථාව)

රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **සූකර ප්‍රේතයකු** අරභයා මේ ගාථා ධර්මය වදාළ සේක.

දිනක් මහා මොග්ගල්ලාන මහ රහතන් වහන්සේ ලක්ඛණ තෙරුන්වහන්සේ ද සමඟ ගිජුකුළු පව්වේ සිට ආපසු වඩිනා අතරමඟදී අතිශයින් දුක්ඛිත පෙනුමක් ඇති හැමදා කුසගින්නෙන් පෙළෙන ප්‍රේතයකු දුට හ. මේ ප්‍රේතයා ගේ හිස ඌරකු ගේ වැනිය. කඳ මිනිසකුගේ බඳුය. ප්‍රේතයා දැක මුගලන් තෙරුන් වහන්සේට සිනා පහළ විය. එහෙත් කිසිවක් මුවින් පළ නොකළහ. ලක්ඛණ තෙරුන් මේ පිළිබඳව ප්‍රශ්න කළ ද මුගලන් හිමි ඒ ගැන කිසිත් නොකියා "බුදුන් හමු වූ විටම ඒ පිළිබඳව කථා කරමු" යි පවසමින් බුදුරදුන් හමු වීම සඳහා වේළුවනාරාමයට පැමිණියහ. බුදුරජාණන් වහන්සේ ඉදිරියේ දී ලක්ඛණ හිමියෝ මුගලන් හිමියන්ගෙන් එන ගමනේ දී සිනා පහළ කිරීමට කරුණු විමසූහ. "ඇවැත්නි, ඒ එන ගමනේ දී මම එක්තරා ප්‍රේතයකු දිටිමි. හිසින් ඌරකු ද ගතින් මිනිසකු ද මෙන් වූ මෙම ප්‍රේතයා කුසගින්නෙන් නිබඳවම පෙළෙන්නෙකි. ඔහු මෙබඳු ප්‍රේතයකු වීමේ අකුශල කර්මයට මා සම්බන්ධව නොවීම ගැන සිනා පහළ කෙළෙමි" යි මුගලන් හිමියෝ පැවසූහ. බුදුරජාණන් වහන්සේ ද මුගලන් හිමියන්ගේ කථාව අනුමත කරමින් "සැබවි, මුගලන්, මම ද බුදු වූ අලුත මෙම ප්‍රේතයා දුටුවෙමි" යි පවසා ඔහු ගේ අකුශල කර්මය මෙසේ පැහැදිලි කළ සේක. කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ සසුන පවත්නා කල්හි එක්තරා භික්ෂූන් වහන්සේ දෙනමක් ගම්බද විහාරයක බෙහෙවින් ශික්ෂාකාමීව සමගි සම්පන්නව විසූ හ. උන්වහන්සේලා දෙනම එකම මවු කුසක උපන් සහෝදරයන් දෙදෙනකු මෙන් ඉතාමත්ම සමගි සම්පන්නව ඔවුනොවුනට හිතවත්ව සිටියහ. මේ අතර ඈත ගම් පෙදෙසකින් කිසියම් ධර්ම කථික භික්ෂුවක් මෙම ස්ථානයට පැමිණිය හ. මෙම විහාරයෙහි භික්ෂූන් වහන්සේලා දෙනම ආගන්තුක භික්ෂුව විචිත්‍ර ධර්ම කථිකයකු බව දැන විහාරයට එන උපාසකවරුනට දම් දෙසීමට එම භික්ෂුවට ඇරයුම් කළ හ. උන්වහන්සේගෙන් දහම් අසා උපාසකවරු ද පැහැදීමට පත් වූහ. ධර්මය මනාව දෙසන බැවින් දින කිහිපයක දී මෙම භික්ෂූන් වහන්සේ අසල ගම් පෙදෙස්වල ද බෙහෙවින් ප්‍රසිද්ධියට පත් වූහ. තමන්ගේ ප්‍රසිද්ධිය ගම්වල පැතිරෙමින් මිනිසුන්ගේ ප්‍රසාදය ලැබෙද්දී මෙම විහාරයෙහිම ස්ථාවරව පදිංචි වුවහොත් තමන්ට ලාභ ප්‍රයෝජන ද බෙහෙවින් ලබා ගත හැකි වනු ඇතැයි මෙම ධර්මකථික භික්ෂුවට අදහස් විය. විහාරය තමන්ගේ තනි ප්‍රයෝජනයට ගැනීමේ අදහසින් පෙළඹුණු මෙම භික්ෂුව නේවාසික භික්ෂූන් දෙදෙනා ඔවුනොවුනට කොටවා භේද කොට විහාරය අතහැර දමා යන තත්වයක් උද්ගත කිරීමට සමත් වූයේ ය. එකිනෙකාගේ නැති අගුණ එකිනෙකාට පවසා ඔවුනොවුන් භේද කොට විහාරයෙන් පළවා හැරීමේ පාප කර්මය නිසා මෙම ධර්මකථික භික්ෂුව මෙබඳු ප්‍රේතයෙක්ව උපන්නේ ය." මේ පුවත හෙළි කළ භාග්‍යවතුන් වහන්සේ "නුවණැත්තහු විසින් තිදොර සංවර කර ගැනීමෙන් උතුම් මාර්ග ඵලාදිය අත්පත් කර ගත යුතුය" යි ධර්ම දේශනා කරමින් යථෝක්ත ගාථාව ප්‍රකාශ කළ සේක.

විවරණාත්මක අනුවාදය (281 ගාථාව)

වාචානුරක්ඛී මනසා සුසංවුතො, කායෙන ච අකුසලං න කයිරා එතෙ තයො කම්මපථෙ විසොධයෙ ඉසිප්පවෙදිතං මග්ගං ආරාධයෙ

වාචානුරක්ඛී: (යමෙක්) වාක් ද්වාරයෙන් වැළකී (තමා වචනයෙන්) රක්නා සුලු ද; **මනසා**: මනසින්; **සුසංවුතො**: මනා කොට රැකුණේ ද; **කායෙන ච**: කයින් ද; **අකුසලං**: අකුශලය; **න කයිරා**: නො කරන්නේ ද; **එතෙ**: මේ; **තයො**: තුන් ආකාර වූ; **කම්මපථෙ**: කර්ම පථයන්; **විසොධයෙ**: පිරිසිදු කරන්නේ ද (හෙතෙමේ); **ඉසිප්පවෙදිතං**: බුද්ධාදී උතුමන් විසින් දක්නා ලද; **මග්ගං**: ආර්‍ය මාර්ගය; **ආරාධයෙ**: ලබා ගන්නේ ය.

ඉදින් යමෙක් වාක් ද්වාරයෙන් ආරක්ෂා වෙමින් මනෝද්වාරය ද සංවර කර ගෙන කායද්වාරයෙන් සිදුවන අකුසල් ද නොකරමින් මේ තුන් කර්ම පථයන් පිරිසිදු කර ගන්නේ නම් බුද්ධාදී උතුමන් විසින් අවබෝධ කරගන්නා ලද ආර්‍ය මාර්ගය අත්පත් කර ගන්නේ ය.

විවරණය

තයො කම්මපථෙ : කය වචන සිත යන තුන්දොර කර්මපථ නමින් මෙහිදී හැඳින්වෙයි. අකුසල කර්ම සිදු වනුයේ මෙම තුන්දොර ඔස්සේ ය. එබැවින් එම දොරටු කර්ම පථ නමින් ද හැඳින්වී ඇත. පුද්ගලයකු ගේ සදාචාර ජීවිතයෙහි ලා මෙම කර්මපථ හෙවත් කර්ම සිදුවන දොරටු පාලනය කර ගැනීම ඉතා වැදගත් වෙයි. පුද්ගලයකු අතින් සිදුවන අකුශල කර්ම මෙම දොරටු තුන් ආශ්‍රයෙන්ම බිහි වෙයි. කායද්වාරයෙන් සිදුවන අකුශල කර්ම තුනක් ද- (පරපණ නැසීම, නොදුන් දෙය ගැනීම හා පරපුරුෂ-පර ස්ත්‍රී සේවනය) වාග්ද්වාරයෙන් අකුශල කර්ම සතරක් ද (බොරුකීම, කේලාම් කීම, පරුෂ වචන කීම හා හිස් වචන කීම) ද මනෝද්වාරයෙන් අකුසල කර්ම තුනක් ද (දැඩි ලෝභය, ද්වේෂය හා මිථ්‍යා දෘෂ්ටිය) ද වේ. ඉහත සඳහන් අකුශල කර්ම කාය වාක් මනෝ යන තුන් දොරටු ආශ්‍රයෙන් සිදුවන බැවින් ඒවා පාලනය කර ගැනීම සදාචාර පාරිශුද්ධිය සඳහා අවශ්‍ය වෙයි. මෙම ගාථාවෙහි සඳහන් කර්මපථ පිරිසිදු කරන්නේය යන්නෙන් අදහස් වන්නේ ඉහත සඳහන් අකුශල කර්මයන් සිදු වීමට ඉඩ නොදීමය. මෙම අකුශල කර්ම පුද්ගලයකුගේ පෞද්ගලික ජීවිතයට පමණක් නොව ඔහු ආශ්‍රය කරන සමාජයේ සුහද සහ ජීවී පැවැත්මට ද හානිදායකය. මෙම කථාවෙහි සඳහන් ධර්ම කථික භික්ෂුව ආත්මලාභය තකා සමගියෙන් සිටි සිල්වත් භික්ෂූන් දෙනමක් භේදයට පත් කරවූවෙකි. ඔහු තමාට විපත්තිය සැලසෙන පාපකර්මයක් කර ගත්තා පමණක් එය නොව අනුනට ද විපත් ගෙන එන ලද්දෙකි. මෙම දශ අකුශල කර්මයට තමාගේත් සමාජයේත් විපතට හේතු වන බැවින් ඒවා සිදුවන දොරටු පාලනය කර ගැනීම බෞද්ධ ජීවන ප්‍රතිපදාවේ අත්‍යවශ්‍ය ලක්ෂණයක් වෙයි.

ඉසිප්පවෙදිතං මග්ගං: ඍෂිවරුන් විසින් අවබෝධ කරන ලද මාර්ගයයි. මෙහි ඍෂිවරුන් නමින් ගැනෙනුයේ බුද්ධාදී ආර්‍ය පුද්ගලයෝ ය. කාය ද්වාරය හා වාග් ද්වාරය ශීලය මගින් සංවර කර ගෙන මනොද්වාරය භාවනා මගින් විශෝධනයට පත් කර ගැනීමෙන් ආර්‍යමාර්ගය අවබෝධ කළ හැකිය. සෝවාන් සකෘදාගාමි, අනාගාමි අරහත් යන සතර මග සතර ඵල අත්පත් කරගත් පුද්ගලයෝම ආර්‍ය නම්. මෙහි මාර්ගය යනු විමුක්තිය පියවරින් පියවර අත්පත් කර දෙන සතර මාර්ග සතර ඵලයයි.

භාවනාවෙහි යෙදීමෙන් නුවණ වැඩේ. භාවනාවෙහි නො යෙදෙන්නහු ගේ නුවණ වැනසේ.

282. යොගා වෙ ජායති භූරි
අයොගා භූරිසඞ්ඛයො
එතං ද්වෙධා පථං ඤත්වා
භවාය විභවාය ච
තථත්තානං නිවෙසෙය්‍ය
යථා භූරි පවඩ්ඪති (20:10)

නුවණ ගෙනෙයි බැවුම මගින්
බැවුම නැතොත් දැනුම නැසෙයි
වැඩෙන නැහෙන දෙමගම දැන
දැනුම වැඩෙන ලෙස යෙදෙන්න

බැවුම් මගින් - නුවණ ගෙනෙයි

20 (5) පොඨිල තෙරණුවෝ පිළිබඳ කතා පුවත (282 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **පොඨිල** නම් වූ තෙර කෙනකුන් අරභයා මෙම ගාථා ධර්මය වදාළ සේක.

පොඨිල තෙරුන්වහන්සේ ත්‍රිපිටක ධර්මය මනාව උගෙන ධර්ම දේශනාදියෙහි බෙහෙවින් ව්‍යක්ත බවක් දැක්වූ කෙනෙකි. උන් වහන්සේ ගෙන් බොහෝ භික්ෂූන් වහන්සේලා ද ධර්මය උගනිති. මෙසේ බොහෝ දෙනකුට ධර්මයෙන් අවවාදානුශාසනා දීමෙහි දක්ෂවීමෙන් ද ධර්මධර වීමෙන් ද උපන් අභිමානයක් පොඨිල තෙරණුවන් කෙරෙහි විය.

ධර්මය මනාව උගෙන සිටියත් අභිමානයෙන් උදම්ව සිටි මේ තෙරුන්ගේ දුර්වල කම දැන උන්වහන්සේට පිහිට වීමට අදහස් කළ බුදුරජාණන් වහන්සේ තමන් හමුවට පොඨිල තෙරුන් එන හැම විටෙකම "හිස් පොඨිල" නමින් අමතන සේක. බුදුන් වහන්සේ ගේ මෙම ඇමතීම කිහිප දිනක් අසා සිටි මේ තෙරණුවෝ මෙහි අර්ථය කුමක්දැයි සිතන්නට වූහ. තමාගේ අභිමානය නිසා තමන් මාර්ගඵලාදියකට නොපෙළඹී ඇති බව බුදුන් වහන්සේ දැන උන් වහන්සේ මට පිහිට වනු සඳහා මෙසේ අමතන සේකැයි උන්වහන්සේට වැටහිණ. තමන් තවදුරටත් මේ ආකාරයෙන් ජීවත් වීමේ හිස්බව තේරුම් ගත් ඒ හිමියෝ අන් අයට ද නොපවසා භාවනා වැඩීම සඳහා විසි යොදුනක් පමණ ඈත වනගත සෙනසුනකට වැඩම කළහ. එහි භික්ෂූන් වහන්සේලා තිස් නමක් භාවනාවන්හි යෙදෙමින් සිටිය හ.

සෙනසුනෙහි ප්‍රධාන මහා තෙරුන් හමු වූ පොඨිල තෙරණුවෝ තමන්ට අනුකම්පාවෙන් භාවනා කටයුතු සඳහා උපදෙස් දෙන මෙන් ඉල්ලා සිටිය හ. මෙම තෙරුන්ගේ අභිමානී ස්වරූපය දැන සිටි ප්‍රධාන
මහ තෙරණුවෝ පොඨිල තෙරුන්ගේ නිහතමානී භාවය ඇති කරවනු කැමැත්තෙන් ඊළඟ මහ තෙරුන් හමුවට යාමට පැවසූහ. පොඨිල තෙරුන් එසේ ගිය ද එම තෙරුන්ගෙන් ද කියැවුනේ ඊළඟ තෙරුන් වෙත යාමටය. මෙසේ පොඨිල තෙරුන්ට අන්තිම සංඝනවක භික්ෂුව දක්වා යාමට සිදුවිය. අන්තිම භික්ෂුන් වහන්සේ වූයේ සත් හැවිරිදි රහත් සාමණේර නමකි. මෙම කුඩා සාමණේර නම පොඨිල තෙරුන්ගේ නිහතමානීත්වය පිළිබඳව පරීක්ෂණයක් ද කොට ඒ වන විට ඉතාම සුවච කීකරු තත්වයෙන් සිටි බැවින් තමන්ගේ ශිෂ්‍යයකු වශයෙන් පිළිගෙන කමටහන් දී භාවනා කළ යුතු ආකාරය පිළිබඳව ද උපදෙස් දුන් හ. ඒ අනුව ක්‍රියා කළ පොඨිල තෙරණුවෝ බෙහෙවින් උත්සාහවත්ව භාවනාවෙහි නිරත වූහ.

බුදුරජාණන් වහන්සේ ඉතා ඈත පෙදෙසක බවුන් වැඩීමෙහි යෙදී සිටි පොඨිල තෙරුන් තම දිවැසින් බලා ඔහු තවදුරටත් උනන්දු කරවනු වස් තමන් එම තෙරුනට පෙනීමට සලස්වා මෙම ගාථාවෙන් ධර්ම දේශනා කළ සේක. පොඨිල තෙරණුවෝ නොබෝ දිනකින්ම රහත් බව ලබා ගත්හ.

විවරණාත්මක අනුවාදය (282 ගාථාව)

යොගා වෙ භූරි ජායති, අයොගා භූරි සඞ්ඛයො, භවාය විභවාය ච එතං ද්වෙධාපථං ඤත්වා යථා භූරි පවඩ්ඪති තථා අත්තානං නිවෙසෙය්‍ය

යොගාඃ (භාවනාවෙහි) යෙදීමෙන්; **වෙ**ඃ ඒකාන්තයෙන්; **භූරි**ඃ ප්‍රඥාව; **ජායති**ඃ උපදියි; **අයොගා**ඃ භාවනාවෙහි නොයෙදීමෙන්; **භූරි**ඃ ප්‍රඥාව; **සඞ්ඛයො**ඃ හානියට යයි; **භවාය**ඃ වැඩ පිණිස ද; **විභවාය ච**ඃ අවැඩ පිණිස ද (හේතුවන); **එතං**ඃ මේ; **ද්වෙධාපථං**ඃ මාර්ග දෙක (යෝග්‍ය ද අයෝග්‍ය ද යන); **ඤත්වා**ඃ දැන; **යථා**ඃ යම් අයුරකින්; **භූරි**ඃ ප්‍රඥාව; **පවඩ්ඪති**ඃ වැඩේ ද; **තථා**ඃ ඒ අයුරින්; **අත්තානං**ඃ තමා (තම සිත); **නිවෙසෙය්‍ය**ඃ පිහිටවන්නේ ය.

භාවනාවෙහි යෙදීමෙන් ප්‍රඥාව ඇති වෙයි. භාවනාවෙහි නොයෙදීමෙන් ප්‍රඥාව හානියට පැමිණෙයි. ප්‍රඥාව වැඩෙන හා පරිහානියට පැමිණෙන මේ මාර්ග දෙක දැන ප්‍රඥාව වර්ධනය වන මාර්ගයෙහි තමන් යෙදිය යුතුය.

විවරණය

යොගා වෙ භූරි ජායතිඃ භාවනාව පුද්ගලයකු ගේ ප්‍රඥාව විශෝධනයට පත් කරයි. ප්‍රඥාව වූ කලී බාහිර වශයෙන් පුද්ගලයකු වෙත ලඟාවන්නා වූ හෝ අන්‍යයකු ගේ බලපෑමෙන් අත්වන්නා වූ තත්වයක් නොවේ. ප්‍රඥාව, ඥානය පුද්ගලයා තුළම පවත්නා ප්‍රබුද්ධ ශක්තියකි. සෑම පුද්ගලයකු තුළම මෙම ශක්ති විශේෂය විවිධ මට්ටම් වලින් පවත්නා බව බුදු දහමින් හෙළි කෙරෙයි. අරිය පරියෙසන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ ලෝක ජනතාව නෙළුම් විලකට උපමා කොට දක්වති. නෙළුම් විලෙහි විවිධ අවස්ථාවන්හි පවත්නා නෙළුම් මල් තිබේ. උඩට මතුව පිපුණ නෙළුම් මල් දක්වා මුහුකුරා යමින් දිය පතුලේ සිටම උඩට එමින් පවත්නා නෙළුම් පොහොට්ටු නෙළුම් විලක දක්නට ලැබේ. එමෙන්ම මිනිසුන් අතර ප්‍රඥා ශක්තිය ද විවිධ මට්ටමින් පවතියි. එය ප්‍රබුද්ධ තත්වය දක්වා වර්ධනය කර ගත හැකිය. එය පුබුදු කිරීමේ ක්‍රියාවලිය පුද්ගලයා විසින්ම කළ යුත්තකි. මේ සඳහා භාවනාව බුදු දහමින් අනුමත වී තිබේ. ප්‍රඥාවර්ධනයට උපයෝගී වන භාවනාව දෙයාකාර කොට දැක්වෙයි. සමථ භාවනා හා විපස්සනා භාවනා යන නම් වලින් හැඳින්වෙන්නේ ඒ දෙපරිදි වූ භාවනවයි. සමථයෙන් මූලික වශයෙන් කෙලෙස් යටපත් කෙරෙයි. ප්‍රඥාව මිනිස් මනසෙහි මුකුලිත වී ඇත්තේ කෙලෙස් නිසාය. කෙලෙස් ක්ෂය කිරීමෙන් ප්‍රඥාව වර්ධනය කර ගත හැකි ය. සමථ භාවනාව උපරිම මට්ටමෙන් වර්ධනය කළ විට මනසේ පිවිතුරු බව ඇති වී විවිධ උසස් ඥානයන් අත්පත් කර ගැනීමට හැකි වෙයි. පංච අභිඥාවන් වශයෙන් හැඳින්වෙන විශිෂ්ට ඥාන වර්ග සයක් සමථය මගින් උපදවා ගත හැකි බව සූත්‍ර ධර්ම වලින් හෙළි වෙයි. විපස්සනා භාවනාව ප්‍රඥාභාවනාව යනුවෙන් ද හැඳින්වෙයි. සංස්කාර ධර්මයන් පිළිබඳ අනිත්‍ය දුක්ඛ අනාත්මතාවන් ආවර්ජනය කරමින් භාවනා කිරීම තුළින් යථාභූත ඥාන දස්සනය නැමැති උත්තරීතර ප්‍රඥාව ලබා ගත හැකිය. මෙයින් අදහස් කෙරෙන්නේ පුද්ගලයන් හා වස්තූන් පිළිබඳ යථාර්ථාවබෝධයයි. මෙම ප්‍රඥාව විමුක්තිඥාන දර්ශනය කෙරෙහි යොමුව පවතියි. සකල ක්ලේෂයන් නසා අරහත් තත්වය ලබා ගැනෙනුයේ මෙම විමුක්ති ඤාණ දස්සනයෙනි. මේ නිසා විමුක්තිඥානය තෙක් ප්‍රඥාව වර්ධනය කර ගැනීමට හැකි වන්නේ භාවනාව මගිනි. අවිද්‍යාව දුරු කොට ප්‍රඥා ආලෝකය පුද්ගලයාට භාවනාව මගින් අත්පත් කර දෙන බැවින් භාවනාවෙන් (යෝගයෙන්) ප්‍රඥාව උපදිතැයි මෙම ගාථාවෙන් ප්‍රකාශ වී ඇත.

කෙලෙස් නමැති වනයේ ලොකු කුඩා කෙලෙස් ගස් සිඳ දමා (=නසා) කෙලෙස් වන රහිත වන්න.

283. වනං ඡින්දථ මා රුක්ඛං
වනතො ජායති භයං
ඡෙත්වා වනඤ්ච වනථඤ්ච
නිබ්බනා හොථ භික්ඛවො (20:11)

වනය කපවු ගස් නොකපවු
බිය ගෙන දෙයි වනය තුලින්
වනය මෙන්ම අකුල් ද සිඳ
නිවන් යන්න මහණෙනි ඔබ

කෙලෙස් වන සිඳලනු

20 (6) මහළු පැවිද්දෝ පස් දෙනෙකු ගේ කතාව (283 සහ 284 ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **මහළු භික්‍ෂූන් වහන්සේලා පස්දෙනකු** අරභයා මේ ගාථා ද්වය දේශනා කළ සේක.

ගිහි කල්හි යහළුව එකට විසූ ධනවත් උපාසකවරු පස් දෙනෙක් මහළු වියට පත් වූ පසු "මේ ගිහිගෙහි වැසීමෙන් කවර වැඩක් ද බුදුරජාණන් වහන්සේ වෙතට ගොස් බුදු සසුනෙහි මහණ වන්නෙමු" යි කතිකා කොට ගෙන දෙව්රම් වෙහෙරට ගොස් බුදුන් වැඳ එකත් පසෙක හිඳ තමන් මහණ කරන ලෙස ඉල්ලා සිටියහ. මේ පස්දෙනා පැවිදි වුව ද මහළු වියෙහි සිටි බැවින් බුදු දහම උගෙන සිතෙහි ධාරණය කර ගැනීම අපහසු විය. ජේතවන විහාර කෙළවර අසපුවක් තනවා ගෙන පස්දෙනා වහන්සේම එහි ජීවත් වුහ. දහවල් ආහාරය සඳහා බොහෝ කොට මේ පස්දෙනා පිඬු සිඟා වඩින්නේ ගිහි කල ඔවුන්ගේ දූ පුතුන්ගේ හෝ පරණ ඇඹෑණිවරුන්ගේ ගෙවලටය.

මේ පස්දෙනා වහන්සේගෙන් එක් කෙනකු ගේ පරණ බිරිය මධුරපාචිකා නම් වුවා ය. ඕ තොමෝ රසවත් ලෙස ආහාර පිසීමෙහි දක්‍ෂ වූවා ය. එමෙන්ම මහලු භික්‍ෂූන් වහන්සේලා පස්දෙනාටම බෙහෙවින් හිතවත්ව විසුවාය. මේ නිසා පස්දෙනාම පිඬු පිණිස ගොස් ආහාර ලැබ මේ උවැසියගේ ගෙදරට පැමිණ එහිදී ආහාර වැළඳීම සිරිතක් කොට ගත්හ. උවැසිය ද රසවත් සේ ව්‍යාංජනයක් පිස භික්‍ෂූන් පස් නමටම බෙදා දෙන්නීය. මෙසේ කල් යත්ම මෙම උවැසියට රෝගයක් වැළඳී එයින්ම ඇය මිය පරලොව ගියා ය. මේ පස්දෙනා වහන්සේ මේ පුවත දැනගෙන ඉතාමත් කණගාටුවට පත්ව පන්සලට වී ඔවුනොවුන් වැළඳ ගෙන උවැසියගේ ගුණ කියමින් හඬන්නට වුහ. අනෙක් භික්‍ෂූන් වහන්සේලා මුන්වහන්සේලාගේ හැඬුම අසා අවුත් හැඬීමට කාරණා කිම්දැයි විමසූහ.

පස්දෙනා වහන්සේ අනෙක් භික්‍ෂූන් වහන්සේලාගේ විමසුමට පිළිතුරු දෙමින් මධුරපාචිකා උවැස්ස මිය ගිය බවත් ඇය ජීවත්ව සිටියදී තමන්ට බෙහෙවින් හිතවත්ව උපකාරී වු බවත් දැන් නැවතත් එබඳු උවැසියක් ලබා ගත නොහැකි බැවින් තමන් හඬන බවත් පැවසූ හ. භික්‍ෂූන් වහන්සේලා දම් සභා මණ්ඩපයෙහි රැස්ව මේ සිද්ධිය පිළිබඳව සාකච්ඡා කරමින් සිටියහ. බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කිරීම සඳහා දම් සභා මණ්ඩපයට වැඩම කොට "තමන් මෙහි එමින් සිටියදී භික්‍ෂූහු කවර කථාවකින් යුක්තව සිටියාහුදැ"යි විචාරා කාරණය දැන ගෙන "මහණෙනි දැන් පමණක් නොව පෙරද මේ භික්‍ෂූහු පස් දෙනාම මෙබඳුම ක්‍රියාවක් කළාහුයයි පවසමින් අතීත භවයක කථාවක් ඉදිරිපත් කළ සේක.

පෙර ආත්ම භාවයකදී මේ සියලු දෙනා ගව දෙනුන්ව උපන්හ. ඔවුනතුරින් එක් දෙනක් මුහුද අසල සැරිසරමින් සිටියදී මුහුදු රළට අසුව මුහුදට ගසා ගෙන ගොස් මිය ගියාය. අනෙක් දෙන්නු සියලු දෙනා මෙය දැක මහත් දුකින් හඬා වැළපෙන්නට වුහ. පසුව ඔවුහු මිය ගිය දෙන මුහුදින් ගොඩට ගැනීමට බලවත් උත්සාහයක් දැරුවත් අසමත් වූ හ.

බුදුරජාණන් වහන්සේ මේ ජාතක කථාව සවිස්තරව පවසා, "මහණෙනි, මේ සියලු දුක් නැති වන්නේ තෘෂ්ණාව නමැති වනය පවත්නා බැවිනි. එබැවින් දුකින් මිදීම සඳහා මෙම කෙලෙස් වනය කපා හළ යුතුය"යි වදාරා යථොක්ත ගාථා ද්වයෙන් ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (283 ගාථාව)

භික්ඛවො වනං ඡින්දථ මා රුක්ඛං වනතො භයං ජායති
වනඤ්ච වනථඤ්ච ඡෙත්වා නිබ්බනා හොථ

භික්ඛවො: මහණෙනි; **වනං**: (තෘෂ්ණාදී කෙලෙස්) වනය; **ඡින්දථ**: කපව්; **මා රුක්ඛං**: රුක් නොකපව්; **වනතො**: කෙලෙස් වනයෙන්; **භයං**: භය; **ජායති**: උපදියි; **වනඤ්ච**: කෙලෙස් නැමති මහා වනය ද; **වනථඤ්ච**: කුඩා කෙලෙස් වනය ද; **ඡෙත්වා**: සිඳ දමා; **නිබ්බනා**: කෙලෙස් රහිතව නිවුණාහු; **හොථ**: වෙත්වා.

මහණෙනි, රාගාදී කෙලෙස් වනය සිඳ හරිවු. රුක් සිඳ නො හරිවු. සිඳ හැරිය යුත්තේ කෙලස් වනය මිස රුක් සහිත වනය නොවේ. කෙලස් වනයෙන් බිය උපදියි. භවෝත්පත්තිය ගෙන දෙන්නා වූ මහා කෙලෙස් වනය ද ප්‍රවෘත්ති විපාක ගෙන දෙන්නා වූ කුඩා කෙලෙස් වනය ද අර්හත් මාර්ග ඥානයෙන් සිඳ හැර කෙලෙස් රහිතව නිවුණාහු වෙත්වා.



යම්තාක් කල් කෙළෙස් නමැති වනය නො සිඳේ ද, ඒ තාක් කල් කෙළෙස් පිළිබඳ සිත දියුණු වන්නේ ය.

284. යාවං හි වනථො න ඡිජ්ජති
අණුමත්තො'පි නරස්ස නාරිසු
පටිබද්ධමනො ව තාව සො
වච්ඡො ඛීරපකො'ව මාතරි (20:12)

පිරිමියකු ගේ ගැහැනුන් වෙත ඇදී යන
නොසිඳලුවොත් සුළු වුව සෙනෙහස තිබෙන
වසු පැටවකු ලෙසින් මව වෙතටම ඇදෙන
පිළිබඳ සිත තිබේ වෙන අතකට නොයන

සුළු ඇල්මෙන් වුවත් - සිත බැඳේ ලෙස සවිමත්

20 (6) මහළු පැවිද්දෝ පස් දෙනෙකු ගේ කතාව (283 සහ 284 ගාථා)

විවරණාත්මක අනුවාදය (284 ගාථාව)

**නරස්ස නාරිසු අණුමත්තො අපි වනථො යාවං හි
න ඡිජ්ජති තාව සො මාතරි ඛීරපකො වච්ඡො ඉව
පටිබද්ධමනො එව**

නරස්ස: පුරුෂයාගේ; **නාරිසු**: කාන්තාවන් කෙරෙහි වූ; **අණුමත්තො අපි**: සුළු වුවද; **වනථො**: ඇල්ම; **යාවං හි**: යම්තාක්; **න ඡිජ්ජති**: නොසිඳිනු ලැබේ ද; **තාව**: ඒ තාක්; **සො**: හෙතෙම; **මාතරි**: මව කෙරෙහි; **ඛීරපකො**: කිරි බොන්නාවූ; **වච්ඡො ඉව**: වසු පැටවකු මෙන්; **පටිබද්ධමනො එව**: (ස්ත්‍රීන් කෙරෙහි) පිළිබඳ සිත් ඇත්තේම (වෙයි).

කාන්තාවන් කෙරෙහි වූ පිරිමියාගේ සුළු වූද ඇල්ම සිඳ දමන තෙක් එම පිරිමියා කිරිබොන වසු පැටවකු මව කෙරෙහි ඇදී යන්නාක් මෙන් පිළිබඳ සිතින්ම පසු වෙයි.

විවරණය

නරස්ස නාරිසු: කාන්තාවන් කෙරෙහි පිරිමියාගේ ඇල්ම මෙයින් අදහස් කෙරෙයි. කාන්තාවන් කෙරෙහි පිරිමියාගේ බැඳීම ඉතා දැඩි, නොබිඳිය හැකි එකක් ලෙස මෙයින් නිරූපණය වෙයි. ලිංගිකත්වය පිළිබඳ බුදුන්වහන්සේගේ ආකල්ප ඇතැම් සූත්‍රධර්මවලින් හෙළිදරව් වෙයි. අංගුත්තර නිකාය ඒකක නිපාතයෙහි සූත්‍රයකින් මෙසේ කියැවෙයි. "මහණෙනි, ස්ත්‍රී රූපය මෙන් පිරිමියකුගේ සිත දැඩිව බැඳ ගන්නා වෙනත් රූපයක් මම මෙලොව නොදකිමි. කාන්තා රූපය මිනිස් සිත මැඩගෙන සිටියි."

"මහණෙනි, ගැහැණියකගේ ශබ්දය, ගන්ධය, රසය හා ස්පර්ශය මෙන් පිරිමියකු ගේ සිත මැඩගෙන පවත්නා වෙනත් කිසිම ශබ්දයක්, ගන්ධයක්, රසයක් හා ස්පර්ශයක් මම මෙලොව නොදකිමි."

මෙම සූත්‍රය ලිංගිකත්වය පිළිබඳව බෙහෙවින් නිශ්චිතාර්ථවත් පැහැදිලි කිරීමක් කරයි. මෙහි සත්‍යතාව ප්‍රතික්ෂේප කළ නොහැක්කකි. ලිංගික ආශාව බුදුන්වහන්සේ විසින් විවරණය කොට ඇත්තේ ඉතා දැඩි ආවේගයක් ලෙසය. යමෙකු - බෙහෙවින් බලවත් පුද්ගලයකු පවා මෙම ආවේගයෙන් මඩනා ලද හොත් හෙතෙම දුබල බවට පැමිණෙයි. එම ආවේගයේ වහලකු බවට පත්ව එම ආවේගයෙන් මෙහෙයවන අන්දමින් ක්‍රියා කරයි. ධ්‍යානලාභිහු පවා ලිංගික ආවේගයෙන් මැඬී ධ්‍යානවලින් පිරිහීමට පත් වෙති. විශේෂයෙන් තාරුණ්‍යයෙදී පවත්නා ලිංගික මෙහෙයවීම ඉතා දැඩි සැලකිල්ලකින් පාලනය කළ යුතු වෙයි. කිසිවකු ඒ පිළිබඳව සාවධානවත් නොවුවහොත් ඔහුට බලවත් විපත් වලට ද මුහුණ දීමට සිදුවනු ඇත. රාගය වැනි වූ ගින්නක් නැත.

බුදුරජාණන් වහන්සේ ප්‍රායෝගික දාර්ශනිකයකු වූ බැවින් උන්වහන්සේ තම අනුගාමිකයන් හැම දෙනකුම ශ්‍රමණ ජීවිතයක් ගෙවීම අපේක්ෂා නොකළ සේක. උන්වහන්සේ තම ගිහි ශ්‍රාවකයන් අමතන්නේ කම් සැප විඳිනා ගිහියන් ලෙසය (ගිහි කාමභොගි) මිනිසුන්ගේ සහජ ආසයන් හා ආවේගයන් පිළිබඳව මනා දැනීමක් පැවති ශාස්තෘවරයකු වූ බුදුරජාණන් වහන්සේ විසින් තම පැවිදි ශ්‍රාවකයන්ට මෙන් ගිහි ශ්‍රාවකයන්ට ලිංගික සම්බන්ධතා පැවැත්වීම තහනම් කොට නැත. නමුත් වැරදි ලෙසින් කෙරෙන කාම සුඛ සන්තර්පනය වැළැක්වීම සඳහා උන්වහන්සේ තම අනුශාසනයන් යොමු කළ සේක. කම් සැප වින්දනයෙන් තොරව පවත්නා බ්‍රහ්මචර්යාව ශ්‍රේෂ්ඨ දෙයක් වුවද එය ගිහියන් සඳහා වූ නිත්‍ය ශීලයකට අන්තර්ගත වී නැත. අවස්ථානුකූලව පිළිපැදිය යුතු ගිහි දස ශීලයෙහි ලා බ්‍රහ්මචර්යාව අවධාරණය වී ඇත. කිසියම් පිරිමියෙක් අවිවාහක සිටීමට තීරණය කරන්නේ නම් හෙතෙම කය සිත වචන යන ද්වාර ත්‍රයෙන් ම පාරිශුද්ධත්වයෙන් සිටිය යුතුය. එහෙත් අවිවාහක තනි ජීවිතයක් ගත කිරීමට තරම් සිත දැඩි නොවන පුද්ගලයා විපත්තිදායක හා වැරදි සහගත වූ ලිංගික සම්බන්ධතාවන්ගෙන් වැළකිය යුතුය. ඔහුට විවාහ ජිවිතයක් ගෙවමින් සදාර සන්තෝෂයෙන් යුක්තව කටයුතු කළ හැකිය. වැරදි සහගත ලිංගික සම්බන්ධතා පැවැත්වීමට යොමු වන්නා පරිහානියට පත් වන්නකු ලෙස සූත්‍ර කිහිපයකින්ම අවධාරණය කොට තිබේ.

තම අඹුවගෙන් නොසැනසී අන් අඹුවන් ගේ හා වෙසඟනන්ගේ පහස ලැබීමට පෙළඹෙන්නා පිරිහෙන්නකු ලෙස පරාභව සූත්‍රයේ දී පැවසී ඇත.

කාමය කෙරෙහි පුද්ගලයාගේ ඇදී යාම ගිහි ජීවිතයක දී කිසියම් සංවිධානාත්මක පාලනයක් යටතේ පවත්වා ගැනීමට ගිහියන් සඳහා වූ සූත්‍රධර්ම මගින් උපදෙස් දී තිබේ. එහෙත් පැවිදි ජීවිතය විරාගය සඳහා වූ ක්‍රියා මාර්ගයක් වන බැවින් එහිදී කාමය, ආශාව, තෘෂ්ණාව වැනි හැඟීම් යටපත් කිරීමට නොව සම්පූර්ණයෙන් මුල් සිඳ දැමීමට අවශ්‍ය වෙයි. විමුක්තිය වූ කලි සියලු කෙලෙසුන්ගෙන් මිදීමකි.

සිය අත්බැව් පිළිබඳ වූ සෙනෙහස සිඳ ලන්න. අරි අටඟි මඟ ම සිය සිත්හි උපදවා ගන්න.

285. උච්ඡින්ද සිනෙහ මත්තනො
කුමුදං සාරදිකං ව පාණිනා
සන්ති මග්ගමෙව බ්‍රෑහය
නිබ්බාණං සුගතෙන දෙසිතං (20:13)

සරදෙහි කුමුදු මල අතකින් නෙලන ලෙසින්
තම සිත සෙනෙහෙ මල සිදහල මැනවි සෙමින්
සන්සුන් සෙත් මගම වැඩුවොත් යෙහෙකි නිතින්
පරම නිවන පවසා ඇත මුනිඳු විසින්

සත්වගට සෙත් මග

20 (7) රන්කරුවකුව සිට පැවිදි වූ තෙර නමක් පිළිබඳ කතා පුවත (285 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ සැරියුත් මහතෙරුන්ගේ **සද්ධිවිහාරික තෙර** කෙනකුන් අරභයා මේ ගාථාව වදාළ සේක.

රන් කරුවකුව සිටි රූමත් තරුණයෙක් සසර කළකිරී සැරියුත් මහ රහතන් වහන්සේ සමීපයෙහි පැවිදි වූයේ ය. තරුණ වියෙහි සිටි හෙයින් රාගචරිතයෙකැයි අදහස් කොට සැරියුත් මාහිමියෝ මොහුට භාවනාව සඳහා උචිත කමටහනක් වශයෙන් අසුභ කර්මස්ථානය පාදක කොට ගෙන භාවනාව වඩන ලෙස උපදෙස් දුන්හ. මේ තෙරණුවෝ ද කමටහන උගෙන සුදුසු සෙනසුනකට ගොස් භාවනා කළහ. මසක පමණ භාවනා කළ ද ඉන් කිසිදු ප්‍රයෝජනයක් අත් නොවුණු බැවින් ආපසු පැමිණ සැරියුත් තෙරුන් සමු වී භාවනාවෙන් ප්‍රතිඵලයක් නොලද බව දැන්වූහ. සැරියුත් හිමියෝ යළිත් ඒ අසුභ කර්මස්ථානයම වටහා ගැනීමට පහසු සේ සරල කොට උගන්වා ඒ තෙරුන් භාවනාව සඳහා මෙහෙයවූ හ. එවර ද භාවනා කොට ප්‍රතිඵලයක් ලබා ගැනීමට තෙරණුවන්ට නොහැකි විය. තෙවෙනි වරද සැරියුත් හිමියන්ගෙන් ලැබුණු උපදෙස් පරිදි ක්‍රියා කොටත් භාවනාවෙන් නිසි පල ලබා ගැනීමට නොහැකි විය. එබැවින් සිවුවෙනි වර සැරියුත් තෙරණුවෝ තෙරණුවන් කැටුව බුදුරජාණන් වහන්සේ හමු වී සියලු විස්තර පැවසූ හ.

බුදුරජාණන් වහන්සේ මේ තරුණ භික්ෂුව රන්කරුවකු වශයෙන් බොහෝ කලක් ජීවත් වූ බවත් මීට කලින් ආත්මභාව පන්සියයක් රන්කරුවකුව ඉපදී ඇති බවත් දැන මොහුට අසුභ කමටහන නොසුදුසු බව වටහාගත් සේක. එබැවින් උන්වහන්සේ මොහුගේ සිතෙහි ප්‍රසාදය ඇති විය හැකි කමටහනක් වශයෙන් රියසකක් පමණ වූ රත් පියුමක් මවා ඔහු අතට දී එය අරමුණු කොට භාවනා වැඩීමට උපදෙස් දුන් සේක. තරුණ තෙරණුවෝ ද බුදුන් වහන්සේ ගේ උපදෙස් පරිදි සුදුසු තැනකට ගොස් රත් පියුම අරමුණු කොට සිත එකඟ කිරීමට උත්සාහ ගත්හ. නිතර රත්රන් දැකීමෙන් සිත්කළු දෙයට සිත ඇදී යන ගතියක් මේ තෙරුන් කෙරෙහි වූ බැවින් රත් පියුම අරමුණු කොට භාවනා කිරීමේ දී සිතේ පහන් බව ඇති වීමෙන් භාවනාව ප්‍රතිඵලදායක විය. රත් පියුම මත සිත එකඟ කරගත් තෙරුන්ට පංච නීවරණ ධර්මයන් ප්‍රහීණ කොට අනු පිළිවෙලින් චතුර්ථධ්‍යානය තෙක් ධ්‍යාන සමාපත්ති උපදවා ගැනීමට හැකි විය.

බුදුරජාණන් වහන්සේ දෙව්රම ගඳකිලියෙහි වැඩ සිටිමින් ම මෙම තෙරුන්ගේ ධ්‍යාන සමාපත්ති ප්‍රතිලාභය දැන අරමුණෙහි තබා තිබූ රත් පියුම ක්‍රමයෙන් පෙති හැලී ජරාවට පත්වන ආකාරයක් පෙනී යාමට අධිෂ්ඨාන කළ සේක. ඉතා පැහැපත්ව සුන්දරව පැවති රත් පියුම ක්‍රමයෙන් පෙති හැලී ජරාවට පත්වන ආකාරය බලා තෙරණුවෝ අනිත්‍ය දුක්ඛ අනාත්ම තත්වයන් වටහා ගැනීමට සමත් වූහ. මේ අවස්ථාවෙහි බුදුරජාණන් වහන්සේ රශ්මි දහරාවක් මවා තමන් තෙරුන්ට පෙනීමට සැලැස්වූ සේක. තෙරණුවෝ බුදුන් තමන් ඉදිරියෙහි සිටින්නාක් මෙන් දැක ගත්හ. බුදුරජාණන් වහන්සේ තෙරුන් වහන්සේ ගේ සිත ලෝකෝත්තර මාර්ගයට යොමු කරවනු රිසියෙන් යථෝක්ත ගාථා ධර්මය දේශනා කළ සේක. ගාථාව අසා තෙරණුවෝ කෙලෙසුන් දුරු කොට රහත් ඵලයෙහි පිහිටියා හ.

විවරණාත්මක අනුවාදය (285 ගාථාව)

සාරදිකං කුමුදං පාණිනා ඉව අත්තනො සිනෙහං
උච්ඡින්ද සන්ති මග්ගං එව බ්‍රූහයෙ නිබ්බාණං සුගතෙන දෙසිතං

සාරදිකං: සරත් කාලයෙහි වූ; **කුමුදං**: කුමුදු මලක්; **පාණිනා ඉව**: තම අතින් කඩන්නාක් මෙන්; **අත්තනො**: තමන්ගේ (සිත තුළ ඇති); **සිනෙහං**: සෙනෙහස; **උච්ඡින්ද**: සිඳ දමන්න; **සන්ති මග්ගං එව**: නිවන් මගම; **බ්‍රූහය**: වඩන්න; **නිබ්බාණං**: නිවන (කෙලෙස් දුරු කිරීම); **සුගතෙන**: බුදුරජාණන් වහන්සේ විසින්; **දෙසිතං**: දේශනා කරන ලදී.

සරත් කාලයෙහි විලෙක (වප් ඉල් දෙමස) හටගත් කුමුදු මලක් සියතින් කඩා දමන්නාක් මෙන් තමාගේ සිත තුළ ඇති ආශාව සිඳ දමන්න. නිවනට පමුණුවන ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයම සිත්හි වඩන්න. ඒ නිවන බුදුරජාණන් වහන්සේ විසින් ශාන්තය. ප්‍රණීතය. සදාකාලික යයි වර්ණනා කොට දෙසන ලදි.

විවරණය

උච්ඡින්ද සිනෙහ මත්තනො: තමා තුළ ඇති තෘෂ්ණාව දුරු කරන්න. මෙහි සිනෙහ යනුවෙන් දැක්වෙනුයේ සෙනෙහස නොහොත් යමකට ඇති ආශාවයි. නිවණ යනු ආශාව හෙවත් තෘෂ්ණාව දුරු කිරීමයි. තෘෂ්ණාව සසර පැවැත්මේ මූල හේතුව ලෙස දැක්වී ඇත.

සන්ති මග්ගං: ශාන්ති මාර්ගය ලෙස දැක්වී ඇත්තේ නිර්වාණ මාර්ගයයි. නිවණින් කෙලෙස් සංසිඳීම සිදුවී සසර පැවැත්ම නමැති දුකින් දුක නිමා කොට ශාන්තියට පත් වෙයි.

නිබ්බාණං සුගතෙන දෙසිතං: තමන් වහන්සේ විසින් අත්දකින ලද නිවණ සෙසු ලෝකයා විසින්ද ප්‍රත්‍යක්ෂ කරනු සඳහා නිර්වාණ මාර්ගය උන්වහන්සේ විසින් ඉදිරිපත් කොට තිබේ. එම නිවන් මගට අනුගතව ක්‍රියා කිරීම ශ්‍රාවකයන්ගේ වගකීම වෙයි.



අනුවණයා වැසි - හිමත් - ගිමත් යන තුන් කලෑ මෙහි ම වෙසෙමි යි සිතත් දිවි අනතුරු නො දන්නේ ය.

286. ඉධ වස්සං වසිස්සාමි
ඉධ හෙමන්ත ගිම්හිසු
ඉති බාලො විචින්තෙති
අන්තරායං න බුජ්ඣති (20:14)

මෙහි වැසි කල ගෙවමි
සීත ගිම්කල් මෙහි වසමි
සිතන අනුවණ දන මෙසේ
අනතුර නොදැන ගන්නේ

අද අද එයි මරු - පින් කරගන්නේ

20 (8) මහාධන වෙළෙන්දා පිළිබඳ කතා පුවත (286 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **මහාධන** නම් වූ වෙළන්දෙක් අරභයා මේ ගාථාව දෙසූ සේක.

බරණැස විසූ මහාධන නම් වූ වෙළෙන්දෙක් කිසියම් උත්සව සමයක ගැල්පන්සියයක මාහැගි රෙදි පිළි සහිත වෙළඳ බඩු පටවා ගෙන සැවැත් නුවරට පැමිණියේ ය. මේ කාලය වැසි සමයෙකි. වෙළෙන්දාට ගඟකින් එතර වී පැමිණීමට සිදු වී තිබිණ. එහෙත් වැස්සෙන් ගඟ පිරී දෙගොඩ තලා දිය බැස යන බැවින් ගඟෙන් එතර වී ගත නොහැකි විය. වැස්සත් ගඟෙහි දිය අඩු නොවීමත් නිසා වෙළෙන්දාට දින සතක්ම ගං තීරයේ වාඩි ලා ගෙන සිටීමට සිදු විය. මේ අතර උත්සවය ද නිමාවට ගොස් තිබූ බැවින් ගඟෙන් එතරව යාමේ අවශ්‍යතාව ද වෙළෙන්දාට නොවිණ.

ඔහු බොහෝ දුර බැහැර ගෙවා බරණැස සිට සැවතට පැමිණි බැවින් බඩු නොවිකුණා බඩු සහිත ගැල් ආපසු ගෙන යාමට ද හෙතෙම නොකැමැති විය. එබැවින් හෙතෙම ශීත, උෂ්ණ සහ වැසි යන ඍතු තුනම එහි වෙසෙමින් රැගෙන ආ බඩු විකුණා ගත යුතු බව හෙතෙම අතවැසියන්ට ද සැල කළේ ය.

බුදුරජාණන් වහන්සේ මේ වෙළෙන්දා සිටි ප්‍රදේශයෙන් පිඬු සිඟා වඩිමින් සිටියදී වෙළෙන්දාගේ තීරණය දැන ගෙන සිනා පහළ කළ සේක. බුදුන් වහන්සේ සිනා පහළ කරනු දුටු අනඳ හිමියෝ ඒ ගැන බුදුන් වහන්සේ ගෙන් විමසූහ. උන්වහන්සේ කරුණු පැහැදිලි කරමින්, "ආනන්ද, ඔබ අර වෙළෙන්දා දක්නෙහි ද? හෙතෙම මුළු අවුරුද්ද මෙහි වෙසෙමින් තම වෙළඳ බඩු අලෙවි කර ගැනීමට අදහස් කරයි. එහෙත් හෙතෙම තව දින සතකින් මිය යන බව නොදනියි. කළයුතු දෙය අදම කළ යුතුය. හෙට මරණය පැමිණෙයි. කවුරු දකිත් ද? අපි මරණයට දින නියම කරගෙන නැත්තෙමු. යමෙකු දිවා රෑ සිහියෙන් යුතුව කෙලෙස් මලින් නොකිලිටි වී උනන්දු සහිතව එක් දිනයක් ජීවත් වූවත් හෙතෙම මනාව ජීවිතය ගෙවූවෙකි" යි පැවසූ සේක.

මෙසේ දෙසූ බුදුරජාණන් වහන්සේ අනඳ හිමියන් මගින් මේ පණිවිඩය මහධන වෙළෙන්දා වෙත දන්වා යැවූ සේක. කාලය ඉතා ඉක්මණින් ගෙවී යන බැවින් නොසැලකිලිමත්ව නොසිට උනන්දුවෙන් සිහි නුවණින් කටයුතු කිරීමේ වැදගත් කම අනඳ හිමියෝ මහධන වෙළෙන්දාට සැළ කර සිටියහ. වෙළෙන්දා ද තමා ඉක්මණින් මිය යන්නකු බව දැන බියට පත්ව සාවධානවත් විය. හෙතෙම සත්වැනි දිනයෙහි බුදු පාමොක් මහ සඟනට ඇරයුම් කොට මහදන් දුන්නේ ය. දානය වළඳා අන්තයෙහි බුදුරජාණන් වහන්සේ භුක්තානුමෝදනා වශයෙන් වෙළෙන්දාට ධර්ම දේශනා කළ සේක. ධර්මය ඇසීමෙන් හෙතෙම සෝවාන් ඵලයට පැමිණියේය. දන් වළඳා විහාරයට වැඩම කළ භාග්‍යවතුන් වහන්සේට බොහෝ දුර වඩිනා තෙක් පසු ගමන් කළ මහධන වෙළෙන්දා ආපසු තම නිවාසස්ථානයට පැමිණෙමින් සිටිය දී බලවත් හිසේ ඇම්මක් සෑදී එයින්ම මිය පරලොව ගියේ ය. හෙතෙම සෝවාන් ඵලයට පත්ව සිටි බැවින් මිය ගොස් තුසිත භවනයෙහි දේව පුත්‍රයෙක්ව උපන්නේ ය.

විවරණාත්මක අනුවාදය (286 ගාථාව)

වස්සං ඉධ වසිස්සාමි හෙමන්තගිම්හිසු ඉධ ඉති බාලො
විචින්තෙති අන්තරායං න බුජ්ඣති

වස්සං: වැසි සමය; **ඉධ**: මෙහි; **වසිස්සාමි**: වසන්නෙමි; **හෙමන්තගිම්හිසු**: ශීත හා උෂ්ණ කාලයන් හි; **ඉධ**: මෙහි (වසන්නෙමි); **ඉති**: යනුවෙන්; **බාලො**: අඥාන තෙමේ; **විචින්තෙති**: සිතයි; **අන්තරායං**: (තමා ගේ දිවියට වන) අනතුර; **න බුජ්ඣති**: නො දනියි.

අඥාන තෙමේ වැසි සමයෙහි මෙහි වසන්නෙමි. ශීත හා උෂ්ණ සමයන්හි මේ මේ තැන වසන්නෙමැයි සිතයි. එහෙත් තමා ගේ දිවියට වන අනතුර වටහා නො දනියි.

විවරණය

අන්තරායං න බුජ්ඣති: තම ජීවිතයට සිදු වීමට ඇති අනතුර නොදකියි. මේ කථාවෙහි සඳහන් වෙළෙන්දා තමාට සිදුවීමට ඇති මරණ අනතුර ගැන අවධානයෙන් නොසිටි තැනැත්තෙකි. මරණය යන වචනය ගැන ඇසීමට පවා අකමැති වන විවිධ තරාතිරම් වල පුද්ගලයෝ මෙලොව වසති. දීර්ඝ ආයුෂ, මනා සෞඛ්‍යය, තාරුණ්‍යය, හා භවභෝග සමෘද්ධිය යන මෙම මදයන්ගෙන් මුළාවට පත් වන්නෝ තමන් යම්කිසි දිනෙක මරණයට පත් වන බව සම්පූර්ණයෙන් අමතක කරති. පසිඳුරන් පිණවීමට පමණක් සිත යොමු කරමින් භෞතික සමෘද්ධිය විෂයෙහි මුළු කාලයම කැප කරන මෙබඳු අය පුනර්භවයක් පිළිබඳව සම්පූර්ණයෙන්ම අමතක කරමින් කය සිත වචනය යන තිදොරින්ම අකුශල කර්මයන් හි යෙදෙති. ඔවුහු මෙම අනිත්‍ය වූ අසාර වූ ජීවිතය සදාකාලික වූත් නොනැසෙන සුව ඇත්තා වූත් දෙයක් ලෙස දකිති.

බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය යොමු වී ඇත්තේ ලෝකයෙහි යථාර්ථය නොදැක මුළාවෙන් අන්ධ වූ ලෝකයාට ලොව පවත්නා තත්වය අවබෝධ කරවීම සඳහාය. සුන්දර සුබ සහගත වස්තූන් ලෙස අනුවණ තැනැත්තා විසින් පිළිගෙන ඇති විෂය වස්තූන් නිබඳ වෙනස්වන අනිස්ථිර දේ බවත් තම නෑදෑහිතවතුන් හා මව්පියාදින්ගේ වියෝවීමෙන් සෝක වීම හේතු කොට ගෙන තමන් දුකට පත්වන බවත් ලොව පවත්නා කිසිදු දෙයක් ආත්ම සහිත නොවන බවත් අවබෝධ කරවමින් ජීවිතයේ අසාර බව පිළිබඳ නියම දර්ශනය ලබා ගැනීම තුළින් උපත් මරණාදියෙන් තොර සදාතනික සුවය සාක්ෂාත් කර ගැනීමට අදාළ ධර්ම මාර්ගය බුදු දහමින් ඉදිරිපත් වෙයි. බුදුරජාණන් වහන්සේ ගේ ත්‍රිලක්ෂණ ධර්මය අවබෝධ කර නොගන්නා පුද්ගලයා තමා නොමියන්නෙකු ලෙස හඟියි. ඔහුට කොතෙක් තමා අවට ලෝකය වෙනස් වන බව, විනාශයට පත් වන බව පෙනීගියත් හෙතෙම එය පිළි ගැනීමට මැලි වෙයි. මෙය එම පුද්ගලයා තුළ ඇති බලවත් අවිද්‍යාව නිසා සිදු වන්නකි. අවිද්‍යාව ඉබේ දුරු නොවෙයි. සංසාරගතව අනාදිමත් කාලයක් සිට පුද්ගල සන්තානයට වැදගෙන ඇති අවිද්‍යාව දුරු කිරීම ලෙහෙසි කටයුත්තක් නොවේ. ඒ සඳහා බුදුන් වහන්සේ විසින් ධර්ම මාර්ගයක් ඉදිරිපත් කොට ඇත. එය විශුද්ධියට මාර්ගයයි. මෙහි විශුද්ධිය යනු අවිද්‍යා අන්ධකාරයෙන් මිදීම තුළින් ඇති වන ප්‍රඥාලෝකයයි.



දරුවන් හා ගෙරිසරකුන් ගැන වෙසෙසින් ඇලුණු මිනිසා සපල නො වූ සිතතත් දිවි අනතුරු නො දන්නේ ය.

287. තං පුත්තපසුසම්මත්තං
බ්‍යාසත්තමනසං නරං
සුත්තං ගාමං මහොඝො'ව
මච්චු ආදාය ගච්ඡති (20:15)

පුත්-ගව සම්පතින් මත්ව
ඇලී බැඳුණු තැනැත්තකුව
සැඩ දිය නිදිගමක් බඳුව
මරු අරගෙන යයි රුදුරුව

ඇල්මෙන් බැඳෙන්නා - මරු වෙත ඇදෙන්නා

20 (9) කිසාගෝතමී පිළිබඳ කතාව (287 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ කිසාගෝතමිය අරභයා මේ ගාථාව වදාළ සේක.

කිසා ගෝතමිය බුදුරදුන් වෙතට පැමිණියේ තම එකම පුතුගේ මරණයෙන් අතිශයින් ශෝකයට පත්ව සිහි අවුල් වූ උම්මත්තියක ලෙසිනි. "ගෝතමී, මේ වියෝගය ඔබට පමණක් අත් වූවක් නොවෙයි. මෙලොව ඉපදෙන සෑම කෙනකුටම තමාගේ ප්‍රියයන්ගෙන් වියෝවීමට සිදු වෙයි. මෙය ලෝකයේ සනාතන ධර්මතාවකි. මරණය කාටත් පොදුය. ඉපදුනහොත් මරණය නියතය. ඇලීම් බැඳීම් වලින් යුක්ත පුද්ගලයා මරණය ද ආවේණික උරුමයක් කර ගන්නෙකි. මරණයෙන් නිදහස් වීමට නම් ඇලීම් බැඳීම් වලින් නිදහස් විය යුතුය." බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය ඇසූ කිසා ගෝතමී සෝවාන් ඵලයට පැමිණියා ය.

විවරණාත්මක අනුවාදය (287 ගාථාව)

පුත්තපසුසම්මත්තං බ්‍යාසත්තමනසං තං නරං සුත්තං ගාමං මහොඝො ඉව මච්චු ආදාය ගච්ඡති

පුත්තපසුසම්මත්තං: පුතුන් ගවයන් වැනි සම්පත්වලින් අතිශයින් මත් වූ; **බ්‍යාසත්තමනසං**: ඇලීමෙන් යුත් සිත් ඇති; **තං නරං**: ඒ මිනිසා; **සුත්තං**: නිදිගත්; **ගාමං** ගමක්;(මුහුදට ගෙන යන) **මහොඝො ඉව**: මහත් සැඩ පහරක් මෙන්; **මච්චු**: මාරයා; **ආදාය**: රැගෙන; **ගච්ඡති**: යයි.

දූ දරුවන් හා ගවයන් වැනි සම්පත් නිසා මත් වූ රූපා දී පස් කම්හි ඇලුණු ගිජු සිත් ඇති පුද්ගලයා මහ ගංවතුරක් නිදිගත් ගමක් ගසා ගෙන මුහුදට ගෙන යන්නා සේ මරුවා ගෙන යයි.

විවරණය

කිසා ගෝතමී: බුදු සසුනෙහි භික්ෂුණී සංඝයා අතර රූක්ෂ සිවුරු දරන්නියන් අතුරෙන් අග තැන්පත් වූ රහත් මෙහෙණි කෙනෙකි. ඇය පියුමතුරා බුදුරදුන් ගේ සසුනෙහි රූක්ෂචීවර දරන්නියන් අතුරෙහි අග තනතුරු දරන රහත් මෙහෙණියක දැක තමා ද මතු බුදු සසුනකදී එසේ වන්නෙමැයි ප්‍රාර්ථනා කළා ය. ඉන් අනතුරුව තම ප්‍රාර්ථනය ඉටු කර ගැනීම සඳහා විවිධ පුණ්‍ය කර්ම කළා ය. බුදු පාමොක් මහ සඟනට මහ දන් දුන්නාය. භාවනාව පුරුදු පුහුණු කළා ය. ඕ මිය ගොස් දෙව්ලොව උපන්නාය. ගෞතම බුදුරදුන්ගේ සමයෙහි ඕ ධනවත් පවුලක දියණියක්ව උපන්නාය. ඇය බෙහෙවින් ශරීරයෙන් කෘශ තැනැත්තියක් වූවා ය. එබැවින් ඇයගේ ගෝත්‍ර නාමය වු ගෝතමී යන්නට කිසා යන්න ද එක්ව කිසා ගෝතමීයයි ප්‍රසිද්ධ වුවාය. ඇය සුදුසු කාලයෙහි විවාපත්ව දරුවකු ද ලැබුවාය. දරුවා හැදී වැඩී ගෙන එන සුරතල් වියේ දී මිය ගියේ ය.

ඇය තම දරුවාට කෙතරම් දැඩි ඇල්මකින් සිටියා ද යත් ඇයට දරුවා ගේ මරණය අදහා ගත නොහැකි විය. දරුවා සිහිසුන්ව ඇතැයි සිතා ගත් ඕ දරුවා ද ඔසවාගෙන නිවසින් පිටත්ව හමුවන හැම කෙනකුගෙන්ම දරුවා ජීවත් කර දෙන ලෙස ඇයැද්දාය. හමුවන හැම කෙනෙක්ම දරුවා මළ බව දැන ඒ බව ඇයට තේරුම් කර දීමට උත්සාහ ගත් නමුත් ඇය ඒ කිසිවක් පිළි නොගත්තාය. ඇයගේ තත්වය තේරුම් ගත් කිසියම් පුද්ගලයෙක් "ඔබගේ දරුවා සුවපත් කර ගැනීම සඳහා ඔබ හමුවිය යුත්තා නම් සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන බුදු පියාණෝය" යි පැවසුවේ ය. ඇය ඒ කියමන අසා දරුවා ද රැගෙන දෙව්රමට ගොස් බුදුන් හමුව හඬා වැලප තම දරුවා සුවපත් කර දෙන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියා ය.

බුදුරජාණන් වහන්සේ කිසාගෝතමිය රහත් බව ලැබීමට තරම් හේතු සම්පත් ඇත්තියක බවත් ඕ මරණය ගැන කිසිත් නොදන්නා බවත් දැන ඇයට අනිත්‍යධර්මතාව පිළිබඳ වැටහීමක් ලබා දීමේ අදහසින් දරුවා සුවපත් කරනු සඳහා කිසිවකු කිසි දිනෙක නොමළ ගෙයකින් අබ ඇට මිටක් රැගෙන එන ලෙස පැවසූ සේක. කිසා ගෝතමී එය ඉතා පහසු දෙයකැයි සිතා දරුවාගේ මළ සිරුරද ඔසවා ගෙන සැවැත් නුවර වීදියක් පාසා ඇවිදිමින් කිසිවකු නොමළ ගෙයකින් අබ සෙවීමෙහි නිරත වූවා ය. ඇය ගිය ගිය හැම නිවසකින්ම දැන්වුයේ ඒ හැම නිවසකම කවුරුන් හෝ මිය ගොස් ඇති බවය.

ඇයට යළි යාමට තැනක් නැති තරමට ඕ ඇවිද්දාය. එහෙත් නොමළ ගෙයකින් අබ නම් සොයා ගත නොහැකි විය. මේ තත්වය යටතේ ඇයට සැබෑ තතු වැටහෙන්නට විය. මරණය සෑම දෙනාටම පොදු දෙයක් බව ඇය අවබෝධ කළා ය. බුදුරජාණන් වහන්සේ ලොව සැබෑ තත්වය පිළිබඳ මේ දැනුම තමාට ලබා දීමට උපායයක් යොදා ඇති බව තේරුම් ගත් ඇය තම දරුවා මෙලොව මිය ගිය එකම දරුවා නොවන බව වටහා ගත් ඕ දරුවාගේ මළ සිරුර සොහොනෙහි හොවා ආපසු දෙව්රම් වෙහෙරට පැමිණ බුදුන් පාමුල වැඳ වැටුනා ය. කිසා ගෝතමී ලෝක ස්වභාවය වටහාගෙන ඇති බව දැන ගත් උන්වහන්සේ ඇයට සුදුසු දහමක් ලෙස ඉහත සඳහන් ගාථාවෙන් ධර්මදේශනා කළ සේක. දේශනාව කෙළවර ඕ සෝවාන් ඵලයට පැමිණියා ය.

බ්‍යාසත්ත මනසං: ආශක්ත වූ, ඇලුණු මනසක් ඇති යනුයි. පංචකාම වස්තු විෂයෙහි පුද්ගලයාගේ මනස ඇලෙයි. ඒවාට වසඟ වෙයි. මෙම ගාථාවට අනුව කිසාගෝතමියගේ මනස තම දරුවා කෙරෙහි වූ ආදරයෙන් ආශක්තව පැවතිණි. යමකට ඇළුණු තරමට පුද්ගලයාගේ මනසට ශෝකය ඇතුළු වෙයි. කිසිදු දෙයක් ලොව වෙනස්ව නොපවතින නිසා කෙතරම් ආශා කරන වස්තුව වුවද විනාශ වෙයි. එවිට ශෝකය හදවත වසා ගනියි. මේ තත්වයෙන් නිදහස් වීමට නම් අනුගමනය කළ යුතු එකම පිළිවෙත වන්නේ යථාර්ථය අවබෝධ කොට තෘෂ්ණාවෙන් මිදීමය. තෘෂ්ණාව දුකට හේතු වේනම් හේතුව නැති කළ විට ඵලය නැති වීම සිදු වන බැවින් තෘෂ්ණාවේ ඵලය වන දුක නැති වේ. බුදු දහම සිය ධර්ම මාර්ගය ඉදිරිපත් කොට ඇත්තේ යථොක්ත නියාම ධර්මයට අනුකූල පරිද්දෙනි.



මැරෙන විටැ මවු-පිය-දූ-පුත්-නෑ-මිත් යන මොවුනතර පිහිටවන කිසිවෙක් නැත.

288. න සන්ති පුත්තා තාණාය
න පිතා න'පි බන්ධවා
අන්තකෙනාධිපන්නස්ස
නත්ථි ඤාතිසු තාණතා (20:16)

දරුවෝ පිහිටට නොම වෙත්
නෑ සිය පියවරුද නො වෙත්
සිටි විට මරු ලඟට අවුත්
නෑ පිහිටක් කවුරු ලබත්?

නැත අන් සරණක් - මරු මුව පත් විට

20 (10) පටාචාරා පිළිබඳ කථා පුවත (288 සහ 289 ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **පටාචාරා** නම් වූ සිටු දියණියක් අරභයා මේ ගාථා ද්වය දේශනා කළ සේක.

ස්වාමියාත්, දරු තිදෙනාත්, බෙහෙවින් ඛේදජනක ලෙස මිය යාමෙන් බලවත් සෝකයෙන් වෙළී සිටි පටාචාරා දෙව්රම් වෙහෙර වැඩ සිටි බුදුරදුන් දහම් දෙසමින් සිටි තැනට පැමිණියේ සිහිය විකල්ව උමතු වූවකු ලෙසිනි. අවස්ථානෝචිතව බුදු උපදෙස් පරිදි රැස්ව සිටි පිරිස ක්‍රියාකිරීම නිසා ප්‍රකෘති සිහිය ලබා ගත් පටාචාරා බුදුන් වහන්සේ ගේ ධර්‍ම දේශනයට සවන් දුන්නාය. උන්වහන්සේ පටාචාරා අමතා, "පටාචාරා, මිය යන පුද්ගලයාට සරණ විය හැකි කිසිවෙක් මෙලොව නැත. තම මවුපියන්, සහෝදර සහෝදරියන්, නෑදෑ හිතවතුන් කෙතෙක් සිටිය ද කෙනකු මරණයෙන් නිදහස් කර ගැනීම සඳහා ඔවුනට පිහිට විය නොහැක. මේ නිසා නුවණැති, බුද්ධිමත් පුද්ගලයා තමාගේ පිහිට තමා ම සොයා ගත්තේ ය. එබඳු පුද්ගලයකු විසින් කළ යුතු එකම දෙය ජාති, ජරා, මරණ, දුක්ඛ දෝමනස්සයන් කිසිත් නැති ශාන්ත නිර්‍වාණය සඳහා වූ මාර්‍ගය පිරිසිදු කර ගැනීමය" යි දේශනා කළ සේක. දේශනාවට සවන් දීමෙන් පටාචාරා සෝවාන් ඵලයට පැමිණියා ය. රැස්ව සිටි අනෙක් පිරිසද ඔවුන්ගේ ශක්ති පරිද්දෙන් මාර්‍ග ඵලාවබෝධය ලැබූහ.

විවරණාත්මක අනුවාදය (288 ගාථාව)

අන්තකෙන අධිපන්නස්ස තාණාය පුත්තා න සන්ති පිතා
න බන්‍ධවා අපි න ඤාතිසු තාණතා නත්ථි

අන්තකෙන: මාරයා විසින්; **අධිපන්නස්ස**: මඩනා ලද්දහුට; **තාණාය**: පිහිට සඳහා; **පුත්තා**: දරුවෝ; **න සන්ති**: නොවෙති; **පිතා න**: පියා ද නැත; **බන්‍ධවා අපි**: නෑදෑයෝ ද; **න**: නැත; **ඤාතිසු**: (මෙසේ ඔහුට) නෑයන් කෙරෙහි; **තාණතා**: පිහිට විය යුතු බවෙක්; **නත්ථි**: නැත.

මරුවා විසින් වැළඳ ගනු ලබන පුද්ගලයාට පුත්‍රයෝ පිහිට නොවෙති. (සිය) පියා ද පිහිට නොවෙයි. නෑදැයෝ ද පිහිට නොවෙති. ඔහුට ඤාතීන් කෙරෙහි පිහිටක් (ආරක්‍ෂාවක්) නොවෙයි.

විවරණය

අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතිසු තාණතා: මාරයා අවුත් වැළඳ ගනු ලබන කල පුද්ගලයාට ඤාතීන් අතුරෙහි කිසිදු පිහිටක් නැත.

මේ කාරණය සල්ල සූත්‍රයේ දී තවදුරටත් පහත සඳහන් ආකාරයෙන් අවධාරණය කොට ඇත.

1. උපන් කිසිවකුට මරණයෙන් ගැලවීම සඳහා (නොමැරී සිටීමට) කිසිදු උපාය මාර්ගයක් නැත.
2. මහළු වයසට එළඹීමත් සමඟ මරණය අනිවාර්යය.
3. ඉදුණු ගෙඩියක් ගසකින් වැටෙන්නාක් මෙන් ඉපදුණු පුද්ගලයා ද මරණයේ බියට මුහුණ දෙයි.
4. කුඹල්කරුවකු තැනූ මැටි බඳුන් බිඳීයාම උරුම කරගෙන ඇත්තාක් මෙන්ම උපන් පුද්ගලයා ද මරණය උරුම කරගෙන ඇත.
5. බාල, මහළු, තරුණ, දුප්පත්, ධනවත්, නුවණැති, මෝඩ ආදී කිසිදු භේදයක් මාරයාට නැත. මරණය සියලු දෙනා වෙත ලඟා වෙයි.
6. මරණය අබියසදී පියා පුතාට සරණ විය නොහැකිය. ඤාතියා ඤාතියාට සරණ විය නොහැකිය.
7. ගවයන් ගව ඝාතකාගාරයට ගෙන යන්නාක් මෙන් පුද්ගලා ද නෑසියන් බලා සිටියදීම මාරයා වෙතට පැමිණෙයි.
8. උපන් හැම කෙනකුම මෙසේ මහළු වියට හා මරණයට ගොදුරු වන බැවින් නුවණැති තෙමේ යථාර්ථය වටහා ගෙන ශෝක නොකරයි.
9. ඇරයුමක් නොකර උපදින අනුමැතියක් නැතිව මියයන පුද්ගලයන් අරභයා ශෝක කිරීම නිෂ්ඵල ක්‍රියාවකි.
10. ශෝක කිරීමෙන්, විලාපයෙන් ශෝකයේ දුක තුනී නො වේ. එය තව තවත් දියුණු වනු පමණි.
11. විලාපයෙන් මානසික සහනය උදා නොවෙයි. එය හදවතට ශෝකය ගෙන දෙනු පමණක් නොව ශරීරයේ ක්ලාන්ත භාවය ද ඇති කරයි.
12. ශෝක කිරීමෙන් ශෝක කරන්නාගේ දුක වැඩි වෙයි. එයින් මිය ගිය පුද්ගලයාට කිසිදු පිහිටක් නැත. එබැවින් ශෝක කිරීම හැඬීම හා වැලපීම අරුත් සුන් ක්‍රියාවකි.
13. ශෝකය අස්වසා නොගත හොත් ඉමහත් දුකකට මුහුණ පෑමට සිදු වෙයි. ඔහු ශෝකයේ ග්‍රහණයෙන් දුක්ඛිත බවට පත් වෙයි.
14. මේ ලෝකයේ අන් අය ඔවුන්ගේ කර්මානුරූපව ඉපිද මිය යන සැටි නුවණින් සලකන්න.
15. තිබිය යුතු යැයි සිතන ආකාරය වෙනස්ව හැම දෙයක්ම සිදු වෙයි. ලෝකයේ ස්වභාවය මෙයයි. මේ අනුව ලෝකයේ ස්වභාවය දෙස නුවණින් බලන්න.
16. මිනිසෙකු අවුරුදු සියයක් ජීවත් වූවත් ඔහු ජීවිතයෙන් තෘප්තියට නො පැමිණෙයි. එහෙත් අවසානයේ දී ඔහුට ජීවිතය පමණක් නොව නෑදෑ හිතවතුන් ද අතැර යාමට සිදු වෙයි.
17. එබැවින් බුද්ධාදී උතුමන්ගේ යථාර්ථ ප්‍රකාශනවලට ඇහුම්කන් දෙමින්, මිය ගිය තැනැත්තා යළි තමන් අතරට නොඑන බව කල්පනා කරමින් ඔබේ සොව තුනී කර ගන්න.
18. ගෙයක ඇවිලෙන ගිනිදැල් වතුරෙන් නිවා දමන්නාක් මෙන් නුවණැති පුද්ගලයා තම සිතෙන් ශෝකය නිවා දමයි.
19. තමාගේම යහපත හා ශුභ සිද්ධිය බලාපොරොත්තු වන පුද්ගලයා තම සිතෙහි තමා විසින්ම ඇන ගෙන ඇති සෝ හුල් ගලවා දමන්නේ ය.

සෝක හුල් ගලවා දමා, මානසික සහනය ලැබ හෙතෙම සොවින් දුරුව සැහැල්ලුවෙන් ජීවත් වෙයි. ප්‍රියයන්ගෙන් වියෝ වීමේ දී හෝ තම සතු දැය විනාශ වීමේ දී මෙසේ සිහියෙන් මෙනෙහි කළ යුතු ය.

1. තමාගේ අඹුදරුවන් නෑදෑ හිතවතුන්, ගේ දොර, රන් රිදී බඩු, මිල මුදල්, වතුපිටි, දැසි දාස, කම්කරු යන මේ හැම දෙයක්ම අතහැර තමාට මිය යාමට සිදු වේ.

2. එහෙත් තමන් කයින් වචනයෙන් හා සිතින් කරන කුශල ක්‍රියා පමණක් පිහිට සඳහා පවතියි. තමාට අයත් වන්නේ එපමණක් ය. එය පමණක් මිය යන විට තමා සමඟ ගෙන යනු ලැබේ. තමා පසුපස එන සෙවනැල්ලක් මෙන් පින් පව් තමා අනුවම එයි.

සියලු සත්වයෝ මැරෙති. ජීවිතය මරණයෙන් නිමා වෙයි. සත්වයන් තම ජීවිතය ගෙවන්නේ තමන් කරන ලද කුශලාකුශල කර්‍මවලට අනුවය. පව් කරන තැනැත්තා දුක් කම්කටොලු බහුල දුගති වල උපදියි. පින් කරන තැනැත්තා සැප සම්පත් බහුල සුගතිවල උපදියි. එබැවින් තුන් දොරෙන් කුශල කර්‍මවල යෙදෙන්නා ගේ පින තමාගේ යහපතටම හේතු වෙයි. සාමාන්‍ය පුද්ගලයා මරණයට බෙහෙවින් බිය වෙයි. මරණය තමාට පමණක් පැමිණෙන විපතක් ලෙස සිතා ඒ පිළිබඳව බියෙන් තැවුලෙන් පසුවෙයි. ලොව පවත්නා සැටිය දැකීමට හැකි පුද්ගලයා මරණයට බිය නොවෙයි. එය ජීවිතයක අනිවාර්‍ය අංගයක් ලෙස දකියි. බුදු දහම ලෝකයේ යථාර්ථය පුද්ගලයන් හමුවේ පැහැදිලි කර දෙයි. මරණය ගැන තැවෙමින් කළයුතු කටයුතු අතපසු කර දැමීම තමාට මෙලොව පරලොව වශයෙන් අයහපතට හේතු වෙයි. එබැවින් බුදු දහමින් මරණය පිළිබඳව හැකිතාක් පැහැදිලි කර දී යහපතෙහි යෙදීම සඳහා පුද්ගලයා උනන්දු කරවීමට නොයෙක් කරුණු ඉදිරිපත් වී ඇත.



මරණය ගැන සලකන නැණවතා සිල් රැක නිවන් මඟ වහා ම පිරිසිදු කරන්නේ ය.

289. ඒතං අත්ථවසං ඤත්වා
පණ්ඩිතො සීලසංවුතො
නිබ්බාණගමනං මග්ගං
ඛිප්පමේ'ව විසොධයෙ (20:17)

නිසි විලසින් දැන මෙකරුණ
සිල් ගුණ ඇති නුවණැති දන
මග නිවරද නිවණට යන
හෙළි කරගත මැන නැණ කින

තම තමන් ගේ නිවන් මග වහාම පිරිසිදු කර ගන්න

20 (10) පටාචාරා පිළිබඳ කථා පුවත (288 සහ 289 ගාථා)

විවරණාත්මක අනුවාදය (289 ගාථාව)

පණ්ඩිතො එතං අත්ථවසං ඤත්වා සීල සංවුතො
නිබ්බාණ ගමනං මග්ගං ඛිප්පං එව විසොධයෙ

පණ්ඩිතො: නුවණැති තෙමේ; **එතං**: මේ කරුණ; **අත්ථවසං**: අර්ථ වශයෙන් (නියම අන්දමින්); **ඤත්වා**: දැන; **සීල සංවුතො**: ශීලයෙන් සංවරව; **නිබ්බාණ ගමනං**: නිවණට යන්නා වූ; **මග්ගං**: මාර්ගය; **ඛිප්පං එව**: ඉක්මණින් ම; **විසොධයෙ**: පිරිසිදු කරන්නේ ය.

නුවණැති පුද්ගලයා තෙම මේ කාරණය (මරණයෙහි දී තමාට පිහිට වන්නෙකු නැතැයි) මනාව දැන සීල සංවරයෙන් යුක්තව නිවනට යන මඟ වහා වහා පිරිසිදු කර ගන්නේ ය.

විවරණය

මරණය පිළිබඳ බෞද්ධ ආකල්පය උරග ජාතක කථාවෙන් ද පැහැදිලි වෙයි. මේ කථාවට අනුව බුදුරජාණන් වහන්සේ තම තරුණ පුතු මියයාමෙන් බලවත් සේ තැවුලට පත් පියකු මුණගැසෙති. උන්වහන්සේ එම පුද්ගලයාගේ තැවුලට හේතු විමසති. එවිට ඔහු පිළිතුරු දෙන්නේ, "ස්වාමීනි, මාගේ පුතු මියගිය අවස්ථාවේ සිට මම ශෝකයෙන් තැවෙමි" යනුවෙනි. බුදුරජාණන් වහන්සේ ඔහුට කරුණු පැහැදිලි කරමින් "විනාශ වීමට ඇති දෙය විනාශ වෙයි. විනාශය උපත සමඟ එක්වී ඇත්තකි. මරණය උපතින් හිමි වී ඇති උරුමයකි. මෙය එක් මිනිසකුට නියමිත වූවක් නොවේ. එක ගමකට එක රටකට එක සමාජයකට උරුම වූවක් නොවේ. හට ගැනීම ස්වභාව කොට ඇති හැම දෙයක්ම විනාශය ද ස්වභාව කොට ඇත. සියලුම සත්වයෝ මරණය උරුම කොට ඇත්තාහ. එහෙත් පැරණි නුවණැත්තෝ තම දරුවකු, හෝ වස්තුව හෝ නැති වූ විට විනාශ වන දෙය විනාශ වන්නේ මය. එබැවින් ශෝක කිරීමෙන් පලක් නැතැයි කීවාහුය"යි ප්‍රකාශ කළ සේක. පුත් වියොවින් දුකට පත් පුද්ගලයා විසින් ඒ කෙසේදැයි විමසන ලදුව බුදුරජාණන් වහන්සේ උරග ජාතකය දේශනා කළ සේක.

අතීතයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්වයෝ බරණැස දොර කොටුවෙන් පිටත වූ ගමක බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවියට පත්ව විවාහ ජීවිතයක් ගෙවමින් සිටිය හ. හෙතෙම තම මහන්සියෙන් උපයාගෙන අඹු දරුවන් සමඟ ඉතා සැහැල්ලු දිවියක් ගත කළේ ය. ඔහුට දරුවෝ දෙදෙනෙක් වූහ. එක් කෙනෙක් පුතෙකි. අනෙකා දියණියකි. පුතු වියපත් කල්හි ඔහුට කුල කුමරියක් සරණ පාවා දුන්නේ ය. මෙසේ දැස්සක ද සහිතව මේ පවුලේ සාමාජිකයෝ සය දෙනෙක් වූහ. මේ සියලු දෙනා ඔවුනොවුනට බෙහෙවින් ඇල්මෙන් හා හිතවත් කමින් සැපවත් දිවියක් ගෙවූහ. බෝධිසත්වයෝ පවුලේ අනෙක් සාමාජිකයන් පින් දහම් කටයුතු වල යොදවමින් ඔවුනට නිබඳ උපදෙස් ද දෙති. "අපට ලැබෙන විදියට දානමාන කටයුතු කරමින් පින් රැස් කරගත යුතුය. නිති පන්සිල් රැකිය යුතුය. සදාචාර ජීවිතයක් ගෙවිය යුතුය. නිතර මරණය ගැන මෙනෙහි කළ යුතුය. ජිවිතය අනිත්‍යය. මරණය නියතය. හටගෙන ඇති හැම දෙයක්ම විනාශ වන සුලුය. එබැවින් තමන්ගේ යහපතට අදාළ කටයුත්තෙහි අප උනන්දු විය යුතුය." පියාගේ (බෝසතුන්ගේ) අවවාද අනුව බිරියත් දරුවෝත් ඉතා උනන්දුවෙන් සදාචාර ජීවිතයක් ගත කළහ. දිනක් බෝසත් තෙමේ තම පුතාද කැටුව සී සෑම සඳහා කුඹුරට ගියේ ය. එහි දී නාගයකු විසින් දෂ්ට කරනු ලැබූ බෝසතුන්ගේ පුත්‍රයා එම නයි විෂෙන්ම කළුරිය කළේ ය. බෝසත් තෙමේ පුත්‍රයා බිම ඇද වැටෙනු දැක එතැනට ගොස් පරීක්ෂා කර බලා මිය ගිය බව දැන මළකඳ ඔසවා ගෙන ගොස් අසල වූ ගසක් මුල තැබීය. රෙදි කඩකින් මළ මිනිය ඔතා තෙමේ ද ඒ අසලින් වාඩි වූයේ ය. තම පුතු ගේ මරණයෙන් හෙතෙම නොවැලපුනේ ය. ශෝක නො කළේ ය. හෙතෙම යථාර්ථය ගැන මෙනෙහි කළේ ය. "හටගත් හැම දෙයක්ම වැනසෙන සුලුය. මරණය හැම කෙනෙකුටම උරුම දෙයකි. සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යය. විනාශවන සුලුය." මෙසේ මරණය හා සංස්කාර ස්වභාවය ගැන මෙනෙහි කළ හෙතෙම යළි නැගිට ගොස් තම නඟුල ද රැගෙන සී සෑමේ කාර්යයෙහි යෙදුනේ ය. මේ අතර අසලින් යන අසල්වැසි මිතුරකු' දැක "සබඳ ඔබ යන ගමනේ අපේ ගෙදරට ගොඩ වී මා බිරිඳට පණිවිඩයක් දෙන්න. අද දහවල් අහර එක්කෙනකුට පමණක් ගෙනෙන්න කියන්න. ගෙදර සිව්දෙනාම පිරිසිදු ඇඳුම් හැඳගෙන මල් හා සුවඳ ද රැගෙන පැමිණිය යුතු බව ද පවසන්නැයි කීවේ ය. අසල්වැසියා ද බෝසතුන් කී පරිදි පණිවිඩය දුන්නේය. "මේ පණිවිඩය දුන්නේ කවරෙක්දැ" යි බෝසතුන්ගේ බිරිය අසල්වැසියා ගෙන් ඇසුවා ය. ඔබගේ ස්වාමිපුරුෂයා විසින් දන්වන ලද බව අසල්වැසියා පැවසීය. මෙය ඇසූ ඇය තම පුතා කිසියම් හේතුවකින් මිය ගොස් ඇති බව තේරුම් ගත්තාය. ඕ මෙයින් වියවුලට පත් නොවුනාය. විලාප නොදුන්නාය. පිරිසිදු සුදුවතින් සැරසී අනෙක් සාමාජිකයන් ද සමඟ මල් හා සුවඳ අතැතිව කෙතට ගියා ය. කෙතට ගිය ඔවුහු මළමිනිය දැක නො ඇඬුහ. විලාප නොකීහ. බෝසත් තෙමේ ද පසෙකට වී තම අහර අනුභව කළේ ය.

අනුභවයෙන් පසු සියලු දෙන එක්ව දර එකතු කොට ගිනි මැලයක් තනා මළමිනිය ආදාහනය කළහ. නමුත් මේ කිසිවෙක් කඳුළු බිඳුවකු ද නොහෙළූ හ. මේ හැම කෙනෙක්ම මරණානුස්සතිය මෙනෙහි කළ හ. මේ ආශ්චර්ය සම්පන්න ක්‍රියාව ශක්‍රදේවේන්ද්‍රයාගේ පඬුපුල් අස්න උණුසුම් වීමට තරම් ශක්ති සම්පන්න වූවක් විය. ශක්‍රයා තම දිවැසින් බෝසතුන් ඇතුළු පිරිසේ අකම්පනීය තත්වය දැන ඔවුන් පරීක්ෂා කරනු වස් වෙස් වළාගෙන එහි පැමිණයේය. මළ මිනිය දවන තැනට පැමිණි ශක්‍රයා බෝසතුන්ගේ "ඔබලා මේ කුමක් කරන්නහු දැ"යි විමසීය. "අපි මිනිසකු ගේ මළ සිරුරක් දවමු" යි හෙතෙම පැවසිය. "මේ ඔබලා දවන්නේ මිනිසකුගේ මළ මිනියක් නොවේ. මට සිතෙන හැටියට ඔබලා මැරූ කිසියම් සතකුගේ මස් පුළුස්සන බවය"යි ශක්‍රයා පැවසීය. "නැත මෙය මිනිසකු ගේ මළ සිරුරකි." "එසේ නම් ඔබලා ගේ සතුරකු ගේ විය හැකිය" "නැත. මේ අපගේ පුතාගේ මළ සිරුර මිස සතුරකුගේ නොවේය"යි බෝසත්තුමා පැවසූහ. "එසේ නම් ඔබේ පුතා ඔබට ආදරණීය නොවූවෙකි." ශක්‍රයා යළි විමසුවේය. "නැත හෙතෙම අපට ඉතාමත් ආදරණීයයෙක් විය." "එසේ නම් ඔබලා නොහඬන්නේ මන් ද?" එවිට බෝසත්තුමා තමා නොහඬන හේතුව පැහැදිලි කිරීමට මෙසේ පැවසීය.

උරගකු පරණ සැව අතහැර දමන ලෙසින්
මිනිසා වෙන්ව ඇත මිය ගොස් පරණ කයින්
මිය යන්නහුට ඇති පලකිම කෙරෙන සොවින්
ඇයි වැලපෙන්නේ! ඇත යායුතු තැනට ගොසින්

ශක්‍රයා බෝසතුන්ගෙන් මේ පිළිතුර අසා ඔහු ගේ බිරිඳ ගෙන් ද තම පුතු වෙනුවෙන් සෝක නොකිරීමට හේතු විමසීය. බෝසතුන්ගේ බිරිඳ මෙසේ පිළිතුර දුන්නාය.

එන ඇරයුම් නැතිව, යන තොර අනුමැතියෙන්
ඒකයි සිරිත ඔහු ගොස් ඇත ආ විලසින්
මිය යන්නහුට ඇති පල කිම කෙරෙන සොවින්
ඇයි වැලපෙන්නේ! ඇත යා යුතු තැනට ගොසින්

බිරියගේ පිළිතුර ඇසූ ශක්‍රයා බෝසතුන් ගේ දියණියගෙන් ද ප්‍රශ්න කළේ ය. ඇයගේ පිළිතුර ද මවගේ පිළිතුරට සමාන වූවක් ම විය. ඕ මෙසේ පැවසූවා ය.

කෙතරම් හඬා වැටුනත් දුක් පිරුණු සිතින්
මට හෝ ඔහුට නැත කිසි පලයකුද එයින්
මිය යන්නහුට ඇති පල කිම කෙරෙන සොවින්
ඇයි වැලපෙන්නෙ ඇත යායුතු තැනට ගොසින්

ශක්‍ර දිව්‍යරාජයා බෝසතුනගේ යෙහෙළියගෙන් ද ප්‍රශ්න කළේ ය. ඇයගේ පිළිතුර ද කලින් පිළිතුරුවලට වඩා වෙනසක් නො වීය. දැස්සගෙ න් විමසූ විට ඇය ද පිළිතුරු දුන්නේ පෙර අය පරිද්දෙනි. ශක්‍රයා මේ පිළිතුරු සියල්ල අසා තමන් සක්දෙව් රජු බවද හඟවා ලෝක ධර්මතාවලින් නොකැලඹීමේ ගුණය ගැන ඔවුනට පසසා යන්නට ගියේ ය. මේ ජාතක කථාවෙන් පැහැදිලි වන්නේ මරණය පිළිබඳව බුදු දහමේ ආකල්පයයි.

බුදුසමයේ අවිචාරී මත නැත.

බුදුසමය සතු විභූතිය නම් විමුක්තිය සඳහා සම්බෝධි ඥානය
අවශ්‍ය බව දක්වා ලීමයි. බුදුසමයෙහි ප්‍රඥා-ශීල දෙක එකිනෙකින් වෙන්
කළ නොහේ. උසස් ජීවනයේ පදනම ශීලයයි. ප්‍රඥාව හා අවබෝධය
නිසා ඒ උසස් ජීවනය සවී සම්පූර්ණ වේ.
පටිච්ච සමුප්පාදය පිළිබඳ සම්පූර්ණ අවබෝධයකින් තොරව
කිසිවකුට සත්‍ය වශයෙන් ශීල සම්පන්න විය හැකි නොවේ.
ඒ සඳහා ප්‍රඥාව හා විදර්ශනාවද අවශ්‍යයි. මෙහිලා,
බුදු සමය අන් ආගම් සියල්ලටම වඩා වෙනස්ය.
ඒකදේවවාදී ආගම් සියල්ලම ආරම්භ වන්නේ යම් කිසි
අනම්‍ය විශ්වාස සමූහයක් පදනම් කොටගෙනයි.
ප්‍රඥාව නිසා ඒ පදනම දෙදරා ගිය කල්හි දුක අධික වේ.
එහෙත්, බුදු සමය ආරම්භ වන්නේ එවැනි අනම්‍ය විශ්වාස පදනම්
කොටගෙන නොවේ. බුදුසමය පිහිටා සිටින්නේ යථා තත්ත්වය නමැති
පර්වතය මතය. ඒ නිසා එය හැම විටම බුද්ධිය පිළිබඳ දීප්තිමත්
ආලෝකයට මුහුණ පාන්නේය.

මහාචාර්ය ලක්ෂමී නරසු 'බුදුසමයේ හරය' නම් ග්‍රන්ථයෙනි.

21 වන පරිච්ඡේදය

පකිණ්ණක වග්ග



මහත් සුවය මොනවට දක්නා නැණවතා ඒ සැපය ලබනට තමා අයත් මඳ සැපය හැර දමන්නේ ය

290. මත්තා සුඛපරිච්චාගා
පස්සෙ චෙ විපුලං සුඛං
චජෙ මත්තාසුඛං ධීරො
සම්පස්සං විපුලං සුඛං (21:1)

අත් හරිමින් සුවය සුළු
විසල් සුවය බලන්නේ ය
නැණැති දනා සැපත කුඩා
හැරලයි මහ සැපත සොයා

වැදගත් දෙය තකා - හළ යුතු නො වැදගත් දෙය.

21 (1) සම්බුදු බල මහිම (290 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **විශාලා මහනුවර දී** මහා සේනාවක් මධ්‍යයෙහි තමන් වහන්සේ විසින් දක්වෙන ලද ප්‍රාතිහාර්‍ය්‍ය බලය අරභයා මෙම ගාථාව වදාළ සේක.

වරක් විශාලා මහනුවර අති දරුණු දුර්භික්ෂයක් හට ගත්තේ ය. පළමුව නියඟයක් ඇති වී කෘෂිකර්මාදිය සඳහා ජලය නොමැති වීමෙන් සම්පූර්ණ ශස්‍ය හානියක් සිදුවිය. මිනිසුනට ආහාරය සඳහා භෝගසම්පත් නොමැති වීමෙන් කුසගින්නෙන් මිනිස්සු විශාල වශයෙන් මිය ගියහ. මේ නිසාම දරුණු වසංගත රෝග ද විශාලා මහනුවර පුරා පැතිරී ගියේ ය. මරණ සංඛ්‍යාව වැඩි වෙත්ම මළ මිනී ගොඩවල් ගැසී කුණු වෙමින් දුර්ගන්ධය ද දසත පැතිර යමින් තිබිණ, දුර්ගන්ධය ඉව වැටී එහි පැමිණි යක්ෂභූතාදීහු ද එහි වූහ. මේ නිසා විශාලා පුර වැසියෝ දුර්භික්ෂ, රෝග සහ යක්ෂ යන තුන් බියකට මුහුණ පෑහ. මේ උවදුරුවලින් බේරීම සඳහා ඔවුහු විවිධ ලෙසින් සරණ පැතූහ. යාග හෝමාදිය කළ හ. කළ හැකි සියලු සෙත් ශාන්ති කළ ද කිසිවකින් ප්‍රතිඵලයක් නො වීය. අන්තිමේ දි ඔවූහු බුදුරජාණන් වහන්සේ ගේ පිහිට පැතූහ.

මේ නිසා මහාලී ලිච්ඡවි රජු හා පුරෝහිත බමුණාගේ පුත්‍රයා ද ප්‍රමුඛ කොට ගත් දූත පිරිසක් රජගහ නුවර ගොස් බිම්බිසාර රජු සමු වී තමන්ගේ නුවරට බුදුරජාණන් වහන්සේ වැඩමවා දෙන ලෙස ඉල්ලීමක් කළේ ය. බුදුරජාණන් වහන්සේට මේ පුවත සැළ කිරීමෙන් පසු තමන් වහන්සේ විශාලා මහනුවරට වැඩම වීම එනුවර ජනතාවට විශාල සෙතක් වන බව සලකා උන්වහන්සේ එහි වැඩම කිරීමට තීරණය කළ සේක. බිම්බිසාර රජතුමා බුදුන් වහන්සේ ගේ ගමනට අවශ්‍ය සියලු කටයුතු පිළියෙල කරවූයේ ය. රජගහ නුවර සිට ගංගානම් ගඟ ඉවුර තෙක් මහා මාර්ගය පිළිසකර කරවා එහි යොදුනෙන් යොදුනට බුදුන් වහන්සේට ගිමන් හැරීම සඳහා විශ්‍රාම ශාලා තැන වීය. සියලු කටයුතු නිම වූ පසු බුදුරජාණන් වහන්සේ පන්සියයක් භික්ෂු සංඝයා ද පිරිවරා ගමන ආරම්භ කළ සේක. බිම්බිසාර රජතුමා ද බුදුන් වහන්සේ පෙරදැරි කර ගෙන ගංගා නම් ගඟ තොටුපල දක්වා ගියේ ය. එහිදි රජතුමා ලිච්ඡවී කුමාරවරුනට පණිවිඩයක් යවමින් බුදුරජාණන් වහන්සේ ගංගා තොටුපලට වඩමවා ඇති බව දැන්වීය. ලිච්ඡවි කුමාරවරුද බිම්බිසාර රජු මෙන්ම විසාලා මහ නුවර සිට ගංතෙර දක්වා මාර්ගය පිළිසකර කරවා යොදුනෙන් යොදුනට විශ්‍රාමශාලා තනවා තිබිණ. බුදුරජාණන් වහන්සේ ලිච්ඡවී කුමරුන් විසින් ගෞරවයෙන් පිළි ගෙන විශාලා මහනුවරට වැඩම කරවනු ලැබූහ. එහෙත් බිම්බිසාර රජු ගඟින් එතෙර නැවතුණේය. බුදුරජාණන් වහන්සේ ගඟින් එතෙරවූ සැණෙකින් මහා වැසි වසින්නට විය. නුවර පුරා තිබු සියලු අපවිත්‍ර දෑ සෝදා ගෙන ගොස් දුගඳ ඉවත්වී ගියේ ය. බුදුරජාණන් වහන්සේට වැඩ සිටිමට නගර මධ්‍යයෙහි විශේෂ මණ්ඩපයක් තනවා තිබිණ, බුදුරජාණන් වහන්සේ පන්සියයක් භික්ෂූන් ද සමඟ එහි වැඩිය හ. මේ පුවත සැලවූ සක් දෙව් රජ තෙමේ තවුතිසාවෙන් පැමිණ බුදුන්ට ගෞරව දක්වා සිටියේ ය. මේ සිද්ධියත් සමඟ සියලු යක්ෂ භූතාදිහුද බියෙන් තැති ගෙන නුවර අතහැර පළා ගියහ. බුදුරජාණන් වහන්සේ ඒදින සවස් භාගයෙහි විශාලා මහනුවරදී රතන සූත්‍රය දේශනා කළ සේක. එසේම එම රතන සූත්‍රයෙන් පිරිත් කරමින් නගරයෙහි පිරිත් දිය ඉසින ලෙස ආනන්ද හිමියන්ට උපදෙස් දුන් සේක. ලිච්ඡවි කුමාරවරුන් පිරිවරමින් අනඳ හිමියෝ ද ඒ අනුව නගරයෙහි සැරිසරමින් රතන සූත්‍රය සජ්ඣායනය කළ හ. මින් පසු රෝගීව සිටි බොහෝ දෙනා සුව පත්ව අනඳ හිමියන් සමඟම ආපසු බුදුන් දැකීමට පැමිණිය හ. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් ද සමඟ සත් දිනක්ම මෙම සූත්‍රය සජ්ඣායනය කළ සේක. සත්වැනි දින අවසන්හි විශාලා මහ නුවර සියලු බිය දුරුව සාමාන්‍ය තත්වයට පැමිණින. ලිච්ඡවි කුමාරවරුන් ඇතුළු මහජනතාව අතිශයින්ම ප්‍රීතියට පත්ව බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයාට තමන් ගේ ප්‍රසාදය පළ කළ හ. සියලු පුද පූජා සත්කාර වලින් බුදුනට ගෞරව දැක්වූ ඔවුහු ආපසු උන් වහන්සේව ගංගා නම් ගං ඉවුර තෙක් ගෞරවයෙන් වැඩමවා ගෙන ආහ. බුදුරජාණන් වහන්සේ ආපසු වඩනා තෙක්ම බිම්බිසාර රජතෙමේ ගංගා මෙතෙර වාඩිලාගෙන සිටියේ ය. බුදුන් වහන්සේ ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් දිව්‍ය බ්‍රහ්ම නාග සේනාවෝද ගඟ මෙතෙර රැස්ව සිටියහ. බුදුරජාණන් වහන්සේ මෙතෙරට වැඩි කෙනෙහි උන්වහන්සේට දිව්‍ය බ්‍රහ්ම, නාග, මනුෂ්‍ය යන හැම පිරිසකගෙන්ම ලැබුණු ගෞරව ප්‍රණාමය නිමක් නැති විය. බුදුරජාණන් වහන්සේ ගේ ගුණ ගායනා දසත පුරාම පැතිරිණි. මේ වූ කලී දිව්‍ය බ්‍රහ්ම, නාග, මනුෂ්‍ය පිරිස් එක්ව බුදු පුද පැවැත් වූ තුන් වැනි අවස්ථාව විය. ශරීරයේ රෝම කූපවලින් ගිනි කඳ හා දිය කඳ නිකුත් කරමින් යමක මහාප්‍රාතිහාර්‍ය්‍යය පෑ පළමු අවස්ථාවයි. දෙවැනි අවස්ථාව බුදුරජාණන් වහන්සේ තව්තිසාවෙහි දෙවියන් උදෙසා අභිධර්මය දේශනා කොට ආපසු පැමිණිමයි.

විවරණාත්මක අනුවාදය (290 ගාථාව)

මත්තාසුඛපරිච්චාගා චෙ විපුලං සුඛං පස්සෙ විපුලං
සුඛං සම්පස්සං ධීරො මත්තා සුඛං චජෙ

මත්තාසුඛපරිච්චාගා: මඳ සුවය අත්හැරීමෙන්; **චෙ**: ඉදින්; **විපුලං**: මහත් වූ; **සුඛං**: සුවයක්; **පස්සෙ**: දකින්නේ ය; **විපුලං**: මහත් වූ; **සුඛං**: සුවයක්; **සම්පස්සං**: මනාව දකිමින්; **ධීරො**: නුවණැති තැනැත්තෝ; **මත්තා සුඛං**: මඳ සුවය; **චජෙ**: අත්හරින්නේ ය.

අල්ප වූ සැපත අතහැර මහත් වූ සැපත දකින්නේ ය. ඉදින් යමෙක් මහත් වූ සැපත (නිවණ) දක්නේ නම් එබඳු නුවණැති පුද්ගල තෙමේ අල්ප වූ සැපත අත්හරින්නේ ය.

අනුන්ට දුක් දී තමහට සැප කැමැති තැනැත්තා වෛරයෙන් නො මිදෙන්නේ ය.

291. පර දුක්ඛූපදානේන
අත්තනො සුඛමිච්ඡති
වෙරසංසග්ග සංසට්ඨො
වෙරා සො න පරිමුච්චති (21:2)

අනුනට දුක් දෙමින්
කැමති වන තම සැපතම
වෛරයෙන් යුත් මිනිසා
ගැලී යයි වෛරයෙහි ම

තම සැපත උදෙසා - නොනසනු අනුන් සැපතා

21 (2) කිකිළි බිජුවට කන කාන්තාවක් (291 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **කාන්තාවක හා කිකිළියක** අතර පැවති වෛරයක් අරභයා මේ ගාථාව දේශනා කළ සේක.

සැවත අසළ ගමක කාන්තාවක් ජීවත් වූවාය. ඇය තම නිවසෙහි කිකිළියක ඇති දැඩි කළා ය. කිකිළිය දමන හැම බිජුවක්ම කෑමේ පුරුද්දක් මේ කාන්තාව සතු විය. මේ කාරණයෙන් බෙහෙවින් සිත් තැවුලට පත් කිකිළිය කාන්තාව කෙරෙහි දැඩි වෛරයක් ඇති කරගත්තාය. තමා මිය ගොස් කිසියම් සතකු වී මේ ස්ත්‍රියගේ දරුවන් විනාශ කරමැයි කිකිළිය සපථ කළා ය. කිකිළිය එම වෛරයෙන්ම මිය ගොස් කිසියම් නිවෙසක බළලකු වී උපන්නාය. එම කාන්තාව ද මිය ගොස් තමා කළ පාප කර්මයේ විපාක වශයෙන් එම බළලා සිටි නිවසේම කිකිළියක වී උපන්නා ය. බළලා කිකිළිය දමන සියලු බිජුවට කයි. කලකට පසුව කිකිළිය මිය ගොස් කොටියකු වී උපන්නාය. බළලා මුවැත්තියක වී උපන්නාය. කොටියා මුවැත්තිය ගේ පැටවුන් පමණක් නොව මුවැත්තිය ද කා විනාශ කළේ ය. මේ අයුරින් මොවුන්ගේ වෛරය ආත්මභාව පන්සියයක් තිස්සේ පැවතිණ. බුදුරජාණන් වහන්සේ ගේ සමයෙත් මොවුන් දෙදෙනා ගෙන් කෙනෙක් ස්ත්‍රියක්ව උපන් අතර අනෙකා යක්ෂණියක්ව උපන්නාය.

එක් අවස්ථාවක එම ස්ත්‍රිය තම දෙමාපියන් ගේ නිවසේ සිට සැවැත අසළ පිහිටි සිය නිවසට ආපසු පැමිණෙමින් සිටියා ය. ඇය සමඟ ඇයගේ සැමියා සහ ඇයගේ කුඩා දරුවා ද වූ හ. ඔවුන් ආපසු එන අතර කිසියම් තැනක මඟ අසළ තිබූ පොකුණක් දැක එතැන මඳ වේලාවක් ගිමන් හැර යාමට අදහස් කළහ. මේ අතර සැමියාට පොකුණෙන් දිය නෑමට සිත් වී ඔහු පොකුණට බැස නහමින් සිටියේ ය. අවස්ථාවක් බලා සිටි යක්ෂණිය මේ දරුවා ඩැහැ ගැනීමට හොඳ වෙලාවකැයි සිතා දරුවා සිටි තැනට එමින් සිටියා ය. ස්ත්‍රිය එම යක්ෂණිය දැක මෝ තමා ගේ පරම සතුරිය බව දැන දරුවා ද වඩා ගෙන දුවන්නට වූවා ය. යක්ෂණිය ද පිටුපසින් ම එළවා ගෙන ගියා ය. ස්ත්‍රිය දුව යමින් අසළ පිහිටි විහාරයක් දැක එයට ඇතුළු වූවා ය. මේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටි දෙව්රම් වෙහෙරයි. බුදුරජාණන් වහන්සේ පිරිස් මැද වැඩ සිටිමින් ධර්ම දේශනා කරමින් සිටි සේක. ස්ත්‍රිය දුවගෙන අවුත් බුදුරජාණන් වහන්සේ ගේ දෙපා අබියස දරුවා තැබුවා ය. යක්ෂණිය ද පසු පසින්ම ආ නමුත් විහාර දොරටුව අරක් ගත් දෙවිවරු ඇයට ඇතුළට යාමට ඉඩ නුදුන් හ. බුදුරජාණන් වහන්සේ යක්ෂණිය දැක ඇය තමා හමුවට කැඳවා ගෙන එන ලෙස අනඳ හිමියන්ට පැවසූ සේක. යක්ෂණිය පැමිණි පසු බුදුරජාණන් වහන්සේ දෙදෙනාටම කරුණු පැහැදිලි කර දෙමින් අද ඔබ දෙදෙනා මෙහි නො පැමිණියේ නම් ඔබ දෙදෙනා ගේ වෛරය කෙළවරක් නැතිව දිගටම පැවතීමට තිබිණ, වෛරය වෛරයෙන් සංසිඳවිය නොහැක. එය සංසිඳවිය හැක්කේ මෛත්‍රියෙන් පමණි.

"අනුනට දුක් පමුණුවා තමන් ගේ සැපත බලාපොරොත්තු වන්නේ නම් වෛරයෙන් මුසපත්ව එයින්ම විනාශයට පත් වෙයි" යනුවෙන් ධර්ම දේශනා කළ සේක.

ධර්මයට සවන් දුන් යක්ෂණිය බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන සරණ ගියාය. ස්ත්‍රිය ධර්ම අසා සෝවාන් ඵලයට පැමිණියාය.

විවරණාත්මක අනුවාදය (291 ගාථාව)

පරදුක්ඛූපදානෙන අත්තනො සුඛං ඉච්ඡති සො වෙර සංසග්ග සංසට්ඨො වෙරා න පරිමුච්චති.

පරදුක්ඛූපදානෙන: අනුනට දුක් උපදවීමෙන්; **අත්තනො**: තමන් ගේ; **සුඛං**: සැපත; **ඉච්ඡති**: කැමති වන්නේ ද; **සො**: හෙතෙම; **වෙර සංසග්ග සංසට්ඨො**: වෛරයෙහි නිරත වීමෙහි යෙදුණු; **වෙරා**: වෛරයෙන්; **න පරිමුච්චති**: නො මිදෙයි.

අනුනට දුක් දෙමින් තම සැප බලාපොරොත්තු වන පුද්ගලයා වෛරයෙහි නිරත වීම නිසාම වෛරයෙන් නො මිදෙයි.

විවරණය

සො වෙරා න පරිමුච්චති: වෛරය වෛර කරන පුද්ගලයාට මෙන්ම එය ලබන පුද්ගලයාට ද ඉමහත් ව්‍යසනයකි. දෙදෙනාම එයින් විනාශයට පත් වෙයි. වෛර කරනු ලබන්නා ද වෛරය තම සිතට වැද්දගන්නේ නම් මෙම දෙදෙනා එකිනෙකට ප්‍රතිවිරුද්ධ පුද්ගලයන් බවට පත්ව අන්‍යෝන්‍ය වශයෙන් පළි ගැනීමට පෙළෙඹෙති. මේ නිසා වෛරය වැඩෙනු මිස සංසිඳීමට නොපැමිණෙයි. වෛරය වූ කලී මනස බෙහෙවින්ම දූෂණයට පත් කරවන කෙලෙස් ධර්මයකි. එයින් මැඩෙන පුද්ගලයා ගින්නෙන් මෙන් දැවෙයි. හෙතෙම මෙලොව පරලොව දෙකින්ම පිරිහෙයි. මේ නිසාම ඔහුට අධ්‍යාත්මික ශාන්තියක් ද නොලැබෙයි. වෛරයේ ප්‍රතිපක්ෂ ධර්මය මෛත්‍රියයි. මෛත්‍රිය වැඩීමෙන් මිතුරන් වැඩෙන අතර වෛරය පවත්වා ගැනීමෙන් සතුරෝ වැඩි වෙති. බුද්ධිමත් පුද්ගලයා වෛරය මැඩලා මෛත්‍රිය ප්‍රගුණ කරමින් තම ආධ්‍යාත්මික ශාන්තිය සලසා ගනියි.

කටයුතු දේ හැර දමා නො කටයුතු දේ කරන දැඩිමන් ඇති පමා වූ තැනැත්තනට කෙළෙස් වැඩේ.

292. යං හි කිච්චං තදපවිද්ධං
අකිච්චං පන කයිරති
උන්නළානං පමත්තානං
තෙසං වඩ්ඪන්ති ආසවා (21:3)

කළ යුතු දේ නො සලකමින්
නොම කළ යුතු දේම කරයි
ආඩම්බර පමා අයට
වැඩෙන්නෝ ය ආසවයෝ

අත්හැර නොකටයුතු - කළ යුතු දේම කළ යුතු

21 (3) භද්දිය නුවර භික්ෂූහු (292-293 ගාථා)

භද්දිය නුවර සමීපයෙහි වැඩ සිටි අවදියක භාග්‍යවතුන් වහන්සේ භද්දිය නුවර වැසි **භික්ෂූන් කිහිප දෙනකු** අරභයා මේ ගාථාද්වය දේශනා කළ සේක.

භද්දිය නුවර විසූ භික්ෂූන් වහන්සේ ලා කිහිප දෙනෙක් කළමනා කටයුතු පසෙක තිබිය දී හැඩවැඩ ඇති දේ කෙරෙහි ඇල්මෙන් අලංකාර පාවහන් පැළඳගෙන හැසිරෙති.

අපිස් ජීවිතයක් ගෙවන භික්ෂූන් වහන්සේ තමන් ගේ අවශ්‍යතාවට පමණක් පිරිමැහෙන භාණ්ඩවලින් සතුටු වෙති. අනුන් ගේ ඇස් තමන් වෙත හරවා ගැනීමේ කැමැත්තෙන් මෙම භික්ෂූන් අලංකාර පාවහන් පාවිච්චි කිරීම භික්ෂු සාරුප්‍ය නොවන්නක් බව මොවුහු කල්පනා නො කළහ.

මේ කරුණ බුදුරජාණන් වහන්සේට සැළ වීමෙන් අනතුරුව උන්වහන්සේ එම භික්ෂූන් කැඳවා "මහණෙනි, තොප කෙලෙස් නසා නිවන් අත් කර ගනු සඳහා පැවිදි වූවහුය. දැන් කළ යුතු දේ පසෙක තබා අනවශ්‍ය දේ කරමින් හැසිරෙති. උඩඟු සිතින් මෙබඳු දේ කරමින් අවශ්‍ය දෙයෙන් පමා වන්නන්ට ආශ්‍රවයෝ වැඩෙති" යි දේශනා කළ සේක. දේශනාව අවසානයේ මේ භික්ෂූහු රහත් ඵලයට පැමිණිය හ.

විවරණාත්මක අනුවාදය (292 ගාථාව)

යං හි කිච්චං තං අපවිද්ධං අකිච්චං පන කයිරති
උන්නළානං පමත්තානං තෙසං ආසවා වඩ්ඪන්ති

යං හි: යමක් වනාහි; **කිච්චං**: කළ යුතු ද; **තං**: එය; **අපවිද්ධං**: නොසලකා හැරියේ ද; **අකිච්චං පන**: නොකළ යුතු දේ වනාහි; **කයිරති**: කරයි ද; **උන්නළානං**: උඩඟු සිත් ඇති; **පමත්තානං**: පමා වූ; **තෙසං**: ඔවුන් ගේ; ආසවා: ආශ්‍රවයෝ; වඩ්ඪන්ති: වැඩෙති.

යමෙක් කළ යුතු දේ නොසලකා හරිමින් නොකළ යුතු දේ කරයි ද, උඩඟු කමින් යුත් පමාවෙහි නිරත වූ එම පුද්ගලයාට ආශ්‍රවයෝ වැඩෙති.

විවරණය

කායගතා සති: ශරීරය අරභයා සිහියෙන් සලකා බැලීමයි. මෙය පටික්කූල මනසිකාර භාවනා යන නමින් ද හැඳින්වෙයි. ශරීරය සැකසී ඇති අංගොපාංගයන් සැලකිල්ලට ගනිමින් ඒවායේ අශුභ, පිළිකුල් සහගත බව මෙනෙහි කරමින් ශරීරය පිළිබඳ යථාර්ථය වටහා ගැනීම මෙම භාවනාවේ අරමුණයි. බුදුරජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් වලට අනුව ශරීරය දෙතිස් කුණප කොට්ඨාශයකින් සැකසී තිබේ. මෙම කොටස් දෙතිස් කොටස් පහ බැගින් අයත් වන වගී සතරකට ද කොටස් සය බැගින් අයත් වන වගී දෙකකට ද බෙදා දැක්වී තිබේ.

1. කේසා - හිසකෙස්
   ලොමා - ලොම්
   නඛා - නිය
   දන්තා - දත්
   තචො - සම

2. මංසං - මස්
   නහාරු - නහර,
   අට්ඨී - ඇට
   අට්ඨිමිඤ්ජා - ඇටමිදුළු
   වක්කං - වකුගඩු

3. හදයං - හදවත,
   යකනං - කැවුත්ත,
   කිලොමකං - කිලෝමකය,
   පිහකං - බඩදිව,
   පප්ඵාසං - පෙනහළු

4. අන්තං - බඩ වැල,
   අන්තගුණං - අකුණු බහන,
   උදරියං - නොදිරූ අහර,
   කරීසං - අශුචි,
   මත්ථලුඞ්ගං - මොලය

5. පිත්තං - පිත
   සෙම්හං - සෙම
   පුබ්බො - සැරව
   ලොහිතං - ලේ
   සෙදො - දහදිය
   මෙදො - මේදය

6. අස්සු - කඳුළු
   වසා - වුරුණු
   ඛෙලො - කෙල
   සිංඝානිකා - සඳමිදුලු
   ලසිකා - සොටු
   මුත්තං - මුත්‍රා

කායගතාසති භාවනාව වඩන මනා සිහිනුවණ ඇත්තහුගේ කෙලෙස් නැසීමට පැමිණෙත්.

293. යෙසඤ්ච සුසමාරද්ධා
නිච්චං කායගතා සති
අකිච්චං තෙ න සෙවන්ති
කිච්චෙ සාතච්චකාරිනො
සතානං සම්පජානානං
අත්ථං ගච්ඡන්ති ආසවා (21:4)

කාගිය සිහිය අරඹා නිති එහි යෙදෙන
නිසි දේ කරමින්ම අනිසිය අත හරින
සිහියෙන් යුතුව හරි දේ මැනවින් දකින
අයගේ කෙලෙස් මල දුරුවේ නිසැකයෙන

සිය සිරුර ගැන නිති - සිහියෙන් බලනු ඇති තතු

21 (3) භද්දිය නුවර භික්ෂූහු (292-293 ගාථා)

විවරණාත්මක අනුවාදය (293 ගාථාව)

යෙසඤ්ච කායගතාසති නිච්චං සුසමාරද්ධා කිච්චෙ සාතච්චකාරිනො තෙ අකිච්චං න සෙවන්ති. සතානං සම්පජානානං තෙසං ආසවා අත්ථං ගච්ඡන්ති.

යෙසඤ්ච: යමෙකු විසින්, **කායගතාසති**: කායගතාසතිය (භාවනා), **නිච්චං**: නිතර, **සුසමාරද්ධා**: මනාව පටන් ගන්නා ලද්දේ ද, **කිච්චෙ**: කටයුත්තෙහි, **සාතච්චකාරිනො**: අනවරතයෙන් යෙදුණු, **තෙ**: ඔවුහු, **අකිච්චං**: නොකළ යුතු දෙය, **න සෙවන්ති**: නොකරති, **සතානං**: සිහියෙන් මෙනෙහි කරන සුලු, **සම්පජානානං**: නුවණැති, **තෙසං**: ඔවුන් ගේ, **ආසවා**: ආශ්‍රවයෝ, **අත්ථං**: අස්තය (විනාශය)ට, **ගච්ඡන්ති**: යති.

නිබඳව කායගතා සතියෙහි යෙදී, කළ යුතු දෙයෙහි පමණක්ම නිරත වන සිහි නුවණින් යුත් බුද්ධිමතුන්ගේ ආශ්‍රවයෝ ප්‍රහීණ වෙති.

විවරණය

මෙසේ වගී කරන ලද කුණප පහේ කොටස් ඇතුළත් පළමු වගීයේ කුණප පසු මුල සිට අගට ද අග සිට මුලටද මෙනෙහි කළ යුතුය. දෙවැනි කොටසේ ද කුණප පස ඒ අයුරින්ම මුල සිට අගටත් අග සිට මුලටත් මෙනෙහි කළ යුතු වන අතර සෑහෙන තත්වයකින් එය පුහුණු වූ පසු වගී දෙකේම කුණප කොටස් එකට ගෙන මුල සිට අගටත් අග සිට මුලටත් මෙනෙහි කළ යුතු වෙයි. අනෙක් සියලු කොටස් ද වෙන වෙනමත් එක්ව ගෙනත් භාවනාව ප්‍රගුණ කළ යුතු වෙයි. මෙම භාවනාව ප්‍රගුණ කිරීමේ දී පහත සඳහන් ක්‍රම සත අනුගමනයෙන් එය වඩාත් වර්ධනය කරගත හැකි වෙයි.

1. **වචසා**: මින් අදහස් කරන්නේ යථොක්ත කුණප කොට්ඨාශ දෙතිස වචනයෙන් කියමින් ඒ පිළිබඳ පුහුණුවක් ලබා ගැනීමය.

2. **මනසා**: යන්නෙන් අදහස් කරනුයේ වචනයෙන් කීම නිසා මතකයෙහි රැඳී ඇති එම කුණප නම් එකින් එක සිතින් අනුස්මරණය කිරීමයි.

3. **වණ්ණතො**: යනු එම කුණප කොටස් එකිනෙකක් පාසා ඒවායේ පැහැය සිතට නඟා ගනිමින් භාවනා කිරීමයි.

4. **සණ්ඨානතො**: යනු එම කුණප කොටස් එකිනෙකෙහි සටහන හෙවත් ආකාරය සිහියට නගා ගනිමින් භාවනා කිරීමය.

5. **දිසාතො**: යනු එක් එක් කුණප කොටසක් ශරීරයෙහි පිහිටි දිශාව සිහියට නගා ගනිමින් භාවනා කිරීමයි. මෙය ශරීරයෙහි උඩ කොටසෙහි ද යට කොටසෙහිද ආදී වශයෙන් වෙන් කොට බලා සිහිපත් කිරීමකි.

6. **ඔකාසතො**: යනු එම කුණප කොටස් නිශ්චිතවම ශරීරයෙහි පිහිටා තිබෙන තැන තීරණය කරමින් භාවනා කිරීමයි.

7. **පරිච්ඡේදතො**: යනු එකිනෙක කුණප කොටසක් අනෙක් කොටස් වලින් වෙන් කොට ගෙන විමසා බලමින් භාවනා කිරීමය.

ශරීරයට ඇල්ම කරන්නේ ශරීරයේ යථාතත්වය නො දන්නා බැවිනි. තමා ගේ ශරීරය හෝ අනෙකුගේ ශරීරය අරභයා එය සුභය සුබය වශයෙන් කාමරාගය ඇති කර ගන්නේත් ඒ මත පිහිටා මානය උඩඟු කම වැනි කෙලෙස් සිතෙහි වගා කර ගන්නේත් ශරීරයෙහි යථා තත්වය නො දන්නා බැවිනි. බුදු දහම යථාර්ථය මත පදනම් වූ බැවින් ශරීරය සියුම් ලෙස විශ්ලේෂණය කරමින් එහිලා පරීක්ෂාකාරීව තමන් ගේ මනස සකස් කර ගැනීමට තම ශ්‍රාවකයන්ට උපදෙස් දෙයි. කායගතාසතිය වූ කලී ශරීරය කුණප කොටස් දෙතිසකට විශ්ලේෂණය කොට ඒවා පිළිබඳව සිත පිහිටුවා ගනිමින් භාවනා කිරීමයි. මෙම භාවනාව ඇතැම් විට කුණප කොටස් දෙතිස් පිළිබඳ භාවනාව පමණක් නොව සතර සතිපට්ඨාන භාවනාවේ පළමු සතිපට්ඨානය වන කායානුපස්සනාවට ද සම්බන්ධ වෙයි. මෙය සමථ භාවනාවට මෙන්ම විපස්සානා භාවනාවට ද උපයෝගී කොට ගත හැකි වීම මෙහි විශේෂත්වයයි.

බුදුරජාණන් වහන්සේ මෙම කායානුපස්සනාව භාවනාව පිළිබඳව මෙසේ පවසා ඇත. "එක් භාවනාවක් ප්‍රගුණ කිරීමෙන්, වර්ධනය කිරීමෙන්, නැවත නැවතත් පුහුණු කිරීමෙන්, ප්‍රඥාව, විසුද්ධිය හා විමුක්තිය අත්පත් කර ගත හැකිය. ඒ වනාහි කායානුපස්සනාව ප්‍රගුණ කිරීමයි.

කායගතා සති භාවනාව සක්කාය දිට්ඨිය නැති කර ගැනීම සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වෙයි. සෑම පුද්ගලයකු තුළම සක්කාය දිට්ඨිය පවතියි. තමන් ගේ කය නිත්‍යය සුභය, සුඛය වශයෙන් වැරදි ලෙස සිතීමට සෑම පෘථග්ජන පුද්ගලයකුම තුළ ප්‍රවණතාවක් පවතී. එය කයෙහි පැවැත්ම පිළිබඳ මනා දැනුමක් නොමැති කම නිසා ඇති වන්නකි. දෙතිස් කුණප වලට ශරීරය විශ්ලේෂණය කොට බැලීමට පුද්ගලයා පුරුදු වන්නේ නම් තම කය අරභයා වැරදි කල්පනාවන් ඇති කර නොගනියි. මෙම දෙතිස් කුණප ශරීරයේ යථාර්ථයයි. මෙයින් විශ්ලේෂණය කර බැලෙන්නේ පුද්ගලයකු පිළිබඳ යථාර්ථයයි. මෙයින් විශ්ලේෂණය කර බැලෙන්නේ පුද්ගලයකු පිළිබඳ පඤ්චස්කන්ධ රූප ස්කන්ධ පමණි. අනෙක් ස්කන්ධ පිළිබඳ විශ්ලේෂණය කර බැලීම සතර සතිපට්ඨානයේ වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යටතේ සිදුවෙයි.

කායගතා සතිය මගින් ශරීරයේ යථාර්ථය මනාව වටහා ගත හැකිය. මෙම ශරීරය උපාදානය කර ගැනීම හෙවත් දැඩිව ගැනීම සුදුසු දෙයක්දැයි පුද්ගලයාට වටහා ගැනීමට මෙම භාවනාව අතිශයින්ම ප්‍රයෝජනවත් වෙයි. අපි මෙම පඤ්චස්කන්ධය උපාදානය කොට ගෙන සිටිමු. උපාදානය යනු දෘඪලෙස ග්‍රහණය කිරීමයි. අත හැරීමට නොහැකි අයුරින් අල්වා ගැනීමයි. උපාදානයේ ප්‍රතිඵලය වන්නේ භව ගාමීත්වයයි. සංසාරය අත නොහැර භවයෙන් භවයට යමින් අනන්ත අපරිමාණ වූ දුක්ඛ ස්කන්ධයකට අප ගොදුරු වන්නේ උපාදානය නිසාය. පටිච්චසමුප්පාද ධර්මයේදී "**උපාදාන පච්චයා භවො**" යනුවෙන් දැක් වීමෙන් උපාදානය භවයට හේතුවන ආකාරය පැහැදිලි කොට තිබේ.

මව හා පියා ද කැත් රජුන් දෙදෙනා ද අනුචරයා සහිත වූ රට ද නසා බමුණුතෙම නිවනට යන්නේ ය.

294. මාතරං පිතරං හන්ත්වා
රාජානො ද්වෙ ච ඛත්තියෙ
රට්ඨං සානුචරං හන්ත්වා
අනීඝො යාති බ්‍රාහ්මණො (21:5)

මව් පිය දෙදෙනා ම මරා
කැත්කුල දෙරජුන් ද මරා
ඇමති සමඟ රට ද මරා
බමුණා යයි බිය ද වරා

කෙලෙස් වනසන්නෝ - නිවන් සුව ලැබ ගන්නෝ

21 (4) භද්දිය තෙරණුවෝ (294-295 ගාථා)

සැවත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **ලකුණ්ටක භද්දිය තෙරණුවන්** අරභයා මෙම ගාථාව වදාළ සේක.

එක්තරා දිනෙක කිසියම් භික්ෂු පිරිසක් බුදුන් දැක වැඳ පුදා ගැනීම සඳහා දෙව්රම් වෙහෙරට පැමිණිය හ. එම පිරිස බුදුරදුන් හමුව ගෞරව නමස්කාර කොට එකත් පසෙක හුන් අවස්ථාවෙහි ලකුණ්ටක භද්දිය තෙරණුවෝ ඒ සමීපයෙන් ගමන් ගත්හ. භද්දිය නමින් යුත් මේ තෙරණුවන්ට ලකුණ්ටක යනුවෙන් උපපදයක් ලැබුනේ උන්වහන්සේ සිරුරින් කුඩා වූවකු බැවිනි. බුදුරජාණන් වහන්සේ එහි සිටි භික්ෂූන්ට ලකුණ්ටක භද්දිය හිමියන් දක්වමින් "මහණෙනි, තෙල භික්ෂුව බලව. හෙතෙම මව සහ පියා යන දෙදෙනාම මරා දමන ලද්දේකි. එහෙත් බිය සැකක් පීඩාවක් නැතිව යයි." යනුවෙන් වදාළ සේක. එහි සිටි භික්ෂූන්ට මෙය ප්‍රහේලිකාවක් විය. බුදුරජාණන් වහන්සේ ගේ කියමනෙහි අර්ථය ඔවුනට පැහැදිලි නොවීය. එබැවින් තමනට එය පැහැදිලි කර දෙන ලෙස භික්ෂූහු බුදුන්ගෙන් ඉල්වා සිටිය හ. මෙහිදි බුදුරජාණන් වහන්සේ මෙම ගාථාව වදාළේ රූපකානු සාරයෙනි.

ඉහත සඳහන් ප්‍රකාශයෙහි බුදුරජාණන් වහන්සේ රහත් කෙනකු අරමුණු කරගෙන එම විස්තරය ඉදිරිපත් කරන සේක. මෙහි මව් පියන්, රජුන් ඇමතියා හා රට යනුවෙන් රූපකයට නගා ඇත්තේ ක්ලේශ ධර්මයි. ඒ සියලු කෙලෙසුන් මරා දමා ඇති බැවින් රහතන් වහන්සේ බියෙන් හා දුකෙන් තොරව සිටින්නෙකි. මෙහි මව හා පියා, යනුවෙන් දැක්වෙන්නේ තෘෂ්ණාව සහ මානයයි. ක්‍ෂත්‍රියයන් දෙදෙනා ලෙස ශාශ්වත සහ උච්ඡේද යන දෘෂ්ටි දෙක දැක්වෙයි. රට සහ ඇමතියා යනු ආධ්‍යාත්මික බාහිර ඉන්ද්‍රිය ආයතන සහ රාගයයි. බ්‍රාහ්මණයා යනු රහතන් වහන්සේයි.

විවරණාත්මක අනුවාදය (294 ගාථාව)

> **මාතරං පිතරං ද්වෙ ඛත්තියෙ රාජානො ච හන්ත්වා**
> **සානුචරං රට්ඨං හන්ත්වා බ්‍රාහ්මණො අනීඝො යාති.**

මාතරං: මව (තෘෂ්ණාව); **පිතරං**: පියා (මානය); **ද්වෙ ඛත්තියෙ රාජානො ච**: කැත්කුල දෙරජුන් ද (ශාශවත හා උච්ඡේද දෘෂ්ටි); **හන්ත්වා**: නසා; **සානුචරං**: (නන්දිරාග නමැති) ඇමතියා ද සමඟ; **රට්ඨං**: රට ද; **හන්ත්වා**: නසා; **බ්‍රාහ්මණො**: රහතන් වහන්සේ; **අනීඝො**: නිදුක්ව (නිවන් පුරට); **යාති**: යයි.

තෘෂ්ණාව නමැති මව ද මානය නැමති පියා ද ශාශ්වත උච්ඡේද දෘෂ්ටි නමැති රජවරුන් දෙදෙනා ද රාගය නමැති අනුචර ඇමති වරයා ද, ආධ්‍යාත්මික බාහිර ඉන්ද්‍රිය ආයතන නමැති රට ද විනාශ කොට බ්‍රාහ්මණ නැමති රහතන් වහන්සේ බිය රහිතව වෙසෙයි.

විවරණය

මේ ගාථා වලින් ආධ්‍යාත්මික පාරිශුද්ධියේ උසස්ම තත්වය ලබා ගැනීම සඳහා විනාශ කළ යුතු කෙලෙස් ගැන අවධාරණය කෙරෙයි. මෙහි දී තණ්හා මාන දිට්ඨි යන ප්‍රපංචයන් පිළිබඳව සඳහන් වී ඇත. තණ්හාව මව වශයෙන් ද මානය පියා වශයෙන් ද දිට්ඨි දෙරජුන් වශයෙන් ද රූපකයට නගා තිබේ. තණ්හා මාන දිට්ඨි යන තුන තනි පදයකින් විවරණය වන විට ප්‍රපංච යන නම යෙදෙයි. මජ්ඣිම නිකාය මධුපිණ්ඩික සූත්‍රයට අනුව ප්‍රපංච බිහිවන්නේ පුද්ගලයා තම ඉන්ද්‍රිය මාධ්‍යයෙන් බාහිර ලෝකයේ විෂය වස්තූන් පිළිබඳ දැනුම ලැබීමේ දී අනවශ්‍ය පරිදි විතක්ක විචාරයන් ඔස්සේ මනස මෙහෙය වීමේ ප්‍රතිඵල වශයෙනි. දැනුමට පදනම් කර ගත් විෂය වස්තූන් වරදවා වටහා ගැනීමෙන් එය "මගේ ය (එතං මම) එය මමය (එ සො හමස්මි) ඒ මගේ ආත්මයය (එ සො මෙ අත්තා)" යනුවෙන් පිළිවෙලින් තෘෂ්ණා මාන සහ දිට්ඨි යන ප්‍රපංච සංසාර දුකට ගොදුරුව විමුක්තිය අත්පත් කර ගත නොහැකිව සසර තුළ වෙසෙන්නේ ප්‍රධාන වශයෙන් මෙම ප්‍රපංච හේතු වෙති.

ගාථාවෙහි රජවරුන් දෙදෙනකු යයි සඳහන් වන්නේ දෘෂ්ටිය සම්බන්ධයෙනි. දෘෂ්ටිය ප්‍රධාන වශයෙන් සස්සත (ශාශ්වත) හා උච්ඡේද වශයෙන් දෙපරිදි වෙයි. පුද්ගලයා සම්බන්ධව වෙනස් නොවී සදාතනිකව පවතින ආත්මයක් ඇත යන මිථ්‍යා දෘෂ්ටිය සස්සත දිට්ඨිය ලෙසද මරණයෙන් පසු ආත්මය ද සම්පූර්ණ යෙන්ම විනාශ වේ යන මිථ්‍යා දෘෂ්ටිය උච්ඡේද දිට්ඨිය ලෙස ද සැලකෙයි.

මව හා පියා ද බමුණු රජුන් දෙදෙනා ද පස් නීවරණයන් ද නසා බමුණුතෙම නිවන් පුරයට යන්නේ ය.

295. මාතරං පිතරං හන්ත්වා
රාජානො ද්වෙ ච සොත්ථියෙ
වෙය්‍යග්ඝපඤ්චමං හන්ත්වා
අනීඝො යාති බ්‍රාහ්මණො (21:6)

මවු පිය දෙදෙනාම මරා
බමුණු කුලේ දෙ රජු මරා
දිවියන් පස් දෙනාම මරා
බමුණු යයි බිය ද වරා

සිටිය හැකි නො බියව - නැසීමෙනි කෙලෙසුන් හැම

21 (4) භද්දිය තෙරණුවෝ (294-295 ගාථා)

විවරණාත්මක අනුවාදය (295 ගාථාව)

**මාතරං පිතරං ද්වෙ ච සොත්ථියෙ රාජානො හන්ත්වා
වෙය්‍යග්ඝපඤ්චමං හන්ත්වා බ්‍රාහ්මණො අනීඝො යාති.**

මාතරං: මව (තණ්හා); **පිතරං** : පියා (මානය); **ද්වෙ ච සොත්ථියෙ රාජානො**: බමුණු කුල දෙරජුන් ද (ශාශ්වත - උච්ඡේද දෘෂ්ටි දෙක); **හන්ත්වා**: නසා; **වෙය්‍යග්ඝපඤ්චමං**: ව්‍යාඝ්‍රයන් පස් දෙනා ද, (පංචනීවරණ); **හන්ත්වා**: නසා; **බ්‍රාහ්මණො**: බමුණු තෙමේ; **අනීඝො**: නිදුක්ව (නිවන් පුරට), **යාති**: යයි.

රහතන් වහන්සේ තෘෂ්ණා මාන නමැති මව් පිය දෙදෙනා මරා දමති. ශාශ්වත උච්ඡේද දෘෂ්ටි නමැති බ්‍රාහ්මණ රජුන් දෙදෙනා ද මරා දමති. නීවරණ නමැති ව්‍යාඝ්‍රයන් පස් දෙනා ද මරා දමති. එසේ මරා දමා බිය රහිතව නිදුක්ව හැසිරෙති.

විවරණය

දිට්ඨිය: බුදු දහමෙහිදි දිට්ඨිය සම්මා - මිච්ඡා යන උපපද යටතේ විශේෂණය කොට දැක්වෙයි. සම්මා දිට්ඨි යන ආර්‍ය්‍ය මාර්‍ගයේ දී යථාර්ථාවබෝධය සඳහා පාදක කර ගනු ලබන නිවැරදි වැටහීමයි. මිච්ඡාදිට්ඨි වූ කලි සම්පූර්ණයෙන්ම ආර්‍ය්‍යමාර්‍ගයට පටහැනි වැරදි විශ්වාසයි. බොහෝ විට සූත්‍ර ධර්‍ම වලදී සම්මා යන උපපදයෙන් විශේෂණය නොවී දිට්ඨි යන පදය තනිව යෙදෙන විට එයින් මිච්ඡාදිට්ඨිය අදහස් කෙරෙයි. කිහිප තැනකදී පමණක් සම්මා දිට්ඨිය සඳහා ද දිට්ඨි යන පදය පමණක් ව්‍යවහාර වී ඇත. දිට්ඨිප්පත්ත, දිට්ඨි විසුද්ධි, දිට්ඨි සම්පන්න යන යෙදුම් ඊට නිදසුන් ය.

මිථ්‍යා දෘෂ්ටි මුළුමනින්ම අත්හල යුතු වැරදි කල්පනයන් ලෙස බුදු දහම දකියි. සියලුම ආකාර වැරදි වලට පුද්ගලයා මෙහෙයවනු ලබන්නේ වැරදි දෘෂ්ටි හෙවත් පිළි ගැනීම් නිසාය. මේ නිසා පුද්ගලයා තුළින් දෘෂ්ටි ඉවත් කරවීමේ අරමුණින් බුදුරජාණන් වහන්සේ තම ධර්‍ම දේශනා රාශියක් දෘෂ්ටි නිරාකරණය සඳහා යොමු කොට තිබේ.

දෘෂ්ටි වලින් පුද්ගලයාට සිදුවන හානිය අවධාරණය කරමින් බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කරන සේක.

"මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය තරම් පුද්ගලයා තුළ මෙතෙක් පහළ නොවී ඇති අකුශල ධර්‍ම පහළ වීම සඳහාත්, පහළ වී ඇති අකුශල ධර්‍ම බහුල වීම සඳහාත්, පහළ වී ඇති කුශල ධර්‍මයන් නොපහළ වීම සඳහාත් පහළ වී ඇති කුසල ධර්මයන් විනාශ වීම සඳහාත්, හේතු කාරක වන අන් කිසිවක් නොදකිමි."

"මහණෙනි, මරණින් මතු පුද්ගලයා දුගතිය - අපාය - නිරය කරා ගෙන යාමට හේතු භූත වන අන් දෙයක් මම නො දකිමි. යම් තාක් දුරට පුද්ගලයා වැරදි දෘෂ්ටිවලින් යුක්ත වේ නම් ඒ තාක් දුරට ඔහු අපායට, දුගතියට, නිරයට, දුකට යොමුව පවතියි".

දෘෂ්ටි බිහිවන්නේ යථාර්ථය දැකීමෙන් නොවේ. යථාර්ථය පිළිබඳ අවබෝධය දෘෂ්ටියක් නොව ප්‍රඥාවකි. බුදු දහමෙහි දිට්ඨි සහ ශ්‍රද්ධා යන දෙකේ වෙනස මෙයයි. ප්‍රඥාවක් කර ගත හැකි දිට්ඨි ද තිබේ. ආරම්භයේ දී සහේතුකව පරතොඝොෂ ප්‍රත්‍යමත සිතා එහි නිවැරදි බව දැන විශ්වාසයක් ගොඩ නගා ගතද අවශ්‍ය මාර්‍ගය අනුව යාමෙන් එය ප්‍රඥාවක් කර ගත හැකිය. විද්‍යාඥයෙකු අභ්‍යුපග මයක් මත පර්යේෂණ මෙහෙයවමින් එම අභ්‍යුපගමය සිද්ධාන්තයක් බවට පමුණුවා ගන්නාක් මෙනි. පර්යෙෂණයට බාධක වන වැරදි අභ්‍යුපගම මුලදීම අත්හැර දැමීමට විද්‍යාඥයාට සිදුවෙයි. එපරිද්දෙන්ම බෞද්ධයකුට මධ්‍යම ප්‍රතිපාදාත්මක ආර්‍ය්‍ය මාර්‍ගයේ ගමන් කරනු විට නිවැරදි දෘෂ්ටියක් - දැක්මක් අවශ්‍ය වෙයි. ආර්‍ය්‍ය මාර්‍ගයේ පළමු පියවර සම්මාදිට්ඨියක් වන්නේ ඒ අයුරිනි. ආත්මයක් ඇත - ආත්මයක් නැත යන අන්තවාදී මිත්‍ථ්‍යාදෘෂ්ටි මෙහි දී අත්හැරීමට සිදු වෙයි. කර්‍මය පුනර්භවය වැනි සංකල්ප පිළිබඳව පෘථග්ජන පුද්ගලයාට නිවැරදි අවබෝධයක් නැත. එබැවින් බුදුරජාණන් වහන්සේ ගේ ධර්‍මයෙහි ඇති සත්‍යතාව හා සාසනිකත්වය පරතෝඝොෂ ප්‍රත්‍යය වශයෙන් ගෙන තමන් ගේ යෝනිසෝ මනසිකාරය යෙදවීමෙන් එම සංකල්පවල යුක්ති සහගත භාවය වටහා ගත යුතු වෙයි. එවිට එම කර්‍ම හා පුනර්භව සංකල්පය පිළිබඳ විශ්වාසය මිථ්‍යාවකි. විශ්වාසයක් නොව සම්‍යක් විශ්වාසයකි. එයම සම්මා දිට්ඨි නම් වේ. ආර්‍ය මාර්‍ගයේ උපයුක්ත වීමෙන් අභිඥාවන් ලබා ගන්නා විට එතෙක් පැවැති සක්කාය දිට්ඨිය ශ්‍රද්ධාවක් බවට පත්වෙයි.

ලෝකයෙහි ජීවත් වූත් ජීවත් වන්නා වූත් පුද්ගලයන් අප්‍රමාණ සංඛ්‍යාවක් ආත්ම දෘෂ්ටිය සමඟ අත්වැල් බැඳ ගත්තෝ ය. භෞතික වාදීන් හැරණු කොට සෑම දර්‍ශනයකින්ම පාහේ උගන්වා ඇත්තේ පුද්ගලයා හා විශ්වය පිළිබඳව සදාතනික ආත්මයක් පවත්නා බවය. භෞතිකවාදීන් මරණයත් සමඟ පුද්ගලයා සම්පූර්‍ණයෙන් විනාශයට පත් වන බව ප්‍රකාශ කරන අතර ආත්මවාදීහු ආත්මය සදාතනිකව පවත්නා බව ප්‍රකාශ කරති. මානව සංහතිය පිළිබඳ ආගමික ඉතිහාසයේ පළමු වරට මෙම අන්තවාදී දෘෂ්ටි දෙකම ප්‍රතික්ෂෙප කළ ආගමික ශාසතෘවරයා වන්නේ බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ පුද්ගලයා පිළිබඳ දෘෂ්ටිවාද ගොඩ නගා නැත. දෘෂ්ටිවාද බොහෝ කොට ගොඩ නැගෙන්නේ කාල්පනික චින්තනයෙනි එය සත්‍ය අවබෝධය පදනම් කර ගන්නක් නොවේ. බුදුරජාණන් වහන්සේ තමන් විසින් අවබෝධ කරන ලද ප්‍රතීත්‍යසමුත්පන්න ධර්‍මතාව යටතේ සත්වයා පිළිබඳ යථාර්ථය අවබෝධ කළ සේක. එබැවින් උන්වහන්සේ දෘෂ්ටිවාද වලින් බැහැර වූවා පමණක් නොව දෘෂ්ටිවාදවල අනිෂ්ට විපාකද ලෝකයාට පෙන්වා දුන් සේක.

**"සඤ්ඤං ච දිට්ඨිං ච යෙ අග්ගහෙසුං
තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකේ"**

උන්වහන්සේ සුත්තනිපාත මාගන්දියා සූත්‍රයේදී එසේ දේශනා කළ සේක.

"සංඥා දෘෂ්ටිගන්නෝ ලෝකයෙහි ගැටෙමින් හැසිරෙති."

බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මජාල සූත්‍රයේ දී එවක භාරතීය ආගමික ශාස්තෘවරුන් විසින් ඉදිරිපත් කරන ලද දෘෂ්ටිවාද සැට දෙකක් වර්‍ගීකර දක්වමින් ඒවා වැරදි ලෙස චින්තනය මෙහෙයවීම නිසා ඇති වූ ඒවා බව පෙන්වා දී ඇත.





රෑ දාවල් දෙක්හි බුදු ගුණ සිහිකරන බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත්.

296. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච
නිච්චං බුද්ධගතා සති (21:7)

රෑ දහවලැයි කිසියම් වෙනසක් නොකර
කිසිවෙක් වෙසේ විද බුදුගුණ සිහියෙ තිර
එවන් ගොයුම් සම්බුදු සව්වෝ නිතර
මනා අවදියෙන් පිබිදෙති සුවෙන් බර

බුදුගුණ බැවුම් වඩා - මනසින් පිබිදෙන්න සදා

21 (5) දර කපන්නකුගේ පුතෙක් (296 සිට 301 දක්වා ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **දර කපන්නකු ගේ පුතකු** අරභයා මේ ගාථා සය වදාළ සේක.

රජගහ නුවර එක්තරා දර කපන්නෙක් කිසියම් දිනක දර කපා රැස්කර ගැනීම සඳහා තම පුතා ද සමඟ වනයට ගියේ ය. ඔවුහු දර ගෙන ඒම සඳහා ගවයන් දෙදෙනෙකු යෙදූ රියක් ද උපයෝගී කර ගත්හ. දර ද පටවා ගෙන ආපසු එද්දී අසළ සමු වූ සොහොන් පිට්ටනියක් සමීපයෙහි නැවතී ගැල නවතා ගවයන් ද ලිහා තණ කෑමට ඔවුන් දිගේලි කොට තමන් ගේ ආහාරය ද අනුභව කළ හ. ටික වේලාවකින් ආපසු යාමට අදහස් කොට ගවයන් සොයා බැලූ නමුත් ඔවුහු පෙනෙන්නට නො සිටිය හ. ගවයන් කොහි හෝ යන්නට ඇතැයි සිතූ දර කපන්නා තම පුතාට එහි රැඳී සිටීමට පවසා ගවයන් සොයන්නට ගියේ ය. එහි සෑම පෙදෙසකම සොයා බලා නැති බව දැන දර කපන්නා ගවයන් ආපසු තම නිවසට යන්නට ඇතැයි සිතා රජගහ නුවරටම ඔවුන් සොයමින් ගියේ ය. කෙසේ හෝ රජගහ නුවරට ගොස් ගවයන් සොයා ගෙන තම පුතු රැඳුනු තැනට ආපසු එන විට බොහෝ රෑ වූ බැවින් නගරයේ දොරටු වසා තිබිණ. මේ නිසා එම රැයේ දර කපන්නාට තම පුතා වෙතට ඒමට නොලැබිණ. පුතා පියා ආපසු එන තෙක් බලා සිටි නමුත් නො එන බව දැන ගැල යටට වී නිදා ගැනීමට අදහස් කළේ ය. කෙසේ වුවද ඔහු නින්දට යාමේ දී බුදු ගුණ සිහි කිරීමේ පුරුද්දක් ඇතිව සිටියේ ය. හෙතෙම මෙදින ද බුදුගුණ සිහි කළේ ය. මැදි රැයේ දී යක්ෂයෝ දෙදෙනෙක් මෙම දරුවා දැක ඔහුට අනතුරු කිරීමට සිතා එහි පැමිණිය හ. එක් යකෙක් දරුවා ගේ එක් පයකින් ඇද්දේ ය. පිබිදුණු දරුවාට නින්දට යාමේ දී තම මනසෙන් තිබුණු බුදුගුණ පාඨය ඉබේටම කියවිණ. (නමෝ බුද්ධස්ස) "බුදුන් සරණ යමි" යන මෙම පාඨය දරුවා ගේ මුවින් කියවෙත්ම යක්ෂයෝ බියෙන් තැති ගත් හ. ඔවුහු දරුවට අනතුරු කිරීමේ අදහස අතහැර රාත්‍රියේ තනිව සිටින මේ දරුවාට ආරක්ෂාව සැපයීමට සිතා ගත් හ. එක් යකෙකු දරුවාට රැකවරණය දෙමින් එහිම නැවතුණු අතර අනෙකා බිම්බිසාර රජුගේ මාලිගයට පිවිස එයින් අහර බඳුනක් රැගෙන ආවේ ය. යක්කු දෙදෙනා දරුවාට ආහාර ද අනුභව කරවා තමන් ගේම දරුවකු ලෙස රැය මුළුල්ලේ අවදිව සිට රැක බලා ගත්තේ ය. රජ මාලිගයෙන් අහර බඳුන් රැගෙන ආ යක්ෂයා බිම්බිසාර රජුට පමණක් දැක ගත හැකි වන සේ හසුන් පතක් ද එහි දමා ඇවිත් තිබිණ. පසු දින උදෑසන රාජ පුරුෂයෝ මාලිගයෙහි ආහාර බඳුන නැති වී ඇති බව දැනගෙන බියට හා තැති ගැන්මට පත් වූහ. ඔවුහු ඒ බව බිම්බිසාර රජතුමාට ද සැල කළ හ. යක්ෂයා ගේ හසුන්පත රජුට දැක ගැන්මට ලැබිණ. රජතුමා ආහාර බඳුන සොයන සේ රාජ පුරුෂයන්ට අණ කළේ ය. මේ පිළිබඳව සෝදිසි කිරීමේ දී දරකපන්නා ගේ පුතා විසූ තැන ගැල යටතිබුණු බඳුන සොයා ගත් හ. මේ බව රජතුමාට සැලකිරීමෙන් අනතුරුව එම දරුවා සහ ඔහු ගේ මව් පියන් රජ ගෙදරට කැඳවනු ලැබූ හ. දරුවා ගෙන් කරුණු විමසීමේ දී ඔහු කියා සිටියේ තමන් ගේ දෙමාපිය දෙපල රැයෙහි ගැල ළඟට පැමිණ තමන්ට ආහාර සැපයූ බවයි. රජතුමා යක්ෂයා ගේ පණිවිඩය මගින් සියලු පවත් දැන සිටි නිසා ළමයාත් ඔහු ගේ දෙමාපියනුත් සමඟ බුදුන් සමුවීමට විහාරයට ගිය හ. රජතුමා බුදුන් වැඳ "ස්වාමීනි, උවදුරු වලින් හා විපත් වලින් මිදීමට හැක්කේ බුදුගුණ සිහි කිරීමෙන් පමණක්මද? ධර්මයේ ගුණයන් සිහි කිරීමෙනුත් එසේ විපත් හා උවදුරු වලින් මිදිය හැකිදැ?" යි විමසූ හ. "රජතුමනි, කරුණු හයක් මෙනෙහි කිරීමෙන් නිතර නිතර සිහිපත් කිරීමෙන් මගේ ශ්‍රාවකයන් ගේ විපත් හා උවදුරු දුරුකර ගත හැකි වේය" යි පැවසූ බුදුරජාණන් වහන්සේ යථොක්ත ගාථා හයෙන් ධර්ම දේශනා කළ සේක. දේශනාව අවසානයෙහි දරුවා සහ ඔහු ගේ දෙමාපියෝ සෝවාන් බවට පත් වූහ. පසු කලෙක ඔවුහු බුදු සසුනෙහි පැවිදිව රහත් බව ලබා ගත් හ.

විවරණාත්මක අනුවාදය (296 ගාථාව)

යෙසං දිවා ච රත්තො ච නිච්චං බුද්ධගතාසති
ගොතමසාවකා සදා සුප්පබුද්ධං පබුජ්ඣන්ති

යෙසං: යම් ශ්‍රාවකයකු; **දිවා ච රත්තො ච**: දහවල් කල ද රාත්‍රී කල ද; **නිච්චං බුද්ධගතාසති**: නිරතුරු වඩනා ලද බුදුගුණ අනුව ගිය සිහිය (ඇත්තේ ද); **ගොතම සාවකා**: (ඒ) බුද්ධශ්‍රාවකයෝ; **සදා**: හැම කල්හි; **සුප්පබුද්ධං**: මනා අවදියෙන්; **පබුජ්ඣන්ති**: පිබිදෙති.

රෑ දහවල් නිබඳවම බුදුගුණ මෙනෙහි කරන බුද්ධශ්‍රාවකයෝ නිතර මනා සේ අවදි වූවෝ වෙත්.

විවරණය

බුද්ධානුස්සති භාවනා: බාල මහලු කවරකුට වුවද නිතර පුහුණු කළ හැකි භාවනාවකි. අනුස්සති යනු සිහියට නගා ගනිමින් මෙනෙහි කිරීමයි. බුදුරජාණන් වහන්සේ ගේ නව අරහාදී බුද්ධගුණය භාවනාවක් වශයෙන් ප්‍රගුණ කිරීම මෙයින් අදහස් කෙරෙයි. බෞද්ධයන් නිතර දෙවේලේ සිහිපත් කරන ඉතිපිසො භගවා අරහං ...... යනා දී පාඨය තුළ එම ගුණ නවය දැක්වී ඇත. මෙම ගුණ සිහියට නගා ගනිමින් භාවනාව වැඩිය යුතු වෙයි. තම මනසෙහි පිළිබිඹු වනු බුදුරුව දෙසට සිත යොමා බුදු ගුණ මෙසේ සිහිපත් කළ හැකිය. බුදුරජාණන් වහන්සේ කිසිදු විටෙක රහසිනුදු පවක් නොකළ සේක. මෙම ගුණය තමාගේ සිතේ තහවුරු වන තෙක් එම ගුණය මතම තරමක වේලාවක් භාවනා කොට එම ගුණය තවදුරටත් අවධාරණය කරමින්ම "බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙස් තම සිතෙන් මුලිනුදුරා දැමූ සේක. උන්වහන්සේ පුද පූජාවන්ට සුදුසු වූ සේක. එබැවන් උන්වහන්සේ අරහත් නමින් දන්නා සේක" යනුවෙන් භාවනාව වැඩිය යුතු වෙයි. මේ ආකාරයට අනෙක් බුදුගුණයෙන් පිලිබඳව ද භාවනාව ප්‍රගුණ කළ යුතුය. මෙසේ අප මෙම බුද්ධානුස්සති භාවනාව පුරුදු කිරීමෙන් අපේ මනස අන් අරමුණු කෙරෙහි ඇදී නොගොස් බුද්ධගුණය කෙරෙහිම රඳවා තබා ගැනීමට අපට හැකි වෙයි. මේ මගින් අපේ මනස පිරිසිදු වනු පමණක් නොව බුදුරජාණන් වහන්සේ සතු ඒ අනන්ත ගුණයෙන් බිඳක් හෝ අප තුළද වර්ධනය කර ගැනීමට පෙළඹවීමක් ද ඇති වෙයි. එබැවින් බෞද්ධයන් ලෙස අප මෙම බුද්ධානුස්සති භාවනාව වැඩීම අවශ්‍යයෙන් ම කළ යුත්තකි.



රෑ දාවල් දෙක්හි දහම් ගුණ සිහිකරන බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත්.

297. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තොච
නිච්චං ධම්මගතාසති (21:8)

රෑ දහවලැයි කිසියම් වෙනසක් නොකර
කිසිවෙක් වෙසේ විද දම් ගුණ සිහියෙ තිර
එවන් ගොයුම් සම්බුදු සව්වෝ නිතර
මනා අවදියෙන් පිබිදෙති සුවෙන් බර

දම් ගුණ බැවුම් - මනසින් පිබිදෙන්න සදා

21 (5) දරකපන්නකු ගේ පුතෙක් (296 සිට 301 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (297 ගාථාව)

යෙසං දිවා ච රත්තො ච නිච්චං ධම්මගතා සති
ගොතමසාවකා සදා සුප්පබුද්ධං පබුජ්ඣන්ති

යෙසං: යම් ශ්‍රාවකයකු; **දිවා ච රත්තො ච**: දහවල් කල ද රාත්‍රි කල ද; **නිච්චං ධම්මගතා සති**: නිරතුරු වඩනා ලද ධර්මය පිළිබඳ සිහිය (ඇත්තේ ද); **ගොතම සාවකා**: (ඒ) බුද්ධශ්‍රාවකයෝ; **සදා**: හැම කල්හි; **සුප්පබුද්ධං**: මනා අවදියෙන්; **පබුජ්ඣන්ති**: පිබිදෙති.

රෑ දහවල් නිබඳවම දහම් ගුණ මෙනෙහි කරන බුද්ධශ්‍රාවකයෝ නිතර මනා සේ අවදි වූවෝ වෙත්.

විවරණය

ධම්මානුස්සති භාවනා: මෙය ධර්මරත්නයේ ගුණ සිහිකිරීමයි. බුදුරජාණන් වහන්සේ විසින් අවබෝධ කරන ලද, එමෙන්ම ලෝකයා ගේ යහපත සඳහා ඉදිරිපත් කරන ලද ධර්මයේ ගුණය ද අනන්ත වෙයි. එය ස්වාක්ඛාතො භගවතා ධම්මො යනුවෙන් දැක්වෙන ධර්ම ගුණ පාඨයේ ඇතුළත් වෙයි. ධර්මයේ ගුණය පහත සඳහන් ආකාරයෙන් වෙන් වෙන් වශයෙන් තම සිතට නඟා ගෙන ඒ මත සිත පිහිටුවාගෙන භාවනාව වැඩිය හැකිය.

1. **ස්වාක්ඛාතො භගවතා ධම්මො**: බුදුරජාණන් වහන්සේ විසින් මනාව ධර්මය දැන මනාව ප්‍රකාශ කරන ලදි. එය මුල මැද අග යන අවස්ථා සියල්ල එකිනෙක ගැලපෙන අයුරෙන් ඉතා පිරිසිදුව පැහැදිලි කොට ඇත.

2. **සන්දිට්ඨිකො**: ධර්මය ප්‍රගුණ කිරීමෙන් එහි ප්‍රතිඵලය මේ ජීවිතය තුළ ම ලබා දෙයි.

3. **අකාලිකො**: ධර්මය කල් නොයවා ප්‍රතිඵල ගෙන දෙන සුළුය. එය කිසියම් එක් කාලයකට පමණක් සීමාවන්නක් නො වේ. ලොව කවර කලක වුවද ප්‍රගුණ කළ හැකිය. ප්‍රගුණ කළ යුතුය.

4. **එහිපස්සිකො**: එව බලව යන ගුණය ධර්මය තුළ ඇත. තමාටම හරිද වැරදිදැයි අත්හදා බැලිය හැකි ගුණයක් ධර්මය තුළ පිහිටා ඇත. එය කෙනෙකුගේ කීම මත පිහිටා තිබෙන්නක් නොවේ. තමාටම අනුගමනය කොට අත්හදා බැලිය හැකිය.

5. **ඕපනයිකො**: ධර්මය අනුගමනය කරන්නා තුළට ලඟාවන ප්‍රතිඵලයෙන් යුක්තය. මෙයින් අදහස් වනුයේ අප ප්‍රතිඵලය කරා යෑම නොව ධර්මයේ ප්‍රතිඵලය අපකරා පැමිණීමයි.

6. **පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහීති**: අනුගමනය කරන ඒ ඒ පුද්ගලයා විසින්ම අවබෝධ කළ යුතු ධර්මයකි. මෙය බුද්ධිමතුන් තම තමා විසින්ම අවබෝධ කටයුතු වූ ධර්මයකි.

ධර්මයේ ගුණ මේ අයුරින් සිහියට නඟා ගැනීමෙන් ධම්මානුස්සති භාවනාව වැඩිය හැකි වෙයි.

මේ හැර සතර සතිපට්ඨානයට ඇතුළත් වන ධම්මානුපස්සනා යනුවෙන් ගැනෙන භාවනාවක් ද වෙයි. එහි ධම්ම යන වචනය භාවිතා වී ඇත්තේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය යන අර්ථයෙන් නො වේ. එහෙත් බුදුදහමින් විවරණය කර දක්වන විවිධ ධර්ම කරුණු කොට්ඨාශ පහක් යටතේ වර්ගීකර දැක්වීමක් එහිදී සිදු වෙයි. පරිග්ගහ යන පදය යටතේ ඒවා මේ අයුරින් වර්ගීකොට දක්වා තිබේ.

1. නීවරණ පරිග්ගහ
2. ඛන්ධ පරිග්ගහ
3. ආයතන පරිග්ගහ
4. බොජ්ඣඞ්ග පරිග්ගහ
5. සච්චපරිග්ගහ

නීවරණ පරිග්ගහ: නිර්වාණාවබෝධය සඳහා අදාළ වන ප්‍රඥාව මනසෙහි පහළ වීමට බාධා කෙරෙන, එමෙන් ම මානසික සමාධියට බාධක වන කරුණු පහක් නීවරණ නමින් ගැනෙයි. ඒවා

1. කාමච්ඡන්ද 2. ව්‍යාපාද 3. ථීන මිද්ධ 4. උද්ධච්චකුක්කුච්ච
5. විචිකිච්ඡා යනුවෙන් දැක්වෙයි.

කාමච්ඡන්ද: යනු කාමවස්තු කෙරෙහි ඇති වන ආශාවයි. ලෝකයේ ඇති රූප ශබ්ද ගන්ධාදී විෂය වස්තු ශුභ, සුඛ, සාර, වශයෙන් පිළි ගැනීම නිසා කාමච්ඡන්දය ඇති වෙයි. මෙම නීවරණය අරභයා භාවනා කරන විට පහත සඳහන් ආකාරයෙන් කළ හැකිය.

1. කාමච්ඡන්දය තම සිතෙහි විද්‍යමාන වන විට එහි විද්‍යමානත්වය පිළිබඳ අවබෝධය ඇතිව ඒ පිළිබඳ සිහියෙන් මෙනෙහි කිරීම.

2. කාමච්ඡන්දය සිතෙහි නොමැති විට එය තම සිතෙහි නො මැති බව දැන ඒ පිළිබඳව මෙනෙහි කිරීම.

3. මෙතෙක් තම සිතෙහි පහළ නොවී ඇති කාමච්ඡන්දය තම සිතට ඇතුළු විය හැකි ආකාරය ගැන දැනුවත් වීම.

4. කාමච්ඡන්ද ඇති වී එය නැති වී යන ආකාරය පිළිබඳව දැනුවත් වීම.

5. සිතෙහි පහළ වු කාමච්ඡන්දය විනාශ වී ගොස් නැවත එය ඇති නොවන ආකාරය පිළිබඳව දැනුවත් වීම.

ව්‍යාපාද: මෙයින් අදහස් වන්නේ ද්වේෂයයි. ක්‍රෝධය යනුවෙන් ද එය හැඳින්වෙයි. මෙය ද නිවන් මග අවහිර කරන ක්ලේෂ ධර්මයකි. ද්වේෂය සිතෙහි ඇති වීම හා නැති වීම පිළිබඳව මෙනෙහි කිරීම ද කාමච්ඡන්දය පිළිබඳ විවරණයට අනුකූල පරිද්දෙන්ම වෙයි.

රෑ දාවල් දෙක්හි සඟ ගුණ සිහිකරන බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත්.

298. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තොච
නිච්චං සඞ්ඝගතාසති (21:9)

රෑ දහවලැයි කිසියම් වෙනසක් නොකර
කිසිවෙක් වෙස්විද සඟගුණ සිහියෙ තිර
එවන් ගොයුම් සම්බුදු සව්වෝ නිතර
මනා අවදියෙන් පිබිදෙති සුවෙන් බර

සඟගුණ බැවුම් වඩා - මනසින් පිබිදෙන්න සදා

21 (5) දරකපන්නකු ගේ පුතෙක් (296 සිට 301 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (298 ගාථාව)

යෙසං දිවා ච රත්තො ච නිච්චං සඞ්ඝගතාසති
ගොතමසාවකා සදා සුප්පබුද්ධං පබුජ්ඣන්ති

යෙසං: යම් ශ්‍රාවකයකු; **දිවා ච රත්තො ච**: දහවල් කල ද රාත්‍රි කල ද; **නිච්චං සඞ්ඝගතාසති**: නිරතුරු වඩනා ලද සංඝානුස්සති භාවනාව (පවතී ද); **ගොතම සාවකා**: (ඒ) බුද්ධශ්‍රාවකයෝ; **සදා**: හැම කල්හි; **සුප්පබුද්ධං**: මනා අවදියෙන්; **පබුජ්ඣන්ති**: පිබිදෙති.

රෑ දහවල් නිබඳවම සඟගුණය මෙනෙහි කරන බුද්ධශ්‍රාවකයෝ නිතර මනා සේ අවදි වූවෝ වෙත්.

විවරණය

ථීන මිද්ධ: කයේ සහ මනසේ උදාසීන භාවයයි. මෙම ථීන මිද්ධය මනසේ විද්‍යාමාන වීම හා නො වීම කාමච්ඡන්ද විග්‍රහය යටතේ දක්වන ලද ආකාරයෙන් භාවනාවට යොමු කර ගත හැකිය.

උද්ධච්ච කුක්කුච්ච: මනසේ නොසන්සුන්තාව හා ඇවිස්සුණු බවයි. මෙම මානසික ස්වභාවය මනසේ ඒකාග්‍රතාවට බාධාවක් වන බැවින් නිවන් මග අවුරණ සුලු නීවරණයකි. ඉහත දක්වන ලද ආකාර පහ යටතේ මෙය ද භාවනාවට අරමුණු කර ගත හැකිය.

විචිකිච්ඡා: කරුණු අටක් පදනම් කර ගෙන ඇතිවන සැකය මෙනමින් හැඳින්වෙයි. එම කරුණු අට මෙසේය.

1. බුදුන්වහන්සේ පිළිබඳ සැකය
2. ධර්මය පිළිබඳ සැකය
3. සංඝයා පිළිබඳ සැකය
4. ශික්ෂාපද පිළිබඳ සැකය
5. අතීත භවය පිළිබඳ සැකය
6. අනාගත භවය පිළිබඳ සැකය
7. අතීත සහ අනාගත භවයන් දෙකම පිළිබඳ සැකය
8. ප්‍රතීත්‍යසමුත්පාද ධර්මතාව පිළිබඳ සැකය.

මෙම සැකය මනසෙහි පැවැත්ම හා නොපැවැත්ම පිළිබඳව ද යථෝක්ත ක්‍රම පහ යටතේ භාවනාව සඳහා අරමුණු කර ගත හැකි වෙයි. ඉහත සඳහන් නීවරණ පංචකය වෙන වෙනම ගෙන නීවරණ පරිග්‍රහ යන නම යටතේ සැලකිල්ලට ගැනෙයි.

ඛන්ධපරිග්‍රහ: උපාදාන ස්කන්ධ පඤ්චකයකින් සමන්විත පුද්ගලයා එම ස්කන්ධයන්ට විශ්ලේෂණය කරමින් පුද්ගලයා පිළිබඳ යථාර්ථය භාවනාව සඳහා යොමු කර ගැනෙයි. ස්කන්ධ පඤ්චකය මෙසේ ය.

1. රූපය හෙවත් ද්‍රව්‍යය පිළිබඳ රාශිය (රූප උපාදාන ස්කන්ධය)

2. වේදනා හෙවත් සංවේදනා පිළිබඳ රාශිය(වේදනා උපාදාන ස්කන්ධය)

3. සංඥා හෙවත් සංජානන පිළිබඳ රාශිය (සඤ්ඤා උපාදාන ස්කන්ධය)

4. සංස්කාර හෙවත් මානසික උපස්ථිති පිළිබඳ රාශිය (සංඛාර උපාදාන ස්කන්ධය)

5. විඤ්ඤාණ රාශිය (විඤ්ඤාණ උපාදාන ස්කන්ධය)

රූපය හෙවත් ද්‍රව්‍යය පිළිබඳව භාවනා කිරීමේ දී 'ද්‍රව්‍යයේ ස්වභාවය මෙබඳුය, එය හේතු ඵල නියාමයට අනුව ඇති වෙමින් නැති වෙයි.' ආදී නයින් සිහියට නඟා ගත යුතු වෙයි. අනෙක් උපාදානස්කන්ධයන් පිළිබඳව භාවනා කරනුයේ ද එපරිද්දෙනි. මේ භාවනාවෙන් අරමුණු වන්නේ ස්කන්ධයන් හි ස්වභාවය වටහා ගනිමින් ඒවා කෙරෙහි ඇලීම් බැඳීම් ආදියෙන් වැළකීමය.

ආයතන පරිග්‍රහ: ආයතන නමින් හැඳින්වෙන්නේ දැනුම ලැබීමට ඉවහල් වන ඉන්ද්‍රියයන් සහ ඒ හා සම්බන්ධ වන අරමුණුය, මේවා සංඛ්‍යාවෙන් දොළසක් වෙයි. එය ද අජ්ඣත්තික (අභ්‍යන්තර) හා බාහිර වශයෙන් දෙපරිදි වෙයි. අජ්ඣත්තික ආයතන සය මෙසේ ය.

1. ඇස (චක්ඛු ආයතන)
2. කණ (සොත ආයතන)
3. නාසය (ඝාන ආයතන)
4. දිව (ජිව්හා ආයතන)
5. ශරීරය (කාය ආයතන)
6. මනස (මන ආයතන)

බාහිර ආයතන සය මෙසේ ය.

1. රූපය (රූපායතන)
2. ශබ්දය (සද්දායතන)
3. .ගන්ධය (ගන්ධායතන)
4. රසය (රසායතන)
5 ස්පර්ශය (පොට්ඨබ්බායතන)
6. ධර්ම - මානසික අරමුණු (ධම්මායතන)

මේ එක් එක් ආයතනයන් වෙන වෙනම ගෙන පහත සඳහන් අයුරින් සිහියෙන් යුතුව සලකා බැලීම ආයතන පරිග්‍රහය යටතේ සිදුවෙයි.

කය අරමුණු කොට උපදනා සිහි ඇති බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත්.

299. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගොතම සාවකා
යෙසං දිවා ච රත්තො ච
නිච්චං කායගතාසති (21:10)

රෑ දහවලැයි කිසියම් වෙනසක් නොකර
කිසිවෙක් වෙසේ විද කාගිය සිහියෙ තිර
එවන් ගොයුම් සම්බුදු සව්වෝ නිතර
මනා අවදියෙන් පිබිදෙති සුවෙන් බර

කයෙහි තතු බලමින් - පිබිදෙති නිති මැනවින්

21 (5) දරකපන්නකු ගේ පුතෙක් (296 සිට 301 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (299 ගාථාව)

යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතාසති
ගොතමසාවකා සදා සුප්පබුද්ධං පබුජ්ඣන්ති

යෙසං: යම් ශ්‍රාවකයකු; **දිවා ච රත්තො ච**: දහවල් කල ද රාත්‍රී කල ද; **නිච්චං කායගතාසති**: නිරතුරු වඩනා කායගතාසති භාවනාව (ඇත්තේ ද); **ගොතම සාවකා**: (ඒ) බුද්ධශ්‍රාවකයෝ; **සදා**: හැම කල්හි; **සුප්පබුද්ධං**: මනා අවදියෙන්; **පබුජ්ඣන්ති**: පිබිදෙති.

රෑ දහවල් නිබඳවම කායගතාසති භාවනාව වඩන බුද්ධශ්‍රාවකයෝ නිතර මනා සේ අවදි වූවෝ වෙත්.

විවරණය

බොජ්ඣඞ්ග පරිග්ගහ: සම්බෝධිය හෙවත් සත්‍යාවබෝධය ලැබීම සඳහා හේතු කාරක වන කරුණු බොජ්ඣඞ්ග නමින් හැඳින්වෙයි. මේවා සංඛ්‍යාවෙන් සතකි.

1. සති සම්බොජ්ඣඞ්ග
2. ධම්මවිචය සම්බොජ්ඣඞ්ග
3. විරිය සම්බොජ්ඣඞ්ග
4. පීති සම්බොජ්ඣඞ්ග
5. පස්සද්ධි සම්බොජ්ඣඞ්ග
6. සමාධි සම්බොජ්ඣඞ්ග
7. උපෙක්ඛා සම්බොජ්ඣඞ්ග

මේ බොජ්ඣඞ්ග සත සත්‍යාවබෝධය සඳහා උත්සුක වන පුද්ගලයකු තුළ විද්‍යාමාන විය යුතු අඩියර සතකි. මේවා එකිනෙකට සම්බන්ධව පවතියි. මේ නිසාම මේවා වෙන් වෙන්ව පැහැදිලි කිරීම ද දුෂ්කරය.

සත්‍යාවබෝධය සඳහා උත්සාහවත් වන පුද්ගලයා තමාගේ සියලු මානසික චින්තනයන් පිළිබඳව මෙන්ම තම ශරීරයේ ක්‍රියාකාරිත්වයන් පිළිබඳව ද සිහියෙන් (සති) යුක්ත විය යුතුය. මෙය **සති සම්බොජ්ඣඞ්ග** නමින් සැලකෙයි.

මෙබඳු සිහියකින් යුක්තව හරි හා වැරදි දේ පිළිබඳව විමර්ශනය කරමින් ඒවා ප්‍රඥාවෙන් වටහා ගැනීමට උත්සාහ කළ යුතුය. මෙසේ විචාරාත්මක විමර්ශනය **ධම්මවිචය සම්බොජ්ඣඞ්ග** නමින් සැලකෙයි.

මෙබඳු ප්‍රඥාවකින් යුතුව හරි වැරදි දේ පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පුද්ගලයා සතර සම්‍යග් ප්‍රධාන වීර්යය උපදවා ගත යුතු වෙයි. එය **විරිය සම්බොජ්ඣඞ්ග** නමින් සැලකෙයි.

උත්සාහයෙන් යුක්තව නිවැරදි ධර්මයන් පිළිබඳ විමංසනයෙන් ඒවා අවබෝධ කිරීමේ දී ඇති වන මානසික ප්‍රීතිය **පීති සම්බොජ්ඣඞ්ග** නම් වෙයි.

කාම වස්තු පිළිබඳ ආශාවෙන් තොරව ප්‍රීතිය වර්ධනය වීමේ දී මානසික හා කායික ඇතිවන සංසුන් බව **පස්සද්ධි සම්බොජ්ඣඞ්ග** නම්.

මානසික සංසුන් බව මත කුශල ධර්මයන් පිළිබඳව ඇති වන චිත්ත ඒකාග්‍රතාව **සමාධි සම්බොජ්ඣඞ්ග** නම්.

සමාධිය වර්ධනය වන විට විෂය වස්තූන් පිළිබඳ අස්ථිර අසාර බව වැටහීමෙන් ඒවාට ඇලීමෙන් හා ද්වේෂ කිරීමෙන් තොර මානසික මධ්‍යස්ථතාවක් ඇති වෙයි. මෙම මානසික මධ්‍යස්ථතාව **උපෙක්ඛා සම්බොජ්ඣඞ්ග** නම්.

සම්බොජ්ඣඞ්ග භාවනාවේ දී මේ එක් එක් බොධි අංගයක් පිළිබඳව පහත දැක්වෙන ආකාරයෙන් සිත පිහිටුවා ගත හැකි වෙයි.

1. බෝධි අංගයක් තමන්ගේ සිත තුළ විද්‍යාමාන වූ විට එය විද්‍යාමාන වන බව මෙනෙහි කිරීම.
2. බෝධි අංගයක් තම සිත තුළ අවිද්‍යාමාන වන විට එය අවිද්‍යාමාන බව මෙනෙහි කිරීම.
3. බෝධි අංගයක් තම සිත තුළ අවිද්‍යාමාන වන විට එය සිතෙහි උපදවා ගත හැක්කේ කෙසේදැයි මෙනෙහි කිරීම.
4. සිතෙහි විද්‍යාමාන වන බෝධි අංගයක් තවදුරටත් වර්ධනය කර ගත හැක්කේ කෙසේදැයි මෙනෙහි කිරීම.

මේ ආකාරයෙන් බෝධි අංගයන් වෙන වෙනම මෙනෙහි කිරීම තුළින් ඒවා තම සිතෙහි උපදවා ගනිමින් වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසෙයි.



රෑ දවල් දෙක්හි කරුණා ගුණයෙහි ඇලුණු බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත්.

300. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගොතම සාවකා
යෙසං දිවා ච රත්තො ච
අහිංසාය රතො මනො (21:11)

රෑ දහවලැයි කිසියම් වෙනසක් නොකර
කිසිවෙක් වෙසේවිද බැවුමෙහි යෙදී තිර
එවන් ගොයුම් සම්බුදු සව්වෝ නිතර
මනා අවදියෙන් පිබිදෙති සුවෙන් බර

පිබිදෙති සිහියෙන් සොඳිනා - බුදු සව්වෝ මෙත් වඩනා

21 (5) දරකපන්නකු ගේ පුතෙක් (296 සිට 301 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (300 ගාථාව)

යෙසං මනො දිවා ච රත්තො ච අහිංසාය රතො
ගොතමසාවකා සදා සුප්පබුද්ධං පබුජ්ඣන්ති

යෙසං: යම් ශ්‍රාවකයකු ගේ; **මනො**: මනස; **දිවා ච රත්තො ච**: දහවල් කල ද රාත්‍රි කල ද; **අහිංසාය රතො**: අවිහිංසාවෙහි ඇලුනේ වේද?; **ගොතම සාවකා**: (ඒ) බුද්ධශ්‍රාවකයෝ; **සදා**: හැම කල්හි; **සුප්පබුද්ධං**: මනා අවදියෙන්; **පබුජ්ඣන්ති**: පිබිදෙති.

රෑ දහවල් නිබඳවම අවිහිංසාවෙහි ඇලුණු සිත් ඇති බුද්ධශ්‍රාවකයෝ නිතර මනා සේ අවදි වූවෝ වෙත්.

විවරණය

සච්චපරිග්ගහ: චතුරාර්ය සත්‍යයට අයත් කරුණු අවබෝධ කර ගැනීම සච්චපරිග්ගහ නමින් දැක්වී ඇත. දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග වශයෙන් ආර්ය සත්‍ය සතරකි.

දුක්ඛ: බුදු දහමින් විවරණය වන්නේ හේතු ප්‍රත්‍යයන් ගේ නිරන්තර ක්‍රියාවලියක් වශයෙන් පවත්නා සංස්කාර ධර්ම හැම එකක්ම දුක් සහගත බව ය. පුද්ගලයකු මේ දුක් සහගත තත්වයෙන් විමුක්ත වීම සඳහා දුකෙහි ස්වභාවය අවබෝධ කර ගත යුතු වෙයි. දොළොස් ආකාරයකින් දුක පිළිබඳ විවරණයක් ඉදිරිපත් වී ඇත.

1. උපත දුකෙකි (ජාති)
2. වෙනසට, මහලු බවට පැමිණීම දුකෙකි (ජරා)
3. මරණය දුකෙකි (මරණ)
4. ශෝකය දුකෙකි (සොක)
5. වැලපීම දුකෙකි (පරිදෙව)
6. ශාරීරික වේදනාව දුකෙකි (දුක්ඛ)
7. මානසික වේදනාව දුකෙකි (දොමනස්ස)
8. වෙහෙස මහන්සිය දුකෙකි (උපායාස)
9. අප්‍රියයන් හා අප්‍රිය දෙය ඇසුරට ලැබීම දුකෙකි (අප්පියෙහි සම්පයොග)
10. ප්‍රියයන්ගෙන් හා ප්‍රිය දෙයින් වෙන් වීමට ලැබීම දුකෙකි. (පියෙහි විප්පයොග)
11. තමන් කැමති වන දේ නොලැබීම දුකෙකි. (යමපිච්ඡං න ලභති)
12. සැකෙවින් මෙම පංච උපාදානස්කන්ධයම දුකෙකි. (සංඛිත්තෙන පංචුපාදානක්ඛන්ධා දුක්ඛා)

දුක්ඛ සංකල්පය පහත දැක්වෙන අයුරින් ආකාර සතකින් ද විමර්ශනය කළ හැකිය.

1. ශාරීරික වේදනාව මගින් ඇතිවන දුක (දුක්ඛ)
2. පවත්නා තත්වය වෙනස්වීම නිසා ඇති වන දුක (විපරිණාම දුක්ඛ)
3. ප්‍රත්‍යයොත්පන්න ධර්මතාව යටතේ ඇති වීමේ හා නැති වීමේ ස්වභාවය නිසා ඇති වන දුක (සඞ්ඛාර දුක්ඛ)
4. අප්‍රකට වූ කායික හා මානසික හේතු නිසා ඇති වන දුක (පටිච්ඡන්න දුක්ඛ)
5. ප්‍රකට වූ විවිධ හේතු වලින් ඇතිවන දුක (අප්පටිච්ඡන්න දුක්ඛ)
6. දුක්ඛ දුක්ඛ නමින් ගැනෙන දුක්වලින් බාහිර වූ සියලු වර්ගයකටම අයත් වන දුක (පරියාය දුක්ඛ)
7. දුක්ඛ දුක්ඛ යනුවෙන් හැඳින්වෙන ශාරීරික හා මානසික දුක (නිප්පරියාය දුක්ඛ)

මේ අයුරින් හේතු ප්‍රත්‍ය ධර්මතාව යටතේ වස්තූන් ගේ ඇති වීම නිසා ඒවාට උරුම වී ඇති දුක පිළිබඳව සිහියෙන් යුතුව මෙනෙහි කිරීමක් අවශ්‍ය වෙයි. එවිට දුකෙහි යථා ස්වභාවය ගැන අවබෝධය ලබා ගත හැකිය. දුක පිළිබඳ අවබෝධය නොමැතිව දුක්ඛ නිරෝධය කළ නොහැකි වෙයි.

සමුදය: දුක හට ගැනීමේ හේතුව පිළිබඳ සත්‍යයයි. මෙයින් අදහස් වනුයේ සියලු දුකට හේතුවන මූලික හේතුවයි. ඒ වූ කලී තෘෂ්ණාවයි. තෘෂ්ණාව මූලික වශයෙන් ත්‍රිවිධ අංශයකින් යුක්තය.

1. කාම තණ්හා: විෂය වස්තූන්ට ඇල්ම,
2. භව තණ්හා: භවයන් පිළබඳ ඇල්ම,
3. විභව තණ්හා පැවැත්මට ඇල්ම හා නොපැවැත්මට ඇල්ම

මෙසේ ත්‍රිවිධ අංශයකින් සමන්විත වූ තෘෂ්ණාව සම්පූර්ණයෙන්ම මුලිනුදුරා දැමිය යුත්තකි. පුද්ගලයකු ගේ සිතේ ඇතිවන තෘෂ්ණාවේ යථාස්වරූපය වටහා ගැනීමට ඒ පිළිබඳව සිහිය පිහිටුවා ගැනීම අවශ්‍ය වෙයි.

නිරොධ: දුක නැවත ඉපදීමක් නැති අයුරින් විනාශ කිරීම නිරොධ නම්, තෘෂ්ණාව සමූල ඝාතනය කිරීම මෙයින් අදහස් වෙයි. දුකෙහි හේතුව වන තෘෂ්ණාව නැති කිරීම ම දුක්ඛ නිරොධ නම් වේ.

මග්ග: තෘෂ්ණාක්ෂය හෙවත් දුක්ඛ නිරෝධය සඳහා හේතු කාරක වන පිළිවෙත මග්ග නමින් සැලකෙයි. මෙය මජ්ඣිමා පටිපදා (මධ්‍යම ප්‍රතිපදාව), අරියො අට්ඨාංගිකො මග්ගො (ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් වලින් ද හැඳින් වී ඇත. මෙම ආර්ය මාර්ග සත්‍යය යන අංග අටකින් සමන්විත වෙයි.

1. නිවැරදි දැකීම (සම්ම දිට්ඨි)
2. නිවැරදි සිතිවිලි (සම්මා සංකප්ප)
3. නිවැරදි කථාව (සම්මා වාචා)
4. නිවැරදි ක්‍රියා (සම්මා කම්මන්ත)
5. නිවැරදි ජීවන (වෘත්තිය සම්මා ආජීව)
6. නිවැරදි වීර්යය (සම්මා වායාම)
7. නිවැරදි සිහිය (සම්මා සති)
8. නිවැරදි සමාධිය (සම්මා සමාධි)



රෑ දවල් දෙක්හි මෙත් ගුණයෙහි ඇලුණු බුදු සවුවෝ සුව සේ නිදත්, සුව සේ පුබුදිත්.

301. සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගොතම සාවකා
යෙසං දිවා ච රත්තො ච
භාවනාය රතො මනො (21:12)

රෑ දහවලයි කිසියම් වෙනසක් නොකර
කිසිවෙක් වෙනස්විද මෙත් සිත ඇතිව තිර
එවන් ගොයුම් සම්බුදු සව්වෝ සතර
මනා අවදියෙන් පිබිදෙති සුවෙන් බර

පිබිදෙති සිහියෙන් සොඳිනා - බුදු සව්වෝ මෙත් වඩනා

21 (5) දරකපන්නකු ගේ පුතෙක් (296 සිට 301 දක්වා ගාථා)

විවරණාත්මක අනුවාදය (301 ගාථාව)

යෙසං දිවා ච රත්තො ච භාවනාය රතො මනො
ගොතමසාවකා සදා සුප්පබුද්ධං පබුජ්ඣන්ති

යෙසං: යම් ශ්‍රාවකයකු ගේ; **දිවා ච රත්තො ච**: දහවල් කල ද රාත්‍රි කල ද; **භාවනාය රතො මනො**: මෛත්‍රී භාවනාව වැඩීමෙහි ඇලුනේ වේද?; **ගොතම සාවකා**: (ඒ) බුද්ධශ්‍රාවකයෝ; **සදා**: හැම කල්හි; **සුප්පබුද්ධං**: මනා අවදියෙන්; **පබුජ්ඣන්ති**: පිබිදෙති.

රෑ දහවල් නිබඳවම භාවනාවෙහි ඇලුණු සිත් ඇති බුද්ධශ්‍රාවකයෝ නිතර මනා සේ අවදි වූවෝ වෙත්.

විවරණය

අහිංසාය රතො: හිංසක මානසිකත්වයෙන් මිදී මෛත්‍රී සහගත සිතින් විසීමයි. බුදු සමයෙන් ඉගැන්වෙන විමුක්තිගාමී පිළිවෙතෙහි විශේෂ ලක්‍ෂණයක් වන්නේ එය සෑම සත්වයකු කෙරෙහි දැක්විය යුතු මෛත්‍රිය පදනම් කර ගෙන ඉදිරිපත් වී තිබීමයි. දෛවය පදනම් කරගෙන පවත්නා විවිධාකාර හිංසාකාරී ක්‍රියාවලින් පමණක් නොව ඒ පිළිබඳ මානසිකත්වයෙන් පවා මිදී මෙන් සිත පෙරදැරිකර ගැනීමේ වැදගත් කම ආර්‍ය අෂ්ටාංගික මාර්ගයේ දෙවැනි පියවරින් ඉදිරිපත් වන අවිහිංසා සංකප්ප යටතේ අවධාරණය වී ඇත.

බුදුරජාණන් වහන්සේ රහල් හිමියන් අරභයා කෙරෙන රාහුලෝවාදයේ දී මෙසේ ප්‍රකාශ කරන සේක. "රාහුල, මෛත්‍රී සහගත සිතින් යුතුව වාසය කරන්න. මෛත්‍රී සහගත සිත ප්‍රගුණ කිරීමෙන්, වර්ධනය කිරීමෙන් හා භාවිත කිරීමෙන් ද්වේෂය විනාශ වී යයි. රාහුල කරුණා සහගත සිතින් යුතුව වාසය කරන්න. කරුණා සහගත සිත ප්‍රගුණ කිරීමෙන්, වර්ධනය කිරීමෙන් හා භාවිත කිරීමෙන් හිංසාව සහ කෲර බව විනාශ වෙයි.''

මෛත්‍රිය සහ කරුණාව අනුක්‍රමයෙන් ද්වේෂයට සහ කෲර බවට ප්‍රති පක්‍ෂව සිටියි. කාමරාගය මෙන්ම ද්වේෂය ද ඇති වනුයේ අපගේ ඉන්ද්‍රියන් බාහිර විෂය වස්තු සමඟ ගැටීමෙන් ඇතිවන මානසික ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් වශයෙනි. පුද්ගලයෙකුගේ ඇස රූප අරමුණක් සමග ගැටීමේ දී ඇතිවන සංවේදන යෝනිසෝ මනසිකාරයෙන් නොසැලකීමෙන් එම සංවේදන මගින් නියෝජනය වන රූපය අප්‍රිය දෙයක් ලෙස සැලකුවහොත් මනස තුළ ද්වේෂය ඇතිවෙයි. කණ - ශබ්දය - නාසය - ගඳ, රසය - දිව, කය - සපර්ශය මනස - ධර්ම ආදී ආකාරයෙන් අනෙක් ඉන්ද්‍රියයන් සම්බන්ධ වන අනුකූල විෂය වස්තු අරභයා ද මෙම ද්වේෂය ජනිත වෙයි. අරමුණෙහි ද්වේෂ කිරීම නිසා පුද්ගලයා එම අරමුණින් ඈත් වීමට එයට හානි පැමිණිවීමට හා විනාශ කිරීමට පෙළඹෙයි. එය හිංසක ක්‍රියාකාරිත්වයක් බවට පැමිණෙයි. හිංසක ක්‍රියාකාරිත්වයෙන් කෙනෙකුට වෙන් විය හැක්කේ මෛත්‍රී සහගත සිතුවිලි තම සිත තුළ වගා කර ගැනීමෙනි.

මෙත්තා යනු බෞද්ධයන් අතර බෙහෙවින් ජනප්‍රිය වචනයකි. මිත්‍රත්වය, විශ්ව ආදරය, වැනි වචන මෛත්‍රිය පැහැදිලි කිරීම සඳහා යෙදෙන නමුත් මෙත්තා - මෛත්‍රී යන පදයෙන් දෙන අදහස දීමට තරම් ඒවා ප්‍රාණවත් නො වේ. මෙත්තා යන්න තුළින් ඉතාමත් මෘදු මොලොක් මානසික ආකල්පයක් නියෝජනය වෙයි. මවකු සිය දරුවකු කෙරෙහි දක්වන අසීමිත හිතවත් බව, සුහද බව බොහෝ දුරට මෙත්තා යන වචනයෙන් ඉදිරිපත් වන අර්ථයයි. බොහෝ විට මිනිසුන් කාමරාගී හැඟීම ද මෙත්තා යන්නෙන් ඉදිරිපත් වන අර්ථය ලෙස වරදවා ගනු ද දක්නට ලැබේ. විෂය වස්තුව කෙරෙහි බැඳීමට ඇලීමට වසඟව සිටීමට හේතුවන ආකල්පයක් මෛත්‍රී යන්නෙන් අදහස් නොවෙයි. එබැවින් පෙම්වතකු පෙම්වතියකට දක්වන ආදර මුසු හැඟීම මෛත්‍රිය ලෙස සලකන්නේ නම් එය වරදවා වටහා ගැනීමකි. හැම කෙනෙකුටම එකසේ සාධාරණය හිතසුව පැතීමේ මෘදුමොලොක් මානසිකත්වයක් මෙත්තා යන්නෙන් අදහස් කෙරෙයි.

මෛත්‍රිය පැතිරවිය යුතු ආකාරය කරණීය මෙත්ත සූත්‍රයේ මනාව පැහැදිලි කොට ඇත. "සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා" යනු මෛත්‍රිය වඩන පුද්ගලයාගේ ආකල්පයයි. "සියලු සත්වයෝ නිදුක් වෙත්වා" මෙබඳු හැඟීමක් මනසට නඟා ගත හැක්කේ තමන්ගේ හිත සුවයට තමා කැමති වන අයුරින්ම අනෙක් හැම කෙනකුගේම හිත සුවයට කැමැති වන හදවතක් ඇති කෙනකුට පමණි. මෙහිදී කිසිවකට හෝ කිසිවකුට බැඳීමක් නැත. කිසිවකුගෙන් යමක් ආපසු බලාපොරොත්තු වෙමින් කරන හිතසුව පැතීමක් මෙහිදී සිදු නොවේ. මෛත්‍රිය වඩන්නා තුළ ඇත්තේ අවංක අධ්‍යාසයකි. ඊර්ෂ්‍යාව, රෞද්‍ර බව ආදී දරුණු සිතිවිලි මෛත්‍රිය මගින් සිතෙන් ඉවත් වෙයි.

භාවනාය රතො: නිතර භාවනාවෙහි සිත අලවා විසීමයි. විමුක්තිය සාක්‍ෂාත් කර ගැනීම සඳහා භාවනාව අත්‍යවශ්‍ය අංගයකි. කෙතරම් පුණ්‍ය කටයුතුවල යෙදුනත් කෙනෙකුට සංසාර දුකෙන් ඉවත් විය නොහැකිය. සිතේ සමාධිය ඇති කර ගැනීමෙන් සංස්කාර වස්තූන්ගෙන් යථා තත්වය අවබෝධ කිරීමෙන් පමණක් විමුක්තිය අත්කර ගත හැකි වෙයි. සිතේ සමාධිය ඇති කර ගැනීම සඳහාත් යථාර්ථය දැකීමේ ප්‍රඥාව විශෝධනය කර ගැනීම සඳහාත් උපයෝගී වන ක්‍රියා මාර්ගය භාවනාවයි. සමථ භාවනාව හෝ විදර්ශනා භාවනාව යන ක්‍රම දෙකින්ම සිතේ එකඟ බව ඇති කරගෙන ඥාන දර්ශනය සඳහා සිත යොමු කර ගැනීමට හැකි වෙයි.



සසර නමැති දික් මඟට නො පැමිණිය යුතු. දුකින් ලුහුබඳනා ලද්දෙක් නො විය යුතුය.

302. දුප්පබ්බජ්ජං දුරභිරමං
දුරාවාසා ඝරා දුඛා
දුක්ඛොසමාන සංවාසො
දුක්ඛානුපතිතද්ධගූ
තස්මා න ච'ද්ධගූ සියා
න ච දුක්ඛානුපතිතො සියා (21:13)

පැවිදි බව ද එහි ඇල්ම ද අපහසුය
ගිහිගෙහි විසීම ද එලෙසම අපහසුය
විසුම ද නොගැලපෙන්නන් හා අපහසුය
සසර මග ගමනෙ යෙදුම ද අපහසුය
එබැවින් සසර ගමනෙහි නොයෙදී ඉන්න
තව දුර දුකට පත් වීමෙන් වළකින්න

නොගොසින් සසර ගමනේ - සුව ලැබ ගන්න නිවනේ

21 (6) වජ්ජිරට භික්ෂුවක් (302 ගාථාව)

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වසන සමයේ විශාලා මහ නුවරින් පැමිණ පැවිදි වූ **භික්ෂූන් වහන්සේ නමක්** අරභයා මේ ගාථා ධර්මය වදාළ සේක.

මේ භික්ෂූන් වහන්සේ වජ්ජි රටෙහි සත්දහස් සත්සිය සත් දෙනකු වූ රජ දරුවන් අතරෙහි සිට රජකම හැර පියා අවුත් පැවිදි වූ කෙනෙකි. වජ්ජි රට විශාලා මහ නුවර ඉල්මස පුන් පොහොය දිනයෙහි දී කාර්තික නම් වූ නැකැත් කෙළියක් පැවැත්වෙයි. මේ දිනයේ දී මුළු මහත් නගරයම උත්සව ශ්‍රීයෙන් බැබලෙයි.
හැම කෙනෙක්ම මා හැඟී වස්ත්‍රාභරණයෙන් සැරසී නැටුම් ගැයුම් වැයුම් පවත්වමින් ප්‍රීතියෙන් යුතුව උත්සවය පවත්වති. මුළු නගරයම පහන් වැටින් ආලෝකමත් වෙයි. ආරාමයෙහි සක්මන් මළුවෙහි සක්මන් කරමින් සිටි මෙම භික්ෂූන් වහන්සේට නගරශ්‍රිය දැක තමන් කෙරෙන් කිසියම් කළකිරීමක් ඇති විණ. තමන් තනිව දැඩි පාලු ගතියක සිටින බව උන්වහන්සේට හැඟිණ. තනි වූ පාලුගති සිත පුරා පැතිර ගිය බැවින් මෙසේ තමන් තමන්ටම කොඳුරා ගත්තේ ය. ''මා තරම් අසරණයෙක් තවත් මෙලොව නැතිව ඇති'' මෙය තමන්ටම කොඳුරා කීයා ගත් නමුත් මෙය එහි සිටි වෘක්ෂ දේවතාවකුට ඇසිණ. භික්ෂූන් වහන්සේ කළකිරීමෙන් පසුවන බව වටහාගත් දේවතාවා උන්වහන්සේ බුදුරජාණන් වහන්සේ වෙතට යැවීමේ උපායයක් වශයෙන් මෙසේ පැවසීය.

"නිරයෙහි සිටින්නනුත් දෙවියන්ට ප්‍රිය කරන්නාක් මෙන් වන සෙනසුන්හි තනිව සක්මනෙහි යෙදෙමින් සිටින ඔබ වහන්සේ වැනි භික්ෂූන් වහන්සේට බොහෝ දෙනෙක් ප්‍රිය කරති."

දේවතාවාගේ මේ වචන ඇසූ භික්ෂූන් වහන්සේ භික්ෂුත්වයෙහි අගය වටහා ගෙන තමා ගේ සිතුවිලි පිළිබඳව පසු තැවිලි වූහ. පසුදින උදෑසනම බුදුරජාණන් වහන්සේ හමුවට ගිය උන්වහන්සේ ඉහත කී සිද්ධිය සැල කළ හ. බුදුරජාණන් වහන්සේ ඊට පිළිතුරු වශයෙන් හැම කෙනකුගේම ජීවිතයෙහි ඇති දුෂ්කරතා පැහැදිලි කරමින් යථෝක්ත ගාථාව වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (302 ගාථාව)

දුප්පබ්බජ්ජං දුරභිරමං දුරාවාසා ඝරා දුඛා අසමාන සංවාසො දුක්ඛො අද්ධගූ දුක්ඛානුපතිතා තස්මා අද්ධගූ න ච සියා දුක්ඛානුපතිතො න ච සියා.

දුප්පබ්බජ්ජං: පැවිදි බව දුෂ්කරය; **දුරභිරමං**: (එහි) සිත් ඇලවීම ද දුෂ්කරය; **ඝරා**: ගෘහයෝ; **දුරාවාසා**: විසීම දුෂ්කර වූවෝ ය; **දුඛා**: දුක් සහිත වූවෝ ය; **අසමාන සංවාසො**: නො ගැලපෙන අය සමඟ එක්ව විසීම; **දුක්ඛො**: දුකකි; **අද්ධගූ**: සසර ගමනට එක්වූ පුද්ගලයා; **දුක්ඛානුපතිතා ච**: දුකින් ලුහුබඳනා ලද ද; **තස්මා**: එහෙයින්; **අද්ධගූ**: සසර මගෙහි යන්නෙක්; **න සියා**: නො වන්නේ ය; **දුක්ඛානුපතිතො ච**: දුකින් ලුහුබඳනා ලද්දෙක් ද; **න සියා**: නො වන්නේ ය.

පැවිදි බව දුෂ්කරය, එහි සිත එළවා විසීම ද දුෂ්කරය, ගිහි ගෙහි වාසය ද දුක් සහිතය, නො ගැලපෙන්නන් හා එක්ව විසීම ද දුෂ්කරය, සසර දිග මගෙහි යාම ද දුෂ්කර වූවකි, දුකට වැටීමකි. එබැවින් දුෂ්කර වූ සසර මගෙහි නොයමින් දුකට නොවැටී සිටින්න.

විවරණය

දුප්පබ්බජ්ජං: පැවිදි ජීවිතයක් ගෙවීම දුෂ්කර වූවකි. නිවන් මගෙහි වත් පිළිවෙත් පුරමින් කටුක ජීවිතයක් ගෙවීමට පැවිද්දට සුදුසු වෙයි. සුඛෝපභෝගී ආහාරපාන ඔහුට නොලැබෙයි. අනුන්ගෙන් ලැබෙන කවර ආහාරයකින් හෝ යැපීමට ඔහුට සිදු වෙයි. මට සිලුටු සුවපහසු දනවන ඇඳුම් පැළඳුම් පැවිද්දාට නැත. පාංශුකූල චීවරයෙන් සතුටු වීමට ඔහුට සිදු වෙයි. සුව පහසු නිවාස ඔහුට නැත. ආරණ්‍ය සේනාසන, වෘක්ෂමූල, කඳු, පර්වත, ගුහා ආදියෙහි හුදෙකලාව වෙසෙමින් දැඩි වෙහෙසකින් ධ්‍යාන භාවනාවන්හි යෙදෙමින් සිටීමට ඔහුට සිදු වෙයි. මෙබඳු කරුණු නිසා පැවිදි ජීවිතය දුෂ්කර වූවකි.

දුරාවාසා ඝරා: ගෘහ ජීවිත දුෂ්කර සහිතය යනු මෙහි අදහසයි. ගෘහ ජීවිතය බෙහෙවින් කරදර කම්කටොලු බහුල වූවකි. ගිහිගෙහි ජීවිතය ගෙන යාම සඳහා බෙහෙවින් දුක් මහන්සි විය යුතුය. තමන් ගේ මෙන්ම තමන් ගෙන් යැපෙන්නන් ගේ ද ජීවත් වීම සඳහා මහන්සියෙන් මුදල් ඉපයිය යුතුය. යුතුකම් හා ආගමික කටයුතු කෙරෙහි ද තත්පර විය යුතුය. මේ ආදී විවිධ කටයුතු නිසා ගෘහ ජීවිතයක් ගෙවීම පහසු වූවක් නොවේ.

අද්ධගූ: දිගු මග ගමන් කරන්නා යන්න අදහසයි. මෙහි අද්ධ යන්නෙහි අරුත වන්නේ සංසාරයයි. සසර බෙහෙවින් දිගු ගමනකි. සසරින් නිදහස් වීම සඳහා අවශ්‍ය පියවර නො ගන්නාට සසරේ සීමාවක් නැත. පුද්ගල ජීවිතය එක් භවයකට පමණක් සීමා නොවේ. අවිද්‍යා තෘෂ්ණා දෙකින් මෙහෙයවනු ලබන පුද්ගලයාගේ සසරෙහි මුල් කෙළවර දැකගත නොහැකි තරම් අසීමිතව දීර්ඝ වූවක් බව බුදු දහමින් කියැවෙයි.
එක් ජීවිත කාලයක් යනු එක් භවයකි. අවිද්‍යා තෘෂ්ණා දෙක පුද්ගල සන්තානයෙහි පවත්නා තාක් කල් පුද්ගල ජීවිතයෙහි භවගාමිත්වය සිදු වෙයි. බුදු දහම ඉදිරිපත් වන්නේ මේ භවගාමිත්වය සිඳ දමා සසර ගමන නිමා කර ගැනීම උදෙසා පුද්ගලයාට උපසේ දීමට ය. මධ්‍යම ප්‍රතිපදාව නොහොත් ආර්‍ය අෂ්ටාංගික මාර්ගය අනුව කටයුතු කිරීම සසර ගමන නිමා කිරීමේ ක්‍රියා මාර්ගයයි. සිතෙහි ඇති අවිද්‍යා තෘෂ්ණා මාන ආදී කෙලසුන් සිඳ දැමූ විට සසර ගමන නවතියි. නිරෝධය යනු සසර ගමනේ නැවැත්මය. ඉන් අනතුරුව පුද්ගලයාට සසර දුක අත් නොවෙයි.





සැදැහැ හා සිල් ඇති යසස් හා සම්පත් ඇති තැනැත්තා සැමතැනදී ම පුදනු ලැබේ.

303. සද්ධො සීලෙන සම්පන්නො
යසො භොග සමප්පිතො
යං යං පදෙසං භජති
තත්ථ තත්ථෙව පූජිතො (21:14)

සිල්වත් සැදැහැගුණ හදවත තුළ දියුණු
පොහොසත් බවද කිත් යසස ද එකතු වුණු
යම් කිසිවෙක් වේද හේ කොහි හෝ රැඳුණු
තැන තැන පුද ලබයි ගරු බුහුමන් පිරුණු

ගුණ යස ඇත්තෝ - ඔහුය ගරු බුහුමන් ලබන්නෝ

21 (7) චිත්ත ගෘහපතියා පිළිබඳ කථාව (303 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **මච්ඡිකාසණ්ඩ** නම් වූ නගර වැසි චිත්ත ගෘහපතියා අරභයා මෙම ගාථා ධර්මය වදාළ සේක.

චිත්ත තෙම සැරියුත් මාහිමියන් ගෙන් ධර්මය අසා අනාගාමී මාර්ග ඵල ලාභී වූ ආර්ය්‍ය පුද්ගලයෙකි. දිනක් චිත්ත ගෘහපතියා ගැල් පන්සියයක ආහාර ද්‍රව්‍ය හා වෙනත් පූජා භාණ්ඩ පුරවා ගෙන තුන්දහසක් වූ පිරිවර ජනයා ද සමඟ බුදුරජාණන් වහන්සේට උපස්ථාන සඳහා ජේතවනාරාමයට පැමිණීමට සිය නිවසින් පිටත් වූයේ ය. දිනපතා එක් යොදුනක් පමණ වූ මඟ ගෙවමින් මේ පිරිසට ජේතවනාරාමයට පැමිණීමට මසක් කල් ගත විය. ජේතවනාරාමයට පැමිණි චිත්ත ගෘහපතියා පිරිසද කැටුව ගොස් බුදුරජාණන් වහන්සේ හමුව වැඳුම් පිඳුම් පවත්වා ගෞරව දක්වා සිටියේ ය. චිත්ත සම්පූර්ණ මාසයක්ම කල් ජේතවනාරාමයේ වෙසෙමින් බුදුන් වහන්සේට දානමානාදියෙන් උපස්ථාන කළේ ය. චිත්ත පැමිණ බුදුන් වහන්සේට පුද සත්කාර කළ දිනයේ දීම අහසින් මල් වර්ෂාවක් පතිත විය. ඔහු මසක් කල් බුදුපාමොක් මහ සඟනට දන් දෙමින් තම පිරිසට ද සංග්‍රහ කරමින් සිටිය දී ඔහු ගේ හිස්වන ගැල්වලට යළි යළිත් බඩු භාණ්ඩ සැපයීම දෙවියන් විසින් කරනලදි. චිත්ත ගෘහපතියා ආපසු තම නිවස කරා යාමට සූදානම්ව තමා ගෙන ආ ඉතිරි සියලු භාණ්ඩ ගැල්වලින් ගෙන ජේතවනාරාමයේ ගබඩාවක තැන්පත් කළේ ය. ඔහු එසේ කළේ බුදු පාමොක් මහ සඟනගේ ප්‍රයෝජනය සඳහායි. චිත්ත ගේ හිස් වූ ගැල් මා හැඟි බඩු භාණ්ඩවලින් යළිත් දෙවියන් ගේ ආනුභාවයෙන් පිරී ගියේ ය. ආනන්ද හිමියෝ චිත්තගේ හිස් වුණු ගැල් යළිත් වටිනා භාණ්ඩයන්ගෙන් පිරීයනු බලා බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසූ හ.
"ස්වාමීනි, චිත්ත ඔබ වහන්සේට ගෞරව දැක්වීමට පැමිණි මේ ගමනේ දී පමණක් මෙසේ ඔහු ගේ භාණ්ඩ සමෘද්ධිය වූයේ ද නැත හොත් වෙනත් තැන් වලදීත් මෙසේ වේ ද?" "ආනන්ද, මෙම චිත්ත ගෘහපතියා ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් සමන්විත වූයෙකි. ඔහු ගේ පරිත්‍යාගශීලී ගුණය බොහෝ ය. ඔහු ගේ යශෝ කීර්තිය බොහෝ පෙදෙස්හි පැතිර ගියේ ය. එබඳු තැනැත්තෙක් යන යන තැන්වලදී අන්‍යයන් ගේ ගරු බුහුමනට බඳුන්වේ" යයි පැවසූ බුදුරජාණන් වහන්සේ යථෝක්ත ගාථා ධර්මය වදාළ සේක.

විවරණාත්මක අනුවාදය (303 ගාථාව)

සද්ධො සීලෙන සම්පන්නො යසො භොග සමප්පිතො
යං යං පදෙසං භජති තත්ථ තත්ථ එව පූජිතො

සද්ධො: ශ්‍රද්ධාවත්; **සීලෙන**: ශීලයෙන්; **සම්පන්නො**: යුක්ත වූ; **යසො**: කීර්තිය ඇති; **භොග සමප්පිතො**: භව භෝගයෙන් ආඪ්‍ය වූ (පුද්ගලයා); **යං යං පදෙසං**: යම් යම් ප්‍රදේශයක්; **භජති**: ඇසුරු කරයි ද; **තත්ථ තත්ථ එව**: ඒ ඒ තැන්හිදීම; **පූජිතො**: පුදන ලද්දේ වෙයි.

ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් යුතු කීර්තිය රාවය ඇති ධනවත් පුද්ගලයා යන යන තන්හි පුදනු ලබයි.

විවරණය

සද්ධා: බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය කෙරෙහි ඇති පැහැදීම සද්ධා නමින් හැඳින්වෙයි. විශේෂයෙන් කෙනකු බුදු දහමට අනුකූල ජීවන පිළිවෙතක යෙදෙන්නේන් බුදු දහමින් පෙන්වා දී ඇති විමුක්ති මාර්ගය අනුගමනය කරන්නෙන් ත්‍රිවිධ රත්නය විෂයෙහි පැහැදීම ඇති විට පමණි. බුදුන් දෙසූ ධර්මයෙහි සත්‍යතාව තමා ගේ මානසික ශක්තිය අනුව වටහා ගැනීමෙන් මෙම ශ්‍රද්ධාව ඇති වෙයි.

බුදු දහම විෂයෙහි ඇති කරගන්නා ශ්‍රද්ධාව යනු භක්තිය නොවෙයි. එය නිවැරදි චින්තනය මගින් මෙහෙයවනු ලැබීමෙන් ඇති වන්නකි. එබැවින් ශ්‍රද්ධාව '**සද්ධා දස්සනමූලිකා**' යනුවෙන් විශේෂණ කොට ඇත. බෞද්ධ ශ්‍රද්ධාව විවේචනයට හා විමර්ශනයට පටහැනි නොවේ. ශ්‍රද්ධාව ඇති කර ගත යුත්තේ ද විවේචනාත්මකව බුදු දහම විෂයෙහි පරීක්ෂණාක්ෂිය යොමු කිරීමෙනි. සොයා බලා විමසා යමක් පිළිගැනීමට බුදු දහම නිතරම අනුබල දෙයි. එසේ බුද්ධ චින්තනයේ ඇති තාර්කික බව කරුණු එකිනෙක ගැලපී මනා සංස්ථානිකත්වයකින් පවත්නා බව වටහා ගැනීම නිසාමය, ශ්‍රද්ධාව ඇති වනුයේ. එබැවින් එය යමක් නො විමසා කියන්නන් වාලේ පිළි ගැනීමට අනුබල දෙන අන්ධ භක්තියක් නොවේ. ශ්‍රද්ධා ඉන්ද්‍රිය මෙන්ම ප්‍රඥා ඉන්ද්‍රිය ද පුද්ගලයකු තුළ සම සමව පැවතිය යුතු වෙයි. අවබෝධය හා ප්‍රඥාව තුළින් කෙනකු ගේ ශ්‍රද්ධාව තහවුරු වීමට එය යථාර්ථයක් බවට පමුණුවා ගත යුතුය. සත්‍යානුභූතිය සමඟ ශ්‍රද්ධාව ප්‍රත්‍යක්ෂයක් බවට පත් වෙයි.

සියලු කුශල ධර්මයන් ගේ මූලය ශ්‍රද්ධාව යැයි ඇතැම් විට සඳහන් වෙයි. අතීත කථා විස්තර වලට අනුව දැඩි විශ්වාසයකින් සදාචාර මාර්ගය පිළිගැනීමට ශ්‍රද්ධාව තුළින් මනසට අනුබලයක් ලැබෙයි. එයින් මෙහෙයවනු ලැබ විමුක්තිගාමී මාර්ගයෙහි පුද්ගලයා නිරත වෙයි.

පුද්ගලයකු තුළ නොසෙල් විය හැකි සේ තෙරුවන විෂයෙහි අචල ප්‍රසාදය ඇති වන්නේ සෝවාන් මාර්ග ඵලයන්ට පැමිණීමෙනි. සංයෝජන ධර්මයන් අතුරෙහි වූ තෙරුවන පිළිබඳ සැකය හෙවත් විචිකිච්ඡා සංයෝජනය සෝවාන් මගින් උදුරා දැමෙයි. එබැවින් නිසැකව ස්ථිරව තෙරුවන පිළි ගැනෙන්නේ එවිටය.



සත්ගුණැතියේ දුර සිටියත් බුදු නුවණට පෙනෙත්. අසත් පුරිස්හු ළඟම සිටියත් නො පෙනෙත්.

304. දූරෙ සන්තො පකාසෙන්ති
හිමවන්තො'ව පබ්බතො
අසන්තෙත්ථ න දිස්සන්ති
රත්ති ඛිත්තා යථා සරා (21:15)

සොඳ දෙය තිබුණත් ඈතින්
එය බබළයි හිමවත සේ
ළඟ තිබුණත් පහත් දෙයක්
නොපෙනේ රැයෙ විදි හී සේ

යහ ගුණ දම් ලොවේ - බබළයි මුතු මැණික් සේ

21 (8) චූල සුභද්දා (304 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහනසේ අනේපිඩු සිටාණන් ගේ දියණියක වූ **චූල සුභද්දාවන්** අරභයා මේ ගාථා ධර්මය වදාළ සේක.

අනේපිඩු නමින් පසු කලෙක හැඳින්වුණු සුදත්ත සහ උග්ග නුවර ධනවත් වෙළෙන්දකුගේ පුත් වූ උග්ග තරුණ වියේ දී එකම ආචාර්යවරයකු යටතේ ශිල්ප ශාස්ත්‍ර හදාළ අයයි. උග්ග සිටාණන්ට පුත්‍රයකු සිටි අතර අනේපිඩු සිටාණන්ට දියණියක සිටියා ය. මේ දෙදෙනා වියපත් වූ විට විවාහ කරවීම උග්ග සිටාණන්ගේ අදහස් විය. එබැවින් මේ පිළිබඳව හෙතෙම අනේපිඩු සිටාණන්ගේ කැමැත්ත විමසීය. දෙපසේ පියවරුන් දෙදෙනාගේම කැමැත්ත යටතේ තරුණ යුවළගේ විවාහය සිදු විය.

විවාහයෙන් පසු චූල සුභද්දාවන්ට සිය මයිලණුවන් ගේ නිවසෙහි පදිංචි වීමට ද සිදු විය. උග්ග සහ ඔහු ගේ පවුලේ සාමාජිකයෝ අන්‍ය ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ දායකයෝ වූහ. බොහෝ විට ඔවුහු අන්‍ය ශ්‍රමණ බ්‍රාහ්මණයන් සිය නිවෙසට කැඳවා දානමානාදියෙන් ඔවුනට සංග්‍රහ කරති. මෙසේ නිරුවත් නිගණ්ඨ පිරිසක් දානය සඳහා මෙම නිවසට පැමිණි සිටි විටෙක චූල සුභද්දාවන්ට තම නැදිමයිලෝ නිගණ්ඨයන් වෙත ගොස් ගරු බුහුමන් දක්වන ලෙස දැන්වූහ. නමුත් චූල සුභද්දා නැදිමයිළන්ගේ මෙම ඉල්ලීමට එකඟ නොවූවාය. ඒ වෙනුවට ඇය කළේ තම නැන්දනියට බුදුරජාණන් වහන්සේගේ සහ භික්ෂූන් වහන්සේ ගේ ගුණ ප්‍රකාශ කර සිටීමයි.

බුදුන්වහන්සේ ගේ හා භික්ෂු සංඝයා ගේ ගුණ චූල සුභද්දා පවසද්දී නැන්දණියට බුදුරජාණන් වහන්සේ දැක ගැනීමේ ආශාවක් ඇති විය. මේ නිසා ඕ බුදුරජාණන් වහන්සේට තම නිවසට දානය සඳහා වැඩමවීමට ඇරයුම් කරන සේ චූලසුභද්දාවන්ට දැන්වූවාය. චූල සුභද්දා ආහාර මෙන්ම වෙනත් පූජා භාණ්ඩ ද බුදු පාමොක් මහ සඟන සඳහා සූදානම් කොට නිවසෙහි මතු මහලට නැගී ජේතවනාරාමය දෙසට මුහුණලා බුදුන් වහන්සේ වෙනුවෙන් මල් පහන් සුවඳ දුම් පූජා කොට බුදු ගුණ සමරමින් මෙබඳු පැතුමක් කළාය.

"ස්වාමීනි, බුදු රජාණන් වහන්ස, හෙට අපගේ නිවසට දානය සඳහා භික්ෂූන් ද කැටිව වඩිනු මැනවි, මේ සඳහා මම ඔබ වහන්සේට ඉතාමත්ම ගෞරවයෙන් ආරාධනා කරමි. මගේ ආරාධනය මේ සමන් මල් වලින් ඔබ වහන්සේට දැන ගැනීමට ලැබේවා" මෙසේ පැතූ චූලසුභද්දා තම අතෙහි වූ සමන් මල් මිටක් අහසට දැමුවාය. මෙම සමන් මල් සුළගේ පාවෙමින් ගොස් ජේතවනාරාමයෙහි බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කරමින් වැඩ සිටි ධර්ම සභාවේ වියනක් ලෙස එල්ලෙමින් අහසෙහිම නැවතිණ.

බුදුරජාණන් වහන්සේ ගේ ධර්ම දේශනයෙන් අනතුරුව අනේපිඩු සිටුතුමා හෙට දින තම නිවසෙහි දානයට වැඩම කරවන සේ උන්වහන්සේට ආරාධනය කළේ ය. තමන් දැනටමත් චූලසුභද්දාවනගේ ඇරයුම් පිළිගෙන ඇති බව බුදුරජාණන් වහන්සේ අනේපිඩු සිටාණන්ට දැන් වූ සේක. බුදුරජාණන් වහන්සේ ගේ පිළිතුරෙන් මවිතයට පත් සිටුතුමා "ස්වාමීනි, චූලසුභද්දා මෙහි නොමැත. ඇය සිටින්නේ සැවතෙහි සිට යොදුන් එකසිය විස්සක් දුර පිහිටි උග්ග නුවර ඇයගේ නැදිමයිලන් ලඟය"යි පැවසූ හ. "ඇත්තයි සිටුතුමනි, මම දනිමි. එහෙත් යහගුණය කෙතෙක් දුර පැවතුණත් එය ලඟ පවතින දෙයක් ලෙසම දැනගත හැකි වෙයි." බුදුරජාණන් වහන්සේ පිළිතුරු වශයෙන් පැවසු සේක.

දෙවැනි දිනයෙහි බුදුරජාණන් වහන්සේ උග්ග නුවර උග්ග සිටාණන්ගේ නිවසට භික්ෂු සංඝයාද පිරිවරා දානය සඳහා වැඩම කළ හ. උන්වහන්සේ මේ ගමන භික්ෂූන් ද සමඟ වැඩම කළේ අහසිනි. උන්වහන්සේට අහසින් වැඩම වීම සඳහා සක් දෙව්රජුගේ අණවුමෙන් දෙවියන් විසින් පුෂ්ප විමානයක් නිර්මාණය කරන ලදී. බුදුරජාණන් වහන්සේ සහ භික්ෂු පිරිස ශෝභාමත්ව අහසින් වැඩමවනු දුටු චූල සුභද්දාවන්ගේ නැදිමයිලෝ භක්තියෙන් පිණාගිය හ. බුදුන් වැඳ බුද්ධ ශ්‍රාවකයන් බවට පත් වූ ඔවුහු සත් දිනක් ම බුදු පාමොක් මහ සඟනට දාන මානාදියෙන් උපස්ථාන කළ හ.

විවරණාත්මක අනුවාදය (304 ගාථාව)

සන්තො දූරෙ හිමවන්තො පබ්බතො ඉව පකාසෙන්ති
අසන්තො එත්ථ රත්තිං ඛිත්තා සරා යථා න දිස්සන්ති

සන්තො: සත් පුරුෂයෝ; **දූරෙ**: ඉතා දුර සිටිය ද; **හිමවන්තො පබ්බතො ඉව**: හිමාලය පර්වතය මෙන්; **පකාසෙන්ති**: ප්‍රකට වෙති; **අසන්තො**: අයහපත් පුද්ගලයෝ; **එත්ථ**: මෙහි සිටිය ද; **රත්තිං ඛිත්තා**: රාත්‍රියෙහි විදින ලද; **සරා යථා**: හීතල මෙන්; **න දිස්සන්ති**: අප්‍රකට වෙත්.

යහපත් පුද්ගලයෝ ඉතා ඈතක සිටියත් හිමාලය පර්වතය මෙන් ඉතා පැහැදිලි සේ දක්නා ලැබෙති. එහෙත් අසත් පුරුෂයෝ ලඟ හිටිය ද රාත්‍රියෙහි විදින ලද හීතල මෙන් අප්‍රකට වෙති.

විවරණය

සන්තො: සත් පුරුෂයෝ, **අසන්තො**: අසත් පුරුෂයෝ ගුණ දහමින් යුක්ත පුද්ගලයා සත් පුරුෂයකු යහපත් පුද්ගලයකු කොට සැලකෙයි. එබඳු පුද්ගලයා බෙහෙවින් ප්‍රකටව අන් පුද්ගලයන් අතුරෙහි කැපී පෙනෙයි. එහෙත් අසත් පුරුෂයා කිසිවකු ගේ සැලකිල්ලට බඳුන් වන්නේ නැත. එහෙයින් සත්පුරුෂයකු ඉදිරියෙහි අසත් පුරුෂයකු ගේ පැවැත්ම හිරු ඉදිරියෙහි කණාමැදිරියකු ගේ පැවැත්ම වැන්න.



භාවනාවෙන් තමා දමනය කරන තැනැත්තා තනිව හිඳීම, සයනය කිරීම, නො මැලිව, හැසිරීම කෙරේ.

305. ඒකාසනං ඒකසෙය්‍යං
එකො චරමතන්දිතො
එකො දමයමත්තානං
වනන්තෙ රමිතො සියා (21:16)

තනි අසුනැතිව තනි යහනෙහි නිදි ඇතිව
අනලස බවින් හැසිරෙන සැමවිට තනිව
තනවම තමා දමනය කරමින් නිසිව
තනිවම සිටී අරණෙහි බැඳි සිත ඇතිව

සිත දමනයෙහි තම - එකළා දිවියමයි සොඳ

21 (9) අරණ වැසි තෙර කෙනෙක් (305 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ අන් අයගේ ඇසුරෙන් තොරව **හුදෙකළාව වසන භික්‍ෂූන් වහන්සේ නමක්** අරභයා මේ ගාථාව වදාළ සේක. මුන්වහන්සේ අනෙක් භික්‍ෂූන් සමඟ ඇසුරකින් තොරව තනිවම සිටින නිසා ඒකවිහාරී යන නමින් ප්‍රසිද්ධ වූහ.

හුදෙකළාව හිඳිමින් හුදෙකලාවම හැසිරෙමින් බෙහෙවින් නිශ්ශබ්ද ජීවිතයක් ගත කළ ඒකවිහාරී තෙරුන් වහන්සේ ගේ මෙම පැවැත්ම අනෙක් භික්‍ෂූන් වහන්සේලා ගේ සිත් නොගත්තේ ය. එබැවින් එම භික්‍ෂූහු බුදුරජාණන් වහන්සේට ඒකවිහාරී භික්‍ෂුවගේ හුදෙකළා පැවැත්ම පිළිබඳව සැළකර සිටිය හ. එවිට බුදුරජාණන් වහන්සේ එකවිහාරී භික්‍ෂුව පසසමින් මෙසේ වදාළ හ. "මහණෙනි, නියම බුද්ධ පුත්‍රයකු වූ එකවිහාරී තනිවම හැසිරෙමින් එකළා ජීවිතයක් ගෙවන බව සැබවි. ඒක විහාරී භික්‍ෂුවගේ ඒ පැවැත්ම අනෙක් භික්‍ෂූන්ට ද ආදර්ශයකි. නියම භික්‍ෂුව හුදෙකලාව වෙසෙමින් තමාගේ විමුක්තිය සඳහා ක්‍රියා කරන්නේ ය."

විවරණාත්මක අනුවාදය (305 ගාථාව)

එකො අත්තානං දමයං එකාසනං එකසෙය්‍යං
අතන්ද්‍රිතො එකො චරං වනන්තෙ රමිතො සියා

එකො: හුදෙකළාව; **අත්තානං**: තමා; **දමයං**: හික්මවා ගනිමින්; **එකාසනං**: තනිව හිඳිමින්; **එකසෙය්‍යං**: තනිව නිදමින්; **අතන්ද්‍රිතො එකො චරං**: හුදෙකළාව හැසිරෙමින්; **වනන්තෙ**: අරණ්‍යයෙහි; **රමිතො**: සිත් ඇලවූයේ; **සියා**: වන්නේ ය.

තනිව හිඳිමින්, තනිව නිදමින් අනලසව තනිව හැසිරෙමින්, තනිව තමා දමනය කරගනිමින් වනයෙහි (අරණ්‍යවාසයෙහි) සිත අලවා වසන්නේ මැනවි.

විවරණය

එකො අත්තානං දමයං: භික්‍ෂු පැවැත්මෙහි මූලික අංගයක් වනුයේ තමා දමනය කර ගැනීමයි. ආත්මදමනය ස්වකීය උත්සාහයෙන්ම කර ගත යුත්තකි. භික්‍ෂු ශීලය පිළිබඳව කියවෙන සූත්‍ර රාශියකට ආත්ම දමනයෙහි ලා වැදගත් වන ශීල කොට්ඨාශ වශයෙන් ප්‍රාතිමොක්‍ෂ සංවර ශීලය සහ ඉන්ද්‍රිය සංවර ශීලය දක්වා තිබේ. ගණ සංඝනිකාවෙහි වාසය කිරීමට වඩා හුදෙකළාව වාසය කිරීමෙන් මෙම ද්වි විධ ශීලයම ආරක්‍ෂා කිරීම පහසුය.

වනන්තෙ රමිතො: විමුක්තිගාමී මාර්ගයෙහි නිරත වන භික්‍ෂුව තමා ගේ භාවනා කටයුතු සඳහා තෝරා ගන්නේ ආරණ්‍ය සේනාසන, වෘක්‍ෂමූල, පර්වත, ගිරිගුහා, වැනි ජනශූන්‍ය ස්ථානයි. එබඳු තැන් භාවනාවට හිතකර තැන් ලෙස දැක්වී ඇත. භාවනා කිරීම මගින් කළ යුතු වන්නේ සිත එකඟ කර ගැනීමයි. විවිධ අරමුණු ඔස්සේ දිවයන සිත එක අරමුණකට ගැනීම සඳහා නිහඬ, නිසසල පරිසරය බෙහෙවින්ම උපකාරී වෙයි. නිහඬ පරිසරයක දී මනසට අරමුණු ගලා ගෙන එන්නේ මද වශයෙනි. බොහෝ කොට මනසට අරමුණු ඇතුළුවන්නේ ඇස, කන යන ඉන්ද්‍රිය දෙක මාධ්‍යයෙනි. වනවාසයේ දී ඇස, කණ දෙකට ගොදුරු වන අරමුණු විරලය. එබැවින් භාවනාව වැඩීම සඳහා ආරණ්‍ය වැනි නිසසල ස්ථාන උපයෝගී කර ගන්නා ලෙස බුදුරජාණන් වහන්සේ විසින් භික්‍ෂූන්ට උපදෙස් දී ඇත.

අතන්ද්‍රිතො: තන්ද්‍රි යනු උදාසීන, අලස බවයි. අතන්ද්‍රි යනු අනලස බවයි. භාවනාව සඳහා භික්‍ෂුව නිබඳවම අනලස බවින් සිටිය යුතුය. ආර්‍ය්‍ය මාර්ගයෙහි සම්මා වායම යන්නෙන් අදහස් වන්නේ මෙම අනලස භාවයයි. අලස බව මානසික සමාධියට බාධා කෙරෙන නීවරණ ධර්මයන් අතුරෙන් එකකි. ථීන මිද්ධ යන නම යටතේ පැහැදිලි කෙරෙන්නේ කායික මෙන්ම මානසික අලස බවයි. මෙම අලස බව සිතෙන් දුරු කර නොගන්නට සිත අරමුණට නගා ගැනීම අපහසු වෙයි. එබැවින් උද්‍යෝගශීලි භාවයෙන් යුතු සම්‍යක් ව්‍යායාමය විමුක්ති සාධනය සඳහා අත්‍යවශ්‍ය අංගයක් ලෙස දැක්වී ඇත.



පාපය පිළිබඳ බෞද්ධ ආකල්පය

බුදු සමයෙහි පාපය පිළිබඳ ආකල්ප ක්‍රිස්තියානි ආකල්පයට
වඩා තරමක් වෙනස්ය. බෞද්ධයාට පාපය වනාහි හුදු මෝඩකමක්
නොහොත් මුළාවකි. පාපී මිනිසා මෝඩයෙකි, අඥානයෙකි.
ඔහුට අවශ්‍ය වන්නේ දඬුවම හෝ හෙළා දැකීම නොව උපදේශයයි.
හෙතෙම දේව නියෝගවලට පටහැනි වූවකු හෝ
දිව්‍යමය අනුකම්පාව සහ සමාව අයැදිය යුත්තකු නොවේ.
පාපය පිළිබඳව දැනුවත් කිරීමට ඔහු ගේ මිතුරන් ගේ මග පෙන්වීම
ඔහුට අවශ්‍යය. යාඥාමය උත්සාහයකින් දෙවියන් සමඟ
කේවල් කිරීමකින් පාපයට ලැබිය යුතු ඵල විපාක වලින් නිදහස් වීමට
පාපියාට හැකි වේ යයි බෞද්ධයා නොපිළි ගනියි.

ජෝන් වෝල්ටර්ස් - ''නොසැලෙන මනස''

22 වන පරිච්ඡේදය

නිරය වග්ග

බොරු කියන තැනැත්තා ද, පවුකොට නො කෙළෙමි යි කියන තැනැත්තා ද අපාය දුකට පැමිණේ.

306. අභූතවාදී නිරයං උපෙති
යො'චාපි කත්වා න කරොමී'ති චාහ
උභො'පි තෙ පෙච්ච සමා භවන්ති
නිහීනකම්මා මනුජා පරත්ථ (22:1)

ඇති නතු වසන්නාහට හිමි නිරයමය
කළ දෙය වළහලන්නාට ද එසේමය
දෙදෙනාගේ ම එම කටයුතු නිහීනය
පරලොව ගිය විට දි එබැවින් සමානය

මුසා බස නිසා - සැලසෙයි දුක අපා

22 (1) සුන්දරී පිරිවැජිය (306 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩවසන භාග්‍යවතුන් වහන්සේ **සුන්දරී** නම් පරිබ්‍රාජිකාව අරභයා මේ ගාථාව වදාළ සේක.

බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රෙෂ්ඨ ගුණ ධර්මත් උන්වහන්සේගේ ධර්ම දේශනාත් නිසා එතෙක් අන්‍ය ශ්‍රමණයන් කරා ගිය ශ්‍රාවක පිරිස් බුදු සසුනෙහි පැහැදීම එම ශ්‍රමණයන්ගේ බලවත් කළකිරීමට හේතුවක් විය. එබැවින් ඔවුහු බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඊර්ෂ්‍යා කරන්නට වූහ. බුදුරජාණන් වහන්සේ ගේ කීර්තියට අපහාස වන අයුරින් යමක් නොකළහොත් තත්වය තවත් නරක අතට යා හැකි බව ඔවුහු සිතූහ. සුන්දරී නම් වූ තරුණ රූමත් පිරිවැජිය මගින් බුදුන් වහන්සේට අපහාසයක් කිරීමට සිතා ගත් ඔවුහු සුන්දරිය කැඳවා මෙසේ උපදෙස් දුන් හ. "සුන්දරී, ඔබ මනා රුවැති තරුණ කතකි. ඔබ මගින් ශ්‍රමණ භවත් ගෞතමයන්ට අපහාසයක් ඇති කරවීමට අපට අවශ්‍යය. ඔබ කළ යුත්තේ මෙයයි. සෑම දිනකම සන්ධ්‍යාවෙහි දෙව්රම් වෙහෙර සිට යන අයට පෙනෙන සේ දෙව්රම පැත්තේ හැසිරෙන්න. උදෑසන ද දෙව්රම වෙහෙර දෙසට එන අයට පෙනෙන සේ දෙව්රම පැත්තේ සිට ආපසු එන්න. එසේ කිරීමෙන් ඔබ ශ්‍රමණ ගෞතමයන් සමග රැය ගෙවන බව ඔවුනට අඟවන්න. ඔබ මෙසේ කළ හොත් ශ්‍රමණ ගෞතමයන් ජනතාවගේ අප්‍රසාදයට පත් වනු ඇත. එවිට අපේ ලාභ ප්‍රයෝජන වැඩි වනු ඇත."

මේ ශ්‍රමණ පරිබ්‍රාජකයන් තමන්ගෙන් බලාපොරොත්තු වන්නේ කුමක්දැයි සුන්දරී තේරුම් ගත්තාය. දැන් ඇය සන්ධ්‍යාව ඉකුත්වීගෙන යද්දී දෙව්රම දෙසට යන්නීය. කොහි යන්නීදැයි යමකු ඇසුවහොත් "මම ශ්‍රමණ ගෞතමයන් හමුවීමට යමි. ශ්‍රමණ ගෞතමයන් සමග ගඳ කිළියෙහි රැය ගත කරමි" යි ඇය පිළිතුරු දෙන්නීය. පසුව ඇය අන් අයට නොපෙනෙන සේ පරිබ්‍රාජකයන් වෙතට යන්නීය. පසුදා උදෑසන පරිබ්‍රාජක අසපුවේ සිට ජේතවනය දෙසට පැමිණ දෙව්රම් වෙහෙරෙහි සිට ආපසු එන්නියක බව අඟවා තමා කැමති තැනකට යන්නීය. කෙනකු කොහි සිට එන්නෙහිදැයි ඇසුවහොත් "ඊයේ රැය දෙව්රම් වෙහෙර ගඳ කිළියෙහි ශ්‍රමණභවත් ගෞතමයන් සමග වැස ආපසු එමි"යි පවසන්නීය. සුන්දරී මේ අයුරින් පිළිවෙළින් දින තුනක් හැසුරුණාය. සිවු වැනි දිනයෙහි පරිබ්‍රාජිකයෝ කුලියට ගත් බේබද්දන් ලවා සුන්දරිය රහසේ මරවා ජේතවනාරාමය අසළ කුණු ගොඩකට ඇයගේ මළ මිනිය දැම්ම වූහ. දෙවැනි දිනයෙහි පරිබ්‍රාජකයෝ සුන්දරී පිරිවැජියගේ අතුරුදහන්වීම පිළිබඳ පුවත දසත පතුරුවා හළහ. ඔවුහු බිම්බිසාර රජුගේ මාළිගයට ගොස් තමන් ගේ සැකය රජුට පළ කළහ. රජතුමා මේ සිද්ධියෙහි ඇතිතතු සොයා බැලීමට ඔවුනට තම අනුමැතිය දුන්නේය. පරිබ්‍රාජිකයෝ දෙව්රම අසළ කුණුගොඩෙහි තිබූ මළ මිනිය රැගෙන බිම්බිසාර රජ මාළිගයට ගියහ. "රජතුමනි, ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවක භික්ෂූන් සුන්දරී මරා තම ශාස්තෘවරයාට සිදුවන කැලල වැසීමට මළ සිරුර ජේතවනය අසළ කුණුගොඩක දමා තිබිණැ"යි ඔවුහු රජතුමාට සැළ කළහ. "එසේ නම් ඔබ වහන්සේලා නගරයෙහි සැරිසරමින් මේ පුවත නගර වැසියන් අතර සැළ කරනු මැනවි" යි රජතුමා ඔවුනට පැවසීය. පිරිවැජියෝ ද බෙහෙවින් සතුටුව නගරය වටා ගොස් "බලව, ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයන්ගේ වැඩක හැටි. තම ශාස්තෘවරයා අපහාසයෙන් බේරා ගැනීමට සුන්දරී මරා සඟවා තිබිණැ"යි මහජනයාට දැනුම් දුන්හ. දෙව්රම් වෙහෙරෙහි සිටි භික්ෂූන් වහන්සේලා පිරිවැජියන්ගේ මේ ක්‍රියාව බුදුරජාණන් වහන්සේට දැනුම් දුන්හ. එහෙත් උන්වහන්සේ භික්ෂූන්ට නොකැළඹී සිටින්නැයි උපදෙස් දෙමින් පූර්වෝක්ත ගාථාව වදාළ සේක. බිම්බිසාර රජතුමා මේ සිද්ධිය මෙපමණකින් අවසන් නොකළේය. හෙතෙම තම රාජ සේවකයන්ට සුන්දරී ඝාතනය පිළිබඳ නිවැරදි තොරතුරු සොයා බැලීමට නියෝග කළේ ය. රාජ පුරුෂයන් කළ පරීක්ෂණයෙන් හෙළි වූයේ පරිබ්‍රාජකයන් බේබදු මිනීමරුවන් කුලියට ගෙන සුන්දරී මරවා සඟවා දැමූ බවයි. රාජපුරුෂයෝ මිනීමරුවන් රජතුමා හමුවට පැමිණ වූහ. ඔවුන්ගෙන් ප්‍රශ්න කළ විට ඔවුහු ඇතිතතු සියල්ල හෙළි කළහ. අනතුරුව රජතුමා පරිබ්‍රාජකයන් කැඳවා ඔවුන්ගෙන් නැවත කරුණු විමසීය. අන්තිමේදී ඔවුහු රජු ඉදිරියේ පාපෝච්චාරණය කළහ. තමන් කළ මෙම වරද මහජනයා ඉදිරියේ හෙළි කරමින් පාපෝච්චාරණය කරන්නැයි රජතෙමේ පරිබ්‍රාජකයන් යළි නගරය වටා යැවී ය. ඔවුහු නගරයෙහි හැසිරෙමින් "අපි ශ්‍රමණභවත් ගෞතමයන්ට නිරපරාධයේ චෝදනා කෙළෙමු. සුන්දරී මැරුවෝ අපිම වෙමු. ශ්‍රමණ භවත් ගෞතමයන්ට අපහාස ඇති කරන අදහසින් අපි මෙසේ කෙළෙමු" යි පැවසූහ. මෙයින් පසු බුදුරජාණන් වහන්සේගේ කීර්ති රාවය වඩ වඩාත් පැතිරෙන්නට විය.

විස්තරාත්මක විවරණය (306 ගාථාව)

අභූතවාදී අපි ච යො කත්වා න කරොමි ඉති ආහ ච නිරයං උපෙති නිහීනකම්මා තෙ උභො මනුජා අපි පෙච්ච පරත්ථ සමා භවන්ති

අභූතවාදී අපි ච: අසත්‍ය පවසන්නා ද; **යො**: යමෙක්; **කත්වා**: (පව්කම්) කොට; **න කරොමි ඉති**: එය නොකළෙමැයි; **ආහ ච**: කියන්නේ ද (හෙතෙමේ ද); **නිරයං**: අපායට; **උපෙති**: යයි; **නිහීනකම්මා**: පහත් කටයුතු ඇති; **තෙ උභො මනුජා අපි**: ඒ මිනිස්සු දෙදෙනාම; **පෙච්ච**: මිය ගොස්; **පරත්ථ**: පරලොවදී; **සමා භවන්ති**: සමාන වෙති.

අසත්‍යයක් ප්‍රකාශ කරන්නා ද, යමක් කොට එය නොකළෙමියි බොරු කියන්නා ද, යන දෙදෙනාම නිරයට යති. පහත් ක්‍රියා ඇති මේ දෙදෙනාම මියයාමෙන් පසු පරලොවදී සමාන වෙති.

කසාවත ගෙල ලා ගත් සංයමයක් නැති අය සිය පවුකම් බෙලෙන් නරකයෙහි උපදිත්.

307. කාසාවකණ්ඨා බහවො
පාපධම්මා අසඤ්ඤතා
පාපා පාපෙහි කම්මෙහි
නිරයං තෙ උපපජ්ජරෙ (22:2)

පව්ටු කම් ඇතිව සිත නොදැමුණු ගතියෙන්
ගෙලෙහි කහනුල දරනහු ඇත වැඩියෙන්
පව්ටෝ තමන්ගේ පවුකම් නියායෙන්
ගැලවී නොහෙති පරලොවදී අපායෙන්

පවුකම් කරන්නෝ - වෙති නිරයටම යන්නෝ

22 (2) තම පවින් අපා දුක් විඳි පිරිසක් (307 ගාථාව)

දෙව්රම් වෙහෙරෙහි වැඩවසන භාග්‍යවතුන් වහන්සේ ප්‍රේතයින් පිරිසක් අරභයා මේ ගාථාව වදාළ සේක.

වරක් මහා මොග්ගල්ලාන තෙරණුවෝ ලක්ඛණ තෙරණුවන් ද සමඟ ගිජ්ඣකූළු පව්වෙහි සිට ආපසු වඩිනා අතරමග දී ඇටසැකිලි වශයෙන් ජීවත් වන ප්‍රේත සමූහයක් දුටහ. අතර මගදී ලක්ඛණ තෙරුන්ට මේ පිළිබඳව කිසිවක් ප්‍රකාශ නොකළ මුගලන් තෙරණුවෝ බුදුරජාණන් වහන්සේ ඉදිරිපිටදී තමන් ප්‍රේත සමූහයක් දුටු බව හෙළි කළහ. මේ ප්‍රේතයන් අතර බොහෝ දෙනෙකු හුදු ඇටසැකිල්ලෙන් පමණක් ජීවත් වන බවත්, ඒ හැර භික්ෂූන් පස් නමක් ගින්නෙන් පිළිස්සෙමින් සිටි බවත් උන්වහන්සේ තවදුරටත් පැවසූහ. මෙය ඇසූ භාග්‍යවතුන් වහන්සේ, "මොග්ගල්ලාන, මේ භික්ෂූන් පස් දෙනා කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි බොහෝ පව්කම් කළෝය. ඒ පාප කර්මයන්ගේ විපාක වශයෙන් ඔවුහු බොහෝ කලක් අපාදුක් වින්දහ. දැන් ප්‍රේතයන් ලෙස ඉපිද තවත් ඉතිරිව ඇති පාපකර්ම විපාක විඳිති"යි වදාළ සේක.

විස්තරාත්මක විවරණය (307 ගාථාව)

කාසාවකණ්ඨා පාපධම්මා අසඤ්ඤතා බහවො තෙ
පාපා පාපෙහි කම්මෙහි නිරයං උපපජ්ජරෙ

කාසාවකණ්ඨා: සිවුරුකඩක් ගෙලෙහි ඇති,
පාපධම්මා: පවිටු දම් ඇති, **අසඤ්ඤතා**: නොදැමුණු අය, **බහවො**: බොහෝ ය, **පාපා**: පවිටු වූ,
තෙ: ඔවුහු, **පාපෙහි කම්මෙහි**: පාප කර්මයන් ගෙන්,
නිරයං: අපායේ, **උපපජ්ජරෙ**: උපදිති.

කසාවත් කඩක් ගෙලෙහි දරා පවුකම් කරමින් නොදැමුණු ගතියෙන් හැසිරෙන්නාහු බොහෝ ය. ඔවුහු තමන්ගේ පාපකර්මයන් හේතු කොට ගෙන අපායෙහි උපදිති.

විවරණය

මෙම කථාවෙහි සඳහන් වන ලක්ඛණ තෙරණුවෝ මොග්ගලාන තෙරුන් වහන්සේගේ සද්ධිවිහාරිකයකු වන අතර පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ සසුනේදී බෝහෝ පින්කම් කරමින් කුශල ධර්ම සම්පූර්ණ කළ කෙනෙකි. මෙතෙම ගෞතම බුදුරදුන්ගේ සමයෙහි බ්‍රාහ්මණ කුලයක ඉපද තුරුණු වියට පත්ව උරුවේල, ගයා සහ නදී යනුවෙන් ප්‍රකටව සිටි කාශ්‍යප සහෝදරවරුන් යටතේ පිරිවැජිදම් පුරමින් සිටියේය. පසුව කාශ්‍යප සහෝදර පිරිවැජිවරුන් බුදු සමය වැළඳ ගත් පසු මෙතෙමේ ද බුදුසසුනෙහි පැවිදි බවට පත්වී ලක්ඛණ තෙරණුවන් නමින් ප්‍රසිද්ධ විය. මොග්ගල්ලාන තෙරණුවෝත් ලක්ඛණ තෙරණුවොත් සද්ධිවිහාරිකයෝ ය. මේ දෙදෙනා ගිජ්ඣකූළු පව්වේ සිට ආපසු එමින් සිටිය දී මුගලන් හිමියනට ප්‍රේත පිරිස දක්නට ලැබුණේය.

මෙම ප්‍රේතයන්ගෙන් එකෙක් කවුඩෙකුගේ ආකාරය ඇත්තෙකි. ඔහු කටින් ගිනි දැල් පිටකරමින් සිටියේය. මුගලන් හිමියන් විසින් විමසන ලදුව ඔහු කියා සිටියේ කාශ්‍යප බුදුන් වහන්සේගේ සමයෙහි තමා කුරුල්ලෙකුව ඉපිද මිනිසුන් භික්ෂූන් වහන්සේලාට දන් පිරිනමනු දැක ඒ අහරින් කටවල් තුනක් සොරා කෑ බවය. ඔහු මෙසේ ප්‍රේතයකුව ඉපිද ඇත්තේ එම පාපකර්මයේ විපාක වශයෙනි.

වෙනත් අවස්ථාවකදී ද මේ තෙරුන් දෙදෙනා වහන්සේම ගිජ්ඣකූළු පව්වේ සිට එන අතර මගදී මුගලන් හිමියන්ට වෙනත් ආකාරයේ ප්‍රේතයකු ද දක්නට ලැබිණ. ඒ ගිනිගෙන දැවෙන දිගු සිරුරක් ඇති සජීයකු බඳු ප්‍රේතයෙකි. මෙම ප්‍රේතයාට මිනිසකුගේ වැනි මුහුණක් පැවති අතර ඔහුගේ කට ඌරකුගේ වැනි විය. මේ ප්‍රේතයා දුටු මුගලන් තෙරුන් වහන්සේගේ මුවින් සිනහවක් පහළ විය. මුගලන් තෙරණුවන් සිනහසීමට කාරණය ලක්ඛණ හිමියන් විමසූ නමුත් එවේලෙහි එය හෙළි නොකළ මුගලන් හිමියෝ ලක්ඛණ හිමියන් ද සමඟ බුදුන්වහන්සේ හමුවී එහිදී එය හෙළි කළහ. තමන් එම ප්‍රේතයා ගැන සානුකම්පිත වූ බවත් තමාට කිසි කලෙක එවන් තත්වයකට පත් වීමට සිදු නොවන බව දැන සිනහවක් පහළ වූ බවක් පළ කර සිටියහ.

කාසාවකණ්ඨා: බුදු සසුන පිරිහීමේදී භික්ෂූහු ද සිල් ගුණ දහමින් පිරිහෙති. තමන්ගේ භික්ෂුභාවය ඔවුන් පළ කරන්නේ කහරෙදි පටියක් ගෙලෙහි ගැට ගසා ගැනීමෙනි. එසේ භික්ෂු බව පළ කරමින් අනුන්ගෙන් යැපෙන ඔවුහු අඹුදරුවන් රකිමින් ගිහි ජීවිතයක්ම ගත කරති. මෙබඳු කහ රෙදි කඩකින් භික්ෂු වේශය ප්‍රකාශ කරන පිරිස හැඳින්වෙන්නේ කාසාවකණ්ඨක නමිනි.

දුසිල් තැනැත්තා රට වැසියා පුදන අහර වැළඳීමට වඩා ගිනිසිලක් වැනි වූ ලෝ ගුලියක් ගිලීම මැනවි.

308. සෙය්‍යො අයොගුළො භුත්තො
තත්තො අග්ගිසිඛූපමො
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො
රට්ඨපිණ්ඩං අසඤ්ඤතො (22:3)

දුසිල්වත්ව නොදැමුණු කම් ඇතිව හිඳ
අහරින් යැපේ නම් අන් අය වෙතින් ලද
ගිනිසිළ බඳුව රත් වු ගිනි රැසින් තද
යවටක් ගිලින එක නොම වෙද වැඩිය සොඳ

දුසිල්වත්ව ලබන බතින් - තමාම වැනසේය නිතින්

22 (3) වග්ගුමුදා ගං තෙර විසූ භික්ෂු පිරිසක් (308 ගාථාව)

විශාලා මහනුවර මහා වනයෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ වග්ගුමුදා ගංතෙර වැසිසමය ගත කළ **එක්තරා භික්ෂු පිරිසක්** අරභයා මේ ගාථාව වදාළ සේක.

මෙය විශාලා මහනුවර දුර්භික්ෂයක් පැවති යුගයකි. මේ නිසා මෙම භික්ෂූන් වහන්සේලාට යැපීමට ආහාර හිඟ විය. ප්‍රමාණවත් සේ ආහාර ලබා ගැනීමේ උපායක් ගැන සිතූ මේ භික්ෂූන් වහන්සේලා ඒ ප්‍රදේශයෙහි වැසි මිනිසුන් වෙතට ගොස් තමන් ලඟ මාර්ගඵලාදිය නැතත් තමන් මාර්ගඵලයන් ලබාගෙන ඇති බව ඇඟවූහ. මේ ඇඟවීම නිසා "මේ භික්ෂූන් වහන්සේලා මාර්ගඵලලාභී ආර්‍ය පුද්ගලයෝය"යි විශ්වාස කළ මිනිස්සු තමන්ට යැපීමට ඇති අහර පවා මෙම භික්ෂූන්ගේ යැපීම සඳහා පරිත්‍යාග කළහ.

වැසි සමයෙන් පසු වස් පවාරණය කොට සියලු පෙදෙස්වල භික්ෂූන්වහන්සේලා බුදුන් වහන්සේ වෙත පැමිණීම සිරිතය. වග්ගුමුදා ගං තීරයෙහි වස් විසූ භික්ෂූහු ද බුදුන්වහන්සේ දැකීමට පැමිණියහ. අනෙක් භික්ෂූන්ට වඩා මෙම භික්ෂූහු මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්තව සිටියහ. අනෙක් භික්ෂූන්ට ආහාර ප්‍රමාණවත්ව නොලැබීම නිසා උන්වහන්සේලා දුර්වලව සිටියහ. බුදුරජාණන් වහන්සේ එහි සිටි සියළු භික්ෂූන් වහන්සේලාගෙන් වස් සමය ගත කළ ආකාරය ගැන විමසූ සේක. විශේෂයෙන් වග්ගුමුදා තීරයෙන් පැමිණි භික්ෂූන්ගෙන් ආහාර පානාදිය අපහසුවක් නොමැතිව ලැබුණිදැයි ඇසූ සේක. ඔවුන්ගේ පිළිතුරු වූයේ තමන්ට කිසිසේත් ආහාර පානාදියෙන් දුෂ්කරතාවක් නොවූ බවයි.

මෙම භික්ෂූන් අපහසුවකින් තොරව ආහාර ලබා ගත්තේ කෙසේදැයි බුදුරජාණන් වහන්සේ දැන සිටියහ. එහෙත් ඔවුනට මේ කරුණ සම්බන්ධයෙන් අවවාද කළ යුතු බැවින්, "ඔබලා වැසි සමය පුරා අපහසුවකින් තොරව ආහාර පාන ලබාගත්තේ කෙසේද"යි ඇසූ සේක. එවිට එම භික්ෂූහු "අපි මාර්ගඵල ධ්‍යානාදිය ලබා ගත් පිරිසක් බව මිනිසුනට අඟවා ආහාර පානාදිය ලබා ගත්තෙමු"යි පැවසූහ. "එසේ නම් ඔබලා මාර්ගඵලාදිය ලබාගෙන ඇත්තහුදැ"යි බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න කළ සේක. එසේ නොමැති බව භික්ෂූන්ගේ පිළිතුරු විය. එම භික්ෂූන් දෝෂ දර්ශනයට ලක් කළ භාග්‍යවතුන් වහන්සේ මෙම ගාථා ධර්මය වදාළ සේක.

විස්තරාත්මක විවරණය (308 ගාථාව)

අසඤ්ඤදතො දුස්සීලො චෙ යං රට්ඨපිණ්ඩං භුඤ්ජෙය්‍ය
තත්ථො අග්ගිසිඛූපමො අයොගුළො භුත්තො සෙය්‍යො

අසඤ්ඤදතො: නොදැමුණු ඉඳුරන් ඇතිව, **දුස්සීලො**: දුසිල් තැනැත්තා, **චෙ**: ඉදින්, **යං රට්ඨපිණ්ඩං**: අනුන් විසින් දෙන ලද යම් අහරක්, **භුඤ්ජෙය්‍ය**: අනුභව කරන්නේ ද? (ඊට වඩා), **තත්ථො**: රත්වූ, **අග්ගි සිඛූපමො** : ගිනිසිළුවක් වැනි වූ, **අයොගුළො**: යගුලියක්, **භුත්තො**: අනුභව කළේ නම්, **සෙය්‍යො**: මැනවි.

නොදැමුණු ඉඳුරන් ඇති දුසිල්වත් භික්ෂුව අනුන් විසින් දෙන පිණ්ඩාහාරය වළඳනුවට වඩා ගිනිසිලුවක් මෙන් රත්වූ යකඩ ගුළියක් ගිලීම මැනවි.

විවරණය

රට්ඨපිණ්ඩං : මහජනයා භික්ෂූන් වහන්සේලා උදෙසා දෙන පිණ්ඩාහාරයයි. පිඬු සිඟා හැසිර ලැබෙන ආහාරයෙන් යැපීම භික්ෂූන්වහන්සේලාගේ ස්වභාවයයි. මෙම කථාවට පසුබිම වන්නේ වැසි සමයක් බැවින් වස් විසූ භික්ෂූන්හු පිඬු සිඟායාමේ නොයෙදෙති. ආරාමයට ගෙනවුත් දෙන ආහාරයෙන් යැපෙති. මෙහි රට්ඨපිණ්ඩ යන වචනය යොදා ඇත්තේ පොදුවේ භික්ෂූන් වහන්සේලාට මහජනයාගෙන් ලැබෙන ආහාරය හැඟවීම සඳහාය.

තමා තුළ නැති ගුණ ඇති බවට හඟවා මහජනයා රවටා ලබා ගන්නා ආහාරය භික්ෂූන්වහන්සේට කැප නැත. තමා තුළ නොමැති උත්තරී මනුෂ්‍ය ධර්ම-එනම්, මාර්ගඵලාදිය ඇති බව අන්‍යයන්ට හැඟවීම කවර තත්වයක් යටතේ වුවද භික්ෂුවට නොසුදුසු ය. පසු කාලීන විනය ශික්ෂා පැනවීමේදී භික්ෂූන්ට උත්තරී මනුෂ්‍යධර්ම ඇඟවීම පාරාජිකයක් වශයෙන් පනවා ඇත. භික්ෂූත්වයෙන් පහ කිරිමට යෝග්‍ය වූ වරදක් ලෙස එය සැලකී තිබේ. මෙම කථාවට සම්බන්ධවන වග්ගමුදා ගං තීරයේ භික්ෂූන්වහන්සේලා අතින් මෙසේ තමන් තුළ මාර්ගඵලාදිය ඇතැයි මහජනයා රැවටීමක් සිදුවන අවස්ථාව වන විට වරද පාරාජික ශික්ෂාවක් වශයෙන් පැනවී නොතිබුණු බව පෙනේ.

භික්ෂූන් වහන්සේලාට මහජනයා සිවු පසයෙන් සංග්‍රහ කරනුයේ භික්ෂූන් ගුණවත් ශික්ෂාකාමී පිරිසක්ය යන හැඟීමෙනි. උත්තම චරිතයක් ඇති අයට සිවුපසයෙන් සංග්‍රහ කිරීමෙන් මහජනයාට පින්සිදු කර ගැනීමට අවස්ථාව සැලසෙයි. තමන්ගේ උත්තම ගුණයන්ට කරන සැලකිල්ලක් ලෙස සිවුපසයෙන් සංග්‍රහ කරන මහජනයා රැවටීම ඉතා පහත් ක්‍රියාවකි. එබඳු රැවටිලිවලින් මහජනයා මුළා කොට ලබාග න්නා ආහාරය වළඳනුවට වඩා රත්වූ යවටක් ගිලීම හොඳ බව මෙම ගාථාවෙන් හෙළි කොට තිබේ.

බෞද්ධ භික්ෂූන් වහන්සේලා අනුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍රය කොට සැලකෙයි. ඒ උන්වහන්සේලා තුළ ඇති උත්තම චරිතාංග නිසාය. එබඳු උත්තම චරිත ලක්ෂණ නොමැති යම් භික්ෂුවක් මිනිසුන් රවටා ආහාර පානාදිය ලබා ගන්නේ නම් අනුත්තර වූ පුණ්‍ය ක්ෂෙත්‍රයටම කරන අපහාසයක් වෙයි. එබැවින් එබඳු ක්‍රියාවක් කවරාකාරයෙකින් සලකා බැලුවත් පහත් ක්‍රියාවක්ම වෙයි.



අන් සතු ගැහැණුන් සේවනය කරන පුරිස්තෙම මෙලොව හා පරලොව දුක් කරුණු සතරකට පැමිණේ.

309. චත්තාරි ඨානානි නරො පමත්තො
ආපජ්ජති පරදාරූපසේවී
අපුඤ්ඤලාභං න නිකාමසෙය්‍යං
නින්දං තතීයං නිරයං චතුත්ථං (22:4)

මත් වූ සිතින් පර අඹුවන් කරා යන
මිනිසා වෙතට සිව් විපතෙකි ගලා එන
පව්රුැස් වීම හා නිදිසුව නොලැබීම
තෙවැනිව නින්දාව හා නිරයට යාම

අන් අඹු සොයන්නෝ - විපතෙහි ගැලෙන්නෝ

22 (4) අනේපිඬු සිටණාන්ගේ බෑණනු ඛේම පිළිබඳ කථා වස්තුව (309 සහ 310 ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ අනේපිඬු සිටාණන්ගේ බෑණනු කෙනකු වූ **ඛේම** නමැති තරුණයකු අරභයා මෙම ගාථා වදාළ සේක.

ඛේම සැවැත් නුවර ධනවත් පවුලකට අයත් වූ අතර බෙහෙවින් සිත් ගන්නා රූප සම්පත්තියෙන් යුක්ත වූවෙක් ද විය. ඔහු ගේ රූමත්කම නිසාම බොහෝ කාන්තාවෝ ඔහු කෙරේ ඇදී යති. විවාහක කාන්තාවෝ පවා ඔහු දැක ඔහු සමඟ අභිරමනයෙහි කැමති වෙති. මේ නිසා ඔහු පරදාර සේවනයට පෙළඹිණ. පරදාර සේවනය රජුන්ගෙන් දඬුවම් හිමි වන වරදකි. ඛේම මෙම වරද සම්බන්ධයෙන් තෙවරක්ම රාජපුරුෂයන් අතට හසුවිය.

ඔහු රජු ඉදිරියට පමුණුවනු ලැබූවත් රජතුමා අනේපිඬු සිටාණන් කෙරෙහි ඇති පක්ෂපාතී භාවය නිසා ඔහුට සිත් රිදීමක් වේය යන අදහසින් ඛේමට අවස්ථා තුනෙහිම දඬුවම් නියම නොකළහ. අවවාද කොට නිදහස් කළහ. අනේපිඬු සිටාණෝ ද මෙම සිද්ධිය දැන තම බෑණනුවන් යහපත් පුද්ගලයකු කරන අදහසින් ඔහු කැටුව බුදුරදුන් හමුවට ගිය හ.

තම බෑණනුවන්ගේ නරක සිරිත ගැන සැළ කොට ඔහු එයින් මුදාගනු සඳහා සුදුසු බණකින් ඔහුට අනුග්‍රහ කරන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියහ. බුදුරජාණන් වහන්සේ ඔහු අරභයා මෙම ගාථා ද්වයෙන් ධර්ම දේශනා කළ සේක.

විස්තරාත්මක විවරණය (309 ගාථාව)

පමත්තො පරදාරූපසේවී නරො අපුඤ්ඤලාභං න නිකාමසෙය්‍යං තතියං නින්දං චතුත්ථං නිරයං චත්තාරි ඨානානි ආපජ්ජති.

පමත්තො: ප්‍රමාදයෙහි ගැළුණු; **පරදාරූපසේවී**: පරදාර සේවනයෙහි යෙදෙන; **නරො**: පුද්ගලයා; **අපුඤ්ඤලාභං**: පව් ලැබීම; **න නිකාමසෙය්‍යං**: සුව නිදි නොලැබීම; **තතියං**: තෙවැනිව; **නින්දං**: නින්දාව; **චතුත්ථං**: සිවු වැනිව; **නිරයං**: අපාය (යන); **චත්තාරි ඨානානි**: කරුණු සතරට; **ආපජ්ජති**: පැමිණෙයි.

ප්‍රමාදයෙහි නියුතුව පරදාරසේවනයෙහි යෙදෙන පුද්ගලයාට ආදීනව සතරකට මුහුණ දීමට සිදුවෙයි. ඒවා නම් පළමුව, පව් රැස්වීම, දෙවනුව, සිත් සේ නිදාගත නොහැකි වීම, තෙවැනිව, නින්දා අපහාස, සිවුවැනිව, අපාගත වීමයි.

විවරණය

පමත්තො: කවර වූ පාපකර්මයක යෙදෙන්නා ප්‍රමාද වූවෙකි. තම සිත පුණ්‍ය කර්මයන් විෂයෙහි උනන්දුව හීන වනවිට පුද්ගලයා ප්‍රමාද වූවෙක් වෙයි. බුදුසමයෙහි ප්‍රමාදය ලෙස නිතරම දැක්වෙන්නේ කුසලයෙහි ප්‍රමාද වීමයි. අකුශල කර්මයන්හි යෙදීම සිදුවන්නේද කිසියම් උනන්දුවකිනි. එහෙත් මෙම උනන්දුව අප්‍රමාදය ලෙස බුදු දහම නොපිළිගනියි. ස්වකීය යහපත මෙන්ම තමන්ගේ යහපතට ද හේතුවන යහපත් කටයුත්තෙහි යෙදීම අප්‍රමාදී පුද්ගලයාගේ ස්වභාවය යි. කෙතරම් උනන්දුවකින් හෝ ව්‍යායාමයකින් දුසිරිතෙහි යෙදුන ද එය අප්‍රමාද බවම වෙයි.

මෙහිදී විශේෂයෙන් පමත්ත යන වචනය යෙදී ඇත්තේ ප්‍රමාදයටත් වඩා පරදාර සේවනයෙහි යෙදෙන්නා තුළ එම ක්‍රියාව විෂයෙහි කිසියම් මත් වීමක් පවත්නා බැවිනි. පුද්ගලයකු පරදාර සේවනයෙහි යෙදෙන්නේ රාග මදයෙන් මත්වීමෙනි. රාගය වූ කලී සුරාවක් මෙනි. සුරාපානයෙන් මිනිසා මත් වෙයි. රාගයෙන් සිදුවන මත් වීම සුරා මතට ද වඩා අධිකය. රාගයෙන් මත් වූ පුද්ගලයාට තමා කරන වරදෙහි ආදීනව නොපෙනෙයි. ඔහුගේ සිත විවෘතව ඇත්තේ තමා කරන්නට අදහස් කරන පරදාරසේවනය පිළිබඳව ම පමණි. අනෙක් හැම දෙයක් සම්බන්ධයෙන්ම ඔහු ගේ මනස අන්ධ වී ඇත. මුළා වී ඇත. එබැවින් මෙම ගාථාවෙහි පමත්ත යන වචනය යෙදී ඇත්තේ පුද්ගලයකු රාගයෙන් පත්වන එම මත්බව හැඟවීමට ය.

චත්තාරි ඨානානි: පරදාරසේවනය නිසා පුද්ගලයකුට අත්වන ආදීනව සතරක් මෙම ගාථාවෙන් අවධාරණය කෙරෙයි. පරදාර සේවනය පාප කර්මයකි. එම නිසා එම වරදෙහි යෙදෙන්නාට පව් රැස් වෙයි. තමා වරදක් කර ඇතැයි හැඟීමෙන් පරදාර සේවනයෙහි යෙදෙන්නා නිබඳව බියෙන් පසු වෙයි. එබැවින් ඔහුට බාධා රහිත නින්දක් නොලැබෙයි. සමාජයේ නින්දා අපහාසයන්ට ද හෙතෙම භාජනය වෙයි. මරණින් මතු අපායගාමී වීමට ද ඔහුට සිදු වෙයි.

අකුසල් රැස්වීමට ද දඬුවම් විඳීමට ද අපායෙහි උපතට ද හේතු වූ පරඹුවන් සෙවුම නො කටයුතු ය.

310. අපුඤ්ඤලාභො ච ගතී ච පාපිකා
භීතස්ස භීතාය රතී ච ථොකිකා
රාජා ච දණ්ඩං ගරුකං පණෙති
තස්මා නරො පරදාරං න සෙවෙ (22:5)

පව් සිදු වෙමින් ලබනේ පව්ටු ගතියකි
බියපත් දෙදෙනකුට ඇති සුළුම සුවයකි
රජදරුවනගෙ දැඩි දඬුවම් හිමි දෙයකි
එබැවින් පර අඹුවන් වෙත නොගියොත් යෙහෙකි.

අන් අඹු සොයන්නෝ - විපතෙහි ගැලෙන්නෝ

22 (4) අනේපිඬු සිටණාන්ගේ බෑණනු බේම පිළිබඳ කථා වස්තුව (309 සහ 310 ගාථා)

විස්තරාත්මක විවරණය (310 ගාථාව)

අපුඤ්ඤලාභො ච පාපිකා ගතී ච භීතස්ස භීතාය රතී ච ථොකිකා රාජා ච ගරුකං දණ්ඩං පණෙති තස්මා නරො පරදාරං න සෙවෙ

අපුඤ්ඤලාභො ච: පව් හිමි වීම ද; **පාපිකා**: ලාමක වූ; **ගතී ච**: උප්පත්ති භවය ද; **භීතස්ස**: බියපත් වූවකු ගේ හා; **භීතාය**: බියපත් වූ තැනැත්තියකගේ; **ථොකිකා**: සුළු වූ; **රතී ච**: එක් වීමෙන් ලබන සුවය ද වේ; **රාජා ච**: රජතෙමේ ද; **ගරුකං**: ඉතා දැඩි වූ; **දණ්ඩං**: දඬුවමක්; **පණෙති**: පමුණුවයි; **තස්මා**: එහෙයින්; **නරො**: මිනිසා; **පරදාරං**: පරඹුවන්; **න සෙවෙ**: සේවනය නොකරන්නේ ය.

පරදාර සේවනය පව්රැස් කර ගැනීමකි. දුගතිය අත් වන්නකි. බියපත් මිනිසකු ගේ හා බියපත් ගැහැනියක ගේ සුළු වින්දනයකි. රජ තෙමේ ද දැඩි දඬුවම් පමුණුවයි. එබැවින් මිනිසා පරදාර සේවනය නොකළ යුතුය.

විවරණය

පරදාරූපසේවී: පරදාර සේවනයෙහි යෙදෙන්නා යන අරුත්ය. අන් පුරුෂයකු සමඟ විවාහ වූ කාන්තාවක සමඟ කාමමිථ්‍යාචාරයෙහි යෙදීම ලෝක සම්මත වැරැද්දකි. බෞද්ධයන්ගේ පංචශීලයෙහි මෙම වරද අවධාරණය කොට තිබේ. පරදාර සේවනයෙන් එහි යෙදෙන පිරිමියාට මෙන්ම ගැහැණියටද පෞද්ගලිකව පව් සිදු වෙයි. මේ හැර මෙය සමාජයට ද බලපාන අපරාධයක්ද වෙයි. කාමමිථ්‍යාචාරය වූ කලී අනුන්ගේ අයිතියක් සොරා ගැනීමකි. ලෝක සම්මත විවාහයෙන් සිදුවනුයේ විවාපත් යුවල ඔවුනොවුනට ඇති අයිතියෙන් බැඳීමයි.

පිරිමියා ගැහැණියටද ගැහැනිය පිරිමියාට ද වශයෙන් ඔවුනොවුන්ගේ අයිතිය එම දෙදෙනාට පමණක් වෙන් කර ගැනීමක් විවාහ චාරිත්‍රය මගින් සිදු වෙයි. එබැවින් කාමමිථ්‍යාචාරයෙහි යෙදීමෙන් ගැහැණිය තම ස්වාමියාගේ විවාහක අයිතිය ප්‍රතික්ෂේප කරමින් වෙන පුරුෂයකු ගේ ඇසුරට පත් වෙයි. පිරිමියා අන් කෙනකුට අයිති වස්තුවක් හිමියාගේ කැමැත්තෙන් තොරව පරිහරණය කරයි. එබැවින් කාමමිථ්‍යාචාරයෙන් සිදු වනුයේ අන් අයිතිය පැහැර ගැනීමකි. කාමමිථ්‍යාචාරය බෞද්ධ සදාචාර ධර්මවලින් ඉවත් කොට ඇත්තේ මෙම හේතුව නිසාය. තමාට සිදුවන පාපයට අතිරේකව අනුන්ගේ අයිතිය සොරා ගැනීමක් ද සිදුවන බැවින් කාමමිථ්‍යාචාරයෙන් දුරුවන ලෙස බුදුසමයෙන් තම ශ්‍රාවකයන්ට උපදෙස් ලැබෙයි.

න නිකාමසෙය්‍යං: පරදාර සේවනයෙහි යෙදෙන්නාට සුවපහසු නින්දක් නොලැබෙයි. තමා වරදකරුවකි යන සදොසී හැඟීම නිසා හෙතෙම නිබඳ බියෙන් පසුවෙයි. තමා පරදාර සේවනයෙන් යෙදුණු කාන්තාවගේ සැමියාගෙන් හෝ වෙනත් අයිතිකරුවන්ගෙන් කොයි මොහොතේ විපතක් සිදුවේ ද යන බිය ඔහු තුළ පවතියි. අනෙක් අතට පරදාර සේවනය රජුන්ගෙන් ද දඬුවම් හිමි වන වරදකි. එබැවින් කවර මොහොතක රාජ පුරුෂයන් අතට අසුවේවිද යන බිය ද ඔහු තුළ ඇත. එබැවින් එබඳු පුද්ගලයා නිතර සිටින්නේ නිදි වරමිනි.

නින්දං: නින්දා අපහාස ලැබීම කාමමිථ්‍යා සේවනයෙහි යෙදෙන්නට අත්වන අනෙක් ආදීනවයයි. මෙම වරද ලෝක සම්මත වරදක් වන බැවින් එහි යෙදෙන්නාට ලෝකයාගෙන් නින්දා අපහාස හිමි වෙයි. ඔහුගේ නමට අපකීර්තිය එක් වෙයි. ඔහු අනුන්ගේ පිළිකුළට ද භාජනය වෙයි.

පාපිකා ච ගති: මෙයින් අදහස් කෙරෙන්නේ දුගතියක උපතයි. පාපකර්මයට දී ඇති විපාක වශයෙන් දුගතියක දුක්බර උපතක් එම පාපකර්මයෙහි යෙදන පුද්ගලයාට අයත් වෙයි. පුද්ගලයා දුසිරිතෙහි හැසිරෙන විට එහි හොඳ පැත්ත පමණක් දකියි. භයානක විපාක ඔහුට නොපෙනෙයි. ඉතා සුළු වින්දනයක් සඳහා මිථ්‍යාකාම සේවනයෙහි යෙදී අනන්ත කාලයක් අපායගාමීව විවිධ අපා දුක් විදීමට සිදුවීම මරණින් මත්තෙහි ඇති වන්නක් බැවින් ඒ පිළිබඳව මිනිසාගේ දෙ ඇස් අඳ වී ඇත.

භීතස්ස භීතාය රතී ච ථොකිකා: බියපත් වූවකුගේ හා බියපත් වූවකගේ අල්ප වූ රතියත් යන අරුති. මිථ්‍යා කාමසේවනයෙහි යෙදෙන පිරිමියා සහ ගැහැණිය යන දෙදෙනාම එහි යෙදෙන්නේ බියෙනි. දෙදෙනාම තමන් කරන්නේ වරදක් බව දනිති. ගැහැණිය තම ස්වාමියාට මෙම වරද හසු වේවිද යන බියෙන් පසු වෙයි. පිරිමියා ද ගැහැණියගේ හිමියාගෙන් තමාට තර්ජනයක් පැමිණෙතෙයි බියෙන් පසුවෙයි. එබැවින් මෙය බියට හා තැති ගැන්මට පැමිණි දෙදෙනකු අතර සුළු වේලාවකට කෙරෙන අභිරමණයකි.

බුදුසමයෙන් අවධාරණය කෙරෙන සමාජ ජීවිතය, පුද්ගලයා හා සමාජය යන අංශ දෙකේම යහපත සඳහා උපයෝගී වන්නකි. සදාචාර ධර්මයන්හි යෙදීමට පුද්ගලයාට බුදුසමයෙන් උපදෙස් ලැබෙන්නේ පෞද්ගලිකව පුද්ගලයාගේ ආධ්‍යාත්මික ජීවිතයේ අභිවෘද්ධිය එමගින් සැලසෙන නිසා පමණක්ම නොවේ. දුරාචාර ධර්ම මගින් සමාජ ජීවිතය දූෂණය වෙයි. එහි සාමකාමී සුහද සහජීවනය පළුදු වෙයි. එබදු සමාජයක් මිනිස් ජීවිතයට අහිතකරය. මිනිසා සමාජය තුළ අනෙකෙකු ගේ අතවරයට, තර්ජනයට ගොදුරු නොවී සාමකාමී හා සුවදායී පරිසරයක ජීවත් විය යුතුය.

සදාචාර ධර්ම සමාජයක් තුළ ආරක්‍ෂා වන විට සාමකාමී සුවදායී පරිසරයක් නිර්මාණය වෙයි. එබඳු සමාජයක බාහිර ආධ්‍යාත්මික යන අංශ දෙකේම අභිවෘද්ධිය ලඟා කර ගැනීම පහසුය. අනික් අතින් සලකන විට සදාචාර ධර්ම පුද්ගලයාගේ ආධ්‍යාත්මික පාරිශුද්ධියේ පදනම වෙයි. බුදු සමයෙහි ශීලය යනුවෙන් ප්‍රකාශ වන්නේ මෙම සදාචාරාත්මක අංශයයි. දුරාචාරයෙන් වැළකී සදාචාර ජීවිතයක් ගෙවීම ආධ්‍යාත්මික ප්‍රගතියේ දොර විවෘත කර ගැනීමකි. නුවණැති පුද්ගලයා ශීලයෙහි පිහිටා තම සිතෙහි පාරිශුද්ධිය උදාකර ගනිතැයි පවසා ඇත්තේ මේ නිසාය.





වත්පිළිවෙත් - සිල්රැකීම් නො කොට වරදවාගත් මහණකම (ඒ තැනැත්තා) අපායට අදනේ ය.

311. කුසො යථා දුග්ගහිතො
හත්ථ'මේවානුකන්තති
සාමඤ්ඤං දුප්පරාමට්ඨං
නිරයායු'පකඩ්ඪති (22:6)

වැරදිව ගත් කුස තණයෙන්
ඇල්ලූ අතම කැපෙන ලෙසින්
නොමගට ගිය පැවිදි කමින්
පෙළෙනු නියති නිරා දුකින්

වැරදුනහොත් මහණ දහම - අත් වේ දැඩි අපාදුකම

22 (5) මුරණ්ඩු භික්ෂුවක් (311 ගාථාවේ සිට 313 ගාථාව දක්වා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ වැරදි බෙහෙවින් සැහැල්ලු සේ සළකන **මුරණ්ඩු භික්ෂුවක්** අරභයා මෙම ගාථා තුන වදාළ සේක.

තම අතින් නොදැනුවත්ව තණ කොළ කැඩීයාමක් සම්බන්ධයෙන් බෙහෙවින් පසුතැවීමට පත් භික්ෂුවක් විය. උන් වහන්සේ මෙම සිද්ධිය තවත් භික්ෂුවකට ප්‍රකාශ කළහ. එම භික්ෂුව වැරදි බොහෝ ලඝු කොට සලකන්නෙකි. ස්වභාවයෙන්ම මුරණ්ඩු හිතුවක්කාරයකු වූ මෙම භික්ෂුව අනෙක් භික්ෂුවට කියා සිටියේ, එය ඉතා සුළු වරදක් නිසා එය ගණන් නොගත යුතු බවත් තවත් භික්ෂුවක හමුවේ ආපත්ති ආරෝචනය කළහොත් එය නින්දාවට හේතුවන බැවින් වරද හෙළි නොකර ඊට පිළියම් නොයොදා සිටිය යුතු බවත් ය. හෙතෙම එසේ කියමින් එබඳු වරද තමන් ගනන් නොගන්නා බව පෙන්වීමට තණ පදුරු කිහිපයක් ගලවා දැම්මේය. මෙම සිද්ධිය බුදුරජාණන් වහන්සේට සැලවී උන්වහන්සේ මුරණ්ඩු භික්ෂුව කැඳවා දෝෂාරෝපණය කොට මෙම ගාථාවන් ගෙන් ධර්‍මදේශනා කළ සේක.

විස්තරාත්මක විවරණය (311 ගාථාව)

යථා කුසො දුග්ගහිතො හත්‍ථං එව අනුකන්තති
දුප්පරාමට්ඨං සාමඤ්ඤං නිරායාය උපකඩ්ඪති

යථා: යම් සේ; **කුසො**: කුසතණ; **දුග්ගහිතො**: වැරදි සේ අල්වා ගන්නා ලද්දේ; **හත්‍ථං එව**: (එම) අතම; **අනුකන්තති**: කපයි ද (එසේ); **දුප්පරාමට්ඨං**: වැරදි ලෙස ග්‍රහණය කරන ලද; **සාමඤ්ඤං**: ශ්‍රමණ බව; **නිරායාය**: අපායට; **උපකඩ්ඪති**: (පුද්ගලයාව) ඇදගෙන යයි.

වැරදි අයුරින් කුස තණ ඇල්ලුවහොත් ඇල්ලූ අතම කැපෙයි. එමෙන්ම වැරදි මගට යොමු කරන ලද පැවිදි කමින් නිරයට ගෙනයනු ලබයි.

විවරණය

මෙම කථාවට සම්බන්ධ ගාථා ඉදිරිපත් වී ඇත්තේ හොඳ නරක ක්‍රියා සම්බන්ධයෙනි. ක්‍රියා පිළිබඳ බෞද්ධ විග්‍රහය මූලික වශයෙන් කර්‍ම ධර්‍මය යටතේ ඉදිරිපත් වී ඇත.

කම්ම: කර්‍මය වූ කලී අප කරන ක්‍රියාවන්ට අනුකූලව ක්‍රියාත්මක වන අපෞරුෂේය වූ මධ්‍යස්ථ රීතියකි. කර්‍මයට රීතියක් වනු විනා එය මෙහෙයවන වෙනත් නියාමක බලවේගයක් නොමැත. කර්‍මය තම ක්ෂේත්‍රය තුළම ක්‍රියාත්මක වන අතර එය කිසිදු බාහිර බලවේගයක හෝ කර්‍තෘ කෙනකුගේ මැදිහත් වීමකට හසු නොවන්නකි.

බුදු දහමට අනුකූල කර්‍මය විවිධ තරාතිරම් යටතේ පැහැදිලි කළ හැකිය.

කුඩා දරුවකුට වටහාගත හැකි සේ කර්‍මය පැහැදිලි කරන්නේ නම් "හොඳ දේ කරන්න. දැන් මෙන්ම මතුවටත් එයින් හොඳ දෙයක්ම සිදුවෙයි. නරක දේ නොකරන්න. දැන් මෙන්ම මතුවටත් එයින් නරක දෙයක්ම සිදු වෙයි." යනුවෙන් පැවසිය හැකිය.

කර්‍මය අස්වනු වැපිරීමක් හා නෙලීමක් වශයෙන් විවරණය කරන්නේ නම් මෙසේ පැවසිය හැකිය. ඉදින් ඔබ මනා බීජ වපුරන්නේ නම් මනා අස්වැන්නක් නෙලිය හැකිය. ඉදින් ඔබ නරක බීජුවට වපුරන්නේ නම් අස්වනු නරක් වනු ඇත.

කර්‍මය විද්‍යාත්මක විග්‍රහයකට ලක් කරන්නේ නම් මෙසේ කිව හැකිය. කර්‍මය වූකලී හේතු හා ඵල පිළිබඳ රීතියයි. වෙනත් අයුරකින් කිවහොත් කර්‍මය වූ කලී සදාචාර හේතුත්වය යි. භෞතික ක්ෂේත්‍රය තුළ ක්‍රියා ප්‍රතික්‍රියා පිළිබඳ රීතිය බලපාන්නාක් මෙන්ම කර්‍මය ද සදාචාර ක්ෂේත්‍රය තුළ බලපායි.





ලිහිල් වැ කරන ලද කුසලය ද කිලුටු වත ද අපිරිසිදු වැ පැවැත්වෙන මහණදම ද උතුම් නොවේ.

312. යං කිඤ්චි සිථිලං කම්මං
සංකිලිට්ඨඤ්ච යං වතං
සඞ්කස්සරං බ්‍රහ්මචරියං
න තං හොති මහප්ඵලං (22:7)

යම් කිසි සුළු කමක් වේද
කෙලෙසුණු යම් වතක් වේද
බඹසර සැක සහිත වේද
නැත එමගින් මහත් පලය

කෙලෙසුණු සිල් වතින් - නොදේ හොඳ පල යහතින්

22 (5) මුරණ්ඩු භික්ෂුවක් (311-313 ගාථා)

විස්තරාත්මක විවරණය (312 ගාථාව)

යං කිඤ්චි සිථිලං කම්මං යං සංකිලිට්ඨං වතං ච
සඞ්කස්සරං බ්‍රහ්මචරියං තං මහප්ඵලං න හොති

යං කිඤ්චි: යම්කිසි; **සිථිලං**: ලිහිල් වූ (පහත්); **කම්මං**: කර්මයක් වේද?; **යං**: යම් ආකාර වූ; **සංකිලිට්ඨං**: කිළිටි වූ; **වතං ච**: ව්‍රතයක් ද වේද; **සඞ්කස්සරං**: සැක සහිත වූ; **බ්‍රහ්මචරියං**: බ්‍රහ්මචර්‍යාව (මහණකම) ද; **තං**: යන එය ද; **මහප්ඵලං**: මහත් ඵලවූයේ; **න හොති**: නොවෙයි.

ඉතා සුළු ක්‍රියාවද, කිළිටි වූ ශීලාදී ව්‍රතය ද සැකසහිත මහණදම ද උසස් ප්‍රතිඵල ලබා නොදෙයි.

විවරණය

කර්මය බුදු දහමින් විවරණය වන්නේ සචේතනික ක්‍රියා වශයෙන් චේතනා චෛතසිකය යෙදී කයින් වචනයෙන් මනසින් කෙරෙන කවර ක්‍රියාවන් වුවද කර්මය යටතට ගැනෙයි. "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි යං කම්මං කරොති කායෙන වාචාය මනසා" යි බුදුරජාණන් වහන්සේ විසින් පවසා ඇත්තේ මේ නිසාය. එබැවින් කර්මය වූකලී කිසියම් සන්තාවක් නොව ශක්තියකි, බලයකි, චේතනාව සමඟ සංයුක්ත වූ කර්මය හා බැඳී ප්‍රතිඵලයක් පවත්නා බව මෙම කර්ම සිද්ධාන්තයෙහි විශේෂත්වයයි. කර්මවල විපාක ඒ කර්ම සිදු කළ තැනැත්තා කෙරෙහි බලපායි.

ඒ බලපෑමේ යුක්ති සහගත භාවයක් ඇත්තේ එම කර්ම කරන්නා ඒවා තම ඕනෑකම මත සිදු කර ඇති බැවිනි. යමෙක් සචේතනිකව යම් කිසි ක්‍රියාවක් කරන්නේ නම් එහි විපාක ඔහු වෙතටම ඒමේ යුක්ති සහගත භාවයක් ඇත. එබඳු ක්‍රියාවක වගකීම එම ක්‍රියාව කරන්නාට ම පැවරෙන බැවිනි.

බෞද්ධ කර්ම සිද්ධාන්තය පිළිබඳව ඇතැම් අය දරන වැරදි මතයක් නම් කර්මය කිසියම් නියතියක් යන්නයි. බෞද්ධ කර්ම සිද්ධාන්තයෙන් නියතිවාදයක් ඉදිරිපත් නො කෙරෙයි. කරන ක්‍රියාව හා ප්‍රතිඵලයක් සම්බන්ධ වීම නියතියක් නොවේ. මිනිසාට බල පෑ නොහැකි අයුරින් මිනිසාගේ ස්වභාවය සැකසෙන කිසියම් බලවේගයක් ඇතැයි විශ්වාස කිරීම නියති වාදයකි. බෞද්ධ කර්ම සිද්ධාන්තයට අනුව බොහෝ දුරට තම ස්වභාවය සකසා ගන්නේ තමාමය. තමා ක්‍රියාකරන ආකාරයට අනුව ස්වභාවය සැකසෙයි. කර්මය යනු පුද්ගලයාගෙන් බාහිර වූ කිසිවක් නොවේ. පුද්ගල ක්‍රියාකාරිත්වයේම කොටසකි. කර්ම කරන්නේ තමාමය එහි ප්‍රතිඵල භුක්ති විඳින්නේත් තමාමය.

මිනිසාගේ ස්වභාවය සැකසීමෙහිලා බලපාන නියාම පසක් බුදුදහමින් ඉගැන්වී ඇත.

1. කම්ම නියාම
2. ධම්ම නියාම
3. චිත්ත නියාම
4. උතු නියාම
5. බීජ නියාම

මිනිසා සම්බන්ධ ක්ෂෙත්‍ර පහක ක්‍රියාකාරිත්වයට අදාළ නියාම පහක් ඉහතින් ඉදිරිපත් වී ඇත. මිනිසාගේ සම්භවයට හා ඇතැම් ගති ස්වභාවයන්ට අදාළව කම්මනියාමය බලපායි. මිනිසාගේ චිත්තන ක්‍රියාකාරිත්වය චිත්ත නියාමයට අනුව ක්‍රියාත්මක වෙයි. ස්වභාව ධර්මයේ රීතීන්ට අනුගතව සිදුවන බලපෑම් පිළිබඳ අංශයක් ද මිනිස් ස්වභාවය හා එක් වී ඇත. ලෝකයේ සෘතු විපර්යාසයන්ට අනුකූල සිදුවීම් ද මිනිස් ජීවිතය කෙරෙහි බලපායි. මව්පිය පාරම්පරික උරුමයන් නිසා ද මිනිස් ස්වභාවයේ සෑහෙන බලපෑම් ඇති වෙයි. මේ අනුව මිනිසාගේ සංස්ථිතියට කර්මය පමණක් එකම හේතුව වශයෙන් පිළි ගැනීමක් නැත.

මිනිස් ස්වභාවය පිළිබඳව,පැවැති වැරදි මත කිහිපයක් අංගුත්තර නිකායෙහි දක්වා ඇත. ඒවා මෙසේය.

1 සෑම දෙයක්ම පෙර ජීවිතයන් හි කළ කර්ම අනුව සිදුවෙයි.
2 මිනිසා පිළිබඳ හැම දෙයක්ම ඊශ්වර නිර්මාණයෙන් සිදු වන දේය.
3 හැම දෙයක්ම සිදුවනුයේ කිසියම් හේතුවක ප්‍රතිඵල වශයෙන් නොවේ. සියල්ල ඉබේ සිදු වෙයි.

නිගණ්ඨනාථ පුත්තයන්ගේ ජෛන දර්ශනය මගින් මුලින් සඳහන් මතය ඉදිරිපත් වී ඇත. මිනිසා මේ ජීවිතයෙහි විඳින සුවදුක් සියල්ලක්ම පෙර කළ කර්ම නිසාම සිදු වෙයි. මෙම කර්ම පුද්ගලයාගේ ජීවය වටා රොක් වී ඇත. පුද්ගලයා පිළිබඳ ජීවයේ විමුක්තය සාදා ගැනීමට නම් ඒ කර්ම විපාක සියල්ල විඳ අවසන් කළ යුතුය.

දෙවැනි මතය ඉදිරිපත් වී ඇත්තේ වෛදික බ්‍රාහ්මණ ගුරුකුලයෙනි. මිනිසා පිළිබඳ හැම දෙයක්ම සිදුවනුයේ දෙවියන්ගේ කැමැත්ත පරිදිය. මිනිසාට ස්වච්ඡන්දයක් නැත. දෙවියන්ගේ කැමැත්ත සියල්ලටම බලපායි. මෙහිදී දෙවියන්ගේ කැමැත්තටම ඉඩදී සිටිනු විනා තමා සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට තමාට අයිතියක් නැති වෙයි.

තෙවැනි මතය ඉදිරිපත් කොට ඇත්තේ බුද්ධ කාලයෙහි විසූ මක්ඛලීගෝසාල නම් වූ ආජීවක ශාස්තෘවරයා විසිනි. සියල්ල ඉබේ නියතියකට අනුව සිදුවන නිසා මේ මතයට අනුවද මිනිසා හුදු රූකඩයක් පමණි. හැම දෙයක්ම ඉබේ සිදුවන තෙක් මිනිසාට බලා සිටීමට සිදු වෙයි.



කුසලය නො පසුබට වැ දැඩි වෙරැති වැ කටයුතු ලිහිල් වු පැවිද්ද සිය සතන් කිලිටි කෙරේ.

313. කයිරා චෙ කයිරාථේ’තං
දළ්හං එතං පරක්කමෙ
සිථිලො හි පරිබ්බාජො
භියෙ‍යා ආකිරතෙ රජං (22:8)

කරන්න කළ යුතු දේ නම්
දැඩි වෙහෙසක් දරන්න එහි
ලිහිල්ව ගත් පිරිවැජියා
වැඩියක් කෙලෙසුන් වගුරයි

කටයුත්තෙහි මනා - යෙදෙනු දැඩි අනලසිනා

22 (5) මුරණ්ඩු භික්ෂුවක් (311ගාථාවේ සිට 313 ගාථා)

විස්තරාත්මක විවරණය (313 ගාථාව)

චෙ කයිරා එතං කයිරාථ එතං දළ්හං පරක්කමෙ හි
සිථිලො පරිබ්බාජො භියේ‍යා රජං ආකිරතෙ

චෙ: ඉදින්; **කයිරා**: කළ යුතු ද; **එතං**: එය; **කයිරාථ**: කරන්න; **එතං**: එහිලා; **දළ්හං**: දැඩි සේ; **පරක්කමෙ**: උත්සාහවන්ත වන්න; **හි**: නිසැකයෙන්ම; **සිථිලො**: ලාමක වූ; **පරිබ්බාජො**: පිරිවැජියා; **භියේ‍යා**: බොහෝ සෙයින්; **රජං**: (රාගාදි) කෙලෙස් දූහුවිලි; **ආකිරතෙ**: වගුරවයි.

යමක් කළයුතු දෙයක් නම් එය කරන්න. එය කිරීමෙහි දැඩි සේ උත්සාහවත් වන්න. මක් නිසාදයත් පැවිදි කම ලිහිල් සේ ගත් පිරිවැජියා බෙහෙවින් කෙලෙස් ඇති කර ගනියි.

විවරණය

බෞද්ධ කර්ම ධර්මය යටතේ පහත සඳහන් නියතිවාද ප්‍රතික්ෂෙප වෙයි.

1. සියල්ල කර්මයෙන් සිදු වෙයි.
2. සියල්ල ඊශ්වරයකු මගින් සිදුවෙයි.
3. සියල්ල ඉබේ සිදුවෙයි.
4. සියල්ල ඉරණමට අනුව සිදුවෙයි.

මේ නියතිවාද පිළිගැනෙන්නේ නම් පුද්ගල විමුක්තිය කිසිවිටෙක සාක්ෂාත් කළ නොහැකි හුදු පරමාදර්ශයක් පමණක් වෙයි. හුදු බලාපොරොත්තුවක් පමණක් වනු මිස ලබා ගත නොහැකි දෙයක් වෙයි. එවිට ආගමික පරමාදර්ශ හිස් දෙසුම් වලට පමණක් සීමා වෙයි. එපමණක් නොව පුද්ගලයකුගේ භෞතික සමෘද්ධිය පවා තමාගේ අපේක්ෂා අනුව ඉටු කරගත නොහැකි තත්වයකට පත් වෙයි. මෙම භෞතික සහ ආධ්‍යාත්මික යන ද්විවිධ පරමාර්ථම ඉටු කර ගැනීමට නම් පුද්ගලයාගේම ස්වච්ඡන්දතාව සහ උත්සාහය අවශ්‍යය. ස්වච්ඡන්දතාව යනු තමාට කැමැති පරිද්දෙන් යථොක්ත ද්විවිධ පරමාර්ථයන් සාධනය කර ගැනීම සඳහා තමාව මෙහෙයවා ගැනීමෙහි ඇති හැකියාවයි. තමා මෙහෙයවා ගැනීමේ නිදහස පුද්ගලයකුට නැති විට පුද්ගලයා පත් වන්නේ හුදු රූකඩයක තත්වයටය. බුදුරජාණන් වහන්සේ මේ සියලු නියතිවාද ප්‍රතික්ෂේප කොට ඇත්තේ පුද්ගල ස්වච්ඡන්දතාව සහ ව්‍යායාමය පුද්ගලයකුට ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව පිළිගෙන ඇති බැවිනි. ජෛන පූර්වකෘත කර්ම නියතිවාදය ප්‍රතික්ෂේප කරමින් බුදුරජාණන් වහන්සේ මෙසේ පවසන සේක.

"පුබ්බෙකතං බොපන භික්ඛවෙ සාරතො පච්චාගතං න හොති ඡන්දෙ වා විරියෝ වා"

"මහණෙනි, පූර්වකෘත කර්ම හේතුවාදය සත්‍යයක් යැයි පිළිගැනේ නම් ඡන්දය (ස්වච්ඡන්දය) හා විරිය (උත්සාහය) ප්‍රතික්ෂේප වෙයි."

බුදු දහමෙහිදී පුද්ගලයා විෂයෙහි ඡන්ද විරිය සංකල්ප දෙක ඉතාමත් වැදගත් තැනකට පත් වෙයි. ආධ්‍යාත්මික පාරිශුද්ධිමය ක්‍රියාදාමයෙහි දී පමණක් නොව භෞතික සමෘද්ධියේ දී ද අත්‍යවශ්‍ය මූලික අවශ්‍යතා දෙකක් ලෙස ඡන්දයට සමව විරියට වැදගත් තැනක් හිමි වී ඇත. මේ සම්බන්ධයෙන් සතර සම්‍යක් ප්‍රධාන වීර්යය පිළිබඳ විවරණය ඉතා වැදගත් නිදසුනකි. එහි මෙසේ සඳහන් වෙයි.

"අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති. විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති"

"නූපන් කුසල් දහම් ඉපදවීම සඳහා කැමැත්ත උපදවයි. වීර්යය අරඹයි. සිත දැඩි කොට ගනියි."

මෙබඳු කැමැත්තකින් හා වීර්යයකින් තොරව පුද්ගල අභිමතාර්ථ ඉටු කළ නොහැක. බෞද්ධ කර්ම ධර්මයට අනුව පුද්ගල අභිමතාර්ථ සාධනයෙහි ලා කර්මයෙන් බලපෑමක් ඇති වන්නේ නැත. කර්මය ප්‍රධාන වශයෙන් පුද්ගලයාගේ භවගාමිත්වයට හා භවයක් තුළ පුද්ගලයාගේ සුඛ සහගත හෝ දුක්ඛ සහගත පැවැත්මට බලපෑමක් කෙරෙන බව සත්‍යයකි. මූලික වශයෙන් කර්මයක ප්‍රතිඵලය ද්විවිධය. ඒ ප්‍රතිසන්ධි විපාක හා ප්‍රවෘත්ති විපාක යනුවෙන් හැඳින්වෙයි. ප්‍රතිසන්ධි විපාක මගින් පුද්ගලයාට භවයක ප්‍රතිසන්ධිය ලබා දෙයි. එසේ ලබාගත් ජීවිතයෙහි පැවැත්මට විශේෂයෙන් සුඛ සහගත හෝ දුක්ඛ සහගත පැවැත්මට සාධක වන්නේ ප්‍රවෘත්ති විපාකයි. මෙම ප්‍රවෘත්ති විපාක වුවද පුද්ගලයාගේ ස්වච්ඡන්දතාව හා උත්සාහය මත කෙරෙන ක්‍රියාකාරිත්වයන් මගින් වැළැක්වීමේ හැකියාව බුදු දහම පිළිගෙන ඇත.

දළ්හං එතං පරක්කමෙ: 'කළ යුතු කාර්‍යයෙහි දැඩි සේ උත්සාහවත් වන්න' යන මෙම ප්‍රකාශය තුළින්ම බෞද්ධ කර්ම සිද්ධාන්තයේ වැදගත් අංගයක් හෙළිදරව් කරයි. එය කර්මයෙහි ලා උත්සාහයට හා වීර්‍යයට හිමි වී ඇති තත්වයයි. පුද්ගලයා කර්මය මගින් නියතියක් බවට පත් වේ නම් දැඩි සේ උත්සාහ ගන්නැයි කරන ප්‍රකාශය අර්ථශූන්‍ය වෙයි. බුදුරජාණන් වහන්සේ විසින් මෙබඳු ප්‍රකාශ කොට ඇත්තේ කර්මයේ බලපෑම් යටපත් කරමින් පුද්ගලයාට ස්වකීය ජීවිතය තමන් කැමති අංශයකට යොමු කරවීමේ හැකියාව ඇති බැවිනි.

පුද්ගලයා තුළ පවත්නා විවිධ ශක්ති විශේෂතා බුදු දහමින් පිළිගෙන තිබේ. ආරම්භ ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු, අත්තකාර, පරකාර වැනි පද මගින් එම ශක්ති විශේෂ හැඳින්වී ඇත. පුද්ගලයාගේ කවර අංශයක හෝ දියුණුව රඳා ඇත්තේ මෙම ශක්ති විශේෂ පුබුදුවා ගැනීම මතය. බුදු දහමින් පුද්ගලයාට ඇරයුම් කරන්නේ තමා තුළ ඇති ඒ විශේෂ ශක්ති පුබුදුවාගෙන ආත්මාර්ථ සාධනය කර ගන්නා ලෙසය.

"ආරභථ, නික්කමථ, යුඤ්ජථ බුද්ධ සාසනෙ" "අරඹන්න. නික්මෙන්න. යෙදෙන්න." යන මේ ප්‍රකාශය පුද්ගලයා බෙහෙවින් ධෛර්‍යමත් කරන්නකි. තමා තුළ ඇති ශක්ති විශේෂ හකුළුවා නොගෙන ඒවා පුබුදුවා ගෙන එමගින් තමා කැමති උසස් ජීවන තත්වයක් හෝ ආගමික අභිප්‍රේතාර්ථයක් සාධනය කර ගන්න යන්න තුළ ඇත්තේ කර්මය ප්‍රතිබාහනය කරමින් පුද්ගලයාට ඉදිරියට යාමේ ඇති ශක්‍යතාවයි.

සිථිලො පරිබ්බාජො: මෙහි ලිහිල් වූ පිරිවැජියා යනු පැවිද්දාට අදාළ වත් පිළිවෙත් ගුණ ධර්ම ආදිය බෙහෙවින් ලිහිල් කොට ගන්නා තැනැත්තායි. පැවිදි පිළිවෙත් ලඝු කොට සිතන්නේ නම් ඒවා පිළිපැදීමට උනන්දුවක් නැති වෙයි. එපමණක් නොව ඒවා කඩ කොට පැවිද්දට අයෝග්‍ය අයථා ක්‍රියාමාර්ගවල යෙදීමට ද නොපසුබට වෙයි. එවිට සිදුවන්නේ තමා තුළ කෙලෙස් බහුල වෙමින් තම විමුක්ති මාර්ගය අවහිර වීමයි. එබැවින් පැවිද්දකු සඳහා ඉදිරිපත් වී ඇති ලොකු කුඩා කවර වූද ශික්ෂා පති පත්ති ආදිය සම්බන්ධයෙන් පැවිද්දකු තුළ විශාල ගෞරවයක් පැවතිය යුතුය.





දුසිරි (= අකුසල්) නො කිරීම හා සුසිරි (= කුසල්) කිරීම ඉතා උතුම් ය

314. අකතං දුක්කතං සෙය්‍යො
පච්ඡා තපති දුක්කතං
කතඤ්ච සුකතං සෙය්‍යො
යං කත්වා නානුතප්පති (22:9)

නරක දෙයක් සොඳ අත්හැර දැමීමය
කළොත් සිදුවන්නෙ පසුවට තැවීමය
හොඳ දේ කරන එක සැමවිට යෙහේමය
එබඳු දෙයින් පසුතැවුලක් නොදේමය.

හොඳ දෙය කිසිවිට - ඔබ නොතවනු ඇත.

22 (6) ඊර්ෂ්‍යා සහගත කාන්තාවක් (314 ගාථාව)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **ඊර්ෂ්‍යා සහගත සිතෙන් පෙළුණු කාන්තාවක** අරභයා මෙම ගාථාව වදාළ සේක.

සැවැත් නුවරෙහි එක්තරා ඊර්ෂ්‍යා සහගත සිතින් නපුරු වු කාන්තාවක් සිය ස්වාමි පුරුෂයා සමඟ වාසය කළාය. සැමියා නිවසෙහි සිටි සේවිකාව සමඟ ආදර සම්බන්ධතාවක් පවත්වන බව ඇයට දැන ගන්නට ලැබිණ. දිනක් මේ ස්ත්‍රිය සේවිකාව අල්ලා ගෙන රැහැනකින් බැඳ ඇයගේ කන් නාසා කපා දැමුවාය. එසේ කොට ඕ සේවිකාව කාමරයකට දමා දොර වසා සිර කර තැබුවාය. පසුව ඇය සැමියා ද කැටුව දෙව්රම් වෙහෙරට ගියා ය. මේ අතරෙහි සේවිකාවගේ නෑදෑයින් කිහිපදෙනෙක් ඇය බැලීම සඳහා එම නිවසට පැමිණියහ.

සේවිකාව කාමරය තුළ සිරකොට ඇති බව දැනගත් ඔවුහු දොර කඩා ඇය නිදහස් කොට ගෙන ඇය ද කැටිව දෙව්රම් වෙහෙරටම ගියහ. ඔවුන් එහි යන විට භාග්‍යවතුන් වහන්සේ පිරිස මැද ධර්ම දේශනා කරමින් සිටි සේක. අවසරයක් ලත්විට සේවිකාව තම ස්වාමි දියණිය තමාට දඬුවම් කළ ආකාරය බුදුරදුන් හමුවේ පවසා සිටියාය. තමාට ඉතා සැර පරුෂ අන්දමින් තලා පෙලා බැඳ කන් නාසා කපා දැමු ආකාරය විස්තර කළාය. සේවිකාවගේ ස්වාමි දියණිය ද පිරිස අතරෙහි සිටි බැවින් ඇය සියලු දෙනාගේ අවඥාවට භාජනය වූවාය. මේ සිද්ධිය අරභයා භාග්‍යවතුන් වහන්සේ මෙසේ ධර්ම දේශනා කළ සේක."මිනිසුන් නොදැන ගනිතියි සිතා රහසින් වුවද වැරදි දෙය නොකරන්න. රහසේ කළ නපුරු දෙය එළි වු විට දැඩි සේ තැවීමට හා ශෝකයට හේතු වෙයි. හොඳ දෙයම කරන්න. ඒ පිළිබඳවම උත්සුක වන්න. හොඳ දෙය අන් අයට නොදැනුවත්ව කරනු ලැබුවත් එයින් සතුටක් මිස පසුතැවීමක් සිදු නොවේ."

විස්තරාත්මක විවරණය (314 ගාථාව)

දුක්කතං අකතං සෙය්‍යො දුක්කතං පච්ඡා තපති යං කත්වා න ආනුතප්පති සුකතං කතඤ්ච සෙය්‍යො

දුක්කතං: නපුරු දෙය; **අකතං**: නොකර සිටීම; **සෙය්‍යො**: මැනවි; **දුක්කතං**: නපුරු දෙය; **පච්ඡා**: පසුව; **තප්පති**: (කළ පුද්ගලයාම) තවයි ; **යං**: යම් ක්‍රියාවක්; **කත්වා**: සිදු කොට; **න අනුතප්පති**: පසුතැවිලි නොවේ ද?; **සුකතං**: (එබඳු වු) හොඳ දෙය; **කතඤ්ච**: කිරීම ද; **සෙය්‍යො**: මැනවි.

යමක් සිදු කොට පසුතැවිලි වීමට සිදු වේ නම් එබඳු ක්‍රියාව නොකර සිටීම මැනවි. යම් දෙයක් කොට පසුතැවිලි වීමට සිදු නොවේ නම් ඒ හොඳ දෙය කිරීම මැනවි.

විවරණය

සුකතං: **දුක්කතං**: මෙම ගාථාවෙන් හොඳ දෙය හා නොහොඳ දෙය වෙන් කොට තීරණය කර ගැනීමෙහි ලා සාධක කර ගත හැකි නිර්ණායකයක් ඉදිරිපත් වී තිබේ. හොඳ හා නොහොඳ පිළිබඳ සංකල්ප සදාචාර ක්ෂෙත්‍රයට අදාල වෙයි. සදාචාරාත්මක වශයෙන් හොඳ දෙය කුමක් ද සදාචාරාත්මක වශයෙන් නරක දෙය කුමක් දැයි වටහා ගැනීම අවශ්‍ය වෙයි. මේ සම්බන්ධයෙන් බුදුදහමින් නිර්ණායක කිහිපයක්ම ඉදිරිපත් කොට තිබේ.

මෙම ගාථාවෙන් පැහැදිලි කෙරෙන නිර්ණායකය වන්නේ තමාගේම අත්දැකීම්ය. යම් ක්‍රියාවක් සිදු කිරීම හේතු කොට ගෙන තමාට පසුව තැවීමට සිදුවේ නම් එය නොකළ යුතු නරක ක්‍රියාවකි. යම් ක්‍රියාවක් කිරීමෙන් තමාට පසුව මානසික සුවයක් සතුටක් අත් විඳීමට ලැබේ නම් එය කළ යුතු හොඳ ක්‍රියාවකි.

චූල රාහුලෝවාද සූත්‍රයෙන් ද හොඳ නරක පිළිබඳ මෙබඳුම නිර්ණායකයක් ඉදිරිපත් වී ඇත. එය තමාගේ අත්දැකීම පමණක් නොව මෙරමාගේ අත්දැකීම ද පාදක කර ගනු ලැබුවකි. යමක් තමාට හිත සුව පිණිස පවතී ද අනුනට හිත සුව පිණිස පවතී ද තමා හා අනුන් යන දෙපාර්ශවයේම හිත සුව සඳහා පවතී ද එය හොඳ ක්‍රියාවකි. යමක් තමාගේ දුකට වේදනාවට අයහපතට හේතු වේද, අනුන්ගේ දුකට වේදනාවට අයහපතට හේතු වේද, තමාගේ හා අනුන්ගේ යන දෙපිරිසේම දුකට, වේදනාවට හා අයහපතට හේතු වේද එය නරක ක්‍රියාවකි.

මෙසේ හොඳ නරක තෝරා බේරා ගෙන හොඳ දෙයෙහි යෙදීම තමා හා අනුන් යන දෙපාර්ශ්වයේම යහපතට හේතු වෙයි. එබැවින් බුදු දහම නිතරම සිය උපදෙස් යොමු කොට ඇත්තේ නරක දෙය අතහැර හොඳ දෙයෙහිම නිරත වන ලෙසය.

මනා රැකවල් ඇති නුවරක් මෙන් සිත රැකගන්න. බුදු උපත ලැබූ කාලයෙන් නිසි පල ලබන්න.

315. නගරං යථා පච්චන්තං
ගුත්තං සන්තරබාහිරං
එවං ගොපෙථ අත්තානං
ඛණො වෙ මා උපච්චගා
ඛණාතීතා හි සොචන්ති
නිරයං හි සමප්පිතා (22:10)

ඇතුළින් පිටතින් සුරැකුණු
විසල් නගරයක් විලසින්
රැක ගන්න තමා
මොහොතකුදු නොදමන්න ඉවතේ
මොහොත වුව හැර දැමුවෝ
නිරයෙහි දුකම දැරුවෝ

තමා රැක ගැන්මේ - යෙදුනොත් තමා සැනසේ

22 (7) භික්ෂු පිරිසකගේ කතා වස්තුව (315 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ පසල් දනවු නුවරෙක වැසි සමය ගත කළ කිසියම් **භික්ෂු පිරිසක්** අරභයා මේ ගාථාව දෙසූ සේක.

ප්‍රත්‍යන්ත නගරයක වස් එළඹ සිටි මෙම භික්ෂූන් වහන්සේලාට නගරවාසීන් ඉතා ගෞරවයෙන් යුක්තව වැසි සමයේ පළමු මාසය තුළ සිවු පසයෙන් ඇප උපස්ථාන සැලැස්සුහ. එහෙත් දෙවැනි මාසයේ දී නගර වැසියන්ට නිසි සේ භික්ෂූන්ට උපස්ථාන කිරීමට දුෂ්කර විය. මීට හේතු වූයේ මෙම නගරයට සොරුන්ගෙන් විශාල බියක් එල්ල වීමය.

සොරු නගරයට පැමිණ ගෙවල් කොල්ලකා වස්තුව පැහැර ගෙන ගියහ. එබැවින් ගෙවල් දොරවල් පිළිසකර කර ගැනීමටත් නගරය වටා පවුරු ප්‍රකාර ඉදි කිරීමටත් නුවර වැසියනට සිදු විය. කාර්‍යය බහුල වූ බැවින් මේ අයට තමන් කැමති පරිද්දෙන් භික්ෂූන්ට ඇප උපස්ථාන කිරීම අසීරු විය. මේ නිසා භික්ෂූන් වහන්සේලා ද වැසි සමය ගත කළේ බොහෝ දුෂ්කරතා මධ්‍යයේ ය. කෙසේ වුවද වස් පවාරණය කොට භික්ෂූන් වහන්සේලා සිරිත් පරිදි බුදුන් බැහැ දැකීමට දෙව්රම් වෙහෙරට පැමිණියහ.

බුදුරජාණන් වහන්සේ වැසි සමය තුළ මෙම භික්ෂූන්ට අත්විඳීමට සිදු වූ දුෂ්කරතා දැනගෙන ඒ කරුණ අරභයා මෙසේ ධර්ම දේශනා කළ සේක. "මහණෙනි, සෑම විටකම සුවසේ දිවි රැක ගැනීම පහසු නොවෙයි. ජීවිතයකට සුව පහසුව මෙන්ම දුෂ්කරතා ද එකසේ පැමිණෙයි. මේ නිසා හැම මොහොතක්ම අපතේ නොයවා තමාගේ ආරක්ෂාව සඳහා කඩිසර විය යුතුය. ආත්මදමනය කර ගැනීමෙන් තමාගේ ආරක්ෂාව සැලසෙයි. නගරයක් ඇතුළතින් හා පිටතින් ආරක්ෂා කර ගත යුතු වූවාක් මෙන්ම තමාගේ පිහිට-විමුක්තිය තම තමා ඉක්මණින් සලසා ගත යුතුය. පමා වීම පරාජයට හේතු වෙයි". මෙසේ ධර්ම දේශනා කළ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව ප්‍රකාශ කළ සේක.

විස්තරාත්මක විවරණය (315 ගාථාව)

යථා පච්චන්තං සන්තරබාහිරං ගුත්තං නගරං එවං
අත්තානං ගොපෙථ වෙ ඛණො මා උපච්චගා ඛණාතීතා
හි නිරයංහි සමප්පිතා සොචන්ති

යථා: යම් සේ; **පච්චන්තං**: ප්‍රත්‍යන්ත දේශයක වූ; **සන්තරබාහිරං ගුත්තං**: ඇතුළත හා බාහිර රැකවරණය ඇති; **නගරං**: නුවරක් වේද; **එවං**: එසේ; **අත්තානං**: තම සිත; **ගොපෙථ**: රැකවරණය කර ගන්න; **වෙ**: ඒකාන්තයෙන්ම; **ඛණො**: ක්ෂණය (මොහොත) ද; **මා උපච්චගා**: නිකරුනේ ගෙවී නොයේවා; **ඛණාතීතා හි**: කාලය ගෙවා දැමුවෝ; **නිරයංහි**: අපායෙහි; **සමප්පිතා**: එළැඹියාහු; **සොචන්ති**: ශෝක කරති.

පසල් දනව්වක වූ නගරයක් ඇතුළත හා බාහිර යන දෙපැත්තෙන්ම ආරක්ෂා කරන්නාක් සේ තමාගේ සිත ආරක්ෂා කර ගන්න. මොහොතකුදු අපතේ නොයවන්න. නිකරුනේ කාලය ගෙවා දැමුවෝ අපායට එළඹ දුක් විඳිති.

විවරණය

අත්තානං ගොපෙථ : මෙයින් අදහස් කරන්නේ භෞතික විපත් කරදරවලින් තමා ආරක්ෂා කර ගැනීම නොවේ. භික්ෂුවක් තමා ආරක්ෂා කර ගැනීම යන්නෙන් අදහස් වන්නේ තම සිතට කෙලෙස් සතුරනට ඇතුළු වීමට ඉඩ නොදීමයි. සිතට කෙලෙස් ඇති වීමෙන් සිතේ පිවිතුර විනාශ වෙමින් අපවිත්‍ර භාවයට පත් වෙයි. ප්‍රකෘති සිත ස්වභාවයෙන් පිරිසිදු වුවත් එයට උපක්ලෙෂ නැමති සතුරන්ගේ පිවිසීම නිසා එහි කෙලසීම ඇති වෙයි. මෙසේ සිත කෙලසීමට ඉඩ නොදෙමින් එය ආරක්ෂාකර ගන්නේ නම් තමාට ඉක්මනින් විමුක්තිය නමැති අභයස්ථානයට පත්විය හැකිය. සියලු දුක් විපත් කරදර කම්කටොලු විරහිත වූ තැන ලෙස දැක්වෙන විමුක්තිය හැඳින්වී ඇත්තේ ක්ෂෙම භූමියක් ලෙසය. මෙම ක්ෂෙම භූමියට පත් වීමෙහි ලා දරන උත්සාහය මොහොතකුදු පමා නොකරන ලෙස මෙම ගාථාවෙන් උපදෙස් දෙයි. අපතේ ගෙවී යන මොහොත පවා තමාට දුක් කරදර ගෙන දීමට සමත් වෙයි.

පුද්ගලයකු ගේ මනස ආරක්ෂා කර ගැනීම යනු මනස පිරිසිදුව තබා ගැනීමයි. විමුක්තිය ලබා ගැනීමට සත්‍යය දැකිය යුතුය. සත්‍යය දැක ගත හැක්කේ මසැසට නොව මනසටය. පිවිතුරු වූ මනසින් සත්‍යය දැකීමට අවස්ථාව ලැබෙන බැවින් මානසික පාරිශුද්ධිය ලැබීම බෞද්ධ විමුක්ති මාර්ගයේ බෙහෙවින්ම වැදගත් අඩියරකි. භාවනාව නිර්දේශ වී ඇත්තේ මේ සඳහාය. මෙම ගාථාවෙන් විශේෂයෙන් කෙරෙන උපදේශය වන්නේ 'සිත පිරිසිදු කර ගැනීම සිදුවන භාවනාමය කාර්යදාමයෙහි නොපමාව යෙදෙන්න' යන්නයි. ගත වන මොහොතද අපතේ යාමකි.

කෙලෙස් සිතට ඇතුළුවීම වළක්වාලිය හැකි එක් ක්‍රමයක් ලෙසින් ඉන්ද්‍රිය සංවරය බුදුසමයෙන් නිර්දේශ වී තිබේ. බාහිර ලෝකයෙහි විෂය වස්තු සම්බන්ධයෙන් ඉන්ද්‍රිය මාධ්‍යයෙන් කෙලෙස් නිපදවයි. කෙලෙස් යනු බාහිරත්වයේ සිට මනසට ඇතුල්වන්නක් නොවේ. බාහිරත්වය පදනම් කොට ඇතිවන සිතේ ක්‍රියාකාරිත්වය මතම සිත තුළ නිෂ්පාදනය වන්නකි. එබැවින් එසේ කෙලෙසුන් බිහිනොවන අයුරින් ක්‍රියාකිරීමෙහිලා ඉන්ද්‍රිය පාලනයෙන් වැදගත් ක්‍රියාදාමයක් සිදු වෙයි. බුදුරජාණන් වහන්සේ බාහිය දාරුචීය අරහයා ඉන්ද්‍රියයන් මගින් කෙලෙස් ඇති නොවන අයුරින් එම ඉන්ද්‍රියයන් පාලනය කර ගත යුතු වන්නේ කෙසේදැයි පැහැදිලි කොට ඇත.



ලජ්ජා නො විය යුතු තැන ලජ්ජාවන, ලජ්ජා විය යුතු තැන ලජ්ජා නො වන, මිසදුටු ගත් අය අපායට යෙත්.

316. අලජ්ජිතායෙ ලජ්ජන්ති
ලජ්ජිතායෙ න ලජ්ජරෙ
මිච්ඡාදිට්ඨිසමාදානා
සත්තා ගච්ඡන්ති දුග්ගතිං (22:11)

ලජ්ජාවනු පෙනේ විය යුතු නැති තැනදී
ලජ්ජා නොවේ ලජ්ජා විය යුතු තැනදී
මිසදිටු හරි ලෙසින් පිළිගත හොත් වැරදී
එවන් දනෝ දුක් විඳලති දුගතියෙදී

ලජ්ජාවන්න - ලජ්ජා විය යුතු තැනදී

22 (8) අඩ නිරුවත් නිගණ්ඨ පිරිසක් (316 සහ 317 ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ සිරුරේ ඉදිරිපස පමණක් වස්ත්‍රයෙන් වසාගත් **නිගණ්ඨ පිරිසක්** අරභයා මෙම ගාථාද්වය වදාළ සේක.

දිනක් මේ නිගණ්ඨ පිරිස සිරුරේ ඉදිරිපස පමණක් වැසෙන සේ වස්ත්‍ර දරාගෙන නිවෙස්වල පිඩු පිණිස හැසුරුණාහුය. භික්ෂූන්වහන්සේලා මේ නිගණ්ඨයින් දැක ඔවුන් ගැන මෙසේ විවේචනයෙහි යෙදුණාහ.

"මේ නිගණ්ඨයෝ සම්පූර්ණයෙන්ම වස්ත්‍ර නැති අචෙලක පිරිවැජියන්ට වඩා ශිෂ්ටය. මොවුහු ඉදිරිපස පමණක් වුවද වසා ගෙන හැසිරෙති. අචෙලකයෝ නග්නවම හැසිරෙති." භික්ෂූන්ගේ මේ විවේචනය ඇසූ නිගණ්ඨයෝ මෙසේ පැවසූහ. "අපි ලජ්ජාව නිසා මෙසේ ඉදිරිපස වසා ගෙන නොසිටිමු. අප ආහාර ගන්නා පාත්‍රයට දූවිලි වැටේය යන බිය නිසා පාත්‍රා වසා ගැනීමට එසේ වස්ත්‍ර දරමු. දූවිලි වල ද ජීවය ඇත. ඒ ජීවීන් පාත්‍රවලට වැටීමෙන් ඔවුන්ගේ ජීවිත අනතුරුවලට භාජනය වන නිසා ඒ පාත්‍රා වැසෙන සේ මෙසේ වස්ත්‍ර දරමු."

බුදුරජාණන් වහන්සේට මේ පුවත සැලවීමෙන් පසු උන්වහන්සේ භික්ෂූන්ට මෙසේ පැවසූහ. "මහණෙනි, ආහාර ගන්නා පාත්‍රය කෙතෙක් වෙලා සඟවා තබාගත්තත් අනුභව කරන විටත් ආහාර ලබා ගන්නා විටත් ඒවා විවෘතවම තබා ගැනීමට සිදු වෙයි. ආහාර ගන්නා භාජන විවෘතව තැබීම ලජ්ජාවට හේතුවක් ද නොවෙයි. එහෙත් මෙම නුවටෝ ලජ්ජා විය යුතු දේට ලජ්ජා නොවෙති. ලජ්ජා නොවිය යුතු තැනම ලජ්ජා වෙති.

ඔවුහු මිථ්‍යාදෘෂ්ටි පිළි ගැනීමෙහිලා ලජ්ජා විය යුත්තාහ. එහෙත් එසේ ලජ්ජා විය යුතු තැන ලජ්ජා නොවී මිථ්‍යාදෘෂ්ටි දරමින්ම හැසිරෙති"මෙසේ වදාළ භාග්‍යවතුන් වහන්සේ යථොක්ත ගාථා ද්වයෙන් ධර්ම දේශනා කළ සේක.

විස්තරාත්මක විවරණය (316 ගාථාව)

අලජ්ජිතායෙ ලජ්ජන්ති ලජ්ජිතායෙ න ලජ්ජරෙ
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා දුග්ගතිං ගච්ඡන්ති

අලජ්ජිතායෙ: ලජ්ජා නොවිය යුත්තෙහි; **ලජ්ජන්ති**: ලජ්ජා වෙති; **ලජ්ජිතායෙ**: ලජ්ජා විය යුත්තෙහි; **න ලජ්ජරෙ**: ලජ්ජා නොවෙති; **මිච්ඡාදිට්ඨි සමාදානා**: මිසදිටු ගැනීමෙන්; **සත්තා**: සත්වයෝ; **දුග්ගතිං**: දුගතියට; **ගච්ඡන්ති**: යති.

ලජ්ජා නොවිය යුත්තෙහි ලජ්ජා, වෙති, ලජ්ජා විය යුත්තෙහි ලජ්ජා නොවෙති, මිසදිටුගත් පුද්ගලයෝ නිරයට යති.

විවරණය

මිච්ඡාදිට්ඨි සමාදානා: පිළිගැනීම හෙවත් දෘෂ්ටිය දෙපරිදි වෙයි. ඒ මිච්ඡාදිට්ඨි සම්මාදිට්ඨි වශයෙනි. දිට්ඨි යන වචනය බොහෝ දුරට අපථවත් වන්නේ ආගමික ක්ෂෙත්‍රයෙන්ය. පුද්ගලයා හා විශ්වය පිළිබඳව කෙරෙන ආධ්‍යාත්මික විවරණයන් හි පුද්ගලයාගේ ස්වභාවය, පුද්ගලයාගේ හට ගැනීම, විශ්වයේ ආරම්භය, එහි ස්වභාවය හා එහි අවසානය ආදිය පිළිබඳව ආගමික ක්ෂෙත්‍රයන්හි විවිධ මත පළ වී තිබේ. මේ මත ඉදිරිපත් වී ඇති ස්වභාවය අනුව බුදුරජාණන් වහන්සේ විසින් ඒවා සම්මා දිට්ඨි හා මිච්ඡා දිට්ඨි වශයෙන් දෙගනයකට වෙන්කර ඇති සැටි විවිධ සූත්‍ර ධර්මයන් ගෙන් හෙළි වෙයි.

බ්‍රහ්මජාල සූත්‍රයේ දී පුද්ගලයා හා විශ්වය පිළිබඳව විවිධ ආගමික ශාස්තෘවරුන් විසින් ඉදිරිපත් කරන ලද දෘෂ්ටි හැට දෙකක් බුදුන්වහන්සේගේ විවේචනයට භාජනය වෙයි. මෙම දෘෂ්ටි එම ශාස්තෘවරුන් විසින් ඉදිරිපත් කර ඇත්තේ කෙසේ ද යන්න ගැන ද බුදුන් වහන්සේ සඳහන් කොට ඇත.

මෙම දෘෂ්ටි ක්‍රම දෙකකින් ඉදිරිපත් වී ඇත. ඇතැම් ශාස්තෘවරුන් භාවනාව මගින් සිත දියුණු කර ගැනීමෙන් ලබන ලද ප්‍රඥාවෙන් පුද්ගලයා හා විශ්වය පිළිබඳව දෘෂ්ටි ඉදිරිපත් කොට ඇත. ඇතැම් ශාස්තෘවරුන් විසින් ස්වකීය තාර්කික බුද්ධිය, කල්පනික චින්තනය මෙහෙයවා දෘෂ්ටි ඉදිරිපත් කොට ඇත.



බිය නො විය යුතු තැන බියවන, බිය වියයුතු තැන බිය නො වන, මිසදුටු ගත් අය අපායට යෙත්.

317. අභයෙ ච භය දස්සිනො
භයෙ චා'භයදස්සිනො
මිච්ඡාදිට්ඨි සමාදානා
සත්තා ගච්ඡන්ති දුග්ගතිං (22:12)

ඇතැම් සත්වයෝ
බිය නොවිය යුත්තට බිය වී
බිය විය යුත්තට බිය නො වී
මිසදිටු ගැනීමෙන් අපායට යත්.

නොබියව ඉන්න - බිය විය යුතු නැති තැන දී

22 (8) අඩ නිරුවත් නිගණ්ඨ පිරිසක් (316 සහ 317 ගාථා)

විස්තරාත්මක විවරණය (317 ගාථාව)

අභයෙ භයදස්සිනො භයෙ අභයදස්සිනො ච සත්තා
මිච්ඡාදිට්ඨිසමාදානා දුග්ගතිං ගච්ඡන්ති

අභයෙ: බිය නොවිය යුත්තෙහි; **භයදස්සිනො**: බිය දක්නා සුලු වූත්; **භයෙ**: බිය විය යුත්තෙහි; **අභය දස්සිනො ච**: බිය නොදක්නා සුලු වූත්; **සත්තා**: සත්වයෝ; **මිච්ඡාදිට්ඨි සමාදානා**: මිසදිටු පිළි ගැනීමෙන්; **දුග්ගතිං**: දුගතියට; **ගච්ඡන්ති**: යති.

බිය නොවිය යුත්තෙහි බිය දකින්නා වූත් බිය විය යුත්තෙහි බිය නො දකින්නා වූත් සත්වයෝ මිසදිටු පිළි ගැනීමෙන් නිරයට යති.

විවරණය

මිච්ඡාදිට්ඨි සමාදානා: බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් දෘෂ්ටි ඉදිරිපත් වී ඇති ක්‍රම දෙකේම දුර්වලතා නිසා එම දෘෂ්ටි සම්මාදෘෂ්ටි තත්වයෙන් පිළි නොගත හැකි බව බෞද්ධ මතයයි. භාවනාව මගින් කිසියම් ආධ්‍යාත්මික දියුණුවක් ලබාගෙන ලෝකය හා පුද්ගලයා සම්බන්ධ මත ඉදිරිපත් කර ඇතත් එම ආධ්‍යාත්මික දියුණුව පරිපූර්ණ ආධ්‍යාත්මික දියුණුවක් ලෙස බුදුන් වහන්සේ පිළි නොගනිති. අපරි පූර්ණ වූ ප්‍රඥාවෙන් යථාර්ථය මනාව නොවැටහෙන බැවින් එම ශාස්තෘවරුන් විසින් තම මත පළ කොට ඇත්තේ එම ශාස්තෘවරුන්ගේ ඥානයට ලෝකයේ ස්වභාවය දක්නට ලැබෙන පරිද්දෙනි. තර්කය හා විමංසනය මත පදනම් වෙමින් කාල්පනික ප්‍රඥාවෙන් ඉදිරිපත් කෙරෙන මත ද යථාර්ථය ඉදිරිපත් නොකරයි. කල්පනික ඥානය සීමා විය යුත්තේ ඉන්ද්‍රිය අනුභූති ක්ෂෙත්‍රයටය. ඉන්ද්‍රිය අනුභූතිය ඉක්මවා ඇති ලෝකය හා පුද්ගලයා පිළිබඳ ක්ෂෙත්‍රය තාර්කික වූ කාල්පනික බුද්ධියට ග්‍රහණය කළ නොහැක. මේ නිසා ඉහතින් දක්වන ලද ක්‍රම දෙකින්ම ඉදිරිපත් වී ඇති මත මිථ්‍යා දෘෂ්ටි ගනයට වැටෙයි.

ආධ්‍යාත්මික ක්ෂෙත්‍රය සම්බන්ධයෙන් බුදුන් වහන්සේ ගේ දර්ශනය මිථ්‍යාදෘෂ්ටි ගණයට නොවැටෙයි. උන්වහන්සේ ලෝකයේ හා පුද්ගලයාගේ ස්වභාවය යථාර්ථ වශයෙන් ස්වකීය පරිපූර්ණ ඥාණයෙන් අවබෝධ කළ පුද්ගලයා ය. බුද්ධ හෙවත් ප්‍රබුද්ධ වූ පුද්ගලයා ලෙස බුදුන් වහන්සේ හැඳින්වෙන්නේ පූර්ණ ප්‍රඥා චක්ෂුස උන්වහන්සේට පහළ වූ හෙයිනි. උන්වහන්සේ ගේ ප්‍රථම ධර්ම දේශනයේ දීම තමා බුද්ධත්වය ලබා ගත් පුද්ගලයා බවට අභීත ප්‍රතිඥාවක් ලෝකයා හමුවේ ඉදිරිපත් කොට තිබේ.

පූර්ණ ප්‍රඥාවෙන් ඉදිරිපත් වන ආධ්‍යාත්මික විවරණ දෘෂ්ටි නොව සත්‍යයයි. බුදුන් වහන්සේ ඉදිරිපත් කළ සත්‍යයන් තවත් කෙනකුට සත්‍ය විය හැක්කේ ඔහු විසින් ද ඒවා අවබෝධ කළ විටය. අවබෝධය නොමැති තැන සත්‍යයක් නැත. අවබෝධයෙන් ඉදිරිපත් කළ කරුණු පවා අවබෝධය නැත්තාට දෘෂ්ටියක් වෙයි. එහෙත් ඒවා අසත්‍යය නොවන බැවින් මිත්ථ්‍යාදෘෂ්ටිද නොවේ. ඒවා අවබෝධයෙන් සත්‍යය බවට පත් කරගත හැකි බැවින් සම්‍යක් දෘෂ්ටි වෙයි.

මිථ්‍යාදෘෂ්ටි භාර ගැනීම නිසා පුද්ගලයාට නිසි පරිදි තම ආධ්‍යාත්මික විශුද්ධිය ලබාගත නොහැකි වෙයි. ආධ්‍යාත්මික ක්ෂෙත්‍රයේ දී ශාස්තෘවරුන් විසින් නිෂ්ටාවක් හා එම නිෂ්ටාව අත්පත් කර ගත හැකි උපායක් ද ඉදිරිපත් කොට ඇත. නිෂ්ටාව මිත්ථ්‍යාවක් වූ විට කවර උපායකින් වුවද එම නිෂ්ටාව අත්පත් කර ගත නොහැකිය. නොමැති දෙයක් ලබා ගැනීමට ක්‍රමයක් නැත. ලබා ගැනීමේ ක්‍රමය සාර්ථක වන්නේ ලබා ගැනීමට කිසියම් නිශ්චිත දෙයක් ඇති විටය. බුදුන් වහන්සේ ආධ්‍යාත්මික නිෂ්ටාව ස්වකීය ඥානයෙන්ම අත්පත් කර ගත් පුද්ගලයා ය. එබැවින් බෞද්ධයාට නිශ්චිත වූත් තීරණාත්මක වූත් නිෂ්ටාවක් තිබේ. එය ක්ලෙෂ නිරෝධයයි. එම නිෂ්ටාව සඳහා උපාය මාර්ගය ද බුදුරජාණන් වහන්සේ තමාගේ අත් දැකීමෙන්ම එහි සාර්ථකත්වය මනාව දැනගෙන ලෝකයා්ට ඉදිරිපත් කරන ලද්දකි. මධ්‍යම ප්‍රතිපදාව, ආර්‍ය අෂ්ටාංගික මාර්ගය, විසුද්ධි මාර්ගය, විමුක්ති මාර්ගය ආදී නම් වලින් දැක්වෙන්නේ එම උපාය මාර්ගයයි. එහි පළමු පියවර සම්මා දිට්ඨිය යි. සම්මා දිට්ඨිය නොමැත්තේ නම් එම උපාය මාර්ගයෙන් ගමන් කළ නොහැක.

මිච්ඡාදිට්ඨි වලින් ඉදිරිපත් වී ඇත්තේ මිථ්‍යා උපාය මාර්ගය බැවින් ඒවා පුද්ගල සන්තානයෙන් ක්ලෙෂ ක්ෂයවීමට නොව ක්ලෙෂ වර්ධනයට හේතු වෙයි. නිරෝධයට නොව සංසාරයට හේතු වෙයි. විමුක්තියට නොව බන්ධනයට හේතු වෙයි. එබැවින්, බුදුරජාණන් වහන්සේ මිථ්‍යාදෘෂ්ටි සම්බන්ධයෙන්, "**න උපසමාය න නිරොධාය, න සම්බොධාය න නිබ්බාණාය සංවත්තති**" යනුවෙන් ප්‍රකාශ කරන්නේ.

ලෝකයට මුලක් තිබේ.
ලෝකයට මුලක් නැත.
ලෝකයට මුලක් තිබේ, අවසානයක් නැත.
ලෝකයට මුලක් ද තිබේ, අවසානයක් ද තිබේ.
ජීවය හා ශරීරය අනන්‍යය.
ජීවය හා ශරීරය අන්‍යය.
පුද්ගලයාට ආත්මයක් ඇත.
පුද්ගලයාට ආත්මයක් නැත.

මේ, ලෝකය හා පුද්ගලයා සම්බන්ධයෙන් ආගමික ක්ෂෙත්‍රයෙන් ඉදිරිපත් වී ඇති දෘෂ්ටි සමහරෙකි. බුදු දහම මේ දෘෂ්ටි සියල්ල මිථ්‍යාදෘෂ්ටි වශයෙන් සලකා ප්‍රතික්ෂේප කරයි.

බුදුරජාණන් වහන්සේ පුද්ගලයා පිළිබඳව සිය බුද්ධත්වය මගින් විමර්ශනය කරන ලද්දේ පුද්ගලයාගේ ස්වභාවය වටහා ගැනීමට ය. පුද්ගලයාට පුද්ගලයාගෙන් බාහිර වූ මුලක් තිබේද නැත්ද යන කරුණු උන්වහන්සේ විමසා බැලුවේ නැත. ආත්මයක් තිබේදැයි නැත්දැයි විමසා බැලුවේ නැත. පුද්ගලයා තුළ ක්‍රියාත්මක වන ස්වභාවය කුමක්ද යන්න උන්වහන්සේගේ ගවේෂණයන්ට ක්ෂෙත්‍රය විය. එබැවින් පුද්ගලයා සම්බන්ධයෙන් පුද්ගලයාගෙන් බාහිර වූ සත්‍යතාවන් බෞද්ධ දර්ශනයෙන් ඉදිරිපත් නොවෙයි. බුදු දහමට අනුව ලෝකය යනු ද පුද්ගලයාමය. ලෝකයේ සත්‍යය ද පුද්ගලයාගේ සත්‍යයමය. බුදුන් වහන්සේ ලෝකයාත් ලෝකයේ හට ගැනීමත් ලෝකයේ නිරොධයත්, ලෝක නිරොධ ගාමිනී මාර්ගයත් යන චතුරාර්ය සත්‍යයම පුද්ගලයාගේ සවිඥානක වූ මේ ශරීරය තුළම දකිති. ප්‍රතීත්‍ය සමත්පන්නව හේතුඵල නියාමතාව අනුව පුද්ගලයා හට ගන්නා බවත් එබැවින් පුද්ගලයාගේ හට ගැනීම ඇති කරවන හේතුවක් ඇති බවත් එම හේතුව නිරෝධය කළ හොත් පුද්ගල නිරෝධය ඇතිවන බවත් ඊට අදාළ වන උපාය මාර්ගයක් පවත්නා බවත් ඊට අදාළවන උපාය මාර්ගයත් පවත්නා බවත් උන්වහන්සේ අවබෝධ කළ සේක.



නිවර ද දෑ වරද සේ ද වරද දෑ නිවර ද සේ ද සලකන මිසදිටු ගත් අය අපායට යෙත්.

318. අවජ්ජෙ වජ්ජදස්සිනො
වජ්ජේ චා'වජ්ජදස්සිනො
මිච්ඡාදිට්ඨිසමාදානා
සත්තා ගච්ඡන්ති දුග්ගතිං (22:13)

නිවරද වරදැයි දක්නෝ
වරදෙහි නිවරද දක්නෝ
මිසදුටු හරියය යන්නෝ
ඔහු වෙති නිරයට යන්නෝ

දැක්කොත් වරදෙහි නිවරද - වරදින්නේමය හැමවර

22 (9) නිගණ්ඨ ශ්‍රාවක පිරිසක් (318 සහ 319 ගාථා)

නිග්‍රොධාරාමයෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **තීර්ථක ශ්‍රාවක පිරිසක්** අරභයා මෙම ගාථා ද්වය වදාළ සේක.

තීර්ථක ශ්‍රාවකවරු ඔවුන්ගේ ශාස්තෘවරුන් ගේ ධර්මයන් පිළිබඳ ව දැඩි භක්තිය ඇත්තෝ ය. තම දරුවන් බුදුන් වහන්සේ හෝ බෞද්ධ භික්‍ෂූන්වහන්සේලා වැඩ සිටි විහාරාරාම වලට යනු දැකීමට කැමති නොවූහ. තීර්ථක දෘෂ්ටි අතහැර බුදුසමය වැළඳ ගනීය යන බියෙන් ඔවුහු තම දරුවනට බෞද්ධ ආශ්‍රමවලට යාම තහනම් කළ හ. බුදුන් වහන්සේ හෝ භික්‍ෂූන් වහන්සේලා සමඟ කථා බහ කිරීමත් විහාරවලට ඇතුළු වීමත් නොකරන ලෙසට ඔවුහු තම දරුවන් සපථ කරවා ගත්හ.

දිනක් බුද්ධශ්‍රාවකයන්ගේ දරුවන් පිරිසක් හා තීර්ථක ශ්‍රාවක වරුන්ගේ දරු පිරිසක් බුදුරජාණන් වහන්සේ වැඩ සිටි විහාරය සමීපයෙහි ක්‍රීඩා කරමින් සිටියහ. ක්‍රීඩා කරන අතරතුර ඔවුනට දිය පිපාසය ඇතිවිය. ඔවුනට දිය බීමට අවශ්‍ය නමුත් විහාරයට නොගොස් දිය ලබා ගැනීමට ක්‍රමයක් නොවීය.

එබැවින් තීර්ථක ශ්‍රාවක දරුවෝ බෞද්ධශ්‍රාවක දරුවනට මෙසේ කීහ. "විහාරයට ඇතුළු විය නොහැකි සේ අපේ මව්පියන් අපව සපථ කරවාගෙන ඇත. එබැවින් දිය බීමට අපට විහාරයට යා නොහැකිය. ඔබ විහාරයට ගොස් දිය බී අපටත් දිය රැගෙන එන්න." බොදු සව්වන්ගේ දරුවෝ විහාරයට ඇතුල්ව දිය ද බී බුදුරජාණන් වහන්සේ වෙත ගොස් වැඳ නමස්කාර කොට තමන් විහාරයට ආ පුවත ද සැළ කළහ. එවිට බුදුරජාණන් වහන්සේ ඔවුනට පැවසුවේ "පිටත සිටින දරුවනට දිය ගෙන නොගොස් ඔවුනට ද මෙහි පැමිණ දිය බොන්නටය"යි දන්වන ලෙසය.

ඔවුහු ද ගොස් පිටත සිට තම යහළුවන්ට එසේ පැවසූහ. දිය පිපාසය බලවත් බැවින් ද බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රකාශය බලවත් බැවින් ද ඔවුනට විහාරයට පැමිණීමට සිදු විය. ඔවුන් දිය පානය කළ පසු බුදුරජාණන් වහන්සේ ඔවුන් අමතා ඔවුන්ගේ චරිතාංගවලට අනුකූල අයුරින් ධර්මය දේශනා කළ සේක. මෙම තරුණ පිරිස ද ධර්මය අසා පැහැදී තෙරුවන් සරණ ගියහ.

ක්‍රීඩාවෙන් පසු නිවෙස්වලට ගිය දරුවන්ගෙන් තමන්ට බුදුන් වහන්සේගෙන් ධර්මය ඇසීමට අවස්ථාවක් ලැබුණු බවත් එය අසා තමන් තෙරුවන් කෙරෙහි පැහැදුණු බවත් මව්පියන්ට දැන ගැනීමට ලැබිණ. එය දැන ගත් ඇතැම් දෙමාපියෝ බෙහෙවින් තැතිගැන්මට පත් වූහ. තම දරුවන් මිසදිටු වැළඳගත් බවත් එයින් දරුවන් මහත් විනාශයකට පත් බවත් කියමින් ඔවුහු මහත් කලබලයක් කළහ. එහෙත් ඇතැම් බුද්ධිමත් දෙමාපියෝ කිසිදු කලබලයක් නොකර තම දරුවන්ට දොස් නොනඟා අනෙක් දෙමාපියන් ද සනසා දරුවන් සමඟම විහාරයට ගොස් බුදුන් හමුවී කථා කිරීමේ වැදගත් කම පැහැදිලි කළ හ.

ඒ අනුව යළිත් දෙමාපියෝ දරුවන් සමඟ විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේ සම්මුඛ වී උන්වහන්සේට සවන් දුන් හ. උන්වහන්සේ සියලු පිරිසට ගැලපෙන අයුරින් ධර්ම දේශනා කළ සේක. දේශනාව කෙළවර බොහෝ දෙනාම බෙහෙවින් සතුටට පත්ව තෙරුවන් සරණ යමින් තමන් මින් මතු බෞද්ධයන් බවට පත් වූ බවට ප්‍රතිඥා දුන් හ.

විස්තරාත්මක විවරණය (318 ගාථාව)

අවජ්ජෙ වජ්ජදස්සිනො ච වජ්ජෙ අවජ්ජදස්සිනො ච
මිච්ඡාදිට්ඨි සමාදානා සත්තා දුග්ගතිං ගච්ඡන්ති

අවජ්ජෙ: නිවැරද්දෙහි; **වජ්ජදස්සිනො ච**: වරද දක්නා සුලු වූත්; **වජ්ජෙ**: වරදෙහි; **අවජ්ජදස්සිනො ච**: නොවැරද්ද දක්නා සුලු වූත්; **සත්තා**: පුද්ගලයෝ; **මිච්ඡාදිට්ඨි සමාදානා**: මිසදුටු පිළිගැනීමෙන්; **දුග්ගතිං**: දුගතියට; **ගච්ඡන්ති**: යති.

නිවැරදි දෙයෙහි වැරද්ද දක්නා සුලු වූත්, වැරද්දෙහි නිවැරදි බව දක්නා සුලු වූත් පුද්ගලයෝ මිසදිටු ගැනීමෙන් දුගතිගාමී වෙති.

වරද දෑ වරද සේ ද නිවරද දෑ නිවරද සේ ද දැන සම්දිටු ගත් අය සුගතියට යෙත්.

319. වජ්ජඤ්ච වජ්ජතො ඤත්වා
අවජ්ජඤ්ච අවජ්ජතො
සම්මාදිට්ඨිසමාදානා
සත්තා ගච්ඡන්ති සුග්ගතිං (22:14)

වරදෙහි වරද දැන
නිවැරැද්දෙ නිවරද දැන
සම්දිටු ද පිළි ගෙන
දනෝ වෙත්මැයි සුගතියට යන

වරදෙහි වරද දක්නේ - නිවරදම පිළිගන්නේ
22 (9) නිගණ්ඨ ශ්‍රාවක පිරිසක් (318 සහ 319 ගාථා)

විස්තරාත්මක විවරණය (319 ගාථාව)

වජ්ජඤ්ච වජ්ජතො ච අවජ්ජං අවජ්ජතො ච ඤත්වා සත්තා සම්මාදිට්ඨිසමාදානා සුගතිං ගච්ඡන්ති

වජ්ජඤ් ච: වරද; **වජ්ජතො**: වරද ලෙසින් ද; **අවජ්ජං**: නිවරද; **අවජ්ජතො**: නිවරද ලෙසින් ද; **ඤාත්වා**: දැන; **සත්තා**: පුද්ගලයෝ; **සම්මාදිට්ඨිසමාදානා**: නිවැරදි දැක්ම පිළි ගැනීමෙන්; **සුගතිං**: සුගතියට; **ගච්ඡන්ති**: යති.

වරද වරද ලෙසින් ද නිවරදි දෙය නිවරදි ලෙසින් ද දක්නා පුද්ගලයෝ නිවැරදි දැකුම පිළිගෙන සුගතිගාමී වෙති.

විවරණය

දුගති: දුක වේදනාව බහුල වූ භූමි දුගති භූමි ලෙස සැලකෙයි. මෙම දුගති භූමිවල ඉපදෙන්නේ අකුශල කර්මවල විපාක වශයෙනි. මේවා ගණනින් සතරක් කොට දැක්වේ. සතර අපාය ලෙසින් ද මේවා හැඳින්වෙයි.

1. **නිරය**: ප්‍රීතිය රහිත තැන යන අරුතින් නිරය නම් වෙයි. මෙහි උපත ලබන්නන්ට තම කර්ම ශක්තිය අවසන් වනතුරු විවිධ දුක් වේදනා විඳීමට සිදු වෙයි. බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වන නිරය සදාකාලිකව දුක් විඳින තැනක් ලෙස පිළි නොගැනෙයි. නිරයෙහි ප්‍රතිසන්ධිය ඇති කළ කර්මයේ විපාක විඳ අවසන් වූ පසු එම පුද්ගලයාගේ චුති චිත්තයට අනුකූල ලෙස වෙනත් භවයක උපත ලැබීමේ හැකියාව ඇත.

2. **තිරච්ඡානයොනි**: තිරිසන් සත්ව ලෝකයයි. කෙනකු මෙහි උපත ලබන්නේ ද අකුශල කර්ම විපාක වශයෙනි.

3. **පේත යොනි**: පේත යන්නෙහි අර්ථය මළගියවුන් යන්නයි. බෙහෙවින් දුක් සහිත තැනක් ලෙස විවරණය වෙයි. අකුසල් කොට මළගිය අය තමන්ගේ කර්ම විපාක අනුව ප්‍රේත යෝනියෙහි උපදිති. ප්‍රේතයිනට විශේෂ ලොවක් ගැන සඳහන් නොවෙයි. ඔවුන් මනුෂ්‍ය ලෝකයෙහිම වන ගහන, අගුපිල්, කුණු ගොඩවල්, සොහොන් බිම් ආදියෙහි වෙසතැයි පිළි ගැනෙයි. මොවුනට විවිධ ආකාරයෙන් විකෘතියට පත් රූපකායක් ද ඇති බව පැවසෙයි. එහෙත් මිනිසුන්ගේ පියෙවි ඇසට ඔවුන් දැක ගත නොහැකි බව ද විශ්වාස කෙරෙයි.

4. **අසුර යොනි**: අසුර යෝනියෙහි උපදින අසුරයන් දෙවියන්ට හෙවත් සුරයිනට විරුද්ධ කම් දක්වන පිරිසකැයි විශ්වාස කෙරෙයි. කෙසේ වුවද මෙය ද දුක් කම් කටොලු සහිත දුගතියක් ලෙස නම් කොට ඇත.

මෙම කථාවෙහි සඳහන් වන අන්දමට නිගණ්ඨ ශ්‍රාවකයන් තම දරුවනට බුදුරදුන් හා භික්ෂූන් වෙසෙන විහාරයට යාමට පවා තහනම් කොට තිබූ බවක් හෙළි වෙයි. මෙය බොහෝ විට නිගණ්ඨයන්ගේ අනුශාසනා නිසා ශ්‍රාවකයන් තුළ ඇති වූ ආකල්පයක් වීයයි සිතිය හැකිය. මේ අනුව පෙනී යන්නේ නිගණ්ඨයන් තුළ අන්තර් සාමායික වශයෙන් කිසිදු සහනශීලතාවක් නොතිබුණු බවයි. තමන් කැමති ආගමක් වැළඳ ගැනීමේ නිදහස නිගණ්ඨයන් තම ශ්‍රාවකයන්ගෙන් අහිමි කොට තිබූ බවක් මෙයින් පෙනෙයි. බුදු සමය සමඟ සසදා බලන කල පුද්ගලයා ගේ ආගමික නිදහස බුදු දහමින් තරම් අන් කවර ආගමකින්වත් අවධාරණය නොවන බව පෙනේ. තමන්ගේ ධර්මය පවා පරීක්ෂා කර බලා පිළිගත යුතු බව බුදුන්වහන්සේ තම ශ්‍රාවකයන්ට ප්‍රකාශ කොට තිබේ. වරක් නිගණ්ඨයන්ගේ ප්‍රධාන පෙළේ දායකයකු වන උපාලි සිටුවරයා බුදු සමය වැළඳ ගැනීම සඳහා බුදුන් වෙත පැමිණි විටක උන්වහන්සේ ඔහුට පැවසූ ප්‍රකාශය ලෝක ආගමික ඉතිහාසයේ කිසිදු ශාස්තෘවරයකුගෙන් නොපැවසුණු බෙහෙවින්ම ආදර්ශමත් ප්‍රකාශයක් කොට සැලකිය හැකිය. "ඔබ වැනි ප්‍රසිද්ධ පුද්ගලයකු හදිසියේ තම ආගම අතහැර මගේ ආගම වැළඳ ගැනීම සුදුසු නොවෙයි. ආගම වැළඳ ගැනීමේදී ශාස්තෘවරයා පවා පරීක්ෂණයට ලක් කළ යුතුය. මා බුදු කෙනෙක් ද නැත්දැයි ඔබ විසින් පරීක්ෂණයට ලක් කළ යුතුය. එසේ පරීක්ෂා කොට බලා තම සිතට එකඟව මේ සුදුසු දහමක් යයි වැටහෙන්නේ නම් පමණක් පිළිගත යුතුය." බුදුන්වහන්සේගේ ආගමික සහනශීලතාව සේ ප්‍රකාශයෙන් මනාව පැහැදිලි වෙයි. අනුන්ගේ ශ්‍රාවකයන් තම ගොඩට දා ගැනීමට බුදුන් වහන්සේට අවශ්‍ය නොවී ය. උන්වහන්සේගේ අවශ්‍යතාව වූයේ විශාල ශ්‍රාවක පිරිසක් ඇති කොට ගෙන ලෝකයා හමුවේ වැජඹීම නොවේ. හැකිතාක් ඔවුනට අවබෝධය ලබා දෙමින් ඔවුන්ගේ ආධ්‍යාත්මික පාරිශුද්ධියට අවශ්‍ය මාර්ගෝපදේශයන් ලබා දීම උන්වහන්සේගේ අවශ්‍යතාව විය.

මේ ධර්මය නැණවතුනට මිස නුවණ නැති අයට නොවේ. "**පඤ්ඤාවන්තස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස**" යන ප්‍රකාශය තුළ වුවද තමන් වහන්සේට ශ්‍රාවකයන් බොහෝ පිරිසක් නමට පමණක් තබා ගැනීමේ අවශ්‍යතාවක් නොතිබූ බව මනාව පැහැදිලි වෙයි.

නිගණ්ඨ පිරිස් බුදු සමය කෙරෙහිත් බුදුන් වහන්සේ කෙරෙහිත් ඊර්ෂ්‍යා සහගත බැල්මකින් විසූ බව බෞද්ධ සාහිත්‍යයෙන් හෙළි වෙයි. බුදුන් වහන්සේ අප්‍රසාදයට ලක් කිරීමට කිහිප අවස්ථාවකදීම ඔවුන් උත්සාහ දරා ඇත. විවිධ සතුරුකම් කිරීමට ඔවුන් ඉදිරිපත් වී ඇත. නමුත් බුදුරජාණන් වහන්සේ හැම කෙනෙක් දෙසම බැලුවේ අසීමිත කරුණාවකිනි. තමන් වෙත ඇදී එන ඔවුන්ගේ ප්‍රධානම දායකයාට පවා ඉක්මන් නොවන ලෙසට කරුණු කීමෙන් හෙළි වන්නේ නිගණ්ඨයන් විවිධ ආකාරයෙන් තමන්ට කළ නපුරු කම් පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොදැක්වූ බවයි.

වජ්ජඤ්ච වජ්ජතො ඤත්වා: වරද වරද ලෙසින් දැකීමේ අගය බුදු දහමින් බොහෝ විට අවධාරණය වෙයි. වරද දුටු විට එය වරදයයි පිළිගැනීමට තරම් පුද්ගලයා අවංක විය යුතු බව මෙයින් අදහස් වෙයි. අනෙක් අතට වරද වරද ලෙස නොපිළිගත හොත් කෙනකුට සිදු වන්නේ නිතරම වරදෙහිම සිටීමට ය. එවිට ඔහුගේ යහපත සම්පූර්ණයෙන්ම ඇන සිටියි. පුද්ගලයකු ගේ ආධ්‍යාත්මික පමණක් නොව භෞතික දියුණුව පවා අත්පත් කර ගත හැක්කේ වරදින් මිදී නිවරද සේ ක්‍රියා කිරීමෙනි. වැරදි මාර්ගවලින් ලබා ගන්නා ආර්ථික සමෘද්ධිය පවා බෞද්ධ සදාචාර ධර්මයන්ටත් ප්‍රතික්ෂෙප වන්නකි.

රණ බිමක්

මුළු මහත් විශ්වයම මහා රණබිමකි. හැම තැනකම සටන්ය.
ජීවත්වීම යනු විෂබීජ, ව්‍යාධි ආදිය හා සමග කෙරෙන
නිරර්ථක සටනකි. අණු හා ඉලෙක්ට්‍රෝන උනුනුන් හා සටන් කරති.
මනසත් යුද බිමකි. නාම, රූප, ශබ්ද, ගන්ධ, රස ආදිය
එකිනෙක හා සටනෙහි යෙදී සිටින බලවේග නිසා පැන නගින්නේ වේ.
යුද්ධය තිබෙන නිසාම හැඟෙන්නේ සර්ව සම්පූර්ණ සාමයකුත් පවත්නා
බවයි. ඒ සාමය අප නම්කරන්නේ නිර්වාණය වශයෙනි.

නාරද මහා ස්ථවිරයන් වහන්සේ 'බෝධිසත්ව සංකල්පය' නම් ග්‍රන්ථයෙනි.

23 වන පරිච්ඡේදය

නාග වග්ග

යුද බිමෙහි ඊ පහර ඉවසන ඇතෙකු මෙන් මම පුහුදුන් වූ ලෝ වැස්සා ගේ පරොස් බස් ඉවසන්නෙමි.

320. අහං නාගො'ව සඞ්ගාමෙ
චාපාතො පතිතං සරං
අතිවාක්‍යං තිතික්ඛිස්සං
දුස්සීලො හි බහුජ්ජනො (23:1)

දුන්නෙන් ඇදී එන දැඩි හී පහර වැද
ඉවසා සිටින යුද බිම ඇත් රජකු ලෙද
ඉවසා සිටිමි මම නින්දා ඇනුම් පද
නුගුණ පිරී ඇත බොහො දෙනෙකු ගේ හද

නින්දා බසින් කිසිදා - නොසැලෙතී අප මුනින්දා

23 (1) ආත්ම දමනය (320-321-322 ගාථා)

ඝෝෂිතාරාමයෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ උදේනි රජු ගේ මෙහෙසියක වු **මාගන්දියා** විසින් මෙහෙයවන ලද කුලීකරුවන් විසින් කරන ලද නින්දා අපහාස තමන් වහන්සේ විසින් ඉවසා සිටින ලද ආකාරය අරභයා මෙම ගාථාත්‍රයය දේශනා කළ සේක.

මාගන්දියා අතිශයින් දැකුම් කළු රූමත් යුවතියකි. වරක් බුදුන් වහන්සේ දැක උන්වහන්සේ ගේ රූ සපුවෙහි පැහැදුණු ඇයගේ පියා බුදුන් වහන්සේ ඇයට ගැලපෙන ස්වාමිපුරුෂයා වනු ඇතැයි සිතා තම දියණිය සරණපාවා ගන්නා ලෙස උන්වහන්සේගෙන් ඇයැද සිටියේය. බුදුරජාණන් වහන්සේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් මාර දූවරුන්ගෙන් ද නොපෙළඹුණු තමා කෙතරම් සුන්දර ස්ත්‍රියක වූව ද පයින් පැහැසීමට ද නො කැමැත්තෙමියි. පැවසූ හ. මෙය ඇසූ මාගන්දියා ගේ පියා සහ මව බුදුරදුන් ගේ විශේෂ ලක්ෂණ දැක උන්වහන්සේ බුදු කෙනකු බව දැන දහම් අසා අනාගාමී බවට පත් වූහ. එහෙත් මාගන්දියා බුදුරදුන් තමාහට බලවත් අපහාසයක් කරනලදැයි සලකා කෙදිනක හෝ උන්වහන්සේ ගෙන් පලි ගැනීමේ අදහසින් පෙළුණාය.

පසුව මාගන්දියා ඇයගේ රූපය නිසාම උදේනි රජුගේ මෙහෙසියන් තිදෙනාගෙන් කෙනකු බවට පත් වූවාය. බුදුරජාණන් වහන්සේ කොසම්බිය නගරයට වැඩි අවස්ථාවක ඒ බව දැනගත් මාගන්දියා බුදුන් වහන්සේ නගරයෙහි පිඬු හැසිරෙන විට උන්වහන්සේට නින්දා අපහාස කිරීම සඳහා කුලියට ගත් මිනිසුන් යෙදවූවා ය. කුලීකරුවෝ බුදුරදුන් අනඳ හිමියන් සමඟ පිඬු සිඟමින් සිටියදී නොයෙක් අසභ්‍ය වචන කියමින් උන්වහන්සේට බලවත් සේ අපහාස කළ හ.

කෙනකුට අසා සිටිය නො හැකි තරම් වු මේ නින්දා බස් වලින් සැළුණු ආනන්ද හිමියෝ මේ නගරය අතහැර වෙනත් නගරයකට යමුයි යෝජනා කළහ. බුදුරජාණන් වහන්සේ අනඳ හිමියන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් මෙසේ පැවසූ සේක. "ආනන්ද අප වෙන නගරයකට ගිය විට එහි මිනිසුන් අපට නින්දා කළහොත් අප කුමක් කරමුද? යන යන හැම තැන මිනිසුන් එසේ කළහොත් අපට යාමට තැනක් නැති වෙයි. තැනින් තැනට යාමට වඩා ප්‍රශ්නය උපන් තැනම විසඳුම සෙවීම මැනවි. යුද බිමට වන් ඇත් රජකු සතර දිගින් එන හී පහර ඉවසන්නා සේ මම අශීලාචාර මිනිසුන් ගෙන් ලැබෙන නින්දා අපහාස ඉවසමි. නින්දා ප්‍රශංසා දෙකින්ම මම නො සැලී සිටිමි."

විවරණාත්මක අනුවාදය (320 ගාථාව)

නාගො සඞ්ගාමෙ චාපාතො පතිතං සරං ඉව අහං
අතිවාක්‍යං තිතික්ඛිස්සං බහුජ්ජනො දුස්සීලො හි

නාගො: ඇත් රජෙක්, **සඞ්ගාමෙ**: යුද බිමක දී,
චාපාතො: දුන්නෙන්, **පතිතං**: හෙලන ලද, **සරං ඉව**: ඊතලයක් ලෙස ඉවසන්නාක් මෙන්, **අහං**: මම, **අතිවාක්‍යං**: නින්දා බස්,
තිතික්ඛිස්සං: ඉවසන්නෙමි, **බහුජ්ජනො**: බොහෝ දෙනා,
දුස්සීලො හි: අශීලාචාර වන්නෝමය.

මම යුදබිමෙහි නොයෙක් දෙසින් දුනුවලින් එවන හී සර ඉවසන ඇත් රජකු සේ මිනිසුන් ගේ නින්දා බස් ඉවසමි. බොහෝ මිනිස්සු දුසිරිත් ඇත්තෝ ය.

විවරණය

දන්තො සෙට්ඨො මනුස්සෙසු: ආත්මදමනය කළ පුද්ගලයා අන් හැම කෙනකුටම වඩා ශ්‍රේෂ්ඨ වෙයි. ආත්ම දමනය කළ අය අතුරෙනුදු ශ්‍රේෂ්ඨතම වන්නේ සම්මා සම්බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ ආත්ම දමනය කිරීමෙන් විශිෂ්ඨ වූ උත්තරී මනුෂ්‍ය ධර්ම උපදවා ගත් පුද්ගලයා ය. බුදුන් වහන්සේ තුළ වූ විශේෂ ගුණ නවයක් සූත්‍ර ධර්ම වලින් නිතරම අවධාරණය වෙයි. ඒවා නව අරහාදී බුදුගුණ නමින් හැඳින්වී අත.

1. **අරහං**: බුදුරජාණන් වහන්සේ කරුණු පහකින් අරහං නම් වන සේක.

   1. උන් වහන්සේ සියලු කෙළෙස් නසාලු සේක.
   2. උන් වහන්සේ සියලු කෙලෙස් සතුරන් විනාශ කළ සේක.
   3. උන් වහන්සේ සංසාර චක්‍රයේ අර (ගරාදි) බිඳලූ සේක.
   4. උන් වහන්සේ සියලු දෙනාගේ පුද පූජාවන්ට සුදුසු වූ සේක.
   5. උන් වහන්සේ රහසිනුදු කිසිදු පවක් නොකරන සේක.

බුදුරජාණන් වහන්සේ මානව ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා වෙති. සියලු ප්‍රඥාවෙන් හා මහා කරුණාවෙන් සමන්විත වෙති. බෝධි මූලයේ දී උන්වහන්සේ සර්වඥතා ඥානය ලබාගත් සේක. තමන් වහන්සේ සසර දුක් කෙළවර කොට දැමුවා පමණක් නොව අන් අයට ද සසර දුක් කෙළවර කිරීමේ මාර්ගය දැක් වූ සේක.

2. **සම්මා සම්බුද්ධො**: ස්වකීය ප්‍රඥාවෙන් ලෝක සත්‍යය අවබෝධ කළ හෙයින් උන්වහන්සේ සම්මා සම්බුද්ධ නම් වන සේක. තමන් වහන්සේ අවබෝධ කළ චතුරාර්ය සත්‍යය ඒ වන විට ලොව කිසිදු පුද්ගලයකු විසින් අවබෝධ කරනු නො ලැබුවකි. සාවුරුද්දක් මුළුල්ලේ විවිධ දුෂ්කර ක්‍රියාකරමින් සත්‍යාවබෝධයෙහි නිරත වූ උන්වහන්සේ බෝධි මූලයේ දී අන් කිසිදු පුද්ගලයකු ගේ මඟ පෙන්වීමකින් තොරව ස්වයංභූ ඥානයෙන්ම ලෝක සත්‍යය අවබෝධ කර ගනිමින් නිර්වාණාවබෝධය ද කළ සේක.

දුසිල් පුහුදුන්ගේ පරොස් බස් ඉවසන හික්මුණු මිනිසා ම ඉතා උතුම් ය.

321. දන්තං නයන්ති සමිතිං
දන්තං රාජාභිරූහති
දන්තො සෙට්ඨො මනුස්සෙසු
යො'තිවාක්‍යං තිතික්ඛති (23:2)

දැමුණු අසකු වුව ජන මැදට ගෙන එති
දැමුණු ඇතකු මත රජවරුද නැග යති
නින්දා වලින් නොසැලෙන ඉවසීම ඇති
දැමුණු අයම මිනිසුන්ගෙන් උතුම් වෙති.

ලොව උතුමෝ - වෙති දැමුණෝ

23 (1) ආත්ම දමනය (320-321-322 ගාථා)

විවරණාත්මක අනුවාදය (321 ගාථාව)

දන්තං සමිතිං නයන්ති රාජා දන්තං අභිරූහති යො අතිවාක්‍යං තිතික්ඛති දන්තො මනුස්සෙසු සෙට්ඨො

දන්තං: (මිනිස්සු) දැමුණු (අසු හෝ ඇතු); **සමිතිං**: මිනිසුන් රැස්වන තැනට; **නයන්ති**: පමුණුවති; **රාජා**: රජතෙමේ; **දන්තං**: දැමුණු (අසු හෝ ඇතු පිට); **අභිරූහති**: නඟියි; **යො**: යමෙක්; **අතිවාක්‍යං**: නින්දා බස්; **තිතික්ඛති**: ඉවසයි ද; **දන්තො**: දැමුණු ඒ පුද්ගලයා; **මනුස්සෙසු**: මිනිසුන් අතුරෙහි; **සෙට්ඨො**: ශ්‍රේෂ්ඨය.

මිනිස්සු හීලෑ වූ අසකු හෝ ඇතකු මිනිසුන් රැස් වූ තැනකට නොබියව ගෙන එති. රජතෙමේ දැමුණු අසකු හෝ ඇතකු පිට නඟියි. යමෙක් අනුන්ගේ අසභ්‍ය වචන ඉවසයි ද, ඒ ඉවසන සුළු පුද්ගලයාම මිනිසුන් අතර ශ්‍රේෂ්ඨය.

විවරණය

නව අරහාදී බුදුගුණ (පෙර පිටුව හා සම්බන්ධයි)

3. **විජ්ජාචරණ සම්පන්නො**: විද්‍යා නමින් ගැනෙන විශේෂ ඥානයන් ගෙන් හා උත්තම චර්‍ය්‍යාධර්මයන් ගෙන් සමන්විත වූ බැවින් බුදුරජාණන් වහන්සේ විජ්ජාචරණ සම්පන්න නම් වෙති. මෙම විජ්ජාචරණ යන්නට ත්‍රිවිධ විද්‍යා සහ පසළොස් චරණ ධර්ම අයත් වෙති. ත්‍රිවිධ විද්‍යා මෙසේ ය.

1. **පුබ්බෙනිවාසඤාණය**: බුදුරජාණන් වහන්සේට තම අතීත භවයන් සිහි කිරීමේ හා ඒවා ගැන දැනීමේ නුවණ ඇත.

2. **චුත්‍යපාත ඤාණය**: පුද්ගලයන් ස්වකීය කර්මානුරූපව භවයන්හි මියයන (චුති) සහ උපදින (උප්පත්ති) ස්වභාවය දැක ගැනීමට හැකි ඥානය උන්වහන්සේ සතුව ඇත.

3. **ආසවක්ඛය ඤාණය**: සියලු කෙලෙසුන්ගේ ක්ෂයවීම පිළිබඳ ඥානයෙන් ද උන්වහන්සේ සමන්විත්ය.

ඇතැම් විට බුදුරජාණන් වහන්සේ සතු වූ විද්‍යාව අටවැදෑරුම් කොට ද සැලකෙයි. එම අට වැදෑරුම් ඤාණය අෂ්ට විද්‍යා නමින් හැඳින්වෙයි. අෂ්ට විද්‍යාව ත්‍රිවිද්‍යාවට අතිරේක වූ ඤාණ පසකින් ද සමන්විත වෙයි. එම අට වැදෑරුම් ඤාණය මෙසේ ය.

1. **දිබ්බ චක්ඛු - දිවැස**: මෙම ඤාණයෙන් දිව්‍යමය වූ හෝ මානුෂික වූ ඕනෑම දෙයක් ඉතා ලඟ පවතින දෙයක් පියෙවි ඇසින් දකින්නාක් මෙන් දැක ගත හැකි වෙයි. පුද්ගලයන් ගේ ඉපදීම සහ මිය යාම දැකගත හැකි වන චුත්‍යපාත ඤාණ යනු ද මෙම දිබ්බචක්ඛු ඤාණමය.

2. **අනාගතංසඤාණ**: අනාගත තත්වයන් දැක ගැනීමේ ඤාණය

3. **යථාකම්මූපග ඤාණ**: පුද්ගලයන් කර්මවිපාක විඳින ආකාරය පිළිබඳ ඤාණය

4. **දිබ්බසොත**: දිව්‍යමය වූ හෝ මානුෂිකමය වූ ඕනෑම ලඟ හෝ ඈත ශබ්දයක් ඇසීමට හැකි ඤාණය

5. **පුබ්බෙනිවාසානුස්සති**: පෙර විසූ කඳ පිළිවෙළ දැකීමේ ඤාණය

6. **පරචිත්තවිජානන ඤාණ**: අනුන් සිතන පතන ආකාරය දැනීම පිළිබඳ ඤාණය

7. **ඉද්ධිවිධ ඤාණ**: විවිධ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය පැවැත්වීමේ හැකියාව ලබා දෙන ඤාණය

8. **ආසවක්ඛය ඤාණ**: සියුලු ආශ්‍රවයන් ක්ෂය වීමෙන් උදාවන ඤාණය

චරණ ධර්ම ලෙස සැලකෙන්නේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි පවතින උත්තම වූ චර්යා ධර්ම සමුහයකි. ඉන්ද්‍රිය දමනය, අහරෙහි පමණ දැනීම, ජාගරියානුයෝගය, පාපයෙහි භය දැකීම, පාපයෙහි ලජ්ජාවීම, වීර්‍ය්‍යය, ස්මෘතිය, යනාදී ගුණ ධර්ම චරණ ධර්ම අතරෙහි වෙයි.

ඇත් - අස් ඈ සතුන් ගේ දමනයට වඩා තමා දමනය කළ තැනැත්තා ම ඉතා උතුම් ය.

322. වරං අස්සතරා දන්තා
ආජානීයා ච සින්ධවා
කුඤ්ජරා ච මහා නාගා
අත්තදන්තො තතො වරං (23:3)

සවිබල සහිත අසු දැමුනොත් ඒ යෙහෙකි
සින්දව අසු ද දැමුනේ නම් ඒ යෙහෙකි
දෙදළ සහිත ගිපිඳා දැමුනොත් යෙහෙකි
තමා දැමුණු මිනිසා සැමගෙන් යෙහෙකි

දැමුණු මිනිසා - සැමගෙන් උතුම්

23 (1) ආත්ම දමනය (320-321-322 ගාථා)

විවරණාත්මක අනුවාදය (322 ගාථාව)

දන්තා අස්සතරා ආජානීයා සින්ධාවා ච කුඤ්ජරා
මහානාගා ච වරං තතො අත්තදන්තො වරං

දන්තා: දමනය වූ; **අස්සතරා**: ශක්තිමත් අශ්වයෝ ද; **ආජානීයා**: උසස් උපතක් ඇති; **සින්ධාවා ච**: සෛන්ධව අශ්වයෝ ද; **කුඤ්ජරා**: දළ ඇති; **මහානාගා ච**: මහා හස්තියෝ ද; **වරං**: උතුම් වෙති; **තතො**: ඒ අය අතුරෙන්; **අත්තදන්තො**: තමා ම දැමුණේ; **වරං**: ශ්‍රේෂ්ඨය.

දමනය වූ ශක්තිමත් අශ්වයෝ ද, උසස් උපතක් ඇති සෛන්ධව අශ්වයෝ ද දළ ඇති මහ ඇත්තුද උසස් වෙති. එහෙත් හැමට වඩා උතුම් වන්නේ තමා ම දැමුණු පුද්ගලයා ය.

විවරණය

නව අරහාදී බුදුගුණ (පෙර පිටුව හා සම්බන්ධයි)

4. **සුගතො**: මනාව ගිය යන අරුතින් සුගත නම් වේ. උන්වහන්සේ මනාවූ මාර්ගයෙහි පළමුවරට ගමන් කළ පුද්ගලයාය. එය යහපත් මාර්ගයකි. යහපතට නැඹුරු වුවකි. ගමනාන්තය විමුක්තියයි. උන්වහන්සේ එම මාර්ගය අන් අයට ද හෙළි කළ පුද්ගලයාය.

5. **ලොකවිදූ**: බුදුරජාණන් වහන්සේ ලෝකය මනා කොට දත් පුද්ගලයාය. භෞතික හා අධ්‍යාත්මික ලෝකය ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දැන එය යථා ස්වභාවය අන්‍ය ලෝක ජනතාවට ද හෙළි කළ සේක. ලෝකය පිළිබඳව එතෙක් ඉදිරිපත් කර තිබූ මතවාද සියල්ල හුදු මිථ්‍යාදෘෂ්ටි වශයෙන් ප්‍රතික්ෂේප කිරීමට බුදුරජාණන් වහන්සේට හැකි වූයේ උන්වහන්සේ ලෝකය යථාර්ථය වශයෙන්ම දත් හෙයිනි. ලෝකය ලෙස බොහෝ දෙනා දකින්නේ සංකල්ප මගින් නිර්මාණය කරගත් ලෝකයක් මිස යථාර්ථ ලෝකයක් නොවන බව පළමුවරට හෙළි කළේ උන්වහන්සේ විසිනි. යථාර්ථ වශයෙන් ලෝකය වූ කලී පුද්ගලයා ගෙන් බාහිරව පිහිටි දෙයක් නොවේ. උන්වහන්සේ ලෝකය දකින්නේ පුද්ගලයා තුළම ය. ලෝකයත්, ලෝකයේ හටගැනීමත්, ලෝකයේ නිරෝධයත් ලෝක නිරොධගාමී ප්‍රතිපදාවත් සංඥා සහගත වූ සවිඥානක වූ මේ බඹයක් පමණ වූ ශරීරය තුළම දක්මැයි බුදුන් වහන්සේ වදාළ හ.

6. **අනුත්තරො පුරිසදම්ම සාරථී**: පුද්ගලයන් දමනය කිරීමෙහි ලා අසහාය වූ මෙහෙයවන්නා යන අරුතින් අනුත්තරො පුරිසදම්ම සාරථී නම් වෙයි. බෙහෙවින්ම සාහසික වූ පුද්ගලයන් පවා විමුක්ති මාර්ගයට මෙහෙයවීමට උන්වහන්සේට හැකි විය. අංගුලිමාල, ආලවක, නාලාගිරි වැනි කෝපයෙන් සාහසික වූ පුද්ගලයන් ඇසිල්ලකින් දමනය කිරීමට උන්වහන්සේ සමත් වූ සේක. අන්‍යාගමික පුද්ගලයකු පවා තම දහම දෙසට අවනත කරවීමෙහි පුදුම දක්ෂතාවක් උන්වහන්සේ කෙරෙහි පැවතිණ.

7. **සත්ථා දෙවමනුස්සානං**: දෙව්මිනිසුන්ගේ ශාස්තෘවරයා වශයෙන් බුදුරජාණන් වහන්සේ සැලකෙන්නේ දිව්‍ය මනුෂ්‍ය දෙවර්ගයාගේම යහපත සඳහා අදාළ ධර්ම මාර්ගය උන්වහන්සේ විසින් දේශනා කළ බැවිනි. ත්‍රිපිටකයට අයත් සූත්‍රධර්ම රාශියක් දෙවියන් සඳහා දේශනා කොට තිබේ. සංයුක්ත නිකායෙහි සම්පූර්ණ පරිච්ඡේදයක් දේවතා සංයුත්ත නමින් හඳුන්වා ඇත. අභිධර්මය සම්පූර්ණයෙන් දෙවියන් සඳහා දේශනා කරන ලද්දක් ලෙස පිළිගැනෙයි. දේව යක්ෂ මනුෂ්‍ය යන සත්ව කොට්ඨාශයන්ට දේශනා කළ සූත්‍ර ධර්ම සූත්‍ර පිටකයෙහි දක්නට ලැබේ. මධ්‍යම රාත්‍රියෙහි දිව්‍යබ්‍රහ්මයන් පැමිණ බුදුන් වහන්සේ ගෙන් විවිධ ප්‍රශ්න අසා ධර්ම කරුණු නිරාකරණය කර ගන්නා බව කියැවෙයි. මේ නිසා බුදුන් වහන්සේ මිනිසුන්ගේ ශාස්තෘවරයා පමණක් නොව දිව්‍ය බ්‍රහ්ම නාග යක්ෂාදීන් ගේ ශාස්තෘවරයා වශයෙන් ද පිළිගැනෙයි.

8. **බුද්ධො**: චතුරාර්ය සත්‍යය අවබෝධ කළ බැවින් බුද්ධ නම් වෙයි. සම්මාසම්බුද්ධ යටතේ ද මේ ගුණයම සාකච්ඡා වන බැවින් මෙහි බුද්ධ යන්න පුනර්වාචකයක් ලෙස පෙනේ.

9. **භගවා**: භාග්‍යවන්තයින් අතුරෙන් බුදුන් වහන්සේ තරම් අග්‍රස්ථානයට පත් වුවෙක් ලෝකයෙහි නොමැත. උන්වහන්සේ සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් දශ පාරමිතාවන් සම්පූර්ණ කිරීම නිසා භාග්‍යයේ ශ්‍රේෂ්ඨස්ථානය උන්වහන්සේට හිමි වී තිබේ. උන්වහන්සේ සියලුම ගුණ ධර්මයන් ගෙන් භාග්‍යත්වයට පැමිණ ඇත. තමන් වහන්සේ ගේ විමුක්තිය අත්පත් කර ගැනීමෙන් උන්වහන්සේ අවසාන වශයෙන් භාග්‍යය හිමි කර ගත්තා පමණක් නොව විමුක්තියේ භාග්‍යය අන් අය වෙත අත් කර දීමට ද උන්වහන්සේ සමත් වූ සේක.

සිත දමනය කළ තැනැත්තා ඇත් - අස් යානාවලින් නො යා හැකි දෙසට යන්නේ ය.

323. න හි එතෙහි යානෙහි
ගච්ඡෙය්‍ය අගතං දිසං
යථා'ත්තනා සුදන්තෙන
දන්තො දන්තෙන ගච්ඡති (23:4)

දැමී තමා මනා ලෙසින්
දැමුණු මගින් යන විලසේ
නොදැමුණු යානයෙන් කෙසේ
යා හැකි වෙද නොගිය දෙසේ

තමා මනා ලෙස නොදැමී - නිවණට යාමට නොහැකිය

23 (2) ඇතුන් දමනයෙහි දක්ෂව සිට පැවිදිවූවෙක් පිළිබඳ කතාව (323 ගාථාව)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ ඇතුන් දමනය කිරීමේ ශිල්පය මනාව දැන සිට පසුව **පැවිදි වූවකු** අරභයා මේ ගාථාව වදාළ සේක.

එක් අවස්ථාවකදී භික්ෂූන් වහන්සේ කිහිප නමක් අචිරවතී ගංතෙර සිටියදී ඇතකු දමනය කරමින් සිටි පුද්ගලයකු දුටු හ. එම පුද්ගලයාට ඇතා නිසි සේ දමනය කරගත හැකි බවක් නොපෙනිණ. ඔහු නොයෙක් අයුරින් උත්සාහ කළ ද ඇතා දමනය නොවනු දුටු මේ භික්ෂු පිරිසේ සිටි එක් භික්ෂුන්වහන්සේ නමක් අනෙක් භික්ෂුවකට කථා කොට ඔය ඇතා දමනය කළ යුත්තේ මේ විදියෙනැයි ඇතු දමනය කළ යුතු පිළිවෙල කීවේ ය. එම භික්ෂුව ගිහිව සිටියදී හස්ති ශිල්පය මනාව හදාළ තැනැත්තෙකි. ඔහු ගේ එම කීම ඇසූ ඇතා දමනය කරමින් සිටි පුද්ගලයා ඒ අයුරින් ක්‍රියා කොට ඉතා පහසුවෙන් ඇතු දමනය කර ගත්තේ ය. එම භික්ෂු පිරිස ආපසු දෙව්රමට පැමිණි පසු මේ සිද්ධිය බුදුරජාණන් වහන්සේට සැළ කළ හ. බුදුන් වහන්සේ එපුවත අසා එම භික්ෂුව අමතා. "මහණ, ඔබ තමා දමනය කර ගත යුතුව තිබියදී ඇතුන් දමනයට උපදෙස් දෙන්නෙහිය. ඔබ තවමත් මාර්ගඵලාදියක් ලබා ගෙන නොමැත. ඇතුන් දමනයට උපදෙස් දීමෙන් ඔබට ලබා ගත හැකි මාර්ගඵලාදියක් නැත. ඔබ මෙතෙක් නොගිය නිවන දෙසට යාමට නම් තමා දමනයෙන් ඊට සුදුසු යානය තනාගත යුතුය" යි පවසමින් ගාථා ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (323 ගාථාව)

දන්තො සුදන්තෙන දන්තෙන අත්තනා යථා අගතං දිසං ගච්ඡති එතෙහි යානෙහි න හි ගච්ඡෙය්‍ය

දන්තො: දැමුණු පුද්ගලයා; **දන්තෙන**: දැමුණා වූ; **සුදන්තෙන**: මනාව දැමුණා වූ; **අත්තනා**: තමා විසින් (සිත කරණ කොට); **අගතං**: නොගිය විරූ (නිවන නමැති); **දිසං**: දෙසට; **යථා**: යම් සේ; **ගච්ඡති**: යයි ද (එසේ); **එතෙහි යානෙහි**: (ඇත් අස් ආදී) මෙම යානයන්ගෙන්; **න හි ගච්ඡෙය්‍ය**: නො හැක්කේමය.

තමාව මනාව හික්මවා ගන්නා ලද පුද්ගලයා මනා දමනය මගින් එතෙක් නොගිය දෙසට (නිවණට) යයි ද එසේ වෙනත් යානයන් ගෙන් එහි යා නොහැක.

විවරණය

අගතං දිසං: නොගිය දෙස යනු වචනාර්ථයි. මින් පෙර නොගිය දෙස යන මෙයින් අදහස් කෙරෙන්නේ විමුක්තිය හෙවත් නිර්වාණයයි. විමුක්ති සංකල්පය පිළිබඳව බුදුරජාණන් වහන්සේ බොහෝ විට මෙබඳු සරල දහම් දෙසුම්වලදී විමුක්තිය යනු කිසියම් ස්ථානයකි, යන අදහස ඇති විය හැකි පද භාවිත කොට ඇති බව පෙනේ. අමතං පදං, අගතං දිසං, නිබ්බාණගමනං, මේ ඇතැම් විට නිවණ හැඳින්වීම සඳහා යෙදී ඇති පද කිහිපයකි. මෙබඳු යෙදුම් මගින් කෙනකුට නිවණ යායුතු කිසියම් තැනක් යන හැඟීමක් ඇති වෙයි. මේ වූ කලී නිවන රූපකයකට නඟා දැක්වීමකි. එහෙත් තරමක් ගැඹුරු ධර්ම විවරණාවලදී නිවණ පිළිබඳව අපට දැකිය හැක්කේ නසත්‍යාර්ථ පද භාවිතයකි. **තණ්හක්ඛයං, යොගක්ඛෙමං, දුක්ඛක්ඛයං, නිබ්බාණං** මේ පදවලින් හුදෙක් තෘෂ්ණාව නැති කිරීම, දුක නැති කිරීම යොග බන්ධනාදිය නැති කිරීම, අර්ථ අපේ සිහියට නංවයි. මේ අයුරින් බලන විට නිවන භාවවාචී පදවලින් මෙන්ම අභාවවාචී පද වලින් ද හැඳින් වී ඇත.

ඇත්තෙන්ම බුදු සමයෙහි නිවණ යන්නෙන් අර්ථවත් වන්නේ කුමක් ද? නිවණ යන බෞද්ධයන් ගේ ආගමික නිෂ්ටාව වන බවට වාදයක් නැත. එහෙත් මෙම නිෂ්ටාවේ ස්වභාවය කුමක් ද? මෙය කෙලෙස් විනාශයෙන් රහත් බව ලබන තැනත්තකු සිය මරණයෙන් පසු වෙසෙන තැනද? බොහෝ ආගම් හා දර්ශනවල විමුක්තිය යනු සසර ඉපදීම නැති කොට පුද්ගලයාගේ ආත්මය සදාතනිකව නැවත සංසාරික ශරීරයක් නොගෙන ස්වකීය ස්වභාවයෙන්ම වෙසෙන තැනයි. දෙවියන් සමඟ එක්වීම, බ්‍රහ්මසහව්‍යතාව, කේවලින් ආදී පද එම දර්ශනවල සඳහන් වන්නේ එම සදාතනික ලෝකෝත්තර විමුක්තිය හැඳින්වීමට ය. එහෙත් බුදු සමයට අනුව කෙලෙස් නැති කිරීමෙන් පසු ශරීරයෙන් වෙන් කරගත යුතු ආත්මයක් නැත. ආත්මය ශරීරය සමඟ බැඳී පැවතීම එම දර්ශනවල සංසාරය වන අතර ආත්මය නැවත ශරීර බන්ධනයකට පත් නො වීම විමුක්තියයි. බුදු සමය පුද්ගලයාගේ සාංසාරික තත්වයේදීවත් පුද්ගලයා පිළිබඳ ආත්මයක් ඇතැයි පිළිනොගනියි. එසේ නම් රහත් වීමෙන් පසුව එබඳු පුද්ගලයකු ගේ මරණයෙන් පසු නිවණට යන ආත්මයක් ගැන කතා කිරීම අර්ථශූන්‍යය ය.

බුදුදහම පුද්ගලයා වශයෙන් දකින්නේ හුදෙක් පංචස්කන්ධ සන්නතියක පැවැත්මයි. මෙය හේතුඵල නියාමය යටතේ පවතියි. මෙම සන්නතියේ පැවැත්මට මූල සාධකය වන්නේ අවිද්‍යාව හා තෘෂ්ණාවයි. හේතුව පවත්නාතාක් ඵලය පැවතීම මෙන්ම හේතුව විනාශ වූ විට ඵලයේ විනාශය සිදු වීමද හේතුඵල න්‍යායයයි. "**හේතුං පටිච්ච සමභූතං හෙතු භංගා නිරුජ්ඣති - යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං**" වැනි ප්‍රකාශවලින් හේතුඵල නියාමය විවරණය වී ඇත. අවිද්‍යා තෘෂ්ණා දී ක්ලෙෂ හේතු කොට ගෙන පඤ්චස්කන්ධ සන්තතිය හට ගැනීම් ඇත්නම් එම ක්ලෙශ විනාශ කළ විට එම සන්නතියේ තවදුරටත් පැවැත්ම විනාශ විය යුතුය. නිරෝධයට පත් විය යුතුය. එවිට තවදුරටත් පුද්ගලයකු හෝ ආත්මයක පැවැත්ම පිළිබඳ ප්‍රශ්නයක් පැන නොනගියි. බුදු සමයේ විමුක්ති සංකල්පය වටහා ගත යුත්තේ ඉහත සඳහන් ආකාරයෙනි.



ධන පාලක නම් ඇත් රජ මවට උවටැන් කිරීම සඳහා ඇතුන් වසන වනයට ම යාමට සිතී ය.

324. ධනපාලකො නාම කුඤ්ජරො
කටුකප්පභෙදනො දුන්නිවාරයො
බද්ධො කබලං න භුඤ්ජති
සුමරති නාගවනස්ස කුඤ්ජරො (23:5)

කොටු කර ගැනුණු මද වැගිරෙන දරුණු වුණු
දනපල් ඇතා නොහැකිය හීලෑ කරනු
ගිජිදා නොරිසි වෙයි තම ආහර බුදිනු
සිතැතිය හෙතෙම සිය නාවනයෙහි බැඳුනු

තිරිසන් සිතේ වුව - තිබේ මාපිය සෙනහස

23 (3) වයසක බමුණෙක් (324 ගාථාව)

රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **මහළු බමුණකු** අරභයා මෙම ගාථාව වදාළ සේක.

කහවණු අටලක්‍ෂයක ධනය රැස්කර ගත් කිසියම් මහළු බමුණෙක් සැවැත් නුවර විසීය. ඔහුට පුත්තු සතර දෙනෙක් වූහ. පුතුන් විය පත් වූ විට ඔවුන්ට ලක්‍ෂය බැගින් දී විවාහ කරවා බමුණා බැමිණිය සමඟ සතුටින් විසීය. කල් යාමේ දී බැමිණිය මිය ගියාය. තනිවූ පියාණන්ට ආහාර පාන ආදිය දෙමින් ඇප උපස්ථාන කිරීමට දරුවෝ ඉදිරිපත් වූහ. ඔවුහු ඇත්තෙන්ම ඔහුට බෙහෙවින්ම සෙනෙහස ඇත්තෝය. මෙසේ ආදර සත්කාර කරමින් සිටි ඔවුනට පියාගෙන් ඉතිරි කහවණු සාරලක්‍ෂයක් ද එක්කෙනකුට ලක්‍ෂය බැගින් ලබා ගැනීමට හැකි විය. සැමදා පුතුන් සතර දෙනාම පැමිණ පියාට සත්කාර කිරීමට වඩා එකිනෙකා වශයෙන් වාර බෙදාගෙන පිය සත්කාරය කිරීම මැනවැයි වටහා ගත් දරුවෝ එම අදහස ක්‍රියාත්මක කළ හ. පළමු වාරය වැඩිමහල් පුතාට හිමිවිය. හෙතෙම පියා තම ගෙදරට කැඳවා ගෙන ගොස් සැලකිලි සත්කාර කළේ ය. ටික දිනක් ගත වන විට පුතාගේ බිරියට මෙය රිසි නොවීය. ඕ මහළු බමුණාගෙන් මෙසේ ඇසුවා ය. "ඇයි ඔබ මේ ගෙදරටම වෙලා ඉන්නේ? ලොකු පුතාට වැඩිපුර මුදලක් හෙම දීල තියෙනව ද? අනෙක් පුතුන්ගෙ ගෙවලට යන පාර දන්නැත් ද?" මෙය ඇසීමෙන් බලවත් ලෙස කිපුණු මහළු බමුණා එම ගෙය අතහැර දෙවැනි පුතාගේ නිවසට ගියේ ය. දෙවැනි පුතා පියාව සතුටින් භාර ගෙන ඇප උපස්ථාන කළේ ය. ටික දිනක් ගත වන විට ඔහු ගේ බිරියගෙන් ද කලින් පරිද්දෙන්ම ඇනුම්පද එල්ල විය. බමුණාට ඒ ගෙය අතහැරීමට ද සිදු විය. පුතුන් සතර දෙනාගේම නිවෙස් වලින් බමුණාට අත් වුයේ එකම ඉරණමකි. බමුණා බෙහෙවින්ම කළකිරීමට පත්ව පුතුන්ගේ නිවෙස් අතහැර මහ මඟට බැසීමට තීරණය කළේ ය. සැරමිටියක් හා බඳුනක් අතට ගෙන අනුන්ගෙන් ලැබෙන අහරකින් ජීවත් වීමට ඔහුට සිදු විය. දිනක් හෙතෙම වේළුවන විහාරයට ගොස් බුදුන් මුණ ගැසී මේ පුවත සැළ කළේ ය. බුදුරජාණන් වහන්සේ බමුණාට ඉගෙන ගැනීමට ගාථාවක් දී එය මතක තබා ගෙන මිනිසුන් රැස්වන තැන්වලදී ශබ්දනඟා කියවන ලෙස බමුණාට උපදෙස් දුන් සේක. එම ගාථාවෙන් කියැවුනේ මෙබඳු දෙයකි. "මගේ මෝඩ පුත්තු සතර දෙනාම නපුරුය. ඔවුන් මට පියා පියායි කියතත් එය හුදෙක් මුවින් පැවසීමක් පමණි. හදවත තුළින් එන ආදරණීය ආමන්ත්‍රණයක් නොවේ. ඔවුහු තම බිරියන්ගේ බසට අවනතව මට සිඟමනට පාර කැපූ හ." බමුණා ද මේ ගාථාව උගෙන මිනිසුන් රැස්වන තැන්වලට වී එය හඬ නඟා කීවේ ය. මේ ගාථාවෙන් කියවුණු අර්ථය තේරුම් ගත් මිනිස්සු බමුණාගේ පුතුන්ට නින්දා අපහාස කිරීමට පටන් ගත්හ. ඇතැම් මිනිස්සු බමුණාගේ පුතුන්ගේ නිවෙස්වලටම ගොස් පියාට සලකන ආකාරය ගැන ඔවුනට දොස් පැවරූහ. තත්වය වටහා ගත් දරුවෝ පියා හමුවට පැමිණ තමන්ගේ වරද පිළිගෙන සමාව අයැද සිටියහ. පසුව ඔවුහු පෙර පරිද්දෙන්ම තම නිවෙස්වලට ගෙන ගොස් පියාට ඇප උපස්ථාන කිරීමට පටන් ගත් හ. මහළු බමුණාට මේ අන්දමින් යළිත් සතුටින් ජීවත් වීමට අවස්ථාව සැලසිණ. බමුණාට යළිත් දරුවන්ගේ ආදර සැලකිලි ලැබීමට හේතු වුනේ බුදුන් වහන්සේ දුන් උපදෙස්වලට අනුව පිළිපැදීමය. මේ නිසා බුදුන්වහහන්සේ ගෙන් තමන්ට අත් වු ලාභයට ප්‍රති උපකාර කළ යුතු යැයි සිතූ බමුණා සෑම දිනකම තමාට පුතුන් සිවු දෙනාගෙ න් ලැබෙන ආහාර බඳුන් සතරින් බඳුන් දෙකක් රැගෙන විහාරයට ගොස් බුදු රදුනට පුද කළේ ය. බමුණා තමාගේ විස්තරය ද පැවසීය. මේ හැර බමුණා දිනපතා බුදුරජාණන් වහන්සේට ආහාර බඳුන් දෙක බැගින් ඉදිරියටද පුද කරන ලෙසට පුතුන්ට උපදෙස් දුනනේ ය. දිනක් බමුණාගේ වැඩිමහල් පුතු බුදුරජාණන් වහන්සේට තම නිවසෙහි දානය සඳහා ඇරයුම් කළේ ය. බුදුරජාණන් වහන්සේ දන් වළඳා අවසානයෙහි මවුපිය උපස්ථානයන්හි වැදගත් කම සම්බන්ධයෙන් ධර්‍ම දේශනයක් ද කළ සේක. මේ හැර බුදුරජාණන් වහන්සේ මව්පිය උපස්ථානය පිළිබඳ නිදර්‍ශනා කථාවක් ද ඉදිරිපත් කළ සේක. මේ කථාවට අනුව නාගවනයෙහි මව්පිය උපස්ථානයෙහි දැඩිව නියැළුණු ධනපාල නම් හස්තියකු රාජ නියෝග යෙන් අල්වා ගන්නා ලදි. රජ සේවකයන් අතට හසු වූ මේ හස්තියා බේරී පලා යාමට විවිධ උත්සාහ කළත් එහි ලා ඔහු අසමත් විය. හෙතෙම මවුපිය දැක්මට යා ගත නොහී රජුගෙන් ලැබුණ කෑම පවා වර්ජනය කළේ ය. මේ කථාව ද ඇතුළත් වූ බුදුරජාණන් වහන්සේගේ ධර්‍මදේශනය ඇසූ බමුණාගේ දරුවෝ සෝවාන් ඵලයට පැමිණියහ.

විවරණාත්මක අනුවාදය (324 ගාථාව)

ධනපාලකො නාම කුඤ්ජරො කටුකප්පභෙදනො
දුන්නිවාරයො බද්ධො කබලං න භුඤ්ජති කුඤ්ජරො
නාගවනස්ස සුමරති.

ධනපාලකො නාම කුඤ්ජරො: ධනපාල නම් හස්තියා; **කටුකප්පභෙදනො**: වැගිරෙන මද ඇත්තේ; **දුන්නිවාරයො**: නො මැඩලිය හැක්කේ; **බද්ධො**: (ඇත් හලෙහි) බඳනා ලදුව; **කබලං**: අහර; **න භුඤ්ජති**: නොබුදියි; **කුඤ්ජරො**: (ඒ) හස්තියා; **නාගවනස්ස**: ඇත්වනය (ම); **සුමරති**: සිහි කරයි.

මද වැගිරෙන ධනපාල නමැති ඇතා මැඩලිය නොහැකි බැවින් බඳනා ලද්දේ අහර අනුභව නො කළේ ය. හෙතෙම තමාගේ මව්පියන් විසූ නාගවනය ගැනම සිහි කරමින් සිටියේ ය.

විවරණය

මෙම කථාව මවුපිය සත්කාරයට සම්බන්ධ වූවකි. දරුවන් විසින් මවුපියන්ට සැලකීමේ අගය බුදු දහමින් නිතරම අවධාරණය කෙරෙයි. මවුපියෝ දරුවනට බොහෝ උපකාර ඇත්තේ ය. දරුවනට උපත ලබා දුන්නෝ ඔවුහුය. ඇති දැඩි කළෝ ඔවුහු ය. ශිල්පශාස්ත්‍ර ප්‍රගුණ කරවූවෝ ඔවූහුය. දරුවන්ගේ ජීවිත සාර්ථක වීමට අවශ්‍ය සියලු කටයුතු කරන මවුපියන් වයස්ගතව දුර්වල වූ විට ඔවුනට ඇප උපස්ථාන කිරීම, රැක බලා ගැනීම දරුවන්ගේ පරම යුතු කමකි.

බොහෝ කොට කා පෙරළී නිදන අනුවණයා නැවත නැවත මවු කුසට ම පැමිණේ.

325. මිද්ධී යදා හොති මහග්ඝසො ච
නිද්දායිතා සම්පරිවත්තසායී
මහාවරාහො'ව නිවාපපුට්ඨො
පුනප්පුනං ගබ්භමුපෙති මන්දො (23:6)

අලසව ඉන්න ආහර බහුලව බුදින
නිදිමත ඇතිව ඔබිනොබ හැරෙමින් නිදන
ඌරකු වගේ විසිකළ අහරින් යැපෙන
උපතම ලබයි යළි යළි නුවණ මඳ තැන

අලසකම නිදිමත - සසරම ඔබට දෙනු ඇත.

23 (4) පසේනදි කොසොල් රජතුමා (325 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **පසේනදි කොසොල් රජතුමා** අරභයා මේ ගාථාව වදාළ සේක.

දිනක් පසේනදි කොසොල් රජතුමා දහවල් අහරගත් ඉක්මණින්ම පාහේ බුදුරදුන් බැහැදකිනු සඳහා දෙව්රම් වෙහෙරට ගියේ ය. දවල් ආහාරය ගැනීමේ දී බුසල් බාගයක පමණ වූ සහලින් පිසූ බත්ද මස් මාංශ සහිත ව්‍යංජන ද අනුභව කිරීම රජුගේ පුරුද්ද විය. මෙසේ බර ආහාර ගෙන විහාරයට ගිය රජතුමාට බුදුරදුන් ඉදිරියෙහි පහසුවෙන් සිටිය නොහැකි විය. ඔහුට නිදිමත ගතිය ද දැනිණ. ඉතා අමාරුවෙන් අවදි බවින් සිටි රජතුමා තමා ඉතා අපහසුවෙන් සිටින බව බුදුරජාණන් වහන්සේට දැන්වුයේය. "එසේය, මහරජ, බත් බොහෝ කොට බුදින කෑදර පුද්ගලයාට අමාරුවෙන් සිටීමට සිදුවේය" යි පවසමින් බුදුරජාණන් වහන්සේ රජුට මේ ගාථාව වදාළ සේක.

ගාථා ධර්මයට සවන් දුන් රජතෙමේ තමා ගන්නා ආහාර ප්‍රමාණය ක්‍රමයෙන් අඩු කිරීමට තීරණය කළේ ය. ඒ අනුව ක්‍රියා කළ රජුට නොබෝ දිනකින් ආහාර ප්‍රමාණය අඩු කරගෙන ශරීර සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීමට හැකි විය.

විවරණාත්මක අනුවාදය (325 ගාථාව)

**යදා මන්දො මිද්ධී මහග්ඝසො ච හොති නිවාපපුට්ඨො
මහාවරාහො ඉව නිද්දායිතා සම්පරිවත්තසායී පුනප්පුනං
ගබ්භං උපෙති**

යදා: යම් විටෙක; **මන්දො**: නුවණ මඳ තැනැත්තා; **මිද්ධී**: උදාසීන වූයේ; **මහග්ඝසො ච**: බොහෝ අනුභව කරන්නේ ද; **හොති**: වෙයි ද; **නිවාප**: විසි කරන ලද අහරින්; **පුට්ඨො**: වැඩුණු; **මහාවරාහො ඉව**: මහත් ඌරකු මෙන්; **නිද්දායිතා**: නිදනු සුලු වුයේ; **සම්පරිවත්තසායී**: පෙරළි පෙරළී නිදන්නේ; **පුනප්පුනං**: නැවත නැවතත්; **ගබ්භං**: මව් ගැබට; **උපෙති**: එළඹෙයි.

අලස වූ බොහෝ කොට ආහාර අනුභව කරන නුවණ මඳ පුද්ගලයා විසිකළ අහරින් යැපෙන මහ ඌරකු මෙන් නිදිමත ගතියෙන් යුතුව පෙරළි පෙරළී නිදන්නේ යළි යළිත් සසරෙහි උපත ලබයි.

විවරණය

මෙම ගාථාව පසේනදි කොසොල් රජතුමා වෙනුවෙන් බුදුරජාණන් වහන්සේ විසින් දෙසන ලද්දකි. පසේනදි කොසොල් රජ තෙමේ බුදුන් වහන්සේ ගේ අග්‍ර දායකයෙකි. සැවත් නුවර අගනුවර කොට ගත් කොසොල් ජනපදය මේ රජුගේ රාජධානිය විය. බුදුරජාණන් වහන්සේට සමකාලීනයකු වූ මේ රජතුමා තරුණ කාලයෙහි විවිධ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු වල මෙන්ම ශිල්පශාස්ත්‍රයන්හිද දක්ෂයකු වූ බැවින් තම පියරජු වූ මහ කොසොල් රජු ජීවත්ව සිටිය දීම රජකම ලබා ගැනීමට සමත් විය.

කොසොල් රජ තෙමේ තම තරුණ අවදියෙහි සිටම බුදුරජාණන් වහන්සේ සමඟ ඉතා කිට්ටුවෙන් ආශ්‍රය කළ තැනැත්තෙකි. බුදුන් වහන්සේ කෙරෙහි අසීමිත භක්ත්‍යාදරයක් රජතුළ පැවතුණි. නිතරම පාහේ ජේතවනාරාමයට පැමිණ බුදුන් හමුව ධර්ම සාකච්ඡාවල යෙදීම රජුගේ සිරිත විය.

කොසොල් රජුගේ අගබිසව වූ මල්ලිකා දේවිය බුදුසසුනෙහි බෙහෙවින් පැහැදුණු ශ්‍රද්ධා සම්පන්න බුද්ධිමත් කාන්තාවක් වූවා ය. ධර්මය පිළිබඳ මනා දැනුමක් ද ඇයට තිබිණ. රජු බුදුසමය කෙරෙහි දැක්වූ විශේෂ අනුග්‍රහයට මල්ලිකා දේවිය ද දායක වූවාය. විවිධ අවස්ථාවන්හි රජු ආගමික කාර්‍යයන්හි මෙහෙයවීමට මල්ලිකා දේවිය සමත් වුවාය.

දිනක් කොසොල් රජතුමා අසාමාන්‍ය වු සිහින දහසයක් දුටුවේය. බමුණන්ගෙන් සිහිනවල ප්‍රතිඵල ඇසූ රජුට දැනගත හැකි වුයේ මෙම සිහින රජුට රටවැසියාට බෙහෙවින් අසුභ විපාක ඇති කරවන බැවින් එයින් නිදහස් වීම සඳහා මහායාගයක් පැවැත්විය යුතු බවයි. යාගය සඳහා මහාධනයක් වැය කිරීමටත් මහා සත්ව බිලි පූජාවක් කිරීමටත් නියමිත විය. රජු මෙම යාගය කිරීමට සූදානම් වුවද මල්ලිකා දේවිය යළි මෙම සිහින පිළිබඳව බුදුරජාණන් වහන්සේගෙන් විමසන ලෙස රජුට දැන්වුවාය. ඇයගේ උපදෙස් පිළිගත් රජතෙමේ බුදුන් හමුව මෙම සිහින ගැන විමසා සිටියේ ය. බුදුන් වහන්සේ රජුට සිහින වල නිසි අරුත් පැහැදිලි කර දුන් සේක. ඒ මගින් මහා සත්ව ඝාතනයකින් රැස් කර ගත හැකිව තිබූ මහා පවකින් රජු ගලවා ගැනීමට මල්ලිකා බිසව සමත් වුවාය.

මගධයේ බිම්බිසාර රජු මෙන් නොව කොසොල් රජුට නොයෙක් අවස්ථාවන්හි බුදුන් වහන්සේ ගෙන් ධර්මය අසා දැන ගැනීමට අවස්ථාව ලැබී ඇත. බුදුන් වහන්සේ කොසොල් රජු අරභයාම දේශනා කළ ධර්ම කොට්ඨාශ සමූහයක් ම සංයුක්ත නිකායෙහි කොසල සංයුක්ත නමින් එන කොටසට අන්තර්ගතව ඇත.



පෙරැ කලැ කැමැති සේ සුව සේ සැරිසැරූ සිත නුවණින් මට්ටුකර හික්මවා ගතයුතු.

326. ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං
යෙනිච්ඡකං යත්ථකාමං යථාසුඛං
තදජ්ජ'හං නිග්ගහෙස්සාමි යොනිසො
හත්ථිප්පභින්නං විය අඞ්කුසග්ගහො (23:7)

කැමති පරිද්දෙන් සුවසේ කැමති තැන
සැරි සැරුවේය මේ සිත පෙර ගතවූ දින
මද ගලනා ඇතකු මෙන් අකුසෙන් මඬින
අද මම එයම නුවණින් කරලමි දමන

ඇතකු මෙන් අකුසෙන් - මැඬලම් මසිත නුවණින්

23 (5) සානු සාමණේරයන් වහන්සේ පිළිබඳ කතා පුවත (326 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **සානු** නම් වූ සාමණේර කෙනකු අරභයා මේ ගාථාව වදාළ සේක.

මේ සාමණේරයන් වහන්සේ සසුනෙහි පැවිදි වූ තැන් පටන් බෙහෙවින් ශ්‍රද්ධාව ඇත්තේ ය. වත් පිළිවෙතින් සරු වූවෝ ය. දහම් දෙසුමෙහි ද දක්ෂ වූවෝ ය. වෙනත් භික්ෂූන් වහන්සේලා මුන්වහන්සේ දම් දෙසුමට දක්ෂ බැවින් උන්වහන්සේ ලවා බණ කියවා ගනිති. ධර්මාසනයට නැගී දේවතාරාධනය කරමින් ධර්ම දේශනා කිරීම මුන්වහන්සේ ගේ සිරිතයි. මියුරුහඬින් මුන් වහන්සේ දෙසන බණ ඇසීමට දෙවියෝ ද කැමති වෙති. දිනක් මුන්වහන්සේ ධර්ම දේශනා කරන විට රැස් වූ දෙවියන් අතර සිට එක්තරා යක්ෂණියක් ද ධර්මය ශ්‍රවණය කළා ය. මෙම යක්ෂණිය සානු සාමණේරයන් ගේ පෙර අත් බැව්හි මෑණියෝය. සාමණේරයෝ දහම් දෙසා ඥාතීන්ට ද පින් අනුමෝදන් කරවූහ. යක්ෂණිය ද පින් අනුමෝදන්ව බෙහෙවින් සතුටට පත් වූවා ය. ඇයගේ සතුට කෙතරම් බලවත් වීදයත් ඇය ධර්ම දේශනය අවසන් වන විට "සාධු සාධු පුත, ඔබ මනාව ධර්මදේශනා කෙළෙහිය. මම ද පින් අනුමෝදන් වූයෙමි" යි කීවාය. මේ ප්‍රකාශය නිසා එහි රැස් වූ දෙවියෝ ද මෙම යකිනිය සානු සාමණේරයන් ගේ පෙර ජාතියෙහි මව බවදැන ගෙන එවක් පටන් ඇයට ද ගෞරව දක්වන්නට වූහ.

මෙම සාමණේරයන් වහන්සේ තරුණ බවට පත් වූ විට පැවිදි බවෙහි උකටලී වී යළි ගිහි වීමෙහි ආසාවෙන් මැඩුනේය. ඔහු තම මව විසූ ගෙදරට ගොස් මවට ඒ බව දන්වා සිටියේ ය. එහෙත් පුතණුවන් යළි ගිහි බවට පත්වීමෙහි ලා මව නොකැමති වූවාය. නැවත පැවිද්දෙහි සිත අලවා ගන්නා ලෙස ඕ පුතණුවන්ට කියා සිටියා ය. එහෙත් සාමණේරයෝ තම අදහසෙහි දැඩිවම සිටිය හ. තමන්ට හැඳ ගැනීමට ගිහි රෙදි පිළි මවගෙන් ඉල්ලා සිටියේ ය. මව ද පුතණුවන් අදහස අත් නොහරින බව දැන, "එසේ නම් අහර අනුභවයෙන් පසු මම රෙදි පිළි ගෙනැවිත් දෙමි. මම අහර සූදානම් කරන තෙක් වැඩහුන මැනවැ"යි පවසා ඕ ආහාර පිළියෙල කිරීමෙහි යෙදුනාය. මේ අතර සාමණේරයන්ගේ පෙර ජාතියෙහි මව වූ යකින්න සාමණේරයන් සිවුරු හැරීමෙහි ආසාවෙන් සිටින බව දැන මෙසේ සිතුවා ය. "මේ සාමණේරයන් කෙරෙහි ගෞරවයෙන් දෙවිදෙවතාවෝ මට ද ගෞරව කරති. මුන් වහන්සේ සිවුරු හළොත් ඔවුන්ගෙන් මට අවමානයක්ම ඇති වෙයි. එබැවින් සාමණේරයන් ගේ අදහස වෙනස් කරවා පැවිද්දෙහිම රඳවා ගත යුතුය" මෙසේ සිතූ යකින්න එහි පැමිණ සාමණේරයන් ගේ ශරීරයට ආවේශ වූවා ය. එවිට සාමණේරයෝ ඇඟ සලිත වී මුවින් සෙම හලාගෙන බිම පතිත වූහ.

මව පුතණුවන්ට වූ ඇබැද්දිය දැක බෙහෙවින්ම තැති ගත්තාය. අසල නිවෙස්වල වූවන්ට ද අඬගසා පුතණුවන් ගැන දැන්වූවාය. අසල්වැසියෝ ද පැමිණ භූත වේශයකැයි දැන බොහෝ ප්‍රතිකාර කළහ. එවිට යකින්න තමා ආවේශ වූයේ සාමණේරයන් ගිහි වීමෙන් වළක්වන්නට බවත් සිවුරු හරනේ නම් යළිත් ආවේශ වන බවත් පවසා සාමණේරයන්ගේ සිරුරෙන් ඉවත් වූවාය. අනතුරුව සාමණේරයෝ ප්‍රකෘති තත්වයට පත් වූහ. මව කඳුලින් යුතුව සිටින සැටිත් අසල්වැසියන් රැස්ව සිටින සැටිත් දැක සාමණේරයෝ තමන්ට කුමක් සිදු වී දැයි මව ගෙන් විමසූ හ. ඇය සියලු තතු පැවසූවාය. සාමණේරයෝ තමන්ට සිදු වූ දෙයින් ලජ්ජාවට පත්ව සිවුරු හැරීමේ අදහස අතහැර යළි විහාරයට ගොස් උකටලී බවින් මිදී ශාසනික බ්‍රහ්මචර්යාවෙහි සිත අලවා ගත් හ.

මෙම සිද්ධිය බුදුන් වහන්සේට දැන ගන්නට ලැබී උන්වහන්සේ සාමණේරයන් කැඳවා, සසුනෙහි ලැඳිව සිත හික්මවා ගැනීමෙහි අගය පවසමින් ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (326 ගාථාව)

ඉදං චිත්තං පුරෙ යෙනිච්ඡකං යත්ථකාමං යථාසුඛං චාරිකං අචාරි. අජ්ජ අහං තං අඞ්කුසග්ගහො පභින්නං හත්ථිං විය යොනිසො නිග්ගහෙස්සාමි.

ඉදං චිත්තං: මේ සිත; **පුරෙ**: කලින්; **යෙනිච්ඡකං**: කැමති දෙයකට; **යත්ථකාමං**: කැමති පරිද්දෙන්; **යථාසුඛං**: සුවසේ; **චාරිකං අචාරි**: සැරිසැරුවේ ය; **අජ්ජ**: අද; **අහං**: මම; **තං**: ඒ සිත; **අඞ්කුසග්ගහො**: ඇත් ගොව්වෙක්; **පභින්නං**: මද වැගිරෙන; **හත්ථිං විය**: ඇතකු (හීලෑ කරන්නාක්) මෙන්; **යොනිසො**: නුවණින්; **නිග්ගහෙස්සාමි**: දමනය කර ගන්නෙමි.

පෙර මේ සිත කැමති පරිද්දෙන් කැමති තැනක බාධා රහිතව හැසුරුණෝය. දැන් මම ඇත් ගොව්වෙක් මද වැගිරෙන ඇතකු හීලෑ කරන පරිද්දෙන් නුවණින් සිත හසුරුවා ගනිමි.

විවරණය

මෙම ගාථාවෙන් ද චිත්ත දමනය සඳහා උපදෙස් ඉදිරිපත් වෙයි. බුදු සසුනෙහි පැවිදි වීමෙන් ලබා ගත යුතු විමුක්ති ඵලය අත් කර ගැනීම සඳහා චිත්ත දමනය අත්‍යවශ්‍ය අංගයක් වෙයි. ආර්ය වූ ඉන්ද්‍රිය දමනය මෙන්ම චිත්ත දමනය ද ප්‍රඥාචක්ෂුස උපදවා ගැනීමෙහි ලා සාධකවෙයි.



නො පමා වන්න. සිය සිත මොනවට රකින්න. විසම වූ කෙලෙස් මඩින් තමන් ගොඩ නගන්න.

327. අප්පමාදරතා හොථ
සචිත්තං අනුරක්ඛථ
දුග්ගා උද්ධරථ'ත්තානං
පඞ්කෙ සත්තොව කුඤ්ජරො (23:8)

නොපමාවෙහි ඇලෙව්
නියැලෙව් සිත රැකීමේ
මඬෙහි ගිලි ඇතු සේ
තමා ඔසවා ගන්න දුමගින්

පමාවෙහි දුරුවී - සිත රැක ගන්න මැනවින්

23 (6) පාවෙය්‍යක හස්තියා (327 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **පාවෙය්‍යක** නම් වූ ඇතකු අරභයා මේ ගාථාව දේශනා කළ සේක.

පාවෙය්‍යක තරුණ කල බෙහෙවින් ශක්තිමත් වූ හස්තියෙකි. එහෙත් වයස් ගත වීම නිසා පසු කලෙක දුර්වල විය. දිනක් පාවෙය්‍යක පොකුණකට බැස සිටියදී එහි වූ වගුරක එරීගියේය. ඔහු ගේ දුබලකම නිසා ඔහුට එයින් නැගී ඒමට නොහැකි විය. පසේනදි රජුට මෙය සැලවූ විට පාවෙය්‍යකට වගුරෙන් එගොඩවීමට උදව් කරනු සඳහා ඇත් ගොව්වෙකු එහි යැවීය.

ඇත්ගොව්වා මේ සඳහා උපායයක් සිතා සටනකට සැරසුන දෙපිරිසක් මෙන් මිනිසුන් පෙළ ගස්වා යුද බෙරයක් වාදනය කිරීමට සැලැස්විය. තරුණ කල යුද පෙරමුනේ ගොස් පුරුදු පාවෙය්‍යක ඇතුට තම දුබලකම අමතක විය. තරුණ කල තිබූ ජව බලය උපදවා ගත් ඇතා තම ශක්තිය යොදා වගුරෙන් ගොඩට ආවේය.

භික්ෂූන් වහන්සේලාගෙන් මෙම සිද්ධිය සැල වූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, පාවෙය්‍යක ඇතා තම ශක්තිය යොදා ගොඩබිමට ඇදී ආ අයුරින් තොපද කෙලෙස් මඩ ගොහොරුවෙන් ගැලවීමට උත්සාහ ගත යුතුය"යි වදාරමින් මෙම ගාථාව දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (327 ගාථාව)

අප්පමාදරතා හොථ සචිත්තං අනුරක්ඛථ පඞ්කෙ
සත්තො කුඤ්ජරො ඉව අත්තානං දුග්ගා උද්ධරථ

අප්පමාදරතා: අප්‍රමාදයෙන් ඇලුම් ඇත්තෝ; **හොථ**: වෙව්; **සචිත්තං**: සිය සිත; **අනුරක්ඛථ**: රැක ගන්න; **පඞ්කෙ**: මඬෙහි; **සත්තො**: එරුණු; **කුඤ්ජරො ඉව**: ඇතා මෙන්; **අත්තානං**: තමා; **දුග්ගා**: කෙලෙස් දුර්ගයෙන්; **උද්ධරථ**: ඔසවා ගන්න.

අනලසව සිත හික්මවා ගන්න. මඬෙහි එරුණු ඇතකු තමාම නැගී සිටින්නාක් මෙන් කෙලෙස් මඩ වගුරෙන් තමා ඔසවා තබා ගන්න.

විවරණය

බුදුරජාණන් වහන්සේ දේශනා විලාසයෙන් විශේෂ ලක්ෂණ ධම්මපදයේ ගාථා රාශියකින්ම විද්‍යාමාන වෙයි. මෙම ගාථාව ද ඒ සඳහා කදිම නිදසුනකි. සමාජයෙහි එදිනෙදා සිදුවන ප්‍රායෝගික ක්‍රියාකාරකම් නිදර්ශනයට ගෙන එමගින් භික්ෂූන් වහන්සේලා ස්වකීය බ්‍රහ්මචර්යාවෙහි නිරත කරවීමට උපදෙස් දීම බුද්ධෝපදේශයෙහි වැදගත් ලක්ෂණයකි. පාවෙය්‍යක ඇතු දුර්වල වුවත් කෙසේ හෝ තම ශක්තිය යොදා ගොඩට ආවාක් මෙන් තමන් ද තම ශක්තිය තමාගේම යහපත සඳහා යොමුකර ගැනීමට භික්ෂූන් වහන්සේට උපදෙස් දී ඇත. ඉතා පහසු සරල උපමා රූපක නිදර්ශන මාධ්‍යයෙන් තම ධර්මය ඉදිරිපත් කිරීම නිසා උන්වහන්සේගේ උපදේශ භික්ෂු ජීවිතයට ඉතා සාර්ථකව බලපා ඇති බව බෙහෙවින් පැහැදිලි දෙයකි. බුදුරජාණන් වහන්සේ නිතරම අනුශාසනයෙහි අගය අවධාරණය කළ සේක. තම ධර්මයෙහි මිනිසුන් පහදවා ඔවුන් යහමගට ගැනීම සඳහා බුදුන් වහන්සේ බොහෝ විට උපයෝගි කළේ අනුශාසනයයි. ඍද්ධි ප්‍රාතිහාර්යයට වඩා අනුශාසනා ප්‍රාතිහාර්යය අගය කළ බුදුරජාණන් වහන්සේ විවිධ තරාතිරම්වල සිටි ස්වකීය ශ්‍රාවකයන්ට නිසිමඟ පෙන්වීමෙහි ලා අනුශාසනා ක්‍රමයම යොදා ගත්හ. උන්වහන්සේ ගේ අනුශාසනා කෙතෙක් පුද්ගලයන් ගේ සිත් සතන් පැහැර ගැනීමෙහි ලා සමත් වූයේ ද යත් මිනිසුන් තමන් දෙසට නතු කර ගැනීමෙහිලා ආවට්ටනී මායාවක් උපයෝග කරතැයි යන චෝදනව ද අන්‍ය ආගමිකයන් ගෙන් බුදුන්වහන්සේට එල්ල විය. උන්වහන්සේ උපයෝගී කළ මායාව වූයේ අන් කිසිවක් නොව සිය කමණීය දේශනා විලාසයි.



නුවණැති කළණ මිතුරෙකු ලදොත් සියලු උවදුරු මැඩ සිහි නුවණින් යෙදී හැසිරෙන්නේ ය.

328. සචෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධු විහාරිධීරං
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි
චරෙය්‍ය තෙන'ත්තමනො සතීමා (23:9)

හැසිරෙන එක්ව යහපත් පැවතුම් ඇතිව
හිතවත් කෙනෙක් වේ නම් නුවණත් යුතුව
සියලුම විපත් දුක් කරදර පව් දුරුව
සිහි නුවණැති කෙනා හැසිරෙයි තුටු සිත්ව

ඇසුර ලබමින් සොඳ - තුටු වේ විපත් දුක් සිඳ

23 (7) පන්සියයක් භික්ෂූන් වහන්සේ (ගාථා අංක 328 සිට 330 දක්වා)

බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍යක වනයෙහි වැඩ වෙසෙමින් **පන්සියයක් භික්ෂූන් වහන්සේලා** ගේ එක්ව විසීම නිමිත්තෙන් මෙම ගාථා ත්‍රිත්වය දේශනා කළ සේක.

බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍යක වනයෙහි හස්තිරාජයකු ගේ උපස්ථාන ලබමින් වැඩ වසන බව බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවන් අතර බෙහෙවින් ප්‍රසිද්ධියට පත් විය. තෙමසක් තුළ බුදුන් වහන්සේගෙන් ධර්මයක් ඇසීමට නොලැබීම සම්බන්ධයෙන් බොහෝ උපාසක උපාසිකාවෝ කණස්සල්ලට පත් වූහ. මේ නිසා සැවැත් නුවර අනාථපිණ්ඩික විශාඛා වැනි ප්‍රධාන පෙලේ බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවෝ අනඳ හිමියනට පණිවිඩයක් යවමින් බුදුන්වහන්සේගෙන් ධර්ම ශ්‍රවණය කිරීමට තමන්ට අවස්ථාව සලසා දෙන ලෙස අයැද සිටිය හ. මේ අන්දමින් ම ඈත ප්‍රත්‍යන්ත ප්‍රදේශවල වාසය කළ භික්ෂූන්වහන්සේලා පන්සිය නමක් ද වස් අවසානයේ දී සැවැත් නුවර ජේතවනාරාමයට පැමිණ අනඳ හිමියන් හමු වී තමන් ට භාග්‍යවතුන් හමු වීමේ අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ හ.

ආනන්ද හිමියෝ ද මෙම භික්ෂූන් පන්සියය සමග බුදුන් සමුවීමට යාමේ අදහසින් සැවතින් පිටත්ව පාරිලෙය්‍යක වනයට පැමිණිය හ. මේ අවස්ථාවෙහි සියලු භික්ෂූන් එක්වර කැටුව බුදුන් සමුවීම අයෝග්‍යයයි සිතූ අනඳ හිමියෝ අන් භික්ෂූන් වනයෙහි නවතා තමන් තනිව බුදුන් වැඩ සිටි තැනට පැමිණිය හ. ආනන්ද හිමියන් දුටු පාරිලෙය්‍යක ඇතා සොඬින් දඬු මුගුරක් ගෙන ආනන්ද හිමියන් පලවා හැරීමට උත්සාහ කළේ ය.

එහෙත් භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන් දැක, "පාරිලෙය්‍යක ඉවත් වන්න. ආනන්ද මා සමුවීමට එයි. ඔහුට එන්න ඉඩ දෙන්න"යි පැවසූ විට හස්ති රාජයා දඬු මුගුර ඉවත ලා අනඳ හිමියන්ට බුදුන් වහන්සේ වෙතට පැමිණීමට ඉඩ හලේ ය. ඇත් රජු අනඳ හිමියන් ගේ පා සිවුරු පිළි ගැනීමට සොඬ දික් කළ නමුත් අනඳ හිමි ඊට ඉඩ නොදුන්හ. ඇතා අනඳ හිමියන් බුදුන් වෙත ලඟා වනු බලා මෙසේ සිතීය. "මුන්වහන්සේ සතර චාරිත්‍ර මනාව දන්නේ නම් බුදුන් වහන්සේ වාඩිවන ගල්තලාවෙහි තම පා සිවුරු නොතබනු ඇත."

අනඳ හිමියෝ ද තම පා සිවුරු බිම තබා බුදුරජාණන් වහන්සේට වැඳ එකත් පස්ව සිටියහ.

"ආනන්ද ඔබ පැමිණියේ තනියමදැ"යි බුදුරජාණන් වහන්සේ අනඳ හිමියන්ගෙන් විමසූහ.

"නැත ස්වාමීනි, පන්සියයක් භික්ෂූන් ද සමග පැමිණියෙමි" යි අනඳ හිමි පිළිතුරු දුන් හ.

"දැන් ඔවුහු කොහි ද?"

"එක්වරම භික්ෂූන් පන්සියය ද කැටුව පැමිණ ඔබ වහන්සේ සමු වීම නොමැනවැයි සිතා ඔවුන් වනයෙහි නවතා පැමිණියෙමි''

බුදුරජාණන් වහන්සේ එම භික්ෂූන් ද කැඳවා ගෙන එන්නැයි අනඳ හිමියන්ට දැන්වූ සේක. අනතුරුව පැමිණි භික්ෂූහු ද බුදුන් නමැද එකත්පසෙක හුන් හ. එසේ සිටි භික්ෂූහු බුදුරජාණන් වහන්සේට මෙසේ පැවසූ හ.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අතිශයින් සුකුමාල සේක. ඔබ වහන්සේ මෙහි තෙමසක් තනිව ඇප උපස්ථානයට ද කිසිවකු නැතිව කල් ගෙවූ සේක. ඔබ වහන්සේ මේ කාලය තුළ ගත කොට ඇත්තේ දුෂ්කර ජීවිතයකි. ඔබ වහන්සේට දානය සැපයීමට පානීය පරිභෝජනීය පැන් එළවීමට කිසිදු උපස්ථායකයෙක් සිටියේ නැත."

භික්ෂූන් වහන්සේ ගේ මේ කථාව ඇසූ භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු වශයෙන් "මහණෙනි පාරිලෙය්‍යක ඇතු මේ සියලු උපස්ථාන මට කළේ ය. මෙබඳු සහායකයකු ලබන පුද්ගලයා තනිව වුවද සුවසේ වෙසෙන්නේ ය." යි මෙසේ පවසා මෙම ගාථාවන්ගෙන් ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (328 ගාථාව)

සචෙ නිපකං සද්ධිං චරං සාධු විහාරි ධීරං සහායං ලභෙථ සබ්බානි පරිස්සයානි අභිභුය්‍ය තෙන අත්තමනො සතීමා චරෙය්‍ය.

සචෙ: ඉදින්, **නිපකං**: නුවණැති වූ; **සද්ධිං චරං**: සමඟ හැසිරෙන; **සාධු විහාරිධීරං**: මනා පැවතුම් ඇති ධෛර්‍යවත් වූ; **සහායං**: කලණ මිතුරෙකු; **ලභෙථ**: ලබන්නේ ද; **සබ්බානි**: සියලු; **පරිස්සයානි**: උවදුරු; **අභිභුය්‍ය**: මැඩ පවත්වාගෙන; **තෙන**: එම සහයකයා සමඟ; **අත්තමනො**: සතුටු සිතින්; **සතීමා**: සිහි නුවණැති තැනැත්තේ; **චරෙය්‍ය**: හැසිරෙන්නේ ය.

සිහි නුවණ ඇති පුද්ගලයකුට බුද්ධිමත් මනා පැවතුම් ඇති, ධෛර්‍යමත් එක්ව හැසිරෙන කලණ මිතුරෙකු ලැබෙන්නේ නම් හෙතෙම ඔහු සමඟ සියලු උවදුරු මැඩලමින් ජීවත් වන්නේ ය.



නුවණැති විසුමට සුදුසු කළණ මිතුරෙකු නො ලදොත් හුදකලාව (=තනිව) ම විසිය යුතු.

329. නො චෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධු විහාරි ධීරං
රාජාව රට්ඨං විජිතං පහාය
එකො චරෙ මාතඞ්ගරඤ්ඤෙව නාගො (23:10)

හැසිරෙන එක්ව යහපත් පැවතුම් ඇතිව
හිතවත් කෙනෙක් නැත්නම් නුවණින් යුතුව
සිටිනා රජකු ලෙස තම විජිතය නැතිව
හැසිරේ ඇත්වනයෙ ගිජිඳකු සේ තනිව

සොඳ යහළුවකු ඇසුරේ - නැතිනම් තනිව හැසිරේ

23 (7) පන්සියයක් භික්ෂූන් වහන්සේ (ගාථා අංක 328 සිට 330 දක්වා)

විවරණාත්මක අනුවාදය (329 ගාථාව)

නිපකං සද්ධිං චරං සාධු විහාරිං ධීරං සහායං නො වෙ ලභෙථ විජිතං රට්ඨං පහාය රාජා ඉව අරඤ්ඤෙ මාතඞ්ගො නාගො ඉව එකො චරෙ

නිපකං: බුද්ධිමත් වූ; **සද්ධිං චරං**: එක්ව හැසිරෙන; **සාධු විහාරිං**: මනා පැවතුම් ඇත; **ධීරං**: නොසෙල් වෙන වෙර ඇත්තා වූ; **සහායං**: කල්‍යාණ මිත්‍රයකු; **නො වෙ ලභෙථ**: නොලබන්නේ ද; **විජිතං රට්ඨං පහාය**: දිනන ලද රට අතහැර;(වනයට වැද තපස් රැකි) **රාජා ඉව**: (මහා ජනක) රජු සේ; **අරඤ්ඤෙ මාතඞ්ගො නාගො ඉව**: (ඇත් මුළෙන් වෙන්ව) වනයෙහි හුදෙකලා ව වසන්නා වූ මාතඞ්ග නම් පාරිලෙය්‍යක ඇතු මෙන්; **එකො චරෙ**: එකලාව හැසිරෙන්නේ ය.

බුද්ධිමත් වූ, ධෛර්යවන්ත වූ, එක්ව හැසිරෙන, මනා පැවතුම් ඇති කල්‍යාණ මිත්‍රයකු නොලබන්නේ නම්, දිනාගත් රට අත්හැර වනයට වැද තපස් රැකි මහා ජනක රජු මෙන් ද, ඇත් මුළෙන් වෙන්ව වනයෙහි හුදෙකලාව වසන ඇතකු මෙන් ද එකලාව හැසිරෙන්නේ ය.

විවරණය

මෙම ගාථා තුනම බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ තමා හමු වීම සඳහා පාරිලෙය්‍යක වනයට පැමිණි පන්සියයක් භික්ෂූන් වහන්සේ උදෙසා ය. බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍යක වනයේ මෙසේ හුදෙකලාව වාසය කළේ කොසඹෑ නුවර භික්ෂු දෙපිරිසක් අතර වු කලහයක් හේතු කොට ගෙනය.

බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවර ඝෝෂිත සිටු විසින් තනවා පිළිග න්වන ලද ඝෝෂිතාරාමයෙහි තමන් වහන්සේ ගේ නව වැනි වසර ගෙවමින් සිටි සේක. භික්ෂූන් වහන්සේ නමක ගෙන් සිදු වූ විනය කඩ කිරීමක් සම්බන්ධයෙන් භික්ෂු දෙපිරිසක් අතර විවාදයක් ඇති විය. යථොක්ත භික්ෂුව වැසිකිළියෙහි ජලය පාවිච්චි කොට බඳුනෙහි ඉතිරි වූ ජලය බඳුනෙහිම තබා පැමිණීම මෙම විවාදයට හේතුවයි. ඇතැම් භික්ෂූන් මෙය විනයානුකූල වරදැකැයි පැවසූ අතර සමහර භික්ෂූන් වහන්සේලා එහි වරදක් නැතැයි පැවසූ හ. මෙම විවාදය මෙසේ පැවතුණේ ධර්මධර හා විනයධර භික්ෂු දෙපිරිසක් අතරය.

වරද කරන ලදැයි චෝදනා කරනු ලැබූ භික්ෂුව වරද පිළිගෙන ඇවැත් දෙසීමට සූදානම් වු නමුත් නොදැන කළ බැවින් එහි වරදක් නැතැයි ඇවැත් දෙසීමේ අවශ්‍යතාවක් නොමැති බව විනය ධර භික්ෂුවක් පැවසූ බැවින් මෙම විවාදය ආරම්භ විණි. ඇවැත් දෙසීමට අවශ්‍ය නැතැයි පැවසූ භික්ෂුවම පසුව වෙනත් භික්ෂූන් හමුවෙහි වරද කළ භික්ෂුව තමන් කළ වරදට ඇවැත් නොදෙසීයයි ප්‍රකාශ කළේ ය. මේ කරුණ සම්බන්ධයෙන් ධර්මධර හා විනයධර යන දෙපක්ෂයෙහි භික්ෂූහු ඔවුනොවුනට චෝදනා කර ගැනීම නිසා මෙම විවාදය බෙහෙවින් උග්‍ර අතට පත් විය. මේ අතර විනයධර භික්ෂූහු වරද කරන ලදැයි චෝදනා කරන ලද භික්ෂුවට ඇවැත් නොදෙසීමේ වරද සම්බන්ධයෙන් උක්ඛේපනීය කර්මය සිදු කොට සංඝයා වෙතින් නෙරපා හැරියහ. මේ සිද්ධිය හේතු කොට ගෙන ධර්මධර භික්ෂූහු විනයධර භික්ෂූන් සමග එකට විනය කර්ම කිරීම පවා ප්‍රතික්ෂේප කළහ. භික්ෂූන් අතර සංඝභේදයක් ඇති වීමේ ඉඩකඩ සලකා බැලූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂු දෙපිරිසටම මේ සම්බන්ධයෙන් අවවාද කළ නමුත් භික්ෂු දෙපිරිසම එම අවවාදය ද නොපිළිගත්හ.

මේ විවාදය බොහෝ කාලයක් පැවතිණි. භික්ෂූහු දෙපසට බෙදී එක් පක්ෂයට විරුද්ධව චෝදනා කර ගත්හ. මේ හේතු කොට ගෙන එම භික්ෂු දෙපිරිසේ දායකවරු පවා දෙපක්ෂයකට බෙදී ගත්හ. මේ ආරාවුල තවදුරටත් වැඩෙන විට මෙය සාසනයට විපත්ති කර දෙයක් වන බැවින් ඇතැම් භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ හමුව විවාදාපන්න භික්ෂූන් සමගි කරවීමේ අවශ්‍යතාව ගැන සාකච්ඡා කළ හ. ඒ අයගේ අදහස වූයේ බුදුරජාණන් වහන්සේ එම භික්ෂූන්ට නැවත අවවාදානුශාසනා කළ යුතු බවය.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ගේ ඉල්ලීම පරිදි යළිත් විවාදපන්න භික්ෂූන් හමුවූහ. එහිදි උන්වහන්සේ ඔවුනොවුන් අතර අරගල පැවතීමේ නරක විපාක පිළිබඳව නිදසුන් ද ඉදිරිපත් කරමින් අවවාදානුශාසනා කළ නමුත් ඔවුනොවුන් වරද පිළිගෙන සමගි වීමට ඒ භික්ෂූහු කැමති නො වූහ.



හුදකලා වැ (=තනි වැ) විසීම ඉතා උතුම් ය. අනුවණයා කෙරෙහි සහාය බවෙක් නැත්තේ ය.

330. එකස්ස චරිතං සෙය්‍යො
නත්ථි බාලෙ සහායතා
එකො චරෙ න ච පාපානි කයිරා
අප්පොස්සුක්කො මාතඞ්ගරඤ්ඤෙව නාගො (23:11)

තනිව සිටිනු වැඩිය යෙහෙකි
නොමැතිව දුදනන් ගෙ ඇසුර
වනයෙහි තනි ඇතකු ලෙසින්
හැසිරේ පවුකම් ද නොකර

දුදන ඇසුර දුරුවූ විට - ලැබේ සිතට සුව සොම්නස්

23 (7) පන්සියයක් භික්ෂූන් වහන්සේ (ගාථා අංක 328 සිට 330 දක්වා)

විවරණාත්මක අනුවාදය (330 ගාථාව)

**එකස්ස චරිතං සෙය්‍යො බාලෙ සහායතා නත්ථි
අරඤ්ඤෙ මාතඞ්ගො නාගො ඉව අප්පොස්සුක්කො
එකො චරෙ පාපානි ච න කයිරා**

එකස්ස චරිතං සෙය්‍යො: හුදෙකලා වූවහුගේ වාසය උතුම් වේ; **බාලෙ සහායතා නත්ථි**: (එවිට) අසත් පුරුෂයකු සමග ඇසුරු බවක් නැත්තේය; **අරඤ්ඤෙ මාතඞ්ගො නාගො ඉව**: වනයෙහි හුදෙකලා ව වසන්නා වූ මාතඞ්ග නම් ඇත් රජු මෙන්; **අප්පොස්සුක්කො**: පිරිස් පරිහරණයෙහි උත්සාහ රහිතව; **එකො චරෙ**: හුදෙකලාව හැසිරෙන්නේ ය; පාපානි ච: පව් ද; **න කයිරා**: නො කරන්නේ ය.

අසත් පුරුෂයකු ගේ ආශ්‍රයෙන් තොරව තනිව හැසිරීම උතුම් වෙයි. වනයෙහි තනිව ජීවත් වන ඇත් රජු පරිද්දෙන් පිරිස් පාලනයෙහි උත්සාහ රහිතව (ආශාව දුරු කොට) හුදෙකලාව හැසිරෙන්නේ ය, ස්වල්ප මාත්‍ර වූ පව්කම් ද නො කරන්නේ ය.

විවරණය

භික්ෂූන් සමථයකට පත් නොවන බව දැනගත් බුදුරජාණන් වහන්සේ, විරුද්ධවාදී කම්වල හා අසමගියෙහි දුර්විපාක තවදුරටත් පැහැදිලි කොට ඇසුරට සත්පුරුෂයන් නැති විට හුදෙකලාව විසීම මැනවැයි පවසා කොසඹෑ නුවරින් පිටත් වූ සේක. උන්වහන්සේ ආපසු වඩිනා අතරතුර බාලකලොණකාරාම (බාලක - ලුණු හදන්නා) ගමෙහි භගු තෙරුන් වහන්සේ ද හමුව පසුව පාචිනවංස උයනට වැඩමවා එහිදී අනුරුද්ධ, නන්දිය හා කිම්බිල යන තිදෙනාවහන්සේ ද හමුවූහ. උන්වහන්සේ ලා තිදෙන ඉතා සමගිව සිටිනු දැක බුදුන් වහන්සේ සමගියෙහි අගය ද වර්ණනා කළ සේක. එයින් පිටත් වූ භාග්‍යවතුන් වහන්සේ පාරිලෙය්‍යක වනයට වැඩි සේක. එහි රක්ඛිත නම් අභය භූමියේ සාල වෘක්ෂයක් මූලයෙහි තමනට සුව පහසු බව දැනී එහි විසීමට තිරණය කළ සේක.

බුදුරජාණන් වහන්සේ කලහකාරී භික්ෂූන්ගෙන් ඉවත්ව තනිව මෙසේ පාරිලෙය්‍යක වනයෙහි වැඩ සිටින විට උන්වහන්සේ ගේ උපස්ථානයට ඉදිරිපත් වූයේ ඇතෙකි. මෙම ඇතාද තම වර්ගයාගෙන් ඉවත්ව හුදෙකලාව හැසිරෙමින් සිටියෙකි. බුදුන් වහන්සේ දැක උන්වහන්සේ කෙරෙහි කරුණාව උපදවා සියලු ඇප උපස්ථාන කිරීමෙහි නිරත විය. සොඬින් ගස් අතු කැබැල්ලක් ගෙන වැඩ සිටින තැන පිස දැමීම, විලකින් ජලය සොඬට ගෙනවුත් ගල්වලක එම ජලය බහා බුදුන් වහන්සේ ගේ ප්‍රයෝජනය සඳහා තැබීම, පලවැල කඩාගෙන අවුත් පිළිගැන්වීම ආදී කුදු මහත් උවටැන් සියල්ල මේ ඇතා විසින් කරන ලදි.

තෙමසක් පාරිලෙය්‍යක වනයෙහි වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේ ආපසු සැවත් නුවර ජේතවනාරාමයට වැඩම කළ සේක. මේ අතර කොසඹෑ නුවර මිනිස්සු භික්ෂූන්ගේ කලහයෙන් ඔවුන් කෙරෙහි කළකිරී ඔවුනට ආහාර සැපයීම අත්හිටවූහ. තමන්ට ජීවත් වීමට ක්‍රමයක් නොමැති වූ විට භික්ෂූහු මේ විවාදය තවදුරටත් පවත්වා ගැනීමට අසමත් වූහ. එබැවින් බුදුන් හමුව තමන් සමගි වීමට තීරණය කළ හ.

සාරිපුත්ත, මොග්ගල්ලාන, මහාකස්සප, රේවත, අනුරුද්ධ, උපාලි, ආනන්ද සහ රාහුල යන තෙරවරුනට කලහකාරී භික්ෂූන් බුදුන් හමුවට එන පුවත දැන ගැනීමට ලැබිණ. එහිදී උන්වහන්සේලා බුදුන් වෙත ගොස් කලහකාරී භික්ෂූන් වෙත කෙබඳු අයුරින් පිළිපැදිය යුතුදැයි විමසූහ. බුදුරජාණන් වහන්සේ ඔවුනට විනයානුකූල ලෙසින් පිළිපැදිය යුතුයයි අනුශාසනා කළහ.

මේ අයුරින්ම මහා ප්‍රජාපතී ගෝතමී, අනාථපිණ්ඩික, විශාඛා ආදීහු ද, බුදුන් වහන්සේ හමුව තමන් කලහකාරී භික්ෂූන් කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය විමසූහ. බුදුරජාණන් වහන්සේ ඔවුනට උපදෙස් දී වදාළේ එම භික්ෂූන්ට දානමානාදියෙන් සංග්‍රහ කළ යුතු බවය.

භික්ෂු දෙපිරිස තමන් බොහෝ කලක් පවත්වා ගෙන ආ විවාදය හා කලහය අතහැර සමගි බවට පත් වූහ. ඔවූහු බුදුරජාණන් වහන්සේ හමුව කළ වරදට සමාව අයැද සිටියහ. බුදු රජාණන්වහන්සේ නැවත ද ඔවුනට ධර්ම දේශනා කරමින් ඔවුන් කළ වරදෙහි ආදීනව පෙන්වා නැවත අසමගියකින් තොරව සාමකාමීව සිටිමට උපදෙස් දුන් සේක. මෙහිදී බුදුරජාණන් වහන්සේ තමන් පාරිලෙය්‍යක වනයෙහි වැඩ සිටිය දී පාරිලෙය්‍යක හස්තියාගෙන් ලැබුණු ඇප උපස්ථාන ගැන ද පවසා කලහයෙන් සහ අසමගින් සිටින පිරිසෙන් ඉවත්ව හුදෙකලාව විසීම සුවදායකයයි වදාළ සේක.

බුදු සසුන මිනිසුන්ගේ යහපත සඳහා බොහෝ කාලයක් පවතිනුයේ භික්ෂූන් වහන්සේ අතර සමගි සම්පන්න භාවය ඇති වී ඔවු'නතර විනයානුකූලව හැසිරීම ස්ථාවර වූ විටය. බුදුරජාණන් වහන්සේ විසින් දෙව් මිනිසුන් ගේ යහපත සඳහා ඉදිරිපත් කරන ලද ධර්මයේ පණිවිඩය බොහෝ විට ආරක්ෂා වන්නේ භික්ෂූන් නිසාය. ධර්මයට අනුව තමන් ජීවත් වෙමින් දෙව් මිනිසුන් අතරට ධර්ම මාර්ගය ඉදිරිපත් කරමින් පරාර්ථචර්යාවෙහි යෙදීම භික්ෂූන්ගේ වගකීම වෙයි. උන්වහන්සේලාට එම වගකීම ඉටුකළ හැක්කේ භික්ෂූන් තුළ විනය හා සමගිය ඇති වූ විටය.

මේ න්‍යාය භාග්‍යවතුන් වහන්සේ "**සුඛා සංඝස්ස සාමග්ගී - සමග්ගානං තපො සුඛො**" යනුවෙන් දේශනා කොට ඇත්තේ.



යහළුවෝ ද තමා සතු දෙයින් සතුටු වීම ද මරණය ළඟ කලැ කරන ලද පිණ ද දුක් නැසීම ද සැප ය.

331. අත්ථම්හි ජාතම්හි සුඛා සහායා
තුට්ඨී සුඛා යා ඉතරීතරෙන
පුඤ්ඤං සුඛං ජීවිතසඞ්ඛයම්හි
සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහානං (23:12)

සුවයකි යහළුවෝ ඇවැසියකදි සිටින
සුවයකි සතුටු විය හැකි නම් ලද දෙයින
මරණය අබියසෙහි පින සුවයකි නිතින
සියලු දුක් නැසුම සුවයකි නිසැකයෙන

සුව ගෙන දෙන කරුණු දොළසක්

23 (8) මාරයා පිළිබඳ පුවත (ගාථා අංක 331 සිට 333 දක්වා)

භාග්‍යවතුන් වහන්සේ හිමවත පෙදෙසෙහි ආරණ්‍ය අසපුවක වැඩ වසන සේක් **මාරයා** අරභයා මෙම ගාථා තුන වදාළ සේක.

හිමාලය පෙදෙසෙහි අසපුවක වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතිවිල්ලක් ඇති විය."මා කෙතෙක් අවවාද අනුශාසනා කළත් රජවරු රාජ්‍යය කරන්නේ බලවත් වූ හිංසක ස්වරූපයකිනි. ඔවුහු මිනිසුනට දඬුවම් පමුණුවති. වධහිංසා පමුණුවති. මිනිසුන් මරණයට පත් කරති. රාජ්‍යය තර කර ගැනීමේ බලාපොරොත්තුවෙන් රාජ්‍යයන් ආක්‍රමණය කරති. සටන් කරමින් මිනිසුන් සමූහ වශයෙන් මරණයට පමුණුවති. මෙය කෙතරම් හිංසක ක්‍රමයක් ද? රජවරුනට සාධාරණව, කරුණාවෙන් හා මෛත්‍රියෙන් කටයුතු කළ නො හැකි ද? සතර සංග්‍රහ වස්තුවෙන් ජනතාවට සැලකිය නො හැකිදෝ?"

බුදුරජාණන් වහන්සේ මෙබඳු සිතුවිල්ලෙන් යුතුව ජනතාව කෙරෙහි උපන් කරුණාවෙන් සිටියදී මාරයාට බුදුන් වහන්සේගේ සිතුවිල්ල වැටහිණ. ඔහු සිතුවේ බුදුරජාණන් වහන්සේ බුද්ධරාජ්‍යය පසෙක තබා ජනතාව ධර්මයෙන් පාලනය කිරීම සඳහා රජවීමේ බලාපොරොත්තු වේය යනුයි. බුදුන් රාජ්‍ය පාලකයෙකු වුවහොත් එය මගේ අදහස ඉටු වීමකි. බුදුන් බුද්ධ රාජ්‍යයෙහි සිටිය හොත් ජනතාව ධර්මය අසා පින් කර ගනිති. එහෙයින් ඔවුහු අපායට නොගොස් දෙව්ලොවටම යති. එයින් මට සිදුවන්නේ පාඩුවකි. එහෙයින් රාජ්‍ය පාලකයකු වීම සඳහා බුදුන් උනන්දු කරවමැයි සිතා බුදුන් වැඩ සිටි තැනට පැමිණියේ ය. මාරයා බුදුන් වෙතට පැමිණ "ස්වාමීනි, අර්ථයෙන් ධර්මයෙන් රාජ්‍ය පාලනය කරනු මැනව. ඔබ වහන්සේට රාජ්‍යයක් හිමිය. අන් රජුනට වඩා ඔබට ජනතාව නොපෙළා දඬුවම් නොදී ඔවුන් නොමරා දැහැමින් සෙමෙන් රාජ්‍යය කළ හැකිය. එවිට ජනතාවට දුක් කරදර නැතිව ප්‍රීතියෙන් ජීවත් විය හැකිය. එබැවින් ඔබ වහන්සේ බුද්ධ රාජ්‍යය තබා ජනරංජනය කරනු මැනවැ"යි පැවසීය. බුදුරජාණන් වහන්සේ මාරයා ගේ බස අසා "එම්බල, පාපිෂ්ට මාරය, තා මා කෙරෙහි කුමක් සිතා එබඳු බසක් පළ කෙළෙහි ද?"යි ඇසූ සේක.

"ස්වාමීනි, ඔබ වහන්සේ සතර ඍද්ධි පාද වඩා ඇත. එබැවින් ඔබ වහන්සේට අවශ්‍ය කවරම දෙයක් වුවද කළ හැකිය. මේ මහා හිමාලය පර්වතය රත්රන් වේවා යි ඔබ වහන්සේ අදිටන් කළහොත් එය රත්රන් කන්දක් බවට පත් වේවි. මම ද අඩුවෙන් සිටිම. එවිට මට ද ඒ ධනය ලබා ප්‍රයෝජන ලබා ගත හැකිය. එබැවින් ඔබ රාජ්‍ය තනතුරක් ලබා ගෙන රට දැහැමින් සෙමෙන් පාලනය කරන්නැ" යි මාරයා පැවසීය. බුදුරජාණන් වහන්සේ මාරයාට මෙසේ පිළිතුරු දුන් සේක. "එම්බල මාරය, මේ මුළු පර්වතය රත්රන් වුවද එය කෙනෙකුගේ ආශාව පිරවීමට නොසෑහෙයි. මෙය දැන ගෙන මිනිසා ධර්මයෙන් ජීවත් විය යුතුය. දුක හටගන්නා බව දකින කවරෙක් නම් ඉන්ද්‍රිය සුඛයෙහි නිරත වේ ද?"

මෙසේ පැවසූ භාග්‍යවතුන් වහන්සේ මාරයාට ගාථාත්‍රයකින් අවවාදනුශාසනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (331 ගාථාව)

අත්ථම්හි ජාතම්හි සහායා සුඛා ඉතරීතරෙන යා තුට්ඨී
සුඛා ජීවිතසඞ්ඛයම්හි පුඤ්ඤං සුඛං සබ්බස්ස දුක්ඛස්ස
පහානං සුඛං

අත්ථම්හි: කටයුත්තක් (අවශ්‍යතාවක්); **ජාතම්හි**: උපන් කල්හි; **සහායා**: යහළුවෝ; **සුඛා**: සැපයකි; **ඉතරීතරෙන**: (තමා සතු) යම්කිසි දෙයකින්; **යා තුට්ඨී**: යම් සතුටක් වේද; **සුඛා**: එය සුවයකි; **ජීවිතසඞ්ඛයම්හි**: මරණාසන්න කාලයෙහි; **පුඤ්ඤං**: කරන ලද කුසල කර්ම; **සුඛං**: සුවයෙකි; **සබ්බස්ස දුක්ඛස්ස**: සියලු සංස්කාර දුක්; **පහානං සුඛං**: ප්‍රහාණය හෙවත් නිර්වාණය සුවයකි.

පැවිද්දෙකුට වුවත් ගිහියෙකුට වුවත් යම්කිසි අවශ්‍යතාවක් හටගත් කල්හි එය සපයන්නට සමර්ථ යහළුවෝ සුවයක් වෙති. හීන වූ හෝ ප්‍රණීත වූ හෝ මඳ වූ හෝ බොහෝ වූ ද ලද දෙයකින් සතුටු වීමට හැකි වීම සුවයකි. මරණාසන්න කාලයෙහි කැමති ලෙසින් මහත් කොට කළ පුණ්‍යකර්ම ද සියලු සසර දුක නසන අර්හත් ඵලය ද සුවයකි.

විවරණය

තුට්ඨී: බුදු දහමේ බෙහෙවින් අගය කෙරෙන ගුණාංගයක් ලෙස සන්තුට්ඨිය දැක්විය හැකිය. මෙය යථාලාභ සන්තෝසය යනුවෙන් ද හැඳින්වෙයි. තමාට ලැබෙන ආකාරයෙන් සතුටු වීමට පුද්ගලයකු පුරුදු වන්නේ නම් ඔහුට නිරන්තරයෙන් මානසික සහනශීලතාවකින් කල් ගෙවීමට හැකිවෙයි. මෙම ලෝකයෙහි ස්වභාවය වන්නේ කිසිදු තත්වයකින් සතුටට පත් නොවීමයි. පුද්ගලයකු ගේ අපේක්ෂාවල සීමාවක් නැත. මේ අපේක්ෂා සියල්ල කිසිවිටෙක ඉටු කර ගත නොහැක. අපේක්ෂා බහුල වී ඒවා ඉටු කර ගත නොහැකි වූ විට පුද්ගලයාට අත්වන්නේ දුකකි, සන්තාපයකි. රන් කහවණු වැසි වැටුණත් තෘප්තියට පත් නොවන ස්වභාවයක් ලෝකයෙහි ඇති විට යමෙක් ලැබෙන ප්‍රමාණයෙන් සතුටු වීමට පුරුද්දක් ඇති කර ගන්නේ නම් හෙතෙම ලෝක ස්වභාවය මැඩගෙන ඉදිරියට ගිය පුද්ගලයෙක් වෙයි. ඔහුට කිසිදු සන්තාපයක් ඇති නොවේ. ඔහුට මානසික ප්‍රසන්නතාවකින් යුක්තව තම කටයුතු වල නිරතවීමට ද අවස්ථාව ලැබෙයි. එනිසාම එම කටයුතු සඵල කර ගැනීමට ද හැකි වෙයි.

මව හා පියා කෙරෙහි මනාව පැවැත්ම ද පැවිද්දන් හා රහතුන් කෙරෙහි ද මනාව පිළිපැදීම සැප එළවන්නේ ය.

332. සුඛා මත්තෙය්‍යතා ලොකෙ
අථො පෙත්තෙය්‍යතා සුඛා
සුඛා සාමඤ්ඤතා ලොකෙ
අථො බ්‍රහ්මඤ්ඤතා සුඛා (23:13)

ලොවෙහි මවට උවටැන සැප වන්නේ
ඒ ලෙස පිය උවටැන සැප වන්නේ
සමණුන් හට උවටැන සැප වන්නේ
බුදුරහතුන් උවටැන සැප වන්නේ

මව්පිය හා ශ්‍රමණ උපස්ථානය ද සැප ලබා දේ

23 (8) මාරයා පිළිබඳ පුවත (ගාථා අංක 331 සිට 333 දක්වා)

විවරණාත්මක අනුවාදය (332 ගාථාව)

මත්තෙය්‍යතා සුඛා අථො පෙත්තෙය්‍යතා සුඛා ලොකෙ
සාමඤ්ඤතා සුඛා අථො බ්‍රහ්මඤ්ඤතා සුඛා

මත්තෙය්‍යතා සුඛා: මව කෙරෙහි මනා පිළිවෙත් ඇති බව සුවයකි; **අථො**: නැවත; **පෙත්තෙය්‍යතා**: පියා කෙරෙහි මනා පිළිපෙත් ඇති බව; **සුඛා**: සුවයකි; **ලොකෙ**: ලොවෙහි; **සාමඤ්ඤතා**: ශ්‍රමණයන් කෙරෙහි මනා පිළිවෙත් ඇති බව; **සුඛා**: සුවයකි; **අථො**: ඉක්බිති; **බ්‍රහ්මඤ්ඤතා**: (ක්ෂීණාශ්‍රව) බ්‍රාහ්මණයන් කෙරෙහි මනාව පිළිපන් බව; **සුඛා**: සුවයකි.

මෙලොව මාතෘ උපස්ථානය සැපතකි. එසේම පිතෘ උපස්ථානය ද සැපතකි. ශ්‍රමණ උපස්ථානය ද සැපතකි. පව් බැහැර කළවුන්ට උපස්ථාන කිරීම ද සැපතකි.

විවරණය

මත්තෙය්‍යතා: පෙත්තෙය්‍යතා: මවට හා පියාට සැලකිලි සත්කාර කිරීම පිළිවෙලින් මත්තෙය්‍යතා පෙත්තෙය්‍යතා යන පදවලින් කියැවෙයි. මවුපිය දෙදෙනා පුද්ගලයකුට මෙලොවෙහි ඇති උතුම්ම සම්පතයි. තමා කරන කවර සත්කාර සම්මානයකින් වුවද මව්පියන් වෙනුවෙන් දැක්විය යුතු උපකාරය සම්පූර්ණ කළ නොහැකිය.

දරුවන් වෙනුවෙන් මව්පියන්ගෙන් සිදුවන සේවය ප්‍රත්‍යුපකාරවලින් ප්‍රමාණ කළ නොහැකිය. එබැවින් මව්පිය සත්කාරය හැකි තරම් උසස් මට්ටමින් දරුවන් විසින් පැවැත්විය යුතුව තිබේ. මවුපියන් හා දරුවන් අතර පවත්වා ගත යුතු සුහද සම්බන්ධතාව සඳහා ඔවුනොවුන් අතින් ඉටුවිය යුතු යුතුකම් බුදුරජාණන් වහන්සේ විසින් සිඟාලෝවාද සූත්‍රයේ දී දක්වා තිබේ.

මව්පියෝ දරුවන් හුදෙක් මෙලොවට බිහිකරන්නෝ පමණක් නොවෙති. දරුවන් ඇති දැඩි කරන්නෝ ද වෙති. ඔවුනට හොඳ නරක කියා දෙමින් යහපතෙහි යොදවමින් ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා ද මෙහෙයවන්නෝ වෙති. නිසි කලට ඔවුනට තමන් සතු භවභෝග සම්පත් පවරා දෙමින් ඔවුන් සුවපත් දිවියකට යොමු කරන්නෝ ද වෙති.

සිඟාලෝවාද සූත්‍රයට අනුව මවුපියන් විසින් දරුවන් වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් පහකි.

1. මව්පියෝ දරුවන් පාපයෙන් වළක්වති.
2. යහපතෙහි යොදවති. යහගුණ කියා දෙති.
3. දරුවන්ට ශිල්ප ශාස්ත්‍රාදිය පුහුණු කරවති.
4. දරුවන් සුදුසු වියට පත් වූ විට ඔවුනට ආවාහ විවාහාදිය කරවා දෙති.
5. නියමිත අවස්ථාවෙහි දරුවනට තම ධන ධාන්‍ය භවභෝග සම්පත් පවරා දෙති.

මෙසේ දරුවන් ගේ යහපත සඳහා ක්‍රියා කරන තම මව්පියන් වෙනුවෙන් දරුවෝ ද මව්පියන්ට කරුණු පහකින් සංග්‍රහ කළ යුතු වෙති.

1. මව්පියන් දුර්වල වූ විට ඔවුන් පෝෂණය කළ යුතුය.
2. මවුපියන් ගේ වැඩ කටයුතු ඉටුකර දිය යුතුය.
3. මවුපිය පරම්පරාවට කැලලක් නොවන අයුරින් ක්‍රියා කරමින් පරම්පරා ගෞරවය ආරක්ෂා කොට පරපුර පවත්වාගත යුතුය.
4. මවුපිය උරුමයන් විනාශ නොකොට ඒවා ආරක්ෂා කර ගත යුතුය.
5. මවුපියන් මිය ගිය විට අවශ්‍ය චාරිත්‍ර වාරිත්‍ර මනාව පවත්වා මවුපියන් වෙනුවෙන් දාන මානාදිය සිදු කිරීමෙන් ඔවුන්ට පින් අනුමෝදන් කළ යුතුය.

මවුපියනට මනාව හිතවත්ව ඔවුන් ගේ සිතැගි අනුව ක්‍රියා කරමින් මව්පිය සත්කාරයෙහි යෙදෙන දරුවන්ට ඔවුනගේ දරුවෝද එසේම සැලකීමට පුහුණුවක් ලබති. මවුපියනට නොසලකන හිතුවක්කාර දරුවන් ගේ දරුවෝ ද තම මවුපියන්ට සැලකීමට නො පෙළඹෙති. එබැවින් තමන් ගේ මවුපියන්ට සැලකීම තමාගේ පරම යුතුකමක් ඉටු කරනු පමණක් නොව පශ්චාත් ජනතාව සඳහා තමා දක්වන උතුම් ආදර්ශයක් ද වෙයි.

සාමඤ්ඤතා: ශ්‍රමණ බවයි. ශීලා දී ගුණධර්ම ආරක්ෂා කර ගනිමින් තම විමුක්තිගාමී මාර්ගයෙහි කැප වන ශ්‍රමණ බව සැපතක් වන්නේ එමගින් පරම සැපත වන විමුක්ති සැපත අත්කර ගත හැකි වන බැවිනි.

බ්‍රහ්මඤ්ඤතා: මෙහි බ්‍රහ්ම යන්නෙන් අදහස් කරන්නේ උතුම් අර්හත්වයයි. අරහ යන්නෙන් ප්‍රකාශ වන්නේ උතුම් බවයි. එබැවින් උතුම් යන අර්ථය ඇති බ්‍රහ්ම යන්නද රහත් බව සඳහා යෙදී ඇත. සියලු කෙලෙසුන් නසා ලබන රහත් බවින් සංසාර දුක්ඛය සම්පූර්ණයෙන් විනාශ වන බැවින් රහත් බව ද උතුම් සුවයක් වෙයි.

සිල් රැකීම හා සැදැහැයෙහි පිහිටීම සැප එළවන්නේ ය. නුවණ ලැබීම හා පවු නො කිරීම සැප එළවන්නේ ය.

333. සුඛං යාව ජරා සීලං
සුඛා සද්ධා පතිට්ඨිතා
සුඛො පඤ්ඤාය පටිලාභො
පාපානං අකරණං සුඛං (23:14)

දිවි කෙළවර තෙක්ම සිල් රකිනු සුවයකි
තිරව පිහිටියේ නම් සැදැහැ සුවයකි
නුවණ ලබා ගැන්ම ද නියම සුවයකි
පව් සැම දුරැරලන විට එයද සුවයකි.

සිත් අත් පත් වුව - ලැබෙයි දෙලොවම සුව

23 (8) මාරයා පිළිබඳ පුවත (ගාථා අංක 331 සිට 333 දක්වා)

විවරණාත්මක අනුවාදය (333 ගාථාව)

සීලං යාව ජරා සුඛං පතිට්ඨිතා සද්ධා සුඛා පඤ්ඤාය පටිලාභො සුඛො පාපානං අකරණං සුඛං

සීලං: (පන්සිල්, අටසිල් ආදී වශයෙන් ප්‍රභේද ඇති) ශීලය; **යාව ජරා**: වයස් ගත වන තුරු; **සුඛං**: සැපතකි; සද්ධා: **ශ්‍රද්ධාව** (ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙයාකාර වූ); **පතිට්ඨිතා සුඛා**: ස්ථිරව පිහිටීම සැපතකි; **පඤ්ඤාය පටිලාභො සුඛො**: ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවගේ ප්‍රතිලාභය සැපතකි; **පාපානං**: පව්; **අකරණං**: නොකිරීම; **සුඛං**: සැපතකි.

වයස්ගතව ජරාවට පත්වන තෙක් සිල් රැකීම සැපතකි. දැඩි සේ පිහිටි ශ්‍රද්ධාව සැපතකි. නුවණ ලැබීම සැපතකි. පව් නො කිරීම ද සැපතකි.

විවරණය

සහායා: යහළුවෝ. පුද්ගලයකු ගේ ජීවිතයට යහළුවන්ගේ අවශ්‍යතාව බොහෝය. තමන්ට කරදරයක් වූ විට යහළුවකු ගේ උදව්ව ලබා ගැනීමට ඇත්නම් එය කෙනකුට ඉමහත් සහනයක් වෙයි. බොහෝ අය යහළු බව දක්වතත් හැම කෙනෙක්ම යහළුවෝ නොවෙති. මිතුරාට අවංකව හිතවත් බව දක්වමින් මිතුරාට යහමඟ පෙන්වමින් ඔහු ගේ හිත සුව පතන්නා හොඳ යහළුවෙක් වෙයි. එමෙන්ම මිතුරාගේ යහපත නොපතන තම ප්‍රයෝජනය පමණක් සලකා ඇසුරු කරන යහළුවෙක් නියම මිතුරෙක් නොවෙයි. මේ නිසා බෞද්ධ විග්‍රහය අනුව යහළුවෝ ප්‍රධාන කොටස් දෙකකට බෙදෙති. ඒ 'පාප සහාය' සහ 'කලයාණ සහාය' යනුවෙනි. පාප සහායකයා තම යහළුවා නරකට පාපයට පොළඹවයි. කලයාණ සහායකයා මිතුරාව සුමඟට පොළඹවමින් ඔහු ගේ සුඛ සෙත බලාපොරොත්තු වෙයි. අවංක කලයාණ යහළුවන් හෙවත් මිත්‍රයන් ගේ අගය පිළිබඳව බුදුරජාණන් වහන්සේ විවිධ අවස්ථාවලදී කරුණු සඳහන් කළ සේක. විශ්වාසවන්තයා, හොඳ යහළුවා උතුම්ම ඤාතිවරයා ලෙසද සඳහන් කොට ඇත. විස්සාස පරමා ඤාති යහළුවන් පිළිබඳ ඉතා වටිනා විවරණයක් සිඟාලොවාද සූත්‍රයෙන් ඉදිරිපත් වෙයි. මේ සූත්‍රයට අනුව මිත්‍රයෝ දෙගණයකට බෙදෙති. ඒ පාපමිත්‍ර සහ සුහද මිත්‍ර යනුවෙනි. පාපමිත්‍රයා මිතුරකු වෙසින් සිටින මිත්‍ර ප්‍රතිවිරූපකයෙකි. එබඳු මිත්‍රයෝ සතර දෙනෙකි.

1. අඤ්ඤදත්‍ථුහර
2. වචී පරම
3. අනුප්පියභාණ
4. අපායසහාය යනුවෙනි.

අඤ්ඤදත්‍ථුහර පාපමිත්‍රයා තම මිතුරාගෙන් යැපෙන්නෙකි. මිතුරාගේ ධනය සම්පත් ආදිය තමා සතු කර ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටියි. මිතුරාට ටිකක් දී මිතුරාගෙන් වැඩි ප්‍රමාණයක් අපේක්ෂා කරයි. එමෙන්ම ඇසුරු කරන්නේ බියෙනි. හෙතෙම මිතුරුකම් පවත්වන්නේ තමාගේම යහපත සඳහාය.

වචීපරම මිත්‍රයා තම මිතුරාට අතීතයෙන් හා අනාගතයෙන් පමණක් සංග්‍රහ කරන්නෙකි. මිතුරාට අවශ්‍යතාවක් වූ විට ඔහු කියන්න කලින් දැන ගත්තා නම් උදව් කරන්නට හැකි වන බවයි. එසේම අද නම් කිසි දෙයක් කරන්න බැහැ ඉදිරියේ දී නම් ඔහොම දෙයක් උනොත් උදව් කරන්නෙම් යනුවෙන් ද කියයි. ඔහු කිසිවිටෙක තම යහළුවාට වැඩක් ඇති දෙයකින් උදව්වක් නොකරයි. අනාගතයෙහි යහළුවා කිරීමට සැලසුම් කොට ඇති ක්‍රියාවන්හි විපත් දක්වයි. ඒවා ධෛර්යමත් නොකරයි.

අනුප්පියභාණී මිතුරා තම යහළුවාගේ හොඳ දෙය ද අනුමත කරයි. නරක දෙය ද අනුමත කරයි. ඉදිරියේ දී යහළුවාගේ ගුණ කියයි. එහෙත් නැති තැන අගුණ කියයි.

අපායසහායකයා තම යහළුවා ප්‍රමාදයට හේතුවන රහමෙර පානයෙහි උනන්දු කරවන්නෙක් වෙයි. වැඩකට නැතුව තැන්තැන්වල කල්මරමින් සිටීමට සහාය දක්වයි. සැණකෙළි නැටුම්හල් වැනි තැන්වල හැසිරීමට අනුබලය දෙයි. සූදුවෙහි අනුබලය දෙති.

මෙසේ මිත්‍රප්‍රතිරූපක වෙසින් සිටින මිතුරන් සතර දෙනාම ආශ්‍රයට සුදුස්සෝ නොවෙති. ඔවුහු එක්කෝ මිතුරාගෙන් යැපීමට බලා සිටිති. නැතහොත් මිතුරා පාපයට යොමු කරති.

එහෙත් ඇසුරට සුදුසු මිතුරා ගේ යහපත බලාපොරොත්තු වන උතුම් මිතුරෝ සතර දෙනෙක් ද සිටිති. ඔවුහු කලයාණ මිත්‍රයෝය. සිඟාලෝවාද සූත්‍රය දක්වන සුහද වූ කලයාණ මිත්‍රයෝ සතර දෙනා නම්;

1. උපකාරක
2. සමාන සුඛ දුක්ඛ
3. අත්ථක්ඛායි
4. අනුකම්පක.

උපකාරක මිත්‍රයා තම යහළුවාට කරුණු සතරකින් සංග්‍රහ කරයි. යහළුවා ප්‍රමාදයෙහි සිටින විට ආරක්ෂා කරගනියි. යහළුවා ප්‍රමාදයෙහි සිටින විට ඔහුගේ සම්පත්වලට තර්ජනයක් වේ නම් සම්පත් භවභොගාදිය ආරක්ෂා කර දෙයි. යහළුවා කරදරයකට පත්ව සිටි නම් ඔහුට එම කරදරයෙන් අත් මිදීම සඳහා උදව් වෙයි. අවශ්‍යතාවක් පැමිණි විට ඊට අවශ්‍යවන මිල මුදල් ආදියෙන් සංග්‍රහ කරයි.

සමාන සුඛ දුක්ඛ මිත්‍රයා ද තම යහළුවාට කරුණු සතරකින් සංග්‍රහ කරයි. යහළුවාගේ සිතෙහි වද දෙන කිසියම් රහසක් ඇත්නම් ඒ බව විමසා බලයි. යහළුවා ගේ ආරක්ෂා කළ යුතු රහසක් තිබේ නම් එය කිසිවකුට එළි නොකොට සඟවා තබා ගනියි. කිසියම් විපතක් කරදරයක් ඇති වූ විට යහළුවා අත නොහැර යහළුවා සමගම සිටියි. යහළුවා ගේ යහපත සඳහා තම දිවි පරිත්‍යාගය කිරීමට වුවද ඉදිරිපත් වෙයි.

අත්ථක්ඛායි යහළුවා ද තම මිතුරාට කරුණු සතරකින් සංග්‍රහ කරයි. තම යහළුවා පාපයන්ගෙන් මුදවයි. යහපතෙහි යොදවයි. යහළුවා නොදත් දෙය කියා දෙයි. සුගතියට මග පාදා දෙයි

අනුකම්පක මිත්‍රයා තම යහළුවා වෙනුවෙන් කරන සංග්‍රහ සතර මෙසේ ය. යහළුවාට සිදුවන විපත් වලින් හෙතෙම සතුටට පත් නොවෙයි. හෙතෙමේ ද යහළුවා සමඟම දුක් වෙයි. යහළුවාට යහපතක් සිදු වූ විට ධනධාන්‍යයක් ලැබුණු විට යහළුවා පරිද්දෙන්ම තෙමේ ද සතුටු වෙයි. කවරකු හෝ යහළුවාගේ නුගුණ කියන විට ඔහු එයින් වළක්වයි. යහළුවාගේ නුගුණ කීමට කිසිවකුට ඉඩ නොදෙයි. යහළුවා ගේ ගුණවර්ණනා කරන්නන් ධෛර්යමත් කරවයි. යහළුවාගේ කීර්ති ප්‍රසංශා පැතිරී යනු දැකීමට හෙතෙම කැමති වෙයි.

වෛද්‍යවරයකු බඳු බුදුරජාණන් වහන්සේ

බුදුරජාණන් වහන්සේ වෛද්‍යවරයකු වැන්න. රෝග විනිශ්චය, රෝග නිදානය හා ප්‍රතිකාර දන්නා වෛද්‍යවරයා ඒවා රෝගීන් කෙරෙහි උපයෝගී කරන්නාක් සේ බුදුරජාණන් වහන්සේ ද දුක, දුකෙහි හේතුව, දුකෙහි නිරෝධය, දුක නිරෝධ කිරීමේ මාර්‍ගය ඇතුළත් චතුරාර්ය සත්‍යය ලෝක සත්වයාට කියා දුන් සේක.

එඩ්වර්ඩ් තොන්සේ - ''බුදුදහම''

තණ්හා වග්ග

පමාවී වෙසෙන මිනිසා ගේ තණ්හාව වැඩේ. තණ්හාවට වසඟ වූ ඒ තැනැත්තා බවයෙන් බවයට යේ.

334. මනුජස්ස පමත්ත චාරිනො
තණ්හා වඩ්ඪති මාලුවා විය
සො ප්ලවති හුරාහුරං
ඵලං ඉච්ඡංව වනස්මිං වානරො (24:1)

පමායෙහි හැසිර සිටිනා මිනිසාට
තණ්හා වැඩෙයි පිළිලක් මෙන් විනාසෙට
පැන පැන සිටිනු ඇත හේ ඒ මේ අතට
වඳුරකුවගේ වනයෙහි පලවැල ලොබට

වඩනා තණ්හා මුළාවේ - පිළිලයක් වේ විනාසේ

24 (1) ගරු සරු නැති භික්ෂුවක් (334 සිට 337 දක්වා ගාථා)

යටගිය දවස පන්සියයකින් සමන්විත **සොර කණ්ඩායමක්** මං පැහැර පළා යන්නාහු ගම්මුන් විසින් ලුහු බඳනා ලද්දාහු ය. සොරුන් පලා යමින් ගම්මුන්ගෙ න් ගැලවී ගනු සඳහා වනයට ඇතුළු වී ඒ මේ අත ඇවිද්දාහ. එවිට ඔවුනට වනවාසව භාවනා කටයුතුවල නිරත වන භික්ෂූන්වහන්සේ නමක් දැක එහි ගොස් උන්වහන්සේ ගෙන් රැකවරණය ඉල්ලා සිටිය හ. "මෙහි තොපට මවිසින් දිය හැකි රැකවරණයක් නැත. තොප සිල්වත්ව සිටියෝ නම් එයම තොපට රැකවරණය වනු ඇත. එහෙයින් පන්සිල් සමාදන්ව සිල්වත් වුව මැනවැයි" උන්වහන්සේ පැවසූ හ. ඔවුහු ද භික්ෂූන්වහන්සේ ගෙන් පන්සිල් සමාදන් වූහ. සොරුන් ලුහුබැඳ ආ ගම්මු මෙහිදී ඔවුන් දැක අල්වා ගෙන මරා දැමූ හ. ටික වෙලාවක් නමුත් ආරක්ෂා කළ පන්සිල් බලයෙන් සොරු දෙව්ලොව දෙවියන්ව උපන්හ. සොර නායකයා ඒ දෙව්වරුන්ට ද නායක දෙවියෝ වූහ. මෙසේ මේ දෙව්වරු දිගු කලක් දෙව්ලොව දෙව්සැප විඳ එයින් මිය ගොස් අපගේ බුදුන් වහන්සේ ගේ සමයෙහි සැවැත් නුවර ධීවර ගම්මානයක පන්සියයක් වූ පවුල්වල පිළිසිඳ ගත් හ. ධීවර නායකයාට පුතකු උපන් දවසේ අනෙක් නිවෙස් වලද පුත්තු බිහි වූහ. දේව කණ්ඩායමේ නායකයා නායක ධීවරයා ගේ පුතා ලෙස ද අනෙක් ධීවරයන් ගේ පුතුන් ලෙස සෙසු දෙව්වරු ද උපන්හ.

මේ පිරිස තරුණවියෙහි සිටිය දී පළමුවරට මාළු ඇල්ලීම සඳහා අචිරවතී ගංගාවට ගොස් එහි දැල එලා සිටියදී ඔවුන් ගේ දැලට රන්වන් මාළුවෙක් අසුවිය. මේ යහළු පිරිසේ මව්පියවරු රන්වන් මාළුවා දැක බෙහෙවින් සතුටුව මාළුවා රජුට ගෙන ගොස් දුන හොත් බොහෝ ධනය ලැබිය හැකියයි සිතා මාළුවා රජුට ගෙන ගොස් දෙන ලෙස තම පුතුනට උපදෙස් දුන් හ. ඔහු ද ගොස් එසේ කළ හ. රජු මාළුවා දැක බෙහෙවින් සතුටට පත්ව ඔවුනට ධනය දී මෙසේ කල්පනා කළේ ය. "මේ මාළුවා බුදුරජුනට දැක්වුවහොත් මොහු රන්වන් වීමට හේතු කාරණා දැනගත හැකි වෙයි." මෙසේ සිතූ හෙතෙම සේවකයින් ලවා මත්ස්‍යයාද රැගෙන ජේතවනාරාමයට ගියේ ය. මත්ස්‍යයා රන් පැහැයෙන් බැබළුනත් ඔහු ගේ මුවෙන් ඉමහත් දුගඳක් විහිදෙයි. රජ තෙමේ මාළුවා බුදුරජාණන් වහන්සේට දක්වා රන්වන් පැහැවීමටත් කටින් දුගඳ පැතිරීමටත් හේතු විමසී ය. බුදුරජාණන් වහන්සේ කරුණු ගෙන හැර පාමින් මෙසේ වදාළ සේක."රජතුමනි, මේ මත්ස්‍යයා කාශ්‍යප බුද්ධ කාලයෙහි භික්ෂුවක්ව සිටියෙකි. එකල එම භික්ෂුවගේ නම කපිලය. කපිල භික්ෂුව බෙහෙවින්ම උගත් ධර්මධරයෙක් විය. මේ නිසාම ඔහුට විශාල අනුගාමික පිරිසක් ද විය. උගත් කම කීර්තිය පැතිරීමට මෙන්ම කෙලෙස් බහුල වීමට ද හේතුවක් වෙයි. ඔහුට පිරිස සම්පත්තිය වැඩිවත්ම ලාභ ප්‍රයෝජන ගලා එන්නට ද විය. මෙතෙම ලැබෙන ලාභයට ගිජු වී භික්ෂු ප්‍රතිපත්ති අතින් ගිලිහුණෝය. මෙපමණක් නොව මෙතෙම ධර්මය අධර්මය කොටත් අධර්මය ධර්මය කොටත් විනය අවිනය කොටත් අවිනය විනය කොටත් ප්‍රකාශ කරයි. සුපෙශල ශික්ෂාකාමී භික්ෂූන් ඔහුට ඔහුගේ මේ අධර්මවාදී අවිනයවාදී ක්‍රියා පෙන්වා දෙන විට උන්වහන්සේලාට නපුරු වචනයෙන් බැණ වදිමින් දොස් පවරයි. මෙබඳු පාප කර්ම නිසා ශීලාදී ගුණයෙන් පිරිහුණු මෙතෙම මිය පරලොව ගොස් අපායෙහි උපත ලැබීය. බොහෝ කලක් අපාදුක් විඳ එයින් පසුව දැන් මේ මත්ස්‍යයකුව ඉපිද සිටී. මොහු දුශ්ශීල වීමට පෙර ගුණ ගරුකව සිල්වත්ව සිටි බැවින් එම පුණ්‍ය කර්මයෙහි බලයෙන් ඔහු ගේ ශරීරය රන්වන් පැහැවිය. භික්ෂූන් වහන්සේලාට දෝෂාරෝපනය කරමින් ධර්ම විපරිත කොට දක්වාලු හෙයින් කටින් දුගඳ හමයි" මෙසේ ප්‍රකාශ කළ බුදුරජාණන් වහන්සේ "මහරජ, මොහු කළ පාපකර්ම මොහුගේම කටින් කියවමු" යි වදාරා මාළුවාගෙන් මෙසේ විමසූ සේක.

"ඔබ කපිලද?"
"එසේය ස්වාමීනි, මම කපිල වෙමි" මත්ස්‍යයා පිළිතුරු දුන්නේ ය.
"ඔබ කොහිසිට පැමිණියෙහි ද?"
"ස්වාමීනි, මම අවීචි මහ නිරයෙහි සිට පැමිණියෙමි"
"ඔබ ගේ වැඩි මහල් සොයුරු සොධනට කුමක් වීද?"
"ස්වාමීනි, සොධන රහත් බවට පත්ව නිවන් අත්දුටුවේ ය."
"ඔබේ මව සාධනීට කුමක් වීද?"
"ස්වාමීනි, ඇය නිරයෙහි උපන්නාය"
"ඔබේ බාල සොහොයුරිය තාසනාට කුමක් වීද?"
"ස්වාමීනි, ඇය ද නිරයෙහි උපන්නාය"
"දැන් ඔබ යළි යන්නේ කොහිද?"
"මා මිය ගොස් නැවත අවීචි මහ නිරයට යමි"

මෙසේ පැවසූ මත්ස්‍යයා පසුතැවිල්ලෙන් යුක්තව බිම හිස ගසාගෙන මිය ගියේ ය. ඔහු ගේ උපත යළි අවීචියෙහිම සිදු විය. මේ සිදු වීම දුටු රැස්ව සිටි බොහෝ පිරිස පාපයෙහි බිය ඇති කර ගත් හ. බුදුරජාණන් වහන්සේ පිරිසට ධර්මදේශනා කරමින් මෙම ගාථා ධර්මයන් ඉදිරිපත් කළ සේක.

විවරණාත්මක අනුවාදය (334 ගාථාව)

පමත්තචාරිනො මනුජස්ස තණ්හා මාලුවා විය වඩ්ඪති
සො ඵලං ඉච්ඡං වනස්මිං වානරො ඉව හුරා හුරං
පලවති

පමත්තචාරිනො: පමාව හැසිරෙන; **මනුජස්ස**: මිනිසා ගේ; **තණ්හා**: තෘෂ්ණාව; **මාලුවා විය**: ගස නසා වැඩෙන මාලුවා වැලක් මෙන්; **වඩ්ඪති**: වැඩේ; **සො**: ඒ මිනිසා; **ඵලං ඉච්ඡං**: ගෙඩි බලාපොරොත්තුවෙන්; **වනස්මිං**: වනයෙහි; **වානරො ඉව**: වඳුරකු මෙන්; **හුරා හුරං**: ඔබිමොබ (උපතින් උපතට); **පලවති**: පනියි.

පමාව හැසිරෙන මිනිසාගේ තෘෂ්ණාව ගසක් නසා ගෙන වැවෙන මාලුවා වැලක් මෙන් වැඩෙයි. තෘෂ්ණාවෙන් පෙළෙන ඒ මිනිසා වනයෙහි ගෙඩි බලාපොරොත්තුවෙන් ගසින් ගසට පනින් වඳුරකු මෙන් උපතින් උපතට පනියි.



ලාමක වූ ද අරමුණු විෂයයෙහි වෙසෙසින් ඇලෙන්නා වූ ද තණ්හාවට වසඟ වූ තැනැත්තාට සෝ දුක් තර වැ වැඩෙත්.

335. යමෙ සා සහතී ජම්මී
තණ්හා ලොකෙ විසත්තිකා
සොකා තස්ස පවඩ්ඪන්ති
අභිවට්ඨංව බීරණං (24:2)

සිතේ වැඩෙන තණ්හා විසකුරුය ලොවේ
එයින් වැඩෙන මිනිසා විපතටම යැවේ
මිනිස් සිතට ඉන් එක්වන දරුණු සොවේ
වැසිදිය ලබා සරුවන තණ ලෙසින් වැවේ

වැඩෙන තණ්හාව සිතේ - බෙහෙවින් විසකුරුය ලොවේ.

24 (1) ගරු සරු නැති භික්ෂුවක් (334 සිට 337 දක්වා ගාථා)

අතීත කථාව

කපිල මත්ස්‍යයාට සම්බන්ධ අතීත කථාව මෙසේ දැක්වෙයි.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලොව පහළව ලෝසතුන් වෙනුවෙන් වැඩ වඩා පිරිනිවන් පෑවාට පසු කලෙක සොහොයුරෝ දෙදෙනෙක් සසර කලකිරී ගිහි ගෙයින් නික්ම භික්ෂූන් වහන්සේ වෙතට ගොස් පැවිදි බවට පත් වූහ. වැඩිමහල් සොහොයුරා සොධන නම් වූ අතර බාල සොහොයුරු කපිල නම් විය. මේ දෙදෙනාම සසුනෙහි පැවිදි වීමෙන් අනතුරුව බෙහෙවින් ශික්ෂාකාමීව වත් පිළිවෙත් පුරමින් ආචාර්ය උපාධ්‍යායවරුන් ට ඇප උපස්ථානාදිය ද කරමින් ශාසනික කටයුතුවල නිරතව විසූහ. මෙසේ ශීලාදි ගුණ ධර්මයන් හි යෙදී සිටියදී මේ දෙදෙනා ග්‍රන්ථධුරය හා විදර්ශනාධුරය වැඩීමෙහි කැමැත්ත දැක්වූ හ.

ඒ අනුව වැඩිමහල් සොහොයුරු භික්ෂුව විදර්ශනා ධුරය වැඩීමට එකඟ වූ අතර බාල සොහොයුරු භික්ෂුව ග්‍රන්ථ ධුරය තෝරා ගත්තේ ය. විදර්ශනා ධුරයෙන් කෙරෙන්නේ අනිත්‍ය දුක්ඛ අනාත්මතාව පදනම් කොට භාවනා වැඩීමයි. ග්‍රන්ථ ධුරය ධර්මය උගෙන ධර්මයෙහි විශාරද බවට පත්ව ශ්‍රාවක ශ්‍රාවිකාවනට ධර්මය කියා දෙමින් ලෝකශාසනික අභිවෘද්ධිය සැලසීම කෙරෙහි යොමු වී ඇත. වැඩිමහල් භික්ෂුව ආචාර්ය උපාධ්‍යාය වරුන් වෙත වෙසෙමින් කමටහන් උගෙන ආරණ්‍යගතව භාවනාවෙහි නියුක්ත විය. හෙතෙම බෙහෙවින් කැප වීමෙන් උත්සාහයෙන් යුක්තව භාවනාවෙහි යෙදී සියලු කෙලෙසුන් නිසා උතුම් රහත් බවට පත්විය.

බාල සොහොයුරු භික්ෂුව ග්‍රන්ථධුරය තෝරාගත්තේ තමා තවම බාල වියෙහි සිටි බැවිනි. තරුණ කාලයෙහි ධර්මය හදාරා මහළු වියෙහි දී විදර්ශනා ධුරය වැඩීම ඔහු ගේ බලාපොරොත්තුව විය. මේ නිසා හෙතෙම ත්‍රිපිටක ධර්මය උගෙන ධර්මය පිළිබඳ විශාරද තත්වයට පත්විය. හෙතෙම ජනප්‍රිය ධර්මකථිකයකු බවටද පත්විය. මොහුගෙන් ධර්මය ඇසීමට බොහෝ දෙන ප්‍රිය කළ හ. එබැවින් මෙම භික්ෂුවට අනුක්‍රමයෙන් විශාල අනුගාමික පිරිසක් ඇති විය. ඔහු ගේ කීර්තිරාවය දිනෙන් දින වැඩෙන්නට විය. මේ නිසාම ඔහුට ලාභ ප්‍රශංසා වැඩි වන්නට විය. ක්‍රමයෙන් ලාභ ප්‍රයෝජන සමඟම ඔහු ගේ අභිමානය ද වර්ධනය විය. තමාට වඩා ධර්මය දන්නා අන් අය නැතැයි සිතන තරමට හෙතෙම උගත්කම පිළිබඳ අභිමානයකින් ද පෙළුනේ ය. මේ නිසාම හෙතෙම වෙනත් ධර්ම විනය ධර තෙරවරුන් ගේ ධර්ම විනයානුකූල ප්‍රකාශන පවා නොසලකා හරින්නෙක් විය. ලැබෙන ලාභ ප්‍රයෝජන කෙරෙහි ගිජු බවින් මඩනා ලද හෙතෙම ධර්ම විනය නොපිට පෙරලා විකෘත කිරීමට පවා පෙළඹුනේ ය. පාපයට ලැජ්ජ භය නැති වීම නිසා ධර්මය අධර්මය ලෙසත් විනය අවිනය ලෙසත් අධර්මය ධර්මය ලෙසත් අවිනය විනය ලෙසත් විකෘත කොට දැක්වී ය. කපිල භික්ෂුව මෙසේ ධර්මවිනයෙන් බැහැරව ලාභ ප්‍රයෝජන කීර්ති ප්‍රසංශාවලට ගිජුව ක්‍රියා කරත් දී අනෙක් භික්ෂූන් ඔහු ගේ වරද පෙන්වා දුන්විට ඒ භික්ෂූන්ට ද දොස් නගා පළවා ගැනීම ඔහු ගේ සිරිත විය. කපිල භික්ෂුව අන් අයගේ අවවාදයට නතු නොවී පාපකාරී ක්‍රියාවල යෙදෙන බව සොහොයුරු සොධන රහතන් වහන්සේට දැන ගැනීමට ලැබිණ. එබැවින් උන්වහන්සේ පැමිණ දුෂ්ප්‍රතිපත්තීන්ගෙන් ඉවත්ව ශාසන බ්‍රහ්මචර්යාවෙන් මනාව හැසිරෙන ලෙස තම සොහොයුරු භික්ෂුවට උපදෙස් දුන් හ. එහෙත් ඒ කිසිදු උපදේශයකට කපිල කන් නොදුන්නේ ය. වැඩිමහල් සොහොයුර තෙවරක්ම උපදෙස් දෙමින් බාල සොහොයුරු සුමගට ගැනීමට උත්සාහ කළ ද ඒ කිසිවකින් ප්‍රතිඵලයක් අත් නො වීය. කපිල තම දුෂ්ඨ ප්‍රතිපත්ති කිසිසේත් අත් නොහළේ ය. වැඩි මහල් සොහොයුරා ද ඔහු සුමඟට ගත නොහැක්කෙකැයි සලකා උපදෙස් දීම අත්හළේ ය. අනෙක් සුපෙසල භික්ෂූහු ද කපිල භික්ෂුව වර්ජනය කළ හ.

මේ සොහොයුරු දෙපලගේ මෑණියන් සහ බාල සොහොයුරිය ද ගිහි ගෙය හැර පියා භික්ෂුණී ශාසනයෙහි පැවිදි වූහ. එහෙත් ඔවුහු ද නොබෝ කලකින්ම නොමගට යොමු වූහ. ශීලාදී ගුණ ධර්ම වැඩීමට හෝ භාවනා කටයුතු වල නිරතව කෙලෙස් තැවීමට හෝ ඔවුහු උනන්දු නො වූහ. බාල පුත්‍ර භික්ෂුව මෙන්ම අසත්‍යයෙහිම හැසිර මිය ගොස් ඔවුහු අපායෙහි උපත ලද හ.

කපිල භික්ෂුව අනෙක් සුපේශල භික්ෂූන් විසින් වර්ජනය කරන ලද්දේ හිතුවක්කාර ලෙසින් අධර්මවාදී අවිනයවාදී ක්‍රියාවලම යෙදී පවු පුරවා ගෙන මිය ගොස් අවීචි මහා නරකයෙහි උපත ලද්දේ ය. එහි බුද්ධාන්තරයක් විවිධ දුක් කම් කටොලු පීඩාවන්ට භාජනය වී එයින් පසුව අචිරවතී ගඟෙහි රන්වන් මත්ස්‍යයකු වී උපත ලද්දේ ය. බුදුරජාණන් වහන්සේ මේ ගාථා ධර්මයන් දේශනා කර වදාරන ලද්දේ මෙම කපිල මත්ස්‍යයා අරභයායි.

විස්තරාත්මක අනුවාදය (335 ගාථාව)

ජම්මී විසත්තිකා එසා තණ්හා ලොකෙ යං සහති තස්ස අභිවට්ඨං බීරණං විය සොකා පවඩ්ඪන්ති

ජම්මී: ලාමක වූ; **විසත්තිකා**: විසකුරු වූ; **එසා තණ්හා**: මේ තෘෂ්ණාව; **ලොකෙ**: මෙලොව; **යං**: යමකු; **සහති**: මැඩලයි ද; **තස්ස**: ඔහුට; **අභිවට්ඨං**: වැසිදිය වැටුණු; **බීරණං විය**: බීරණ තෘණ මෙන්; **සොකා**: ශෝකයෝ; **පවඩ්ඪන්ති**: වැඩෙත්.

ලාමක වූ විස සහිත වූ මේ තෘෂ්ණාව මෙලොව යමකු මඩියි ද (තෘෂ්ණාවෙන් මැඩගනු ලැබෙයිද) ඔහුට වැසි වතුරෙන් වැවෙන බීරණ තණ මෙන් ශෝකය වැඩෙයි.

ලාමක වූ ද දුක සේ ඉක්මවිය යුතු වූ ද තණ්හාව මැඩලු තැනැත්තා කෙරෙන් සෝ දුක් පහව යෙත්.

336. යො චෙතං සහති ජම්මිං
තණ්හං ලොකෙ දුරච්චයං
සොකා තණ්හා පපතන්ති
උදබිංදුව පොකඛරා (24:3)

දුරලනු අපහසුය තණ්හා තමා වෙතින්
කිසිවෙක් මඩී නම් එය මතු නොවන ලෙසින්
නොරඳා ගලායයි සෝදුක් ඔහු ගෙ සිතින්
දියබිඳු ගලා බස්නා මෙන් පොකුරු පතින්

මිඳෙන්නට නම් සෝදුකින් - දුරලනු තණ්හාව සිතින

24 (1) ගරු සරු නැති භික්ෂුවක් (334 සිට 337 දක්වා ගාථා)

විස්තරාත්මක අනුවාදය (336 ගාථාව)

ලොකෙ යොච ජම්මිං දුරච්චයං එතං තණ්හා සහති
තම්හා සොකා පොක්ඛරා උදබින්දු ඉව පපතන්ති.

ලොකෙ: මෙලොව; **යොච**: යම් පුද්ගලයෙක් වනාහි; **ජම්මිං**: ලාමක වූ; **දුරච්චයං**: දුරලීම අපහසු වූ; **එතං තණ්හා**: මේ තෘෂ්ණාව; **සහති**: මැඬලයි ද; **තම්හා**: ඔහු කෙරෙන්; **සොකා**: ශෝකයෝ; **පොක්ඛරා**: නෙළුම්පතින්; **උදබින්දු ඉව**: දියබිඳු මෙන්; **පපතන්ති**: නොරැඳා ගලා යයි.

මෙලොව යමෙක් පහත් ලාමක වූ දුරු කිරීමට දුෂ්කර වූ මේ තෘෂ්ණාව මැඬලයිද, ඔහු ගේ සිතෙහි නෙලුම් පතින් දිය නොරැඳා ගලා යන්නාක් මෙන් ශෝකය නොරැඳා ගලා හැලෙයි.

විවරණය

මාලුවා විය: මාලුවා නමින් හැඳින්වෙන වැල් වර්ගයක්. මෙය ගසක එතී වැවෙයි. වැල වැඩෙන විට සම්පූර්ණයෙන් ගස යටකර ගැනෙයි. එවිට ගසේ වැඩීම නවතියි. අන්තිමේ දී ගස විනාශ වී යයි. එබැවින් ගසක එතී වැවෙන මාලුවා වැල ගසේ පිලිලක් කොට සැලකෙයි. මෙහිදී තණ්හාව ද මාලුවා වැලට සමාන කොට දක්වා ඇත. තෘෂ්ණාවෙන් පුද්ගලයා මැඩෙන බැවිනි. සිතේ වැඩෙන තෘෂ්ණාව සිත සම්පූර්ණයෙන් අපවිත්‍ර කොට කෙලෙසා,දැමීමට සමත් වෙයි.

ඵලං ඉච්ඡං වානරොව්ය: ගස්වල ගෙඩි බලාපොරොත්තුවන වඳුරකු මෙන්, තමා සිටින ගසේ ගෙඩිවලින් පමණක් සතුටු නොවන වඳුරා අනෙක් ගස්වල ඵලවලට ලොබින් ගසින් ගසට පැනයයි. තෘෂ්ණාවෙන් මඬිනා ලද පුද්ගලයන් ගේ භවයෙන් භවයට උපත සොයා යයි.

විසත්තිකා: තෘෂ්ණාව සඳහා යෙදෙන විශේෂණ පදයක් ලෙස මෙය දැක්වෙයි. දැඩිව අල්වා ගනු ලබන ස්වභාවයක් තෘෂ්ණාවෙහි ඇති බැවින් මේ නම යෙදී තිබේ.

බීරණං: තෘණ වර්ගයක නමකි. වැසි වතුරෙන් ඉතා සරුවට පඳුරු ගසා වැඩෙන තණ වර්ගයක් ලෙස හැඳින්වෙයි. තෘෂ්ණාව ශෝකය වැඩීමට හේතුවක් වෙයි. එය මෙහිදී දක්වා ඇත්තේ උපමානුසාරයෙනි. තෘෂ්ණා නමැති වැසි දිය වැටීමෙන් ශෝක නැමති බීරණ තණ පඳුරු ගස් වැඩෙයි.

දුරච්චයං: තෘෂ්ණාව මිනිසා ගේ සිත වසා පැතිර පවතින්නකි. අනාදිමත් කාලයක් තුළ සංසාර්යට තෘෂ්ණා වශයෙන් බැඳී සිටීම නිසා තෘෂ්ණාව සිතෙන් ඉවත් කර ගැනීම ඉතාමත් දුෂ්කර දෙයකි.

රහත් මඟ නැණින් තණ්හාවේ මුල උදුරා දමන්න මාරයගේ මැඩීමට නැවත නැවත අසු නොවන්න.

337. තං වො වදාමි භද්දං වො
යාවන්තෙත්ථ සමාගතා
තණ්හාය මූලං ඛණථ
උසීරත්ථො ව බීරණං
මා වො නලං ව සොතො ව
මාරො භඤ්ජි පුනප්පුනං (24:4)

යහපත් දෙයක් පවසමි ඔබහට පැමිණි
සැවැන්දරාවෙන් වැඩ ඇතියකු වෙතිනි
ගලවා හැරෙන වැඩකට නැති තණ ලෙසිනි
සිඳලනු මැනවි තණ්හාවේ මුල සොදිනි
කැඩෙනා නෙලුම් දඬුමෙන් සැඩකර දියෙනි
යළි යළි නොමැඩෙන්න පාපී මරු අතිනි.

තණ්හාවේ මුල් උදුරා - මඬින්න මරු සතුරා

24 (1) ගරු සරු නැති භික්ෂුවක් (334 සිට 337 දක්වා ගාථා)

විස්තරාත්මක අනුවාදය (337 ගාථාව)

**යාවන්තො එත්ථ සමාගතා වො තං භද්දං වදාමි.
උසිරත්ථො බීරණං ඉව තණ්හාය මූලං ඛණථ. සොතො
නලං ඉව මාරො වො පුනප්පුනං මා භඤ්ජි**

යාවන්තො: යම් පමණ දෙනෙක්; **එත්ථ**: මෙහි; **සමාගතා**: රැස්වුවාහු ද; **වො**: තොපට; **භද්දං**: යහපත් දෙයක්; **වදාමි**: කියමි; **තං**: එහෙයින් **උසිරත්ථො**; උසීර තෘණ බලාපොරොත්තු වන්නෙක්; **බීරණං ඉව**: බීරණං තෘණ (ගලවා ලන්නාක් මෙන්); **තණ්හාය**: තෘෂ්ණාවගේ; **මූලං**: මූල ; **ඛණථ**: සාරා දමවූ; **සොතො**: සැඩ දිය පහරක්; **නලං ඉව**: නෙළුම් දණ්ඩක් මෙන්; **මාරො**: මාරයා; **වො**: තොපව; **පුනප්පුනං**: යළි යළිත්; **මා භඤ්ජි**: නොපෙළාවා

යම් පමණ දෙනෙක් මෙතැනට රැස් වුවාහු නම් ඒ හැමටම යහපත් දෙයක් කියමි. උසීර තෘණ ගොමුවෙන් හීරණ තණ ගලවා දමන්නාක් මෙන් තෘෂ්ණාවන්ගේ මූල ගලවා දමන්න. සැඩ දිය පහරකින් නෙලුම් දණ්ඩක් සිඳ බිඳ දමන්නාක් මෙන් මාරයා විසින් ඔබ සැම යළි යළිත් මැඬලනු නොලබත්වා.

විවරණය

මේ ගාථා කිහිපය මගින්ම තෘෂ්ණාවේ පුද්ගලයාට ඇති විපත්ති කර තත්වය පැහැදිලි කර දෙයි. පුද්ගලයාගේ සාංසාරික පැවත්ම සම්බන්ධයෙන් සලකන විට තෘෂ්ණාව ඒ සඳහා මූලකරණය වෙයි. එබැවින්ම සියලු සාංසාරික ව්‍යසනයන්ට හේතුව තෘෂ්ණාවයි. චතුරාර්ය සත්‍යයේ දෙවැනි සත්‍යයෙන් මේ කාරණය පැහැදිලි කොට තිබේ. තෘෂ්ණාව මුලිනුදුරා දැමීම දුෂ්කර වූ දෙයකි. කෙතරම් දුෂ්කර වූවත් එය සාංසාරික විමුක්තිය අපේක්‍ෂා කරන්නකු විසින් සම්පූර්ණයෙන් තමා කෙරෙන් ඉවත් කර ගත යුත්තකි. පුද්ගලයකු ගේ උපත තෘෂ්ණාව නිසා සිදු වෙයි. ඒ ඒ ආත්ම භවයෙහි තරව ඇලීමක් තෘෂ්ණාවෙන් සිදු කරන බැවින් පුද්ගලයා සසර අත නොහැර අල්වා ගෙන සිටින්නේ තෘෂ්ණාව මගිනි. සසර තෘෂ්ණාවෙන් ඇති වේ නම් සසර නැති කළ හැක්කේ තෘෂ්ණාව නැති කිරීමෙනි.

තෘෂ්ණාව පුද්ගලයා තුළට පිටතින් ඇතුළු වන්නක් නොවේ. එය පුද්ගලයා විසින්ම තමා තුළම ඇති කර ගන්නකි. එබැවින් එය නැති කර ගැනීම ද පුද්ගලයා විසින්ම කළ යුත්තකි. මෙය දුෂ්කර වුවත් නො කල හැක්කක් නොවේ. මේ සඳහා පුද්ගලයකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙතක් තිබේ. ඒ පිළිවෙත මධ්‍යම ප්‍රතිපදාව නමින් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයකින් යුක්තව බුදුරජාණන් වහන්සේ විසින් ලෝක සත්වයා ගේ විමුක්තිය සඳහා ඉදිරිපත් කොට තිබේ.

පුද්ගලයා කාමාස්වාදයට වසඟ වීමට කරන ප්‍රයත්නය තෘෂ්ණාව තුළින් සිදු වන්නකි. දකින දකින කාම වස්තූන් පිළිබඳව තම පංචේන්ද්‍රියයන් මගින් ආස්වාදය ලැබීමට පුද්ගලයා පෙළඹෙයි. මේ පෙළඹීම සිදු වනුයේ ඉන්ද්‍රිය අසංවරය නිසාය. කාමාදි කෙලෙස් ඇතුළු වීමෙන් සිත ආරක්‍ෂා කර ගැනීම සඳහා මූලික පියවරක් ලෙස ඉන්ද්‍රිය සංවරය බුදු දහමින් අනුමත වෙයි. කාමවස්තු කෙරෙහි සිත යොමු නොකොට ඒ වස්තූන් අරභයා ඇති කර ගන්නා සිතුවිලි ඔස්සේ සිතට හැසිරීමට ඉඩ නොදී තබා ගැනීම ඉන්ද්‍රිය සංවරය යන්නෙන් අදහස් කෙරෙයි.
කාම වස්තූන් කෙරෙහි පුද්ගලයා ගේ සිත ඇදී යන්නේ එම වස්තූන් සුන්දරය, සුඛය, සුභය වශයෙන් බැලීමේ ප්‍රවණතාවක් පුද්ගලයා තුල ඇති බැවිනි. මෙය ප්‍රධාන වශයෙන් අවිද්‍යාව නිසා ඇති වන්නකි. අවිද්‍යාව යනු සංස්කාර ධර්‍මයන්හි යථා ස්වභාවය නො දැනීමයි. මේ නිසා රාගයට හෙවත් තෘෂ්ණාවට ප්‍රතිපක්‍ෂවූ විරාගය ඇති කර ගැනීම සඳහා වස්තූන් දෙස ඒවා පවත්නා සැටියෙන් දැකීමේ නුවණක් අවශ්‍ය වෙයි.

මෙම දැනුම අපට ලබා දෙන්නේ බුදු සමයෙන් ඉදිරිපත් වී ඇති පටිච්චසමුප්පාද ධර්‍මයෙනි. ඒ මගින් උපදින-හට ගැනෙන සෑම දෙයකම පැවැත්මේ යථා සත්‍යය විවරණය කර දෙයි. සියලු වස්තු ඇතිවෙමින් නැතිවෙමින් යළි ඇති වෙමින් හා නැති වෙමින් පවතියි. ඒ හේතු ප්‍රත්‍යයක් ගෙන් හටගන්නා සංස්කාර ධර්‍මයන්හි ස්වභාවයයි. හේතු පවත්නා තාක් වෙනස් වෙමින් දුකට පත් වෙමින් ජරාවට පත් වෙමින් නිරන්තර ප්‍රවාහයක් මෙන් අඛණ්ඩතාවකින් ඇති වේ. පැවැත්ම නවත්වා ලිය නො හැක. එසේ නැවත්වීමට නම් හේතුවේ පැවැත්ම නැති කළ යුතුය. වස්තූන්හි මේ වෙනසට බඳුන් වන මෙම අභිනව පැවැත්ම පුද්ගලයකු ප්‍රත්‍යක්‍ෂ කරන්නේ නම් එබඳු වස්තු නිත්‍ය, සුඛ, සුඛ වශයෙන් නො සලකයි.

ඒවා යේ තෘෂ්ණා වශයෙන් ඇලීම වෙනුවට සිතේ ඇති කර ගන්නේ විරාගයයි. එබැවින් මේ විරාගය ඇති කර ගැනීම සඳහා වස්තූන්ගේ යථාතත්ත්වය පෙන්නුම් කෙරෙන විදර්‍ශනාව වැඩිය යුතු වෙයි. භාවනාමය කාර්ය දාමයකට සිත නැඹුරු කර ගත යුත්තේ මෙම විදර්‍ශන ඥානය ඇති කර ගැනීම සඳහා ය. විදර්‍ශනා ඥානය පහළ නොවන තාක් පුද්ගලයාගේ සිත තුළ තෘෂ්ණාව වැඩීම පවතියි. එබැවින් බුදු සමය නිරෝධගාමී මාර්‍ගයෙහි අවසාන පියවර වශයෙන් නිර්දේශ කොට ඇත්තේ භාවනාව හෙවත් සමාධියයි. එයද හුදු චිත්ත සමථය සඳහා නොවේ. සම්පූර්‍ණයෙන් තෘෂ්ණාදි ක්ලෙෂ ක්‍ෂය සඳහාය.

තණ්හාව හේතුකොට උපදනා කෙලෙස් නො නැසූ කලැ මේ දුක් රැස නැවත නැවත හට ගැනෙන්නේ ය.

338. යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තතී දුක්ඛමිදං පුනප්පුනං (24:5)

උදුරා දමන තුරු මුල් සැම දැඩි විලසින්
කැපූ ගස වුවද යළි ලියලා වැඩෙයි නිතින්
තණ්හානුසය ගලවා ලන තෙක් මනසින්
වෙන් වීමක් නොමැත මේ දුක් විපත් රැසින්

බව දුක් නිවාලන්න - තණ්හා මුල් උදුරලන්න

24 (2) සූකර පෝතිකාව (338 සිට 343 දක්වා ගාථා)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම වෙසෙන අවදියෙහි දිනක් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පෙරටු කොට ගත් භික්ෂූන් පිරිවරා පිඬු සිඟා යද්දී තරුණ ඊරියක් දැක බුදුරජාණන් වහන්සේ සිනහ පහළ කළ සේක.

සිනහවෙන් පැහැපත් වූ උන්වහන්සේ ගේ මුහුණ දුටු අනඳ හිමියෝ සිනහ පහළ කිරීමට හේතුව බුදුරජාණන් වහන්සේ ගෙන් විමසූ හ. එවිට බුදුන් වහන්සේ "ආනන්ද, අර ඊරිය දෙස බලන්නැ"යි පැවසූ සේක. "මම දකිමි ස්වාමීනි" යි අනඳ හිමියන් ගේ පිළිතුරු විය.

"කකුසඳ බුදුරජාණන් වහන්සේ ගේ සසුන පවතින කාලයෙහි මේ ඊරිය කිකිළියක් ව සිටියා ය. ඇය සිටි පෙදෙසට ආසන්නයෙහි භාවනාවෙහි යෙදෙන භික්ෂූන් වහන්සේ නමක් භාවනා කරන විට කියවන විදර්ශනා පාඨය ඇසීමට ඇය පුරුදුව සිටියා ය. හුදෙක් ඇය මේ විදර්ශනා පාඨය ඇසීම නිසා ඒ කිකිළි අත් බැවින් ගිය පසු රජකුලයක උබ්බරී නම් කුමාරිකාවක් වී උපන්නාය.

ඕ තොමෝ දිනක් පිළුණු වූ අහරක රොක්ව සිටි පණු කැලතක් දැක පිළිකුලක් උපදවා පුළවක සංඥාවෙන් යෙදී ප්‍රථම ධ්‍යානය උපදවා ගත්තාය. පසුව ඇය මිය පරලොව ගොස් ප්‍රථමධ්‍යාන බලයෙන් බ්‍රාහ්මලෝකයෙහි උපන්නා ය.

එහි ආයු ප්‍රමාණය ගෙවා එයින් චුතව චුති ප්‍රතිසන්ධි වශයෙන් විවිධ තැන්වල ඉපිද දැන් මේ ආත්මභාවයෙහි මෙහි ඊරියක්ව ඉපිද සිටී. මේ සිද්ධිය දැක මම සිනහ පහළ කෙළෙමි" යි බුදුරජාණන් වහන්සේ තම හසිතුප්පාදයට කරුණු හෙළි කළ සේක.

මේ කාරණය ඇසූ එහි සිටි භික්ෂූන් වහන්සේලා බෙහෙවින් පුදුමයට පත් වූහ. එමෙන්ම උන්වහන්සේලා බෙහෙවින්ම සසර භයට පැමිණියහ. බුදුරජාණන් වහන්සේ මෙහිදි තෘෂ්ණාවෙහි නිශ්සාරතාවත් එමගින් මිනිසාට දුක ලඟා වන ආකාරයත් පැහැදිලි කරමින් මෙම ගාථා ධර්මයන් ප්‍රකාශ කළ හ.

338
ගසක් කපා දැමුවත් එහි මුල් ගලවා නොදැමුවහොත් නැවත ලියලා වැඩෙන්නා සේ තෘෂ්ණා අනුසය මුලිනුපුටා නොදැමුවහොත් මෙම සසර දුක නැවත නැවතත් ඇති වෙයි.

339
යමකු ගේ කාමාස්වාදය දෙසට ඇදී යන සතිසක් වූ ප්‍රවාහයෝ බලවත් වෙත් ද වේගවත් වෙත් ද ඒ බලවත් වූ ඇලීම සහිත වූ සංකල්පයෝ යථාර්ථය මනාව නොදක්නා ලද පුද්ගලයා මැඩ ගෙන යති.

340
හැම තන්හි තෘෂ්ණා ප්‍රවාහයෝ ගලා යති. තෘෂ්ණා නැමැති වැල නැගී සිටියි. ඒ හටගත් තෘෂ්ණා වැල දැක ප්‍රඥාවෙන් එහි මුල සිඳ දමන්න.

341
මිනිසුනට අරමුණු දෙසට ගලා යන තෘෂ්ණාවෙන් තෙත් වූ සොම්නස් සහගත සිතුවිලි වෙයි. ප්‍රීතිය දෙසට නැඹුරු වූ සැප කැමති ඒ මිනිස්සු ජාතිජරාවන්ට පැමිණෙන්නෝ වෙති.

342
තෘෂ්ණාවෙන් පෙරටු කර ගන්නා ලද මිනිස්සු කොටු කර ගන්නා ලද සාවකු මෙන් තැති ගනිති. සංයෝජනයන්ගෙන් ගටනා ලද ඒ මිනිස්සු ජාතිජරාවන්ට පැමිණෙන්නෝ වෙති.

343
තෘෂ්ණාවෙන් පෙරටු කර ගන්නා ලද මිනිස්සු කොටු කරගන්නා ලද සාවකු මෙන් තැති ගනිති. එබැවින් තමන් ගේ විමුක්තිය අපේක්ෂා කරන භික්ෂුව තෘෂ්ණාව දුරු කරන්නේ ය.

විස්තරාත්මක අනුවාදය (338 ගාථාව)

යථා අපි අනුපද්දවෙ මූලෙ දළ්හෙ ඡින්නො රුක්ඛො අපි පුන එව රූහති. එවං අපි තණ්හානුසයෙ අනූහතෙ ඉදං දුක්ඛං පුනප්පුනං නිබ්බත්තති

යථා අපි: යම් සේ නම්; **අනුපද්දවෙ**: නො උදුරන ලද; **මූලෙ**: මුල්; **දළ්හෙ**: දැඩිව ඇති කල්හි; **ඡින්නො**: කපන ලද්දා වූ; **රුක්ඛො අපි**: ගස වුවද; **පුන එව**: නැවත ද; **රූහති**: වැඩෙයි ද; **එවං අපි**: එසේම; **තණ්හානුසයෙ**: තෘෂ්ණා අනුසය; **අනූහතෙ** (න ඌහතෙ): විනාශ නො කරන ලද කල්හි; **ඉදං**: මේ; **දුක්ඛං**: දුක; **පුනප්පුනං**: නැවත නැවතත්; **නිබ්බත්තති**: උපදියි.

ගසක් කපා දැමුවත් එහි මුල් උගුලා නො දමන තුරු නැවත නැවත ලියලා වැඩෙයි. එසේම තෘෂ්ණා අනුසස් සිතෙන් මුලුමනින් විනාශ කර නො දමන්නේ නම් දුක යළි යළිත් හට ගනියි.

විවරණය

අනුපද්දවෙ දළ්හෙ: සාමාන්‍ය ජන ව්‍යවහාරයෙහි පවත්නා උපමා රූපක අනුසාරයෙන් ගැඹුරු ධර්මකරුණු පිළිබඳව සාමාන්‍ය ජනතාවට අවබෝධයක් ලබා දීමට උත්සාහ ගැනීම බුද්ධ භාෂිතයෙහි නිබඳව දැක්වෙන ලක්ෂණයකි.

ගසක් කපා දැමුවත් එහි මුල් උගුල්ලා නොදමා දැඩිව පැවතීමට ඉඩ හළොත් ගස නැවත ලියලා එන්නාක් මෙන් තෘෂ්ණාවද සමුලෝත්පාටනය නොකළොත් එය නැවතත් හටගන්නා බව මෙහිදී පැහැදිලි කොට ඇත.



යමෙකුට මන වඩන අරමුණු විසයෙහි තණ්හාව බලවත් වේ ද ඒ කාම සිතිවිලි ඒ පුගුලා අපායට පමුණුවයි.

339. යස්ස ඡත්තිංසතී සොතා
මනාපස්සවනා භුසා
වාහා වහන්ති දුද්දිට්ඨිං
සඞ්කප්පා රාගනිස්සිතා (24:6)

බලවත් වේද යමෙකු ගෙ සතිසක් දහරා
විසිරී යාද සිත සුව අරමුණුම කරා
එවස් කෙනක සිටිනා යහ දැකුම් වරා
උසුලා ගැනෙනු ඇති සිතුවිලි වලින් සරා

නිසි දැකුම් නැත්තේ - මැඩෙයි තණ්හා දහරින්

24 (2) සූකර පෝතිකාව (338 සිට 343 දක්වා ගාථා)

විස්තරාත්මක අනුවාදය (339 ගාථාව)

යස්ස ඡත්තිංසතිසොතා මනාපස්සවනා භුසා දුද්දිට්ඨිං රාගනිස්සිතා සඞ්කප්පා වාහා වහන්ති

යස්ස: යමෙකුට ගේ; **ඡත්තිංසති සොතා**: ශ්‍රොතස් සතිසකින් යුක්ත වූ; **මනාපස්සවනා**: මනවඩන රූපාදියෙහි වැගිර පවත්නා වූ (තෘෂ්ණා තොමෝ); **භුසා**: බලවත්ව (වේද,) **දුද්දිට්ඨිං**: නුවණ නැති (ඒ පුද්ගලයාට); **රාගනිස්සිතා**: රාගය (ඇල්ම) ඇසුරු කොට ඇති; **සඞ්කප්පා**: සිතුවිලි නැමති; **වාහා**: ප්‍රවාහයෝ බලවත් වූවාහු; **වහන්ති**: (අපායට) පමුණුවන්නා හ.

යම් පුද්ගලයකුගේ සතිස් වැදෑරුම් තෘෂ්ණා ප්‍රවාහයෝ සුව දනවන අරමුණු කෙරෙහිම ඇදෙමින් බලවත්ව පවතී ද, රාග නිශ්‍රිත වූ චිත්ත සංකල්ප නමැති එම ප්‍රවාහයෝ වැරදි දෘෂ්ටි ඇති එම පුද්ගලයාව යටපත් කර ගනිති.

විවරණය

ඡත්තිංසතිසොතා: තෘෂ්ණා ප්‍රවාහයන් සතිසක් පිළිබඳව මෙයින් කියවෙයි. තෘෂ්ණාව ජල ප්‍රවාහයක් මෙන් සදොරින් නොකඩවා ගලා යාමක් පවතියි. තෘෂ්ණාව ඇති වන්නේ ඉන්ද්‍රියයන් හා අරමුණු පදනම් කොට ගෙන ඇති වන විඥානමය ක්‍රියා සංතතිය නිසාය.

තෘෂ්ණාව තෙවැදෑරුම් වෙයි. ඒ කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙනි. මෙම ත්‍රිවිධ වූ තෘෂ්ණාව ජනිත වීම සඳහා ඉන්ද්‍රියයන් හා අරමුණු අතර සම්බන්ධතාවයක් අවශ්‍ය වෙයි. ඉන්ද්‍රියයන් සයක් වන අතර ඒ හා සම්බන්ධ වන අරමුණු ද සයකි. ඒවා චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය, මන සහ රූප, සද්ද, ගන්ධ, රස පොට්ඨබ්බ, ධම්ම යනුවෙන් හැඳින්වී ඇත. මේවා අතුරෙන් බාහිර වූ රූප සද්දා දී බාහිර ආයතන නම ලබයි. චක්ඛු සොතා දී ඉන්ද්‍රිය සය අජ්ඣත්තික ආයතන නම ලබයි.

යම් තෘෂ්ණාවක් සත්ත්වයා නැවත නැවත භවයෙහි උපදවා ද ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද ස්කන්ධයන් කෙරෙහි ඒවා හොඳයයි ගෙන-සතුටු වීම් හා ඇලීම් කෙරේද, ලැබුවා වූ ද පැමිණියා වූ ද කුඩා වූ ද මහත් වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද ඒ ඒ භවයන් හි සතුට හා ඇල්ම කෙරේ ද කාම තෘෂ්ණා භව තෘෂ්ණා විභව තෘෂ්ණා වශයෙන් ත්‍රිවිධ වූ මේ තෘෂ්ණාවට දුක්ඛ සමුදය සත්‍යය යයි කියනු ලැබේ මෙයින් තෘෂ්ණාව දුක්ඛ සමුදය සත්‍යය බව දුක් ඉපදීමේ සැබෑ හේතුව බව දැක්විණි.

තෘෂ්ණාව යනු මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්මා දී සත්ත්වයන් වශයෙන් පෙනෙන උපාදානස්කන්ධයන් කෙරෙහි හා රන් රිදී මුතු මැණික් ආහාර වස්ත්‍රාදී බාහිර රූපයන් කෙරෙහි ද ඒවා හොඳය ඕනෑය යනාදීන් පවත්නා වූ ඇල්මය.

මෙය ආධ්‍යාත්මික ස්කන්ධයන්හි අතිශයින් බලවත් ව පවතී. පවතින්නේ ද මාගේ ඇසය. මාගේ කනය. මාගේ දිවය. මාගේ හිසකෙස්ය. මාගේ හිසය. මාගේ අතය. මාගේ සැපය. මාගේ සිහිය. මාගේ අතය. මාගේ නුවණය. මාගේ මෛත්‍රිය. මාගේ කරුණාවය. මාගේ වීර්යය. මාගේ ජීවිතය යනාදීන් ඒ ඒ ස්කන්ධයන් කෙරෙහි වෙන් වෙන් වශයෙන් ය.

මේ අනුව බාහිර ආයතන හයට අනුකූලව මනසේ ක්‍රියාකාරිත්වය මත ඇතිවන තෘෂ්ණාව සය වැදෑරුම් වෙයි. අජ්ඣත්තික ආයතන සම්බන්ධව තෘෂණාව ද සය වැදෑරුම් ය. මේ අනුව තෘෂ්ණාව දොළොස් වැදෑරුම් වෙයි. ඒවා කාම, භව, විභව තෘෂ්ණා අනුසාරයෙන් ගණනය කරන විට තිස් හය වැදෑරුම් වෙයි. මෙම ගාථාවෙහි සතිසක් තෘෂ්ණා ප්‍රවාහ යනුවෙන් සඳහන් වන්නේ මේ නිසාය.

රාගනිසසිතා: තෘෂ්ණාව රාගය ඇසුරු කොට ඇත්තේය. ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි තෘෂ්ණාව හැඳින්වෙන විට තත්‍රතත්‍රාභිනන්දනී යනුවෙන් සඳහන් වන්නේ තෘෂ්ණා ඇති බැවිනි.





තණ්හා නමැති ලතාව සදොරින් මතුවී සය අරමුණෙහි පවතී ඒ ලතාව පිරික්සා බලා නුවණින් මුල සිදින්න.

340. සවන්ති සබ්බධී සොතා
ලතා උබ්භිජ්ජ තිට්ඨති
තඤ්ච දිස්වා ලතං ජාතං
මූලං පඤ්ඤාය ඡින්දථ (24:7)

තණ්හා සැඩ පහර හැම දෙස ගලා යයි
ඉඳුරන් නමැති වැල ලියලා නැගී එයි
දැක ගෙන වැලද එය නැඟ එන නියාවයි
නැණ අවියෙන් මුල සිදිහොත් මනා වෙයි.

තියුණු නුවණ විදරා - නසනු තණ්හා මුලින් උදුරා

24 (2) සූකර පෝතිකාව (338 සිට 343 දක්වා ගාථා)

විස්තරාත්මක අනුවාදය (340 ගාථාව)

සොතා සබ්බධී සවන්ති ලතා උබ්භිජ්ජ තිට්ඨති ජාතං
තං ලතං ච දිස්වා පඤ්ඤාය මූලංඡින්දථ

සොතා: (තෘෂ්ණා) ප්‍රවාහයෝ; **සබ්බධී**: සෑම තන්හි; **සවන්ති**: වැගිරෙයි; **ලතා**: (තෘෂ්ණා නමැති) වැල; **උබ්භිජ්ජ**: (සදොරින්) උඩට මතුව; **තිට්ඨති**: සිටියි; **ජාතං**: හටගත්; **තං ලතං**: ඒ (තෘෂ්ණා) නැමති වැල ද; **දිස්වා**: දැක; **පඤ්ඤාය**: නුවණින්; **මූලං**: මුල; **ඡින්දථ**: සිඳුවු.

තෘෂ්ණා ප්‍රවාහයෝ හැම තන්හි ගලා බසිති, සදොරින් මතු වී එන ඒ තෘෂ්ණා නමැති වැල් උඩට මතුවී සෑම තැනම පැතිරෙයි, හටගත් ඒ වැල් දැක නුවණින් එහි මුල සිඳින්න.

විවරණය

මූලං පඤ්ඤාය ඡින්දථ: තෘෂ්ණාව යටපත් කර දැමීමෙන් පමණක් එහි නැවත ඇති වීම නවත්වා ලිය නොහැකිය. එය මූලෝත්පාටනය කළ යුතු වෙයි. මුල් නොගලවා දමා කපන ලද ගසක් නැවත ප්‍රරෝහණය වන්නාක් මෙන් තෘෂ්ණාව ද නැවත නැවත උපදියි. එය සම්පූර්ණයෙන් වැළැක්විය හැක්කේ ප්‍රඥා නමැති අවියෙන් පමණි. බුදු සමයෙන් ප්‍රඥාව වර්ධනය කළ යුතුයැයි අවධාරණය කරනුයේ ප්‍රඥාවෙන් පමණක් තෘෂ්ණා ප්‍රවාහය නවතාලිය හැකි වන බැවිනි. ප්‍රඥාව උපදවා ගැනීමෙන් සංස්කාර ධර්මයන් පිළිබඳ අනිත්‍ය, දුක්ඛ අනාත්මතාව ප්‍රත්‍යක්ෂ වෙයි. එවිට සංස්කාර ධර්මයන්හි විරාගය ඇති වෙයි. විරාග යෙන් නිරොධය ඇති වෙයි. තෘෂ්ණා නිරෝධය ඇති කර ගැනීමෙන් පමණක් ජාති ජරා මරණාදියෙන් යුක්ත සංසාර දුක්ඛයෙන් ඉවත් වීමට හැකි වෙයි.

සංයොජන සඞ්ගසතතා: සංයෝජනයන් හි ඇලීමෙන් බැඳුණු යන අරුත්ය. පුද්ගලයා සසරෙහි බැඳ තබන සංයෝජන දසයෙකි. මේවා දස සංයෝජන නමින් හැඳින්වෙයි. ඒවා, පහත සඳහන් පරිදි වේ.

1. **සක්කාය දිට්ඨි**: තමන් තුළ නොනැසෙන සදාතනික වූ ආත්මයක් ඇතැයි යන විශ්වාසය
2. **විචිකිච්ඡා**: බුද්ධාදී අට තැනක් පිළිබඳ සැකය
3. **සීලබ්බතපරාමාස**: ශීල ව්‍රතයන් නිෂ්ටාව වශයෙන් සලකා ඒවා දෘඪග්‍රහණයෙන් ගැනීමේ මානසික ප්‍රවණතාව
4. **කාම රාග**: පංචකාම වස්තූන් කෙරෙහි ඇලීමේ මානසික ප්‍රවණතාව
5. **ව්‍යාපාද**: ද්වේශය, මානසික ප්‍රදුෂ්‍යතාව, දැඩි තරහ යන නම් වලිනුදු මෙය හැඳින්විය හැකිය.
6. **රූපරාග**: රූප භවයන් හි ඇලීම
7. **අරූප රාග**: අරූප භවයන් හි ඇලීම
8. **මාන**: තමා අනුන් හා සැසඳීමෙන් මනසෙහි ඇති කර ගන්නා ආඩම්බර සහගත ප්‍රවණතාව
9. **උද්ධච්ච**: මානසික නොසන්සුන් බව, මනසෙහි පවතින ඇවිස්සුණු ගතිය
10. **අවිජ්ජා**: චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැනීම, මුලාව.

මේ දස සංයෝජනයන් අතුරෙන් මුල්පස ඔරම්භාගිය සංයෝජන නමින් හැඳින් වෙයි. මේ සංයෝජන සහිත පුද්ගලයා භව තුන අතුරෙන් පහත් ම භවය වන කාමභවයෙහි පමණක් උපත ලබන බැවින් පහත් කොටස් යන නම ඇති ඔරම්භාගිය සංයෝජන ලෙස සැලකී ඇත. දෙවන පස හැඳින්වෙන්නේ උද්ධමභාගිය සංයෝජන නමිනි. උසස් වූ රූප සහ අරූප භවයන් හි උපතට හේතු වන බැවින් උඩ කොටස යන නම ඇති උද්ධමභාගිය සංයෝජන ලෙස සැලකී ඇත. මේවා සියල්ල සෝවාන් ආදී සතර මග සතර ඵල පිළිවෙලින් විනාශ කර දැමීමෙන් සංසාර නිරෝධය කළ හැකි වෙයි.

තණ්හාවට වසඟ වැ සොම්නසින් පිණා සැප සොයන සත්හු ජාති - ජරා දුකට පැමිණෙත්.

341. සරිතානි සිනෙහිතානි ච
සොමනස්සානි භවන්ති ජන්තුනො
තෙ සාතසිතා සුඛෙසිනො
තෙ වෙ ජාතිජරූපගා නරා (24:8)

ආශා දියෙන් තෙත් වී අරමුණු වෙතට
ඇදෙමින් සතුටු සිතිවිලි ඇති වෙයි සතට
සුවරිසි දනෝ නතු වූ සොම්නස දෙසට
නියතින් ගොදුරු වන්නෝ වෙති බව දුකට

කම් සුවෙහි ඇලුනේ - බව දුකෙහිමයි ගැලුනේ

24 (2) සූකර පෝතිකාව (338 සිට 343 දක්වා ගාථා)

විස්තරාත්මක විවරණය 341 ගාථාව

**සරිතානි සිනෙහිතානි ච සොමනස්සානි ජන්තුනො
භවන්ති තෙ සාතසිතා සුඛෙසිනො තෙ නරා වෙ
ජාතිජරූපගා**

සරිතානි: (රූපාදී) අරමුණු දෙසට ගලා යන; **සිනෙහිතානි ච**: තෘෂ්ණාවෙන් තෙත් වූ; **සොමනස්සානි**: සොම්නස් සිතුවිලි; **ජන්තුනො**: මිනිසාට; **භවන්ති**: වෙත්; **තෙ**: ඔහු තුමූ; **සාතසිතා**: සැපය හා සතුට ඇසුරු කළාහු; **සුඛෙසිනො**: සුව සොයන සුලු (වෙති); **තෙ නරා**: එබඳු මිනිස්සු; **වෙ**: ඒකාන්තයෙන්; **ජාතිජරූපගා**: ජාතියට හා ජරාවට යන්නෝය.

අරමුණු දෙසට ගලා යන තෘෂ්ණාවෙන් තෙත් වූ සොම්නස් සහගත සිතුවිලි මිනිසුන්ට, ඇති වෙයි. ප්‍රීතිය දෙසට නැඹුරු වූ සැප කැමති ඒ මිනිස්සු ජාති ජරාවන්ට පැමිණෙන්නෝ වෙති.

විවරණය

සරිතානි: තෘෂ්ණා සහගත විඥානමය ක්‍රියාකාරිත්වයේ අඛණ්ඩතාව මෙයින් කියැවෙයි. නිබඳව ම තෘෂ්ණා සහගත මානසිකත්වය බාහිර විෂය වස්තූන් දෙසට ඇදී යාමේ ස්වභාවයකින් යුක්තය.

සාතසිතා: සුඛ සහගත අරමුණු කෙරෙහි බැඳී ගිය ස්වභාවයෙන් තෘෂ්ණාව පවත්නා බව මෙයින් අදහස් කෙරෙයි.

මේ ගාථාවලට පදනම් වන කථාව සංසාර ගාමීව නැවත නැවත ඉපදීම පිළිබඳ ධර්මතාව පැහැදිලි කර දෙන්නකි. පුනර්භව සිද්ධාන්තය බුදු සමයේ මූලික පිළිගැනීමකි. පුද්ගලයාට සසර ගමනක් ඇත්තට ම පවතින්නේ නම් පමණි. බෞද්ධ විමුක්ති සංකල්පය පවා අර්ථවත් වන්නේය. පුද්ගලයකුගේ මරණින් පසු සියල්ල අවසන් වන්නේ නම් විමුක්තියක අවශ්‍යතාවයක් උද්ගත වන්නේ නැත. එසේ නම් එනිසාම බෞද්ධ විමුක්ති මාර්ගය ලෙස සැලකෙන ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රතිඵලයක් නැති වනු ඇත.

බුදු දහම මූලික වශයෙන් ක්‍රියාවාදී ඉගැන්වීමකි. පුද්ගලයා කරන හොඳ නරක කර්මවල ප්‍රතිඵල ඇති බවත් ඒ ප්‍රතිඵල කරන කොට ගෙන පුනර්භවය යහපත් වීම හෝ අයහපත් වීම සිදු වන බවත් බුදු සමය විශ්වාස කරයි. එබැවින් ම දුක් විපාක ගෙන දිය හැකි අකුශල කර්ම කිරීමෙන් පමණක් භවය නැති කළ නොහැකිය. භවයක කුශල කර්මවලින් සැප විපාක ලබා දුන්නත් පරම සුවයක් කිසිවිට ලබා ගත නොහැක. භව සැපය කොතෙක් ඇතත් ඒ හැම සැපයක් ම දුකටම නතු වී ඇත. භවයට උරුම වූ දුක් වලින් මිදීමට පුද්ගලයකුට කුශල කර්මයන්ගෙන් නොහැකි වෙයි. එබැවින් සසර නැවත නැවත ඉපදීම දුකක් බවත් උපත නැති කර ලබන නිවනම පරම සුවය බවත් බුදු සමය අදහස් කරයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය නිර්දේශ වී ඇත්තේ උපත නැති කළ හැකි සේ සිතෙන් සම්පූර්ණයෙන් ක්ලේශ ධර්මයන්ගේ ඉපදීම මුලින් සිඳ දැමීම සඳහාය.

පුද්ගලයකුට නැවත නැවත උපත සිදු කෙරෙන භවගාමීත්වයක් නැතැයි ද එබැවින් කුශල හෝ අකුශල වශයෙන් ක්‍රියා වෙන් කොට බැලීමේ තේරුමක් නැතැයි ද එම කවර හෝ කර්මයකට විපාකයක් හිමි වී නැතැයි ද කියන නාස්තික දෘෂ්ටිය මෙන්ම අකිරියවාදය ද බුදු සමය ප්‍රතික්ෂේප කරයි. මෙම නාස්තික දෘෂ්ටිය බුදුදහමේ විවේචනයට ලක් වන්නේ නියත මිත්‍යාදෘෂ්ටියක් වශයෙනි. මෙය පුද්ගලයකුට විපත්තිකර ආගමික ඉගැන්වීමක් ලෙස සැලකෙයි. කුශලාකුශල කර්ම විපාක පිළිගැනීම බුදු සමයේ ආර්ය මාර්ගයේ ප්‍රථම අංගයෙන්ම එනම් සම්මා දිට්ඨියෙන්ම සිදු කෙරෙයි. බුදුරජානන් වහන්සේ අවබෝධ කළ ධර්මයෙන් පුද්ගලයකුගේ භවගමන හෙවත් සංසාරිකත්වය අවබෝධ කරගත් සේක. උන් වහන්සේ විමුක්ති මාර්ගයක් ඉදිරිපත් කොට ඇත්තේ ස්වකීය ප්‍රත්‍යක්ෂ අනුභූතියෙනි. පුද්ගලයෙකු නැවත උපතක් නැතැයි යන මතය විශ්වාස කොට හොඳ නරක නොසලකා ඕනෑම ක්‍රියාවක් කරන්නේ නම් ඔහු ට භවයෙන් භවයේ දී ඉතාමත් රුදුරු වූ අනිටු විපාක විඳීමට සිදු වෙයි. ඔහුට කිසි විටෙක මේ සංසාර දුකින් මිදීමට ද නොහැකි වෙයි.

බුදු සමයෙහි එන පුනර්භවය හුදු විශ්වාසයක් පමණක්ම නොවේ. එහි සත්‍යතාව ඕනෑම කෙනකුට අත්හදා බැලිය හැක්කකි. භාවනා වඩා ප්‍රඥාව දියුණු කරගත් විට ප්‍රතක්‍ෂ කර ගත හැකි චුත්දපපාත ඥානයේ දී කර්මානුරූපව පුද්ගලයකු ගේ භවගමන සිදු වන ආකාරය තමාටම දැක ගත හැකි වෙයි.

බුදුසමය පුනර්භවය පිළිගන්නා නමුත් පුනර්ජන්මය පිළි නොගනියි. පුනර්භව පුනර්ජන්ම යන පද දෙකින් එකිනෙකට වෙනස් වූ දාර්ශනික අර්ථ දෙකක් ඉදිරිපත් වෙයි. බුදුරජාණන් වහන්සේ පහළ වීමට පෙර පවා භාරතයෙන් පුනර්ජන්ම සංකල්පය ඉදිරිපත් කළ දාර්ශනිකයෝ විසූ හ. උපනිෂද් නමින් ගැනෙන දර්ශනයෙන් පුනර්ජන්ම සංකල්පය මුල් වරට ඉදිරිපත් විය. පුනර්ජන්ම සංකල්පයට අනුව පුද්ගලයා තුළ නොනැසෙන ආත්මයක් ඇත. මරණය නමින් ගැනෙන ශරීරයේ විනාශයෙන් පසු මෙම ආත්මය වෙනත් ශරීරයක් පිළිගනියි.

පුද්ගල ආත්මයට මෙම නව ශරීරය ලැබෙන්නේද කරන ලද කර්ම විපාකවලට අනුකූලවය. භවයෙන් භවයට, උපතින් උපතට ගමන් කෙරෙන්නේ මෙම සදාකාලික වූ ආත්මයයි. ශරීරයේ විනාශයක් ඇත ද ආත්මය විනාශ නොවෙයි. ආත්මය පරමාත්මය සමග එක් වීමෙන් ලබා ගන්නා විමුක්තිය තෙක් ආත්මයේ පුනර්ජන්මය සිදු වෙයි. බෘහදාරණ්‍යයක නමැති උපනිෂද් ග්‍රන්ථයේ දී පුද්ගයා සතු ආත්මයේ ගමන විවරණය කර ඇත්තේ කුඩැල්ලකු එක් තණපතක් අතර අනෙක් තණපතකට යන්නාක් මෙන් ආත්මය පරණ ශරීරය අතහැර අලුත් ශරීරයකට යාමක් වශයෙනි. භගවත් ගීතා ග්‍රන්ථයට අනුව,
"මිනිසකු පරණ ඇඳුමක් අතහැර අලුත් ඇඳුමක් ඇඳ ගන්නාක් මෙන් ආත්මය ද පරණ ශරීරය අතහැර අලුත් ශරීරයකට යයි."

දුකට නැවත නැවත නො පැමිණීම සඳහා නිවන් පතා තණ්හාව දුරු කළ යුතු.

342. තසිණාය පුරක්ඛතා පජා
පරිසප්පන්ති සසො'ව බන්ධිතො
සංයොජනසඞ්ගසත්තා
දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය (24.9)

තණ්හා පෙරදැරි මිනිස්සු
ගැහෙති බැඳුණු සාවකු සේ
සංයෝජනයෙන් බැඳුණා හු
යළි යළි දුකට ම එළඹෙති

බැඳුණොත් ඔබ තණ්හාවෙන් - තැති ගනු ඇත සාවකු සේ

24 (2) සූකර පෝතිකාව (338 සිට 343 දක්වා ගාථා)

විස්තරාත්මක විවරණය 342 ගාථාව

තසිණාය පුරක්ඛතා පජා බාධිතො සසො ඉව පරිසප්පන්ති සංයෝජනසඞ්ගසත්තා චිරාය පුනප්පුනං දුක්ඛං උපෙන්ති.

තසිණාය: තෘෂ්ණාවෙන්; **පුරක්ඛතා**: පෙරටු කරන ලද; **පජා**: සත්ත්වයො; **බාධිතො**: උගුලට හසුකරගන්නා ලද; **සසො ඉව**: සාවකු මෙන්; **පරිසප්පන්ති**: තැති ගනිත්; **සංයෝජනසඞ්ගසත්තා**: සංයෝජනයන් ගෙන් ඇලී ඇති බැවින්, **චිරාය**: බොහෝ කලක්, **පුනප්පුනං**: නැවත නැවතත්; **දුක්ඛං**: දුකට; **උපෙන්ති**: පැමිණෙති.

තෘෂ්ණාවෙන් පෙරටු කර ගන්නා ලද මිනිස්සු උගුලට හසු කරගත් සාවකු මෙන් බියෙන් තැති ගනිති. සංයෝජනයන්ගෙන් බැඳී ඇති බැවින් බොහෝ කලක් තුළ නැවත නැවතත් දුකට පැමිණෙති.

විවරණය

බුදු දහම භවයෙන් භවයට පුද්ගලයකු ගේ උපත පිළිගනිතත් පුද්ගලයා සතු ආත්මයක අනුසාරයෙන් භව ගමන සිදුවන බව නො පිළිගනියි. පුනර්ජන්ම සංකල්පයෙන් ඉදිරිපත් වන්නේ පවත්නා ආත්මයම උපතින් උපතට සංක්‍රමණය වීමකි. බුදු සමයට අනුව භවයෙන් භවයට එසේ සංක්‍රමණය වීමට ආත්මයක් පුද්ගලයාට නැත. පුද්ගලයා හුදෙක් නිබඳ වෙනසට පත්වන ස්කන්ධ පංචකයක් පමණි. සංඥා සහගත වූ විඥාන සහගත වූ ධර්ම සමූහයක පැවැත්මකට අපි පුද්ගලයා, මිනිසා, පිරිමියා, ගැහැණිය වැනි නම් භාවිත කරමු. මෙම සංස්කාර ධර්මයන්ගේ පැවැත්ම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම තත්වයෙන්ම පවතියි.

සදාතනිකව වෙනස් නොවන පුද්ගලයා පිළිබඳ සාර පදාර්ථයක් - ආත්මයක් පුද්ගලයා තුළ හෝ පිටත නැත. මෙම සංස්කාර ධර්මයන් ගේ එකතුව සිදුවන්නේ හේතු ප්‍රත්‍යය අනුසාරයෙනි. සංස්කාර ධර්මයන්ගේ නිරන්තර පැවැත්මට අදාල හේතු ප්‍රත්‍ය ඉදිරිපත් වන්නේ කුශලාකුශල කර්ම මගිනි. එබැවින් මරණය නමින් සැලකෙන විනාශයේ දී පවා එම විනාශයෙන් අනතුරුව අලුත් නාමරූප සහගත පඤ්ච ස්කන්ධයක පැවැත්ම එම හේතු ප්‍රත්‍ය අනුසාරයෙන්ම උදා කරයි. මෙහිදී සංස්කාර ධර්මයන් ගේ නව පැවැත්මක් උදා වන බැවින් එය හැඳින්වෙන්නේ පුනර්භව නමිනි. භවය යනු සංස්කාර ධර්ම සමූහයක පැවැත්මයි. එබැවින් බුදු සමය පිළිගන්නේ පුනර්භවය මිස පුනර්ජන්මය නොවේ.

භවයෙන් භවයට ගමන් කරන ආත්මයක් ඇතැයි පිළි ගැනීම මිථ්‍යාදෘෂ්ටියකි. මෙය මිථ්‍යාදෘෂ්ටියක් වන්නේ ලෝකය හා පුද්ගලයා පිළිබඳ යථාර්ථය එය නොවන බැවිනි. බුදුරජාණන් වහන්සේ හැර ලොව එතෙක් සිටි සෑම දාර්ශනිකයෙක් ම පාහේ පුද්ගලයා හා ලෝකය පිළිබඳව විවිධ දෘෂ්ටි පළ කොට ඇත. ඔවුන් බොහෝ කොට උත්සාහ කොට ඇත්තේ පුද්ගලයා ගේ ස්වභාවය විශ්ලේෂණය කොට බැලීමට වඩා පුද්ගලයා පිළිබඳ කිසියම් සත්‍යයක් තිබේදැයි සෙවීමටය. බුදු දහමට අනුව පුද්ගල ස්වභාවයට වඩා අන්‍ය වූ සත්‍යයක් ඔහු සතුව නැත.

භවයෙන් භවයට ගමන් කරන්නේ පුද්ගලයා තුළ ඇති ආත්මය නමැති සත්‍යතාව බව බොහෝ දෙනෙක් විශ්වාස කළ හ. මේ නිසා බුදුරජාණන් වහන්සේ එබඳු වෙනස් නොවී පවත්නා සත්‍ය වූත් තථ්‍යවූත් එබඳු ආත්මයක් නැති බව දැක්වීමට විවිධ සූත්‍ර මගින් කරුණු දැක්වූහ. බුදුරජාණන් වහන්සේ තමන් පුද්ගලයා පිළිබඳ දුටු යථාර්ථය ප්‍රථම ධර්ම දේශනයෙන් හෙළි කළ අතර දෙවැනි ධර්ම දේශනය වූ අනන්ත ලක්ඛණ සූත්‍රය දේශනා කරන ලද්දේ මිනිසුන් තුළ පවත්නා ආත්ම දෘෂ්ටියෙහි ඇති නිස්සාරතාව හෙළි කිරීමටය. පුද්ගලයා පඤ්චස්කන්ධයකට විශ්ලේෂණය කරමින් ඒ එක් එක් ස්කන්ධයක් තුළ හෝ ඉන් පිටත ආත්මයක් පවතීදැයි මෙම සූත්‍රයෙන් ප්‍රශ්න කෙරෙයි.

"රූපය නිත්‍ය ද?" බුදුරජාණන් වහන්සේ මෙම අනන්ත ලක්ඛණ සූත්‍රයේ දී පස්වග මහණුන්ගෙන් ප්‍රශ්න කරති.

"නැත ස්වාමීනි," පස්වග මහණෝ පිළිතුරු දෙති.

"යමක් අනිත්‍ය නම් එය සුඛයක් ද?"

"නැත ස්වාමීනි, එය දුක්ඛයකි."

"යමක් දුක්ඛ නම් එය ආත්මසහිත වුවක්ද ?"

"නැත ස්වාමීනි, එය අනාත්මය."

ස්කන්ධ පංචකය පිළිබඳව බුදුරජාණන් වහන්සේ මෙම තත්වය පස්වග මහණුන්ට පැහැදිලි කර දෙති. පුද්ගලයා පිළිබඳ ආත්මය නමින් ගත හැකි කිසියම් ස්ථාවර සාර පදාර්ථයක් ඇතැයි පිළි ගැනීම නිසා, පුද්ගලයා මෙම සසරට බැඳී තෘෂ්ණාව වර්ධනය කර ගැනීමෙන් සංසාර දුකින් එතෙර වීමට නොහැකි තත්වයට පත්වන නිසාම බුදුරජාණන් වහන්සේ ආත්මදෘෂ්ටියෙහි ඇති සාවද්‍යතාව හෙළි කිරීමට සූත්‍රධර්ම රාශියක්ම යොමු කොට ඇත. උන්වහන්සේ විශේෂයෙන් මෙම සූත්‍ර ධර්මවලදී ආත්මයක් පුද්ගලයා සතුව නොමැති බව හෙළි කිරීමට උපයෝගී කරගත් ක්‍රමය වන්නේ පුද්ගලත්වය විවිධ ලෙසින් විශ්ලේෂණය කොට දැක්වීමටය. පුද්ගලයා පිළිබඳව බුදුදහමින් ඉදිරිපත් කොට ඇති විශ්ලේෂණ කිහිපයකි.

1. නාමරූප විභාගය

මෙහිදී පුද්ගල පැවැත්ම නාමරූප වශයෙන් කොටස් දෙකකට විශ්ලේෂණය කෙරෙයි. නාම යන්නෙන් ගැනෙන්නේ පුද්ගලයා පිළිබඳ වෛඥානිකත්වය යි. පුද්ගලයා තුළ විඥානමය අංශයක් මෙන්ම භෞතික අංශයක් ද ඇත. මෙම වෛඥානික ස්වභාවය හා භෞතික ස්වභාවය නාම රූප විභාගය මගින් ප්‍රකට කෙරෙයි.

(ඊළඟ පිටුව බලන්න)

දුකට නැවත නැවත නො පැමිණීම සඳහා නිවන් පතා තණ්හාව දුරු කළ යුතු.

343. තසිණාය පුරක්ඛතා පජා
පරිසප්පන්ති සසොව බන්ධිතො
තසමා තසිණං විනොදයෙ
භික්ඛු ආකඞ්ඛී විරාගමත්තනො (24:10)

තණ්හා පෙරදැරි මිනිස්සු
ගැහෙති බැඳුනු සාවකු සේ
මහණ කැමති තම ගැලවුම
දුරු කරලයි ඇලුම බැඳුම

වැසුවොත් තණ්හා දොර - ඇරෙයි නිවණෙහි දොර

24 (2) සූකර පෝතිකාව (338 සිට 343 දක්වා)

විස්තරාත්මක අනුවාදය (343 ගාථාව)

තසිණාය පුරක්ඛතා පජා, බන්ධිතො සසො ඉව පරිසප්පන්ති. තස්මා අත්තනො විරාගං ආකඞ්ඛී භික්ඛු තසිණං විනොදයෙ

තසිණාය: තෘෂ්ණාවෙන්; **පුරක්ඛතා**: පෙරටු කර ගන්නා ලද; **පජා**: මිනිස්සු; **බන්ධිතො**: උගුලට හසු කර ගන්නා ලද; **සසො ඉව**: සාවකු මෙන්; **පරිසප්පන්ති**: තැති ගනිති; **තස්මා**: එබැවින්; **අත්තනො**: තමා හට; **විරාගං**: (නිවන) මිදීම; **ආකඞ්ඛී**: අපේක්ෂා කරන; **භික්ඛු**: භික්ෂුව; **තසිණං**: තෘෂ්ණාව; **විනොදයෙ**: දුරු කරන්නේ ය.

තෘෂ්ණාවෙන් පෙරටු කර ගන්නා ලද මිනිස්සු උගුලට හසු වූ සාවකු මෙන් බියෙන් තැති ගනිති. එබැවින් තමා ගේ විමුක්තිය බලාපොරොත්තු වන භික්ෂුව තෘෂ්ණාව දුරු කරන්නේ ය.

විවරණය

(පෙර පිටුව හා සම්බන්දයි)

2. **පඤ්චස්කන්ධ විභාගය**

ඉහතින් දැක්වූ නාම රූප දෙක ඊට වඩා සියුම් ලෙස විග්‍රහ කොට බැලීමක් පඤ්චස්කන්ධ විභාගයෙන් ඉදිරිපත් වෙයි. ඒ අනුව භෞතිකත්වය රූප නමින් එක් කොටසක්ටත් වෛඥානිකත්වය කොටස් සතරකටත් විශ්ලේෂණය වී තිබේ. ස්කන්ධ පඤ්චකය මෙසේ ය.

රූපස්කන්ධය : පුද්ගලයා පිළිබඳ භෞතික අංශය

වේදනාස්කන්ධය : පුද්ගලයා මානසිකව අත්විදින ස්කන්ධ සුඛ, දුක්ඛ, උපේක්ඛා නම් වූ වේදනා පිළිබඳ අංශය

සඤ්ඤාස්කන්ධය : පුද්ගලයාගේ හැඟීම් පිළිබඳ අංශය

සංඛාරස්කන්ධය : කර්මසංඛ්‍යාවට ගැනෙන මානසික වූ අභිසංස්කරණාත්මක අංශය

විඤ්ඤාණස්කන්ධය : සම්පූර්ණ මානසිකත්වය මෙහෙයවන මානසික වූ ක්‍රියාකාරිත්වය.

3. **ධාතු විභාගය**

මෙයින් සිදුවන්නේ පුද්ගලයා මූල ධාතු කොටස් සයකට විග්‍රහ කිරීමකි. පඤ්චස්කන්ධ විභාගය යටතේ භෞතිකත්වය රූප නමින් එක කොටසකටත් සම්පූර්ණ මානසිකත්වය හෙවත් වෛඥානිකත්වය කොටස් සතරකටත් විග්‍රහ වූ ආකාරය අපි දුටිමු. මෙහි දී විඥානමය අංශය එක් කොටසකටත් රූපමය හෙවත් භෞතික අංශය කොටස් පහකටත් විග්‍රහ වෙයි. රූපය: පඨවි, ආපො, තෙජො, වායු, ආකාස, නාමය : විඤ්ඤාණ

4 **ආයතන විභාගය**

මෙහිදී නාමරූප දෙක එකට සම්බන්ධ කොට ආයතන නමින් වූ කොටස් දොළසකට විග්‍රහ කෙරෙයි.

1). ඇස — 2). ඇසට සම්බන්ධ වූ රූපය
3). කණ — 4). කණට සම්බන්ධ වූ ශබ්දය
5). නාසය — 6). නාසයට සම්බන්ධ වූ ගඳ සුවඳ
7). දිව — 8). දිවට සම්බන්ධ වූ රසය
9). කය — 10). කයට සම්බන්ධ වූ ස්පර්ශය
11). විඤ්ඤාණය — 12). විඤ්ඤාණයට සම්බන්ධ වූ ධර්ම

5 **අට්ඨාරස ධාතු විභාගය**

ආයතනමය වශයෙන් ඉදිරිපත් වූ කොටස් තවදුරටත් විශ්ලේෂණය වෙමින් ධාතු කොටස් අටලොස කට පුද්ගලයා විග්‍රහ කොට දැක්වීමක් මෙයින් සිදු වෙයි.

1. චක්ඛු	7. රූප	13. චක්ඛු විඤ්ඤා
2. සොත	8. සද්ද	14. සොත විඤ්ඤාණ
3. ඝාන	9. ගන්ධ	15. ඝාන විඤ්ඤාණ
4. ජිව්හා	10. රස	16. ජිව්හා විඤ්ඤාණ
5. කාය	11. පොට්ඨබ්බ	17. කාය විඤ්ඤාණ
6. මන	12. ධම්ම	18. මනො විඤ්ඤාණ

මෙම සියලු විශ්ලේෂණ මගින් සිදුවන්නේ පුද්ගලයා විවිධ කොටස්වලට විග්‍රහ කරමින් ඒ එක් එක් කොටසක ඇති අනිත්‍ය දුක්ඛ, අනාත්ම ස්වභාවය දැක ගැනීමට පුද්ගලයාටම අවස්ථාව ලබා දීමයි. මේ තත්වයන් යටතේ ආත්මය යනු හුදෙක් මිථ්‍යා සංකල්පයක් බව පුද්ගලයාටම අවබෝධ කර ගැනීමට හැකි වෙයි.

ආත්මයක් තිබේ යනුවෙන් වැරදි මනසක් තබා ගැනීමේ අනිටු විපාකය කිමෙක් ද? බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන පරිදි තණ්හා, මාන දිට්ඨි යන ත්‍රිවිධ ප්‍රපංචයම බිහිවන්නේ ආත්මය නමින් වැරදි ආකල්පයක් ඇති කර ගැනීම තුළිනි.

සිතන්නා මම වෙමින් සිතීම තුළ මේ සියලු ක්ලේශයක්ම මුල බැහැගෙන තිබේ. මෙය තව දුරටත් හෙළිකරමින් එම තත්ත්වය උද්ගත වන්නේ කෙසේ දැයි මෙසේ පැහැදිලි කර දෙති.

එතං මම: "මෙය මගේ ය" යි තෘෂ්ණාවක් ඇති කර ගන්නේ තමා ආත්මය නමැති හැඟීම නිසාය.

එසොහමස්මි:"මේ මම වෙමි" යි පුද්ගලයා මානයක් ඇති කරගන්නේ ආත්මය නමැති හැඟීමනිසාය.

එසොමෙ අත්තා: "මේ මගේ ආත්මයයි" යනුවෙන් දෘෂ්ටියක් ඇති කර ගන්නේ ද ආත්මීය හැඟීම් නිසාය.

මෙසේ පුද්ගලයා තුළ තණ්හා, මාන දිට්ඨි යන ක්ලේශධර්ම බිහිවන්නේ මෙම ආත්ම නමැති මිථ්‍යාදෘෂ්ටිය නිසාය. මෙම දෘෂ්ටිය පවත්නා තෙක් පුද්ගලයාට ක්ලේශධර්මයන් ගෙන් ඉවත් වීමක් නොවෙයි.





ගිහිගෙයැ ආසා හැර තපසෙහි ඇලී වැස නැවත කම්සැප සොයා ගිහිගෙය කරා ම දුවමින් බැඳුනු තැනැත්තා බලන්න.

344. යො නිබ්බනථො වනාධිමුත්තො
වනමුත්තො වනමෙව ධාවති
තං පුග්ගලමෙව පස්සථ
මුත්තො බන්ධන මෙව ධාවති (24:11)

වනයෙහි ඇලෙන්නේ වනයෙන් මිදීමට
වනයෙන් මිදෙන්නා එහි යන්නේ කුමට
සිදුවේ ඔබට ඒ අය දෙස බැලීමට
මිදුනහු දුවන්නේ යළි යළි බැඳීමට

තණ්හාවෙන් මිදී - තණ්හාවටම දිව යේ.

24 (3) උපැවිදි වූවෙක් (344 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ **ශිෂ්‍යයකු** අරභයා මේ ගාථාව වදාළ සේක.

මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ ශිෂ්‍යයකු ලෙස පැවිදි බව ලබා ගත් භික්ෂූන් වහන්සේ නමක් භාවනා වඩා චතුර්ථධ්‍යානය උපදවා ගෙන සිටියේ ය. දිනක් මුන්වහන්සේ පිඬු සිඟා යමින් සිටියදී තම මයිළණුවන්ගේ නිවසෙහි සිටි රුවති තරුණියක දැක ඇය පිළිබඳ සිත ඇති කර ගත්තේ ය. මෙම කාන්තාව පිළිබඳව සිත යොමු වීමෙන් පසු මෙතෙම සසුනෙහි උකටලී බවට පත්ව උපැවිදි වූයේ ය. උපැවිදි වී ගිහියකු බවට පත් වුව ද වෙහෙස මහන්සියක් රැකියාවක් කර මුදල් උපයාගෙන සාර්ථකත්වටකට පත්වීමට අපොහොසත් වූ මෙතෙම එම කාන්තාව සරණ පවා ගැනීමට ද අසමත් විය. ජීවිතයෙන් අසාර්ථක වූ මෙතෙම අන්තිමේ දී සොරු කණ්ඩායමක එක්ව මංපැහැරීම් ගෙවල් බිඳීම් වැනි සොරකම්වල යෙදුනේ ය. කෙසේ හෝ ඔහු රාජපුරුෂයන් අතට පත්ව හිස ගැසුම් කෑමට නියමිත වූයේ ය.

අන් සොරුන් සමඟ මොහු ද හිස ගසා දැමීම සඳහා අමුසොහොනකට ගෙනයනු ලැබීය. කෙසේ හෝ මොහු ජීවත් වීමට වාසනාව ඉතිරිව පැවති නිසාදෝ මේ අවස්ථාවෙහි කාශ්‍යප මහරහතන් වහන්සේ මේ ස්ථානය අසලින් වැඩම කරත් දී උන්වහන්සේ ගේ ඇසට තම පැරණි ශිෂ්‍යයා මුණ ගැසිණ. උන්වහන්සේ ඒ අසලට වැඩම කොට ඔහුට කථා කොට මේ අවස්ථාවෙහි මනස භාවනාමය අරමුණක දැඩිව රඳවා ගන්නා ලෙස අවවාද කළ සේක. මෙතෙමේ ද එම උපදේශය පිළිපදිමින් සිත තරයේ පරණ පුරුදු භාවනා අරමුණෙහි දැඩිව පිහිටුවා ගත්තේ ය.

වධකයන් මොහු හිස ගසා දැමීම සඳහා සූදානම් වුවද මොහු ගේ දැඩි මානසික ඒකාග්‍රතා ස්වරූපයත්. මරණයට කිසිදු බියක් නොදැක්වීමත් නිසා මොහු ගේ මේ අසාමාන්‍ය ස්වරූපයෙන් විමතියට පත් වධකයෝ ඔහු නොමරා මේ සිද්ධිය රජුට වාර්තා කළ හ. රජතුමා මොහු ගැන අසා ඔහු නිදහස් කරන ලෙස නියෝග කළේ ය. මේ සිද්ධිය බුදුරජාණන් වහන්සේටද සැළ විය. බුදුරජාණන් වහන්සේ මේ පුද්ගලයා වෙත රශ්මිදහරාවක් නිකුත් කොට තමන් වහන්සේ ඔහු ඉදිරියෙන් වැඩ හිඳිනා සෙයක් දක්වා මෙම ගාථාවෙන් ධර්ම දේශනා කළ සේක.

බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයට සවන් යොමු කළ මෙම පුද්ගලයා දැඩිව සිත භාවනාවට මෙහෙයවා සංස්කාර ධර්මයන්හි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම තත්වයන් මෙනෙහි කරමින් නොබෝ වේලාවකින් සෝවාන් ඵලයට පත් වූයේය. පසුව මෙතෙම ජේතවනාරාමයට පැමිණ බුදුන් වහන්සේ හමුව යළිත් භික්ෂුභාවය ලබා ගත්තේ ය. යළි ශික්ෂාකාමී භික්ෂුවක වශයෙන් ක්‍රියා කරමින් තව දුරටත් කෙලෙස් සිඳ බිඳ දමා රහත් බවද අත්පත් කර ගත්තේ ය.

විස්තරාත්මක අනුවාදය (344 ගාථාව)

යො නිබ්බනථො වනාධිමුත්තො වනමුත්තො වනං එව ධාවති. මුත්තො බන්ධනං තං පුග්ගලං එව පස්සථ එව.

යො: යමෙක්; **නිබ්බනථො**: (තෘෂ්ණාව නම්) වන රහිත වූයේ; **වනාධිමුත්තො**: තපෝ වනයෙහි ඇලුනේ; **වනමුත්තො**: (තෘෂ්ණා) වනයෙන් මිදුණුනේ; **වනං එව**: එම වනයටම (තෘෂ්ණාවට); **ධාවති**: දිව්වේ ද; **මුත්තො**: (ගිහි බන්ධනයෙන්) මිදුනේ; **බන්ධනං**: ඒ බන්ධනයටම (දිව්වේ ද); **තං පුග්ගලං**: ඒ පුද්ගලයා; **එවං**: මෙසේ (ව්‍යසනයට පැමිණියහු); **පස්සථ**: බලන්න.

තෘෂ්ණා සහිත ගෘහ ජීවිතයෙන් මිදෙනු කැමැත්තේ ආරණ්‍යශ්‍රිත ශ්‍රමණ ජීවිතයෙහි ඇලුම් කරයි. එම පුද්ගලයාම යළි ශ්‍රමණ ජීවිතය අත හැර තෘෂ්ණාබර ගෘහ ජීවිතය කරා යයි. එබඳු පුද්ගලයා දෙස බලන්න. හෙතෙම තෘෂ්ණාවෙන් මිදී යළි ගෘහ බන්ධනය වෙතටම දිව යයි.

විවරණය

මෙම ගාථාව තරමක ප්‍රහේලිකා ස්වරූපයකින් ඉදිරිපත් වුවකි. මෙහි නිබ්බන ථො යන්නෙහි නිබ්බත යන පදය යෙදී ඇත්තේ තෘෂ්ණා රහිත තත්වය දැක්වීමට ය. තෘෂ්ණාවෙන් වෙන් වීමේ අරමුණින් වන දිවිය තෝරා ගැනෙතැයි පළමු ගාථා පදයෙන් කියැවෙයි. එහි ප්‍රථම පදයෙන් වන යන්නෙන් අදහස් වන්නේ තෘෂ්ණාවයි. වනාධි මුත්තො යන්නෙන් යෙදෙන වන යන්නෙන් ආරණ්‍ය යන අදහස දෙයි. පළමුව තෘෂ්ණාවෙන් මිදීම සඳහා භික්ෂු ජීවිතය තෝරා ගත් පුද්ගලයා යළිත් ගෘහ ජීවිතය කෙරෙහි සිත බැඳී තෘෂ්නා වසඟයට යාමේ ප්‍රවණතාව මෙම ගාථාවට සන්දර්භය වී ඇත.





යකඩ-දැව-තණ-රැහැන් බැඳුම දැඩි නො වේ. දැඩි බැඳුම ධනය හා අඹුදරුවන් කෙරෙහි ඇති ආසාව ම ය.

345. න තං දළ්හං බන්ධනමාහු ධීරා
යදායසං දරුජං බබ්බජඤ්ච
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු
පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා (24:12)

යදමින් දැවෙන් හා රැහැණින් කෙරෙන බැඳුම්
දැඩි නොම වේය යනු වේ පඬුවනගේ කියුම්
මිණි අබරණෙහි හා අඹුදරු කෙරෙහි ඇලුම්
දැඩි කර වේය ඉක්මවමින් සියලු බැඳුම්

තණ්හා බැම්මෙන් මිදී - නිවහල් වුවොත් යෙහෙකි.

24 (4) දඟ ගෙයක් (245-246 ගාථා)

ග්‍රාමවාසී භික්ෂු පිරිසක් සැවැත් නුවරට පැමිණ බුදුරජාණන් වහන්සේ බැහැදැකීම සඳහා ජේතවනාරාමයට වැඩියහ. මෙම පිරිසෙහි භික්ෂූන් වහන්සේ ලා තිස් නමක් වූ හ. බුදුරජාණන් වහන්සේ බැහැදැක වැඳපුදා අවවාදානුශාසනාද ලබා ගත් මෙම භික්ෂූන් වහන්සේලා දෙවිරම රැය ගෙවා පසු දින සැවත් නුවර පිඩු සිඟා වැඩිය හ. එසේ උන්වහන්සේලාට අපරාධකරුවන් සිරගත කොට තබන දඟ ගෙයක් දක්නට ලැබිණ. මෙහි සිරගත කොට තබා ඇත්තේ ගෙවල් බිඳින මං පහරණ හා වෙනත් අපරාධ කරන වැරදි කරුවන් ය. රාජ පුරුෂයන් විසින් ඔවුන් අල්වා ගෙන කොසොල් රජුට ඉදිරිපත් කළ විට රජතුමා ඔවුන් යදමින් බැඳ සිරගත කිරීමට අණ කරයි. යදමින්, රැහැන් පටින් හා කඹ වලින් බැඳී ඉමහත් දුක් වේදනා විඳින සිරකරුවන් දුටු භික්ෂූන් වහන්සේ පිඩු සිඟා අවුත් දන්වළඳා සවස් භාගයේහි ගඳ කිළියට ගොස් බුදුන් දැක වැඳ පුදා තමන් දුටු මේ දඟ ගෙය පිළිබඳව උන්වහන්සේට සැළ කළ හ. "ස්වාමීනි, අපි පිණ්ඩපාතයේ යෙදී සිටින අතර කොසොල් රජතුමාගේ අපරාධකරුවන් සිරගත කොට තබා ඇති බන්ධනාගාරය දුටිමු. එහි සිටියේ දරුණු අපරාධ කළ සිර කරුවෝය. ඔවුහු ඉතා දැඩි සේ යදම් පටින් රැහැනින් හා කඹවලින් බඳිනු ලැබ සිටියහ. ස්වාමීනි ඒ බැඳුමෙන් ඔවුනට නිදහස් විය නොහැක. මෙයටත් වඩා දැඩි බැම්මක් අපි නො දුටුවෙමු. ලොව මීටත්. වඩා දැඩි වූ තවත් බැම් ඇත්දැයි අපි නොදනිමු".

භික්ෂූන් ගේ මේ ප්‍රකාශය ඇසූ භාග්‍යවතුන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ සේක. "මහණෙනි, ඔය කවර බන්ධනයක් ද? ඔය බැම්මෙන් මිදීම එතරම් අපහසු නොවේ. යමකු තෘෂ්ණාවෙන් බඳනා ලද හොත් ඒ බැම්මෙන් නිදහස් වීම ඉතාමත් අපහසුය. ධනයට වස්තුවට අඹුදරුවන්ට ඇලීම නිසා ඇතිවන තෘෂ්ණා බන්ධනය ඔබ දුටු බන්ධනයට වඩා දහස්වාරයකින් දැඩිය. එහෙත් අධිෂ්ඨාන පරවශ නුවණැති මිනිස්සු මේ තෘෂ්ණා බන්ධනයෙන් ද මිදී අතීතයෙහි හිමාල වනයට පිවිස ගෘහ බැඳුමෙන් නිදහස් වූ නිවහල් ජීවිතයක් ගත කළ හ."

"ස්වාමීනි, ඒ කෙසේ දැයි" විමසූ භික්ෂූනට භාග්‍යවතුන් වහන්සේ ඊට අදාළ අතීත කථාව මෙසේ ගෙන හැර පා වදාළ සේක. මහණෙනි, අතීතයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනකු රාජ්‍යය කරන සමයෙහි අනාගතයෙහි බුදු වන බෝධිසත්වයෝ කිසියම් දිළිඳු කුල ගෙයක උපත ලදහ. ඔහු වැඩිවිය පැමිණි කල්හි පියා මිය ගිය බැවින් ඉතා අපහසුවෙන් හා අමාරුවෙන් ජීවන වෘත්තියක් කර ගෙන තම මව රැක ගැනීමට ඔහුට සිදු විය. තම මව ආදරයෙන් තමා විසින්ම ආරක්ෂා කර ගත යුතු යැයි සිතූ බෝධිසත්වයෝ විවාහයක් කර ගැනීමට ද අකැමැති වූහ. එහෙත් මවගේ බල කිරීමෙන් බේරීමට නොහැකි වූ බැවින් කිසියම් වැදගත් කුල ගෙයකින් කුල කුමරියක් සරණ පාවා ගත් හ. මෙසේ කලක් ගත වන විට බෝසතුන්ගේ මව මිය පරලොව ගියාය. මවගේ අභාවයද හේතු කොට ගෙන ගිහි ජීවිතයෙහි කලකිරුණු මෙතෙම ගිහිගෙය අත හැර වනයට ගොස් තවුස් දහම් රැකීමට සිතා ගත්තේ ය. එබැවින් හෙතෙම තම බිරියට මෙසේ පැවසී ය."සබඳ, මම ගිහි ජීවිතයෙහි කලකිරී සිටිමි, මෙතෙක් කල් මා ගිහි ජීවිතයෙහි සිටියේ මව ආරක්ෂා කර ගත යුතු බැවිනි, දැන් මවගේ අභාවයෙන් මම තව දුරටත් කලකිරී සිටිමි. එබැවින් තපසට යාමට ඔබේ අනුමතිය මට දෙන්න." එවිට බිරිය මෙසේ කීවාය. "ස්වාමීනි, ඔබට මේ වනතුරු නොදන්වා සිටියත් මා කුස තුළ දරුවෙක් පිළිසිඳ ගෙන ඇත. ඔබතුමාට තපසට යාමට අවශ්‍යම නම් මගේ දරුවා බිහිවන තෙක් සිටින්න. එවිට ඔබට දරුවා ද දැක බලාගෙනම තපසට යා හැකිය." බෝධිසත්වයෝ බිරියගේ බස් අසා බෙහෙවින් සතුටුව ඉක්මණින් තපසට යාමේ අදහස් කල්දමා ගෘහ වාසයෙහිම නතර වූ හ. එහෙත් බිරියට දරුවා ලැබුණු පසු තපසට යාමේ අදහසින් විසූ හ.

(ඊළඟ පිටුව බලන්න)

විස්තරාත්මක අනුවාදය (345 ගාථාව)

ආයසං දාරුජං බබ්බජං යං ච තං ධීරා දළ්හං බන්ධනං
න ආහු මණිකුණ්ඩලෙසු සාරත්තාරත්තා පුත්තෙසු
දාරෙසු ච යා අපෙක්ඛා

ආයසං: අයෝමය වූද; **දරුජං**: දැවමය වූ ද; **බබ්බජං**: බබුස් තණමය වූද (යම් බන්ධනයක් වේ ද); **යං ච**: යම්කිසි බන්ධනයක් වේ නම්; **තං**: එය (ඒ හැම බන්ධන), **ධීරා**: නුවණැත්තෝ; **දළ්හං බන්ධනං**: දැඩි වූ බන්ධනයකැයි; **න ආහු**: නොකී හ; **මණිකුණ්ඩලෙසු**: මැණික් කණ්ණාභරණ ආදියෙහි; **සාරත්තරත්තා**: අතිශයින් ඇලුනා වූ; **පුත්තෙසු**: දරුවන් කෙරෙහිද; **දාරෙසු ච**: බිරියන් කෙරෙහි; **යා අපෙක්ඛා**: යම් අපේක්ෂාවක් (ආශාවක්) වේ ද නම්. (එයම දැඩි බන්ධනයයි කීහ.)

නුවණැත්තෝ යම් බඳු වූ දැවමය අයෝමය සහ තෘණමය බන්ධනයක් දැඩි වූ බන්ධනයකැයි නොකීහු ද ඔවුහු මැණික් රන්රිදී, අඹුදරුවන් ආදීන් කෙරෙහි වූ බන්ධනයම දැඩි බන්ධනයකැයි කීවාහු ය.

විවරණය

ආයසං දාරුජං බබ්බජඤ්ච: සාමාන්‍ය ලෝකයේ බැඳීම් කරන ක්‍රමය දැක්වීමට බැඳීම සඳහා ගන්නා භෞතික වස්තු විදහා පෑමක් මේ පද මගින් සිදු වෙයි. යදම් වලින් දැවමය උපකරණවලින් සහ වෙනත් තණ වැනි දෙයින් කෙරෙන රැහැන්වලින් යමක් බැඳ තැබීම කරනු ලැබේ.

මණිකුණ්ඩලෙසු: රන් මිණි මුතු අබරණ, ධනය ආදිය කෙරෙහි පුද්ගලයා තෘෂ්ණාව ඇති කර ගනියි. එම භෞතික කාම වස්තු කෙරෙහි තෘෂ්ණා වශයෙන් ඇති කර ගැනෙන බන්ධනය ලොව ඇති දෘඪ වූ බන්ධනය වශයෙන් මෙහිදී කියැවෙයි.

සාරත්තරත්තා: දැඩි සේ බැඳුණු යන අරුත්ය.

නුවණැත්තෝ ඉතා දැඩි බැඳුම් සිඳ දමා කම්සුවයෙහි බලාපොරොත්තු හැරදමා පැවිදි වෙත්.

346. ඒතං දළ්හං බන්ධනමාහු ධීරා
ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං
ඒතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති
අනපෙක්ඛිනො කාමසුඛංපහාය (24:13)

ලිහිල් වේගවත් අපහසු මිදීමට
දැඩි බැඳුමකැයි යෙති නුවණැති දනා සෙට
කම්සුව නොරිස් දන එය අතහැර සොඳට
මේ බැඳුම ද මුදා හැසිරෙති රිසි ලෙසට

හැඩි දැඩි වුවද බැඳුම් - නුවණැත්තෝ මිදෙති එයින්

24 (4) දඟ ගෙයක් (345-346 ගාථා)

පෙර පිටුව හා සම්බන්ධ වේ.

නියමිත කාලය ගත වන විමෙන් බිරිය දරුවකු ප්‍රසූත කළා ය. කිහිපදිනක් ගිය විට බෝසාතානෝ තම අදහස බිරියට පැවසූහ. එහෙත් බිරිය පැවසූවේ "හිමියනි, මේ සිඟිත්තා තවමත් තණෝන් කිරි උරා බොන වයසෙහි සිටින්නෙකි. මොහු දුව පැන ඇවිදින සමය වන තෙක්වත් මෙහි රැඳී සිටිය මැනව" යනුවෙනි. බෝසතානෝ එම යෝජනාවට ද එකඟ වූහ. මෙසේ සිටින අතරතුර දෙවන දරුවාද බිරිඳගේ කුස පිළිසිඳ ගත්තේ ය.

බිරියට දන්වා සිටියහොත් තමාට කෙදිනක හෝ තපසට යාමට නොලැබෙන බව මනාව දත් බෝසතාණෝ බිරියට මේ පිළිබඳව වචනයකුදු නොපවසා හොර රහසේම ගෙදරින් පළා ගොස් වනයට වැදී තවුස් දම් රැකීමට අදහස් කර ගත් හ. මේ අනුව හෙතෙම දිනක් ගෙදරින් පළා ගියේ ය. මෙසේ රාත්‍රියෙහි ඔහු රාජපුරුෂයන් අතට හසු වුවද තමා තමාගේ මව රකින පුද්ගලයකැයිද මවගේ අවශ්‍යතාවක් සඳහා මෙසේ රාත්‍රියෙහි යාමට සිදු විනැයි ද බොරුවක් පවසා ඔවුන් ගේ අනුකම්පාව ලැබ බේරී හිමාලය පියසට ගොස් එහි තවුස් දම් රැකීම ආරම්භ කළේ ය.

කාලයක් තවුස් දමින් හැසිරෙමින් භාවනා වඩා පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ගැනීමට ද බෝසතුනට හැකි විය. තවුස් දමෙහි ඉතා උසස් ප්‍රතිඵල ලබා ගත් බෝසතාණෝ තමාටම මෙසේ සිතා ගත්හ. "මම සිඳ බිඳ දැමීමට ඉතාම දුෂ්කර බන්ධනයෙන් මිදුනෙමි. අඹුදරුවන් වස්තුව සම්පත් ආදියට කාම වශයෙන්, තෘෂ්ණාවශයෙන් බැඳීම වූ කලි ලෝකයෙහි ඉතාමත් ම දැඩි වූ බන්ධනයයි. මම එය ජයගතිමි" දිවි අවසන් වන තෙක් තවුස් දම් වැඩූ බෝසතාණෝ මිය පරලොව ගොස් බ්‍රහ්ම ලෝකයෙහි උපන්න. බුදුරජාණන් වහන්සේ මෙම අතීත කථාව ගෙන හැර දක්වා ගාථා ද්වයකින් ධර්ම දේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (346 ගාථාව)

එතං ධීරා ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං දළ්හං බන්ධනං ආහු අනපෙක්ඛිනො කාමසුඛං පහාය එතං අපි ඡෙත්වාන පරිබ්බජන්ති.

එතං: මේ බන්ධනය; **ධීරා**: නුවණැත්තෝ; **දළ්හං බන්ධනං**: දැඩි වූ බන්ධනයයි; **ආහු**: කීවාහුය; **ඔහාරිනං**: වේගයෙන් ඇදගෙන යන්නා වූ; **සිථිලං**: ලිහිල් වූ; **දුප්පමුඤ්චං**: මිදීමට අපහසු; **එතං අපි**: මේ බැම්ම ද; **ඡෙත්වාන**: (නැණ කමින්) සිඳ දමා; **අනපෙක්ඛිනො**: (කාමයෙහි) අපේක්ෂා නැත්තෝ; **කාමසුඛං**: කම් සුවය; **පහාය**: අතහැර; **පරිබ්බජන්ති**: පැවිදි වෙති.

වේගයෙන් ගසාගෙන යන්නාවුත් එහෙත් ලිහිල් වූත් මිදීමට දුෂ්කර වූත් මේ බන්ධනය දැඩි බැඳීමකැයි නුවණැත්තෝ පවසති. කම් සුවය පිළිබඳ බලාපොරොත්තු නැත්තෝ එය හැර පියා මේ දැඩි බන්ධනයද සිඳ දමා හැසිරෙති.

විවරණය

ඔහාරිනං: ඇද ගෙන යා හැකි යන අරුත්ය දිගෙලි කිරීමක් වැනි අදහසක් මෙම පදයෙන් ඉදිරිපත් වෙයි. භෞතික වශයෙන් ඇති වන බැඳීමකදී යමකට තබා ගැට ගැසීමක් සිදු වෙයි. එහෙත් මානසික බන්ධනය භෞතික බන්ධනයෙන් වෙනස් කොට දැක්වීමට මෙහි ඔහාරිනං යන පදය යෙදී ඇත.

සිථිලං: ලිහිල් වූ යන අරුතය. මෙහිදී බැඳීම ලිහිල් යන්නෙන් අදහස් කෙරෙන්නේ පුද්ගලයාට ඔබමොබ හැසිරීමට හැකි බවයි. භෞතික බන්ධනයකදී යමකට තබා ගැට ගැසූ විට එහාට මෙහාට වීමට ඉඩක් නැත. එහෙත් මෙම මානසික බන්ධනයේ දී පුද්ගලයා බන්ධනයක් නැත්තකු මෙන් ලිහිල්ව හැසිරෙති.

අනපෙක්ඛිනො කාම සුඛං: තෘෂ්ණා වශයෙන් ඇති වන බන්ධනයෙන් මිදීමට හැකි වන්නේ කාම සැපය කෙරෙහි අපේක්ෂාවක් නැත්තාටය. ලෝකයෙහි සාමාන්‍ය ස්වභාවය වන්නේ කාම වස්තු පිළිබඳව දැඩි අපේක්ෂා ඇති කර ගැනීමයි. රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පංචකාම සම්පත්තියෙහි පමණක් නොව අඹුදරු රන්රිදී අබරණ උපභෝග පරිභොග සම්පත්ති ධන ධාන්‍යාදිය කෙරෙහි පුද්ගලයා ඇදීයයි. එය සාමාන්‍ය පුද්ගල ස්වභාවයයි. එහෙත් එබඳු දේ කෙරෙහි මනසෙහි බැඳීම නැති කර ගැනීමට නම් ඒවා පිළිබඳ නිරපේක්ෂක භාවයක් ඇති කරගත යුතුය.

කාමයන් ගේ ආදීනවය දැකීමට බුදු දහමින් උපදෙස් දී ඇත්තේ කාම වස්තුවලට ඇතිවන තෘෂ්ණා බන්ධනයෙන් පුද්ගලයා මුදා ගැනීමට ය. මෙම තෘෂ්ණා බන්ධනය ඉතා දැඩි වූ බන්ධනය වශයෙන් නුවණැත්තෝ සලකති. එහෙත් තෘෂ්ණාව කෙතරම් දැඩි බන්ධනයක් වුවද එයින් වුවද මිදිගත හැකි බව මේ ගාථා දාමයෙන් අවධාරණය කෙරෙයි. පුද්ගලයා තෘෂ්ණාවට වසඟ කර ගැනීම ලෝකයෙහි ස්වභාවය වුවත් එම ලෝක ස්වභාවය ඊට ප්‍රතිවිරුද්ධ දෙසට හැරවීමේ ව්‍යායාමයක් බුදු දහමින් ඉදිරිපත් වෙයි. බුදුදහම පටිසෝතගාමී වශයෙන් හැඳින්වී ඇත්තේ එබැවිනි. ගඟක යටිගං බලා යාම අනුසෝතගාමී
වෙයි. එය ලෝකයෙහි ස්වභාවයයි. එහෙත් බුදුදහමින් කෙරෙන්නේ උඩුගං බලා යාමකි. මෙය දුෂ්කරය. එහෙත් නොකළ හැක්කක් නොවේ. මේ සඳහා පුද්ගලයකු තුළ අධිෂ්ඨානය අවශ්‍ය වෙයි. අධිෂ්ඨාන පරවශ පුද්ගලයෙකුට නොකළ හැක්කක් නොමැත. තෘෂ්ණාව සිඳ බිඳ දැමීමට නිර්දිෂ්ට වූ මාර්ගයක් තිබේ. අධිෂ්ඨානයෙන් යුතුව එම මාර්ගය පිළිපදින්නේ නම් තෘෂ්ණා නිරෝධය කළ හැකි වෙයි. එම ලෝක නිරෝධය ද වෙයි.



රාගයෙන් රත්වූ අය තණ්හා නමැති සැඩදිය පහරට අසුවෙත්. නැණවත්හු කම් සැපයෙහි නො ඇලී සියලු දුක් දුරු කෙරෙත්

347. යෙ රාගරත්තානුපතන්ති සොතං
සයං කතං මක්කටකොව ජාලං
එතම්පි ඡෙත්වාන වජන්ති ධීරා
අනපෙක්ඛිනො සබ්බදුක්ඛං පහාය. (24:14)

ඇලුනෝ රාගයෙන් යෙති තණ්හා ගොසට
විලසින් මකුළුවකු සේ ඔහු ගෙම දැලට
හැම දුක් අතැර රිසි නැතිවී කම් සුවට
බැඳුම් මුදා යති නුවණැති දන යසට

රාගයේ මකුළු දැල

24 (5) ඛේමා තෙරණිය (347 ගාථාව)

රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ බිම්බිසාර රජුගේ අගමෙහෙසිය ඛේමා අරභයා මෙම ගාථාව වදාළ සේක.

ඛේමා අග මෙහෙසිය රූපයෙන් අග තැන්පත් වුවා එනිසාම ඇතිවූ රූපමදයෙන් ද මත් වූවා ය. බුදුරජාණන් වහන්සේ රූපයෙහි අනිත්‍යතාව, හා නිසරු බව පිළිබඳව ධර්මය දේශනා කරන බැවින් එබඳු දහමක් දෙසන බුදුන් දැකීමට යාම ඛේමා නොරිස්සුවාය. එබැවින් ඇය නිතරම තැත් කළේ බුදුන් මුණ ගැසීමෙන් ඉවත්ව සිටීමටය. එහෙත් ශ්‍රද්ධාවන්ත බෞද්ධයකු වූ බිම්බිසාර රජතුමා කෙසේ හෝ ඛේමා බුදුන් වෙතට යැවීමේ අදහසින් පසු විය. මේ සඳහා උපායක් යෙදූ රජතුමා ඇමති වරුනට නියෝග කොට බුදුන් වසන වේළුවනයෙහි අසිරිය විරුදු කරුවන් ලවා ගායනා කරවීමට කටයුතු යෙදීය. වේළුවන විහාරයෙහි පවත්නා ශාන්ත සුන්දර පරිසරය පිළිබඳව විරුදු කරුවන් ගැයූ ගීතිකා අසන කවරකු වුවද එහි ගොස් එම අසිරිය නැරඹීමට කැමති වනු නො අනුමානය. ඛේමාට ද මේ සිත පහළ විය. තමා බුදුන් හමු නොවී දෙව්රම අසිරිය පමණක් නරඹා එන්නෙමැයි ඇය සිතා ගත්තාය.

ඛේමා බිසව වේළුවන වෙහෙරට පැමිණෙන විට බුදුරජාණන් වහන්සේ පැමිණ සිටි පිරිසට දහම් දෙසමින් වැඩ සිටි සේක. ඛේමාගේ රූප මානය පිළිබඳව දැන සිටි උන්වහන්සේ ඇයගේ රූපයට ඇති වැරදි මතය බිඳ දැමීමේ අදහසින් ඇයට පෙනෙන සේ අතිශයින්ම රූප සෞන්දර්‍යයෙන් අගතැන්පත් නව යොවුන් තරුණ කතක් නුදුරෙහි සිට තමන් වහන්සේට පවන් සලමින් සිටින ආකාරයක් තම සෘද්ධිබලයෙන් මවා පෑ සේක. ඛේමා දුරදීම මේ දර්ශනය දැක තමා බුදුන් කෙරෙහි වැරදි හැඟීමක් ඇති කර ගෙන ඇතැයි සිතුවාය.

"මෙ තරම් ලස්සන තරුණ කතක් බුදුන් සමීපයෙහිම සිට පවන් සලන්නේ නම් රූපයට බුදුන් දොස් කියතැයි කීම බොරුවක් විය හැකිය"යි ඇය තමාටම සිතා ගත්තාය. මේ නිසා ඕතොමෝ කිසිදු සැකයක් නැතිව බුදුන් දහම් දෙසමින් සිටි දම්සභා මණ්ඩපය දෙසටම ආවා ය. මෙම සුන්දර කාන්තාවගේ රූපය තම රූපයත් සමඟ සසඳන විට තමා වැදිරියක් වෙතැයි ඕ සිතුවාය. ඛේමා තව තවත් දම්සභාමණ්ඩපය දෙසට එද්දී බුදුරජාණන් වහන්සේ පවන් සලමින් සිටි කාන්තාවගේ රූපය ක්‍රමයෙන් වැහැරෙමින් ජරා දුවිලි බවට පත්වන ආකාරයක් මැවූ සේක. ඛේමා මෙය දැක මවිත වූවා ය. තමා මානයෙන් පෙළෙන්නේ මෙසේ වෙනස් වන ජරාවට යන රූපයකටදැයි නුවණින් ඇය සිතුවාය. මෙසේ ඛේමා සංස්කාර ධර්මයන් ගේ අනිත්‍යතාව වටහා ගැනීමට සමත් වූවා ය.

බුදුරජාණන් වහන්සේ ඛේමා ගේ අදහස් මැනවින් දැන ඇය ගේ සිතුවිලි වලට අනුකූල වූ ධර්මයක් දේශනා කළ සේක. සංස්කාර ධර්මයන්හි අනිත්‍ය දුක්ඛ අනාත්මතාව අවබෝධ කළ ඕ සෝවාන් ආදී මාර්ගඵල පිළිවෙලින් රහත් බවට පත් වූවා ය. රහත් බවට පත් වීමෙන් අනතුරුව ඕ භික්ෂුණියක ලෙස පැවිදි බව ලබා ගත්තාය. ඛේමා රහත් තෙරණින් වහන්සේ බුදුරජාණන් වහන්සේ ගේ අග්‍ර ශ්‍රාවිකාව වූවා ය.

විස්තරාත්මක අනුවාදය (347 ගාථාව)

රාගරත්තා යෙ සයං කතං ජාලං මක්කටකො ඉව සයං කතං සොතං අනු පතන්ති ධීරා එතං අපි ඡෙත්වාන අනපෙක්ඛිනො සබ්බදුක්ඛං පහාය වජන්ති.

රාගරත්තා: රාගයෙන් රත් වූ; **යෙ**: යමෙක්; **සයං කතං**: තමන් විසින් කළ; **ජාලං**: දැළ (අනුව පවත්නා); **මක්කටකො ඉව**: මකුළුවකු මෙන්; **සයං කතං**: තමන් උපදවා ගත්; **සොතං අනු**: තෘෂ්ණා ප්‍රවාහයෙහි; **පතන්ති**: වැටෙත් ද; **ධීරා**: නුවණැත්තෝ; **එතං අපි**: මේ බැම්ම ද; **ඡෙත්වාන**: (නැණ කමින් සිඳ); **අනපෙක්ඛිනො**: (කම් සුවයෙහි) අපේක්ෂා නැත්තෝ; **සබ්බදුක්ඛං**: සියලු දුක්; **පහාය**: දුරු කොට; **වජන්ති**: (නිවන් පුර) යන්නාහ.

රාගයෙන් බැඳුණු මිනිස්සු තමා විසින්ම කරන ලද දැලට වැටෙන මකුළුවකු මෙන් තෘෂ්ණා ප්‍රවාහයට ඇද වැටෙති. නුවණැත්තෝ මෙම බන්ධනයෙන් ද නිදහස්ව කම්සුව අපේක්ෂා නොකරමින් සියලු දුක් අතහැර දමා හැසිරෙති.

විවරණය

පංචකාම වස්තූන් කෙරෙහි ඇල්මෙන් පුද්ගලයා තෘෂ්ණා ජාලයට වැටෙයි. එයින් ඔහුට ගොඩ ඒමට දුෂ්කර වෙයි. එහෙත් නුවණැත්තෝ කම් සැප අතහැර සියලු දුකින් මිදී මේ තෘෂ්ණා බන්ධනයෙන් මිදෙති.

තුන් කල්හි ම පස්කඳ පිළිබඳ ඇල්ම දුරලන්න. බවයාගේ පරතෙරට යන්න. ජාති ජරා දුකට නො පැමිණෙන්න.

348. මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො
මජ්ඣෙ මුඤ්ච භවස්ස පාරගූ
සබ්බත්ථ විමුත්තමානසො
න පුන ජාතිජරං උපෙහිසි (24:15)

මුල මැද අග අත් හරින්න
බවයෙහි පරතෙරට යන්න
හැම තැන මිදුනෙක්ව ඉන්න
යළි උපතට පත් නො වන්න.

බවයෙන් එතර වී - ඉන්න සඳහට දුක් නොවී

24 (6) උග්ගසේන කුල පුත්‍රයා (348 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන භාග්‍යවතුන් වහන්සේ **උග්ගසේන** නම් වූ කුල පුත්‍රයකු අරභයා මේ ගාථාව දේශනා කළ සේක.

වරක් සංචාරක නාට්‍ය කණ්ඩායමක් බිම්බිසාර රජතුමාගේ මාලිගා අංගනයෙහි සත් දිනක් තුළ නාට්‍ය සංදර්ශනයක් පැවැත්වීය. මෙම නාට්‍ය කණ්ඩායම නළු නිළියන් පන්සියයකින් සමන්විත විය. මැජික් දර්ශනකරුවෝද පිණුම් කරුවෝද ඔවුනතර වූහ. එක් පිණුම් කරුවකුගේ දියණියක වූ රූමත් නිළියක් උඩ අහසෙහි අදින ලද කඹයක සක්මන් කරමින් ගී ගයමින් නැටුම් ද ඉදිරිපත් කළා ය. නාට්‍ය සංදර්ශනය නැරඹීමට පැමිණි සිටි උග්ගසේන නම් වූ සිටු පුත්‍රයෙක් මේ රූමත් තරුණ නිළිය දැක පිළිබඳ සිත් ඇති කරගත්තාය. ඇය විවාහ කර ගැනීමේ දැඩි ආශාවෙන් පෙළුණු හෙතෙම මවුපියන්ගේ විරෝධතා මධ්‍යයෙහි වුවද ඇය විවාහ කර ගත්තේ ය. උග්ගසේන බිරිය සමඟ තම මවු පියන් ගේ නිවසෙහි විසීමට අවසරයක් නොලද නිසා බිරිය ද කැටුව නාට්‍ය කණ්ඩායමත් සමඟ තැනින් තැනට යමින් ජීවත් විය. කල් ගත වන විට මෙම උග්ගසේන යුවළට දරුවෙක් ද ලැබුණේ ය. උග්ගසේන ධනවත් සිටු පුතෙකුව සිටි නිසා ඔහු කිසි ශිල්ප ශාස්ත්‍රයක් නො දැන සිටියේය. එබැවින් ඔහුට නාට්‍ය කණ්ඩායමෙහි කිරීමට කිසිදු වැදගත් වැඩක් නොවීය. එබැවින් ඔහු කළේ නාට්‍යකණ්ඩායමේ ගැල් පැදවීම, බඩු මුට්ටු ඔසවා ගෙන ඒවා එහා මෙහා කිරීම වැනි බර වැඩය. ඔහු ගේ බිරිය සැමියා ගේ මේ නොහැකියාව පිළිබඳ කළකිරී සිටියාය. එබැවින් ඇයට ඔහුට ඇනුම්පදයක් වන ලෙසින් ගීයක් තනා එය ගයමින් දරුවා නැලවීම පුරුද්දක් කර ගත්තාය.

ඒ ගීයෙන් කියවුනේ, "ගැල පදවන්නා ගේ පුතුනේ නැලවී ගන්න මගෙ පුතුනේ, බඩු ගෙන යන්නාගේ පුතුනේ,නැලවී ගන්න මගේ පුතුනේ," වැනි අදහසකි. උග්ගසේන මෙම දරු නැලවිල්ල අසා මෙය තමාටම කියන ඇනුම්පදයකැයි සිතා බෙහෙවින් සිත් තැවුලට පත්විය. මෙයින් ලජ්ජාවට පත් හෙතෙම මම ද පිණුම් කරුවෙක් වෙමි යි සිතා සිය බිරියගේ පියා වෙතට ගොස් තමාට ද පිණුම් ශාස්ත්‍රය පුහුණු කරවන ලෙස ඉල්ලා සිටියේ ය. ඔහු ගේ මයිලණුවෝද පිණුම් ශිල්පය ඔහුට පුහුණු කරවුයේය. අවුරුද්දක ඇවෑමෙන් උග්ගසේන දක්ෂ පිණුම් කරුවෙක් වූයේය. තමාට දක්ෂලෙස පිණුම් ගැසීමට හැකි බව වටහා ගත් උග්ගසේන රජගහ නුවරට ගොස් දින සතකින් තමන් ප්‍රසිද්ධ පිණුම් දර්ශනයක් පවත්වන බව ප්‍රචාරය කළේය. සත් වැනි දිනයෙහි විශාල පිරිසක් උග්ගසේනගේ කරණම් නැරඹීමට පැමිණ සිටිය හ. හෙතෙම පිට්ටනිය මැද සිට වූ දිග කණුවක් මතට නැගී කණුවෙහි අග සිට කරණම් ගැසීය. මේ අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේ ගේ නුවණැ'සට උග්ගසේන රහත් වීමට භාග්‍ය සම්පත් ඇති තැනැත්තකු බව දක්නට ලැබිණ. එබැවින් බුදුරජාණන් වහන්සේ රජගහ නුවරට වැඩම කොට නරඹන්නන් උග්ගසේන දෙස බලනු වෙනුවට තමන් දෙස බලන ලෙසට අධිෂ්ඨානයක් කළ සේක. උග්ගසේන පිරිසෙන් නැගෙන ප්‍රතිචාරයක් නොමැති නිසා බෙහෙවින් කණස්සල්ලට පත්විය. එවිට බුදුරජාණන් වහන්සේ උග්ගසේන අමතා මෙසේ දේශනා කළ සේක.

"උග්ගසේන, බුද්ධිමත් පුද්ගලයා, කම් සැපත කෙරෙහි ඇති ආශාවෙන් මිදෙයි. තණ්හා බන්ධනයට පත් නො වෙයි. මේ සංසාර දුකින් නිදහස් වීම සඳහා අප්‍රමාදයෙන් කටයුතු කරයි."

මෙම දෙසුම කෙළවර උග්ගසේන කණුව මත සිටිමින්ම රහත් බවට පැමිනියේය. හෙතෙම කණුවෙන් බැස අවුත් බුදුන් වැඳ අවසර ගෙන භික්ෂුභාවයට පත් වූයේය.

විස්තරාත්මක විවරණය 348 ගාථාව

පුරෙ මුඤ්ච පච්ඡතො මුඤ්ච මජ්ඣෙ මුඤ්ච භවස්ස පාරගූ සබ්බත්ථ විමුත්තමානසො පුන ජාතිජරං න උපෙහිසි

පුරෙ: අතීතය (සම්බන්ධ කල්පනාවන් ගෙන්); **මුඤ්ච**: මිදෙන්න; **පච්ඡතො**: අනාගත කල්පනාවන් ගෙන්; **මුඤ්ච**: මිදෙන්න; **මජ්ඣෙ**: මැද කල්පනාවන් ගෙන් ද මිදෙන්න; (මෙසේ ඇති කළ) **භවස්ස**: භව සයුරේ; **පාරගූ**: පරතෙරට ගියේ; **සබ්බත්ථ**: (ස්කන්ධ ආදී) හැම තැන්හි; **විමුත්තමානසො**: මිදුණු සිත් ඇති ඔබ; **පුන**: යළි; **ජාතිජරං**: ජාති ජරා දී දුකට; **න උපෙහිසි**: නො එළඹෙන්නෙහිය.

අතීත අනාගත වර්තමාන කාල වලට අයත් තෘෂ්ණා සහගත කල්පනාවන් ගෙන් මිදෙන්න. සංසාර සාගරයෙන් එතෙර වන්න. හැම තැනකම මිදුණු සිතින් යුක්තව වසන්න. එවිට ඔබ ජාතිජරාදී සසර දුකට යළි නො එළඹෙයි.

විවරණය

භවස්ස පාරගූ: භවයේ එතරට ගිය යන අරුතයි. පුද්ගල පැවැත්ම පිළිබඳ භූමි වශයෙන් සලකන විට භවය තුන් ආකාරය වෙයි. ඒවා කාම භව, රූප භව අරූප භව යනුවෙන් හැඳින් වී ඇත. කාමාවචර සත්ව ලෝකය කාම භවයයි. රූපවචර බ්‍රහ්ම ලෝක රූප භවයයි. අරූපවචාර බ්‍රහ්ම ලෝක අරූප භවයයි. පැවැත්ම පිළිබඳ භව සංකල්පය වෙනත් ආකාරයකට ද විවරණය වී ඇත. එහි දී භවය දෙයාකාරයකට සැලකී තිබේ.

1. කම්මභව
2. උප්පත්ති භව වශයෙනි.

භව යන වචනයෙන් අදහස් වන්නේ පැවැත්මයි. පැවැත්මේ ක්‍රියාකාරී අංශයක් වෙයි. භවය ඇති කරවීමට මූලික වශයෙන් හේතුවන්නේ පුද්ගලයා විසින් සිදු කරන කුශල වූ හෝ අකුශල වු කර්මයි. එය කම්මභව නමින් හැඳින්වෙයි. පුද්ගලයා ගේ වර්තමාන කර්ම ක්‍රියාකාරිත්වය මෙයින් අදහස් කෙරෙයි. කර්මභවයා ගේ විපාක වශයෙන් ලබා ගන්නා උත්පත්ති ඇති කරවන භූමි - යථෝක්ත ත්‍රිවිධ භවය උප්පත්ති භව නමින් අදහස් කෙරෙයි.

කාම සිතිවිලිවලට වසඟ වූ තැනැත්තාට තණ්හාව වැඩේ. ඒ පුගුලා තණ්හා නමැති බැඳුම දැඩි කරන්නේ ය.

349. විතක්කපමථිතස්ස ජන්තුනො
තිබ්බරාගස්ස සුභානුපස්සිනො
භීයෙ‍‍යා තණ්හා පවඩ්ඪති
එස ඛො දළ්හං කරොති බන්ධනං (24:16)

රාගය දැඩිව ඇති පස් කම්සුව දකින
මිනිසා කෙරෙහි පවි සිතුවිල්ලෙන් වැඩුන
තණ්හා වැඩි එනු නියතයි බොහො ලෙසින
මෙතෙමේ හිර කරයි මෙ බැඳුම දැඩි බවින.

තණ්හා වඩන්නෝ - සසරට බැඳෙන්නෝ

24 (7) ධනුර්ධරයෙක් (249-250 ගාථා)

තරුණ හෙරණුන්දෑ, කෙනෙක් තමාට සලාක පතින් ලැබුණු කැඳ ද රැගෙන එය වැළඳීමට සිතා දානශාලාවට වැඩම කළ විට එහි බීමට දිය නොතිබු බැවින් දිය සොයාගෙන අසළ වූ නිවසකට ගිය හ. එහි විසූ තරුණ කාන්තාවක් හෙරණුන්ද දැක පිළිබඳ සිත් ඇති කර ගත්තාය. උන්වහන්සේට දිය පිළිගැන්වූ ඕ තොමෝ නැවත පැන් අවශ්‍ය විටක මෙහිම පැමිණෙන්නැයි ආරාධනයක් ද කළා ය.

හෙරණුන්ද දානශාලාවෙහි දිය නොමැති හැම විටකම එම නිවසට ගොස් කාන්තාව අතින් දිය ලබා ගැන්ම සිරිතක් කර ගත්තේ ය. මෙසේ කල්යත්ම කාන්තාව හෙරණුන්දැට වැඩි සැලකිලි දක්වන්නට වූවා ය. දිනක් බීමට කැඳ පිළිගැන්වුවාය. තවත් දිනෙක දහවල දානය සිය නිවසෙහිදීම පිළිගැන්වූවා ය. හෙරණුන්දැ දානය වළඳන අවස්ථාවෙහි කාන්තාව ඉතා සමීපයට වී හිඳ ගෙන මෙසේ කීවාය.

"ස්වාමීනි, මෙහි මා වෙසෙන්නේ ඉතා පාලුවෙනි. ජීවිතය ගෙන යාමට මෙහි කිසිදු අඩුවකු ද නැත. අඩුවකට ඇත්තේ මෙහි පිරිමියකු පමණි."

කාන්තාවගේ මේ කථාවෙන් පසු ඇය තමාට ආදරය කරන බව වටහාගත් හෙරණුහුදෑ ද ඇය ගැන කල්පනාවෙන්ම කාලය ගෙවීය. කාන්තාව සමඟ ජීවත් වීමේ කැමැත්තෙන් හෙතෙම පෙළුනේ ය. එබැවින් සසුනෙහි උකටලී බව ඇති විය. මේ බව අනෙක් භික්‍ෂූනට වැටහී හෙරණුන් දෑ ඔහු ගේ ආචාර්ය උපාධ්‍යාය වරුන් වෙතට ගෙන යනු ලැබිණ. ආචාර්ය උපාධ්‍යායවරුද හෙරණුන්දැව බුදුරජාණන් වහන්සේ වෙතට පැමිණවූහ. හෙරණුන්දැ සසුනෙහි උකටලීව සිටින බව බුදුරජාණන් වහන්සේට සැලකළ හ.

"මහණ සසර කළකිරී ගිහිගෙයින් ඉවත්ව සසුනට වන් පුද්ගලයා සසුනෙහි බඹසර රකිමින් සෝවාන් ආදී මාර්ගඵලයක් ලබා ගැනීම සඳහා උත්සාහ නොගෙන සිටීම කෙතරම් වරදක් ද? සසර දුකින් එතර වීමේ අදහසින් මහණ වූ ඔබ යළි සසර දුකටම යන්නෙහිදැයි පවසා උකටලී වීමට හේතු කවරේදැ"යි බුදුන් වහන්සේ තෙරණුන්දැ ගෙන් විමසූ සේක.

"ස්වාමීනි, අසුවල් සත්‍රිය මෙබඳු දෑ මට පැවසීය"යි හෙතෙම සියලු පුවත් භාග්‍යයතුන් වහන්සේට දැන්වීය.

"මහණ එම සත්‍රිය දැන් ඔබ ගේ ශීලය බිඳීමට උත්සාහ දැරීම පුදුමයට කරුණක් නොවෙයි. පෙරද මැය මුලු දඹදිව පුරා ධනුර්ධරයා ලෙස ප්‍රකටව සිටි පුද්ගලයකු හැර පියා එකෙණෙහි දුටු සොරකු කෙරෙහි පිළිබඳ සිත ඇති කර ගත්තාය" යි පැවසූ භාග්‍යවතුන් වහන්සේ එම අතීත කථාව මෙසේ ප්‍රකට කොට දැක්වූ සේක.

විස්තරාත්මක විවරණය 349 ගාථාව

විතක්කපමථිතස්ස තිබ්බරාගස්ස සුභානුපස්සිනො
ජන්තුනො තණ්හා භියෝ‍යා පවඩ්ඪති. එසො ඛො
බන්ධනං දළ්හං කරොති

විතක්කපමථිතස්ස: පව් සිතුවිලි වලින් මඩන ලද්දා වූ; **තිබ්බරාගස්ස**: තියුණු රාගය ඇති; **සුභානුපස්සිනො**: සුභ වශයෙන් බලන සුලු; **ජන්තුනො**: සත්වයා හට; **තණ්හා**: තෘෂ්ණාව; **භියෝ‍යා**: බෙහෙවින්; **පවඩ්ඪති**: වැඩෙයි; **එසො ඛො**: මෙතෙම වනාහි; **බන්ධනං**: තෘෂ්ණා බන්ධනය; **දළ්හං කරොති**: දැඩි කරයි.

පව් සිතුවිලි වලින් වඩනා ලද්දා වූ තියුණු රාගයෙන් යුක්ත පිළිකුල් කටයුත්තෙහි සුභ සහගත හැඟීම් ඇති පුද්ගලයා තුළ තණ්හාව බෙහෙවින් වැඩෙයි. මේ පුද්ගලයා බන්ධනය දැඩි කර ගනියි.

විවරණය

සුභානුපස්සිනො: ලොව පවත්නා සැම සංස්කාර ධර්මයක්ම අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම යන ලක්‍ෂණයන්ගෙන් යුක්තය. එබඳු වස්තූන් හි පිළිකුල මිස සුභ සහගත බවක් නො මැත. රාගයෙන් බැඳෙන මිනිසා අසුභ දෙයෙන් සුභයම දකියි.

කාම සිතුවිලි සන්සිඳවීමෙහි ඇලුණු තැනැත්තා අසුභ භාවනා වඩන්නෙකි. මරු ගේ බැම් සිඳින්නෙකි.

350. විතක්කූපසමෙ ච යො රතො
අසුභං භාවයති සදා සතො
එස ඛො ව්‍යන්තිකාහිති
එස ඡෙච්ඡති මාර බන්ධනං (24:17)

සැක සංසිඳුවනුව සිත යොමු කරන දන
වැඩුමෙහි අසුබ සිහි ඇතිවම නිති රඳන
මෙතෙමේ වේය නිසැකව තණ්හා නසන
මර බැඳුම ද සිඳලයි හේ තම නැණින.

තණ්හා නසන්නේ - මර බැඳුමෙන් මිදෙන්නේ

24 (7) ධනුර්ධරයෙක් (349-350)

අතීතයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍යය කරන සමයෙහි **එක්තරා තරුණයෙක්** තක්සලාවෙහි දිසාපාමොක් ඇදුරන් වෙත ගොස් ශිල්ප උගත්තේ ය. හෙතෙම විශේෂයෙන් ධනු ශිල්පය පිළිබඳව අතිදක්ෂ තත්වයට පත් වූයේ ය. දිසාපාමොක් ආචාරීන්ගේ දක්ෂතම ශිෂ්‍යයා මොහු වූ බැවින් ඉගෙනීමෙන් පසු මොහුට ආචාරීන් ගේ දියණිය පාවා දෙනු ලැබුවා ය. අධ්‍යාපන කටයුතු නිමා කළ මෙම තරුණයා සිය බිරිය ද සමග ආපසු බරණැස් නුවරට ඒමට පිටත් වූයේ ය. අතර මගදී වනගහණයක් පසු කර ඒමේ දී වනයෙහි සිටි සොරුනට මේ දෙදෙනා මුණ ගැසිණ. සොරුන් මේ දෙදෙනා කොල්ල කෑමට සූදානම් වීමේ දී ධනුර්ධර කුමරු තම අතේ තිබූ හී වලින් සොර දෙටුවා හැර අතර සියලු සොරුන් විනාශ කළේ ය. හී සියල්ල අවසන් වූ බැවින් අනතුරුව ඔහු කල්පනා කළේ තම බිරිය අතෙහි වූ කඩුවෙන් සොර දෙටුවා විනාශ කිරීමට ය. එහෙත් සිදු වූයේ නොසිතූවිරූ දෙයකි. සොර දෙටුවා සමග සටනේ දී ධනුර්ධර තම අසිපත තමාට දෙන්නැයි ඉල්ලා සිටි විට ඇය කළේ කඩුව සොර දෙටුවා අතට දීමය. සොර දෙටුවා දුටු කෙණෙහි ඇය තුළ ඔහු කෙරෙහි පිළිබඳ සිතක් ඇති වීම ඊට හේතුවයි. හිමියා සටනින් මිය ගිය විට සොර දෙටු සමග ජීවත් විය හැකියයි සිතූ ඕ කඩුව සොර දෙටු අත තැබිය. කඩුව අතට ගත් හෙතෙම ධනුර්ධරට පහර දී ඔහු මරා දැමිය. පසුව සොර දෙටු ධනුර්ධරගේ බිරිය ද කැටුව ඔහු වෙසෙන දෙසට ගියේ ය. යන අතර මග හෙතෙම මෙසේ සිතූ වේය.

"මේ කාන්තාව මා දැක හිමියා මරා ගන්නා අදහස් ඇති කරගත්තාය. මෙසේම මෝ වෙනත් මිනිසකු දුටු විට මා මරා ගැනීමට ද අදහස් පහළ කරගනු ඇත. මෙබඳු ගැහැනියකගෙන් මට ඇති ප්‍රයෝජනය කවරේ ද?" මෙසේ සිතූ හෙතෙම අතර මගදී සමුවූ ගඟක් අසබඩදී ගැහැණියගේ අබරණ ආදිය පැහැර ගෙන ඇය තනි කොට දමා පළා ගියේය. සොර දෙටුවා ගඟින් එතරව යන විට තමා ද රැගෙන යන්නැයි ඇය හඬමින් කීවාය. එහෙත් සොර දෙටුවා ගඟින් එතෙරව සිට මෙසේ කීවේ ය. "ගැහැණිය, ඔබ කලක් ඇසුරු කළ සැමියා එක් දිනක දුටු මිනිසකු වෙනුවෙන් මරා දැමීය. ඔබ මටද කරන්නේ මේ ටිකය." මෙසේ කියමින් හෙතෙම නොපෙනී යන්නට ගියේ ය. මේ සිද්ධිය දිවැසින් දුටු සක්දෙව් රජ තෙමේ ගැහැණිය ලජ්ජාවට පත් කරවන අදහසින් ඔහු ගේ රථාචාර්‍යයා සහ ගන්ධර්වයා ද සමග ගැහැණිය සිටි ගං තෙරට පැමිණියේ ය. ඔවුන් එහි පැමිණියේ වෙස් මාරු කරගෙනය. ශක්‍රයා සිවලකු සේ ද රථාචාර්‍යයා මාලුවකු සේ ද ගාන්ධර්වයා කුරුල්ලකු සේ ද වෙස්වලා ගත්හ. සිවලා කටින් මස් කැබැල්ලක් ගෙන ගැහැණිය සමීපයෙහි සිටියේ ය. මාළුවා ජලයෙන් උඩට මතු විය. සිවලා කටේ තිබූ මස් කැබැල්ල අතහැර කට දල්වා මාළුවා අල්ලා ගැනීමට ඉදිරියට පැන්නේ ය. කුරුල්ලා බිම වැටුණු මස් කැබැල්ල ඩැහැගෙන අහසට පියාසර කළේ ය. සිවලා මාළුවා අල්ලා ගැනීමේ අදහසින් කටේ තිබුණු මස් වැදැල්ල අතහැර දැමීමෙන් මස් කැබැල්ලත් මාලුවාත් සිවලාට නැති වනු බලා ගැහැණිය මහ හඬින් සිනහ සුනාය. එය අසා සිවලා මෙසේ කීය."මේ ගංතෙර වන ලැහැබෙහි සිනාසෙන්නී කවරක් ද? මෙහි නැටුමක් ගැයුමක් හෝ විහිළුවක් නැත. ඇඬිය යුතු අවස්ථාවක කුමක් හෙයින් සිනා සෙන්නී ද?" ගැහැනිය මෙසේ කීවාය. "එම්බල මෝඩ කැණහිලා, නුඹ හරිම මෝඩ අනුවණ සිවලෙකි. නුඹ මස් කැබැල්ලත් මාලුවාත් යන දෙකම නැති කරගෙන දැන් පශ්චාත්තාප වන්නෙහි. " සිවලා මෙසේ කීවේය. "අනුන්ගේ වරද දැකීමට පහසුය. නමුත් තමුන්ගේ වරද දැකීම අපහසුය. ඔබ සැමියාත් පෙම්වතාත් දෙදෙනාම නැති කර ගත්තෙහිය. ඔබ ද පසුතැවිලි වනවාට සැකයක් නැත." ගැහැනිය මෙසේ කීවාය."එසේ වැරදී ගිය ද වෙනෙකක් හරියනු ඇත. පෙම් කළ සොරා නොලැබී ගියත් වෙන සුදුසු සැමියකු මට ලැබෙනු ඇත. "පිළිතුරු වශයෙන් සිවලා මෙසේ කීය. "මැටි වළඳක් සොරා ගෙන සොරකම වසං කරන්නට රන්තලියක් සොරා ගෙන එය ද වසං කළ හැකිය. ඔබ එක් වරදක් කළෙහිය. අන් වැරදි කිරීමට ද බියක් සැකක් ඔබට ඇති නොවනු ඇත. " බුදුරජාණන් වහන්සේ මෙම චුල්ල ධනුර්ධර ජාතකය විවරණය කොට, ඒ හෙරණුන් අමතා මෙසේ ප්‍රකාශ කළ සේක.

"හෙරණ, අතීතයෙහි චුල්ල ධනුර්ධරව ඒ ගැහැනිය නිසා මැරුම්කෑවේ ඔබයි. ඒ සොරා විසින් අතහැර දැමූ ගැහැණිය නම් දැන් මේ කාන්තාවය. එදා ගැහැණියට ලජ්ජා පමුණුවා පාපයෙහි බිය දක්වන අදහසින් එහි පැමිණි ශක්‍රයා නම් දැන් බුදුව සිටින මේ මම වෙමි'' මෙසේ පැවසූ බුදුරජාණන් වහන්සේ "ගැහැනියක නිසා ඔබ අතීතයෙහි ද විපතට පැමිණියෙහි. දැන් මේ සසුනෙහි පැවිදිව මේ කාන්තාව නිසා ශ්‍රේෂ්ඨ පැවිදි ජිවිතය නැති කර ගැනීමට තැත් කරන්නේය. අප්‍රමාදව සසුනෙහි කැමැත්ත යොදවා තම ජීවිතය සරු කර ගැනීමට උනන්දු වේව" යි ධම් දේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (350 ගාථාව)

යො විතක්කූපසමෙ රතො ච, සදා සතො අසුභං භාවයති. එසො ඛො ව්‍යන්තිකාහිති එසො මාරබන්ධනං ඡෙච්ඡති.

යො: යම් මහණෙක්; **විතක්කූපසමෙ රතො**: කාමාදී විතර්ක සංසිඳවීමෙහි (ප්‍රථම ධ්‍යානයෙහි) ඇලුණේ වේද; **සදා සතො**: නිරතුරු සිහි ඇතියේ; **අසුභං භාවයති**: අශුභ ධ්‍යානය වඩා ද; **එස ඛො**: මේ මහණ; ව්‍යන්තිකාහිති: (තෘෂ්ණාව) දුරු කරන්නේය; **එසො**: මේ මහණ තෙමේ; **මාරබන්ධනං**: මාරබන්ධනය; **ඡෙච්ඡති**; (කම්-ක්ලේශ-විපාක යන ත්‍රෛභූමික වෘත්තය'යි කියන) මාර බන්ධනය අර්හත් මාර්ගඥානයෙන් සිඳ හරින්නේය.

යමෙක් කාමුක සිතිවිලි සංසිඳවාලීම සඳහා අශුභ භාවනාව වඩයි නම් ඔහු තෘෂ්ණාව නසා මර බැඳුම සිඳලයි.



කටයුතු නිම වූ තණ්හාව දුරු කළ තැනැත්තා බව උපත සින්දේ ය. මේ ඔහු ගේ අන්තිම ශරීරය යි.

351. නිට්ඨඞ්ගතො අසන්තාසි
වීතතණ්හො අනඞ්ගණො
අච්ඡින්දි භවසල්ලානි
අන්තිමොයං සමුස්සයො (24:18)

ජීවිතයෙහි කෙළවරට නිපන්නේ
නැති නොම ගෙන ආසා ද නසන්නේ
රාගාදී බව හුල් ද බිඳින්නේ
අන්තිම භව යයි එය උතුමන්නේ

භවය උපත සිඳි තැනැත්තාට තැති ගැණීමාදිය නොඑයිත

24 (8) වසවර්ත්ති මාරයා (ගාථා අංක 351-352)

බුදුරජාණන්වහන්සේ වැඩ සිටියදී සැවැත් නුවර දෙවුරම් වෙහෙරට වහන්දෑ නිතර වැඩමවති. බුදුරදුන් දැකීම් - වැඳීම් සඳහා වඩින ඒ වහන්දෑ අතුරෙන් ඇතැම් කෙනෙක් දහම් අසති, පැන විසඳති, බොහෝ දෙන රහත් ඵල ලබති, අනගැමි - සෙදගැමි - සෝවාන් ඵලයන්හි පිහිටති. දවසෙක බොහෝ රෑ වීමෙන් පසු ආගන්තුක වහන්දෑලා කිහිප නමක් පැමිණියහ. කාලවේලා ඉක්මවා වැඩි ඒ වහන්දෑ මෙසේ සිතුහ.

මේ මහ රෑ ඔවුනොවුන් අවදි කරවන එක සුදුසු නැත. මේ ලැගුම් ගෙයි සැතපෙන්නේ රාහුල හාමුදුරුවෝය. උන් වහන්සේ නින්දෙන් අවදි කරවමුය'යි කතා කොට අවදි කරවූහ.රාහුල තෙරුන්වහන්සේ වහා නැගිට ඒ ආගන්තුක වහන්දෑට උවටැන් කොට සිය ලැගුම් ගෙස ආසන පණාවාදී සැතපීමට සලසා වැඩියහ.

වහන්දෑ ද ඒ ඒ අසුන්වල සැතපුණාහ.

රාහුල තෙරණුවෝ බුදුරදුන්ගේ වැසිකිළි ආලින්දයේ සැතපුණාහ.

වසවත් මාරයා රාහුල මහතෙරුන් වැසිකිළි ආලින්දයේ නිදන සැටි දැක මෙසේ සිතයි 'අහෝ සුද්ධෝදන මහරජතුමාගේ මුනුබුරුවද, බුදුපුත්වූද රාහුල මහතෙරුන් වහන්සේ වැසිකිළි ආලින්දයේ මේ මහරෑ තනියම නිදති. මුන්වහන්සේ තැති ගන්වමි, බිය ගන්වමි' යි සිතා මහත් වූ ඇත් වෙසක් මවාගෙන අවුත් පසෙක සිට සොඬ නගා සිවුදෙස දෙදරා මහත් හඬින් ඝෝෂා කළේය.

බුදුරදුන්වහන්සේ ගඳකිළියේ සැතපෙනසේක් හෙණ හඬක් බඳු වූ ඒ හඬ අසා 'මාරයා බව දැන 'මාරය, ඔබ වැනි සිය දහස් දෙනෙකු අවුත් ඝෝෂා කළත් රාහුල තෙරුන් වැන්නන් තැතිගන්වන්න, බිය ගන්වන්න සමත් නොවෙතැයි පවසා, මෙහි දැක්වූ දෙගය වදාරා මාරයා පලවා හැරියේය.

විස්තරාත්මක අනුවාදය (351 ගාථාව)

(යො) නිට්ඨඞ්ගතො අසන්තාසි. වීතතණ්හො අනඞ්ගණො භවසල්ලානි අච්ඡන්දි (අන්තිමොයං - අන්තිමො + අයං) අයං (තස්ස) අන්තිමො සමුස්සයො.

නිට්ඨඞ්ගතො: (යම් මහණෙක්) අර්හත්වය යි කියන නිෂ්ඨාවට පැමිණයේ වේද; **අසන්තාසි**: සන්ත්‍රාස හෙවත් බිය නැත්තේ වේද; **වීතතණ්හො**: පහ කළා වූ කාම තෘෂ්ණා ඇත්තේ වේද; (එහෙයින් ම) **අනඞ්ගනො**: රාගාදි අඞ්ගන රහිත වේද?; **භවසල්ලානි**: භවගාමී වූ රාගාදි කෙලෙස් හුල්; **අච්ඡින්දි**: (අර්හත් මාර්‍ග ඥානයෙන් කපා හරින ලද්දේ ද?; **අයං**: වර්තමානයේ දරන්නාවූ මේ ශරීරය; **අන්තිමො සමුස්සයො** : ඔහුගේ අන්තිම ආත්ම භාවයයි.

යමෙක් කටයුතු නිම කෙළේ ද? තැති නොගත්තේ ද? පහවූ තෘෂ්ණාව ඇත්තේ ද? කෙලෙස් නැත්තේ ද? ඔහු උපතට හේතු වූ කෙලෙස් මුල් සිඳ්දෝය. මෙය අන්තිම ආත්මභාවයයි.

විවරණය

නිට්ඨාඞ්ගතො: නිමාවට පැමිණීමය. සිය ජීවිතයෙන් කළයුතු දේ බිඳක්වත් ඉතිරි නොකොට අවසන් කිරීමය.

නිට්ඨාඞ්ගත: යනුවෙන් දැක්වෙන්නේ කටයුතු නිමාවට පත් රහතුන් වහන්සේය.

අසන්තාසි: තැති නොගැන්මය. ජීවිත ආශා නැති හෙයින් සී - වග - ඇත් ඈ සතුන් නිසා බිය හා තැති ගැනුම් නැති බවය.

වීතතණ්හො: පහවූ තණ්හා ඇති බවය. භවය පිළිබඳ අශා දුරුවීමිය.

භව සල්ලානි: භවයේ උපතට හේතු වූ උල්ය. සසර ඒ ඒ බවයන්හි ඉපැද්ම ඇති කරන කෙලෙස් නමැති උල්ය.
අච්ජින්දි: සිඳලීමය. ඉතිරි නොකොට මුල් සහිත ව උදුරා දැමීමය.

අන්තිමෝ සමුස්සයො: අන්තිම ශරීරය. මේ පවත්නේ අන්තිම සිරුරය. මින් මතු උපතක් නැති හෙයින් තවත් සිරුරක් (අත් බැවක්) ඇති නොවන්නේය.



තණ්හාව පහකළ සිවු පිළිසිඹියාවන්හි නිපුණවූ සිරුරැති තැනැත්තාම මහ නුවණාත්තාය.

352. වීත තණ්හො අනාදානො
නිරුත්ති පදකොවිදො
අක්ඛරානං සන්නිපාතං
ජඤ්ඤා පුබ්බපරානි ච
ස'වෙ අන්තිමසාරීරො
මහාපඤ්ඤො මහ පුරිසොති වුච්චති (24:19)

තණ්හා සිඳහළ ගැණුම් නො වන්නේ
සිව් පිළිසිඹියා කෝවිද වන්නේ
පෙරපර'කුරු දැන කෙළවර ඉන්නේ
එතුමා මහනුවණැති'යි කියන්නේ

කෙලෙස් නසා සිව් පිළිසිඹියා ලැබුවහු මහා ප්‍රාඥායාය

24 (8) වසවර්ත්ති මාරයා (ගාථා අංක 351-352)

විස්තරාත්මක අනුවාදය (352 ගාථාව)

(යො) වීතතණ්හො. අනාදානො, නිරුත්තිපදකොවිදො,
අක්ඛරානං සන්නිපාතං පුබ්බාපරානි ච ජඤ්ඤා.
අන්තිමසාරීරො සො වෙ මහාපඤ්ඤො ඉති වුච්චති.

වීතතණ්හො: අර්හත්මාර්ග ඥානයෙන් පහ කරන ලද භව තෘෂ්ණා ඇත්තේ ද; **අනාදානො**: ස්කන්ධාදියෙහි ආත්ම වශයෙන් ග්‍රහණයෙන් නැත්තේ ද; **නිරුත්තිපදකොවිදො**: නිරුක්ති පදයන්හි හෙවත් අත්ථ, ධම්ම නිරුත්ති පටිභාන යන සිවුපිළිසිඹියාවෙහි දක්‍ෂ ද; **අක්ඛරානං සන්නිපාතං**: අක්‍ෂර සමුදාය ද; **පුබ්බාපරානි ච**: පූර්වාක්‍ෂරයන්ද අපරාක්‍ෂරයන් ද; **ජඤ්ඤා**: දන්නේ වේද; **අන්තිමසාරීරො**: අන්තිම ශරීරයෙහි පිහිටියා වූ; **සවෙ**: (සෝ වේ) ඒ මහණ තෙමේ ඒකාන්තයෙන් ; **මහා පඤ්ඤො**: මහත් ප්‍රඥා ඇත්තේ යයි ද; **මහා පුරිසොති**: මහා පුරුෂ යැයි ද; **වුච්චති**: කියනු ලැබේ.

පහ කළ ආශා ඇති 'මාගේය' ආදී වශයෙන් ගැනීමක් නැති භාෂා විශාරද ශබ්ද ශාස්ත්‍රය හා පෙර අපර අකුරු දැනුම් ඇති අන්තිම ශරීරධාරී ඒ උතුමා ඒකාන්තයෙන් මහා ප්‍රඥාවන්තයෙකි.

විවරණය

නිරුත්තිපදකෝවිදො: භාෂාවන් විෂයෙහි හා සෙසු පදයන් විෂයෙහි වෙසෙසින් නිපුණ බවය.

අත්‍ථ - ධම්ම - නිරුත්ති - පටිභානයන අටිසම්භිදා සතරෙහි දක්‍ෂ වුයේ නිරුත්ති පද කෝවිද නම්.

එහි අත්‍ථෙ ඤාණං: අත්‍ථපටිසම්භිදායි වදාළ බැවින් අත්‍ථයන්ගේ ප්‍රභේදය සලකා ගැන්මෙහි අරුත් මතු කර ගැන්මෙහි සමත්‍ථ නුවණ අත්‍ථපටිසම්භිදා නම් වේ. අත්‍ථ ප්‍රභේදයාගේ හෙවත් ඵල විශේෂයාගේ සැළකීම, ප්‍රකට කිරීම නියම කිරීම යන මෙහි සමර්ථ වූ අත්‍ථයෙහි හෙවත් ඵලයෙහි ප්‍රභේද විසින් පැවති නුවණ අත්‍ථපටිසම්භිදා යනු එහි අරුතයි. ධම්මේ ඤාණං ධම්මපටිසම්භිදායි වදාළ බැවින් ධර්මයන්ගේ ප්‍රභේද සලකා ගැන්මෙහි, ධර්මය මේයයි. මතුකර ගැන්මෙහි සමර්ථ වූ නුවණ ධම්මපටිසම්භිදා නම් වේ. හේතු ප්‍රබෝධයාගේ හෙවත් හේ විශේෂයාගේ සැලකීම, ප්‍රකට කිරීම නියම කිරීම මෙහි සමර්ථ වූ හේතුයෙහි ප්‍රභේද විසින් පැවති නුවණ ධම්මපටිසම්භිදා යනු එහි අරුතයි.

නිරුත්තාභිලාපෙ පභේදගතං ඤාණං නිරුත්තිපටිසම්භිදා,යි අත්‍ථපටිසම්භිදායෙහි කියූ පස්වැදෑරුම් අර්ථයෙහි හා ධම්මපටිසම්භිදායෙහි කියූ පස්වැදෑරුම් ධර්මයෙහි හා තතු දැනුමෙහි එක්වන් උපකාරකව සිට ශබ්දව්‍යාවහාරයෙහි ප්‍රභේදගතවූ නුවණ නිරුත්ති පටිසම්භිදාය.

ස්වභාව නිරුක්ති ප්‍රභේදයාගේ හෙවත් ස්වභාව නිරුක්ති විශේෂයාගේ සැලකීම, ප්‍රකට කිරීම නියම කිරීම යන මෙහි සමර්ථ වූ ස්වභාව ප්‍රඥාප්තීන්ගේ අභිලාෂය උසුරුවීමෙහි යෙදෙන ශබ්ද ප්‍රභේදයයෙහි පැවති නුවණ නිරුත්ති සටිසම්භිදා නම්.

ඤාණේසු ඤාණං පටිභානපටිසම්භිදා අත්‍ථධර්මාදී වු අටිසම්භිදා ඥානයන්හි උපන් ප්‍රත්‍යුත්පන්න බුද්ධියයි. අර්ථ ධර්ම නිරුක්ති යන තෙවැදෑරුම් වු පටිසම්භිදා ඥානයන්ගේ ප්‍රභේදය සැළකීම ප්‍රකට කිරීම නියම කිරීම යන මෙහි සමර්ථවූ පටිභාන පටිසම්භිදායෙහි ප්‍රභේද විසින් පැවති නුවණ පටිභාන පටිසම්භිදාය යනු අරුත් වේ.

"පද" යනුවෙන් (සිවුපිළිසිඹියාවේ) සෙසු පද තුන දැක්වේ.

"අත්ථ පටිසම්භිදා, අත්ථ-ධම්ම-නිරුක්ති-පටිභාන යන සතරම ගැනේ. අරුත් දන්නා නුවණය.

ධම්මපටිසම්භිදා: පෙළ දන්නා නුවණය.

නිරුත්තිපටිසම්භිදා: භාෂාවන් දන්නා නුවණය.

පටිභානපටිසම්භිදා: 'අත්‍ථ-ධමම- නිරුතති' යන තුන වෙන් වෙන් වශයෙන් දන්නා වෙසෙස් නුවණය.

අක්ඛරානං සන්නිපාතං: අකුරු සමූහය. පද සතර පිළිබඳ වු අකුරු රැසය.

පුබ්බාපරානි: පෙර - පර අකුරුය. මුල අකුරු - මැද අකුරු - අග අකුරු දැනීමය. යම් පදයක මුල අකුරු පෙනේ නම් මේ මුල අකුරට මෙනම් අකුරු මුල මැද අකුරු හා අග අකුරු විය යුතු යයි ද අග අකුරු පෙනේ නම් මේ අග අකුරට මෙනම් අකුරු මැද අකුරු හා විය යුතු යයි ද දැනීමය.

කටයුතු නිම වූ අන්තිම ශරීර ඇත්තා හා සිවුපිළිසිඹියාවන්හි නිපුණ වු මහ තැනැත්තා දක්වා මේ දෙගය වදාළ සේක.

සියල්ල මැඩලු සියල්ල දත්, සියලු දැයෙහි නොඇලුණු, සියල්ල දුරැලු, මම කවරෙකු ඇදුරුයයි කියම් ද?

353. සබ්බාභිභූ සබ්බ විදූ' හමස්මි
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං (24:20)

සියල්ල මැඩ හැර දැනගෙන ඉන්නේ
සියලු දහම්හිම නොඇලී ඉන්නේ
සියලු දෙයම හැර ලොබ ද නසන්නේ
ලදුයෙම් මම දැන ගුරු කොහි වන්නේ

බුදුරජාණන්වහන්සේට ඇදුරු කෙනෙක් නැත

24 (9) උපක ආජීවකයා (ගාථා අංක 353)

උරුවෙල් දනව්හි නේරංජනා ගඟතෙර පෙදෙස වූ ජය සිරිමහ බෝරුක් මුල හිඳ වෙසක් පුණු පොහෝදා සව්කෙලෙස් මුල් සිඳදමා සිදුහත් මහ බෝසතාණෝ සම්මා සම්බුදු බවට පැමිණාසේක.

එකල සහම්පතී නම් මහාබඹු විසින් දහම් දෙසීමට කරන ලද ආරාධනාව කුළුණින් පිළිගෙන තමන් වහන්සේට කලක් සහායව සිටියා වූ කොණ්ඩඤ්ඤ - භද්දිය - වප්ප - මහානාම - අස්සජි යන පස්වග තවුසන් බරණැස් නුවර ඉසිපතනයෙහි සිටිනු දැක ඔවුන්ට ධම්මචක්කපවත්තන සූත්‍රය දෙසීමට එහි වැඩිසේක.

උරුවෙල් දනව්වට හා බරණැස් නුවරටත් අතරමඟදී තෙදින් හා නැණින් වැඩුනු උපක නම් ආජීවකයා එසේ වඩිනා බුදුරදුන් දැක මෙසේ සිතුවේය.

"අහෝ! මේ කෙබඳු කෙනෙක් ද? මුහුණ යහපත්ය. ඇඟ පැහැය යහපත්ය. ඉඳුරන්ගේ පැවැත්ම ඉතා මනාය. මෙබඳු පුරිස් කෙනෙක් පෙර නොදුටිමි"යි සිතමින්ම බුදුරදුන් ළඟට ගොස් පසෙක සිට "පින්වත, ඔබ කවුද? කවරෙක් උදෙසා මහණ වූයෙහිද? ඔබගේ ඇදුරු-උවදෑවරු කවරහුද" යනුවෙන් ඇසීය. එවිට බුදුරජාණන්වහන්සේ "මම කිසිවෙක් උදෙසා මහණ නොවූයෙමි. මට ඇදුරු-උවදෑවරු කෙනෙක් නැත. මම කිසිවකුගේ දහමක් අනුගමනය නොකරමිය"යි ප්‍රකාශ කළ සේක.

ඒ නිමිති කොට තමන් වහන්සේ කිසිවකුගේ උපදෙසක් නොමැතිව සියල්ල අවබෝධ කරගත් බව දැක්වීම සඳහා මේ ගාථාව වදාළ සේක.

මෙසේ වදාළ කල්හි උපකාජීවකයෝ සතුටක් හෝ නොසතුටක් නොදක්වා හිස සලා ඉවත්ව ගියහ. නැවත පසු කලෙක ඔහු බුදුරදුන් කරා පැමිණ බණ අසා අනාගාමීව, මිය ගොස් 'අවිහ' නම් බඹලොව ඉපිද රහත් ඵලයට පත්වූහ.

විස්තරාත්මක අනුවාදය (353 ගාථාව)

(සබ්බවිදූහසමස්මි - සබ්බවිදූ + අහං + අස්මි) අහං සබ්බ + අභිගූ අස්මි. සබ්බවිදූ අස්මි. සබ්බෙසු ධම්මෙසු. අනුපලිත්තො. සබ්බං ජහො තණ්හාඛයෙ විමුත්තො. සයං අභිඤ්ඤාය (කමුද්දිසෙය්‍යං - කං + උද්දිසෙය්‍යං) කං උද්දිසෙය්‍යං

අහං: මම; **සබ්බවිදූ අස්මි**: සියලු කාම, රූප අරූප ත්‍රෛභූමික ධර්මයන් අභිභවනය කළෙමි; **සබ්බවිදූ අස්මි**: (කාමාවචර රූපාවචර අරූපාවචර, ලෝකෝත්තර යන චාතුර්භූමක ධර්මයන් සර්වාකාරයෙන් අවබෝධ කළෙමි; **සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තෝ**: සියලු ත්‍රෛභූමක ධර්මයන්හි නොඇලුණෙමි; **තණ්හක්ඛයේ විමුත්තෝ**: අර්හත්පල විමුක්තියෙන් මිදුණෙමි වෙමි; **සයං අභිඤ්ඤාය**: දත් යුතු තාක් සියල්ල මා විසින් ම නුවණින් දැන; **කං උද්දිසෙය්‍යං**: කවරෙක් මාගේ ආචාර්යයන් කොට දක්වම් ද?;

මම තුන් භවයට අයත් සියලු දේ මැඩ පැවැත්වීමි. සියල්ල දන්නේ වෙමි. සියලු දැයෙහි ඇලීම් හැරියෙමි. සියල්ල අත්හැරියෙමි. තෘෂ්ණාවෙන් මිදුණෙමි. මෙසේ සියළු ධර්‍මයන් මා විසින්ම අවබෝධ කරගත් හෙයින් මට කවර ඇදුරෙක්ද?

විවරණය

සබ්බාභිභූ: සියල්ල මැඩ පැවැත්වීමය. තුන් භවයට අයත් සියලු දෑය.

සබ්බවිදූ: සියල්ල දැනීමය. සිව්බිම පිළිබඳ සියලු දේ අවබෝධ කිරීමය.

අනූපලිත්තෝ: නො ඇලීමය. තුන් භවයට අයත් වූ කිසි දැයක ඇලීමක් නැති බවය.

සබ්බං ජහෝ: සියල්ල දුරු කළ බවය. තුන් භවයේම උපත දුරු කළ බවය.

සයං අභිඤ්ඤාය: තෙමේම සියල්ල දැන ගෙනය. සියලු අයුරින් ඉතිරි නොකොට පසක් කොට තමා විසින්ම සියල්ල අවබෝධ කළ බවය.



ධර්මදානයද, ධර්මරසයද උතුම්ය. සියලු දුක් නැති කරන හෙයින් රහත් පලය ද උතුම්ය.

354. සබ්බදානං ධම්මදානං ජිනාති
සබ්බං රසං ධම්ම රසො ජිනාති
සබ්බං රතිං ධම්මරතී ජිනාති
තණ්හක්ඛයො සබ්බ දුක්ඛං ජිනාති (24:21)

සියලු දනින් දම් දනයි දිනන්නේ
සියලු රසින් දම් රසයි දිනන්නේ
සියලු රතින් දම් රතියි දිනන්නේ
රහත් බවයි සැම දුකම දිනන්නේ

ධර්මදානය, ධර්මරසය, ධර්මරතිය හා රහත් බව ලොව ශ්‍රේෂ්ඨය

24 (10) ශක්‍ර දිව්‍යරාජයා (ගාථා අංක 354)

බුදුරජාණන් වහන්සේ දැකීමට එකල සැවත් නුවර දෙව්රම් වෙහෙරට දෙව්ලොව වැසි දෙවියෝ නොයෙක්විට මැදියම් රැයෙහි පැමිණෙති. ඇතැම් දේවතා කෙනෙක් යම් යම් කරුණු පිළිබඳව හට ගැණුනු සිය සතුට පැවසීම සඳහා ද, ඔවුනොවුන් අතර දේවසමාගම්වල දී පැන නැඟුණු ප්‍රශ්න අසා විසඳා දැන ගැනීම සඳහා ද පැමිණෙති.

තව්තිසා දෙව්ලොව වැසි දේවතාවන්ගේ රැස්වීමකදී හටගැණුනු මේ සිවු පැන නො විසඳී පැවතුනි.

'දාන අතුරෙන් කවර දනක් උතුම් ද?
රස අතුරෙන් කවර රසයක් උතුම්ද?
ඇලීම් අතුරෙන් කවර ඇල්මක් උතුම් ද?
රහත් පලය කුමක් නිසා උතුම් ද?

අනික් දෙව්ලොව දෙවියන් අතර ද මේ ප්‍රශ්න පැතිරිණ. ඒ ඒ දේවතාවෝ නොයෙක් අදහස් පැවසූහ. දොළොස් අවුරුද්දක් පමණ ගතවීත් මේ සිවු පැන විසඳීමට සමත් දේවතා කෙණෙක් නොවූහ.

ධතරට්ඨ-විරූඪ-විරූපක්ඛ-වෙස්සවණ යන සිවුවරම් දෙව් රදුන් වෙත් ද, පමුණුවා මේ ප්‍රශ්න විසඳා ගැනීමට නොහැකි විය. ඒ සිවුවරම් දෙවුරදහු දේවතා පිරිස් සමඟ සක් දෙව්ඳුන් වෙත ගොස් සිවු පැන විමසූහ. සක් දෙව්ඳු 'මෙ බඳු පැන විසඳුමට අපි නුසුදුසු වෙමු. බුදුරදුන්වහන්සේම සුදුසුමය. බුදු නැණම පමණය'යි පවසා සිවුවරම් දෙව්රදුන් ඇතුළු දේවතාවන් පිරිවරා මැදියම් රැයෙහි දෙවුරම් වෙහෙරට පැමිණ හාත්පස බබුළුවා බුදුරදුන් නැමඳ පසෙක සිටියේය. එවිට, බුදුරදුන්වහන්සේ, සක්දෙව්ඳුනි" බොහෝ දෙවියන් පිරිවරා කුමක් නිසා අවුදැයි අසා වදාළ සේක.

සක්දෙව් - 'බුදුරදුන් වහන්ස! අප දෙවියන් අතර හට ගැණුන සතර පැනයක් දොළොස් අවුරුද්දක් ගතවීත් නොවිසඳුණු බැවින් ඒ විසඳා ගැනීම සඳහා පැමිණියෙමු' යි ඒ සිවුපැන පැවසූයේය.

ඒ ඇසු බුදුරදුහු මේ ගාථාව වදාළ සේක. ඒ වේලෙහි සක්දෙව්ඳු 'මේ උතුම් ධර්මදානයෙහි පින් අපට දෙන සේ සලසා වදාළ මැනවැ'යි අයැදියේය. බුදුරද බික්සඟුන් අමතා 'කුදු-මහත් සියලු දම්දෙසුම්හි පින් අනුමෝදන් කරවන්නැ'යි වදාළ සේක.

විස්තරාත්මක අනුවාදය (354 ගාථාව)

ධම්මදානං සබ්බදානං ජිනාති, ධම්මරසො සබ්බං
ධම්මදානං සබ්බදානං ජිනාති, ධම්මරසො සබ්බං රසං
ජිනාති ධම්මරති සබ්බං රතිං ජිනාති. තණ්හක්ඛයො
සබ්බ දුක්ඛං ජිනාති.

ධම්මදානං: ලාභාදියෙහි අපේක්ෂා රහිතවම නිරාමිසාධ්‍යාශයෙන් දහම් දෙසන්නවුනට ඇතිවන කුසල චේතනාව; **සබ්බදානං ජිනාති**: සියලු ආමිස දානයන් දිනන්නේය; **ධම්මරසො**: සත්තිස් බෝධිපාක්ෂික ධර්ම හා නව ලොවුතුරු ද්හම් යන ධර්ම රසය; **සබ්බරසං ජිනාති**: ලෝකයෙහි ඇති තාක් සියලු රසයන් දිනන්නෝය; **ධම්මරති**: නිස්සරණාධ්‍යාශයෙන්ම ධර්මය දෙසන්නහුට හා අසන්නවුනට ඇතිවන ප්‍රීතිය නම් වූ ධර්ම රතිය; **සබ්බරතිං ජිනාති**: පංචකාමයන් කෙරෙහි (ඒවා ලැබීමෙන් ඇතිවන්නා වූ ප්‍රීතිය හෙවත්) රතිය දිනන්නේය; **තණ්හක්ඛයො**: තෘෂ්ණාක්ෂය යි කියන ලද නිවන; **සබ්බදුක්ඛං ජිනාති**: සියලු සසර දුක් දිනන්නේය;

ධර්ම දානය සෙසු දීම් පරදවයි. ධර්ම රසය අනික් රස පරදවයි. ධර්මයෙහි ඇලීම සෙසු ඇලීම් පරදවයි. තෘෂ්ණාව නැසීම සියලු දුක් පරදවයි.

විවරණය

ධම්ම දානං: ධර්ම දානය, සතර පද ගාථාවකිනුදු අනුනට හිතවැඩ සඳහා ද, සග-මොක් සුව සලසාලීම සඳහා ද, දහම් දෙසීම් දෙසවීම් ලිවීම්, ලීයවීම්, හා දහම් පොත් පූජා කිරීම්ය.

සබ්බ දානං: සියලු ආමිස දන්ය. සිවුරු පිරිකර, ආහාරපාන, ගේදොර, කෙත්වත් ආදී දන්ය.

ධම්ම රසෝ: ධර්ම රසය. දහම් දැනීමෙන් හා සිවුපස් දහම් අවබෝධ කිරීමෙන් හට ගැනෙන රසය.

සබ්බං රසං: සියලු රසය. මිනිසුන් අතර පවත්නා සියලු රස හා දෙවියන් අතර පවත්නා සියලු රසය.

ධර්ම රති: දහම් දෙසන, අසන, කියවන හැමවිට සිත පිනවීමෙන් ඇතිවන ඇල්මය.

සබ්බං රතිං: සියලු ඇලීම්ය. අඹුදරු-ධන-ඉසුරු ආදී දේ කෙරෙහි පවත්නා ඇල්මය.



අනුවණයා වස්තු තණ්හාව හේතුකොට අනුන් නසන්නාක් මෙන් තමන්ද නසන්නේය.

355. හනන්ති භොගා දුම්මෙධං
නො වෙ පාරගවෙසිනො
භොගතණ්හාය දුම්මෙධො
හන්ති අඤ්ඤෙ'ව අත්තනං (24:22)

අනුවණයා සම්පතින් නසින්නේ
නිවන් සොයන්නහු ඉන් නො නසින්නේ
දද දන දන රිසි අනුන් නසන්නේ
මෙන් ඒ ලෙසටම තමන් නසන්නේ

තණ්හාවෙන් අනුන් නසන්නා තමන් ද නසාගණියි

24 (11) අපුත්තක සිටු (ගාථා අංක 355)

සැවැත් නුවර **අපුත්තක** සිටාණන් තමන් සතුවූ මහත් වූ ධනයෙන් කිසි සැපයක් නොවිඳ මළේය. දරුවෙක් නැති බැවින් සත් දවසක් මුළුල්ලේ ඒ වස්තු ගෙනවිත් රජමාලිගයේ රැස් කොට තැබුයේය. රජතුමා එය අවසන් වූ දා දෙවුරම් වෙහෙරට ගොස් බුදුරදුන් වැඳ පිළිසඳරෙහි යෙදුණි.

"බුදුරජාණන් වහන්ස, බොහෝ ධනයක් හිමිව සිටි ඒ සිටුතුමා සැපයක් නො වින්දේය. කාඩි ඇඹුලක් සාදවා බීමද, නිවුඩු සාලේ නොපැහුනු කුඩු සහිත හාලේ බත් කෑමද, හණ වැහැරි පිළි තුන්කඩක් දෙතැනින් මස්වා හැඳීමද කළේය. ගොන්මාල්ලකු යෙදූ දිරාගිය රියකින් ගමන් කළේය. දිරුණු පත් කුඩයක් හිසට එසවූයේය"යි ද පැවසූ කල කොසොල් රජතුමාට අපුත්තක සිටාණන්ගේ පෙරකම් පවසා වදාළ සේක.

පෙර ආත්මයක ඔහු තද මසුරෙකි. බිරිඳ දීමට නොමැලිය. දවසෙක ඔවුන්ගේ නිවසට තගර සිඛී පසේ බුදුරදහු පිඬු පිණිස වැඩියාහ. සැමියා බිරිඳ අමතා අහර මොකුත් දෙන්ට කියා ගියේය. බිරිඳ පාත්‍රය පුරවා මිහිරි පිඬු පිළිගැන්වීය.

ඒ දුටු සැමියා බොහෝ දීම ගැන නොසතුටුව "මේ අහර කම්කරුවෙකුට දුනි නම් කටයුතු නොමැලිව කෙරෙති"යි සිතා කලකිරුණේය. එනිසා සිටාණන්ට මහත් වූ ධනය ලැබුණත් එයින් පල ලැබුමට සිත නොනැමුණ බව වදාළ සේක.

රජු එවිට "සම්පත් නොවිඳිමට හේතුව කුමක්ද?" බුදුරජාණන් වහන්සේගෙන් ඇසීය. බුදුරදුන්, "තගරසිඛී පසේබුදුන්ට පිදූ අහර කම්කරුවෙකුට දෙන ලද නම් ඔවුහු නොමැලිව වැඩ කෙරෙති"යි සිතී කලකිරීමයයි දක්වා, තගරසිඛී පසේ බුදුන්ට අහර දීමට නියම කළ බැවින් සත් වරෙකම දෙව්ලොව උපන් බවද, මේ සැවැත් නුවර සත් වරෙකම සිටුව උපන් බවද, දීම ගැන දොම්නස් වූ නිසා ඒ සත් වරදීම ලද්දා වූ සම්පත් විඳීමට සිත නොනැමන බවද වදාළ පසුව රජතුමා ඔහු දරුවන් නොලැබුමට හේතුව කුමක් දැයි යළිත් ඇසීය.

බුදුරජාණන්වහන්සේ පෙර කලෙක ඒ සිටාණන්ගේ දෙටු සොහොයුරා මළ කළ ඔහුගේ එකම ළදරු පුතා සතු මහත් ධනය තමා අයත් කරගැනීම සඳහා ඒ ළදරුවා මරා දැමීමේ පව හේතු කොට සිටුව උපන් සත්වරෙකම දරුවෙක් නොලද බව පවසා මේ ගාථාව වදාළසේක.

විස්තරාත්මක අනුවාදය (355 ගාථාව)

හොගා දුම්මෙධං හන්නති. පාරගවෙසිනො නො වෙ (හන්නති) දුම්මෙධො හොග තණ්හාය අඤ්ඤෙද ඉව අත්තානං හන්ති

හොගා: වස්ත්‍රාභරණාදී උපභෝග වස්තූහු ද දාසි දාස ගව මහිෂාදී පරිභෝග වස්තූහු ද; **දුම්මේධං හනන්ති**: අඥාන පුද්ගලයා නසන්නාහ; **නෝ වේ පාරගවේසිනො**: නිවන් නමැති පරතෙර සොයන්නා වූ නුවණැත්තන් නොනසන්නාහ; **දුම්මේධො**: අඥාන පුද්ගල තෙමේ; **භෝගතණ්හාය**: උපභෝග පරිභෝග වස්තුවෙහි උපන් තෘෂ්ණාව හේතුකොට ගෙන; **අත්තානං අඤ්ඤෙද් ඉව**: තමා අනුන් නසන්නාක් මෙන්; **හන්ති**: නසන්නේය, අපායට පමුණුවන්නේය.

සම්පත්තිහු මෝඩයා නසත්, නිවන් යන්නන් නොනසත්, මෝඩයා වස්තු ලෝභයෙන් තමන් මෙන්ම අනුන් ද නසයි.

විවරණය

භෝගා: සම්පත්ය උපභෝග - පරිභෝග සම්පත් වශයෙන් දැක්වෙන වස්තුය. උපභෝග නම්, මිනිසා විසින් කෑම්-බීම් වසයෙන් ගනු ලබන ආහාරය. ඇඳුම් - පැළඳුම් වශයෙන් ගනු ලබන රෙදිපිළි හා අබරණය. පරිභෝග නම්, ගේ දොර-වතුපිටි - ඇත් - අස් - ගව මහීස ආදී වස්තුය.

දුම්මේධො: අනුවණයාය. වරද නිවරද නොදත් තැනැත්තාය.

පාරගවේසිනො: පරතෙර සොයන්නන්ය පරතෙර නම්, නිවණය. නිවණ නමැති පරතෙර සෙවිය යුත්තේ දැහැමිව සීසෑම් වෙළදාම් කොට දිවි රැක්මෙන් හා සිල් රැකීම් - භාවනා වැඩීම් කොට පිළිවෙත රැඳීමෙන්ය.

භෝගතණ්හාය: වස්තු තණ්හාවෙන්ය. උපභෝග - පරිභෝග සම්පත් විෂයෙහි පවත්නා ආසාව හේතුකොටය.

අත්තානං හන්ති: තමා විපතට හා දුකට පැමිණවීම් වශයෙන් නසයි කෙසේ ද අනුන් නසන්නාක් මෙන්ය.

මේ සත්වයෝ රාග හා දෝස සහිතයහ. රාග හා දෝස පහකළ රහතුනට දුන්දේම මහත් ඵල දායකය.

356. තිණදොසානි ඛෙත්තානි
රාගදොසා අයං පජා
තස්මා හි වීතරාගෙසු
දින්නං හොති මහප්ඵලං (24:23)

කෙත් කුඩු මැටි දෝසෙන් යුතු වන්නේ
ජනයා රා දෝසෙන් යුතු වන්නේ
එහෙයින් රහතුන් වෙත දන් දුන්නේ
(ඒ කුසලින්) මහ පල ලැබ ගන්නේ.

රාගය දුරුකළ අයට දුන්දෙය මහත් ඵලය

24 (12) අංකුර දෙව්පුත් (ගාථා අංක 356-359)

සැවැත් නුවර දී යමාමහ පෙළහර පවත්වා බුදුරදුන්වහන්සේ තවුතිසා දෙව්ලොවට වැඩ විජම් බණ දෙසනු සඳහා සක් දෙවිඳු විසින් මොනවට පිළියෙළ කරන ලද අසුනෙහි වැඩහුන් සේක. එකල **අංකුර** හා **ඉන්‍දක** යන දෙව්පුතුන් දෙදෙන "අපි බුදුරදුන් ළඟම හිඳ බණ අසමු"යි ගිවිසගත්හ.

ඉන්‍දක දෙව්පුත් බුදුරදුන්ගේ දකුණු පසට ළංව හුන්නේය.

අංකුර දෙව්පුත් ඒ ඒ දෙවියන් පැමිණෙන විට පසු බැස දොළොස් යොදුනක් තැන අවසරයක් ලැබ හිඳිනේය. ඉන්‍දක දෙව්පුත් හුන්තැනම හිඳිනේය. ඒ දුටු බුදුරදුහු ඉන්‍දක අංකුර දෙන ලද සැපතෙහි වෙසෙස් ඒ දෙව් සබාවෙහි දැක්වීම සඳහා අංකුර දෙව්පුත් අමතා මෙසේ වදාළහ.

"අංකුරයෙනි, මෙහි එන්න, මාගේ වම්පස ළඟම හිඳගත් ඔබ දැන් දොළොස් යොදුනක් තැන් පසු බැස අවසරයක් ලැබ හිඳිනෙහිය. ඊට කරුණු කිමදැ"යි වදාළහ.

එවිට අංකුර දෙව්පුතු "බුදුරදුන් වහන්ස, මම පෙර අත්බැව්හි දඹදිව ද්වාරවතී නුවර අංකුර රජ වූයෙමි. දොළොස් යොදුන් තැන ලිප් බඳවා පිළියෙළ කොට මහදන් දුනිමි. ඒ දන් පිළිගන්ට සිල්වත්හු නො සිටියහ. දුසිල් වත්හුම පිළිගත්හ. එයින් මෙසේ බොහෝ දිව සැප ලැබුවත් ඒ සැපත එඩිතර නො වූයේය.

ඒ නිසා දොළොස් යොදුන් තැන් පසු බැස ගොස් හිඳීමට අවසරයක් ලැබගතිමි"යි පැවසුයේය.

අනතුරුව බුදුරදුහු ඉන්‍දක දෙව්පුත් අමතා මෙසේ වදාළහ.

"ඉන්‍දකයෙනි, ඔබ මාගේ දකුණු පස ළඟම හිඳගත්තෙහිය. මාගේ වම්පස ළඟම හිඳගත් අංකුරයන් මෙන් පසු නොබැස හුන් තැනම හිඳිනෙහිය. ඊට කරුණු කිමදැ"යි ඇසූසේක.

ඉන්‍දක එවිට දෙව්පුත් තෙමේ,

"බුදුන්වහන්ස, මම මිනිස් ලොව දුගියෙක්ව දිවි රැක ගතිමි. එකල දවසෙක මා ලද එකම බත් සැන්දක් එවලේම අනුරුද්ධ මහ රහතන් වහන්සේට පිදුවෙමි මෙසේ බොහෝ සැප ලැබීමටත් ඒ සම්පත් එඩිතරව විඳීමටත් සිල් වතුන්ට දන් දුන් ඒ පින හේතු විය. ඒ නිසා මම හුන් තැනම හිඳිමි"යි පැවසූයේය.

ඒ නිමිති කොට වීත රාගී වූ වීත දෝස වූ වීත මෝහ වූ පහ වූ තණ්හා ඇතියන් රහතුන් ඇතියන් රහතුන් කෙරෙහි දෙන ලද දේ මහත් පල බව පවසා මෙහි දැක්වූ ගාථා හතර වදාළ සේක.

විස්තරාත්මක අනුවාදය (356 ගාථාව)

ඛෙත්තානි තිණදොසානි. අයං පජා රාග දොසා.
තස්මාහි විතරාගෙසු දිනනං මහප්ඵලං හොති.

ඛෙත්තානි: හැල් කෙත් ආදී ක්‍ෂෙත්‍රයෝ; **තිණදොසානි**: කුඩුමැටි ආදී තෘණයන් දෝෂය කොට ඇත්තාහු ද එසේම; **අයං පජා**: මේ මනුෂ්‍ය ප්‍රජාවද; **රාග දොසා**: රාගය දෝෂය කොට ඇත්තාහ; **තස්මා හි**: එහෙයින්; **වීතරාගෙසු දින්නං**: රාගය දුරුකරන ලද ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේලාට දෙන ලද්ද; **මහප්ඵලං හොති**: මහත්ඵල වෙයි.

කුඹුරු තණ දොස් සහිතය. මේ ප්‍රජාව රාග දොස් සහිතය. එබැවින් වීතරාගීන් කෙරෙහි දුන් දෙය මහත් ඵල වෙයි.

විවරණය

ඛෙත්තානි: කෙත්ය. ගොවියා විසින් වපුරන ලද කුඹුරුය.

තිණදොසානි: තණ දොස්ය. මනාව පිළියෙළ කොට වපුරන ලද කුඹුරුවල ගොයම් හටගැනීමෙන් පසු මාරතු අදී තණ පැලවීමෙන් ඇති වන දොස්ය. කුඹුරු නිසරුවීමය.

පජා: සත්කැළම පුහුදුන් වූ මහා ජන සමුහය.

රාගදොසා: රාග දොස්ය. කාමයෙහි ඇලීම් නිසා ඇතිවන කම්කටොළුය.

වීතරාගෙසු: පහ වූ රාග ඇතියනටය. රාගදොස් දුරලූ රහතුනටය.





මේ සත්ව සමූහය රාග හා දෝස සහිතය. රාග දෝස පහකළ රහතුනට දුන්දේම මහත් පලය.

357. තිණදොසානි ඛෙත්තානි
දොසදොසා අයං පජා
තස්මා හි වීතදොසෙසු
දින්නං හොති මහප්ඵලං (24:24)

කෙත් කුඩු මැටි දෝසෙන් යුතු වන්නේ
මිනිසුන් දෝ දෝසෙන් යුතු වන්නේ
දොස් නැති රහතුන් වෙත දන් දුන්නේ
(ඒ කුසලින්) මහ පල ලැබ ගන්නේ

ද්වේෂය දුරුකළ අයට දුන්දෙය මහත් ඵලය

24 (12) අංකුර දෙව්පුත් (ගාථා අංක 356-359)

විස්තරාත්මක අනුවාදය (357 ගාථාව)

ඛෙත්තානි තිණදොසානි අයං පජා දොසදොසා. තස්මාහි වීතදොසෙසු දින්නං මහපඵලං හොති.

ඛෙත්තානි: හැල් කෙත් ආදී ක්‍ෂෙත්‍රයෝ; **තිණදොසානි**: කුඩමැටි ආදී තෘණයන් දෝෂය කොට ඇත්තාහු ද එසේම; **අයං පජා**: මේ මනුෂ්‍ය ප්‍රජාව ද; **දොස දොසා**: ද්වේෂය දෝෂය කොට ඇත්තාහ; **තස්මා හි**: එහෙයින්; **වීතදොසෙ දින්නං**: රාගය දුරුකරන ලද ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේලාට දෙන ලද්ද; **මහප්ඵලං හොති**: මහත්ඵල වෙයි.

සත්ත්වයා ද්වේෂ (මෝහ) නැමැති දෝෂයෙන් යුක්තය. එහෙයින් දෝෂයන් නැසුවනට දෙන දානය මහත් ඵල වෙයි.

විවරණය

ඛෙත්තානි: කෙත්ය. ගොවියා විසින් වපුරන ලද කුඹුරුය.

තිණදොසානි ඛෙත්තානි: කුඹුරු තණදොස් ඇත්තාහ.

තිණ නම් ගව මහිෂාදීන් විසින් කනු ලබන තණකොළ වල් පැළෑටි ආදියයි. තිණියතෙ තිණභක්ඛෙහි ගොණාදීහි ආදී යතේ භක්ඛීයතේහ තිණං යන විවෘත්ති විසින් ඒ දන්නා ලද්දේය.

තණ වැල් පැළෑටි නැගීමෙන් ප්‍රකෘත්තියෙන් සරු කෙත් ද නිසරු වන්නේය. එබැවින් තෘණ දොෂැයි ගණිත්. කර මැටි බොරලු ගල් කැට ආදිය නිසාත් කෙත් දූෂිත වන බැවින් නිසරු වන බැවින් ඒ කිරිමැටි ආදියත් තෘණ දෝෂයෙහි ඇතුළත්ය.

ඛෙත්ත නම් හැල් වී හමු-තිරිඟු-වරා-යව-තණ-උ-මුං වපුරන ගොඩ ගොයම් මඩ ගොයම් කරන තැන්ය.

දොස දොසා අයං පජා: මේ සත්වප්‍රජාව ද්වේෂ ඇත්තීය.

කුඹුරු, තණ දොසින් ගැවසී ගත්තා සේ මේ ලෝකයෙහි ඇති තාක් සත්ත්වයෝ දෝස වශයෙන් දූෂිතය.

සිත් නොගත් සිත් නොද පිණවන අරමුණු කරන කොට සිත්හි උපදනා සැඩ ගතිය දෝස නම්වේ. මේද සසර දුක් නසාලන තුරුම මුල් නොතබා සිතින් ගලවාලනතුරුම සත්වයා දූෂිත කරන්නේය. සත්වයා මිනීමරුවකු-කරන්නේය. සිත්හි නැගී සැඩ ගතිය ගලවලන තුරුම සත්වයා දූෂිත කරන්නේය.

සත්වයා මිනීමරුවකු කරන්නේය. සැඩ ගතිය සිත්හි නැගී ආවිට මව මරන්නේය. පියා මරන්නේය. රහතුන් මරන්නේය. අන්හු මරණු කියනු කිම.

තණ දොස්ය. මනාව පිළියෙළ කොට වපුරන ලද කුඹුරුවල ගොයම් හටගැනීමෙන් පසු මාරතු ආදී තණ පැලවීමෙන් ඇතිවන දොස්ය. කුඹුරු නිසරුවීමය.

පජා: සත්කැලය පුහුදුන් වූ මහා ජන සමූහය.

දොසදොසා: ද්වේෂ දොස්ය. ක්‍රෝධය නිසා හටගැනෙන කම් කටොල්ය.

වීතදොසෙසු: පහ වූ දොස් ඇතියනටය. ක්‍රෝධය දුරළූ රහතුනටය.

තස්මාහි වීතදොසෙසු දින්නං හොති මහප්ඵලං: එහෙයින් ද්වේෂය නසා සිටි රහතුන් වහන්සේලාට දෙන ලද දානය ස ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දානයෙන් මහත්පල ඇත්තේ වේ. ද්වේෂයෙන් දුෂ්ට වුවනට ද්වේෂයෙන් චණ්ඩ වූවනට දෙන ලද දානය එබඳු මහත්ඵල මහත් අනුසස් ඇත්තේ නොවේ.

යම් සත්කැළ මෝහ හා තණ්හා දොස් සහිතය. මෝහය හා තණ්හාව පහකළ රහතුනට දුන්දේ මහත්ඵලය.

358. තිණදොසානි ඛෙත්තානි
මොහදොසා අයං පජා
තස්මා හි වීතමොහෙසු
දින්නං හොති මහප්ඵලං (24:25)

කෙත් කුඩු මැටි දෝසෙන් යුතු වන්නේ
මිනිසුන් මෝහ දෝසින් යුතු වන්නේ
මෝහය නැති රහතුන් වෙත දුන්නේ
(ඒ කුසලින්) මග පල ලැබ ගන්නේ

මෝහය දුරුකළ අයට දුන්දෙය මහත් ඵලය

24 (12) අංකුර දෙව්පුත් (ගාථා අංක 356-359)

විස්තරාත්මක අනුවාදය (358 ගාථාව)

ඛෙත්තානි තිණදොසානි අයං පජා මොහදොසා. තස්මාහි වීතමොහෙසු දින්නං මහප්ඵලං හොති.

ඛෙත්තානි: හැල් කෙත් ආදී ක්ෂෙත්‍රයෝ; **තිණදොසානි**: කුඩුමැටි ආදී තෘණයන් දෝෂය කොට ඇත්තාහු ද එසේම; **අයං පජා**: මේ මනුෂ්‍ය ප්‍රජාවද; **මොහ දොසා**: මෝහය දෝෂය කොට ඇත්තාහ; **තස්මා හි**: එහෙයින්; **වීතමොහෙසු දින්නං**: මෝහය දුරුකරන ලද ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාට දෙන ලද්ද; **මහප්ඵලං හොති**: මහත්ඵල වෙයි.

සත්ත්වයා මෝහ (මුග්ධ) නමැති දෝෂයෙන් යුක්තය. එහෙයින් මෝහය. දෝෂය නැසුවනට දෙන දානය මහත් ඵල වෙයි.

විවරණය

ඛෙත්තානි: කෙත්ය. ගොවියා විසින් වපුරන ලද කුඹුරුය.

තිණදොසානි: තණ දෝස්ය. මනාව පිළියෙළ කොට වපුරන ලද කුඹුරුවල ගොයම් හටගැනීමෙන් පසු මාරතු ආදී තණ පැලවීමෙන් ඇති වන දොස්ය. කුඹුරු නිසරුවීමය.

පජා: සත්කැලය පුහුදුන් වූ මහා ජන සමූහය.

මෝහදොසා: මෝහදොස්ය. අනුවණකම හේතුකොට ඇතිවන දොස්ය.

කුඹුරු, තණදොසින් ගැවසී ගත්තා සේ මේලෝකයෙහි ඇති තාක් සත්වයෝ මෝහයෙන් දූෂිතය. මෝහයෙන් මුළා වූහ. මෝහයෙන් අන්ධයහ.

අරමුණු තතු නො දැනීම අරමුණුවල සත්වයන් මුළා කරන කුසල් අකුසල් හොඳ නොහොඳ යුතු අයුතු ගුණ අගුණ නොවැටහෙන්නේය. මෝහ නම් මෙ ද සසර දුක් ගෙවාලන තුරුම මුල් නොතබා සිතින් උදුරා දමන තුරුම සත්වයා දූෂිත කරන්නේය. සත්වයා ජඩ කරන්නේය.

තස්මාහි වීතමොහෙසු දින්නං හොති මහප්පලං: එහෙයින් පහ වූ මෝහ ඇතියවුන් කෙරෙහි දුන් දනම මහත්ඵල ඇත්තේ වේ.

අර්හත්මාර්ගඥානයෙන් මෝහය නසා සිටි රහතුන් වහන්සේලාට දෙන ලද දානයම ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දානයෙන් මහත් ඵල ඇත්තේ වේ. මෝහයෙන් මුඨ වූවනට මෝහයෙන් ජඩ වූවනට දෙන ලද දානය එබඳු මහත්ඵල මහත් අනුසස් ඇත්තේ නොවේ.

තිණදොසානි ඛෙත්තානි: කුඹුරු තණදොස් ඇත්තාහ
තිණ නම් ගව මහීස ආදීන් විසින් කනු ලබන තණකොල වල් පැළෑටි ආදියයි. තණ වල් පැළෑටි නැගීමෙන් ප්‍රකෘත්තියෙන් සරු කෙත් ද නිසරු වන්නේය.

එබැවින් තෘණ තෘණ දෝෂයි ගණිත් කරමැටි බොරළු ගල් කැට ආදිය නිසාත් තේ දූෂිත වන බැවින් නිසරු වන බැවින් ඒ කිරිමැටි ආදියත් තෘණ දෝෂයෙහි ඇතුළත්ය.

අර්හත්මාර්ග ඥානයෙන් සිදුවන කෙලෙස් නැසීම එකවට ම වුන මුත් රාගය නැසී ගිය පසු ද්වේෂයත් ද්වේෂය නැසී ගිය පසු මෝහයත් නැසී යනු නොවන්නේය.

දුක්ඛ: දුක්ඛ සත්‍යය

දුඃඛ සත්‍යය ආර්‍ය්‍ය සත්‍ය අතුරෙහි පළමුවැන්නය.
දුඃඛ නම් උපාදානස්කන්ධ පංචකයයි.
කතමං ච භික්ඛවේ දුක්ඛං අරිය සච්චං මහණෙනි දුඃඛාර්‍ය්‍ය සත්‍යය කවරේද? යත් පඤ්චු පාදානකඛන්ධා පංච උපාදානස්කන්ධයෝය.

මේ එහි සංක්ෂිප්ත දේශනාය. රූපුපාදානස්කන්ධය. වේදනූපාදානස්කන්ධය. සංඥොපාදානස්කන්ධය සංස්කාරූපස්කන්ධයෝය. විඥාපාදානස්කන්ධය උපාදානස්කන්ධයෝය. කාම දිට්ඨි සීලබ්බත අත්තවාද යන මොවුනට විෂය වන කෙලෙස් සහිත වූ රූප වේදනා සංඥා සංස්කාර විඥාන යන උපාදානස්කන්ධයෝමය.

එකොළොස් වැදෑරුම් වූ කාමභවය සොළොස් වැදෑරුම් වූ රූප භවය, සිව් වැදෑරුම් වූ අරූපභවය යන භවත්‍රයට ඇතුළත් කර්ම විපාකයන්ගේ පැවැත්මැයි කියන උපාදානස්කන්ධයන්ගේ පිළිවෙල නො සිඳ දිගින් දිගටම යෑම දුඃඛ නැමැයි මෙසේත් කීය හැකිය. දුක්ඛං තෙභූමකං වට්ටං යනු මෙහිලා දත යුතුය.

වීතමොහෙසු : පහකළ මෝහ ඇතියනටය. අනුවණකම දුරැලූ රහතුනටය.

මේ සත්කැළ මෝහ හා තණ්හාදොස් සහිතය. මෝහය තණ්හාව පහකළ රහතුනට දුන්දේ මහත් ඵලය.

359. තිණදොසානි ඛෙත්තානි
ඉච්ඡාදොසා අයං පජා
තස්මා හි විගතිච්ඡෙසු
දින්නං හොති මහප්ඵලං (24:26)

කෙත් කුඩු මැටි දෝසෙන් යුතු වන්නේ
දන ආසා දෝසෙන් යුතු වන්නේ
ආසා නැති රහතුන්ට පුදන්නේ
(ඒ කුසලින්) මහ පින්පල ගන්නේ

ඉච්ඡාව දුරුකළ අයට දුන්දෙය මහත් ඵලය

24 (12) අංකුර දෙව්පුත් (ගාථා අංක 356-359)

විස්තරාත්මක අනුවාදය (359 ගාථාව)

ඛෙත්තානි තිණදොසානි අයං පජා ඉච්ඡාදොසා. තස්මාහි විගතිච්ඡෙසු දිනනං මහප්ඵලං හොති

ඛෙත්තානි: හැල් කෙත් ආදී ක්ෂෙත්‍රයෝ; **තිණදොසානි**: කුඩුමැටි ආදී තෘණයන් දෝෂය කොට ඇත්තාහු ද එසේම; **අයං පජා**: මේ මනුෂ්‍ය ප්‍රජාවද; **ඉච්ඡා දොසා**: නොලද ලාභයෙහි පැතීම හා ලද ලාභයෙහි බලවත් ඇල්ම දෝෂය කොට ඇත්තාහ; **තස්මා හි**: එහෙයින්; **විගත + ඉච්ඡෙසු දින්නං**: පහ කරන ලද ඉච්ඡාව ඇති රහතන් වහන්සේලාට දෙන ලද්ද; **මහප්ඵලං හොති**: මහත්ඵල වෙයි.

කුඹුරු තණ දොස් සහිතය. මේ ප්‍රජාව තෘෂ්ණා දොස් සහිතය. එබැවින් පහකළ තෘෂ්ණා දොස් ඇත්තවුන්ට දුන් දෙය මහත් ඵල වෙයි.

විවරණය

ඛෙත්තානි: කෙත්ය. ගොවියා විසින් වපුරන ලද කුඹුරුය.

තිණදොසානි: තණ දොස්ය. මනාව පිළියෙළ කොට වපුරන ලද කුඹුරුවල ගොයම් හටගැනීමෙන් පසු මාරතු ආදී තණ පැළවීමෙන් ඇති වන දොස්ය. කුඹුරු නිසරුවීමය.

පජා: සත්කැල ය. පුහුදුන් වූ මහා ජන සමූහය.

ඉච්ඡා දොසා: ඉච්ඡා දොස්ය. තණ්හාව හේතුකොට ඇතිවන දොස්ය.

ඉච්ඡා දොසා අයං පජා: මේ සත්ත්ව ප්‍රජාව ඉච්ඡා දොස ඇත්තීය.

ඉච්ඡා: යනු තෘෂ්ණාවට නමකි. තෘෂ්ණාව කුදු මහත් කිසිවක් නො හැර හැම දැයක්ම සොයන බැවින් හැම දැයක්ම පතන බැවින් ඉච්ඡා නම් වේ. මෙ ද සසර දුක් නසාලන තුරුම මුල් නො තබා සිඳ හරින තුරු ම සත්ත්වයා දුෂිත කරන්නේය. සත්ත්වයා කුදු මහත් හැම දැයෙහි ඇලුනකු කරන්නේය.

තස්මාහි විගතිච්ඡෙසු දින්නං හොති මහප්පලං: එහෙයින් පහ වූ ඉච්ඡා දොස ඇතියවුන් කෙරෙහි දුන් දනම මහත් ඵල ඇත්තතේ වේ.

අර්හත් මාර්ගඥානයෙන් ඉච්ඡාව නසා සිටි රහතුන් වහන්සේලාට දෙන ලද දානයම ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දානයෙහි මහත්ඵල ඇත්තේ වේ. ඉච්ඡායෙන් බඩජහරි වූවනට ඉච්ඡායෙන් කෙළ වගුරන්නවුනට දෙන ලද දානය එබඳු මහත් ඵල මහත් අනුසස් ඇත්තේ නොවේ.

අර්හත් මාර්ගඥානයෙන් සිදුවන කෙලෙස් නැසීම එකවරටම වනු මුත් රාගය නැසී ගිය පසු ද්වේශය නැසී ගිය පසු මෝහයක් නැසී යනු නොවන්නේය.

අර්හත් මාර්ගඥානය තමා රාගද්වේෂ මෝහාදී වූ සත්වයන්ගේ සිත් තුළ කෙළවරක් නො කියැකි කාලයක පටන් තද බදව සිටුනා සියලුම කෙලෙස් එකට සිඳලන්නේය.

ශ්‍රාවකයන්ගේ අවබෝධය පහසු කරනු පිණිස බුදුරජාණන් වහන්සේ රාග දෝස මෝහ ඉච්ඡා යන මේ කෙලෙස් සතර වෙන් වෙන් කොට දක්වා වදාළ සේක. අර්හත් මාර්ගඥානයෙන් රාගය මුළුමනින්ම නැසී ගිය පසු දෝෂමෝහයන්ගේ ඉතිරිවීමක් නොවන්නේය.

හෙන පහරින් මුළු ගසම ඇද වැටෙන්නා සේ අර්හත් මාර්ගඥානයෙන් සියලු කෙලෙස් නැසී යන්නේය. එහෙයින් රාග දොෂ මොහ ඉච්ඡා යන කෙලෙස් නසා සිටි මහ රහතුන් වහන්සේට ම දෙන ලද දානය ප්‍රතිසන්ධි ප්‍රවෘත්තිය විපාක වශයෙන් ප්‍රධාන විසින් මහත්ඵල වේයයි දත යුතුය.

මෙසේ වත්ම චතුර්විධ මාර්ගඥානය පිණිස පිළිවෙත් පුරණ අන්සච්චකුහට ද මහරහතුන් වහන්සේගේ ගුණයෙහි බැඳී සිට දෙනු ලබන දානය ද මහත්ඵල වනු පිණිස බුදුරජාණන් වහන්සේ විසින් ශාසනක්ෂෙත්‍රය සකස් කොට වදාළෝය.

මේ ගාථා සතරෙහි යෙදී සිටි හි යනු නිපාතය. එය රාගද්වේෂ මොහ තෘෂ්ණාකාල ධර්ම නසා සිටි මහරහතුන් වහන්සේට දෙනලද දානය ම මහත්ඵල මහා අනුසස් ඇත්තේය යනු ඒකාන්ත විසින් තීරණය කරන්නේය. නිශ්චිත කරන්නේය. එයි වෙනසක් නොවන බව කියාලන්නේය.

විගතිච්ඡෙසු: පහකළ තණ්හා ඇති යනටය. ආශාව දුරලූ රහතුනටය. රාගය, දෝෂය මෝහය හා තණ්හාව දුරුකළ රහතුනටය දුන්දේ මහත් ඵල බව දක්වා මේ ගාථා සතර වදාළ සේක.



බුද්ධ සංදේශය

මානව ඉතිහාසයේ ප්‍රථම ධර්මදූත සමයවාදය බුදුසමයයි.
මුළුමහත් මානව වර්ගයාටම විමුක්තිය සපයන සර්වසාධාරණ
සංදේශයක් බුදුසමය විසින් පතුරුවා ලන ලදී.
සම්මා සම්බෝධි ඥානය ලැබීමෙන් පසුව බුදුහිමියෝ,
බහුජන හිත පිණිස, බහු ජන සුව පිණිස ධර්මය දේශනා කරන්නට
තමන්ගේ ශ්‍රාවකයන් හැට එක් දෙනෙකු මෙහෙයවාලූහ.

ආචාර්ය කේ.එන්. ජයතිලක 'බුදුසමය සහ සාමය' නමැති ග්‍රන්ථයෙනි.

25 වන පරිච්ඡේදය

භික්ඛු වග්ග



සියලු තැන්හි ම සංවරය ඉතා යහපත් ය. සංවරයෙන් යුත් තැනැත්තා සියලු දුකින් මිදෙන්නේ ය.

360. චක්ඛුනා සංවරො සාධු	ඇසෙන් සංවර වීම යහපත්ය
සාධු සොතෙන සංවරො	කණෙන් සංවර වීම යහපත්ය
ඝාණෙන සංවරො සාධු	නැහැයෙන් සංවර වීම යහපත්ය
සාධු ජිව්හාය සංවරො (25:1)	දිවෙන් සංවර වීම යහපත්ය

ඉන්ද්‍රිය සංවරය

25 (1) සැවතෙහි තෙරුන් පස් දෙනකුගේ කථාව (ගාථා 360 සහ 361)

සැවැත් නුවරෙහි තෙරුන් වහන්සේලා පස් නමක් වාසය කළහ. උන්වහන්සේ එක් එක් නම දොරටු පසින් (චක්ඛු, සෝත, ඝාන, ජිව්හා) එක් එක් දොරටුව බැගින් සංවර කොට ගෙන විසූහ. දිනක් උන්වහන්සේලා මුණගැසී සංවරයට අමාරුම දොරටුව සංවර කරන්නේ තම තමන්යයි කියමින් විවාදයක යෙදුනහ. විවාදයෙහි අවසානයකට පැමිණිය නොහැකි වූ උන්වහන්සේලා බුදුරජාණන් වහන්සේ හමුව මේ පිළිබඳව සත්‍යය දැන ගැනීමට තීරණය කළහ. එබැවින් උන්වහන්සේලා බුදුරජාණන් වහන්සේ වෙත ගොස් වැඳ නැමද ගරුබුහුමන් දක්වා මෙසේ විමසූහ. "බුදුරජාණන් වහන්ස. අපි එක් එක්කෙනා එක් එක් දොරටුව බැගින් සංවර කරමු. තම තමන් සංවර කරන දොරටුව අනෙක් දොරටුවලට වඩා සංවර කිරීම දුෂ්කරයයි සිතමු. එබැවින් භාග්‍යවතුන් වහන්ස, කවර දොරටුවක් සංවර කිරීම ඉතාමත් දුෂ්කර වන්නේදැයි පවසන්නේ නම් මැනවි."

එක් භික්ෂුවක් තවත් භික්ෂුවකට වඩා පහත් තත්වයකට නොහෙලා පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක. "මහණෙනි, මේ දොරටු පසම සංවර කිරීම බෙහෙවින් දුෂ්කරය, නමුත් ඔබ වහන්සේලා මේ දොරටු පසෙහි සංවර වීමට අසමත් වූවාහු දැන් පමණක් නොවෙති. පෙර භවයකදීද මෙසේම බුද්ධිමතුන්ගේ අවවාද නොපිළිගෙන ඉන්ද්‍රිය සංවරයෙහි අසමත්ව විනාශයට පත් වූහ". මෙය කෙසේ කවදා සිදුවිණිදැයි තෙරවරුන් විමසූ විට බුදුරජාණන්වහන්සේ අතීත කථාව (තක්කසිලා ජාතකය) මෙසේ ගෙනහැර දැක්වූ සේකඃ

භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීමට අනුව බුදුරජාණන් වහන්සේ විස්තර සහිතව මෙම ජාතක කථාව දේශනා කරමින් අතීතයෙහි කිසියම් රාක්ෂසියක විසින් රාජපුරුෂයකු විනාශ කර දැමීමෙන් පසුව රජුවිසින් පවත්වනලද රාජකීය පිළිගැනීම ලබා සේසත් නංවනලද සිංහාසනයේ හිඳ තමන්ගේ අතීතස්මරණ ඥානයෙන් සිහිකරමින් "මිනිසුන් අධිෂ්ඨාන ශක්තියෙන් ක්‍රියාකළයුතුය"යි තමන්ටම සිතා ගනිමින් පහත සඳහන් ගාථා ධර්මය ප්‍රකාශකළ සේක.

දැඩි උත්සාහය නිසා මම ගුණධර්මයන්හි නිරත වූයෙමි. බියක් තැතිගැන්මක් නොදැක්වූ නිසා මම යකින්නයගේ බලයට නතු නොවූයෙමි. බලවත් අනතුරකින් නිදහස්ව සිටියෙමි.

මේ ගාථාව පවසා බුදුරජාණන් වහන්සේ ජාතක කථාව මෙසේ සැකෙවින් දෙසූ සේක. එකල්හි බෝසතුන් තක්කසිලා රාජධානිය ගැනීම සඳහා ගිය විට එතුමන් වටා සිට අවිආයුධ රැගෙන මග රැකවල් කළ පස් දෙනා නුඹලා වූවාහුය. නමුත් නුඹලා එමග යමින් සිටියදී යකින්නක් පංචකාම වස්තුන්ගෙන් නුඹලා පෙළඹවූවාය. එවිට නුඹලා බෝසතුන් දුන් උවදෙස් නොතකා ඇයට වසඟව විනාශයට පත් වූවාහුය. ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව යකින්නගේ පෙළඹවීම්වලට නතු නොවී උවදුරකින් තොරව සුවසේ තක්කසිලා නගරයට සැපමිණ රාජ්‍යය ලබාගත් ඒ බෝසතාණන් වහන්සේ අන් කිසිවෙක් නොව දැන් මම වෙමි.

ජාතක කථාව මෙසේ හකුළුවා වදාළ බුදුරජාණන් වහන්සේ "භික්ෂුව සියළු දොරටු සංවර කළ යුතුය. එසේ දොරටු (ඉන්ද්‍රිය) සංවර කිරීමෙන් පමණක් සියළු දුකින් තොර වූ නිවණ ලබාගත හැකිවන්නේය"යි දෙසූ සේක.

විස්තරාත්මක අනුවාදය (360 ගාථාව)

චක්ඛුනා සංවරො සාධු සොතෙන සංවරො සාධු ඝාණෙන සංවරො සාධු ජිව්හාය සංවරො සාධු

චක්ඛුනා සංවරොඃ ඇසෙන් සංවර වීම; **සාධුඃ** යහපත්ය;
සොතෙන සංවරොඃ කණෙන් සංවර වීම; **සාධුඃ** යහපත්ය;
ඝාණෙන සංවරොඃ නහයෙන් සංවරවීම; **සාධුඃ** යහපත්ය;
ජිව්හාය සංවරොඃ දිවෙන් සංවරවීම; **සාධුඃ** යහපත්ය.

ඇසෙන් සංවර වීම යහපත්ය. කණෙන් සංවර වීම යහපත්ය. නාසයෙන් සංවර වීම යහපත්ය. දිවෙන් සංවර වීම ය

සියලු තැන්හි ම සංවරය ඉතා යහපත් ය. සංවරයෙන් යුත් තැනැත්තා සියලු දුකින් මිදෙන්නේ ය.

361. කායෙන සංවරො සාධු
සාධු වාචාය සංවරො
මනසා සංවරො සාධු
සාධු සබ්බත්ථ සංවරො
සබ්බත්ථ සංවුතො භික්ඛු
සබ්බදුක්ඛා පමුච්චති (25:2)

කයෙන් සංවර වීම යහපත්ය
වචනයෙන් සංවර වීම යහපත්ය
මනසින් සංවර වීම යහපත්ය
සියලු තැන්හි සංවර වීම යහපත්ය
සියලුතැන්හි සංවර වූ භික්‍ෂුව
සියලු දුකින් මිදෙයි.

හැම පැත්තෙන් ම ඇතිවන සංවරයෙන් දුක් නිමා වෙයි

25 (1) සැවතෙහි තෙරුන් පස් නමක් පිළිබඳ කථාව (ගාථා 360 සහ 361)

විස්තරාත්මක අනුවාදය (361 ගාථාව)

කායෙන සංවරො සාධු වාචාය සංවරො සාධු මනසා සංවරො සාධු සබ්බත්ථ සංවරො සාධු භික්ඛු සබ්බත්ථ සංවරො සබ්බදුක්ඛා පමුච්චති.

කායෙන සංවරො: කයෙන් සංවර වීම; **සාධු**: යහපත්ය. **වාචාය සංවරො**: වචනයෙන් සංවර වීම; **සාධු**: යහපත්ය; **මනසා සංවරො**: මනසින් සංවර වීම; **සාධු**: යහපත්ය; **සබ්බත්ථ සංවරො**: සියලු තැන්හි සංවර වීම; **සාධු**: යහපත්ය; **සබ්බත්ථ සංවරො**: සියලු තැන්හි සංවර වූ; **භික්ඛු**: භික්ෂුව; **සබ්බදුක්ඛා**: සියලු දුකින්; **පමුච්චති**: මිදෙන්නේය.

කයෙන් සංවර වීම මැනවි. වචනයෙන් සංවරවීම මැනවි. මනසින් සංවරවීම මැනවි. සියලු තැන්හි සංවරවීම මැනවි. සියලු තැන්හි සංවර වූ භික්ෂුව සියලු දුකින් මිදෙන්නේය.

විවරණය

බුදුරජාණන් වහන්සේ මේ ගාථාවලින් ඉන්ද්‍රියප්‍රත්‍යක්ෂයේ සියලු දොරටු සංවර කර ගැනීමට භික්ෂූන්වහන්සේට අනුශාසනා කරන සේක. මේ අරමුණ ඉටුකරගැනීමට ඇති එකම මාර්ගය වන්නේ භාවනාවයි. මනසේ වැඩීම හෙවත් සංවර්ධනය 'භාවනා' යයි කියනු ලැබේ.

වෙනත් තාක්ෂණික පද මෙන් නොව භාවනා යන පදය යෙදෙන්නේ ප්‍රායෝගික මානසික ශික්ෂණ ක්‍රමය හැඟවීමටය. එය පුළුල් අර්ථයෙන් ගත්විට එයින් සංවර්ධනය කළහැකි භාවිතයන් සහිත සමස්ත ක්‍රියාදාම පද්ධතියක් ආවරණය කරගෙන ඇත. භාවනා යන පදය බෞද්ධ මූලග්‍රන්ථයන්හි යෙදී ඇති විට එය සාමාන්‍යයෙන් යෙදී ඇත්තේ මානසික ශක්තීන් වැඩීම යන අර්ථයෙනි.

මෙත්තං රාහුල භාවනං භාවෙහි
රාහුල, මෛත්‍රී භාවනාව ප්‍රගුණ කරන්න.

අසුභාය චිත්තං භාවෙහි
අසුභ භාවනාවෙන් සිත වඩන්න.

(මානසික විෂයවස්තුවක් හෝ මානසික පිළිබිඹුවක් ගැන සිතීම සඳහා පමණක් යෙදෙන) ඣායති යන්න මෙන් නොව භාවෙති යන්න කවර ආකාරයේ හෝ මානසික වර්ධනය සඳහා යෙදෙයි. නිදසුන් ලෙස පහත දැක්වෙන යෙදුම් දැක්විය හැකිය.

"කුසලං චිත්තං භාවෙති,
හෙතෙම කුසල් සිත් වඩයි.

ඣානං භාවෙති, සමාධිං භාවෙති, විපස්සනං භාවෙති මග්ගං භාවෙති".
හෙතෙම ධ්‍යාන, සමාධි, මාර්ග වඩයි.

භාවනා යන පදය භාවනා විෂය හඟවන වචන සමඟ සමාසගත වී තිබෙනු දක්නට ඇත. ඣාන භාවනා, සමාධිභාවනා, මග්ගභාවනා" ආදී වශයෙනි. මේවා මෙසේ යෙදී ඇත්තේ විවිධ භාවනා වර්ග වෙන් කොට දක්වනු සඳහාය.

බුද්ධඝොස හිමියෝ භාවෙති යන ආඛ්‍යාත පදය වීම, සිදුවීම යන අර්ථ ඇති භූධාතුවේ උද්ධෘතයක් ලෙස නිර්වචනය කරමින් ජනෙති (හටගනියි) උප්පාදෙති (උපදවයි) වඩ්ඪෙති (වර්ධනය කරයි) යන පද සමග සමාන කොට දක්වති . භාවෙති යන්න නිපදවීමේ (උප්පාදන) හා වැඩීමේ (වඩ්ඪන) අර්ථයෙන් යෙදී ඇති බව දැක්වීමට උන්වහන්සේ ත්‍රිපිටක කෘතිවලින් පාඨ ගෙනහැර දක්වති.

ඉංග්‍රීසි භාෂාවේ එන Meditation යන පදයට වඩා භාවනා යන පදයට බෙහෙවින් ශක්තිමත් හා ක්‍රියාශීලී අර්ථයක් ඇත. නිපදවීම, අත්කරගැනීම; දක්ෂවීම, වර්ධනය කිරීම, ප්‍රගුණකිරීම, භාවනාකිරීම වැනි අර්ථ රාශියක් ඒ හා බැඳී ඇත. මෙහිදී අප එම පදය භාවිත කරනුයේ ප්‍රගුණ කිරීම හා වර්ධනය කිරීම යන අර්ථය දීම සඳහාය.

භාවනාවෙහි කිසියම් චින්තන ප්‍රවාහයක් ඇතිබව සත්‍යයකි. එය මානසික ප්‍රාර්ථනාවකට හෝ සුවපත් වේවා සුවපත් වේවා ආදි වශයෙන් මෛත්‍රී භාවනාවේදී කරන පුනර්වාචක ජල්පනයක් වැනි යමකට හෝ (කසිණ භාවනාවේදී) පොළොව පොළොව යනුවෙන් නැවත නැවත කියමින් කරන මානසික චින්තනයකට හෝ සමානය. නමුත් භාවනාව යනු ඊට වඩා වැඩි යමකි, එය තමන් තුළ සැමවිටම යහපත් වූ යමක් ගොඩ නැඟීමට විශේෂ ක්‍රමයකට සිතීමකි, එබැවින් භාවනාවෙහි වැදගත්ම දෙය වන්නේ කිසියම් පුද්ගලයකුගේ චරිතය තුළ චින්තන විෂයෙහි අඩංගු වන සත්‍යය හෝ අත්‍යවශ්‍ය ගුණය ප්‍රකට කරවන හෝ නිපදවන ශක්තියයි. නිදසුනක් වශයෙන් යමෙකු මෛත්‍රී භාවනාව ප්‍රගුණ කරන විට මෛත්‍රිය ගැන සිතනු පමණක් නොව හෙතෙම එය පවතින දෙයක් බවට පත් කිරීමට සිතින් උත්සාහ දරයි. එමෙන්ම වෛරය පලිගැනීම ක්‍රෝධය වැනි පව්වු සිතිවිලි සිතින් නැතිකර දැමීමටත් උත්සාහ දරයි. අවසානයෙහි භාවනාවෙහි යෙදෙන්නා සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රිය දක්වයි.

භාවනාව යනු සියලු යහපත් ගුණයන් කෙනකු තුළ ඒකරාශී කරවන්නකි. එය ආවසානික වශයෙන් නිර්වාන ලාභය ඇති කරවන්නකි. මේ හැර භාවනාව ථෙරවාද සම්ප්‍රදායෙහි ආගමික ජීවිතයෙහි ජනප්‍රිය ප්‍රායෝගික අංශයෙකි.

සංයමයෙන් යුතු කමටහන් භාවනා ඇති එකඟ වූ සිතැති මග-පලයන්ගෙන් සතුටු වූ පුගුලා භික්ෂු ය.

362. හත්ථසඤ්ඤතො පාදසඤ්ඤතො
වාචාය සඤ්ඤතො සඤ්ඤතුත්තමො
අජ්ඣත්තරතො සමාහිතො
එකො සන්තුසිතො තමාහු භික්ඛුං(25:3)

අත් සන්සිඳුනේ පා සන්සිඳුනේ
වදනින් සන්සිඳුනේ සන්සිඳුමෙන් උතුම් වූයේ
ඇතුළත ඇළුනේ සමවතෙහි යෙදුනේ
එකලා වූයේ සතුටු සිතැත්තේ භික්ෂුවකැයි කියනුලැබේ

නියම භික්ෂුව

25 (2) හංසයකු මැරූ භික්ෂුවකගේ කථාව (362 ගාථාව)

බුදුරජාණන් වහන්සේ සැවත් නුවර ජේතවනාරාමයෙහි වැඩවසන කල්හි **හංසයකු මැරූ භික්ෂුවක්** අරභයා මේ ගාථාව දෙසූසේක.

සැවත් නුවර කුලපුත්‍රයෝ දෙදෙනෙක් සසර කළකිරී සසුන් ගතව බෙහෙවින් හිතවත් මිතුරෝ වූහ. දිනක් මේ දෙදෙනා අචිරවතී නදියට ගොස් දිය නා ඉවුරට ගොඩ වී ඉරු එළියෙහි සිටිමින් පිළිසඳරෙහි යෙදුනාහ. එවේලාවෙහි හංසයෝ දෙදෙනෙක් අහසෙහි පියාසර කරමින් සිටියහ. ඒ දුටු එක් භික්ෂුවක් ගල් කැටයක් අතට ගෙන "මම මේ හංසයකුගේ ඇසට ගසමියි කීවේය. ඔබට එසේ කළ නොහැකැ"යි අනෙක් භික්ෂුව කීවේය.

"ඔබ බලා ඉන්න මම මේ පැත්තෙන් හංසයාගේ ඇසට ගසා අනෙක් පැත්තේ ඇසට ද ගසමි"යි ගල අතට ගත් භික්ෂුව පැවසීය. "ඔබට මේ එකක්වත් කළ නොහැකිය" අනෙක් භික්ෂුව කීය. "හොඳයි එසේ නම් ඔබ බලා ගන්න" යයි පැවසූ භික්ෂුව ගල ගෙන හංසයාගේ පිටුපසට ගැසීය. හංසයා ගල එන ශබ්දය ඇසී හිස හරවා පිටුපස බැලීය. එවිට භික්ෂුව අනෙක් ගලක් ගෙන හංසයාගේ එක් ඇසකට වැදී අනෙක් ඇසෙන් පිටව යන පරිද්දෙන් දමා ගැසීය. හංසයා වේදනාවෙන් කෑගසාගෙන අහසෙහි කැරකෙමින් අවුත් භික්ෂූන් දෙදෙනා අසළ පතිත විය.

අසළ සිටි වෙනත් භික්ෂූන් වහන්සේලා මේ සිදුවීම දැක හංසයා මැරූ භික්ෂුවට මෙසේ කීහ. "ඇවැත්නි, සසර කළකිරී බුදුසස්නෙහි පැවිදිව සතෙකුගේ දිවි තොර කිරීමෙන් ඔබ කළේ බෙහෙවින් නොහොබිනා ක්‍රියාවකි. එසේ පවසා ඒ භික්ෂූන් දෙදෙනා කැටුව බුදුරජාණන් වහන්සේ හමුවට ගියහ. එවිට බුදුරජාණන් වහන්සේ හංසයා මැරූ භික්ෂුවගෙන් "ඔබ මේ හංසයා මැරූ කථාව සත්‍යයක්දැ"යි විමසූ සේක. "එසේය ස්වාමීනි සත්‍යයයකැ"යි එම භික්ෂුව පිළිතුරු දුන්නේය.

"මහණ, සසර කළකිරී නිවනට යොමුව ඇති මගේ සසුනෙහි පැවිදිව මෙබඳු ක්‍රියාවක් ඔබ කළේ කෙසේද? බුදුන් පහළ වීමට පෙර පවා විසූ බුද්ධිමත් මිනිස්සු ගිහිගෙහි සිටිමින් ද හොඳ නරක ගැන දැනුම ඇතිව සුළු වරදින්ද වැළකී සිටියහ. නමුත් ඔබ බුදුසසුනෙහි පැවිදිව කෙසේ නම් මෙසේ හොඳ නරක ගැන දැනුමක් නොලැබුවෙහිද? යනුවෙන් බුදුරජාණන් වහන්සේ එම භික්ෂුව අමතා පැවසූ සේක.

විස්තරාත්මක අනුවාදය (362 ගාථාව)

හත්ථසඤ්ඤතො පාදසඤ්ඤතො වාචාය සඤ්ඤතො
සඤ්ඤතුත්තමො අජ්ඣත්තරතො සමාහිතො එකො
සන්තුසිතො තං භික්ඛුං ආහු

හත්ථසඤ්ඤතො: ඉදින් යමෙක් අත් සංවර කරගත්තේ ද; **පාදසඤ්ඤතො**: පා සංවර කරගත්තේ ද; **වාචාය සඤ්ඤතො**: වචනයෙන් සංවර වූයේද; **සඤ්ඤතුත්තමො**: සංවරයෙන් උතුම් වූයේ ද; **අජ්ඣත්තරතො**:ආධ්‍යාත්මිකත්වයෙහි ඇළුනේ වේද; **සමාහිතො**: සමාහිත සිත් ඇත්තේද; **එකො**: හුදෙකළා වූයේ: **සංතුසිතො**: සතුටු සිතැත්තේ වේද; **තං**: ඔහු; **භික්ඛුං**: භික්ෂුවකැයි; **ආහු**: කියනු ලැබේ.

යමෙක් තමාගේ අත් සංවර කර ගත්තේ ද පා සංවර කර ගත්තේ ද වචන සංවර කර ගත්තේද සංවරයෙන් උතුම් තත්වයට පත් වූයේ ද ආධ්‍යාත්මික දියුණුවෙහි සිත ඇළුනේද හුදෙකළා වූයේ සතුටු සිතැත්තේ ද හෙතෙම (නියම) භික්ෂුවක් වෙයි.

විවරණය

සමාහිතො: සමාධිගත හෙවත් සන්සුන් මනසක් ඇති පුද්ගලයා ගැන මෙයින් කියවෙයි. පූර්ණ ඒකාග්‍රතාවකින් සන්සුන් වූ මනසකින් යුක්ත තැනැත්තා මෙයින් අදහස් වෙයි.

සමාධි යන වචනය ඒකාග්‍රතාව (එකඟතාව) යන වචනයෙන් මනාව පැහැදිළි වෙයි. මේ හැර මෙම පදය බුදුරජාණන් වහන්සේ විසින් හඳුන්වා දෙන ලද මූලික පදයක් ලෙස ද හැඳින්විය හැකිය. ප්‍රථම ධර්ම දේශනාවේදීම මෙම පදය දක්නට ලැබේ. සම්මා සමාධිය හෙවත් නිවැරදි එකඟතාව යන අර්ථයෙන් එය යෙදී ඇත. එකට තැබීම, එකඟවීම යන අරුත් ඇති සමාධා යන මූල රූපයෙන් සැදී ඇති සමාධියෙන් නිර්දේශ වන්නේ මනසේ කිසියම් අවස්ථාන්තරයකි. තාක්‍ෂණික අර්ථයෙන් ගත්විට එයින් අදහස් වන්නේ එම මානසික අවස්ථාව සහ එම අවස්ථාව ලබා ගැනීමට උපයෝගී කෙරෙන ක්‍රමය යන දෙකමයි.

ධම්මදින්නා තෙරණිය හා විසාඛ උපාසක යන දෙදෙනා අතර වූ සංවාදයෙහිදී මානසික අවස්ථාවක් වශයෙන් මෙන්ම මානසික ශික්ෂණ ක්‍රමයක් වශයෙන්ද සාකච්ඡා කෙරෙයි. සමාධි යනු කුමක්දැයි විශාඛ ඇසීය. තෙරණිය පිළිතුරු දුන්නේ 'සමාධිති චිත්තස්ස එකග්ගතා' (සමාධි යනු සිතෙහි එකඟතාවයි) යනුවෙනි. එය උපදවන්නේ කුමකින්දැයි විශාඛ ඇසූ ප්‍රශ්නයට තෙරණිය දුන් පිළිතුර වූයේ සතර සතිපට්ඨාන යනුයි. "ඒ සඳහා අවශ්‍යතා කවරේද?" "සතර සම්‍යක්ප්‍රධාන වීර්යයයි". "එහි වැඩෙන්නේ මොනවාද?" "සිහිය සහ වීර්යයයි".

මේ සාකච්ඡාවේදී මානසික අවස්ථාවක් වශයෙන් සමාධිය සිතෙහි එකඟතාව (චිත්තස්ස එකග්ගතා) ලෙස නිර්වචනය වී ඇත. මෙය සූත්‍රයන්හි එන ඒ පිළිබඳ පළමු නිර්වචනය ලෙස පෙනී යයි. අභිධර්මයේදී මෙය විවිධ පද මගින් නිර්වචනය වී ඇතත් අර්ථය අතින් ධම්මදින්නා තෙරණියගේ නිර්වචනයට බෙහෙවින් සමාන වී ඇත.

කටේ සංවරය ඇති නිවුණ සිතැති දහම් අරුත් දත් තැනැත්තහු ගේ වචනය මිහිරි ය.

363. යො මුඛසඤ්ඤතො භික්ඛු මන්තභාණී අනුද්ධතො අත්ථං ධම්මං ච දීපෙති මධුරං තස්ස භාසිතං (25:4)	යම් භික්ෂුවක් මුවින් සංවර වූයේ ද බුද්ධිමත්ව කථාකරන්නේ ද උඩඟු නොවූයේ ද හෙතෙම අර්ථය හා ධර්මය මනාව පැහැදිළි කරයි ඔහුගේ කථාව මිහිරිය

සැබෑ භික්ෂුව

25 (3) කොකාලික භික්ෂුවගේ කථාව (ගාථා 363)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩවෙසෙමින් මේ කථාව **කොකාලික භික්ෂුව** අරභයා දේශනා කළ සේක.

කොකාලික භික්ෂුව පද්ම නම් නරකයෙහි උපන් පසු භික්ෂූන් වහන්සේලා දම්සභා මණ්ඩපයෙහි රැස්ව ඒ කාරණය අරභයා මෙසේ අදහස් පළ කළහ. "කොකාලික භික්ෂුව තමන්ගේ මුව සංවර නොවීම නිසා අගසව් දෙනමට ද අපහාස කොට පොළව පැලී ගොස් නිරයෙහි උපන්නේය". එවේලාවෙහි බුදුරජාණන් වහන්සේ එතැනට වැඩම කොට "කවර නම් කථාවකින් යුක්තව සිටියහුදැ"යි භික්ෂූන්ගෙන් විමසූ සේක. භික්ෂූන් කාරණය සැළකළ කල්හි උන්වහන්සේ "මහණෙනි, කොකාලික තමන්ගේ මුඛය අසංවර වීම නිසා නිරයෙහි උපන්නේ මෙවර පමණක් නොවේ. පෙර අත්බවයකදී ද මෙසේම වීයැ"යි පැවසූ සේක. එය කෙසේ සිදුවීදැයි භික්ෂූන් විමසූ විට උන්වහන්සේ ඒ අතීත කථාව මෙසේ දේශනා කළසේක.

අතීතයෙහි එක් කලෙක හිමාලය අසබඩ විලෙක ඉදුබුවෙක් විසීය. දිනක් තරුණ කොක්කු දෙදෙනෙක් අහර සොයමින් යන අතර එම විල දැක එහි නැවතී ඉදුබුවා ද දැක ඔහු සමග කථා කොට යහළු වූහ. පසුව නිතර නිතර එහි අවුත් ඉදුබුවා සමග කථා බහ කිරීම නිසා ඔවුහු කෙටි කලකින්ම දැඩි මිතුරෝ වූහ. දිනක් කොක්කු ඉදිබුවා හමුව මෙසේ කීහ: "යහළුව, අපි හිමාලය අසබඩ චිත්තකූට පර්වතයෙහි රත්රන් ගුහාවක වෙසෙමු, එය ජීවත්වීමට ඉතාමත් ප්‍රිය උපදවන තැනකි, අප සමග එහි යාමට ඔබ කැමති නැද්ද?" "මිතුරනි, කෙසේනම් මම එහි යම්"දැයි ඉදුබුවා පැවසීය. "ඉදින් ඔබට ඔබේ මුව වසාගෙන සිටිය හැකි නම් අපි ඔබව එහි රැගෙන යන්නෙමු"යි කොක්කු පිළිතුරු දුන්හ. "යහළුවනි, මම මගේ මුව වසාගෙන සිටින්නෙමි. මා රැගෙන යන්නැ"යි ඉදිබුවා පෙරැත්ත කළේය. "හොඳයි" යනුවෙන් පිළිතුරු දුන් කොක්කු ලී දණ්ඩක මැද ඉදුබුවාට එල්ලෙන්නට කියා දණ්ඩේ දෙපැත්තෙන් ඩැහැගෙන පියාසර කරන්නට වූහ.

ගම්දරුවෝ මෙය දැක පුදුමයට පත්ව "මේ බලන්න. කොක්කු දෙන්නෙක් ඉදිබුවකු දණ්ඩක රඳවාගෙන ඉගිලෙනෝ"යි කෑගසන්නට වූහ. ඉදිබුවා එය අසා "නොසණ්ඩාලයෙනි, තොපට එයින් ඇති වැඩේ කිමෙක්දැ"යි කීමට සිතා මුව විවර කළේය. මේ වෙලාවෙහි කොක්කු බරණැස් නුවර රජමාලිගය උඩින් පියාසර කරමින් සිටියහ. එබැවින් ඉදිබුවා මුව විවර කරනවාත් සමගම එල්ලී සිටි දණ්ඩෙන් ගිලිහී රජමාලිගයේ අංගනය මැදට පතිත විය. බිමට වැටීමත් සමඟ ඉදිබුවා කෑලිවලට පැලී මිය ගියේය. බුදුරජාණන්වහන්සේ මේ බහුභාණී ජාතක කථාව ගෙනහැර දක්වා "මහණෙනි, භික්ෂුව තමාගේ මුව සංවර කරගත යුතුය. සන්සුන්ව ජීවත් වෙමින් තම සිත කෙලෙසුන්ගෙන් තොරව තබාගත යුතුය"යි දේශනා කළසේක.

විස්තරාත්මක අනුවාදය (363 ගාථාව)

යො භික්ඛු මුඛසඤ්ඤතො මන්තභාණී අනුද්ධතො
අත්ථං ධම්මං ච දීපෙති තස්ස භාසිතං මධුරං.

යො භික්ඛු: යම් භික්ෂුවක්; **මුඛසඤ්ඤතො**: මුවින් සංවර වූයේ ද; **මන්තභාණී**: බුද්ධිමත්ව කථාකරන්නේ ද; **අනුද්ධතො**: උඩඟු නොවූයේ ද; **අත්ථං**: අර්ථය හා; **ධම්මං ච**: ධර්මය ද; **දීපෙති**: මනා කොට පළට කරයිද; **තස්ස**: ඔහුගේ; **භාසිතං**: කථාව; **මධුරං**: මිහිරිය.

මුවින් සංවර වූ බුද්ධිමත්ව කථාකරන උඩඟු නොවූ අර්ථය හා ධර්මය පැහැදිළිව පවසන භික්ෂුවගේ කථාව මිහිරිය,

විවරණය

මෙම ගාථාවේදී ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි එක් අංගයක් වන සම්මා වාචා නමැති ශීලගුණය මතු කොට දැක්වෙයි. සංවර නොකළ හා ශික්ෂණයට පත් නොකළ වචනයෙහි ආදීනව පහක් බුදුරජාණන්වහන්සේ විසින් පෙන්වා දී තිබේ.

(1) වචනය සංවර නොකළ තැනැත්තා බොරු කියයි
(2) කේළාම් කීමට පෙළඹෙයි
(3) රළු වචන කීමට පෙළඹෙයි
(4) අරුත්සුන් වචන කීමට පෙළඹෙයි
(5) මරණින් මතු නිරයෙහි උපදියි,

නිවැරදි වචනයෙහි ආනිසංස හතරක් දහමෙහි දැක්වෙයි, ඒ මෙසේය:

(1) කෙනෙක් බොරු කීමෙන් වළකියි. එබඳු පුද්ගලයා ඇදහිය හැකි අවංක විශ්වාස කළහැකි තැනැත්තෙකි.

(2) සම්‍යක් වචනය පුහුණු කරන්නා කේළාම් කීමෙන් මිතුරන් නොබිඳවයි. මෙබඳු වැරදි වචන භාවිත නොකරන පුද්ගලයා සමාජ සමගිය සඳහා දායක වෙයි.

(3) සම්‍යක් වචනය පුහුණු කරන්නා ඵරුෂ වචන කීමෙන් වළකියි. ඒ නිසාම හෙතෙම අනුන්ගේ සතුට ඇති කරවන්නෙක් වෙයි. රළු නපුරු වචන ඇසීමෙන් අනුන්ගේ මනසෙහි ඇතිවන වේදනාවක් ඔහු නිසා ඇති නොවන බැවින් එබඳු පුද්ගලයා මිනිසුන් අතරෙහි ජනප්‍රිය වෙයි.

(4) අනර්ථකාරී අර්ථශූන්‍ය වචන භාවිතයෙන් තොරව ප්‍රයෝජනවත් වචන කීමටද පුහුණු වෙයි. නිරර්ථක වචන භාවිතයට වඩා නිශ්ශබ්දව සිටීම මැනවැයි බුදුන් වහන්සේ අනුදැන ඇත.

දහමෙහි ඇලුණු දහම නැවත නැවත සිහිකරන තැනැත්තා සදහමින් නො පිරියෙහේ.

364. ධම්මාරාමො ධම්මරතො
ධම්මං අනුවිචින්තයං
ධම්මං අනුස්සරං භික්ඛු
සද්ධම්මා න පරිහායති(25:5)

දහමෙහි ඇලෙන දහමෙහි සතුටුවන
දහම අනුව සිතන
දහම සිහි කරන භික්ෂුව
දහමින් නොපිරිහෙයි

ධර්මයෙහි බැඳෙන භික්ෂුව

25 (4) ධම්මාරාම තෙරුන්ගේ කථාව (ගාථා 364)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩවෙසෙමින් මේ ගාථාව **ධම්මාරාම තෙරුන් වහන්සේ** අරභයා දේශනා කළ සේක.

බුදුරජාණන් වහන්සේ සිවු මසකින් පිරිනිවන් පාන සේකැයි දැනගත් විට පුහුදුන් (මගපල නොලත්) භික්ෂූන් වහන්සේලා බෙහෙවින් සොවින් පෙළෙමින් කුමක් කළයුතුදැයි නොදැන සිටියහ. ඔවුහු බුදුරජාණන් වහන්සේ සමීපයෙහි රැඳෙමින් උන්වහන්සේ කෙරෙන් බැහැර නොයා සිටියහ, කෙසේ වුවද ධම්මාරාම නම් වූ භික්ෂුවක් බුදුරජාණන් වහන්සේ වෙත නොගොස් හුදෙකලාව සිටියේය. ඔහුගේ අදහස වූයේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට පෙර කෙසේ හෝ රහත් බවට පැමිණීමයි. එබැවින් උන්වහන්සේ දැඩි උත්සාහයකින් විදසුන් වැඩීමෙහි යෙදී සිටියහ. උන්වහන්සේගේ ආකල්පය සහ උසස් අරමුණ නොදත් අනෙක් භික්ෂූන් වහන්සේලා උන්වහන්සේ වැරදි ලෙස තේරුම් ගත්හ.

ඒ භික්ෂූන් වහන්සේලා ධම්මාරාම තෙරුන් රැගෙන බුදුරජාණන් වහන්සේ වෙත ගොස් "භාග්‍යවතුන් වහන්ස, අනෙක් සියලු භික්ෂූන් වහන්සේලා ඔබ වහන්සේ සමීපයෙහි රැඳී සිටියදී මේ ධම්මාරාම තෙරුන් ඔබ වහන්සේ කෙරෙහි ගරුබුහුමනක් නැති ලෙස හුදෙකලාව සිටිති"යි පැවසූහ. අනෙක් භික්ෂූන් වහන්සේලා ඔවුනට අවශ්‍ය දෙය බුදුන් වහන්සේට පැවසූ කල්හි ධම්මාරාම තෙරුන් වහන්සේ බුදුන් වහන්සේට වැඳ නමස්කාර කොට තමන් විදර්ශනා භාවනාවෙහි දැඩි සේ නියැලී සිටි බව සැල කර සිටියේය.

බුදුරජාණන් වහන්සේ ධම්මාරාම තෙරුන්ගේ ප්‍රකාශයෙන් මෙන්ම ඔහු ක්‍රියාකළ ආකාරයෙන් ද බෙහෙවින් පැහැදී "මා පුත් ධම්මාරාම, ඔබ මනාව ක්‍රියාකළෙහිය. මට ගරුබුහුමන් දක්වන භික්ෂුව ඔබ මෙන් පිළිපැදිය යුතුය. මල් ගඳ විලවුන්වලින් මා පුදන අය මට නිසි ගරුබුහුමන් කරන්නෝ නොවෙති. ධර්මයට අනුව පිළිපදින්නා පමණක් මට ගරුබුහුමන් දක්වන්නේය"යි පැවසූසේක.

විස්තරාත්මක අනුවාදය (364 ගාථාව)

ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං ධම්මං
අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති

ධම්මාරාමො: දහමෙහි ඇලෙන; **ධම්මරතො**: දහමෙහි සතුටුවන; **ධම්මං අනුවිචින්තයං**: දහම අනුව සිතන; **ධම්මං අනුස්සරං**: දහම සිහි කරන; **භික්ඛු**: භික්ෂුව; **සද්ධම්මා**: සද්ධර්මයෙන්; **න පරිහායති**: නොපිරිහෙයි.

දහමෙහි ඇලෙන, දහමෙහි සතුටුවන, දහම අනුව සිතන, දහම සිහි කරන, භික්ෂුව දහමින් නොපිරිහෙයි

විවරණය

ධර්මයෙහි ගුණය: ධර්මයෙහි ගුණය අරභයා මානසික ඒකාග්‍රතාවෙහි නියැලුණු භික්ෂූන් වහන්සේ නමක් අරභයා බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

ධර්මයෙහි විශේෂ ගුණ සයක් දක්වනු ලැබේ.

(1) **ස්වාක්ඛාතො භගවතා ධම්මො**: ධර්මය බුදුරජාණන් වහන්සේ විසින් මනාව දේශනා කරන ලදි. එය පටන් ගැන්ම කළණ බවින් යුක්තය. මධ්‍යය ද කළණ බවින් යුක්තය. අවසානය ද කළණ බවින් යුක්තය. ධර්මය හැම විටම එකම රසයකින් යුක්තය. ඒ නිවන් රසයයි.

(2) **සන්දිට්ඨිකො**: මෙයින් අදහස් කෙරෙන්නේ ධර්මයෙහි ප්‍රතිඵල කල් නොයවා මේ ජීවිතයෙහි ම ලැබෙන බවය.

(3) **අකාලිකො**: ධර්මය කාලවියුක්තය. ධර්මය සත්‍යය වන බැවින් එය කාලත්‍රයටඅයත්ය. ඊට කාලභේදයක් නැත.

(4) **එහිපස්සිකො**: ධර්මය කාටත් විවෘතය. එහි වචනාර්ථයෙන් කියවෙන්නේ 'එව බලව' යන්නයි.

(5) **ඔපනයිකො**: මෙයින් අදහස් වන්නේ ධර්මයෙහි යෙදෙන කවර කෙනකු වුව ද විමුක්තියට යොමු කරවීමේ ශක්තිය ධර්මයට පවත්නා බවය.

(6) **පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි**: බුද්ධිමතුන් තම තමන් විසින්ම අවබෝධ කළයුතු වෙයි.

සිය ලාබය පහත් කොට නො සැලකිය යුතු. අනුනට ලැබෙන ලාබය පතන්නා සමාධියට නො පැමිණේ.

365. සලාභං නාතිමඤ්ඤෙය්‍ය නාඤ්ඤෙසං පිහයං චරෙ අඤ්ඤෙසං පිහයං භික්ඛු සමාධිං නාධිගච්ඡති (25:6)	තම ලාභය ලඝු කොට නොසලකන්න අනුන්ගේ ලාභයට ගිජු නොකරන්න අනුන්ගේ ලාභයට ගිජු කරන භික්ෂුව චිත්තසමාධියට නොපැමිණෙයි

ලැබෙන දෙය පිළිගන්න

25 (5) පාවා දෙන භික්ෂුවගේ කථාව (ගාථා 365-366)

බුද්ධශ්‍රාවක වූ එක් භික්ෂුවක් **දෙව්දත් තෙරුන්** අනුගමනය කළ භික්ෂුවක සමග මිතුදමින් බැඳී සිටියේය. දිනක් එම භික්ෂුව අනෙක් සහෝදර භික්ෂූන් ද සමග පිඬුසිඟා ගොස් දන් වළඳා ආපසු එමින් සිටියදී ඉහත කී වර්ගවාදී භික්ෂුව හමු විය. එහිදී තමන් ඉතා මිහිරි රසවත් ආහාරපානාදිය පිඬුසිඟීමෙන් ලබා ගන්නා බවත් තමන් සමග සිටියහොත් ඒවා ලබා ගැනීමට හැකි බවත් වර්ගවාදී භික්ෂුව පැවසීය. එය පිළිගත් එම භික්ෂුව ද කිහිප දිනක් දෙව්දත් අනුගාමිකයන් සමග වාසය කොට ආපසු තම විහාරයට පැමිණියේය.

මෙය දැනගත් සෙසු භික්ෂූන් වහන්සේලා එම භික්ෂුව කළ වරද බුදුරජාණන් වහන්සේට සැළ කරමින් එම භික්ෂුව දෙව්දත් තෙරුන් වෙනුවෙන් ලැබෙන ලාභ ප්‍රයෝජන වළඳමින් සිටියේයයි දැන්වූහ. බුදුරජාණන් වහන්සේ එම භික්ෂුව කැඳවාගෙන ඒමට සැළකොට ඔහු පැමිණි කල්හි "මහණ, ඔබ එසේ කළෙහිදැ"යි විමසූ සේක.
"එසේය ස්වාමීනි, මම මගේ හිතවත් භික්ෂුවක් නිසා දෙව්දත් තෙරුන්ගේ අනුගාමිකයන් සමග දින කිහිපයක් එහි සිටියෙමි. එහෙත් දෙව්දත් තෙරුන්ගේ ලබ්ධි නොගත්තෙමැ"යි එම භික්ෂුව පැවසීය. "ඔබ මිථ්‍යා දෘෂ්ටි ගෙන නොසිටියත් ඔබ ඇසුරු කළ එම භික්ෂූන්ගේ දෘෂ්ටි ගෙන හැසිරෙන ආකාරයෙන් ක්‍රියා කළෙහිය. ඔබ මෙබඳු දෙයක් කළේ දැන් පමණක් නොව පෙරද කෙළෙහි"යයි බුදුරජාණන් වහන්සේ පැවසූ සේක.

"ස්වාමීනි භාග්‍යයවතුන් වහන්ස මේ භික්ෂුව මෙහිදී කළ දේ අපි මනාව දුටුවෙමු. එහෙත් පෙර භවයක කවර කෙනෙකුගේ දෘෂ්ටි ගෙන ක්‍රියා කළේදැයි අපි නොදනිමු. එබැවින් එය අපට ප්‍රකාශ කරනු මැනවැ"යි භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියහ. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා මෙම කථා ප්‍රවෘත්තිය (කාන්තා මුහුණක් ඇති හස්තියා මහිලාමුඛ ජාතකය) දේශනා කළ සේක. එම ජාතක කථාවට අනුව මනා හැසිරීමකින් සිටි හස්තියා සොරුන්ගේ සහ මිනීමරුවන්ගේ කතාබහ ඇසීමෙන් පසු දරුණු වී ඇත් ගොවුවාද මරා දමයි. නමුත් මුනිවරුන්ගේ සහ බ්‍රාහ්මණයන්ගේ කථාබහ ඇසීමෙන් පසු නැවතත් හස්තියා යථාතත්වයට පත් වෙයි. එකල මහිලාමුඛ හස්තියා දැන් මේ පාවා දීමෙහි යෙදුනු භික්ෂුව වූයේය.

පරණ සොරුන්ගේ වචන ඇසීමෙන් පසු මහිලාමුඛ හස්තියා වනසමින් හා නසමින් ඔබ-මොබ ගියේය. නමුත් ආත්ම දමනය කළ උතුම් මිනිසුන්ගේ වචන ඇසීමෙන් පසු හස්තිරාජයා තම උතුම් ගුණ යළි ලබාගත්තේය.

මේ මහිලාමුඛ ජාතකය ගෙනහැර දක්වා බුදුරජාණන් වහන්සේ "මහණෙනි භික්ෂූන් වහන්සේ හැමවිටම තමන්ට ලැබෙන දෙයින් (යථාලාභයෙන්) සතුටු විය යුතුය. ඉදින් යමෙක් අනුන්ට ලැබෙන දෙයට ගිජු කරන්නේ නම් හෙතෙම ධ්‍යානයක් හෝ මාර්ගඵලයක් නොලබන්නේය. නමුත් තමන්ට ලැබෙන දෙයින් සතුටු වන භික්ෂුව ධ්‍යානඵලලාභයෙන් ආධ්‍යාත්මික ශාන්තිය ලබා ගන්නේය" දේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (365 ගාථාව)

සලාභං න අතිමඤ්ඤෙය්‍ය අඤ්ඤෙසං පිහයං න චරෙ
අඤ්ඤෙසං පිහයං භික්ඛු සමාධිං න අධිගච්ඡති

සලාභං: තම ලාභය; **න අතිමඤ්ඤෙය්‍ය**: ලඝු කොට නොසලකන්නේය; **අඤ්ඤෙසං**: අනුන්ගේ ලාභය; **පිහයං**: බලාපොරොත්තු වෙමින්; **න චරෙ**: නො හැසිරෙන්නේය; **අඤ්ඤෙසං**: අනුන්ගේ ලාභය; **පිහයං**: බලාපොරොත්තු වන; **භික්ඛු**: භික්ෂුව; **සමාධිං**: සමාධියක්; **න අධිගච්ඡෙය්‍ය**: නොලබන්නේය.

තම ලාභය ලඝු කොට නොසලකන්න. අනුන්ගේ ලාභයට ගිජු නොකරන්න. අනුන්ගේ ලාභයට ගිජු කරන භික්ෂුව චිත්තසමාධියකට නොපැමිණෙයි.





තමා ලද සුලු ලාභය පහත් කොට නො සිතිය යුතු. පිරිසිදු දිවි පැවතුම් ඇති මහණහට දෙවියෝ පසසත්.

366. අප්පලාභොපි චෙ භික්ඛූ
සලාභං නාතිමඤ්ඤති
තං වෙ දෙවා පසංසන්ති
සුද්ධාජීවිං අතන්දිතං (25:7)

අඩුවෙන් ලබන්නේ වුවද භික්‍ෂුව
තමන්ට ලැබෙන දෙය හෑල්ලු නොකරයිද
දෙවියෝ ඒකාන්තයෙන්ම පිරිසුදු ජීවිකාව ඇති
අනලස් වූ එම භික්‍ෂුව පසසති

දෙවියෝ ගුණවත් භික්ෂූන් පසසති

25 (5) පාවා දෙන භික්ෂුවගේ කථාව (ගාථා 365 සහ 366)

විස්තරාත්මක අනුවාදය (366 ගාථාව)

භික්ඛූ අප්පලාභො අපි චෙ සලාභං නාතිමඤ්ඤති
දෙවා චෙ සුද්ධාජීවිං අතන්දිතං තං පසංසන්ති

භික්ඛූ: භික්ෂුව; **අප්පලාභො අපි**: අඩුවෙන් ලබන්නේ වුවද; **චෙ**: ඉදින්; **සලාභං**: තමාගේ ලාභය; **න අතිමඤ්ඤති**: සුළු කොට නො සලකයි නම්; **දෙවා**: දෙවියෝ; **චෙ**: ඒකාන්තයෙන් ම; **සුද්ධාජීවිං**: පිරිසුදු දිවියක් ඇති; **අතන්දිතං**: අනලස් වූ; **තං**: එම භික්ෂුව; **පසංසන්ති**: පසසති.

භික්ෂුව අඩුවෙන් ලබන්නෙක් වුව ද තමාට ලැබෙන දෙය හෑල්ලු කොට නොතකන්නේය, තමාට ලැබෙන දෙයින් සතුටු වන්නේය, එබඳු පිරිසිදු දිවි පැවතුම් ඇති අනලස් වූ භික්ෂුවට දෙවියෝ ද පැසසුම් කරත.

විවරණය

බුදුරජාණන් වහන්සේ මේ ගාථාවෙන් තමන්ට ලැබෙන පමණින් සතුටු වීමේ ගුණය ගැන භික්ෂූන්ට අනුශාසනා කරන සේක. අනුන්ට ලැබෙන දේ පිළිබඳව කුහුල් සිතින් නොබැලීම ද ඒ ගුණයටම අයත්ය. තමන්ට ලැබෙන දෙයින් සතුටු වීම විස්තර වන්නේ අප්පිච්ඡතා ගුණය ලෙසයි. යථාලාභසන්තොස යනුවෙන් ද එය හැඳින් වෙයි.

අප්පිච්ඡතා:(අඩු අපේක්ෂා ඇතිබව) යනු භික්ෂුවගේ ජීවිතයෙන් ඉවත් කළ නොහැකි ගුණයකි. භික්ෂුවක සතු විය යුතු ගුණාංග සතරක් මෙසේ දැක්වෙයි:

කවර හෝ ලැබෙන සිවුරකින් සතුටුවීම,

කවර හෝ ලැබෙන පිණ්ඩාහාරයකින් සතුටුවීම,

කවර හෝ ලැබෙන සෙනසුනකින් සතුටුවීම,

මානසික ශික්ෂණයෙහි හා විරාගයෙහි ඇලීම.

"භික්ෂුව කවර සිවුරකින් හෝ සතුටු වෙයි. කවර පිණ්ඩාහාරයකින් සතුටුවෙයි. කවර හෝ සෙනසුනකින් සතුටුවෙයි. විරාගයෙහි හා අධ්‍යාත්මික ශික්ෂණයෙහි ඇලෙයි. ඒ සම්බන්ධයෙන් හෙතෙම උඩගු වන්නේ හෝ අනුන් පිරිහෙලා සළකන්නේ නොවෙයි. සිහියෙන් යුත් යෝග්‍ය වූ එබඳු භික්ෂුව ආර්ය ව්‍යවහාරයෙහි ශ්‍රේෂ්ඨයකු කොට සළකනු ලැබේ."

භික්ෂු සාසනය: භික්ෂු සාසනය ආරම්භ කරන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසින් සිය ප්‍රථම ධර්ම දේශනාව ඉදිරිපත් කරන ලද පංචවග්ගිය භික්ෂූන් වහන්සේගෙනි. එතැන් සිට යස කුලපුත්‍ර සසුනට එක්වීමද සමග සංඝසංස්ථාව ක්‍රමානුකූලව වර්ධනය වන්නට විය.

බරණැස් නුවර සුඛෝපභෝගී ජීවිතයක් ගතකළ යසකුල පුත් නමින් වූ ධනවත් ගෘහපුත්‍රයෙක් විසීය. ගෘහ ජීවිතයෙහි කළකිරුණු හෙතෙම තම නිවසින් පිටත්ව "මම කළකිරුණෙමි සන්තාපයට පැමිණියෙමි"යි සිතමින් බුදුරජාණන්වහන්සේ පස්වග මහණුන්ට දහම් දෙසා ඔවුන් රහත් බවට පමුණුවා වැඩ විසූ ඉසිපතනාරාමය දෙසට යමින් සිටියේය. යස කුලපුතුන් එනු දුටු බුදුරජාණන් වහන්සේ "යස, මෙහි තැවුල් සන්තාප නැත මෙහි එන්න හිඳගන්න"යයි පැවසූ සේක.

කළකිරී සිටි යසකුලපුත්‍ර බුදුන්වහන්සේගේ ධෛර්යය වඩවන වචන අසා තම රන් මිරිවැඩි සඟල ගලවා පසෙක තබා බුදුන්වහන්සේට ගරු බුහුමන් දක්වා පසෙකින් හිඳ ගත්තේය. බුදුන්වහන්සේ ඔහුට ධර්මදේශනා කළසේක. ධර්මය අසා හෙතෙම සෝවාන් පෙලෙහි පිහිටියේය. බුදුන්වහන්සේ ඔහුට ක්‍රමානුකූලව දානකථා සීලකථා සග්ගකථා කාමයන්හි ආදීනව ආදි වශයෙන් අනුපූර්ව ප්‍රතිපදාවෙන් ධර්මදේශනා කරමින් අවසන්හි පැවිද්දෙහි අනුසස් ද දේශනා කළසේක යසකුලපුතුගේ සිත ගැඹුරු දහමට නැඹුරු වෙමින් පවත්නා බව දැන ගත් බුදුරජාණන් වහන්සේ ඔහුට චතුරාර්ය සත්‍යයෙන් දහම් දෙසූසේක.

තම පුතු නිවසෙහි නොමැති බව පළමුවෙන් දැන ගත්තේ යස කුලපුතුගේ මවයි. ඈ ඒබව තම සැමියාට දැන්වූවාය. එකෙණෙහිම සිටුවරයා පුතු සෙවීමේ අරමුණින් අසරුවන් සිවු දෙසට යවා තෙමේ පුතුගේ රන්මිරිවැඩි සඟලෙහි සලකුණු අනුව යමින් ඉසිපතනාරාමය දෙසට පිය නැඟුවේය. බුදුන්වහන්සේ ඔහුගේ පැමිණීම දුරදීම දිවැසින් දැක ඔහු පැමිණි විට පුතු නොදකින ලෙසට ඉටු සේක. සිටුතුමා බුදුන් වෙත පැමිණ ගරුබුහුමන් දක්වා "තම පුතු දුටුවෙයිදැ"යි විමසීය.

"හොඳයි සිටුතුමනි හිඳගන්න ඔබට ඔහු දැකගත හැකිය"යි බුදුරදුන්ගේ පිළිතුර විය. එම පිළිතුරෙන් සතුටට පත් සිටුවරයා එහි හිඳගත්තේය. බුදුන්වහන්සේ ඔහුට දහම් දෙසූසේක. හෙතෙම බෙහෙවින් සතුටට පත්ව "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඉතාම ශ්‍රේෂ්ඨය. යටිකුරු වූවක් උඩුකුරු කරන්නාක් මෙන් ද, සැඟවුන ලද්දක් විවර කර දක්වන්නාක් මෙන් ද, මං මුළාවූවෙකුට මග කියා දෙන්නාක් මෙන් ද, අඳුරෙහි වූවෙකුට ඇස් ඇත්තෝ දකිත්වායි පහනක් දරන්නකු මෙන් ද, බුදුරජාණන්වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය මනාව දේශනා කරන ලදි. මම බුදුන් දහම් සඟුන් යන ත්‍රිවිධ රත්නය සරණ යමි. බුදුරජාණන්වහන්සේ මා අද පටන් දිවි ඇති තෙක් තෙරුවන් සරණ ගිය උවසුවකු කොට සළකන සේක්වා"යි පැවසීය. මෙසේ හෙතෙම පළමු තේවාචක උපාසකයා බවට පත් විය.

තම පියාට දෙසූ දහම් අසා යස කුලපුත් තෙමේ රහත් බවට පත් විය. අනතුරුව බුදුරජාණන්වහන්සේ යසගේ පියාණන්ට යස දක්නට ලැබේවායි ඉටු සේක. එවිට සිටුවරයා තම පුතු දුටුවේය. සතුටට පත් හෙතෙම භික්ෂුසංඝයා සමග පසුදින දානය සඳහා තම නිවසට පැමිණෙන ලෙස බුදුරජාණන්වහන්සේට ආරාධනා කළේය. උන්වහන්සේ ද එය නිහඬතාවෙන් පිළිගත් සේක.

සිටුවරයා පිටත්ව ගිය පසු යස බුදුන් වහන්සේගෙන් පැවිදි උපසම්පදාව අයැද සිටියේය. "එව මහණ මනාව දුක් නිමා කිරීමට බඹසර හැසිරෙන්න" යනුවෙන් බුදුන් වහන්සේ පවසනවාත් සමගම යස තුන් සිවුරු පෙරවී උපසපන් බවෙහි පිහිටියේය. මෙසේ යස තෙරුන් වහන්සේ සමග රහතන්වහන්සේලා සය නමක් ලොව පහළ වූහ. ආරාධනාව පරිදි බුදුරජාණන්වහන්සේ තම ශ්‍රාවකයන් සය නම ද සමග සිටුවරයාගේ නිවසට වැඩම කළහ. යස තෙරුන්ගේ මව සහ ඔහුගේ පැරණි බිරිය දහම් අසා සෝවාන් ඵලයෙහි පිහිටා පළමු කාන්තා ශ්‍රාවිකාවන් බවට පත් වූහ.

විමල, සුභාහු, පුණ්ණජි, සහ ගවම්පතී යන යසගේ යහළුවෝ සතරදෙනෙක් වූහ. ඔවුහු තම යහළුවා කෙස් රැවුල් බහා කහවත් හැඳ පැවිදි වූබව අසා අවුත් යස තෙරුන් හමුව තමන් ද පැවිදි වීමට කැමති බව පැවසූහ. යස තෙරුන් වහන්සේ ඔවුන් බුදුරජාණන්වහන්සේට හඳුන්වා දුන්හ. ඔවුහු ද දහම් අසා පැවිදිව රහත් බවට පැමිණියහ.

විවිධ ප්‍රදේශයන්හි උසස් කුලවලට අයත් වූ තවත් යස තෙරුන්ගේ යහළුවෝ පණස් දෙනෙක් ද පැමිණ දහම් අසා පැවිදිව රහත් බවට පත් වූහ. බුද්ධත්වයෙන් දෙමසක් පමණ ගතවන විට ක්‍රමයෙන් රහතන් වහන්සේලාගේ සංඛ්‍යාව සැටක් බවට පත්විය. මේ සියළු දෙනාම උසස් කුලවලින් පැමිණ පැවිදිවූවෝ වෙති.

නාම-රූප වශයෙන් ගැනෙන පස්කඳෙහි ''මම ය මාගේ ය'', යන හැඟීමක් නැත්තා භික්ෂුව ය.

367. සබ්බසො නාමරූපස්මිං
යස්ස නත්ථි මමායිතං
අසතා ච න සොචති
ස වෙ භික්ඛූති වුච්චති (25:8)

නාමරූපයන් කෙරෙහි කිසිදු ලෙසකින්
මගේයයි ගැනීමක් කෙනෙකුගේ නැද්ද
සත්‍ය ලෙස නැති දෙයෙහි නොවැලපෙයි ද
හෙතෙම භික්ෂුවකැයි කියනු ලැබේ.

නාමරූපයන් කෙරෙහි නො ඇලුණු හෙතෙම භික්‍ෂුවකි

25 (6) බුදුන්ට දන් පිදූ බමුණකුගේ කථාව (ගාථා 367)

බුදු පාමොක් මහ සඟනට නිතර දන් පුදන **පරිත්‍යාගශීලී බමුණෙක්** සැවැත් නුවරෙහි වාසය කළේය.

දිනක් බුදුරජාණන් වහන්සේ මහා කරුණා සමාපත්තියෙන් ලොව බලා වදාරණ කල්හි මේ බමුණාට සහ ඔහුගේ බිරියට අනාගාමි ඵලයට පැමිණීමේ හේතුවාසනා ඇති බව දිවැසින් දුටු සේක. ඒ අනුව බුදුරජාණන්වහන්සේ එහි වැඩමවා බමුණාගේ නිවසෙහි දොරටුව ඉදිරිපිට වැඩසිටි සේක. බමුණා අහර ගනිමින් සිටි බැවින් ඒබව නුදුටුවේය. එතකුදු වුවත් බැමිණිය දුටුවාය.

එහෙත් බමුණා තමා බුදිමින් සිටි අහර බුදුරදුනට පුදනු ඇතැයි බියෙන් ඔහුට ඒබව නොකීවාය. එසේ වුවහොත් යළිත් ඇයට අහර පිසීමට සිදුවන බැවිනි. ඇය මෙබඳු සිතිවිලිත් සමග බුදුරදුන් සැමියාට නොපෙනෙන පරිදි සැමියා ඉදිරිපසට වී සිට ගත්තාය. අනතුරුව ඇය සෙමින් සීරුවේ පිටුපසට පිය තබමින් බුදුරදුන්ට සමීපව "ස්වාමීනි අද ඔබට දීමට කිසිවක් අප ලග නැතැ"යි කීවාය. බුදුරජාණන් වහන්සේ එය අසා තම අත වැනූ සේක. එය දුටු බැමිණිය තමා පාලනය කරගත නොහී සිනහසෙන්නට වූවාය.

එකෙණෙහි බමුණා හිස හරවා බලා බුදුරදුන් වැඩසිටි අයුරු දුටුවේය. ඔහුට තම බිරිය කළ දේ වැටහිණ. හෙතෙම ඇයට දොස් නගන්නට පටන් ගත්තේය. "තී මා නැසුවෙහිය. අප බුදු පියාණන් පැමිණ සිටින විට තී ඒබව මට කිවයුතුව තිබිණ. එසේ නොකිරීමෙන් තී මට නපුරක් කළෙහිය". බමුණා එසේ දොස් නගමින් තම අහර බඳුන ගෙන බුදුරදුන් වෙත ගොස් සමාව අයදිමින් "ස්වාමීනි මේ මා අඩක් වැළඳූ අහර අනුකම්පාවෙන් පිළිගනු මැනවි. අඩක් වැළඳූ අහර පිදීමට සිදුවීම ගැන කණගාටු වෙමැ"යි පැවසීය.

"බමුණ, කවර අහරක් වුව ද මට සුදුසුය"යි බුදුරජාණන් වහන්සේ බමුණාට පිළිතුරු වශයෙන් පැවසූහ. තමා පිදූ ආහාරය බුදුන් වහන්සේ විසින් පිළිගැනීම පිළිබඳව බමුණා බෙහෙවින් ම සතුටට පත් වෙමින් "කවර ලෙසකින් භික්‍ෂුවක් වන්නේදැ"යි බුදුන් වහන්සේගෙන් විමසීය. බමුණා සහ බැමිණිය මේ වන විටත් මානසිකත්වය හා භෞතිකත්වය (නාමරූප) පිළිබඳව ධර්මානුකූලව යමක් දන්නා බව දැන සිටි බුදුරජාණන් වහන්සේ "බමුණ, නාමරූපයන්හි යමෙක් නොඇලේ නම් හෙතෙම භික්‍ෂුවක් නම් වෙතැ"යි පැවසූ සේක. මෙම ධර්ම දේශනාව අවසන්හි බමුණා සහ බැමිණිය අනාගාමි ඵලයෙහි පිහිටියහ.

විස්තරාත්මක අනුවාදය (367 ගාථාව)

යස්ස නාමරූපස්මිං සබ්බසො මමායිතං නත්ථි අසතා
ච න සොචති සො වෙ භික්ඛූති වුච්චති

යස්ස: යමෙකුට; **නාමරූපස්මිං**: නාමරූපයන්හි; **සබ්බසො**: සර්වප්‍රකාරයෙන් ම; **මමායිතං**: මගේයයි ගැනීමක්; **නත්ථි**: නැද්ද; **අසතා ච**: සත්‍ය වශයෙන් නොපවතින දෙයෙහි; **න සොචති**: ශෝක නොකරයි ද; **සො**: හෙතෙම; **වෙ**: ඒකාන්තයෙන් ම; **භික්ඛූති**: භික්‍ෂුවකැය; **වුච්චති**: කියනු ලැබේ.

යමෙක් නාමරූපයන් තමන්ගේය යන හැඟීමෙන් ඉවත් වූයේ ද ඔහුට මම මගේ යන සංකල්පවල පැවැත්මක් නැත. එවිට ඔහුගේ නාමරූපයන් දිරාපත් වී නැසී ගියද ඔහුට ශෝකයක් නැත. එබඳු පුද්ගලයා භික්‍ෂුවක් නම් වෙයි.

විවරණය

නාමරූපස්මිං: යනු මානසිකත්වය සහ භෞතිකත්වයි. මෙය ප්‍රතීත්‍යසමුත්පාදයෙහි සතරවැනි සම්බන්ධකයයි. විඥානය ප්‍රත්‍යය වෙමින් එය බිහි වෙයි. නාමරූප ප්‍රත්‍යය වෙමින් සළායතනාදිය ඇති වෙයි. ප්‍රතීත්‍යසමුත්පාදය විස්තර කෙරෙන සූත්‍ර දෙකකම විඥානය නාමරූපයන්ටත් නාමරූප විඥානයටත් අන්නෝන්‍ය වශයෙන් ප්‍රත්‍ය වන බව පැවසෙයි. නාමරූප ස්පර්ශයට සෘජු වශයෙන් ප්‍රත්‍යය වෙයි.

සප්ත විසුද්ධීන්ගෙන් තෙවැන්න වන දිට්ඨිවිසුද්ධිය නිර්වචනය කොට ඇත්තේ නාමරූප පිළිබඳ නිවැරදි දැකීම යනුවෙනි. විපස්සනා භාවනාව මාධ්‍යයෙන් නාමරූප පිළිබඳ නිවැරදි දැනීමක් ඇති කරගනු සඳහා විවිධ ක්‍රමොපායයන් ද දක්වා ඇත. මෙම සන්දර්භයෙහිලා නාම යටතට රූපස්කන්ධය හැර අනෙක් ස්කන්ධ සතරම ගෙන තිබේ.

පංච වොකාර භව සංකල්පයෙහිදී නාමරූප දෙක වෙන් නොකළහැකි අනොන්‍ය වශයෙන් රඳා පවතින ධර්මයන් ලෙස දක්වා ඇත. මේ සම්බන්ධය නිදසුන් කොට දක්වා ඇත්තේ එකිනෙක නොවැටී සිටින ලෙස හේත්තු කොට තබා ඇති උණබම්බු මිටි දෙකකටය. එහිදී එකක් ඇද වැටුනහොත් අනෙක ද ඇද වැටෙයි. එසේ ම අන්ධයකු කර මත නැගී සිටින කොරකු ලෙසද නාමරූප දෙකෙහි පැවැත්ම දක්වා ඇත. එකිනෙකාගේ උදව්වෙන් ඒ දෙදෙනා ගමන් ගන්නා බැවිනි.

මෙත් විහරණ ඇති බුදු සසුන්හි පැහැදීම් ඇති පැවිද්දා උතුම් වූ නිවන් සැපතට පැමිණේ.

368. මෙත්තා විහාරී යො භික්ඛූ
පසන්නො බුද්ධසාසනෙ
අධිගච්ඡෙ පදං සන්තං
සඞ්ඛාරූපසමං සුඛං (25:9)

මෙත් සිතින් වෙසෙන භික්ෂුව
සසුනෙහි පසන් වූයේ
සංස්කාර සන්සිඳුණු
ශාන්ත වූ නිවන් සුවය ලබන්නේය

මෙත් සිතින් වෙසෙන භික්ෂුව ශාන්ත සුවය ලබයි

25 (7) සැදැහැති කතකගේ හා සොරුන්ගේ කථාව (368 ගාථාවේ සිට 376 ගාථාව තෙක්)

එක් කලෙක මහා කච්චාන මහ රහතන් වහන්සේ අවන්ති රටෙහි කුරාරඝාර නුවරෙහි කඳු පවුවක වෙසෙද්දී **සෝණ කුටිකණ්ණ** නමැති ගිහි ශ්‍රාවකයෙක් උන්වහන්සේගෙන් ධර්මය අසා සත්‍යය වටහා ගෙන ගිහි ගෙය හැර පියා පැවිදි වීමට කැමැත්ත දැක්විය. එහෙත් උන්වහන්සේ "සොණ තනිව වෙසෙමින් තනිව වළඳමින් කෙරෙන බඹසර විසීම ඉතාම දුෂ්කර ක්‍රියාවකැ"යි පවසමින් දෙවරක් ම ඔහුව හරවා යැවීය.

නමුත් සෝණ අධිෂ්ඨානය අත්හළේ නැත. හෙතෙම තෙවැනි වරද පැවිද්ද අයැද සිටියේය. එවර හෙතෙම මහා කච්චාන මහ රහතන් වහන්සේගෙන් පැවිද්ද ලබා ගැනීමට සමත් විය. දක්ෂිණ ජනපදයෙහි භික්ෂූන්වහන්සේගේ හිඟය නිසා වසර තුනක් ගත වන තෙක් සෝණට උපසපන් බව ලබා ගැනීමට නොහැකි විය. තෙවසරකින් උපසපන්වූ හෙතෙම සැවතෙහි දෙව්රම් වෙහෙරට ගොස් බුදුන් වහන්සේ දැකබලා ගැනීමට අදහස් කොට සිය උපාධ්‍යායවරයාගෙන් අවසර ලබා ගත්තේය. උපාධ්‍යායවරයාගෙන් පණිවිඩයත් ද රුගෙන හෙතෙම සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩසිටි බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට පිටත්ව ගියේය. දෙව්රම් වෙහෙරට පිවිසි හෙතෙම බුදුන් දැක වැඳපුදා සිටි කල්හි බුදුරජාණන්වහන්සේ විසින් පිළිගනු ලැබූ ඔහුට උන්වහන්සේ සමග ම ගඳකිළියෙහි රැය පහන් කිරීමට අවසර ලැබිණ.

සෝණ තෙරුන් වහන්සේ රැයින් වැඩි කොටසක් සක්මණින් කල් යවා ඉතිරි කොටස ගඳකිළියෙහි තමන්ට වෙන්ව තිබූ සයනෙහි ගත කළේය. රැය පහන් වූ විට අවදි වූ උන්වහන්සේට බුදුන් වහන්සේගේ නියමයෙන් සුත්තනිපාත අට්ඨක වර්ගය සජ්ඣායනය කිරීමට සිදුවිය. ඒ සජ්ඣායනය ඉතා නිවැරදිව මධුරස්වරයෙන් පැවැත්වීම නිසා බුදුන් වහන්සේ තම ප්‍රසාදය පළ කරමින් "මැනවි සෝණ මැනවි ඔබ ඉතා හොඳින් එය කළෙහිය"යි ස්තුති කළහ. එය අසා දෙව් බඹ පිරිස් ද සාධුකාර දෙමින් ස්තුතිය පළ කළේය.

එවේලෙහි දෙව්රම් වෙහෙරෙන් යොදුන් එකසිය විස්සක් දුරින් පිහිටි අවන්තියෙහි කුරරඝාර නුවරෙහි විසූ සෝණ තෙරුන්ගේ මවගේ නිවසට අධිගෘහිත දේවතාවා ද මහ හඬින් සාධුකාර දුන්නේය. සෝණ තෙරුන්ගේ මව ඒ හඬ අසා වට පිට බැලීමේදී දේවතාවා දැක සාධුකාර දුන්නේ කවරෙක්දැයි ඇසුවාය. තමා සාධුකාර දුන් බව පැවසූ දේවතාවාගෙන් ඔබ කවරෙක්දැයි විමසූ තමා නිවසට අධිගෘහිත දේවතාවා බව පැවසීය. "මීට පෙර ඔබ මට සාධුකාර දී නැත. අද සාධුකාර දුන්නේ කුමක් නිසාදැ"යි මාතාව විමසූ විට ඔහු කියා සිටියේ තමන් සාධුකාර දුන්නේ සෝණ කුටිකණ්ණ තෙරුන් වහන්සේට බවයි.

"මගේ පුතා කුමක් කළේදැ"යි මාතාව විමසා සිටියාය. "අද ඔබේ පුතා බුදුන් වහන්සේ සමග ගඳකිළියෙහි වෙසෙමින් බුදුන්වහන්සේගේ ඉල්ලීමෙන් ගාථා සජ්ඣායනය කළේය. එය අසා උන්වහන්සේ ද සාධුකාර දුන්සේක. ඒනිසා මම ද සාධුකාර දුන්නෙමි. බුදුන්වහන්සේගේ සාධුකාර හඬ අසා පොළවේ සිට අකනිටා බඹ ලොව දක්වා වූ සියළු දෙව්බඹහුද සාධුකාර දුන්නාහුය" දේවතාවා පැවසීය.

"ඔබ පවසන්නේ සත්‍යයක්ද? ඇත්තටම මා පුතු බුදුපියාණන් හමුවේ දහම් දෙසුවේද? එසේ නැතහොත් බුදුපියාණෝ මාපුතුට දහම් දෙසූ සේක්ද?"

"නැත. ඔබ පුත් සෝණ තෙරණුවෝ බුදුරජාණන් වහන්සේට දහම් දෙසූහ."

දේවතාවා එසේ කී විට ඕතොමෝ පස්වණක් ප්‍රීතියෙන් පිණා ගියාය. "ඉදින් මගේ පුතා ගඳකිළියෙහි බුදුන් සමග වැඩ හිඳිමින් බුදුන් හමුවෙහි දහම් දෙසුවේ නම් උන්වහන්සේ ආපසු පැමිණි විට මට ද උන්වහන්සේගෙන් දහම් ඇසිය හැකිය. මා පුතු පෙරළා පැමිණි පසු දහම් දෙසීමට සූදානම් කරන්නෙමි. ඒ දහම් මම අසන්නෙමි". ඕතොමෝ එසේ සිතුවාය.

විස්තරාත්මක අනුවාදය (368 ගාථාව)

යො භික්ඛු මෙත්තා විහාරී බුද්ධසාසනෙ පසන්නො
සඞ්ඛාරූපසමං සුඛං සන්තං පදං අධිගච්ඡෙ

යො භික්ඛු: යම් භික්ෂුවක්; **මෙත්තා විහාරී**: මෙත් සිතින් වෙසේද; **බුද්ධසාසනෙ**: බුදුසසුනෙහ; **පසන්නො**: පැහැදුනේද; **සඞ්ඛාරූපසමං**: සංස්කාර උපසමනය වූ (සන්සිඳුණු); **සුඛං**: සුවය ඇති; **සන්තං පදං**: නිවන; **අධිගච්ඡෙ**: ලබන්නේය.

මෙත් සිත පතුරුවා වෙසෙන බුදුසසුනෙහි පසන් සිතැති භික්ෂුව සංස්කාරයන් සංසිඳුණු සුවය ඇති නිවන ලබන්නේය.



මේ අත් බැව් නමැති නැවේ පිරී තිබෙන කෙලෙස් සිතිවිලි නමැති ජලය ඉසදමා නිවන් පුරයට වහා යන්න.

369. සිඤ්ච භික්ඛු ඉමං නාවං
සිත්තා තෙ ලහුමෙස්සති
ඡෙත්වා රාගං ච දොසං ච
තතො නිබ්බාණමෙහිසි (25:10)

මහණ, මේ නැව හිස් කරන්න
එය හිස් වූ විට ඉක්මණින් යයි
රාගය ද ද්වේෂය ද සිඳ (දැමීමෙන්)
නිවණට පහසුවෙන් පැමිණෙන්නේය

රාගය සහ ද්වේෂය හැර දමන්න

25 (7) සැදැහැති කතකගේ හා සොරුන්ගේ කථාව (368 ගාථාවේ සිට 376 ගාථාව තෙක්)

බුදුරජාණන්වහන්සේ **සෝණ තෙරුන්ගේ** සජ්ඣායනයට සාධුකාර දුන් පසු සෝණ තෙරණුවෝ මෙසේ සිතූහ. "දැන් මගේ උපාධ්‍යායයන් වහන්සේගේ පණිවිඩය දැනුම්දීමට නිසි වේලාවය". එසේ සිතා ඒ පණිවිඩයට අනුව බුදුන් වහන්සේගෙන් වර පසක් අයැද සිටියහ. ඉන් පළමු වරය වූයේ විනයධර භික්ෂුවක් සහිත පංචවග්ගික භික්ෂූන්වහන්සේට ප්‍රත්‍යන්ත දේශයකදී උපසම්පදාවක් පැවැත්වීමට අනුදැනීමයි. එම වරය ද ලබාගෙන කිහිප දිනක් දෙව්රමෙහි වැස අනතුරුව සෝණ තෙරුන්වහන්සේ තම උපාධ්‍යායයන් වූ මහා කච්චාන මහ රහතන්වහන්සේ බැහැ දැකීමට ආපසු පැමිණියහ.

පසු දින මහා කච්චාන මහ රහතන්වහන්සේ සෝණ තෙරුන් ද සමග පිඩු සිඟා වඩිමින් තෙරුන්ගේ මවගේ නිවස අබියසට ද පැමිණියහ. මව සෝණ තෙරුන් දුටු විගස සතුටින් පිණා ගොස් උන්වහන්සේගෙන් මෙසේ ඇසුවාය. "ස්වාමීනි ඔබවහන්සේ බුදුපියාණන් සමග ගඳකිළියෙහි වෙසෙමින් උන්වහන්සේට දහම් සජ්ඣායනය කළ බව සැබෑවක්ද?"

"මාතාවනි ඔබට එය පැවසුවේ කවරෙක්ද?" සෝණ තෙරණුවෝ විමසූහ.

"මේ ගෘහයට අධිගෘහිත දේවතාවා එසේ පැවසීය." මව පිළිතුරු දුන්නාය.

සෝණ තෙරුන්ගේ මව තව දුරටත් මෙසේ කීවාය: "දේවතාවා එසේ පැවසූ පසු මට මෙබඳු අදහසක් ඇතිවිය. "ඉදින් මගේ පුතා බුදුන් හමුවේ දහම් දෙසුවේ නම් මට ද දහම් දෙසනු ඇත." එසේ පැවසූ ඇය තමන් සූදානම් කරන දිනට තමන්ට සදහම් දෙසන ලෙසට ඇරයුම් කළාය. තෙරණුවෝ එය පිළිගත්හ, නියමිත දිනයේදී එම කාන්තාව භික්ෂුසංඝයාට දන් පිළිගන්වා ගරුබුහුමන් දැක්වූවාය.

අනතුරුව සෝණ තෙරුන්ගෙන් දහම් ඇසීමට සිතා ගෙදර රැකවලට එක් දැස්සක රඳවා සෙසු සියළු පිරිවර සමග දහම් ඇසීමට ගියාය. ධර්ම දේශනාව පැවැත්වීමට නගරයේ කිසියම් තැනක මණ්ඩපයක් පිළියෙල කොට තිබිණ. සෝණ තෙරණුවෝ එතැනට වැඩමවා අලංකාර ලෙස පිළියෙල වූ අසුනෙහි හිඳ දම් දෙසීම ආරම්භ කළහ.

මෙදින මේ වේලාවෙහි සොරුන් නව සියයක් දෙනා මේ කාන්තාවගේ නිවසට පැන එහි භාණ්ඩ සොරකම් කිරීමට සූදානම් වෙමින් සිටියහ. මේ නිවස සොරුන්ගෙන් ආරක්ෂා වීම සඳහා නිවස වටා පවුරු සතක් ඉදිකොට එකිනෙකට ආරක්ෂිත දොරටු දමා තිබිණ. මේ හැර විටින් විට දරුණු සුනඛයෝ දොරටු වටා යමින් රැකවලෙහි යෙදුනාහ. තවද නිවසේ පියස්සෙන් ජලය පතිත වන තැන අගලක් කැණ එහි දිය පුරවා තිබිණ. දිය අගල අසලින් තියුණු හුල් ඇති යහුල් ද ළං ළංව සිටුවා තිබිණ.

නිවසෙහි මෙබඳු ආරක්ෂාව නිසාත් නිවෙස් වැසියන් සිටි නිසාත් මීට පෙර සොරුනට එහි සොරකම් කිරීමට අවස්ථාවක් නොලැබිණ. එහෙත් මෙදින නිවෙස් වැසියන් නොමැති බව දැන සොරු පැමිණ පවුරුවලට හා දිය අගල්වලට යටින් උමගක් හාරා නිවසට සමීප වූහ. සොරමුල නිවසට ඇතුළු වීමට පෙර සොර දෙටුවා දහම් අසමින් සිටි ගෙහිමි කාන්තාව වෙත යවා ඇය මුර කිරීමටත් කිසිවකුගෙන් සොරුන් නිවසට ආ පුවත දැන එහි යාමට ඇය සැරසුණහොත් කඩුවෙන් කපා ඇය මරා දැමීමටත් තීරණය කළේය. ඒ අනුව සොර දෙටුවා විහාරයට යවා සොරු ගෙට ඇතුළු වූහ.

විස්තරාත්මක අනුවාදය (369 ගාථාව)

භික්ඛු ඉමං නාවං සිඤ්ච තෙ සිත්තෙ ලහුං එස්සති
රාගං ච දොසං ච ඡෙත්වා තතො නිබ්බාණං එහිසි

භික්ඛු: මහණ; **ඉමං නාවං**: මේ නැව; **සිඤ්ච**: හිස්කරන්න; **තෙ**: එය; **සිත්තෙ**: හිස් කළ විට; **ලහුං**: සැහැල්ලු බවට; **එස්සති**: පැමිණෙන්නේය; **රාගං ච**: රාගයද; **දොසං ච**: ද්වේෂයද; **ඡෙත්වා**: සිඳ දමා; **තතො**: එයින්; **නිබ්බාණං**: නිවනට; **එහිසි**: පැමිණෙන්නෙහිය.

මහණ, ඔබේ නැව හිස් කළ යුතුය. එවිට එය සැහැල්ලු වෙයි. රාගය සහ ද්වේෂය සිඳ දැමිය යුතුය. එවිට ඔබ නිවනට පැමිණෙන්නෙහිය.

දස සංයෝජන සිඳ පසක් වැඩූ පස් සංගයන් ඉක්ම වූ පැවිද්දා සතර මහ ඕඝයෙන් එතෙරවූවෙකි.

370. පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ
පඤ්චචුත්තරි භාවයෙ
පඤ්ච සඞ්ගාතිගො භික්ඛු
ඔඝතිණ්ණොති වුච්චති (25:11)

පහක් සිඳින්න පහක් අත්හරින්න
මත්තෙහි පහක් වඩන්න
පස් බැඳුම් ඉක්මවා ගිය භික්ෂුව
සැඩ පහරින් එතෙර වූවෙකැයි කියනු ලැබේ

සංයෝජන ඉවතලූ තැනැත්තේ සැඩපහර ඉක්මවූවෙකි

25 (7) සැදැහැති කතකගේ හා සොරුන්ගේ කථාව (368 ගාථාවේ සිට 376 ගාථාව තෙක්)

ඔවුහු ගෙතුළ පහනක් දල්වා තඹකාසි තිබූ ගැබෙහි දොර විවර කළහ. එවිට නිවසෙහි සිටි දැස්ස මෙය දැක වහා විහාරයට ගොස් සොරුන් තඹකාසි සොරා ගන්නා බව ස්වාමි දියණියට දැන්වූවාය.

කාන්තාව එය අසා "දැස්ස, සියලු තඹකාසි සොරු රැගෙන ගියාවේ. මම මගේ පුතණුවන්ගෙන් දහම් අසමි. මගේ බණ ඇසීමට අවහිර නොකර නිවසට යව"යි කීවාය. සොරු තඹකාසි සියල්ල ගෙන රිදීකාසි ඇති ගැබට පිවිසුණහ. දැස්ස ඒබව ද ස්වාමි දියණියට සැළ කළාය. එවර ද ඇය කීවේ "දැස්ස මගේ බණ ඇසීමට අවහිර නොකරව. සොරු සියලු රිදීකාසි රැගෙන ගියාවේ. තී නිවසට යව" යනුවෙනි.

සොරු රිදීකාසි සියල්ලද ගෙන රන්කාසි ඇති ගැබට පිවිසුණහ. දැස්ස දිව ගොස් ඒබව ද ස්වාමි දියණියට සැළ කළාය. "දැස්ස, තී දෙවරක් මෙහි අවුත් මගේ ධර්මශ්‍රවණයට අවහිර කෙළෙහිය. සියලු රන්කාසි සොරු රැගෙන ගියාවේ. මම මගේ පුතණුවන්ගෙන් දහම් අසමි. මගේ බණ ඇසීමට අවහිර නොකර නිවසට යව. තී යළිත් පැමිණ මට අවහිර කළහොත් තිට කරන දේ දනුවයි"යි කියා එම කාන්තාව දැස්ස හරවා යැව්වාය.

සොර දෙටුවා මේ සියල්ල අසා සිට තමාටම මෙසේ කියා ගත්තේය. "අපි මෙබඳු කාන්තාවකගෙන් භාණ්ඩ සොරා ගතහොත් අපට හෙණ හතම ගසාවි, අප කළේ මහා අපරාධයකි" මෙසේ සිතූ හෙතෙම වහා දිව ගොස් "ඉක්මන් කරවු. ගත් සියලු දේ ඒ ඒ තන්හිම තබවු"යයි අණ කළේය. ඒ ඇසූ සොරු වහ වහා සොරා ගත් සියලු දේ ගත් ගත් තැන්හිම තැබුවාහුය. සත්‍යයෙන් ම සොරුන්ගේ මේ හැසිරීම අන් කිසිවක් නොව ධර්මයෙහි බලය අත්පානා පිට ක්‍රියාත්මක වීමකි.

ධර්මය ධර්මයෙහි හැසිරෙන්නාව ආරක්ෂා කරතැයි දෙසූ බුදුරජාණන්වහන්සේ මෙසේ වදාළහ.

ධර්මය ධර්මයෙහි හැසිරෙන්නා රකියි
ධාර්මික ජීවිතය සතුට ගෙන දෙයි
ධාර්මිකව ජීවත් වීමේ ආනිසංශය මෙයයි
ධර්මයෙහි හැසිරෙන්නා කිසිවිට දුගතියට නොයයි.

කරමින් සිටි සොරකම අත්හළ සොරු දහම් දෙසන ශාලාවට ඇතුළු වී බණ අසන්නට වූහ. රැය පහන් වූ කල්හි තෙරණුවෝ දම් දෙසුම නිමවා ධර්මාශනයෙන් පිටතට වැඩම කළහ. එකෙණෙහි සොර දෙටුවා තෙරණුවන්ගේ මව වෙතට ගොස් වැඳවැටී මෙසේ කීවේය: "ස්වාමි දියණියෙනි සමා වුව මැනවි" "කිමෙක්ද? ඇයි ඔබ සමාව අයදින්නේ" කාන්තාව ඇසුවාය.

"ඔබ අකැමැති දෙයක් මම කෙළෙමි. ඔබව නැසීමට සිතා මෙහි සිටියෙමි"යි සොර දෙටුවා සියල්ල නොවළහා කීවේය. කාන්තාව එය අසා සමාව දුන්නාය. අනෙක් සොරු ද එසේම සමාව ගත්හ. අනතුරුව සොරු කාන්තාව අමතා "ඔබතුමිය සමාව දෙන්නේ නම් අපි ඔබතුමියගේ පුත් තෙරුන් වහන්සේගෙන් පැවිද්ද ලබාගනු කැමැත්තෙමු"යි කීහ.

විස්තරාත්මක අනුවාදය (370 ගාථාව)

පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච උත්තරි භාවයෙ
පඤ්ච සඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණො ඉති වුච්චතෙ

පඤ්ච: (ඔරම්භාගිය සංයොජන) පහ, **ඡින්දෙ**: සිඳින්නේය, **පඤ්ච**: (උද්ධංභාගිය සංයොජන) පහ, **ජහෙ**: අත්හරින්නේය, **උත්තරි**: මත්තෙහි වූ, **පඤ්ච**: පංච බලයන්, **භාවයෙ**: වඩන්නේය, **පඤ්ච සඞ්ගාතිගො**: පස් බැඳුම් ඉක්මවා ගිය, **භික්ඛු**: භික්ෂුව, **ඔඝතින්නො ඉති**: සැඩපහර තරණය කරන ලද්දෙකියි, **ඉති වුච්චති**: කියනු ලැබේ.

(ඔරම්භාගිය සංයොජන) පහ, සිඳින්නේය, (උද්ධංභාගිය සංයොජන) පහ අත්හරින්නේය, මත්තෙහි වූ පංච බලයන් වඩන්නේය, පස් බැඳුම් ඉක්මවා ගිය භික්ෂුව සැඩපහර තරණය කරනලද්දෙකියි කියනු ලැබේ.

දැහැන වඩන්න. සිත කම්සැපයෙහි නො යොදන්න. පමාවී නිරයෙහි ඉපිද ලෝහගුලි නො ගිලින්න.

371. ඣාය භික්ඛු මා ච පමාදො මා තෙ කාමගුණෙ භමස්සු චිත්තං මා ලොහගුලං ගිලි පමත්තො මා කන්දි දුක්ඛං ඉදන්ති ඩය්හමානො (25:12)	මහණ, භාවනා කරන්න. පමා නොවන්න කාමගුණයෙහි සිත යොමු නොකරන්න පමා වෙමින් ලෝහ ගුලි නොගිලින්න දැවෙමින් මේ දුකකැයි නොහඬන්න

උනන්දුවෙන් භාවනාවෙහි යෙදෙන්න

25 (7) සැදැහැති කතකගේ හා සොරුන්ගේ කථාව (368 ගාථාවේ සිට 376 ගාථාව තෙක්)

සෝණ තෙරුන්ගේ මව තෙරුන් සමීපයට ගොස් ගෞරව දක්වා මෙසේ කීවාය: "ස්වාමීනි, මේ සොරු මගේ යහ ගුණයන්ටත් ඔබවහන්සේගේ දහම් දෙසුමටත් පැහැදී සසුන්ගත වීමට කැමැත්ත පළ කරති. අනුකම්පා කොට ඔවුන් සසුන්ගත කළ මැනවි". "ඉතා මැනවැ"යි පැවසූ තෙරුන් වහන්සේ සොරුන්ගෙන්ම වස්ත්‍ර ලැබ ඒවා කපා සිවුරු කරවා පඬු පොවා ඔවුනට හඳවා සසුන්ගත කළහ. ඔවුන් උපසපන්හි ද පිහිටි පසු ඔවුනට එකිනෙකාට ගැලපෙන පරිද්දෙන් කමටහන් දී භාවනා කිරීමට උපදෙස් දුන්හ. අනතුරුව මේ නව සියයක් භික්ෂූන්වහන්සේලා භාවනාවට අරමුණු ද ලබාගෙන කිසියම් පර්වත පාදයකට ගොස් තමතමන්ට එක් එක් ගස බැගින් තෝරාගෙන ඒ ගස් සෙවනෙහි හිඳ භාවනානුයෝගී වූහ.

බුදුරජාණන්වහන්සේ යොදුන් එකසිය විස්සක් ඈතින් වූ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙමින්ම දිවැසින් මේ නවසියයක් භික්ෂූන් දැක ඔවුන් දෙසට රැස්වලල්ලක් යවා එහි තමන් ඔවුන්ගේ මුහුණට මුහුණ ලා පෙනී සිටිමින් මෙම ගාථාවන්ගෙන් ධර්මදේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (371 ගාථාව)

භික්ඛු ඣාය මා ච පමාදො තෙ චිත්තං කාමගුණෙ මා
භමස්සු පමත්තො ලොහගුලං මා ගිලි ඩය්හමානො
ඉදං දුක්ඛං ඉති මා කන්දි

භික්ඛු: මහණ; **ඣාය**: භාවනා වඩන්න; **පමාදො**: ප්‍රමාදවූයේ; **මා ච**: නොවන්න; **තෙ**: ඔබගේ; **චිත්තං**: සිත; **කාමගුණෙ**: කාමගුණයෙහි; **මා භමස්සු**: යොමු නොකරන්න; **පමත්තො**: පමා වූයේ; **ලොහගුලං**: යගුලිය; **මා ගිලි**: නොගිලින්න; **ඩය්හමානො**: දැවෙන්නේ; **ඉදං**: මෙය; **දුක්ඛං ඉති**: දුකකැයි; **මා කන්දි**: නොහඬන්න.

මහණ, භාවනා කරන්න. පමා නොවන්න. කාමගුණයෙහි සිත යොමු නොකරන්න. පමා වෙමින් යගුලිය නොගිලින්න. දැවෙමින් මේ දුකකැයි නොහඬන්න්.

විවරණය

මෙත්තාවිහාරී: මෙත් සිත පතුරුවා විසීමයි. බුදු සසුනෙහි මෙය බෙහෙවින් අවධාරණය කරන්නකි.

මෙත්තා: මෙයින් අදහස් වන්නේ සීමා බන්ධන රහිතව සමස්ත සත්ව සංහතිය කෙරෙහි පතුරුවාලන මිතුරු බවයි. ඒ වූ කලී ආත්මපරිත්‍යාග යේ ධනාත්මක අංශයයි. මෙහි දී කොටස් කිරීමක් හෝ වෙන් කිරීමක් නැත. සමස්ත විශ්වය පුරා එක සේ පතුරුවාලන මෙම මිතුරුබව ලොකු කුඩා භේදයකින් තොරව සෑම සතකු කෙරෙහිම යොමු වෙයි. මෛත්‍රිය බුදුන්වහන්සේගේ මෙන්ම උන්වහන්සේගේ ශ්‍රාවකයන්ගේ ජීවිත තුළින්ද ප්‍රදර්ශනය කෙරිණ.

එය හුදෙක් ඇලීම් බැඳීම්වලින් තොර උත්කෘෂ්ට මානසික අවස්ථාවකි. අනුන්ට සේවය කිරීම හොඳහිත හා මිතුරුබව ඒතුළ ගැබ්වී ඇත. මෙය ක්‍රියාත්මක වන්නේ පුද්ගලයාගේ කායික වාචසික හා මානසික ක්‍රියා අනුසාරයෙනි. මෙම උතුම් ගුණාංගයේ වැදගත්කම පැහැදිළි කිරීමට බුදුන්වහන්සේගේ දේශනා රැසකින් උත්සාහ දරා ඇත.

මෛත්‍රියේ භාවිතය මනොවිද්‍යාත්මකව සැළකෙන්නේ නම් සදාචාර සංකල්පයක් ලෙස හැඳින්විය හැකිය. එය හුදු භාවනා මාත්‍රයක් පමණක් නොව හොඳහිත පිළිබඳ භාවප්‍රකාශනයකි. කෙසේ වුවද භාවනාව ප්‍රගුණ කරන්නා කවර භාවනාවක නිරත වුවත් ද්වේෂය තරහ වැනි කෙලෙස් මනසින් ඉවත් කළයුතු බැවින් මෛත්‍රියද වැඩිය යුතු වෙයි. එබැවින් මෛත්‍රිය භාවනාව අත්‍යවශ්‍ය අංගයක් වෙයි.
මහා රාහුලොවාද සූත්‍රයෙහිදී බුදුරජාණන්වහන්සේ කුඩා රාහුල තෙරුනට ද්වේෂය දුරු කිරීම සඳහා මෛත්‍රිය වැඩීමට උපදෙස් දුන් සේක. මෙඝිය සූත්‍රයේදී පාපසිතිවිලි නිතර සිතේ පහළ වීම නිසා භාවනාවෙන් නිසි පල ලද නොහැකි වූ මෙඝිය තෙරුනට මෛත්‍රිය වැඩීමට උපදෙස් දුන් සේක. ඒ අනුව මෛත්‍රිය වඩා පාපසිතිවිලි ඉවත් කොට රහත් බව ලබා ගැනීමට මෙඝිය තෙරුන්ට හැකි විය.

අනුවණයාට දැහැනයෙක් නැත. දැහැන නො වඩන්නාට නුවණ නැත. දැහැණත් නුවණත් ඇත්තා නිවණ ළඟ ම ය.

372. නත්ථි ඣානං අපඤ්ඤස්ස
නත්ථි පඤ්ඤා අඣායතො
යම්හි ඣානං ච පඤ්ඤා ච
ස වෙ නිබ්බාන සන්තිකෙ (25:13)

නුවණ නැත්තාට ධ්‍යානයක් නැත,
ධ්‍යාන නොකරන්නාට ප්‍රඥවක් නැත,
යම් කෙනෙකුට ධ්‍යානය හා ප්‍රඥව ඇත්තේ නම්
හෙතෙම නිවන සමීපයෙහිය.

ධ්‍යාන නොකරන්නාට ප්‍රඥාවක් ඇති නොවේ

25 (7) සැදැහැති කතකගේ හා සොරුන්ගේ කථාව (368 ගාථාවේ සිට 376 ගාථාව තෙක්)

විස්තරාත්මක අනුවාදය (372 ගාථාව)

අපඤ්ඤස්ස ඣානං නත්ථි අඣායතො පඤ්ඤා නත්ථි
යම්හි ඣානං ච පඤ්ඤා ච සො වෙ නිබ්බාන සන්තිකෙ

අපඤ්ඤස්ස: නුවණ නැත්තාට; **ඣානං**: ධ්‍යානයක්; **නත්ථි**: නැත; **අඣායතො**: ධ්‍යාන නොකරන්නාට; **පඤ්ඤා**: ප්‍රඥාවක්; **නත්ථි**: නැත; **යම්හි**: යම් කෙනෙකු කෙරෙහි; **ඣානං ච**: ධ්‍යානය ද; **පඤ්ඤා ච**: ප්‍රඥාව ද ඇත්තේ නම්; **සො**: හෙතෙම; **වෙ**: ඒකාන්තයෙන්ම; **නිබ්බාන සන්තිකෙ**: නිවන සමීපයෙහිය.

යමෙකුට ප්‍රඥාව නැත්තේ නම් ඔහුට ධ්‍යානයක් නැත, යමෙකුට ධ්‍යානය නැත්තේ නම් ඔහුට ප්‍රඥාව ද නැත, ප්‍රඥා ධ්‍යාන දෙකම ඇත්තාට ඒකාන්තයෙන් ම නිවන සමීපය.

විවරණය

මෛත්‍රිය වෙනමම භාවනාවක් වශයෙන් පුහුණු කිරීමට ක්‍රම කිහිපයක්ම සූත්‍රයන්හි දක්වා තිබේ. මේ සම්බන්ධයෙන් ක්‍රම සතරක් විශේෂ වශයෙන් සලකා බැලිය හැකිය.

මෙම ක්‍රම සතරින් සතර බ්‍රහ්මවිහාර සංකල්පය සූත්‍රවල නිතර සඳහන් වන අතර තෙජ්ජ සූත්‍රයේදී විශේෂ වශයෙන් දැක්වෙයි. මෙහි දැක්වෙන ආකාරයට මෙත් සිත සියලු සතුන් විෂයෙහි පැතිරවෙයි. එමෙන්ම එය ධ්‍යාන අංගයක් බවටද පත් වෙයි. මෙහිදී මෛත්‍රිය සමගම කරුණා මුදිතා හා උපෙක්ඛා යන අංගද වර්ධනය කෙරෙයි. එහි විශෙෂ ලක්‍ෂණය පැහැදිලි වනු සඳහා පාලි පාඨය මෙහිදී ගෙනහැර දක්වමු.

සො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං පරිත්වා විහරති තථා දුතියං...තථා චතුත්ථං ඉති උද්ධං අධො තිරියං සබ්බධි සබ්බත්ථතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන පරිත්වා විහරති

එහි අදහස මෙසේය:

හෙතෙම මෛත්‍රීසහගත සිත එක් දිසාවක පතුරුවා වාසය කරයි: එසේම දෙදිසාවක...සිවු දිසාවෙහි පතුරුවා වාසය කරයි. එසේම උඩ යට සරස සියලු තන්හි සියල් ලොව පළල් වූ මහත්වූ අපමණ වූ වෛර නැති ද්වේෂ නැති මෛත්‍රීසහගත වූ සිත පතුරුවා වාසය කරයි.

බුද්ධඝොස හිමි විසුද්ධිමග්ගයේදී මේ පාඨය විවරණය කරමින් විකුබ්බනා යනුවෙන් එය විශේෂ කොට දක්වයි. මේ පදය නොයෙක් ආකාරයේ මානසික ශක්තීන් පළට කෙරෙන ඉද්ධිවිධ ඤාණය ගැන සඳහන් කෙරෙන විටද විකුබ්බනා ඉද්ධි යනුවෙන් දක්නට ලැබේ. එයින් අදහස් වන්නේ අප්පණා හෙවත් ධ්‍යාන තත්වය දක්වා වර්ධනය වූ අප්‍රමාණ ලෙස පැතුරුණු මෛත්‍රීසහගත සිතේ ස්ථාවර බවයි. එබැවින් ඉහත සඳහන් පාඨයෙන් කියවෙන්නේ මෛත්‍රිය ප්‍රගුණ කිරීමෙන් ධ්‍යාන තත්වය ලබාගත් පුද්ගලයාගේ මානසික ආකල්පයයි. කරුණා මුදිතා හා උපෙක්ඛා යන මනො තත්වයන් පිළිබඳවද මේ ආකාරයෙන්ම විස්තර වනු දක්නට ලැබේ.

භාවනානුයෝගීන් විසින් තම ජීවයට වැළඳගතයුතු ජීවන පැවැත්මක් විවරණය කෙරෙන මෙම පාඨයෙන් අවධාරණය වන්නේ බාහිර ලෝකය සම්බන්ධයෙන් එබඳු පුද්ගලයකු දක්වන මානසික ආකල්පයයි. එය තව දුරටත් තමා මෙන්ම අනුන් වධයට පත් නොකරන එසේම සන්සුන් සිතින් ශාන්ත භාවයේ සුවය විඳින තමා බ්‍රහ්ම තත්වයෙහි තබා ගන්නා පුද්ගලයකුගේ පැවැත්ම පිළිබිඹු කොට දක්වයි (බ්‍රහ්මභූතෙන අත්තනා). මෙම පාඨයට අදාළ විශේෂ සන්දර්භය උපාලි සූත්‍ර සන්දර්භයට සමාන වෙයි.

එහිදී ධ්‍යාන සහ ඍද්ධිබල ලබා සිටින එහෙත් මෛත්‍රිය ප්‍රගුණ නොකළ පුද්ගලයාට සිතෙහි ද්වේෂය ක්‍රියාත්මක වීමෙන් අනුන් ඝාතනය කිරීමටද හැකිවන බව දැක්වෙයි. දණ්ඩක, කාලිංග, මෙජ්ඣ සහ මාතංග යන වනාන්තර ඒ තත්වයට පත් වූයේ පැරණි ඍෂිවරුන්ගේ (පුබ්බකා ඉසයො) වෛර සිතුවිලි නිසා බවද කියවෙයි. නමුත් එම පාඨයෙන් කියවෙන පරිදි බුද්ධශ්‍රාවකයෝ වෛර ද්වේෂ විරහිතවූ මෙත්සිත මුළු මහත් විශ්වය තුළ පතුරුවා වෙසෙති.

මෙත්තසුත්ත: කරණීයමෙත්තසුත්ත නමින් බෙහෙවින් ප්‍රකට සූත්‍රය ආත්මාරක්‍ෂාව සඳහා වූ මාධ්‍යයක් මෙන්ම කර්මස්ථානයක් ලෙසද මෛත්‍රිය වැඩිය යුතු ආකාරය ඉදිරිපත් කරයි. සතුට හා සාමය අපේක්‍ෂාවෙන් ආගමික ශික්‍ෂණයෙහි යෙදෙන ශ්‍රාවකයාගේ අත්‍යවශ්‍ය යුතුකමක් ලෙස මෙත් වැඩීම එහිදී අවධාරණය වී ඇත. ආගමික සේවාවන්හිදී මෙන්ම විවිධ ලෙඩ රෝග වැළඳුනු අවස්ථාවන්හිදී ඒවායින් ආරක්‍ෂාවීම සඳහා කෙරෙන පිරිත් සජ්ඣායනයන්හිදී භාවිතා කිරීම සඳහා වෙන් කොටගෙන ඇති සූත්‍ර අතුරෙන් මෙත්ත සූත්‍රය බෙහෙවින් වැදගත් තැනක් ගනියි.



නිවුණු සිත් ඇති රූ-අරූ දහම් මනාකොට වෙසෙසා බලන මහණට මිනිසුන් පිළිබඳ නො වූ ප්‍රීතියක් ඇති වේ.

373\. සුඤ්ඤාගාරං පවිට්ඨස්ස
සන්තචිත්තස්ස භික්ඛුනො
අමානුසී රතී හොති
සම්මා ධම්මං විපස්සතො (25:14)

මිනිසුන් නැති හිස් තැනකට පිවිස
සන්සුන් සිතැති භික්ෂුව
ධර්මය ගැන විදසුන් වඩන්නේ
මිනිසත් බව ඉක්මවූ සොම්නසක් ලබයි

සන්සුන් මනසින් විදසුන් වඩන්නා ලොවුතුරු සතුට ලබයි

25 (7) සැදැහැති කතකගේ හා සොරුන්ගේ කථාව (368 ගාථාවේ සිට 376 ගාථාව තෙක්)

විස්තරාත්මක විවරණය (373 ගාථාව)

සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස ධම්මං සම්මා විපස්සතො භික්ඛුනො අමානුසී රතී හොති

සුඤ්ඤාගාරං: ශූන්‍යාගාරයකට; **පවිට්ඨස්ස**: පිවිසියා වූ; **සන්තචිත්තස්ස**: සන්සුන් සිත් ඇති; **ධම්මං**: ධර්මය; **සම්මා විපස්සතො**: මනාව විදර්ශනාවෙන් දකින; **භික්ඛුනො**: භික්ෂුවට; **අමානුසී**: මිනිස් බව ඉක්ම වූ; **රතී**: ඇල්මක්; **හොති**: (ඇති) වෙයි.

ශූන්‍යාගාරයකට පිවිස සන්සුන් සිතින් ධර්මය මනාව විදසුන් නුවණින් දකින භික්ෂුවට මිනිස්බව ඉක්මවාලූ ඇල්මක් ඇති වෙයි.

විවරණය

සියලු භාවනා කටයුතුවලට පෙරාතුව කළයුතු පූර්ව කර්තව්‍යයක් වශයෙන් පාලි මෙත්ත සූත්‍රය සජ්ඣායනය කළයුතුබව යෝගාවචර සංග්‍රහයෙහි සඳහන්ව ඇත. වචන තුළට ආරක්ෂක බලයක් ගැබ්වන ආකාරයෙන් මේ සූත්‍රය සැකසී ඇතැයි විශ්වාස කෙරෙයි. මෙසේවුවද මේ සූත්‍රයෙහි ප්‍රධාන අරමුණ වන්නේ මෛත්‍රිය පැතිරවිය යුතු ආකාරය පැහැදිලි කිරීම හා නිශ්චිත භාවනා ක්‍රමයක් ඉදිරිපත් කිරීමයි.

තවද එය මෙත්සිත පැතිරවිය යුතු ආකාරය තෙවිජ්ජ සූත්‍රයෙහි දැක්වෙන ක්‍රමයට බෙහෙවින් සමාන ආකාරයෙන් හඳුන්වා දීමක් ලෙසද දැක්විය හැකිය. මෙත්ත සූත්‍රයේදී මෛත්‍රිය මාතෘප්‍රේමයට සමාන කොට දැක්වෙයි. එමෙන්ම එය බ්‍රහ්මවිහාරයක් ලෙසද හැඳින්වී ඇත. මෛත්‍රීභාවනාව ප්‍රගුණ කිරීම පුනර්භවයෙන් විමුක්ත වීමට හේතුකාරක වන බවද එහි සඳහන් වෙයි.

මෛත්‍රිය ප්‍රගුණ කිරීමේ අනෙක් විශේෂ ප්‍රයෝගය ඛන්ධපරිත්තයේදී දක්නට ලැබේ. නාගයන්ගෙන් සිදුවන විපත්වලින් ආරක්ෂාවීමේ ක්‍රමයක් වශයෙන් එහිදී එය විස්තර කරනු ලැබේ. සැවැත් නුවර කිසියම් භික්ෂුවක් නාගයකු දෂ්ට කිරීමෙන් මියගිය බව එහි සඳහන් වෙයි. අනෙක් භික්ෂූන් මේ බව බුදුන්වහන්සේට දැන්වීමෙන් පසු උන්වහන්සේ පවසා ඇත්තේ එම භික්ෂුව නාගකුල සතර කෙරෙහි මෛත්‍රිය පතුරුවා නොමැති බවයි. විරූපක්ඛ එරාපථ ඡබ්‍යාපුත්ත හා කණ්හාගොතමක යනුවෙන් නාගකුල සතරක් සඳහන් වෙයි. එම භික්ෂුව ඉහත සඳහන් නාගකුල සතර වෙත මෙත්සිත පැතුරුවේ නම් නාගයකු දෂ්ට කිරීමෙන් මිය නොයනු ඇත. "මහණෙනි, එම නාගයන් වෙත මෙත්සිත පතුරුවා වාසය කරන්නැ"යි (මෙත්තෙන චිත්තෙන පරිත්තං) බුදුරජාණන් වහන්සේ උපදෙස් දුන්හ.

මෙත්සිත පැතිරවීමේ ක්‍රමය මෙහිදී දක්වා ඇත්තේ ගාථාවන්ගෙනි. නාගකුලයන්ගෙන් පටන් ගෙන ක්‍රමයෙන් මෛත්‍රිය ඉදිරියට ව්‍යාප්ත කිරීමේ ක්‍රමයක් එහිදී හඳුන්වා දෙනු ලැබේ,

මගේ මෙත් සිත විරූපක්ඛයන් වෙත පැතිරේවා.
මගේ මෙත් සිත එරාපථයන් වෙත පැතිරේවා.
මගේ මෙත් සිත ඡබ්‍යාපුත්තයන් වෙත පැතිරේවා.
මගේ මෙත් සිත කණ්හාගොතමකයන් වෙත පැතිරේවා.

මෙත්සිත පැතිරවීම ක්‍රමයෙන් ඉදිරියට ව්‍යාප්ත කරනු ලැබේ, ඒ විවිධ සත්ව වර්ගයන් කෙරෙහිය. අපා දෙපා සිවුපා හා බහුපා වශයෙන් සතුන් වර්ග කොට දැක්වෙයි.

ඉන් අනතුරුව භාවනානුයෝගියාගේ ප්‍රාර්ථනය මෙසේ දැක්වෙයි.

පා රහිත සත්තු මට හිංසා නොකරත්වා.
දෙපා සත්තු මට හිංසා නොකරත්වා.
සිවුපා සත්තු මට හිංසා නොකරත්වා.
බහුපා සත්තු මට හිංසා නොකරත්වා.

භාවනානුයෝගියා තව දුරටත් මෙත් සිත අප්‍රමාණ ලෙස වර්ධනය කරයි

සබ්බෙ සත්තා සබ්බෙ පාණා
සබ්බෙ භූතා ච කෙවලා
සබ්බෙ භද්‍රානි පස්සන්තු
මා කඤ්චි පාපමාගමා

සියලු සත්වයෝ සියලු ප්‍රාණීහු
හුදෙක් සියලුම උපන් සත්වයෝ
සියල්ලෝ යහපතක් ම දකිත්වා
කිසිවකුට විපතක් නොවේවා

යමෙක් පස්කඳ දහම්හුගේ හටගැනීම හා නැසීම මෙනෙහි කෙරේ ද ඒ නුවණැතියන්ට අමාවකි.

374. යතො යතො සම්මසති
බන්ධානං උදයබ්බයං
ලභති පීති පාමොජ්ජං
අමතං තං විජානතං (25:15)

ස්කන්ධයන්ගේ උපත හා විපත
නුවණින් විමසයි ද
හෙතෙම ප්‍රීතිය හා ප්‍රමුදිත බව ලබයි
එය දන්නාට අමාසුව දැනෙයි

ඇතිවීම හා නැතිවීම දකින්නා සුවය ලබයි

25 (7) සැදැහැති කතකගේ හා සොරුන්ගේ කථාව (368 ගාථාවේ සිට 376 ගාථාව තෙක්)

විස්තරාත්මක අනුවාදය (374 ගාථාව)

යතො යතො බන්ධානං උදයබ්බයං සම්මසති පීති
පාමොජ්ජං ලභති තං විජානතං අමතං

යතො යතො: යම් යම් සේ; **බන්ධානං**: ස්කන්ධයන්ගේ; **උදයබ්බයං**: ඇතිවීම හා නැතිවීම; **සම්මසති**: නුවණින් සළකයි ද; **පීති පාමොජ්ජං**: ප්‍රීතිය හා ප්‍රමුදිත බව; **ලභති**: අත්කර ගනියි; **තං**: එය; **විජානතං**: දන්නාහට; **අමතං**: අමා සැපතයි.

පංචස්කන්ධයන් ඉපදෙන හා විනාශවන ආකාරය නුවණින් විමසන විට ප්‍රීතිය හා ප්‍රමුදිත බව ඇති වෙයි. එම ප්‍රීතිය හා ප්‍රමුදිත බව දන්නාට නිවන් සුවය දැනෙයි.

විවරණය

මෙම ගාථාවෙහි පසුකාලීන පොත්වල භාවනාවේදී උපයෝගී කෙරෙන සබ්බෙ සත්තා, සබ්බෙ පාණා, සබ්බෙ භූතා වැනි පද යෙදී ඇත,

අවසානයෙහි ප්‍රාර්ථනය මෙසේ දැක්වෙයි:

බුදුන්වහන්සේගේ ගුණ අප්‍රමාණය, ධර්මයේ ගුණ අප්‍රමාණය, සංඝයාගේ ගුණ අප්‍රමාණය,නාග, ගෝනුසු, පත්තෑ, මකුලු, කටුසු, මී වැනි උරගයෝ සීමිතය. මවිසින් රැකවල් කරන ලදි. මවිසින් ආරක්‍ෂාව කරනලදි.

සත්වයෝ මා වෙතින් දුරු වෙත්වා
බුදුන්ට නමස්කාර වේවා
සත් බුදුවරුන්ට නමස්කාර වේවා

මේ සූත්‍රය ඉතා දීර්ඝ වූ හා බෙහෙවින් තහවුරු වූ සම්ප්‍රදායකට හිමිකම් කියයි. එය දක්නට ලැබෙන්නේ ඛන්ධවත්ථු ජාතකයේයි. ඒ ජාතක කථාවට අනුව බෝධිසත්වයෝ තම අනුගාමිකයන්ට උරගයන්ගෙන් ආරක්‍ෂාවීමේ මාර්ගයක් ලෙස මේ පිරිතට අනුව ජීවත් වීමට උපදෙස් දෙති. හිමාලය ප්‍රාන්තයෙහි ඒ පිරිස ජීවත් වූ ප්‍රදේශයෙහි විසකුරු සර්පයන් බහුලව විසූ බැවිනි. බෝසතුන්ගේ උපදෙස් පිළිපදිමින් අනුගාමික තවුසෝ සර්පයන්ගෙන් අනතුරු නොලබා දිගු කලක් ජීවත් වූහ.බෝසත්හුද සතර බ්‍රහ්මවිහාර වඩමින් සිට මිය ගොස් බ්‍රහ්ම ලෝකයෙහි උපන්හ. බුදුන්වහන්සේ තම අතීත අත්දැකීමක් හෙළි කරන මේ කථාව භික්‍ෂූන්ට පවසා එම පිරිතම භික්‍ෂූන්ට ද අනුදැන වදාළසේක.

චුල්ලවග්ගයෙහි එන ඛුද්දක-වත්ත-ඛන්ධයෙහි විනය නීතියක් මෙන්ම යුතුකමක් ලෙස දක්වා ඇති භාවනාමය ක්‍රියාමාර්ගයට මේ පිරිතේ විශෙෂ නම වන ඛන්ධපරිත්ත යන්න සම්බන්ධ වී ඇති බව පෙනේ. මේ පරිත්ත දෙකින් මෙත්ත-සූත්‍රයෙහි දැක්වෙන ක්‍රමය ධ්‍යාන අවස්ථාවෙහි අනුගමනය කෙරෙන ක්‍රමයට මෙන්ම තෙවිජ්ජ සූත්‍රයෙහි එන ක්‍රමයට ද අනුරූප වෙයි. අනෙක් ක්‍රමය මෛත්‍රිය පැතිරවීමේ ප්‍රාථමික අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

කෙසේවුවද මේ ක්‍රම දෙකටම පටිසම්භිදාමග්ගෙහි විස්තර කෙරෙන අනොධිසො (අසීමිත) හා ඔදිසො (සීමිත) යන විධි දෙකම අයත් වෙයි. අසීමිත හා සීමිත යන ක්‍රම දෙකම මෛත්‍රිය වැඩීමේ සතරාකාරයෙහි දැක්වෙන සියලු දිශාවන්හි මෛත්‍රිය පැතිරවීම සමග සම්බන්ධ වෙයි. ඒ දෙයාකාරය වචන වශයෙන් වෙනස් වුවද එහි හරය වශයෙන් සමානය. වඩාත් පුළුල් ලෙස මෙත්සිත පැතිරවීම පටිසම්භිදාමග්ගයෙහි එන මෙත්තා-කථාවෙහි විස්තර වශයෙන් දැක්වෙයි. මෙහිදී සංඛ්‍යාපිළිවෙලට ඉදිරිපත් කෙරෙන විධික්‍රම කිහිපයක්ම විස්තරාත්මකව දක්නට ලැබේ. ඒවා පංචේන්ද්‍රිය පංචබල සත්තබොජ්ඣංග හා අරියඅට්ඨංගිකමග්ග වැනි සත්තිස් බොධිපාක්‍ෂික ධර්ම කොට්ඨාශයන් සමග සම්බන්ධ කෙරෙමින් ඉදිරිපත් වී ඇත. පළමුව අංගුත්තර නිකායෙහි දැක්වෙන මෙත්තානිසංශ සූත්‍රය දක්නට ලැබේ. එහි මෛත්‍රී භාවනාවෙහි අනුසස් එකොළසක් වෙයි. අනතුරුව මෙත පැතිරවීමේ ක්‍රම දැක්වෙයි. එහි ක්‍රම තුනෙකි.

(1) අනොධිසො ඵරණා - සීමා රහිතව මෙත පැතිරවීම
(2) ඔධිසො ඵරණා - සීමා සහිතව මෙත පැතිරවීම
(3) දිසා ඵරණා - දිසානුසාරයෙන් මෙත පැතිරවීම

අනොධිසො ක්‍රමය පස් ආකාරයකට බෙදා දැක්වෙයි. ඒ හැම ආකාරයක්ම මෙත්සිත පැතිරවීමේ ක්‍රමයක් වෙයි.

(1) සබ්බේ සත්තා - සියලු සත්වයෝ
(2) සබ්බේ පාණා - සියලු ප්‍රාණීහු
(3) සබ්බේ භූතා - පැවැත්මට පැමිණි සියල්ලෝ
(4) පුග්ගලා - සියලු පුද්ගලයෝ
(5) සබ්බේ අත්තභාවපරියාපන්නා - ආත්මභාව ලබාගත් සියල්ලෝ

මේ හැම වර්ගයක් සමගම මෛත්‍රියට අදාළ අංශ එක්කෙරෙයි. ඒ පහත සඳහන් පරිදිය.

(අ) අවෙරා හොන්තු - වෛර නැත්තෝ වෙත්වා.
(ආ) අබ්‍යාපජ්ජා හොන්තු - ව්‍යාපාද නැත්තෝ වෙත්වා.
(ඉ) අනීඝා හොන්තු - උවදුරු නැති වෙත්වා.
(ඊ) සුඛී අත්තානං පරිහරන්තු - තමන් සුවපත්ව පවත්වා ගනිත්වා.

ඉහත සඳහන් ක්‍රමයේදී මෙසේ වෙන් වෙන්ව භාවනා කරමින් අනතුරුව සියලු මෙත් වැඩීම් එකට ගෙන පහත සඳහන් පරිදි මෙත් වැඩීම කළ යුතුව තිබේ.

සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා. ව්‍යාපාද නැත්තෝ වෙත්වා. උවදුරු නැත්තෝ වෙත්වා. සුවපත් වෙත්වා.





පස්කඳ දහම්හුගේ හට ගැනීම්-නැසීම් මෙනෙහි කරන්න. සිවු පිරිසිදු සිල්හි පිහිටන්න. කලණ මිතුරන් ඇසුරු කරන්න.

375. තත්‍රායමාදි භවති
ඉධ පඤ්ඤස්ස භික්ඛුනො
ඉන්ද්‍රියගුත්ති සන්තුට්ඨි
පාතිමොක්ඛෙ ච සංවරො
මිත්තෙ භජස්සු කලයාණෙ
සුද්ධාජීවෙ අතන්ද්‍රිතෙ (25:16)

නැණවත් භික්‍ෂුවගේ සසුන් මගෙහි
මේ ආරම්භයයි
ඉඳුරන් රක්නේ සතුටු සිතැත්තේ
ප්‍රාතිමොක්‍ෂයෙහි සංවර වූයේ
පිරිසුදු දිවියෙන් යුත් අනලස්වූ
කලණමිතුරන් ඇසුරු කරන්නේ

නුවණැති භික්ෂුව උතුම් ගුණ ඇත්තේයි

25 (7) සැදැහැති කතකගේ හා සොරුන්ගේ කථාව (368 ගාථාවේ සිට 376 ගාථාව තෙක්)

විස්තරාත්මක අනුවාදය (375 ගාථාව)

ඉධ පඤ්ඤස්ස භික්ඛුනො තත්‍ර අයං ආදි භවති
ඉන්ද්‍රියගුත්ති සන්තුට්ඨි පාතිමොක්ඛෙ ච සංවරො
සුද්ධාජීවෙ අතන්දිතෙ කල්‍යාණෙ මිත්තෙ භජස්සු

ඉධ: මේ ශාසනයෙහි; **පඤ්ඤස්ස**: ප්‍රඥාවන්ත වූ; **භික්ඛුනො**: භික්ෂුවට; **තත්‍ර**: එම උදයව්‍යය භාවනාවෙහ; **අයං**: මේ; **ආදි**: ආරම්භය; **භවති**: වෙයි; **ඉන්ද්‍රියගුත්ති**: ඉන්ද්‍රිය පාලනය කරගත්තේ; **සන්තුට්ඨි**: ලද දෙයින් සතුටු වන්නේ; **පාතිමොක්ඛෙ ච**: ප්‍රාතිමොක්ෂ ශීලයෙහි ද; **සංවරො**: සංවරය ඇත්තේ; **සුද්ධාජීවෙ**: පිරිසිදු දිවි පැවැත්මෙහි යෙදුනේ; **අතන්දිතෙ**: අනලස් වූයේ; **කල්‍යාණෙ**: යහපත් වූ; **මිත්තෙ**: මිත්‍රයන්; **භජස්සු**: ඇසුරු කරන්නේය.

උදයව්‍යය භාවනාවෙහි යෙදෙන නුවණැති භික්ෂුවට එහි ආරම්භයෙහි අවශ්‍ය වන ගුණාංග ලෙස පහත සඳහන් කරුණු දැක්වෙයි. ඒවා නම්: ඉන්ද්‍රිය සංවරයෙහ් යුක්තවීම ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තවීම පිරිසිදු දිවිපැවැත්ම අනලස්වීම හා කළණ මිතුරන් ඇසුරු කිරීම යනුයි.

විවරණය

මේ අයුරින්ම සත්වවර්ග සියල්ල එක්කොට පහත සඳහන් පරිද්දෙන් ද මෙත් සිත පැතිරවීම කළයුතුව තිබේ. "සියලු සත්වයෝ සියලු ප්‍රාණීහු සියලු පුද්ගලයෝ ජීවිත පැවැත්මට පත් සියල්ලෝ වෛර නැත්තෝ වෙත්වා. ව්‍යාපාද නැත්තෝ වෙත්වා. උවදුරු නැත්තෝ වෙත්වා. සුවපත් වෙත්වා."

මේ ක්‍රමය අනුගමනය කිරීමේදී භාවනානුයෝගියා විසින් ඔහුගේ මෛත්‍රී සහගත සිතට සියලු සත්වයන් ඇතුළත් කොට එය සීමාවන්ගෙන් තොරව පතුරුවා හැරිය යුතුය. මෙය අනොධිසො ඵරණා නමින් සැළකෙයි.

(2) **ඔධිසො ඵරණා** හෙවත් සීමා සහිතව මෙත්සිත පැතිරවීමේදී සත් ආකාරයක් දැක්වෙයි.

(අ) සබ්බා ඉත්ථියො - සියලු ස්ත්‍රීහු
(ආ) සබ්බෙ පුරිසා - සියලු පුරුෂයෝ
(ඉ) සබ්බෙ අරියා - සියලු ආර්යයෝ
(ඊ) සබ්බෙ අනරියා - සියලු අනාර්යයෝ
(උ) සබ්බෙ දෙවා - සියලු දෙවියෝ
(ඌ) සබ්බෙ මනුස්සා - සියලු මිනිස්සු
(එ) සබ්බෙ සත්තා - සියලු සත්වයෝ

භාවනා කරන අවස්ථාවෙහි භාවනානුයෝගියා විසින් මේ එක් එක් කොටසකට ප්‍රාර්ථනා සතරාකාරය එක් කොට ගෙන වෙන් වෙන්ව හෝ සමස්තයක් වශයෙන් ගෙන මෙත් සිත පැතිරවිය යුතු වෙයි.

මේ ක්‍රමය අනුගමනය කිරීමේදී භාවනානුයෝගියා සත්වයන්ගේ ස්වභාවය හා තත්වයන් අනුව ඔවුන් වර්ග කරමින් මෙත්සිත පතුරුවයි. එම නිසා මෙම භාවනාව හැඳින්වී ඇත්තේ ඔධිසො ඵරණා යන නමිනි. එයින් අදහස් කරන්නේ එක් එක් වර්ගය කෙරෙහි වෙන වෙනම මෙත්සිත පතුරුවන බවයි.

(3) පෙරදිගින් පටන් ගෙන දිසා අනුදිසා අනුසාරයෙන් මෛත්‍රිය වැඩීමේ ක්‍රම දහයක් ද දැක්වෙයි. ඒවාට අයත් වන්නේ දිසා සතර, අනු දිසා සතර, උඩ සහ යටයි.

ඒ ක්‍රම මෙසේ දැක්වෙයි:

"පෙරදිග සියලු සත්වයෝ අවෛරී වෙත්වා. ද්වේෂ නැත්තෝ වෙත්වා. නිදුක් වෙත්වා. සුවපත් වෙත්වා."

මේ අයුරින්ම, අපරදිග, උතුර, දකුණ, ඊසාන, ගිනිකොණ, නිරිත, වයඹ, උඩ හා යට සිටින සියලු සත්වයෝ අවෛරී වෙත්වා. ද්වේෂ නැත්තෝ වෙත්වා. නිදුක් වෙත්වා. සුවපත් වෙත්වා. යනුවෙන් මෙත් සිත පතුරුවයි:



පිළිසඳර පැවැත්මෙන් හා යහපත් හැසිරීමෙන් යුතු සතොස බහුලකොට ඇත්තා දුක් කෙළවර කරන්නෙකි.

376. පටිසන්ථාරවුත්‍යස්ස
ආචාරකුසලො සියා
තතො පාමොජ්ජබහුලො
දුක්ඛස්සන්තං කරිස්සති (25:17)

පිළිසඳරෙහි යෙදෙන්නේ වෙයි
යහ පැවැත්මෙහි නිරත වෙයි
එලෙසින් සතුට බහුල කොට ඇත්තේ
දුක් කෙළවර කරයි

භික්ෂුව හැමවිටම විනීත විය යුතුය

25 (7) සැදැහැති කතකගේ හා සොරුන්ගේ කථාව (368 ගාථාවේ සිට 376 ගාථාව තෙක්)

විස්තරාත්මක අනුවාදය (376 ගාථාව)

පටිසන්ථාරවුත්ති අස්ස ආචාරකුසලො සියා තතො
පාමොජ්ජබහුලො දුක්ඛස්සන්තං කරිස්සති

පටිසන්ථාරවුත්ති: පිළිසඳර පැවතුම් ඇත්තේ; **අස්ස**: වන්නේය; **ආචාරකුසලො**: යහ පැවැත්මෙහි දක්ෂ වූයේ; **සියා**: වන්නේය; **තතො**: එයින්; **පාමොජ්ජබහුලො**: ප්‍රමුදිත බව බහුල කොට ඇත්තේ; **දුක්ඛස්සන්තං**: දුක් කෙළවර; **කරිස්සති**: කරන්නේය.

පිළිසඳර පැවතුම් ඇත්තේ ද යහ පැවැත්මෙහි දක්ෂ වූයේ ද එමගින් ප්‍රමුදිත බවින් යුක්තව දුක් කෙළවර කරන්නේය.

විවරණය

මෙත්සිත පැතිරවීම පිළිබඳ මේ තුන් ක්‍රමයේදී පහ, හත, සහ දහය වශයෙන් ආකාර විසිදෙකක් දක්නට ඇත. අට්ඨකථාවට අනුව මේ සියලු ආකාරයකින්ම පතුරුවන මෛත්‍රිය අප්පණාවට හෙවත් ධ්‍යාන අවස්ථාවට යොමුව ඇත.

පස් ආකාර අනොධිසො ඵරණයෙහි "සියලු සත්වයෝ අවෛරී වෙත්වා" යනු එක් අප්පණාවකි, "ද්වේෂ නැත්තෝ වෙත්වා" යනු තවත් අප්පණාවකි. එසේම "නිදුක් වෙත්වා" හා "සුවපත් වෙත්වා" යනු වෙන් වෙන් වූ අප්පණායි.

මේ අනුව අනොධිස ඵරණයෙහි අප්පණා විස්සක් දක්නට ඇත. ක්‍රම පසෙහි ආකාර සතර බැගිනි. මේ අයුරින්ම සත් ආකාරයෙහි අප්පණා සතර බැගින් අප්පණා සූවිස්සක් ඔධිසඵරණයෙහි වෙයි.

ඔධිසඵරණයෙහි පස් ආකාරය ද දස දිසාව හා සම්බන්ධ වෙයි, ඒ මෙසේය:

"පෙරදිග සියලු සත්වයෝ අවෛරී වෙත්වා. ද්වේෂ නැත්තෝ වෙත්වා. නිදුක් වෙත්වා. සුවපත් වෙත්වා." මේ මෙත් පැතුම දිසා දහයටම ව්‍යාප්ත කෙරෙයි. මේ අනුව සියලු ආකාර දිසා දහය සමග එක් කොට ගැනීමේදී එකකට විසිඅට බැගින් අප්පණා දෙසිය අසූවක් ලැබේ. අනොධිස හා ඔධිස යන ප්‍රධාන ක්‍රම දෙකම එක්කොට ගැනීමේදී සියලු අප්පණා ප්‍රමාණය පන්සිය විසිඅටක් බවට පත් වෙයි. ඒවා විස්ස, විසිඅට, දෙසීය, දෙසිය අසූව යන වශයෙනි. කරුණා, මුදිතා හා උපෙක්ඛා යන අනෙක් බ්‍රහ්මවිහාර තුන සම්බන්ධයෙන් ද මේ අප්පණා ප්‍රමාණය මෙසේම ලැබෙන බව අට්ඨකථාවෙහි දැක්වෙයි. මේ කවර ආකාර අප්පණා තත්වයෙන් වුවද මෛත්‍රිය වැඩීමෙන් භාවනානුයෝගියාට ආනිශංස එකොළසක් ලැබෙන බව මෙත්තානිශංස සූත්‍රයෙහි දැක්වෙයි. එහි මෙසේ සඳහන් වෙයි.

මෛත්‍රීචෙතොවිමුක්තිය ප්‍රගුණ කිරීමෙන්, වර්ධනය කිරීමෙන්, එය නිතර නිතර භාවිත කිරීමෙන් අනුසස් එකොළසක් බලාපොරොත්තු විය හැකිය. ඒ එකොළස කවරේද?

1. සුවසේ නිදයි.
2. සුවසේ අවදි වෙයි.
3. පවිටු සිහින නොදකියි.
4. මිනිසුන්ට ප්‍රිය වෙයි.
5. අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි.
6. දෙවියෝ ඔහු ආරක්ෂා කරති.
7. ගින්න, වස විෂ, අවි ආයුධ, ඔහු වෙත ලං නොවෙයි.
8. වහා මනස එකඟ වෙයි.
9. ඔහුගේ ඡවිවර්ණය පැහැපත් වෙයි.
10. සිහිමුළාවෙන් තොරව කළුරිය කරයි.
11. මත්තෙහි මාර්ග ඵලයක් නොලබන්නේ නම් බ්‍රහ්ම ලෝකයෙහි උපත ලබයි.

දෑසමන් වැල, මැලවී ගිය මල්, නටුවෙන් මුදාලන්නාක් මෙන් රා-දොස් දෙක සිතින් මුදාලන්න.

377. වස්සිකා විය පුප්ඵානි
මද්දවානි පමුඤ්චති
ඒවං රාගං ච දොසඤ්ච
විප්පමුඤ්චෙථ භික්ඛවො(25:18)

සමන්වැලක් තම පරවූමල්
අත්හරනාක් මෙන්
රාගය ද දෝසය ද
මහණෙනි අත්හරින්න

රාගයත් දෝසයත් අත්හරින්න

25 (8) දැසමන් මලක් අරහයා බවුන් වැඩූ කථාව (ගාථා 377)

සැවැත් නුවරෙහි වූ **භික්ෂුපිරිසක්** බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් රැගෙන භාවනාවෙහි යෙදීම සඳහා වනයට පිවිස එහි බවුන් වැඩීමෙහි නිරත වූහ.

ඔවුන් බවුන් වඩන අතරතුර උදයේ පිපුණු සමන් මල් සවස්වන විට පරවී නටුවෙන් ගිලිහී වැටෙනු ඔවුනට දක්නට ලැබිණ. මෙසේ දුටු ඔවුහු මේ මල් පර වී නටුවෙන් වැටීමට පෙර අපි අපේ සිත්වලින් රාග ද්වේෂ ඉවත් කර ගන්නෙමුයි සිතා ගත්හ. එසේ සිතා වැඩි උනන්දුවකින් භාවනාවෙහි යෙදුනාහ. බුදුන්වහන්සේ මේ භික්ෂූන් දිවැසින් දැක මෙසේ අවවාද දුන්හ.

"මහණෙනි මල නටුවෙන් ගිලිහී යන්නාක් මෙන් භික්ෂුවක විසින් තම සිතින් කෙලෙස් මල දුරු කොට ජාති ජරා මරණ දුක්වලින් මිදීමට වෑයම් කළයුතුය." මෙසේ පැවසූ උන්වහන්සේ තම ගඳකිළියෙහි සිටිමින්ම රැස් දහරක් යවා තමන් ඔවුනට පෙනෙන්ට සලස්වා පහත සඳහන් ධර්ම දේශනාව කළසේක.

"මහණෙනි සමන්වැලක් තම පරවූමල් අත්හරිනාක් මෙන් රාගයද දෝසය අත්හරින්න."

බුදුන්වහන්සේගේ දහම් දෙසුමෙන් අනතුරුව භික්ෂූන් වහන්සේලා රහත් බවෙහි පිහිටියහ.

විස්තරාත්මක අනුවාදය (377 ගාථාව)

වස්සිකා පුප්ඵානි මද්දවානි විය පමුඤ්චති එවං රාගං ච දෝසඤ්ච විප්පමුඤ්චෙථ භික්ඛවෝ

වස්සිකා: (යම් සේ) සමන් වැලක්; **මද්දවානි**: මැලවුනු; **පුප්ඵානි**: මල්; **පමුඤ්චති**: අත්හරින්නාක්; **විය**: මෙන්; **එවං**: එසේ; **රාගං ච**: රාගය ද; **දොසං ච**: ද්වේෂය ද; **භික්ඛවෝ**: මහණෙනි; **විප්පමුඤ්චෙථ**: මුදාහරිවූ.

සමන්වැලක් පරවූ මල් අත්හරින්නාක් මෙන් මහණෙනි රාගය ද ද්වේෂය ද මුදා හරින්න.

විවරණය

මේ ගාථාව පර වී බිමට වැටෙන සමන් මල් අරහයා බවුන් වැඩූ භික්ෂූන් වහන්සේලා පිරිසකට දේශනා කරන ලද්දකි. බොහෝ අවස්ථාවල භාවනානුයෝගීන් යම් යම් අරමුණු ගෙන භාවනා කිරීමෙන් මනස එකඟ කොට ගෙන අභිඥාවන් ලැබූ බව සඳහන් වෙයි. බෞද්ධ මානසික ශික්ෂණයෙහි මූලික අරමුණ වන්නේ සසර දුකින් එතෙරවනු සඳහා සිතේ ඇති කෙලෙස් මල දුරු කොට මානසික පාරිශුද්ධියෙන් ඇතිවන පූර්ණ ප්‍රඥාව ලබා ගැනීමයි.

බුදුදහමින් නිර්දේශිත මානසික ශික්ෂණය වූ කලි උසස් චින්තනයේ ශික්ෂණයක් වන අතර එමගින් සදාචාර ප්‍රතිපත්ති මත පිහිටා මනස එකඟතාවට පත් කෙරෙයි. මනස එක් අරමුණකට එකඟ කර ගැනීමෙන් එය ප්‍රකෘති තත්වයට පැමිණ ප්‍රභාස්වරත්වයට පත් වෙයි මේ මනෝ චිත්‍රය භාවනානුයෝගියාගේ මනසින් ගිලිහී යා නොදී මනස ඒ මත තබා ගැනීමට වෑයම් කළ යුතුය. මනස පිරිසුදු හෝ අපිරිසුදු වන්නේ එහිම නෛසර්ගික ස්වභාවයෙන් නොවේ.

නමුත් මනසේ පහළවන පිරිසුදු හෝ අපිරිසුදු සිතිවිලි මගිනි. එබැවින් මූලික අවධානය තබා ගන්නා අරමුණ පවිත්‍රත්වය ගුණධර්ම හා සත්‍යය ඇසුරු කොට ඇත්තක් විය යුතුය. භාවනාව සඳහා යොදාගන්නා අරමුණ භාවනානුයෝගියාගේ මනෝභාවයන්ට අනුරූප වන්නක් ද වියයුතුය.

බුදුන්වහන්සේ විසින් ස්වකීය ධර්මදේශනයන් සඳහා දිවැසින් දැක තෝරා ගනු ලැබූ පුද්ගලයන්ගේ ආශයානුශයන් පිළිබඳ මනා අවබෝධයක් උන්වහන්සේ වෙත තිබූ බවත් ඒ අනුව උන්වහන්සේ යෝග්‍ය කමටහන් එම පුද්ගලයන්ට නිර්දේශ කළ බවත් ධර්ම ග්‍රන්ථයන්හි සඳහන් වෙයි.

බුදුන්වහන්සේ විසින් අනුගමනය කළ මෙම ක්‍රම බොහෝ දෙනෙකුගේ යහපත සඳහා යොදා ගැනීමට හැකි පරිද්දෙන් පසුකාලීන ධර්මග්‍රන්ථයන්හි සංවර්ධනයට පත් කොට තිබේ. එම ක්‍රම සංවර්ධනයට පත් කොට ඇත්තේ විශ්ලේෂණ වර්ගීකරණ ආදිය මගිනි. එමගින් විවිධ භාවනා ක්‍රම පුද්ගලයන්ගේ මානසික ප්‍රවණතාවන්ට හා පෞද්ගලික ලක්ෂණයන්ට අදාළ පරිද්දෙන් වර්ගීකරණය කොට ඇත. මේවා නිකාය ග්‍රන්ථයන්හි අභිධර්ම කෘතීන්හි හා අර්ථකථාවන්හි විස්තර විභාග සහිතව දැක්වෙයි.



හික්ම වූ කය-වචන-සිත යන තුන් දොර ඇති වමාරා දැමූ කම්සුව ඇති පැවිද්දා ඉතා ම සන්සුන් ය.

378. සන්තකායො සන්තවාචො
සන්තවා සුසමාහිතො
වන්තලොකාමිසො භික්ඛු
උපසන්තොති වුච්චති (25:19)

ගත සන්සුන් වදනින් සන්සුන්
සන්සුන් ව මනාව දැමුණු
ආමිෂයෙහි ඇල්ම දුරකළ භික්ෂුව
උපශාන්ත වූවෙකැයි කියනු ලැබේ.

ලෞකික බැඳීම්වලින් මිදුනේ උපශාන්ත වූවෙකි

25 (9) සාන්තකාය තෙරුන්ගේ කථාව (ගාථා 378)

පෙර ආත්මයෙහි සිංහයකු වී උපන් පුද්ගලයකු පැවිදිව **සාන්තකාය** නමින් ප්‍රසිද්ධව වාසය කළේය. මේ තෙරුන් වහන්සේ අතින් හෝ පයෙන් සිදුවන නොමනා ඉරියවු වලින් වැළකී සිටි බව කියනු ලැබේ. හෙතෙම කිසිවිට ඇනුම් හැරීමක් හෝ අත්පා විසුරුවා හිඳීමක් හෝ නොකළේය. හැමවිටම මනාව සිරුර තබාගෙන සන්සුන් ඉරියව් වලින් යාම් ඊම් පැවැත්විය.

මේ කථාවට අනුව මේ තෙරුන් වහන්සේ අතීත ජන්මයෙහි සිංහයකුව උපන්නෙකි. සිංහයන්ගේ ඇවතුම් පැවතුම් වෙනත් සතුනට වඩා වෙනස්යයි කියනු ලැබේ.

ඔවුන් තම අහර ගැනීමෙන් පසු කිසියම් ගුහාවකට පිවිස සත්දිනක් නිදාගනිතැයි ද නිදා අවදිව තමන් අපිළිවෙලට නිදා සිටියේදැයි විමසා බලතැයිද එසේ වූයේ නම් එසේ නොවන්නට සිතාගෙන යලි දින සතක් නිදන බවත් කියවෙයි. සාන්තකාය තෙරුන්ගේ ඇවතුම් පැවතුම් එසේ ශාන්ත වූයේ පෙර ආත්මයෙහි සිංහයකුව උපන් බැවිනි.

මේ තෙරුන්ගේ ඇවතුම් පැවතුම් දැක එහි විශේෂත්වයක් ඇති බැවින් ඊබව අනෙක් භික්ෂූන් වහන්සේලා බුදුරජාණනන් වහන්සේට දැන්වූහ.

බුදුරජාණන් වහන්සේ එය අසා "මහණෙනි, භික්ෂූන් සාන්තකාය තෙරුන් මෙන් ගතින් සිතින් සාන්ත විය යුතු"යයි පැවසූ සේක.

විස්තරාත්මක අනුවාදය (378 ගාථාව)

සන්තකායො සන්තවාචො සන්තවා සුසමාහිතො
වන්තලොකාමිසො භික්ඛු උපසන්තොති වුච්චති

සන්තකායො: සන්සුන් වූ කය ඇති; **සන්තවාචො**: සන්සුන් වචන ඇති; **සන්තවා**: ශාන්තවූ; **සුසමාහිතො**: මනාව සන්සුන් සිතැති; **වන්තලොකාමිසො**: ලෞකික ලාභප්‍රයොජන අත්හළ; **භික්ඛු**: භික්ෂුව; **උපසන්තො ඉති**: උපශාන්ත වූවෙක්යැයි; **වුච්චති**: කියනු ලැබේ.

සන්සුන් වූ කය ඇති, සන්සුන් වචන ඇති, මනාව සන්සුන් සිතැති, ලෞකික ලාභප්‍රයොජන අත්හළ භික්ෂුව උපශාන්ත වූවෙකැයි කියනු ලැබේ.

විවරණය

වචනාර්ථයෙන්ද යහපත් වූ භික්ෂුවක් වීම සඳහා කායික මෙන්ම වාචික ක්‍රියාවන්ගෙන් ද ශාන්ත විය යුතුය. මෙම ශික්ෂණය භික්ෂුවගේ මානසික ශික්ෂණයට පෙළඹවීමක් වෙයි. මේ ත්‍රිවිධ ශික්ෂණය උතුම් පැවතුම් අනාවරණය කරයි.

එක් අවස්ථාවකදී බුදුරජාණන්වහන්සේ තමන් වහන්සේ ද සිංහයකුට උපමා කොට ගෙන ඇත්තේ උන්වහන්සේගේ ඇතැම් ගුණාංග සිංහයකුගේ ශ්‍රේෂ්ඨ ගුණාංගවලට සමාන වන නිසා විය යුතුය.

"මහණෙනි, තිරිසන් සතුන්ගේ රජු වන සිංහයා තම ගුහාවෙන් පිටතට පැමිණ කෙසරු සලා සිවුදෙසටම හිස යොමා වටපිට බලයි. අනතුරුව තෙවරක් සිංහනාද කරයි. එසේ කොට ගොදුරු සොයා පිටත්ව යයි.

සිංහනාදය අසන බොහෝ සත්තු බියට පත් වෙති. ඔවුහු තිගැස්සෙති. ගුහාවන්හි වෙසෙන සත්තු ගුහාවන්ට පිවිසෙති. ජලජ සත්වයෝ දියයට කිමිදෙති. කැලෑ සත්තු කැලෑවන්ට පිවිස සැඟවෙති. කුරුල්ලෝ අහසට නැගෙති.

බුදුරජාණන් වහන්සේ සිංහයාගේ ස්වභාවය දක්වා "මහණෙනි මෙසේම අර්හත් වූ, සම්‍යක්සම්බුද්ධ වූ ප්‍රඥවෙන් හා චරණ ධර්මයන්ගෙන් පරිපූර්ණ වූ, මනාව ලෝකය දත්තා වූ, තථාගත වූ, සම්මා සම්බුදු රජාණෝ ලොව පහළව සිංහනාද නගන්නා සේ බ්‍රහ්මස්වර විහිදුවා ධර්මදේශනා කරතැ"යි පැවසූසේක.



තමා විසින් තමාට චෝදනා කරගත යුතු විමසිය යුතු ඒ තැනැත්තා සුව සේ වසන්නේ ය.

379. අත්තනා චොදයත්තානං
පටිමාසෙථ අත්තමත්තනා
සො අත්තගුත්තො සතිමා
සුඛං භික්ඛු විහාහිසි (25:20)

තමන් තමන්ව මෙහෙයවන්න
තමන් පිරික්සා බලන්න
ඒ තමා රැකගත් සිහියෙන් යුත්
භික්ෂුව සුවසෙ වෙසෙන්නෙහිය

තමන් රැකගන්නා සුවසේ වෙසෙයි

25 (10) නංගල කුල තෙරුන්ගේ කථාව (ගාථා 379 සහ 380)

මේ කථාවෙන් කියවෙන්නේ අනුන් යටතෙහි සේවාකම් කරමින් ජීවත් වූ පුද්ගලයකු පිළිබඳවය. කිසියම් දිනක තෙරුන් වහන්සේ නමක් මේ පුද්ගලයා වැහැරුණු ඇඳුම් හැඳ නගුලක් ද කරින් ගෙන තනිව ගමන් කරනු දුටුවේය. දැක ඔහුට දොස් කීහ: "ඔබ ජීවත් වන්නේ මෙසේ නම් ඔබ මහණ නොවන්නේ මන්ද?" "මා මෙන් ජීවත් වන්නකු කවරෙක් නම් මහණ කරන්නේදැ"යි හෙතෙම විමසීය.

"ඉදින් ඔබ කැමැත්තෙහි නම් මම ඔබ මහණ කරන්නෙමි" තෙරුන් වහන්සේ පැවසූහ."මැනවි ස්වාමීනි ඉදින් ඔබ මා මහණ කරන්නෙහි නම් මම පැවිදි වනු කැමැත්තෙමි"යි හෙතෙම පැවසීය. ඉන් පසු තෙරුන් වහන්සේ ඔහු රැගෙන ජේතවනාරාමයට ගොස් ඔහුට නෑමට සලස්වා කසාවත් හඳවා පැවිදි කළහ. එසේ කළ තෙරුන් වහන්සේ ඔහු ලවා ඔහුගේ දිරාපත් ඇඳුම් හා නගුල ගස් අත්තක රඳවා තැබූහ. පැවිද්දට පත් හෙතෙම උපසපන් බවද ලබා ගත්හ. පැවිද්දට පෙර නගුලක් ගෙන ජීවිකාව කරගත් බැවින් හෙතෙම නංගලක තෙරුන් නමින් ප්‍රසිද්ධ විය.

නංගලකුල භික්‍ෂුව ශ්‍රද්ධාවෙන් දෙන අහර අනුභව කරමින් නොබෝ දිනකින්ම ශක්තිමත් බවක් ලබා ගත්තේය. එහෙත් කලක් ගතවන විට පැවිද්දෙහි කළකිරී සිවුරු හැර ගිහිවීමට කැමැත්තක් ඔහුට ඇතිවිය. ඔහු එසේ සිතා අසපුවෙන් පිටත්ව යන විට අතරමගදී ගසේ එල්වා තිබූ තම නගුල හා ඉරුණු රෙදි දැක මෙසේ සිතීය. "එම්බල නංගලකුල නුඹ ලජ්ජා නැත්තෙකි. පැවිද්දට පෙර ඔබ ජීවත්වූයේ කෙසේ ද? ඒ ජීවිතය අතහැර පැවිදි වීමට පොරොන්දු වූයෙහිය." මෙසේ සිතා නැවතත් උනන්දුව ඇති කොට ගෙන අසපුවට ගොස් පැවිදි දහමෙහි නිරත විය. එහෙත් වැඩිකල් නොයා දී නැවතත් පැවිද්ද අත් හැරීමෙහි කැමැත්ත ඇති විය. එවර ද ගසෙහි එල්ලෙමින් තිබූ ඔහුගේ භාණ්ඩ දැක අදහස වෙනස් කොට ගත්තේය. මේ ආකාරයෙන් කිහිපවරක්ම එසේ සිදුවිය.

වෙනත් භික්‍ෂූන්වහන්සේලා නංගලකුල තෙරුන්ගේ මේ ක්‍රියාව දැක ඔහුගෙන් ඒගැන විමසූහ. "ආයුෂ්මත් නංගලකුල ඔබ වරින්වර ගසක් යටට ගොස් ආපසු එන්නෙහිය. එහි අදහස කිමෙක්ද?" නංගලකුල ඊට පිළිතුරු වශයෙන් කීවේ තමන් තම ගුරුවරයා දැකීමට යන බව යි. නොබෝ දිනකින් නංගලකුල තෙරුන් වහන්සේ උනන්දුවෙන් බවුන් වඩා රහත් බවට පැමිණියහ. ඉන්පසු හෙතෙම එසේ නිතර නිතර ගස ලගට යාම නවතා දැම්මේය. මේ වෙනස දුටු සෙසු භික්‍ෂූහු "කිමෙක්ද ඔබ ගුරුවරයා දක්නට යාම අත්හළෙහිදැ"යි විමසූහ.

"එසේය ආයුෂ්මත්නි මා ලෝකයෙහි වෙසෙන විට එසේ කෙළෙමි. දැන් එසේ නොකරන්නෙමැ"යි නංගලකුල තෙරහු පැවසූහ. භික්‍ෂූන්වහන්සේලා මෙය අසා ඒ බව බුදුරජාණන්වහන්සේට සැළකළහ. උන්වහන්සේ "මහණෙනි මාපුත් නංගලකුල බොරු නොකියයි. හෙතෙම තමාටම අවවාද කර ගනියි. ගස යටට වරින් වර යමින් ඔහු කළේ එයයි. දැන් ඔහු බ්‍රහ්මචර්යාවෙහි ප්‍රතිඵල ලබා ඇතැ"යි පවසා ඉහත සඳහන් ගාථාවෙන් ධර්මදේශනා කළ සේක.

විස්තරාත්මක අනුවාදය (379 ගාථාව)

අත්තනා අත්තානං චොදය අත්තමත්තනා පටිමාසෙථ
අත්තගුත්තො සතිමා සො භික්ඛු සුඛං විහාහිසි

අත්තනා: තමාවිසින්; **අත්තානං**: තමන්ට; **චොදය**: චෝදනා කරගන්න; **අත්තමත්තනා**: තමා විසින් තමාව; **පටිමාසෙථ**: පරීක්‍ෂා කරන්න; **අත්තගුත්තො**: තමා රක්නා ලද; **සතිමා**: සිහියෙන් යුත්; **සො භික්ඛු**: ඒ භික්‍ෂුව; **සුඛං**: සැපසේ; **විහාහිසි**: වසන්නේය.

තමන් තමන්ව මෙහෙයවන්න. තමන් පිරික්සා බලන්න. තමා ආරක්‍ෂා කරගන්නා ලද සිහිනුවනින් යුත් භික්‍ෂුව සුවසේ වෙසෙන්නේය.

තමා ම තමාට පිහිට ය. තමා ම තමාට පිළි සරණ ය. එහෙයින් තමා මොනවට රැකගන්න.

380. අත්තා හි අත්තනො නාථො
අත්තා හි අත්තනො ගති
තස්මා සඤ්ඤමයත්තානං
අස්සං භද්‍රංව වාණිජෝ (25:21)

තමා තමන්ගේ ස්වාමියාය
තමා තමන්ගේ සරණයි
එබැවින් තමා හික්මවා ගන්න
අස් වෙළෙන්දකු හොඳ අසකු සේ

ඔබට ඔබේම සරණයි

25 (10) නංගල කුල තෙරුන්ගේ කථාව (ගාථා 379 සහ 380)

විස්තරාත්මක අනුවාදය (380 ගාථාව)

හි අත්තා අත්තනො නාථො හි අත්තා අත්තනො ගති
තස්මා භද්‍රං අස්සං වාණිජො ඉව අත්තානං සඤ්ඤමය

හි: ඒකාන්තයෙන්ම; **අත්තා**: තමා; **අත්තනො**: තමන්ගේ; **නාථො**: ස්වාමියාය; **හි**: ඒකාන්තයෙන්ම; **අත්තා**: තමා; **අත්තනො**: තමන්ගේ; **ගති**: පිහිටයි; **තස්මා**: එබැවින්; **වාණිජො**: වෙළෙන්දෙක්; **භද්‍රං**: වටිනා; **අස්සං**: අශ්වයකු; **ඉව**: මෙන්; **අත්තානං**: තමා; **සඤ්ඤමය**: හික්මවා ගන්න.

තමා තමන්ගේ ස්වාමියායි. තමාට තමන්ගේ පිහිටයි. එබැවින් අස් වෙළෙන්දෙක් වටිනා අශ්වයකු දමනය කරන්නාක් මෙන් තමා දමනය කර ගන්න,

විවරණය

අත්තනා අත්තානං චොදය: පුද්ගලයෙක් තමා මනාව ආධ්‍යාත්මික කරුණු සම්බන්ධයෙන් මෙහෙයවා ගත යුතුය. මෙය බුදුන්වහන්සේගේ ධර්මයෙහි තේමාවයි. තමා මුදාගත හැකි හෝ ආරක්‍ෂා කර ගත හැකි බාහිර බලවේගයක් හෝ පුදපූජාවක් හෝ නොමැති බව දැන තම ශක්තිය මත රඳා සිටීමට බෞද්ධයා අදිටන් කරගතයුතුව ඇත. එසේම තම වත්මන් ජීවිතය මෙන්ම අනාගත ජීවිතය ද රඳා පවත්නේ තමන් මතම පමණක් බව වටහා ගත යුතුය. තම තමන්ගේ විමුක්තිය තම තමන් මතම පවතියි. විමුක්තිය අත් පත් වීම දරුනු වණයක් සුවවීමකට සමානය. වෛද්‍යවරයා රෝග ලක්‍ෂණ විමසා නිවැරදි බෙහෙත් නිර්දේශ කරයි. කෙතරම් විශ්වකර්ම වෛද්‍යවරයකුට වුවද රෝගියා ප්‍රතිකාර නොගන්නේ නම් රෝගය,සුව කිරීමට හැකියාවක් නැත. වෛද්‍යවරයාට පුදපූජා පැවැත්වීමෙන් හෝ යාගහෝම පැවැත්වීමෙන් හෝ රෝගය සුවවීමක් නම් නොවේ.

බෙහෙත් තුණ්ඩුව බැලීමෙන් හෝ කියවීමෙන් රෝගයෙන් සුව විය නොහැකිය. ලියා දුන් බෙහෙත් තුණ්ඩුව ඉතා හොඳ එකකැයි පිළිගැනීමෙන් ද වැඩක් නොවේ. එය කරඬුවක දමා ඇතෙකු පිට තබා පෙරහරකින් වැඩමවීමෙන් ද වැඩක් නොවේ. මේවායින් රෝගියා සුවපත් නොවේ. බෙහෙත් තුණ්ඩුව මලසුනක තබා මල්ගඳවිලවුන්වලින් පුදා මෙයින් මගේ රෝගය සුවපත් වේවායි පැතුවද කිසිපලක් නොවේ. රෝගියාගේ භාර්යාව රෝගියා වෙනුවෙන් පෙනී සිටිමින් "හෙතෙම වයස්ගතය. දුර්වලය. බෙහෙත් ද කටුකය. බීමට අමාරුය. මේ තිත්ත බෙහෙත ඔහු වෙනුවෙන් මම බොමියි කියා බීවද රෝගියා සුව වීමක් නම් නොලබයි.

රෝගයක් සුව වීමට නම් රෝගියා වෛද්‍යවරයාගේ උපදෙස් මනාව පිළිපදිමින් ප්‍රතිකාර ලබා ගතයුතුය. එසේ කිරීමෙන් පමණක් සුවය ලබා තමන් සුවපත් බව දැනගනියි. මේ අයුරින්ම බුදුන්වහන්සේගේ ධර්මය පිළිගෙන ඒ අනුව තමාම පිළිපැද ලෝභ දෝස මෝහ දුරු කොට දුකින් නිදහස් විය යුතුව තිබේ. මේ ක්‍රමයෙන් පමණක් බුදු දහමින් නිර්දේශිත විමුක්තිය සාදා ගත හැකිය. බුදුන් වහන්සේට වැඳපුදා යාතිකා කිරීමෙන් හෝ උත්සව සැණකෙලි පැවැත්වීමෙන් හෝ කිසිවකුට විමුක්තිය අත්පත් කරගත නොහැකිය.



සතුට බහුල කොට ඇති බුදුරදුන් ගේ අනුසස්නෙහි පහන් වූ මහණතෙම නිවන් සුව ලබන්නේ ය.

381. පාමොජ්ජබහුලො භික්ඛු
පසන්නො බුද්ධසාසනෙ
අධිගච්ඡෙ පදං සන්තං
සඞ්ඛාරූපසමං සුඛං (25:22)

බුදුසස්නෙහි පසන් වූ
ප්‍රමුදිත බව්න්යුත් භික්‍ෂුව
සංස්කාර සන්සිඳුණු
නිවන් සුවය ලබයි

සතුටින් හා සැදැහැයෙන් අරමුණට ළඟා වන්න

25 (11) වක්කලි තෙරුන්ගේ කථාව (ගාථා 381)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩවසන සමයෙහි **වක්කලි තෙරුන්** අරභයා මේ ගාථා ධර්මය දේශනා කළ සේක,

වක්කලි තෙරුන් වහන්සේ සැවැත් නුවර බ්‍රාහ්මණ කුලයක උපත ලැබුවෙකැයි කියනු ලැබේ, හෙතෙම ගිහි කල දිනක් බුදුන්වහන්සේ නගරයෙහි පිඬුසිගමින් වඩිනු දුටුවේය, බුදුරජාණන් වහන්සේගේ රූපශ්‍රිය දැක එය දැක්මෙන් පමණක් නොසෑහී, "බුදුරජාණන් වහන්සේ නිතරම දැකගැනීමේ වාසනාව ලබා ගනිමි"යි සිතා හෙතෙම ගිහිගෙය හැරපියා බුදුරජාණන් වහන්සේ වෙත පැවිදි බව ලබා ගත්තේය. එතැන් පටන් හෙතෙම නිබඳවම බුදුන් මනාව පෙනෙන තැනක හිඳගෙන අන් සියලු ශාසනික වත්පිළිවෙත් හැර දමා බවුන් වැඩීමෙන්ද තොරව බුදුන් දෙසම ඇස් නොහැර බලා සිටින්නේය.

බුදුරජාණන් වහන්සේද වක්කලිගේ නුවණ මුහුකුරා යනතුරු මේ සම්බන්ධයෙන් කිසිවක් නොකී සේක. දිනක් බුදුරජාණන් වහන්සේ ඔහු තුළ නුවණ මුහුකුරා ඇතිබව දැන ඔහුට මෙසේ වදාළසේක. "වක්කලි, මේ දෙතිස් කුණපයෙන් පිරුණු මගේ සිරුර දෙස බලා සිටීමෙන් කවර වැඩක්ද? වක්කලි, යමෙක් ධර්මය දකී නම් හෙතෙම මා දකියි".

බුදුන්වහන්සේ එසේ අවවාද කළද වක්කලිට බුදුන් නොදැක සිටීමට හා උන්වහන්සේගේ දර්ශනයෙන් ඉවත් වීමට නොහැකි විය. "මේ මහණ අවවාදයෙන් පලක් නොලබයි. එහෙයින් උපායකින් මොහු ගලවා ගතයුතුය"යි බුදුන්වහන්සේ සිතූ සේක. මේ වන විට වස්සාන සමය එළඹ තිබිණ. එබැවින් බුදුරජාණන් වහන්සේ වස් එළඹීමට රජගහ නුවරට වැඩමවන සේක් වක්කලි දෙව්රමෙහි නවතා තමන්වහන්සේ එහි වැඩි සේක. එහෙයින් වස් තෙමස තුළ වක්කලිට බුදුන්වහන්සේ දැකගැනීමට අවස්ථාවක් නොලැබිණ. හෙතෙම මෙසේ සිතුවේය.

"බුදුන් වහන්සේ තව දුරටත් මට කථානොකරන සේක. එබැවින් මේ ජීවිතයෙන් ඇති පලය කිමෙක්ද? කඳුමුදුනකින් පහතට පැන දිවිනසා ගනිමි" එසේ සිතා වක්කලි කඳු මුදුනකට නැග ගත්තේය. බුදුරජාණන් වහන්සේ වක්කලිගේ මේ තත්වය දැන මේ භික්ෂුව කිසියම් අස්වැසිල්ලක් මගෙන් නොලද හොත් කෙලෙසුන් දුරුකොට රහත්වීමට ඇති වාසනාව නැති කර ගන්නේයයි සිතා වක්කලි තෙරුන් වෙත රැස්දහරක් යවා තමන් එහි පෙනී සිටි සේක.

බුදුරුව දුටු කෙණෙහිම වක්කලි තෙරුන් වහන්සේගේ සිතෙහි වූ ශෝකය පහව ගියේය. එවිට බුදුන්වහන්සේ නියඟින් දිය සිඳුණු විලක් වතුරින් පුරවන්නාක් සේ වක්කලි තෙරුන්ගේ සිත පුරා ප්‍රසාදය හා සතුට ඉතිර යාමට සැලැස්වීය.

වක්කලි තෙරුන්වහන්සේ "දසබල වූ තථාගතයන් වහන්සේ දුටුවෙමි. උන්වහන්සේ මට කථා කළ සේක"යි සිතා ඉමහත් ප්‍රීතියට හා සතුටට පත් වූහ. සිතෙහි ඇති වූ දැඩි සොම්නසින් යුත් තෙරුන්වහන්සේ බුදුන් වෙතට පිය නගමියි සිතා කඳුමුදුනෙන් පයක් පෙරට තැබූහ. එසේ පා ඔසවද්දීම බුදුන්වහන්සේගේ ගාථා ධර්මය අසමින් ප්‍රීතියෙන් පිණා ගොස් අරහත් බවෙහි පිහිටියහ. උන්වහන්සේ රහත් බව ලබමින් බුදුන් පසසමින් සෘද්ධි බලයෙන් බුදුන් වහන්සේ ඉදිරියෙහි පෙනී සිටියහ.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට තනතුරු ප්‍රදානය කරන අවස්ථාවෙහි වක්කලි තෙරුන් සැදැහැවතුන් අතුරෙහි අග තනතුරෙහි පිහිටවූහ.

විස්තරාත්මක අනුවාදය (381 ගාථාව)

පාමොජ්ජබහුලො බුද්ධසාසනෙ පසන්නො භික්ඛු
සඞ්ඛාරූපසමං සුඛං සන්තං පදං අධිගච්ඡෙ

පාමොජ්ජබහුලො: ප්‍රමුදිත බව බහුල කොට ඇති, **බුද්ධසාසනෙ**: බුදුසසුනෙහි, **පසන්නො**: පැහැදුනු, **භික්ඛු**: භික්ෂුව, **සඞ්ඛාරූපසමං**: සංස්කාර සංසිඳීමට පත් වූ, **සුඛං**: සුවපත්බව ඇති, **සන්තං පදං**: ශාන්ත පදය වූ නිවන, **අධිගච්ඡෙ**: ලබා ගනියි.

ප්‍රමුදිත බවින් යුතුව බුදුසස්නෙහි පසන් වූ භික්ෂුව සංස්කාර සන්සිඳුණු ශාන්ත වූ නිවන් සුවය පසක් කරයි.

විවරණය

සංඛාරූපසමං: සියලු සංස්කාර සන්සිඳීමයි. සංස්කාර යනු පංචස්කන්ධයන්ට අයත් එක් ස්කන්ධයකි. සංස්කාර යනු මනො සංස්කරණයක් ලෙස විස්තර කෙරෙයි.

අභිධර්ම විස්තරවලට අනුව සංස්කාර යන නම පණස් එකක් වූ චෛතසික ධර්මයන්ට අයත් වන අතර එයින් එකොළසක් පකිණ්ණක නමින් හැඳින්වෙන චෛතසික ගණයට ඇතුළත් වෙයි. විසිපහක් සොභන හෙවත් කුසල චෛතසිකයෝයි. දහහතරක් අකුසල චෛතසිකයි. සංස්කාර යනු පටිච්චසමුප්පාද ධර්මයෙහි දෙවන අංගය ද වෙයි. බුදුදහමෙහි සංස්කාර යන පදය කවර වූ හෝ හේතුප්‍රත්‍යයන්ගෙන් හට ගත් වස්තූන් උදෙසාද භාවිත වෙයි.

බුදු සසුන්හි යෙදී වෙසෙන ළදරු පැවිද්දා ද මෙ ලොව මොනවට බබළවන්නේ ය.

382. යො හවෙ දහරො භික්ඛු
යුඤ්ජති බුද්ධසාසනෙ
සො ඉමං ලොකං පභාසෙති
අබ්භා මුත්තොව චන්දිමා (25:23)

යම්කිසි දහර භික්‍ෂුවක් වුව
සසුන් පිළිවෙතෙහි යෙදෙයි නම්
හෙතෙම මෙලොව බබුළුවයි
වළාවෙන් මිදුනු සඳක් මෙන්

සසුනෙහි යෙදේ නම් තරුණ භික්ෂුව වුවද මෙ මුලු ලොව බබුළුවයි

25 (12) සෘද්ධිබල පෑ සුමන තෙරණුන්ගේ කථාව (382 ගාථාව)

සුමන හෙරණපාණන් වහන්සේ අනුරුද්ධ හිමියන්ගේ ශිෂ්‍යයෙක් වූහ. උන්වහන්සේ ළදරු වියෙහි විසුවද පෙර කුසල බලයෙන් සෘද්ධිප්‍රාතිහාර්ය පෑමෙහි බලයෙන් යුත් රහතන් වහන්සේ නමක් වූහ.

වරක් උන්වහන්සේ තම ආචාර්ය අනුරුද්ධ හිමියන් අසනීප වූ විටකදී ලඟාවීමට බෙහෙවින් දුෂ්කර වූ එසේම ඉතා දුරින් පිහිටි අනොතත්ත විලට ගොස් එයින් ජලය රැගෙන පැමිණියහ. උන්වහන්සේගේ සෘද්ධි බලය නිසා එය උන්වහන්සේට දුෂ්කර කාර්යයක් නොවූයේය. පසු කලෙක අනුරුද්ධ හිමිපාණෝ සුමන හෙරණුන් ද සමග පූර්වාරාම වෙහෙරට ගොස් බුදුරදුන් බැහැ දුටහ.

පූර්වාරාමයේදී බොහෝ සාමණේරවරු සුමන හෙරණුවන් දැක ඔහුට උසුළු විසුළු හා කෙළි කවටකම් පෑහ. සුමන හෙරණුන්ගේ දුර්ලභ ගුණ අනෙක් සාමණේරවරුන්ට පෙන්වීමට බුදුරජාණන් වහන්සේට අවශ්‍ය විය. එබැවින් උන්වහන්සේ සාමණේරවරුන් කිහිප දෙනෙකු කැඳවා තමන්ට අනෝතත්ත විලෙන් දිය බඳුනක් අවශ්‍ය බව දැන්වූ සේක.

එහෙත් ඒ කිසිවකුට එය කළ නොහැකි විය. අන්තිමේදී අනඳ හිමියන්ගේ ඉල්ලීමෙන් සුමන හෙරණුන් වහන්සේ අනෝතත්ත විලට ගොස් දිය බඳුනක් ගෙනවුත් බුදුන්වහන්සේට පිරිනැමූහ. පෙර මෙන්ම මේ අවස්ථාවෙහිද හෙරණපාණෝ තම සෘද්ධිබලයෙන් එසේ කළහ.

එදින සවස භික්ෂු සන්නිපාතයෙහිදී භික්ෂූන් වහන්සේලා බුදුන් වහන්සේ හමුවෙහි සුමන හෙරණුන්ගේ සෘද්ධි බලය ගැන ප්‍රශංසා මුඛයෙන් කථා කළහ. "මහණෙනි ළදරු වයසේ සිටියද කෙනෙක් සසුනෙහි උනන්දුවෙන් යෙදෙන්නේ නම් ඔහුට සෘද්ධිබල ලබා ගැනීම දුෂ්කර නොවෙතැ"යි බුදුරජාණන්වහන්සේ පැවසූ සේක.

විස්තරාත්මක අනුවාදය (382 ගාථාව)

යො දහරො භික්ඛු හවෙ බුද්ධසාසනෙ යුඤ්ජති සො
අබ්භා මුත්තො චන්දිමා ඉව ඉමං ලොකං පභාසෙති

යො: යම්; **දහරො**: ළදරු වූ; **භික්ඛු**: භික්ෂුවක්; **හවෙ**: ඒකාන්තයෙන්ම; **බුද්ධසාසනෙ**: බුදුසසුනෙහි; **යුඤ්ජති**: යෙදේද; **සො**: ඒ භික්ෂුව; **අබ්භා**: වළාකුලෙන්; **මුත්තො**: මිදුනු; **චන්දිමා**: චන්ද්‍රයා; **ඉව**: මෙන්; **ඉමං**: මේ; **ලොකං**: ලෝකය; **පභාසෙති**: බබුළුවයි.

යම්කිසි ළදරු භික්ෂුවක් වුවද බුදු සසුනෙහි නිබඳ පිළිවෙත් සපුරන්නේ නම් හෙතෙම වළාකුළුවලින් මිදුනු සඳ මෙන් මෙලොව ආලෝකවත් කරයි.

විවරණය

මේ ගාථා ධර්මය දේශනා කරන ලද්දේ ඉතා ලාබාල වියෙහි සිටි සෘද්ධිප්‍රාතිහාර්ය පෑමෙහි දක්ෂ වූ සාමණේර කෙනකු අරභයායි, සෘද්ධිප්‍රාතිහාර්ය වනාහි මානසික සමාධිය ඇති කරවන භාවනාවේ ප්‍රතිඵලයකි, භාවනාව වූ කලි ස්වයං අවබෝධනයට හේතුකාරක වන ආත්ම සංවර්ධනයේ සාධනාත්මක හා ක්‍රියාශීලී මාධ්‍යයකි, ජීවිතයේ අවිනිශ්චිතතාවන්ගෙන් පළා යන ක්‍රියා මාර්ගයක් නොවේ, එය ඇත්ත වශයෙන්ම මිනිසාගේ සැඟවුණු ශක්‍යතාවන් අවදි කරවීමට හේතුකාරක වන ශ්‍රෙෂ්ඨ මාධ්‍යයකි.

සමාධි භාවනාවේදී දැඩිව මනස ඒකාග්‍රකර ගැනීමෙන් මනසෙහි කෙලෙසුන් යටපත් වෙයි. එසේම නීවරණ ධර්ම යටපත් වෙයි. එමගින් කුශල ධර්ම මතුවෙමින් විවිධ අභිඥාවන්ට සිත යොමු කර ගැනීමට හැකි වෙයි. දිබ්බචක්ඛු ආදී ෂට්විධ අභිඥාවන් මනසෙහි පහල වන්නේ සමාධි භාවනාවේ ප්‍රතිඵල වශයෙනි.

භාවනාවෙහි නිරතවන භාවනානුයෝගියාට එහි ප්‍රතිඵල වශයෙන් මනුෂ්‍යත්වය ඉක්මවූ ශ්‍රෙෂ්ඨ ගුණධර්ම හෙවත් උත්තරි මනුස්ස ධම්ම ඇතිවන බව ධර්මග්‍රන්ථයන්හි විස්තර වෙයි. ධ්‍යාන භාවනාවෙහි නිරතවන ශ්‍රාවකයා සමාපත්ති සුවය මේ ජීවිතය තුළම අත්විඳීමේ වාසනාව ලබයි. අභිඥාවන් මෙන්ම ධ්‍යාන සමාපත්ති අත් කරගනිමින් අවසානයෙහි විපස්සනා භාවනාවට සිත නගා ගනිමින් සියලු කෙලෙසුන් නසා සියලු ජාත්‍යාදී දුකින් නිදහස් වූ අමා මහ නිවන ද ලබා ගැනීමේ හැකියාව භාවනානුයෝගියාට අත්පත් වෙයි.

බුදුරජාණන්වහන්සේ සමස්ත මානව වර්ගයා සඳහායි

බුදුරජාණන්වහන්සේ බෞද්ධයා පමණක් සතු වස්තුවක් නොවේ.
උන්වහන්සේ සමස්ත මානව වර්ගයා සතු උරුමයකි.
උන්වහන්සේගේ ඉගැන්වීම් හැම කෙනකුටම අයත්ය.
බුදුන්වහන්සේගෙන් පසු ඇති වූ සෑම ආගමක්ම උන්වහන්සේගේ
ඉගැන්වීම්වල ආභාසය ලබා ගෙන ඇත.

අබෞද්ධ උගතෙක්

නැණවත් පියෙක්

බුදුරජාණන්වහන්සේ ලෞකිකත්වය නමැති ගින්නෙහි දැවෙමින්
සෙල්ලම් කරන තම දරුවන් දැක ඔවුන් එම ගින්නෙන් පිටට ගැනීමට
නොයෙක් උපායයන් යොදමින් ඔවුන් නිර්වාණ අභයභූමියට
යොමු කරවන පියෙකි.

මහාචාර්ය ලක්ෂ්මි නරසු
The Essence of Buddhism

26 වන පරිච්ඡේදය

බ්‍රාහ්මණ වග්ග

වෙර වඩා තණ්හාව සිඳින්න. කාමය දුරු කරන්න. නිවණ අවබෝධ කරන්න.

383. ඡින්ද සොතං පරක්කම්ම
කාමෙ පනු ද බ්‍රාහ්මණ
සඞ්ඛාරානං ඛයං ඤත්වා
අකතඤ්ඤූසි බ්‍රාහ්මණ (26:1)

බමුණ උත්සාහයෙන් සැඩ පහර සිඳ ලන්න
කම්සැප හැර ලන්න
සංස්කාරයන්ගේ විනාශය දැක
නොකළ දෙය දත්තෙක් වන්න බමුණ

අමාමහ නිවන දන්නෙක් වන්න.

26 (1) භක්තිමත් බමුණකු ගේ කථාව

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙන සමයෙහි භික්ෂු පිරිසකට ඉමහත් භක්තියක් දැක්වූ **බමුණකු** අරභයා මේ ගාථා ධර්මය දෙසූ සේක.

වරක් බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයට සවන් දුන් බ්‍රාහ්මණයෙක් එයින් බෙහෙවින් පැහැදී දිනපතා භික්ෂූන් වහන්සේලා සොළොස් නමකට දානය පිරිනැමීමට පුරුදුව සිටියේ ය. භික්ෂූන් තම නිවසට පැමිණි පසු "රහතන් වහන්සේලා වඩිනු මැනව, රහතන් වහන්සේලා වැඩ සිටිනු මැනව" ආදි වශයෙන් කියමින් බමුණා උන්වහන්සේලා පිළිගනියි. කවර භික්ෂුවක් පැමිණිය ද බමුණා උන්වහන්සේ අමතන්නේ රහතුන් වහන්සේ නමක් ලෙස සිතා ගෙනය. මේ පිළිබඳව රහතුන් නොවන භික්ෂූහු මෙසේ සිතූහ. "මේ බමුණා අප රහතුන් නොවන බව නොදනියි" රහතුන් නොවන කෙනෙකු රහතුන් ලෙස පිළිගැනීමට අකැමැති වූ භික්ෂූහු බමුණාගේ නිවසට යාම නවතාලූහ.

මෙයින් බමුණා බෙහෙවින් කණස්සල්ලට පත් විය. උතුම් වූ රහතන් වහන්සේලා මගේ දානයට නොවඩින්නේ මන්දැයි හෙතෙම විපිළිසර විය. එබැවින් හෙතෙම විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේ හමුව ගරු බහුමන් දක්වා සියලු තොරතුරු පවසා සිටියේ ය. එවිට උන්වහන්සේ භික්ෂූන් කැඳවා බමුණාගේ නිවසට නොයෑමේ හේතුව විමසූ හ. භික්ෂූන් වහන්සේලා කාරණය සැළ කළහ. "මහණෙනි, තොප රහතුන් ලෙස ඇමතුම් ලැබීමට නොකැමැත්තහු ද?" බුදු පියාණෝ විමසූහ."එසේය භාග්‍යවතුන් වහන්ස, අපි නොකැමැත්තෙමු" භික්ෂූන් වහන්සේලා දැනුම් දුන්හ. "මහණෙනි, මෙය හුදෙක් බමුණාගේ භක්තිය හා සතුට ප්‍රකාශ කිරීමක් පමණි. සැදැහැයෙන් හා භක්තියෙන් කරණ එබඳු ප්‍රකාශයක් වරදක් නැත. රහතන් වහන්සේලා කෙරෙහි බමුණාගේ ඇති භක්තිය අසීමිතය. එබැවින් තොපද ඒ බව දැන තෘෂ්ණා ඕඝය සිඳ බිඳ රහත් බවෙහි උත්සුක වන්නැ"යි බුදුරජාණන් වහන්සේ පැවසූ සේක.

විවරණාත්මක අනුවාදය (383 ගාථාව)

බ්‍රාහ්මණ පරක්කම්ම සොතං ඡින්ද කාමෙ පනු ද
බ්‍රාහ්මණ සඞ්ඛාරානං ඛයං ඤත්වා අකතඤ්ඤූ අසි

බ්‍රාහ්මණ: බමුණ, **පරක්කම්ම**: උත්සාහ කොට, **සොතං**: සැඩ පහර, **ඡින්ද**: සිඳලන්න, **කාමෙ**: කාමයන්, **පනුද**: අත්හැර දමන්න, **බ්‍රාහ්මණ**: බමුණ, **සඞ්ඛාරානං**: සංස්කාරයන්ගේ, **ඛයං**: විනාශය, **ඤත්වා**: දැන, **අකතඤ්ඤූ**: නොකළ දෙයෙහි හෙවත් සංස්කාරයන්ගෙන් නිර්මාණය නොවූ නිවන දන්නෙක්, **අසි**: වෙන්න.

සසර නමැති මෙම සැඩ පහර උත්සාහ දරා සිඳ බිඳ දමන්න. කම් සුව හැර ලන්න. බමුණ සංස්කාර ධර්මයන් විනාශ වන බව දැන සංස්කාර ධර්මයන්ගෙන් නිර්මාණය නොවූ නිවණ දැනගත් කෙනෙක් වන්න.

විවරණය

සොතං ඡින්ද: සැඩ පහර සිඳලන්න. මෙහි සැඩ පහර යනුවෙන් හැඳින්වෙන්නේ තෘෂ්ණාවයි. සෝතය හෙවත් සැඩපහර සිඳලීමේ පළමු පියවරට පත් තැනැත්තා සෝතාපන්නයයි කියනු ලැබේ. සෝවාන් පුද්ගලයා තවදුරටත් පුහුදුන් හෙවත් පෘථග්ජන පුද්ගලයෙක් නොවේ. සෝවාන් මඟට පිවිසෙන්නේ පුද්ගලයා සසරට බැඳ තබන සංයෝජන තුනක් දුරු කිරීමෙනි.

සක්කාය දිට්ඨි: මෙයින් අදහස් වන්නේ පංචස්කන්ධය තමායයි ගැනීමේ දෘෂ්ටියයි. රූප වේදනා සඤ්ඤා සංඛාර හා විඤ්ඤාණ යන පංචස්කන්ධය කෙරෙහි මමය මාගේ ය යනුවෙන් පවත්නා දෘෂ්ටිය සක්කාය දිට්ඨි නමින් ගැනෙයි. මෙහි කාය යනුවෙන් සැලකෙන්නේ පුද්ගලයා පිළිබඳ පංචස්කන්ධයයි. එය සත්‍ය වශයෙන් පවත්නා ආත්ම තත්වයක් ලෙස සැලකීමට පුද්ගලයෝ පුරුදුව සිටිති. සෝවාන් මගට පිවිසීමත් සමඟ ආත්ම දෘෂ්ටිය පුද්ගලයාගේ සිතෙන් ඉවත් වෙයි.

1. **විචිකිච්ඡා**: සැකය, බුද්ධාදී අට තැනක් කෙරෙහි පුද්ගලයා තුළ ඇති සැකය විචිකිච්ඡා නමින් සැලකෙයි.

   1. බුදුන් වහන්සේ කෙරෙහි සැකය
   2. ධර්මය කෙරෙහි සැකය
   3. සංඝයා කෙරෙහි සැකය
   4. ශික්ෂාවන් කෙරෙහි සැකය
   5. අතීත පැවැත්ම පිළිබඳ සැකය
   6. අනාගත පැවැත්ම පිළිබඳ සැකය
   7. අතීත අනාගත භව දෙකම පිළිබඳ සැකය හා
   8. පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳ සැකය විචිකිච්ඡාවට අයත් වෙයි.

2. **සීලබ්බතපරාමාස**: වැරදි ශීලවුත චාරිත්‍රාදිය නිවැරදි නිර්වාණ මාර්ගය ලෙස ගෙන ඒවායේ ඇලීමයි.

ධම්ම සංගිනිය විස්තර කරන අන්දමට සසුනෙන් බැහැර ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් විවිධ වුත චාරිත්‍ර විමුක්ති මාර්ග වශයෙන් දැඩිව පිළිගෙන ක්‍රියා කිරීම සීලබ්බතපරාමාසයයි.

සමත්-විදසුන් දහම්හි පරතෙර පැමිණ සිවුසස් දහම් දන්නහු ගේ සංයෝගයෝ වැනසෙති.

384. යදා ද්වයෙසු ධම්මෙසු
පාරගූ හොති බ්‍රාහ්මණො
අථස්ස සබ්බෙ සංයොගා
අත්ථං ගච්ඡන්ති ජානතො (26:2)

යම් විටෙක දෙදහමෙක්හි
බමුණා යයිද පරතෙර
එවිට ඔහුගේ සියලු බැඳුම්
සිඳී යයි දන්නා බැවින්

සිතේ එකඟතාව දියුණු කරන්න.

26 (2) භික්ෂූන් තිස් නමකගේ කථාව (384 ගාථාව)

සැවැත් නුවර දෙව්රමෙහි වෙසෙමින් බුදුරජාණන් වහන්සේ මේ ගාථා ධර්මය **භික්ෂූන් තිස් දෙනකු** ඇරබ දේශනා කළ සේක.

දිනක් දුරු රටක වෙසෙන භික්ෂූන් වහන්සේලා තිස් නමක් දෙව්රමට පැමිණ බුදුරජාණන් වහන්සේ බැහැ දැක ගරුබුහුමන් දක්වා සිටියහ. සැරියුත් මහ රහතන් වහන්සේ මෙම භික්ෂූන් වහන්සේලා ගේ රහත් වීමට ඇති හේතු සම්පත් දැන බුදුන් වෙත එළඹ පහත සඳහන් ප්‍රශ්නය බුදුන්වහන්සේ ගෙන් ඇසූ හ. "භාග්‍යවතුන් වහන්ස කරුණු දෙකක් ගැන නිතරම කියැවෙයි. ඒ කරුණු දෙක කිමෙක් ද?" "ඒ කරුණු දෙක අන් කිසිවක් නොව මානසික සමාධිය හා විපස්සනා"යි බුදුරජාණන් වහන්සේ පිළිතුරු දුන් සේක.

විවරණාත්මක අනුවාදය (384 ගාථාව)

බ්‍රාහ්මණො යදා ද්වයෙසු ධම්මෙසු පාරගූ හොති අථ ජානතො අස්ස සබ්බෙ සංයොගා අත්ථං ගච්ඡන්ති

බ්‍රාහ්මණො:බමුණා; **යදා**: යම් විටෙක; **ද්වයෙසු ධම්මෙසු**: ධර්ම දෙකෙක; **පාරගූ හොති**: පරතෙරට ගියේ වෙයි ද; **අථ**: ඉක්බිති; **ජානතො**: දන්නාවූ; **අස්ස** : ඔහුගේ; **සබ්බෙ**:සියලු; **සංයොගා**: බන්ධනයෝ; **අත්ථං ගච්ඡන්ති**: අවසන් වෙත්.

බමුණා යම් කිසි විටෙක දහම් දෙකෙක්හි පරතෙරට යයි ද දන්නා වූ ඔහු ගේ සියලු බැඳුම් අවසන් වෙයි.

විවරණය

ද්වයෙසු ධම්මෙසු : දහම් කරුණු දෙකකි. සමථ හා විපස්සානා යනු ඒ දහම් කරුණු දෙකයි. මේ වූ කලි සසරෙන් එතෙර වීම සඳහා අවශ්‍ය වන මානසික විධි ක්‍රම දෙකයි. ක්‍රම දෙකින් පළමු වැන්න සමථයයි. එයින් අදහස් වන්නේ චිත්ත ඒකාග්‍රතාවයි. සිතේ ඇතිවන එකඟ බවයි. නොවිසුරුණු මනසකින් යුතුව සිටීමට මානසික ඒකාග්‍රතාව අවශ්‍ය වෙයි. අනෙක විපස්සනා හෙවත් විදර්ශනාවයි. සාංසාරික පැවැත්මේ භෞතික හා මානසික ධර්මයන්ගේ අනිත්‍ය දුක්ඛ අනාත්මතාවන් අවබෝධ කොට ගෙන යථාර්ථය දැකීමට ඉවහල් වන්නේ විපස්සනාවයි. සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය දුක්ඛ අනාත්මතාවන් විමර්ශනය කිරීම මගින් ප්‍රඥාව විශෝධනය වෙයි. ඒ වූ කලි සීල සමාධි ප්‍රඥා යන ත්‍රිශික්ෂා වේ නිෂ්ටාප්‍රාප්තියයි. සමාධි හෙවත් සමථ: කිසියම් එක් විෂය වස්තුවක් කෙරෙහි මනස ඒකාග්‍ර කිරීම මෙයින් අදහස් වෙයි.

මෙය චිත්තස්ස එකග්ගතා යනුවෙන් ද හැඳින්වෙයි. එකග්ගතාව බෙහෙවින් දුර්වල වුවත් එය සබ්බචිත්ත සාධාරණ යන සියලු සිත්වල නොවෙනස්ව යෙදෙන චෛතසික ධර්මයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අවසාන අංගය වශයෙන් ගැනෙන සම්මා සමාධිය භාවනාමය ධ්‍යාන සතර අර්ථයෙන් එකඟ බවද ඊට අයත් වෙයි. ඒ අනුව එය සියලු කුසල් සිත්වල සම්මා සමාධි ලෙස ද සියලු අකුසල සිත්වල මිච්ඡා සමාධි වශයෙන් ද යෙදෙයි. ධර්ම ග්‍රන්ථයන්හි මෙය මිච්ඡා හෝ සම්මා වශයෙන් විශේෂත්වයකින් තොරව යෙදෙන විට එයින් අදහස් වන්නේ සම්මා සමාධියයි. සමාධියෙහි පවත්නා දැඩි බව අනුව එය දෙයාකාර වෙයි.

1. **පරිකම්ම සමාධි**: මානසික ශික්ෂණයේ ආරම්භයෙහි දී පවතින මානසික ඒකාග්‍රතාව පරිකම්ම සමාධි යනුවෙන් ගැනෙයි. මෙය එතරම් ස්ථාවර මට්ටමක පවතින්නක් නොවේ.

2. **උපචාර සමාධි**: ධ්‍යාන ලාභිත්වයට ආසන්නයෙහි පවතින සිතෙහි එකඟතාව මෙයින් අදහස් වෙයි. ප්‍රථම ධ්‍යාන ආරම්භයට සමීපව පවතින සමාධි තත්වයක් බැවින් එයට උපචාර සමාධි යන නම යෙදී ඇත. භාවනාවට උපයෝගී කරගන්නා ආරම්මණයට අනුකූල වූ නිමිත්තක් එනම් ප්‍රතිභාග නිමිත්ත මනසට ගෙන එන්නේ මෙම උපචාර සමාධියත් සමඟය.

3. **අප්පණා සමාධි**: ධ්‍යානයට සිත නංවන චිත්ත ඒකාග්‍රතාව මෙනමින් හැඳින්වෙයි. මෙය ධ්‍යාන අවස්ථාව තුළ පවතින සමාධි තත්වයයි.

නිවන අරමුණ වශයෙන් ගෙන සතර මග සතර ඵල වල පවත්නා සමාධි තත්වය ලෝකෝත්තර තත්වයෙන් සැලකෙයි. අනෙක් සියලු ධ්‍යාන සිත්වල පවතින සමාධිය ලෞකික වෙයි. සමථ භාවනාව වැඩීමෙන් චතුර්විධ ධ්‍යානයන් හා බැඳුණු ධ්‍යාන සුඛය මෙන්ම පංච අභිඥා ලබා ගැනීමට ද හැකි වෙයි.

විපස්සනා: සාංසාරික ප්‍රවෘත්තිය පිළිබඳ සියලු ආකාර භෞතික වුත් මානසික වුත් සංස්කාර ධර්මයන්ගේ යථාර්ථය හෙවත් අනිත්‍ය දුක්ඛ හා අනාත්ම තත්වයන් පවත්නා පරිද්දෙන් වටහා ගැනීමට විපස්සනා භාවනාව අවශ්‍ය වෙයි. මෙය බුදුදහමට විශේෂ වූ භාවනා ක්‍රමයක් ලෙස පිළිගැනෙයි. බුදු දහමට අනුව විමුක්ති සාධක භාවනා මාර්ගය විප්සසනාවයි. සීල සමාධි ශික්ෂණයන් ඔස්සේ වර්ධනය කෙරෙන විපස්සනාව කුළු ගැන්වීමෙන් ජනිතවන ප්‍රඥාව සංස්කාර ධර්මයන්ගේ යථාර්ථය හෙළි කරයි. ඒ අනුව අවිද්‍යාව නිසා ඇති වන තෘෂ්ණා ද්වේෂ හා මොහාදි ක්ලේෂ ධර්මයන් විනාශ කරමින් විමුක්තිය සාක්ෂාත් කිරීමට අවස්ථාව පෑදෙයි.

ප්‍රඥාව වූ කලී හුදෙක් බුද්ධිමය අවබෝධයනයේ ප්‍රතිඵලයක් නොවේ. නමුත් එය කෙනෙකු තමාගේම භෞතික හා මානසික සාංස්කාරයන් විමර්ශනාත්මකව දැකීමට දරණ උත්සාහයේ ප්‍රතිඵලයෙකි. අට්ඨකථාවල විදර්ශනාභාවනාවේ වර්ධනයේ අවස්ථා පහත සඳහන් පරිද්දෙන් ඉදිරිපත් කොට ඇත.

1. රූපස්කන්ධයේ සංස්ථිතිය පිළිබඳ විමර්ශනාත්මක දැනුම
2. නාමස්කන්ධයේ පැවැත්ම පිළිබඳ යථාර්ථවත් දැනීම **3**. නාම-රූප අංශ දෙකේම පැවැත්ම හා ඒවායේ අන්‍යෝන්‍ය රඳා පැවැත්ම යථාර්ථවත්ව වටහා ගැනීම **4**. ප්‍රතීත්‍යසමුත්පන්න ධර්මතා ලෙස නාම-රූප යන අංශ දෙකම එකට සලකා බැලීම **5**. අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම යන ත්‍රිලක්ෂණය නාම-රූප අංශයන්හි ක්‍රියාත්මක වීම පිළිබඳ දැනීම

ක්‍රමානුකූලව වර්ධනය වන විදර්ශනා ඥානය නව විධ ආකාරයකින් දක්නට ඇත. ඒවා විදර්ශනා ඥාන යනුවෙන් හැඳින්වෙයි.

අටළොසක් වූ මහා විදර්ශනා ඥාන ද ග්‍රන්ථයන්හි දක්වා ඇත.

1. අනිත්‍යතාව විදර්ශනයට නැගීම (අනිච්චානුපස්සනා) **2.** සංස්කාර ධර්මයන්හි දුක්ඛ ස්වභාවය විදර්ශනයෙන් දැකීම (දුක්ඛානුපස්සනා) **3.** සංස්කාරයන් අනාත්ම වශයෙන් දැකීම (අනත්තානුපස්සනා) **4.** සංස්කාර ධර්මයන් නිර්වේදනයෙන් යුතුව දැකීම (නිබ්බදානුපස්සනා) **5.** විරාගී මනසින් යුතුව සංස්කාරයන් දැකීම (විරාගානුපස්සනා)
6. සංස්කාරයන්ගේ නිරෝධය හෙවත් විනාශය දැකීම (නිරොධානුපස්සනා)
7. සංස්කාර ධර්මයන්ගෙන් ඉවත්වීම හෙවත් අතහැරීම පිළිබඳ විමර්ශනය (පටිනිස්සග්ගානුපස්සනා) **8.** සංස්කාරයන් ගේ ක්ෂය වීම අනුව දැකීම (ඛයානුපස්සනා) **9.** සංස්කාරයන් ගේ විනාශවීම දැකීම (වයානුපස්සනා)
10. සංස්කාරයන්ගේ විපරිනාමභාවය හෙවත් වෙනස්වීම දැකීම (විපරිනාමානුපස්සනා) **11.** සංස්කාරයන්ගේ නිමිත්තක් ගැනීමට නොහැකි බව මනාව දැනීම (අනිමිත්තානුපස්සනා) **12.** ප්‍රණීත භාවයක් සංස්කාර තුළ නොමැති බව දැකීම (අප්පණිහිතානුපස්සනා) **13.** සංස්කාරයන් ශූන්‍ය ලෙස දැකීම (සුඤ්ඤතානුපස්සනා) **14.** අධිප්‍රඥා ධර්මතාවන් විදර්ශනයෙහි යෙදීම (අධිපඤ්ඤා විපස්සනා) **15.** පවත්නා සැටියෙන් වස්තූන් දැකීම (යථාභූත ඤාණදස්සන) **16.** සංස්කාරයන්ගේ ආදීනවයන් දැකීම (ආදීනවානුපස්සනා) **17.** බුද්ධියෙන් විමර්ශනය කිරීම (පටිසංඛානුපස්සනා)
18. අසංස්කෘත තත්වයට හැරීම විමර්ශනය කිරීම (විවට්ටානුපස්සනා)

යමෙකුට තමා පිළිබඳ වූ ද අනුන් පිළිබඳ වූ ද ආයතනයන්හි ආසා නැද්ද? ඒ තැනැත්තා නියම බමුණා ය.

385. යස්ස පාරං අපාරං වා
පාරාපාරං න විජ්ජති
වීතද්දරං විසංයුත්තං
තම'හං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:3)

යමෙකුට එතෙර ද මෙතෙර ද
එතෙර මෙතෙර දෙකම නැද්ද
ගැටළු නොමැති බැඳුම් නොමැති
එවැන්නෙකුට බමුණෙකැයි කියමි

බැඳුමෙන් තොර වූයේ බමුණෙකි.

25 (3) මාරයාගේ කථාව (385 ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන බුදුරජාණන් වහන්සේ **මාරයා** අරභයා මේ ගාථාව වදාළ සේක.

කිසියම් වේලාවක මාරයා මිනිසකු මෙන් වෙස්වලා ගෙන බුදුරදුන් හමුවට පැමිණියේ ය. "ස්වාමීනි, ඔබ නිතරම එතෙර ගැන කථා කරයි. කිමෙක් ද මේ එතෙර?" හෙතෙම බුදුරදුන්ගෙන් විමසා සිටියේ ය. මේ මාරයායයි මනාව දත් බුදුරජාණන් වහන්සේ "කපටි මාරය, එතෙර මෙතෙර යන වචනවලින් ඔබට වැඩක් නැත. සසරින් එතෙර වීම අරුත් කොට ඇති එතෙරට ලඟාවිය හැක්කේ සියලු කෙලෙස් නැසූ රහතුන්ට පමණකැ" යි පිළිතුරු දුන්සේක.

විවරණාත්මක අනුවාදය (385 ගාථාව)

> **යස්ස පාරං අපාරං වා පාරාපාරං න විජ්ජති වීතද්දරං**
> **විසංයුත්තං අහං තං බ්‍රාහ්මණං බ්‍රෑමි**

යස්ස: යමෙකුට; **පාරං**: එතෙර ද; **අපාරං වා**: මෙතෙර ද; **පාරාපාරං**: එතෙර මෙතෙර දෙකම ද; **න විජ්ජති**: නොවේ ද; **වීතද්දරං**: කෙලෙස් නැති; **විසංයුත්තං**:(සියලු කෙලෙසුන් ගෙන් මිදුනු) බැඳුම් නැති; **තං**: ඔහු; **බ්‍රාහ්මණං**: බමුණකැයි; අහං: මම; **බ්‍රෑමි**: කියමි.

යමෙකුට එතෙරත් මෙතෙරත් එතෙර මෙතෙර දෙතෙරත් නැද්ද, කෙලෙසුන්ගෙන් තොර බැඳුම් වලින් නිදහස් වු පුද්ගලයා බමුණෙකි.

විවරණය

පාරං: ඉන්ද්‍රිය විෂය ක්‍ෂෙත්‍රයයි. එය දොළොස් ආකාරය. එයින් හයක් ආධ්‍යාත්මිකයි. හයක් බාහිරයි. ඒවා ආයතන වශයෙන් ද නම් කොට තිබේ. පුද්ගලයන්ගේ මානසික ක්‍රියාකාරීත්වයට අදාළ විෂය වස්තුවලට සම්බන්ධව මේ ආයතන දොළස පවතියි. ආධ්‍යාත්මික ඉන්ද්‍රිය හෝ ආයත්න ලෙස ගෙන ඇත්තේ චක්‍ඛු (ඇස), සොත (කණ), ඝාන (නාසය), ජිව්හා (දිව), කාය (කය) හා මනො (මනස) යන සයයි.

ඒවාට අනුකූල විෂය වස්තූන් බාහිර ඉන්ද්‍රිය හෝ ආයතන ලෙස සැලකී ඇත. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ෂ හා ධර්ම ඒවාට අයත් වෙයි. චක්ඛු ඉන්ද්‍රියය යනු රූපයේ පිළිබිඹුව ග්‍රහණය කෙරෙන ඇසේ පවතින ප්‍රසාදරූපයයි. සොත ඝානාදිය ද වටහාගත යුත්තේ එම ආකාරයෙනි. එම තැන්වල පවත්නා ප්‍රසාද රූප පමණක් ඉන්ද්‍රිය හෝ ආයතන යන්නට ඇතුළත් වෙයි.

එම ප්‍රසාද රූප සැකසී ඇත්තේ පඨවි, ආපො, තෙජො, වායො යන සතර මහා භූත රූපයන්ගේ එකතුවෙනි. මනස ඉන්ද්‍රියක් ලෙස ක්‍රියාත්මක වෙමින් ධර්මාරම්මණ ග්‍රහණය කරන බැවින් මනො ඉන්ද්‍රිය හෙවත් මනායතන ලෙස පිළිගෙන ඇත. ඉන්ද්‍රිය බද්ධ විෂය වස්තු මනස මගින් පිළිගැනෙන සම්පටිච්ඡන යන කාර්යයන් සිද්ධ කෙරෙන මනොධාතු යන්න මනො ඉන්ද්‍රියයෙන් වෙන් කොට සැලකිය යුතුය.

මනස මනො ඉන්ද්‍රිය හෝ මනායතනය වශයෙන් ද මනොධාතු වශයෙන් ද වෙන් කොට සැලකෙන්නේ මනසින් කෙරෙන ඒ ඒ කාර්යයන් අනුවය. ආධ්‍යාත්මික හා බාහිර ආයතන එකතුව විෂය බද්ධ විඤ්ඤාණයන් උපදවයි. ඒවා මගින් අපි ලෝකය හා බැඳී සිටිමු. ලෝකය හා පුද්ගලයා අතර සම්බන්ධය ගොඩ නැගෙන්නේ මේ දෙයාකාර ආයතන මගිනි.



දැහැන කරන කෙලෙස් රජස් නැති කරන ලද කිස ඇති රහත් ඵලපත් පුගුලා බ්‍රාහ්මණයා ය.

386. ඣායිං විරජමාසීනං
කත කිච්චං අනාසවං
උත්තමත්ථං අනුප්පත්තං
තම'හං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:4)

ඇලුම් නැතිව බවුන් වඩන
කළ කිස ඇති කෙලෙස් නොමැති
උතුම් තැනට පැමිණි ඇති
එවැන්නෙකුට බමුණෙකැයි කියමි.

බවුන් වඩන්නේ බමුණායි

26 (4) බමුණෙකුගේ කථාව (386 ගාථාව)

සැවැත් නුවර දෙව්රමෙහි වැඩ වසන බුදුරජාණන් වහන්සේ කිසියම් **බමුණකු** අරබයා මේ ගාථාව වදාළ සේක.

මේ බමුණා දිනක් තමාටම මෙසේ සිතාගත්තේ ය. "බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට බ්‍රාහ්මණයයි කියති. මම උපතින් මෙන්ම පරපුරෙන් ද බ්‍රාහ්මණයෙක්මි. එබැවින් බුදුන් විසින් මට ද මේ නම යෙදිය යුතුය." මෙසේ සිතූ බමුණා දිනක් බුදුරදුන් හමුවට ගොස් කාරණය සැළ කළේ ය. "මම හුදෙක් උපත හා පරපුර නිසාම කෙනෙකුට බ්‍රාහ්මණයයි නොකියමි. උත්තමාර්ථයට පත් පුද්ගලයාට පමණක් බ්‍රාහ්මණයයි කියමි" යි බුදුන් වහන්සේ පැවසූ හ.

විවරණාත්මක අනුවාදය (386 ගාථාව)

ඣායිං විරජං ආසීනං කතකිච්චං අනාසවං උත්තමත්ථං
අනුප්පත්තං තං අහං බ්‍රාහ්මණං බ්‍රෑමි

ඣායිං: ධ්‍යානවඩන; **විරජං**: (රාගාදී) රජස් නැති; **ආසීනං**: තනිව සිටින; **කතකිච්චං**: (සිව් මඟින්) කරන ලද කටයුතු ඇති; **අනාසවං**: (කාමාදී) කෙලෙස් රහිත; **උත්තමත්ථං**: (අරහත් ඵල යයි කියු) උත්මාර්ථයට; **අනුප්පත්තං**: පැමිණියා වූ; **තං**: (ඔහු) ඒ ක්ෂීණාශ්‍රවයා; **අහං**: මම; **බ්‍රාහ්මණං බ්‍රෑමි**: බ්‍රාහ්මණ යයි කියමි.

ධ්‍යාන වඩන, කෙලෙස් දූවිලි නැති, එකලා වූ, කළ යුතු දේ කොට නිම වූ, කෙලෙස් කසට නැති, පුද්ගලයා බ්‍රාහ්මණයකැයි කියමි.

විවරණය

උත්තමත්ථං අනුප්පත්තං: උසස්ම ආධ්‍යාත්මික තත්වයට පත්වූ. මෙයින් අදහස් වන්නේ ආධ්‍යාත්මික ශික්ෂණයෙහි ප්‍රතිඵල වශයෙන් ශ්‍රේෂ්ඨ තත්වයට පත් වූ පුද්ගලයා යි. අර්හත් මාර්ගගාමී ආර්ය තත්වය මෙයින් අපේක්ෂා කෙරෙයි. ආර්ය පුද්ගලයෝ සිවු දෙනෙකි. සොතාපත්ති, සකදාගාමි, අනාගාමි හා අරහන්ත යනු ඒ ආර්ය පුද්ගල තත්ව සතරයි.

1. **සොතාපත්ති මාර්ගයේ** දී කෙනකු පළමු සංයෝජන තුනෙන් නිදහස් වෙයි. සංයෝජන යනු පුද්ගලයා සසරට බැඳ තබන රැහැන්ය. සක්කාය දිට්ඨි (පංචස්කන්ධය ආත්ම දෘෂ්ටියෙන් ගැනීම), විචිකිච්ඡා (බුද්ධාදී අට තැනක පවත්නා සැකය), හා සීලබ්බතපරාමාස (ශීලව්‍රතයන් දැඩි සේ ග්‍රහණය කිරීම) යනු පළමු සංයෝජන තුනයි. සෝවාන් මාර්ගයට පැමිණීමත් සමඟ එම සංයෝජන දුරුවෙයි.

2. **සකෘදාගාමි මාර්ගයෙන්** සතර වැනි සහ පස්වැනි සංයෝජනයන්ගේ දැඩි ගතිය දුරුවෙයි. කාමරාග (පංචකාම වස්තූන් කෙරෙහි රාගය) හා ව්‍යාපාද (දැඩි ද්වේෂය) එම සංයෝජන දෙකයි.

3. **අනාගාමි මාර්ගයෙන්** ඕරම්භාගිය සංයෝජන හෙවත් සංයෝජන පසෙන් මුල් සංයෝජන පහ සම්පූර්ණයෙන් ම සිඳ බිඳ දැමෙයි.

4. **අර්හත් මාර්ගයෙන්** අවසාන සංයෝජන පස හෙවත් උද්ධම්භාගිය සංයෝජන පස එනම් රූපරාග (රූප භවයෙහි ඉපදීමේ කැමැත්ත), අරූපරාග (අරූප භවයන් හි ඉපදීමේ කැමැත්ත), මාන (මානය), උද්ධච්ච (මානසික නොසන්සුන් බව), හා අවිජ්ජා (අවිද්‍යාව) සම්පූර්ණයෙන්ම විනාශ කර දැමෙයි.

1. පළමු සංයෝජන තුන දුරුකොට සෝවාන් මගට පැමිණෙන ආර්ය ශ්‍රාවකයා දුගතීන්හි පුනර්භවය නොලබන්නෙක් බවට පත් වෙයි. හෙතෙම නිර්වාණ ප්‍රතිලාභයෙහි ස්ථිරව පිහිටියේ වෙයි. උපරිම මට්ටමින් එබඳු පුද්ගලයකුට හිමිව ඇත්තේ සත්වරක් උපත ලැබීමටය. ඉන් අනතුරුව හෙතෙම අනිවාර්යයෙන් රහත් බවට පත්ව නැවත ඉපදීම නිමා කොට දමයි.

2. **සකෘදාගාමී** යන්නේ වාච්‍යාර්ථය වන්නේ වරක් පැමිණෙන්නා යනුයි. මුල් සංයෝජන තුන සම්පූර්ණයෙන් දුරු කොට ඇති හෙතෙම අනතුරු සංයෝජන දෙකේ ද දැඩි ගතිය තුනී කොට ඇති බැවින් එක්වරක් පමණක් උපත ලැබීමට සුදුස්සෙක් වෙයි. අනතුරුව අර්හත්වය ඔහුට නියමිතය.

3. **අනාගාමී** යන්නේ අර්ථය යළි නොපැමිණෙන්නා යනුයි. මුල් සංයොජන පස සම්පූර්ණයෙන්ම දුරු කොට ඇති හෙතෙම යළිත් කාම ලෝකයෙහි උත්පත්තිය නොලබාම අර්හත්වය ලබා ගනියි.

4. **අරහත්ත**: ඕරම්භාගිය සහ උද්ධංභාගිය යන සංයෝජන දහයම දුරුකොට නිවණට සැපැමිණෙන ආර්යශ්‍රාවකයා පුනර්භවය සම්පූර්ණයෙන්ම ක්ෂය කොට දමන්නෙකි. අර්හත්වය ලැබීමත් සමග හෙතෙම නිර්වාණය සාක්ෂාත් කරගනියි.



හිරු දාවල් සඳු රෑ රජ සැරසුණු කල බබලයි. රහත් පුගුල් සමවත් සමවැදි කල ද බුදුරද රෑ-දවල් දෙක්හි ද, බබලයි.

387. දිවා තපති ආදිච්චො
රත්තිං ඔභාති චන්දිමා
සන්නද්ධො ඛත්තියො තපති
ඣායී තපති බ්‍රාහ්මණො
අථ සබ්බං අහොරත්තිං
බුද්ධො තපති තෙජසා (26:5)

හිරු බබළයි දිවා කාලේ
සඳ බබළයි රෑ කාලේ
අවි ගෙන ඇති රජුන් දිලේ
බවුන් වඩන බමුණු දිලේ
බුදුහු දිලෙති සියලු කලේ

රෑ දහවල් වෙනස නැතිව බුදුහු දිලෙති සදාකල්හි

26 (5) අනඳ තෙරුන්ගේ වත (387 ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙමින් බුදුරජාණන් වහන්සේ **අනඳ තෙරුන් වහන්සේ** ඇරබ මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

පසේනදී කොසොල් රජ තෙමේ කිසියම් උත්සව දිනයක සියලු රාජාභරණයෙන් සැරසී බෙහෙවින් ප්‍රතාපවත් ලෙසින් ජේතවනාරාමයට පැමිණියේ ය. මේ අවස්ථාවෙහි කාලුදායි තෙරුන්වහන්සේ සන්නිපාත ශාලාවෙහි කිසියම් තැනක හිඳ ධ්‍යානයකට සමවැදී සිටියහ. රන්වන් පැහැයෙන් බබලන සිරුරක් ඇති කාලුදායි තෙරුන් වහන්සේ ධ්‍යානයට ද සමවැදී සිටි හෙයින් වඩාත් බබලමින් සිටියහ. මේ වේලාවෙහි හිරු බැස යමින් හා සඳු නැගෙමින් තිබිණ. එවේලාවෙහි අනඳ තෙරුන් වහන්සේ පසේනදී කොසොල් රජු දෙසත්, කාලුදායි තෙරුන් දෙසත්, බුදුරජාණන් වහන්සේ දෙසත් දෙනෙත් යොමා බැලූහ. තිදෙනාම බබලමින් සිටිති. නමුත් බුදුරජාණන් වහන්සේගේ බැබලීම අන් සියල්ලන් පරදවා යමින් තිබිණ.

අනඳ තෙරුන් වහන්සේ බුදුන් වැඳ නමස්කාර කොට මෙසේ කීහ. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, අද මම මේ සියල්ලන්ගේ බබලන සිරුරු දෙස බැලීමි. ඒ හැම සිරුරකින්ම නික්මෙන කාන්තිය පරදමින් ඔබ වහන්සේගේ සිරුරෙන් නික්මෙන කාන්තිය හා දීප්තිය බෙහෙවින්ම සිත් ගන්නේ ය." බුදුරජාණන් වහන්සේ අනඳ හිමියන්ට මෙසේ පැවසූ සේක. "ආනන්ද, හිරු දහවල් කාලයෙහි බබලයි. සඳ බබලන්නේ රෑයෙහියි. හුදෙකලාව වෙසෙමින් ධ්‍යානගතව සිටින රහතන් වහන්සේ ද බබලයි. බුදුරජාණන් වහන්සේ රෑ දාවල් දෙක්හිම පස්වණක් ඝන බුද්ධරශ්මියෙන් බබලන සේක."

විවරණාත්මක අනුවාදය (387 ගාථාව)

> **ආදිච්චො දිවා තපති චන්දිමා රත්තිං ඔභාති ඛත්තියො**
> **සන්නද්ධො තපති බ්‍රාහ්මණො ඣායී තපති අථ සබ්බං**
> **අහොරත්තිං බුද්ධො තෙජසා තපති.**
>
> **ආදිච්චො**: සූර්යයා; **දිවා**: දහවලෙහි; **තපති**: බබලයි; **චන්දිමා**: චන්ද්‍රයා; **රත්තිං**: රාත්‍රියෙහි; **ඔභාති**: බබලයි; **ඛත්තියො**: රජ තෙමේ; **සන්නද්ධො** :(අබරණින්) අවි ආයුධයෙන් සැරසුනේ; **තපති**: බබලයි; **බ්‍රාහ්මණො**: ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ තෙමේ; **ඣායී**: ධ්‍යාන වඩන්නේ; **තපති**: බබලයි; **අථ**: එසේ ද වුවත්; **සබ්බං**: සියලු; **අහොරත්තිං**: දහවල් හා රාත්‍රියෙහි; **බුද්ධො**: බුදුරජාණන් වහන්සේ; **තෙජසා**: තෙදින් (චරණ, ගුණ, ඥාන, පුණ්‍ය, ධර්ම වන පස් විධ තෙදින්); **තපති**: බබලන සේක.

දහවල් කාලයෙහි හිරු බබලයි. රෑ කාලයෙහි සඳ බබලයි. සන්නද්ධ වූ රජතුමා බබලයි. ධ්‍යාන වඩන ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයා, බබලයි. බුදුරජාණන් වහන්සේ තම කාන්තියෙන් රෑ දහවල් දෙකෙහිම බබලයි.

විවරණය

ඣායී: ධ්‍යාන වඩන්නා යන්නයි. ධ්‍යාන යනු පංචවිධ ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වයට සම්පවිය නොහැකි මානසික අවස්ථාවකි. මේ වුකලි භාවනානුයෝගීව සිටිමින් සිතේ එකඟතාව මත ලබා ගත යුතු මානසික ශක්තියකි.

කාම වස්තූන්ගෙන් ඉවත්ව අකුසලයන්ගෙන් වෙන්ව භාවනානුයෝගියා පංචවිධ ධ්‍යානයන්ට සමවදියි. එම ධ්‍යාන සමඟ විතක්ක, විචාර, පීත, සුඛ, එකග්ගතා යන ධ්‍යානාංග ද යෙදෙයි. මේ අංග පසම එක්ව යෙදෙන්නේ ප්‍රථම ධ්‍යානයෙහිය. මෙම ධ්‍යානය ලබා ගන්නා විට පංචවිධ ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය තාවකාලිකව නතර වෙයි. එමෙන්ම පංචනීවරණ යටපත් වෙයි. මේ අනුව ප්‍රථම ධ්‍යානය කරුණු පසකින් යුක්ත වන අතර කරුණු පසකින් වියුක්ත වෙයි. එහිදී ඉවත් වන්නේ නීවරණ පසයි. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච හා විචිකිච්ඡා යනු එම නීවරණ පසයි.

විතක්ක විචාර පීති, සුඛ එකග්ගතා ධ්‍යානයෙහි යෙදෙන අංග පසයි. ප්‍රථම ධ්‍යානයෙහි යෙදෙන මේවා ධ්‍යානාංග ලෙස නම් වී ඇත. විතක්ක හා විචාර වාචික ක්‍රියාකාරිත්වයට අදාල වෙයි. එබැවින් ඒවා හැඳින්වෙන්නේ වචී සඞ්ඛාර ලෙසය. විතක්ක මගින් අරමුණ සිතට නැංවීමේ ක්‍රියාකාරිත්වයත් විචාරය මගින් එය පිරික්සා බැලීමේ ක්‍රියාකාරිත්වයත් ඉටු වෙයි. විසුද්ධිමග්ගයෙහි දී විතක්කය බඳුනක් ඔසවා ගැනීමට සමාන කෙරෙයි. විචාරය එම බඳුන පිසදැමීමට සමාන කෙරෙයි. මේ අංග දෙකම ප්‍රථම ධ්‍යානයෙහි දී යෙදෙන්නේ තරමක් දුර්වල මට්ටමකිනි. දෙවැනි ධ්‍යානයෙහි දී එම අංග දෙකම සම්පූර්ණයෙන්ම නොයෙදෙයි. ඉතිරි අංග තුන යෙදෙයි. තෙවැනි ධ්‍යානයේ දී යෙදෙන්නේ පීති අංගය ද අතහැරී උපෙක්ඛා සුඛ හා එකග්ගතා යන අංගයයි. සිවුවැනි ධ්‍යානයේ දී සුඛ තත්වය අත හැරී උපෙක්ඛා හා එකග්ගතා පමණක් යෙදෙයි. විසුද්ධි මග්ගයේ දී ධ්‍යාන තත්වයන් ලබා ගැනීමට අවශ්‍ය වන භාවනාවේ දී උපයෝගී කර ගත හැකි කර්මස්ථාන සතළිසක් දැක්වෙයි.



බ්‍රාහ්මණ, සමණ, පබ්බජිත, යන නම් වලින් හැඳින්විමට සුදුසු අය.

388. බාහිතපාපො'ති බ්‍රාහ්මණො
සමචරියා සමණො'ති වුච්චති
පබ්බාජය'අත්තනො මලං
තස්මා පබ්බජිතො'ති වුච්චති (26:6)

පව් ඉවත ලුයේ බමුණායි
උතුම් පැවැත්මෙන් මහණෙක් වෙයි
තම කෙලෙස් හැරලීමෙන්
පැවිද්දෙකු වෙතැයි පැවසේ

පව් ඉවත ලූයේ උතුමෙකි

26 (6) බමුණු තවුසෙකු ගේ කථාව (388 ගාථා)

බුදුන් වහන්සේ හැර වෙනත් ගුරුවරයකු යටතේ තවුස් දිවියට පත් **කිසියම් බමුණෙක්** මෙසේ සිතුවේය. "බුදුරජාණන් වහන්සේ තමන්ගේ ශ්‍රාවකයන්ට ශ්‍රමණ යයි කියන සේක. මම ද ශ්‍රමණයෙක්මි. ශ්‍රමණ යන නාමය මට ද යොදා ගත යුතුය" බමුණු තවුසා දිනක් බුදුන් වෙත එළඹ තම සිතෙහි වූ කාරණය සැළ කර සිටියේය.

"ඔබ කියන කරුණ නිසාම මම ශ්‍රමණයයි හෝ ප්‍රව්‍රජිතයයි නොකිමි. තමාගේ පව් හා කෙලෙස් දුරලීමෙන් පමණක් කෙනෙක් ශ්‍රමණයෙක් හෝ ප්‍රව්‍රජිතයෙක් වේය" යි බුදුරජාණන් වහන්සේ බමුණාට පැවසූ සේක.

විවරණාත්මක අනුවාදය (388 ගාථාව)

බාහිතපාපො බ්‍රාහ්මණො ඉති සමචරියා සමණො ඉති වුච්චති. අත්තනො මලං පබ්බාජයං තස්මා පබ්බජිතො ඉති වුච්චති

බාහිතපාපො: පව් දුරලූ තැනැත්තේ; **බ්‍රාහ්මණො ඉති**: බ්‍රාහ්මණයෙකැයි ද; **සමචරියා**: යහපත් පැවැත්ම නිසා; **සමණො ඉති**: ශ්‍රමණයෙකැයි ද; **වුච්චති**: කියනු ලැබේ; (එමෙන්ම යමෙක්) **අත්තනො**: තමන්ගේ; **මලං**: කෙලෙස් කිළුටු; **පබ්බාජයං**: අතහැර දමන්නේ ද; **තස්මා**: එහෙයින්; **පබ්බජිතො ඉති**: පැවිද්දෙකැයි; **වුච්චති**: කියනු ලැබේ.

පාපධර්ම දුරු කිරීමෙන් බ්‍රාහ්මණයෙක් වෙයි. යහපත් හැසිරීමෙන් යුක්ත පුද්ගලයා ශ්‍රමණයෙක් වෙයි. තමාගේ සිතෙහි ඇති කෙලෙස් මල දුරු කිරීමෙන් පැවිද්දෙක් වෙයි.

විවරණය

බ්‍රාහ්මණො, සමණො, පබ්බජිතො: බ්‍රාහ්මණ, ශ්‍රමණ ප්‍රව්‍රජිත යන මේ නම් බුද්ධකාලීන භාරතීය සමාජයෙහි ආගමික ජීවිතයක් ගත කළ පුද්ගලයන් හැඳින්වීමට යෙදී ඇත. විශේෂයෙන් ගෘහජීවිතය අතහැර දමා හුදෙකලා ආගමික ජීවිතයක් වැළඳ ගත් එක් එක් කණ්ඩායම් ඉහත කී නම්වලින් හැඳින්විණ. බුදුන් වහන්සේ පහළ වූ යුගයෙහි මෙබඳු නම් වලින් හැඳින්වුණු පුද්ගලයෝ බොහෝ විට සංචාරක ජීවිතයකට හුරුව සිටියහ. මේ යුගයෙහි ශ්‍රමණ කණ්ඩායම් අතුරෙන් වැඩි ශ්‍රමණ ශ්‍රාවක පිරිසක් ඇතිව සිටි ශාස්තෘවරයකු වූයේ නිගණ්ඨනාථ පුත්තයි.

නිගණ්ඨනාථ පුත්තගේ ජීවිත කථාව බොහෝ දුරට බුදුන් වහන්සේගේ ජීවිත කථාවේ සමහර කරුණුවලට සමානව තිබේ. මේ ශ්‍රේෂ්ඨ ආගමික ශාස්තෘවරුන් දෙදෙනා සමකාලීනව භාරතයේ එකම ප්‍රදේශයක සංචාරය කරමින් තම ඉගැන්වීම ප්‍රචාරය කළ ද එකට මුණ ගැසුණු බවට කිසිදු වාර්තාවක් නැත. නිගණ්ඨනාථ අර්ධමාගධී භාෂාව මාධ්‍යයෙන් තම ධර්මය ඉදිරිපත් කළ අතර බුදුරජාණන් වහන්සේ තම දේශනා මාධ්‍යය කරගෙන ඇත්තේ ශුද්ධ මාගධියයි. පසු කාලීනව මෙම මාධ්‍යය පාලි භාෂාව නමින් ජනප්‍රියත්වයට පත් විය. නිගණ්ඨනාථ පුත්තගේ ජෛන ශාසනය පසු කලෙකදී කොටස් දෙකක් වශයෙන් බිඳී ගියේ ය. ඉන් එකක් ස්වතාම්බර (සුදුවත් හඳනා) නමින් ද අනෙක දිගම්බර (නිරුවත්) නමින් ද හැඳින්විණ.

නිගණ්ඨනාථ පුත්ත ඊශ්වර නිර්මාණ වාදය පිළිගත්තෙක් නොවීය. හෙතෙම කර්මවාදය දැඩිව විශ්වාස කළ ශාස්තෘවරයෙකි. බෞද්ධ සූත්‍ර ධර්ම කිහිපයකම මොහුගේ ඉගැන්වීම ගැන සඳහන් වෙයි. දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රය හා මජ්ඣිම නිකායේ උපාලි සූත්‍රය ද ඒ අතරින් ප්‍රධාන වෙයි. මෙම සූත්‍රයන් හි ඔහුගේ චේතනා සංවර හා ත්‍රි දණ්ඩ යන ඉගැන්වීම් ගැන සඳහන්ව ඇත. මේ හැර මජ්ඣිම නිකායේ දෙවදහ සූත්‍රයේ ද මොහුගේ පුබ්බෙකතහේතුවාදය ගැන සඳහන්ව තිබේ. මෙම ශාස්තෘවරයා දැඩි අවිහිංසා වාදයක් ඉදිරිපත්කොට ඇත. මොහුගේ ත්‍රිදණ්ඩ පිළිබඳ සංකල්පයෙහි අංශ තුනකි. ඒවා

1 කාය දණ්ඩ (කාය ශික්ෂණය)
2 වාග් දණ්ඩ (වාග් ශික්ෂණය)
3 මනො දණ්ඩ (මානසික ශික්ෂණය) යනුවෙන් දැක්වෙයි.

ජෛන දහමට අනුව අනුගාමිකයන් සිය ආගමික ප්‍රතිපදාවේදී නිරන්තරයෙන්ම අත්තකිලමථානුයෝගය පුගුණ කළ යුතු වෙයි. මෙය බුදුන් වහන්සේ විසින් සිය ප්‍රථම මංගල ධර්මදේශනාවේදීම ප්‍රතික්ෂේප කොට ඇත. එහෙත් නිගණ්ඨනාථ පුත්තගේ අවිහිංසා වාදය බුදු සසුන කෙරෙහි ද බලපා තිබේ. එහි බලපෑම හේතුවෙන් බුදුන් වහන්සේට ඊට අනුකූලව ශික්ෂාපද පැනවීමට පවා සිදු වී ඇත.

වස්සාන සමයෙහි චාරිකාවෙන් වැළකී වස් සමාදන් වීම සඳහා බුදුන් වහන්සේ විසින් සිය ශ්‍රාවක භික්ෂූන්ට ශික්ෂාපදයක් පැනවීමට සිදු වූයේ ජනතාව ජෛන අවිහිංසාවාදය පිළිගෙන තිබූ බැවිනි. ජෛන දහමෙහි වෘක්ෂ ලතාදියට ද ආත්මයක් ඇතැයි පිළිගෙන තිබුණ බැවින් වෘක්ෂලතාදිය සිඳ බිඳ නොදමන ලෙසට භික්ෂූන් සඳහා ශික්ෂාපද පැන වී ඇත්තේ ද ජෛන දහමේ බලපෑම නිසාය.

නිගණ්ඨනාථ පුත්තගේ ජෛන දහමට අනුව සියලු ජීව හා අජීව වස්තූන්ට ආත්මයක් තිබේ. මේ නිසාම ජෛන ශ්‍රාවකයෝ ගමන් බිමන් යන විට මුඛ වාඩම් සහිතව සිටීමට පුරුදුව සිටියහ. ජෛන දහමට අනුව ජීව අජීව වස්තුගත ආත්මය ත්‍රිවිධය

1. නිත්‍ය සිද්ධාත්ම (මෙය හින්දූන්ගේ පරමාත්මයට සමානය)
2. මුක්තාත්ම (මෙය බුදු දහමෙහි ආසව යන්නට සමානය)
3. බද්ධාත්ම (බෞද්ධ කම්ම සංකල්පයට සමානය)

මෙම ත්‍රිවිධ ආත්ම අතුරෙන් බද්ධාත්මය පුද්ගලයාගේ සිරුර පුරා පැතිරී ඇත. අත්තකිලමථානු යෝගයෙන් තොරව කෙනෙකුට මෙම බද්ධ ආත්මයෙන් මිදීමට නොහැකිය. නිගණ්ඨනාථ පුත්ත කම්වාදියකු වුවද එම කර්ම වාදය බුදු දහමින් ප්‍රතික්ෂෙප වෙයි. එම කර්ම වාදය කිසියම් නියතිවාදයකට නෑකම් කියන බැවිනි. බුදු දහම සියලු ආකාර නියතිවාද ප්‍රතික්ෂේප කරයි.

රහතුනට පහර නො දියයුතු රහතුනට පහර දෙන්නාට නින්දා කටයුතු.

389. න බ්‍රාහ්මණස්ස පහරෙය්‍ය
නා'ස්ස මුඤ්චෙථ බ්‍රාහ්මණො
ධී බ්‍රාහ්මණස්ස හන්තාරං
තතො ධී යස්ස මුඤ්චති (26:7)

බමුණාට පහර නොදෙන්නේ ය
බමුණා නොකිපෙයි තමා පෙළන්නාට
බමුණකු පෙළන්නා නින්දිතය
ඔහුට කිපෙන්නා වඩාත් නින්දිතය

ගැසුවත් නොකිපෙති උතුම් දනා

26 (7) සැරියුත් හිමියන්ගේ වත (389 සහ 390 ගාථා)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙවුරම් වෙහෙරෙහි වැඩ වෙසෙමින් **සැරියුත් තෙරුන් වහන්සේ** අරබයා මේ ගාථා ධර්මය දෙසූ සේක.

සැරියුත් තෙරපාණන් වහන්සේ තමාගේ උතුම් ගුණ නිසා නිබඳව අන් අයගෙන් පැසසුම් ලැබූ රහතන් වහන්සේ නමකි. "අපගේ ආචාර්යයන් වහන්සේ අතිශයින්ම ඉවසනසුලු කෙනෙකි. තමන්ට අපහාස කළද තලා පෙළුවද කිසිවකුට උන්වහන්සේ පෙරළා නොකිපෙති" මේ සැරියුත් හිමියන්ගේ ශිෂ්‍යයන් නිබඳව තම ආචාර්යවරයා ගැන කියන ප්‍රකාශයෙකි.

සැරියුත් හිමියන්ගේ ගුණ වැණුම් ඇසූ කිසියම් මිථ්‍යාදෘෂ්ටික බමුණෙක් "කිසිවිටෙක නොකිපෙන්නේ කවරෙක්ද"යි සැරියුත් හිමියන්ගේ අනුගාමිකයන්ගෙන් විමසා "එසේ නොකිපෙන්නේ නම් කිසිවෙක් ඔහු තරහ ගස්වා නැතැ"යි පැවසීය. "නැත බමුණ එසේ නොවෙයි." තෙරණුවන්ගේ අනුගාමිකයෝ කීහ. "ඔබට හැකි නම් අප ඇදුරු තුමන් තරහ ගස්සන්නැ"යි ද බමුණාට ඔවුහු අභියෝගයක් ද කළ හ. "මා විශ්වාස කරන්න. කළ යුතු කුමක්දැයි මම දනිමි" යි බමුණා කීවේය.

මේ අතරතුර සැරියුත් හිමිපාණන් වහන්සේ නගරයෙහි පිඩු සිගා වඩිමින් සිටියහ. බමුණා උන්වහන්සේ දැක පිටුපසින් සිට අත මිට මොලවා දැඩි පහරක් තෙරුන් වහන්සේගේ පිටුපසට එල්ල කළහ. "ඒ කිමෙක්දැ" යි පිටුපසට නොහැරීම ප්‍රශ්න කළ තෙරුන් වහන්සේ එය වැඩි සැලකිල්ලකට නොගෙනම තම පිඩු සිඟීමෙහි නිරත වූහ. තෙරුන්ට පහර දීමත් සමගම බමුණාගේ සියලු සිරුර සන්තාපයෙන් වෙළී ගියේය.

"මේ තෙරුන් වහන්සේ මොනතරම් ගුණවතෙක්දැයි ඔහුට සිතිණ. හෙතෙම වහා තෙරුන් ඉදිරියට ගොස් දනින් වැඳ වැටී තමාට සමා වන්නැයි ඉල්ලා සිටියේ ය. කිමෙක් ද මෙයින් ඔබ අදහස් කරන්නේ යයි තෙරහු විමසූහ. "ඔබගේ ඉවසීම විමසා බලන්නට මම ඔබතුමන්ට පහර දුනිමි" යි බමුණා පැවසීය" "හොඳයි මම සමාව දෙමි" තෙරණුවෝ පිළිවදන් දුන්හ. "ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ මට සමාව දීමට කැමැත්තේ නම් මින්පසු මගේ නිවසින් පමණක් අහර ලබා ගන්නැ"යි බමුණා තෙරුන්ගෙන් ඉල්ලා සිටියේ ය. එසේ කියමින්ම බමුණා තෙරුන්ගේ පාත්‍රය රැගෙන උන්වහන්සේ සමග තම නිවසට ගොස් තෙරුන්ට අහරින් සංග්‍රහ
කළේ ය.

බමුණා තෙරුන්ට පහර දෙනු දුටු අසළ සිටි මිනිස්සු බෙහෙවින් කිපී "මේ බමුණා අපගේ ස්වාමීන් වහන්සේට පහර දුන්නේ ය. මොහුට නිදහස් වී යාමට ඉඩ නොදිය යුතුය. දැන්ම ඔහුට පහර දිය යුතුයයි සිතා ගල් පොලු මගුරු ආදිය ගෙන ඔහුගේ නිවසට පහර දෙමින් නිවස වට කර සිටියහ. තෙරුන් වහන්සේ දන් වළඳා අවසන්හි තම පාත්‍රය බමුණාගේ අතට දුන්හ. තෙරුන් වහන්සේගේ පාත්‍රය ද ගෙන තෙරුන් වහන්සේ සමග එන බමුණා දුටු පිරිස "ස්වාමීනි, ඔය බමුණාට ආපසු යාමට අණ කරන්නැ"යි තෙරුන්ට පැවසීය. "ඇයි ඔබ එසේ කියන්නේය"යි තෙරණුවෝ පිරිසෙන් ප්‍රශ්න කළහ. "ඔය බමුණා ඔබ වහන්සේට පහර දුන්නේ ය. එහෙයින් අපි ඔහුට නිසි දඬුවම් දෙන්නෙමු" පිරිස පැවසීය. ඔහු පහර දුන්නේ ඔබලාට ද මට දැ"යි තෙරණුවෝ විමසූහ "ඔබ වහන්සේටය" "එසේය, ඔහු මට පහර දුන්නේ ය. ඊට ඔහු මගෙන් සමාව ගත්තේ ය. එපමණකි. ඔබ ඔබලාගේ නිවෙස් බලා යන්නැ"යි තෙරණුවෝ පිරිසට පැවසූ හ. එසේ පවසා බමුණාට ද ආපසු යාමට අවසර දී උන්වහන්සේ විහාරයට වැඩම කළ හ.

මේ පුවත දම්සභා මණ්ඩපයෙහි භික්ෂූන් වහන්සේලාගේ සාකච්ඡාවට බඳුන් විය. සැරියුත් හිමියන්ට පහර දුන් බමුණාට සමාව දී ඔහුගේම නිවසින් පිණ්ඩාහාරය උන්වහන්සේ ලබා ගත්හ. එසේ කිරීමෙන් බමුණා අන් භික්ෂූන්ට ද පහර දීමට පෙළඹෙනු ඇත. ආදි වශයෙන් භික්ෂූන් කථා කරමින් සිටිය දී බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩමවා භික්ෂූන් සාකච්ඡා කරමින් සිටියේ කුමක්දැයි විමසූ සේක. භික්ෂූන් වහන්සේ තත්වූ පරිද්දෙන් බුදුන් වහන්සේට කරුණු සැළකර සිටියහ.

"මහණෙනි, බ්‍රාහ්මණයෙක් තවත් බ්‍රාහ්මණටකුට පහර නොදෙන්නේ ය. ඒ පහර දුන් බමුණා හුදෙක් ආගමික පූජක බමුණෙකු නොව ගෘහවාසී බමුණෙකු විය යුතුය. කෙනකු අනාගාමී ඵලයට පැමිණි පසු ඔහු තුළ තරහක් ක්‍රෝධයක් ඇති නොවේය" යි බුදුරජාණන් වහන්සේ පවසා පහත සඳහන් ගාථා ධර්මයෙන් ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (389 ගාථාව)

බ්‍රාහ්මණස්ස න පහරෙය්‍ය බ්‍රාහ්මණො අස්ස න මුඤ්චෙථ බ්‍රාහ්මණස්ස හන්තාරං ධී යස්ස මුඤ්චති තතො ධී

බ්‍රාහ්මණස්ස: (ක්ෂීණාශ්‍රව) බ්‍රාහ්මණයාට; **න පහරෙය්‍ය**: පහර නොදෙන්නේ ය; **බ්‍රාහ්මණො**: බ්‍රාහ්මණ තෙමේ; **අස්ස**: (තමාට යමෙක් පහර දුන්නා ද ඒ) පහර දුන් පුද්ගලයාට; **න මුඤ්චෙථ**: ද්වේෂය මුදා නොහරින්නේය; **බ්‍රාහ්මණස්ස**: බමුණාට; **හන්තාරං**: පහර දෙන්නාට; **ධී**: නින්දා වේවා, **යස්ස**: ඒ පහර දුන් පුද්ගලයාට; **මුඤ්චති**: තරහා පහළ කරන්නාට; **තතො ධී**: වඩාත් නින්දා වේවා. (ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයාට පහර දුන්නාහුට වඩා ඒ පහර දුන් අය ගැන කිපෙන්නන්ට වඩාත් නින්දා වේ.)

බමුණාට කිසිවකු පහර නොදිය යුතුය. තමාට පහර දුන් බමුණාට ද කිපෙනු නොයුතුය. බමුණාට පහර දෙන්නා නින්දිතයෙකි. පහර දෙන්නාට ද්‍රෝහී වෙන්නා වඩාත් නින්දිතයෙකි.



රහත්හුගේ උතුම් ගුණය එකටෙක නොකිරීම ය. කෝප සිතින් වැළැක්මෙන් සසර දුක සන්සිඳේ.

390. න බ්‍රාහ්මණස්සෙ'තද කිඤ්චි සෙය්‍යො
යදා නිසෙධො මනසො පියෙහි
යතො යතො හිංසමානො නිවත්තති
තතො තතො සම්මතිමෙව දුක්ඛං (26:8)

කිසිත් නැත බමුණාට යහපත
උතුම් දෙයින් සිත වැළකේ නම්
යම් යම් ලෙස නපුරෙන් වෙන් වෙද
එලෙස දුක් ද නිමාවට යෙයි

රහත්හු පලි නොගනිති.

26 (7) සැරියුත් හිමියන්ගේ වත (389 සහ 390 ගාථා)

විවරණාත්මක අනුවාදය (390 ගාථාව)

**යදා පියෙහි නිසෙධො මනසො බ්‍රාහ්මණස්ස එතං
කිඤ්චි සෙය්‍යො න යතො යතො හිංසමානො නිවත්ති
තතො තතො දුක්ඛං සම්මති එව**

යදා: යම් විටෙක; **පියෙහි**: තමන් කැමති දෙයින්; **නිසෙධො**: වළක්වන ලද; **මනසො**: මනසක් ඇත්තේ ද (එවිට); **බ්‍රාහ්මණස්ස**: බමුණාට, **එතං**: මෙය; **කිඤ්චි**: සුළු වූ; **සෙය්‍යො**: යහපතක්; **න**: නොවේ; **යතො යතො**: යම් යම් ලෙසකින්; **හිංසමානො**: හිංසා කරන්නේ; **නිවත්ති**: නවත්නේ ද; **තතො තතො**: ඒ ඒ පරිද්දෙන්; **දුක්ඛං**: දුක; **සම්මති එව**: නවතින්නේ මය.

යම් විටෙක බමුණා තමන් සිත අලවන දෙයින් ඉවත් වන්නේ නම් එය ඔහුට සුළුපටු ලාභයක් නොවේ. යම් යම් ලෙසකින් හිංසා කිරීමේ නපුරු සිතිවිලි නවත්වන්නේ ද ඒ ඒ ලෙසින් දුක නිමාවට යයි.

විවරණය

හිංසමානො නිවත්තති: හිංසා කිරීමේ සිතුවිලි වලින් වළකියි. මේ ගාථා ධර්ම මූලික වශයෙන් කාරුණික වීමේ අගය මතු කර දෙයි. පුද්ගලයකුගේ ද්වේෂයෙන් ආවේගවත් වීම මැඩ පැවැත්වීමට සාධක වන උත්තම ගුණ ධර්ම සතරක් සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් ඉදිරිපත් වී තිබේ. මේ ගුණධර්ම සතර පිළිවෙළින් මෙත්තා, කරුණා, මුදිතා හා උපෙක්ඛා යනුවෙන් හැඳින්වෙයි. මේ උත්තම ගුණ ධර්ම සතරින්ම පුද්ගලයකුගේ ද්වේෂ සහගත හැඟීම් මැඩ පවත්වා මිත්‍රශීලී ආකල්ප ඇති කරවන අතර අවිහිංසාව කෙරෙහි ඔහු යොමු කරවයි.

පළමුවැනි බ්‍රහ්ම විහාර ගුණාංගය මෙත්තා වන අතර එය මෛත්‍රිය නමින් ජනප්‍රිය ව්‍යවහාරයෙහි දැක්වෙයි. යහපත් මිත්‍රයකුගේ ස්වභාවය මෛත්‍රිය ලෙසින් නිර්වචනය වී ඇත. මිත්‍රයෙක් කිසිදු විටෙක තම මිත්‍රයකුට විපතක් සිදු වනවාට කැමති නොවෙයි. මිතුරාගේ යහපතම පතයි. මවක් සිය එකම දරුවාට දක්වන සෙනහස වැනි හැඟීමක් මෛත්‍රිය වඩන්නා තුළ සමස්ත සත්ව සංහතිය කෙරෙහිම පවතියි.

දෙවැන්න කරුණාවයි. අනුන්ගේ දුකක් හෝ විපතක් දැක තමන්ගේ සිත කම්පාවට පත්වන සුලු ස්වභාවය කරුණාව ලෙස අර්ථ දක්වා ඇත. කරුණාවේ කාර්යය වන්නේ අනුන්ගේ දුක දුරලමින් යහපත සඳහා ක්‍රියාත්මක වීමයි.

කරුණාවෙන් යුක්ත පුද්ගලයකුගේ හදවත මලකට ද වඩා මෘදුය. අනුන්ගේ දුක්ඛිත තත්වයන් ඉවත් වන තෙක් කාරුණික පුද්ගලයන්ට සහනයක් නොමැත. ඇතැම් විට අනුන් දුකින් මුදවා ගැනීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කිරීමට ද ඔවුහු පෙළඹෙති. කුසගින්නෙන් පෙළුණු ව්‍යාඝ්‍ර ධේනුවකගේ හා ඇයගේ පැටවුන්ගේ ජීවිත ගලවා ගනු සඳහා තම ජීවිතය පරිත්‍යාග කළ බෝසතුන්ගේ කථා පුවත දැක්වෙන ව්‍යාඝ්‍රී ජාතකය මේ සඳහා නිදසුන් කළ හැකිය. නියම කරුණාවෙන් යුක්ත පුද්ගලයා ජීවත් වන්නේ තමන් සඳහා නොව අනුන් සඳහාය. කිසිදු ප්‍රති උපකාරයක් අපේක්ෂා නොකොට අනුන්ගේ යහපත සඳහා ක්‍රියා කිරීමට අවස්ථාවක් එනතුරු බලා සිටීම කරුණාබර පුද්ගලයාගේ ස්වභාවයයි.

අප අතර සිටින බොහෝ දෙනෙක් කරුණාව ලැබීමට සුදුස්සෝ ය. මෙහිලා දිළින්දන්, ගිලනුන් දුක්ඛිතයන් හා තනිවූවන් බොහෝවිට යහපත් කාරුණික සත් පුරුෂයන්ගේ කරුණාවට බඳුන් කර ගැනීමේ අවශ්‍යතාව වර්තමාන සමාජයෙහි ද දක්නට ඇත. ඇතැම් රටවල් භෞතික වශයෙන් සංවර්ධනය වී ඇතත් ආධ්‍යාත්මික වශයෙන් නොදියුණු තත්වයෙන් පවතියි. ඇතැම් රටවල් ආධ්‍යාත්මික වශයෙන් පොහොසත් වුවද භෞතික වශයෙන් දිළිඳුය. මේ තත්වයන් දෙකම භෞතිකව හා ආධ්‍යාත්මිකව සංවර්ධනය වූවන්ගේ කාරුණික අවධානයට යොමු විට යුතුය.

ජීවිතයේ බොහෝ අවශ්‍යතා ඉටු කරගත නොහැකිව දුක් විඳින ජනතාවගේ දුක්ගිනි නිවීම සඳහා ඉදිරිපත්වීම ධනවත් පුද්ගලයන්ගේ පරම යුතුකමක් වෙයි. අවශ්‍ය ප්‍රමාණයට ද වඩා ධනය හිමිව සිටින්නන් ඔවුන්ගේ සැපවත් දිවි පැවැත්මට කිසිදු අඩුවක් නොතබා තමන්ගේ අතිරික්ත ධනයෙන් බොහෝ දෙනෙකු සුවපත් කිරීමට ඉදිරිපත් වන්නේ නම් එය කෙතරම් කාරුණික ක්‍රියාවක් ද?

භෞතික දියුණු පුද්ගලයාගේ කරුණාව භෞතිකව නොදියුණු පුද්ගලයා වෙතට යොමු වියයුතුවාක් මෙන්ම ආධ්‍යාත්මිකව දියුණු වූ පුද්ගලයාගේ කරුණාව ආධ්‍යාත්මික දාරිද්‍රතාවෙන් පෙළෙන්නා වෙත යොමු විය යුතුව තිබේ. ධනයෙන් සමෘද්ධිමත් වීමෙන් පමණක් කෙනෙකුට නියම සතුට අත්කරගත නොහැකිය. ඔහුට ආධ්‍යාත්මික සංවර්ධනයෙන්ද යුක්ත වූ විට නියම සතුට අත්කරගත හැකි වෙයි. එබැවින් ආධ්‍යාත්මික ගුණ ධර්ම ගැන ප්‍රබෝධයක් ලබා දීමට ආධ්‍යාත්මික ගුණධර්මයන්ගෙන් තොර පුද්ගලයන් වෙත කරුණාව දක්වා ක්‍රියා කිරීමට ආධ්‍යාත්මික පොහොසත් කමක් ඇති පුද්ගලයන්ගේ යුතුකමක් වෙයි.

බුදුරජාණන් වහන්සේ මුළු මහත් ජීවිතයම කැප කොට ඇත්තේ ජනතාව ආධ්‍යාත්මිකව මෙන්ම භෞතිකව ද සුවපහසුවට පත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ඔවුන් වෙත ලබා දීමටයි. උන්වහන්සේ ගේ කරුණාව යොමු නොවූ සමාජ අංශයක් නොමැත. රජ ඇමති ප්‍රභූ දරිද්‍ර යන සෑම සමාජ කොටසකටම බුදුන් වහන්සේ තම කරුණාව යොමු කළ බවට ත්‍රිපිටකයෙන් ලැබෙන නිදසුන් අපමණය.



යමෙක් කය-වචන-සිත යන තිදොරින් සිදුවන අකුසල් හලේ ද, ඔහු බ්‍රාහ්මණයා ය.

391. යස්ස කායෙන වාචාය
මනසා නත්ථි දුක්කතං
සංවුතං තීහි ඨානෙහි
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:9)

කය සිත වචනයෙන්
යමෙකුට නැද්ද පව්කම්
තුන් දොරම සංසුන්
තැනැත්තා බමුණෙකැයි පවසම්

මනාව සංවර වූයේ නියම බමුණායි

26 (8) මහා ප්‍රජාපතී තෙරණියගේ කථාව (391 ගාථා)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙමින් බුදුරජාණන් වහන්සේ ගේ මේ ගාථා ධර්මය මහා **ප්‍රජාපතී ගෝතමී තෙරණින් වහන්සේ** අරබයා දෙසූ සේක.

අෂ්ටගරු ධර්ම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට කලින් බුදුරජාණන් වහන්සේ පෞද්ගලිකව ඒවා ප්‍රජාපති ගෝතමී තෙරණිය වෙත ඉදිරිපත් කළ සේක. එවිට තෙරණිය ඒවා පිළිගත්තේ අබරණින් සැරසුණු පුද්ගලයකු සුවඳැති මල් දමක් පැළඳවීමට තම ගෙල පහතට නමා එය පිළිගන්නාක් වැනි නිහතමානී ගෞරවයකිනි. ඇයගේ පිරිවර භික්ෂුණී පිරිසද එබඳුම ගෞරවයකින් එම අෂ්ටගරු ධර්ම පිළිගත්තේ ය.

පසු අවස්ථාවක එම භික්ෂුණීහු ප්‍රජාපතී ගෝතමියට උපසම්පදාව ලැබුණු ආකාරය පිළිබඳව විවේචනයෙහි යෙදුනාහු ය. "ප්‍රජාපතී ගෝතමියට අපට මෙන් ආචාර්යවරයෙක් හෝ උපාධ්‍යාය වරයෙක් නැත. තමාගේම අතින් සිවුරු පිරිකර ලැබ පැවිදි වුවා ය" මෙබඳු විවේචන එම භික්ෂුණී පිරිසෙන් කියවිණ. මේවාට සවන් දුන් ඇතැම් භික්ෂුණීහු ප්‍රජාපතී ගෝතමී තෙරණිය සමඟ එකට ආගමික වත් පිළිවෙත් කිරීමට නොකැමති වුහ. එපමණක් නොව මේ කරුණ ඔවුහු බුදුන් වහන්සේට ද සැළ කළහ. බුදුරජාණන් වහන්සේ ඔවුන් කී කරුණුවලට සවන් දී මෙසේ පැවසූ සේක. "ප්‍රජාපතී ගෝතමිය අෂ්ටගරුධර්ම පිළිගෙන උපසම්පදාවට පත් වූයේ මා අතිනි. මම ඇයගේ ආචාර්යවරයාත් උපාධ්‍යායවරයාත් වෙමි. කයින් වචනයෙන් හා මනසින් සිදුවන පව් දුරලා තිදොර සංවරකරගත් අය සැනසීමට පත් වෙති".

විවරණාත්මක අනුවාදය (391 ගාථාව)

යස්ස කායෙන වාචාය මනසා දුක්කතං නත්ථි තීහි ඨානෙහි සංවුතං තං අහං බ්‍රාහ්මණං බ්‍රෑමි

යස්ස: යමෙකුට; **කායෙන**: කයින් ද; **වාචාය**: වචනයෙන් ද; **මනසා**: මනසින් ද සිදුවන; **දුක්කතං**: අකුශලයක්; **නත්ථි**: නැත් ද; **තීහි ඨානෙහි**: (මෙකී) තුන් තැනින්; **සංවුතං**: සංවර වූ; **තං**: එබඳු තැනැත්තා; **අහං**: මම; **බ්‍රාහ්මණං**: බ්‍රාහ්මණයයි; **බ්‍රෑමි**: කියමි.

කය සිත වචන යන තිදොරින් සිදුවන පව් නොමැති එම තිදොර සංවර වූ තැනැත්තා බමුණෙකැයි මම පවසමි.

විවරණය

මහා ප්‍රජාපතී ගෝතමී : ඉහත සඳහන් ගාථා ධර්මය බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ මහා ප්‍රජාපතී ගෝතමිය අරබයා අනෙක් භික්ෂුණීන් විසින් කියනු ලැබූ කරුණු පාදක කොට ගෙනය. මහා පජාපති ගෝතමිය සුප්පබුද්ධ රජුගේ බාල සොහොයුරියයි. ඇයගේ වැඩිමහලු සොහොයුරිය වූයේ මහාමායා දේවියයි. මේ සොහොයුරියන් දෙදෙනාම සුද්ධෝදන රජු සමඟ විවාපත් වුවාහු ය. පජාපතී ගෝතමියට නන්දා නමින් දියණියක් ද නන්ද නමින් පුතෙක් ද වුහ. මහාමායා දේවිය කළුරිය කළ පසු ඇයගේ පුත් සිද්ධාර්ථ කුමරු තම දරු කමට ගෙන හදා වඩා ගත්තී ප්‍රජාපතී ගෞතමියයි. ඇයගේ පරම්පරා නාමය ගොතමී යනුයි. ඇයගේ උපතින් පසු ඇය පිළිබඳව බමුණන්ගේ අනාවැකිය වූයේ ඇය මහ පිරිවරකට අධිපතිනිය වන බවයි. එහෙයින් ඇයට මහා පජාපති යන නම තැබිණ.

බුදුරජාණන් වහන්සේ පළමුවරට කිඹුලවතට වැඩමවා සුද්ධෝදන රජුගේ මාලිගයේ දී ධම්මපාල ජාතකය දෙසූ විට එය අසා ඕ තොමෝ සෝවාන් ඵලයෙහි පිහිටියා ය. සුද්ධෝදන රජුගේ ඇවෑමෙන් ඕ තොමෝ සිද්ධාර්ථ හා නන්ද යන දෙදෙනා ගිහි ජීවිතය හැරපියා පැවිදි වූ බැවින් තමා ද පැවිදි වීමට සිතා අනගාරිකව සිටියා ය. බුදුරජාණන් වහන්සේ ශාක්‍ය කොලිය දෙපිරිස අතර රෝහිණී නදියෙහි ජලය අරභයා ඇති වූ‍ර ගැටුම සංසිඳීම සඳහා කපිලවත්ථු පුරයට වැඩම කළ අවස්ථාවෙහි ගෝතමිය බුදුන් වහන්සේ වෙත එළඹ කාන්තාවන්ට පැවිදි උපසම්පදාව සඳහා අවසර දෙන ලෙස ඉල්ලා සිටියා ය. උන්වහන්සේ "ගෞතමිය පැවිදි උපසම්පදාව සඳහා උනන්දු නොවන්නැ"යි පවසමින් ඇයගේ ඉල්ලීම තෙවරක්ම ප්‍රතික්ෂේප කළ හ.

පසු කලෙක බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර මහාවන උද්‍යානයෙහි වු කූටාගාර ශාලාවෙහි වැඩ සිටි සේක. බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ ද පැවිද්දෙහි අදහස අත්නොහළ මහා ප්‍රජාපති ගෝතමිය ඇයගේ යහළු ශාක්‍යකුල කාන්තාවන් රාශියක් ද සමඟ හිස මුඩු කොට කාෂාය වස්ත්‍ර පොරවා ගෙන බුදුන් වහන්සේ හමුවී යළිත් පැවිදි උපසම්පදාව ඉල්ලා සිටීමේ අපේක්ෂාවෙන් විශාලා මහනුවර මහාවනයෙහි වු කූටාගාර ශාලාව බලා පිටත් වූවාය. කිඹුල්වතෙහි සිට සැතපුම් එකසිය පණහක පමණ දුර ඉතා දුෂ්කර සේ පාගමනින්ම ගිය මෙම ගමන ඔවුනට බෙහෙවින් කටුක අත්දැකීමක් විය.

ඔවුන් කූටාගාර ශාලාවට යන විට ඔවුන්ගේ දෙපා ඉදිමී තිබිණ. ගත වෑහැරී තිබිණ. මෙම සියලු දුෂ්කරතා විඳගෙන ගොතමිය බුදුන් වෙතට ගොස් තමන් පිරිවර සමඟ පැමිණි හේතුව බුදුන් වහන්සේට සැළ කළ ද උන්වහන්සේ පෙර පරිද්දෙන්ම ඇයගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ. තෙවරක් ම ඇය ඉල්ලීම ඉදිරිපත් කළා ය. තෙවරම ප්‍රතික්ෂේප විය. අන්තිමේ දී ඇය බෙහෙවින් ශෝකයට පත්ව කූටාගාර ශාලාවෙහි දොරටුව සමීපයෙහි වැළපෙමින් සිටියා ය. මෙය අනඳ තෙරුන් වහන්සේ ගේ ඇස ගැසිණ. උන්වහන්සේ ගෝතමිය සමීපයට ගොස් කරුණු විමසූහ. ඕ තොමෝ හඬමින් ම සියලු තොරතුරු උන්වහන්සේට සැළ කළාය.

අනඳ තෙරුන් වහන්සේ තොරතුරු අසාගෙන බුදුන් වහන්සේ හමුවට ගොස් ගරු බුහුමන් දක්වා බුදුන් වහන්සේගෙන් මෙසේ ඇසූහ. "කාන්තාවන් සම්බුදු සසුනෙහි බඹසර විසීමෙන් ඔවුහු සෝවාන් සකෘදාගාමි, අනාගාමි සහ අරහත් යන මගපල ලබා ගැනීමට හැකි වන්නහු ද?"

"එසේය ආනන්ද ඔවුහු එසේ සමත් වන්නෝය"යි බුදුන් වහන්සේ පිළිතුරු දුන් හ. බුදුන් වහන්සේගේ මේ පිළිතුරින් ධෛර්යයට පත් අනඳ තෙරණුවෝ "ස්වාමීනි, මහාප්‍රජාපතී ගෝතමිය ඔබ වහන්සේගේ සුළු මෑණියෝ ය. ඇය ඔබ වහන්සේට බෙහෙවින් කාරුණිකව උපකාරවත් වූවාය. ඔබ වහන්සේ ගේ මව මිය ගිය පසු ඇය ඔබ ආදරයෙන් රැක බලා ගත්තාය. ඇයගේ කිරි දෙමින් ඔබ වහන්සේව මාතෘ ස්නේහයෙන් රැක බලා ගත්තාය. දැන් ඇය කිඹුල්වතෙහි සිට පා ගමනින්ම පැමිණ පැවිදි උපසපන් බව අයැදමින් සිටී. අනුකම්පා කොට කාන්තාවන්ට උපසපන් බව ලබා ගැනීමට ඔබ වහන්සේ ගේ අනුමතිය ලබා දෙනු මැනවි" යනුවෙන් බුදුන් වහන්සේ ගෙන් ඉල්ලා සිටියහ. "ඉදින් ආනන්ද මහා ප්‍රජාපතී ගෞතමිය අෂ්ට ගරු ධර්ම පිළිගන්නී නම් එයම ඇයට පැවිදි උපසම්පදාව වන්නේ ය" යි බුදුරජාණන් වහන්සේ පැවසූ සේක. මෙසේ මහා පජාපති ගෝතමිය අෂ්ටගරු ධර්ම පිළිගෙන භික්ෂුණී සංස්ථාවේ පුරෝගාමී භික්ෂුණිය වූවාය.

දහම් දෙසීමෙන් හා හැදෑරවීමෙන් අවබෝධ කරැ වූ ඇදුරුතුමාට සකසා නමැදිය යුතු.

392. යම්හා ධම්මං විජානෙය්‍ය
සම්මාසම්බුද්ධදෙසිතං
සක්කච්චං තං නමස්සෙය්‍ය
අග්ගිහුත්තං'ව බ්‍රාහ්මණො (26:10)

සම්බුදුන් දෙසූ සදහම්
දැනගන්නේ යමෙකුගෙන්ද
ඔහු මනාව නමදින්නේ ය
බමුණා ගිනි පුදන්නා සේ

ගරු කළ යුත්තාට ගරු කරනු වටී

26 (9) සැරියුත් තෙරුන්ගේ කථාව (392 ගාථාව)

සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙන බුදුරජාණන් වහන්සේ **සැරියුත් මහ රහතුන්** අරබයා මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

සැරියුත් හිමිපාණන් වහන්සේ සම්බුදු සසුනෙහි පැවිදි වීමට පෙරම අස්සජි තෙරුන් වහන්සේගෙන් ධර්මය අසා දැනගන්නට සමත් වුහ. එබැවින් සැරියුත් තෙරණුවන් තුළ අස්සජි තෙරුන් වහන්සේ කෙරෙහි පැවතුනේ ඉමහත් ගෞරවයකි. අස්සජි තෙරුන් වහන්සේගෙන් දහම් ඇසීමට ලැබුණු දෙසට මෙන්ම අස්සජි තෙරුන් වහන්සේ වැඩ වෙසෙන දෙසට සිරස නමා ගෞරව දැක්වීම සැරියුත් තෙරුන් වහන්සේගේ දෛනික පුරුද්දක් විය. අස්සජි තෙරුන් වැඩ සිටින පැත්තට හිස යොමු කොට නිදා ගැනීම ද උන්වහන්සේ ගේ සිරිතක් විය. මෙය අනෙක් භික්ෂූන් වහන්සේලා ගේ කතාබහට ලක්විය. එම කරුණු බුදුරජාණන් වහන්සේ වෙත භික්ෂූන් විසින් සැලකර සිටියේ සැරියුත් තෙරුන් ඒ ඒ දිසාවන් නමස්කාර කරන මිථ්‍යා ලබ්ධියක් වැළඳ ගෙන සිටින බවට වැරදි අර්ථකථනයක් කරමිනි.

බුදුරජාණන් වහන්සේ සැරියුත් හිමියන්ට තමා හමුවට පැමිණෙන ලෙස දන්වා සිටියහ. සැරියුත් හිමියන් පැමිණි පසු බුදුන්වහන්සේ උන්වහන්සේගෙන් මෙසේ විමසූහ. "සාරිපුත්තයෙනි, මේ භික්ෂූන් පවසන කරුණු සැබෑවක් ද? ඔබ වරින්වර ඒ ඒ දිසාවන්ට නමස්කාර කරන්නෙහි ද?" එවිට සැරියුත් තෙරුන් වහන්සේ "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබතුමන් මා ගැන දන්නා සේක. මා ඒ ඒ දිසාවන්ට වදින්නේ ද යන කරුණ ද ඔබ වහන්සේ දන්නා සේකැ"යි පැවසූ හ. බුදුරජාණන් වහන්සේ සෙසු භික්ෂූන් අමතා "මහණෙනි, සැරියුත් තෙරුන් දිසා නමස්කාර නොකරයි. තම ආචාර්ය අස්සජි තෙරුන්ට ගෞරව වශයෙන් අස්සජි තෙරුන් සිටින දෙසට ගෞරව දක්වයි. භික්ෂූන් වහන්සේලා තමන්ට ධර්මය දේශනා කළ දේශකයන් වහන්සේලාට ගෞරවාචාර කළ යුතුය"යි දෙසූ සේක.

විවරණාත්මක අනුවාදය (392 ගාථාව)

යම්හා සම්මාසම්බුද්ධදෙසිතං ධම්මං විජානෙය්‍ය
අග්ගිහුත්තං බ්‍රාහ්මණො ඉව තං සක්කච්චං නමස්සෙය්‍ය

යම්හා: යම් කෙනකුගෙන්; **සම්මාසම්බුද්ධදෙසිතං**: සම්මා සම්බුදුන් විසින් දෙසන ලද; **ධම්මං**: ධර්මය; **විජානෙය්‍ය**: අසා දැනගනු ලබන්නේ ද?; **අග්ගිහුත්තං**: අග්නිහොමය (පුදන); **බ්‍රාහ්මණො ඉව**: බමුණෙක් මෙන්; **තං**: ඒ ගුරුවරයා(ට); **සක්කච්චං**: මනාකොට; **නමස්සෙය්‍ය**: නමස්කාර කරන්නේ ය.

සම්බුද්ධ දේශිත ධර්මය අසන්නට සැලැස්වූ තැනැත්තාට බමුණකු ගිනි පූජාවකට ගරු කරන්නාක් මෙන් මනාව ගරු බුහුමන් දැක්විය යුතුය.

විවරණය

අස්සජි තෙරපාණෝ: මෙම ගාථා ධර්මය දේශනා කොට ඇත්තේ අස්සජි තෙරුන් වහන්සේ කෙරෙහි සැරියුත් තෙරුන් වහන්සේ තුළ පැවති ගෞරවය අරභයායි. තථාගතයන් වහන්සේ ගේ ප්‍රථම ධර්ම දේශනාව පවත්වා ඇත්තේ අස්සජි තවුසන් ද ඇතුළත් වූ පස්වග මහණුන්ටය. බුදුන්වහන්සේ විසින් සංඝ සංස්ථාව ආරම්භ කරන ලද්දේ මෙම පස්වග තවුසන්ගෙනි.

තථාගතයන් වහන්සේගේ අග්‍රශ්‍රාවක තනතුරට පත් සැරියුත් හිමියන් උපතිස්ස නමින් සිටිය දී ඔහුට සම්බුද්ධ ධර්මය ප්‍රථමවරට කියා දීමේ ගෞරවය හිමි වන්නේ අස්සජි තෙරුන් වහන්සේටය. ඒ වන විට අස්සජි තෙරුන් වහන්සේ ද බුදු සසුනට නවකයෙක් විය. උපතිස්ස හමු වන විට අස්සජි හිමියන් සසුන්ගතව වැඩි කලක් ඉකුත්ව නොතිබිණ. එහෙයින්ම උපතිස්ස අස්සජි හිමියන්ගෙන් ධර්මය ගැන විමසන විට තමන් අලුතින් සසුනට ඇතුළත් වූවකු බව ප්‍රකාශ කළේ ය. එහෙත් උපතිස්ස ගේ ඇවිටිලි කිරීම නිසාම එකම ගාථාවකින් තමා දත් ධර්මය පැහැදිලි කළේ ය. එම ගාථා ධර්මය සමස්ත බුද්ධ ධර්මය එකට අලලා ඉදිරිපත් කිරීමක් වැන්න. බුදු දහමේ හරය එහි ගැබ්ව තිබේ. අස්සජි හිමියන් උපතිස්සට පැවසූ ගාථාව පහත දැක්වෙයි.

යෙ ධම්මා හෙතුප්පභවා
තෙසං හෙතුං තථාගතො ආහ
තෙසං ච යො නිරොධො
එවං වාදී මහා සමණො

මෙයින් කියවෙන්නේ බුද්ධ ධර්මයෙහි හරය වශයෙන් ගැනෙන ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයයි. හේතුඵල ධර්මය යනුවෙන් හැඳින්වෙන්නේ ද එයයි. හේතූන්ගෙන් හටගත් ධර්මයන්ගේ එම හේතු බුදුන් වහන්සේ විසින් දක්වන බවත් එම හේතූන්ගේ විනාශය ද උන්වහන්සේ විසින් ප්‍රකාශ කරන බවත් එම ගාථා ධර්මයෙන් කියවෙයි.

මෙම ගාථාවෙන් පළමු පද දෙකින් පැහැදිලි කෙරෙන්නේ ලෝකයෙහි ඇති හැම දෙයක්ම හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා බවයි. මෙය චතුරාර්ය සත්‍යයෙහි පළමු සත්‍ය දෙකින් කියවෙන යථාර්ථයයි. අවසන් පද දෙක හේතූන් විනාශ කිරීමෙන් වස්තූන්ගේ හට ගැනීම අවසන් වන බවයි. මෙය නිරෝධ සත්‍යයයි. මෙතරම් ගැඹුරු වූ ධර්මයක් පාදක කොට ගෙන ඇති මෙම ගාථා ධර්මය ඇසීමෙන් උපතිස්ස සම්බුද්ධ ධර්මයේ ශ්‍රේෂ්ඨ ඵලය අත්පත් කර ගැනීමට සමත් විය.



සිවුසස් දහම් හා නව ලොවුතුරා දහම් පසක් කළ තැනැත්තා ම බ්‍රාහ්මණයා ය.

393. න ජටාහි න ගොත්තෙන
න ජච්චා හොති බ්‍රාහ්මණො
යම්හි සච්චඤ්ච ධම්මො ච
සො සුචී සො ච බ්‍රාහ්මණො (26:11)

නම් ගොතින් හෝ ජටාවෙන්
බමුණෙක් නොවේ උපතින්
යමකු වෙත වේද දහමක් ඇත්තක්
ඔහුය බමුණත් පිරිසුදුත් ඔහුමය.

බමුණෙක් නොවේ උපතින්

26 (10) ජටා මඬුලු ඇති බමුණෙකුගේ කථාව (393 ගාථා)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙමින් මේ ගාථා ධර්මය ජටා මඬුලු දැරූ **බමුණකු** අරබයා දෙසූ සේක.

එක්තරා ජටිල නම් තවුස් බමුණෙක් බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන් උදෙසා බ්‍රාහ්මණ යන නම යොදනු දැන තමාටම මෙසේ කියා ගත්තේ ය. "මම උපතින්ම බ්‍රාහ්මණයෙක්මි. මව් පසින් ද පිය පසින් ද පිරිසිදුව උපන්නෙක්මි. ශ්‍රමණ භවත් ගෞතමයෝ තමන් ගේ ශ්‍රාවකයන්ට ද බ්‍රාහ්මණ යන නම යොදති. මේ ගැන ශ්‍රමණ භවත් ගෞතමයන්ගෙන් අසා දැනගත යුතුය." මෙසේ සිතූ ජටිල බමුණා දිනක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ ඒ ගැන විමසුවේ ය. බුදුන්වහන්සේ ගේ පිළිතුර වූයේ "බමුණ, මම උපත නිසාම හෝ දරන ජටා මඬුලු නිසාම කෙනෙකුට බමුණෙකැයි නොකියමි. නමුත් යමෙකු වෙත ධර්මය හා සත්‍යය පවතී ද ඔහුට මම බමුණෙකැයි කියමි." යනුවෙනි.

විවරණාත්මක අනුවාදය (393 ගාථාව)

ජටාහි බ්‍රාහ්මණො න හොති ගොත්තෙන න ජච්චා න යම්හි සච්චඤ්ච ධම්මො ච සො සුචී ච සො බ්‍රාහ්මණො ච

ජටාහි: ජටා මඬුල්ලෙන්; **බ්‍රාහ්මණො න හොති**: බමුණෙක් නම් නොවෙයි; **ගොත්තෙන**: ගෝත්‍රය කරණ කොට ගෙන ද; **න**: නොවෙයි; **ජච්චා**: ජාතිය කරණ කොට ගෙන ද; **න**: නොවෙයි; **යම්හි**: යම් කෙනකු වෙත; **සච්චඤ්ච**: සත්‍යය ද; ධම්මො ච: ධර්මය ද (වේ නම්); **සො**: හෙතෙමේ; **සුචී ච**: පිරිසිදු වූවෙක් ද; **සො**: හෙතෙමේ ම; **බ්‍රාහ්මණො ච**: බ්‍රාහ්මණයෙක් (වෙයි).

කෙනෙක් ජටා මඬුලු නිසා හෝ ගෝත්‍රය නිසා හෝ උපත නිසා හෝ බ්‍රාහ්මණයෙක් නොවේ. සත්‍යය හා ධර්මය පවත්නා පුද්ගලයාම පිරිසිදු වූවෙක් මෙන්ම බ්‍රාහ්මණයෙක් ද වෙයි.

විවරණය

න ජච්චා හොති බ්‍රාහ්මණො: කෙනෙක් හුදෙක් උපතින් පමණක් බ්‍රාහ්මණයෙක් නොවෙයි. බ්‍රාහ්මණ අධිකාරයට යටත් වූ භාරතීය සමාජ සංස්ථාව කැලඹීමට ලක්,කළ බුදුරජාණන් වහන්සේ ගේ විප්ලවීය සමාජ දර්ශනය ඉහත සඳහන් ප්‍රකාශයෙන් ගම්‍ය වෙයි.

තමන් මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් උපත ලැබූ උපතින්ම බ්‍රාහ්මණ බව, ලැබූ එබැවින්ම සෙසු සමාජය විසින් ගරු කළයුතු පිරිසක් බව, මේ යුගයෙහි බමුණෝ සමාජ ආකල්පයක් ගොඩ නඟා තිබිණ. බුදුරජාණන් වහන්සේ මේ ආකල්පයෙහි ඇති සාවද්‍ය බව නොයෙක් සූත්‍රානුසාරයෙන් ප්‍රකාශයට පත් කළහ.

මේ යුගයෙහි සමාජය වර්ණ නමින් සැලකෙන කොටස් සතරකට බෙදී තිබිණ. බුදුරජාණන් වහන්සේ මෙම වර්ණ හෙවත් කුල භේදයේ පැවැති අසාධාරණ ස්වභාවය සමාජයට වටහා දීමට දැඩි උත්සාහයක් ගෙන ඇත. මේ නිසාම සමාජයේ දැඩි අසාධාරණයට ලක්ව සිටි සමාජ කොට්ඨාශයන්ට සිදු වූ යහපත අසීමිතය.

බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර යනුවෙන් බමුණන් විසින්ම වර්ග කරන ලද සමාජයේ ශුද්‍ර යන කණ්ඩායම මෙම කුල භේදයෙන් වඩාත්ම තාඩන පීඩනයන්ට ලක්වූ පිරිසයි. ඔවුන් මහා බ්‍රාහ්මයාගේ පාදයෙන් උපන් පිරිසකැයි ද එහෙයින්ම ඔවුන් සමාජ වරප්‍රසාදයන්ට අහිමි පිරිසකැයි ද බමුණන් විසින් සලකන ලදි.

බමුණන් ආගමික අධිකාරය තමන් අතට ගෙන තිබූ බැවින් ඔවුන්ගේ මතවාදයන් සමාජය පුරා පැතිරවීමට ඔවුහු සමත් වූහ. සමාජ, ආර්ථික, දේශපාලනික, ආගමික හා අධ්‍යාපනික යන අංශයන්හි කිසිදු වරප්‍රසාදයක් භුක්ති විඳීමේ නිදහසක් ශුද්‍ර නමින් වු සමාජය කොට්ඨාශයට අහිමි විය. බුදුරජාණන් වහන්සේ අනුශාසනයෙන් පමණක් නොව ආදර්ශයෙන් ද සමානාත්මතා ධර්මය ක්‍රියාත්මක කොට දැක්වූහ.

තම සංඝ සංස්ථාවට කිසිදු භේදයකින් තොරව ඕනෑම කුලයකට අයත් කෙනෙකුට ඇතුළත් වී ධර්මයේ ප්‍රතිලාභ ලැබීමට සැලස් වූ බුදුරජාණන් වහන්සේ සූත්‍ර ධර්ම රාශියකින් කුලභේදයේ ඇති අසාධාරණත්වය මෙන්ම අතාර්කිකත්වය ද ඔප්පු කොට දැක් වූහ.

සිරුර රා-දොස් මලින් (=කිලුටින්) පිරී තිබියදී පිට පැත්ත ම සැරසීම ඉතා නිසරු ය.

394. කිං තෙ ජටාහි දුම්මෙධ
කිං තෙ අජිනසාටියා
අබ්භන්තරං තෙ ගහණං
බාහිරං පරිමජ්ජසි (26:12)

අනුවණය, ජටාවෙන් ඇති පලය කිම ඔබේ
වැඩක් ඇති වෙද අඳුන් දිවිසමෙන් ඔබේ
ඔබේ ඇතුළත කෙලෙස් වනයෙකි
පිටත සරසා ගන්නෙහිය ඔබ

පිරිසිදු වන්න ඇතුළතින්

26 (11) කුහක බමුණකුගේ කථාව (ගාථා 394)

බුදුරජාණන් වහන්සේ විශාලාවෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වෙසෙන සමයෙහි කුහක පැවතුම් ඇති **බමුණකු** අරභයා මෙම ගාථා ධර්මය දේශනා කළ සේක.

කිසියම් කුහක ගති පැවතුම් ඇති බමුණෙක් විශාලාවෙහි නගරද්වාරය අසළ වූ ගසකට නැගී එහි අත්තක හිස පහළට සිටින සේ දෙපයින් එල්ලී, එය බලා සිටි මිනිසුන්ට මෙසේ කීවේය. "මිනිසුනි, මට ගවයන් සියයක්, රිදී කාසි හා දාසයන් ගෙනැවිත් දෙවු. නැතහොත් මම මේ අයුරින්ම ගසින් වැටී මිය යන්නෙමි. එසේ වුවහොත් මේ මුළු නගරයම විනාශ වී යයි."

බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ද පිරිවරා නගරයට පිවිසෙන විට මොහු ගසේ එල්ලී සිටින අයුරු දැක ගන්නට ලැබිණ. උන්වහන්සේ නගරයෙන් පිටව යන විට ද බමුණා එලෙසින්ම ගසේ එල්ලී සිටියේ ය. නගර වැසියෝ ගසේ එල්ලී සිටින බමුණා දැක මෙසේ සිතූහ. "මේ මිනිසා උදේ සිටම මෙසේ ගසේ එල්ලී සිටියි. ඉදින් මේ මිනිසා ගසින් වැටී මිය ගිය හොත් නගරයම විනාශ වී යනු ඇත." නගරය විනාශ වී යනු ඇතැයි ඇති බිය නිසා බමුණාගේ ඉල්ලීම් සියල්ලම ඉටු කිරීමට නගර වැසියෝ ක්‍රියා කළහ. අනතුරුව බමුණා ගසෙන් බැස ලැබුණු දෙය ද රැගෙන යන්නට ගියේ ය.

භික්ෂූන් වහන්සේලා ආරාමය අසළින් යමින් සිටි බමුණා දැක ඔහුව හඳුනා ගත්හ. උන්වහන්සේලා "බමුණ ඔබ ඉල්ලා සිටි දේ ලැබිණි" දැයි ඔහුගෙන් විමසූ හ. "එසේ ය, මා ඔවුන්ගෙන් ඉල්ලා සිටි දේ මට ලැබුණේය"යි හෙතෙම පැවසීය. මේ කරුණ භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට සැළ කර සිටියහ. "මහණෙනි, මේ බමුණා මිනිසුන් රවටා යම් යම් දේ ලබා ගත්තේ දැන් පමණක් නොවේ. පෙර ආත්මයක දී ද මොහු කුහක කමින් මිනිසුන් රැවටූ සොරෙක් වූයේ ය. පෙර භවයෙහි නුවණැතියන් රැවටීමට අසමත් විය." ඒ කෙසේදැයි විමසා සිටි භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ ඒ අතීත කථාව ගෙන හැර පෑ සේක.

එක් කලෙක කිසියම් තවුසෙක් කෘෂිකාර්මික ගමක් අසළ පදිංචිව සිටියේ ය. මෙතෙම ස්වභාවයෙන්ම කපටි තවුසෙකි. මේ තවුසාගේ අවශ්‍යතා සපයා දුන් පවුලක් ද තවුසාගේ ආරාමය අසළ පදිංචිව සිටියේ ය. කෑම බීම ආදී සියලු දේ තවුසාට ලැබුණේ එම නිවසෙනි. සවස තමන් සඳහා පිළියෙල කරන අහරින් කොටසක් ඉතිරි කර තබා පසු දින තවුසාට පිළිගැන්වීම ඔවුන්ගේ සිරිත විය.

මේ තවුසාගේ අසපුව අසළ තුඹසක විසූ හුනෙක් දිනපතා තවුසා බැහැදැකීමට යාමට පුරුදුව සිටියේ ය. නමුත් තවුසා දිනක් හුනා මරා දැමීමට අදහස් කළේ ය. එබැවින් හෙතෙම හුනාට නොපෙනෙන සේ කෝටුවක් තම ඇඳුම අස්සේ සඟවා ගෙන තුඹස අසළට වී හිඳගෙන නිදා සිටින ආකාරයෙන් සිටියේ ය. හුනා තුඹසෙන් පිටතට අවුත් තවුසා දැක තවුසාගේ අමුතු ආකාරයෙන් කිසියම් සැකයක් ඇති කර ගත්තේ ය. එබැවින් හෙතෙම තවුසාගෙන් තරමක් ඈත්ව සිටියේ ය. තවුසා හුනා තුඹසෙන් පිටතට ආ බව දැන තම ඇඳුමේ සඟවා ගෙන සිටි කෝටුව රැගෙන හුනාට දමා ගැසීය.

එහෙත් එය බලාපොරොත්තුවෙන් සිටි හුනා එයින් බේරී තුඹස තුළට පිවිස හිස එළියට දමා මෙසේ කීය. "මම මෙතෙක් ඔබ නියම තවුසෙක් යයි වරදවා සිතුවෙමි. අද ඔබේ නියම ස්වරූපය එළි විය. ඔබ සොර තවුසෙකි. ඔබ හැඳ සිටින තවුස් ඇඳුම්වලින් ඇති පලය කිමෙක් ද? ඔබගේ ඇතුළත පවතින්නේ පව් ගොඩකි. ඔබ ඔබේ බාහිර ස්වරූපය අලංකාර ලෙස සරසා ගෙන සිටී. එයින් ඔබට කිසි වැඩක් නොවේ."

විවරණාත්මක අනුවාදය (394 ගාථාව)

දුම්මෙධ, තෙ ජටාහි කිං තෙ අජිනසාටියා කිං තෙ අබ්භන්තරං ගහණං බාහිරං පරිමජ්ජසි

දුම්මෙධ: අනුවණය; **තෙ**: ඔබගේ; **ජටාහි**: ජටා මඩුල්ලෙන්; **කිං**: කවර වැඩෙක් ද?; **තෙ**: ඔබගේ; **අජිනසාටියා**: අඳුන් දිවිසමෙන්; **කිං**: කවර වැඩෙක් ද?; **තෙ**: ඔබගේ; **අබ්භන්තරං**: ඇතුළත; **ගහණං**: කෙලෙස් වනයකි (ඔබ); **බාහිරං**: පිටත; **පරිමජ්ජසි**: සරසන්නෙහි ය.

ඔබේ ජටා මඩුල්ලෙන් පමණක් ඇති ප්‍රතිඵලය කිමෙක් ද?. ඔබේ තවුස් ඇඳුමෙන් ඇති පලය කිමෙක් ද? ඔබේ ඇතුළත කෙලෙස්වලින් පිරුණු කැලයකි. එහෙත් ඔබේ බාහිර පෙනුම සරසා ගන්නෙහිය.



පසුල් සිවුරු දරන වනයෙහි හුදකලාව දැහැන කරන තැනැත්තා බ්‍රාහ්මණයා ය.

395. පංසුකූලධරං ජන්තුං
කිසං ධමනිසන්තථං
එකං වනස්මිං ඣායන්තං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:13)

පංසුකූල සිවුරු දරා
කෙසඟ වෙමින් නහර නැගුණු
තනිවම හිඳ බවුන් වඩන
තැනැත්තාම බමුණෙකියි පවසම් මම

වනයෙක හිඳ තනිව බවුන් වඩන්නාම බමුණායි

26 (12) පංසුකූල සිවුරු දැරූ කිසා ගෝතමියගේ කථාව (395 ගාථාව)

බුදුරජාණන් වහන්සේ ගිජ්ඣකූළු පව්වෙහි වැඩ විසූ සමයෙක **කිසා ගෝතමිය** අරභයා මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

රාත්‍රියෙහි ප්‍රථම යාමය ගෙවෙමින් තිබියදී ශක්‍ර දිව්‍යරාජයා දේවගණයා ද පිරිවරාගෙන බුදුරජාණන් වහන්සේ වෙත එළඹ වැඳ නමස්කාර කොට එකත් පසෙක හිඳ උන්වහන්සේගේ ධර්ම දේශනාවට ඇහුම්කම් දෙමින් සිටියේ ය. මේ අවස්ථාවෙහි කිසාගෝතමී තෙරණිය බුදුන් දැකීමට අදහස් කොට එදෙසට එමින් සිටිය ද සක් දෙවිඳුන් දැක ආපසු හැරුණාය. සක් දෙවිඳු එය දැක බුදුන් වහන්සේට වැඳ "ස්වාමීනි, ඒ කෙට්ටු කාන්තාව කවරෙක්දැ"යි විමසා සිටියේ ය."ශක්‍රදේවය ඒ මාගේ දියණිය කිසාගෝතමී තෙරණිය" යි. ඕ පංශුකූල චීවර දරන්නියන් අතර අග්‍රස්ථානයෙහි සිටියි. බුදුරජාණන් වහන්සේ පිළිවදන් දුන් හ.

විවරණාත්මක අනුවාදය (395 ගාථාව)

පංසුකූලධරං කිසං ධමනිසන්ථතං වනස්මිං එකං
ඣායන්තං තං ජන්තුං අහං බ්‍රාහ්මණං බ්‍රෑමි

පංසුකූලධරං: පාංශුකූල සිවුරු දරමින්; **කිසං**: කෘශ වූ; **ධමනිසන්ථතං**: නහර ගැටගැසී ඇති; **වනස්මිං**: වනයෙක; **එකං**: හුදෙකලාව; **ඣායන්තං**: ධ්‍යාන වඩන; **තං ජන්තුං**: ඒ පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බ්‍රාහ්මණයෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: කියමි.

පංසුකූලික සිවුරු දරා සිහින්ව නහර නැගී ඇති ගතින් යුතුව වනයෙහි තනිව බවුන් වඩන තැනැත්තා බ්‍රාහ්මණයෙකැයි පවසමි.

විවරණය

පංසුකූලධරං: පොළොවෙන් අසුලාගත් රෙදි කැබලි එකතු කොට තැනූ සිවුරු පොරවා ගත් යන අරුත්ය. පංශුකූලික සිවුරු පමණක් දැරීම කෙලෙස් ධූතංගයන් අතුරෙන් එකකි. ධූතංග යනුවෙන් අදහස් කෙරෙන්නේ භික්ෂූන් වහන්සේලා විසින් සමාදන්ව ආරක්ෂා කරන බෙහෙවින් දුෂ්කර හා කටුක ව්‍රත ධර්මයකි. කෙලෙස් සොළවන යන අරුතින් ධූතංග නම් වෙයි. මේවා බුදුන් වහන්සේ විසින් භික්ෂූන්ට සමාදන්ව පිළිපැදිය යුතු ව්‍රත චාරිත්‍ර ලෙස අනුදැන ඇත. එහෙත් මෙම ව්‍රත දැරීමට සියලුම භික්ෂූන්ට නියම කිරීමක් නැත. කැමති භික්ෂුවකට එකක් හෝ වැඩිගණනක් සමාදන් වී ආරක්ෂා කළ හැකිය. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ධූතංගධාරීන් අතුරෙන් ශ්‍රේෂ්ඨ ස්ථානයට පත් වූහ. මෙම ධූතාංග සමාදන්ව ඒවාට අනුකූලව ජීවත් වීමෙන් ශීල ශික්ෂණයේ උත්කෘෂ්ට තත්වයට ලඟා විය හැකිය. අල්පෙච්ඡතාව, සන්තුෂ්ටිය, විරාගය වැනි ගුණාංග උපරිම මට්ටමෙන් ලඟාකර ගැනීම සඳහා ඒවා උපකාරි වෙයි.

ධූතාංග තෙළෙස මෙසේ දැක්වෙයි.

1. **පංසුකූලිකාංග** - පාංශුකූලික සිවුරු පමණක් දැරීම
2. **තෙචීවරිකාංග** - තුන් සිවුරු පමණක් දැරීම
3. **පිණ්ඩපාතිකාංග** - පිණ්ඩපාතයෙන් පමණක් යැපීම
4. **සපදානිකාංග** - ගෙපිළිවෙළින් පිණ්ඩපාතයෙහි යාම
5. **එකාසනිකාංග** - එක් අසුනක හිඳ දිනකට වරක් පෙරවරුවෙහි වැළඳීම
6. **පත්තපිණ්ඩිකාංග** - පාත්‍රයෙන් පමණක් අහර වැළඳීම
7. **ඛලුපච්ඡාභත්තිකාංග** - අහර පිළිගැනීමෙන් පසු යළි ආහාර පිළි නො ගැනීම
8. **අරඤ්ඤිකාංග** - අරණ්‍යවාසයෙහි සිටීම
9. **රුක්ඛමූලිකාංග** - වෘක්ෂ මූලයන් හි පමණක් විසීම
10. **අබ්භොකාසිකාංග** - පියසි නැති එළිමහනෙහි පමණක් විසීම
11. **සුසානිකාංග** - සොහොන්හි පමණක් විසීම
12. **යථාසන්ථතිකාංග** - ලැබෙන කවරම හෝ ස්ථානයක නිදා ගැනීම
13. **නෙසජ්ජිකාංග** - කිසිවිටෙක නොනිදා සෙසු ඉරියව් වලින් පමණක් විසීම

මෙම ධූතංග සමාදන් වන ආකාරය දැන ගැනීම සඳහා පළමු ධූතාංග සමාදන් වන පිළිවෙළ පහත දැක්වෙයි. "ගෘහපතියන් විසින් පිදෙන සිවුරු නො පිළිගනිමි. පංශුකූලික සිවුරු පමණක් දැරීමේ ධූතංගය සමාදන් වෙමි" මේ ධූතංගවලින් සමහර අංග ගෘහස්ථ උපාසකරුන්ට ද සමාදන් විය හැකි ය.

අලුතින් උපසම්පදාව ලබන නවක භික්ෂුව ලැබෙන කවරම සිවුරකින්, කවරම පිණ්ඩපාතයකින් කවරම සෙනසුනකින් කවරම ගිලන් පසකින් සතුටු වීමට අවවාද කෙරෙන බව මෙහිලා සඳහන් කළ යුතුය.

බමුණු යෝන්හි ඛපැද්මෙන් වත් බැමිණි මවු කුසැ හටගැන්මෙන් වත් බ්‍රාහ්මණ නම් නො වේ.

396. නචාහං බ්‍රාහ්මණං බ්‍රෑමි
යොනිජං මත්තිසම්භවං
භොවාදි නාම සො හොති
ස වෙ හොති සකිඤ්චනො
අකිඤ්චනං අනාදානං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:14)

මම නොකියමි බමුණෙකැයි
මවු කුසයෙන් උපන්නෙකුට
භොවාදියෙක්ය හේ
පවට හිමිකම් කියන්නෙක් නම්
කෙලෙස් නොමැති ඇලුම් නොමැති
කෙනෙකුට බමුණෙකැයි කියමි

කෙලෙසුන් නැති ඇල්මෙන් තොර තැනැත්තාම බමුණෙක් වේ

26 (13) බමුණා යනු කවරෙක් ද? (396 ගාථාව)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සමයෙහි **කිසියම් බමුණකු** අරබයා මෙම ගාථාධර්මය දේශනා කළ සේක.

කිසියම් බ්‍රාහ්මණයෙක් දිනක් බුදුන් වහන්සේ වෙත එළඹ මෙසේ පැවසීය.

"ස්වාමීනි, ඔබ වහන්සේ ඔබ වහන්සේගේම ශ්‍රාවකයන්ට 'බ්‍රාහ්මණ' යන නම යොදන්නෙහි ය. මම බමුණු මවකගේ කුසයෙන් උපන්නෙක්මි. එබැවින් මට ද බ්‍රාහ්මණ යන නම යෙදෙයි." "බමුණ මම මව්කුසයෙන් උපන් පමණින් කෙනෙකුට බමුණායයි නොකියමි. වස්තුකාමයෙන් නො ඇලුණු කෙලෙසුන් කෙරෙන් දුරු වූ පුද්ගලයකුට පමණක් මම බමුණෙකැයි කියමි" යි බුදුන් වහන්සේ පිළිතුරු වශයෙන් පැවසූ සේක.

විවරණාත්මක අනුවාදය (396 ගාථාව)

අහං යොනිජං මත්තිසම්භවං බ්‍රාහ්මණං න ච බ්‍රෑමි
සචෙ සකිඤ්චනො හොති සො භොවාදී නාම හොති
අකිඤ්චනං අනාදානං තං අහං බ්‍රාහ්මණං බ්‍රෑමි

අහං: මම; **යොනිජං මත්තිසම්භවං**: (බ්‍රාහ්මණ ජාතික) මවු කුසයෙන් උපන්නකු; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **න ච බ්‍රෑමි**: නොකියමි; **සචෙ**: ඉදින් (යමෙක්); **සකිඤ්චනො**: කෙලෙස් සන්තකයන් ඇත්තේ; **හොති**: වෙයි ද; **සො**: හෙතෙම; **භොවාදී**: භොවාදියෙක්; **නාම**: නම්; **හොති**: වෙයි; **අකිඤ්චනං**: කෙලෙස් සන්තකයන් නැති; **අනාදානං**: කාම වස්තු දැඩිව නොගන්නා; **තං**: තැනැත්තකුට; **අහං**: මම; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **බ්‍රෑමි**: කියමි.

බමුණා මවකගේ කුසයෙන් උපන් පමණින්ම කෙනෙක් බමුණෙක් නොවෙයි. එබඳු යමෙකුට කෙලෙස් සත්තකයන් ඇත්ද හෙතෙම භොවාදී බ්‍රාහ්මණයෙක් වෙයි. කෙලෙස් සන්තකයන් නැති, වස්තූන් උපාදානයෙන් නොගන්නා පුද්ගලයාම නියම බ්‍රාහ්මණයෙක් වෙයි.

විවරණය

බ්‍රාහ්මණ : ඉහත සඳහන් ගාථාවට අනුව කිසියම් නම් ගොත් නැති බ්‍රාහ්මණයෙක් තමන් බ්‍රාහ්මණ වංශයට අයත් කාන්තාවකගේ කුසයෙන් උපන් බැවින් බ්‍රාහ්මණයෙක් වෙමැයි බුදුන්වහන්සේ ඉදිරියෙහි ප්‍රකාශ කළ ද බුදුන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළ හ. උන්වහන්සේට අනුව නියම බ්‍රාහ්මණයා යනු කෙලෙස් කසට නැති වස්තුකාම ක්ලේශ කාමයන් හි නො ඇලුණ තැනැත්තා යි.

භොවාදි : බුදුන් වහන්සේ ගේ සමයෙහි බමුණෝ ආගමික පූජකයෝ වූහ. දෙවියන් වෙනුවෙන් කෙරෙන යාග හෝම ව්‍රත චාරිත්‍ර පැවැත්වීම ඔවුන්ගේ ආගමික කාර්‍යය විය. තම ආගමික කටයුතු බමුණන් ලවා කරවා ගැනීමට පැමිණෙන අයට ඇමතුවේ භො (පින්වත) යන පදයෙනි. එබැවින් ඔවුනට භොවාදී (භො යයි කියන්නා) යන නම යෙදිණ.

ද්‍රොණ බමුණා: බෞද්ධ සාහිත්‍යයෙහි බෙහෙවින් ප්‍රසිද්ධ බ්‍රාහ්මණයකු ලෙස ද්‍රොණ බමුණා හැඳින්විය හැකිය. බුද්ධ පරිනිර්වාණයෙන් පසු බුදුන් වහන්සේ ගේ ශාරීරික ධාතූන්ට බොහෝ දෙනෙක් අයිතිවාසිකම් කීහ. මගධයේ අජාසත්ත රජු, වේසාලියෙහි ලිච්ඡවී රජවරු, කපිලවත්ථුවෙහි ශාක්‍ය රජවරු, අල්ලකප්ප නුවර බූලි රජවරු, රාම ග්‍රාමයෙහි කෝලිය වංශිකයෝ, පාවා නුවර මල්ල රජවරු මෙන්ම වෙඨදීපයේ බ්‍රාහ්මණයෙක් ද බුදුන් වහන්සේගේ ශාරීරික ධාතු ඉල්ලා සිටියහ. නමුත් ඒ අතරම කුසිනාරාවෙහි මල්ල රජවරු "බුදුන් වහන්සේ තම රාජ්‍යයෙහි පිරිනිවන් පෑ බැවින් සියලු ධාතූන් තමන් සතු විය යුතුය"යි කියා සිටියහ.

එබැවින් ධාතූන් වහන්සේලා සම්බන්ධයෙන් මේ සියලු පිරිස් අතර ආරාවුලක් ඇති වෙමින් තිබිණ. එහිදි ද්‍රොණ නම් වූ බමුණෙක් ඉදිරිපත්ව ආරාවුල සමථයකට පත් කළේ ය. බුද්ධ පරිනිර්වාණයත් සමඟ ආරාවුල් ඇති කර ගැනීමට බෞද්ධයන්ට නොහොබිනා ක්‍රියාවක් බවත් බුදුරජාණන් වහන්සේ ඉවසීමේ ගුණ ධර්මයේ ශ්‍රේෂ්ඨත්වය ලෝකයට ප්‍රකාශ කළ ශාස්තෘවරයෙකු බවත් එහෙයින්ම ධාතු බෙදා ගැනීම සාමයෙන් කළ යුතු දෙයක් බවත් හෙතෙම කියා සිටියේ ය. ඒ අනුව ධාතු බෙදීමේ කාර්යය ද්‍රොණ බමුණාට පැවරිණ. හෙතෙම සියලු ධාතූන් කොටස් අටකට බෙදා අයිතිවාසිකම් කියූ සෑම පාර්ශ්වයකටම සමසේ බෙදා දුන්නේ ය. ධාතු මැනීම කළ හිස් බඳුන එනම් ද්‍රොණය ඉල්ලා සිටි මෙම බමුණා එය තැන්පත් කොට චෛත්‍යයක් තැනවීය. ධාතූන් වහන්සේලා ලබා ගත් සියල්ලෝම එම ධාතූන් තැන්පත් කොට ස්තූප තැනවූහ.



යමෙක් සියල් සංයොජුන් සිඳ තැතැ නො ගැනේ ද කෙලෙසුන් කෙරෙන් වෙන් වූ ඒ තැනැත්තා බ්‍රාහ්මණයා ය.

397. සබ්බසඤ්ඤොජනං ඡෙත්වා
යො වෙ න පරිතස්සති
සඞ්ගාතිගං විසංයුත්තං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:15)

සංයෝජන සියල්ල සිඳ
යමෙක් නොබියව වෙසේ නම්
ඇලුම් ඉක්මූ වෙළුම් නැති වූ
කියමි බමුණැයි එවන් කෙනකුට

සියලු බැඳුම් සිඳලූ තැනැත්තේම බමුණෙකි

26 (14) පිනුම්කරු උග්ගසේනගේ කතා පුවත (397 ගාථාව)

උග්ගසේන තෙරුන් වහන්සේ "තමන්ට කිසිදු බියක් නොමැති බව සහතික කොට පවසන්නේ යයි" ද එය උන්වහන්සේගේ අසත්‍ය ප්‍රකාශයක් මිස සත්‍යයක් නොවේ යයි ද භික්ෂූන් වහන්සේලා විසින් බුදුරජාණන් වහන්සේට සැළ කළ විට "මගේ පුත් උග්ගසේන වැනි අය ඇලීම් බැඳීම් ඉක්මවා ඇති බැවින් ඔවුන් තුළ බියක් ඇති නොවෙතැ" යි උන්වහන්සේ පැවසූ සේක.

අට්ඨකථාවෙහි "ඉකුත් දේ අත්හරින්න. නොපැමිණි දේ ද අත්හරින්නැ" යි පැවසෙන ගාථාවට සම්බන්ධව මේ කථාව විස්තර සහිතව දැක්වෙයි.

විවරණාත්මක අනුවාදය (397 ගාථාව)

යො සබ්බසඤ්ඤොජනං ඡෙත්වා වෙ න පරිතස්සති
සඞ්ගාතිගං විසංයුත්තං අහං තං බ්‍රාහ්මණ බ්‍රෑමි

යො: යමෙක්; **සබ්බසඤ්ඤොජනං**: සියලු දස සංයෝජන; **ඡෙත්වා**: සිඳ දමා; **වෙ**: ඒකාන්තයෙන්ම; **න පරිතස්සති**: තැති නොගනියි ද; **සඞ්ගාතිගං**: රාගාදී බැඳීම් ඉක්මවාලූ; **විසංයුත්තං**: කෙලසුන් ගෙන් ඉවත් වූ; **අහං**: මම; **තං**: එම පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **බ්‍රෑමි**: පවසමි.

සියලු සංයොජන සිඳ දැමූ පුද්ගලයෙක් වේද හෙතෙම ඒකාන්තයෙන්ම බියට තැති ගැන්මට පත් නොවෙයි. ඇලීම් ඉක්මවා බැඳීම් වලින් තොරව සිටින පුද්ගලයාම බ්‍රාහ්මණයෙක් වෙතැයි මම ප්‍රකාශ කරමි.

විවරණය

සබ්බසඤ්ඤොජනං: සියලු දස සංයෝජන. සත්වයා සසරට බැඳ තබන සංයෝජන දහයක් ගැන බුදු දහමෙහි සඳහන් වෙයි. ඒවා මෙසේ ය.

1. සක්කායදිට්ඨි - තම කයෙහි ආත්මයක් පවතී යන හැඟීම
2. විචිකිච්ඡා - බුද්ධා දී අට තැනක පවත්නා සැකය
3. සීලබ්බතපරාමාස - ශීල ව්‍රතයන් දැඩිව ග්‍රහණය කිරීම
4. කාමරාග - කාම වස්තූන් කෙරෙහි පවත්නා ඇල්ම
5. ව්‍යාපාද - දැඩි ද්වේෂය
6. රූපරාග - රූප භවයන් අරභයා පවතින ඇල්ම
7. අරූපරාග - අරූප භවයන් අරභයා පවත්නා ඇල්ම
8. මාන - මානය
9. උද්ධච්ච - මානසික නොසන්සුන්තාව
10. අවිද්‍යා - යථාර්ථය නොදැනීම

මේ සංයෝජන දහයෙන් පළමු පහ ඔරම්භාගිය සංයෝජන වශයෙන් හැඳින්වෙයි. ඒවා කාමලෝකය අරභයා පවත්නා බැවිනි. ඉතිරි සංයෝජන පහ හැඳින්වෙන්නේ උද්ධම්භාගිය යන නමිනි. ඒවා කාමලෝකයට වඩා උසස් වූ ලෝකයන් අරභයා පවත්නා බැවිනි. රූප භවයට හා අරූප භවයට ඒවා සම්බන්ධ වෙයි.

සඞ්ගාතිගං: මෙහි දී ඇලීම් ඉක්මවා ලූ යන්නෙන් අදහස් වන්නේ කාම, දිට්ඨි, සීලබ්බත හා අත්තවාද නමින් එන සතරාකාර උපාදානයන් ඉක්මවා සිටීම යනුයි.

න පරිතස්සති: තැති නොගනියි. බිය නොවෙයි යන අදහසයි. සසරට බැඳී, රාග දොසාදී කෙලෙසුන් සහිත පුද්ගලයෝ බියට තැති ගැන්මට පැමිණෙති. එහෙත් ඒවා ඉක්මවා කෙලෙසුන් නැසූ පුද්ගලයාට බියක් සැකක් නොමැත. එබැවින් තැති නොගනියි.

අවිද්‍යා නමැති අගුල උපුටා සිවුසස් දහම් දත් තැනැත්තා බ්‍රාහ්මණයා ය.

398. ඡෙත්වා නද්ධිං වරත්තඤ්ච සන්දාමං සහනුක්කමං උක්ඛිත්තපළිඝං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26.16)	රැහැන් හා වරපට සිඳ සැකිල්ලෙන් සහමුලින් වෙන්වී දොරගුළු මුගුරු සිඳිමින් පුබුදු වූ උතුමා බමුණෙකැයි පවසමි

වෛර නැත්තේ බමුණෙකි.

26 (15) බමුණන් දෙන්නා ගේ කථාව (ගාථා 398)

බුදුරජාණන් වහන්සේ දෙවුරම් වෙහෙරෙහි වැඩ වෙසෙන සමයෙහි බමුණන් දෙදෙනකු අරබයා මෙම ගාථා ධර්මය වදාළ සේක.

මේ බමුණන් දෙදෙනාට ගොන්නු දෙන්නෙක් වූහ. එක් ගොනෙකුගේ නම චුල්ල රොහිතය. අනෙක් ගොනා මහා රොහිත නම් විය. මේ බමුණන් දෙදෙනා තම තමන්ගේ ගොනුන් ගැන මහ ඉහලින් කතා කරති.

චුල්ල රොහිත බෙහෙවින් ශක්තිමත් බර ඇදීමට දක්ෂ ගොනකු ලෙස ඔහු ගේ හිමිකරු බමුණා පවසයි. මහා රෝහිත ගොනා ගැන ද ඔහු ගේ හිමිකරු බමුණා පවසන්නේ ද එසේමය. දිනක් මේ බමුණන් දෙදෙනා තමන්ගේ ගොනුන්ගේ ශක්තිමත් භාවය ගැන වාදයක යෙදුනාහ. වාදයෙහි අවසන් නිගමනය වූයේ ගොනුන් දෙදෙනාගේ ශක්තිය ඔප්පු කර දැක්වීමය. ඒ අනුව බමුණන් දෙදෙනා අචිරවතී ගං තෙරට ගොස් කරත්ත දෙකක වැලි පටවා ගොනුන් දෙදෙනා කරගස්හි බැඳ කරත්ත ඇදීමට සැලැස්වූහ. මේ අවස්ථාවෙහි භික්ෂූන් වහන්සේලා ජලස්නානය සඳහා අචිරවතී ගං තෙරට පැමිණියහ.

බමුණන් දෙදෙනා වැලි පැටවූ කරත්ත ඇදීමට ගොනුන් දෙදෙනා මෙහෙය වූහ. නමුත් ගොනුන් වෙර දරා ඉදිරියට යාමට තැත් කළ ද කරත්ත එක අඟලකුදු ඉදිරියට ඇදී නොගියේය. ගොනුන්ගේ වියපට කැඩී ගියා මිස කරත්ත ඇදීමට නොහැකි විය. මේ සියලු විස්තර භික්ෂූන් වහන්සේලා බලා සිටියහ. උන්වහන්සේලා ස්නානයෙන් පසුව විහාරයට ගොස් මෙම සිදුවීම බුදුන් වහන්සේට සැළ කළහ. බුදුන් වහන්සේ මෙසේ පැවසූහ. "මහණෙනි, මේවා බාහිර රැහැන්ය. වරපටය. විය ලනුය. ඒවා සිඳ බිඳ දැමීමට පහසුය. නමුත් භික්ෂූන් ඇතුළත ඇති බැඳුම් පට හා රැහැන් සිඳලිය යුතුය. ඒවා නම් තෘෂ්ණා වෛර වැනි ඇතුළත බැඳීම්ය." එසේ පවසමින් උන්වහන්සේ පූර්වෝක්ත ගාථා ධර්මය දෙශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (398 ගාථාව)

නද්ධිං වරත්තඤ්ච සහනුක්කමං සන්දාමං ඡෙත්වා
උක්ඛිත්තපළිඝං බුද්ධං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

නද්ධිං: ක්‍රෝධ නමැති දැඩි රැහැනද; **වරත්තඤ්ච**: තෘෂ්ණා නමැති වරපටද; **සහනුක්කමං සන්දාමං**: අනුක්‍රම නම් වූ කාමරාගාදී සප්තානුශයන් සහිත (දෙසැට මිසදිටු නමැති) මහ දම්වැල ද; **ඡෙත්වා**: සිඳ; **උක්ඛිත්තපලිඝං**: (අවිද්‍යා නමැති) ඔසවන ලද දොරගුල ඇති; **බුද්ධං**: සිව්සස් දන්නා වූ; **තං**: එම පුද්ගලයා; **අහං**: මම, **බ්‍රාහ්මණං බ්‍රෑමි**: බමුණෙකැයි කියමි.

ක්‍රොධ රැහැනින් මිඳුණු, තෘෂ්ණා වරපට මුදාලූ, සසර දොරගුලු හළ ප්‍රාඥ පුද්ගලයා බමුණාකැයි පවසමි.

විවරණය

මෙම ගාථාවෙහි විමුක්තිය සොයා යන්නා ගොනුන් හා ගැල ඊක බලා ගන්නාට සමාන කොට ඇත.

නද්ධිං: ගැල-ගොනු උපමාවෙහි වෛරය සමාන කොට ඇත්තේ රැහැන්ටය. ආධ්‍යාත්මික විමුක්තියෙහි ලා වෛරය බන්ධනයක් ලෙස දැක්වෙයි.

වරත්තං: ගැල සහ ගොන් උපමාවෙහි තෘෂ්ණාව තෝන් ලනුවට සමාන කොට ඇත. සත්වයා සංසාරයෙහි මෙහෙය වන බලවේගය ලෙස දැක්වෙන්නේ තෘෂ්ණාවයි.

සන්දාමං සහනුක්කමං: ගැල සහ ගොනාගේ උපමාවෙහි නාස්ලනුව ලෙස දක්වා ඇත්තේ දෙසැටක් වූ මිථ්‍යාදෘෂ්ටියි. මෙම දෘෂ්ටිය ද සංසාර ප්‍රවර්තක බලවේගයක් ලෙස සැලකෙයි.

අසන දෙය පිළිබඳ බුදුන්වහන්සේ ගේ ආකල්පයට මෙම ගාථාව මෙන්ම වෙනත් ගාථා කිහිපයක්ම ද බුදුන් වහන්සේ විසින් ඉදිරිපත් කොට ඇත්තේ තමන් වහන්සේට අසන්නට ලැබුණු කරුණු පිළිබඳවය. උන්වහන්සේ ගේ දේශනා ක්‍රමය ගැන විමසා බලන විට පෙනී යන්නේ උන්වහන්සේට අසන්නට දකින්නට ලැබෙන දෙය නිමිති කොට ගෙන බොහෝ දෙනාට හිත සුව ගෙන දෙන ආධ්‍යාත්මික කරුණු ගෙන හැර දැක්වීමය.

දිනක් බුදුරජාණන් වහන්සේ පිඩු පිණිස සැවත් නුවර සැරිසරන විට ළමුන් පිරිසක් ජලය සිඳුනු විලෙක මසුන් අල්ලමින් සිටිනු උන්වහන්සේට දක්නට ලැබිණ. උන්වහන්සේ ළමුන් වෙතට ගොස්, "දරුවනි, නුඹලා වේදනාවට බිය ද එය නොකැමැතිදැයි ඇසූහ. එවිට ළමුන් පිළිතුරු දුන්නේ ස්වාමීනි අපි දුකට බිය වෙමු. දුක නොකැමැති වෙමු යනුවෙනි." ඉතින් ඔබලා දුකට බිය නම් එය නොකැමැති නම් කිසිදු නරක ක්‍රියාවක් නොකරන්නාහුය. ඔබලා යම් කිසි දුශ්චරිතයක හැසිරෙන්නහු නම් "නුඹලාට දුකින් මිදීමක් නැත" යි බුදුරජාණන් වහන්සේ පැවසූහ.

අක්‍රෝශ හා වදබැඳුම් ඉවසන ඒ ඉවසීම බල ඇණිය කොට ඇත්තා බ්‍රාහ්මණයා ය.

399. අක්කොසං වධබන්ධඤ්ච
අදුට්ඨො යො තිතික්ඛති
ඛන්තිබලං බලාණීකං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:17)

ඉවසන හැම වධබන්ධන
නොකිපී ඉවසීම රකින
ඉවසන බලයෙන් බලගතු
කෙනෙකු බමුණකැයි පවසමි

බමුණා ඉවසන්නෙකි

26 (16) අක්කොස භාරද්වාජගේ කතා පුවත (ගාථා 399)

බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙක මේ ගාථා ධර්මය **අක්කොස භාරද්වාජ** නම් වූ බමුණකු අරභයා දේශනා කළ සේක.

භාරද්වාජ නම් වූ බමුණකුට අක්කොස භාරද්වාජ නමින් සහෝදරයෙක් ද සෝවාන් ඵලයට පත් ධනඤ්ජානි නම් වූ භාර්යාවද වූහ. යම් විටක ඇයට කිවිසුමක් ගිය විට හෝ කැස්සක් ඇති වූ විට "තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේට ස්තුති වේවා"යි කියන්නීය. දිනක් ඇය බමුණන්ට අහර බෙදමින් සිටිය දී කිවිසුමක් යාම නිසා ඇයගේ මුවින් ඉහත සඳහන් වදන් කියැවිණ. එය ඇසූ බමුණා දැඩිව කිපී, මේ පව්ටු ගැහැණිය හැම විටකම මෙසේ කියන්නී යයි සිතමින්, "එම්බා පව්ටු ගැහැණිය, මම දැන් ගොස් තිගේ ශාස්තෘවරයා සමග වාද කොට ඔහු පරදවම්"යි තම බිරියට පැවසුවේය. "බමුණ, ඕනෑම විදියකින් යන්න. මගේ ශාස්තෘවරයා වාදයෙන් පැරදවූ කිසිවකු තවම මම දැක නැතැ"යි ඕ තොමෝ කීවා ය. බමුණා විහාරයට ගොස් බුදුන් හමුව ගරු බුහුමන් ද නොදක්වා එකත්පසෙක සිට පහත සඳහන් පරිද්දෙන් ප්‍රශ්නයක් විමසුවේ ය.

"කෙනෙක් පහසුවෙන් ජීවත් වීම සඳහා විනාශ කළ යුත්තේ කුමක් ද? තවදුරටත් දුක් නැතිව සිටීමට කෙනෙකු දුරු කළ යුත්තේ කුමක් ද? නිරෝධය සඳහා ඔබ දක්වන එකම හේතුව කුමක් ද?"

බුදුරජාණන් වහන්සේ මෙම ප්‍රශ්නවලට පහත දැක්වෙන අයුරින් පිළිතුරු සැපයූහ.

"ක්‍රොධය දුරලීමෙන් කෙනෙක් සුවසේ වෙසෙයි. ක්‍රොධය දුරලීමෙන් ශෝකය තවදුරටත් නොපවතියි. එබැවින් ක්‍රොධය විනාශ කිරීම බුද්ධාදී උතුමන්ගේ පැසසුමට බඳුන් වෙයි."

භාරද්වාජ බ්‍රාහ්මණයා බුදුන් වහන්සේගේ පිළිතුරු අසා බෙහෙවින් සතුටට පත්විය. හෙතෙම බුදුන් කෙරෙහි පැහැදී පැවිදි වීමට අවසර ගෙන බුදු සසුනෙහි පැවිදි විය.

තම සොහොයුරා පැවිදි වූ පුවත බමුණාගේ බාල සොහොයුරාට අසන්නට ලැබිණ. හෙතෙම මේ පුවතින් කෝපයට පත්ව බුදුන් හමුවට ගොස් සොහොයුරා පැවිදි කිරීම සම්බන්ධයෙන් බුදුන්වහන්සේට ආක්‍රොශ පරිභව කරන්නට විය. එවිට බුදුන්වහන්සේ "බ්‍රාහ්මණය ඔබ යමෙකුට ආහාරයක් දුන්විට එය නොපිළිගන්නේ නම් ඒ ආහාරය ඔබටම අයිති වෙයි. එලෙසින්ම ඔබගෙන් කියැවුණු නින්දා අවලාද මම පිළි නොගනිමි. එබැවින් ඒ නින්දා අවලාද සියල්ල ඔබටම ආපසු අයිති වෙයි" යනුවෙන් පැවසූ සේක. අක්කොස භාරද්වාජ බමුණා ද බුදුන් කෙරෙහි පැහැදී පැවිද්දට පත්විය.

අක්කොස භාරද්වාජ මෙන්ම ඔහුගේ තවත් සහොදරයන් දෙදෙනෙකු වන සුන්දරී භාරද්වාජ හා බිලංගික භාරද්වාජ යන බමුණන් දෙදෙනා ද විහාරයට පැමිණ මේ සිද්ධිය සම්බන්ධයෙන් බුදුන් වහන්සේට පරිභව කළ ද උන්වහන්සේගෙන් දහම් අසා පැවිදි බවට පත්වූහ.

එක් දිනෙක භික්ෂූන් වහන්සේලා දම් සභා මණ්ඩපයෙහි රැස්ව භාරද්වාජ සොහොයුරන් පැවිදි කළ ආකාරය සම්බන්ධයෙන් බුදුන්වහන්සේ ගේ ගුණ වර්ණනා කරමින් සිටියහ. බුදුන් වහන්සේ දම් සභා මණ්ඩපයට වැඩමවා "මහණෙනි මා එන්නට පෙර කවර කථාවකින් යුතුව සිටියාහුදැ"යි විමසූහ. එවිට භික්ෂූන් වහන්සේලා භාරද්වාජ බ්‍රාහ්මණයන් පැවිදි කරවීමේ පුවත කථා කරමින් සිටියෙමුයි පැවසූහ. මහණෙනි, මම ඉවසීමේ බලය අත්පත් කරගෙන සිටිමි. මම පාප ධර්මයන් සම්පූර්ණයෙන් විනාශ කළේ වෙමි. එබැවින්ම මම අනුත්තර වූ සම්මා සම්බුද්ධ වෙමි"යි බුදුරජාණන් වහන්සේ පැවසූහ.

විවරණාත්මක අනුවාදය (399 ගාථාව)

යො අක්කොසං වධබන්ධඤ්ච අදුට්ඨො තිතික්ඛති
ඛන්තිබලං බලාණීකං තං අහං බ්‍රාහ්මණං බ්‍රෑමි.

යො: ඉදින් යම් කෙනෙක්; **අක්කොසං**: ආක්‍රොශ පරිභව ද; **වධබන්ධඤ්ච**: වධ හා බන්ධන ද; **අදුට්ඨො**: කෝපයට නොපැමිණියේ; **තිතික්ඛති**: ඉවසයිද; **ඛන්තිබලං**: ක්ෂාන්තිය බලය කොට ඇති; **බලාණීකං**: (නැවත නැවත උපදනා) එම ක්ෂාන්තියම බල ඇණිය කොට ඇති; **තං**: එම පුද්ගලයා; **අහං**: මම; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **බ්‍රෑමි**: ප්‍රකාශ කරමි.

තමාට ආක්‍රොශ පරිභව කළ විට යමෙක් කෝප නොවී ඒවා ඉවසයි ද ක්ෂාන්තියම බලය කොට ඇති ක්ෂාන්තියම බල ඇණිය කොට ඇති එබඳු පුද්ගලයකු බමුණකු වෙතැයි මම පවසමි.



නො කිපෙන සුලු වූ දුහගවත් ඇති සීලයෙන් යුතු වූ අන්තිම සිරුර ඇති සුගුලා බ්‍රාහ්මණයා ය.

400. අක්කොධනං වත වන්තං
සීලවන්තං අනුස්සුතං
දන්තං අන්තිමසාරීරං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:18)

නොකිපෙන පැවිදිවත් ඇති
සිල්වත් ඇලුම් අත්හළ
හික්මුණු අත්බවෙහි අන්තිම
කෙනෙකුට බමුණැයි කියමි මම

බමුණෙක් නම් තොර වේය කෝපයෙන්

26 (17) මවගෙන් නින්දා අපහාස ලත් සැරියුත් තෙරුන්ගේ වත (ගාථා 400)

පන්සියයක් පිරිවර භික්ෂූන් ද සමග සැරියුත් තෙරුන් වහන්සේ පිඩු සිගා වඩිමින් නාලක නම් වූ ගමට සැපත් වූහ. පිළිවෙළින් පිඩු සිඟන උන්වහන්සේ තම මව ජීවත් වන ගෙදරටද පැමිණයහ. එහිදී මව තෙරුන් සහිත අනෙක් භික්ෂූන් ද පිළිගෙන වඩා හිඳුවා දානය ද පිළිගැන්වූවා ය. දන් පිළිගන්වන අතර තුර ඕ තොමෝ තම පුත් වූ සැරියුත් තෙරුන්ට අවලාද නැගුවාය

"ඉඳුල් කන්නානෙනි, ඔබ අනුන්ගේ ගෙවල්වල ඉඳුල් කෑමට අසු කෙළෙක් ධනය හැරදා ගෙදරින් පළා ගියෙහිය. දැන් හොඳට කන්න" ආදි වශයෙන් ඇය සැරියුත් හිමියනට අවලාද කරන්නට වූවා ය. තම පුතු තමන් හැරදා ගෙයින් පිටව ගොස් පැවිදි වීම සම්බන්ධයෙන් ඇය තුළ වූ කෝපය මේ අයුරින් අවලාද ලෙසින් පිට කළාය. අනෙක් භික්ෂූන්ට ද අහර දෙමින් ඔවුනට ද දොස් පරොස් බිණුවාය. භික්ෂූහු පිණ්ඩපාතය ද රැගෙන විහාරයට වැඩම කළ හ. රාහුල තෙරුන් වහන්සේ දානය වළඳන ලෙස බුදුන් වහන්සේට ඇරයුම් කළහ. "රාහුල ඔබ කොහි ගියෙහිදැ"යි උන්වහන්සේ රහල් තෙරුන්ගෙන් ඇසූහ. "ස්වාමීනි, අත්තම්මා පදිංචි ගමට ගියෙමි"යි රහල් තෙරුන්ගේ පිළිතුර විය. "ඔබේ අත්තම්මා ඔබේ උපාධ්‍යායවරයාට කීවේ මොනවාද?" බුදුන් වහන්සේ යළි ඇසූහ. "ස්වාමීනි, අත්තම්මා උන්වහන්සේට අවලාද නැගුවාය." "මොනවාද ඇය කීවේ?" "ස්වාමීනි, මේ මේ දේ කියමින් ඇය උපාධ්‍යායන් වහන්සේට අපවාද නැගියයි පැවසූ රහල් තෙරණුවෝ සිදු වූ සියලු පවත් බුදුන්ට දන්වා සිටියහ.

මේ ප්‍රවෘත්තිය අසා සිටි භික්ෂූන් වහන්සේලා දම් සභාවෙහි රැස්ව මේ පිළිබඳව සාකච්ඡා කරන්නට වූහ. "ඇවැත්නි සැරියුත් තෙරුන් වහන්සේගේ ගති පැවතුම් කෙතරම් පුදුම සහගතද? තම මව ආක්‍රොශ පරිභව කළ ද උන්වහන්සේ ඒවායින් කිපීමට නොපැමිණියහ." ආදි වශයෙන් භික්ෂූන් වහන්සේලා සැරියුත් තෙරුන්ගේ ගුණ ධම් සභාවෙහිදී ප්‍රකාශ කළහ. ඒ අතර එහි වැඩම කළ බුදුන්වහන්සේ "කවර කථාවකින් යුක්තව සිටියා"දැයි විමසා සියලු තොරතුරු දැන යථොක්ත ගාථාවෙන් ධර්මදේශනා කළහ.

විවරණාත්මක අනුවාදය (400 ගාථාව)

**අක්කොධනං වතවන්තං සීලවන්තං අනුස්සුතං දන්තං
අන්තිමසාරීරං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි**

අක්කොධනං: නොකිපෙන සුලු වූ; **වතවන්තං**: (ධුතාංග) ව්‍රත ඇති; **සීලවන්තං**: සිල්වත් වූ; **අනුස්සුතං**: සිහි නුවණ ඇති; **දන්තං**: හික්මීමෙන් යුත්; **අන්තිමසාරීරං**: පශ්චිමභවික වූ (අන්තිම භවයෙහි සිටින); **තං**: එබඳු පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: ප්‍රකාශ කරමි.

ක්‍රොධයෙන් තොර, ව්‍රතචාරිත්‍ර දන්නා, සිල්වත් වූ, සිහි නුවණින් යුක්ත, මනාව හික්මුණු, අනාගත උපත් නැති කළ පුද්ගලයාම බ්‍රාහ්මණයකැයි පවසමි.

විවරණය

සැරියුත් මහ රහතන් වහන්සේ: බෞද්ධ ලෝකයෙහි බොහෝ දෙනාගේ ආදර බුහුමනට පත් වූ චරිතයක් ලෙස සැරියුත් හිමියන්ගේ චරිතය හඳුන්වා දිය හැකිය. බුදුරජාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවකවරුන් දෙදෙනාගෙන් දක්ෂිණ ශ්‍රාවකයා ලෙස සැලකෙන්නේ සැරියුත් තෙරුන් වහන්සේයි. බුදුන්වහන්සේගේ අග්‍ර උපස්ථායක ආනන්ද තෙරුන් ධර්ම භාණ්ඩාගාරික ලෙස හැඳින්වෙන්නා සේම සැරියුත් තෙරණුවෝ ධර්මසේනාපති යනුවෙන් හැඳින්වෙති. ධර්ම දේශනා කුශලතාවෙන් හා ප්‍රඥාවෙන් උන්වහන්සේ දෙවෙනි වන්නේ බුදුරජාණන් වහන්සේට පමණි.

බුදුන් වහන්සේ විවේක ගන්නා අවස්ථාවන්හි උන්වහන්සේ වෙනුවෙන් බොහෝ විට ධර්ම දේශනා පවත්වන්නේ සැරියුත් තෙරණුවන් විසිනි. වරක් බමුණෙක් උන්වහන්සේගේ ඉවසීම පිරික්සීමට හිසට දැඩි පහරක් එල්ල කළේය. එයින් උන්වහන්සේ කිසිදු කැළඹීමකට හෝ කෝපයකට පත් නොවූහ.

සත් හැවිරිදි සාමණේර භික්ෂුවකට උන්වහන්සේ දැක් වූ ගෞරවය ගැන බෙහෙවින් ප්‍රසිද්ධය. වරක් උන්වහන්සේ සිවුරු කොණක් බිම ඇතිල්ලෙමින් ගමන් කරන අයුරු දුටු මේ සත් හැවිරිදි සාමණේර භික්ෂුව එය උන්වහන්සේට පෙන්වා දුන්නේ ය. එය බෙහෙවින් ගෞරවයෙන් පිළිගත් උන්වහන්සේ එම සාමණේර භික්ෂුවට පැසසුම් කළහ.

රහල් තෙරණුවන්ට හා උන්වහන්සේ ගේ මව වන යසෝධරා තෙරණියට සැරියුත් හිමියන් තුළ විශේෂ සැළකිල්ලක් තිබිණ. වරක් යශෝධරා තෙරණියට උදරාබාධයක් ඇති වූ විට විශේෂ අඹ වර්ගයක යුෂ බෙහෙතක් වශයෙන් ඇයට පිළිගැන්වූහ. තවත් වරෙක එබඳුම රෝග ාවස්ථාවකදී උන්වහන්සේ පසේනදී කොසොල් රජුට දන්වා අවශ්‍ය ප්‍රතිකාර සැලැස්වූහ.

වරක් අනේපිඬු සිටාණන් රෝගාතුර වූ විටෙක ආනන්ද හිමියන්ද සමඟ එහි වැඩම වූ උන්වහන්සේ සිටුවරයාට සූත්‍ර ධර්මයකින් අනුශාසනා කළහ. එම සූත්‍ර දේශනාව අනාථ පිණ්ඩිකොවාද සූත්‍රය නමින් සූත්‍රපිටකයට ඇතුළත්ව තිබේ.

බුදුරජාණන් වහන්සේ තව්තිසා දෙව්ලොව මාතෘ දිව්‍යරාජයා ප්‍රමුඛ දෙව්වරුන්ට අභිධර්මය දේශනා කොට උන්වහන්සේ දිනපතා පිඬු පිණිස උතුරුකුරු දිවයිනට වැඩම කළ විට එහිදී සැරියුත් තෙරුන් හමු වී උන්වහන්සේට දෙව්ලොවදී දේශනා කළ පරිච්ඡේදන්ම අභිධර්මය දෙසූ බව සඳහන් වෙයි. සැරියුත් හිමියන් විසින් විවිධ අවස්ථා වලදී දේශනා කරන ලද ඉතා වැදගත් සූත්‍රධර්ම රාශියක් සූත්‍ර පිටකයට ඇතුළත් කොට තිබේ.



නෙළුම්පතැ ජලය මෙන් ද, ඉඳිකටු අගැ අබ ඇටක් මෙන් ද, කාමයන්හි ඇලීම් නැත්තා බ්‍රාහ්මණයා ය.

401. වාරි පොක්ඛරපත්තෙව ආරග්ගෙරිව සාසපො යො න ලිම්පති කාමෙසු තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:19)	නෙළුම්පතෙහි දිය මෙන් හිඳි තුඩෙහි අබ මෙන් යමෙක් කම් සුවයෙහි නො ඇලේ නම් බමුණෙකැයි ඔහු කියම් මම

කම් සැපෙහි නො ඇලෙන්නේ බමුණෙකැයි දන්නේ

26 (18) උප්පලවණ්ණා තෙරණියගේ කථාව (ගාථා 401)

බුදුරජාණන් වහන්සේ සැවත් නුවර දෙව්රමෙහි වැඩ වෙසෙමින් මෙම ගාථා ධර්මය **උත්පලවණ්ණා තෙරණිය** අරභයා දේශනා කළ සේක. මෙහි කථාව අර්ථකථාවෙහි සවිස්තරව දක්වා ඇත.

නන්ද නම් වූ තරුණයකු විසින් කෙලෙසීමට ලක්වූ උප්පලවණ්ණා තෙරණිය සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේලා දම් සභා මණ්ඩපයෙහි සාකච්ඡා කරමින් සිටියදී ඔවුන් අතර වූ කථාවක් මෙසේ ය. වෙනත් මිනිසුන්ගේ මෙන්ම භෞතික කයකින් නිර්මිත වූ මසින් ලෙයින් හැඳුණු රහතන් වහන්සේලා කම් සැපයෙහි නොයෙදේ ද? "මේ සම්බන්ධයෙන් බුදුන් වහන්සේ මෙසේ පැවසූහ. "මහණෙනි, රහතන් වහන්සේලා කම් සැපයෙහි නොයෙදෙති. කාමයෙහි නො ඇලෙති. නෙලුම් පතෙක දිය නොපිහිටන්නාක් මෙන් ද ඉදිකටු තුඩෙක අබ ඇටයක් නොරැඳන්නාක් මෙන් ද රහතන් වහන්සේලා කාම සැපයෙන් දුරුව වෙසෙති."

විවරණාත්මක අනුවාදය (401 ගාථාව)

පොක්ඛරපත්තෙ වාරි ඉව ආරග්ගෙ සාසපො ඉව යො
කාමෙසු න ලිම්පති තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

පොක්ඛරපත්තෙ: පියුම් පතෙහි; **වාරි**: ජලය; **ඉව**: මෙන් ද; **ආරග්ගෙ**: ඉදිකටු තුඩෙහි; **සාසපො**: අබ ඇටය; **ඉව**: මෙන් ද; **යො**: යමෙක්; **කාමෙසු**: කාමයන්හි; **න ලිම්පති**: නො ඇලෙයිද; **තං**: එම පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බ්‍රාහ්මණයෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: කියමි.

යමෙකු පියුම් පතෙක දිය මෙන් ද ඉදිකටු තුඩෙහි අබ ඇටයක් මෙන් ද කාමයෙහි නො ඇලී සිටි නම් එබඳු පුද්ගලයකු බ්‍රාහ්මණයෙකැයි මම කියමි.

විවරණය

උප්පලවණ්ණා තෙරණියගේ කථා පුවත: ධනවත් පවුලක උපන් උත්පලවණ්ණා තරුණ වියට එළැඹි විට විවිධ පලාත්වලින් ඇයට විවාහ යෝජනා ගලා එන්නට විය. නමුත් ඇයගේ පියා ඒ කිසිදු යෝජනාවකට කැමැත්ත පළකළේ නැත. ඔහුගේ අවශ්‍යතාව වූයේ උත්පලවණ්ණා බුදු සසුනෙහි පැවිදි ජිවිතයට ඇතුළත් කිරීමටය.

උත්පලවණ්ණා පියාගේ කැමැත්තට අනුව පැවිදි බව ලැබුවාය. කලකට පසුව ඇයට භික්ෂුණීන් ඇවැත් දෙසන සීමාවෙහි කටයුතු පිරික්සීමේ වගකීම පැවරිණ. සීමාවෙහි ආලෝකය ලබා දීමට දල්වා ඇති පහනෙහි ක්‍රියාකාරිත්වය පිරික්සීමට අවස්ථාව ඇයට ලැබිණ.

දැල්වෙන පහන දෙස ඇය විමසිල්ලෙන් බලා සිටියාය. පහන ආලෝකය ලබා දෙන්නේ තෙල් සහ වැටිය නිසාය. ඇතැම් විට සුළඟ වැදීමෙන් ආලෝකය අඩු වැඩි වන සැටිද ඇයගේ නෙත ගැටිණ. පහනේ ක්‍රියාකාරිත්වය ජීවිතයේ පැවැත්මට සමාන කරමින් විමසා බලා අනිත්‍යය මෙනෙහි කරමින් ඕ තොමෝ රහත් බවට පැමිණියාය. රහත් ඵලය ද සමඟ ඕ තොමෝ තම පෙර ජීවිත අනුස්මරණය කිරීමේ ඥානය ද ලැබුවාය.

උත්පලවණ්ණා වනගත ප්‍රදේශයක තනිව ජීවත් වෙමින් සිටිය දී ඇයගේ ඥාතියකු වන නන්ද නම් වූ ගොපල්ලකු අතින් බලහත්කාරකමකට ගොදුරු වූවාය. ඇය පිඬු සිඟා ගෙන තමා වසන ගුහාවට ඇතුළු වන විටම ඇඳුරේ සැඟවී සිටි යථොක්ත ගොපල්ලා ඇයගේ විරුද්ධත්වය ද නොතකා මෙම බලහත්කාරකම කළේ ය. මෙම පාපතර පුද්ගලා ඇය කෙලෙසීමෙන් පසු එළියට එත්ම පොලොව පැලී ගොස් එහි පතිතව අවීචිමහා නරකයෙහි උපත ලැබීය.

මේ කාරණය අරමුණු කොට ගෙන බුදුරජාණන් වහන්සේ මෙහෙණින්ට තනිව වනගතව විසීම තහනම් කරමින් ශික්ෂාවක් ද පැනවූ සේක.

උප්පලවණ්ණා තෙරණිය නොබෝ කලකින්ම ඍද්ධිබලයෙන් අගතැන්පත් තෙරණිය ලෙස බුදුන් වහන්සේ විසින් නම් කරනු ලැබූ අතර මහරහතන් වහන්සේලා අතුරෙන් එම තනතුර මහ මුගලන් තෙරුන් වහන්සේට හිමිවිය.





යමෙක් තමා ගේ දුක පිළිබඳ නැස්ම දනී ද, බහා තැබූ බර ඇති ඒ පුගුලා බ්‍රාහ්මණයා ය.

402. යො දුක්ඛස්ස පජානාති
ඉධෙව ඛයමත්තනො
පන්නභාරං විසංයුත්තං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:20)

යමෙක් තම දුකෙහි කෙළවර
දනීද මේ ජීවිතය තුළ දී
බර බිම දැමූ බැඳුම් තොරවූ
තැනැත්තකු බමුණෙකැයි පවසමි

බැඳුම් සිඳ හළේ බමුණායි.

26 (19) බර හැර දැමූ වහලෙකුගේ කථා පුවත (ගාථා 402)

පළා යන වහලුන් පැවිදි කිරීම තහනම් කිරීමේ ශික්ෂාපදය පැනවීමට කලින් කිසියම් හිමියකු සතුව සිටි වහලෙක් පළා ගොස් බුදු සස්නෙහි පැවිදිව රහත්ඵලයටද පත්විය.

දිනක් එම භික්ෂුව බුදුන් වහන්සේ සමගින් නගරයට ඇතුල් වෙමින් සිටියදී උන්වහන්සේ කලින් වහලෙකුව සිටියදී තමාගේ හිමිකරු වූ බ්‍රාහ්මණයාට දකින්නට ලැබිණ. එසේ දැක බමුණා උන්වහන්සේ ගේ සිවුරෙන් අල්ලා ගත්තේය. බුදුන් වහන්සේ මේ සිද්ධිය දැක "කිමෙක්ද බමුණ ඔබ කළේ ය"යි බමුණාගෙන් විමසූහ. "භවත් ගෞතමයන් වහන්ස මේ මගේ වහලා ය"යි බමුණා පැවසීය. "බමුණ ඔහුගෙන් ඒ වහල් බර දැන් ඉවත් වී ඇත. එහෙයින් හෙතෙම තවදුරටත් වහලෙක් නොවේය"යි බුදුන් වහන්සේ පැවසූහ. බමුණා කරුණු වටහා ගත්තේය. බුදුන් වහන්සේ එසේ පැවසුවේ එම භික්ෂුව රහත් බව ලබා ඇති නිසායයි බමුණාට වැටහිණ.

විවරණාත්මක අනුවාදය (402 ගාථාව)

යො ඉධ එව අත්තනො දුක්ඛස්ස ඛයං පජානාති
පන්නභාරං විසංයුත්තං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

යො: යමෙක්; **ඉධ එව**: මේ අත් බැව්හිම; **අත්තනො**: තමන්ගේ; **දුක්ඛස්ස**: දුක පිළිබඳ; **ඛයං**: විනාශය, **පජානාති**: දන්නේ ද; **පන්නභාරං**: හැර දැමූ බර (ස්කන්ධ) ඇති; **විසංයුත්තං**: කෙලෙසුන් ගෙන් මිදුනා වූ; **තං**: ඒ පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: ප්‍රකාශ කරමි.

යමෙක් මේ ජීවිතය තුළදීම ඔහුගේ දුක අවසන් වී ඇති බව දන්නේ ද, හැර දැමූ කෙලෙස් බර ඇති, කෙලෙසුන්ගෙන් ඉවත් වූ එම පුද්ගලයා බමුණෙක් වෙතැයි මම කියමි.

විවරණය

ස්වාමියා කෙරෙන් පළා ගොස් පැවිදිව රහත් බවට පත්වූ දාසයකුට බුදුරජාණන් වහන්සේ විසින් දක්වන ලද උපකාරයක් සම්බන්ධව යථෝක්ත ගාථාවට වස්තු වූ කථාවෙන් කියවෙයි. බුදුරජාණන් වහන්සේ අවස්ථා කිහිපයකදීම ස්ත්‍රී පුරුෂ දාසයන් කිහිප දෙනෙකුටම උපකාර කිරීමේ කථා පුවත් දක්නට ඇත. මේ අය උන්වහන්සේගේ ආධ්‍යාත්මික මග පෙන්වීම්වල උදව්වෙන් ආගමික ප්‍රතිලාභයන් උරුම කරගත් බව සඳහන් වෙයි.

මේ සම්බන්ධයෙන් පුණ්ණා නම් වූ දාසියගේ කථාව නිදසුනක් ලෙස දැක්විය හැකිය. පුණ්ණා රජගහනුවර ධනවත් සිටුවරයකු ගේ බැලමෙහෙවරයෙහි යෙදුණු දාසියක් වූවාය. දිනක් ඕ තොමෝ රාත්‍රියෙහි වී කොටා සහල් කොට අවසන්හි එළිමහනට පැමිණියාය. එහිදී ඇය භික්ෂූන් කිහිප දෙනෙක් සිටිනු දුටුවාය. පසු දින උදයෙන් අවදිව කැවුම් තනා ඒවා ද රැගෙන භික්ෂූන් වහන්සේලා සිටි දෙසට පිටත්ව ගියා ය.

එදින බුදුරජාණන් වහන්සේ පිඩු සිඟායාම සඳහා පුණ්ණා ගමන් ගත් මාර්ගයෙහි වඩිමින් සිටියහ. බුදුන් දුටු පුණ්ණා තම අතෙහි තැබූ කැවුම් බුදුන් වහන්සේට පිළිගැන්වූවාය. උන්වහන්සේ ද පුණ්ණාට අනුකම්පා කොට ඒවා පිළිගත්හ. බුදුරජාණන් වහන්සේ තමාගේ කැවුම් වළඳන සේක් ද නැතහොත් මාලිගයකින් හෝ සිටු මැදුරකින් පිණ්ඩපාතය ලබාගනීවිද යන විමතිය පුණ්ණා තුළ විය. නමුත් බුදුන් වහන්සේ අනඳ හිමියන් විසින් සැකසූ තැනක මඟ අසළ වාඩි වී පුණ්ණා පිළිගැන්වූ ආහාරය වැළඳූ සේක. මේ දැක බෙහෙවින් සතුටු වූ පුණ්ණාට බුදුරදුන්ගෙන් ධර්ම ශ්‍රවණය කිරීමේ භාග්‍යය ද ලැබිණ. දහම අසා ඕ සෝවාන් පෙලෙහි පිහිටියා ය.

මෙසේම බුදුන් වහන්සේගෙන් ධර්මය අසා සෝවාන් බවට පත් වූ තවත් දාසියක වන්නේ ගයාවෙහි නිවසක මෙහෙකාර කම් කළ රජ්ජුමාලායි. රජ්ජුමාලාට තම ස්වාමි දියණියගේ නොයෙක් වධබන්ධන වලට මුහුණ පෑමට සිදුවිය. ස්වාමි දියණියගෙන් ඇයට කිසිදු කරුණාවක් නොලැබිණ. බොහෝවිට ඇයගේ කෙස් වැටියෙන් අල්ලාගෙන ඇයට පහර දීමට ස්වාමි දියණිය පෙළඹුණාය. එබඳු පහරදීම් වලින් වැළකීමට රජ්ජුමාලා තම කෙස් වැටියද කපා දැමුවාය. ඇයට රජ්ජුමාලා යනුවෙන් නම වැටුනේ ඇයගේ ගෙලට රැහැනක් දමා තිබූ බැවිනි. ස්වාමි දියණියගේ වධබන්ධන ඉවසා සිටිය නොහැකි වූ ඕ තොමෝ දිනක් දිය ගෙනෙන මුවාවෙන් එළියට අවුත් හොර රහසේම නිවසින් පළා ගියාය. වනයට පළා ගිය ඕ තොමෝ ගෙලවැල ලාගෙන මිය යාමට තැත් කළාය.

බුදුරජාණන් වහන්සේ මහා කරුණා සමාපත්තියෙන් ලොව බලා වදාරණ විට රජ්ජුමාලාට සෝවාන් වීමට හේතු සම්පත් ඇති බව දැන ඇය ගෙලවැල ලා ගැනීමට තැත් කරමින් සිටි තැනට වැඩම කොට ඇයට ධර්ම දේශනා කළ සේක. ඕ තොමෝ සෝවාන් පෙලෙහි පිහිටා මිය යාමේ අදහස ඉවත දමා ආපසු විසූ තැනටම ගියාය. එසේ ගොස් ස්වාමි දියණියට තමන් බුදුන් වහන්සේ මුණ ගැසුණු පුවත සැළ කළා ය.

ස්වාමි දියණිය හා ඇයගේ මාමණ්ඩිය එය අසා විහාරයට පැමිණ බුදුන් වහන්සේ හමුව ධර්මය අසා උන්වහන්සේට තම නිවසෙහි දානයට ද ආරාධනය කළහ. දන් වළඳා අවසන්හි බුදුන් වහන්සේ "රජ්ජුමාලා පෙර භවයක ධනවත් නිවසක ඉපිද තම දාසියට වධ හිරිහැර කිරීමේ පාපය නිසා මේ භවයෙහි මෙසේ වීය"යි පැහැදිලි කළහ. දහම් අසා පැහැදුණු ස්වාමි දියණිය රජ්ජුමාලාව දාස බවින් නිදහස් කොට දියණියක ලෙස හදා වඩා ගත්තාය.



පස්කඳ පිළිබඳ ගැඹුරු පැණැති විදසුන් නුවණැති මග දන්නා පුගුලා බ්‍රාහ්මණයා ය.

403. ගම්භීරපඤ්ඤං මේධාවිං
මග්ගාමග්ගස්ස කොවිදං
උත්තමත්ථං අනුප්පත්තං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:21)

ගැඹුරු දැනුමැති බුද්ධිමත් වූ
මග නොමග දැනුමෙන් ද යුත් වූ
උතුම් තැනටම පැමිණියේ වේද
එවන් කෙනෙකුට කියමි බමුණැයි

උත්තමාර්ථයට පත් වූයේ බමුණායි

26 (20) බුද්ධිමත් ඛේමා (ගාථා 403)

බුදුරජාණන් වහන්සේ ගිජු කුළු පව්වෙහි වැඩවසන සමයෙහි **ඛේමා තෙරණිය** අරහයා මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

දිනක් පෙරයම අවසන් වෙත්ම ශක්‍ර දේවේන්ද්‍රයා පරිවාර දෙව් පිරිසක් ද කැටුව බුදුන් වහන්සේ ධර්ම දේශනා කරන තැනට පැමිණ එකත් පසෙක සිට ධර්ම දේශනයට සවන් දෙමින් සිටියේ ය. එවේලාවෙහි ඛේමා තෙරණිය බුදුන් දැකීමට පැමිණ සක් දෙවිඳු දහම් අසමින් සිටිනු දැක ආපසු හැරී ගියාය. තෙරණිය ආපසු හැරී යනු දුටු සක්දෙවිඳු බුදුන් වහන්සේගෙන් ඒ ගැන විමසීය. එවිට උන්වහන්සේ ඒ මාගේ දියණිය වු ඛේමා ය. ඕ මඟ නොමඟ දැන බුද්ධිමත්ව කටයුතු කරන්නීයයි පවසමින් යථොක්ත ගාථාවෙන් ධර්ම දේශනා කළහ.

විවරණාත්මක අනුවාදය (403 ගාථාව)

ගම්භීරපඤ්ඤං මෙධාවිං මග්ගාමග්ගස්ස කොවිදං
උත්තමත්ථං අනුප්පත්තං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

ගම්භීරපඤ්ඤං: ගැඹුරු ප්‍රඥාව ඇති; **මෙධාවිං**: විදසුන් නුවණැති; **මග්ගාමග්ගස්ස කොවිදං**: මඟ නොමඟ තෝරා ගැනීමෙහි දක්‍ෂ වූ; **උත්තමත්ථං**:(අරහත් ඵලයට) උත්තමාර්ථයට; **අනුප්පත්තං**: සැපැමිණියා වූ; **තං**: එබඳු පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: ප්‍රකාශ කරමි.

ගැඹුරු ප්‍රඥාවෙන් යුක්ත වූ බුද්ධිමත් වූ මඟ නොමඟ තීරණය කිරීමෙහි දක්‍ෂ වූ උත්තමාර්ථය අත්පත් කරගත් පුද්ගලයා බ්‍රාහ්මණයෙකැයි මම පවසමි.

විවරණය

ඛේමා ගේ කථා පුවත: ඛේමා සාගල නුවර රජකුල කුමාරිකාවක්ව උපන් තැනැත්තියෙකි. ඇය බෙහෙවින් රූමත් කාන්තාවක් වූවාය. ඇයගේ ඡවි වර්ණය රන් පැහැ ගැන්වී තිබිණ. ඇය රජගහ නුවර බිම්බිසාර රජු සමඟ විවාපත් වූවාය. බුදුරජාණන් වහන්සේ රූපයෙහි අනිත්‍යතාව පිළිබඳව නිබඳව දම් දෙසන බැවින් ඕ තොමෝ බුදුන් දැකීමට මැලි වූවාය. තමාගේ ස්වාමියා වූ බිම්බිසාර රජු විසින් කරවා පිළිගැන්වූ වේලුවනාරාමයෙහි බුදුන් වහන්සේ වැඩ සිටිය ද ඛේමා උන්වහන්සේ දැකීමට නොගියා ය.

උද්‍යානය නැරඹීමට නොයෙක් වර ගිය ද ඕ තොමෝ බුදුන් දැකීමෙන් වැළකී සිටියා ය. බිම්බිසාර රජු මේ බව දැන මිනිසුන් ලවා බුදුන් දැකීමට යාමට ඇය පොළඹවනු ලැබුවාය. බුදුන් වහන්සේ ඇය පැමිණෙනු දැක ඇයට පෙනෙන සේ තමන්ට රූමත් දෙවඟනක පවන් සලමින් සිටිනු දක්නට සැලැස්වූහ. එය දුටු ඕ තොමෝ බුදුන් රූපයට ගරහතැයි කීම මුසාවකැයි සිතමින් දෙවඟනගේ රූපය දෙස බල බලා බුදුන් වෙතට සෙමෙන් සෙමෙන් ගමන් කළාය. බුදුන් වහන්සේ මැවූ දෙවඟනගේ රූපය ක්‍රමයෙන් ජරාවට පත්වන ආකාරයක් පෙනෙන්නට සැළැස්වූහ.

ක්‍රමයෙන් තරුණ වියේ සිට මහළු වියටද එයින් ජරාවට ද අන්තිමේ දී බිම පතිතව මරණයට ද පත්වන දෙවඟන දුටු ඛේමා තම නුවණින් රූපයේ අනිත්‍ය අස්ථිර බව මෙනෙහි කරමින් බුදුන් වෙතට පැමිණියා ය. බුදුරජාණන් වහන්සේ ඛේමා ගේ වෙනස් වු මනසට ගැලපෙන අයුරින් ධර්ම දේශනා කළහ. ඛේමා අනිත්‍ය දුක්ඛ අනත්ත ස්වභාවයන් මෙනෙහි කරමින් සෝවාන් පෙළෙහි පිහිටියාය. බිම්බිසාර රජුගෙ න් අවසර ගත් ඛේමා පැවිදි බවට පත් වූවාය. බුදුන් වහන්සේ ගෙන් තවදුරටත් ධර්මය අසා ඇයට රහත් බවට පත් වීමේ වරම් ලැබිණ, පසු කලෙක ඕ තොමෝ ප්‍රඥාවන්ත භික්‍ෂුණීන් අතුරෙන් අග තනතුරෙහි පිහිටවන ලැබූවාය.

බුදුරජාණන් වහන්සේට භික්‍ෂූන් අතුරෙන් සැරියුත් මුගලන් හිමියන් දෙනම අගසව් වූවාක් මෙන් භික්ෂුණීන් අතුරෙන් අගසව් වීමේ භාග්‍යය හිමි වූයේ ඛේමා තෙරණිය හා උත්පලවණ්ණා තෙරණිය යන දෙදෙනාටය.

ගිහි පැවිදි දෙ පස හා එක්වීම් නැති තණ්හා නමැති ගෙයි හැසිරීම් නැති තැනැත්තා බ්‍රාහ්මණයා ය.

404. අසංසට්ඨං ගහට්ඨේහි
අනාගාරේහි චූ'භයං
අනොකසාරිං අප්පිච්ඡං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:22)

ගැහැවියන් සමඟ ඇළුම් රහිතව
පැවිද්දන් කෙරෙහිද එසේ වී
තැනින් තැන යන අපිස් ගුණ සතු
කෙනෙකු බමුණකු වේය පවසමි

කිසිවකු කෙරෙහි කුලුපඟ කම් නොමැත්තේ බ්‍රාහ්මණයායි.

26 (21) තෙර කෙනකුගේ සහ දෙවඟනකගේ කථාව (ගාථා 404)

මෙම ගාථා ධර්මය බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ උන්වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වෙසෙද්දී පර්වත ප්‍රාන්තයක වාසය කළ බැවින් **පබ්භාරවාසී තිස්ස** නම් වූ තෙර කෙනකුන් අරභයායි.

තිස්ස තෙරණුවෝ භාවනාව සඳහා කමටහන් ගෙන පර්වත ප්‍රාන්තයකට ගියහ. එහිදී ඔහුට ගල් ගුහාවක් දක්නට ලැබී එය තම වාසයට සුදුසු යයි තෝරා ගැණින. උන්වහන්සේ වස් තුන් මාසයම එහි ගත කළහ. සෑම උදයකම උන්වහන්සේ ගම්මානයකට ගොස් පිඬු සිඟා ගත්හ. ගම්මානයෙහි කිසියම් වයසක කාන්තාවක් උන්වහන්සේට දිනපතා පිණ්ඩපාතය පිළිගැන්වුවාය. තිස්ස තෙරුන් විසූ ගල් ගුහාවෙහි ඊට අරක්ගත් යකින්නක් ද විසුවාය. ශීලාදී ගුණයෙන් උතුම් චරිතයක් ඇතිව විසූ තිස්ස තෙරුන් නිසා ඇයට එහි වාසය කිරීම දුෂ්කර විය. එසේම ගුහාව අතහැර යන ලෙස තෙරුන්ට පැවසීමට ද ඇය ධෛර්යමත් නොවූවාය. එබැවින් තෙරුන්ගේ කිසියම් දෝෂයක් ඇතිවන ආකාරයේ උපායයක් යෙදීමට ඇය කල්පනා කළාය. තිස්ස තෙරුන් පිණ්ඩපාතය සඳහා නිතරම යන නිවසේ කාන්තාවගේ වැඩිමහලු පුතුට ආවේශ වීමට එම යකින්න තීරණය කළාය. ඕ තොමෝ ඔහුට ආවේශ වී ඔහුගේ හිස පිටුපසට හැරී ඇස් දල්වා සිටින ආකාරයක් ඇති කළේ ය. මෙය දුටු කාන්තාව බිය වී කෑ ගැසුවාය එවිට යකින්න මෙසේ කීවාය. "මම නුඹේ පුතුට ආවේශ වූයෙමි. ඒ ආවේශයෙන් ඉවත් වීමට නම් ඔබ පිණ්ඩපාතය දෙන භික්ෂුව ලවා ඔහු ගේ පා සේදූ ජලය තරුණයාගේ හිසට වත් කළ යුතුය. එවිට පමණක් මම ඔබේ පුතු අත්හැර යමි"

පසුදින තිස්ස තෙරුන් වහන්සේ තම නිවසට පිඬු පිණිස පැමිණි විට මහලු කාන්තාව සියලු තොරතුරු තිස්ස තෙරුන්ට පැවසුවාය. තෙරුන්වහන්සේ ද කියූ අයුරින්ම කටයුතු කළහ. එවිට කාන්තාවගේ පුතුගෙන් යකින්න බැහැරවී ගියාය. ඕ තොමෝ ගල් ගුහාවට ගොස් තෙරුන් එහි එන තෙක් බලා සිටියා ය. තෙරුන් පැමිණිවිට තමා තෙරුන්ට පෙනෙන්නට සලස්වා මෙසේ කීවාය. "මම මේ ගුහාවට අරක් ගත් යකින්න වෙමි. ඔබ දුසිල්වතෙකි. ඔබට මෙහි විසීමට නොහැකිය. ඔබ මේ ගුහාවෙන් පිට වී යා යුතුය." තමන් ශීලාදී ගුණයෙන් නො අඩුව ජීවත් වන බව තෙරණුවෝ දැන සිටියහ. භික්ෂූන්ට නියමිත ශික්ෂාපද කිසිවක් තමා අතින් කඩ වී නොමැති බවද උන්වහන්සේ දැන සිටියහ. එබැවින් උන්වහන්සේ තමන් ශීලාදී ගුණයෙන් යුක්ත භික්ෂුවක් වෙමැයි යකින්නට පැවසූහ. එවිට යකින්න ඔබ මහලු ස්ත්‍රියගේ පුතුට පිළියම් කළේයයි තෙරුන්ට චෝදනා කළාය.

නමුත් තෙරුන් වහන්සේ තමන්ගේ චරිතය පිළිබඳ ආවර්ජනයක යෙදුනහ. ඒ ආවර්ජනය නිසාම උන්වහන්සේ තමන් කළ කිසිදු දෝෂයක් නොමැති බව වැටහී ප්‍රීති ප්‍රමෝදයක් උන්වහන්සේ තුළ ඇති විය. මෙම ප්‍රීතියත් සමඟම උන් වහන්සේ රහත් ඵලය අවබෝධ කර ගත්හ. ගුහා දොරටුවෙහි සිටිමින් ම රහත් වීමට උන්වහන්සේට හැකි විය. රහත් ඵලයට පත් තිස්ස තෙරණුවෝ යකින්නට මෙසේ පැවසූහ. "මා වැනි ශීලාදී ගුණයෙන් පිරිසුදු වූ භික්ෂුවකට ඔබ වැරදි ලෙස චෝදනා කළෙහිය. එය පාප කර්මයකි. යළිත් එබඳු දේ නොකරන්න. මා මේ ගුහාවෙහි වාසය කරන්නේ වස් තුන් මාසය අවසන් වන තෙක් පමණි. ඉන් පසු මම ජේතවනාරාමයට යන්නෙමි."

වස් කාලයෙන් පසුව උන් වහන්සේ ජේතවනාරාමයට පැමිණ එහි වාසය කළේය. මේ සිද්ධිය අනෙක් භික්ෂූන් වහන්සේලාට ද දැන ගන්නට ලැබිණ. උන්වහන්සේලා තිස්ස තෙරුන් අමතා "යකින්නගේ ක්‍රියා කලාපයෙන් ඔබ කෝපයට පත් නොවූයෙහිදැ"යි විමසූහ. තමන් කෝපයට නොපත් බව තිස්ස තෙරණුවෝ පැවසූහ. සෙසු භික්ෂූන් වහන්සේලා මෙම පුවත බුදුන් වහන්සේට ද පවසා "තිස්ස තෙරුන් වහන්සේ යකින්නගේ තර්ජනයෙන් කෝපයට නොපත් බව පවසති. එය සත්‍යයක්දැ"යි බුදුන් වහන්සේගෙන් විමසූහ. "මහණෙනි, තිස්ස සත්‍යයක්ම පවසයි. ඔහු ඇත්තටම රහත් බවට පත් භික්ෂුවකි. තව දුරටත් හෙතෙම කිසිවකට ඇලුම් කරන්නෙක් නොවේ. කිසිවකු සමඟ කෝපවීමට ඔහුට කරුණක් නැතැ"යි බුදුන් වහන්සේ පැවසූහ.

විවරණාත්මක අනුවාදය (404 ගාථාව)

ගහට්ඨෙහි අනාගාරෙහි ච උභයං අසංසට්ඨං
අනොකසාරිං අප්පිච්ඡං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

ගහට්ඨෙහි: ගිහියන් සමග ද; **අනාගාරෙහි ච**: ගිහිගෙයින් නික්මුණාවුන් ද (යන); **උභයං**: දෙපිරිසම සමඟ; **අසංසට්ඨං**: නොගැටුණු; **අනොකසාරිං**: ඇලුම් නැතිව හැසිරෙන; **අප්පිච්ඡං**: අපිස් බවින් යුත්; **තං**: එම පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි** පවසමි.

ගිහි පැවිදි දෙපක්ෂය සමඟම ඇලුම් ගැටුම් නැති කිසිවක් කෙරෙහි බලාපොරොත්තු නැතිව හැසිරෙන, අල්පෙච්ඡ ගුණයෙන් යුත් පුද්ගලයාම බ්‍රාහ්මණයකැයි මම පවසමි.

විවරණය

භික්ෂූන් හා භූතාත්මයන් අතර සිදු වූ ඇතැම් ප්‍රවෘත්ති පිළිබඳව බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වෙයි. භික්ෂූන් වහන්සේලා තම භාවනා කටයුතු සඳහා වනගත පෙදෙස්, සුසානභූමි වැනි ජනශූන්‍ය තැන් තෝරා ගන්නේ නිහඬ පරිසරයක භාවනා කිරීම ප්‍රතිඵලදායක බැවිනි. එබඳු තැන්වල භූතාත්ම අරක් ගෙන ඇති බව කියැවෙයි. භික්ෂූන් එබඳු තැන්වල භාවනා කිරීමේ දී නොයෙක් භූතයන්ගෙන් ඇතිවන හිරිහැරවලින් මිදීම සඳහා කරණීය මෙත්ත සූත්‍රය බුදුන් වහන්සේ විසින් දේශනා කොට ඇති බව කියැවෙයි. සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රිය පැතිරවීම කරණීය මෙත්ත සූත්‍රයෙන් බලාපොරොත්තු වෙයි. එසේ මෛත්‍රී සිත සව් සතුන් කෙරෙහි පතළ කොට හරින විට භූතාදීන් සතුටට පත්ව භික්ෂූන්ට හිරිහැර නොකරන බවට විශ්වාස කෙරෙයි.

තැතිගැනුම් සහිත වූ ද රහිත වූ ද සතුන් නො නසන නො නසවන තැනැත්තා බ්‍රාහ්මණයා ය.

405. නිධාය දණ්ඩං භූතෙසු
තසෙසු ථාවරෙසු ච
යො න හන්ති න ඝාතෙති
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:23)

බිය ගත් සහ බිය නොගෙන සිටින්නේ
සතුන්ට හිංසාවක් නොකරන්නේ
නො නසන්නේ සහ නොම මරවන්නේ
වී නම් හේ බමුණැයි පවසන්නේ

අන් අය නොපෙළන කිසිසේ - කෙනෙකුට බමුණායි පැවසේ

26 (22) තෙර කෙනකුන්ගේ හා කාන්තාවකගේ කථා පුවත (ගාථා 405)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි **එක්තරා තෙර කෙනකුන්** අරභයා මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

කිසියම් තෙර කෙනකුන් වහන්සේ භාවනාව සඳහා කමටහන් ද ලබා ගෙන වන පියසකට පිවිස අප්‍රමාදීව ධ්‍යාන සමාපත්ති හා මාර්ගඵල ලබා ගැනීම සඳහා උනන්දුවෙන් භාවනා කටයුතුවල යෙදී නොබෝ දිනකින් රහත්ඵලයට පැමිණියහ. එසේ රහත් භාවයට පත් උන්වහන්සේ තමන්ගේ අධිගමය බුදුරජාණන් වහන්සේට දන්වන්නෙමැයි අදහස් කළහ.

එබැවින් වන පියසින් පිටත්ව බුදුන් වැඩ සිටින ආරාමයට පැමිණීම සඳහා උන්වහන්සේ ගමන් ඇරඹූහ. උන්වහන්සේ වඩිනා අතර මගදී කිසියම් කාන්තාවක් තම සැමියා සමග ආරාවුලක් ඇති කොට ගෙන ඔහු නැති විටෙක සැමියාගේ නිවසින් පිටත්ව තම මවුපියන්ගේ නිවස කරා යාමට මගට පිළිපන්නාය. ඕ තොමේ මඟ වඩිනා තෙරුන් වහන්සේ දැක උන්වහන්සේට කිට්ටුවෙන්ම යාම මැනවැයි සිතා උන්වහන්සේ පිටුපසින් ගමන් කළාය. එහෙත් තෙරුන් වහන්සේ ඒ කිසිවක් නොදැන සිටියහ.

මෙම කාන්තාවගේ සැමියා නිවසට පැමිණ බිරිය නැති බව දැන ඇය තම මවුපියන් සොයා යන්නට ඇතැයි සිතා ඇය සොයා ගන්නා අරමුණින් නිවසින් පිටත් වූයේ ය. හෙතෙමේ ද ඒ මගෙහිම ගමන් ගත් බැවින් ඈතින් තම බිරිය ගමන් කරනු දුටුවේය. එසේ දැක ඔහු මෙසේ සිතීය. "ඇය මේ බියකරු වන බිමෙහි තනිවම නොයනු ඇත. එබැවින් ඇය තවත් කවරකු හෝ සමඟ යා යුතුය." මෙසේ සිතූ හෙතෙම ඉක්මනින් ඇය පසු පසින් ගොස් ඉදිරියෙන් යන තෙරුන් වහන්සේ දැක්කේය.

"මාගේ බිරිය රැගෙන පළා යන්නේ මේ භික්ෂුව විය යුතුය"යි සිතූ හෙතෙම තෙරුන් වෙත එළඹ තර්ජනය කළේය. එවිට ඔහු ගේ බිරිඳ "මේ යහපත් භික්ෂුවකි. හෙතෙම මා දෙස හැරී බැලුවේ වත් නැත. එතුමා එතුමාගේ පාඩුවේ යන්නේය"යි පැවසූවාය. "තී කියන්නේ තී තනිවම මෙසේ නිවසින් පිටව ආවා කියා ද? එය එසේ විය නොහැකිය. තී මොහුගේ බසට අවනතව මෙසේ ආ බව මම දනිමි. මොහුට මම හොඳ පාඩමක් උගන්වමි"යි පැවසූ සැමියා තෙරුන් වහන්සේට පහර දුන්නේය. එසේ පහර දී බිරිය ද රැගෙන ආපසු නිවස බලා ගියේ ය.

පහර කෑම නිසා තෙරුන් වහන්සේගේ සිරුර පුරා තුවාල වී තිබිණ. විහාරයට ගිය පසු අනෙක් භික්ෂූන් වහන්සේලා උන් වහන්සේගෙන් එසේ සිරුරෙහි තුවාල ඇති වීමට හේතුව විමසූහ. තෙරුන් වහන්සේ සියලු පවත් දැන්වූහ. "ආයුෂ්මත්නි ඒ මිනිසා ඔබ වහන්සේට මෙසේ පහර දුන් විට ඔබ වහන්සේ පැවසුවේ කුමක් ද? ඔබ තරහ නොගත්තෙහිද?" භික්ෂූහු ඇසූහ. "නැත මම කිසිවක් නොකීමි. තරහ ද නොගත්තෙමි" තෙරණුවෝ පිළිතුරු දුන්හ. අනතුරුව භික්ෂූන් වහන්සේලා ඒ බව බුදුරජාණන් වහන්සේට සැළ කළහ. "මහණෙනි, කෙලෙසුන් නසා රහත් වූ තැනැත්තේ කිසිවකින් කම්පාවට නොපැමිණෙයි. හෙතෙම කෝපයට පත් වන්නේ ද නැතැ"යි පැවසූ බුදුන් වහන්සේ ඉහත සඳහන් ගාථාවෙන් ධර්මදේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (405 ගාථාව)

යො තසෙසු ථාවරෙසු ච භූතෙසු දණ්ඩං නිධාය න හන්ති න ඝාතෙති තං අහං බ්‍රාහ්මණං බ්‍රෑමි.

යො: යමෙක්; **තසෙසු**: තැති ගන්නා වූ ද; **ථාවරෙසු**: තැති නො ගන්නා වූ ද; **භූතෙසු**: ප්‍රාණීන් කෙරෙහි; **දණ්ඩං**: දඬු මුගුරු; **නිධාය**: අත්හැර දමා; **න හන්ති**: පහර නොදෙයි ද; **න ඝාතෙති**: ඝාතනය නොකරයි ද; **තං**: එබඳු තැනැත්තා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

යමෙක් බියගුළු සත්වයන් කෙරෙහි මෙන්ම බිය රහිත සත්වයන් කෙරෙහිද මෛත්‍රියෙන් දඬු මුගුරු ඉවත දමා ඔවුන් නොපෙළයි ද ඝාතනය නොකරයි ද එබඳු තැනැත්තා බ්‍රාහ්මණයෙකැයි පවසමි.

විවරණය.

තසෙසු: බියට පත්වන දැඩි ආත්ම ශක්තියක් නැති දුර්වල සත්ව විශේෂ ගැන මෙයින් කියවෙයි.

ථාවරෙසු: කාමාදී කෙලෙසුන් හැර දමා අකම්පන තත්වයට පත් වන රහතන් වහන්සේලා වැනි ස්ථාවර පුද්ගලයන් මෙයින් අදහස් වෙයි.

සතුරු වූවන් අතරැ සතුරු නො වූ ද සතුන් නො නසන නො නසවන තැනැත්තා බ්‍රාහ්මණයා ය.

406. අවිරුද්ධං විරුද්ධෙසු
අත්තදණ්ඩෙසු නිබ්බුතං
සාදානෙසු අනාදානං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:24)

විරුද්ධවාදීන් අතරෙහි අවිරුද්ධවූ
හිංසාකාරීන් අතරෙහි අවිහිංසකවූ
ගන්නන් අතරෙහි නොගන්නෙක් වූ
තැනැත්තේම බමුණෙකැයි පවසමි

සතුරන් අතුරෙහි මිතුරෙක් වන්නේ බමුණායි

26 (23) සාමණේරයන් වහන්සේලා සතර දෙනෙකු ගේ කතා පුවත (ගාථා 406)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙමින් සාමණේරයන් වහන්සේලා **සතර නමක** අරභයා මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

කිසියම් බ්‍රාහ්මණයකුගේ භාර්යාව භික්ෂූන් සතර දෙනෙකුට ආහාර පිළියෙල කොට බමුණා අමතා "යන්න විහාරයට ගොස් මහළු බමුණන් සතර දෙනකු තෝරා ගෙන ගෙදරට කැටුව එන්නය"යි පැවසුවාය. බමුණා විහාරයට ගොස් රහත් පදවිය ලත් සත් හැවිරිදි සාමරෙණ්රයන් වහන්සේලා සතර නමක් කැටුව ගෙදරට පැමිණියේ ය. ඒ සාමණේරයන් වහන්සේලා නම්, සංකිච්ච, පණ්ඩිත, සොපාක හා රේවත යන සිවු නමයි. නිවසට පැමිණෙන සාමණේරවරුන් සිවු නම දුටු වනම බැමිණිය තරහෙන් පිපිරෙමින් බමුණාට බැණ වැදුනාය. "ඔබ විහාරයට ගොස් ඔබේ මුණුබුරන්ට ද වඩා වයස අඩු සතර දෙනෙකු තෝරාගෙන පැමිණියෙහි ය"යි කියමින් ඇය සාමණේරවරුන් තමා පිළියෙල කළ වටිනා අසුන්හි හිඳුවීමට නොකැමැති වූවාය. නමුත් තත්වයෙන් බාල අසුන් සතරක් පිළියෙල කොට "මෙහි හිඳගන්නැ"යි සාමණේරවරුන්ට තරහින්ම කීවාය. එසේ කියා යළිත් විහාරයට ගොස් මහලු බමුණන් කිහිප දෙනකු ගෙන එන්නැයි බමුණාට දැන්වූවාය. බමුණා ආරාමයට යළිත් ගොස් එහිදී සැරියුත් හිමියන් දැක එහිමියන් ද සමඟ නිවසට පැමිණියේ ය. උන්වහන්සේ නිවසට පැමිණි විට සාමණේරවරුන් දැක"මේ බ්‍රාහ්මණයන් ගෙන් ආහාරය ලබා ගත්තේ නැත්දැ"යි විමසූහ. නැතැයි බමුණා පිළිතුරු දුන්නේ ය. සැරියුත් හිමියෝ ආහාරය සතර දෙනකුන්ට පමණක් පිළියෙල කොට ඇති බව දැන තම පාත්‍රය බමුණාගෙන් ඉල්වා ගෙන දානය නොගෙනම ආපසු වැඩම කළහ. එවිට බැමිණිය මෙසේ කීවාය. "උන්වහන්සේ අහර ගැනීමට කැමති නැතිවා විය හැකිය. එබැවින් විහාරයට ගොස් වෙනත් කෙනකු කැඳවා ගෙන එන්න." බමුණා නැවතත් විහාරයට ගොස් මුගලන් හිමිපාණන් දැක උන්වහන්සේ වැඩමවා ගෙන නිවසට පැමිණියේය. සාමණේරවරුන් දුටු උන්වහන්සේ ද සැරියුත් හිමියන් ඇසූ පරිද්දෙන්ම අසා පාත්‍රයද රැගෙන ආපසු වැඩම කළහ. ඒ භික්ෂුවද අහර ගැනීමට කැමැති නැතිවා විය හැකිය. දැන් බමුණන් සිටිනා තැනකට ගොස් කවර හෝ බමුණකු රැගෙන එන්නැයි බැමිණිය බමුණාට පැවසූවාය. මේ සියල්ල දැනගත් ශක්‍රදේවේන්ද්‍රයා වැරහැලි හැඳගත් මහලු බමුණකුගේ වෙස් ගෙන බ්‍රාහ්මණයන් නිවසන සීමාවට වී සිටියේ ය. බමුණා එහි යනවිට මේ මහලු බමුණා දැක තම බිරිය මේ බමුණාට නම් කැමති වනු ඇතැයි සිතා ඒ බමුණාද කැටුව නිවසට ගියේ ය. බැමිණිය ඔහු දුටු වනම බෙහෙවින් සතුටට පත් වූවාය. ඕ තොමෝ වහා වටිනා අසුන ඔහු වෙනුවෙන් වෙන් කොට "ස්වාමීනි, වඩිනු මැනව, මෙහි හිඳුනු මැනව"යි කීවාය. මහළු බමුණු වෙසින් සිටි ශක්‍රයා නිවසට පිවිස හෙරණපාණන් සතර දෙනාට පසඟ පිහිටුවා වැඳ නමස්කාර කොට උන්වහන්සේලාගේ අසුන් කෙළවර වාඩි වූයේය. බැමිණිය මෙය දැක තම ස්වාමියාට මෙසේ කීවාය. ඔබ ඇත්තටම බමුණෙක් ද ගෙන ආවේ? ඔබේ පියාට ද වඩා මහලු වූ බමුණකු රැගෙන මෙවර ඔබ ආවෙහිය. ඒ බමුණා ඔහුගේ මුණුබුරන්ටද වඩා බාල වූ තෙරණුන්ට වැඳ නමස්කාර කළේය. ඔහුගෙන් අපට ඇති ඵලය කිමෙක්ද? ඔහු පළවා හරින්න. එවිට බ්මුණා මහළු බමුණාගේ අතින් පයින් ඇද ඔහු හුන් තැනින් ඇද දැමීමට උත්සාහ කළේ ය. නමුත් බමුණු වෙසින් සිටි ශක්‍රයා හිඳි තැනින් ඉවත් නොවූයේ ය. එවිට බැමිණිය බමුණාට කථා කොට "ඔබ ඔහු ගේ එක් අතකින් අදින්න. මම අනෙක් අතින් අදින්නෙමැයි කීවාය." දෙදෙනාම එක්ව මහළු බමුණාගේ දැතින් ඇද නිවසින් එළියටම දැම්මාහු ය. බමුණා හා බැමිණිය මහළු බමුණා එළියට ඇද දමා නිවස තුළට පැමිණ බලන විට මහළු බමුණා සිටි තැනම ඔහු සිටින සැටි දුටුවාහුය. එයින් ඔවුහු බෙහෙවින් බියට පත්ව කෑමොර දෙන්නට වූහ. එවිට ශක්‍රයා තමාගේ නියම ස්වරූපය පෙන්වා සිටියේ ය. අනතුරුව බමුණා හා බැමිණිය ආගන්තුකයන් පස් දෙනාටම ආහාරයෙන් සංග්‍රහ කළහ. පස් දෙනාම ආහාර රැගෙන පිටත්ව ගියහ. එසේ යාමේ දී එක් හෙරණුන් දෑ කෙනෙක් ගෙහි කැණිමඩල පලා ගෙන අහසින් ගියහ. තව කෙනෙක් ගෙහි ඉදිරි පියස්ස පලා ගෙන පිටත්ව අහසින් වැඩම කළහ. වෙනත් කෙනෙක් පියස්සෙහි පසු පසින් එය බිඳ ගෙන අහසට පැන නැංගේය. සිවුවැන්නා පොළොව පලාගෙන ගෙයින් පිටත් වූහ. ශක්‍රයා වෙනත් මගකින් ගියේ ය. එතැන් පටන් එම නිවස විවර පසක් ඇති නිවසයයි ප්‍රසිද්ධ විය. සාමණේරවරු සිවුදෙනා විහාරයට පැමිණියහ. භික්ෂූන් සිදුවීම අසා "කෙසේ ද බැමිණියගේ ක්‍රියා කලාපයෙන් කෝපයට පත් නොවාහුදැ"යි විමසු විට තමන් කෝප නොවු බව සාමණේරවරු පැවසූහ. මේ පුවත බුදුරදුන්ට සැල වූ විට උන්වහන්සේ ප්‍රකාශ කළේ හෙරණුන් කෝපයට පත් නොවු බව කීම සත්‍යයක් බවය. එහිදී උන්වහන්සේ "මහණෙනි, කෙලෙසුන් ගෙන් වෙන් වූ රහතන් වහන්සේලා අවලාදයන්ට නොකිපෙන බවත් උන්වහන්සේලා විරුද්ධවාදීන් අතර විරුද්ධ කම් නොමැතිව වෙසෙන බවත්ය".

විවරණාත්මක අනුවාදය (406 ගාථාව)

විරුද්ධෙසු අවිරුද්ධං අත්තදණ්ඩෙසු නිබ්බුතං
සාදානෙසු අනාදානං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

විරුද්ධෙසු: විරුද්ධවාදීන් අතුරෙහි; **අවිරුද්ධං**: විරුද්ධ කම් නොමැති වූ; **අත්තදණ්ඩෙසු**: දඬු ගත්තවුන් අතුරෙහි; **නිබ්බුතං**: නිවීමෙන් යුතුවු; **සාදානෙසු**: (පඤ්චස්කන්ධය මමය මාගේය යයි) ගැනීම් ඇත්තවුන් අතුරෙහි; **අනාදානං**: ගැනීම් වලින් තොරවු; **තං**: එම පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

විරුද්ධ අදහස් අය අතරෙහි මෛත්‍රියෙන් යුක්තව දඬුමුගුරු ගෙන කලහකරන්නවුන් අතරෙහි නිසලව සන්සුන්ව සිටින දැඩි බැඳීම් ඇත්තන් අතුරෙහි එසේ බැඳීම් නැතිව සිටින පුද්ගලයා බ්‍රාහ්මණයෙක් වෙයි.

රාගය හා ද්වේෂය ද, මානය හා ගුණමකු බව ද, නැසූ තැනැත්තා බ්‍රාහ්මණයා ය.

407. යස්ස රාගො ච දොසො ච
මානො මක්ඛො ච පාතිතො
සාසපොරිව ආරග්ගා
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:25)

රා දොස් නැත්ද යමෙකුට
මාන මකුබව මකා දැම්මේ
අබැටැක් ලෙසින් හිඳි තුඩ
ඔහුට බමුණැයි කියන්නේ මම

සියලු කෙලෙසුන් දුරලූයේ ය බමුණා

25 (24) මහා පන්ථක තෙරුන්ගේ කථාව (ගාථා 407)

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මහා **පන්ථක තෙරුන්වහන්සේ** අරභයා මෙම ගාථා ධර්මය දේශනා කළ සේක.

චුල්ල පන්ථක තෙරුන්ට තෙමසක් තුළ එක් ගාථා ධර්මයක්වත් කටපාඩමින් මතක තියා ගැනීමට බැරිවීම නිසා මහාපන්ථක තෙරුන් වහන්සේ "ධර්මානුශාසනා ලැබීමේ හැකියාවක් ඔබට නැත. ගෘහ ජීවිතයේ සැප පහසුකම් ලැබීමේ වාසනාවද ඔබට නැත. එබැවින් තව දුරටත් මේ අරම තුළ විසීමෙන් ඇති ඵලය කිමෙක්දැයි පවසමින් චුල්ල පන්ථක තෙරුන් තම අරමින් නෙරපා හළහ. මේ පුවත භික්ෂූන් අතර සාකච්ඡාවට බඳුන් විය. "දුසිරිත් දුරු කළ උතුමන් අතර ද ඇතැම් විට තරහව ඇතිවිය හැකි බව මේ සිද්ධියෙන් පෙනේය"යි ඇතැම් භික්ෂුවක් පැවසූ හ. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් මෙසේ සාකච්ඡා කරන තැනට පැමිණ ''මහණෙනි, කවර නම් කථාවකින් යුතුව හුන්නහුදැයි ඇසූ විට සිද්ධිය උන්වහන්සේලා බුදුරජාණන් වහන්සේට දැන්වූහ. "මහණෙනි, කෙලෙසුන් දුරු කළ රහතුන් වහන්සේලාට රාග දොෂාදී සිතුවිලි පහළ නොවේය"යි පවසමින් බුදුරජාණන් වහන්සේ මේ ගාථා ධර්මයෙන් ධර්ම දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (407 ගාථාව)

යස්ස රාගො ච දොසො ච මානො මක්ඛො ච ආරග්ගා
සාසපො ඉව පාතිතො තං අහං බ්‍රාහ්මණං බ්‍රෑමි.

යස්ස: යමෙකුගේ; **රාගො ච**: රාගය ද; **දොසො ච**: ද්වේෂය ද; **මානො**: මානය ද; **මක්ඛො ච**: මකු බව ද; **ආරග්ගා**: ඉදි කටු තුඩෙන්; **සාසපො ඉව**: ඇබ ඇටයක් මෙන්; **පාතිතො**: හෙළා දමනු ලද්දේ ද; **තං**: එබඳු තැනැත්තා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

රාග දොස, මාන මකුබව ආදී දුසිරිත් යමෙකුගේ සිතෙන් ඉදිකටු තුඩකින් අබ ඇටයක් ගිලිහී යන්නාක් මෙන් ගිලිහී ගියේ ද එබඳු පුද්ගලයා නියම බ්‍රාහ්මණයෙකැයි පවසමි.

විවරණය

දෙසොහොයුරු තෙරුන්ගේ කතා පුවත: මහා පන්ථක හා චුල්ල පන්ථක යනු සොහොයුරෝ දෙදෙනෙකි. මේ දෙදෙනා ම මහ මග උපන් හෙයින් පන්ථක යන නම ඔවුනට ලැබිණ. විවිධ රූප නිර්මාණය කොට දැක්වීමේ ප්‍රාතිහාර්ය බලය නිසා චුල්ල පන්ථක තෙරුන් වහන්සේ අන් සියලු රහතන් වහන්සේලා අතුරෙන් ඒ සම්බන්ධයෙන් අග්‍රස්ථානයට පත් වූහ.

මහාපන්ථක හා චුල්ලපන්ථක යන දෙදෙනා ධනවත් සිටුවරයකු ගේ දියණිය පියාගේ සේවයකු සමඟ අසම්මත විවාහයකට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් බිහි වූ දරු දෙදෙනෙකි. සිටු දියණිය සේවකයා සමඟ පළා ගොස් ඇයට පළමු දරු උපත ලැබීමට ආසන්නයේ සිට දෙමාපියන් හමුවට යාමේ දී අතර මගදී දරු උපත සිදුවිය. දෙවැනි දරුවාගේ උපත සිදු වූයේ ද එසේමය. එබැවින් ඔවුනට පන්ථක යන නම යොදනු ලැබිණ, වැඩිමලා මහා පන්ථක යනුවෙන් ද බාලයා චුල්ල පන්ථක නමින් ද ප්‍රකට විය. දරුවන් මහ මඟ දී ලද බැවින් සිටු දියණියට මව්පියන් බැලීමට යාමේ අවස්ථාවක් නොලැබිණ.

මහා පන්ථක බුදු සසුනෙහි පැවිද්ද ලබා ගත්තේය. තම මළණුවන්ට ද එම භාග්‍යය උදා කරලීමට කැමැති වූ හෙතෙම මළණුවන් ද පැවිදි කරවා තම ආරාමයෙහිම විසීමට සැලැස්වීය. නමුත් චුල්ල පන්ථකට ගාථා කටපාඩම් කර ගැනීමේ හැකියාවක් නොතිබිණ. හෙතෙම ස්මරණ ශක්තියෙන් දුර්වල විය. චුල්ල පන්ථකට එක් ගාථාවක් කට පාඩම් කර ගැනීමට තෙමසක කාලයක් දුන් නමුදු එම ගාථාව පාඩම් කර ගැනීමට හෙතෙම අපොහොසත් විය. මේ නිසා මහා පන්ථක තෙරණුවෝ සිය සොහොයුරු පැවිද්දෙහි සිටීමේ පලක් නැතැයි සිතා ආරාමයෙන් පිටමං වන ලෙස ඔහුට පැවසූහ.

චුල්ලපන්ථක තෙරණුවෝ සොහොයුරාගේ මේ ක්‍රියාවෙන් බෙහෙවින් දුකට පත්ව ආරාමයෙහි කිසියම් තැනකට වී හඬමින් සිටියහ. මේ අවස්ථාවෙහි මහ පන්ථක තෙරුන් වහන්සේ ජීවක වෛද්‍යවරයාගේ නිවසෙහි දානය සඳහා බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට එහි වැඩම වීමට කටයුතු පිළියෙල කරමින් සිටියහ.

බුදුරජාණන් වහන්සේ චුල්ලපන්ථක තෙරූන් හඬමින් සිටින තැනට පැමිණ ඉතා පිරිසිදු රෙදි කඩක් ඔහු අතට දී එය පිරිමදිමින් රජොහරණං යනුවෙන් කියමින් භාවනා කිරීමට උපදෙස් දුන්හ.

චුල්ලපන්ථක තෙරුන් රෙදිකඩ එසේ පිරිමදින විට ඉතා පිරිසිදු වු රෙදිකඩ ක්‍රමයෙන් කිළිටි බවට පත් වන්නට විය. ඔහුගේ අත්ලෙහි තිබු දුවිලි සුදු පැහැති රෙදි කඩෙහි ඇතිල්ලීම නිසා එසේ විය. සුදු පැහැති රෙදි කැබැල්ල කිළිටු පැහැගැන්වීම කෙරෙහි සිත මෙහෙය වූ චුල්ල පන්ථක හිමියන්ට අනිත්‍යතා ධර්මය ක්‍රමයෙන් පැහැදිලි වන්නට විය. අනිත්‍යය මෙනෙහි කිරීම නිසා වස්තූන්ගේ යථාර්ථය දකිමින් චුල්ලපන්ථක තෙරණුවෝ රහත් පලයෙහි පිහිටියහ. එකෙණෙහිම උන්වහන්සේට සෘද්ධිවිධ ඥානය ද පහළ විය. මෙම සෘද්ධිවිධ ඥානය තුළින් අනෙකවිධ රූප මවා පෑමට උන්වහන්සේට හැකිවිය.

චුල්ල පන්ථක තෙරුන් හැර විහාරයේ සියලු බුදුපාමොක් මහ සඟන දානය සඳහා වැඩම කොට සිටියහ. දායකයන් දානය බෙදන විට බුදුන් වහන්සේ තම පාත්‍රයට අත පා දන් බෙදීම වැළකූහ. චුල්ලපන්ථක හිමියන් දානයට වැඩම කොට නොසිටීම ඊට හේතුව විය. උන්වහන්සේ වැඩමවාගෙන ඒමට පුද්ගලයකු යවනු ලැබීය. ඔහු ආරාමයට යන විට ආරාමය පුරා එකම ස්වරූපයේ භික්ෂූන් වහන්සේලා දහස් ගණනක් වැඩ සිටියහ. ගිය පුද්ගලයාට චුල්ලපන්ථක තෙරුන් හඳුනා ගැනීමට නොහැකිව ආපසු දානය පැවැති තැනට පැමිණියේ ය. පැමිණ "විහාරයෙහි දහස් ගණනක් එකම විදියේ භික්ෂූහු සිටිති. චුල්ල පන්ථක හිමියන් කවුරුන්දැයි දැන ගැනීමට ක්‍රමයක් නැතිවිය"යි හෙතෙම පැවසීය. ජීවකගේ අනුදැනුමෙන් යළිත් එම පුද්ගලයා විහාරයට යැවිණ. ඔහු ගොස් චුල්ලපන්ථක තෙරුන් වහන්සේ කවුරුන්දැයි විමසා සිටියේ ය. එවිට ඔහුගේ පුදුමයට සියලු භික්ෂූහු තමන් චුල්ලපන්ථකයයි කියා සිටියහ. එවර ද ඔහු හිස් අතින් දානය පැවති තැනට පැමිණ සියලු තතු පැවසීය. එවිට බුදුන් වහන්සේ, "එසේ නම් ඔබ යළිත් විහාරයට ගොස් භික්ෂූන් ලඟින්ම සිට චුල්ලපන්ථක කවුරුන්දැයි අසන විට මුලින්ම තමන් චුල්ල පන්ථක යයි කියන භික්ෂුවගේ අත අල්වා ගෙන චුල්ල පන්ථක හිමියන්ව බුදුන් අපේක්ෂා කරති"යි පවසා ඔහු ද කැටුව එන්නැයි පැවසූහ. පුරුෂයා යළිත් විහාරයට ගොස් බුදුන් කී ලෙසින්ම චුල්ලපන්ථක හිමියන්ද කැටුව දාන ශාලාවට පැමිණයේ ය. සියලු භික්ෂූන් වහන්සේලා දන් වළදා අවසන් වූ පසු බුදුරජාණන් වහන්සේ චුල්ලපන්ථක හිමියන්ට අනුමෙවෙනි බණ දේශනා කිරීමට ද අවස්ථාව සලසා දුන් සේක.

අනුන් කෝප නො කරන රළු නො වූ යහපත් වචන කියන තැනැත්තා බ්‍රාහ්මණයා ය.

408. අකක්කසං විඤ්ඤාපණිං
ගිරං සච්චං උදීරයෙ
යාය නාභිසපෙ කිඤ්චි
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:26)

සුමුදු වූ අරුත් බර
පවසයි ද සැබෑ වදනම
නොකරයි ද දොස් පැවරුම
හෙතෙමේ වේය බමුණා

චෝදනා මුඛයෙන් දොස් නොනඟන්නේ බමුණායි.

26 (25) පිළින්දිවච්ඡ තෙරුන්ගේ කතා පුවත (ගාථා 408)

බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වෙසෙන සමයෙහි **පිළින්දිවච්ඡ තෙරුන්** නිමිති කොට ගෙන මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

මෙම පිළින්දිවච්ඡ තෙරුන් වහන්සේ ගිහිපැවිදි කවරෙකුට වුවද කථා කරන විට බෙහෙවින් පහත් පෙළේ කුලහීනයන්ට යොදන පහත් වචනයෙන් අමතන්නෙකි. "අධමය මෙහි එව, අධමය මෙහි යව" ආදී වශයෙනි. දිනක් භික්ෂූන් වහන්සේලා පිළින්දිවච්ඡ තෙරුන්ගේ මෙම පහත් පුරුද්ද ගැන බුදුන් වහන්සේට සැළ කළහ. උන්වහන්සේ පිළින්දිවච්ඡ තෙරුන් කැඳවා "එය සැබෑවක්දැ"යි විමසූහ. පිළින්දිවච්ඡ තෙරණුවෝ භික්ෂූන්වහන්සේලා ගේ කීම සත්‍යයක් බව පිළිගත්හ.

බුදුරජාණන් වහන්සේ පිළින්දිවච්ඡ තෙරුන්ගේ පෙර විසූ කඳපිළිවෙල සිය නුවණැසින් විමසා බලා ඔහුගේ මෙම ස්වභාවයට හේතුව දැනගත්හ. එබැවින් භික්ෂූන් අමතා මෙසේ ප්‍රකාශ කළ සේක. "මහණෙනි, පිළින්දිවච්ඡ පෙර ආත්ම පන්සියයකම බ්‍රාහ්මණයෙක්ව උපන් අයෙකි. මෙසේ අනුන්ට නින්දා සහගත ලෙස කථා කිරීම මෙම ආත්ම පන්සියයේදීම ඔහු විසින් පුරුදු කරන ලද්දකි. කෙලෙසුන් විනාශ කළ උතුමෝ කිසි දිනෙක රළු පරළු වචන නොකියති. එහෙත් ඔහුගේ භවාන්තර පුරුද්ද නිසා මෙබඳු රළු පරළු වචන කීමට ඔහු පෙළඹී සිටී"

විවරණාත්මක අනුවාදය (408 ගාථාව)

යාය කිඤ්චි න අභිසජෙ අකක්කසං විඤ්ඤාපණිං
සච්චං ගිරං උදීරයෙ තං බ්‍රාහ්මණං අහං බෲමි.

යාය: යම් වචනයකින්; **කිඤ්චි**: කිසිවකු; **න අභිසජෙ**: කුපිත නොකරේ ද; **අකක්කසං**: කර්කශ නොවූ; **විඤ්ඤාපණිං**: අර්ථවත්; **සච්චං ගිරං**: සත්‍ය වූ වචන; උදීරයෙ: (යමෙක්) කියන්නේ ද; **තං**: එබඳු වූ පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බ්‍රාහ්මණයෙකැයි; **අහං**: මම; **බෲමි**: ප්‍රකාශ කරමි.

මෘදු අර්ථවත් හා සත්‍ය වචන කියන තම වචනයෙන් අනුන්ට රිදුමක් නොදෙන පුද්ගලයා බ්‍රාහ්මණයෙකැයි පවසමි.

විවරණය

පිළින්දිවච්ඡ තෙරුන්ගේ වත: පිළින්දිවච්ඡ සැවැත් නුවර උපන් බමුණෙකි. බුදුන් වහන්සේගෙන් ධර්මය අසා පැහැදී සසුනෙහි පැවිද්ද ලබා ගත්තේය. පුද්ගලයන්ට පහත් විදියෙන් ඇමතීමේ පුරුද්දක් ඔහුට තිබිණ. මේ පුරුද්ද ඔහුට උරුම වුයේ ජාති පන්සියයකම බමුණකුව ඉපිද කුලමානයෙන් විසීම නිසාය. පුද්ගලයෙකු කෙලෙසුන් මුලිනුපුටා දැමුවත් ඔහුගේ පුරුදු අත් නොහරෙන බව කියවෙයි. මෙම පුරුදු වාසනා යනුවෙන්ද ඇතැම්විට හැඳින්වෙයි. එහෙත් බුදුරජාණන් වහන්සේට මෙම පුරුදු කිසිවක් නැත. සියලු පුරුදු සහිත ක්ලේශයන් මුලිනුපුටා දැමීම බුද්ධත්වයේ දී සිදුවෙයි. මේ නිසාම උන්වහන්සේ වාසනාගුණ කිසිවකුත් නැති උතුමකු ලෙස හැඳින්වෙයි. පිළින්දිවච්ඡ හිමියන්ගේ වසල වාදය භික්ෂූන්ට ඉවසන්නට බැරි වූ විට උන්වහන්සේලා එය බුදුරජාණන් වහන්සේට සැළ කළහ.

බුදුරජාණන් වහන්සේ පිළින්දිවච්ඡ හිමියන් පිළිබඳ යථාතත්වය භික්ෂූන් වහන්සේලාට පැහැදිලි කර දුන්හ. රහත්භාවයේ පිහිටි පිළින්දිවච්ඡ තෙරුන් තුළ රාග ද්වේෂාදී කෙලෙස් මල නොපිහිටියේ ය. එහෙත් භවාන්තර පුරුද්ද නිසාම ඔහු ගේ මේ හැසිරීම මෙසේ වියයි භික්ෂූහුද වටහා ගත්හ.

පිළින්දිවච්ඡ හිමියන් නිසා තිප්පිලි වෙළෙන්දෙකුට සිදුවූ අකරතැබ්බයක් පිළිබඳවද සඳහන් වෙයි. දිනක් තිප්පිලි වෙළෙන්දෙක් කරත්තයක් පුරා තිප්පිලි පටවාගෙන වෙළඳාමට ගෙන යමින් සිටියේය. එසේම ඔහු අතේ භාජනයක අමු තිප්පිලි ද විය. ඔහු මෙසේ පහන් දොරින් යන අතර කිසියම් භික්ෂූන් වහන්සේ නමක් ජේතවනාරාම දොරටුවෙහි දී ඔහුට මුණ ගැසිණ. එහිදී උන්වහන්සේ වෙළෙන්දාට, වසලයයි අමතමින් අතේ ඇති භාජනයේ කුමක් තිබේදැයි විමසූහ. මේ වසල වාදය නොරිස්සූ වෙළෙන්දා තරහෙන් භාජනයෙහි ඇත්තේ මී බෙටියයි පැවසීය. තෙරණුවෝද එසේනම් එසේ වේවායි කියමින් යන්නට ගියහ. පසුව වෙළෙන්දාට දක්නට ලැබුනේ භාජනයෙහි හා ගැලෙහි ඇති තිප්පිලි සියල්ල මීබෙටි වී ඇති බවය. වෙළෙන්දා බලවත් ශෝකයට පත් විය.

තිප්පිලි මෙසේ වීමට හේතුව ගැන සිතීමේදී මුලින් දුටු භික්ෂුව නිසා මෙසේ වන්නට ඇතැයි ඔහුට සිතින. මේ අතර ඔහුට කිසියම් යහපත් මිනිසෙක් මගදී මුණ ගැසිණ. වෙළෙන්දා ඔහුට සියල්ල පැවසූ විට ඒ හමුවූයේ පිළින්දිවච්ඡ තෙරුන් වහන්සේ බවත් උන්වහන්සේ මහරහතුන් වහන්සේ කෙනෙකු බවත් මෙය යළිත් නිවැරදි කර ගැනීමට ඇති එකම මාර්ගය උන්වහන්සේ මුණගැසීම බවත් ඒ යහපත් මිනිසා වෙළෙන්දාට පැවසීය. වෙළෙන්දා පසුදින පහන්දොර පෙරසේම තිප්පිලි ගැලෙහි පටවාගෙන ජේතවනාරාම දොරටුව ඉදිරියෙන් යමින් සිටියේය. පිළින්දිවච්ඡ තෙරණුවෝ එදින ද පෙර පරිද්දෙන්ම විමසූහ. එවිට වෙළෙන්දා මේවා තිප්පිලියයි පැවසීය. "මැනවි එය එසේම වේවායි" උන්වහන්සේ වෙළෙඳාට කීහ. පසුව වෙළෙනන්දා භාජනය හැර බැලූ විට සියලු මී බෙටි යළිත් තිප්පිලි වී ඇති සැටි දුටුවේය. එහෙයින් ඔහු බෙහෙවින් සතුටට පත්විය.

පිළින්දිවච්ඡ තෙරණුවෝ මහරහතන් වහන්සේ කෙනෙකු පමණක් නොව බුදුන් වහන්සේ විසින් දෙවියන් ප්‍රිය කරන තෙරුන්වහන්සේලා අතුරෙන් අග්‍රස්ථානයෙහි පිහිට වූ ශ්‍රාවක භික්ෂූන් වහන්සේ ද වූහ.



දික් වූ කෙටි වූ කුඩා වූ මහත් වූ යහපත් වූ නපුරු වූ හා අන්සතු දෑ නො ගන්නා තැනැත්තා බ්‍රාහ්මණයා ය.

409. යොධ දීඝං ච රස්සං වා
අණුං ථූලං සුභාසුභං
ලොකෙ අදින්නං නාදියති
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:27)

යමෙක් දික් හෝ කෙටි
කුඩා ලොකු හොඳ නරක
නුදුන් දේ නොගන්නේ ද
බමුණෙක් වේය හෙතෙමේ

සොරකම් නොකරන්නා බමුණෙකි.

26 (26) සොරකු ලෙස චෝදනා ලද භික්ෂුවකගේ කථාව (ගාථා 409)

සැවැත් නුවර කිසියම් මිථ්‍යාදෘෂ්ටික **බ්‍රාහ්මණයෙක්** දිනක් දහඩියෙන් තම ඇඳුම කිළිටි වේ යයි සිතා එය පසෙකින් දමා තම වැඩපලෙහි නිරත විය.

මෙ අවස්ථාවෙහි මේ නිවස අසලින් ගිය රහතන් වහන්සේ නමක් අයිතිකරුවකු නැතිව මෙන් පසෙක දමා තිබූ වස්ත්‍රය දැක අයිතිකරුවකු ද පෙනෙන්නට නොසිටි නිසා එය ඉවත දැමූ රෙදි කඩක් යයි සිතා පංශුකූල චේතනාවෙන් එය රැගෙන ගියහ. බමුණා තම ඇඳුම රැගෙන භික්ෂුවක් යන ආකාරය දුටුවේය. හෙතෙම භික්ෂුව පිටු පසින් ගොස් ඔහුට සමීපව "ඔබ මගේ ඇඳුම සොරකම් කරගෙන යන්නෙහිය"යි පැවසීය "බමුණ මෙය ඔබගේ ඇඳුම ද? අයිතිකරුවකු නැති ඉවත දැමූ රෙදිකඩකැයි සිතා මම රැගෙන ආමි. මෙය ඔබේ නම් ගනුව"යි කියමින් භික්ෂුව එම ඇඳුම බමුණාට දුන්නේ ය. භික්ෂූන් වහන්සේ විහාරයට ගොස් මෙම සිදුවීම අන් භික්ෂූන්ට ද පැවසූහ.

භික්ෂූන් වහන්සේලා මේ සිද්ධිය අසා එය විහිළුවට ගෙන "කෙසේද ඔබ ගත් ඒ රෙදිකඩ කුඩාද? දිගද, මට සුමුටුද, රළු ද" ආදී වශයෙන් ඇසූහ. "ආයුෂ්මත්නි, එය ලොකු ද, කුඩා ද, හොඳද, නරකද කියා විමසීමට මට කිසිදු උවමනාවක් නැත මගේ ඒ ගැන උනන්දුවක් නැතැ"යි එම භික්ෂුව පිළිතුරු දුන්නේ ය. අනෙක් භික්ෂූන් වහන්සේලා එය අසා මේ භික්ෂුව බොරු කියන්නේ යයි සිතා පුවත බුදුන්වහන්සේට සැළ කළහ. "නැත මහණෙනි, ඒ භික්ෂුව කියන්නේ සත්‍යයකි. රාග දොසාදිය දුරු කළ තැනැත්තා කිසිවකට ඇලුම් නැත්තෙකැයි පවසමින් බුදුරජාණන් වහන්සේ ඉහත සඳහන් ගාථා ධර්මය දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (409 ගාථාව)

යො ඉධ ලොකෙ දීඝං වා රස්සංවා අණුං ථූලං වා
සුභාසුභං අදින්නං න ආදියති තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

යො: යමෙක්; **ඉධ ලොකෙ**: මේ ලෝකයෙහි; **දීඝං වා**: දිගු හෝ; **රස්සං වා**: කෙටි වු හෝ; **අණුං**: කුඩා වූ හෝ; **ථූලං**: මහත් වූ හෝ; **සුභාසුභං**: යහපත් හෝ අයහපත් වූ; **අදින්නං**: නොදුන් දෙයක්; **න ආදියති**: නොගනියි ද; **තං**: එබඳු වු පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

මෙලොව යමෙක් දිගු හෝ කෙටි, කුඩා හෝ මහත්, හොඳ හෝ නරක, නොදුන් යමක් (සොරසිතින්) නොගන්නේ ද එබඳු පුද්ගලයා බ්‍රාහ්මණයෙක් වේයයි පවසමි.

විවරණය

බ්‍රාහ්මණයෝ: බුදුරජාණන් වහන්සේ හා උන්වහන්සේගේ ශ්‍රාවකයන් නොයෙක් විට බමුණන්ගේ එදිරිවාදුවට ලක් වූ බොහෝ අවස්ථා ගැන බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වෙයි. ඉහත සඳහන් ගාථා ධර්මයට වස්තුවූ කතා පුවතින් ද එබඳු අවස්තාවක් වාර්තා වෙයි. බුදුන්වහන්සේ හා බ්‍රාහ්මණයන් අතර දාර්ශනික කරුණු සම්බන්ධයෙන් ඇති වූ ගැටුම් මීට වඩා බහුල වශයෙන් දක්නට ලැබෙයි.

මේ එබඳු අවස්ථාවකි. බමුණෝ ඔවුන්ගේ සම්ප්‍රදාය හා අධිකාරය එකම සත්‍යය බවට පිළිගැනීමට් සමාජයට බලකළ පිරිසකි. වරක් උගත් බ්‍රාහ්මණ පිරිසක් බුදුන් වහන්සේ හමුව දිගු සාකච්ඡාවකට මුල පිරූහ. ඒ බමුණන් අතර බෙහෙවින්ම බුද්ධිමතකු ලෙස ප්‍රකටව සිටි කාපටික නම් සොළොස් හැවිරිදි බමුණෙක් බුදුන් වහන්සේට මෙබඳු ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය. "ශ්‍රමණ භවත් ගෞතමයනි බ්‍රාහ්මණයන් සතුව දීර්ඝ කාලයක් තුල අඛන්ඩව පවත්වා ගෙන එන ශුද්ධ වූ ධර්ම ග්‍රන්ථය ඇත. ඒ පිළිබඳව බ්‍රාහ්මණයන් අතර එයම සත්‍යය. අනෙක් සියල්ල මුසාවක් යන දැඩි විශ්වාසයක් තිබේ. ශ්‍රමණ භවත් ගෞතමයන් ඒ ගැන කියන්නේ කිමෙක්ද?" බමුණන් අතර එක් කෙනෙක් හෝ එය ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන එයම සත්‍යයය. අන් සියල්ල අසත්‍යයයි ප්‍රකාශ කරන්නේ ද? බුදුන් වහන්සේ පෙරළා ප්‍රශ්න කළහ.

"නැත ශ්‍රමණ භවත් ගෞතමයිනි"යි කීමට තරම් බමුණු තරුණයා අවංක විය.

"එසේ නම් මේ බමුණන්ගේ ආචාර්යවරයෙක් හෝ ප්‍රාචාර්යවරයෙක් එසේත් නැතහොත් එම ධර්ම ග්‍රන්ථ ප්‍රකාශයට පත් කළ ආදිම ඍෂිවරයෙක් හෝ එසේ ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන ගෙන එය සත්‍යයයි පවසන්නේ ද?"

"නැත ශ්‍රමණ භවත් ගෞතමයෙනි"

එය එසේ නම් බමුණන් පරපුරෙන් පරපුරට මෙයම සත්‍යයය. අන් සියල්ල අසත්‍යයයි පැවසීම එකිනෙකා කණවැල අල්ලාගෙන එන අන්ධපිරිසකට සමානය. මුලින් එන අන්ධයා ද නොදකියි මැදින් එන්නා ද නොදකියි. අවසානයෙහි එන අන්ධයා ද නොදකියි. එබැවින් බ්‍රාහ්මණයන්ගේ එම ප්‍රකාශය අන්ධවෙණි පරම්පරාවක් ලෙස මම දකිමි"යි බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ. මෙසේ පැවසූ උන්වහන්සේ බමුණු පිරිසට ඉතා වැදගත් අනුශාසනයක් කළහ. "මෙයම සත්‍යයය අන් සියල්ල අසත්‍යයයි නිගමණය කිරීම බුද්ධිමතුනට සුදුසු නොවේ."

සත්‍යය පිළිබඳව ප්‍රකාශ කළ යුතු ආකාරය විමසූ තරුණ බ්‍රාහ්මණයාට බුදුරජාණන් වහන්සේ, "මිනිසකුට විශ්වාසයක් තිබේ නම් මෙය මගේ විශ්වාසයයි කීමෙන් එතෙක් හෙතෙම සත්‍යයක් පවසයි. නමුත් විශ්වාසය පදනම් කරගෙන මෙයම සත්‍යයයි. අන් සියල්ල අසත්‍යයයි. ඒකාංශික නිගමණයකින් ප්‍රකාශ කිරීම වැරදිය."





දෙව් ලොව සැප හා මිනිස් ලොව සැප කෙරෙහි ආසා නැත්තා බ්‍රාහ්මණයා ය.

410. ආසා යස්ස න විජ්ජන්ති
අස්මිං ලොකෙ පරම්හි ච
නිරාසයං විසංයුත්තං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:28)

නැද්ද ආසා යමෙකුට
මෙලොව හා පරලොව ගැන
ආසා නැති ඇලුම් නොමැති
කෙනෙක්ම බමුණෙකැයි කියමි.

ආසාවෙන් මිදුනේ බ්‍රාහ්මණයෙකි.

26 (27) වරදවා වටහා ගත් සැරියුත් හිමියන්ගේ කතා පුවත (ගාථා 410)

එක් කාලෙක සැරියුත් මහරහතන් වහන්සේ තමන්ගේ පිරිවර පන්සියයක් භික්ෂූන් ද කැටුව කිසියම් විහාරස්ථානයක වස් විසූහ. උන්වහන්සේ දුටු මිනිස්සු උන්වහන්සේ හා පිරිසට වස් තුන්මස තුළ සියලු අවශ්‍යතා සපුරා දීමට ප්‍රතිඥා කළහ. නමුත් උන්වහන්සේගේ වස්සාන කර්මය පවත්වා අවසන් වනතුරු මිනිස්සු ඇතැම් අවශ්‍යතා සම්පූර්ණ නොකළහ. වස් අවසන්ව උන්වහන්සේ විහාරයට යාමට තීරණය කොට සෙසු භික්ෂූන් වහන්සේලාට මෙසේ කීහ. "දායකවරුන් තරුණ හා නවක භික්ෂූන්ට පරිෂ්කාර ගෙන ආ විට ඒවා පිළිගෙන ඔවුන් ආපසු යවන්න. එසේ නොගෙන ආවොත් ඒ බව මට දන්වා එවන්න."පැවසූ උන්වහන්සේ බුදුන්වහන්සේ වැඩ සිටි විහාරයටගියහ.

භික්ෂූන් වහන්සේලා අතර මේ කාරණය ගැන සාකච්ඡා ඇති විය. ඇතැමෙක් මෙසේ කීහ. "සාරිපුත්ත හිමිපාණන් වහන්සේ තම භික්ෂු පිරිසට පරිෂ්කාර සම්බන්ධයෙන් එසේ පවසා ඇත්තේ තවමත් උන්වහන්සේ තුළ ආශාව පවත්නා බැවිනි." මේ කථාව දැන ගන්නට ලැබුණු බුදුන් වහන්සේ භික්ෂූන් අමතා "නැත මහණෙනි මා පුත් සාරිපුත්තයන්ට එබඳු ආශායක් නැත. හෙතෙමෙ කෙලෙසුන් නැසූ ආර්ය පුද්ගලයෙකි. ඔහු තම පිරිසට එසේ පවසා ඇත්තේ දායකවරුන්ට පිණෙන් හානියක් නොවේවා යන අදහසින් හා තරුණ නවක භික්ෂූන්ට පරිෂ්කාරයෙන් හානියක් නොවේවා යන අදහසින්ය. එසේ නැතිව පරිෂ්කාර කෙරෙහි ආශාවකින් නොවේයයි" පැවසූහ.

විවරණාත්මක අනුවාදය (410 ගාථාව)

යස්ස අස්මිං ලොකෙ පරම්හි ච ආසා න විජ්ජන්ති
නිරාසයං විසංයුත්තං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි.

යස්ස: යමෙකුට; **අස්මිං ලෝකෙ**: මෙලොව (ද); **පරම්හි ච**: පරලොව ද; **ආසා**: ආසාවෝ; **න විජ්ජන්ති**: නො මැත්තේ ද; **නිරාසයං**: තෘෂ්ණා රහිත වූ; **විසංයුත්තං**: කෙලෙසුන් හා සංයුක්ත නොවූ; **තං**: එබඳු පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණකු කොට; **අහං**: මම; **බ්‍රෑමි**: කියමි.

මෙලොව හා පරලොව සම්බන්ධයෙන් යමෙකුට ආශාවක් නොමැත්තේ ද, ආශාවලින් තොර බැඳුම් වලින් මිදුනු පුද්ගලයා බ්‍රාහ්මණයෙකැයි මම පවසමි.

විවරණය

ආසා: යනු තෘෂ්ණාවට නමකි. පුද්ගලයා සසරට බැඳ තබන, පුනර්භවය ඇති කරවන නන්දිරාගයෙන් යුක්ත, ඒ ඒ තැන ඇලෙන මෙම බලවේගය නැති කර දමන තුරු සංසාර විමුක්තියක් ඇති නොවෙයි. මෙම තෘෂ්ණාව කාමයන්හි ඇලීම් ඇති කරවන කාමතණ්හා, පැවැත්ම හෙවත් භවය කෙරෙහි ඇල්ම ඇති කරවන භවතණ්හා සහ නොපැවැත්ම කෙරෙහි ඇල්ම ඇති කරවන විභව තණ්හා යන ත්‍රිවිධ භේදයකින් යුක්තය. ආශාව, රාගය, ප්‍රේමය, තෘෂ්ණාව ආදී නම් වලින් හැඳින්වෙන මෙම චිත්ත වේගය නිසා සියලු ආකාර දුක්ඛයන් ද පුද්ගලයාගේ සංසාර ගමන ද ඇති වෙයි. නමුත් එය මේ සියලු කරුණු පිළිබඳ පළමු හේතුව වශයෙන් නොගත යුතුය. ලොව කිසිම දෙයකට පළමු හේතුවක් දැක්විය හැකි නොවේ. බුදුදහමට අනුව ලොව තුළ පවත්නා සියලු දෙය එකිනෙකට සාපේක්ෂකව ඇති වෙයි. ඔවුනොවුන්ගේ පැවැත්ම ඔවුනොවුන් මත රඳා පවතියි. එය ප්‍රතීත්‍ය සමුත්පන්න පැවැත්මක් ලෙස හැඳින්වෙයි. දුක් ඇති වීමේ හේතුව වශයෙන් දක්වා ඇති තණ්හාවද තවත් හේතු කරණකොට ගෙන ඇති වෙයි. හේතු ප්‍රත්‍ය මත එහි පැවැත්ම ද සිදු වෙයි. තෘෂ්ණාවේ ආසන්න හේතුව වේදනාවය. වේදනාව ස්පර්ශය නිසා ඇති වෙයි. මේ ආදී වශයෙන් චක්‍රීය පැවැත්මක් හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා සියලු වස්තූන්ට ඇත. බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රතීත්‍ය සමුත්පාද (පටිච්ච සමුප්පාද) ධර්මයෙන් දක්වා ඇත්තේ එම ස්වභාවයයි.

තණ්හාව දුක්ඛ සමුදයේ පළමු හේතුව හෝ එකම හේතුව නොවන බව මෙයින් පැහැදිලිය. නමුත් එය බෙහෙවින් ප්‍රබල හා සමීපස්ථ හේතුව වෙයි. එය දුක්ඛ සමුදයේ එකම හෝ පළමු හේතුව නොවන නිසා දුක්ඛ සමුදය විවරණය කරන ඇතැම් සූත්‍රවලදී දුක්ඛ සමුදයේ හේතුව වශයෙන් කිලෙස, ආසය, අනුසය ආදී වශයෙන් තණ්හාවට අතිරේකව දක්වා ඇත.

බුදුදහමට අනුව තෘෂ්ණා (තණ්හා) යන පදයට ඇතුළත් වන්නේ කාම වස්තූන්, ධනය, බලය ආදියට ඇති ඇල්ම පමණක් නොවේ. සිතුවිලි, විශ්වාස මත, සිද්ධාන්ත හා සංකල්ප ආදියට ඇති ඇල්ම ද තණ්හාවටම අයත් වෙයි. ඒවාට ඇති ආශාව හෙවත් තෘෂ්ණාව ධම්ම තණ්හා යනුවෙන් හැඳින්වෙයි. බුදුන් වහන්සේ ගේ ඉගැන්වීම් වලට අනුව දෙදෙනෙකු අතර ඇති වන සුළු අවුලකින් හටගන්නා අර්බුදයකට පමණක් නොව සියලු ආකාර ගැටුම්, ආරාවුල්, සටන්, යුද්ධ හා සංග්‍රාම ආදී මහා විනාශයන් ඇති කරවන තත්වයන්ට හේතු වන්නේ පුද්ගලයා තුළ ඇති මෙම විනාශකාරී බලවේගයයි. එනම් තෘෂ්ණාවයි. මෙය නැති කිරීම සියලු ආකාර දුක්දුරු කිරීමක් වෙයි.



ආසා නැති නුවණින් දැන සැක දුරැලූ අමාමහ නිවනට සැපත් තැනැත්තා බ්‍රාහ්මණයා ය.

411. යස්සාලයා න විජ්ජන්ති
අඤ්ඤාය අකථංකථී
අමතොගධං අනුප්පත්තං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:29)

තණ්හාවෝ නැද්ද කිසිත්
කිසිදැනුමෙන් යුත් නිසැකව
අමා ගඟට එළඹද ඇති
කෙනෙකුට බමුණෙකැයි කියමි.

අමාවෙන් සැනසුනේ බමුණායි

26 (28) මුගලන් මහතෙරුන්ගේ කතා පුවත (ගාථා 411)

සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වෙසෙමින් සිටියදී බුදු රජාණන් වහන්සේ මේ ගාථා ධර්මය මහ **මුගලන් මහතෙරුන් වහන්සේ** අරභයා දේශනා කළ සේක.

මේ ගාථා ධර්මයට වස්තු වූ කථාවද ඉහතින් දක්වන ලද කථා වස්තුවට බෙහෙවින් සමානය. මෙහිදී බුදුරජාණන් වහන්සේ මහ මුගලන් මහතෙරුන් වහන්සේ රාගාදිය දුරු කොට රහත් භාවය ලබා ගත්තකු බව ප්‍රකට කරමින් මේ ගාථා ධර්මය ඉදිරිපත් කළහ.

විවරණාත්මක අනුවාදය (411 ගාථාව)

යස්ස ආලයා න විජ්ජන්ති අඤ්ඤාය අකථංකථී
අමතොගධං අනුප්පත්තං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

යස්ස: යමෙකුට; ආලයා: තෘෂ්ණාවෝ; **න විජ්ජන්ති**: නැද්ද ද; **අඤ්ඤාය**: (බුද්ධාදී අට තැන්) දැන; **අකථංකථී**: (කෙසේ කෙසේදැයි පැවති) සැක නැති; **අමතොගධං**: (නිර්වාණයට බැස) අමා දහරට; **අනුප්පත්තං**: (ඒ නිවනට) පිළිවෙලින් පැමිණියා වූ; **තං**: එබඳු පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

යමෙකුට ආශාවෝ නොපවතිත් ද ප්‍රඥාවෙන් යුක්ත වූ සැකයෙන් තොර වූ අමානිවණට සැපැමිණියා වූ තැනැත්තේ බ්‍රාහ්මණයෙකැයි මම පවසමි.

විවරණය

මහා මොග්ගල්ලාන තෙරුන්ගේ කථාව: සැරියුත් මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ගේ දක්ෂිණ පාර්ශවයෙහි අග්‍රශ්‍රාවකයන් වූ පරිද්දෙන් ම මුගලන් හෙවත් මොග්ගල්ලාන තෙරුන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ වාම පාර්ශ්වයෙහි අග්‍රශාවකයා වූහ. සැරියුත් මුගලන් දෙදෙනාම එකම දිනෙක උපත ලබා ඇති අතර පෙර ආත්ම රාශියක එකට ඇසුරු කළ මිතුරෝ වූහ. රහත් බව ලත් මෙම ජාතියෙහි ද දෙදෙනා එකට ඇසුරු කරමින් සත්‍යය සොයමින් එක්ව ක්‍රියා කළ දෙදෙනෙක් වූහ.

බුදුන් වහන්සේ විසින් මුගලන් මහ තෙරුන් වහන්සේ ඍද්ධිලාභීන් අතුරෙහි අග්‍රස්ථානයෙහි පිහිට වනු ලැබූහ.

නන්දොපනන්ද නම් වූ නාග රාජයා බෙහෙවින් බලගතු මුලු හිමාලයම තැති ගන්වාගෙන සිටි නාගයකු ලෙසින් බෙහෙවින් ප්‍රකටය. මෙම නාගරාජයා දමනය කිරීමට නොයෙක් මහරහතන් වහන්සේලා ඉදිරිපත් වුවද බුදුන් වහන්සේගෙන් ඒ සඳහා අනුමතියක් නොලැබිණි. අවසානයෙහි මහ මුගලන් මහ රහතන් වහන්සේ ඊට ඉදිරිපත් වූ විට බුදුන් වහන්සේ කැමැත්තෙන්ම අනුමැතිය දුන්හ.

නාගයා දමනය සඳහා උන්වහන්සේ වැඩම කළ විට නාගරාජයා තම උපරිමයෙන් බලපරාක්‍රමය පෙන්වා සිටියත් ඒ සියල්ල අභිභවනය කළ මුගලන් තෙරුන් වහන්සේ ගේ ඍද්ධි බල මහිමය ඉක්මවා යාමට නාගරාජයාට නොහැකි විය. එබැවින් අන්තිමේ දී නන්දොපනන්ද නාගරාජයා මුගලන් මහ තෙරුන් වහන්සේ අතින් දමනයට පත් විය.

ශක්‍ර දේවයන්ගේ වෛජයන්ත මාලිගය සොලවා ලීමෙහි ද අවීචිය දක්වා නිරයන් හි සංචාරය කිරීමෙහි ද උන්වහන්සේ එකසේ සමත් වූහ. නිරයයන්හි උන්වහන්සේ කළ සංචාරයන්ගෙන් උන්වහන්සේට බොහෝ තොරතුරු එක් රැස් කර ගැනීමට අවස්ථාව සැලසිණ. ත්‍රිපිටකයට ඇතුළත් ජේතවත්‍ථු, විමාන වත්‍ථු ආදියෙහි ඇතුළත්ව ඇත්තේ උන්වහන්සේගේ එබඳු සංචාරයන්ගෙන් ලබා ගත් අත්දැකීම් පිළිබඳ තොරතුරුය. ඒ ඒ පුද්ගලයන් නරකාදී අපායයන්හි ඉපදී අනෙකවිධ වූ දුක්විඳීමට හේතු භූත වු පාප කර්මයන් විග්‍රහ කොට මෙලොව වසන මිනිසුන්ගේ යහපත සඳහා ඒවා වාර්තා කිරීමට උන්වහන්සේ සමත් වී ඇත.

මහ මුගලන් මහතෙරුන් සතුව කෙතරම් ඍද්ධිබල පැවතිය ද පෙර ආත්මයක කළ පාප කර්මයක විපාකයෙන් මිදීමට උන්වහන්සේට රහත් භාවයට පත් අන්තිම ජාතියෙහි ද නොහැකි විය. උන්වහන්සේ ගේ අවසන් කාලයෙහි හොරු දෙවරක්ම උන්වහන්සේට තළා මරා දැමීමට රැකවල් ලා ගෙන සිටියහ. උන්වහන්සේ ඍද්ධි බලයෙන් ඒ අවස්ථා මග හැර සිටියත් තෙවැනි වරට ද සොරුන් එසේ කළ විට මෙය මග හැරිය නොහැකි කර්මයක විපායක් බව උන්වහන්සේ දැන ගත්හ.

කර්ම විපාකයට ඉඩ දීම හැර වෙන කළයුත්තක් නොමැති බව දත් උන්වහන්සේ සොරුන්ට කැමැති දෙයක් කිරීමට ඉඩ හැර සිටියහ. සොරු උන්වහන්සේට නොයෙක් වධ හිංසා පමුණුවා ඇටකටු තළා පෙළා දැමූහ. එහෙත් එයින් උන්වහන්සේගේ පරිනිර්වාණය සිදු නොවිනි. තෙරුන් වහන්සේ මිය ගියේයයි සිතා සොරුන් උන්වහන්සේ හැරදා ගිය විට උන්වහන්සේ ඍද්ධියෙන් අහසට පැන නැගී ඍද්ධි ප්‍රාතිහාර්ය දක්වා පරිනිර්වාණයට පත් වූහ. බුදුරජාණන් වහන්සේ මුගලන් තෙරුන්ගේ පරිනිර්වාණය අසා උන්වහන්සේගේ ගුණ කථනයක ද යෙදුනා හ.

කුසල් අකුසල් දෙක දුරුකළ කෙලෙස්කිලුටු නැති පිරිසිදු පුද්ගලයා බ්‍රාහ්මණයා ය.

412. යොධ පුඤ්ඤඤ්ච පාපඤ්ච
උභො සඞ්ගං උපච්චගා
අසොකං විරජං සුද්ධං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:30)

යමෙක් පින් හා පව්
ගැට දෙකම ඉක්මවාලුයේ
සොවින් තොර නිකෙලෙස් පිවිතුරු වූ
හෙතෙම බමුණැයි කියමි මම

පින් පවු ඉක්මවා පවිත්‍ර වූයේ බ්‍රාහ්මණයායි.

26 (29) රේවත තෙරුන්ගේ වත (412)

බුදුරජාණන් වහන්සේ පුබ්බාරාමයෙහි වැඩ වෙසෙන සමයක **රේවත තෙරුන්** වහන්සේ අරභයා මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

දිනක් භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට මෙසේ සැළකර සිටියහ. "ස්වාමිනී රේවත තෙරණුන්දෑ මිනිසුන්ගෙන් පුද සත්කාර බොහෝ කොට ලබයි. හෙතෙම කීර්ති ප්‍රශංසාද ලබයි. ඔහු තනිවම වනයෙහි වෙසෙතත් ඔහු ගේ ඍද්ධි ප්‍රාතිහාර්ය බලයෙන් භික්ෂූන් පන්සියයක් සඳහා ආරාම පන්සියයක් ද තනා තිබේ." මෙසේ පැවසූ භික්ෂූන්ට බුදුන්වහන්සේ "මහණෙනි, මා පුත් රේවත පින් පව් දෙකම ඉක්මවා සිටින කෙලෙසුන් දුරුකළ තැනැත්තෙකි"යි පැවසූහ.

විවරණාත්මක අනුවාදය (412 ගාථාව)

ඉධ යො පුඤ්ඤඤ්ච පාපඤ්ච උභො සඞ්ගං උපච්චගා
අසොකං විරජං සුද්ධං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි.

ඉධ: මේ ලෝකයෙහි; **යො**: යමෙක්; **පුඤ්ඤඤ්ච**: පින ද; **පාපඤ්ච**: පව ද; **උභො**: (යන) දෙක ද; **සඞ්ගං**: (රාගා දී සප්ත) සඞ්ගය ද; **උපච්චගා**: ඉක්මවූයේ ද; **අසොකං**: ශෝක රහිත; **විරජං**: (රාගා දී) කෙලෙස් නැති; **සුද්ධං**: පවිත්‍ර වූ; **තං**: එබඳු පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: කියමි.

මේ ලෝකයෙහි යමෙක් පින හා පව යන ගැට දෙකම ඉක්මවා ගියේ ද ශෝක රහිතව, නිකෙලෙස්ව පිරිසිදු වූයේ ද එබඳු පුද්ගලයා බ්‍රාහ්මණයෙකැයි පවසමි.

විවරණය

රේවත තෙරුන් වහන්සේගේ කථාව: උන්වහන්සේට කංඛා රේවත යන නම ලැබී ඇත්තේ සසුනට ඇතුළත් වීමට පෙර හෙතෙම නිතරම ශංසයවාදී පුද්ගලයකු ලෙස ක්‍රියා කළ බැවිනැයි කියවෙයි. ඔහු හැම දෙයක්ම සැකයට භාජනය කළ කෙනෙකි. පැවිද්දෙන් පසුව රහත් භාවයට පත්ව ධ්‍යාන සුවයෙන් කල්ගත කළ භික්ෂුවකි. සත් දිනක් පුරා නිරොධ සමාපත්තියට සමවැදී සමාපත්ති සුවයෙන් කල් යැවීමට සමත් කම් හිමි කර ගත් රහතන් වහන්සේ නමකි. උන්වහන්සේ බොහෝ කොට වනයෙහි කල් ගත කළහ.

රහතන් වහන්සේ නමක් වීමට පෙර උන්වහන්සේ හැම දෙයක් කෙරහි සැකමුසුව විසීය. ආගමික සංකල්ප පිළිබඳව ඔහු තුළ පැවතුනේ නිරන්තර සැකයෙකි. එහෙත් බුද්ධශාසනයෙහි පැවිදි වීමෙන් පසුව උනන්දුවෙන් භාවනාවෙහි යෙදුනු උන්වහන්සේ හුදෙකලා වාසය ප්‍රිය කරමින් වැඩි කලක් වනගතව විසූ භික්ෂුවක් විය. බුදුරජාණන් වහන්සේ පසු කලෙක කංඛාරේවත තෙරුන් වහන්සේ වහා අභිඥාවන්ට සම වැදීමේ හැකියාව ඇති ශ්‍රාවකයන් අතුරෙන් අග්‍රස්ථානයට පත් කර වදාළහ.

පුරසඳ සේ නිමල් වූ පහන් වූ නොකැළඹුණා වූ ආසාව ගෙවාලු තැනැත්තා බ්‍රාහ්මණයා ය.

413. චන්දං ව විමලං සුද්ධං
විප්පසන්නං අනාවිලං
නන්දිභවපරික්ඛීණං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:31)

සඳසේ නිමල්ව පිරිසිදු වූ
සුපසන්ව නොකැළඹුණා වූ
භවරාගයෙන් මිදුනු
කෙනෙකුම බමුණෙකැයි කියමි.

භවරාග බිඳහැර සුපසන් වූයේ බමුණෙකි.

26 (30) චන්දාභ තෙරුන්ගේ කතා පුවත (ගාථා 413)

රජගහ නුවර ධනවත් පවුලක උපත ලැබූ **චන්දාභ නම්** වූ තෙරුන්වහන්සේ අරහයා බුදුරජාණන් වහන්සේ මෙම ගාථා ධර්මය දේශනා කළ සේක.

චන්දාභ තෙරුන් වහන්සේ උපදින විට සඳමෙන් පැහැපත් බබලන රැස්වලල්ලක් නැබ වටා පිහිටා තිබියදී උපන් බැවින් මවුපියන් විසින් චන්දාභ යයි නම් කරනු ලැබූහ.

තම පුතණුවන් තුළ වූ මෙම ලක්ෂණය නිසා ඔහු ගේ මවු පියෝ එය ධනය ඉපයීමේ මාර්ගයක් වශයෙන් යෙදවීමට අදහස් කළහ. එබැවින් ඔවුහු දරුවා රථයක හිඳුවා ගමින් ගමට යමින් මිනිසුනට දරුවාගේ විශේෂ ලක්ෂණය පෙන්වා ධනය ඉපැයූහ. එහිදී ඔවුන් මිනිසුනට පැවසුවේ මේ දරුවා ස්පර්ශ කරන කවරෙක් වුවද බෙහෙවින් බලගතු පුද්ගලයකු වන බවයි. මේ අසන මිනිස්සු කහවණු දහස, පන්සියය ආදී වශයෙන් මුදල් දෙමින් දරුවා ස්පර්ශ කිරීමට අවස්ථාව සලසා ගත්හ. මවුපියෝ මෙසේ දරුවා ද රැගෙන ගමින් ගමට යන අතරතුරු සැවැත් නුවරට පැමිණ නගරයට හා ජේතවන විහාරයට අතර මැද පෙදෙසක නැවතුම් ගත්හ.

සැවැත් නුවර බොහෝ ආර්යශ්‍රාවකයෝ භික්ෂූන් වහන්සේලාට උදෑසන දන් පිළිගන්වා උදා ආහාරයෙන් පසුව මල් ගඳවිලවුන් රැගෙන විහාරයට ගොස් බුදුන් පුදා ධර්මශ්‍රවණය කරති. මෙසේ යන මෙම පිරිස දුටු දරුවාගේ මවුපියෝ ඔවුන් යන්නේ කොහේදැයි විමසූහ. පිරිස කියා සිටියේ තමන් බුදුරජාණන් වහන්සේගෙන් ධර්මශ්‍රවණය කිරීම සඳහා විහාරයට යන බවයි. එය ඇසූ දරුවා රැගෙන යන බමුණෝ "ඔබ දහම් අසා ලබන දෙයක් නැත. එන්න මේ දරුවා දෙස බලන්න. ඔහු ගේ ඇඟ ස්පර්ශ කිරීමෙන් ඔබට නොයෙක් ආශ්චර්යමත් බලයන් හා සමෘද්ධිය ලැබිය හැකියයි විහාරයට යන පිරිස අමතා පැවසූහ. ඔබගේ දරුවාගේ ශරීරය පිරිමැදීමෙන් ලැබිය හැකි ආශ්චර්යමත් බලයන් කවරේද පිරිස පෙරළා බමුණාගෙන් ඇසූහ. මේ මේ ආශ්චර්යමත් බලයන් ලැබිය හැකියයි පැවසුවද පිරිස එය පිළි නොගත්හ. දෙපිරිස අතර එකඟතාවක් නොවූ බැවින් බමුණෝ පිරිසට මෙසේ කීහ. "යමු විහාරයට ගොස් අපේ දරුවාගේද බලය ඇත්තේ ඔබගේ ශාස්තෘවරයාගේ දැයි විමසා බලමු." මේ කථාවට එකඟ වූ දෙපිරිසම විහාරයට ගියහ.

බුදුන් ලඟට චන්දාභ රැගෙන ගිය විට ඔහුගේ නැබ වටා පිහිටි රැස්වලල්ල අතුරුදහන් විය. බුදුන් වහන්සේ කෙරෙන් ඉවතට රැගෙන ගිය විට රැස්වලල්ල නැවත පෙනෙන්නට විය. දෙවෙනි තෙවෙනි වරද එසේ කළ විට ප්‍රතිඵලය පෙර සේම විය. ඒ දුටු චන්දාභ මෙසේ සිතුවේය. "ඒකාන්තයෙන්ම මේ පුද්ගලයා තමන් සතුව ඇති මන්ත්‍රයක් මතුරා මෙසේ කරනු ඇත. එබැවින් ඒ මන්ත්‍රය මේ පුද්ගලයාගෙන් ඉල්වා ගත යුතුය." එසේ සිතා චන්දාභ බුදුන්ගෙන් මෙසේ විමසීය. "ඔබ මන්ත්‍රයක් මතුරා මගේ රැස් දහර නොපෙනෙන්නට සැලැස්සුවා නොවෙහිද?"

"එසේය. මා ලග එසේ කළ හැකි මන්ත්‍රනයක් ඇතැ"යි බුදුන් වහන්සේ පැවසූහ. "එසේ නම් එය මට ද දෙන්න" "එය ගිහිගෙන් නික්ම පැවිදි නොවූ කෙනෙකුට දිය නොහැකිය."

එය ඇසූ චන්දාභ ඔහු සමග පැමිණි මවු පියන් ඇතුළු බමුණන්ට මෙසේ කීවේය. "මම මේ මන්ත්‍රය ඉගෙන ගත් විට මම මේ මුළු මහත් දඹදිවටම ප්‍රධාන පුද්ගලයෙක් වන්නෙමි. මා මෙය ඉගෙන ආපසු ඔබ වෙතට පැමිණෙන තුරු ඔබලා මේ නුවර හැරදා නොයන්න. එතෙක් මේ නගරයෙහිම පදිංචිව සිටින්න." මෙසේ බමුණන්ට පැවසූ චන්දාභ තමන් පැවිදි කරන ලෙස බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය. බුදුන් වහන්සේ ඔහු පැවිදි කරවා ඔහුට සිරුරේ දෙතිස් කුණපයන්ට සම්බන්ධවන භාවනා කමටහනක් දුන්නේ ය. එසේ දී මෙය මන්ත්‍රය ලබා ගැනීමට මත්තෙන් පුහුණු කරගත යුත්තකි. එබැවින් එය නැවත නැවත අධ්‍යයනය කරන්නැයි බුදුරජාණන් වහන්සේ පැවසූහ.

චන්දාභ කිසියම් තැනකට වී කමටහන නිමිති කොට ගෙන එය මෙනෙහි කරන්නට විය. ඔහු ගේ පිරිවර බමුණන් විටන් විට ඔහු වෙතට පැමිණ මන්ත්‍රය ලබා ගත්තේ දැයි විමසන විට තවම නැතැයි පිළිතුරු දුන්නේ ය. මෙසේ චන්දාභ කමටහන ඔස්සේ මෙනෙහි කිරීමෙන් නොබෝ දිනකින්ම රහත් භාවයට පත් වූයේ ය. බමුණන් ආපසු ඔහු වෙත පැමිණ ඔහු ගෙන් විමසූ විට ඔහු පැවසුවේ. "මා වෙතින් ඉවත් වන්න. මම යළිත් ආපසු නොයන තත්වයට පත් වුවෙමි" යනුයි. චන්දාභ මෙසේ පැවසූ කරුණ ඇසූ භික්ෂූන් වහන්සේලා බුදුන් වහන්සේ වෙත ගොස් ඔහු ඔහුගේ බමුණන්ට කියූ කරුණ බුදුන් වහන්සේ වෙත සැළ කොට, "මේ චන්දාභ මේ අයුරින් බොරුවක් කියා ඇතැ"යි පැවසූහ."නැත මහණෙනි, මගේ පුත් චන්දාභ ලෞකික සුවයන් ඉක්මවා ගොස් ඇත. ඔහු කියා ඇත්තේ බොරුවක් නොව සත්‍යයකැ"යි බුදුන් වහන්සේ පැවසූහ.

විවරණාත්මක අනුවාදය (413 ගාථාව)

චන්දං ඉව විමලං සුද්ධං විප්පසන්නං අනාවිලං
නන්දීභවපරික්ඛීණං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි.

චන්දං ඉව: සඳ මෙන්; **විමලං**: කැලැල් නැති; **සුද්ධං**: පිවිතුරු වූ; **විප්පසන්නං**: බෙහෙවින් පැහැපත් වූ; **අනාවිලං**: නොකැළඹුණා වූ; **නන්දීභවපරික්ඛීණං**: භවයෙහි සතුට උපදවන තෘෂ්ණාව ක්ෂය කළා වූ; **තං**: එම පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

සඳමෙන් නොකැලැල් පිරිසිදු බෙහෙවින් පැහැපත් නොකැළඹුණු භව තෘෂ්ණාව ක්ෂයකළා වූ පුද්ගලයා බ්‍රාහ්මණයෙකැයි මම ප්‍රකාශ කරමි.



කිසිවක් දැඩි සේ නො ගෙන කෙලෙස් පිරිනිවීමෙන් නිවුණු තැනැත්තා බ්‍රාහ්මණයා ය.

414. යො ඉමං පළිපථං දුග්ගං
සංසාරං මොහමච්චගා
තිණ්ණො පාරගතො ඣායී
අනෙජො අකථංකථී
අනුපාදාය නිබ්බුතො
තමහං බෲමි බ්‍රාහ්මණං (26:32)

මේ මහ දුෂ්කර සසර මනින්නේ
මෝහය පසු කොට පීනා යන්නේ
බවුන් වඩා තිරවූ නිසැ කින්නේ
නිවනට පත් ඔහු බමුණු කියන්නේ

සන්සුන් පුද්ගලයා

26 (31) මවුකුසේ සත්වසරක් (ගාථා 414)

කෝලිය වංශයෙහි දියණියක වූ **සුප්පවාසා** අවුරුදු සතක් මුළුල්ලේ තම කුසතුළ දරුවකු දරා සිටි මාතාවකි. දරුවා බිහිවීමට දවස් සතක සිට ඇයට විලිරුදාව පැවතිණ. ඒ කාලය තුළ ඇය දරුණු වේදනාවෙන් පෙළුණාය. මේ අතර ඕ තොමෝ මෙසේ සිතුවාය. "මාගේ මේ වේදනාව වැනි දුක් දුරු කිරීමට ධර්මය දේශනා කළ ඒ උත්තමයා ශාන්ති නායක බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේගේ ශ්‍රාවක සංඝයා සුපටිපන්නය. ලෝකයාගේ පුණ්‍යක්ෂේත්‍රයයි. නිර්වාණය වූ කලී සියලු දුක් දුරු කොට ලබන්නා වූ ශාන්තිපාදයයි" මෙබඳු කල්පනාවෙන් යුක්තව ඕ තොමෝ තමා තුළ වූ වේදනාව උසුලාගෙන සිටියා ය. මේ අතර ඕ තොමෝ තමාගේ වචනයෙන් බුදුන් වහන්සේට ගෞරවය දක්වනැයි තම ස්වාමිපුරුෂයා බුදුන් වහන්සේ හමුවට යැව්වා ය. හෙතෙම ගොස් බුදුන් වැඳ සුප්පාවාසා ගේ වචනයෙන් බුදුන් වහන්සේට ගරු බුහුමන් දැක්වූයේ ය. එවිට බුදුන් වහන්සේ කෝලිය කුල කුමරිය සුප්පවාසා සුවපත් වේවායි ද ඇයට සුවසේ දරුවකු ලැබේවායි ද ආශීර්වාද කළහ. බුදුන්වහන්සේ මේ ආශීර්වාදය දෙත්ම සුප්පවාසා සුව පහසුවෙන් සුවපත් දරුවකු බිහි කළාය. අනතුරුව ඕ තොමෝ බුදු පමොක් මහ සඟන තම ගෘහයට වඩමවා සත් දිනක් පුරා දන් පිළිගන්වමින් සත්කාර සම්මාන පැවැත්වූවාය. පසු කලෙක මෙම දරුවා වැඩි වියට එළඹුණු පසු ගිහිගෙය හැර දමා බුදු සසුනෙහි පැවිදිව නොබෝ කලකින් රහත් භාවයද ලබා ගත්තේය. දිනක් භික්ෂූන් වහන්සේලා ධම්සභා මණ්ඩපයට රැස්ව මෙබඳු වූ කථාවක යෙදුනාහ. "රහත් බවට පත්වීමට තරම් භාග්‍යයක් තිබුණු දරුවා සත්වසරක් මව්කුස විසීම කෙතරම් පුදුම සහගත ද? ඒ කාලය තුළම හෙතෙම ඉමහත් දුකක් වින්දේය?" භික්ෂූන් වහන්සේලාගේ මේ කථාව ගැන දැන ගන්නට ලැබුණු භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, එය එසේ වුවත් මගේ පුතණුවන් සියලු දුක් දුරු කොට නිවන් සුව අත්පත් කරගෙන ඇතැයි පැවසුසේක.

විවරණාත්මක අනුවාදය (414 ගාථාව)

යො ඉමං පළිපථං දුග්ගං සංසාරං මොහං අච්චගා
තිණ්ණො පාරගතො ඣායී අනෙජො අකථංකථී
අනුපාදාය නිබ්බුතො තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි.

යො: යමෙක්; **ඉමං**: මේ; **පළිපථං**: කෙලෙස් මඩ සහිත වගුරු මගක් වූ; **දුග්ගං**: එතෙර වීමට දුෂ්කර වූ; **සංසාරං**: සසර ද; **මොහං**: මොහය ද; **අච්චගා**: ඉක්මී ද; **තිණ්ණො**: (ඔඝයෙන්) එතර වූයේ; **පාරගතො**: (නිවන් නැමති) පරතෙරට පැමිණියේ වේද; **ඣායී**: ධ්‍යාන වඩන්නේ; **අනෙජො**: කෙලෙස් රහිත; **අකථංකථී**: සැකදුරු කළ; **අනුපාදාය**: (කිසිවක්) දැඩි සේ නොගෙන **නිබ්බුතො**: කෙලෙස් පිරිනිවීමෙන්) නිවුනේ ද; **තං**: එබඳු වූ පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බ්‍රාහ්මණයෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: ප්‍රකාශ කරමි.

යමෙක් මේ වගුරු බිමක් වූ දුර්ග වූ සංසාරය ඉක්මවා යමින් පාරප්‍රාප්ත වූයේ ද ධ්‍යාන වඩන සුලු රාගාදි කෙලෙසුන්ගෙන් දුරු වූයේ ශාංකාවෙන් තොරවූයේ කාමාදිය ග්‍රහණය නොකරමින් නිවී සැනහියේ ද එබඳු වූ පුද්ගලයා බ්‍රාහ්මණයෙකැයි මම ප්‍රකාශ කරමි.

විවරණය

සීවලී රහතන් වහන්සේ ගේ කථාව: මුන් වහන්සේ අතීත භවයන් බොහෝ ගණක සිට දාන පාරමිතාව සම්පූර්ණ කළ උත්තමයකු ලෙස දැක්වෙති. විපස්සී සම්මා සම්බුදුන් වහන්සේගේ සමයෙහි මෙතුමාගේ ජීවිතයෙහි ඉතා වැදගත් සිදුවීමක් ගැන අසන්නට ලැබෙයි. මෙම බුදුන් වහන්සේට දානය දීම සඳහා රජු හා රටවැසි ජනතාව අතර තරඟකාරී බවක් ඇතිවිය. එකිනෙකා පරයමින් බුදුන් වහන්සේට දානය පිළියෙල කර දීමෙහි හැමෝම උත්සුක වූහ. මහජනතාව විසින් දානය සැපයීමෙහි අවස්ථාව පැමිණි විට දානයට අවශ්‍ය වූ කිරි සහ පැණි ලබා ගැනීමෙහි දුෂ්කරතාවක් මතු විය. මේ නිසා ඔවුහු ප්‍රමාණවත් මුදල් ද සමඟ කිසියම් පුද්ගලයකු නගරද්වාරය අසල නවත්වා කිසිවකු හෝ කිරි හා පැණි රැගෙන යන්නේ නම් මිළ දී ගැනීමට පැවසූහ. මෙසේ නගරද්වාරයෙහි සිටි පුද්ගලයාට කිසියම් තරුණයකු බඳුනක් ද රැගෙන යනු දක්නට ලැබිණි. තරුණයා නවතා විමසූ විට ඔහුගේ බඳුනෙහි කිරි හා පැණි ඇති බව දක්නට ලැබිණ. කිරි මිළදී ගැනීමට උත්සුක වූවත් තරුණයා ඒවා විකිණීමට එතරම් රුචියක් නොදැක්විය. මේ නිසා මිළ වැඩි කරමින් කිරි තමන්ට දෙන ලෙස දන්වා සිටියේ ය. තරුණයා දන්දීමෙහි අනුසස් දැන සිටියෙකි. ඔහුට අවශ්‍ය වූයේ දානයට සහභාගී වී පින් ලබා ගැනීමයි. හෙතෙම එහි ලා බාධාවක් නොමැති බව දැන කිරි හා පැණි වෙනුවෙන් කහවුණු දහසක් දීමට කෙනෙක් සිටි දැයි විමසීය. කහවුණු දහසක් ගෙවීමට කිරි හා පැණි මිළදී ගැනීමට සිටි පුද්ගලයා අතෙහි නොවීය. එවිට එම තරුණයා මෙම කිරි කහවුණු දහසක් නොව කහවුණු දෙදහසක්ම වටිනාකම් ඇත්තේ වුවද තමාට අවසර දෙන්නේ නම් තමා සත්තකයේ ඇති කිරි හා පැණි නොමිලයේ සැපයිය හැකි බවයි. කිරි ගැනීමට පැමිණි පුද්ගලයා එයට කැමැත්ත දැක්වීය. බුදුරජාණන් වහන්සේට දානය සැපයීමට අවශ්‍ය කිරි හා පැණි නොමිලයේ ලබා දුන් තරුණයා අප සම්මා සම්බුදුන් වහන්සේගේ සමයෙහි සුප්පවාසා නම් වූ කෝලිය කුල කුමරියගේ කුසෙහි පිළිසිඳ ගත්තේ ය. සුප්පවාසාගේ කුසෙහි දරුවකු පිළිසිඳ ගැනීමත් සමඟ එම පවුලට අතිමහත් සමෘද්ධිමත් කාලයක් උදාවිය. නමුත් මව සහ දරුවාට අතීත භවයක කරන ලද අකුශල කර්මයක දුක්ඛ විපාකයකට මුහුණ දීමට සිදුවිය. අවුරුදු සතක්ම දරුවා කුසදරා සිටි සුප්පවාසා දරුවා බිහි වීමට දින සතක් තිබිය ද දැඩි දුක්ඛ වේදනාවකට මුහුණ දුන්නාය. ඇය සිතුවේ තමා දැන් මරණ මුඛයට පැමිණ ඇති බවයි. මේ අතර ඇයට බුදුන්වහන්සේගෙන් ආශිර්වාද ලබා ගැනීමේ කැමැත්තක් ඇතිවිය. එබැවින් තම ස්වාමි පුරුෂයා බුදුන් දැකීමට විහාරයට පිටත් කර යැව්වාය. ස්වාමියා දානය සඳහා තම නිවෙසට වැඩම කරවන ලෙස බුදු පාමොක් මහ සඟනට අරයුම් කළේය. බුදුන් වහන්සේ සංඝයා ද සමඟ එහි වැඩමවා දානය වළඳා සුප්පවාසාට ආශිර්වාද කළ සේක. එම ආශිර්වාදයත් සමඟම ඕතොමෝ සුවපත්ව දරු ප්‍රසූතිය කළාය. දරු ප්‍රසූතිය සුප්පවාසාගේ නිවසට අතිශය ප්‍රීතිප්‍රමෝදයයක් ගෙන දුන්නේ ය. දරුවාට සීවලී යනුවෙන් නම තබන ලදි. සීවලි කුමරුට දින සත වන විට පළමු කෙස් රොද කැපීමේ මංගල්‍යය සිදුවිය. දවස් සතක් පුරා බුදුපාමොක් මහසඟනට පැවැති දානයේ අවසන් දිනය වූයේ එදිනය. උපතින් දින සතක් ගෙවුන ද සිවලී කුමරුගේ නියම වයස වූයේ සත්හවුරුදු සත් මසෙකි. සත් වැනි දින දානය අවසන්හි බුදුන් වහන්සේගෙන් ධර්මය අසා සීවලී කුමරු සෝවාන් වූ බව පැවසෙයි. මෙය සිදු වුයේ කුමරුගේ කෙස් කපන දිනයෙහිය. ඔහුගේ ප්‍රථම කෙස් රොද කැපීමෙහි දී කුමරු සෝවාන් පෙළෙහි පිහිටි අතර අවසන් කෙස්රොද කැපීමෙහිදී රහත් පලයට පැමිණයේය. එබැවින් සීවලී කුමරු ඉපදී දින සතකින් රහත් බව ලබා ගත් පුණ්‍යවන්ත යකු බව කියවෙයි. එම නිසාම කුමරුට පැවිදි වීමට සිදු විය. පසු කාලෙක සීවලී මහරහතන් වහන්සේ ලාභීන් අතර අග්‍රස්ථානයට පත් වූහ.

ගිහි ගෙය හැර මහණ වැ කාමයන් හා භවයන් නැසූ තැනැත්තා බ්‍රාහ්මණයා ය.

415. යොධ කාමෙ පහත්වාන
අනාගාරො පරිබ්බජෙ
කාමභවපරික්ඛීණං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:33)

යම් කිසිවෙක් කම් සුවය හරින්නේ
ගිහිගෙන් නික්මව පැවිදිව ඉන්නේ
කාම ද භවය ද වනසා ලන්නේ
නම් හේ බමුණැයි මා පවසන්නේ

පෙළඹවීම් වලින් මිදුනේ බමුණායි

26 (32) සුන්දර සමුද්ද තෙරුන් වහන්සේ ගේ කතාව (ගාථා 415)

මේ ගාථා ධර්මය බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ උන්වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ සිටියදී **සුන්දර සමුද්ද** නම් වූ භික්ෂුවක අරභයායි.

සුන්දර සමුද්ද කුමාර තෙමේ සැවැත් නුවර මහ ධන සිටුවරයෙකු ගේ පුතෙකි. ඔහුට සුන්දර සමුද්දයයි නම් තබන ලද්දේ ඔහුගේ පැවැති රූපශ්‍රීය නිසාය.

දිනක් මෙතෙම මහජනයා මල් ගඳ විලවුන් රැගෙන බුදුන් වැඳීම සඳහා විහාරයට යනු බලා ඔවුන්ගෙන් කොහි යන්නහුදැයි ඇසුවේය. මිනිස්සු තමන් බුදුන් දැක දහම් ඇසීම සඳහා විහාරයට යන බව පැවසූහ. එවිට තමන්ට ද එසේ දහම් ඇසීමට ආසාවක් ඇති වී එම මිනිසුන් සමගම විහාරයට ගියේ ය. මහජනයා දහම් අසා ආපසු ගිය පසු හෙතෙම බුදුන් වහන්සේට සමීපව පැවිදි වීමේ කැමැත්ත පළ කළේය. මවුපියන්ගේ අවසරය නොලද දරුවන් පැවිදි නොකරන බව බුදුන් වහන්සේ පැවසූහ. එබැවින් හෙතෙම නිවසට ගොස් මවුපියන්ට තමන්ගේ කැමැත්ත පවසා පැවිදි වීමට ඔවුන්ගෙන් අවසරය ලබා ගෙන විහාරයට අවුත් බුදුන් හමුව පැවිදි බව ලබා ගත්තේය. පැවිදි වී නොබෝ කලකින් උපසම්පදාවද ලබා බුදුන් වහන්සේගෙන් අවසර ගෙන රජගහ නුවරට ගොස් එහි පිඬු සිඟා යැපෙමින් විහාරයක වාසය කළේය.

දිනක් සැවැත් නුවර උත්සව සැණකෙළියක් තිබිණ. සුන්දර සමුද්දගේ මවුපියෝ ද සැණකෙළිය නරඹා සතුටු වීමට එහි ගියහ. ඒ අතරෙහි සුන්දර සමුද්දගේ පැරණි මිතුරන් ද එහි පැමිණ ප්‍රීති වන සැටි ඔවුනට දකින්නට ලැබිණ. ඒ නිසා ඔවුනට සුන්දර සමුද්ද සිහිපත් විය. මේ වන විට ඔහු ගිහිගෙහි සිටියේ නම් මිතුරන් මෙන්ම ඔහු ද කෙළිදෙලෙන් පසු වනු ඇතැයි ඔවුනට සිතිණ. ඔවුන් ආපසු නිවසට ගියද ඔවුන්ගේ සිතෙන් පුතු නැති ශෝකය පහව ගියේ නැත. මේ අතරතුර දිනක කිසියම් නගර ශෝභිනියක් මෙම නිවසට පැමිණියාය. ඔවුන් හැඬු කඳුලෙන් සිටින සැටි දුටු ඕතොමෝ සුන්දර සමුද්දගේ මාපියන්ගෙන් කණගාටුවට කරුණු විමසූවාය. එවිට ඔවුහු තත්වූ පරිද්දෙන් සියලු තොරතුරු ඇයට පැවසූවාය. "හොඳයි මම ඔහු රැගෙන ඔබ වෙතට ගෙන ආවොත් ඔබ මට දෙන්නේ කුමක්දැ"යි ඕතොමෝ ඇසුවාය. "අනේ එසේ කරන්නේ නම් කෙතරම් දෙයක් ද ඔබ අපේ පුතණුවන් රැගෙන ආවොත් මේ සියලු දේපලද සමඟ ඔබ පුතුට සරණ පවා දෙමි." ඔවුහු එසේ කීහ. "මැනවි මම එසේ ඔබේ පුතු රැගෙන එමි. ඒ සඳහා මට යම් මුදලක් වියදම් කිරීමට සිදු වෙයි. එබැවින් එම මුදල මට පළමුව දෙන්න"යි පවසා නගරශෝභිනිය එම මුදලද රැගෙන රජගහ නුවර බලා පිටත් වූවාය. රජගහ නුවරට සැපත් ඕතොමෝ සුන්දර සමුද්ද භික්ෂුව ගැන තොරතුරු විමසා ඔහු පිඬු සිඟා යන මග තොට ගැන ද දැන ගත්තාය. එබැවින් එම භික්ෂුව පිඬු සිඟා වඩනා මග අසල නිවසක් ද කුලියට ලබා ගෙන එහි පදිංචි වූවාය. දිනක් ඇය උදෑසනින්ම රසවත් භෝජනයක් පිළියෙල කොට භික්ෂුව පිඬු සිගා එනතුරු බලා සිටියාය. උන්වහන්සේ වඩින විට මග අසළට ගොස් පිණ්ඩපාතය පිළිගැන්වූවාය. මෙසේ දින කිහිපයක්ම මග අසළට පැමිණ දන් පිළිග න්වා එක් දිනක උන්වහන්සේට තම නිවසට පැමිණ දන් වළඳන ලෙස ඇරයුම් කළාය. ඇරයුම පිළිගෙන භික්ෂුව ඇයගේ නිවසට ගොස් දන් වැළඳීය. මින් මතු තම නිවසට පැමිණ දිනපතා තම නිවසින් දානය ලබා ගන්නා ලෙසද ඇය පැවසූවාය. භික්ෂූන් වහන්සේ ද ඒ අනුව දිනපතා නිවසට පැමිණ දන් වළඳා ආපසු යාමට පුරුදු වුයේය. දින කිහිපයක් යන විට භික්ෂුව පොළඹවා ගැනීමට ඕ තොමෝ විවිධ උපාය යෙදුවාය. සියලු ස්ත්‍රී මායම් දක්වා ඔහු පෙළඹවා ගැනීමට තැත් කළාය. මේ අවස්ථාවෙහි සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ සිටි බුදුරජාණන් වහන්සේට සුන්දර සමුද්ද භික්ෂුවගේ මනෝවිතර්කය දිවසින් දක්නට ලැබිණ. උන්වහන්සේට මේ සියලු සිදුවීම් දැක මුවගට සිනහවක් නැගිණ. අනඳ හිමි බුදුන් සිනහසෙනු දැක කරුණු විමසීය. "ආනන්දය, රජගහ නුවර සත්මහල් පහයක මතු මහලෙහි සුන්දර සමුද්ද හා නගර ශෝභනියක අතර සටනක් වෙයි. එය දැක සිනහසුනෙමි"යි බුදුන්වහන්සේ පැවසූහ. "ඒ සටනින් කවරෙක් දිනාවිද ස්වාමීනි " ආනන්ද හිමියෝ ඇසූහ.

"සුන්දර සමුද්ද සටනින් ජය ගනියි" පැවසු බුදුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ සිටිමින්ම රශ්මිධාරවක් සුන්දර සමුද්ද භික්ෂුව වෙත යවා තමන් එහි පෙනී සිටිමින් මෙසේ පැවසූහ. "මහණ, රාගයෙන් හා ආශාවෙන් දුරු වන්න." බුදුන් වහන්සේගේ දේශනයට සවන් දුන් සුන්දර සමුද්ද තෙරණුවෝ රහත් පලයෙහි පිහිටියහ. මේ සිද්ධිය අරභයා ධම්සභා මණ්ඩපයෙහි භික්ෂූන් අතර සාකච්ඡාවක් විය. සුන්දර සමුද්ද තෙරුන් රසයට ගිජුව නගරශෝභිනියකගේ පෙළඹවීමට ලක්වීමට තිබිය දී බුදුන් වහන්සේගේ මැදිහත් වීමෙන් එයින් නිදහස් වියයි භික්ෂූහු පැවසූහ. මෙය ඇසූ බුදුන් වහන්සේ "මහණෙනි මා සුන්දර සමුද්ද මුදා ගත්තේ දැන් පමණක් නොවෙමි. පෙර භවයකදීද මම ඔහු මෙසේම මුදා ගත්තෙමිය"යි ජාතක කථාවක් ද ගෙන හැරපාමින් යථොක්ත ගාථා ධර්මය ප්‍රකාශ කළ සේක.

විවරණාත්මක අනුවාදය (415 ගාථාව)

ඉධ යො කාමෙ පහත්වාන අනාගාරො පරිබ්බජෙ
කාමභවපරික්ඛීණං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි.

ඉධ: මේ ලෝකයේ; **යො**: යමෙක්; **කාමෙ**: කාමයන්; **පහත්වාන**: අත්හැර ඇත්තේ; **අනාගාරො**: අනගාරික වුයේ; **පරිබ්බජෙ**: පැවිදි වේද; **කාමභවපරික්ඛීණං**: කාමයන් හා භවයන් ක්‍ෂය කළ; **තං**: එබඳු පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

මෙලොව යමෙක් කාමයන්ගෙන් මිදී ගිහිගෙය හැර පැවිද්දකුව කාමභව තෘෂ්ණාවන් අත්හරින්නේ ද එම පුද්ගලයා බ්‍රාහ්මණයෙකැයි පවසමි.



ගිහි ගෙය හැර පැවිදි වැ තණ්හාව හා භවයන් නැසූ තැනැත්තා බ්‍රාහ්මණයා ය.

416. යොධ තණ්හං පහත්වාන
අනාගාරො පරිබ්බජෙ
තණ්හාභවපරික්ඛීණං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26.34)

මෙහි යමෙක් තණ්හා හැරලා
අනගාරිකව හැසිරේ නම්
තණ්හා භව ගෙවා දැමූ
හෙතෙමේ බමුණෙකැයි කියමි

තණ්හා හා භවය නැසූ පුද්ගලයා

26 (34) ජටිල තෙරුන් හා ජෝතිය තෙරුන් පිළිබඳ කතාව (ගාථා 416)

බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි **ජෝතිය තෙරුන්** අරභයා මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

අජාසත් කුමරු දෙව්දත් සමග කුමන්ත්‍රණය කොට සිය පියා වූ බිම්බිසර රජු මරා රාජ්‍යය ගෙන ජෝතිය සිටුවරයාගේ මන්දිරය ලබා ගැනීමට අදහස් කළේය. ජෝතිය ධනවත් සිටුවරයකු වූ බැවින් ඔහු සතු විශාල ආරක්ෂක පිරිසක් සිටියේ ය. එබැවින් අජාසත් රජු ද මහා බළ සෙනඟක් ගෙන ඔහු ගේ මන්දිරය අත්කර ගැනීම සඳහා එහි ගියේ ය.

මේ දිනයෙහි ජෝතිය සිටුවරයා බුදුන් වහන්සේ වැඩ සිටින විහාරයට ගොස් බුදුන් වහන්සේගෙන් ධර්මය අසමින් සිටියේය. අජාසත් රජු ඔහුගේ නිවසට ගිය විට එහි ද්වාරාරක්ෂකයාව සිටි යමකෝලි නම් යක්ෂයා ඉදිරියට අවුත් රජුගෙන් "කොහි යන්නේදැ"යි අසා පිරිස සහිත රජු වේගයෙන් තල්ලු කර දැමීය. යක්ෂයාට බිය වූ රජු සහ පිරිස සී සී කඩ පළා ගියහ. අන්තිමේ දී අජාසත් රජු විහාරයට ගොස් ජෝතිය සිටුවරයා හමු විය. සිටුවරයා රජු දුටු විගස හුනස්නෙන් නැගිට ගරු බුහුමන් දක්වා සිටියේ ය. "ඔබ මා සමඟ සටන් කිරීමට පිරිස යොදවා දැන් බණ අසන මුවාවෙන් මෙහි සිටින්නේය"යි රජ තෙමේ ජෝතිය සිටුවරයාට පැවසීය.

"රජතුමනි ඔබතුමා මගේ මාලිගය ගැනීමට අදහස් කෙළෙහිදැ"යි සිටුවරයා විමසා සිටියේ ය. "එසේය." ඒ අදහසින් මම එහි ගියෙමියි රජ තෙමේ පැවසීය. "රජතුමනි, ඔබ පමණක් නොව රජ වරුන් දහසක් ගිය ද මගේ කැමැත්තෙන් තොරව එය ගැනීමට නොහැක"යි සිටුවරයා පැවසීය. මෙය අසා අජාසත් රජ තෙමේ බෙහෙවින් කුපිත වී මෙසේ කීවේය. "එසේ නම් ඔබ රජ වීමට අදහස් කරන්නෙහිද?" "නැත ස්වාමීනි"යි සිටුවරයා පිළිතුරු දුන්නේ ය. "එහෙත් මගේ කැමැත්තෙන් තොරව මගේ නිවස ඔබ තුමාට ගත නොහැකැ"යි හෙතෙම තව දුරටත් පැවසීය.

"එසේ නම් ඔබේ කැමැත්තෙන් මට ඒ නිවස ගත හැකි ද?" "රජතුමනි, මෙහි මගේ අතෙහි ඇඟිලි දහයෙහි මුදු දහයක් තිබේ. මම ඒවා ඔබට නොදෙමි. හැකි නම් ඒවා ගන්නැ"යි සිටුවරයා පැවසීය. එවිට රජතෙමේ ඉමහත් වැර යොදා මුදු ගැනීමට උත්සාහ කළේය. රජු සියලු වැර යෙදුවද ඔහුට එක මුදුවක් හෝ සිටුවරයාගේ ඇඟිලි වලින් ඉවත් කිරීමට නොහැකි විය. "ස්වාමීනි ඔබගේ සළුව අල්ලන්නැ"යි කියු සිටුවරයා තම ඇඟිලි රජුගේ සළුවට පහත් කොට ඇල්ලීය. එවිට සියලු මුදු සිටුවරයාගේ ඇඟිලිවලින් ගිලිහී රජුගේ සළුවට වැටින.

"ස්වාමීනි, මේ පරිද්දෙන්ම මා සතු කිසිවක් බලෙන් කිසිවකුට ගත නොහැකිය"යි සිටුවරයා පැවසීය. කෙසේ වුවද රජුගේ ක්‍රියා කලාපයෙන් කළකිරීමට පත් සිටුවරයා "රජතුමනි, ඔබතුමා අවසර දෙන්නේ නම් පැවිදි වනු කැමැත්තෙමැ"යි රජුට පැවසීය. මොහු පැවිදි වන්නේ නම් "එවිට මට මොහුගේ ධනය පහසුවෙන්ම ගත හැකි වෙතැ"යි සිතූ අජාසත් රජ තෙමේ එසේ නම් පැවිදි බව ලබා ගනුවයි" පැවසීය.

ජෝතිය සිටුවරයා බුදුන්වහන්සේ හමුව තම කැමැත්ත පවසා පැවිදි බවට පත් වුයේය. නොබෝ කලකින්ම ජෝතිය තෙරුන් වහන්සේ රහත් බවට පත් වූහ. උන්වහන්සේ රහත් බවට පත් වීමත් සමඟ ජෝතිය සිටුවරයාව සිටිය දී ඔහු සතු වූ සියලු ධනධ්‍යාන්‍යාදී වස්තුව අතුරුදහන් විය.

දිනක් භික්ෂූන් වහන්සේලා ජෝතිය තෙරුන් වහන්සේගෙන් මෙසේ විමසූහ. "ආයුෂ්මත්නි, ඔබට තව දුරටත් ඔබේ වස්තුව හා භාර්යාව ගැන ඇල්මක් තිබේ ද?" "මට එබඳු කිසිදු ඇල්මක් නැතැ"යි ජෝතිය තෙරණුවෝ පැවසූහ. එය ඇසූ භික්ෂූහු බුදුන් හමුව "ස්වාමීනි ජෝතිය භික්ෂුව ඔහු සතුව තිබු වස්තුවට ඇල්මක් නැතැයි කීමෙන් මුසාවක් කියයි"යි පැවසූහ. "නැත මහණෙනි, මා පුත් ජෝතිය සැබෑවක්ම කියයි. ඔහුගේ සිතෙහි කාම වස්තූන් කෙරෙහි කිසිදු ඇල්මක් නැතැ"යි පවසා බුදුරජාණන් වහන්සේ ඉහත සඳහන් ගාථාවෙන් ධර්මදේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (416 ගාථාව)

ඉධ යො තණ්හං පහත්වාන අනාගාරො පරිබ්බජෙ
තණ්හාභව පරික්ඛීණං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

ඉධ: මේ ලෝකයෙහි; **යො**: යමෙක්; **තණ්හං**: තෘෂ්ණාව; **පහත්වාන**: දුරුකොට; **අනාගාරො**: අනගාරික වුයේ; **පරිබ්බජෙ**: පැවිදි වන්නේ ද; **තණ්හාභවපරික්ඛීණං**: තෘෂ්ණා භවදෘෂ්ටි ක්ෂය කළා වු; **තං**: එබඳු පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බ්‍රාහ්මණයෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

මේ ලෝකයෙහි යමෙක් තෘෂ්ණාව අතහැර දමා අනගාරිකව හැසිරෙයිද තෘෂ්ණා භවාශාවන් ගෙවා දැමුවේද එබඳු පුද්ගලයා බමුණෙකැයි මම පවසමි.

මනු ලොව හා දෙව්ලොව සැප හැර සිව් යෝගයෙන් වෙන් වූ තැනැත්තා බ්‍රාහ්මණයා ය.

417\. හිත්වා මානුසකං යොගං
දිබ්බං යොගං උපච්චගා
සබ්බයොගවිසංයුත්තං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:35)

මිනිස් ආයු කම් සුව හැර ඉන්නේ
දිව්‍ය ආයු කම් සුව ඉක් මන්නේ
සියලු යෝග බැමි වලින් මිදෙන්නේ
එවැනි අයට බමුණකැයි කියන්නේ

සියලු බැඳුමෙන් ඔබ්බට යන්නේ බමුණාය

26 (35) කවටයෙක්ව සිටි භික්ෂුවකගේ කතා පුවත (ගාථා 417)

තැනින් තැන සංදර්ශන පවත්වමින් බලා සිටින්නන් සතුටු කොට සිනහ ගස්වන කිසියම් කවට **නළුවෙක්** එසේ සංදර්ශන පවත්වමින් ගමින් ගමට යන විට බුදුන් වහන්සේ ගැන අසන්නට ලැබී එහි ගොස් දහම් අසා ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණ රහත් බව ලබා ගත්තේ ය.

දිනක් මෙම භික්ෂූන් වහන්සේ බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා සමඟ පිඬු සිඟා වඩිනා විට ඒ සමීපයෙන් යන්නා වූ වෙනත් කවට නළුවකු දක්නට ලැබිණ. ඔහු දුටු භික්ෂූන් වහන්සේලා කලින් කවට නළුවකුව සිටි භික්ෂූන් වහන්සේගෙන් මෙසේ ඇසූහ.

"ආයුෂ්මත්නි, අර පෙනෙන කවට නළුවාද ඔබ දැක්වූවා වූ කවට සංදර්ශනම පැවැත්වීමට යයි. ඔබට ඒ ජීවිතය මතක් වී ඒ ජීවිතය ගැන ඇල්මක් ඇති නොවන්නේ ද?" "නැත ආයුෂ්මත්නි"යි එම භික්ෂූන් වහන්සේ පිළිතුරු දුන්හ. අනෙක් භික්ෂූන් වහන්සේලා මොහු බොරුවක් කියනු ඇතැයි සිතා එය බුදුන් වහන්සේට සැළ කළහ.

"මහණෙනි, මා පුත් බොරුවක් මුසාවක් නොකියයි. හෙතෙම සියලු ගැට මුදා හළ තැනැත්තෙකි"යි බුදුරජාණන් වහන්සේ පවසා මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (417 ගාථාව)

මානුසකං යොගං හිත්වා දිබ්බං යොගං උපච්චගා
සබ්බයොගවිසංයුත්තං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

මානුසකං යොගං: (යමෙක්) මානුෂික ආයුෂ හා පඤ්ච කාමය; **හිත්වා**: අතහැර; **දිබ්බං යොගං**: දිව්‍යායුෂ හා දිව්‍ය පඤ්චකාමය; **උපච්චගා**: ඉක්මවූයේ ද; **සබ්බයොග විසංයුත්තං**: සියලු බැඳුම් වලින් වෙන් වූ; **තං**: එම පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණොකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: ප්‍රකාශ කරමි.

මානුෂික වු හෝ දිව්‍යමය බැඳුම් ලිහා දමා සියලු යෝග යන්ගෙන් නිදහස් වූ පුද්ගලයා බමුණොකැයි මම පවසමි.

විවරණය

මෙම ගාථා ධර්මය කවට නළුවකු පිළිබඳ කථා පුවතක් නිසා ප්‍රකාශයට පත් වෙයි. මෙම නළුවා පැවිදි වීමෙන් පසුව දැඩි උත්සාහයෙන් භාවනා කටයුතු වල යෙදෙමින් ආගමික අභිමතාර්ථය සාධනය කර ගන්නා ලද්දෙකි. විමුක්ති සාධනය සඳහා ඉවහල් වන්නා වූ මෙම ප්‍රයත්නය පධාන - උත්සාහය යනුවෙන් හැඳින්වෙයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි සය වැනි අංගය ලෙස සඳහන් වන සම්මාවායාම හෙවත් සම්‍යක් පධානය සතරාකාර වෙයි. එය **"චත්තාරො සම්මප්පධානා"** යනුවෙන් හැඳින්වෙයි. එම සතර ආකාර සම්‍යක් ප්‍රධානය මෙසේ දැක්වෙයි.

1. උපන්නා වූ අකුසල ධර්මයන් ප්‍රහානය කිරීමට දැරෙන උත්සාහය
2. නුපන්නා වූ අකුසල ධර්මයන් නූපදවීමට ගන්නා උත්සාහය
3. උපන්නා වූ කුසල ධර්මයන් වැඩි දියුණු කිරීමට ගන්නා උත්සාහය.
4. නුපන්නා වූ කුසල ධර්මයන් උපදවීම සඳහා ගන්නා වු උත්සාහය.

මෙම සතර සම්‍යක් පධානය පහත සඳහන් පරිද්දෙන් ද හඳුන්වා තිබේ.

1. (සංවර පධාන) ඉවත් කිරීමේ උත්සාහය
2. (පහාන පධාන) යටපත් කිරීමේ උත්සාහය
3. (භාවනා පධාන) වර්ධනය කිරීමේ උත්සාහය
4. (අනුරක්ඛනා පධාන) ආරක්ෂා කිරීමේ උත්සාහය

භික්ෂුව තමන්ගේ නූපන්නා වු අකුසල ධර්මයන් නූපදවීම සඳහා උත්සාහ කරයි. වීර්යය ආරම්භ කරයි. සිත දැඩිව උත්සාහයෙහි යොදවයි. උපන්නා වු අකුසල ධර්මයන් යටපත් කිරීමට - නුපන් කුශල ධර්මයන් ඉපදවීමට - උපන්නා වු කුශල ධර්මයන් වැඩි දියුණු කිරීමට උත්සාහ දරයි. වීර්යය ආරම්භ කරයි. සිත දැඩිව පවත්වා ගනියි.

1. මහණෙනි, දුරු කිරීමට දරන උත්සාහය කිමෙක් ද? රූපයක් හෝ ශබ්දයක් හෝ ගන්ධයක් හෝ රසයක් හෝ ස්පර්ශයක් හෝ ලැබ එහි සමස්තයෙහි හෝ කොටසක නො ඇලෙයි ද ඒවා අරභයා මතුව එන සියලු අකුසල සිතුවිලි සම්පූර්ණයෙන් ඉවත් කොට දමයි ද සංවර නොවු ඉන්ද්‍රියන් නිසා ඇති වන රාග දොස මොහාදී සියලු අකුසල සිතුවිලි නුපදවා සිටියි ද එය දුරු කිරීමට දරණ උත්සාහය නම් වෙයි.

2. යටපත් කිරීමේ උත්සාහය කිමෙක්ද? භික්ෂුව කිසිදු කාමරාග සිතුවිල්ලක්, පැන නැගිය හැකි කිසිදු ආකාර පව්ටු සිතුවිල්ලක් ඇති වීමට ඉඩ නොදෙයි ද පලවා හැරීමට උත්සාහ දරයි ද එය යටපත් කිරීමේ උත්සාහයයි.

3. වර්ධනය කිරීමේ උත්සාහය කිමෙක් ද? භික්ෂුව බොධ්‍යංගයන් වර්ධනය කරයි ද ඒවා නම් කවරේදයත් සතිය, ධර්මය පිළිබඳ විමර්ශනය (ධම්ම විචය) සමාධිය, වීර්යය, ප්‍රීතිය, සන්සුන්භාවය, උපේක්ෂාව යන මේවායි. මේවා වර්ධනය කිරීමට වැඩි දියුණු කිරීමට දරන උත්සාහයයි.

4. ආරක්ෂාකර ගැනීමට, පවත්වා ගැනීමට දරණ උත්සාහය යනු කිමෙක්ද? භික්ෂුව තරයේ දැඩිව අරමුණෙහි සිත තැන්පත් කරයි ද සිත ඊට බද්ධ කොට පවත්වා ගනියිද ඒ වු කලි ආරක්ෂා කර ගැනීමේ උත්සාහයයි.

පස්කම් ගුණ විසයයෙහි ඇල්ම හා මහණ දම්හි දලකිරුම් තැනැත්තා බ්‍රාහ්මණයා ය.

418. හිත්වා රතිඤ්ච අරතිඤ්ච
සීතිභූතං නිරූපධිං
සබ්බලොකාභිභුං වීරං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:36)

රතිය ද අරතිය ද හැර
සිසිල් වූ බැඳුම් රහිතව
සියල් ලොව මැඩලූ විරුවා
බමුණෙකැයි පවසමි මම

සිත සිසිල් වූයේ බමුණායි.

26 (36) කවට නළුවකුව සිටි භික්ෂුවකගේ කථාව (ගාථා 418)

මෙම ගාථා ධර්මය බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වෙසෙන සමයෙහි දේශනා කරන ලද්දේ කලින් කවට නළුවකුව සිටි භික්ෂුවක අරභයායි.

මෙම ගාථා ධර්මයට වස්තු වූ කථාව බොහෝ සෙයින් මුලින් දැක් වූ කථාවට සමානය. මෙහිදී දක්නට ලැබෙන්නේ ගාථා ධර්මයේ අන්තර්ගතයේ වෙනස පමණි.

විවරණාත්මක අනුවාදය (418 ගාථාව)

රතිඤ්ච අරතිඤ්ච හිත්වා සීතිභූතං නිරූපධිං
සබ්බලොකාභිභුං වීරං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි.

රතිඤ්ච: රාගය ද; **අරතිඤ්ච**: විරාගය ද; **හිත්වා**: අතහැර; **සීතිභූතං**: සිසිල් වූ; **නිරූපධිං**: කෙලෙසුන්ගෙන් තොර; **සබ්බලොකාභිභුං**: සියලු ලෝකය මැඩ පැවැත්වූ; **වීරං**: වීරයා; **තං**: එබඳු පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බ්‍රාහ්මණයෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

රාගය හා විරාගය යන දෙකම අත්හළ, කෙලෙස් නිවීමෙන් සිසිල් බවට පත් වූ, චතුර්විධ උපදි නැත්තා වූ සියලු ස්කන්ධ ලොකය අභිභවනය කළා වූ ඒ වීරයා බ්‍රාහ්මණයෙකැයි මම පවසමි.

විවරණය

නිරූපධි: උපධීන්ගෙන් විමුක්ත වු යන අදහසයි. උපධි සතරක් අට්ඨකථාවන්හි දක්වා තිබේ. ඒවා නම්:

1. පංච උපාදනස්කන්ධය,
2. කාමය,
3. මානසික ක්ලේෂ ධර්ම
4. කර්මය.

නිරුපධි යන්න සුත්‍රවල නිබඳ යෙදී ඇත්තේ නිර්වාණය විස්තර කොට දක්වනු සඳහාය. සබ්බූපධිපටිනිස්සසග්ග යන වචනය සූත්‍රවල යෙදී ඇත්තේ නිවන හැඳින්වීමටයි.

උපධීන් ගෙන් වෙන්වීමෙන් විවෙකය ලබා ගත හැකි බව නිද්දෙස පාලියෙහි දැක්වෙයි. එහි ත්‍රිවිධ විවේකයක් ගැන සඳහන් වෙයි.

1. **කාය විවෙක**: කාය විවේක යනු කාම වස්තූන්හි සිත් බැඳවීමට සමත් වන ස්ථාන හැරපියා ඒකකීව විසීමෙන් ඇති වන ශාරීරික විවේකයයි.

2. **චිත්ත විවෙක**: චිත්ත විවේක යන්නෙන් අදහස් වන්නේ කාම වාස්තූන් කෙරෙහි සිත යෙදෙවීමෙන් තොර වීම නිසා ඇති වන මානසික විවේකයයි.

3. **උපධි විවේක**: උපධි විවේක යනු පැවැත්මට මූලාධාර වන ක්ලේෂ ධර්මයන් ගෙන් වෙන්ව සිටීමයි.

වීරං: වීරයා යන අදහසින් යෙදී ඇත. ආධ්‍යාත්මික වීර්යවත් බවින් යුක්ත පුද්ගලයා හැඳින්වීම සඳහා මෙම වචනය භාවිත වී ඇත. ක්ලේෂ ප්‍රහාණය කිරීමේ දී පුද්ගලයකු සතු විය යුතු ආධ්‍යාත්මික ප්‍රයත්නය හෙවත් ව්‍යායාමය වීර්යය ලෙස සැලකෙයි. වීර්යයෙන් යුක්ත පුද්ගලයා වීර වශයෙන් සැලකිය හැකිය. ඉන්ද්‍රිය හා බල යන අංශ දෙකටම අයත් වන ගුණ ධර්මයක් ලෙසින් ද සූත්‍ර ධර්මයන්හි වීර්යය හඳුන්වා ඇත. පංච බල පංච ඉන්ද්‍රිය යන කොටස් දෙකටම ඇතුළත් වන අංගයක් ලෙස වීර්ය යන ගුණය බුදු දහමින් සැලකිල්ලට ගැනෙයි. එබැවින් වීර්යය බලයක් ලෙසද ඉන්ද්‍රියයක් ලෙසද සැලකෙයි.



බවයෙහි නො ඇලී යහපත් සේ නිවණට ගිය සිවුසස් දහම් තැනැත්තා බ්‍රාහ්මණයා ය.

419. චුතිං යො වෙදි සත්තානං
උපපත්තිඤ්ච සබ්බසො
අසත්තං සුගතං බුද්ධං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:37)

සත්වයන්ගේ විපත දන්නේ
හැම ලෙසින් ඔවුන් සතු උපත ද
නො ඇළුණු මනාගති හා දැනු මැති
බමුණෙකැයි පවසම් ඔහු

ඇලීම් හා කලකිරීම් ඇති කර ගන්නෝ

26 (37) වංගීස තෙරුන් පිළිබඳ කතා පුවත (ගාථා 419-420)

රාජගහ නුවර අනුන් මියගිය පසු කවර තැනක උපදින්නේදැයි පවසන **වංගීස** නම් බ්‍රාහ්මණයෙක් විසීය. හෙතෙම මළගිය පුද්ගලයාගේ හිස් කබල රැගෙන එයට තට්ටු කොට මොහු අපායෙහි උපන්නේය, තිරිසන් ගතියෙහි නැතහොත් මිනිස් ලොව උපන්නේය යනුවෙන් පවසයි.

අනෙක් බමුණෝ මොහු යොදවා මිනිසුන්ගෙන් මුදල් අයකර ගැනීමට හැකියයි සිතූහ. එසේ සිතා ඔහුට රතු වස්ත්‍ර දෙකක් හඳවා ඔහු ද රැගෙන මිනිසුන් රැස්වන තැන්වලට ගොස් මෙම වංගීස මළ මිනිසුන්ගේ හිස් කබල බලා ඔවුන් උපදින තැන කියන්නට දක්ෂයෙකි. ඔබලා ගේත් මළගිය ඥාතීන් උපත ලද තැන් දැන ගැනීමට කැමැත්තේ නම් ඔහුගෙන් අසා දැන ගත හැකිය"යි පවසති. මිනිස්සු එය අසා තම තමන්ගේ ඥාතීන් උපත ලද තැන් දැන ගැනීමට උනන්දුවෙන් ඔහුට මුදල් දුන්හ.

මේ පිරිස මෙසේ තැනින් තැනට යමින් මුදල් රැස් කරමින් වරෙක සැවැත් නුවරට පැමිණ ජේතවනාරාමයට නුදුරුව කඩාරම් ගසා ගෙන එහි පදිංචි වූහ. එසේ සිටියදී ඔවුනට මිනිසුන් මල් ගඳවිලවුන් ගෙන විහාරයට යනු දක්නට ලැබිණ. ඔවුන් එසේ යාමට හේතුව මිනිසුන් ගෙන් දැන ගැනීමට ඔවුනට හැකි විය. "විහාරයට ගොස් දහම් අසා කුමක් කරන්නද, අපේ වංගීස බමුණා මෙන් දක්ෂයෙක් මුළු රටේම නැත. ඔහුට මියගියවුන් උපන් තැන් කීමට හැකිය"යි ඔවුහු විහාරය දහම් ඇසීමට යන මිනිසුන්ට කීහ. එවිට බුද්ධ ශ්‍රාවක වූ එම පිරිස "ඔබලාගේ වංගීස බමුණා කවරෙක් ද? අපේ බුදුරජාණන් වහන්සේගේ අසළකින් වත් තැබිය හැකිද? මුළු ලෝකයේම බුදුන් වහන්සේට සම කළ හැක්කෙක් නැතැයි කීහ. නමුත් වංගීසගේ පිරිස එය නොපිළිගත්හ. තම කීම ඔප්පු කිරීමට ම ඔවුහු තැත් කළහ. මෙසේ ඔවුනතර විවාදයක් ද හට ගත්තේ ය. අන්තිමේ දී බුද්ධ ශ්‍රාවක පිරිස "එසේ නම් එන්න විහාරයට ගොස් බුදුන් හමුව මේ කාරණය නිරාකරණය කරගත හැකි"යි පැවසූහ. එයට කැමැති වූ දෙපිරිසම විහාරයට ගොස් බුදුන් හමුවූහ.

බුදුන් වහන්සේ මේ පිරිස තමා හමුවට එන බව කලින්ම දැන මළගිය පුද්ගලයන් පස් දෙනෙකුගේ හිස් කබල් පහක් ගෙන්වා ගෙන ඒවා පෙළට තිබූහ. මේ හිස් කබල් පිළිවෙලින් අපායෙහි, තිරිසන් ලෝකයෙහි, මිනිසුන් අතර, දෙවියන් අතර උපන්නවුන්ගේ හා (පස්වැන්න) පිරිනිවන් පෑ රහතන් වහන්සේ නමකගේ ද විය.

වංගීස ඇතුළු පිරිස බුදුන් වෙතට පැමිණි කල්හි, "වංගීස ඔබ මළවුන්ගේ හිස් කබල්වලට තට්ටු කොට ඔවුන් මිය ගොස් උපන් තැන කියන්නෙහිදැ"යි ඇසූහ. "එසේය මම එක් එක් හිස් කබලක් ගෙන ඒ ඒ අය උපන් තැන කියන්නෙමි"යි වංගීස පැවසීය. "එසේ නම් මේ හිස් කබල් බලා එසේ කියන්නැ"යි බුදුන් වහන්සේ වංගීසට පැවසූහ. පළමුවැන්න පිරික්සා බැලූ හෙතෙම මෙය නිරයෙහි උපන්නෙකුගේ යයි පැවසීය. එවිට බුදුන් වහන්සේ "මැනවි වංගීස ඔබ නිවැරදිව කියති"යි ප්‍රසංශා කළහ. අනතුරුව හෙතෙම දෙවැන්න ගෙන මෙය තිරිසනුන් අතර උපන්නෙකු ගේ යයි ද තෙවැන්න මිනිසුන් අතර උපන්නකුගේ යයිද සිවුවැන්න දෙවියන් අතර උපන්නෙකුගේ යයි ද පැවසීය. හෙතෙම පස්වැනි හිස් කබල ගෙන එයට තට්ටු කොට බලා එයින් වික්ෂිප්ත භාවයට පත් විය.

ඔහුට එය කාගේදැයි කීමට හැකියාවක් නොවීය. එවිට බුදුන් වහන්සේ, "වංගීස, ඔබ එය නොදන්නෙහිදැ"යි විමසූහ. "එසේය. ස්වාමීනි, මට එය කිව නොහැකිය"යි වංගීස පැවසීය. බුදුරජාණන් වහන්සේ එය තමා දන්නා බව පැවසූහ. එවිට වංගීස ස්වාමීනි, එසේ නම් එය දැන ගන්නා මන්ත්‍රය මට ද දෙනු මැනවැයි ඉල්ලා සිටියේ ය.

"භික්ෂුවකට නොවන කෙනෙකුට එය ඉගැන්විය නොහැකි"යි බුදුන් වහන්සේ පැවසූහ. "ඉදින් මම මේ ශාස්ත්‍රය ද දැනගතහොත් මම මේ ජම්බුද්වීපයටම අග්‍ර පුද්ගලයෙක් වන්නෙමි. එබැවින් කෙසේ හෝ එය ගත යුතුය"යි සිතූ වංගීස, ඔහුගේ අනිත් පිරිසට තමන් මන්ත්‍රය ඉගෙන පැමිණෙන තෙක් තමාගෙන් ඉවත්ව සිටින ලෙස පවසා බුදුන් වහන්සේගෙන් පැවිද්ද ඉල්වා සසුනෙහි භික්ෂුවක් බවට පත් විය. උන්වහන්සේ වංගීස තෙරුන් වහන්සේ නමින් ප්‍රකට වූහ.

වංගීසට බුදුන් වහන්සේගෙන් භාවනාව සඳහා අවශ්‍ය කමටහන් ලැබිණ. ඒ කමටහන් ඔස්සේ සිත මෙහෙයවීමට බුදුන් වහන්සේගෙන් ලැබුණ උපදෙස් පරිදි හෙතෙම ක්‍රියා කළේය. ලොව අනිත්‍යය අවබෝධ කළ වංගීස තෙරුණුවෝ නොබෝ කලකින්ම රහත් බවට පැමිණියහ. උන්වහන්සේ අරභයා ඉහත සඳහන් ගාථා ධර්මය බුදුන්වහන්සේ විසින් ප්‍රකාශ කරන ලදි.

විවරණාත්මක අනුවාදය (419 ගාථාව)

යො සත්තානං චුතිං ච උප්පත්තිඤ්ච සබ්බසො වෙදි
අසත්තං සුගතං බුද්ධං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

යො: යමෙක්; **සත්තානං**: සත්වයන්ගේ; **චුතිං ච**: මියයාම ද; **උප්පත්තිඤ්ච**: ඉපදීම ද; **සබ්බසො**: හැම ලෙසින්ම; **වෙදි**: දැනගත්තේ ද; **අසත්තං**: කම් සැපයෙහි නො ඇළුණා වූ; **සුගතං**: මනා පැවතුම් ඇති; **බුද්ධං**: (සිව්සස්) අවබෝධ කළා වූ; **තං**: එම පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බ්‍රාහ්මණයකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

යමෙක් සත්වයන්ගේ චුතිය හා උත්පත්තිය සියලු ආකාරයෙන් දැන ගත්තේ ද, කම් සැපතෙහි නො ඇළුණු මනා පැවතුම් ඇති අවබෝධය ලබාගත් එබඳු පුද්ගලයා, බමුණෙකැයි මම පවසමි.



දෙවි-මිනිස්සු යමෙකු ගේ ඉපැද්ම නො දනිද්ද කෙලෙස් නැසූ ඒ තැනැත්තා බ්‍රාහ්මණයා ය.

420. යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා ඛීණාසවං අරහන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:38)	යමෙනකුගේ ගතිය නො දනිත් ද දෙව් ගඳඹු සත්වයෝ කෙලෙස් නැසූ අරහත් වූ කෙනෙක් බමුණෙකැයි කියමි

නොදත් ගති ඇත්තා බමුණෙකි

26 (37) වංගීස තෙරුන් පිළිබඳ කතා පුවත (ගාථා 419-420)

විවරණාත්මක අනුවාදය (420 ගාථාව)

යස්ස ගතිං දෙවා ගන්ධබ්බමානුසා න ජානන්ති
ඛීණාසවං අරහන්තං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

යස්ස: යමෙකු ගේ; **ගතිං**: (උත්පත්ති) ගතිය; **දෙවා**: දෙවියෝද; **ගන්ධබ්බමානුසා**: ගාන්ධර්වයෝ හා මිනිස්සු ද; **න ජානන්ති**: නොදනිත්ද; **ඛීණාසවං**: අශ්‍රවයන් ක්‍ෂය කළ; **අරහන්තං**: රහත් වූ; **තං**: එම පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

දෙවි මිනිස් ගන්ධබ්බ යන අය යම් කිසිවකුගේ උත්පත්ති ගතිය නොදනිත්ද, එබඳු වූ ක්‍ෂය කළ කෙලෙස් ඇති රහතන් වහන්සේම බමුණෙකැයි මම පවසමි.

විවරණය.

මෙම කථාව පුද්ගලයන්ගේ චුත වීම හා යළි ඉපදීම දැන ගන්නා චුතූපපාත ඥානය හා සම්බන්ධ වෙයි. මෙම දැනුම ෂඩ් විධ අභිඥාවන් අතුරෙන් එකකි. අභිඤ්ඤා සයක් ගැන ඡළභිඤ්ඤා යනුවෙන් සූත්‍ර ධර්මයන්හි සඳහන් වෙයි. මේවා අතිමානුෂික ඥාන විශේෂයන් ලෙස දැක්විය හැකිය. සාමඤ්ඤඵල වැනි සූත්‍රවල මෙම අභිඥා සඳහන් කරන විට "අතික්කන්ත මානුසකෙ" යනුවෙන් විශේෂ කොට දක්වා ඇත. එයින් අදහස් වන්නේ මෙම ඥාන විශේෂ මිනිසුන්ගේ සාමාන්‍ය දැනුම වන ඉන්ද්‍රියඥානය ඉක්මවා ඇති බවයි. එබැවින් ඒවා අතිමානුසික ඥාන යනුවෙන් විස්තර කොට දැක්වෙයි. මෙම අභිඥා සයෙන් පහක්ම ලෞකික පක්‍ෂයට අයත් වෙයි. අවසානයෙහි සය වැන්න වශයෙන් දැක්වෙන ඥානය ලෝකෝත්තර වූ ඥානයකි. ලෞකික අභිඥා පස ඉද්ධි විධ, දිබ්බසොත, චෙතොපරිය, දිබ්බචක්ඛු හා පුබ්බෙනිවාස යනුවෙන් දැක්වෙයි. ලෝකෝත්තර වූ අභිඥාව වන්නේ ආසවක්ඛය ඤාණයයි.

"මහණෙනි, භික්‍ෂුව විවිධ වූ සෘද්ධි බලයන් ලබා ගනියි. එක් කෙනකු ලෙස සිට බොහෝ දෙනකු වී යළි එක් කෙනකු බවට පත් වෙයි. කිසිදු අවහිරයක් නොමැතිව පවුරු පර්වත තුළින් ගමන් කරයි. සුළඟ ගමන් කරන්නාක් මෙනි. ජලයෙහි මෙන් පොළොවෙහි කිමිදී යළි මතු වෙයි. පොළොවෙහි මෙන් ජලයෙහි ගමන් කරයි. පියාපත් ඇති කුරුල්ලන් මෙන් අරමිනිය ඔතාගෙන අහසෙහි ගමන් කරයි. තම අතින් සඳහිරු පහසයි. මෙබඳු බෙහෙවින් බලවත් සෘද්ධි ප්‍රාතිහාර්ය පෑමේ බලය අත්පත් කර ගනියි."

දිවැසින් (**දිබ්බචක්ඛු, යථා කම්මූපග ඤාණ, චුතූප්පාත ඤාණ**) සත්වයන් මෙලොවෙන් චුතවන සැටිත් දැක ගනියි. තමන්ගේ කර්මයන්ට අනුකූලව උසස් පහත්, රූමත් විරූපී, ලෙස සත්වයන් උපත ලබන ආකාරය ඔහුට දැක ගත හැකි වෙයි. කායික වාචසික හා මානසික වශයෙන් වන අකුශල කර්මයන් මෙන්ම රහතුන් ගැරහීම හා මිසදිටු ගැනීම වැනි ක්‍රියාකාරකම් වලට අනුව ඔවුන් මරණින් මතු පහත් ජන්මයන්හි, සතර අපායන්හි හා දුක් සහිත නිරයන්හි උපත ලබන සැටිත් කුසල කර්මයන් කළවුන් සුබ සහගත ජන්මයන්හි, දිව්‍ය මනුෂ්‍ය භවයන්හි උපත ලබන ආකාරයත් දැක ගනියි.

භික්‍ෂුව පෙර විසූ කඳ පිළිවෙල (පුබ්බෙ නිවාස) සිහිපත් කරයි. එක් ජාතියක් ජාති දසදහසක්, ආදි වශයෙන් නොයෙක් ආකාර ජාතීන්හි විසූ ආකාරය සිහිපත් කිරීමට ඔහුට හැකි වෙයි. "මෙබඳු නම්ගොත් වලින් මම විසුවෙමි. එයින් මිය ගොස් වෙනත් භවයක උපන්නෙමි. එහිදී මම මේ මේ නම් ගොත්වලින් විසුවෙමි ආදී වශයෙන් අනෙක ජාතීන්හි විසූ ආකාරය දැන ගනියි.

සියලු කෙලෙසුන්ගේ නිරෝධයෙන් (ආසවක්ඛය) මේ ජීවිතය තුළදීම චිත්ත විමුත්තිය මෙන්ම පඤ්ඤා විමුත්තිය ද ලැබ අවබෝධ කොට ගෙන ප්‍රත්‍යක්‍ෂ කර ගනියි."

පෙර-මතු-වත්මන් බවයන්හි පස්කඳ කෙරෙහි කරදර නැත්තා බ්‍රාහ්මණයා ය.

421. යස්ස පුරෙ ච පච්ඡා ච
මජ්ඣෙ ච නත්ථි කිඤ්චනං
අකිඤ්චනං අනාදානං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26.39)

යමෙකුට පෙර හා පසු
මැද ද නැත කිසිවක්
කිසිත් නැති ඇලුම් නැති
හෙතෙම බමුණකු වෙතැයි පවසමි.

ඇළුම් බැඳුම් නැති කිසිවක කෙනෙකි බමුණු නියම ලෙසට

26 (38) ධම්මදින්නා තෙරණියගේ කථාව (ගාථා 421)

ධම්මදින්නා නම් වූ බිරිය ජීවත්ව සිටිය දීම **විශාඛ** නමැති ස්වාමි පුරුෂයා බුදුන්ගෙන් ධර්මය අසා අනාගාමී ඵලයට පැමිණියේය.

එබැවින් තම සියලු ධන ධාන්‍යාදිය තම බිරිය වූ ධම්මදින්නාට පැවරීමට විශාඛ කල්පනා කළේය. ධම්මදින්නා කවුළුවෙන් තමා දෙස බලා සිටින විට ඇයට සිනහවකින් සංග්‍රහ කිරීම විශාඛ ගේ පුරුද්දක් විය. නමුත් මේ දිනයෙහි ද ඇය කවුළුවෙන් බලා සිටිය ද ඇයට සිනහවකින් සංග්‍රහ නොකරම විශාඛ පැමිණි සැටි දුටු ධම්මදින්නා මෙදින තම ස්වාමියාගේ වෙනස තේරුම් ගැනීමට අපොහොසත් වූවාය. එබැවින් ස්වාමියා අහර අනුභව කරන විට දැන ගනිමියි සිතා ගත්තාය. දිවා භොජනයට වාඩි වූ ස්වාමියාට ධම්මදින්නා පිළියෙල කොට තිබූ ආහාරය පිළි ගැන්වූවාය. "එන්න, අප දෙදෙනාම එකට අහර ගනිමු"යි විශාඛ වෙනදා පැවසුවත් මෙදින එසේ නොකියාම නිහඬව තනිවම අනුභව කළේය. ස්වාමියා කිසිවකට තරහෙන් ඇතැයි ධම්මදින්නා සිතුවාය. ආහාරයෙන් පසුව අසුනක වාඩිගත් විශාඛ ධම්මදින්නා කැඳවා මෙසේ කීවේය. "ධම්මදින්නා, මේ නිවසෙහි ඇති සියලු ධනය ඔබටය. එය භාර ගන්න." තරහෙන් සිටින කෙනෙකු තම ධනය නොපවරන බව සිතූ ධම්මදින්නා, මෙහි අදහස කිමෙක්දැයි සිතා ස්වාමියාගෙන් විමසා සිටියාය. "හිමියනි, සියලු ධනය මට පැවරුවහොත් ඔබට වන්නේ කුමක්ද?" "අද පටන් මම තවදුරටත් ලෞකික වැඩවල නිරත නොවෙමි." එවිට ධම්ම දින්නා මෙසේ කීවාය. "ඔබට එපා වූ ධනය මට අවශ්‍ය වන්නේ කෙසේද මට භික්ෂුණියක් වීමට අවසර දෙන්න." "ධම්මදින්නා, කොතරම් යහපත් ඉල්ලීමක් ද? මගේ විරුද්ධත්වයක් නැත. පැවිදි වන්නැයි විශාඛ ධම්මදින්නාට පැවිදි වීමේ අවසරය දුන්නේය. ස්වාමියා තමාට පැවරූ ධනය භික්ෂුණී ආරාමයකට පුද කළ ධම්මදින්නා නොබෝ දිනකින්ම පැවිදි වී උපසම්පත්තිය ද ලබා ධම්මදින්නා තෙරණියයි ප්‍රසිද්ධ වූවාය. ධම්මදින්නා තෙරණිය ටික දිනකින්ම භික්ෂුණීන් පිරිසක් ද සමඟ කමටහන් ද ගෙන රජගහ නුවරින් පිටත්ව කුඩා ගමකට පැමිණ භාවනාවෙහි යෙදෙමින් රහත් බව ලබා ගැනීමට සමත් වූවාය. ඉන් පසු යළිත් රජගහ නුවර සැපත් ඕ තොමෝ එහි මෙහෙණවරක විසුවාය. ධම්මදින්නා යළි පෙරලා පැමිණි පුවත ඇසූ විශාඛ උපාසකතුමා ඇය හමුවට පැමිණ ඇයගෙන් ධර්මය පිළිබඳ ප්‍රශ්න සතරක් ඇසුවේය. සෝවාන්, සකෘදාගාමි හා අනාගාමී තත්වයන් පිළිබඳව ඇසූ එම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු දුන් ධම්මදින්නා අරහත්භාවය සම්බන්ධයෙන් ඇසූ ප්‍රශ්නයට පිළිතුරු නොදී මෙසේ කීවාය. "උපාසකතුමනි, මේ සතර වැනි ප්‍රශ්නයට පිළිතුරු දීමට මම අපොහොසත් වෙමි. ඊට පිළිතුරු ඔබට බුදුන් හමුවුවහොත් අසා දැනගත හැකියයි" පැවසුවාය. විශාඛ බුදුන් හමුව සිදු වූ තොරතුරු පවසා සිවු වැනි ප්‍රශ්නය බුදුන් හමුවෙහි තැබුවේය. "උපාසක තුමනි, ධම්මදින්නා මගේ දියණිය ප්‍රශ්නවලට කදිමට පිළිතුරු දී ඇත. මේ ප්‍රශ්නයට ද ඇයගේ පිළිතුරු සෑහෙනු ඇතැයි පැවසූ බුදුන් වහන්සේ මෙම ගාථා ධර්මය දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (421 ගාථාව)

යස්ස පුරෙ ච පච්ඡා ච මජ්ඣෙ ච කිඤ්චනං නත්ථි
අකිඤ්චනං අනාදානං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි

යස්ස: යම් කෙනෙකුට; **පුරෙ ච**: අතීතයෙහි ද; **පච්ඡා ච**: අනාගතයෙහි ද; **මජ්ඣෙ ච**: වර්තමානයෙහි ද; **කිඤ්චනං**: කිසි අල්වා ගැනීමක්; **නත්ථි**: නැද්ද; **අකිඤ්චනං**: අල්වා ගැනීමක් නැති; **අනාදානං**: උපාදානය කිරීමක් නැති; **තං**: එබඳු පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බමුණෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

යමකු තුළ අතීත වර්තමාන අනාගත යන කාලයන්ට අයත් වන කිසිවක අල්ලා ගැනීමක් නැද්ද, එබඳු අල්වා ගැනීම් නැති, උපාදාන වශයෙන් ග්‍රහණය කිරීම් නැති පුද්ගලයා බ්‍රාහ්මණයෙකැයි මම පවසමි.

විවරණය

ධම්මදින්නා තෙරණියගේ කථාව: මෙම ශාසනයට අයත් කාලයෙහි ධම්මදින්නා වූ කලි රජගහ නුවර විශාඛ නම් වූ ධනවත් සිටුවරයකු ගේ භාර්යාවයි. විශාඛ බිම්බිසාර රජුගේ හිතවතෙක් විය. බුදුන් කෙරෙහි අතිශය පැහැදීමකින් සිටි බිම්බිසාර රජු සමඟ වේළුවනාරාමයට ගොස් බුදුන් වහන්සේ දැකීමේ භාග්‍යය විශාඛට ලැබිණ. හෙතෙම ධර්මය අසා සෝතාපත්ති ඵලයට පත් වූයේ ය. නිවසට ආපසු පැමිණීමේදී යන විට සිටි තත්වයට වඩා වෙනස් වූ පුද්ගලයකු වශයෙන් විශාඛ ධම්මදින්නාට වැටහිණ. මේ වෙනසට හේතුව කිමෙක්දැයි ධම්මදින්නා සිය සැමියාගෙ න් විමසීය. එවිට හෙතෙම බුදුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙන් පසු තමාගේ සිතෙහි ලෞකිකත්වයෙහි නො ඇලෙන තත්වයට පත්ව ඇතැයි පැවසුවේය. මේ වෙනස තමාට ද ලබා ගැනීමෙහි කැමැත්ත දැක් වූ ධම්මදින්නා විශාඛගෙන් අවසර ලබා ගෙන විහාරයට ගොස් බුදුන් හමුව ධර්මය අසා පැහැදී භික්ෂුණී තත්වයට පත් වූවාය. තමන් භික්ෂුණී තත්වයෙහි අසාර්ථක වුවහොත් ගිහිගෙය හැර පියා පැවිදිවීමේ අර්ථයක් නැති බව සිතූ ඕ තොමෝ ආගමික අධිගමයන් ලැබීම උදෙසා දැඩි සේ උනන්දු වූවාය. එනිසා ඇයට නොබෝ කලකින් රහත් බව ලබා ගැනීමට හැකි විය. පිට ප්‍රදේශයක සිට බවුන් වඩා රහත් බව ලබා විහාරයට යළි සැපැමිණි ධම්මදින්නාට තමාගේ කලින් ස්වාමියාව සිටි විශාඛ මුණ ගැසින. එහිදී විශාඛ ධම්මදින්නා පැවිද්දෙහි ප්‍රතිඵල ලබා ගත්තේදැයි දැන ගැනීම සඳහා ඇයගෙන් මාර්ගඵල පිළිබඳ ප්‍රශ්න කිහිපයක් ඇසුවාය. රහත් ඵලය පිළිබඳ ප්‍රශ්නයට හැර අනෙක් ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු දුන් ධම්මදින්නා සිවුවැනි ප්‍රශ්නයට පිළිතුරු බුදුන් වහන්සේගෙන් අසා දැන ගන්නැයි පැවසුවාය. එසේ පැවසුවේ එම ප්‍රශ්නයට පිළිතුරු දීමට තරම් දැනුමක් තමාගේ තිබුන ද එම පැහැදිලි කිරීම් තේරුම් ගැනීමට තරම් මුහුකුරා ගිය දැනුමක් විශාඛට නොතිබූ බැවිනි. බුදුන් වහන්සේ පුද්ගලයන්ගේ සිත් හසර දැන ඊට අනුව ධර්මය දේශනා කරන බැවින් ධම්මදින්නා එසේ කීවාය. විශාඛ ගොස් බුදුන්ගෙන් විමසූ විට උන්වහන්සේ ධම්මදින්නා ගේ දැනුම ද පවසා ඉහත සඳහන් ගාථා ධර්මය දේශනා කළ සේක. බුදුන් වහන්සේ සැකෙවින් පවසන ධර්මය විස්තර කොට ප්‍රකාශ කිරීමේ ශක්තිය ධම්මදින්නා සතු වූ බැවින් බුදුන් වහන්සේ භික්ෂුභික්ෂුනීන් අග්‍රස්ථානයන්ට පත් කරන අවස්ථාවෙහි සැකෙවින් පැවසූ ධර්මය විස්තර විභාග කොට කියන භික්ෂුණීන් අතුරෙන් අග්‍රස්ථානය ඇයට පිරිනැමූ සේක.

බියනැති සතුරන් දිනූ ආසා නැති කෙලෙස් මල (=කිලුටු) සෝදාහළ නැනැත්තා බ්‍රාහ්මණයා ය.

422. උසභං පවරං වීරං
මහෙසිං විජිතාවිනං
අනෙජං නහාතකං බුද්ධං
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:40)

උසස් උතුම් විරුවකු වන
කෙලෙස් දිනූ මහ ඉසිවර
නොකැලැල් පිවිතුරු දැනුමැති
කෙනෙක්ම බමුණකැයි කියමි

කෙලෙස් දිනා පිරිසිදු වූ - කෙනෙකුයි බමුණකු වන්නේ

26 (39) අංගුලිමාල තෙරුන්ගේ කතාව (ගාථා 422)

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වෙසෙන සමයෙහි **අංගුලිමාල තෙරුන්වහන්සේ** අරභයා මෙම ගාථා ධර්මය දේශනා කළ සේක.

"ආයුෂ්මත් අංගුලිමාල, ඔබ දරුණු ඇතකු ඉදිරියේ ඡත්‍රයක් අල්ලාගෙන සිටියදී ඔබට බියක් ඇති වුයේ නැද්ද"යි භික්ෂූන් ඇසූ විට අංගුලිමාල තෙරුන් වහන්සේ "මට එසේ බියක් දැනුනේ නැතැයි පැවසූහ. මේ සිද්ධිය බුදුන් වහන්සේට සැළ කළ භික්ෂූහු අංගුලිමාල තෙරුන් බොරුවක් කියා ඇතැයි පළ කළහ. "මහණෙනි, මා පුත් අංගුලිමාලට බියක් නැත. මා පුත් අංගුලිමාල වැනි වූ සියලු භික්ෂූහු දුශ්චරිතයන්ගෙන් වෙන්ව කෙලෙසුන් දිනා උත්තම බවට පත්ව සිටිති. එබඳු උතුමන්ට කිසිවිට බියක් ඇති නොවේය"යි පවසමින් බුදුන්වහන්සේ යථොක්ත ගාථා ධර්මය ප්‍රකාශ කළ සේක.

විවරණාත්මක අනුවාදය (422 ගාථාව)

උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං අනෙජං
නහාතකං බුද්ධං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි.

උසභං: භය සන්ත්‍රාසය නොමැති; **පවරං**: උතුම් වූ; **වීරං**: වීර්යවත් වූ; **මහෙසිං**: මහත් ඉසිවරයකු වන; **විජිතාවිනං**: කෙලෙසුන් මැඩ පැවැත්වූ; **අනෙජං**: තෘෂ්ණා රහිත වූ; **නහාතකං**: කෙලෙස් සෝදා හළ; **බුද්ධං**: සත්‍යය අවබෝධ කළ; **තං**: එබඳු පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බ්‍රාහ්මණයෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: පවසමි.

භය සන්ත්‍රාසය නොමැති උතුම් වීර්යවත් වූ කෙලෙසුන් දිනූ නිකැලැල් වූ කෙලෙසුන් සෝදා හළ සත්‍යය අවබෝධ කළ තැනැත්තා බමුණෙකැයි මම පවසමි.

විවරණය

අංගුලිමාල තෙරුන්ගේ කථාව: අංගුලිමාල තෙරුන් වහන්සේ සම්බුද්ධ ශාසනය තුළ බෙහෙවින් ප්‍රසිද්ධියට පත් භික්ෂුවකි. කෝසල රජුගේ පුරෝහිත වූ භග්ගව නම් බ්‍රාහ්මණයාගේ පුත්ව උපන් අහිංසක කුමරු පසුව අංගුලිමාල නමින් ප්‍රසිද්ධ වුයේ සිය ගුරුවරයාගෙන් ලැබුණු නියෝගයක් ඉටු කිරීමට යාම නිසාය. අහිංසක ඉගෙනීම සඳහා තක්සලා නුවර දිසාපාමොක් ආචාර්යවරයා වෙත ගොස් ඉතා දීප්තිමත් ශිෂ්‍යයෙක්ව ඉගෙනීමේ කටයුතු කරගෙන යාමේ දී ඊට ඊර්ෂ්‍යා කළ අනෙක් ශිෂ්‍යයෝ මොහුට විරුද්ධව කුමන්ත්‍රණය කළහ. ආචාර්යවරයාගේ බිරිය සමඟ අහිංසකගේ අනියම් සම්බන්ධයක් ඇතැයි අනෙක් ශිෂ්‍යයෝ බොරුවක් ගොතා ආචාර්යවරයාට පැවසූහ.

එයින් කිපුණු ආචාර්යවරයා අහිංසක ඉගෙනීම අවසන් කොට ආපසු යාමට අවසර ගැනීමේ දී ගුරු දක්ෂිණාව වශයෙන් ඉටු කළ නොහැකි දෙයක් ඉල්ලා සිටියේය. එය ඉටු කරන්නට යාමෙන් අහිංසක මිනිසුන් අතින් මරණයට පත් වන බව ආචාර්ය වරයා දැන සිටියේය. ඔහුගේ ඉල්ලීම වුයේ එක මිනිසකුගෙන් එක ඇඟිල්ල බැගින් කපා ගෙන ඇඟිලි දහසක් ගුරු ප්‍රදක්ෂිණාව ලෙස පුද දෙන ලෙසයි. ගුරු දක්ෂිණාව ඉටු නොකළහොත් තමන් උගත් ශාස්ත්‍රය නොපිහිටන බව එකල තිබූ විශ්වාසයකි. අහිංසක කිසිවකුට හිංසා නොකරන, බෙහෙවින් විනීත ශිෂ්‍යයකු බැවින් ගුරුවරයාගේ ඉල්ලීම ඉටු කිරීමට ද ඔහුට නොහැකිය.

එහෙත් ගුරුවරයාගේ ඉල්ලීම කිසිසේත් වෙනස් නොවුණ බැවින් එය කෙසේ හෝ ඉටුකරමියි සිතා ගත්තේය. එබැවින් හෙතෙම වනගත ප්‍රදේශයකට ගොස් තමන් ඉදිරියට එන මිනිසුන්ගෙන් එක් කෙනකුගෙන් එක ඇඟිල්ල බැගින් කපා ගෙන ඒවා රැස් කරන්නට විය. ඇඟිලි කපා තැනක තැබුව හොත් ඒවා සතුන් කා විනාශ වනු ඇතැයි සිතූ ඔහු කැපූ ඇඟිලි එකට ගොනු කර මාලයක් මෙන් තනා තම ගෙලෙහි දමා ගත්තේය. එබැවින් හෙතෙම අංගුලිමාල නමින් ප්‍රසිද්ධ විය. අංගුලිමාල මිනිසුන්ගේ ඇඟිලි කැපීමේ සිද්ධිය මුළු ප්‍රදේශයේම පතළ වන්නට විය. ඔහුගේ නම ඇසූ තරමින් මිනිස්සු භය වූහ.

එබැවින් කිසිවකු ඒ ප්‍රදේශයෙන් යාමක් නොකළහ. ඔහු ජනතාවට මහත් බියක් ගෙනදුන් හෙයින් මිනිසුන්ගේ පෙළඹවීම මත ඔහු මරා හෝ ජීවග්‍රහණයෙන් හෝ ගැනීමට රජුගෙන්ද රාජ සෙබළුනට නියෝග නිකුත් විය. රාජ පුරුෂයන් සිය පුතු අල්වා ගැනීමට යන බව දැන ගත් අංගුලිමාල ගේ මව පුතු එයින් බේරා ගැනීමට සිතා ඔහු හමුවන අදහසින් ගෙදරින් පිටත් විය. මේ වන විට අංගුලිමාල මිනිසුන් නවසිය අනූනවයකගෙන් ඇඟිලි එක් රැස්කර ගෙන තිබිණ. ගුරුදක්ෂිණාවට අඩුව තිබුනේ තව එක ඇඟිල්ලක් පමණි. තමාට හමුවන ඕනෑම කෙනෙකුගෙන් ඒ ඇඟිල්ල ලබා ගැනීමේ චෙතනාව අංගුලිමාල ගේ සිත තුළ පැසවමින් තිබිණ.

මව අංගුලිමාල හමුවීමට නියමිත දිනයේදී මහාකරුණාවෙන් ලොව බලා වදාරණ බුදුරජාණන් වහන්සේට අංගුලිමාලගෙන් සිදු වීමට යන මේ මහා අපරාධය ගැන දැන ගන්නට ලැබිණ. තමා එහි ගොස් අංගුලිමාල දමනය නොකළහොත් මව මරා මාතෘඝාතක පාප කර්මයට හසුවන බවත් තමා ගියහොත් ඔහු දමනය කිරීමෙන් ඔහුට රහත් බවට පැමිණීමේ හේතු සම්පත් මතුකර ගත හැකි බවත් උන්වහන්සේ දිවැසින් දුටහ. එබැවින් උන්වහන්සේ අංගුලිමාලට මව හමුවීමට කලින් එහි යාමට පිටත් වූහ. අතර මගදී මිනිස්සු බුදුන් වහන්සේ අංගුලිමාලගේ අඩවියට පිවිසීමට යන බව දැන අනතුරු ඇඟවූහ.

එහෙත් බුදුන්වහන්සේ ඒ අනතුරු හැඟවීම් නොතකා ඉදිරියටම වැඩියහ, අංගුලිමාල අද මගේ බලාපොරොත්තුව ඉෂ්ට කරගත හැකිය. ඉදිරියෙන් එන ශ්‍රමණයාගේ ඇඟිල්ල කපාගෙන ගුරුදක්ෂිණාව කළ හැකියයි සිතා කඩුවද ඔසවා ගෙන බුදුන් පසුපස දිව ගියේය. බුදුන් වහන්සේ තම පියවි ගමනින්ම වැඩම කළත් අංගුලිමාලට උන්වහන්සේ ලුහුබැඳ සමීපයට පැමිණීමට නොහැකිවිය. බොහෝ වේලාවක් බුදුන් ලුහුබඳිමින් හති වැටී සිටි අංගුලිමාල "මහණ නොදුවා නවතින්නැ"යි කීවේය. එවිට බුදුන්වහන්සේ "අංගුලිමාල මම නැවතී සිටිමි. ඔබත් නවතින්නැ"යි පැවසූහ. අංගුලිමාලට එය ප්‍රහේලිකාවක් විය. "මේ ශ්‍රමණයා ගමන් කරමින්ම නැවතී සිටිමියි කියයි. නැවතී සිටින මට නවතින්නැයි කියයි. මෙහි අදහස කුමක්දැයි සිතූ අංගුලිමාල ඔබ ඔය කියන නැවතීම කුමක්දැයි ඇසීය.

එවිට බුදුන් වහන්සේ ඔහුට කාරුණිකව ධර්මය කියා දුන් සේක. රහත් වීමේ හේතු සම්පත් හැඟවී තිබූ අංගුලිමාලට බුදුන් කියන දෑ මනාව වැටහිණ. එබැවින් හෙතෙම අත තිබූ කඩුව පසෙකට ලා දිව අවුත් බුදුන් පාමුල වැටී වැඳ සමාව ඇයැද සිටියේ ය. බුදුන් වහන්සේ ධර්මය අසා පැහැදුණු අංගුලිමාල උන්වහන්සේගෙන් පැවිද්ද අයැද සිටියේය. ඊහි භික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි උපසම්පදාව ලත් අංගුලිමාල තව දුරටත් බුදුන් වහන්සේගේ ධර්ම දේශනාවට සවන් දෙමින් රහත් බවට ද පත් විය.

ඉපැද්ම නැසුවා වූ ද දත යුතු දේ මනා නුවණින් දැන නිම වූ ද, බඹසර වැය නිමනූ ද, තැනැත්තා බ්‍රාහ්මණයා ය.

423. පුබ්බෙ නිවාසං යො වේදී	දත්තේ යමෙක් ද පෙර විසුම්
සග්ගාපායඤ්ච පස්සති	දකියි ද දෙව්ලොව හා අපායත්
අථො ජාතික්ඛයං පත්තො	උපන් හැම ගෙවමින්
අභිඤ්ඤා වොසිතො මුනි	මනා දැනුමෙන් රහත් වූ
සබ්බවොසිත වොසානං	කළයුතු හැම කළා වූ
තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං (26:41)	හෙතෙමේ වේය බමුණෙක්

දන්දෙන්නා හා ලබන්නා

26 (40) බුදුන්ට උණුදිය සැපයූ බමුණෙකුගේ කතාව (ගාථා 423)

බුදුරජාණන් වහන්සේ සැවත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සමයෙහි **දෙවාහිත** නම් වූ බමුණාකු නැගූ ප්‍රශ්නයක් අරභයා මේ ගාථා ධර්මය දේශනා කළ සේක.

බුදුරජාණන් වහන්සේ කිසියම් ශරීරාබාධයකින් පෙළුණු විටෙක පරිභෝජනය සඳහා උණු ජලය අවශ්‍ය වී උපවාන තෙරුන් අමතා දෙවාහිත නම් වූ බමුණාගෙන් උණුදිය ඉල්ලාගෙන ඒමට දැනුම් දුන්හ. උපවාන තෙරුන්වහන්සේ බමුණා හමු වී බුදුන්වහන්සේගේ ශරීරාබාධය ගැන පවසා උන්වහන්සේ උණුදිය ඉල්වා ගෙන එන ලෙස පැවසූ බව දැනුම් දුන්හ. බමුණා බෙහෙවින් සතුටට පත්විය. "ඒ මට කෙතරම් වාසනාවක් දැයි පවසමින් බුදුන්වහන්සේට පිරිනැමීම සඳහා උක්සකුරු බඳුනක්ද උණුදිය ද සපයා තම අතවැස්සකු අතෙහි ඒවා විහාරයට යැව්වේය. තෙරුන් වහන්සේ උණු දියෙන් බුදුන් නහවා උක්සකුරු උණුදිය හා මුසු කොට බුදුන්වහන්සේට පානය සඳහා සකසා දුන්හ. එය වැළඳූ බුදුන් වහන්සේ ක්ෂණිකවම සුවපත් වූහ.

උණුදිය හා සකුරු බුදුන් වහන්සේට සැපයූ දේවාහිත බමුණා ඒවා දීමෙන් පසුව මෙසේ සිතුවේය. "කවරෙකුට නම් දානයක් පිරිනැමීමෙන් වැඩිම ආනිශංස ලැබිය හැකිද? බමුණා බුදුන්වහන්සේ හමුවීමට ගොස් මෙම ප්‍රශ්නය උන්වහන්සේට ඉදිරිපත් කළේය. බුදුන්වහන්සේ පිළිතුරු දෙමින් මෙබඳු වූ ගුණ ඇති කෙනෙකු දෙන දානයෙන් වැඩිම ආනිශංස ලැබිය හැකියයි පවසා යථොක්ත ගාථා ධර්‍මය දේශනා කළ සේක.

විවරණාත්මක අනුවාදය (423 ගාථාව)

යො පුබ්බෙ නිවාසං වේදි සග්ගාපායඤ්ච පස්සති
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤා වොසිතො මුනි
සබ්බවොසිත වොසානං තං බ්‍රාහ්මණං අහං බ්‍රෑමි.

යො: යමෙක්; **පුබ්බෙ නිවාසං**: පෙර විසූ කඳ පිළිවෙල; **වේදි**: දන්නේද; **සග්ගාපායඤ්ච**: ස්වර්ගය හා අපාය ද; **පස්සති**: දකියි ද; **අථො**: ඉක්බිති; **ජාතික්ඛයං**: උත්පත්තීන්ගේ අවසානයට; **පත්තො**: පත් වූයේ; **අභිඤ්ඤා**: ශ්‍රේෂ්ඨ දැනුමෙන්; **වොසිතො**: සියලු කෙලෙස් නිම කළේ; **මුනී**: රහත් වූයේ ද; **සබ්බවොසිත වොසානං**: කෙලෙස් නැසීම සඳහා කළ යුතු සියල්ල කොට නිමවූ; **තං**: එබඳුවූ පුද්ගලයා; **බ්‍රාහ්මණං**: බ්‍රාහ්මණයෙකැයි; **අහං**: මම; **බ්‍රෑමි**: කියමි.

තමන් පෙර විසූ කඳ පිළිවෙල දන්නා වූ, සුගතිය හා අපාය ද දකින්නා වූ, තමන්ගේ ජාතික්ෂයට පැමිණියාවූ මාර්ගඥානය ලබමින් රහත් බවට පත්වූවා වූ කෙලෙසුන් නැසීම සඳහා කළ යුතු සියලු දෑ කොට නිමවූ පුද්ගලයා බමුණෙකැයි මම පවසමි.

විවරණය

උපවාන තෙරුන්ගේ කතාව: මෙම ගාථා ධර්මයට පදනම් වූ කථා වස්තුව අනුව බුදුරජාණන් වහන්සේ තමාට දෙවාහිත බමුණාගෙන් උණුදිය ගෙන්වා ගන්නේ උපවාන තෙරුන්වහන්සේ අත පණිවිඩයක් යැවීමෙනි.

උපවාන තෙරුන් වහන්සේගේ අතීත ජීවන කථාවෙන් වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් වන්නේ පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරුවය. මෙම බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු උන්වහන්සේගේ ශරීරික ධාතූන් වහන්සේලා නිධන් කිරීම සඳහා අති විශාල චෛත්‍යයක් ඉදිවෙමින් පැවතිණ. ඒ අවධියෙහි උපවාන දිළිඳු පුද්ගලයෙක්ව සිටියේය. ඔහුට ධාතූන් තැන්පත් කොට ඉදිවන චෛත්‍යයට පූජා කිරීමට තරම් වස්තුවක් තිබුනේ නැත. එහෙයින් හෙතෙම උඩුකය වසා ගැනීමට පාවිච්චි කෙරෙන සාටකය ගෙන සෝදා පිරිසිදු කොට එය ධජයක් මෙන් උණගසක රඳවා චෛත්‍යය අසල තැනක සිටුවා එය චෛත්‍යයට පූජාවක් වේවායි සිතුවේය.

අභිසම්මතක නම් වූ භූතයෙක් මෙම සාටකය රහසින් උණගසෙන් ගලවා චෛත්‍ය මස්තකයෙහි තැන්පත් කළේය. මෙය දුටු එම දිළිඳු පුද්ගලයා අතිශය ප්‍රීති ප්‍රමෝදයට පත් වූයේ ය. තමා කළ පුණ්‍ය කර්මය පිළිබඳව වඩ වඩාත් ප්‍රීති වීමේ හේතුවෙන් ඔහු උපන් සෑම ආත්මයකදීම ඔහුට මිනිසුන් අතර නායකත්වය හිමිවිය. බොහෝ ජාතීන්හි ඔහුට දෙවියන්ට අධිපත් සක් දෙවිඳුන්ව ඉපදීමටත් ඇතැම් ජාතීන්හි මනු ලොව චක්‍රවර්ති රජකුව ඉපදීමටත් එම පුණ්‍ය කර්මය හේතුභූත විය. ගෞතම බුද්ධ ශාසනයෙහි උපවාන තෙරුන් වීමට අවස්ථාව ලද ජාතියෙහි හෙතෙම බ්‍රාහ්මණ කුලයක උපවාන නමින් උපත ලද්දේය. බුදුන් වහන්සේ වෙතින් පැවිද්ද ලැබීමට පෙර හෙතෙම වේද පාරප්‍රාප්ත බ්‍රාහ්මණයකුව විසූවේය.

ආනන්ද තෙරුන් වහන්සේට පෙර බුදුන් වහන්සේගේ උපස්ථායක තනතුරෙහි ක්‍රියා කළේ උපවාන තෙරුන් වහන්සේයි. බුදුන් වහන්සේ අසනීප වන අවස්ථාවන්හි දායකයන් වෙත ගොස් බෙහෙත් සපයාගෙන ඒවා සකසා බුදුන් වහන්සේ සුවපත් කිරීමට උපවාන තෙරුන් වහන්සේ උනන්දුවෙන් ක්‍රියා කළහ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන අවස්ථාවෙහි උන්වහන්සේට පවන් සලමින් සිටියේ ද උපවාන තෙරුන් වහන්සේය. රහත් භවයට පත්ව සිටි උන්වහන්සේ අසූමහා ශ්‍රාවකයන් අතරට එක් වන්නෙකි.



ගාථා ආරම්භක පද අනුපිළිවෙළ

ගාථාවන්ගෙන් පළමුවන පදවල ඉදිරියේ ඇති අංකවලින් පෙනෙන්නේ ගාථාවල අංකයි. මේ අනුක්‍රමණිකාව සකස්කර ඇත්තේ පාලි අක්‍ෂර මාලාවේ අනුපිළිවෙළට අනුගතවය.

අ

අකක්කසං 408
අකතං දුක්කතං 314
අක්කොච්ඡි මං 3, 4
අක්කොධනං 400
අක්කොධෙන 223
අක්කොසං 399
අචරිත්වා 155, 156
අචිරං වතයං 41
අඤ්ඤාහි 75
අට්ඨීනං නගරං 150
අත්තදත්ථං 166
අත්තනා චොදයත්තානං 379
අත්තනාව කතං පාපං 161, 165
අත්තානං චෙ 157, 159
අත්තානමෙ'ව පඨමං 158
අත්තා හවෙ ජිතං 104
අත්තාහි අත්තනො 160, 380
අථ පාපානි කම්මානි 136
අථ වස්ස අගාරානි 140
අත්ථම්හි ජාතම්හි 331
අනවට්ඨිත චිත්තස්ස 38
අනවස්සුත චිත්තස්ස 39
අනික්කසාවො කාසාවං 9
අනුපුබ්බෙන මෙධාවී 239
අනූපවාදො අනූපඝාතො 185
අනෙකජාති සංසාරං 153
අන්ධභූතො අයං 174
අපි දිබ්බෙසු කාමෙසු 187
අපුඤ්ඤලාභො ච 310
අප්පකා තෙ මනුස්සෙසු 85
අප්පමත්තො 29, 56
අප්පමාදරතා හොථ 327
අප්පමාදරතො භික්ඛු 31, 32
අප්පමාදෙන මඝවා 30
අප්පමාදො අමතපදං 21
අප්පම්පි චෙ සහිතං 20
අප්පලාභොපි චෙ 366
අප්පස්සුතායං පුරිසො 152
අභයෙ ච භය 317
අභිත්ථරෙථ කල්‍යාණෙ 116
අභිවාදන සීලස්ස 109
අභූතවාදී නිරයං 306
අයසාව මලං 240
අයොගෙ යුඤ්ජමත්තානං 209
අලඞ්කතො චෙපි සමං 142
අලජ්ජිතාය ලජ්ජන්ති 316
අවජ්ජෙ වජ්ජමතිනො 318
අවිරුද්ධං විරුද්ධෙසු 406
අසංසට්ඨං ගහට්ඨෙහි 404
අසජ්ඣායමලා මන්තා 241
අසතං භාවනමිච්ඡෙය්‍ය 73
අසාරෙ සාරමතිනො 11
අසාහසෙන ධම්මෙන 257
අසුභානුපස්සිං විහරන්තං 8
අස්සද්ධො අකතඤ්ඤූ ච 97
අස්සො යථා භද්‍රො 144
අහං නාගොව සංගාමෙ 320
අහිංසකා යෙ මුනයො 225

ආ

ආකාසෙ පදං නත්ථි 254, 255
ආරොග්‍ය පරමා ලාභා 204
ආසා යස්සං න විජ්ජන්ති 410

ඉ

ඉදං පුරෙ 326
ඉධ තප්පති 17
ඉධ නන්දති 18
ඉධ මොදති 16
ඉධ වස්සං 286
ඉධ සොචති 15

උ

උච්ඡින්ද සිනෙහ 285
උට්ඨානකාලම්හි 280
උට්ඨානවතො 24
උට්ඨානේනප්පමාදෙන 25
උත්තිට්ඨෙ නප්ප 168
උදකං හි නයන්ති 80, 145
උපනීතවයො ච 237
උය්‍යුඤ්ජන්ති 91
උසභං පවරං වීරං 422

එ

එකස්ස චරිතං 330
එකං ධම්මං 176
එකාසනං එකසෙය්‍යං 305
එතං ඛො සරණං 192
එතං දළ්හං 346
එතං විසෙසතො 22
එත මත්ථවසං 289
එතම්හි තුම්හෙ 275
එථ පස්සථිමං 171
එවං භො පුරිස 248
එවං සංකාරභූතෙසු 59
එසොව මග්ගො 274

ඔ

ඔවදෙය්‍යානුසාසෙය්‍ය 77

ක

කණ්හං ධම්මං 87
කයිරා චෙ 313
කාමතො ජායතී 215
කායප්පකොපං 231
කායෙන සංවරො 361
කායෙන සංවුතා 234
කාසාවකණ්ඨා 307
කිං තෙ ජටාහි 394
කිච්ඡො මනුස්ස 182
කුම්භූපමං 40
කුසො යථා දුග්ග 311
කො ඉමං පඨවිං 44
කොධං ජහෙ 221
කොනු හාසො 146

ඛ

ඛන්තී පරමං 184

ග

ගතද්ධිනො 90
ගබ්භමෙකෙ 126
ගම්භීර පඤ්ඤං 403
ගහකාරක දිට්ඨොසි 154
ගාමෙ වා යදි 98

ච

චක්ඛුනා සංවරො 360
චත්තාරි ඨානානි 309
චන්දංච විමලං 413
චන්දනං තගරං වාපි 55
චරං චෙ නාධිගච්ඡෙය්‍ය 61
චරන්ති බාලා 66
චිරප්පවාසිං පුරිසං 219
චුතිං යො වෙදි 419

ඡ

ඡන්දජාතො අනක්ඛාතෙ 218
ඡින්ද සොතං 383
ඡෙත්වා නද්ධිං 398

ජ

ජයං වෙරං පසවති 201
ජිඝච්ඡා පරමා 203
ජීරනති වෙ රාජරථා 151
ඣාය භික්ඛු මා 371
ඣායිං විරජමාසීනං 386

ත

තං පුත්ත පසුම්මත්තං 287
තං වො වදමි 337
තං ච කම්මං 68
තණ්හාය ජායතී 216
තතො මලා මලතරං 243
තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය 88
තත්‍රායමාදි භවති 375
තථෙව කතපුඤ්ඤම්පි 220

තසිණාය පුරක්ඛතා ... 342, 343
තස්මා පියං න ... 211
තස්මාහි ධීරංච ... 208
තිණාදෙසානි ඛෙත්තානි ... 356, 359
තුම්හෙ හි කිච්චං ... 276
තෙ ඣායිනො ... 23
තෙ තාදිසෙ පූජයතො ... 196
තෙසං සම්පන්නසීලානං ... 57

ද

දදති වෙ යථා ... 249
දන්තං නයනති ... 321
දිවා තපති ආදිච්චො ... 387
දිසො දිසං යං ... 42
දීඝා ජාගරතො ... 60
දුක්ඛං දුක්ඛ සමුප්පාදං ... 191
දුප්ප බ්බජ්ජං දුරභිරමං ... 302
දුන්නි ග්ගහස්ස ලහුනො ... 35
දුල්ලභො පුරිසා ... 193
දූරඞ්ගමං එකචරං ... 37
දූරෙ සන්තො පකාසෙන්ති ... 304

ධ

ධනපාලකො නාම ... 324
ධම්මං චරෙ සුචරිතං ... 169
ධම්මපීති සුඛං ... 79
ධම්මාරාමො ... 364

න

න අත්තහෙතු ... 84
න අන්තලික්ඛෙ ... 127, 128
න කහාපණ වස්සෙන ... 186
නගරං යථා ... 315
න චාහං බ්‍රාහ්මණං ... 396
න චාහු න ච ... 228
න ජටාහි ... 393
න තං කම්මං ... 67
න තං මාතා ... 43
න තාවතා ... 259
න තෙන අරියො ... 270
න තෙන ථෙරො ... 260
න තෙන පණ්ඩිතො ... 258
න තෙන භික්ඛු ... 266
න තෙන හොති ... 256
න තං දළ්හං ... 345
නත්ථි ඣානං ... 372
නත්ථි රාගසමො ... 202, 251
න නග්ගචරියා ... 141
න පරෙසං විලොමානි ... 50
න පුප්ඵගන්ධො ... 54
න බ්‍රාහ්මණස්ස ... 389
න බ්‍රාහ්මණස්සෙතද කිංචි ... 390
න භජෙ පාපකෙ ... 78
න මුණ්ඩකෙන ... 264
න මොනෙන මුනි ... 268
න වාක්කරණ මත්තෙන ... 262
න වෙ කදරියා ... 177
න සන්ති පුත්තා ... 288
න සීලබ්බතමත්තෙන ... 271
න හි එතෙහි ... 323
න හි පාපං කතං ... 71
නහි වෙරෙන ... 5
නිට්ඨංගතො අසන්තාසි ... 351
නිධාය දණ්ඩං ... 405
නිධීනංව පවත්තාරං ... 76
නෙක්ඛං ජම්බො ... 230
නෙතං ඛො සරණං ... 189
නෙව දෙවො න ... 105
නො වෙ ලභෙථ ... 329

ප

පංසුකූලධරං ජන්තුං ... 395
පංච ඡින්දෙ ... 370
පටිසන්ථාර වුත්තස්ස ... 376
පඨවිසමො නො ... 95
පණ්ඩුපලාසොව ... 235
පථව්‍යා එකරජ්ජෙන ... 178
පමාදං අප්පමාදෙන ... 28
පමාදමනුයුඤ්ජන්ති ... 26
පරදුක්ඛූපදානෙන ... 291
පරවජ්ජානුපස්සිස්ස ... 253
පරිජිණ්ණමිදං රූපං ... 148
පරෙ ච න විජානන්ති ... 6
පවිවෙකරසං පිත්වා ... 205
පස්ස චිත්තකතං ... 147
පාණිම්හි චෙ ... 124
පාපං චෙ පුරිසො ... 117
පාපානි පරිවජ්ජෙති ... 269
පාපොපි පස්සති ... 119
පාමොජ්ජබහුලො ... 381
පියතො ජායති ... 212
පුඤ්ඤඤ්චෙ පුරිසො ... 118
පුත්තා මත්ථි ... 62
පුප්ඵානි හෙව ... 47, 48

පුබ්බෙනිවාසං යො . . . 423
පූජාරහෙ පූජයතො . . . 195
පෙමතො ජායතී . . . 213
පොරාණමෙතං අතුල . . . 227

ඵ

ඵන්දනං චපලං . . . 33
ඵෙණූපමං කායමිමං . . . 46
ඵුසාමි නෙක්ඛම්ම . . . 272

බ

බහුම්පි චෙ සහිතං . . . 19
බහුං වෙ සරණං . . . 188
බාලසංගතචාරීහි . . . 207
බාහිත පාපො'ති . . . 388

භ

භද්‍රොපි පස්සති . . . 120

ම

මග්ගානට්ඨඞ්ගිකො . . . 273
මත්තා සුඛපරිච්චාගා . . . 290
මධුවා මඤ්ඤති . . . 69
මනුජස්ස පමත්තචාරිනො . . . 334
මනොපකොපං . . . 233
මනොපුබ්බඞ්ගමා . . . 1-2
මමෙව කතමඤ්ඤන්තු . . . 74
මලිත්ථියා දුච්චරිතං . . . 242
මාතරං පිතරං හන්ත්වා . . . 294, 295
මා පමාදමනුයුඤ්ජෙථ . . . 27
මාපියෙහි සමාගඤ්ජි . . . 210
මාප්පමඤ්ඤෙථ . . . 121, 122
මාවොච ඵරුසං . . . 133
මාසෙ මාසෙ . . . 70, 106
මිද්ධී යදා හොති . . . 325
මුඤ්ච පුරෙ . . . 348
මුහුත්තමපි චෙ . . . 65
මෙත්තාවිහාරී යො . . . 368

ය

යං කිංචි . . . 108, 312
යං හි කිච්චං . . . 292
යං වෙ විඤ්ඤූ . . . 229
යතො යතො සම්මසති . . . 374
යථා අගාරං . . . 13, 14
යථා දණ්ඩෙන . . . 135
යථාපි පුප්ඵරාසිම්හා . . . 53
යථාපි භමරො . . . 49
යථාපි මූලෙ . . . 338
යථාපි රහදො . . . 82
යථාපි රුචිරං . . . 51,52
යථා බුබ්බුලකං . . . 170
යථා සඞ්කාරධානස්මිං . . . 58
යදා ද්වයෙසු . . . 384
යම්හා ධම්මං . . . 392
යම්හි සච්චං ච . . . 261
යස්ස අච්චන්ත . . . 162
යස්ස කායෙන . . . 391
යස්ස ගතිං න . . . 420
යස්ස චෙතං . . . 250, 263
යස්ස ඡත්තිංසතී . . . 339
යස්ස ජිතං නාවජීයති . . . 179
යස්ස පාපං කතං . . . 173
යස්ස පාරං . . . 385
යස්ස පුරෙ ච . . . 421
යස්ස ජාලිනී . . . 180
යස්ස රාගො ච . . . 407
යස්සාසවා පරික්ඛීණා . . . 93
යස්සා'ලයා න . . . 411
යස්සින්ද්‍රියානි . . . 94
යං එසා සහතී . . . 335
යානිමානි අපත්ථානි . . . 149
යාව ජීවම්පි . . . 64
යාවදෙව අනත්ථාය . . . 72
යාවං හි වනථො . . . 284
යෙච ඛො සම්ම . . . 86
යෙ රාගරත්තා . . . 347
යෙසං සම්බොධි . . . 89
යෙසං සන්නිචයො . . . 92
යෙසං ච සුසමා . . . 293
යෙ ඣානපසුතා . . . 181
යො අප්පදුට්ඨස්ස . . . 125
යො ඉමං පලිපථං . . . 414
යො දණ්ඩෙන . . . 137
යො දුකඛස්ස . . . 402
යොගා වෙ ජායතී . . . 282
යොධ පුඤ්ඤං ච . . . 267, 412
යො නිබ්බානථො . . . 344
යො පාණමතිපාතෙති . . . 246
යො බාලො මඤ්ඤති . . . 63
යො මුඛ සඤ්ඤතො . . . 363
යො ච සමෙති . . . 265

යො ච වන්ත 10
යො ච පුබ්බෙ 172
යො ච බුද්ධඤ්ච. 190
යො වෙ උප්පතිතං 222
යො චෙතං සහතී 336
යො'ධ දීඝං වා 409
යො'ධ කාමෙ 415
යො'ධ තණ්හං 416
යො වෙ ගාථා 102
යො වෙ වස්සසතං 107-115
යො සහස්සං 103
යො සාසනං 164
යො හවෙ දහරො 382

ර

රතියා ජායතී 214
රමණීයානි අරඤ්ඤානි 99
රාජතො වා 139

ව

වචීපකොපං රක්ඛෙය්‍ය 232
වජ්ජං ච වජ්ජතො 319
වනං ජිනදථ 283
වර'මස්සතරා දන්තා. 322
වස්සිකා විය 377
වාචානුරක්ඛී මනසා 281
වාණිජොව භයං 123
වාරිජොව ථලෙ. 34
වාරි පොක්ඛරපත්තෙව 401
විතක්ක පමථී. 349
විතක්කූපසමෙ ච. 350
වීත තණ්හො අනාදනො 352
වේදනං ඵරුසං. 138

ස

සචෙ නෙරෙසි. 134
සචෙ ලභෙථ නිපකං. 328
සච්චං භණෙ න 224
සදා ජාගරමානානං. 226
සද්ධො සීලෙන 303
සන්තං තස්ස මනං 96
සන්තකායො සන්ත 378
සබ්බත්ථ වෙ. 83
සබ්බ දානං 354
සබ්බ පාපස්ස 183
සබ්බසංයොජනං. 397
සබ්බසො නාමරූපස්මිං. 367
සබ්බාභිභූ සබ්බ 353
සබ්බෙ තසන්ති. 129, 130
සබ්බ ධම්මා. 279
සබ්බෙ සඞ්ඛාරා 277, 278
සරිතානි සිනෙහිතානි 341
සලාභං නාතිමඤ්ඤෙය්‍ය. 365
සවන්ති සබ්බධී. 340
සහස්සම්පි චෙ 100, 101
සාරං ච සාරතො. 12
සාහු දස්සනමරියානං 206
සිංච භික්ඛු ඉමං 369
සීල දස්සනසම්පන්නං. 217
සුකරානි අසාධූනි. 163
සුඛං යාව ජරා 333
සුඛකාමානි භූතානි. 131, 132
සුඛා මත්තෙය්‍යතා 332
සුඛො බුද්ධානං. 194
සුජීවං අහිරිකෙන 244
සුඤ්ඤාගාරං පවිට්ඨස්ස 373
සුදස්සං වජ්ජං. 252
සුදුද්දසං සුනිපුණං 36
සුප්පබුද්ධං පබුජ්ඣන්ති 296-301
සුභානුපස්සිං විහරන්තං 7
සුරාමෙරය පානඤ්ච 247
සුසුඛං වත ජීවාම 197-200
සොබො පඨවිං. 45
සෙය්‍යො අයොගුළො 308
සෙලො යථා එකඝනො 81
සො කරොහි 236,238

හ

හත්ථ සඤ්ඤතො 362
හංසාදිච්චපථෙ යන්ති. 175
හනන්ති භොගා 355
හිත්වා මානුසකං 417
හිරී නිසෙධො. 143
හිත්වා රතිං ච 418
හිරීමතා ච. 245
හීනං ධම්මං න. 167

Dedication of Merits for Sponsoring the Printing of the Book "Treasury of Truth"

Sponsor Name	Dedicate To
Alice Thong	Lim Zhi Yu, All Sentient Beings, Buddhas, Dharma and Sangha of the ten directions
Alice Lee Kim Neo	Late Lee Tai San, Late Ng Siew Eng, Lee & Ng ancestors, Late Notail & Cutie and all Sentient Beings
Ang Sor Hoon	All Sentient Beings
Bein Siong	Wong Fatt Kum & Family, Wong Bein Shu & Family
Betty Tan S H	Late Tan & Lim ancestors, their late relatives & friends & all'sentient beings
Betty Teo	Late Joe Fan Djin
Buddhist Devotees	All Sentient Beings
Chan Kin Sung	Chan Peng Kwang & Family
Chen Mei Jiun	Chen Mei Jiun & Family
Chen Ruiling	Tan Beng Teck
Chen Su Qin	To all Sentient Beings in the lower realms
Chew Ah See	To all Sentient Beings in the lower realms
Chia Siew Eng	Late Chia Teck Soon, Late Loh Ah Kiaw, All sentient beings
Choong Siew Lan	
Chow Boon Kuan	Chong Siew Yeit, Chow Zhi Wei, Chow Hong Xin, Chow Jing Yuan
Chow Mei Pin	Chow Seng Yeok, Chow Boon Sang, Tan Swee Hong, Chow Yew Wah, Chow Ying Hua, Chow Mei Lee, Lim Soon Seng, Lim Jun Hong, Lim Jun Sheng, Chow Mei Lan, Late Chong Kim Loong, Late Chow Sim Poh, Late Yong Chor Ying, Late Goh Guan Eng, Late Chua Yin, Late Chong Tai Late Hong Shi Zhong, All sentient beings
Chua Lay Lian	All Sentient Beings
Chua Lee Cheng	Choo Somg Kee, Chua Lee Keng
Chuen Yun Lye	
Daniel Goh	Teo Ah Mui
Daniel Lee Chin Kian	Late Lee Tai San, Late Ng Siew Eng, Lee & Ng ancestors and all Sentient Beings
Dave Tan	Tan Mui Hoon, Tan Mui Cheng, Tan Sin Yee, Tang Kim Fong
Diana Tan	Late Tan & Lim ancestors, their late relatives & friends & all sentient beings
Diana Teo Ming Li	Teo & Lee ancestors and all Sentient Beings
Disciples of the Triple Gem	All Sentient Beings
Elena Lee Geok Lan	Late Lee Tai San, Late Ng Siew Eng, Lee & Ng ancestors, Late Notail & Cutie and all Sentient Beings
Eric Hu	Hu Zhenzhong & Family
Fong Lok Moi	All Sentient Beings
Foo See Fong	
Goh Sin Chien	To all Sentient Beings in the lower realms
Ha Pi Lian & Family	fn!oaO
Heng Joon Tiang	
Hung Chuan Song	Late Son, Leong Chong Hoe Raymond
Hung Guek Eng	All Sentient Beings
Hung Swee Ing	All Sentient Beings
Jackie Chang	Jackie Chang Jye Chyi & Family
James Yeo Siow Tong Mr. & Mrs. & Family	All Sentient Beings
Jasmine Yap Bee Hong	Jasmine & Family
Joan Wong	
Katherine Ang	Ang Shun Chui & All Sentient Beings
Kee Geok Suan	Late Husband, Ong Boon Tat
Khee Lai Lan	To all Sentient Beings in the lower realms
Koh Sai Keow & Family	Tan & Koh ancestors and all Sentient Beings
Kon Chin Yak and Goh Jessin	All Sentient Beings
Law Kay Hin	All Sentient Beings
Law Kian Peng	All Sentient Beings
Law Wah Ling	All Sentient Beings
Lee Chiew Beng	
Lee Guan Jie	
Lee Huijuan Raeanne	All Sentient Beings
Lee Huiying Nala	All Sentient Beings
Lee Kim Hock	All Sentient Beings
Lee Kim Leng Mr. & Mrs. & Family	Late Lee Tai San, Late Ng Siew Eng, Lee & Ng ancestors and all Sentient Beings
Lee Kim San Mr & Mrs. & Family	Late Lee Tai San, Late Ng Siew Eng, Lee, Late Yap Willie, Late Benson Lee Chin Wee, Lee & Ng ancestors and all Sentient Beings
Lee Wei Hong	
Leow Hoay Yee	Leow Beng Soon, Foo Kim Lian
Leow Lian Huay & Family	All Sentient Beings
Liew Hwee Fong	Late Ong Teck Seng
Liew Kim Chuan	Late Liew Guan Seng, Late Chng Sou, All sentient beings
Lim Sin Mian	Lim Hwee Tiong & family, Toh Ah Ee & family, Teo Kwang Eng & family, Late Lau Hong Wan, Late Neo Chew Huat

Low Kie Song and Family	Late Hung Koot Cheong
Lum Wan Chong	Late Yee Moy Moy
Lyndy Lee Kim Huay	Late Lee Tai San, Late Ng Siew Eng, Lee & Ng ancestors, Late Notail & Cutie and all Sentient Beings
Ma Yali	To all Sentient Beings in the lower realms
Mabel Loon Ting Ting	Wong Tock Lan & Family
Mary Tan Sock Keng	Tan & Koh ancestors and all Sentient Beings
Mei Yann Fen	
Mei Yann Wei	Wong Amoi, Chan Yuen Fung, Tse Yun Keung, Buddhas, Dharma and Sangha of the ten directions, All Sentient Beings, Mei Yea Lin
Mei Yea Lin	
Mei Yung Jian	Ong Hui Hua, Mei Le Xuan, Mei Le Yang
Michelle Heng Mui Shang	
Mr. Chong	Sabbe satta一切衆生
Ng Ah Suan	All Sentient Beings
Ng Gek Keng	
Ng Li May	All Sentient Beings
Ong Kian San & Family	All Sentient Beings
Ong Lin Kim & Family	Ong Lin Kim & Family, All beings
Ong Soon Sheng	Ong Cheng Aun & Family
Ong Tiaw Beng & Family	All Sentient Beings
Ong Wai Lit	Ong Wai Lit & Family
Patrick Lee Kim Yam Mr & Mrs. & Family	Late Lee Tai San, Late Ng Siew Eng, Late Lee Chin Kiat, Lee & Ng ancestors and all Sentient Beings
Poh Chin Huat Mr. & Mrs. & Family	All Sentient Beings
Raymond Leong	Late Leong Kam Thong, Late Kwok Chow Hoo, Leong Family
Rev. Weragoda Sunanda	Late father Mr. B. Dharmadasa and late sister B. I. Dharmalata
Robert Lee Kim Chuan Mr & Mrs. & Family	Late Lee Tai San, Late Ng Siew Eng, Lee & Ng ancestors and all Sentient Beings
Seah Chen Sin & Family	All Sentient Beings
Shirley Leong	Chan Chung Hor, Chan Yi Qing, Chan Jing Xiang
Shirley Tan	
Sin Fan Kiow	
Soh Poh Choo & Family	All Sentient Beings
Steve Hong	To whom in need
Tan Ai Teen	Late Husband, Hung Hoe Ping
Tan Cheng Song	All Sentient Beings
Tan Kong Chai	Late Tan Tua Tee @ Tan Keng Siang
Tan Lee Hiang	To all Sentient Beings in the lower realms
Tan Lee Yin	Tan Lee Yin & Family
Tan Siew Eng	Late Tan & Lim ancestors, their late relatives & friends & all sentient beings
Tan Wei Liang Shawn	All Sentient Beings
Tan Yi Ting	Tan & Toh ancestors and all Sentient Beings
Tan Yu Xuan	Tan & Toh ancestors and all Sentient Beings
Teng Sze Chew & Family	Teng Sze Chew & Family
Tenssy Ang	Ang Pei Yong & All Sentient Beings
Teo Ban Hong Mr & Mrs. & Family	Teo & Lee ancestors and all Sentient Beings
Teo Chin Chai Mr & Mrs. & Family	All Sentient Beings
Teo Chin Heng Mr & Mrs. & Family	All Sentient Beings
Teo Kian Guan Mr& Mrs. & Family	All Sentient Beings
Teo Kian Meng Mr & Mrs. & Family	All Sentient Beings
Teo Seow Ling & Family	All Sentient Beings
The Late Mr. Lee Weng Sung	All Sentient Beings
Toh Ah Poh	Tan & Toh ancestors and all Sentient Beings
Toh Lian Eng & Family	All Sentient Beings
Tse Hoi Ching	To all Sentient Beings in the lower realms
Tse Hoi Ying	To all Sentient Beings in the lower realms
Vanessa Ong Rong Xuan	Late Ong Bee Bee
Ven. Weragoda Sarada Nayaka Maha Thero	Late father Mr. G. A. Podisingho and late Mother Mdm. G. G. Emalishami
	Veronica Chan
Woo Wei Fen	Woo Wei Fen & Family
Yati & Family	Late Parents and ancestors
郑广量	To whom in need
陈淑喻	To whom in need

Through the high merit accruing from the sponsorship of this publication
may the sponsors achieve happiness, good health and prosperity.
May the merit accruing from the publishing of this book ensure eternal bliss to their dear departed ones.

Ven. Weragoda Sarada Nayaka Maha Thero
Chief Prelate, Singapore
27. 11. 2013

Members of the Maha Sangha whose voices were heard in the first Buddhist long-play record of Buddhist Sutra Chanting, 1972.
Seated (L-R) Ven. Upananda, Ven. M. Mahavira, Ven. P.. Pemaratana, Ven. Dr. K. Sri Dhammananda.
Standing (L-R) Ven. H. Hemasiri, Ven. G Gnanissara, Ven. W. Sarada, Ven. K. Piyananda, Ven. K. Pemaloka and Ven. B. Dhammaratana

SBMC
publications
Authored
By
Ven. Weragoda Sarada
Maha Thero




















THE GREATEST MAN WHO EVER LIVED
THE SUPREME BUDDHA


BUDDHA'S CONSTANT COMPANION VENERABLE ANANDA
VEN. WERAGODA SARADA MAHA THERO

TEACH YOURSELF PALI IN ENGLISH

THE HIGHEST BLESSING
VEN. WERAGODA SARADA MAHA THERO


The First Discourse of The Buddha
Ven. Narada Maha Thera


THE BUDDHIST WAY OF MEDITATION

"THE BUDDHA - WORD"


VANDANA
Buddhist Devotions


REFLECTION ON DEATH


DOCTRINAL & CULTURAL ASPECTS OF BUDDHISM
VEN. WERAGODA SARADA MAHA THERO


MEDITATION
ON LOVING KINDNESS
(KARANIYA METTA SUTTA)
REV. W. SARADA
THE SINGAPORE BUDDHIST MEDITATION CENTRE



FIRST SERMON OF THE BUDDHA


BUDDHIST DEVOTIONS

MAHA SATIPATTHANA SUTTA

BUDDHIST PROTECTIVE CHANTS


THE GREAT BOOK OF PROTECTION

Blessings to Conquer Sickness

THE HIGHEST BLESSING


The Great Book of Protection

Callers jam lines for free Buddhism book

S. TSERING BHALLA

MORE than 2,000 people have called up to ask for a free book of the core teachings of Buddha published by the Singapore Buddhist Meditation Centre.

They have been calling the centre and various other Buddhist centres, such as the Buddhist Mission and the Sri Lankara Buddhist Temple here, ever since The Straits Times published a news story on the book, Treasury Of Truth – Illustrated Dhammapada, on Feb 20.

Many of the callers are from places as far away as the United States, India, France and Britain. There were also calls from places nearer home, such as Jakarta, Kuantan and Penang, says the author of the book, Rev Sarada Weragoda Maha Thero.

He is not sure how they heard about the book.

The book was printed in Taiwan by the Corporate Body of the Buddha Educational Foundation.

The foundation bore the cost of the printing, which amounted to US$300,000 (S$477,000) for 10,000 copies.

The calls petered down to about 100 a day and then soared again after the book's review in Life! last Saturday.



Heartening though this development is for the meditation centre, which has been giving out the books for free, Rev Sarada is worried that they will not be able to keep up with the demand.

"There are over 2,000 requests for the book and we have only about 400 left, so we'll need to reprint the book. We hope the people who ask for the book will also donate towards its printing costs," he says.

He says the centre will have to print at least 10,000 copies because anything fewer than that will not be economically viable.

Mr Ee Fook Choy, the centre's president adds: " Although this is not at all a commercial venture, to ensure the book's continuity, the least people can do is contribute towards its reprinting cost."

It will cost S$277,000 to print the book, this time as the Taiwanese benefactors of the book have donated the colour separation films to the centre. This works out to be nearly S$28 per book.

The 900-page, hard-cover book is the first fully illustrated English translation of Buddhist teachings.

It contains all 423 verses of Lord Buddha's sayings, each of which is illustrated with specially-commissioned full-colour paintings X.

The illustrations are the work of well-known Sri Lankan artist P.Wickramanayaka.

The book has been described by the venerable Ananda Maitreya Maha Nayaka Thero, the patriarch of Buddhism in Sri Lanka, as a great contribution to literature on Buddhism.

(For enquiries on the book, call the Singapore Buddhist Meditation Centre on 6778-3330 between 8am and 9pm only.)

Books

Tenets of Buddhism with drawings

An unwise man who knows he is a fool is wise thereby. Knowing it not, he is truly a fool.

Hatred never conquers hatred. Only non-hatred conquers hatred.

No depraved vision, no heedlessness, and no low pursuits for worldly gains.

Religion

TREASURY OF TRUTH ILLUSTRATED DHAMMAPADA
by Weragoda Sarada Maha Thero
The Buddha Educational Foundation
Taipei / 1993 / 900 Pages

Francis Chin

THE Dhammapada, a collection of 423 verses in 26 chapters, has been a source of inspiration to Buddhists for more than 2,000 years.

Its trust is simple. Live a morally-pure life in a mental state of awareness and alertness. The opposite and sorry state is to be asleep, ignorant and unaware. Despite its high calling, the Dhammapada is full of simple workaday illustrations and examples that the Buddha used to drive home his lessons.

All that we experience begins with thought. Our words and deeds spring from thought.

If we speak or act with evil thoughts, unpleasant circumstances and experiences inevitably result. Wherever we go, we create bad circumstances because we carry bad thoughts. We cannot shake off this suffering as long as we are tied to our evil thoughts…

These words, which sum up the core teachings of Buddhism, make up the first verse of the Dhammapada, perhaps the best-known and most widely translated of the Buddhist scriptures.

Like Jesus Christ's Sermon on the Mount, Lao Tzu's Tao Te Ching and the Analects of Confucius, the Dhammapada text is pithy, conversational and memorable. Its advice is down-to-earth and practical, its exhortation inspiring and earnest and its instructions clear and concise.

And now, the latest English edition of this timeless treasure is a monumental work of over 500 large-sized pages with lavish illustrations for each verse.

The book was a labour of love for highly-regarded Sri Lankan scholar-monk, Weragoda Sarada Maha Thero.

The author has taught in several Buddhist institutions in Asia and is currently chief resident monk at The Singapore Buddhist Meditation Centre, which he founded in 1979.

His work is probably the most exhaustive English exposition of the Dhammapada, which surpasses easily the 669-page edition published in Malaysia in 1988.

Treasury of Truth gives the Pali text of each verse – this and Sanskrit were the two original languages used in Buddhist scriptures – with a line-by-line literal rendering in English.

This is followed by an elaborate explanatory translation and commentary, and a parable from the Buddha which phrases the verse in an everyday context. The final flourish is a painting in vivid colour.

The edition is not for casual reading. Its very size and weight require it to be placed on the desk for serious if not devotional study. It is a book that will reward amply the effort and time put in it.

The Dhammapada can be read again and again. Each reading will give you a new perspective and, depending on your disposition, stir you towards the pursuit of knowledge and light.

In Chapter Four on Flowers, for instance, the Buddha says:

As a bee gathers the nectar of a flower and flies away without destroying its beauty or fragrance, so let the sage wander in this life. Think not of the faults of others, of what they have done or not done. Think rather of your own errors.

Time and again the reader is exhorted to avoid evil deeds as a man who values his life avoids prison". The work goes into great length on the practical difficulties of moral living. Even the dull repetition of sacred verses is considered a taint on one's character.

But the greatest taint, one is told, is ignorance. The worst sin is deliberate ignorance of the truth.

On his deathbed, the Buddha told Ananda, his most faithful disciple:

You must be your own lamp and refuge. Take refuge in nothing outside yourself. Hold firm to the Truth as a lamp and a refuge, and do not look for anything as refuge besides yourself.

Treasury of Truth is not for sale. Those interested in obtaining a copy should contact the Singapore Buddhist Meditation Centre on 6778-3330.

Francis Chin, a Buddhist, is a sub-editor with The New Paper.







සනාතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක වේරගොඩ සාරද, ස්ථවිරයන් වහන්සේ අද ලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්ම දූත යතිනායක වරයාණන් වහන්සේ නමකි.

1941 නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

කර්තෘ ස්වාමීන්ද්‍රයන් වහන්සේ

වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක.

එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN: 981-00-4938-2